# පාර්ලිමේන්තු විවාද

**(හැන්සාඩ්)**

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**286 වන කාණ්ඩය**

தொகுதி 286

**Volume 286**

**(12.11.2021 — 22.11.2021)**

# INDEX

## TO

# PARLIAMENTARY DEBATES

## OFFICIAL REPORT

**Volume 286**

**2021**

Printed at the Department of Government printing. Sri Lanka

# PARLIAMENTARY DEBATES

## OFFICIAL REPORT

THE NINTH PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST
REPUBLIC OF SRI LANKA

**FIRST SESSION**

## INDEX

to

Volume 286

2021

# INDEX

TO THE

PARLIAMENTARY DEBATES

**FIRST SESSION OF THE NINTH PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

OFFICIAL REPORT
Volume 286

*12th November, 2021 - 22nd November, 2021*

EXPLANATION OF ARRANGEMENT AND ABBREVIATIONS

Bills: 1R., 2R., 3R.,- read First, Second and Third time

Bills are indexed under Bills and under the names of Ministers and Members presenting them and /or participating in debate. Private Members' Bills appear under the heading, 'Bills, Private'.

Boards, Corporations, Departments and other statutory bodies are generally indexed under the key word indicating the institution.

Ministers' Statements are indexed under 'Ministerial Statements, subject headings and under the names of the respective Ministers.

Motions, etc., are indexed under subject headings and under the names of Ministers and Members presenting them and / or participating in debate

Orders, Regulations, Resolutions and Rules appear under one heading starting with " Orders...."

Private Members' Motions are indexed under 'Private Members', Motions' and under the names of Members participating in debate.

Questions are indexed under five separate headings to facilitate reference, i.e. Questions by Private Notice; Questions, Adjournment; Questions, Oral; Questions, Prime Minister's; Questions, Written.

Questions are also indexed under the names of Members asking them and Minister's replying. Questions relating to matters of public importance are cross indexed under the subject heading.

Subjects discussed on Motions of Adjournment are indexed under the names of Members participating in debate and under 'Debates, Adjournment'.

Addl. - Additional
Admin. - Administration
Am. - Amendment
Assoc. - Association
Asst. - Assistant
Cert. - Certificate
Co. - Company
Com. - Committee
Comm. - Commission
Cons. - Consultative
Const. - Constitution
Co-op. - Co-operative
COPA - Com. on Public Accounts
COPE - Com. on Public Enterprises
Corp. - Corporation
Dep. - Deputy
Dept. - Department
Dev. - Development
Dist. - District
Div. - Division
Doc. - Document
DS - Divisional Secretariat
Exam. - Examination
Fed. - Federation
Found. - Foundation
Gen. - General
GN - Grama Niladhari
Govt. - Government
H.E. - His/Her Excellency
Info. - Information
Inst. - Institution
LSC - Legislative Standing Com.
Ltd. - Limited
MC - Municipal Council
Memo. - Memorandum
Mgt. - Management
MPP/MPs - Members of Parliament
Nom. - Nomination
Notifi. - Notification
Opp. - Opposed
Org. - Organization
PC - Provincial Council
PFC - Public Finance Com.
Pr. - Presented
Prov. - Provision
PS - Pradeshiya Sabha
Pvt. - Private
Ref. - Reference
Rep. - Report
Rev. - Reverend
SC - Supreme Court
SL - Sri Lanka
SO - Standing Order
SOC - Sectoral Oversight Com.
Sp. - Special
Sp's - Speaker's
Std. - Standing
Techno. - Technology
Temp - Temporary
UC - Urban Council
Unop. - Unopposed

**Note:** This Index has been prepared for the Uncorrected Hansard, The column numbers may slightly vary in the corrected version - Indexing Unit

**Abeygunawardhena, The Hon. Rohitha,** *M.P., Minister of Ports and Shipping:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1294-301

**Abeysinghe, The Hon. Ashok,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1217-20

Reference to:
Officers of M/ Defence, Visiting Govt. Institutions to Find Out about Persons Engaged in Protest, 894

**Adaikkalanathan, The Hon. Selvam,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 886-94

Reference to:
Development Programme Meeting:
invitation to MPP, 1046
Provincial Council Election, 889

**Ahamed, The Hon. Naseer,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1115-20

Reference to:
Koralai Pattu West Div.:
delimitation issues, 1119-20
Presidential Task Force for 'One Country One Law', 1119

**Alagiyawanna, The Hon. Lasantha,** *M.P., State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 912-6

**Alahapperuma, The Hon. Dullas,** *M.P., Minister of Mass Media:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 935-42

Petitions:
Sunil, Mr. Witharanage, Palatuwa, 1006

Reference to:
Anoma's Kitchen Programme on ITN, 869
Motor Car Racing Champion, Mr. Dilantha Malagamuwa, 870

**Alawathuwala, The Hon. J.C.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 462-6

**Alawathuwala, The Hon. J.C.:** *(Contd.)*
Debates, Adjournment:
Forest Protection in Puttalam District, 845-7

Questions, Oral:
Cardamom, Clove and Pepper Prices Drop:
financial assistance for cultivators, 1011-2

Reference to:
Nano Fertilizer Importation, 1015

**Ali Sabry, The Hon. M.U.M.,** *M.P., Minister of Justice:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 570-5

**Aluthgamage, The Hon. Mahindananda,** *M.P., Minister of Agriculture:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1273-80

Questions, Oral: Replies:
Rice, Maize, Green Gram, Cowpea, Ginger and Turmeric, Cultivation of: steps taken, 227-8

Reference to:
Hantana Lands and Mrs. Shamin Kiriella, 1279
Seed Production in Sri Lanka, 229-30

**Amarasena, The Hon. Thushara Indunil,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 801-5

Questions, Oral:
Community-Based Water Supply Projects:
Kurunegala District, 1177-8

Reference to:
Hon. Wimal Weerawansa, 803
SJB Rally: obstruction by the Police, 804

**Amarasuriya, The Hon. (Dr.) (Ms.) Harini,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 621-5
Bills, Private:
Shaili Edutainment Foundation (Inc.): 1R., 397

Reference to:
International Monitory Fund, 622

**Amaraweera, The Hon. Mahinda,** *M.P., Minister of Environment:*
Ministerial Statements:
Calcite Deposit in Balangoda, 717-9

**Annual Reports:**
Airport and Aviation Services SL, (2018):
Ministerial Cons. Com. Rep., 863

**Annual Reports:** *(Contd.)*
Audit Office, National (Annual Work Programme), 1164; PFC Rep., 1165
Auditor General, (2020), 1005
Cey Nor Foundation Ltd., (2017): Ministerial Cons. Com. Rep. 1165
Ceylon Fisheries Harbour Corp., (2018): Ministerial Cons. Com. Rep. 1165
Civil Aviation Authority SL, (2018): Ministerial Cons. Com. Rep., 863
Delimitation Commission, (2020), 862
Department of National Museums, (2020), 220
Homoeopathic Medical Council, (2015, 2016), 698
M/ Port and Shipping: ministerial reply on COPA Rep., 698
M/ Power and Energy and Business Development: ministerial reply on COPA Rep., 1005
Marine Environment Protection Authority, (2017, 2018), 1164
National Physical Planning Department, (2020), 1005
Office of Missing Persons, (2019), 539
Office of the Cabinet Ministers: ministerial reply on COPA Rep., 219
'Ranaviru Seva' Authority, (2019), 220
SM/ Production and Supply of Fertilizer and Regulation of Chemical Fertilizer and Insecticide Use, (2020), 220
Sri Lanka Airlines, (2018, 2019): Ministerial Cons. Com. Rep., 863
Sri Lanka Convention Bureau, (2019): Ministerial Cons. Com. Rep., 863
Sri Lanka Institute of Local Governance, (2018), 698
Sri Lanka Institute of Tourism and Hotel Management, (2014, 2015, 2016, 2017, 2018): Ministerial Cons. Com. Rep., 863
Sri Lanka Tourism Promotion Bureau, (2017, 2018): Ministerial Cons. Com. Rep., 863
State Pharmaceuticals Manufacturing Corp. of SL, (2019), 862

**Appuhamy, The Hon. Hector,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 444-51

Debates, Adjournment:
Forest Protection in Puttalam District, 843-5

Questions, Oral:
Ranawarapitiya Grama Niladhari Division: illegal gravel mining, 395-6

Reference to:
Puttlam District Flood Affected People, 449

**Arambepola, The Hon. (Dr.) (Mrs.) Seetha,** *M.P., State Minister of Skills Development, Vocational Education, Research and Innovation :*
Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular, 999-1000

**Athaullah, The Hon. A.L.M,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1101-5

**Athukorala, The Hon. Kapila,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 360-3

**Athukorala, The Hon. Sampath,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1107-9

Debates, Adjournment:
Calcite Deposit in Balangoda, Reaping Economic Benefits from, 536-8
Tourist Attractions, Upgrading, 687-8

Reference to:
Hon. Rohini Kumari Wijeratna's Remarks re a Photograph of 'Sade Hiru Seya' Ceremony , 1109

**Athukorala, The Hon. (Mrs.) Thalatha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 764-7

Reference to:
Chairman of Consumer Affairs Authority, 765

**Attanayake, The Hon. Tissa,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 599-604

Petitions:
Ekanayake, Mr. E.M.D.P.K., Kaduwela, 699

**Audit Office, National:**
Annual Work Programme, 1164

**Auditor General's Reports:**
For 2018:
4th Installment (part XVI), 697
9th Installment (part XXVII), 859
For 2019:
2nd Installment (part XXVII), 859
4th Installment (part XV, XVI), 697
9th Installment (part XIX, XX), 859
For 2020:
1st Installment (part II, III, IV, V, VI), 697
2nd Installment (part V), 859
3rd installment (part III), 859
4th Installment (partI, II, III), 697

**Bathiudeen, The Hon. Risad,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 677-82

**Bathiudeen, The Hon. Risad:** *(Contd.)*
Reference to:
LLB Exam Papers: leaked, 681-2
'One Country One Law', 679-80, 681

**Balasuriya, The Hon. Tharaka,** *M.P., State Minister of Regional Co-operation:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 331-3

**Bandara, The Hon. (Prof.) Ranjith,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1250-4

**Bandara, The Hon. Rohana,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1143-8
Bills, Private:
Ananda Aluthgamage Development, Social Services and Charity Foundation (Inc.): 1R., 562

Debates, Adjournment:
Climate Disasters, Preparedness to Face, 370-2

Petitions:
Deries de Sa, Mr. T.C., Anuradhapura, 380

**Bandara The Hon. Shantha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 282-6

Petitions:
Jayalath, Mr. J.A. Anil Premachandra, Panaderagama, 699

Questions, Oral:
Rice, Maize, Green Gram, Cowpea, Ginger and Turmeric, Cultivation of: steps taken, 226-7

Reference to:
Cultivation Destroyed by Wild Animals, 230

**Berugoda, The Hon. Vijitha,** *M.P., State Minister of Dhamma Schools, Pirivenas and Bhikkhu Education:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 487-90

**Bills:**
Appropriation (2022): 2R., 246-366, 398-528, 563-685, 723-843, 871-992, 1026-152, 1192-308; passed, 1308
Appropriation (Am): Cert., 219
Civil Procedure Code (Am.): 1R., 1191
Immigrants and Emigrants (Am.): Cert., 219
Minimum Retirement Age of Workers: Cert., 697
Termination of Employment of Workmen (Sp. Pro.) (Am.): Cert., 697

**Bills, Private:**
Ananda Aluthgamage Development, Social Services and Charity Found. (Inc.): 1R., 562
Institute of Chartered Shipbrokers of SL (Inc.): 1R., 1025-6
Mabotuwana Sri Piyarathana Nayaka Thero Suwasevana Found. (Inc.): 1R., 245
Shaili Edutainment Found. (Inc.): 1R., 397

**Budget Estimates:**
Draft, (2022), 1

**Budget Speech (2022):**
3-62 (Sinhala), 75-140 (Tamil), 153-206, (English)

Annexures:
63-74 (S), 141-152 (T), 206-19 (E), 63-74, 141-152, 206-19

Reference to:
Act on the Right of the Different-abled, 20, 95, 169
Amendment to the Appropriation Bill (2022) Preventing Requests for Supplementary Estimates, 16, 90, 165
Client-Centered Public Service:
digitization, 49,125, 194
Covid-19 Pandemic, Relief for Those Affected, 42, 117, 187
Expenditure of Government Institution:
quarterly warrants instead of annual, 15, 89 164
Fuel Allowance and Telephone Expenses:
reduction, 16, 90, 165
Green Agriculture Development Act, 23, 98, 171
Home Shop, Mini Supermarket Chain for Women Entrepreneurs, 49, 124, 193
Motor Cycle for Public Officers, 50, 125,194
Pension for Members of Parliament:
serving period extended to ten years, 16, 91, 165
Pensioners' Pay Anomalies:
elimination, 50-1126, 195
Perpetual Treasuries Ltd., 55, 131, 198
Public Service:
appraisal system (KPI), 17, 91, 166
new salary structure, 17, 91, 166
retirement age extended to 65 years, 17, 92, 166
Radio and Television Spectrum: auctions, 20
'Samurdhi' Banking Movement, Restructuring (One-Stop-Shop), 18, 92, 167
Schools, Fiber Optic Broadband Connection, 19, 95, 168
Senior Citizens: contributory pension scheme, 20, 95,168
Sri Lanka Customs, Single Window System, 18, 93, 167
Sri Lanka, Five-Hub Strategy, 23, 99, 171
Teachers' and Principals' Salary Anomalies, 25-6, 150,194
Three-wheeler Regulatory Authority, 20, 95, 168
Wellness Tourism, etc., Promoting, 22, 97, 170

**Chanaka, The Hon. D.V.,** *M.P., State Minister of Aviation and Export Zones Development:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1254-8

**Chandrasena, The Hon. S.M.,** *M.P., Minister of Lands:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 455-7

**Committee Reports, Ministerial Consultative:**
Annual Reports
Airport and Aviation Services SL, (2018), 863
Cey Nor Found. Ltd., (2017), 1165
Ceylon Fisheries Harbour Corp., (2018), 1165
Civil Aviation Authority SL, (2018), 863
Sri Lanka Institute of Tourism and Hotel Management, (2014, 2015, 2016, 2017, 2018), 863
Sri Lanka Airlines, (2018, 2019), 863
Sri Lanka Convention Bureau, (2019), 863
Sri Lanka Tourism Promotion Bureau, (2017, 2018), 863

Regulations:
Civil Aviation Act, 863
Fisheries and Aquatic Resources Act: (02), 1165

**Committee Reports, Public Finance:**
Annual Work Programme of the National Audit Office, 1165

Fiscal Management Committee Rep.:
M/ Finance, (2022), 1165

Notification
Excise Ordinance, 1165

Orders:
Excise (Sp. Pro). Act, 1165
Ports and Airports Development Levy Act, 1165

Regulations:
Imports and Exports (Control) Act, 1165

**Committees, Select:**
Identify Appropriate Reforms of the Election Laws and the Electoral System and to Recommend Necessary Amendments: extension of time, 397

**Cumaratunga, The Hon. Gevindu,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 832-5

**Dasanayake, The Hon. Chamara Sampath,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 990-2

**de Silva, The Hon. (Dr.) Harsha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 246-61

Documents, Tabled:
Covid-19 Prevention:
money received from other countries, 256
money spend, 'Daily News' article, 256
Directors of Rice Producers' Cooperative Society:
affidavit, 1185
Dr. M.N. Perera's Speech (year 1959), 259
RFP Issued by Central Bank, 258
Treasury Audit Report (2020), 247

Privileges:
Hon. Indika Anurudha Herath's Defamatory Statement re Him, 1184-5

Reference to:
Freelancers Earnings, Mandatory to Convert in to Rupees, 255
Hon. Namal Rajapaksa Driving a All-terrain Vehicle at the Port City, 248
Mr. Subaskaran Allirajah, Chairman of Lycamobile, 259
New Fortress Agreement, Signing of, 254
Organic Fertilizer and Organic Insecticides, 253
West Container Terminal, Selling to Adani Group, 253
Vaccine, PCR and Antigen Fraud, 256
'Yugadanavi' Power Plant, Selling of, 253

**de Silva, The Hon. Mohan Priyadarshana,** *M.P., State Minister of Coast Conservation and Low-lying Lands Development:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 923-6

**de Silva, The Hon. Nimal Siripala,** *M.P., Minister of Labour:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 430-4

Debates, Adjournment:
Migrant Workers, Pension Scheme and Social Security Programme for, 1159-62

Documents, Tabled:
Loans Taken by Sri Lanka: tables, 431

**de Silva, The Hon. Shan Vijayalal,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 647-50

**Debates, Adjournment:**
Calcite Deposit in Balangoda, Reaping Economic Benefits from, 529-38

**Debates, Adjournment:** *(Contd.)*
Career Guidance Inclusion in School Curricular, 993-1004
Climate Disasters, Preparedness to Face, 367-78
Forest Protection in Puttalam District, 843-5
Migrant Workers, Pension Scheme and Social Security Programme for, 1153-62
Tourist Attractions, Upgrading, 686-96

**Denipitiya, The Hon. (Major) Sudarshana,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 350-3

Reference to:
Hon. S. Shritharan's Speech re Genocide, 282

**Devananda, The Hon. Douglas,** *M.P., Minister of Fisheries:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 758-63

Reference to:
Sri Lankan Refugees in Thamil Nadu, India: return, 761

**Dharmasena, The Hon. W.H.M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1112-4

**Dhileeban, The Hon. Kulasingam,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 828-32

Reference to:
Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, 830-1
Vavunia North D.S. Division: demarcation, 829-30

**Dissanayaka, The Hon. Anura,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1026-39

Reference to:
AirLanka, Chief Executive, Mr. Kapila Chandrasena's Wife, 1030
Mr. Mohan T. Perera, 1032
President Residing at His Home in Mirihana: difficulties face by people in the area, 1035

**Dissanayake, The Hon. Duminda,** *M.P., State Minister of Solar Power, Wind and Hydro Power Generation Projects Development:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 583-7

**Dissanayake, The Hon. Rohana,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 658-61

Questions, Oral:
Agriculture Faculties Affiliated to State Universities: details, 1179-80

**Dissanayake, The Hon. S.B.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1213-7

**Divisions:**
Appropriation Bill (2022): 2R., (Electronic Voting System), 1308-12

**Documents, Tabled:**
Agreement between Govt. and NFE SL Power Holding LLC, 241
Audit Report of North Central Cooperative Dev. Dept., 977
Calcite Deposit in Balangoda:
letter of Prof. H.M.T.G.A. Pitawala, 531
Central Bank Report:
some notes re foreign reserves, 1282
Colombo- Kandy Express Way Opening, Reply to Oral Question re, 399
Covid -19 Effect on Global Economy:
Hon (Dr.) Bandula Gunawardana's Speech, 264
Information re, 265
Covid-19 Prevention:
money received from other countries, 256
money spend on: 'Daily News' article, 256
Daily Ft Article by Mr. W.A. Wijewadena re the Budget, 1282
Dr. M.N. Perera's Speech (1959), 259
Dr. Suranga de Silva's Article re Using Tourism to Develop the Country, 693
Foreign Exchange Reserves, (2015-2020), 579
House of Commons:
madam speaker's ruling, 240
report re privilege, 240
IMF Report re Covid-19 Expenditure of Countries, 321
Lanka Sama Samaja Party Budget Proposals, 672
Late Hon. N. M.Perera's Speech in1972 on Appropriation Bill, 605
Loans Taken by Sri Lanka: tables, 431
M/Trade, Building: rent agreement, 559
Medical Officers in Militaries, Impact of Extension of Compulsory Retirement Age of , 1091
Nelson Mandela, Quotation of, 1236
Oil Refinery Expansion and Modernization, Report, 953
Rest of the Speeches by MPP:
Hon. Faizal Cassim, 987
Hon. Madhura Withanage, 505
Hon. (Dr.) Nalaka Godahewa, 1211
Hon. Premalal Jayasekara, 912
Hon. (Dr.) Susil Premajayantha, 772
Hon. Thenuka Vidanagamane, 524

**Documents, Tabled:** *(Contd.)*
RFP Issued by Central Bank, 258
Rice Producers' Cooperative Society, Directors of : affidavit, 1185
Sewanagala Sugar Company, Corruptions, (Doc. not Tendered), 990
Sri Lanka Communist Party's Short Term Budget Proposals for (2022), 307
Tourist Attraction in SL (New), 694
Treasury Audit Report (2020), 247
Unemployed Ayurveda Medical Graduates' Union, Request of, 305

**Dolawatte, The Hon. Premnath C.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 519-22

Debates, Adjournment:
Calcite Deposit in Balangoda, Reaping Economic Benefits from, 531-3
Climate Disasters, Preparedness to Face, 368-9
Tourist Attractions, Upgrading, 693

Documents, Tabled:
Dr. Suranga de Silva's Article re How to Use Tourism to Develop the Country, 693

**Dushmantha, The Hon. H.R. Sarathie,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 644-7

**Edirimanna, The Hon. Sanjeeva,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 298-302

Petitions:
Nishantha Kumara, Mr. M.A., Nabada, 540

**Ellawala, The Hon. Akila,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 841-3

**Ellawala, The Hon. Lalith,** *M.P.:*
Debates:
Appropriation, (2022): 2R., 328-30

**Expunctions:**
288, 311, 314, 404, 660, 661, 721, 725, 726, 727, 794, 803, 804, 830, 831, 873, 878, 906, 933, 934, 935, 947, 966, 970, 971, 976, 1096, 1097, 1098, 1147, 1187, 1236, 1239, 1247, 1249, 1259, 1262, 1272

**Faizal Cassim, The Hon. M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 985-7

Documents, Tabled:
Rest of His Speech, 987

Questions, Oral:
Mrs. M.S.S. Ralina: pension in arrears, 237-9

**Fernando, The Hon. Arundika,** *M.P., State Minister of Coconut, Kithul and Palmyrah Cultivation Promotion and Related Industrial Product Manufacturing and Export Diversification:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 604-7

Documents, Tabled:
Late Hon. N. M. Perera's Speech in (1972) on Appropriation Bill, 605

Reference to:
International Monitory Fund, 604-7

**Fernando, The Hon. Harin,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1235-9

Documents, Tabled:
Nelson Mandela, Quotation of, 1236

Reference to:
Badulla Hospital Not Having a Cath Lab, 1238
Book by Mr. Gamini Viyangoda, 1237
'Lankadeepa Article' re Government Servants: not to post anything against Govt. on Facebook, 1237
Mr. Dilith Jayaweera, 1237
Mr. Shani Abeysekara, Imprisonment, 1235
'One Country One Law' Presidential Task Force, Chairman, 1236
Police Officer, Nishantha de Silva, Leaving the Country, 1235
Parliament: Requested to Distribute CDs Instead of Books, 1237

**Fernando, The Hon. Johnston,** *M.P., Minister of Highways and Chief Government Whip:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1288-94
Regulations:
National Medicines Regulatory Authority (02), 862

**Fernando, The Hon. Johnston:** *(Contd.)*
Reference:
Questions for Oral Answers Inclusion in the Order Paper: decision taken in the party leaders meeting, 861-2
Colombo-Kandy Express Way Opening, 399-400
Derogatory Remarks against The President, 1292
Mr. Ananda Palitha, 1293
President Not Residing in His Official House, 1293
Vaccination: Sri Lanka in first ten countries, 1294

**Fernando, The Hon. Nalin,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 665-7

**Fernandopulle, The Hon. (Dr.) (Mrs.) Sudharshani,** *M.P., State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1071-3

Questions, Oral: Replies:
BTI Bacteria to Control of Dengue Mosquitoes, 1009-10
Teaching Hospital (Colombo South), New Ward Complex at: details, 1167-8

**Fiscal Management Committee Rep.:**
M/ Finance, (2022), PFC Rep., 1165

**Fiscal Management Report, (2022),** 2

**Fonseka, The Hon. Field Marshal Sarath,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 926-35

Reference to
Litro Gas Chairman's Statement, 932
Millennium City Incident, 935

**Galappaththi, The Hon. (Dr.) Upul,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 525-8

**Gamage, The Hon. (Mrs.) Diana,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 667-9

Reference to:
Cannabis Cultivation to be Legalized, 668

**Gamalath, The Hon. Siripala,** *M.P., State Minister of Canals and Common Infrastructure Development in Settlements in Mahaweli Zones:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 516-8

**Gammanpila, The Hon. Udaya,** *M.P., Minister of Energy:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1053-8

Questions, Oral: Replies:
Petroleum Deposit in Mannar Basin: details, 1171-3

Reference to:
Fuel Shortage: incorrect information, 1057
New Fortress Energy Issue, 1174

**Godahewa, The Hon. (Dr.) Nalaka,** *M.P., State Minister of Urban Development, Waste Disposal and Community Cleanliness:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1205-11

Documents, Tabled:
Rest of His Speech, 1211

**Gunawardana, The Hon. (Dr.) Bandula,** *M.P., Minister of Trade*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 262-70

Documents, Tabled:
Building Housing M/Trade: rent agreement, 559
Covid-19 Effect on Global Economy:
information, 265
his speech, 264

Ministerial Statements:
M/ Trade, Rent for Building and Entertainment Expenses, 558-62

Reference to:
Bretton Woods Conference, 265
Indian Scientist, Abdul Kalam's Statement, 262

**Gunawardena, The Hon. Dinesh,** *M.P., Minister of Education and the Leader of the House of Parliament:*
Budget Estimates, Draft (2022): Pr., 1

Debates:
Bills:
Appropriation, (2022): 2R., 410-8
Civil Procedure Code (Am.): 1R., 1191

Fiscal Management Report, (2022): Pr., 2

Select Committee:
Identify Appropriate Reforms of the Election Laws and the Electoral System and to Recommend Necessary Amendments: extension of time, 397

Reference to:
Agreement Signed by Former Govt. , Never being Tabled in Parliament, 243

**Gunawardena, The Hon. Dinesh:** *(Contd.)*
Questions for Oral Answers: 50 questions taken in one day, 859-60
Central Bank Bond Issue and Perpetual Treasuries, 417
Easter Sunday Attack, 411
Prof. David Card, 2021 Nobel Prize Winner in Economics, 417

**Gunawardena, The Hon. Yadamini,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 895-9

Reference to:
Prof. C.R. Panabokke's Report re Small and Medium Scale Tanks in SL, 896

**Gunawardene, The Hon. (Mrs.) Kokila,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 669-71

**Hakeem, The Hon. Rauff,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 640-4

Reference to:
Chairman of 'One Country One Law' Presidential Task Force, 642
Muslims Died due to Covid-19: burial issue, 642
Verite Research Institute Chief, Mr. Nishantha Mel, 641

**Harees, The Hon. H.M.M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1083-6

Reference to:
Delimitation Commission for New GN Div. and DS Div., 1085
Lycamobile, Mr. Subaskaran, 1085-6
Presidential Task Force for 'One Country One Law', 1085

**Hashim, The Hon. Kabir,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 314-22

Documents, Tabled:
IMF Report re Covid-19 Expenditure of Countries, 321

Reference to:
Hon. Shehan Semasinghe's visit to Inland Revenue Department, 317
Union Secretary, Mr. Udayasiri, 318
'Yugadanavi' Power Plant, Selling of, 318

**Herath, The Hon. (Prof.) Charitha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 333-6

**Herath, The Hon. D.B.,** *M.P., State Minister of Livestock, Farm Promotion and Dairy and Egg Related Industries:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 618-21

**Herath, The Hon. Indika Anuruddha,** *M.P., State Minister of Rural Housing and Construction and Building Material Industries :*
Debates:
Bills:
Appropriation (2022): 2R., 971-9

Documents, Tabled:
Audit Report North Central Cooperative Dev. Dept., 977

Reference to:
Muthurajawela Lands, 972
'Shakthi Sahal' Cooperative Society, Chairman, 976

**Herath The Hon. Jayarathna,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 920-3

**Herath, The Hon. Kanaka,** *M.P., State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 615-8

**Herath, The Hon. Vijitha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 286-94

Questions, Oral:
Hokandara North: water supply disruption, 232-3

Reference to:
Litro Gas Company Chairman's Statement, 288

**Imthiaz, Bakeer Markar, The Hon.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 575-81

Documents, Tabled:
Foreign Exchange Reserves, (2015-2020), 580

Petitions:
Fernando, Mr. E.J.A. Guy, Beruwela, 699

**Imthiaz, Bakeer Markar, The Hon.:** *(Contd.)*
Reference to:
Former Central Bank Deputy Governor, Mr. W.A. Wijewardena, 579
Government Trying to Suppress the Opposition, 576

**ITN Payments:**
Mr. Dilantha Malagamuwa's Programme and Anoma's Kitchen Programme, 867-70

**Jayakody, The Hon. Sisira,** *M.P., State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 490-3

**Jayamaha, The Hon. Nalin Bandara,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1301-5

Questions, Oral:
Feeder Canal to Kochchipathana Tank:
details, 541-2

Reference to:
Being Late to Come to Parliament due to Check Points and Missing His Chance to Ask Oral Question, 548
Hon. Thisakutti Arachchi's Insulting Remarks:
request to expunge from Hansard, 1100
Question Oral:
priority to be given to opposition, 705
taking time to answer, 859
Roads Closed with Barriers, 556

**Jayaratne, The Hon. Piyankara,** *M.P., State Minister of Foreign Employment Promotion and Market Diversification:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 814-7

**Jayasekara, The Hon. Dayasiri,** *M.P., State Minister of Batik, Handloom and Local Apparel Products:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 631-6

Petitions:
Subasingha Amarakoon, Mr. A.M., Siyambalagaskotuwa, 539

**Jayasekara, The Hon. Premalal,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 908-12

Documents, Tabled:
Rest of His Speech, 912

Reference to:
Former Government Taking Revenge from Him, 908

**Jayasumana, The Hon. (Prof.) Channa,** *M.P., State Minister of Production, Supply and Regulation of Pharmaceuticals :*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 636-40

Reference to:
Covid-19, Situation in the World, 636-7

**Jayathilake, The Hon. Milan,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1086-9

**Jayawardhana, The Hon. (Dr.) Kavinda Heshan,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 790-3

Reference to:
Father, Cyril Gamini, Questioned by CID, 792
Negambo International Quarantine Centre, 791

**Kajendren, The Hon. Selvarajah,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1080-3

**Kalai Arasan, The Hon. Thavaraja,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 753-8

Reference to:
Eastern Provincial Council Casual Employees: appointments, 757
Open University of SL, Law Degree Entrance Exam: issues, 757
Sri Lankan Refugees in India: return, 756

**Karunatilleka, The Hon. Gayantha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 434-40

Reference to:
Benthara Bridge Area: placing barriers by Police, 722
Oil Refinery: closed down, 440

**Ketagoda,The Hon. Jayantha,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1134-7

**Kiriella, The Hon. Lakshman,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 398-410; Div., 1308

**Kiriella, The Hon. Lakshman:** *(Contd.)*
Documents, Tabled:
Colombo- Kandy Express Way Opening, Reply to Oral Question re, 399

Privileges:
Video Footage Published on 'BATTI TV', 1024

Reference to:
Colombo- Kandy Express Way, Opening of, 399
Colombo - Kandy Road: closed at Kadugannawa due to landslide, 398
COPE Chairmanship Given to Government Member, 418,
Hon. Finance Minister's Remarks on Public Servants, 406
Parliament Tradition: M/Finance's presence in the house during budget debate, 878
SJB Protest: prevented by Inspector General of Police, 731-2
Tea Cultivation: loosing yield, 1016
Ven. Muruththettuwe Ananda Thero Appointed as the Chancellor of University of Colombo, 407

**Kirindigoda, The Hon. Udayana,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 963-5

Reference to:
Back Bench Members Not Getting Enough Time for their Speeches, 965

**Kodithuwakku, The Hon. Karunadasa,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1131-4

**Kottegoda, The Hon. Nalaka Bandara,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 344-7

**Kumar, The Hon. Velu,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 496-500

**Kumara Sumithraarachchi, The Hon. Jagath,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 363-6

**Kumarasinghe, The Hon. (Mrs.) Geetha Samanmale,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1109-12

Debates, Adjournment:
Tourist Attractions, Upgrading, 686-7

**Kumarasinghe, The Hon. (Mrs.) Geetha Samanmale:** *(Contd.)*
Reference to:
Women Representation in Parliament, 1110

**Kumarasiri, The Hon. K.P.S.,** *M.P.:*
Questions, Oral:
BTI Bacteria to Control of Dengue Mosquitoes, 1007-8

Reference to:
'Sada Hiru Seya' Opening Ceremony; all participant went through antigen test, 1011

**Lokuge, The Hon. Gamini,** *M.P., Minister of Power :*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 457-61

Reference to:
Holcim Cement and Tokyo Cement Companies, 461

**Madduma Bandara, The Hon. R.M. Ranjith,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 724-7

Petitions:
Hettiarachchi, Mr. A.S., Nawala, 699
Shantha Kumara, Mr. H.K., Ampara, 699

Reference to:
SJB Protest: government obstructions, 724-6

**Maharoof, The Hon. Imran,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 661-4

Debates, Adjournment:
Tourist Attractions, Upgrading, 691-2

Reference to:
'One Country One Law', 664

**Manjula, The Hon. Sudath,** *M.P.:*
Debates, Adjournment:
Climate Disasters, Preparedness to Face, 372-3

**Mannapperuma, The Hon. Ajith,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 965-70

Petitions:
Dissanayake, Mr. Don Mahinda, Kelaniya, 864

Reference to:
Muthurajawela Wetland Acquired by Urban Dev. Authority, 965

**Marikkar, The Hon. S.M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1226-31

Questions, Oral:
Teaching Hospital (Colombo South), New Ward Complex at: details, 1166-7

Reference to:
'Yugadanavi' Agreement and LNG Terminal Tender Document: not presented to parliament, 720

**Masthan, The Hon. Kader Kader,** *M.P.:*
Questions, Oral:
Land in Ahaththimurippu Alakkattu Village, Mannar: permits, 386-7

**Messages from the President:**
Public Security Proclamation (Sec. 12), 1163

**Ministerial Reply on COPA Report:**
Annual Reports:
M/ Power and Energy and Business Development, 1005
M/ Port and Shipping, 698
Office of the Cabinet Ministers, 219

**Ministerial Statements:**
Calcite Deposit in Balangoda, 717-9
M/ Trade, Rent for Building and Entertainment Expenses, 558-62

**Muzammil, The Hon. Mohamad,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 682-5

Questions, Oral:
Milk and Milk-Related Products Imported (from 2015- 2019): details, 700-1

**Muszhaaraff, The Hon. S.M.M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 823-8

Debates, Adjournment:
Tourist Attractions, Upgrading, 688-90

**Nanayakkara, The Hon. Manusha,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1280-8

Documents, Tabled:
Central Bank Report: some notes re foreign reserves, 1282
Daily FT Article by Mr. W.A. Wijewadena re the Budget, 1282

**Nanayakkara, The Hon. Vasudeva,** *M.P., Minister of Water Supply:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 594-9

Petitions:
Gunathilaka, Mr. M.M.B., Rambukkana, 1006

Reference to:
Hon. Udaya Gammanpila's Statement in 'Island' Paper re Fuel Importation, 556
International Monetary Fund, 594-5

**Nandasena, The Hon. H.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 353-5

**Navarathna, The Hon. Asanka,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 348-50
Bills, Private:
Mabotuwana Sri Piyarathana Nayaka Thero Suwasevana Found. (Inc.): 1R., 245

**Nawananda, The Hon. Gayashan,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 671-5

Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular, 1000-2

Documents, Tabled:
Lanka Sama Samaja Party Budget Proposals, 672

Reference to:
Elephant Fence for Monaragala, 674
International Monetary Fund, 673
Politicians and Public Servants are Responsible for the Present Situation of the Country, 673

**Nelson, The Hon. Kins,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1126-30

Reference to:
Mr. Dilantha Malagamuwa, Motor Car Racing Champion, 870

**Nirmalanathan, The Hon. Charles,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1211-3

**Orders, Regulations, Resolutions, Rules, etc.:**
Notifications:
Excise Ordinance: PFC Rep., 1165

**Orders, Regulations, Resolutions, Rules, etc.:** *(Contd.)*
Orders:
Excise (Sp. Pro). Act: PFC Rep., 1165
Ports and Airports Development Levy Act: PFC Rep., 1165

Proclamation:
Public Security Ordinance (Sec. 12), 1163

Regulations:
Civil Aviation Act: Ministerial Cons. Com. Rep., 863
Fisheries and Aquatic Resources Act: (02): Ministerial Cons. Com. Rep., 1165
Imports and Exports (Control) Act: PFC Rep., 1165
National Medicines Regulatory Authority (02): 1R., 862

**Parliament:**
Questions for Oral Answers Inclusion in the Order Paper, 857-8

**Pasqual, The Hon. Anupa,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1123-6

**Pathirana, The Hon. Buddhika,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1089-94
Bills, Private:
Institute of Chartered Shipbrokers of SL (Inc.), 1025

Documents, Tabled:
Impact of Extension of Compulsory Retirement Age of Medical Officers in Militaries, 1091

Reference to:
Police Officers Obstructing Busses at Kotapola, Akuressa and Malinbada Area, 567

**Pathirana, The Hon. (Dr.) Ramesh,** *M.P., Minister of Plantation :*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 625-30

Questions, Oral: Replies:
Cardamom, Clove and Pepper Prices Drop: financial assistance for cultivators, 1013-4

Reference to:
Minor Export Crops:
highest export income in (2021), 1014

**Peiris, The Hon. (Prof.) G.L.,** *M.P., Minister of Foreign :*
Debates:
Bills:
Appropriation (2022): 2R., 879-85, 888

**Peiris, The Hon. (Prof.) G.L.:** *(Contd.)*
Reference to:
British Foreign Secretary Ms. Elizabeth Mary Truss, Meeting with, 880
British Prime Minister Representative, Hon. Lord Davies of Abersoch, Meeting with, 880

**Perera, The Hon. Dilan,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1221-5

Reference to:
Secretary to a State Ministry Mr. Palitha Fernando, 1224

**Perera, The Hon. Niroshan,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 916-20

Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular, 995-6

**Perera, The Hon. Sanath Nishantha,** *M.P., State Minister of Rural and Divisional Drinking Water Supply Projects Development:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 322-4

Debates, Adjournment:
Forest Protection in Puttalam District, 847-8

Reference to:
Hon. Harin Fernando's Remarks on Zaharan's Wife, 324

**Perera, The Hon. Sujith Sanjaya,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 809-14

Petitions:
Udawatta, Mr. U.D. Wimalasiri, Alawathura, 864

Reference to:
Environmental Destruction in 'Yaddessa', and 'Neluwathukanda' Areas in Nuwara Eliya, 813

**Petitions:**
Deries de Sa, Mr. T.C., Anuradhapura, 380
Dharmasena, Mr. W.K., Mathugama, 1006
Dissanayake, Mr. Don Mahinda, Kelaniya, 864
Ekanayake, Mr. E.M.D.P.K., Kaduwela, 699
Gunarathnam, Mr. Jude Wimalraj, 1166
Gunathilaka, Mr. M.M.B., Rambukkana, 1006
Hettiarachchi, Mr. A.S., Nawala, 699
Jayalath, Mr. J.A.A. Premachandra, Panaderagama, 699

**Petitions:** *(Contd.)*
Kumarasinghe, Mr. A.P., Anuradhapura, 699
Lasantha Kumara, Mr. D.M.P., Ransegoda, 540
Lingeshwaran, Mr. Thambirajah, 1166
Nihara, Mrs. A.F., Pilimathalawa, 540
Nishantha Kumara, Mr. M.A., Nabada, 540
Pushpakumara, Mr. K.M.A., Mullariyawa New Town, 1006
Samarasekara, Mr. P.D.G., Battaramulla, 699
Sandiligama, Mrs. S.M. Shamali Kumari, Weuda, 540
Shantha Kumara, Mr. H.K., Ampara, 699
Sidath Gamini, Mr. R.D., Ampara, 220
Subasingha Amarakoon, Mr. A.M., Siyambalagaskotuwa, 539
Sunil, Mr. Witharanage, Palatuwa, 1006
Udawatta, Mr. U.D. Wimalasiri, Alawathura, 864
Wickramarathnam, Mr. S., Mannar, 1166

**Piyathissa, The Hon. Nimal,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 307-9

**Ponnambalam, The Hon. G.G.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 959-62

**Premadasa, The Hon. Sajith,** *M.P., Leader of the Opposition:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1192-205

Questions by Private Notice:
State Bank Employees Salary Increment for (2021-2023), 550-1

Reference to:
'One Country One Law', 1202
People's Protest Rally: obstruction by Police, 565-7
Reverend Father Cyril Gamini: questioning by CID, 1204
Sapugakanda Oil Refinery: stopped functioning, 553-4

**Premajayantha, The Hon. (Dr.) Susil,** *M.P., State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 768-73

Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular, 1002-4

Documents, Tabled:
Rest of His Speech, 772

Petitions:
Pushpakumara, Mr. K.M.A., Mullariyawa New Town, 1006

**Premajayantha, The Hon. (Dr.) Susil:** *(Contd.)*
Questions, Oral: Replies:
Teacher Service: filling of vacancies, 381-3

**Premarathne, The Hon. Uddika,** *M.P.:*
Questions, Oral:
Habarana Tourist Zone: details, 866-7

**Prishanthi, The Hon. (Mrs.) Muditha,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1138-40

Debates, Adjournment:
Calcite Deposit in Balangoda, Reaping Economic Benefits from, 535-6
Climate Disasters, Preparedness to Face, 374
Tourist Attractions, Upgrading, 690-1

**Privileges:**
'Batti TV' Published a Video Footage of Hon. R. Sampanthan: Sp's Ruling, 379
Hon. (Mrs.) Rohini Kumari Wijeratna Mentioning Hon. Shasheendra Rajapaksa's Name Relating to a Fertilizer Importation Fraud, 1181-4
Hon. Indika Anurudha Herath's Defamatory Statement re Hon. (Dr.) Harsha de Silva, 1184-5
Hon. Tisakutty Arachchi's Derogatory Remakes re Hon. (Mrs.) Rohini Kumari, 1185-9
Parliament's Right to Information, 239-42
Video Footage Published on 'BATTI TV', 1024

**Pushpakumara, The Hon. Jagath,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 987-90

Documents, Tabled:
Sewanagala Sugar Company, Corruptions (Doc. Not Tendered), 990

Questions, Oral:
Department of Trade and Investment Policy: irregularities, 235-7

**Questions by Private Notice:**
State Bank Employees Salary Increment for (2021-2023), 550-1

**Questions by Private Notice, Replies to:**
State Bank Employees Salary Increment for (2021-2023), 552

**Questions, Oral:**
Advisers to Ministry of Plantation (from 2015-2019): details, 1018-23
Agriculture Faculties Affiliated to State Universities: details, 1179-81
BTI Bacteria to Control of Dengue Mosquitoes, 1007-11
Cardamom, Clove and Pepper Prices Drop: financial assistance for cultivators, 1011-7

**Questions, Oral:** *(Contd.)*
Community-Based Water Supply Projects:
Kurunegala District, 1177-9
Department of Trade and Investment Policy:
irregularities, 235-7
Drought Relief: Ratnapura District, 221-26
Feeder Canal to Kochchipathana Tank:
details, 541-3
Fish Demand, Production and Point Pedro Fishery
Harbour Construction: details, 386-92
Habarana Tourist Zone: details, 866-7
Hokandara North:
water supply disruption, 232-5
ITN, Special Programmes Telecast on during
(2015-2019): payments made, 867-70
Kalawanchikudy Hospital:
shortage of resources, 714-7
Kili/ Iramanadapuram Maha Vidyalaya, Construction
of Auditorium: non-release of fund, 543-6
Land in Ahaththimurippu Alakkattu Village, Mannar:
permits, 386-8
Milk and Milk-Related Products Imported
(from 2015- 2019): details, 700-4
Mrs. M.S.S. Ralina: pension in arrears, 237-9
'Nearest School Is The Best School' Programme:
Colombo District, 392-5
Pepper Harvest: details, 707-14
Petroleum Deposit in Mannar Basin:
details, 1170-6
Ranawarapitiya Grama Niladhari Division:
Illegal Gravel Mining, 395-6
Rice, Maize, Green Gram, Cowpea, Ginger and
Turmeric, Cultivation of: steps taken, 226-31
Teacher Service:
filling of vacancies, 380-5
Teaching Hospital (Colombo South), New Ward
Complex at: details, 1166-9

**Radhakrishnan, The Hon. (Dr.) V.,** *M.P.:*
Debate :
Bills:
Appropriation, (2022): 2R., 650-4

Reference to:
JEDB Workers: salary payments, 654
Kotagala Area, Land Issue, 654
'Sacred Heart of Jesus' Statue:
destroyed in Nuwara Elia Area, 654

**Raghavan, The Hon. (Dr.) Suren,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 942-6

Questions, Oral:
Fish Demand, Production and Point Pedro Fishery
Harbour Construction: details, 388-90

**Rahuman, The Hon. Ishak,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 473-8

**Rahuman, The Hon. Mujibur,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 336-44

Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular,
997-8

Petitions:
Gunarathnam, Mr. Jude Wimalraj, 1166
Lingeshwaran, Mr. Thambirajah, 1166
Wickramarathnam, Mr. S., Mannar, 1166

Questions, Oral:
'Nearest School Is The Best School, Programme:
Colombo District, 392-4

Reference to:
Garlic Fraud in Sathosa, 341
Litro Gas Company Chairman's Statement re Fraud,
341
Mahinda Rajapaksa Trophy for International Soccer
Tourney: spectators' participation, 1169
Police not Allowed to Park Any Vehicle in Colombo
Yesterday due Protest, 723

**Rajakaruna, The Hon. Harshana,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 479-87

Reference to:
Birthday Party In Anuradhapura , 885
Police Coming to His Office at Kirindiwela, 569
Public Servants Salary Increase by Pervious Govt.,
483-4

**Rajapaksa, The Hon. Chamal,** *M.P., Minister of Irrigation and State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1231-5

Debates, Adjournment:
Climate Disasters, Preparedness to Face, 375-8

Questions, Oral: Replies:
Drought Relief: Ratnapura District, 223-4

Reference to:
Former President of India, Hon. Abdul Kalam's
Statements, 1234

**Rajapaksa, The Hon. Basil Rohana,** *M.P., Minister of Finance:*
Budget Speech, (2022), 3-62

Debates:
Bills:
Appropriation (2022): 2R., 1305-8

**Rajapaksa, The Hon. Mahinda,** *M.P., Prime Minister, Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 563-5

**Rajapaksa, The Hon. Shasheendra,** *M.P., State Minister of Promoting the Production and Regulating the Supply of Organic Fertilizer and Paddy and Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 786-9

Privileges:
Hon. (Mrs.) Rohini Kumari Wijeratna Mentioning His Name Relating to a Fertilizer Importation Fraud, 1181-4

**Rajapakse, The Hon. Ajith,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1120-3

Reference to:
'Sade Hiru Seya' Opening, 1121

**Rajapaksha, The Hon. Gunathilaka,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 675-7

Questions, Oral:
ITN, Special Programmes Telecast during (2015-2019): payments made, 867-9

Reference to:
Hiru TV, 'Salakuna' Programme: M/Finance Interview, 677
Perpetual Treasuries (Pvt.) Ltd., 676

**Rajapaksha, The Hon. Upul Mahendra,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 838-40

**Rajapakshe, The Hon. (Dr.) Thilak,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 355-8

Petitions:
Sidath Gamini, Mr. R.D., Ampara, 220

**Rajapakshe, The Hon. (Dr.) Wijeyadasa,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 493-6

**Rajapakshe, The Hon. (Dr.) Wijeyadasa:** *(Contd.)*
Reference to:
Hambantota Port, 494
SriLankan AirLines, 494

**Ramanathan, The Hon. Angajan,** *M.P., Deputy Chairman of Committees:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1039-46

**Rameshwaran, The Hon. M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 655-8

**Ranasinghe, The Hon. Roshan,** *M.P., State Minister of Provincial Councils and Local Government :*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 309-13

**Ranatunga, The Hon. Prasanna,** *M.P., Minister of Tourism :*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1269-73

Debates, Adjournment:
Tourist Attractions, Upgrading, 694-6

Documents, Tabled:
New Tourist Attraction in SL, 694

Reference to:
MPP in the Chamber Not Wearing Face Mask, 885

**Ranawaka, The Hon. Patali Champika,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 777-81

**Ranaweera, The Hon. Prasanna,** *M.P., State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 505-10

**Rasamanickam, The Hon. Shanakiyan Rajaputhiran,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 419-30

Questions, Oral:
Kalawanchikudy Hospital: shortage of resources, 714-6

Reference to:
ADB, I Road Project, 422
Eastern Province: no MRI scan, 426

**Rasamanickam, The Hon. Shanakiyan Rajaputhiran:** *(Contd.)*
Reference to:
Ferry Service from Rameshwaram to Talaimannar, 428
Moody's Rating, 424
MPs' Pension, 423
Open University LLB Exam: papers leaked, 419
State Ministers: not needed, 423

**Rathnasekara, The Hon. B.Y.G.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 469-73

**Rathnayaka, The Hon. Kumarasiri,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1140-2

Questions, Oral:
Pepper Harvest: details, 707-8

Reference to:
Turmeric Cultivation, 714

**Ratnayake, The Hon. C.B.,** *M.P., Minister of Wildlife and Forest Conservation:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 441-4

Debates, Adjournment:
Forest Protection in Puttalam District, 849-55

**Samaraweera, The Hon. Jayantha,** *M.P., State Minister of Warehouse Facilities, Container Yards, Port Supply Facilities and Boats and Shipping Industry Development:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 955-8

**Santhirakanthan, The Hon. Sivanesathurai,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 981-3

**Semasinghe, The Hon. Shehan,** *M.P., State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1262-9

Questions by Private Notice, Replies to:
State Bank Employees Salary Increment (for 2021-2023), 552

Questions, Oral: Replies:
Milk and Milk-Related Products Imported (from 2015- 2019): details, 701-2

**Semasinghe, The Hon. Shehan:** *(Contd.)*
Reference to:
Hon. Harin Fernando's Information re Religion in the Parliamentary Web Site, 1262
'Sada Hiru Seya' Ceremony, 874-5

**Senaratne, The Hon. (Dr.) Rajitha,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1062-71

**Senewiratne, The Hon. W.D.J,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 466-9

**Shritharan, The Hon. S.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 272-82

Points of Order:
Incorrectly Mentioning Name of Hon. Shanakiyan Rajaputhiran Rasamanickam's to be Expunged, 831

Questions, Oral:
Kili/ Iramanadapuram Maha Vidyalaya, Construction of Auditorium: non-release of fund, 543-5

Reference to:
Sri Lankan Political History, 275-82
Subaskaran Allirajah, Chairman of Lycamobile, 273
Tamil Diaspora and Investment, 273-4
Task Force on 'One Country One Law', 281

**Sirisena, The Hon. Maithripala,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 727-35

Reference to:
'Maw Bima' Article re Cancer and Kidney Diseases, 730
Insurance Companies Taking the Service of Officers of Government Analyst's Dept., 732
Businessman, Mr. Indika Thushara, 732

**Sithadthan, The Hon. D.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 607-14

Reference to:
'One Country One Law' Presidential Task Force, 610

**Speaker and Deputy Speaker: Announcements, etc.:**
Auditor General's Reports:
For 2018:
4th Installment (part XVI), 697
9th Installment (part XXVII), 859

**Speaker and Deputy Speaker: Announcements, etc.:** *(Contd.)*
Auditor General's Reports: *(Contd.)*
For 2019:
2nd Installment (part XXVII), 859
4th Installment (part XV, XVI), 697
9th Installment (part XIX, XX), 859
For 2020:
1st Installment (part II, III, IV, V, VI), 697
2nd Installment (part V), 859
3rd installment (part III), 859
4th Installment (part I, II, III), 697

Certificates on Bills:
Appropriation (Am), 219
Immigrants and Emigrants (Am.), 219
Minimum Retirement Age of Workers, 697
Termination of Employment of Workmen (Sp. Pro.) (Am.), 697

Comments on
Oral Questions: 'only five questions will be taken during Budget period', 547
Hon. Thisakutti Arachchi's Insulting Remarks: not heard, 1100

Divisions:
Appropriation Bill (2022): 2R., (Electronic Voting System), 1308-13

Messages from the President:
Public Security Proclamation (Sec. 12), 1163

Privilege: 'Batti TV' Published a Video Footage of Hon. R. Sampanthan:'motion may be moved', 379

Questions for Oral Answers:
Inclusion in the Order Paper, 857-8
Equal Opportunity to be Given for All MMP, 862
Statue Destroyed in Nuwara Elia Area Mentioned by Hon. V. Radhakrishnan: directed to Speakers attention, 655

**Speaker and Deputy Speaker: Rulings:**
Expunctions:
288, 311, 314, 404, 660, 661, 721, 725, 726, 727, 794, 803, 804, 830, 831, 873, 878, 906, 933, 934, 935, 947, 966, 970, 971, 976, 1096, 1097, 1098, 1147, 1187, 1236, 1239, 1247, 1249, 1259, 1262, 1272

**Suresh, The Hon. Vadivel,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 510-5

**Tennakoon, The Hon. Premitha Bandara,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 782-5

**Thigambaram, The Hon. Palany,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1105-6

**Thisakutti Arachchi, The Hon.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1094-9

Reference to:
Family of Mr. Rohana Wijeweera, 1098
Hon. Rohini Kumari's Statement, 1096
Son of Hon. Anura Dissanayake, 1098

**Thondaman, The Hon. Jeevan,** *M.P., State Minister of Estate Housing and Community Infrastructure:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1073-9

Reference to:
New University for Up Country Area, 1076

**Udayakumar, The Hon. M.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 817-23

**Udukumbura, The Hon. U.K. Sumith,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1058-62

Reference to:
'Sada Hiru Seya', 1060

**Undugoda, The Hon. (Major) Pradeep,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 835-8

**Vidanagamage, The Hon. Thenuka,** *M.P., State Minister of Rural and School Sports Infrastructure Improvement:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 522-4

Documents, Tabled:
Rest of His Speech, 524

**Vino, The Hon. S.,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1047-53

Reference to:
Presidential Task Force for 'One Country, One Law', 1051-2
Provincial Councils: operation/ election, 1049-50

**Vitarana, The Hon. (Prof.) Tissa,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 979-80

Reference to:
Pfizer Vaccine, 980

**Viyalanderan, The Hon. S.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 805-8

**Wakkumbura, The Hon. Janaka,** *M.P., State Minister of Development of Minor Crops Including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 795-8

Questions, Oral: Replies:
Pepper Harvest: details, 708-13

**Waleboda, The Hon. Gamini,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1148-52

Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular, 993-4
Migrant Workers, Pension Scheme and Social Security Programme for, 1157-8

Questions, Oral:
Advisers to Ministry of Plantation (from 2015-2019): details, 1018-9

**Wanniarachchi, The Hon. (Mrs.) Pavithra Devi,** *M.P., Minister of Transport:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 452-5

**Wedaarachchi, The Hon. Dilip,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 946-51

**Weerakkody, The Hon. Chandima,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 951-4

Documents, Tabled:
Oil Refinery Expansion and Modernization, Report, 953

**Weerasekara, The Hon. (Dr.) Sarath,** *M.P., Minister of Public Security:*
Clarification on:
Death of Indika Jayarathna, 735

**Weerasekara, The Hon. (Dr.) Sarath:** *(Contd.)*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 773-7

Petitions:
Kumarasinghe, Mr. A.P., Anuradhapura, 699
Samarasekara, Mr. P.D.G., Battaramulla, 699

Reference to:
People's Rally or Any other Event that Allow to Spread Covid-19 Need to be Prevented, 568-9
Thotagamuwe Sri Rahula Thero, 775-6

**Weerasingha, The Hon. D.,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 294-7

**Weerasinghe, The Hon. Weerasumana,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 303-7

Documents, Tabled:
Sri Lanka Communist Party's Short Term Budget Proposals for 2022, 307
Unemployed Ayurvedic Medical Graduates' Union, Request of, 305

Petitions:
Lasantha Kumara, Mr. D.M.P., Ransegoda, 540

**Weerawansa, The Hon. Wimal,** *M.P., Minister of Industries:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 744-53

Reference to:
New Fortress Energy: case filled in court, 749

**Welgama, The Hon. Kumara,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 899-907

Petitions:
Dharmasena, Mr. W.K., Mathugama, 1006

Reference to:
Hon. Harin Fernando, 1239
FCID and Mr. Ravi Vidyalankara, 901
Police Coming into His House During Former Govt. Searching for Vehicles, 902

**Wickramaratne, The Hon. Eran,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 736-43

Reference to:
Death of Indika Jayarathna, 736

**Wickramasinghe, The Hon. (Mrs.) Rajika,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 799-801

Debates, Adjournment:
Climate Disasters, Preparedness to Face, 367-8
Migrant Workers, Pension Scheme and Social Security Programme for, 1158-9

**Wickremasinghe, The Hon. Ranil,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 588-94

Documents, Tabled:
Framework Agreement between Govt. and NFE Sri Lanka Power Holding LLC, 241
House of Commons:
madam speaker's ruling, 239-42
house of commons, report re privilege, 240

Privileges:
Parliament's Right to Information, 239-42

Reference to:
International Monitory Fund, 592, 593

**Wijerathna, The Hon. (Mrs.) Rohini Kumari,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 871-7

Privileges:
Hon. Tisakutty Arachchi's Derogatory Remakes re Her, 1185-9

Questions, Oral:
Teacher Service: filling of vacancies, 380-1

Reference to:
Deshabandu (Dr.) Vajira Chithrasena, Awarding 'Padma Sri Sammanaya', 1186
Fertilizer Ship, 873
Selandiva Investment (Pvt.) Ltd. 874
'Sada Hiru Seya':
ceremony, 873
opening day photograph & gender sociability, 877
Teacher Advisers, Issues re, 383
Teachers and Principals, Salary Anomalies of:
giving solutions, 383
Lady Teacher, Waruni Asanka: death, 383

**Wijesekera, The Hon. Kanchana,** *M.P., State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1240-6

**Wijesekera, The Hon. Kanchana:** *(Contd.)*
Reference to:
Hon. Harin Fernando, Coming to Parliament from National List, 1241

**Wijesiri, The Hon. Chaminda,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1258-62

Debates, Adjournment:
Calcite Deposit in Balangoda, Reaping Economic Benefits from, 533-5
Migrant Workers, Pension Scheme and Social Security Programme for, 1153-5

Questions, Oral:
Petroleum Deposit in Mannar Basin: details, 1170-1

Reference to:
Country Having Three Laws, 568
His Oral Questions not Included in the Order Paper, 546-7
HNB Account of Mr. Roy, Money Deposited to, 1259
Opposition Protest: not allowed by Minister for Police, 720
Oral Questions:
giving priority to government, 704
inclusion in the order paper, 858
limiting the number during budget period, 225
Yugadanavi Power Plant, 1173

**Withana, The Hon. M.W.D. Sahan Pradeep,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 983-5

**Withanage, The Hon. Hesha,** *M.P.:*
Debates:
Bills:
Appropriation (2022): 2R., 1246-50

Debates, Adjournment:
Calcite Deposit in Balangoda, Reaping Economic Benefits from, 529-31
Migrant Workers, Pension Scheme and Social Security Programme for, 1155-7

Documents, Tabled:
Calcite Deposit in Balangoda:
letter of Prof. H.M.T.G.A. Pitawala, 531

Questions, Oral:
Drought Relief: Ratnapura District, 221-3

Reference to:
Mr. Indika Jayarathna of Embilipitiya: death, 721-2
Oral Questions, to have a criterion for asking, 705

**Withanage, The Hon. Hesha:** *(Contd.)*
Reference to: *(Contd.)*
Questions for Oral Answers Inclusion in the Order Paper, 861
Sapugaskanda Oil Refinery, 1175

**Withanage, The Hon. Madhura,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 500-5

Documents, Tabled:
Rest of His Speech, 505

Reference to:
Late Hon. N.M. Perera's Remarks about Late Hon. J.R. Jayawardena, 502
World Bank, Ease of Doing Business Index, 502

**Yapabandara, The Hon. Wasantha,** *M.P.:*
Debates:
Bills:
Appropriation, (2022): 2R., 358-60


Debates, Adjournment:
Career Guidance Inclusion in School Curricular, 994-5

Petitions:
Nihara, Mrs. A.F., Pilimathalawa, 540
Sandiligama, Mrs. S.M. Shamali Kumari, Weuda, 540

Reference to:
Oral Question, Fair Opportunity to Ask, 548-9

286 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 286 - இல. 2
Volume 286 - No. 2

2021 නොවැම්බර් 13 වන සෙනසුරාදා
2021 நவம்பர் 13, சனிக்கிழமை
Saturday, 13th November, 2021

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**2021 නොවැම්බර් 13 වන සෙනසුරාදා**
**2021 நவம்பர் 13, சனிக்கிழமை**
**Saturday, 13th November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද:**
තොරතුරු දැනගැනීමට පාර්ලිමේන්තුව සතු අයිතිය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
මාබොටුවන ශ්‍රී පියරතන නාහිමි සුවසෙවන පදනම (සංස්ථාගත කිරීමේ) -[ගරු අසංක නවරත්න මහතා] - පළමුවන වර කියවන ලදී.

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 [පළමුවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
කාලගුණ ආපදාවලට මුහුණ දීමේ පෙර සූදානම

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**
தகவலறிவதற்கான பாராளுமன்றத்தின் உரிமை

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
மாபொட்டுவன ஸ்ரீ பியரத்தன தேரர் சுவசெவன மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு அசங்க நவரத்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது.

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட முதலாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
காலநிலை அனர்த்தங்களுக்கு முகங்கொடுப்பதற்கான முன்னாயத்தம்

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:
Parliament's Right to Information

PRIVATE MEMBERS' BILLS:
Mabotuwana Sri Piyarathana Nayaka Thero Suwasevana Foundation (Incorporation) - [The Hon. Asanka Navarathna] - Read the First time

APPROPRIATION BILL, 2022 - [First Allotted Day]
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
Preparedness to Face Climate Disasters

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021 නොවැම්බර් 13 වන සෙනසුරාදා***
*2021 நவம்பர் 13, சனிக்கிழமை*
*Saturday, 13th November, 2021*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 නොවැම්බර් 12 දින මවිසින් "විසර්ජන (සංශෝධන)" සහ "ආගාමික හා විගාමික (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත්වල සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අමාත්‍ය මණ්ඩල කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2020 වර්ෂය සඳහා පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමි නාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව,- [කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) திலக் ராஜபக்ஷ)
(The Hon. (Dr.) Thilak Rajapakshe)

ගරු කථානායකතුමනි, අම්පාර, නව නගරය, එල්/165 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩී. සිදත් ගාමිණී මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නියං සහනාධාර : රත්නපුර දිස්ත්‍රික්කය
### வரட்சி நிவாரணம் : இரத்தினபுரி மாவட்டம்
### DROUGHT RELIEF : RATNAPURA DISTRICT

12/2020

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2018 වර්ෂයේදී ඇති වූ නියඟය හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පීඩාවට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ අතරට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් නොවන්නේ නම්, හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ සහන ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ නිකුත් කළ චක්‍රලේඛ;

(ii) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය;

(iii) එම චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ සහනාධාර ගෙවීමට වැය කළ මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) NDR/2018/03 චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2018ஆம் ஆண்டில் ஏற்பட்ட வரட்சி காரணமாக இரத்தினபுரி மாவட்டத்தில் பாதிக்கப்பட்ட பிரதேச செயலகப் பிரிவுகள்;

(ii) அவற்றில் எம்பிலிபிட்டிய பிரதேச செயலகப் பிரிவு உள்ளடங்காவிடின் அதற்கான காரணங்கள்;

யாவையென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2018ஆம் ஆண்டில் வரட்சி நிவாரணம் வழங்கும் கட்டம் IIஇன்கீழ் நிவாரணம் வழங்கப்பட்ட பிரதேச செயலகப் பிரிவுகள் யாவையென் பதையும்;

(ii) அதற்குச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்திற்கும் அமைவாகத் தனித் தனியாக அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 2018ஆம் ஆண்டில் வரட்சி நிவாரணம் வழங்கும் கட்டம் IIஇன்கீழ் வெளியிடப்பட்ட சுற்றறிக் கைகள் யாவையென்பதையும்;

(ii) அவற்றில் இறுதியாகச் செயற்படுத்தப்பட்ட செல்லுபடியாகும் சுற்றறிக்கை யாதென் பதையும்;

(iii) மேற்படி சுற்றறிக்கைக்கு அமைவாக இரத்தினபுரி மாவட்டத்தில் தெரிவுசெய்யப்பட்ட பயனாளிகளின் எண்ணிக்கை மற்றும் நிவாரணம் வழங்குவதற்குச் செலவிடப்பட்ட பணத்தொகை என்பன ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுகளுக்கும் அமைவாகத் தனித்தனியாக யாவையென்பதையும்;

(iv) NDR/2018/03 சுற்றறிக்கைக்கு அமைவாக இரத்தினபுரி மாவட்டத்தில் இனங்காணப்பட்ட பயனாளிகளின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுக்கும் அமைவாகத் தனித்தனியாக யாதென்பதையும்;

அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he state-

(i) the names of the Divisional Secretaries' Divisions in Ratnapura District that were affected by the drought in year 2018; and

(ii) if the Embilipitiya Divisional Secretary's Division is not included in that list, the reasons for not including it?

(b) Will he also state, separately on per district basis -

(i) the names of the Divisional Secretaries' Divisions to which relief was provided under Phase II of the Drought Relief Programme of year 2018; and

(ii) the total amount of money that was spent on providing such relief?

(c) Will he further state -

(i) the circulars that were issued under Phase II of the Drought Relief Programme in year 2018;

(ii) out of the aforesaid circulars, the last valid circular that was issued in that regard;

(iii) separately on per Divisional Secretary's Division basis, the number of beneficiaries that were selected in Ratnapura District as per the aforesaid circular, and the total amount that was spent on payment of such relief; and

(iv) separately on per Divisional Secretary's Division basis, the number of beneficiaries that were identified in Ratnapura District as per Circular No. NDR/2018/03?

(d) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පමණි.

(ii) නියඟයෙන් හානි සිදු වී නොමැති බවට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ලිපියක් මඟින් දැනුම් දී ඇත. ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරමි.

(ආ) (i) රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත පමණක් සහන ලබා දී ඇත.

(ii) රුපියල් 20,791.66ක මුදලක් ඒ සඳහා වැය කර ඇත. ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කරමි.

(ඇ) (i) නියං සහනාධාර දීමේ අදියර II යටතේ චක්‍රලේඛ 3ක් නිකුත් වී ඇත. එනම් NDRSC/2018/03, NDRSC/2018/03(I) සහ NDRSC/2018/03 (ii).

(ii) අවසන් වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය වන්නේ NDRSC/2018/03(ii) වේ.

(iii) NDRSC/2018/03(ii) ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයෙන් ප්‍රතිලාභීන් හඳුනාගෙන නොමැත.

(iv) NDRSC/2018/03ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 අතරින් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පමණක් ප්‍රතිලාභීන් 09 දෙනෙකු තෝරාගෙන ඇත. සහනාධාර ගෙවීම සඳහා රුපියල් 44,000.00ක මුදලක් වැය කර ඇත. සෙසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ප්‍රතිලාභීන් තෝරාගෙන නොමැත. ඇමුණුම 03 ලෙස ඉදිරිපත් කරමි.

(ඈ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමා, ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් එවූ ලිපියක්. එහි සඳහන් වෙනවා, නියඟයෙන් පීඩාවට පත් ගොවි පවුල් හා ධීවර පවුල් කිසිවකුත් කොට්ඨාසය තුළ නොමැති බව. මම හිතන විධියට එය තමුන්නාන්සේගේ ආසනය.

ඇමුණුම 02හි තිබෙන්නේ මුළු ලංකාව පුරාම, නියං සහනාධාර (2018) II අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම පිළිබඳ විස්තරයක්.

ඇමුණුම 03හි තිබෙන්නේ නියං සහනාධාර (2018) II අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීම. ඒක රත්නපුර ප්‍රාදේශීය ලේකම් විසින් යවා තිබෙන්නේ. සාමාජිකයන් තිදෙනෙකුට හෝ ඊට වැඩි පවුල් සඳහා රුපියල් 40,000යි. සාමාජිකයන් තිදෙනෙකුට අඩු පවුල් සඳහා රුපියල් 4,000යි.

ඇමුණුම් 01, 02, 03 **සභාගත*** කරමි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබාදීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. 2018 දී සිදු වූ කාරණාවක් සම්බන්ධයෙන් මම මේ ප්‍රශ්නය ඇහුවේ. එතකොට එය වර්තමාන ආණ්ඩුව කාලයේ නොව, යහ පාලන ආණ්ඩුව කාලයේ කාරණාවක්. මෙහිදී මම බලාපොරොත්තු වන්නේ, මේ ආණ්ඩුව කාගේද කියන එකට වඩා අපේ රටේ මේ වෙනුවෙන් නිසි ක්‍රමවේදයක් නිර්මාණය වෙලා නැහැ කියන්නයි. නියං සහනාධාර වේවා, ගංවතුර සහනාධාර වේවා සහනාධාර ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ ඒ ඒ දිස්ත්‍රික්කවල ඉන්න එවකට ආණ්ඩුකරණයේ නිරත ඇමතිතුමාගේ හයියත් එක්කයි. ඇමතිතුමාට ශක්තිමත් විධියට ආණ්ඩුවෙන් සල්ලි ටික ගන්න පුළුවන් නම් නියඟය ආවත්, නැතත් ආධාර බෙදා දෙන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඔබතුමාගේ පිළිතුරෙන් දැන ගන්න ලැබුණු විධියට එවකට රත්නපුර දිස්ත්‍රික්කයේ නව දෙනාටයි නියං සහනාධාර ලැබිලා තිබෙන්නේ. මුළු රටටම මේ ප්‍රශ්නය බලපාලා නියං සහනාධාර බෙදන කොට ඔබතුමාම පැවසූ පරිදි, රත්නපුර දිස්ත්‍රික්කයේ නව දෙනාටයි දීලා තිබෙන්නේ. ඔය කාල සීමාවේ රත්නපුරයටත් දැඩි ලෙස නියඟය බලපෑවා. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකස් කරන්න කියලා.

අදටත් මේ ප්‍රශ්නය තිබෙනවා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයේදී ඔබතුමාට ඒ සම්බන්ධ යම්කිසි නිදසුනක් ඉදිරිපත් කරන්නම්. මෙවැනි කාරණාවලදී අසරණ වන මිනිසුන්ට දේශපාලන පක්ෂ, පාට භේදයකින් තොරව කෑම පැකට් එකක් ලබා දෙන්නවත් හරියට ක්‍රමවේදයක් හදා ගන්න බැරි නම්, කවුරු ආණ්ඩු කළා වුණත්, අපි අපොහොසත් රටක් විධියටයි මම නම් දකින්නේ. ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු වන ඔබතුමාගෙන් මම දැන ගන්න කැමැතියි, මේ වෙනුවෙන් විශේෂ ක්‍රමවේදයක් හදන්න අමාත්‍යාංශය දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙනවාද, එහෙම නැත්නම් එවැනි අදහසක්වත් ඔබතුමන්ලාට තිබෙනවාද කියලා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

තමුන්නාන්සේලාටත් බලයේ ඉන්න කොට මේ කිසිවක් පෙනෙන්නේ නැහැ. බලය නැති වුණාට පස්සේ තමයි ඔක්කොම ප්‍රශ්න මතු වෙන්නේ. දැන් අපි තමුන්නාන්සේගේ ප්‍රශ්නයම මුල් කරගෙන මේ සඳහා පිරිසිදු, පැහැදිලි, ප්‍රායෝගික චක්‍රලේඛයක් නිකුත් කරන්නම්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා.

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය ඇමතිතුමා හැටියට එතුමාටත්, ඒ වාගේම ගරු කථානායකතුමා හැටියට ඔබතුමාටත් මම කියන්න කැමැතියි, පාර්ලිමේන්තුවේ අපට ප්‍රශ්න ඇසීම සඳහා තිබෙන අවස්ථාවට යම් ආපදාවක් සිදු වෙලා තිබෙන බව. ඒක පක්ෂ නායක රැස්වීමේ දී ගත්ත තීන්දුවක් කියලා ඔබතුමන්ලා කියාවි. ප්‍රශ්න ඇසීමේදී, දැන් එය ප්‍රශ්න 05කට පමණක් සීමා වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ වාගේ අය වැය ලේඛනයක් තුළ අපට පැන නඟින ප්‍රශ්න ගණනාවක් ගැන කථා කරන්න තිබෙන අවස්ථාව නොලැබී තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු අමාත්‍යතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. "ආපදා" කියන කාරණය ගත්තොත්, නිශ්චිත වශයෙන්ම අපේ රට තුළ ඒවා ඇති වන්නේ කොයි කාලයට ද, කොයි වෙලාවට ද කියලා සමහර කාලගුණික විපර්යාස -වෙනස්වීම්- තුළ අපි දන්නවා. මෝසම් වර්ෂාව වාගේම ලෝකයේ තිබෙන කාලගුණික, දේශගුණික වෙනස්වීම් එක්ක අපට ඒවා දැන ගන්න පුළුවන්. සියයට සියයක්ම දැන ගැනීමට හැකි නොවුණත්, අදාළ කාලසීමාව තුළ - අදාළ මාසය, වර්ෂය තුළ - එය සිද්ධ වෙයි කියන කාරණය අපි දන්නවා.

එහෙම නැත්නම්, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන උපකරණ හරහා අපට හඳුනා ගන්න පුළුවන්; නිශ්චිත කර ගන්න පුළුවන් සිද්ධ වීමට යන විපර්යාසයේ යම් තරමක්. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, හැම වැසි කාලයටම ගංවතුර උවදුර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම උත්සාහ කරන්නේ මෙන්න මේ කාරණය කියන්න. ආපදා කාලය තුළ ඒ සිදු වන ආපදා වෙනුවෙන් ආධාර බෙදන කාරණයට වඩා උචිත විසඳුමක් අපි හඳුනාගන්න ඕනෑ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හැටියට මේ වන විට එවැනි විසඳුමක් සොයා ගෙන තිබෙනවාද දන්නේත් නැහැ. ඒකයි මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ. ගංවතුර ගලනකොට අනිවාර්යයෙන්ම පහත් බිම් ප්‍රදේශ තමයි හැම දාම යට වෙන්නේ. එතකොට අපි ගිහින් ඒ ප්‍රදේශවලට ආධාර දෙනවා; ඒ වෙනුවෙන් වියදම් කරනවා. හැබැයි, ආපදාවට ලක්වන ප්‍රදේශ ලෙස හඳුනා ගත් ස්ථානවලට නිශ්චිතව මුදල් යොදවා, -එම ජනතාව වෙනත් තැනකට ගෙන ගොස් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් උස් බැම් බැඳීමෙන් වෙන්න පුළුවන්- ඒ ජන කොට්ඨාසයට කිසිම අවුරුද්දකදී පීඩා ඇති නොවන විධියේ සාධාරණ වැඩ පිළිවෙළක් කරන්න කුමන ආණ්ඩුවක් තුළවත් යෝජනා ඉදිරිපත් වන්නේ නැහැ. අපි පුරුදු වෙලා ඉන්නවා ආපදා කාලයට ඒ ප්‍රදේශවලට ගිහිල්ලා සහනාධාර බෙදලා එන්න. නමුත්, ගරු ඇමතිතුමනි, සහමුලින්ම ඒ කොට්ඨාස ටික හඳුනාගෙන, ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කර, ඔවුන්ගේ පහසුකම් ටික, ඔවුන්ගේ ආර්ථිකය හදන්න අපිට පුළුවන්කම ලැබුණොත් රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුරට යටවන ප්‍රදේශවලට හැම දාම ආධාර බෙදන්න ඕනෑ වෙන්නේ නැහැ. ඒ නිශ්චිත වැඩ පිළිවෙළ ගැන ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරින් හෝ කවුරුන් හෝ අවධානය යොමු කළ යුතුයි කියා මම හිතනවා.

බදුල්ල දිස්ත්‍රික්කයේත් මේ ප්‍රශ්නය තිබෙනවා, ගරු ඇමතිතුමනි. අපි දන්නවා, බදුල්ල දිස්ත්‍රික්කයේ නාය යන්නේ කුමන ප්‍රදේශවල ද කියලා. නාය යන කාලයට ඒ ස්ථානවල පදිංචි අය එතැනින් ඉවත් කරනවා. ඊට පස්සේ ගිහිල්ලා සහන ටික දෙනවා. ඒ අය කඳවුරුවල තබනවා. ආයෙත් ඒ අය ගෙනැල්ලා ඒ තැන්වල පදිංචි කරවනවා. ඊළඟ අවුරුද්දේත් වැස්ස එනවා. එතකොට නාය යනවා. නැවතත් ඔවුන් ඉවත් කරනවා. සෑම වර්ෂයකම මේ සිදුවීම වෙනවා. මම හිතනවා, බුද්ධිමත්, කාර්යක්ෂම ඇමතිවරයෙක් හැටියට ඔබතුමා මේ කාරණය පිළිබඳව අවධානය යොමු කරයි කියලා. අපි දන්නේ නැහැ, ප්‍රායෝගිකව අපි දකින දේ ඔබතුමාට සහ ඔබතුමන්ලාගේ ආණ්ඩුවට වැදගත් ද කියලා. නමුත්, ඒ සාධාරණ කාරණාව නිශ්චිතව ඉටු කිරීම සඳහා, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා දීර්ඝ කාලයක් තිස්සේ නොවුණු වැඩ පිළිවෙළක් කරන්න ඔබතුමා සූදානමක සිටිනවාද කියා මා අහන්න කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, අපේ ආපදා කළමනාකරණ අංශය, ඒ වාගේම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ආපදා සිදුවන ස්ථාන හොඳින් හඳුනාගෙන තිබෙනවා. විශේෂයෙන් පහත්බිම්වලට තමයි ජලය ගලන්නේ. ඒක හැම දාම වෙනවා, වර්ෂාව නිසා. ඒ වාගේම ජලාශවල දොරටු ඇරියාම ජලය පිටාර ගිහිල්ලා පහත් බිම් යට වෙනවා. පාර්ලිමේන්තුවත් යට වෙනවා නේ. ඒවාට තවම ස්ථිර විසඳුම් සොයා ගන්න අමාරුයි. මොකද, ඒවා පහත් බිම්. ඒ වාගේම මුහුදු මට්ටමත් එයට බලපානවා. මේ දවස්වල පුත්තලම දිස්ත්‍රික්කයේත් වතුර පිරිලා තිබෙනවා. ඒ නිසා ඉහත සඳහන් කළ ආකාරයේ ස්ථානවලින් ජනතාව ඉවත් කිරීම කරන්න අමාරුයි. නමුත් ඒ ස්ථානවල ආපදා අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නවා, දෙපැත්තේ bunds බැඳලා ඒ අවශ්‍ය කටයුතු කරලා.

රත්නපුර දිස්ත්‍රික්කයේ අයගම වාගේ ප්‍රදේශවල සහ බදුල්ලෙත් නාය යන ප්‍රදේශ තිබෙනවා. එවැනි නාය යන ස්ථාන හඳුනාගෙන තිබෙනවා. ඒ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ක්‍රියාකාරකම් තුළ ඇති වෙන දේවල් හඳුනාගෙන ඒ අයට අවවාද කර තිබෙනවා, වෙනත් ස්ථානවලට යන්න කියලා. නමුත්, ඒ අයට ගෙවල් හදලා දීලා වෙනත් තැනකට යැව්වත් ආපසු ඒ අයගේ තවත් කවුරු හෝ ඇවිල්ලා එතැන පදිංචි වෙනවා. මේවාට අපිට අලුතෙන් නීති සම්පාදනය කරන්න වෙනවා; තද නීති සම්පාදනය කරන්න වෙනවා, කොහොමද මේ අය ඉවත් කරන්නේ කියලා.

ඊළඟ ප්‍රශ්නය තමයි හඳුනා ගත් එවැනි අයට දෙන්න ඉඩම් නොමැතිකම. රත්නපුරයේ දැනට 2,000කට ආසන්න පිරිසක් ඉන්නවා. නමුත් ඉඩම් නැහැ. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා හැම දාම අමාත්‍ය මණ්ඩල රැස්වීමේත් මතු කරන ප්‍රශ්නයක් තමයි ඒ අයට ගෙවල් හදලා දෙන්න ඉඩම් අත්පත් කර ගන්න කියන කාරණය. හුඟාක් ඉඩම් තේ වතු, රබර් වතු. ඒවා විශාල කොම්පැනිවලට දීම තුළ ඉඩමක් ලබා ගන්න අමාරුකමක් තිබෙනවා. ඒ පිළිබඳවත් අපි කටයුතු කරගෙන යනවා. නැවත ඒ අයගෙන් අවශ්‍ය ඉඩම් ප්‍රමාණය අත්පත් කරගෙන මේ කියන ජනතාවට ලබාදීමට බලාපොරොත්තු වනවා. ඒ නිසා දීර්ඝ කාලයක් තිස්සේ පවතින මේ නොවිසඳුණු ප්‍රශ්න හැකි ඉක්මනින් විසඳන්න ඉදිරියේදී අපි කටයුතු කරනවා.

## සහල්, බඩ ඉරිඟු, මුං, කව්පි, ඉඟුරු සහ කහ වගා කිරීම : ගෙන ඇති පියවර

அரிசி, சோளம், பயறு, கௌப்பி, இஞ்சி மற்றும் மஞ்சள் பயிர்ச்செய்கை: நடவடிக்கை

CULTIVATION OF RICE, MAIZE, GREEN GRAM, COWPEA, GINGER AND TURMERIC: STEPS TAKEN

767/2020

**2. ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ වගා කළ හැකි භෝග වර්ග ගණනාවක් ආනයනය කරනු ලබන බව එතුමා පිළිගන්නේද;

(ii) සහල්, බඩ ඉරිඟු, මුං, කව්පි, ඉඟුරු සහ කහ ආදියෙහි වාර්ෂික අවශ්‍යතාව මේ වනවිට හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් භෝග ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பயிரிடக்கூடிய ஏராளமான பயிர் வகைகள் இறக்குமதி செய்யப்படுகின்றன என்பதை அவர் ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(ii) அரிசி, சோளம், பயறு, கௌப்பி, இஞ்சி மற்றும் மஞ்சள் போன்றவற்றின் வருடாந்தத் தேவை இன்றளவில் கணிப்பிடப்பட்டுள்ளதா என் பதையும்;

(iii) ஆமெனில், அத்தேவை வெவ்வேறாக யாதென் பதையும்;

(iv) மேற்குறிப்பிட்ட பயிர்களை இலங்கையில் பயிரிடுவதற்கு வேலைத்திட்டமொன்று உருவாக் கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture;

(a) Will he inform this House-

(i) whether he admits that a number of crops which can be cultivated in Sri Lanka are imported to the country;

(ii) whether the annual requirement of rice, maize, green gram, cowpea, ginger and turmeric has been identified by now;

(iii) if so, separately, the amounts of the aforesaid requirement; and

(iv) whether a programme has been prepared to cultivate the aforesaid crops in Sri Lanka?

(b) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) සහල්, බඩ ඉරිඟු, මුං සහ කව්පි ආදියෙහි වාර්ෂික අවශ්‍යතාව මේ වන විට හඳුනාගෙන ඇති අතර, ඉඟුරු සහ කහ භෝග මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවේ.

(iii) වාර්ෂික දේශීය අවශ්‍යතාව (මෙට්‍රික්ටොන්)

| භෝගය | ජාතික අවශ්‍යතාව (මෙට්‍රික්ටොන්) |
|---|---|
| සහල් | 2,560,000 |
| බඩ ඉරිඟු | 650,000 |
| කව්පි | 20,000 |
| මුං ඇට | 28,000 |

(iv) සහල්, බඩ ඉරිඟු, මුං සහ කව්පි ආදී භෝග ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ඇත. "සෞභාග්‍යයේ දැක්ම" යටතේ ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය සඳහා භෝග වර්ග 16ක් හඳුනාගෙන ඇති අතර මෙම භෝග ප්‍රවර්ධනය තුළින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා මෙම ආහාර භෝග ආනයනය සීමා කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

අදාළ භෝග වර්ගවල නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වගා වපසරිය වැඩි කිරීමට හා ඵලදායිතාව ඉහළ නැංවීමට ගොවි මහතුන් දිරි ගැන්වීම සඳහා,

- සහන ක්‍රම යටතේ බීජ ලබා දීම
- වාරි පහසුකම් සැපයීම
- යන්ත්‍ර උපකරණ සැපයීම
- නවීන තාක්ෂණ ක්‍රම ගොවීන් වෙත හඳුන්වා දීම
- පෞද්ගලික අංශය හා සහයෝගීත්ව ප්‍රවේශ ක්‍රමය මත නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව දියුණු කිරීම හා වෙළෙඳ පොළ ස්ථාවර මිලක් සහතික කිරීම

සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබාදීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා.

විශේෂයෙන්ම, 1977න් පස්සේ ඇති වුණු විවෘත ආර්ථිකයත් එක්ක අපේ රටට විවිධ භෝග වර්ග විශාල වශයෙන් ආනයනය කරන්න පටන් ගත් බව අපි දන්නවා. පසුගිය කාල වකවානුවේ - අපේම ආණ්ඩු පැවැති කාලයේත්- අයවැය කථාව කළ අවස්ථාවලදීත්, එහෙම නැත්නම් කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කළ අවස්ථාවලදීත් මොන දේවල් කිව්වත්, අපේ රටේ හදන්න පුළුවන් භෝග විශාල ප්‍රමාණයක් පිට රටින් අපේ රටට ගෙනැවිත් තිබෙනවා. අල, ලූනු, විශේෂයෙන්ම බඩ ඉරිඟු, සහල් ඇතුළු අපේ රටේ හදන්න පුළුවන් භෝග වර්ග විශාල ප්‍රමාණයක් එදා පිට රටින් ගෙනාවා. ඒ හැම අවස්ථාවකදීම පාර්ලිමේන්තුවේදීත්, ඉන් පිටතදීත් කියනවා අපි දැක්කා, "නැහැ, අපි ඊළඟ අවුරුදුවල ගේන්න කටයුතු කරන්නේ නැහැ, අපේ රට තුළ ඒවා නිෂ්පාදනය කරන්න වැඩ පිළිවෙළක් හදනවා" කියලා. නමුත්, අපි කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, ඇත්තටම එහෙම වැඩ පිළිවෙළක් නැති බව. අපේ රටේ වගා කරන්න පුළුවන් භෝග වර්ග හැම වර්ෂයකදීම පිට රටින් ගෙනැල්ලා තිබෙනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ කාල පරිච්ඡේදයේ හැම

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

භෝගයක්ම පාහේ මේ රටේ නිෂ්පාදනය කරන්න පටන් ගත් බව. හිටපු කෘෂිකර්ම අමාත්‍ය ගරු කොබ්බෑකඩුව මැතිතුමාගේ කාලයේ උතුරේ ජනතාව එතුමිය පිළිගත්තේ බොහොම ඉහළින්. කාන්තාවන් බිම දිගා වෙලා කොණ්ඩය පලසක් හැටියට දාලා අල, ලූනු, මිරිස්වලින් මල් මාලා දාලා තමයි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පිළිගත්තේ. එදා උතුරේ ජනතාවගේත් දායකත්වයෙන් අපේ රට කෘෂි කර්මාන්තය අතින් ස්වයංපෝෂිත වෙලා තිබුණා. බොහෝ සාරවත් පොළොවක් තිබෙන, හොඳ දේශගුණයක් තිබෙන අපේ රට තුළ වගා කරන්න පුළුවන් භෝග වර්ග ටික වගා කරලා, එම කෘෂි නිෂ්පාදන පිට රටින් ගෙන්වන එක නවත්වන්න, කෘෂිකර්ම අමාත්‍යතුමා හැටියට ඔබතුමා හෝ යම් පැහැදිලි ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක් හදනවාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ. අපි මුලින්ම කියන්න ඕනෑ, පසුගිය වසර 5ක කාලය තුළ අපි පුරුදු වෙලා සිටියේ යැපුම් ආනයන ආර්ථිකයකට බව. අපි ඒක පිළිගන්න ඕනෑ.

සියලු දේ පිට රටින් ආනයනය කරන්න තමයි අපි පුරුදු වෙලා තිබෙන්නේ. අපේ රටේ නිෂ්පාදනය කළ හැකි දේ නිෂ්පාදනය කරගන්න අපි කටයුතු කරලා නැහැ. අපේ රටේ භෝග වර්ග පමණක් නොවෙයි, බීජ ගත්තත් එහෙමයි. අපේ රටේ නිෂ්පාදනය කළ හැකි බීජ අපි ආනයනය කරනවා. ගරු කථානායකතුමනි, අපි අවුරුද්දකට රුපියල් බිලියන දෙකක් -මිලියන 2,000ක්- වැය කරනවා, බීජ ආනයනය කරන්න. ඒ බීජ අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්. නමුත්, පිට රටින් ගෙනැල්ලා කන්නත්, පිට රටින් ගෙනැල්ලා හදන්නත් තමයි අප හැම දාම පුරුදු වෙලා තිබෙන්නේ. ඒ ඇරෙන්න, අපේ රටේ නිෂ්පාදනය කරන්න පුරුදු වෙලා නැහැ.

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේ යැපුම් ආනයන ආර්ථිකයෙන් මිදිලා නිෂ්පාදන ආර්ථිකයක් කරා ඉදිරි වසර පහ තුළ යන්නේ කොහොමද කියලා. ගරු මන්ත්‍රීතුමනි, ආනයනය සඳහා අප වැඩිම මුදලක් වැය කරන්නේ අල, ලූනු, මිරිස් සඳහායි. එදා අපේ රටේ සියයට 100ක් මිරිස් නිෂ්පාදනය කළා. නමුත්, අපි අද මිරිස් අවශ්‍යතාවෙන් සියයට 100 ම ආනයනය කරනවා. අපි වේළිච්ච මිරිස් මෙට්‍රික්ටොන් 50,000ක් ආනයනය කරනවා. ගරු කථානායකතුමනි, අපේ බලාපොරොත්තුව, 2024 වන කොට ඒ ආනයනය නවත්වන්න. ඒ සඳහා අපට බීජ කිලෝ 2,500ක් ඕනෑ. එය වගා කරන්න අපට හෙක්ටෙයාර 10,000ක භූමි ප්‍රමාණයක් අවශ්‍යයි. ගරු කථානායකතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ මගේ නාවලපිටිය ආසනයේ වර්ග අඩි 150,000ක බීජ නිෂ්පාදන ගම්මානයක් අපි පටන් ගත්තා. අපේ සමහර කට්ටිය කිව්වා, ඒක කරන්න බැහැ කියලා. නමුත්, අපේ රටේ ජාතික මිරිස් බීජ අවශ්‍යතාවෙන් සියයට 75ක් සැපයීම සඳහා අපි නාවලපිටිය, අලුත්ගම බීජ නිෂ්පාදන ගම්මානය තුළ බීජ නිෂ්පාදනය කරනවා. ඒවා වගා කරන්න උතුර, නැඟෙනහිර ප්‍රදේශ ද ඇතුළුව හෙක්ටෙයාර 4,000ක් දැනට හඳුනාගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, වියළි මිරිස් අවශ්‍යතාවෙන් සියයට 100 ම ආනයනය කරපු එක අපි ලබන අවුරුද්දේ සියයට 75කට අඩු කරනවා. ඒවා වගා කරන්න අපි දැන් කටයුතු කර තිබෙනවා. අවශ්‍ය බීජ ටික හදලා දැන් ඒ කටයුත්ත කරනවා.

ගරු කථානායකතුමනි, අපි ලූනු අවශ්‍යතාවෙන් සියයට 65ක් ආනයනය කරනවා. අපි දඹුල්ලේ දිගම්පතන කියන ගමේ බීජ නිෂ්පාදන ගම්මානය පටන් ගත්තා. ඒ බීජ ටික හදන්න අපි එක ගොවියෙකුට රුපියල් ලක්ෂ 25 ගණනේ ආධාර දුන්නා.

අපි දැන් ලංකාවටම අවශ්‍ය බීජ ටික දඹුල්ලේ දිගම්පතන ගම්මානයේ හදනවා. අපට මේ රටේ ලොකු ලූනු අවශ්‍යතාව සියයට සියයක් සම්පූර්ණ කර මේ රට ලූනුවලින් ස්වයංපෝෂිත කරන්න බැහැ. අවශ්‍ය ඉතුරු ප්‍රමාණය රතු ලූනුවලින් සම්පූර්ණ කරන්න අපි බලාපොරොත්තු වනවා. අපි ඉදිරි වසර හතර වනකොට රටට අවශ්‍ය ලූනු ප්‍රමාණයෙන් සියයට 65ක් මේ රටේ නිෂ්පාදනය කරගන්න බලාපොරොත්තු වනවා.

දැනට අපේ රටේ අල අවශ්‍යතාවෙන් සියයට 65ක් අපි ආනයනය කරනවා. සීතාඑළියේ ඇති අපේ farm එකේ බීජ මිලියන 3යි අපි නිෂ්පාදනය කළේ. අපි එය මිලියන 9 දක්වා වැඩි කළා. ඊළඟට අපි දැන් "G0" බීජ හදන්න පටන් ගත්තා. අලුත් තාක්ෂණයත් එක්ක, අපි වැඩියෙන්ම ආනයනය කරන අල, ලූනු, මිරිස් මේ රටේ නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළ අපි ආරම්භ කරලා ඉවරයි, ගරු කථානායකතුමනි. ඒ සඳහා අවශ්‍ය බීජ ටික අපි නිෂ්පාදනය කරනවා. ඒ සඳහා අවශ්‍ය ඉඩම් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රටට අවශ්‍ය කිරිපිටිවලින් සියයට 60ක් අපි දැනට ආනයනය කරනවා. මේ රට කිරිවලින් ස්වයංපෝෂණය කිරීමේ වැඩසටහනත් අපි හදලා ඉවරයි.

මේ රටේ නිෂ්පාදනය කළ හැකි සියලු බීජ වර්ග, භෝග වර්ග ඉදිරි වසර හතර තුළ මේ රටේ නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආරම්භ කරලා ඉවරයි. ඒ සඳහා අවශ්‍ය බීජ හදනවා. මේ සඳහා අපි මිලියන 6,000ක් වෙන් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම, ඒ සියලු භෝග අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්. ආණ්ඩුවක් හැටියට අපි ඉදිරි වසර හතර තුළ ඒ කටයුත්ත කරනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතා වැදගත් පණිවුඩයක් අපට ලබා දුන්නා. බීජ මධ්‍යස්ථානයක් හදන්න හොඳම ස්ථානයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ තමයි මා නියෝජනය කරන නාරම්මල ආසනයේ බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටා ඇති ස්ථානය. පුළුවන්කමක් තිබෙනවා නම් දෙවැනි බීජ නිෂ්පාදන ගම්මානය එම ස්ථානයේ හදන්න කටයුතු කරන්න, ගරු ඇමතිතුමනි. ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒ ආයතනය තිබෙන්නේ. එතැන අක්කර 64ක විශාල භූමි ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම ඉතා හොඳ විභවයක් තිබෙන තැනක්.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රටේ ගොවි ජනතාවට අද මුහුණ පාන්න සිදු වෙලා තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, වන සතුන්ගෙන් භෝගවලට සිදු වන හානිය.

මේ සම්බන්ධයෙන් මා නියෝජනය කරන දඹදෙණිය මැතිවරණ කොට්ඨාසයේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාව පුරාම ගොවීන්ගේ විශාල මැසිවිල්ලක් තිබෙනවා. විශේෂයෙන්ම ඌරන්, රිළවුන්, වඳුරන් ඇතුළු වන සතුන් අතිවිශාල ප්‍රමාණයකගෙන් සිදු වන විනාශය නිසා ගොවි ජනතාව දැඩි පීඩනයකට පත් වෙලා සිටිනවා. මේ ගැන අපි දිගටම කථා කරලා තිබෙනවා. හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් පාර්ලිමේන්තුවේ දී මේ ගැන කථා කළා. අපි හැමෝම පක්ෂ භේදයකින් තොරව මේ ප්‍රශ්නය දකිනවා. බෞද්ධ රටක් හැටියට අපට විවිධ ප්‍රායෝගික ගැටලු තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට විසඳුමක් සෙවිය යුතුයි, ගරු ඇමතිතුමනි. ඒ නිසා වෙනත් රටවල් මේ උවදුර පාලනය කරන ආකාරය පිළිබඳව විශේෂඥ දැනුම ලබා ගන්න. අමාත්‍යාංශයක් හැටියට ඒ ගැන තනිවම තීන්දු අරගෙන කටයුතු කරන්න බැරි නම්, ජනාධිපති කාර්ය සාධක බලකායක් හදලා හෝ පාර්ලිමේන්තු විශේෂ කාරක

සභාවක් පත් කරලා, ඒ සඳහා අවශ්‍ය විශේෂඥයන් ගෙන්වලා යම් වැඩ පිළිවෙළක් හැදුවොත්, අපේ රටේ ආහාර නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් පරිභෝජනයට ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම ගොවි ජනතාවගේ දැඩි පීඩනය අඩු කරන්නත් පුළුවන්කම ලැබෙනවා. අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ගැන කථා කළාට වැඩක් නැහැ. ඒ සඳහා පිළියමක් යොදන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා මූලික වෙලා, ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරලා විශේෂ කාරක සභාවක් හෝ පත් කරලා, ඒ සම්බන්ධයෙන් විශේෂඥ දැනුම තිබෙන අය ගෙන්වලා, මේ සඳහා ස්ථිරසාර වැඩ පිළිවෙළක් හදන්න. ඔබතුමා නායකත්වය ලබාදීලා එවැනි වැඩ පිළිවෙළක් කරන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් කෘෂිකර්ම අමාත්‍ය ධුරයේ කටයුතු කර තිබෙන නිසා අපේ රටේ ආහාර නිෂ්පාදනයේ දී වන සතුන්ගෙන් සිදු වන හානිය සහ ප්‍රවාහනයේ දී සිදු වන හානිය පිළිබඳව හොඳින්ම දන්නවා ඇති. අපේ රටේ ආහාර නිෂ්පාදනයෙන් සියයට 45ක්, 50ක් වන සතුන්ගෙන් සිදු වන හානි නිසාත්, ප්‍රවාහනයේ දී සිදු වන හානි නිසාත් නාස්ති වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි වැඩ පිළිවෙළක් හදලා නැහැ. අපේ රටේ කෘෂිකර්මාන්තයට විශාලම හානියක් සිදු වන්නේ වන අලින්ගෙන්. වන සතුන්ගෙන් වගාවලට වන මේ හානිය වැළැක්වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා පළමුවැනි වතාවට ඒ සම්බන්ධයෙන් වෙනම රාජ්‍ය අමාත්‍යවරයෙක් පත් කරලා, එම අමාත්‍යාංශය මඟින් මේ වෙනකොට කිලෝමීටර් විශාල ප්‍රමාණයක් අලිවැට හදලා ඒ කටයුතු කරගෙන යනවා. ගරු කථානායකතුමනි, මෙතෙක් ගිනි අවි බලපත්‍ර ලබා දුන්නේ හෙක්ටෙයාර 5කට වැඩි භූමි ප්‍රමාණයක වගා කරන ගොවීන්ට විතරයි. මම යෝජනා කළා, ගිනි අවි ලබා දීමේ ක්‍රමවේදය හෙක්ටෙයාර 2ක දක්වා අඩු කරන්න කියලා. මොකද, වල්ඌරන් වැනි සතුන්ගෙන් වගාවලට වන හානිය ඉතාම ඉහළයි. ඒ නිසා දැන් ගිනි අවි බලපත්‍ර ලබාදීම හෙක්ටෙයාර දෙක දක්වා අඩු කරලා එයට අවශ්‍ය අනුමැතිය අපි ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි රිළවුන්ගෙන් සිදු වන හානිය. රිළවුන් නිසා අද ගෙවත්තක මිරිස් පැළයක් තියා ගන්න බැහැ. මේකත් අද ඉතාම බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ සඳහා වනජීවී අමාත්‍යාංශයත්, අපිත් එකතුවෙලා ඒකාබද්ධ කමිටු පත් පත් කරලා තිබෙනවා. මේ සඳහා විවිධ යෝජනා ඇවිල්ලා තිබෙනවා. මේ පිළිබඳව අපි සාකච්ඡා කරනවා. තවමත් මගේ අමාත්‍යාංශයට විසඳා ගන්න බැරි වෙලා තිබෙන එකම ප්‍රශ්නය තමයි, මේ රිළවුන්ගෙන් වන හානිය. විදේශ රටවල් මෙවැනි ප්‍රශ්නවලදී කටයුතු කරන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපේ කමිටුවක් විසින් අධ්‍යයනය කරගෙන යනවා. අපි මේ ප්‍රශ්නයටත් කඩිනමින් විසඳුමක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ප්‍රවාහනයේදී සිදු වන හානිය අවම කිරීම සඳහා අපේ එළවලු ඇතුළු ආහාර බෝග දුම්රියෙන් ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් අපි දැන් සකස් කරමින් සිටිනවා. ගරු කථානායකතුමනි, අපේ කැප්පෙටිපොළ එළවලු ටික කොළඹට එන්නේ ආර්ථික මධ්‍යස්ථාන 4ක් හරහා බව ඔබතුමා දන්නවා. කොළඹට එන එළවලු හතර පාරක් බානවා; නැවත ලොරි හතරකට පටවනවා. මේ නිසා සිද්ධ වෙන නාස්තිය ඉතාම ඉහළයි. ඒ නිසා ප්‍රවාහනයේ දී සිදුවන මේ හානිය අවම කරන්න අපි දැන් වෙනම කෝච්චි පෙට්ටියක් design කරගෙන යනවා. නුවරඑළියේ සියලුම එළවලු ටික කෙළින්ම කොළඹට එන වැඩසටහන අපි දැන් හදනවා. ඒ නිසා ප්‍රවාහනයේදී සිදු වන නාස්තියත් අවම කිරීමට අපි දැන් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1590/2021- (1), ගරු විජිත හේරත් මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1908/2021- (1), ගරු ජගත් පුෂ්පකුමාර මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1997/2021- (1), ගරු ෆයිසාල් කාසිම් මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## උතුරු හෝකන්දර ප්‍රදේශයට ජලය සැපයීම: අඩාළවීම
### ஹோகந்தர வடக்குக்கான நீர் வழங்கல்: தடைப்படல்
### WATER SUPPLY TO HOKANDARA NORTH: DISRUPTION

1590/2021

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු විජිත හේරත් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு விஜித ஹேரத் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon.Vijitha Herath)

ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කඩුවෙල, උතුරු හෝකන්දර ප්‍රදේශයේ ගම්මාන රාශියක නිවාස විශාල සංඛ්‍යාවකට ලබා දී ඇති ජල සැපයුම උදෑසන කාලයේදී අඩාළ වන අතර එය යථා තත්ත්වයට පත්වන්නේ පෙ.ව. 10.00ට පමණ බවත්, ප.ව. 5.00ට පමණ නැවත ඇනහිටින ජල සැපයුම යථා තත්ත්වයට පත්වන්නේ රාත්‍රී 9.00න් පසුව බවත්;

(ii) නිවාඩු දිනවල බොහෝ අවස්ථාවලදී සම්පූර්ණ දිවා කාලයටම ජලය නොලැබෙන බවත්;

(iii) විශේෂයෙන් එක් මහලක් හෝ සහිතව ඉදිකරනු ලැබූ නිවාසවලට මෙම ගැටලුව තදින්ම බලපා ඇති බවත්;

(iv) මේ සම්බන්ධයෙන් ජල සම්පාදන අමාත්‍යාංශය දැනුවත් කර තිබුණ ද මෙතෙක් විසඳුමක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ප්‍රදේශවාසීන්ට දවස පුරා අඛණ්ඩව ජලය ලැබෙන පරිදි මෙම ගැටලුව කඩිනමින් විසඳීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடுவலை, ஹோக்கந்தர வடக்குப் பிரதேசத்தின் பல்வேறு கிராமங்களிலுள்ள பெரும் எண்ணிக்கையிலான வீடுகளுக்கு வழங்கப் பட்டுள்ள நீர் இணைப்பு காலை வேளைகளில் பாதிக்கப்படுவதோடு, அது மு.ப 10.00 மணி

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

அளவிலேயே இயல்பு நிலைக்கு வருகின்றதென் பதையும், பி.ப 5.00 மணியளவில் மீளத் தடைப்படும் நீர் இணைப்பு இரவு 9.00 மணிக்குப் பின்னரே இயல்பு நிலைக்கு வருகின் றதென்பதையும்;

(ii) விடுமுறை நாட்களில் அநேகமான சந்தர்ப்பங்களில் பகல் முழுவதும் நீர் கிடைப்பதில்லை என்பதையும்;

(iii) குறிப்பாக ஒரு மாடியையேனும் கொண்டதாக நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளுக்கு இப்பிரச் சினை கடும் பாதிப்பை ஏற்படுத் தியுள்ளதென்பதையும்;

(iv) இவ்விடயம் தொடர்பாக நீர் வழங்கல் அமைச்சுக்கு அறிவிக்கப்பட்டுள்ளபோதிலும், இதுவரை தீர்வெதுவும் கிடைக்கவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட பிரதேச மக்களுக்கு நாள் முழுவதும் தொடர்ச்சியாக நீர் கிடைக்கும் வகையில் இப்பிரச்சினையைத் துரிதமாகத் தீர்ப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply:

(a) Is he aware that -

(i) the water supply connected to a large number of residences in many hamlets in Hokandara North area in Kaduwela is disrupted in the morning and gets to normalcy only around 10.00 a.m. while the supply is disrupted again around 5.00 p.m. and does not get to normalcy until after 9.00 p.m.;

(ii) often water is not available for the whole of daytime on holidays;

(iii) this problem particularly affects households that have been constructed with at least one upper floor; and

(iv) although the Ministry of Water Supply has been informed of the matter, no solution has been given so far?

(b) Will he inform this House -

(i) whether he will take steps to solve this problem so that the people in the area concerned can receive water round the clock; and

(ii) if so, on which date?

(c) If not, why?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) දැනුවත්ය.

මෙම ප්‍රදේශවල පවතින අධික ජන ඝනත්වය හේතුවෙන් ජල සැපයුම සඳහා ඇති ඉල්ලුම අතිශයින් ඉහළ ගොස් ඇත. ඒ හේතුවෙන් ජල පරිභෝජනය අධික කාර්ය බහුල වේලාවන් ලෙස සැලකෙන උදෑසන 6.30-10.00ත් සහ සවස 5.00ත් රාත්‍රි 9.00ත් අතර බෙදා හැරීම් පද්ධතියේ විශේෂයෙන් උස් බිම් ප්‍රදේශවල ජල සැපයුම අඩාළ වීම හෝ පීඩනය අඩුවීම සිදු වේ. මෙය ජලය ගබඩා කිරීමේ පහසුකම් තබා ගෙන නොමැති නිවාස 500ක පමණ පිරිසකට තදින්ම බලපා ඇති අතර, අවශ්‍ය ගබඩා පහසුකම් ඇති කර ගන්නා ලෙසට ද ඔවුන් දැනුවත් කර ඇත. පැය 24ම අවශ්‍ය ජලය ලබා දුන්න ද ජල ගබඩා පහසුකම් හෙවත් ජල ටැංකි තබා නොගැනීමෙන් ඉහත කාර්ය බහුල වේලාවන්හිදී සිදුවන පද්ධතියේ පීඩනය අවම වීම හේතුවෙන් අදාළ පාරිභෝගිකයන්ට සිදුවූ අපහසුතාව තිවූ වී තිබිණ.

(ii) දැනුවත්ය.

ඉහත දැක්වූ කාර්ය බහුල වේලාව තුළ මෙන්ම සති අන්ත හෝ නිවාඩු දිනවලදී ජල පරිභෝජනය සතියේ සාමාන්‍ය දිනක පරිභෝජනය මෙන් දෙගුණයක් පමණ වේ. මේ හේතුවෙන් බෙදාහැරීම් පද්ධතියේ උස් භූමි සඳහා වන සැපයුම බිඳ වැටේ.

(iii) දැනුවත්ය

කාර්ය බහුල වේලාවන්හිදී එක් මහලක් සහිතව ඉදිකර ඇති නිවාසවල පහත මාලයට ජලය සැපයීම සිදු වුවද ඉහළ මහල් සඳහා ජලය සැපයීමට අවශ්‍ය පීඩනය නොමැති වේ.

එසේ වුවද පද්ධතියේ ජල පීඩනය නිසි පරිදි තිබෙන කාර්ය බහුල නොවන අවස්ථාවලදී ජලය ගබඩා කර තබාගෙන, එම ජලය අනෙක් වේලාවේදී භාවිත කිරීමට හැකි වන බැවින් බොහෝ විට මෙම ගැටලුව ඇති නොවේ.

(iv) දැනුවත්ය.

මෙම ගැටලුව විසඳීම සඳහා බත්තරමුල්ල බෙදාහැරීම් කලාපයෙහි ඇති ජලය බෙදා හැරීමේ පද්ධතිය යාවත්කාලීන කළ යුතු අතර, ඒ සඳහා වන වැඩිදියුණු කිරීම් හඳුනාගෙන අවශ්‍ය සැලසුම් සිදු කරමින් පවතී. මෙම සැලසුම් මණ්ඩලීය සාමූහික සැලැස්මෙහි 2022-2023 වසරවලට අදාළ සැලසුම්වල කාණ්ඩ අංක 02හි අනුවෙනි අයිතමය ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිත වේ. (ඇමුණුම**)

(ආ) (i) පැය 24 සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය සැපයීම අනිවාර්යයෙන් සිදු කරන අතර, හැකි සෑම විටම පැය 24 පුරා මෙම ජලය අඛණ්ඩව සැපයීමට මණ්ඩලය කටයුතු කරයි. මෙහි දක්වා ඇති ජල ගැටලුව විසඳීමට පවතින ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා මණ්ඩලය මගින් මේ වනවිට හෝකන්දර වානගුරු මාවත සහ කළල්ගොඩ මාර්ගයෙහි වැඩි ධාරිතාවෙන් යුතු බෙදාහැරීම් නළ එළීම අවසන් අදියරේ පවතී. මෙම කටයුතු 2021 වසර අවසාන වීමට පෙර සම්පූර්ණයෙන් නිම කරන අතර, ඉන් පසු මෙම පළාතෙහි ජල ගැටලුව විසඳෙනු ඇත.

(ii) වානගුරු මාවතේ ජල නළ එළීම මේ වනවිට අවසන් කර ඇති අතර, පද්ධතිය අද වනවිට ක්‍රියාත්මක වේ. කළල්ගොඩ

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

මාර්ගයෙහි නළ එළා අවසන්ව ඇති අතර, එය පවතින පද්ධතියට සම්බන්ධ කරමින් පවතී. එය නිම කිරීම සඳහා තවත් මාසයක පමණ කාලයක් ගතවනු ඇත. ඉන්පසු කඩුවෙල උතුරු හෝකන්දර ප්‍රදේශයේ ගම්මාන රාශියකට පැය 24 පුරා ජලය ලැබෙනු ඇත. එහෙත් මහල් ගොඩනැඟිලි සඳහා පොම්ප යොදා ගැනීමට සිදුවිය හැකි ය.

(ඇ) අදාළ නොවේ.

## වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව: අක්‍රමිකතා
## வர்த்தக மற்றும் முதலீட்டுக் கொள்கைகள் திணைக்களம்: முறைகேடுகள்
## DEPARTMENT OF TRADE AND INVESTMENT POLICY: IRREGULARITIES

1908/2021

**4. ගරු ශාන්ත බණ්ඩාර මහතා (ගරු ජගත් පුෂ්පකුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு சாந்த பண்டார - மாண்புமிகு ஜகத் புஷ்பகுமார சார்பாக)
(The Hon. Shantha Bandara on behalf of the Hon. Jagath Pushpakumara)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வர்த்தக மற்றும் முதலீட்டுக் கொள்கைகள் திணைக்களத்தில் 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில் ஏதேனும் முறைகேடு, முறையற்ற நியமனம், ஊழற் செயற்பாடு அல்லது சட்டவிரோதச் செயற்பாடு இடம்பெற்றுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவை வெவ்வேறாக யாவை யென்பதையும்;

(iii) மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு செயற்பாட்டின் விளைவாகவும் அரசாங்கம் இழந்துள்ள நிதி, சொத்து மற்றும் மனித வளங்களின் பெறுமதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி (அ) (i)இல் குறிப்பிடப்பட்ட செயற்பாடுகளுக்குப் பொறுப்புக் கூறவேண்டிய அலுவலர்களை அடையாளம் காண்பதற்கெனப் புலனாய்வுகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) பொறுப்புக்கூற வேண்டிய அலுவலர்கள் அடையாளம் காணப்பட்டிருப்பின், அவர்களுக்கு எதிராக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்;

(iii) அவர்களுக்கு எதிராக நடவடிக்கைகள் மேற் கொள்ளப்படாவிடின், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(iv) அவர்களுக்கு எதிராக எதிர்காலத்தில் நடவடிக் கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(v) எதிர்காலத்தில் இடம்பெறக்கூடிய இத்தகைய ஊழல் செயற்பாடுகளைத் தடுப்பதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை யென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he state -

(i) whether any irregularity, irregular appointment, any act of corruption or any illegal activity has taken place in the Department of Trade and Investment Policy during the period from year 2015 to 2019;

(ii) if so, separately the nature of such acts that have taken place at the aforesaid Department; and

(iii) separately, the value of the financial resources, property and human resources that the Government has lost due to each of the aforesaid acts?

(b) Will he also state -

(i) whether investigations have been carried out to identify the officers who are responsible for the acts mentioned in (a) (i) above;

(ii) if the responsible officers have been identified, the action that has been taken against them;

(iii) if no action has been taken against them, the reasons for that;

(iv) whether action will be taken against them in future; and

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

(v) the measures that will be taken to prevent the occurrence of such acts of corruption in future?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***** **සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදාළ කාල සීමාව තුළ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් යොමු කර ඇති රජයේ විගණන විමසුම්, අභ්‍යන්තර විගණන විමසුම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා වාර්තා හෝ වෙනත් එවැනි පිළිගත හැකි විමර්ශනයක් මඟින් කිසියම් අක්‍රමිකතාවක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදුවී ඇති බවට වාර්තා වී නොමැත.

(ii) ප්‍රශ්නය අදාළ නොවේ.

(iii) ප්‍රශ්නය අදාළ නොවේ.

(ආ) (i) ප්‍රශ්නය අදාළ නොවේ.

(ii) ප්‍රශ්නය අදාළ නොවේ.

(iii) ප්‍රශ්නය අදාළ නොවේ.

(iv) ප්‍රශ්නය අදාළ නොවේ.

(v) ප්‍රශ්නය අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

## එම්.එස්.එස්. රලිනා මහත්මිය: හිඟ විශ්‍රාම වැටුප
திருமதி எம்.எஸ்.எஸ். ரலீனா: ஓய்வூதிய நிலுவை
MRS. M.S.S. RALINA: PENSION IN ARREARS

1997/2021

**5. ගරු ශාන්ත බණ්ඩාර මහතා (ගරු ෆයිසාල් කාසිම් මහතා වෙනුවට)**
(மாண்புமிகு சாந்த பண்டார- மாண்புமிகு பைஸால் காசிம் சார்பாக)
(The Hon. Shantha Bandara on behalf of the Hon. Faizal Cassim)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 1994 - 2014 අමප/16/0323/734/002 හා 2016.03.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සහ විශ්‍රාමික උපගුරු එම්.එස්. එස්. රලිනා මහත්මිය (විශ්‍රාම අංක 01-1020485 හා ජාතික හැඳුනුම්පත් අංක 498042872X දරන) අමතන ලද, ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අංක ගා/කලාප/ගු.ආ./2/5 විශ්‍රාම සහ 2017.05.29 දිනැති ලිපියේ සඳහන් පරිදි 2005.11.01 දිනට රලිනා මහත්මිය වෙත ලබා දිය යුතු වැටුප් වර්ධක අගය මත (645x2=1,290) විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී ඇයට හිමිවිය යුතු මුළු හිඟ මුදල කොපමණද;

(ii) ඉහත තීරණය පරිදි රු.198,660/=ක් වන වැටුප් පියවරේ අගය මත 2005.11.01 සිට 2018.08.01 දින දක්වා මාස 154ක් සඳහා ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප සැකසීමේදී යම් දෝෂයක් සිදු වී තිබෙන බව රලිනා මහත්මිය විසින් අදාළ ආයතන දැනුවත් කරන ලද බව දන්නේද;

(iii) එසේ නම්, රලිනා මහත්මියගේ වැටුප් වර්ධක නිවැරදි ලෙස ගණනය කර ඇයට හිමි හිඟ විශ්‍රාම වැටුප් මුදල ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1994-2014 අමප/16/0323/734/002 மற்றும் 2016.03.02ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தின்படியும் ஓய்வுபெற்ற உதவி ஆசிரியை திருமதி எம்.எஸ்.எஸ். ரலீனா (ஓய்வூதிய இலக்கம் 01-1020485 மற்றும் தேசிய அடையாள அட்டை இலக்கம் 498042872X) அவர்கள் விளிக்கப்பட்ட, காலி வலயக் கல்விப் பணிப்பாளரின் இலக்கம் ගා/කලාප/ගු.ආ./2/5 විශ්‍රාම மற்றும் 2017.05.29ஆம் திகதிய கடிதத்தில் குறிப்பிடப்பட்டுள்ளதன்படியும் 2005.11.01ஆம் திகதியில் திருமதி ரலீனா அவர்களுக்கு வழங்கப் படவேண்டிய சம்பள ஏற்றத்திற்கான பெறுமதியின் அடிப்படையில் (645 x 2 = 1,290) ஓய்வூதியம் கணிப்பிடப்படும்போது அவருக்குக் கிடைக்கவேண்டிய மொத்த நிலுவைத் தொகை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி தீர்மானத்திற்கமைவாக ரூ. 198,660/= எனும் சம்பளப் படிமுறைக்கான பெறுமதியின் அடிப்படையில் 2005.11.01 தொடக்கம் 2018.08.01 வரையிலான 154 மாதங்களுக்காகச் செலுத்தப்படவேண்டிய நிலுவை ஓய்வூதியத் தினைத் தயாரிக்கும்போது தவறு ஏற்பட்டுள் ளதாக திருமதி ரலீனா அவர்கள் தொடர்புடைய நிறுவனங்களை விழிப்பூட்டியுள்ளார் என்பதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், திருமதி ரலீனா அவர்களின் சம்பள ஏற்றங்களைச் சரியாகக் கணக்கிட்டு, அவருக்கு உரித்தான நிலுவை ஓய்வூதியத் தொகையை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப் படுமா என்பதையும்;

அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) the total of arrears payable to Mrs. M.S.S. Ralina, Retired Assistant Teacher (Pension No. 01-1020485 and National Identity Card No. 498042872X) when calculating her pension based on the salary increment value (Rs. 645 x 2 = 1,290) that should be paid to her as at 01.11.2005 as per Cabinet Decision No. 1994-2014 අමප/16/0323/734/002 dated 02.03.2016 and as per the letter No. ගා/කලාප/ගු.ආ./2/5විශ්‍රාම dated 29.05.2017 addressed to retired teacher Mrs. Ralina by the Zonal Director of Education;

(ii) whether he is aware that Mrs. Ralina had informed the relevant institutions that an error has occurred in preparing the pension payable to her for the 154 months from 01.11.2005 to 01.08.2018 based on the salary step Rs. 198,660/- as per the above-mentioned decision;

(iii) if so, whether he will take steps to calculate Mrs. Ralina's salary increments accurately and grant her the pension, to which she is entitled?

(b) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**සபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) මුළු හිඟ මුදල රු.117,155.50කි.

(ii) එසේ දැනුවත් කිරීමක් සිදු කර නොමැති බව ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් වාර්තා කර ඇත.

(iii) මේ වනවිට එම්.එස්.එස්. රලිනා මහත්මියට හිමි හිඟ විශ්‍රාම වැටුප් මුදල ගෙවා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

## වරප්‍රසාද: තොරතුරු දැනගැනීමට පාර්ලිමේන්තුව සතු අයිතිය
## சிறப்புரிமை: தகவலறிவதற்கான பாராளுமன்றத்தின் உரிமை
## PRIVILEGE: PARLIAMENT'S RIGHT TO INFORMATION

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම කථා කරන්නේ ඇමතිතුමන්ලා පාර්ලිමේන්තුවට තොරතුරු ලබාදීම වළක්වන ගිවිසුම් ගැනයි. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43වැනි ව්‍යවස්ථාව යටතේ ඇමතිවරු පාර්ලිමේන්තුවට සාමූහිකව වගකියන්න ඕනෑ. විශේෂයෙන්ම 4(ඇ) ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට තමයි පාර්ලිමේන්තු කටයුතු ගැන අධිකරණ බලතල තිබෙන්නේ.

ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 67වන ව්‍යවස්ථාවෙන් කියනවා, පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල පාර්ලිමේන්තුව විසින් විධිමත් කරන්න ඕනෑ කියලා. ඊළඟට, 74වන ව්‍යවස්ථාවෙන් කියනවා, ස්ථාවර නියෝග මඟින් විවිධිධාන සලස්වන්න පාර්ලිමේන්තුවට බලතල තිබෙනවා කියලා.

1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 7වන වගන්තියෙන් කියනවා, මේ පනතින් ලබාදී තිබෙන බලතල, ආරක්ෂාව හා වරප්‍රසාදවලට අමතරව එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ කොමන්ස් සභාවේ මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතිවාසිකම් සියල්ල ද අපට තිබෙනවා කියලා. ඊළඟට, එම පනතේ 9වන වගන්තියෙන් කියනවා, මේ සියලු වරප්‍රසාද, ආරක්ෂාව හා බලතල රටේ සාමාන්‍ය නීතියේ කොටසක් කියලා - "...shall be part of the general and public law....". ඒ වාගේම අපට කොමන්ස් සභාවේ තිබෙන අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන්නත් පුළුවන්. එම නිසා විශේෂයෙන්ම පාර්ලිමේන්තුවට තොරතුරු ලබාදෙන එක අපේ ස්ථාවර නියෝගවලිනුත්, කොමන්ස් සභාවේ නියෝග අනුවත් ක්‍රියාත්මක වෙනවා. අපේ ස්ථාවර නියෝග 31 යටතේ, පොදු කටයුතු පිළිබඳ ප්‍රශ්න අගමැතිතුමාට හෝ ඒ විෂය භාර ඇමතිවරයාට යොමු කරන්න පුළුවන්. අදාළ ඇමතිතුමා පැමිණ නැත්නම්, ස්ථාවර නියෝග 32(2) යටතේ රාජ්‍ය ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් වෙලා ඒ සඳහා පිළිතුරු දිය යුතුයි.

ඊළඟට, ස්ථාවර නියෝග 34(1)හි කියන්නේ, ප්‍රශ්න අහන්නේ ඇමතිතුමා යටතේ තිබෙන වැඩ කටයුතු පිළිබඳව කියායි. මේ පිළිබඳව කොමන්ස් සභාවේත් හරියටම පැහැදිලි කර තිබෙනවා. Sir, I quote from Madam Speaker's Ruling in Column 609 of the Parliamentary Debates, Sixth Series - Volume 278, Session 1995-96 of the House of Commons:

> "The purpose of a question is to obtain information or press for action."

හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම ඒක වෙනම **සභාගත*** කරනවා.

ඒ වාගේම, Erskine Mayහි 25වැනි වෙළුමේ, 521වැනි පිටුවේ, paragraph 22.11හි මෙසේ කියනවා:

> "The purpose of a question is to obtain information.."

ඊට අමතරව කොමන්ස් සභාවේ ඒකාබද්ධ තේරීම් කාරක සභාව පාර්ලිමේන්තු වරප්‍රසාද ගැන පළමුවැනි වාර්තාවේ මේ ගැන සඳහන් කර තිබෙනවා. Erskine May, paragraph 15.2හි මෙසේ කියනවා:

> "Generally speaking, any act or omission which obstructs or impedes either House of Parliament in the performance of its functions, or which obstructs or impedes any Member or officer of such House in the discharge of their duty,.."

මම එම වාර්තාවත් මෙම ගරු සභාවේදී **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා රජයත්, NFE Sri Lanka Power Holding LLC එකත් අතර තිබෙන ගිවිසුම පිළිබඳව විශේෂයෙන්ම මම මෙම ගරු සභාවට කියන්න කැමැතියි.

---

***පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

The Framework Agreement between the Government of Sri Lanka and the NFE Sri Lanka Power Holding LLC is in breach of the ministerial duty of providing information to Parliament. මම විශේෂයෙන්ම එහි 8 වැනි වගන්තිය ගැන කියනවා. I draw your attention to Clause 8 - Confidentiality and Announcements - of the the Framework Agreement, which states, I quote:

> "For a period .....Five (5) years…………..shall not, except with the prior written consent of the other Parties, disclose to any Person any information…:"

According to Clause 8.2 - Permitted Disclosure - information is required to be disclosed to comply with an order of a court, arbitral tribunal or an order, decree, regulation or rule of any Governmental Authority. This Clause excludes any information from being provided to Parliament. It makes reference to a Governmental Authority, but Parliament is not the Government. It is the Legislature. There is no specific provision for information to be provided to Parliament. Therefore, the Minister cannot obtain information under this Joint Venture Agreement for the purpose of disclosing it to Parliament. මම විශේෂයෙන්ම උසාවියෙන් ලබා ගත් ඒ ගිවිසුමේ කොපියක් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

Hon. Speaker, you, in exercising your powers as Speaker of Parliament granted under the Constitution and Parliament (Powers and Privileges) Act, should, (a) declare the Agreement to be in violation of powers, privileges and immunities of Parliament and (b) specially on matters relating to the terms of this Agreement or any other entered into pursuant to this Agreement or subject matter thereof or relating to the business finances, assets, liabilities, contracts, dealings, know-how, customers, suppliers, process, plans or affairs of the parties of this House.

Then, I also request you to summon the Secretary to the Treasury, Directors of NFE Sri Lanka Power Holding LLC and the Attorney-General before Parliament. The first two have signed the Agreement. So, they are in breach of our powers and the Attorney-General has approved it on the basis that it is legal. මම කියන්නේ, එහෙම නම් මේක අවලංගු කරලා, මේ ගැන සාකච්ඡා කරන්න භාණ්ඩාගාරයේ ලේකම්තුමා, මේ සමාගමේ අධ්‍යක්ෂවරු හා නීතිපතිතුමා පාර්ලිමේන්තුවට කැඳවන්න කියායි.

දෙවනුව, පාර්ලිමේන්තුව අප නොමඟ යැවීමක් කර තිබෙනවා. අපට ප්‍රකාශ කර තිබෙනවා, මේ ගැන ඒකාධිකාරයක් නැහැ කියලා. ඒක වැරැදියි. This is wrong because in addition to the two plants that they are going to supply and also supplying the Kelanitissa Power Station, according to paragraph 5.3 of the Cabinet Memorandum dated 09th June, 2021, which states, I quote:

> "The GOSL through ST could enter into the Gas Supply Term Sheet (GSTS) as part of the SSPA ......., NFE will be given the right of first refusal to supply LNG for any other plants that may be developed at Kerawalapitiya to operate on LNG."

මේ අනුව කියන්නේ කෙරවලපිටියේත් අයිතිය දෙන්නේ මේ අයට විතරයි, ඕනෑ නම් ලබා දෙන්න පුළුවන් කියලායි.

මම එක කාරණයක් කියන්න කැමතියි. LNG වුවමනා නම්, අපි ඉස්සෙල්ලා කථා කළා, ඉන්දියාව, ජපානය එක්ක. ඒත් ත්‍රිකුණාමලයෙන් ගෙනෙන්න බැහැ. ගෙනෙන්න තිබෙන්නේ කොළඹට විතරයි. කොළඹත් එක තැනක් විතරයි තිබෙන්නේ. ඒ, කෙරවලපිටිය. කෙරවලපිටිය හැර වෙන කොහේටවත් ගෙනෙන්න බැහැ. A floating terminal can only go to Kerawalapitiya. එහෙම නම්, කෙරවලපිටියට එවනවා කියන්නේ, තනි අයිතිය කෙරවලපිටියට දෙනවා කියන එකයි. ඒ කාරණය මම විශේෂයෙන් කියන්න කැමතියි. අපි මේ ගැන සාකච්ඡා කළාම, we said, "Let the first FSRU be given to the two main companies and once it is commercially viable, the second and third ones can be given."

ඊට අමතරව අපි හම්බන්තොට එකක් දුන්නා. මොකද, චීනයෙන් ඉල්ලුවා,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයට සීමා වුණා නම් හොඳයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
අපි නොමඟ යැව්වා. චීනය ඉල්ලුවා, ඒ ගොල්ලන්ගේ විශේෂ ආර්ථික කලාපයට. අපි කිව්වා, එතැනටත් ඕනෑ නම් තව දමන්න කියලා. දැන් එතැනටත් මේ අයිතිය දෙන්නේ නැතිව එකකට සීමා කළොත්, ඇත්ත වශයෙන්ම එය තනි අයිතිය දීලා තිබෙනවා. So, this is illegal and we have been led astray.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That can be taken up in a debate on a later date.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
I would like to tell you one thing, Sir. This is a matter, I think, that you must ask the Party Leaders and all to express their views on. The Hon. M.A. Sumanthiran, Member of Parliament, has gone to America though he also wanted to raise it here. So, maybe after the Budget Debate is over, give us an opportunity in December or January to discuss it fully. It involves the rights of the House and these Agreements cannot be valid if they violate the law because under the law, any contract that violates the law is invalid.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා පිළිතුරක් දෙනවාද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, හිටපු ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් නඟන ලද කාරණාවට අපේ විදුලිබල ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී දෙවරක් පිළිතුරු ලබා දීලා තිබෙනවා. එනමුත්, තුන්වන වරටත් හිටපු ඇගමැතිතුමා "අදාළ ගිවිසුමේ පිටපතක් මෙතෙක් ලැබී නැත" කියලා එතුමා අතේ තිබෙන පිටපතකින් කරුණු ඉදිරිපත් කළා. අපි අදාළ ඇමතිතුමාට යළිත් මේ කාරණය ඉදිරිපත් කරන්නම්. ඔබතුමා ඉල්ලනවා නම් a special Party Leaders' Meeting, we can have one. It is good that you raised this. After all, we did not see any of the Agreements that you all signed; Before this House, the Agreements that were signed by the last Government had never been placed. But, we, on behalf of the Government, are ready to discuss and show the former Prime Minister and the Party Leaders the present position of the said Agreement.

Thank you.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Speaker, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, it is a matter of Privilege that the former Prime Minister raised. Let us not argue on the other issue. Hon. Member, you raised a matter of Privilege. So, go on that. If we go into the details of any other issue, then it becomes a debate. And, we are ready to discuss this issue on behalf of the Government.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

Hon. Speaker, I have written to you that this Agreement violates the Privileges, powers and immunities of this House. That is all that you can rule on. Thereafter, if you say that it violates them, then it is an illegal contract and they have to go into a new contract. I only want to protect the rights of the House.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is exactly what the Hon. -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

Secondly, I referred to the fact that we have been told that there is no monopoly. But I pointed out to you, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
So, we will take it up at a debate.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

Taking it up with the Party Leaders is all right, but if any other Hon. Member wants to express his views on that, we may have to have a debate in the House.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Definitely.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

That, we can decide later. I do not mind that. Once, the Hon. Sumanthiran comes back, we will decide whether the Party Leaders or the House should meet to discuss it. Some of the Members who want to speak on that are not registered Members of the party under which they contested. So, they may also want to give their views.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Right.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවත්, පාර්ලිමේන්තු වරප්‍රසාද අනුවත් මන්ත්‍රීවරුන් ඉල්ලන තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ආණ්ඩුව බැඳිලා ඉන්නවා. මේ යුගදනව් ගිවිසුමෙහි එක වගන්තියක් තිබෙනවා. මේක කවුරු ඉල්ලුවත් දෙන්නේ නැහැ. මම ඔබතුමාට කියනවා, මේ ප්‍රශ්නය ඉක්මනට වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්න කියලා. මොකද, මේක තීරණාත්මක ගිවිසුමක්. ආණ්ඩුව ජාත්‍යන්තර ගිවිසුමක් අත්සන් කරනකොට ඒ තොරතුරු කාටවත් දෙන්නේ නැහැ කියලා ගිවිසුම් අත්සන් කරන්න බැහැ; පාර්ලිමේන්තුවට ඒවා දෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Right. We will take it up later.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
### தனி உறுப்பினர் சட்டமூலங்கள்
### PRIVATE MEMBERS' BILLS

### මාබොටුවන ශ්‍රී පියරතන නාහිමි සුවසෙවන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### மாபொட்டுவன ஸ்ரீ பியரத்தன தேரர் சுவசெவன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### MABOTUWANA SRI PIYARATHANA NAYAKA THERO SUWASEVANA FOUNDATION (INCORPORATION) BILL

**ගරු අසංක නවරත්න මහතා**
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

" මාබොටුවන ශ්‍රී පියරතන නාහිමි සුවසෙවන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுகாதார அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු.

විසර්ජන පනත් කෙටුම්පත 2022, පළමුවැනි වෙන් කළ දිනය. විවාදය ආරම්භ කිරීම, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
### APPROPRIATION BILL, 2022

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී*
*ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12]*
*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" [ ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]*
*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [12th November]*
*"That the Bill be now read a Second time".- [ The Hon. Basil Rohana Rajapaksa.]*
*Question again proposed.*

[පූ.භා. 10.09]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, අද විපක්ෂය වෙනුවෙන් 2022 අය වැය විවාදය ආරම්භ කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මට වේලාව ලබා දුන්නාට විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඊයේ ගරු මුදල් ඇමතිතුමා අය වැය ඉදිරිපත් කරනකොට එතුමාගේ පවුල් පසුබිම ගැන කථා කළා. එතුමා, එතුමාගේ පියාණන් ගැන කථා කළා; එතුමාගේ ලොකු තාත්තා ගැන කථා කළා; සහෝදරයන් ගැන කථා කළා; මැදමුලන කේන්ද්‍ර වෙච්ච රාජපක්ෂවරුන්ගේ සාඩම්බර ගෞරවනීය, වරප්‍රසාද ලත් පෙළපත ගැන කථා කළා. අනේ! අපිට නම් එහෙම නැහැ. මම නියෝජනය කරන්නේ සාමාන්‍ය මැද පන්තිය. රජයේ සේවකයන් දෙදෙනකුගේ දරුවෙකු වන මම ස්වෝත්සාහයෙන් මේ ගරු සභාවට ආපු කෙනෙක්. සමගි ජන බලවේගය පක්ෂය තුළ මම වාගේ සාමාන්‍ය අයටත් ඉදිරියට එන්න අවස්ථාවක් තිබෙනවා. එවැනි සමාජයක් නිර්මාණය කරන්න අපි පෙනී ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමාගේ මේ අය වැය නම් පුස්සක් බව පළමුවෙන්ම මම කියන්න ඕනෑ. ඒක මෙලෝ රහක් නැති හුදු ලියවිල්ලක් පමණයි. මැදමුදලන රාජපක්ෂ පරම්පරාවේ අසාර්ථකත්වය ඊයේ දිනයේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ලෝකයටම පෙන්නුවා.

මෙවර අය වැයේදී ගරු මුදල් ඇමතිතුමා නොයෙකුත් දත්ත ඉදිරිපත් කළා. මම මෙහෙම කියනවාට සමාවෙන්න ඕනෑ. මේ දත්ත අපට නම් කිසිසේත් විශ්වාස කරන්න බැහැ. එයට හේතුව තමයි, 2019දී බලයට ආපු දවසේ ඉඳලා මෙතුමන්ලා දත්ත විජ්ජා කරපු එක. පසුගිය අවුරුද්දේදී 2021 අය වැය ඉදිරිපත් කරනකොට කිව්වා, "2020 දී ආදායම රුපියල් බිලියන 1,588යි, වියදම රුපියල් බිලියන 2,854යි, -ඒ කියන්නේ ණය ගෙවීම් හැර- අය වැය පරතරය රුපියල් බිලියන 1,266යි" කියලා. නමුත්, විගණකාධිපතිවරයා සහතික කළ 2020 භාණ්ඩාගාර විගණන වාර්තාවේ මොකක්ද තිබෙන්නේ? ගරු කථානායකතුමනි, ගරු

මුදල් ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා හිටියා නම් හොඳයි. මොකද, එතුමාගේ අය වැය ගැන අපි මේ කථා කරන්නේ. 2020 වාර්ෂික වාර්තාව මම **සභාගත*** කරනවා.

මේ වාර්තාවේ මොනවාද කියන්නේ? ඒකේ කියනවා, 2020 ආදායම රුපියල් බිලියන 1,378යි, වියදම රුපියල් බිලියන 3,493යි, අය වැය පරතරය රුපියල් බිලියන 2,115යි කියලා. ඒ කියන්නේ, එදා පාර්ලිමේන්තුවේදී එහෙම කිව්වාට, මහ බැංකු වාර්තාව මඟින් ඉදිරිපත් කරලා තිබෙන අය වැය පරතරය සලකා බැලුවාම, 2020 වර්ෂයේ මේ රටේ සත්‍ය අය වැය පරතරය රුපියල් බිලියන 849කින් වැඩියි.

ඒ කියන්නේ රුපියල් කෝටි 84,900ක්. මේ ආණ්ඩුව දත්ත විජ්ජාවක් කරලා තිබෙනවා. ලජ්ජයි! ගරු කථානායකතුමනි. මෙයට ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා. එදා අය වැය කථාවේදී කිව්වා, කිසි විධියකට, මාසයකින් ලබා ගැනීමට නොහැකි ආදායමක් ලැබෙනවා කියලා. අවසානයේ ආදායම් පරතරය විතරක් රුපියල් බිලියන 210ක්. ඒ කියන්නේ, කෝටි 21,000ක්. ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට 2020 වර්ෂයේ යම් යම් වියදම් ප්‍රමාණයක් සඳහා කලින් වසරට ගිණුම් තිබුණා. මේක තනිකර පහත් දේශපාලන ක්‍රියාවක්. කිසි දවසක එහෙම කරලා නැහැ. What we have is a cash accounting basis, not an accrual accounting basis. So, what you spend in that year has to be accounted for in that year itself, not in a previous year or in a year coming in the future. අවසානයේදී, ඒ ඉදිරිපත් කරපු දත්තවලින් කිව්වා දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස අය වැය හිඟය 7.9යි කියලා.

ගරු කථානායකතුමනි, මම මේ ගරු සභාවේදී වග කීමෙන් මේ කාරණය කියනවා. 2020 අය වැය පරතරය සියයට 7.9 නොවෙයි, විගණකාධිපතිතුමාගේ වාර්තාව අනුව එය සියයට 14.1යි. ඒක තමයි ඇත්ත. 2021 දී අපට කිව්වා, "ආදායම රුපියල් බිලියන 2,029යි, වියදම රුපියල් බිලියන 3,594යි, හිඟය රුපියල් බිලියන 1,565යි, අය වැය පරතරය සියයට 8.9යි. අවශ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,997යි" කියලා. නමුත් ඊයේ කියනවා, "ආදායම රුපියල් බිලියන 1,561යි, වියදම රුපියල් 3,387යි, එතකොට අය වැය හිඟය රුපියල් බිලියන 1,821යි" කියලා. ඒ කියන්නේ, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.1ක්. හැබැයි, මම අද කියනවා මේ අවුරුද්ද ඉවර වෙනකොට තවත් සියයට දෙකකින් පමණ ආදායම අඩු වෙලා වියදම වැඩි වෙලා මේ පරතරය වැඩි වෙයි කියලා. බලන්න, ගරු කථානායකතුමනි, මේ කියලා තිබෙන අසත්‍යය. ආදායම වැඩි කරලා පෙන්වනවා. වියදම අඩු කරලා පෙන්වනවා. අන්තිමට පරිපූරක ඇස්තමේන්තු දානවා. අවසානයේදී මේවා ගැන කථා කරලා වැඩක් නැති තැනට පාර්ලිමේන්තු සභා ගර්භයේ අයිතිවාසිකමත් උල්ලංඝනය කරනවා. ගරු කථානායකතුමනි, දත්ත මුළාව විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම ඉතිහාසයේ මේ තරම් ජනතාව මුළා කරපු යුගයක් අපට මතක නැහැ; රවට්ටපු යුගයක් අපට මතක නැහැ. මේකයි මුල ඉඳලාම කළේ. හැබැයි, මොකක්ද මෙතුමන්ලා කිව්වේ? "ලංකාවට සෞභාග්‍යය ගෙනෙනවා. සම්ප්‍රදායික දේශපාලනයෙන් එහා ප්‍රතිපත්තිගරුක ජනතා හිතවාදී වැඩ පිළිවෙළක් හරහා රටේ ජනතාවගේ ආර්ථිකය දියුණු කරනවා" කිව්වා.

ජනතාවට බලාපොරොත්තු ගොන්නක් දුන්නා. කෝටි පැරැද්දුවා වාගේ, දුප්පත්කමත් පරද්දනවා කිව්වා. ඒක නිසා වැඩ කරන විරුවාට වැඩේ කරන්න ලක්ෂ 69ක ජනතාව ඡන්දය දුන්නා. සමහරු ඡන්දය දෙන්න පිට රටවල ඉඳලා ටිකට් අරගෙන ලංකාවට ආවා. අනේ! මොකද වුණේ? ඡන්දයෙන් දිනුවාම කිව්වා, වැඩ කරන්න නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ඕනෑ කියලා. අයියා අගමැති කරන්න ඕනෑ කිව්වා. මල්ලි මුදල් ඇමති කරන්න ඕනෑ කිව්වා. එතුමාගේ ඇමෙරිකානු පුරවැසිකමත් තියාගෙන මේ වැඩේ කරන්න විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න ඕනෑ කිව්වා. ඒ ඔක්කොම ලබා ගන්න, මේ තනි සිංහල ආණ්ඩුව මුස්ලිම් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට වරප්‍රසාද දීලා ඒක දිනාගත්තා. දැන් ජනාධිපතිතුමා කියනවා, "අපි අසාර්ථක වුණා, අපිට වැරදුණා. අපිට බැරිවුණා." වශයෙන් නිදහසට නොයෙකුත් කාරණා. ටික දවසකට කලින් කිව්වා, "මට මේවා තේරෙන්නේ නැහැ" කියලා. දැන් විපක්ෂයට බණිනවා උදව් කරන්නේ නැහැ කියලා. හරි වැඩක්නේ. මට නම් තේරෙන්නේ නැහැ. ඔය ඉදිරිපත් කරන නිෂ්පාදන ආර්ථිකය වචන ටිකක් විතරයි. න්‍යායාත්මකව බලන කොට මට නම් තේරෙනවා ඔබතුමන්ලා කියන ආනයන ආදේශන කර්මාන්තකරණය හරහා තවදුරටත් රට වැටෙන එක විතරයි වෙන්නේ කියලා.

ගරු කථානායකතුමනි, 2020 නොවැම්බර් 18වැනි දා විපක්ෂය වෙනුවෙන් පිළිතුරු කථාව කරද්දී මම මෙහෙම කථාවක් කිව්වා. "මම කියන්නම් වෙන දේ. ඉහළ ආනයන බදු - high tariffs and duties - දාන්න වෙනවා. ආනයන සීමා කරන්න වෙනවා. Quotas දාන්න වෙනවා. ඊළඟට අධිප්‍රමාණ විනිමය අනුපාතයක් - overvalued exchange rate එකක් - පවත්වා ගන්න වෙනවා. හැබැයි, සාර්ථක වෙන්නේ නැහැ. මොකද, ආනයන ආදේශන නිෂ්පාදන භාණ්ඩ ගෝලීය වෙළෙඳ පොළේ තරගකාරී නැහැ. ඕකෙන් වෙන්නේ ඵලදායී නොවන අකාර්යක්ෂම ආර්ථිකයක් නිර්මාණය වීමයි" කියලා මම එදා කිව්වා. ඊට පසු 2020 දෙසැම්බර් 10 වැනිදා මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට ගන්නකොටත් මම මේ කාරණය නැවත අවධාරණය කළා. එදා මම කිව්වා, "ඔබලාගේ ආනයන ආදේශන න්‍යායට සල්ලි අච්චු ගහන "magic money tree" කියන අපභ්‍රංශ න්‍යාය එකතු කළාම වෙන්නේ උද්ධමනය වැඩිවෙලා, රුපියලේ අගය කඩාගෙන වැටිලා මේ ඉන්න වළෙනුත් තවත් පහළට වැටෙන එකයි" කියලා.

රටකට ආණ්ඩුවක් ඕනෑ වන්නේ නිසි වැඩ පිළිවෙළක් ඇතිව ඒ රට ඉදිරියට අරගෙන යන්නයි. මේ ආණ්ඩුවට කිසිම වැඩ පිළිවෙළක් නැහැ; සැලැස්මක් නැහැ; තනි තීරණයක් නැහැ. රට ඉබාගාතේ යනවා. දැක්මක් නැහැ, ප්‍රතිපත්තියක් නැහැ. හැම ගැසට් එකක්ම reverse කරනවා. මේ සතියට පමණක් ගැසට් දෙකක් reverse කළා. මෙහෙම රටක් ගෙන යන්න පුළුවන්ද? හැබැයි, ආණ්ඩුවේ ලොක්කන්ට වගේ වගක් නැහැ. රෝමය ගිනි ගනිද්දී නීරෝ වීණා වාදනය කළා කියලා ලොක්කෝ තවම බයිලා ගහනවා.

මම දැක්කා අපේ නාමල් ඇමතිතුමා, Port City එකේ all-terrain vehicle එකක් පදිනවා, pillion එකේ අපේ ප්‍රසන්න ඇමතිතුමාවත් දාගෙන. රට යන්නේ reverse එකේ. *[බාධා කිරීමක්]* විපක්ෂය කියන දේවල් අහන්නේ නැහැ ලු. නමුත්, අපි කිව්වා. අඩු ගණනේ තමන්ගේම විශේෂඥ උපදේශකවරු කියන දේවත් අහන්නේ නැති එකේ අපේ කථාව අහයිද? අපේ විපක්ෂ නායකතුමා 2020 ජනවාරි මාසයේ ඉඳන් කිව්වා, වසංගතය එනවා, වගකීමෙන්, විද්‍යාත්මකව රට පාලනය කරන්න කියලා. හැබැයි, මෙතුමන්ලා මොකද කළේ? මිථ්‍යාවට ප්‍රමුඛතාව දුන්නා. පැණි පෙව්වා; ගඟට මුට්ටි විසි කළා. අවසානයේදී වසංගතයට අහිංසක ජීවිත 13,297ක් බිලි දෙන්න සිද්ධ වුණා. හරි ද? ඒ, එන්නත්කරණය ප්‍රමාද වෙච්ච නිසා; විද්‍යාවට නැතුව මිථ්‍යාවට ඇහුම්කන් දීපු නිසා. මේ වසංගතය නිසා අපේ හිටපු මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමාත් අපට අහිමි වුණා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවට නොපෙනෙන, එහෙමත් නැත්නම් නොතේරෙන රටේ ඇත්ත තත්ත්වය මම කෙටියෙන් පැහැදිලි කරන්නම්. ඇත්ත කථාව තමයි දැන් ලංකාවම කළු කඩයක්. මහා පරිමාණ මුදලාලිලාගේ ජාවාරම් පමණයි සිද්ධ වෙන්නේ. හැම බඩුවක්ම ගිනි ගණන්. රුපියල් 1,000ට ෂොපිං බෑග් එකක් පිරෙන්න බඩු ගන්න බැහැ. අද තිබෙන මිල නොවෙයි, හෙට තිබෙන්නේ. වෙළෙන්දෝ හිතු හිතු ගණන්වලට බඩු විකුණනවා. මිනිස්සු කොහොමද ජීවත්වෙන්නේ, ගරු කථානායකතුමනි? මිල පාලනය කියන්නේ යල් පැනපු න්‍යායක් කියලා මුදල් ඇමතිතුමා ඊයේ කිව්වා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාව සමච්චලයට පත් කළා. ගැසට් ගහලා මේවා කරන්න බැහැ කිව්වා. සමාවෙන්න, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමාගේ මුහුණ බලාගෙන මේක කියන්න සිද්ධ වුණාට. මේ මොකක්ද කියන්නේ? ආණ්ඩුව නියාමනයෙන් සම්පූර්ණයෙන් ඉවත් වෙලා ද? තනිකරම නව ලිබරල්වාදයට ගමන් කරලා තියෙන්නේ. ඊයේ ලේබල් එක නළලේම අලවා ගත්තා. මේ තිබෙන්නේ ජනතාවගේ ලේ උරා බොන යුගයක්. අය වැය කථාවේදී ලොකුවට කිව්වේ මොකක්ද? ලංකාවේ ආදායම් අසමානත්වයක් තිබෙනවා ලු; ඒක උග්‍ර වෙලා ලු. නමුත් ඒ විෂමතාව විසඳන්න, ඇති නැති පරතරය අඩු කරන්න එක යෝජනාවක්වත් මේ පාර්ලිමේන්තුවට ඊයේ ඉදිරිපත් කළේ නැහැ. ඉතින් කථාවේදී කොච්චර කිව්වත්, ක්‍රියාවෙන් ඒක ඔප්පු කරන්න බැරි නම් ඇති වැඩක් නැහැ. Oracle Database හදන්න ආපු ආණ්ඩුව අන්තිමට ජනතාව තුන්වේල කන එකත් නැති කළා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවට හිතක් පපුවක් නැද්ද? පවුලේ අය විතරද කාලා බීලා ඉන්න ඕනෑ? බලන්න කෝ, අත්‍යවශ්‍ය බඩුවල මිල? මම ගිය සතියේ මහ බැංකු වාර්තාවෙන් තොරතුරු ගත්තා.

අද නාඩු සහල් කිලෝවක මිල රුපියල් 140යි. ජනාධිපතිතුමා පත් වනකොට නාඩු සහල් කිලෝවක් රුපියල් 90යි. සියයට 50කින් මිල වැඩිවෙලා තිබෙනවා. අද සම්බා සහල් කිලෝවක මිල රුපියල් 170යි. ජනාධිපතිතුමා පත් වනකොට සම්බා කිලෝවක් රුපියල් 97යි. සියයට 65කින් මිල වැඩිවෙලා තිබෙනවා. අද වියළි මිරිස් කිලෝවක මිල රුපියල් 600යි. එදා රුපියල් 440යි. සියයට 36කින් මිල වැඩිවෙලා තිබෙනවා. පරිප්පු කිලෝවක මිල අද රුපියල් 250යි. එදා ජනාධිපතිවරණය දවස වන විට පරිප්පු කිලෝවක් රුපියල් 110යි. සියයට 127කින් මිල වැඩිවෙලා තිබෙනවා. අද සීනි කිලෝවක මිල රුපියල් 150යි. එදා රුපියල් 100යි. සියයට 50කින් මිල වැඩිවෙලා තිබෙනවා. අද කිරි පිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල රුපියල් 480යි. එදා රුපියල් 395යි. සියයට 22කින් මිල වැඩිවෙලා තිබෙනවා. අද එල්පී ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,675යි. එදා රුපියල් 1,493යි. සියයට 79කින් මිල වැඩිවෙලා තිබෙනවා. අද ටින් මාළු මිල රුපියල් 380යි. එදා රුපියල් 230යි. සියයට 65කින් මිල වැඩිවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අහිංසක මිනිස්සු මැරෙන්නේ නැතිව ජීවත් වෙන්නේ කොහොමද? ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, දරිද්‍රතාවෙන් මිදිලා ඉහළට එන්න ඕනෑ නම් පුද්ගලයකුට දිනකට කිලෝ කැලරි 2,040ක් පරිභෝජනය කරන්න පුළුවන් වෙන්න ඕනෑ, ඒකට සරිලන ආදායමක් තිබෙන්න ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, කිලෝ කැලරි 2,040ක් පරිභෝජනය කරන්නේ කොහොමද? භාණ්ඩවල මේ තිබෙන මිල බැලුවාම, කිලෝ කැලරි 1,000ක්වත් දිනකට පරිභෝජනය කරන්න බැහැ. මේ හැම දෙයටම බලපෑවේ වසංගතයයි කියලා මුදල් ඇමතිතුමා කියනවා. වී ගොවිතැනට, සහල් නිෂ්පාදන ක්‍රියාවලියට වසංගතය බලපෑවේ කොහොමද කියන්න, ගරු කථානායකතුමනි. ඔබතුමාත් කෘෂිකර්ම අමාත්‍ය ධුරයේ සිටියා නේ. ඒවාට වසංගතය බලපෑවේ නැහැ. හැබැයි, වීවලින් ස්වයංපෝෂිත මේ රටේ දැවැන්ත සහල් හිඟයක් තිබෙනවා. එහෙම වෙන්නේ කොහොමද? කවුද හිතුවේ අපට කන්න නැති වෙයි කියලා? නමුත් රට අවුරුදු 50ක් පස්සට ගියා. මේක ශාපයක්. මිනිස්සු කියනවා, මේක ශාපයක් කියලා. දුක් විඳින ජනතාවට මේ අය වැයෙන් කිසිම දෙයක් දීලා නැහැ.

ගිය වර කිව්වා, VAT එක අඩු කළාය, PAYE Tax එක නැති කළාය, Economic Service Charge එක ඉවත් කළාය, ලාභය මත බදු අඩු කළාය කියලා. මේ සියලු දේ හරහා බඩු මිල අඩු වෙනවා විතරක් නොවෙයි, ඒ අඩු වුණු මිල පවත්වාගෙන යන්නත් පුළුවන් කිව්වා. ඒක සෞභාග්‍යයේ දැක්මේ කළු අකුරෙන් ලියලා තිබෙනවා. හැබැයි, දැන් බදු වැඩි කරලා තිබෙනවා. ගහෙන් වැටුණු මිනිහාට ගොනෙක් ඇන ගෙන, ඇන ගෙන යනවා වගේ දෙයක් තමයි දැන් සිද්ධවෙලා තිබෙන්නේ.

2021 වර්ෂයේ බදු ආදායම රුපියල් බිලියන 1,556යි. 2022 වර්ෂයට බලාපොරොත්තු වන බදු ආදායම රුපියල් බිලියන 2,274යි. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඒ කියන්නේ, 2022 වර්ෂය තුළ තව වැඩිපුර රුපියල් බිලියන 718ක -රුපියල් කෝටි 71,800ක්- බදු මුදලක් අය කරගන්න බලාපොරොත්තු වෙනවා. කවුද මේවා ගෙවන්නේ? ඊයේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා වැඩි කළ බදු කවුද ගෙවන්නේ? අය වැයෙන් සෘජු බදු එකක්වත් වැඩි කළේ නැහැ. වත්කම් බදු පැනෙව්වේ නැහැ. සියලු බදු පැනෙව්වේ පාරිභෝගිකයා මතයි.

අපි එක බද්දක් ගැන විශ්ලේෂණය කරමු. අය වැය කථාවේ 69වන පිටුවේ සඳහන් වනවා, සමාජ සංරක්ෂණ බද්ද සියයට 2.5යි කියලා.

ඇත්තටම කනගාටුයි, මුදල් ඇමතිතුමා ගරු සභාවේ ඉන්න එපායැ. ඒක නේ, සදාචාරය. එතුමා Budget Proposals ඉදිරිපත් කළා, දැන් විපක්ෂය ඒකට පිළිතුරු දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා hospital එකේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එතුමාට අසනීප වෙලාද දන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතුමාත් නැහැ. *[බාධා කිරීමක්]* වෙන කවුරුවත් නැහැ. අඩු ගණනේ එතුමාට කියන්න, මීට පස්සේ විපක්ෂයේ පළමුවැනි කථාව වෙලාවටවත් සභාවේ ඉන්න කියලා. *[බාධා කිරීම්]* හැබැයි, අය වැය කථාවේ 69වන පිටුවේ එහෙම කිව්වත්, තාක්ෂණික සටහනේ තිබෙනවා, එම බද්ද සියයට 3යි කියලා. *[බාධා කිරීමක්]* මම වැදගත් කථාවක් මේ කියන්නේ, ගරු කථානායකතුමනි. සමාජ සංරක්ෂණ බද්ද සියයට 2.5යි කියලා මුදල් ඇමතිතුමා මෙතැනදී කිව්වා. හැබැයි, අය වැය කථාවේ තාක්ෂණික සටහනේ තිබෙනවා, සියයට 3යි කියලා. *[බාධා කිරීමක්]*

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, Facebook එකේ live බලන්න කියලා මෙතුමා අපට කියලා තිබෙනවා. එතුමාගේ කථාව අහන්න 10දෙනෙක්වත් නැහැ. දැන් මුදල් ඇමතිතුමා ගැන කියනවා. පුළුවන් නම් 10දෙනෙක් එතුමාට මෙතැනට ගේන්න කියන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ සම්ප්‍රදායක් තිබෙනවා, විපක්ෂයේ ප්‍රධාන කථාව කරනකොට ඒකට disturb කරන්න එපා කියලා. කරුණාකර ඒ ගරු මන්ත්‍රීතුමාට ඒක කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක කාටත් අයිතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මේ ගරු සභාව ඇතුළේ කිසිම විධියකට Facebook එකේ live එන්න බැහැ. එම නිසා, එතුමාගේ පුස් කථාවලට ඉඩ දෙන්න එපා.

මම කරන්නේ වැදගත් දෙයක් ගැනයි. ගහපු ලොකුම බද්ද සියයට දෙකහමාරයි කියලා කටින් කියනවා. හැබැයි පොතේ කියනවා, සියයට 3යි කියලා. මොකක්ද, මේ කථාවේ තේරුම? එතකොට මේ බද්ද සියයට දෙකහමාරද, සියයට තුනද? උත්තර දෙන්න. ඒකයි මුදල් ඇමතිතුමාගෙන් අපි අහන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා, උත්තර දෙන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
කැබිනට් මණ්ඩලයේ කී දෙනෙක් මේ වෙලාවේ සභාවේ ඉන්නවාද? ඒකට උත්තරයක් දෙන්න. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, බද්ද කීයද කියන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
"කෝකටත් තෙලය" නැඟිටින්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අඩුම ගණනේ ඒකවත් ඉදිරිපත් කරගන්න බැහැ. කවුද, මේවා ලියලා දුන්නේ? මේක පිරිවැටුම් මත වන බද්දක් - turnover tax එකක්. VAT එකක් නොවෙයි. එකතු කළ අගයට නොවෙයි, මුළු අගයටම ගෙවන්න ඕනෑ. Turnover tax එක සියයට 3ක් ගහනවා කියන්නේ, VAT එක නම් සියයට 5ක්, 6ක් වගේ ප්‍රමාණයක්. ඊට පස්සේ මාසයට පිරිවැටුම රුපියල් මිලියන 25ක් නම්, ඒකට තවත් සියයට 8ක හෝ සියයට 15ක හෝ දැන් වැඩි කරපු සියයට 18ක හෝ VAT එකක් එකතු කරන්න ඕනෑ. ඒ කියන්නේ, turnover tax එකත් තිබෙනවා, ඊට පස්සේ VAT එකත් තිබෙනවා. කොහොමද, මේ බදු කළමනාකරණය කරන්නේ? Tax administration කරන්නේ කොහොමද? එම නිසා, මේක අවුලක් වෙලා තිබෙන්නේ.

බැසිල් ඇමතිතුමා කියනවා, බද්ද පාරිභෝගිකයන්ට තල්ලු කරන්න එපා කියලා. විහිළු කථාවක් නේ! ඒකට නීතියක් දාන්න පුළුවන්. නමුත්, දැම්මේ නැහැ. ධනවතා බේරලා සාමාන්‍ය මනුස්සයාට බද්ද ගැහුවා. මේක විශාල පසුගාමී බද්දක්. Accident එකක් වුණත් රජයට බද්දක් ගෙවන්න ඕනෑ ලු. මට හිතාගන්නත් බැහැ! චක්‍රාකාරයෙන් insurance එකේ premium එකෙන් ගන්න යනවා. මොන රටේද එහෙම කරන්නේ? මමත් කාලයක් ඇමෙරිකාවේ ජීවත් වුණා. ඇමෙරිකාවේ වත් එහෙම නැහැ. කොහේවත් නැහැ, මෙහෙම බද්දක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගහෙන් වැටිච්ච මිනිහාට ගොනා ඇන්නා වාගේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
"ගහෙන් වැටිච්ච මිනිහාට ගොනා ඇන්නා වාගේ" කියලා ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියනවා, ගරු කථානායකතුමනි.

දැන් කිසිම බදු ප්‍රතිපත්තියක් නැහැ. බදු අඩු කරනවා, වැඩි කරනවා, වෙනස් කරනවා. 2019 දෙසැම්බර් මාසයේ කිසිම විශ්ලේෂණයක් නැතිව තමයි, අධ්‍යයනයක් නැතිව තමයි බදු අඩු කළේ. එදා ස්වාධීන ආර්ථික විශේෂඥයන් කිව්වා වාගේම එමගින් රජයේ භාණ්ඩාගාරයේ පාඩුව රුපියල් බිලියන 500ට වැඩියි. හැබැයි, ඒ රුපියල් බිලියන 500න් -කෝටි 50,000න්- සතයක් වත් පාරිභෝගිකයාට ගියේ නැහැ. මුළු මුදලම ලොකු ව්‍යාපාරික පිරිස ලබා ගත්තා. ඒ දැවැන්ත බදු අඩු කිරීමත් සමඟ රජය විශාල අර්බුදයකට ගියා. භාණ්ඩ මිල පාලනය කළා වාගේම භාණ්ඩාගාර බිල්පත්වල මිලත් පාලනය කරන්න ගියා. ඒකට ගෙවන පොලිය සියයට 5ට සීමා කළා. නමුත් එම අඩු පොලියට ජනතාව කවුරුවත් ආයෝජනය කළේ නැහැ. හැම සතියකම වාගේම වෙන්දේසියට ලංසු ලැබුණේ නැහැ. ඒ නිසා රජයේ අවශ්‍යතාවන්ට මහ බැංකුව මීට කලින් කිසි දවසක නොකළ ආකාරයට මුදල් අච්චු ගැහුවා. ඒකට තමයි මම පසු ගිය Budget එකේදී කිව්වේ, "magic money tree" න්‍යාය කියලා. අද වන කොට මේ රටේ හැමෝම දන්නවා, ඉමක් කොනක් නැතිව සල්ලි අච්චු ගැහුවාම මොකක්ද වෙන්නේ කියලා. අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා මොනවා කිව්වත්, උද්ධමනය ශීඝ්‍රයෙන් ඉහළ ගියා; ඩොලරයට සාපේක්ෂව රුපියල ශීඝ්‍රයෙන් කඩා වැටුණා. ඊයේ බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඒ ගැන වචනයක් වත් සඳහන් කළේ නැහැ. ඩොලරයේ මිල රුපියල් 203යි කියනවා. නමුත් ඔබතුමන්ලා මට කියන්න, ඩොලරයක් රුපියල් 203ට ගන්න පුළුවන් කොහෙන්ද කියලා. Chatham Street එකේ ඩොලරයක් රුපියල් 225යි; 230යි. එහි අවසන් ප්‍රතිඵලය තමයි අහස උසට බඩු මිල නැඟීම. අසරණ ජනතාවගේ ඉතිරිකිරීම්වල වටිනාකම මුළුමනින් කඩාගෙන වැටුණා. නමුත් මම කලින් කිව්වා වාගේ බඩු මිල අඩු කරන්න කිසිම යෝජනාවක් හෝ වැඩ පිළිවෙළක් මේ අය වැයේ නැහැ. සත පහක සහනයක් නැහැ.

මම කියන්නම් ඉදිරියේදී වෙන දේ. බඩු මිල තවත් ඉහළ යනවා. ඒ, කිසිසේත් වසංගතය නිසා නොවෙයි. ඒ, ආණ්ඩුවේ අමනෝඥ, උද්දච්ච තීරණ නිසා. ගරු කථානායකතුමනි, දැන් බලන්න, මේ කාසියේ අනෙක් පැත්ත. කෘෂිකර්මය, කර්මාන්ත, සේවා ආර්ථිකය දිහා බලන්න. කෘෂිකර්මය විනාශ වෙලා ඉවරයි පොහොර නැති නිසා. නැති ප්‍රශ්නයක් ඇති කර ගත්තා. මේ රට විශාල ආහාර අර්බුදයකට ලක් වෙලා. රට යන්නේ සාගතය දෙසට. මිනිසුන්ට දුර්භික්ෂ භය ඇති වෙලා. ගිනි ගණන්වලට

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

airlift කරපු නැනෝ යූරියා දාලා පැළයට අවශ්‍ය නයිට්‍රජන් ලබා දෙන්න බැහැ. ඒක ඔබතුමා දන්නවා. අපි හිතුවා, ගොවි මහත්වරු බලාපොරොත්තු වුණා, අය වැයෙන් ඒ බැරෑරුම් ප්‍රශ්නයට විසඳුමක් දෙයි කියලා.

නමුත්, ඒ ගැන වැඩිය කථා කළේ නැහැ. සියලු කාබනික පොහොර සහ කාබනික කෘමි නාශක නිෂ්පාදනය කරන්න, රුපියල් බිලියන 35ක් දීලා තිබෙනවා. සොච්චමයි දීලා තිබෙන්නේ. නමුත්, මේ මහ කන්නයේ පොහොර නැතිව ගොවියාට සිදු වූ පාඩුවට සතයක්වත් දීලා නැහැ. අස්වැන්න සියයට 40කින්, 50කින්, 60කින් පමණ පහළ වැටෙනවා. හැබැයි මුදල් ඇමතිතුමා කියනවා, "පරිපූරක ඇස්තමේන්තු එකක් වත් දාන්න දෙන්නේ නැහැ" කියලා. මේ Budget එකෙන් සත පහක්වත් ඒකට වෙන් කරලා නැත්නම්, ගොවි මහත්වරුන්ගේ අස්වැන්න කඩා වැටුණාම, ඒකට වන්දි ගෙවන්නේ අහසෙන් ගෙනැල්ලාද? කවුද වන්දි ගෙවන්නේ? "වන්දි ගෙවන්න පරිපූරක ඇස්තමේන්තුවක් දාන්න බැහැ" කියලා මුදල් ඇමතිතුමා කිව්වා. එහෙම නම්, අපි ගොවි මහතුන්ට කියනවා, මේ Budget එකේ කියන දේ හොඳ සිහි බුද්ධියෙන් අහගන්න කියලා. කෘෂිකර්මය වැටෙන කොට මුළු ග්‍රාමීය ආර්ථිකයම විනාශ වන බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා ඒ ලක්ෂ 69ක් වූ ජනතාව තවදුරටත් රවටන්න බැහැ, ගරු කථානායකතුමනි. මන්ත්‍රීවරුන් ගමට එනකල් ඔවුන් බලාගෙන ඉන්නවා, සලකන්න.

මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නැත්තටම නැති කළා. බැංකුවලට උකස් කරපු ගෙදර අහිමි වනවා. ලිසිංකාරයෝ වාහනයට පැනලා, දරුවාගේ බෙල්ල මිරිකලා වාහනය උදුරා ගන්නවා.

සහල් නිෂ්පාදකයන් ගැන මම එක උදාහරණයක් විතරක් දෙන්නම්. මේ දවස්වල ලොකු මෝල් හිමියන් යන්නේ හෙලිකොප්ටර්වලින්. පොඩ්ඩක් පිටුපස බැලුවොත් කියයි, කවුද කියලා. හැබැයි, පොඩි මෝල් හිමියන්ගේ මෝල් බැංකුවට සින්න වෙන්න ඉඩ තිබෙනවා. අපි එදා කුඩා මෝල් 200ක් විතර එකතු කරලා "ශක්ති" කියලා සමුපකාර ව්‍යාපාරයක් දිස්ත්‍රික්ක අටක පටන් ගත්තා. ඒක විනාශ කරලා දැම්මා. අපි එදා කුඩා මෝල් හිමියන්ට ශක්තිය දුන්නා, තරග කරන්න. ඒක නැති කළා. දැන් මොකද කියන්නේ? දැන් කියනවා,"අපිට කරන්න දෙයක් නැහැ. හැබැයි, අපි රටින් හාල් ගේනවා. අපි රටින් හාල් ගෙනැල්ලා මේ රට සහල්වලින් ස්වයං පෝෂිත කරනවා" කියලා. ගරු කථානායකතුමනි, මොන කථාවක්ද ඒ කිව්වේ?

මහා පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය දිහා බලන්න. ආර්ථික මර්මස්ථානවලට මොකද කළේ? දේශීය සම්පත් ආරක්ෂා කරනවා කිව්වා. ඒ ආකාරයේ අසත්‍ය කියලා බලයට ඇවිල්ලා යුගදනවි බලාගාරයේ කොටස්වලින් සියයට 40ක් සින්නක්කරයට වික්කා. ඒකේ ඩොලර් මිලියන 650ක Power Purchase Agreement එකක් තිබෙනවා, තරගකාරී නොවන ලෙස ලබා ගත්. ඒකයි මේකේ තිබෙන catch එක. සෙලෙන්දිවා කියන කොම්පැනිය දාලා ප්‍රධාන තැපැල් කාර්යාල ගොඩනැඟිල්ල, විදේශ අමාත්‍යාංශ ගොඩනැඟිල්ල ආදී සියල්ල විකුණන්න යනවා. හැබැයි, තවම කුණු කොල්ලයටවත් ඒවා ගන්න කවුරුවත් ඉදිරිපත් වෙලා නැහැ. මහා ලොකුවට කිව්වා, "කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය ඉන්දියාවට විකුණන්න දෙන්නේ නැහැ" කියලා. හැබැයි, අනෙක් පැත්තෙන් ඊට වඩා ලාභදායක බටහිර පර්යන්තය අදානි සමාගමට වික්කා. මේ ළඟදි අජිත් නිවාඩ් කබ්රාල් බ්ලූම්බර්ග් ආයතනයට කිව්වා, 2021 දෙසැම්බර් වන කොට ඩොලර් මිලියන 400ක්, ඩොලර් බිලියන 1ක් පමණ ප්‍රමාණයක් රටේ ආර්ථික මර්මස්ථාන විකුණා ලබා ගන්නවා කියලා. මේ දේශ හිතෛෂී රාජපක්ෂ අය වැයෙන් ඒ යන මාර්ගය පැහැදිලි වනවා, ගරු කථානායකතුමනි. මොකක්ද ඒ මාර්ගය? පෞද්ගලීකරණය; රටේ සම්පත් විකිණීම. මේ නිසා වෘත්තීය හා දේශපාලන අරගළ උත්සන්න වෙලා.

මුළු රටම වාගේ එක මතයක ඉන්නවා, අර ඇමෙරිකානු කොම්පැනියට එල්එන්ජී බලාගාරයේ අධිකාරය ලබා දීමට විරුද්ධයි කියලා.

දැන් රජයේ පැවැත්ම පිළිබඳත් අභියෝගයක් තිබෙනවා. ගරු විමල් වීරවංශ ඇමතිතුමා, ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා සෝලිස් හෝටලයේදී කථා කරපු ආකාරය අපි දැක්කා නේ. "කැබිනට් මණ්ඩලයටවත් පෙන්වන්නේ නැතිව හොර පාරෙන් නිව් ෆෝට්‍රස් ගිවිසුම අත්සන් කළා" කිව්වා. අපේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද කිව්වා, ඒ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැති එක, වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් කියලා. ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා කියලා එතුමා සභානායකතුමාට කිව්වා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ගිවිසුම විශ්ලේෂණය කරන්න. මොකක්ද, විමල් වීරවංශ ඇමතිතුමා කිව්වේ? "මේක තමයි ඉතිහාසයේ දැවැන්තම හොරකම" කියලා එතුමා කිව්වා.

එක පැත්තකින්, කුඩා කර්මාන්තවලට මරු පහරක් දෙන ගමන් විශාල කර්මාන්ත ටික විදේශිකයන්ට හොර රහසේ, යක්කු ගස් යන මහ රෑ විකුණා දමනවා. දැන් ජනාධිපතිතුමා කියනවා, "විපක්ෂයට මේ පිළිබඳව උද්ඝෝෂණය කරන්න බැහැ" කියලා. පුදුම කථාවක් නේ! අපි ජනතාව වෙනුවෙන් පෙනී ඉන්නවා. අපි බලන්නේ ජනතාවගේ ප්‍රශ්න රජයට ඉදිරිපත් කරන්න; උද්ඝෝෂණය කරලා හෝ කියන්න. ගරු කථානායකතුමනි, උද්ඝෝෂණය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ඒක ගැසට් එකක් ගහලා නවත්වන්න බැහැ. අපි දන්නවා, කොවිඩ් වසංගතය තිබෙන බව. ඒ නිසා සෞඛ්‍ය නීති රීති හරියට පිළිපැදලා, අපි අපේ උද්ඝෝෂණය කරගෙන යනවා.

ඒ විතරක් නොවෙයි. අද සමහර රටවල් මේ රට ප්‍රාණ ඇපයටත් අරගෙන. මහ උජාරුවට කිව්වා නේ, "කාබනික පොහොර නිෂ්පාදනය කරනවා" කියලා. කෝ, එයට මුදල් වෙන් කරලා නැහැ නේ. කෝ, මුදල්? නමුත්, කාබනික පොහොර කියලා, අසූචි නැවක් දැන් බාන්න බලාගෙන ඉන්නවා. මොකක්ද දෙයියනේ, ඔබතුමන්ලා මේ රටට කළේ? විදේශ අමාත්‍යාංශය නිදිද? චීනය අපේ මිත්‍ර රටක්. ප්‍රශ්නය මෙච්චර දුර දිග යන්න ඉඩ දුන් එක ඔබතුමන්ලාගේ වැරැද්දක්. ඔබතුමන්ලාට මේ විධියට මේ රට විනාශ කරන්න ඉඩ දෙන්න බැහැ. කරන්න බැරි නම් කියන්න. බැරි නම් යන්න. අපි ඇවිල්ලා කරලා දෙන්නම්.

අපේ සේවා ආර්ථිකයට මොකද වුණේ? බලන්න, ගුරුවරු දිහා. මේ ආණ්ඩුව ගුරුවරු මහ පාරට ඇද දමලා දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කළා. අපේ රජය ගුරුවරුන්ගේ පඩිය සියයට 106කින් වැඩි කළා. හැබැයි, මෙතුමන්ලාට රුපියල් බිලියන 30ක් දී ගන්න බැරිව ගුරුවරුන් ගැන සමාජයේ තිබුණු ගරුත්වයත් බිඳ දැම්මා. දැන් කියනවා, "දෙන්නම්" කියලා. දෙන්න පුළුවන් නම් ඇයි, මෙච්චර ප්‍රමාද කළේ? එතැනත් පොහොට්ටු දේශපාලනයක් කරනවා මම දැක්කා. ලජ්ජයි! *[බාධා කිරීම්]* ගුරුවරුන්ට ගෙවන්න සල්ලි නැහැ කිව්වාට, වසංගත කාලයේ දිවා රෑ වැඩ කළ හෙද හෙදියන්ට දෙන්න පොරොන්දු වෙච්ච දීමනා ගෙවන්න සල්ලි නැහැ කිව්වාට, තමන්ගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 40 ගණනේ බෙදනවා. හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් උප සභාපතිවරුන් කරලා, රුපියල් ලක්ෂ 200 ගණනේ බෙදනවා ලු. ඊට අමතරව සභාපතිවරුන්ට රුපියල් ලක්ෂ 1,000 ගණනේ දෙනවා ලු. ඒක සම්පූර්ණයෙන් දේශපාලන ක්‍රියාවක්.

සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ටවත් කිසි දවසක මෙහෙම බලයක් දීලා නැහැ. කිසිම විනිවිදභාවයක් නැතිව

සාක්කුවට කොටසක් දාගන්න ඒවාට ප්‍රතිපාදන තිබෙනවා. ගරු කථානායකතුමනි. මේ සඳහා මුළු වියදම රුපියල් බිලියන 85ක් - කෝටි 8,500ක්- කියලා මුදල් ඇමතිතුමා කිව්වා. ලජ්ජා නැද්ද? ගුරුවරුන්ට අමතරව, සේවා ආර්ථිකයෙන් ජීවත් වන මිලියන ගණනක අපේ ජනතාව අද අසරණ වෙලා ඉන්නේ. ගෑස් නැතිව අද පොඩි තේ කඩයක්වත් කරන්න විධියක් නැහැ; ආප්ප කඩයක් කරන්න විධියක් නැහැ. සිමෙන්ති නැතිව මේසන් බාස්ලාට වැඩ නැහැ; වඩු බාස්ලාට වැඩ නැහැ. පේන්ට් බාස්ලාට වැඩ නැහැ; ස්වයං රැකියා කරන කට්ටියට වැඩ නැහැ. ඒ හැමෝටම යන එන මං නැහැ.

ගරු කථානායකතුමනි, තවත් වැදගත් කථාවක් තිබෙනවා. දැන් පාස්පෝර්ට් පෝලිමක් ගැන කථා කළා නේ. බොහෝ තරුණ පිරිස් ලංකාවේ ඉඳගෙන පිටරටවලට තමන්ගේ සේවය සපයනවා. මෙහේ ඉඳලා software හදනවා; graphic design කරනවා; online tuition දෙනවා; back office කරනවා. මේවා කරන්න, freelance platforms තිබෙනවා: "Fiverr" කියලා තිබෙනවා, "Freelancer" කියලා තිබෙනවා, "Upwork" කියලා තිබෙනවා, "OnaWadak" කියලා තිබෙනවා, "Prathilaba" කියලා තිබෙනවා. එහෙම කරලා, ලංකාවේ ඉඳන් අලුත් ලෝකයේ අලුත් ක්‍රමයට Internet එක හරහා අපේ තරුණ තරුණියන් ඩොලර් ගේනවා. මේ අමනෝඥ ආණ්ඩුව පසුගිය සතියේ මොකක්ද කළේ? සියලු ඩොලර් රජය කියන රුපියල් 203ට අනිවාර්යයෙන්ම - mandatory - මාරු කරන්න ඕනෑ කියලා බලෙන්ම නීතියක් දැම්මා. ඒකෙන් වෙන්නේ, අර යහතින්, තමන්ගේ මහන්සියෙන් රජයට බරක් නොවී හොඳ ආදායමක් ලැබූ තරුණ තරුණියන් කණ්ඩායමත් පාස්පෝර්ට් පෝලිමට පන්නලා දමන එක. ඇයි, මෙහේ ඉඳන් ඒවා කරනවා නම් දඩයක් තිබෙනවා. රට ගිහින් කළොත් දඩයකුත් නැහැ. මේක හරිම contradictory. මේකට ඉංග්‍රීසියෙන් කියනවා, "oxymoron" කියලා.

ඊළඟට, මුදල් ඇමතිතුමා අය වැය කථාවේ කියනවා, freelance කරන කට්ටිය, entrepreneursලා දිරිගන්වනවා ලු. මොන විහිළුද, ගරු කථානායකතුමනි මේ? කවුද මේ තීරණ ගන්නේ? ඇත්තටම මේ සියලුදෙයට වඩා හොරකම, දූෂණය, වංචාව රජ වෙලා. සීනි වංචාකරුවන්ට, සුදු ලූනු වංචාකරුවන්ට මොකද වුණේ? සීනි වංචාව සම්බන්ධයෙන් ව්‍යෝහාරික විගණනයක් ඉල්ලලා, දැන් අවුරුද්දකට කිට්ටු වෙනවා, තවම නැහැ. සුදු ලූනු හොරකම් කළේ ලොකු ලොක්කෝ කියලා බරපතළ චෝදනාවක් තිබෙනවා. චෝදනා කරපු කට්ටිය ඇතුළේ, හොරු එළියේ කියලා මිනිසුන් කියනවා. මේ එකක් දෙකක් විතරයි. හැබැයි, මේ දූෂිත ආණ්ඩුව ගැන හොඳටම කිව්වේ ගරු විමල් වීරවංශ ඇමතිතුමා. එතුමා මුළු ලෝකෙටම ඇහෙන්න කිව්වා, මේ රජය තමයි මේ රටේ ඉතිහාසයේම තිබුණු දූෂිතම රජය කියලා. අපි මොනවා කියන්නද තව? කැබිනට් මණ්ඩලයේ ඇමති කෙනෙක් නේ ඒක කිව්වේ.

ඇත්ත කථාව තමයි, අය වැයෙන් කොච්චර සුන්දර කථා කිව්වත් පොඩි මිනිහාට, පොඩි ව්‍යාපාරිකයාට මේ රටේ දැන් ඉඩක් නැහැයි කියන එක, ගරු කථානායකතුමනි. ජාවාරම්කරුවන්ට, ගජ මිතුරන්ට තමයි සුපිරි කාලයක් උදා වෙලා තිබෙන්නේ.

Bathroom accessory set එක කීයටද තිබුණේ? රුපියල් 15,000ට. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? විශාල ආනයන බද්දක් ගැහුවා, ආනයන සීමා කළා. දැන් bathroom accessory set එක කීයද? රුපියල් 50,000යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ගේන්නේ?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)0
(The Hon. (Dr.) Harsha de Silva)

එහෙම කරලා, සමස්ත කුඩා ව්‍යාපාරිකයන් හාන්සි කරලා හෙංචයියන් එක් කෙනෙකුට, දෙදෙනෙකුට ප්‍රකෝටිපතියෝ වෙන්න ඉඩ දුන්නා. මෙතැන තනිකරම තිබෙන්නේ ගජ මිතුරු සංග්‍රහය. කොවිඩ් වසංගතය බිස්නස් එකක් කරගත් ලෝකයේ එකම රට ලංකාව. එක vaccine එකකින් ඩොලර් 10ක් රටට පාඩු කළ vaccine වංචාව, PCR Test kit වංචාව, Antigen Test kit වංචාව යන සියල්ලම කළා. රට විරුවන් නිරෝධායනය කරනවා කියලා ගසා කෑවා. ආණ්ඩුව ලජ්ජා වෙන්න ඕනෑ, ජනතාවගෙන් සමාව ගන්න ඕනෑ. එහෙම කරපු ආණ්ඩුව දිගින් දිගටම කියනවා, "කොවිඩ් වසංගතයට විශාල මුදලක් වෙන් කළා, ඒ නිසා ජනතාවට සහන දෙන්න බැරි වුණා" කියලා.

ගරු කථානායකතුමනි, 2021 අගෝස්තු 30වන දින පළ වූ "ඩේලි නිවුස්" පුවත් පතින් උපුටා ගත් ලිපියක් මේ අවස්ථාවේ දී මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, මේක තමයි එහි ප්‍රධාන ශීර්ෂ පාඨය. ඒකේ සඳහන් වෙනවා, "කොවිඩ් මර්දනයට රුපියල් බිලියන 700ක් වියදම් කළා" කියලා. ඒ කියන්නේ 2020 රාජ්‍ය ආදායම වුණු රුපියල් බිලියන 1,380න් හරියටම භාගයක් කියලා හිටපු ඇමතිවරයා කියනවා. මේක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. මුදල් අමාත්‍යාංශය නිකුත් කළ ජූනි මාසයේ වාර්තාවේ කියනවා, "2020ට වියදම් කළේ රුපියල් බිලියන 117යි, 2021 ජනවාරි ඉඳලා ජූලි වෙනකොට රුපියල් බිලියන 53යි" කියලා. ඊට අමතරව, ඊයේ -නොවැම්බර් 12වැනි දින- සභාගත කළ මුදල් අමාත්‍යාංශයේ 'වාර්ෂික වාර්තාව - 2020'හි කියනවා, "2020ට වියදම රුපියල් බිලියන 79යි, 2021 වියදම රුපියල් බිලියන 148යි" කියලා. මොන වාර්තාවට අනුව වුණත් රුපියල් බිලියන 200ක් විතර තමයි කොවිඩ් මර්දනයට වියදම් වෙලා තිබෙන්නේ. බිලියන 700ක් නොවෙයි. ඇයි මෙහෙම බොරු කියන්නේ? ඇයි මේවා වාර්තා කරන්නේ? කොහොමද මේවා පුවත් පත්වල ප්‍රධාන ශීර්ෂ පාඨ වෙන්නේ? ඇයි, මිනිස්සු මුළා කරන්නේ?

ඔය වියදම පියවා ගන්න ලෝකයේ මිත්‍ර රටවලින් සහ ලෝක බැංකුව වැනි ආයතනවලින් ගොඩක් ප්‍රදාන ලැබුණා. ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන 144ක් ප්‍රදාන හැටියට ලැබුණා. ඩොලර් මිලියන 843ක් ඉතාම සහනදායි ණය හැටියට ලැබුණා. ඒ කියන්නේ, රුපියල් බිලියන 200ක්. මේ වියදම් කළ හැම ඩොලර් එකක්ම, හැම සතයක්ම ලෝක බැංකුව වැනි ආයතනවලින් සහනදායී ණය හැටියට, එහෙම නැත්නම් තෑගි හැටියට තමයි අපට ලැබිලා තිබෙන්නේ. හැබැයි, මේ ගරු සභාවට ඇවිල්ලා කියන්නේ මොකක්ද? සල්ලි තිබුණේ නැහැ කියනවා. මේවා මිනිස්සු විශ්වාස කරනවා, මිනිසුන් මුළා කරනවා. රටවලින් සහ ජාත්‍යන්තර ආයතනවලින් ලැබුණු මුදල් පිළිබඳ විස්තර ඇතුළත් ඒ සියලු ලේඛන මා **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මෙතුමන්ලා හැම දේම කොවිඩ් වසංගතය මත පටවලා ජනතාව මුළා කරනවා. 2021 සැප්තැම්බර් 07වෙනි දා මුදල් ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී මොනවාද කියා තිබෙන්නේ? මම ඒ කොටස එදින හැන්සාඩ් වාර්තාවෙන් උපුටා දක්වන්න කැමැතියි.

මේක සඳහන් වන්නේ එතුමා එදා කළ ඒ කථාවේ. ගරු කථානායකතුමනි, 2021 සැප්තැම්බර් 07වැනි දින පළ වූ හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 172හි මෙසේ සඳහන් වෙනවා:

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

"විශේෂයෙන්ම මේ කොවිඩ් වසංගතය නිසා අද වනකොට මේ වර්ෂයට පමණක් අපට ලැබිය යුතු ආදායමෙන් රුපියල් බිලියන 1,500ත්, රුපියල් බිලියන 1,600ත් අතර ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා."

එතුමා ඊයේ කියනවා, ආදායමෙන් රුපියල් බිලියන 500ක් අඩු වෙලා කියලා. මොන විකාරයක්ද මේ, ගරු කථානායකතුමනි? රුපියල් බිලියන 1,600ත්, රුපියල් බිලියන 500ත් අතර ලොකු වෙනසක් තිබෙනවා නේද? තුන් ගුණයකින් අතිශයෝක්තියට ලක් කරලා, අපේ ජනතාව මුළා කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඇත්තටම රජය ආදායම අඩු කර ගත්තේ කිසිම හිතිල්ලක් බැලිල්ලක් නැතිව තමන් විසින්ම බදු අඩු කරපු නිසා. එදා කරපු ඒ අමනෝඥ ක්‍රියාව නිසා මුළු රටම දුක් වින්දා. අය වැය ඒ ගැන වචනයක්වත් කථාවේ නැහැ. නිදහසින් පස්සේ තිබුණු අසාර්ථකම අය වැය මේක වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, සාමාන්‍ය භාෂාවෙන් කියනවා නම් මෙහෙම ඒවාට කියන්නේ, "ඇදගෙන නානවා" කියලායි.

බලන්න, ඊයේ ඉදිරිපත් කරපු මූල්‍ය වාර්තා. 2022ට ආදායම රුපියල් බිලියන 2,284යි, වියදම බිලියන 3,912යි, අය වැය හිඟය රුපියල් බිලියන 1,628යි. දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස එය සියයට 8.8යි. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ බැසිල් ඇමතිතුමා ගෙනාපු අය වැයෙන් බදු වැඩි කිරීම සියයට 46ක්. මේ, ණය වාරික නැතිව. මේකත් පොඩ්ඩක් අහගන්න, ගරු කථානායකතුමනි. ණය වාරික එකතු කළාට පස්සේ මුළු වියදම රුපියල් බිලියන 5,245යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 524,500යි. හැබැයි, බලාපොරොත්තු වන ආදායම කෝටි 228,400යි. ඒ කියන්නේ, ණය ගන්න සිද්ධ වෙනවා රුපියල් කෝටි 320,000ක්. හරි ද? එන අවුරුද්දේ මේ ණය ප්‍රමාණයෙන් අවම වශයෙන් ආණ්ඩුව ඩොලර් බිලියන 5ක ණය ගෙවන්න තිබෙනවා. කෝ, ඒකට ඩොලර්? මේ විධියට විනාශ කරපු රටකට ආයෝජකයෝ ඒවි ද? කිසිම ස්ථාවරයක් නැති රටකට ආයෝජකයෝ ඒවි ද? බලෙන් තමන්ගේ ඩොලර් රුපියල්වලට මාරු කරවන රටකට මොන ආයෝජකයාද එන්නේ? අද ලංකාව ආයෝජකයෙක් නැති වේළෙන රටක් වෙලා. අඩු ගණනේ ස්වෛරී බැඳුම්කරයකවත් ආයෝජනය කරන්න කවුරුවත් නැහැ. 2019 දෙසැම්බර් ඉඳලා අපි ශ්‍රේණිගත කිරීම්වලින් ශීඝ්‍රයෙන් පහළට වැටුණා. අද අපි ඉන්නේ Moody's දර්ශකයේ "Caa2" කියන මට්ටමේ. තව එක level එකයි තිබෙන්නේ "Caa3"වලට යන්න. ඒක අඩිය. ඊට පස්සේ "Caa" මට්ටම. ඒ කියන්නේ ණය පැහැර හරින රටක්. අපට ණය ගන්න ජාත්‍යන්තර වෙළෙඳ පොළට යන්න බැහැ. දොරවල් වැහිලා. ගරු කථානායකතුමනි, මම අද උදේ පාන්දර 1.30ට විතර website එකට ගිහිල්ලා බැලුවා, ලංකාවේ ස්වෛරී බැඳුම්කර ද්විතියික වෙළෙඳ පොළේ විකිණෙන්නේ කීයට ද කියලා.

විකිණෙන්නේ අධි අවදානම් තත්ත්වයක. ඩොලරයක වටිනාකමක් තිබෙන අපේ බැඳුම්කරයකට මිනිස්සු ask එක තියන්නේ - ලංසු දමන්නේ - ශත 60ක විතර ප්‍රමාණයකට. සමහර වෙලාවට ඊටත් අඩුවෙන්. දැන් ඔබතුමන්ලාගේ telephone එකෙන් www.bondsupermart.com කියන website එකට ගිහිල්ලා බලන්න, 2020 ජූලි මාසයේ 25වැනි දා කල් පිරෙන සියයට 5.85 බැඳුම්කරයට තිබෙන ලංසුව කීයද කියලා. සියයට 44.2යි, වාර්ෂික පොලිය. ඒ කියන්නේ එහි ආයෝජනය කරන්න නම්, annualize ක්‍රමයට සියයට 44.2ක ප්‍රතිලාභයක් ඔවුන් බලාපොරොත්තු වෙනවා. ඒකයි ඇත්තටම මේ රටට වෙලා තියෙන්නේ. 2023 අප්‍රේල් 18වැනි දා කල් පිරෙන බැඳුම්කරයට තිබෙන ලංසුව සියයට 43.1යි. සංසාරෙට අපට මෙහෙම වෙලා නැහැ. Our International Sovereign Bond prices have crashed in the secondary market. Almost all our bonds are trading at less than 60 cents to the dollar. මේ රජය අපේ රට මහා ණය උගුලක හිර කරලා, ගරු කථානායකතුමනි. තොණ්ඩුව ජනතාවගේ බෙල්ලටම වැටිලා තිබෙන්නේ. තොණ්ඩුව ගැස්සෙන එක වළක්වන්න මුදල් ඇමතිතුමාට මේ අය වැයෙන් බැරි වෙලා තිබෙනවා. ඒ බව අපට කනගාටුවෙන් කියන්න සිද්ධ වෙනවා. සර් සහ සර්ගේ සහෝදරයෝ එකතු වෙලා කරපු හදිය බලන්න. දැන් මොකද කරන්නේ? ඩොලර් ණය ගෙවන්නේ කොහොමද? ලබන මාස 12ට අපට ඩොලර් බිලියන 7ක මුළු ණය ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. නමුත්, සංචිත තියෙන්නේ ඩොලර් බිලියන 2.2යි.

නොයෙකුත් රටවලින් අපට ණය දෙනවා කිව්වා. මම ඒ නම් ලැයිස්තුව ලියා ගත්තා. චීනයෙන් ඩොලර් බිලියනයක් දෙනවා කිව්වා. ඉන්දියාවෙන් ඩොලර් මිලියන 400ක swap එකක්, ඩොලර් බිලියනයක ණයක් දෙනවා කිව්වා. ඕමානයෙන් ඩොලර් බිලියන තුනහමාරක් දෙනවා කිව්වා. කටාර් රාජ්‍යයෙන් ඩොලර් මිලියන තුනහමාරක් දෙනවා කිව්වා. ඇමෙරිකාවෙන් සියයට 7ක fee එකක් ගෙවලා Kenneth de la Motte හරහා ඩොලර් බිලියන දෙකහමාරක් ගෙවනවා කිව්වා. කෝ? මොනවාද ආවේ? මොකුත් නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නේ නැතිව, අපි කවුරුවත් දන්නේ නැතිව ඊයේ අය වැය කථාව කියවන වෙලාවේ හරි ෂෝක් වැඩක් වෙලා තිබෙනවා. මේ සල්ලි එන්නේ නැති බව දැන ගත්තාම, මහ බැංකුවෙන් ඊයේ Request For Proposal issue කර තිබෙනවා. Yesterday, while the Budget was being read out by the Finance Minister, the Central Bank floated an RFP for arrangers to securitize the approximately seven billion dollar remittances. Can you even believe it? Unbelievable! If we tie these receivables to structure a financing facility, how will we use the process to pay for our imports? That is how we bridge our trade deficit. මැද පෙරදිගින් අපට අවුරුද්දකට ඩොලර් බිලියන 7ක පමණ ප්‍රේෂණ ලැබෙනවා. අය වැය කථාව පැවැත්වෙන වෙලාවේ, ඒ ලැබෙන ඩොලර් බිලියන 7 ඇපයට තියලා ණයක් ගන්න මහ බැංකුවෙන් RFP එකක් නිකුත් කරලා තිබෙනවා, arrangersලා හොයන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි. ලජ්ජයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මම එම RFP එක **සභාගත*** කරනවා.

මේ කරන්නේ මොකක්ද? ඒ මිනිසුන්ගේ සල්ලි ටික securitize කරලා කියනවා, "මේක තමයි ඇපය, අපට ණයක් දෙන්න" කියලා. මේ තිබෙන්නේ ඒක. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ කියනවාද? ලජ්ජයි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම කියන්නම්, ණය දෙන්න ඇවිල්ලා ඉන්නේ කවුද කියලා. කළු සල්ලි ලොන්ඩරියට ආවේ කවුද කියා මම කියන්නම්. ඇවිල්ලා ඉන්නේ එල්ටීටීඊ එකේ පරණ යාළුවා. ඒ, ලයිකා මොබයිල්කාරයා, සුබාස්කරන් අලිරාජා. කාටත් මතකයි නේ, Sky Network කථාව. ඔහු තමයි, Jaffna LPL team එකත් බලෙන්ම ගත්තේ. ඔහු යන්නේ Air Force එකේ හෙලිකොප්ටරයේ. දැන් මුදල් විශුද්ධිකරණය කරන්න පුළුවන් විධියට ගෙනා නීතියත් හරි නේ, ගරු කථානායකතුමනි. බලමු කෝ, ත්‍රස්තවාදී කළු සල්ලි ඩොලර් බිලියන කීයක් මොහු ගෙනෙනවාද කියලා. හැබැයි මම එක දෙයක් කියන්නම්, ගරු කථානායකතුමනි. මේක backfire වෙනවා. වැදගත් විධියට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක සාකච්ඡා කරලා ගෙවන්න තිබෙන ඩොලර් බිලියන 14 වාණිජ ණය ටික ප්‍රතිව්‍යුහගත කරගන්න ඕනෑ. ඒක කල්දමා ගන්න ඕනෑ; moratorium එකක් ගන්න ඕනෑ; හුස්ම ගන්න අවස්ථාවක් ගන්න ඕනෑ. ඊට පසු අපට පුළුවන්, මේ රට හදා ඒ ටික ගෙවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න. මම කථාව අවසන් කරනවා.

ගරු බැසිල් ඇමතිතුමා ඊයේ හොඳ කථාවක් කිව්වා. හිටපු මුදල් ඇමති, ගරු ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා IMF එක විවේචනය කළා කිව්වා. ලොකු කථාවක් කිව්වා නේ. පිටු ගණනක් කියෙව්වා. මම එක දෙයක් කියන්නම්. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට IMF එක සමඟ ණයක් ගැනීමට සාකච්ඡාවක් ආරම්භ කළේ හිටපු මුදල් අමාත්‍ය ගරු ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා. 1964 සැප්තැම්බර් මාසයේ ටෝකියෝවලදී, IMF Annual Summit එකේදී එතුමා ණය මුදලක් ඉල්ලුවා. මේක ගැන දන්නා නිසායි මම කියන්නේ. ආර්ථික ඉතිහාසය ගැන යම්කිසි දෙයක් හෝ දන්නවා නම්, ඒක- *[බාධා කිරීමක්]* මොකක්ද?

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

1961දී තමයි පළමුවැනි loan එක ගත්තේ. *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

1959දී. *[බාධා කිරීම්]* 1959දී කථා කරලා තිබෙනවා. *[බාධා කිරීම්]* මම එතුමාගේ එම කථාව **සභාගත*** කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මම තව තත්පර කීපයයි ගන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

Sir, I rise to a point of Order.- [Interruption.]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා, රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා දෙතුන් වතාවක් කිව්වා, ගරු මුදල් ඇමතිතුමා පාර්ලිමේන්තුවේ නැහැ කියලා. එතුමා මේ වේලාවේ ඉන්නේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැත්වෙන Budget එක සම්බන්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවේ. මම ඒ ගැන ගරු සභාවට මතක් කරන්න කැමැතියි.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, අඩු ගණනේ ඔබතුමාගේ විපක්ෂ නායකතුමාවත් සභාවේ නැහැ, ඔබතුමාගේ කථාව අහන්න. *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමාවත් ගෙන්වා ගන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

හොඳයි, *[බාධා කිරීම්]* මම අවසන් කරන්නම්. *[බාධා කිරීම්]*

ජනතාවගේ බෙල්ලේ දමපු තොණ්ඩුව දැන් ගැස්සෙන්නයි යන්නේ.

ගරු කථානායකතුමනි, මේ අය වැය කථාව මෙලෝ රහක් නැති හුදු ලියවිල්ලක් විතරයි; නිකම්ම නිකම් පුස්සක්. මේකෙන් ලබපු ලොකුම ජයග්‍රහණය තමයි, තමන්ගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට බෙදපු රුපියල් බිලියන 85. අනෙක තමයි, මාර්ග සංවර්ධනය. හැම දාම ඕක තමයි කරන්නේ. අධ්‍යාපනය වෙනුවෙන් මෙවර අය වැයෙන් මොනවාද කළේ? සෞඛ්‍යයට මෙවර අය වැයෙන් වැඩක් නැහැ. පොදු ප්‍රවාහනය ගැන වචනයක්වත් එහි සඳහන් වෙලා නැහැ. සංචාරක ක්ෂේත්‍රය කඩාගෙන වැටිලා. ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ කණ්ඩායම බලාගෙන හිටියා, සංචාරක ක්ෂේත්‍රයට මෙවර අය වැයෙන් මොනවා හරි ලැබෙයි කියලා. නමුත්, සංචාරක ක්ෂේත්‍රය ගැන වචනයක්වත් කථා කළේ නැහැ. *[බාධා කිරීමක්]* තාක්ෂණය ගැන කථා කළේ නැහැ, නවෝත්පාදනය ගැන කථා කළේ නැහැ. මෙවර අය වැය අසාර්ථකයි. මේ කොල්ලකාරයන්ගෙන්, බොරුකාරයන්ගෙන්, වංචාකාරයන්ගෙන්, මායාකාරයන්ගෙන්,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, please wind up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

I only need 30 seconds, Sir. I am going to wind up. - [*Interruption.*]

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දැනටම මේ රට අත්හැර දමා යන්න තරුණ තරුණියන් පාස්පෝර්ට් පෝලිමේ පොර කනවා. ගරු කථානායකතුමනි, මෙහෙම ගියොත් Passport Office එකක් නොවෙයි, හත අටක් විවෘත කරන්න වෙයි. කරපු දේවල් දැන් හොඳටම ඇති.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තව සුළු වෙලාවක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි තවත් විනාඩි පහක කාලයක් එතුමාට ලබා දෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. You have another five minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමන්ලාට තවදුරටත් ජනතාව රවටන්න බැහැ. අපට, අපේ රට ගොඩ ගන්න පැහැදිලි දැක්මක් තිබෙනවා. අපි ඒ ගමන යනවා. *[බාධා කිරීම්]* අපි අපේ රට ලෝකයේ කීර්තිමත් රාජ්‍යයක් බවට පත් කරනවා. මේ ණය උගුලෙන්, රටේ දැවෙන ප්‍රශ්නවලින් අපි නුදුරේදීම අපේ ආණ්ඩුවක් තුළින් ජනතාව බේරා ගන්නවා. ජනතාව බේරා ගන්නවා පමණක් නොවෙයි, සත්‍ය වශයෙන්ම ජනතාවට සෙතක් සලසනවා. ශ්‍රී ලංකාව ලෝකයට එකතු කරලා, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් හරහා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර, සැමට එක සේ සලකන රටක් අපි සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වය යටතේ, පුළුල් සන්ධානයක් හරහා බිහි කරන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Ajith Rajapakse to the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I propose that the Hon. Ajith Rajapakse do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் திலிருந்து அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

[පූ.භා. 10.54]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය වෙනුවෙන් කලින් හිටපු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා වෙනුවට සමගි ජන බලවේගය විසින් නිර්මාණය කළ හර්ෂ ද සිල්වා මහත්මයා දේශපාලන කථාවක් මිස අය වැය ලේඛනය පිළිබඳව මේ උත්තරීතර සභාවේ විද්‍යාත්මක විග්‍රහයක් නොකිරීම සම්බන්ධයෙන් මම බෙහෙවින් කනගාටු වෙනවා.

ලෝකයේ විශිෂ්ටතම විද්‍යාඥයෙක් ලෙස සැලකෙන මහා භාරතයේ අබ්දුල් කලාම් මැතිතුමා එක්තරා අවස්ථාවක කළ ප්‍රකාශයක් මා ළඟ තිබෙනවා. මේ ගරු සභාවට එය වැදගත් වෙයි කියා මා හිතනවා. අබ්දුල් කලාම් මැතිතුමා කළ එම ප්‍රකාශයේ සඳහන් වෙනවා, "ගෞරවනීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම තරුණ මන්ත්‍රීවරුනි, මා ඔබ හමුවන සෑම අවස්ථාවකම ඔබ තුළින් මා දකින්නේ මහත්මා ගාන්ධි, ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාද්, පණ්ඩිත් ජවහර්ලාල් නේරු, සර්දාර් පටෙල්, සුබාෂ් චන්ද්‍රබෝස්, ආචාර්ය අම්බෙඩ්කාර්, අබ්දුල් කලාම් අසාද්, රාජාජි සහ අපේ ජාතියේ බොහෝ ශ්‍රේෂ්ඨ විචක්ෂණශීලී නායකයින්ගේ සදාකාලිකව දැල්වෙන අධ්‍යාත්මික ජීව ගුණයයි. ඔබට වඩා ඉහළින් ජාතිය නංවාලිය හැකි ආකාරයේ දැක්මක් සහිත නායකයින් වන්නට ඔබටත් පුළුවන්ද? ඉන්දියාවේ ශ්‍රේෂ්ඨයන් අතර කෙනෙකු වන්නට ඔබටත් පුළුවන්ද? ඔව්, ඔබට පුළුවන්. වර්ෂ 2020ට පෙර ඉන්දියාව ආර්ථික වශයෙන් සමෘද්ධිමත්, ප්‍රීතිමත්, ශක්තිමත් හා ආරක්ෂා සහිත රටක් බවට පරිවර්තනය කිරීමේ ශ්‍රේෂ්ඨ මෙහෙවර උදෙසා නායකත්වය ලබා දෙමින් පාර්ලිමේන්තුව ප්‍රාණවත්භාවයට පත් කළ හැකි නම් ඒ උදාරතර තත්ත්වය ඇති කිරීමට ඔබට පුළුවන. එම තත්ත්වය ඇති කිරීමට නම්, ගෞරවනීය මන්ත්‍රීවරුනි, ඔබට විසල් අරමුණක් තිබිය යුතුවාක් මෙන්ම පාර්ලිමේන්තුව තුළදී සහ ඉන් බාහිරවත් රට ජාතිය වෙනුවෙන් වැඩ කළ යුතු ය. කටයුතු සම්පාදනයේදී ලසුව විසිරී ගිය මානසික තත්ත්වයෙන් අත්මිදී රටත් ජාතියත් වෙනුවෙන් ශ්‍රේෂ්ඨ, නිර්භීත හා ජවසම්පන්න මෙහෙවරක් ඉටු කිරීම වෙනුවෙන් ඉතිහාසය ඔබ සදාකාලිකව ස්මරණය කරනු ඇත." කියලා.

අබ්දුල් කලාම් කියලා තිබෙන හැටියටත්, ජාතියක් හැසිරවීම පිළිබඳ, විශේෂයෙන් රාජ්‍ය මූල්‍යය පිළිබඳ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව අනුවත් මේ වගකීම පැවරිලා තිබෙන්නේ මේ උත්තරීතර සභාවට. ඒ නිසා අපි ආපසු හැරී බලන විට හැම දාම, අය වැය ලේඛනයකින් පසු මේ විධියට සිද්ධි අල්ලා ගෙන විවිධ අවලාද, අපහාස, උපහාස, මඩ ගැසීම් කරනවා නම්, මේ ජාතිය වැටිලා තිබෙන අර්බුදයෙන් ගොඩ එන්න අපට පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ.

මම එයට උදාහරණයක් දක්වන්න කැමැතියි. මීට අවුරුදු 44කට පෙර මේ රටේ ආර්ථික ඉතිහාසයේ ගමන් මග වෙනස් කරමින් විවෘත වෙළඳපොළ ආර්ථිකය ගෙන ඒමේදී 1977 නොවැම්බර් මාසයේ 15වන දා, තවමත් ජීවතුන් අතර සිටින ගරු රොනී ද මැල් හිටපු මුදල් ඇමතිතුමා, දැන් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන ටික ඒ ආකාරයෙන්ම කියලා තිබෙනවා. මීට

අවු 44කට පෙර, එනම් 1977 නොවැම්බර් මාසයේ 15වෙනි දා ඉදිරිපත් කළ අය වැය කථාවේ 3වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"මේ රටේ ප්‍රධාන අර්ථික අංශවල නිෂ්පාදනය වේගයෙන් පහළ වැටුණි. සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදම රොකට්ටුවක වේගයෙන් ඉහළ ගියා..."

අර කිව්ව විධියටම, බඩු මිල වැඩිවීම ගැන අවුරුදු 44කට ඉස්සෙල්ලා රොනී ද මැල් මහත්තයා මේ සභාවේ කිව්වා. එතුමා එහි තවදුරටත් මෙසේ කියා තිබෙනවා:

"සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩු කාලය තුළ රක්ෂා නැති අයගේ සංඛ්‍යාව පන්ලක්ෂයේ සිට දොළොස් ලක්ෂය දක්වා වැඩි වුණි..."

එතුමා රක්ෂා ප්‍රශ්නය ගැනත් එහි කියා තිබෙනවා. මේ, එහි සඳහන් වන තවත් කාරණයක්:

"ගත වූ අවුරුදු හත ඇතුළත දූෂණය සහ නාස්තිය වසංගත රෝගයක් බවට පත් විය..."

ඒ, මීට අවුරුදු 44කට ඉස්සෙල්ලා. ඒ කියන්නේත් දූෂණය, වංචාව පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී කරන චෝදනාවක්.

ඊළඟට එහි වැඩිදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"මේ රටේ ඉතිහාසයේ කිසිම දවසක සිදු නොවූ ආකාරයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව විසින් ගතවුණු අවුරුදු හත ඇතුළත මේ රටේ ණය බර ඉහළ නංවනු ලැබිණි..."

මේ කියන්නේ, රාජ්‍ය ණය බර ගැන. ඒ අවුරුදු 7හි කවදාවත් නැති විධියට ණය බර ඉහළ නැංවූවා කියනවා.

ඊළඟට, එම අය වැය කථාවේ 8වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"විදේශීය ණයවලින් කොටසක් වෙනුවෙන් ගෙවීමට සිදුව ඇති අධික පොලී ප්‍රමාණය දෙස බලන විට, අපේ තේවල අනාගත ඵලදාව පවා විදේශ රටවලට උකස් කර තිබේ..."

විදේශ ණය පොලිය ගෙවා ගන්න විධියක් නැහැ කියලා 1977දී රොනී ද මැල් ඇමතිතුමා කියනවා. මේක උගස් කර තිබෙනවා කියනවා.

ඊළඟට, එම අය වැය කථාවේ 15 වෙනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"ඉතිරිකිරීමේ අනුපාතය සියයට 10.5 දක්වා පහත වැටී ඇත. ආනයන අනුපාතය 15.5 දක්වා පහත වැටී ඇත..."

එහි 24වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"වෙළඳ හිඟයත්, විදේශීය ණය සඳහා අධික පොලී ප්‍රමාණයත් නිසා ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය ඉහළ මට්ටමක පැවතිණි..."

මේ බලන්න, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අවුරුදු 44 කට පස්සේ කියන්නේත් ඒ ටිකමයි. එහෙම නම් මොකක්ද අපට ඒකෙන් කියා දෙන පාඩම? අවුරුදු 44ක් අවුරුදු 50ක් ගියත් රාජ්‍ය මූල්‍ය හැසිරවීම සම්බන්ධයෙන් අපට ජාතික වශයෙන් මේ පාර්ලිමේන්තුවේ යුතුකම, වගකීම ඉෂ්ට කරන්න බැරිවෙලා තිබෙනවා. අපට ඒක පිළිගන්න වෙනවා. අද ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ නිදහසින් පසු ලංකා ඉතිහාසයේ විශාලතම වෙනස්කම් සහිත යුගයක. දිගින් දිගටම පැතිරෙන කොවිඩ් වසංගතයක් තුළ තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ. මීට පෙර ලංකාවේ කිසිම මුදල් ඇමතිවරයෙක් මෙවැනි වසංගත තත්ත්වයක් ඇතිව අය වැය ලේඛනයක් ඉදිරිපත් කර නැහැ.

දෙවැනි කාරණය මේකයි. කොවිඩ් - 19 නිසා ගෝලීය ආර්ථිකයට දැවැන්තම අර්බුදය ඇති වෙලා තිබෙන අවස්ථාවක මෙවැනි අය වැයක් මීට පෙර ලංකා ඉතිහාසයේ ඉදිරිපත් වෙලා නැහැ. තුන්වැනි කාරණය මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ විශාලතම ආර්ථික පසුබෑම පසුගිය -2020- වර්ෂයේදී සෘණ 3.6ක වර්ධනයක් තිබුණා. එවැනි තත්ත්වයක් තුළ -සෘණ වූ අවස්ථාවක- ඒ ආණ්ඩුවට අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ. උදාහරණයක් වශයෙන් කිව්වොත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ බලය යටතේ ආර්ථිකය සෘණ වෙනකොට ඇතිවුණු අර්බුදය තුළ එක්සත් ජාතික පෙරමුණ විසින් තමයි අලුත් අය වැය ලේඛනයක් ඉදිරිපත් කළේ.

සියයට 3.6කින් කඩාගෙන වැටුණු රටක් තිබිලා, කොවිඩ් - 19 වසංගතයත් පවතිද්දී මෙවැනි අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍යයෙන්ම අභියෝගාත්මක කාර්ය භාරයක්. ඒ අභියෝගය හමුවේ ඒ කාර්යභාරය ඉෂ්ට කරපු මුදල් ඇමතිවරයා ලෙසයි, බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉතිහාසයට එකතු වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි මේ කොවිඩ් - 19 වසංගත තත්ත්වය සම්පූර්ණයෙන්ම අමතක කරලා තමයි අද ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කථා කළේ.

ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයට අනුව, තහවුරු කරන ලද කොවිඩ් - 19 රෝගීන් ගෝලීය වශයෙන් මිලියන 252.8 ඉක්මවා තිබෙනවා. තහවුරු වූ මරණ සංඛ්‍යාව මේ වන විට මිලියන 5.7 ඉක්මවා තිබෙනවා. ලෝකයේ ප්‍රබලතම රාජ්‍යය ලෙස සැලකෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ කොවිඩ් වසංගතයට ගොදුරු වූ සංඛ්‍යාව මිලියන 48යි. ඇමෙරිකා එක්සත් ජනපදයේ මරණ සංඛ්‍යාව ලක්ෂ අටකට ආසන්න වෙමින් පවතිනවා. යුද බලය, ආර්ථික බලය, පර්යේෂණ බලය ඇතුළු සියලු ශක්තීන් සංයුක්ත වෙච්ච එරටේ ලක්ෂ අටකට ආසන්න මනුෂ්‍යයින් පිරිසක් කොවිඩ් - 19 වසංගතයෙන් මැරෙනකොට ඒ රටේ ජනතාව කියනවාද, "ජෝ බයිඩන් සර් ෆේල්" කියලා? ජෝ බයිඩන් තමයි මේක කළේ කියනවාද? මේ ලෝක අර්බුදය තුළ කොවිඩ් - 19 ආසාදනයේ සිව්වන රැල්ලක් මේ වන විට ලොව පුරා පැතිරෙමින් තිබෙනවා. ජර්මනිය තුළ බ්‍රහස්පතින්දා දිනයේ පමණක් කොරෝනා වයිරස් රෝගීන් 50,196ක් වාර්තා වුණා. පිට පිට දින පහක් තුළ ජර්මනියේ කොරෝනා රෝගීන්ගේ සංඛ්‍යාව වාර්තාගත ලෙස ඉහළ ගියා. පසුගිය පැය 24 තුළ රුසියාවේ කොරෝනා වයිරසය ආශ්‍රිත මරණ 1,237ක් වාර්තා වුණා. ප්‍රංශය කොරෝනා වයිරස් වසංගතයේ පස්වන රැල්ල ආරම්භයේ සිටින බව එරට සෞඛ්‍ය අමාත්‍ය ඔලිවියර් වේරන් පවසා තිබෙනවා. ප්‍රංශ සෞඛ්‍ය අමාත්‍යාංශය පවසන අන්දමට නව රෝගීන් සංඛ්‍යාව බදාදා දිනයේ 10,000 ඉක්මවූවා.

කොවිඩ් - 19 වයිරසය කියන්නේ, ලොව පුරා පැතිර ගිය නවතම වයිරස්වලින් එකක් පමණයි. මේ වන විට එය ලොව පුරා පුද්ගලයන් හා ව්‍යාපාර යන දෙකටම අසාමාන්‍ය බලපෑමක් ඇති කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් - 19 වසංගතය කරණකොටගෙන ගෝලීය ආර්ථිකයට ඇති වී තිබෙන බලපෑම් පිළිබඳ දීර්ඝ විස්තරය මගේ කථාවේ ඉතිරි කොටස ලෙස මම **සභාගත*** කරනවා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ඊට අදාළ තොරතුරු ලේඛන දෙකක් ද මා මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඒ තත්ත්වය තුළ අද ගුවන් තොටුපොළවල් වහලා තිබෙනවා. නැව් ගමනාගමනය නතර වෙලා තිබෙනවා. වරායවල කන්ටේනර් ගොඩ ගැසී තිබෙනවා. ලෝකයේ ඕනෑ සමාජයක සිද්ධ වන ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා. එනම්, නිෂ්පාදනය, පරිභෝජනය, හුවමාරුව - production, consumption, exchange. මේ මූලික ආර්ථික ක්‍රියා තුනම දෙවන ලෝක යුද්ධයටත් වඩා, 1930 ගණන්වල ඇති වූ අවපාතයටත් වඩා වැඩියෙන් ලෝකය වෙළාගෙන තිබෙනවා. ඒ නිසා ලෝකය පුරාම අසාමාන්‍ය ලෙස මිල ඉහළ යෑමක් සිදුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩි 40 කන්ටේනරයක යුරෝපයට භාණ්ඩ යවන්න හෝ යුරෝපයෙන් භාණ්ඩ ගෙනෙන්න ගාස්තුව ඩොලර් 1,750ට තිබුණේ. අද ඒ ගාස්තුව 20,000යි. කන්ටේනර් ගාස්තුව විතරක් සියයට 1,042කින් වැඩි වෙලා තිබෙනවා. ලෝකයේ ඛනිජතෙල් මිල වැඩි වෙනවා. පසුගිය මාසයේ ලෝකයේ ගෑස් මිල සියයට 130කින් වැඩි වුණා. ලෝකයේ මුළු සැපයුම් ජාලය - supply chain එක - අඩපණ වෙලා තිබෙනවා. සුමට ලෙස ගමන් කරන්න බැරි වෙනකොට විනිමය අනුපාත කඩා වැටෙනවා. රටවල බඩගින්න, මන්දපෝෂණය, දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන විධියට, 1930 ගණන්වලින් පසු ලෝකයේ දුප්පත්කම වැඩියෙන්ම වර්ධනය වී තිබෙන කාලය තමයි කොවිඩ් 19 වසංගතය ඇති වූ කාලය. ඇමෙරිකානු ඩොලර් බිලියන 80ක පුංචි ආර්ථිකයක් තිබෙන අපි වාගේ රටකට තනි තනිව මෙයට විසඳුම් සොයන්න බැහැ. දෙවන ලෝක සංග්‍රාමයේදී මේ සඳහා ඇති වූ අර්බුදයේදී Bretton Woodsවල වෙනම සම්මේලනයක් පැවැත්වූවා. එදා, එක්සත් රාජධානියේ ජෝන් මෙනාඩ් කේන්ස් ආර්ථිකය ගොඩගන්නේ කෙසේද කියලා සැලැස්මක් ඉදිරිපත් කළා. එතුමා වයිට් සැලැස්ම කියන එක ඉදිරිපත් කළා. එතකොට ලෝකයේ ඉන්න උගත්ම ආර්ථික විද්‍යාඥයන් මේ වාගේ දේශපාලන කතන්දර කියන්නේ නැතිව, වැටී තිබෙන ලෝකය ගොඩගන්නේ කොහොමද කියන එක පිළිබඳ මහා පුළුල් සංවාදයක් ඇති කරලා, ලෝකය අලුතින් ගොඩගන්න ආයතන දෙකක් නිර්දේශ කළා. ඒ තමයි, ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. මේ ආයතන දෙක Bretton Woods සම්මේලනයේ නිවුන් සොහොයුරන් ලෙසයි සලකන්නේ.

දෙවන ලෝක යුද්ධයේ පශ්චාත් ප්‍රතිඵලයක් ලෙස ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යන ආයතන දෙක ඇති වුණා. අද ඊට වඩා වැඩි සංවාදයක් ලෝකයේ ඇති වෙන්න ඕනෑ. නමුත්, අවාසනාවකට ඇමෙරිකා එක්සත් ජනපදයත්, මහජන චීනයත් අතර පවතින වෙළෙඳ යුද්ධය කරණකොටගෙන, ලෝකයේ මෙවැනි විසඳුම් මාර්ගයකට එන්නේ නැතිකම තුළ අපි වාගේ පුංචි ආර්ථිකයක් තිබෙන රටකට ඔරොත්තු නොදෙන බාහිර කම්පනයක් තිබෙනවා කියන එක අප මතක තබා ගත යුතු වෙනවා. එවන් තත්ත්වයක් යටතේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනතාව වෙනුවෙන් ඉමහත් සේවයක් කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආණ්ඩුවකට පවරා දෙන ප්‍රධාන වගකීම තමයි ජනතාවගේ ජීවිත හා දේපොළ ආරක්ෂා කිරීම කියන මූලික කාරණය. ඕනෑම රටක රජයක මූලික වගකීම වෙන්නේ ඒ රටේ නිරායුධ, අවිහිංසක ලක්ෂ ගණන් ජනයාගේ ජීවිතවල හා දේපොළ ආරක්ෂාව සැලසීමයි. ඒ යුතුකම ඉෂ්ට කරන්න එතුමා වෙනම විශේෂ කාර්ය සාධක බලකායක් ඇති කරලා, සෞඛ්‍ය අංශ යොමු කරගෙන, හමුදා අංශ යොමුකර ගෙන, රටේ යොදා ගත හැකි හැම පුරවැසියෙක්ම යොදා ගෙන දිනපතා රැස්වෙමින්, දිනපතා සාකච්ඡා කරමින්, දිනපතා විසඳුම් සොයමින් කටයුතු කරනවා.

දැනට ලංකාවේ මුළු ජනගහනයෙන් අවුරුදු 16ට වැඩි අය මිලියන 16.2ක් සිටිනවා. එයින් මිලියන 15.8කට කොවිඩ් පළමු එන්නත ලබා දීලා අවසන් කරලා තිබෙනවා. ලංකාවේ ජනගහනයෙන් සියයට 98කට -අවුරුදු 16ට වැඩි අයට- එන්නත්කරණය කරලා විශිෂ්ටතම ලෙස කොවිඩ් මර්දනය කළ රටක් බවට ලංකාව වාර්තාවක් තියලා තිබෙනවා කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරනවා. ඒ වාගේම ආසියාවේ එන්නත් ලබා දීම සම්බන්ධයෙන් ලංකාව පළමුවෙනි තැනට පත් වෙලා තිබෙනවා. ඊළඟට, මුළු ජනගහනයෙන් සියයට 72ක් එන්නත්කරණය සඳහා කෝටි-ප්‍රකෝටි සංඛ්‍යාත පිරිවැයක් දරමින්, වියදමක් දරමින් අය වැය ඇස්තමේන්තුවල නැති මුදල් යොදාගෙන, ඒ සඳහා ලබා ගත හැකි සියලු විදේශ ආධාර ලබා ගෙන පෞද්ගලිකවම එතුමා මැදිහත් වෙලා, විවිධ රටවල රාජ්‍ය නායකයන්ට කථා කරලා, එන්නත් ලබා ගෙන මේ කරපු ජාතික යුතුකම හා වගකීම අපි අගය කළ යුතු වනවා. හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සියලු ජනතාවට අභය දානය ලබා දීමේ පින්කම කළා වාගේ, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනතාව කොවිඩ් වසංගතයෙන් බේරා ගැනීමේ යුතුකම ඉෂ්ට කළාය කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරනවා. ඒ අභියෝගය තුළ තමයි මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කළේ.

මේ වන විට අපේ රටේ ප්‍රධාන අර්බුද තුනක් තිබෙනවා. පළමුවැන්න, රාජ්‍ය මූල්‍යයේ පවතින අර්බුදය. දෙවැන්න, විදේශ විනිමය, නැත්නම් ගෙවුම් ශේෂ අර්බුදය. තුන්වැන්න, කඩා වැටුණු ආර්ථිකය නැවත ගොඩනැඟීම පිළිබඳ අර්බුදය. මේ ප්‍රධාන අර්බුද තුන අද ඊයේ ඇති වෙච්ච දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා, මේ කාරණයට. 1977දී විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නා. 1980දී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම සියයට 23.5යි; වියදම සියයට 42.7යි; අය වැය පරතරය සියයට 19.3යි; බඩු මිල වැඩිවීමේ වේගය සියයට 33.7යි. 1981 දී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් විධියට රජයේ ආදායම සියයට 20.6යි; වියදම සියයට 33.0යි; අය වැය පරතරය සියයට 12.4යි; බඩු මිල වැඩි වීමේ වේගය සියයට 17යි. 1983 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ආදායම සියයට 22යි; වියදම සියයට 32.6යි; අය වැය පරතරය සියයට 10.6යි; බඩු මිල වැඩි වීමේ වේගය සියයට 25යි. එහෙමයි තිබුණේ. අද ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, මේක ලෝකයේ මෙවැනි කොවිඩ් අර්බුදයක් යටතේ ඇති වෙන අසාමාන්‍ය මිල ඉහළ යාමක් නොවෙයි කියලා. එදා එහෙම කිසිම අර්බුදයක් තිබුණේ නැහැ. යුද්ධයක් තිබුණේ නැහැ. ඒ කාලයේ සියයට 25කින් බඩු මිල වැඩි වෙනවා. එතකොට ඒ සඳහා මේ සභාව යොමු කළ අවධානය මොකක්ද? 2014 දී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට රට භාර දෙනකොට රජයේ ආදායම අඩු වෙලා තිබුණා. ඇත්ත. එතකොට රජයේ ආදායම සියයට 11.6යි; වියදම සියයට 17.3යි. නමුත් අය වැය පරතරය, Budget deficit එක සියයට 5.7යි. බඩු මිල වැඩි වීමේ වේගය සියයට 3.2යි.

2019දී අපි රට භාර ගන්න කොට රජයේ ආදායම සියයට 12.6යි; වියදම සියයට 22.6යි; අය වැය පරතරය සියයට 9.6යි; බඩු මිල වැඩිවීමේ වේගය සියයට 3.4යි. පාර්ලිමේන්තුවේදී අය

***පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වැය ගැන කථා කරනවා නම්, අපි කථා කළ යුත්තේ කුමක්ද? රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම, අය වැය පරතරය, එම පරතරය පියවන ආකාරය, ඒකෙන් ඇති වන බලපෑම ගැන නොවෙයිද අපි කථා කරන්න ඕනෑ? අපේ හිතේ තිබෙන දෙයක් හෝ කවුරු හෝ ලියා දෙන දෙයක් අපිට කියන්න පුළුවන්. නමුත් විවිධ ආකල්ප, ධර්මතා තිබෙන ජන වර්ගවල ලක්ෂ ගණන් ජනයාගේ ඡන්දයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් 225දෙනෙකු තෝරා එවන්නේ රාජ්‍ය මූල්‍ය හැසිරවීම පිළිබඳ බුද්ධිමය දායකත්වයක් ඔබට ලබා දිය හැකිය කියන විශ්වාසය ඇතිවයි. අපි එවැනි බුද්ධිමය දායකත්වයක් ලබා දුන්නාද? අපි රටේ ආදායම වැඩි කරන්නේ කොහොමද? තමුන්නාන්සේලාගේ රජය යටතේ ආදායම වැඩි කිරීම සඳහා බදු දඩයමක් කළා. ඒ බදු දඩයම යටතේ අසාමාන්‍ය ලෙස බදු බර වැඩිවෙලා ජනතාවට බදු ගෙවා ගන්න බැරි වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දහයක් ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් දෙනවා.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් පත්වෙනකොට මේ බදු පීඩනය නිසා කඩ වැහෙනවා, සාප්පු වැහෙනවා, ව්‍යාපාර කරගෙන යන්න බැහැ. මේ තත්ත්වය තුළ තමයි, එතුමා ජනතාව මත පැටවිලා තිබුණු විශාල බර අඩු කරන්න සියයට 15ට තිබුණු VAT එක සියයට 5ට අඩු කළේ. ජාතිය ගොඩනැඟීමේ බද්ද අපි සම්පූර්ණයෙන් අහෝසි කළා. උපයන විට ගෙවීමේ බද්ද සම්පූර්ණයෙන් නැති කළා. එසේ බදු අඩු කරලා සියයට 28ට වාගේ පැවතුණ ණය පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් කළා. මෙසේ කරනකොට තමුන්නාන්සේලා දිගින් දිගටම කිව්වේ මේ බදු අඩු කිරීම නිසා රාජ්‍ය අයභාරයට රුපියල් බිලියන 600ක පාඩුවක් කළාය කියලා. ඒ පාඩුවත් එක්ක යන්න බැරි නිසා තමයි තමුන්නාන්සේලාගේ කාලයේ තරම් බදු පීඩනයක් ඇති වන්නේ නැති ලෙස මුදල් ඇමතිතුමා අලුතින් බදු වර්ග කිහිපයක් හඳුන්වා දී තිබෙන්නේ. මූලික බදු කිසිවක් වෙනස් කරන්නේ නැහැ කියලා දීලා තිබෙන ස්ථාවරය එලෙසින්ම තබාගෙන යනවා. සියයට 8 VAT එක එලෙසින්ම පවත්වාගෙන යන අතර තමයි, ඉහළ ආදායම් ලබන; රුපියල් මිලියන 2,000ට වඩා තක්සේරු ආදායමක් තිබෙන අයගෙන් සියයට 25ක් ගන්නේ. ඒක මහ ජනතාවගෙන් ද ගන්නේ? කොවිඩ්-19 වසංගතය යටතේත්, ඒක ගන්නේ රුපියල් මිලියන 2,000කට වැඩියෙන් ආදායම් තිබෙන සමාගම්වලින්. ඒ අනුව සියයට 25ක ආදායම් බදු අධිභාරයක් ගන්නවා. මොකක්ද, එහි තිබෙන වැරැද්ද? තමුන්නාන්සේලා එහෙම නොවෙයි නේ කළේ. එදා රවි කරුණානායක හිටපු මුදල් ඇමතිවරයා, රටේ පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයෝ එදා මහින්ද රාජපක්ෂ යුගයේ අසාමාන්‍ය ලෙස ලාභ ලැබුවා කියලා Super Gain Tax කියලා එක පාරට රුපියල් බිලියන 50ක් කොල්ල කෑවා. එහෙම එකක් නොවෙයි, මේ කරලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමා, බද්ද සියයට දෙකහමාරද, තුනද කියලා කියන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
යෝජනා වෙලා තිබුණේ තුනයි. ඒ පිළිබඳ නිවැරදි පැහැදිලි කිරීමක් කරාවි. එතැන කරන්නේ කොහොමද? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගෙන ඉන්න.

අවුරුදු 25ක් තිස්සේ ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳලා නැහැ කියලා, තමුන්නාන්සේලාගේ අවුරුදු පහක කාලයේත් ඒක විසඳුවේ නැහැ. ගුරුවරු ඒ වෙනුවෙන් පාරට ඇවිල්ලා අහිංසක දරුවන්ට උගන්වන එක නතර කරලා තිබෙනකොට, ඒ සඳහා රුපියල් බිලියන 30ක් වෙන් කරනකොට කොහෙන්ද ඒ මුදල ගන්නේ? දැන් කවුරු හෝ 'රජයේ වියදම වැඩි කරපියව්' කියනකොට ඒකේ අනික් පැත්තේ තිබෙන බෝඩ් එක තමයි කාගෙන් හෝ ගන්න ප්‍රමාණය වැඩි කරපන් කියන එක. වෙන කොහෙන්ද ගන්නේ? රටේ ජනතාවගෙන් බදු ගන්නවාද? නැත්නම්, දෙවැනි ක්‍රමය ලෙස තිබෙන්නේ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන යනාදියේ ලාභ, ලාභාංශ වැඩි කිරීම, බදු කුලී වැඩි කිරීම, පොලී ආදායම වැඩි කර ගැනීමයි. එහෙම කරන්න පුළුවන්ද? ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභ ලබන්න නම්, කරන්න ඕනෑ මොකක්ද? ඛනිජ තෙල් මිල වැඩි කරන්න ඕනෑ. වෙළෙඳ පොළේ තිබෙන මිලට අනුව ඛනිජ තෙල් මිල හදන්න ඕනෑ. විදුලිබලය වැඩි කරන්න නම්, විදුලි බලයට තිබෙන නිෂ්පාදන වියදම අනුව එය වැඩි කරන්න ඕනෑ. එහෙම කරන්නත් බැරි නම්, බදු අය කරනකොට බදු අය කරනවාටත් විරුද්ධ වෙනවා නම් කරන්න ඕනෑ මොකක්ද? එක සැරයක් බණිනවා බදු නැති කර ගත්තාය, බදු අඩු කර ගත්තාය කියලා. බදු පැනෙව්වාම බණිනවා බදු පැනෙව්වාය කියලා. මෙහෙම නම් පාර්ලිමේන්තුව හැසිරෙන්නේ, රටේ මූලික ප්‍රශ්නයට පාර්ලිමේන්තුව දෙන විසඳුම මොකක්ද? ඒක තමයි එදා මූල්‍ය කළමනාකාරණයේ තිබුණු වැරැද්ද. දේශපාලන වශයෙන් විවිධ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා අපිටත් කියන්න පුළුවන් රුපියල් දස දහසකින් පඩි වැඩි කරනවාය කියලා. මුදල් ඇමතිතුමාට බොහොම ජනප්‍රිය තීන්දුවක් ගත හැකියි ලබන සතියේ සිට සියලුම රජයේ සේවකයන්ට රුපියල් දස දහසකින් පඩි වැඩි කරනවා කියලා.

එතකොට කාගෙන් හරි ගන්න එපා යැ. මැදමුලනෙන් ගෙනැල්ලා රුපියල් 10,000 දෙනවා නම්, ප්‍රශ්නයක් නැහැ. එහෙම ගේන්න බැහැ. මහ ජනතාවගෙන් ඒ මුදල අය කරගන්න ඕනෑ. රුපියල් 10,000 ගෙවන ප්‍රමාණය වැඩි වෙනකොට, බදු ප්‍රමාණය වැඩි වෙනකොට, අය වැය පරතරය වැඩි වෙනකොට එතැන ඇති වෙනවා, වැටුප් වැඩිවීමත් සමඟ වැටුප් දහර උද්ධමනයක්. වැටුප වැඩි කරන්න කියලා උද්ඝෝෂණ ඇති වෙනවා. මෝඩ ආණ්ඩු විසින් "හිටපියව්" කියලා පඩි වැඩි කරනවා. පඩි වැඩි වුණාම ජනයා අත ගැවසෙන මුදල් ප්‍රමාණය වැඩි වෙනවා. ඒ තුළ සමහර භාණ්ඩවල ඉල්ලුම වැඩි වෙනවා. නමුත් ඉල්ලුම වැඩි වුණාට ඒ හා සාපේක්ෂව නිෂ්පාදනය වැඩි වෙන්නේ නැහැ. උද්ධමනාත්මක පරතරයක් ඇතිවෙලා තව වරක් බඩු මිල වැඩි වෙනවා. බඩු මිල පසු පස වැටුපත්, වැටුප පසු පස බඩු මිලත් එකිනෙක පරයා හඹා යාම කරණකොටගෙන වැටුප් දහර උද්ධමනයක් ඇති වෙනවා. Wage-Price Spiral කියලායි ඒකට කියන්නේ. අපට වෙලා තිබෙන්නේ ඒකයි. අතීතයේ සේවකයකුගේ වැටුප තිබුණේ රුපියල් 100යි. දැන් වැටුප් ඉලක්කම්වලින් වැඩි වෙලා; දහස් ගණන්, ලක්ෂ ගණන් වැටුප් ලැබෙනවා. ඒ හා සමානව බඩු මිලත් වැඩි වෙලා. ඉතින් බඩු මිල පසුපස වැටුපයි, වැටුප පසුපස බඩු මිලයි එනවා. ඒ නිසා කොහොමද ඒක පාලනය කරන්නේ කියන එක ගැන ප්‍රබුද්ධ සංවාදයක් මේ ගරු සභාවේ ඇති වෙන්න ඕනෑ නේද? එහෙම වෙනවාද? නැහැ. තමුන්නාන්සේලා රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වැඩිපුර තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
හොඳයි.

මුදල් වැටුප වැඩි වුණා. නමුත් මුදල් වැටුපෙන් මිලදී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය -මූර්ත වැටුප- වැඩි වුණේ නැහැ. නිකම් වැටුප් වැඩිවීමක් විතරයි වුණේ. ඒ නිසා මම යෝජනාවක් කරන්න කැමැතියි. කාගේ ආණ්ඩුවක් ආවත්, මහ පොළොවේ පවතින මේ යථාර්ථයට මුහුණ දෙන්න සිදු වන නිසා නිසා ගරු අග්‍රාමාත්‍යතුමනි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක ආදායම හා වියදම, අය වැය පරතරය පවත්වාගෙන යාම පිළිබඳ පාර්ලිමේන්තුවේ ගත යුතු ප්‍රතිපත්තිය කුමක්ද කියන එක පිළිබඳ සාකච්ඡා කරන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න ඕනෑ කියා මා හිතනවා. මේ පාර්ලිමේන්තුවට මුදල් පිළිබඳ බලය භාරදීලා තිබෙන නිසා ඒක කරන්න ඕනෑ. එහෙම නැත්නම් වෙන්නේ බොරු කියලා ණය ගන්න එකයි.

ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට එනකොට තිබුණු ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි. ඒක, ඒ වනතුරු තිබුණු ණය ප්‍රමාණය. අපි සප්ත මහා අර්බුදයකට ඒ කාලයේ මුහුණ දුන්නා. සුනාමියෙන් විනාශ වෙච්ච රට ගොඩ ගන්න වුණා; මේ රට කඩන්නේ නැතුව, බෙදන්නේ නැතුව ප්‍රභාකරන්ගෙන් රට බේරාගන්න තිබුණා; මොකද, අවුරුදු 30ක් තිස්සේ නිම වෙච්ච නැති යුද්ධයක් තිබුණා; ලෝක බනිජ තෙල් අර්බුදය තිබුණා; ලෝක ආහාර අර්බුදය තිබුණා; ලෝක මූල්‍ය අර්බුදය තිබුණා; රටේ ණය අර්බුදය තිබුණා; සංවර්ධනය නොවී රටේ ආර්ථිකය එක තැන ලැග තිබෙන අර්බුදය තිබුණා. මේ සියලු අර්බුද යටතේත් මුළු ණය ප්‍රමාණය කීයද? ට්‍රිලියන 7යි. මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාරගන්නකොට ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි. එතුමා රට භාරදෙනකොට ණය ප්‍රමාණය ට්‍රිලියන 7යි. අවුරුදු 10කට ණය ප්‍රමාණය වැඩි වුණේ ට්‍රිලියන 5යි. නමුත් තමුන්නාන්සේලාගේ කාලයේ යුද්ධයක් තිබුණා ද? නැහැ. තෙල් මිලත් අඩු වුණා. ඊළඟට, වසංගතයක් තිබුණාද? ඒ මොකුත් නැහැ. නමුත්, ඒ කාලයේ තමුන්නාන්සේලා ගත්ත ණය ප්‍රමාණය කීයද? අපට රට භාරදෙනකොට තිබුණු ණය ප්‍රමාණය ට්‍රිලියන 13යි. තමුන්නාන්සේලා අවුරුදු 5කට ගත්තා, ට්‍රිලියන 6ක්. මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු 10කට වැඩිපුර ගත්තේ ට්‍රිලියන 5යි. තමුන්නාන්සේලා අවුරුදු 6ට කිසිවක් කරන්නේ නැතුව වැඩිපුර ගත්තා, ට්‍රිලියන 6ක්. එහෙම අර ගත්තා විතරක් නොවෙයි, අපි හදලා තිබුණු හම්බන්තොට වරාය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4කට වික්කා. දැන් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, "අපට Sovereign Bonds issue කරන්න බැහැ ලු." කොහේ issue කරන්නද? ලංකා ඉතිහාසයේ නරකම විධියට ඇමෙරිකානු ඩොලර් බිලියන 13ක Sovereign Bonds issue කරලා තිබෙනවා. මතක තියා ගන්න, ඒවා තමයි ගෙවන්න තිබෙන්නේ. මහින්ද මහත්මයාගේ කාලයේ නිකුත් කරපු Sovereign Bonds එකක්වත් අද වන කොට ගෙවන්න නැහැ. *[බාධා කිරීම්]* ඉන්න, ඉන්න. 2029 වෙනතුරු- *[බාධා කිරීම්]* මේ තිබෙන්නේ ඉලක්කම් ටික. අසත්‍ය කියන්න එපා. රට කාලා- *[බාධා කිරීම්]* එතකොට කොහේද හිටියේ? රට කනකොට කොහේද හිටියේ? අවුරුදු පහක් දිගින් දිගටම ඒ දේ සිද්ධ වුණා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, හෘදය සාක්ෂියට එකඟව හිතලා බලන්න, 2015 වර්ෂයට වඩා 2016 හොඳ වුණා, 2016ට වඩා 2017 හොඳ වුණා, 2017ට වඩා 2018 හොඳ වුණා, 2018ට වඩා 2019 හොඳ වුණා කියලා ආර්ථික විශේෂඥයෙක් විධියට තමුන්නාන්සේට නැඟිටලා කියන්න පුළුවන්ද? තමුන්නාන්සේට එහෙම කියන්න බැහැ නේද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා? තමුන්නාන්සේට දේශපාලන කථාවක් කියන්න පුළුවන්. කවුරු ආණ්ඩු කළත් 2029 වෙනතුරු අපි - ජාතිය, රට- ණය වාරික හා පොලී ගෙවීම සඳහා වෙන් කරන්න ඕනෑ, ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5කට වැඩි ප්‍රමාණයක්. මේක තමයි ඇති කරලා තිබෙන අර්බුදය. එතකොට මේ සඳහා ඩොලර් එන්නේ කොහෙන්ද? 1977දී-

මේ තිබෙන විදේශ විනිමය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා අපට විකල්ප තුනයි තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ කාලයේ අපනයන වැඩි කරන්න තිබුණා. එදා අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 11.1යි. අපි භාරදෙනකොට අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 11.9යි.

ඒ අවුරුදු පහේ අපනයන වැඩි කරන්න තිබුණා නේ. ඔබතුමන්ලා ඒ ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන අපනයන වැඩි කරන්න මොකක්ද කළේ? අපනයන වැඩි කරන්න නම් අපනයන භාණ්ඩ විවිධාංගීකරණයක් කරන්න ඕනෑ; වෙළෙඳ පොළ විවිධාංගීකරණයක් කරන්න ඕනෑ; අපනයන නවීකරණයක් කරන්න ඕනෑ. මේ අය වැය ලේඛනයෙන් එවැනි අපනයන දිරි ගැන්වීම සඳහා ගම් මට්ටමින්, බිම් මට්ටමින් අපනයන නිෂ්පාදන ගම්මාන වැඩ පිළිවෙළවල් ඇති කරලා, මේ රටේ ජනතාව හා මේ රටේ සම්පත් පිළිබඳ විශ්වාසය තබා, පරාධීන නොවන ජාතික ආර්ථිකයක් අලුතින් ගොඩ නඟා ගැනීම සඳහා වන සැලැස්මකට අනුවයි ගමන් කරන්නේ. ඒ නිසා අපි දෙන්න පුළුවන් උපරිම සහන දීම සඳහා මැදිහත් වෙනවා. තමුන්නාන්සේලා සහල් මිල අඩු කළේ 1977 සිට දිගටම සහල් ආනයනය කරලායි. පසුගිය රජය යටතේ එක අවුරුද්දකට සහල් මෙට්‍රික් ටොන් 745,000ක් ආනයනය කළා. ඇමෙරිකානු ඩොලර් මිලියන 600කට වඩා වැය කරලා සහල් ආනයනය කළා.

අපි සහල් ආනයනය නතර කළා. ඒ නිසා මිල වැඩි වුණා. නමුත්, අපි මේ මුළු කාලය පුරාවටම නාඩු සහල් රුපියල් 98ට සතොස මඟින් අළෙවි කරනවා. අපි මුං ඇට ආනයනය නතර කළා. මුං ඇට ආනයනය නතර කළාට පස්සේ මුං ඇට නිෂ්පාදනය වැඩි වුණා. අපි ගොවියාට මුං ඇට කිලෝවකට රුපියල් 450ක් දීලා මේ රටේ ගොවියාට අතට එන මුදල වැඩි කර තිබෙනවා. රුපියල් 450ට ගන්න මුං ඇට ලබන සතියේ ඉඳලා රුපියල් 225කට ලංකාව පුරාම තිබෙන සතොස අළෙවි සැල්වලින් පොදු ජනතාව වෙත බෙදා දීමේ කටයුත්ත කරන්නය කියලා ජනාධිපතිතුමා නියම කරලා තිබෙනවා.

මේ තිබෙන අමාරු තත්ත්වය පිළිබඳව සලකා බලා අපි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව කටයුතු කළ යුතු වනවා. මේ රටේ විදේශ විනිමය අර්බුදය විසඳා ගැනීම සඳහාත්, මේ වැටුණු රට, පස්සට ගිය ආර්ථිකය ගොඩ නැඟීම සඳහාත් අපට අලුතින් හිතලා, එකතුවෙලා වැඩ කරන්න ශක්තිය ලැබේවායි කියා පතමින් මගේ කථාව අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

ගෝලීය කොරෝනා වයිරස් වසංගතයෙන් සිදුවන ආර්ථික හානිය කෙතරම්දැයි නිශ්චිතව පැවසීමට ක්‍රමයක් අපට නැතත්, එය ගෝලීය ආර්ථිකයට දැඩි සෘණාත්මක බලපෑම් සිදු කර ඇති බවට ආර්ථික විද්‍යාඥයින් අතර පුළුල් එකඟතාවක් පවතිනවා. පූර්ව ඇස්තමේන්තු අනුව, වයිරසය ගෝලීය වසංගතයක් බවට පත් වුවහොත්, බොහෝ ප්‍රධාන ආර්ථිකයන් 2020 වසර තුළ ඔවුන්ගේ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) අවම වශයෙන් සියයට 2.9ක් අහිමි වනු ඇති බවට ප්‍රක්ෂේපණය කෙරුණා. ගෝලීය දළ දේශීය නිෂ්පාදිතය 2019දී එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 87.55ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණා. එයින් අදහස් කරන්නේ, ආර්ථික වර්ධනය සියයට 4.5කින් පහත වැටුණොත් ලෝක ආර්ථිකයට ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 3.94ක ආර්ථික නිමැවුමක් අහිමි වනවා කියන එකයි.

වයිරසය පැතිරීම මැඩපැවැත්වීම සඳහා ලොව පුරා ආණ්ඩු නව අගුලු දැමීමේ ක්‍රියාමාර්ග සමඟ අරගළ කරන අතර, එහි ව්‍යාප්තිය ජාතික ආර්ථිකයන්ට සහ ව්‍යාපාර පිරිවැයට සිදු වූ හානිය ගණන් කරමින් සිටිනවා. නව එන්නත් නිපදවීම තිබියදීත්, බොහෝ අය තවමත් කල්පනා කරන්නේ ආර්ථිකය කෙසේ ප්‍රකෘතිය කරා ළඟා වෙයිද යන්න පිළිබඳ නිශ්චිත අදහසක් නැහැ.

ඊළඟට, මෙතෙක් වයිරසයේ ආර්ථික බලපෑම ගැන අපි සලකා බලමු.

**ගෝලීය කොටස් වෙළෙඳ පොළට ඇති වූ බලපෑම.**

වසංගතයෙන් සමාගම්වල කොටස් මිලදී ගැනීම සහ විකිණීම සිදු කෙරෙන ගෝලීය කොටස් වෙළෙඳ පොළවලට විශාල බලපෑමක් සිදු වුණා. එම තත්ත්වය විශ්‍රාම වැටුප් හෝ තනි ඉතුරුම් ගිණුම්වල වටිනාකමට බලපානවා. කොවිඩ් රෝගීන් සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ FTSE, Dow Jones Industrial Average සහ Nikkei යන සියල්ලම විශාල පහත වැටීමක් දක්නට ලැබුණා. ඊට ප්‍රතිචාර වශයෙන්, එක්සත් රාජධානිය ඇතුළු බොහෝ රටවල මහ බැංකු පොලී අනුපාත අඩු කළා. එය න්‍යායාත්මකව, ණය ගැනීම ලාභදායී කර ආර්ථිකය නංවාලීම සඳහා වියදම් දිරිමත් කිරීමේ සැලසුමක්.

මෙම වසරේ ජනවාරි මාසයේදී සමහර වෙළෙඳ පොළවල් යථා තත්ත්වයට පත් වූ නමුත්, තවදුරටත් අගුලු දැමීමට ඇති ඉඩකඩ සහ එන්නත් වැඩසටහන් ප්‍රමාදවීම මෙම වසරේ වෙළෙඳ පොළ අස්ථාවරත්වයක් ඇති කළ හැකි බව විශ්ලේෂකයින් පෙන්වා දෙනවා. විරැකියාව ඉහළ යාම ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ඔවුන්ගේ රැකියා අහිමි වීම හෝ ඔවුන්ගේ ආදායම අඩුවීමක් සිදුව තිබෙනවා. ලොව පුරා ප්‍රධාන ආර්ථිකයන්හි විරැකියා අනුපාත ඉහළ ගොස් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අනුව, ඇමෙරිකා එක්සත් ජනපදයේ රැකියා ප්‍රසාරණයේ දශකයක අවසානයක් සනිටුහන් කරමින්, රැකියා විරහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතයේ වාර්ෂික එකතුව සියයට 8.9කට ළඟා වුණා.

සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාරය වැනි ආර්ථිකයේ කොටස් සියල්ලම පාහේ ඇනහිට ඇති බැවින් මිලියන සංඛ්‍යාත කම්කරුවන් රජයේ සහාය ලබන යෝජනා ක්‍රමවලට යොදවා තිබෙනවා. බොහෝ රටවල නව රැකියා අවස්ථා සංඛ්‍යාව තවමත් ඉතා අඩුයි. ඕස්ට්‍රේලියාවේ රැකියා පුරප්පාඩු 2019 පැවති මට්ටමටම නැවත පැමිණ තිබෙනවා. ප්‍රංශය, ස්පාඤ්ඤය, එක්සත් රාජධානිය සහ තවත් රටවල් කිහිපයක විරැකියා අනුපාතය බෙහෙවින් ඉහළයි. බොහෝ රටවල් දැන් ඉන්නේ ආර්ථික අවපාතයක.

ආර්ථිකය වර්ධනය වන්නේ නම්, එයින් අදහස් කරන්නේ වැඩි ධනයක් සහ නව රැකියා වැඩිවීමක් සිදු වන බවයි. එය මනිනු ලබන්නේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශත වෙනස්වීම හෝ නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවාවල වටිනාකම, සාමාන්‍යයෙන් මාස තුනක් හෝ වසරක් තුළදී බැලීමෙනි.

අන්තර්ජාතික මූල්‍ය අරමුදල ඇස්තමේන්තු කරන්නේ ගෝලීය ආර්ථිකය 2020දී සියයට 4.4කින් හැකිළී ගිය බවයි. මෙය එම සංවිධානය විස්තර කළේ 1930 ගණන්වල මහා අවපාතයෙන් පසු ඇති වූ නරකම පරිහානිය හැටියටයි. 2020දී වර්ධනයක් පෙන්නුම් කළ එකම ප්‍රධාන ආර්ථිකය චීනයයි. චීනය සියයට 2.3ක වර්ධනයක් වාර්තා කළා. කෙසේ වෙතත්, අන්තර්ජාතික මූල්‍ය අරමුදල පුරෝකථනය කරන්නේ 2021දී ගෝලීය වර්ධනය සියයට 5.2ක් වනු ඇති බවයි. එය මූලික වශයෙන් ඉන්දියාව සහ චීනය වැනි රටවල් විසින් මෙහෙයවනු ලබන අතර, එම රටවල් දෙක පිළිවෙළින් සියයට 8.8 සහ සියයට 8.2කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එක්සත් රාජධානිය හෝ ඉතාලිය වැනි විශාල සේවා මත රඳා පවතින, වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ආර්ථිකයන්හි ප්‍රකෘතිය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරෙනවා.

**ගුවන් ගමන් ඇනහිටීම.**

ගුවන් සමාගම් ගුවන් ගමන් කපා හැරීම සහ ගනුදෙනුකරුවන් ව්‍යාපාරික සංචාර සහ නිවාඩු අවලංගු කිරීම හේතුවෙන් සංචාරක කර්මාන්තයට දැඩි ලෙස හානි සිදුවී තිබෙනවා. මෑත මාසවලදී පමණක් සොයා ගන්නා ලද වයිරසයේ නව ප්‍රභේද දැඩි සංචාරක සීමා හඳුන්වාදීමට බොහෝ රටවලට බලපෑම් කර තිබෙනවා. ගුවන් කර්මාන්තය ප්‍රකෘතිමත් වීමට තවමත් බොහෝ කලක් ගත වන්නට පුළුවන් බව විශේෂඥයන්ගේ අදහසයි. ලොව පුරා ආගන්තුක සත්කාර අංශයේ දොරටු වසා ඇත. මිලියන ගණනක් රැකියා අහිමිවීම සහ බොහෝ සමාගම් බංකොලොත්වීමත් සමඟ සත්කාරක අංශයට දැඩි ලෙස පහර වැදී තිබෙනවා.

ලොව පුරා මිලියන 35කට අධික හෝටල් සහ ගිමන්හල් ලැයිස්තුගත කිරීම් ආවරණය කරන කර්මාන්තයේ ප්‍රමුඛ බුද්ධි සමාගමක් වන Transparent වෙතින් ලබාදුන් දත්තවලට අනුව, සියලුම ඉහළම සංචාරක ගමනාන්තයන්හි කාමර වෙන් කිරීම්වල අඩුවීමක් වාර්තා වනවා.

සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම 2025 වර්ෂයේ විතර වේවි. 2020 දී සංචාරක කර්මාන්තයට ඩොලර් බිලියන ගණනක් අහිමි වී ඇති අතර, 2021 සඳහා පුරෝකථනය වඩා හොඳ වුවත්, බොහෝ විශ්ලේෂකයින් විශ්වාස කරන්නේ ජාත්‍යන්තර සංචාර සහ සංචාරක ව්‍යාපාරය 2025 පමණ වන තෙක් සාමාන්‍ය පූර්ව වසංගත මට්ටමට නොපැමිණෙන බවයි.

**ජයග්‍රාහකයින් අතර ඖෂධ සමාගම්**

ලොව පුරා ආණ්ඩු කොවිඩ් - 19 එන්නතක් සහ ප්‍රතිකාර විකල්ප සඳහා ඩොලර් බිලියන ගණනක් ලබාදීමට පොරොන්දු වුණා. එන්නත් සංවර්ධනයට සම්බන්ධ සමහර ඖෂධ සමාගම්වල කොටස් වාර්තාගත ලෙස ඉහළ ගොස් තිබෙනවා. Moderna, Novavax සහ AstraZeneca සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබෙනවා. නමුත්, Pfizer හි කොටස් මිල පහත වැටී තිබෙනවා.

තෙල් සහ ගෑස් මිල තව තවත් ඉහළට බලශක්ති තොරතුරු පරිපාලනය (EIA) නම් වූ ආයතනය යාවත්කාලීන කළ පුරෝකථනයට අනුව, ඔක්තෝබර් මාසයේදී බොරතෙල් බැරලයක මිල ඩොලර් 84ට ළඟාවීමෙන් පසු, බ්‍රෙන්ට් බොරතෙල් ස්ථාන මිල 2021 අවසානය වන විටත් වර්තමාන මට්ටමට ආසන්නව පවතිනු ඇත. එම ඒජන්සිය පසුගිය අඟහරුවාදා ප්‍රකාශයට පත් කරන ලද එහි නවතම කෙටි කාලීන බලශක්ති වාර්තාවට අනුව, වසරේ සිව්වන කාර්තුවේදී බ්‍රෙන්ට් බොරතෙල් ස්ථාන මිල සාමාන්‍ය ඩොලර් 82ක් වනු ඇත. බොරතෙල් මිල පාලනය සඳහා සැපයුම වැඩි කරන ලෙසට ලෝකයේ බලවත්ම රට වන ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ජෝ බයිඩන් කළ ඉල්ලීම ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය හෙවත් ඔපෙක් සංවිධානය ප්‍රතික්ෂේප කොට තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 29ක කාලයක් තිබෙනවා.

[மு.ப. 11.24]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எனக்கு ஒதுக்கப்பட்ட நேரம் 30 நிமிடங்கள்! அதிலும், ஒரு நிமிடத்தைக் குறைத்திருப்பதானது மனவருத்தத்தை அளிக்கின்றது. நேற்றைய தினம் இந்த உயரிய சபையிலே 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டம் கௌரவ நிதி அமைச்சரால் சமர்ப்பிக்கப்பட்டது. இந்த வரவு செலவுத் திட்டத்தைப் பற்றி நாங்கள் நேரடியாகவும் சுருக்கமாகவும் சொல்லக்கூடியது என்னவென்றால், "The operation was a success, but the patient died" என்றுதான். அதாவது, இந்த வரவு செலவுத் திட்டத்தினூடான சத்திரசிகிச்சை வெற்றி பெற்றிருக்கின்றது. ஆனால், ஆள் தப்பக்கூடிய வாய்ப்புகள் இல்லை. ஏனென்றால், இந்த வரவு செலவுத் திட்டத்தினூடாக முன்மொழியப்பட்டிருக்கின்ற திட்டங்கள் அல்லது அறிவிக்கப் பட்டிருக்கின்ற செலவினங்கள் தொடர்பில் பல்வேறுபட்ட கேள்விகள் எழுந்துள்ளன. அதாவது, இதற்கான வருமான வழிகள் என்ன? இந்த அரசாங்கம் அதிகளவு கடனையும் அதற்கான வட்டியையும் செலுத்தவேண்டியிருக்கிறது. இவ்வாறு, கடனையும் அதன் வட்டியையும் செலுத்த வேண்டியுள்ள அரசாங்கத்தால், எதிர்வருகின்ற 2022ஆம் ஆண்டிலே எவ்வாறு அபிவிருத்திப் பணிகளைச் செம்மையாகச் செய்ய முடியும்? என்பது போன்ற கேள்விகள் எழுந்துள்ளன.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

குறிப்பாக, 80 ஆண்டுகளுக்கு முன்னர் இலங்கையின் தலா வருமானம் - தனிநபர் வருமானம் சிங்கப்பூர், யப்பான் போன்ற நாடுகளைவிட உயர்ந்த நிலையிலே இருந்தது. ஆனால், இன்று அது எவ்வளவோதூரம் கீழ்நிலைக்கு வந்திருக்கிறது. அதேவேளை சிங்கப்பூர், யப்பான் போன்ற நாடுகள் எவ்வளவோதூரம் வளர்ந்திருக்கின்றன. இதற்குக் காரணம், அந்த நாடுகளிலே வாழுகின்ற மக்களுக்கிடையே இருந்த ஒற்றுமை உணர்வும் அங்கு கட்டிவளர்க்கப்பட்ட இன சௌஜன்யமும்தான். ஆனால், இலங்கையிலே 70 ஆண்டுகளுக்குமேல் யுத்தமும் இனவாதமும் கைகோர்த்திருந்த காரணத்தால், சிறந்த முறையில் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி, இன ஒற்றுமையோடு இந்த நாட்டைக் கட்டிவளர்க்கக்கூடிய தலைவர்கள் உருவாக்கப்படவில்லை. இதனை நாங்கள் இந்த நாட்டின் பெரும் துர்ப்பாக்கியமாகவே பார்க்க வேண்டும். இனியும் அதற்கான சந்தர்ப்பத்தை இந்த நாடு இழக்கப்போகிறதா? அல்லது சரி செய்யப்போகிறதா? என்பதைக் காலம்தான் தீர்மானிக்க வேண்டும். இப்பொழுதுகூட, காலம் கனிந்திருக்கிறது. நீங்கள் இந்த நாட்டிலே இருக்கின்ற தமிழ்த் தேசிய இனத்தைச் சிங்களத் தேசிய இனத்தோடு இணைத்து, இந்த நாட்டிலே தமிழ் பேசுகின்ற மக்களுக்குரிய உரித்துக்களை வழங்கி, அவர்களையும் அரவணைத்துச் சென்றால் மட்டுமே இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டிவளர்க்க முடியும் என்பதை மறந்துவிடக்கூடாது.

இன்று உலகத்தில் மிகப் பலம்வாய்ந்த ஒரு diasporaஆக தமிழ் diaspora இருக்கின்றது. அவர்களிடம் நிதிப் பலம் இருக்கின்றது; இங்கு முதலீடு செய்வதற்கான வாய்ப்புகள் அதிகமாக இருக்கின்றன. இன்று இங்கு பேசிய கௌரவ ஹர்ஷ த சில்வா அவர்கள் சொன்னார், "அல்லிராஜா அவர்கள் பயங்கரவாதத்தினூடான நிதியைத்தான் இந்த நாட்டுக்குக் கொண்டுவருகிறார்" என்று. எதிர்க்கட்சியில் இருக்கின்ற கௌரவ ஹர்ஷ த சில்வா போன்ற படித்தவர்கள் இவ்வாறான தவறான வார்த்தைகளைப் பிரயோகிப்பதைத் தவிர்த்துக் கொள்வது நல்லது! அல்லிராஜா என்பவர் பெரும் தொழில் அதிபர்களில் ஒருவர்; தொலைத்தொடர்புச் சேவைகளை வழங்கக்கூடிய 'லைக்கா மொபைல்' என்ற நிறுவனத்தை உலகில் பல நாடுகளில் வைத்திருப்பவர். பல்வேறுபட்ட நிதியீட்டல் முறைகளுக்கூடாக வருமான வழிகளை ஏற்படுத்திக்கொண்டவர். அந்தவகையில், இலங்கையிலும் பல முதலீடுகளைச் செய்திருக்கிறார். இலங்கையில் இருக்கின்ற மக்களுக்கு இனம், மொழி பேதம் பார்க்காமல் வீடுகளைக் கட்டிக் கொடுத்திருக்கிறார்; கல்விக்காக உதவி செய்திருக்கிறார். கொரோனா பெருந்தொற்றுக் காலத்தில் நிவாரணப் பணிகளை ஆற்றியிருக்கிறார். வெள்ளப்பெருக்கு ஏற்பட்டிருக்கின்ற இந்தக் காலத்தில்கூட, அவர் உதவிகளைச் செய்திருக்கிறார். அல்லிராஜா ஒரு தமிழன் என்ற காரணத்துக்காக, கலாநிதிப் பட்டம் பெற்ற ஹர்ஷ த சில்வா போன்றவர்கள் இவ்வாறான தவறான வார்த்தைகளை இந்தச் சபையிலே பிரயோகிப்பதை நான் மிகவும் வன்மையாகக் கண்டிக்கின்றேன். தயவுசெய்து, அவ்வாறான வார்த்தைகளைப் பிரயோகிப்பதைத் தவிர்த்துக் கொள்ளுங்கள்!

அல்லிராஜா மட்டுமல்ல, ஐ.பி.சி. பாஸ்கரன்கூட உலகளாவிய ரீதியில் 'லிபரா' என்ற ஒரு தொலைபேசி வலையமைப்பை ஏற்படுத்தி, அதனூடாக உழைத்த வருமானத்தை இந்த மண்ணிலே முதலீடு செய்திருக்கிறார். இவர்கள் வடக்கு, கிழக்கிலே பல முதலீடுகளைச் செய்து, தமிழ் முதலீட்டாளர்களாக மாறியிருக்கிறார்கள். DAN TVஇனுடைய உரிமையாளராக இருக்கின்ற குகநாதன் அவர்கள்கூட, இன்று இத்தொலைக்காட்சி நிறுவனத்தினூடாக வடக்கு, கிழக்கிலே பலருக்கு வேலைவாய்ப்புகளை வழங்கி, வருமான வழிகளைத் திறந்துவிட்டிருக்கிறார். ஆகையால், தமிழர்கள் முதலீடு செய்வதைத் தடுக்காதீர்கள்! அவர்களுடைய முதலீட்டை நீங்கள் பயங்கரவாதமாகக் காட்டமுனைவது, ஓர் ஆரோக்கியமான விடயமாக எனக்குத் தென்படவில்லை. இவர்களைவிட இன்னும் பலர் இந்த நாட்டிலே முதலீடுகளைச் செய்யக் காத்திருக்கிறார்கள்.

கௌரவ பிரதம அமைச்சர் அவர்கள் இந்த சபையிலே இருக்கின்றபோது, நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். மிக முக்கியமாக ஆனையிறவு, குறிஞ்சாத் தீவு உப்பளம் தொடர்பான விவகாரத்தை நான் உங்கள் கவனத்திற்கும் கொண்டுவருகின்றேன். அந்தக் குறிஞ்சாத்தீவு உப்பளத்தைத் தங்களிடம் தந்தால் அதிலே முதலீடு செய்து வடக்கு, கிழக்கிலே குறிப்பாக யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சிப் பிரதேசங்களை அண்டியிருக்கின்ற மக்களுக் கான வேலைவாய்புக்களை உருவாக்கிக் கொடுப்பதாகக் கூறி யாழ்ப்பாண வணிகர் கழகத்தினர் விண்ணப்பங்களைச் செய்திருந்தார்கள். ஆனால், கிளிநொச்சி மாவட்ட அரசாங்க அதிபர் ஊடாகவும், பச்சிலைப்பள்ளிப் பிரதேச செயலாளர் ஊடாகவும் அந்த உரிமம் மன்னாரிலே இருக்கின்ற மாதோட்டம் உப்பளத்திற்காக வழங்கப் பட்டிருக்கின்றது. அதன் உரிமையைத் தென்பகுதியைச் சேர்ந்தவர்கள்தான் எடுத்துக்கொள்ள இருக்கிறார்கள். வட பகுதியிலே இருக்கின்ற தமிழர்கள் அதனைக் கேட்கின்றார்கள். ஆனால், அதனைக் கொடுப்பதற்கு எங்களுடைய அதிகாரிகள்தான் தடையாக இருக்கின்றார்களா? அல்லது அரசாங்கத்தினுடைய தென்பகுதி அதிகாரிகள் தடையாக இருக்கின்றார்களா? அல்லது அமைச்சு தடையாக இருக்கின்றதா? கௌரவ பிரதமர் அவர்களே, தயவுசெய்து நீங்கள் இதனைக் கருத்திலே யெடுத்து, யாழ்ப்பாண வணிகர் கழகம் குறிஞ்சாத்தீவு உப்பளத்தினை நடத்துவதற்கு ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுத்தால் அது அப்பகுதி மக்களுக்கு ஒரு வரப்பிரசாதமாகவும், வேலைவாய்ப்புக்கான ஒரு களமாகவும் அமையுமென்பதை நான் இந்த இடத்திலே பதிவு செய்கின்றேன்.

இந்த நாட்டினுடைய அபிவிருத்தியென்பது இன ஒற்றுமையில்தான் தங்கியிருக்கின்றது; இனங்களுக் கிடையிலான ஒரு புரிதலிலேதான் தங்கியிருக்கின்றது. இங்கே 7 தசாப்த காலங்களுக்கும் மேலாகத் தொடர்ந்து போராடிய தமிழினம் தங்களுடைய சுதந்திர உரிமைகளுக்காக இப்பொழுதும் காத்திருக்கின்றது. அவர்களுடைய வரலாறு வித்தியாசமானது. ஆகவே, நீங்கள் அவர்களையும் அரவணைத்துக்கொண்டு செல்லுகின்றபொழுது இந்த நாட்டிலே ஒரு மாற்றத்தைக் கொண்டுவர முடியும்; இந்த நாட்டிலே ஒரு முன்னேற்றத்தை ஏற்படுத்தமுடியும். தொடர்ச்சியாக வரவு செலவுத்திட்டங்கள் துண்டுவிழும் நிலைமையை எதிர்கொள்ளவேண்டிய அவசியம் வராது; சென்மதி நிலுவைப் பற்றாக்குறை ஏற்படாது. இந்த நாடு முன்னேறக்கூடிய வாய்ப்புக்கள் அதிகம் உண்டு. சர்வதேச சமூகம் அதனைத்தான் எதிர்பார்க்கின்றது. சர்வதேச சமூகத்திற்கும் அந்தக் கடமை இருக்கின்றது. அந்தவகையில், வரலாற்றைச் சுருக்கமாக இந்த இடத்திலே நான் குறிப்பிட விரும்புகின்றேன்.

கௌரவ பிரதமர், முன்னாள் ஜனாதிபதி கௌரவ மஹிந்த ராஜபக்ஷஅவர்களும் தற்போது சபையில் இருக்கின்றார். இன்று உலகளாவிய ரீதியில் diaspora ஒரு சக்தியாக இருக்கின்ற காரணத்தினால், அவர்களுடைய நிதியையும்

பெற்று இலங்கையிலே தமிழர்கள் வாழுகின்ற வடக்கு, கிழக்குப் பிரதேசங்களில் அவர்களுடைய உள்ளக சுயநிர்ணய உரிமையை அடிப்படையாக வைத்து, சமஷ்டி அடிப்படையிலான ஒரு தீர்வை இணைந்த இலங்கைக்குள்ளே நீங்கள் முன்வைக்கின்றபொழுது, இந்த நாடு உலகத்தினுடைய மிக முக்கியமான பொருளாதார வல்லரசு நாடாக வளரக்கூடிய வாய்ப்பு அதிகமாக இருக்கின்றது. அதனை நீங்கள் புரிந்துகொண்டால், எதிர்காலம் உங்களுடைய கைகளிலே இருக்கும். அரிய சந்தர்ப்பங்கள் தவறவிடப்பட்டிருக்கின்றன. 2009களுக்குப் பிற்பாடு இன்றைய பிரதமரான உங்களுக்குக்கூட ஒரு வாய்ப்பு இருந்தது. அந்த வாய்ப்பு பின்னைய ஆண்டுகளில் தவறிப்போனது. இப்பொழுதுகூட ஒரு வாய்ப்பு உங்கள் கைகளிலே வந்திருக்கின்றது. 2/3 பெரும்பான்மை அரசியற் பலம் உங்களுடைய கரங்களிலே இருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தைச் சரியாகப் பயன்படுத்துங்கள்! சமாதானத்திற்கான ஒரு கடைசிச் சந்தர்ப் பமாகக்கூட இது இருக்கலாமென்று நான் நினைக்கின்றேன். சமாதானத்தைக் கட்டிவளர்க்கக்கூடிய ஒரு வாய்ப்பின் இறுதிக்கட்டத்திலேதான் இந்த நாடு இருக்கின்றது. ஆகவே, இதனை நீங்கள் துல்லியமாக உங்களுடைய கரங்களிலே எடுத்துக்கொள்ளவேண்டும். அது தொடர்பிலே நான் சில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன்.

இலங்கைத் தீவில் தமிழர்களின் தேசிய இனப்பிரச் சினைக்கான தீர்வு தொடர்பாகவும், தமிழர்களின் வரலாற்று இறைமை சரியான முறையில் மக்களாணைக்கு உள்ளாக்கப் பட்டு ஓர் ஆட்சி முறை உருவாக்கப்படுவது தொடர்பாகவும், பல அடிப்படைகளில் சர்வதேச சமூகத்திற்குரிய பொறுப்புக்கூறல் இருக்கிறது. மீண்டும் ஓர் அரசியலமைப்பு, மேலும் வலுப்படுத்தப்பட்ட ஒற்றையாட்சி, "ஒரு நாடு, ஒரு சட்டம்" என்ற பேச்சுக்கள் எழுந்துள்ள இந்தக் காலகட்டத்தில் இந்த அவையில் சர்வதேசப் பொறுப்புக்கூறல் தொடர்பான விடயங்களை எடுத்துரைப்பதன்மூலம் தொடர்புள்ள வட்டாரங்களுக்கு இந்தக் கருத்துச் சென்றடையும் என்று நான் எதிர்பார்க்கின்றேன். தவிரவும், சர்வதேச பொறுப்புக் கூறலுக்கான - international accountability - அடிப்படைகள் சிலவற்றை ஒரு வரலாற்றுப் பதிவாகவும் இன்று இந்த உயர்ந்த சபையில் நான் பதிவிட விரும்புகின்றேன்.

இந்தத் தீவில் ஆயிரக்கணக்கான ஆண்டுகளாக இரண்டு மொழிவழி நாகரிகங்கள் அல்லது பண்பாடுகள் இருந்துள்ளன. கால ஓட்டத்தில் தனித்துவமான மொழிவழி இராச்சியங்களாக அவை கூர்ப்படைந்து தனித்துவமான இராச்சிய இறைமைகளாகப் பல நூற்றாண்டுகளாக இயங்கி வந்திருக்கின்றன. மறுக்கப்பட முடியாத தொல்லியல் மற்றும் வரலாற்றுச் சான்றுகள் இவற்றுக்கு இருக்கின்றன. இத்தீவின் மீதான பிரித்தானிய காலனித்துவ சக்திகளின் ஆக்கிரமிப்பு பதினாறாம் நூற்றாண்டில் ஆரம்பித்தது. சிங்கள இராசதானியான கோட்டை 1580இல் போர்த்துக்கேய மன்னரின் முடிக்குரிய ஆட்சிக்குக்கீழ் முதன்முதலாகக் கொண்டுவரப்பட்டது. சிங்கள இராச்சியமான கோட்டையில் ஏற்பட்டிருந்த உட்சிக்கல் காரணமாகவே போர்த்துக்கேய ஆட்சி சாத்தியமாகியது. போர்த்துக்கேயர் மூன்றுமுறை முயன்று இறுதியாக 1619இல் யாழ்ப்பாண இராச்சியம் கைப்பற்றப்பட்டபோது, தமிழ் இராச்சியத்தின் இறைமை இறுதியும் அறுதியுமாக ஐரோப்பிய காலனித்துவத்தால் பறிக்கப்பட்டமை நிகழ்ந்தது. இத்தீவை ஒல்லாந்தர்கள் ஆண்டபோது கணிசமாகத் தமிழ் ஆட்சிக்கு இடமளித்தார்கள். வடக்கில் இருந்த 'தேச வழமை' மற்றும் கிழக்கில் இருந்த 'முக்குவ' சட்டங்கள் போன்றவற்றைப் பதினெட்டாம் நூற்றாண்டில் வழமைச் சட்டங்களாகத் தொகுத்துக் குறியிட்டார்கள். இவற்றால் மட்டுமல்ல, வடக்கு, கிழக்கு இணைபிரியாத் தமிழர் தாயகம் என்ற அடிப்படைகளை டச்சுக் காலத்தில் மதித்து நடந்தவர்கள் என்ற வகையிலும் ஒருவித வரலாற்றுப் பொறுப்புடனான கடமை இன்றைய நெதர்லாந்து அரசிற்குத் தமிழர் தொடர்பாக இருக்கவேண்டும் என்பதையும் இங்கு நான் பதிவிட விரும்புகின்றேன்.

அரச இறைமை - State sovereignty - என்பது 1648இல் ஜேர்மனியில் உள்ள வெஸ்ட்பேலியாவில் உருவாகியது. இதனால் நவீன அரச முறைமை பற்றிய வரலாற்றியல் அதனை 'வெஸ்ட்பேலியன் இறைமை' என்று குறிப்பிடுகிறது. இலங்கைத் தீவு காலனித்துவ ஆதிக்கத்துக்கு உட்பட்டிருந்த போது, அதுவும் மேற்கு உலகிலே பிறந்த ஒன்றுதான் இந்த 'நவீன தேசியவாதம்' என்ற கோட்பாடு. ஆகவே, சிங்களத் தேசியம் என்றாலும் தமிழ்த் தேசியம் என்றாலும் இவை நவீன உலகில் 'வெஸ்ட்பேலிய இறைமை' எனும் தனித்துவத்துக் கூடாகவே அணுகப்படவேண்டியவை. தேசம் - nation - மற்றும் தேசிய அரசு - nation State - என்ற புதிய உலக ஒழுங்குக்கான இறைமைக் கோட்பாடு, ஐரோப்பாவிலே 1648இல் உதித்ததிலிருந்து காலனித்துவ ஆட்சிக்குள் இலங்கைத் தீவு முழுவதும் பிரித்தானியக் கட்டுப்பாட்டுக்குள் வந்த 1815ஐத் தொடர்ந்து, 1833இல் ஓர் ஒற்றை நிர்வாகத்துக்குரிய அடிப்படை பிரித்தானியர்களால் இடப்பட்டதன் பின்னர், 1948இல் பிரித்தானிய காலனித்துவம் முடிவுக்கு வரும்போது ஒற்றையாட்சியாக - unitary State - இந்தத் தீவிலே பிறப்பாக்கம் கண்டிருக்கிறது.

இரண்டாம் உலகப் போரிலே ஈடுபட்ட ஒரு தரப்பான மேற்குலக நேசநாடுகளின் நான்கு முக்கிய உச்ச படைத் தலைமையகங்களில் ஒன்றாகிய தென் கிழக்காசியக் கட்டளை மையம் - South East Asia Command - இலங்கைத் தீவின் கண்டியில் இருந்தது. அதிலே, திருகோணமலைத் துறைமுகத்தின் முக்கியத்துவத்தை அப்போதைய புவிசார் அரசியலாக நாம் பார்க்கவேண்டும். இந்த இராணுவரீதியான தனது பாதுகாப்புத் தேவைகளின் நிமித்தமே சிங்கள ஆட்சியாளர்களோடு ஒத்திசைந்து செல்லுமாறு தமிழர்களைப் பிரித்தானியா நிர்ப்பந்தித்திருக்கிறது. இலங்கையின் சுதந்திரம் தொடர்பாகவும் அது எந்த அடிப்படைகளில் நிகழவேண்டும் என்பதையும் இந்தக் கட்டளை மையத்தின் தொடர்ச்சியான பிரித்தானிய இராணுவத் தலைமையால் 1947இல் மேற்கொள்ளப்பட்ட முடிவுக்கான "Top secret document by Admiral of the Fleet Sir John H.D. Cunningham dated 05th May, 1947" என்ற ஆதாரத்தின்மீது இந்த அவையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன்.

சிங்கள ஆட்சியாளர் கையில் தமிழர்களின் இறைமையைத் தமிழர்களாகிய நாம் மக்களாணை - democratic mandate - ஒன்றின் ஊடாகக் கையளிக்கவில்லை. பிரித்தானிய முடிக்குரிய காலனித்துவ அரசே எமது கோரிக்கைகளுக்கு மாறாக எமது இறைமையைச் சிங்கள ஆட்சியாளர்களிடம் கையளித்தது என்றே தமிழர்களிடையே காணப்படும் வரலாற்றுப் புரிதல் இருக்கிறது என்பதை இங்கு நான் குறிப்பாகச் சுட்டிக்காட்ட விரும்புகிறேன். 'ஐம்பதுக்கு ஐம்பது' என்ற கோரிக்கையை முன்வைத்துப் போராடியதும் முடிக்குரிய பிரித்தானிய அரசுக்குத் தமிழர்கள் தமது சுயநிர்ணய உரிமை பற்றி நினைவூட்டியதும் வரலாறு சொல்லிநிற்கும் செய்திகள்.

பிற்காலத்தில் இலங்கையின் முதலாவது பிரதமராகிய டி.எஸ். சேனாநாயக்க, "சுதந்திர இலங்கையில் சிங்கள மக்களாகிய எமது கைகளில் தமிழர்களாகிய உங்களுக்கு எவ்வித தீங்குக்கும் நீங்கள் அஞ்சவேண்டியதில்லை" என்று 1945இல் தமிழ்ப் பிரதிநிதிகளின் ஆதரவைச் சோல்பரி

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

யாப்புக்குப் பெறுவதற்காக ஒரு வாக்குறுதியாகச் சொல்லியிருந்தார். ஆனால், 1948இல் சுதந்திரம் என்ற போர்வையில் சிங்கள ஆட்சியாளர் கையில் ஒற்றையாட்சியதிகாரம் சென்றடைந்ததும் அதே சேனாநாயக்க தனது வாக்குறுதியிலிருந்து பின்னடித்து, சிங்களப் பேரினவாதச் சிந்தனையோடு மலையகத் தமிழர்களின் குடியுரிமையைப் பறித்தார். இந்தத் தீவில் ஒற்றையாட்சி திணிக்கப்பட்டபோது, தமிழ் மக்கள் மக்களாட்சி முறையில் அதற்கு முறைப்படியான ஆணையை வழங்கியிருக்கவில்லை. அவர்களின் பிரதிநிதிகள் ஏமாற்றப்பட்டார்கள்; தவறான நோக்கில் கையாளப்பட்டார்கள். இதனால் முடிக்குரிய பிரித்தானியக் காலனித்துவத்துக்கும் அதன் இன்றைய தொடர்ச்சியான ஐக்கிய இராச்சியத்துக்கும் இது சரியாக முடித்துவைக்கப்படாத விடயம் என்ற வகையில் பொறுப்புக்கூறல் ஒன்றிருக்கிறது. இலங்கை சுதந்திரம் அடைவதற்கு டி.எஸ். சேனாநாயக்கவிற்குத் துணைபோன செ. சுந்தரலிங்கம் அவர்கள் பிற்காலத்தில் ஆனால், காலந்தாழ்த்தாது, பிரித்தானிய அரசுக்கும் பிரபு சோல்பரிக்கும் இதனைத் தெளிவாக உணர்த்தியிருக்கிறார். இந்தப் பொறுப்புக்கூறலுக்குரிய கடமை பொதுநலவாயத்துக்கும் - The Commonwealth - போய்ச் சேருகிறது. அதற்குள் அடங்கும் ஏனைய நாடுகளுக்கும்கூட தார்மீகம் சார்ந்த ஒரு பொறுப்பிருக்கிறது என்றும் நான் இந்த இடத்தில் சொல்ல விரும்புகிறேன்.

1948இல் சுதந்திரம் பெற்றாலும் ஏழு வருடங்கள் கழிந்தும், 1955 வரை, ஐ.நா.வில் உறுப்புரிமை பெற இலங்கையால் முடியவில்லை. இரண்டாம் உலகப் போருக்குப் பின்னரான உலக ஒழுங்கில் சோவியத் யூனியன் அதைத் தடுத்துவந்தது. அப்போது தமிழர் தலைவர்கள் புவிசார் அரசியலைப் புரிந்து செயற்பட்டிருந்தால், ஒருவேளை சமஷ்டி முறையிலான ஆட்சிமுறையொன்று வரவேண்டும் என்ற சிந்தனையைச் சர்வதேச மட்டத்தில் உரப்பாக ஏற்படுத்தி, இலங்கையின் ஐ.நா. உறுப்புரிமையை உறுதி செய்வதற்கு முன்னர் சரியான ஓர் அரசியல் யாப்பையும் உருவாக்கியிருக்கலாம். 1955இல் ஐக்கிய நாடுகள் சபையின் உறுப்புரிமை பெற்ற அடுத்த வருடமே அதாவது, 1956இல் சிங்களம் மட்டும் சட்டம் என்ற கொள்கை உருவாகியதும் இனக் கொலைத் தாக்குதல்கள் ஆரம்பமானதும் தமிழர்களின் பாரம்பரியத் தாயகத்தில் சிங்களக் குடியேற்றத்திட்ட நகர்வுகள் அபிவிருத்தி என்ற போர்வையில் மேற்கொள்ளப்பட்டதும் இன அழிப்பு என்ற பெருந்திட்டத்தோடு இலங்கை அரச இயந்திரம் செயலாற்ற முனைந்த துணிவுக்கான சர்வதேசக் காரணியாகிவிட்டது.

இங்கேதான் ஐ.நா.வின் இலங்கை தொடர்பான பொறுப்புக்கூறல் ஆரம்பிக்கின்றது. பிரித்தானிய அரசோடு இணைந்திருந்த அமெரிக்கா, இலங்கைக்கான ஐ.நா. உறுப்புரிமை தொடர்பாக சோவியத் யூனியனோடு 'வீட்டோ' பேரம் பேசலில் ஈடுபட்டு, இலங்கைக்கான ஐ.நா. உறுப்புரிமையை ஏற்படுத்தியது. இதனால் பிரித்தானியாவுக்கு மட்டுமல்ல, அமெரிக்காவுக்கும் மக்களாட்சியின் பாற்பட்டு இத்தீவில் தமிழ் மக்களின் இரண்டாம்தர நிலை உருவாக்கப்பட்டது தொடர்பான ஒரு பொறுப்புக்கூறல் இருக்கிறது.

தமிழரசுக் கட்சி 1956ஆம் ஆண்டு ஓகஸ்ட் மாதம் 19ஆம் திகதி திருகோணமலையில் நடாத்திய வருடாந்த மாநாட்டின் தீர்மானத்தை வெளியிட்டபோது, "இலங்கை அரசு ஒரு திட்டமிட்ட இன அழிப்பை மேற்கொள்ள ஆரம்பித்துள்ளது" என்று எமது மூத்த தலைவர்களான வ. நவரத்தினம் அவர்களும் தந்தை செல்வா அவர்களும் இணைந்து எழுதிய தீர்மானம் தெட்டத்தெளிவாகத் தவறாமல் எடுத்துரைத்தது என்பதை நான் இங்கு நினைவுபடுத்த விரும்புகிறேன். இதைத் தொடர்ந்து, சர்வதேச சமூகத்தின் பொறுப்பை நினைவுபடுத்து முகமாக "இலங்கை சிக்கலை எதிர்நோக்குகிறது" என்ற வெளியீட்டையும் சர்வதேசத்துக்கு முன்வைத்திருந்தார்கள். எல்லாவற்றுக்கும் மேலாக, 1972இல் இலங்கைக் குடியரசு ஓர் இறுக்கமான ஒற்றையாட்சியாக மீண்டும் தமிழ் மக்களின் மக்களாணை இல்லாது, அதுவும் தமிழ் மக்களின் எதிர்ப்புக்கு மத்தியில் ஒருதலைப்பட்சமாகப் பிரகடனம் செய்யப்பட்ட போது, பிரித்தானியாவின் முடிக்குரிய இறைமையிடமிருந்த தமிழ் மக்கள் தொடர்பான பாதுகாப்புப் பொறுப்பு முழுமையாகத் துண்டிக்கப்பட்டுவிட்டது. சோல்பரி யாப்பில் பிரித்தானியா வழங்கியிருந்த சிறுபான்மை மக்களுக்கான மிகக் குறைந்த பாதுகாப்புகளும் - constitutional safeguards - பறிக்கப்பட்டன.

இதற்கு முன்னர், 1971ஆம் ஆண்டிலேயே மகாராணியாரின் கோமறை மன்றத்தின் நீதிக்குழுவின் - Judicial Committee of the Privy Council - மேன்முறையீட்டுப் பராதீனம், Court of Appeal Bill ஊடாக ஒருதலைப்பட்சமாக இரத்துச் செய்யப்பட்டது. 1972இல் இலங்கையில் பௌத்தத்துக்கு முன்னுரிமை கொடுக்கும் ஒற்றையாட்சிக் குடியரசு பிரகடனப்படுத்தப்பட்ட பின்னர், பிரித்தானிய அரசு Sri Lanka Republic Act in 1972 என்ற இலங்கைக் குடியரசு சட்டத்தைத் தனது பாராளுமன்றில் நிறைவேற்றி, இதற்கு அங்கீகாரம் வழங்கியிருக்கிறது. இதனால், பிரித்தானியாவின் தமிழ் மக்கள் தொடர்பான பொறுப்புக்கூறல் எனும் பொறுப்பு மேலும் அதிகரிக்கிறது.

இதன் பின்னர், சோவியத் யூனியன், அமெரிக்கா எனும் இரு துருவ உலக ஒழுங்குகள், தென் ஆசியா மற்றும் இந்து சமுத்திரம் என்ற வகையிலான பார்வையில், அமெரிக்கா ஏற்படுத்திக்கொண்ட இலங்கையுடனான உறவின் மத்தியில், இங்கு ஜே.ஆர். ஜயவர்தனவால் கொண்டுவரப்பட்ட 1978 அரசியல் யாப்பையும் அதனோடு முன்னெடுக்கப்பட்ட அமெரிக்கத் தரப்பின் இராணுவ நலன்கள் குறித்த புவிசார் அரசியலையும் அதற்கு மாற்றான இந்திய அணுகுமுறையினால் உருவான 1987 இந்திய - இலங்கை ஒப்பந்தத்தையும் - Indo-Sri Lanka Accord - அரசுகளுக்கிடையிலான புவிசார் அரசியல் பேரம் பேசல்களாகவே தமிழ் மக்களால் பார்க்க முடியும். இதன் விளைவாகத் தமிழ் மக்கள்மீது யுத்தம் திணிக்கப்பட்டு, பலத்த பாதிப்புகளுக்கும் நாம் உள்ளானோம். இவற்றுக்கான பொறுப்புக்கூறலும் அமெரிக்காவுக்கும் இந்தியாவுக்கும் இருக்கிறது. குறிப்பாக, இந்திய - இலங்கை ஒப்பந்தத்தின் தொடர்ச்சியாக உருவாக்கப்பட்ட 13ஆம் திருத்தச் சட்டம் பொருத்தமற்றதாக உருவாக்கப்பட்டதைத் தமிழ்த் தரப்புக்கள் தெளிவாகச் சுட்டிக்காட்டியபோதும், அதற்கான நடவடிக்கையைச் சரிவர மேற்கொள்ளாதுவிட்டது மட்டுமன்றி, இலங்கை அரசு தான் நடைமுறைப்படுத்துவதாக வாக்களித்த அதிகாரப் பரவலாக்கல் பொறிமுறையைச் சரிவர நடைமுறைப்படுத்தாமைக்கு, அதுவும் குறிப்பாக 2009இன் பின்னரும் 12 வருடங்களாகத் தவறியுள்ளமைக்கு, தகுந்த நடவடிக்கை எடுக்கத் தவறியுள்ளமையும் இந்தியாவுக்கான தமிழ் மக்கள் சார்ந்த பொறுப்புக்கூறலாக உள்ளது.

அதுமட்டுமல்ல, தொடர்ந்து இடம்பெற்ற போரை ஓர் இன அழிப்புப் போராக இலங்கை அரசு கையாண்டபோது, அதற்கு இராணுவ உதவிகளை நல்கிய அனைத்து நாடுகளுக்கும் தமிழர்களின் இன்றைய நிலை குறித்தான திட்டவட்டமான

ஒரு பொறுப்புக்கூறல் இருக்கிறது. குறிப்பாக, அமெரிக்கா, ரஷ்யா, சீனா, இஸ்ரேல், இந்தியா, பாகிஸ்தான் போன்ற பல நாடுகளுக்கும், தமிழர் தரப்புமீது தடைகளை விதித்து எமது தற்பாதுகாப்புத் திறனைப் பாதிக்கச் செய்த நாடுகளுக்கும் இன்னொருவகைப் பொறுப்புக்கூறல் இருக்கின்றது. அதேபோல, சமாதான ஒப்பந்தத்தை February, 2002, the Ceasefire Agreement - CFA - and the Sri Lanka Monitoring Mission - SLMM - மேற்கொண்டு, நடுநிலையோடு செயற்பட்டிருக்கவேண்டிய நோர்வே நாடும் சமாதான காலத்தின்போதே திசை திருப்பப்படுவதற்கு இணைத் தலைமை நாடுகளின் Co-Chairs of Tokyo Donor Conference என்ற புவிசார் அரசியற்கூட்டு வழிவகுத்துள்ளது என்ற கருத்து பலமாக முன்வைக்கப்பட்டுள்ளது. இதனால், இணைத் தலைமை நாடுகளுக்குரிய ஒரு பொறுப்புக்கூறலும் இருப்பதாகவே தமிழர்கள் கருதுகிறார்கள். இது தொடர்பாக நோர்வே நாட்டின் வெளியுறவு அமைச்சின் பணிப்பின் பேரில் பிரித்தானியா, நோர்வே ஆகிய நாடுகளின் இரண்டு பல்கலைக்கழகத்தினர் இணைந்து மேற்கொண்ட ஆய்வின் பின்னர், 2011ஆம் ஆண்டு நவம்பர் 11ஆம் திகதி வெளியிட்ட ஆய்வறிக்கையான Pawns of Peace: Evaluation of Norwegian Peace Efforts in Sri Lanka, 1997-2009, Norad publication இல் நோர்வே நாட்டுக்கென்ற பொறுப்பு ஒன்று இருப்பதைச் சுட்டிக்காட்டியுள்ளது.

நோர்வே, வடதுருவ மற்றும் ஐரோப்பா வாழ் புலம்பெயர் தமிழர்களால் இணைத் தலைமை நாடுகளதும் நோர்வேயினதும் பொறுப்புக்கூறல் மற்றும் பொறுப்புக் குறித்த மேலதிக அழுத்தம், குறித்த நாடுகள்முன் கொண்டுசெல்லப்பட வேண்டும். குறிப்பாக, அமெரிக்கா மற்றும் பிரித்தானியா ஆகியவற்றின் போர் மற்றும் சமாதான காலத்துக்குரிய பொறுப்புக்கூறலுக்கான அடிப்படைகள், 'டப்ளின்' மற்றும் 'பிரேமன்' ஆகிய நகரங்களில், முறையே 2010இலும் 2013இலும் மேற்கொள்ளப்பட்ட மக்கள் தீர்ப்பாயங்களால் - Permanent Peoples' Tribunal on Sri Lanka - 2010, Dublin Session in 2010 and Bremen Session in 2013 - கனதியாக முன்வைக்கப்பட்டுள்ளன என்பதையும் நாம் இங்கு நோக்க வேண்டும்.

"இன அழிப்புப் போரின்போது ஐ.நா. நடந்துகொண்ட முறை தொடர்பான பொறுப்புக்கூறல் என்று ஒன்று இருக்கிறது" என்பது ஐ.நா. செயலாளர் நாயகத்தின் அறிக்கையிலே தெளிவாக முன்வைக்கப்பட்டுள்ளது. Report Of the Secretary-General's Internal Review Panel on United Nations Action in Sri Lanka, 2012இல் இந்தக் கருத்து பரவலாக ஏற்றுக்கொள்ளப்பட்டுள்ளது. ஐ.நா. தான் கற்றுக்கொண்ட பாடமாகத் தன்னை மேம்படுத்துவதில் மட்டும் நாட்டம் செலுத்தியுள்ளது. தமிழ் மக்கள் இன அழிப்பை எதிர்கொண்டபோது, அவர்களைப் பாதுகாக்கும் பொறுப்பு - Responsibility to Protect - R2P - ஐ.நா. வுக்கு இருந்திருக்கிறது. ஆனால், அதற்குரிய பரிகார நீதி பாதிக்கப்பட்டவர்களுக்கு இதுவரை கிடைக்கவில்லை. ஐ.நா. மனித உரிமைப் பேரவையில் கொண்டுவரப்பட்டுள்ள தீர்மானங்களும்கூட 'இன அழிப்பு' என்றும், 'தொடருகின்ற கட்டமைக்கப்பட்ட இன அழிப்பு' என்றும் தமிழர்கள் ஒன்றிணைந்து முன்வைக்கும் குற்றச்சாட்டை விசாரிப்பதற்கோ, அதற்குரிய ஆதாரங்களைத் தேடிச் சேகரிப்பதற்கான குறிப்பான ஆணையை வழங்குவதற்கோ இதுவரை தவறியுள்ளன. ஆக, போர்க் குற்றங்களும் மனித குலத்திற்கு எதிரான குற்றங்களும் என்ற மட்டுப் படுத்தலும், போரில் பங்கேற்ற இரண்டு தரப்புகளுக்கு மட்டுமே பொறுப்புக்கூறல் உள்ளதென்பதான வியாக்கியானங்களும் தொடர்ச்சியாக முன்வைக்கப்பட்டு வருகின்றன.

இந்த நிலையிலேயே இலங்கை அரசு மீண்டும் ஓர் அரசியலமைப்பைத் தனது ஒற்றையாட்சியை மேலும் பலப்படுத்தும் நோக்கிலும், சிங்கள பௌத்த ஆக்கிரமிப்பை மக்கள் விருப்புக்கு எதிராக வடக்கு, கிழக்கில் முன்னெடுக்கும் நோக்கோடும் ஒரு வரைவாக முன்வைக்கவிருக்கும் இன்றைய சூழலில், சர்வதேச சமூகத்தின் ஒட்டுமொத்தப் பொறுப்புக் கூறலை உலகெங்கும் பரந்து வாழும் ஈழத் தமிழர்கள் தட்டிக்கேட்டால் மாத்திரமே நியாயமான அரசியல் தீர்வுக்கான பாதையை உருவாக்குவதும் கட்டமைக்கப்பட்ட இன அழிப்பிலிருந்து தமிழ்த் தேசிய இனத்தையும் தமிழ் பேசும் மக்களை வடக்கு, கிழக்கில் காப்பாற்றுவதும் சாத்தியமாகும். இதுவே இன்று எம்மிடமுள்ள சர்வதேச அறத்தை நிலைநாட்டுவதற்கான வழியாகிறது. மேலும், கடுமையான ஓர் ஒற்றையாட்சி இங்கு உருவாக்கப்பட்டால், அதற்குரிய பொறுப்புக்கூறல் சர்வதேச சமூகத்திற்கே பிரதானமாக இருக்கும் என்பதை மேற்குறித்த வரலாற்று ரீதியான பொறுப்புக்கூறல்களோடு இங்கு நான் எடுத்துச்சொல்ல விரும்புகின்றேன். மிக முக்கியமாக, புதிய அரசியல் யாப்பு ஒன்று உருவாக்கப்படுவதற்கான முயற்சிகள் மேற்கொள்ளப் படுகின்ற இந்தக் காலகட்டத்தில்தான் நான் இந்தப் பதிவை மேற்கொள்ள விரும்புகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்த இடத்திலே இன்னுமொரு விடயத்தைக் குறிப்பிட விரும்புகிறேன். 2002ஆம் ஆண்டிலே தமிழீழ விடுதலைப் புலிகளுக்கும் இலங்கை அரசாங்கத்துக்கும் இடையிலே ஒஸ்லோவில் நடைபெற்ற பேச்சுவார்த்தைக்குத் தமிழீழ விடுதலைப் புலிகள் சார்பில் அவர்களுடைய தத்துவ ஆசிரியரான அமரர் அன்ரன் பாலசிங்கம் அவர்களும் இலங்கை அரசாங்கம் சார்பில் தற்போதைய வெளிநாட்டு அலுவல்கள் அமைச்சர் மாண்புமிகு பேராசிரியர் ஜீ.எல். பீரிஸ் அவர்களும் தலைமை வகித்திருந்தார்கள். இப்பேச்சுவார்த்தை முடிந்த கையோடு, இடம்பெற்ற ஒரு பத்திரிகையாளர் மாநாட்டிலே மாண்புமிகு ஜீ.எல். பீரிஸ் அவர்கள் முன்வைத்த சில விடயங்களை நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகிறேன்.

தமிழீழ விடுதலைப் புலிகளின் தலைமைத்துவத்தினால் முன்வைக்கப்பட்ட ஓர் ஆலோசனைக்குப் பதிலளிக்கும் வகையில், "ஐக்கிய இலங்கைக்குள் சமஷ்டிக் கட்டமைப்பின் அடிப்படையில் - தமிழ் பேசும் மக்களின் வரலாற்று ரீதியான வாழ்விடப் பிரதேசங்களில் உள்ளக சுயநிர்ணய உரிமை என்னும் கோட்பாட்டின் அடிப்படையில் அமைந்த ஒரு தீர்வை ஆராய்வதற்கு தரப்புக்கள் இணங்கின; அத்தீர்வு சகல சமூகங்களும் ஏற்றுக்கொள்ளக்கூடியதாக இருக்கவேண்டும் என்பதையும் தரப்புக்கள் ஏற்றுக்கொண்டன; இந்தக் குறிக்கோளினால் வழிநடத்தப்பட்டு, மத்திய அரசுக்கும் பிராந்தியத்துக்கும் இடையேயும், மத்திய அரசுக்கு உள்ளேயுமான அதிகாரப் பகிர்வு, பூகோளப் பிராந்தியம், மனித உரிமைகள், பாதுகாப்பு, அரசியல் மற்றும் நிர்வாகப் பொறிமுறைகள், அரச நிதி, சட்டம் மற்றும் ஒழுங்கு முதலிய முதன்மையான அரசியல் விடயங்கள் தொடர்பானதும் ஆனால், அவற்றுக்கு மட்டும் மட்டுப்படுத்தப்படாததுமான கலந்துரையாடல்களை ஆரம்பிப்பதற்கு இரு தரப்புக்களும் இணங்கின" என்று குறிப்பிட்டிருந்தார். இவ்வாறு 2002ஆம் ஆண்டு பேராசிரியர் ஜீ.எல். பீரிஸ் அவர்கள் சமஷ்டி அடிப்படையிலான ஒரு தீர்வுக்கு இணங்கிக்கொண்ட விடயத்தை அவரே ஒரு பத்திரிகையாளர் மாநாட்டிலே குறிப்பிட்டிருந்தார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்த இடத்தில் மிக முக்கியமாகக் குறிப்பிடுவது

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

என்னவெனில், இந்த நாட்டிலே புரையோடிப்போய் இருக்கின்ற இனரீதியான பிரச்சினைக்குச் சமஷ்டி அடிப்படையில் ஒரு தீர்வை முன்வைப்பதற்கான மிகப் பொருத்தமான காலகட்டங்கள் எல்லாம் வந்துபோய் இருக்கின்றன எனினும், அவை நடைமுறைப்படுத்தப்படாமல் தள்ளிவிடப்பட்டிருக்கின்றன என்பதைத்தான். அவ்வாறான வாய்ப்புக்களில் ஒன்றாகத்தான், தமிழீழ விடுதலை புலிகள் இருக்கின்றபொழுது, 2002ஆம் ஆண்டிலே ஒஸ்லோவிலே நடந்த பேச்சுவார்த்தைக்குப் பின்னர் ஜீ.எல். பீரிஸ் அவர்கள் இவ்வாறு குறிப்பிட்டிருந்தமை பார்க்கப்படுகின்றது. இது ஒரு மிக முக்கியமான செய்தியாக இருந்தது. இதனை நான் மீண்டும் இந்த இடத்திலே ஞாபகப் படுத்துவதற்கான காரணம், இன்று இலங்கையில் புதிய ஓர் அரசியல் யாப்பு கொண்டுவரப்பட இருப்பதாகப் பேசப்படுகின்றது. அதேநேரம், இலங்கையில் “ஒரே நாடு, ஒரே சட்டம்” என்ற செயலணியை இந்த நாட்டினுடைய மேதகு சனாதிபதி அவர்கள் சிறைக் கைதியாக இருந்த ஒருவருடைய தலைமையில் நியமித்திருக்கிறார். அதுகூட, இந்த நாட்டில் பாரதூரமான நம்பிக்கையற்ற தன்மையை ஏற்படுத் தியிருக்கிறது. இதனால், இங்கிருக்கின்ற, அளவில் சிறிய தேசிய இனமான தமிழ்த் தேசிய இனம் தன்னுடைய இருப்புக் குறித்து, எதிர்காலம் குறித்துச் சிந்திக்க வேண்டிய ஒரு காலகட்டத்தில் இருந்துகொண்டிருக்கிறது. அதனால்தான் நான் இந்த இடத்திலே சில விடயங்களை உங்கள் முன்னிலையில் பதிவுசெய்கின்றேன். இது மிக முக்கியமானதொரு காலகட்டம்!

நான் இந்த இடத்திலே மிக முக்கியமாகச் சொல்ல வேண்டிய இன்னுமொரு விடயமும் இருக்கிறது. குறிப்பாக, ஜே.ஆர். ஜயவர்தன அவர்கள் இந்த நாட்டில் மிகவும் மோசமான முறையில் ஆட்சி செய்த ஆட்சியாளர்களில் ஒருவர்! இவர், தனது ஆட்சிக் காலத்தில் “போர் என்றால் போர்; சமாதானம் என்றால் சமாதானம்” என்று நிராயுதபாணிகளாக நின்ற தமிழர்கள்மீது ஆயுதப் போராட்டத்தையும் ஆயுத வன்முறையையும் நிகழ்த்திய ஒருவர். அவர்கூட, தனது வாழ்க்கையின் இறுதிக் காலத்தில் - 1995ஆம் ஆண்டு சனவரி மாதம் முதலாம் திகதி "The Sunday Times" பத்திரிகைக்கு வழங்கிய செவ்வியிலே, “இந்த நாட்டிலுள்ள இன முரண்பாட்டைத் தீர்ப்பதற்கு முதல் தெரிவாக இருக்கக்கூடியது சமஷ்டி முறையிலான தீர்வுதான்" எனக் குறிப்பிட்டிருந்தார். ஓர் ஆணைப் பெண்ணாகவும் பெண்ணை ஆணாகவும் மாற்றுவது தவிர்ந்த ஏனைய அனைத்து அதிகாரங்களையும் உள்ளடக்கிய ஓர் அரசியல் யாப்பை 1978ம் ஆண்டு நடைமுறைக்குக் கொண்டுவந்த, இந்த நாட்டிலே இரத்த ஆறு ஓடுவதற்குக் காரணமாக இருந்த ஜே.ஆர் ஜயவர்தன அவர்கள்கூட, தனது வாழ்க்கையின் இறுதிக் காலத்தில் கொடுத்த வாக்குமூலத்தில், “வடக்கு, கிழக்குப் பிரச்சினைக்குத் தீர்வாக அமையக்கூடியது சமஷ்டி முறையில் அமைந்த ஒரு தீர்வுதான்” என்ற கருத்தைக் குறிப்பிட்டிருந்தார்.

அதேபோல, 65 சதவீதமான சிங்கள மக்களுடைய வாக்கு களைப் பெற்று சனாதிபதியாக வந்த சந்திரிகா அம்மையார் அவர்கள், அவரது பதவிக்காலத்தின் இறுதியில் குறிப்பிட்ட விடயத்தையும் நான் இங்கே குறிப்பிடுகிறேன். அதாவது, "யுத்தத்தின்மூலம் தமிழர்களைச் சிங்களவர்கள் வென்றிருக் கிறார்கள்; ஆனால், சமாதானத்தினூடாகத் தமிழர்களைச் சிங்களவர்கள் வெல்லவில்லை" என்று. ஆகவே, இந்த இடத்தில் நீங்கள் ஒன்றைப் புரிந்துகொள்ளுங்கள்! இந்த நாட்டிலே யுத்தம் நடைபெற்றது. அதனை சிங்களத் தலைவர்கள் வழிநடத்தினார்கள். அவர்களுடைய யுத்த வழிநடத்தல்களே இந்த நாட்டில் மேலோங்கி இருந்தது. அந்த அடிப்படையில்தான், இந்த மண்ணிலே தமிழர்கள் அழிக்கப் பட்டு, நாங்கள் இன்றும் ஓர் அரசியல் தீர்வுக்காக ஏங்குகின்றோம். ஆகவே, இந்த நாட்டிலே வாழுகின்ற மக்களுக்குத் தமிழ் மொழி, சிங்கள மொழி என்ற அடிப்படையில், மொழிவாரியில் அமைந்ததான ஒரு சமஷ்டித் தீர்வை புதிய அரசியல் யாப்பினூடாக முன்வைக்க வேண்டு மெனவும், அடுத்த வரவு செலவுத் திட்டம் ஒரு மிகையான வரவு செலவுத் திட்டமாக வருவதற்குத் தமிழர்களுடைய பொருளாதாரத்தையும் நீங்கள் பயன்படுத்தவேண்டுமெனவும் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් කථා කළ ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා "ජන සංහාරයක්" ගැන තමයි හැම වෙලාවේම කථා කළේ. එහෙම කථා කරනකොට වෙනස් interpretation එකක් තමයි පිටට යන්නේ. එතුමාගෙන් කථාවෙන් දෙමළ ජාතීන් අතරට, එහෙම නැත්නම් ලෝකයට යන්නේ වෙන අදහසක්. මොකද, එතුමා කියන්නේ වෙන කථාවක් නේ. එතුමාගේ කථාවේ හැම තැනකදීම කිව්වේ, “සිංහල බෞද්ධ රටක් නිර්මාණය කිරීම විතරයි රජයේ පරමාර්ථය. දෙමළ ජනතාව ඇතුළු අනෙකුත් සියලු ජනතාව අයින් කරනවා” කියලායි. එතුමා කියනවා,"ජන සංහාරයක් කරනවා" කියලා. ඒ වාගේම සිංහල හමුදාව විසින් දෙමළ ජනතාව තනිකරම විනාශ කළා කියා එතුමා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කථාව වෙනස් කරන්න ඕනෑ. දෙමළ ජනතාව තනිකරම විනාශ කළා කියලා තමයි එතුමාගේ කථාවෙන් කියන්නේ. නමුත්, ඒක නොවෙයි සිදු වුණේ. ත්‍රස්තවාදයයි විනාශ කළේ. අපේ රටේ තිබුණේ ත්‍රස්තවාදයක්. ත්‍රස්තවාදීන් විනාශ කරපු එක වෙන කතන්දරයක්. නමුත්, ජන සංහාරයක් කළා කියලා තමයි එතුමා හැම වෙලාවේම කිව්වේ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, I rise to a point of Order.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஏற்கெனவே நடந்ததைத்தான் நான் குறிப்பிட்டேன். யுத்தத் தின்போது பல்லாயிரக்கணக்கான மக்கள் கொல்லப் பட்டார்கள்; பொருளாதாரத்தடை விதிக்கப்பட்டது. அதனை இந்த அரசாங்கம் –

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා. ඒක point of Order එකක් නොවෙයි.

මීළඟට, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.52]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය දෙවන වර කියවීමේ විවාදයට අද දිනයේ සම්බන්ධ වන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. නිදහස් ශ්‍රී ලංකාවේ 76වන අය වැය ලේඛනය

ඊයේ දවසේ මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ වාගේ සාර්ථක, සමබර අය වැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි කියලා මන්ත්‍රීවරු හැටියට අපිවත්, වෙන කවුරුවත් අවංකවම බලාපොරොත්තු වුණේ නැහැ. අපි හිතුවා, මේ අය වැය ජනතාවට වැඩි බරක් පැටවෙන අය වැයක් වෙයි කියලා. නමුත්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා හරියට 'සූර සරදියෙල්' වාගේ තමයි කටයුතු කළේ. සූර සරදියෙල් කළේත්, තිබෙන අයගෙන් අරගෙන නැති අයට දීමයි. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් අහිංසක ජනතාව මත පීඩනය පටවන්නේ නැතිව, මේ රටේ අතිවිශාල ලාභ ලබන සමාගම්වලින් නීත්‍යානුකූලව අරගෙන ජනතාවට දෙන්න කටයුතු කරනවා. ඒ දෙදෙනා අතර පුංචි වෙනසයි තිබෙන්නේ. සූර සරදියෙල් ඒ දේ කළේ බලහත්කාරයෙන්, ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා එය කරන්නේ නීත්‍යානුකූලව. මොකද, ඒ සමාගම් ලාභ ලබන්නේ අපේ රටේ තිබෙන යටිතල පහසුකම් උපයෝගි කරගෙනයි. මාර්ග, පානීය ජලය, තාක්ෂණික පහසුකම් ඇතුළු ඒ යටිතල පහසුකම් සියල්ල සපයන්නේ ආණ්ඩුව. පවතින රජයන් විසින් ජනතාවගේ බදු මුදල් වියදම් කරලා සලසනු ලබන යටිතල පහසුකම් පාවිච්චි කරලා ලාභ ලබාගන්නා සමාගම්වලින් අරගෙන රටේ ජන ජීවිත ගොඩ නංවන්න ගරු මුදල් ඇමතිතුමා අද කටයුතු කරනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, මේක ඉතා අසීරු සහ අභියෝගාත්මක වෙලාවක් බව. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුවට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. සෞභාග්‍යයේ දැක්ම හදනකොට අපි බලාපොරොත්තු වුණේ නැහැ, මේ වාගේ ලෝක වසංගතයක් එයි කියලා, මේ වාගේ වසංගතයක් ඇවිල්ලා අපි බලාපොරොත්තු නොවුණු තරම් විශාල මුදලක් යට කරන්න සිද්ධවෙයි කියලා. මේ වසංගතය නිසා අපේ රටේ ජනතාව විශාල පීඩනයකට පත් වුණා.

දැන් විපක්ෂය කිව්වා, කොවිඩ් පාලනය කිරීමට රජය අසමත් වුණා කියලා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, අපේ රටේ නැති වූ ජීවිත ප්‍රමාණය පිළිබඳව මහා ලොකුවට කිව්වා. හැබැයි, කොවිඩ් රෝගය වැලඳිලා රෝහලකට ආවා නම්, එසේ රෝහල්වලට පැමිණි අයගෙන් 535,000ක් නැවත ගෙවල්වලට යවන්න අපේ සෞඛ්‍ය අංශයට -අපේ රජයට- හැකියාව ලැබුණු බව තමුන්නාන්සේලා මතක තබාගන්න. තමුන්නාන්සේලා ඒ ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, කොවිඩ්වලින් මැරුණු ගණන ගැන ලොකුවට කියලා ඒකෙන් සතුටක් ලබනවා. මේ අය වැයෙන් ජනතාව හොඳටම පීඩනයට පත්වෙයි, මේක ජනතාවට සම්පූර්ණ පීඩනයක් දෙන අය වැයක් බවට පත්වෙයි කියලා විපක්ෂය බලාපොරොත්තු තබාගෙන බලා සිටියා. නමුත්, ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වුණා. මොකද, මේ අභියෝගාත්මක වෙලාවේත් ඉතා සාර්ථක අය වැයක් ඉදිරිපත් කිරීමේ හැකියාව අපට ලැබී තිබෙනවා කියන එක මම ඉතාම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි.

ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, විශේෂයෙන්ම දුප්පත් ජනතාව ගොඩ ගැනීම සඳහා මේ අය වැය තුළ කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට කියනවා, කුරුණෑගල දිස්ත්‍රික්කයට, දඹදෙණිය ආසනයට එන්න කියලා. අදාළ ස්ථානවලට මම තමුන්නාන්සේ එක්කගෙන යන්නම්. නිවාස ඇමතිවරයා හැටියට කටයුතු කරන ගරු අග්‍රාමාත්‍යතුමාට මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙන්නේ නැහැ, පින් දෙනවා. ඒ ආසනයේ අහිංසක, දුප්පත් ජනතාවගේ ගෙවල්වලට ගියාම මගේ ඇස්වලින් කඳුළු එනවා. තමන්ට ස්ථිර නිවසක් නැති නිසා තමන් ඉන්න තැන ඉටිරෙදිවලින් වට කරගෙන, එහෙම නැත්නම් නොයෙක් රෙදිවලින් වට කරගෙන වැඩිවියට පත්වුණු ගැහැනු දරුවන් ආරක්ෂා කර ගන්න බැරුව අම්මයි, තාත්තායි කඳුළු බොනවා.

පසු ගිය කාලවල තිබුණු හැම රජයක්ම නිවාස වැඩසටහන්වලදී මොකක්ද කළේ? රුපියල් 20,000ක, රුපියල් 50,000ක cheque එකක් දුන්නා. ඒ මුදලින් කවදාවත් ඒ අයට ගෙයක් හදා ගන්න බැහැ. පසු ගිය කාලයේ ක්‍රියාත්මක වුණු නිවාස වැඩසටහනේදී මිනිස්සු ණයකාරයන් බවට පත් වුණා. එසේ වුණත් අපේ වර්තමාන ආණ්ඩුවේ නිවාස ඇමතිවරයා හැටියට අපේ ගරු අග්‍රාමාත්‍යතුමා, රාජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලුදෙනා එකතු වෙලා ඒ අයට ලක්ෂ හයක ආධාරයක් දෙනවා. ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ සභාවේ ඉන්න අවස්ථාවේ මම ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් ඒ මුදලට තවත් ලක්ෂ දෙකක් එකතු කරලා දෙන්න කියලා. අද තිබෙන තත්ත්වයත් එක්ක තවත් ලක්ෂ දෙකකුත් එක්ක සම්පූර්ණ මුදල ලක්ෂ අටක් දුන්නොත් ඒ අහිංසක, දුප්පත් අය ස්ථිර නිවසක් හදාගෙන ඉතාම සතුටින් ජීවත් වෙයි. එහෙම තමයි දුප්පත්කමින් ගොඩට ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රැකියා ස්ථිර නොකරපු තරුණ උපාධිධාරින් සියලුදෙනා අපට කථා කරනවා. ඔවුන් මොන රජයක් යටතේ බඳවා ගත්තත් ඒ සියලු උපාධිධාරින් ස්ථිර කරන්න මේ අය වැයෙන් තීන්දු කරලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ ගරු විජිත හේරත් මැතිතුමාගෙනුත්, සමඟි ජන බලවේගයේ තමුන්නාන්සේලාගෙනුත් මම අහනවා, තමුන්නාන්සේලා මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවාද? TNA එකෙනුත් මම ඒ ප්‍රශ්නයම අහනවා. අපේ ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා විදුහල්පතිවරයෙක්. ඔබතුමා කියන්න, ඔබතුමන්ලා මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවාද? එහෙම විරුද්ධව ඡන්දය දෙනවා නම් තමුන්නාන්සේලා ගුරු, විදුහල්පති වැටුප් ගැටලුව විසඳනවාට විරුද්ධයි. ඒක විසඳනවාට විරුද්ධ අය තමයි, මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්නේ. මේ ගුරු, විදුහල්පති වැටුප් ගැටලුව කවුරු ඇති කරපු ගැටලුවක්ද? ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇති කරපු ගැටලුවක්ද? නැහැ, ඒක දීර්ඝ කාලීනව ආපු ගැටලුවක්. අපි හැම ආණ්ඩුවකදීම ඒ ගැන කථා කළා. හැම තැනකම කථා කළා. නමුත් ඒක විසඳන්න බැරි වුණා. අද මේ අසීරු, අමාරු වෙලාවේ බිලියන 30ක් ඒ වෙනුවෙන් වෙන් කරලා එය විසඳන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. මම මේ රටේ ගුරු, විදුහල්පති ප්‍රජාවට කියනවා මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන හැම කෙනාම තමුන්නාන්සේලාගේ ගුරු, විදුහල්පති වැටුප් ගැටලුව විසඳනවාට විරුද්ධ අයයි කියලා. අද රට තුළ දැවැන්ත සංවර්ධනයකට මුල පුරලා තිබෙනවා. නැවත වතාවක් මේ රට වැඩ බිමක් බවට පත් වෙලා තිබෙනවා. අද ග්‍රාමීය සංවර්ධනයට සෑම ග්‍රාම නිලධාරි වසමකටම රුපියල් ලක්ෂ 30 ගණනේ ලබා දෙනවා. එජාපයේ හිටියත්, ජනතා විමුක්ති පෙරමුණේ හිටියත්, TNA එකේ හිටියත් ඒ කොට්ඨාසය ජයග්‍රහණය කරලා තිබෙන මන්ත්‍රීතුමාට පක්ෂ භේදයකින් තොරව ලක්ෂ 40ක් දෙනවා.

මම 1997 වර්ෂයේදී තමයි ප්‍රාදේශීය සභාවට පත් වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට අවුරුද්දටම ලක්ෂයක් විතර තමයි හම්බ වුණේ. 1997 වර්ෂයේදී මට ලැබුණු රුපියල් ලක්ෂයෙන් නාරම්මල - දිගන්දෙණිය මගේ ගමට යන පාරේ කඳු කොටසට කොන්ක්‍රීට් ටිකක් දැම්මා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය මාර්ග කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීමයි. ඒ සංකල්පයට කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු අගමැතිතුමා විශාල ශක්තියක් ලබා දෙන අතර අපේ කැබිනට් ඇමතිතුමා -ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා- අද දැවැන්ත මාර්ග විප්ලවයක් රට තුළ කරනවා. ඒක නිසා මම එදා පයින් ඇවිදගෙන ගිය පාරට අද කාපට් එක වැටෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකයි, අපේ දේශපාලනය. ඒකයි, රජයේ වැඩ පිළිවෙළ.

ඒ වාගේම, ඒ අහිංසක දුප්පත් මිනිසුන් ඉන්න ඒ ගම්දනව්වලට පානීය ජලය ලබා දෙන වැඩ පිළිවෙළට අතිවිශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ තුළින් ජන ජීවිතය උසස්

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

වෙන්නේ නැද්ද? ඒ තුළින් ජන ජීවිතය උසස් කිරීම නේද කරන්නේ? අද සෑම නිවසකටම විදුලිය ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජීවනෝපාය සංවර්ධනය ගැන බලන්න. විශේෂයෙන්ම ජීවනෝපාය සංවර්ධනයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අපි විශාල වශයෙන් ඒ අයට උපකරණ ප්‍රදානය කරනවා. ඒ අයට අවශ්‍ය වතුර පොම්පයක්ද, ඒ කාන්තාවකට අවශ්‍ය මහන මැෂිමක්ද එහෙම නැත්නම් තවත් උපකරණයක්ද, ඒවා ලබා දීම තුළින් මොකක්ද වෙන්නේ? ඒවායින් වෙන්නේ ජන ජීවිතය උසස් වෙන එක නොවෙයිද? ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙන් අපි අහනවා, ඒවා නොවෙයිද ජන ජීවිතය උසස් කරන්න කළ යුත්තේ කියලා.

විශේෂයෙන්ම අපේ රටේ ආදායම් වියදම් පරතරය අපි අඩු කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආදායම් තත්ත්වය වර්ධනය කිරීම සඳහා ජනතාවට පීඩනයක් නොවන, ජනතාව මත බර පටවන්නේ නැති වැඩ පිළිවෙළක් සකස් කරන්න අපේ ගරු මුදල් ඇමතිතුමා අපේ ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා ඇතුළු කණ්ඩායමකට භාර දුන්නා. අපි ඒ ආයතනවලට ගියා. මේ රටේ ආදායම් උපයන ප්‍රධානම ආයතන මොනවාද? ඒවා නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා සුරාබදු දෙපාර්තමේන්තුව. මේ ආයතන තුනේම නිලධාරීන් උනන්දුවෙන් වැඩ කරනවා. නමුත් පවතින තාක්ෂණික ගැටලු නිසා, පවතින නීති රාමුවල ගැටලු නිසා අපේ රජයට -ඕනෑම රජයකට- එන්න තිබෙන මුදලින් සියයට 60යි අය වෙන්නේ. සියයට 40ක් මුදල් අය වෙන්නේ නැහැ. නීත්‍යනුකූලව ලැබිය යුතු මුදල් අය වෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න මොනවාද? එක පැත්තකින්, තාක්ෂණ ගැටලු ටික අපට නිරාකරණය කරන්න බැරිවෙලා තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, පසුගිය කාලයේ ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් කථා කළාට ඒවාට නායකත්වය දුන්නේ නැහැ. ඒ සියල්ල එකිනෙක පස්සෙන් පස්සට ගිය ඒ තත්ත්වය නිසා අද අපට ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. අපි ඒ ප්‍රශ්න විසඳන්න ඕනෑ. අපි එකතුවෙලා පාර්ලිමේන්තුවේ ප්‍රතිපත්ති හදන්න ඕනෑ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තිබෙන ගැටලු මොනවාද, අපේ පැත්තෙන් ඔවුන්ට දිය යුතු දායකත්වය මොකක්ද කියලා බලන්න ඕනෑ. ඊළඟට, සුරාබදු දෙපාර්තමේන්තුවේ තිබෙන ගැටලු මොනවාද කියා සොයා බලා ඒවාට වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ඒ ආයතනවලට නව නීතිරීති ගෙනැවිත්, ඒ ක්‍රියාවලිය ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් ගරු මුදල් අමාත්‍යතුමා මේ අය වැය තුළින් යෝජනා කරලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වන අතරේ එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක තමයි කරන්න ඕනෑ. අහිංසක ජනතාවගේ සාක්කුවෙන් මුදල් ගන්නවාට වඩා නීත්‍යනුකූලව අපට අය විය යුතුව තිබෙන, විදේශ රටවලින් අපේ රටට විවිධ භාණ්ඩ ගෙන්වනකොට ඒ සම්බන්ධයෙන් අය වෙන්න තිබෙන මුදල් නිසියාකාරව අය කර ගත්තොත්, විශාල මුදල් ප්‍රමාණයක් රජයට එකතු කර ගන්න පුළුවන්කම ලැබෙනවා.

මට පෙර ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කළා. එතුමාත් හිටපු විදුහල්පතිවරයෙක්. මමත් පාසලක උගන්වපු ගුරුවරයෙක්. අපි ඔක්කොම දරුවන්ට ආදරෙයි; ජනතාවට ආදරෙයි; රටට ආදරෙයි. ඔබතුමා වැදගත් කරුණු රාශියක් කිව්වා. එතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. දැන් බලන්න, අපේ පාර්ලිමේන්තුවේ ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා ඉන්නවා; ගරු අංගජන් රාමනාදන් මැතිතුමා ඉන්නවා; අපේ ගරු ආචාර්ය සුරේන් රාඝවන් මැතිතුමා ඉන්නවා.

ඒ අයත් දෙමළ මන්ත්‍රීවරු. එතුමන්ලා අද ආණ්ඩුවත් එක්ක එකතු වෙලා වැඩ කරනවා. එතුමන්ලා දෙමළ ජනතාවට සහ උතුරු පළාතට මොනවා හෝ දෙයක් කරන්න මැදිහත් වනවා. ඔබතුමන්ලා අපේ ගරු අගමැතිතුමා එක්ක කථා කරන්න. එතුමා කවදාවත් ඔබතුමන්ලාව ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඔබතුමන්ලා අපේ ගරු ජනාධිපතිතුමා එක්ක කථා කරන්න. ඔබතුමන්ලා පොදුජන පෙරමුණේ සාමාජිකත්වය ගන්නත් එපා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ගන්නත් එපා. ඔබතුමන්ලා TNA එකේ මන්ත්‍රීවරු හැටියටම ඉඳගෙන ආණ්ඩුවේ සහයෝගය අරගෙන, උතුරු පළාත වෙනුවෙන් වැඩ කරන්න. ඒ අහිංසක ජනතාව විඳින පීඩනයෙන් මුදා ගන්න.

තමුන්නාන්සේලා අද නිදහසේ ඉන්නේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසාය කියලා මම මේ ගරු සභාවේදී ගෞරවයෙන් කියනවා. එතුමා තමයි තමුන්නාන්සේලාටත් නිදහස ලබා දුන්නේ. තමුන්නාන්සේලාගේ දරුවෝ එදා සයනයිඩ් කරල බෙල්ලේ බැඳගෙනයි හිටියේ. ළමා සොල්දාදුවෝ බවට පත් කළ ඒ දරුවෝ ටික බේරා ගත්තේ, ඒ දෙමළ කාන්තාවන්ගේ කඳුළු පිසදැම්මේ එවකට ජනාධිපතිවරයාව සිටි ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමා තමයි උතුරට වැඩිම වැඩ කොටසක් කරලා තිබෙන්නේ. එතුමා තමයි නැඟෙනහිරට වැඩිම වැඩ කොටසක් කරලා තිබෙන්නේ. ඒවා අමතක කරන්න එපා.

තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේම පක්ෂයේ ඉඳගෙන මේ ආණ්ඩුවත් එක්ක එකතු වෙලා උතුරේ අහිංසක ජනතාව ඒ විඳින පීඩනයෙන් මුදා ගන්න වැඩ කරන්න. ඔබතුමන්ලාට ඒ ආරාධනය කරමින්, මම නිහඬ වනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, I rise to a point of Order.
கௌரவ உறுப்பினர் அவர்களே, நான் ஓர் ஆசிரியராகவும் அதிபராகவும் இருந்ததை நீங்கள் ஏற்றுக்கொண்டது நல்லது. நீங்களும் ஓர் ஆசிரியராக இருந்தவர். நாங்கள் இப்பொழுதும் அரசாங்கத்தோடு பேசுவதற்குத் தயார்! நாங்கள் பேச மாட்டோம் என்று சொல்லவில்லையே! கௌரவ பிரதம அமைச்சர் அவர்கள் இங்கிருக்கின்றார். அவரோடுகூட, அவரது காலத்தில் 13 தடவை நாங்கள் பேசியிருக்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 24ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.06]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් ශ්‍රී ලංකාවේ 76 වන අය වැය ඉදිරිපත් වනකොට ආණ්ඩුවේ ගොඩක් අය කිව්වේ, "බැසිල් රාජපක්ෂ මහත්මයාගේ පළමු අය වැයෙන් ලොකු පෙරළියක් වනවා. ලොකු වෙනසක් වනවා" කියලායි. ජනතාවත් හිතුවා, "ඇත්තටම, යම් ප්‍රමාණයකට පෙරළියක් වෙයි දෝ" කියලා. නමුත්, අපි ඊයේ දැක්කේ ජනතාවට පෙරළිකාරී අය වැයක් ඉදිරිපත් කරනවා නොවෙයි. ජනතාවට තවත් දඬුවම් දාලා කලන්තේ හැදෙන අය වැයක් තමයි ඊයේ ඉදිරිපත් වුණේ. වැඩි වෙලා තිබෙන බඩු මිල නිසා දරා ගන්න බැරි ජීවන වියදමත් එක්ක ආර්ථික අතින් මිරිකිලා, තෙරපිලා ඉන්න වෙලාවේ මේ අය වැය තුළින් යම් හෝ සහනයක් දෙයි කියලා ජනතාව බලාපොරොත්තු වුණාට, ඇත්තටම ඒ කිසිවක් මේ අය වැය තුළ නැහැ.

හරියටම ගත්තොත්, මෙවර අය වැය සංවර්ධන අය වැයකුත් නොවෙයි; සුබසාධන අය වැයකුත් නොවෙයි. ආරක්ෂාකාරී අය වැයක් - defensive Budget එකක් - තමයි ඉදිරිපත් කළේ. Defensive Budget එකක් ඉදිරිපත් කරන්න, වචන හරඹයක් ඉදිරිපත් කළා. ලස්සන, ලස්සන වචන කිව්වා. අපට මතකයි එතුමාම ඒ කාලයේ "අපි වවපු - රට හදමු" වාගේ වචනත් දැම්මා. හැබැයි, 73 අවුරුද්දක ප්‍රතිඵලය තමයි මට පෙර කථා කළ ආණ්ඩුවේ ගරු මන්ත්‍රීතුමා කිව්වේ. එතුමාගේ ආසනයේ ජීවත් වෙන්න නිවාසයක් නැතිව රෙදි කෑලි වට කරගෙන කුඩාරම් වාගේ ඒවායේ ජීවත් වන පවුල් ඉන්නවා කිව්වා. අන්න ඒ පවුල්වලට ගෙයක් හදා දෙන්න අගමැතිතුමා මැදිහත් වනවා කිව්වා. ඒක තමයි ඇත්ත තත්ත්වය. තමන්ගේ ආසනයේම එහෙම ජීවත් වන පවුල් ඉන්නවා කියන්නේම, පසුගිය කාලයේ ඉදිරිපත් කළ අය වැයවල ප්‍රතිඵලය තමයි, ඒ. රට හැදුණා නම්, රටේ ආර්ථිකය ශක්තිමත් වුණා නම්, 76 වන වතාවට අය වැය ඉදිරිපත් වනකොට රෙදි කෑලි වටේ එල්ලාගෙන ජීවත් වන ජනතාවක් ඉන්න ඕනෑ නැහැ. නමුත්, ඒක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. මෙවර අය වැය තුළ තිබෙන්නේත් ඒ ආරක්ෂාකාරී පියවර තමයි. මෙය සංවර්ධනය ඉලක්ක කරගත් අය වැයක් නොවෙයි.

ඔබතුමන්ලා කියනවා, කොවිඩ් වසංගතය තමයි මේ හැම දේකටම බලපෑවේ කියලා. නැහැ. ඒක සම්පූර්ණ අසත්‍යයක්. 2020 පළමු කාර්තුවේදී අපේ රටේ කොවිඩ් වසංගතය තිබුණේ නැහැ. අපේ රටේ පළමු කොවිඩ් රෝගියා හඳුනා ගත්තේ 2020 මාර්තු මාසයේ 11 වැනි දා. ඇත්තෙන්ම අප්‍රේල් මාසයෙන් පස්සේ තමයි රට වැහුවේ. හැබැයි, පළමු කාර්තුවේ අපේ රටේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ කඩා වැටීම සියයට 5.6යි, කර්මාන්ත ක්ෂේත්‍රයේ කඩා වැටීම සියයට 7.8යි. 2020 පළමු කාර්තුවේ අපේ සේවා ආර්ථිකය සියයට 1.6කින් පහත වැටුණා. පළමු කාර්තුවේ මුළු කඩා වැටීම සියයට සෘණ 1.7යි. මෙය කොවිඩ් වසංගතය නිසා ද වුණේ? 2020 පළමු කාර්තුවේ රටේ ආර්ථිකය සියයට සෘණ 1.7ට පහත වැටුණේ කොවිඩ් නිසාද? නැහැ.

දැන් හාල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. හාල් මාෆියාවක් ඇති වෙලා තිබෙනවා. හාල් කිලෝවක මිල රුපියල් 240, 260 දක්වා ඉහළ ගියේ කොවිඩ් නිසා ද? නැහැ නේ. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහලා බලන්න. ඔබතුමන්ලාට හාල් මාෆියාව මෙල්ල කර ගන්න බැරි වුණා. ඇත්ත කථාව ඒකයි. ඔබතුමන්ලා හදිසි නීතිය දැම්මා. මේ සම්බන්ධව කටයුතු කරන්න හමුදාවේ හිටපු නිලධාරින් වන මේජර් ජෙනරාල් නිවුන්හැල්ල බ්‍රිගේඩියර් කඳනආරච්චි, මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක පත් කළා. හමුදාවේ කට්ටිය කොච්චර දැම්මත් හාල් මාෆියාව මෙල්ල කර ගන්න බැරි වුණා.

ඒක කොවිඩ් එක්ක සම්බන්ධයක් නැහැ. අද නාඩු සහල්වල, සම්බා සහල්වල, කීරි සම්බාවල මිල වැඩි වෙලා තිබෙන්නේ කොවිඩ්වල බලපෑමෙන් නොවෙයි. සීනි මිල වැඩි වුණේ කොහොමද? ඔබතුමන්ලා සීනි කිලෝ එකක ආනයන බද්ද සත 25 දක්වා අඩු කළා. ඒකෙන් තමයි සීනි මාෆියාවක් ඇති වුණේ. විල්මා ට්‍රේඩින් කොම්පැනිය සීනි මෙට්‍රික් ටොන් විශාල ප්‍රමාණයක් ගෙනැල්ලා, තොග ගබඩා කර ගත්තා. අන්තිමට සීනි කිලෝ එක රුපියල් 240ට නැග්ගුවා. ඒ ව්‍යාපාරිකයන් අදත් ඒ ලාභය ලබනවා. පෙබරවාරි 28වන දා වනකොට ආණ්ඩුවේ අලාභය රුපියල් කෝටි 1,500යි. අද වනකොට එය රුපියල් කෝටි 6,000ක් විතර දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒවාට කොවිඩ් එක්ක සම්බන්ධයක් නැහැ. ඒවා, වැරදි තීන්දු නිසා වුණු දේවල්. ඒ නිසා මේ හැම දේම කොවිඩ්වලට ඌනනය කරන්න එපා. අද ගොවි ජනතාව මුහුණ දීලා තිබෙන පොහොර ප්‍රශ්නය, බෙහෙත් ප්‍රශ්නය කොවිඩ් වසංගතයත් එක්ක ඇති වුණු දේවල් නොවෙයි. ඒ ප්‍රශ්න ජනාධිපතිතුමා ගත්ත වැරදි තීන්දුවත් එක්ක ඇති වුණු ඒවා. ගොවි ජනතාව මහ පාරට වැටිලා තිබෙන්නේ ඒකෙන්. ඒ නිසා, කොවිඩ් හේතුවෙන් ආර්ථිකය වැටුණාය කියන එක සම්පූර්ණයෙන් අසත්‍යයක්.

ඔබතුමන්ලාගේ මේ අයවැය ලේඛන තුළ ඉතා පැහැදිලිව කියා තිබෙනවා, ආණ්ඩුවේ ආදායමට වඩා වියදම වැඩියි කියලා. ඇත්තටම ගත්තොත්, වියදම රුපියල් බිලියන 3,912ක් කිව්වාට ඊට වඩා වැඩියි. මොකද, "ණය ගෙවීම්" මෙතැනට ඇතුළත් කරලා නැහැ. ඔබතුමන්ලාගේ අය වැය උපලේඛනයේ ඉතා පැහැදිලිව තිබෙනවා, ණය ආපසු ගෙවීම් ඇතුළු මුළු ගෙවීම් පිළිබඳව. ඒකේ රුපියල් බිලියන 5,245ක් තිබෙනවා. ඒක තමයි ඇත්ත වියදම. අපේ ආදායම රුපියල් බිලියන 2,284යි. හැබැයි, වියදම රුපියල් බිලියන 5,245යි. ආදායමට වඩා වියදම වැඩියි. පසු ගිය අවුරුදු ගණනාව තිස්සේ අපි මුහුණ දීපු යථාර්ථය මේකයි. නිෂ්පාදන මත ආර්ථිකය මෙහෙයවූවා නම් එහෙම වෙන්නේ නැහැ. සේවා ගැන විශ්වාසය තියලා කටයුතු කළ නිසා තමයි මේ තත්ත්වය ඇති වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1977දී කෘෂි කර්මාන්තයෙන් අපේ ජාතික ආදායමට සියයට 31ක් එකතු කළා. අද වනකොට කෘෂි කර්මාන්තයෙන් ජාතික ආදායමට සියයට 7යි එකතු වෙන්නේ. අපේ නිෂ්පාදනය වැට්ටුවා. ගොවියා හිතලා මතලා වැට්ටුවා නොවෙයි, ආණ්ඩුවේ වැරදි ප්‍රතිපත්ති නිසා වැටුණු තැන ඒකයි. පසුගිය කාලය පුරාවටම අපි නිෂ්පාදන ආර්ථිකයකට ගියේ නැහැ. මෙවර අය වැය ලේඛනය තුළත් වචනය තිබුණාට හරයෙන් නිෂ්පාදන ආර්ථිකයට යාමක් නැහැ. ඒ නිසා අපට තවත් මේ වියදම් පිළිබඳ අර්බුදයට මුහුණ දෙන්න සිදු වෙනවා. අද ඒ නිසාම මහා විශාල ණය අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඊළඟට, ඩොලර් අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. බඩු මිල, ජීවන වියදම පිළිබඳ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි අපේ ආදායම් නැති කම. රටේ ආදායම කඩා වැටිලා තිබෙනවා. එයාර් ලංකා සමාගම දවසට රුපියල් කෝටි 84ක් පාඩු ලබනවා. ආදායම අහිමි වෙනවා විතරක් නොවෙයි, පසුගිය කාලයේ වුණු අඩුපාඩුකම් නිසා එයාර් ලංකා සමාගම එක දවසකට රුපියල් කෝටි 84ක් වතුරේ දමනවා. ඒවා කොහොමද වෙනස් කරන්නේ? ඒ නාස්ති වන වියදම් කොහොමද පියවා ගන්නේ? එහෙම එකක් ගැන මෙවර අය වැය ලේඛනයේ නැහැ. ඒ නිසා තමයි අද මේ අර්බුදය මෙච්චර උග්‍ර වෙලා තිබෙන්නේ.

පසුගිය කාලය පුරාවට රටේ උපයන ආදායමෙන් වංචා, දූෂණවලට කොච්චර නාස්ති වුණාද? වංචා, දූෂණ නැති කිරීම ගැන නම් වචන තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඊයේ අය වැය කථාවේදී පැහැදිලිව කිව්වා, "වංචාවෙන්, දූෂණයෙන් තොරව රට පාලනය කරන නායකයෙක් ඉන්නවා. ඒ නිසා එහෙම දේවල් වෙන්නේ නැහැ" කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එහෙම කථාවක් කියැවෙන කොට මට ඇත්තටම පුදුම හිතුණා. ඒක මුළු රටම දන්නා දෙයක්.

ඊයේ පෙරේදා ලිට්රෝ ගෑස් සමාගමේ සභාපතිවරයා කියපු කථාව මොකක්ද? ලිට්රෝ ගෑස් සමාගමේ සභාපති ජනාධිපතිවරයා පත් කළ පුද්ගලයෙක්. එතුමා කියනවා, ගෑස් ගෙන්වීමේදී මහා වංචාවක්, දූෂණයක් තිබෙනවා, එතැන ලොකු මාෆියාවක් තිබෙනවා, ඒ නිසා තමයි ගෑස් හිඟයක් ඇති වෙලා තිබෙන්නේ කියලා. එතකොට සමාගමේ සභාපතිවරයා පිළිගන්නවා, අදත් ඒ වංචා, දූෂණ සිදු වෙනවා කියලා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයා එතැනින් ඉවත් වුණා, සුදු ලූනු වංචාව සහ තවත් ගොඩක් වංචා ඒක ඇතුළත වෙනවා කියලා. අද එතුමා එළියට ඇවිල්ලා ඒ දේවල් කියනවා. ඒ, වෙන කවුරුවත් නොවෙයි, වියත් මගේ හිටපු පුද්ගලයෙක්. එතකොට එතුමා කියන්නේ අසත්‍යයද? ලිට්රෝ ගෑස් සමාගමේ සභාපති කියන්නේ අසත්‍යයද? ජනතා විමුක්ති පෙරමුණේ අපි කිව්වා නම් කියාවි, විපක්ෂයේ ඉන්න නිසා

[ගරු විජිත හේරත් මහතා]

කුහකකමට කියනවා කියලා. නැහැ, ආණ්ඩුවෙන්ම තමයි මේවා කියන්නේ. අද මේ රටේ විශාල ගෑස් භීතියක් තිබෙනවා. මේ කථා කරන මොහොතේත් මිනිසුන්ට ගෙවල්වල උයන්න පිහන්න ගෑස් නැහැ. ගෑස් නැතිව සමහර බත් කඩ, තේ කඩ වහලා. ජනතාවගේ ඒ ප්‍රශ්නයට මේවර අය වැයෙන් උත්තරයක් හම්බ වෙලා නැහැ. ගෑස් මාෆියාව මෙල්ල කරලා, මිනිසුන්ට අවශ්‍ය ගෑස් ටික ලබා දෙන ක්‍රමවේදයක් ගැන කියලා නැහැ.

මේ හැම එකකින්ම පැහැදිලියි, බැසිල් රාජපක්ෂ මහත්මයා ඉදිරිපත් කර තිබෙන අය වැයත් සාම්ප්‍රදායික තවත් ලියවිල්ලක් විතරයි කියන එක. මේක වචන ටිකක් එහාට මෙහාට මාරු කරලා තිබෙන අය වැය ලේඛනයක් හැර, මේ රට මුහුණ දී තිබෙන දැවැන්ත ණය අර්බුදයට, මහා ආර්ථික අර්බුදයට උත්තරයක් ලැබෙන අය වැය ලේඛනයක් නොවෙයි. මෙය, රජය බොහෝ ආරක්ෂණවාදී ක්‍රියා මාර්ග ගත්ත අය වැය ලේඛනයක් පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය පිළිබඳව කථා කළොත්, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, 2005 වෙනතුරු ගත්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි කියලා. 1950 ඉඳලා 2005 වෙනකම් ගනිපු ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි. ඒ වාගේම, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලය තුළ -ඒ අවුරුදු 9ට- ගත්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 6යි කියා එතුමා කිව්වා. එතකොට 1950 සිට 2005 දක්වා ට්‍රිලියන 2යි; 2005 සිට 2014 දක්වා ට්‍රිලියන 6යි, එකතුව ට්‍රිලියන 8යි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ට්‍රිලියන 6ක් නොවෙයි, ට්‍රිලියන 5යි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
හොඳයි, ඒ අවුරුදු 9ට ගත්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 5යි කියමුකෝ. එතකොට එකතුව ට්‍රිලියන 7යි. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂය ප්‍රධාන යහ පාලන ආණ්ඩුවේ අවුරුදු 5ක කාලය තුළ තවත් ට්‍රිලියන 6ක් ණය වශයෙන් ගත්තා. ගරු මුදල් ඇමතිතුමා ඒ සේරම ගැන කථා කළා. හැබැයි, එතැනින් එහාට ගත්ත ණය ගැන කථා කළේ නැහැ. ඇයි, 2020 අවුරුද්දේ ගත්ත ණය ප්‍රමාණය කීයද? 2020දී ට්‍රිලියන 2යි. එතකොට 1950 ඉඳලා 2005 වනතුරුම ගත්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි. 2020 දී, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ එක අවුරුද්දට ගත්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි. 2021 දී ට්‍රිලියන 3යි. දැන් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අය වැය තුළින් 2022 වසර වෙනුවෙන් තවත් ට්‍රිලියන 3ක් ණය ගන්න බලාපොරොත්තු වනවා. එතකොට එකතුව කීයද? අවුරුදු 3ට ට්‍රිලියන 8යි. මේක හරි ද? මේකෙන් සතුටු වෙන්න පුළුවන් ද? *[බාධා කිරීමක්]* කවුරු හරි මොළය නැති කෙනෙක් මට බාධා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ණය අර්බුදයෙන් රට ගොඩ ගන්න පුළුවන් ද මේ වාගේ අයත් එක්ක? මේ රට මුහුණ දීලා තිබෙන දැවැන්ත ආර්ථික අර්බුදයෙන් රට ගොඩ ගන්න පුළුවන් ද මේ වාගේ අයත් එක්ක? බැහැ නේ.

අද ලෝක බැංකුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගන්නේ නැහැ කිව්වාට මේ අය වැය ලේඛනය ඇතුළේ ඉතා පැහැදිලිව කියනවා, ලෝක බැංකුවෙන් අපි ඩොලර් මිලියන 301ක් අරගෙන තිබෙන බව. පසුගිය අගෝස්තු මාසය දක්වා ඩොලර් මිලියන 301ක් අරන් තිබෙනවා ලෝක බැංකුවෙන්. ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 212ක් ගන්නවා. ජත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගත්තේ නැහැ කියනවා. නමුත් ලෝක බැංකුවෙන් අරගෙන තිබෙන්නේ. ආසියානු සංවර්ධන බැංකුවෙන් අරගෙන තිබෙන්නේ. ඊළඟට, මහ බැංකුවේ අධිපතිවරයා සහ ආණ්ඩුව ගත්ත ඊළඟ ක්‍රියා මාර්ගය තමයි, මේ මූල්‍ය අර්බුදය පියවන්න මුදල් අච්චු ගහපු එක. 2019 දෙසැම්බර් මාසයේ ඉඳලා 2021 අගෝස්තු මාසය දක්වා ට්‍රිලියන 2.8ක් මුදල් අච්චු ගහලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 42ක ප්‍රමාණයකින් මුදල් වෙළෙඳ පොළට නිකුත් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් අපි දන්නා ආර්ථික විද්‍යාව අනුව නිෂ්පාදනයක් නැතිව මුදල් අච්චු ගැහුවාම භාණ්ඩ හා සේවා මිල ඉහළ යනවා; ඒක වළක්වන්න බැහැ. මහ බැංකුවේ ප්‍රධාන අරමුණ හා කාර්ය භාරය වන්නේ, උද්ධමනය පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමයි. හැබැයි, ආණ්ඩුව සිද්ධ කළේ මොකක්ද? දිගින් දිගටම මුදල් අච්චු ගැහුවා. මුදල් අච්චු ගැහුවේ ලෝකයේ තිබෙන අලුත් ආර්ථික න්‍යායට අනුවයි; Modern Monetary Theory - MMT - එකට අනුවයි. ඒක ඇමෙරිකා එක්සත් ජනපදයට හරි. මොකද, 'ඩොලරය' කියන්නේ ලෝකය පුරා සංසරණය වන ජාත්‍යන්තර මූල්‍ය ඒකකයක්. හැබැයි, ලංකාවේ රුපියලට ඒක අදාළ නැහැ. ඒක අපට ප්‍රායෝගිකව ගැළපෙන්නේ නැහැ. ආණ්ඩුවේ ඔස්තාර්ලා ඒ වෙනුවෙන් කිව්වේ මොකක්ද? මුදල් අච්චු ගැහුවාම බැංකු පොලී අනුපාතය පහළ බහිනවා; බැංකු පොලී අනුපාතය පහළ බැස්සාම පෞද්ගලික අංශය බැංකුවලින් ණය අරගෙන ආයෝජනය කරනවා; නිෂ්පාදනය වැඩි වෙනවා; ආර්ථිකය ශක්තිමත් වෙනවා; ආර්ථික වර්ධන වේගය වැඩි වෙනවා; ආර්ථික වෘද්ධිය වැඩි වෙනවා කියලායි ඒ අය කිව්වේ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, පෞද්ගලික අංශය බැංකුවලින් ණය අරගෙන ආයෝජනය කරලා නිෂ්පාදනය වැඩි කළේ නැති එකයි. මේ කාලය පුරාවටම වාණිජ බැංකුවලින් වැඩිපුරම ණය ගත්තේ කවුද? රජයයි. රාජ්‍ය බැංකුවලින් නිකුත් කරපු මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 2,400ක්. 2014 දෙසැම්බර් ඉඳලා 2021 අගෝස්තු මාසය දක්වා වාණිජ බැංකුවලින් නිකුත් කරපු ණය ප්‍රමාණය රුපියල් කෝටි 2,400යි. ඒ කෝටි 2,400න්, රුපියල් කෝටි 2,200ක්ම අරගෙන තිබෙන්නේ රජය. පෞද්ගලික අංශයේ ආයෝජනයට යොදලා තිබෙන්නේ කෝටි 200යි. ඒ නිසා සල්ලි අච්චු ගහලා ආර්ථික වෘද්ධිය වැඩි වෙනවා ද? බැංකු පොලී අනුපාතිකය වෙනස් කරලා රාජ්‍ය බැංකුවලින් ණය අරගෙන, ඒ ණය නිෂ්පාදනයට යෙදවිලා තිබෙනවා ද? නැහැ, ප්‍රතිඵලය ලෙස එහෙම වෙලා නැහැ. මේ පොහොර ගනුදෙනුවටත් රජයේ බැංකුවලින් තමයි සල්ලි ගත්තේ.

ඒක නිසා හරි පැහැදිලියි, Modern Monetary Theory -MMT- එක ජාත්‍යන්තරයේ ඇමෙරිකා එක්සත් ජනපදයට ගැළපුනාට ලංකාවට ගැළපෙන්නේ නැහැ කියන එක. ඒක ප්‍රායෝගිකව ඔප්පු වෙලා තිබෙනවා. ඒ මුදල් අරගෙන මොකක්ද කළේ? රජය ඒ මුදල් ආයෝජනය කරලා නිෂ්පාදනයෙන් ප්‍රතිලාභ හෙව්වාද? නැහැ. ලක්ෂ 14ක් වන රජයේ සේවකයන්ට පඩි ගෙවන්නයි, විශ්‍රාම වැටුප් ගෙවන්නයි තමයි ඒවා වියදම් කළේ. ඊළඟට, ආණ්ඩුවේ සමහර නාස්තිකාර වියදම්වලට ඒ මුදල් යෙදෙව්වා. එහෙම නැතිව, ඒවා ආයෝජනයට යෙදෙව්වා නොවෙයි. ඒ නිසා මුදල් අච්චු ගහපු එකේ ප්‍රතිඵලය ඔබතුමන්ලා බලාපොරොත්තු වන ආකාරයට රටට ලැබිලා නැහැ. ඒ තුළ ආර්ථික වෘද්ධියක් ඇති වෙලා නැහැ. ඉල්ලුමට සරිලන විධියට සැපයුම ඇති වෙලා, නිෂ්පාදනය වැඩි වෙලා නැහැ. ඉල්ලුමට සරිලන සැපයුම නැති වුණාම උද්ධමනය වැඩි වෙනවා. ඔක්තෝබර් මාසයේ උද්ධමනය සියයට 7.6යි. මේ අය වැයෙන් බලාපොරොත්තු වෙනවා, උද්ධමනය ලබන අවුරුද්දේ සියයට 5.5ට අඩු කරන්න. කොහොමද අඩු කරන්නේ? බඩු මිල වේගයෙන් වැඩි වෙනවා. ගොවියා පාරට වැටෙනකොට, ගොවිතැන් විනාශ වෙනකොට ලබන අවුරුද්දේ මේ උද්ධමනය තවත් වැඩි වෙනවා. ඒ නිසා ඒ කියන ඉලක්කවලට යන්න බැහැ. පසුගිය කාලයේත් ඒ ඉලක්කවලට ගිහිල්ලා නැහැ. ඔය හැමදේකින්ම වෙන්න පුළුවන් එකම දේ තමයි තවත් ණය කන්දක් ජනතාවගේ හිස මතට පහත් වෙන එක. දැන් කෝටි

තුන්ලක්ෂ විසිදහසක ණයක් ජනතාවගේ හිස මතට පහත් වෙලා තිබෙන්නේ. ඒක තමයි මම කිව්වේ, මේ අය වැය ජනතාවට දඬුවම් දමන, ක්ලාන්තය හැදෙන අය වැයක් කියලා. සාමාන්‍ය ගොවියා, කම්කරුවා, රජයේ සේවකයා, පෞද්ගලික අංශයේ සේවකයා තමයි මේ ණය ගෙවන්න ඕනෑ. එහෙම නැතිව මේ ණය ගෙවන්න රජයේ ඇමතිවරුන්ට ක්‍රමයක් නැහැ. ඔබතුමන්ලා මේ ඔක්කොම කැත වහගන්න කැබිනට් ඇමතිවරු සහ අනෙකුත් අමාත්‍යවරු වෙනුවෙන් තිබෙන වියදම් කපා හරිනවා කියලා පොඩි රැවටිල්ලක් කළා. ගණන් හදලා බලන්නකෝ. ඇමතිවරු ගණන උපරිම වශයෙන් ගත්තොත්, කැබිනට් ඇමතිවරු තිස්දෙනායි, රාජ්‍ය ඇමතිවරු හතළිස්දෙනායි. එකතුව හැත්තෑව නේ. ඒ අයට දෙන ඉන්ධන දීමනාව මාසයට පෙට්‍රල් ලීටර් 5කින් අඩු කරනවා කියනවා. ගණන් එකතු කරලා ගත්තොත්, සියලුම අයගෙන් අඩු කරන ප්‍රමාණය පෙට්‍රල් ලීටර් 350යි. පෙට්‍රල් ලීටරයක් රුපියල් 157යි නේ. එතකොට ඒ වෙනුවෙන් මාසයකට වැය වන්නේ රුපියල් 50,000යි. ඉතින් කැබිනට් ඇමතිවරු සහ අනෙකුත් අමාත්‍යවරු සඳහා වන වියදම්වලින් රුපියල් 50,000ක් පමණක් අඩු කරලා රටේ ජනතාවට කියනවා, “අපි කැපකිරීම් කළා, අපි අපේ වියදම් කපා හැරියා” කියලා. කාටද මේ බොරු කරන්නේ? කවුද මේ රවටන්න හදන්නේ? මේ අය වැය ජනතාවට සහන දෙන අය වැයක් නම්, ඇත්තටම ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වන, පසුගිය කාලයේ ලාභ ලබන්න බැරි වුණු අයට සහනයක් ලබා දෙන අය වැයක් වෙන්න ඕනෑ.

ත්‍රිරෝද රථ හිමියන්ට සහන දීමනාවක් ලබා දෙන්න රුපියල් මිලියන 600ක් වෙන් කළා කියනවා. මම දන්න විධියට ලංකාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ ලක්ෂ 11ක් තිබෙනවා. අපි ඒවායින් ලක්ෂ 3ක් පැත්තකින් තියමුකෝ. පාරේ හයර් යන ත්‍රිරෝද රථ ලක්ෂ 8ක විතරක් ගනිමු. අර වෙන් කරපු රුපියල් මිලියන 600 ඒ ලක්ෂ අටෙන් බෙදලා බැලුවාම, ත්‍රිරෝද රථ හිමිකරුවෙකුට ලැබෙන්නේ රුපියල් 750යි. රුපියල් 750ක් දීලා තෙල් ලීටර් කීයද ගහන්න පුළුවන්? ඔබතුමන්ලා කාටද මේ විජ්ජා පෙන්වන්නේ? මේ රටේ ජනතාවටයි ඔබතුමන්ලා මෙහෙම කරන්නේ. ජනතාව මේවාට රැවටෙන්නේ නැහැ. ජනතාව ඒක තේරුම් අරගෙන තිබෙන්නේ. මෙවැනි බොරු පැලැස්තර දමලා ජනතාව රවට්ටලා මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න බැහැ.

දැන් තිබෙන මේ ඩොලර් අර්බුදයත් එක්ක අපේ රුපියල කඩාගෙන වැටෙනවා. දැන් මහ විශාල අර්බුදයකට ඇවිත් තිබෙන්නේ. ඒකෙන් වෙන්න පුළුවන් අනෙක් හානිදායක තත්ත්වය තමයි අපි ගත්ත ණයවලටත් ගෙවන රුපියල් ප්‍රමාණය වැඩි වන එක. අපි කලින් ඩොලර් ලක්ෂයක් ගත්තා කියලා හිතමු. ඔබතුමන්ලා කියන විධියට අද ඩොලරයක වටිනාකම රුපියල් 203යි නේ. එහෙම නම් ඒ වටිනාකම අනුව අපි රුපියල් මිලියන 20.3ක් ගෙවන්න ඕනෑ. හැබැයි, දැන් ඩොලර් එක රුපියල් 250ට, 260ට නැඟලා තිබෙන්නේ. තව මාස දෙක තුනකින් ඩොලර් එකේ අගය රුපියල් 300 වුණොත්, අපි ගෙවිය යුතු ණය ප්‍රමාණය රුපියල් මිලියන 30යි. ඒ කියන්නේ, රුපියල බාල්දු වෙන්න, බාල්දු වෙන්න අපි ගෙවන්න ඕනෑ ණය ප්‍රමාණය තවත් වැඩි වෙනවා. ඒ බරත් වැටෙන්නේ සාමාන්‍ය ජනතාව මතට. එහි ප්‍රතිවිපාකවලට මුහුණ දෙන්න වෙන්නේත් මේ රටේ සාමාන්‍ය ජනතාවට විතරයි.

ඔබතුමන්ලා තරුණයන්ට කියනවා, රට හැර දමා යන්න ඕනෑ නැහැ, අපේ රට තුළ ජීවත් වෙන්න පුළුවන් ශක්තිමත් තත්ත්වයක් හදනවා කියලා. හැබැයි, අය වැය තුළ තිබෙන්නේ මොකක්ද? තරුණ තරුණියන්ට රට යන්න පාර කපන, ඒකට ඉඩ සලසන යෝජනා තමයි ඒකේ ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු අගමැතිතුමා ඇහුවා, චිත්‍ර -සිතුවම්- ඇඳපු ඒ තරුණයෝ කෝ, කියලා. ඒ තරුණයෝ දැන් මහ පාරේ අතරමං වෙලා, බෝක්කු කණු උඩට වෙලා ඉන්නවා. ඒ ගොල්ලෝ රස්තියාදු ගහනවා, රක්ෂා නැතිව. සමහරු රට යන්න පාස්පෝර්ට්, වීසා හදා ගන්න පෝලිමේ ඉන්නවා. ඇයි මේ? මේ රටේ ආර්ථිකය කඩා වැටිලා. මිලියන දෙකක් වන රට ගිය ශ්‍රී ලාංකිකයන් තමයි වැඩියෙන්ම විදේශ විනිමය සොයලා NRFC ගිණුමට එවන්නේ. හැබැයි, ඊයේ, පෙරේදා මහ බැංකු අධිපතිවරයා මොකක්ද කළේ? චක්‍රලේඛයක් ගහලා, NRFC ගිණුමට එන ඩොලර් සල්ලි ටික මහ බැංකුව කොල්ලකනවා; හොරා කනවා.

විදේශ රැකියාවක් කරන ලාංකිකයෙකු ඒ රටේ ඉඳන් ඩොලර් 20,000ක් එවලා මෙහෙන් ඒ සල්ලි ටික ගන්න ගියොත්, මෙහේ ගිණුමේ ඩොලර් නැහැ. මොකද, මහ බැංකුව ඒක අදිනවා; ඇදලා රුපියල් කරලා තියනවා. මොකක්ද මේ කරන්නේ? අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා මේ කරන්නේ මොකක්ද? විදේශ ශ්‍රමිකයන් ලංකාවට එවන ඩොලර් ටිකත් කොල්ල කෑමක් මේ කරන්නේ. එහෙම කරලා කියනවා, "රටවලට ගිහින් රැකියා කරන්න, ඩොලර් හොයන්න, ඒවා අපට එවන්න" කියලා. ඒ එවන ඩොලර් ටිකත් මහ බැංකුව කොල්ල කනවා නම් ඒ ගොල්ලෝ සල්ලි එවන එකක් නැහැ. මේ මඟින් උණ්ඩියල් ක්‍රමයට පාර කපනවා; හොර පාරෙන් සල්ලි එවන්න පාර කපනවා. එහෙම නැත්නම්, ඒ අය සල්ලි එවන්නේ නැතිව ඉන්නවා. ඕක තමයි වෙන්නේ. අද විදේශගත ශ්‍රී ලාංකිකයෝ හුඟදෙනෙකු කියන්නේ, "අපි සල්ලි එවන්නේ නැහැ. එව්වාට වැඩක් නැහැ, තේරුමක් නැහැ" කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කර්මාන්තය පිළිබඳවත් මේ අය වැය යෝජනා තුළ සඳහන් වෙනවා. සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් ලැබෙනවා ලු. ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් කෙසේ වෙතත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ලංකාවට වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් ආවේ 2018 වර්ෂයේදී. එම වර්ෂයේදී සංචාරකයෝ ලක්ෂ 23ක් විතර ඇවිල්ලා තිබුණා. එතරම් පිරිසක් ඇවිල්ලා තමයි ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5ක ආදායමක් උපයා තිබුණේ. ඒ ආදායම හැම දාම සොයන්න බැහැ. සංචාරකයන් මේ රටට එන්න බලපාන හේතු මොනවාද? මෙහේ හෝටල් කාමරවල මිල අඩු නම්, මෙහේ ඇවිල්ලා බොන තැඹිලි ගෙඩියක මිල අඩු නම්, පාරේ ටැක්සියෙන් යන කොට අය කරන මිල අඩු නම් තමයි සංචාරකයන් ලංකාවට එන්නේ. ලංකාවේ ආර්ථිකය කඩා වැටිලා නම්, කලින් තැඹිලි ගෙඩියක් බොන්න වියදම් කළේ ඩොලර් එකක් වුණත් හෙට ඒ සඳහා ඩොලර් දෙකක් වියදම් කරන්න වෙනවා නම් කලින් ආ ඒ සුද්දා ආයෙත් එන්නේ නැහැ. ඇත්ත කථාව ඒකයි. වැඩිහරියක්ම අපේ රටට එන්නේ, බජට් සුද්දෝ. ලක්ෂ විසි ගණනක් ආවත්, බජට් සුද්දෝ තමයි සංචාරකයන් හැටියට මෙහේට වැඩිහරියක්ම එන්නේ. ඒ ගොල්ලෝ මේ රටට එන්න කලින් මේ රටේ ආර්ථිකය පිළිබඳව සොයා බලනවා. බඩු මිල වැඩි වෙලා, රටේ ආර්ථිකය කඩා වැටිලා නම් ඔබතුමන්ලා බලාපොරොත්තු වන විධියට සංචාරක කර්මාන්තයෙන් ආදායම සොයන්නත් බැහැ. දැන් සිද්ධ වන දේ අනුව හරි පැහැදිලිව යථාර්ථය පෙනෙනවා. තමුන්නාන්සේලා හික්කඩුව, අලුත්ගම දිහාට ගිහිල්ලා බලන්න. ඒ මුහුදු වෙරළ අයිනේ ඉන්න ව්‍යාපාරිකයන්ගෙන් අහලා බලන්න, 'සංචාරකයෝ එනවාද? ඇවිල්ලා වියදම් කරනවාද?' කියලා. ඒ අය කියාවි, "නැහැ" කියලා. සංචාරකයන් ආවත්, දැන් මේ රටේ රුපියල බාල්දු වීමත් එක්ක, ඒ ගොල්ලනුත් වියදම් සීමා කරන නිසා, අපේක්ෂිත ආදායම ලැබෙන්නේ නැහැ. අනෙක් අතට, සංචාරකයෝ එන්නේත් නැහැ. ඒ නිසා ඔය කියන ආදායම අපට සොයන්නත් බැහැ.

ඊළඟට, ආයෝජකයන් ගෙන්වා ගැනීම ගැන බලමු. ආයෝජකයන් ගෙන්වා ගන්න නම්, රටේ ආර්ථිකය පිළිබඳ ඔවුන්ගේ හිතේ විශ්වාසයක් ඇති කරන්න ඕනෑ. ආයෝජකයෙකු ලංකාවට එන්නේ ලංකාවේ තිබෙන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසාය ගැන බලලායි. අද මේ රටේ ආර්ථිකය කඩා වැටීමත් එක්ක ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටිලා තිබෙන්නේ. ඒ නිසා ඒ අය ලංකාවේ ආයෝජනය කරන්න එන්නේ නැහැ; කොච්චර කථා කළත්, ආරාධනා කළත් එන්නේ නැහැ. එන

[ගරු විජිත හේරත් මහතා]

ආයෝජකයාත් අපේ තිබෙන ලාභාංශ ටික අරගෙන යනවා. දැන් මේ ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තිය අනුව, විදේශිකයන් ඇවිල්ලා මෙහේ රස්සාවල් කරලා වැටුප අරගෙන යනවා. විදේශිකයන් ලංකාවේ ඉඳලා හම්බ කරන සල්ලි, -වැටුප් දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියනයකට ආසන්න මුදලක්; මිලියන 900 ගණනක්- ආපහු අරගෙන යනවා; ලාභාංශත් අරගෙන යනවා. අද මේ රටේ ආර්ථිකය වැටිලා තිබෙන තත්ත්වය අනුව, ඒ පැත්තෙන් මේ ආණ්ඩුව බලාපොරොත්තු වන දේවල් සිද්ධ වන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය ගැනත් අද කථා කළා. ගුරු වැටුප් විෂමතාව විසඳන්න යම් සාධනීය පියවරක් ගත්තා. ඒක බොහොම හොඳයි. හැබැයි, ඒක රිදී බන්දේසියේ තියලා දුන්නේ නැහැ. ඒක දෙන්න තිබුණේ එහෙමයි. නමුත්, එහෙම දුන්නේ නැහැ. මේ රටේ 260,000ක් වන විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් අවුරුද්දක් තිස්සේ දැවැන්ත අරගළයක් කරලා, මහ පාරේ සටන් කරලා, අත් අඩංගුවේ ඉඳලා තමයි ඒ අයගේ ප්‍රශ්නයට උත්තරයක් ලබා ගත්තේ. අපට මතකයි, කොටුව පොලීසිය ගුරුතුමියලා -අම්මලා- අත් අඩංගුවට ගත් හැටි. එහෙම අත් අඩංගුවට පත් වෙලා, දවස් ගණන් අත් අඩංගුවේ ඉඳලා, පොලීසිවල ඉඳලා, කන්න නැතිව, බොන්න නැතිව දුක් විඳලා අරගළ කරලා, අන්තිමට එක ගුරුවරියක් ජීවිතයෙන් පවා වන්දි ගෙව්වා. ඒ විධියට කළ මහා සටනේ ප්‍රතිඵලයක් විධියට තමයි ගුරු වැටුප් විෂමතාවට යම්කිසි හෝ උත්තරයක් ගත්තේ. ඒක බැසිල් රාජපක්ෂ මහත්මයා බන්දේසියේ තියලා, "මෙන්න" කියලා දුන්නේ නැහැ. එදා ගුරුවරුන්ට කළ අපහාස, උපහාස අපට මතකයි. "කාලකණ්ණි" කියලා ගුරුවරුන්ට ඇමතුවේ. කාලකණ්ණි ගණනට දැමූ ඒ ගුරුවරුන්ගේ බලය, අරගළය ඔවුන් නැවැත්තුවේ නැහැ. මේ රටේ වැඩ කරන ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ බලය විධායක බලයට වඩා, තුනෙන් දෙකේ බලයට වඩා ශක්තිමත් කියලා පෙන්වමින් තමයි ඔවුන් එය ජයග්‍රහණය කළේ. එහෙම නැතිව, ආණ්ඩුවේ විධායක බලයෙන්, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන්, පාර්ලිමේන්තුවේ බහුතර බලයෙන් දීපු එකක් නොවෙයි, එය. එය අරගළයෙන් ලබා ගත් ජයග්‍රහණයක් කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව බලාපොරොත්තු වුණු සුබසාධන ක්‍රියා මාර්ග, ඒ වාගේම මේ ඇති වෙලා තිබෙන දැවැන්ත ආර්ථික අර්බුදයට උත්තර කිසිවක් මේ අය වැය තුළ නැහැ කියන එක අද ආණ්ඩුව විසින් ඉතා පැහැදිලිව ඔප්පු කර තිබෙනවා. එහෙම නම්, මොකක්ද මේ අය වැයෙන් අවසානයේ ලැබිලා තිබෙන්නේ? මේ අයවැයෙන් ලැබිලා තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි, මහා ණය කන්දක් ජනතාවගේ හිස මත පතිත වීමක් සහ තවත් බදු බරක් ජනතාව මත පතිත වීමක් විතරයි මේකෙන් සිදු වෙලා තිබෙන්නේ. එම නිසා රටක් විධියට රටේ ආර්ථිකය ශක්තිමත් දිශානතියකට ගෙන යන්න මේ රටේ 76වන අයවැය කිසිසේත් සමත් වෙලා නැහැ. ඇත්තටම වෙලා තිබෙන්නේ ජනතාව තවත් කබලෙන් ළිපට වැටීමක් පමණයි. මේ ආණ්ඩුවේ සමහර අය කියපු විධියට ජනතාව බලාපොරොත්තු වුණා පෙරළිකාරී අය වැයක් ඉදිරිපත් වෙයි, තිබෙන අර්බුදයට යම් හෝ උත්තරයක් ලැබෙයි කියලා.

අන්තිමට සිද්ධ වුණේ ගොවියාත් මහ පාරට වැටෙන තත්ත්වයක් ඇති වෙච්ච එක. ගොවියා මහ පාරට වැටුණා; ගුරුවරයා මහ පාරට වැටුණා; වැඩ කරන කම්කරුවා මහ පාරට වැටුණා. අද සිමෙන්ති නැහැ; ගෑස් නැහැ; කිරිපිටි නැහැ; සීනි නැහැ. මේ අර්බුද ඇති වෙලා තිබෙන්නේ කොවිඩ්-19 නිසා නොවෙයි. ඉතා පැහැදිලිව, මා කියපු උදාහරණ තුන කොවිඩ්-19 නිසා ඇති වෙච්ච අර්බුද නොවෙයි. ඒවා මේ ආණ්ඩුවේ වැරැදි; ඔළමොට්ටළ තීන්දු නිසා ඇති වෙච්ච දේවල්. එම නිසා අද අවසානයේ සිද්ධ වෙලා තිබෙන්නේ රටේ ජනතාව තව තවත් සාගතයෙන් සාගතයට යෑමක් විතරයි. අන්තිමට ජනතාවට කියන්න වුණේ "මොළ හතේ සාගතේ අපිට ආවා" කියන එක විතරයි. ඒ සාගතයට මේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිදු වන තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වයෙන් මේ රටේ ජනතාව මුදා ගන්න මේ අය වැය කිසිසේත් සමත් වෙලා නැහැ. ජනතාව කබලෙන් ළිපට වැටීමක් පමණයි සිද්ධ වුණේ. මෙම තත්ත්වය වෙනස් කරලා, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් සැබෑ නිෂ්පාදන ආර්ථිකයකට ගමන් කළ යුතුයි කියන කාරණය අවධාරණය කරමින් මා නතර වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! දිවා ආහාර විවේකය සඳහා පස් වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා ] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

[අ.භා.1.00]

**ගරු ඩී. වීරසිංහ මහතා**
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු 76වැනි අය වැය පිළිබඳ විවාදයේ පළමුවැනි දවසේ දීම මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී අපේ විපක්ෂයේ කණ්ඩායමේ බොහෝදෙනා බලාපොරාත්තු වුණා, අපි මේ අය වැය තුළින් මේ රටේ සාමාන්‍ය ජනතාවට බදු පිට බදු පනවලා, ඒ අයට ජීවත් වෙන්න බැරි තත්ත්වයක අය වැය ලේඛනයක් අපි ඉදිරිපත් කරයි කියලා. හැබැයි, ඊයේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය තුළ ඉතාම පැහැදිලිව පෙනුණා, කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ජන ජීවිතය අඩාළ වුණු, ආර්ථිකය කඩා වැටුණු ජනතාවගේ ආර්ථික තත්ත්වය ආරක්ෂා කරමින් ඔවුන්ගේ ජන ජීවිතය නැවත යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් අය වැය ලේඛනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු බව. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට මා විශේෂයෙන් මේ කාරණය මතක් කරන්න ඕනෑ. මේ රටේ ඉතිහාසයේ පන්සලේ පින් කැටයටත් බදු පනවලා, මිනිසුන්ට ජීවත් වෙන්න බැරි විධියට බදු පිට බදු පනවපු ඔබතුමන්ලා අපේ ආණ්ඩුවෙන් එහෙම එකක් බලාපොරොත්තු වුණා නම්, ඊයේ ඔබතුමන්ලාගේ බලාපොරොත්තුව ඉෂ්ට කරගන්න බැරි වුණා කියන එකයි මා විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අද උදේ කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු ඇහුවා, මේ අය වැයෙන් මේ රටේ මිනිසුන්ට දුන්නේ මොනවාද කියලා. කෘෂි කාර්මික ප්‍රදේශයක ජීවත් වෙන මන්ත්‍රීවරයකු විධියටත්, කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ගේ ඡන්දය අරගෙන පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයකු විධියටත් මා විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්නට ඕනෑ. මේ කොවිඩ් -19 වසංගත තත්ත්වයෙන් මුළු ලෝකයේම ආර්ථිකය කඩා වැටිලා, මුළු ලෝකයේම ආර්ථිකය ආපස්සට හැරෙනකොට,

අපේ රටේ ආර්ථිකය ඉස්සරහට අරගෙන යන්න මුදල් ඇමතිවරයා විධියට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඊයේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙන් ගොවියා ආරක්ෂා කරන්න කටයුතු කර තිබෙනවා. අද උදේ කථා කරපු මන්ත්‍රීවරු කිව්වා, "කාබනික ගොවිතැනට යනකොට මේ ආණ්ඩුව ඒකට මුදල් වෙන් කරලා නැහැ" කියලා. මා ඒ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා අය වැය ලේඛනය පොත අරගෙන කියවලා බලන්න. මේ අය වැය තුළ වස විසෙන් තොර අලුත් ආහාර සංස්කෘතියක් ඇති කරන්න, කාබනික පොහොරවලට ගොවියා යොමු කරන්න, ඒ වෙනුවෙන් සහනාධාර දෙන්න සැලසුම් කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඉතා සද්භාවයෙන් මේ තීරණය ගන්නකොට, මේ රටේ මිනිසුන්ට වස විසවලින් තොර ආහාර වේලක් දෙන්න තීරණය කරනකොට, ඒක කඩාකප්පල් කරන්න අද බොහෝ දෙනෙක් කටයුතු කරනවා.

විශේෂයෙන්ම කෘෂිකර්ම ඇමතිතුමාගෙන් සහ රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා, කෘෂිකර්ම ඇමතිතුමා, රාජ්‍ය ඇමතිතුමා මේ තීන්දුවත් එක්ක කටයුතු කරනකොට, මේක මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න හදනකොට කකුලෙන් අදින සමහර නිලධාරින් ඉන්නවා. එම නිසා මා ඉල්ලීමක් කරනවා, ඔවුන් කෙරෙහිත් අවධානය යොමු කරන්න කියලා. ගමේ ඉන්න කෘෂි පර්යේෂණ නිලධාරිතුමා, කෘෂිකර්ම නිලධාරිතුමන්ලා විශාල කැප කිරීමක් කරනකොට, ඔවුන්ට උඩින් ඉන්න සමහර නිලධාරින් ඔවුන්ගේ කකුලෙන් අදින නිසා මේ කටයුත්ත මහ පොළොවේ යථාර්ථයක් කර ගන්න අද අපට අපහසු වෙලා තිබෙනවා.

මෙම අය වැයෙන් අලුත් ආහාර සංස්කෘතියක් බිහි කරන්න, ගොවි ජනතාවට අවශ්‍ය කාබනික පොහොර ලබා දෙන්න කටයුතු කරන්න රුපියල් මිලියන 35,000ක් වෙන් කර තිබෙනවා. උදේ එක මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒ සඳහා සල්ලි වෙන් කරලා නැහැ කියලා. රුපියල් මිලියන 35,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, නව කෘෂි තාක්ෂණය හඳුන්වා දීම සඳහා වෙන් කළ රුපියල් මිලියන 17,005ට අමතරව තව රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. අපට අලුත් තාක්ෂණය අවශ්‍යයි. කාබනික ගොවිතැනට යනවා නම්, අපි අලුත් තාක්ෂණය භාවිත කළොත් තමයි ගොවියාට එහි වඩා ඉහළ ප්‍රතිලාභ ලබාගන්න පුළුවන්. ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරන්න, ගරු මුදල් ඇමතිවරයා විසින් විශාල මුදලක් මේ වෙනකොට වෙන් කර තිබෙනවා.

ඒ වාගේම පශු සම්පත් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් මේ අය වැය ලේඛනය තුළින් වෙන් කර දී තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම විපක්ෂයේ අයට මතක් කර දෙන්න කැමැතියි, ඉතාම අමාරු වේලාවකත් මේ රටේ කෘෂි කර්මාන්තය නඟා සිටුවීමට, ඒ තුළින් මේ රටේ ජනතාවගේ ජන ජීවිතය ගොඩනැඟීමට, ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය විශාල වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනය තුළ ඇතුළත් කර තිබෙන බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "වාරි සෞභාග්‍යා" වැඩසටහන ගැනත් මා සඳහන් කරන්න කැමැතියි. අපි මේ ආණ්ඩුව භාර ගන්න කොට, ඉතාම අමාරු තත්ත්වයක තමයි මේ රට තිබුණේ; හිස් වූ භාණ්ඩාගාරයක් තිබුණේ. ඒ වාගේම මහ බැංකුව කඩා මේ රටේ සල්ලි හොරකම් කරලා, ජනතාවට බදු පිට බදු ගහලා තිබුණු වෙලාවක වාරි සෞභාග්‍යා වැඩසටහන ගෙනැල්ලා, 2022 වසර වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබෙන රුපියල් මිලියන 48,237ට අමතරව තව රුපියල් මිලියන 20,000ක මුදලක් මේ අය වැය තුළින් වෙන් කර දීලා තිබෙනවා. අපි දැක්කා, ගම්වල අවුරුදු 50, 60 හදා තිබුණේ නැති ඇළවල් ටික පසුගිය කාලයේ හැදුවා. අවුරුදු 60, 70 ප්‍රතිසංස්කරණය කර තිබුණේ නැති කුඩා වැව් ටික ප්‍රතිසංස්කරණය කළා. ඒ අනුව පසුගිය අවුරුද්දේ විතරක් කුඩා වැව් 1,050ක වැඩ අවසන් කර තිබෙනවා. තවත් වැව් 2,000ක අමුණු හදන්න 2022 අය වැයෙන් මුදල් වෙන් කර දීලා තිබෙනවා.

අපි දන්නවා, පානීය ජලය සම්බන්ධවත් විශාල ප්‍රශ්නයක් තිබෙන බව. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල පානීය ජලය සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. අපි 2010 අවුරුද්දේ සිට 2015 වෙනකම් මේ රටේ දැවැන්ත ජල ව්‍යාපෘති කළා. හැබැයි, ඊට පසුව පැවතුණු ආණ්ඩුව කාලයේ ගම්වල මිනිසුන්ට වතුර දෙන ව්‍යාපෘතිය ඇන හිට තිබුණා. අපේ රජය විසින් 2022 වර්ෂය සඳහා වන අය වැයෙන් වෙන් කර තිබෙන රුපියල් මිලියන 33,963ට අමතරව, පවුල් තිස්තුන්ලක්ෂ දහහතරදහස් පන්සියයකට නව ජල සැපයුම් ලබා දීමට තවත් රුපියල් මිලියන 15,000ක් වෙන් කර දීලා තිබෙනවා. ඒ වාගේම 2024 අවුරුද්ද වෙනකොට මේ රටේ සිටින ජනතාවගෙන් සියයට 90කට පානීය ජලය ලබා දෙන්න අවශ්‍ය මුදල් මේ අය වැය ලේඛනය තුළ වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 ජනවාරි 08 වෙනකොට අපි මේ රටේ අධිවේගී මාර්ග හදලා, ගම්බිම්වලට යන්න පුළුවන් මාර්ග ටික හදලා, හැම ප්‍රධාන නගරයක්ම යා වෙන විධියට ප්‍රධාන මාර්ග කාපට් කර තිබුණු බව විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට අද අමතක වෙලා තිබෙනවා. හැබැයි, අපි හදපු අධිවේගී මාර්ගවල කටයුතු ඉන් පසුව නතර වුණා. එතැනින් ඉස්සරහට එම කටයුතු කරගෙන ගියේ නැහැ. නැවත අපේ ආණ්ඩුව බලයට ආවාට පසු, මේ රටේ ජනතාවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දෙන්නත්, ඒ වාගේම ගම්වල ගොවි බිම්වල හැදෙන අපේ ධාන්‍ය ටික, එළවලු ටික ඉතා ඉක්මනින් නගරයට ගෙනෙන්නත්, ආර්ථික මධ්‍යස්ථානවලට ගෙනෙන්නත්, මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන තුළින් මේ රටේ පාරවල් හදන්නත් පටන් ගත්තා. මේ අවුරුද්ද වනවිට ඒ කිලෝමීටර් ලක්ෂයෙන් කිලෝමීටර් 18,000ක වැඩ අවසන් කර තිබෙනවා. ඒ වාගේම දැනට ඉතුරු වැඩ කටයුතු කරගෙන යනවා. මේ වැඩ කටයුතු කරගෙන යෑමට වෙන් කර ඇති රුපියල් මිලියන 260,000ක මුදලට අමතරව තවත් රුපියල් මිලියන 20,000ක මුදලක් 2022 අය වැයෙන් වෙන් කර දීලා තිබෙනවා. මේ කටයුත්තේ දී ගරු මහාමාර්ග අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය අමාත්‍යතුමාටත්, ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපේ ආණ්ඩුව බලාපොරොත්තු වූ මහා මාර්ග සැලසුම කඩිනමින් මේ රටේ ක්‍රියාත්මක කරන්න ඔවුන් ගත් උත්සාහය අපි මේ වේලාවේ සිහිපත් කරන්න ඕනෑ.

කවදාවත් රාජ්‍ය නායකයෙක් ගමට ගියේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වුණාට පසුව ගමට ගිහිල්ලා "ගම සමඟ පිළිසඳර" වැඩසටහන දියත් කළා. ඒ වාගේම, අපි හැමෝම ගමට යවා ගමේ මිනිසුන්ගේ යෝජනා මොනවාද කියා සොයා බලන ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය සඳහා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිතුමා විධියට විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අනුව මේ රටේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් 14,021ට, එක ග්‍රාම නිලධාරි වසමකට ලක්ෂ 30 බැගින් මුදල් වෙන් කර තිබෙනවා, ගමේ ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට කලින් කථා කළ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා, අපි දේශපාලන වාසි ගන්න ගමට මුදල් යවා තිබෙනවා කියලා. අපි කිසිම දේශපාලන වාසියක් ගන්නේ නැහැ. මේ රටේ හැම පළාත් පාලන ආයතනයක්ම ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරුන්ට ඒ කොට්ඨාස තුළ වැඩ කරන්න -එක්සත් ජාතික පක්ෂයද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද, ජනතා විමුක්ති පෙරමුණද කියලා බලන්නේ නැතිව- ලක්ෂ 40ක මුදලක් ගමට යවා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රුපියල් මිලියන 19,894ක් යවා තිබෙනවා, ඒ

[ගරු ඩී. වීරසිංහ මහතා]

ප්‍රදේශවල ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන පක්ෂ-විපක්ෂ අප හැමෝටම රුපියල් මිලියන 15ක් දක්වා විමධ්‍යගත අරමුදල් වැඩි කර තිබෙනවා. ඒ වාගේම ගම සමඟ පිළිසඳර ග්‍රාමීය වැඩසටහන සඳහා රුපියල් මිලියන 85,000ක මුදලක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව ගම්වල ඉතාම අඩු ආදායම්ලාභී පවුල්වල දිරිය කාන්තාවන්ට නිවාස හදා ගන්න, වෙළෙඳ සැලක් දමාගෙන තමන්ගේ ආර්ථිකය ගොඩනගාගන්න අවශ්‍ය වන ආකාරයට මුදල් වෙන් කර දීලා තිබෙනවා.

කොවිඩ් වසංගතය නිසා ආර්ථිකය කඩා වැටුණු මේ රටේ ස්වයං රැකියාවල යෙදුණු අයගේ, ත්‍රීරෝද රථ රියැදුරන්ගේ, පාසල් වෑන් රථ රියැදුරන්ගේ, පෞද්ගලික බස් රථ රියැදුරන්ගේ, කඩල, බුලත්, තැඹිලි ගෙඩියක් විකුණා එදා දවස ජීවත් වන අයගේ ජන ජීවිතය නඟා සිටුවන්න මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මෙම කාරණයත් මතක් කරන්න ඕනෑ. යූඑන්පී ආණ්ඩුවට වාගේම යූඑන්පී ආණ්ඩුවට කඩේ ගිය ජනතා විමුක්ති පෙරමුණට -ඒ හැමෝටම- අවුරුදු 25ක් තිස්සේ විසඳන්න බැරිව තිබුණු ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳීමට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 30,000ක මුදලක් වෙන් කළා. මේවා ඉතා අමාරු වෙලාවක අපේ ආණ්ඩුව කරපු වැඩ. ඒකෙන් කාටවත් ලකුණු දමා ගන්න විධියක් නැහැ. අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු මුදල් ඇමතිතුමා ජනතාව එක්ක හිටපු, ජනතාවගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දුන් නායකයන් විධියට මේ කටයුත්ත කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු ඩී. වීරසිංහ මහතා**
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)
අවසාන වශයෙන් මට මේ කාරණයත් කියන්න කෙටි වෙලාවක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

2015දී අපි ආණ්ඩුව භාර දෙනකොට මේ රටේ රාජ්‍ය සේවකයන්ට යතුරු පැදි ලබා දුන්නා. ඊට පසු බලයට පැමිණි රජයෙන් යතුරු පැදි ඉල්ලා රාජ්‍ය සේවකයන් පෙළපාළි ගියා. නමුත්, ඔවුන්ට යතුරු පැදි දුන්නේ නැහැ. අපි මෙවර අය වැයෙන් රාජ්‍ය සේවකයන්ට යතුරු පැදි ලබා දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. පසුගිය කාලයේ -2015 අවුරුද්දෙන් පස්සේ- උපාධිධාරීන් ඔක්කෝම බෝර්ඩ් උස්සාගෙන ලිප්ටන් වටරවුමේ උද්ඝෝෂණ කළා. රස්සා ලබා දෙන්න කියලා ඔවුන් අරලියගහ මන්දිරය වැටලුවා. අපේ ආණ්ඩුව උපාධිධාරීන් 53,000කට රස්සා ලබා දුන්නා. අපි ඒ 53,000ම ස්ථිර සේවයටත් ඇතුළු කරනවා.

අපට භාර දුන්නේ කඩා වැටුණු ආර්ථිකයක් සහිත රටක්. අපි දන්නවා, ඩොලරයට සාපේක්ෂව 130ක්ව තිබුණු රුපියලේ අගය 178ට ගිය බව. ඒ වාගේම සියයට 6.8ක්ව තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 3.1 දක්වා කඩා වැටී තිබුණා. එලෙස පැවැති රටේ ආර්ථිකය නඟා සිටුවන්න මුදල් ඇමතිවරයා විධියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉතා සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. කොවිඩ් වසංගතයෙන් කඩා වැටුණු රට ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්න හැමෝටම එකතු වෙන්න කියන ආරාධනය කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Sanjeeva Edirimanna. You have 20 minutes.

[අ.භා.1.12]

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩි දහයක කාලයක් තිබෙනවා. මේ කාලය ඇතුළත මගේ කාරණා ටික ගොනු කර ගන්න බැරි වුණොත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ අවසරය මත ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමාගේ,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have been allocated 20 minutes.

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
Okay, thank you.

ඊයේ මම පාර්ලිමේන්තුවේ පුස්තකාලයට යනකොට ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා පුස්තකාලයේ පොත් පෙරළා බලමින් කථාවක් හදනවා මම දැක්කා. පැය දෙකක් විතර මමත් පුස්තකාලයේ හිටියා. මම දැක්කා, එතුමා පොත් පෙරළා බලමින් අපේ අය වැයත් එක්ක හැප්පෙන්න අලුත් කථාවක් හදනවා. ඒ නිසා මම අද උදේ පාර්ලිමේන්තුවට ආවේ බොහෝ බලාපොරොත්තු ඇතුව, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ආචාර්ය උපාධියටවත් ගැළපෙන ලස්සන, තාර්කික, විෂයානුබද්ධ කරුණු සහිත කථාවක් කරයි කියලා. නමුත්, එතුමා කිව්වේ මොනවාද? බැරි නම් දෙන්න ලු, කරලා පෙන්වන්නම් ලු. අපි දැක්කා නේ, එතුමන්ලා කරපු හැටි! මට ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් අහන්න තිබෙන්නේ මේකයි. එතුමන්ලාගේ කාලයේ මේ රටේ ආර්ථිකය ප්‍රශස්ත ලෙස කළමනාකරණය කළා නම්, අද එතුමන්ලාගේ ආණ්ඩුවේ මුදල් ඇමතිවරු මේ විපක්ෂයේ වැජඹි-වැජඹී ඉන්න එපා යැ. කෝ, රවි කරුණානායක මැතිතුමා? එතුමා පරාදයි, ගෙදර. එතුමා පාර්ලිමේන්තුව ළඟ ඉන්නවා. පාර්ලිමේන්තුව ආසන්නයේ තමයි එතුමාගේ ගෙදර තිබෙන්නේ.

පාර්ලිමේන්තුව ළඟ, හැබැයි ඇතුළේ නැහැ. මංගල සමරවීර මැතිතුමාගේ අභාවය පිළිබඳව මිනිස්සු විධියට අපේ පපුවේ තිබෙන්නේ වේදනාවක්. නමුත්, මංගල සමරවීර මැතිතුමාත් මුදල් ඇමතිවරයෙකු විධියට අසාර්ථක වුණා. ඒ අසාර්ථකභාවය මුලින්ම තේරුම් ගත්තේ වෙන කවුරුවත් නොවෙයි, මංගල සමරවීර මැතිතුමාමයි. එම නිසා තමයි මේ ගරු සභාවේ ඉන්න ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාටත් බයේ එතුමා අපේක්ෂක ලැයිස්තුවෙන් ඉල්ලා අස්වෙලා ගෙදර ගිහිල්ලා තමන්ගේ මුදල් ඇමතිකම අවසන් කළේ. තවත් රාජ්‍ය ඇමතිතුමෙක් හිටියා. කෝ, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා? අපි හිතුවා, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට පසු වැඩිම මනාප ලබා ගෙන දෙවන ස්ථානයට එන්න එතුමා බය නැතුව කොළඹින් ඡන්දය ඉල්ලයි, campaign එකට බහියි කියලා. ඔන්න, ඊළඟ මුදල් ඇමති. මහජන මතයෙන් -මහජන කැමැත්තෙන්- ඡන්දය දිනලා පාර්ලිමේන්තු එන්න බය වෙලා බොහොම අමාරුවෙන් ජාතික ලැයිස්තුවට නම දමා ගත්තා. එතුමන්ලා ආර්ථිකය කරපු හැටි අපි දැක්කා නේ. එම නිසා අපි එතුමන්ලාට කියනවා, එදා හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධයක් කරමින් අපේ ජාතික ආර්ථිකය ඉතා

මැනවින් කළමනාකරණය කර, මේ රටේ දැවැන්ත ආර්ථික සංවර්ධනයක් ඇති කර බාර දීපු රට තමයි එතුමන්ලා බරපතළ ලෙස විනාශ කළේ කියලා. ජාතික ආර්ථිකය තුළ ඉහළ දැමිය යුතු සෑම දර්ශකයක්ම පසුගිය යහ පාලන ආණ්ඩුව බිමටම දැමුවා. ඒ වාගේම ජාතික ආර්ථිකය තුළ පහළ දැමිය යුතු සෑම දර්ශකයක්ම පසුගිය යහ පාලන ආණ්ඩුව විසින් ඉහළ දැමුවා. එම නිසා "දෙන්න, අපි කරලා පෙන්වන්නම්" කියන එක අපට නම් කියන්න එපා. ගෙදර ගිහිල්ලා වෙන කාට හරි ඒක කියන්න. මේවා තර්ක නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිදහස් ශ්‍රී ලංකාවේ 76වෙනි අය වැය විවාදයේ පළමුවෙනි දවසේම විවාදයට මම එකතු වෙන්නේ ආධුනික මන්ත්‍රීවරයෙකු විධියට බොහොම සතුටෙන් සහ ආඩම්බරයෙන්. මට ලැබුණු මේ අවස්ථාව මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට ලැබුණු ගෞරවයක් විධියට බාර ගන්න මම කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැයේ අභ්‍යන්තර කතන්දරයට අපි එමු. ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා 2022 මුදල් වර්ෂයට අදාළව මේ අය වැය ඉදිරිපත් කරන්නේ ඉතාම සංකීර්ණ ගෝලීය අර්බුදයක් විසින් අපේ ජාතික ආර්ථික දේහයට බරපතළ මාරාන්තික ප්‍රහාරයක් එල්ල කර තිබෙන වෙලාවක. නමුත්, ගෝලීය ආර්ථික ව්‍යසනයකින් අපේ ජාතික ආර්ථිකය බැට කන වෙලාවක ලංකාවේ අය වැයක් ඉදිරිපත් කළ පළමු මුදල් ඇමතිවරයා බැසිල් රාජපක්ෂ මැතිතුමාය කියලා කියන්න තරම් මම බොළඳ වෙන්නේ නැහැ.

මම මේ උත්තරීතර සභාවේ අවධානය රැගෙන යනවා, 1953 අවුරුද්දට. 1920න් පසු ලෝකයේ දැවැන්තම ආර්ථික සහ ආහාර අර්බුදයට එදා ආණ්ඩුව මුහුණ දුන්නා. ඒ, 1953 අප්‍රේල් මාසයේ 23 වෙනිදා. එවක අගමැතිවරයා වුණේ ඩඩ්ලි සේනානායක මැතිතුමා. මුදල් ඇමතිවරයා වුණේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. එදා ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ ආණ්ඩුවේ ජේ.ආර්. ජයවර්ධන මුදල් ඇමතිතුමා අය වැය ගෙනැල්ලා මොනවාද කළේ? එතුමා මාර වැඩ ටිකක් කළා. රුපියල් මිලියන 300ක් වූ ආහාර සහනාධාරය සියයට 50කට ආසන්න ප්‍රමාණයකින් කප්පාදු කරලා රුපියල් මිලියන 160ට අඩු කළා. ඒ කාලයේ පාසල් දරුවන්ට දිවා ආහාර සහනාධාරයක් ලබා දෙමින් තිබුණා. ඒ කාලයේ හිටපු මුදල් ඇමති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පාසල් දරුවන්ගේ ඒ දිවා ආහාර සහනාධාරය කප්පාදු කළා. ඒ වාගේම තැපැල් ගාස්තුව වැඩි කළා. දුම්රිය ගාස්තුව වැඩි කළා. ඒ වෙනුවෙන් අහිංසක මිනිස්සු පාරට බැස්සා. ඒකට තමයි අපි "හර්තාලය" කියලා කිව්වේ. ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ ආණ්ඩුව යටතේ ජේ.ආර්. ජයවර්ධන මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැය නිසා කැළඹුණු හර්තාලයට සාහසික ලෙස වෙඩි තැබුවා. අගෝස්තු මාසයේ 23වන දා තැබූ ඒ වෙඩි තැබීමෙන් මිනිසුන් නවදෙනෙකු විතර කොළඹදී මහපාරේ මැරිලා වැටුණා. අන්තිමේදී ඩඩ්ලි සේනානායක අගමැතිතුමා ඉල්ලා අස්වෙලා ගෙදර ගියා. එවක ඩඩ්ලි සේනානායක අගමැතිතුමාට විතරක් නොවෙයි තනතුර නැතිවෙන්නේ. මුදල් ඇමති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාටත් තමන්ගේ මුදල් ඇමතිකමෙන් ඉල්ලා අස්වෙලා කෘෂිකර්ම ඇමතිකමට මාරු වෙන්න සිද්ධ වෙනවා. ඊට පසු 1956දී මහ ඡන්දය එනවා. එහිදී එක්සත් ජාතික පක්ෂය කුජීත වෙන්න පරදිනවා. දේශපාලන අතීතය පිළිබඳ විග්‍රහයක් තිබෙන මිනිසුන් අදටත් විශ්වාස කරනවා, 1956දී UNP එක පරදින්න ප්‍රධානතම හේතුව 1953දී ඉදිරිපත් කළ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ අය වැය කියලා.

අපි බැසිල් රාජපක්ෂ මැතිතුමාට මේ රටේ, මේ ජාතියේ උත්තමාචාරය පුද කරන්නේ එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට කරන්න බැරි වූ දේ කරපු නිසායි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ලංකාවේ දේශපාලනය තුළ හිටපු, දැවැන්ත දේශපාලන පෞරුෂයක් හෙබි පුද්ගලයෙක්. එතුමාට සුපිරි මොළයක් තිබුණා කියලා අපේ තාත්තා ඒ කාලයේ කියනවා මම අහලා තිබෙනවා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාටවත් කරන්න බැරි වෙච්ච දෙයක් කරන්න, ගෝලීය අර්බුදයකින් රටේ ජාතික ආර්ථිකය බැට කන මොහොතක, රටේ ජාතික ආර්ථිකයට සහන දෙන්න, ජාතික ආර්ථිකය තුළ සිද්ධ වෙච්ච බරපතළ ආත්මීය ඉරිතැලීම් සුවපත් කරන්න බැසිල් රාජපක්ෂ අපේ ගරු මුදල් ඇමතිතුමාට හැකියාව ලැබුණා. ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආණ්ඩුවට බැසිල් රාජපක්ෂ මැතිතුමා වාගේ මුදල් ඇමතිවරයෙක් හිටියා නම්, මම අදටත් විශ්වාස කරනවා, ඩඩ්ලි සේනානායක අගමැතිතුමාට එදා ගෙදර යන්න වෙන්නේ නැහැ කියලා. 1956 දී පංච මහා බලවේග අරගළය මොන තරම් බලවත් වුණත්, එදා ජේ.ආර්.ජයවර්ධන ඩඩ්ලි සේනානායකගේ ආණ්ඩුවට නිවැරැදි අය වැයක් ඉදිරිපත් කරලා දුන්නා නම්, සමහර විට තවමත් යූඑන්පී ආණ්ඩුවක් මේ රටේ තිබෙන්න තිබ්බා. මෙන්න, මේ නිසායි අපි මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ගරු කරන්නේ.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මෙවර අය වැයෙන් ඇන ගන්නා තුරු බලාගෙන හිටපු විපක්ෂයේ ආදරණීය මිතුරනි, අපට සමාවෙයල්ලා නුඹලාගේ බලාපොරොත්තුව අපි අතින් සුන්නද්දූලි වෙලා ගිය එකට. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂය බලාගෙන හිටියා, ආදායම් අහිමි වෙච්ච මිනිස්සු එක්ක පාරට බැහැලා මේ ආණ්ඩුව පෙරළා ගෙදර යවන්න.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා රුපියල් මිලියන 33,000ක මුදලක් මේ රටේ ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. අපි ඒක සතුටින්, ආඩම්බරයෙන් කියන්නේ. විපක්ෂය බලාගෙන හිටියා කොවිඩ් - 19 කාලය තුළ ආදායම අහිමි වෙච්ච සහෝදර ත්‍රීරෝද රථ හිමිකරුවා පාරට බස්සන්න. ආදායම් අහිමි වෙච්ච ත්‍රීරෝද රථ කරුවන් වෙනුවෙන් බැසිල් රාජපක්ෂ අපේ මුදල් ඇමතිතුමා රුපියල් මිලියන 600ක දැවැන්ත මුදලක් වෙන් කළා. පෞද්ගලික බස් රථ ව්‍යාපාරිකයාත් පාරට අරගෙන එන්න විපක්ෂය බලාගෙන ඉන්න ඇති. කොවිඩ් - 19 නිසා ආදායම අහිමි වෙච්ච පෞද්ගලික බස් රථ කර්මාන්තයට යුක්තිය ඉටු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

පසුගිය වසර එකහමාර තුළ අපේ දරුවන් පාසල් ගියේ නැහැ. ඒ නිසා අපි school bus එකේ මාසික වාරිකය ගෙව්වේ නැහැ. ඒ නිසා පාසල් බස් රථ සහ වෑන් රථ හිමියන් බරපතළ අසීරුතාවකට පත් වුණා. ඒ සියලුදෙනා වෙනුවෙන් සහන දෙන්න රුපියල් මිලියන 400ක මුදලක් අපේ මුදල් ඇමතිතුමා වෙන් කළා. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක දැවැන්ත මුදල් සම්භාරයක් වෙන් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,021ක් තිබෙනවා. මම ජීවත් වන්නේ කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, 633 වේරවත්ත ගමේ. මගේ ගමත්, මුදල් ඇමතිතුමාගේ අංක 399 - මැදමුලන ග්‍රාම නිලධාරි වසම ද ඇතුළුව අපි හැමෝගෙම ගම්වලට කිසිදු භේදයකින් තොරව, අපේ මුදල් ඇමතිතුමා රුපියල් ලක්ෂ තිහ බැගින් ලබා දෙනවා.

මේ රටේ අලුතින්ම එකතු වුණු දේශපාලන පරිපාලනමය ව්‍යුහය තමයි, පළාත් පාලන මන්ත්‍රී කොට්ඨාසය. මේ රටේ පළාත් පාලන මන්ත්‍රී කොට්ඨාස 4,917යි. ඒ සෑම වසමකටම රුපියල් හතළිස් ලක්ෂය බැගින් සංවර්ධන ප්‍රතිලාභයක් ගමට යවා තිබෙනවා. රටේ සෑම දිස්ත්‍රික්කයකටම මෙවර රාජ්‍ය ජාතික අය වැය තුළින් සංවර්ධන ප්‍රතිලාභ වෙන් කරලා තිබෙනවා. මුදල්

[ගරු සංජීව එදිරිමාන්න මහතා]

ඇමතිතුමා අපට හැම දාම ආදරයෙන් කිව්වේ, සමහර තැන්වලදී දැඩිව අවධාරණය කළේ, ජීවනෝපාය සංවර්ධනයට වැඩිම ඉඩක් දෙන්න කියලායි. එතුමා දිස්ත්‍රික්කවලට මුදල් වෙන් කිරීමේදී දිස්ත්‍රික්කයේ භූමිය, ජනගහනය, ආර්ථික සම්පත් ඇතුළු තවත් ආර්ථික සාධක සියල්ල සැලකිල්ලට අරගෙනයි මේ කටයුතු කළේ. හැබැයි, මෙතැනදී අපට ලොකු වගකීමක් තිබෙනවා. දැන් විපක්ෂය කියනවා, ගමේ මන්ත්‍රීට කප්පම් දීලාලු. ගමේ මිනිසුන්ගේ පාර හදන්න, බෝක්කුව හදන්න, වෙල මැද්දේ පුංචි පාරේ පැති බැම්ම දමන්න ගමට යවපු ඒ සංවර්ධන ප්‍රතිලාභයට නින්දා කරන්නට තරම් දේශපාලනිකව විපක්ෂය ගෝත්‍රික වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සූදානම් ඉතාම දැඩි මූල්‍ය විනයකට යටත්ව, දැඩි විනිවිදභාවයකින් යුතුව ඉතාම ඵලදායි සංවර්ධන ව්‍යාපෘති සමඟ අපේ ගම්වල මිනිසුන්ගේ ජීවිත ඉහළට ඔසවන්න, මේ අය වැය ප්‍රතිපාදන සමඟ.

ඊළඟට, ගුරු ප්‍රශ්නය ගැනත් මම කිව යුතුයි. සමඟි ජන බලවේගයට, ජනතා විමුක්ති පෙරමුණට ලබන ආත්මයේදීවත් මේ රටේ ගුරු භවතුන් ආයෙත් පාරට බස්සන්න බැරි වෙනවා. අවුරුදු 24ක වැටුප් අසාධාරණයක් දරා ගනිමින් අපේ දරුවන්ගේ ඇස් පාදපු ආදරණීය ගුරු භවතුනි, ඔබට සිද්ධ වෙච්ච ඓතිහාසික අසාධාරණයට අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව, ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාගේ ආණ්ඩුව දෙන්න පුළුවන් සුපිරිම උත්තරය ලබා දෙමින් ඔබට යුක්තිය ලබා දීලා තිබෙනවා. ඒ අතර, මේ සමාජයේ තව දුරටත් ඉන්නවා, බාහිර හව්හරණක් නැතිව තමන්ගේ දෛනික ජීවිතය ගැට ගහ ගන්න බැරි මිනිස්සු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මොහොත අලුත් ආධාර, අලුත් සහනාධාර, අලුත් ප්‍රතිලාභ දෙන්න පුළුවන් වෙලාවක් නොවෙයි. මේක, රට යුද්ධයක පැටලුණු වෙලාවක් වාගෙයි. එදා දෙවන ලෝක යුද්ධය වෙලාවේ බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය වින්ස්ටන් චර්චිල් BBC එකෙන් බ්‍රිතාන්‍ය රට වැසියන් අමතා කිව්වේ, "ආදරණීය රට වැසියනි, මේ මොහොතේ මට ඔබට දිය හැක්කේ ලේ සහ කඳුළු විතරයි" කියලා. නමුත්, රාජපක්ෂවරුන් මේ රටේ යුද්ධයක් කරන වෙලාවේත් මේ රටේ සංවර්ධනය අතහැරියේ නැහැ. යුද්ධයක් කරන වෙලාවේදීවත් මේ රටේ අහිංසක මිනිසුන්ගේ සහනාධාරය කප්පාදු කළේ නැහැ. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමන්ට තිබෙන්නේ අන්න ඒ ලේ උරුමය. ඒ නිසා තමයි අලුත් සහනාධාරයකටත් අපේ මිනිසුන්ට උදව් කරන්න අවස්ථාවක් ලැබෙන්නේ.

තමන්ගේ ජීවිතය ගැට ගහ ගන්න තනියෙන් අවස්ථාව උදා කරගත නොහැකි මිනිස්සු වෙනුවෙන් රුපියල් මිලියන 15,000ක දැවැන්ත ප්‍රතිපාදනමය අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. මුදල් ඇමතිතුමාගේ මේ සද්භාවයේ අපේක්ෂාව යථාර්ථයක් බවට පත් කරන්නට නම් මීට අදාළ ප්‍රතිලාභින් ඉතා සාධාරණ නිර්ණායකයන්ට යටත්ව අප විසින් නිවැරදිව තෝරා ගත යුතුයි. ගම්වල ඉන්න ආදරණීය ක්ෂේත්‍ර නිලධාරීන්, අපේ දේශපාලන නායකයන්, සිවිල් නායකයන් යනාදී සියලුදෙනාට ඒ වෙනුවෙන් බරපතළ යුතුකමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේ දී අහනවා, මෙච්චර පාරවල් මොකට ද කියලා. මම ඔබතුමාට මගේ දුරකථනය එවන්නම්. අද උදේ 6.10යි. මට ආපු පළමුවෙනි ඇමතුම බුලත්සිංහල ආසනයේ එහා කෙළවරේ තැන්නහේනේ ජයන්ත මාමාගෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදේ පාන්දර තැන්නහේනේ ජයන්ත මාමා මට කථා කරලා කියනවා, "පුතේ, තැන්නහේනේ ඉඳලා ඉහළ වෙල්ගමට යන පාරේ අඩි 60 පාලම ඊයේ කඩා වැටිලා. දළු ලොරියටවත් යන්න බැහැ" කියලා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කෝට්ටේ ඉඳලා මේක දන්නේ නැහැ. සමඟි ජන බලවේගයේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා මේක දන්නේ නැහැ. එතුමන්ලාට මේ රටේ මිනිසුන්ගේ ඇත්ත සමාජ ආධ්‍යාත්මයට එබිකම් කරන්න තරම් දේශපාලන අවබෝධයක් නැහැ කියන එකයි අපේ තේරුම් ගැනීම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දිස්ත්‍රික්කයේ අගලවත්ත, පාලින්දනුවර, වළල්ලාවිට, බුලත්සිංහල, බේරුවල ඇතුළු ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ ගණනාවක තවමත් පාරවල්වල ලොකු ප්‍රශ්න. පාර කැඩිලා නම් අපේ ගම්වල තේ ගොවියාගෙන් තේ ෆැක්ටරි එක රුපියල් පහක් කපනවා. පාර හදලා දුන්නාම දළු කිලෝ එකට අමතරව තවත් රුපියල් පහක් ලැබෙනවා. ඒ ආර්ථික විද්‍යාව ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා දන්නේ නැහැ. හැබැයි, මේ රටේ අහිංසක මිනිස්සු එක්ක ජීවත් වෙන අපි, පොහොට්ටුවේ දේශපාලන බලවේගය හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයේ උරුමය ලද අතිගරු ගෝඨාභය ජනාධිපතිතුමාගේ අවංක, ඍජු නායකත්වය මැද, බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මේ ආර්ථික දැක්ම මත අපි මේ සියල්ල මැනවින් අවබෝධ කර ගත්තා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇහුවා, "ඇයි, පාරවල් හදන්නේ, අර ප්‍රශ්න ඉවර කරන්නේ නැතිව?" කියලා. මම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කියනවා, මේක zero කරලා අරක පටන්ගනිමු කියලා සංවර්ධන න්‍යායක් ලෝකයේ නැති බව. මම දන්නේ නැහැ, හර්ෂ මන්ත්‍රීතුමා කියවපු පොත මොකක්ද කියලා. අපි කියවපු කිසිම ආර්ථික විද්‍යා පොතක මේක zero කරලා, අරක පටන්ගනිමු කියලා එකක් නැහැ. අපි පුංචි කාලයේ, 1996 දී අර්ජුන රණතුංග මහත්මයා එක්ක අපේ ටීම් එක ක්‍රිකට් ගහනකොට සමහරු ඇහුවා, "අපේ කොල්ලෝ මෙහේ යුද්ධ කරනවා. යුද්දේ කරන කාලයේ මොන ක්‍රිකට් ද?" කියලා. යුද්ධය ඉවර කරලා ක්‍රිකට් ගහන්න හිටියා නම්, අපේ රටේ ක්‍රිකට් කියලා එකක් ඉතිරි වන්නේ නැහැ.

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ඉන්දියාවේ වැසිකිළි ප්‍රශ්නය අවසන් කරලා අනික් ටික කරන්න ගියොත් ඉන්දියාවට අනාගතයක් නැහැ. ඉන්දියාව හතර වතාවක් අහහරු ලෝකයට ගිහිල්ලා අවසන්. මීට මාස 2කට පෙරාතුව "ගගන් යාන්" කියලා අලුත් යානයක් ඉන්දීය අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාගේ නායකත්වය සහිත ආණ්ඩුවෙන් එළිදැක්වුවා. අපේ රටේ වැසිකිළි පද්ධතිය පිළිබඳ ප්‍රශ්නය අවසන් කරලා අපි අහහරු වෙත යනවා කියලා මෝදිගේ ආණ්ඩුව හිතුවා නම්, ඉන්දියාවට අනාගතයක් නැහැ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා වැඩිහිටියෙක් නිසා මම තමුන්නාන්සේගෙන් වැඳලා ඉල්ලන්න කැමැතියි, මේ වාගේ තකතීරු දේශපාලන මතවාද ආර්ථික න්‍යායන් විධියට ඉදිරිපත් කරන්න එපා කියලා. මේ බොරුව අපේ මිනිසුන්ගේ පපුවට දෙන්න එපා. මේ වාගේ වැරදි දේශපාලන න්‍යායන් මිනිසුන්ගේ දේශපාලන මනසට දීලා මේ දේශපාලන වටපිටාව විකෘති කරන්න එපා.

මම හිතනවා ඊළඟට ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කථා කරයි කියලා. අපි කැමැතියි, එතුමා මේ රටේ ජාතික සමඟියේ සංකේතයක් විධියට වුණත් පිළිගන්න. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා, අද උදේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු අසත්‍ය කාරණා ටිකත් එක්ක, මේ සභාවේ ඉඳලා ගිය ගරු විජිත හේරත් මැතිතුමා කියපු අතාර්කික දේශපාලන කරුණුත් එක්ක ඔබතුමාගේ කථාව කරන්න එපා කියලා. අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා, සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ඇමතිකම කළා. ඒ කාලයේ මොනවාද කළේ කියලා කියන්න දෙයක් නැති ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට අද අය වැය විවාදයේදීත් කියන්න දෙයක් තිබුණේ නැහැ. මේ ටිකත් එකතු කරලා ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා වෙනුවෙන් උත්තරයක් දෙන්න කියලා ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Weerasumana Weerasinghe. You have ten minutes.

[අ.භා. 1.32]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පාර්ලිමේන්තු ඉතිහාසයේ 76 වැනි අය වැය නොවැම්බර් 12 වන දා ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළා. නිදහසින් පසු අපේ රටේ ආර්ථිකයේ දැවැන්තම ආර්ථික අර්බුදය තිබෙන වෙලාවේ තමයි ඊයේ දවසේ ඒ අය වැය ඉදිරිපත් කරන්න ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට සිද්ධ වුණේ. එතුමා ඒ අය වැය ප්‍රකාශය ඉදිරිපත් කරනකොට, ඒ අය වැයේ පූර්විකාවක් විධියට ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් මුහුණ දෙන තත්ත්වයන් තුළ තිබෙන අර්බුද ගැන කථා කළා. අර්බුද ගැන කථා කිරීමේදී, ගෝලීය සහ දේශීය ආර්ථික අර්බුද සම්බන්ධව ප්‍රධාන කාරණා 5ක් එතුමාගේ කථාවේ සඳහන් කළා. මම හිතනවා, කාලයකට පස්සේ තමයි මුදල් අමාත්‍යවරයෙක් ඇති නැති පරතරය ගැන අය වැය කථාවක සඳහන් කළේ කියලා. ඒ වාගේම තිරසර සංවර්ධනයේ ඉලක්ක ළඟා කර ගැනීමේ වේගය අඩාළ වීම, ගෝලීය උෂ්ණත්වය, බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය සහයෝගය නොලැබීම සම්බන්ධව එතුමා සඳහන් කළා. ඇති හැකි රටවල් ඔවුන්ගේ ප්‍රශ්නවලට උත්තර හොයනවා මිසක් අනෙක් ප්‍රශ්නවලට උත්තර හොයන්න ඉඩකඩක් නැහැ. ඒ වාගේම කොවිඩ් අර්බුදය ගැනත් කථා බහ කළා.

ගෝලීය අර්බුද වශයෙන් තිබෙන එම අර්බුදවලට අමතරව තවත් අර්බුද ගණනාවක් අපි දකිනවා. එක පැත්තකින් ජාත්‍යන්තර ත්‍රස්තවාදය, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම වාගේම, අනික් පැත්තෙන් ගෝලීය සරණාගත ප්‍රශ්නයක් අලුතින් නිර්මාණය වෙලා තිබෙනවා. මිලියන 84ක් - කෝටි අටහමාරක් - ජනතාව තමන්ගේ රටේ නැතිව අනික් රටවල ජීවත්වන සරණාගතයන් බවට පත්වෙලා තිබෙනවා. මේ සමස්ත ආර්ථික, ගෝලීය තත්ත්වයන් කාණ්ඩ 3ක් යටතට ගත්තාම, එක් පැත්තකින් ගෝලීය ආර්ථික අර්බුදයත්, ඊළඟට දේශීය ආර්ථික අර්බුදයත්, අනික් පැත්තෙන් ගෝලීය කොවිඩ් වසංගතයත් එක්ක තමයි මෙවර අය වැය ඉදිරිපත් වන්නේ. එවැනි පරිසරයක් තුළ මීට වඩා දෙයක් ඉදිරිපත් කළ හැකිද කියන කාරණාව හෘදය සාක්ෂියට එකඟව ප්‍රශ්න කරන්න කියා මා විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ අර්බුදය තුළත් සාධනීය කාරණා ගණනාවක් ඊයේ දවසේ ඉදිරිපත් කළ අය වැයේ සඳහන් කළා. එතුමා මේ ගරු සභාවේදී වාචිකව සඳහන් කළ කාරණාවලට වඩා ලිඛිතව ලබා දුන් අය වැය ප්‍රකාශනයේදී -එතුමාගේ මුද්‍රිත ප්‍රකාශනයේදී- කාරණා ගණනාවක් ඉදිරිපත් කරන්න එතුමා කටයුතු කළා. ඒ නිසා හොඳින් කියවන කෙනෙකුට, හොඳින් බලන කෙනෙකුට -හොඳින් පරිශීලනය කරන කෙනෙකුට- මෙවර අය වැය මෑත ඉතිහාසයේ තිබෙන තත්ත්වය අවබෝධ කර ගැනීම තුළ ඉදිරිපත් කළ හොඳ අය වැයක් ලෙස කියන්න පුළුවන්.

මේ අය වැය තුළ එතුමා කෘෂි කර්මාන්තය, කාබනික පොහොර, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය, කර්මාන්ත ක්ෂේත්‍රය, ධීවර කර්මාන්තය සම්බන්ධව ඉතාම පැහැදිලි කාරණා රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. සමස්තයක් විධියට ගත්තාම, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019 දී බලයට පත්වෙනකොට ඉදිරිපත් කරපු "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය සහ පසු ගිය අවුරුද්දේ මුදල් අමාත්‍යවරයා විධියට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරපු අය වැය ප්‍රකාශයේ තිබෙන "දේශීය ආර්ථිකයක්" කියන ආර්ථික සංකල්පය ඉදිරියට ගෙන යන අය වැයක් තමයි අපට මෙවර දකින්න ලැබෙන්නේ. ඒ නිසා මෙවර අය වැයේ ඉලක්ක සාධනය කර ගන්න අපි මොකක්ද කළ යුත්තේ? අය වැයේ ගණන් හිලව් මත තිබෙන මුදල් ප්‍රමාණය, සංකල්පමය යෝජනා ප්‍රමාණය සාධනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ අමාත්‍යාංශවල සිටින නිලධාරින්ට සහ රට පාලනය කරන්න මැදිහත් වෙන ග්‍රාමීය පහළ මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරින් දක්වා වූ සියලු දෙනා එක පෙළට එකතු වුණොත් විතරයි. ඒ නිසා අප කාටත් බරපතළ වගකීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය තුළ සාධනීය ලක්ෂණ ගණනාවක් තිබෙනවා. 2022 විසර්ජන පනත් කෙටුම්පත විවාද කරන අවස්ථාවේ ලැබෙන කෙටි වේලාව තුළ මේ යෝජනා ගැන කරුණු වශයෙන් මිසක් විස්තර වශයෙන් සඳහන් කරන්න ඉඩකඩක් ලැබෙන්නේ නැහැ. මෙම අය වැය තුළ යටිතල පහසුකම් සම්බන්ධ දැවැන්ත කියවීමක් තිබෙනවා. ඒ පිළිබඳව සඳහන් වෙච්ච නිසාවෙන් ඒ සඳහා මම වේලාව ගන්නේ නැහැ. ඒ වාගේම ග්‍රාමීය නිවාස, වතු නිවාස සම්බන්ධවත් වැඩි කියවීමක් මේ අය වැයේ තිබෙනවා. අපි බලය බෙදීම සම්බන්ධයෙන් අරගළ කරපු කණ්ඩායමක්; බලය විමධ්‍යගත වෙන්න ඕනෑ කියලා මතවාදයක්, සංකල්පයක් ඇතිව හිටපු කණ්ඩායමක්. ඒ බලය බෙදීම, විමධ්‍යගතවීම ග්‍රාමීය මට්ටමට නොවෙයි, ග්‍රාම නිලධාරි මට්ටමට පත්වෙන ආකාරයක් පෙන්වන අය වැයක් බවට මෙවර ඉදිරිපත් වෙලා තිබෙනවා. ඉතිහාසයේ පළමු වතාවට විමධ්‍යගත අය වැයක්, ග්‍රාමීය මට්ටමට පහළටම බෙදුණු අය වැයක් බවට අද මේ අය වැය පත් වෙලා තිබෙනවා. මෙතෙක් කාලයක් අමාත්‍යාංශ මට්ටමින් තමයි මුදල් වෙන් වුණේ. අපි දැක්කා, පසු ගිය අය වැයේදී රාජ්‍ය අමාත්‍යාංශ වලට වෙන් කරපු මුදල් ප්‍රතිපාදන, වැය ශීර්ෂයන් අද වෙනකොට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පහළට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා 14,021 ක් වූ ග්‍රාම සේවා වසම් දක්වා ම වෙන් වෙන අය වැයක් බවට මේ අය වැය පත් වෙලා තිබෙන බව. ඒ නිසා සංකල්පමය අවශ්‍යතාව සාධනය වෙන්න නම්, ඒ ගම සමඟ පිළිසඳරක් යෝජනාවලියෙන් විශේෂයෙන් ජීවනෝපාය සම්බන්ධයෙන් ඉදිරිපත් වෙච්ච යෝජනා, අදහස් ශක්තිමත් කර ගන්න පුළුවන්කම ලැබුණොත් තමයි මේ රට වැටිච්ච ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ වාගේම කොවිඩ් නිසා පීඩාවට පත් වෙච්ච අය ගැන සඳහන් වුණා; ඒ පිළිබඳ ගණන් හිලව් සඳහන් වුණා. ත්‍රිරෝද රථ රියැදුරන්, පෞද්ගලික බස් රථ රියැදුරන් ආදී වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් සහනාධාර විශාල ප්‍රමාණයක් ලබා දෙන්න මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මම ඉතාම ඕනෑකමින් කියනවා, මේවා ලබාදීමේදී ඉතාම සීරු මාරුවෙන්, ඉවසීමෙන් යුක්තව කටයුතු කරන්න ඕනෑ බව. එහෙම නැත්නම් සිදු වෙන්නේ සාධාරණය හරියට සිද්ධ වෙන්නේ නැති එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රජය යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දැවැන්ත පරිවර්තනයක් සිද්ධ වෙනවා, ජාතික පාසල් සංකල්පය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව. සමස්ත අය වැයෙන් සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් -සියයට 7කට වැඩි ප්‍රමාණයක්- අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරන්න මෙවර අය වැයෙන් කටයුතු කරලා තිබෙනවා. ඒක ඉතාම සාධනීය පියවරක්. සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශාල මුදලක්, -මිලියන 33,000කට ආසන්න ප්‍රමාණයක්- වෙන් කරනකොට එතැන පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, 'සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ හෙළ වෙදකම දියුණු කිරීම සම්බන්ධව' කියලා. අපේ රටේ මෙතෙක් කාලයක් සෞඛ්‍ය ක්ෂේත්‍රය කිව්වාම, ආයුර්වේදය සහ හෙළ වෙදකම ගැන ඉතාම ප්‍රාථමික විධියට තමයි හිතන්න පතන්න කටයුතු කළේ කරලා තිබුණේ. සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා මෙවර අය වැයෙන් සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීම සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. කොවිඩ් අර්බුදය වෙලාවේ

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

දේශීය වෛද්‍යවරුන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැවැන්ත කැපකිරීම හා සමානවම විශාල කාර්ය භාරයක් සිද්ධ කළා. මේ වෙලාවේ මම විශේෂ කාරණයක් කෙරෙහි සෞඛ්‍ය විෂය භාර අමාත්‍යතුමාගේත්, දේශීය වෙදකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේත් ගෞරවනීය අවධානය යොමු කරවනවා. උපාධිය ලබාගත් දේශීය වෛද්‍යවරුන් 715කට ආසන්න සංඛ්‍යාවක් 2018 ඉඳලා රැකියා විරහිත වෛද්‍ය උපාධිධාරීන් හැටියට ඉන්නවා. ඔවුන් අද රැකියා විරහිත ගොඩේ ඉන්නේ. ඒ නිසා ඔවුන්ට රැකියා අවස්ථා ලබාදීම සම්බන්ධවත් මේ ලැබිච්ච මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයෙන් කොටසක් ලබාදෙන්න කටයුතු කරන්න කියලා විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. රැකියා විරහිත උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංගමයෙන් ඉදිරිපත් කරපු ඉල්ලීම මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මෙවර අය වැය තුළ ගෘහස්ත ආර්ථිකය සම්බන්ධවත් සාධනීය යෝජනා ගණනාවක් තිබෙනවා. ඒ වාගේම "Home Shop" කියන සංකල්පය ඉතා වැදගත්. හැම ග්‍රාම නිලධාරි වසමකටම කාන්තා ව්‍යවසායකයන් බිහි වෙන වෙළෙඳ කුටියක් ඉදිකරන්න අය වැයෙන් යෝජනා කරනවා. ඒ තුළ අපේ රටේ මිල පාලනය සහ වෙළඳ පොළ කළමනාකරණය කරන්න ශක්තියක් ලැබේවි කියා මා විශ්වාස කරනවා. මේකට සමගාමීව සමුපකාර ව්‍යාපාර, සතොස ව්‍යාපාර ශක්තිමත් කළොත්, පාලන මිලට ලංකාව තුළ බඩු බෙදා හැරීමේ ජාලයක් - chain එකක්- රටේ හැම ග්‍රාම නිලධාරි වසමකම ඇති කරන්න පුළුවන්. ඒ නිසා මා විශ්වාස කරන්නේ මේ සඳහා අය වැයේ පළමු කාර්තුවේදීම වැඩි බරක් තියනවා නම් හොඳයි කියලායි.

මේ ක්‍රමය තුළ බඩු මිල වැඩිවෙලා තිබෙනවා. බඩු මිල පාලනය කිරීම අසීරුවෙලා තිබෙනවා. වෙළෙඳ පොළ කළමනාකරණය කිරීම බරපතළ අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුව මෙතෙක් අසමත් වී තිබෙන දේවල්වලින් එක් දෙයක් තමයි, මේ වෙළෙඳ පොළ ආර්ථිකය හමුවේ බඩු මිල පාලනය කිරීම. උදාහරණයක් වශයෙන්, සීනි කිලෝවක් ඉහළ මධ්‍යම පාන්තිකයාටත්, කෝටිපතියාටත්, එදිනෙදා කුලී වැඩ කරන මනුෂ්‍යයාටත් එක මිලකට ලැබීම අසාධාරණයි. ඒ නිසා ඒ දුප්පත් මිනිසුන් වෙනුවෙන් සහන මල්ලක් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න රුපියල් මිලියන 15,000ක ප්‍රතිපාදන මේ අය වැය තුළින් වෙන් කර තිබෙනවා. මේ අවස්ථාවේදී ඒ වෙනුවෙන් ගරු මුදල් ඇමතිතුමාට අපේ ගෞරවය හා ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ සහන මල්ල වාගේම ගැබිනි මාතාවන් වෙනුවෙන් සහනාධාර ලබාදීම ඇතුළු කාරණා ගණනාවක් මෙවර අය වැය යෝජනා තුළින් ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය සේවයේ ප්‍රශ්න ගණනාවක් සඳහා මේ අය වැය යෝජනා තුළින් විසඳුම් ලබාදීලා තිබෙනවා. අවුරුදු 24ක් තිස්සේ තිබුණු ගුරු හා විදුහල්පති සේවයේ වැටුප් විෂමතාව ඉවත් කරන බවට වුණු පොරොන්දුව මේ අය වැය තුළින් ඉෂ්ට කර තිබෙනවා; ඒ කාරණා සම්බන්ධයෙන් මැදිහත් වෙලා තිබෙනවා. රාජ්‍ය සේවකයන් බලාපොරොත්තු වුණා, මේ අය වැයෙන් වැටුප් වැඩි වෙයි කියලා. නමුත් පවතින තත්ත්වය තුළ ඒ සඳහා මැදිහත් වෙන්න ඉඩකඩක් ලැබිලා නැහැ. ඉඩකඩක් ලැබෙන පළමුවන අවස්ථාවේදීම ඒ පිළිබඳව අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, විශ්‍රාම වැටුප් විෂමතාවට විසඳුම් ලබා දීම සඳහා රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. 2016 වැටුප් විෂමතා නිසා ඉන් පසු විශ්‍රාම ගත් අයට බරපතළ අසාධාරණයක් වෙලා තිබෙනවා. ඒ අසාධාරණය ඉවත් කරන්න කටයුතු කරන්න කියලා විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

රාජ්‍ය අංශයේ විශ්‍රාම ගැන්විය යුතු වයස අවුරුදු 65 දක්වා වැඩි කිරීමේ යෝජනාව මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්න සහගත යෝජනාවක් කියලා අපි පෞද්ගලිකව විශ්වාස කරනවා. මීට දින කිහිපයකට කලින් අපි පෞද්ගලික අංශයේ විශ්‍රාම ගැන්විය යුතු වයස අවුරුදු 55 සිට අවුරුදු 60 දක්වා වැඩි කළා. නමුත්, රාජ්‍ය අංශයේ විශ්‍රාම ගැන්විය යුතු වයස අවුරුදු 60 සිට අවුරුදු 65 දක්වා වැඩි කිරීම fifty-fifty හොඳ නරක තිබෙන කාරණාවක්. ඒ නිසා මේ ගැන නැවත වතාවක් කල්පනා කරන්න ඕනෑ. අය වැය යෝජනා පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, ඉදිරි මාසයක කාල සීමාව තුළ මේ කාරණය සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලන්නය කියලා. කැමැති අයට, ඔවුන්ගේ කාර්ය සාධනය මත, අවුරුදු 60න් පසුව සේවයේ යෙදෙන්න පුළුවන් ක්‍රමයක් සකස් කරනවා මිසක්, අවුරුදු 65 දක්වා සේවයේ යෙදීම අනිවාර්ය කිරීමක් කළොත් නැති අර්බුද ප්‍රමාණයක් නිර්මාණය වෙන්න පුළුවන්. මොකද, අපේ රටේ රාජ්‍ය සේවයට එකතු වෙන්න තිබෙන ඉඩකඩ බොහොම සීමිත වෙලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලැබී තිබෙන කාලය තුළ අවසාන වශයෙන් තව කාරණාවක් කියන්න ඕනෑ. බදු ආදායම ලබා ගැනීම සඳහා ඉතාම හොඳ යෝජනා කිහිපයක් මෙවර අය වැයේ ඉදිරිපත් කර තිබෙනවා. අපි කිව්වා, මහ බැංකු වංචාවෙන් රටට අහිමි කළ මුදල් මේ රටේ ආර්ථිකයට එකතු කරන්න ඕනෑය කියලා. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 8.5ක මුදලක් එකතු කරන්න යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුපිරි ආදායම් ලබන ඉහළ පෙළේ කණ්ඩායම් ඉන්නවා. විශේෂයෙන් කොවිඩ් - 19 වසංගතයෙන් හැම ක්ෂේත්‍රයක්ම කඩා වැටෙද්දී ලාභ ලැබූ කණ්ඩායම් ප්‍රමාණයක් ඉන්නවා. එවැනි සමාගම් 62ක් එකතු කළ සුපිරි ආදායමට surcharge tax එකක් එකතු කර තිබෙනවා. ඒ වාගේම සමාජ ආරක්ෂණ tax එකක් සහ තවත් බදු ප්‍රමාණ ඉහළ ආදායම් ලබන අයගෙන් ලබා ගන්නත් කටයුතු කරලා තිබෙනවා.

ඊළඟට, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මතු වුණු ප්‍රශ්නයක් තමයි, අහිමි වුණු ආදායම් බදු එකතු කර ගැනීම පිළිබඳ කාරණය. ඒ සඳහාත් මැදිහත් වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය පරතරය පියවීම සඳහා අපට ආයෝජන ගැන කල්පනා කරන්න වෙනවා; ණය ගැනීම් ගැන කල්පනා කරන්න වෙනවා. විශේෂයෙන් ආයෝජන කිරීමේදී සහ ණය ගැනීමේදී කලාපීය සහ භූ දේශපාලන තත්ත්ව ගැන කල්පනා කර කටයුතු කරනවා මිසක් ක්ෂණිකව ආර්ථික උපක්‍රමවලට යන්න ගියොත් අපි විශාල අමාරුවක වැටෙනවා. ඒ නිසා විදෙස් ආයෝජන කිරීමේදී සහ ණය ගැනීමේදී ජාතික වාගේම ජාත්‍යන්තර දේශපාලනයත්, මේ කලාපයේ තිබෙන දේශපාලන බල තුලනයත් ගැන වෙනදාට වඩා කල්පනා කර නොබැඳි විදේශ ප්‍රතිපත්තියක්, නොබැඳි ආර්ථික ප්‍රතිපත්තියක් එක්ක ඉදිරියට යන්න, කටයුතු කරන්න පුළුවන්කම ලැබුණොත්, අපේ රටට ඉතාම හොඳ කාලයක් නිර්මාණය කරන්න පුළුවන්කම ලැබෙයි. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ප්‍රාර්ථනා කරපු, එතුමිය යෝජනා කරපු, එතුමිය නායකත්වය දීපු නොබැඳි ආර්ථික ප්‍රතිපත්තියක, නොබැඳි විදේශ ප්‍රතිපත්තියක ඕනෑකම ඉදිරි දශක ගණනාවක අවශ්‍යතාවක් බවට පත්වෙලා තිබෙනවා. කලාපයේ දේශපාලන තත්ත්වය මේ වන විට ඉතාම අර්බුදකාරී

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

තත්ත්වයකයි පවතින්නේ. ඒ නිසා ණය ගැනීම්, ආයෝජන සම්බන්ධ කාරණාවලදී ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය විධියට අපි ගරු මුදල් අමාත්‍යතුමාට ලබා දෙන ලද 2022 අය වැය කෙටි කාලීන යෝජනාවලිය මා **සභාගත*** කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Nimal Piyathissa. You have ten minutes.

[අ.භා. 1.44]

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2022 අය වැය ලේඛනය දෙවන වර කියවීමේ විවාදයේදී අදහස් දැක්වීමට මට අවස්ථාව ලැබීම පිළිබඳව විශේෂයෙන් මා සතුටු වෙනවා. මීට පෙර වසර 12ක් පමණ අපි පළාත් සභාවලදී අය වැය විවාදවලට සම්බන්ධ වුණා. දැන් පාර්ලිමේන්තුව තුළ ජාතික මට්ටමේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ සහ මුළු ලෝකයේම ඇති වෙලා තිබෙන තත්ත්වය එක්ක 2019 ඉඳලාම, අපේ ආණ්ඩුව නිර්මාණය වුණු දවසේ ඉඳලාම අපට මුහුණ දීමට සිදු වූ ප්‍රධානම බාධකය, අභියෝගය, ගැටලුව එක්ක පොර බදමින් තමයි වාර්ෂිකව මේ කටයුතු ඉදිරියට අරගෙන යන්න වෙලා තිබෙන්නේ කියන එක කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් අපි පිළිගන්න ඕනෑ.

විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා රටට අදාළව නිදහසේ යමක් කරන්න බලාපොරොත්තු වුණත්, ආණ්ඩුව විධියට අපි නිදහසේ යමක් කරන්න උත්සාහ ගත්තත්, මාරාන්තික කොවිඩ්-19 වසංගතය ඉතා ප්‍රබලව අපට, රටට බාධා කළා කියන එක අමුතුවෙන් පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. විශේෂයෙන් මෙන්න මේ කියන මූලික බාධකයට යටත්වයි අපට 2022 අය වැයට අදාළවත් කරුණු ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඉතිහාසය පුරාම, අපි දන්නා කාලයේ ඉඳලාම පාර්ලිමේන්තුවේ අය වැය ලේඛන ඉදිරිපත් කළා. සෑම වසරකටම අදාළව අය වැයක් ඉදිරිපත් වෙනවා. ඒ කියන්නේ, ඉදිරි වසරට අදාළ මුදල් ප්‍රකාශනය; අය සහ වැය. හැබැයි, මෙවර අය වැයේදී අපට සුවිශේෂී අත්දැකීමක් එකතු වුණා. මුදල් අමාත්‍යතුමා මෙවර අපූරු අත්දැකීමක් මහජන නියෝජිතයෝ වන අපට එකතු කළා.

මෙවර අය වැය ජනතා අය වැයක් විධියට හඳුන්වන්න පුළුවන්. 2022ට අදාළ අය වැයට යෝජනා ලබා ගැනීම සඳහා අපි ග්‍රාම නිලධාරි වසම් 14,021ටම ගියා. ග්‍රාම නිලධාරි වසමකට මූලිකව රුපියල් මිලියන 3කත්, පළාත් පාලන කොට්ඨාසයකට රුපියල් මිලියන 4කත්, ඒ වාගේම පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට ඒ දිස්ත්‍රික්කයට අදාළව රුපියල් මිලියන 100කටත් අදාළ යෝජනා සකස් කරලා මුදල් අමාත්‍යාංශයට භාර දෙන්න අපට අවස්ථාව ලැබුණා. අපට මුදල් අර්බුද තිබෙනවා. ඩොලර් අර්බුද, රුපියල් අර්බුද බරපතළ විධියට තිබුණා වුණත්, මෙවර පතුලටම ගිහිල්ලා -ගමටම ගිහිල්ලා- ඔවුන්ගේ යෝජනා අරගෙන, ඒ යෝජනාවලින් සමන්විත අය වැයක් ඉදිරිපත් කරන්න අපේ ආණ්ඩුව උත්සාහයක් ගත්තා. මෙවර අය වැය සුවිශේෂී වෙන්නේ ඒ කාරණයත් එක්කයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුවක් කටයුතු කරගෙන යද්දී, අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාව වෙද්දී ස්වාභාවික ව්‍යසනවලට, වසංගත තත්ත්වයන්වලට මේ තරම් බරපතළ ආකාරයෙන් මුහුණ දෙන්න වුණු අවස්ථාවක් ඉතිහාසය පුරාවටම අපි අත්දැකලා නැහැ. අපේ රට තුළ දශක 7කට වඩා කාලයක් තුළ විවිධ ආණ්ඩු තිබුණා. නමුත්, ඒ ආණ්ඩුවලට මේ වගේ ව්‍යසන, බාධක, වසංගත තත්ත්වවලට මුහුණ දෙන්න සිදු වුණේ නැහැ. එවැනි තත්ත්වයක් නොතිබියදී පවා ඉදිරිපත් කළ අය වැය හරහා රටේ ආර්ථිකය බොහෝ දුරට අපි බලාපොරොත්තු වුණු මූලික ඉලක්කවලට ගෙන එන්නට සමත් වුණේ නැහැ. 2005 ඉඳලා 2014 තෙක් කාල පරිච්ඡේදය තුළ ලබා ගත් යම් කිසි සුවිශේෂී ජයග්‍රහණ ගණනාවක් අපි දැක්කා. හැබැයි, ඊට පෙර ගත්තොත්, ජාතික මට්ටමින් මේ වගේ අභියෝග නොතිබියදී, ඕනෑ තරම් ජයග්‍රහණ රටට ලබා දෙන්න පුළුවන්කම තිබියදී, මේ රටේ සිටි නායකයෝ, එහෙම නැත්නම් නිර්මාණය වුණු ආණ්ඩු විටින් විට විවිධ විධියට විදේශීයකරණය වෙලා, ෆෙඩරල් වෙලා, ලිබරල් වෙලා එක එක ක්‍රියාමාර්ග ගත්තා.

1977 දී විවෘත ආර්ථික ක්‍රියාවලිය ආවා. හැබැයි, ඒ විවෘත ආර්ථික ක්‍රියාවලිය ඇතුළේත් අපි නෙළා ගත් අස්වැන්න මොකක්ද? ලෝක පරිමාණයෙන් ව්‍යාප්ත වුණු කොවිඩ්-19 වසංගතය අපට පාඩමක් ඉගැන්වූවා. අපි හැම විටකම ගෝලීයකරණය ගැන කථා කරනවා. ලෝකයේ අනෙක් රටවල් එක්ක තිබෙන සම්බන්ධතා ගැන, විවිධ නිෂ්පාදන ගැන, විවිධ ආදායම් මාර්ග ගැන, පොදු ආර්ථිකය ගැන අපි විවිධ අදහස් පළ කරනවා; විවිධ විධියේ වැඩ පිළිවෙළවල් ගේනවා. හැබැයි, මෙවර මේ වසංගතය, "රට අභ්‍යන්තරයේ නිෂ්පාදනයට ප්‍රමුඛතාව දීපල්ලා" කියලා ලෝකයේ හැම රටකටම පාඩමක් ඉගැන්නුවා.

රට අභ්‍යන්තරයේ ජාතික නිෂ්පාදනයක්, රටට අනන්‍ය වෙච්ච නිෂ්පාදනයක්, රටට අනන්‍ය වෙච්ච ජාතික ආර්ථිකයක් ගොඩනඟා ගත් අයට තමයි මහා පරිමාණයෙන්, ලෝක පරිමාණයෙන් එන ස්වාභාවික ව්‍යසනයකට මුහුණ දීමේ හැකියාව තිබෙන්නේ. අද ලෝකයේ තිබෙනවා, තමන්ගේ රට ඉලක්ක කර ගත්, රටට අනන්‍ය වෙච්ච ස්ථාවර ආර්ථිකයක් හදා ගත් රටවල්. ඒ රටවල් මේ ව්‍යසනයට සාර්ථකව මුහුණ දුන්නා. බොහෝ රටවල් විවිධ රටවලින් හාල් ටික එන කල්, විවිධ පාරිභෝජන භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය ටික එනකල් බලාගෙන ඉන්නවා. හැබැයි, දැන් අපට පැහැදිලි වෙනවා, අපේ රට අභ්‍යන්තරයේ තිබෙන ස්වාභාවික සම්පත් උපයෝගී කරගෙන නිෂ්පාදන ඉලක්ක පෙරට ගන්න, ආර්ථික ස්ථාවරත්වය ක්‍රමිකව උඩට ගෙනෙන්න පුළුවන් වාතාවරණය හදන්න කියන බලපෑම අපට මේ වසංගතය මඟින් කර තිබෙන බව. අපේ රට කෘෂි ආර්ථිකය මත පදනම් වුණු රටක්. මේ රටේ ජනගහනයෙන් සියයට 70කට වඩා ජීවත් වන්නේ කෘෂි ආර්ථිකය මත පදනම් වෙලායි.

දෙකෝටියක් ඉක්ම වූ ජනතාවක් වෙසෙන අපේ රටේ රාජ්‍ය සේවකයන් ලක්ෂ 15ක්, 16ක් විතර තමයි ඉන්නේ. තවත් පිරිසක් ඉන්නවා, විදේශගත වෙලා. තවත් පිරිසක් ඉන්නවා, පෞද්ගලික ආයතනවල කටයුතු කරන. නමුත් අපේ රටේ හදවත මූලික වශයෙන් ගැට ගැහිලා තිබෙන්නේ, බැඳිලා තිබෙන්නේ කෘෂි කර්මාන්තයත් එක්ක. ඒක රට පුරාවටම විහිදී ගිය නිෂ්පාදන ක්‍රියාවලියක්. එළවලු ටික උඩ රටින් එනවා, හේන් ගොවිතැන ක්‍රියාත්මක වනවා, වී ගොවිතැන ක්‍රියාත්මක වනවා, කුඩා තේ වතු

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නිමල් පියතිස්ස මහතා]

හිමියන් තේ වගාව කරනවා, පොල් වගාව කරනවා. අපේ රටේ තිබෙන්නේ වගාවට ගැළපෙන සරුසාර භූමියක්; වඩා හොඳ පරිසරයක්. අපේ රටේ මේ භූමිය පාවිච්චි කරලා, කෘෂි ආර්ථිකය මත පදනම් වූ අපේ රටේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන්. ඉතිහාසය පුරාවටම අපි එය අත් දැක තිබෙනවා.

කෘෂි ආර්ථිකය මත පදනම් වෙච්ච නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙකු විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට අතිගරු ජනාධිපතිතුමාට, මුදල් ඇමතිතුමාට, අපේ ආණ්ඩුවට මා යෝජනාවක් කරනවා. 'කාබනික පොහොර ද, එහෙම නැත්නම් රසායනික පොහොර ද' කියන මාතෘකාවත් එක්ක ගොවි ජනතාව අද යම්කිසි අපහසුතාවකට, අසහනයකට පත් වෙලා සිටිනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙකු විධියට බරපතළ පීඩනයක් මටත් තිබෙනවා. මේ රටේ කවුරුවත් කාබනික පොහොර ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. මහජන නියෝජිතයන් වන අපිත් කාබනික පොහොර ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. නමුත්, අපේ රට අද මුහුණ දීලා තිබෙන, ලෝක පරිමාණයෙන් පවතින මේ අර්බුදය නිසා අපි යෝජනා කරනවා, ගොවීන්ට බලපා තිබෙන මේ බරපතළ ගැටලුව පිළිබඳව, අසහනය පිළිබඳව, අපහසුව පිළිබඳව, බාධකය පිළිබඳව නැවත නැවතත්, නැවත නැවතත් අවධානය යොමු කරන්න කියලා; අවධානය යොමු කරලා අපේ ගොවියාගේ පොහොර අවශ්‍යතාව සපුරන්න කියලා. ගොවියාට මූලිකව අවශ්‍ය කරන පොහොර වර්ගය ගොවි ජනතාවට ලබා දීලා, අපේ ඒ මූලික ඉලක්කයට, අතිගරු ජනාධිපතිතුමාගේ ඒ සංකල්පයට ක්‍රමානුකූලව ළඟා වෙන්න කටයුතු කළ යුතුය කියලා මම යෝජනා කරනවා. හැබැයි, ඉන් පෙර අපේ මේ කෘෂි ආර්ථිකය බිඳ වැටුණොත්, ගොවිතැන බිඳ වැටුණොත්, සහල් හිඟය බරපතළ විධියට ආවොත්, එළවලු හිඟය බරපතළ විධියට ආවොත්, ඉදිරි කාලය තුළ අපට විශාල අභියෝගත් එක්ක පොර බදන්න වනවා කියා මම හිතනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන, ගොවි ජනතාව නියෝජනය කරන, රට පුරා ගොවි ජනතාව නියෝජනය කරන ජාතික ගොවි ව්‍යාපාරයේ සභාපතිවරයා විධියටත් මට තිබෙනවා වගකීමක්, මගේ ස්වාධීන යෝජනාව ඉදිරිපත් කරන්න.

ජාතික නිදහස් පෙරමුණ විධියටත් අපි ගරු මුදල් ඇමතිතුමාට 2022 අය වැයට අදාළව යෝජනාවලියක් භාර දුන්නා. ඒ පිළිබඳත් අවධානය යොමු කරලා, මම කියපු කරුණු කාරණා පිළිබඳ නැවත වතාවක් විශේෂ අවධානය යොමු කරලා 2022 ජයග්‍රාහී වසරක් බවට පත් කර ගන්න පුළුවන් ශක්තිය, ධෛර්යය අපේ ආණ්ඩුවට, අපේ රටේ ජනතාවට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Roshan Ranasinghe . You have ten minutes.

[අ.භා. 1.54]

**ගරු රොෂාන් රණසිංහ මහතා (පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Roshan Ranasinghe - State Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට 2022 වර්ෂය සඳහා වූ අය වැය ඊයේ දිනයේදී මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අපට අමුතුවෙන් කරුණු හංගන්න දෙයක් නැහැ. අපේ රට, 2015 වර්ෂයේ සියයට 8.2ක ආර්ථික වර්ධනයක් තිබුණු රටක්. එදා පැවැති ඒ දැවැන්ත නායකත්වයට විරුද්ධව මහත් අසත්‍ය ගොතලා, චෝදනා හදලා, එම නායකයා පරාජය කරලා යහ පාලනයේ අය බලයට ආවා. ඒ අය බලයට ආ ගමන් පළමුවෙන්ම මහ බැංකුව කොල්ල කාලා, මේ රට ජාත්‍යන්තර වශයෙන් මහත් හානිදායක තත්ත්වයකට පත් කළා. අපේ සහෝදර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද මොනවා ප්‍රකාශ කළත්, මේ රටේ ආර්ථික පරිහානියට පැහැදිලිවම වග කියන්න ඕනෑ, යහ පාලන ආණ්ඩුව සහ එයට සහයෝගය දක්වපු කණ්ඩායම්. යහ පාලන ආණ්ඩුව කාලය තුළ දිගින් දිගටම ආර්ථිකය කඩා වැටුණා. එදා ආර්ථිකය කොයි තරම් දුරට කඩා වැටුණාද කියනවා නම්, සියයට 8.2ට තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 2.7ට බැස්සුවා. එතකොට තමයි මේ රටේ ජනතාව යහ පාලන ආණ්ඩුව ගහලා පැන්නුවේ; ගෙදර යැව්වේ.

එදා යහ පාලන ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයකු විධියට කටයුතු කරපු රවි කරුණානායක මැතිතුමාට මෙවර පාර්ලිමේන්තුවට එන්න බැරි වුණා; එතුමා ඡන්දය ඉල්ලලා පරාජය වුණා. ඒ වාගේම, මංගල සමරවීර මැතිතුමා ඡන්දය ඉල්ලන්න බැරි තත්ත්වයකට පත් වුණා. අපි දැනුත් දකිනවා, විපක්ෂය පැත්තේ කෙරෙන සාකච්ඡාවක්. ආණ්ඩුව එදා කරපු විධිය ගැන තමයි ඔය ඔක්කෝම එකතු වෙලා දැනුත් සාකච්ඡා කරනවා ඇත්තේ. අසත්‍යය කියලා තමයි එදා එතුමන්ලා බලයට ආවේ. ඒකට ජනතා විමුක්ති පෙරමුණත් පැහැදිලි ලෙස වග කියන්න ඕනෑ. මොකද, එතුමන්ලාත් ඒකේ මැදිහත්කරුවෙකු විධියට කටයුතු කළා. අදත් මෙතැනදී එකතු වෙලා ඒ සම්බන්ධව කථා කරන ආකාරයක් අපි දකිනවා. එදා මංගල සමරවීර මැතිතුමාටත් මොකක්ද වුණේ? ජනතා විමුක්ති පෙරමුණේ උපදෙසුත් අරගෙන කටයුතු කරලා, ඡන්දය ඉල්ලන්නවත් බැරි තත්ත්වයට එතුමා පත් වුණා.

ඊයේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා මාධ්‍ය තුළින් කියනවා අපි දැක්කා, "අය වැය හොඳයි" කියලා. අපි මාධ්‍යවලින් දැක්කේ, එතුමා අය වැය හොඳයි කියන බවකුයි. කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ වාගේ අය වැය කථාව ඉවර වෙලා තේ පැන් සංග්‍රහයට ගිය එතුමාට mike එක ළං කළ ගමන්, වෙන කියන්න දෙයක් නැතිව එතුමා කිව්වා, "හොඳ අය වැයක්" කියලා. මම මේක වගකීමෙන් කියන්නේ. මා ඊයේ "දෙරණ" මාධ්‍ය තුළිනුයි එය දැක්කේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොවිඩ් වසංගතය කියන්නේ, වසර 100කට පස්සේ ආ දැවැන්තම ව්‍යසනය බව අපි දන්නවා. මේ රටේ ජනතාව උගත්, බුද්ධිමත්. මේ රටේ පුංචි දරුවාගේ ඉඳලා දන්නවා, මේ කොවිඩ් වසංගතය කියන්නේ, අවුරුදු 100කට පස්සේ ආ දැවැන්තම ව්‍යසනය බව. මෙය මීට අවුරුදු 100කට කලින් ස්පාඤ්ඤයේ ඇති වූ Spanish flu එකෙන් පස්සේ ආ දැවැන්තම ව්‍යසනය. කොවිඩ් වසංගතය නිසා ලෝකයම ආර්ථික වශයෙන් කඩා වැටුණා. මෙතුමන්ලා අවුරුදු පහක් කාබාසිනියා කරපු රටයි අපට භාර දුන්නේ. අපේ ආණ්ඩුවට තිබෙනවා අභියෝගයක්, කොවිඩ් වසංගතයත් පාලනය කරගෙන මේ රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියලා.

කවුරු කෙසේ කිව්වත්, සමගි ජන බලවේගය රට ගැන, රටේ ජාතික ආරක්ෂාව ගැන හැඟීමක් තිබෙන පාලනයක් කරගෙන යාවි කියන එක ගැන මේ රටේ ජනතාව තුළ කිසිදු විශ්වාසයක් අදටත් නැහැ. රාජපක්ෂවරුන් මේ රට ආරක්ෂා කරනවා, රට රකිනවා, ගොවියා රකිනවා කියලා මේ රටේ ජනතාව පැහැදිලිව දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා, විපක්ෂය දැන් ගොවියා ගැන කථා කරන්න පටන් ගෙන තිබෙන බව.

එතුමන්ලා දැන් බොර දියේ මාළු බානවා. එදා ගොවියාට මොකක්ද කළේ? 2015-2020 කාලයේ ගොවියාගේ වී කිලෝව රුපියල් 25ට වත් විකුණා ගන්න පුළුවන් වුණේ නැහැ. ගරු මන්ත්‍රීවරුනි, එදා ඔබතුමන්ලාගෙන් කවුද ගිහින් ඒ ගැන කථා කළේ? මිල දී ගත් වී ටිකෙනුත් ගසා කෑවා. යහ පාලන ආණ්ඩුවේ හිටපු නායකයෝ ඒකෙනුත් හොරා කෑවා. ඒ ආණ්ඩුවේ එදා හිටපු නායකයන්ගේ සහෝදරයන්ට කුණුකොල්ලෙට -කිලෝව රුපියල් 24ට- ඒ වී ටික විකුණුවා. සත්ත්ව ආහාරවලට කියලායි දුන්නේ. ඒක මහා කොල්ල කෑමක්!

ඊළඟට, සංස්කෘතික අරමුදලට මොකක්ද කළේ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එදා සංස්කෘතික අරමුදල නැති හංගස්ථාන කළා; නිවාස සංවර්ධන අධිකාරියේ අරමුදල් ටික නැති කළා; අලිමංකඩවල ගෙවල් හැදුවා. හැබැයි, අද වන කොට අපි නිවාස කීයක් හදලා තිබෙනවාද? දිළිඳු පවුල් ගොඩනඟන වැඩ පිළිවෙළ තුළ අප මේ වන කොට -මේ අවුරුදු එකහමාරට- නිවාස 20,000ක් හදලා ඉවරයි. මේ වසරේ නිවාස 10,000ක් හදන්න අපේ ආණ්ඩුව මුදල් වෙන් කර දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. හැම දාම ගොවියා රැක්කේ, නැඟිට්ටෙව්වේ රාජපක්ෂ ආණ්ඩුවක්. පසුගිය මැතිවරණයේදී ගොවියා තමයි යහ පාලනය පන්නන්න පැහැදිලි ලෙසම මූලික වුණේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට පොළොන්නරුව නියෝජනය කරන මම, කුරුණෑගල නියෝජනය කරන ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා, මොණරාගල නියෝජනය කරන අපේ ගරු විජිත බේරුගොඩ මැතිතුමා, ගරු ජානක වක්කුඹුර මැතිතුමා, ගරු අමරකීර්ති අතුකෝරළ මැතිතුමා ඇතුළු මේ ඔක්කෝම ගොවි ජනතාව නියෝජනය කරමින්, ගොවි ජනතාවගේ වටිනා ඡන්දයෙන් තමයි පාර්ලිමේන්තුවට ආවේ.

ඒ නිසා ගොවි ජනතාව රකින වගකීම අපට කවුරුවත් උගන්වන්න ඕනෑ නැහැ. ඒ වාගේම අපි දන්නවා, කිසි දවසක පොදු ජන පෙරමුණ දමලා ගොවි ජනතාව යන්නෙත් නැහැ කියන එක. නමුත් මේ ගොල්ලන් බලනවා, පොඩි chance එකක් ගන්න පුළුවන්ද කියලා. ගොවි ජනතාවට අපි කියනවා, භය නැතිව කුඹුරට බහින්න කියලා. ගොවියා රැක ගැනීමේ වගකීම විතරක් නොවෙයි, අතිගරු ජනාධිපතිතුමා ගෙනාපු, කාබනික වගාවට යොමු වීමේ වැඩ පිළිවෙළ සඳහා වන අවශ්‍යතා සියල්ලත් ඉෂ්ට වෙයි. ඒ නිසා "ගොවි ජනතාව විධියට ඔබ වගා කටයුතු කරන්න, ආර්ථික වශයෙන් ඔබට වැඩිපුර ප්‍රතිලාභ ලැබෙනවා" කියන පණිවුඩය අපි ඒ අයට ලබා දෙනවා. මේ අයට පොඩි මෝඩ චූන් එකක් ගන්න අවස්ථාවක් හම්බ වුණාම ඒකෙන් උපරිම ප්‍රයෝජන ගන්න බලනවා. මේ වෙලාවේත් බලනවා, මේකෙන් ගොඩ යන්න පුළුවන්ද කියලා. හැබැයි ඉතින් එහෙම ගොඩ යන්න හම්බ වෙන්නේ නැහැ. අපි ඕනෑම වෙලාවක මැතිවරණවලට සූදානම්. අපි මැතිවරණවලට භයත් නැහැ.

මේ වෙලාවේ අය වැය ගෙනෙන්නේ කොහොමද, ආර්ථිකය ගොඩ නඟන්නේ කොහොමද කියලා විපක්ෂය හිතුවා. පළාතයි මධ්‍යම රජයයි ගත්තාම පැහැදිලි ලෙස අධ්‍යාපනයට සියයට 13කට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා; සෞඛ්‍යයට සියයට 12කට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා; කෘෂිකර්මාන්තයට අති දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකය ඇති කිරීමේ වැඩ පිළිවෙළ සඳහා ගමට රුපියල් ලක්ෂ තිහකට වැඩි මුදල් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා, මේ අය වැයෙන්. එක මන්ත්‍රීවරයකු කියනවා අපි දැක්කා, ගමට වැඩ කරන්න මන්ත්‍රීවරුන්ට මුදල් දීලා තිබෙනවා කියලා. ඉතින් මන්ත්‍රීවරුන්ට නේ මුදල් දෙන්නේ. විමධ්‍යගත මුදල් දෙන්නේ කාටද? එදා මෛත්‍රීපාල විමධ්‍යගත මුදල් දීලා තිබෙන්නේ මහජන නියෝජිතයන් විධියට මන්ත්‍රීවරුන්ට තමයි. මහජන නියෝජිතයන් විධියට ඒ අයට මුදල් ටික දෙනකොට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාට රුපියල් ලක්ෂ දාහක් දීලා තිබෙනවා, පුද්ගල ආර්ථිකය නඟා සිටුවන වැඩ පිළිවෙළට මේ අය වැය තුළින්. ඒ තුළින් ගමේ ආර්ථිකය අලුතෙන් ආරම්භ කරන්න පුළුවන්. ගම තුළින් තමයි හැම දාම රාජපක්ෂ රජය මේ රට ආර්ථික වශයෙන් නැඟිට්ටුවේ.

2005දී අපි බලයට එනකොටත් මේ වාගේම තමයි. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පාලනයත් එක්ක රට නැති හංගස්ථාන කරලා, කොටියාට රටෙන් භාගයක් ලියා දීලා තිබුණා. ඒ අර්බුද මැද තමයි එදාත් අපි රට භාර ගත්තේ. එදා යුද්ධය අවසාන කරන්න අපට HSBC එකෙන් ණය ගන්න වුණා. හැබැයි, අපි යුද්ධයත් අවසන් කළා; රටත් ගොඩ නැඟුවා. යම් යම් අය කාලකණ්ණි සතුටක් ලබනවා ඇති, ආර්ථිකය ඇනගනියි කියලා. නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල අය වැය විධියට මේ අය වැය යෝජනාවලිය ගෙනාවේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළත් එක්කයි. බොහොම සද්භාවයෙන් ඉදිරිපත් කළ ඒ වැඩ පිළිවෙළේ සඳහන් පොරොන්දුවලින් සියයට 50කට වැඩි ප්‍රමාණයක් මේ වනකොට අපි අවසන් කරලා තිබෙනවා; ඉෂ්ට කර දීලා තිබෙනවා. ගුරු වැටුප් විෂමතාව ගැන "සෞභාග්‍යයේ දැක්ම"ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපි කථා කළා. අපි මේ වනකොට ඒ සඳහා විසඳුම් ලබා දීලා හමාරයි. පසුගිය කාලයේ සමහර අය උඩුඹ් විඩුඹ් කරන්න ගත්තා, "දුප්පත් ජනතාවට දෙන වියළි ආහාර මල්ල කෝ?" කියලා. ඒ වියළි ආහාර මල්ල ලබා දෙන්නත් මෙවර අය වැය තුළින් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පසුගිය කාලයේ lockdown එකත් එක්ක ත්‍රිරෝද රථ රියැදුරන්ට ආදායම අහිමි වුණා. දරුවන් පාසල් ගියේ නැති නිසා පාසල් වෑන් රථවලට ආදායමක් නැතුව ගියා. පාරේ යන බස්වලට ආදායමක් නැති වුණා. ඒ සියල්ල වෙනුවෙන් මෙවර අය වැය යෝජනාවලිය හරහා මුදල් වෙන් කර දීලා තිබෙනවා.

මේ රට ආර්ථික වශයෙන් නඟා සිටුවන්න නම්, මාර්ග පද්ධතිය හදන්නම ඕනෑ. යහ පාලන ආණ්ඩුව කාලයේ කොහේද එහෙම වුණේ? හිටපු ජනාධිපතිවරයා ඇහුවා, "පාරවල් කාපට් කරන්නේ මොකටද, කන්නද?" කියලා. හැබැයි, අද රටේ මාර්ග ටික හැදෙනවා. ආර්ථික වශයෙන් රටක් දියුණු වෙන්න නම්, මාර්ග පද්ධතිය අවශ්‍යයි. රුවන්පුර අධිවේගී මාර්ගය, එදා යහ පාලන ආණ්ඩුව අත ගහා ඉඳලා වැඩ අවසන් කර ගන්න බැරි වුණු මධ්‍යම අධිවේගී මාර්ගය ආදී සියල්ල අද ඉදිවෙමින් පවතිනවා. අපේ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමන්ලා අද ඒ සඳහා නායකත්වය ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා ආර්ථිකය නඟා සිටුවීම වෙනුවෙන් සමෘද්ධිලාභී පවුල් සඳහා "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩ පිළිවෙළ දියත් කළා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ආර්ථිකය නඟා සිටුවන්න ගෙනාපු ඉතාම වැදගත් වැඩ පිළිවෙළක්, ඒක. එම වැඩ පිළිවෙළ තවත් පුළුල් කරලා, මෙවර අය වැය තුළින් නිෂ්පාදන ගම්මාන සංකල්පය ගෙනැල්ලා ආර්ථිකය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කරන්න කටයුතු කරලා තිබෙනවා.

පළාත් සභා හා පළාත් පාලන කටයුතු භාර රාජ්‍ය අමාත්‍යවරයා විධියට විශේෂයෙන්ම මගේ ස්තුතිය පුද කළ යුතු කාරණයක් තිබෙනවා. කොට්ඨාස 4,917කින් තමන්ගේ කොට්ඨාසය වෙනුවෙන් වැඩ කරන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට 2010දී වසරකට ලබා දුන්නේ රුපියල් ලක්ෂ 50යි. මෙවර අය වැයෙන් කොට්ඨාසයක් භාර පළාත් පාලන මන්ත්‍රීවරයාට ලක්ෂ 40ක

[ගරු රොෂාන් රණසිංහ මහතා]

මුදලක් ලබාදීලා තිබෙනවා. අපේ සහෝදර හර්ෂ ද සිල්වා මැතිතුමන්ලා, කබීර් හෂීම් මන්ත්‍රීතුමන්ලා මේ සම්බන්ධයෙන් සතුටු වෙන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත්, අනෙක් පැත්තෙන් ජනතා විමුක්ති පෙරමුණේ කොට්ඨාස නියෝජනය කරන මන්ත්‍රීවරුන් කිහිප දෙනාටත්, - ගොඩක් නැති වුණත්, ඉන්න කීහිප දෙනාට - එම රුපියල් ලක්ෂ 40 ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේක ප්‍රජාතන්ත්‍රවාදයේ ගරුත්වය උපරිම වශයෙන් ලබා දීලා තිබෙන අවස්ථාවක්. ජනතා ඡන්දයෙන් පත් වුණේ මොන පක්ෂයක නියෝජිතයෙකු වශයෙන් වුණත්, එතුමන්ලාට වැඩ කරන්න පුළුවන් පසුබිම සකස් කරලා, රුපියල් බිලියන 19,668ක් පළාත් පාලන මන්ත්‍රීවරුන්ට ලබාදීම තුළම පළාත් පාලනයට සුවිශේෂී දායකත්වයක් මේ රජය විසින් ලබා දීලා තිබෙනවා කියන එක විශේෂයෙන්ම මම සිහිපත් කරනවා.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක වෙනවා. වැටුණු රටක් අපි භාර ගත්තේ. අපේ පැවැති රජය යහ පාලනයට මේ රට භාර දෙනකොට අපේ මුළු ණය තිබුණේ ට්‍රිලියන 7යි. ඒ කියන්නේ, බිලියන 7,000යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි නැවත මේ රට භාර ගනිද්දී ණය ප්‍රමාණය බිලියන 14,000කට ආසන්නයි. ඔන්න එතුමන්ලාගේ ආර්ථික කළමනාකරණය. ඒ වාගේම, අපි මේ රට බාර දෙනකොට ණය බර දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 72යි. නැවත අපි රට බාර ගනිද්දී ඒ ප්‍රමාණය සියයට අනූ ගණනයි. ඊළඟට අපේ රුපියලට මොකක්ද වුණේ? සියයට 18කට වැඩිය රුපියල අවප්‍රමාණය වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please wind up now.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
මේ තත්ත්වයෙන් තමයි අපි රට භාර ගත්තේ. ඒක නිසා අපි පැහැදිලිව මේ කාරණය කියනවා. සාධනීය වශයෙන් යම් විවේචනයක් තිබෙනවා නම් ඒක කළාට කමක් නැහැ, නමුත් ජාතියක් ලෙස අර්බුද ගණනාවකට මුහුණ දෙමින් සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙන වෙලාවක, ඔබතුමන්ලා සාධනීයව කටයුතු කරලා හොඳ දෙය, හොඳ විධියට දකින්න පුරුදු වෙන්න. යම් ගැටලුවක් තිබෙනවා නම් ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කළාට කමක් නැහැ. කුහකත්වයෙන් මේ දිහා බලන්න එපා. මොකද, කවුරුවත් නොසිතපු සුවිශේෂී අය වැයක් ගරු මුදල් ඇමතිතුමා මේ රටේ ජනතාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ බවත් විශේෂයෙන්ම සිහිපත් කරමින්, මුදල් අමාත්‍යවරයා විධියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට අපේ ගෞරවය පුද කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Kabir Hashim. Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya to the Chair?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I propose that the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *took the Chair.*

[අ.භා. 2.07]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කරුණු පිළිබඳව අදහස් කිපයක් ඉදිරිපත් කළා. මම කැමැතියි, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කියපු දේවල් තවදුරටත් තහවුරු කරන්න. එතුමා ඒ කිව්වේ ඇත්ත බව සහතික කරලා පෙන්වන්න මට අවශ්‍යයි. විශේෂයෙන්ම අද රටේ පවතින තත්ත්වය අය වැය ඉලක්කම්වලට එහා ගිය තත්ත්වයක් කියන එක රටේ බොහෝ දෙනෙක් හොඳටම දන්නවා. අද මේ රටේ ව්‍යුහාත්මක ඌනතාවක් තිබෙන බව සාමාන්‍යයෙන් මේ රටේ බහුතරයකට හොඳටම තේරෙනවා ඇති කියලා මම විශ්වාස කරනවා. අපේ රටේ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා. එයින් ප්‍රධාන ප්‍රශ්න දෙක තමයි, මූල්‍ය ගිණුම් හිඟය. නැත්නම්, fiscal deficit එක. ඊළඟ එක තමයි, බාහිර ජංගම ගිණුමේ හිඟය. නැත්නම්, external current account එකේ හිඟය. අද ශ්‍රී ලංකාවේ පෞද්ගලික ඉතිරි කිරීම් කඩා වැටෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම, රාජ්‍ය ආදායම් කඩා වැටෙනවා. මේ විධියට බලනකොට ඇත්තටම මේ රට උපයනවාට වඩා වියදම් කරනවා. මේ රට නිෂ්පාදනය කරනවාට වඩා පරිභෝජනය කරනවා. මේ ප්‍රශ්නය ගැන මේ අය වැයෙන් ආමන්ත්‍රණය කරලා නැහැ. පළමුවෙන්ම, මේ මූල්‍ය අසමතුලිතතාවට යම් විසඳුමක් දෙන්නට රජය අපොහොසත් වෙලා තිබෙනවාය කියන එක ඉතාම පැහැදිලියි. පසුගිය අවුරුදු දෙකෙත් ඒක කළේ නැහැ. මේ අය වැයෙන් ඒ ගැන කථා කරලවත් නැහැ; ඒ ගැන ආමන්ත්‍රණය කරලාවත් නැහැ. මොකද, මේ ප්‍රශ්න විසඳන්න නම් ස්ථිර ප්‍රතිපත්ති රාමුවක් අවශ්‍යයි. ඒ ප්‍රතිපත්ති රාමුව මේ ආණ්ඩුවේ නැහැ. මේ ආණ්ඩුව දුවන්නේ "එඩාවෙල ටුවර්ස්" හැටියටයි. ඒ නිසා තමයි "ජීආර්" කියලා කිව්වාම, ගොඩක් අය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන්නේ. උදේට නිකුත් කරන ගැසට් එක හවසට ආපහු හරවනවා. මේ වාගේ දේවල් කරලා රටක් ගෙනයන්න පුළුවන් ද? අපට නම් හිතා ගන්න බැහැ.

අපට අද විශේෂයෙන්ම දකින්න ලැබෙන්නේ විටෙක පොහොට්ටුවේ අය විසින්ම ජනතාව ආමන්ත්‍රණය කරලා රටේ සංවර්ධනයට, ස්වාධිපත්‍යයට, ජාතික ආරක්ෂාවට අහිතකරයි කියලා දේශපාලන වේදිකාවල හංවඩු ගහපු ඒ ප්‍රතිපත්ති කිසිම අවබෝධයකින් තොරව, ක්‍රමවේදයකින් තොරව, අත්තනෝමතිකව ක්‍රියාත්මක කරගෙන යන බවයි. ඇත්තටම අපට පෙනෙන විධියට, මේ රට පාලනය කරන්නේ අවුල් හවුලක් වාගේයි. පිටිසර ගම්මානයක වියපත් මිත්තණියක් තමන්ගේ හේනෙන් එකතු කර ගත් කලවම් පලා වට්ටියකට තමයි අපට මේ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති සම කරන්න පුළුවන් වෙන්නේ. මොකද, කිසිම සංගතභාවයක් නැහැ. එම නිසා මේකෙන් සිදුවන හානිය

විශාලයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තිරසර ආර්ථික සංවර්ධනයක් ඇති කර ගැනීමට රටේ සමාජ, ආර්ථික පසුතලයට ගැළපෙන, ඒ වාගේම භූගෝලීය සාධක ගළපා ගත හැකි සබුද්ධික ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් සකස් කළ යුතු බව අලුත් බලවේගයක් හැටියට සමගි ජන බලවේගය නියෝජනය කරන අපි විශ්වාස කරනවා. හැබැයි, මේ ආණ්ඩුවට අවුරුදු දෙකකින් ඒක නිර්මාණය කරන්න බැරි වුණා. එහෙම නැත්නම් ප්‍රදර්ශනය බැරි වුණා, ක්‍රියාත්මක කරන්න බැරි වුණා.

සාමාන්‍යයෙන් අනුන්ට දොස් කීමේ පුරුද්දක් දේශපාලනඥයන්ට තිබෙනවා. එම නිසා ඔවුන් නිතරම නිදහසට කරුණු සොයන්න උත්සාහ කරනවා. ඒ සඳහා කවුරු හෝ දඩමීමා කර ගන්න, ඉංග්‍රීසියෙන් කිව්වොත් "scapegoat" කෙනෙක් සොයන්න උත්සාහ කරනවා. හැම රටකම, හැම දේශපාලනඥයෙකුම වාගේ දඩයක්කාරයෝ හොයනවා. උදාහරණයක් ගත්තොත්, ඇමෙරිකාවේ හිටපු ට්‍රම්ප් ජනාධිපතිවරයා ප්‍රශ්න තිබෙන කොට දඩමීමා කර ගත්තේ මෙක්සිකෝවෙන් එන නීති විරෝධී සංක්‍රමණිකයි. එහෙම නැත්නම් චීනයෙන් ලාභෙට ආනයනය කරන භාණ්ඩයි. ඒවා පෙන්වා-පෙන්වා ඇමෙරිකන්කාරයා නිදහසට කරුණු කිව්වා. ඒ වාගේම එංගලන්තයේ බොරිස් ජොන්සන් මොකක්ද කළේ? නැඟෙනහිර යුරෝපයෙන් එන සංක්‍රමණිකයන් පෙන්වා-පෙන්වා pro-Brexit සටන් පාඨ අරගෙන එංගලන්තයේ තිබෙන ප්‍රශ්න වහගන්න බැලුවා.

හැබැයි, ශ්‍රී ලංකාවේ තත්ත්වය ඊට වඩා පොඩ්ඩක් වෙනස්. ශ්‍රී ලංකාවේ නිතරම දඩමීමා කර ගන්නේ, එහෙම නැත්නම් දඩයක්කාරයෝ හැටියට හොයා ගන්නේ සුළු ජාතීන්. කොටින්ම කියනවා නම්, ජාතිය, ආගම පෙන්වා-පෙන්වා සුළු ජාතීන් දඩමීමා කරගෙන තමන්ගේ නොහැකියාව වහගන්න උත්සාහ කරන ආණ්ඩුවක් තමයි අද මේ රටේ තිබෙන්නේ. දැන් අලුත්ම දේ තමයි, ඒ විධියට දඩමීමා කර ගන්න අලුත් දේවල් සොයන එක. දැන් කොරෝනා වයිරසය අල්ලාගෙන කියනවා, මේ ඔක්කෝම වුණේ කොරෝනා නිසා කියලා. ඒක සම්පූර්ණ අසත්‍යයක්. ඒක අපි මේ රටට සහතික කර පෙන්වන්නම්.

මෙතුමන්ලා මේ වෙනකොට හාල් මාෆියාව දඩමීමා කරගෙන තිබෙනවා. ඊළඟට, සීනි මාෆියාව. එහෙම නැත්නම් ඊළඟට කියනවා, පොහොර මාෆියාව ගැන. මෙතුමන්ලාම ප්‍රශ්න ඇති කරගෙන දැන් ඒ සඳහා එක එක හේතු දඩමීමා කර ගන්නවා. දැන් කියනවා, ගුරු මාෆියාවක් තිබෙනවා, වෘත්තීය සමිති මාෆියාවක් තිබෙනවා කියලා. මේවායෙන් නිදහසට කරුණු පෙන්වන එක නවත්වා, හයියක් තිබෙනවා නම් ඇත්ත තත්ත්වය කියලා, ඒවාට විසඳුම් ලබා දෙන්න ආණ්ඩුව කටයුතු කරනවා නම් තමයි අපට ආණ්ඩුවට ගරු කරන්න පුළුවන් වෙන්නේ. මේ රජයේ දුර්වල ප්‍රතිපත්ති සම්පාදනය, මන්දගාමී නිරූපණ, ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්, ජාත්‍යන්තර අවබෝධතා ගිවිසුම්, ඒ වාගේම නීතිය සහ නීතියේ ආධිපත්‍යය හරියට ක්‍රියාත්මක නොකිරීම ආදී ප්‍රශ්න නිසා අද ජාත්‍යන්තරය තුළ අපේ රට ගැන තිබෙන විශ්වාසය බිඳ වැටී තිබෙනවා; ගිලිහී ගිහින් තිබෙනවා.

සමහර අය ප්‍රශ්න කරනවා, අපේ විකල්පය මොකක්ද කියලා. අපට ඒකට ගොඩක් දේවල් කියන්න පුළුවන්. හැබැයි, මට හිතෙන ඔබතුමන්ලාට හිතාගන්න බැරි ප්‍රධානම දෙයක් තමයි, දේශයක රාජ්‍ය තන්ත්‍රික උපාය මාර්ගවල මූලික කොටසක් වන ආර්ථික රාජ්‍ය තන්ත්‍රිකභාවය - economic diplomacy - කියන එක. ඒක මේ ආණ්ඩුවට ගැව්ලාවත් නැහැ. එම ආර්ථික රාජ්‍ය තන්ත්‍රිකභාවයෙන් හසුරවන්නේ රටේ ආර්ථික තරගකාරිත්වය වැඩි කිරීම, ආර්ථික සහ සම්බන්ධතාව ශක්තිමත් කිරීම, අපනයන ඉලක්ක වර්ධනය කිරීම සහ විදේශ ආයෝජන තවත් පුළුල් කිරීමයි. හැබැයි, ඒ ඉලක්කයට යන්න ආර්ථික රාජ්‍ය තන්ත්‍රිකභාවය පමණක් මදි. ඒකට බලගතු, පිරිසිදු පාලන රාමුවකට නැංගුරම් දමන වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. එහෙම පිරිසිදු පාලනයක් මේ ආණ්ඩුවේ නැහැ. ඒ කළමනාකරණය, ඒ රාජ්‍යකරණය ඉස්මතු කර පෙන්වන්න මේ රජයට අද බැරිවෙලා තිබෙනවා. ඕතැන තමයි ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ. මෙවර අය වැයෙනුත් පැලැස්තර ඇලවීම හැර ප්‍රධාන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැරිවෙලා තිබෙනවා. සමගි ජන බලවේගයේ අපි විශ්වාස කරනවා, මේ අය වැය පැලැස්තර ඇලවීමක් කියලා. මොකද, ව්‍යුහාත්මක ප්‍රශ්න ආමන්ත්‍රණය කරන්න මෙවර අය වැයෙන් පියවර කිහිපයක් ගන්න තිබුණා. නමුත්, ඔබතුමන්ලාට ඒ හයිය තිබුණේ නැහැ. හරි නම් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට ඒ ආමන්ත්‍රණය කරන්න තිබුණා. මාස දෙකකට කලින් මේ සභාවේදී එතුමා පිළිගත්තා, ප්‍රශ්න ගොඩක් තිබෙනවා කියලා.

මේ රටේ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ගැන මේ අය වැයේ කථා කරන්නේ නැහැ. මේ රටේ මූල්‍ය ඒකාබද්ධ කිරීමක් - fiscal consolidation - ගැන මේ අය වැයෙන් ආමන්ත්‍රණය කළේ නැහැ. රාජ්‍ය ආදායම් වැඩි කිරීම සඳහා ස්ථිරසාර වැඩ පිළිවෙළක් මේ අය වැයෙන් ඉදිරිපත් කළේ නැහැ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කියන එක ඇල්ලුවේවත් නැහැ. මුදල් ප්‍රතිපත්ති, කාර්ය සාධනය සහ විනිමය අනුපාත පාලනය කිරීම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබුණත්, අය වැයේ ඒ ගැන කථා කළේත් නැහැ. ජාත්‍යන්තර වෙළෙඳාම, වෙළෙඳ ප්‍රතිපත්තිය, ආයෝජන ප්‍රතිපත්තියක් ගැන පැහැදිලිව කථා කළේත් නැහැ. ආණ්ඩුවක් හැටියට මේ ප්‍රශ්න ටික විසඳන්නේ කොහොමද? හරි නම් අය වැයකින් ඒ මූලික ගැටලු ආමන්ත්‍රණය කරන්න ඕනෑ. ඒක මාර්ග සිතියමක් වෙන්න ඕනෑ. හැබැයි, මේ අය වැයෙන් එවැනි ගැටලු ආමන්ත්‍රණය කළාද කියලා අපට හිතාගන්න බැහැ.

මම දන්නේ නැහැ, වෙන කවුරු හරි ඒ ප්‍රශ්නය ආමන්ත්‍රණය කළාද කියලා. මොකද, පසුගිය ඔක්තෝබර් මාසයේ 01වැනි දා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා කරුණු 20ක් සහිත මාර්ග සිතියමක් ඉදිරිපත් කළා. එතුමා කිව්වා, මේක තමයි අපි ගෙනයන වැඩ පිළිවෙළ කියලා. එතුමා මේ දේවල් පිළිගත නොහැකි විධියට, වංක විධියට සුරංගනා කථා ගොඩක් කිව්වා. විනිමය අනුපාත ප්‍රශ්නය, බාහිර ණය ප්‍රශ්නය, ගෙවුම් ශේෂයේ හිඟය, මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම හෝ රාජ්‍ය ආදායම පිළිබඳව ඒ කරුණු 20 ඇතුළේ විසඳුම් ලබා දෙන්න එතුමාටත් බැරි වුණා. එතකොට මොකක්ද වුණේ? ඔක්තෝබර් 01වෙනි දා එතුමා ඉදිරිපත් කළ ඒ මාර්ග සිතියමේ ප්‍රතිඵලය මොකක්ද? හරියට මාසයක් ගිහිල්ලා නොවැම්බර් 01වෙනි දා වෙනකොට Moody's කියන ජාත්‍යන්තර ශ්‍රේණිගතකිරීම් ආයතනය මොකක්ද කළේ? ඔවුන් ලංකාව B1 සිට Ba2වලට මූල්‍ය දර්ශකවලින් පහළ හෙළුවා; ඒ කියන්නේ downgrade කළා. මේ මාර්ග සිතියම ඉදිරිපත් කළ මහ බැංකු අධිපතිවරයාටයි, ආණ්ඩුවටයි හරියට කම්මුල් පහරක් දුන්නා වාගේ දෙයක් ඒ වුණේ. එතකොට ඒ ශ්‍රේණිගතකිරීම් ආයතනය තව පාරක් ශ්‍රී ලංකාව පහත හෙළුවා - downgrade කළා- නම්, ශ්‍රී ලංකාවට මොකක්ද වෙන්නේ? ලංකාව ජාත්‍යන්තර මුදල් වෙළෙඳ පොළේ අපලේඛනගත - blacklist- වෙනවා. මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, මේ අය වැය ඉදිරිපත් කළාට පසු -මාසයක් ඇතුළත- ශ්‍රී ලංකාව නැවත downgrade කරලා අපලේඛනගත වුණොත් පුදුම වෙන්න එපා කියලා.

මොකද, මේ වෙනකොට චීනය අපේ මහජන බැංකුව අපලේඛනගත කර තිබෙනවා. මේ දේවල් නිසා ලංකාවේ කීර්තිනාමයට මොකක්ද වෙන්නේ? මූල්‍ය විශ්වාසයට මොකක්ද වෙන්නේ? ලජ්ජයි, කියන්න. මේ ආණ්ඩුව ඉදිරිපත් කරන අය වැයෙන් ඒවාට විසඳුමක් දෙන්නේ නැතුව සිල්ලර කථා ටිකක් කියලා මේකෙන් බේරෙන්න බලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රට මෙතැනට වැටුණේ කොහොමද? සමහර අය කියනවා, මේක කොරෝනා වසංගතය නිසා වූ දෙයක් කියලා. අද අපි අසාර්ථක රාජ්‍යයක් බවට, බංකොලොත් රටක් බවට පත්

[ගරු කබීර් හෂීම් මහතා]

වෙලා තිබෙනවා. ඒක ඇත්ත. මෙතුමන්ලා මෙහෙම ලොකුවට කථා කළාට ඒක නේ ඇත්ත. මොකද, ඩොලර් නැති නිසා වරායෙන් බඩු ටික ගන්න බැහැ. මේ වනකොට බඩු මිල අහස උසට නැඟලා. එහෙම වෙලා තියෙන්නේ කොරෝනා වසංගතය නිසාය කියනවා. ඒක අසත්‍යයක්. මේක කොරෝනා නිසා ඇති වූ තත්ත්වයක් නොවෙයි. මෙහි වගකීම ගන්න ඕනෑ, රටේ ප්‍රධානියා -විධායකය- විසින්. ඒ අනුව, ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි මේ වගකීම ගන්න ඕනෑ. මොකද, මේ තත්ත්වයට හේතුව කොරෝනා වසංගතය නම් අනෙක් රටවලත් මේ ප්‍රශ්න ඇති වෙන්න ඕනෑ.

මේ වෙනකොට ඉන්දියාවේ විදේශ සංචිතය ඩොලර් බිලියන 431 සිට 641ට වැඩි වෙලා තිබෙනවා. බංග්ලාදේශයේ විදේශ සංචිතය ඩොලර් බිලියන 32 සිට 48ට වැඩි වෙලා තිබෙනවා. 2019දී යහ පාලන ආණ්ඩුව ඔබතුමන්ලාට මේ රට භාර දෙනකොට අපේ විදේශ සංචිතය ඩොලර් බිලියන 7.9යි. නමුත්, අද අපේ විදේශ සංචිතය ඩොලර් බිලියන එකහමාරක්වත් නැහැ. ඒක තමයි යථාර්ථය. ලංකාවට විතරක් මේ ප්‍රශ්නය තිබෙන්නේ ඇයි? මේ ප්‍රශ්නයේ මුල මම කියන්නම්.

ජනාධිපතිවරයා 2019 දෙසැම්බර් මාසයේ බලයට පත්වූ ගමන් මොකක්ද කළේ? බඩු මිල අඩු කරලා ජනතාවට සහන දෙන්න ඕනෑ කියලා රාජ්‍ය ආදායම් කප්පාදු කළා. රාජ්‍ය ආදායම් කප්පාදු කළාම ජනතාවට සහන ලැබුණාද? බඩු මිල අඩු වුණාද? එදා සිට අද වෙනතුරු බඩු මිල වැඩි වුණා මිසක්, තඹ ශතයකින් අඩු වුණේ නැහැ. හැබැයි, රාජ්‍ය ආදායම් කප්පාදු කළාට පස්සේ මොකක්ද වුණේ? ඒ වෙලාවේ VAT එක සියයට 47කින් අඩු කළා. එතකොට හරිනම් බඩු මිල සියයට 47කින් අඩු වෙන්න ඕනෑ. ඒ අඩු කළ බදු ප්‍රමාණය ගත්තාම, රාජ්‍ය ආදායම් අඩුවීම නිසා රජයට ඇති වෙච්ච පාඩුව රුපියල් කෝටි 600ක්. එතකොට බඩු මිල අඩුවීමත් එක්ක ඒ රුපියල් කෝටි 600 ජනතාවට හිමි වෙන්න ඕනෑ. හැබැයි, ඒක එහෙම වුණේ නැහැ. ඒ රුපියල් කෝටි 600 කියන්නේ වර්ෂයකට නැති වෙච්ච ආදායම. ඒ රුපියල් කෝටි 600 කාගේ සාක්කුවටද ගියේ? ඒ රුපියල් කෝටි 600ට මොකක්ද වුණේ? එතැනින් තමයි මේ ප්‍රශ්නය පටන් ගත්තේ. ඒ රුපියල් කෝටි 600 ගියේ තමන්ගේ ගජමිතුරු සමාගම්වලට. එහෙම නැත්නම් තමන්ගේ වියත්මග කල්ලියට. එහෙම නැත්නම් තමන්ගේ ලොකු ලොකු ව්‍යාපාරිකයන්ට. ඔවුන් ශුද්ධ ලාභය අරගෙන සාක්කුවේ දමා ගත්තා. මේ රටේ මිනිසුන්ගේ බඩට ගහලා, රුපියල් කෝටි 600ක රාජ්‍ය ආදායමක් නැති කරලා පළමුවෙනි වසරේම ඒ මුදල් තමන්ගේ සාක්කුවට දමා ගත්තා. දෙවැනි වසරේත් ඒක තමයි වෙන්නේ. එතකොට ඒ වගකීම කෙළින්ම ජනාධිපතිතුමා ගන්න ඕනෑ. එතැනින් තමයි පළමුවෙන්ම ජාත්‍යන්තරයෙන් ප්‍රශ්න ඇති කරන්න පටන් ගත්තේ. මේ නිසා අපේ රට කෙරෙහි තිබුණු ජාත්‍යන්තර විශ්වාසය බිඳ වැටුණා. ණය අලුත් කිරීම් නැවතුණා. ඒ වාගේම ඩොලර් හිඟය ඇති වුණා. ඒත් එක්කම මූල්‍ය අර්බුදයක් රටේ නිර්මාණය වුණා. මේ තත්ත්වය ඇති වුණේ කොරෝනා වසංගතය නිසා නොවෙයි.

ඔක්තෝබර් 31වැනි දා "The Sunday Times" පුවත්පතේ පළ වූ කාරණාවක් මම දැක්කා. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිවරයා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යනවා, බදු වැඩි කරන්නේ කොහොමද කියලා අහන්න. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා හොඳින් පිළිගන්නවා. එතුමා "The Sunday Times" පුවත්පතට කියනවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගියාට පස්සේ, රටට රුපියල් කෝටි ගණනක් අහිමි වුණා කියන එක එතුමාත් පිළිගන්නවා කියලා. එතුමා ඒ බව එම පුවත්පතට ප්‍රකාශ කර තිබෙනවා. ඒ අනුව, එතුමාත් ඒක පිළිගන්නවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෘත්තීය සංගමයක ලේකම්වරයෙකු වන උදයසිරි මහතා කියනවා, රටට රුපියල් කෝටි ගණනක් පාඩු වුණා විතරක් නොවෙයි, බදු ගිණුම් - tax files - ලක්ෂයකට වඩා වහන්න සිද්ධ වුණා කියලා. එතකොට tax files ලක්ෂයක් වසා දැමීමට හේතුව මොකක්ද? ඒවා කාගේද? රට බංකොලොත් කරන්න තමන්ගේ යාළුවන්ගේ tax files වහලා දැම්මා. ඒ වගකීම මේ රජය භාර ගත යුතුයි. තමුන්නාන්සේලා විදේශ සමාගම්වලට, විදේශිකයන්ට, මිතුරු සමාගම්වලට ඕනෑ තරම් බදු සහන ලබා දී තිබෙනවා. තමුන්නාන්සේලා 'යුගදනවි' කියන ආයෝජන ව්‍යාපෘතිය ඇමෙරිකන් සමාගමකට දැන් විකුණා තිබෙනවා. ඒ සමාගම එක්ක තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? ඩොලර්වලින් තමන්ගේ ආදායම ආපහු ඇමෙරිකාවට ගෙනයන්නත්, අවුරුදු ගණනාවක් යනතුරු අපේ රටට තඹ ශතයක බදු නොගෙවන්නත් තමුන්නාන්සේලා ඒ සමාගමට අවසර දීලා තිබෙනවා. එතකොට මේකෙන් අපේ රටට තිබෙන වාසිය මොකක්ද?

මේ ආණ්ඩුවෙන්ම පටන් ගත් ෂැන්ග්‍රි-ලා හෝටලය අද වෙනතුරු බදු ලෙස තඹ ශතයක් අපේ රටට ගෙවන්නේ නැහැ. හැබැයි, පුංචි මිනිසුන්ට බදු ගෙවන්න වෙනවා. මේ කරන්නේ මොකක්ද? මෙහෙම බදු සහන දෙන්නේ කාටද? ඒ අනුව, විදේශ ආයෝජන හමුවේ තම ඇඳිවත පවා උනා දැමීමට රජය සූදානම් බව අපට තේරුම් ගන්න පුළුවන්. මේක පුදුම වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රජය විදේශ ආයෝජන ගැන නිතරම කථා කරනවා. හැබැයි, තමුන්නාන්සේලා ගේන්නේ විදේශ ආයෝජන නොවෙයි. මේ රජය කරන්නේ මේ රටේ සම්පත් විකිණීම. මොකද, විදේශ ආයෝජන ගේනවා නම් මෙහෙම කටයුතු කරන්නේ නැහැ. මේ කරන්නේ සම්පත් විකිණීම. හැබැයි, සමගි ජන බලවේගයේ අපට විදේශ ආයෝජන ගැන පැහැදිලි ස්ථාවරයක් තිබෙනවා.

විදේශ ආයෝජන සඳහා ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි, ස්වයංකාරී විදේශ ආයෝජන. අනෙක තමයි, අනුග්‍රාහක විදේශ ආයෝජන. ස්වයංකාරී විදේශ ආයෝජන මත පමණයි මේ රටේ අලුත් ව්‍යාපෘති බිහි වෙන්නේත්, අලුත් ප්‍රාග්ධන ඇති වෙන්නේත්. හැබැයි, ඒවා නොවෙයි ඔබතුමන්ලා කරන්නේ. ඔබතුමන්ලා කෙළින්ම කරන්නේ වෙන ක්‍රමයක් වන අනුග්‍රාහක විදේශ ආයෝජන. අනුග්‍රාහක විදේශ ආයෝජන කියන්නේ, ව්‍යාපෘතියක නම් මාරු කිරීම, අයිතිකාරයන් මාරු කිරීම විතරයි; ලංකාවේ අයිතිය තිබෙන සම්පතක් වෙනත් රටකට ලබා දෙන එක විතරයි. මේ ආණ්ඩුව දිගටම ක්‍රියාත්මක කරලා තිබෙන්නේ මෙන්න මේ වාගේ වැඩක්. අපේ සම්පත් ටික තවත් කාට හරි විකුණනවා. ඒක විදේශ ආයෝජන නොවෙයි. විදේශ ආයෝජන කියන්නේ අලුත් ව්‍යාපෘති ආරම්භ කිරීම, වෙළෙඳ කලාප ඇති කිරීම. හැබැයි, Selendiva Investments එකෙන් අපේ තිබෙන බලාගාර, වරායවල් ටික -සියලු දේ- අනික් රටවලට විකුණන්න පටන්ගෙන තිබෙනවා. මේ ඔක්කොම අර්බුද නිර්මාණය කරලා කියනවා, "කොරෝනා නිසා" කියලා. සල්ලි නැති වනකොට කියනවා, අපි අපේ දේපළ විකුණලා මේ ටික ගෙවනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අර්බුදය තවදුරටත් උග්‍ර කරන්න කටයුතු කළේ මේ ආණ්ඩුවමයි. මේ ආණ්ඩුව මුදල් අච්චු ගහන්න පටන් ගත්තා. බලයට ආවාට පස්සේ අද වනකොට රුපියල් කෝටි දෙලක්ෂ අනුදාහක මුදල් අච්චු ගහලා තිබෙනවා. එලෙස මුදල් අච්චු ගැසීමෙන් තමයි බඩු මිල වැඩි වෙන්නේ. කොරෝනා නිසා නොවෙයි බඩු මිල වැඩිවෙලා තිබෙන්නේ. අද මිනිසුන්ට ඉවසන්න බැරි තරමට ජීවන වියදම වැඩිවෙලා තිබෙනවා. එය පාලනය කිරීම වගකීමක්, මේ ආණ්ඩුවේ.

මිල පාලනයක් තිබෙනවාය කිව්වා. ඔබතුමන්ලා මිල පාලනය ගැන වාගේම දේශීය නිෂ්පාදනය ගැන ලොකුවට කථා කරනවා. ලජ්ජයි කියන්න, මේ රටේ හාල් අතිරික්තයක් තිබෙනකොට පිටරටින් හාල් ගෙනෙන්න ඉතිහාසයේ පළමුවැනි වතාවට තීරණයක් ගෙන තිබෙන්නේ මේ ආණ්ඩුව. සත විසිපහට බද්ද අඩු කරලා, කොමිස් ගහන්නත් එක්ක හාල් ගෙනෙන්න කටයුතු කළ මේ ආණ්ඩුව ලජ්ජා නැතිව අද ගොවීන් ගැන කථා කරනවා. මේ මිල පාලනයයි, යහ පාලනයයි යටතේ තිබෙන පාලන මිල අපි සංසන්දනය කර බලමු. 2019 යහ පාලනය යටතේ පරිප්පු කිලෝ එකක් රුපියල් 110යි; දැන් මිල පාලනය යටතේ රුපියල් 275යි. යහ පාලනය යටතේ සීනි කිලෝ එකක් රුපියල් 100යි; දැන් මිල පාලනය යටතේ රුපියල් 160යි. හාල් කිලෝව යහ පාලනය යටතේ රුපියල් 85යි; මිල පාලනය යටතේ දැන් රුපියල් 130යි. මුංඇට කිලෝව යහ පාලනය යටතේ රුපියල් 235යි; මිල පාලනය යටතේ දැන් රුපියල් 685යි. ගෑස් මිල යහ පාලනය යටතේ රුපියල් 1,735යි. අද මිල පාලනය යටතේ රුපියල් 2,720යි. එහෙම බඩු මිල වැඩි කරලා, නැති වෙන්න තරම් මිනිසුන්ගේ බඩට ගහද්දී ජනාධිපතිතුමා කොහේදීද කියනවා මම දැක්කා, "මම පත් කළේ සීනි මිල අඩු කරන්නයි, පරිප්පු මිල අඩු කරන්නයි නම්, මගෙන් වැඩක් නැහැ" කියලා. පරිප්පු මිල පාලනය කරන්න බැරි නම්, හාල් මිල පාලනය කරන්න බැරි නම්, සීනි මිල පාලනය කරන්න බැරි නම් -ඒ වාගේ සරල දෙයක් කරන්න බැරි නම්- ජනාධිපතිතුමා කොහොමද රටේ මූල්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, ජාත්‍යන්තර ණය අර්බුදය, විනිමය අනුපාතය පාලනය කරන්නේ කියලා මම අහන්න කැමැතියි. ජනාධිපතිතුමාට මම මතක් කරන්න කැමතියි, පාලකයන්ගේ ප්‍රධාන වගකීම තමයි රට වැසියන්ට දුක් විඳින්න නොදී බලා ගැනීමයි කියන කාරණය. පාලකයා තමන්ගේ රටවැසියන්ට සංවේදී විය යුතුයි.

බුද්ධාගම ලංකාවට ගෙනාවේ මිහිඳු මහ රහතන් වහන්සේ. උන්වහන්සේගේ පියා ධර්මාශෝක රජතුමා බුද්ධාගම වැලඳ ගත්තා. එතුමා ධර්මාශෝක රජතුමා හැටියට දුකක් නැතිව, බඩගින්නක් නැතිව, සංවේදීව රටේ වැසියන් බලා ගන්න කටයුතු කළා. ඒක තමයි පාලකයෙකුගේ, නායකයෙකුගේ ලක්ෂණය. හැබැයි, අතිගරු ජනාධිපතිතුමනි, අද මේ රටේ ඉන්න අම්මලා පිඟානට බෙදන බත් ප්‍රමාණය අඩු කරලා තිබෙන්නේ. තේ කෝප්පයට දමන සීනි ප්‍රමාණය අඩු කරලා තිබෙන්නේ. දරුවාට දෙන කිරි ප්‍රමාණය අඩු කර තිබෙන්නේ. මේ යථාර්ථය මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට තේරෙන්නේ නැතිව ඇති. හැබැයි, අද වනකොට ඒ ජනතාවට මේ අය වැයෙන් කිසිම සහනයක් ලබා දෙන්නට මේ ආණ්ඩුවට හැකියාවක් ලැබිලා නැහැ; ජනතාව වෙනුවෙන් කිසිම දෙයක් කර නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ඔක්කොම ගොඩ දමන්න ගැලවුම්කරුවෙක් ගෙනාවා. ඒ ගැලවුම්කාරයාගෙන් මේ ඔක්කොම කර ගන්න පුළුවන් කියලා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ගෙනාවා. එතුමා විස්මිත චරිතයක්, එතුමාට මැජික් කරන්න පුළුවන් කියලා තමයි කිව්වේ. එතුමාගේ මංගල අය වැය ඊයේ ඉදිරිපත් කළා. හැබැයි, මම නම් හිතන හැටියට එය එතුමාගේ මංගල අය වැය වුණාට, ආණ්ඩුවේ අවමංගල අය වැය වෙන්න පුළුවන්. මොකද, මේ රටේ ප්‍රධාන ප්‍රශ්න ටිකට මේ අය වැයෙන් ආමන්ත්‍රණය කරලා නැහැ. බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇලඩින්ගේ පුදුම ලාම්පුව අරගෙන ආවා. ඒ ලාම්පුව උලනවා, උලනවා -අතුල්ලනවා. හැබැයි, ඒ ලාම්පුවේ තෙල් නැතිවද කියන්න මම දන්නේ නැහැ, ඒකෙන් ඉස්මතු වුණේ දේව භූතයෙක් නොවෙයි, යක්ෂ භූතයෙක්. පත් වුණු ගමන්ම යක්ෂ භූතයා ගහනවා, මේ රටේ ජනතාවට.

බඩු මිල අහස උසට ගියා බැසිල් රාජපක්ෂ මැතිතුමා පත් වුණාට පස්සේ. මිල පාලනයක් නැති වුණා. මේක මේ රටේ මිනිසුන්ට ඉවසන්න පුළුවන්ද? දැන් කිව්වා එතුමා ගැලවුම්කාරයා කියලා. කාගේ ගැලවුම්කාරයා ද කියලා මට නම් තේරෙන්නේ නැහැ. එතුමා මේ පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා -2020 සිට- ජීවන වියදම් කමිටුවේ සාමාජිකයෙක්. එතුමා, දරිද්‍රතා කමිටුවේ සභාපතිවරයා. එතුමා දන්නවාද 2020, 2021 වෙන කොට රැකියා සහ ආදායම් අහිමි වෙච්ච විශාල පිරිසක් මේ රටේ වර්ධනය වුණා -වැඩිවුණා- කියලා? එමඟින් අවිධිමත් අංශයට ලොකු බලපෑමක් සිදු වුණා. අවිධිමත් අංශය කියන්නේ මොකක්ද? අවිධිමත් අංශය කියන්නේ, මේ රටේ ආර්ථිකය දුවවන ප්‍රධාන අංශයක්. ඒ කියන්නේ, රජයේ අනුග්‍රහය නොලැබෙන, සුරක්ෂිතභාවය නොලැබෙන, ආර්ථික ක්‍රියාවල යෙදෙන, ක්ෂුද්‍ර හා සුළු ව්‍යාපාර, ස්වයං රැකියා, අනියම් සේවක, සිල්ලර කඩය, ගෙවල්වල තිබෙන සුළු කර්මාන්ත, ත්‍රිවිල් හිමියා, 'පික් මී' හිමියා, 'ඌබර්' හිමියා, ඩිමෝ බට්ටා හිමියා, පාසැල් ප්‍රවාහන සේවයේ ඉන්න මිනිස්සු. හැබැයි, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දැනගන්නට ඕනෑ මේ අවිධිමත් අංශයෙන් ලක්ෂ 30කට වඩා වැඩි ප්‍රමාණයක් යැපෙනවා කියලා. එයින් සියයට 60ක්, නැත්නම් ලක්ෂ 17කට කොරෝනාවලින් පසුව තමන්ගේ රැකියා සහ ආදායම් අහිමි වුණා. මෙයින් වැඩිම පිරිසකට -ක්ෂුද්‍ර හා කුඩා කර්මාන්තකරුවන්ට- මේක බලපෑවා. ප්‍රාග්ධන ප්‍රශ්නය විශේෂයෙන්ම බලපෑවා. ඒ වාගේම ණය ගෙවීම් ප්‍රශ්නය ආවා. අමුද්‍රව්‍යවල මිල වැඩි වුණා. අමුද්‍රව්‍ය හිඟයක් ඇති වුණා. මේ ප්‍රශ්න ඔක්කෝම ආවා. හැබැයි කලාපීය රටවල මේ වාගේ ප්‍රශ්න එනකොට ඒ ගොල්ලන් මොනවාද කළේ? ඒ ගොල්ලන් ආධාර දුන්නා. පඩි දුන්නා. සමහර තැන්වල රස්සා නැති වෙන අයට රජයෙන් මාස ගණනකට පඩි ගෙව්වා. හැබැයි, ඔබතුමන්ලාගේ රජය -මේ රජය- මොකක්ද කළේ? රැකියා අහිමි වෙන, පඩි කැපෙන, අනතුරුවලට භාජන විය හැකි කණ්ඩායම් සහ අවිධිමත් අංශවල ඉන්න අයට ඉතාම සොච්චම් cash transfer එකක් කළා. ඒක 2020දී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 0.6යි. 2021 වෙනකොට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 0.1යි. ඒකෙන් ඇතිවුණු ප්‍රතිවිපාකය මොකක්ද? ඒ මිනිසුන්ට -අවිධිමත් අංශයේ ඉන්න සාමාන්‍ය මිනිසුන්ට- උදව් කරපු නැති නිසා මේ රටේ දරිද්‍රතාව වැඩි වුණා. ලෝක බැංකුවෙන් ශ්‍රී ලංකාව පිළිබඳව "Sri Lanka Development Update 2021" කියලා වාර්තාවක් ඉදිරිපත් කළා. එම වාර්තාවේ 27 වෙනි පිටුවේ කියනවා, "With jobs lost and earnings reduced, poverty increased significantly in 2020." ඒ කියන්නේ, රැකියා අහිමි වීම, ආදායම් අහිමි වීම නිසා 2020දී දරිද්‍රතාව බරපතළ ලෙස වැඩිවුණාය කියන එකයි. ඒ වාගේම ඔවුන් කියනවා, 2020 තුළ රැකියා අහිමි වීම නිසා දරිද්‍රතා ප්‍රතිශතය වැඩිවීමත් සමඟ ලක්ෂ 5ක් විතර දරිද්‍රතා රේඛාවට ඇතුළත් වෙලා තිබෙනවාය කියලා. මේ රටේ ජනගහනයෙන් තවත් ලක්ෂ 5ක් ඇතුළත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2021 වෙනකොට -මේ වෙනකොට- ගොවීන්ට ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒ, පොහොර ප්‍රශ්නය. අද පොහොර නැහැ. ගොවීන්ට ඇතිවෙන ප්‍රතිවිපාකයට ඔබතුමන්ලා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා නැහැ. ඒ ප්‍රශ්නයත් එක්ක -ජීවන වියදම වැඩිවීමත් එක්ක- එතැනිනුත් තවත් ලක්ෂ 5ක් දරිද්‍රතා රේඛාවට ඇතුළත් වෙනවා. ඒ සමඟම මේ රටේ දරිද්‍රතා රේඛාව තුළ ඉන්න මිනිසුන් ලක්ෂ 10කින් පමණ වැඩිවෙනවා. ඒ අනුව, ලක්ෂ 30කට විතර වැඩි වෙනවා. මේ ප්‍රශ්නයට ඔබතුමන්ලා මේ අය වැයෙන් ආමන්ත්‍රණය කරලා නැහැ. ඔබතුමන්ලා අවංක නම්, මේ ආණ්ඩුව අවංක නම් මේ ක්ෂේත්‍රය ගැන බලන්න තිබුණා. මෙයින් පැහැදිලි වෙන්නේ -මේකෙන් ඔප්පු වෙන්නේ- එක දෙයක්. මේ රජය සර්ව ආර්ථික කළමනාකරණයෙනුත් ෆේල් වෙලා තිබෙනවා. ක්ෂුද්‍ර ආර්ථික කළමනාකරණයෙනුත් ෆේල් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම ෆේල්. මේකෙන් පැහැදිලිව පේනවා. මොකද, ඔබතුමන්ලාට හයියක් තිබුණේ නැහැ මේ ප්‍රශ්න දිහා බලලා මේ අය වැයෙන් ඒවාට ආමන්ත්‍රණය කරන්න. ඔබතුමන්ලා අවංක

[ගරු කබීර් හෂීම් මහතා]

නම්, නිහතමානී නම් මේ රට වැටිලා තිබෙන තැනෙන් ආපසු ඔසවා තබන්න, අපේ රටේ කීර්ති නාමය ජාත්‍යන්තරය තුළ ආරක්ෂා කරන්න මේ අය වැයෙන් පියවර ගන්න තිබුණා. තව දවස් කිහිපයක් යනකොට ශ්‍රේණිගත ආයතන අපේ රට ගැන මොකක්ද හිතන්නේ කියලා පෙන්වයි. ඇයි දරිද්‍රතාව වැඩි වුණේ? මුදල් අමාත්‍යාංශයේ වාර්තාව අනුව කියනවා, ගිය පාර කොවිඩ්වලින් වියදම් කරපු ප්‍රමාණයෙන් 2020, 2021 තුළ රුපියල් බිලියන 200ක මුදලක් පමණයි වෙන් කළේ කියලා. ඒ ගැන මා මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා පැහැදිලිව කිව්වා. හැබැයි, ඔබතුමන්ලා කියනවා, රුපියල් බිලියන 500ක් වෙන් කළා කියලා. නමුත්, මුදල් අමාත්‍යාංශයේ වාර්තාව අනුව තිබෙන්නේ රුපියල් බිලියන 200යි. ඒ වාගේම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF - නිකුත් කර ඇති වාර්තාව අනුව කියනවා, කලාපීය රටවලට සාපේක්ෂව ලංකාව තමයි කොවිඩ්වලින් අඩුම වියදම ජනතාවට ලබා දීලා තිබෙන්නේ කියලා. ඒ වාර්තාව මම **සභාගත*** කරනවා.

මේ වාර්තාවේ පැහැදිලිව සඳහන් වෙනවා, මාලදිවයින කොවිඩ් - 19 වසංගතය සඳහා 2021 ජුනි මාසය වනතුරු තමන්ගේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6.9ක් වෙන් කර තිබෙනවා කියලා. ඉන්දියාව සියයට 3.5ක් වෙන් කර තිබෙනවා; ඇෆ්ගනිස්තානය සියයට 2.1ක් වෙන් කර තිබෙනවා; පාකිස්තානය සියයට 2ක් වෙන් කර තිබෙනවා; බංග්ලාදේශය සියයට 1.4ක් වෙන් කර තිබෙනවා. කොවිඩ් - 19 වසංගතය වෙනුවෙන් ජුනි මාසයේ 20, 21 වනතුරු ලංකාව වෙන් කර තිබෙන්නේ, සියයට 0.8ක් පමණයි. එතකොට මේ රටේ දරිද්‍රතාව, දුප්පත්කම ආදී සෑම ප්‍රශ්නයක්ම වෙලා තිබෙන්නේ අවශ්‍ය දේ කරපු නැති නිසායි. දකුණු ආසියාවට සාපේක්ෂව බලනකොට අපි ගත් පියවරයි, අනෙක් රටවල් ගත් පියවරයි අතර වෙනස මොකක්ද? මාලදිවයින මොකක්ද කළේ? ජනතාවගේ විදුලි බිලෙන් සියයට 40ක් රජයෙන් ගෙව්වා. වතුර බිලෙන් සියයට 30ක් රජයෙන් ගෙව්වා. අපේ රටේ එහෙම තඹ සතයක් ගෙව්වාද? මාලදිවයිනේ රැකියා අහිමි වූ අයට රජයෙන් ආධාර මුදලක් වෙනම ලබා දුන්නා. ඉන්දියාවේ අවිධිමත් අංශය තුළ අඩු වැටුප් ලැබෙන අයට රජයෙන් මුදලක් ගෙව්වා. ඇෆ්ගනිස්තානය තමන්ගේ රටේ පුරවැසියන්ට පාන් සහ පිටි නොමිලේ බෙදුවා. ඊළඟට, රුපියල් 2,600ට වඩා අඩු විදුලි බිල්පත් හිමියන්ගේ විදුලි බිල රජයෙන් ගෙව්වා. වතුර බිලත් රජයෙන් ගෙව්වා. මෙහෙම කළේ, ඇෆ්ගනිස්තානය. ඊළඟට, නේපාලයේ කුඩා කර්මාන්තවලට සේවක අර්ථසාධක අරමුදල - EPF එක- හා ETF එක ගෙව්වේ රජයෙන්. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කළේ? ලංකාවේ කළේ මොකක්ද? ත්‍රී විලර්කරුවන්ගේ ෆිනෑන්ස් ගෙවන්න බැරි වෙනකොට ත්‍රී විලර් එක, school van එක ඉස්සුවා.

ඊළඟට, සංචාරක ව්‍යාපාරවල නිරත වන අයගේ වාහනවල lease එක ගෙවන්න බැරි වෙනකොට ඒ වාහන ඉස්සුවා. ලයිට් බිලට මොකක්ද කළේ? වැල් පොලියත් එක්ක බිල් එක ගෙනැල්ලා දුන්නා. ලයිට් බිල ආණ්ඩුවෙන් ගෙවන්න නොවෙයි, අඩු තරමින් නිකම්වත් ඉන්න තිබුණා නේ. ඒකට වැල් පොලියත් එක්ක අය කළා. වතුර බිලත් එහෙමයි. මිනිසුන්ට දස වධයක් දුන්නා. මේක ආණ්ඩුවක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයක් හැටියට මෙතුමන්ලා මේ ඇත්තට මුහුණ දෙන්න සූදානම් නැහැ. ජනතාවට ඇත්ත තත්ත්වය කියන්නේ නැතිව ව්‍යුහාත්මක වෙනසකට යාමට නිවැරදි වැඩ පිළිවෙළක් මෙවර අය වැයෙන් ඉදිරිපත් කරන්න ඔබතුමන්ලා අසමත් වෙලා තිබෙනවා. අද රට ගැන නිහතමානිව හිතන්න ඕනෑ. බරපතළ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙන මොහොතක ඔබතුමන්ලාට මූල්‍ය ක්ෂේත්‍රය තුළ සර්ව ආර්ථිකය හදාගන්නත් බැරි වුණා, ක්ෂුද්‍ර ආර්ථිකය හදා ගන්නත් බැරි වුණා. මේකෙන් ජනතාව තමයි දුක් විඳින්නේ. ඇත්ත කථා කරන්න ඔබතුමන්ලාට හයියක් නැහැ. ඔබතුමන්ලාට ඒ තීන්දු ගන්න බැරි නම් මේ ප්‍රශ්නය තවත් ඔඩු දුවන එකයි සිද්ධ වන්නේ. ඒ නිසා අපි විපක්ෂයක් හැටියට විකල්ප අදහස් සහ යෝජනා හදාගෙන ඒකට සූදානම් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන්, ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙකු වන ගැලලියෝ ගැලලීගේ ප්‍රකාශයක් උපුටා දක්වමින් මගේ කථාව අවසන් කරන්න කැමැතියි. මේක මේ ආණ්ඩුවට ගැළපෙන ප්‍රකාශයක්. එතුමා කියනවා, "සත්‍ය නොදැන එයට අසත්‍යයක් යැයි කියන්නා මෝඩයෙක්. සත්‍ය දැන දැන එය අසත්‍ය යැයි කියන්නා අපරාධකරුවෙක්" කියලා. ඔබතුමන්ලාට ඕනෑ තොප්පියක් දමාගන්න පුළුවන්. එක්කෝ සත්‍ය නොදැන අසත්‍යයක් කියනවා නම් ඔබතුමන්ලා මෝඩයෙක් වෙනවා. නැත්නම්, සත්‍ය දැන දැන එය අසත්‍යයක් කියලා කියනවා නම් ඔබතුමන්ලා අපරාධකරුවෙක් වෙනවා. ඒක තමයි මේ ආණ්ඩුවේ පසුබිම. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සනත් නිශාන්ත රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

**ගරු සනත් නිශාන්ත මහතා (ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனத் நிசாந்த - கிராமிய மற்றும் பிரதேச நீர்க் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha - State Minister of Rural and Divisional Drinking Water Supply Projects Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා 2022 අය වැය ඉදිරිපත් කරලා, ඊට පසු දිනයේදීම මට අදහස් ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳ හදවතින්ම මම සතුටු වෙනවා. ආර්ථික ඔස්තාර් කෙනෙක් මහ බැංකුව කොල්ල කාලා, රට විනාශ කරලා, භූතයෝ, යක්ෂයෝ, කුතන්ඩි ගැන කථා කරනවා. මම හිතන විධියට, ඒ භූතයෝ, යක්ෂයෝ, කුතන්ඩි තමයි එදා මහ බැංකුව කොල්ල කාපු උදවිය. මහ බැංකුව නැති කරලා, ආර්ථිකය විනාශ කරලා, රටේ ණය බර දෙගුණයකින් වැඩි කරලා රට ඉතාම නරක තැනකට තල්ලු කරපු අය අද අපිට රට කරන විධිය ගැන කියලා දෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමාටත් එක්කයි මේ කියන්නේ. අපේ කබීර් හෂීම් හිටපු ඇමතිතුමා තමයි පසුගිය අය වැය විවාදයේ ආරම්භක කථාව කළේ. මේ සැරේ batting බැහැ වාගේ එතුමා මැද පෙළට දමලා තිබෙනවා. Performance නැහැ වාගෙයි. අඩු ගණනේ ඔබතුමාගේ කථාව අහන්න ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමා හිටියේ නැහැ නේ. බලන්න, කොච්චර වැරැද්ද කියලා. ඔබතුමා ජාතික ආරක්ෂාව ගැන කථා කළා. හැබැයි තමුන්නාන්සේගේ ලේකම්ගේ පස්ස පැත්ත බේර ගන්න බැරිව ගියා. පිටුපස පැත්තට නේ ද වෙඩි තිබ්බේ? ඔබතුමා ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ළඟ ඉඳගෙන හෙමිහිට ඔළුව අත ගගා ඉන්නවා. පිටිපස්සෙන් ඇවිත් පිහියෙන් අනින යහළුවෝ තමයි ඔබතුමාට ඉන්නේ, ගරු මන්ත්‍රීතුමා. නායකයා ළඟට ගිහිල්ලා කේලාම් කියලා පසුගිය වතාවේ පළමුවැනි කථාව කරපු මිනිහා හෙමිහිට කපලා, මැද පෙළට දාලා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට මෙවර අය වැය පිළිබඳ කථා කරන්න වෙන්නේ 2005 වර්ෂයේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර ගත්ත තැන ඉඳලායි. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගත්තේ රටේ මහ මුහුදෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් කොටි ත්‍රස්තවාදීන්ගේ අතට ගිය වෙලාවකයි. දරුවා පාසලට ගිහිල්ලා එළියට එනතුරු දෙමව්පියෝ ගේට්ටුව ළඟ වෙව්ල-වෙව්ලා මුර කරපු වෙලාවක තමයි කඩා වැටුණු ආර්ථිකයක් එක්ක එතුමා රට භාර ගත්තේ. *[බාධා කිරීම්]* ලබන සැරේ ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට ආරම්භක කථාව දෙයි ද දන්නේත් නැහැ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කැපුවා නේද? *[බාධා කිරීම්]* හරි, හරි. සතුටුයි සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගන්නකොට රටේ ණය ප්‍රමාණය ට්‍රිලියන 2යි. රටේ යුද්ධය අවසන් කරන්න, රටේ දැවැන්ත සංවර්ධනයක් කරන්න, වරාය හා ගුවන් තොටුපොළ හදන්න, අධිවේගී මාර්ග හදන්න, රටේ අස්සක් මුල්ලක් නැර විදුලිය දෙන්න, ප්‍රජා ශාලා හදන්න, මාතෘ සායනවලට, ද්විතීය පාසල් වැඩසටහන, පාසල් ළමුන් සඳහා පෝෂණ වැඩසටහන, ගම නැඟුම, මහ නැඟුම, දිවි නැඟුම යනා දී වැඩසටහන්වලින් මුළු රටම එක වැඩ බිමක් බවට පත් කරන්න ඒ ආණ්ඩුව තවත් ට්‍රිලියන 5ක් ණය ගත්තා. ඒ වසර 9ටම සමස්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 7යි. මෙතුමන්ලා යහ පාලන ආණ්ඩුව හදලා හම්බන්තොට වරාය විකුණුවා. ගුවන් තොටුපොළ විකුණන්න ගිහිල්ලා අනුනවයෙන් ඒක බේරුණා. මෙතුමන්ලා එදා කරපු මහ ලොකු දෙයක් නැහැ, සංවර්ධනයක් නැහැ. පාරකට එක බොරලු ට්‍රැක්ටරයක් ගෙනැල්ලා දැම්මේ නැහැ. පාරක වළක්වත් වැහුවේ නැහැ. ඒ විතරක් නොවෙයි, ජාතික සම්පත් විනාශ කළා. ගොවියා, කිරි ගොවියා, ධීවරයා විනාශ කළා. ග්‍රාමීය ආර්ථිකය නැති කළා. මේ සියල්ල ම කරලා මෙතුමන්ලා ආපහු අපට රට භාර දෙනකොට ණය ප්‍රමාණයත් දෙගුණයක් වෙලා තිබුණා. එතුමන්ලාගේ කාලයේ සිදු වුණු මහ ලොකු සංවර්ධනයකුත් නැහැ. හොරු, හොරු, කියලා හොරු අල්ලමින් වටේ ඇවිද ඇවිද හිටියා මිසක් අල්ලපු හොරෙකුත් නැහැ. මෙතුමන්ලාගේ යහ පාලන ආණ්ඩුව කාලයේ නටපු තොවිලයකුත් නැහැ, බෙරේ පළුවකුත් නැහැ කියලා තමයි කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට ඇඹුල් කෙසෙල් හිටවලා කෝලිකුට්ටු කපන්න බැහැ. රටේ තිබෙන ආර්ථිකයත් එක්ක තමයි අපට අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වෙන්නේ. මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැය ඉතාම සාර්ථක අය වැයක්. මේක, පාරේ බුලත්විට විකුණන මනුස්සයාගේ ඉඳලා, ත්‍රිරෝද රථයේ රියැදුරු මල්ලිගේ ඉඳලා, දරුවෝ පාසලට ගෙන යන බස් රථයේ ඉඳලා සියලු දෙනා දිහා ඉතාම ආකර්ෂණීයව බලලා හදපු අය වැයක් කියලා තමයි අපි කල්පනා කරන්නේ. එක පැත්තකින්, කොවිඩ් 19 වසංගතයත් එක්ක රටේ ආර්ථිකය විනාශ වෙලා. රට වැඩි කාලයක් වහලා තිබුණේ. ඒ කාලයේ ආර්ථිකයේ කටයුතු සිද්ධ වුණේ නැහැ. මෙතුමන්ලා විදේශ සංචිත ගැන කියනවා. විදේශ සංචිත ගත්තාම, මෙතුමන්ලා ගත්ත ණයත් එක්ක ණය වාරිකය ගෙවන්න විතරක් අපට වාර්ෂිකව ඇමෙරිකන් ඩොලර් බිලියන 6ක් ඕනෑ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. හැබැයි, එදා අපි සංචාරක ව්‍යාපාරයෙන් විතරක් ඇමෙරිකන් ඩොලර් බිලියන 7ක් හෙව්වා. දැන් මේ තත්ත්වය නිසා සංචාරක කර්මාන්තය එහෙම පිටින්ම නතර වෙලා. විදේශගත ශ්‍රී ලාංකිකයෝ ඒ රටට මේ රටට යන්නේ එන්නේ නැහැ. ඔවුන්ට යන්න එන්න පුළුවන්කමක් නැහැ. තමන්ගේ දෙමව්පියන්ට, දරුවන්ට වියදම විතරයි ඔවුන් ලංකාවට එවන්නේ. ඒ විතරක් නොවෙයි, ඔවුන් ඉන්න රටවල රැකියාවක් කර ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ලෝක වසංගතයක් ඉදිරියේ අද අපේ අතිගරු ජනාධිපතිතුමා රට ඉස්සරහට ගෙනිහිල්ලා තිබෙනවා.

අපේ ආර්ථික ඔස්තාර්තුමා කිව්වා අපි COVID -19 වසංගතය වෙනුවෙන් වියදම් කරලා තිබෙන්නේ ඉතාම පොඩි මුදලක් කියලා. මම දන්නේ නැහැ අතිගරු ජනාධිපතිතුමා මේක කොහොම කළමනාකරණය කළා ද කියලා. එතුමාගේ කළමනාකරණයේ දක්ෂතාව කියන්නේ, රජයේ කළමනාකරණයේ දක්ෂතාව කියන්නේ ඉතාම පොඩි මුදලක් වියදම් කරලා ලෝකයේ හොඳම වැක්සින්කරණය කරපු රටවල් 10 අතරට මේ රට ඇවිල්ලා තිබෙනවා. ඒ පළමුවෙනි රටවල් 5 අතරට අපේ රට ඇවිල්ලා තිබෙනවා. අපේ රට අමාරුවෙන් නැඟිටින වෙලාවක්, මේක. අද වන විට වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය වාගේ ප්‍රදේශ ගං වතුර උවදුර නිසා විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම අපි තව පැත්තකින් සතුටු වනවා, අපේ රටට විදේශ විනිමය එන ප්‍රධාන ආදායම් මාර්ග වන තේ, පොල්, රබර් අතරට, ඉස්සන් කර්මාන්තයත් එකතු කරන්න අපේ රජයට පුළුවන්කම ලැබුණා. අද මේ වන විට ඉස්සන් මෙට්‍රික් ටොන් 15,000කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉස්සන් කර්මාන්තයේ ගං වතුරට විනාශ වෙච්ච ප්‍රමාණය - ගං වතුරට ගහ ගෙන ගිහිල්ලා තිබෙන ප්‍රමාණය - විතරක් ටොන් 700කට ආසන්නයි. හෙට හවස් වරුවේ අපේ ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා, ඒ වාගේම අපේ රාජ්‍ය ඇමතිවරු කණ්ඩායම එතැනට ගිහිල්ලා සොයා බලා ඒ අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. විනාශයට පත්වුණු නිවාස වෙනුවෙන් නිවාස දෙන්නත්, ඉස්සන් කර්මාන්තය විනාශ වුණු ගොවීන්ට ආධාර දෙන්නත් බලාපොරොත්තු වනවා. අපි දන්නවා, කල්පිටිය අර්ධද්වීපයේත් විශාල හානියක් සිදු වෙලා තිබෙන බව. ඔවුන්ගේ අඩුපාඩු මොනවාද කියා සොයා බලන්නත්, ඒ සඳහා රජය පැත්තෙන් උදව් කරන්නත් බලාපොරොත්තුවෙන් හෙට දවසේ ඒ ප්‍රදේශයේ සංචාරයක යෙදෙන්න කටයුතු යොදාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රෝහලේ වාට්ටුවේ ඉන්න රෝගියා "අම්මෝ, අම්මෝ, අයියෝ" කියලා කෑ ගහද්දී ෆෝන් එක අරගෙන SMS ගහන සමහර නර්ස් නෝනලා වාගේ තමයි එදා යහ පාලන ආණ්ඩුව හැසිරුණේ. ගමේ මිනිස්සු කෑ ගහද්දී, රටේ මිනිස්සු දුක් විඳිද්දී, මිනිස්සු ඉතාම අසරණ තැනට පත් වෙද්දී එදා යහ පාලන ආණ්ඩුවට ඒවා ගැටලුවක් වුණේ නැහැ. එතුමන්ලා ජාතික ආර්ථිකය නැති කරලා, ජාතික ආරක්ෂාව නැති කරලා, මහ බැංකුව කොල්ලකාලා වැඩකටයුතු කළා. ඒ වාගේම පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා අහිංසක මිනිස්සු පල්ලි ඇතුළේ මියගියා. මම හිතන විදියට ඒ ගැන තාත්තා සාස්තර කියපු අපේ හිටපු ඇමතිතුමා මේ වෙලාවේ මේ ගරු සභාවේ නැහැ. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා පසුගිය දිනක කියා තිබුණා, අපේ ආරක්ෂක අංශ සහරාන්ගේ බිරිඳ සමඟ ගනුදෙනු කර තිබෙනවා කියලා. මේ කාරණය සම්බන්ධව ජනාධිපති නීතිඥවරයෙක් මා සමඟ කිව්වා. එතුමා කිව්වා, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් සියලුම සාක්ෂි ටික ගන්නකම් එතුමා ඒ කටයුතුවලට සහභාගි වුණා, කිසිම තැනක එහෙම කථාවක් කියැවුණේ නැහැ කියලා. හරින් මන්ත්‍රීතුමාට කිව්වා, පුළුවන් නම් අසවල් දවසේ අසවල් තැනදී ඒ ආකාරයෙන් සාක්ෂි දුන්නා කියා පෙන්වන්න කියලා. එහෙම ප්‍රකාශයක් කර තිබෙනවා කියා පෙන්වා දුන්නොත් එතුමා නැවත වතාවක් අධිකරණයට යන්නේ නැහැ කිව්වා. බොරු බේගල් ඇදබාපු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට තාත්තා කියා තිබෙනවා, "පුතේ, හෙට පල්ලියේ බෝම්බ ගහනවා, උඹ යන්න එපා" කියලා. අඩු ගණනේ ඒක කාදිනල් හිමිපාණන්ටවත් කියාපු නැති හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අද ඒ අපරාධය අපේ ආණ්ඩුව පැත්තට තල්ලු කරන්න යනවා. ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

අවසාන වශයෙන්, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉදිරිපත් කර ඇති මේ අය වැය රටට යහපත් අය වැයක් කියන කාරණය මතක් කරමින්, මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2022 වර්ෂය සඳහා වන අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සම්බන්ධ වෙමින් අදහස් දක්වන්නට මා වෙත අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මෙවර අය වැය ඉදිරිපත් වුණේ කොරෝනා වසංගතයත් එක්ක අපේ රටේ ආර්ථිකයට දැඩි බලපෑම් එල්ල වුණු අසීරු අවස්ථාවක වුණත්, කාලෝචිත, කාලයට ගැළපෙන අය වැයක් මුදල් අමාත්‍යතුමා ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. 1988-89 කැරලි කෝලාහල සමඟත් යුද්ධය, ත්‍රස්තවාදී ක්‍රියා ඇතුළු මිනිසා විසින් නිර්මාණය කළ ක්‍රියාවලි වාගේම සුනාමිය ආදී ස්වාභාවික ක්‍රියා තුළිනුත් පසුගිය දශක කිහිපය පුරාවට අපේ රටේ ආර්ථිකයට දැඩි බලපෑම් එල්ල වුණු ආකාරය අපි දැක්කා. හැබැයි, කොරෝනා වසංගතය නිසා අපේ රටේ ආර්ථිකයට වාගේම ලෝක ආර්ථිකයට එල්ල වුණු බලපෑම වාගේ වෙනත් බලපෑමක් අපට මෑත ඉතිහාසයේ දකින්න ලැබුණේ නැහැ.

මේ අය වැය අපේ රට සේවා සහ කෘෂිකාර්මික අංශයෙන් ශක්තිමත් කරන අය වැයක් කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම නිෂ්පාදන ආර්ථිකයක් වෙත යොමු වීම සඳහා අවශ්‍ය ක්‍රියාවලීන් මේ වනකොටත් ආරම්භ කර තිබෙන අතර, මේ අය වැය තුළින් තවදුරටත් එයට විශාල ශක්තියක් ලබා දෙනවා. ඒ වාගේම, රැකියා බලාපොරොත්තුවෙන් සිටින තරුණ තරුණියන්ගේ මානසිකත්වය අලුත් කර, වෙනස් කර, ඒ අය ව්‍යවසායකයන් බවට පත් කරන්න අවශ්‍ය ශක්තිය ලබා දෙන්න, ඒ අය රැකියා උත්පාදනය කරන උදවිය බවට පත් කරන්න අවශ්‍ය වාතාවරණය නිර්මාණය කරන්න අවශ්‍ය යෝජනා මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අයගේ ව්‍යාපාර ලියාපදිංචිය ඇතුළු වැඩ කටයුතු ඒකාබද්ධව, පහසුවෙන්, කාලය, ශ්‍රමය ඉතිරි කරගනිමින් කරගෙන යාම සඳහාත්, ව්‍යවසායකයන් බවට පත්වෙලා ආදායම් ලබන පිරිස් බවට පත්වීම සඳහාත් අවශ්‍ය මූලික වැඩ පිළිවෙළ මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවාය කියන කාරණයත් විශේෂයෙන් අපි සිහිපත් කරන්න ඕනෑ.

අපි දන්නවා, නව තාක්ෂණයත් සමඟ එකතු වෙලා වැඩ කටයුතු කරන ව්‍යවසායකයන් - freelance entrepreneursලා - ගැන. ඒ අයගේ ක්‍රියාවලියෙන් විදේශ විනිමය හරහා ඒ අය ලබන ආදායම් ඉතාම පහසුවෙන් ඒ අයට ලැබෙන ආකාරයට ඒ අදාළ නීති රීති පහසු කර තිබෙනවා. ඒ ක්ෂේත්‍රය වෙත යොමු වන්නට උනන්දුවෙන් ඉන්න තරුණ තරුණියන්ට ශක්තියක් ලබා දීමයි ඉන් බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන් මේ නව තාක්ෂණයත් එක්ක තරුණ තරුණියන් විශාල පිරිසක් ඒ ආශ්‍රිත නිෂ්පාදනවලින්, ක්‍රියාකාරකම්වලින් ආදායම් ලබන්න තම දැනුම පාවිච්චි කරනවා. ඒ අය වෙනුවෙනුත් සහාය ලබාදීම වැදගත්ය කියන කාරණය විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේත්, බද්දේගම ආසනයේත් ජනතාව විශාල වශයෙන් තේ ඇතුළු වැවිලි භෝග වගා ආශ්‍රිතව ජීවත් වෙනවා. අපි දන්නවා, මේ අය වැයෙන් වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් මිලියන 10,000ක් අමතරව වෙන් කර තිබෙන බව. ඒ, ජනතාවගේ වැවිලි භෝග ආශ්‍රිත වැඩකටයුතු ශක්තිමත් කිරීම සඳහායි. විශේෂයෙන්ම පැළ සිටුවීමට, නව වගාවට, නැවත සිටුවීමට මේ මුදල් ලබා දෙනවා කියන කාරණය අපි දන්නවා. ඒ වාගේම භූමිය නිසියාකාරයෙන් කළමනාකරණය කර, භූමියෙන් උපරිම ඵල ප්‍රයෝජන ලබාගන්න පුළුවන් ආකාරයට වැවිලි භෝග වගාව වර්ධනය කිරීම සඳහා ඒ ජනතාවට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න කටයුතු කරනවා. එම ජනතාව විශාල පිරිසක් මේ තුළින් ස්ථිර මාසික ආදායමක් ලබනවා. ඔවුන් මේ වැවිලි ක්ෂේත්‍රය තුළින් තමයි ජීවත් වෙන්නේ. ඒ වාගේම අපේ රටේ ආර්ථිකයටත් විශාල ශක්තියක් ඒ අය ලබා දුන් බව විශේෂයෙන්ම මම සඳහන් කළ යුතුයි. නමුත් අපි දකිනවා, වැවිලි ක්ෂේත්‍රය ගත්තාම, ශ්‍රම හිඟයක් පවතින බව. ඒ නිසා තේ හා ඒ ආශ්‍රිත භවභෝග සඳහා කාර්මික තාක්ෂණය යොදා ගන්න, යන්ත්‍රෝපකරණ යොදා ගැනීමේ අවශ්‍යතාව පවතිනවා. ඒවායේ ගුණාත්මකභාවය අඩු නොවන ආකාරයට මේ අලුත් තාක්ෂණය යොදා ගන්න දැනටමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මකයි. අපි විශ්වාස කරනවා, ඉදිරි කාලසීමාවේදීත් මේ හරහා ඒ වැඩ පිළිවෙළ හොඳින් ක්‍රියාත්මක වෙයි කියලා. ඒ වාගේම වැසි කාලයට අපට ප්‍රශ්නයක් නැති වුණාට, වැසි නොමැති කාලවලදී වගාවන් පවත්වාගෙන යාමේදී ජලය පිළිබඳ ගැටලු මතු වෙනවා. ඒ ගැනත් අපේ අවධානය යොමු විය යුතුයි.

ඊළඟට දේශීය ගෘහ හා පාරම්පරික කර්මාන්ත විනාශ වීමට ඉඩ නොදී රැක ගැනීම සඳහාත් ගරු මුදල් අමාත්‍යතුමා මේ අය වැය තුළින් විශාල අවධානයක් යොමු කර තිබෙනවා. තමන්ගේ නිෂ්පාදන විදේශිකයන්ට අළෙවි කරන්නත්, දේශීයව ඒවා අවශ්‍ය අයට අළෙවි කරන්නත්, අඛණ්ඩව, පාරම්පරිකව තිබෙන මේ ක්‍රියාවලිය, කර්මාන්ත රැකගෙන පෙරට යාම සඳහාත් අවශ්‍ය ශක්තිය ඔවුන්ට ලබා දීලා තිබෙනවා. එය බොහොම අනාගතවාදී දැක්මක් ඇතිව කරපු ක්‍රියාවලියක් බවත් අපි විශේෂයෙන්ම සිහිපත් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටේ, සමාජයේ දැඩි කථා බහක් ඇති වුණා, කිරිපිටි සම්බන්ධයෙන්. දේශීය දියර කිරි සහ කිරිපිටි නිෂ්පාදනය සඳහා අපේ සමාජයේ විශාල ඉල්ලුමක් තිබෙනවා. හැබැයි, ඒ ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය නිෂ්පාදකයන්ට අවශ්‍ය ශක්තිය ප්‍රමාණවත්ව ලැබී නැහැ කියන කාරණය අපි දකිනවා. ඉල්ලුමට සරිලන ලෙස සැපයුම ලබාදිය හැකි ආකාරයට ඒ අය ශක්තිමත් කිරීම වැදගත්. ඒ ක්ෂේත්‍රය වෙනුවෙනුත් තවදුරටත් රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙන බව අපි විශේෂයෙන්ම මතක් කරනවා. අපි විශ්වාස කරනවා, මේ හරහා විදේශ රටවලට යන මුදල් ප්‍රමාණය අවම කර ගැනීමට හැකියාව ලැබෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ජනතාවගේ මූලිකම අවශ්‍යතාවක් වන පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා "සැමට ජලය" වැඩසටහන අපේ ආණ්ඩුව පත් වූ දවසේ ඉඳන්ම ඉතාම ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක කරපු ආකාරය අපි දැක්කා. මේ ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන් කරලා 2022දී ලක්ෂ දෙකකට ආසන්න නිවාස ප්‍රමාණයකට පිරිසිදු පානීය ජලය ලබාදීම තමයි විශේෂයෙන්ම රජයේ බලාපොරොත්තුව. මොකද, මෙය ජනතාවගේ මූලික අවශ්‍යතාවක්. එය ඉටු කිරීම සඳහා අනෙකුත් වැඩකටයුතු කරගෙන යන අතර, රජය ඒ වෙනුවෙන් විශාල මුදලක් වියදම් කරනවා.

ඊළඟට, තම පවුලත් සමඟ ඉතාම ශක්තිමත්ව ගොඩනැඟිලා, නිවැරැදි විධියට සමාජයේ ජීවත් වෙන්න, අඩු ආදායම්ලාභීන් සහ විශේෂයෙන් කටුමැටි නිවාසවල ඉන්න ජනතාව වෙනුවෙන් සෑම ග්‍රාම නිලධාරි වසමකම නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘති ඉතාම ශක්තිමත්ව, නිවැරැදි ආකාරයට පසුගිය කාලසීමාවේ ක්‍රියාත්මක වුණා. ඉදිරියටත් මේ වැඩ කටයුත්ත ක්‍රියාත්මක කිරීම සඳහා මේ අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි නාගරික නිවාස ව්‍යාපෘති. අපට තිබෙන සීමිත භූමිය නියමිත ආකාරයට ක්‍රමවත්ව පාලනය කරගනිමින් ඒ නාගරික නිවාස ඉදිකිරීම වැදගත්. අනාගතවාදීව ඒ කටයුතු සිදු කිරීම වෙනුවෙන්, විශේෂයෙන් භූමිය නිසියාකාරයෙන් කළමනාකරණය කර ගනිමින් නාගරික නිවාස ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2,000ක මුදලක් සහ ග්‍රාමීය නිවාස වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක මුදලක් වෙන් කිරීම අනෙකුත් වැඩකටයුතු අතර ඉතාම වැදගත් කියා අපි විශ්වාස කරනවා.

ඇතැම් අය මොන විවේචන ඉදිරිපත් කළත්, මාර්ග සංවර්ධනයත් ඉතාම වැදගත්ය කියන කාරණය අපි විශ්වාස කරනවා. අපේ රටට එන ආයෝජකයන්ට ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ආයෝජනය කර ඒ ස්ථාන වෙත ඉතාම ඉක්මනින් ප්‍රවිෂ්ට වෙන්න වාගේම රටේ ජීවත් වෙන ජනතාවට තමන්ගේ එදිනෙදා වැඩකටයුතු ටික සිදු කර ගන්නත් මාර්ග සංවර්ධනය කිරීම අවශ්‍ය වෙනවා. තමන්ගේ නිවසේ ඉඳන් තමන් වැඩ කටයුතු කරන රාජකාරි ස්ථානයට යෑම සඳහා වෙන්න පුළුවන්, පාසලට යෑම සඳහා වෙන්න පුළුවන්, වෙනත් තැනකට යෑම සඳහා වෙන්නත් පුළුවන්, ඒ ඕනෑම තැනකට යන්න මාර්ග පද්ධතිය ඉතාම වැදගත්. අප නියෝජනය කරන දිස්ත්‍රික්කවලත්, ආසනවලත් ජනතාවගෙන් තවමත් අපට ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙනවා, ඔවුන්ගේ ප්‍රදේශවල මාර්ග වැඩිදියුණු කර දෙන්න කියලා. මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මේ වන විට ඉතාම වේගයෙන්, ශක්තිමත් ආකාරයට ක්‍රියාත්මකයි. ඉදිරියටත් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. එය, මේ රටේ ජනතාවගේ එක් බලාපොරොත්තුවක්, ඉල්ලීමක් ඉටු කිරීමක් ද වනවා. මොකද, ඒ වැඩ කටයුතු කරවා ගැනීම සඳහා අපේ දිස්ත්‍රික්කවලත්, අපේ ආසනවලත් ජනතාව කර තිබෙන ඉල්ලීම් ප්‍රමාණය නිරන්තරයෙන් අපි දකිනවා.

ඒ විතරක් නොවෙයි. "ගම සමඟ පිළිසඳර" වැඩසටහන මඟින්, ගමටම ගිහින් ගමේ විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලා, සමිති සමාගම් ඇතුළුව ගමේ ජනතාව එක තැනකට එකතු කරලා ගමේම ජනතාවගේ අදහස් අරගෙන, යෝජනා අරගෙන, ඒ අදහස්, යෝජනා ගොනු කරලා, ඒවා අය වැය ලේඛනයට ඇතුළත් කරන්න අපි කටයුතු කළා. ඒ වාගේම ඒ අයට මුදල් ලබා දීලා ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා ගම සංවර්ධනය කිරීමේ වැඩ කටයුත්ත "ගම සමඟ පිළිසඳර" වැඩසටහන තුළින් ක්‍රියාත්මකයි. ඒ සඳහාත් මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කරනවා වාගේම ගම ඇතුළේ සිටම යම් කටයුත්තක නිරත වෙලා, තමන්ට අවශ්‍ය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා තමන්ගේ ආදායම ශක්තිමත් කර ගන්නා තැනට ඒ අය පත් කිරීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිත් මේ හරහා ක්‍රියාත්මකයි. ඒ වාගේම ග්‍රාම නිලධාරි වසම් මට්ටමිනුත්, පළාත් පාලන කොට්ඨාස මට්ටමිනුත් මේ හරහා ජනතාවට විශාල මුදලක් ලබා දෙන්න හැකියාව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ස්වශක්තියෙන් නැඟී සිටි මිනිසුන් විශාල පිරිසකට කොරෝනා වසංගතය නිසා තමන්ගේ ආදායම අහිමි වුණු ආකාරය අපි දැක්කා. ඒ අය වෙනුවෙන්, එනම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට, පාසල් ප්‍රවාහන සේවා සපයන්නන්ට, ත්‍රිරෝද රථ රියැදුරන්ට, බස් රථ හිමියන්ට, උත්සව සේවා සපයන්නන්ට මේ අය වැය තුළින් අදාළ සහන ලබා දෙන්නට ගරු මුදල් අමාත්‍යතුමා යෝජනා කර තිබෙන්නේ, පසුගිය කාල සීමාවේ විවිධ ක්‍රියාවලි හරහා ඔවුන්ට ලබා දුන් සහයට අමතරවයි. අපි විශ්වාස කරනවා, එමඟින් ඔවුන්ට යළි ගොඩ නැඟීම සඳහා අවශ්‍ය ශක්තිය ලබා දෙන්නට හැකියාව ලැබෙයි කියා.

ඒ විතරක් නොවෙයි, "ජාතික පාසල් 1000ක් ඇති කිරීමේ වැඩසටහන" වෙනුවෙනුත් මෙවර අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. මා නියෝජනය කරන බද්දේගම ආසනයටත් ජාතික පාසල් 5ක් ලබා ගන්න අපට හැකියාව ලැබුණා. අපි විශ්වාස කරනවා, ඒවායේ යටිතල පහසුකම් සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කරන්නට මේ වැඩසටහන හරහා හැකියාව ලැබෙයි කියලා.

අපි දන්නවා, සහනාධාර සහ ශුභසාධන වැඩසටහන් ගණනාවක් රජය දීර්ඝ කාලීන වශයෙන් ක්‍රියාත්මක කරන බව. ජනතාව තමන්ගේ ගම් තුළම ආදායම් උපදවන ව්‍යාපෘතීන් වෙත යොමු කිරීම වැදගත් යැයි මා විශ්වාස කරනවා.

ගෘහ ආර්ථික වැඩසටහනත් මේ අය වැය තුළ තිබෙන ඉතාම වැදගත් යෝජනාවක් බව මා විශේෂයෙන්ම සිහිපත් කරනවා. එවැනි තවත් යෝජනා ගණනාවක් මෙහි තිබෙනවා. ගැබිනි මාතාවන්ට දෙන පෝෂණ මල්ල අවුරුදු දෙකක් දක්වා අඛණ්ඩව ලබා දෙන්නත්, දිළිඳු පවුල් වෙනුවෙන් සහන මල්ලක් ලබා දෙන්නත් මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා. "Home Shop" සංකල්පය ගැනත් මම කියන්න ඕනෑ. එමඟින් විශේෂයෙන්ම ගැමි කාන්තාවන්ට තමන්ගේ නිවසේ සිටම ආදායමක් ලබන්නත්, ඒ භාණ්ඩ ටික ගමේ ජනතාවට මිලදී ගන්නත් හැකි වනවා. ඒ ආකාරයේ වැඩසටහන් ගණනාවක් මෙම අය වැය තුළ තිබෙනවා. මා ඒ කාරණයත් විශේෂයෙන් සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගුරු හා විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කරලා ඒ ගැටලුවට විසඳුමක් ලබා දෙන්න කටයුතු කිරීමත් අප සියලුදෙනා අගය කළ යුතුයි කියන කාරණයත් විශේෂයෙන් සඳහන් කරමින්, මේ තීරණාත්මක අවස්ථාවේදී රට යළිත් ආර්ථිකමය වශයෙන් ශක්තිමත්ව ගොඩ නැඟීම සඳහා සියලුදෙනාගේ ශක්තිය, ධෛර්යය ලබා දෙන්න කියන ඉල්ලීමත් කරමින්, මට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමියටත් මගේ ස්තුතිය පළ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.55]

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුවේ ඒ කාලයේ අපි දැකපු අය වැය ඉදිරිපත් කිරීම වාගේ නොවෙයි, අද කාලයේ අය වැය ඉදිරිපත් කිරීම. මොකද, ලෝකයම ගෝලීය අර්බුද 5කට මැදි වෙලා ඉන්න අවස්ථාවක තමයි අපේ රජය මේ අය වැය ඉදිරිපත් කරන්නේ. ඒ නිසා තමයි ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමාගේ දක්ෂතාව මේ අය වැය හරහා අද මුළු රටම දකින්නේ. මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඒ අර්බුද ගැන එහි හොඳින් පැහැදිලි කර තිබෙනවා අපි දැක්කා.

ඒ සමඟම, එතුමා ආර්ථිකය හොඳින් කළමනාකරණය කර තිබුණා. මේ වන කොට කිසිදු කාලයක ඇති නොවුණු සමාජ හා ආර්ථික විෂමතා ලෝකයේ පවතිනවා. ඇති නැති පරතරය ඉන් එකක්. මෙය, ඇති නැති පරතරය වැඩි වෙමින් පවතින කාලයක්. ඒ වාගේම මුළු ලෝකයේ -හැම රටකම- සංවර්ධන වේගය අඩු වෙලා තිබෙනවා. අද පරිසර විපත්, පරිසර හානි විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. රට රටවල් අතර කෙරුණු බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය උපකාර අද නැති වෙලා තිබෙනවා. ඒත් එක්කම,

[ගරු ලලිත් එල්ලාවල මහතා]

මුළු ලෝකයටම බලපෑ කොරෝනා වසංගතය අපටත් බලපා තිබෙනවා. මේ වසංගතය හමුවේ අය වැයක් ඉදිරිපත් කරද්දී අපේ රටටත් බොහොම අමාරු තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපිවත් බලාපොරොත්තු වුණේ නැහැ, මේ වාගේ ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා තමයි අප ප්‍රකාශ කරන්නේ, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කියන්නේ ආර්ථිකය හොඳින් කළමනාකරණය කරන්න පුළුවන් අමාත්‍යවරයෙක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකට ප්‍රධානම හේතුව තමයි, අපට ශක්තිමත් රජයක් තිබීම.

අපි පත් කරගත්තා, ශක්තිමත් ජන වරමක් සහිත ජනාධිපතිවරයෙක්. ඒ තමයි අපේ අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා. අපේ ජනාධිපතිතුමා හොඳ ශක්තිමත් නායකයෙක්; ඍජු නායකයෙක්; හොරකම, දූෂණය, වංචාව පිටු දකින නායකයෙක්; බොහොම සරල නායකයෙක්. ඒක රජයට, අපට ලොකු ශක්තියක් වෙලා තිබෙනවා. ඒත් එක්කම, පස්වන විධායක ජනාධිපතිතුමා, එනම් වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන්නේ, අපේ මුළු රටේම ජනතාවට අභය දානය දුන්, මුළු ලෝකයටම ආදර්ශවත් නායකයෙක්. ඉතින්, මේ වාගේ නායකයන් සිටින, තුනෙන් දෙකේ බහුතර පාර්ලිමේන්තු බලයක් තිබෙන මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් වන අප ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දකින්නේ, මුදල් අමාත්‍ය ධුරයට සුදුසුම කෙනා විධියටයි. මම දැකපු හැටියට අපේ රටේ මුදල් අමාත්‍යවරුන් අතරින් දක්ෂම මුදල් අමාත්‍යවරයා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමායි. මම අද ඒ බව බොහොම ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අපි දැකපු තවත් දෙයක් තිබෙනවා. අපි ජනාධිපතිවරුන් ගැන සංසන්දනය කර බලන්න ඕනෑ. අපි දැක්කා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට මේ රට භාර දෙන කොට මේ රටේ නිෂ්පාදන අතිරික්තයක් තිබුණු බව. ඒ වාගේම, එදා හොඳ දේශීය ආර්ථිකයක් තිබුණා. හැබැයි, එදා එක්සත් ජාතික පක්ෂය ඇට වර්ග 8ක් දෙනවා කියලා ජනතාව රැවටුවා. එතුමන්ලා ජනතාව රවටලා බලය අරගෙන මේ රටට විවෘත ආර්ථිකය ගෙනාවා. ඒ අනුව හොඳ දේයි, නරක දේයි දෙකම එදා මේ රටට ගෙන ආවා. අද මේ රටට මෙතරම් ණය බරකින් වෙළෙන්න සිදු වුණේ විවෘත ආර්ථිකයේ හොඳ දේයි, නරක දේයි සියල්ල මේ රටට ගෙන ආ නිසායි. අද මේ රටේ ණය බර වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක් ඇති වුණේ ඒ පක්ෂවල නායකයන් කරපු දේවල් නිසා තමයි.

ආර්. ප්‍රේමදාස මැතිතුමාත් මේ රට පාලනය කළා. අන්තිමට, මේ රටේ මිනිසුන් අතර නමක් ලැබුවා, "වියරු මිනිසා" කියලා. ඒ තරමට වියරු වැටිලා තමයි ඒ කාලයේ රට පාලනය කළේ. අපට මතකයි, එදා තරුණයන් 60,000කට ආසන්න ප්‍රමාණයක් ඝාතනය කළ බව. එසේ ඝාතනය කළ තරුණයන් සියලුදෙනා හොඳ, උගත්, බුද්ධිමත්, මේ රටේ ඉන්න ඕනෑ අයයි. එදා ඒ බුද්ධිමය සංහාරය කරපු නිසා එය අද මේ රටට බලපා තිබෙනවා. ඒත් එක්කම කියන්න ඕනෑ, ජනතා විමුක්ති පෙරමුණ ගැන. මා දකින විධියට, ජනතා විමුක්ති පෙරමුණ පවා එදා ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක කරලා අපේ තරුණයන් 60,000ක් පමණ අපේ රටෙන් ඉවත් කර දැම්මා. ඒක අද අපට විශාල හානියක්, පාඩුවක් වෙලා තිබෙනවා. අපේ රටේ හැම ජනාධිපතිවරයකුම ගෙන බැලුවාම අපට පෙනෙනවා, අද මේ රටට මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ -අද සමගි ජන බලවේගය- නායකයන් අපේ රට පාලනය කළ නිසාය කියන එක.

සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් කථා කරන කොට කිව්වා "මේ අය වැය ජනතාවට වැඩක් නැහැ" කියලා. මේ අයවැය ජනතාවට වැඩක් වනවාද නැද්ද කියලා අද එළියට බැහැලා ඔබතුමන්ලා ජනතාවගෙන්ම අහලා බලන්න ඕනෑ. විපක්ෂය කියන දේවල් නොවෙයි, අද ජනතාව පිළිගෙන තිබෙනවා මේක ඉතාම හොඳ අය වැයක් බව.

ගමට ගිහිල්ලා ගමේ යෝජනා අරගෙන තමයි අපි කටයුතු කරන්නේ. අපේ රටේ පළාත් පාලන කොට්ඨාස 4,917ක් තිබෙනවා. මෙවර අය වැයෙන් කොට්ඨාසයේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට මිලියන හතර ගණනේ දෙන්න යෝජනා කරලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට යම් මුදලක් තිබෙනවා, තමන්ට ඕනෑ විධියට ගමේ වැඩ කරන්න; දිස්ත්‍රික්කයේ වැඩ කරන්න. ඒ වාගේම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුටත් යම් මුදලක් ලබා දීලා තිබෙනවා. හැබැයි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට එහෙම මුදලක් ලබා දීලා තිබුණේ නැහැ. මේ රජය තමයි පක්ෂ, පාට භේදයකින් තොරව පළමුවැනි වතාවට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට ගමේ ජනතාවත් එක්ක එකතු වෙලා වැඩ කරන්න රුපියල් මිලියන හතරක් ලබා දෙන්න යෝජනා කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. කොරෝනා ව්‍යසනය නිසා විශාල අපේ රටේ විශාල පිරිසකට තම ආර්ථික ශක්තිය අහිමි වුණා. ඒවාට අපි සල්ලි වෙන් කළාම විපක්ෂයේ අය හිනා වෙනවා. අපි දන්නවා, මේ වසංගතය නිසා කුලී ත්‍රිරෝද රථ හිමියන්ට විශාල වශයෙන් ආදායම් අහිමි වුණු බව. ඒ අය වෙනුවෙන් අද මේ අය වැයෙන් රුපියල් මිලියන 600ක් පමණ වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පාසල් වෑන් රථ රියැදුරන් මාධ්‍ය හමු තියලා ඇඬුවා, අපි දැක්කා. අද විපක්ෂයට ඒවා තේරෙන්නේ නැහැ. ඔවුන් වෙනුවෙන් රුපියල් මිලියන 400ක පමණ මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික බස් රථ හිමියන් වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. මේ විධියට අරගෙන බැලුවාම කොරෝනා ව්‍යසනය නිසා විශාල වශයෙන් ආදායම් අහිමි වෙච්ච සියලු දෙනාටම වාගේ මේ අය වැයෙන් උපකාර කරලා තිබෙනවා.

රජයේ සේවකයන්ට අවුරුදු 65 වෙන කල් රාජ්‍ය සේවයේ ඉන්න පුළුවන් කියලා මේ අය වැයේ තිබෙනවා, අපි දැක්කා. ජනතා විමුක්ති පෙරමුණේ -ජාතික ජන බලවේගයේ- මන්ත්‍රීවරුන් අද ඒ ගැන කථා කළා. අපට පුදුම හිතුණා. එදා, 1989-90 කාලයේ එතුමන්ලා මොකක්ද කිව්වේ? එදා කිව්වා, "60ට වැඩි අය රටට බරක්. ඒක නිසා ඔවුන් මරලා දාන්න ඕනෑ" කියලා. ජනතා විමුක්ති පෙරමුණ එදා කිව්වේ එහෙමයි. හැබැයි, අපේ රජය එහෙම කළේ නැහැ. අද අපේ රජය රාජ්‍ය සේවකයන් විශ්‍රාම යන වයස අවුරුදු 65 වනතුරු දීර්ඝ කර තිබෙනවා. ඒ අයගේ අත්දැකීම් බලලා, ඒ ගොල්ලන් කරපු සේවාව බලලා අවුරුදු 65 වෙන කල් ඒ අයට සේවය කරන්න පුළුවන් විධියට අද මේ රජය කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ජනතාවට හැම අතින්ම සහන දෙන මෙවැනි අය වැයක් ඉදිරිපත් කළත්, එය ජනතාව අතරට අරගෙන යන එක ගරු අමාත්‍යවරුන්ගේ, රාජ්‍ය අමාත්‍යවරුන්ගේ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ වගකීමක්. මේ වාගේ නායකයන් ඉන්න පක්ෂයක් තුළ, මේ වාගේ රජයක් තුළ කටයුතු කරන්න කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව මා පාර්ලිමේන්තුවට එවීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ වාගේ ව්‍යසනකාරී වෙලාවක ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කිරීම ගැන ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට නැවත නැවතත් අපේ ගෞරවනීය ස්තුතිය, ප්‍රණාමය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තාරක බාලසූරිය රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.05]

**ගරු තාරක බාලසූරිය මහතා (කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக பாலசூரிய - பிராந்திய உறவு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Regional Co-operation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම අය වැය පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්නට මට විනාඩි 10ක කාලයක් ලබාදීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මා දන්නා අන්දමට, 1948 ඉඳන් මේ දක්වා මුදල් ඇමති කෙනෙකුට ඉදිරිපත් කරන්න සිද්ධ වුණු අමාරුම අය වැය තමයි අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයේ අපිත්, විපක්ෂයේත් ඉන්න මන්ත්‍රීතුමන්ලාත් ඒක අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. විශේෂයෙන්ම මේ කාලය කොවිඩ් වසංගතය නිසා යම් කිසි අවිනිශ්චිතතාවක් තිබෙන කාලයක්. එතකොට යම් දෙයක් සැලසුම් කිරීමේ අපහසුතාවක් තිබෙනවා. මම දැක්කා, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ගිය අවුරුද්දේ සංඛ්‍යා ලේඛන ගැන කියමින් ප්‍රකාශ කළා, මේ සංඛ්‍යා ලේඛන එක්ක ඇත්ත සංඛ්‍යා ලේඛන බැලුවොත් විශාල වෙනසක් තිබෙනවා කියලා. ඒක හැම අය වැයකදීම වෙන දෙයක්. ඒ නිසා Budget Office එකක් නිර්මාණය කරන්න තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි සියලු දෙනාම සහයෝගය දෙන්න ඕනෑ. අපේ රවි කරුණානායක මැතිතුමාගේ පළමුවැනි අය වැය හෝ දෙවැනි අය වැය ඉදිරිපත් කරන කොට ඒ අය වැයේ ආදායම් වර්ධනය සියයට 47ක්, සියයට 50ක් වාගේ ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබුණා.

හැබැයි, අය වැයක් ඉදිරිපත් කිරීමේදී ඇති අභියෝග මොනවාද කියලා අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා හොඳින් හඳුනා ගත්තා. අභියෝග පහක් තිබෙන බවයි එතුමා හඳුනා ගත්තේ. ඒ අභියෝග පහට අමතරව තවත් අභියෝගයක් තිබෙන බවයි මා විශ්වාස කරන්නේ. ඒ අභියෝගය තමයි අපේ කෙටි කාලීන අවශ්‍යතාත්, දීර්ඝ කාලීන ඉලක්කවලත් යම් පරස්පරතාවක් තිබීම. විශේෂයෙන් පසුගිය අවුරුදු තුන දිහා බැලුවොත්, සංචාරක ව්‍යාපාරය කඩා වැටීම නිසා අපට ඩොලර් බිලියන 12ක්, 13ක් විතර අහිමි වුණා. විශේෂයෙන්ම ඒ නිසා අද රුපියලට විශාල පීඩනයක් තිබෙනවා. රුපියලට පීඩනයක් තිබෙන කොට, එක පැත්තකින් අපට රුපියල බාල්දු කරන්න පුළුවන්. එහෙමත් නැත්නම්, ඩොලරය රුපියල් 203, 204 දක්වා ගෙන යන්න පුළුවන්.

අපි දන්නවා, ඊළඟ අවුරුද්දේ International Sovereign Bond - ISB - එකක් එන බව. ඒ අනුව ජනවාරිවල මිලියන 500ක් එනවා. අවුරුද්ද මැදදී තව බිලියනයක් වාගේ එනවා. මේ වෙලාවේ අපි රුපියල බාල්දු කළොත් මොකක්ද වෙන්නේ? අපට ඒ ඩොලර් ප්‍රමාණය ගෙවීමේදී අපහසුතාවකට මුහුණ පාන්න සිදු වනවා. හැබැයි අපි දන්නවා, මේ ගණනට ඩොලරය පවත්වා ගෙන යෑමෙත් යම්කිසි අවාසිදායක තත්ත්වයක් තිබෙන බව. කෙටි කාලීන ආයෝජකයෙක් ගත්තොත්, ඔහු සමහර විට මේ අවස්ථාවේ ලංකාවට ඇවිත් ආයෝජනය කරන්න කැමැති නොවෙන්න පුළුවන්. මොකද, බැරි වෙලාවත් රුපියල බාල්දු වෙලා තිබුණොත් ආයෝජනය ගණනය කරන්න යම්කිසි අපහසුතාවක් තිබෙනවා. මෙවැනි අවස්ථාවකදී, -මෙවැනි මූලික ප්‍රශ්නයක් තිබෙද්දි- මොකක්ද අපට තිබෙන විසඳුම? මම දකින අන්දමට නම් අපට විසඳුම් විශාල ප්‍රමාණයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා පැවසූ අන්දමට මේ සඳහා තිබෙන එක විසඳුමක් තමයි, අපට IMF එකට යන්න පුළුවන්. IMF එකට ගියොත් මොකක්ද වෙන්නේ? IMF එකේ කට්ටිය කියනවා, austerity measures ගන්න කියලා. එහෙමත් නැත්නම්, belt එක මීටත් වඩා තද කර ගන්න කියලා. ඊට පස්සේ සමහර විට ග්‍රීසියට අත් වෙච්ච ඉරණම තමයි අපට අත් වෙන්නේ. ඊළඟට අපට තිබෙන විකල්පය තමයි අපේ දේශීය ආර්ථිකය නඟා සිටුවන්න යම්කිසි මට්ටමකින් මුදල් වියදම් කිරීම. අපට කොහෙන්ද මුදල් එන්නේ? ඩොලර් ප්‍රශ්නයක් තිබුණාට අපි 2008 ඉඳන් බැලුවොත්, ඇත්ත වශයෙන්ම බහුතරයක් තිබෙන්නේ අච්චු ගහපු මුදල්. මේක වෙන්නේ ලංකාවේ විතරක් නොවෙයි, ඇමෙරිකාවෙත් එහෙමයි. 2008දී ඇමෙරිකාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් ණය හැටියට තිබුණේ සියයට 60යි. හැබැයි, අද වනකොට ඒ ප්‍රමාණය සියයට 120 දක්වා වැඩි වෙලා තිබෙනවා. සියලු රටවල් - විශේෂයෙන්ම මේ කොවිඩ් වසංගතය තිබෙන වකවානුවේදී - මුදල් අච්චු ගහලා තිබෙනවා. ඒකට සමහර කට්ටිය, Modern Monetary Theory කියනවා. නමුත් සමහර ආර්ථික විද්‍යාඥයෝ, විශේෂයෙන්ම Austrian School එකේ ආර්ථික විද්‍යාඥයෝ කියනවා මේ නිසා යම්කිසි මට්ටමකට උද්ධමනයකට පරිවර්තනය වෙන්න පුළුවන් කියලා. නමුත් මමත් අවිවාදයෙන් පිළිගන්නා කාරණයක් තමයි, මුදල් අච්චු ගැසීමේදී වුණත් අපට යම්කිසි සීමාවක් තිබෙනවා කියන එක.

කෙසේ වෙතත්, අපේ රජය කල්පනා කර බලලා, ගරු මුදල් ඇමතිතුමා බිලියන 85ක පමණ මුදල් ප්‍රමාණයක් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කරන්න වෙන් කර තිබෙනවා. මට පෙර කථා කරපු මන්ත්‍රීවරයෙකු පැවසූ අන්දමටම, එක වසමකට රුපියල් මිලියන 3කුත්, සෑම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුටම රුපියල් මිලියන 4ක මුදල් ප්‍රමාණයකුත් වෙන් කර තිබෙනවා. ඒ සම්පූර්ණ මුදල් ප්‍රමාණය මිලියන 85ක්. මේ මුදල් ගම්වලට එනකොට අපට දේශීය ආර්ථිකය යම්කිසි මට්ටමකට නඟා සිටුවන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

අද අපි ගම්මානවලට ගිහිල්ලා බැලුවොත්, "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" කියලා ලංකාවේ ගම්මාන 600ක් විතර සංවර්ධනය කර තිබෙනවා. අද ලංකාවේ විශේෂයෙන්ම officesවල වැඩ කරන ගැහැනු ළමයින්ගෙන් බහුතරයක් අඳින්නේ, handloom සහ බතික් රෙදිවලින් මැසූ ඇඳුම්. එලෙස අපි දේශීය නිෂ්පාදන මිලදී ගන්නවා නම්, දේශීය නිෂ්පාදන වර්ධනය කිරීමට පුළුවන් වනවා.

ඊළඟ ගැටලුව තමයි, ආහාර හිඟය. අපි දන්නවා ආහාර හිඟයක් එන බව. මේක ලංකාව විතරක් මුහුණ දෙන ගැටලුවක් නොවෙයි. එක පැත්තකින් අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රය දියුණු කිරීමෙන් ගමට අවශ්‍ය ආහාර නිෂ්පාදනය කර ගන්න අපට පුළුවන් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උදාහරණයක් කිව්වොත්, මට භාර දී තිබෙන කෑගල්ල ආසනයේ හැම වසමකම බිත්තර නිෂ්පාදනය සඳහා අපි ඒ අයව විශේෂයෙන් උනන්දු කරවනවා.

ඇයි, අපි එහෙම කරන්නේ? අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා පැවසූ අන්දමට එක පුද්ගලයෙකු දවසකට කැලරි 2,040ක් ගන්න ඕනෑ. එහිදී අපට දවසකට අවශ්‍ය ප්‍රෝටීන් ප්‍රමාණය බිත්තරවලින් ලෙහෙසියෙන්ම ලබා ගන්න පුළුවන්. අපි දැන් විදේශ වෙළෙඳ පොළ හොයා ගන්නත් කටයුතු කරනවා. ඒ අනුව, මගේ අමාත්‍යාංශය හරහා අපි කටාර් රාජ්‍යයට ගිහිල්ලා, LuLu Hypermarket කියන ආයතනයත් එක්ක සාකච්ඡා කළා. ලබන ජනවාරි මාසය වන විට ලංකාවේ හෑන්ඩ්ලූම් සාරි සහ බතික්

[ගරු තාරක බාලසූරිය මහතා]

සාරි ආශ්‍රිත වෙළෙඳ ප්‍රදර්ශනයක් පවත්වන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ මුදල් දීලා තිබෙන්නේත් මහජන නියෝජිතයන් හරහා. ඒකත් මා කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් යම් ආසනයක් දිනා තිබෙනවා නම්, ඒ රුපියල් ලක්ෂ 40 හම්බ වෙන්නේ ඒ මන්ත්‍රීතුමාට. ඒ මන්ත්‍රීතුමාගේ අභිමතය අනුව තමයි ඒ මුදල් පාවිච්චි කරන්නේ.

පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේදී කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හැටියට කටයුතු කළේ කවුද? ඒ, එක සභාපතිවරයෙක් තමයි, එක්සත් ජාතික පක්ෂයේ හිටපු සංවිධායකතුමා. අනෙක් සභාපතිවරයා තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු සංවිධායකතුමා. ඒ දෙදෙනාම අඩුම ගණනේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුවත් නොවෙයි. ඒ ආකාරයෙන් කටයුතු කළ අය තමයි දැන් අපට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියන්නේ, රාජ්‍ය මුදල් පාවිච්චි කරන්න ඕනෑ කොහොමද කියලා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ග්‍රාමීය ආර්ථිකය දියුණු කරන ගමන් රට සංවර්ධනය කරන්න තිබෙන අනෙක් ක්‍රමවේදය මොකක්ද? අපි ආයෝජන ගේන්න ඕනෑ. ආයෝජන ගේනකොටත් "එපා" කියනවා, ආයෝජන ගේන්නේ නැති වෙනකොටත් යම් යම් දේවල් කියනවා. මේ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යම් යම් අදහස් තිබෙනවා. මම මෑතකදී BOI එකේ සභාපතිතුමා එක්ක ප්‍රංශයට ගියා. ප්‍රංශයේ ආයතන 17ක් එක්ක අපි කථා කළා. ඒ අනුව, පසුගිය මාස තුන තුළදී අපට ආයෝජන 3ක් ලැබුණා. ඉන්දියාවෙන් මිලියන 600ක, 700ක පමණ ආයෝජනයක් ලැබුණා. ඒ වාගේම elevated highway එකක් සඳහා චීනයෙන් ආයෝජනයක් ලැබුණා. ඒ වාගේම ඇමෙරිකාවෙන් මිලියන 250ක ආයෝජනයක් ලැබී තිබෙනවා. "රට බංකොලොත්" කියලා විපක්ෂය කිව්වාට, ප්‍රධාන රටවල් තුනකින් පසුගිය මාස තුනේ අපට ආයෝජන ලැබී තිබෙනවා. මුදල් ආයෝජනය කරලා factories ආරම්භ කරන්න අපට සල්ලි නැත්නම්, රටට ආයෝජන ගේන්න ඕනෑ. හැබැයි, ආයෝජන ගේනකොට අපි ලබා දෙන කොටස් ප්‍රමාණයත් බලන්න ඕනෑ. මෙතුමන්ලා හම්බන්තොට වරාය අවුරුදු 99කට බදු දීලා, ඊට පසු තවත් අවුරුදු 99කට ඒ ගිවිසුම දික් කළා වාගේ අපි දුන්නේ නැහැ. New Fortress Energy සමාගමට ලබා දෙන කොන්ත්‍රාත්තුව අවුරුදු පහළොවකින් පසු විදුලිබල මණ්ඩලයට හිමි වෙනවා. ඒ වාගේම අවුරුදු 30ක, 35ක කාල සීමාවක් සඳහා තමයි අනෙක් ආයෝජනවලටත් අපි අවස්ථාව දීලා තිබෙන්නේ. මා හිතන විධියට කුමන රජයක් බලයට ආවත් අනිවාර්යයෙන්ම මේ තීන්දු ගන්නවා. හුඟක් කට්ටිය හිතන අන්දමටම අපේ choices නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයන් වුණත් මොකක්ද කියන්නේ? ඔවුන් කියන්නේත් ග්‍රාමීය ආර්ථිකය, දේශීය ආර්ථිකය නඟා සිටුවන්න කියලායි. අපි දැන් කරන්න හදන්නේ ඒක නොවෙයිද? අපි යන මේ මාර්ගය අසාර්ථක වුණොත්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන අන්දමට අපට තව එක මාර්ගයයි තිබෙන්නේ. ඒ තමයි, IMF එකට යන එක. IMF එකට ගිහිල්ලා රටවල් කීයක් දියුණු වෙලා තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි. ඒ නිසා, මේ තරම් අමාරු කාල වකවානුවක වුණත් මෙවැනි ප්‍රගතිශීලී, ඒ වාගේම ජනතාව ඉලක්ක කර ගත් අය වැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය නිම කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.15]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2022 අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සහභාගි වෙන්න ලැබීම ගැන මා ඉතා සතුටට පත් වෙනවා. ප්‍රධාන කරුණු තුනක් සම්බන්ධ කර ගනිමින් කරුණු ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

පළමුවැනි කාරණය මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය කියන්නේ ඇත්තටම ආර්ථිකයත්, දේශපාලනයත් කියන දෙකම එකට ගැට ගැහුණු මැදිහත්වීමක්.

අද උදේ ඉඳලා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභාවේදී අය වැය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ අයගේ අදහසක් තිබෙනවා, 'අය වැය' යම් ආකාරයක ඉලක්කම් විජ්ජාවක් වෙන්න ඕනෑ කියලා. එවැනි assumption එකක්, නැත්නම් යටි සිතාගැනීමක් ඇතිව තමයි මේ අය වැය සම්බන්ධයෙන් සමහරු කරුණු ඉදිරිපත් කෙරුවේ. නමුත්, මම හිතන්නේ අය වැයක් කියන්නේ political economy එකක්; දේශපාලනයත්, ආර්ථිකයත් කියන පැති දෙකම එකට ගැට ගැහිච්ච මැදිහත්වීමක් කියලායි. අපි අය වැය පිළිබඳව කරන සංවාදයකදී මෙන්න මේක ඒ අර්ථයෙන් තේරුම් ගැනීම ඉතාම වැදගත්. රටක දේශපාලනයත්, ආර්ථිකයත් කැටි කර ගත් මැදිහත්වීමක් විධියටයි රජය අය වැයක් ඉදිරිපත් කරන්නේ. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, මේ රටේ දේශපාලන අභියෝග සමඟ ගැට ගැහිච්ච ආර්ථිකමය මැදිහත්වීමක් ලෙස අපේ අය වැය පිළිගන්න කියලා. විශේෂයෙන්ම කොළඹ කේන්ද්‍රීය බුද්ධි මණ්ඩලවල, එහෙම නැත්නම් think-tanksවල බොහෝ අය කල්පනා කරන්නේ අය වැයක් කියන එක ඉලක්කම් මත පමණක් පදනම් වෙච්ච මැදිහත්වීමක් කියලායි. ඒක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දෙවැනි කාරණය මෙයයි. අපි, අපේ රටේ ආර්ථිකය දේශපාලනයත් එක්ක ගැළපුවාම තිබෙන ඇත්ත තත්ත්වය පිළිගත යුතුව තිබෙනවා. අපේ රටේ ආර්ථිකය පසුගිය අවුරුදු 72ක කාලයක ඉඳලා විශාල අර්බුදයක ගැට ගැහිලා තිබෙනවා. මේ අර්බුදය තවත් වර්ධනයවීමක් කොවිඩ් -19 උවදුරත් එක්ක සිදු වුණා කියන එක අපි පිළිගත යුතුව තිබෙනවා. විදේශ මූල්‍යකරණය සම්බන්ධයෙන් ලෝකයේ හැම රටකටම, විශේෂයෙන්ම අපි වාගේ තුන්වැනි ලෝකයේ රටවලට මේ වසංගතයෙන් විශාල බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපට විදේශ මුදල් ලැබෙන මාවත් සියල්ලම වාගේ කළමනාකරණය කරන්න බැරි තරමට සමහර තැන්වල වැහිලා තිබෙනවා. මේක අපි පිළිගන්නවා. මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉතාම පැහැදිලිව එතුමාගේ මූලික අදහස් දැක්වීමේදීත් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. ආර්ථිකමය වශයෙන් අප වාගේ රටවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන මේ තත්ත්වය එක්ක එකට ගළපා තමයි මෙවර අය වැය සම්බන්ධ සාකච්ඡාව සිදු කරන්න ඕනෑ. මම ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා යම්කිසි ආකාරයකට දේශපාලනමය වශයෙන් තිබෙන emotional intervention එකක් මත මිස, මහ පොළොවේ තිබෙන යථාර්ථය සම්බන්ධව කල්පනා කරන්නේ නැතිවයි මෙවර අය වැයට මැදිහත් වෙන්නේ කියලා. ඒ බව අපට පේනවා. විශේෂයෙන්ම විදේශ මූල්‍ය පිළිබඳ පැත්ත විතරක් නොවෙයි, අපට බරපතළ රාජ්‍යයක් නඩත්තු කරන්නත් සිදුවෙලා තිබෙනවා. මේක පොදුජන පෙරමුණේවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේවත්, එක්සත් ජාතික පක්ෂයේවත් තනි වගකීමට දෙන්න මම ලෑස්ති නැහැ. අවුරුදු 72ක කාලය තුළ අපි ගොඩ නඟපු බරපතළ රාජ්‍යයක් දැන් අපට නඩත්තු කරන්න සිදුවෙලා තිබෙනවා. අපේ දේශපාලනය පැත්තෙන්, ආර්ථිකය පැත්තෙන් මේක යථාර්ථයක්.

ඊළඟ අය වැයේදී අපේ රටේ පුනරාවර්තන වියදම රුපියල් බිලියන 5,128ක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ රාජ්‍ය සේවයේ අද ලක්ෂ 17ක් - 1.7 million - පමණ ඉන්නවා. ඒ නිසා අපි ආණ්ඩුව කළත්, අනෙක් පැත්තේ අය ආණ්ඩුව කළත්, මේක බරපතළ ප්‍රශ්නයක් විධියට තිබෙනවා. ඒ වාගේම, එතැනින් එහාට ගිහිල්ලා රාජ්‍ය මූල්‍යකරණය විසින් අපේ රාජ්‍යය සතු ව්‍යාපාර විශාල අර්බුදයකට ලක්කර තිබෙනවා. විශේෂයෙන්ම මේ ගරු සභාව දන්නවා, අපේ රාජ්‍ය ව්‍යාපාරවල සමහර දේවල් රටට විශාල සුදු අලියෙකු විධියට තමයි තිබෙන්නේ කියලා. මේක එක ආණ්ඩුවකට විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවුණාට, ආණ්ඩුව කරන පක්ෂය විධියට අපට මේ යථාර්ථයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපට බොහෝ අලාභ ලබා දෙන ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රීලන්කන් ගුවන් සමාගම, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, සතොස ඇතුළු ආයතන 32ක් අපේ රටේ තිබෙනවා. මේ ආයතන 32න්, මම නම් සඳහන් කළ ආයතන හතර විතරක් ගත්තත්, එම ආයතන හතර අපේ රටේ ආර්ථිකයට බරපතළ බලපෑමක් සිදු කරනවා. මේ ආයතන හතර අද තිබෙන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ දේශපාලන තීරණ නිසායි.

ඒ දේශපාලන තීරණය නොසලකා හැරලා, දන්නේ නැහැ වාගේ හිතලා, අපි කළේ නැහැ වාගේ හිතලා කථා කරන එක ලෙහෙසියි. නමුත් ඒක සත්‍යය නොවෙයි. ඒ කථාව අහන, අපේ සමාජයේ හිතන මතන හැමකෙනෙක්ම දන්නවා, මේ බරපතළ රාජ්‍ය යන්ත්‍රණය මෙහෙයවන්න, මේ බරපතළ අලාභ ලබන රාජ්‍ය ව්‍යාපාර පද්ධතිය අරගෙන යන්න හැම රජයකටම සිදු වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් මම කියපු ආයතන හතර විතරක් ගත්තත්, ලංකා විදුලිබල මණ්ඩලයේ 2020 වසරේ අලාභය රුපියල් බිලියන 62යි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ 2020 වසරේ අලාභය රුපියල් බිලියන 45ක් -රුපියල් මිලියන 45,000ක්- වෙනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2020 වසරේ යම් ලාභයක් ලබලා තිබෙනවා. සතොස සමාගමට රුපියල් බිලියනයකට වඩා අලාභ වෙලා තිබෙනවා. මේ වාගේ විශාල අලාභ සහිත රාජ්‍ය ව්‍යාපාර පද්ධතියක් නඩත්තු කරගෙන අපට යන්න වෙලා තිබෙනවා. රාජ්‍යයට ව්‍යාපාර කරන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය මේ සභාවේ අපි පැහැදිලිව පැත්තකට බෙදෙන්නේ නැතිව සාකච්ඡා කරන තැනට මේ ආයතන අප ගෙනැල්ලා තිබෙනවා. මෙන්න මේ බරපතළ ආර්ථික අර්බුදය හමුවේ තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉදිරිපත් කරන තුන්වැනි කාරණය මෙයයි. ඉතාම වැදගත්, අලුත් දැක්මක් මේ අය වැය ලේඛනය තුළ තිබෙනවා. අපේ රටේ මාසයේ අන්තිමට පඩිපත ලැබෙන, රාජ්‍ය අංශය වේවා, පෞද්ගලික අංශය වේවා, අපි කියන සංවිධිත ආර්ථිකය ගැන පමණක් බලලා අය වැය ඉදිරිපත් කළ ඉතිහාසයක් තමයි අපට තිබුණේ. අපි හැම දාම අය වැයකදී රාජ්‍ය සේවයේ පඩි වැඩි කරනවා, හැම දාම අය වැයකදී ප්‍රධාන කොම්පැනිවල ආදායම ගැන අපි හිතනවා.

රාජ්‍ය සේවය සහ පෞද්ගලික අංශයේ ප්‍රධාන කොම්පැනි කියන දෙකෙන් මාසයේ අන්තිමට පඩිපත ලැබෙන කණ්ඩායමෙන් එහා ගිය ආර්ථික කලාපයක් රටක තිබෙනවා. මට කලින් කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් මේක වෙන විධියකට කිව්වා. එතුමන්ලා විශ්වාස කරන විධිය වැරදියි. මේ අවිධිමත්, නොවිධිමත්, informal economy එක අපේ රටේ ආර්ථිකය ඇතුළේ සිටින policymakersලා, එහෙම නැත්නම් ප්‍රතිපත්ති හදන අය නොසලකා හැරලා තිබෙන්නේ. මෙවර අය වැයේදී විශේෂයෙන්ම ඒ ප්‍රධාන ධාරාවෙන් එළියේ තිබෙන, සියයට 50කට වැඩි ධාරිතාවක් තිබෙන සමාජ කොට්ඨාසය - අවිධිමත්, නොවිධිමත්, informal economy එක - සම්බන්ධව බරපතළ මැදිහත්වීමක් සිදු කර තිබීම ගැන ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට අපේ ස්තුතිය පිරිනමනවා. නිෂ්පාදන ආර්ථිකය සහ ජීවනෝපාය සංවර්ධනයට මිලියන 33,000යි. ඒ වාගේම, "ගම සමඟ පිළිසඳර" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හරහා මම මේ කියන සමාජ කණ්ඩායම් ඇතුළට යන්නේ රුපියල් මිලියන 85,000යි. ඒ වාගේම අපේ සමාජය ඇතුළේ ගොවියාගේ, ධීවරයාගේ, පෙදරේරුවාගේ, මේසන්වරයාගේ එහෙම නැත්නම්, සතියේ, මාසය අන්තිමට බැංකුවේ account එකකට සල්ලි යන්නේ නැති මූල්‍ය හුවමාරුකරණයේ ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට හැකි උපරිම දුරට ගිහින් තිබෙන අය වැයක් විධියට මම මේ අය වැය සලකනවා. ඒ නිසා මේක රැඩිකල් පදනමක් තිබෙන අය වැයක් විධියට අපි තේරුම් ගන්න ඕනෑ. බොරුවට සාම්ප්‍රදායික economics ඇතුළේ ඉඳගෙන 'අරක නැහැ, මේක නැහැ' කියලා අපට කියන්න පුළුවන්. ඇත්තටම නැති දේවලුත් මේකේ තිබෙනවා තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රධාන ධාරාවේ ආර්ථික කලාපයෙන් එළියේ සිටින නොවිධිමත් ආර්ථික කලාපය ආමන්ත්‍රණය කිරීම අය වැයක් අතුළේ සිදු වුණා නම්, ඒක වැඩියෙන්ම සිදු කළ අය වැය මෙවර අය වැයයි කියලා මම තර්ක කරනවා.

ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 27ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.25]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉදිරිපත් කළා. අද රටේ තිබෙන දේශපාලන තත්ත්වයත්, කොවිඩ් වසංගත තත්ත්වයත් පිළිබඳව අපි දන්නවා. ලෝකය පුරාම කොවිඩ් වසංගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවාය කියන එක අපි සියලුදෙනාම දන්නා කාරණාවක්. මේ කොවිඩ් වසංගත තත්ත්වය තිබියදී ලෝකයේ සමහර රටවලට පුළුවන්කම ලැබුණා, ආර්ථිකයේ වර්ධනයක් නොමැතිව වුණත් යම් කිසි ආකාරයකට තමන්ගේ ජනතාව රැක බලාගෙන ඉදිරියට යන්න. එය ලෝකයේ අනෙකුත් රටවල් ගොඩ නඟා ගත්ත දෙයක් හැටියට අපට කියන්න පුළුවන්.

ඒ වාගේම ලංකාව දිහා බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඉන්නේ ඉතාම අමාරු තැනක කියලා අපි කියන්න ඕනෑ. මොකද, අද වෙනකොට මේ රජය විසින්ම රටේ ආර්ථිකයට විශාල අර්බුද ගණනාවක් නිර්මාණය කරලා දීලා තිබෙනවා. ඒ හේතුවෙන් අද වෙනකොට මේ රටේ පහළ ආදායම් ලබන ජනතාව ඉතාම අසීරු දරිද්‍රතාවකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාව පටන් ගන්න කලින් සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. මා ළඟ තිබෙනවා ආචාර්ය බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ලියපු “2015 - ශ්‍රී ලංකා ආර්ථික අපගමනය” කියන පොත. ඒ පොතේ මෙහෙම තිබෙනවා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා සභාවෙන් පිටව

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

යනවා. මම හිතනවා එතුමා මේ කථාව අහලා ගියා නම් හොඳයි කියලා. මොකද, ඔබතුමාම ලියපු පොතක්නේ මේක, ගරු ඇමතිතුමා. එතුමා ඒ පොතේ 07 පරිච්ඡේදයේ, 89වෙනි පිටුවේ මෙහෙම කියනවා.

"උද්ධමනාත්මක පීඩනයක් - ජීවන වියදම

සාමාන්‍ය පොදු මිල මට්ටම අඛංඩව ඉහළ යාමේ තත්වයක් උද්ධමනය යනුවෙන් හැඳින්වේ. රටෙක සියළුම භාණ්ඩ හා සේවාවන්ගේ මිල ගණන් වල සාමාන්‍යය, අඛංඩව ඉහළ නගින විටෙක, මුදලේ ක්‍රම ශක්තිය (මිලදී ගැනීමේ හැකියාව) අඩුවේ. ඒ නිසා මිල උද්ධමනය ජීවන වියදම ඉහළ නැංවීමට හා ජීවන තත්ත්වය පහත වැටීමට බලපාන ප්‍රධානත සාධකය වේ. එහෙයින් ඕනෑම රජයක ප්‍රධාන ආර්ථික අරමුණක් ලෙස "මිල ස්ථායීකරණය" සැලකේ. කිසියම් ආණ්ඩුවකට මිල ස්ථායීකරණයක් ඇති කොට, එම රටෙහි මුදලේ අභ්‍යන්තර අගය හා බාහිර අගය ආරක්ෂා කළ නොහැක්කේ නම්, එවැනි ආණ්ඩුවක් පොදු ජනතාව පෙළන ආණ්ඩුවක් බවට පත්වීම වැළැක්විය නොහැක."

කවුද මෙහෙම කියන්නේ? මේ කියන්නේ ආචාර්ය බන්දුල ගුණවර්ධන ඇමතිතුමා, "2015 - ශ්‍රී ලංකාවේ ආර්ථික අපගමනය" කියලා එතුමා ලියපු පොතේ. මම කියන්නේ, එතුමා ඒ කියපු ටික තමයි දැන් මේ රටේ මේ වෙන්නේ. නේද? එතුමා කියන විධියටම මේ ආණ්ඩුව පොදු ජනතාව පෙළන ආණ්ඩුවක්. එතුමාගේ පොතේ කියලා තිබෙන නිර්දේශ, නිර්ණායක අනුවම, ආචාර්ය ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියලා තිබෙන ආණ්ඩුවක් මනින නිර්ණායක ටික බැලුවාම අපට පෙනෙනවා මේක පොදු ජනතාව පෙළන ආණ්ඩුවක් හැටියට එතුමාම හඳුන්වලා තිබෙන බව. නමුත් කනගාටුවට කරුණ තමයි, එතුමා පොත් එහෙම ලියලා අද උදේ ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඉඳගෙන ආණ්ඩුව ආරක්ෂා කරන්න කථා කිරීම. ඒක ඉතින් හරිම කනගාටුයි. එතුමා ආර්ථික විද්‍යා ගුරුවරයෙක්. මමත් අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය කරන කොට එතුමාගේ ආර්ථික විද්‍යා පන්තිවලට ගිහින් තිබෙනවා. නමුත්, එතකොට නම් එතුමා අපට මෙහෙම ආර්ථික විද්‍යාවක් ඉගැන්වූවේ නැහැ. ඒ හින්දා අපි ආර්ථික විද්‍යාව සමත් වුණා. දැන් මේ කියන ආර්ථික විද්‍යාව නම් සම්පූර්ණයෙන් අසත්‍යය. එතුමාගේ ඇමතිකම ආරක්ෂා කර ගන්න කරන ආර්ථික විද්‍යාවක් තමයි එතුමා දැන් කරන්නේ. එදා අපට උසස් පෙළ විභාගයට උගන්වන කොට නම් මෙහෙම ආර්ථික විද්‍යාවක් එතුමා ඉගැන්වූවේ නැහැ. ඒකත් මම කියන්නට ඕනෑ, එතුමාට සාධාරණයක් ඉෂ්ට කිරීම වෙනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වෙනකොට අපට පෙනෙන දේ අනුව ආණ්ඩුව විසින් නිර්මාණය කර ගත්ත ආර්ථික අර්බුදයක් මේ රටේ දැන් තිබෙන්නේ. මේක කොවිඩ්වලට බැර කරන්න ආණ්ඩුව උත්සාහ කරනවා. මේක කොවිඩ් හින්දා ඇති වුණු තත්ත්වයක් නොවෙයි. කොවිඩ් තත්ත්වයත් ආර්ථිකයේ ඉදිරි ගමනට යම් යම් විධියට බලපෑවා, ඒක අපි සියලුදෙනාම පිළිගන්නවා. නමුත්, ඊට එහා ගිය කරුණු තිබෙනවා, ආණ්ඩුවේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති හින්දා වුණු දේවල් හැටියට. ඒවා තමයි, විශේෂයෙන්ම 2019දී ජනාධිපතිවරණ ජයග්‍රහණයත් එක්කම ගෝඨාභය රාජපක්ෂ මහත්මයා එතුමාට උදවු කළ විශාල ව්‍යාපාර පැළැන්තියකට බදු සහන ලබා දුන්න ඒවා. එදා බිලියන 600ක 700ක බදු සහන ලබාදීම තුළ ආණ්ඩුවට ලැබෙන රාජ්‍ය ආදායම ආණ්ඩුව අඩු කර ගත්තා. එහෙම කළේ, ආණ්ඩුව හිතුවා තමන්ගේ හිතවතුන්ට සලකන්න ඕනෑ කියලා. ජනාධිපතිතුමා 'වියත් මග' එහෙම නැත්නම් "කියත් මග", ඒ "මග" කියන ඔක්කොම දේවල් අහපු නිසා අද මුළු රටම මහ මග නැවතිලා තිබෙන්නේ; රට යන්නේ නැහැ ඉස්සරහට. රටේ හැම තැනම උද්ඝෝෂණ. ගොවියෝ පොහොර ඉල්ලනවා, රාජ්‍ය සේවකයෝ වැටුප් වැඩිවීම් ඉල්ලනවා, සාමාන්‍ය ජනතාව කියනවා බඩු මිල අඩු කරන්න කියලා. ජීවත් වෙන්න විධියක් නැහැ. දවස ගණනේ බඩු මිල ඉතාම අසීමිත විධියට ඉහළ යනවා. ඇයි ඒ? ආණ්ඩුවට සහනාධාර ටිකවත් දී ගන්න බැහැ. එහෙම බැරි වුණේ ආණ්ඩුව ගත්ත වැරදි ආර්ථික තීන්දු-තීරණ හින්දා. අද මේ රටේ සාමාන්‍ය ජනතාව විතරක් නොවෙයි, පෞද්ගලික අංශයත් මංමුලා වෙලා ඉන්නේ. අද ඒ ගොල්ලත් අසරණවෙලා, ඒ ගොල්ලන්ටත් කර කියා ගන්න දෙයක් නැතිව ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මේ රටේ කොවිඩ් වසංගතය තවම අවසන් වෙලා නැහැ. කොවිඩ්-19 වසංගතය නිසා අපේ රටේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා. තවම ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා, දරුවන්ට online අධ්‍යාපනය කරන්න. ගුරුවරු බොහොම අමාරුවෙන් තමන්ගේ පොකට් එකේ මුදලින් data දමලා තමයි දරුවන්ට online අධ්‍යාපනය කළේ. ඇත පළාත්වල විතරක් නොවෙයි, කොළඹ නගරයේ පවා ඉන්නවා, online අධ්‍යාපනය කරගන්න බැරි, 3G mobile phone එකක් නැති ළමයි. අපි කථා කරන ඈත ගම්වල විතරක් නොවෙයි, කොළඹ නගරය ඇතුළේ ඉන්නවා ඉතා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවෝ. ඒ දරුවන්ටත් බැරි වෙලා තිබෙනවා, mobile phone එකක් නැති නිසා online අධ්‍යාපනය කරන්න. නමුත් ආණ්ඩුව ඒ වෙනුවෙන් කරපු වියදමක් නැහැ. ඒ වෙනුවෙන් පසුගිය කාලයේම ආණ්ඩුවට වැඩ පිළිවෙළක් තිබුණේත් නැහැ. එහෙම වැඩ පිළිවෙළක් නැති නිසා තමන්ට හැකියාවෙන් කරන්න පුළුවන් දේ ගුරුවරු රටේ දරුවන් වෙනුවෙන් කළා. නමුත් ආණ්ඩුව එහෙම කළේ නැහැ. ආණ්ඩුව හැම දාම ඒකත් ඇදගෙන ගිහිල්ලා අන්තිමට ගුරුවරුන්ගේ උද්ඝෝෂණ රට පුරාම මතු වුණාම, ගුරුවරුන්ට ඒ සහන ටිකවත් දී ගන්න බැරුව ඒ වෙලාවේත් online අධ්‍යාපනය වෙනුවෙන් මොකුත් කළේ නැහැ. නමුත් අපට පෙනෙනවා, ආණ්ඩුව සෞඛ්‍ය, කෘෂිකර්මය, අධ්‍යාපනය යන සියලුදේට වඩා පාලම් හදන්නයි, කාපට් දාන්නයි අය වැයෙන් සියයට 35ක් වෙන් කර තිබෙන බව. ඒක තමයි ආණ්ඩුවේ ඉන්න ගෝලබාලයන්ට හම්බ කරන්න තිබෙන තැන. පාරවල් කොච්චර කාපට් කරනවාද කිව්වොත්, කොන්ක්‍රීට් දාලා තිබෙන පාරවල්වල කොන්ක්‍රීට් එක උඩිනුත් කාපට් දානවා. ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු, මන්ත්‍රීවරු ඒ තරමට කාපට්වලට ආදරෙයි. ඊළඟට ගුවන් පාලම් ඕනෑ නැති තැන්වලටත් ගුවන් පාලම් හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොම්පඤ්ඤ වීදියේ රේල් ගේට්ටුව උඩින් යන්නත් ගුවන් පාලමක් දාලා තිබෙනවා. කොම්පඤ්ඤ වීදියේ රේල් ගේට්ටුව උඩින් යන්න ගුවන් පාලම් දාලා කොළඹ නගරයේ රථ වාහන තදබදය අඩු කරන්න බැහැ. අපරාදේ ඒ සල්ලි. එහෙම නම් ඒ ගුවන් පාලම හදන්න ඕනෑ, පිත්තල හන්දියේ colour lights ඔක්කොම පහු කරගෙන, දෙහිවල හන්දියත් පහු කරගෙන යන විධියටයි. එහෙම කළොත් තමයි වාහන තදබදය අඩු කරගන්න පුළුවන් වෙන්නේ. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ප්‍රශ්නය, උඩින් යන්න ගුවන් පාලම් හදන්න යන වියදම. ඒ හරහා ලැබෙන පංගු නිසා අවශ්‍ය නැති තැන්වලටත් ගුවන් පාලම් දමන තත්ත්වයක් තිබෙන්නේ. කෘෂි කර්මාන්තය වෙනුවෙන්, සෞඛ්‍යය වෙනුවෙන්, අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන මුදල් ආණ්ඩුව ඉතා සීමාසහිත කරලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, අපි දන්නවා අද කොවිඩ් -19 වසංගතය රට පුරා පැතිරී තිබෙන බව. ඒ සඳහා තව බෙහෙත් වර්ග අවශ්‍ය වෙනවා; යටිතල පහසුකම් අවශ්‍ය වෙනවා. ඒ සඳහා ආණ්ඩුව ඉදිරි පියවරක් අරගෙන නැහැයි කියන කාරණාව ආණ්ඩුවේ මේ ක්‍රියාමාර්ගවලින් අපට පෙනෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපට පෙනෙනවා අද වෙනකොට උද්ධමනය සියයට 11ට වඩා ඉහළ ගොස් තිබෙන බව. උද්ධමනය පාලනය කර ගන්න කිසිදු ආකාරයේ වැඩ පිළිවෙළක් නැහැ. ඒකට ආණ්ඩුව මිල

පාලනයක් ගේන්න හැදුවා. මිල පාලනය කරන්න ආණ්ඩුව මොකක්ද කළේ? හදිසි නීතිය ගෙනාවා. හදිසි නීතිය ගෙනැල්ලා කිව්වා, "දැන් ජනාධිපතිතුමාත් එක්ක සෙල්ලම් දාන්න බැහැ. හදිසි නීතියත් එක්ක සෙල්ලම් කරන්න බැහැ" කියලා. එහෙම කියලා තමිල්නාඩුවේ ද්‍රවිඩ චිත්‍රපට බලනවා වාගේ අපට සති කිහිපයක් පෙන්නුවා, ඒක ඒක දේවල්. ඒ දෙමළ filmsවල වාගේ, හමුදාවත් එක්ක ගිහිල්ලා, වට කරලා, අහිංසක මිනිසුන්ගේ ගබඩාවල තිබෙන හාල් ටික අරගෙන යන හැටි පෙන්නුවා. නමුත් ලොකු හාල් මෝල්කරුවන්ගේ ගබඩා වට කළේ නැහැ. අපි දන්නවා නේ, ඒ ලොකු හාල් මෝල්කරුවන් ඔක්කොම ආණ්ඩුවේ ඉන්නේ. හිටපු ජනාධිපතිතුමාගේ සහෝදරයා ඉන්නවා. ඊළඟට තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙකු හෝ රාජ්‍ය ඇමතිවරයෙකු ඉන්නවා. එතුමා විශාල ලෙස හාල් නිෂ්පාදනය කරන, ගබඩා තියෙන කෙනෙක්. ඊළඟට හාල් ව්‍යාපාර කරන තමුන්නාන්සේලාගේ සංවිධායකවරයෙක් ඉන්නවා. ඒ අයගේ හාල් මෝල්වලට කඩා පැන්නේ නැහැ; ඒ පැත්ත පළාතේවත් ගියේ නැහැ. අහිංසක සාමාන්‍ය ජනතාවගේ ගෙවල්වලට කඩා පැනලා, ඒ වී ටික අරගෙන ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනුරාධපුරය පැත්තේ සමහර අයට තවම සල්ලි ගෙවලාත් නැහැ කියලා මට පැමිණිලි ඇවිල්ලා තිබෙනවා. ඔවුන් සුළු ව්‍යාපාරිකයෝ. ඔවුන්ගෙන් වී අරගෙන ගිහිල්ලා ඒවාට තවම මුදල් ගෙවලාත් නැහැ. හමුදාව අරගෙන ගිහිල්ලා එහෙම පොඩි දර්ශනයක් අපිට පෙන්නුවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ජනරාල්වරයෙකු පත්කරලා, මේ කටයුත්ත කරන්න පුළුවන් කිව්වා. ඊළඟට, මිල පාලනය සඳහා ගැසට් නිවේදන 10ක්, 12ක් විතර නිකුත් කළා. හාල්වලට ගැසට් නිවේදනයක් නිකුත් කළා; සීනිවලට ගැසට් නිවේදන නිකුත් කළා; පරිප්පුවලට ගැසට් නිවේදන නිකුත් කළා; සැමන්වලට ගැසට් නිවේදන නිකුත් කළා. ගැසට් නිවේදන නිකුත් කළේ නැත්තේ මොනවාටද? හැම එකටම ගැසට් නිවේදන නිකුත් කළා. ගැසට් නිවේදන නිකුත් කරලා මොකක්ද කළේ? අන්තිමට මාෆියාවට මුහුණ දී ගන්න බැරිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත පාර්ලිමේන්තුවේදී වෙනස් කළා.

ඒ පනත වෙනස් කරලා, ලක්ෂ දෙකේ දඩය ලක්ෂ පහ කළා. යම් භාණ්ඩයක නියමිත මිලට වඩා රුපියලක් හෝ වැඩියෙන් එම භාණ්ඩය විකුණුවොත් ලක්ෂ පහක් දඩ ගෙවන්න ඕනෑය, නැත්නම් හිරේ දමනවාය කියා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමතිවරයා කිව්වා. එහෙම කිව්වාම අපිත් ඒ සංශෝධනයට ඡන්දය දුන්නා. හැබැයි දැන් පාරිභෝගික ආරක්ෂණ පනතත් නැහැ. අන්තිමේදී ජනාධිපතිතුමා මොකක්ද කළේ? ජනාධිපතිතුමා සියලු ම භාණ්ඩ මිල පාලනයෙන් නිදහස් කළා. දැන් හාල් ඕනෑ ගණනකට විකුණන්න පුළුවන්; සීනි ඕනෑ ගණනකට විකුණන්න පුළුවන්. මම දන්නා විධියට තවම මිල පාලනය තිබෙන්නේ Antigen Test එක සහ PCR Test එක සම්බන්ධයෙන් විතරයි. ඒ දෙකේත් මිල පාලනය කොයි වේලාවේ නැති වෙයිද දන්නේ නැහැ. මොකද, ඔය බිස්නස් එකේ ඉන්නේත් ජනාධිපතිතුමාගේ යාළුවෝ ටික. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකේ සභාපති වෙලා ඉන්නා එක්කෙනා ඇතුළු ඒ ඔක්කෝම මේ ව්‍යාපාරයේ ඉන්නා උදවිය. කොයි වේලාවේ ඒ මිල පාලනයත් අයින් කර දමාවිද දන්නේ නැහැ. ඒ ආකාරයට අද වෙනකොට සෑම භාණ්ඩයකම මිල පාලනය අයින් කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ ආණ්ඩුව කාලයේ අපි හාල්මැස්සන් විකිණීමේදීත් මිල පාලනයක් දැම්මා. මොකද, අහිංසක, දුප්පත් මිනිස්සු කන්නේ ඒවා. හාල්මැස්සන් සඳහා තිබුණු මිල පාලනයත් තමුන්නාන්සේලා අයින් කළා. ඒ ආකාරයට අද වෙනකොට රටේ ඉන්නා කළු කඩකාරයන්ට, ව්‍යාපාරිකයන්ට ඕනෑ විධියට වෙළෙඳ පොළ හසුරුවන්න අවශ්‍ය පරිසරය තමුන්නාන්සේලා නිර්මාණය කර තිබෙනවා.

බලන්න, අද රුපියල් 120ට හාල් නැහැ. සීනි රුපියල් 150ටවත් නැහැ. පරිප්පු රුපියල් 200ටත් වඩා ඉහළ ගිහිල්ලා. කිරිපිටි පැකට් එකක් රුපියල් 480යි. ගෑස් සිලින්ඩරය රුපියල් 2,600යි. අද වෙනකොට හැම භාණ්ඩයකම මිල සියයට 100කින් වැඩි වෙලා තිබෙනවා. පොඩි දරුවාට කන්න දෙන බිස්කට් පැකට් එකේ මිලත් අද රුපියල් 30කින්, 40කින් වැඩි වෙලා තිබෙනවා.

රටේ ජනතාව අද ඉතාම අමාරු තත්ත්වයක් යටතේ ජීවත් වෙන්නේ. එහෙම අමාරු කාලයක තමයි තමුන්නාන්සේලා මේ අය වැය ඉදිරිපත් කළේ. ජනතාව මේ අය වැයෙන් සහන බලාපොරොත්තු වුණා. මොකද, ඒ අය අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒ නිසා සහන ටිකක්වත් දෙයි කියා ජනතාව බලාපොරොත්තු වුණා. මොකද, තමුන්නාන්සේලා ඒ ජනතාවගේ ඔළුවල සහන මැව්වා. පසුගිය කාලයේ මොකක්ද, කිව්වේ? ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මොළ හතක් තිබෙනවාය කිව්වා; එතුමාගේ ඇඟ පුරාම මොළය තිබෙනවා කිව්වා. එහෙම කිව්වාට, එතුමාම කිව්වා, "දෙන්න දෙයක් නැහැ. ජනතාවගෙන් තමයි අපි ගන්න ඕනෑ. ඒ නිසා අපිට දැන් දෙන්න විධියක් නැහැ" කියලා. මුදල් ඇමතිතුමා එහෙම කිව්වා.

අපි දන්නවා, කොරෝනා වසංගතය නිසා සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන්ගේ විතරක් නොවෙයි, සුළු කර්මාන්තකරුවන්, ඒ වාගේම ස්වයං රැකියා කරන ඒ සියලු අයගේ ආදායම් මාර්ග අද වෙනකොට අහිමි වෙලා තිබෙන බව. ලක්ෂ හතරකට වැඩි පිරිසකගේ රැකී රක්ෂා නැති වෙලා තිබෙනවා. ඒ ජනතාව වෙනුවෙන් සහනයක් ලබා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ අය වැය තුළින්වත් ඉදිරිපත් කර නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ තුළින්ම අපට පෙනෙනවා නේ, මේ ආණ්ඩුව කොයි තරම් ජනතාවට සංවේදීද කියලා. මේ ආණ්ඩුව තුළ ජනතාව කෙරෙහි එහෙම සංවේදීතාවක් නැහැ. මේ ආණ්ඩුව, ජනතාවගේ ගැටලු ගැන හිතන්න පුළුවන්, එහෙම දැනෙන, සංවේදීතාවකින් යුතු ආණ්ඩුවක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟ කාරණය තමයි විදේශ ආයෝජන. විදේශ ආයෝජන ගේන්වන්න පුළුවන් වැඩ පිළිවෙළක් මෙම අය වැය තුළ නැහැ. එහෙම විදේශ ආයෝජන ගෙනෙන්න පුළුවන් රටාවක්, යෝජනාවක්, යටිතල පහසුකම් ගැන කථා කිරීමක් මේකේ නැහැ. 2020දී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා Port City එකේ පළමුවැනි ආයෝජන ගිවිසුම LOLC එකත් එක්ක අත්සන් කළා. එසේ සිදු කර අද වනවිට අවුරුද්දක් ගත වී තිබෙනවා. නමුත් තවම Port City එකේ එම වැඩ කටයුතු පටන් ගෙන නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඔක්කෝම දේවල් නැවතිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා, මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න වැඩ කළ උදවිය ගැන. ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණ වේදිකාවලදී system change එකක් ගැන කථා කළා; මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑය කිව්වා. එතුමා කිව්වා, "මම නිර්පාක්ෂික අපේක්ෂකයෙක්; කාටවත් අයිති නැති කෙනෙක්" කියලා. ඒ නිසා හුඟාක් අය හිතුවා, විශේෂයෙන්ම රටේ මැද පන්තිය කල්පනා කළා, මෙතුමා බලයට ඇවිල්ලා රට තුළ විශාල වෙනසක් නිර්මාණය කරාවි කියලා. එහෙම විශ්වාසයක් ඒ ජනතාව අතර ගොඩනගන්න එතුමන්ලාට එදා හැකියාවක් ලැබුණා. නමුත් ලක්ෂ 69ක් එතුමාට ඡන්දය දීලා අද වෙනකොට අවුරුදු දෙකකට ආසන්න කාලයකට ළඟා වී තිබෙන මේ මොහොතේ අපි ආපසු හැරිලා බැලුවොත් පෙනෙනවා, ශේෂ පත්‍රය බින්දුවයි කියලා. ඒ කියන්නේ, ශේෂ පත්‍රයේ කිසි දෙයක් නැහැ. එතුමාගේ අවුරුදු දෙකක කාලය තුළ ශේෂ පත්‍රය අරගෙන බැලුවොත් ශේෂ පත්‍රයේ ලාභ නැහැ, ඔක්කොම තිබෙන්නේ අලාභ. කිසිදු ආකාරයකින් එහි වර්ධනයක් පෙන්වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේවා අපි නොවෙයි කියන්නේ. මේ දේවල් අපි කියනවාට වඩා ආණ්ඩුවේම උදවිය

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කියනවා. ගරු විමල් වීරවංශ ඇමතිතුමා මොකක්ද කියන්නේ? එතුමාගේ වචනවලින්ම කිව්වොත්, එතුමා කියනවා, "මේක තක්කඩි ආණ්ඩුවක්" කියලා. ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා මොකක්ද කිව්වේ? එතුමා කියනවා, "ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව, ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුව, රනිල් වික්‍රමසිංහ මහත්මයා හිටපු ආණ්ඩුව කියන ඒ සියලු ආණ්ඩුවලට වඩා දූෂිත ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුව" කියලා. මෙහෙම කියන්නේ අපි නොවෙයි. විපක්ෂයේ ඉන්න අපි කියනවාට වඩා ඉස්සරහට ගිහින් එතුමන්ලා ඒ දේවල් කියනවා. "මේක හොර ආණ්ඩුවක්, තක්කඩි ආණ්ඩුවක්, දූෂිත ආණ්ඩුවක්" කියන්නේ අපි නොවෙයි.

ඊළඟට, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හිටපු විධායක අධ්‍යක්ෂතුමා මොකක්ද කිව්වේ? එතුමා සුදු ලූනු වංචාව ගැන කථා කළා. සතොසේ බඩු අනියම් ආකාරයෙන් පෞද්ගලික වෙළෙඳ පොළට ගිහිල්ලා, නැවත සතොස මිලදී ගැනීම් කරනවා කියන වංචාවක් ගැන එතුමා හෙළිදරව් කළා. එම නිසා එතුමාට ඒ ආයතනයෙන් යන්න සිදු වුණා. අන්තිමට එතුමාගේ ජීවිතයට තර්ජනයක් තිබෙනවා කියා එතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් දැම්මා. තවම ඒ ගැන විභාගයක් පවත්වා නැහැ. එතුමා පත් කළේ කවුද? ජනාධිපතිතුමා. එතුමාම කියනවා, ජනාධිපතිතුමා තමයි මට ආරාධනා කළේ කියලා. නමුත්, එතුමා දමපු පැමිණිල්ල අනුවවත් මේ වංචාව ගැන හොයන්නේ නැහැ.

අපට ඊයේ-පෙරේදා ආරංචි වුණා වරායෙන් සතොසට ආපු තවත් සුදු ලූනු කන්ටේනර් 81ක් පෞද්ගලික වෙළෙඳ පොළේ ඉන්න කඩකාරයන්ට නැවත වතාවක් ගිහිල්ලා තිබෙනවා කියලා. එහෙම නම්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හිටපු විධායක අධ්‍යක්ෂතුමා කිව්ව දේ ඇත්තයි කියන කාරණය අපට දැන් තහවුරු වීගෙන යනවා. නමුත් එතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ඉන්න කවුරුවත් උත්තර දෙන්න යන්නේ නැති බව අපිට පෙනෙනවා. එතුමා දමපු පැමිණිල්ල සම්බන්ධයෙන්වත් විභාගයක් පවත්වන්නේ නැහැ. ආණ්ඩුවේ ඉන්න උදවිය තමයි මේවා කියන්නේ.

ඊළඟට, ලිට්රෝ ගෑස් සමාගමේ සභාපතිතුමා ඊයේ-පෙරේදා මොකක්ද කිව්වේ? එතුමා පත් කළේත් ජනාධිපතිතුමා. එතුමා කියනවා, රුපියල් කෝටි දාහක වංචාවක් සිදුවෙලා තිබෙනවා කියාලා. කවුද, මෙහෙම කියන්නේ? ලිට්රෝ ගෑස් සමාගමේ අලුත් සභාපතිතුමා. කවුද, ඒ වංචාව කළේ? කලින් හිටපු සභාපතිතුමා. කලින් හිටපු සභාපතිතුමා පත් කළේ කවුද? කලින් හිටපු සභාපතිතුමා පත් කළේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා. ඔහු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ හිතවතෙක්. එතුමාට චෝදනාවක් ආපු නිසා එතුමා ඉවත් කළා. අලුත් සභාපතිතුමා පත් කළා, ජනාධිපතිතුමා විසින්. එතුමා පුවත් පත් සාකච්ඡාවකට ඇවිල්ලා කිව්වා, "මට ජනාධිපතිතුමා නම් ගම් එක්ක ඔක්කොම කියන්න කිව්වා" කියලා. රුපියල් කෝටි දාහක වංචාවක් සිදුවෙලා තිබෙනවා කිව්වා. ඒ වාගේම "ගෑස් පමා වුණේ වෙන දෙයක් නිසා නොවෙයි, මේ වංචාව නිසායි " කියලාත් ලිට්රෝ ගෑස් සමාගමේ සභාපතිතුමා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේවා මේ රටේ ජනතාවගේ මුදල්.

ඊළඟට, රුපියල් කෝටි 1,500ක -රුපියල් මිලියන 15,000ක- සීනි බදු වංචාව සිදු වුණාම මුදල් අමාත්‍යාංශය පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කර පිළිගත්තා, ආණ්ඩුවට ලැබෙන්න ඕනෑ රුපියල් කෝටි 1,500ක මුදලක් අහිමි වුණා කියලා. මේවා අපි කියන දේවල් නොවෙයි. *[බාධා කිරීමක්]*

මහ බැංකු බැඳුම්කර සිද්ධියට අදාළ අයට එරෙහිව නඩු දමලා ඒ අය හිරේ දමනවා කිව්වා. දැන් ඒ කටයුත්ත කරගෙන යන්න. මේවා මේ අපි කියන දේවල් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ ආණ්ඩුවේ ඉන්න සභාපතිවරු, ඇමතිවරු වාගේම මේ ආණ්ඩුවේ ඉන්න අනෙකුත් කොටස් තමයි මෙහෙම කියන්නේ.

කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ඊයේ-පෙරේදා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "ආණ්ඩුව ෆේල්" කියලා. "කොහේද යන්නේ" ඇහුවාම, "මල්ලේ පොල්" කියනවා වාගෙයි කිව්වා. ඇමති මණ්ඩලයම අසාර්ථකයි කිව්වා. ප්‍රතිපත්තියක් නැහැයි කිව්වා. මම නොවෙයි කිව්වේ. අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා. එතුමා ප්‍රසිද්ධ රූපවාහිනී වැඩසටහනකදී ප්‍රකාශ කළේ. එතුමා කියනවා, කැබිනට් මණ්ඩලයම අසාර්ථකයි කියලා. කොහේද යන්නේ කියාවත් දන්නේ නැහැයි කියනවා. මෙහෙම ගියොත් මේ රට විනාශ මුඛයට යනවාය කියාත් එතුමා කිව්වා. *[බාධා කිරීමක්]* ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, මම දන්නේ නැහැ, එතුමා එක්ක ඔබතුමාට තිබෙන "ඇරියර්ස්" එක මොකක්ද කියලා. එතුමාගේ සහ ඔබතුමාගේ "ඇරියර්ස්" ගැන අපි දන්නේ නැහැ. අපි කියන්නේ එතුමා මේ ආණ්ඩුව ගැන කියන දේවල්. ඩිව් ගුණසේකර මැතිතුමා මොකක්ද කියන්නේ? *[බාධා කිරීමක්]* කොමියුනිස්ට් පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා සභාවෙන් යන්න ගියා. *[බාධා කිරීමක්]* මට අහ ගන්න දෙයක් නැහැ. මම කියන්නේ එතුමා කියපු දෙය ගැනයි. *[බාධා කිරීමක්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු ඇමතිතුමා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම එතුමා ගැන මොනවත් කිව්වේ නැහැ. මම නිශ්ශබ්දවයි හිටියේ. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ නම කිව්ව නිසායි මේ පිළිතුරක් දෙන්නේ. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා එක්ක මගේ පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. එතුමා මගේ හොඳ මිත්‍රයෙක්. එතුමා හොඳ නම්, ඔබතුමා එතුමා වෙනුවෙන් පෙනී සිටිනවා නම් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තිබෙන කාලයක එතුමාට ඇමතිකමක් දෙන්න. කලින් ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු අය නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුවේ ඉන්න උදවියයි මේවා කියන්නේ. කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්තුමා වන ඩිව් ගුණසේකර මැතිතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා "රට විනාශයි" කියලා. නමුත් අද එතුමාගේ ගෝලයා -මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා- ඇවිල්ලා ආණ්ඩුවේ අය වැයට පක්ෂව කථා කළා. එතුමාගේ පක්ෂයේ ලේකම්තුමා කියනවා, "රට විනාශයි, කැබිනට් එකේ ඉන්න අය මෙලෝ දෙයක් දන්නේ නැහැ" කියලා. එහෙම තමයි කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ විවේචනයට වඩා, අපි මේ හෙළිදරව් කරනවාට වඩා වැඩියෙන් ආණ්ඩුවේ තිබෙන වංචා, දූෂණ ප්‍රමාණයක් ගැන ආණ්ඩුවේ ඉන්න උදවියම හෙළිදරව් කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක තමයි මේකේ තිබෙන දෙදරීම. යුගදනවි බලාගාරය ගැන අද අපි කථා කරනවා. යුගදනවි බලාගාරයට අදාළ ගිවිසුම ගැන ගරු විමල් වීරවංශ ඇමතිතුමා කියනවා. "බොරු කියන්න එපා, කැබිනට් එකට ඒ ගිවිසුම ඉදිරිපත් කළේ නැහැ" කියලා එතුමා කිව්වා. අපි නොවෙයි මේවා කියන්නේ. එතුමා අසත්‍ය කියනවා නම් එතුමාට විරුද්ධව ක්‍රියා මාර්ගයක් ගෙන කැබිනට් මණ්ඩලයෙන් අයින් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලිට්රෝ ගෑස් සමාගමේ සභාපතිතුමා කියනවා හිටපු සභාපතිතුමා කෝටි 1,000ක වංචාවක් සිද්ධ කර තිබෙනවා කියලා. හිටපු සභාපතිතුමාව පත් කළේ බැසිල් රාජපක්ෂ මැතිතුමායි. එහෙම නම් ඒ ඇමතිවරයාගේ අනුදැනුම ඇතිව ද මේ ගිවිසුම් ගැහුවේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒක ගැන කථා කරන කොට මිනිස්සු කියනවා, බැසිල් රාජපක්ෂ මැතිතුමාට මුදල් ඇමතිකම භාර දුන්නු එක "වක්කඩේ හකුරු හැංගුවා වාගේ" කියලා. එහෙම තමයි දැන් කථාව තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අපි නොවෙයි මේවා කියන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ කථා ටික අහලා අපේ නිගමනය තමයි කියන්නේ. අපිට හිතෙන දේ කියන්නේ. ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්න උදවිය තමයි මේ වංචා, දූෂණ ගැන කියන්නේ. ඒ කියන දේවල් අපි කියන දේවල් එක්ක යම්කිසි ආකාරයකට සැසඳෙනවා. ගණන් හිලව් තමයි අඩු වැඩි වෙලා තිබෙන්නේ. අපි ටිකක් අඩුවෙන් කියනවා. ඔබතුමන්ලාගේ පැත්තේ උදවිය හරි ගණන දන්නවා. අපි දන්නේ ගණන ටිකක් අඩුවෙන්. මොකද, අපිට එන news එකේදී ගණන පොඩ්ඩක් අඩුවෙන් තමයි එන්නේ. ඔබතුමන්ලාගේ පැත්තේ උදවිය දන්නවා අරයා කීයක් ගන්නවාද, මෙයා කීයක් ගන්නවාද කියලා. ඔබතුමන්ලාගේ පැත්තේ ඇමතිවරු ටික, සභාපතිවරු ටික අමාත්‍යාංශවල ඉන්න උදවිය ඔක්කෝම දේවල් දන්නවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* තව තිබෙනවා. ඉවර වුණේ නැහැ. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ ආණ්ඩුවේ ඉන්න උදවියගේ තිබෙන චෝදනා තුළම අපට පේනවා මේ රටේ යථාර්ථය ගැන. *[බාධා කිරීම්]* ඒක තමයි අය වැයක් ඉදිරිපත් කරන්න නොහැකි වෙලා තිබෙන්නේ. වංචාව තිබෙන්නේ. සීනි බදු වංචාවෙන් කෝටි 1,500යි. ලිට්රෝ ගෑස් සමාගමේ වංචාව කෝටි 1,000යි. පොහොර ගෙන්වනවාය කියලා මහජන බැංකුවේ කෝටි 200ක් වංචා කළා. ඉතින් කොහොමද අය වැයක් හදන්නේ? අය වැය හදන්න නොවෙයි, ඔක්කෝම සල්ලි එක එක්කෙනාගේ සාක්කුවේ. ඉතින් කොහොමද ජනතාවට සහන දෙන්නේ? ජනතාවට සහන වශයෙන් දෙන මුදල් ටික තමයි හොරා කාලා තිබෙන්නේ. ඒක තමයි යථාර්ථය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එම නිසා තමයි ජනතාවාදී අය වැයක්වත් මෙතුමන්ලාට ඉදිරිපත් කරගන්න බැරිවුණේ. මේ ඉදිරිපත් කර තිබෙන්නේ ජනතාවාදී අය වැයක්ද? ජනතාවාදී අය වැයක් නෙවෙයි, ජාවාරම්කරුවන්ට හැදෙන්න පුළුවන් අය වැයක් තමයි මේ ගෙනැවිත් තිබෙන්නේ.

ඊළඟට, ඩොලර් ප්‍රශ්නය ගැන බලන්න. මහ බැංකුව ඩොලර් එක සම්බන්ධයෙන් මිල පාලනයක් කර තිබෙනවා අපි දැක්කා. ඩොලර් එක රුපියල් 203ක් ලෙස මිල පාලනයක් දමා තිබෙනවා. අපි දන්නවා එළියේ ඩොලර් එක විකිණෙන්නේ රුපියල් 235ට කියලා. සමහර තැන්වල රුපියල් 240ටත් ඩොලර් එක විකිණෙනවා. නමුත් අපි දන්න විධියට මහ බැංකුව, සියලුම බැංකුවලට නියෝග කර තිබෙනවා රුපියල් 203න් එහාට යන්න එපා කියලා. මොකක්ද මේකෙන් මේ ආර්ථිකයට වෙලා තිබෙන අලාභය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වෙනකාට ආනයනකරුවන් තමන්ගේ ගනුදෙනුකරුවන්ට මුදල් ගෙවා ගන්න බැරිව ඉතා අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. සමහර ආනයනකරුවන් ඉන්නවා අවුරුදු එකහමාරක සිට තමන්ගේ ගනුදෙනුකරුවන්ට මුදල් ටික ගෙවා ගන්න බැරිව. මොකද, බැංකුවල ඩොලර් නැහැ. එය එක් ප්‍රශ්නයක්. ඊළඟට, අපනයනකරුවන් සම්බන්ධයෙන් බලන්න. ඔවුන් ඩොලර් ටික ලංකාවට ගෙනෙන්නේ නැහැ. ඇයි ඒ? ලංකාවට ගෙනාවාම ඩොලර් එකට රුපියල් 202යි, 203යි හම්බ වෙන්නේ. එම නිසා ඔවුන් ඩොලර් ගෙනෙන්නේ නැතිව ඒ ඩොලර් ටික යවනවා ඩුබායිවලට, සිංගප්පූරුවට. ඇයි ඒ? ලංකාවේ වර්තමාන වෙළෙඳ පොළේ තිබෙන පාලන මිල හින්දා තමන්ට ලැබෙන්න ඕනෑ ඇත්ත අගය ලැබෙන්නේ නැති හින්දා අපනයනකරුවෝ ඩොලර් ටික ගෙනෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒක තමයි යථාර්ථය. මෙන්න, මේ වාගේ වැරදි ආර්ථික තීන්දු උඩ මේ රටම අද එක තැන නැවතී තිබෙනවා. ඒ බව අපි මතක් කරන්න ඕනෑ, මේ ආණ්ඩුවට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපිට පිටුපසින් හිටපු බංග්ලාදේශය, වියට්නාමය වාගේ රටවල් අද අපිව පසු කරගෙන ගිහින් තිබෙනවා. අද අපි කොයි තරම් අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවාද? බංග්ලාදේශය වාගේ රටවලිනුත් ණය ගන්නා තත්ත්වයට අද මේ රට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ඉතිහාසයේ අවුරුදු දෙකක් වාගේ කෙටි කාලයක් තුළ මෙසේ අපකීර්තියට පත් වෙච්ච ආණ්ඩුවක් කවදාවත් තිබුණේ නැහැ. මේ ආණ්ඩුවට විරුද්ධව හැම ප්‍රදේශයකම ගොවි ජනතාව, ගුරුවරු, සාමාන්‍ය ජනතාව -සෑම ක්ෂේත්‍රයකම අය- අද පාරට ඇවිත් තිබෙනවා. ඒ, වෙන මොකවත් හින්දා නොවෙයි, තමන්ගේ ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කරගන්නයි. ඒ හින්දා මේ අය වැයත් එක්ක ඉදිරි කාලයේදී ඒ සටන තියුණු වෙනවා කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam to the Chair?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

Madam, I propose that the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *left the Chair, and* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *took the Chair.*

[අ.භා. 3.53]

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවන් අසීරු අවස්ථාවක ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අය වැය ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මුලින්ම මම කියන්න ඕනෑ, මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා ඉතාම ආවේගශීලීව, හැඟුම්බරව, විශාල අභූත චෝදනා ගොඩක් එල්ල කළ බව. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අයවැය කථාවේ සඳහන් වුණා, පසුගිය ආණ්ඩුව කාලයේ කොල්ල කාපු රුපියල් බිලියන 8.5ක මුදල මහා භාණ්ඩාගාරය වෙත මාරු කිරීමට යෝජනා කරනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, මට හිතෙන විධියට, ඔබතුමාටත් ඒකෙන් කොටසක් ලැබුණාද දන්නේ නැහැ. ඒක ආපසු දෙන්න වෙයි කියන හිතේ වේදනාවෙන් වෙන්න ඇති ඔබතුමා ඒ විධියට කථා කරන්න ඇත්තේ. ඒ වාගේම, ඔබතුමා චෝදනා කරන්න කලින් තමන් දිහාට හැරිලා බලන්න, තමන් පසුගිය කාලයේ මොකක්ද කළේ කියලා.

අපි මේ ආණ්ඩුව භාර ගන්න කොට අතිගරු ජනාධිපතිතුමාට තිබුණු ප්‍රධානම අභියෝගය තමයි, මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන එක. අපි ආණ්ඩුව භාර ගෙන මාස 6ක් යනකොට එතුමා මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කළා. *[බාධා කිරීමක්]* ඔය කෑ ගහන අය එදා කැගැහුවේ නැහැ නේ. *[බාධා කිරීමක්]* අද ත්‍රස්තවාදියෝ කෑ ගහන්නේ නැහැ. *[බාධා කිරීමක්]* අද අන්තවාදියෝ කෑ ගහන්නේ නැහැ. අන්තවාදියෝ අද පැනලා යනවා.

අපි ආණ්ඩුව අරගෙන කළ පළමුවැනිම කාර්යය තමයි, මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම. මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරලා, කුඩු, පාතාලය මර්දනය කරලා, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරමින් ඉන්න කොට තමයි මේ රටට කොවිඩ් වසංගතය පැමිණියේ. අද අපි කොවිඩ් වසංගතය මර්දනය කරන අභියෝගය ජය ගන්නා ගමන්, එක පැත්තකින් එන්නත්කරණය ඉතාම සාර්ථකව සිදු කරනවා. ලෝකයේ එන්නත්කරණය ඉතාම සාර්ථකව සිදු කරන රටවල් කිහිපය අතරට අද ලංකාවත් එකතු වෙලා තිබෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාටත්, සෞඛ්‍ය අංශ සහ ආරක්ෂක අංශවලටත් එහි ගෞරවය හිමි විය යුතුයි.

මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. පසුගිය කාලයේ කොවිඩ් වසංගතය මර්දනය කරගෙන යන කොට, ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය කටයුතු කරන කොට විපක්ෂය ඉතාම අවස්ථාවාදී ලෙස ආණ්ඩුවේ කකුලෙන් ඇද්දා. එතුමන්ලා විවිධාකාරයෙන් අකුල් හෙළුවා, විවිධාකාරයේ වර්ජන කළා. කොවිඩ් වසංගතය යන්තම් අඩු වීගෙන යන කොට ආපසු සැරයක් අලුත් රැලි නිර්මාණය කළා.

පසු ගිය කාලයේ මගේ ගමේ -මාතලේ ප්‍රදේශයේ- මෙතුමන්ලා ගොවි උද්ඝෝෂණයක් සංවිධානය කළා. පොළොන්නරුවෙන්, අනුරාධපුරයෙන් බස් පුරවලා සෙනඟ ගෙනැල්ලා තමයි ඒ උද්ඝෝෂණය කළේ. ඒ වෙලාවේ මගේ ගමේ ගොවියෝ කුඹුරු කොටනවා; හානවා; ලියදි රකිනවා. ඒ අය උද්ඝෝෂණය කරන්න පිටින් බස් පුරවලා මිනිස්සු ගෙනැල්ලා. මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතැනට ගිහින් ඇහුවා, “ඔබතුමන්ලා කොහෙන්ද ආවේ?” කියලා. ඒ ගොල්ලන්ට කට උත්තර නැහැ. මොකද, මම මගේ ප්‍රදේශයේ මිනිසුන් හඳුනනවා. අන්න එහෙම තමයි, මෙතුමන්ලා උද්ඝෝෂණ කරලා මෙමෙ වසංගතය පතුරවන්න අවශ්‍ය කටයුතු පසු ගිය කාලයේ කළේ.

අපි මතක තබා ගන්න ඕනෑ, පසුගිය මාස 12න් -අදින් පටන් ගෙන මාස 12ක් ආපස්සට බැලුවොත්- අඩුම ගණනේ මාස 8ක්වත් අප මේ රටේ සංචරණ සීමාවලට, එහෙම නැත්නම් කොවිඩ් ඇඳිරි නීතියට යටත් වෙලා හිටපු බව. එහෙමත් නැත්නම්, මෙම වසංගතය හේතුවෙන් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගන්න බැරිව, එදිනෙදා ක්‍රියාකාරකම් කරගන්න බැරිව අපි රට වසා තැබුවා. එවැනි පසු බිමක වුවත්, පසු ගිය අය වැයෙන් ජනතාවට පොරොන්දු වුණු සංවර්ධන කටයුතු අපි ඒ විධියටම ක්‍රියාත්මක කළා. විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ සංවර්ධන කමිටුවේ සභාපතිවරයා විධියට මම කියනවා, මුළු මාතලේ දිස්ත්‍රික්කයේම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා රුපියල් මිලියන 975ක සංවර්ධන වැඩ කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර තිබෙන බව. ඒ වාගේම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කරන්න පසු ගිය වසර ඇතුළත රුපියල් මිලියන 778ක් අපි මේ වනවිට වැය කර තිබෙනවා.

ඒ වාගේම, අපේ ආණ්ඩුව ලංකාවට "පුරවර විශ්වවිද්‍යාල" සංකල්පය ගෙනැල්ලා, මාතලේ දිස්ත්‍රික්කයේ පුරවර විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ නායකත්වය යටතේ මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන හරහා පසු ගිය වසර තුළ මාතලේ දිස්ත්‍රික්කය තුළ විතරක් මාර්ග කිලෝමීටර් 300කට ආසන්න ප්‍රමාණයක් කාපට් කරලා තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, අපි මුළු රටේම මාර්ග සංවර්ධන කටයුතු කරගෙන යනවා. ඒ වාගේම ගලේවෙල - මාතලේ ප්‍රධාන මාර්ගය හදන්නත් පටන් ගත්තා. විශේෂයෙන්ම මෙම මාර්ගය සංවර්ධනය කිරීම තුළින් ගලේවෙල සහ පල්ලෙපොළ නගර ආශ්‍රිතව විශාල ආර්ථික ප්‍රබෝධයක් ඇති වෙනවා. එම ආර්ථික ප්‍රබෝධය නිසා අපේ රටේ ආර්ථික මර්මස්ථාන සියල්ල වෙනස් වෙමින් මාතලේ ගලේවෙල, පල්ලෙපොළ කේන්ද්‍ර කර ගනිමින් ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැඟෙන්නට නියමිතයි. ඊත් එක්කම, අපට පුළුවන් වුණා, පසුගිය අවුරුද්ද තුළ මාතලේ මහ රෝහල ජාතික රෝහලක් බවට පත් කරන්න. ඒ වාගේම පසුගිය වසර තුළ මාතලේ දිස්ත්‍රික්කයේ ජාතික පාසල් 27ක් ආරම්භ කළා. ඊත් එක්කම, අලුතින් පොලිස් ස්ථාන 5ක් ඉදිකිරීමටත් අපට හැකියාව ලැබුණා.

මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාගේ "ගම සමඟ පිළිසඳර" වැඩසටහන ගැන. එම වැඩසටහන මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වුණා. අද මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන විශාලම සංවර්ධන ව්‍යාපෘතියක් තමයි "වත්තේගෙදර වැව" ව්‍යාපෘතිය. ඒ වාගේම හිඹිලියාකඩ ප්‍රදේශය ආශ්‍රිතව විශාල සංවර්ධන වැඩසටහන් රැසක් මේ වනවිට ක්‍රියාත්මක වෙනවා. මේ සියලු සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්නේ විපක්ෂය කකුලෙන් අදින තත්ත්වයක් හමුවෙයි. ලෝක කොවිඩ් වසංගතයට මුහුණ දෙමින් එම වසංගතයට එරෙහිව එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක වෙමින් තිබෙන අවස්ථාවක තමයි මේ සා විශාල සංවර්ධනයක් අප ක්‍රියාත්මක කරන්නේ. ඊත් එක්කම "විසල් මාතලේ" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා මාතලේ දිස්ත්‍රික්කයේ තුනෙන් එකක ජනතාවට ජලය ලබා දෙන්න අපට පසුගිය මාසයේ දී හැකි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සියක් නගර" ව්‍යාපෘතිය මුළු ලංකාවේම නගර 100ක් තෝරා ගෙන කරනු ලබන ව්‍යාපෘතියක්. මෙම වසර තුළ නගර සංවර්ධන කිරීමේ වැඩ සටහන යටතේ මේ දෙසැම්බර් 31 වන දා වනවිට මාතලේ දිස්ත්‍රික්කයේ නගර 6ක් සංවර්ධනය කර අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සියල්ල සූදානම් කර තිබෙනවා. මම මෙම අවස්ථාවේ දී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ වැඩසටහනක් විධියට ක්‍රියාත්මක "ගමට ගෙයක්-රටට හෙටක්" ග්‍රාමීය නිවාස වැඩසටහන ගැන. ඒ වැඩසටහන හරහා මේ වෙද්දි මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය නිවාස දහස් ගණනක් ඉදිකර අවසන්.

අප පසුගිය අය වැයේ දැකපු ඉතාම කාලෝචිත සහ ජනතාවට සංවේදී ව්‍යාපෘතියක් තමයි "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" ව්‍යාපෘතිය. මේ වනවිට මාතලේ දිස්ත්‍රික්කයේ එවැනි ගම්මාන ව්‍යාපෘති 31ක් ක්‍රියාත්මක වෙනවා. මා එම වැඩසටහන දකින්නේ, ජනතාව වෙත ගිහිල්ලා ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනය කරන්න ගත් ඉතා හොඳ උත්සාහයක් ලෙසයි.

මාතලේ දිස්ත්‍රික්කය තුළ කෙරෙන මැණික් කර්මාන්තය හරහා ජාතික ආර්ථිකයට විශාල වශයෙන් සහයෝගයක් ලබා දීලා තිබෙනවා. මැණික් කර්මාන්තය ආශ්‍රිතව ලංකාව සියයට 76ක වර්ධනයක් ලබද්දී, එයින් සියයට 30ක දායකත්වයක් මාතලේ දිස්ත්‍රික්කයෙන් ලබා දී තිබෙනවා. මෙහිදී මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ගරු ලොහාන් රත්වත්තේ රාජ්‍ය අමාත්‍යතුමාට. මොකද, "සුරකිමු මැණික්" ව්‍යාපෘතිය හරහා මාතලේ දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තයට සහ ඒ ආශ්‍රිත කර්මාන්තකරුවන්ට විශ්‍රාම වැටුපක් හඳුන්වා දීලා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒත් එක්කම, මේ වාගේ අසීරු මොහොතක 2022 අය වැය හරහා විශාල සංවර්ධන වැඩ රාශියක් අපි මාතලේ දිස්ත්‍රික්කයේ සැලසුම් කර තිබෙනවා.

විශේෂයෙන්ම වගා ආරක්ෂා කිරීමේ අරමුණින් වඳුරන්ගේ සහ රිළවුන්ගේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා විශේෂ නියමු ව්‍යාපෘතියක් අපි මාතලේ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. එසේම සුළු අපනයන භෝග ප්‍රවර්ධනය සඳහා වෙළෙඳ ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. පාරම්පරික කර්මාන්තවලට තිබෙන විශාලම ගැටලුව තමයි ඔවුන්ට වෙළෙඳ පොළ සොයා ගැනීමට තිබෙන අපහසුතාව. මේ ගැන ගරු අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා පාරම්පරික කර්මාන්තකරුවන් සඳහා අළෙවි ප්‍රදර්ශන කුටි සහ ඒ සඳහා වෙළෙඳ පොළ ලබා දීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ද නියමිතයි. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය දියුණු කරමින්, මාතලේ නකල්ස් කඳුවැටිය ආශ්‍රිතව තිබෙන සේර ඇල්ල වෙත පිවිසීම සඳහා මොරගහකන්ද ජලාශයේ සිට සේර ඇල්ල දක්වා නාවික තටාකාංගණයක් හා වාරි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම, මාතලේ නගර සංවර්ධන සැලැස්ම ඉදිරි වසර තුළ ක්‍රියාත්මක කර අවසන් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ ආකාරයට ඉදිරි වසර තුළත් රුපියල් මිලියන ගණනක මුදලක් වැය කරමින් මෙම වසංගතය හමුවේ වුවත් මාතලේ දිස්ත්‍රික්කය සංවර්ධනය කරන්න අපි කටයුතු කර තිබෙනවා.

අපි ගරු මුදල් අමාත්‍යතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම උපාධිධාරී පත්වීම් ස්ථිර කිරීමට කටයුතු කිරීම සම්බන්ධව. පසුගිය සමයේ පත්වීම් ලබාගත් උපාධිධාරීන් රාශියක් තමන්ගේ පත්වීම් ස්ථිර කරවා ගැනීම සම්බන්ධයෙන් දැඩි විමසිල්ලෙන් සිටියා. අද ඔවුන්ගේ බලාපොරොත්තුව ඉෂ්ට වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසන් වශයෙන්, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට විශේෂ ස්තුතියක් කරනවා, මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම ගැන. දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට යන ගමනේදී ලබන වසර වෙනුවෙන් ඉදිරිපත් කළ මේ අය වැය සියලු ආකාරයෙන් සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරන ගමන්, පසුපෙළ මන්ත්‍රීවරුන් විධියට අප ඒ සඳහා එතුමාට අවශ්‍ය සියලු ශක්තිය හා ධෛර්යය ලබා දීමට එතුමා පිටුපසින් ඉන්නවා කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසංක නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.02]

**ගරු අසංක නවරත්න මහතා**
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ 76 වැනි අය වැය ප්‍රකාශය ඊයේ දවසේ මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා සිය මංගල අය වැය ලේඛනය විධියට ඉදිරිපත් කළා. විශේෂයෙන්ම එතුමා මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන මොහොතේ අපේ රටේ ජනතාව ඉතාම අසීරු තත්ත්වයක සිටින බව රහසක් නොවෙයි. ඒ වාගේම දීර්ඝ කාලයක් තිස්සේ පැවති ආණ්ඩු විසින් ගත් වැරදි තීන්දු නිසා මේ තත්ත්වයට පත්වුණාය කිව්වොත් එය නිවැරදියි. ඒ වැරදි තීන්දු නිසාත්, පසු ගිය කාලයේ ඇති වුණු ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය නිසාත් අපේ රටේ ආර්ථිකය විශාල සංකෝචනයකට, මහා කඩා වැටීමකට ලක් වුණා කියන එක අපි කවුරුත් දන්නා කාරණාවක්. විශේෂයෙන්ම යහ පාලන ආණ්ඩුව අපේ පොදුජන පෙරමුණ ආණ්ඩුවට භාර දුන්නේ කඩා වැටුණු ආර්ථිකයක්. ඔබතුමන්ලා දන්නවා, හිස් වුණු භාණ්ඩාගාරයක් තමයි එතුමන්ලා අපට භාර දුන්නේ. එසේ ආර්ථිකය කඩා වැටී තිබුණු මොහොතක අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජය මේ රට ආර්ථික වශයෙන් ගොඩනඟන්න දැවැන්ත උත්සාහයක් ගත්තා.

විශේෂයෙන්ම කොවිඩ් වසංගතය නිසා අපේ රටට ලැබෙන්න තිබුණු රුපියල් බිලියන 500කට වැඩි ආදායමක් අපට අහිමි වුණා. සංචාරක කර්මාන්තය හරහා වාර්ෂිකව ඩොලර් බිලියන 5කට වැඩි ආදායමක් අපට ලැබුණා. සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන් කඩා වැටුණා. ඒ වාගේම විදේශ රැකියාවල යෙදී සිටි ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ රැකියා නැතිවීම නිසා ඔවුන් ලංකාවට එවන මුදල් නිසි කාලයට එවා ගන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ වාගේම පසු ගිය කාලය පුරා කොවිඩ් වසංගතයත් එක්ක සෘජු විදේශ ආයෝජන අපේ රටට ලැබුණේ නැහැ. රාජ්‍ය ආදායම විශාල අර්බුදයකට ලක්වුණු යුගයක් තමයි 2020 සිට මේ ගත වුණු වසර එක හමාරක, දෙකක කාලය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතක් කරන්න ඕනෑ, කොවිඩ් මර්දනයට ශීඝ්‍ර එන්නත්කරණය සඳහා අතිගරු ජනාධිපතිතුමා දැවැන්ත නායකත්වයක් දුන් බව. ලෝකයේ අනෙක් රටවල් එක්ක ගත්තාම, අපේ රටේ එන්නත්කරණය ඉතාම ඉහළ තැනකට ගෙන එන්නට, ඒ සඳහා ප්‍රමුඛතාව ලබා දී, එන්නත්කරණය සම්පූර්ණ කරන්නට එතුමා නායකත්වය ලබා දෙමින් සිටිනවා. ඒ නිසා 2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී රාජ්‍ය ආදායම යම් ප්‍රමාණයකින් වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රය ගත්තාම, 2020 මුල් මාස 8ට සාපේක්ෂව 2021 දී සංචාරක ක්ෂේත්‍රයෙන් රුපියල් මිලියන 51ක ආදායමක් ලබා ගන්න අපට පුළුවන්කම ලැබුණා. පසු ගිය ඔක්තෝබර් මාසයේ සංචාරකයන් 22,000කට ආසන්න ප්‍රමාණයක් අපේ රටට පැමිණියා.

කොවිඩ් වසංගත තත්ත්වය නිසා අපේ රටේ ආර්ථිකය ඉතාම පහළ මට්ටමකට ගියා. විදේශ සංචිතවල සංකෝචනයක් ඇතිවෙලා තිබුණා. ඒ හේතු නිසා ආනයනය කරන භාණ්ඩ,

[ගරු අසංක නවරත්න මහතා]

විශේෂයෙන්ම කිරි පිටි, ගෑස්, සීනි, සිමෙන්ති ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ඉහළ ගියා. මේ නිසා ජනතාවගේ ජීවන වියදම ඉහළ ගියා. ඔවුන් ලොකු අමාරුවකින් ජීවත් වන බව පක්ෂ, විපක්ෂ අපි සියලුදෙනාම පිළිගන්නා කාරණාවක්. මේ තත්ත්වය තේරුම් අරගෙන, කොවිඩ් වසංගතයට මුහුණ දුන් ජනතාවට කෙටිකාලීනව සහන සලසමින්, දීර්ඝකාලීනව අපේ රටේ ආර්ථිකය ගොඩනඟන්න ගරු මුදල් අමාත්‍යතුමා ඉතාම සැලසුම් සහගත අය වැය ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබෙනවාය කියන කාරණාව මේ වෙලාවේ මම මතක් කරනවා. ඒ පිළිබඳව, මා නියෝජනය කරන ශ්‍රී ලංකා මහජන පක්ෂය වෙනුවෙනුත්, ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙනුත් මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා. 2020 මුල් මාස 8හි රුපියල් බිලියන 908ක් වුණු රාජ්‍ය ආදායම, සියයට 3.8කින් වැඩි කර ගෙන 2021 දී එය රුපියල් බිලියන 943ක් දක්වා ඉහළ ගෙනෙන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම සංවරණ සීමා ලිහිල් කිරීමත්, එන්නත්කරණය ශීඝ්‍ර කිරීමත් එක්ක අපේ අපනයන ආදායම වැඩි වුණා. ඒ අනුව, 2020 දී ඩොලර් මිලියන 6,445ක් ලෙස තිබුණු අපනයන ආදායම 2021 දී ඩොලර් මිලියන 7,903ක් දක්වා සියයට 22.6කින් වර්ධනය කර ගන්න අපට පුළුවන් වුණා.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අපනයන ක්ෂේත්‍රයේ කටයුතු කරන ව්‍යාපාරිකයන් පසුගිය කාලය පුරා අර්බුද රැසකට මුහුණ දුන් බව. ඔවුන්ගේ කටයුතු කිරීමේදී සමහර රාජ්‍ය නිලධාරින්ගේ සහයෝගය ලැබුණේ නැති තැන අපිත් එක්ක ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ නිසා අපනයන ආදායම වැඩි කර ගන්න අපි ආණ්ඩුවක් විධියට වැඩි අවධානය යොමු කරන්න ඕනෑය කියන කාරණාව මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. අවුරුදු 10කට පස්සේ පසුගිය මාසයේ දී අපට ඩොලර් මිලියන 1,156ක පමණ ඉහළ අපනයන ආදායමක් ලබා ගන්නත් අපට පුළුවන්කම ලැබුණා.

ඊළඟට, 2020ට සාපේක්ෂව මේ වර්ෂයේ විරැකියාව අඩු වෙලා තිබෙනවා. 2021 දී යම් ප්‍රමාණයකින් විරැකියා ප්‍රතිශතය අඩු කර ගන්න අපට පුළුවන්කමක් ලැබුණා. මුදල් අමාත්‍යතුමාගේ මේ අය වැය ලේඛනයෙන් දෛනික ආදායම අහිමි වුණු පවුල් සඳහා ජීවනාධාර ලබා දෙන්න රුපියල් මිලියන 15,000ක් වෙන් කර තිබෙනවා. ගැබිණි මව්වරුන්ට වසර දෙකක් පුරා මසකට රුපියල් 10,000ක පෝෂණ මල්ලක් ලබා දෙන්නත්, ඒ වාගේම ගොවීන් කාබනික ගොවිතැනට හුරු කිරීම සඳහා වල්පැළහරණයට රුපියල් මිලියන 4,000ක් වෙන් කිරීමටත් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපනයන ඉලක්ක කර ගත් නව ආයෝජන කලාපවල යටිතල පහසුකම් සංවර්ධනයට රුපියල් මිලියන 5,000ක් වශයෙන් විශාල මුදල් කන්දරාවක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, සෑම ග්‍රාම නිලධාරි වසමකටම, සෑම පළාත් පාලන කොට්ඨාසයකටම සංවර්ධන කටයුතු සඳහා මුදල් ලැබෙන ආකාරයට මෙම අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ මේ වෙලාවේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් තමන්ගේ ජීවන වියදම වැඩිවීම නිසා අර්බුදයකට ලක් වෙලා සිටින බව. අපි දන්නවා, මේ වෙලාවේ වැටුප් වැඩිවීමක් සිදු කරන්න බැරි බව. නමුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල දරා ගන්න බැරි මට්ටමක තිබෙන නිසා ඔවුන්ට මේ කාල සීමාව ගත කරන්න අඩු ගණනේ ජීවන වියදම් දීමනාවක් හෝ කෙටි කාලීනව ගෙවන්න පුළුවන් නම් එය ඉතාම සුදුසුයි කියලා අපි යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 25ක් තිස්සේ පැවති ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා ගැටලුව විසඳන්න මේ වෙනකොට වෙන් කරලා තිබෙන රුපියල් මිලියන 109,000ට අමතරව, තවත් රුපියල් මිලියන 30,000ක් වෙන් කරලා ඒ ප්‍රශ්නයට ස්ථිර සාර විසඳුමක් ලබා දෙන්න ගරු අග්‍රාමාත්‍යතුමාත්, මුදල් අමාත්‍යතුමාත් කටයුතු කර තිබෙනවා. ඒත් එක්කම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අපිත් සමඟ සාකච්ඡා කළා, ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සංගමය. මොකද, 6/2006 වැටුප් චක්‍රලේඛයත් එක්ක ඔවුන්ට මතු වෙලා තිබෙන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඔවුන්ගේත් වැටුප් විෂමතාවක් තිබෙනවා. ඒ සඳහාත් අපි ඉතාම කඩිනමින් විසඳුම් ලබා දෙන්නට අවශ්‍යයි.

විශේෂයෙන්ම රසායනික පොහොර ආනයනය තහනම් කිරීමත් එක්ක කාබනික ගොවිතැන ප්‍රචලිත කිරීමට ජනාධිපතිතුමා අද දැවැන්ත වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1960දී සිංගප්පූරුව හා මැලේසියාවට වඩා අපේ ආර්ථිකය ඉහළින් තිබුණා. නමුත් අද වෙනකොට සිංගප්පූරුවේ දළ දේශීය නිෂ්පාදනය, එක්සත් ජනපද ඩොලර් මිලියන 340ක් ලෙසත්, අපේ දළ දේශීය නිෂ්පාදනය එක්සත් ජනපද ඩොලර් මිලියන 81ක් වාගේ පහළ අගයකත් පවතිනවා. ඒ නිසා අපි පසුගාමිත්වය තේරුම් ගන්නට අවශ්‍යයි. නිවැරදි ආර්ථික කළමනාකරණ උපක්‍රම භාවිත කරලා නැඟී එන ආර්ථිකයක් අත් කර ගැනීම සඳහා පක්ෂ, විපක්ෂ සියලු දෙනාම එකට එකතු වෙලා මේ රටේ ආර්ථිකය ගොඩනඟමු කියන යෝජනාව කරමින්, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Major) Sudarshana Denipitiya. You have eight minutes.

[අ.භා. 4.10]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව වන පාර්ලිමේන්තුවේ දෙවන අය වැය, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් ඊයේ දිනයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. එය එතුමාගේ මංගල අය වැයයි. මේ අය වැය ඉතිහාසයේ අමාරුම කාලයක ඉදිරිපත් කළ අය වැයක්. රටට හිතකර වැදගත් අය වැයක් ඉදිරිපත් කළා කියලා තමයි අපේ විශ්වාසය. ඒක තමයි ඇත්ත. මේක, විපක්ෂයේ බලාපොරොත්තු සුන් වෙච්ච අය වැයක්. බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මාහට විවාදයේ ප්‍රථම දිනයේ දී කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳවත් මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරු අගමැති ලී ක්වාන් යූ මැතිතුමා කියලා තිබෙනවා, "If you do not know history, you think short term. If you know history, you think medium and long term" කියලා. මම හිතන්නේ විපක්ෂය මේකේ මුල් කොටසේ තමයි ඉන්නේ. ඒ කියන්නේ, not knowing the history. ඉතිහාසය දන්නේ නැති විපක්ෂයක් විධියට කථා කරන නිසා තමයි මේ විධියට ඇවිල්ලා නොයෙක් නොයෙක් අපවාද නඟන්නේ. ඔවුන් බලාපොරොත්තු වන ලොසින්ජර අය වැය දුන්නේ නැති නිසා තමයි මේ තත්ත්වයට ඔවුන් පත් වෙලා ඉන්නේ.

මා හිතන හැටියට ලංකාවේ හැමෝම පුරුදුවෙලා තිබෙන්නේ අය වැයෙන් මොනවාද අඩු කළේ, මොනවාද දුන්නේ කියා

දැනගන්නයි. බොහෝදෙනා එතැනින් එහා හිතන්න අසමත් වෙලා තිබෙනවා. අප රටට මේ තත්ත්වය උදා වුණේ ලොසින්ජර අය වැය න්‍යාය නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යවරයා ලොසින්ජර න්‍යාය අය වැයක් වෙනුවට උපාය මාර්ගික සැලසුමකින් යුත් ජාතික ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කරන අය වැයක් ඉදිරිපත් කළා. මේ අය වැය විශේෂ අය වැයක් බවට පත් වුණා. මා කිව්වා වාගේ දුෂ්කර කාලයක ඉදිරිපත් කළ ඉතාම වැදගත් අය වැයක් බවට මේ අය වැය පත් වුණා. සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු ඉතිහාසය නොදන්නා නිසා ඒ ගැන කථා කරන්න අකැමැති ස්වභාවයක් තමයි අපි දකින්නේ. නමුත්, ඉතිහාසයේ වැදගත්කමක් අපට තිබෙනවා. පසුගිය අවුරුදු පහේ මොනවාද කළේ, මේ රටට වුණේ මොකක්ද, 1977න් පස්සේ මේ රට මොන තැනකටද ඇදලා දැම්මේ කියා අපි හැමදෙනාම කථා කරන්න ගත්තා. නමුත්, විපක්ෂය ඒ ගැන කථා කරන්න අකැමැති නිසා තමයි මේ ආකාරයෙන් කටයුතු කරන්නේ. ඒ නිසා තමයි හැම දෙයක් සඳහාම අපේ රජය දිගු කාලීන සැලසුම් හදන්නේ. කෙටි කාලීනව හිතලා අද දවසේ පැලැස්තර දමන න්‍යායක් නොවෙයි අපට තිබෙන්නේ. අපි ගොඩක් දුර බලනවා. ඒ නිසා තමයි ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා දුර බලා මනා කළමනාකාරිත්වයකින් යුතු විශිෂ්ට අය වැයක් ඉදිරිපත් කළේ.

භූමියේ ප්‍රමාණය කියන එක රටක් දියුණු වීමට අවශ්‍ය සාධකයක් නොවෙයි. රටේ විනය, අපේ ජනතාවගේ විනය නියමාකාරයෙන් තිබුණොත් පමණයි, අපේ රට හොඳින් දියුණු කරන්න පුළුවන් වන්නේ. වර්තමානයේ අපට කොවිඩ් ප්‍රශ්නය තිබෙනවා. කොවිඩ් - 19 වසංගතය පැතිරීම සම්බන්ධයෙන් අපට හොඳ උදාහරණත් තිබෙනවා. රට කොතරම් වසා තිබුණත්, නීති-රීති කොතරම් පැනෙව්වත් කොවිඩ් වසංගතය වේගයෙන් පැතිර ගියා. නමුත්, කොවිඩ් වසංගතය පැතිර යන කාලයේදීත් අපි මනා කළමනාකාරිත්වයෙන් වැඩ කරපු නිසා තමයි අපේ රජයට හොඳ තැනකට එන්න පුළුවන්කම ලැබුණේ. කොවිඩ් වසංගතය නියමාකාරයෙන් පාලනය කර ගන්න පුළුවන්කම ලැබුණේත් ඒ නිසායි. මුලින්ම විපක්ෂය කිව්වේ මොකක්ද? අපට vaccines එකක්වත් ගේන්න බැහැයි කිව්වා. මෙතුමන්ලා කථා කළේ ඒ දේවල්. අපි ඒ තරම් demoralize කළා. අපට ඒ තරම් දේවල් කිව්වා. හැබැයි, ඒ එකකින්වත් අපි නැවතුණේ නැහැ. මේ වනකොට අපි vaccines ගෙනැල්ලා අපේ ජනතාව බේරා ගන්න අවශ්‍ය කටයුතු සියල්ල කරලා තිබෙනවා. එම නිසා අපි හොඳ nation එකක් බවට පත් වුණා. ජනතා හිතවාදී අය වැයක් ඉදිරිපත් කරනකොට එතුමන්ලාට නොයෙකුත් කථා කියන්න පුළුවන්. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා නොයෙකුත් දේවල් කියලා මේ සභාවෙන් පිටවෙලා ගියා. කොහොම වුණත් කමක් නැහැ, මෙය ජනතා හිතවාදී අය වැයක්. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ දීර්ඝ කාලීන සැලසුම් ක්‍රියාත්මක කරන අය වැයක් බවට මේ අය වැය පත් වුණා.

විශාල වශයෙන් ධනය උපයන සමාගම් 64ක් පමණ අපේ රටේ තිබෙනවා. රුපියල් මිලියන 2,000කට වැඩි ආදායමක් උපයන අයගෙන් හෝ සමාගම්වලින් එක් වරක් පමණක් සියයට 25ක බද්දක් ලබා ගන්නවා කියලා ඊයේ මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා. ඒ වෙලාවේ විපක්ෂය මොකක්ද කිව්වේ? එතුමන්ලා ඒකටත් කැමැති නැහැ. Perpetual Treasuries Limited බැඳුම්කර සිද්ධියේදී උපයන ලද මුදල් රජයට ලබා ගැනීම සම්බන්ධයෙනුත් ඊයේ එතුමා දැනුවත් කළා. ඒ වෙලාවේදීත් විපක්ෂය කිව්වේ මොකක්ද? එතුමන්ලා සියලුදෙනා ඒකට ඇඳිලායි ඉන්නේ. විශේෂයෙන්ම යහ පාලන ආණ්ඩුවේ කණ්ඩායමක් මේ කතන්දරයට ඇඳිලා ඉන්නවා. ඔවුන්ට ඒ මුදලුත් ආපසු දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි මෙතුමන්ලා මේ තරම් බෙරිහන් දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටේ මාර්ග පද්ධතිය ගැනත් මම කථා කරන්න ඕනෑ. මාර්ග හදන්නේ මොකටද කියලා අහනවා. රටක ඉස්සෙල්ලාම කරන්න ඕනෑ, මාර්ග පද්ධතිය නියමාකාරයෙන් හදා ගන්න එකයි. ඒ තුළින් රටේ මුදල් නාස්ති වෙන්නේ නැහැ. ඒ වාගේම රටේ මුදල් පිට රටට ඇදී යන එකත් අඩු වෙනවා. ඒ තුළින් කොපමණ ඉන්ධන ප්‍රමාණයක් ඉතිරි වෙනවාද? ඒ වාගේම අමතර කොටස්වලට යන වියදම කොපමණ ප්‍රමාණයකින් ඉතිරි වෙනවාද? මේ සියල්ල කරන්නේ long-term plans මඟින් මේ රට දියුණු කරන්නයි. ඉස්සර අපි පාරක් හදලා ටික දවසකින් වතුර සඳහා බට දමන්න නැවත ඒ පාර කඩනවා. දැන් එවැනි තත්ත්වයක් ඇති වන්නේ නැහැ. දැන් ජල නළ එළා ඊට පස්සේ මාර්ගය හදනවා. ඒ විධියට මේ රටේ සියලුම සංවර්ධන කටයුතු නියමාකාරයෙන් සිදු වෙනවා.

ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. ග්‍රාම නිලධාරි වසමකට ගෙයක් බැගින් ග්‍රාම නිලධාරි වසම් 14,021ට ගෙවල් 14,021ක් අපේ රජයෙන් ඉදිකළා. අපි බොහොම නිශ්ශබ්දව ඒ කටයුතු කරගෙන යනවා. මෙවර අපි ගෙවල් 5 බැගින් ඉදිකරනවා. එතකොට ගෙවල් 70,000ක් පමණ මේ රටේ අහිංසක, දුප්පත් ජනතාවට ලැබෙනවා. ඒ වාගේම අපි වැව් විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරනවා. ඒවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. 2025 වර්ෂය වනකොට සැමට පිරිසිදු පානීය ජලය ලබාදීමේ වැඩ කටයුතු මේ වනකොට අපි ආරම්භ කර තිබෙනවා.

අපි මේ වෙනකොට මේ රට සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු විශාල වශයෙන් ආරම්භ කර ඒවා ඉදිරියට කරගෙන යනවා. කවුරුවත් හිතුවේ නැහැ, වතුවල ලයින් කාමර අයින් කරලා හොඳ ගෙවල් ලබාදෙයි කියලා. නමුත්, අපි ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කළා. මේ වෙනකොට තායිලන්තයේ තිබෙන OTOP System එක වාගේ අපේ රටේත් නිෂ්පාදන ගම්මාන ඇති කරගෙන යනවා. යහ පාලන ආණ්ඩුව ආ ගමන් නවතා දැමූ රාජ්‍ය නිලධාරීන් සඳහා යතුරුපැදි ලබා දීමත් අපි නැවත වරක් ආරම්භ කළා. ඒවා තමයි විපක්ෂයේ මෙතුමන්ලාට දරා ගන්න බැරිවෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අපි බන්ධනාගාර රැඳවියන් ගැනත් මතක් කරන්න ඕනෑ. එය කවුරුවත් කථා කරන්නේ නැති දෙයක්. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඔවුන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට වෙන් කර ඇති ප්‍රතිපාදනවලට අමතරව තවත් රුපියල් මිලියන 200ක පමණ මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අධිකරණ කටයුතු කාර්යක්ෂම කිරීමට වෙන් කර ඇති ප්‍රතිපාදනවලට අමතරව තවත් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. මේවා තමයි, plus points. මේවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. විශේෂයෙන්ම සමහර වෙලාවට මම දකිනවා, මත්කුඩු සම්බන්ධයෙන් කථා කරනකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු නොයෙක් විධියට අපට අපහාස උපහාස කරන ආකාරය. මේ වෙනකොට මත්කුඩු නැවැත්වීමට අවශ්‍ය මෙහෙයුම් කටයුතු සියල්ල අපි සිදු කරගෙන යනවා. නමුත්, විපක්ෂය ඒවා ගැන කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බහු ජාතික සමාගම් පොහොසත් කරන එක නොවෙයි අපි කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ඒ වාගේම ත්‍රීරෝද රථ හිමියන්ට සහන සැලසීම වෙනුවෙන් රුපියල් මිලියන 600ක පමණ මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. පෞද්ගලික බස් රථ හිමියන් සඳහා පහසුකම් සහ සහන සැලසීමට රුපියල් මිලියන 1,500ක ප්‍රමාණයක් වෙන් කළා. එම මුදල වෙන් කළේ කොවිඩ් වසංගතය නිසා ඔවුන්ට සිදු වූ අපහසුතා මග හරවා ගන්නයි. ඔවුන්ගේ ලීසිං පහසුකම් සහ ඔවුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබා දෙන්න තමයි අපි මේ කටයුතු කරන්නේ.

අවුරුදු 24ක් තිස්සේ තිබුණු ගුරු-විදුහල්පති වැටුප් ගැටලුව අපි මේ අය වැයෙන් සම්පූර්ණයෙන් අවසන් කර දුන්නා. ඒක කාටවත් කරන්න බැරිවෙලා තිබුණු දෙයක්. තවත් රුපියල් මිලියන 30,000ක මුදලක් වෙන් කර අපි එම ප්‍රශ්නය අවසන් කළා.

මම අවසන් වශයෙන් කියන්න ඕනෑ, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය ගැන දැන් අපේ ගමේ ජනතාව පැසසුමකින් යුතුව කථා කරන බව. වෙනදාට විපක්ෂය කථා කළේ කොහොමද? දැන් එතුමන්ලා පවා නිහඬ වෙලා. සාර්ථක අය වැයක් ඉදිරිපත් කළ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා, රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා ඇතුළු සියලු අමාත්‍යවරුන්ටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර්. ආටිගල මහතා ඇතුළු සියලුදෙනාටත් මගේ ගෞරවය, ස්තුතිය හා ප්‍රශංසාව පිරිනමමින්, මේ අවස්ථාවේදී අපි සියලුදෙනා එකතුවෙලා මේ තිබෙන බැරෑරුම් තත්ත්වයෙන් මිදිලා සංවර්ධනය කරා ගමන් කරමු කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එච්. නන්දසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.19]

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමස්ත අය වැය පිළිබඳව කථා කිරීමට ප්‍රථමයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. පසුගිය කාලය මුළුල්ලේ මේ රටම විශාල ව්‍යාකූල තත්ත්වයකට පත් කරපු, ඒ වාගේම අපේ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව, අනාගතය පිළිබඳව මහා අවිනිශ්චිතභාවයක් ඇති වූ, එසේ ඇති වීමට හේතු වූ, ඒ වාගේම පාසලේ උගන්වන්න ඕනෑ ගුරු මෑණිවරු, පියවරු මහ පාරට ඇද දැමූ ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව අපි සියලුදෙනාට මහා බරක් වෙලා තිබුණා. නමුත්, මෙවර අය වැය ඉදිරිපත් කරන්නත් කලින් ඒ වැටුප් විෂමතාවට සාධාරණ විසඳුමක් ලබා දෙන්න කටයුතු කිරීම නිසා අද අපට නිදහසේ ඔළුව තියාගෙන ඉන්න විතරක් නොවෙයි, ගමනක් යන්නත් පුළුවන්කම ලැබී තිබෙනවා. එම නිසා ප්‍රථමයෙන් ඒ කාර්යයට ආශීර්වාදය ලබා දුන් අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම ඒ කාර්යයට මග පෙන්වීම කළ ගරු අග්‍රාමාත්‍යතුමන්ට මෙන්ම, එම වගකීම් භාර අරගෙන අවුරුදු 24ක් මුළුල්ලේ දිගින් දිගට, පැසව පැසවා, ඇදී ඇදී ආ, බෝම්බයක් වගේ පුපුරා ගිය ගුරු-විදුහල්පති වැටුප් අර්බුදයට විසඳුමක් ලබා දීම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාට ප්‍රථමයෙන්ම අපේ ශීර්ෂ ප්‍රණාමය පුද කරන්න ඕනෑ.

දිගු කාලයක් තිස්සේ පැවැති ආණ්ඩු විසින් අරගත් අදූරදර්ශී, අමනෝඥ දේශපාලන කළමනාකරණ තීන්දු නිසා ණය මත යැපෙන ආර්ථිකයක් අපේ රට තුළ ඇතිවෙලා තිබෙනවා. විදේශ රටකින් ණය ගන්නවා විතරක් නොවෙයි, ගත් ණය ගෙවන්න තවත් රටකට ණය වන, ඒ වාගේම රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ පිට රටින් එනතෙක් කට ඇරගෙන බලාගෙන සිටින රටක් බවටත් අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ විධියට ඉඳල, කොස්ස, සරුංගලය, වෙසක් කූඩුව, යට ඇඳුම, ලේන්සුව පමණක් නොවෙයි, අමුඩ ලේන්සුවත් පිට රටින් එනතෙක් බලාගෙන ඉන්න, ඒ වාගේම පසුගිය දවස්වල යට ඇඳුම් නැහැ කියලා උද්ඝෝෂණ කරන්න, පෙළපාළි යන්න සූදානම් වූ දේශපාලනඥයෝ සිටින ලෝකයේ අසාර්ථකම රාජ්‍යයන් අතරට ළංවෙමින් තිබුණු රටක් දෙපයින් සිටුවීමට හදපු අය වැයක් හැටියට තමයි මම මේ අය වැය දකින්නේ.

මේ අය වැය ආරම්භ කරන්නත් කලින් ඒ සඳහා නිවැරදි ප්‍රවේශයක් අපේ මුදල් ඇමතිතුමා අරගෙන තිබෙනවා. අපි දන්නවා, මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ ඕනෑ තරම් තිබෙද්දී ඒ සියල්ල පිට රටින් ගෙනාපු බව. ඒක නිසා තමයි පසු ගිය දවස්වල මුදල් ඇමතිවරයා භාණ්ඩ 623ක් මේ රටට ආනයනය කිරීම අධෛර්යවත් කිරීමට කටයුතු කළේ. එසේ අධෛර්ය කිරීමට කටයුතු කිරීම පිළිබඳව මා මුදල් ඇමතිතුමාට ස්තුතිය පුද කරනවා. මම නම් ප්‍රාර්ථනා කරන්නේ මේ රටේ හදන්න පුළුවන් සියලු භාණ්ඩ ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නවත්වන්න ඕනෑ කියලායි.

මේ රටේ ඕනෑම මිදුලක් අපේ ඉදලෙන් අතුගාන්න පුළුවන්. මේ රටේ ඕනෑම දරුවෙකුට සරුංගලයක් හදා ගන්න පුළුවන්; වෙසක් කූඩුවක් හදා ගන්න පුළුවන්. මේ රටේ මහන යට ඇඳුමක් අඳින්න බැරි කෙනෙකු නැහැ; ලේන්සුවක් පාවිච්චි කරන්න බැරි කමක් නැහැ. හැබැයි, ඒ භාණ්ඩ ගෙන්වන එක අධෛර්ය කරලා විතරක් මදි, සම්පූර්ණයෙන් නවත්වන්න ඕනෑ. අධෛර්ය කරන්න එතුමා ගත්තු ඒ තීරණයට අපි ගරු කරනවා. ඒක මීට කාලයකට ඉස්සෙල්ලා කරන්න ඕනෑ වැඩක්. එතුමා මුදල් ඇමතිවරයා බවට පත්වීම නිසාම මේ රටේ ආර්ථිකයට වෙච්ච ඉතාම යහපත් ක්‍රියාවක් හැටියට තමයි මම ඒ දේ දකින්නේ. ඒක නිසා මම නැවත වතාවක් අපේ මුදල් ඇමතිතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටින්න ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ යථාර්ථයක් බවට පත් කරන්න, සියලු ක්ෂේත්‍රවල පුනර්ජීවයක් ඇති කරන්න, ඒ වාගේම කඩිනම් ආර්ථික සංවර්ධනයක් සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්න මේ අය වැය මනා වටපිටාවක් හදලා තිබෙනවා. ඒ වාගේම, පුනරාවර්තන වියදම් අඩු කිරීම සඳහා ලොකු උත්සාහයක් දරා තිබෙනවා. මට කථා කරන්න සුළු කාලයක් තිබෙන නිසා මම ඒ ගැන දිගින් දිගට කියන්න යන්නේ නැහැ. ඒ වාගේම, අපනයන ආදායම් ඉහළ නංවා ගැනීමට ලොකු උත්සාහයක් දරන බව අය වැය කථාවේදී අපට හොඳට දකින්න පුළුවන්කම ලැබුණා. විදේශ සේවා අවස්ථා වැඩි කර ගන්න, සංචාරක කර්මාන්තය දියුණු කරන්න විශාල වශයෙන් උත්සාහ දරලා තිබීම ගැන අපි සතුටට පත් වෙනවා. මේ රට නාවික හා ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කරලා ඒ හරහා වැඩි විදේශ විනිමයක් උපයා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් අය වැය තුළින් යෝජනා කර තිබෙනවා දැකීම මේ රටේ පුරවැසියන් හැටියට අපි වඩා සතුටට පත් වෙන කාරණාවක් වෙනවා. මේ රටේ අනාගතය තීරණය වෙන ප්‍රධානම කාරණය තමයි පිට රටින් උපයා ගන්නා විදේශ විනිමය. දෙවැනි කාරණය තමයි අපේ පුනරාවර්තන වියදම්, රාජ්‍ය වියදම් අඩු කරන එක. ඒ සඳහා ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළ ගැන සතුටු වෙනවා. පුනරාවර්තන වියදම් අඩු කළත් වැඩිහිටි දීමනා, සමෘද්ධි දීමනා, රෝගාතුර දීමනා, පාසල් දරුවන් සඳහා දරන වියදම, අධ්‍යාපනය සඳහා දරන වියදම පසු ගිය කාලයට වඩා වැඩි කරලා තිබෙනවා.

මම 1991 වර්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු හැටියට, 1993 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට පත් වෙලා 2017 වර්ෂයේ පළාත් සභා ක්‍රමයට තිත තියන තෙක් මම එහි මහජන නියෝජිතයකු හැටියට කටයුතු කරලා තිබෙනවා. හැබැයි, කිසිම දවසක අය වැය යෝජනාවක් පිළිබඳව කථා කරන්න, යෝජනාවක්, අදහසක් දෙන්න අපට කවදාවත් අවස්ථාවක් ලැබිලා තිබුණේ නැහැ. නමුත් අපි සතුටට පත් වෙනවා, මේ සැරේ අය වැය සකස් කිරීමේදී අපේ මුදල් ඇමතිතුමා ලංකාවේ ජනතාව එකතු කරගෙන, හැම ග්‍රාම නිලධාරි වසමකම රැස්වීමක් පවත්වලා අදහස් යෝජනා ලබා ගැනීම ගැන. ලංකාවේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් 14,022ටම එක රැස්වීමකට 20ක් ආවොත් 280,000කට වඩා ජනතාවකගෙන් අදහස්, යෝජනා අරගෙන තමයි මේ අය වැයක් සකස් කරලා තිබෙන්නේ.

මට කථා කරන්න තිබෙන කාලය සීමිත නිසා මම කෙටියෙන් තව කරුණු කීපයක් කියන්නම්. අනුරාධපුර මගේ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 694ක් තිබෙනවා. ඒ ග්‍රාම නිලධාරි වසම් 694ටම ලක්ෂ 30 ගණනේ ලැබිලා තිබෙනවා. අපේ ප්‍රාදේශීය සභා ඡන්ද කොට්ඨාස 225ක් තිබෙනවා; ලක්ෂ 40 ගණනේ ලැබිලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සම්බන්ධීකරණ උපසභාපතිලා 12දෙනෙක් ඉන්නවා; ලක්ෂ 200 ගණනේ ලැබිලා තිබෙනවා. සභාපතිවරුන්ට ලක්ෂ 1,000 ගණනේ ලැබිලා තිබෙනවා. ඒ අනුව අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයට ලංකාවටම වියදම් කරන මිලියන 85,000න් මිලියන 3,922ක් එහෙම නැත්නම් ලක්ෂ 39,220ක් ලබා දෙන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපේ ගරු මුදල් ඇමතිතුමාට මගේ ගෞරවය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාබනික වගාව ගැන මම වචනයක් කථා කරන්න ඕනෑ. මගේ ප්‍රදේශය ගොවි ජනපදයක්. ගොවි ජනපදයක ජීවත් වන නිසා මා දන්නවා, කෘෂිකර්මය දියුණු කිරීමට යොදන්නේ කාබනික පොහොරද, රසායනික පොහොරද කියන කාරණය ගොවි ජනතාවට ලොකු ප්‍රශ්නයක් නොවන බව. හැබැයි, පොහොර කලට වේලාවට ලබා දෙන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය මේකයි. කාබනික පොහොර දෙන එක හෝ පළිබෝධ නාශක දෙන එක විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. කලට වේලාවට ගොවිතැන් කරන ක්‍රමයක් තිබෙනවා. අද යල - මහ කියන එක දන්නේ නැහැ. යල කියන්නේ, පායන කාලයේ ගොවිතැන් කරනවා සහ මහ කියන්නේ, වැහි කාලයේ ගොවි තැන් කරන එක නොවෙයි. දවස තීන්දු වෙන්නේ, සූර්යයාගේ ගමන අනුව. වර්ෂය තීන්දු වෙන්නේ, සූර්යයාගේ ගමන අනුව. යල මහ කියන්නේත් ඒ වාගේම තමයි. සූර්යයා ලංකා භූමියෙන් කර්කටක නිවර්තනයට පිට වනකොට ඒක, යල වනවා. මකර නිවර්තනයට යනවා නම් ඒක මාස් කන්නය වනවා. මේ කන්න දෙක පැහැදිලිව තේරුම් අරගෙන යලට මහට වගා කරනවා නම්, කලට වේලාවට පළිබෝධ නාශක සහ පොහොර ටික ලබා දෙනවා නම්, ඒවා භාවිත කරන ආකාරය පිළිබඳව දැනුවත් කරනවා නම්, අපට මේ කාර්යය කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කාබනික වගාව දියුණු කරන්න අවස්ථාව උදා කර ගන්න අපට ඉඩ ලැබේවා කියමින්, මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. (Dr.) Thilak Rajapakshe, please. You have eight minutes.

[අ.භා. 4.27]

**ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) திலக் ராஜபக்ஷ)
(The Hon. (Dr.) Thilak Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 76 වැනි අය වැය වාගේම, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ දෙවැනි අය වැය ඊයේ ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කළා. හැබැයි, අද මෙතැන කථා කළ බොහෝ දෙනෙකුගේ ප්‍රකාශවලට පිළිතුරක් ලෙස මා මුලින්ම සිහිපත් කරන්න කැමැතියි, මේ රටේ සහ ලෝකයේ කුමන වාතාවරණයක් යටතේද මේ අය වැය ඉදිරිපත් වෙන්නේ කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශ කර සිටිනවා, ලෝකයේ දුප්පත්කම වැඩි වෙච්ච වසර තමයි 2021 වසර කියලා. ලෝකයටම ඇති වෙච්ච කොරෝනා වසංගතයත් එක්ක ලෝකයේ සියලු රටවල ආර්ථිකය සහ නිෂ්පාදන සංකෝචනය වීම නිසායි මේ තත්ත්වය ලෝකයට උදා වුණේ. මුළු ලෝකයටම එවන් තත්ත්වයක් උදා වන කොට මේ පුංචි ශ්‍රී ලංකාවටත් ඒකෙන් මිදෙන්න හැකියාවක් තිබුණේ නැහැ. දෙවන ලෝක යුද සමයටත් වැඩිය ලෝකයේ දුප්පත්කම වැඩි වෙච්ච වසර හැටියට මේ වසර තිබෙන වෙලාවේ තමයි, එවන් වාතාවරණයක් යටතේ තමයි අපි මේ අය වැය ඉදිරිපත් කළේ. ලෝකයේ නිෂ්පාදනයත්, පාරිභෝජනයත්, හුවමාරුවත් අතර බරපතළ බිඳ වැටීමක් තිබෙන වෙලාවක තමයි මේ අය වැය ඉදිරිපත් වෙන්නේ. ලෝකයේ නිෂ්පාදන පාරිභෝජනය සඳහා මිනිසුන් ගාවට ගෙන යන්න විධියක් නැහැ. ලෝකයේ නැව් මාර්ග සහ ගුවන් මාර්ග සියල්ල කඩා වැටිලා. ඒ නිසා තමයි පසු ගිය කාලයේ කිරි පිටි සහ ගෑස් හිඟය වාගේ දේවල් අප අතරටත් ප්‍රශ්න හැටියට ගලාගෙන ආවේ. හැබැයි එකක් මතක තබා ගන්න. රාජපක්ෂ ආණ්ඩු සියල්ලක්ම බිහි වුණේ, මේ රටේ මිනිස්සු අන්ත අසරණ වෙලා, ජීවිතය අයදිමින් ඉන්න වෙලාවක තමයි.

අපට මතකයි එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වනකොට මේ රටේ නවත්වන්න බැහැයි කියපු යුද්ධයක් තිබුණා. එතුමා බලයට ආවාම මිනිස්සු "යුද්ධය නතර කරලා දෙන්න" කියනකොට, එතුමා එදා කැබිතිගොල්ලෑවට ගිහිල්ලා, මිනිසුන්ට පැහැදිලි පොරොන්දුවක් දුන්නා, මම ඉතා ඉක්මනින් මේ යුද්ධය ඉවර කරනවා කියලා. ඒ අධිෂ්ඨානශීලී හැඟීම ඇතිව තමයි, එදා යුද්ධය ඉවර කළේ. ඒ විතරක් නොවෙයි. අද මෙතැන ඉන්න බොහෝ දෙනෙක් කිව්වා, "ණය ගත්තා" කියලා. ඔව්, එදා ණය අරගෙන, යුද්දෙත් ඉවර කරලා, රටත් සංවර්ධනය කළා. ආසියාවේ වැඩිම සංවර්ධන වේගය තිබෙන රට බවට ලංකාව පත් කරලා තමයි, එදා අපි 2014 වසර අවසානයේ 2015 මේ රට ආපහු භාර දුන්නේ. 2014දීත් විපක්ෂය මේ විධියටම විවිධාකාර මඩ ප්‍රහාර, අවලාද, අපහාස, අසත්‍ය මෙන්ම අභූත චෝදනා ඉදිරිපත් කරලා මිනිසුන්ගේ මනස විකෘති කරලා තමයි එදා රජය පෙරළුවේ. හැබැයි, නැවත වතාවක් මේ කරළියට එන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කරළියට ආවේ මිනිසුන්ගේ ඉල්ලීමට.

මේ රටේ නැවත වතාවක් වර්ගවාදී යුද්ධයක් ඇති වෙලා, ආර්ථිකය කඩා වැටිලා, මහ මඟ එළිපිට දවාලේ මාෆියා, පාතාලය, මත් ද්‍රව්‍ය ආදී මේ සියල්ල සිද්ධ වනකොට තමයි මිනිසුන් ඉල්ලුවේ, "මේවායින් රට බේරා දෙන්න" කියලා. ඔව්, එදා ඒ බලාපොරොත්තු වුණ දේ අද වනකොට ඉතා හොඳින් ඉෂ්ට සිද්ධ වෙමින් පවතිනවා. හැබැයි, අවසානාවකට අද හැමෝම කථා කරන කොරෝනා වසංගතය ආවා. එදා කොරෝනා වසංගතය පැතිරෙනකොට චීනයේ මිනිස්සු මහ මඟ මැරි මැරී වැටෙන දර්ශන පෙන්වනකොට මිනිස්සු ඉල්ලුවේ, අප මේ රෝගයෙන් බේරා දෙන්න කියලායි. හැමෝටම මතක ඇති, අපේ ශිෂ්‍යයෝ චීනයේ හිර වෙලා සිටිය බව. එදා හැමෝම කිව්වේ, ඒ දරුවෝ

[ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා]

ටික කොහොම හරි බේරා දෙන්න කියලා. ජනාධිපතිතුමා එඩිතර තීන්දුවක් අරගෙන, රාත්‍රියේම ගුවන් යානයක් වීනය බලා ගුවන්ගත කෙරෙව්වා. මහා මෙහෙයුමක් කරලා, ඊට පසුව දා ඒ දරුවෝ ටික ලංකාවට අරගෙන ආවා. ඊට පස්සේ පිට රට සිටි අපේ මිනිස්සු ඉල්ලුවා, "අපත් බේරා ගන්න" කියලා. එතුමා එදා ඒ සියල්ල කළා. හැබැයි, මිනිසුන්ට අද ඒ දේවල් මතක නැහැ.

එදා පළමු කොරෝනා රෝගය වාර්තා වනකොට අපට තිබුණේ IDH රෝහල පමණයි. හැබැයි, පසුගිය දවස්වල අපි කොරෝනා ප්‍රතිකාර සඳහා රෝහල් 186ක් වෙන් කළා. ලෝක සෞඛ්‍ය සංවිධානය "මේකට හොඳම ප්‍රතිකාරය එන්නත" කියනකොට, ජනාධිපතිතුමා එන්නත් තිබෙන ලෝකයේ රාජ්‍ය නායකයන් සහ ආයතන එක්ක කථා කරලා, හැකි ඉක්මණින් එන්නත් ටික ලබා ගන්න අවස්ථාව සලසා ගත්තා.

අද වනකොට සියයට 72ක එන්නත්කරණයකට යන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය ඉලක්කය දුන්නේ, දෙසැම්බර් වනකොට ලෝක ජනගහනයෙන් සියයට 40ක් එන්නත් කරන්න කියලායි. හැබැයි, අපි සියයට 72ක ඉලක්කයකට ගිහිල්ලා තිබෙනවා. අද මිනිසුන්ට ඒවා මතක නැහැ. ඒවා වචන වුණාට, සියලුදෙනා වෙනුවෙන් ඒ වචන ක්‍රියාවට නංවන්න අපට අධික මුදලක් වැය කරන්න සිදු වුණා. එවන් වාතාවරණයක් යටතේ තමයි අපට අද අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න වෙලා තිබෙන්නේ. අද රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරලා, මත් ද්‍රව්‍ය ජාවාරම නතර කරලා තිබෙනවා. පසුගිය කාලයේ සෑම සෙනසුරාදාවකම දුප්පත් මිනිසුන් සිටින දුෂ්කර ගම්මානයකට ගිහිල්ලා, මිනිස්සු හම්බ වෙලා "ගම සමඟ පිළිසඳර" වැඩ පිළිවෙළ දියත් කරලා, ඒ ගම්මාන දියුණු කරගෙන යනකොට තමයි අපට මේ වසංගතයට මුහුණ දෙන්න සිදු වුණේ.

මේ රජය කිසිම වෙලාවක දේශපාලන පළිගැනීම් මත බොරු චෝදනා පටලවා කවුරුවත් හිරේ විලංගුවේ දමන්නේ නැතුව තමයි මේ සියලු කටයුතු කරගෙන ගියේ. අතිගරු ජනාධිපතිතුමා මිනිසුන්ට ලියන්න, කියන්න නිදහස දුන්නා; උද්ඝෝෂණවලට, අරගළවලට ඉඩ දුන්නා. උද්ඝෝෂණවලට, අරගළවලට කවදාවත් ජල ප්‍රහාර, බැටන් ප්‍රහාර එල්ල කළේ නැහැ. ඉතිහාසයේ කිසිම දවසක නොවූ විධියට සමහර වෙලාවට ඒ අයට කිරි තේ එකකින් පවා සංග්‍රහ කළා. ඒ සියල්ල කළේ පක්ෂ, විපක්ෂ භේදවලින් තොරව, රටට ආදරය කරන හැම කෙනෙකුම එකතු කරගෙන රට දැවැන්ත ඉදිරි ගමනකට ගෙන යන්නයි. නමුත් කුහක දේශපාලනය නිසා විපක්ෂය මොකක්ද කළේ? 2014 වසරේදී අවසාන වශයෙන් ක්‍රියාත්මක කරන්න තිබුණු සමහර කටයුතු මේ රජයට ආපසු මුල ඉඳලාම ක්‍රියාත්මක කරන්න සිද්ධ වුණා. උදාහරණයක් තමයි ගුරු උද්ඝෝෂණය. ඒ අයගේ අරගළය සාධාරණයි, ඉල්ලීම් සාධාරණයි කියලා අපි පිළිගන්නවා. හැබැයි අපි කිව්වේ, ඒ සඳහා මේක වෙලාව නොවෙයි කියලායි. මොකද, අවුරුදු 24ක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක් මේ වෙලාවේ විසඳා ගන්න හදපු එක තමයි එතැන තිබුණු ගැටලුව. කොරෝනා වසංගතයත් එක්ක සමාජය තුළ රෝගීන් බොහෝ සෙයින් වර්ධනය වෙලා, රට වහලා, අපි අසීරු තත්ත්වයක හිටපු වෙලාවක තමයි ඒ අරගළය ආවේ. නමුත් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, ඒ අරගළය සඳහා විසඳුමක් දෙන්න ඕනෑය කියලා අපේ රජය, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තීන්දු කළා. හැබැයි, ඒ අරගළය ඉවර වෙලා විසඳුම අරගෙන එළියට එනකොටම මහින්ද ජයසිංහලා මේ ජයග්‍රහණයට පියෙක් හොයා ගන්න ඉතාම නිර්ලජ්ජිත විධියට මහ පාරේ ගහ බැණ ගත්ත ආකාරය අපි දැක්කා. ඒ නිසා ඇත්තටම අපට කියන්න තිබෙන්නේ, එතැන තිබුණේ ගුරු අරගළයක් නොවෙයි, දේශපාලන අරගළයක් කියලායි. කෙසේ වෙතත්, දැන් අපට අය වැය හිඟය පියවන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා රජයක් හැටියට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තීන්දු කරලා තිබෙනවා, රටේ ආර්ථිකය නිෂ්පාදන ආර්ථිකයක් හැටියට සංවර්ධනය කරන්න ඕනෑය කියලා. ඒකට හොඳම ක්‍රමය මොකක්ද? පසුගිය වසරේ ඉඳලා අපේ ඖෂධ නිෂ්පාදනය වේගයෙන් ඉදිරියට යනවා. පසු ගිය අවුරුද්දේ අපට සේලයින්වලින් විතරක් රුපියල් බිලියනයක් ඉතිරි කර ගන්න හැකියාව ලැබුණා. හොරණ, මිල්ලෑව සහ ඔයාමඩුව ප්‍රදේශවල ඖෂධ නිෂ්පාදනය සඳහා ආයෝජන කලාප අපි ඇති කරලා තිබෙනවා. ඒ තුළින් බිලියන ගණනාවක් රජයට ඉතිරි කර ගන්න පුළුවන්කම ලැබෙයි කියා මා හිතනවා.

ඇඟලුම් කර්මාන්තය තුළිනුත් අපට ඩොලර් බිලියන හතරක විතර ආදායමක් ලැබෙනවා. හැබැයි, ඒ සඳහා අවශ්‍ය රෙදි පිළි පිට රටින් ගෙනෙන්න සිදු වෙලා තිබෙනවා. නමුත්, එරාවූර් ප්‍රදේශය මුල් කරගෙන ලංකාවේ රෙදි පිළි නිෂ්පාදනයට අවශ්‍ය රෙදි ටික නිෂ්පාදනය කර ගත්තොත්, අපට තවත් ඩොලර් බිලියන දෙකක් ඉතිරි කර ගන්න පුළුවන්.

අද සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ තිහක් ලැබෙනවා. කොට්ඨාසයේ මන්ත්‍රීවරයාට රුපියල් ලක්ෂ හතළිහක් සහ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ දාහක් දෙනවා. ඒ දුන්නේ, රටේ ආර්ථිකයට ශක්තියක් විය හැකි සැබෑ මිනිසුන්ගේ අවශ්‍යතා තෝරාගෙන, ඒ අයට උදව් පදව් කරන්නයි. උදාහරණයක් හැටියට කියනවා නම්, මට හම්බ වෙන රුපියල් ලක්ෂ දාහෙන් රුපියල් ලක්ෂ හත්සිය පනහක් මම වෙන් කළේ, යම්කිසි හැකියාවක් තිබෙන මිනිසුන්ගේ ජීවනෝපාය සංවර්ධනය කරන්නයි. එයින් රුපියල් ලක්ෂ හයසිය පනහක්ම වියදම් කරලා තිබෙන්නේ, සුළුවට වුණත් යම් දෙයක් රටේ නිෂ්පාදනය කරලා, පිට රට යවලා, ලංකාවට විදේශ විනිමය ගෙන්වා දිය හැකි අංශ සංවර්ධනය කිරීම සඳහායි. *[බාධා කිරීමක්]* ඒ සියල්ල අපට දුන්නේ, ගමේ ආර්ථිකය නඟා සිටුවන්න ශක්තිය දෙන්න කියලායි.

2014දී රාජ්‍ය සේවකයන්ට යතුරුපැදි ලබා දුන්නා. එය පසුව නතර වුණා. විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ කිසිම රාජ්‍ය සේවකයෙකුට යතුරුපැදි හම්බ වුණේ නැහැ. යතුරුපැදි හම්බ වුණේ නැති ලංකාවේ සියලු රාජ්‍ය සේවකයන් සඳහා එම වැඩසටහන නැවත ක්‍රියාත්මක වෙයි කියලා මා හිතනවා. ඒ වාගේම, ත්‍රිරෝද රථ නියාමනය කරන්න අධිකාරියක් පත් කරලා තිබෙනවා. මා ඉල්ලීමක් කරනවා, එය අත්‍යවශ්‍ය සේවාවක් වාගේම, එය ජනතාවට ප්‍රිය මනාප, ආරක්ෂිත සේවයක් බවට පත් කරන්න අවශ්‍ය නීති රීති ගෙන එන්න කියලා. මෙවර අය වැයෙන් සුබසාධන කටයුතු සඳහා මුදල් වෙන් වෙලා තිබෙනවා; එහි බොහෝ සාධනීය තැන් තිබෙනවා.

නමුත්, සමහර අය කියන්න පුළුවන් අපට මේකෙන් සාධාරණයක් වුණේ නැහැ කියලා. හැබැයි, ඉදිරිපත් කරන්න පුළුවන් හොඳම අය වැයක් තමයි මේ වෙලාවේ අපේ ආණ්ඩුව ඉදිරිපත් කළේ. සියලු මැති ඇමතිවරුන් ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ නිලධාරින් මේකට සහයෝගය දීලා, මේක සාක්ෂාත් කරගන්න අපට ශක්තිය ලබා දෙයි කියලා විශ්වාසයෙන් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

The next speaker is the Hon. Wasantha Yapabandara. You have eight minutes.

[අ.භා. 4.37]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය පිළිබඳව අද අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව පසුපෙළ මන්ත්‍රීවරයෙක් විධියට ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා. දැවැන්ත ලෙස මුළු ලෝකයම ව්‍යසනයකින් වෙළා ගත්ත කොරෝනා වසංගතය වැනි තත්ත්වයක් මේ සියවසේ ඇත්තටම ඇති වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ මේ වාගේ ආර්ථික අවපාතයක් සිද්ධ වෙච්ච ප්‍රබලම අවස්ථාව මේකයි. අපි දන්නවා, ලෝකයේ තෙල් මිල ඉහළයාම දැවැන්ත ලෙස 1970 දශකයේ ආරම්භ වුණු බව. 1973 වාගේ කාලය තුළ ඉතාමත්ම දරුණු විධියට තෙල් මිල ඉහළ ගියා. ඒ අවස්ථාවේදී ඇන්.ඇම්. පෙරේරා මුදල් අමාත්‍යතුමා 1970-75 අතර කාලය තුළ අය වැය ලේඛනය සකස් කිරීමේදී ඉතා දරුණු විධියේ, මේ හා සමාන අවස්ථාවකට මුහුණ දුන්නා. මම හිතනවා, එවැනි දරුණු අවස්ථාවකට මුහුණු දුන්නු ඊළඟ වතාව මේකයි කියලා. ඒ නිසා ගරු මුදල් අමාත්‍යතුමාට ඉතාම දරුණු ව්‍යසනයක් හමුවේ තමයි ආර්ථිකය කළමනාකරණය කරන්න වෙලා තිබෙන්නේ.

ආර්ථික විශාරදයන් විධියට හඳුන්වා දෙන අපේ විපක්ෂයේ මැතිතුමන්ලා කිහිප දෙනෙක්ම බොහොම හැඟීම්බරව මේ සාර්ව ආර්ථිකයේ තිබෙන තත්ත්වය විකෘති අන්දමට හුවා දක්වමින් අද උදෑසන අදහස් ඉදිරිපත් කළා. ඒ නිසා මට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2020 වන විට අපේ රටේ ඍණ 3.6ක ආර්ථික වර්ධන වේගයක් තමයි අපි දකින්නේ. ඒ වාගේම, රාජ්‍ය ආදායම 2020 අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදනයට අනුපාතිකව සියයට 9.2යි. රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදනයට අනුපාතිකව සියයට 20.3ක වාගේ ප්‍රමාණයක් නිසාවෙන්ම, ප්‍රායෝගිකව සියයට 10කට ආසන්න ප්‍රමාණයක අය වැය හිඟයක් වාර්තා කරපු අවුරුද්දක් තමයි 2020 අවුරුද්ද. 2019-2020 වර්ෂවල දිගුවක් විධියට ආවේ යහ පාලන ආණ්ඩු සමයේ පැවැති ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිවිපාකයි. ඒ ප්‍රතිවිපාකවලට තමයි අපි දැන් මුහුණ දෙන්නේ.

යහ පාලන ආණ්ඩු කාලයේ ලංකාවේ ආර්ථිකය මේ වාගේ දරුණු ව්‍යසනයකට මුහුණ දෙනවා තබා පොඩි කුණාටුවකටවත් ලක් වෙච්ච නැති වසර 5ක් තමයි ගත වුණේ. නමුත් ඊට පස්සේ ඇතිවෙලා තිබෙන තත්ත්වයත් එක්ක බලන කොට අපේ රටේ භාණ්ඩ මිල ගණන් ලෝකයේ භාණ්ඩ මිල ගණන්වලට සමානුපාතිකව ඉහළ නොගියත්, දැවැන්ත ලෙස භාණ්ඩ මිල ඉහළ යාම රජය කළමනාකරණය කරන්න උත්සාහ කරනවා. මේවා අමතක කරලා, රටේ සාර්ව ආර්ථික යථා තත්ත්වය අමතක කරලා, මේ අය වැය පිළිබඳව හුදු අවලාද ඉදිරිපත් කරන විපක්ෂය පෙන්වා දෙන කාරණා සම්බන්ධයෙන් අපට තිබෙන්නේ විමතියක්. එතුමන්ලා කථා කරනවා, රටේ ව්‍යුහාත්මක ආර්ථික වෙනස්කම් කරන්න කියලා. එහෙම වෙනස්කම් කරන්න කියන උදවිය කාබනික පොහොර පිළිබඳ සාකච්ඡාවේදී ක්‍රියා කරන්නේ, හැසිරෙන්නේ කොයි විධියටද? දේශීය නිෂ්පාදන ආර්ථිකයට නැඹුරු වෙච්ච ආර්ථික ක්‍රමයක් පිළිබඳ ආදර්ශ ගෙනෙන වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේත්, සමඟි ජන බලවේගයේත් ඉන්න ප්‍රතිසංස්කරණවාදීන් ගෙනහැර දක්වන ප්‍රතිසංස්කරණ පිළිබඳව අපට තිබෙන්නේ විශ්මයක්. එතුමන්ලා කාබනික පොහොර ව්‍යාපෘතිය එදා පුන්කලස තියලයි පටන් ගත්තේ. නමුත්, අද වනතෙක් ඔවුන්ට එය යථාර්ථයක් කර ගන්න බැරි වුණා. අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන්න කියලා කියන්නේ මේ කියන සාධනීය තත්ත්වය පිළිබඳව යහපත් ආකල්පයකින් ද? අද වන විට ලෝකයේ මොකක්ද වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? 2015දී ගෑස් මිල විතරක් මම උදාහරණයකට ගන්නම්. 2015දී LP gas මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 551යි. 2020දී LP gas මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 501ක් විධියටයි සඳහන් කරන්නේ. ඒ කියන්නේ, ගෑස් මිල දෝලනය වුණේ ඩොලර් 551ත්, 501ත් කියන මේ වාගේ සීමාවක් තුළයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය සීමිත නිසා මම ඉක්මනින් කියන්නම්, 2021 ඉඳලා මාසයෙන් මාසය ගෑස් මිල වර්ධනය වුණේ කොහොමද කියලා. LP gas මෙට්‍රික්ටොන් එකක මිල වර්ධනය වුණේ මෙහෙමයි. ඩොලර් 641යි; ඩොලර් 696යි; ඩොලර් 709යි; ඩොලර් 644යි; ඩොලර් 631යි; ඩොලර් 725යි; ඩොලර් 761යි; ඩොලර් 770යි; ඔක්තෝබර් මාසය වන කොට ඩොලර් 901යි. LP gasවල වාගේම කිරි පිටිවල, තිරිඟු පිටිවල, සිමෙන්තිවල, පරිප්පුවල මිලත් ලෝක වෙළෙඳ පොළ තුළ මාසයෙන් මාසයට අදහාගන්න බැරි විධියට ඉහළ ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි ලෝකයේ භාණ්ඩ මිල මේ විධියට ඉහළ ගියේ? ලෝකයේ රටවල් මාස ගණන් වහලා තිබුණා. ඕස්ට්‍රේලියාව අවුරුද්දක් වහලා තිබුණා. රටක් වහනකොට නිෂ්පාදන ආයතන වහනවා. නිෂ්පාදන ආයතන අරින්නේ රට විවෘත කරනකොටයි. පසුගිය දවස්වල නැවත රට විවෘත කළා. ඒ විවෘත කරනකොට සැපයුම ස්ථාවරව තිබුණා. නමුත් දැවැන්ත ලෙස මිනිසුන් තමන්ගේ ඉල්ලුම වැඩි කළා. බාගෙට හදපු ගෙවල් හදන්න පටන් ගත්තා. Lockdown සීමා ඉවත් කළා. ගමනාගමනය බහුල වුණා. තෙල් මිල ඉහළ ගියා. මේ සියල්ලත් එක්ක ලෝක මට්ටමින් සිමෙන්ති මිල, ගෑස් මිල, කිරිපිටි මිල, පරිප්පු මිල ඇතුළු සියලු භාණ්ඩවල මිල ගණන් ඉහළ ගියා.

අපේ සංචාරක කර්මාන්තය, අපේ රටේ ආදායමේ ප්‍රබල මූලයක් බව අපි දන්නවා. අපේ රටේ සේවා ආර්ථිකය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 56ක ප්‍රමාණයක් බව ඔබතුමන්ලා දන්නවා. මේ සේවා ආර්ථිකයේ ප්‍රබල අවස්ථාවක් තමයි සංචාරක කර්මාන්තය. 2018දී සංචාරක ඉපැයීම්වල ප්‍රමාණය ඩොලර් මිලියන 4,301යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, 2021 වසරේ තව මාස දෙකක් තිබෙනවා. මේ වන විට සංචාරක ඉපැයීම්වල ප්‍රමාණය ඩොලර් මිලියන 33යි. මෙබඳු සාර්ව ආර්ථික අගාධයක් තිබෙන අවස්ථාවක හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලාට මේ තත්ත්වය පේන්නේ නැත්තේ ඇයි? විදේශ සංචිත ප්‍රමාණය පැත්තෙන් සහ ණය බර පහත දැමීම පැත්තෙන් අප මේ රට ගෙනැවිත් තිබූ තැනවත් ආරක්ෂා කිරීමට පසුගිය අවුරුදු පහ ඇතුළේ එතුමන්ලාට පුළුවන් වුණාද කියලා මම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙන් අහනවා.

අපේ ගරු මුදල් අමාත්‍යතුමා ඉතා සාධනීය යෝජනා රැසක් මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා. පංචවිධ ආර්ථික කේන්ද්‍රය පුබුදුවාලීමට එතුමා ගන්නා උත්සාහය මේ ආර්ථිකය නංවාලීමට ගත්ත ඉතාම වැදගත් උත්සාහයක් කියා මා විශ්වාස කරනවා. දැනුමේ කේන්ද්‍රය, බල ශක්තියේ කේන්ද්‍රය, වාණිජ කේන්ද්‍රය, නාවික කේන්ද්‍රය, ගුවන් කේන්ද්‍රය යන පංචවිධ කේන්ද්‍රයට පණ දෙන්න එතුමාට ශක්තිය, ධෛර්යය ලැබෙයි කියා මම විශ්වාස කරනවා. මේ රටේ විශාලත්වය වර්ග කිලෝමීටර් 65,610යි. මේ කුඩා රටේ අපට කළ හැකි වැඩිම ආයෝජනය තමයි ලෝකයේ ඉන්න දරුවන්ට -ශිෂ්‍යයන්ට- අධ්‍යාපනය ලබා දීම සඳහා ජාත්‍යන්තර පාසල්, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ඇති කිරීම. දැනුම අළෙවි කරන, ආසියාවේ දැනුමේ කේන්ද්‍රය බවට මෙරට පත් කිරීමට මෙවර අය වැයෙන් අත තැබීම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කපිල අතුකෝරල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු කපිල අතුකෝරල මහතා**
(மாண்புமிகு கபில அதுகோரல)
(The Hon. Kapila Athukorala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජයේ දෙවැනි අය වැය ලේඛනය ඊයේ දිනයේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. පසුගිය යහ පාලන රජය සමයේ මේ රටටත්, රටේ මිනිසුන්ටත් දැවැන්ත අසාධාරණයන්ට ලක් වීමට සිදු වුණා. ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් මේ රටේ මිනිසුන් කඩා වැටිලා තිබුණු අවස්ථාවක, රටේ ජාතික ආරක්ෂාවට දැවැන්ත බලපෑමක් එල්ල වෙමින් තිබූ අවස්ථාවක, වසර 30ක් තිස්සේ තිබුණු යුද්ධය අවසන් කරලා අනෙක් සියලු ප්‍රශ්නත් විසඳලා මේ රට අපි පසුගිය යහ පාලන රජයට භාර දුන්නා. නමුත්, ආපසු ඉස්ලාම් අන්තවාදය, දමිළ අන්තවාදය තැන් තැන්වල හිස ඔසවනකොට, තැන් තැන්වල මිනිසුන් මැරෙනකොට, බෝම්බ පුපුරණකොට, තැන් තැන්වල ලේ ගංගා ගලනකොට මිනිසුන් ජාතික ආරක්ෂාව යහපත් කර දෙන්න කියලා ඉල්ලුවා. ඒකට විසඳුම දුන්නු නායකයා, ඒ වේලාවේ ඇති වුණු ප්‍රශ්නයත් එක්ක මේ රටේ සුවිසල්ම දේශපාලන ව්‍යාපාරය නිර්මාණය කළ නායකයා වන වර්තමාන මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අද සෞභාග්‍යයේ දැක්මට අනුගත වෙමින් සිය මංගල අය වැය ඉදිරිපත් කර තිබෙනවා. මේ මොහොතේ විශේෂයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිටින සිංහල, දමිළ, මුස්ලිම් ජනතාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ එකම මන්ත්‍රීවරයා විධියට මම පළමුවෙන්ම මේ සභාවට දැන්විය යුතු කරුණක් තිබෙනවා. මේ ඉදිරිපත් කළ අය වැය හරහා විශේෂයෙන් මගේ දිස්ත්‍රික්කයේ මිනිසුන්ට වාගේම මේ රටේ මිනිසුන්ට යහපතක් වන "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය හෙට දින යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් කියලා මම පළමුවෙන්ම මතක් කළ යුතුයි.

මේ ඉදිරිපත් කර තිබෙන්නේ මේ රටේ 76වැනි අය වැයයි. මීට පෙර ගොඩක් නායකයෝ මේ රට පාලනය කළා. ඇමතිවරු, මන්ත්‍රීවරු බොහොමයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ බොහෝ වකවානුවල තත්ත්වය මොකක්ද? විශේෂයෙන් ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ සමය ගත්තොත්, ඒ යුගයේ තමයි එල්ටීටීඊ සංවිධානය බිහි වෙන්නේ, දෙමළ අන්තවාදී කඳවුරු බිහි වෙන්නේ. ඒ විතරක් නොවෙයි, 1983 ජූලි වැඩ වර්ජනයත් එක්ක වෘත්තිකයන් 5,000කට වැඩි පිරිසක් රැකියාවලින් එළියට දැම්මා. 1988-1989 කාලයේ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරලා, එදා ඒ අඳුරු යුගය නිර්මාණය කළා. ඒ වාගේම 1985 මැයි 14වැනිදා අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉදිරිපිට මනුෂ්‍ය ඝාතන රැසක් සිදු කළා. 1987 ජූනි 02වෙනි දා අරන්තලාවේදී භික්ෂූන් වහන්සේලා හතළිත් දෙනමක් ඝාතනය කළා. කාත්තන්කුඩි පල්ලියට ආගම අදහන්න ගිය 144දෙනෙකු ඝාතනය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ආර්. ප්‍රේමදාස යුගයේ 1988 -1989 කාලය කියන්නේ තරුණ තරුණියෝ 60,000ක් මේ රටට අහිමි කළ යුගයක්. ඒ වාගේම නීත්‍යානුකූල නොවන "කොළ කොටි, කහ බළල්ලු" වාගේ මර්දනකාරී සංවිධාන නිර්මාණය කළ යුගයක්; සූරියකන්ද, බටලන්ද වාගේ තැන් නිර්මාණය වුණු යුගයක්; එල්ටීටීඊ සංවිධානය නැවතත් ශක්තිමත් කරගන්න අවශ්‍යකරන සහයෝගය දුන්නු කාලයක්. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලාට මතක ඇති, ඒ කාලය ඩෙන්සිල් කොබ්බෑකඩුව මැතිතුමා වාගේ හොඳ නායකයෝ නැති වුණු යුගයක් වාගේම, 1993 මැයි 01වෙනි දා රටේ හිටපු නායකයාත් ඝාතනය වුණු යුගයක් බව. ඉන් පසුව බලයට ආපු චන්ද්‍රිකා කුමාරතුංග යුගය තුළ, 1996 ජනවාරි 31වෙනි දා ත්‍රස්තවාදීන් මහ බැංකුවට ප්‍රහාරය එල්ල කළා. එහිදී මරණ 31ක් වුණා. තුවාලකරුවන් 1,400ක් සිටියා. ඒ වාගේම 1998 ජනවාරි 25වෙනි දා ශ්‍රී දළදා මාළිගාවට ප්‍රහාරයක් එල්ල වුණා. 2001 ජූලි 24වෙනි දා කටුනායක ගුවන් තොටුපළට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වුණා. රටට මිලියන, බිලියන ගණනක් පාඩු කළ යුගයක් ඒ යුගය. මම ඔබතුමන්ලාට මතක් කළ යුතුයි, හැම දාම රාජපක්ෂවරු මේ රට භාර ගත්තේ රටට ඉතාම අපහසු යුගවලදී බව. නියපොත්තෙන් කඩන්නට තිබුණු දේ පොරවෙන්වත් කඩලා අවසන් කරන්නට බැරි අවස්ථාවලදී තමයි එතුමන්ලාට මේ රට භාරගන්න සිද්ධ වුණේ.

ඔබතුමන්ලාට මතක ඇති, එල්ටීටීඊ සංවිධානය අපේ යුද හමුදා සොල්දාදුවන්ගේ කකුල් කපලා අරගෙන ගියා "බූට්" දෙක ගන්න. ඒ වාගේම, සොල්දාදුවන්ට "වෙපන්" එකක් අතේ නැති වුණු වෙලාවක් තිබුණා. අවසානයේ ත්‍රස්තවාදීන් මිසයිල මඟින් සහ ගුවන් යානාවලින් ප්‍රහාර දියත් කරන්න පටන් ගත්තා. එවැනි තත්ත්වයක් තිබියදීයි 2005දී මහින්ද රාජපක්ෂ මහත්මයා බලයට එන්නේ. එදා මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ බලයට ආවේ නැත්නම් කථා කරන මමත්, මගේ කථාව අහගෙන ඉන්න මේ බොහොමයක් දෙනාත් අද ජීවතුන් අතර නැති බව මම පළමුවෙන් මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ්-19 වයිරසය ගැන අද මිනිසුන්ට අමතක වෙලා. මේ වයිරසයත් එක්ක වසර දෙකකට ආසන්න කාලයක් රටේ මිනිසුන්ට ජීවනෝපාය මාර්ග අහිමි වුණා, දරුවන්ට අධ්‍යාපනය අහිමි වුණා, ඥාති හිතවතුන් නැති වුණා. එවැනි යුගයක් පාස් කරලා -පහු කරලා- ආර්ථික පසුබෑම් බොහොමයක් ඇතිවෙලා තිබෙන වෙලාවකයි ගරු මුදල් ඇමතිතුමා මේ අය වැය මේ රටට ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජීවත් වන කෙනෙකු හැටියට මේ වෙලාවේ මම මේ කාරණයත් මතක් කළ යුතුයි. පසුගිය කාලයේ ත්‍රිකුණාමලයේ ඉඳලා හබරණට එන්න, කොළඹට එන්න බැරි යුගයක් තිබුණා. මේ වයිරසය පාලනය කර ගන්න රට වැහුවා, ඇඳිරි නීතිය දැම්මා. ඒ වෙලාවේ මේ රටේ මිනිසුන්ට ආර්ථික ප්‍රශ්න බොහොමයක් ඇති වුණා, නිෂ්පාදනය ඇනහිටියා. එහෙම යුගයක් පහු කරලායි ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති, "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළත් එක්ක මේ වෙනකොටත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ බොහොමයක් වැඩ කටයුතු ක්‍රියාත්මක වෙන බව. "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" සිංහලද, දමිළද, මුස්ලිම්ද කියලා බලන්නේ නැතිව සිංහල, දමිළ සහ මුස්ලිම් මිනිස්සු ජීවත් වෙන හැම කොට්ඨාසයකම ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම මාර්ග කිලෝමීටර ලක්ෂයක් කාපට් කිරීමේ වැඩ සටහන තුළ හැම තැනම පාරවල් ටික කාපට් වෙනවා. අද දමිළ, මුස්ලිම් ජනතාව ජීවත් වන ප්‍රදේශවල පවා ජාතික පාසල් ටික ස්ථාපිත වෙලා තිබෙනවා. "සියක් නගර", "වාරි සෞභාග්‍යා" වැනි වැඩසටහන් සහ වැව්ලි භෝග වැඩසටහන යටතේ දැවැන්ත සංවර්ධන කටයුත්තක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට කර දී තිබෙන බව මම මතක් කරන්නට ඕනෑ, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමනි. ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා වාගේම ගරු කෘෂිකර්ම ඇමතිතුමා මේ කටයුතු සඳහා අවශ්‍ය කරන සහයෝගය දීලා තිබෙනවා. තවත් ගරු ඇමතිවරු සහ රාජ්‍ය ඇමතිවරු ගණනාවක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සිංහල, දමිළ සහ මුස්ලිම් මිනිසුන්ට අවශ්‍ය කරන සේවා සපයමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මතක් කරන්න ඕනෑ තවමත් ජාතිවාදී අදහස් එක්ක, අන්තවාදී අදහස් එක්ක දේශපාලනය කරන කඳවුරු විපක්ෂය පැත්තේ සිටීම අභාග්‍යයට කාරණාවක් බව. විශේෂයෙන් සමගි ජන බලවේගය, එක්සත් ජාතික පක්ෂය, දෙමළ ජාතික සන්ධානය, මුස්ලිම් කොංග්‍රසය වාගේ පක්ෂ තවමත් ජාතිවාදය වපුරමින් දේශපාලනය කිරීම ගැන මා තුළ තිබෙන්නේ විරෝධයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙනකොට දමිළ ත්‍රස්තවාදීන්ගේ ඍජු ප්‍රහාරයට හසු වුණු වෙරුගල්, ඊච්චලම්පත්තු ගම්මාන පවා දියුණු කරන්න අවශ්‍ය කටයුතු ටික සිද්ධ කරගෙන යනවා. ඒ වාගේම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට සිංහල ද, දමිළ ද, මුස්ලිම්ද කියලා බලන්නේ නැතිව නිවාස 750කට ආසන්න ප්‍රමාණයක් අපි මේ වෙනකොටත් ඉදි කර දී තිබෙනවා.

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ රටට අපහසුම වෙලාවක ජනතාවට සේවා සපයන්න අවශ්‍ය කරන යෝජනා රැසක් මේ අය වැය මඟින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අතරින් අධ්‍යාපන අංශයේ සංවර්ධනය වෙනුවෙන් දැනට වෙන් කර තිබෙන මුදල්වලට අමතරව රුපියල් මිලියන 5,300ක පමණ මුදලක්, ජීවනෝපාය සංවර්ධනයට රුපියල් මිලියන 19,894ක පමණ මුදලක් වෙන් කර තිබෙනවා. ගැබිනි මාතාවන්ට පෝෂණ මල්ල ලබා දෙන කාලය වසර දෙකක් දක්වා දීර්ඝ කර තිබෙනවා. ඊළඟට, සෞඛ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. ත්‍රිරෝද රථ රියැදුරන්ටත් මේ අය වැය හරහා පහසුකම් දෙන්න එතුමා කටයුතු කර තිබෙනවා. "Home Shop" වාගේ වැඩසටහන් ගෙනැල්ලා, ග්‍රාමීය නිෂ්පාදනයට අවශ්‍ය කරන සේවා ටික සපයලා තිබෙනවා. ඒ වාගේම, ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව අවසන් කරන්න අවශ්‍ය කරන සහයෝගය දීලා තිබෙනවා.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මේ වෙලාවේ මම මෙන්න මේ කාරණය මතක් කරනවා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මොහොතකට ඉස්සෙල්ලා මෙතැනදී වීරයෙකු වාගේ කෑ ගහමින් විවිධ දේවල් කිව්වා. නමුත්, එතුමා 2005 වර්ෂයේ මානුෂීය මෙහෙයුම වෙලාවේ HSBC බැංකුව ඉස්සරහා උද්ඝෝෂණය කළා. එතුමා කිව්වා, මේ රටට ණය දෙන්න එපා, ණය දුන්නොත්, එතුමන්ලාගේ ආණ්ඩුවක් ආවොත් ඒවා ගෙවන්නේ නැහැ කියලා. යුද්ධය අවසන් කරන කොට, මිනිසුන්ගේ දුප්පත්කම අවසන් කරන කොට විපක්ෂය විධියට විරුද්ධ වෙච්ච කණ්ඩායම අදත් විපක්ෂයේ ඉදිරි පෙළ සිටීම කනගාටුවට කාරණාවක්. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා විධියට මේ රටට ඉදිරිපත් කර තිබෙන අයවැය වාර්තාව හරහා හෙට දවසේ රටට සුබදායක දෙයක් වෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.53]

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම දරුණු විධියට මේ රටේ ආර්ථිකය කඩා වැටිලා, රටේ ජන ජීවිතය අඩාළ වෙලා තිබෙන වෙලාවක, ලෝක වසංගත තත්ත්වයකට මුහුණ දෙන වෙලාවක බොහෝ දෙනා කිව්වේ, ශක්‍රයාගේ පුතා වයිමා ආවත්, රටේ ජනතාවට සහන දෙන්න බැහැ කියන කාරණාවයි. හැබැයි, එවැනි වාතාවරණයකදී පවා රට යම් සුබවාදී තැනකට ගේන්න, සාධනීය අය වැයක් ඉදිරිපත් කරන්න ගරු මුදල් අමාත්‍ය, බැසිල් රාජපක්ෂ මැතිතුමා කටයුතු කර තිබෙනවා. අපට අද පෙනෙනවා, මේ ඉතාම අසීරු, අමාරු අවස්ථාවේ ඉතාම නිවැරැදි ආකාරයෙන් රටේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වැඩසටහන් සහිතව එතුමා මේ අය වැය ඉදිරිපත් කර තිබෙන බව. මේ අය වැය තුළ මේ රටේ සියලුදෙනාගේ අපේක්ෂා, බලාපොරොත්තු ඉෂ්ට වන යෝජනා රාශියක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහෝ අය මේ අය වැය විවේචනයට ලක් කරන්න උත්සාහ කරන්නේ උඩින් අත පත ගාලා. විපක්ෂයේ සමහර අයත් කිව්වා, "මේ තියෙන තත්ත්වයත් එක්ක මේ සැරේ නම් සාර්ථක අය වැයක් ලේසියෙන් ගේන්න බැහැ." කියලා. හැබැයි, ඊයේ ගරු මුදල් ඇමතිතුමා අය වැය යෝජනා කියවන කොට අපට පෙනුණා, එතුමා සූක්ෂ්ම විධියට ආදායම් උත්පාදනය කරගෙන තිබෙන බව. ඒ වාගේම, "මල නොතළා රොන් ගන්නවා වාගේ" බදු අය කර ගන්නා ගමන්, අනෙත් පැත්තෙන් අඩු ආදායම් ලබන පොඩි මිනිහාට සහන රාශියක් මේ අය වැය හරහා ලබා දීලා තිබෙනවා. එම නිසා පළමුව අපි එතුමාට අපේ ගෞරවය, ප්‍රණාමය පළ කරන්න ඕනෑ.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පසුගිය කාලයේ කිව්වේ, "සංවර්ධනය ඕනෑත් නැහැ; මාර්ග හදන්න ඕනෑත් නැහැ; අධිවේගී මාර්ග ඕනෑත් නැහැ. මොන වැඩක් නොකළත් කමක් නැහැ. ඒ සියල්ල නවත්වලා ගුරුවරුන්ගේ ප්‍රශ්නය විතරක්වත් විසඳන්න" කියලායි. විපක්ෂයේ අයට විතරක් නොවෙයි, ඒ මතයේ හිටපු හැමෝටම මම මේ වෙලාවේ කියනවා, ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳුවා වාගේම රටේ සංවර්ධනය සහ ජනතාවගේ අනෙක් අවශ්‍යතාත් විසඳන්නත් මේ අය වැය හරහා යෝජනා ඉදිරිපත් කර තිබෙන බව. එතුමන්ලා කිව්වා වාගේ එක කටයුත්තක් කරන්න අනෙක් සියල්ල නැති කරලා නැහැ. ගුරුවරුත් හිතුවේ නැහැ, ඔවුන්ට මේ වෙලාවේ එකවර මේ සහනය දෙන්න ආණ්ඩුවට පුළුවන් වෙයි කියලා; ආණ්ඩුව මේ සහනය දෙයි කියලා. දරුවාගේ හෙට දවස යහපත් කරන්න ඕනෑ නිසා මේ රටේ දරුවාගේ හෙට දවස හදන නායකයා වන ගුරුවරයාට නියම තැන දෙන්න එතුමා අවශ්‍ය කැප කිරීම කරලා, අදාළ මුදල වෙන් කර දුන්නා. එම නිසා අවුරුදු 24ක් පැවැති ප්‍රශ්නයක් එකවර විසඳාගන්න ඒ හරහා පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, මේ අය වැය හරහා අපට පුළුවන්කම ලැබුණා, විවිධ ක්ෂේත්‍රවලට සහන ලබා දෙන්න. මෙවර අය වැය ගැන බොහෝ දෙනා මෙම ගරු සභාවේත්, එළියේත් කථා කරන කොට කී කරුණු අනුවත්, පුවත් පත්වලට අනුවත් අපට පෙනෙන්නේ, රාජ්‍ය අංශයේ පඩි වැඩි නොකරපු එකයි, මේ ජීවන වියදම අවම කරන්න යම් විසඳුමක් මෙහි නැහැ කියනවා වාගේ අදහසකුයි. හැබැයි අපට පැහැදිලිව කියන්න පුළුවන්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මේ අය වැය තුළ රාජ්‍ය සේවකයා සම්බන්ධයෙන් යම් යම් කාරණා කියා තිබෙන බව. අපේ ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ යතුරුපැදි දෙනකොට ඒ සඳහා රුපියල් 50,000ක් ගැනීම ගැන යහ පාලන ආණ්ඩුව බලයට ගෙන ආ අය කිව්වා, "නැහැ, අපි යතුරුපැදි නිකම් දෙනවා" කියලා. අනේ, අපේ ආණ්ඩුව දීපු යතුරුපැදියෙන් ගිහිල්ලා යහ පාලන ආණ්ඩුව බලයට ගෙනෙන්න ජනතාව ඡන්දය දුන්නා. අන්තිමට තිබුණු එකත් නැති වුණා. ගරු සජිත් ප්‍රේමදාස මහත්මයලා, ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයලා එදා ඒ සියල්ල දෙනවා කියලායි බලයට ආවේ.

ඒ සියල්ල දෙනවා කියා බලයට ඇවිත් එදා එතුමන්ලා තිබුණු එකත් නැති කළා. අද නිකම් මැරිලා ඉපදුණා වාගේ එතුමන්ලා කියන්න හදනවා, "අපි හිටියා නම්, හොඳට කරනවා. පට්ට වැඩක්

[ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා]

කරන්න තිබුණා." කියලා. අපි එතුමන්ලාට කියනවා, එතුමන්ලා කළ පට්ට වැඩේ ගැන. උස නම් ඒ අයට සිකියුරිටි දුන්නා; මිටි නම් කම්කරු දුන්නා. එතුමන්ලා ඊට වඩා දෙයක් රටට කර තිබුණේ නැහැ. මහ දවල් මහ බැංකුව කොල්ල කාලා, මේ රටේ ආර්ථිකය කඩා වට්ටලා, මේ රටේ ජන ජීවිතය අඩාළ කරලා, පාස්කු ඉරු දින ප්‍රහාරය එල්ල වන විධියට රටේ ආරක්ෂාව තුට්ටුවට දමා කටයුතු කළ ඒ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ ජන ජීවිතය විනාශ වනකල් බලා සිටියා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමන්ලා අද වීරයන් වාගේ කෑ ගහනවා. නමුත් එදා පාස්කු ඉරු දින ප්‍රහාරය එල්ල වුණාම එතුමන්ලා "මීක්" කිව්වේ නැහැ. එතුමන්ලා එදා සද්ද නැතිව සිටියා. මොකද, ඒ සියලු චෝදනා එතුමන්ලාගේ කර පිට වැටුණා. දැන් කියන්න හදනවා, ඒකත් අපේ වැඩක් කියලා. හැබැයි, අද වනවිට පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධවත් තීන්දු තීරණ ගෙන තිබෙනවා; අනෙකුත් කාරණා සම්බන්ධවත් තීන්දු තීරණ ගෙන තිබෙනවා.

අපේ රජය මේ රටේ ජාතික පාසල් ගොඩ නැඟීම ඇතුළුව පාසල් පද්ධතිය සංවර්ධනය කරන්න, දරුවාට අවශ්‍ය පහසුකම් ටික සපයන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා විතරක් නොවෙයි, අඩු ආදායම්ලාභී ජනතාව ඇතුළු සියලු දෙනාට සහන ලැබෙන විධියේ වැඩ පිළිවෙළකුත් මේ අය වැය හරහා සකස් කර තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, ලක්ෂ හතරකගේ පමණ රැකී රක්ෂා අඩපණ වුණා, ඔවුන්ට සහනයක් දීලා නැහැ කියලා. ඉතින්, ත්‍රිරෝද රථ රියැදුරන් කියන්නේත් රැකී රක්ෂා අඩපණ වෙච්ච අය තමයි. ඒ වාගේම, වෑන් රථ රියැදුරන් ඇතුළු කුලී රථ රියැදුරන්, පාසල් දරුවන් ප්‍රවාහන කරන අයත් එදිනෙදා ආදායම් උපයා ගත් අය. ඒ සියලු දෙනාට සහන ලබා දීමට අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. පසු ගිය කාලයේ එතුමන්ලා කිව්වා, ගැබිනි මාතාවන්ට ලබා දෙන පෝෂණ මල්ලත් දෙන්නේ නැහැ කියලා. හැබැයි, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඒකට උත්තරයක් දීලා තිබෙනවා, අවුරුද්දක් නොවෙයි, අවුරුදු දෙකක් යනකල් එම පෝෂණ මල්ල දෙන්න අපට පුළුවන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැවැති මුදල් ප්‍රමාණයත් එක්ක බැලුවාම මේවා කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබුණා. හැබැයි, ඒ සියලු සහන ලබා දීලා තිබෙනවා.

අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කියා තිබෙනවා, "මේක හීන් දාඩිය දමන අය වැයක්" කියලා. අපි අහනවා, හීන් දාඩිය දමන්නේ, ප්‍රකෝටිපතියන්ගෙන් සියයට 25ක මුදලක් ගන්නකොට ද කියලා. සමහර විට එහෙම වෙන්නේ යටින් එතුමන්ලාට යන මුදල් නැති වන නිසා වෙන්න ඇති. එහෙම නැත්නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දෙන කාල සීමාව දීර්ඝ කළ නිසාද, එහෙමත් නැත්නම්, මේ රටේ නාස්තිය, දූෂණය පිටු දකින නිසාද හීන් දාඩිය දමන්නේ? රාජ්‍ය අංශවල තිබෙන නාස්තිය අඩු කරලා, ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ වැය ශීර්ෂවලට වෙන් කරන මුදල් අඩු කරලා, ඒවා මේ රටේ ගුරුවරුන්, දරුවන් ඇතුළු ජනතාවට සහන ලබා දීමට යොදවා තිබෙනවා. දූෂණය, වංචාව වැළැක්වීම විතරක් නොවෙයි, නිවැරැදි කළමනාකරණයක් කරලා අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන කොට විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සතුටු වෙන්න ඕනෑ. හැබැයි, විපක්ෂය හිතුවේ, මෙහෙම අය වැයක් නොව මීට වඩා අන්ත අමාරු අය වැයක් ගෙන එනවා කියලායි.

මේ අය වැය ගෙනාවාම ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා කියා තිබෙනවා, මේක ඉතියෝපියාවේ අය වැයක් කියලා. එතුමන්ලාට අමතක වෙලා තිබෙනවා, එතුමන්ලාගේ ආණ්ඩු කාලය ගැන. එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ගෙන ආ අයවැයවලින් මේ රටේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළේ එක අවස්ථාවකදී විතරයි. ඒ ආණ්ඩුව පැවැති අවුරුදු 5ටම වැටුප වැඩි කළේ රුපියල් 10,000කින් විතරයි. ඒකෙන් අවුරුද්දකට ලබා දුන්නේ රුපියල් 2,000ක පමණ මුදලක්. අද තිබෙන මේ තත්ත්වයත් එක්ක ගත්තාම, වැටුප් සම්බන්ධව සමාලෝචනයකට ගිහිල්ලා ඊළඟ වර්ෂවලදී වැටුප් වැඩි කිරීමකට යන්න අපට පුළුවන්. අද මෙතරම් අමාරුම තැනක සිටියදීත් තමයි ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය විසඳා දුන්නේ. එහෙම නම්, අපේ ආණ්ඩුව වැටුප් සම්බන්ධ ප්‍රශ්නයත්, රාජ්‍ය අංශයේ අනෙක් ගැටලුත් විසඳන්න කටයුතු කරන බව පැහැදිලියි. මම විශ්වාස කරනවා, වැටුප් වැඩි කරන තීන්දු තීරණ ගන්නා අතරම, ඉදිරි කාලය තුළ ඒ ඒ අමාත්‍යාංශවල නිලධාරින් හරියාකාරව මැදිහත් වෙලා රාජ්‍ය සේවකයන්ගේ ප්‍රශ්න ටික විසඳනවා නම්, වැටුප් වැඩි කිරීම් හා සමානව යම් යම් සහන ලැබෙයි කියලා. වැටුප් වර්ධක ගෙවීම විවිධ කාරණා නිසා හිර කරගෙන සිටියා. නමුත් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා කියා තිබෙනවා, වැටුප් වර්ධක ලබා දෙන්න, ඒවා හිර කරගෙන ඉන්න එපා, වෙන වෙන නීති දමන්න එපා කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිවම කියන්න ඕනෑ, මේ ආණ්ඩුව ජනතාවට සහන දෙන කොට විපක්ෂයේ අයට බලාගෙන ඉන්න බැරි බව. මොකද, ඒ අය හිතුවේ නැහැ මෙවැනි තත්ත්වයකට යන්න අපට පුළුවන්කම තිබේවි කියා. නමුත් අපට ඒ තැනට යන්න පුළුවන් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට ඉතියෝපියාවක්, එහෙම නැත්නම් සෝමාලියාවක් බවට පත් කළා නම්, එසේ කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේයි, සජිත් ප්‍රේමදාස මහත්මයාගේයි ආණ්ඩුව. ඒ කාලයේ තමයි රටේ ජනතාව මහා විශාල අපහසුතාවකට පත් වුණේ. අනෙක් අතට, පල්ලියට ගිය අහිංසක මිනිසුන් පාස්කු ඉරු දින ප්‍රහාරය නිසා ලේ ගංගා මැද මැරී වැටුණා. ඒ තැනට මේ රට පත් කළේ කවුද? ඒ නිසා අපි පැහැදිලිව කියනවා, සියයට 8.3ක ආර්ථික වර්ධනයක් එක්ක අප භාර දුන් ආර්ථික වර්ධනය සියයට 2.3 දක්වා අඩු කරලා රට අවාසනාවන්ත තැනකට ගෙනිහින් විනාශ කළා නම්, එසේ කළේ පසු ගිය යහපාලන ආණ්ඩුව බව. ඒක කවුරුත් දන්නවා. තමන්ට මේ රටේ පැවැති ඡන්ද පදනම බිංදුවට වැටිලා අද විපක්ෂයට යන්න සිදු වුණේ ඒ නිසායි කියන කාරණාව අමතක වෙලා නම්, එය මතක් කරගන්න කියා අපි එතුමන්ලාට කියනවා.

ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2021 නොවැම්බර් 15 වන සඳුදා පවත්වනු ලැබේ.***

*அப்பொழுது நேரம் பி.ப.5.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2021 நவம்பர் 15, திங்கட்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Monday, 15th November, 2021.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තැබීම, ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය.

## කාලගුණ ආපදාවලට මුහුණ දීමේ පෙර සූදානම
## காலநிலை அனர்த்தங்களுக்கு முகங்கொடுப்பதற்கான முன்னாயத்தம்
## PREPAREDNESS TO FACE CLIMATE DISASTERS

[අ.භා. 5.01]

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "කාලයක් ශ්‍රී ලංකාව ස්වාභාවික විපත්වලින් ආරක්ෂිත රටක් ලෙස පිළිගැනීමට පත්ව තිබුණද, අද වනවිට එම තත්ත්වය වෙනස් වෙමින් පවතී. විශේෂයෙන් ලෝක කාලගුණික අවදානම් දර්ශකයේ 2017 වර්ෂය වනවිට 109 වන ස්ථානයේ පසු වූ ශ්‍රී ලංකාව මේ වනවිට 31 වන ස්ථානයට පැමිණීමෙන් මෙම බැරෑරුම් තත්ත්වය මනාව පැහැදිලි වේ.
>
> ගෝලීය උණුසුම ඉහළ යෑමත් සමඟම මෙම අහිතකර ප්‍රතිඵල ඇති වීම සිදු වන බව පරිසරවේදීන්ගේ මතය වන අතර, පෙර පැවති සම්ප්‍රදායික කාලගුණික රටා වෙනස් වන බව දක්නට ඇත. පසුගිය වසර කිපය ඇතුළත ශ්‍රී ලංකාවේ ඇති වූ ගංවතුර, නාය යෑම්, සුළි හු වලන, නියඟ ආදිය කෙරෙහි අවධානය යොමු කිරීමේදී මේ බව පෙනී යයි. මෙම තත්ත්වයට කෙසේ මුහුණ දිය යුතුද යන්න අප පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව සොයා බැලිය යුතුය.
>
> මේ වනවිට ලංකාවේ කෑගල්ල, මහනුවර, නුවරඑළිය, බදුල්ල වැනි කඳුකර දිස්ත්‍රික්ක නාය යෑම්වලට ලක්වී විශාල පිරිසක් අවතැන්ව සිටින අතර ජීවිත හානිවීම් ද වාර්තා වේ. මෙම අවතැන් පුද්ගලයන්ට සහන සැලසීම, වන්දි ගෙවීම නොපමාව සිදු කළ යුතු අතර හඳුනා ගත් අවදානම් කලාපවලින් ජනතාව ඉවත් කිරීමටත්, ඔවුන්ට ජීවත් වීමට සුදුසු ප්‍රදේශ ලබා දීමටත් වහාම පියවර ගත යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.
>
> එමෙන්ම දැනට ලෝකයේ ඇති වෙමින් පවතින කාලගුණික අවදානම් තත්ත්වයට කෙසේ ශ්‍රී ලංකාව මුහුණ දිය යුතුද යන්න සොයා බැලීමට සියලුම ක්ෂේත්‍රයන්හි විශේෂඥයින්, ප්‍රවීණයන්ගෙන් යුත් කමිටුවක් පත් කරන ලෙසත්, එකී නිර්දේශ හා යෝජනා කඩිනමින් ලබාගෙන මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි යෝජනා කර සිටිමි."

පසුගිය කාලයේ මෙරට භූමි ප්‍රමාණයෙන් සියයට 30ක් නාය යෑමේ හා පස් කණ්ඩි කඩා වැටීමේ අවදානමට ලක්වී ඇති බව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ නාය යෑම් පර්යේෂණ අංශය ප්‍රකාශයට පත් කර තිබෙන බව අපි දැක්කා. වර්ෂා කාලයේ දී මේ ආපදා තත්ත්වය ලෝකයට වාගේම අපේ රටටත් විශාල ලෙස බලපානවා. ඒ නිසා මේ සඳහා කෙටි කාලීන විසඳුම් නොව ස්ථිරසාර විසඳුම් අවශ්‍ය බව අපි විශ්වාස කරනවා. මොකද, හැමදාම ජනතාව ආපදාවට පත්වනවා. අපි කවදාවත් හිතුවේ නැහැ, කොළඹ සහ ගම්පහ නගර ගංවතුරින් යට වෙයි කියලා. හැබැයි, අපි අහලා තිබෙන ආකාරයට මීට අවුරුදු දහයකට, පහළොවකට පෙර එක අවස්ථාවක පමණයි කොළඹ සහ ගම්පහ නගර ගංවතුරෙන් යට වුණේ. නමුත් අද වනකොට - අවුරුදු දෙක තුනක් ඇතුළත- කොළඹ නගරයත් ගංවතුරින් යටවෙලා, ජනතාව ආපදාවට ලක්වෙලා අසරණ වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගංවතුර මුළු රටටම බලපානවා. විශේෂයෙන්ම මම නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කය තුළ සිදු වූ ඉතා ආසන්නතම සිදුවීම තමයි, රඹුක්කන, ගලිගමුව ප්‍රදේශයේ සිදු වූ ආපදා තත්ත්වය. එම ආපදා තත්ත්වය නිසා මේ වනවිට ජීවිත හයක් අහිමි වෙලා තිබෙනවා.

අපට මතකයි, 2016 මැයි 18 වැනිදා අරණායක ප්‍රදේශය නාය යෑමට ලක් වුණු අවස්ථාවේ ජීවිත ගණනාවක් බිලි දෙන්න සිදු වුණු බව. එවකට පැවති ආණ්ඩුවෙන් එම ජනතාවට සාධාරණයක් ඉටු වුණේ නැහැ. මේ වනතුරුත් ඔවුන්ට සාධාරණයක් ඉටුවෙලා නැහැ. එහි යම් යම් අඩුපාඩු, ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා තාවකාලික විසඳුම් නැතිව ස්ථිර විසඳුමක් මේ ජනතාවට ලබා දෙන්න කියා මේ ගරු සභාවට වාගේම ගරු අමාත්‍යතුමාටත් මම යෝජනා කරනවා. ඔවුන්ට පදිංචියට සුදුසු ස්ථාන හොයා දීලා, ඔවුන් එම ස්ථානවල ස්ථිරවම පදිංචි කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. මොකද, අපි ඒ ජනතාව බලන්න ගියාම ඔවුන් හඬා වැටෙමින් අපිට කිව්වා, "අවුරුදු ගණනාවක් අපි හම්බ කරපු දේවල් නැති වුණා. අපි බැංකුවලින් loans අරගෙන ජීවිත කාලයම වපුරපු දේ තමයි අද මේ කඩා වැටිලා තිබෙන්නේ. මුළු පවුලම ඉවරයි, දරුවන්ගේ අනාගතය ඉවරයි" කියලා. මේ සියලු කාරණා තුළින් අපිට මනාව පැහැදිලි වන්නේ මේ කාරණයට අපි ස්ථිරසාර විසඳුමක් ලබා දිය යුතු බවයි.

මේ වනවිට ආපදා තත්ත්වයත් එක්ක කඩුගන්නාව ප්‍රධාන මාර්ගය තාවකාලිකව වසා දමා තිබෙනවා. මේ ආපදා තත්ත්වය මුළු රටටම බලපානවා; රටේ ආර්ථිකයට බලපානවා. මේ කාරණය කෙරෙහි දැඩි අවධානය යොමු කරන්න කියා ගරු ඇමතිතුමාගෙන් මම මේ අවස්ථාවේ දී ඉල්ලා සිටිනවා. අහිංසක, දුප්පත් ජනතාව ජීවිත කාලයේ දීම හම්බ කළ සියලු සේසත මේ ආපදා තත්ත්වයත් එක්ක එක මොහොතකින් විනාශ වෙලා යනවා. හැබැයි, මේකට ජනතාවත් වග කිව යුතුයි. මොකද, අනාරක්ෂිත සහ අවදානම් ස්ථානයක් කියලා කිව්වත්, ජනතාව එම අවදානම් තත්ත්වය නොතකමින් ඒ ස්ථානවලම පදිංචිවෙලා ඉන්නවා. ආපදාවක් පැමිණි අවස්ථාවක අපිට ගිහිල්ලා කියන්න පුළුවන්, මේ ස්ථානය අවදානම් නිසා එතැන ඉන්න එපා කියලා. හැබැයි, ඒ මිනිසුන්ට අපි යන්න කියන්නේ කොහේටද? ඒ මිනිසුන්ට පදිංචි ස්ථානයෙන් ඉවත් වෙන්න කිව්වාට ස්ථිර ස්ථානයක් නැතිව ඒ අය ඒවායෙන් ඉවත් වෙන්නේ නැහැ. අවදානම් තැනක පදිංචිව සිටීම නිසා ඒ අයගේ ජීවිත විනාශ වෙනවා. එම නිසා මේ මොහොතේ අපි ජනතාවගේ පැත්තෙනුත් හිතන්න ඕනෑ. විශේෂයෙන්ම කඳු ආශ්‍රිතව ජීවත් වෙන ජනතාවට ජීවත් වෙන්න සුදුසු බිම් - වතු ආශ්‍රිත ඉඩම් - සොයා දී ඒ මිනිසුන්ට ස්ථිර නිවාස හදලා දෙන එක තමයි මෙයට ස්ථිරසාර විසඳුම වන්නේ. එම නිසා රජයකට බරක් නොවෙන ආකාරයට ඉදිරියට අපි ඒ ස්ථිරසාර විසඳුමට යා යුතු වෙනවා.

මෙම යෝජනාව ඉදිරිපත් කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා. එතුමිය ඉදිරිපත් කර තිබෙන යෝජනාව අපි කාටත් දැනෙන, අපිට බලපාන කාරණයක්. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ, කැලණිගඟ මිටියාවතේ, අංගොඩ ප්‍රදේශයේ ඉඳලා හංවැල්ලට යනකම් ගත්තාම, අවුරුදු 50ක් ගතවන තුරුත් එම ප්‍රදේශයෙන් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙක් තේරී පත්වෙලා තිබුණේ නැහැ. නමුත් සූරියමල් ව්‍යාපාරයේ ඉඳලා වාමාංශික ඡන්ද විශාල ප්‍රමාණයක් තිබුණු ඒ කැලණි ගඟ මිටියාවත ප්‍රදේශය තුළින් මන්ත්‍රීවරයෙකු බිහිවීමත් සමඟම කොළඹ දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය සම්බන්ධයෙන් විශාල වශයෙන් නොයෙකුත් පියවර ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිපුරම ගංවතුරට යට වන ප්‍රදේශයක තමයි මගේ නිවස පිහිටා තිබෙන්නේ. ගරු අමාත්‍යතුමාට මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අවිස්සාවේල්ල - කොටහැර කන්ද ගැන. මම මීට අවුරුද්දකට පෙරත් මේ කාරණය මතක් කළා . අවිස්සාවේල්ල - කොටහැර කන්ද අවට තිබෙන නිවාස විශේෂයෙන්ම NBRO එක විසින් මුල් අවස්ථාවේ දී අනාරක්ෂිතයි කියලා ඉවත් කරන්න ඕනෑ කිව්වත්, එම කාරණය පාර්ලිමේන්තුවේ දී සහ COPE කමිටුවේදී ඉදිරිපත් වුණාට පසුව, ආපසු වාර්තාවක් එනවා ඒ ගෙවල් ටික ආරක්ෂිතයි කියලා. ඉතින් මට විශාල ගැටලුවක් තිබෙනවා, මේක කොහොමද වෙන්නේ කියලා. මොකද, දශක ගණනක් තිස්සේ අනාරක්ෂිතයි කියපු නිවාස ටික, අපි පාර්ලිමේන්තුවේ කථා කර ටික දවසකට පසුව එක පාරටම ආරක්ෂිත බවට පත් වුණේ කොහොමද? ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු ඇමතිතුමනි. මොකද හේතුව, යම් තත්ත්වයක් නිර්මාණය වෙලා, ඒ අහිංසක මිනිසුන් මැරුණාට පසුව ඒ ගැන අපි ශෝක වෙලා, ශෝක පණිවුඩ යවලා වැඩක් නැති බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඩුවෙල ප්‍රදේශයේ ගංවතුර පාලනය කරන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන යම් වේල්ලක පසුගිය දිනෙක යම් leak එකක් තිබිලා, ඒ leak එක නවත්වන්න ප්‍රාදේශීය ලේකම්තුමා, නගරාධිපතිතුමා සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරු ඉතා කඩිනමින් මැදිහත් වුණා. පසුගිය දා අපි නොහිතපු ලෙස ගංවතුර තත්ත්වය ඉහළ යාම තුළ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කර, ඒ කාරණය ඉතා ඉක්මනින් මැඩ පවත්වා ගන්න අපිට පුළුවන් වුණා. නැත්නම් ඒ වේල්ල හඳන අවස්ථාවේ ගඟේ වතුර ඇතුළට එනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, කඩුවෙල වෙළේ හන්දියේ bund එක අපි දැන් නවීකරණය කරගෙන යන බව. ඒත් එක්කම ලැනරෝල් මාවතේ පාලමේ floodgate එක අලුතෙන් හදනවා. මුත්තෙට්ටු ඇළ රන්වල bund එක පුරවන්න කටයුතු කර තිබෙනවා. සති පාසල අසළ ඇස්තමේන්තු කර තිබෙනවා. වාරි මාර්ග දෙපාර්තමේන්තුව මහා මාර්ග දෙපාර්තමේන්තුවත් සමඟ එකතුවෙලා තමයි මේ කාරණා සිද්ධ කරන්නේ. ඒත් එක්කම අතුරුගිරිය පාර අසළ තිබෙන floodgate එක නවීකරණය කරන්නත් අපි අඩිතාලම දාලා තිබෙනවා. හෙට්ටිගේ ඔය අසළ පාලම, ඒ වාගේම කොරතොට පන්සල අසළ පාලම ලැනරෝල් මාවතේ පාලම කියන මේ සියල්ල කඩිනමින් ඉදිවෙනවා. ගරු අමාත්‍යතුමනි, මේ ආරම්භ කරපු වැඩ ටික ගංවතුර කාලයට විතරක් නැවත ආරම්භ කරන්නේ නැතුව ඉතා ඉක්මනින් ඉදිරි ගංවතුරට ඉස්සෙල්ලා අවසන් කිරීමේ යුතුකම ආණ්ඩුවක් හැටියට අපි කළ යුතුයි කියන කාරණය මේ අවස්ථාවේ මම අවධාරණය කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs)

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ප්‍රේම්නාත් සී.දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *left the Chair, and* THE HON. PREMNATH C. DOLAWATTE *took the Chair.*

[අ.භා. 5.10]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය අද දිනයේ මෙම ගරු සභාවට කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මීට කලින් ශ්‍රී ලාංකික පුරවැසියන් විධියට අපි කථා කළේ, පාසැල් යන කාලයේ අපිට අහන්න, දකින්න ලැබුණේ, අපි ඉගෙන ගත්තේ ශ්‍රී ලංකාව කියන්නේ ස්වභාවික විපත්වලින් අඩුම රටක් කියලායි. නමුත්, අපි දැන් රටක් විධියට ගත්තාම ගිනි කඳු කියන උවදුරෙන් හැරෙන්න අනෙකුත් සියලුම උවදුරුවලට මුහුණ දෙන රටක් බවට පත් වෙලා සිටිනවා. මෙය ක්‍රමානුකූලව අපේ රටේ වසරක්, දෙකක් තුළ නිර්මාණය වෙච්ච කාරණයක් නොවුණා වුණත්, හැම රජයක් විසින්ම තමන්ගේ හිතවතුන් පිනවන්න, තමන්ගේ දේශපාලන අවශ්‍යතා සපුරා ගන්න මේ රටේ ඉදි කරපු සංවර්ධන යෝජනා හරහා ක්‍රමානුකූලව ආපු ගමන් මගක ප්‍රතිඵල තමයි අපි අද භුක්ති විඳිමින් සිටින්නේ.

අපට එක කාලයකට නියඟයට මුහුණ දෙන්න වෙනවා. තවත් කාලයකට ගංවතුරට මුහුණ දෙන්න වෙනවා. ඒ විතරක් නොවෙයි. දැන් අපි භූමිකම්පාවලටත් මුහුණ දෙන රටක් බවට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ සමහර විපත් පාලනය කර ගන්න බැරි වුණාට, නිවැරදි කළමනාකරණය තුළින් රටක් විධියට දීර්ඝ දැක්මක් අනුව සංවර්ධන කටයුතුවලට මුහුණ දුන්නා නම්, ගංවතුර, නාය යෑම් වාගේ දේවල් පාලනය කර ගන්නත් අපට පුළුවන්කම ලැබෙනවා. හැබැයි, අපේ අවාසනාවට, රටේ අවාසනාවට ඒ සියල්ලට අද අපි මුහුණ දෙමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව අධීක්ෂණය කර ඔබතුමාගේ අවධානය යොමු කළොත් ගංවතුර උවදුර අඩු කර දෙන්න ඔබතුමාට පුළුවන්. ගංවතුර උවදුරෙන් අපේ රට බේරා ගැනීමට අවශ්‍ය යම් කිසි කාර්යභාරයක් කරන්න ඔබතුමාට පුළුවන්. අනෙක් කාරණය තමයි, නිවැරදි දැක්මක් ඇතිව කැපවීමෙන් හා සද්භාවයෙන් කටයුතු කරනවා නම්, අපේ රටට නියඟය පැමිණෙන කාල සීමාවේදී අපට එයටත් හොඳින් මුහුණ දිය හැකියි. අපට මේ උවදුරුවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ මෙවැනි දේවල් සම්බන්ධයෙන් අපේ රටේ ගත්තා වූ වැරදි තීන්දු නිසායි. අපි අහලා තිබෙන විධියට අපේ අතීත රජවරු කිව්වේ, අහසින් වැටෙන එක දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යෑමට ඉඩ නොදිය යුතු බවයි. හැබැයි, අද වැස්සක් වහිනකොට දෝරෙ ගලා ගෙන යනවා. අනුරාධපුරය දිස්ත්‍රික්කය ගත්තාම කලා වැව, රාජාංගනය වැව වාගේ වැව් හා ජලාශ සමහර කාලවලදී දෝරෙ ගලා ගෙන යනවා. ඒවායෙන් අද ප්‍රයෝජන ගන්නේ නැහැ. අද අපේ රටේ ජනතාව කෘෂි කර්මාන්තයෙන් ඈත් වෙලා වෙන පැත්තකට යනවා. ගරු ඇමතිතුමනි, මේ දිනවල මේ විධියට වර්ෂාව ලැබුණත් ජූනි, ජූලි, අගෝස්තු වාගේ කාලය වන විට නැවත අපට නියඟයකට මුහුණ දෙන්න සිදුවන බව ඔබතුමාත් දන්නවා. ඒ නිසා දෝරෙ ගලාගෙන යන මේ වතුර ටික ගබඩාකර තබාගන්න පහසුකම් සපයා ගැනීමට අපට පුළුවන් නම්, ඒක ඉතා වටිනවා. වාරිමාර්ග අමාත්‍යවරයා විධියටත්, එහෙම නැත්නම් මේ රජයේ වගකීමක් දරන බලසම්පන්න අමාත්‍යවරයෙකු විධියටත්, අය වැයෙනුත් විශාල මුදලක් වෙන්වෙලා තිබෙන අමාත්‍යවරයෙකු විධියටත් ඔබතුමා මේ කටයුතු නිවැරදිව කළමනාකරණය කරගෙන සුපුරුදු වැව් නඩත්තු කිරීමේ කටයුතු කරනවා නම් හොඳයි.

"වාරි සෞභාග්‍යා" වැඩසටහන කියන්නේ හරි ලස්සන වැඩසටහනක්. "සෞභාග්‍යය" කියන වචනය එල්ලුවාම සියලු ප්‍රශ්න විසඳෙයි කියලා අපි හිතාගෙන ඉන්නවා. නමුත්, "වාරි සෞභාග්‍යා" වැඩසටහන අපේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙන නිසා ඒ ගැන මම දන්නවා. ඒ වැඩසටහන මුදල් කාබාසිනියා කරන සුදු අලියෙක් කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, අනුරාධපුරය දිස්ත්‍රික්කයට මීට පෙර කවදාවත් වෙන් නොකරපු විධියට වැව් සංවර්ධනය කිරීමට මුදල් සම්භාරයක් වෙන් කර තිබෙන බව. එක වැවකට කවදාවත් වෙන් නොවුණු විශාල මුදලක් වෙන් කර තිබෙනවා. හැබැයි, එලෙස මුදල් වෙන් කර සංවර්ධනය පටන් ගත යුතු කාල සීමාවේ නොවෙයි ඒවායේ සංවර්ධන කටයුතු පටන් ගත්තේ. අප්‍රේල්, මැයි මාසය වාගේ වැව් පිරී ඉතිරී තිබෙන කාලයක "වාරි සෞභාග්‍යා" වැඩසටහනට රුපියල් ලක්ෂ 800ක්, රුපියල් ලක්ෂ 1,200ක් වාගේ මුදලක් වෙන් කරනවා. මීට පෙර කවදාවත් මා නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයේ වැවකට එවැනි මුදලක් වෙන් කරලා නැහැ. මෙවා නිතරම නඩත්තු කෙරෙන වැව්. නමුත්, ඒ වැව්වලටත් එච්චර මුදලක් වෙන් කර තිබෙනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඒ ස්ථානය කියන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු අමාත්‍යතුමනි, අනුරාධපුරයෙන් පටන් ගත්තාම ගල්කුලම වැව පළමුවෙනි වැව. ඊට පසු තිරප්පනේ වැව, මරදන්කඩවල වැව, කැකිරාවේ මලව වැව, කැකිරාවේ තිබ්බටු වැව යනාදී තවත් වැව් කිහිපයක් තිබෙනවා. ඔබතුමාට මම ඒ සියලු විස්තර දෙන්නම්. ඒ සියලු වැව්වල සංවර්ධන කටයුතු පටන් ගත්තේ වතුර තිබෙන කාලයේ. ඒ කාලයේ බැකෝ එකක් ගෙනැත් දමාගෙන බැකෝ එක පාවෙවී, පාවෙවී පස් කඳු ගැහුවා. අවසානයේදී අගෝස්තු මාසය වන විට ඒ වැව් සියල්ල හිඳුණා. ඊට පස්සේ පාවෙවී කඳු ගහපු පස් ටික ඩෝසර්වලින් අරගෙන යනවා. අපරාදේ, අපේ ඇස් පනා පිට මුදල් කාබාසිනියාවීමක් සිදු වුණා. නිසි වෙලාවේ නියම විධියට කටයුතු කළා නම්, ඒ වැව සංවර්ධනය කරන්න එතරම් මුදලක් අවශ්‍ය වන්නේ නැහැ. අපේ රටට ජලය ලැබෙන කාලයේදී ඒ ජලය ගබඩා කර ගැනීමේ අවස්ථාව උදා කර දෙනවා නම් මම හිතනවා, අපට එක පැත්තකින් නියඟයට මුහුණ දෙන්න හැකියාව ලැබෙනවා වාගේම, අනෙක් පැත්තෙන් ගංවතුරටත් නිසි පිළියමක් ලැබෙනවා කියලා. එම නිසා අපි මේ කාරණා පාලනය කර ගත යුතුයි.

අනෙක් පැත්තෙන් අද අපි නාය යෑමේ උවදුරටත් මුහුණ දී තිබෙනවා. අපි දැක්කා ජනාධිපතිතුමා කියනවා, "ගොවියා කෘෂි කර්මාන්තයට බලහත්කාරයෙන්, ඕනෑ නම් බෙල්ලෙන් අල්ලාගෙන ගිහිල්ලා තල්ලු කරලා දාන්න අපට පුළුවන්" කියලා. අද නාය යෑම් වෙලා මේ රටේ ජීවිත ගණනාවක් හානි වෙනකොට කියනවා, "අපි රතු කලාප විධියට නම් කර දීලා මේ ස්ථානවලින් ජනතාවට අයින් වෙන්න කිව්වත්, ඒ ජනතාව අයින් වුණේ නැති නිසා තමයි අද මේ ජීවිතවලින් වන්දි ගෙවන්න වෙලා තිබෙන්නේ, මේ දේපළ විනාශ වෙලා තිබෙන්නේ" කියලා. ඒක නිලධාරි මහත්වරුන්ගේ වචනවලින්ම තමයි අපට අහන්න ලැබුණේ. ගොවියාගේ බෙල්ලෙන් අල්ලාගෙන ගිහිල්ලා, ඔවුන් බලහත්කාරයෙන් කුඹුරුවලට දාලා කාබනික වගාව කරවන්න පුළුවන් කියලා හැඟීමක් ජනාධිපතිතුමාට ඇති වෙනවා නම්, අදාළ නිලධාරින් විසින් නාය යන අවදානම් ප්‍රදේශ හඳුනා ගෙන තිබෙනවා නම්, තමන්ට ජීවිත අවදානමක් තිබෙනවා කියලා නොතේරෙන අහිංසක වැසියන් පිළිබඳ අවධානය යොමු කරලා මේ අය අවදානම් ස්ථානවලින් ඉවත් කර ඒ අයට සුදුසු ස්ථානයක් ලබා දීමට කටයුතු නොකරන්නේ මන්ද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. ඒ නිසා මේ කියන දේවල් කථාවට හොඳයි. අපි බොහෝ දේවල් කථා කරනවා, විවාද කරනවා. නමුත්, ප්‍රායෝගිකව මේ පොළෝ තලයේ නොවුණු කාරණා තමයි අපි අවුරුදු ගණනාවක් තිස්සේ අත් විඳිමින්, භුක්ති විඳිමින් ඉන්නේ කියන එක බොහොම පැහැදිලියි. මේ රටේ ජනාධිපතිවරයාගේ වාගේම, අගමැතිවරයාගේ වැඩිමහල් සහෝදරයා විධියටත්, මෙවර අය වැයෙනුත් විශාල මුදලක් වෙන් කර තිබෙන මේ ආණ්ඩුවේ බලසම්පන්න අමාත්‍යවරයෙකු විධියටත්, මේ සිදුවන ස්වාභාවික විපත්වලින් අපේ රට ආරක්ෂා කර ගන්න පුළුවන් හැම අංශයකින්ම අපේ රට ආරක්ෂා කර දෙන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් කරමින් මම නිහඬ වනවා, ගරු ඇමතිතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදත් මංජුල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද මා නියෝජනය කරන දිස්ත්‍රික්කයම නියෝජනය කරන ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය දිස්ත්‍රික්කයට වාගේම රටටත් -විශේෂයෙන් අපට- සෘජුවම බලපාන ආපදා තත්ත්ව පිළිබඳව ඉදිරිපත් කළ මේ යෝජනාව මම අගය කරනවා.

ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය වාගේම, වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාත් මේ සභාවේ සිටින වෙලාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියටත්, වසර පුරා අඛණ්ඩව ආපදාවලට මුහුණ දෙන ප්‍රදේශයක මහජන නියෝජිතයකු හැටියටත් කරුණු කාරණා ගණනාවක් කියන්න මා බලාපොරොත්තු වෙනවා. පසුගිය සති දෙකක කාලය තුළ අපි ගංවතුර තර්ජනයට මුහුණ දුන්නා. ඒ වාගේම නාය යෑමේ තර්ජනයටත් අපි සෘජුව මුහුණ දුන්නා. ගතවූ දින 14 තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජීවිත 6ක් ඇතුළු රටේම ජීවිත 26ක් අහිමි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද තාක්ෂණය මොන තරම් ඉදිරියට ගියත්, භූමිය අවභාවිත කිරීම නිසා තමයි මෙවැනි ප්‍රධාන අභියෝග ගණනාවකට අපි මුහුණ දී තිබෙන්නේ කියා මා සිතනවා. මෙහිදී අපි දකින ප්‍රධාන කාරණයක් තිබෙනවා. සංවර්ධනය රටට අවශ්‍යයි. සංවර්ධනය සඳහා භූමිය භාවිත කිරීමේදී සිදුවන අවභාවිත කිරීම් තුළ අපි විවිධ අභියෝගවලට මුහුණ දෙනවා. එක පැත්තකින් ස්වාභාවික විපත් හැටියට අපි දකින ගංවතුර, නාය යෑම්, නියඟය, අකුණු සැර වැදීම, සුළි සුළං වැනි තත්ත්ව අතරින් නාය යෑමේ තර්ජනවලට ගොදුරු වෙන්න ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ භූමිය අවභාවිත කිරීමයි.

ඒ වාගේම තමයි, ගංවතුර තර්ජනයත්. ගරු අමාත්‍යතුමනි, අපි ජීවත් වන්නේ කැලණි ගං මිටියාවතේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල තුන් කෝරළේ බැලුවාම කැලණි ගඟ, ගුරුගොඩ ඔය, රිටිගහ ඔය, වී ඔය නිසා අපේ ප්‍රදේශයට විශාල තර්ජනයක් තිබෙනවා වාගේම, කොළඹ දිස්ත්‍රික්කයේ ගංවතුර තර්ජනයටත් ඒවා සෘජුව බලපානවා.

මීට කලින් වයඹ පළාතේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්න කැලණි ගඟේ ජලය අපේ ප්‍රදේශයෙන් භූගත ක්‍රමයකට වයඹ පළාතට ගෙනයන්න යෝජනාවක් තිබුණා. බොහොම පැහැදිලි තාක්ෂණ ක්‍රමවේද භාවිත කර එවැනි කටයුත්තක් කළොත්, කොළඹ දිස්ත්‍රික්කයට ගංවතුරින් වන විපත පාලනය කරන්න පුළුවන් වාගේම, අපේ ප්‍රදේශයේ ක්ෂණිකව ඇතිවන ගංවතුර තර්ජන පාලනය කරන්නත් අනාගතයේදී අවස්ථාවක් ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාණිජ කටයුතු සඳහා භූමිය භාවිත කිරීම, ජනාවාස සඳහා භූමිය භාවිත කිරීම, කෘෂි කාර්මික කටයුතු සඳහා භූමිය භාවිත කිරීම, රක්ෂිත ලෙස භූමිය යොදා ගැනීම ආදී කටයුතුවලදී තාක්ෂණික වශයෙන් පැහැදිලිව ඒ භූමිය පිළිබඳ පූර්ව අධ්‍යයනයක් කරලා කටයුතු කළොත් මෙවැනි විපත්වලින් අනාගතයේදී අපට ආරක්ෂා වෙන්න පුළුවන්.

රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකේම ආපදා ගම්මාන දෙකක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. එකක් තමයි, 2016දී සාමසර කන්ද නාය යෑමට සමගාමීව දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිදු වූ නාය යෑම නිසා පවුල් 39ක් සහමුලින් ඉවත් කර "සඳමිණිගම" කියන ආදර්ශ ආපදා ගම්මානයට ඒ අය ගෙන ගොස් තිබෙනවා. ඒ වාගේම රුවන්වැල්ල, මුරලිය ප්‍රදේශයේ ආපදා ගම්මානයක් තිබෙනවා. එහි පවුල් 37ක් සිටිනවා. හැබැයි, මේ අයට අවශ්‍ය මූලික කරුණු කාරණා ඉෂ්ට කරන්න යහ පාලන රජය කාලයේ කටයුතු කළේ නැහැ. අපි තමයි ඊයේ-පෙරේදා ඒ ප්‍රදේශයට ජල පහසුකම් ටික දුන්නේත්, ගරු අමාත්‍යතුමනි. ඒ ප්‍රදේශයට ප්‍රවේශ මාර්ගය හදා දුන්නේ නැහැ, ජලය දුන්නේත් නැහැ. එම නිසා ඒ අය තවත් ආපදාවකට තමයි ලක් කළේ, ගරු අමාත්‍යතුමනි. මේ වාගේ ආපදාවලට ලක්වූ ජනතාවට ආපදා සඳහා සහන සලසනකොට ඒ අයට අවශ්‍ය මූලික පහසුකම් ටික නිසි පරිදි ලබාදීමට අවධානය යොමු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, මේ යෝජනාව ගෙන ඒම ගැන අපේ සහෝදර මන්ත්‍රීතුමියට නැවත වරක් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය විසින් අද ඉදිරිපත් කළේ කාලෝචිත යෝජනාවක්.

ඇත්තටම මේ කාලය තුළ පමණක් නොවෙයි, සෑම අවුරුද්දකම ස්වාභාවික විපත් අප රට තුළ වෙනවා. එයින් ජීවිත හානි, දේපළ හානි විශාල වශයෙන් සිද්ධ වෙනවා. ඒක දැන් වැඩිවෙලා තිබෙනවා. නියං කාලයේත් එහෙමයි. මේ අවුරුද්ද තුළ විශාල ගං වතුර ගැලීම්, නාය යෑම් සිද්ධ වුණා. මම ජීවත් වෙන රත්නපුර දිස්ත්‍රික්කයත්, කෑගල්ල දිස්ත්‍රික්කයත් වර්ෂාව වැඩි දිස්ත්‍රික්ක. ඉතින් ගං වතුර ගැලීම්, නාය යෑම් බහුලව වෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශවල නිරන්තරයෙන්ම ගල් පෙරළීම්, පස් කඳු කඩා වැටීම් සිද්ධ වෙනවා අයහපත් කාලගුණය නිසා. රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැළියගොඩ, පැල්මඩුල්ල, බලංගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නාය යෑම් අවදානම් පැවතිය හැකි ප්‍රදේශ ලෙස ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් නම් කරලා තිබෙනවා. ඒ වාගේම අප දිස්ත්‍රික්කයේ තිබෙන කළු ගඟ අයහපත් කාලගුණ තත්ත්වය හමුවේ පිටාර ගලනවා. ඒ නිසා කළු ගඟ අවට ප්‍රදේශවල ජීවත් වෙන ජනතාවට විශාල වශයෙන් හානි සිද්ධ වෙනවා. ගොඩක් ජනතාව ජීවත් වෙන්නේ ගංගා දෙපස. ඒ නිසා ජීවිත හානි, දේපළ හානි වෙනවා. මේ තත්ත්වය නිසා ඔවුන්ට තිබෙන පහසුකම් නැති වෙනවා. මොකද, ගං වතුර ගැලුවාම යන්න එන්න විධියක් නැතුව කොටු වෙනවා. මොකද, ඔවුන්ට බෝට්ටු නැහැ; ඔරු නැහැ. ඉතින් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ ගොල්ලන්ට ඒ පහසුකම් ලබා දෙන්න කියලා. මොකද, ආහාරපානවත් නැතුව ඒ ජනතාව ඉතාම අපහසුතාවට පත් වෙනවා. අනෙක් අයටවත් මේ විපතට පත්වන අයට ආහාරපාන ගෙනියන්න විධියක් නැහැ. මොකද, එතැනට යන්න අපහසුකම් තිබෙනවා, බෝට්ටු, ඔරු නැති ප්‍රශ්නය නිසා. ඉතින් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපේ ඒ ජනතාවට ඒ පහසුකම් ලබා දෙන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රදේශවල නාය යෑම් බහුලව සිද්ධ වෙනවා. ඒ නිසා ඒ ජනතාවට ඒ ප්‍රදේශවලින් හැකි ඉක්මනින් අයින් වෙන්න කියනවා. නමුත් ඒ ගොල්ලන්ට යන්න

තැනක් නැහැ; ස්ථිර තැනක් නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ ජනතාවට සුදුසු ස්ථාන තෝරා දීලා, ඒ ගොල්ලන් ඒ ස්ථානවල පදිංචි කරවන්න කියලායි. ආපදාවක් වෙනවා කිව්ව හැටියේම ඒ ගොල්ලන් එක්කෝ පන්සලකට නැත්නම් පාසලකට ගිහිල්ලා නවාතැන් ගන්නවා. නමුත් ඔවුන්ට කිසිම පහසුකමක් නැතුවයි එතැන ඉන්න වෙන්නේ. ඒ ආපදාව ඉවර වෙච්ච හැටියේම නැවතත් නාය යෑම්, ගං වතුර ඇතිවන ප්‍රදේශවලටමයි ඒ අයට යන්න කියන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, ඔවුන්ට ස්ථිර තැනක් ලබා දෙන්න කියලා.

පසුගිය සතියේ ඇති වූ අසාමාන්‍ය කාලගුණ තත්ත්වය හේතුවෙන් ඇති වූ අධික වර්ෂාව නිසා දිවයිනේ දිස්ත්‍රික්ක බොහොමයක, එනම් කෑගල්ල, රත්නපුර, කළුතර, පුත්තලම, නුවරඑළිය, මහනුවර, ගාල්ල යන ප්‍රදේශ නාය යෑම්වලට ලක් වුණා. මේ වන විටත් ජීවිත හානි 25ක් සහ දේපළ හානි සිද්ධ වෙලා තිබෙනවා. සමහර ජනතාවගේ නොසැලකිල්ල නිසාත් මේ හානි සිද්ධ වෙනවා. අවදානම් සහිත ප්‍රදේශවලින් ඔවුන්ට ඉවත් වෙන්න කිව්වත්, ඔවුන් යන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමල් රාජපක්ෂ අමාත්‍යතුමා.

[අ.භා. 5.15]

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ කෑගල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙමින් මම මේ ගරු සභාවට ස්වභාවික විපත් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න කැමැතියි.

ශ්‍රී ලංකාව ස්වාභාවික විපත්වලින් ආරක්ෂිත රටක් සේ පැවතුණද, මේ වන විට එම තත්ත්වය වෙනස් වෙමින් පවතිනවා. පැවති ආවේණික කාලගුණික රටාව ගෝලීය උණුසුමත් සමඟ වෙනස් වී තිබෙනවා. ස්වාභාවික පරිසරයේ සමතුලිත බව ගිලිහී තිබෙනවා. ආපදා උවදුරුද ඉහළ ගොස් තිබෙනවා. ඒ අනුව, විවිධ ආපදා හා ආපදා අවදානම් තත්ත්වය හමුවේ ජන ජීවිත සුරක්ෂිත කොට යථාවත් කිරීම රජයේ ප්‍රමුඛ කාර්යයක්. එමෙන්ම ආපදා රහිත පරිසරයක ජීවත්වීම සියලු ජනයා සතු අයිතියක් බව අපි පිළිගන්නවා.

කාලයක් තිස්සේ ස්වාභාවික විපත්වලින් ආරක්ෂිත පරිසරයක ජීවත් වුවද, ශ්‍රී ලංකාව තවදුරටත් එසේ නොවන බව වත්මන් ලෝක කාලගුණික දර්ශකයේ 31වන ස්ථානයට අප රට පත්වීමෙන් නිරූපණය වෙනවා. අද අප ජීවත්වන ලෝකය ගෝලීය දේශගුණික විපර්යාසයන්ගේ බහුල බලපෑමට ලක්වී තිබෙනවා. සමස්ත ලෝකයේම අවධානය යොමු වී ඇත්තේ ලෝකයටම දැඩි බලපෑම් එල්ල කරන ගෝලීය දේශගුණික විපර්යාස හා ඒ නිසා ඇතිවන අහිතකර ස්වාභාවික විනාශකාරී තත්ත්වයන් වෙතයි.

වර්තමානයේ ස්වාභාවික විපත් සම්බන්ධයෙන් දැකිය හැකි ප්‍රධානතම ලක්ෂණය වන්නේ ඒවා ඇති වීමේ තීව්‍රතාව ඉහළ යෑමයි. මෙම වර්ෂයේ මේ දක්වා ස්වාභාවික ආපදා හේතුවෙන් පුද්ගල මරණ 106ක් වාර්තා වෙනවා. පසුගිය වර්ෂයේදී එම සංඛ්‍යාව 62ක් වුණා. එමෙන්ම මෙම වර්ෂයේ නොවැම්බර් මස දක්වා සිදු වූ නිවාස හානි සංඛ්‍යාව 23,119ක්. පසුගිය වර්ෂයේ එම ප්‍රමාණය 29,584ක්. ආපදා කළමනාකරණ කාර්යයන් සඳහා රජයට දරන්නට වන පිරිවැයද මෙම තත්ත්වය නිසා ඉහළ යනවා.

පසුගිය සති දෙක තුළ සිදු වූ ආපදා තත්ත්වය මත කෑගල්ල, මහනුවර, නුවරඑළිය, බදුල්ල යන කඳුකර දිස්ත්‍රික්කවල සිදු වූ නාය යෑම් තත්ත්වය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක පවුල් 546ක් සහ පුද්ගලයන් 1,895ක් පීඩාවට ලක් වුණා. අතර 06දෙනකු මිය ගියා. මීට අමතරව කෑගල්ල දිස්ත්‍රික්කයේ පූර්ණ හානි වූ නිවාස 08ක් සහ අර්ධ නිවාස හානි 278ක් වාර්තාවෙලා තිබෙනවා. සහන මධ්‍යස්ථාන 04ක පුද්ගලයන් 104ක් රඳවා තිබෙනවා.

මහනුවර දිස්ත්‍රික්කයේ අර්ධ නිවාස හානි 116ක්ද, පූර්ණ නිවාස හානි 01ක්ද, මරණ 01ක්ද වාර්තාවෙලා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක පවුල් 45ක පුද්ගලයන් 180ක් පීඩාවට ලක්ව ඇති අතර සහන මධ්‍යස්ථාන 02ක පුද්ගලයන් 16ක් රඳවා තිබෙනවා. අර්ධ හානි සිදු වූ නිවාස 12ක් තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14ක පවුල් 819ක පුද්ගලයන් 3,198ක් පීඩාවට ලක්ව ඇති අතර සහන මධ්‍යස්ථාන 04ක පුද්ගලයන් 118ක් රඳවා තිබෙනවා. නාය යෑම් නිසා මිය යෑම් 04ක් සිදුව ඇති අතර පූර්ණ හානි නිවාස 11ක් සහ අර්ධ හානි නිවාස 647ක් තිබෙනවා.

මේ ආකාරයට කඳුකරයේ නාය යෑම් මත පීඩාවට පත් වූ සියලු අයට ක්ෂණිකව ලබාදිය යුතු ආහාර පාන, වෛද්‍ය සහාය සහ අත්‍යවශ්‍ය අවශ්‍යතා ලබාදී ඇති අතර හානි වූ සියලු නිවාස සඳහා මූලිකව ලබාදෙන රුපියල් 10,000ක දීමනාව දැනටමත් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යවා තිබෙනවා. තවද, සියලු ජීවිත හානි සඳහා අනුමත රුපියල් 2,50,000ක මුදල මුදා හැර තිබෙනවා.

තවද, කඳුකර ප්‍රදේශයේ නාය යෑමේ උවදුරට මුහුණ දී ඇති සියලු නිවාස ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන තිබෙනවා. මෙම නිවාසවල පදිංචිකරුවන් එම ප්‍රදේශයේම වෙනත් ආරක්ෂිත භූමිවල පදිංචි කරවීමේ ක්‍රියාවලියක් රජය විසින් ගෙන ඇති අතර, මේ සඳහා ඉඩම් මිලදී ගැනීමට රුපියල් ලක්ෂ 4ක මුදලක්ද, නිවාස ඉදි කිරීම සඳහා රුපියල් ලක්ෂ 12ක මුදලක්ද දැනට ලබා දෙනවා. ලබන වසරේදී මෙම මුදල තවත් වැඩි කිරීමට බලාපොරොත්තු වෙනවා.

මේ වන විට මෙවැනි හඳුනාගත් නිවාසවලින් ඉදිකිරීම් 1,573ක් අවසන් කර ඇති අතර තවත් නිවාස 1,701ක් ඉදිකරමින් පවතිනවා. තවද, ඉදිරියේදී නිවාස ඉදි කිරීම සඳහා තවත් ඉඩම් 933ක් අත්පත් කරගෙන ඇති අතර එම නිවාස ඉදිකිරීමේ කටයුතුද කඩිනමින් ආරම්භ කරනවා. තවද ඉඩම් අත්පත් කර ගැනීමේ අපහසුතාව මත මහල් නිවාස ඉදිකිරීමටද සැලසුම් කරමින් පවතිනවා.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

කඳුකරයට අමතරව අනෙකුත් දිස්ත්‍රික්කවලද ගංවතුර උවදුර නිසා ආපදාවට ලක් වූ සියලුම අයවලුන්ට මේ සියලුම සහන සහ වන්දි ලබාදීම දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා සිදු කරමින් පවතිනවා.

ගෝලීය කාලගුණික හා දේශගුණික රටාවල ඇතිවන වෙනස්වීම්, වැරැදි භූමි පරිභෝජන රටා හා විනාශකාරී පාරිසරික සාධක කෙරෙහි අවධානය යොමු නොකිරීම, මෙම ආපදා නිරන්තරයෙන් ඇති වීමට හේතු සාධක වී තිබෙනවා.

කෑගල්ල දිස්තික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය විසින් 2021.11.13 දින -අද- සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ යෝජනාවට සමගාමීව මෙම ස්වාභාවික විපත් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීමේ වැදගත්කම මේ ගරු සභාවට පෙන්වා දෙන්න මා කැමැතියි. ගරු මන්ත්‍රීතුමිය යෝජනා කර තිබුණා, විද්වත් වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කරලා ඔවුන්ගේ අදහස් අරගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා. කාලගුණික අවදානම් තත්ත්වයන්ට මුහුණ දිය යුතු ආකාරය සම්බන්ධයෙන් සියලු පාර්ශ්ව ඇතුළත් විද්වත් කතිකාවක් ගොඩ නැඟිය යුතු බව අප රජය තරයේ විශ්වාස කරනවා. අපි දැනටමත් ඒ කටයුතු කරගෙන යනවා. දැනටමත් ඒ සඳහා රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන තිබෙන අතර ඒ සඳහා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය යන ආයතන නියෝජනය වන පරිදි විද්වත් වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීමට විධිවිධාන සිදුකර තිබෙනවා. එමෙන්ම 2021.11.13 දින වන විට, එනම් අද වන විට මෙම ආයතන නියෝජනය කරමින් විද්වත් වෘත්තිකයන්ගේ කමිටුව සඳහා නාම යෝජනා ලබාදෙන ලෙස අමාත්‍යාංශ සහ ආයතන ප්‍රධානීන් දැනුවත් කර තිබෙනවා. ඒ නම් දැන් ලැබෙමින් පවතිනවා. එතකොට අපට පුළුවන් වෙනවා, ඒ පිළිබඳව කමිටුව පත් කරලා කටයුතු කරන්න.

මෙම ගෝලීය වෙනස්වීම් සඳහා ශ්‍රී ලංකාව මුහුණ දෙන්නේ කෙසේද යන්න සබැඳිව පුළුල් කතිකාවකට පැමිණීම අත්‍යවශ්‍ය සේ ම ඒ සඳහා පක්ෂ විපක්ෂ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය අපේක්ෂා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝලීය කාලගුණික අවදානම් තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ කාර්යභාරය, හැම විටම සුරක්ෂිත ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම අරමුණු කරගෙන සිදු කළ යුතු බව මම විශ්වාස කරනවා. ඒ සඳහා දිගු කල් පවත්නා වැඩ පිළිවෙළක් වෙත යොමු වීමට මේ ගරු සභාවේ සියලු පාර්ශ්වයන්ගේ සහාය අවශ්‍ය බව දන්වන්නට කැමැතියි. ඒ වාගේම මේ අවස්ථාවේ කථා කළ අනෙකුත් මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා ඉදිරිපත් කළ අදහස් කෙරෙහිත් අපේ අවධානය යොමු කරනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයෙක් අනුරාධපුරයේ වාරි සෞභාග්‍යා ව්‍යාපෘතිය පිළිබඳව කරුණු දැක්වූවා. මම මේ මාසයේ 18වැනි දා හෝ 20වැනි දා අනුරාධපුරේ යනවා. එතකොට මම එතුමා කියපු කරුණු පිළිබඳව පෞද්ගලිකවම සොයා බලනවා. මම එතුමාටත් ආරාධනා කරනවා, එතුමා සඳහන් කළ වැව් ටික බලන්න මාත් එක්ක එන්න කියලා. එහෙම නැතුව මෙතැනදී චෝදනා කළාට මදි. මම ඒවා පිළිබඳව සොයා බලා කටයුතු කරන්නම්. ඒ වාගේම, රක්වාන ආසනය නියෝජනය කරන ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමියගේ අදහසුත් සැලකිල්ලට අරගෙන, ඒ හැම දිස්ත්‍රික්කයේම සිදු වන දේවල් පිළිබඳව ආපදා කළමනාකරණ අංශයෙන් සොයා බලා කටයුතු කරන්නම්.

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.32ට, 2021 ඔක්තෝබර් 21 වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 15 වන සඳුදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி. ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி. ப. 5.32 மணிக்கு பாராளுமன்றம் அதனது 2021 ஒக்ரோபர் 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 15, திங்கட்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.32 p.m. until 9.30 a.m. on Monday, 15th November, 2021, pursuant to the Resolution of Parliament of 21st October, 2021.*

286 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 286 - இல. 3
Volume 286 - No. 3

2021 නොවැම්බර් 15වන සඳුදා
2021 நவம்பர் 15, திங்கட்கிழமை
Monday, 15th November, 2021

# පාර්ලිමේන්තු විවාද
## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
## (HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

**2021 නොවැම්බර් 15වන සඳුදා**
**2021 நவம்பர் 15, திங்கட்கிழமை**
**Monday, 15th November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
වරප්‍රසාද: "BATTI TV" නාලිකාවේ විකාශය වූ වීඩියෝ දර්ශනය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**මැතිවරණ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව**

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය] - පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 – [දෙවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල්තැබීමේ යෝජනාව:**
බලංගොඩ කැල්සයිට් නිධියෙන් ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சிறப்புரிமை: "BATTI TV" அலைவரிசையில் வெளியான வீடியோ காட்சி

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தேர்தல் சட்டங்கள் மற்றும் தேர்தல் முறைமை தொடர்பாகப் பொருத்தமான சீர்திருத்தங்களை அடையாளங்காண்பதற்கும் தேவையான திருத்தங் களைப் பரிந்துரைப்பதற்குமான தெரிகுழு**

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
ஷைலி கல்விசார் மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய] - முதன்முறை மதிப்பிடப்பட்டது.

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட இரண்டாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
பலங்கொடை கல்சைட் படிவிலிருந்து பொருளாதார அனுகூலங்களைப் பெறல்

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Privilege: Video Footage Published on "BATTI" TV

ORAL ANSWERS TO QUESTIONS

SELECT COMMITTEE TO IDENTIFY APPROPRIATE REFORMS OF THE ELECTION LAWS AND THE ELECTORAL SYSTEM AND TO RECOMMEND NECESSARY AMENDMENTS

PRIVATE MEMBERS' BILLS:
Shaili Edutainment Foundation (Incorporation) - [The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya] - Read the First time

APPROPRIATION BILL, 2022 - [Second Allotted Day]:
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
Reaping Economic Benefits from Calcite Deposit in Balangoda

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021* නොවැම්බර් *15*වන සඳුදා**
*2021 நவம்பர் 15, திங்கட்கிழமை*
*Monday, 15th November, 2021*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### වරප්‍රසාද: "BATTI TV" චැනලයේ විකාශය වූ වීඩියෝ දර්ශනය
### சிறப்புரிமை: "BATTI TV" அலைவரிசையில் வெளியான வீடியோ காட்சி
### PRIVILEGE: VIDEO FOOTAGE PUBLISHED ON "BATTI TV" CHANNEL

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා විසින් 2021 අගෝස්තු 6වන දින වරප්‍රසාද ප්‍රශ්නයක් යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දිලිප් වෙදආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු එම්.එස්. තව්ෆික් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, අනුරාධපුරය, ප්‍රීමන් මාවත, අංක 512/ඒ දරන ස්ථානයේ පදිංචි ටී.සී. ඩේරියස් ද සා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -778/2020- (2), ගරු කේ. කාදර් මස්තාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### ගුරු සේවය : පුරප්පාඩු පිරවීම
### ஆசிரியர் சேவை: வெற்றிடங்களை நிரப்புதல்
### TEACHER SERVICE: FILLING OF VACANCIES

783/2020

**2. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 1989-1990 කාල සීමාව තුළ රජයේ ගුරු සේවයට බඳවාගනු ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට එම ගුරුවරුන් විශ්‍රාම යැමේ අවධියට ආසන්නව සිටින බවත්;

(ii) එම ගුරුවරු විශ්‍රාම යැමත් සමඟ ගුරු සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති වන බවත්;

එතුමා දන්නේද?

(ඇ) මෙම තත්ත්වය තුලනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1989 - 1990 காலப்பகுதியில் அரசாங்க ஆசிரியர் சேவைக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்ட ஆசிரியர் களின் எண்ணிக்கை எத்தனை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தற்போது மேற்படி ஆசிரியர்கள் ஓய்வுபெறும் கட்டத்தை அண்மித்துள்ளனர் என்பதையும்;

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය ]

(ii) மேற்படி ஆசிரியர்கள் ஓய்வுபெற்றதன் பின்னர் ஆசிரியர் சேவையில் பெருமளவிலான வெற்றி டங்கள் ஏற்படுமென்பதையும்;

அவர் அறிவாரா?

(இ) இந்த நிலைமையைச் சமநிலைப்படுத்துவதற்காக அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of the number of teachers recruited for the government teacher service during the period from 1989 to 1990?

(b) Is he aware that -

(i) the aforesaid teachers are nearing retirement; and

(ii) a large number of vacancies will be created in the teacher service after the aforesaid teachers retire?

(c) Will he also inform this House of the actions that will be taken by the Ministry to address this situation?

(d) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)

(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) වර්ෂ 1989 - 1990 කාල සීමාව තුළදී රජයේ ගුරු සේවයට බඳවා ගනු ලැබුවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව මඟින් දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේය.

එම ගුරුවරුන්ට පත්වීම් ලබා දී ඇත්තේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මඟිනි. පසු ගිය වසර හතක පමණ සංගණන වාර්තාවල ඇතුළත් ගුරුවරුන්ගේ පත්වීම් වර්ෂ අධ්‍යයනයෙන් 1989 - 1990 කාලසීමාව තුළ බඳවා ගත් ගුරුවරු සංඛ්‍යාව 37,000ක් පමණ වන බව නිරීක්ෂණය වේ.

(ආ) (i) ඔව්.

එම කාල සීමාව තුළදී රජයේ ගුරු සේවයට බඳවා ගනු ලැබූ ගුරුවරුන්ගේ යම් සංඛ්‍යාවක් මේ වන විට විශ්‍රාම යෑමට ආසන්නව සේවයේ නිරත වේ.

(ii) ගුරුවරු විශ්‍රාම යෑමත් සමඟ ඇති වන පුරප්පාඩු තුලනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග පහත (ඇ) ප්‍රශ්නය යටතේ ඉදිරිපත් කර ඇත.

අමාත්‍යාංශය ගනු ලබන එම ක්‍රියාමාර්ග මඟින් මෙම ගුරුවරු විශ්‍රාම යෑම මඟින් ගැටලුවක් ඇති නොවේ.

(ඇ) මෙම තත්ත්වය තුලනය කර ගැනීම සඳහා පවතින අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ගුරු හිඟය මඟ හරවා ගනිමින් උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ගුරු පුරප්පාඩුවලට බඳවා ගැනීමට අදාළව 2020.09.30 දිනැතිව ඉදිරිපත් කරන ලද ED/EST/20/42 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඊට අදාළ අංක 20/1703/340/004 හා 2020.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ ක්‍රමවේදය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමටත්, ඒ අනුව සමස්ත පද්ධතිය තුළ පවත්නා ගුරු පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කිරීමටත් නියමිතය.

තවද, මීට අමතරව මෙම වසර අවසානයේ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ගෙන් පුරප්පාඩු 4,000ක් පමණ සම්පූර්ණ කිරීමට නියමිතව පවතී.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, 1988 - 1989 කාල සීමාව තුළ බඳවා ගත්ත ගුරුවරුන් සංඛ්‍යාව සහ ඔවුන් කුමන වර්ෂවලදී විශ්‍රාම යෑමට සිටිනවාද කියන කාරණා පිළිබඳ වැඩිදුර විස්තර මා ළඟ තිබෙනවා. මා ළඟ ඇති ප්‍රස්තාරය අනුව, ඔවුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 60ට ගණන් බැලීමේදී, දළ වශයෙන් 3,500ත් - 4,000ත් අතර පිරිසක් 2017 වර්ෂයේ සිට ක්‍රමානුකූලව විශ්‍රාම යමින් සිටිනවා.

සාමාන්‍යයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ෂයකට 4,000-5,000 අතර සංඛ්‍යාවක් විශ්‍රාම යනවා. ගරු මන්ත්‍රීතුමියනි, 1989-1990 යන අධ්‍යයන වර්ෂ දෙක තුළදී එකවර බඳවා ගත් සංඛ්‍යාව 37,000ක් වීම සහ ඒ අය විශ්‍රාම යෑම තමයි ඔබතුමිය අසා තිබෙන ප්‍රශ්නයට තුඩු දී තිබෙන්නේ. නමුත්, ඒ බඳවා ගත්ත පිරිස් විවිධ වයස් කාණ්ඩවල අය. ඒ සියලුදෙනාම එකම වයස් කාණ්ඩයේ අය නොවෙයි. මේ ප්‍රස්තාර අනුව පෙනී යනවා, අවුරුදු 5-10 අතර වයස් පරතරයක් තිබෙන බව. ඒ අනුව තමයි දළ වශයෙන් - on average - 3,500-4,000 අතර සංඛ්‍යාවක් විශ්‍රාම යෑමට නියමිතව තිබෙන්නේ.

පිළිතුරේ සඳහන් කාරණය මා තව පොඩ්ඩක් විස්තර කරන්නම්. මීට අදාළ වන යෝජනා දෙකක් ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය ලේඛනයේ ඇතුළත් වී තිබෙනවා. එකක් තමයි, රජයේ සේවකයන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 60 සිට 65 දක්වා දීර්ඝ කිරීම. අධ්‍යාපන ක්ෂේත්‍රයේ 250,000කට ආසන්න ගුරුවරු සහ 12,000ක් වන විදුහල්පතිවරු අතරින් මා මුලින් කිව්වා වාගේ 5,000ක් පමණ විශ්‍රාම යෑමට නියමිතව සිටියත්, දැන් එය යම් ප්‍රමාණයකින් කල් යෑමට ලක් වෙනවා. එතකොට ප්‍රවීණ ගුරුවරු සංඛ්‍යාවක් තවදුරටත් අධ්‍යාපන සේවයේ ඉතිරි වෙනවා. අනෙක් යෝජනාව අනුව, අභ්‍යාසලාභීන් ලෙස උපාධිධාරීන් 60,000ක් බඳවා ගැනීමේ වැඩසටහනේදී 53,000ක් අභ්‍යාසලාභීන් හැටියට රජයේ විවිධ ආයතනවලට අනුයුක්ත කරලා තිබෙනවා. එයින් 18,000ක් පමණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අනුයුක්ත කරලා තිබෙනවා, අභ්‍යාසලාභී ගුරුවරුන් විධියට. ඊට අමතරව කලාප කාර්යාල සහ අනෙකුත් කාර්යාලවලට අනුයුක්ත කරලා තිබෙන සංඛ්‍යාවත් එක්ක දැන් පළාත් මට්ටමින් ගණනය කරගෙන යනවා. ගුරු වර්ගය අනුව, උපාධිය සහ ප්‍රධාන විෂයයන් අනුව තිබෙන ඌනතා කුමන ආකාරයෙන්ද තුලනය කරන්නේ, විශ්‍රාම යෑම නිසා ඇති වන පුරප්පාඩු කොහොමද තුලනය කරන්නේ කියන කාරණා සම්බන්ධයෙන් ගණනය කර ගෙන යනවා.

2022 ජනවාරි පළමුවැනිදා සිට ඒ සියලු ම උපාධිධාරීන් ස්ථිර කිරීම සඳහා ගරු මුදල් ඇමතිතුමා අය වැයෙන් අතිරේක ප්‍රතිපාදනයක් වෙන් කළා. වර්තමානයේ තිබෙන තත්ත්වය සලකා බලලා, අපි මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කටයුතු කරනවා. ගරු

මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ප්‍රශ්නය අහන වෙලාවේදී අප දැනගෙන හිටියේ නැහැ, විශ්‍රාම යන කාලසීමාව අවුරුදු 65 කරාවි කියලා. අනෙක් කාරණය මේකයි. ඒ බඳවාගත්ත උපාධිධාරීන් අතරින් 18,000ක් ගුරු අභ්‍යාසලාභීන් හැටියට අනුයුක්ත කර තිබෙනවා. නමුත් මම හිතනවා, ඊට වැඩියෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට ගුරුවරු බඳවා ගනීවි කියලා. ඔවුන් පුහුණු කිරීමේ වැඩසටහනකුත් දැනට අපි සම්පාදනය කරමින් සිටිනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අහන්න කලින් මගේ ස්තුතිය පළ කරන්න ඕනෑ, ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව සම්බන්ධයෙන් වසර 24ක් තිස්සේ තිබුණු ගැටලුවේදී එයට අදාළ මුදලෙන් තුනෙන් එකක් මූලික වැටුපට එකතු කරන්න කටයුතු කිරීම පිළිබඳව. එම විෂමතාව, එම ගැටලුව විසඳීමට මුලපිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, බොහොම දැක්මක් ඇතිව හැමදාම අධ්‍යාපනය ගැන කථා කරමින් එහි ගැටලු තේරුම් ගත්ත ගරු සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය ඇමතිතුමාටත්, ඒ වාගේම මේ සඳහා සහයෝගය දීපු ගුරු වෘත්තීය සමිති නායකයන්ටත්, අරගළ කරපු ගුරුවරුන්ටත්, වචනයකින් හෝ මේ සම්බන්ධයෙන් සහයෝගය දුන් සියලු දෙනාටත් විශ්‍රාමික ගුරුවරියක් හැටියට මගේ ස්තුතිය මේ වෙලාවේ පළ කර සිටිනවා. ගරු ඇමතිතුමනි, ගරු කථානායකතුමනි, මරණයෙන් මෙහා නවතින්නේ නැහැයි කියන අදහසින් තමයි මේ වෙනුවෙන් ගුරුවරු පාරට පැස්සේ. ඒකෙදී දෙනියාය ජාතික පාසලේ සේවය කළ අවුරුදු 29ක් වැනි බොහොම අඩු වයසක සිටි ගුරු සොයුරියක් අපට නැති වුණා. එය අපට අමතක කරන්න බැහැ.

ඒ.ඩී. වරුණි අසංකා ගුරු සොයුරියගේ පවුලේ සියලුදෙනාට විපක්ෂය වෙනුවෙන් විපක්ෂ නායකතුමාගේත්, විපක්ෂයේ සියලු ම මන්ත්‍රීවරුන්ගේත්, ගුරුවරුන් කාලකණ්ණි විධියට නොදකින, ත්‍රස්තවාදීන් විධියට නොදකින, ගුරුවරුන් උළ තියන්න, ඒ අයට කුණු බිත්තර ගහන්න, තක්කාලි ගහන්න හීනෙකින්වත් නොහිතන ආණ්ඩු පක්ෂයේ සියලු ම මන්ත්‍රීවරුන්ගේත් කනගාටුව, සංවේගය පළ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා, ගරු කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ විධියට ගුරු වැටුප් විෂමතාව ඉවත් කිරීමට කටයුතු කිරීම ගැන ඇත්තටම සතුටුයි. හැබැයි, ගුරු උපදේශක සේවය ගැන මේකේ කොතැනකවත් සඳහන් වෙලා තිබෙනවා මම දැක්කේ නැහැ. ඒ කියන්නේ GE 3 වැටුප් කාණ්ඩය. මම වැරදි නම් නිවැරදි කරන්න. මේ අය ගැන මේකේ කොතැනකවත් සඳහනක් තිබෙනවා මම දැක්කේ නැහැ. මේ වනවිට පත්වීම් ලිපි ලබා දී තිබෙන බව අපි දන්නවා. නමුත් ඒ අයට කාර්ය පටිපාටියක් නැහැ. සාමාන්‍යයෙන් කාර්ය පටිපාටියක් නැතිව පත්වීම් ලියුමක් දෙන එක ප්‍රායෝගික නැහැ. ඒ තුළ ඒ අය ලොකු ගැටලුවක ඉන්නවා. ගුරු උපදේශකවරු කොයි ශ්‍රේණියේද පිහිටුවන්නේ කියලා නිවැරදි තීරණයක් නැතිව මේ වෙන්න යන දෙයින් මේ අයට පාසල්වලට ගිහින් ගුරුවරුන්ගේ අධීක්ෂණ කටයුතු කරන්න බැරිව යනවා. ඔබතුමාට තේරෙනවා ඇති මම කියන්නේ මොකක්ද කියලා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඒ අයගේ වැටුප අනෙක් අයගේ වැටුපට වඩා පහළයි නම්, මේ අයගේ ශ්‍රේණිය අනෙක් අයගේ ශ්‍රේණියට වඩා පහළයි නම් ඉදිරියේදී ලොකු අර්බුදයක් ඇති වෙයි. ඒ නිසා ඔබතුමා පැහැදිලි කරන්න, වැටුප් විෂමතාව ඉවත් කිරීමේදී ගුරු උපදේශකවරු ඉන්නේ කොතැනද කියලා. මේ වනවිට ගුරු උපදේශකවරු අන්තර්ග්‍රහණය කිරීමට ලියුම් යවා තිබුණත්, හුහක්දෙනා ඒවා භාර ගන්න මැළි වෙලා තිබෙනවා.

මේ නිසා ඉදිරියේදී, අලුතින් සේවාවක් විධියට ස්ථාපිත කළ ගුරු උපදේශක සේවාව නැතිවෙලා යයි කියලා මම හිතනවා. මොකද, මේකට කට්ටිය එන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගුරු උපදේශක සේවාව අධ්‍යාපන ක්ෂේත්‍රයට අනිවාර්යයෙන් අවශ්‍ය සේවාවක්. මොකද, ගුරු උපදේශකවරුන් තමයි සාමාන්‍යයෙන් අවුරුදු අටකට වරක් විෂය මාලා සංවර්ධන කිරීමේදී සැසි පවත්වමින් සහ උපදෙස් දෙමින් ඒ වෙනස් වූ කරුණු ගුරුවරුන් අතරට ගෙන යන්නේ. ඊට අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධීක්ෂණ කාර්ය භාරයේ විශාල වගකීම් කොටසක් ගුරු උපදේශකවරුන් තමයි ඉටු කරන්නේ. මම බස්නාහිර පළාත් සභාවේ මහ ඇමති වෙලා සිටියදී තමයි පළමු වතාවට කාලාන්තරයක් තිස්සේ තිබුණු ගුරු උපදේශක වැටුප් ප්‍රශ්නයට දීමනාවක් දෙන්න තීන්දු කළේ. ඉන් පසුව ඒක දිගටම ගියා.

කෙසේ වෙතත්, වර්ෂ ගණනාවකට පස්සේ ගුරු උපදේශකවරුන් සඳහා සේවා ව්‍යවස්ථාවක් අමාත්‍ය මණ්ඩලය මඟින් පසු ගිය දා සම්මත කළා. එහෙම සම්මත කළාට ඒකේ තව අඩු පාඩු කිහිපයක් තිබෙනවා. මොකද, තවම මේකේ කාර්ය පටිපාටිය අනුමත වෙලා, චක්‍රලේඛයක් නිකුත් වෙලා නැහැ. මේ පිළිබඳව ඔබතුමිය මීට පෙර අවස්ථාවක අතුරු ප්‍රශ්නයකින් අවධානය යොමු කළ අවස්ථාවේ මම අදාළ අතිරේක ලේකම්වරියට කථා කළාම එතුමිය මට දුන්නු උත්තරය තමයි, "සියලු තොරතුරු ලබා ගැනීමට පළාත් අධ්‍යක්ෂවරුන්ට යවා තිබෙනවා. නමුත්, තවම ලැබුණේ නැහැ" කියන එක. මම එතුමියට උපදෙස් දුන්නා සතියක් ඇතුළත ඒ සියලු අයගේ තොරතුරු ලබා ගෙන ගුරු උපදේශක සේවාවේ වෘත්තීය සමිති සහ විවිධ කණ්ඩායම් එක්ක සාකච්ඡාවක් තියන්න කියලා. ඊට අමතරව ඔබතුමියගේ මැදිහත්වීමෙන්ම මට කථා කළ අයට, මම අවස්ථාව දුන්නා හෙට දිනයේ පස්වරුවේ ඇවිල්ලා මාව මුණ ගැහෙන්න කියලා. මම හිතනවා අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් මේ සඳහා යම් කාලයක් වෙන් කර ගන්න පුළුවන් වෙයි කියලා. අවශ්‍ය තොරතුරු සියල්ල සූදානම් කරන්න කියලා මම විෂය භාර අතිරේක ලේකම්තුමියට දැනුම් දුන්නා.

දැනට ඒ ප්‍රශ්නයෙන්ම මතු වුණු කාරණය තමයි, ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව ගැන කථා කරද්දී -1994න් මෙපිටට- ඒ කොතැනකදීවත් ගුරු උපදේශකයන් පිළිබඳව වෙනම සලකා බැලුවේ නැහැ කියන එක. එය ඔබතුමිය දන්නවා. 2018දී වැටුප් සකස් කරද්දිත්, සුබෝධනී වාර්තාවේත් ඒ සේවය වෙනම අරගෙන නැහැ. ගුරු සේවයේ 3 පන්තියේ "අ" සහ "ආ" ශ්‍රේණි තිබෙනවා. ඊට පස්සේ 2 පන්තිය තිබෙනවා. 2 පන්තියේ II ශ්‍රේණිය තිබෙනවා. ඊට පස්සේ 1 පන්තිය තිබෙනවා. බොහෝ වෙලාවට ගුරු උපදේශක තනතුරට එනකොට ගුරුවරුන්ගේ සේවා කාලය සහ සුදුසුකම් මත 2 පන්තියේ II ශ්‍රේණියෙන් එහාට තමයි අයත් වන්නේ. එම නිසා මේ අයට ගුරු සේවයේ 1 පන්තියේ වැටුප් තල ටික තමයි සංශෝධනය වෙමින් එන්නේ. ඊට අමතරව, මුලින් ලබා දෙමින් ආපු දීමනාව යම් ආකාරයකින් වෙනස් කරන්නේ කොහොමද කියන එක ගැන සොයා බලන්න අපිට පුළුවන්. ඊළඟට, අය වැයෙන් ඉදිරිපත් කරන යෝජනාව චක්‍රලේඛයක් හැටියට යවන්න ඕනෑ. එම චක්‍රලේඛය යැවීමට මත්තෙන් අපි සාකච්ඡා කරලා, තිබෙන පරිපාලනමය ගැටලුවට විසඳුමක් දෙන්න කියලා ගුරු අධ්‍යාපන ඇමතිතුමාට මා යෝජනා කරනවා. හෙට සවස ඒ ගැන කථා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. නැත්නම් වෙන්නේ ගරු උපදේශකවරු මැට්ටටත් නැති, වළඳටත් නැති වළං කට්ටක් වෙන එකයි. එම නිසා ඔබතුමා ඒ පිළිබඳව වගකීමෙන් කටයුතු කරලා, ඒ අයට සුදුසු තැන ලබා දෙන්න කියලා මම නැවත වතාවක් ඉල්ලනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වැටුප් විෂමතාව ඉවත් කිරීම තුළ විදුහල්පතිවරුන්ට යම්කිසි ගැටලුවක් මතු වෙලා තිබෙනවා. අධ්‍යාපන විෂයභාර ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට විදුහල්පතිවරු ඒ පිළිබඳව ලියුමක් එවලා තිබෙනවා. එහි පිටපතක් මා ළඟ තිබෙනවා. එම ලිපියෙහි ඒ අය කියනවා, මේ වැටුප් විෂමතාව තුළ ගුරු සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියේ කෙනාටත් පහළින් 3 පන්තියේ විදුහල්පතිවරුන්ගේ වැටුප පිහිටුවා තිබෙනවාය, ඒ තුළ ඒ අය යම් කිසි ගැටලුවකට මුහුණ දෙනවාය කියලා.

කාලය ගතවන නිසා මම ඒ පිළිබඳ වැඩි විස්තර කථා කරන්නේ නැහැ. මෙතැනදී ඔබතුමාට පැහැදිලි ඇති, ගුරු සේවයේ ඉඳලා විදුහල්පති සේවයේ 3 පන්තියට එන කෙනෙක් විදුහල්පති සේවයට වඩා ඉහළ වැටුපක් ලබන කෙනෙක් බවට පත් වෙන බව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා පැහැදිලි කර දෙන්න.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමියනි, මේක මුල ඉඳලාම තිබුණු ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම ගරු රිචර්ඩ් පතිරණ ඇමතිතුමා ගුරු සේවා ව්‍යවස්ථාවයි, ගුරු සේවයයි පිහිටුවන කොට එහි එක අපේක්ෂාවක් වුණා, දක්ෂ, ප්‍රවීණ ගුරුවරු ගුරු සේවයේම තබා ගැනීම. ඒ නිසා තමයි මුලින්ම ගුරුවරුන්ගේ වැටුප් තල විතරක් හැදුවේ. පසුව උසාවි ගිහිල්ලා තමයි විදුහල්පතිවරු සඳහා වැටුප් තල ලබා ගත්තේ. කොහොම හරි, ඊට පස්සේ ඒ දෙගොල්ලන්ම එකතුවෙලා හදපු වැඩසටහනෙන් තමයි ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව ඇති වුණේ. හැබැයි, සමස්තයක් හැටියට සෙසු රාජ්‍ය සේවයන් එක්ක ගුරු විදුහල්පති කාණ්ඩ දෙකම එකට ගත්තාම විෂමතාවක් තිබෙනවා. ඒ සඳහා තමයි යම් ප්‍රමාණයකින් හෝ මේ ආකාරයේ විසඳුමක් ලැබුණේ. හැබැයි, ගුරු සේවයයි, විදුහල්පති සේවයයි අතරත් විෂමතාවක් තිබෙනවා. ඒ නිසා තමයි අනුකමිටුවෙන් කියලා තිබෙන්නේ, පරිපාලන ගැටලු ටික ඊළඟ මාස කිහිපය තුළ විසඳා ගන්න කියලා. ඒ පිළිබඳව අපේ අවධානය යොමු වෙනවා. පරිපාලනමය ගැටලු ටික ඇතුළතදීම විසඳා ගන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -881/2020- (2), ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -938/2020- (1), ගරු මුජිබුර් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1670/2021- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## මන්නාරම, අහත්තිමුරිප්පු අලක්කට්ටු ගම්මානයේ ඉඩම: බලපත්‍ර

### மன்னார், அகத்திமுறிப்பு அளக்கட்டு கிராம காணி: உரிமங்கள்

### LAND IN AHATHTHIMURIPPU ALAKKATTU VILLAGE, MANNAR: PERMITS

778/2020

**1. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය (ගරු කේ. කාදර් මස්තාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன - மாண்புமிகு கா. காதர் மஸ்தான் சார்பாக)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna on behalf of the Hon. K.Kader Masthan)

ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා අහත්තිමුරිප්පු අලක්කට්ටු ගම්මානයේ පිහිටා ඇති ඉඩම වෙන් කර ඒ සඳහා වන බලපත්‍ර, එවකට අග්‍රාමාත්‍යවරයා විසින් අදාළ පවුල්වලට 2014.10.12 වන දින කිලිනොච්චියේදී ලබා දුන් බව එතුමා දන්නේද?

(ආ) (i) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක NP/28/04/03/169 හා 2013.07.02 දිනැති ලිපියට අනුව, සකස් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් අතරින් මේ වනවිට බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් බලපත්‍රලාභීන් අතරින් මේ වන විට ඉඩම් ලැබී ඇති බලපත්‍රලාභීන් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වන තෙක් ඉඩම් ලැබී නොමැති බලපත්‍රලාභීන්ට ඉඩම් ලබා දෙන දිනය කවරේද;

(vi) ඉඩම් බලපත්‍ර ලබා දීමේදී ප්‍රමාදයන් ඇති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மன்னார் மாவட்டத்தின் முசலி பிரதேச செயலகப் பிரிவின் மீள்குடியேற்ற நடவடிக்கைகளுக்காக அகத்தி முறிப்பு அளக்கட்டு கிராமத்தில் அமைந்துள்ள காணி ஒதுக்கப்பட்டு, அதற்கான காணி உரிமங்கள் அப் போதைய பிரதம அமைச்சரினால் ஏற்புடைய குடும் பங்களுக்கு 2014.10.12ஆம் திகதியன்று கிளிநொச்சி யில் வைத்து வழங்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) காணி ஆணையாளர் நாயகத்தின் 2013.07.02 ஆம் திகதிய என்பி/28/04/03/169ஆம் இலக்கக் கடிதத்தின் பிரகாரம், தயாரிக்கப்பட்ட உரிமங் களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி உரிமப்பத்திரதாரிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) இவர்களுள் இன்றளவில் உரிமங்கள் வழங்கப் பட்டுள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(iv) மேற்குறிப்பிட்ட (iii)இல் குறிப்பிடப்பட்டுள்ள உரிமப்பத்திரதாரிகளுள் ஏற்கனவே காணிகள் கிடைத்துள்ள உரிமப்பத்திரதாரிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) இதுவரை காணிகள் கிடைக்காத உரிமப்பத்திர தாரிகளுக்கு காணிகள் வழங்கப்பட்டுள்ள திகதி யாதென்பதையும்;

(vi) காணி உரிமங்களை வழங்குவதில் தாமதம் ஏற்படக் காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Is he aware that the land situated in the village named Ahaththimurippu Alakkattu was set aside for resettlement purposes of the Musali Divisional Secretary's Division in Mannar District and the then Prime Minister awarded permits for this purpose to respective families on 12.10.2014 at Kilinochchi?

(b) Will he inform this House -

(i) the number of permits prepared as per the Land Commissioner General's letter No. NP/28/04/03/169 dated 02.07.2013;

(ii) the names of the recipients of such permits;

(iii) the number of those among them who have received permits by now;

(iv) the number of those recipients referred to in (iii) above who have received lands;

(v) the date on which the recipients of permits who have not received lands so far will be given lands; and

(vi) the reasons why delays have occurred in granting land permits?

(c) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - காணி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Lands)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

****සභාමේසය මත තබන ලද පිළිතුර:***
**සபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
**Answer tabled:*

(අ) දනිමි.

(ආ) (i) 1,155.

(ii) ඇමුණුමෙහි** දක්වා ඇත.

(iii) 838.

(iv) 720.

(v) නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

(vi) නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා මෙම ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් මේ වන විට අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් විමර්ශනයක් පවත්වමින් තිබීම.

(ඇ) අදාළ නොවේ.

## පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීම: ප්‍රගතිය
## பருத்தித்துறை மீன்பிடித் துறைமுக நிர்மாணம்: முன்னேற்றம்
## CONSTRUCTION OF POINT PEDRO FISHERY HARBOUR: PROGRESS

881/2020

**3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය (ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා වෙනුවට)**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன - மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் சார்பாக)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna on behalf of the Hon.(Dr.) Suren Raghavan)

ධීවර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අවශ්‍යතාව කොපමණද;

(ii) එම අවශ්‍යතාවෙන් දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1982 වර්ෂයේදී උතුරු සහ නැඟෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) උතුරු සහ නැඟෙනහිර පළාත්වල පැවති යුදමය තත්ත්වය අවසන්ව මේ වනවිට අවුරුදු 11ක් ගත වුවද, 1982 වර්ෂයේදී එම පළාත්වලින් ලද මත්ස්‍ය අස්වැන්න මේ වනවිට නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උතුරු පළාතේ හඳුනාගත් ප්‍රදේශවල මේ වනතෙක් ධීවර වරායන් ඉදිනොකිරීමට හේතු කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ අනෙකුත් පළාත්වල ඉදිකරන ලද ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාරවල ස්වභාවය සහ එම ආධාර මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් රටවලින් ලබා දෙන ණය මඟින් මෙම වරාය ඉදිකිරීමට හේතු කවරේද;

(vi) එමඟින් ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අශෝක් අබේසිංහ මහතා]

கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் வருடாந்த மீன் தேவை எவ்வளவென்பதையும்;

(ii) அத்தேவையில் உள்நாட்டு ரீதியாக உற்பத்தி செய்யப்படுகின்ற அளவு மற்றும் இறக்குமதி செய்யப்படுகின்ற அளவு தனித்தனியாக எவ்வள வென்பதையும்;

(iii) 1982ஆம் ஆண்டு வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் மேற்கொள்ளப்பட்ட மீன் உற்பத்தியானது இலங்கையின் மொத்த மீன் உற்பத்தியின் சதவீதமாக எவ்வளவென்பதையும்;

(iv) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் நிலவிய யுத்த நிலைமை முடிவடைந்து, தற்போது 11 வருடங்கள் கடந்துள்ள நிலையிலும் 1982ஆம் ஆண்டு அம்மாகாணங்களிலிருந்து கிடைக்கப் பெற்ற மீன் அறுவடை இன்னும் கிடைக்கப் பெறாமைக்கான காரணங்கள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வட மாகாணத்தில் இனங்காணப்பட்டுள்ள பிரதேசங்களில் மீன்பிடித் துறைமுகங்கள் இது வரை நிர்மாணிக்கப்படாமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) கடந்த 15 வருட காலப்பகுதியில் ஏனைய மாகாணங்களில் நிர்மாணிக்கப்பட்டுள்ள மீன் பிடித் துறைமுகங்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(iii) பருத்தித்துறை மீன்பிடித் துறைமுகத்திற்கான நிர்மாணப் பணிகளின் முன்னேற்றம் யாதென்ப தையும்;

(iv) இதற்காக ஆசிய அபிவிருத்தி வங்கியிலிருந்து கிடைத்த உதவியின் தன்மை மற்றும் அந்த உதவிகள் தற்போது நிறுத்தப்பட்டுள்ள மைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) நோர்வே மற்றும் டென்மார்க் ஆகிய நாடுகள் வழங்கும் கடன் தொகைகளைக்கொண்டு இத்துறைமுகம் நிர்மாணிக்கப்படுவதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(vi) அதன்மூலம் கிடைக்கப்படும் மேலதிக அனுகூலங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries:

(a) Will he inform this House -

(i) the annual demand for fish in Sri Lanka;

(ii) the amount locally produced and the amount imported, separately, to meet that demand;

(iii) the amount of fish production in the Northern and the Eastern Provinces in the year 1982, as a percentage of the total volume of fish produced in Sri Lanka; and

(iv) the reasons for not being able to produce at present a harvest as large as that produced in those Provinces in the year 1982, although 11 years have elapsed since the end of the war in the Northern and Eastern Provinces?

(b) Will he also inform this House -

(i) the reasons for not constructing fishery harbours in the identified areas of the Northern Province;

(ii) the number of fishery harbours constructed in the other provinces of the country during the past 15 years;

(iii) what the progress of the construction of the Point Pedro Fishery Harbour is;

(iv) the nature of the aid received from the Asian Development Bank for this and the reasons for suspension of that aid by now; and

(v) the reasons for constructing this Harbour from the loans given by Norway and Denmark; and

(vi) the additional benefits received through that?

(c) If not, why?

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) මසුන්, කරවල, ටින් මාළු, උම්බලකඩ යන සියලු ආකාරයෙන් පරිභෝජනය කිරීම සඳහා සහ වාර්ෂික සාමාන්‍ය අපනයන අවශ්‍යතාව සඳහා ඇස්තමේන්තුගත අගය සජීවී මත්ස්‍ය බර පදනමව මෙට්‍රික් ටොන් 660,000ක් පමණ.

(ii) දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණයේ ඇස්තමේන්තුගත අගය - මෙට්‍රික් ටොන් 500,000ක් පමණ.

ආනයනය කරන ප්‍රමාණයේ ඇස්තමේන්තුගත අගය - සජීවී මත්ස්‍ය බර අනුව මෙට්‍රික් ටොන් 160,000ක් පමණ.

(iii) 1982 වර්ෂයට අදාළ මත්ස්‍ය නිෂ්පාදන දත්ත නොපවතින අතර 1983 වසරේ දත්ත අනුව එය සියයට 56.49කි.

(iv) 1983 වර්ෂයේ මෙට්‍රික් ටොන් 104,360ක් පමණ වූ මත්ස්‍ය අස්වැන්න 2019 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 146,170ක් දක්වා වැඩි වී ඇත.

(ආ) (i) උතුරු පළාතේ ධීවර වරායන් සහ නැංගුරම්පළ ඉදිකිරීම සඳහා පේදුරුතුඩුව, පේසාලේ, ගුරුනගර්, වාලච්චේනෙයි, මාදගල්, මන්ඩතිව් හා ඩෙල්ෆ්ට් යන ප්‍රදේශ හඳුනා ගෙන ඇත. තවද, 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද මයිලෙඩි ධීවර වරාය ඉදිකිරීමේ පළමු අදියරෙහි අවසන් කටයුතු 2019 වර්ෂයේ ධීවර අයිතියට පත් කරන ලදී. එහි දෙවන අදියර 2021 වර්ෂයේදී ඇරඹීමට නියමිතය.

(ii) වරායන් 10කි.

(iii)

| අදියර | මූල්‍ය මූලාශ්‍රය | මුදල | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය % | භෞතික % |
| අදියර 1 ශක්‍යතා අධ්‍යයනය | දේශීය අරමුදල් | රු.මි.15.985 | 100 | 100 |
| අදියර 2 සවිස්තරාත්මක සැලසුම් හා ඉංජිනේරුමය ඇස්තමේන්තු සකස් කිරීම | දේශීය අරමුදල් ආසියානු සංවර්ධන බැංකුව | රු.මි.72.0 ඇ.ඩො. 881,007.1 | 100 | 100 |
| අදියර 3 වරායේ ඉදිකිරීම් කටයුතු | දේශීය අරමුදල් හා ආසියානු සංවර්ධන බැංකුව | 0 | 0 | 0 |

අදියර 1 - මෙම වරායෙහි ශක්‍යතා අධ්‍යයන කටයුතු 2017 වර්ෂයේදී මොරටුව විශ්වවිද්‍යාලය මඟින් සිදු කරන ලදී.

අදියර 2 - මෙම වරායෙහි සවිස්තරාත්මක සැලසුම් හා ඉංජිනේරුමය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු EML Consultant (Pvt.) Ltd ආයතනය මඟින් සිදු කරන ලදී.

පේදුරු තුඩුව ධීවර වරාය ඉදිකිරීමට එරෙහිව පේදුරු තුඩුව මෙතෝදිස්ත බාලිකා විද්‍යාලයේ දෙමව්පිය සංගමය, රාජ්‍ය නොවන සංවිධානයක් හා එම ප්‍රදේශයේ ජනතාව දැක්වූ විරෝධතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම දිගින් දිගටම ප්‍රමාද විය. අදාළ ධීවර ප්‍රජාව, පාසල් සංවර්ධන සමිතිය, රාජ්‍ය නිලධාරීන් හා දේශපාලන අධිකාරිය ඇතුළු සියලු පාර්ශ්වයන් සමඟ දිගින් දිගටම මේ පිළිබඳ සාකච්ඡා කළද විසඳුමක් නොලද අතර නැවත ප්‍රජාවගේ විරෝධතාව හේතුවෙන් මෙම ධීවර වරාය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.

ඉහත කරුණු මත ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ණය ලබා දීමට අදාළ ණය ගිවිසුම් ශ්‍රී ලංකා රජය සමඟ අත්සන් නොකරන ලදී. එම තත්ත්වය මත ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව ඉදිරියට කරගෙන යාමට නොහැකි විය.

(iv) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘති සැලසුම්කරණ අත්තිකාරම් ණය මුදලක් ලෙස රුපියල් මිලියන 190ක ණය ආධාර හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස රුපියල් මිලියන 72ක් වෙන් කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට සිදු වූයේ ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය අතර ඉහත හේතූන් මත ණය ගිවිසුම අත්සන් නොකිරීම හා ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙනි.

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් ප්‍රතිපාදන යටතේ පේදුරු තුඩුව ධීවර වරාය ඉදිකිරීම සම්බන්ධව මේ වන තෙක් නිශ්චිත ප්‍රතිචාරයක් දක්වා නොමැත.

(vi) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

## "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන: කොළඹ දිස්ත්‍රික්කය
## "அண்மித்த பாடசாலை சிறந்த பாடசாலை" நிகழ்ச்சித்திட்டம்: கொழும்பு மாவட்டம்
## "NEAREST SCHOOL IS THE BEST SCHOOL" PROGRAMME: COLOMBO DISTRICT

938/2020

**4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය (ගරු මුජිබුර් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன - மாண்புமிகு முஜிபுர் ரஹுமான் சார்பாக)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna on behalf of the Hon. Mujibur Rahuman)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය රජය විසින් "ළඟම පාසල හොඳම පාසල" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්;

(ii) ඒ යටතේ කොළඹ අධ්‍යාපන කලාපය තුළ පිහිටි සුසමයවර්ධන විද්‍යාලය, ශාන්ත අන්තෝනි පිරිමි විදුහල, මහාබෝධි විද්‍යාලය, අනුරුද්ධ බාලිකා විදුහල, ශාන්ත අන්තෝනි බාලිකා (ප්‍රාථමික) විදුහල, මුතුවෙල්ල හින්දු විද්‍යාලය සහ මෝදර ආනන්ද විද්‍යාලය යන විද්‍යාල සංවර්ධනය කිරීම ආරම්භ කළ බවත්;

(iii) ඒ සඳහා පසුගිය රජය විසින් මුදල් වෙන් කළ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම වැඩසටහන යටතේ කොළඹ 12-හමීඩ් අල් හුසෙයිනි විද්‍යාලයේ ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට මුල්ගල තැබූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) ඉහත අ(ii)හි සඳහන් පාසල්වල ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය ]

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்கத்தினால் "அண்மித்த பாடசாலை சிறந்த பாடசாலை" என்ற பெயரில் நிகழ்ச்சித்திட்டமொன்று நடைமுறைப்படுத்தப் பட்டதென்பதையும்;

(ii) அத்திட்டத்தின்கீழ் கொழும்பு கல்வி வலயத்தில் அமைந்துள்ள சுசமயவர்தன வித்தியாலயம், புனித அந்தோனியார் ஆண்கள் வித்தியாலயம், மகாபோதி வித்தியாலயம், அனுருத்த மகளிர் வித்தியாலயம், புனித அந்தோனியார் மகளிர் வித்தியாலயம் (ஆரம்பப் பிரிவு), முத்துவெல்ல இந்து வித்தியாலயம் மற்றும் கொ/முகத்துவாரம் ஆனந்த வித்தியாலயம் ஆகிய பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டன என்பதையும்;

(iii) அப்பணிக்காகக் கடந்த அரசாங்கத்தினால் நிதி ஒதுக்கப்பட்டதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அந்நிகழ்ச்சித்திட்டத்தின்கீழ் கொழும்பு-12, ஹமீத் அல்-ஹுஸைனி வித்தியாலயத்தில் கட்டிட மொன்றை அமைப்பதற்கு அடிக்கல் நாட்டப் பட்டது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) அது தொடர்பாக எதிர்காலத்தில் எடுக்கவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) இந்நிகழ்ச்சித்திட்டத்தின்கீழ் கொழும்பு மாவட் டத்தில் அபிவிருத்தி செய்யப்பட்ட பாடசாலை களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட நிகழ்ச்சித்திட்டம் தொடர்ந்தும் நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) மேலே அ (ii) இல் குறிப்பிடப்பட்டுள்ள பாடசாலை களின் கட்டிட நிர்மாணப் பணிகளை நிறைவு செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் மேலும் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) the previous Government implemented a programme called "The Nearest School is the Best School";

(ii) development of Susamayawardana Vidyalaya, St. Anthony's Boys' College, Mahabodhi Vidyalaya, Anuruddha Balika Vidyalaya, St. Anthony's Girls' College (Primary), Muthuwella Hindu Vidyalaya and Modara Ananda Vidyalaya in the Colombo Education Zone was commenced under the aforesaid programme; and

(iii) the previous Government allocated funds for that?

(b) Will he state in this House-

(i) whether he is aware that the foundation stone was laid for the construction of a building at Hameed Al Hussaini College, Colombo 12 under the aforesaid programme; and

(ii) the steps that will be taken in connection with the aforesaid construction work?

(c) Will he inform this House-

(i) the number of schools in the Colombo District which have been developed under this programme; and

(ii) whether the aforesaid programme will be implemented continuously?

(d) Will he also state whether steps will be taken to complete the construction work of the buildings in schools named in (a) (ii) above?

(e) If not, why?

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக்கல்வி, பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் கல்விச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Women and Child Development, Preschools and Primary Education, School Infrastructure and Education Services)

ගරු කථානායකතුමනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා සභා ගර්භය තුළ නැහැ. ඒ වුණාට පිළිතුර නම් ලැහැස්තියි. ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම 01** යටතේ දක්වා ඇති පරිදි මෙම පාසල්වල ඉදිකිරීම් සිදුකර ඇත.

(iii) ඇමුණුම 01 හා 02** යටතේ දක්වා ඇති පරිදි මුදල් වෙන්කර ඇත.

(ආ) (i) "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මෙම පාසල සඳහා ගොඩනැඟිල්ලකට මුල්ගල තබා නොමැත. පළාත් සභා ප්‍රතිපාදන යටතේ ද එවැනි ඉදිකිරීමක් සිදුකර නොමැති බව ද වාර්තා කර ඇත.

(ii) "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මෙම පාසල සඳහා ගොඩනැඟිල්ලකට මුල්ගල තබා නොමැති බැවින් අදාළ නොවේ.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(ඈ) (i) පළාත් පාසල් 309ක් ද, ජාතික පාසල් 37ක් ද වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව 346කි.

(ii) "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/0451/308/030 හා 2021.03.08 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය සඳහා 2021 මාර්තු 30 දින ලද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, මෙම ව්‍යාපෘතිය 2021.12.31 දක්වා වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීමටත්, ඒ අනුව ජාතික අය වැය දෙපාර්තමේන්තුව විමසමින් දැනට වැඩ අවසන් කර ඇති ව්‍යාපෘතිවලට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීමටත්, ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණවලට යටත්ව සවිස්තරාත්මක විගණනයක් සිදු කිරීමටත්, ඒ මත පදනම්ව ඉතිරි ඉදිකිරීම් වැඩ අවසන් කිරීමටත්, අනතුරුව සන්දේශයේ සඳහන් අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ හා උපකරණ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ මිලදී ගැනීමටත්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බැවින් එම තීරණ මත පදනම්ව කටයුතු කරනු ලබයි.

(ඈ) මෙම ව්‍යාපෘති කාල සීමාව 2021.12.31 දින දක්වා දීර්ඝ කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ඉ) අදාළ නොවේ.

## රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසම: නීතිවිරෝධී බොරලු කැණීම

ரணவராபிட்டிய கிராம அலுவலர் பிரிவு: சட்டவிரோத சரளை அகழ்வு

RANAWARAPITIYA GRAMA NILADHARI DIVISION: ILLEGAL GRAVEL MINING

1670/2021

**5. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය (ගරු හෙක්ටර් අප්පුහාමි මහතා වෙනුවට)**

(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன - மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி சார்பாக)

(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna on behalf of the Hon. Hector Appuhamy)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාලියවැව අංක 638 -රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ නීතිවිරෝධී බොරලු කැණීමක් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එම නීති විරෝධී බොරලු කැණීම මැඩපැවැත්වීම සඳහා අමාත්‍යාංශය විසින් මේ වනවිට ගෙන ඇති සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கருவலகஸ்வெவ பிரதேச செயலகப் பிரிவின் சாலியவெவ இலக்கம் 638 - ரணவராபிட்டிய கிராம அலுவலர் பிரிவில் சட்டவிரோதமாக சரளை அகழ்வு இடம்பெறுகின்றதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி சட்டவிரோத சரளை அகழ்வைத் தடுப்பதற்காக அமைச்சு இன்றளவில் மேற்கொண்டுள்ள மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ள எதிர்பார்க்கின்ற நடவடிக்கைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that an illegal gravel mining is taking place at No. 638 - Ranawarapitiya Grama Niladhari Division in Saliyawewa of Karuwalagaswewa Divisional Secretary's Division; and

(ii) separately, the measures taken and expected to be taken by the Ministry to halt the aforesaid illegal gravel mining?

(b) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) නීති විරෝධී බොරලු කැණීමක් සිදුකර ඇති බව භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇත.

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාලිය වැව අංක 638 රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ සිදුවන නීති විරෝධී බොරලු කැණීම් සම්බන්ධයෙන් වැටලීම් සිදුකර අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරි ද, පුත්තලම නියෝජ්‍ය පොලිස්පති සහ කරුවලගස්වැව පොලිස් ස්ථානයෙහි ස්ථානාධිපති දැනුවත් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් කටයුතු කර ඇති බව වාර්තා කර ඇත.

තවද, මෙම නීති විරෝධී පස්/බොරලු කැණීම් සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ ක්ෂේත්‍ර නිලධාරි විසින් 2021.11.06 දිනැතිව ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර මෙම පස්/බොරලු කැණීම නීති විරෝධී ආකාරයෙන් සිදු කරන ලද්දක් බව තහවුරු කරගෙන ඇත. මෙම නීති විරෝධී පස්/බොරලු කැණීම සිදු කරන ලද පුද්ගලයින් අත්අඩංගුවට ගෙන ඔවුන් අධිකරණය වෙත ඉදිරිපත් කර, අංක 76033/2021 දරන නඩුකරය යටතේ නඩු පවරා ඇති බව සාලිය වැව පොලිස් ස්ථානාධිපතිවරයා වෙතින් විමසා තහවුරු කර ගත් බව භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇත.

(ආ) පැන නොනගී.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන ඇමතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා, ගරු සභානායකතුමා.

## මැතිවරණ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

## தேர்தல் சட்டங்கள் மற்றும் தேர்தல் முறைமை தொடர்பாகப் பொருத்தமான சீர்திருத்தங்களை அடையாளங் காண்பதற்கும் தேவையான திருத்தங்களைப் பரிந்துரைப்பதற்குமான தெரிகுழு

## SELECT COMMITTEE TO IDENTIFY APPROPRIATE REFORMS OF THE ELECTION LAWS AND THE ELECTORAL SYSTEM AND TO RECOMMEND NECESSARY AMENDMENTS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2021 අප්‍රේල් 05 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තව දුරටත් කාලය අවශ්‍යවන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2022 ජනවාරි 16 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්

## தனி உறுப்பினர் சட்டமூலங்கள்

## PRIVATE MEMBERS' BILLS

### ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### ஷைலி கல்விசார் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

### SHAILI EDUTAINMENT FOUNDATION (INCORPORATION) BILL

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ශෛලී අධ්‍යාපනික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

විසර්ජන පනත් කෙටුම්පත 2022, දෙවැනි වෙන් කළ දිනය. විවාදය ආරම්භ කිරීම, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022

### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022

### APPROPRIATION BILL, 2022

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***
***ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12]***
***" පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" [ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [12th November]*
*"That the Bill be now read a Second time".- [ The Hon. Basil Rohana Rajapaksa]*
*Question again proposed.*

[පූ.භා. 9.50 ]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, 2022 අය වැය ගැන අදහස් දක්වන්න කලින්, කොළඹ - මහනුවර මාර්ගය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන මම කියන්න ඕනෑ. කඩුගන්නාවේදී එම මාර්ගයට ගල් පෙරළීම නිසා පාර වහලා තිබෙනවා. ඒ ප්‍රශ්නය ඉතාම බැරෑරුම්. මොකද, ඒ මාර්ගය අවුරුදු 150ක් විතර පරණයි. පාර තිබෙනවා; කන්ද තිබෙනවා; කන්දට උඩින් තිබෙන්නේ රේල් පාර. රේල් පාරේ තෙරපීමත් බලපානවා, ගරු කථානායකතුමනි.

මේ ප්‍රශ්නය කවදා අවසන් වෙයිද දන්නේ නැහැ. ඒ නිසා මම රජයෙන් ඉල්ලා සිටිනවා, කොළඹ - මහනුවර අධිවේගී මාර්ගයේ මීරිගම - කුරුණෑගල කොටස විවෘත කරන්න කියලා. ඒ කොටස විවෘත කිරීම ගැන මම ඒ engineersලාගෙන් ඇහුවා. ඒ අය සූදානම්, ඒ කොටස විවෘත කරන්න.

2020 ජනවාරි මාසයේ මම ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, එම අධිවේගී මාර්ගය ගැන. එතුමා 2020 පෙබරවාරි මස 05වන දා ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී ලබා දුන් පිළිතුර මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

එතුමා කියා තිබෙනවා, ගිය අවුරුද්දේ අගෝස්තු මාසය වනවිට එම කොටස විවෘත කරනවා කියලා. කෙසේ වෙතත්, ප්‍රමාද වෙලා හෝ එය විවෘත කරන්න දැන් තමයි වෙලාව.

මහාමාර්ග ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, එම අධිවේගී මාර්ගයේ මීරිගම - කුරුණෑගල කොටස විවෘත කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම engineersලාගෙන් ඇහුවාම ඒ අය කිව්වා, එම කොටස විවෘත කරන්න පුළුවන් කියලා. මහනුවර ජනතාව මේ නිසා විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා ඉන්නේ. කඩුගන්නාවේ ප්‍රශ්නය දීර්ඝ කාලීන ප්‍රශ්නයක්. එය ලේසියෙන් අවසන් වන්නේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, අපේ හිටපු මහාමාර්ග ඇමතිතුමා මධ්‍යම අධිවේගී මාර්ගය ගැන කිව්වා. මම ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ ඒ මාර්ගය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ වෙලාව යනවා, ගරු ඇමතිතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමා මගේ වෙලාවෙන් ගන්න. I have to reply. ඔබතුමාට උත්තරයක් ඕනෑ නම් මම කථා කරන්නම්. නැත්නම් මම වාඩි වෙන්නම්. ඔබතුමාට උත්තරය කියන්නත් ඕනෑ; ඒකට ගන්නා වෙලාවත් ඕනෑ. *[බාධා කිරීමක්]* අපේ ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් - මගේ වෙලාවෙන් - ඔබතුමා ඒ කාලය ගන්න. ඔබතුමාට අපි අසාධාරණකම් කරන්නේ නැහැ. රැස්වීම ආරම්භයේදීම මේ දේවල් කියන්න පටන් ගත්තා නම්, පිළිතුර අහගෙන ඉන්නත් ඔබතුමන්ලාට හයියක් තිබෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපි ඒ අධිවේගී මාර්ගය මේ මාසයේ විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන ඉංජිනේරුවන්ගෙන් අහපු එක ගැන මම සතුටු වෙනවා. ගිය අවුරුද්දේ එය විවෘත කරන්න තිබුණා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේම, කැබිනට් මණ්ඩලයේ වාඩි වෙලා හිටපු ඇමතිවරයෙකුගේ කොම්පැනියකට තමයි ඔබතුමන්ලා එහි කොන්ත්‍රාත් දුන්නේ. ඔබතුමා දැන් අපේ ආණ්ඩුවට කියනවා, "අපේ ආණ්ඩුව කාලයේ ඒක හැදුවා. තවත් කිලෝමීටර් දෙකයි හදන්න තිබුණේ. ඒකවත් හදා ගන්න ඔබතුමන්ලාට බැහැ" කියලා. ඒ පණිවිඩය තමයි ඔබතුමා දුන්නේ. එදා ඔබතුමන්ලාට අඩුම ගණනේ නුවර තිබෙන පාරවල් ටිකවත් හදන්න බැරි වුණා. අපි ඇවිල්ලා තමයි ඒ ව්‍යාපෘති ඔක්කෝම පටන් ගත්තේ. ඔබතුමන්ලා නිකම් ලකුණු දමා ගන්න හදන්න එපා. ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ තමයි එහි මුල් ගල් තියලා වැඩ ආරම්භ කළේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාම ඒක cancel කරලා රුපියල් බිලියනයක් වැඩියෙන් කොන්ත්‍රාත් එක දුන්නා; කිලෝමීටරයකට ලක්ෂ 10,000ක් වැඩියෙන් දුන්නා. ඒ ගැන අපෙන් අහගන්න එපා. අපි බොහොම සාධාරණව කටයුතු කරන්නේ. ඒවා ඔබතුමා කළා කියලා මම කියන්නේ නැහැ. ඒවා කරපු අය ඉන්න ඕනෑ හිර ගෙවල්වල. ඒ කාලයේ අපට බොරුවට මඩ ගහලා, අසත්‍ය පැමිණිලි දමලා, අසත්‍ය සාක්ෂි හදලා, නඩු හදලා තමයි තමුන්නාන්සේලා අපට විරුද්ධව කටයුතු කළේ.

ගරු කථානායකතුමනි, මේ අවුරුද්දේ දී අපි ඒ මාර්ගයේ එම කොටස විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, මෙතුමන්ලා පටන් ගත්, කඩවත ඉඳලා මීරිගම දක්වා කොටස නැතිව තමයි මෙතුමන්ලා අධිවේගී මාර්ගය හැදුවේ. මුලකුත් නැහැ, අගකුත් නැහැ. අපි මුල පටන් අරගෙන අග දක්වාම කටයුතු කරලා අවසන් කරනවා, අපේ ආණ්ඩුව කාලය තුළදී. තවත් අවුරුදු දෙකකින් කෙළින්ම නුවරට යන්න පුළුවන් විධියට අධිවේගී මාර්ගය අපි හදනවා. එම මාර්ගයේ කලින් කියපු කොටස අපි මේ අවුරුද්දේ විවෘත කරනවා.

ගරු කථානායකතුමනි, එතුමා කියපු කරුණ ගැන විවාදයක් කරන්නත් අපි සූදානම්. මොකද, COPE එක මේ කරුණු සියල්ල පරීක්ෂා කරලා එවැනි කිසිම දෙයක් නැහැ කියලා වාර්තා කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට වෙනම විවාදයක් ඉල්ලන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනෙක් කාරණය මේකයි, ගරු කථානායකතුමනි. 2015 වර්ෂයේ අපි බලයට එනකොට කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය හදන්න එක බිම් අඟලක්වත් මැනලා තිබුණේ නැහැ.

මම මහාමාර්ග ඇමති කාලයේ ඊට අදාළව ඉඩම් කැබැලි 20,000ක් මැන්නා. මැනලා, කොටස් තුනකට දේශීය කොන්ත්‍රාත්කරුවන්ටයි එම කොන්ත්‍රාත්තු දුන්නේ. සියයට 90ක් වැඩ ඉවර කරලායි අපි භාර දුන්නේ. ඒක තමයි යථාර්ථය. ඒක අගමැතිතුමා පිළිගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, අපේ ආණ්ඩුවේ හිටපු කැබිනට් ඇමතිවරයෙකුට කොන්ත්‍රාත් දුන්නා කියලා. මම ඔබතුමාගෙන් අහනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් පාරවල් හදන්න එතුමාට කොන්ත්‍රාත් දීලා නැද්ද කියලා. ඒ හිටපු කැබිනට් ඇමතිවරයා නරක නම්, එතුමාටම කොන්ත්‍රාත් දීලා තිබෙන්නේ ඇයි?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා කොන්ත්‍රාත් දුන් විධිය ඇතුළු ඔක්කොම දේවල් ගැන අපට කියන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ පිළිබඳ විවාදයට සූදානම් නම්, අපිත් විවාදයට සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට වෙනම විවාදයක් ගනිමු.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එහි කොන්ත්‍රාත් දුන් විධියත්, කිලෝමීටරයට ලක්ෂ 10,000ක් වැඩියෙන් දුන්නු විධියත් මම කියන්නම්. තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා රෙදි ඇඳගෙන පාර්ලිමේන්තුවට එන්නේ කොහොමද දන්නේ නැහැ, කරපු දේවල්වල හැටියට. ඊළඟට, ඔබතුමා මොකක්ද කළේ? කඩවත ඉඳන් මීරිගම කොටසේ වැඩ පටන් ගත්තාද, ඒ අවුරුදු පහ තිස්සේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, අපි ඔය ප්‍රශ්නය වෙනම විවාදයකට ගනිමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙතුමා හදන්නේ අපට අපහාස කරන්න. මම අරක්කු පෙරන මිනිහෙක් නොවෙයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපහාස කළා නොවෙයි, මම කිව්වේ ඇත්ත.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කසිප්පු පෙරන මිනිහෙක් නොවෙයි. කසිප්පු පෙරන මිනිස්සු, බයිබලයෙන් ගහපු මිනිස්සු, පුටු පෙරළපු මිනිස්සු- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය ගැටුම්වලට යන්නේ නැතිව ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි විවාදයකට සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට වෙනම දිනයක් යොදා ගනිමු.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දෙන්න උත්තර නැති වුණාම අපහාස කරනවා. මම ඉල්ලුවේ, පාර අරින්න කියලා විතරයි. පාර අරින එක ඔච්චර ප්‍රශ්නයක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විවාදයට වෙනම දිනයක් යොදා ගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට කථා කරන්න කාලය ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට නියමිත කාලය දෙන්නම්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමා අපේ ආණ්ඩු පක්ෂයෙන් වෙලාව ගන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු කථානායකතුමනි, මම බෞද්ධ ආගමට ගොඩක් ගරු කරන පුද්ගලයෙක්. හැබැයි, මම කතෝලිකයෙක්. මෙතුමා ගැන මම ලජ්ජා වෙනවා. නිකම් පොතකට බයිබලය කියලා කතෝලික ආගමට අගෞරව කරන්න එපා. ඒක මතක තබා ගන්න. අනෙක් ආගම්වලට එක එක කථා කියන්න එපා, පාර්ලිමේන්තුව ඇතුළෙදි. මම මීට ඉස්සරත් මේ ගැන කියලා තිබෙනවා. මේ ගරු සභාව ඇතුළේ බයිබලයක් නැහැ, ගරු කථානායකතුමනි. ඔබතුමාත් ඒක හොඳට දන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතැන බයිබලයක් නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ලජ්ජා වෙන්න ඕනෑ. ඔය වාගේ කථා කියන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමා කියන චෝදනා එකක්වත් කෝප් කමිටුවේ සනාථ වෙලා නැහැ. මේවා පාර්ලිමේන්තුවේ ගහන මඩ විතරයි. අනෙක් එක තමයි, අපි කසිප්පු පෙරන්නේ නැහැ; හොර අරක්කු පෙරන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කථාව කරගෙන යන්න කෝ. ඒ මාතෘකාව මෙතැනට අදාළ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වෙලා ඉදිරිපත් කරපු පළමුවෙනි අය වැයෙන්ම - first Budget එකෙන්ම - වැට් බදු සහන දීලා රුපියල් බිලියන 800ක් නැති කර ගත්තා. මේ ආණ්ඩුවේ ප්‍රශ්නවලට මුල එතැනයි. ගරු කථානායකතුමනි, යහ පාලන ආණ්ඩුව බලයට එනකොට අපේ ආදායම Rs. 1,000 billion. අපේ අවුරුදු හතරහමාරක කාලය තුළ අපි ඒක රුපියල් බිලියන 2,000කට ආසන්න ගණනකට ගෙනාවා. We had doubled our income; අපේ ආදායම දෙගුණයක් කර ගත්තා. ඒකයි අපේ ආණ්ඩුව තිබුණු අවුරුදු හතරහමාර තුළ අපෙන් ඉල්ලපු හැම ඉල්ලීමක්ම අපි ඉටු කළේ. අපි ජනතාවගේ ජීවන වියදම පාලනය කළා. රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කළා. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කළා. *[බාධා කිරීමක්]* රටේ මිනිස්සු තමයි, නමුත් පොඩි මිනිහාගෙන් නොවෙයි ගත්තේ. ගරු කථානායකතුමනි, අපි බදු ගත්තේ කොම්පැනිකාරයන්ගෙන්. අපි පොඩි මිනිසුන්ගෙන් බදු ගත්තේ නැහැ. අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනය කරමින් අපි අවුරුදු හතරහමාරක් රට පාලනය කළා. ළමයින් රක්ෂණය කළා. සමෘද්ධි දීමනාව දෙගුණයක් කළා. හැම වෘත්තීය සමිති ඉල්ලීමක්ම අපි ඉටු කළා නේ.

ගුරුවරුන්ගේ ප්‍රශ්නය 2020 මුල් කාර්තුවේ අපි විසඳන්නයි හිටියේ. එයට වැය වන්නේ රුපියල් බිලියන 30යි. අපි රුපියල් බිලියන 1,000කින් ආදායම වැඩි කර ගත්තා. විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්නයත් අපි 2020 ජනවාරි මාසයේ විසඳන්නයි හිටියේ. ආදායමත් අපි දෙගුණයක් කර ගත්තා. අපි බදු ගත්තේ කොම්පැනිකාරයින්ගෙන්; ලොකු මිනිසුන්ගෙන්. ඒකයි අපි ආදායම වැඩි කර ගත්තේ. මෙතුමන්ලා මොකක්ද කළේ, ගරු කථානායකතුමනි? ආවා විතරයි, VAT සහන දීලා, විවිධ බදු සහන දීලා රුපියල් බිලියන 800ක් නැති කර ගත්තා. ඒකයි මේ අර්බුදයට මුල. අනික් එක තමයි Withholding Tax එක. මිනිස්සු මුදල් තැන්පත් කරලා තිබෙනවා. ඉස්සර බැංකුවලින්, finance companiesවලින් ඒ tax එක අය කරනවා. මොකක්ද, මේ ගොල්ලන් කළේ? Tax එක තිබෙනවා. නමුත්, finance companiesවලටයි, බැංකුවලටයි කිව්වා ඒ බද්ද අය කරන්න එපා කියලා. මුදල් තැන්පත් කරලා තියෙද්දීත් ආයෙත් වෙන form එකක් දීලා ගෙවන්න කිව්වා. ආදායම නැති කර ගැනීමක් නේද, මේක? විශ්‍රාමිකයන්ට පුළුවන්ද, forms පුරවන්න? විශ්‍රාමිකයන් රුපියල් ලක්ෂ දහයක් තැන්පත් කරලා තිබුණා නම්, බැංකුවෙන්ම Withholding Tax එක අඩු කරලා ගෙවනවා. මෙතුමන්ලා ඒක නැති කළා. හැබැයි tax එක තිබෙනවා. මුදල් තැන්පත් කර තිබෙන කෙනාට කියනවා, form එකක් පුරවලා ගෙවන්න කියලා. මේවාට කවුරු උපදෙස් දෙනවාද කියලා අපට අදහාගන්න අමාරුයි. ආදායම තිබුණා, ගරු කථානායකතුමනි. එතකොට මේ අය වැය ගත්තොත්, - Hon. Semasinghe, are you the Deputy Minister of Finance? මොකද, මුදල් ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ නැහැ. නියෝජ්‍ය ඇමතිවරයෙක් සිටිනවාද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය අහන්න කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැහැ, මම කියන්නේ මේකයි. මුදල් ඇමතිතුමාත් සභාවේ නැහැ. ඇයි මේ? මුදල් ඇමතිතුමා එන්නේ නැහැ. අපි කාටද කථා කරන්නේ?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමාට යම්කිසි පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම්, මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් අපි ඒකට සූදානම්. විපක්ෂ නායකතුමාත් මේ වෙලාවේ සභාවේ නැහැ නේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කීදෙනාද සභාවේ ඉන්නේ?

හිටපු අගමැතිතුමාත් එක්ක ඉන්නේ හතරදෙනායි. මේ හතර දෙනෙක් ඉඳලා මෙතුමා හොයනවා, මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් කවුද ඉන්නේ කියලා. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඔබතුමා ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. අපි ඒ පැහැදිලි කිරීම ලබා දෙන්නම්. ඔබතුමාට කථා කරන්න කරුණු නැතිව මෙතැන බොරු පණිවුඩ දෙන්න හදන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අපට ඕනෑ නිල වශයෙන් උත්තර දෙන්න පුළුවන් කෙනෙක්; Cabinet Minister කෙනෙක්. කවුද ඉන්නේ? *[බාධා කිරීමක්]* හරි, හරි. මුදල් ඇමතිතුමා *[බාධා කිරීමක්]* හැංගිලා. උත්තර දෙන්න බැරුව හැංගිලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයක් අහන්නේ නැතුව උත්තරයක් දෙන්න බැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම ප්‍රශ්න අහන්නේ මට උත්තරයක් දෙන්න පුළුවන් කෙනෙකුගෙන්. නිකම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ප්‍රශ්න අහන්න මම සූදානම් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා සභාවේ නැහැ. ඇත්තටම සම්ප්‍රදායක් හැටියට එතුමා සභාවේ ඉන්න ඕනෑ. අපි එතුමාගෙන් ඉල්ලීමක් කරමු, හෙට ඉඳන් ඇවිල්ලා මේ සභාවේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඉන්න කියලා. මොකද, රොනී ද මෙල් හිටපු ඇමතිතුමාගේ කාලයේ ඉඳලා හැම මුදල් ඇමතිවරයෙක්ම, මේ සභාවේ එහෙම ඉඳලා තිබෙනවා, කථා කරන්න එක් කෙනෙක් විතරක් සිටියත්. අද ගැන අපි වාද නොකර, එතුමාට හෙට ඉඳන් සභාවට ඇවිල්ලා ඉන්න කියලා ආරාධනා කරමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, *[බාධා කිරීමක්]* මගේ වේලාව ගන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ වේලාව දෙන්නම්. ඔව්, රාජ්‍ය ඇමතිතුමා කියන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් අපේ ඇමතිවරුත් ඉන්නවා; රාජ්‍ය ඇමතිවරුත් ඉන්නවා. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළොත් අපට උත්තරයක් දෙන්න පුළුවන්. මෙතැන ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ නැතිව, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉන්නවාද නැද්ද, යන තැන කොහේද, එතුමා මොකක්ද කරන්නේ කියන එක සොය සොයා හිටියාට අපි ඒක ප්‍රශ්නයක් හැටියට දකින්නේ නැහැ. අපි අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. අපට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. ගරු කථානායකතුමනි, අදහස් නැතිව, කරුණු නැතිව කථා කරන්න ගියාම මේක තමයි වෙන්නේ. එතුමාගේ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දෙන්න අපි සූදානම් බව මම කියන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ අපේක්ෂිත ආදායම ලැබෙන්නේ නැහැ කියලා දැනටමත් ආණ්ඩුව පිළිගෙන තිබෙනවා. ඒකට හේතුව තමයි, "පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත අනුමත කිරීමෙන් පසු මුදල් අමාත්‍යවරයා රාජ්‍ය ආයතනවලට වියදම් කිරීමට මුළු වර්ෂය සඳහා දෙනු ලබන විවෘත බලය - Annual Warrant එක - මින් ඉදිරියට කාර්තුවෙන් කාර්තුවට නිකුත් කිරීමට..." යනුවෙන් අය වැය කථාවේ සඳහන් කර තිබීම. අපි දන්නා කාලයේ සිට හැම වර්ෂයේම විසර්ජන පනත අනුමත කිරීමෙන් පසු වරෙන්තුව නිකුත් කරන්නේ අවුරුද්දකටයි. දැන් කාර්තුවෙන් කාර්තුවට මුදල් වෙන් කරනවා කියන්නේ ආණ්ඩුවට ආදායම ගැන විශ්වාසයක් නැහැ කියන එකයි. ආණ්ඩුවේ අස්ථාවරභාවය මේ තුළින්ම පෙනෙනවා.

ගරු මුදල් ඇමතිතුමා 2022 අය වැය ලේඛනය ඉදිරිපත් කළා, ගරු කථානායකතුමනි. එතුමා මේ සභාවේ හිටියා නම් මම එතුමාගෙන් අහන්නයි හිටියේ, රටේ තිබෙන දැවෙන ප්‍රශ්න දෙකට උත්තර තිබෙනවාද කියලා. ඒකෙන් එක ප්‍රශ්නයක් තමයි, ඩොලර් ප්‍රශ්නය. අපේ යහ පාලන ආණ්ඩුව තිබෙන කල් ඩොලර් ඕනෑ තරම් තිබුණා. නමුත්, අද ඩොලර් නැහැ. මම බැංකුවකට කථා කරලා ඇහුවා. කියන්න ලජ්ජයි, එක බැංකුවකින් කිව්වා, ඒ බැංකුවේ තිබෙන්නේ ඩොලර් 100යි කියලා. ඩොලර් ප්‍රශ්නයට උත්තරයක් ඔබතුමන්ලාට තිබෙනවාද? *[බාධා කිරීමක්]*

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා මුදල් රාජ්‍ය ඇමති නම් උත්තර දෙන්නකෝ. *[බාධා කිරීමක්]* ඩොලර් ප්‍රශ්නයට උත්තරයක් තිබෙනවාද? පළමුවන ප්‍රශ්නය එයයි. දෙවන ප්‍රශ්නය, මේ ණය ගෙවන්නේ කොහොමද කියන එකයි. How are we going to pay the debts? අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් අපිට ගෙවන්න තිබෙනවා. ඒ මුදල ගෙවන්න මාර්ග තිබෙනවාද? ඒකට උත්තරයක් නැහැ, ගරු කථානායකතුමනි. අපි ඩොලර් සොයන්නේ කොහොමද? ඒ සඳහා අපි අපනයනය වැඩි කර ගන්න ඕනෑ.

මේ අය වැයේ අපනයනය ගැන වචනයක්වත් කථා කරලා නැහැ. Exports වැඩි කරගන්නේ කොහොමද කියලා කථා කර නැහැ. කාලීන ප්‍රශ්නවලට මුදල් ඇමතිතුමා උත්තර දෙන්න ඕනෑ. ඒකයි මම කියන්නේ, මුදල් ඇමතිතුමාට මේ සභාවේ ඉන්න කියලා. එතුමාට උදව් කරන්න අපට පුළුවන්. *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තු සම්ප්‍රදාය මොකක්ද කියලා දන්නේ නැහැ. පාර්ලිමේන්තුවට එන්නේ නැතිව හැන්දෑවට press conferences තියනවා. ලජ්ජයි. හැන්දෑවට press conference එකක් තියලා මොකක්ද කියන්නේ? "රාජ්‍ය සේවකයෝ බරක්" කියනවා. ඒක කොච්චර අපහාසාත්මක කථාවක්ද, ගරු කථානායකතුමනි? රාජ්‍ය සේවකයෝ බරක්ද? නව ලක්ෂයේ ඉඳලා දහහත් ලක්ෂය දක්වා රාජ්‍ය සේවකයන් ප්‍රමාණය වැඩි කෙරුවේ ඔබතුමන්ලා. අපි නොවෙයි. එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය හැම දාම කිව්වා, පෞද්ගලික අංශයටත් මේ රටේ කාර්ය භාරයක් කරන්න තිබෙනවා කියලා. ඔබතුමන්ලා ඡන්ද ගන්න, "අච්චර දෙනවා, මෙච්චර දෙනවා" කියලා රාජ්‍ය සේවකයන් ප්‍රමාණය නව ලක්ෂයේ ඉඳන් දහහත් ලක්ෂය දක්වා වැඩි කරලා දැන් කියනවා, ඒ අය බරක් කියලා. අපි කියන්නේ රාජ්‍ය සේවකයන්ට අපහාස කරන්න එපා කියලායි. නිදහස් අධ්‍යාපනයේ හා නිදහස් සෞඛ්‍ය සේවයේ ප්‍රතිලාභ ලබමින් ඉගෙන ගත් ළමයි තමයි රාජ්‍ය සේවයට බැඳී තිබෙන්නේ. ඒ අය අපට සම්පතක්. අපේ රටට සුනාමිය ආ කාලයේදී මේ රට ආරක්ෂා කෙරුවේ කවුද? එදා ජනතාව ආරක්ෂා කෙරුවේ රාජ්‍ය සේවකයෝ. එම නිසා රාජ්‍ය සේවකයන්ට අපහාස කරන්න එපා. අද අපි සන්තෝෂ වෙනවා, එදා ආණ්ඩුවක් හැටියට ඒ අයගේ වටිනාකම තේරුම් අරගෙන අපි රුපියල් 10,000කින් ඒ අයගේ පඩි වැඩි කිරීම සම්බන්ධව. ඒ අවස්ථාවේදී අපි එක් රාජ්‍ය සේවකයෙකුවත් අත්හැරියේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ සියයට 80ක් ඉන්නේ ගොවියෝ. රසායනික පොහොරවලින් කාබනික පොහොරවලට පරිවර්තනය වීම පිළිබඳ ප්‍රශ්නය ගැන ගොවීන් එක්ක සාකච්ඡා කෙරුවාද, ගරු ඇමතිතුමනි? සියයට 80ක් ඉන්නේ වී වගා කරන, තේ වගා කරන, විවිධ භෝග වගා කරන ගොවියෝ. ඔවුන් එක්ක සාකච්ඡා කෙරුවාද? කෘෂිකර්ම ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවාද? නැහැ. එතුමන්ලා ගොවීන් එක්ක සාකච්ඡා කෙරුවේ නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් කාලයක් කෘෂිකර්ම ඇමති ධුරය දරපු නිසා මම මේ කාරණය කියන්නම්. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන්නේ මේ කාබනික වගාවට යන එක අවුරුදු 10කින් කරනවා කියලා. අවුරුද්දෙන් ඒක කරනවා කියලා නැහැ. මේ ආණ්ඩුව පළමුවැනි අය වැයෙන්

රුපියල් බිලියන 800ක් නැති කර ගත් නිසා ආණ්ඩුවට සල්ලි නැති වුණා. ඒකයි වුණේ. එම නිසා අවුරුදු 10න් කරනවා කියපු එක අවුරුද්දෙන් කරන්න ගියා. ඒ ගැන ගොවීන්ගෙන් ඇහුවාද? සාකච්ඡා කෙරුවාද? ඒක මුදල් නැතිකම නිසා සිදු වෙච්ච දෙයක්. ඒ ගැන පුළුල් ලෙස සාකච්ඡා කරන්න තිබුණා. ඒ ගැන කෘෂි කාර්මික විශේෂඥයන් එක්ක, විපක්ෂය එක්ක කිසිම සාකච්ඡාවක් කළේ නැහැ.

මේ නිසා, අද කන්ද උඩරට පළාත්වල තේ ගොවීන්ගේ අස්වැන්න සියයට 50කින් අඩු වෙලා. ගරු කථානායකතුමනි, ඔබතුමා ඉන්න පළාතෙත්, තේ තිබෙනවා. අද කන්ද උඩරට පළාතේ සියයට 50කින් තේ අස්වැන්න අඩු වෙලා. මට කථා කළා හසලක, මිනිපේ හා මහියංගනය පළාත්වලින්. ඒ පළාත්වල කිසිම ගොවියෙක්, ගොවිතැන් කටයුතු ආරම්භ කරලා නැහැ. ගොවීන්ට රසායනික පොහොර දෙන්නේ නැතුව කාබනික පොහොර හදා ගන්න කිව්වා. ඒකට රුපියල් 12,500ක් දෙනවා කිව්වා. ඒක තවම හරියට දීලා නැහැ. ඇයි මෙහෙම කරන්නේ? මේක මුළු රටම අනතුරේ දැමීමක්, ගරු කථානායකතුමනි? ඔබතුමා පරිණත දේශපාලනඥයෙක්. ඔබතුමාත් කෘෂිකර්ම ඇමතිවරයකු හැටියට ඉඳලා තිබෙනවා නේ. ඇයි මේ රජය මෙවැනි දේවල් කරන්නේ?

පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවෝ කොළඹ විශ්වවිද්‍යාලයේ කුලපති විධියට පත් කරලා. හැබැයි, උන් වහන්සේ අද කියා තිබෙන දේ දැක්කාම මට හිනා ගියා. උන් වහන්සේ කියා තිබෙනවා, "මේක පතෝල අය වැයක්" ලු. එහෙම කියන්නේ, මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවෝ. අනෙක් ඇමතිවරු කියපු දේවල් මම කියන්නේ නැහැ. මම අද උදේත් දැක්කා ජෝන් සෙනෙවිරත්න මැතිතුමා සහ හිටපු පාර්ලිමේන්තු ඇමතිවරු බොහෝ දෙනෙක් කියපු කථා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම දැන් මේ ගොල්ලෝ අපෙන් අහනවා ප්‍රශ්නයක්, "ඔබතුමන්ලා ආවොත් කොහොමද රට පාලනය කරන්නේ?" කියලා. ණය ගෙවන්නේ කොහොමද, ඩොලර් හොයන්නේ කොහොමද කියලා අහනවා. අපි ඒකට උත්තරයක් දෙන්නම්.

මම තමුන්නාන්සේලාට කියනවා, අපේ ආණ්ඩුවක් නම්, ජාත්‍යන්තරයත් එක්ක කථා කරලා අපි මේ ණය ටික reschedule කර ගන්නවා. Reschedule කර ගන්න, ඔබතුමන්ලා. ණය reschedule කරන්න පුළුවන්, අවුරුදු පහෙන් ගෙවන්න තිබෙනවා නම්, දහයෙන් ගෙවන්න. එතකොට ගරු කථානායකතුමනි, හුස්ම ගන්න ඉඩක් එනවා, you get a breathing space. දැන් එක අවුරුද්දකට අපි US Dollars 6 billion ගෙවන්න ඕනෑ. ගෙවන්න පුළුවන්ද? දැන් මේ අවුරුද්දේ දේපළ වික්කා. ඊළඟ අවුරුද්දේ මොනවාද විකුණන්නේ? මේ කාරණය මම රජයට කියනවා. ඒත් මෙතැන දැන් ජ්‍යෙෂ්ඨ ඇමතිවරු කවුරුවත් නැහැ ඒක කියන්න. *[බාධා කිරීමක්]* මම කියන්නේ, ජාත්‍යන්තරයත් එක්ක කථා කරන්න කියලායි. ඔබතුමන්ලා ණය reschedule කර ගන්න. අපට පුළුවන් ඒක කරන්න. මොකද, අපි ජාත්‍යන්තරයත් එක්ක වැඩ කරන පක්ෂයක්. එක්සත් ජාතික පක්ෂයේ, සමගි ජනබලවේගයේ අපි ජාත්‍යන්තරයත් එක්ක වැඩ කරන්නේ. බලන්න, එදා අපේ ආණ්ඩුව බලයට ආවා විතරයි GSP සහනය දුන්නා. පළමු මාස හය තුළ GSP සහනය ආපහු දුන්නා. මොකද, ඒ අය දැන ගත්තා අපේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන ආණ්ඩුවක්, සුළු ජාතීන්ට හිරිහැර නොකරන ආණ්ඩුවක්, මානව හිමිකම් ආරක්ෂා කරන ආණ්ඩුවක් කියලා. මේවා කඩ කරන අයට ජාත්‍යන්තරයේ සහයෝගය නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන, නීතියේ උත්තරීතරභාවය විනාශ කරන, සුළු ජාතීන්ට හිරිහැර කරන ආණ්ඩුවකට ජාත්‍යන්තරයේ ආධාර නැහැ. ඒක තේරුම් ගන්න.

ඒක තේරුම් ගන්න ඕනෑ. 2015දී අපි බලයට ආවාම අපට මාසයෙන් GSP සහනය දුන්නා. අපට ආර්ථික ප්‍රශ්නයක් තිබුණාද? ඩොලර් ප්‍රශ්නයක් තිබුණාද? ඔබතුමන්ලාට ඩොලර් නැහැ; රුපියල් සතවත් නැහැ. ඔබතුමන්ලා ඇවිල්ලා මොකක්ද කරන්නේ? ගෝඨාභය මහත්මයාත් යන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ගිය පාරේ. ඒක කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මැතිතුමා මොකක්ද කළේ? යුද්ධය දිනුවා. යුද්ධය දිනලා එතුමා ඉතිහාසයට එක් වුණා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. හැබැයි, මානව හිමිකම් වැනි ප්‍රශ්නවලදී දුර්වල වුණා. 2012දී අපට විරුද්ධව මානව හිමිකම් යෝජනාවක් ගෙනාවා. 2013දීත් ගෙනාවා. 2014දීත් ගෙනාවා. අවුරුදු තුනක් පිට පිට අපට විරුද්ධව යෝජනා ගෙනාවා. 2015දී එතුමා ඡන්දයකට ගියේ ඇයි ගරු කථානායකතුමනි? 2015දී එතුමා ඡන්දයකට ගියේ, ආර්ථික සම්බාධක එන නිසායි. ආර්ථික සම්බාධකවලට මුහුණ දෙන්න බැරි නිසා එතුමා ඡන්දයකට ගියා. දැන් මේ ආණ්ඩුවත් යන්නේ ඒ පාරේ. පළමුවැනි අවුරුද්දේම එක්සත් ජාතීන්ගේ සංවිධානය තරහ කර ගත්තා. UN Human Rights Council එකේ අපට විරුද්ධව යෝජනාවක් සම්මත වුණා. ඒ වාගේම යුරෝපා සංගමය කිව්වා, GSP සහනය ගැන යළි සලකා බලන්න ඕනෑ කියලා. ලබන මාර්තුවේ මොනවා වෙයිද දන්නේ නැහැ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය රැස් වුණාම. නමුත් අපට පුළුවන්, ජාත්‍යන්තරයත් එක්ක කටයුතු කරන්න. අපට පුළුවන් මේ ණය දීර්ඝ කාලයකට ගෙවන ක්‍රමවේදයක්, හුස්ම ගන්න ඉඩක් හදා ගන්න. එහෙම කළොත්, තමුන්නාන්සේලා ඒක කළොත්, තමුන්නාන්සේලාට ඉදිරි අවුරුදු දෙක-තුන තුළ රට ඉදිරියට අරගෙන යන්න පුළුවන්.

ඔබතුමන්ලා හැම එකටම, 'කොවිඩ් නිසා' කියනවා. හැම එකටම හේතුව, කොවිඩ්. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, අසල්වැසි එක රටකවත් පෝලිම් තිබෙනවාද කියලා? ඉන්දියාවේ බඩු ගන්න පෝලිම් තිබෙනවාද? පාකිස්තානයේ පෝලිම් තිබෙනවාද? බංග්ලාදේශයේ පෝලිම් තිබෙනවාද? මේ අවට එක රටකවත් පෝලිම් නැහැ. ගරු කථානායකතුමනි, කොවිඩ් වසංගත කාලයේ ඒ අයගේ විදේශ වත්කම් වැඩි වෙලා. මම මේ දත්ත ටික කියවන්නම්. 2019දී ඉන්දියාවේ Foreign Exchange Dollar Reserves US Dollars 424.9 billion. 2021දී ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 612කට ඉහළ නැග්ගා. ඒ රටේ විදේශ සංචිත වැඩි වෙලා. බංග්ලාදේශයේ US Dollars 32.41 billion. මේ අවුරුද්දේ US Dollars 44 billion; ඇමෙරිකානු ඩොලර් බිලියන 44යි. මැලේසියාවේ 2019දී ඇමෙරිකානු ඩොලර් බිලියන 103.63යි. මේ අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන106යි. මේ විස්තර ඇතුළත් ලැයිස්තුව මා ළඟ තිබෙනවා. ඒ හැම රටේම විදේශ සංචිත වැඩි වෙලා.

ලංකාවේ විතරයි විදේශ සංචිත අඩු වෙලා, පෝලිම් වැඩිවෙලා තිබෙන්නේ. මේකට ආණ්ඩුව වග කියන්න ඕනෑ. ඒකට අපට කරන්න දෙයක් නැහැ. අපි ආණ්ඩුව බාරදෙනකොට මිලියන 2,000ක - 2000 million - ආදායමක් එක්ක බාර දුන්නේ. දැන් ආණ්ඩුවේ වැරැද්දෙන්ම ඒ මුදලින් මිලියන 800ක් නැති කරගෙන අපට දොස් කියනවා.

මේ අවස්ථාවේදී මම ගුරුවරුන්ගේ ප්‍රශ්නය ගැනත් කියන්න ඕනෑ. අපේ ආණ්ඩුව තිබුණා නම් 2020 මුල් කාර්තුව තුළ ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳනවා. මොකද, ඒකට අවශ්‍ය බිලියන 30යි නේ; Rs.30 billion. අපි ආදායම මිලියන 1,000කින් වැඩි කර ගත්තා. ඉතින්, බිලියන 30ක් දෙන එක මොකක්ද? විශ්‍රාමිකයන්ගේ දීමනාවේ අන්තිම කොටසත් අපි කැබිනට් මණ්ඩලයෙන් අනුමත කළා. මේ ආණ්ඩුව ඒක දුන්නේත් නැහැ.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ]

මම ඔබතුමාගෙන් අහන්න ඕනෑ. ජනතාවට කොයි පැත්තකින් හරි සහනයක් තිබෙනවා ද? කොයි පැත්තකින් හරි? සහනයක් නැහැ. පාසල් පද්ධතිය අවුල් වෙලා. ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. රාජිත සේනාරත්න මැතිතුමා සෞඛ්‍ය ඇමති කාලයේ බෙහෙත් මිල කොහොමද තිබුණේ? සේනක බිබිලේ ප්‍රතිපත්තිය ගෙනැල්ලා බෙහෙත් මිල පාලනය කළා. අද මම website එකේ දැක්කා, සමහර බෙහෙත්වල මිල සියයට සියයකින් වැඩි වෙලා. ඉතින් කොයි පැත්තෙන් ද ජනතාවට සහනයක් තිබෙන්නේ? ජනතාවට ජීවත් වෙන්න බැහැ, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල වැඩිවෙලා.

අනෙක් එක ගරු කථානායකතුමනි, දැන් මේ රටේ මිල පාලනයක් තිබෙනවා ද? මම අවුරුදු 33ක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට ඉන්නවා. මම නම් දැකලා නැහැ, ආණ්ඩුවක් මේ විධියට මිල පාලනය අත්හරින දෙයක්. ඒක ලජ්ජාවක්. ඒ කියන්නේ ආණ්ඩුවට ඒක පාලනයක් නැහැ කියන එකයි, out of control. වෙළෙඳ මාෆියාව මිල පාලනය බදාගෙන කටයුතු කරනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මට විනාඩි 20ක් තිබුණා. ඒ ඔක්කෝම එකතු කළා ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ඔක්කෝම තමයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට තව points දෙකක්, තුනක් ඉදිරිපත් කරන්න තිබෙනවා, ගරු කථානායකතුමනි.

මම අවසාන වශයෙන් රජයෙන් අහන්නේ මෙච්චරයි. අපිට ඕනෑ මේවාට උත්තර, ගරු කථානායකතුමනි. අපි මේ වාද විවාද කරලා වැඩක් නැහැ. අපි ඔක්කෝම පාර්ලිමේන්තුවට එන්නේ ජනතාවගේ ඡන්දයෙන්. අද මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ. මේවාට උත්තර දෙන්න කෙනෙක් නැහැ. මේ ප්‍රශ්නවලට නිල උත්තර ඕනෑ, official answers ඕනෑ. මම දැක්කා එක කාන්තාවක් website එකක කියනවා, "අපේ රට විකුණනවා; අපිත් එක්ක වික්කා නම් ඉවරයි." කියලා. ඒ කාන්තාව කියලා තිබුණා, "ජනතාවත් එක්කම වික්කා නම් ඉවරයි, එතකොට ගන්න කෙනා අප බලා ගනීවි නේ" කියලා. මේ වාගේ දේවල් ඇහෙනකොට ඇත්තටම අපට ලජ්ජයි.

පාර්ලිමේන්තුවේ ඉන්න අපටත් ලජ්ජයි. මේක ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]* මේක ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ දෙයක් නොවෙයි. "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළේ තිබෙන එක පොරොන්දුවක්වත් ඔබතුමන්ලා ඉෂ්ට කර නැහැ. ඒක තමයි ඇත්ත. මම කලින් කිව්වා වාගේ නැවතත් රජයට කියනවා, ජාත්‍යන්තරයත් එක්ක කථා කරලා මේ ණය reschedule කර ගන්න කියලා. මේ ණය reschedule කරගෙන හුස්ම ගන්න ඉඩක් ගන්න. ජාත්‍යන්තරයත් එක්ක හොඳින් ඉන්නවා නම් තමුන්නාන්සේලාට ඒක කරන්න පුළුවන්. ජාත්‍යන්තරයත් එක්ක කැත්තට පොල්ල වාගේ ඉන්නකොට ඒක කරන්න බැහැ. ඒක තමයි ලංකාවට තිබෙන එකම විසඳුම. අපේ රජයක් ආවොත් අපට මේක කරන්න පුළුවන්. ජාත්‍යන්තරයත් සමඟ ගනුදෙනු කළ හැකි පරිණත නායකයන් අපේ පැත්තේ ඉන්නවා. ඒක ලෝකයම දන්නවා. *[බාධා කිරීම්]* යහ පාලනයේ හිටපු අය දැන් මේ විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඉන්නවා. යහ පාලනයේ හිටපු අය විරුද්ධ පාර්ශ්වය පැත්තේ පළමුවෙනි පේළියේ ඉන්නවා. ඒ ගොල්ලොත් යහ පාලනයේ වැඩ කළ කොටස්කාරයෝ.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා.

[පූ.භා. 10.17]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මුදල් ඇමති ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා 2022 අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් අය වැය කථාව සිදු කළා. ඒ අනුව 2022 වර්ෂයේ රටේ ආර්ථික කළමනාකරණය හා සංවර්ධන ක්‍රියාදාමය වාගේම සරල ක්‍රියාමාර්ග තුළින් රටේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගත්තා වූ එඩිතර පියවරවලට මම පළමුකොට ස්තුති කරන්න කැමැතියි.

ලෝක ආර්ථිකය ඉතාමත් අමාරුවෙන් හිස ඔසවමින් ගත කරන බව ඔවුන්ගේම සංඛ්‍යා ලේඛන ප්‍රකාශ කරන පසුබිමක සිට, මුදල් ඇමතිතුමා 2022 වර්ෂය සඳහා උච්ඡාන වීර්යයෙන්, උච්ඡාන අය වැයක් රටට ලබා දීලා තිබෙනවා. දැවැන්ත උත්සාහයකින් අපේ රටට හිස ඔසවන්නට පුළුවන් මාර්ගය ඉතා පැහැදිලිව මෙයින් පෙන්නුම් කරනවා. මට පෙර කථා කළ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා යම් යම් අඩු පාඩුකම් කියලා තිබෙනවා.

අඩු පාඩුකම් නොවෙයි, ඉතා පැහැදිලිව දීර්ඝ කාලයක සිට - වර්ෂයක් නොවෙයි දශක දෙක තුනක් තිස්සේ - ඇදී එන යම් යම් අංශවල යථාර්ථය, නාස්තිකාර ක්‍රියාමාර්ග ගැන මුදල් ඇමතිතුමා අවංක ප්‍රකාශයක් පාර්ලිමේන්තුවට හා රටට කරලා තිබෙනවා. ඒවා නිවැරදි කළ යුතුයි. ඔබතුමන්ලා කැමැති වුණත්, නැතත් ඒවා නිවැරදි කළ යුතුයි. ඒවා නිවැරදි කිරීම සඳහා ගත හැකි පියවර ගැන එතුමා යෝජනා කරලා තිබෙනවා.

I just wanted to mention, Sir, I will quote from the Hon. Lakshman Kiriella's favourite institution, the IMF.

Real GDP Growth (Y-o-Y)

| | 2019 | 2020 | 2021 (Projection) | 2022 (Projection) |
|---|---|---|---|---|
| World Output | 2.8 | -3.2 | 5.9 | 4.9 |
| Advanced Economies | 1.6 | -4.6 | 5.2 | 4.5 |
| United States | 2.2 | -3.5 | 6.0 | 5.2 |
| Euro Area | 1.3 | -6.5 | 5.0 | 4.3 |
| Japan | 0.0 | -4.7 | 2.4 | 3.2 |
| United Kingdom | 1.4 | -9.8 | 6.8 | 5.0 |
| Emerging Market and Developing Economies | 3.7 | -2.1 | 6.4 | 5.1 |
| Russia | 2.0 | -3.0 | 4.7 | 2.9 |
| China | 6.0 | 2.3 | 8.0 | 5.6 |
| India | 4.0 | -7.3 | 9.5 | 8.5 |
| Brazil | 1.4 | -4.1 | 5.2 | 1.5 |
| ASEAN | 4.9 | -3.4 | 2.9 | 5.8 |

මොකද, මේ නිසා අපට තිබෙන අවස්ථා වැඩි වෙනවා. ලෝක ආර්ථික පසුබෑමකින් හැරී හිස ඔසවන අවස්ථාවකදී අපේ ආර්ථිකය අපනයන පදනම් කරගෙන තිබෙන තත්ත්වයන් මත මෙවර අය වැය ලේඛනයෙන් ගරු මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වෙන සියයට 5.6ක ආර්ථික වර්ධන වේගයට ගමන් කිරීමේ ඉලක්කයට යන්නට නම්, අපට දැඩි විශ්වාසයක් හා කැපවීමක් තිබිය යුතුයි. මේ ආර්ථික පසුබෑම ලංකාවට සීමා වුණු දෙයක් නොවෙයි. ඒ බව ඉහත සංඛ්‍යා ලේඛනවලින් ඔප්පු කරනවා. අපට මතකයි අපේ ජයග්‍රහණය වෙලාවේ, අපට රට භාර දෙන අවස්ථාවේ, එදා තිබුණු තත්ත්වය විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා. 2019දී අපට භාර දුන්නේ සියයට 2.2කට වැටුණු, කඩා දමන ලද ආර්ථිකයක්. යහ පාලනයක් තිබුණේ නැහැ. යහ පාලනය කඩා වැටිලා එය යම් පාලනයක් බවට පත් වෙලා තිබුණා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමාට, අපට මතකයි.

පාස්කු දිනයේ මහා විනාශය ගැන තොරතුරු දැනගෙන කටයුතු නොකිරීම පිළිබඳ වග කිව යුත්තන් කවුද කියන එක අකැමැත්තෙන් හෝ කනගාටුවෙන් වීදුරු කාමරයේ කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බලන්න කියලා ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට මම කියනවා.

ඒ මහා විනාශයට, කඩා වැටීමට කවුරුත් නොව, මුළු රටක් මුහුණ දුන්නා. අද අපට මෙතුමන්ලා කියනවා, යහ පාලනයක් තිබුණා කියලා. එතැනින් පස්සේ ආර්ථිකය තවත් හෙල්ලිලා වැටෙන්න පටන් ගත්තා. සංචාරකයන්ගේ පැමිණීම අර්බුදයකට පත් වුණා. හිටපු අගමැතිතුමා මෙම ගරු සභාවේ ඉන්නවා. එතුමන්ලා උත්සාහ දරලා ආර්ථිකය යළි පණ ගන්වන්න පුළුවන්කම ඇති වුණා. නමුත් මෙයින් ඇති වුණු දැවැන්ත පසුබෑම, හෙල්ලීම අපි අමතක කළ යුතු නැහැ. 2019දී අපට භාර දුන්නේ එහෙම කඩා වැටිච්ච රටක්.

ගරු කථානායකතුමනි, 2020දී කොවිඩ් -19 වසංගතය ආවා. ලෝකයේ අනෙක් රටවල් වාගේම ඒ සියලු අභියෝග හරහා අපේ ආණ්ඩුව ගමන් කර තිබෙනවා. ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් අපේ ජන වරම තුළින් කටයුතු කිරීමේ හැකියාව ඇති කළා. 2021 අද වන විටත් කොවිඩ් වසංගතය තවමත් අප රටට බාධා ඇති කරනවා. මම කියවපු සංඛ්‍යා ලේඛන අනුව මේ කිසිවෙකුට කියන්න පුළුවන්ද, ලෝක ආර්ථිකය වේගයෙන් වර්ධනය වෙමින් පවතිනවා කියලා? නැහැ. දැනට සුමාන දෙකක් නැහැ. ඇමෙරිකා එක්සත් ජනපදය කොංග්‍රස් මණ්ඩලයට ගිහිල්ලා තමන්ගේ ණය සීමා වැඩි කරන්න අවසර ගත්තා. මොකටද? ඒ ලෝකයේ පොහොසත්ම රට කියන ඇමෙරිකා එක්සත් ජනපදය. මෙතුමන්ලා කියනවා, එතුමන්ලාට පුළුවන් ලු, ගිහිල්ලා සල්ලි අරගෙන එන්න. මේවා විහිළු කථා. පසුගිය සතියේත් ලෝක බැංකුවෙන් ආවා. අපි ඔවුන් එක්ක සාකච්ඡා කළා. ලෝක බැංකුවත් එක්ක සාකච්ඡා කරන්න අපට කිසිම මැළිකමක් නැහැ. යම් යම් අංශවලට ලබාදෙන ආධාර අඛණ්ඩව ඉදිරියට ගෙනයන්න ඒ අයගේ සහයෝගය අපට ලබා දී තිබෙනවා. ඒ නියෝජිතයන් ජනාධිපතිතුමාවත් හමු වෙලා ගියා. එම නිසා විපක්ෂය නැති ප්‍රශ්න කෙරෙහි විශ්වාසය තබන්නේ ඇයි, ගරු කථානායකතුමනි? රට කඩා වැටිලා, එතුමන්ලාට ආණ්ඩුවක් ලැබෙයි කියලා එතුමන්ලා හිතාගෙන ඉන්නවා.

එතුමන්ලා 2020දී මොකක්ද කිව්වේ? එතුමන්ලා පාර්ලිමේන්තුවේදී කිව්වා, කොවිඩ් -19 වසංගතය සම්බන්ධයෙන් ආණ්ඩුවට කාගේවත් සහයෝගය ලැබෙන්නේ නැහැ කියලා. එහෙම කිව්වේ මේ විපක්ෂයමයි. ආණ්ඩුවට කොවිඩ් වසංගතය කළමනාකරණය කර ගන්න බැරි වෙනවා, මහා විනාශයක් වෙනවා කියලා කිව්වා. එය ජයගත්තේ නැද්ද අපි? අපිට එය කළමනාකරණය කරගන්න පුළුවන් වුණේ නැද්ද? එහෙම පුළුවන් වීම නිසා ආර්ථිකය යළි පණ ගැන්වීම ආරම්භ වෙලා නැද්ද? එම නිසා විපක්ෂය කලින් කලට තමන් තෝරා ගත්තා වූ මිථ්‍යාවන් පස්සේ ගොස් ආණ්ඩුව කඩා වැටෙනවා කියන එක පෙන්වමින් ජීවත් වෙන්න තමයි, දේශපාලන වශයෙන් උත්සාහ දරන්නේ. රටට, ජනතාවට තිබෙන ආදරයක් ගැන මෙතුමන්ලා ජාතික වශයෙන් කල්පනා කරනවා කියා මා හිතන්නේ නැහැ. එම නිසා අධිෂ්ඨානයෙන් 2022 හරහා ගමන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මම වැඩිපුර වේලාව ගන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මෙවර අය වැය; කුඩා දරුවන්, කිරි දෙන මව්වරුන්, වැඩිහිටියන් ඇතුළු සමාජයක් විසින් රැකබලා ගතයුතු සියලු කොටස් වෙත පූර්ණ අවධානය යොමු කරන ලද අය වැයක්. අභියෝගාත්මක කාල පරිච්ඡේදයක වුණත්, මේ කටයුතු ඉෂ්ට කර තිබෙනවා. ඒ වාගේම රටේ විවිධ ක්‍රියාකාරී ආර්ථික බලවේගයන්ට කිසි කලකටත් වඩා එකවර වැඩි වටිනාකමක් ගෙන දෙන ප්‍රතිපාදන අය වැය ලේඛනයෙන් වෙන් කර තිබෙනවා.

බලශක්ති සම්කරණය ඒ වාගේම තමයි. රටේ ආර්ථික ක්‍රියාවලියට සහනයක් දෙන නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න නම්, ඒ සඳහා අඛණ්ඩ සැපයුමක් ලබා ගත හැකි බලශක්ති ආරෝපණයක් අවශ්‍යයි. ඒ අතරම පරිසර හිතකාමී සූර්යය ශක්තිය, සුළං බලය, අලුත් ජලවිදුලිය ආදී ප්‍රභවයන් කෙරෙහි -ස්වභාව ධර්මයාගේ දායාද ඇති රටක් හැටියට- මෑත කාලයේත් පුළුල්ම ආයෝජන ඇති අය වැයක් බවට මෙය පත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකාව පුරා ඇති ග්‍රාම සේවා වසම් 14,021ටම -උතුරුකරයේ පේදුරු තුඩුවේ ඉඳලා දකුණුකරයේ දෙවුන්දර තුඩුව දක්වා වන සෑම ග්‍රාම සේවා වසමකටම- එකම ප්‍රමාණයෙන් ප්‍රතිපාදන සලසා දී තිබෙනවා. ඒ වාගේම පළාත් පාලන කොට්ඨාසවල කවුරු දින්නත්, කවුරු පැරදී සිටියත්, මන්ත්‍රීවරුන් අඩුවෙන් පත් වෙලා සිටියත්, විරුද්ධ පැත්තෙන් දිනපු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

මන්ත්‍රීවරුන් සියල්ලටත් එකම ප්‍රමාණයෙන් මහ භාණ්ඩාගාරයෙන් ඍජු ප්‍රදාන ලබා දෙන අය වැයක් බවට මෙම අය වැය පත් කර තිබෙනවා. මෙවැනි යෝධ පියවරක් ගැනීම සම්බන්ධව ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත විය යුතුයි.

මේ ශක්තිය කෙළින්ම ගමට යොදවා ජාතික නිෂ්පාදනය වැඩි කරන්න, ජීවන උපාය මාර්ග වැඩි කරන්න, විවිධ කටයුතු සඳහා, මහජනයාගේ එදිනෙදා කටයුතු සඳහා යොදා ගන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නැඟිට "ආණ්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධීයි" කියා කියනවා නම්, ඒ ගැන මම දන්නේ නැහැ. එතුමන්ලාගේ පක්ෂය අපට ඒ කාලයේ මෙහෙම සැලකුවේ නැහැ.

ගරු කථානායකතුමනි, අද රටේ හැම කොට්ඨාසයක්ම, හැම ජන කොට්ඨාසයක්ම වාගේම සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර සියල්ල සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි දැවැන්ත ආයෝජනයක් මේ තුළින් කර තිබෙනවා. අපේ රටේ එක් විශාලතම ජයග්‍රහණයක් තමයි කෘෂිකර්මය. ඒ වාගේම සෞඛ්‍යය හා අධ්‍යාපනය තමයි අපේ රටේ තිබෙන අනෙක් ලොකුම ජයග්‍රහණයන් වන්නේ. ඒ කිසිම ක්ෂේත්‍රයකට ප්‍රතිපාදන සැලසීමේදී කිසි අඩුවක් කරලා නැහැ. පළමුවැනි වසරේ - ප්‍රාථමිකයේ- සිට විශ්වවිද්‍යාලය දක්වා වන අධ්‍යාපනයේ සෑම ක්ෂේත්‍රයකටම අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ ගොල්ලන් සිටියා නම්, ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳනවා කිව්වා. මේ ප්‍රශ්නය 1994 ඉඳලා තිබුණා.

ඒ ගොල්ලන්ගේ ආණ්ඩු ආවා, ගියා. අපි මැරිලා ඉපදුණේ නැහැ නේ. ඒ අයගේ ආණ්ඩු ආවා, ගියා. යහ පාලනයකුත් තියාගත්තා. ප්‍රශ්නය විසඳුවාද? නැහැ. මුදල් ඇමතිතුමා යෝධ මුදල් ප්‍රතිපාදනයක් හරහා මේ විෂමතාව හමාර කරලා ඉතාම වැදගත්, ඉතිහාසයේ අමතක නොවන තත්ත්වයක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට ලබා දීම සඳහා රුපියල් බිලියන 30ක් වෙන් කර තිබෙනවා. එය කෙළින්ම තිබෙන ප්‍රතිපාදනයක් පමණයි. මගේ මිත්‍ර ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට මම කියනවා, අධ්‍යාපනය වෙනුවෙන් එතුමා තවත් බිලියන ගණනාවක් පළාත් සභා හරහා වෙන් කර තිබෙන බව. එතකොට, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ මුදල මුළු අය වැයෙන් සියයට 7.5 ඉක්මවා තිබෙනවා. ගරු කථානායකතුමනි, තවත් ක්ෂේත්‍ර ගණනාවකින්, විශේෂයෙන් ශිෂ්‍යයන් ගමන් කරන විවිධ පෞද්ගලික සේවා පහසුකම් සඳහා, වෑන් රථ සඳහා, කුඩා බස් රථ සඳහා වෙනම මුදලක් වෙන් කර තිබෙනවා. ඒ පිළිබඳවත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ අර්බුදකාරී කාල පරිච්ඡේදයේ සෞඛ්‍ය නීති රීතිවලට ගරු කරමින් අපි ඒ කටයුතු කරන්න ඕනෑ. එසේ සෞඛ්‍ය නීති රීතිවලට ගරු කරමින් කටයුතු කිරීමේදී ප්‍රවාහන අංශවලට අතිරේක වැයක් දරන්න වෙනවා. මුදල් ඇමතිතුමා ඒ බව පිළිගෙන තිබෙනවා. එතුමා ඒ සඳහා වෙනම මුදල් වෙන් කර තිබෙනවා. එම නිසා, මේ වැදගත් අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමා අධ්‍යාපනය වෙනුවෙන් ඓතිහාසික ස්ථානයක් ලබා දී තිබෙනවාය කියා මා සටහන් කළොත්, එය ඉතාම නිවැරදියි. It is a historical milestone in the education sector of Sri Lanka. අපි එතැනට හැරිලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ තුළින් දැනුමෙන් සමන්විත අලුත් පරම්පරාවකට රට හැරෙන්න අවශ්‍ය සියලු ආයෝජනයන් යළි ඇති කර තිබෙන බව මෙම අය වැය ලේඛනය සම්බන්ධයෙන් කථා කරනකොට මම විශේෂයෙන් කියන්න ඕනෑ. එම නිසා ප්‍රාථමික සහ ද්විතීයික පාසල්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය, දුරස්ථ අධ්‍යාපනය සහ නව තාක්ෂණ අධ්‍යාපනය වෙනුවෙන්, ඒ වාගේම දහම් අධ්‍යාපනය වෙනුවෙන්ද එලෙසම මුදලක් වෙන් කර තිබෙනවා. අනාගත පරපුර වන අපේ දරුවන් කෙරෙහි විශාල ආයෝජනයක් මේ මඟින් කර තිබෙනවා. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් එය නැහැ කියනවා නම්, තමන්ගේ ගෙදර ඉන්න දරුවන්ටත් කරන්නේ අපහාසයක් කියන එක මම කියන්න ඕනෑ.

පාසල් විවෘත කරලා තිබෙනවා. ඔක්තෝබර් මාසයේ 21වැනිදා සෞඛ්‍ය නීති රීතිවලට අනුව පාසල් ආරම්භ කළා. ඔක්තෝබර් මාසයේ 1වැනිදායින් පසුව තමයි පාසල් විවෘත කරන්න පුළුවන්කම ලැබුණේ. මුලින්ම ප්‍රාථමික පන්තිවලින් පාසල් ආරම්භ කළා.

240,000ක් ගුරුවරු දෙවතාවක් එන්නත් කර තිබෙනවා. ගුරුවරුන්ට එන්නත ලබා දීලා තමයි පාසල් පටන් ගත්තේ. අද වනකොට පාසල්වල ඉහළ පන්ති සියල්ල විවෘත කරන්න අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඉදිරි සතියේ අපි පාසල්වල අනෙකුත් ශ්‍රේණි ආරම්භ කරනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා අපි කවුරුත් සතුටු වෙන්න ඕනෑ, මේ දොර වැස්මෙන් පස්සේ, after the lockdown, the schools have opened. Irrespective of political priorities, we stand for our children who are going to school. They will be going through school and going up the ladder to enter the future across the universities and other areas that are being opened and facilitated.

කුඩා දෙයක් අල්ලාගෙන එය මහා බරක් හැටියට පෙන්වන විරුද්ධ පක්ෂය මේ සිද්ධිය නිසා තවත් අසාර්ථක වුණා. එතුමන්ලා කිව්වා, අපිට මේ ගුරුවරු වෙනුවෙන් ගෙවන්න සල්ලි නැහැ කියා. අපි සාකච්ඡා කරමින් කොටසින් කොටස එම මුදල ගුරුවරුන්ට ගෙවන්න උත්සාහ දැරුවත් ඔවුන් ඒකට එකඟ වුණේ නැහැ. ගරු මුදල් ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවට පැමිණ සිටිනවා. මම යළිත් එම කාරණය සඳහන් කරනවා. කෙසේ හෝ මේ දැවැන්ත මුදල ගුරුවරුන් වෙනුවෙන් මෙවර අය වැයෙන් ලබා දීලා තිබෙනවා. ඒ තරම් ඓතිහාසික අවස්ථාවකට අපි පැමිණියාම විපක්ෂය යළිත් අහනවා, මොකක්ද අපි කර තිබෙන්නේ කියා.

ගරු කථානායකතුමනි, අපේ කම්කරු ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. නමුත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ, එදා විපක්ෂය මේ වාගේම නැඟිටලා මේ පාර්ලිමේන්තුවේදී කියපු කාරණයක්. කොවිඩ් වසංගතය නිසා මිනිසුන් ලක්ෂ ගණනකට රක්ෂා නැති වනවා, වැඩ පොළවල් වහනවා, දහස් ගණනක් හෙට-අනිද්දා වනකොට රක්ෂාවලින් එළියට දමනවා, එතකොට ඒ අයගේ රක්ෂා නැති වනවාය කියා විපක්ෂය එදා පාර්ලිමේන්තුවේදී කිව්වා. නමුත් මම කියන්න ඕනෑ, රක්ෂා ලක්ෂ ගණනක් නැති වීම වළක්වන්න කම්කරු අමාත්‍යවරයා හැටියට මට එදා මැදිහත් වෙන්න පුළුවන්කම ලැබුණු බව. ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ Taskforce එකේ සහායත් ලැබුණා. අපි ත්‍රෛපාක්ෂික -හාම්පුතුන්, වෘත්තීය සමිති, කම්කරු අමාත්‍යාංශය- එකඟතාවකට ආවා, කිසි කෙනෙකු රක්ෂාවලින් ඉවත් කරන්නේ නැහැ කියා. අපේ ආණ්ඩුව වැඩ කරන ජනතා හිතකාමී ආණ්ඩුවක්. නිෂ්පාදනය යළි ක්‍රමානුකූලව පටන් ගමු කියා අපි එකඟතාවකට ආවා. ඒ අනුව තමයි එම ත්‍රෛපාක්ෂික ගිවිසුම සාර්ථක වුණේ. ඔබතුමන්ලා එදාත් කිව්වා, ලක්ෂ ගණනක් මිනිස්සු රක්ෂාවලින් එළියට දමනවා කියා. මොකද, ඔබතුමන්ලා බලන්නේ පොතේ ගුරු හැටියට න්‍යාය විතරයි, යථාර්ථය නොවෙයි. ඉන්දියාවේ ලක්ෂ ගණනක් මිනිස්සු එළියට දැම්මා, factories වහලා. නමුත් ශ්‍රී ලංකාවට එවැනි තත්ත්වයකට පරිවර්තනය වෙන්න අපි ඉඩ තැබුවේ නැහැ. මාසිකව රුපියල් 14,500ක අවම ගෙවීමක් ගෙදර සිටියත් ඔවුන්ට ලබා දුන්නා. කම්කරු ඇමතිතුමා ඔවුන්ට ඒ ආරක්ෂාව ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම නිෂ්පාදනය පටන් ගත්තා. Specially, the apparel sector started to re-orient and re-export. ඒක අමතක කරන්න එපා. ඔබතුමන්ලා කිව්වා අපට කිසි දෙයක් පිටරට පටවා ගන්න බැහැ කියලා. මගේ මිත්‍ර ගරු මන්ත්‍රීවරුනි, අපි විතරක් නොවෙයි, ලෝකයේ කන්ටේනර් ගමනාගමනය ඇණහිටියා. මතක නැද්ද? නැව් ගමනාගමනයට කන්ටේනර් පටවන්න බැරි තත්ත්වයක් ලෝකයේ තිබුණා. අදත් සම්පූර්ණ වෙලා නැහැ. ඔබතුමන්ලා මේ ගරු සභාවට ඇවිල්ලා කථා කරනවා ඇයි, ශ්‍රී ලංකාවට අරක කරන්නට බැරි, මේක කරන්නට බැරි කියලා.

මේ වෙනකොට රබර් මිල නැඟලා තිබෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ ගම පැත්තට ගියා නම් රබර් මිල නැඟපු එක ගැන ගම්මු කියයි. Telephone call එකෙන් ආපු පණිවිඩය ගැන නෙවෙයි ඒ ගම්වල කාන්තාවන් කියන්නේ. රබර් කිරි කපලා අපට දැන් ආදායම ටිකක් වැඩියි කියලා කියන ගමන් අනෙකුත් ද්‍රව්‍යවල මිලත් වැඩි කර ගැනීමේ උත්සාහයක් මේ අය වැය ලේඛනයෙන් අපිට ලබා දීලා තිබෙනවා කියනවා.

ඒ වාගේම අපේ මිත්‍ර රටවල් ගැන සඳහන් කළා. අපිත් එක්ක ඔක්කෝම අමනාපයිලු. අපිත් එක්ක අමනාප නම් ඉන්දියාවෙන් අපිට එන්නත් ලබා දෙයිද? එන්නත් නොමිලයේත් ලබා දුන්නා; මුදලටත් ලබා දුන්නා ඉන්දියාව ඇතුළේ කොවිඩ් අර්බුදය වනතුරු. ඒ වාගේම චීනය එන්නත් ප්‍රමාණයක් ලබා දුන්නා. රුසියාව "ස්පුට්නික් - වී" එන්නත ලබා දුන්නා. ඇමෙරිකාව ලබා දුන්නා. යුරෝපය හා ජපානය ලබා දුන්නා. ඉතින් ඔබතුමන්ලා කියනවා අපිට ජාත්‍යන්තරව මිත්‍රයන් නැහැයි කියලා. මේ වාගේ බොරු කවුරු සඳහා ද කියන්නේ? රුසියාව, ජපානය, මැද පෙරදිග වැනි රටවල ආර්ථික ශක්තිය ලැබුණා. ඒ වාගේම විවිධ රටවල මහ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මූල්‍ය අවබෝධයක් ඇතිව කටයුතු කළා. කිසිම රටක විශ්වාසය නැත්නම් මෙහෙම කටයුතු කරන්නේ කොහොමද? අපෙන් අහනවා, ගරු මුදල් ඇමතිතුමා පැහැදිලි කළා, ඔබතුමන්ලා සවන් දුන්නා. නමුත් ඔබතුමන්ලා කියන්න කැමැතියි, අපේ රටට මේක කරන්න අමාරුයි කියලා. විදේශ ණය කෙරෙහි තිබුණු දැවැන්ත බර අඩු කර ගෙනයාමට රජයේ ප්‍රතිපත්ති හැටියට කල්පනා කර තිබෙන නිසායි මේ වැඩ පිළිවෙළට අපි අවතීර්ණ වුණේ. ඔබතුමන්ලා ඒ වෙනුවට කියන්න හදන්නේ, අපට රට කරගෙන යන්න බැහැ කියලා. Sri Lanka is making use of all financial instruments available to us. We did not invent any of these, my dear Friends. They existed around the world. Various countries have used them under different conditions. We will use financial instruments such as swaps, bonds, barter, FDI and joint ventures, if they are available to us, without hesitation, instead of heavy borrowings, but under certain conditions that we will stick to. That is what we have stated.

විපක්ෂය තවත් බොරු කිව්වා, විදේශ ණය වාරික ගෙවන්න බැරි වෙනවා කියලා. ඒක තමයි මම ඇහුවේ? එහෙම ගෙවන්න බැරි වුණාද? නැහැ, අද දක්වා ඔක්කොම ගෙව්වා. දැන් කියනවා, අපේ ඉතිරිය තිබෙන්නේ කියලා. අපි ණය ගෙවලා තිබෙන බව සත්‍යයක් හැටියට ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ. ඒ වාගේම මුදල් ඇමතිතුමා ඒ විශ්වාසය ඇතිව තමයි, ඉදිරියේදීත් අපේ ණය ගෙවන්න පුළුවන්කම කෙරෙහි මේ අය වැය ලේඛනයේදී විශ්වාසයෙන් යුතුව සඳහන් කළේ.

මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා හිටපු ඇමතිතුමා සඳහන් කළා, විදේශ රැකියාවලින් ලැබෙන සල්ලි අපි උකස් තියන්න හදනවා කියලා. ඒවා ලංකාවට ලැබෙනවා නම්, ඒවා ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා විදේශ විනිමය බවට පරිවර්තනය වෙනවා. "විදේශ විනිමය නැහැ" කියන කථාව එක පැත්තකින් කියමින් අනෙක් පැත්තෙන් කියනවා, විදේශ විනිමය ලැබෙන දෙයින් මේවා ගෙවන්න හදනවා කියලා.

Sri Lanka has honoured all foreign debt payments that were due within the past two years, amidst the COVID crisis and misleading false statements by the Opposition. Irrespective of what the Opposition is saying, we have fulfilled our financial obligations and won the trust of the international financial agencies that we are managing under the present circumstances and amidst all these problems, without going into any kind of a sovereign default. This House remembers what you all were saying. You all were predicting that we would be going into a sovereign default. How many times you all have repeated that in the House. Why are you all behaving like this?

In a national crisis, all of us must protect our citizens, our country and our economy, and not just reasons to oppose.

ගරු කථානායකතුමනි, මම හිතනවා, මේ නිසා අද වන විට ලෝකයේ න්‍යායාත්මක ආර්ථික විශ්ලේෂණ විශේෂඥයින්ගේ උපදෙස් සියල්ල අසාර්ථක බවට බවට පත් වෙලා තිබෙනවා කියලා. මගෙත් එක්ක සමහර විට මගේ හිත මිත්‍ර හිටපු අග්‍රාමාත්‍යතුමා එකඟ වෙයි. මහජන එක්සත් පෙරමුණ හැම දාම "පොතේ ගුරුවාදය" ප්‍රතික්ෂේප කළා. එය හෙළා දැක්කා. මම කලින් කිව්වා වාගේ, ලෝකයේ දියුණු යයි කියන ආර්ථිකයනුත් අද කොවිඩ්-19 වසංගතය නිසා අමාරුවේ වැටිලා තිබෙනවා. පසුගිය මාසයේ ඇමෙරිකා එක්සත් ජනපද සෙනෙට් සභාව විසින් ණය සීමාව වැඩි කළා. You will agree. ඒ වාගේම අනෙක් රටවල් ඒ විධියටම ආර්ථිකය සම්බන්ධයෙන් වෙනදා වාගේ එක න්‍යායාත්මක-

There is no static formula. This is what you all in the Opposition and we have to think. This is what the Hon. Minister of Finance has very clearly stated. We know that, from both sides-from the Right to the Left, all the theories have been worked out today in order to achieve the progress and protection that each society wants in this crisis because we have never faced this kind of a crisis before.

ලෝක යුද්ධයක් ආවා, ඉවර වුණා. නමුත්, ලෝක යුද්ධයක් නොවෙයි, මිනිස් ජීවිත පිළිබඳ අවිනිශ්චිතභාවයක් දැන් තියෙන්නේ.

මම මගේ කථාව අවසන් කිරීමට මත්තෙන් මේ ටිකත් කිව යුතුයි. අපි මොන ආර්ථික න්‍යායේ පොතේ ගුරුවාදවලට ගොදුරුව සිටියත්, එයින් මිදුණු යථාර්ථික වැඩ පිළිවෙළට අවතීර්ණ වෙන්න ඕනෑ බව තමයි මෙවර අය වැය ලේඛනය අනුව පෙනෙන්නේ. මම කලින් කිව්වා වාගේ මේ ගැන තවදුරටත් සඳහන් කරන්න ඕනෑ. ග්‍රාමීය ආර්ථිකයේ, දේශීය ආර්ථිකයේ ශක්තිමත්භාවය ඇති කරන්න ගරු මුදල් ඇමතිතුමා මෙවර අය වැය ලේඛනයෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. The rural economy will be the forerunner of the national economy. We are not going against the private sector. We are not going against any other sector. Hon. Minister of Finance has agreed to revive the rural economy and given an assurance even to the co-operative sector.

අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව අපේ පළාත්වල හොඳින් වැඩ කළා කියලා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලයේම අපේ පළාතේ ණය ගෙවා ගන්න බැරිව අසරණව සමුපකාර ග්‍රාමීය බැංකුවල රුපියල් කෝටි ගණනින්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

මුදල් තැන්පත් කරපු අහිංසක ගැමි ජනතාවගේ ඒ මුදල් ඒ අයට නැතිව ගියා. The Central Bank did not act. The Central Bank failed to act in terms of some of the finance companies. This is why they were collapsing. Before they collapse, the necessary steps have to be taken. Otherwise, we have to reimburse what has been lost.

ගරු මුදල් අමාත්‍යතුමා ඒ ණය සම්පූර්ණයෙන්ම යළි ගෙවා දැමීමට හා සමුපකාර අංශයේ,- ගරු කථානායකතුමනි, ගාල්ලෙන් එහා සමුපකාර සංගම් ගණනාවක ද එසේ තැන්පත් කරපු මුදල් ඒ අයට අහිමි වෙලා තිබෙනවා. ඒ සියලු දෙනාට ඒ විශ්වාසය ඇති කරලා තිබෙනවා. අවසානයේ දී පසුගිය ආණ්ඩුව වැඩ වරද්දා ගත්තේ මහ බැංකුවේ මහ හොරකම නිසායි. ඒකෙන් තමයි පසුගිය ආණ්ඩුව ආපු ගමන්, වැඩ වරද්දා ගත්තේ. මුදල් ඇමතිතුමා අය වැය කථාවේ කියනවා. මගේ මිත්‍ර කිරිඇල්ල මන්ත්‍රීතුමාට ඒක මතක නැහැ, මහ බැංකුවට සිද්ධ වෙච්ච දේ. ඒක තමයි ආර්ථිකය කැළඹීමකට ලක් කරපු කාරණාව. පසුගිය රජය සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ මහ වංචාවට මුල් වුණු පර්පෙචුවෙල් ට්‍රෙෂරීස් නමැති සමාගම අයථා ලෙස මුල්‍ය වංචා සහගතව උපයා ගත් ඒ හැම සතයක්ම යළි භාණ්ඩාගාරයට ලබා ගැනීමට අය වැය ලේඛනයෙන් ප්‍රකාශ කළා.

එය ඉතාම වැදගත්. එය තවම හමාර නැහැ. එහි මුල් ගිය තැන්, එය කෙසේ විහිදී ගියාද කියා සොයා බලන්න ඔබතුමන්ලාගේ මහ බැංකුවේ හිටපු අධිපතිතුමා තවම ලංකාවට එන්නේ නැහැ. ඒ, ඔබතුමන්ලාගේ මුදුන්මල්කඩ. මහ බැංකුවේ ඉහළින්ම තැබූ කෙනා. ඔහු කොයි රටේ හැංගිලා ඉන්නවාද කියා අපි දන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවා කොයි රටේද හැංගිලා ඉන්නේ කියලා. මම ඉතාම ඕනෑකමින් ඒ ටික සඳහන් කළේ ඇයි? අපේ මහ බැංකුවට එවැනි මහා විනාශයක් සිදු වෙනවා බලන් හිටපු ආණ්ඩුවක් තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව. අද ඔබතුමන්ලා ඇවිල්ලා කථා කරන්නේ මූල්‍ය සාධාරණකම ගැනයි.

ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කරමින්, ගරු මුදල් ඇමතිතුමාත්, ඒ වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් සිටින මේ අවස්ථාවේදී අවධානය යොමු කරන්න කැමැතියි, I wish to bring to the notice of the House the latest findings of Prof. David Card, 2021 Nobel Prize Winner in Economic Sciences. He and his colleagues' research work has established that the minimum wage helps create more jobs, more economic power and more purchasing power. These new findings are definitely and totally contrary to the established economic dogmas. That is why we do not want to trust or encourage "*the potheguru wadaya*".

මේ අවම ආදායම් මාර්ග පිළිගනිමින් තමයි අපි ඉදිරියට ගමන් කරන්නේ. අපේ අඩුම ආදායම් ලබන, අමාරුවෙන් ජීවත් වන ජනතාවගේ ප්‍රශ්නයට සුවිශේෂිව අවධානය යොමු කරන්න මේ අය වැය ලේඛනයේ ගත් උත්සාහය ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. ඒකට අපට එකතු කළ හැකි තවත් සෑම ශක්තියක්ම ඉදිරි කාලයේ එකතු කරන්නට ඕනෑ. මොකද, අඩු ආදායම් ලබන ජනතාව තමයි මේ වැඩිම පීඩනයට මුහුණ දෙන්නේ. ඒ වාගේම, අනාගත ශ්‍රී ලංකාව වෙනුවෙන් කෘෂි කර්මාන්තයට, වාරි කර්මාන්තයට දැවැන්ත ආයෝජනයක් අය වැය ලේඛනයෙන් ලබා දී තිබෙනවා. ගොවි ජනතාවට ලබාගත හැකි වැඩි ආදායම් මාර්ග ඇති කිරීම සඳහා පසුගිය කාලයේම ස්ථාවර මිල වැඩි කිරීමක් කළා. ඒ තුළින් ඔවුන්ගේ ආදායම් මාර්ග වැඩි වුණා. අපි ස්වභාව ධර්මය ප්‍රතික්ෂේප නොකරන, අපේ ගමේ සිට ග්‍රාමීය ආර්ථිකය යළි පණ ගැන්වෙන දැවැන්ත උත්සාහයකට අවතීර්ණ වෙමු.

අය වැය ලේඛනය පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී සමස්ත අය වැය දෙස බලන ලෙසත්, පොඩි පොඩි කෑලි අල්ලාගෙන හෝ එදිනෙදාට ලැබෙන ප්‍රවෘත්ති කිහිපයක් අල්ලාගෙන විරුද්ධ පක්ෂය මේ ආණ්ඩුවේ දේශපාලන හා ආර්ථික කළමනාකරණය මෙලෙස විවේචනයට ලක් කරන්නට නැඟී සිටීම ගැන කනගාටු වෙනවා. ඒ වාගේම මෙම අය වැය තුළින් පොදු ජනතාවගේ පැත්තෙන් ලබා දෙන සහන පිළිබඳවත් කියවා බලන ලෙස යළිත් ඉල්ලීමක් කරනවා. "උට්ඨානවතො සතිමතො" - උට්ඨාන වීර්යය අතිශයින් ඇති මිනිස්සු එකතු වී දියුණු රටක් ලෙස ශ්‍රී ලංකාව ඔසවා තබා ආරක්ෂා කිරීමට අපි කැපවෙමු කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is the point of Order, Hon. Lakshman Kiriella?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කිහිප වතාවක් මගේ නම සඳහන් කළා. එතුමා කිව්වා, Perpetual Treasuries හොර සල්ලි කියලා. හරි, අපි ඒක පිළිගන්නවා. නමුත් මේ ආණ්ඩුව කොතරම් බංකොලොත් ද කිව්වොත්, අය වැය හිඟය පියවන්න හොර සල්ලිත් ගත්තා. ලජ්ජයි! හොර සල්ලිත් ගත්තා. *[බාධා කිරීම්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, Perpetual Treasuries සමාගම ගැන මම කියපු දේ එතුමා "ඔව්" කියලා පිළිගත්තා. පළමුවෙනුව එතුමාගේ කටින් කියැවුණා, " මහා වංචාව අපි පිළිගන්නවා" කියලා. ඉතින්, තව මොනවාද කථා කරන්නේ? වංචා කරලා, වංචා කරලා, මහ බැංකුව හොරකම් කළා. මීට වඩා හොරකමක් මොකක්ද, ගරු කථානායකතුමනි? ආණ්ඩුවකට රටක මහ බැංකුවක් හොරකම් කරන්න පුළුවන් නම් ඒ ආණ්ඩුව ගැන අපට මොනවාද හිතන්න වෙන්නේ? මම කියනවා, පෘතුගාලයේ මහ බැංකු හොරකම ගැන සඳහන් පොත කියවා බලන්න කියලා. At that time, I gave that book to the then Prime Minister. පෘතුගාලයේ මහ බැංකුව හොරකම් කරපු මනුෂ්‍යයා හොයා ගන්න බැරුව ඉන්නකොට, ඔහු හොයා ගත්තේ අප්‍රිකාවේ කැලෑවකට ගිහිල්ලා. ඒ ගැන පොතක් ලියලා තිබෙනවා. මේ අය අර වීදුරු ගෙවල්වල තියලා රටට ප්‍රදර්ශනය කළ යුතු මිනිස්සු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, යහ පාලන ආණ්ඩුව කාලයේ COPE එකේ සභාපතිකම අපි ගත්තේ නැහැ. අපි ඒකේ සභාපතිකම දුන්නේ JVP එකට. අපේ ආණ්ඩුව කාලයේ තමයි මේ හොරකම හෙළිදරව් වුණේ. නමුත් මෙතුමන්ලා COPE එකේ සභාපතිකම දීලා තිබෙන්නේ තමන්ගේ ආණ්ඩු පක්ෂයේ අයට. සීනි වංචාව කෝටි 15,000යි. ඒක හෙච්චාද? හෙච්චේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා නැඟිටලා කිව්වා, Perpetual Treasuries සමාගමේ තිබුණු ඒ මුදල් අපි ගත්තාය කියලා. ඔව්, අපි ඒ මුදල් ගත්තා. මුදල් ඇමතිතුමා ඒ මුදල් අය වැයෙන් ගත්තා. මෙතුමාට ඒ ගැන පොඩි අමාරුවක් තිබෙනවා. මොකද, පසුගිය ආණ්ඩු කාලයේ මෙතුමන්ලා තනිකරම මේ සල්ලිවලින් තමයි දේශපාලනය කළේ. එක සංවිධායකවරයකුට ඒ සල්ලිවලින් රුපියල් ලක්ෂ 200 ගණනේ ගෙව්වා. එතුමන්ලා මේ ඉතුරු සල්ලි ටිකත් තියාගෙන හිටියේ ඊළඟ මැතිවරණයටයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam.

[පූ.භා. 10.49]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මගේ කථාවට ප්‍රථමයෙන් ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් දෙගොල්ලන්ම හොරකම් ගැන කථා කළා. හොරකම් කරපු අය අල්ලලා හිරේ දමන්න. ඒවා බලන්න අපිත් ආසයි. මහ බැංකුවෙන් හොරකම් කරපු අය ඉන්නවා නම් ඒ අය අල්ලලා හිරේ දමන්න. ඒවා බලන්න අපිත් ආසයි. අද මම කථා කරන්න plan කරගෙන ආපු දේවල් කියන්න කලින් එක කාරණයක් ඉදිරිපත් කරන්න ඕනෑ. මා ඇත්තටම බලාපොරොත්තු වුණා, the Hon. M.U.M. Ali Sabry, Minister of Justice මේ සභාවේ ඉඳියි කියලා, පොඩි ගැටලුවක් ගැන අහන්න. එතුමා මේ වෙලාවේ සභාවේ නැති නිසා මම මේ කාරණය අපේ ගරු මුදල් ඇමතිතුමාට යොමු කරන්නම්. ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න, ගරු මුදල් ඇමතිතුමනි. ඊයේ Open University එකේ LLB Entrance Exam එක තිබුණා. ඒකේ English Language, Tamil Language, General Knowledge and General Intelligence papers කලින්ම leak වෙලා තිබෙනවා, Pramuka Law School කියන institute එකෙන්. මම මේ file එක ඔබතුමාට එවන්නම්. පුළුවන් නම් මේ ගැන සොයා බලන්න. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මේ ගැන සොයා බලන්න.

அடுத்து, சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற வரவு செலவுத்திட்டத்தைப் பற்றி ஒருசில விடயங்களை நான் நிச்சயமாகத் தமிழ் மொழியிலே சொல்ல வேண்டும். கடந்த நல்லாட்சி அரசாங்கக் காலப்பகுதியிலும் சரி, அதற்கு முன்னைய காலப்பகுதியிலும் சரி, தமிழ்த் தரப்பு அரசோடு இணைந்திருந்தால்தான் தமிழர் பகுதிகளில் அபிவிருத்திகளைச் செய்யலாம் என்று சிலர் ஒரு மாயையை உருவாக்கி, கடந்த தேர்தல்களிலே தமிழ் மக்களுடைய வாக்குகளைப் பெற்று, இந்தப் பாராளுமன்றத்துக்குத் தெரிவானார்கள். ஆனால், இன்றுவரைக்கும் அவர்களால் அபிவிருத்திகளைச் செய்ய முடியவில்லை.

எங்களுடைய பிரதேசம் 30 - 40 வருடங்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசம் என்பது உங்களுக்குத் தெரியும்! அப்படிப்பட்ட பிரதேசத்திலே வாழுகின்ற எங்களுடைய மக்களின் நலன் சார்ந்த எந்தவொரு விடயமும் - விசேடமாக எங்களுடைய மக்களைக் குறிவைத்த எந்தவொரு முக்கியமான விடயமும் இந்த வரவு செலவுத்திட்டத்திலே இல்லாமை கவலைக்குரிய விடயமாகும். எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசங்களில் நல்லாட்சி அரசாங்க காலப்பகுதியில் முன்னாள் அமைச்சர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்களின் அமைச்சினூடாக ஆரம்பிக்கப்பட்ட வீட்டுத் திட்டங்களில் 7,000க்கும் மேற்பட்ட வீடுகள் இன்னும் முழுமைபெறாத நிலையில் இருக்கின்றன. எனவே, எதிர்வரும் காலத்தில் வரவு செலவுத்திட்டத்தினூடாக நிதியை ஒதுக்கி, அந்த வீடுகளை முழுமைப்படுத்தித் தருமாறு நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, வேலைவாய்ப்பு என்ற விடயத்தை எடுத்துக் கொள்வோம். இந்த அரசாங்கம் "ஓரிலட்சம் வேலைவாய்ப்பு" என்ற ஒரு வேலைத்திட்டத்தை ஆரம்பித்தது எங்களுக்குத் தெரியும். இந்த வேலைத்திட்டத்தின்கீழ் நாடு பூராவும் சுமார் 35,000 பேருக்கு வேலைவாய்ப்பு வழங்கப்பட்டிருந்தாலும்கூட, கடந்த ஒன்பதாம் மாதம் வரை 1,800 தமிழ், முஸ்லிம் இளைஞர்களுக்கு மாத்திரமே வேலைவாய்ப்புக்கள் வழங்கப் பட்டிருக்கின்றன. கௌரவ நிதி அமைச்சர் அவர்களே, முடிந்தால் இந்த ஓரிலட்சம் வேலைவாய்ப்புத் திட்டத்தின்கீழ் வடக்கு, கிழக்கிலே வாழுகின்ற தமிழ் இளைஞர்களுக்கு மட்டுமல்ல, இலங்கை பூராவும் வாழுகின்ற தமிழ்மொழி பேசும் தமிழ், முஸ்லிம் இளைஞர்களுக்கும் வேலைவாய்ப்புக்களை வழங்குமாறு நான் கேட்டுக்கொள்கிறேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

எங்களுடைய பிரதேசத்திலுள்ள உள்வீதிகள் புனரமைக் கப்பட வேண்டும்; வைத்தியசாலைகள் புனரமைக்கப்பட வேண்டும்; பாடசாலைகள் புனரமைக்கப்பட்ட வேண்டும். இருந்தாலும்கூட, இந்த வரவு செலவுத்திட்டத்திலே அதற்கான நிதி ஒதுக்கீடுகளைக் காண முடியவில்லை. அதுமாத்திரமன்றி, எங்களுடைய பிரதேசத்திலுள்ள விவசாயிகள் பசளை இல்லாமல் பெரும் கஷ்டத்துக்கு முகங்கொடுத்துக் கொண்டிருக்கிறார்கள்.

கௌரவ நிதி அமைச்சர் அவர்கள் இங்கே இருக்கின்றபொழுது, நான் சில விடயங்களைச் சிங்கள மொழியிலே சொல்ல விரும்புகின்றேன்.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

Budget Speech එක අහගෙන හිටියාම අපට දැනුණේ, මඟුල් ගෙදර කරන්න ඕනෑ කථාවක් මළගෙදර කළා වාගේ හැඟීමක්. ලංකාවේ තත්ත්වය මළ ගෙදරක් වාගේ තිබෙන කොට මඟුල් ගෙදරක කරන speech එකක් වාගේ එකක් තමයි මුදල් ඇමතිතුමාගේ Budget Speech එකේදී දැක ගන්න පුළුවන් වුණේ. අය වැය ලේඛනයක අය සහ වැය කියන දෙකම තිබෙන්න ඕනෑ. හැබැයි, අය වැය ලේඛනයේ පිටු 300ක වැය තිබෙනවා නම්, අපට revenue හම්බ වෙන ක්‍රම තිබෙන්නේ පිටු 30කයි. අපි මේ ගත කරන්නේ ඉතාම අමාරු කාලයක්. ලංකාවේ ආර්ථිකය ඉතාම අමාරුවෙන් ඉදිරියට ගෙන යන කාලයක්, මේක. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේ Budget එකෙන් මීට වඩා දෙයක් අපි බලාපොරොත්තු වුණා. අපේ ගරු මුදල් ඇමතිතුමාගෙන් අපට සහනයක් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වුණා. හැබැයි, Budget එකේ තිබෙන යම් යම් දේවල් දිහා බලන කොට අපට පොඩි සැකයක් ඇති වෙනවා, ලංකාවේ ආර්ථිකය ගැන කිසිම උනන්දුවක් නැතිව මේ Budget එක හැදුවාද කියලා. එහි තිබෙන යම් යම් වියදම් දිහා බැලුවාම, අපට ඒක පෙනෙනවා.

"ගම සමඟ පිළිසඳර" වැඩසටහන යටතේ ග්‍රාම සේවා වසමකට මිලියන තුනක වැඩ පිළිවෙළක් කිරීමේ බලාපොරොත්තුවක් තිබෙනවා කියන එක අපට පැහැදිලියි. හැබැයි, "ගම සමඟ පිළිසඳර" වාගේ වැඩ කටයුත්තක් මේ අවස්ථාවේ කරන්නේ ඉදිරි කාලයේ තිබෙන ඡන්දයක් පදනම් කරගෙනද කියන සැකය අපට තිබෙනවා. ඇත්තටම අපි අනවශ්‍ය වියදම් පුළුවන් තරම් අඩු කරගෙන ඉදිරියට යන්න ඕනෑ කාලයක්, මේක. හැබැයි, ඇත්තටම මේ කාල වකවානුව තුළ ඡන්දයක් පදනම් කරගෙනද මේ වැඩ පිළිවෙළ කරන්නේ කියලා අපට හිතෙනවා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙමළ භාෂාවෙන් කථා කරන කොට කිව්වා, උතුර-නැඟෙනහිරට අය වැයෙන් කිසිම වාසියක් සිදු වුණේ නැහැ කියලා. හැබැයි, දැන් ඔබතුමා සිංහල භාෂාවෙන් කථා කරන කොට අහනවා, "ග්‍රාමසේවා වසමකට රුපියල් ලක්ෂ තිහක් දීලා තිබෙනවා, මොකටද දුන්නේ?" කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ දෙපිට කාට්ටු කථා කියන්න එපා. ඔබතුමා හැම තිස්සේම ඕක තමයි කරන්නේ. ඉංග්‍රීසියෙන් කථා කරන කොට කියන්නේ එකක්. දෙමළෙන් කථා කරන කොට කියන්නේ තව එකක්. සිංහලෙන් කථා කරන කොට කියන්නේ තවත් එකක්. ඔබතුමා ඩයස්පෝරාවේ නියෝජිතයෙක්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කළ කාරණය point of Order එකක් නොවෙයි. මමත් ඔය මූලසුනේ කටයුතු කරන කෙනෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාම අපට කියලා තිබෙනවා, මූලසුනේ කටයුතු කරනකොට හරියට ඒ කටයුතු කරන්න කියලා. මම හිතන විධියට එතුමා point of Order එකක් නොවෙයි ඉදිරිපත් කළේ.

ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කිරීමක් කරන්නම්. ඇත්තටම මම කිව්වේ, උතුර-නැඟෙනහිර target කරපු විශේෂිත වැඩ පිළිවෙළක් නැහැ කියන එක. *[බාධා කිරීමක්]* කියන්න, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I do not want to take your time. Now, we are very clearly trying to revive the rural economy. That is why 14,500 Grama Niladhari Divisions across the country have been given this investment and benefit. Do not worry about elections. When election come up, all of us can contest. There is no problem. It has been scheduled for next year. But, if you want, we have to bring in amendments to hold the election.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මා හිතවත් ගරු ගලප්පත්ති මන්ත්‍රීතුමනි, මම දෙමළ භාෂාවෙන් කියපු එක ඔබතුමාට තේරුණේ නැහැ. මම කිව්වේ, තිස් අවුරුදු යුද්ධයකට මුහුණ දුන් උතුර - නැඟෙනහිරට විශේෂිත වූ කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියන එකයි. ඒ කියන්නේ අවුරුදු 30ක් අපට ඒ පැත්ත සංවර්ධනය කරන්න බැරි වුණා. ඒ පළාත් වෙනුවෙන් විශේෂිත වූ වැඩ පිළිවෙළක් කළේ නැහැ. ඒ වුණාට "ගම සමඟ පිළිසඳර" වාගේ වැඩ පිළිවෙළක් මේ අවස්ථාවේදී සුදුසුයිද කියන ප්‍රශ්නය තමයි මම ඇහුවේ. එහෙම නැතිව මම දෙපිට කාට්ටු කථාවක් නොවෙයි කළේ. මම දෙමළෙන් කියන එකම තමයි සිංහලෙන් කියන්නේත්. සිංහලෙන් කියන එකම තමයි ඉංග්‍රීසියෙන් කියන්නේත්. එහෙම නැතුව භාෂාවත් එක්ක සෙල්ලම් කරන්නේ නැහැ. ඔබතුමාට භාෂා පරිවර්තනය අහන්න පුළුවන්කම තිබෙනවා. ඒකෙන් ඕනෑම පුද්ගලයෙකුට තේරුම් ගන්න පුළුවන්, මොකක්ද කියන්නේ කියලා. ඔබතුමා ඒ interpretation එක හරියට අහගෙන හිටියා නම් පැහැදිලිව තේරෙයි.

ඇත්තටම මම කියාගෙන ආවේ, "ගම සමඟ පිළිසඳර" වාගේ වැඩ පිළිවෙළක් මේ අවස්ථාවේ කරන එක තුළින් වියදම් වැඩි වෙනවා කියන එකයි. අපි පුළුවන් තරම් අපේ රටේ වියදම් අඩු කරගන්න ඕනෑ. අපේ ආදායමයි, වියදමයි අතර තිබෙන පරතරය අපි පුළුවන් තරම් අඩු කරගන්න ඕනෑ. ඒ වාගේ අවස්ථාවක "ගම සමඟ පිළිසඳර" හරහා කරන සංවර්ධනය තුළින් රටේ ආර්ථිකයට තවත් ලොකු හානියක් සිදු වෙනවා කියන එක තමයි මම කිව්වේ. එහෙම නැතිව අපි සංවර්ධනයට විරුද්ධ වෙනවා නොවෙයි.

මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කරනවා. ගරු ජොන්ස්ටන් ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. එතුමාට මමත් පාරවල් කිහිපයක ලැයිස්තුවක් දුන්නා. පුළුවන් නම් ඒ පාරවල් ටික මේ අවුරුද්දේ හරි හදලා දෙන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගිය අවුරුද්දේ හදලා දුන්නෙත් නැහැ.

හැබැයි, ADB එකෙන් iRoad Project එක යටතේ හදපු පාරවල් decide කර තිබුණේ, ඒ පාරේ තිබෙන economic benefit එක ගැන අධ්‍යයනය කිරීමෙන් පස්සේ කියලා මම දන්නවා. ඒ පාර හැදීමෙන් ලංකාවේ ආර්ථිකයට යම් වැදගත්කමක් තිබෙනවාද කියා අධ්‍යයනය කිරීමෙන් පසු තමයි ඒ පාර හදනවාද, නැද්ද කියලා decide කළේ. දැන් ග්‍රාමීය මාර්ග කිලෝමීටර් ලක්ෂයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ගත්තාම තමතමන්ට ඕනෑ පාරවල් හැදුවොත් මොකද වෙන්නේ? ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ ගෙදරට යන පාර, නැත්නම් පාක්ෂිකයාට අවශ්‍ය පාර, එහෙමත් නැත්නම් ඒ පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අක්කාගේ ගෙදරට යන පාර හදන්න ප්‍රමුඛත්වය දුන්නොත් මොකද වෙන්නේ? රටක් සංවර්ධනය කරන්න පාරවල් හදන්න

ඕනෑ. හැබැයි, ඒ පාර හැදීමෙන් ආර්ථිකයට වටිනාකමක් එකතු වෙන්නත් ඕනෑ. We have to build roads which economically contribute to reduce our national debt crisis. අපට පුළුවන් වෙන්න ඕනෑ, ඒ හදන පාරවල් තුළින් ආර්ථිකයට වටිනාකමක් එක් කරන්න. මම ලබා දුන් ලැයිස්තුව අනුව නම්, අපේ දිස්ත්‍රික්කයට එම පාරවල් ඉදිකිරීම ඉතා ප්‍රයෝජනවත්. සමහර විට අක්කර 4,000ක විතර කුඹුරක් තිබෙන විට, ඒ හරහා පාරක් ඉදිකිරීමෙන් මිනිසුන්ට පහසුවෙන් යන්න එන්න පුළුවන්කම ලැබෙනවා. ඒකෙන් කාර්යක්ෂමතාව වැඩි වනවා. ඒ වාගේ දේවල් කරන්න කියා ඇත්තෙන්ම මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් රාජ්‍ය අමාත්‍යවරු පත් කර තිබෙනවා. ඇත්තටම සමහර රාජ්‍ය අමාත්‍යාංශ මෙලෝ වැඩක් නැහැ. මේ රටේ අද තිබෙන තත්ත්වය අනුව කැප කිරීම් කරනවා නම්, අනවශ්‍ය වියදම් කපනවා නම්, මුදල් ඉතිරි කරනවා නම්, කරන්න තිබෙන්නේ ඇතැම් රාජ්‍ය අමාත්‍යවරු අයින් කරන එකයි. කැබිනට් ඇමතිතුමා හොඳටම ඇති. කැබිනට් ඇමතිතුමාට ඒ වැඩ ටික කරන්න පුළුවන්. රාජ්‍ය ඇමතිවරයෙක් පත් කරලා, එතුමාට වාහන දීලා, ඉන්ධන දීමනාව දීලා, office එකක් දීලා, driver කෙනෙක් දීලා, පඩි දීලා, දෙන්න තිබෙන ඔක්කෝම සහන ටික දීලා ඊට පසු කියනවා, අපි රාජ්‍ය වියදම අඩු කරනවා කියලා. එම නිසා මේ කාරණා සඳහා ප්‍රතිපත්තිමය තීන්දු ගන්නවා නම් හොඳයි කියා මම කියනවා.

මෙවර ඉදිරිපත් කරපු Budget එකෙන් පස්සේ සමාජ මාධ්‍ය තුළ වැඩියෙන්ම කථා බහට ලක් වෙච්ච කාරණයක් තමයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ pension එක පිළිබඳ යෝජනාව. මට දැන් අවුරුදු 31යි. මට දැනට pension එකක් අවශ්‍යත් නැහැ. මම නම් කියන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට pension එකක් ඕනෑ නැහැ කියලායි. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දුන් pension එකත් අයින් කරන්න ඕනෑ. මොකද, ජනතා සේවයට එන එකට pension එකක් දෙන්න ඕනෑ නැහැ නේ? හැබැයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ pension එක පිළිබඳ යෝජනාව ඉදිරිපත් වුණාට පස්සේ මට පොඩි කතන්දරයක් ආරංචි වුණා. මේ අවස්ථාවේ මුදල් ඇමතිතුමා සභාවේ හිටියා නම් හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිකුරාදා රාත්‍රියේ පොඩි සාදයක් පවත්වා තිබෙනවා. ඒ සාදයේදී මන්ත්‍රීවරු කණ්ඩායමක් එකතු වෙලා කියා තිබෙනවා, "මේ ආණ්ඩුව කරන වැඩ පිළිවෙළ අනුව අපට නම් ආයේ පාර්ලිමේන්තු යන්න වෙන්නේ නැහැ. අපේ pension එකටත් ෂොට් එක දුන්නා. දැන් කරන්න තිබෙන්නේ, පුළුවන් තරම් අපේ බිස්නස් ටික කර ගන්න එක තමයි, මචං" කියලා. ඇත්තටම අපට නම්, pension එක ඕනෑ නැහැ. Pension එක නැති වෙන්න යනවා කියපු ගමන්, සමහර මන්ත්‍රීවරු හොරකමට පෙලඹෙනවා කියන එකත් කියන්න ඕනෑ. ඒ කථාවට සම්බන්ධ වෙච්ච කවුරුවත් දැන් මෙතැන නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ බොරු කතන්දර කියලා රටේ ජනතාව රවටන්නේ නැතිව, ඇත්තටම ආර්ථිකය හදනවා නම් මම කියපු සමහර ක්‍රමවේද අනුගමනය කරන්න ඕනෑ.

අද බලන්න, ඉන්ධන ගෙන්වීම අපට ලොකු බරක්. අපි දන්නවා, ඉන්ධන ගෙන්වීමට යන වියදම. අපි දන්නවා, මංගල සමරවීර මැතිතුමා ඉන්නකොට මිල සූත්‍රයක් ගෙනා බව. එතුමා ගෙනා මිල සූත්‍රය ඒ දවස්වල හැල්ලුවට ලක් කළා. හැබැයි, ඒ වාගේ මිල සූත්‍රයක් තිබුණා නම්, අද පෙට්‍රල් සහ ඩීසල් ගෙන්වීම වෙනුවෙන් රජයට පාඩු ලබමින් වියදම් කරන්න වෙන්නේ නැහැ. තව කොච්චර කාලයක් අපි මේවා artificially තියාගෙන ඉන්නවාද කියලා මට නම් හිතා ගන්න බැහැ.

මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු අය වැයේ යම් යම් හොඳ Proposals තිබුණා. "සැමට ජලය", "ගැබිනි මාතාවන්ට දෙන පෝෂණ මල්ල" වාගේ යෝජනා ඉතා හොඳයි. හැබැයි, ඒවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සල්ලි කොහේද තිබෙන්නේ? අපි දන්නවා, පසුගිය කාලයේ පඩි ගෙවීම ආදී සියලු දේවල් කළේ මුදල් අච්චු ගහලා බව. පසුගිය මාස කීපය තුළ බිලියන, ට්‍රිලියන ගණනක මුදල් අච්චු ගැහුවා. මේ විධියට මුදල් අච්චු ගැහුවාම මොකක්ද වෙන්නේ? මේ වාගේ යෝජනා හොඳයි. අපිත් කැමැතියි, සැමට ජලය සහ ගැබිනි මාතාවන්ට පෝෂණ මල්ල ලබා දීම වැනි යෝජනාවලට. හැබැයි, මේවාට සල්ලි කොහෙන්ද හොයා ගන්නේ කියලා අපි හිතන්න ඕනෑ.

අනාගතයේ, -මම දන්නා තරමින් ඉදිරි අවුරුදු 5 තුළ- හැම අවුරුද්දකම අපට ඩොලර් බිලියන 5ක debt repayment එකක් කරන්න තිබෙනවා. ලංකාවේ සල්ලි අපට අච්චු ගහන්න පුළුවන් වුණාට, ඩොලර් අච්චු ගහන්න බැහැ නේ? ඩොලර් repayment එකක් කරන්න අපි කරන්න ඕනෑ මොනවාද කියලා හිතන්න ඕනෑ. එහෙම නැත්නම්, අපේ රට ඇතුළට එන ආදායම වැඩි කර ගන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. ඒ අනුව, අපට ඩොලර් ගේන්න පුළුවන් වෙන්න ඕනෑ. හැබැයි, අපි මොනවාද කරන්නේ? අපි දන්නවා, පසුගිය කාලයේ MCC වාගේ ගිවිසුම් අත්සන් කරන්න ගියාම බොරුවට දේශ ප්‍රේමීන් යයි කියා ගත් සෙට් එකක් ඇවිල්ලා කෑ ගැහුවා. ඒ දේශ ප්‍රේමීන් Port City එක සම්බන්ධ දේවල්වලට "මීක්" සද්දයක්වත් නඟන්නේ නැහැ. චීනයට දෙනකොට චීන දේශ ප්‍රේමී කට්ටිය කථා කරන්නේ නැහැ. හැබැයි, MCC ගිවිසුම ගේනකොට සම්පූර්ණයෙන් අසත්‍ය පවසමින් කෑ ගැහුවා. ඒ ගිවිසුම අනුව ආයෝජන විධියට ඩොලර් මිලියන 400ක්, 500ක් අපේ රටට එනවා. එම ගිවිසුම ඉරලා, වීසි කරලා ගිහින් බංග්ලාදේශයෙන් debt swap එකක් ගන්නවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක.

මේ රට ඇතුළට මුදල් ගේන්න අපි තව ක්‍රමවේදයක් හදන්න ඕනෑ. අද බලන්න, අපි ඩොලර් එක artificially රුපියල් 200කට වාගේ තියාගෙන ඉන්න නිසා, අපේ export economy එක සම්පූර්ණයෙන් කඩා වැටෙනවා. මොකද, exportersලාට ඩොලරය එන්නේ රුපියල් 200 ගණනේ. හැබැයි, importersලා වෙනත් රටකට ගිහිල්ලා සල්ලි අරගෙන, ලංකාවට ඒ බඩු ටික ගෙනැල්ලා ඩොලරයකට රුපියල් 240ක් ලැබෙන විධියට තමයි විකුණන්නේ. හැමෝම එහෙම කරනවා කියලා මම කියන්නේ නැහැ. සුළු පරිමාණ importersලාට ඒක කරන්න බැහැ. රජයට හිතවත් මහා පරිමාණ importersලා අද වෙන වෙන තැන්වලින් ඩොලර් යවා ලංකාවට කියනවා, ඩොලරයකට රුපියල් 240 ගණනේ ගෙවලා තමයි ගෙනාවේ කියලා. ඒ වාගේ ලොකු මාෆියාවක් අද මේ රට තුළ ඇති වෙලා තිබෙනවා. ඇත්තටම අපි Moody's, එහෙම නැත්නම් S&P වාගේ credit agenciesවල අපේ ranking එක වැඩි කරන්නේ කොහොමද කියලා තමයි බලන්න ඕනෑ. හැබැයි මම දැක්කා, සමහර මන්ත්‍රීවරු පසුගිය කාලයේ Moody's ආයතනයට බණිනවා.

Moody's ආයතනය කරන්නේ බොරුවක් කියලා කිව්වා. Moody's ආයතනය කියන්නේ ඇමතිවරු කිව්වාම, අගමැතිවරු කිව්වාම, ජනාධිපතිවරු කිව්වාම ඒ විධියට ratings හදන, ලංකාවේ තිබෙන ආයතනයක් කියලා හිතුවාද දන්නේ නැහැ. ඒ ආයතනය එහෙම ratings හදන්නේ නැහැ. ලංකාවේ තිබෙන තත්ත්වය තමයි ඒ ආයතනය කියන්නේ. Moody's වාගේ ආයතනවල rating එක අනුව, ලංකාව හරි තැනකට එනතෙක් රට තුළට ආයෝජන ගලාගෙන එයි කියලා මට නම් ඇත්තටම හිතන්න බැහැ. හැබැයි අපි දැක්කා, super charge tax එකක් යෝජනා කර තිබෙන බව. මා හිතන විධියට එම යෝජනාව කරපු පළමුවැනි වතාව මේක නොවෙයි. 1960 ගණන්වල ඉඳලා නොයෙක් කාලවලදී super charge tax එක පනවා තිබෙනවා. 2015දී රවි කරුණානායක මහත්මයාත් Super Gain Tax එක පැනෙව්වා. හැබැයි, super

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

charge tax වාගේ බදු පනවන එකෙන් මොකක්ද වෙන්නේ? ඇත්තටම 2019දී හොඳට තිබුණු economy එකට මොකද වුණේ? 2019දී තිබුණු ආර්ථික ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති වාගේ හොඳට තිබුණු දේවල් ඔක්කොම අනවශ්‍ය ලෙස, එහෙම පිටින්ම අහක් කරලා දැම්මා. ඒ වෙලාවේ එහෙම කරන්න කියලා ජනතාව ඉල්ලුවේ නැහැ. ඒ බදු ප්‍රතිපත්ති එක්ක ජනතාව සතුටෙන් හිටියේ. මෙතුමන්ලා බලයට පත් වූ ගමන් තමන්ගේ ව්‍යාපාරික හිත මිතුරන්ට උදව් කරන්න කියලා බදු සහන දීලා, අවුරුදු දෙකකට පසු super charge tax කියලා එකක් අය කරන්න යනවා. මෙහෙම කරන එකෙන් වෙන්නේ මොකක්ද? ආයෝජකයන්ට තිබෙන confidence නැති වෙනවා. හෙට ලංකාවේ ආයෝජනයක් පටන් ගත්තොත්, අවුරුදු 3ක් විතර යද්දි ඒ ආයතනයට super charge tax එකක් ගැහුවොත්, සමහර විට ඒ ආයතනයට ඉදිරියට යන්න බැරි වෙයි. ඒ නිසා අපි අපේ බදු ප්‍රතිපත්ති ගැන තවත් උනන්දු වෙන්න ඕනෑ. අපි වෙන රටකට ගිහිල්ලා කියමු, අපට මේ බදු ප්‍රතිපත්තිය හදා ගන්න උදව් කරන්න කියලා. නැත්නම් IMF එකට කියමු, මේ debt restructure කර දෙන්න කියලා. මම පොඩි උදාහරණයක් කියන්නම්. අද ෂැන්ග්‍රි-ලා හෝටලයෙන් කෑවාම ගෙවන්න වෙන බිලටවත් VAT එක වදින්නේ නැහැ. මම නම් දකින විධියට, ෂැන්ග්‍රි-ලා හෝටලයට ගිහිල්ලා කන්න පුළුවන් මනුස්සයෙකුගෙන් VAT එක අය කළාට වැරැද්දක් නැහැ. ඒ නිසා අපේ බදු ප්‍රතිපත්ති ගැන අපි මීට වඩා උනන්දුවෙන් හොයා බලන්න ඕනෑ බව තමයි මම කියන්නේ.

Sri Lanka Railways එකට අයිති ඉඩම් ඇතුළු රජයට අයිති ඉඩම් අනාගතයේදී විකුණන්න යනවා, නැත්නම් lease එකට දෙන්න යනවා. එතැනදීත් රටේ ජනතාවගේ දේපළ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය විධියට දෙන්න යනවාද කියලා මට සැකයක් තිබෙනවා. හැබැයි, ඊටත් වඩා තවත් භයානක, බැරෑරුම් දෙයක් මම දැක්කා. Education and health යන දෙකටම tax concessions දීලා තිබෙනවා, disparities between the districts අඩු කරන්න. ඒ කියන්නේ, දිස්ත්‍රික්ක අතරේ අධ්‍යාපනයේ සහ සෞඛ්‍යයේ තිබෙන වෙනස්කම් අඩු කරන්න බදු සහන - tax concessions - දීලා, ඉස්පිරිතාල සහ ඉස්කෝල පටන් ගන්නවා කියලා තිබෙනවා. ඉතින් ඇත්තටම වෙන්න ඕනෑ දේ මොකක්ද? ඇත්තටම අපේ Education Ministry එකට ඇති තරම් funds වෙන් කරලා තිබෙන්නේ. මේ වෙන් කරපු funds ටික අපි හරියට කළමනාකරණය කරන්න ඕනෑ. දැන් බලන්න, ජාතික පාසල් 1,000ක් ඇති කරනවා කියනවා. පළාත් සභා ක්‍රමයේ powers අඩු කරන මුවාවෙන් ඒක කරනවාද දන්නේ නැහැ. දැනට ලංකාවේ ජාතික පාසල් 300කට කිට්ටු සංඛ්‍යාවක් තිබෙනවා. ලංකාවේ student population එක මිලියන 4යි. එතකොට, අලුතෙන් ජාතික පාසල් 1,000ක් ඇති කළාම මොකද වෙන්නේ? ජාතික පාසලක් වුණාම, සාමාන්‍යයෙන් ළමයි 2,000ක්, 3,000ක් විතර ඒ පාසලකට යනවා. ලංකාවේ පළාත් සභා ඉස්කෝල 10,000ක් පමණ තිබෙනවා. ඒ 10,000න් 1,000ක් අරගෙන ජාතික පාසල් බවට පත් කළොත්, ලංකාවේ මිලියන 4ක් වන student population එකෙන් මිලියන 3ක් විතර ඒ ජාතික පාසල්වලට යනවා. එතකොට ඉතුරු මිලියනය විතරද, පළාත් සභා පාසල්වල ඉගෙන ගන්නේ? අපට ඕනෑ ජාතික පාසල් නොවෙයි, ජාතික පාසල් මට්ටමේ තිබෙන පාසල්. ඒ කියන්නේ ජාතික පාසලකින් ලැබෙන අධ්‍යාපනයේ මට්ටමට සියලු පාසල්වල අධ්‍යාපනය ගේන්න ඕනෑ. හැබැයි, අපේ දිස්ත්‍රික්කවල ඉස්කෝලයකටවත් ගියේ නැති සමහර මන්ත්‍රීවරු, ඒ ගොල්ලන් ඉගෙන ගත්තාය කියන ඉස්කෝලය ජාතික පාසලක් බවට පත් කරන්න යනවා. යම් පාසලක් ජාතික පාසලක් බවට පත් කරන්න විද්‍යාත්මක පදනමක් තිබෙන්න එපායැ. සමහර අය නම් ඉස්කෝලෙ ගියාද කියලාත් අපට සැකයක් තිබෙනවා. හැබැයි, තමන් ගිය ඉස්කෝලය ජාතික පාසලක් කරන්න ඕනෑය කියලා සමහර පාසල් ජාතික පාසල් බවට පත් කරන්න නම් හදනවා. ඇත්තටම වෙන්න ඕනෑ මොකක්ද? පළාත් සභා ක්‍රමය යටතේ තිබෙන පාසල් පද්ධතිය හොඳට වැඩ කරනවා. ඒවා කාර්යක්ෂම කරන්න, ඒකට තව මුදල් ටිකක් වෙන් කළා නම්, අපේ අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කරන්න පුළුවන්.

උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කියනවා නම්, ඉගෙන ගන්නා ළමයින්ට යම් ණය ක්‍රමයක්, එහෙම නැත්නම් ඒ ළමයින්ට යන වියදම ආපසු හොයා ගන්න පුළුවන් යම් ක්‍රමයක් සහිත වැඩ පිළිවෙළක් පටන් ගන්න ඕනෑ. සමහර MBBS doctorsලා පෙර පාසලේ ඉඳලා විශ්වවිද්‍යාල අධ්‍යාපනය - MBBS - දක්වාම ලංකාවේ බදු ගෙවන ජනතාවගේ සල්ලිවලින් ඉගෙන ගෙන උපාධිය ඉවර වෙලා වෙනත් රටවලට යනවා. එහෙම නැත්නම් migrate කරනවා; ලංකාවේ මිනිසුන්ගේ බදු මුදල්වලින් ඉගෙන ගෙන, වෙන රටකට ගිහිල්ලා වැඩ කරනවා. ඒ නිසා ඔවුන් එහෙම යනකොට, ඔවුන්ට උගන්වලා දොස්තර කෙනෙක් කරන්න දරපු වියදම පියවා ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් පටන් ගන්න ඕනෑ. අපි එතැනින් පටන් ගනිමු. ඒ විධියට මුදල් අය කර ගෙන, ඒ මුදල් තුළින් ඉදිරියේදී රට සංවර්ධනය කරන තැනට යන්න ඕනෑ කියන එක තමයි මම මේ අවස්ථාවේ කියන්නේ.

සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම, රෝහල්වලට බදු සහන දීම තුළින්, නැත්නම් අලුතෙන් රෝහල් ස්ථාපනය කරන්න බදු සහන දීම තුළින් අපට රෝහල් හදන්න පුළුවන් කියා මා හිතන්නේ නැහැ. මොකද, අද පෞද්ගලික රෝහල්වලට යන්න පුළුවන් මිනිස්සු අඩුයි. ඒ නිසා අපට තිබෙන රජයේ රෝහල් සංවර්ධනය කරන්න ඕනෑ. පසුගිය අවුරුද්දේ අගමැතිතුමා පොරොන්දු වුණා, මඩකලපුවට cath lab එකක් දෙනවා කියලා. හැබැයි, පසුව ඒ cath lab එකත් අපෙන් හොරකම් කර ගත්තා. ඒ cath lab එක අපට දුන්නේ නැහැ. මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, මොනරාගල, බදුල්ල, කෑගල්ල, රත්නපුර කියන දිස්ත්‍රික්ක එකකවත් cath lab එකක් නැහැ.

Heart සම්බන්ධ ලෙඩක් තිබෙන එක්කෙනෙකුටවත් ප්‍රතිකාර කරන්න තැනක් නැහැ. ඒ සියලුදෙනා කොළඹට එන්න ඕනෑ. මඩකලපුව දිස්ත්‍රික්කයට නොවෙයි, නැඟෙනහිර පළාතටම MRI scanner එකක්වත් නැහැ. The population is more than 1.2 million in Batticaloa, Trincomalee and Ampara, but there is not a single MRI scanner. මඩකලපුව රෝහලේ CT scanner එක කැඩිලා. අවුරුදු ගණනක් තිස්සේ අලුත් CT scanner යන්ත්‍රයක් ඉල්ලනවා, තවම ලැබුණේ නැහැ. මේ වාගේ ඒවා හදන්න සල්ලි ඕනෑ. අපි ආර්ථිකය හදනකොට මේ සල්ලි කොහෙන්ද ගේන්නේ කියලා අපි බලන්න ඕනෑ. මම දැකලා තිබෙනවා, සමහර රටවල "Medicare" වාගේ tax system එකක් තිබෙනවා. අපට පුළුවන් surcharge එකක් දාන්න. ඇමෙරිකාවේ "Obamacare" වාගේ, කැමැති නම් මෙහේත් ඒකට "Gotabayacare" කියලා නමක් දාන්න. එතකොට ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාගේ නමත් ප්‍රචලිත කරන්න පුළුවන්. ඒ වාගේ නමක් දාන්න. මිනිස්සු ඒකට කැමැතියි. අපේ රටේ තිබෙන බෙහෙත්වලට, laboratory facilities දියුණු කරන්න, එහෙම නැත්නම් inpatientsලාගේ system එක develop කරන්න බද්දක් අය කරනවාට මිනිස්සු කැමැතියි. මිනිසුන්ගේ අකමැත්තක් නැහැ. අපි වෙනම consolidated fund එකක් හදමු. අපි පොඩි බද්දක් ගහලා, ඒ බද්ද අරගෙන ඒක වෙනම තියලා, සෞඛ්‍ය ක්ෂේත්‍රය විතරක් දියුණු කරන්න අපි ඒ බද්ද පාවිච්චි කරමු. එහෙම නැතිව, අපි ඒ බදු මුදල් වෙන ඒවාට ගන්න හොඳ නැහැ. මිනිසුන්ට අද භය තිබෙන්නේ ජනතාවගේ සල්ලි බදු හැටියට අරගෙන ඒවායින් මෙවැනි දේවල් වෙයිද නැද්ද කියලා. .

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව කොච්චර වෙලාවක් තිබෙනවා ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි 10ක් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අපි ඒ විධියට ජනතාවගේ සල්ලි අරගෙන අපේ hospitals ටික develop කරමු. අද අපේ උතුර, නැඟෙනහිර පළාත්වල තිබෙන සමහර රෝහල්වල දොස්තරලා නැහැ. Buildings තිබෙනවා, දොස්තරලා නැහැ. ඒකට හේතුව, දොස්තර කෙනෙක් ආපු ගමන් එයා transfer එකක් හදාගෙන කොළඹට යනවා. එම නිසා ඒ සඳහා මොනවා හරි වැඩ පිළිවෙළක් හදන්න. අපේ Dr. Galappaththi මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් පොඩ්ඩක් බලලා, GMOA එකත් එක්ක කථා කරලා මේ දේවල් කරන්න. ඔබතුමන්ලාගේ හිතවත් අයත් ඒ තැන්වල ඉන්නවා නේ. පොඩ්ඩක් කථා කරලා ඒ අඩුපාඩු අපට හදලා දෙන්න. හැබැයි, ආණ්ඩුවෙන් මොනවාද කරන්නේ? මම දැක්කා ඊයේ-පෙරේදා GMOA එකෙන් ලියුමක් එවලා තිබෙනවා. 08.11.2021 දිනැති internal memo එක. ඒකේ තිබෙන්නේ, "ensure centralized health service" කියලායි. දැන් තිබෙන සෞඛ්‍ය system එකට මුදල් වෙන් කරලා ඒකට තව මුදල් හොයාගෙන ඒක develop කරන්න උනන්දු වෙන්නේ නැතිව, පළාත් සභා ක්‍රමයේ ශක්තිය අඩු කරන්න, පළාත් සභා ක්‍රමය destabilize කරන්න, නැත්නම් "ඒක වැඩක් නැති එකක්, ඒක ඕනෑ නැහැ." කියලා පෙන්වන්න ද දන්නේ නැහැ මේ විධියට කටයුතු කරන්නේ. උතුරු පළාතේ තිබෙන general hospitals, teaching hospitals දැනට තිබෙන්නේ National Government - Central Government - එක යටතේ. අනෙක් provincial hospitals ටිකත් මධ්‍යම රජයට ගන්න හදනවා. දැනට තිබෙන ටිකවත් හරියට අපට කරගන්න බැහැ. එතකොට දැනට තිබෙන ටිකවත් අපට හරියට කර ගන්න බැරිකොට මේ ටිකත් අරගෙන මොනවාද කරන්නේ? මේ ඔක්කෝම කරන්නේ මොකටද? පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න හොඳ නැහැ, පළාත් සභා ක්‍රමය අවශ්‍ය නැහැ, ඒ වාගේ මොනවා හරි කථාවකට තමයි මේ වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, tourism කියන්නේ ලංකාවට වැඩිපුර විදේශ විනිමයක් උපයන්න පුළුවන් ක්ෂේත්‍රයක් බව අපි සියලුදෙනාම දන්නවා. ගරු මුදල් ඇමතිතුමාත් දිගින් දිගටම ඒ ගැන කිව්වා. අපි දැක්කා දිගින් දිගටම කියනවා, මේ කොවිඩ් වසංගතය නිසා බිලියන 5ක ආදායමක් නැති වෙනවා, බිලියන 5ක ආදායමක් නැති වෙනවා කියලා. මම ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. ඒ නිසා පුළුවන් නම් කවුරු හරි මේක verify කරන්න. US Dollars 5 billion කියලා කියන එක වැරදියි. ඩොලර් බිලියන 5ක් කියලා ඒ ගණන හදලා තිබෙන්නේ ලංකාවට එන එක tourist කෙනෙක් ඩොලර් 180ක් දවසකට වියදම් කරනවා කියන පදනම යටතේ ඉඳගෙන. ඇත්තටම මම හිතන්නේ නැහැ, එක night එකකට ඩොලර් 180ක් ගෙවන touristsලා ලංකාවට වැඩිපුර එනවා කියලා. මේ tourism industry එකෙන් US Dollars 5 billion නැති වුණා, US Dollars 5 billion නැති වුණා කියන්නේ ඒ පදනම මත ඉඳගෙන. ඒ හරි ගණන සොයා බලන්න. ඒ වාගේම මට ආරංචියක් ලැබුණා, tourism ප්‍රවර්ධනය කරන්න ඕනෑ කියලා ලංකාව පුරාම supermarketsවලට අලුතින් liquor permits දෙන්න යනවා කියලා. එහෙම අදහසක් තිබෙනවා නම්, කරුණාකර උතුර-නැඟෙනහිරටවත්, ග්‍රාමීය දුෂ්කර පළාත්වල තිබෙන supermarketsවලටත් මේ bars නම් එපා. මොකද, tourism හදන්න bars අවශ්‍ය නැහැ. ඒ කියන්නේ, tourism හදන්න supermarketsවල ඇල්කොහොල් තිබෙන්න ඕනෑ නැහැ. මොකද, මුලින්ම ලංකාවට touristsලා එන්න ඕනෑ. ඒ touristsලා එන්න ඕනෑ උතුර-නැඟෙනහිරට. දැනට තිබෙන ඒ bars ටික හොඳටම ඇති. අපේ ප්‍රදේශවලට touristsලා එන්නේ නැතිව supermarketsවලට අලුතින් bars දුන්නොත්, ඒ ගමේ ඉන්න මනුස්සයා තමයි ඒ ටිකත් බොන්න යන්නේ. අපට දැන ගන්න තිබෙන විධියට කාගේ හරි private ව්‍යවමනාවකට අලුතින් bar licences 220ක් විතර supermarketsවලට දෙනවා කියලා ආරංචියක් තිබෙනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් කරුණාකර එය හකුළා ගන්න. මොකද, උතුර-නැඟෙනහිරට ඒ bars ටික ආවොත් නම් අපි විරුද්ධයි. අනෙක් දිස්ත්‍රික්කවලත් ඉන්න මහජන නියෝජිතයෝත් එහෙම විරුද්ධත්වයක් පෙන්වනවා නම් එහෙම කරයි. කරුණාකර උතුර-නැඟෙනහිරට නම් bars දෙන්න එපා, සංචාරකයන් නැතිව.

සංචාරකයෝ ලංකාව ඇතුළට ගේන්න නම්, විශේෂයෙන්ම උතුර-නැඟෙනහිර ගත්තාම connectivity නැහැ. කොළඹ ඉඳන් යාපනයට යන්න පැය 8ක් යනවා. කොළඹ ඉඳන් මඩකලපුවට යන්න පැය 7ක් යනවා. අපට ඒ connectivity ඇති කර ගන්න අපි ගොඩක් දේවල් ඉල්ලලා තිබෙනවා. Consultative Committee on Foreignහිදී මම දිගින් දිගටම කිව්වා, මේ Rameswaram-Talaimannar ferry service එක ආයේ පටන් ගන්න කියලා. Consultative Committee on Tourism සඳහාත් මම ගියා. මම ගිය අවුරුද්දේ පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කළා. අපි කියා සිටියා, පුළුවන් නම් Jaffna International Airport එක ආපහු ඉක්මනට පටන් ගන්න කියලා, ඒකෙන් මිනිසුන්ට යන්න එන්න. එක්කෝ Batticaloa domestic airport එක international status එකකට upgrade කරලා දෙන්න කියලා ඉල්ලුවා. උතුර-නැඟෙනහිරට touristsලා ගේන්න මේ වාගේ requests ඕනෑ තරම් අපි දීලා තිබෙනවා. අපට ඕනෑ ඒ touristsලා පාසිකුඩාවල, නැත්නම් යාපනයේ ලොකු හෝටලයක ඉන්නේ නැතිව, ගම ඇතුළට ගිහිල්ලා ගම ඇතුළේ සල්ලි වියදම් කරන්න පුළුවන් touristsලායි. එහෙම අය තමයි අපට ඕනෑ.

ඒ වාගේ touristsලා ගේන්න, අපට connectivity හදන්න, Rameshwaram-Talaimannar ferry service එක පටන් ගන්න. අපි දැක්කා පසුගිය සතිය ඇතුළත - *[බාධා කිරීමක්]* Supermarkets දීලාද? බලමු. පසුගිය සතිය ඇතුළත India-Sri Lanka Parliamentary Friendship Association එක තිබුණා. ඒක ගැන හැමෝම ලොකුවට ලියලා තිබුණා. ලොකු crowd එකක් ආවා කියලා කිව්වා. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාත් කියලා තිබුණා, ඒක කවදාවත් දැකපු නැති crowd එකක් කියලා. දැන් ඉන්දියාවත් එක්ක අපි හරි යාළුයි කියලා පෙන්වන්න එහෙම කියනවා. හැබැයි, Rameshwaram-Talaimannar ferry service එක පටන් ගන්න වැඩි උනන්දුවක් නැහැ. Jaffna International Airport එක හදමු කිව්වාම ඒක ගැන උනන්දුවක් නැහැ. මොකද, යාපනේ ඉඳන් ඉන්දියාවට කිලෝමීටර 30ක දුරක් තිබෙන්නේ. කොළඹට වඩා ළඟයි. ඉතින් ඒ පැත්තේ ඉන්න සංචාරකයන් උතුර, නැඟෙනහිරට ආවාම ඒ පැත්ත සංවර්ධනය කරන්න පුළුවන්. එතකොට ඇත්තටම අපට tourism හරහා US Dollars 5 billion ගෙනෙන්න පුළුවන්. ඇයි කරන්නේ නැත්තේ? හැබැයි, ලංකාවේ ස්වාමීන් වහන්සේලා සියයක් - 100 monks - pilgrimage එකක් අරගෙන ගිහින් ඉන්දියාවේ airport එකක් විවෘත කරලා එන්න පුළුවන්. ඒ වාගේ ඉන්දියාවේ ඉඳන් සියදෙනෙක් ගෙනැල්ලා අරින්නකෝ යාපනයේ airport එක.

Why do you all not restart flights from India to Palaly, Jaffna? If 100 monks can travel to India to open an airport in India, why can the Government of Sri Lanka not invite the Prime Minister of India and open up the Rameshwaram-Talaimannar ferry service? Why can you

not do that? Are you worried? You cannot have two faces; you need to stop having two faces because, otherwise, people are not going to trust you. That is the problem. You are not supportive of restarting the Rameshwaram-Talaimannar ferry service; you do not want to restart  flights from Palaly to India, but you want to say that we are very close to India. I do not understand the logic behind this.

In all honesty, I know that all the senior Ministers and senior politicians of this Government are aware that the TNA's position is that we want to live in this country as Sri Lankans. We want to live in one undivided and indivisible country as Sri Lankans. We have said that; we have said that again and again and again. But, you do not want us to live like that because that is what your politics depend on. You want to keep us divided; you do not want to work with us. You do not want the Sri Lankan Tamils to say, "We are Sri Lankans and want to live together" because your politics fully depend on that. You are worried that the minute you say, "No, look, the TNA is not a separatist political party. Let us work with them", you would lose your vote share.

The present Prime Minister Hon. Mahinda Rajapaksa had two opportunities in the past. When he finished the war in 2009, he had his first opportunity to unite this country and solve this country's ethnic problem. At the end of the day, all these economic constraints come down to us because we have not addressed our national ethnic question and the current Prime Minister of this country had an opportunity for that when he ended the war. He had the support of the international community too. Then, in 2010, he had a two-thirds majority in Parliament. He could have solved this ethnic problem then. That was his second opportunity. But, what did he do? He got the Eighteenth Amendment to the Constitution  passed and got more powers to him. Now, this is the third time. "The third time is lucky" කියලා හරි කරන්න බලමු. You know that for the third time, you have been given an opportunity by the people of this country to solve this problem.  So, you can solve this issue. Your name would be written in golden letters if you solve this issue. Right now, Hon. Prime Minister, you are seen as one of the most senior politicians in the Asian Region. You could even win the Nobel Peace Prize. Why do you not do that? Why do you not solve this issue? All we are asking from you is to solve this issue.

Right now, we are lobbing for a political solution; we are lobbing for our rights; we are lobbing for the rights of our Tamil people. All that we are asking is to be treated equally in this country and let us enjoy the same privileges that everybody else does. How hard is that? How hard is that for you to do? Sir, imagine the amount of money that we could bring in if we work together. As the TNA, we are happy to help you.  But, first, you need to solve this issue. Think about it this way. Rght now, we go to most of the countries to speak about the human rights situation of this country and the political solution that has been pending in this country. But imagine, if you solve this issue, we would go to those countries on your behalf, on behalf of this country and bring money into this country. Then, you will not have a debt crisis. You will have foreign reserves that will surpass your needs. So, do that; all that we ask for is to resolve this issue. If you do not resolve this issue, your names will be written in this country as the worst - Sir, I will say that in Sinhala because the country needs to understand.

අද ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාට සහ රාජපක්ෂ පවුලට ලංකාවේ හුඟක් මිනිසුන්  කැමැතියි. අපි ඒක දන්නවා. හැබැයි, තව අවුරුදු 30කින් වෙන දේ ගැන හිතලා බලන්න. 1956 කාලයේ බණ්ඩාරනායක මහත්මයා කරපු වැරැදි ගැන අද මිනිසුන් කථා කරනවා. ඒ දවස්වල එතුමාට support කළ සිංහල ජනතාව අද ඒ ගැන කථා කරනවා. 1980 ගණන්වල ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කරපු වැරැදි ගැන අද ජනතාව කථා කරනවා. තව අවුරුදු 40කින් විතර -2040, 2050 වෙනකොට- අනිවාර්යයෙන්ම රාජපක්ෂලා තමයි මේ රට කෑවේ කියලා කථා කරන තැනට කටයුතු සලස්වන්න එපා කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I will wind up my speech stating one thing that I saw on social media. It states, "The generation who cannot do anything today will live through your current decisions". ඒ කියන්නේ මගේ පරම්පරාව - මගේ generation එක - අතේ බලය නැහැ, මේ තීන්දු වෙනස් කරන්න. අපේ අතේ බලය නැහැ, තීන්දු ගන්න. හැබැයි, ඔබතුමන්ලා ගන්න ඕනෑ තීන්දු ගන්නේ නැත්නම්, we will have to live through your current decisions. ඔය ගොල්ලන් ගන්න මේ වැරැදි තීන්දුවල ඵල විපාක ගෙවන්න වෙන්නේ මගේ generation එකට කියන එක මතක තියා ගන්න. ඒක තමයි 1980දී වුණේ. 1950දී හිටපු නායකයන් කළ දෙයින් 1980 හිටපු කට්ටිය කෑවා. 1980 හිටපු කට්ටිය කරපු දෙයින් දෙදහස් ගණන්වල කට්ටිය කෑවා. දැන් 2020-2030 වකවානුවේ ගන්න තීරණවලින් මේ රට තව පස්සට ගෙනයන්න එපා. අපි ඉල්ලන්නේ සාධාරණ දෙයක්. අපි ඉල්ලන්නේ නොබෙදිය හැකි, නොබෙදිය යුතු ශ්‍රී ලංකාවක් තුළ අපේ දේශපාලන අයිතිවාසිකම්. ද්‍රවිඩ ජාතික සන්ධානය බෙදුම්වාදී පක්ෂයක් කියලා පෙන්වලා ඔබතුමන්ලා ඡන්දය අරගෙන මෙච්චර කල් හිටියා. තව දුරටත් ඒක කරන්න ගියොත්, ඔබතුමන්ලාට මේක කරන්න බැහැ.

ස්තුතියි,  ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.18]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා.

අපේ ගරු මුදල් ඇමතිතුමාට තිබෙන කාර්ය භාරය පිළිබඳව විවිධ අදහස් පළ වුණා. ඊයේ "The Sunday Times" පුවත් පතේ ඉතා හොඳ headline එකක් දමලා තිබෙනවා මම දැක්කා. It states, I quote:

> "Govt. caught in stormy weather: Finance Minister in tough rescue task."

මේක තමයි යථාර්ථය. අද මේ රට ආර්ථික කුණාටුවකට හසුවෙලා තිබෙන්නේ. මුදල් ඇමතිවරයා ඒ අභියෝගය භාරගෙන එයින් රට ගොඩ ගැනීමේ කාර්ය භාරය සඳහා තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ. ඒ ගැන විපක්ෂයේ විවිධ අදහස් ඇති, අපේ අය තුළත් විවිධ අදහස් ඇති. ඒ කෙසේ වුවත්, අපේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ රට ගොඩ ගන්නේ කොහොමද කියන ප්‍රශ්නයට පිළිතුරු සෙවීමයි. ඒ නිසා මේ පිළිබඳව සුළු ආර්ථික විග්‍රහයක් කිරීම මගේ යුතුකමක්. මම මුලින්ම උදාහරණයක් කියන්නම්. 2010දී අපේ රටේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 8යි; 2011 දී සියයට 8.4යි; 2012 දී සියයට 9.1යි; 2013 දී සියයට 3.4යි; 2014දී සියයට 5යි; 2015 දී සියයට 5යි; 2016 දී සියයට 4.5යි; 2017 දී සියයට 3.6යි; 2018 දී සියයට 3.3යි; 2019 දී සියයට 2.3යි; 2020 දී සියයට සෘණ 3.6යි. මෙන්න මේ යථාර්ථයට අපි මුහුණ දෙන්න ඕනෑ. කොවිඩ් වසංගතය නිසා ශ්‍රී ලාංකික ආර්ථිකය පමණක් නොවෙයි, සමස්ත ලෝකයේම ආර්ථිකය සංකෝචනයට ලක් වුණා. ඒ නිසා අද ලෝකයේ නිෂ්පාදන ක්‍රියාවලියේ දැවැන්ත අඩු වීමක් තිබෙනවා; gap එකක් තිබෙනවා. ගල් අඟුරු ප්‍රශ්නය, පාරිසරික ප්‍රශ්න වැනි ගැටලු රාශියක් නිසා අද මොකද වෙලා තිබෙන්නේ කියලා බලන්න.

අද නිෂ්පාදනයේ අඩුවක් තිබෙනවා. චීනය වාගේ දැවැන්ත නිෂ්පාදන කරන රටවල පවා නිෂ්පාදන ධාරිතාවේ අඩුවීමක් වෙලා තිබෙනවා. මේක අපේ ආර්ථික සංවර්ධනයට සුවිශේෂී වශයෙන් බලපානවා. ඩොලර් පිළිබඳ ප්‍රශ්නයේදී හුඟක් අය අහනවා, "අපි මොකක්ද කළ යුත්තේ?" කියලා. විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකයේ තත්ත්වය මොකක්ද? අපි මේ වෙනකොට ණය වෙලා තිබෙනවා, දේශීයව රුපියල් බිලියන 15,117ක් හා විදේශීයව රුපියල් බිලියන 6,052ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විස්තර ඇතුළත් වගු මම **සභාගත*** කරනවා.

අපි දැවැන්ත ලෙස ණය වුණු රාජ්‍යයක්. මේකට අපි එක එක්කෙනාට බැණලා, එක එක්කෙනාට අවලාද කියලා වැඩක් නැහැ. This is the present status of the economy; දැන් අපි ඩොලර් crisis එකකට, ඩොලර් හිඟයකට මුහුණ පාලා තිබෙනවා. So, how can we get over this problem? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට ප්‍රධාන හේතු මොනවාද? සාමාන්‍යයෙන් අපිට විගමනික ශ්‍රමිකයන්ගෙන් වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක් පමණ ලැබෙනවා. සංචාරක ව්‍යාපාරයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5ක් පමණ ලැබුණා. අපනයන ආදායම ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් පමණ ලැබුණා. ඉතිරි ටික විදේශීය ආයෝජන. මේ ඩොලර් අර්බුදය විසඳීම සඳහා එක්කෝ අපි ඩොලර්වලින් කරන වියදම් අඩු කරන්න ඕනෑ, එහෙම නැත්නම් ඩොලර් වැඩිපුර ලබා ගන්න ඕනෑ. ඩොලර් වැඩිපුර ලබා ගන්න නම්, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමත්, ශ්‍රී ලාංකික විගමනිකයන්ගෙන් වැඩි මුදල් ප්‍රමාණයක් ලබා ගැනීමත් අපේ අරමුණු කර ගන්න ඕනෑ.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කම්කරු අමාත්‍යවරයා වශයෙන් මම කියන්න ඕනෑ, විදේශ සේවය සඳහා අප 2009දී 247,126ක්, 2010දී 267,000ක්, 2011දී 262,000ක්, 2012දී 282,000ක්, 2013දී 293,000ක්, 2014දී 300,000ක්, 2015දී 263,000ක්, 2016දී 242,000ක්, 2017දී 211,000ක්, 2018දී 211,000ක්, 2019දී 203,000ක් සහ 2020දී 53,717ක් වශයෙන් විශාල පිරිසක් යවා තිබෙන බව. දළ වශයෙන් මම ඒ ගණන් කිව්වේ. පසු ගිය අවුරුදු දෙක ඇතුළත ලංකාවේ ශ්‍රමිකයන් පිට රටවලට යැවීම අඩු වුණා. ඒ වුණත් අපට පුළුවන් වුණා අපේ ආදායම ස්ථාවරව පවත්වා ගන්න. ඒ අනුව 2019දී ඇමෙරිකානු ඩොලර් මිලියන 6,717ක්, 2020දී ඩොලර් මිලියන 7,104ක් සහ 2021 පළමු කාර්තුවේදී ඩොලර් මිලියන 1,867ක් අපි ලබාගෙන තිබෙනවා. අපි දැන් ඒ පිළිබඳවත් පුරෝකථනයක් කර තිබෙනවා, අපට target එකක් දීලා තිබෙනවා. ඒ අනුව අපි මේ වෙනකොට ශ්‍රමිකයන් 83,000ක් පමණ විදේශගත කර තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වෙනකොට අපි ඒ සංඛ්‍යාව 100,000 පන්නනවා. ඊළඟ අවුරුද්දේදී අපි කෙසේ හෝ 200,000 සීමාව පසු කරන්න, -250,000-300,000 පිරිසක් යවන්න- කටයුතු කරනවා. එතකොට තමයි අපට වැඩිපුර විදේශ විනිමය ප්‍රමාණයක් සොයා ගන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා ක්‍රමෝපායන් දැන් අපේ රජය මඟින් සකස් කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ඩොලර් හිඟය සඳහා තිබෙන විසඳුම තමයි දේශීය නිෂ්පාදන ආර්ථිකය සවිමත් කිරීම. කිරි පිටි, ඇඳුම් වාගේම ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් අනෙකුත් දේවල් වැඩි වැඩියෙන් නිෂ්පාදනය කිරීම සහ පිට රටින් ආහාර ද්‍රව්‍ය ගෙන ඒම පුළුවන් තරම් අවම කිරීම තමයි කළ යුත්තේ. ඒ කටයුතු තමයි මේ අය වැය ලේඛනයෙන් ඉලක්ක කර තිබෙන්නේ. ඒක දිගු කාලීන ආර්ථික දැක්මකින් යුතු වූ වැඩ පිළිවෙළක් බව මම ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම විගමනික ශ්‍රමිකයන් පුහුණු ශ්‍රමිකයන් විධියට යවන්න අපි දැන් කටයුතු කරගෙන යනවා. දැන් කොරියාවත්, ජපානයත් අපට විශාල වශයෙන් පුහුණු ශ්‍රමිකයන් ඒ රටවලට එවන්න අවස්ථාව සලසා දීලා තිබෙනවා. මම හිතන විධියට එහි ප්‍රතිඵල ඉතා ඉක්මනින් අපට ලැබෙයි.

අපි නිෂ්පාදනයේදී තෙල් සඳහා යන වියදම අඩු කළ යුතුයි. ඒක එක දවසකින් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ජනාධිපතිතුමාගේ වැදගත්ම වැඩ පිළිවෙළක් තමයි පුනර්ජනනීය බලශක්තිය ප්‍රචලිත කිරීම. ඒ සඳහා අපට ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ආධාරයක් ලැබිලා තිබෙනවා. අපි එය ඉතා අගය කරනවා. ඒ මුදල සම්පූර්ණයෙන්ම පරිහරණයට අරගෙන අපි පුනර්ජනනීය බල ශක්තිය වැඩි දියුණු කළොත්, තෙල් ගෙනෙන එක ඉදිරියේදී අපිට අඩු කර ගැනීමට පුළුවන් වෙයි. ඒක දවසකින් දෙකකින් කරන්න බැහැ. ඒකට අවුරුද්දක් විතර යයි. මේ අය වැය ලේඛනය තුළින් මේ අවුරුද්ද සඳහා පමණක් නොවෙයි, ඉදිරි අවුරුදු 3, 4ක් සඳහා අවශ්‍ය බිම් මට්ටමේ ඒ අත්තිවාරම - foundation එක - දැමීමේ වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙන බව මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු ඇමතිවරයා වශයෙන් මා සතුටු වෙනවා, මෙවර අය වැය තුළින් උපාධිධාරීන් ස්ථිර කිරීම, රුපියල් බිලියන 30ක් වෙන් කරලා ගුරු-විදුහල්පති වැටුප් ගැටලුව සමථයකට පත් කිරීම, විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීම, දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට වන්දි ගෙවීම, සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ, රාජ්‍ය සේවයේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම, පෞද්ගලික අංශයේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීම යන වැදගත් තීන්දු, තීරණ අරගෙන තිබීම සම්බන්ධයෙන්. මේවා මේ අය වැය ලේඛනයෙන් කම්කරු ජනතාව, නැත්නම් මේ රටේ වැඩ කරන ජනතාව ලබපු ප්‍රතිලාභ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා ]

විශේෂයෙන්ම මේ සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ ඉතා වැදගත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ පෞද්ගලික අංශයට ජනතාව යොමු නොවෙන එක හේතුවක් තමයි, ශක්තිමත් සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් නොමැතිකම. ඒ පිළිබඳව කම්කරු අමාත්‍යාංශය ඉතාම ප්‍රබුද්ධ කණ්ඩායම් සමඟ සාකච්ඡා කරලා, ඉතා හොඳ සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කිරීමේ කටයුතු දැන් කරගෙන යනවා. මා හිතනවා, ඒක කළොත් මීට වඩා කම්කරුවන්ගේ අයිතිවාසිකම් ලබා දීමත්, ඔවුන් අමාරුවට පත් වුණු අවස්ථාවකදී ඔවුන්ට සහන සලසා දීමත් අපිට අනිවාර්යයෙන්ම කරන්න පුළුවන් වෙයි කියලා.

රටක යටිතල පහසුකම් දියුණු කිරීම අවශ්‍යයි. එහෙම නැතිව ආයෝජකයන් ආකර්ෂණය කර ගන්නේ කොහොමද? එක අතකින් කියනවා, ආයෝජකයන්ට එන්න කියලා. තවත් අවස්ථාවක කියනවා, Highways හදනවාට විරුද්ධයි කියලා. ගම්වල ඉන්න අය ඒ සේවා ස්ථානවලට - factoriesවලට - එන්න ඕනෑ. ඒ නිසා ග්‍රාමීය පාරවල් අවශ්‍යයි. ඒ නිසා ඒවා ප්‍රමුඛතාවක් දිය යුතු කාරණා නොවෙයි කියන එක මිථ්‍යාවක් බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා මේ වන විට මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කර තිබෙන බව. මේ රටේ ආයෝජන ශක්තිමත් කිරීම සඳහා ඒක අතිශයින්ම අවශ්‍යයි. ජාතික ආරක්ෂාව නැති තැනක ඒ වැඩ කටයුතු කිරීමට පුළුවන්කමක් නැහැ. ආයෝජකයන් පැමිණෙන්නේ නැහැ. විශේෂයෙන් ඔබතුමා දන්නවා, පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා ආයෝජකයන් හැරිලා ගිය බව සහ අපේ ආර්ථිකයට විශාල තර්ජනයක් ඇති වුණු බව. මේවා පාඩමට අරගෙන අපි ජාතික ආරක්ෂාව සඳහා වැඩ කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම, කොවිඩ්-19 වසංගතය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ගන්නා ලද ප්‍රායෝගික ක්‍රියා මාර්ගය නිසා අද අපට ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීමට පුළුවන් වෙලා තිබෙනවා පමණක් නොවෙයි මේ එන්නත්කරණ වැඩ පිළිවෙළ යටතේ ජනතාවට විශාල සේවාවකුත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම් පළාත්වල ප්‍රශ්නයක් තිබුණා. රබර්වලට හොඳ මිලක් නැහැ; කුරුඳුවලට හොඳ මිලක් නැහැ; ගම්මිරිස්වලට හොඳ මිලක් නැහැ. දැන් මේ ඔක්කොම නිෂ්පාදන සඳහා, සුළු අපනයන භෝග සඳහා ඉතා හොඳ මිලක් ලැබිලා, ඒ සුළු අපනයන භෝග වගාවන්හි යෙදී සිටින ජනතාව ආර්ථික වශයෙන් ස්ථාවර වෙලා තිබෙනවා.

අද බඩු මිල ගැන කථා කරනවා. ලෝක ආර්ථිකයත් සමඟ ගැටුණු විවිධ දේවල් නිසා විවිධ commoditiesවලට ප්‍රශ්න ඇති වුණා. අපේ රටේ ගෑස් නැහැ, පෙට්‍රල් නැහැ, ඩීසල් නැහැ. ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල ඉහළ ගියාම අනිවාර්යයෙන්ම ඒවායේ මිල වැඩි වෙනවා. ඒවායේ මිල අඩු වීමේ ප්‍රවණතාවක් නැහැ. එම නිසා මේ ප්‍රශ්නය දිහා අපි යථාර්ථවාදීව බලන්න ඕනෑ.

අද අපි සුබසාධනය අමතක කරලා නැහැ. විශේෂයෙන් ගැබිනි මවුවරුන්ට පෝෂණ මල්ල ලබා දෙන වැඩසටහන ඇතුළු විවිධ සුබසාධන වැඩසටහන් රාශියක් මේ අය වැය ලේඛනය තුළින් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මෙවැනි දුෂ්කර අවස්ථාවකදී වුවත් මේ මට්ටමෙන් හරි මේ කටයුත්ත කිරීමට පුළුවන් වීම ගැන අප සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි හිතන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ජනතාව දැන් නොයෙකුත් සහන බලාපොරොත්තු වෙනවා. කිසිම රජයක් සහන ලබා දෙන්න අකමැත්තක් දක්වන්නේ නැහැ. තමන්ගේ දේශපාලන පැවැත්ම සඳහා හෝ ජනතාවට සහන ලබා දෙන්න තමයි හැම රජයක්ම කටයුතු කරන්නේ. නමුත්, ඒ ලබා දීමේ යම් ප්‍රමාණයක් තිබෙනවා; සීමාවක් තිබෙනවා. ඒ සීමාව තීරණය වෙන්නේ අපේ ආර්ථික සංවර්ධනයත් එක්කයි.

රටේ සමස්ත ආර්ථික සංවර්ධනය තමයි අපි අය වැය ලේඛනයකින් බලාපොරොත්තු වෙන්නේ. මේ රට වැටිලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න එක තමයි අපේ ප්‍රමුඛ කාර්යය බවට පත්වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදු ආදායම් ලබා ගැනීමේ කාර්යයේදී "මල නොතළා රොන් ගන්නා සේ" කටයුතු කරමින් ගරු මුදල් ඇමතිතුමා මේ අය වැයෙන් මේ රටේ රුපියල් මිලියන 2,000ට වඩා ආදායමක් ලබන ප්‍රධාන සමාගම්වලට සියයට 25ක අධිභාර බද්දක් දැම්මා. මම එය ඉතාම අගය කරනවා. මම කියන්නේ, එය සියයට 25ක් නොවෙයි, සියයට 50ක් කරන්න ඕනෑ කියායි. එසේ අධිභාර බද්දක් දාලා රුපියල් බිලියන 100ක් සොයා ගන්න කටයුතු කර තිබෙනවා. මොකද, සමාජ ආරක්ෂණ අරමුදලක් සෑදීමට කටයුතු කරනකොට වුණත්, අපි කථා කරපු බොහෝ හාම්පුතුන් අද සියයට 1ක්, 2ක් දෙන්නත් මැළිකමක් දක්වනවා. එම නිසා, ගරු මුදල් ඇමතිතුමා ඊළඟ අය වැයෙන් හෝ තවත් සියයට 5ක හෝ අධිභාරයක් දාලා සමාජ ආරක්ෂණ අරමුදල ශක්තිමත් කරයි කියලා මම විශ්වාස කරනවා. That is a part of the social responsibility of the employer. අද වතුකරයේ කම්කරු ජනතාවට රුපියල් 1,000ක දෛනික වැටුප දෙන්නත් බොහොම ඇලි මැළිකම් පෙන්වන හාම්පුතුන් ඉන්නවා. මේක ඒ අයට හොඳ පාඩමක්. ඒ නිසා අපි කොයි ආකාරයෙන් හෝ ඒ කටයුත්ත කරන්න ඕනෑ. අපට මේ රට සංවර්ධනය කරන්න අවශ්‍යයි. එසේ සංවර්ධනය කිරීමේදී විදේශ ආයෝජන අවශ්‍යයි, නිෂ්පාදන දිරි ගැන්වීම් අවශ්‍යයි. ඒ සමඟම කම්කරු අයිතිවාසිකම්, වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් රැක ගැනීමත් අත්‍යවශ්‍ය බව ප්‍රකාශ කරන්න ඕනෑ. වර්තමාන තත්ත්වයත් එක්ක මුදල් ඇමතිතුමා විශාල අභියෝගයකට මුහුණ දීලා තිබෙන්නේ. ඒ අභියෝගයෙන් ජයගත හැකි නොවුණොත් පරාජය වෙන්නේ එතුමා නොවෙයි, මේ රටයි. එම නිසා, එතුමාට ඒ අභියෝගය ජය අරගෙන රට ගොඩ ගන්නට අවස්ථාව ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.33]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවේ දෙවැනි අය වැය විවාදයට ගන්නා අවස්ථාවේ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම ගැන මම අතිශයින් සතුටු වෙනවා.

රටම අමාරුවේ දාපු මේ ආණ්ඩුවේ අවුරුදු දෙකක ශේෂ පත්‍රය විධියට තමයි මේ අය වැය හඳුන්වන්න වෙන්නේ, ගරු නියෝජ්‍ය

කථානායකතුමනි. අය වැය කථාව අහගෙන ඉන්නකොටත් මට මතක් වුණු කාරණයක් තිබෙනවා. ඒ දවස්වල පාසල් යන සමහර දරුවෝ විභාගය ෆේල් වුණාම, තමන්ට ලැබුණු ලකුණු සංඛ්‍යාව ගෙදරට කියන්න තිබෙන භය නිසා ප්‍රගති වාර්තාවේ ලකුණු 7, 8 ලැබුණු විෂයයන් ඉදිරියේ තිබෙන ඒ සංඛ්‍යාවට ඉදිරියෙන් බින්දුවක් දානවා. ඒ විධියට හත, හැත්තෑව කරලා, ඒ වාගේම අට, අසූව කරලා දෙමව්පියෝ රවට්ටන හැටි තමයි මට මතක් වුණේ. හැබැයි, ලකුණු කොහොම දැම්මත් ඒ ළමයා ෆේල් කියන එකයි යථාර්ථය. හොර, ඇස්බැන්දුම් ලකුණුවලින් දෙමව්පියන්වත්, ලෝකයාවත් රැවැට්ටුවාට, අන්තිමට යථාර්ථයට මුහුණ දෙනකොට විභාගය අසමත් ළමයෙක් විතරක් නොවෙයි, වංචාකාරී ළමයෙක් බවත් අනාවරණය වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයත් ඒ විධියට බොරු ලකුණු දාලා, කටුක යථාර්ථයට උඩින් අයිසිං කරලා ඉදිරිපත් කරපු අය වැයක් විධියටයි අපි දකින්නේ. හැබැයි, ඇත්ත හෙළි වෙනකොට ආණ්ඩුව ෆේල් විතරක් නොවෙයි, අය වැය වංචාවක් බවත් හෙළි වෙනවා.

ඒ නිසාම අද මේ වංචනික අය වැය ප්‍රෝඩාව ගැන කථා කරන්න, ආර්ථික විග්‍රහ ඉදිරිපත් කරන්න විද්වතුන් ඉදිරිපත් වන හැටි අපි දකින්නේ නැහැ; පරිණත දේශපාලනඥයන් ඉදිරිපත් වන බවක් දකින්නත් නැහැ. ඒ වෙනුවට මේ ආණ්ඩුව ආ දවසේ ඉඳලාම දන්නා දේටයි, නොදන්නා දේටයි හැම දේටම කථා කරන රෙදි සේදීමේ විශේෂඥයන් කිහිප දෙනෙක් විතරක් ඉතිරි වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකුමනි, පසු ගිය කාලයේ අපි දැක්කා, ආර්ථිකය ගැන කථා කරද්දී ආර්ථික විශේෂඥයන් නිහඬ වෙලා, කට මැත දොඩවන්නන් ආර්ථිකය ගැන කථා කරන බවක්. කාබනික ගොවිතැන ගැන කථා කළත්, රසායනික පොහොර ගැන කථා කළත් ඒ විෂයයන් ගැන හසළ දැනුමක් තිබෙන විශේෂඥයන්ගේ කථා වෙනුවට වාචාල කථා විතරයි ආණ්ඩුව පැත්තෙන් අපට අහන්න ලැබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එක රටක්-එක නීතියක්" ගැන කථා කරන කොටත්, නීති විශාරදයන් පැත්තකට දමා තිබෙනවා. නීති කඩන අය තමයි ඒ ගැනත් කථා කරන්න පටන් ගත්තේ. ඒ වාගේම තමයි අද මේ අය වැය ගැනත් කථා කරන්න ආණ්ඩුවේ රෙදි සෝදන අංශයට තමයි භාර දීලා තිබෙන්නේ.

මේක තමයි මේ ආණ්ඩුවේ දේශපාලන ගැඹුර, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නිසි දැක්මක් නැති පිරිසකට රටේ සුක්කානම භාර දීපු පාපයට අද මුළු රටේම ජනතාව ගොදුරු වෙලා ඉවරයි. අය වැයට කලින් කොහොමද, කිව්වේ? "මොළ හතක් ඇති කෙනෙක් තමයි මුදල් ඇමතිකම කරන්නේ" කිව්වා. "ද්විත්ව පුරවැසිභාවය තිබෙන, ඒ වෙනුවෙන්ම රටේ ව්‍යවස්ථාවත් වෙනස් කරලා ගෙනැවිත් පත් කළ ඇමතිවරයෙක් තමයි අය වැය ඉදිරිපත් කරන්නේ" කිව්වා. බැසිල්වාදී වියතුන් කිව්වා, "මේ පාර ගෙනෙන්නේ රටම විස්මයට පත් කරන අය වැයක්." කියලා. ඇත්ත තමයි, ඒක නම්. මොකද, බොහෝ දෙනෙක් විස්මයට පත් වුණා, මේ වාගේ හිස් ලියවිල්ලක් දුටුවාම. ලංකාවේ මේ වාගේ හිස් අය වැයක් කවදාවත් ඉදිරිපත් කර තිබුණේ නැහැ.

මේ අය වැයෙන් බඩු මිල අඩු කරයි, සහන ලැබෙයි කියා පාරිභෝගිකයෝ හිතුවා. මේ තිබෙන ජීවන බර හින්දා, වැටුප් වැඩි වෙයි කියා, මොනවා හෝ දෙයක් තමන්ට ලැබෙයි කියා රාජ්‍ය සේවකයන් සහ පෞද්ගලික අංශයේ සේවකයන් බලාගෙන සිටියා. රැකියා අපේක්ෂා කරන තරුණ පිරිසගේ බලාපොරොත්තු ඔක්කෝම සුන් කර දැම්මා. සමෘද්ධිලාභීන් ගැන, අඩු ආදායම්ලාභීන් ගැන, කුඩා ව්‍යාපාරිකයන් ගැන, ස්වයංරැකියාවල නිරත වෙච්ච පුද්ගලයන් ගැන, ගොවි ජනතාව ගැන, කම්කරු ජනතාව ගැන මේ අය වැයේ කිසිවක් සඳහන් කර නැහැ. අපේ ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඊයේ කිව්වා වාගේ තනිකර පුස් ලියවිල්ලක් හැටියට තමයි අපි මේ අය වැය දකින්නේ.

ජනතාව අය වැයකින් බලාපොරොත්තු වන්නේ සුරංගනා කථා නොවෙයි. තමන් මුහුණ දෙන, දැවෙන ප්‍රශ්නවලට සහන ලැබෙයි කියායි ජනතාව බලාගෙන ඉන්නේ. ජනතාව, පොහොර ටික දෙන හැටි කියයි කියලා හිතාගෙන හිටියා; හාල් මිල අඩු කරන හැටි පෙන්වා දෙයි කියා හිතාගෙන හිටියා; අත්‍යවශ්‍ය බඩු මිල යම් ප්‍රමාණයකින් හෝ අඩු කරන හැටි කියා දෙයි කියා හිතුවා. තමන්ගේ ජීවන බරට මේ අය වැය යම් හෝ පිළිසරණක් වෙයි කියලායි ඔවුන් හිතුවේ. මොකද, මේ වෙලාවේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයට ඕනෑම ලාංකික පුරවැසියෙක් සංවේදීයි. ඒ නිසායි බොහෝ දෙනෙක් කියන්නේ, මේ අය වැය නම් ලාංකික පුරවැසියෙකුගේ මානසිකත්වයෙන් හදපු අය වැයක් නොවෙයි කියලා. මිනිසුන් අද එහෙම කථා කරන්න පටන් ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ වියදම ට්‍රිලියන 3.2යි; ආදායම ට්‍රිලියන 2.2යි; පරතරය ට්‍රිලියන 1යි. මේක පියවා ගන්න තිබෙන ක්‍රමය තමයි, ණය ගැනීම. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව විසින් ආර්ථික වශයෙන් සහ රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් බංකොලොත් කළ රටට, කවුද ණය දෙන්නේ? මෙතුමන්ලා විපක්ෂයේ සිටියදී ආර්ථික ඔස්තාර් වාගේ ක්‍රියා කළ කෙනෙක් තමයි අද වෙළෙඳ ඇමති වෙලා ඉන්නේ. වෙළෙඳ ඇමතිවරයා කියනවා, "රට බංකොලොත් වෙයි." කියලා. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වලින් අපි දිනපතා - දවස ගණනේ- පල්ලම් බහිනවා; පහළට ඇද වැටෙනවා. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම රටකට කවුද ණය දෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය ඔක්තෝබර් මාසයේ අග වන කොට අපේ රටේ විදේශ සංචිතය ඩොලර් මිලියන 2,267යි. විදේශ වත්කම් අපට තිබෙන්නේ තව මාස එකහමාරකට විතරයි. සාමාන්‍යයෙන් ආර්ථික විද්‍යාවේ පිළිගැනීම අනුව මාස තුනකටවත් විදේශ සංචිත තිබෙන්න ඕනෑ. 2022 ජනවාරියේ ණය වාරික වශයෙන් ඩොලර් මිලියන 500ක් ගෙවන්න තිබෙනවා. නැවත 2022 ජූලි වන කොට ඩොලර් මිලියන 1,000ක් ගෙවන්න තිබෙනවා. එතැනම ඩොලර් මිලියන 1,500ක්. එතකොට ඩොලර් මිලියන 700ක් තමයි ඉතිරි වෙන්නේ. අනෙක් සියලු දේවල් ආනයනය කරන්න වෙන්නේ ඒ ඉතිරි මුදලින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම බලන කොට අපි රටක් ලෙස මහා ගිනි කන්දක් උඩ නොවෙයිද ඉන්නේ? හැබැයි, මේ මහා ඩොලර් අර්බුදයට කිසිම විසඳුමක් මෙවර අය වැයේදී දෙන්න මුදල් ඇමතිතුමාට බැරි වුණා.

අද බලන්න, බැංකුවල තත්ත්වය. දැන් ලංකාවට ඩොලර් එන්නේ බැංකු හරහා නොවෙයි. මහ බැංකුවේ අධිපතිවරයා කිව්වා, ඩොලරයක් මිලට ගැනීම රුපියල් 203ට සීමා කළ යුතුයි කියලා. ඒ නිසා දැන් කළු කඩයේ ඩොලරයක් රුපියල් 235, 240, 250 වාගේ ගණන්වලට තමයි අළෙවි වන්නේ. එහෙම වන කොට, බැංකු හරහා ඩොලර් එවන්නේ කවුද? මේ ආණ්ඩුව හාල්, සීනි, කිරි පිටි, සිමෙන්ති වාගේ අත්‍යවශ්‍ය භාණ්ඩ හැම එකක්ම අද පාලන මිලෙන් ඉවත් කරලා, කළු කඩ මිලට ගන්න පාර කපා තිබෙනවා. මේ ආණ්ඩුව නිසා ඩොලර් ගැනීමත් දැන් කළු කඩ ක්‍රමයට සිදු වෙමින් තිබෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ තත්ත්වයක් බැංකුවලයි, මූල්‍ය ආයතනවලයි පවතිද්දී කොරේ පිටට මරේ වාගේ, මූල්‍ය ආයතනවල ගනුදෙනු කරන කොට අය කළ සියයට 15 වැට් බද්ද සියයට 18ට වැඩි කරන්න කටයුතු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගෙවුම් ශේෂයේත් විශාල හිඟයක් පවතිනවා. මුදල් ලේකම්වරයා මාධ්‍ය හමුවකට ඇවිල්ලා කිව්වා, වාහන ආනයනය කිරීමට තිබෙන සීමා ඉවත් කරන්නේ මේ ගෙවුම් ශේෂය සමබර වුණාමයි කියලා. හැබැයි, ගෙවුම් ශේෂය සමබර කිරීමට කිසිම වැඩ පිළිවෙළක් මෙවර අය වැයේ අපි දැක්කේ නැහැ. වටිනා දේශීය සම්පත් විකිණීමත්, තව තවත් අසීමිතව ණය ගැනීමත් තමයි රජයට තිබෙන එකම විකල්පය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම බලන කොට වාහනයක් මිලට ගන්නා එකත් බොහෝ දෙනෙකුට හීනයක් පමණක් වෙයි කියලායි අපට නම් පෙනෙන්න තිබෙන්නේ. ඒකයි අප හැම තිස්සේම කියන්නේ, මේ ආණ්ඩුව, කරනවා කියපු දේවල් නොකරන, නොකරනවා කියපු දේවල්ම කරන ආණ්ඩුවක් කියලා. අද ඒ විධියට තමයි මේ ආණ්ඩුව දෙස ජනතාව දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා ඉලක්කම් විජ්ජා කරන හැටි. සමහර ඒවාට මිලියන ගණනින් මුදල් වෙන් කරන බව කියන කොට පසුපෙළ මන්ත්‍රීවරුන් අත්පුඩි ගහපු හැටි අපි දැක්කා. හැබැයි, වෙනසකට තිබුණේ, ඉදිරි පෙළ එක්කෙනෙකුවත් අය වැය වෙනුවෙන් අත්පුඩියක්වත් ගහන්න සිටියේ නැති එකයි. මිලියන ගණන් මුදල් වෙන් කරන බව කියන කොට ඒක අහලා පසුපෙළ මන්ත්‍රීවරු පොඩි වුන් එකක් ගත්තා. ත්‍රිරෝද රථ රියැදුරන්ට රුපියල් මිලියන 600ක් -රුපියල් කෝටි 60ක්- වෙන් කරනවා කිව්වාම ඒ අය දඩ බඩ ගාලා අත්පුඩි ගැහුවා. කැන්ටිමට ගිහිල්ලා තේ බීලා එද්දී මාධ්‍යවල mike එක ඉස්සරහට ඇවිල්ලාත් ඒ කාරණා ගැන පුරසාරම් දෙඩෙව්වා. ගෙදර ගිහිල්ලා තමයි බැලුවේ අය වැයෙන් වෙන් වෙච්ච මුදලයි, ත්‍රිරෝද රථ රියැදුරන් සංඛ්‍යාවයි අනුව එක් කෙනෙකුට කීයද ලැබෙන්නේ කියලා. ත්‍රිරෝද රථ රියැදුරන් ලක්ෂ අටක් විතර ලියා පදිංචි වෙලා ඉන්නවා. ඒ මුදල ඒ රියැදුරන් ගණනින් බෙදුවාම අවුරුද්දටම ත්‍රිරෝද රථ රියැදුරෙකුට වෙන් වන්නේ රුපියල් 750යි. ත්‍රිරෝද රථ රියැදුරෙකුට රුපියල් 750න් කරන්න පුළුවන් මොකක්ද? ටයර් එකක්වත් ගන්න පුළුවන්ද? පාසල් වෑන් සහ බස් රථ හිමියන් සඳහා රුපියල් මිලියන 400ක් වෙන් කරනවා කියන විටත් අත්පුඩි ගැහුවා. පාසල් වෑන් රථ සහ බස් රථ 40,000ක් තිබෙනවා. එතකොට එක් කෙනෙකුට ලැබෙන්නේ අවුරුද්දටම රුපියල් 10,000යි. පෞද්ගලික බස් රථ හිමියන් වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක් වෙන් කරනවා කිව්වාමත් අත්පුඩි ගැහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික බස් රථ තිබෙනවා, 20,000ක්. එතකොට එක් කෙනෙකුට ලැබෙන්නේ අවුරුද්දටම රුපියල් 75,000යි. මේ වසංගතය කාලයේ අවුරුදු දෙකක් විතර ෆිනෑන්ස් එක ගෙවා ගන්න බැරිව -වාහන නඩත්තු කර ගන්න බැරිව- ඒ මිනිස්සු බැට කෑවා. මේ වාගේ සොච්චමක් ඔවුන්ට දුන්නාම හරිද කියා අපි අහනවා. වාහන අමතර කොටස් ගන්න කොට ඒ වාගේ දහගුණයක් විතර ආණ්ඩුව ගසා කනවා. ත්‍රිරෝද රථ, පාසල් වෑන් රථ, පෞද්ගලික බස් රථ හිමියන් පත් වී ඇති තත්ත්වය පිළිබඳව මීට වඩා ගැඹුරින් බලා, ප්‍රායෝගිකව ගැළපෙන විධියට මුදල් වෙන් කළ යුතුව තිබුණා කියා සමගි ජන බලවේගය හැටියට අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැයේ අරුම පුදුම යෝජනාවක් තිබෙනවා මම දැක්කා. අනතුරු වැඩියි කියා ඊට පිළියමක් ලෙස අලුත් ක්‍රමයක් හඳුන්වා දෙනවා කියමින්, රිය අනතුරක් සිදු වුණාම වාහනය හප්පන ලද කෙනාගෙන් ගණනක් අය කර ගන්න ක්‍රමයක් ගැන කිව්වා. මේ ඇහැ වහලා ගහපු එකෙන් හප්පන අයයි, හැප්පෙන අයයි දෙගොල්ලන්ම හැප්පිලා ඉවරයි, insurance එක ගන්නකොට. රක්ෂණය කරනකොට මේකට ගණනක් එකතු වෙනවා. එතකොට හප්පන්න ඕනෑ නැහැ, ගණන ගෙවන්න. වාහනයක් තිබෙන ඕනෑම මිනිහෙක් full coverage insurance එකක් ගත්තත්, third-party insurance එකක් ගත්තත් මේක හැම කෙනාටම සාක්කුවෙන් ගෙවන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ රැකියා බලාගෙන ඉන්න තරුණ තරුණියන්ගේ සියලුම අපේක්ෂා සුනු විසුනු වී ගිය අයවැයක් තමයි මේ අයවැය. ඔබතුමා දන්නවා නේ, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් කී දෙනෙක් ඔබතුමා හමුවෙන්න එනවාද රස්සාවල් බලාගෙන. අයවැය ඇස්තමේන්තු පිළියෙල කරන්න ඉස්සෙල්ලා මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට එව්වා. මා ළඟ එම චක්‍රලේඛය තිබෙනවා. එහි තිබෙනවා "2022 වර්ෂය තුළ නව බඳවා ගැනීම් අධෛර්යමත් කරන බැවින්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් නොකරනු ලැබේ" කියලා. එතකොට තරුණ, තරුණියන්ට මේක දැනගන්න ලැබෙන්නේ අයවැයෙන් පසුව. එම නිසා පාස්පෝර්ට් පෝලිම දික් ගැස්සෙන එක විතරයි මේ ආණ්ඩුව තිබෙනතුරු සිද්ධ වෙන්නේ කියන එක අපට බය නැතුව කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අට සමත් ලක්ෂයකට රස්සාවල් දෙනවා කියලා මේ ආණ්ඩුව කිව්වා නේ. කොටසකට දීලා තිබෙනවා, රුපියල් 22,500ක ගෙවීමක් එක්ක. ඒක දෙනකොටම සමෘද්ධිලාභී පවුලක කෙනෙක් නම් කෙළින්ම සමෘද්ධියත් නැති වෙනවා. සමෘද්ධියත් නැති කරගෙන රුපියල් 22,500ට රස්සාවට ගිය මිනිස්සු බලාගෙන හිටියා, මේ අයවැයෙන් පසුවවත් ස්ථිර වෙයි; පඩි වැඩි වෙයි; මොකක් හරි සුරක්ෂිතභාවයක් ඇති වෙයි කියලා. ඒ අය ගැන කිසි දෙයක් - වචනයක්වත්- මේ අයවැයේ සඳහන් කරලා නැහැ. ඒ මදිවාට රාජ්‍ය සේවකයා පුදුම විධියට හෑල්ලු කිරීමට ලක් කරනවා අපි දැක්කා. රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 60 ඉඳලා 65 දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා කියලා මේ සභාවේ දී ප්‍රකාශ කරලා, පැය 24ක් යන්න ඉස්සෙල්ලා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට ගිහින්, මාධ්‍ය හමුවේදී මුදල් ඇමතිවරයා කියනවා "රාජ්‍ය සේවය අකාර්යක්ෂමයි" කියලා. රාජ්‍ය සේවය රටට බරක් ලු. රාජ්‍ය සේවකයා ගැන ඒ විධියේ අදහසක් තමයි මේ ආණ්ඩුවට තිබෙන්නේ කියන එක ඒ වෙලාවේ ප්‍රසිද්ධියේ කිව්වා.

අපිත් ආණ්ඩු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රජය රාජ්‍ය සේවකයා ඉල්ලන්නේත් නැතිව ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩි කිරීම කළා. රුපියල් 10,000ක් එකවරම පඩියට එකතු කළා. අපි රාජ්‍ය සේවකයා බරක් හැටියට කවදාවත් දැක්කේ නැහැ. මේ ආණ්ඩුවම තමයි මීට ඉස්සෙල්ලා රාජ්‍ය සේවය පුළුල් කරලා වැඩි හරියක් බඳවා ගැනීම් කරන්න පාර කැපුවේ. දැන් කියනවා ඒ අය බරක් ලු. රාජ්‍ය සේවකයන් තැපැල් ඡන්දය වෙලාවේ මේ ආණ්ඩුව පත් කරන්න දීපු ධෛර්යය ගැනවත් හිතුවා ද? පුදුම දීමක් නේ රාජ්‍ය සේවකයෝ ආණ්ඩුවට දුන්නේ. පඩි වැඩි කරපු යහ පාලන ආණ්ඩුවත් අමතක කරලා, ඒ අය මේ ආණ්ඩුවට ඡන්දය දුන්නා. අද ඒක අමතක වෙලා. පසුගිය කාලයේ කොවිඩ් වසංගතය වෙලාවේ දේශපාලනඥයෝ කොච්චර ලකුණු දා ගන්න දැඟලුවත් රාජ්‍ය සේවකයෝ කරපු කැපවීම අපට අමතක කරන්න පුළුවන් කමක් නැහැ, ආණ්ඩුවට අමතක වුණාට. දැන් ආණ්ඩුවට ඒ ගොල්ලන් බරක් ලු. ගංවතුරක් ආවාම, සුනාමියක් ආවාම, ඒ වාගේම කොවිඩ් වසංගතය වෙලාවේත් රාජ්‍ය සේවකයෝ තමයි ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු කළේ. දැන් බලන්න, එන්නත ගැන ලොකුවට කථා කරනවා.

එන්නතෙන් ලෝක වාර්තාවක් තිබ්බා ලු. දේශපාලනඥයෝ ද එන්නත ගැහුවේ? රාජ්‍ය සේවකයෝ. කොවිඩ් වසංගතය වෙලාවේ හමුදාවේ, පොලිසියේ, සෞඛ්‍ය අංශවල ලොකු, පොඩි හැමදෙනාම, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින්, ප්‍රාදේශීය ලේකම්වරු, දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලුම සේවකයන් දිවා රාත්‍රී නොබලා, ජීවිත අවදානම ගැන නොතකා කරපු විශිෂ්ට සේවයට රාජ්‍ය සේවකයාට රජය උපහාර දක්වන්නේ මේ විධියට හැල්ලු කරලා ද කියලා මම අහන්න කැමැතියි.

ළඟදී පුවත් පතක සඳහන් කරලා තිබෙනවා මම දැක්කා, මහ බැංකුව පිහිටුවලා වසර 70ක් පිරෙනකොට මුද්‍රණය කරපු මුදල් ප්‍රමාණයයි, මේ මාස විස්ස ඇතුළත ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් මුද්‍රණය කරපු මුදල් ප්‍රමාණයයි බලනකොට අතිවිශාල වෙනසක් තිබෙනවා කියලා. මේක තමයි මේ ආණ්ඩුවේ අලුත්ම සෙල්ලම. සෙල්ලම් කරන්න වාගේ සල්ලි අච්චු ගහනවා.

බලාගෙන ඉන්දෙද්දි බඩු මිල වැඩි වෙනවා. මේ සෙල්ලම් සල්ලි ප්‍රාදේශීය දේශපාලනඥයන්ට බෙදලා, දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරලා, අන්ත විධියට පරදින්න යන අයගේ ඡන්ද ටික බේරා ගැනීමට මේ අය වැය තුළින් උත්සාහයක් ගෙන තිබෙන බවත් අපිට පෙනෙනවා. ගල් අතුරපු පාරට තාර දමන්න, තාර පාර කාපට් කරන්න, කාපට් කරපු පාර උඩින් ආපසු කාපට් කරන්න දේශපාලනඥයන්ට විශාල මුදලක් අය වැයෙන් වෙන් කර තිබෙනවා. රටේ මේ තරම් බරපතළ ආර්ථිකයක් පවතින වෙලාවක, සල්ලි අච්චු ගසමින් ප්‍රාදේශීය දේශපාලනඥයන් හරහා ගමට පොම්ප කරන්නේ, අද වෙද්දී පලු යන්න බැණ බැණ ඉන්න ගමේ පක්ෂ යන්ත්‍රණය ආයෙත් පණ ගන්වන්න හිතාගෙන ද කියලා අපිට අහන්න සිද්ධ වෙනවා. නමුත්, මේ වාරයේත් ජනතාව රවට්ටන්න හිතුවොත් නම් ආණ්ඩුවට වරදිනවා. දැන් බලන්න, ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුදු දෙකයි. දෙවසරක ප්‍රගතිය හැටියට මොනවාද පෙන්නන්න තිබෙන්නේ? තමුන්නාන්සේලා ආණ්ඩුව භාර ගන්නකොට තිබුණු මිලයි, එදා, "සැප ද?" කියලා සමච්චල් කරපු අය අද ආණ්ඩු කරනකොට තිබෙන මිලයි බැලුවාම ජනතාව තීරණය කරයි, මොකක්ද කරන්න ඕනෑ කියලා.

2019 නොවැම්බර්වල රුපියල් 90ට ගත් නාඩු සහල් කිලෝව අද ගන්නේ රුපියල් 140කට. රුපියල් 97ට ගත් සම්බා කිලෝව අද ගන්නේ රුපියල් 170කට. රුපියල් 110ට ගත් පරිප්පු කිලෝවක් අද රුපියල් 250ට ගන්නකොට හැටනව ලක්ෂයක් ඡන්දය දීපු මිනිස්සු කියනවා, "මෙහෙම පරිප්පුවක් නම් ජීවිතේට කෑවේ නැහැ" කියලා. රුපියල් 440ට තිබුණු වියළි මිරිස් කිලෝව අද රුපියල් 600ටයි ගන්නේ. රුපියල් 100ට තිබුණු සීනි කිලෝවක් අද රුපියල් 150ට ගන්නේ. රුපියල් 380ට තිබුණු කිරි පිටි පැකැට්ටුවක් අද රුපියල් 480යි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ පක්ෂයේ වෙලාවෙන් එතුමාට තව විනාඩි තුනක් ලබාදෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට වැඩිපුර වෙලාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් රුපියල් 1,493ට ගත් ගෑස් සිලින්ඩරය පෝලිම්වල ඉඳලා, දවසක් රස්තියාදු වෙලා, රුපියල් 2,675ක් දීලායි අද ගන්නේ. සැමන් සහ පරිප්පුවල මිල අඩු කරනවා කියලා ජාතිය අමතා විහිළුවක් සැපයුවා. සති දෙකෙන් ගැසට් එක ඉවරයි. රුපියල් 230ට ගත් සැමන් ටින් එක රුපියල් 380ටයි දැන් ගන්නේ. එදා "සැප ද" කියලා අහපු අය තමයි, මේ ගණන්වලට අද බඩු මිල වැඩි කරලා තිබෙන්නේ.

මට තව විනාඩි දෙකක් ලැබුණු නිසා මේ කාරණාත් මම කියන්නම්. ගොවීන්ට වන්දි දෙනවා කිව්වා. ගොවීන්ට වන්දි දෙන ආකාරය ගැන එක වචනයක්වත් මේ අය වැය ලේඛනයේ නැහැ. ඒ වෙනුවෙන් සත පහක් වෙන් කර නැහැ. පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්නත් බැහැ ලු. මේ ප්‍රෝඩාව කරන්නේ කාටද කියලා අපි අහන්න කැමැතියි.

අවසාන වශයෙන්, මම තව එක කාරණයක් කියන්න කැමැතියි. දැන් අපේ රටේ තෙල් පිරිපහදුව වහලා තිබෙනවා. අවුරුදු 52කට පස්සේ තෙල් පිරිපහදුව වහපු එක ගැන අද අපිට කථා කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ ගැන කථා කරන්න අපිට අයිතියකුත් තිබෙනවා. 1967 වසරේ ලංකාවේ පළමුවෙනි පිරිපහදුවට මුල්ගල තිබ්බේ, හිටපු අගමැති ඩඩ්ලි සේනානායක මැතිතුමායි. 1969දී ඩඩ්ලි සේනානායක හිටපු අගමැතිතුමා මෙය විවෘත කළා. අවුරුදු 52ක් අඛණ්ඩව එහි තෙල් පිරිපහදුව ක්‍රියාත්මක වුණා. පළමුවෙනි වතාවට, බොරතෙල් නැති නිසා අද පිරිපහදුව වහන්න සිදුවෙලා තිබෙනවා. ආණ්ඩුවේ ඇමතිවරු කියනවා, ඩොලර් ප්‍රශ්නයක් නිසා මේක වහන්න සිදු වුණා කියලා. පළමුවෙනි වතාවට රජයට බොරතෙල් ටික පිරිපහදුවට ලබා දෙන්න බැරි වුණා. බොරතෙල් ගෙනෙන්න බැරි ඩොලර් නැති නිසා ලු. දැන් සභාපතිවරයායි, ඇමතිවරයායි කියනවා, බොරතෙල් නැතුවාට, පිරිපහදුව වැහුවාට, පිරිපහදු කරපු තෙල් ගෙනැල්ලා අඛණ්ඩව බෙදනවා කියලා. පිරිපහදු කරපු තෙල් බැරලයක් බොරතෙල් බැරලයකට වඩා ඩොලර් 15කින් වැඩියි. එහෙම නම්, ඩොලර් නැති රටේ බැරලයකට වැඩිපුර ඩොලර් 15ක් දීලා ගන්න සල්ලි කොහෙන්ද කියා මම අහනවා.

ඊළඟට, අපේ රටට අවශ්‍ය භූමිතෙල් ප්‍රමාණය සියයට සියයක්ම හැදුවේ තෙල් පිරිපහදුවෙන්. දැන් මොකක්ද වෙන්නේ? ගෑස් භීතිය නිසා මේ දිනවල භූමිතෙල් පෝලිමක් රටේ ඇති වෙලා තිබෙනවා. පිරිපහදුව තිබෙද්දීත් භූමිතෙල් පෝලිමක් තිබුණා නම්, ඉදිරියට කොහොම වෙයිද කියලා අපිට හිතා ගන්න පුළුවන්. නැවත වතාවක් මම අහනවා, බොරතෙල් ගෙනෙන්න ඩොලර් නැති රටේ වැඩි මිලට පිරිපහදු කරපු තෙල් ගෙනෙන්නේ කොමිස්වලට ද, එහෙම නැත්නම් ඇත්තටම ඩොලර් නැති නිසා ද කියන එක හරියට කියන්න කියලා.

දැන් සල්ලිත් නැහැ, බඩුත් නැහැ, මිලත් වැඩියි, පෝලිමත් දිගයි. මේ වාගේ බැටකන ජනතාවක් ඉන්න වෙලාවක තමයි මෙවර අය වැය ගැන අපට කථා කරන්න වුණේ. ඒ නිසා සමහර අයට සවලෙන් බෙදන ගමන් සමහරුන්ට කන් හැන්දෙන් බෙදන බවක් තමයි අපි දැක්කේ. ලෝකයේම රටවල් සෞඛ්‍යය වෙනුවෙන් වෙන් කරන මුදල වැඩි කරද්දී, මේ රටේ සෞඛ්‍යය වෙනුවෙන් වෙන් කරන මුදල අඩු කර තිබීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සී.බී. රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.56]

**ගරු සී.බී. රත්නායක මහතා (වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Wildlife and Forest Conservation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 අය වැය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

විපක්ෂයට ගියාම, ඒ අය සාම්ප්‍රදායිකව කරන කථා අපි අහලා තිබෙනවා; අපිත් විපක්ෂයට ගියාම එහෙම කථා කරලා තිබෙනවා. ඒ වාගේම, රටක ජනතාවට පණිවුඩයක් දෙන්න අපි සූදානම් කර තිබෙනවා. මේ තට්ටු මාරු ක්‍රමය තුළ රටක අය වැයක් ඉදිරිපත් කරනකොට කරපු කථා අනන්ත අප්‍රමාණ අපි අහලා තිබෙනවා. ඒකෙන් පීඩා වින්දේ අහිංසක ගැමියෝ, පීඩිත ජනතාව, එහෙම නැත්නම් කම්කරු ජනතාව. එතැනින් ඔවුන් ගොඩ ගැනීම සඳහා අපි කටයුතු කළ යුතු වෙනවා. එතැනින් ඔවුන් ගොඩ ගැනීමට කටයුතු කිරීමේදී අපට අතීතය අමතක කරන්න බැහැ. අතීතය තුළින් වර්තමානය ගොඩ නැඟිය යුතු වෙනවා. ඒ වාගේම වර්තමානයෙන් අනාගතය සාදා ගැනීම සඳහා අපි කටයුතු කළ යුතු වෙනවා. එම නිසා අපි කරන්නේ ලෝකය වැලඳගත් මේ වසංගතය විකිණීමක් නොවෙයි. ඉස්සෙල්ලා කිව්වා, "යුද්ධය විකුණනවා", "යුද්ධය ඔඩු දුවනවා", "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියලා. ඒ වාගේම, "අලිමංකඩ කියලා පාමංකඩ යනවා" කිව්වා. මෙන්න මේ වාගේ කතන්දර කියා මිනිසුන්ගේ මනස අවුල් කරලා තියෙද්දිත් අපි යුද්ධය අවසන් කරලා ඒ නිදහස ලැබුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතියේම අම්මා හැටියට කටයුතු කරපු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා, -1970දී- දේශීය ආර්ථිකයට මුල් තැන දෙමින් දේශීය භෝග වගාව, දේශීය ආර්ථිකය ගොඩ නැඟීම සඳහා කටයුතු කළා. හැබැයි, සමහර අය තමන්ට තනතුරු තානාන්තර නැති වෙනකොට ජාති, ආගම්, කුල මල භේද කරපින්නාගෙන, ඒ සඳහා පෙළ ගැසී කටයුතු කරපු අවස්ථාවක, විපක්ෂය ඔවුන් ඩැහැගෙන ඔවුන් එක්ක ජනතාවට විවිධ මතිමතාන්තර දෙන්න පටන් ගත්තා. ඒ විධියට විවිධ මතිමතාන්තර දෙන්න පටන් ගත්තාම ජනතාවට තිබුණු පීඩනය නිසා ඔවුන් එක්ක ජනතාව ගොනු වෙන්න පටන් ගත්තා. ඒ කාලයේ පාන් පෝලිමේ හිටපු කෙනෙක් හැටියටයි මමත් කථා කරන්නේ. ඒ වෙලාවේදී අපි ඒ පීඩාව වින්දා. හැබැයි අපේ ආර්ථිකය ගොඩ නඟනකොට උතුරේ ජනතාව එදා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය උතුරට ගිය වෙලාවේදී හරසරින් පිළිගත්තා. මිරිස් ටික දේශීය වශයෙන් වගා කරගෙන ඉස්සරහට ආ හැටි ඒ අවස්ථාවේදී අභිමානයෙන් කථා කළා. නමුත්, එවක පැවැති ආණ්ඩුව පෙරළුවා. ආණ්ඩුව පෙරළා ඒ පස් අවුරුදු සැලැස්ම විවේචනය කළා, 1978 අය වැය විවාදයේදී. ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේදී එවක මුදල් අමාත්‍ය රොනී ද මැල් මැතිතුමා අය වැය විවාදයේදී කරපු කථාවට අපි "හූරේ" කියලා අත්පුඩි ගැහුවා. "රටට සෞභාග්‍යය උදා කරනවා" කියලා එදා කිව්වා. එදා විවෘත ආර්ථිකයත් එක්ක ඒ දේශීය ආර්ථිකය අකා-මකා දැම්මා. අද අපි කථා කරන්නේ මොකක්ද? සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා දේශීය වගාව අභිමානයෙන් කරගෙන ගියා, අපි එතැනට එනවා කියලා. නමුත් විවෘත ආර්ථිකයත් එක්ක එදා ගෙදර තිබුණු රම්පෙ පැළය ගලවා දැම්මා; අමු කහ පැළය ගලවා දැම්මා; ගෙදර තිබුණු අමු ඉඟුරු පැළය ගලවා දැම්මා. එහෙම කරලා හැමදේම කඩෙන් ගේන්න අපි අවස්ථාව සලසා ගත්තා. කුඹුරු යාය පිටින් පුරන් වුණා. කඩෙන් හාල් ගේන්න පටන් ගත්තා. එදා මැතිනියගේ ආණ්ඩුව පරාද කරලා විවෘත ආර්ථිකය ගොඩනැඟී එන අවස්ථාවේදී අපි අලුත් දෙයකට යොමු වුණා. එහි හොඳ නරක දෙකම තිබෙන්න පුළුවන් වෙයි.

හැබැයි, පක්ෂ, විපක්ෂ දෙගොල්ලන්ම තට්ටු මාරුවට කථා කරපු දේවල් එක්ක අපි එහි ආදීනව බුක්ති විඳිනවා. අපට නිදහස් අධ්‍යාපනය ලැබුණේ මිෂනාරි අධ්‍යාපනයෙන් පසුවයි. අපේ මුතුන් මිත්තෝ අකුරු කළේ වැලි මිදුලේ. එතැනින් පස්සේ ගල් ලෑල්ල, ගල් කූර ආවා. ගල් කූරෙන් ගල් ලෑල්ලේ "අ" යන්න ලියලා අපේ මුතුන් මිත්තෝ අකුරු කෙරෙව්වා. ඒ අධ්‍යාපන ක්‍රමයත් එක්ක නිදහස් අධ්‍යාපනය අපට ලබා දුන්නා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය ලබා දීලා මැදි මහා විදුහල් 43ක් රටට දායාද කර දුන්නා. එසේ දායාද කර දුන් මැදි මහා විදුහල්වලින් මේ රටේ රාජ්‍ය පරිපාලනයට විශාල සංඛ්‍යාවක් එකතු වුණා. ග්‍රාමීය මට්ටමේ නැති බැරි මිනිසුන්ගේ දරුවෝ රටේ පරිපාලන ක්ෂේත්‍රයට එකතු වුණා. එකතු වුණා විතරක් නොවෙයි, ඔවුන් පරිපාලනයේ වගකීම අතට ගත්තා. දිසාපතිවරු, ලේකම්වරු වැනි අය ගත්තාම, ඒ අය කටයුතු කළ ආකාරය බලද්දී ඒ පුටුවේ ඉඳගත්තාට පසු ඔවුන්ට ග්‍රාමීය මට්ටම අමතක වුණා. කම්කරු ජනතාව ගැන අමතක වුණා. සමහර අයට ගමේ පාරවල් අමතක වුණා. මේවා අපි කථා කරන්න අකැමැති මාතෘකා බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අදත් ඒ තත්ත්වය තිබෙනවා. ඒ නිසා නේද, පොඩි දරුවන්ගෙන් පළිගන්න වර්ජන කළේ? කොවිඩ් වසංගතය නිසා 1 වසරේ හිටපු දරුවා අවුරුදු 2ක් ගිහිල්ලා 3 වසරේ ඉන්න ඕනෑ වුණත් තවම ඉන්නේ 1 වසරේ. පාර දිගේ උපවාස කරලා, මළ මිනී මතින් නැඟිටින්න උත්සාහ කරමින් අරගළ කළා. ඒ කාලයේ වසංගත තිබුණේ නැහැ. යුද්ධය තිබුණේ නැහැ. රටේ ආර්ථික පීඩනයක් තිබුණේ නැහැ. ඒ වෙලාවේ ගුරුවරුන්ගේ වැටුප දෙන්න තිබුණා. නමුත්, ඒ වෙලාවේ ඒවා ගැන කථා කරන්නේ නැතුව හිටියා.

මත්පැන්හල් දමන්න හදනවා කියලා ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා. මත්පැන්හල් දමන එකට සමහර තැන්වලදී අපි විරුද්ධයි තමයි. හැබැයි, අපට සැලසුම් තිබෙන්න ඕනෑ. මේ සැලසුම් ගැන අපි කථා කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. මේ රටේ මිනිස්සු ගත්තොත්, ඔවුන් මත්වතුර බීලා වැඩිවෙලා පදමට ආවාම කියන සින්දුව මොකක්ද? ඔවුන් කියන්නේ වෙන මොකක්වත් නොවෙයි, "පෘතුගීසිකාරයා රටවල් අල්ලන්න සූරයා" කියලා. පෘතුගීසිකාරයා ගැහුවේ කොයි රටටද? අපේ මාතෘ භූමියට නේද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක් තිබෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon.C.B. Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තේනුක විදානගමගේ රාජ්‍ය ඇමතිතුමාගේ වෙලාවෙන් විනාඩි 5ක් දෙනවා කියනවා. ඒකට මට අවසර දෙන්න. මගේ කථාව ඉතා ඉක්මනින් අවසන් කරන්නම්.

අපි අද බෝගම්බර ගැන, වැලිකඩ ගැන, මුල්ලේරියාව ගැන කථා කරනවා. නමුත්, ඒ උදාර සටන් ගැන කථා කරන්නේ නැහැ. තවම අපි කථා කරන්නේ හිරගෙවල්, පිස්සන් කොටු ගැනයි. අපට තවම ඒ ක්‍රමය වෙනස් කර ගන්න බැරිවුණා. ඒ ක්‍රමය වෙනස් කළොත් මේ මාතෘ භූමිය සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාගේ තත්ත්වයට ගෙන ඒමේ අවස්ථාව සැලසෙනවා. මෙන්න මේ කාර්යය කරන්න නේද අපි සූදානම් වන්නේ? අපි ජාතික පාසල් ආරම්භ කරන්න හදනවා. ඒ මන්ත්‍රීතුමා ගියේ ට්‍රිනිටි විද්‍යාලයට වෙන්න පුළුවන්. ඒක ජාතික පාසලක් නොවෙයි. මුදල් ගෙවා ඉගෙන ගන්න පාසලක්. ඒ පාසලට ගිය කෙනා දන්නේ නැහැ, නිදහස් අධ්‍යාපනය කියන්නේ මොකක්ද කියලා. එය අවබෝධ කර ගන්නේ නැතිව නිදහස් අධ්‍යාපනය ගැන කථා කරන්න බැහැ. අපි මොකක්ද මේ කරන්න යන්නේ කියන එක අපි අවබෝධ කරගන්න ඕනෑ. එදා තිබුණේ මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය. අද තිබෙන්නේ සමාජ මාධ්‍ය. සමාජ මාධ්‍ය තුළ මෙය ක්‍රියාත්මක කිරීමේ වගකීම අපට තිබෙනවා. ඒ වගකීම එක්ක නව අරුතක් ඇතුව රටේ ආර්ථිකය සහ ආර්ථික ප්‍රතිගමනය පිළිබඳව පංච බල කේන්ද්‍රයත් එක්ක ගමට ගෙනයන සංවර්ධනයට දැන් විරුද්ධ වෙලා තිබෙනවා. ඒ ගැන වෙන අර්ථ කථන ගේන්න සූදානම් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අර්ථ කථන ගේන්න යන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. මේකෙදි දේශපාලනය කරන්න යනවා කියලා පෙනෙනවා. මේ විධියට දේශපාලනය කරමින් ඡන්දය ඉල්ලනකොට මිනිස්සු ඡන්දය දෙයි. ඒක පැත්තකින් තබන්න.

ගම හදා රට හැදීමේ වගකීම භාර ගත්තේ මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමායි. එතුමාගේ ඒ වගකීම ගමේ හිටපු අපි සහ ගමේ ඉන්න සියලුදෙනා භාර ගත්තා. ගම සංවර්ධනය වෙනවා නම්, ඒ සතුට අපට තිබෙනවා. පක්ෂ, පාට එතැන ඇත්තේ නැහැ. මේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,021ක් තිබෙනවා. මේ 14,021ට රුපියල් ලක්ෂ 30 ගණනේ යොමු කරන්නේ අපට පාක්ෂිකයෝ හදා ගන්න නොවෙයි.

අපට ඡන්ද හදා ගන්න නොවෙයි. ගම හැදෙනවා නම්, ඒකයි අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ. අපි ඔක්කෝම එකට එකතුවෙලා ගම හදාගෙන ඊළඟ මැතිවරණයට යමු. ප්‍රාදේශීය මට්ටමේ මන්ත්‍රීවරු අටදහස් ගණනක් ඉන්නවා. ඒ අය පොහොට්ටුවේද, එක්සත් ජාතික පක්ෂයේද, නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ ද කියලා නැහැ. ඒ හැම කෙනාටම ලක්ෂ 40 ගණනේ ලැබෙනවා. ඒ විතරක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වෙන් වන විමධ්‍යගත අය වැය රුපියල් ලක්ෂ 100 අද ලක්ෂ 150 දක්වා වැඩි කරලා දීලා තිබෙනවා. මෙන්න මේ අරමුදල්වලින් ගම සංවර්ධනය කර ගන්න යන්න ඕනෑ. පාරවල් කාපට් කිරීම වැදගත් වෙනවා. "කොළඹට කිරි - අපට කැකිරි" කියපු කථාව වෙනස් කරලා අපි අවස්ථාව සලසා ගන්න ඕනෑ. මේ තත්ත්වය වෙනස් කරලා අපි ගම සංවර්ධනය කිරීමේ අවස්ථාවට කඩිනමින් අවකාශය සලසා ගන්න ඕනෑ. ඒ කාලයේ කතරගම දේවාලය වඳින්න යනකොට නුවරඑළියේ ඉඳලා බෙරගල හරහා අපි දවස් දෙකක් විතර යනවා. නමුත් අද උදේ ගිහිල්ලා, හැන්දෑවේ පූජාව තියලා රෑට ගෙදරට එන්න පුළුවන් අවස්ථාව සලසා දීලා තිබෙනවා, මාර්ග පද්ධතිය හදලා දීලා. නිවාස යෝජනා ක්‍රමය බලන්න. රටේ ග්‍රාම නිලධාරි වසම් 14,021ක් තිබෙනවා. එක ග්‍රාම නිලධාරි වසමකට නිවාස 5ක් හදන්න යෝජනා කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් රටපුරා පෝස්ටර් ගැහුවේ නැහැ. රට පුරා පුරාජේරු නැටුවේ නැහැ. ග්‍රාම නිලධාරි වසම් 14,021 පහෙන් වැඩි කරලා එන ප්‍රමාණයක නිවාස එක වසරකදී ඉදි වෙනවා.

ඒ විතරක් නොවෙයි, අපි බෞද්ධ රටක්. බෞද්ධයන්ට සහ අන්‍ය ආගම්වල සිටින පූජකවරුන්ගේ දරුවන්ට, ඒ වාගේම භික්ෂූන්වහන්සේලාගේ දෙමාපියන්ට නිවසක් නැත්නම් නිවසක් හදලා දීමේ වගකීම ඉතිහාසයේ පළමු වතාවට හරියාකාරව ඉෂ්ට කරලා දීලා තිබෙනවා. ග්‍රාමීය මට්ටමෙන් මේ කාර්යයන් ක්‍රියාත්මක කරන්න සූදානම් වෙද්දී, ගුරුවරයාගේ වැටුප ලබාදෙන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම කොරෝනා නිසා ව්‍යසනයට ලක් වූ ව්‍යාපාරිකයන්ට ඒ අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහාත් කටයුතු කරලා තිබෙනවා.

මේ අය වැය ගැන කියනවා නම්, ආර්ථික වශයෙන් ගත්තොත් වරාය, ගුවන්තොටුපළ, විදුලි සංදේශ පහසුකම්, විදුලි සැපයීම් සඳහා මූලිකව අවශ්‍ය පහසුකම් ටික සලසා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒත් එක්කම මම කියන්න ඕනෑ, විදේශ සංචිත කළමනාකරණය, අපනයන වර්ධන හැකියාව, ආනයන ආදේශන පුළුල් කිරීම, විදේශ ඍජු ආයෝජන, ආහාර සුරක්ෂිතතාව ආදිය පිළිබඳව ආකල්ප මෙවර අය වැය තුළින් පෙන්වාදීලා තිබෙනවා කියන කාරණය. මේකට පුහුණුව අවශ්‍යයි. ඒක ඇත්ත. අපි හැමෝම එකතු කරගෙන යන්න ඕනෑ. ඒක අමාරු කාර්යයක් වෙන්න පුළුවන්. අපට චෝදනා එන්න පුළුවන්. ඒ චෝදනා ආවත් අපි රට හදන්න ඉස්සරහට යන්න ඕනෑ.

විදුලි සංදේශ ක්ෂේත්‍රය ගැන කථා කරනකොට එදා තිබුණේ කොහොමද? අපි කොළඹට කෝල් එකක් ගන්නවා නම්, "hello girl"ට කියලා කෝල් එකක් බුක් කරලා, පැය දෙක තුනක් post office එකේ හිටගෙන ඉන්නයි වෙලා තිබුණේ. අද ඊට වඩා තාක්ෂණය වෙනස් වෙලා. අද හැමකෙනා අතේම ජංගම දුරකථන දෙක තුනක් තිබෙනවා. මම මේ කරන කථාවටත් comments දාන්න පුළුවන්. අද ඒ තාක්ෂණයත් එක්ක යනකොට සුරක්ෂිත ආහාර රටාවක් එක්ක ලෝකයට සෞඛ්‍ය සම්පන්න දරු පරපුරක් බිහි කිරීමේ වගකීමක් තිබෙනවා. ඒ කාර්යභාරය කරන්නයි සූදානම් වෙන්නේ.

විපක්ෂයක් හැටියට මේ කරන්නේ විපක්ෂයේ කාර්යභාරය වෙන්න පුළුවන්. නමුත් ඒ කාර්යභාරය කරනවා වාගේම, රට ගැන හිතලා අවශ්‍ය කටයුතු කරන්න. මොකද, මේ කැරකිලා යන වේලාවේ යම් දවසක හරි ඔබට රට භාර ගන්න වුණොත්, මේ ආදීනවම ඔබටත් එනවා. ඒ නිසා මේ රට හදන්න අපි සූදානම් වෙන්න ඕනෑ. මේ රට අපේ අනාගත පරපුරට නිදහස්, නිවහල් සහ සෞඛ්‍ය සම්පන්න රටක් බවට පරිවර්තනය කිරීම සඳහා ආර්ථික සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මේක දන්සලක්වත්, නැත්නම් ලොසින්ජර අය වැයක්වත් විය යුතු නැහැ. රට ගොඩ නැඟීම සඳහා ක්‍රියාත්මක කරගෙන යන වැඩ පිළිවෙළක් අපි ඉදිරියට ගෙනියන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළේදී දේශීය කර්මාන්ත දියුණු කරගෙන අපි අපේ රට ඉස්සරහට ගෙනෙන්න ඕනෑ. අනුන්ට අත නොපා ජීවත් වෙන රටාවකට එන්න අවශ්‍ය කටයුතු අපි කරන්න ඕනෑ.

වාරි සෞභාග්‍යය ඇති කරන්න, වන ගහනය වැඩි කරන්න, කිරි නිෂ්පාදනය වැඩි කර ගන්න, පශු සම්පත් ක්ෂේත්‍රය වැඩිදියුණු කර ගන්න කටයුතු කරගත යුතුව තිබෙනවා. අවශ්‍ය ජීවනෝපාය ක්‍රමවේද හඳුන්වාදීලා ආදායම වැඩි කර ගන්න මේ අය වැයෙන් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා කවුරු මොනවා කිව්වත්, මුදල් ඇමතිතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. අපි අලුත් විධියට හිතලා, අලුත් ක්‍රමවේදයක් යටතේ ඉදිරියට යන්න සූදානම් වනකොට ඇතිවන බාධාවලට, අභියෝගවලට මුහුණ දීලා අපි රට හදමු.

ඔබතුමන්ලා සියලුදෙනාටම ස්තුතියි.

[අ.භා. 12.11]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, 2022 අය වැය ලේඛනයේ ප්‍රධාන මාතෘකා යටතේ කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන්.

පළමුවෙන්ම කියන්න ඕනෑ, මේ ඉදිරිපත් කළ 2022 අය වැය ඇමෙරිකන් අය වැයක් කියලා. ඇමෙරිකන් මොඩලයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකට පළමුවන හේතුව මා කියන්නම්. මේ අය වැයේ තිබෙනවා, වාහනයක් කොතැනකදී හෝ අනතුරකට ලක් වුණොත් ආණ්ඩුවට බද්දක් ගෙවන්න ඕනෑ කියලා. ඒ විධියට ආණ්ඩුවට බද්ද ගෙවන එක ඇමෙරිකාවේ ක්‍රියාත්මක වෙනවා. ඇමෙරිකාවේ සමහර ප්‍රදේශවල ඒක ක්‍රියාත්මක වෙනවා. අපට මේ යෝජනාව ගෙනාවේ ඇයි? අපි කියනවා, මේක මේ අය වැයෙන් අපේ දුප්පත් මිනිහාට ගහපු පළමුවන බඩේ පහර කියලා. මොකක්ද මේ බඩේ පහර? අපට ප්‍රශ්නයක් තිබෙනවා. එවැනි අනතුරක් සිද්ධ වුණාම කවුද ආණ්ඩුවට ඒ බද්ද ගෙවන්නේ? වාහන දෙකක් හැප්පුණාම කවුද බද්ද ගෙවන්නේ? සාමාන්‍යයෙන් අනතුරක් සිද්ධ වුණාම රක්ෂණයට කථා කරලා එතැනින් ඒ ප්‍රශ්නය බේරා ගන්නවා. දැන් එහෙම බේරා ගන්න බැහැ. දැන් අධිකරණයට යන්න වෙනවා. ඊට පස්සේ දඩයක් ගහනවා. පළමුවන වතාවට දඩය ගහලා ආදායමක් ලබා ගන්නවා. ඒ, පළමුවන කාරණය.

දෙවන කාරණය මොකක්ද? සාමාන්‍යයෙන් රුපියල් 50,000ක රක්ෂණයක් ඊළඟට රුපියල් 75,000ක් වෙනවා. රුපියල් 75,000ක් වුණාම මොකද වෙන්නේ? අය වැය හදන අය වටේ ඉන්න රක්ෂණ සමාගම් මේ ගොල්ලන්ට එතකොට හොඳට සලකනවා. එතකොට රක්ෂණ සමාගම් ටික දියුණු වෙනවා. ඊළඟ කාරණය හැටියට රක්ෂණ මුදල වැඩි වනකොට ඒ තුළින් බදු මුදලක් ආණ්ඩුවට යනවා. මෙන්න දුප්පත් මිනිහාට ගහපු පළමුවන ෂොට් එක. දැන් මෙතැනින් වෙන්නේ මොකක්ද? මෝටර් සයිකලයක් තිබෙන, ත්‍රිරෝද රථයක් තිබෙන, වෑන් එකක් තිබෙන දුප්පත්, අහිංසක මනුස්සයෙකුගේ වාහනය හැප්පුණ ගමන් ඒ මනුස්සයාට දඩ ගහනවා. ඒ ගහන දඩය ගහද්දී ඒ එක්කම අර නිකම් ඉන්න මිනිස්සුත් රක්ෂණයට සල්ලි ගෙවනවා. ගමේ ඉන්න, රටේ ඉන්න වාහන තිබෙන ලක්ෂ ගණනක මිනිස්සුත්, කිසිම අනතුරක් සිදු නොවුණු මිනිස්සුත් මේ හරහා ආණ්ඩුවට බද්දක් ගෙවනවා. ඒ නිසා මෙය වක්‍රාකාරව මිනිසුන්ට ගහපු බද්දක් හැටියට තමයි සලකන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා කථා කරද්දී හරිත ආර්ථිකය ගැන කථා කරනවා; නිෂ්පාදනය දිරිමත් කිරීම ගැන කථා කරනවා. මෙතැනදී හොඳටම පෙනෙන කාරණයක් තිබෙනවා නේ. කාබනික පොහොර න්‍යාය ආපු ගමන්ම රටට සිද්ධ වුණේ මොකක්ද? මේ වෙලාවේ කාබනික පොහොරවලින් රටට සෙතක් වුණාද? දැන් කාබනික පොහොර පිට රටින් ආනයනය කරනවා. එහෙම නම්, මේ රටේ විදේශ විනිමය ඉතිරි කර ගන්න වැඩසටහනක් හැදුවාද? එතැනින් අපට විදේශ විනිමය නැතිව ගියා. ඊළඟට මොකක්ද වෙන්නේ? රටේ ගොවියා සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා. ජාතික නිෂ්පාදනය, ගමේ නිෂ්පාදනය කඩා වැටෙනවා. ඊළඟට මේ රටේ සාගතයක් ඇති වෙනවා. එතකොට අපට ආහාර පිට රටින් ගෙන්වන්න වෙනවා. ආහාර පිට රටින් ගෙන්වූවාම අපේ විදේශ විනිමයට මොකද වෙන්නේ? අපේ විදේශ විනිමය ඒ රටවලට යනවා. විදේශ විනිමය ඒ රටවලට යනවා විතරක් නොවෙයි සිද්ධ වෙන්නේ. අපි පිට රටින් නැවත වතාවක් ගෙන්වන්නේ මොනවාද? රසායනික පොහොර යොදා නිෂ්පාදනය කරපු ආහාර තමයි අපි පිට රටින් ගෙන්වන්නේ. මේ තුළින් වක්‍රාකාරව සිද්ධ වුණේ මොකක්ද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ මිනිසුන්ගේ, ජාවාරම්කාරයන්ගේ බඩ පිරුණු එක විතරයි. ජාවාරමක් විතරයි මෙතැන සිද්ධ වුණේ. ඒ නිසා ජනතාවට මේ අය වැයෙන් යම්කිසි සහනයක්වත්, වැඩ පිළිවෙළක්වත් තිබෙන බව දැක්කේ නැහැ.

ආහාර සුරක්ෂිතතාව - food security - ගැන කථා කරනවා. හැබැයි මේ ගොල්ලෝ food security එක food safety කියලා පටලවාගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, food safety කියන එක එකක්, food security කියන එක වෙන එකක්. ආහාර සුරක්ෂිතතාව කරනවා නම්, අනාගතයේදී මිනිසුන්ට කන්න අවශ්‍ය ආහාර මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්ද? එහෙම කරන්න බැරි නම්, පිට රටින් ගෙන්වන්න අවකාශයක් තියෙනවාද කියලා පැහැදිලි අවබෝධයකින්, සැලසුම් සහගතව වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙන්න ඕනෑ. එතකොට තමයි අපේ මිනිසුන්ට කන්න දෙන්න පුළුවන් කියලා අපි තීන්දුවක් ගන්නේ. අපි දන්නවා, අනාගතයේදී වැඩිහිටි අය වැඩි වෙනවා කියලා. ඒ වැඩිහිටි අය බලාගන්න, ඔවුන්ට කන්න දෙන්න සැලසුමක් අපි ළඟ තිබෙනවාද? ඒ සැලසුම් මේ අය වැයෙන් පටන්ගෙන තිබෙනවාද? නැහැ, පටන් ගෙන නැහැ. එහෙම නම්, ඒ වැඩිහිටියන්වත් "අබ සරණං" කරන්න තමයි හදන්නේ.

දැන් විදේශ ආයෝජන ගැන කථා කරනවා. විදේශ ආයෝජන කියන්නේ, මේ රටේ ප්‍රධාන සම්පත් තුට්ටු දෙකට විකුණන වැඩසටහන් නොවෙයි. විදේශ ආයෝජන කිරීමේදී පැහැදිලිවම රටට යහපතක් වන, රටේ ආදායම් තත්ත්වය වැඩිවන, ඒ හා සමානව විදේශීය රටවල් එක්ක සම්බන්ධතා වැඩි කරගෙන අපේ විදේශ වෙළෙඳාම හදා ගැනීමේ වැඩසටහන් හදන්න ඕනෑ. හැබැයි දැන් මොකද වෙලා තිබෙන්නේ? බොර තෙල් ටිකවත් මේ රටට එවන්න තීන්දුවක් අරගෙන නැහැ. ඒ කියන්නේ, පිට රටවල් ටෙන්ඩරය භාරගෙන නැහැ. අද පිරිපහදුව වහනවා කියන්නේ, මොකක්ද වෙලා තිබෙන්නේ මේ රටට? මේ රට බංකොලොත්, ඒ නිසා මේ රටට කිසිම දෙයක් එවන්න බැහැයි කියලා ලෝකයේ රටවල් තීන්දුවක් ගෙන තිබෙනවා. එහෙම නම්, ලෝකයේ රටවල් ගෙන තිබෙන ඒ තීන්දුව අහෝසි කරගන්න, ලෝක ප්‍රජාව ඒක රාශි කරගන්න මේ අය වැයෙන් යම්කිසි ආකර්ෂණීය වැඩසටහනක් ඉදිරිපත් කළාද? එහෙම කරලා නැහැ. ඒ බව පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මිල පාලනය සම්බන්ධ ගැසට් නිවේදන ගැන බලන්න. මිල පාලනය සම්බන්ධ ගැසට් නිවේදනයක් අහෝසි කළාට, ඒක TV එකේ ගියාට ජනතාවට තේරෙන්නේ නැහැ. අපි පැහැදිලිව කියනවා, මිල පාලනය සම්බන්ධ ගැසට් නිවේදන අහෝසි කරන්නේ, ඒ තුළ ජාවාරමක් තිබෙන නිසාය කියලා. සිමෙන්තිවල පාලන මිල සඳහන් ගැසට් නිවේදනය අයින් කළේ නිකම්ද? නිකම් නොවෙයි. ඒකට හම්බ වෙච්ච ගණන කොච්චරද කියලා අපි ඉදිරි කාලයේදී කියන්නම්. ඒ වාගේ තමයි අනෙක් සියලු දේත්. සීනි වෙන්න පුළුවන්, පරිප්පු වෙන්න පුළුවන්, පොල්තෙල් වෙන්න පුළුවන්. ඒ වාගේම කෑම, ගෑස් ඇතුළු අත්‍යවශ්‍ය සියලු දේවලට සිදු වෙන්නේ ඒ දේමයි. මේවා අස්සේ සිදු වෙච්ච කාරණාවන් ගැන හොඳට බලන්න කෝ. සීනිවලින් හොරකමක් සිදු වුණා. සුදු ලූනු බිකෙනුත් හොරකම් කරපු අය නේ ඉන්නේ. සුදු ලූනු බිකෙන් හොරකම් කරලා, පොල්තෙල් ටිකෙනුත් හොරකම් කරලා, ගෑස් එකෙන් හොරකම් කරලා, සියල්ලෙන්ම හොරකම් කරලා තිබුණත් ඒවා වළක්වා ගන්න මේ අය වැයෙන් යම්කිසි විසඳුමක් ලබා දීලා තිබෙනවාද? එහෙම ලබා දීලා නැහැ. එහෙම ලබා දීලා නැත්නම් රටේ ජනතාවට දෙයියන්ගේම පිහිටයි කියන එක තමයි කියන්න තිබෙන්නේ.

මෙතැනදී අපි මතක තියා ගන්න ඕනෑ විශේෂ කාරණාවක් තිබෙනවා. අපි බඩු මිල ගනිමු කෝ. ඊයේ බෝංචි කිලෝ එක

කීයද? බෝංචි කිලෝ එක රුපියල් 600යි. කැරට් කිලෝ එක කීයද? ඊටත් වැඩියි. එළවලු සියල්ලම ගිනි ගණන්. මන්ත්‍රීවරුන්, වටේ ඉන්න ව්‍යාපාරිකයෝ, ජාවාරම්කාරයෝ විතරද කැරට්, බෝංචි කන්නේ? එතකොට අනෙක් මිනිසුන්ට කන්න ඕනෑ නැද්ද? ඉදිරි කාලය තුළ සාමාන්‍ය මිනිසුන්ට කන්න මොනවාද තිබෙන්නේ?

රසායනික පොහොර ටිකක් හංගාගෙන ඉඳලා ගොවියා ඒ පොහොර ටික දාලා වගා කටයුතු කළා. රසායනික පොහොර දාලා වගා කරලා කාබනික පොහොරවලින් තමයි ඒ අස්වැන්න ආවේ කියලා පෙන්වන්න ඒ ගොල්ලන් බලාගෙන හිටියා. අවසානයේ මොකක්ද සිදු වුණේ? වර්ෂාව ඇවිල්ලා ස්වභාව ධර්මයෙන් ඒ සියල්ල විනාශ කළා. ඒවා විනාශ වුණාට පස්සේ ප්‍රධාන දේවල් කිහිපයක් සිදු වුණා. නැවත වතාවක් අපට විශාල ආහාර හිඟයක් එනවා. ඊළඟ ප්‍රශ්නය මොකක්ද?

විශේෂයෙන්ම ගොවියා වී ගොවිතැන කරද්දී තමුන් දාපු කාබනික පොහොරත් එක්ක පසේ රොන් මඩ තැන්පත් වෙනවා. මේ වැස්සත් එක්ක ඒ පොහොර ටික සම්පූර්ණයෙන්ම ගහගෙන ගිහිල්ලා. දැන් අලුතෙන් ඒ ගොවි බිම හදන්න ඕනෑ. කොහොමද හදන්නේ? කාබනික පොහොර එහෙම හදන්න පුළුවන්ද? "නයිට්‍රෝ රජා" ගහපු ගේම් එක මොකක්ද? නයිට්‍රෝ රජා ගෙනාවත් වැස්සේ ගහන්න පුළුවන්ද? වැස්සේ ගහන්න බැහැ. නයිට්‍රෝ රජා වැස්සේ ගැහුවොත් ඒ පොහොර ටික ඔක්කෝම දිය වෙලා යනවා. එතකොට ඒ පොහොර ටික ගහට අල්ලනවාද? ගහට අල්ලන්නේ නැහැ. එතකොට මොකක්ද සිදු වන්නේ? එතැනදී ගොවියා විතරක් නොවෙයි, රටේ සමස්ත ජනතාවටම කන්න නැති තත්ත්වයක් ඇති වෙලා රටම විනාශ වෙන එක තමයි වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවය ගැන කිව්වා. රාජ්‍ය සේවය බරක් කියන එක මහා බොළඳ, විහිළු, ඔළ මොට්ටළ කථාවක් නේ. රාජ්‍ය සේවය බරක් කියලා පාලකයාට කියන්න බැහැ. එහෙම කියනවා නම්, ඒක පාලකයාගේ අසමත්භාවය. පාලකයා දක්ෂ නැහැ. රාජ්‍යයට විතරක් නොවෙයි, රටේ ජනතාවටත් ඵලදායී සේවාවක් ලබා දෙන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් රාජ්‍ය සේවකයා වෙනුවෙන් හදන්න. ඒකයි අපි කරන්න ඕනෑ. රාජ්‍ය සේවය බරක් කියන එක නොවෙයි වැඩේ. හැබැයි, තමුන්ගේ දේශපාලන හෙංචයියලා රාජ්‍ය සේවයට බඳවා ගන්න කොට ඒක බරක් නොවෙයි.

හොඳට වැඩ කරන්න පුළුවන්, හොඳට සැලසුම් කරන්න පුළුවන්, නිර්මාණය කරන්න පුළුවන් ඵලදායී මිනිස්සු ටික යට කරලා තිබෙනවා. දේශපාලන හෙංචයියන්ලා ටික උඩට දාලා සමහර තැන් පාලනය කරන්නේ හොඳට මොළේ තියෙන එක්කෙනා නොවෙයි, මොළය නැති එක්කෙනා. හෙණ්ඩුව අරගෙන ඒ ආණ්ඩුවේ ආයතනත් පාලනය කරන්න උත්සාහ කරනවා. දැන් බලන්න සිදු වෙච්ච කාරණාව මොකක්ද කියලා. ඵලදායී සේවාවක් ලබා ගන්න වැඩ පිළිවෙළක් හදන්න දන්නේත් නැහැ. ඒක කරන්නේත් නැහැ. හැබැයි, විශ්‍රාම යන කාලය අවුරුදු 65 වෙන කල් දික් කරනවා. පුදුම විධියට පරස්පරයි. මොකක්ද මේ කරන්නේ? විශ්‍රාම යන වයස අවුරුදු 65 දක්වා දික් කළත් කමක් නැහැ කියන්න කෝ. හැබැයි, එහෙම කළාම අපේ තරුණයන්ට රැකියා දෙන්න බැරුව යනවා. තාප්පවල චිත්‍ර ඇඳපු තරුණයෝ ටිකට, ගෙයින් ගෙට ගිහිල්ලා ඡන්දය කරපු ලක්ෂ 69ට එකතු වෙච්ච තරුණ තරුණියන්ට මොකක්ද වෙන්නේ? ඒ සියලු දෙනාට විශ්වාසය නැතුව යනවා. රට ගැන විතරක් නොවෙයි, දේශපාලනය ගැන විතරක් නොවෙයි, හැම එක්කෙනා ගැනම ඒ තරුණයන්ට වෛරයක් ඇති වෙනවා.

අඩුම ගණනේ මේ අය වැයෙන් පෞද්ගලික අංශය දිරිමත් කරන්න, පෞද්ගලික අංශයේ රැකියා ටික වැඩි කරන්න වැඩසටහනක් හැදුවාද? එහෙම වැඩ පිළිවෙළක් නැහැ. මොකක්ද කළේ? පෞද්ගලික ව්‍යාපාරික කණ්ඩායමකට ලොකු බද්දක් ගහලා ඒ බද්ද ආණ්ඩුවේ ආදායමට ගන්න එක විතරයි කළේ. ව්‍යාපාරිකයන්ට බද්දක් ගහන ගමන් රැකියා අවස්ථා වැඩි කරන්න අලුත් නිර්මාණයක් කරන්න තිබුණා. රැකියා අවස්ථා වැඩි කරලා ඒ තරුණ තරුණියන්ට ඒ අවස්ථාව ලබා දෙන්න තිබුණා. හැබැයි, ඒ පිළිබඳව කිසිම කථාවක් කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැයෙන් සල්ලි ටික බෙදන එක ගැන කථා කළා. මන්ත්‍රීවරුන්ට ගමේ වැඩ කරන්න ඒ සල්ලි ටික දෙනවා. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාට කියන්න පුළුවන්ද ඒකෙන් රටේ ජාතික නිෂ්පාදනය වැඩි වෙනවා කියලා? ඒ විතරක් නොවෙයි, විදේශ විනිමය ගෙන්වා ගන්න අපනයන වැඩි වෙනවා කියලා ඔබතුමන්ලාට කියන්න පුළුවන්ද?

අපට ප්‍රශ්න කිහිපයයි තිබෙන්නේ. අපනයනය සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සඳහා විදේශීය වෙළෙඳ පොළ හරියට හඳුනාගෙන, විදේශීය වෙළෙඳ පොළට අවශ්‍ය නිෂ්පාදන ගොඩක් අපට මේ රටේ කරන්න පුළුවන්. ඒ සඳහා වූ වැඩ පිළිවෙළක් මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවාද? නැහැ. එහෙම වැඩ පිළිවෙළක් තිබුණා නම් අපට ඉදිරි කාලය තුළ විදේශ විනිමය ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඒ සඳහාත් වැඩ පිළිවෙළක් නැහැ. එහෙම නම්, දේශීය පරිභෝජනයට ගන්නා නිෂ්පාදන ගැන ජාතික වශයෙන් මොකක් හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඒකත් නැහැ. ඇයි? පොහොර ටිකත් නැහැ. පොහොර ලබා දීම සම්බන්ධව වැඩ පිළිවෙළකුත් නැහැ. පොහොර නොමැතිව සම්පූර්ණයෙන් විනාශ වෙච්ච ගොවියාව ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළකුත් නැහැ. එහෙම නම් කිසිම වැඩ පිළිවෙළක් නැති අය වැය ගැන බොරුවට කථා කිරීමෙන් වැඩක් නැහැ. මේකේ හොඳ වචන ටිකක් තිබෙනවා; ලස්සන වචන ටිකක් තිබෙනවා. සංදර්ශන විධියට කථා කරන්න පුළුවන්. එක එක ජාතිවලින් මවලා කියන්න පුළුවන්. හැබැයි එහෙම කිව්වාට ප්‍රායෝගිකව රටට වැඩක් වුණේ නැත්නම්, ඒ ගැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා කියන කාරණය විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් මන්ත්‍රීවරුන්ට සල්ලි බෙදන්නේ මොකද? තමුන්නාන්සේලා ඡන්දයකට යන්න තමයි මේ වැඩේ කරන්නේ. හැබැයි, තමුන්නාන්සේලා ඒ බෙදන සල්ලි ටික අහිංසක, දුප්පත් ජනතාවගෙන් හොයා ගන්නේ. තමුන්නාන්සේලා ගමේ දහ දෙනෙකුට සල්ලි බෙදෙනකොට, ඒ ගමේ ඉන්න පවුල් 200ම තමුන්නාන්සේලාට බදු හැටියට දෙන සල්ලි ටික තමයි ඒ ගන්නේ. ඒ සල්ලි අරගෙන තමුන්නාන්සේලාගේ හෙංචයියෝ ටික තමුන්ගේ සාක්කුවේ දාගන්න කටයුතු කරනකොට, අර අහිංසක, දුප්පත් මිනිස්සු දහඩිය, කඳුළු හෙළමින් රටේ දුක් විඳින බව මතක තබා ගන්න. ඒක මේ රටට මහා පාපයක්. තමුන්නාන්සේලා ඒ පාපය මේ රටට කරලා තිබෙන්නේ. අපි එහෙම නොවෙයි, කරන්න ඕනෑ. අපට සැලැස්මක් තිබෙන්න ඕනෑ. මන්ත්‍රීවරයා හරහා ඕනෑම දෙයක් බෙදුවාට කමක් නැහැ. හැබැයි, ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. අපේ රටේ විදේශ විනිමය හිඟයක් තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ ටික ගෙන්න ගන්න, සේවා ටික සපයන්න අවශ්‍ය කරන විදේශ විනිමය අපට නැහැ. එහෙම නම් විදේශ විනිමය ගන්න පුළුවන් නිෂ්පාදන ටික වැඩි කරන්න අපි මේ අය වැයෙන් සල්ලි වෙන් කරන්න ඕනෑ.

අද රටේ මිනිසුන්ට කන්න නැහැ. බඩු මිල අහස උසට නැගලා. ජනතාවට අවශ්‍ය ආහාර ටික දේශීය වශයෙන් නිෂ්පාදනය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ මේ අය වැයෙන් මුදල් වෙන් කරලා හදන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ හදනවා වෙනුවට, මොකක්ද කළේ? තමුන්නාන්සේලාට ගමට යන්න බැහැ. ගමෙන් එළවනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ගහලා එළවන තත්ත්වය එනකොට තමුන්නාන්සේලා බලනවා, තමුන්නාන්සේලා එක්ක වැඩ කරපු කට්ටියට සල්ලි බෙදා දීලා, ඒ මිනිස්සු ටික සන්තෝෂ කරන්න. මතක තබා ගන්න. ඒක මේ රටට ලොකු ත්‍රස්තවාදයක්. එසේ නොවන්න, අපි තමුන්නාන්සේලාට යෝජනාවක් කරනවා. තමුන්නාන්සේලා ඒ සල්ලි ටික දෙන්න. කමක් නැහැ. හැබැයි, ඒ සල්ලිවලින් හැම ගමකම තිබෙන සම්පත් කළමනාකරණය කරන්න වැඩ පිළිවෙළක් හදන්න. යම් යම් ප්‍රදේශවල වවන්න පුළුවන් දේවල් වවන්න. යම් ප්‍රදේශයක කර්මාන්ත කරන්න පුළුවන් නම්, එම වැඩ පිළිවෙළ හදන්න. ඒ විතරක් නොවෙයි, සේවා සපයන්න පුළුවන් වැඩ පිළිවෙළ හදන්න. ඒ සියලු දේ හදන්න. විපක්ෂය හැටියට අපිත් තමුන්නාන්සේලාට අවශ්‍ය සහයෝගය දෙන්නම්. අපිට ඡන්ද එපා. අපට සල්ලිත් එපා. තමුන්නාන්සේලා එක්ක එකතු වෙලා මේ රටේ දුක් විඳින, මැරෙන මිනිසුන් වෙනුවෙන් උදව් කරන්නම්. විශේෂයෙන්ම ඒ වැඩ පිළිවෙළ හදන්න කියලා, නැවත වතාවක් තමුන්නාන්සේලාට ගෞරවයෙන් කියනවා. මොකද, රටේ මිනිස්සු කන්න නැතුව ඉදිරි කාලයේ මැරෙන්නයි යන්නේ.

අපේ පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින තත්ත්වය ගැන මේ මොහොතේදී මම විශේෂයෙන්ම ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ. මොකද, ඒ ගැන කථා නොකළොත් හොඳ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාව මේ වනකොට ගංවතුරෙන් දැඩි ලෙස පීඩාවට පත් වෙලා සිටිනවා. අද වනකොට සියලු ව්‍යාපාරිකයෝ ගංවතුර නිසා පීඩා විඳිනවා. ලුණු ව්‍යාපාරිකයෝ, ඉස්සන් කර්මාන්තයේ යෙදෙන්නන්, පොල් එකතු කරපු හා පොල් නිෂ්පාදනය කරපු අය, පොඩි පොඩි කර්මාන්තශාලා කරපු අය තවමත් ගංවතුරෙන් පීඩා විඳිනවා. ඒකට යම්කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මොකද, කල්පිටිය ප්‍රදේශයේ එළවලු ගොවියෝ තමයි දවස් 365ම හැම වෙළෙඳ පොළකටම එළවලු ටික එවන්නේ. මේ වනකොට මුළු කල්පිටියම වතුරෙන් යට වෙලා. එළවලු ටික විනාශයි. ඒ නිසා ඒ ප්‍රදේශයේ සියලු දෙනා අද විනාශයි. හරියට කිරලා මැනලා බලන්න. ඒ ගොවියාගේ වගාව විනාශ වෙලා ආදායම් මාර්ගය නැති වුණාම, ඒ ප්‍රදේශයේ සිල්ලර බඩු කඩේ, චින්කලේ, ස්විප් කඩේ මේ සියලු දෙනා බිමට වැටෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ එළවලු ටික මැනිං මාර්කට් එක ඇතුළු මාර්කට්වලට ආවේ නැත්නම් මොකද වෙන්නේ? තමුන්නාන්සේලා නම් හොඳට කයි. එළවලු කිලෝ එකක මිල රුපියල් 1,000ක් වුණත් තමුන්නාන්සේලාට කන්න පුළුවන්. හැබැයි, පැල්පතේ ඉන්න අහිංසක, දුප්පත් මිනිහා මොනවාද කන්නේ? ඒ අයට කන්න දෙයක් නැති වෙනවා. ඒ අයට හාමතේ මැරෙන්න වනවා. ඒ නිසා කරුණාකර ඒවාට වැඩ පිළිවෙළක් හදන්න. දැන් ඔබතුමන්ලාට තිබෙන්නේ අවශ්‍ය වැඩ පිළිවෙළ හදන එකයි. ඒ වැඩ පිළිවෙළ හදද්දී ඔබතුමන්ලා කියනවා නම් අපටත් යම්කිසි කැප කිරීමක් කරන්න කියලා. අපි ඒ කැප කිරීම කරන්න සූදානම්. හැබැයි කැප කිරීම් කරද්දි මතක තබා ගන්න, ඒ කැප කිරීම කරන එකේ ප්‍රතිඵලයක් අපි දකින්න ඕනෑ. ඒ කැප කිරීමේ ප්‍රතිඵලයක් දකින්න නැත්නම් වැඩක් නැහැ.

දැන් බලන්න, ත්‍රී වීලර්වලට කරන්න යන වැඩේ. ත්‍රී වීලර් නියාමනයක් දාන්න යනවා. ත්‍රී වීලර් නියාමනය දාලා, එක ත්‍රී වීලර් එකකට දෙන්න යන්නේ කීයද? ලියා පදිංචි කරපු ත්‍රී වීලර් ගත්තත් එක ත්‍රී වීලර් එකකට ගෙවන්න වෙන්නේ අවුරුද්දකට රුපියල් 750යි.

හැබැයි, මෙතැනදී වෙන් කරන සම්පූර්ණ මුදල ගැන කිව්වාම - රුපියල් මිලියන 70,000ක් කිව්වාම- ඒක ලොකු ගණනක්. ඒ මුදල පත්තරේ පොල් ගෙඩි අකුරෙන් දමලා පෙන්වන්න පුළුවන්. හැබැයි, ත්‍රී රෝද රථ පදවන අපේ සහෝදරයන්ට මා කියනවා, තමුන්නාන්සේලාට හම්බ වෙන්නේ අවුරුද්දකට රුපියල් 750ක් බව. එහෙම කරලා ඊළඟට ගහන්න යන ගේම් එක මොකක්ද? මතක තියා ගන්න, බලාපොරොත්තුවෙන් ඉන්න, නියාමනය කරලා, තමුන්නාන්සේලා ලියාපදිංචි කරගෙන, ඊළඟ අවුරුද්දේ ඉඳලා පාරේ දුවනවාට, අනිවාර්යයෙන් තමුන්නාන්සේලාගෙන් බද්දක් අය කරනවා කියන එක. ඒකට තමයි මේ සූදානම් වෙන්නේ. ඒක තමයි American style එක; American system එක. ඒක තමයි ඉස්සරහට කරන්න හදන්නේ. රුපියල් 750ක් දීලා, රුපියල් 1,500ක්, 2,000ක් අය කරගන්න පුළුවන් වන විධියට වැඩ සලස්වා ඔළුව පැළෙන්න දෙන්නයි හදන්නේ; බඩට ගහන්නයි හදන්නේ. ඒකට සූදානම් වෙන්න කියලා අපි ත්‍රී රෝද රථ පදවන සහෝදරයන්ට කියනවා. ඊළඟට, පාසල් සේවා බස් රථවලටත්, පෞද්ගලික බස් රථවලටත් ඉදිරි කාලයේදී ඒ වැඩේම තමයි කරන්න හදන්නේ. මේ සියල්ල බැලුවාම, වක්‍රව සහ සෘජුව අපේ අහිංසක මිනිසුන්ට ගහන එක තමයි මෙවර අය වැයෙන් සිදු වෙලා තිබෙන්නේ.

අපි ඔබතුමන්ලාට තවත් විශේෂ කාරණා කිහිපයක් කියන්න ඕනෑ. දැන් බලන්න, අලි ප්‍රශ්නය නිසා මිනිස්සු කොච්චර අපහසුතාවට පත් වෙලා තිබෙනවාද කියලා. අලි වැට හදලා, ඒ ජනතාව බේරා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද? ගොවි පොළවල් ටික බේරා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද? ලැබෙන අස්වැන්න අරපරෙස්සම් කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද? මේ අය වැය යෝජනාවලිය තුළ එහෙම වැඩ පිළිවෙළක් දකින්න නැහැ.

ඊළඟට, ඉඩම් කොල්ලය දෙස බලන්න. ඉදිරි කාලයේදී අමාත්‍යාංශවලට අදාළ විෂයයන් ගැන කථා කරද්දී අපි නම්, ගම් එක්ක පෙන්වන්නම්, ඉඩම් කොල්ලකාලා තිබෙන විධිය. මෙතැන කථා කරන සමහර ඇමතිවරු, මහා ඇමතිවරු, සමහර විශාල වැඩකටයුතු භාරගෙන ඉන්න අය කොල්ලකාපු ඒවා අපි ඉස්සරහට පෙන්වන්නම්. හැබැයි, ඒවා නතර කරන්න වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

අපි පරිසරය ආරක්ෂා කිරීම ගැන කථා කරනවා; කැලය ගැන කථා කරනවා. අන්න, පුත්තලම දිස්ත්‍රික්කයෙන් එහා පැත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කය පටන් ගන්න තැන අක්කර ලක්ෂ එකහමාරක විතර භූමි ප්‍රමාණයක කැලය කපනවා, කොම්පැනිවලට මොනවාද වවන්න දෙන්න කියලා. මෙහෙම කැලය කපනකොට, අපේ වන ගහනය අඩු වනකොට ඒ වෙනුවෙන් අපි ළඟ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? හරි නම් ඉස්සර වෙලාම ජාතික වශයෙන් යම් සැලැස්මක් හදලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පෙන්වන්න ඕනෑ, මෙන්න මෙච්චර වන ගහනයක් තිබෙනවා, මෙච්චර ප්‍රමාණයක් කපනවා, හැබැයි අපි ඒ වෙනුවෙන් මෙච්චර ප්‍රමාණයක් හදනවා කියලා. ඒ වැඩ පිළිවෙළ අපට පෙන්වන්න ඕනෑ. හැබැයි, තවම අපට එහෙම වැඩ පිළිවෙළක් පෙන්වා නැහැ. එහෙම වැඩ පිළිවෙළක් පෙන්වන්නේ නැතුව, හැම තැනකම කැලෑ ටික කපලා ඉඩම් ටික කොල්ලකනවා. ඒක සම්පූර්ණයෙන්ම කරන්නේ දේශපාලන කණ්ඩායම්; වෙන කවුරුවත් නොවෙයි. ඒ නිසා විශේෂයෙන් ඒ ගැන බලන්න කියන කාරණය මතක් කරනවා. අඩු ගණනේ ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් දැන් හදන්න බැරි වුණත් පසුව හෝ එවැනි වැඩ පිළිවෙළක් හදලා මේකට එකතු කර ගන්න පුළුවන් නම් ඉදිරි කාලයේදී මේ රටේ ගොඩක් දේවල් ඉතිරි කර ගන්න හැකි වන බව මා කියන්න ඕනෑ.

මේ වන විට අපට තව ප්‍රශ්න රාශියක් එකතු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ ආණ්ඩුව - පොහොට්ටුව පක්ෂයේ ආණ්ඩුව - හදද්දී American system එකට තමයි හැදුවේ. මොකද, එහි අයිතිකාරයත් American කෙනෙක්නේ. ඒ නිසා බලය ගන්න

එනකොටම මේ ගිවිසුම් ටික ගහලාද ආවේ කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඇමෙරිකාවට මේක දෙන්නම්, චීනයට මේක දෙන්නම්, ඉන්දියාවට මේක දෙන්නම්, ජපානයට මේක දෙන්නම්, කොරියාවට මේක දෙන්නම් කියලා සමස්ත ලෝකයටම මේ රට බෙදලා විකුණන වැඩසටහන හදලා, ඒ සැලැස්මත් එක්කද මෙතැනට ඇවිල්ලා වාඩි වුණේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඉදිරි කාලය තුළ ඒ ප්‍රශ්නය ඉතාම බැරෑරුම් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට පිහිටා තිබෙන්නේ, ආසියාවේ මැද. ජාත්‍යන්තර නැව් ගමන් මාර්ගයට ආසන්න හොඳම තැන අපි ඉන්නේ. අපේ රටේ පිහිටීමේ වැදගත්කම මත මේ රටේ දේවල් පිට රටට විකුණන එක නොවෙයි කළ යුතු වැඩේ. මේ රටේ මිනිස්සු ජීවත් කරවන්න, මේ රටේ තරුණ තරුණියන්ට රැකියා දෙන්න, මේ රටේ තරුණ තරුණියන්ගේ බුද්ධියට මේ රටෙත්, ලෝකයෙත් තැනක් හදලා දෙන්න පුළුවන් වැඩසටහනක් සකස් කිරීමයි කළ යුතු වන්නේ. ඒ වෙනුවට මේ රට කෑලි කෑලිවලට බෙදලා විකුණලා, තමන්ගේ සාක්කු පුරවාගෙන, අවුරුදු පහෙන් ගෙදර යන එක නොවෙයි කළ යුතු දේ. එහෙම කරනවා නම්, ඒක මහා ශාපයක් වන බවත් මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 වන තෙක් සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**නියෝජ්‍ය මහ ලේකම්**
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
කරුණාකර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (ප්‍රවාහන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - போக்குவரத்து அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Transport)
"ගරු හර්ෂණ රාජකරුණා මහතා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. HARSHANA RAJAKARUNA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi. You have 18 minutes.

[අ.භා. 1.00]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (ප්‍රවාහන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - போக்குவரத்து அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Transport)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශතවර්ෂයකට පසුව එළැඹි ගෝලීය වසංගතයට අපි අද මුහුණ දී සිටිනවා. වෛද්‍යවරුන්, හෙදියන් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය එම අභියෝගය ජය ගැනීමේ පෙරමුණු බලකාය වී තිබෙනවා. ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ අනෙකුත් රාජ්‍ය සේවකයන් ඒ සඳහා දෙවන පෙරමුණ ගොඩ නැඟුවා. ව්‍යාපාරිකයන් සහ ව්‍යවසායකයන් ලොකු කුඩා භේදයකින් තොරව හැකි උපරිම අයුරින් ජාතික ආර්ථිකය රැක ගත්තා. ඒ සියල්ලටම මනා දේශපාලන නායකත්වයක් ද හිමිව පැවැතුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි ප්‍රතිඵලයක් ලෙස අද අප මෙම ගෝලීය වසංගතයේ තුන්වන රැල්ල ද පරයා ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතභාවයත්, ජාතික ආර්ථිකය නැවත ගොඩ නැඟීමත් සිදු කරමින් සිටිනවා.

2019 නොවැම්බර් 16වැනි දා හැටනවලක්ෂයකට වැඩි ජනතා වරමින් අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත්වීමෙන් අනතුරුව 2020 නොවැම්බර් 17වැනි දින පොදුජන පෙරමුණ රජයේ ප්‍රථම අය වැය ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා මුදල් අමාත්‍යවරයා ලෙස මෙම ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එදින එම අය වැය ඉදිරිපත් කරන මොහොත වන විටත් කොවිඩ්-19 වසංගතයට අප මුහුණ දී සිටි අතර, ඒ වන විට කොවිඩ්-19 රෝගීන් 18,075ක් වාර්තා වී තිබුණා. එපමණක් නොව, අපගේ සහෘද ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත 66ක් කොවිඩ්-19 රෝගය හේතුවෙන් ඒ වන විට අහිමිව තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රජයේ මංගල අය වැය ඉදිරිපත් කළ 2020 නොවැම්බර් 17වන දින සිට අපගේ දෙවන අය වැය ඉදිරිපත් කරනු ලැබූ පසුගිය සිකුරාදා වන විට තවත් කොවිඩ් රෝගීන් 530,709ක් ශ්‍රී ලංකාව තුළ වාර්තා වී තිබූ අතර, තවත් ජීවිත 13,884ක් ද අපට අහිමි වී තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කනගාටුවට කරුණ නම් මෙම ගෝලීය වසංගතයේ දරුණුකම සහ එකී වසංගතය ගෝලීයව මෙන්ම දේශීයව සමාජ, ආර්ථික හා සෞඛ්‍ය පද්ධතියට සිදු කරන ලද බරපතළ තර්ජනය පිළිබඳව විපක්ෂයේ සමහර කණ්ඩායම්වලට තවමත් තේරුම් ගැනීමට නොහැකි වීමයි. කොවිඩ්-19 වසංගතයේ බරපතළ තත්ත්වයෙන් මිදී අද මුළු ලෝකයම නැවත සෞඛ්‍ය මෙන්ම සමාජ ආර්ථිකමය පරිහානියෙන් ක්‍රමක්‍රමයෙන් සුවපත් වීමේ උපාය මාර්ග ගනිමින් සිටිනවා. මුළු ලෝකයම "පසු කොවිඩ් ගෝලීය පෙළගැස්ම" හෙවත් "Post-COVID World Order" ගොඩ නැඟීම පිළිබඳව විශාල කතිකාවක සිටිනවා.

ලෝකයේ බොහෝ රාජ්‍යයන් මෙම වර්ෂයේදී ස්වකීය අය වැය යෝජනා ඉදිරිපත් කරන විට මෙම කාරණය පිළිබඳව සුවිශේෂී සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඉන්දියාවේ මුදල් අමාත්‍ය ගරු නිර්මලා සීතාරාමන් මැතිනිය පසුගිය පෙබරවාරි පළමුවන දා ස්වකීය අය වැය කථාව සිදු කළ අවස්ථාවේදී විශේෂ කාරණයක් ඉස්මතු කළා.

අතීතයේ ලෝක යුද්ධ දෙක අවසානයේ සිදු වූවාක් මෙන් කොවිඩ් වසංගතයෙන් පසුව ද දේශපාලනික, ආර්ථික සහ උපාය මාර්ගික සම්බන්ධතාවල ගෝලීය වෙනස්කම් සිදුවීමේ ලක්ෂණ පෙන්නුම් කරමින් තිබෙන බවත්, එය නව යුගයක ආරම්භයක් බවත් එතුමිය ප්‍රකාශ කළා. එම තර්කය ශක්තිමත් කිරීමට

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය ]

රබින්ද්‍රනාත් තාගෝර් දාර්ශනිකයාගේ කවි පන්තියක් ද ඇය භාවිත කළා. එනම්, “Faith is the bird that feels the light and sings when the dawn is still dark”. එහි අර්ථය නම්, "මේ මොහොතේ අපගේ අනාගතය පිළිබඳව විශ්වාසය කෙබඳුද යත්, හිරු උදා නොවුණ ද අරුණෝදය පිළිබඳව හැඟීම දැනී හිමිදිරි උදෑසන ගී ගයන කුරුල්ලන් වැනිය." යන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළින් හැඟී යන්නේ මුළුමහත් ලෝකයම මේ වසංගතයෙන් මිදෙමින් සිටින විට ගොඩ නැඟෙන නව ආර්ථික පෙළගැස්මේ ස්වකීය ස්ථානය බලාපොරොත්තු සහගතව සොයන බවයි.

එලෙසම එක්සත් රාජධානියේ මුදල් අමාත්‍යවරයා වන ගරු රිෂි සුනක් මැතිතුමා 2021 මාර්තු 03වන දින සිය අය වැය කථාව ඉදිරිපත් කරමින් පවසා සිටියේ ඔවුන්ගේ ආර්ථිකය අවුරුදු 300කට පසු සියයට 10කින් හැකිළී ගිය බව සහ ලෝක යුද්ධ වකවානුවෙන් පසුව වැඩියෙන්ම ණය ගැනීමට සිදු වූ වකවානුව මෙම කොවිඩ් වසංගත වකවානුව වන බවයි. එලෙසම, ඔහු 2021 ඔක්තෝබර් 21වන දා සිය අය වැය පිළිබඳ සමාලෝචන කථාවේදී පවසා සිටියේ, ඔවුන්ගේ අය වැය පසු කොවිඩ් තත්ත්වය හමුවේ නව ආර්ථික ප්‍රවේශයක් ලබා ගැනීමට ආරම්භයක් ලබා දෙන බවයි.

ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් මෙම වර්ෂයේ අය වැය සකස් කරන්නේ කොවිඩ් වසංගතය හේතුවෙන් හානියට පත් වූ ස්වකීය සමාජ, ආර්ථික, අධ්‍යාපනික සහ සෞඛ්‍ය බිඳවැටීම් යථා තත්ත්වයට පත් කර ගැනීමට මිස ආකර්ෂණීය සහන පැකේජ ලබා දීමට නොවන බව සනාථ කිරීමට ඕනෑ තරම් ජාත්‍යන්තර නිදර්ශක අපට මෙම සභාවේ ගෙනහැර දැක්විය හැකියි.

බොහෝ රාජ්‍යවල ආණ්ඩු පක්ෂයට මෙන්ම විපක්ෂයට ද කොවිඩ්-19 වසංගතයෙන් පසු ගොඩනඟන ලෝක ආර්ථික පෙළගැස්ම තුළ ස්වකීය රාජ්‍ය ස්ථානගත කළ යුත්තේ කෙසේද යන්න සහ ඒ සඳහා වන සමාජ ආර්ථික හා සෞඛ්‍ය උපාය මාර්ග කවරේද යන්න පිළිබඳව දැක්මක් සහ වැඩ පිළිවෙළක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝලීය තත්ත්වය එසේ තිබියදී මෙම අය වැය මඟින් කොවිඩ්-19 වසංගතය මෙරටට සිදු කරන ලද බරපතළ සමාජ, ආර්ථික හානිය ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට එහා ගිය සුවිශේෂී තත්ත්වයක් ද පෙන්නුම් කරනවා. ලෝකයේ අනෙකුත් රටවල මෙම වකවානුවේදී ඉදිරිපත් කරන ලද අය වැයවලට එහා ගොස් වැටුප් විෂමතා ඉවත් කිරීම, ජනතා සහන ලබාදීම මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ද ප්‍රමුඛතාවක් ලබා දීම අතිශය සුවිශේෂී තත්ත්වයක්.

මෙම අය වැය කොවිඩ් වසංගතයෙන් විනාශ වූ ජාතික ආර්ථිකය නැවත ප්‍රකෘතිමත් තත්ත්වයට පත් කිරීමේ අය වැයක් විය යුතු බවට අප පවසා සිටින්නේ ඇයි? කොවිඩ් වසංගතයෙන් මේ රටට වූ ජාතික ආර්ථික පරිහානිය පිළිබඳව මඳක් සිතන්න. 2021 ඔක්තෝබර් 31 වනවිට රජය කොවිඩ් එන්නත් ගෙන්වීම සඳහා පමණක් රුපියල් බිලියන 66.4ක් වියදම් කර තිබෙනවා. එය අපගේ ආර්ථිකයට සිදු වූ අනපේක්ෂිත වියදමක් නොවේද? එලෙසම, 2021 ඔක්තෝබර් 31වන දින වනවිට රජය විසින් මෙරටට PCR පරීක්ෂණ කට්ටල 7,392,603ක් ද, Rapid Antigen Tests කට්ටල 12,642,020ක් ද ගෙන්වා තිබෙනවා. එපමණක් නොව, කොවිඩ්-19 තුන්වන රැල්ලේ අවදානම වැඩි වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කෙරෙන ඔක්සිජන්වලට අමතරව තවත් ඔක්සිජන් කිලෝග්‍රෑම් 1,161,340ක ප්‍රමාණයක් විදේශයෙන් ගෙන්වීමටද සිදු වුණා. මේවා අප වැනි කුඩා රටක ආර්ථිකයකට දරන්න පුළුවන්ද? සෞඛ්‍ය අමාත්‍යාංශයට කොවිඩ්-19 මර්දනය සඳහා පමණක් රාජ්‍ය ආදායමෙන් රුපියල් බිලියන 117ක් 2020 වර්ෂයේදීත්, රුපියල් බිලියන 164ක් 2021 වර්ෂයේදීත් වෙන් කර වියදම් කරනු ලැබුවා. මෙවැනි වියදමක් අපගේ ආර්ථිකයට දැරීම අතිශය අපහසු බව අප සියලුදෙනාම පිළිගත යුතුයි. ඒ විතරක් නොවෙයි, 2020 මාර්තු 19වෙනි දා මධ්‍යම රාත්‍රිය වන විට අපගේ සියලු ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් වසා දැමුවා. ගුවන් තොටුපොළවල් නැවත විවෘත කෙරුණේ මාස 10කට පසුව 2021 ජනවාරි 21වන දිනයි. නැවතත් 2021 මැයි 21 සිට වසා දැමුණු ගුවන් තොටුපොළවල් නැවත විවෘත කෙරුණේ 2021 ජූනි 01වෙනි දායි. මෙය අපගේ ජාතික ආර්ථිකයට මරු පහරක් නොවේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතක් වනතුරු පැවති සංචරණ සීමා, පළාත් සංචරණ සීමා, සෞඛ්‍ය මාර්ගෝපදේශ සීමාවලට අමතරව සම්පූර්ණ වශයෙන් රට වසා දැමීමට අවස්ථා තුනකදී අපට සිද්ධ වුණා. එයට අමතරව බස්නාහිර පළාත ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක් මාස ගණනාවක් වසා දැමීමට සිදු වුණා. මෙය රටේ ජාතික ආර්ථිකයට මරු පහරක් නොවේද? එපමණක් නොව රට වැසීම හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාවට අවස්ථා හතරකදී රුපියල් 5,000 බැගින් සහනාධාරයක් ලබා දෙන්න රජයට සිදු වුණා. ඒ සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුවෙන් පමණක් රජය වැය කළ සමස්ත මුදල රුපියල් මිලියන 72,678ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ලාංකීය ආර්ථිකයට වූ හානිය මෙපමණ යැයි ගණනය කිරීමට නොහැකි තත්ත්වයකට පත් වී තිබෙනවා. 2019 වර්ෂයේ කිසිදු ගෝලීය වසංගතයක් නොමැතිව ඊනියා යහ පාලන ආණ්ඩුවේ ආර්ථික වර්ධන වේගය වුණේ සියයට 2.26යි.

කොවිඩ්-19 වසංගතයෙන් හානියට පත් වූ ජාතික ආර්ථිකය ගොඩ ගැනීමේ රජයේ දර්ශනය අතිශය පැහැදිලියි. එහි පළමු පියවර, සියලු අභියෝග ජය ගනිමින් රටේ ජනතාව එන්නත්කරණය කර රටේ සමාජ, ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමයි. අද රටේ ජනගහණයෙන් සියයට 65ක් අප පූර්ණ එන්නත්කරණයට ලක් කර තිබෙනවා. සියයට 75කට ආසන්න ප්‍රමාණයකට පළමු එන්නත ලබා දී තිබෙනවා. එය ලෝකයේ දියුණුම රටවල එන්නත්කරණ ප්‍රගතියට සමාන තත්ත්වයක්. ඒ වාගේම තුන්වන එන්නත් මාත්‍රාව ලබා දීම ද අප රජය ආරම්භ කර තිබෙන බව මහත් අභිමානයෙන් යුතුව පවසා සිටිනවා.

එලෙස සුවපත් වන දේශය ගොඩනඟන අපගේ අනෙක් උපාය මාර්ගය වනුයේ, ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා පසු ගිය සිකුරාදා ඉදිරිපත් කරන ලද ඇය වැයයි. මෙවර අය වැය තුළ පසු කොවිඩ් ආර්ථිකය ගොඩ නැඟීමේ ක්‍රියාවලිය උදෙසා ගන්නා ලද පියවර කිහිපයක් තිබෙනවා. ඒ අනුව, ග්‍රාමීය ජනයාගේ ජීවනෝපාය සහ යටිතල පහසුකම් නැවත යථා තත්ත්වයට පත් කිරීම පමණක් නොව, පැවති තත්ත්වයටත් වඩා ඔසවා තැබීම සඳහා සාධනීය පියවර ගෙන තිබෙනවා. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූවන්ට සහන සැලසීම මෙම අය වැයෙහි තවත් ප්‍රධාන ලක්ෂණයක්. විදේශ විනිමය ඉහළ නැංවීම සඳහා වන නිෂ්පාදන ආයෝජන කලාප බිහි කිරීම මෙම අය වැයෙහි ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස මා දකිනවා. කොපමණ ආර්ථික අභියෝග පැවතියත් මෙම අය වැය තුළින් යටිතල පහසුකම් ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති පියවර සුවිශේෂීයි. සැමට පානීය ජලය, වාරි සෞභාග්‍යා, මාර්ග සංවර්ධනය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ නිවාස හා නාගරික සංවර්ධනය වෙනුවෙන් සුවිශේෂී ප්‍රතිපාදන වෙන් කර තිබීම කොවිඩ්වලින් පසුව ගොඩ නැඟෙන රටෙහි යහපත් මහජන සේවයක් ලබාදීමට අවශ්‍ය පදනම නිර්මාණය කරනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා නිදහසින් පසු ලාංකීය ඉතිහාසයේ වැඩිම ප්‍රතිපාදන මෙම අය වැයෙන් වෙන් කර තිබීම සුවිශේෂී කාරණයක්. සමස්ත රාජ්‍ය වියදමින් සියයට 6කට වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනයට වෙන් කරන ලෙස ඉල්ලා ශිෂ්‍යයන්, කථිකාචාර්යවරු, ගුරුවරුන් සහ වෘත්තිකයන් පසු ගිය දශක ගණනාවක් තිස්සේ අරගල කළා. එහෙත් කිසිදු ආණ්ඩුවක් ඒවාට සවන් දුන්නේ නැහැ. එසේ වුවත්, කොවිඩ් -19 වසංගත අභියෝගය හමුවේ පවා අධ්‍යාපන ක්ෂේත්‍රයට සමස්ත රාජ්‍ය වියදමෙන් සියයට 7.4ක් වෙන් කිරීම පිළිබඳව අප ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ සියල්ල සිදු කිරීම සඳහා බදු ප්‍රතිපත්තිය සැකසීමේදී සාමාන්‍ය ජනතාවට බරක් නොවන පරිදි, සුපිරි ආදායම් ලබන්නන් සහ පහළ ආදායම් ලබන්නන් අතර පරතරය අවම කරමින්, බදු අය කර ගැනීමේ ප්‍රතිපත්තිය සැකසීම මෙම අය වැයෙහි සුවිශේෂී ප්‍රවේශයක්.

මේ සියල්ලටම අමතරව ගැබිනි මව්වරුන්ට ලබා දෙන පෝෂණ මල්ල මාස 10කට සීමා නොකර අවුරුදු 2ක් දක්වා දීර්ඝ කිරීමට ගරු මුදල් අමාත්‍යතුමා ගත් තීරණය මා අතිශය අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව කොවිඩ් ආර්ථික අභියෝග ජය ගැනීමත්, ඉහළ ග්‍රාමීය සංවර්ධනයක් සිදුවීමත්, පොදු ජනයාට සහන ලබාදීමත්, බහුතරයක් වූ රටේ සාමාන්‍ය පොදු ජනතාව සෘජු බදුවලින් නිදහස් කිරීමත් තුළින් මෙම අය වැය ඓතිහාසික ජනතාවාදී අය වැයක් බවට පත් වෙනවා. ඒ නිසාම අද විපක්ෂය දේශපාලනික වශයෙන් අපේක්ෂා භංගත්වයට පත් වී තිබෙනවා.

මෙම අය වැයෙන් පසුව විපක්ෂය යොදා ගැනීමට බලාපොරොත්තු වූ බොහෝ සටන් පාඨ අද නිෂේධනය වී තිබෙනවා. එබැවින්, මෙම ජනතාවාදී අය වැයේ ඉදිරි ප්‍රතිඵල සමඟ අපගේ විපක්ෂනායකතුමා මහත් බලාපොරොත්තුවෙන් සිටින මැතිවරණයකදී නැවතත් එතුමා හමුවීමේ බලාපොරොත්තුව සහිතව මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.15]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - காணி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Lands)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැය ගැන කථා කරනකොට ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, අපේ රටේ විශාල ආර්ථික අර්බුදයක් තිබෙන වෙලාවක මෙම අය වැය ගෙන ආ නිසා. ඒ ආර්ථික අර්බුදය නිර්මාණය වෙන්න, ඒ ආර්ථික අර්බුදය ඇති වෙන්න හේතු කිහිපයක් තිබුණා. අපි දන්නවා, පසුගිය යහ පාලන ආණ්ඩුව අවසන් වී ගෙන යන කාලය තුළ මහ බැංකු කොල්ලයත් එක්ක විශාල වශයෙන් අපේ රටේ බැංකු පද්ධතිය කඩාගෙන වැටුණු බව. බැංකු ගැන තිබෙන විශ්වාසය ඇන හිටියා. ඒ නිසා අපේ රටට ව්‍යවසායකයන් පැමිණීම යම්කිසි ප්‍රමාණයකින් අඩු වුණා. ඒ වාගේම, යහ පාලන ආණ්ඩුවේ අවසාන කාලයේ දී සහරාන්ගේ බෝම්බ සිද්ධියත් එක්ක අපේ රටේ සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා. මේක අපි පැහැදිලිවම දන්නා කාරණයක්. සංචාරක ව්‍යාපාරයෙන් අපේ රටට ලැබුණු රුපියල් බිලියන 4.5ක් පමණ ආදායම සම්පූර්ණයෙන් ඇන හිටියා. ඒ විතරක් නොවෙයි. එම කාල පරිච්ඡේදය තුළ අපේ ජාතීන් අතර අවිශ්වාසය ඇති වෙලා, නොයෙකුත් ප්‍රශ්න පැන නැඟිලා, රට ඉතා ව්‍යාකූල තත්ත්වයකට පත් වුණ අවස්ථාවක තමයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රටේ නායකයා හැටියට පත් වෙලා අපි ආණ්ඩුව හැදුවේ. එතුමා පත් වෙලා කෙටි කාලයක් තුළ -මාසයක හමාරක කාලය තුළ- කොරෝනා වසංගතය පැමිණියා. ඒක නිදහසට කාරණයක් නොවෙයි. මුළු ලෝකයේම හැම රටකම -ලොකු රටවල්, මධ්‍යම ප්‍රමාණයේ රටවල්, කුඩා රටවල්, දූපත් - මේ කොරෝනා වසංගතය පැතිරුණා.

කොරෝනා වසංගතයත් එක්ක අපේ රටේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම ආර්ථිකය කඩාගෙන වැටුණා කියන එක අපි කවුරුත් දන්නා කාරණයක්. අපේ විදේශ සංචිත අපට නැතුව ගියා; විදේශ සංචිත අඩු වුණා. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු ඒ විශාල මුදල අපට නැති වුණා. ඒ වාගේම අපේ විදේශ ශ්‍රමිකයන්ගෙන් අපට ලැබෙන විදේශ ආදායම් අපට අඩු වුණා. ඒ විතරක් නොවෙයි. ඒ අය වෙනුවෙන් අපට වියදම් කරන්න සිද්ධ වුණා. සියලු රටවල සිටින ශ්‍රී ලාංකිකයන් අපට ගෙන්වන්න සිද්ධ වුණා. ඒ අය ගෙන්වා ගෙන, ඒ අයට වියදම් කරන්නත් අපට සිද්ධ වුණා. ඒ වාගේම මාස ගණනක් රට වහලා තිබුණා. මාස 2, 3ක් සම්පූර්ණයෙන්ම රට lockdown කරලා තිබුණා. විටින් විට රට වහන්න සිද්ධ වුණා. කර්මාන්තශාලා විශාල වශයෙන් අඩපණ වුණා; වැහුණා. ඒ වාගේම අපේ අපනයන ආර්ථිකය කඩා වැටුණා.

ඒ සියලු දේවල් දිහා බැලුවාම, රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන වෙලාවක තමයි අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට 2022 වර්ෂය සඳහා මේ අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ. 1948න් පස්සේ මුදල් ඇමතිවරයකු අභියෝගවලට මුහුණ දුන්නා නම්, මේ අය වැය තමයි ඒ අභියෝගය කියන එක අපි කියන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත්, බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉතා දක්ෂ පුද්ගලයකු හැටියට අපි දකිනවා. එතුමා හැර වෙන කෙනෙකුට මේ වැඩේ කරන්න බැරි තත්ත්වයක් පැන නැඟිලා තිබුණා. ආර්ථිකය ඍණ පැත්තට ගිහිල්ලා තිබෙන වෙලාවක තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම නිසා දෙන්න පුළුවන් පහසුකම් එතුමා ජනතාවට දීලා තිබෙනවා. අපේ රටේ හිටපු දක්ෂ මුදල් ඇමතිවරයෙකු තමයි, ආචාර්ය ඇන්. ඇම් පෙරේරා මැතිතුමා. එතුමා හිටියා නම් මේ අය වැය පිළිබඳව බැසිල් රාජපක්ෂ මැතිතුමාට ප්‍රශංසා කරනවා, මෙවැනි අය වැයක් ගෙනාවේ කොහොමද කියන එක ගැන.

අපේ රටේ ජනතාවට විශාල වශයෙන් සහන සලසන්න අවශ්‍යයි. සහන සලසන්න අවශ්‍ය වුණත්, භාණ්ඩාගාරයේ සල්ලි නැත්නම්, අපට විදේශ විනිමය එන්නේත් නැත්නම් මොකක්ද කරන්නේ? මේවා පසුගිය අවුරුදු එකහමාරෙන් දෙකෙන් අපි කරපු දේවල් නොවෙයි. පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ සිට ගලාගෙන ආ ආර්ථිකය කඩා වැටීමේ තත්ත්වය තමයි කොරෝනා වසංගතයත් එක්ක තහවුරු වුණේ.

රාජ්‍ය සේවකයන්ට පඩි වැඩි කරනවා නම් අපි හරි කැමැතියි. ඒ ගොල්ලෝ සතුටු වෙනවා නම් අපි හරි කැමැතියි. පුළුවන් තරම් බඩු මිල අඩු කරලා ජනතාවට සහන සලසන්න පුළුවන් නම් කවුද අකැමැති? ඒකට ආණ්ඩු පක්ෂයේ අපි අකැමැති වෙන්නේ මොකටද? ඒකට අපි කවුරුත් කැමැතියි. නමුත්, තිබෙන ආර්ථික තත්ත්වය ලෝක ආර්ථික තත්ත්වයත් එක්ක ගැට ගැහිලා තිබෙන්නේ.

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා ]

අද බලන්න, අපේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩවල හැර අනෙක් සියලු භාණ්ඩවල මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. ලෝකයේ හැම තැනකම එහෙමයි. සිමෙන්ති, ගෑස්, ඩීසල්, පෙට්‍රල් ඇතුළු ඉන්ධන වර්ග වාගේම, පිට රටින් අපේ රටට ගොඩබාන සෑම භාණ්ඩයකම මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. කාලයක් තිස්සේ රජය විශාල වැය බරක් දරමින් පෙට්‍රල් සහ ඩීසල් අඩු මුදලට ලබා දුන් බව අපි දන්නවා. අදටත් අපි ජනතාවට ඒ සහන දෙමින් පවතිනවා. අදටත් ඒ කටයුතු විශාල වශයෙන් කෙරෙනවා.

විශේෂයෙන්ම ඒ අතරතුර අපි විශ්‍රාමිකයන් ගැනත් සොයා බලා තිබෙනවා. ඒ වාගේම කාන්තා පක්ෂය ගැනත් සොයා බලා තිබෙනවා. අපේ රටේ පරිසරය ආරක්ෂා කරන්න වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා. වන සංරක්ෂණය සහ වන අලි ප්‍රශ්න විසඳීම සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. වාරිමාර්ගවලට සහ කෘෂිකර්මය සඳහාත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. හැම අංශයකම වාගේ සංවර්ධනය සඳහා යම් කිසි මුදලක් වෙන් කර තිබෙනවා. චීනයේ කියමනක් තිබෙනවා, බඩගින්න හැදුනාම බිලී පිත්තක් අතට දෙන්න කියලා. මුදල් ඇමතිතුමා අපේ ජනතාව බඩගින්නේ තියන්නේ නැතුව බිලී පිත්තක් විතරක් නොවෙයි, යම් කිසි ප්‍රමාණයකින් කන්නත් දීලා තිබෙනවා. මුදල් ඇමතිතුමාගේ දක්ෂකම නිසා ජනතාවට ඒ දෙකම දීලා තිබෙනවා. අපි දන්නවා, 2022 වර්ෂය කියන්නේ අපේ රට සංවර්ධනය කෙරෙන වර්ෂය බව. ග්‍රාම නිලධාරි වසම් දාහතරදහස් ගණනම සංවර්ධනය වෙනවා. ග්‍රාම නිලධාරි වසම් දාහතරදහස් ගණනේම පාරවල් කාපට් වෙනවා. අපි ඒ සෑම ග්‍රාම නිලධාරි වසමකම වැව් අමුණු ටික හදනවා. හැම ග්‍රාම නිලධාරි වසමකම ස්වයං රැකියා අවස්ථා ඇති කරනවා. කාබනික පොහොර නිෂ්පාදනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මේ වාගේ යටිතල පහසුකම් සංවර්ධනයත් එක්කම 2022 වර්ෂය අවසානය වන විට අපි නොහිතන ආර්ථික සංවර්ධනයක් මේ අය වැයත් එක්ක අපේ රටට ලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ගාමිණී ලොකුගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.23]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (විදුලිබල අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - மின்சக்தி அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Power)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැය ගැන කථා කරනකොට, අද අපේ රටේ තත්ත්වය පිළිබඳවත්, ලෝකයේ තත්ත්වය පිළිබඳවත් කල්පනා කරන්න ඕනෑ. මම කථා කරන මොහොතේ ගරු මුදල් ඇමතිතුමාත් මේ සභාවට පැමිණීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා.

අපේ රට අභ්‍යන්තර සහ බාහිර අභියෝග රැසකට මුහුණ දෙන අවස්ථාවක මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරන ලද මෙම අය වැය, ශ්‍රී ලංකාව සමෘද්ධිමත් දේශයක් බවට පත් කිරීමට ගත් කාලෝචිත අය වැයක් ලෙස සඳහන් කිරීමට මා කැමැතියි. එහෙම කියන්න එක හේතුවක් තිබෙනවා.

තමුන්නාන්සේලා සියලුදෙනාම දන්නවා, දෙවන ලෝක යුද්ධයේදී සහ පළමුවන ලෝක යුද්ධයේදී මිය ගිය පිරිසට වැඩි පිරිසක් අද කොවිඩ් අර්බුදය නිසා මිය ගිහිල්ලා තිබෙන බව. අපේ රට වාගේ නොවෙයි, ලෝකයේ බලවත්ම රාජ්‍යයන් වන ඇමෙරිකාව ගත්තත්, රුසියාව ගත්තත්, අනෙකුත් යුරෝපීය රටවල් ගත්තත් ඒ රටවල ජනතාවත් දහස් ගණනින් මිය ගිහිල්ලා තිබෙනවා. මොන තරම් තාක්ෂණය තිබුණත්, විද්‍යාව තිබුණත්, විවිධ ආයතන තිබුණත්, ඒ එකකින්වත් එම මරණ ප්‍රමාණය නවත්වාගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. ශ්‍රී ලංකාව පැත්තෙන් බලනකොට අපි සන්තෝෂ වෙන්නේ, අපේ රටේ ඒ තරම් සම්පත් නොතිබුණත්, මේ මොහොත වන විට අපේ රටේ කොවිඩ් වසංගතයේ යම් කිසි පාලනයක් ඇති කරන්න පුළුවන් වෙලා තිබීම නිසායි.

මුල්ම කොවිඩ් රෝගියා හමු වූ අවස්ථාවේදී අපි ඔක්කෝම බය වුණා. එම රෝගියා ගමන් කළ වාහනය පැදවූ රියැදුරු මහත්මයා සිටියේ මගේ ගමට අල්ලපු ගමේ, මත්තේගොඩ. ඔහුගේ පුතා ගියේ Ananda College එකට. මේක ආරංචි වුණාම, ඒ වෙලාවේ Ananda College එකේ හිටපු ඔක්කෝම දරුවන්ගේ දෙමව්පියන් තම දරුවන් ගෙවල්වලට ගෙනයන්න පටන් ගත්තා. රජයට සිද්ධ වුණා, ඉස්කෝල වහන්න. නමුත්, චීන ජාතික ඒ නෝනා මහත්මිය කොවිඩ් සනීප වෙලා ගෙදර යනකොට, අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමියත් ගිහිල්ලා එතුමියට සුබ පැතුවා. අපි හිතුවා, කොවිඩ් අර්බුදය එතැනින් අවසන් වෙයි කියලා. නමුත්, ඒක එතැනින් අවසන් වුණේ නැහැ. ඊට පසු දවසින් දවස විවිධ ආකාරයේ ප්‍රභේදවලින් මෙම වයිරසය ඇවිල්ලා සිංහල අලුත් අවුරුදු රැල්ලත් එක්ක තෝරා බේරා ගන්න බැරි තරම් වේගයකින් කොවිඩ් අර්බුදය රට පුරා පැතිරිලා දවසකට රෝගීන් 3,000ක්, 3,500ක් පමණ හමුවන තත්ත්වයට පත් වුණා.

නමුත්, අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව ගත් උත්සාහය නිසා අපට පුළුවන්කම ලැබුණා, ලංකාවේ ජනගහනයෙන් සියයට 70කට අවශ්‍ය එන්නත් ලබා දෙන්න. මේ ගරු සභාවේදී විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු කිව්වේ, "අන්තිම පුද්ගලයාට එන්නත දෙනකම් අපි එන්නත ගන්නේ නැහැ" කියලායි. හැබැයි, කොවිඩ් වැලඳී රෝගී තත්ත්වයට පත් වුණාට පසු විපක්ෂ නායකතුමාටත් ඒ එන්නත් මාත්‍රා දෙකම ගන්න සිද්ධ වුණා. අද විපක්ෂයේ සිටින සියලුදෙනා එන්නත් මාත්‍රා දෙකම අරගෙන ඉන්නේ. නැත්නම් ඒක බොහොම අඩු පාඩුවක්. හැබැයි, තමුන්නාන්සේලා මේ ගරු සභාවේදී කථා කළේ එහෙම නොවෙයි.

එසේ එන්නත් ලබා දීම නිසා පසුගිය සතිය වෙනකොට අපේ රටේ හඳුනා ගත් කොවිඩ් රෝගීන් ගණන 500ට අඩු වෙලා තිබුණත්, මේ සතිය බලනකොට එම ප්‍රමාණය 600ට වඩා වැඩි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට ඕනෑ තරම් උද්ඝෝෂණ කරන්න පුළුවන්. හැබැයි, කොවිඩ් රෝගීන් බෝ කරන්න එපා කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

මේ රටේ ප්‍රශ්න රාශියක් තිබුණා. තමුන්නාන්සේලා හිතුවා, මේ ප්‍රශ්න නිසා තමුන්නාන්සේලාට ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන් වෙයි කියලා. මේ ප්‍රශ්න ඇති වුණේ, තමුන්නාන්සේලාගේ කාලයේ ඇති වූ ප්‍රශ්න නිසායි. දැන් ගුරුවරුන්ගේ ප්‍රශ්න ගැන කථා කරනවා. ගුරු සේවය ගත්තාම, අපි අදත් හිටපු අමාත්‍ය ගරු රිචඩ් පතිරණ මැතිතුමා ගැන මතක් කරන්න කැමැතියි. ගුරු ශ්‍රේණි ක්‍රමය ආරම්භ කළ වෙලාවේ අපේ ගුරුවරු සියලුදෙනාට විශාල පඩි වැඩිවීමක් සිදු වුණා. එසේ පඩි වැඩිවීමක් සිදු වූ නිසා තමුන්නාන්සේලාගේ කාලයේ රජයේ සේවකයන්ගේ පඩි සංශෝධනය කරනකොට, ගුරුවරුන්ගේ පඩිය සංශෝධනය

කළේ නැහැ. එම නිසා ඒ ප්‍රශ්නය දිගටම ඔබ්බ දුවගෙන ආවා. යහ පාලන ආණ්ඩුවේ කවුරුවත් ඒ ගැන කථා කළේ නැහැ. නමුත්, අපි විපක්ෂයේ ඉන්නකොට අපේ ගුරු සංගම් කිව්වා, "සැලසුම් හදනකොට මෙහෙම අඩු පාඩුවක් වෙලා තිබෙනවා, ඒක නිවැරදි කරන්න ඕනෑ" කියලා. ඒ ගුරු සංගම්වල කීම අපි පිළිගත්තා. අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා, අපේ පක්ෂයේ ජාතික සංවිධායක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අපි මැතිවරණ ප්‍රකාශනයට ඒක ඇතුළත් කළා, "මේ විෂමතාව අපි නිවැරදි කරනවා" කියලා. එසේ ඇතුළත් කළා විතරක් නොවෙයි. අපේ ආණ්ඩුවක් බලයට පත් වෙලා අමාත්‍ය මණ්ඩලය පත් වීමෙන් පසු ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කල්පනා කළා, මේ කටයුත්ත කරන්න ඕනෑ කියලා. ඒ අනුව කමිටුවක් පත් කළා. නමුත්, ඒ කමිටුව පත් කරන මොහොත වෙනකොට කොවිඩ් අර්බුදය ඇවිල්ලා අපේ රටේ ආර්ථිකය බොහොම විශාල අභාග්‍යයකට පත් වුණා. අන්න ඒ අවස්ථාවෙන් තමුන්නාන්සේලා ප්‍රයෝජන ලබා ගත්තා. තමුන්නාන්සේලා හිතුවා, ආණ්ඩුව පෙරළන්න පුළුවන් වෙයි කියලා. ස්ටාලින්ලා, ජයසිංහලා ඒකෙන් ප්‍රයෝජන ගත්තා. නමුත්, අපි ආණ්ඩුවක් හැටියට ප්‍රතිපත්තිමය තීන්දුවක සිටියා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳීම සඳහා මේ අය වැය ලේඛනය තුළින් තවත් රුපියල් මිලියන 30,000ක් වෙන් කර තිබීම ගැන. ඒක තමයි අපේ ආණ්ඩුවේ හැටි.

තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නේ, පොහොර නැති නිසා ගොවීන් එකතු වුණොත් ආණ්ඩුව පෙරළන්න පුළුවන් කියලායි. ඒක අපි ඉදිරියේදී බලමු. තමුන්නාන්සේලාට ඡන්දයක් ඉල්ලන්න බලයක් නැහැ. අද මේ රටේ පළාත් සභා ඡන්දය නැත්තේ ඇයි? එහෙම වුණේ තමුන්නාන්සේලා කළ කැත වැඩේ නිසායි. එදා කරු ජයසූරිය මහත්මයා කථානායකවරයා වශයෙන් සිටියදී පාර්ලිමේන්තුවේ කටයුතු කල් තියන්න තිබුණේ සවස 4.30ට. නමුත්, පක්ෂ නායක රැස්වීමක්වත් මොකුත් නැතුව රාත්‍රි 10.00 වෙනකම් පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වාගෙන ගිහිල්ලා තමුන්නාන්සේලා සුළු ජාතීන්ගේ ප්‍රශ්නවලට අදාළ ඒ පනත සංශෝධනය කළ නිසා අද ඒ මැතිවරණය පවත්වන්න විධියක් නැති වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා පුළුවන් නම් කියන්න අද පළාත් සභා මැතිවරණය පවත්වන්න පුළුවන් කියලා. එහෙම කරන්න බැහැ. ඒ, තමුන්නාන්සේලා කළ කැත වැඩේ නිසායි. තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. අද මේ රටේ පළාත් සභා මැතිවරණ පවත්වන්න පුළුවන්කමක් නැහැ. සුළු ජාතික පක්ෂ තමයි පළාත් සභා ඕනෑ කිව්වේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් සිටියදී උතුරු සහ නැඟෙනහිර පළාත්වල පළාත් සභා මැතිවරණ පැවැත්වූවා. පවත්වලා, ඒ පළාත් පාලනය කරන්න ඔවුන්ට බලය දුන්නා. අපි පක්ෂයක් හැටියට හැම දාම පිළිගන්නවා, ඡන්ද බලයෙන් පත් වූ ආණ්ඩුවක් තමයි තිබිය යුත්තේ, ආයුධවලින් පත් වූ ආණ්ඩුවක් නොවෙයි කියලා.

ඒ නිසා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට යුද්ධය අවසන් කරන්න කටයුතු කළේ. තමුන්නාන්සේලා බැලුවේ යුද්ධය අවසන් කළාම අපේ හමුදා නිලධාරින් ඔක්කොම ජිනීවාවල යුද අධිකරණයට ගෙන යන්නයි. එහෙම කටයුතු කළ කණ්ඩායමක් තමයි තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා ජිනීවා ගැන අද මොකද කියන්නේ? තමුන්නාන්සේලා ඇමෙරිකාව ගෙනාපු යෝජනාව ඒකපාර්ශ්විකව සම්මත කරලා මොකද කළේ? අපේ අහිංසක සොල්දාදුවන් හිරේ දමන්නයි තමුන්නාන්සේලා කල්පනා කළේ. අද තමුන්නාන්සේලා ගොවියා ගැන කථා කරනවා. නමුත් රට බේරා ගත් හමුදා නිලධාරියා -හමුදා සොල්දාදුවා- ගැන කථා කරන්නේ නැහැ. සජිත් ප්‍රේමදාස මහත්මයා ඒ ගැන කථා කරනවා. ඒ ගැන මම බොහොම කනගාටු වනවා. ඒ කාලයේ මමත් හිටියේ සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තාගේ ආණ්ඩුවේ. උතුරු - නැඟෙනහිර පළාතේ ටීඑන්ජී එකත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා, අපේ සොල්දාදුවන් -හමුදා නිලධාරින්- 700ක් එක තැන මරා දමන්න ඉඩ දුන්නා. අද ඒ ගැන කථා කරනවාද තමුන්නාන්සේලා කවුරු හරි? විපක්ෂ නායකතුමා කථා කරනවාද? අඩු ගණනේ "අපට කනගාටුයි" කියලා කියනවාද? නැහැ.

ඒ වාගේ බරපතළ අඩුපාඩුකම් කරපු ආණ්ඩුවක් තමයි ඒ ආණ්ඩුව. ඒ නිසා තමයි අපි එක්සත් ජාතික පක්ෂය අත්හැරලා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක එකතු වුණේ මේ රටේ යුද්ධය අවසන් කරලා රටට සාමය ඇති කරන්න. අපි අදත් ඒ ගැන සන්තෝෂ වනවා. තමුන්නාන්සේලා කළේ මොකක්ද? මේ රටට නිදහස ලබා දුන්නු ඩී.එස්. සේනානායක මැතිතුමා හදපු පක්ෂය එකම ආසනයක්වත් නැති පක්ෂයක් බවට පරිවර්තනය කරපු එක තමයි තමුන්නාන්සේලා කළේ. ඒකට තමුන්නාන්සේලා ඔක්කොම වග කියන්න ඕනෑ. මේ රටේ තිබුණු පැරණිම දේශපාලන පක්ෂය, පාර්ලිමේන්තුවට එක මන්ත්‍රීවරයෙකුවත් ගෙනෙන්න බැරි තත්ත්වයට පත් වුණා. ඒ, තමුන්නාන්සේලා කරපු වැරැදි නිසායි. තමුන්නාන්සේලා දැන් ආණ්ඩුවක් පිහිටුවන්න එන්නේ ඒ වාගේ අපරාධ කරපු පක්ෂයක් හැටියට.

අපි මේ ආණ්ඩුවට වාගේම බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙන්නේ, කොවිඩ් අර්බුදය නිසා අසහනයට පත් වෙච්ච හැම කෙනෙකු පිළිබඳවම මෙවර අය වැය ලේඛනයෙන් බලා තිබෙන නිසායි. කොවිඩ් අර්බුදය නිසා මේ රටේ පාසල් බස් රථ රියදුරන්, පෞද්ගලික බස් රථ රියදුරන්, කුඩා ව්‍යාපාරිකයන්, කුඩා කර්මාන්තකරුවන්, පොළවල්වල බඩු විකුණපු අය, බේකරිවල වැඩ කරපු උදවිය, ගම්වල ආප්ප, ඉඳිආප්ප හදපු උදවිය අසහනයට පත් වුණා. ඒ හැමෝම වෙනුවෙන් මේ අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඇයි එහෙම කරන්නේ? අපට ඕනෑ කරනවා, මේ රටේ වැටුණු හැම මිනිහෙකුම නැවතත් පරණ තත්ත්වයට නැඟිටුවන්න. එහෙම නැතිව කාටවත් බැණ අඬ ගහලා, කවුරුවත් බාල්දු කරන්න නොවෙයි අපට ඕනෑ කරන්නේ. අපට මේ රටේ මහ ජනයා බලය දුන්නේ ඒ මහ ජනයා ආරක්ෂා කරන්නයි, ඒ මහ ජනයා ඉතා හොඳ තැනකට නැඟිටුවා තියන්නයි. ඒ කටයුත්ත තමයි අපි අද කරන්නේ. ඒ සඳහා විශාල අමාරුකම් තිබෙනවා.

තමුන්නාන්සේලා දන්නවා. අද සංචාරක ව්‍යාපාරය කඩාගෙන වැටිලා; ජාත්‍යන්තර ආධාර නැවතිලා; විදේශ විනිමය එන මාර්ග අවහිරවෙලා. නමුත් ඒ හැම ප්‍රශ්නයක්ම තිබියදී -රට වහලා තිබියදීත්- සංචාරක කර්මාන්තය කරගෙන යන්න අවශ්‍ය සියලු පහසුකම් මේ ආණ්ඩුව ලබා දුන්නා. නමුත් තවමත් ඒ තුළින් අපට ලැබෙන ආදායම මදි. අපනයනය කිරීමෙන් ජාත්‍යන්තර වශයෙන් අපට ලැබෙන්න ඕනෑ ආදායම තව වර්ධනය වෙන්න ඕනෑ. මේ අය වැය ලේඛනය බැසිල් රාජපක්ෂ මැතිතුමා සකස් කරලා තිබෙන්නේ අපි එතැනට යන්නේ කොහොමද කියන එක ඉලක්ක කරගෙන. අපි විශ්වාස කරනවා, ඊළඟ අය වැය ලේඛනය එනකොට මේ රට මේ අමාරු බවින් මිදුණු රටක් හැටියට ගෙන යන්න. අද උදේ මාධ්‍ය බලනකොට මම දැක්කා, තෙල් සංස්ථාවේ හිටපු සේවකයෙක් වන පාලිත. මම ඔහු හඳුනනවා. දැන් ඔහු වෘත්තීය සමිති නායකයෙක් වෙලා තෙල් බෙදන්න බැරි වෙයි කියලා කියනවා. කවුරු මොනවා කිව්වත් හිඟයක් නැතිව තෙල් ලබා දෙන්න මේ රජය කටයුතු කරලා තිබෙනවාය කියන එක මේ ගරු සභාවේදී මම කියන්න කැමතියි.

අපි ලංකා විදුලිබල මණ්ඩලය හැටියට මොන ප්‍රශ්න ඇති වුණත්, විදුලිය කපන්නේ නැතිව, විදුලි ගාස්තු වැඩි කරන්නේ නැතිව මේ අවුරුද්ද පුරාම විදුලිය ලබා දෙන්න වුවමනා කරන

[ගරු ගාමිණී ලොකුගේ මහතා ]

සැලැසුම් සකස් කර තිබෙන බව තමුන්නාන්සේලාට කියන්න කැමතියි. තමුන්නාන්සේලා බලාගෙන හිටියා, තෙල් නැතිවෙයි, පෝලිමක් ඇති වෙයි; පිටි නැතිවෙයි, පෝලිමක් ඇතිවෙයි; සිමෙන්ති නැතිවෙයි, පෝලිමක් ඇති වෙයි කියලා. ඒ වාගේ පොඩි පොඩි අඩුපාඩුකම් ඇති වුණත් ඒ ආයතන රජය පාලනය කරන ඒවා නොවෙයි. පෞද්ගලික අංශය තමයි ඒ ආයතන පාලනය කරන්නේ.

සිමෙන්ති සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට භාර දුන්නේ තමුන්නාන්සේලා. හොල්සිම් සමාගම ලංකාවට ගෙනාවේ තමුන්නාන්සේලා. හොල්සිම් සමාගමට අපේ සිමෙන්ති සංස්ථාව වික්කේ තමුන්නාන්සේලා. අද හොල්සිම් සමාගම තමයි ලංකාවේ සිමෙන්ති බෙදා හැරීම කරන්නේ. ඒ එක්කම ටෝකියෝ සිමෙන්ති සමාගම ගෙනාවේ තමුන්නාන්සේලා. ටෝකියෝ සිමෙන්ති සමාගමේ සිමෙන්ති නිෂ්පාදනය කරන්නේ තමුන්නාන්සේලා. ඒ නිසා ඒකේ වගකීම තමුන්නාන්සේලාත් ගන්න ඕනෑ. අද සිමෙන්ති නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සියයට 95ක් මූලික අමු ද්‍රව්‍ය තිබෙන්නේ ලංකාවේ. Limestone එක්ක තමයි සිමෙන්ති හදන්නේ. මම විශ්වාස කරනවා තව මාසයක් දෙකක් යනකොට ඒ වාගේ ප්‍රශ්න, යම් යම් අඩුපාඩුකම් මඟ හරවා ගන්න පුළුවන් වෙයි කියලා.

ඒ නිසා අද අපි මේ රට දිහා බලන්න ඕනෑ යාවත්කාලීනව; කොහොමද අපේ රට නැවත නැඟිටුවන්නේ කියලා. විපක්ෂය හිතන්නේ, මේ රට ආර්ථික වශයෙන් කඩා ගෙන වැටුණොත් - බින්දුවට වැටුණොත්- ඉක්මනටම ජනතාව එකතුවෙලා ඔවුන්ට ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන් කියලා. ඔබතුමන්ලාට ආණ්ඩුවක් පිහිටුවන්නවත් පළාත්සභා මැතිවරණයක් දැන් තියන්න විධියක් නැහැ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදලා අපි පළාත් සභා මැතිවරණයක් පවත්වනවා. එදාට ඔබතුමන්ලා සහ අපි තරග කර බලමු කවුද දිනන්නේ කියලා; ගම කවුරුත් එක්කද ඉන්නේ කියලා.

අද මේ රටේ හැම කටයුත්තක්ම කරන්නේ ග්‍රාමීය මට්ටමේ අහිංසක කර්මාන්තකාරයා දියුණු කරන්න; අහිංසක ව්‍යවසායකයා දියුණු කරන්න; අහිංසක පුද්ගලයා දියුණු කරන්න; පාසල් දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න. ඒ නිසා තමයි ගුරු - විදුහල්පති ප්‍රශ්නය විසඳන්න ආණ්ඩුව රුපියල් මිලියන 30,000ක් වෙන් කළේ. තමුන්නාන්සේලා ඇති කරපු විෂමතාවක් තමයි අද මේ රටේ තිබෙන්නේ. තමුන්නාන්සේලා අධිකරණ ක්ෂේත්‍රයට පඩි වැඩි කළ නිසා අද රාජ්‍ය සේවයේ ලොකු විෂමතාවක් ඇති වෙලා තිබෙනවා. කවුද ඒකට වගකියන්නේ? තමුන්නාන්සේලාගේ හිටපු නායකයා වග කියන්නේත් නැහැ, සජිත් ප්‍රේමදාස මැතිතුමා වගකියන්නේත් නැහැ. විෂමතාවක් ඇති කරන එක ලේසියි. ඒක නිරවුල් කරන එක ඉතාම අමාරුයි. තමුන්නාන්සේලා අධිකරණ ක්ෂේත්‍රයට සහ රාජ්‍ය සේවයට බරපතළ විෂමතාවක් ඇති කළා. කවුද ඒකට දැන් වගකියන්නේ? රාජ්‍ය සේවකයන් බලාගෙන ඉන්නවා ඒ විෂමතාව නිවැරදි කරයි කියලා. ඒවා ඇති කළේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා එහෙම ඇති කළේ පෙරහැරේ යන්න පුළුවන් කියලා හිතාගෙන. නමුත් එහෙම යන්න පුළුවන්කමක් නැහැ. මට කථා කරන්න තිබෙන කාලය අවසන් වන නිසා මම දීර්ඝව කථා කරන්නේ නැහැ.

ඉතාම හොඳ අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ මුදල් ඇමතිතුමාට රටේ ජනතාව වෙනුවෙන් මාගේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී.අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.37]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේදී කරුණු කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ඉදිරිපත් කර තිබෙන අය වැය දිහා බැලුවාම කරුණු කිහිපයක් තිබෙනවා, මේ අය වැය තුළින් ඒවාට විසඳුම් තිබෙනවාද කියලා විමසා බලන්න. ප්‍රධාන වශයෙන්ම, නිදහසින් පස්සේ අද අපේ රට ඉතාම භයානක, ආර්ථික, සමාජයීය අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. මේ ආර්ථික, සමාජයීය අර්බුදයට මුදල් ඇමතිවරයා ඉදිරිපත් කරපු අයවැය තුළින් යම් විසඳුමක් තිබෙනවාද කියලා අපි ඉස්සෙල්ලාම බලන්න ඕනෑ. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය බලයට පත් වෙලා මාසයක් ඇතුළත විශාල බදු සහනයක් දුන්නා. VAT සහනය ලබා දීම තුළ බිලියන 600කට එහා ගිය ආදායමක් අපට අහිමි වුණා. එතකොට මේ ආණ්ඩුව ආරම්භයේ ඉඳලාම,- *[බාධා කිරීමක්]* ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මගේ වෙලාව ඉවර වෙනවා නේ. විශේෂයෙන් මේ තත්ත්වය තුළ මොකක්ද ඇතිවුණේ? තමන්ගේ ගජ මිතුරන්ට බිලියන 600කට ආසන්න මුදලක බදු සහනයක් ලබා දුන්නා. නමුත් රටේ ජනතාවට, පාරිභෝගිකයාට භාණ්ඩවල මිල අඩු වුණාද? සේවාවල මිල අඩුවුණාද? අපි විශ්වාස කරන්නේ නැහැ සත පහකින්වත් ඒවා අඩු වුණා කියලා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේ තත්ත්වය තුළ භාණ්ඩාගාරයට ලැබෙන්න තිබෙන බදු ආදායම ශීඝ්‍ර ලෙස අඩු වුණා. බලන්න, මේ තත්ත්වය තුළ මොකක්ද සිද්ධ වුණේ? අපේ රටේ ආර්ථික අර්බුදය ආරම්භ වුණේ එතැනින්. මට ඉස්සෙල්ලා කථා කරපු ගාමිණී ලොකුගේ මැතිතුමාත් කිව්වා කොවිඩ් තත්ත්වය තමයි මේ ඔක්කෝටම ප්‍රශ්නය කියලා. එහෙම නම් අපි බලන්නට ඕනෑ අනික් රටවලත් මේ ප්‍රශ්න තිබෙනවාද කියලා. වැඩි ඈතක යන්න ඕනෑ නැහැ. අපේ ළඟම තිබෙන රටවල් -ඉන්දියාව, බංග්ලාදේශය- දිහා බලමු. මේ රටවලත් ආර්ථික ප්‍රශ්න තිබෙනවාද? බංග්ලාදේශය කියන්නේ අපට වඩා පහළින් හිටපු රටක්, ආර්ථික වශයෙන් සහ සමාජයීය වශයෙන්. නමුත්, අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අපේ රටට සිද්ධ වුණා බංග්ලාදේශයෙන් ණය ගන්න. ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් ණයට ගත්තා. එහෙම නම් අපට විතරක් කොහොමද කොවිඩ් තත්ත්වය හමුවේ භයානක ආර්ථික අර්බුදයක් ඇති වුණේ? ඒක සිද්ධ වුණේ මේ රජයේ තිබෙන වැරැදි කළමනාකාරිත්වය නිසා.

ඒ විතරක් නොවෙයි. තමන්ගේ ගජ මිතුරන්ට බදු සහන ලබා දෙමින් ගෙනගිය වැරැදි ප්‍රතිපත්තිය නිසා තමයි, ජනතාවට අද තුන් වේලක් කන්න බැරිව එක වේලක් හෝ ලෙවකන තැනකට මේ රට පත්ව තිබෙන්නේ. ඒකේ වගකීම ගන්න ඕනෑ මේ ආණ්ඩුව; රාජපක්ෂ පාලනය.

මේ තත්ත්වය තුළ අපි බැලුවා අඩු ගණනේ අය වැයෙන් හෝ මේ ප්‍රශ්නවලට විසඳුම් ලැබී තිබෙනවාද කියලා. අද මේ ආර්ථික අර්බුදය තුළ අපට තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි ඩොලර් අර්බුදය. අපි දන්නවා, 2019 වසරේ ඔබතුමන්ලා මේ රජය භාර ගන්නකොට අපේ රටේ ඩොලර් බිලියන 7.5ක සංචිතයක් තිබුණු බව. දැන් අද තත්ත්වය මොකක්ද? අද ඒ ප්‍රමාණය දෙකයි දශම

ගණනකට අඩු වෙලා තිබෙනවා. අපට විශාල ණය ප්‍රමාණයක් ගෙවන්නත් තිබෙනවා. ලබන වසරේ මාර්තු, අප්‍රේල් වෙනකොට ඒ ණය ගෙවන්න තිබෙනවා. එහෙම නම්, මොන තැනකද අපේ රට තිබෙන්නේ? මේ අය වැය තුළින් මේවාට අපි විසඳුම් සොයා තිබෙනවාද?

අද අපි නිදහසින් පසු ඉතා අසරණ තැනකට පත් වෙලා තිබෙනවා වාගේම මේ අය වැය නිදහසින් පසු ඉදිරිපත් කළ අසාර්ථකම අය වැය කියන එක අපට පැහැදිලිවම කියන්න පුළුවන්. මේ අය වැය තුළින් මොකක්ද මේ රජය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ? මුදල් අච්චු ගහලා හෝ මේ අය වැය තුළින් රුපියල් බිලියන 8,500ක් වෙන් කරලා තිබෙනවා තමන්ගේ ගෝල බාල හෙංචයියලාට ගමේ සංවර්ධනය මුවාවෙන් සල්ලි හම්බ කරගන්න. දැන් මේ සංවර්ධනයද රටේ කරන්න ඕනෑ? අද රටේ මොකක්ද වෙලා තිබෙන්නේ? අපි කියනවා ඩොලර් හිඟයි කියලා. එහෙම නම්, අපට ඩොලර් ලැබෙන මාර්ග මොනවාද?

අපට ඩොලර් ලැබෙන මාර්ග තමයි විදේශ රැකියා ක්ෂේත්‍රය. 2019 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරණයට කලින් විදේශ රැකියාවල නිරත වෙලා හිටපු අය ඡන්දය පාවිච්චි කරන්න ලංකාවට ආවා. එතකොට එයාලට කිව්වා, "රට විරුවෝ" කියලා. දැන් මොකක්ද වුණේ? කොවිඩ් -19 වසංගත තත්ත්වය තුළ "රට විරුවෝ" කියපු අය ලංකාවට එන්න සූදානම් වුණා. නමුත්, අවුරුද්දක් යනතුරු ඒ ගොල්ලන්ට එන්න දුන්නේ නැහැ. ඒ ගොල්ලන්ට ලොකු අසාධාරණයක් සිද්ධ කළා. ඒ විතරක් නොවෙයි, ඒ එන හැම එක්කෙනාම නිරෝධායනය මුවාවෙන් රුපියල් ලක්ෂ එකහමාර සිට ලක්ෂ තුනහමාර දක්වා -ඉතාලිය වාගේ රටවල සිට ආපු අයට ලක්ෂ හතර දක්වා- සූරා කෑවා. නිරෝධායන ක්‍රියාවලිය මඟින් තමන්ගේ ගජ මිතුරන්ගේ හෝටල්වලට සල්ලි හම්බ කරගන්න අවස්ථාව උදා කර දුන්නා. මෙන්න මේකයි කළේ. මෙන්න අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන හතක් ගෙනැත් දෙන රට විරුවන්ට ආණ්ඩුව සලකපු හැටි! ඒ ගැන තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ. විදේශ රටවලට -විශේෂයෙන්ම මැද පෙරදිග රටවලට- ගිහිල්ලා කුලී වැඩ කරලා, ගෙවල්වල වැඩ කරලා අවුරුදු දෙකක්, තුනක් තිස්සේ හම්බ කරපු සල්ලි -සියලු සේසතම- මෙහේ ඔබතුමන්ලාගේ හෝටල් ව්‍යාපාරයේ ඉන්න අයට නිරෝධායනය මුවාවෙන් ගෙවන්න සිද්ධ වුණා. ඒක මොන තරම් අසාධාරණයක්ද? ඒ නිසා අද අපි මේ ක්ෂේත්‍රය ගැන කථා කරනවා. අද ඒ පිරිස සම්පූර්ණයෙන් කලකිරෙන තත්ත්වයට පත් කළා.

2018දී සංචාරකයන්ගේ හොඳම ගමනාන්තය ලංකාව. සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 4.5ක් අපි උපයලා තිබෙනවා. නමුත්, යම් යම් හේතු මත විශේෂයෙන්ම කොවිඩ් -19 වසංගත තත්ත්වය තුළ ඒක කඩා වැටුණා. කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ මේ ක්ෂේත්‍රය කඩා වැටුණාම නැවත වතාවක් එය නඟා සිටුවන්න නම්, සංචාරක ක්ෂේත්‍රයේ සේවයේ කරපු අය, ඒ සේවාව සපයපු අය, ඒ රැකියා කරපු අයත් බලා ගන්න ඕනෑ. දැන් ඒ අය බලාගන්න ක්‍රමයක් මේ අය වැයේ තිබෙනවාද? මේ දක්වා ඒ අය බලාගත්තද? දැන් අවුරුදු එකහමාරක් වෙනවා ඒ අය බලා ගත්තාද? සංචාරක සේවයේ මඟ පෙන්වන්නන්, -guides- හෝටල් සේවකයන් ඉන්නවා. සංචාරක ක්ෂේත්‍රයේ සෘජුව 250,000ක් වැඩ කරනවා. ඒ අයට ආදායම් මාර්ග අහිමි වුණා. සමහර හෝටල්වල වැඩ කරපු අයට පඩි නැතිව ගෙදර යන්න කිව්වා. Guidesලා සම්පූර්ණයෙන්ම අනාථ වුණා. එතකොට ඒ අයට වාහන තිබුණා. අඩු ගණනේ ඒ අයගේ වාහනවල leases ගෙවනකොට සහනයක් දුන්නාද? සමහර වාහන leasing companiesවලින් උස්සාගෙන ගියා. අද සංචාරක ව්‍යාපාරයේ නිරත වූ අය කුලී වැඩ කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. සමහර අය රට දමා වෙනත් රැකියාවලට ගියා. අපි අහනවා, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හොඳ වෙනකොට සංචාරක ව්‍යාපාරය නැවත නඟා සිටුවන්න නම්, මේ ක්ෂේත්‍රයට උදවු කර තිබෙනවාද කියලා?

අපි මේ සේවකයෝ බලාගෙන තිබෙනවාද? මේ සේවකයන්ගේ ආරක්ෂාව පවත්වා ගෙන යන්න පුළුවන් මට්ටමකට අපි උදව් කරලා තිබෙනවාද? එහෙම නැහැ. අද බලන්න, අපේ රට ආසන්නයේ තිබෙන මාලදිවයින සංචාරක ක්ෂේත්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. දැන් ඒ රටට සංචාරකයන් විශාල සංඛ්‍යාවක් යනවා. ඔවුන් ඒ ආදායම් මාර්ගය නැවත හදා ගෙන තිබෙනවා. මේ වන විට සීෂෙල්ස් කියන කුඩා රටට සංචාරකයන් යනවා; නැවත ඒ ආදායම් මාර්ග හදා ගෙන තිබෙනවා. මේ තත්ත්වය තුළ, කොවිඩ් වසංගතය තුළ අපේ සංචාරක ව්‍යාපාරයට වෙච්ච හානිය වෙනම කථාවක්. නමුත් ඒ ක්ෂේත්‍රයේ සෘජු සහ වක්‍ර රැකියා කරන ලක්ෂ 5කට ආසන්න සේවකයන් බලා ගන්න රජයක් හැටියට වැඩ පිළිවෙළක් හදා ගත්තේ නැහැ. ඒ නිසා සංචාරක ව්‍යාපාරයෙන්, ඒ සේවාවෙන් ඔවුන් අයින් වෙලා තිබෙනවා. අද ඒ සේවාව නැවත ගොඩගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එහෙමනම්, ඒකට මේ අය වැය තුළින් කරලා තිබෙන්නේ මොනවාද?

අපි මේ කාරණයත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ලෝකයේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය තුළ අපේ රට වහලා තිබෙන වෙලාවේදීත් ගමේ ඉන්න ගොවියාට කෘෂි කර්මාන්තයේ සක්‍රියව වැඩ කරන්න පුළුවන්කම තිබුණා. මේ සඳහා ලෝකයේ හැම රටකම පහසුකම් ලබා දුන්නා. නමුත් අපි කළේ මොකක්ද? අපි මිථ්‍යා විශ්වාස මත ගිහිල්ලා "කාබනික පොහොර" සංකල්පයක් ගෙනාවා. ලෝකයේ කොහේවත් රටක මෙවැනි සියයට-සියයක් කාබනික පොහොර සංකල්පයක් ක්‍රියාත්මක කරලා නැහැ. එහෙම නැතිව තියෙද්දී මේ සංකල්පය ගෙනැල්ලා මොකක්ද කළේ ? අද ගොවියා සම්පූර්ණයෙන්ම අනාථ කරලා තිබෙනවා. ගොවියාගේ වගාව, වී ගොවිතැන, අනෙකුත් එළවලු බෝග විතරක් නොවෙයි අපේ අපනයන කෘෂි කර්මාන්තයේ තේ, පොල්, රබර් විතරක් නොවෙයි, කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි යන මේ හැම බෝගයකම නිෂ්පාදනය අද පහත වැටිලා තිබෙනවා. මොකද, ඒවාට අවශ්‍ය පොහොර නැහැ. ඒ පොහොර නැති වුණු පාඩුව අපට නැවත ගන්න බැරි වෙනවා. අද මෙවැනි විනාශයක් සිදු වෙනවා. කවුරු මේවාට උපදෙස් දුන්නා ද දන්නේ නැහැ. මෙවැනි විනාශයක් නිසා අපේ රට අනාගතයේදී, -ඊළඟ සිංහල අලුත් අවුරුද්ද වන විට- සාගතයකට මුහුණ දෙන තත්ත්වයකට පත් කරලා තිබෙනවා. මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරලා තිබෙන්නේ මේවායි.

අපේ රට නිදහස ගන්නකොට -1948 වන විට- රටේ වී ගොවිතැන, වී නිෂ්පාදනය සියයට 39යි තිබුණේ. එතකොට ජනගහනය අදට ඉන්න ප්‍රමාණයෙන් භාගයයි හිටියේ. නමුත්, පසුගිය අවුරුද්ද වන විට අපි සහල්වලින් ස්වයංපෝෂිත රටක් බවට පත් වුණා. ඒක එක රජයක් විතරක් කළ දෙයක් නොවෙයි. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ ඉඳලා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා මහවැලි කඩිනම් ව්‍යාපාරය හරහා ඒ ගෙනාපු සංවර්ධනය තුළින් අපට සහල්වලින් ස්වයංපෝෂිත වෙන්න පුළුවන් වුණා. එදා නිදහස ලබා ගන්නකොට සියයට 39ක සහල් ප්‍රමාණයක් නිෂ්පාදනය කළත්, අද ජනගහනය දෙගුණ වෙලා, පරිභෝජනයට අවශ්‍ය සහල් ප්‍රමාණය අපි නිෂ්පාදනය කර ගන්න සූදානම් වෙලා ඉන්න වෙලාවක තමයි කාබනික පොහොර පිස්සුව ගෙනැල්ලා අපේ රටේ ගොවියා අනාථ කරලා තිබෙන්නේ. තරුණයන් ගොවිතැන ආදායම් ලබන මාර්ගයක් බවට පත් කරගෙන, ගොවිතැනට ඇතුළත් වෙන අවස්ථාවක තමයි කාබනික පොහොර වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා අද ඔවුන් අනාථ කරලා තිබෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා මේක මහ විනාශයක්, මේ රටට කරපු විශාල ශාපයක් කියලා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කර්මාන්තය දෙස බලන්න. තේ කර්මාන්තය අපට අවුරුදු 150ක් විදේශ විනිමය ගෙනාපු කර්මාන්තයක්. අපේ ඒ කර්මාන්තයට "Ceylon Tea" කියලා හොඳ නමක් තිබෙනවා. අද ලෝකයේ තේ නිෂ්පාදනය අතින් අපි හතරවන ස්ථානයේ ඉන්නේ. ලංකාවේ තේවලට අපනයනය අතින් ලෝකයේ දෙවැනි ස්ථානය තිබෙනවා. දැන් වෙන්නේ මොකක්ද? තේවලට අවශ්‍ය පොහොර ප්‍රමාණය අවශ්‍ය වෙලාවට නැතිකොට අපි තේ නිෂ්පාදනයෙන් පස්සට යනවා. ඒ එක්කම, අවුරුදු 150ක පමණ කාලයක් තිස්සේ තිබුණු "Ceylon Tea" නාමය අපට නැති වෙලා යනවා. අපට ලැබෙන ඩොලර් මිලියන එක්දහස් ගණනක ආදායමක් නැති වෙලා යනවා. එහෙමනම්, ඩොලර් ප්‍රශ්නයට විසඳුම් දෙන්නේ මේ විධියටද? තේ කියන්නේ ඩොලර්. කුරුඳු කියන්නේ ඩොලර්. මේවා ඔක්කොම අපනයනය කරන භාණ්ඩ. මේවාට අවශ්‍ය සහයෝගය, පොහොර ටික දෙන්නේ නැතිව මේ කරන ක්‍රියාවලිය නිසා විශාල හෝදාපාළුවක් කෘෂි කර්මාන්තයට සිද්ධ වෙනවා. මේ නිසා ග්‍රාමීය ආර්ථිකය එහෙම පිටින්ම කඩා වැටෙනවා. ග්‍රාමීය ආර්ථිකය එහෙම පිටින්ම කඩා වැටුණාම, අපේ ගමේ මිනිහාගේ ආර්ථිකය කඩා වැටුණාම මොකද වෙන්නේ? තේ අක්කර 5ක් තිබුණා නම්, තේ අක්කර 2ක් තිබුණා නම් ඒ අය එදා තුන්වේල කාලා, තමන්ගේ දරුවාට අධ්‍යාපනය දීලා හොඳ ආර්ථිකයක් අරගෙන ගියා. ඒ ආර්ථිකය අද එහෙම පිටින්ම කඩා වැටිලා තිබෙනවා. එහෙමනම් මොකක්ද මේවාට බලපෑවේ? මේවාට බලපෑවේ කොවිඩ්ද? හැම එකකටම "කොවිඩ්, කොවිඩ්" කියනවා. මේවාට බලපෑවේ කොවිඩ් නොවෙයි. එක මතයක ඉඳලා, මහන්තත්ත්වයෙන් ඉඳලා, "මම තමයි හොඳටම කරන්නේ. මම තමයි හරියට කරන්නේ" කියලා ජනතාව ඉතා අමාරු තැනකට අද ඇද දාලා තිබෙනවා.

කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු අයට වාගේම අද මේ ඩොලර් ප්‍රශ්නයත් එක්ක සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් බොහෝ දෙනෙකුට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙනෙන්න ඕනෑ පිටරටින්. නමුත් ඒ අමුද්‍රව්‍ය ගෙනෙන්න ඩොලර් කෝ? බැංකුවට ගියාම අමුද්‍රව්‍ය ගෙන්වන්න අවශ්‍ය ඩොලර් ප්‍රමාණය දෙනවාද? ඒ නිසා අද ඒ අයට ඩොලර් මිලදී ගන්න කළු කඩයට යන්න සිද්ධ වෙලා. කළු කඩයෙන් ඩොලර් මිලදී ගනිද්දී ඩොලර්වලට ගෙවන්න වෙන්නේ කොහොමද? උණ්ඩියල් ක්‍රමයට ගන්න පුළුවන් කියයි, තව ක්‍රමවලට ගන්න පුළුවන් කියයි. ඩොලර් එකකට ඒ ගොල්ලන් අය කරන මිල කීයද? බැංකුවෙන් ලබා ගනිද්දී ඩොලර් එකක මිල රුපියල් 202යි, 203යි. නමුත්, උණ්ඩියල් ක්‍රමයට ඩොලර් ගන්න ගියාම වෙන දේ පැහැදිලිව කියන්න ඕනෑ. ඊයේ පෙරේදා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් අප සමඟ සාකච්ඡා කළා. ඒ අයට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වන්න ඩොලර් යවද්දී ඒ අයට දැන් එක ඩොලරයකට රුපියල් 235ත්, 250ත් අතර ගණනක් වැය වෙනවා කියනවා. මේක තමයි ඇත්ත. ඒ මුදලට අමුද්‍රව්‍ය ගෙනැල්ලා -ඒ වාගේ කළු කඩ මිලකට ගෙනැල්ලා- මේ රටේ නිෂ්පාදන කරලා, ඒවා අපනයනය කරලා ලාභයක් ලබන්න ඒ අයට පුළුවන්ද? ඒ නිසා අද මේ ක්ෂේත්‍ර හැම එකක්ම කඩා වැටෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිසා අපේ රටේ ඉතා අවාසනාවන්ත තත්ත්වයක් නිර්මාණය වෙනවා. මෙවර අය වැයෙන් මේ ප්‍රශ්න එකකටවත් විසඳුම් ලබා දීලා නැහැ. අය වැයෙන් මේවාට විසඳුම් ලබා දෙන්නේ නැතිව අද මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? කර්මාන්ත, කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, විදේශ රැකියා ක්ෂේත්‍රය ආදී මේ හැම එකකටම අවශ්‍ය පහසුකම් අද ලබා දෙන්නේ නැහැ. විශේෂයෙන් විදේශ රැකියා සඳහා යන අය දිරිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැතිව ඔවුන් අධෛර්යවත් කරන වැඩ පිළිවෙළක් තමයි පසු ගිය කාලයේ ක්‍රියාත්මක කළේ. රැකියා ඒජන්සි ඇතුළු විදේශ සේවා සපයන ආයතනවල ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. පසුගිය අවුරුදු එක හමාරක, දෙකක කාලය තුළ ඒ අයට තමන්ගේ සේවකයන් තබා ගන්නත් බැරි වුණා. ඒ ආයතනවලට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒ එකක්වත් මේ අය වැය යෝජනාවල නැහැ.

අපි ණය බරකින් ඉන්නවා නම්, ඉදිරියේදී ඒ ණය ගෙවන්න අපට දැනට තිබෙන ක්‍රමවේදවලින්, ඒ කියන්නේ, විදේශ රැකියා ක්ෂේත්‍රයෙන්, සංචාරක ව්‍යාපාරයෙන්, අපනයන ක්ෂේත්‍රයෙන්, ආයෝජකයන් ලංකාවට ගෙන ඒමෙන් - ඒ එකකින්වත්- අපට ඩොලර් එන මාර්ගයක් පෙනෙන්නේ නැහැ. එහෙමනම්, මේ රට බංකොලොත් තැනකට නේද අරගෙන යන්නේ? අද ගාමිණී ලොකුගේ මැතිතුමා කිව්වා, "සිමෙන්ති නැතිව පෝලිමක් ඇති වෙයි" කියලා අපි බලාගෙන සිටියාය කියලා. දැන් පෝලිම් ඇති වෙලා තිබෙන්නේ. දැන් සිමෙන්ති නැහැ. අද සිමෙන්ති නැති එකෙන් තව විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩ කරන මේසන් බාස්ලා, වඩු බාස්ලා ආදී හැම කෙනෙකුගේම රැකියා අද අනතුරට ලක්වෙලා තිබෙනවා. හැම පැත්තෙන්ම ආදායම් මාර්ග ඇණහිටලා මේ රටේ ජනතාවට තුන් වේලක් නොවෙයි, එක වේලක්වත් ලෙවකන්න බැරි තැනකට මේ ආණ්ඩුව පත් කරලා තිබෙනවා කියන කාරණය මතක් කරමින්, වෙලාව ලබාදීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.53]

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு ஜோன் செனவிரத்ன)
(The Hon. John Seneviratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

ඇත්ත වශයෙන්ම අද මේ වැදගත් විවාදය පැවැත්වෙන වෙලාවේ මම පළමුවෙන්ම ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයකට උත්තර දෙන්න බලාපොරොත්තු වෙනවා. එතුමා කිව්වා, මේ ආණ්ඩුව ආවාට පසු ආර්ථිකය විනාශ කළා කියලා. මේ ආණ්ඩුව නොවෙයි ආර්ථිකය විනාශ කළේ. ආර්ථිකය විනාශ කළේ එදා 2015 බලයට පැමිණි ආණ්ඩුවයි කියන එක මම කියන්න ඕනෑ.

මහින්ද රාජපක්ෂ මහතා 2015දී රට භාර දෙන කොට අපේ රටේ දළ ජාතික නිෂ්පාදනය -2014 වර්ෂයේ- සියයට 7යි. නමුත්, 2020දී අපි නැවත රට භාරගන්නකොට දළ ජාතික නිෂ්පාදනය සියයට 3.6යි. ඒ වන විට ඒ ආකාරයට ආර්ථිකය කඩා වැටී තිබුණා. මම පිළිගන්නවා, අද එය සියයට 2.5 දක්වා අඩු වී තිබෙන බව. මොකද, පසු ගිය අවුරුදු දෙක තුළ තිබුණු කොවිඩ් වසංගතය නිසා රටේ නිෂ්පාදනය වැටිලා, කර්මාන්ත වැටිලා, ආර්ථික අතින් විශාල අභේනියකට පත්වුණු කාලපරිච්ඡේදයක් ලංකාවේත්, අනෙක් රටවලත් තිබුණු බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා අපේ දළ ජාතික නිෂ්පාදිතය සියයට 2.5 දක්වා පහත වැටී තිබෙනවා. නමුත්, කාටවත් කියන්න බැහැ, 2015 ඉඳලා 2020 දක්වා කාලය

තුළ මේ රටේ ශක්තිමත් ආර්ථිකයක් තිබුණාය කියලා. ආර්ථික අතින් විශාල අභේනිදායක කාලයක් ආරම්භ වුණේ ඒ කාලයේදීයි කියන එක මම කියන්න ඕනෑ.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ණය ගැනත් කථා කළා. එතුමා කිව්වා, අපි බොහෝ ණය අරගෙන ණය ගෙවන්න බැරුව ඉන්නවා කියලා. මේ ණය ගත්තේ කොහොමද කියලා අතීතය දිහා බැලුවාම අපට පෙනෙනවා. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුව භාරදෙනකොට අපේ විදේශ ණය තිබුණේ සියයට 72යි. නමුත් යහ පාලන ආණ්ඩුවට පසු මේ ආණ්ඩුව බලයට එන අවස්ථාව වන කොට ඒ ණය ප්‍රමාණය සියයට 96 දක්වා වැඩි වෙලා තිබුණා. එතකොට විශාල ණය ප්‍රමාණයක් ඒ අය බලයේ සිටි අවුරුදු පහ තුළ අරගෙන තිබෙන බව අපි කියන්න ඕනෑ. මේ ගැන අපි කරුණු පැහැදිලි කරලා තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා, මේ ණය ගෙවීම අපි අඛණ්ඩව කරනවා, මොනම විධියකින්වත් අපි ණය නොගෙවා ඉන්නේ නැහැ කියලා. දැනට -මේ අවුරුද්දේ- ඩොලර් මිලියන 500ක් ගෙවන්න තිබෙනවා. ඒක ගෙවනවා. ඒ වාගේම ඩොලර් මිලියන 1,000ක් ලබන අවුරුද්දේ ගෙවන්න තිබෙනවා. ඒකත් ගෙවනවා. එතුමා ඒ ප්‍රකාශය කළා. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, මේ ණයවලින් වැඩි ප්‍රමාණයක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ ගත්ත ණය.

ඊළඟට, මීට පෙර කථා කළ ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය ආණ්ඩුව කාලයේ රට සහලින් ස්වයංපෝෂිත වුණා කියලා. නමුත්, ඊටත් පෙර පැවැති ආණ්ඩුව -2010-2015 දක්වා පැවැති ආණ්ඩුව- කාලයේ තමයි අපේ රට සහලින් ස්වයංපෝෂිත වුණේ. නමුත්, 2015 බලයට පත් වෙච්ච ආණ්ඩුව මොකද කළේ? 2016 වෙනකොට පිටරටින් සහල් ගෙන්වන්න පටන් ගත්තා. විශේෂයෙන් 2020 වනතුරුම මේ රටට සහල් ගෙන්නුවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට ඇවිල්ලා තමයි මේ රටේ කෘෂිකර්මාන්තයේ නවෝදයක් ඇති කරන්න, ගොවියා දිරිමත් කරන්න කටයුතු කළේ. පොහොර නොමිලේ දෙන්න පටන් ගත්තා. ඒ නිසා පුරන් කුඹුරු යායවල් අස්වද්දලා වීවලින් රට ස්වයංපෝෂිත වෙන්න පටන් ගත්තා.

අමාරු පරිසරයක් යටතේ ගෙනැවිත් තිබෙන මේ අය වැය ලේඛනය අද නොයෙක් විධියේ බොරු කියලා විවේචනය කිරීම සාධාරණයි කියලා මා හිතන්නේ නැහැ.

නිදහසින් පසුව අපි රටක් විධියට මුහුණ දුන් ඉතාම දුෂ්කර වාගේම තීරණාත්මක කාලපරිච්ඡේදයක් තමයි මේ පසු කරමින් ඉන්නේ. කොවිඩ්-19 ගෝලීය වසංගතය මේ වන විට ගෝලීය ආර්ථිකයට සිදු කර ඇති බලපෑම ඉතාම ප්‍රබලයි. අද ලෝකයේ බොහෝ දියුණු රටවල පවා ආර්ථික අර්බුදයක් මතු වෙමින් පවතිනවා. විශාල වශයෙන් ආදායම් අහිමිවීම, නිෂ්පාදන ක්‍රියාවලිය අඩාළ වීම, විරැකියාව ඉහළ යෑම ආදී ආර්ථික අර්බුද වාගේම දැඩි ආහාර හිඟයකට ද මුහුණ දීමට සිදුවන කාලවකවානුවක් තමයි අපි මේ පසු කරමින් සිටින්නේ. ඒ නිසා ලංකාවේ පමණක් නොවෙයි, ගෝලීය ආර්ථිකයේත් දැඩි පසුබෑමක්, අර්බුදයක් පවතින වකවානුවක ගරු මුදල් ඇමතිතුමා විසින් මේ අභියෝගාත්මක අය වැය යෝජනාවලිය ඉදිරිපත් කිරීම අපි ප්‍රශංසා කළ යුතු කාරණයක් බව මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

ජාත්‍යන්තර මුදල් ශක්තිය -විදේශ මූල්‍ය ශක්තිය- අපේ රටේ ආර්ථිකයට සෘජුවම සම්බන්ධ වී තිබෙනවා. විදේශ මුදල් රට තුළට ගලා ඒම නිශ්චිත කර ගන්නේ නැතුව රටේ ආර්ථිකය ස්ථාවර කර ගැනීමේ හැකියාවක් නැහැ. ඊට ප්‍රධාන හේතුව, අපේ රටේ සේවා සහ අවශ්‍යතා විශාල වශයෙන් විදේශීය ආනයන සමඟ සම්බන්ධ වී ඇති නිසායි. ඛනිජ තෙල්, සීනි අවශ්‍යතාවෙන් සියයට 75ක්, කිරිපිටි අවශ්‍යතාවෙන් සියයට 90ක්, තිරිඟු පිටි අවශ්‍යතාවෙන් සියයට 70ක්, අපට වුවමනා කරන ගෑස් අවශ්‍යතාවෙන් සියයට 100ක් අද අපි ගෙන්වන්නේ පිටරටින්. මේ භාණ්ඩවල මිල පාලනය කරන්න නම්, ඩොලරයේ මිලට සාපේක්ෂව දේශීය මුදලේ -රුපියලේ- වටිනාකම පාලනය කළ යුතුව තිබෙනවා. රුපියලේ වටිනාකම අවප්‍රමාණ වීම හේතුවෙන් ඉහත කී සෑම භාණ්ඩයකම මිල ඉහළ යෑම අද ආරම්භ වෙලා තිබෙනවා.

මෙවර අය වැය අභියෝගාත්මක අය වැයක් යැයි කිව යුත්තේ විදේශ මුදල් නැත්නම් ඩොලර් සොයා ගැනීමේ අපහසුතාව ප්‍රධාන කාරණයක් වශයෙන් පවතින වකවානුවක මේ අය වැය ඉදිරිපත් කර තිබීම නිසායි. පසුගිය වසර 70ට අධික කාලය පුරා රටක් වශයෙන් අපි ගත් ණය ප්‍රමාණය ඉතා විශාලයි. අද අපේ ආර්ථිකයට එම ණය ගෙවීමේ කොන්දේසි ඉටු කිරීම මහත් බරක් වී තිබෙනවා. නමුත්, මෙම රජය කෙසේ හෝ එම ණය වාරික හා පොලිය ගෙවීම අප වෙත පැවරී ඇති වගකීමක් වශයෙන් සලකා එය ප්‍රමාද නොකර ක්‍රියාත්මක කරන්නට කටයුතු කරනවාය කියන එක අපි දන්නවා.

මේ ණය ලබාගෙන අප ක්‍රියාත්මක කළ සමහර ව්‍යාපෘතිවලින් එතරම් ඵලදායිතාවක් ලැබුණේ නැහැ. ඒවා සුදු අලින් බවට පත් වෙලා තිබෙනවා.

කොවිඩ් - 19 වසංගතය නිසා අක්‍රිය වුණු සංචාරක ව්‍යාපාරය වැනි මාර්ගවලින් ලැබුණු ආදායම, සියයට 100ක් අහිමි වීම බරපතළ ලෙස අපේ විදේශීය මූල්‍ය තත්ත්වයට බලපා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය රජය කාලයේ සිදු වෙච්ච පාස්කු ඉරුදින ප්‍රහාරය හේතුවෙන් රටට ආයෝජකයන් නොපැමිණීම නිසා විශාල ආර්ථික පසුබෑමක් ඇති වුණා.

මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කළේ, එතුමා මේ අය වැය ඉදිරිපත් කරන්නේ ගෝලීය අර්බුද 5කට මුහුණ දෙමින් සිටින අවස්ථාවක බවයි. කොවිඩ් - 19 වසංගතය නිසා දේශීය හා විදේශීය වශයෙන් සේවා සැපයීමෙන් අපට උපයා ගැනීමට තිබූ රුපියල් බිලියන 500කටත් වැඩි මුදලක් භාණ්ඩාගාරයට අහිමි වූ වකවානුවක මේ අය වැය ඉදිරිපත් කරන බවයි එතුමා ප්‍රකාශ කළේ. මේකෙන්ම තේරෙනවා, කොවිඩ් - 19 වසංගතය නිසා රාජ්‍ය ආදායම කොතරම් අහිමි වී තිබෙනවාද කියලා.

දැන් මුළු ලෝකයම අනපේක්ෂිත ආර්ථික අර්බුදයක පැටලිලා තිබෙනවා. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පුරෝකථන අනුව මේ වසංගතය නිසා ලොව පුරා මිලියන 25කගේ පමණ රැකියා අහිමි වීමට ඉඩ තිබෙනවා. අපේ රටටත් විදේශ විනිමය ගෙන එන ශ්‍රමිකයන් විශාල පිරිසකගේ රැකියා මේ වන විට අහිමි වෙලා තිබෙනවා. අපේ ඩොලර් හිඟයට එයත් ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට ඕනෑ. රටක් විධියට මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට නම් අප දැන්වත් නිශ්චිත උපායශීලී ආර්ථික කළමනාකරණයකට වහාම යොමු විය යුතුයි; විදේශ වෙළෙඳාම සහ සෘජු විදේශ ආයෝජන නිසි ලෙස කළමනාකරණයට ලක් කළ යුතුයි; විදේශ මුදල් රට තුළට ගෙන ඒමට අවශ්‍ය විධිමත් සූක්ෂ්ම වැඩ පිළිවෙළක් ද සකස් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් කථා කළ හැම කථිකයෙක්ම වාගේ ප්‍රකාශ කළා, අපේ රටේ සිමෙන්ති, කිරි පිටි වැනි භාණ්ඩවල හිඟයක් තිබෙනවා කියලා. මේ සියලු දෙයටම බලපා තිබෙන්නේ විදේශ මුදල් අහිමි වීම සහ විදේශ රටවලින් ගෙන්වන භාණ්ඩවල මිල ඉහළ යෑමයි.

[ගරු ජෝන් සෙනෙවිරත්න මහතා]

ඒ වාගේම, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, ලෝකයේ කොවිඩ් - 19 මර්දනය සඳහා කරනු ලබන එන්නත්කරණය සාර්ථකව සිදු කරන රටවල් අතර අපේ රට ඉතාම සාර්ථක ප්‍රතිඵල ගත් රටවල් කිහිපයෙන් එකක් වන බව. ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ කොවිඩ් - 19 වසංගතයෙන් ජනතාව ආරක්ෂා කරගැනීම සඳහා ජනගහනයෙන් සියයට 70කට වැඩි සංඛ්‍යාවකට එන්නත් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. මේ වන විට ජනගහනයෙන් සියයට 70ක් පූර්ණ එන්නත්කරණයට ලක් කර තිබෙනවා.

කොවිඩ් වසංගතය පාලනය සඳහා එන්නත් ලබා දීම සංචාරක ක්ෂේත්‍රයේ පුනර්ජීවනය වෙනුවෙන් ඉතාම ශුභදායී පෙර නිමිත්තක් බව කියන්නට ඕනෑ. සංචාරක ව්‍යාපාරය තුළින් ජීවත් වන විශාල පිරිසක් අපේ රටේ ඉන්නවා. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පෙර නොවූ විරූ ආර්ථික පසු බෑමකට ලක් වෙලා සිටින ඒ සියලුදෙනාට මේ නිසා විශාල සහනයක් ලැබෙයි කියා අපි කල්පනා කරනවා. මෙවැනි අමාරු කාලයක, මෙවැනි දුෂ්කර පරිසරයක ජනතාවට බර නොපටවා මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන කීපය අවසාන කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගුණපාල රත්නසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.04]

**ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභියෝගාත්මක අවස්ථාවක ඒ සියලු අභියෝගවලට මුහුණ දෙමින් ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ වාගේම, ඒ සඳහා අවකාශ සලසා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අය වැය විවාදයේදී විපක්ෂය වෙනුවෙන් පළමු කථාව කළ ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇතුළු අනෙකුත් මන්ත්‍රීවරුන් කළ කථා, දැක්වූ අදහස් මා අහගෙන සිටියා. පසු ගිය අවුරුදු එකහමාර තිස්සේ එතුමන්ලා මේ පාර්ලිමේන්තුව තුළ රජය විවේචනය කරමින් කියපු කථා ටිකම, මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් වන විවාදයේදීත් ඉදිරිපත් කළා විනා, මේ අය වැය ලේඛනයේ තිබෙන කරුණු අරගෙන, ඒවායින් නොගැළපෙන යෝජනා මොනවාද, නොකළ යුතු දේවල් මොනවාද, තවත් ඇතුළත් විය යුතු, කළ යුතු දේවල් මොනවාද, ඒවා ඇතුළත් කරන්නේ කොහොමද කියන කරුණු ඇතුළත් බුද්ධිමත් සංවාදයක මේ පාර්ලිමේන්තුව තුළ යෙදුණේ නැහැ කියන හැඟීම තමයි මා තුළ තිබෙන්නේ.

මේ අය වැය විවාදය පටන් ගත් වේලේ ඉඳන් බොහෝ අය කිව්වා, අය වැය හිඟය ගැන. අපේ අය වැය කථාව මුද්‍රණය කරපු මේ පොතේ ඒ ගැන පැහැදිලිව ලියා තිබෙනවා. 1988, 1989 වර්ෂවල ජාතික ආදායමින් සියයට 10 ඉක්මවා ගිය අය වැය හිඟයක් තිබුණා. ඊට පසුවත් සියයට 10ක අය වැය හිඟයක් තිබුණු වර්ෂ ගණනාවක් තිබුණා. හැබැයි, ඒ කිසිදු වර්ෂයක මෙවැනි දැවැන්ත ව්‍යසනයක් තිබුණේ නැහැ. මේ අය වැය, දෙවන ලෝක යුද්ධයටත් එහා ගිය දැවැන්ත ව්‍යසන තත්ත්වයක් තුළ ඉදිරිපත් කරපු අය වැයක් කියන එක විපක්ෂය සම්පූර්ණයෙන් අමතක කරලා තිබෙනවා.

කොවිඩ් ව්‍යසනය ගැන ඕනෑ තරම් කරුණු කථා කෙරුණු නිසා මම ඒ ගැන මොකුත් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අප දන්නා ලෝක ඉතිහාසයේ දැවැන්තම ව්‍යසන තත්ත්වය තුළ සමස්ත ලෝකයම සළිත වෙලා තිබෙන වෙලාවක, අපේ ආර්ථිකයටත් වෙන්න පුළුවන් උපරිම හානි සිදු වෙලා තිබෙන වෙලාවක ඉදිරිපත් කරපු අය වැය ලේඛනයක මේ වාගේ අය වැය හිඟයක් සාමාන්‍යයි කියන එක තමයි අවංකව කථා කරන ඕනෑ කෙනෙකු කියන්නේ.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථා බොහොමයක කියැවුණා, රට ණය උගුලක හිර වෙලා කියලා. රට ණය උගුලක හිර වෙලා කියපු අය 2015 වසරේ ආණ්ඩුව ගන්න කොට රටේ ණය ප්‍රමාණය තිබුණේ රුපියල් බිලියන 7,487 යි. හැබැයි, ඒක 2019 වසරේදී ආණ්ඩුව ආපහු භාර දෙන කොට රුපියල් බිලියන 13,032ක ණය මුදලක් බවට පරිවර්තනය වෙලා තිබුණා. 2018 අප්‍රේල් මාසයේ ඉඳලා 2019 ජූලි මාසය වන කල් විතරක් -මාස 15කට- ලබා ගත් මුළු ඩොලර් ණය ප්‍රමාණය ඩොලර් බිලියන 6.9ක් බවට පරිවර්තනය වෙලා තිබුණා. ඒ අවුරුදු හතරහමාරක කාල සීමාව තුළ ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ඩොලර් බිලියන 13ක ණය මුදලක් අරගෙන තිබුණා.

ඒ කථා කරපු අය අපෙන් ඇහුවා, ඔබ මේ රටට මොකක්ද කළේ කියලා? අපට ආපස්සට ඒ ප්‍රශ්නයම එතුමන්ලාගෙන් අහන්න සිදු වෙනවා. යුද්ධයක් නැතිව තිබියදීත්, මේ වාගේ කොවිඩ් ව්‍යසනයක් නැතිව තිබියදීත්, වෙනත් ස්වාභාවික විපත් කිසිවක් නැතිව තිබියදී, ලෝක ආර්ථිකය නිසි ලෙස ක්‍රියාත්මක වෙද්දී ඔබතුමන්ලා මේ රටට මොකක්ද කළේ කියලා පෙරළා ප්‍රශ්න කරන්න අපට සිදු වෙනවා.

බිලියන 13ක ස්වෛරීත්ව බැඳුම්කර ගැන කිව්වා; ඒ ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළෙඳ පොළේ විකිණෙන්නේ අඩු මිලට කිව්වා. මේ කාලයේ ආයෝජකයන් ආයෝජනය කරන්න පෙළඹෙනවා අඩුයි. එහෙම ආයෝජනය කරලා තිබෙනවා නම්, ඒ මොන මොන රටේද කියලා, හැකි නම් අපට කරුණු ඉදිරිපත් කරන්න. මේ කාලයේ ආයෝජකයන් ලෝකයේ රටවල ආයෝජනය කරන්න පෙළඹෙනවා අඩුයි. ඒකට හේතුව, ලෝක ආර්ථිකය කොහේට යනවාද කියලා කාටවත් තවම හිතාගන්න බැරි වීමයි. ඒ නිසා ලෝකයේ රටවල් අතිවිශාල සංඛ්‍යාවක ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළෙඳ පොළේ විකිණෙන්නේ අඩු මිලටයි කියන එක ඕනෑම කෙනෙකුට පෙනෙන කාරණාවක්. ඒ නිසා ලංකාවේ ඉලක්කම විතරක් අරගෙන එසේ කියන එකේ යම් අසාධාරණයක් තිබෙනවා.

ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා කථා කරමින් කිව්වා, නිදහස් තරුණ ව්‍යවසායකයන්ගේ සල්ලි, මේ රටට ගෙනෙන ඩොලර් ආණ්ඩුව හොරා කනවා, ඒවාට දඩ ගහනවා, ඒවා මංකොල්ල කන විධියට රජය කටයුතු කරනවා කියලා. හැබැයි, අපේ මේ අය වැය කථාවේ 5.4.42.6 යටතේ පිටු අංක 32හි සඳහන්ව තිබෙනවා, තොරතුරු තාක්ෂණය පාවිච්චි කරලා අන්තර් ජාලය ඔස්සේ උපයන මුදල් මෙරටට ගෙනෙන, විශේෂයෙන්ම freelance ලෙස වැඩ කරන නිදහස් තරුණ ව්‍යවසායකයන්ට උපරිම දිරි දීමනා දෙනවා කියලා. ඒ බව මේ අය වැය ලේඛනයෙහිම සඳහන් කර තිබෙනවා.

විපක්ෂය නියෝජනය කරමින් කථා කළ හැම දෙනාම වාගේ කිව්වේ, "මේ අය වැය ලේඛනය පුස්සක්, හුදු ලියවිල්ලක් විතරයි" කියලායි. එහෙම කියන අය එක්කෝ මේ අය වැය ලේඛනය කියවා නැහැ. එහෙම නැත්නම්, කියෙව්වත් එතුමන්ලාට ඒක තේරුම් ගිහින් නැහැ. එහෙමත් නැත්නම් මෙය කියෙව්වා; තේරුණා; හැබැයි, කුහකකමට මේක වැඩක් නැහැ කියලා සාම්ප්‍රදායික කථාවක් කියන්න බලාපොරොත්තු වුණා.

මේ අය වැය කථාව පුස්සක් කිව්වත්, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ තිබෙන සියලු ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් දෙන්න සැලසුම් හදලා තිබෙන බව මේ අය වැය කථාවේම සඳහන්ව තිබෙනවා. නව කෘෂි කාර්මික තාක්ෂණය හඳුන්වා දීම සඳහා අතිවිශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. වැවිලි කර්මාන්තය, ධීවර කර්මාන්තය, පශු සම්පත්, පාරම්පරික ගෘහ කර්මාන්ත, අත්යන්ත්‍ර, රෙදිපිළි, බතික් ආදී සෑම අංශයකටම අතිවිශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒවාට අතිවිශාල මුදලක් වෙන් කරලා ඒ ක්ෂේත්‍ර සංවර්ධනය කරන්න ගත් තීන්දුව වැරැදිද, රටේ ඉන්න සෑම දෙනාටම පානීය ජල ව්‍යාපෘති මඟින් පානීය ජලය දෙන්න ගත්තු තීරණය වැරැදිද, ඒවාට මුදල් වෙන් කරලා තිබෙන එක වැරැදිද, "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ වැව් ටික හදන්න සල්ලි වෙන් කරපු එක වැරැදිද, මාර්ග සංවර්ධනය වැරැදිද කියලා අපි විපක්ෂයෙන් අහනවා.

පාරවල් මොකටද කියලා එතුමන්ලා ඇහුවා? ඇත්තටම මීට කලින් මේ රටේ හරියට පාරක් තොටක් තිබුණාද? 2005 ඉඳලා 2015 දක්වා මහින්ද රාජපක්ෂ යුගය තුළ අවුරුදු 30ක යුද්ධයකුත් ඉවර කරලා, දැවැන්ත මාර්ග සංවර්ධනයක් ගෙනාවේ නැත්නම් අද වන විට අපි ගමන් කරන්නේ මොන වාගේ පාරවලද? අපි ග්‍රාමීය යෝජනා ගන්න ගියාම ගමේ හැම කෙනෙක්ම ඉල්ලුවේ ජීවනෝපාය සංවර්ධන යෝජනා නොවෙයි. ඔවුන් ඉල්ලුවේ පාර හදලා දෙන්න කියලායි. ඒක තමයි යථාර්ථය. හැම කෙනෙක්ම දන්නවා, ගමේ යෝජනා එන කොට ගමේ යෝජනා ගොඩේ පළමුව තිබෙන්නේ පාර හදලා දෙන්න කියන එක බව.

ඒ නිසා මාර්ග සංවර්ධනයට අතිවිශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒක වැරදිද?

ඊළඟට, නිවාස සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. නිවාසයක් නැතිව කුඩාරම් වැනි නිවාසවල ජීවත් වන අය ඉන්නවා. වෙනදා, "උදාගම්" ව්‍යාපාරය හරහා බොරු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. අපේ පැතිවලත් "උදාගම්" ව්‍යාපාරය යටතේ හදපු නිවාස තිබෙනවා. හැබැයි, අපි මේ වනකොට නිවාස සංවර්ධන අධිකාරිය, සමෘද්ධි ව්‍යාපාරය හරහා සෑම ආසනයකම ගෙවල් 400කට අධික ප්‍රමාණයක් හදලා ඉවරයි, කුඩාරම් වැනි නිවාස ඉවත් කිරීමේ කටයුත්ත වෙනුවෙන්.

ඊළඟට, අධ්‍යාපනයට මෙතෙක් ඉතිහාසයේ වෙන් කළ වැඩිම මුදල වෙන් කර තිබෙනවා. මේක වැරදිද? ඊළඟට, ක්‍රීඩා, සෞඛ්‍ය, සුළු වාරිමාර්ග, වෘත්තීය පුහුණුව හා මගී ප්‍රවාහනයට අතිවිශාල මුදලක් වෙන් කර තිබෙනවා. එසේ වෙන් කිරීම, මේ අය වැය ලේඛනයේ තිබෙන වැරැද්දක්ද?

අපේ රටේ මහ බැංකුව මහ දවල් කොල්ල කෑවා. ඒ කොල්ල කාපු මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට දාන්න ගරු මුදල් ඇමතිතුමා මේ අය වැය ලේඛනයෙන් යෝජනා කර තිබෙනවා. ඒ හොරකම් කරපු මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට ගැනීම වරදක්ද? පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ සල්ලි ටික අනිවාර්යයෙන්ම මේ රටේ මහ ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා යොදන්න ඕනෑ නැද්ද?

විශේෂයෙන්ම රූපවාහිනී, ගුවන් විදුලි නාළිකා හදන්න සංඛ්‍යාත ලබා දෙනකොට හැම වෙලාවේම කිව්වේ, "ගජ මිතුරන්ට සලකනවා" කියලා. එහෙම නම් අපේ හිතවතෙකුට, හිතවත් ව්‍යාපාරිකයකුට රූපවාහිනී නාළිකාවක්, ගුවන් විදුලි නාළිකාවක් පටන් ගන්න තිබුණා. හැබැයි ගරු මුදල් ඇමතිතුමා කියනවා, "මින් පස්සේ අපි මේ සංඛ්‍යාත වෙන්දේසියේ විකුණනවා" කියලා. එසේ කටයුතු කරන්නේ හිත මිතුරන්ට දෙන්නද?

ඊළඟට, ගොඩක් දෙනෙකුගේ දැවැන්ත විවේචනයට ලක්වුණා ග්‍රාමීය සංවර්ධනය සඳහා මුදල් වෙන් කිරීම පිළිබඳව. විශේෂයෙන් ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් ප්‍රාථමික පරිපාලන ඒකකයකට මුදල් වෙන් කළා. විපක්ෂයේ සෑම කෙනෙක්ම කිව්වේ, "මේ හදන්නේ ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට හා දේශපාලන හෙංචයියලාට හොරකම් කරන්න දෙන්න" කියලා. මම අලුත් මන්ත්‍රීවරයෙක්. මම ඔබතුමන්ලාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. මන්ත්‍රීවරු හැටියට ඔබතුමන්ලාට මේ දක්වා විමධ්‍යගත අය වැයෙන් මුදල් වෙන් කළා. මේ වතාවෙත් විමධ්‍යගත අය වැයෙන් ලක්ෂ 150 ගණනේ වෙන් කරනවා. ඒ වෙන් කළ මුදල් ඔබතුමන්ලා හොරකම් කළාද? ඒ අත් දැකීමද මේ කියන්නේ? ගමේ තිබෙන කුඩාම පරිපාලන ඒකකය තමයි ග්‍රාම නිලධාරි වසම. ග්‍රාම නිලධාරි වසමේ ඉන්න මිනිසුන්ට සල්ලි දෙන්නේ නැහැ. ග්‍රාමීය කමිටුවක් තිබෙනවා. ග්‍රාම නිලධාරි වසමකට රුපියල් ලක්ෂ 30 ගානේ දෙනවා, යෝජනා දෙන්න කියලා ග්‍රාමීය කමිටුවට කියනවා. ඊළඟට තිබෙන කුඩාම ඒකකය තමයි, පළාත් පාලන ආයතන. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා වසමේ තිබෙන සියලු පොදු දේවල් පිළිබඳව යෝජනා දෙන්න කියනවා. වසම් කීපයකට අයිති ඇළ මාර්ගයක් තිබෙන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් යෝජනා දෙන්න කියනවා. ඊළඟට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරුන්ට, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ඇතුව යෝජනා දෙන්න කියනවා. ඒ සල්ලි යන්නේ දිස්ත්‍රික් ලේකම්තුමාට. ඒක ප්‍රාදේශීය ලේකම්තුමා හරහා ගෙවනවා. ඉතින් මොකක්ද මේ වංචා කරනවා කියන එකේ තේරුම? මේ රට නොමඟ යවන්න එපා; ජනතාව නොමඟ යවන්න එපා. ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් කුඩාම පරිපාලන ඒකකයෙන් පටන් අරගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දක්වා සල්ලි වෙන් කරලා තිබෙනවා. ඒක ඇත්ත. නිෂ්පාදනය වැඩි වන ව්‍යාපෘතිවලට - සංවර්ධන ව්‍යාපෘතිවලට - ඒ මුදල් ගන්න කියලා ගරු මුදල් අමාත්‍යතුමා ඉතා පැහැදිලිව කිව්වා.

නමුත් කථා කළ බොහෝ දෙනෙක් කිව්වේ, නිෂ්පාදනය වර්ධනය වන අය වැයක් ඉදිරිපත් කරලා නැහැ කියන එකයි. එහෙම නැහැ. මෙම අය වැයේ කර්මාන්ත කලාප ආරම්භ කිරීම සම්බන්ධයෙන් වූ යෝජනා තිබෙනවා. ඒ වාගේම ග්‍රාමීය යෝජනා අතර, අවම වශයෙන් සියයට 40ක් හෝ සියයට 100 දක්වා වන ව්‍යාපෘති, හුදෙක් අද වනකොට ජීවනෝපායක් නැති -ජීවත් වෙන්න මාර්ගයක් නැති- අය වෙනුවෙන් ජීවනෝපාය ව්‍යාපෘති විය යුතුයි කියා කොන්දේසියක් දාලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිමද ඉදිරිපත් කරන්නේ කියලා හොයලා බලන්න තමයි, ඔක්තෝබර් 31ට කලින් එම යෝජනා එවන්න කියලා තිබුණේ. එම යෝජනා දැන් හදාගෙන යනවා. දෙසැම්බර් 31 වනකොට එම යෝජනා ටික හදාගෙන, ජනතාවට ඉහළ ජීවනෝපායක් සලසන්න තමයි අපේක්ෂා කරන්නේ. මේ තුළින් ගමේ මනුස්සයාගේ ජීවන මට්ටම යම් ප්‍රමාණයකට සමෘද්ධිමත් කරන්න පුළුවන්.

කොවිඩ් වසංගතය නිසා බොහොම ව්‍යසනයට පත් වෙලා තිබෙන ජීවිත, යම් මට්ටමකට හෝ ගොඩ ගන්න පුළුවන්ද කියලා බලන්න තමයි මේ අය වැය ලේඛනයෙන් අපි මේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න පෙර ඇත්තටම අපි සෑම ආයතනයකින්ම යෝජනා ලබා

[ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා]

ගත්තා. මේ යෝජනා ලබා ගන්න මම පෞද්ගලිකව සම්බන්ධ වුණා. අපි සෑම ආයතනයකින්ම යෝජනා ලබා ගත්තා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව කියන මේ හැම ආයතනයකින්ම කිව්වේ, "බදු වැඩිකරන්න" කියන එකයි. බදු වැඩි කිරීමේ යෝජනා ඒ ආයතන ලිඛිතව දීලා තිබෙනවා. හැබැයි මුදල් ඇමතිතුමා කිව්වේ, VAT එක වැඩි කළොත්, බදු අඩු කරද්දී වාසිය ක්ෂණිකව නොලැබුණත්, -[බාධා කිරීමක්] සමහර මන්ත්‍රීවරුන්ට මෙය තේරෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මට තව තත්ත්පර 30ක් දෙන්න, මෙය පැහැදිලි කරන්න. "මේ VAT එක අඩු කිරීමේ ඵලවිපාක නැහැ, සත පහක වාසියක් ලැබුණේ නැහැ" කිව්වා. නැහැ, ඒ කථාව වැරැදියි. අද වනකොට සියයට 15 VAT එක තිබුණා නම්, විදේශ රටකින් ආනයනය කරපු රුපියල් 100ක් වන භාණ්ඩයක මිල, රුපියල් 300යි.

එහෙම වුණා නම්, සියයට 15 ගණනේ වැට් එක හැටියට රුපියල් 45ක් මිලට එකතු වනවා. හැබැයි, අද එකතු වෙන්නේ රුපියල් 24යි. එතැන මිලෙහි අඩුවීමක් තිබෙනවා. ඒ නිසා එදා ඉඳලා මේ දක්වා වැට් එක අඩු කිරීම නිසා මිල අඩු වීමේ වාසිය ජනතාවට ලැබී තිබෙනවා. ඒක "නැහැ" කියන්න එපා. බදු අඩු කරපු වෙලාවේ ක්ෂණිකව ඒ වාසිය ලැබුණේ නැති වෙන්න පුළුවන්. හැබැයි, මුදල් ඇමතිතුමා කියන විධියට මෙතැනදී අපි වැට් එක ආපසු වැඩි කළා නම්, වැට් එක එකතු වෙලා ක්ෂණිකව ආයෙත් මිල වැඩි වෙනවා. ජනතාව මත දරන්න බැරි බරක් පැටවෙනවා. ඒ නිසා ඇත්තටම බදු වැඩි කරලා නැහැ. මූල්‍ය ක්ෂේත්‍රය සඳහා නම් වැට් එක සියයට 3කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම කියනවා, වක්‍ර බදු තමයි සම්පූර්ණයෙන්ම වැඩි කළේ කියලා. රුපියල් මිලියන 2,000කට වඩා වැඩි, බදු අය කළ හැකි ආදායමක් තිබෙන ආයතනවලින් සියයට 25ක බදු අධිභාරයක් ගැනීම වක්‍ර බද්දක්ද? ඒක සම්පූර්ණයෙන්ම සෘජු බද්දක්. ඒ නිසා මේ අය වැය ලේඛනය මේ ව්‍යසනයෙන් රට ගොඩගන්න දරපු දැවැන්ත උත්සාහයක්. ගරු මුදල් අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ ව්‍යසන තත්ත්වය තුළත්, මේ අභියෝග තත්ත්වය හමුවේත් එතුමා දරපු ප්‍රයත්නය සම්බන්ධයෙන්. මේ අය වැය ලේඛනය අනුව කොවිඩ් උවදුරෙන් මේ රට මුදාගෙන, මේ රට නිවැරදි මාවතට ගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ සඳහා ඔබතුමන්ලාගේත් සහයෝගය දෙන්න කියලා මේ අවස්ථාවේ දී මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.16]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මට විනාඩි 14ක කාලයක් ලැබී තිබෙනවා. මේ කාලය තුළ මම Budget එක සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

இந்த வரவு செலவுத்திட்டமானது, இந்த நாட்டின் வடக்கையும் கிழக்கையும் தெற்கையும் மேற்கையும் ஒன்றுபடுத்தி, இனவாதம், மதவாதம் இல்லாத, அபிவிருத்திக்கான ஒரு வரவு செலவுத் திட்டமாக அமைந்துள்ளதை நாங்கள் அனைவரும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. உதாரணமாக, இந்த நாட்டில் 833 முஸ்லிம் GN Divisions இருக்கின்றன. அத்துடன், 412 முஸ்லிம் பிரதேச சபை உறுப்பினர்களும் அரசோடு சம்பந்தப்பட்ட 11 முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கிறார்கள். இவை எல்லாம் உள்ளடங்கலாக, இந்த நாட்டில் வாழ்கின்ற சிறுபான்மைச் சமூகங்களுக்கென 7,000 மில்லியன் ரூபாய் இந்த வரவு செலவுத் திட்டத்திலே ஒதுக்கப்பட்டிருக்கிறது. இவ்வாறு ஒதுக்கப்பட்டு -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair and* THE HON. SANJEEVA EDIRIMANNA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please continue with your speech.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே உள்நாட்டு உற்பத்தியை ஊக்குவிக்கக்கூடியவாறு இந்த வரவு செலவுத்திட்டம் அமைந்திருப்பதை நாங்கள் மிகவும் சந்தோஷமாக ஏற்றுக்கொள்ள வேண்டியதாக

இருக்கின்றது. ஏனென்றால், இந்த நாட்டிலே உள்நாட்டு உற்பத்தி பாரிய வீழ்ச்சியைக் கண்டிருக்கின்ற இக் காலகட்டத்திலே, உள்நாட்டு உற்பத்தியை அதிகரிப்பதற்குரிய சுயதொழில் வாய்ப்புக்களை ஏற்படுத்தக்கூடியவாறு இந்த வரவு செலவுத்திட்டம் அமைந்திருக்கின்றது.

இந்த நாட்டிலே சிறுபான்மைச் சமூகம் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுத்த வரலாறு அனைவரும் அறிந்த ஒரு விடயமாகும். உதாரணத்துக்கு, கொரோனாவால் இறந்தவர்களின் ஜனாஸாக்கள் எரிக்கப்பட்ட விடயத்தை எடுத்துக்கொள்வோம். அந்தச் சந்தர்ப்பத்தில்கூட, நாங்கள் யாரை அணுகினோம்? கௌரவ பிரதமரையும் நிதி அமைச்சரையும்தான் அணுகினோம். அவர்கள் எங்களுக்காகக் குரல்கொடுத்து, அதற்குரிய தீர்வைக் காலக்கிரமத்திலே பெற்றுத்தந்தார்கள். அதேநேரம், இன்று இந்த நாட்டின் பொருளாதாரத்திலே முக்கிய பங்கை வகிக்கின்ற பால் உற்பத்தி, இறைச்சி உற்பத்தி என்பவற்றுடன் சம்பந்தப்பட்ட விடயமான மாடறுப்பு தொடர்பிலும் பிரச்சினை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்காக மீண்டும் நாங்கள் கௌரவ பிரதமரையும் நிதி அமைச்சரையும்தான் நாடியுள்ளோம். அவர்கள் சம்பந்தப்பட்டவர்களுடன் பேசி, இன்ஷா அல்லாஹ்! அதற்குரிய தீர்வை மிக விரைவிலே பெற்றுத்தருவதாக எங்களுக்கு வாக்குறுதியளித்திருக்கிறார்கள்.

எனவே, இந்த நாட்டிலே வாழ்கின்ற சிறுபான்மைச் சமூகங்களுக்குப் பிரச்சினைகள் ஏற்படுகின்றபொழுது, ஆட்சியாளர்களுடன் பேசி அவற்றைத் தீர்ப்பது சிறந்ததா? அல்லது வாயினால் வற்றாளை நாட்டுவதுபோல், வெற்றுப் பேச்சுக்களைப் பேசி, சிறுபான்மைச் சமூகத்தை உசுப்பேற்றி, மென்மேலும் பிரச்சினைகளை உருவாக்குவது சிறந்ததா? என இந்த நாட்டிலே வாழுகின்ற நான் சார்ந்த சிறுபான்மைச் சமூகத்திடம் கேட்கின்றேன். காரணம் என்னவென்றால், எங்களுடைய சமூகம் பாரிய பிளவுகளுக்கும் பிரச்சினைகளுக்கும் முகங்கொடுக்கக்கூடிய ஒரு காலகட்டத்திலே வாழ்ந்துகொண்டிருக்கின்றது. இப்படியான சந்தர்ப்பங்களில் நாங்கள் என்ன செய்ய வேண்டும்? இருக்கின்ற அரசோடு இணைந்து, எமது பிரச்சினைகளைப் பேசி அதற்குரிய நிரந்தரத் தீர்வுகளை நாங்கள் காணவேண்டுமேயொழிய, அதற்கு மாறாக, 'எல்லோரும் எதிர்க்கின்றார்கள், நாங்களும் எதிர்க்க வேண்டும்' என்று எதிர்ப்பைக் காட்டினால், எங்களுடைய சமூகம் பாரியதொரு பிளவுக்கு முகங்கொடுக்கவேண்டிய சந்தர்ப்பம் இந்த நாட்டிலே ஏற்படும்.

இந்த நாட்டிலே பாரிய டொலர் தட்டுப்பாடு ஏற்பட்டிருக்கின்றது என்பது அனைவரும் அறிந்த ஒரு விடயமாக இருக்கின்றது. காரணம் என்ன? உள்நாட்டு உற்பத்தி பாதிக்கப்பட்டிருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உங்களுக்கும் நன்றாகத் தெரியும்! எங்களுடைய அயல் நாடான இந்தியாவிலே 99.9 வீதமான மக்கள் உள்நாட்டிலே உற்பத்தி செய்கின்ற இயற்கையான பாலைத்தான் அருந்துகின்றார்கள். எங்களுடைய நாட்டிலும் பால் உற்பத்தி செய்யப்படுகின்றது. ஆனால், மக்கள் என்ன செய்கின்றார்கள் என்றால், அந்தப் பாலைக் கடைக்குக் கொடுத்துவிட்டு, வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யப்படுகின்ற பால் மாவைத்தான் தங்களுடைய குழந்தைகளுக்குக் கொடுக்கின்றார்கள். இவ்வாறான ஒரு நிலைமையைத்தான் நாங்கள் எமது நாட்டிலே காண்கின்றோம். எங்களுடைய கௌரவ நிதியமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்கள் உள்நாட்டு உற்பத்தியை அதிகரிக்க வேண்டும் என்பதற்காக, உள்நாட்டு உற்பத்திக்குரிய வாய்ப்பை ஏற்படுத்த வேண்டும் என்பதற்காகப் பாரிய நிதியைக் கிராமரீதியாக ஒதுக்கியுள்ளார். அதாவது, ஒரு கிராமத்துக்கு - GN Divisionக்கு 30 இலட்சம் ரூபாய் வீதமும் ஓர் உள்ளூராட்சிப் பிரிவுக்கு 40 இலட்சம் ரூபாய் வீதமும் நிதியை ஒதுக்கியுள்ளார். கிராம மக்களுடைய காலடிக்குச் சென்று, அவர்களுடைய தேவைகளைக் கேட்டறிந்து, அவற்றை நிறைவேற்றக்கூடிய வகையில்தான் இந்த வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. எனவே, நாடளாவிய ரீதியிலே உற்பத்திகளை அதிகரித்து, பொருளாதாரத்திலே பாரிய ஒரு மாற்றத்தை ஏற்படுத்துவதற்கான ஒரு வாய்ப்பாக இது அமையும் என்பதை நான் இந்தச் சபையிலே தெரிவித்துக்கொள்கின்றேன்.

அதேநேரம், நாங்கள் எமது நாடு சிங்கப்பூர் போன்று வரவேண்டும்; இந்தியா போன்று வரவேண்டும் என்கின்றோம். எப்படி வருவது? நாங்கள் உள்நாட்டு உற்பத்திக்கு முக்கியத்துவம் கொடுக்காவிட்டால், எங்களால் அந்நாடுகள் போன்று வரமுடியாது. ஆகவே, உள்நாட்டு உற்பத்தியை அதிகரிக்கக்கூடிய அனைத்து ஏற்பாடுகளையும் செய்தால் மாத்திரம்தான், எங்களால் இந்த நாட்டை முன்னேற்ற முடியும். இல்லாவிட்டால், சிங்கப்பூர் போன்றும் மலேசியா போன்றும் இந்த நாடு வரவேண்டும் என்று வார்த்தைகளால் மட்டும்தான் சொல்ல முடியுமே தவிர, செயலிலே இந்த நாட்டை முன்னேற்ற முடியாது. எனவே, இப்படியான ஒரு வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டதன் நோக்கம், இந்த நாட்டை உலகத்திலே ஓர் உன்னதமான நாடாக்க வேண்டும் என்பதுதான்.

இன்று நாடு கொரோனாவினால் பாதிக்கப்பட்டு, டொலர் இல்லாத பாரிய பிரச்சினைக்கு முகங்கொடுத்துக் கொண்டிருக்கின்ற ஒரு காலகட்டத்திலேதான் நாங்கள் இருக்கின்றோம் என்பது எம்மனைவருக்கும் தெரிந்த விடயம்! இதற்கு நிரந்தரத் தீர்வு என்ன? இந்தியாவை எடுத்துக்கொண்டால், அந்த நாட்டிலே அனைத்துப் பொருட்களும் உற்பத்தி செய்யப்படுகின்றன. இதனால், அந்நாட்டு மக்கள் யாருக்கும் அடிபணியவேண்டிய தேவையில்லை. அதனால்தான் இன்று இந்தியா தலைநிமிர்ந்து நிற்கக்கூடிய ஒரு நாடாகக் காணப்படுகின்றது. ஆகையால், நான் இந்த நாட்டிலே வாழ்கின்ற எங்களுடைய சிறுபான்மைச் சமூகத்தினரிடம் கேட்டுக்கொள்ள விரும்புவது என்னவென்றால், இருக்கின்ற ஆட்சியாளர்களோடு இணைந்து, எங்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வுகளைக் காணவேண்டும் என்றுதான்.

1948ஆம் ஆண்டு இந்த நாட்டுக்குச் சுதந்திரத்தைப் பெற்றுக்கொடுப்பதற்காக உழைத்த ரி.பி. ஜாயா, சேர் ராசிக் பரீத், அறிஞர் எம்.சி. சித்திலெப்பை ஆகியோரும் எங்களுடைய முன்னாள் கல்வி அமைச்சர் பதியுத்தீன் மஹ்மூத் அவர்களும் மறைந்த மாமனிதர் அஷ்ரப் அவர்களும் இன, மத அடிப்படையில் அரசியல் செய்வது இந்த நாட்டுக்குப் பொருத்தமில்லை என எங்களுக்கு வழிகாட்டிச் சென்றுள்ளார்கள். அதாவது, எங்களுடைய சமூகப் பிரச்சினையானாலும் சரி, வேறெந்தப் பிரச்சினையானாலும் சரி, இருக்கின்ற ஆட்சியாளர்களோடு இணைந்து, அவர்களிடம் எமது பிச்சினைகளை முன்வைத்து, அவர்களது உள்ளங்களை வென்று, அவற்றைத் தீர்க்க வேண்டும் என்றுதான் எங்களுக்கு வழிகாட்டிச் சென்றிருக்கிறார்கள். மறைந்த மாமனிதர்கள் காட்டித் தந்த அந்த வழியிலே எங்களுடைய அரசியல் பயணம் நடைபெறாததன் காரணமாகத்தான் இன்று சிறுபான்மைச் சமூகம் இந்த

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

நாட்டிலே அடிமைச் சமூகமாக, உரிமையிழந்த சமூகமாகத் தத்தளித்துக்கொண்டிருக்கின்றது. எப்போது நாங்கள் எங்களுடைய உரிமைகளைப் பெறுவது? அம்பாறை மாவட்டத்திலும் சரி, மட்டக்களப்பு மாவட்டத்திலும் சரி, சிறுபான்மைச் சமூகத்தினுடைய எத்தனையோ பிரச்சினைகள் தீர்க்கப்படாமல், தலைக்கு மேலால் போய்க் கொண்டிருக்கின்றன. அவற்றை எப்படித் தீர்ப்பதென்று எங்களுடைய தலைவர்கள் யாரும் முன்வந்து எந்தவிதமான முன்மொழிவையும் முன்வைக்காமல் இருக்கின்றார்கள். 'பிச்சைக்காரனுக்குப் புண் இருக்கும் வரைக்கும்தான் பிச்சை வாங்க முடியும்' என்பதுபோல, எங்களுடைய சமூகத்திலே எந்தளவுக்கு சமூகப் பிரச்சினை இருக்கின்றதோ, அந்தளவுக்குத்தான் எங்களுடைய அரசியல்வாதிகளுக்கு அரசியல் செய்யலாம். எனவே, நாம் செய்யக்கூடிய அரசியலானது தீர்வுக்குரிய அரசியலாக இருக்க வேண்டுமே ஒழிய, தீர்வில்லாத அரசியலாக இருக்கக்கூடாது. அதாவது, இந்த நாட்டிலே அமைதியாக வாழ்கின்ற முஸ்லிம் சமூகத்தை, கத்தோலிக்க சமூகத்தை, தமிழ்ச் சமூகத்தைப் பலிகொடுத்து அரசியல் செய்வது முறையல்ல.

அன்று, தமிழ் சமூகத்தைச் சார்ந்த சிலர் LTTE என்ற அமைப்பினூடாக இந்த நாட்டிலே பாரிய விளைவுகளை ஏற்படுத்தினார்கள். அதன்மூலம் அந்தச் சமூகம் எதைக் கண்டது? 30 வருடகால யுத்தத்திலே கண்டது எதுவுமே இல்லை! ஆனால், இழந்தது பல்லாயிரம் கோடி ரூபாய் பெறுமதியுடைய சொத்துக்களும் பல்லாயிரக்கணக்கான உயிர்களுமே! அதேபோன்றுதான், நல்லாட்சி அரசாங்கக் காலத்திலே நாசமாய்ப்போன சஹ்ரான் என்பவன் ஓர் அநியாயமான, கொடூரமான, மோசமான செயலில் ஈடுபட்டு, இந்த நாட்டில் வாழ்கின்ற சிறுபான்மைச் சமூகமான அப்பாவி முஸ்லிம் சமூகத்தைப் பலிகொடுத்த வரலாறும் இந்த நாட்டில் இருக்கின்றது. ஆகையால், இந்தச் சமூகத்திலே வாழுகின்ற எங்களுடைய சகோதரர்களிடம் நாங்கள் கேட்டுக்கொள்வது என்னவெனில், வெறுமனே பேச்சளவில் மட்டும் வீரம் பேசக்கூடிய அரசியல்வாதிகளுக்கு அடிபணிந்து, அடிமைச் சமூகமாக வாழாது, ஆட்சியாளர்களுடன் பேசி, எங்களுடைய உரிமைகளை வென்றெடுக்கக்கூடிய சமூகமாக வாழ வேண்டும் என்பதைத்தான். இந்த நாட்டிலே இருக்கின்ற சனாதிபதியாக இருக்கலாம்; பிரதம அமைச்சராக இருக்கலாம்; ஏனைய அமைச்சர்களாக இருக்கலாம். இவர்களுடன் பேசி, எங்களுடைய உரிமைகளைப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில் அரசியல் செய்தால் மாத்திரமே, எங்களால் எங்களுடைய பிரச்சினைகளைத் தீர்க்க முடியும். அதைவிடுத்து, வாயினால் வற்றாளை நாட்டுவதுபோல, இங்கு வெற்றுப் பேச்சுக்களைப் பேசிவிட்டு, கிராமங்களுக்குச் சென்று மக்களிடம், "அதோ பேசிவிட்டோம்; இதோ வருகிறோம்!" என்றுகூறி, எமது சமூகத்தை வேண்டுமானால் ஏமாற்ற முடியும். அதனால், எமது சமூகம் எந்தப் பலனையும் காண முடியாது.

ஆகவே, நான் எனது சமூகத்தினரிடம் கேட்கிறேன், நீங்கள் எங்களைப் பாராளுமன்றத்துக்கு அனுப்பியது வெறுமனே இந்தச் சபைக்கு வந்து உங்களைப் பலிகொடுப்பதற்காகவா? உங்களை ஏமாற்றுவதற்காகவா? உங்களை உசுப்பேற்றுவதற்காகவா? அல்லது உங்களுடைய பிரச்சினைகளுக்கு நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுப் பதற்காகவா? என்று. எங்களுடைய கிராமங்களிலே எவ்வளவோ பிரச்சினைகள் இருக்கின்றன. வெறுமனே கட்சியின் நிறத்தை வைத்து, "வெட்டினால் சிவப்பு! வெட்டினால் பச்சை! வெட்டினால் மஞ்சள்!" என்று சொல்லிக்கொண்டிருந்தால், எங்களுடைய எதிர்காலம் ஒளிமயமாகாது. நாங்கள் கல்வியிலே முன்னேற வேண்டும்; சுகாதாரத்திலே முன்னேற வேண்டும். அத்துடன், எமது கிராமங்கள் அபிவிருத்தியடைய வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர்கள் அவர்களே, அப்படியென்றால், நாங்கள் என்ன செய்ய வேண்டும்? எங்களுடைய கிராமங்களை அபிவிருத்தி செய்ய வேண்டும்; உற்பத்திகளை அதிகரிக்க வேண்டும்; வியாபாரத்தை முன்னேற்ற வேண்டும்; தொழில்வாய்ப்புக்களை அதிகரிக்க வேண்டும். இவ்வாறு செய்வதன்மூலம் மாத்திரம்தான், எங்களால் இந்த நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்லக் கூடியதாக இருக்கும். நாங்கள் எங்களுடைய சமூகத்துக்கும் நாட்டுக்கும் பயனுள்ள மக்கள் பிரதிநிதிகளாக இருக்க வேண்டுமே ஒழிய, இந்தச் சபைக்கு வந்து வெறுமனே உசுப்பேற்றக்கூடிய வார்த்தைகளைப் பேசி, எங்களுடைய சமூகத்தைப் பலிகொடுக்கக்கூடியவர்களாக இருக்கக்கூடாது. அந்த அடிப்படையில்தான் நாங்கள் அரசாங்கத்தோடு இணைந்து செயற்படுகிறோம். நான் உட்பட எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் அனைவரும் ஒன்றுசேர்ந்து, எமது சமூகம் முகம்கொடுத்துக்கொண்டிருக்கும் பிரச்சினைகள் தொடர்பில் சம்பந்தப்பட்ட உயர் அதிகாரிகளுடன் பேசிப் பல பிரச்சினைகளுக்குத் தீர்வுகளைக் கண்டிருக்கிறோம்; தீர்வுகளைக் கண்டுவருகிறோம். அவ்வாறே, எங்களுடைய சமூகத்தை நோக்கி வந்துகொண்டிருக்கின்ற பிரச்சினைகளுக் கான தீர்வுகளைக் காண்பதற்கும் நாங்கள் தயாராகிக் கொண்டிருக்கிறோம்.

இந்த வரவு செலவுத்திட்டமானது எந்த இனத்தையோ, எந்தக் குலத்தையோ, எந்த மதத்தையோ அடிப்படையாகக் கொண்டு சமர்ப்பிக்கப்பட்ட ஒரு வரவு செலவுத்திட்டம் அல்ல.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இந்த நாட்டிலே வாழுகின்ற அனைத்து இன மக்களையும், அனைத்துச் சமூகங்களையும் உள்ளடக்கி, அனைவருக்கும் சமமான முறையில் ஒரே விதமாக நிதி ஒதுக்கீடுகளைச் செய்து, அபிவிருத்தியை நோக்கிய ஒரு Budgetஆக இது சமர்ப்பிக்கப் பட்டிருப்பதாகத்தான் நான் இதனைப் பார்க்கின்றேன். உண்மையிலேயே இந்த வரவு செலவுத்திட்டமானது, வரவேற்கத்தக்க ஒரு வரவு செலவுத்திட்டமாக இருக்கின்றது. காரணம் என்னவென்றால், இந்த நாட்டிலே வாழுகின்ற சிறுபான்மைச் சமூகங்களுக்கென 7,000 மில்லியன் ரூபாய் நிதி இந்த வரவு செலவுத்திட்டத்திலே ஒதுக்கீடு செய்யப்பட்டிருக் கின்றது. எனவே, உள்நாட்டு உற்பத்தியை அதிகரித்து, எமது நாட்டை முன்னேற்றமடைந்த ஒரு நாடாக மாற்றுவதற்காகத் தயாரிக்கப்பட்டதுதான் இந்த வரவு செலவுத்திட்டம் எனக் கூறி, எனக்கு நேரத்தை ஒதுக்கித் தந்த உங்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හෙට-අනිද්දා වෙනකොට මේ ජනාධිපතිතුමා පත් වෙලා, මේ ආණ්ඩුව පත් වෙලා වසර දෙකක කාලයක් සම්පූර්ණ වෙනවා. මේ රටේ ජනතාව විශාල බලාපොරොත්තු එක්ක තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එදා ජනාධිපතිවරයා හැටියට පත් කළේත්, මේ ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් ලබා දුන්නේත්. නමුත්, ආණ්ඩුවත්, ජනාධිපතිවරයාත් බලයට ඇවිල්ලා අවුරුදු දෙකක් සම්පූර්ණ වන මේ මොහොත වන විට, මේ රටේ කවදාවත් ජනාධිපතිවරයෙක්, ආණ්ඩුවක් විවේචනය නොකරපු අන්දමට ජනතාව මේ ආණ්ඩුවත්, ජනාධිපතිවරයාත් විවේචනය කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුව, මේ ජනාධිපතිවරයා මේ රටට සාපයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ ගැන ජනතා විරෝධය මේ වෙනකොට දැඩි ලෙස ඇවිල්ලා තිබෙනවා. හෙට දිනයේදී සමගි ජන බලවේගයත්, මේ ආණ්ඩුවට විරුද්ධ සියලු පාර්ශ්වත්, මේ ආණ්ඩුවට විරුද්ධ ජන මතයක් ඇති වෙලා තිබෙන නිසා, අපත් තල්ලු කරගෙන මේ ආණ්ඩුවට විරුද්ධව විරෝධතාවක් ගෙන එන්න ලෑස්තියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට එම ජන මතයට විරුද්ධව කවදාකවත් නැති ආකාරයට ආණ්ඩුවෙන් විශාල මර්දනයක් එල්ල වෙලා තිබෙන බව ඔබතුමාත් දන්නවා. ජනතාව එකතුවෙන මෙවැනි අවස්ථාවකට ආණ්ඩුවක් මේ විධියට දැඩි වශයෙන් භය වෙලා තිබෙන ආකාරයක් මම දැකලා නැහැ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින්ට බලපෑම් කරලා කොවිඩ් වසංගතයේ ගැටලුවක් පෙන්වාදීලා, මේ එකතුවීමට විරුද්ධව සෞඛ්‍ය නීතිරීති ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම, පසුගිය සති අන්තයේ ඉඳන් පොලීසියේ ඉහළ නිලධාරින්ට දැඩි ලෙස බලපෑම් කරලා තිබෙනවා. කොටින්ම කිව්වොත්, අපට සහයෝගය ලබා දෙන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට ගිහිල්ලා ඒ මන්ත්‍රීවරුන්ට බලපෑම් කරලා තිබෙනවා, මේ කටයුත්තට සම්බන්ධ වෙන්න එපා කියලා. අද එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. හැම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේම ගෙවල්වලට එවැනි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මෙන්න මේ වාගේ ගැටලුවක් අද තිබෙනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා කියන්නේ කොහොමද එවැනි දෙයක් සිද්ධ වෙලා නැහැ කියලා? එහෙම නම් පොලීසිය උසාවි ගාණේ ගිහිල්ලා මේ විරෝධතාව නතර කරන්න, තහනම් නියෝග ගන්න උත්සාහ කරන්නේ ඇයි? නමුත්, අපි කියන්න සතුටුයි, බොහෝ අධිකරණ ඊට විරුද්ධව තීන්දු ලබාදීලා තිබෙන බව. මේවායින් අපි තවත් ධෛර්යවත් වෙනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන්සේලා කරන්න පුළුවන් දෙයක් කරන්න. තමුන්නාන්සේලා ඔච්චර භය මොකද? තමුන්නාන්සේලාට පුළුවන් නම් ඒවා නතර කරන්න. අපි ඉතා වගකීමෙන් කියන්නේ, මේ ආණ්ඩුවට විරුද්ධව ඇතිවෙලා තිබෙන ජනමතය පාගලා නතර කරන්න බැහැ කියලායි. ඒක පාගලා නතර කරන්න බැහැ. ඒක පාගලා නතර කරන්න විධියක් නැහැ. මොකද, මේ වෙනකොට අපට වඩා තමුන්නාන්සේලාගේ පැත්තෙන් තමයි මේ ආණ්ඩුවට විරෝධය තිබෙන්නේ. ඔන්න, ඔබතුමාට එහා පැත්තේ ඉන්න පාර්ශ්වයෙන්. මේ ආණ්ඩුව ඇතුළත ඉඳගෙන ඊට වඩා ලොකු විරෝධතාවක් තිබෙනවා. මේ වන විට අද ආණ්ඩුවට විරුද්ධව දැවැන්ත රැල්ලක් ඇතිවෙලා තිබෙනවා. හැබැයි, "එක රටක්-එක නීතියක්" කියලායි බලයට ආවේ. "එක රටක්-එක නීතියක්" නම් මේ රටේ තිබෙන්නේ මම මේ ගැන අහන්න කැමැතියි. පඩුවස්නුවරදී රාජ්‍ය උත්සවයක් ඊයේ තිබුණා. ඒකට නිරෝධායන නීති බලපාන්නේ නැද්ද? තමුන්නාන්සේලාගේ පොහොට්ටු පක්ෂයේ,-

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ. පඩුවස්නුවර කියන්නේ ඔබතුමාගේ නම නොවෙයි නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමනි, මමයි ඒක සංවිධානය කළේ. ඒකයි මම කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිසිම වෙලාවක ඒ කඨින උත්සවයට සහභාගි වෙන්න කියලා කිසිම කෙනෙකුට ආරාධනා කළේ නැහැ. ඔවුන් ස්වේච්ඡාවෙන් ආවේ. නමුත් මේ තිබෙන උද්ඝෝෂණවලට බස්වලින් සෙනඟ ගෙනැල්ලා තමයි වැඩේ කරන්න හදන්නේ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා මගේ වෙලාව මට ලබා දෙන්න. ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාගේ පොහොට්ටුවේ සම්මේලන තියනකොට නිරෝධායන නීති නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ යම් යම් උත්සව තියනකොට නිරෝධායන නීති නැහැ. ඒ නිසා "එක රටක් -එක නීතියක්" නොවෙයි තිබෙන්නේ. මේ ආණ්ඩුවට විරුද්ධව ජනතාව එකතු වෙනකොට, ආණ්ඩුවට විරුද්ධව ජනතාව මේ වාගේ පෙළ ගැහෙනකොට ඒවාට විරුද්ධව තමුන්නාන්සේලා කරන දේ ඉතාම ලජ්ජයි. අය වැය නොවෙයි, අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්න තමයි දැන් මේ උත්සාහ කරන්නේ.

**ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத் தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගෙන් මා අහනවා, ඔබතුමා ජාතික කඨින මහෝත්සවය පවත්වනවාට විරුද්ධද, නැද්ද කියලා. නමුත් ඔබතුමන්ලාට-

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
අනේ ගරු ඇමතිතුමා, අපේ කඨින උත්සවයේ කඨින පෙරහැර අද පාන්දර හතරට මගේ ගෙදරටත් ඇවිල්ලා තමයි ගියේ. අපි කඨින උත්සවවලට විරුද්ධ නැහැ. තමුන්නාන්සේට වඩා ලොකු බෞද්ධයෙක් මම. [බාධා කිරීමක්] අනේ යන්න, කෑ ගහන්නේ නැතුව. ඒ වුණාට රාජ්‍ය උත්සව සිය ගණනක්-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මගේ වෙලාව.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
වෙලාව අපෙන් ගන්න. [බාධා කිරීමක්] වෙලාව අපෙන් අඩුකර ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට මා කියන්න කැමැතියි,- [බාධා කිරීමක්] නැහැ, නැහැ. නිවැරදි කරන්න ඕනෑ. ඔබතුමා පාර්ලිමේන්තුව නොමඟ යවනවා. ඒ කඨින උත්සවය තිබුණේ අපේ දිස්ත්‍රික්කයේ. ඒ ගමේ මිනිස්සු තමයි ඒකට ඇවිල්ලා හිටියේ. හැබැයි, අපි ඒ මිනිස්සු රැස් කළේ, කොවිඩ් බෝ කරන්න නොවෙයි. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ පක්ෂය තමයි ගුරුවරු ගෙනැල්ලා පාරට බස්සලා, උද්ඝෝෂණ කරලා මිනිස්සු මරණ යුගය ඇති කළේ. පසුගිය අවුරුද්දේම -හැමදාම- කළේ ඒක. මිනිස්සු මරා ගන්න කැමති විපක්ෂයක්! ඒක තමයි ඇත්ත තත්ත්වය. වෙන දෙයක් නොවෙයි. මිනිස්සු මරා ගන්න හදන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට මයික් එක දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඇමතිතුමා කිව්වා වෙලාව දෙන්නම් කියලා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
එහෙම රීතියක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, ඔබතුමා කථා කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, "එක රටක්-එක නීතියක්" නැහැ කියන එකයි මම කියන්නේ. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයට ඕනෑකොට, ආණ්ඩු පක්ෂයේ උත්සව තියනකොට කොරෝනා හැදෙන්නේ නැද්ද? විපක්ෂයේ යම් විරෝධතාවක් තිබෙනකොට විතරද, කොරෝනා හැදෙන්නේ? ඇයි භය? [බාධා කිරීම්] ඇයි භය? [බාධා කිරීම්] ඇයි භය? [බාධා කිරීම්] තමුන්නාන්සේලාට -ආණ්ඩු පක්ෂයට- එක නීතියකුත්, විපක්ෂයට තවත් නීතියකුත් තිබෙන්න බැහැ. ඔබතුමන්ලා ලස්සනට ඒ උත්සවය සංවිධානය කළා; හොඳයි. ඒ විධියටම විපක්ෂයටත් අවස්ථාව දෙන්න. දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරන්න එපා කියන එක විතරයි අපි කියන්නේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටයි, ආණ්ඩු පක්ෂයේ අනෙක් සියලුදෙනාටයි මේක ඇහිලා රිදිලාද, භය වෙලාද, මොකක් වෙලාද කියලා මා දන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමනි, මෙහේ ඇවිත් උද්ඝෝෂණ කර කර ඉන්නේ නැතිව ඔබතුමාත් හොඳ කඨින උත්සවයක් කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මන්ත්‍රීතුමනි, කඨින උත්සවයක්ද, නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. මෙතැන තිබෙන ප්‍රශ්නය ජනතාව එක්රැස් වෙනවාද, නැද්ද කියන එකයි. උත්සවයෙන් උත්සවයට නොවෙයි අවසර ලබා දෙන්නේ. ඔබතුමා නීතිඥ මහත්මයෙක් හැටියට ඒ ගැන මීට වැඩිය හොඳට දන්නවා. තමුන්නාන්සේලාම නේ කිව්වේ අපට මේවා කියන්න කියලා. *[බාධා කිරීම්]* මේක අය වැය තමයි. *[බාධා කිරීම්]* මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන ලොකු ප්‍රශ්නයක්. මේක ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න කියලා. ඒක ආණ්ඩු පක්ෂයටද, විපක්ෂයටද කියන එක නොවෙයි. ඒ සියලුදෙනාට අවස්ථාව ලබා දෙන්න කියලා මම මේ වෙලාවේ කියනවා. *[බාධා කිරීම්]* බොරලුද, පස්ද? *[බාධා කිරීම්]* හරි, හරි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඉතා උනන්දුවෙන් මේ විවාදයට එකතු වෙලා තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Hon. Member, please speak about the Budget that has been presented, not about other things. We have - *[Interruption]* The Hon. Minister is here.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Hon. Member, this is my turn to speak. I will speak on the topic that I prefer, not according to your preference.

Going back to the point, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආර්ථිකය මෙහෙයවනකොට ප්‍රධාන වශයෙන් ආණ්ඩු පක්ෂයේ තර්කය වන්නේ, කොවිඩ් වසංගතය නිසා තමයි ආර්ථික අර්බුදයක් ඇති වෙලා තිබෙන්නේ කියන එක. කොවිඩ්

ප්‍රශ්නය නිසා ආර්ථික අර්බුදයක් ඇති වෙන එක ගැන කිසිම විවාදයක් නැහැ. මේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ අනෙක් රටවලත් කොවිඩ් වසංගතය නිසා ආර්ථිකයට බලපෑමක් වුණා. නමුත් මේ ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණයේ තිබුණු ගැටලුව නිසා, නිසි ආකාරයෙන් කළමනාකරණය නොකිරීම නිසා තමයි අද මෙවැනි අර්බුද තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා දන්නවා, මේ වෙනකොට ලොකු භයක් සැකයක් ඇති වෙලා තිබෙනවා, ලබන සතිය වෙනකොට පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් තියෙයිද නැද්ද කියන එක පිළිබඳව. අපට ආරංචි වෙලා තිබෙනවා, ඉතිහාසයේ කවදාවත් නොවූ ආකාරයට විශාල හිඟයක් ඇති වෙනවා කියලා. බොර තෙල් අවසන් වෙලා, බොර තෙල් ආනයනය කිරීමේ ගැටලුවක් තිබෙනවාය කියනවා. ඒ අමාත්‍යවරයා ප්‍රකාශ කළා, මාසයක පමණ කාලයකට පමණක් තිබෙනවා කියලා. එතුමා ප්‍රකාශය කරලා දැන් නම් මාසය ඉවර වෙලා. දැන් අර්බුද තත්ත්වයක් තිබෙනවා. අද සිමෙන්ති ටික නැහැ. මේ ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරු කියනවා, සිමෙන්ති පෝලිම් එනතුරු අපි බලාගෙන හිටියා කියලා. අපි මොනවා කරන්නද? සිමෙන්ති පෝලිම තවම තිබෙනවා. අද ඉදිකිරීම් ක්ෂේත්‍රය නැති වෙලා. ඒ විතරක් නොවෙයි. තවම ගෑස් සිලින්ඩරයක් ගන්න පෝලිම්වල ඉන්න වෙලා තිබෙනවා. කිරිපිටි පැකට් එකේ ප්‍රශ්නය තිබෙනවා. ඒ ප්‍රශ්න විසඳිලා නැහැ. මේ අය වැයෙන් අපේ රටේ ජීවත් වෙන ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලැබිලා තිබෙනවාද, නැද්ද කියන එක ලොකු ප්‍රශ්නයක්. පසුගිය වසර දෙක ඇතුළත ජීවන වියදම තුන්හතර ගුණයකින් වැඩි වෙලා තිබෙන බව ඔබතුමන්ලා දන්නවා. සෑම භාණ්ඩයක හා සේවාවක මිල ගණන් දෙතුන් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. දෙතුන් ගුණයකින් වැඩි වුණු ජීවන වියදමේ බරට යම් සහනයක් ලබා දෙන්න මේ අය වැයෙන් කටයුතු කරලා තිබෙනවාද? නැහැ. අපි එදා රුපියල් 10,000කින් - සියයට 106කින් - රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා.

නමුත්, මේ වෙනකොට ඒ ප්‍රමාණයත් මදි වෙලා තිබෙනවා. මේ රටේ පෞද්ගලික අංශයේ සහ රජයේ සියලු සේවකයන් බලාපොරොත්තු වුණා යම් මුදලක් තමාගේ වැටුපට වැඩි වෙයි කියලා. අපි සතුටු වෙනවා ගුරුවරුන්ගේ ප්‍රශ්නයට මැදිහත් වෙලා මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම පිළිබඳව. ගුරුවරු මෙපමණ කාලයක් එළියට බහින්නේ නැතුව හිටියේ අපේ කාලයේ ලබා දුන්න රුපියල් 10,000 නිසායි. ඒ රුපියල් 10,000 විතරක් නොවෙයි, අපි 2019 වර්ෂයේදී තවත් රුපියල් 2,500ක් ලබා දුන්නා. ඒ අය ගෙදර ගෙනියන වැටුප සියයට 106කින් වැඩි කළා. ඒක හින්දා තමයි ඒ අය මෙච්චර කාලයක් පාරට බහින්නේ නැතිව හිටියේ. හැබැයි, ගුරුවරුන්ගේ ප්‍රශ්නය යම් ආකාරයෙන් විසඳුණාට, සමස්ත සෙසු රජයේ සේවකයන්ගේ වැටුපට මොකක්ද වෙන්නේ? අද සාමාන්‍ය රජයේ සේවකයෙකුගේ වැටුපෙන් ජීවත් වෙන්න බැරි මට්ටමකට පත් වෙලා තිබෙනවා. ඒකයි යථාර්ථය. ඒ නිසා විශේෂයෙන්ම මම මේ වෙලාවේදී, මේ ජීවන වියදමට විසඳුමක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* මගෙන් නොවෙයි මූලාසනයෙන් ඉල්ලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු මන්ත්‍රීතුමනි, කාරණාවක් අහන්න පොඩ්ඩක් ඉඩ දෙන්න කියලායි ඉල්ලුවේ.

දැන් ඔබතුමා පඩි ගැන කියනවා. තමුන්නාන්සේලා අධිකරණ ක්ෂේත්‍රයට විශාල වරප්‍රසාද දුන්නා. ඇයි රාජ්‍ය සේවයට ඒක දුන්නේ නැත්තේ? තමුන්නාන්සේලාගේ කාලයේ අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරින්ට වරප්‍රසාද විශාල ප්‍රමාණයක් දුන්නා, State Counselsලා වාගේ සියලුදෙනාටම දුන්නා. ඇයි ඒවා රාජ්‍ය සේවයට දුන්නේ නැත්තේ? රාජ්‍ය සේවයේ විධායක නිලධාරින්-

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු ඇමතිතුමනි, මම අදහස් ප්‍රකාශ කළේ අපි සමස්තයක් හැටියට රජයේ සේවකයන් සියලුදෙනාගේම වැටුප සියයට 106කින් වැඩි කළ බවයි. එවැනි දෙයක් ඉතිහාසයේ කවදාවත් කරලා තිබුණේ නැහැ. මූලික වැටුපට එපමණ මුදලක් වැඩි කිරීම කවදාවත් සිදු වෙලා නැහැ. ඒක ගුරුවරුන්ට පමණක් නොවෙයි, හැමෝටම ලැබුණා. සමස්ත රජයේ සේවකයන්ට ඒ වැටුප ලැබුණා. කරුණාකරලා මම මේ වෙලාවේ තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ විධියේ දෙයක් කරන්න කියලා. *[බාධා කිරීම්]* මම කියන්නේ එච්චරයි. ගරු මුදල් ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. ගුරුවරුන්ගේ වැටුප් වැඩි වීම හොඳයි; ස්තුතියි. ඒ ගැන විවාදයක් නැහැ. මගේ යෝජනාව, සමස්ත රජයේ සේවකයන්ට මේ වැඩිවීම කරන්න කියන එකයි. මොකද, ඒ අය අද එදාට වඩා අමාරු තත්ත්වයකයි ඉන්නේ. ඇත්තටම 2015 ඉඳලා 2019 වනතුරු භාණ්ඩ මිල ගණන් ඉහළ ගිහින් තිබුණේ නැහැ. ඇත්තටම මිල ගණන් අඩු වෙලායි තිබුණේ. ඉන්ධන මිල ගණන් අඩු වෙලායි තිබුණේ, ගෑස් මිල ගණන් අඩු වෙලායි තිබුණේ. 2019 ඉඳලා, විශේෂයෙන් පසුගිය අවුරුදු තුන ඇතුළත භාණ්ඩ මිල ගණන් දැවැන්ත ලෙස ඉහළ යෑමක් සිදු වෙලා තිබෙනවා. ඒකයි යථාර්ථය. තමුන්නාන්සේලා ඒක පිළිගන්නවා නම් පිළිගන්න, නැත්නම් පිළිගන්න එපා. ඒකත් අපේ වැරැද්ද නිසා කියන්න පුළුවන්. ඒ කෙසේ වෙතත්, මම මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, සමස්ත රාජ්‍ය සේවයටම ඒ අවස්ථාව ලබා දෙන්න කියලා.

අද තමුන්නාන්සේලා මැදිහත් වෙන්න ඕනෑ ප්‍රධානම දේ තමයි, මේ අය වැයෙන් බලාපොරොත්තු වෙන ප්‍රධානම දේ තමයි, මේ රටේ ජනතාව ජීවත් කරවීම. ඒ අයට ජීවත්වීම ගැටලුවක් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා අද අම්මලා තමන්ගේ දරුවන් එක්ක සියදිවි නසා ගන්නා උත්සාහයක යෙදෙන බව. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි ජීවත් වෙන්න බැරිකම නිසා. *[බාධා කිරීම්]*

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera )
හරි. මම දන්නේ නැහැ, ඔබතුමා කියනවා සියයට 106කින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා කියලා. මම දන්නේ නැහැ ඔය දර්ශක කොහොමද කියන එක. *[බාධා කිරීම්]* නමුත්, අපි කියමුකෝ සියයට 106කින් වැඩි කළා කියලා. එහෙම නම් ඇයි තැපැල් ඡන්දවලින් පැරදුණේ? *[බාධා කිරීම්]*

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දන්නේ නැතිකමට මට මොළය දෙන්න බැහැනේ. මොළය දෙන්න බැහැනේ. *[බාධා කිරීමක්]* හරි, හරි. මට කියන්න පුළුවන්. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාගෙන් හරි අහගන්න, කොහොමද කියලා. ඔබතුමා පොඩ්ඩක් කියලා දෙන්න. *[බාධා කිරීමක්]* ඒකනේ කියන්නේ, මගේ වේලාව ගන්න එපා, ඔබතුමා වෙනම කියලා දෙන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මන්ත්‍රීතුමා මගේ නම කිව්වා. මම හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගෙන් අහන්නේ ඔබතුමන්ලා පඩි වැඩි කළා කිව්වානේ. ඒත් තැපැල් ඡන්ද පරාදයිනේ?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒක හරි. හැටනව ලක්ෂයක් තමුන්නාන්සේලාට ඡන්දය දුන්නා. හැබැයි, ඒ හැටනව ලක්ෂයෙන් හැට ලක්ෂයක් මේ වෙනකොට නැති වෙලා. ඒකයි ඇත්ත.

තමුන්නාන්සේලා දන්නවා නේ, කොහොමද ඡන්දය ගත්තේ කියලා. හැටනව ලක්ෂයක් ජනතාව රැවටුණා. ඒ ජනතාව දැන් පිළිගන්නවා රැවටුණා කියලා. ජාතිවාදය අවුස්සලා, ආගම්වාදය අවුස්සලා, බෝම්බ ගහලා, නයි පෙන්නලා-*[බාධා කිරීමක්]* Dr. Shafi හිටියේ තමුන්නාන්සේ නියෝජනය කරන ප්‍රදේශයේ ඉස්පිරිතාලයේ නේ, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි. වඳ සැත්කම්, වඳ පෙති, වඳ කොත්තුත් තියෙනවා කිව්වා නේ, ගරු ඇමතිතුමනි. දැන් කෝ, Dr. Shafi? දැන් කෝ? දැන් ඒ කට්ටියටම බබාලා හම්බ වෙලා ඇති. දැන් ඒ ගැන කියලා කෑ ගහපු නෝනලාත් නැහැ. ඒ වෙලාවේ ලස්සනට ඒක කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙක, තුනක කාලයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අමතරව විනාඩි එකහමාරක් ඔබතුමාට දුන්නා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයට වෙන් කර තිබෙන කාලයෙන් විනාඩි දෙකක් මට ලබා දෙයි. *[බාධා කිරීමක්]* ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඔබතුමාත් විනාඩි 5ක් දෙනවා කිව්වා නේ. ඒ අවස්ථාව දෙන්න. ගරු ප්‍රසන්න රණවීර රාජ්‍ය ඇමතිතුමා අහපු ප්‍රශ්නයට උත්තරය "ඔව්. තැපැල් ඡන්දවලින් පරාජය වුණා" කියන එකයි. ඒ ගැන විවාදයක් නැහැ. නමුත්, මම මේ කාරණාවත් කියන්න කැමැතියි. තමුන්නාන්සේලා මෙවර අය වැයෙන් ගුරුවරුන්ගේ වැටුප් වැඩි කළා. ඔය කොච්චර වැඩි කළත්, මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරු තත්ත්වයක් තිබෙන නිසා ඊළඟ මැතිවරණයේදී තමුන්නාන්සේලා තැපැල් ඡන්දවලින් පරාජය වෙනවා කියලා මට සියයට සියයක් විශ්වාසයි. අපි තමයි ඊළඟ මැතිවරණයේදී ජයග්‍රහණය කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හීනෙන් තමයි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මම විශ්වාස කරනවා, ජයග්‍රහණය කරයි කියලා. *[බාධා කිරීම්]* හීනෙන් හරි මම විශ්වාස කරනවා. මේ යන විධියට මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැරි මට්ටමට යනවා. එම නිසා අපි මේ කරන විවේචනයෙන් තමුන්නාන්සේලා වැරැදි නිවැරැදි කරගන්න. මොකද, අපිට බලාපොරොත්තුවක් නැහැ, හෙට අනිද්දා ආණ්ඩු බලය ගන්නවත් වෙනත් දෙයක් කරන්නවත්. ඒ සඳහා මැතිවරණයක් තිබෙනවා. තමුන්නාන්සේලා හොඳට කළා කියලා ජනතාව හිතනවා නම්, "මම තමයි හොඳටම කළේ" කියන එක හරියි කියලා ජනතාව හිතනවා නම් තමුන්නාන්සේලාට ජනතාව ඡන්දය දෙයි. අපි ගැන විශ්වාසයක් තිබෙනවා නම් අපට ඡන්දය දෙයි. ඒක රටේ ප්‍රජාතන්ත්‍රවාදය. මේ වෙලාවේ මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ -

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Sir, I rise to a point of Order.

Hon. Member, do not waste time. We are debating the important National Budget. Now, you mentioned about Dr. Shafi. What has Dr. Shafi got to do with this?- *[Interruption.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Thank you, Hon. Presiding Member.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, අපි කියන්නේ මේකයි. ආණ්ඩු පක්ෂයේ ඔබතුමන්ලාට ඡන්දය දෙන්නත්, අපට ඡන්දය දෙන්නත්, කාට ඡන්දය දෙන්නත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තියෙන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට දේශපාලනය කරන්නත්, ජනතාවගේ ජනතා මතයටත් නිදහස තියෙන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයෙන් යම් යම් උත්සව සංවිධානය කරනකොට ඔබතුමන්ලාට නිරෝධායන නීති රීති අදාළ වෙන්නේ නැත්නම්, ඒ සෞඛ්‍ය නීති රීති අදාළ වෙන්නේ නැත්නම් විපක්ෂයේ යම් විරෝධතාවක් හෝ යම් උත්සවයක් පැවැත්වෙද්දීත් ඒ ආකාරයටම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. පොහොට්ටු පක්ෂයේ සම්මේලනය තමුන්නාන්සේලාට කිසිම ගැටලුවක් නැතුව කරන්න පුළුවන් වුණා. ඊළඟට, ඊයේ දිනයේත් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය උත්සවයක් පැවැත්වුණා. ඒ උත්සව කරන්න පුළුවන් නම් අපටත් ඒ අවස්ථාව දෙන්න ඕනෑ. අපට ආරංචියක් තිබෙනවා, හෙට අනිද්දා වනකොට අනුරාධපුර ජනාධිපති මන්දිරයේත් උත්සව කිහිපයක් පැවැත්වෙනවා කියලා. උපන්දින සාදයක් තියෙනවාලු. ඊට අමතරව මේ ආණ්ඩුවට වර්ෂ දෙකක් සම්පූර්ණ වීම නිමිත්තෙන් සාදයක් පැවැත්වෙනවාලු. ඒවා කරන්න. කිසි ගැටලුවක් නැහැ. ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ ඒ උත්සව පැවැත්වීම ගැන කිසි ගැටලුවක් නැහැ. තමුන්නාන්සේලා සෞඛ්‍ය නීති රීති ආරක්ෂා කරගෙන ඒවා කරන්න. ඒ ගැන විවාදයක් නැහැ. ගරු ඇමතිතුමනි, එහෙම උත්සවයක් තියෙනවා නේද? කමක් නැහැ, ඒ උත්සව පවත්වන්න. නමුත් ඒ අවස්ථාවම විපක්ෂයටත් ලබා දෙන්න ඕනෑ; අනෙක් දේශපාලන පක්ෂවලටත් ලබා දෙන්න

ඕනෑ. ඒවා මර්දනය කරන්න එපා. ඒවා මර්දනය කරන්න යන එක තමයි මෙතැන තියෙන ගැටලුව. තමුන්නාන්සේලාට සහ අපි හැමෝටම ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කිරීමයි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වගකීම. එහෙම නැතුව අත් අය පාගලා සදාකාලිකව බලයේ ඉන්න, සදාකාලිකව දේශපාලනය කරන්න, සදාකාලිකව ඒකාධිපතිවාදයක් ගෙනයන්න කටයුතු කිරීම සුදුසු නැහැ. මොකද, 2015ට කලින් මේ රට පාලනය කළේ කොහොමද කියන කාරණයත් එක්ක අපටත් පොඩි භයක්, සැකයක් තිබෙනවා නේ. මාධ්‍ය ආයතනවලට, මාධ්‍යවේදීන්ට වෙච්ච දේවල් පිළිබඳව මේ රටේ පුරවැසියන් හැටියට අපටත් ගැටලුවක් තිබෙනවා.

අපි එවැනි තත්ත්වයක් නැවත ලබා දෙන්න අවශ්‍ය නැහැ. ඒක මේ රටට ඉතා අඳුරු යුගයක්; කළු පැල්ලමක්. ඒ නිසා අපට GSP Plus සහනාධාරය නැති වුණා, ජාත්‍යන්තර වශයෙන් ගැටලු ඇති වුණා. *[බාධා කිරීමක්]* 2015ට කලින් වෙච්ච දේ මම කියන්නේ. ඒක නිසා තමුන්නාන්සේලා- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, හිර ගෙවල්වල දාපු අය ගැනත් මට කියන්න පුළුවන්. අද හැමදාම නිදොස් කොට නිදහස් වන එකනේ වෙන්නේ. අද උසාවියක්, උසාවියක් ගානේ නිදොස් කොට නිදහස් වෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් චෝදනා ලැබූ අයත් අද නිදොස් කොට නිදහස් වෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් චෝදනා ලැබූ අයත් නිදොස් කොට නිදහස් වෙනවා. මේක කොතැනින් හෝ නතර වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම "එක රටක්, එක නීතියක්" හැටියට කටයුතු කරගෙන යනවා නම් හැමෝටම සම අවස්ථා ලබා දෙන්න අවශ්‍යයි. අපි මර්දනයට විරුද්ධව පෙනී සිටිනවා. මේ රටේ ජනතාව පාගලා, මර්දනය කරලා රට ඉදිරියට ගෙනයන්න බැහැ. ඒකෙන් මේ ආණ්ඩුවට විරුද්ධව එන රැල්ල තව තවත් වැඩි වෙනවා මිස අඩු වීමක් වෙන්නේ නැහැ. මම ඒක විශ්වාසයෙන් කියනවා. ඒකාධිපති වියරුවට විරුද්ධව පෙනී සිටින්නේ ජන මතයයි, ජන අරගළයයි කියන එකට ලෝකයේ අත්දැකීම් තිබෙනවා. එම නිසා තමුන්නාන්සේලා ජන මතයට විරුද්ධව පෙනී සිටින්න එපා.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත බේරුගොඩ රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.56]

**ගරු විජිත බේරුගොඩ මහතා (දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித பேருகொட - அறநெறிப் பாடசாலைகள், பிரிவேனாக்கள் மற்றும் பிக்குமார் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Vijitha Berugoda -State Minister of Dhamma Schools, Pirivenas and Bhikkhu Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය පිළිබඳව ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය අදහස් ඉදිරිපත් කරන අවස්ථාවේ මටත් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

බොහෝ වෙලාවට විපක්ෂය අය වැය සම්බන්ධයෙන් බිල්ලෙක් දකිනවා. මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ රටේ තත්ත්වය -වාතාවරණය- හොඳින් අවබෝධ කරගෙන, ඉතා සංයමයකින්, අනාගත දැක්මක් ඇතිව, විචාරශීලී හා ප්‍රායෝගික අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. වැටුප් වැඩි කරන, බඩු මිල අඩු කරන සිල්ලර අය වැයක් තමයි විපක්ෂය නිතර අපේක්ෂා කරන්නේ. හැබැයි, වසංගත තත්ත්වයකට, ස්වාභාවික ව්‍යසනයකට ලෝකයේ අනෙකුත් සියලු රටවල් වාගේම මේ රටත් මුහුණ දී තිබෙන අවස්ථාවක එයින් මේ රටේ ජනතාවගේ වටිනා ජීවිත ආරක්ෂා කරගෙන, මේ රටේ ජන ජීවිත ගොඩ නඟන්නට අවශ්‍ය යෝජනා ඇතුළත් අය වැයක් තමයි ගරු මුදල් අමාත්‍යතුමා 2022 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළේ.

ඒ වාගේම මේ අය වැය සෑම සමාජ තීරුවක්ම, සෑම සමාජ ස්ථරයක්ම ස්පර්ශ වන විධියට, මුළු රටම වැලඳ ගන්නා විධියට, අනාගත දැක්මක් සහිතව ඉදිරිපත් කළ අය වැයක්. ඉපදෙන්න සිටින බිළිඳාගේ සිට ජීවිතයේ සැඳෑ සමය ගෙවන ජ්‍යෙෂ්ඨ පුරවැසියා දක්වාත්, පාසල් යන දරුවාගේ සිට, අනාගතයට දරුවාගේ ජීවිතය හැඩ ගස්වන ගුරු විදුහල්පතිවරු දක්වාත් මේ අය වැයෙන් විශේෂ අවධානය යොමු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සාමාන්‍ය ජනතාවට ප්‍රවාහන පහසුකම් සලසන ත්‍රි රෝද රථ හිමියාගේ සිට සමූහ වශයෙන් මඟී ප්‍රවාහන පහසුකම් සලසන පෞද්ගලික බස් රථ හිමියා දක්වාත් අවධානය යොමු කර තිබෙනවා. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයාගේ සිට අතුරුදන් වූ පුද්ගලයන්ගේ පවුල්වල සුබසාධනය සම්බන්ධයෙනුත් අවධානය යොමු කළ අය වැයක්. එක පැත්තකින් මේ රටේ නිෂ්පාදනය මුල් කර ගත් ආර්ථිකයක් ගොඩ නඟන්නට, අපනයනය ප්‍රවර්ධනය කරන ආර්ථිකයක් ගොඩ නඟන්නට අවශ්‍ය මූලික පදනම මේ අය වැයෙන් දමා තිබෙනවා.

ගෘහ කර්මාන්තයේ යෙදී සිටින කාන්තාවන්, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්, ග්‍රාමීය මට්ටමේ ස්වයංරැකියා කරන අය, විශේෂයෙන්ම පෙදරේරුවන්, වඩු කාර්මිකයන්, පින්තාරුකරුවන්, ජලනළ සවි කරන්නන්, විදුලි කාර්මිකයන් වාගේම ගරාජ් වැනි ස්වයංරැකියා ආයතන පවත්වා ගෙන යන අය, විසිතුරු මල් නිෂ්පාදකයන්, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයන්, ජංගම වෙළෙඳ සැල් පවත්වා ගෙන යන්නන්, එළවලු වෙළෙන්දන්, පලතුරු වෙළෙන්දන්, උත්සව භාණ්ඩ සපයන්නන් ආදි වශයෙන් මෙකී නොකී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන විධියට ඒ අයගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කළ අය වැයක් තමයි මෙය. අපේ ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා බොහොම ඕනෑකමින් මේ සම්බන්ධව අවධානය යොමු කළ බවක් මා දුටුවා.

මේ අය වැය තුළින් සෑම ග්‍රාම නිලධාරි වසමකටම රුපියල් මිලියන තුනක් සෘජුවම වෙන් කර තිබෙනවා. පළාත් පාලන කොට්ඨාසයකට රුපියල් මිලියන හතරක් බැගින් වෙන් කර තිබෙනවා, ඊළඟ අවුරුද්දේ සිට. ඒ වාගේම, සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයකු සඳහා තම කොට්ඨාසය සංවර්ධනය කරන්න මුදල් වෙන් කර තිබෙනවා. යටිතල පහසුකම් සංවර්ධනයට විතරක් නොවෙයි, ජීවනෝපාය සංවර්ධනයටත්, තිරසර පරිසර සංවර්ධනයටත්, සමාජ ශුභසාධනයටත්, සමාජ සංවර්ධනයටත් විශාල වශයෙන් මුදල් වෙන් කළ අය වැයක්, මේක. ඒ නිසා මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්නට, ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග නංවාලන්නට වාගේම අපනයන ආර්ථිකය දියුණු කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි මේ අය වැය තුළින් නිර්මාණය කර තිබෙන්නේ.

විපක්ෂය මේ අය වැය යෝජනා දිහා මතුපිටින් බලා කථා කළත් මේ පිළිබඳව ගැඹුරට කල්පනා කළොත් මේවා ගැන නියම විධියට විග්‍රහ කරන්න අපට පුළුවන්.

[ගරු විජිත බේරුගොඩ මහතා ]

විශේෂයෙන්ම කොවිඩ් වසංගතය හේතුවෙන් දිළිඳු ජනතාවගේ ආදායම් මාර්ගවල අඩුවීමක් වූ නිසා ඔවුන් යම් අපහසුතාවකට පත් වුණු බව දකින්නට ලැබෙනවා. දිළිඳු ජනතාවට විතරක් නොවෙයි, ස්වයංරැකියාවල නියුතු නිෂ්පාදකයන්ට, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට හා ව්‍යාපාරිකයන්ටත් මේ තත්ත්වය බලපෑවා. මේ නිසා ක්‍රමානුකූලව පියවරෙන් පියවර ඒ අයගේ ආර්ථික ශක්තිය දියුණු කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ මේ අය වැයෙන් සකස් කර දී තිබෙනවා. දිළිඳු ජනතාවට සහන සැලසීම සඳහා සහන මල්ලක් ලබා දීමට රුපියල් කෝටි 1,500ක් වෙන් කර තිබෙනවා. මේවා තමයි බිම් මට්ටමට ප්‍රතිලාභ ගලා යන වැඩ පිළිවෙළ. අපේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා අය වැය කථාවේදී සඳහන් කළා, මාළුවෙක් අල්ලා දෙනවාට වඩා, බිලි පිත්තක් දීම වැදගත් කියලා. මේක සමාජ විද්‍යාඥයෙක් සඳහන් කළ ඉතා වටිනා ආප්තෝපදේශයක්. ඒ නිසා මුලින්ම දිළිඳු ජනතාවට අවශ්‍ය සහන සලසා ඒ අයගේ ජීවත් වීමේ අයිතිය තහවුරු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි දන්නවා, වසර 25ක් පමණ කාලයක් විසඳා ගන්න බැරිව තිබූ මේ රටේ ගුරු-විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව ගැන. ඒ අය දින 102ක් උද්ඝෝෂණ කළා. ආණ්ඩුව නිරන්තරයෙන් කිව්වා, ඒ අයගේ වැටුප් විෂමතාව ඉවත් කරනවා කියලා. හැබැයි, විපක්ෂය ඒ අයගේ පිටුපස ඉඳිමින් මේ උද්ඝෝෂණවලට උල්පන්දම් දුන්නා. ඒකේ ප්‍රතිඵලය විධියට අද කොවිඩ් රැල්ල වැඩි වීමට එයින් යම් බලපෑමක් වී ඇති බව අපි දන්නවා. හැබැයි, මේ අය වැයෙන් ඒ අයට සාධාරණය ඉෂ්ට කළා. ඒ අනුව රුපියල් කෝටි 3,000ක් එම වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා ලබා දී තිබෙනවා. ඒ, ගුරු හා විදුහල්පති වැටුප් සඳහා දැනට ගෙවන රුපියල් මිලියන 109,000ට අමතරවයි.

ජනතා විමුක්ති පෙරමුණ එක්තරා කාලයක අපේ තරුණයන් මහ මඟට අරගෙන ආවේ, "කොළඹට කිරි - ගමට කැකිරි" කියලායි. ඒ, සමාජ විෂමතාව නිසායි; පළාත් අතර, දිස්ත්‍රික් අතර තිබෙන විෂමතාව නිසායි. ඒකට විසඳුමක් විධියට, දිස්ත්‍රික් මට්ටමින් පවතින එම අසමානතාව තුරන් කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකටම අන්තර්ජාතික මට්ටමේ රෝහලක් සහ පාසලක් ඉදි කිරීමට අවශ්‍ය යෝජනා මේ තුළ ඉදිරිපත් කර තිබෙනවා. ඒක ඉතා වැදගත් යෝජනාවක්. අපේ රටේ අපනයන ආර්ථිකය වර්ධනය කරනවාට අමතරව, සේවා සඳහා පවතින ජාත්‍යන්තර ඉල්ලුම සපයන්නට අපේ ශ්‍රමිකයන් පුහුණු කරන්නට ඕනෑ; අපේ අධ්‍යාපනය ඒ තැනට ගෙන යන්න ඕනෑ. අපේ අධ්‍යාපනය ඒ තැනට ගෙන යෑම සඳහා දරුවන්ට දැනුම විතරක් නොව, කුසලතාත් ලබා දීමට, අනාගතය දකින දරුවන් පිරිසක්, ජාත්‍යන්තරය ජය ගන්න පුළුවන් දරුවන් පිරිසක් බිහි කිරීමට අවශ්‍ය සියලු පහසුකම් සහිත ජාතික පාසල් දහසක් දියුණු කිරීම සඳහා විශාල මුදලක් මේ අය වැය ලේඛනයෙන් වෙන් කර තිබෙනවා.

ඒක විශේෂ කාරණයක් විධියට සඳහන් කරන්න ඕනෑ.

සමෘද්ධි ව්‍යාපාරය ගෙන බලන්න. මේ රටේ ජනගහනයෙන් සියයට 23ක් සමෘද්ධි ප්‍රතිලාභ ලබන අය. හැබැයි, ඊට වඩා වැඩි ප්‍රමාණයක් අඩු ආදායම්ලාභින් විධියට ජීවත් වනවා. සහනාධාර වැඩ පිළිවෙළට එහා යමින් ග්‍රාමීය සංවර්ධනයට, නිෂ්පාදන ආර්ථිකයට එම ජනතාව සම්බන්ධ වන වැඩ පිළිවෙළක් මෙම අය වැය ලේඛනයෙන් යෝජනා කර තිබෙනවා. සෑම සමාජ ස්තරයක්ම වැලඳගන්නා, සෑම සමාජ ස්තරයකටම හයිය දෙන්න පුළුවන් නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නඟන ඉතා වටිනා අය වැය ලේඛනයක් ගරු මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළා.

ඒ විතරක් නොවෙයි, බදු අය කිරීමේදී සාධාරණ විධියට බදු අය කරන වැඩ පිළිවෙළක් ගැනත් සඳහන් කර තිබෙනවා. මට පොඩි වෙලාවක් ලබා දෙන්න, ඒ පිළිබඳත් සඳහන් කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රුපියල් මිලියන 2,000ට වඩා ආදායමක් උපයන අය හෝ සමාගම්වලින් සියයට 25ක අධිභාර බද්දක් අය කරන්න යෝජනා කර තිබෙනවා. මෙයින් උපයාගැනීමට අපේක්ෂා කරනවා, රුපියල් බිලියන 100ක්. බැංකු හා මූල්‍ය ආයතන හුඟක් වෙලාවට විශාල වශයෙන් ආදායම් ලබනවා. මේ රටේ ග්‍රාමීය ජනතාව ඒ අයගේ ව්‍යාපාර දියුණු කරගන්න ණය මුදලක් ලබා ගැනීමට බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට ගියාම ඒ සඳහා අවශ්‍ය පහසුකම් හරියට ලබා දෙන්නේ නැහැ. ඇප සුරැකුම් බරපතළ විධියට ඉල්ලනවා. විශාල වශයෙන් ආදායම් ලබන බැංකු හා මූල්‍ය සේවා ආයතනවලින් අය කරන සියයට 15 වැට් බද්ද සියයට 18 දක්වා වැඩි කිරීමට යෝජනා කර තිබෙනවා. එමඟින් රුපියල් බිලියන 14ක් පමණ උපයන්න අපේක්ෂා කරනවා.

ඒ වාගේම සිගරට් -දුම් වැටි- සඳහා වන බදු වැඩි කර තිබෙනවා. සුරා බදු වැඩි කර තිබෙනවා. මේ විධියට බදු වැඩි කරලා, මේ රටේ ආදායම් තර කර ගන්නේ මේ රටේ අඩු ආදායම් ලබන ජනතාව ශක්තිමත් කරන්නයි. අපි කවුරුත් දන්නවා, යහ පාලන ආණ්ඩුව කාලයේ යහ පාලන ආණ්ඩුවට එල්ල වුණු බරපතළ චෝදනාව ගැන. ඒ තමයි, මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම අයථා විධියට ලාභ ලබා උපයා ගත් රුපියල් කෝටි 850ක මුදල මහා භාණ්ඩාගාරයට ගැනීම සඳහා අවශ්‍ය යෝජනා මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා.

විපක්ෂය බොර දියේ මාළු බාන්නේ නැතිව, කල දුටු කල වළ ඉහගන්නේ නැතිව, මේ අය වැය ලේඛනයේ තිබෙන සාධනීය ලක්ෂණ පෙන්වා දෙන්න. අඩු පාඩු තිබෙනවා නම්, සංශෝධන අවශ්‍ය නම් ඒවා ඉදිරිපත් කරන්න. මේ ආණ්ඩුව, ජනතා හිතකාමී ආණ්ඩුවක් විධියට සාධනීය දේවල්, ජනතාවට වැදගත් වන යෝජනා, මේ රටේ ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් වන යෝජනා ඉදිරිපත් කරනවා නම් ඒවා පිළිගන්න අප සූදානම් කියන පණිවුඩයත් මා ලබා දෙනවා.

මම විශ්වාස කරනවා, මෙවැනි අර්බුද තත්ත්වයක් තුළ, ව්‍යසන තත්ත්වයක් තුළ ඉතා සාධනීය අය වැයක් ඉදිරිපත් කර තිබෙන බව. ඒ අය වැයෙන් මේ රටේ ජනතාවගේ ජන ජීවිතයත්, මේ රටේ ආර්ථිකයත් සංවර්ධනය වන වැඩ පිළිවෙළක්, පසු බිමක් හදා තිබෙනවාය කියන පණිවිඩයත් මේ මොහොතේ ලබා දෙමින් මගේ කථාව නිම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10යි.

[අ.භා. 3.07]

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාදයට අදාළ මගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථම හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට පිළිතුරක් දිය යුතුයි කියා මා හිතනවා. එතුමන්ලා උද්ඝෝෂණ ව්‍යාපාරයක් ලෑස්ති කරනවා. මේ අය වැය යෝජනාවල තිබෙන

සමහර කරුණු සම්බන්ධයෙන් එතුමන්ලාට උද්ඝෝෂණය කරන්න හිතෙනවා ඇති. මහ බැංකු බැඳුම්කර වංචාකරුවන්ගේ රුපියල් කෝටි 850කට වඩා වැඩි මුදලක් නැවත අය කර ගැනීමට යෝජනාවක් අය වැය යෝජනා මඟින් ඉදිරිපත් කරන කොට හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාලා අතිශයින්ම කම්පනයට පත් වනවා; එතුමන්ලාට උද්ඝෝෂණය කරන්න හිතෙනවා; බැඳුම්කර හොරකම පිළිබඳ විමර්ශන අවස්ථාවලදී පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ හිමිකරුවන්ගෙන් වැඩිම දුරකථන ඇමතුම් ප්‍රමාණය ලබපු අය කුපිත වෙනවා. වැඩිම telephone calls අර්ජුන් ඇලෝසියස්ගෙන්. එහෙම නේද, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා? අය වැය යෝජනාවක් මඟින් ඒ මුදල් අය කර ගන්න කොට විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් වන තමුන්නාන්සේලාට මහ පාරට බහින්න හිතෙනවා කියන එක, කෑ ගහන්න හිතෙනවා කියන එක ගැන අපට අමුත්තක් නැහැ.

මේ අය වැය ලේඛනය ගරු මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කරන්නේ අපේ සියලු මහජන නියෝජිතයන් ප්‍රකාශ කළා වාගේ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් බරපතළ විනාශයක් ඇති වූ යුගයක බව අපි දන්නවා. ලෝක බැංකු ප්‍රධානියා කියනවා, මිලියන 600ක් ජනතාව නිරාහාරව ඉන්න කාල පරිච්ඡේදයක් තමයි මේ වසංගත රෝග තත්ත්වය හමුවේ උදා වෙලා තිබෙන්නේ කියලා.

මේක අපට විතරක් පොදු තත්ත්වයක් නොවෙයි. මේක බරපතළ වූ ජාතික, ජාත්‍යන්තර ව්‍යසන තත්ත්වයක්. මේ ව්‍යසන තත්ත්වයෙන් ජනතාව මුදා ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමා රෝග පාලනය වෙනුවෙන් සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රටේ ආර්ථික ශක්තිය සම්පූර්ණයෙන් මුදා හැර තිබෙනවා. විශේෂයෙන්ම මේ වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළට එතුමා ඉතා නිවැරදි නායකත්වයක් ලබා දීලා තිබෙන බව රහසක් නොවෙයි. එවැනි අසීරු කාලපරිච්ඡේදයක තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ. සාම්ප්‍රදායික අය වැය ලේඛනවලට වඩා වෙනස් විධියට, පුළුල් දැක්මකින් මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන බව අපිට පෙනී යනවා.

ගරු මුදල් ඇමතිතුමාගේ යෝජනා පිළිබඳව විමසද්දී අපට පෙනෙනවා, ස්වශක්තිය මත නැඟී සිටීමට සමත් ජාතියක් නිර්මාණය කිරීම සඳහා වූ ජාතික අය වැය ලේඛනයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ කියලා. විශේෂයෙන්ම අපේ රටේ ගොවි ජනතාව, කර්මාන්තකරුවන්, සුළු කර්මාන්තකරුවන්, මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්, අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල නියැළෙන ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු මහජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ඉතිහාසයේ දැවැන්තම ආයෝජනය කරලා, රට තුළ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ ඉලක්කසහගත වැඩපිළිවෙළක් සඳහා තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ. එම නිසා ඈත ගම්-බිම්වල වෙසෙන, සෑම ග්‍රාම නිලධාරි වසමකම විවිධ කර්මාන්තවල, විවිධ වෘත්තීන්වල යෙදෙන රැකියා අපේක්ෂිත, අලුතින් කර්මාන්ත ආරම්භ කිරීමට බලාපොරොත්තු වන නිෂ්පාදකයන් බලගැන්වීම සඳහා වූ වැඩපිළිවෙළක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන මොහොත වන විට වසංගත රෝග තත්ත්වය පමණක් නොවෙයි, විනාශ වෙච්ච ආර්ථිකයක් සහිත රටක් තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට භාර දීලා තිබුණේ. 2014දී රුපියල් බිලියන 7,487ක්ව තිබුණු විදේශ ණය බර ප්‍රමාණය, රුපියල් බිලියන 13,000ක් දක්වා වැඩි කරපු කාල පරිච්ඡේදයක මහා ණය කන්දක් එක්ක තමයි අපට රට භාර දීලා තිබුණේ. සංවර්ධන යෝජනා කිසිම දෙයක් නොකර යහපාලන ආණ්ඩුව ඒ අවුරුදු පහේ දී රටේ සංවර්ධන වේගය කඩා දැමුවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා සියයට 7 දක්වා ගොඩනඟා තිබුණු සංවර්ධන වේගය සියයට 3ක අගයක් දක්වා කඩා වැටී තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයේ මන්ත්‍රීවරු සංචාරක ව්‍යාපාරයට සහන සැලසීම සම්බන්ධයෙන් කථා කළා. සංචාරක ව්‍යාපාරය කඩා වැටුණේ කොරෝනා වසංගත තත්ත්වයෙන් විතරක් නොවෙයි. ඊට පෙර, 2019 අප්‍රේල් 21වැනි දා පාස්කු ප්‍රහාරයෙන් හානියට පත් වුණු සංචාරක ව්‍යාපාරය ගොඩනඟන්න ඔබතුමන්ලා මොනවාද කළේ? එදා ඉඳන් තමයි සංචාරක ක්ෂේත්‍රය කඩා වැටෙන්න පටන් ගත්තේ. අපේ රටට සංචාරකයන් පැමිණීම නැවැත්වූයේ එදා ඉඳන්; කොරෝනා වසංගත තත්ත්වය නිසා නොවෙයි. එමනිසා ඒ දරුණු පාපයේ හවුල්කරුවන් වන්නේ ඔබතුමන්ලාමයි. 97 වතාවක් දැනුම් දීලා තිබෙද්දීත්, රාජ්‍ය නායකයාගේ ඉඳන් ආරක්ෂක අංශවල සියලු ප්‍රධානීන්ට ප්‍රහාරය එල්ල කරන දිනය, වේලාව, අවස්ථාව දැනුම් දීලා තිබෙද්දීත්, ඒ සියල්ල නොසලකා හැරියා. එමනිසා හෙට හරි, අනිද්දා හරි ඔබතුමන්ලා කරන උද්ඝෝෂණවලට සහරාන්ගේ අවතාර ටික, මරාගෙන මැරෙන බෝම්බකරුවන් ටික ඉස්සරහින් යයි. ඇයි, දැන් ඔවුන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එම නිසා ඔවුන්ගේ සහචරයෝ පෙළපාළිවල ඉස්සරහින් යයි. ඊළාම්වාදය කර පින්නාගෙන හැමදාම මේ රටට හානි කරපු -මාතෘ භූමියට හැමදාම අපහාස කරපු- ඒ අන්තවාදීන් ටික ඕනෑ නම් පෙළපාළිවල යයි. ඔවුන් තමයි ඔබතුමන්ලාත් එක්ක එකතු වෙන්නේ. ප්‍රභාකරන්ගේ අවතාර, සහරාන්ගේ අවතාර, මහ බැංකු බැඳුම්කර හොරුන්ගේ නියෝජිතයෝ තමයි ඔබතුමන්ලාත් එක්ක එකතුවෙලා පෙළපාළි යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු 4 1/2ක කාලය අපට අමතක කරන්න බැහැ. ඒ කරපු විනාශය මේ රටේ ජනතාවට අමතක කරන්නත් බැහැ. එම නිසා ඔබතුමන්ලාට ඒ පාපයෙන් ගැලවෙන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා, අපට ලැබෙන රාජ්‍ය ආදායම අද වැඩි වශයෙන් වැය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ රාජ්‍ය සේවය වෙනුවෙන් කියලා. රජයේ සේවකයන්ගේ වැටුප් සහ දීමනා වෙනුවෙනුත්, විශ්‍රාමිකයන් වෙනුවෙනුත් විශාල මුදලක් වැය කරන්න්ට සිදුවෙලා තිබෙනවා. ලක්ෂ 20කට ආසන්න රාජ්‍ය සේවයක් නඩත්තු කරන්න අපට සිදුවෙලා තිබෙනවා. ඒ නිසා අද රාජ්‍ය සේවයේ ඵලදායකත්වය පිළිබඳ නැවත සාකච්ඡාවක් රට තුළ ආරම්භ වෙලා තිබෙනවා.

අද අපි දන්නවා, සෑම අවස්ථාවකම මන්ත්‍රීවරු 225 දෙනාටම බනින බව. පාර්ලිමේන්තුව තුළ මහජනයාගේ දේවල් වැරැදි ලෙස යොදා නොගත්, මේ රටට, මේ මව්බිමට ආදරය කරන මොන තරම් මහජන නියෝජිතයන් සිටිනවාද? හැබැයි, මේ 225දෙනාටම බනින එක තමයි ප්‍රශ්නය. ලක්ෂ 20ක් වූ රාජ්‍ය සේවකයන් විසින් මේ රට ගොඩනැඟීම සඳහා දෙන ලද දායකත්වය තව තවත් සක්‍රිය කිරීමේ අවශ්‍යතාව අපට තිබෙනවා. ඒ සඳහා රටේ වැඩි වැය බරක් දරන්නට අපිට සිද්ධ වෙලා තිබෙනවා. ඒ හා සමානව ලක්ෂ 20කට වැඩි පවුල් සංඛ්‍යාවකට සහනාධාර දෙන්න රටක් හැටියට අපට සිද්ධ වෙලා තිබෙනවා. මේ අභියෝග එක්ක තමයි ජාතික අය වැය ලේඛනය සකස් කරන්න සිද්ධ වුණේ. මෙය ක්ෂණිකව හට ගත් ප්‍රශ්නයක් නොවෙයි, දීර්ඝ කාලයක් තිස්සේ ගොඩනැඟුණු ආර්ථික ක්‍රියාවලියක ප්‍රතිඵලයක්. එය කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වයත් එක්ක උග්‍ර වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් හමුවේ තමයි අද අපට මේ අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ රටේ මහ පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් අධිභාරයක් ලබාගෙන අය වැය ලේඛනයේ හිඟය පියවන්න කටයුතු කිරීම සම්බන්ධවත්, බැඳුම්කර වංචාවෙන් උපයා ගත් මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයට ලබාගෙන, රටේ ජනයා වෙනුවෙන් මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගෙනයන්නා වූ වැඩ පිළිවෙළ ගැන අපි සතුටු වෙනවා.

[ගරු සිසිර ජයකොඩි මහතා ]

පසුගිය කාල පරිච්ඡේදය තුළ අපේ රටේ අය වැය ලේඛනවල දේශීය වෙදකම හෙවත් හෙළ වෙදකම ගැන, ආයුර්වේදය ගැන අහන්න ලැබුණේ ඉතාම අඩුවෙන්. මේ අය වැය ලේඛනය මඟින් අපේ කමට, අපේ දේශීයත්වයට, දේශීය වෙදකමට, හෙළ වෙදකමට, ආයුර්වේදයේ පිබිදීම සඳහා වූ වැඩ පිළිවෙළකට යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව එතුමාට අපේ සතුට, අපේ ප්‍රසාදය සහ අපේ ආචාරය පිරිනමනවා. දැවැන්ත සමාජ, ආර්ථික ගැටලු රාශියක් එක්ක අභියෝගාත්මකව මේ රට ගොඩනැඟීම පිළිබඳ වූ අධිෂ්ඨානයෙන් අපි සියලුදෙනා එකට එකතු වෙමු. විවිධ අර්බුද අවස්ථාවල ජාති, කුල, පක්ෂ භේදවලින් තොරව ලෝකයේ සියලු ජාතික ව්‍යාපාර, දේශපාලන පක්ෂ එකට එකතු වෙනවා. ඒ විධියට අපි සියලුදෙනාම ඒකාබද්ධ වෙලා, මේ රට ගොඩනැඟීමේ ක්‍රියාවලියට, මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් වූ යෝජනා මල්ඵල ගන්වන ක්‍රියාදාමයට හවුල්ව කටයුතු කරමු කියන කාරණය සඳහන් කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ 121,000ක් ජනතාවගේ මනාපය ලබාගත් ජනතා නියෝජිතයකු විධියට 2021 වසරේ පළමුවරට පාර්ලිමේන්තුව අමතන්නට ලැබුණු මේ විනාඩි දහය මට ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

වෙනදා වාගේම මේ අය වැයේ දීත් විපක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් දෙපාර්ශ්වයකට බෙදිලා එකිනෙකාට අවලාද නඟමින් "අපි තමයි හරියට කළේ" කියලා ඔප්පු කරන්න කණ්ඩායම් දෙකම උත්සාහ කරන ආකාරය අපි දැක්කා. ඒක තමයි අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදායය. අද මේක රටේ ජනතාව අප්‍රිය කරනවා; හෙළා දකිනවා. මේක එපා වෙලා තිබෙන්නේ. පසුගිය අවුරුදු 20ක, 30ක කාලය තුළ පාර්ලිමේන්තුව තුළ අය වැය විවාදවල දී එකිනෙකාට බැන ගනිමින් උද්වේගකර ලෙස මොන තරම් වාද විවාද කරලා තිබෙනවාද? ඒ හේතුවෙන් අපේ රටේ ආර්ථිකය ඉහළට ඇවිල්ලා තිබෙනවාද?

2005 ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ රට භාර ගන්නකොට අපේ රාජ්‍ය ණය බර තිබුණේ රුපියල් බිලියන 2,000යි. අද උදේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා පෙන්වා දුන්නා, අපේ රාජ්‍ය ණය බර දැන් රුපියල් බිලියන 21,000 දක්වා වැඩි වෙලා තිබෙන බව. අවුරුදු 15ක් යනකොට මේ වාගේ දහ ගුණයක් අපේ ණය ප්‍රසාරණය වෙලා, අපේ ආදායම අඩු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කථානායක පුටුවේ වාඩි වෙලා හිටියාට ඔබතුමා රුපියල් ලක්ෂ නවයහමාරකට උකස් කරලා තිබෙන්නේ. ඔබතුමාගේ පවුලේ 5 දෙනෙක් ඉන්නවා නම්, රුපියල් ලක්ෂ හතළිස් හතහමාරකට උකස් කරලා තිබෙන්නේ. මේ රටේ මහා නායක හාමුදුරුනමක් ඉන්නවා නම්, ඒ මහා නායක හාමුදුරුවෝත් උකස් කරලා තිබෙන්නේ. කාදිනල් හිමිපාණන් වහන්සේත් උකස් කරලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න සේවක මහත්තයාත් රුපියල් ලක්ෂ නවයහමාරකට උකස් කරලා තිබෙන්නේ. කවුද ඒක කළේ? ඒක කළේ මේ පාර්ලිමේන්තුව. කාලයක් තිස්සේ දිගින් දිගටම ආ මේ ගමනට තිතක් තියන්න කාටවත් බැහැ. අපි තවම එවැනි තත්ත්වයකට පත් වෙලා නැහැ. අපට තිබෙන්නේ වෛරී දේශපාලනයක්. අපි බලයට කෑදරයි.

මේ වනකොට අපේ ආදායම අඩු වෙලා තිබෙන්නේ කොහොමද? අපට විශාල වශයෙන් ආදායම් ගන්න තිබුණා. අපේ ධන උල්පත් අද අපට තිබෙනවාද? එදා හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇමෙරිකන් ඩොලර් මිලියන 1,300ක් ණය අරගෙන හදපු අපේ හම්බන්තොට වරාය අද කෝ? එදා හම්බන්තොට වරාය වෙනුවෙන් හුහක් අය ඇඬුවා. එදා හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා හම්බන්තොට වරාය චීනයට දෙන්න යනකොට කැබිනට් මණ්ඩලයෙන් මා නෙරපුවා. මම අද සිය දහස් වාරයක් සතුටු වෙනවා, මගේ මාතෘ භූමිය පාවා දීමේ පාප කර්මයට මම දායක වුණේ නැති නිසා. ඒ නිසා අද මම සතුටින් ඉන්නවා, මට හොඳින් නින්ද යනවා. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා කැබිනට් මණ්ඩලයෙන් මම එළියට දාලා - නෙරපා- කිව්වා, "විජයදාස රාජපක්ෂගේ දේශපාලන ගමන මම නතර කළා" කියලා. එදා හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා අදත් මේ ගරු සභාවේ ඉන්නවා. මම එදා එතුමාට අභියෝග කළා,"තමුන්නාන්සේට මගේ දේශපාලන ගමන නතර කරන්න බැහැ. මගේ ගමන තිබෙන්නේ රට වෙනුවෙන්. හැබැයි, තමුන්නාන්සේ කරපු වැඩෙන් මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහත්මයා -ජාතියේ නිදහසේ පියා- මේ රටට දායාද කරපු එක්සත් ජාතික පක්ෂය මහ පොළොවෙන් අතුරුදහන් කරනවා" කියලා. ඒක මට තනියෙන් කරන්න බැහැ. හැබැයි, මේ රටේ ජනතාව ඒක කළේ නැද්ද? අද ඒ පක්ෂය එක ආසනයට බැස්සේ නැද්ද? රටට ද්‍රෝහීව රටේ සම්පත් විනාශ කරන ඕනෑම දේශපාලන නායකයෙකුට, ඇමති කෙනෙකුට, මන්ත්‍රී කෙනෙකුට මේක හොඳ පණිවුඩයක්.

දැන් බලන්න, අපට ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් ආදායම් ගන්න තිබුණා. අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද රුපියල් බිලියන 250ක් පාඩුයි. මේක ගෙවන්නේ කවුද? COPE එකේ සභාපති මහාචාර්ය චරිත හේරත් මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී පැහැදිලිව ප්‍රකාශ කළා, "ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ගුවන් යානයක් ඇහැට දැකපු නැති මිනිහෙක් අද රුපියල් 17,000ක් ණය ගෙවන්න ඕනෑ, ශ්‍රීලන්කන් ගුවන් සේවයට කරපු විනාශයට" කියලා. ඒ තත්ත්වයට අද මේ රට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අනෙක් සම්පත් පවා ක්‍රමානුකූලව අපට අහිමි වෙමින් තිබෙනවා. Colombo Port City එකේ ලොකු ව්‍යාපාර ස්ථාන හදලා ඒවාට පනත් සම්මත කර දුන්නේ මේ පාර්ලිමේන්තුවෙන්. විදේශිකයෝ ඇවිල්ලා ඉතා දක්ෂ ලෙස ව්‍යාපාර මෙහෙයවා, ලාභ උපයනකොට ඒවා ඔක්කෝම යන්නේ චීනයට. හම්බන්තොට වරායෙන් ලාභ නැද්ද? ලාභ තිබෙනවා. ඒවා ඔක්කෝම යන්නේ චීනයට. ඉතින්, අපේ අය වැය පරතරය පියවන්නේ කොහොමද? අය වැය පරතරය පියවන්න චීනයෙන් හිඟා කන්න ඕනෑ. එදා සමහරු හම්බන්තොට වරාය ගැන ඇඬුවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් ඡන්දය අරගෙන ආ එක මන්ත්‍රීවරයෙකුටවත් අද වනවිට මතක නැහැ, අපට අපේ කියලා හම්බන්තොට වරායක් තිබුණා කියලා. මතකද, කාටවත්? එදා මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "අපේ හත්මුතු පරම්පරාව අල, බතල, මඤ්ඤොක්කා හිටවලා කාපු අපේ මාතෘ භූමියේ අඟලක්වත් දෙන්න එපා. මේක ලක් මාතාව ශාප කරන සාහසික අපරාධයක්" කියලා.

අද අපේ රටට ඇත්තටම වෙලා තිබෙන්නේ මොකක්ද? අපේ රටේ හදවත අපි චීනයට විකුණලා. අපේ රටේ පෙණහලු අපි

ඇමෙරිකාවට විකුණලා. ඊ දොළහට ඇවිල්ලා පෙණහලු ටික හොරෙන් ලියාගෙන යනවා. අපේ රටේ වකුගඩු ටික තව මොකෙකුට හෝ විකුණන්න හොය හොයා ඉන්නවා. මෙහෙම රටක් දියුණු කරන්න පුළුවන්ද? මේකටද, මේ මහජන නියෝජිතයන් 225දෙනෙකු පත් කරලා මේ පාර්ලිමේන්තුවට එව්වේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයන් ඕනෑ වන්නේ අපේ රටේ ජනතාවට අයිති පාරම්පරික උරුම, සම්පත්, අයිතිවාසිකම් විදේශිකයන්ට විකුණා දෙන්න නොවෙයි. අපට මහජන නියෝජිතයන් ඕනෑ වෙලා තිබෙන්නේ ඒවා ආරක්ෂා කරන්නයි. යමක් විකුණා තිබෙනවා නම්, ඒවා ආපසු ගන්නයි. පසුගිය මැතිවරණ දෙකේදී අපි වේදිකාවක් වේදිකාවක් ගණනේ උගුර ලේ රහ වෙනකම් කෑ ගැහුවා. මොනවා කියලාද කෑ ගැහුවේ? "අපි හම්බන්තොට වරාය ආපසු ගන්නවා, අපි එක බිම් අඟලක් කාටවත් දෙන්නේ නැහැ" කියලායි කෑ ගැහුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, "පළමුවත් රට, දෙවනුවත් රට, තුන්වෙනුවත් රට" කියලා පපුවට ගහලා මහ පොළොව සිප ගත්තා. එතුමාට මේ රටේ ජනතාව ආදරේ කළා. අද එතුමාගේත් හද කම්පා කරනවා ඇති. අද අපට කියලා මොකක්වත් නැහැ. ඔක්කොම එකින් එක විකිණෙමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන සීමිත කාලයේදී මම අවසාන වශයෙන් මේ ගරු සභාවේ සිටින ගෞරවනීය ඇමතිතුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාට පණිවුඩයක් දෙන්න කැමැතියි. අපේ රටේ ඊළඟට පවත්වන මැතිවරණය ජනාධිපතිවරණය වෙන්න පුළුවන්, පාර්ලිමේන්තු මැතිවරණය වෙන්න පුළුවන්, ඒ මැතිවරණය පවත්වන්නේ ජන මත විචාරණයක් විධියටයි. හොර ගිවිසුම් ගහලා, කොමිස් පිට ගිවිසුම් ගහලා, හම්බන්තොට වරාය, කොළඹ වරාය නගරය වාගේ දීපු හැම එකක්ම අපි ආපසු ගන්න ජන වරමක් ඉල්ලන මැතිවරණයක් විධියට තමයි ඒක පවත්වන්නේ.

ජාත්‍යන්තරයේදී චීනය බලගතු රටක් තමයි. ඇමෙරිකාවත් බලගතුයි. හැබැයි, ඒ බලගතුකම්වලට යටවෙලා අපට නිවට වෙන්න බැහැ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යටතේ ඇමෙරිකාවට තිබෙන බලයම තමයි අපටත් තිබෙන්නේ. අපේ රට පුංචි රටක් බව ඇත්ත. හැබැයි, අපේ ස්වෛරීභාවය ගත්තාම අපි ඇමෙරිකාවට දෙවැනි නැහැ. අපි චීනයට දෙවැනි නැහැ. අපි ලෝකයේ කිසිම රටකට දෙවැනි නැහැ. අපි ජාත්‍යන්තර නීතියට භය වෙන්න ඕනෑ නැහැ. ලෝකයේ ඕනෑ රටක් වංචනික විධියට කොමිස් දීලා යම් යම් ගනුදෙනු ඇති කරගෙන තිබෙනවා නම්, ඒවා අවලංගු කරන්න බලය තිබෙන්නේ කාටද? ඒ බලය තිබෙන්නේ මෙන්න මේ පාර්ලිමේන්තුවේ සිටින 225දෙනාටයි. අපි ඒ බලය පාවිච්චි කරලා වැඩි දිනක් යන්න කලින් අපේ ජාතික සම්පත් අත්පත් කර ගත්තේ නැත්නම්, අපට රටක් ඉතිරි වන්නේ නැහැ. අද ගිහිල්ලා බලන්න, එදා චිත්‍ර ඇඳපු දරුවෝ පාස්පෝට් පෝලිමේ ඉන්නවා. දවසකට 20,000ක්, 30,000ක් එහෙම පෝලිම්වල ඉන්නවා. මොකටද මේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රට එපාවෙලා. ඉන්න හිතෙන රටක් නොවෙයි, දමලා යන්න හිතෙන රටක් හැදිලා තිබෙනවා. අද අපේ කොල්ලෝ, කෙල්ලෝ ඔක්කෝම මොනවා හෝ රස්සා හොයාගෙන පෝලිමේ යනවා. ආණ්ඩුවක් ඕනෑ මේ වැඩේ කරන්නද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගෞරවනීය සභාවේ සිටින සියලු මන්ත්‍රීවරුන්ගේ නෙත් පෑදිලා, බුද්ධිය පෑදිලා, මේ රටේ ජනතාවගේ නෙත් පෑදිලා, අපේ ඉලක්කය ඉටු කර ගන්න, පක්ෂ භේද පැත්තක තියලා කටයුතු කරන්න කියා මම අවසාන වශයෙන් ආයාචනය කරනවා. ආගම් භේද, ජාති භේද අපට අවශ්‍ය නැහැ. මේ රටේ සිංහල, දමිළ, මුස්ලිම්, මැලේ, බර්ගර්, පාර්සි වාගේ තවත් බොහෝ ජන කොටස් සිටිනවා. මේ ඔක්කෝටම ඉන්නේ එක ලක් මාතාවයි. එක අම්මයි ඉන්නේ, අම්මලා දෙදෙනෙක් නැහැ. මේක කෑලි කෑලිවලට කඩලා, විකුණලා අපි ගන්න සල්ලිවලින් මොනවා කරන්නද? මේක අපේ මුතුන් මිත්තන් ජීවත් වූ රට. ඒ ගොල්ලන් හුස්ම ගත් ප්‍රාණ වායුවෙන් තමයි අපිත් අද හුස්ම අරගෙන ජීවත් වන්නේ. මේක රැක ගන්න බැරි මිනිසුන්ට මහජන නියෝජිතයන් කියලා කියන්නේ කොහොමද?

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.29]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය පිළිබඳව රටේ ජනතාවට ලොකු බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. ඒකට හේතුව, මේ වනකොට වෙන්න ඕනෑ ඔක්කෝම ජනතාවට වෙලා තිබීමයි.

ඒ වාගේම රජය පිළිබඳ අවිශ්වාසය -විශ්වාසය නැතිකම- ජනතාව අතර ගොඩනැගිලා තිබුණා. රජය ඉදිරිපත් කරන රජයේ ගැසට් පත්‍රිකා, රජයේ චක්‍රලේඛ, රජයේ ලේඛනවලට තිබෙන පිළිගැනීම සම්පූර්ණයෙන්ම රට තුළ නැති වෙලායි තිබුණේ. ඒ නිසා මේ ඉදිරිපත් කරන අය වැය ලේඛනය පිළිබඳවත් ජනතාව තුළ විශ්වාසයක් තිබුණේ නැහැ. නමුත් රජයේ පසු පෙළ මන්ත්‍රීවරු නව මුදල් ඇමතිතුමාත් එක්ක එකතුවෙලා පෙන්නුවා, අපි ආර්ථිකය පුම්බනවා, අපි ආර්ථිකය උඩට ගෙනෙනවා කියලා. පසු පෙළ මන්ත්‍රීවරු පුම්බලා පෙන්නුවා. නමුත් අද මොනවාද වෙලා තිබෙන්නේ? ඒ මන්ත්‍රීවරුත් හිස් අතින් ඉන්නේ. හිස් අතින් තමයි ඒ මන්ත්‍රීවරුන්ට මේ අය වැයත් සමඟ ගමට යන්න වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මම මෙතැනදී සඳහන් කරන්නට ඕනෑ, අද රට තුළ තිබෙන විශාලතම අර්බුදය කුමක්ද කියන කාරණය. අද අපේ ආර්ථික යාන්ත්‍රණය දුවන්නේ නැහැ. කැඩී කැඩී - breakdown වෙවී - යන්නේ. එහෙම යන්නේ ඇයි? ඒකට මූලික හේතුව තමයි අපේ රටට අවශ්‍ය විදේශ විනිමය නැතිකම. ඩොලර් ටික නැහැ. මේ විධියේ ඩොලර් අර්බුදයක් තිබෙනකොට තමයි මේ අය වැය ඉදිරිපත් කරන්නේ. එතකොට මූලික වශයෙන් අපේ උපායමාර්ග සහ වැඩපිළිවෙළක් තිබෙන්න ඕනෑ, අප රට තුළට ඩොලර් ටික -විදේශ විනිමය ටික- ගේන්නේ කොහොමද කියන එක ගැන. ඒ

[ගරු වේලු කුමාර් මහතා ]

පිළිබඳව මේ අය වැය තුළ මට නම් දකින්න කිසිම දෙයක් නැහැ. අපට ඩොලර් එන මාර්ග ගත්තොත්, ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තයෙන් -tourismවලින්- අපට ඩොලර් මිලියන 5,000කට ආසන්න ප්‍රමාණයක් එනවා. නමුත් දැන් ඒක කඩා වැටිලා තිබෙනවා. ඒක කඩා වැටිලා තිබෙනවා නම්, ඒක නැවත ලබා ගන්නට මොකක්ද අපි ළඟ තිබෙන වැඩපිළිවෙළ? විදේශ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට, රට තුළට ඇද ගැනීමට, රට තුළට ගන්නට මේ අය වැය තුළ ඉදිරිපත් කරලා තිබෙන යෝජනා කුමක්ද කියලා අපට අහන්න වෙනවා. ඒ කඩා වැටිච්ච ක්ෂේත්‍රය ගත්තාම, පුංචි මිනිහාගේ ඉඳලා ලොකු ව්‍යාපාරිකයා දක්වාම ඒ කඩා වැටීම තිබෙනවා. පසුගිය රජය කාලයේදී අපි දැක්කා, සංචාරකයන් සඳහා homestay සහ dorm පහසුකම් සපයන ව්‍යාපාර කරපු අයට, සංචාරක කර්මාන්තයේ ඉන්න සාමාන්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දෙන ත්‍රී රෝද රථයේ, වෑන් රථයේ, කාර් රථයේ ඉඳලා ඒ කර්මාන්තය තුළ හිටපු සියලුදෙනාටම යම්කිසි විධියක දායකත්වයක් ලබා දෙන්න කටයුතු කළ බව. දැන් අපට ඩොලර් අවශ්‍යයි. ඩොලර් නැතුව මේ රට තුළම තිබෙන මුදල් කොච්චර අපි එහේ මෙහේ කළත් ඒකෙන් අපට මේ යාන්ත්‍රණය ගෙනයන්න බැහැ. නමුත් ප්‍රධානම මූල්‍ය මාර්ගයක් වූ සංචාරක කර්මාන්තය වෙනුවෙන් කිසිම වැඩපිළිවෙළක්, යෝජනාවක් මේ අය වැය තුළ නැති නිසා අපට කියන්න වෙනවා, මේක හිස් අය වැයක් කියලා. ඉතින් පළමු ප්‍රධාන මූල්‍ය මාර්ගය මේ අය වැයේ නැහැ.

එහෙම නම් අපි දෙවන එකට යමු. දෙවන ක්ෂේත්‍රය තමයි ඇඟලුම් කර්මාන්තය. අපට ඩොලර් මිලියන 5,000ක් පමණ ලබා ගන්න පුළුවන් ක්ෂේත්‍රයක් තමයි ඇඟලුම් ක්ෂේත්‍රය. ඒ කර්මාන්තය නගාසිටුවන්නටත් කිසිම යෝජනාවක්, වැඩපිළිවෙළක් මේ අය වැය තුළ නැති නිසා අපට කියන්න වෙනවා, මේක හිස් අය වැයක් කියලා. විශේෂයෙන් කියන්න ඕනෑ, විදේශ විනිමය ලබා ගැනීමේදී ඇඟලුම් කර්මාන්තයෙන් ඩොලර් මිලියන 5,000ක් අපි ලබා ගත්තත්, ඩොලර් මිලියන 2,000ක් නැවත අපෙන් එළියට යන බව.

තුන්වනුව, අපට විශාල විදේශ විනිමය ලැබෙන්නේ වැවිලි කර්මාන්තයෙන් හා spicesවලින්. තේ වලින් ඩොලර් මිලියන 2,000ක් පමණ, රබර්වලින් ඩොලර් මිලියන 700ක් පමණ ලැබෙනවා. ඒ වාගේම, පොල් සහ spicesවලින් ඩොලර් මිලියන 600, 700ක පමණ විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපි ලබා ගන්නවා. එතකොට තේ කර්මාන්තය සඳහා, රබර් කර්මාන්තය සඳහා වැඩපිළිවෙළක් මේ අය වැය තුළ ඉදිරිපත් වෙලා තිබෙනවාද කියන එක අපට අහන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි කර්මාන්තය සඳහා තිබෙන ඒ ඉඩම් නැවත සකස් කරලා කෘෂිකර්මාන්තයට ලබාදීමට යොමු වෙනවා කියන කරුණ මේ අය වැය තුළ ඉදිරිපත් කරලා තිබෙනවා.

අපට අවශ්‍ය ඩොලර් ලබාදෙන තේ කර්මාන්තය, රබර් කර්මාන්තය හා ඒ ආසන්න වැවිලි කර්මාන්තයට තිබෙන ඉඩම්වල නැවත වගා කරලා, ඩොලර් උපයා ගන්න මාර්ගයකට යනවා වෙනුවට, මේ ඉඩම් ටික අල්ලාගෙන තමන්ගේ දේශපාලන වුවමනාවට බෙදා දෙන්න පුළුවන් යෝජනාවක් තමයි මේ අය වැය තුළින් ඉදිරිපත්වෙලා තිබෙන්නේ. මේකෙන් තවත් කඩා වැටීමක් තමයි සිද්ධ වෙන්නේ කියන එක අපි මතක් කරලා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රටේ සංවර්ධන වැඩ කටයුතු ඉදිරිපත් කරනකොට, නගර සංවර්ධනය කියලා කියනවා, ග්‍රාමීය සංවර්ධනය කියලා කියනවා. නමුත් වැවිලි කර්මාන්තයට සම්බන්ධ වතු ක්ෂේත්‍රය ඒ දෙකටම ඇතුළත් වෙන්නේ නැහැ. කලාප වශයෙන් ගත්තාම පළාත් හයක මේ වැවිලි කර්මාන්තය තිබෙනවා; මේ වතු ටික තිබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික්ක 8ක පමණ මේ වතු ටික තිබෙනවා. ඒ වුණාට මේ අය වැය ලේඛනයේ සංවර්ධන යෝජනා පිළිබඳ කියනකොට නගර සංවර්ධනය, ග්‍රාමීය සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, නගර යටිතල පහසුකම් - ඒක පාරක් වෙන්න පුළුවන්, පානීය ජල සැපයුමක් වෙන්න පුළුවන්, සංවර්ධනය කරන අනිකුත් යටිතල පහසුකම් වෙන්න පුළුවන්- කියන දෙක තමයි සඳහන් කරන්නේ. මේ රටට දිගින් දිගටම ඩොලර් උපයා දුන්නු, අදත් මේ රටට ඩොලර් ටික ලබාදෙන ඒ ජනතාව කොන් කරලා, වෙන් කරලා තබන ක්‍රමයක් තමයි සියලු රජයන් කරගෙන ගියේ. ඒක ඒ ආකාරයෙන්ම මේ අය වැය තුළත් ඉදිරිපත් කර තිබෙන එක කනගාටුදායක දෙයක්. ග්‍රාම නිලධාරි කොට්ඨාසයට දෙන රුපියල් ලක්ෂ 30 වෙන්න පුළුවන්, එහෙම නැත්නම් දේශපාලන වශයෙන් ඒ කොට්ඨාසයකට දෙන රුපියල් ලක්ෂ 40 වෙන්න පුළුවන්, මේ මුදල් නිලධාරිවරුන්ගේ අතට යනකොට කියන්නේ, මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ ග්‍රාම සංවර්ධනයට, මේ මුදල් වත්තට වෙන් කරලා නැහැ කියලායි. ග්‍රාම නිලධාරි කොට්ඨාසයකට වත්තක කොටස් තිබෙනවා, ගම් දෙකක්, තුනක් තිබෙනවා. ඒ ගම්වලට තමයි මුදල් වෙන් කරන්නේ. මන්ත්‍රීතුමා, මේ මුදල් ග්‍රාමීය සංවර්ධනයට ගමට වෙන් කර තිබෙන මුදල් කියලා කියනවා. එතකොට කොහොමද තේ කර්මාන්තය දියුණු කරන්න පුළුවන් වෙන්නේ? එතකොට කොහොමද රබර් කර්මාන්තය දියුණු කරන්න පුළුවන් වෙන්නේ? එතකොට කොහොමද මේ රට දියුණු කරන්න පුළුවන් වෙන්නේ? එතකොට කොහොමද අපට ඩොලර් ටික උපයා ගන්න පුළුවන් වෙන්නේ? ඒ ශාපය තමයි අපි අද මේ රට තුළ විඳින්නේ කියන එක මේ ඉන්න නායකයන් දැන ගන්න ඕනෑය කියන එක මා මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි. මේ කාරණයත් මා මතක් කර දෙන්න ඕනෑ. අද වන කොට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතු කම්කරුවන් 4,000කට ආසන්න පිරිසක් ඉන්නවා. මාසයේ 10වන දා වනකොට ඔවුන්ට පඩිය ලබා දෙනවා. අද දිනය 15යි. ඒත් ඒ වතු කම්කරුවන්ට පඩි දීලා නැහැ. ජනතා වතු සංවර්ධන මණ්ඩලය බංකොලොත්වෙලා. මේ රටට ඩොලර් ටික ගෙනෙන, තේ දළු නෙළන වතු කම්කරුවා අද බඩගින්නේ ඉන්නේ. මේ මාසයේ පඩිය ලබා දෙන්නට බැරි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඇයි ඒ? වැරැදි ක්‍රමයට ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙනියලා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට දැම්මා. වැවිලි අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධානම ආයතනය ගෙනගිහින් දැම්මා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට. වැවිලි කර්මාන්තයෙන් තමයි ප්‍රධාන වශයෙන් ඩොලර් උපයා ගන්නේ. ඒ ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශයට දමලා, රුපියල් ලක්ෂ ගණනක පඩියක් දීලා දැන් නිලධාරිවරයෙක් පත් කරගෙන තිබෙනවා, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ඉඩම් ටික නැවත පරීක්ෂණ කරලා විකුණන්නට. දැන් රජය, වරායවල්, කොළඹ තිබෙන ඉඩකඩම්වලට අමතරව වැවිලි කර්මාන්තය තුළ තිබෙන ඉඩකඩම් ටිකත් විකුණන්නට අවශ්‍ය අඩිතාලම දමන බජට් එකක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක අපට කියන්න වෙනවා. මේ ගමන මේ විධියට ගියොත් එහෙම, මේ රටේ ඉතුරුවෙලා තිබෙන සම්පත් ටිකත් අපට නැති කරගන්න වෙනවා.

விசேடமாக, இம்முறை சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற 2022ஆம் ஆண்டுக்கான பாதீடானது, அனைத்து மக்களினதும் எதிர்பார்ப்புக்களைத் தொலைத்திருக்கின்ற ஒரு பாதீடாகவே இருக்கின்றது. அதுமட்டுமல்ல, இந்த நாட்டிலே அபிவிருத்தி குறித்துப் பேசுகின்றபோது நகர மற்றும் கிராம அபிவிருத்தி பற்றிப் பேசப்படுகின்றதே ஒழிய, பெருந்தோட்டப் பகுதியின் அபிவிருத்தி பற்றிப் பேசப்படுவதில்லை. ஏறக்குறைய 6

மாகாணங்களில், 8 மாவட்டங்களுக்கும் அதிகமான மாவட்டங்களில் வாழுகின்ற பெருந்தோட்ட மக்கள் அனைத்துப் பாதீடுகளிலும் ஒதுக்கப்படுவது வழமை! அதேபோலதான் இந்தப் பாதீட்டிலும் ஒதுக்கப்பட்டிருக் கிறார்கள்.

அதுமட்டுமல்லாது, இங்கு நாங்கள் விசேடமாக ஒன்றைக் குறிப்பிட வேண்டும். கௌரவ நிதியமைச்சர் அவர்கள் இந்தப் பாதீட்டிலே அடுத்துவரும் 03 ஆண்டுகளுக்குள் பெருந் தோட்டங்களில் இருக்கின்ற 'லயன்' அறைகளை அகற்றி, வீடுகளை அமைக்கவென 500 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்வதாகக் குறிப்பிட்டிருக்கின்றார். இதன்படி பார்த்தால், ஓர் ஆண்டுக்கு கிட்டத்தட்ட166 மில்லியன் ரூபாய் ஒதுக்கப்படும். ஒரு வீடு கட்டுவதற்கு கிட்டத்தட்ட 1.3 மில்லியன் ரூபாய் செலவாகும் எனக் கருதினால், ஏறக்குறைய 130 வீடுகளைக் கட்டலாம். ஆக, 03 ஆண்டுகளில் ஏறக்குறைய 300 வீடுகளைக் கட்டி, 'லயன்' அறைகளை ஒழிப்பதென்று ஒரு முட்டாள் தனமான, சிறுபிள்ளைத்தனமான முன்மொழிவை இந்தப் பாதீட்டிலே முன்வைத்திருப்பதிலிருந்து இந்த அரசாங்கம் பெருந்தோட்ட மக்களை எங்கே வைத்திருக்கின்றது என்பது எங்களுக்குத் தெரிகின்றது. அதேபோல, தோட்ட உட்கட்டமைப்பு அமைச்சை ஒரு பெட்டிக் கடையாக - வெற்றிலை, பாக்கு விற்கும் கடையளவுக்குச் சிறுமைப்படுத்தி ஒதுக்கியிருப்பது கவலைக்குரிய விடயமாகும்.

විශේෂයෙන්ම මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. අය වැයේ වතු ජනතාව පිළිබඳව යෝජනාවක් තිබෙනවා, වතුවල තිබෙන ලයිම් කාමර ටික ඉවත් කරන්නට රුපියල් මිලියන 500ක් ඉදිරියේ එන අවුරුදු තුනක් තුළ ලබා දෙනවා කියලා. ඒ කියන්නේ අවුරුද්දකට රුපියල් මිලියන 166යි. එතකොට එක නිවසක් හදන්න රුපියල් මිලියනයක් කියලා ගත්තත් නිවාස 166ක් හදන්න පුළුවන්. නිවාස 300ක් හදලා රටේ තිබෙන ලයිම් කාමර ටික ඉවත් කරනවා කියන බොළඳ තත්ත්වයට තමයි මේ ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, වතුවලට නිවාස 165,000ක් අවශ්‍යයි කියන එක මම මතක් කරනවා. නිවාස 300ක් හදලා ලයිම් ටික අයින් කරනවා කියන තත්ත්වයට ආණ්ඩුව වැටිලා තිබෙනවා නම්, මේක මේ රටේ ජනතාව කොතැනද ඉන්නේ කියන එක දන්නේ නැති අය වැයක් කියන එක මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව කොච්චර තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

மக்கள் தோட்ட அபிவிருத்திச் சபையினால் - JEDB நிறுவனத்தினால் எங்களுடைய தோட்டத் தொழிலாளர் களுக்குக் கடந்த மாதம் 10ஆம் திகதி வழங்கப்படவேண்டிய சம்பளமானது இன்னும் வழங்கப்படாமல் இருக்கின்றது. இதனால், இன்று ஏறக்குறைய 4,000 தோட்டத் தொழிலாளர்கள் பட்டினியிலே இருக்கவேண்டிய ஒரு நிலைமையை இந்த அரசாங்கம் ஏற்படுத்தியிருக்கின்றது. இதற்குக் காரணம், இன்று பெருந்தோட்டத்துறை அமைச்சின்கீழ் இருந்த இந்நிறுவனத்தை கமத்தொழில் அமைச்சின்கீழ்க் கொண்டுவந்து, பல இலட்சம் ரூபாய் சம்பளத்தில் ஒருவரை நியமித்து, அங்குள்ள காணிகளைப் பிரித்து விற்பனை செய்கின்ற ஒரு வேலைத்திட்டம் ஆரம்பிக்கப்பட்டமையாகும். இந்த அரசாங்கம் வங்குரோத்து நிலையை அடைந்துவிட்டது என்பதற்கான இன்னுமோர் அறிகுறியாகவே இது இருக்கின்றது. நாளை மறுநாள் ஆகின்றபோது மக்கள் தோட்ட அபிவிருத்திச் சபையானது - JEDBஆனது - அதன் ஊழியர்களுக்கு வழங்கவேண்டிய சம்பளத்தை முழுமையாக வழங்காதபட்சத்தில், அந்த ஊழியர்களோடு நாங்களும் சேர்ந்து இந்த அரசாங்கத்திற்கு எதிராகச் செயற்படவேண்டிய ஒரு கட்டாய நிலை ஏற்படும். இந்த நாட்டுக்குத் தங்களது உழைப்பின்மூலம் டொலரை ஈட்டித்தருகின்ற எங்களது மக்களை இரண்டாம் தரப் பிரஜைகளாகக் கருதி, அவர்களை அபிவிருத்தியிலிருந்து ஒதுக்கி, அவர்களுக்காக இருக்கின்ற இராஜாங்க அமைச்சைக்கூட ஒரு பெட்டிக் கடையாக - வெற்றிலை விற்கும் கடையாக மாற்றி, ஒரு பிரதேச சபை உறுப்பினர் அளவிற்கு இராஜாங்க அமைச்சரைத் தள்ளியிருப்பது வெட்கக்கேடான ஒரு விடயமாக இருக்கின்றது. இவ்வாறானதொரு நிலையில், நீங்கள் இன்னும் இந்த அரசாங்கத்தின் பங்காளிகளாக எவ்வாறு இருக்கின்றீர்கள்? என்பதைத்தான் நாங்கள் சம்பந்தப்பட்டவர்களிடம் கேட்க வேண்டியிருக்கின்றது. ஆகவே, இந்தப் பாதீடானது ஒன்றுமில்லாத ஒரு வெற்றுப் பாதீடாகும்.

හැමෝම කියනවා වාගේ මේ ඉදිරිපත් කරලා තිබෙන "බජට්" එක, "පතෝල බජට්" එකක් කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මධුර විතානගේ මහතා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.43]

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා, විපක්ෂය හොටු පෙරාගෙන අඬලා, කෙඳිරි ගගා මොනවාදෝ වචන ටිකක් අද දවස පුරාවටම කියනවා. ඒවා පැහැදිලිත් නැහැ. ගැළපීමකුත් නැහැ. අගක් මුලකුත් නැහැ. මම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි, මීට දශක පහකට විතර කලින් ලක්ෂ්මී බායි මැතිනිය කියපු ගීතයක්. එහි සඳහන් වෙන්නේ, "ආදී සිංහලුන් පිට දීප දේශ ජය ගත්තා. තම රට දේවල් පිට රට පටවා පිට කාසිය මෙහි ඇද්දා. අන්තිමේදී කන්න අදින්නත් පිට රටින් එන තුරු මූදට දත නියවන්නා" කියලායි.

මේ ගීතයෙන් අර්ථවත් වෙන දේ නැවත වතාවක් රටේ ඇති වෙන්නට ඉඩ තබන්නේ නැහැ කියන එක තමයි අපේ ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කරපු අය වැයෙන් අපි දැක්කේ. අද විපක්ෂයේ ඉන්න අය පසු ගිය වසර පහ තුළ කරපු විනාශය ගැන අපට දවස් 365ක් පාර්ලිමේන්තුවේ කථා කළත් ඉවර කර ගන්න බැහැ. 2019 වසරේ අපි රට භාර ගන්න කොට හඳුන්කූර, වෙසක් කාඩ් එක, සරුංගලයේ සිට මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ 433ක් දක්වා ප්‍රමාණයක් මේ රටට ගෙනාවා. අතිගරු ජනාධිපතිතුමා ඒවා මෙරටට ගෙනෙන

[ගරු මධුර විතානගේ මහතා]

එක නැවැත්වුවා. හැබැයි, යම් යම් ජාවාරම්කාරයන්ට ඒකෙන් ගොඩක් රිදුණා. ඒවා සඳහා 2018 වසරේදී ඇමෙරිකන් ඩොලර් බිලියන 2.2ක් මේ රටින් එළියට ගියා. ඒ වාගේම 2019 වසරේදී මේ රටේ නිපදවන්න පුළුවන් භාණ්ඩ ගන්න ඇමෙරිකන් ඩොලර් බිලියන 1.2ක් එළියට ගියා. පසු ගිය වසර එකහමාර තුළ ඒ විධියට රටට ගෙන්වීම නතර කරපු භාණ්ඩවලට ආදේශන හැකි පමණ නිෂ්පාදනය කළා. ඒ නිසා අපට ඩොලර් බිලියන 1.6ක් අප රට තුළම නවත්වා ගන්න පුළුවන් වුණා. ඒක තමයි මේ ප්‍රශ්නවලට තිබෙන එක උත්තරයක්. ඉරිසියාවට, කුහකකමට ක්‍රෝධයෙන්, වෛරයෙන් කථා කළාට අපි ප්‍රතිපත්තියක් අනුව, දර්ශනයක් අනුව රට පාලනය කරනවා නම් අපට මේ රට ජයග්‍රහණ කරා ගෙන යන්න පුළුවන්.

විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් බොහෝදෙනා ගමට යන්න හොරගල් ඇහිඳිනවා. ගමට යන්න, 'ගමට යං යං' කියලා යම් යම් වැඩසටහන් කරනවා. හැබැයි, ගමට යන්න බැහැ. අපේ රජය කාලයේ දැවැන්ත යුද්ධයක් තිබෙන වෙලාවේදීත් සෑම මැතිවරණ කොට්ඨාසයකම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන විධියට එක ගමකට එක වැඩසටහනක් කිරීම තුළින් ගම ශක්තිමත් කළා. "ගම සමඟ පිළිසඳර" වැඩසටහන තුළින් පක්ෂ, විපක්ෂ සෑම මන්ත්‍රීවරයෙකුටම රුපියල් ලක්ෂ 40ක ප්‍රතිපාදනයක් වෙන් කරලා ලංකාවේම ග්‍රාම නිලධාරි වසම් 14,022 ආවරණය වෙන විධියට අතිදැවැන්ත වැඩසටහනක් මෙවර අය වැයෙන් සංවිධානය කරලා තිබෙනවා.

මෙන්න මේවා කරන කොට සමහරුන්ට රිදිලා තිබෙනවා. අවුරුදු පහක් රට පාලනය කළාට ගමේ මන්ත්‍රීවරයාට -ගමේ මහජන නියෝජිතයාට- ගමේ මිනිසුන්ට අවශ්‍ය දේ කළේ නැහැ. බිලියන ගණනක් ණය අරගෙන කළේ 'කහ ඉරි සුදු කරන එක' විතරයි. වෙනත් දෙයක් කරනවා අපි දැක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නැවතුණු සංචාරක කර්මාන්තය පටන් ගත්තා. ඔක්තෝබර් මාසය වන විට සංචාරකයන් 27,770ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. අලුත් ගුවන් සේවා අපේ රටට ඇවිල්ලා තිබෙනවා. කොරෝනා රෝගය මර්දනය කරමින්, විනිවිදභාවයකින් රාජ්‍ය පාලනය ගෙන යමින්, ප්‍රතිපත්තිගරුක භාවයෙන් කටයුතු කිරීම නිසා විශේෂයෙන්ම විදේශ රටවල් අපේ රට කෙරෙහි අවධානය යොමු කරලා තිබෙනවා.

මෙවර අය වැයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ශක්තිමත් කරන්න රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. "සෞභාග්‍යා" වැඩසටහන යටතේ සෘජුව අමාත්‍යාංශවල අරමුදල් ගම්වලට වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම "Home Shops" වැඩසටහන යටතේ මිලියන 15,000ක් වෙන් කර තිබෙනවා. මේ සමස්ත වෙන් කිරීම එකතු කළාට පස්සේ, ගම අනිවාර්යයෙන්ම -නියත වශයෙන්ම- ශක්තිමත් වනවා.

විදේශ රැකියාවලට යෑම නැවත පටන් අරගෙන තිබෙනවා. වසර එකහමාරක් තිස්සේ විදේශ රැකියාවලට යෑමට නොහැකි තත්ත්වයක් ඇති වුණා. අපේ රටට වැඩියෙන්ම ආදායම් එන ප්‍රභවයක් තමයි, විදේශ රැකියා ක්ෂේත්‍රය. නමුත් අද ඒකටත් මඩ ගහනවා, "මිනිස්සු රට අතහැරලා යනවා" කියලා. හැබැයි, අවුරුදු පහක් ඒ මිනිස්සු දුක් මහන්සියෙන් හම්බ කරපු මුදල්වලින් ඩෙහි නටමින්, ඔක්කෝම බලිතොවිල් නැටුවා. හැබැයි අද ඒ තරුණයන් රට යනකොට ඒකටත් මඩ ගහනවා. කියනවා, "රට අතහැරලා යනවා" කියලා. රට අත හැරලා යන්න තවම රටවල් විවෘත කරලාත් නැහැ. ප්‍රංශය, ජර්මනිය වාගේ රටවල් ඔක්කෝම වහලා. ඒ රටවලට තවම විදේශිකයන් ගන්නේ නැහැ. අපේ මිනිස්සු මේ යන්නේ, රස්සාවට. නොවැම්බර් 13වන දා වනකොට 84,753ක් මේ රටින් විදේශ රැකියාවලට ගිහින් තිබෙනවා. ඇත්තටම ඒක අපට ලොකු ශක්තියක්. අපි මේ වෙලාවේ ඒ ශ්‍රම බලකායට අපේ ගෞරවනීය ප්‍රණාමය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශිෂ්ට ආර්ථික විශේෂඥයකු මෙන්ම කෘතහස්ත දේශපාලනඥයකු වන ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා 1969දී කළ ප්‍රකාශයක් මම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි. එතුමාගේ පොතකින් මම මේක උපුටා ගත්තේ. 1969දී එතුමා කිව්වා, "ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට රට භාර දෙන්න එපා. භාර දුන්නොත් ආයේ ගන්නත් එපා. ඒ භාර ගන්න රටෙන් වැඩක් නැහැ. මොකද, ඒ තරම් මේ රට විනාශ කරනවා. ඒකේ ප්‍රතිඵල ඔබට දකින්න පුළුවන්. ඒක මට දැන් කියන්න බැහැ. හැබැයි, අනාගතයේදී බලාගන්න පුළුවන් එහෙම භාර දුන්නොත් මොකද වෙන්නේ කියලා. ඒ ගැන මම කනගාටු වනවා" කියලා. ඇත්තටම 1977දී ඒ විනාශය පටන් ගත්තා. දේශීය කර්මාන්ත විනාශ කරලා, දේශීය කෘෂි කර්මාන්තය නැති කරලා, විවිධ වර්ගයේ කර්මාන්තශාලා පරණ යකඩවලට විකුණලා මේ රට අන්ත අසරණභාවයකට පත් කරන්න ඒ රජය එදා කටයුතු කළා. වාරි කර්මාන්තය හා කෘෂි කාර්මික අතින් ශක්තිමත් වසර 2500ක ඉතිහාසයක් තිබෙන අපේ රටට අවුරුදු 200ක පමණ ඉතිහාසයක් තිබෙන රටවල හදන පොහොර ගෙනැල්ලා මේ රට නැති කරන තැනට පිඹුරුපත් හැදුවේ ඒ රජය විසින්. ඒ ගැන මම විශේෂයෙන් කනගාටුව ප්‍රකාශ කරනවා. අපි එවැනි වැරදි ඉදිරියේදී නැවත වෙන්න දෙන්නේ නැහැ. මම දැක්කා අපේ පැත්තේ ඉඳගෙනත් විරුද්ධ පක්ෂයේ භූමිකාව රඟපාමින් ඇතැම් මන්ත්‍රීවරු කථා කරනවා. ඒ ගැන අපි කනගාටු වනවා. පසුගිය කාලයේ සිදු වූ දේවල් වෙන්න ඉඩ නොතිබීම නිසා තමයි අද ගොඩක් අයට රිදිලා තිබෙන්නේ. එක එක රටවල ඒජන්තවරු විධියට තමයි ගොඩක් අය අද මෙතැන රඟපාන්නේ. ඒ ගැන අපි වෙනම කථා කරමු. අපට ඒ ගැන කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා, තොරතුරු එක්ක.

යහ පාලන ආණ්ඩුව 2018 සිට 2019 ජූලි 15වන දා වනකොට ඩොලර් බිලියන 6.9ක් ණය අරගෙන තිබෙනවා. හැබැයි, කරපු සංවර්ධනයක් නැහැ. මම කලින් කිව්වා වාගේ, කහ ඉරි සුදු කරන එක හැරෙන්න ඵලදායිතාවක් තිබෙන, භෞතිකව පෙනෙන කිසිම දෙයක් කළ බවක් අපි දැක්කේ නැහැ. මේ රටේ බදු ගෙවන මහ ජනතාවට භුක්ති විඳින්න පුළුවන්, භෞතිකව ඵල ප්‍රයෝජනය ගන්න පුළුවන් කිසිම දෙයක් හදලා දීලා නැහැ. එහෙම නම්, මහ ජනතාවගෙන් ලබාගත් බදු මුදල්වලට මොනවාද වුණේ? ඒ ගැන දැන් පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා වනවා. පසුගිය දිනක ඒ කමිටු වාර්තාවක් ඉදිරිපත් කළා. ඒකෙන් යම් කාරණයක් අනාවරණ වුණා. ඒ තමයි, මිල්ලනිය ප්‍රදේශයේ කර්මාන්ත පුරයක් හදලා තිබෙනවා; අපනයන කර්මාන්ත පුරයක්. හැබැයි ඒ ඉඩම අරගෙන නැහැ. නැති ඉඩමකට රුපියල් බිලයන 2ක් වියදම් කරලා තිබෙනවා. මේවා තමයි යහ පාලන රජයේ කෙරුවාව. තව කථා කරන්න බොහෝ එවැනි කාරණා තිබෙනවා.

විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ ඉන්න ආචාර්යවරු කණ්ඩායමත් හරි කැමැතියි විදේශ ණය ගන්න. අද අය වැය විවාදයේ දෙවැනි දවස. මේ දවස් දෙක පුරාවටම එතුමන්ලා කිව්වේ, "විදේශ ණය ගන්න" කියලායි. සමහර වෙලාවට අපට හිතෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හෝ ලෝක බැංකුවේ නියෝජිතයෝත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු විධියට ඉන්නවාද කියලා. ඒ තරම් මට කුතුහලයක් තිබෙනවා. ඒ ගැනත් අපි හොයන්න ඕනෑ. යහ පාලනයේ කෙරුවාව අපට බලන්න පුළුවන්, ලෝක බැංකුවේ Ease of Doing Business Index එකෙන්. ඒ

කියන්නේ, ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පිළිබඳ දර්ශකය අනුව. ඒ දර්ශකයට අනුව, 2013-2014 වර්ෂයේදී අපි හිටියේ 81වැනි ස්ථානයේ. ඉන්දියාව හිටියේ 134වැනි ස්ථානයේ. Google එකෙන් Wikipedia එකට ගියාම Ease of Doing Business Index එකේ විස්තර බලා ගන්න පුළුවන්. මම මේ කියන්නේ ඒ අයගේ කෙරුවාව ගැන. 2013-2014 වර්ෂයේ අපි 81වැනි ස්ථානයේ ඉන්නකොට ඉන්දියාව හිටියේ 134වැනි ස්ථානයේ. 2018-2019 වර්ෂය වන විට විපක්ෂයේ ඉන්න ආචාර්යතුමන්ලාගේ කෙරුවාව නිසා අපි 111වැනි ස්ථානයට පහළ වැටුණා. 2013-2014 වර්ෂයේදී 81වැනි ස්ථානයේ හිටපු අපි 2018-2019 වර්ෂය වන විට 111වැනි ස්ථානය දක්වා පහළට ගියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
Sir, I propose that the Hon.Velu Kumar do now take the Chair.

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SANJEEVA EDIRIMANNA *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Ease of Doing Business Index එක ගැනයි මම කථා කළේ. එම දර්ශකය අනුව 2013-2014 වර්ෂයේදී අපි හිටියේ 81වැනි ස්ථානයේ. 2018-2019 වසර වන විට අපි 111වැනි ස්ථානයට පසු බැහැලා තිබෙනවා. හැබැයි, 134වැනි ස්ථානයේ හිටපු ඉන්දියාව 63වැනි ස්ථානය දක්වා ඉහළට ඇවිල්ලා තිබෙනවා. 2013-2014 වන කොට පැවැති අපේ කලින් ආණ්ඩුවේ ඒ ක්‍රමවේදය දිගටම ක්‍රියාත්මක කරගෙන ආවා නම්, අද අපි ගොඩක් ඉස්සරහට ඇවිල්ලා. මොකද, ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය - Ease of Doing Business Index - බලලා තමයි මේ රටට ආයෝජකයෝ එන්නේ. එම දර්ශකයට අනුව 111වැනි ස්ථානයේ තිබුණු රට අපි මේ වන විට 99වැනි ස්ථානයට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම මෙවර ඉදිරිපත් කර තිබෙන ආර්ථික සංකල්ප හා අය වැය වැඩසටහන් එක්ක ඉදිරියේදී එම ස්ථානය තවත් ඉහළට ගෙන යන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

ඊළඟට, 2014 වන විට දූෂිත රටවල් පිළිබඳ ලැයිස්තුවේ - Corruption Index - අපි හිටියේ 54වැනි ස්ථානයේ. හැබැයි, යහපාලන -ඇත්තටම "යහපාලනය" වෙනුවට "වැරැදි පාලනය" කියලා නම වෙනස් කර ගන්න වෙනවා- රජය කාලයේ 64වැනි ස්ථානයට ගෙනැල්ලායි 2019දී අපට මේ රට භාර දුන්නේ. ඒ වාගේ තත්ත්වයක් මත තමයි අපට රට භාර දුන්නේ.

2015දී යහපාලන ආණ්ඩුවේ නායකයෝ මහ බැංකු අධිපති තනතුර සඳහා සිංගප්පූරුවෙන් පුද්ගලයකු ආනයනය කළා. ඒ වාගේ ආනයන තමයි ඒ කාලයේ කළේ. ඒ ආනයනය කරපු පුද්ගලයා මහ බැංකු අධිපති තනතුරේ වැඩ භාර ගන්නකොට මේ රටට ඉහෙන් බහින රෝගයක් තිබුණේ නැහැ; කොරෝනා වසංගතයක් තිබුණේ නැහැ. හැබැයි, උන්නැහේලා එකතු වෙලා, රුපියල අසනීප කරලා, "සේලයින්" දෙනකොටත් වත්මන් විපක්ෂ නායකතුමා හිටියේ කොහේද? යාල අභය භූමියේ අලි බලමින්. එතකොටත් හිටපු අගමැතිතුමා තමන්ගේ ගෝල බාලයන් එක්ක හොඳට රටට වැඩේ දීගෙන යනවා. අද කිඹුල් කඳුළු හෙළුවාට, කොයිම වෙලාවකවත් ඒ කට්ටිය මැදිහත් වෙලා මේ රට යම්තාක් දුරකට හෝ ගොඩට ගන්න කටයුතු කරනවා මා දැක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා "ලංකාදීප" පුවත් පතට කියා තිබුණා, "රුපියල අවප්‍රමාණය වීම පැති ගොඩකින් රටට හොඳයි. ජනතාව මෙදා අඩු වියදමෙන් අවුරුදු කනවා." කියලා. සුජිත් හේවාජුලිගේ තමයි එය වර්තා කරලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අපහාසයට නොවෙයි මෙය කියන්නේ. ලංකාදීප පත්තරේ ඒ කොටස මගේ ළඟ තිබෙනවා. පත්තරේ තිබෙන දේ තමයි මා සඳහන් කළේ. ඒ වාගේම ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝට්ටේ ආසනය නියෝජනය කරන අපේ ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාට ඕනෑ නම් මේ ගැන Lobby එකේදී මගෙන් අහන්න තිබුණා. මට මඩ ගහන්නයි මේ වෙලාවේ මේ ගැන කිව්වේ. සුජිත් හේවාජුලිගේ මාධ්‍යවේදියාගේ ඒ වාර්තාව සම්පූර්ණයෙන් වැරැදියි. එය නිවැරැදි කරලා ඊළඟ දවසේ ලංකාදීප පුවත් පතේ correction එකක් පළ කරලා තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒ correction එකත් ඕනෑ නම් මම ඔබතුමාට දෙන්නම්.

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
එහෙම correction එකක් තිබෙනවා නම් හොඳයි. ඔබතුමා මට ඒක දෙන්න. එතකොට මටත් ඒක බලා ගන්න පුළුවන්. මම සඳහන් කළ කාරණය වැරැදි නම් නිවැරැදි කළාට බොහොම ස්තුතියි. පුවත් පතේ තිබුණු කාරණාව තමයි මම කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල වුණේ ඇමෙරිකානු ඩොලර් 40යි. නමුත්, අපේ රටේ තෙල් මිල අඩු වුණේ නැහැ. ඒ කාලයේ හිටපු මුදල් රාජ්‍ය ඇමතිතුමා කිව්වා, පරිසර දූෂණය වළක්වන්නයි එහෙම කටයුතු කළේ කියලා. ඒ වාගේම සීනි මිල වැඩි වනකොට එදා හිටපු සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, රටේ දියවැඩියා රෝගීන් වැඩියි, දියවැඩියා රෝගීන් අඩු කරන්නයි එහෙම කටයුතු කළේ කියලා. ඒවාත් එක්ක බැලුවාම, විපක්ෂ නායකතුමා නිර්දේශ කරපු අර කොරෝනා බෙහෙත් ටික බිව්වා නම් රටටම අබ සරණයි කියලාත් දැන් අපට තේරෙනවා. විශේෂයෙන් යහපාලන රජයේ නායකයන්ගේ දුර්වල පෞරුෂය නිසා හම්බන්තොට වරාය

[ගරු මධුර විතානගේ මහතා]

සම්බන්ධ ගිවිසුමට අදාළව අද කලාපයේ විශාල රාජ්‍ය තාන්ත්‍රික ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ තුළින් ආර්ථික හා සාමාජයීය වශයෙන් අපේ රටට ඉතා අහිතකර බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. මේ වන විට වෙලා තිබෙන දැවැන්ත රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමට ප්‍රධාන වශයෙන්ම බලපාපු කාරණයක් හැටියටයි මා ඒ ගිවිසුම දකින්නේ.

අද විපක්ෂය ඉතාම වගකීම් විරහිතව හැසිරෙන අන්දමක් මම දකිනවා. මොකද, ලෝකයේ තිබෙන කිසිම දේශපාලන ව්‍යාපාරයක් දැවැන්ත ගෝලීය වසංගතයක් තිබෙන මේ වාගේ කාලයක මේ විධියට පෙළපාළි ගිහිල්ලා රට අකර්මණ්‍ය කරන්න උත්සාහ කරන්නේ නැහැ. එක පැත්තකින් ඒ අය කියනවා, සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා කියලා. නමුත්, රටේ පෙළපාළි යනකොට, කොරෝනා වසංගතය රට තුළ ව්‍යාප්ත කරන්න හදනකොට සංචාරකයෝ මේ රටට එන්නේ නැහැ. ඒක තමයි විපක්ෂයේ ඒ ගොල්ලන්ගේ අරමුණ වෙලා තිබෙන්නේ. ඒක ඉතා පැහැදිලියි. ඒ අයට ඕනෑ වන්නේ, කොවිඩ් ආසාදිතයන් සමඟ පෙළපාළි, උද්ඝෝෂණවලට යන්නයි, වසංගතය නැවත ව්‍යාප්ත කරන්නයි, කොවිඩ් ආසාදිතයන්ගෙන් රෝහල් පුරවන්නයි, එදා වේල හම්බ කරගෙන කන අහිංසක මිනිස්සුන්ගේ ආර්ථිකයට ගහන්නයි. මොකද, එවිට මිනිස්සු විපතට පත් වනවා. ඒක තමයි ඒ අයට අවශ්‍ය කරන්නේ. ඒ වාගේම, කර්මාන්තශාලා වහන්නත්, රටේ සාමාන්‍ය ජන ජීවිතය අඩාළ කරන්නත් ඒ ගොල්ලන්ට අවශ්‍යයි. ඒක තමයි 1977 ඉඳන් කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
මිනිස්සුන්ගේ ලේවලින්, මිනිස්සුන්ගේ වේදනාවෙන්, මිනිස්සුන්ගේ ප්‍රශ්නවලින් තමන්ගේ දේශපාලනය කරන්න තමයි ඒ ගොල්ලන්ගේ බලාපොරොත්තුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ප්‍රසන්න රණවීර රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.59]

**ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජය විසින් ඉදිරිපත් කරන ලද දෙවැනි අය වැය ලේඛනය වන, මුදල් අමාත්‍යතුමා හැටියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරන ලද පළමුවැනි අය වැය ලේඛනය වන, නිදහස් ශ්‍රී ලංකාවේ 76වැනි අය වැය ලේඛනය වන, 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මෙම අය වැය ලේඛනය සම්බන්ධයෙන් කරුණු කාරණා කීපයක් කථා කරන්න ලැබීම පිළිබඳව මම බෙහෙවින්ම සතුටට පත් වෙනවා.

නිදහසින් පසු රටක් ලෙස මුහුණ දෙන බරපතළම අභියෝග ගණනාවක් මධ්‍යයේ ඉදිරිපත් කළ අය වැයක් විධියටයි අපි මේ අය වැය ලේඛනය සලකන්නේ. මානව ශිෂ්ටාචාරයට බරපතළ අභියෝගයක් එල්ල කළ කොරෝනා වසංගතය විසින් අපේ රට පමණක් නොව, මුළු ලෝකයේම රටවල් ඔසවා පොළොවේ ගහපු යුගයක මේ වාගේ අභියෝගාත්මක අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාට අපේ ගෞරවය පුද කර සිටිනවා.

ඉතා දරුණු ආර්ථික අවපාතයක් සහිත රටක් බාරගෙන තිබෙන අවස්ථාවක, කොවිඩ් වසංගතය හමුවේ ලෝකයේ සියලු රටවල් දැවැන්ත අභියෝගයකට මුහුණදී සිටින අවස්ථාවක, එයින් ඇති වූ නරක ප්‍රතිඵල ඉතා බරපතළ ලෙස අත් විඳිමින් සිටින අවස්ථාවක රට ගොඩ නැඟීමට ඉදිරිපත් කළ අභියෝගාත්මක අය වැයක් ලෙස මෙම අය වැය ඉතිහාසගත වන බව නොඅනුමානයි.

ඒ වාගේම, රට මුහුණදී තිබෙන අභියෝග හමුවේ යථාර්ථවාදීව රට ගැන සිතා, සමාජය දෙස හා ජන ජීවිතය ගැන, ලෝක ආර්ථිකය ගැන ගැඹුරින් අධ්‍යයනය කරමින් ඉදිරිපත් කරපු අය වැයක් විධියටත් මෙම අය වැය අපට හඳුන්වන්න පුළුවන්. මේ අය වැය තුළ ජනප්‍රිය සහ ආකර්ෂණීය යෝජනා නොදකින්න පුළුවන්. නමුත් නිෂ්පාදන ආර්ථිකය ගොඩ නැඟෙන, ග්‍රාමීය ආර්ථිකය ඉහළ නංවන, රට සෞභාග්‍යය කරා රැගෙන යෑමට අවශ්‍ය සැලසුම් අන්තර්ගතව තිබෙන අය වැයක් ලෙස මේ අය වැය හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම, පටු දේශපාලන සහ පෞද්ගලික වාසි අරභයා ජනප්‍රිය යෝජනාවලින් තොරව, රටේ අභියෝග ජයගැනීමේ පරමාර්ථයෙන් මෙම අය වැය ඉදිරිපත් කර තිබීම විශේෂ ලක්ෂණයක් ලෙස මම දකිනවා. එවැනි නිර්භීත පියවරක් ගැනීම පිළිබඳව ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට අපගේ ගෞරවය අපි මේ අවස්ථාවේදී පුද කරනවා.

මීට අවුරුදු 43කට කලින් 1977 ගෙනාපු විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක ආනයන අභිමුඛ ආර්ථිකයක් තමයි ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ප්‍රමුඛ එවකට ආණ්ඩුව අපේ රටට ඉදිරිපත් කළේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගෙනාපු සංවෘත ආර්ථිකය, දේශීය ආර්ථිකය කඩාකප්පල් කරලා, ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය තුළ ඉල්ලුම හා සැපයුම මත සියලු කටයුතු කළ හැකියි, ඒ අනුව අපනයන වැඩි කර, ආදායම වැඩි කරන්න පුළුවන් කියන සංකල්පමය ආර්ථික ක්‍රියාවලිය තමයි ඒ ආර්ථික ඔස්තාර්ලා ඉදිරිපත් කළේ.

ඒ කාල පරිච්ඡේදය තුළම -1977 සිට 2002 දක්වා කාල පරිච්ඡේදය තුළ විතරක්- ආර්ථික වර්ධන වේගයේ සුළු වැඩි වීමක් වූ බව අපි දකිනවා. නමුත්, 1977 සිට මේ දක්වාම, මේ වසර 43ක කාල පරිච්ඡේදය තුළම මේ රටේ ගෙවුම් ශේෂ හිඟයත් -වෙළෙඳ ශේෂ හිඟයත්- අය වැය පරතරයත් එන්න එන්නම, දිගින් දිගටම විශාල ලෙස වැඩි වුණා.

ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ 2009 වසරේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5කට ගෙනෙන්න පුළුවන් වුණා. ඒ දක්වා සෑම වර්ෂයකම මේ රට විශාල යුද්ධයකට මුහුණ දුන්නා; ආර්ථික අවපාතයකට මුහුණ දුන්නා. ඒ වාගේම 2008 වර්ෂයේදී ආසියානු රටවල් සමඟ ශ්‍රී ලංකාවත් දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නා. අප කොටි ත්‍රස්තවාදයට මුහුණ දුන් ඒ කාල සීමාව තුළ කොටි ත්‍රස්තවාදීන් අපේ රටේ ආර්ථික

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මර්මස්ථානවලට පහර දුන්නා. එකී ප්‍රශ්න සහ සෘජු ආයෝජන ගලා ඒම නතර වීම, විදේශ සංචාරකයන්ගේ පැමිණීම අඩු වීම හමුවේ වුණත් මේ රටේ ආර්ථික වර්ධන වේගය යම් සැලකිය යුතු මට්ටමකින් පවත්වාගෙන යන්න අපට පුළුවන් වුණා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා දෙවන වරටත් ජනාධිපති ධුරය දැරූ කාලයේ, එනම් 2010-2015 කාල පරිච්ඡේදය තුළ අභියෝග රාශියක් තිබියදී 2012 වර්ෂයේ සියයට 9ක ආර්ථික වර්ධන වේගයක් ගෙන එන්න අපට හැකියාව ලැබුණා. එදා තිබුණේ එවැනි ආර්ථිකයක්. 2009 වර්ෂයේදී තමයි අපි යුද්මය තත්ත්වයෙන් මිදුනේ.

එදා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් මේ රටේ විරැකියාව සියයට 8.3 සිට 4.3 දක්වා අඩු කරනු ලැබුවා. ඒ වාගේම විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 2.3 සිට 8.3 දක්වා වැඩි කළා. ඩොලර් බිලියන 8.3ක ප්‍රමාණයක් එදා අප මේ රටේ ඉතිරි කරනු ලැබුවා. ඒ වාගේම, අපි ඒක පුද්ගල ආදායම විශාල ලෙස වැඩි කළා. ඒ එක්කම අපට හැකියාව ලැබුණා, අපේ ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 20 සිට 80 දක්වා ඉහළ ප්‍රමාණයකට ගෙන එන්න.

සංචාරක ව්‍යාපාරය ගත්තොත්, 2008 වර්ෂයේදී සංචාරකයන් 438,478 දෙනෙකු පමණයි අපේ ලංකාවට ආවේ. ඒ වුණත් 2014 වනකොට එම සංඛ්‍යාව 1,527,153 දක්වා සියයට 248කින් වර්ධනය කිරීමට අපට හැකියාව ලැබුණා. එමඟින් රුපියල් කෝටි 31,750ක ආදායමක් උපයා ගන්න අපට අවස්ථාව ලැබුණා.

2008 වර්ෂයේ කොටස් වෙළෙඳ පොළේ තිබුණේ කෝටි 46.4යි. 2014 වනකොට එය කෝටි 141.5 දක්වා වර්ධනය කර ගන්න අපට පුළුවන් වුණා. මෙවැනි තත්ත්වයක් තුළ තමයි අපි 2014 වර්ෂය දක්වා වැඩ කටයුතු කළේ.

අපි වර්ෂ 2014දී රට භාර දුන් වෙලාවේ බොරතෙල් බැරලයක මිල US Dollars 110 වාගේ ගණනක තිබුණේ. නමුත් 2015 යහ පාලන ආණ්ඩුව බලයට පත්වන විට එය ඩොලර් 40 දක්වා අඩු වුණා. එයින් කෝටි 200කට වැඩි මුදලක් ඒ ආණ්ඩුවට, මේ රටට ඉතිරි කර ගැනීමට හැකියාව, අවස්ථාව උදා වුණා.

2016 වර්ෂයේ අපේ ආර්ථික වර්ධන වේගය සියයට 4.4 දක්වා පහතට වැටුණා; විරැකියාව සියයට 7 දක්වා වැඩි වුණා. කොටස් වෙළෙඳ පොළ පහළට වැටුණා. එදා 2015 වර්ෂයේ 5.5ක අලාභයක් සිදු වුණා. 2009 වර්ෂයේත් ඒ වාගේම තමයි. 9.7ක අලාභයක් සිදු වුණා. එදා සියයට 7.3ක ආර්ථික වර්ධන වේගයක් සහිතව අප භාර දුන් රට 2019 වර්ෂයේදී අපට යළිත් භාර දුන්නේ සියයට 2.3ක ආර්ථික වර්ධන වේගයක් සහිතවයි. එදා මේ රටේ මේ වාගේ ගෝලීය වසංගත කිසිවක් තිබුණේ නැහැ; ත්‍රස්තවාදය තිබුණේ නැහැ. ඒකීය රටක් තුළ සියලුදෙනාට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් අපි නිර්මාණය කරලා රට භාර දුන්නා වුණත්, ඒ යහ පාලන ආණ්ඩුවේ ආර්ථික ඔස්තාර්ලාගේ මහා කෙරුවාවල් තුළ මේ රටේ ආර්ථිකය විශාල ලෙස පහළට ඇද දැමුවා. වර්ෂ 2019දී ඒක පුද්ගල ආදායම ඩොලර් 227කින් පහත හෙළනු ලැබුවා. අපි 2005 වර්ෂයේ ණය ගනිද්දී, අපේ රටේ ණය රුපියල් බිලියන 2,000ක් පමණ වුණා.

2015 වන විට රුපියල් බිලියන 7,400 දක්වා අපේ රට ණය අරගෙන තිබුණා. 2005 සිට 2015 දක්වා අපේ ආණ්ඩු පැවැති අවුරුදු 10ක කාල පරිච්ඡේදය තුළ අපි රුපියල් බිලියන 5,000කට ආසන්න ප්‍රමාණයක් ණය අරගෙන තිබුණා. නමුත් අපි ඒ රුපියල් බිලියන 5,000ක ප්‍රමාණයෙන් ඇහැට පෙනෙන, ඇඟට දැනෙන දැවැන්ත සංවර්ධනයක් සිදු කළා. අදටත් කාටවත් කියන්න බැහැ, අධිවේගී මාර්ග පාඩුයි කියලා. ඒවා ලාභ ලබන, ආදායම් ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් මෙගාවොට් 900කට ආසන්න විදුලිබල ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. ඒ බලාගාරය, අදාළ ණය ගෙවලාත් ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අප වර්ෂ 2019 දී නැවත රට භාර ගන්නා විට රුපියල් බිලියන 13,031 දක්වා ණය උගුලකට අපේ රට හසු කරලා, අපේ රටේ කරගෙන ආ සංවර්ධනයත් නතර කරලා, මහ බැංකුවේ බැඳුම්කර වංචාව සිදු කරලා තිබුණා. ඒ වංචා කළ මුදල් අද මහා භාණ්ඩාගාරයට ගන්න කොට විපක්ෂය කිඹුල් කඳුළු හෙළනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

අපේ ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය ඇමතිතුමාට විනාඩි 10ක් තිබෙනවා. ඒකෙන් විනාඩි දෙකතුනක ප්‍රමාණයක් ගන්න කියලා තිබෙනවා.

ඉහතින් ඒ කිව්වා වාගේ තත්ත්වයක් තුළ තමයි අප රට භාර ගත්තේ. නමුත්, ආණ්ඩුව භාර අරගෙන දින 52ක කාල පරිච්ඡේදයක් යද්දී අපට යළිත් කොරෝනා වසංගතයට මුහුණ දෙන්න සිදු වුණා. අපි ඒ වසංගතය හමුවේ ලෝකයේ එන්නත්කරණය අතින් හොඳම රටවල් 10 අතරට එක් වුණා; එන්නත්කරණය අතින් අපි ඉදිරියට ආවා. ඒ සඳහා අපි රුපියල් බිලියන 500කට වඩා වියදම් කළා. කොරෝනා වසංගතය නිසා අපට වුණු පාඩුව රුපියල් කෝටි 1,600කට වඩා වැඩියි.

අද මහ ලොකුවට කෑ ගහනවා, අපේ රටේ ඉන්න තරුණ තරුණියන් මේ රට දාලා පිට රට යනවා කියලා. අපි අහනවා, එදා තමුන්නාන්සේලා විපක්ෂයේ ඉඳන් මොනවාද කිව්වේ කියලා. "රට විරුවන් ඡන්දයට ගෙන්වා ගත්තා, නමුත් ඔවුන් ගැන බලන්නේ නැහැ" කිව්වා. එදා අපි 150,000කට වැඩි රට විරුවන් පිරිසක් ලංකාවට ගෙන්වලා, ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතභාවයට පත් කළා. ලංකාවට ආදායම් ගෙන එන්න, අපට විදේශ ප්‍රේෂණ ලබා දෙන්න ඒ රට විරුවන් නැවත වරක් පිට රට යනවා. ඔවුන් නැවත පිට රටවලට ගිහින් අපේ දේශීය ආර්ථිකය ශක්තිමත් කරන්න ඩොලර් ටික එවන කොට අද විපක්ෂය ඒ පිළිබඳව කිඹුල් කඳුළු හෙළීම පිළිබඳව අපි බෙහෙවින් කනගාටුවට පත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමා, කෙටියෙන් අවසන් කරන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මට තව විනාඩි දෙකක් දෙන්න.

ඒ වාගේම, සුරක්ෂිත ආහාර වේලක් ජනතාවට උරුම කිරීම සඳහා රජය අවංක උත්සාහයක් ගන්නවා. පෙර වසරවල වාගේම අපට රසායනික පොහොර දෙන්න හැකියාව තිබෙනවා. ඕනෑ නම් අපට ඒක කරන්න පුළුවන්. නමුත් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල එහෙම එකක් නැහැ. සුරක්ෂිත ආහාර වේලක්, වස විසෙන් තොර කෘෂි කර්මාන්තයක් කියන සංකල්ප තුළ ඉඳගෙනයි අප කථා

[ගරු ප්‍රසන්න රණවීර මහතා ]

කළේ. ඒ සංකල්ප ගැන අප විතරක් නොවෙයි කථා කළේ. ඒවා ගැන ජනතා විමුක්ති පෙරමුණත් කථා කළා; එක්සත් ජාතික පක්ෂයත් කථා කළා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු රාජ්‍ය ඇමතිතුමනි,-

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අපේ ගරු කෘෂිකර්ම රාජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඊළඟ කථාව තිබෙනවා නේ. එතකොට ඒ ගැන කථා කරන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අපේ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කැමැති නම් මේකට උත්තරයක් දෙන්න. ඊයේ පෙරේදා කිව්වා යූරියා පොහොර ගෙනැල්ලා දෙනවා, මේ රටේ පොහොර ප්‍රශ්නයට උත්තර සොයනවා කියලා. ගරු ප්‍රසන්න රණවීර රාජ්‍ය අමාත්‍යතුමා ඒ මතයේ ඉඳගෙන නොවෙයි, වෙනත් මතයක ඉඳගෙන කථා කරන්නේ. මොකක්ද හරි එක?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මොකක්ද, ඔබතුමා මතු කරන රීතිය. රීති ප්‍රශ්නය නගන්න කෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා කථාව කෙටියෙන් අවසන් කරන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
අපේ අතිගරු ජනාධිපතිතුමාගේ වස විසෙන් තොර කෘෂි කර්මාන්තයක් කියන සංකල්පය අපි ඉදිරියට ගෙන යනවා. යම්කිසි අඩු පාඩුවක් වුණොත්, ගොවීන්ට අසාධාරණයක් වුණොත් එහිදී අවශ්‍ය සහන ලබා දීලා වස විසෙන් තොර කෘෂි කර්මාන්තයක් අපි ඇති කරනවා.

මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය අවුරුදු දෙක තුළ කොරෝනා වසංගතය නිසා මිය ගිය සංඛ්‍යාව 14,000 යි. නමුත් මේ වස විස ශරීරගත වීම නිසා අද වන කොට ජනතාවගෙන් 30,000කට ආසන්න පිරිසක් වර්ෂයකට වකුගඩු රෝගීන් බවට පත් වෙනවා. ඒ වාගේම වර්ෂයකට 16,000ක් විතර වකුගඩු රෝගයෙන් මිය යනවා. හැබැයි, පසු ගිය ආණ්ඩුව නම් ඒවාට කැමැති වුණා.

හිටපු සුවපති, නැත්නම් සෞඛ්‍ය ඇමති මේ රටේ ජනතාවට බාල බෙහෙත් ගෙනැල්ලා දීලා, ඒ තුළින් නැව් ගත්ත එක තමයි කළේ. අපිට එහෙම කරන්න අවශ්‍ය නැහැ. විටින් විට ක්ෂණිකව මිලදී ගැනීම් කියලා මිලදී අරගෙන, මේ රටේ ඖෂධ මාෆියාවක් ඇති කළා. අපි කවදාවත් ඒවා කරන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ නිරෝගීමත්, සෞඛ්‍ය සම්පන්න පිරිසක් මේ රටේ නිර්මාණය කරන්නයි.

ස්වයං උත්පාදන ආර්ථික ක්‍රමයක් තුළ අපේ රටේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න අපි කටයුතු කරනවා. ඒ තුළ, ග්‍රාම නිලධාරි වසම් 14,021කටත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන කොට්ඨාස 4,900කටත් සහන ලබා දීලා සියලු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න අපි අපේක්ෂා කරනවා. අපි සේවා ආර්ථිකයකට ගියොත්, යම්කිසි වෙලාවක එක බෝම්බයක් ගැහුවොත්, ඒ සේවා ආර්ථිකයම කඩා වැටෙන්න පුළුවන්. අපි ජනතාවගේ ජීවන තත්ත්වය ශක්තිමත් කිරීම තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කරනවා. පවුල ශක්තිමත් කිරීම තුළින් ගම ශක්තිමත් කරලා, ගම ශක්තිමත් කිරීම තුළින් රට ශක්තිමත් කරලා, ස්වයං පෝෂිත ආර්ථික රටාවක් තුළින් අපේ රට ඉදිරියේ දී ආර්ථික සංවර්ධනය කරා අප ගෙනයනවා කියන එක බොහොම පැහැදිලිව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ வடிவேல் சுரேஷ் அவர்கள், உங்களுக்கு 13 நிமிடங்கள்!

[பி.ப. 4.13]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்திலே கலந்துகொண்டு, என்னுடைய தொப்புள்கொடி உறவுகளான மலையக மக்கள் சார்பாக இங்கு ஒருசில விடயங்களைப் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்ற அதேநேரம் என்னை இச்சபைக்கு அனுப்பிய மக்களுக்கும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட உரையின் போது, நான் சார்ந்த சமூகமான மலையக மக்கள் சார்பாக எந்தவிதமான முன்மொழிவும் செய்யப்பட்டிருக்கவில்லை. எனினும், இந்த வரவு செலவுத் திட்டத்தில் முன்மொழியப் பட்டுள்ள அபிவிருத்திகள் அனைத்தையும் அனுபவிப்பதற்கு மனிதர்கள் உயிரோடு இருக்கவேண்டுமே! கடந்த ஓரிரு வருடங்களிலே இந்த நாட்டிலே அத்தியாவசியப் பொருட்கள் உட்பட அனைத்துப் பொருட்களின் விலைகளும் இரண்டு - மூன்று மடங்காக அதிகரித்திருக்கின்றன. இவ்வாறானதொரு

சூழலில், பெருந்தோட்டத் தொழிலாளர்களின் 1,000 ரூபாய் சம்பள உயர்வு விடயத்தை வைத்துப் பந்தாடிக் கொண்டிருக்கின்றார்கள். “பிள்ளையையும் கிள்ளித் தொட்டிலையும் ஆட்டுவது” போன்ற ஒரு நிகழ்வாகவே நான் இந்த 1,000 ரூபாய் சம்பள உயர்வு தொடர்பான வர்த்தமானி அறிவித்தல் வெளியீட்டைப் பார்க்கிறேன். இவ்வாறு அந்த மக்களுக்கு எந்தவிதமான நிவாரணமும் இல்லாத ஒரு சூழ்நிலையில், இந்த வரவு செலவுத் திட்டத்திலே அடுத்த 3 வருடங்களுக்குள் 'லயன்' அறைகளை அகற்றி, தோட்ட வீடுகளை அபிவிருத்தி செய்வதற்கென 500 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. இதன் அடிப்படையில் ஒரு வீட்டுக்கு கிட்டத்தட்ட 15 இலட்சம் ரூபாய்படி பார்த்தால், ஒரு வருடத்தில் 110 வீடுகள்! மூன்று வருடங்களில் 330 வீடுகள்! 330 வீடுகளுக்குரிய நிதியை ஒதுக்கிவிட்டு, “எதிர்வரும் 03 வருடங்களில் மலையகத்திலிருக்கின்ற அனைத்து 'லயன்' வீடுகளையும் இல்லாமல் ஆக்கிவிடுவோம்” என்று கூறுவது கேலிக்குரிய விடயமாகும்.

அடுத்து, தொழில்வாய்ப்பு! இன்று அரசாங்க உத்தியோகத்தர்கள் தொடர்பான அரசாங்கத்தின் நிலைப்பாடு வெளிப்படையாகவே கூறப்பட்டிருக்கிறது. அப்படியானால், மலையகத்திலுள்ள படித்த இளைஞர்களின் எதிர்காலம் என்ன? அரச நியமனங்களைப் பெறவேண்டும் என்ற அவர்களுடைய கனவு என்னவாகும்? எவ்வாறு நாங்கள் மலையகத்தினுடைய கல்வியிலே ஒரு புரட்சியை ஏற்படுத்த முடியும்? அதற்காக இந்த வரவு செலவுத் திட்டத்திலே எவ்வளவு நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது? “மலையகத்துக்கெனத் தனியானதொரு பல்கலைக்கழகம் அமைக்கப்படும்” என்றுகூறி ஆட்சிக்கு வந்தவர்கள் நீங்கள், ஏன் அதற்குரிய நிதியை ஒதுக்கவில்லை? அது தொடர்பில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் என்ன? இவ்வாறான பல கேள்விகளை எழுப்பவேண்டிய நிலைக்கு நாங்கள் தள்ளப்பட்டிருக்கின்றோம்.

அடுத்து, மலையக வைத்தியசாலைகளின் அபிவிருத்தி! இன்று மலையக மக்கள் கொரோனா பெருந்தொற்று, டெங்கு நோய், மண்சரிவு போன்ற இன்னோரன்ன பிரச்சினைகளுக்கு முகங்கொடுத்துக் கொண்டிருக்கின்ற சூழலிலே, அப்பகுதிகளிலுள்ள வைத்தியசாலைகளின் அபிவிருத்தி நடவடிக்கைகள் முழுமையாக நிறுத்தப்பட்டிருப்பது மட்டுமல்லாது, அதற்கென எந்தவிதமான நிதியும் ஒதுக்கப்படவில்லை. அதுமாத்திரமன்றி, அங்குள்ள வைத்தியசாலைகளில் தமிழ்மொழி பேசக்கூடிய உத்தியோகத்தர்களை - குடும்பநல உத்தியோகத்தர்களையோ, தாதிமாரையோ, வைத்தியர்களையோ - நியமிப்பது சம்பந்தமான எந்தவித முன்மொழிவையும் நாங்கள் இதில் காணவில்லை.

அடுத்து, வீதி அபிவிருத்தி! நாங்கள் வீதி அபிவிருத்தி சம்பந்தமாகப் பேசுகின்றோம். எங்களுடைய ஆட்சிக் காலத்தில் என்னால் எங்களுடைய மாவட்டத்திலே ஆரம்பிக்கப்பட்ட அனைத்து வீதிகளின் அபிவிருத்திப் பணிகளும் இடைநிறுத்தப்பட்டிருக்கின்றன. குறிப்பாக, அப்புத்தளைப் பிரதேசத்திலே கிளனோர் - தங்கமலைத் தோட்டத்தில் ஆரம்பித்து இதல்கஸ்ஹின்ன ஊடாகச் செல்கின்ற பாதையின் அபிவிருத்திப் பணிகள் இடைநடுவிலே நிறுத்தப்பட்டிருக்கிறது. இதனால், அந்தப் பிரதேசத்தில் வாழ்கின்ற மக்கள் அந்தப் பாதையினூடாகச் செல்லவும் முடியாமல், வேறு வழியும் இல்லாமல் தவித்துக்கொண்டிருக்கிறார்கள். அதேபோல, லுணுகல பிரதேசத்திலே என்னால் ஆரம்பித்து வைக்கப்பட்ட அடாவத்தைப் பாதையின் அபிவிருத்திப் பணிகளும் இடைநடுவிலே நிறுத்தப்பட்டிருக்கிறது. மடுல்சீமைப் பிரதேசத்திலே மாதோவவிலிருந்து லுணுகலைக்குச் செல்கின்ற பாதையின் அபிவிருத்திப் பணிகளும் இடைநடுவிலே நிறுத்தப்பட்டிருக்கிறது. இவ்வாறு இடைநடுவிலே நிறுத்தப்பட்டிருக்கின்ற, துன்பப்பட்டு, வஞ்சிக்கப்பட்டிருக்கின்ற மக்களுக்குரிய வீதி அபிவிருத்தி வேலைத்திட்டங்களை நிறைவுசெய்வதற்கு எந்தவிதமான நிதி ஒதுக்கீடும் இந்த வரவு செலவுத்திட்டத்தில் இல்லை. எனவே, அவற்றை உடனடியாக நிறைவு செய்யவேண்டும். நிறைவுசெய்யாத பட்சத்தில், அங்கு வாழ்கின்ற மக்களுடைய நிலைமை கேள்விக்குறியாகிவிடும்.

2022ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்டத்தில் மலையக மக்களுடன் தொடர்புடைய விடயம் 03 வருடங்களை மையப்படுத்திக் கூறப்பட்டிருக்கின்றது. அந்த மூன்று வருடங்களிலும் மலையக மக்கள் எவ்வாறான சவால்களுக்கெல்லாம் முகங்கொடுக்கப் போகின்றார்கள்! இன்றைக்கு அவர்களுடைய 1,000 ரூபாய் சம்பள உயர்வு தொடர்பான விடயம் நீதிமன்றத்திலே விசாரணையில் இருக்கின்றது. அது தொடர்பில் சரியானதொரு முடிவை எடுக்க முடியாமல், அரசாங்கம் தடுமாறிக்கொண்டிருக்கிறது. முடிந்தும் முடியாமல் அந்த விடயம் இருந்துகொண்டிருக்கிறது. ஆகவே, இன்று இந்த நாட்டிலே காணப்படுகின்ற வாழ்க்கைச் செலவு உயர்வு, அத்தியாவசியப் பொருட்களின் விலையேற்றம், மலையகப் பெருந்தோட்ட மக்களுடைய சம்பள அதிகரிப்பு போன்ற விடயங்களை எடுத்துக்கொண்டால், அவற்றில் சூழ்ச்சிகரமான ஒரு தன்மை இருப்பதாகவே நாங்கள் கருதுகின்றோம்.

இன்று மலையகம் என்றவுடன் இங்கு பேசிய சிலர் விதண்டாவாதமாகப் பேசினார்கள்; அடுக்கு மொழியிலே பேசினார்கள். நாங்களும் கேட்டுக்கொண்டிருந்தோம். அத்துடன், இங்கு சில அமைச்சர்கள் விகிதாசாரம் சம்பந்தமாகப் பேசினார்கள். விகிதாசாரம் சம்பந்தமாக விதண்டாவாதமாகவும் அடுக்குமொழியிலும் பேசும்போது, அது நடைமுறையிலே சாத்தியப்படக்கூடிய விடயமா? என்பது தொடர்பிலும் சிந்திக்க வேண்டும். இன்று மலையக மக்கள் என்றவுடன், அனைவரினது மனதிலும் தோன்றுவது தோட்டத் தொழிலாளர்கள்தான். மலையகத்தில் வாழ்பவர்கள் எல்லோரும் தோட்டத் தொழிலாளர்கள் அல்லர். இன்று அங்கு வாழ்கின்ற 15 இலட்சம் மக்களில் வெறுமனே 1,47,222 மக்கள் மாத்திரம்தான் தோட்டத் தொழிலாளர்களாக இருக்கின்றார்கள். ஆனால், மலையகம் எங்களுடைய இருப்பு! எங்களுடைய தாய்நாடு! மலையகத்திற்கு என்று தனியானதோர் அந்தஸ்தும் அந்தச் சமூகத்திற்கு என்று தனியானதொரு கௌரவமும் இருக்கின்றது. அத்துடன், அந்தச் சமூகத்திற்கு மானமும் மரியாதையும் இருக்கின்றது. அவர்கள் உழைத்து வாழ்பவர்கள்; இந்த நாட்டிற்கு எந்தவகையிலும் சங்கடத்தைக் கொடுக்காதவர்கள். "மலையக மக்கள் இந்த நாட்டுக்குச் சுமையில்லை" என்று இந்த வரவு செலவுத்திட்டத்தில்கூட கூறப்பட்டது. நிச்சயமாக அப்படித்தான்! அவர்கள் உழைத்து வாழ்பவர்கள். ஆனால், அவர்களுக்கு உழைப்புக்கு ஏற்ற ஊதியம் கிடைப்பதில்லை. இதுதான் இங்குள்ள பிரச்சினை! பெருந்தோட்டக் கம்பனிகளின் அடாவடித்தனத்துக்கு இந்த வரவு செலவுத்திட்டத்திலே முற்றுப்புள்ளி வைக்கவில்லை. குறிப்பாக, தோட்டத் தொழிலாளர்களின் காணிகள் அபகரிக்கப்பட்டு, அவர்களைத் தோட்டங்களிலிருந்து வெளியேற்றும் நடவடிக்கைகளுக்கும் பெருந்தோட்டக் கம்பனிகள் பொலிஸ் நிலையத்திற்குச் சென்று அம்மக்களை வஞ்சிக்கின்ற செயற்பாடுகளுக்கும் முற்றுப்புள்ளி வைக்கவில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உங்களுடைய கண்டி மாவட்டத்திலுள்ள கலபொட, மவுஜின் தோட்டங்களின் இன்றைய நிலைமை என்ன? JEDB -

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

'ஜனவசம' இன்கீழ் இருக்கின்ற தோட்டத் தொழிலாளர்களுக்கு இன்றுவரை கடந்த மாதச் சம்பளம் வழங்கப்படவில்லை. இந்த JEDB எனும் 'ஜனவசம' நிறுவனமானது நேரடியாக அரசாங்கத்துக்குக்கீழ் வருகின்ற ஒரு தாபனமாகும். தற்போது பாடசாலைகள் ஆரம்பிக்கப்பட்டிருக்கின்றன. ஆனால், தோட்டத் தொழிலாளர்களின் பிள்ளைகள் பாடசாலைக்குச் செல்லமுடியாத நிலையில் இருக்கின்றார்கள். JEDBஇன் தலைவர் அரசாங்கத்தின் பிரதிநிதி. அது ஓர் அமைச்சின்கீழ் வருகின்றது. எனவே, அவர்களுக்குரிய சம்பளத்தை வழங்கு வதற்குரிய நடவடிக்கைகளை எடுப்பது பற்றிச் சிந்திக்காமல், வரலாறு பற்றிப் பேசிக்கொண்டு இருக்கின்றார்கள். ஆகையால், இந்த வரவு செலவுத்திட்டத்தைப் பார்க்கும்போது மிகவும் வேதனையாக இருக்கின்றது.

அடுத்து, பாதை அபிவிருத்தியை எடுத்துக்கொண்டால், மலையகத்திலுள்ள நாவலப்பிட்டி - இம்புல்பிட்டி ஊடான போகில் - கடியன்லென - கெட்டபுலா - கொலப்பத்தனை - குயின்ஸ்பரி - தெல்பெத்த - பத்தனைச் சந்தி வரையான பாதை பல வருடங்களாகச் சீர்செய்யப்படாமல் இருக்கின்றது. இன்று சுற்றுலாத்துறையை ஊக்குவிக்கக்கூடிய நீர் வீழ்ச்சிகள் உட்பட அனைத்து விடயங்களும் அந்தப் பிரதேசத்தில் இருந்தும்கூட, குயின்ஸ்பரித் தோட்டத்திலிருக்கின்ற இந்து சமயத்தவர்களின் நமிநாதர் ஆலயம் போன்று பல வரலாற்றுச் சான்றுகளுள்ள அந்தப் பிரதேசத்தை ஊடறுத்துச் செல்கின்ற குறித்த பாதையானது பல தசாப்த காலமாக எந்தவித அபிவிருத்தியும் இல்லாமல், சீர்செய்யப்படாமல் முடக்கப்பட்ட நிலையில் இருக்கின்றது. ஏன் அந்தப் பாதையைச் சீர்செய்ய முடியாது? நாவலப்பிட்டியிலிருந்து பத்தனை வரை இருக்கின்ற ஒரேயொரு மாற்றுவழி அது மாத்திரமே! நாவலப்பிட்டியி லிருந்து ஹட்டன் வழியாகச் செல்லும் பாதையில் ஏதாவது பிரச்சினை ஏற்பட்டால்கூட, ஒரு மாற்றுப் பாதையாக அமைந்திருப்பது இந்த பாதை மாத்திரம்தான். எனினும், இந்தப் பாதையின் அபிவிருத்தி முழுமையாகப் புறக்கணிக்கப்பட்டிருக்கின்றது. ஆகவே, இந்த வரவு செலவுத்திட்டத்தில் இவ்வாறான வேலைத்திட்டங்கள் உட்பட தோட்டங்களிலுள்ள பல்லாயிரக்கணக்கான மக்கள் நன்மை யடையக்கூடிய அபிவிருத்திசார் வேலைத்திட்டங்கள் உள்ளடங்கியிருக்க வேண்டும்.

அடுத்து, கைத்தொழில் போட்டைகள்! இன்று மலைய கத்திலே ஆங்காங்கேயிருக்கின்ற தொழிற்சாலைகள் மூடப் பட்டிருக்கின்றன.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමනි, ඔබතුමා කැමැති නම් ඒ පාර මොකක්ද කියන්න. අපි ඒක හදලා දෙන්නම්. "ඒ පාර වහලා. හදන්නේ නැහැ. සංවර්ධනය කරන්නේ නැහැ" කියලා ඔබතුමා පාරක් ගැන කිව්වා නේ.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
ඔව්, ගරු ඇමතිතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒ පාර මොකක්ද කියන්න, අපි හදලා දෙන්නම්.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
ඒක නාවලපිටිය නගරයේ ඉඳලා Pathana Junction එකට තිබෙන පාර. ගරු ඇමතිතුමනි, ඒ පාර තමයි නුවරඑළියට, හැටන්වලට යන්න පාවිච්චි කරන්නේ. වෙනත් විකල්පයක් නැහැ. ඒ පාර තමයි ඉස්සෙල්ලාත් තිබුණේ. ඊට පස්සේ තමයි අලුත් පාරවල් හැදුණේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේකට මැදිහත් වීම ගැන මම හුඟක් සතුටු වෙනවා, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Pathana Road, is it?

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
නාවලපිටිය, කඩියන්ලෙන, කැටපොල හරහා පතන හන්දියට යනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
කිලෝමීටර් කීයක් තියෙනවාද, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
මම වැරදි නැත්නම්, එතැන කිලෝමීටර් 18ක් ඇති, ගරු ඇමතිතුමනි. Approximately 18 kilometres. Thank you.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
We will do that.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

அந்தப் பிரதேச மக்கள் சார்பாக நான் கௌரவ அமைச்சர் ஜோன்ஸ்டன் பர்னாந்து அவர்களுக்கு நன்றியைத் தெரிவித் துக்கொள்கின்றேன். இவ்வாறுதான் நடவடிக்கை எடுக்க வேண்டும்; இது வரவேற்கத்தக்கது.

இன்றைக்கு பெருந்தோட்டக் கம்பனிகளால் மூடப்பட்டிருக் கின்ற தொழிற்சாலைகளைக் கைத்தொழிற் பேட்டைகளாக மாற்றுவதனூடாக மலையக இளைஞர், யுவதிகளுக்குத் தொழில்வாய்ப்பைப் பெற்றுக்கொடுப்பதற்கு வாய்ப்பு ஏற்படும். அந்தத் தொழிற்சாலைகள் எல்லாம் அரசாங்கத் தினுடைய சொத்துக்கள்! ஆனால், இன்று அந்தத் தொழிற்சாலைகள் எல்லாம் மூடப்பட்டு, - abandon - முழுமையாகக் கைவிடப்பட்ட நிலையில் இருக்கின்றன. அந்தத் தொழிற்சாலைகளைக் கைத்தொழிற் பேட்டைகளாக மாற்றினால், அவற்றின்மூலம் பல வேலைத்திட்டங்களை முன்னெடுக்க முடியும். மத்தளையில் விமான நிலையம் இருக்கின்றது. அதேபோன்று, அம்பாந்தோட்டையில் துறைமுகம் இருக்கின்றது. ஆகையால், பதுளை மாவட்டம் உட்பட மலையகத்தில் ஆங்காங்கே மூடப்பட்டிருக்கின்ற

தொழிற்சாலைகளைக் கைத்தொழிற் பேட்டைகளாக மாற்றுவதற்குரிய விடயங்கள் எல்லாம் இருக்கின்றன. இவை எல்லாவற்றையும் உற்பத்திக்கான வளங்களாக உள்வாங்கும் போது, பொருளாதார ரீதியில் பாரியதொரு சக்தியை எமது மக்களுக்கு வழங்கக்கூடியதாக இருக்கும்.

அடுத்து, மலையகத்தின் கல்விப் புரட்சி! மலையகத்தின் கல்வியிலே ஒரு புரட்சி ஏற்பட வேண்டுமென்றால், நிச்சயமாக மலையகத்தில் பல்கலைக்கழகமொன்று வரவேண்டும்; அதற்கான தேவை அங்கிருக்கின்றது. அதுமட்டுமல்ல, மலையக மக்களின் வாழ்விலே ஒரு மாற்றம் ஏற்பட வேண்டுமென்றால், இந்திய அரசாங்கத்தினால் வழங்கப்பட்டிருக்கின்ற வீடமைப்புத் திட்டங்களுக்குரிய உட்கட்டமைப்பு வசதிகள் செய்துகொடுக்கப்படல் வேண்டும். அதேபோன்று, இன்று மலையகத்திலே திறமையான மாணவர்கள் இருக்கின்றார்கள். அவர்கள் சிறந்த பெறுபேறுகளைப் பெற்றுப் பாடசாலைக்கும் எங்களது சமூகத்துக்கும் இந்த நாட்டுக்கும் பெருமை தேடிக் கொடுத்திருக்கின்றார்கள். அதுமட்டுமல்ல, விளையாட்டுத் துறையிலும்கூட மலையக இளைஞர்கள் இந்த நாட்டுக்குப் பெருமை தேடிக் கொடுத்திருக்கின்றார்கள். கடந்த மாதம் இந்திய அணிக்கும் இலங்கை இராணுவ அணிக்கும் இடையில் பலாங்கொடையிலே நடைபெற்ற volleyball matchஇல் வேவெஸ்ஸ தோட்டத்தைச் சேர்ந்த ஓர் இளைஞன் திறமையாக விளையாடியதால், இலங்கை இராணுவ அணி வெற்றி பெற்றது. அந்த வகையில், விளையாட்டுத்துறையிலும் சரி, கல்வியிலும் சரி, விவசாயத்திலும் சரி, இந்த நாட்டின் பொருளாதாரத்திலும் சரி, அந்நியச் செலாவணியை ஈட்டுவதிலும் சரி, அனைத்திலுமே தம்மை முழுமையாக அர்ப்பணித்து, இந்த நாட்டுக்காக 5 - 6 பரம்பரையாக வாழ்ந்து கொண்டிருப்பவர்கள்தான் இந்த மலையக மக்கள்! ஆகவே, இந்த வரவு செலவுத்திட்டத்திலே அந்த மக்கள் தொடர்பில் விசேட கவனம் செலுத்தியிருக்க வேண்டும். அவர்களுடன் சம்பந்தப்பட்ட பல அபிவிருத்தி வேலைத்திட்டங்களை இதில் உள்ளடக்கியிருந்தால், இது ஒரு வரவேற்கத்தக்க வரவு செலவுத்திட்டமாக இருந்திருக்கும் என்பதுதான் என்னுடைய யோசனை!

அடுத்து, பதுளை மாவட்டத்திலுள்ள சில்மியாபுர கிராமத்திலே வாழ்கின்ற முஸ்லிம் மக்களுடைய சுகாதார வசதி, பாதை வசதி, பாடசாலை வசதி போன்றவற்றை முழுமையாக அபிவிருத்தி செய்யவேண்டிய ஒரு கட்டாய நிலை ஏற்பட்டிருக்கின்றது. மஹியங்கனையிலே பங்கரகம பிரதேசத்திலிருந்து சில்மியாபுரம் வரைக்கும் சிறுபான்மையிலும் சிறுபான்மையினராக வாழ்ந்துகொண்டிருக்கின்ற முஸ்லிம் மக்களுடைய அபிவிருத்தி சம்பந்தமாகக் கவனம் செலுத்த வேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. சில தீய சக்திகள் மதக் கலவரங்களையும் இனக் கலவரங்களையும் ஏற்படுத்தி, இந்தச் சமூகத்தைப் பிழையான வழிக்கு இட்டுச்செல்ல முயற்சி செய்கின்றன. ஆகவே, மலையக மக்கள் சார்பாக மீண்டும் மீண்டும் இந்த உயரிய சபையில் நான் கேட்டுக்கொள்ள விரும்புவது என்னவென்றால், அவர்கள் தொடர்பில் இந்த அரசாங்கம் - இந்த நாடு மற்றும் நாட்டிலே உள்ளவர்கள் விசேட கவனத்தைச் செலுத்த வேண்டும் என்பதைத்தான். இதுவே என்னுடைய தாழ்மையான வேண்டுகோளாகவும் இருக்கின்றது என்று கூறி, நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Siripala Gamalath. You have eight minutes.

[අ.භා. 4.26]

**ගරු සිරිපාල ගමලත් මහතා (මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிறிபால கம்லத் - மகாவலி வலயங்களை அண்டியுள்ள கால்வாய்கள் மற்றும் குடியிருப்புகள் பொது உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Siripala Gamalath - State Minister of Canals and Common Infrastructure Development in Settlements in Mahaweli Zones)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය වෙනුවෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මා ඉතා සතුටට පත් වෙනවා. ඒ වාගේම මා පැහැදිලිව කියන්න ඕනෑ, මේ කථා අහගෙන හිටියාම මට අහන්න තියෙන්නේ විපක්ෂයේ සමහර අය නැවතත් ඉපදිලාද කියන එකයි. සමහරු කිව්වා, "අතිගරු ජනාධිපතිතුමා පත් වෙලා අවුරුදු දෙකක්. මොකද මේ? රටේ බඩු මිල වැඩි වෙනවා" කියලා. එතුමන්ලා මේ ගැන තමයි කථා කළේ. හැබැයි අපි පැහැදිලිව කියන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වෙලා, 2019 නොවැම්බර් මාසයේ මේ රට භාර ගත්තාට පස්සේ මාර්තු 21වැනි දා වෙනකොට මේ රට වහන්න සිද්ධ වූ බව. ඒ වාගේම මැතකදිත් කොවිඩ්-19 වසංගතයත් එක්ක නැවත මේ රට වහලා තිබුණා. මේ ගෝලීය වසංගතය හේතුවෙන් ගෝලීය ආර්ථිකය දිහා බැලුවත්, ඒ දියුණුයි කියන අනෙක් රටවල පවා සේවකයන් අයින් කළා, එහෙම නැත්නම් ඔවුන්ගේ පඩි අඩු කළා. ඒ රටවල් සම්පූර්ණයෙන්ම වැහුවා පමණක් නොවෙයි, මිනී කඳු ගොඩ ගැහෙන තත්ත්වයටත් පත් වුණා. අතිගරු ජනාධිපතිතුමාගේ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීමත් එක්ක මේ රටේ කොරෝනා වසංගතය පාලනය කර ගන්න, මේ රටේ ජනතාව බේරා ගන්න පමණක් නොවෙයි, මේ වෙනකොට සියයට 70කට වඩා පිරිසකට කොවිඩ්-19 එන්නත දීලා, මේ රට නැවතත් විවෘත කරලා, මේ රට සංවර්ධනය කිරීමේ හැකියාව අද අපට ලැබී තිබෙනවා. ඒ නිසා අද මොනතරම් අමාරුකම් තිබුණත්, මේ රටේ සංවර්ධනයටත්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්නත් තමයි, 2022 අය වැය ඉදිරිපත් කරලා තියෙන්නේ. ගම හදලා, රට හදන මේ සංකල්පයත් එක්ක මේ අය වැය ඉදිරිපත් කිරීම සඳහා අතිගරු ජනාධිපතුමාගේ මහ පෙන්වීමටත්, රජය විධියට අග්‍රාමාත්‍යතුමාටත්, අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත් මගේ ගෞරවනීය ස්තුතිය පළමුවෙන්ම පිරිනමනවා. ඒ විතරක් නොවෙයි. ග්‍රාමීය සංවර්ධනය මෙන්ම නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම පදනම් කරගෙන කොතරම් අසීරු තත්ත්වයක වුණත්, පසුගිය කාලයේ ආදායම් අඩු වූ සමාජයේ සහන ලැබිය යුතු සියලුදෙනාට සහන ලබා දෙන අය වැයක් විධියටත් මේ අය වැය ඉදිරිපත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, පසුගිය කාලයේ -2005දී- අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර ගන්නකොට මේ රට අභ්‍යන්තරයේ යුද්ධයක් තිබුණා. ඒ වෙලාවේ අපි කල්පනා කළා, ආර්ථිකමය වශයෙන් අපට මුහුණ දෙන්න තිබෙන බරපතළම අවස්ථාව ඒ අවස්ථාවයි කියලා. හැබැයි, යුද්ධය තියාගෙනත් අපි මේ රට සංවර්ධනය කරන්න දැවැන්ත කාර්යභාරයක් කළා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතාම කෙටි කාලයකින් යුද්ධය නිමා කළා පමණක් නොවෙයි, ඒ නායකයා ගොවි ආර්ථිකයත් ශක්තිමත් කළා. ගොවි ජනතාවට විශාල හයියක් දෙමින් පොහොර සහනාධාරය දීලා වී මිල ඉහළට ගැනීමේ දැවැන්ත කාර්ය භාරයත් කළා. අපි ගම්වලට ගියාම ඒ ගම්වලට විදුලිය තිබුණේ නැහැ. ඒ ගම්වලට විදුලිය දෙන්න කියලා තමයි ඔවුන් ඉල්ලුවේ. ඒ අනුව, නගරයට සීමාවෙලා තිබුණු විදුලිය මේ රටේ ජනතාවගෙන් සියයට 99කටම ලබා දීලා අවසන් කරන්න අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කටයුතු කළා.

[ගරු සිරිපාල ගමලත් මහතා ]

එදා පාරවල් ටික කාපට් කළා. හැබැයි, ඒ වෙලාවේ අපට ඒ කටයුත්ත ඉවර කර ගන්න ලැබුණේ නැහැ. මෙවර අය වැයෙන් මේ රටේ මාර්ග පද්ධතියට දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙන බව මම පැහැදිලිව කියනවා. ලෝකයේ දියුණු රටවල් ගත්තාම, එම රටවල් වේගයෙන් දියුණු වෙන්න ප්‍රධානම හේතුව එම රටවල තිබෙන මාර්ග පද්ධතිය කියන එක අපි පිළිගන්න ඕනෑ. ගම, නගරය සමඟ සම්බන්ධ කිරීම, ඒ වාගේම අගනුවර සමඟ සම්බන්ධ කිරීම පමණක් නොවෙයි, මෙම වැඩ පිළිවෙළ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වෙනවා. මහාමාර්ග අමාත්‍යතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා. අපි අවුරුදු 70කට විතර කලින් ඒ ප්‍රදේශවල ඉඩම් දුන්නත්, දැන් තමයි අපේ ගෙවල් පැතිවල පාරවල් කාපට් වෙන්නේ. හැබැයි, මම අද පැහැදිලිවම සතුටු වෙනවා. මොකද, දැවැන්ත මොරගහකන්ද වැඩසටහනත් එක්ක කාපට් මාර්ග ඇතුව බිසෝපුර ගම්මානයේ ජනතාව පදිංචි කරවන්න අපට හැකියාව ලැබීම ගැන තමයි අපි අද සතුටු වෙන්නේ. "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනත් එක්ක අතිගරු ජනාධිපතිතුමා ඒ ප්‍රදේශයට ගිහිල්ලා දැවැන්ත කාර්ය භාරයක් කරන්න, නැවත පදිංචි කරන ගම්මාන දැවැන්ත ලෙස දියුණු කරන්න කටයුතු කර තිබෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ. ඒ නිසා, පසුගිය අවුරුද්ද තුළ පාරවල් 1,500ක වැඩ අවසන් කරන්න -කිලෝ මීටර් 18,000ක වැඩ අවසන් කරන්න- අවස්ථාව ලැබුණා වාගේම, කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහන 2024 වර්ෂයේදී අවසන් කිරීම සඳහා 2022 වසරේ කිලෝමීටර් 25,000ක් සෑදීමට මුදල් වෙන්වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා.

මාර්ග පද්ධතියත් එක්ක මේ රටේ ඇති වන දියුණුව සංචාරක ව්‍යාපාරයට ප්‍රධාන වශයෙන් බලපානවා. සංචාරක ව්‍යාපාරය දියුණු වෙන්න නම්, මේ රටේ මාර්ග පද්ධතිය දියුණු වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ආයෝජකයන් මේ රටට එන්න නම්, මේ රටේ මාර්ග පද්ධතිය දියුණු වෙන්න ඕනෑ. කවුරු මොනවා කථා කළත්, අපේ රට කෘෂි කාර්මික රටක්. මේ රටේ සියලු දේ ප්‍රවාහනය කරන්න අපට මාර්ග පද්ධතිය අවශ්‍ය වෙනවා. ඒ සඳහා විශාල මුදලක් වෙන්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, වාණිජ කටයුතු ඇතුළු සියලු කටයුතු සඳහා අද අධිවේගී මාර්ග හැදෙනවා. ඒ සඳහාත් මුදල් වෙන්වෙලා තිබෙනවා.

මධ්‍යම අධිවේගී මාර්ගය ගැන මම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ ගරු මහාමාර්ග ඇමතිතුමාට, ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාට මම මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මීරිගම-කුරුණෑගල අධිවේගී මාර්ගයේ වැඩ පටන් ගන්නත් අපට පුළුවන්කම තිබෙනවා. කුරුණෑගල සිට දඹුල්ල දක්වා මාර්ගය හදන්නත් රුපියල් මිලියන 300ක් වෙන්වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 වෙනකොට කොළඹ ඉඳලා කුරුණෑගලට ඒ අධිවේගී මාර්ගය හරහා යන්න හැකියාව ලැබෙයි කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. අධිවේගී මාර්ග ගත්තාම, විශේෂයෙන්ම කඩවත-මීරිගම මාර්ගයේ වැඩ දැන් පටන් අරගෙන තිබෙනවා වාගේම, ඒ සඳහා විශාල මුදලක් වෙන්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ මාර්ග පද්ධතිවලට අමතරව, පොතුහැර සිට ගලගෙදර දක්වා, කුරුණෑගල සිට දඹුල්ල දක්වා, කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ග හදන්නත්, කැලණි පාලමේ වැඩ සම්පූර්ණ කරන්නත් දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ කථාව කෙටි කරලා අවසන් කරන්න.

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)
මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි 10ක කාලයක් තිබුණා.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, "වාරි සෞභාග්‍යා" වැඩසටහන ගැන.

මේ තුළින් ගොවි ජනතාවට කන්න දෙක වගා කරන්න ඉල්ලන වතුර ටික ලබා දෙන්න අද සූදානම් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)
ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා මොන තරම් මුදල් අගහිඟකම් තිබුණත්, මේ අවුරුද්දේ වැව් 2,000කට ආසන්න ප්‍රමාණයක් සංවර්ධනය කරන්න කටයුතු කරන්නේ කියන කාරණයත් සඳහන් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කෙටියෙන් අවසන් කරන්න.

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න. උතුරු මැද පළාත් මහ ඇළ, වයඹ පළාත් මහ ඇළ, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, මිනිපේ වම් ඉවුරු ඇළ, පහළ මල්වතු ඔය, උමා ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය, බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය, මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය, කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය, කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය, ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, තල්පිටිගල බහුකාර්ය යෝජනා ක්‍රමය වැනි ව්‍යාපෘති සඳහා දැවැන්ත මුදලක් වෙන් කරමින් මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් 2024දී අවසන් වන යෝජනා ක්‍රම රාශියක් පටන් ගන්නවාය කියන කාරණයත් සඳහන් කරමින්, ඒ සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා කියන එකත් සඳහන් කරමින්, මේ වෙනුවෙන් කටයුතු කළ ගරු මුදල් ඇමතිතුමා ඇතුළු ඒ සියලු රාජ්‍ය නිලධාරින්ට මගේ ගෞරවනීය ප්‍රණාමය හා ස්තුතිය පිරිනමමින් සියලුදෙනාටම සුබ පතමින් නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Premnath C. Dolawatte.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Hesha Withanage to the Chair?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I propose that the Hon. Hesha Withanage do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

[අ.භා. 4.35]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2022 අය වැය විවාදය පැවැත්වෙන මේ මොහොතේ මදක් අතීතයට යන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015.12.19 වැනි දින පැවති අය වැය තෙවැනිවර කියවීමේදී අය වැයට පක්ෂව ඡන්ද 160කුත්, විපක්ෂව 51කුත් ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ, අපේ ගරු ටී. රංජිත් ද සොයිසා මැතිතුමාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටි කාලයක්. අපි ඒකාබද්ධ විපක්ෂයේ සිටියදී එතුමාත් එක්ක එකතු වෙලා අපි පුංචි සටනක් දියත් කළා. ඒ කාරණය සම්බන්ධයෙන් පුංචි මතක් කිරීමක් කරන්න මා කැමැතියි. එදා ඒ යහපාලන ආණ්ඩුවේ අය වැය තුළින් එම ආණ්ඩුවට පෙර 2014 තිබුණු ආණ්ඩුවෙන් ලබා දී තිබුණු සහන ගණනාවක් කප්පාදු කළා. එසේ කප්පාදු කිරීම නිසා, ඒවාට "විරුද්ධයි" කියපු හැම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාම එසේ විරුද්ධ වෙන්න හේතුවත් කියලා තමයි ඊට විරුද්ධ වුණේ. ඒක අලුත් සම්ප්‍රදායක් වුණා. එවකට හිටපු කරු ජයසූරිය කථානායකතුමා කිව්වා, විරුද්ධ වෙන හේතුව කියන්න ඕනෑ නැහැ, විපක්ෂ නම් විපක්ෂයි කියන්න කියලා. හැබැයි, එදා ඒකාබද්ධ විපක්ෂයේ නීතිඥයා හැටියට මම, දිවංගත අපේ සොයිසා මන්ත්‍රීතුමාත් එක්ක එකතු වෙලා කොළ ටිකක් බෙදලා අමුතු විධියේ සටනක් ගෙන ගියා, එදා යහපාලන ආණ්ඩුව ගෙනා අය වැයෙන් ජනතාවගේ සහන හතළිස් ගණනක් කප්පාදු කළා කියලා.

අද අපට තිබෙන ගැටලුව තමයි මේ අය වැය විවේචනය කිරීම. අද නොයෙක් කතන්දර කියනවා. අපි දන්නවා, මේ අය වැය ගෙනෙන මොහොතේ අද තිබෙන තත්ත්වය ඒ තරම් හොඳ එකක් නොවෙයි කියලා. අද මේ රට තිබෙන්නේ ගිලුණු නැවක් වාගේයි. මේ නැවේ අපට දහලන්න බැහැ. අපි ක්‍රමානුකූලව මේ නැව සකසා ගන්නකම්, අපි ක්‍රමානුකූලව ගමන් කරන්න ඕනෑ. එසේ ක්‍රමානුකූලව ගමන් කළොත් තමයි අපට නිවැරදිව අපේ නැව දියත් කරගෙන අපේ ගමනාන්තය දක්වා යන්න පුළුවන් වන්නේ.

අද වනවිට අපට නිදහස ලැබී අවුරුදු 70කට වඩා කාලයක් ගතවෙලා තිබෙනවා. මේ තරම් කාලයක් තුළ සිදු වූ දේවල්වලට දේශපාලනඥයන්ට විතරමයි ඇඟිල්ල දිගු කරන්නේ. හැබැයි, අද කථා කරන මේ තත්ත්වයට, රජයේ අය සහ වැය අතර පවතින මේ හිඟයට මේ සමාජයේ සිටින නිලධාරින්, රාජ්‍ය සේවකයන් කියන මේ හැම කෙනාම අඩු වැඩි වශයෙන් වග කියන්න ඕනෑ. මම මේකට හොඳ උදාහරණයක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය අය වැය තුළින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ප්‍රතිපාදන හැටියට රුපියල් මිලියන 10ක් දුන්නා. මේ අය වැයෙන් ඒ මුදල රුපියල් මිලියන 15ක් කරලා තිබෙනවා. මට අවිස්සාවේල්ල ප්‍රදේශයට වතුර මෝටර් තුනක් ගන්න අවශ්‍ය වුණා. ඒ වතුර මෝටර් තුන මට කොම්පැනියකින් ගන්න පුළුවන්, රුපියල් 35,000ට. හැබැයි, අපේ මේ රාජ්‍ය යාන්ත්‍රණය තුළ, මේ තිබෙන ටෙන්ඩර් පටිපාටි තුළ ඒවා ගන්න ගියාම රුපියල් 53,000ක් කියනවා. මම තව උදාහරණයක් කියන්නම්. මම පසුගිය අවුරුද්දේ අපට ලැබුණු මිලියන දහයේ ප්‍රතිපාදනවලින් දහම් පාසල්වලට, පාසල්වලට, පුස්තකාල 50ක් ලබා දෙන්න කටයුතු කළා. ඒ පුස්තකාල දුන්නා. අපි දන්නා විධියට එළියෙන් ඒ පොත් ටික ගන්න ගියා නම් ඒවාට අපට සියයට 30ක වට්ටමක් ලැබෙනවා. නමුත් අවාසනාව කියන්නේ ඒ කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඒ පුස්තකාල පොත් කට්ටලයක් හදන්න ගියාම, එළියෙන් 44,000කට ගන්න පුළුවන් පොත් කට්ටලයට 55,000ක් වැය කරන්න වෙනවා. එතකොට ඒවාට කවුද, වග කියන්නේ? දේශපාලනඥයාද, රාජ්‍ය නිලධාරියාද?

අඩු වැඩි වශයෙන් අපි සියලුදෙනාම මේ වෙනුවෙන් වග කියන්න ඕනෑ කියා මම කියනවා. ඒක තමයි දැන් සිදුවෙලා තිබෙන්නේ. අපේ ජනතාවගේ බදු මුදල් ඇත්තටම නිවැරදිව ජනතා සේවයට යෙදෙනවාද කියන ප්‍රශ්නය අද තිබෙනවා. මේ ප්‍රශ්න අපි අඩු කර ගත්තේ නැත්නම් අපට හැම දාම සිදු වෙන්නේ එක් එක්කෙනාට චෝදනා කරමින්, අපේ අය වැය හිඟය පිළිබඳව කථා කරමින්, දියුණු වෙමින් පවතින රටක් හැටියට සිටින්නයි.

හැබැයි, බැසිල් රාජපක්ෂ මැතිතුමා ආටෝප නැති අය වැයක් ගෙන ඒම ගැන අද මම සතුටු වනවා. අය වැය එතුමා තමයි ගෙනාවේ. අය වැය පාස්ද, ෆේල්ද කියලා තීරණය වෙන්නේ අපි ඔක්කොම එකතුවෙලා, එය ක්‍රියාත්මක කරන ස්වරූපය තුළයි. අද අපි අය වැය ගැන විවාද කරනවා. හැබැයි, ඊළඟ අවුරුද්ද තුළ රාජ්‍ය සේවකයන්, දේශපාලනඥයන් -පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු විතරක් නොවෙයි, ප්‍රාදේශීය දේශපාලනඥයන්- එකතුවෙලා, මේ යෝජනා මහ පොළොවට ගෙන යන්නේ කොහොමද කියන යථාර්ථය බලලා තමයි මේ අය වැය පාස්ද, ෆේල්ද කියලා තීරණය වෙන්නේ. සමහර වෙලාවට අපි දකිනවා, ප්‍රතිපාදන ගෙනෙනකොට පළාත් පාලන ආයතනවල ප්‍රධානියා ප්‍රතිපාදන ගන්න කැමැති නැති බව. සමහර වෙලාවට ආපසු ප්‍රතිපාදන හරවා යවනවා. මෙහිදී පක්ෂ-විපක්ෂ භේදයක් බලන්න බැහැ. රටේ ජනතාවට ඔවුන් සේවය කරන්න ඕනෑ. දේශපාලනඥයන්ට ලැබෙන මුදල් ගමට යන්න ඕනෑ. ඒ මුදල් ගමට යනවාට කවුරු හෝ නිලධාරියෙකු හෝ දේශපාලනඥයකු වළ කපනවා නම් ඒක තමයි එතැන තිබෙන වැරැද්ද. මේවා අපි නිවැරැදි කර ගන්න ඕනෑ. මේ කාරණා නිවැරැදි නොකළොත් අපට ඉදිරියට යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

අද නොයෙකුත් කතන්දර කිව්වා, අපේ විපක්ෂයේ නායකයන් හෙට කරන්න යන උද්ඝෝෂණය සම්බන්ධයෙන්. එතුමන්ලාට අමතකවෙලා තිබෙනවා, ජන සටන පාද යාත්‍රාව ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි නුවර ඉඳලා කොළඹට ආවේ කොරෝනා කාලයේ නොවන බව. හැබැයි, තමුන්නාන්සේලා එදා තහනම් නියෝග ගන්න හැම උසාවියක් ගණනේම ගියා. එදා කොරෝනා ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මම කියන්නේ නැහැ, තහනම් නියෝග ගත්තා කියලා අපිට කිසිම දෙයක් බලපාන්නේ නැහැ කියලා. අපි නම් ඒවා ගණන් ගත්තේවත් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ තමුන්නාන්සේලාගේ නායකයන්ට නිවැරැදි තොරතුරු, අවවාද, අනුශාසනා ලබා දෙන පිරිස් නොමැතිකමයි. තමුන්නාන්සේලාගේ නායකයා යාරයක් මහනකොට බඹයක් ඉරනවා. ඒක තමයි ඇත්ත කථාව. අපි වාගේ උපදේශකයෝ තමුන්නාන්සේලාගේ නායකයා ළඟ හිටියා නම් කවදාවත් තමුන්නාන්සේලාගේ

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

නායකයා තෙමන්නේ නැහැ. අපි කියනවා, "නායකතුමා තෙමෙන්න එපා. තෙමුනොත් මේක විහිළුවක් වෙනවා" කියලා. ඊට වඩා එහාට ගිහිල්ලා, අපි තමුන්නාන්සේලාගේ නායකයාට කියනවා, "මේ වෙලාවේ මිනිස්සු කොළඹට ගෙනෙන්න එපා" කියලා. තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය උපරිමයට ගෙන ගියා ඇති. පුළුවන් නම් අද රට ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලා කියන්න, අපි මේ උද්ඝෝෂණ නවත්වනවා කියලා. එතකොට ජනතාව කියයි, මොළය ඇති තීරණයක් ගත්තා කියලා. තමුන්නාන්සේලාට එහෙම උපදෙස් ලබා දෙන්න උපදේශකයෝ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගේ තත්ත්වය ගැන මම කම්පා වනවා.

කොහොම වුණත් අද අපි පැහැදිලිව කියන්න ඕනෑ, මෙන්න මේ කාරණය. අපි ඔක්කොම එකතුවෙලා, දේශපාලන වශයෙන් පැති බෙදිලා, එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගන්නවාට වඩා රටට සේවය කරන්න ඕනෑ. අද ඉතුරුවෙලා තිබෙන්නේ ආටෝප නැති නියම අය වැයක්. වෙනදාට හැම දාම මුදල් අමාත්‍යවරුන්ට නිලධාරින් තමයි කරුණු දෙන්නේ. හැබැයි, අද මම සතුටු වනවා, බැසිල් රාජපක්ෂ මැතිතුමා පිළිබඳව. එතුමා එහි හරි වැරදි හොයලා, එතුමාම තීරණය කරලා, මේ කාර්යය ඉදිරියට ගෙන යන්න උත්සාහ කළා. ඒ නිසා අද දෙපැත්තට ඇඟිල්ල දිගු කර ගන්නවා වෙනුවට මේ කටයුතු සාර්ථක කර ගන්න අපි ඔක්කොම එකතු වෙන්න ඕනෑ.

මම දැකලා තිබෙනවා, අද දේශපාලනඥයන්ට බණින සමාගම් ගණනාවක් තිබෙන බව. උදේ ඉඳලා හවස් වනතුරු දේශපාලනඥයන්ට බණිනවා. ඒ අය සමාජ සත්කාර කරනවා කියනවා. අද ඒ සමාගම්වලට හොඳ අවස්ථාවක් අපි ආණ්ඩුවක් හැටියට මෙවර අය වැය තුළින් ගෙනැල්ලා තිබෙනවා. රටේ වැඩිම ලාභ ලබා ගත් සමාගම් 60කින් අපි සියයට 45ක් බදු වශයෙන් ගන්නවා. මම බලාගෙන ඉන්නවා, ඒ සමාගම් 60න් ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත්වෙලා මුලින්ම ඒ බදු ටික රටට ගෙවන්නේ කවුද කියලා.

සමහර අය සංඛ්‍යාත උපයෝගි කරගෙන, විකාශන නාලිකා අරගෙන, ජනතාව ගැන හොයනවා කියලා ජනතාවගෙන්ම මුදල් එකතු කරනවා. සමහරු වතුර බෝතලයක් බෙදලා, වතුර ලොරියක් බෙදුවා වාගේ ජනතාව ඉදිරියට ඇවිල්ලා බොරු ප්‍රචාර කරනවා. මම ඉල්ලන්නේ මේකයි. අද ඒ සමාගම්වලට හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ තරම් ජනතාවට ආදරය කරන multi-millionaire companiesවලට පුළුවන්කම තිබෙන්න ඕනෑ, මේ කියන සියයට 45 බදු මුදල රජයට ගෙවන්න.

මම හිතන්නේ මෙවර අය වැය සරදියෙල් අය වැයක් කියායි. අපි අය වැයෙන් මුදල් වෙන් කරගෙන, අහිංසක මිනිස්සුන්ට දෙන්න උත්සාහ කරනවා. අපේ රටේ දැනුම තමයි ප්‍රාග්ධනය. අධ්‍යාපනය දියුණු කරන්න අවුරුදු 24ක් තිස්සේ තිබුණු ප්‍රශ්නය අද විසඳා තිබෙනවා. ඒක විය යුත්තක්. ඒ වාගේම ජාතික පාසල් 10,000ක් ඇති කරන්න අවස්ථාව අද නිර්මාණය කරලා තිබෙනවා. විශේෂයෙන් මම කියන්න ඕනෑ, ආකර්ෂණීය දේවල් නොමැති වුණාට සෙමින් පටන්ගෙන වේගයෙන් ගමනාන්තය දක්වා ගමන් කරන්න පුළුවන් අය වැයක් අපි ගෙනැල්ලා තිබෙන බව.

පසුගිය කාලයේ කිව්වා, ඩීසල් වාගේම පෙට්‍රල් හිඟයක් ඇති වනවා කියලා. අද ඇත්තටම තිබෙන්නේ භීතිකාවක්. ඔය කියන සපුගස්කන්ද තෙල් පිරිපහදුව වහලා තිබෙනවා. හැබැයි, මම මතක් කරන්න කැමතියි, අතීතයේ -යහ පාලන ආණ්ඩුව කාලයේ- තෙල් නැව එන්නේ නැතිව දවස් දෙකක් තෙල් බෙදා හැරීම පමා වුණු බව. අපි කියන්නේ, යහ පාලන කාලයේ වැරදි වුණා කියලා දැනුත් වැරදි වෙන්න ඕනෑ කියලා නොවෙයි. නමුත් මම කියන්නේ අපි ඒ සම්බන්ධයෙන් අනියත බියක් ඇති කර නොගත යුතු බවයි. තමුන්නාන්සේලා ඔය කියන භයංකර තත්ත්වය නිර්මාණය කිරීම නිසා අනවශ්‍ය පරිභෝජන අවශ්‍යතාවක් ඇතිවෙලා, ජනතාව අද පෝලිම් ගැහිලා ඉන්නවා. ඒ පෝලිම් ගැහීම නිසා අපට අවශ්‍ය තෙල් නැති වන තත්ත්වයක් නිර්මාණය වෙන්න පුළුවන්.

මේ අවස්ථාව තුළ දේශපාලන වශයෙන් වාසි ගන්නවාට වඩා අපි එකතුවෙලා කරන්න ඕනෑ කොරෝනා වසංගතය පවතින මේ අපහසු අවස්ථාවේ රට ඉදිරියට ගෙන යන එකයි. ඒක අපි ඔක්කෝම එකතුවෙලා කරන්න ඕනෑ. එහෙම නැතුව අපි එකිනෙකාට ඇඟිල්ල දික් කරන එක නොවෙයි කරන්නට ඕනෑ. අද අමුතුම ආකාරයට දේශපාලනඥයන්ට බැණ වදිමින් බලය උදුරා ගැනීම සඳහා අන්තගාමී කොට්ඨාස බලාගෙන ඉන්නවා. ඒ පිළිබඳ අවශ්‍යතාවක් ඒ අයට නිර්මාණය වෙලා තිබෙනවා. මම දෑස් යොමු කර බලාගෙන ඉන්නවා මේ සමාගම් 60න් මුලින්ම අදාළ බදු මුදල් ගෙවලා රටේ අසරණ ජනතාව වෙනුවෙන් කැප වෙන්නේ කවුද කියලා. එසේ කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තේනුක විදානගමගේ රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු තේනුක විදානගමගේ මහතා (ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தேனுக விதானகமகே - கிராமிய மற்றும் பாடசாலை விளையாட்டு உட்கட்டமைப்பு வசதிகள் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Rural and School Sports Infrastructure Improvement)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආයතනවල වියදම් අඩු කරමින්, දේශීය නිෂ්පාදනයට මුල් තැන දෙමින්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජයේ දෙවැනි අය වැය යෝජනාවලිය මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා පසුගිය 12වැනි දා ඉදිරිපත් කළා. ඒ වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ අද දවසේත් පසුගිය 13වැනි දාත් විපක්ෂය චෝදනා විශාල ප්‍රමාණයක් අය වැය සම්බන්ධයෙන් කළා. ඒ වාගේම පසුගිය යහපාලන රජය කටයුතු කරපු, 'දින 100න් අලුත් රටක්' කියලා කථා කරපු, අවුරුදු 4කට 4 1/2කට ආසන්න කාලයක් රට පාලනය කරපු විපක්ෂයේ බොහෝ පිරිස අද අය වැය සම්බන්ධයෙන් විවිධ චෝදනා එල්ල කළා. එහෙම චෝදනා එල්ල කරන අයට අපි කියනවා, මේ අය වැය තුළ ඉදිරිපත් කරපු ඒ වාගේම ගෝලීය කොවිඩ් වසංගතයත් එක්ක රට ඉදිරියට ගෙන යන්න, රටේ ඉදිරි කාලය ශක්තිමත් කර ගන්න පුළුවන්, ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් වැඩපිළිවෙළක් ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා කියලා. මේ වැඩ පිළිවෙළ තුළ වැරදි අභියෝගයක් හෝ දුර්වලතාවක් ක්‍රියාත්මක වෙනවා කියලා විපක්ෂය දකිනවා නම්, එය ක්‍රියාත්මක කිරීමේ යම් අපහසුතාවක් තිබෙනවාය කියලා කියනවා නම් ඒ චෝදනා කරන සියලු දෙනාගෙන් අපි ඉල්ලීමක් කරනවා ගෝලීය කොවිඩ් වසංගතය හමුවේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න, රටට විදේශ විනිමය ගෙන එන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රැකියා ලක්ෂයක් නිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල්වලට රැකියා ලබා දෙනකොට ඒක විවේචනය කරපු අයත් හිටියා. ඒ වාගේම අඩු ආදායම්ලාභී පවුල ශක්තිමත් කරන වැඩ පිළිවෙළ යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඉදිරිපත් කරපු යෝජනාව යථාර්ථයක් බවට පත් කරමින්, ගමක ඉන්න රැකියාවකට යා ගන්න බැරි වෙච්ච අහිංසක තරුණ-තරුණියන්ට අද රාජ්‍ය සේවයේ රැකියා අවස්ථා ලබා දීම ගැන අපි සතුටු වෙන්න ඕනෑ. එම නිසා මේ වැඩපිළිවෙළ විවේචනය කරන්න එපා, ඒකෙන් දේශපාලනය කරන්න එපා කියන එකත් අපි පළමුවෙන්ම කියන්න ඕනෑ.

ඒ වාගේම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන සියලුදෙනාම අද මතක් කළා, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනකොට කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන බව. ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් අලුතින් ගමේ පාර කාපට් වෙන වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ගරු සිරිපාල ගමලත් රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා මේක ගම සංවර්ධනය වෙන වැඩ පිළිවෙළක් කියලා. ලබන වසර තුළදී කිලෝමීටර 25,000ක මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. අපි මතක් කරන්නට ඕනෑ පසුගිය යහපාලන රජයේ නිවාස ඇමතිවරයා විධියට කටයුතු කරපු ඇමතිවරයාට වඩා මේ ආණ්ඩුව තුළ නිවාස ඇමතිවරයා විධියට කටයුතු කරන ගරු අග්‍රාමාත්‍යතුමා මේ වෙනකොට ග්‍රාම නිලධාරි වසම් 14,021කට නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙන බව. නිවාස ණයක් නොවෙයි, නිවාස ආධාරයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළාය කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ අය වැය යෝජනා තුළින් අවුරුදු 60න් රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම ගැනීම අවුරුදු 65 දක්වා දීර්ඝ කරලා තිබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට විශ්‍රාම වැටුප ලැබීම සඳහා සේවය කළ යුතු කාලය වසර දහය දක්වා දීර්ඝ කළා.

පසුගිය කාලය තුළ ගුරු-විදුහල්පති වැටුප සම්බන්ධයෙන් රට පුරාම උද්ඝෝෂණ කළා. ඒ අයගේ ගැටලුවට අය වැයෙන් විසඳුමක් ලබා දෙනවාය කියන පිළිතුර අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු මුදල් ඇමතිතුමා ලබා දුන්නා. ඒ වෙනුවෙන් අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න රුපියල් කෝටි 3,000ක ප්‍රතිපාදන වෙන් කර තිබෙන බවත් අපි මතක් කරන්න ඕනෑ. ඒ වාගේම උපාධිධාරි අභ්‍යාසලාභීන් 53,000කට රජයේ ස්ථිර පත්වීම් ලබාදීමටත් අවශ්‍ය කටයුතු කරනවා.

ඊළඟට, මෙවර අය වැයෙන් ග්‍රාමීය සංවර්ධනයට රුපියල් කෝටි 4,206ක මුදලක් වෙන් කර දී තිබෙනවා. එක් ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන තුනක -ලක්ෂ තිහක- ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා වාගේම, සෑම පළාත් පාලන කොට්ඨාසයකටම රුපියල් මිලියන හතරක -ලක්ෂ 40ක- ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. පළාත් පාලන කොට්ඨාස මට්ටමින් ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරුන්ට පක්ෂ, විපක්ෂ, පාට භේදයකින් තොරව ඒ ප්‍රතිපාදන වෙන් කර දී තිබෙනවා. අද උදේ කථා කරපු ඇතැම් ගරු මන්ත්‍රීවරු කිව්වා, ඒ සල්ලි අරගෙන ගමේ ඉන්න අයට දීලා දේශපාලනය කරන්න උත්සාහ කරනවා කියලා. ඒ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, විපක්ෂයටත් අපි මතක් කරන්න ඕනෑ, ගමේ ඉන්න ප්‍රධානීන්, වසම නියෝජනය කරන ප්‍රධානීන් එක්ක සාකච්ඡා කරලා ඒ අවශ්‍යතා ඉටු කරන්නයි, ඒ ප්‍රතිපාදන දෙන්නේ කියන එක.

ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වෙන් කර දුන් රුපියල් ලක්ෂ 100ක විමධ්‍යගත මුදල රුපියල් ලක්ෂ 150 දක්වා වැඩි කරන්න කටයුතු කර තිබෙනවා. අඩු ආදායම්ලාභී පවුල්වලට කෝටි 1,500ක ප්‍රතිපාදන වෙන් කර දී තිබෙනවා. දුම්රිය සහ බස් රථ ප්‍රවාහනය නැංවීමට රුපියල් කෝටි 200ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

ඉතිහාසයේ ප්‍රථම වරට අධ්‍යාපනයට සියයට 7.51ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. සෑම දිස්ත්‍රික්කයකටම ජාත්‍යන්තර පාසලක් සහ රෝහලක් ඉදිකිරීමටත් යෝජනා කර තිබෙනවා.

"වාරි සෞභාග්‍යා" වැඩසටහනට රුපියල් කෝටි 2,000ක මුදලක් වෙන් කර දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් සෑම අමාත්‍යාංශයකටම වෙන් කර දුන් මුදලට අමතරව, අය වැය යෝජනා තුළිනුත් අතිරේක ප්‍රතිපාදන සලසා දීමට ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා කටයුතු කර තිබෙනවා. මා නියෝජනය කරන අමාත්‍යාංශයට වෙනම අතිරේක ප්‍රතිපාදනයක්ද, වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට රුපියල් මිලියන 2,000ක්ද, සමාජ සුබසාධන ක්ෂේත්‍රයට රුපියල් මිලියන 1,000ක්ද, පාරම්පරික දේශීය නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයට රුපියල් මිලියන 1,000ක්ද, පශු සම්පත් ක්ෂේත්‍රයට රුපියල් මිලියන 1,000ක්ද වශයෙන් අමාත්‍යාංශ විශාල ප්‍රමාණයකට ප්‍රතිපාදන වෙන් කර දී තිබෙන බව අපි මතක් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වෙලාවේ පැහැදිලිව කියනවා, අපි කොවිඩ් වසංගතයෙන් ජනතාව බේරා ගැනීම සඳහා සෑම පුරවැසියකුම එන්නත්කරණය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවාය කියන එක. අතිගරු ජනාධිපතිතුමාගේ ඉලක්කය මේ රටේ සෑම පුරවැසියෙක්ම එන්නත්කරණය කරන්නයි. විවිධ අය විවිධ චෝදනා කරන්න උත්සාහ දැරුවත්, මේ අය වැය තුළින් විශාල වැඩ පිළිවෙළක් ඉදිරි වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන්නට හැකියාව තිබෙනවාය කියන එකත් අපි මතක් කරන්න ඕනෑ.

මගේ කථාවේ ඉතිරි කොටස මා **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HESHA WITHANAGE *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

[අ.භා. 4.53]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් කිරීම සඳහා, අපේ රජයේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ නවවන පාර්ලිමේන්තුවේ දෙවන අය වැය විවාදයේ, දෙවන දිනයේ අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව ප්‍රථමයෙන්ම මම සතුටු වෙනවා.

ගෝලීය වසංගතයෙන් අවුරුදු දෙකකට වැඩි කාලයක් අපේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම බැට කාපු අභියෝගාත්මක කාලයක පුංචි ආර්ථිකයක් තිබෙන අපේ රටේ අය වැයක් ඉදිරිපත් කිරීමම විශාල අභියෝගයක්. නමුත්, එම අභියෝගයට සාර්ථකව මුහුණදීමට මුදල් ඇමතිතුමා ඇතුළු අපේ ආණ්ඩුවට හැකි වෙලා තිබෙනවා. තිරසාර සංවර්ධිත ඉලක්ක සහිත, දේශීය ආර්ථිකයක් බිහි කිරීම අරමුණු කරගත් "Made in Sri Lanka" යුගයක් ඇති කිරීම, නාවික, සංචාරක, අධ්‍යාපන, සෞඛ්‍ය ක්ෂේත්‍ර දකුණු ආසියාවේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම සඳහා විදේශ ආයෝජන දිරිමත් කිරීමටත්, ගමේ කුඩා පරිමාණ ව්‍යවසායකයා ශක්තිමත් කිරීමටත් අවශ්‍ය යෝජනා මෙම අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා.

අපේ රටේ කාන්තාවන් බොහොමයක් නිවසේ වැඩ ටික කරගෙන නිවසට වෙලා ඉන්නවා. ඒ කාන්තාවන් අපේ රටේ ආර්ථිකයට දායක කර ගැනීම කළ යුතු වනවා. ඒ වාගේම O/L සහ A/L අධ්‍යාපනය නිම කරපු තරුණ-තරුණියන් ව්‍යවසායකයන් කිරීමේ අරමුණ පෙරදැරිව කටයුතු කළ යුතු වෙනවා. ඒ වාගේම ගමේ යටිතල පහසුකම් ටික සංවර්ධනය කළ යුතු වෙනවා. මාර්ග ටික හදලා, බෝක්කු, පාලම් ටික හදලා, ජලය, විදුලිය පහසුකම් ලබා දීලා ඒ අවශ්‍ය කටයුතු කරලා ගමේ නිෂ්පාදන ටික නගරයට ගෙනෙන වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා.

ඒ වාගේම අපි දේශපාලනික වශයෙන් යම් කැපවීම් කළ යුතු වෙනවා. අද ගමට ගියාට පස්සේ ජනතාව කියන්නේ, "ඩොක්ටර්, මරු කාලයක තමයි පාර්ලිමේන්තු ගියේ" කියලායි. මම ඇහුවා, "ඇයි" කියලා. "ඔක්කොම කප්පාදු කරන කාලයකනේ ඔබතුමා පාර්ලිමේන්තු ගියේ" කියනවා. Vehicle prermit එක නැහැ, අපේ pension එක ලබා ගැනීමට සේවය කළ යුතු කාලය අවුරුදු 10ක් දක්වා දීර්ඝ කරලා, වරප්‍රසාද අඩු කරලා, petrol allowance එක ලීටර් 5කින් අඩු කරලා තිබෙනවා. ඒ නිසා නියම කාලයක තමයි පාර්ලිමේන්තුවට ගියේ කියලා ගමේ ජනතාව කියනවා. අපි ඒ වෙනස කරන්න තමයි ආවේ. හැබැයි, බොහෝ අයට ඒක අමතක වෙලා තිබෙනවා. අපි ආවේ ඒ වෙනස කරන්නයි කියන එක අමතක වෙලා තිබෙනවා. නමුත්, අපට ඒක අමතක වෙලා නැහැ. ඒ වෙනස කරන්න තමයි අපට ජන වරම දුන්නේ. ඒ වෙනසට අපේ අතිගරු ජනාධිපතිතුමා ආදර්ශයක් දීලා තිබෙනවා. අපිත් ඒ සඳහා දායකත්වය ලබා දෙන්න ඕනෑ කියලා ගරු මුදල් ඇමතිතුමා හිතන්න ඇති. ඒ නිසා තමයි අපේ වරප්‍රසාද ටිකක් අඩු කරගෙන, මේ රට වෙනුවෙන්, රටේ සුබසිද්ධිය සඳහා ආර්ථිකය ගොඩනඟන වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීම වෙනුවෙන් අපි දායක වෙලා ඉන්නේ. මේ සියල්ල සමඟ "සෞභාග්‍යයේ දැක්ම" යථාර්ථයක් බවට පත් කිරීමට ගෙනාපු ඉතා ශක්ති සම්පන්න, විනිවිදභාවයෙන් යුක්ත තිරසාර අය වැයක් විධියටයි මම මේ අය වැය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතයෙන් තොර වර්තමානයක් හෝ අනාගතයක් නැහැ. හැබැයි, ඒ බව විපක්ෂයට අමතක වෙලා තිබෙනවා. ඒකත් අපි මේ ගරු සභාවේදී විපක්ෂයට මතක් කර දෙන්න ඕනෑ. ඒ අය විදේශ කුමන්ත්‍රණවලින්, විදේශ ඩොලර්වලින් තම තමන්ගේ පක්ෂ ශක්තිමත් කිරීමට කටයුතු කළා වාගේම, බොරුව සමාජගත කරලා, වෛරය, ක්‍රෝධය පතුරවලා කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. දස රාජ ධර්මයෙන් රට පාලනය කරනවා කියලා බලයට ආපු යහ පාලන ආණ්ඩුව 2015-2019 දී කළ කී දේ, මේ රටට කරපු ද්‍රෝහිකම් ජනතාවට වාගේම අපටත් අමතක නැහැයි කියන එක මේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න ඕනෑ.

හොරකම ම ප්‍රතිපත්තිය කර ගත් ගජ මිතුරන්ට බැංකු කොල්ලකන්න ඉඩ දීලා තිබුණා. සමහර හිටපු මුදල් ඇමතිලා පගා ගත්තේ මුදල්වලින් පමණක් නොවෙයි. ගෙවලුත් පගා විධියට ගත්තා. පාද සටහන් - footnotes - දාලා සමහරු ගත්ත ඒ පගා කොහොම ගත්තා ද කියලා අපි දන්නේ නැහැ. ඒ ගෙවල්වලින් ද, සල්ලිවලින් ද කියලා අපි දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණුවා. හම්බන්තොට වරායට මොකද වුණේ කියන එක අපට මතකයි. විජයදාස රාජපක්ෂ මැතිතුමාත් ඒක මතක් කළා. ගොවියාට නැඟිටින්න බැරි වෙන්න,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමාගේ අවසරයත් එක්කයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

ස්ථාවර නියෝග 91(ආ) යටතේ පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේ දී මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති යටතේ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මහ බැංකුව ගැන කිව්වා. ඒ මුදල් අරගෙන තමයි තමුන්නාන්සේලා දැන් දෙන්න හදන්නේ. එතකොට ඒ මුදල නැද්ද කියලා පොඩ්ඩක් පැහැදිලි කරන්නකෝ මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* මහ බැංකුවේ ඒ සල්ලි අරගෙන තමයි තමුන්නාන්සේලා මේ කටයුතු කරන්න හදන්නේ.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ point එකක් නැහැ. එතුමාත්, අපිත් දන්නවා ඒ රුපියල් බිලියන 8.5 අපි නැවත ගත්තා කියලා. *[බාධා කිරීම්]* ඒක තමයි ගත්තේ. හොරකම් කරපු සල්ලි ගන්නේ නැතිව කොහොමද? හොරකම් කරපු සල්ලි නැවත ගන්න ඕනෑ. *[බාධා කිරීම්]* ඊට අමතරව තමයි footnote එක

දානකොට පගා දුන්නේ. ඊට අමතරව තමයි ගෙවල් දුන්නේ. මතක තියා ගන්න. ඔය කියන රුපියල් බිලියන 8.5 ඇතුළේ ඒක නැහැ. මතක තියා ගන්න. ඒ සල්ලි ටික-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ගරු උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා හරියට උත්තර දුන්නේ නැති නිසා මම ඒ ගැන පැහැදිලි කරන්නම්. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඒ මුදල් පවරා ගන්න කටයුතු කර තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් තමයි ඒ මුදල අත්හිටෙව්වේ. ඒ අත්හිටුවනකොට, ඒ අදාළ සමාගමේ අතුරු සමාගම්වලට රුපියල් බිලියන 14ක ණය කිසිම නීත්‍යනුකූල පදනමක් නැතිව රාජ්‍ය බැංකුවලින් දීලා තිබෙනවා. එක පැත්තකින් අත්හිටුවලා අනෙක් අතට තවත් රුපියල් බිලියන 12කට, 14කට කිට්ටු වෙන්න ඒ සමාගම්වලට ණය දීලා තිබෙනවා; ගෙවලා නැහැ. ජාතික බැංකු දෙකට තිබෙන දේවල් ඔක්කොම පවරා ගත්තත් කරන්න දෙයක් නැහැ. කිසිම නීත්‍යනුකූල පදනමකින් නොවෙයි දීලා තිබෙන්නේ. ඔබතුමා ඒ ගැන දන්නේ නැතිව ඇති. ඔබතුමන්ලාගේ මට්ටමින් නොවෙයි ඒවා වෙලා තිබෙන්නේ. මේක තමයි යථාර්ථය. එක පැත්තකින් හොරකම අල්ලා ගත්තා කියලා පෙන්වනවා; ඒ සල්ලි තියා ගත්තා කියලා පෙන්වනවා. අනෙක් පැත්තෙන් ඊට වැඩිය තව රුපියල් බිලියන 5ක්, ලක්ෂ 10,000 ඒවා 14ක් විතර ලංකා බැංකුවෙන්, සහ මහජන බැංකුවෙන් ඒ සමාගම්වලට දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මා හිතන්නේ, අපේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ඒක මතක නැතිව ඇති. පගා ගත් ඒවා ඒ බිලියන 8.5 තුළ නැහැ. ඒවා වෙනම යන්නේ. ඒ සල්ලි ගත් අය, ඒවායෙන් ගෙවල් ගත් අය ඒ ගැන දන්නවා. ඒ බිලියන 8.5 තුළ පගා ගත් ඒවා නැහැ. මා ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම, අපේ ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණපු, ගොවියාට නැඟිටින්න බැරි වෙන්න ගහපු, ගොවියා සියදිවි හානි කර ගන්නා තත්ත්වයට පත් කරපු, බෞද්ධ සංස්කෘතිය විනාශ කරපු, සංඝයා වහන්සේ භේදභින්න කරපු, රටට අහිතකර හොර ගිවිසුම් -MCC ගිවිසුම, ශ්‍රී ලංකා-සිංගප්පූරු ගිවිසුම, ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම වාගේ ගිවිසුම්- ගෙන ආපු ආණ්ඩුවක් තමයි පසු ගිය ආණ්ඩුව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්ෂ 2015දී සියයට 6 ඉක්මවා තිබූ ආර්ථික වර්ධනය වර්ෂ 2019 වෙද්දී සියයට 2ට බැස්වූ, රටේ ආරක්ෂාව නැත්තටම නැති කරලා බෝම්බ පිපිරෙන තත්ත්වයට පත් කරපු, සෞඛ්‍ය, අධ්‍යාපනය බල්ලාට දැමූ, ජනතාවගේ බෙහෙත් ටිකෙනුත් හොරකම් කර ගත්, ගම අමතක කළ යහ පාලන ආණ්ඩුවේ මැති ඇමතිවරුන් අද මේ සභාවේ කථා කරන හැටි දැක්කාම ලජ්ජයි. සාමාන්‍යයෙන් ඒ කාලේ මුදල් ඇමතිවරයෙකු අය වැයක් ඉදිරිපත් කළාම ඡන්දය ඉල්ලන්න ජනතාව ඉදිරියට යන්න බය නැහැ. හැබැයි, පසු ගිය ආණ්ඩුවේ අය වැය ඉදිරිපත් කළ මුදල් ඇමතිවරු දෙදෙනාම ගෙදර ගියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මට විනාඩි දෙකක් දෙන්න, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග අනුව, පස් වරු 5.00ට කටයුතු අත්හිටුවා විවාදය කල් තබන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මට තව විනාඩියක් දෙන්න, මගේ කථාව අවසන් කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුති කරලා ඔබතුමා ඔහොමම කථාව අවසන් කරන්න. ස්ථාවර නියෝග අනුව, නියමිත වේලාවට කටයුතු අත්හිටුවා විවාදය කල් තබන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

තව විනාඩි දෙකක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

නැහැ, නැහැ. කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මට තවත් විනාඩියක් දෙන්න. *[බාධා කිරීමක්]* මේ සියල්ල එක්ක මේ කථාව අවසන් කරගන්න බැහැ.

අපි මේ අවස්ථාවේ සන්තෝෂ වෙන්න ඕනෑ, මේ වෙලාවේ ගුරු-විදුහල්පති ගැටලුව විසඳීම ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි, ඔබතුමාට.

***එකල්හි වේලාව අ.භා. 5.00 වුයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2021 නොවැම්බර් 16 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.***

*அப்பொழுது நேரம் பி.ப.5.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2021 நவம்பர் 16, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 16th November, 2021.*

# කල්තැබීම
## ඉத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අද දින කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න නියමිතව තිබෙනවා. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා එම යෝජනාව ඉදිරිපත් කරන්න. අද කැබිනට් මණ්ඩලයේ රැස්වීම. ගරු මහින්ද අමරවීර ඇමතිතුමා මේ වෙලාවේ කැබිනට් මණ්ඩලයේ රැස්වීමට සහභාගි වී සිටින නිසා අද ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අමාත්‍යාංශ නිවේදනයක් මඟින් ඉදිරි දිනකදී පිළිතුරු ලබා දෙන බව එතුමා දන්වා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න. ඔබතුමාට දන්වා එයට පිළිතුර ගරු ඇමතිතුමා උදය වරුවක ලබා දේවි. මා ඔබතුමාට ගෞරවයෙන් එම කාරණය මතක් කර සිටිනවා.

## බලංගොඩ කැල්සයිට් නිධියෙන් ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම
## பலங்கொடை கல்சைட் படிவிலிருந்து பொருளாதார அனுகூலங்களைப் பெறல்
## REAPING ECONOMIC BENEFITS FROM CALCITE DEPOSIT IN BALANGODA

[අ.භා. 5.01]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ස්තුතියි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රදේශයේ පිහිටි කැල්සයිට් නිධිය අපේ රටට ආර්ථික නිධානයකි. නමුත්, අද වන විට එම නිධියෙන් සියයට 2ක් පමණ කුකුළු කෑම නිෂ්පාදනය සඳහා පමණක් භාවිත කෙරේ. රටට සම්පතක් වන මෙම නිධියෙන් රටට උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගත හැකි වන ආකාරයේ වැඩසටහනක් සකස් කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අද ඉදිරිපත් කළ මේ යෝජනාව දේශපාලන කාරණාවක් නොවෙයි. එය ඇත්තටම ආණ්ඩු පක්ෂයට බෙහෙවින්ම වැදගත් වන කාරණාවක්. රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ මැතිවරණ කොට්ඨාසයේ පිහිටි කැල්සයිට් නිධියෙන් අපේ රටට විශාල විදෙස් විනිමයක් උපයන්නත් පුළුවන්; විදෙස් විනිමය ඉතිරි කරන්නත් පුළුවන්. මොකද, අපි ආනයනය කරන අමු ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් නිර්මාණය කළ හැකි ඒ කැල්සයිට් නිධිය මඟින් විදෙස් විනිමය ඉතිරි කරන්න පුළුවන්. ඒ වාගේම, එයින් අපනයනයක් - export - විධියට ආදායමක් එකතු කරන්නත් පුළුවන්. මෙවැනි ඉතා වටිනා ඛනිජමය සම්පතක් මේ වන තුරු නිවැරදි ක්‍රමවේදයකට භාවිත නොකිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමට තමයි මම මේ යෝජනාව ගෙන එන්නේ.

මෙම කැල්සයිට් නිධිය පිහිටා තිබෙන්නේ බලංගොඩ ප්‍රදේශයේ, රජවක, මොලමුරේ කියන ග්‍රාම නිලධාරි වසමේ. ගරු ඇමතිතුමා මේ සම්බන්ධව පසුව පිළිතුරක් ලබා දෙනවා කිව්වා. පිළිතුරක් ලබා දෙනවාට වඩා වැදගත් වෙනවා, මේ පිළිබඳව ක්‍රියාත්මක වීම. මෙය ඛනිජමය වටිනාකමක් තිබෙන විශාල ප්‍රදේශයක්. මෙහි පෞද්ගලික ඉඩම් සහ රජයේ ඉඩම් තිබෙනවා. ඒ ඉඩම්වල අයිතිය ලබාගෙන මෙය විශාල ව්‍යාපෘතියක් විධියට කර ගෙන යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආශ්‍රිතව දැනට කරගෙන යන්නේ කවුරුන් හෝ එකතු වෙලා කුකුළු කෑම හැදීම වැනි සාම්ප්‍රදායිකව අවුරුදු ගණනාවක සිට කරගෙන එන කුමක් හෝ ව්‍යාපෘතියක්. නමුත්, මෙයට රජය මැදිහත් වෙලා ලොකු වටිනාකමක් තිබෙන ව්‍යාපෘතියක් කරන්න පුළුවන්. මෙච්චර කාලයක් මෙය කාගේවත් ඇස නොගැටීම අපරාධයක් කියා මා හිතනවා. එම නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, මේ වෙනුවෙන් නිසි අවධානය යොමු කර, ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා අවශ්‍ය තොරතුරු ලබාගෙන මේ සම්පත අපේ රටේ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස.

මේ වනකොට රත්නපුර දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන කොලොන්න මැතිවරණ කොට්ඨාසයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොස්වැටිය ප්‍රදේශයේ, අපේ ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගපොළ සහ ගල්පාය ආදි ප්‍රදේශවල කැල්සයිට් නිධි තිබෙනවා. නමුත් ඒවා කිසිදු නිසි ක්‍රමවේදයකට භාවිත වන්නේ නැහැ. සමහර වෙලාවට ඒවාට අදාළ කටයුතු ජාවාරමක් විධියට කරගෙන යනවා. ඒ නිසා රජය මැදිහත් වෙලා මුදල් උපයන්න පුළුවන් තවත් මාර්ගයක් හැටියට සලකා මේ ගැන සොයා බලන්න කියන ඉල්ලීම මා කරනවා.

ඒ වාගේම, මේ ඛනිජ සම්පත් පරිහරණය කිරීමට අදාළව රටේ කොච්චර නීති තිබුණත්, අද වන කොට ඒ නීතිවලින් පිට ගිහිල්ලා එක එක අයට, මුදල් ඇති ජාවාරම්කාරයන්ට හයිය තිබෙන විධියට ඒ කටයුතු කරගෙන යනවා. අපි මේ වෙලාවේ මේ කාරණයත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපට පෙනෙනවා, සමහර ප්‍රදේශවල ජනතාවට සිදු වන අපහසුතාව ගැනවත් සොයා බලන්නේ නැතිව කළු ගල් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආකාරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා ක්‍රියාත්මක වන්නේ එක පිරිසක් අතරයි. එහි මේ වන විට පවතින තත්ත්වය අපි සොයා බැලුවා. අපේ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාත් මේ ගරු

සභාවේ සිටින නිසා මා ඒ ගැන කියන්න ඕනෑ. මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ඒ ව්‍යාපෘති සියල්ල පවරාගෙන, රජයේ මැදිහත් වීමකින් නැවත ලබා දෙන ක්‍රමවේදයක් ඇති කරන්න කටයුතු කරනවා කියලා මේ වන කොට යෝජනා වෙලා තිබෙනවා. එහි වරදක් නැහැ. රජය මැදිහත්වීමක් කරන කොට එහි නියාමනයක් සිදු වෙයි. එහෙම නැති වුණොත්, එය ජාවාරම්කාරයන් අතට ගිහිල්ලා අහිංසක මිනිසුන්ට හානි වෙනවා; ඒවායේ ප්‍රයෝජනය නිවැරැදිව රටට ලබා ගන්නත් නොහැකි වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, ඒ ඛනිජ නිධි සම්බන්ධව මීට වඩා සොයා බැලීමක් කරන්න කියලා. දැනට ලෝකයේ තිබෙන හොඳම කැල්සයිට් නිධිය බලංගොඩ නිධිය බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල මහතා සඳහන් කර තිබෙනවා. එම නිධිය පිළිබඳව එතුමාගේ කරුණු දැක්වීම් සහිත ලිපියක් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඒ ලිපියෙන් එතුමා විස්තර කරලා තිබෙනවා, එම නිධියේ තිබෙන වටිනාකම ගැන. ඒ අනුව අවශ්‍ය පියවර ගන්න කියන ඉල්ලීම කරන ගමන් මම විශේෂයෙන්ම මේ වෙලාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒවා ගැන හෙළි කරන, ඒවා ගැන තොරතුරු කියන, ඒ වෙනුවෙන් මැදිහත් වන පිරිස් දඬු කඳේ ගහන එක නොවෙයි, ඒ අයට අවශ්‍ය සහයෝගය දීම තමයි රජයක වගකීම. මොකද, මේ වන කොට ආසන්නම සිද්ධිය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සුබසාධක කළමනාකාරවරයා වන විපුල ගනේවත්ත මහතා සම්බන්ධ සිද්ධියයි. මේ සමාජය නිවැරැදි මඟට ගෙන යන්න පුළුවන් අදහස් ප්‍රකාශ කිරීම වාගේ කාරණා නිසා මේ වන කොට එතුමාට හදිසි ස්ථාන මාරුවක් ලබා දීලා තිබෙනවා. එවැනි තැනකට තල්ලු නොවී සාධාරණ විධියට කටයුතු කරන්න. රටට සල්ලි නැත්නම් සල්ලි හොයන්න මාර්ගයක් වන මේ කටයුත්ත වෙනුවෙන් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව ගන්නා පියවර පිළිබඳව රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් විධියට අපි බලාගෙන ඉන්නවාය කියන කාරණයත් මතක් කරමින් මගේ යෝජනාව පිළිබඳ කරුණු දැක්වීම මින් අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 5.07]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

විශේෂයෙන්ම අපේ රටේ තිබෙන ඛනිජ ලවණ, ඛනිජ ද්‍රව්‍ය සුවිශාල කාල රාමුවක ඉඳලා අවුරුදු දහස් ගණනකට ඉස්සෙල්ලා ඉඳලා තමයි මේ විධියට හැඩ ගැහිලා තිබෙන්නේ. මැණික්, මිනිරන් ආදිය ගත්තාම, අපි මේවායින් වසර 180ක පමණ කාලයක ඉඳලා ආර්ථිකමය වශයෙන් විශාල වෙළෙඳ පොළක් නිර්මාණය කරගෙන තිබුණා කියන කාරණය අද වන කොට පැහැදිලිව අවබෝධ කරගෙන තිබෙනවා. නමුත් ඒවා අමු ද්‍රව්‍යයක් ලෙසටම අපනයනය කළාම ඒවායේ නියම ආර්ථික ශක්තිය රජයට ලැබෙන්නේ නැහැ කියන කාරණය ඉතාම පැහැදිලියි.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඒ කාරණය ඉතාම නිවැරැදියි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ඛනිජ වැලි, ඛනිජ ලවණ ආදියට ඉතාම ඉහළ වටිනාකමක් තිබෙනවා. විශේෂයෙන් පුල්මුඩේ, කයිකාවල, පුල්කොටුව, කුදිරමලෙයි යන ප්‍රදේශවල ඒ වාගේ ඛනිජ ලවණ, ඛනිජ වැලි පිහිටා තිබෙනවා. එවැනි විශාලම නිධියක් තමයි පුල්මුඩේ තිබෙන නිධිය. ඒක ටොන් මිලියන 4ක් වාගේ උසස්ම නිධියක් ලෙස අපට සලකන්න පුළුවන්.

ඒ වාගේම ශ්‍රී ලංකාවේ මිනිරන් ගැන කථා කළොත්, මා මීට පෙර කිව්වා වාගේ මිනිරන් වෙළෙඳ පොළට වසර 180ක පමණ ඉතිහාසයක් තිබෙනවා. මිනිරන්වල පවිත්‍රතාව ගත්තොත් එය සියයට 99ක්. ලෝක යුද්ධ සමයේ අපේ ලංකාවේ මිනිරන්වලට විශාල ඒකාධිකාරයක් තිබුණා. ඒ කාලයේ පතල් 6,000කට වැඩි ප්‍රමාණයක් අපේ රටේ තිබිලා තියෙනවා. මම මේවා ගැන කථා කළේ අද මේ යෝජනාවේ මාතෘකාවට ප්‍රවේශයක් ලෙසයි. හුනුගල් හෙවත් කැල්සියම් කාබනේට්වල සංඝටකයක් වෙලා එන, ස්ඵටිකරූපී ආකාරයෙන් එන කැල්සයිට් ගැන තමයි අපේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අවධානය යොමු කළේ.

ඇත්තටම ලොව තිබෙන හොඳම කැල්සයිට් නිධියක් තමයි බලංගොඩ කැල්සයිට් නිධිය. දැන් කුකුළු කෑම සඳහා පමණයි මේවා යොදා ගන්නේ. කැල්සයිට් ටොන් 2,000ක් කැණීම්වලින් ඉවත් කර ගත්තා. පසුගිය ජූලි මාසයේ පරිසර අමාත්‍ය මහින්ද අමරවීර ඇමතිතුමාගේ මූලිකත්වයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කළාය කියලා නොනිල ආකාරයෙන් මට දැනුම් දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් දන්නේ නැතුව ඇති. ඒ සම්බන්ධයෙන් අපේ පරිසර අමාත්‍යතුමා උත්තර දෙයි. මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල මැතිතුමා කියන ආකාරයට ලෝකයේ තිබෙන ගුණාත්මකභාවයෙන් ඉහළම කැල්සයිට් තමයි අපේ රටේ බලංගොඩ ප්‍රදේශයේ තිබෙන්නේ. ඇත්තටම මේවා කුකුළු කෑම සඳහා පමණක් යොදා ගන්නවාට වඩා නැවත අගය එකතු කරලා නිමි ද්‍රව්‍යයක් ලෙස පිට රට යවන්න පුළුවන් නම්, විදේශ වෙළෙඳ පොළට යවන්න පුළුවන් නම් විශාල ආදායමක් අපට ලැබෙනවා. මේ කැල්සියම් කාබනේට් බෙහෙත් පෙති නිෂ්පාදනය, සත්ව ආහාර නිෂ්පාදනය, තීන්ත නිෂ්පාදනය, ගොඩනැඟිලි කර්මාන්තය, දත් බෙහෙත් නිෂ්පාදනය, ප්ලාස්ටික් හා පීවීසී නිෂ්පාදනය, පිඟන් මැටි කර්මාන්තය, වෑල්ඩින් කර්මාන්තය සඳහා යොදා ගන්නවා. විශේෂයෙන්ම වෙනත් රටවල තිබෙන කැල්සයිට් තිබෙන්නේ ඩොලමයිට් සමඟ එකතුවෙලායි. මා නැවත වතාවක් කියනවා, ඒ ආකාරයෙන් කැල්සයිට් වෙන් කර ගන්න එක ඉතාම දුෂ්කරයි කියලා. නමුත් බලංගොඩ, කල්තොට තිබෙන්නේ, පවිත්‍රතාවෙන් යුතුව වෙනම ලබාගන්න පුළුවන් කැල්සයිට් නිධියක්. ඒ නිසා ස්වාභාවිකව අපට ලැබී තිබෙන සම්පතක් මේ විධියට නිකම්ම පිට රට යවනවාට වඩා, නිකම්ම භාවිත කරනවාට වඩා, අගය එකතු කරලා විශාල මුදලක් උපයා ගන්න පුළුවන් ක්‍රමවේද ඇති කිරීම සම්බන්ධයෙන් රජයක් හැටියට අපට විශාල යුතුකමක් තිබෙනවා. ඒක තමයි විය යුත්තේ. පරිසර අමාත්‍යතුමා දැනටමත් ඒ ආකාරයෙන් තීන්දු තීරණ ගෙන තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටට ගැළපෙන පරිදි, අපේ රටේ පරිසරයට ගැළපෙන පරිදි, පරිසරයත් ආරක්ෂා කර ගනිමින් මේ තීන්දු තීරණ ගත යුතුයි කියන එක පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්පත් වැඩිදියුණු කරන්න අපට තාක්ෂණය නැත්නම්, ඒවා දියුණු කරන්න විදේශ රටවල ආධාර උපකාර ගන්නකොට අපේ රටට වැඩි බලයක්

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

තබාගෙන තමයි අපි කටයුතු කළ යුත්තේ කියන කාරණයත් අවධාරණය කරමින්, මට මේ කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.12]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදයට එකතු වෙන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සම්ප්‍රදායෙන් බැහැර වීම සඳහා යම් සාධාරණ කාරණයක් කිව්වා. ඒකට කමක් නැහැ. අපි ඒක පිළිගන්නවා. නිල නොවන මුදල් රාජ්‍ය ඇමතිවරයා පමණයි මේ සභාවේ ඉන්නේ. මා හිතනවා, මුදල් අමාත්‍යාංශයේ අය වැය සකස් කරන්න එතුමාට දුන්නා නම් මීට වඩා හොඳට සකස් කරයි කියලා. මොකද, එතුමා රාජ්‍ය ඇමතිවරයකු හැටියටත්, තරුණයකු හැටියටත් විශාල වැඩ කොටසක් කරලා තිබෙනවාය කියලා අපි දන්නවා. අය වැය විවාදය තුළ පාරවල් ගැන තමයි වැඩිහරියක් කථා කළේ කියන එක අපි දැක්කා. නමුත් අපේ රාජ්‍ය ඇමතිතුමාට මේ වැඩ පිළිවෙළ සකස් කරන්න දුන්නා නම් මීට වඩා ශුභ සාධන වැඩ පිළිවෙළක් අපට දකින්න පුළුවන් වෙයි.

කෙසේ වෙතත් මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව තුළින් ඉදිරිපත් කර තිබෙන්නේ අපේ රටේ සම්පතක් ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා කියන්නේ ශ්‍රී ලංකාවට කියලා අපි දන්නවා. එහි වටිනාකම පිළිබඳව මහා විශාල ගැඹුරු අර්ථයක් තිබෙන බව අපි දන්නවා. භූ දේශපාලනික බලපෑම් එන්නේ, රට තුළ තිබෙන සම්පත්වල තිබෙන මහා විශාල වටිනාකම් පිළිබඳවයි කියන කාරණය අපි දකිනවා. තෙල් ප්‍රශ්නය ගත්තත්, ගෑස් ප්‍රශ්නය ගත්තත්, මේ සියලු දේවල් රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. රට වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් පරිසරය රකින්න පරිසර අමාත්‍යාංශයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසර අමාත්‍යාංශයේ තිබෙන නීති පද්ධතියෙන් රට රැකෙන්නේත් නැහැ; රටේ අනාගතය රැකෙන්නේත් නැහැයි කියන එකයි මට පෙනෙන්නේ. ඒ සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට පමණක් අපි චෝදනා කරන්නේ නැහැ. ඒ වැදගත් යයි කියන අමාත්‍යාංශය තුළින් ජනතාවගේ ඉදිරි පැවැත්ම වෙනුවෙන් මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙන ස්වභාව සෞන්දර්යයේ සම්පත් ටික රැක ගැනීම බරපතළ අර්බුදයක තිබෙනවා. ඒ නිසා තමයි අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමාත් කිව්වේ මේවා වටිනවා, මේවා සඳහා යම් වැඩ පිළිවෙළක් ඕනෑ, මේවා රටේ අනාගතයට ඉවහල් වෙනවාය කියලා. නමුත් අවුරුදු 70කට එහා ගිය ඉතිහාසය දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ රටේ පැවැත්ම වෙනුවෙන් මේවා ආරක්ෂා කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීමට කිසිම පුද්ගලයකුට හැකියාව ලැබී නැහැයි කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීති පද්ධතියේ තිබෙන දුර්වලකම තමයි ඒකට හේතුව විධියට මට පෙනෙන්නේ. නීති හදලා තිබෙන්නේ මේ රටේ දේශපාලනයේ පැවැත්ම සඳහාය කියන කාරණය කියන්න වෙනත් හේතු ඕනෑ නැහැ. අපේ සම්පත් රැක දිය යුතුයි කියන කාරණය දිගින් දිගටම යෝජනා කරනවා. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, මේ මොහොතේ රටේ තිබෙන සම්පත් කවුරුවත් එළියට දාලා පෙන්වන්න එපා. ඛනිජ ද්‍රව්‍ය විතරක් නොවෙයි, වෙනත් වටිනා කියන දේවල් වුණත් කවුරු හරි දකිනවා නම්, මම නම් කියන්නේ දැක්කේ නැහැ වාගේ ඉන්න කියලායි. කාලය වාගේම, සිටින team එක පිළිබඳවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා කොහේට අරගෙන යයිද, ඒවා කොහොම ගනීවිද, ඒවා ලංකාවට එයිද, ඒවා ඇමෙරිකාවට යයිද කියන ප්‍රශ්නය තිබෙනවා. මම නම් අපේ රටේ පුරවැසියන්ට කියන්නේ, මේ රටේ වටිනා කියන ඛනිජමය සම්පත් තිබෙන බව දැක්කා නම්, ඒවා දැක්කේ නැහැ වාගේ හිටියා නම් හොඳයි කියන එකයි. ඒක තමයි රටට කරන හොඳම ආයෝජනය. එහෙම නැත්නම් බඩු ටිකට වැඩේ දෙයි, හොයා ගන්න බැරි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෑ 12.00ට ගිවිසුම් අත්සන් කරලා මේ රටේ සම්පත් ටික දෙන යුගයක් මේක. ඒක නිසා තමයි මම මේ කතන්දරය කියන්නේ. ඒක මට දැනෙන දේ. මීට වඩා රකින්න කියලා කියන්න දෙයක් මට නැහැ. රට විනාශ වෙලා තිබෙන වේලාවක, රට නන්නත්තාර වෙලා තිබෙන වේලාවක, රටේ ජනතාව තුන්වේල කන්න නැතිව ඉල්ලන වේලාවක මන්ත්‍රීවරුන් මොනවාද මේ කියන්නේ? මන්ත්‍රීවරුන් මොකක්ද මේ වැඩ පිළිවෙළ තුළ දකින්නේ කියන කාරණය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ ජනතාව ඉල්ලන්නේ එක දෙයක්, රටේ පාලකයෝ කියන්නේ තව දෙයක්. රටේ පැවැත්ම පිළිබඳව අර්බුදයක් තිබෙන වෙලාවක, රටේ අභ්‍යන්තරයේ තිබෙන වටිනා කියන සම්පත් සුරක්ෂිත කොට ආරක්ෂා කරන්න තිබෙන එකම ක්‍රමවේදය හැටියට මම දකින්නේ ඒවා දැක්කා නොදැක්කා විධියට රටේ ජනතාව ඉන්න එකයි. සංවර්ධනය කරන්න කියලා ඒවා කණින්න පටන් අරගෙන ජාවාරම්කාරයන්ගේ සාක්කුවට දාලා රටේ අනාගතය විනාශ වෙන්න ඉඩ දෙන්න හොඳ නැහැ. පසු ගිය කාලයේ මේ සම්පත් සුරක්ෂිතව ආරක්ෂා කිරීම වෙනුවෙන් සකස් කළ සමහර වැඩ පිළිවෙළවල් තිබුණා, අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති චක්‍රලේඛ සියල්ල උල්ලංඝනය කරලා තමයි රටේ නීතියට එහා ගිය නීතියක් ක්‍රියාත්මක වුණේ. අපි මොන නීති පද්ධතියක් හැදුවත් ඒ නීති ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑන, ඊට එහා ගිය නීතියක් මේ රටේ අනුමත වෙලා තිබෙනවා. ඒක නිසා මේ තිබෙන සම්පත්වල වටිනාකම ආරක්ෂා කිරීමේ හොඳම ක්‍රමවේදය පිළිබඳව තමයි මම කලින් යෝජනා කළේ. විශේෂයෙන්ම පාරිසරික හානි දිගින් දිගටම සිදු වෙන්නේ, මේ වාගේ විශාල සම්පත් රටේ ප්‍රයෝජනයට ගැනීමේදී අප සතුව තිබෙන තාක්ෂණ දැනුම මදිකම නිසායි. අපි තවම භාවිත කරන්නේ පරණ තාක්ෂණ ක්‍රමවේද. ඒ සඳහා අපට ප්‍රාග්ධනය මදි වෙන්න පුළුවන්. නමුත් අලුත් තාක්ෂණ ක්‍රමවේදය තුළ ඒවා කණින්න, ඒවා රටේ පරිභෝජනයට අවශ්‍ය විධියට හදන්න අවශ්‍ය තාක්ෂණය ඉතාම වැදගත් කාරණයක්. ඒක නිසා තමයි පරිසර හානි වැඩි හරියක් සිදු වෙන්නේ; පරිසර හානි වැඩි හරියක් අපි දකින්නේ. මම හිතන්නේ නැහැ, ඒ සඳහා වූ ක්‍රමවේදයක් අමාත්‍යාංශය තුළ හදලා තිබෙනවා කියලා. අපි අරගෙන බලමු, කළු ගල් වළක් පිළිබඳව. කළු ගල් කඩන්නේ පරණ සාම්ප්‍රදායික ක්‍රමයට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට වඩා එහා ගිය තාක්ෂණයක් ලෝකයේ තිබෙනවා. ඒ තාක්ෂණය අපේ රටට තවම ඇවිල්ලා නැහැ. වෙඩි බෙහෙත් දාලා, ගල් බෝර දාලා ඒවා පුපුරණ කොට මහා දැවැන්ත පාරිසරික හානියක් සිදු වෙනවා. හැබැයි, අමාත්‍යාංශය විසින් ඒවාට අවධානය යොමු නොකොට, පිරිවැය අඩු වීම පිළිබඳව වැඩි අවධානයක් යොදවලා තිබෙන නිසා විශාල පරිසර හානියක් සිදු වෙනවා.

උඩ රට ප්‍රදේශවල විශාල කළු ගල් කඩන තැන් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා නිසා තමයි වර්ෂා කාලවලදී නාය යන්නේ. වර්ෂාව එන කොට භූගතව තිබෙන පස් තට්ටුවේ සෙලවීමත් එක්ක සිදු වෙන පාංශු ඛාදනය නිසා තමයි මහා දැවැන්ත පාරිසරික හානියක් සිදු වන්නේ. පරණ තාක්ෂණික ක්‍රමවලින් ඈත් වෙලා ලෝකයේ තිබෙන නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීලා, මේ පාරිසරික පද්ධතිය ආරක්ෂා කරන්න පුළුවන් ශක්තිමත් වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක විය යුතුයි කියන යෝජනාව අපේ පරිසර ඇමතිවරයාට ඉදිරිපත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය. ඔබතුමියට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸான்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද සභාව කල් තබන අවස්ථාවේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වැදගත්. මට පෙර කථා කළ අපේ ගරු චමින්ද විජේසිරි මැතිතුමා කිව්වා, මේ ආණ්ඩුව ඒ කැණීම් කරන්න ගියොත් දූෂණ වෙනවා, යම් යම් අකටයුතුකම් සිදු වෙනවා කියලා. නමුත් එතුමන්ලා අවුරුදු පහක් බලයේ හිටියා. ඒවා සංවර්ධනය කරලා, කර්මාන්තශාලා ඉදිකරලා, ඒවායෙන් ප්‍රයෝජනය ගන්න එතුමන්ලාට අවස්ථාව තිබුණේ නැද්ද?

දැන් අපට දොස් කියනවා. ඔබතුමන්ලාත් අවුරුදු 5ක් ආණ්ඩුවේ හිටියා. ඒ කාලයේ මේවාට විසඳුමක් දෙන්නේ නැතුව, දැන් අපේ ආණ්ඩුවට ඇඟිල්ල දික් කරනවා.

ඇත්තටම මමත්, හේෂා විතානගේ මන්ත්‍රීතුමාත් ජීවත් වන රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රදේශයේ පිහිටි කැල්සයිට් නිධිය අපේ රටට ආර්ථික නිධානයක්. මගේ ආසනයේ ගල්පාය, බඹරගල ප්‍රදේශයේත් කැල්සයිට් නිධි පිහිටා තිබෙනවා. ඒ වාගේම ඇඹිලිපිටිය ප්‍රදේශයේත් කැල්සයිට් නිධි යම් ප්‍රමාණයක් තිබෙනවා. කැල්සයිට්වලින් සියයට 2ක් පමණ භාවිත කරන්නේ කුකුළු කෑම නිෂ්පාදනය සඳහායි. ඒ වාගේම සිමෙන්ති, තීන්ත, පොටි හා ඖෂධ නිෂ්පාදන සඳහාත් කැල්සයිට් භාවිත කරනවා. කැල්සයිට් වැඩිපුරම කුකුළු කෑම නිෂ්පාදන සඳහා යොදා ගන්නේ බිත්තර කටුව ශක්තිමත් වෙන්නයි. ඒ වාගේම මෙය රූප ලාවණ්‍ය ද්‍රව්‍ය, ඇඳුම් කර්මාන්තය ආදී කර්මාන්ත ගණනාවක් සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍යයක්. කැල්සයිට් අවශ්‍ය තරමටත් වඩා අපේ රටේ භූගර්භයේ තිබෙන බවත්, එසේ තිබියදීත් ඉන් නිසි ප්‍රයෝජන නොගෙන කැල්සයිට් ආනයනය සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 3,000කට වඩා අධික මුදලක් පිට රටවලට වැය කරන බවත් පරිසර අමාත්‍යාංශය පවසනවා. මේවා නිෂ්පාදනය කරන්න අපේ රටේ එම නිධි තිබෙන ප්‍රදේශවල සුදුසු කර්මාන්තශාලා නැහැ. ඒ නිසා ඒ සඳහා වෙනත් ප්‍රදේශවලට යන්න වෙලා තිබෙනවා. එමඟින් නිෂ්පාදන වියදම වැඩි වෙනවා. එම නිසා කැල්සයිට් තිබෙන ප්‍රදේශවලම කර්මාන්තශාලා ඉදි කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ, තාක්ෂණයෙන් ඉහළ කර්මාන්තශාලාවක් ඉදි කරන්න කියලාත් මා ඉල්ලීමක් කරනවා. එහෙම වුණොත් වැඩි නිෂ්පාදනයක් කරන්න අපට හැකියාව ලැබෙනවා. ඒ වාගේම රැකියා උත්පාදනය කර ගන්නත් පුළුවන්කම ලැබෙනවා. මේ ප්‍රදේශයේ තරුණ තරුණියන් රැකියා නොමැතිව සිටිනවා, ඒ අයගේ රැකියා ප්‍රශ්නයටත් මේ තුළින් විසඳුමක් දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ මැතිතුමා බලංගොඩ කැල්සයිට් නිධිය සම්බන්ධව ගරු සභාවට ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට කාලය ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා පුදුම කාරණය මේකයි. හේෂා විතානගේ මන්ත්‍රීතුමා රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මීට පෙරත් අවුරුදු පහක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කරපු අපේ ආදරණීය නායකයෙක්. ඒ වාගේම සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයෙක්. ඒ වාගේම එතුමා දන්නවා, පසුගිය අවුරුදු පහ තුළ රත්නපුර දිස්ත්‍රික්කයේ වැලි, ගල්, පස් යනාදියේ ඒකාධිකාරය තිබුණේ කා ළඟද කියලා. ඒ නිසා එතුමන්ලාගේ පසුගිය රජය පවතිද්දී පරිසර අමාත්‍යාංශයත් සමඟ, ඒ වාගේම එතුමන්ලාගේ නායකතුමන්ලාත් සමඟ සැලසුම් කරන්න තිබුණු දේවල් තමයි මේවා. අඩු තරමේ හේෂා විතානගේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඒ අවුරුදු පහේ කාල සීමාව තුළ මේ වෙනුවෙන් යෝජනාවක්වත් ඉදිරිපත් වුණේ නැහැ.

අද පවුල් දෙතුන් දහසක් කැල්සයිට් කර්මාන්තය තුළින් යම් මුදලක් උපයනවා වුණත්, ඒ නිධියේ ප්‍රයෝජනය අපි නිසි ලෙස අරගෙන නැහැ. නමුත්, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඇතුළත් නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණ ඇතුව, නිෂ්පාදන ආර්ථිකයකට, නිෂ්පාදන ක්‍රියාවලියකට අපේ රට පෙළගස්වන, අපේ රට හැඩ ගස්වන අය වැයක් මෙවර ඉදිරිපත් කර තිබෙනවා. අපේ රටේ ඛනිජ ද්‍රව්‍ය වාගේම, ඛනිජ නිධි සියල්ලේම අගය එකතු කරමින් නිෂ්පාදන කර්මාන්ත සකස් කිරීම සඳහා මේ වන විට අපි අවශ්‍ය පෙළ ගැස්ම සකස් කරමින් ඉන්න බව මා විශ්වාස කරනවා.

ඔබතුමා නොදන්නවා වුණාට, මේ වනකොට පේරාදෙණිය විශ්වවිද්‍යාලයත්, පරිසර අමාත්‍යාංශයත්, GSMB Technical Services (Pvt.) Limited ආයතනයත් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරලා, රජය සමඟ හවුල් ව්‍යාපාරයක් විධියට රත්නපුර දිස්ත්‍රික්කයේ පඤ්ඤම්තැන්න කියන අක්කර අටක ඉඩම පවරාගෙන, ඒ ඉඩමේ කර්මාන්තශාලාවක් අරඹන්න කටයුතු කර තිබෙනවා. අද තමයි ඒ ඉඩම නිදහස් කරලා පවරා දීමේ ලිපිය ප්‍රාදේශීය ලේකම්වරයාට ලබා දෙන්නේ. ඔබතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන මොහොත වෙද්දී කැල්සයිට් නිධියෙන් උපයා ගත යුතු ධනය උපයා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය ඒ වගකීම ඉටු

[ගරු සම්පත් අතුකෝරල මහතා]

කරමින් තිබෙනවා. අපි විදේශ රටවලින් කැල්සියම් කාබනේට් ආනයනය කරනවා. ඛනිජ ද්‍රව්‍යයක් විධියට අපි අපේ කැල්සයිට් ටික පිට රට යවලා, ඉතාම සුළු ප්‍රමාණයක් මේ රටේ කර්මාන්තවලට පාවිච්චි කරලා, කැල්සියම් කාබනේට් ආනයනය කරනවා. ඒ නිසා අපේ ජනතාවට වැඩි මුදලක් ගෙවා කැල්සියම් කාබනේට් මිලදී ගැනීමට සිදුවනවා. දැනට කැල්සයිට් කිලෝ එකකට ලැබෙන්නේ රුපියල් තුනයි ශත පනහක මුදලක්. හැබැයි, මේ කර්මාන්තශාලාව ආරම්භ කළාට පසු කිලෝවකට රුපියල් හයයි ශත පනහක් ගෙවන්න බලාපොරොත්තු වෙනවා. විශාල ප්‍රමාණයේ කැල්සයිට් ගල් පැටෙව්වාට පසු ඉතිරි වන කුඩා ප්‍රමාණයේ කැබලි විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ කුඩා ප්‍රමාණයේ කැබලි නිසා ඒ ප්‍රදේශයට බරපතළ පාරිසරික හානියක් වෙනවා. මේ කර්මාන්තශාලාව ආරම්භ කළාට පසු කුඩා ප්‍රමාණයේ කැබලි කිලෝවකටත් රුපියල් තුනයි ශත හැත්තෑපහක් ගෙවන්න මේ කර්මාන්තශාලාව එකඟ වෙලා තිබෙනවා. එය ඒකාබද්ධ ව්‍යාපෘතියක්. ඒ කර්මාන්තශාලාව ආරම්භ කරලා, විශාල පිරිසකට රැකියා සපයන්න වාගේම, අපේ රටින් විදේශවලට ඇදී යන විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගන්න අද පරිසර අමාත්‍යාංශය සැලසුම් සකස් කරලා, ඒ ඉඩම පැවරීමේ කටයුත්තත් හමාර කර තිබෙනවා.

අපි ඇත්තටම දුක් වෙන්න ඕනෑ, රත්නපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට ඔබතුමා ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ මේ දේවල් නොකිරීම පිළිබඳව. ඔබතුමන්ලාගේ පක්ෂයටම මේ ලෙඩේ තිබෙනවා. ඔබතුමන්ලාට ආණ්ඩු බලය තියෙද්දි පෑදුණේ නැති මොළය පෑදෙනවා, විපක්ෂයේ ඉන්නකොට. ඒ වාගේම ආණ්ඩු බලය තිබෙන කාලයේ මතක් වුණේ නැති දේවල් සියල්ලම ඔබතුමන්ලාට මතක් වෙනවා, විපක්ෂයේ ඉන්නකොට. ඔබතුමන්ලාගේ නායකයාගේ ඉඳලා ඔබතුමන්ලාගේ පක්ෂයේ සියලුදෙනාට අඩු වැඩි වශයෙන් මේ ප්‍රශ්නය තිබෙනවා. නමුත්, ඒ කාලයේ පෑදුණේ නැති මොළය දැන් හෝ පෑදීම ගැන අපි සතුටු වෙනවා. හැබැයි, රජය -ආණ්ඩුව- විධියට අපි අපේ කටයුතු ආරම්භ කරලායි තිබෙන්නේ.

අපේ ප්‍රතිපත්තිය තුළ අපි කවදාවත් මේ රටේ ඛනිජ සම්පත් විනාශ කරන්නේ නැහැ. "සෞභාග්‍යයේ දැක්ම" අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ, පරිසරය ආරක්ෂා කරගෙන, ඛනිජ නිධි ඇතුළු අපේ රටේ සම්පත් ආරක්ෂා කරගෙන, අපේ රටේ නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කිරීමයි. ඒ නිසා අපේ රජය අපේ රටේ ජනතාවට අලුත් ආරම්භයක් දීලා තිබෙනවා. ඒ තමයි, වෙළෙඳ පොළ ආර්ථිකයෙන් මිදී නිෂ්පාදන ආර්ථිකයට යමු කියන එක. භාණ්ඩ ආනයනය කිරීම නිසා අපේ රටේ මුදල් විදේශවලට ගලා යෑම වළක්වා, ඒ මුදල් ප්‍රමාණය ඉතිරි කරන්න පසුගිය වසරක කාලය තුළ අපි ලොකු මහන්සියක් ගත්තා. ආහාර ද්‍රව්‍ය වාගේම ආනයනය නොකළ යුතු විවිධ භාණ්ඩ ආනයනය අපි තහනම් කළා. ඒ වාගේම අපේ ඛනිජ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් අපි සූදානම් කරමින් පවතිනවා. කාලාන්තරයක් තිස්සේ සියලු දෙයට බණිමින්, සියලු දෙයට දොස් පවරමින්, අඳෝනා නඟමින් ඉන්නවාට වඩා අපේ කාලය තුළ ඒ සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම තමයි අපේ යුතුකම සහ වගකීම විය යුත්තේ. ඒ නිසා අපේ රජයේ සියලුදෙනා එකතු වෙලා මහන්සි ගන්නේ රට නැවත වතාවක් නිෂ්පාදන ක්‍රියාවලියකට ගෙන යන්නයි. 1970-77 කාලයේදී අපේ රටේ නිෂ්පාදනය කළ රෙදි පිළි, වානේ ආම්පන්න, රේඩියෝ ඇතුළු බොහෝ දේවල්වලට ලෝකයේ විවිධ රටවලින් ඉල්ලුමක් තිබුණා. හැබැයි, ඔබතුමන්ලාගේ නායකවරු විවෘත ආර්ථිකය හඳුන්වා දීලා නිෂ්පාදන ආර්ථිකය විනාශ කළා විතරක් නොවෙයි, අපේ රටේ තිබුණු කන්තලේ වාගේ සීනි කර්මාන්තශාලා පවා වසා දැම්මා.

තුල්හිරිය, පූගොඩ පෙහෙකම්වල් වහලා දැම්මා. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා ගෙනා විවෘත ආර්ථිකය අපේ රටේ නිෂ්පාදනය ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම විනාශ කළා. රට සම්පූර්ණයෙන්ම විවෘත ආර්ථිකය වැළඳගෙන අපේ නිෂ්පාදන ක්‍රියාවලිය විනාශ කරලා දැම්මා.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, මේ යෝජනාව සාධනීය යෝජනාවක්. හැබැයි, ඔබතුමා යෝජනාව ගෙනෙද්දි අපි ඒ කටයුත්ත ආරම්භ කරලා ඒ වෙනුවෙන් ගමනක් ගිහිල්ලා ඉවරයි. ඒ කර්මාන්තශාලාව අරඹන්න ඉඩම පැවරීමේ කටයුත්ත කල් ගියා. නමුත්, ඉඩම පැවරීමේ කටයුත්ත නිමා කරලා අද වන විට ප්‍රාදේශීය ලේකම්ට පැවරීමේ ලිපිය ලැබිලා ඉවරයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, අපි සූදානම්, අපේ රජය සූදානම්, අපේ ජනාධිපතිතුමා සූදානම්, රට පරිවර්තන යුගයකට ගෙනයන්න.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 21වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 16වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2021 ஒக்ரோபர் 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 16, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 16th November, 2021, pursuant to the Resolution of Parliament of 21st October, 2021.*

**286 වන කාණ්ඩය - 4 වන කලාපය** | **2021 නොවැම්බර් 16වන අඟහරුවාදා**
**தொகுதி 286 - இல. 4** | **2021 நவம்பர் 16, செவ்வாய்க்கிழமை**
**Volume 286 - No. 4** | **Tuesday, 16th November, 2021**


# පාර්ලිමේන්තු විවාද

**(හැන්සාඩ්)**

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**2021 නොවැම්බර් 16වන අඟහරුවාදා**
**2021 நவம்பர் 16, செவ்வாய்க்கிழமை**
**Tuesday, 16th November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
රාජ්‍ය බැංකු සේවකයන්ගේ 2021-2023ට අදාළ වැටුප් වැඩිවීම

**වෙළෙඳ අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ල සඳහා කුලිය සහ සංග්‍රහ වියදම්:**
වෙළෙඳ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ආනන්ද අලුත්ගමගේ සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු රෝහණ බණ්ඩාර මහතා ] - පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 - [තුන්වැනි වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
සංචාරක ආකර්ෂණ ස්ථාන වැඩිදියුණු කිරීම


# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
அரச வங்கி ஊழியர்களின் 2021 - 2023க்கான சம்பள அதிகரிப்பு

**வர்த்தக அமைச்சுக் கட்டிடத்துக்கான வாடகை மற்றும் விருந்துபசாரச் செலவு:**
வர்த்தக அமைச்சரினது கூற்று

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
ஆனந்த அலுத்கமகே அபிவிருத்தி, சமூக சேவைகள், அறக்கட்டளை மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு ரோஹண பண்டார] - முதன்முறை மதிப்பிடப்பட்டது.

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட மூன்றாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
சுற்றுலாக் கவர்ச்சிமிகு இடங்களின் மேம்பாடு


# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Salary Increment of State Bank Employees for 2021-2023

RENT FOR BUILDING HOUSING MINISTRY OF TRADE AND ENTERTAINMENT EXPENSES:
Statement by Minister of Trade

PRIVATE MEMBERS' BILLS:
Ananda Aluthgamage Development, Social Services and Charity Foundation (Incorporation) - [The Hon Rohana Bandara] - Read the First time

APPROPRIATION BILL, 2022 - [Third Allotted Day]:
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
Upgrading Tourist Attractions

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021 නොවැම්බර් 16වන අඟහරුවාදා***
*2021 நவம்பர் 16, செவ்வாய்க்கிழமை*
*Tuesday, 16th November, 2021*

---

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
ගරු කථානායකතුමනි, 2019 වර්ෂය සඳහා අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)
ගරු කථානායකතුමනි, සියඹලාගස්කොටුව, නෙත්තිපොලගෙදර යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. සුබසිංහ අමරකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
ගරු කථානායකතුමනි, නැබඩ, වරකාගොඩ, පහළ කරන්නාගොඩ, අංක 96/03/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. නිශාන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පිළිමතලාව, ඉළුක්වත්ත, අංක 24/ඩී දරන ස්ථානයේ පදිංචි ඒ.එෆ්. නිහාරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වැඋඩ, පල්ලේගම, වෙලේගෙදර යන ලිපිනයේ පදිංචි එස්.එම්. ශ්‍යාමලී කුමාරි සන්දිලිගම මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, රන්සැගොඩ, මීපාවිට, බෙන්ටිස් හේන යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.පී. ලසන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -274/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -646/2020- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -802/2020- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය යතුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1017/2020- (2), ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1403/2021- (1), ගරු සමන්ප්‍රිය හේරත් මහතා - *[සභා ගර්භය යතුළ නැත.]*

දෙවන වටය.

## කොච්චිපොතාන වැව දක්වා වූ පෝෂක ඇළ මාර්ගය: විස්තර

## கொச்சிபொதான வாவிக்கான நீரேந்துக் கால்வாய்: விபரம்

FEEDER CANAL TO KOCHCHIPATHANA TANK: DETAILS

646/2020

**2. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කොච්චිපොතාන වැවට ජලය ගෙන යෑම සඳහා දෙමටවැව සිට පෝෂක ඇළ මාර්ගයක් ඉදිකර ඇති බවත්;

(ii) මේ හේතුවෙන් එම ඇළ මාර්ගය දෙපස පිහිටා ඇති නිවාස සඳහා ප්‍රවේශ වීමට හරස් මාර්ග ඉදිකිරීමට සිදු වී ඇති බවත්;

(iii) එම ඇළ මාර්ගයේ ජලය ගලා නොබසින අතර එහි ඉදි කිරීම් කටයුතු තවදුරටත් සිදු කළ යුතු බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ඇළ මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේද;

(iv) එසේ නම්, මෙම ඇළ මාර්ගය ඔස්සේ මේ වන විට මුදා හරිනු ලබන ජල ධාරිතාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொச்சிபொதான வாவிக்கு நீரைக் கொண்டு செல்வதற்கு தெமட்ட வாவியில் இருந்து நீரேந்துக் கால்வாயொன்று நிர்மாணிக்கப் பட்டுள்ளதென்பதையும்;

(ii) இதன் காரணமாக மேற்படி கால்வாயின் இருமருங்கிலும் அமைந்துள்ள வீடுகளுக்குப் பிரவேசிப்பதற்காக கால்வாய்க்கு குறுக்காலான பாதைகளை நிர்மாணிக்கவேண்டி ஏற்பட்டுள்ள தென்பதையும்;

(iii) மேற்படி கால்வாயில் நீர் வழிந்து செல்வதில்லை என்பதுடன், இதன் நிர்மாணப் பணிகளைத் தொடர்ந்தும் முன்னெடுக்க வேண்டியுள்ள தென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கால்வாய்க்கான நிர்மாணக் கருத் திட்டத்தின் மதிப்பீடு செய்யப்பட்ட செலவினம் யாது;

(ii) மேற்படி கருத்திட்டத்தை நிறைவு செய்வதற்காக மேற்கொள்ளப்பட்டுள்ள மொத்தச் செலவினம் யாது;

(iii) மேற்படி கருத்திட்டத்தின் உத்தேச நோக்கங்கள் நிறைவேறியுள்ளனவா;

(iv) ஆமெனில், இன்றளவில் மேற்படி கால்வாயினூடாக விடுவிக்கப்படும் நீரின் கொள்ளளவு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Is he aware that -

(i) a feeder canal has been made to take water to the Kochchipathana Tank from the Demata Wewa;

(ii) cross roads have to be made to access the houses situated on either side of that canal owing to this; and

(iii) water does not flow along this canal and the construction of it is yet to be completed?

(b) Will he inform this House -

(i) the estimated cost of the project of constructing the above canal;

(ii) the total cost incurred to complete that project;

(iii) whether the expected objectives of that project have been achieved; and

(iv) if so, the volume of water that is released along this canal at present?

(c) If not, why?

**ගරු අනුරාධ ජයරත්න මහතා (ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - கிராமிய வயல் நிலங்கள் மற்றும் அண்டியுள்ள குளங்கள், நீர்த்தேக்கங்கள் மற்றும் நீர்ப்பாசன அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Tanks, Reservoirs and Irrigation Development Related to Rural Paddy Fields)

ගරු කථානායකතුමනි, දෙවන වටය නිසා උත්තරය සභාගත කරන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාගත කරන්න, දෙවන වටයනේ.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அனுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) මෙම ඇළ මාර්ගයේ ජලය ගලා බසින අතර, එම ඇළ මාර්ගය මඟින් ජලය ලබා දෙන්නේ කොච්චිපොතාන වැවට ජලය අවශ්‍ය වූ විට හා දෙටගමුව වැවේ වැඩි ජල ප්‍රමාණයක් තිබෙන අවස්ථාවේ පමණි. ඇළේ ඉදි කිරීම් කටයුතු බොහෝ දුරට අවසන් කර ඇති අතර, නිර්මිත කිහිපයක් පමණක් ඉදි කිරීමට ඉතිරිව ඇත. එම කටයුතුද මේ වන විට සිදුවෙමින් පවතී.

(ආ) (i) සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 274.5ක්. වේ.

(ii) මෙම ව්‍යාපෘතියේ වැඩ කොටස් රාශියක් මේ වන විට නිම වෙමින් පවතින අතර, මේ දක්වා දරා ඇති වියදම රුපියල් මිලියන 251කි.

(iii) ව්‍යාපෘති වැඩ අවසන් වූ පසු අපේක්ෂිත අරමුණු ඉටු වනු ඇත.

(iv) ඉහත (අ) (iii) සඳහන් පරිදි ජලය අවශය වූ විට පමණක් මුදා හරින අතර, එම ප්‍රමාණය තත්පරයට ඝන මීටර් .5ක් පමණ වනු ඇත.

(ඇ) ඉහත පිළිතුරට අනුව අදාළ නොවේ.

## කිළි/ඉරාමනාදපුරම් මහා විද්‍යාලය සඳහා ශ්‍රවණාගාරයක් ඉදිකිරීම: අරමුදල් මුදා නොහැරීම
## கிளி/ இராமநாதபுரம் மகா வித்தியாலயத்துக்கான கேட்போர்கூட நிர்மாணம்: நிதி விடுவிக்கப்படாமை
## CONSTRUCTION OF AUDITORIUM FOR KILI/ IRAMANADAPURAM MAHA VIDYALAYA: NON-RELEASE OF FUNDS

802/2020

**3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Sivagnanam Shritharan)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කිළි/ඉරාමනාදපුරම් මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදි කිරීමට 2018 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදි කිරීම මේ වන විට නවතා ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ශ්‍රවණාගාරය ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදි කර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදි කිරීම් සම්පූර්ණ කර එය සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தில் கரச்சி பிரதேச செயலாளர் பிரிவின் கிளி/ இராமநாதபுரம் மகா வித்தியாலயம் எனும் பெயரில் பாடசாலை யொன்று அமைந்துள்ளதென்பதையும்;

(ii) அப்பாடசாலைக்கு புதியதொரு கேட்போர் கூடத்தை அமைப்பதற்கு 2018ஆம் ஆண்டில் அடிக்கல் நாட்டப்பட்டதென்பதையும்;

(iii) ஒதுக்கப்பட்ட நிதி ஒதுக்கீடு விடுவிக்கப்படாத காரணத்தால் கேட்போர்கூடத்தின் நிர்மாணப் பணிகள் தற்போது நிறுத்தப்பட்டுள்ள தென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கேட்போர்கூடத்தை நிர்மாணிப்பதற்கு ஒதுக்கீட்டினை மேற்கொண்ட அமைச்சு யாதென்பதையும்;

(ii) மேற்படி ஒதுக்கீடு விடுவிக்கப்படாமைக்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி கேட்போர்கூடத்தின் நிர்மாணப் பணியை முழுமையாக நிறைவுசெய்வதற்குத் தேவையான பணத்தொகை எவ்வளவென் பதையும்,

(ii) இவ்விடயத்திற்கு நிதி ஒதுக்கீட்டினை மேற்கொள்ளும் திகதி யாதென்பதையும்;

(iii) அதன் நிர்மாணப் பணியைப் பூர்த்திசெய்து அதனை மாணவர்களின் பாவனைக்கு வழங்குவதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Education:

(a) Is he aware that -

(i) there is a school by the name of Kili/ Iramanadapuram Maha Vidyalaya in the Karachchci Divisional Secretary's Division of the District of Kilinochchi;

(ii) the foundation stone to construct an auditorium for the above school has been laid in 2018; and

(iii) the construction activities of the auditorium have been stopped due to not releasing the funds allocated for this purpose?

(b) Will he inform this House -

(i) the Ministry which has allocated funds for the construction of this auditorium;

(ii) the reasons for not releasing the funds allocated for the same?

(c) Will he also inform this House -

(i) the amount of money needed to complete the construction of the above-mentioned auditorium;

(ii) the date on which allocations will be made for this purpose; and

(iii) the time needed to complete the construction of the said auditorium and to provide it for the use of the students?

(d) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

පළාත් බලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තා අනුව කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි/ ඉරමනාදපුරම් මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇත.

(ii) ඉදිරිපත් කර ඇති වාර්තාවලට අනුව, 2018.07.30 දින එවකට ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නව ශ්‍රවණාගාරය ඉදි කිරීම සඳහා මුල්ගල තබා ඇත.

(iii) මෙම කාර්යය කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරයා හරහා සිදු වී ඇති බවත්, ශ්‍රවණාගාරයේ ඉදි කිරීමේ වැඩ නැවතීම සම්බන්ධයෙන් ඔවුන් විසින් අදාළ පාර්ශ්ව වෙත දැනුම් දෙන්නට ඇති බවත් උතුරු පළාත් අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් වාර්තා කර ඇත.

(ආ) (i) මෙම ශ්‍රවණාගාරය ඉදි කිරීම සඳහා ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් 2018 වසරේදී ප්‍රතිපාදන වෙන් කරන ලදී.

(ii) අය වැයෙන් ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙනි.

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම්ගේ 2018.07.19 දිනැති අංක KN/DPS/D3/Edu/141 ලිපියට අනුව (ඇමුණුම**) මූලික අය වැය ඇස්තමේන්තුව මිලියන 35ක් වන අතර, I අදියර සඳහා මිලියන 7ක් නිකුත් කර ඇත.

එබැවින් ශ්‍රවණාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යවල මිල ඉහළ යාම හේතුවෙන් මෙම කාර්යය නිම කිරීමට මිලියන 30කට වඩා අවශ්‍ය වේ.

(ii) මහා භාණ්ඩාගාරයේ අය වැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 05/2020 අනුව වසර දෙකක් යන තෙක් නව ඉදි කිරීම් නොකරන ලෙස දන්වා ඇති අතර, නව ඉදි කිරීම් සඳහා ප්‍රතිපාදන ද වෙන් නොවන බැවින්, 2023 අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කළ පසු ශ්‍රවණාගාරයේ ඉදි කිරීම් සම්පූර්ණ කළ හැක.

(iii) ප්‍රතිපාදන වෙන් වූ පසු එහි ඉදි කිරීම් සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළ හැක.

(ඈ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1403/2021- (2), ගරු සමන්ප්‍රිය හේරත් මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න පිළිබඳව ගත්ත පක්ෂ නායක තීන්දුව ගැන නොවෙයි මම කථා කරන්න යන්නේ. මේ ප්‍රශ්න 15 ගන්න විධිය අපට තේරෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්න 1 සිට 15 දක්වා ගන්නකොට, 1,2,3 හෝ 4 ප්‍රශ්න

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

අතරේ මගේ ප්‍රශ්නයත් තිබෙනවා. දැන් දින තුනක සිට මගේ ප්‍රශ්න නැහැ. අපි සාම්ප්‍රදායිකව පාර්ලිමේන්තුවේ Table Office එකට ප්‍රශ්න භාරදෙන පිළිවෙළට තමයි, යම් ක්‍රමවේදයකට ඒ ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ. ඇතුළත් කළ ක්‍රමය ගැන අපට ප්‍රශ්නයක් නැහැ. මොකද, අපි දන්නවා, පක්ෂ නායක රැස්වීමේදී ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ කරාතේ පන්තිය නේ තියෙන්නේ. එතුමා කියන විධියට කරන්න වෙනවා. ඒකට කමක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න 15 තුළ 1, 2, 3, 4, 5 ප්‍රශ්න අතර මගේ ප්‍රශ්නය තියෙනවා. දැන් දවස් තුනක් තිස්සේ මගේ ප්‍රශ්නයක් ඇතුළත් කරලා නැහැ. එහෙම වෙන්න බැහැ, ගරු කථානායකතුමනි. එහෙම වුණොත්, Table Office එක කටයුතු කරන්නේත් ආණ්ඩුවේ කැමැත්ත පරිදිද කියන කාරණය මට අහන්න වෙනවා. මොකද, ගරු කථානායකතුමනි, අනිවාර්යයෙන් දවසක් හැර හෝ දවසක් මගේ ප්‍රශ්නයක් තියෙන්න ඕනෑ. මම ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවෙන් ප්‍රශ්න ඉදිරිපත් කරන්න කියලා තිබෙන නීත්‍යානුකූල ක්‍රමවේදයට අනුව මම ප්‍රශ්න ඉදිරිපත් කරපු නිසායි මේ ප්‍රශ්නය මම අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එදා තීරණය කළේ හැම මන්ත්‍රීවරයෙකුටම අවස්ථාවක් දෙන්න ඕනෑ නිසා හැම සතියේම එතුමන්ලාගේ පළමුවැනි ප්‍රශ්නය ඇතුළත් කරන්න කියලායි. ඒ අනුව තමයි මේ ප්‍රශ්න තෝරලා තියෙන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නයක් තියෙනවා නම්, ලේකම්තුමාට, පක්ෂනායකතුමාට දන්වන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, සාම්ප්‍රදායිකව දීර්ඝ කාලයක් තිස්සේ පාර්ලිමේන්තුවේ පැවතුම අනුව Table Office එකට ප්‍රශ්න දෙන පිළිවෙළට ඒ අයගේ රාජකාරිය හරි ක්‍රමවේදයකට කරගෙන ආවා. අපි ඒ විධියට ප්‍රශ්න භාර දුන්නත්, අපට අසාධාරණයක් වෙන බව මෙතැනින් පැහැදිලිවම ඔබතුමාට තේරෙන්නේ නැද්ද? මෙතැන විශාල අසාධාරණයක් තිබෙනවා. ඒ අසාධාරණය වෙනුවෙන් පෙනී සිටින්න කවුද ඉන්නේ පාර්ලිමේන්තුවේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මේකයි වුණේ. මේ කාල සීමාව තුළ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ ප්‍රශ්න 5යි. ඒ ප්‍රශ්න 5 කාටත් සාධාරණව බෙදිලා යන විධියට තමයි Table Office එකෙන් ප්‍රශ්න ගොනු කරලා තිබෙන්නේ. එක මන්ත්‍රීවරයෙකුට එක සතියකට එක ප්‍රශ්නයක් යොමු කරන්න පුළුවන්. මොකද, ඒ තරම් ප්‍රශ්න ගොඩක් මන්ත්‍රීවරු එවලා තියෙනවා. සමහර මන්ත්‍රීවරු ප්‍රශ්න දෙසිය ගණන්, තුන්සිය ගණන් එවලා තිබෙනවා. ඒ විධියට ගියොත්, ඒ මන්ත්‍රීතුමා විතරයි හැම දාම ප්‍රශ්න අහන්නේ. ඒකයි තත්ත්වය.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, නීත්‍යානුකූලව, ඉදිරිපත් කරන ක්‍රමවේදයට අනුව ප්‍රශ්න ඉදිරිපත් කළ නිසා තමයි මට මේ පිළිබඳව හිමිකමක් ලැබෙන්නේ. ඒක අපේ අයිතිවාසිකමක්. ඒ ප්‍රශ්න අපි හරියට ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, ඒක බැහැර කළා. මේක ලොකු අසාධාරණයක්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම කියන්න එපා, ගරු මන්ත්‍රීතුමා. මන්ත්‍රීවරු සියලුදෙනාටම එක හා සමාන අයිතියක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මේ විධියට ප්‍රශ්න තේරුවොත්, ආණ්ඩුවට අවශ්‍ය ප්‍රශ්න ටික විතරක් න්‍යාය පත්‍රයට ඇතුළත් කරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මන්ත්‍රීවරු සියලුදෙනාටම එක හා සමාන අයිතියක් තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අයිතීන් වෙනුවෙන් ඔබතුමා පෙනී සිටිනවා. අද මම මේ ප්‍රශ්නය වෙනුවෙන් බිංගිරියේ ඉඳලා උදේ 6ට ආවේ. මම එනකොට මඟදී checkpoints 21ක් හම්බ වුණා. ඒවායින් 10ක මාව නැවැත්තුවා. මෙතැනදී මගේ ප්‍රශ්නය අහන්න එන්න විනාඩියයි පරක්කු වුණේ. අද ප්‍රශ්නවලට උත්තර දෙන්න වෙන කවුරුත් සිටියේත් නැහැ. ගරු කථානායකතුමනි, මම එන්න ප්‍රමාද වුණේ මගේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. ගරු සරත් වීරසේකර ඇමතිතුමා බිංගිරියේ ඉඳලා පාර්ලිමේන්තුව දක්වා checkpoints 21ක් දාලා. ඒවායින් 10කදී මාව නැවැත්තුවා. මට ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුවට බෝම්බ ගහනවාද, එහෙම නැත්නම් ප්‍රභාකරන් නැවතත් නැඟිටලා බෝම්බ ගහන්න එනවා කියලා මොකක් හරි ප්‍රශ්නයක් නිසාද මේ විධියට checkpoints දාලා තිබෙන්නේ? හැම තැනකදීම නවත්වලා ප්‍රශ්න කරනවා. ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට අවස්ථාව දෙන්න. මේක හරිම අසාධාරණයි. මම උදේ 6ටයි ගෙදරින් ආවේ. උදේ 6 ඉඳලා මම එනවා. මම දන්නේ නැහැ, මේ විධියට checkpoints දාලා තිබෙන්නේ මොකද කියලා. අද රටේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවාද? ගරු කථානායකතුමනි, එම නිසා කරුණාකර මගේ මේ ප්‍රශ්නය වෙනුවෙන් සාධාරණ අවස්ථාවක් දෙන්න. මට විනාඩියයි පරක්කු වුණේ. වෙන කවුරුවත් ප්‍රශ්න අහලාත් නැහැ. ඔබතුමා මගේ ප්‍රශ්නය පිළිබඳව සානුකම්පිතව හිතන්න. මොකද, මේ ප්‍රශ්නය අහන්න තිබෙන නිසා මම අද checkpoints 21ක් පහුකරගෙනයි ආවේ. මේක හරිම අසාධාරණයක්, ගරු කථානායකතුමනි. ඔබතුමා අපේ වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ checkpoints දාලා තිබෙන්නේ ඔබතුමන්ලාගේම ආරක්ෂාවට. *[බාධා කිරීම්]* ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු කථානායකතුමනි, ඇත්තටම අපි වාගේ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා. සමහර වෙලාවට මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න 500ක් විතර එකවර භාරදෙනවා. ගරු කථානායකතුමනි, අපි මෙතැනදී වැදගත්ම ප්‍රශ්නයක් තමයි අහන්නේ. මොකද,

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යෑමේදී කාලය ඉතාම වැදගත්. ඒ නිසා අපි ප්‍රශ්න කිහිපයයි ඉදිරිපත් කරන්නේ. ඒ නිසා අපි වාගේ මන්ත්‍රීවරුන් පිළිබඳවත් සැලකිල්ලක් දක්වන්න. ප්‍රශ්න 500 දෙන එක්කෙනාට, ඒ ප්‍රශ්න 500ම ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නොත්, මුළු කාලයම දෙන්න වෙන්නේ එක මන්ත්‍රීවරයෙකුට විතරයි. එතකොට එක ප්‍රදේශයක ප්‍රශ්න විතරයි නියෝජනය වෙන්නේ. ඒ නිසා අපි පිළිබඳවත් සලකා බලන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හරි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආණ්ඩු පක්ෂ රැස්වීමක් තිබෙනවා. එතකොට අදාළ ඇමතිවරුන්ගෙන් අහලා ඒ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒ වරප්‍රසාදය නැහැ. ඒ නිසා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න යොමු කරන්නේ. අපිට කියා නැහැ, එක ප්‍රශ්නයක් දෙන්නද, ප්‍රශ්න 500ක් දෙන්න ද කියලා. අපිට කියා තිබෙන්නේ Table Office එකට ප්‍රශ්න ටික ලබා දෙන්න කියලායි. එම ක්‍රමවේදයට අනුවයි අපි අටවැනි පාර්ලිමේන්තුවේදීත් ප්‍රශ්න ඉදිරිපත් කළේ. අපි නවවැනි පාර්ලිමේන්තුවේදීත් ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ ඒ විධියටයි. හැබැයි, දැන් එම ක්‍රමවේදයෙන් බැහැර වෙලා තිබෙනවා. එසේ බැහැර වීම නිසා අපි අහන ප්‍රශ්න කල් දැමීමක් වෙනවා කියන කාරණය තමයි පෙනෙන්න තිබෙන්නේ. මේ දින තුන තුළදී න්‍යාය පත්‍රයට ඇතුළත් කළ ප්‍රශ්න 15 තුළට එක දිනයකදීවත් අපි ඉදිරිපත් කළ ප්‍රශ්නයක් ඇතුළත් කර නැහැ කියන්නේ, ඒක අපට කරන බරපතළ අසාධාරණයක්, ගරු කථානායකතුමනි. එහෙම කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සතියට එකයි ඇතුළත් කරන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ අසාධාරණය නිවැරදි කර දෙන්න, ගරු කථානායකතුමනි. දවසක් හැර දවසක් හෝ අපේ ප්‍රශ්නයක් යොමු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමේදී තීරණය ගන්න කියන්න. *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියන කාරණාව මෙතැනට අදාළ කරගන්න බැහැ, ගරු කථානායකතුමනි. මොකද, ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී මේ ප්‍රශ්න ගැන කථා කළාට, අපිට ප්‍රශ්න ඉදිරිපත් කරන, අපි මෙතැනට එවපු මිනිසුන්ට ඒක දැනෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකර පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ඇසීමට අපට අවස්ථාවක් ලබා ගැනීමට සාධාරණයක් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලිවම.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ප්‍රශ්න දුන් ප්‍රමාණය මත ප්‍රමුඛතාව දෙන එකේ ගැටලුවක් නැහැ. නමුත් ගරු කථානායකතුමනි, අනෙක් අයටත් සාධාරණයක් වෙන විධියට එම ප්‍රමාණය සැලකිල්ලට ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### රාජ්‍ය බැංකු සේවකයන්ගේ 2021-2023ට අදාළ වැටුප් වැඩිවීම
### அரச வங்கி ஊழியர்களின் 2021 - 2023க்கான சம்பள அதிகரிப்பு
### SALARY INCREMENT OF STATE BANK EMPLOYEES FOR 2021-2023

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, කොවිඩ් වසංගතය හමුවේ රට පුරා සංචරණ සීමා පනවා තිබුණු අවස්ථාවේදී වුවද, දැඩි අවදානම් සහිත තත්ත්වයක් යටතේ සිය සේවය නොමඳව ලබා දෙමින් රටේ ආර්ථිකය සහ සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම සඳහා උපරිම සහයෝගයක් බැංකු ක්ෂේත්‍රයේ සේවකයන් ලබා දී තිබෙනවා.

වසර තුනකට වරක් සමස්ත සේවකයන්ට වැටුප් වැඩිවීමක් ලබා දීමට සියලු බැංකු මඟින් කටයුතු කිරීම බැංකු සේවකයන් සඳහා වන සාමූහික ගිවිසුමේ කොන්දේසියකි. කෙසේ වෙතත්, එම සාමූහික ගිවිසුමත්, පසුගිය කාල සීමාවේ ඔවුන් විසින් ඉටු කළ සේවයත් යන කරුණු දෙකම නොසලකා හරිමින් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල සේවයේ නියුතු සේවකයන්ට 2021-2023 සඳහා අදාළ වැටුප් වැඩිවීම මේ දක්වා ගෙවා නොමැත. මෙම සාමූහික ගිවිසුම හත්වැනි ශ්‍රේණියේ සිට පළමුවැනි ශ්‍රේණිවලට අයත් වන 25,000ක් පමණ සේවකයන්ගේ වැටුප් වැඩිවීම සඳහා බලපෑමක් ඇති කරයි.

ඉහත සඳහන් කළ සියලු ම බැංකු එකතුව සාමූහික ගිවිසුම අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සේවකයන් එකඟ වූ ආකාරයෙන් වැටුප් වැඩිවීම ලබා ගැනීම සඳහා වූ යෝජනාව මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

ගරු කථානායකතුමනි, කෙසේ වෙතත්, එම යෝජනාව මුදල් අමාත්‍යාංශයට යොමු කර මාස දෙකක පමණ කාලයක් ගත වී ඇතත්, මේ වනතෙක් ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී නොමැත. අධ්‍යක්ෂ මණ්ඩලයන්ගේ අනුමැතිය හිමිව තිබියදීත් මෙතරම් කාලයක් බැංකු සේවකයන්ගේ වැටුප් වැඩිවීම ලබා දීම ප්‍රමාද වූ ප්‍රථම අවස්ථාව මෙය බව බැංකු වෘත්තීය සමිති පෙන්වා දෙනවා.

වසර තුනකට වරක් මෙතෙක් කිසිදු ගැටලුවකින් තොරව ලබා දුන් වැටුප් වැඩිවීම බලාපොරොත්තුවෙන් තම සැලසුම් සකස් කළ බැංකු සේවකයන් අද අසරණ වී ඇත. පියවීමට බලා සිටි ණය වාරික, ලීසිං වාරික, දරුවන්ගේ පාසල් ගාස්තු වැනි සැලසුම් කළ සියලුම අනෙකුත් කටයුතු අද වන විට ඇණහිට ඔවුන් දැඩි මූල්‍ය අවිනිශ්චිතතාවකට පත්ව තිබෙනවා. රාජ්‍ය සේවය රටට බරක් ලෙස හඳුන්වා දෙමින් මුදල් අමාත්‍යතුමා විසින් රාජ්‍ය සේවකයන් අධෛර්යයට පත් කරන අවස්ථාවක, රාජ්‍ය බැංකු සේවකයන් වෙත ඔවුන් විසින්ම උපයාගත් වැටුප් වැඩිවීම ලබා නොදීම එම සේවකයන් වෘත්තීය කලකිරීමකට ලක් කිරීමක් වනවා.

ගරු කථානායකතුමනි, මේ වැටුප් වැඩිවීමෙන් මහා භාණ්ඩාගාරයට කිසිම බරක් නැහැ. මෙය ඇත්ත වශයෙන්ම බැංකු පද්ධතිය උපයන ලාභයෙන් තමයි ක්‍රියාත්මක කරන්නේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණත් ඇයි, මේ වනතෙක් මුදල් අමාත්‍යාංශය මෙය ක්‍රියාත්මක කරන්නට අනුමැතිය ලබා නොදෙන්නේ කියන එක කුතුහලයට කාරණාවක්; හිතාගන්න බැරි කාරණාවක්.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1) රාජ්‍ය බැංකු සේවකයන්ගේ 2021- 2023 වසර සඳහා වැටුප් වැඩිවීම ලබාදීම ප්‍රමාද වී ඇති බව රජය පිළි නොගන්නේ ද?

2) ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු යන රාජ්‍ය බැංකුවල සාමූහික ගිවිසුම මඟින් එකඟ වූ අයුරින් ලබාදිය යුතුව ඇති වැටුප් වැඩිවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබිය දී, ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දීම ප්‍රමාද කිරීමට හේතු කවරේද?

3) මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වෙන් කිරීමක් අවශ්‍ය නොවන මෙම වැටුප් වැඩිවීම ලබාදීම සඳහා අනුමැතිය ලබාදීමට බලාපොරොත්තු වන්නේද? එසේ නම්, ඒ කවදා වන විටද?

විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාට මම කියන්න කැමැතියි, සෑම බැංකුවකම සමඟි සේවක සංගමයේ නියෝජිතයන් ඇතුළු සමස්ත වෘත්තීය සමිති ජාලයම ඉදිරිපත් කරපු දුක් ගැනවිල්ලක් - අඳෝනාවක්- තමයි, මම මේ ඉදිරිපත් කළේ කියන එක. විශේෂයෙන්ම ආරංචියක් තිබෙනවා, මේ වසරේ නැතිව 2022 වසරේ සිට ඉදිරියට මෙය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා කියලා. එහෙම කරන්න එපා. මම රජයෙන් ඉල්ලීමක් කරනවා, පොරොන්දු වුණු ආකාරයට 2021 ඉඳලාම මෙය ක්‍රියාත්මක කිරීමට කාරුණික වන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

කොවිඩ් - 19 වසංගතය හමුවේ රාජ්‍ය අංශයේ මෙන්ම, රාජ්‍ය ව්‍යාපාරවල මෙහෙයුම් කෙරෙහිද එල්ල කළ බලපෑම් සුළුපටු නොවේ. මෙම තත්ත්වය තුළ ආර්ථිකයට සිදු වූ බලපෑම හේතුවෙන් වියදම් ඉතා සකසුරුවම් ලෙස කළමනාකරණය කරගත යුතුය.

කෙසේ වෙතත්, රාජ්‍ය බැංකු විසින් කොවිඩ් වාතාවරණය තුළ සිදු කරනු ලැබූ කර්තව්‍යය අගය කරන අතර, සාමූහික ගිවිසුම සම්බන්ධයෙන් වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කිරීමට මේ වන විටත් මුදල් අමාත්‍යතුමා විසින් දින නියම කර ඇත. ඒ අනුව ඉදිරි කාලයේදී මේ සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා කිව්වා, එතුමන්ලාගේ පක්ෂයේ වෘත්තීය සමිතිය මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කර තිබෙනවා කියලා. රජයක් හැටියට අපි වෘත්තීය සමිති සම්බන්ධයෙන් කටයුතු කරනකොට කිසිම වෘත්තීය සමිතියක් රජයට පක්ෂපාතී ද, රජයට විරුද්ධ ද කියන කාරණාව අදාළ කර ගන්නේ නැහැ.

විශේෂයෙන්ම සාමූහික ගිවිසුම් සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනත තුළත් වගන්ති සඳහන් වෙනවා. ඒ අනුව අපි කටයුතු කරනවා. අපි සියලු වෘත්තීය සමිතිවල ඉල්ලීම්වලට ගරු කරනවා වාගේම, ඒ අයට ඇහුම්කන් දෙන්න සූදානම් රජයක්. ඒ නිසා කිසිදු පාර්ශ්වයකට අසාධාරණයක් නොවෙන්න අපි මේ ප්‍රශ්නය නිරාකරණය කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම මේ සූදානම් වෙන්නේ වාද විවාද කරන්න නොවෙයි. ඇත්ත වශයෙන්ම මම ගරු රාජ්‍ය ඇමතිතුමාට කියන්න කැමැතියි, මෙය භේදයකින් තොරව බැංකු ක්ෂේත්‍රයේ සියලු වෘත්තීය සමිති එක පයින්ම, එක හඬින්ම කරන ඉල්ලීමක් බව. ඒ වාගේම ඔබතුමා කිව්වා, "මේ කොවිඩ් වසංගත තත්ත්වය තුළ මූල්‍ය ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා" කියලා. ඒක අපි පිළිගන්නවා, නැහැ කියන්නේ නැහැ. නමුත්, ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ සහනය, මේ වැඩිවීම ඒ අය බලාපොරොත්තු වෙන්නේ ඒ ආයතන උපයපු ලාභයෙන්. මුදල් අමාත්‍යාංශයට මේක නිසා කිසිදු බරක් ඇතිවන්නේ නැහැ. ඒ බැංකුවලට මේ සඳහා හැකියාව තිබෙන නිසා තමයි ඒ බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල එකඟ වෙලා තිබෙන්නේ; අනුමැතිය ලබා දීලා තිබෙන්නේ. ඉතින්, බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය -තමුන්නාන්සේලාම පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලය- මේ සඳහා අනුමැතිය දීලා තිබෙන මොහොතක මුදල් අමාත්‍යාංශය මේක කල්මරමින් සිටින්නේ ඇයි? මේකට අනුමැතිය ලබා නොදෙන්නේ ඇයි? මොකද, මහා භාණ්ඩාගාරයට කිසිදු බරක් නොදෙමින් තමයි මේ වැටුප් දීමනා වැඩිවීම සිදු වන්නේ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා මේ සම්බන්ධයෙන් අවසාන වශයෙන් එකඟතාවකට පැමිණිය යුතුයි. ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමා මෙය විශේෂ කාරණාවක් හැටියට අරගෙන තිබෙනවා. ඒ වෘත්තීය සමිති නායකයන් සමඟ, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කර, ඔවුන්ට අසාධාරණයක් නොවෙන විධියට ඒ ගැටලුවට අවශ්‍ය විසඳුම ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ නිසා අපි විශේෂයෙන්ම කියන්නේ මේකයි, ගරු විපක්ෂ නායකතුමනි. මේ බැංකු සේවකයන් කොවිඩ් අර්බුදය තුළ කටයුතු කළ ආකාරය අපි කිසිසේත් අවතක්සේරු කරන්නේ නැහැ. අපි ඒ කාරණාව අගය කරනවා. විශේෂයෙන්ම මගේ පිළිතුරේත් මම සඳහන් කළා, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය අප අගය කරන බව. අවසානයේ මුදල් ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා දෙපාර්ශ්වයටම ගැළපෙන සාධාරණ විසඳුමක් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, තව කාරණයක් කියන්න මට පුංචි අවස්ථාවක් ලබා දෙන්න. තව විනාඩි 10ක් ඉතිරි වෙලා තිබෙනවා, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අවස්ථාවේ. ගරු අග්‍රාමාත්‍යතුමා මේ ගරු සභාවේ සිටින මොහොතේ වැදගත් කාරණාවක් කෙරෙහි එතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා ඇති, මීට දින කිහිපයකට පෙර සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ නිෂ්පාදන වැඩ කටයුතු නතර කරන්න කටයුතු කළ බව. තෙල් පිරිපහදුවෙහි ක්‍රියාකාරිත්වය නතර කරන්න සිදු වෙලා තිබෙන කාරණාව හැටියට ඉදිරිපත් කර තිබෙන්නේ බොරතෙල් ගෙන්වන්න ප්‍රමාණවත් ඩොලර් නැහැ කියන එකයි. හැබැයි, ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමාත් හොඳින් දන්නවා, මේ තෙල් පිරිපහදුව හරහා භූමිතෙල්, පෙට්‍රල්, ඩීසල්, දැව්තෙල්, ඒ වාගේම ගුවන්යානාවලට අවශ්‍ය ඉන්ධන යනාදී වශයෙන් ඉන්ධන ගණනාවක් නිෂ්පාදනය කරන බව. ගරු අග්‍රාමාත්‍යතුමනි, රජය කියනවා මේ නිෂ්පාදන ක්‍රියාවලියෙන් නිෂ්පාදනය වන ප්‍රමාණය - ඒ හිඟ කොටස- වෙනුවට පිරිපහදු තෙල් ගෙන්වනවා කියලා. මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. බොරතෙල් ගෙන්වන්න ඩොලර් නැත්නම්, පිරිපහදු තෙල් ගෙන්වන්න ඩොලර් තිබෙන්නේ කොහොමද? මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු අගමැතිතුමනි. පිරිපහදු තෙල් ගෙන්වන්න යනකොට ඒවා සිදු වන්නේ ක්ෂණික මිලදී ගැනීම් ලෙසයි.

ඒ වෙලාවේම තීන්දු තීරණ ගන්නවා, ප්‍රසම්පාදන ටෙන්ඩර් ක්‍රියාවලියක් නැතිව. ඉතින් එවන් තත්ත්වයක් තුළ ඔබතුමා ම දන්නවා, දූෂණ අක්‍රමිකතාවලට, ඒ වාගේ මූල්‍ය අක්‍රමිකතාවලට අනිවාර්යයෙන් ඉඩ ප්‍රස්ථාව තිබෙන බව. මට ඔබතුමා පොඩ්ඩක් කියන්න, බොරතෙල් ගෙන්වන්න ඩොලර් නැත්නම්, තෙල් පිරිපහදුවෙන් නිපදවන තෙල් ප්‍රමාණයේ හිඟතාව පියවන්න පිරිපහදු තෙල් ගෙන්වන්න ඩොලර් තිබෙන්නේ කොහේද කියලා. මේක බරපතළ ප්‍රශ්නයක්. මේ තත්ත්වය තුළ අද බොහෝ ඉන්ධන පිරවුම්හල්වල ලොකු කලබලයක් ඇති වෙලා තිබෙනවා. දැන් ඉන්ධන පෝලිම් තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා දන්නවා, ගෑස් පෝලිම, කිරිපිටි පෝලිම, සීනි පෝලිම, සහල් පෝලිම වාගේම, මේ පෝලිම් ඔක්කෝටම අමතරව දැන් ඉන්ධන පෝලිමකුත් ඇති වෙලා තිබෙන බව. ඉතින් මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර පුළුවන් නම්, මේකට උත්තරයක් ලබා දෙන්න කියලා. එය බොහොම වැදගත් වෙනවා. බොරතෙල් ගෙන්වන්න ඩොලර් නැති අවස්ථාවක කොහොමද, පිරිපහදු තෙල් ගෙන්වන්නේ? ගරු අගමැතිතුමනි, මේකට උත්තරයක් දෙන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මා විශේෂයෙන් සඳහන් කරනවා, අපේ විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නය සම්බන්ධයෙන් විෂයභාර ගරු ඇමතිතුමා ඇවිත් ප්‍රකාශයක් කරාවි කියලා.

මම පැහැදිලිව කියන්න ඕනෑ, දැනට ඉන්ධනවල කිසිදු හිඟයක් නැති බව. අපරාධයක්, ජනතාව හදිසි වෙලා ගිහිල්ලා පෝලිම්වල ඉන්න එක. මමත් පෝලිමේ ඉඳලා තමයි තෙල් ගහ ගත්තේ. යම් යම් කණ්ඩායම් ජනතාව අවුස්සමින් ලොකු ඉන්ධන හිඟයක් එනවා කියලා ජනතාව අපහසුතාවට පත් කරනවා. ඒක තමයි සිද්ධ වෙන්නේ. මම කියන්නේ මෙය දේශපාලනයට හරවා ගන්න එපා කියලායි. මොකද, ඇති වෙන්න -අඩු පාඩුවක් නොවෙන්න- ඉන්ධන තියෙනවා. අදාළ ගරු ඇමතිවරයාත් එය ප්‍රකාශ කළා.

ඒ නිසා අපි ජනතාවට ඉතාම ගෞරවයෙන්, පැහැදිලිව කියනවා, හදිසි වෙලා, කලබල වෙලා ගිහින් tank එක full කර ගන්න අවශ්‍ය නැහැ කියලා. මීට ඉස්සෙල්ලාත් මෙවැනි ප්‍රශ්න ඇති වුණා; ප්‍රශ්න ඇති කළා. අපි ජනතාවට පැහැදිලිව කියනවා, කලබල වෙන්න එපා, ඇති වෙන්න ඉන්ධන තිබෙනවා, මේ රජය හිඟයකින් තොරව ඉන්ධන සපයනවා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ගරු අධිකරණ අමාත්‍යතුමාත් කථා කරන්න සූදානමින් ඉන්නවා. වෙලාව ගත වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඉක්මනට කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පෙර වරු 10.00ට තමයි අය වැය විවාදය පටන් ගන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එහෙම එකක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දැන් ඔබතුමා - *[බාධා කිරීමක්]* මේක වැදගත් ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව වැඩ තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මෙය රටට බලපාන වැදගත් ප්‍රශ්නයක්. මෙය, කවුරුවත් අපහසුතාවට පත් කරන්න කියන දෙයක් නොවෙයි. ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ හැම දෙනාටම වඩා ඔබතුමාට මේ මාතෘකාව ගැන තේරෙනවා. ඒකයි මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ.

බොරතෙල් ගෙන්වන්න දැන් ඩොලර් නැති ලු. එහෙම නම්, පිරිපහදු තෙල් ගෙන්වන්න ඩොලර් තිබෙන්නේ කොහොමද, ගරු අගමැතිතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය ප්‍රශ්නය දැන් දෙපාරක් ඇහුවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මෙය වැදගත් කාරණාවක්. මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න, කථා කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් කථා කළා නේ. ඔබතුමා ඔය ප්‍රශ්නය දැන් දෙපාරක් ඇහුවා. සභාවේ කාලය නිකම් නාස්ති වෙනවා. අපට තව වැඩ තිබෙනවා නේ. ප්‍රශ්න වටයට වෙන් කළ කාලයෙන් තව විනාඩි 4යි තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට පොඩි ඉඩක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනට කියන්න, වැල්වටාරම් කියන්නේ නැතිව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, කරුණාකර මේ තෙල් පිරිපහදුව වැසීම පිටුපස තිබෙන කුමන්ත්‍රණය ගැන සොයන්න කියලා. එතැන කුමන්ත්‍රණයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා අහන ප්‍රශ්නය වන්නේ, බොරතෙල් ගෙන්වන්න සල්ලි නැත්නම් කොහොමද පිරිපහදු කරපු තෙල් ගෙන්වන්නේ කියන එකයි. අපේ බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා මේ සම්බන්ධයෙන් අද "ද අයිලන්ඩ්" පුවත් පතට ඉතා වැදගත් ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඒ ප්‍රකාශයේ කියලා තිබෙනවා, බොරතෙල් ගෙන්වන්න සල්ලි නැති වුණත්, පෙට්‍රල් හා ඩීසල් කෙළින්ම පිරිපහදු කරලා ගෙන්වන්නේ කොහොමද කියලා. "ද අයිලන්ඩ්" පුවත් පත කියවලා ඔබතුමාට ඒකත් පැහැදිලි නැත්නම් නැවත ප්‍රශ්නය මතු කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, අමාත්‍යාංශ නිවේදනය, ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබතුමාටත් ලොකු වගකීමක් තිබෙනවා. ගරු සරත් වීරසේකර ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින නිසා මම එතුමාගෙන් මේ ගැන අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, අද ලොකු බෝම්බයක්වත් ගහනවා කියලා ආරංචියක් තිබෙනවා ද? අපට ලොකු භයක් තිබෙනවා. මොකද, අද රට පුරා හැම තැනම barriers දාලා තිබෙනවා. අද පාරවල් හැම එකක්ම වහලා. ගරු සරත් වීරසේකර ඇමතිතුමනි, අපට කියන්න අද ජාතික ආරක්ෂාව සම්බන්ධව මොකක් හරි බරපතළ තත්ත්වයක් තිබෙනවාද කියලා. ඒ නිසාද හැම තැනම barriers දාලා පාරවල් වහලා තිබෙන්නේ?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය ගැනමයි මටත් කියන්න තිබෙන්නේ. හල්දුම්මුල්ල ගැනයි මම කියන්නේ. අද බදුල්ලේ ඉඳලා කොළඹ එන කිසිම බස් එකකට එන්න දෙන්නේ නැහැ. Army එකයි, පොලීසියයි barriers දාලා. අපි ඒ ගැන දැනගන්න ඕනෑ. මොකද, අපිටත් දැන් බදුල්ලට යන්න තිබෙනවා. මේ කථාව පිළිබඳව අපි හරියට දන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය මතු කළා. ගරු සරත් වීරසේකර ඇමතිතුමනි, ඔබතුමා උත්තරයක් දෙනවා ද?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
Sir, I rise to a point of Order.
ගරු කථානායකතුමනි, අද කොළඹට එන සෙනඟ හැමෝම barriers දාලා නවත්වලා තිබෙන්නේ. මහජන ආරක්ෂක ඇමතිතුමා මොකක්ද මේ කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය ගැන තමයි දැන් සියලු දෙනාම ඇහුවේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ප්‍රජාතන්ත්‍රවාදයක් නැද්ද මේ රටේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ ගැන ඇහුවා නේ. එකම ප්‍රශ්නය අහන්න එපා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගන්නා ක්‍රියා මාර්ග වැරැදි ද, නැද්ද කියන්න රටේ අධිකරණයක් තිබෙනවා. ඒවා වැරැදි නැහැයි කියලා අධිකරණ තීන්දුවලින් කියද්දී එවැනි දේවල් කරන්න පොලීසියට බලය තිබෙන්නේ කොහොමද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ ගැන වෙනමම අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ස්ථාවර නියෝග අනුව, රටේ උද්ගත වෙලා තිබෙන කාලීන ප්‍රශ්න පිළිබඳව කථා කරන්න අපට අයිතියක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒක ඔබතුමා තේරුම් ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා වෙනම විවාදයක් ඉල්ලන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක කාලීන ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට වෙනම යෝජනාවක් ගෙනෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Checkpoints දාලා බස් නවත්වන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දන්නවා, වෙනම යෝජනාවකින් මිසක් ඒ ගැන සාකච්ඡා කරන්න බැහැ කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් ගත්තාම ආණ්ඩුවේ සියලු කටයුතු නවත්වලා ඒ වරප්‍රසාද ප්‍රශ්නය ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට අවස්ථා තුනක් දුන්නා. ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීම්]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාටත් අවස්ථා තුනක් දුන්නා නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මේක වැදගත් කරුණක්. අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

## වෙළෙඳ අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ල සඳහා කුලිය සහ සංග්‍රහ වියදම්: වෙළෙඳ අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## வர்த்தக அமைச்சுக் கட்டிடத்துக்கான வாடகை மற்றும் விருந்துபசாரச் செலவு: வர்த்தக அமைச்சரினது கூற்று
## RENT FOR BUILDING HOUSING MINISTRY OF TRADE AND ENTERTAINMENT EXPENSES: STATEMENT BY MINISTER OF TRADE

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
ගරු කථානායකතුමනි, මගේ අමාත්‍යාංශයේ තේ පැන් වියදම සහ අමාත්‍යාංශයේ කාර්යාල කුලිය පිළිබඳව ඉතාම අසත්‍ය, ද්වේෂසහගත තොරතුරු ප්‍රමාණයක් ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා විසින් මේ ගරු සභාවේදී සාවද්‍ය ලෙස ප්‍රකාශයට පත් කොට ඇත.

පසු ගිය යහ පාලන ආණ්ඩුවට පෙර සමුපකාර සහ අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා තිබුණි. යහ පාලන රජය පැවැති සමයේදී වෙළෙඳ අමාත්‍යාංශය වෙත වෙනත් විෂයයන් රාශියක් එක් කර පුළුල් විෂය පථයක් සහිත අමාත්‍යාංශයක් බවට පත් කර තිබූ හෙයින් අමාත්‍යාංශය කාර්යාල කිහිපයකම පවත්වාගෙන ගොස් තිබුණි. *[බාධා කිරීම්]* සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල එවකට කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා වන රිසාඩ් බදියුදීන් මහතා ඔහුගේ අතිරේක පාවිච්චිය සඳහා යොදාගෙන තිබූ අතර, එහි 8 වන මහලේ නිල කාමරයද පරිහරණය කර තිබුණි. හිස්ව තිබූ ඉඩකඩ සඳහා කොළඹ කොටුව නිශ්‍රීස් ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය ලංකා සතොස ප්‍රධාන කාර්යාලය එම ගොඩනැගිල්ල වෙත රැගෙන විත් තිබුණි. *[බාධා කිරීම්]* එහි මේ වන විට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය, ලංකා සතොස සමාගමේ ප්‍රධාන කාර්යාලය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, සතොස සිකුරිටීස් සමාගම, සතොස ඉංජිනේරුමය සහ ඉදිකිරීම් සමාගම ආදී ආයතන ගණනාවක් ස්ථාපිත කර ඇත. මා වෙළෙඳ අමාත්‍යවරයා වශයෙන් වැඩ භාර ගන්නා අවස්ථාවේදී වෙළෙඳ අමාත්‍යාංශය සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබුණි. ඉඩකඩ මදිවීම හේතුවෙන් සතොස සභාපතිගේ නිල කාමරය වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පරිහරණය සඳහා යොදා ගැනීමට ද සිදු විය. ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් වෙළෙඳ අමාත්‍යාංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව තිබුණි. ඉඩකඩ මදිවීම හේතුවෙන් සම්පූර්ණ කර ගැනීමට නොහැකිව තිබූ මාණ්ඩලික නිලධාරි පුරප්පාඩු තනතුරු 7ක් ද මේ වන විට ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් වීම හේතුවෙන් සම්පූර්ණ වී ඇති අතර, තවත් මාණ්ඩලික නිලධාරි තනතුරු දෙකක් සඳහා නිලධාරින් නොබෝ දිනකින් පැමිණීමට නියමිතය.

අභ්‍යාසලාභී උපාධිධාරින් 100කට අධික ප්‍රමාණයක් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. රටේ ප්‍රධාන කාර්ය භාරයක් හිමි අමාත්‍යාංශයක රාජකාරි කටයුතුවලට ඉඩ පහසුකම් මදිවීම මත හෝ නිලධාරින් නොමැති වීම හේතුවෙන් අකාර්යක්ෂම වීමට ඉඩ දිය නොහැක. ගෝලීය කොරෝනා වසංගතය හේතුවෙන් "Zoom" තාක්ෂණය ඔස්සේ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කර ගැනීමට සතොස පැරණි ගොඩනැගිල්ලේ අපහසුතා ඇති වීම මත යහ පාලන ආණ්ඩුවේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සඳහා වර්ග අඩියක් රුපියල් 198 බැගින් වූ කුලී මුදලකට වසරක කාලයකට ලබාගෙන තිබූ මෙම ගොඩනැගිල්ලේ හිමිකරු සමඟ අමාත්‍යාංශයේ ලේකම් සාකච්ඡා කර වර්ග අඩියක් රුපියල් 150ක කුලියකට ලබා ගැනීමට කටයුතු කරන ලදී. පසුගිය රජය විසින් අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා වර්ග අඩියකට රුපියල් 198ක් ගෙවා තිබුණා. අපේ රජය විසින් වර්ග අඩියක් රුපියල් 150කට ලබා ගන්න ගිවිසුම් අත්සන් කර තිබෙනවා. එම ගිවිසුමේ පිටපතක් මා **සභාගත*** කරනවා.

වර්ග අඩි 41,460කින් යුත් මෙම ගොඩනැගිල්ල රුපියල් 175කට ලබා දීමට එකඟ වී රජයේ තක්සේරුකරු විසින් 2021.03.17 වැනි දින නිර්දේශ කර ඇත.

තක්සේරුකරු විසින් තක්සේරු කර තිබෙන්නේ, රුපියල් 175ක් ගෙවිය යුතුයි කියලා. අපි ගෙවා තිබෙන්නේ තක්සේරුකරුගේ තක්සේරුවටත් වඩා අඩුවෙන්. එනම්, රුපියල් 150යි. එම තක්සේරු වාර්තාවත් සභාගත කරන්න මා බලාපොරොත්තු වෙනවා.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශ රටවල් 33ක වාණිජ නිලධාරින් රාජකාරි කටයුතු කරන වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ රුපියල් මිලියනයකට අධික කුලී පදනම මත පවත්වාගෙන ගිය අතර, රක්ෂණ සංස්ථාවට එම ඉඩ පහසුකම් අවශ්‍ය බව පවසමින් එම ස්ථානයෙන් වාණිජ දෙපාර්තමේන්තුවට ඉවත් වන ලෙස දැනුම් දී තිබුණි. එම දෙපාර්තමේන්තුවද මෙම ස්ථානයේ ස්ථාපිත අතර, ඊට අමතරව බිම් මහලේ සතොස හරිත වෙළෙඳ සැලක්ද ආරම්භ කිරීමට අවශ්‍ය ඉඩප්‍රස්ථා වෙන් කර ගත්තා. පසුගිය රජය සමයේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලද සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ ප්‍රධාන ගොඩනැගිලි පරිශ්‍රයෙන් පෞද්ගලික ගොඩනැගිල්ලකට ගෙන යාමට ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා විසින් කටයුතු කර තිබුණි. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා ද මෙම ගොඩනැගිල්ලේ කාර්යාල පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීමට විද්වත් කමිටුවක් පත් කර ඇති අතර, එය ආචාර්යවරුන්ගෙන්, කථිකාචාර්යවරුන්ගෙන්, මහාචාර්යවරුන්ගෙන් සහ ප්‍රධාන පෙළේ වෙළෙඳ ව්‍යාපාරිකයන්ගෙන් සමන්විතය. ඒ සඳහා රුපියල් ලක්ෂයක් බැගින් ගෙවා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කාමරයක් කාර්යාල පහසුකම් සඳහා ලබාගෙන තිබූ අතර, එම කාර්යාලය ද දැන් මෙම නව ගොඩනැගිල්ලට අප ගෙනැවිත් තිබීමෙන් එම රුපියල් ලක්ෂයේ මුදලද ඉතිරි කරගෙන තිබෙනවා. ඒ අනුව, වර්ග අඩියකට රුපියල් 198 බැගින් ගෙවා පසුගිය රජයෙන් ලබාගෙන තිබූ ගොඩනැගිල්ල අපේ අමාත්‍යාංශය විසින් වර්ග අඩියක් රුපියල් 150කට ලබා ගැනීමට කටයුතු කර තිබෙනවා. මා වෙළෙඳ අමාත්‍යාංශය භාර ගැනීමේදී ගරු මලික් සමරවික්‍රම මහතා අමාත්‍ය ධුරය දරන ලද සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය ද මා අමාත්‍ය ධුරය දරන වෙළෙඳ අමාත්‍යාංශයට එක්වූ අතර එම අමාත්‍යාංශ කාර්යාලය ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වර්ග අඩි 9,000ක ඉඩ ප්‍රමාණයක පැවැති අතර, ඒ සඳහා වර්ග අඩියකට රුපියල් 440ක කුලියක් ගෙවා තිබෙනවා. වර්ග අඩියකට රුපියල් 440ක් ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පවත්වාගෙන යන්න ගෙවා තිබියදී, අපි ගෙවා තිබෙන්නේ වර්ග අඩියකට රුපියල් 150යි. එමඟින් රුපියල් මිලියන 4කට අධික මුදලක් වර්ග අඩි 9,000ක් සඳහා පමණක් කුලී වශයෙන් ගෙවන ලද අතර, මෙම ගොඩනැගිල්ලේ වර්ග අඩි 41,460 සඳහාම ගෙවනු ලබන්නේ රුපියල් මිලියන 8ක් නොව, රුපියල් 6,219,000ක් පමණි. ඒ තුළින් රජයට මසකට ඉතිරි කරන මුදල රුපියල් 1,990,080කි.

යහ පාලන රජයේ ප්‍රබල කොටස්කරුවෙක් වූ මේ ගරු මන්ත්‍රීතුමා මේ ගැන ප්‍රශ්න කර ඇත්තේ පසුගිය රජයේ මැති ඇමතිවරුන් ගෙව්වාට වඩා අඩු මුදලක් ගෙවීම සම්බන්ධයෙනි. ඒ ගැන මා සමඟ වෛරයක් ඇති කර ගැනීම සාධාරණ නොවන බව එතුමාට කාරුණිකව දැනුම් දෙන්නට කැමැතියි.

වෙළෙඳ විෂය පථය අභ්‍යන්තර වෙළෙඳාම හා ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධව සකස් වී ඇති අතර, අමාත්‍යාංශය යටතේ පවත්නා ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව මඟින් ද්විපාර්ශ්වික, කලාපීය හා බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මේ සඳහා නිරන්තරයෙන් ජාත්‍යන්තර වෙළෙඳාම් හා සම්බන්ධිත විදේශ දූත පිරිස්, තානාපතිවරු, මහ කොමසාරිස්වරු, වෙළෙඳ විෂය භාර අමාත්‍යවරු සහ වෙනත් ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනුවලට සම්බන්ධ විවිධ පුද්ගලයන් රාශියක් දිනපතාම මේ කාර්යාලයේදී මා හා නිලධාරින් හමුවීමට පැමිණෙනවා. එවන් විටෙක සංකේතාත්මකව තිළිණයක් ප්‍රදානය කර, තේ පැන් සංග්‍රහයක් කරනු ලබන අතර, එය රාජ්‍යතාන්ත්‍රික සාමාන්‍ය ස්වභාවයයි.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

මීට අමතරව, රටේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛව කටයුතු කරන ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය අප රටේ අපනයන ඉපැයීම් ඉහළ නැංවීම සහ ආර්ථික වර්ධනයට දායකවීම සඳහා ශ්‍රී ලාංකික වෙළෙඳ සමාගම්වලට ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමට අවස්ථාව සහ සහාය ලබාදීම සිදු කරයි. එමඟින් ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාම සහ රැකියා අවස්ථා වැඩි කිරීම වෙනුවෙන් දේශීය අපනයනකරුවන් සමඟ, -ඔවුන්ගේ ඉල්ලීම් මත- නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වේ. 1949 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 10වන වගන්තිය අනුව උපදේශන කමිටු 23ක් මා විසින් ඇති කර, අතිවිශේෂ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ රැස්වීම් සඳහා සංග්‍රහ වියදම්ද මෙයට ඇතුළත් වන අතර, 1203 අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අමාත්‍යවරයෙකුට සංග්‍රහ වියදම් වෙනුවෙන් රුපියල් 200,000ක මුදලක් වෙන් කර තිබුණද, 2021 වර්ෂය පුරාවටම සංග්‍රහ වියදම් වෙනුවෙන් වැය වී ඇත්තේ රුපියල් 188,541කි.

වෙන් කර තිබෙන මුදලටත් වඩා අඩුවෙන් තමයි මේ සංග්‍රහ වියදම් කරලා තිබෙන්නේ. කෝටි ගණනත් තේ පැන් සංග්‍රහ සඳහා වියදම් කළා කියලා, මේ උත්තරීතර සභාව පාවිච්චි කරලා ප්‍රකාශ කිරීමෙන් මේ ගරු මන්ත්‍රීවරුන් බලාපොරොත්තු වෙන්නේ කුමක්ද කියලා මට වටහා ගන්න බැහැ. ඒ වාගේම, මම ඒ ගරු මන්ත්‍රීතුමාට සඳහන් කරන්නට කැමැතියි, නොනවතින යුද්ධය පැවති කාල පරිච්ඡේදය තුළදී මගේ ඉල්ලීම පරිදි මගේ මුළු මන්ත්‍රී වැටුපම පාර්ලිමේන්තුවෙන් "අපි වෙනුවෙන් අපි" අරමුදලට බැර කළා. මගේ මව මිය යැමෙන් පසු "අපේ අම්මා සමාජ සත්කාරක අරමුදල" ටයි මගේ වැටුප බැර කළේ. මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ, -දකුණු ආසියාවේ විශාලතම විද්‍යාලය- විදුලි බිල ගෙවීම සඳහා සෑම මසකම මම රුපියල් 50,000 බැගින් වෙන් කර තිබෙනවා. "ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව අරමුදල" කියන අරමුදල සෑදීම සඳහා මගේ පෞද්ගලික මුදලින් මුදල් යෙදෙව්වා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා එදා රුපියල් 10,000ක්- *[බාධා කිරීම්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
තමුන්නාන්සේලාට points of Order ඉදිරිපත් කරන්න පුළුවන්. මිනිසුන්ට-*[බාධා කිරීම්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. එතුමා ලියලා දීලා තිබෙන එක කියවන්න ඕනෑ. එතුමා ඒකෙන් පිට කියවනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ලියපු ටික අනුව තමයි කියවන්නේ. ලියලා *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ලියලා දීපු ඒවා අනුවද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මිනිසුන්ගේ ආත්ම ගෞරවය ඔක්කොම කෙලෙසලා කථා කරන්නේ? *[බාධා කිරීම්]* තමුන්නාන්සේලාට ආත්ම ගෞරවයක් තියෙනවාද? *[බාධා කිරීම්]* පල් බොරු කියලා මේ පාර්ලිමේන්තුව නොමඟ යවලා, මේ රටේ මිනිස්සු අතර වෛරය ඇති කරලා, මේ රටේ මන්ත්‍රීවරු දහස් ගණනක් ගෙනිහිල්ලා, *[බාධා කිරීම්]* සිය ගණනක් හිර කරලා, වද දීලා, ඒ වද දීපු ඒකේ නායකයකු විධියට හිටපු මිනිස්සු *[බාධා කිරීම්]* බොරු චෝදනා දාලා, පක්ෂ නායකවරු හිරේ යවලා තමුන්නාන්සේලා එදා මොනවාද කළේ? අමු බොරු කරලා කරලා දැනුත් ඇවිල්ලා ඒ බොරුවම කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඊළඟට අගමැතිතුමා කථා කරන්න ඉන්නේ. *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු කථානායකතුමනි, මම අවසන් කරනවා.

බුදුරජාණන් වහන්සේ මෙලෙස දේශනා කරලා තිබෙනවා.

"අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති. මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති"

"අල්පශ්‍රැත (ශාස්ත්‍රයක් පුහුණු නොකළ, මඳ කරුණක් දත්) පුද්ගලයා වැඩෙන්නේ නිකම් ගොනකු මෙනි. ඔහුගේ මස් නම් ලියලයි. එහෙත් ඔහුගේ නුවණ නොවැඩෙයි"

නුවණ වැඩෙන්නේ නැති මස් විතරක් ලියලන 'සජබ' කණ්ඩායමට තමයි මා මේ ටික කියන්නේ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත්. ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ආනන්ද අලුත්ගමගේ සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ஆனந்த அலுத்கமகே அபிவிருத்தி, சமூக சேவைகள், அறக்கட்டளை மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### ANANDA ALUTHGAMAGE DEVELOPMENT, SOCIAL SERVICES AND CHARITY FOUNDATION (INCORPORATION) BILL

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ආනන්ද අලුත්ගමගේ සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය"

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி சுகாதார அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health for report.*

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
## APPROPRIATION BILL, 2022

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" [ ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Order read for resuming Adjourned Debate on Question - [12th November]*
*"That the Bill be now read a Second time".- [The Hon. Basil Rohana Rajapaksa]*
*Question again proposed.*

[පූ.භා. 10.13]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing)

ගරු කථානායකතුමනි, ඉතා සුවිශේෂීව සැලසුම් කරන ලද 2022 වර්ෂය සඳහා වන අය වැය වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට සුබ පතමින් මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි.

බහුවිධ අංශවලින් පැන නැඟුණු අභියෝග මධ්‍යයේ තීරණාත්මක සන්ධිස්ථානයක සිට මෙම අය වැය ඉදිරිපත් කළ බව කියන්න අවශ්‍යයි. මේ මඟින් ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ බලපෑම්වලින් ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීම ඉලක්ක කර තිබෙනවා.

කොවිඩ්-19 වසංගතය මඟින් ජන ජීවිතයට දරුණු දුෂ්කරතා ඇති කරමින් සමස්ත ලෝකයටම බලපෑම් ඇති වුණා. ශ්‍රී ලංකාවටත් එම බලපෑම්වලින් මිදීමට හැකි වුණේ නැහැ. ඒ වාගේම, අප රජය කොවිඩ් වසංගතයෙන් ජනතාව බේරා ගැනීමට විවිධ ක්‍රියා මාර්ග ගත්තා. අප ගත් ක්‍රියා මාර්ග නිසාම ආර්ථිකය හැකි ඉක්මනින්ම සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමට හැකි වන බව අපගේ විශ්වාසයයි.

ගරු කථානායකතුමනි, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ වුවද, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටද රජය අඛණ්ඩව කටයුතු කළා. අපි මේ වන විට රැකියා විරහිත උපාධිධාරින් 60,000කට පමණ රැකියා ලබා දී තිබෙනවා. දරිද්‍රතාව අවම කිරීමේ අරමුණින් අඩු ආදායම්ලාභී පවුල්වල නුපුහුණු පුද්ගලයන් ලක්ෂයකට රාජ්‍ය අංශයේ රැකියා ලබා දී තිබෙනවා. රාජ්‍ය අංශයේ මෙම නව බඳවා ගැනීම් සඳහා වැටුප් ගෙවීමට මසකට රුපියල් බිලියන 3.5ක් පමණ රජය වැය කරනවා.

අභියෝග මධ්‍යයේ වුවද, රජය රටේ ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමද අඛණ්ඩව සිදු කරමින් සිටිනවා. ජල සම්පාදනය, බලශක්තිය, ප්‍රවාහනය, නාගරික සංවර්ධනය, සෞඛ්‍ය, අධ්‍යාපනය වෙනුවෙන් සහ දරිද්‍රතාව පිටුදැකීම සඳහා සිදු කර ඇති අඛණ්ඩ ආයෝජන කොවිඩ්-19 වසංගතය හමුවේ ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය සහ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව සනාථ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් දැඩි අභියෝග රැසකට මුහුණ දෙන්නට පසුගිය කාලයේදී අපට සිදු වුණා. එසේ වුවත්, ඉදිරි කාල පරිච්ඡේදය තුළ අපේක්ෂිත පරිදි ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ වර්ධනය සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ ආර්ථිකයේ විදේශීය අංශය, වසංගතයේ බලපෑම නිසා අභියෝගයට මුහුණ දී තිබෙනවා. විදේශ විනිමය, ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීමට රුපියල මත පීඩනය ලිහිල් කිරීම සඳහා ඉදිරි කාලය තුළ විදේශ විනිමය ගලා ඒම සුරක්ෂිත කිරීමට රජය සහ මහ බැංකුව පියවර ගනිමින් සිටිනවා.

ගෝලීය සංචාරක කර්මාන්තය නැවත ආරම්භ වීමත් සමඟ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේද සැලකිය යුතු ධනාත්මක වර්ධනයක් ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා. එසේම විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමට සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, බැංකු පද්ධතිය වෙත ආකර්ෂණය කර ගැනීමට අපි මහ බැංකුවත් සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් සිටිනවා.

විදේශීය අංශයේ ස්ථායිතාව ශක්තිමත් කිරීම සඳහා කෙටි කාලීන උපාය මාර්ගික සැලසුම් ඇතුළත් ආර්ථිකය පිළිබඳ සියලු පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තවදුරටත් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් "සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම" මහ බැංකුව විසින් පසුගිය දා ප්‍රකාශයට පත් කිරීම පිළිබඳවත් අපි සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, ආර්ථික අභියෝගාත්මක කාලයක් පසු කරමින් සිටින බව අපි දන්නවා. මෙවර අය වැයෙන් ඉදිරිපත්

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

කර ඇති ප්‍රගතිශීලී යෝජනා තුළින් ඉදිරි වසර තුළ සහ ඉන් ඔබ්බට ආර්ථිකය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තියේ අපගේ අනාගතවාදී සැලසුම් පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එහි ඇතුළත් සැමට ප්‍රතිලාභ අත්වන ජනතා කේන්ද්‍රීය සමාජ සහ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට මෙවර අය වැයෙන් මනා පිටිවහලක් ලැබී තිබෙනවා.

රට මුහුණ දී ඇති අභියෝග ජය ගැනීමට අප ක්‍රියාත්මක කරන තිරසර විසඳුම් වැඩ පිළිවෙළ සමඟ අත්වැල් බැඳ ගෙන රටේ ඉදිරි ගමනට දායක වන ලෙස සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂ කාරණාවක් පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේත්, ඔබතුමාගේත් අවධානය මම මේ අවස්ථාවේ යොමු කරවන්න කැමැතියි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, අද දවසේ මුළු රටේම විවිධ පොලිස් බලකායන් යොදවා, මාර්ග බාධක දමා, දැවැන්ත ලෙස ජනතා නිදහස අහිමි කිරීමක් සිදු වෙනවා. මුළු රටේම මේක සිද්ධ වෙනවා. මිනිසුන්ව බස්වලින් එළියට අරගෙන, නම් ලැයිස්තුගත කරලා, ජාතික හැඳුනුම් පත් අංක ලියාගෙන, බස් රථ රියැදුරන්ට තර්ජනය කරලා, ඒ ගොල්ලන්ගේ මාර්ග බලපත්‍රය - route permit එක - අහෝසි කරනවාය කියා - *[බාධා කිරීමක්]* නැහැ, බොරු නොවෙයි. මම ඔබතුමාට සාක්ෂි ඉදිරිපත් කරන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අසත්‍ය කියන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අසත්‍ය කියන්න හේතුවක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා භයවෙලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ කාරණය ඔබතුමාගෙන් අහන්න කැමතියි, ගරු අග්‍රාමාත්‍යතුමනි. ඔබතුමාත් පාද යාත්‍රා ගිය කෙනෙක්. ඔබතුමාට ආරක්ෂාව සහිතව පාද යාත්‍රා යන්න ඉඩ ලබා දුන්නා. *[බාධා කිරීම්]* මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, තමන්ගේ දුක්ගැනවිලි, තමන් මුහුණ දෙන ප්‍රශ්න, තමන් මුහුණ දෙන ආර්ථික, සමාජයීය ගැටලු විපක්ෂ නායකවරයාට ඉදිරිපත් කරන්න රටේ ජනතාවට නිදහසක් නැද්ද කියලා. රටේ ජනතාවට තමන්ගේ දුක්ගැනවිලි පිළිබඳව කථා කිරීමේ නිදහසක් නැද්ද? අදහස් ඉදිරිපත් කිරීමේ නිදහසක් නැද්ද? මම මේ අවස්ථාවේදී අහන්න කැමතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වී තිබෙන මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාව මේ රජයට අමතකවෙලාද කියලා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් බව. ප්‍රජාතන්ත්‍රවාදී රට තුළ මූලික අයිතීන් තිබෙනවා; මූලික අයිතිවාසිකම් තිබෙනවා; සිවිල් අයිතිවාසිකම් තිබෙනවා; දේශපාලන අයිතිවාසිකම් තිබෙනවා. ඔබතුමාම හොඳාකාරවම දන්නවා, ඊයේ දවසේ පොලිසි රාශියක නිලධාරිතුමන්ලා ගැවසුණේ පොලිසිවල නොවන බව. තමන්ගේ රාජකාරි කටයුතු කිරීම නොවෙයි එතුමන්ලා කළේ. එතුමන්ලා කළේ උසාවිවල තහනම් නියෝග ගත් එක. හැමෝම දන්නවා නේ තහනම් නියෝග ලබා දීමේදී ඇති වුණු ප්‍රතිඵලය මොකක්ද කියලා. අධිකරණ කීයකින් ඒක ප්‍රතික්ෂේප කළාද?

මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර රටේ ජනතාවට කථා කිරීමේ නිදහස -භාෂණයේ නිදහස-, අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම රටේ ජනතාවට විපක්ෂ නායක කාර්යාලයට ඇවිල්ලා, විපක්ෂ නායකවරයාට දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ නිදහස -ඒ අයිතිය- තිබෙනවා. ඒ අයිතිය නතර කරන්න හොඳ නැහැ. අද මාර්ග බාධක - checkpoints - දමා තිබෙනවා. මම කැමති නැහැ රටේ පොලිසියට, ආරක්ෂක අංශවලට නිග්‍රහ කරන්න. නමුත් ඒ අයට බල කරලා තිබෙනවා, ගෙවල්වලට ගිහිල්ලා, කොළඹට අද නාම ලේඛන අරගෙන යනවාද බලන්න කියා. මම මේ ඇත්ත කියන්නේ, ගරු අග්‍රාමාත්‍යතුමනි, අසත්‍ය කියන්න මට කිසිම හේතුවක් නැහැ. අපිට ලැබිලා තිබෙන ඒ වීඩියෝ දර්ශන ටික මම ඔබතුමාට ලබා දෙන්නම්. ඒවා අසත්‍ය දේවල් නොවෙයි; ඒවා හදපු දේවල් නොවෙයි. ඒ ප්‍රදේශවලට අදාළ වීඩියෝ දර්ශන තිබෙනවා.

මම කියනවා ජනතා පීඩනය, ජනතාව අසහනයට ලක් කිරීම, ජනතා අයිතිය මර්දනය කිරීම, මේ තෙරපීම වහා නතර කරන්න කියලා. මේක නුසුදුසු ක්‍රියාවක්. ඇත්ත වශයෙන්ම පොලිසිය භාර භාර ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ සියලුම පොලිස් භට කණ්ඩායම් යොදවලා, ආරක්ෂක භට කණ්ඩායම් යොදවලා කතෝලික ප්‍රජාව, ඒ වාගේම අති උතුම් කාදිනල්තුමාගේ ඉල්ලීම් ඉටු කරන්න කියලා. මොකක්ද එතුමාගේ ඉල්ලීම? පාස්කු ප්‍රහාරය පිටුපස හිටපු කණ්ඩායම්, ඒකේ මොළකරුවන් පිළිබඳව සොයලා එහි සම්පූර්ණ සත්‍යය රටට හෙළි කරන්න කියන එක. අන්න ඒවා හොයන්න කටයුතු කරන්න. ඒවාට පොලිස් කණ්ඩායම් යොදවන්න. ඒක තමයි කතෝලික ප්‍රජාවගේ ඉල්ලීම; කාදිනල්තුමාගේ ඉල්ලීම. රටේ ජාතික ආරක්ෂාව ගැන මේ තරම් ලොකු උනන්දුවක් දක්වනවා නම්, මම ඉල්ලීමක් කරනවා ඒ දේ කරන්න කියලා. පොලිස් ක්ෂේත්‍රය භාර ඇමතිතුමාගෙන්, වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා කරුණාකර මේ කරන්නා වූ බාධා නතර කරගන්න කියලා. ඒවා ඉතාම නින්දා සහගතයි. *[බාධා කිරීම්]*

ඉතාම පහත් ක්‍රියාවක් මේ කරන්නේ. එම නිසා මා කරුණිකව ඉල්ලීමක් කරනවා, රටේ ජනතාවට තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ක්‍රියාත්මක කිරීමේ නිදහස ලබා දෙන්න කියලා. මතක තියා ගන්න, රට තුළ තමයි රටේ ප්‍රශ්න විසඳාගන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ රට ඇතුළත තමයි අපි රටේ ප්‍රශ්න විසඳාගන්න ඕනෑ. විවිධ බාහිර බලවේග හරහා අපි උත්සාහ දරන්නේ නැහැ රටේ ප්‍රශ්න විසඳාගන්න. මොකද, මේක අලුත් සංස්කෘතියක්. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. එතුමාට ඇඟිල්ල දිගු කරන්න. මට ඇඟිල්ල දිගු කරන්න එපා. *[බාධා කිරීම්]* ගරු අග්‍රාමාත්‍යතුමනි, මම ඔබතුමාට කියන්නේ රටේ ප්‍රශ්න රට ඇතුළත අපි විසඳා ගන්නවා. *[බාධා කිරීම්]* රටේ ප්‍රශ්න විසඳා

ගන්න ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක් තිබෙනවා. පොලිස් ක්ෂේත්‍රය භාර ඇමතිතුමා දන්නවා නේ, මේ රට පොලිස් රාජ්‍යයක් නොවෙයි නේ. This is not a police State. මේක ස්වෛරී රටක්; ඒකීය රටක්; භෞමික අඛණ්ඩතාව ආරක්ෂා වුණු රටක්. ගරු අග්‍රාමාත්‍යතුමාම කියනවා නේ, රටේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැම්මා කියලා. ඒක හොඳ දෙයක්. නමුත් අද කියනවා ත්‍රස්ත ක්‍රියාවක් සිදුවීමේ ඉඩකඩ තිබෙනවා කියලා. එහෙම කොහොමද වෙන්නේ? අද මාධ්‍යවල එහෙම සඳහන් වෙලා තිබෙනවා. මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් කාරණයක් අහන්න කැමැතියි. ත්‍රස්තවාදය මුලිනුපුටා දමපු රටක ජාතික ආරක්ෂාව සුරක්ෂා කිරීමේ වගකීමෙන් යුතුව රාජ්‍ය බලයට ප්‍රවේශ වුණු ඔබ සියලුදෙනා රටේ ජාතික ආරක්ෂාව රැක ගන්න ඕනෑ, ප්‍රහාර එල්ල වෙනවා කියලා බිය වැද්දීම් කරන්නේ නැතිව රට ආරක්ෂා කර ගන්න ඕනෑ. ජනතාව එන්නේ තමන්ගේ දුක්ගැනවිලි විපක්ෂ නායකවරයාට ඉදිරිපත් කරන්න. ඒකටත් නිදහසක් නැද්ද? ජනතාව එන්නේ අපිට ජනතා ප්‍රශ්න ඉදිරිපත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමාගේ කාලය තමයි ගන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කිරිපිටි පෝලිම, ගෑස් පෝලිම, සීනි පෝලිම, හාල් පෝලිම, පරිප්පු පෝලිම, තෙල් පෝලිම, භූමිතෙල් පෝලිම ගැන ප්‍රශ්න ඉදිරිපත් කරන්න තමයි ජනතාව අපිත් සමඟ අත්වැල් බැඳ ගන්නේ. *[බාධා කිරීමක්]* මම බොහොම කාරුණිකව නැවත වරක් ඉල්ලීමක් කරනවා, ජනතා මර්දන ක්‍රියාවලිය වහාම නතර කරන්න කියලා. මේක ප්‍රජාතන්ත්‍රවාදී රටකට සුදුසු දෙයක් නොවෙයි. රටේ ස්වෛරීත්වය ගැන අපි ආඩම්බර වෙනවා. රටේ ස්වෛරීත්වය, ජනතා ස්වෛරීත්වයට - for pepole's sovereignty - වාගේම ජනතා පරමාධිපත්‍යයට රටේ තැන තිබෙන්න ඕනෑ. මම මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. මේ සිද්ධ වන මර්දනකාරී ක්‍රියාවලිය වහා නතර කරන්න කියලා ගරු අග්‍රාමාත්‍යතුමාගෙනුත් පොලිස් ක්ෂේත්‍රය භාර ගරු ඇමතිතුමාගෙනුත් මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි දහයක් ගත්තා, විපක්ෂ නායකතුමනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මම මේ කාරණය කියන්න ස්ථාවර නියෝග 88 තමයි අදාළ කර ගන්නේ. ඒ වාගේ දේවල් කරලා තිබෙන්නේ කොහෙද කියලා ඇහුවා නේ. දෙනියාය මැතිවරණ කොට්ඨාසයේ කොස්මෝදර පොලිස් වසමේ කොටපොල හන්දියේදී මේ මොහොත වන විට කොස්මෝදර පොලීසියේ සිල්වා කියන මහත්මයා දෙනියායෙන් ආපු බස් එක නතර කළා. අකුරැස්ස පොලිස් වසමේ, අමලගොඩ හන්දියේදී, අකුරැස්ස මැතිවරණ කොට්ඨාසයේ අකුරැස්ස පොලීසියෙන් අකුරැස්ස, අතුරලිය, මාලිම්බඩ බස් තුන නතර කළා. තැන් තුනක් මම ඇහුවා. තැන් දෙකක් කිව්වා. බස් හතරක් නවත්වපු හැටි කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම මේ කාරණයට සම්බන්ධ වන්නේ ස්ථාවර නියෝග 91(එ) යටතේ. මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විෂය කරුණට අදාළව කථා කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමනි, මේ විෂය කරුණට අදාළව ගත්තොත්, අපේ රටේ නීති තුනක් තිබෙනවා. එකක්, අපි වැදගත් කියන අලි සබ්රි ඇමතිතුමාගේ -අධිකරණ ඇමතිතුමාගේ- නීතිය. දෙවැනි එක, ඥානසාර හාමුදුරුවන්ගේ නීතිය. තුන්වැනි එක, සරත් වීරසේකර ඇමතිතුමාගේ නීතිය. මේ නීති තුනෙන් කුමන නීතිය ක්‍රියාත්මක කරලා ද අද මේ එන මහ ජනතාව නවත්වන්න හදන්නේ? මෙතැන නීති තුනක් නේ තිබෙන්නේ. එක රටක එක නීතියක් තිබෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒක ප්‍රකාශ කළා.

ගරු සරත් වීරසේකර ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ගරු සභාව සහ ජනතාව නොමඟ යවන්න තමයි මේ කටයුතු කරන්නේ. ඇත්ත වශයෙන්ම රටට අංශු මාත්‍රයක තරම්වත් ආදරයක් තිබෙනවා නම්, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂය කළ යුත්තේ, ආණ්ඩුවත් සමඟ එකතු වෙලා වයිරසය විනාශ කරනවා මිසක් වයිරසය සමඟ එකතු වෙලා ආණ්ඩුව විනාශ කරන්න කටයුතු කිරීම නොවෙයි.

දැන් එතුමන්ලා කරන්නේ ඒකයි. ගරු කථානායකතුමනි, පොලීසිය තිබෙන්නේ නීතිය හා සාමය රකින්නයි. ඒ විතරක් නොවෙයි. ජන රැළි පැවැත්වීම හෝ වෙනත් මොනවා හෝ කටයුත්තක් කොරෝනා රෝගය ව්‍යාප්ත වීමට තුඩු දෙනවා කියා සෞඛ්‍ය අංශ බලධාරීන් විසින් එය වැළැක්වීමට යම් මහ පෙන්වීමක් කර උපදෙසක් ලබා දුන් පසු ඒ සියලු කටයුතු නවත්වන්න කටයුතු කරන්න ඕනෑත් පොලීසියයි. එතකොට පොලීසිය කරන්නේ නීතිගරුක කටයුත්තක්. යම් කාරණාවකට අදාළව පැමිණිල්ලක් කිරීමට තිබෙනවා නම්, එය කරන්න. අපි ඒ ගැන විභාග කරන්නම්.

අපි ජාතික ආරක්ෂාව තහවුරු කරලා තිබෙනවා. විපක්ෂයේ කෙනෙක් තමයි, "හෙට බෝම්බයක් ගහනවා" කියලා තාත්තා කිව්වාම බුදියාගෙන ඉඳලා කාදිනල්තුමාටවත් කියන්නේ නැතිව කතෝලික ජනතාවගේ ජීවිත සම්පූර්ණයෙන්ම අවදානමට ලක් කිරීමට කටයුතු කළේ. එහෙම කළේ, තමුන්නාන්සේලාගේ පක්ෂයේ කෙනෙක්. අපේ පැත්තේ එහෙම අය නැහැ.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

ඒ වාගේම තමයි ගරු විපක්ෂ නායකතුමනි, යම් සිද්ධියක් ගැන ඔබතුමාගේ ආරක්ෂක නිලධාරියාට වෙන කෙනෙක් ඇවිල්ලා තමයි තුණ්ඩුවක් දීලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන්න තිබෙනවා නම් කරන්න. අපි අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධව කටයුතු කරන්නම්. ජාතික ආරක්ෂාව අපි දැන් තහවුරු කරලා තිබෙනවා. කිසි දෙයකට භය වෙන්න එපා. පොලීසිය විසින් කරන්නේ සෞඛ්‍ය බලධාරින්ගේ යම් කිසි උපදෙසක් තිබෙනවා නම්, අධිකරණ නියෝගයක් තිබෙනවා නම් ඒක ක්‍රියාත්මක කිරීමයි. ඒ නිසා පොලීසියට නිකරුණේ දෝෂාරෝපණ කරන්න එපා. තමුන්නාන්සේලාට යම් කිසි පැමිණිල්ලක් කරන්න තිබෙනවා නම් ඒක කරන්න. ඒක අපි විභාග කරන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මගේ වරප්‍රසාද කඩවීමක් වෙලා තිබෙනවා. මිල්ලතේ, කිරිදිවැල තිබෙන මගේ කාර්යාලය ඉදිරිපිටත් පොලීසිය barricade එකක් දාලා තිබෙනවා. පොලීසිය මගේ කාර්යාලයට ඇවිල්ලා බලපෑම් කර තිබෙනවා, විරෝධතාවක් සංවිධානය කිරීම පිළිබඳව. ගරු කථානායකතුමනි, පාස්කු ඉරිදා ප්‍රහාරයේ ත්‍රස්තවාදීන් කොළඹට එනවා වාගේ තමයි දැන් මේ ජනතාවට සලකන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමාගේ කාරණය කිව්වා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, -

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කාරණය කිව්වා. දැන් ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මේ වාගේ සිදුවීම් වෙලා තිබෙන්නේ කොහේද කියලා දැන් ඇහුවා. මගේ මිල්ලව නිවස ළඟත් මේ තත්ත්වයම තමයි තිබෙන්නේ. කුරුණෑගල පොලීසියෙන් ඇවිල්ලා ඒ සියලු ජනතාව විසුරුවා හරින්න හදනවා. මේ මොකක්ද වෙන්නේ? දැන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැද්ද? මේ විධියට කටයුතු කරන්නේ කොහොමද? මේ රටේ ජනතාවගේ ප්‍රශ්න සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් දෙන්නේ නැද්ද? *[බාධා කිරීමක්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍ය ගරු සරත් වීරසේකර මැතිතුමා කිව්වා, "මේවා කොවිඩ් වසංගතය නිසා දුන්නු නියෝග" කියලා. අධිකරණයෙන් එක තීන්දුවක් දෙනවා. එතුමා එක තීන්දුවක් දෙනවා. අපිට තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලා මේ විධියට හැමදාම barriers දමා ගෙන ද රට කරන්න හදන්නේ? අද ගොවියා මහ පාරේ; පාරිභෝගිකයා මහ පාරේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි, වෙනත් ප්‍රශ්නයක්.

මීළඟට, ගරු එම්.යූ.එම්. අලි සබ්රි අමාත්‍යතුමා.

[පූ.භා. 10.30]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
ගරු කථානායකතුමනි, 2022 අය වැය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මුලින්ම මා කියන්න ඕනෑ, මෙවර අය වැය ඉතාම අභියෝගාත්මක අය වැයක් බව. ලංකාවට පමණක් නොවෙයි, ලෝකයටම විශාල අභියෝගයක් වුණු කොවිඩ් වසංගතය හේතුකොටගෙන යම් යම් තීන්දු-තීරණ ගන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. එවැනි අභියෝගාත්මක අවස්ථාවකදී, රැල්ලට නොගිහින් රට ගැන හිතලා, දීර්ඝකාලීනව රටේ ස්ථායීත්වය ගැන හිතලා, ආර්ථිකය ගැන හිතලා, අභියෝගාත්මකව නිවැරදි අය වැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමාට අපේ ප්‍රණාමය පුද කරන්න ඕනෑ.

අපි සියලුදෙනාම දන්නවා, ලංකාවට ආදායම් ලැබෙන මාර්ග රාශියක් තිබෙන බව. දේශීය වශයෙන් අපට ආදායම් ලැබෙන මාර්ග කිහිපයක් තිබෙනවා. එකක් තමයි අපේ ආදායම් බදුවලින් - Income Taxවලින් - ලැබෙන ආදායම. ඒ වාගේම සුරාබදු පනතෙන් ලැබෙන ආදායම් සහ ශ්‍රී ලංකා රේගුවෙන් අපට ලැබෙන ආදායම් තිබෙනවා. මේවා සියල්ලම දැඩි පීඩනයකට ලක්වෙලා තිබෙනවා. ඒක අපි සියලුදෙනාම පොදුවේ පිළිගත යුතු දෙයක්. ඒ හේතුකොටගෙන රජයේ ආදායම ඉතාම බරපතළ ලෙස පීඩාවට ලක්වෙලා තිබෙනවා.

විදේශ ආදායම් ගැන, විදේශ විනිමය ගැනත් බොහෝ දෙනා විවිධ කථා කිව්වා. විදේශ විනිමය අපට ලැබෙන ආකාර ගණනාවක් තිබෙනවා. එකක් තමයි, විදේශවල සේවය කරන අපේ ශ්‍රී ලාංකිකයන් විසින් ලංකාවට එවන remittances. දෙවැන්න තමයි, අපි කරන exports. තුන්වැන්න තමයි, පිට රටින් ඇවිල්ලා ලංකාවේ කරන ආයෝජන. අපි දන්නා ආකාරයට අනිවාර්යයෙන්ම හතරවැන්න තමයි, සංචාරක ව්‍යාපාරය. 2019 වර්ෂය වනකොට ලංකාවට සංචාරක ව්‍යාපාරයෙන් පමණක් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.6ක් ලැබුණා. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු යළිත් හිස ඔසවනකොට 2020දී ඇති වුණු මේ වසංගත තත්ත්වය හේතුකොටගෙන එය යළිත් සම්පූර්ණයෙන්ම කඩා වැටී තිබෙනවා.

මෙහිදී අපට කළ හැකි දේවල් කිහිපයක් තිබෙනවා. එකක් තමයි අපනයනයට අවශ්‍ය පහසුකම් සලසා දී, රට විවෘත කර

පාලනය කරන එක. ඒක අපි හොඳට කරලා තිබෙනවා. ඒ හේතුකොටගෙන මේ වසංගතය තුළත් අපේ අපනයනය වැඩිදියුණු වෙලා තිබෙනවා. නමුත්, ලෝකයේම රටවල් සංචාරක ව්‍යාපාරය වහන කොට -ඔබතුමන්ලා දකින්න ඇති, ඉන්දියාව මාස 20කට පසු ප්‍රථම වතාවට tourist visa එකක් දෙන්නේ මේ සතියේයි. නවසීලන්තයේත් එහෙමයි; ඕස්ට්‍රේලියාවේත් එහෙමයි.- අපි මේ අභියෝග මධ්‍යයේත් සංචාරක ව්‍යාපාරය නැවත පටන් අරගෙන තිබෙනවා. පසු ගිය මාසය වනකොට, මේ මාසය වන කොට එහි පොඩි වර්ධනයක් තිබෙනවා. අපි සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ අභියෝගාත්මක කාලය තුළ යළිත් මේ රටේ වසංගතය පැතිරවීම සඳහා කටයුතු කරන්න එපා කියලා. රට ගැන හිතන්න. රට කරන්න කාටත් රටක් අවශ්‍යයි. නැවත වතාවක් මේ වසංගතය වැඩි වෙලා රට වහන්න සිද්ධ වුණොත්, විදේශිකයන් ලංකාවට එන එක නැවත වැළකුණොත් රට කරන්න වෙන්නේ නැහැ කියන එක අපි හැමෝම තේරුම් ගත යුතුයි.

එම නිසා අපි ඉතාම ගෞරවයෙන් මතක් කර සිටිනවා, මෙය දේශපාලනය කරන අවස්ථාවක් නොවෙයි, රට ආරක්ෂා කරගත යුතු අවස්ථාවක් බව. පක්ෂ විපක්ෂ අපි සියලු දෙනාම දැඩි වගකීමකින් යුතුව, ඕනෑකමකින් යුතුව, මනා පාලනයකින් යුතුව මේ අවස්ථාවේදී කටයුතු කළ යුතුයි. මේ වසංගතය තවදුරටත් ඉදිරියට රැගෙන නොයාමට වගබලා ගත යුතුයි.

අය වැය යන්නෙන් අදහස් කරන්නේ ආදායම හා වියදම කියන එකයි. අද හැම කථාවකදීම වියදම ගැන නැවත නැවත කියැවෙනවා. අර වියදම් කරන්න, මෙයාට වැඩියෙන් දෙන්න, අරයාට dole එකක් දෙන්න යනාදිය කියනවා. නමුත් ආදායම වැඩි කර ගන්න කවුරුත් අපට උපදෙස් දෙන්නේ නැහැ. ඕනෑම පුද්ගලයෙකුට පුළුවන් මෙය විවේචනය කරන්න නම්. විවේචනය කිරීම ඉතාම පහසුයි. විවේචනයට වඩා වැදගත් වන්නේ, "කොහොමද, මේ රට කරන්නේ?" කියන එක සම්බන්ධයෙන් අපට ධනාත්මකව උපදෙස් දෙන එකයි. එදා ගරු මුදල් ඇමතිතුමා කියපු ආකාරයට අපි ඔබතුමන්ලාගේත් උපදෙස් ලබා ගෙන කටයුතු කරන්න කැමැත්තෙන් ඉන්නවා. නමුත් ඒවා එන්නේ නැහැ. තව තවත් doles බෙදන්න කියලායි කියන්නේ. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "If you want to please everyone, sell ice cream" කියලා. ඒ කියන්නේ "ඔබට සියලු දෙනාම සතුටු කරන්න ඕනෑ නම්, අයිස්ක්‍රීම් විකුණන්න තමයි වෙන්නේ" කියන එකයි. නමුත්, ඉතාම වැදගත් අවස්ථාවක, තීරණාත්මක අවස්ථාවක, අභියෝගාත්මක අවස්ථාවක වඩා හොඳ sustainable economy එකක් ඇති කර ගැනීම සඳහා; තිරසර ආර්ථික සංවර්ධනයක් ඇති කරගැනීම සඳහා හොඳ අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව නැවත වතාවක් රජයට හා ගරු මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, මම හිතනවා අපි නිදහස් අධ්‍යාපනය වෙනුවෙන්, නිදහස් සෞඛ්‍ය සේවය වෙනුවෙන් හා දරිද්‍රතාවෙන් පීඩාවට පත්වන ජනතාව බේරා ගන්න ආරක්ෂක යන්ත්‍රණයක් - safety net එකක් - සකස් කිරීම වෙනුවෙන් හැරුණාම අනෙක් සියලු දේවල් සිදු කළ යුත්තේ dole බෙදන ක්‍රමයකින් නොවෙයි කියලා. දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව ඉන් ආරක්ෂා කරගෙන, නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරගෙන, නිදහස් සෞඛ්‍ය සේවය ආරක්ෂා කරගෙන අපි තවදුරටත් රට පාලනය කළ යුත්තේ, dole බෙදන ක්‍රමයකින් නොවෙයි. එහෙම කරලා මේ රට දියුණු කිරීමේ හැකියාවක් නැහැ. අවුරුදු 71ක් තිස්සේ අපි ඒ බව දැනගෙන තිබෙනවා. මහ බැංකුවෙනුත් ඒ යෝජනාව කරලා තිබෙනවා මම දැක්කා.

විශේෂයෙන්ම මේ ඉන්ධන පිළිබඳව ගත්තාම, ලෝක ඉන්ධන යන්ත්‍රණයට සාපේක්ෂව, ලෝක මිල ගණන්වලට සාපේක්ෂව, ක්‍රමානුකූලව විචලනය විය යුතු ක්‍රමවේදයකට ආපසු යා යුතුයි කියා මා හිතනවා. මහ බැංකුව ඒ යෝජනාව කර තිබෙනවා; මම පෞද්ගලිකව එකඟ වෙනවා, එම යෝජනාවට. මොකද, අවසාන වශයෙන් මේ බදු ගෙවන්නේ මේ රටේ දුප්පත් සියලු දෙනාගේ මුදල්වලින්. පෙට්‍රල් කාර් එකක් පාවිච්චි කළ හැකි, එහෙම නැත්නම් ඩීසල් කාර් එකක් පාවිච්චි කළ හැකි පුද්ගලයෙකුගේ ඩීසල් හා පෙට්‍රල් වියදම ආවරණය කිරීම සඳහා මහ ජනතාවගේ මුදල් යෙදවීම තේරුමක් නැහැ. ඒ subsidiary එක සුදුසු නැහැ. එම නිසා මහ බැංකුව කියපු ආකාරයට යළිත් වතාවක් මිල සූත්‍රයකට යා යුතුයි කියන ස්ථාවරය පිළිබඳව යළි සලකා බලන්න කියලා මා මේ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමාට හා රජයට යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මේ සියල්ල අතරතුර මේ අය වැය ලේඛනය දිහා ආපසු හැරිලා බලන කොට අපට පෙනෙනවා, මේ අය වැය තුළ අපේ කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහාත්, අපේ ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සඳහාත්, අපේ නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහාත්, අපේ ගොවියා රැක ගැනීම සඳහාත් ඉතාම හොඳ, ප්‍රගතිශීලී, ධනාත්මක යෝජනා රාශියක් තිබෙන බව. අපි උදාහරණයක් ගනිමු. කෘෂි කර්මාන්තය දියුණු කරන්න, කෘෂි තාක්ෂණික විප්ලවයක් ඇති කරන්න, සියලුදෙනාට පානීය ජලය සපයන්න, වැවිලි ආර්ථිකය ගොඩ නහන්න, පාරම්පරික නිෂ්පාදන ගොඩ නඟන්න, පශු සම්පත් වැඩි කරන්න, ආයෝජන කලාප ඇති කරන්න, අත් යන්ත්‍ර, බතික් ඇතුළු පේෂ කර්මාන්තය සඳහා ආයෝජන මධ්‍යස්ථාන ඇති කරන්න සහ ආර්ථිකය යළි ගොඩ නහන්න යෝජනා රාශියක් මේ අය වැය තුළ ඉදිරිපත් කර තිබෙනවා. මා හිතන හැටියට ඒකෙන් විතරයි අපට ගොඩ එන්න පුළුවන් වෙන්නේ.

කිසිම දවසක, විදේශිකයකු හෝ වෙනත් කිසිම පුද්ගලයකු ඇවිල්ලා අපට නිකම් ආධාර දෙන්නේ නැහැ. ඒ ආධාර පිටුපස තිබෙනවා, සැඟවුණු න්‍යාය පත්‍රයක්. එහෙම නම්, අපි දෙපයින් නැඟී සිටින්න ඕනෑ. දෙපයින් නැඟී සිටින්න නම් අපි ආර්ථිකය දියුණු කරන්න ඕනෑ; නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ; අපේ ජනතාවගේ හැකියාවන් වැඩිදියුණු කරන්න ඕනෑ. මේ අභියෝගාත්මක අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කර තිබෙන ආයෝජන අතිවිශිෂ්ටයි.

ඒ හා සමානවම, මේ රටේ යටිතල පහසුකම් සලසන්නේ නැතිව කිසිම ආර්ථිකයක් දියුණු කරන්න බැහැ; ආර්ථිකය ඉදිරියට ගෙන යන්නත් බැහැ; මිනිසුන්ට උදවු කරන්නත් බැහැ. විපක්ෂයේ සමහර අය ඒ සම්බන්ධයෙන් විවේචනය කරනවා මා දැක්කා. එය වැරදියි. වාරි සෞභාග්‍යය නැතිව ගොවියා කොහොමද ගොවිතැන් කරන්නේ? පානීය ජලය නැතිව මේ රටේ මිනිස්සු කොහොමද ජීවත් වෙන්නේ? ඒ හේතුකොටගෙන ඔවුන්ට ඇති වන රෝගී තත්ත්වය තුළ ඔවුන් නැවත වතාවක් රෝහල්ගත වුණා නම්, ඒකට ගෙවන්න වෙන්නේත් මේ රටේ ජනතාවගේ මුදල්.

හරිත බල ශක්තිය අපි ඉතාම හොඳින් කළමනාකරණය කරගෙන යනවා. විශේෂයෙන්ම ඉතාම අභියෝගාත්මක තීන්දු තීරණ රාශියක් ගෙන තිබෙනවා. ඒකේ ප්‍රතිලාභ අවසාන වශයෙන් ලැබෙන්නේ මේ රටේ ජනතාවට. අපට කෙටි කාලයක් අභියෝගවලට මුහුණ දෙන්න සිදු වෙයි. නමුත් අවසානයේදී ඒකේ ප්‍රතිලාභ ලැබෙන්නේ මේ රටේ මිනිසුන්ට. උදාහරණයක් හැටියට පාරවල් හදන එක ගනිමු. පාරවල් හදන එකේ ප්‍රතිලාභ ගොඩක් තිබෙනවා. පාරවල් හැදුණේ නැත්නම්, තමන්ගේ නිෂ්පාදනය අදාළ තැන්වලට ගෙන යන්නේ කොහොමද? මිනිසුන් ප්‍රවාහනය කරන්නේ කොහොමද? නිෂ්පාදනයට අවශ්‍ය යටිතල පහසුකම් හැදෙන්නේ කොහොමද?

මෑතකදී ලෝක බැංකුවේ උප සභාපතිවරයා ලංකාවට පැමිණියා. එතුමා සමඟ පැවැති සාකච්ඡාවකට මමත් සම්බන්ධ

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

වුණා, ගරු අගමැතිතුමා එක්ක. එතුමා ඉතාම පැහැදිලිව සඳහන් කළා, ලංකාවේ සම්පූර්ණ මාර්ග පද්ධතියේ තිබෙන සංවර්ධනය අද්විතීයයි කියලා; එය ඕනෑම දියුණු රටක් එක්ක සංසන්දනය කළ හැකියි කියලා. ඔවුන් ඉතාම කැමැත්තෙන් ඉදිරිපත් වුණා, ඒකට උදව් කරන්න.

අපේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය කරන්න අපි අනිවාර්යයෙන්ම ඉදිරිපත් වෙන්න ඕනෑ කියලායි මම නම් හිතන්නේ. එය දියුණු කිරීම සඳහා අපි අනිවාර්යයෙන්ම කටයුතු කළ යුතුයි. එහෙම කරලා තමයි අපට පුළුවන් වන්නේ, දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධනයකට අවශ්‍ය අඩි තාලම යොදන්න. එම නිසා මම හිතනවා මේ ආයෝජන අත්‍යවශ්‍යයි කියලා. මේ ආයෝජනවලින් බලාපොරොත්තු වන්නේ කාටවත් බෙදන්න නොවෙයි, අවසාන වශයෙන් රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය පසු බිම සකසන්නයි.

මම විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අවුරුදු 70ක් තිස්සේ මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට හා නීති ක්ෂේත්‍රයට ලැබිය යුතු ප්‍රමුඛතාව ලැබිලා තිබුණේ නැහැ. අපේ නීති යාවත්කාලීන වෙලා නැහැ. අපේ රටේ සමහර නීති අවුරුදු 100ක්, 120ක් පිටුපසින් තිබෙන්නේ. ජනගහනය මිලියනයකට සාපේක්ෂව විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව ගත්තොත්, අපේ රටේ අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව තමයි ලෝකයේ තිබෙන අඩුම ප්‍රමාණය. එනම්, ජනගහනය මිලියනයකට විනිශ්චයකාරවරු 15 දෙනකු පමණයි අපේ රටේ ඉන්නේ. නමුත්, මේ ආර්ථික අභියෝග මධ්‍යයේත් අපි බලාපොරොත්තු වුණු ප්‍රමාණයටම ඒ අවශ්‍ය වෙනස් කිරීම් කරන්න එතුමා ඉඩ සලසා තිබෙනවා. ඒකෙන් අප දෙන අදහස මොකක්ද? ඒ තමයි, මේ රටේ නීතිය යාවත්කාලීන කරන්න ඕනෑ කියන එක. මේ රටේ නීතිය යාවත්කාලීන කරන්නේ මොකටද? ලෝකය ඉදිරියේ අපි විශිෂ්ට ජාතියක් හැටියට නැඟී සිටින්නයි අපි එහෙම කරන්නේ. ආයෝජකයා ආවාම තමන්ගේ ආයෝජන පිළිබඳ ගැටලු ඉක්මනින් විසඳා ගන්න හැකි විය යුතුයි. එතකොට තමයි ආයෝජකයෝ ඒ පිළිබඳව විශ්වාසයක් ගොඩ නඟාගෙන නැවත ඇවිල්ලා මේ රටේ ආයෝජනය කරන්නේ. සමහර වෙලාවට, ඒ ප්‍රතිඵල අපට පෙනෙන්නේ නැහැ.

අපි උදාහරණයක් ගනිමු. නඩුවක් විසඳන කල් කවුරු හරි අවුරුදු 5ක් රිමාන්ඩ් භාරයේ ඉන්නවා නම්, ඒ අවුරුදු පහටම ඔහුට කන්න බොන්න දෙන්න වෙනවා; ඔහු රඳවාගෙන ඉන්න වෙනවා. අන්තිමේදී ඔහු නිදහස් කරනවා. අලුත් උසාවියක් පිහිටුවලා, ඔහුගේ නඩුව මාස තුනෙන් විසඳලා, නීතියේ ආධිපත්‍යය පිළිබඳව මිනිස්සු තුළ විශ්වාසයක් ගොඩ නඟන එක ඊට වඩා ලාභ නැද්ද? ඒ පිළිබඳව සලකා බලා මේ අභියෝගාත්මක අවස්ථාවේදී පවා ඒ සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දැක්වීම පිළිබඳව මම ක්ෂේත්‍රයේ සම්පූර්ණ කැමැත්ත ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, තවත් වැදගත්ම දෙයක් තමයි මේ රටේ අධ්‍යාපනය. මේ රටට ඉදිරියට යන්න ඕනෑ නම්, මේ රට වෙනස් වෙන්න ඕනෑ නම්, මේ රටේ සාමාන්‍ය මිනිසුන්ට තමන්ගේ ජීවිතය ජය ගන්න අවශ්‍ය පසුබිම සලසා දෙන්න ඕනෑ නම්, නිදහස් අධ්‍යාපනය තරම් වැදගත් දෙයක් තවත් නැහැ. අපි නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරලා තිබෙනවා. අවුරුදු 24ක්, 28ක් තිස්සේ විසඳා ගන්න බැරි වෙච්ච ගුරු ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා මේ වෙලාව තෝරා ගත්තා. නමුත් මේ අභියෝග මධ්‍යයේත් ඒ සියලු ප්‍රශ්න විසඳීම සඳහා අපි විශාල මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ, රුපියල් මිලියන 30,000ක පමණ ප්‍රමාණයක්.

ඒක මීට පෙර කවදාවත් කරගන්න බැරි වෙච්ච දෙයක්. අපි ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ඒ තමයි, මේ රටේ නිදහස් අධ්‍යාපනයට අපේ තිබෙන කැමැත්ත; ඇල්ම. නිදහස් අධ්‍යාපනය තුළින් මේ රටේ ජනතාව, විශේෂයෙන් සාමාන්‍ය ජනතාව දුගී දුප්පත්භාවයෙන් මුදාගෙන ඔවුන්ගේ අධ්‍යාපන පහසුකම් හා ශිල්පීය ඥානය තුළින් මේ රටේ තිරසර සංවර්ධනයට පාර කැපීමයි අප අදහස් කරන්නේ. ඒවා අභියෝගාත්මක දේවල්. ඒවා, ලොසින්ජර් බෙදනවා වාගේ, අයිස්ක්‍රීම් බෙදනවා වාගේ ලේසි දේවල් නොවෙයි. ඒ අභියෝග පිළිගැනීම, පිළිගෙන ඒවාට මුහුණ දීම සඳහා ශක්තියක් තිබෙන්න ඕනෑ; ධෛර්යයක් තිබෙන්න ඕනෑ; කොන්දක් තිබෙන්න ඕනෑ. එය කිරීමට හැකියාව ලැබීම පිළිබඳව මේ රජයේ කැබිනට් අමාත්‍යවරයෙකු හැටියට මම ආඩම්බර වෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට අපි විමසා බලන්න ඕනෑ අපේ රාජ්‍ය සේවය ගැන. මම යෝජනා කරනවා, අපේ රාජ්‍ය සේවය නවීකරණය කරන්න ඕනෑ, යාවත්කාලීන කරන්න ඕනෑ, එයට අවශ්‍ය ශිල්පීය ඥානය ලබා දෙන්න ඕනෑ කියලා. ලෝකයේ රටවල් රාශියක දියුණු රාජ්‍ය සේවයක් තිබෙනවා. බොහෝ රටවල් දියුණු වෙලා තිබෙන්නේ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හේතුකොටගෙන. උදාහරණයක් හැටියට බිහාර් ප්‍රාන්තය ගනිමු. ඔබතුමන්ලා එහි ගිහිල්ලා බැලුවාම පෙනේවි, නිතිෂ් කුමාර් කියන මහ ඇමතිවරයා බිහාර් ප්‍රාන්තයේ අතිවිශාල වෙනසක් කරලා තිබෙන බව. අතිශයින්ම දරිද්‍රතාවයෙන් පීඩා විඳි බිහාර් ප්‍රාන්තය අද වන කොට ඉන්දියාවේ වේගයෙන්ම දියුණු වන ප්‍රාන්තයක් බවට පත් කරලා තිබෙනවා. Corruption සම්පූර්ණයෙන් ඉවත් කරලා තිබෙනවා. ඒ සඳහා ඔහු උපයෝගි කරගෙන තිබෙන්නේත් තාක්ෂණයයි. අපේ රටේ තාක්ෂණයටත් ඩිජිටල්කරණය උපයෝගි කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසාගෙන යනවා. ඒ සඳහා අපි ආයෝජනය කරනවා.

ලෝකයේ පිළිගත් මතයක් තිබෙනවා. ඒක තමයි, වැඩි වැඩියෙන් මිනිසුන් අතරින් file එකක් යන කොට අල්ලසට, දූෂණයට තිබෙන අවස්ථාව වැඩියි කියන එක. Human touch එක පුළුවන් තරම් අඩු කරන්න ඕනෑ. ඒ කටයුතු online කිරීමේ හැකියාව තිබෙනවා නම්, ඒක ඉක්මනට, විනිවිද පෙනෙන ආකාරයට, කාර්යක්ෂම ලෙස කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ හින්දා අපි බලාපොරොත්තු වෙනවා, රාජ්‍ය සේවය, අධිකරණ ක්ෂේත්‍රය, Sri Lanka Customs ඇතුළු සියලු ආයතන පුළුවන් තරම් දුරට online ක්‍රමවේදයකට පවත්වාගෙන ගිහින්, ඩිජිටල්කරණයට ලක් කරලා මිනිසුන්ට බය නැතුව, රස්තියාදු වෙන්නේ නැතුව තමන්ගේ වැඩ ටික කර ගැනීමේ හැකියාව ඇති කරන්න. Online solution එකක් කියලා කිව්වාම සමහර අය වැරැදියට තේරුම් අරගෙන තිබෙනවා. එනම්, online එකෙන් application form එක print කරලා, ඒක අතින් පුරවලා, පෝලිමේ ඉඳලා භාර දීලා, තව තැනකට ගිහිල්ලා ඊට අදාළ මුදල් cashierට ගෙවන කටයුත්තයි කියලා. ඒක නොවෙයි, online කියන එකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. අපට ඉලක්කයක් තිබෙනවා. ඒ මොකක්ද? Online තිබෙනවා නම්, online apply කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒක download කරලා online ම submit කරන්න පුළුවන් වෙන්න ඕනෑ. Payment gateway එකක් ඇරලා ඒක online ම ගෙවන්න පුළුවන් වෙන්න ඕනෑ.

Online ගෙවීම් සිදු වුණාට පස්සේ, ඒක process කරලා online email කරන ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඒ මට්ටමට යා යුතුයි. මෙය අනෙක් රටවලට කරන්න පුළුවන් නම් අපට කරන්නට බැරි ඇයි? ඒ වෙනස කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ වනකොට විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රයේ සුප්‍රිම් උසාවි ඇතුළු උසාවි රාශියක් online ක්‍රමය - මාර්ගගත ක්‍රමය - යටතේ නඩු අහන්න පටන් අරගෙන තිබෙනවා. මෙම ක්‍රමවේදය

මේ රටේ සියලු ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබෙනවා නම්, අපට මේ රටේ ලොකු වෙනසක්, විප්ලවයක් කරන්න හැකියාව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සැලැස්ම හා ඊට අවශ්‍ය ආයෝජන මෙම අය වැය - Budget එක - තුළින් ඉදිරිපත් කිරීම පිළිබඳව නැවත වතාවක් මම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මම නැවත වතාවක් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටින්නේ මෙයයි. මේක ඉතා අභියෝගාත්මක කාලයක්. හැමෝටම පුළුවන් විවේචනය කරන්න, චෝදනා හෝ යෝජනා ඉදිරිපත් කරන්න. මම ඉල්ලා සිටින්නේ, අපි සියලුදෙනා එකට එක්වෙමු; we all should be together in this. අපේ පක්ෂයේ අයටත්, විපක්ෂයේ අයටත්, රජයේ සේවකයන් ඇතුළු සියලු දෙනාට අපි ඉතා ගෞරවයෙන් කියා සිටිනවා, මේ අමාරු අවස්ථාවේ දී සියලු දෙනාටම යම් යම් කැපවීම් කරන්න සිද්ධ වන බව. මේකෙන් අපි එළියට එන්න ඕනෑ. අපට මේකෙන් එළියට එන්න කාලයක් ගත වෙයි; අවම වශයෙන් තව මාස 8ක්, මාස 12ක් විතර ගත වෙයි. නමුත්, වාසනාවකට වාගේ අපට පෙනෙනවා Port City හරහා ආයෝජන දිනා ගැනීමේ හැකියාවක් අපට තිබෙන බව. සංචාරක ව්‍යාපාරය තුළ සංචාරයකයන් නැවත ගෙන්වා ගැනීමේ හැකියාව අපට තිබෙනවා. ඒවා යථා තත්ත්වයට එන්න ටිකක් කල් ගත වෙයි. එතෙක් රට ගැන හිතලා ඉවසීමෙන් සහ ත්‍යාගශීලිව යම් යම් කැපවීම් කරන්න කියලා මා සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ රට යළි සංවර්ධනය පැත්තට යොමු කිරීම සඳහා මේ අය වැය තුළින් අවස්ථාව ලැබේවා, කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක් තිබෙනවා.

[පූ.භා. 10.47]

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මුලින්ම මුදල් ඇමතිතුමාට සුබ පතන්න මම කල්පනා කළා. එතුමා මේ ගරු සභාවේ සිටියා. නමුත්, දැන් එතුමා සභාවේ නැහැ, පිටව ගිහින්. එතුමා ආපහු එයිද කියලා මම දන්නේ නැහැ. මොකද, විවාදය පැවැති පසුගිය දිනවල දීත් අපි එතුමා වැඩිය දැක්කේ නැහැ.

ගරු කථානායකතුමනි, මට මේ වෙලාවේ මගේ පාසල් කාලය මතක් වනවා. පිලිප් ගුණවර්ධන මහත්මයා, රොබට් ගුණවර්ධන මහත්මයා වැනි සටන්කාමී මන්ත්‍රීවරුන් සිටි කාලයේ අපි පාර්ලිමේන්තුව බලන්න ඇවිත් මහජන ගැලරියේ වාඩි වෙලා සිටියා. එහිදී අපි දැක තිබෙනවා, මුදල් ඇමතිතුමන්ලා විවාදය පුරාම ආසනයේ වාඩි වෙලා ඉන්නවා. එදා, වයෝවෘද්ධ වන්නිනායක මුදල් ඇමතිතුමා සටහන් ගත්ත හැටි මට මතකයි. එතුමා හදිසි අවශ්‍යතාවකට එළියට ගියත්, විනාඩියෙන් ආපහු ආවා. ඒ වාගේම තමයි එන්.එම්. පෙරේරා මැතිතුමා සටහන් ලියා ගත්ත හැටි. අද ඒ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය කොහේ ගිහින්ද දන්නේ නැහැ.

මේ පාර්ලිමේන්තුව කෙරෙහි ගරුත්වයක් තිබෙන්න ඕනෑ. මහජන නියෝජිතයන්ගේ අදහස්වලට ගරුත්වයක් තිබෙන්න ඕනෑ. මා විශ්වාස කරනවා, අපේ මුදල් ඇමතිතුමා නැවත සභාවට එයි කියලා. පසුගිය කාලයේ දී එතුමා වැඩිය දැක්කේ නැහැ. මේ සභාවට ඇවිල්ලා, එතුමා නැවත ඒ සම්ප්‍රදායට පණ දෙයි කියලා මා විශ්වාස කරනවා. ඔබතුමන්ලාගේ ආභාසය නිසා - *[බාධා කිරීමක්]* කිසිම සමාවකට හේතු නැතුව මුදල් ඇමතිවරු මේ සභාවට ප්‍රමුඛතාව දුන්නා, ගරු ඇමතිතුමනි. ඒක අමතක කරන්න එපා. අය වැය තමයි ලංකාවේ ප්‍රධානම දේ. *[බාධා කිරීමක්]* මා පිළිගන්නවා. හේතු ඇති. නමුත් මා කියන්නේ, ඒ කාලයේ ඇමතිවරු කටයුතු කළ විධිය. *[බාධා කිරීමක්]* පොඞ්ඩක් මම කියන දේ සාධනීය පැත්ත බලන්න කෝ, නිෂේධාත්මක විධියටම කටයුතු කරන්නේ නැතුව. මුදල් ඇමතිතුමා මගේ පාසල් මිත්‍රයා. මුදල් ඇමති ධුරයට පත් වීම ගැන මම එතුමාට සුබ පතන්නයි හිටියේ. හැබැයි, මේ අය වැය යෝජනා සම්බන්ධයෙන් මල් පොකුරු දෙන්න නම් අපට පුළුවන්කමක් නැහැ.

අපේ විපක්ෂ නායකතුමා මට පෙර කථා කළා. එතුමා වැදගත් කරුණක් ගැන සඳහන් කළා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම ගැන එතුමා කථා කළා. අපි ප්‍රජාතන්ත්‍රවාදී රටක්. ලබන සතියේ පාසල් සියල්ල සම්පූර්ණයෙන්ම පටන් ගන්න ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා. ජනාධිපතිතුමා සහභාගි වන රැස්වීම්වල සෙනඟ පිරිලා ඉන්න හැටි අපි දකිනවා. එහෙම නම් විපක්ෂය යම්කිසි දෙයක් කරන්න යනකොට බාධා කරන්නේ ඇයි?

මම තව එක දෙයක් කියන්න කැමැතියි. මම නම කියලා අපහාස කරන්න කැමැති නැහැ. මට දැන ගන්න ලැබුණා, අපේ ඇමතිවරයෙක් එක්තරා කොට්ඨාසයක -මටත් සම්බන්ධ කොට්ඨාසයක- ඉහළ පෙළේ පොලිස් නිලධාරියෙකුගේ කාර්යාලයට ගිහිල්ලා, හෙට තිබෙන විරෝධතාව සම්බන්ධයෙන් කටයුතු කරන්න සිවිල් ඇඳුමෙන් කණ්ඩායමක් ලැහැස්ති කරන්න කියලා OIC මහත්වරුන්ට කථා කරලා උපදෙස් දෙන ලෙස කියා තිබෙන බව. ඒක ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට සුදුසු නැහැ. අපේ රටෙත්, ඒ වාගේම ලෝකයෙත් මේ විධියට අධි මර්දනය තුළින් ජනතාවගේ අදහස් යටපත් කරන්න හදපු පාලකයන්ට ජනතාව තීන්දු දීලා තිබෙනවා. 1970-1977 කාලය මතක් කරලා බලන්න. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට කිව්වා, ෆිඩෙල් කැස්ත්‍රෝ වාගේ කෙළින් ඉන්න කියලා; මාඕ සේතුං වාගේ කෙළින් ඉන්න කියලා. 1970-1975 දක්වා බලයට පත් වුණු ආණ්ඩුව 1977 දක්වා ජනමත විචාරණයක්වත් නැතිව පාලන කාලය දීර්ඝ කර ගත්තා. ගරු කථානායකතුමනි, ඔබතුමාට මේවා ගැන හොඳට අත්දැකීම් තිබෙනවා. මා ඒ පරණ කාලය මතක් කරන්න කැමැතියි. මට මතකයි, අපි අත්තනගල්ලේ සත්‍යග්‍රහයට ගිය වෙලාවේ ගස් කපලා පාරට දැම්මා; නියතපාල මහත්මයාගේ ඔළුව පැළුවා. තලප්පාවක් බැඳගෙන වාගෙයි එතුමා ගියේ. තර්ජන ගැන දැන ගත්ත නිසා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එදා අනුරාධපුර සත්‍යග්‍රහයට කලින්ම ගිහිල්ලා හිටියා. මොකද වුණේ? ගියොත්, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් දෙනවාය කිව්වා. දේපළ රාජසන්තක - *[බාධා කිරීමක්]* හරි. මේ විෂම චක්‍රය අපි නැවැත්විය යුතුයි. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඒ ගොල්ලන් කරපු නිසා ඔබතුමන්ලාත් කරනවා නම්, මේක නවතින්නේ කවදාද? අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න ඕනෑ. බණ්ඩාරනායක මැතිනිය කරපු ඒ දේවල් නිසා අවසානයේ මොකද වුණේ? ජනමත විචාරණයක් නැතිව 1975-1977 දක්වා එතුමියගේ පාලන කාලය දීර්ඝ කර ගත්තා. 1977දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට හයෙන් පහක බලයක් ලැබිලා, එතුමියට ගෙදර යන්න සිදු වුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, -

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මේක මගේ වෙලාව, ගරු ඇමතිතුමා. ඔබතුමා මගේ මිත්‍රයා. *[බාධා කිරීමක්]* මගේ වෙලාවේ, මගේ අවස්ථාවට බාධා කරන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. මට තිබෙන්නේ සීමිත කාලයක්.

බණ්ඩාරනායක මැතිනිය ගෙදර යැව්වේ, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට හයෙන් පහක බලයක් දීලා. ඉතිහාසය මතක් කර ගන්න. ෆිඩෙල් කැස්ත්‍රෝ වගේ කෙළින් ඉන්න කියලා, දිරව්ව ලුණු කාපු නායකයන්ට මේ රටේ ජනතාව පාඩම් ඉගැන්නුවා. ලෝක ඉතිහාසය දිහා බලන්න. ඉඩි අමීන්ලාට වෙච්ච දේ දිහා බලන්න. ඉරානයේ ෂාට වෙච්ච දේ දිහා බලන්න. ටියුනීසියාවේ ඒකාධිපති පාලකයාට සිද්ධ වෙච්ච දේ දිහා බලන්න. හංගේරියාවේ, පෝලන්තයේ ඒකාධිපති පාලකයන්ට සිද්ධ වෙච්ච දේවල් දිහා බලන්න. සිහින මවන්න එපා. ජනතාව බලවත්. මහ ජනතාවගේ හඬ මේවායින් යටපත් කරන්න බැහැ. පාඩමක් ඉගෙන ගන්න. අපේ රටේ ඉතිහාසයෙනුත්, ලෝක ඉතිහාසයෙනුත් පාඩමක් ඉගෙන ගන්න කියලා මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

මම දැන් අය වැය පිළිබඳව කථා කරන්නම්, ගරු කථානායකතුමනි. මේ අය වැය ගැන කථා කරද්දී මට එක කාරණයක් කියන්න තිබෙනවා. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක් සහ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන අද ලෝකයේ කථා කරනවා. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනකොට, ජනතාවට බලපාන ප්‍රශ්නවලදී ජනතාව සම්බන්ධ කර ගැනීම ඉතාම වැදගත්. විවෘත ආර්ථිකය තුළ ජනතා සහභාගිත්වයට ඉඩ දීම වැදගත්. නමුත් අද ගොවීන්ගේ ප්‍රශ්න ආදිය ගන්නකොට ඒවාට සම්බන්ධ වී ගොවියා, හේන් ගොවියා, පලතුරු ගොවියා, එහෙම නැත්නම් එම ක්ෂේත්‍රයේ සිටින නිපුණයන් එක්ක සාකච්ඡා කරලා තීන්දු ගන්නවාද? එහෙම දෙයක් නැහැ. උද්ධච්ච තීරණවලට යනවා. "අපි අවුරුදු 10කින් කරනවා"යි කියලා, "සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ කියලා, පැය විසිහතරෙන් දඩි බිඩි තීරණ අරගෙන ඒ දේවල් ක්‍රියාත්මක කරන්න යනවා. මිනිසුන්ට ආදායමක් නැහැ. අපේ අපනයන ආදායම් බිඳ වැටිලා. බලන්න, මේ තත්ත්වය දිහා. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වුණොත්, ඒ රටවල දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය තිරසාර වෙනවා; ස්ථිර වෙනවා. නෝර්ඩික් රටවල, ස්කැන්ඩිනේවියානු රටවල මේ තත්ත්වය තිබෙන බව අපි දකිනවා. මේවායින් අපි පාඩම් ඉගෙනගත යුතුව තිබෙනවා. ඒ නිසා අද අපේ රටටත්, ජනතාවටත් ආර්ථික අතින් මුහුණ දෙන්න සිදුවී තිබෙන අනතුරුදායක තත්ත්වය අපි කාටවත් වසන් කරන්න පුළුවන්කමක් නැහැ. "Nikkei Asia" කියන්නේ ජපානයේ තිබෙන මූල්‍ය පුවත් පතක්. ඒක තමයි ලෝකයේ වැඩියෙන්ම විකිණෙන පුවත් පත. ඒ පුවත් පත එක දවසකට මිලියන තුනක් විකිණෙනවා. පසුගිය සතියේ "Nikkei Asia" පුවත් පත කියා තිබෙනවා, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කුමන මොහොතක හෝ පිපිරෙන්න ආසන්න කාලබෝම්බයක් කියලා. මේක තමයි යථාර්ථය. අපි මේ තත්ත්වය වසන් කරන්න යාමෙන් අපේ රටට කරන්නේ හොඳක් නොවෙයි, අනර්ථයක්. 70 දශකයේ අපේ රටේ ජනතාව මුහුණ දුන් තත්ත්වය හා සමාන හෝ ඊට වඩා දරුණු තත්ත්වයකට අද අපි ඇවිත් ඉන්නවා. අද අපේ ජනතාව මුහුණ දීලා තිබෙන ප්‍රධාන අභියෝගය ජීවත් වීම පිළිබඳ ප්‍රශ්නය; ජීවත් වීමේ අරගළය, ගරු කථානායකතුමනි.

රටක් වශයෙන් අපට මුහුණ දීමට සිදුව ඇති ප්‍රධාන අභියෝග කිහිපයක් තිබෙනවා. පළමුවැන්න හැටියට මම සලකන්නේ අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය පතුලටම බැස තිබීම. මේ පිළිබඳව මම වැඩිදුර කරුණු පැහැදිලි කරන්න ඕනෑ නැහැ. සපුගස්කන්ද තෙල් පිරිපහදුව රජය විසින් ඊයේ දින 50කට වහලා දැම්මා. මේ බව කිව්වේ අදාළ ඇමතිවරයා. එතුමා මොකක්ද කිව්වේ? රට විදේශ විනිමය පිළිබඳ අර්බුදයක පැටලී ඇති බවත්, රටට අත්‍යවශ්‍ය වන ද්‍රව්‍ය ආනයනය කර ගැනීම සඳහා පවතින සීමිත විදේශ විනිමය පාවිච්චි කිරීමට සිදුව ඇති බවත්, ඒ හේතුවෙන් තෙල් මිලට ගැනීමට විදේශ විනිමය නොමැති හෙයින් මේ තීරණය ගත් බව සඳහන් කළා. මේ ප්‍රකාශය කළේ කැබිනට් ඇමතිවරයා.

දෙවැනි අභියෝගය වෙන්නේ ගෙවන්න මඟක් නොමැතිව, එහෙත් දිනෙන් දිනම වැඩි වෙමින් වර්ධනය වෙමින් යන අපේ රටේ විදේශ ණය කන්දරාව. ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර වශයෙන් පිළිගැන්මට භාජන වෙලා තිබෙන ණය ශ්‍රේණිගත කිරීම් පිළිබඳ ආයතන වන Fitch, Moody's සහ S&P වැනි ආයතන ප්‍රකාශ කරනවා, ඉතිහාසයේ ප්‍රථම වරට ශ්‍රී ලංකාව ලබන අවුරුද්දේ ණය ගෙවාගත නොහැකි තත්ත්වයකට වැටෙන බව. ලෝකය පිළිගත්, ණය පිළිබඳ ශ්‍රේණිගත කිරීමේ සංවිධාන මෙය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

තුන්වැනි අභියෝගය වන්නේ අපේ රුපියලේ අගය අවප්‍රමාණය වීම සඳහා ඇති බැරෑරුම් පීඩනය. අප කවුරුත් දන්නවා, රුපියලේ නිල වටිනාකම තුළින් එහි නියම වටිනාකම දැක ගන්න බැහැ කියන එක. අපේ රටේ විදේශ විනිමය ඉපැයීම්වලින් හතරෙන් එකක් පමණ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ඉපැයීම් තුළින් ලැබෙන ආදායම. මෙම ආදායම් අද ශ්‍රී ලංකාවට බොහෝ දුරට එවීම සිදු වන්නේ නීත්‍යානුකූල නොවන මාර්ගවලින්. එයට හේතුව, ඒ මඟින් ඩොලරයේ නියම වටිනාකම ලබා ගැනීමට ඔවුන්ට පුළුවන්කමක් ලැබෙන නිසා.

හතරවැනි අභියෝගය රජයේ ආදායම් අඩු වීම. පස්වැනි අභියෝගය හැටියට මම සලකන්නේ ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ විශේෂයෙන් ආහාර, බෙහෙත්, ඉන්ධන, පොහොර ආදිය ආනයනය කිරීමට රජයට ඇති හැකියාව අඩු වෙමින් පැවතීම. මේ ගැටලුව අපේ විදේශ විනිමය හිඟකම හා බැඳුණු එකක්. හයවැනි අභියෝගය වන්නේ රටේ ජනතාවට ඉදිරියේදී අවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයක් ඇතිවීමට තිබෙන අවදානම. දැනටමත් රට පුරා විවිධ ආහාර ද්‍රව්‍ය සඳහා මෑත කාලයේ අප නොදුටු විධියට පෝලිම් යුගයක් ආරම්භ වෙලා තිබෙන බව අපි දන්නවා. පොහොර පිළිබඳව දුර දැක්මකින් තොරව ගෙන ඇති කලබල තීරණ නිසා ඉදිරි කාලයේ ආහාර ද්‍රව්‍ය පිළිබඳ අස්වැන්නේ ලොකු අඩුවීමක් අපේක්ෂා කරනවා. මේ පසුබිම තුළ විශාල ආහාර හිඟයක්, සාගතයක් පිළිබඳව පවා අනාවැකි පළ වෙමින් තිබෙනවා.

හත්වන අභියෝගය වන්නේ, ජනතාවට දරාගත නොහැකි තරමට භාණ්ඩ මිල ඉහළ යාමයි. රටක් ලෙස අප මුහුණ දී ඇති මේ අනතුරුදායක අභියෝග ගැන, අපේ අබියසට පැමිණ ඇති මේ ඛේදවාචක ගැන නිසි ලෙස අවබෝධ කරගෙන, වගකීමෙන් යුතුව ඒවා අමතන්න ගෙන ඇති උත්සාහයක් මේ අය වැය තුළින් නම් දැක ගන්න නැහැ. ජනතාව මුහුණ දී ඇති ජීවන අරගළය මෙන්ම රටට ආහාර සපයන, රටට ආදායම් ගෙන දෙන ජනතාව තම නිෂ්පාදන කටයුතුවලදී මුහුණ දී සිටින අනේක විධ ප්‍රශ්න සම්බන්ධව සංවේදී වී ඒ සඳහා පිළියම් ලබා දීමට මේ අය වැය

සැලකිලිමත් වී නැහැ. මේ අය වැයේ ආදායම් පාර්ශ්වය සහ වියදම් පාර්ශ්වය අතර ඇති පරතරය දිහා බලන්න. අද අප මුහුණ දී ඇති ප්‍රශ්න තුළ මේ පරතරය බිය ගෙන දෙන තත්ත්වයක්; අනතුරුදායක තත්ත්වයක්; රටට ආදරය කරන ඕනෑම පුරවැසියෙකුට කම්පනයක් ගෙනදෙන තත්ත්වයක්.

අපේ රටේ ගෞරවයට පාත්‍රව සිටින හිටපු මහ බැංකු නියෝජ්‍ය අධිපතිවරයෙකු වූ ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහත්මයා පසුගිය දා සඳහන් කර තිබුණා, 1977න් පසු ප්‍රථම වරට අපේ රටේ විදේශ වත්කම් ඍණ තත්ත්වයකට පත්ව ඇති බව. මහ බැංකුවේ දළ දේශීය වත්කම් ප්‍රමාණය - net foreign assets position - අගෝස්තු මාසයේ අවසානය වන විට ඍණ තත්ත්වයකට බැස ඇති බවට මාධ්‍ය වාර්තා පළ වී තිබුණා. මහ බැංකුවේ විදේශ විනිමය වගකීම්, විදේශ වත්කම් ප්‍රමාණය ඉක්මවා ගිය විට මේ ඍණ තත්ත්වය ඇති වෙනවා. රටක ආර්ථිකය මෙලෙස ඍණ තත්ත්වයකට පත්වීම මඟින් පෙන්නුම් කරන්නේ ආර්ථික කළමනාකාරිත්වයේ ඇති අසාර්ථක බවයි. 1977 දී, එවකට පැවැති රජයට අන්ත පරාජයකට පත් වන්න සිදු වුණේ මේ හා සමාන ආර්ථික තත්ත්වයක් එදා යුගයේ උදා වී තිබීම නිසායි.

අද අප මුහුණ දී ඇති තත්ත්වය තුළ රටේ ආර්ථිකය ගොඩ ගැනීම සම්බන්ධයෙන් මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා ඔක්තෝබර් මාසයේදී "ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා මාස හයක මාර්ග සිතියමක්" - six-month Road Map - ඉදිරිපත් කළා. එහිදී එතුමා කියා සිටියා, ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් සහ ඕමානයෙන් විදේශ ණය ලැබීමට තිබෙනවා කියලා. ජාත්‍යන්තර මෙන්ම දේශීය විශ්වසනීය මට්ටමේ නිරීක්ෂකයන් එදා මහ බැංකු අධිපතිවරයාගේ මේ සහතික කිරීම ගැන ප්‍රශ්න කර සිටියා. එතුමා මේ ප්‍රකාශය කර දැන් මාස එකහමාරක් ගත වී තිබෙනවා. එහෙත් එතුමා ප්‍රකාශ කළ පරිදි මෙතෙක් ඒ කිසිම ණය ප්‍රමාණයක් ලැබී නැහැ. මේ වන විට ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය පතුලටම බැස තිබෙනවා. එදා ඒ දෙස් විදෙස් නිරීක්ෂකයන් ප්‍රසිද්ධියේ කියා සිටියේ මහ බැංකු අධිපතිවරයාගේ ප්‍රකාශය, හුදු ප්‍රාර්ථනා ගොඩක් පමණක් වන බවයි.

මෙවර අය වැයෙන් මුදල් අමාත්‍යතුමා ආදායම් වැඩි කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ එක් යෝජනාවක් වුයේ මාර්ග අනතුරුවලට ලක්වන වාහනවලින් බද්දක් අය කර ගැනීමයි. මේ බද්ද රක්ෂණයෙන් අය කර ගැනීමට කටයුතු කරන බව එතුමා ප්‍රකාශ කර සිටියා. මෙයින් සිදු වන්නේ මහ ජනතාවට ගෙවන්න සිදු වන රක්ෂණ වාරික ගාස්තු ඉහළ යාමයි. තවත් පැත්තකින් මෙය සදාචාරාත්මක ප්‍රශ්නයක් මතු කරනවා, ගරු කථානායකතුමනි. අපි අනතුරක් ලෙසින් හඳුන්වන්නේ කුමක්ද? එය සිතා මතා සිදු කරන ක්‍රියාවක් නොවෙයි. එය අවාසනාවන්ත සිද්ධියක්. කෙනෙකුගේ අවාසනාව තුළින් අනුකම්පා විරහිත විධියට සූරා කෑමකටයි රජය මේ යෝජනාව තුළින් කටයුතු කරන්නේ. "ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ" කියන කියමන මට මතක් වෙනවා. මෙතැන වෙන්නේ, වැටුණු මිනිහාට අනිනවාට වඩා වැටෙනතුරු බලන් ඉඳලා අනිනවා වාගේ වැඩක් බව මට කියන්න සිද්ධ වෙනවා.

මේ අය වැයෙන් මුදල් ඇමතිතුමා ගෙනා තවත් යෝජනාවක් තමයි රජයේ සේවකයන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම. මේ යෝජනාව කරමින් එතුමා කියා හිටියා, "මේ නිසා තරුණ උදවියට රැකියා අවස්ථා නැති වෙනවා කියලා බය වෙන්න එපා. මම රජයේ සේවයේ cadre එක වැඩි කරනවා" කියලා. විශ්‍රාම යන වයස් සීමාව වැඩි කිරීම ඉල්ලවු කරන්න, ඵලදායී බව ගැන කිසිදු විමසීමකින් තොරව රජයේ සේවයේ cadre එක වැඩි කරන බව කීම තුළින් රජය මේ කටයුතු මෙහෙයවන්නේ රටේ අනාගතය පිළිබඳව දුර දැක්මක් ඇතිවද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඊට පහුවෙනිදා මාධ්‍ය සාකච්ඡාවක් තියලා මුදල් ඇමතිතුමා කියනවා, "රජයේ සේවය රටට බරක්, ලෝකයේ වැඩියෙන්ම රජයේ සේවකයන් ඉන්නේ අපේ රටේ" කියලා. එළියට ගිහිල්ලා එහෙම කියන ඇමතිතුමා ඇතුළේදී කියනවා, "මම රාජ්‍ය සේවයේ cadre එක වැඩි කරනවා" කියලා. අප කළ යුතුව ඇත්තේ, අපේ තරුණ කොටස්වල නිපුණතා වර්ධනය කිරීමට කටයුතු කර, ඔවුන් ඵලදායී අංශවලට යොමු කිරීමයි. ඒ සඳහා, රැකියා අවස්ථා ජනනය කරන ඉදිරි ආර්ථික ගමනකට යාමට පුළුල් දැක්මකින් යුතුව කටයුතු කිරීමයි. පටු දේශපාලන වාසි සඳහා දුර දැක්මකින් තොරව කටයුතු කිරීම තුළින් මේ උදවිය මේ රටට කරන්නේ දිගු කාලීනව විශාල අනර්ථයක්.

දකුණු ආසියාවේ අපේ කලාපයේ අපට පිටුපසින් සිටි බංග්ලාදේශය ඇතුළු සියලු රටවල් දුර දැක්මකින් යුතුව තම රටවල ආර්ථිකය මෙහෙයවීම නිසා ඒ සියලු රටවල් දැන් අපි පහු කරගෙන ඉදිරියට යමින් සිටිනවා. අපේ විදේශ සංචිත පමණක් පතුලටම බැස තිබෙනවා. කොවිඩ් -19 වසංගතය මධ්‍යයේත් ඇෆ්ඝනිස්තානය හැරුණාම අපේ කලාපයේ අනෙක් රටවල් සියල්ලම තම විදේශ සංචිත වර්ධනය කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය මඟින් මා ලබා ගත් දත්ත සහ වගු සටහන් හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

මෙන්න බලන්න, මේ වගු සටහන් දිහා. පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය පතුලටම කඩා වැටිලා තිබෙන බව මෙහි පළමුවැනි වගුවෙන් පෙන්වනවා. මේ වගුව අනුව, ඉන්දියාවේ විදේශ සංචිත ප්‍රමාණය ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේවා පිළිගත් මූලාශ්‍ර. මේවා මම ලබා ගත්තේ පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශයෙන්. පාකිස්තානයේ, බංග්ලාදේශයේ, නේපාලයේ, මාලදිවයිනේ පවා විදේශ සංචිත ඉහළ ගිහිල්ලා තිබෙනවා. ලංකාව පමණක් පතුලටම බැහැලා තිබෙනවා. මේ සියලු සංඛ්‍යා ලේඛන සහ වගු සටහන් මා ලබා ගත්තේ පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය මඟින්; පිළිගත් මූලාශ්‍රවලින්, ගරු කථානායකතුමනි.

මේ මොහොතේ මගේ මතකයට එනවා, ලෝවැඩ සඟරාවේ තිබෙන කවියක පද දෙකක්. එනම්, "ළිප ගිනි මොළවන තෙක් දිය සැළියේ - සැපයක් යයි කකුළුව දිය කෙළියේ". ජනතාවගේ දැවෙන, ප්‍රධාන ප්‍රශ්නවලට විසඳුම් දීගත නොහැකිව, ජනතාව ඉදිරියට යාමට නොහැකිව සිටින තම දේශපාලන ක්‍රියාකාරීන්ට ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණවලදී ජනතාවට සීනි බෝල පෙන්වීම සඳහා මුදල් වෙන් කරමින්, නත්තල් පප්පා කෙනෙකුගේ දේශපාලන පැවැත්ම සඳහා ඉදිරිපත් කළ අය වැයක් ලෙසයි මා මේ අය වැය දකින්නේ. සමාවෙන්න මා එහෙම හැඳින්වූවාට. මේක තමයි, යථාර්ථය. මේ ආකාරයේ පියවරවලින් තම ප්‍රාදේශීය දේශපාලන නායකයන්ට යම් අස්වැසිල්ලක් ලබා දුන්නත්, රට මුහුණ දී ඇති මහා ආර්ථික ව්‍යාධීන්ට පිළියම් ලබා දීමේ අවංක උත්සාහයක් නම් මේ අය වැයේ දකින්න නැහැ.

මගේ කථාව ආරම්භයේදීම රට මුහුණ දී ඇති ප්‍රධානතම බැරෑරුම් අභියෝග 7ක් ගැන මා සඳහන් කළා. ඒ අභියෝග 7ට නිසි පිළියමක් මේ අය වැය යෝජනාවලින් ඉදිරිපත් වී නැහැ. ඒ අභියෝග 7ට පිළියම් නොදීම හේතුවෙන් වඩාත්ම බැට කන්නේ,

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

මේ රටේ නැති බැරි උදවිය සහ ලැබෙන මාසික ආදායමින් ජීවිතය ගැට ගසා ගැන්මේ ගැටලුවට මුහුණ දී සිටින මධ්‍යම පාන්තික ජනතාවයි.

රටේ ආර්ථිකය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගවලට නිසි ලෙස ඇමතීමක් සිදු කිරීම තුළින් රටේ බහුතර ජනතාව මුහුණ දී ඇති මේ අනේක විධ දුෂ්කරතා සම්බන්ධව සංවේදීව පිළියම් යෙදීම රාජ්‍ය පාලනයක මූලික වගකීමයි. එය පැහැර හරිමින් මේ රජය මේ අය වැය තුළින් ද සිදු කර ඇත්තේ, අපි හැම දාම දකින විධියට තමන්ගේ දේශපාලන පැවැත්ම ජනතාවගේ අභිවෘද්ධියට වඩා ඉහළින් සහ ප්‍රමුඛව සලකමින්, එම අරමුණ සඳහා තම දේශපාලන හිතෛෂීන් සතුටු කරන ලෙසින්, ඔවුන්ට මුදල් ගලා යාමට මං සැලසීම මිසක මේ අර්බුද තුළින් බැට කන ජනතාවගේ දුක් කඳුළු නිවීමට පියවර ගැනීම නොවේ. දේශපාලන පැවැත්ම සඳහා තෝරාගත් කරුණු කිහිපයකට පමණක් පැලැස්තර ඇලවීමක්, නැත්නම් ටින්කර් කිරීමක් මිසක අපේ ආර්ථිකය මුහුණ දී ඇති ඛේදවාචකයේ මූල හේතූන් ඇමතීමක් මේ අය වැයෙන් සිදු කර නැත.

ජාතියක් ලෙස ශ්‍රී ලාංකික අපි, අප දෙසම හැරී බැලිය යුතු තීරණාත්මක සන්ධිස්ථානයකට අද ඇවිත් තිබෙනවා. ඉතිහාසයේ අප කළ වැරදි නිවැරදි කර ගත යුතුව තිබෙනවා. අපේ රට නිවැරදි මඟට අවතීර්ණ කර ගත යුතුව තිබෙනවා. මුදල් අමාත්‍යතුමා මහගම සේකරයන්ගේ කවියක් උපුටාගෙන තිබුණා, එතුමාගේ අය වැය කථාව අවසන් කරන්න. එය එතුමාගේ ලිඛිත කථාවේ තිබුණත්, අසනීප තත්ත්වය නිසා දෝ ඒක කියවන්න එතුමාට නොහැකි වුවා යැයි මා හිතනවා. මම කැමැතියි, එතුමාට එදා කියවන්න බැරිවූ ඒ කවියේ පද කිහිපය උපුටා දක්වන්න.

"ධර්මේ
කාසිම්
රාජසුන්දරම්
මෙහෙ වරෙල්ලා
අපි ඔක්කොම එකතුවෙලා
මේ ලෝකය යහපත් තැනක් කරමු මීට වැඩිය."

මහගම සේකරයන්ගේ මේ පද කිහිපය උපුටා දැක්වීම තුළින් එතුමන් කරන්නට අපේක්ෂා කළේ, පසුගිය කාලය තුළ පටු දේශපාලන පැවැත්ම උදෙසා අපේ සමාජය තුළ වැපිරූ බෙදුම්වාදී විෂබීජ පිළිබඳ වූ පාපොච්චාරණයක් කිරීමදැයි මට සිතුණා.


අපේ රටේ නිදහසින් පසු, 1947 සිට අද දක්වා වාර්ෂික ආර්ථික වර්ධන වේගය විමසා බැලුවොත් ඉතා හොඳින් අවබෝධ කර ගන්නට පුළුවන්, රට අභ්‍යන්තරයේ වාර්ගික, පන්ති, ආගම් භේද ඇති වූ සෑම කාල වකවානුවකම අපේ ඉදිරි ගමන කඩාකප්පල් වූ බව. මෙම ගීතයෙන් කියන අර්ථය පටු දේශපාලන වාසි සඳහා මතු පිටින් පමණක් මතු කරන මන්ත්‍රයකට සීමා නොකර, හදවතින්ම උතුර, දකුණ, නැඟෙනහිර ඇතුළු සියලු පළාත්වල සියලු ශ්‍රී ලාංකිකයන් එකමුතු කරගෙන රට ගොඩනඟන, බෙදුම්වාදී අදහස් පරදවන අධිෂ්ඨානයකට මේ රට අවංකව මෙහෙයවන්න කියා සියලු දේශපාලන පක්ෂ නායකයන්ගෙන් ඉල්ලා සිටින්නට මගේ කථාවේ මේ අවසන් විනාඩිය පාවිච්චි කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.


***සභාමේසය මත තබන ලද සටහන් :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட வரைபடங்கள்:*
*Graphs tabled:*

**Foreign Exchange Reserves (2015 -2020)**


Sri Lanka





India





Pakistan





Bangladesh




Nepal



Maldives




**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු දුමින්ද දිසානායක රාජ්‍ය අමාත්‍යතුමා.

Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

[පූ.භා. 11.06]

**ගරු දුමින්ද දිසානායක මහතා (සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - சூரிய சக்தி, காற்று மற்றும் நீர் மின்னுற்பத்திக் கருத்திட்ட இராஜாங்க அமைச்சர்)
(The Hon. Duminda Dissanayake -State Minister of Solar Power, Wind and Hydro Power Generation Projects Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ කථා කරන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

අවුරුදු 21ක් වන මගේ පාර්ලිමේන්තු ජීවිතය තුළ, අද මේ අය වැය විවාදය ගත්තොත්, එදා වාගේම මේ අය වැය විවාදය අදත් සාම්ප්‍රදායිකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුව පැත්තෙන් අය වැය හොඳයි කියනවා, විපක්ෂය පැත්තෙන් අය වැය හොඳ නැහැ කියනවා. මේක තමයි මගේ පාර්ලිමේන්තු දිවියේ අවුරුදු 21ක් තුළ අය වැය විවාදවලදී හැමදාමත් දැක්කේ. හැබැයි, අය වැය කියන කාරණාවේදී දේශපාලන වාසියකුත් ගත යුතු වෙනවා. ඒ වාගේම තමයි, අපි මේ රට ඉස්සරහට ගෙන යන්නේ කොහොමද, යම් කිසි අභියෝගාත්මක අවස්ථාවක රටක් විධියට මේ රට ඉස්සරහට ගෙන යෑම සඳහා අපේ වගකීම් මොනවාද කියන කාරණාව පිළිබඳවත් අපි සාකච්ඡා කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෝක ආර්ථිකය ගත්තොත්, අද ලෝකයේ සෑම රටක්ම ආර්ථිකමය වශයෙන් විශාල කඩා වැටීමකට ලක්වෙලා තිබෙනවා. දියුණු රටවල්ද, දියුණු වෙමින් පවතින රටවල්ද, එහෙම නැත්නම් මධ්‍යම ප්‍රමාණයකින් දියුණු වූ රටවල්ද කියන කාරණාව නොවෙයි, මේ කොවිඩ් වසංගතයත් එක්ක අද ඒ සෑම රටකම ආර්ථිකය ඉතාම පහත් තත්ත්වයකට, එහෙම නැත්නම් රටට දරා ගන්න බැරි තැනකට වැටිලා තිබෙනවා. සමහර රටවල ජනතාවගේ රැකියා නැතිවෙලා තිබෙනවා. ඒ වාගේම බඩු මිල වැඩිවෙලා තිබෙනවා, ජීවන වියදම වැඩිවෙලා තිබෙනවා. එහෙම නම්, ලෝකයටම පොදු තත්ත්වයක් තිබෙන මොහොතක, ශ්‍රී ලංකාව වාගේ පුංචි ආර්ථිකයක් තිබෙන, ඒ වාගේම ආදායම් උත්පාදනය පිළිබඳව විශාල හයියක් නැති රටක් විධියට අපට මේ කොවිඩ් වසංගතය දරුණුවට බලපා තිබෙනවා. එහෙම නම්, මෙම අය වැය පිළිබඳව කථා කරනකොට අපි මේ වෙලාවේ ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත විය යුතුයි. මොකද, මෙවැනි තත්ත්වයක් යටතේ අපේ රට පවත්වාගෙන යෑම සඳහා, ඉදිරියේදී රට ගොඩ නැඟීම සඳහා යම් කිසි සැලැස්මක්, framework එකක් සහිත, හොඳ අඩිතාලමක් සහිත අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සතුටු විය යුතු වෙනවා.

හැබැයි, මේ අය වැයෙන් සියලුදෙනාම සතුටු නොවන තත්ත්වයක් අපි දකිනවා. අය වැයක් ගෙනෙනකොට රටේ ජනතාව බොහෝ සහන බලාපොරොත්තු වුණා. නමුත්, ඒ සියලු සහන දෙන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, යම් සැලැස්මක්, යම් හරයක්, යම් පදනමක් මෙම අය වැය තුළ දකින්නට ලැබීම පිළිබඳව තරුණ දේශපාලනඥයකු විධියට, එහෙම නැත්නම් අනාගතයේදී යහපත් ශ්‍රී ලංකාවක් බලාපොරොත්තු වන දේශපාලනඥයකු විධියට මම සතුටු වෙනවා. මොකද, ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති කරනකොට මේ රටේ ජනතාව බලාපොරොත්තු වූ කාරණා ගණනාවක් තිබෙනවා. ඒ බලාපොරොත්තු රාශිය තුළ තිබුණු දෙයක් තමයි, මේ රටේ systems ටික හදා ගැනීම. දේශපාලනය මාරු වෙනකොට, ආණ්ඩු මාරු වෙනකොට, ඇමතිවරු මාරු වෙනකොට, හැමදාමත් වෙනස් වන ක්‍රමවේදයකට යන්නේ නැතුව මේ රට තුළ යම් කිසි system එකක් හදයි කියලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා; විශේෂයෙන් මේ රටේ තරුණ ජනතාව බලාපොරොත්තු වුණා. ඒ නිසා තමයි තරුණයෝ ස්වේච්ඡාවෙන් ඇවිල්ලා චිත්‍ර ඇන්දේ. ඒ නිසා තමයි ආණ්ඩුව හදන්න තරුණයෝ උදව් කළේ. හැබැයි, මේ අය වැය අරගෙන බැලුවාම අපට පෙනෙනවා, පසුගිය කාලවල ඉදිරිපත් වූ අය වැයවලට වඩා මේ තුළ යම් රාමුවක් සකස් වෙලා තිබෙන බව. හැබැයි, එහි ප්‍රතිඵල දකින්න ටිකක් කල් යයි. ඒ රාමුව තුළින් නැවත වතාවක් අපට විශ්වාසයක් ඇති කර ගන්න පුළුවන්කම තිබෙනවා.

අපි ඒ රාමුව ඉදිරියටත් ශක්තිමත් කරගෙන ගිහින් අපේ රටේ ආදායම් උත්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය නිෂ්පාදනයක්, දේශීය ආර්ථිකයක්, දේශීය වැඩ පිළිවෙළක් කියන මේ සියල්ලම ආරම්භයක් විධියට සිදු කර, එය හරියාකාරව පවත්වා ගෙන ගියොත්, අනාගතයේදී අපට සුබවාදී ආර්ථිකයක් සහිත සුබවාදී ලංකාවක් ගැනත්, අපේ දරුවන්ගේ අනාගතය සුබවාදී වෙයි කියන කාරණයත් හිතන්න පුළුවන්කම තිබෙනවා.

අපි දැක්කා, ඊයේ එක්තරා ටීවී නාළිකාවක පැවැති සාකච්ඡාවකදී ගරු මුදල් ඇමතිතුමා ඉතාම නිහතමානිව පිළිගත්තා, අඩු පාඩුකම් හා තිබෙන අමාරුකම් පිළිබඳව. මේක තමයි වෙන්න ඕනෑකම තිබෙන්නේ. මොකද, අපි රටක් ඉදිරියට ගෙන යන්න නම්, අපි ඉන්න ඇත්ත තත්ත්වයේ සිට මේ ගමන ආරම්භ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ හැමෝම කථා කරනවා, අපේ ඩොලර් අර්බුදය ගැන. ඩොලර් අර්බුදය පිළිබඳ ඉතිහාසය බැලුවොත්, අපි දෙගොල්ලන්ටම බැණ ගන්න පුළුවන්කම තිබෙනවා. අපේ ආණ්ඩුව තමයි වැඩියෙන් ණය අරගෙන තිබෙන්නේ කියනවා. අපි එහෙම කරලා නැහැ කියලා අනෙක් පැත්තේ අය කියනවා. හැබැයි, දැන් ඒ සම්බන්ධව post-

[ගරු දුමින්ද දිසානායක මහතා]

mortems තියන කාලයක් නොවෙයි තිබෙන්නේ. අපි කවුරු ණය ගත්තත්, ඒ මොන ආණ්ඩුවක් වුණත්, මොන ඇමතිවරයෙක් වුණත් අද අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ යථාර්ථයට මුහුණ දෙන්න. එහෙම නම් මේ පවතින තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා අපගේ උපක්‍රමය විය යුත්තේ මොකක්ද? ඒ උපක්‍රමය රටේ ජනතාවට බරක් නොවී, රටේ ජනතාව තුළ බලාපොරොත්තු ඇති කරන්නක් විය යුතුයි. එවැනි ගමනක් අපි යන්නේ කොහොමද කියන එක පිළිබඳවයි, අපි මේ අය වැය තුළින් දකින්න ඕනෑකම තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් සෑම ක්ෂේත්‍රයක්ම ආමන්ත්‍රණය කර තිබෙනවා. අපි කියන්නේ නැහැ, ඒ ඇති කියලා. හැබැයි, යම් වැඩ පිළිවෙළක් තුළින් අනාගත දැක්මක් එක්ක ගමනක් යෑම ගැන අපි සතුටු වෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපි දැක්කා, සේවා ආර්ථිකයක් ගැන, නිෂ්පාදන ආර්ථිකයක් ගැන, කෘෂිකර්මික ආර්ථිකයක් ගැන වාගේම දේශීයව අපට නැඟිටින්න පුළුවන් නම් එසේ නැඟිටින්නේ කොහොමද කියන එක පිළිබඳව මේ තුළ යම් අඩිතාලමක් මේ අය වැය තුළ වැටී තිබෙන බව. සමහර වේලාවට වෙනත් පක්ෂයක් මේ කාරණය විවේචනය කරන්න පුළුවන්, ලෝකයේ අනෙක් හැම රටක්ම විවෘත වෙලා ඉන්නකොට, අපට විතරක් පුළුවන්ද රට ඇතුළේ ආර්ථිකයක් හදාගන්න කියලා. හැබැයි, උත්සාහයක් විධියට මේක හොඳයි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් තුළ කථා කළා දේශීය ආර්ථිකයක් ගැන. හැබැයි, අපි දේශීය ආර්ථිකය ගැන පමණක් නොවෙයි, නව ලෝකයත් එක්ක සම්බන්ධ වෙන්න පුළුවන් අනෙකුත් ආදායම් උත්පාදනය කරන ක්ෂේත්‍ර පිළිබඳවත් මේ අය වැයේදී කථා බහ කරනවා. ඒ නිසා අපි විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, අපි දෙගොල්ල එකතු වෙලා මේ රට නගාසිටුවන ක්‍රමයක් හදමු කියලා. අපි එහෙම කළේ නැත්නම්, අනාගතයේ කවුරු ආණ්ඩු බලය ගත්තත්, ඒ කිසිම ආණ්ඩුවකට මේ රටේ ජනතාවට සාධාරණයක් කරන්න බැරි වෙයි. අද ආණ්ඩුවේ ඉන්නේ අපි වෙන්න පුළුවන්. අනාගතයේ ඔබතුමන්ලා ආණ්ඩුවක් බලාපොරොත්තු වෙන්න පුළුවන්. හැබැයි, මේ රට මෙතැනින් එහාට වැට්ටුවොත්, මෙතැනින් එහාට මේ රට වට්ටන්න උදවු කළොත් අපි හැමෝටම අනාගතයේදී නූපන් දරුවන්ගෙන් පවා බැණුම් අහන්න සිද්ධ වෙයි, අපි මේ කරන වැරදි වැඩේට. ඒ නිසා අපි සියලුදෙනාම එකා වාගේ අත්වැල් බැඳ ගෙන මේ වේලාවේ ඇති වෙලා තිබෙන මේ ප්‍රශ්න ටිකට විසඳුම් හොයන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමන්ලා සියලුදෙනාම කොටස්කාරයෝ, පංගුකාරයෝ වෙන්න කියලාත් අපි ආරාධනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි Sustainable Development Goals ගැන කථා බහ කරනවා. ඒ වාගේම අපි කථා බහ කරනවා, කාබන් විමෝචනය පිළිබඳවත්. අද ලෝකයේ බොහෝ රටවල් මෙන්න මේ කියන Sustainable Development Goals සම්බන්ධව, ඒ වාගේම carbon emission පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. අපි දැන් ඉඳලාම ඒ සම්බන්ධයෙන් වැඩ කළේ නැත්නම් අනාගතයේදී තවත් අනතුරුදායක තත්ත්වයකට අපි අපේ රට අරගෙන යනවා. ගරු ජනාධිපතිතුමා 2030 වසර වෙනකොට පුනර්ජනනීය බලශක්තිය මගින් ජාතික විදුලිබල අවශ්‍යතාවෙන් සියයට 70ක් නිෂ්පාදනය කර ගැනීම සඳහා අපට ඉලක්කයක් දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක ජනාධිපතිතුමාගේ ඉලක්කයක් නොවෙයි, මේ රටේ ඉලක්කයක් බවට පත් කරගන්න ඕනෑ. ඉදිරියේදී මොන ආණ්ඩුවක් බලයට ආවත්, ඒ ආණ්ඩුව පුනර්ජනනීය බලශක්තිය මගින් සියයට 70ක් විදුලිය නිෂ්පාදනය කරගන්නවා කියන්නේ, අද අපි පොසිල ඉන්ධන සඳහා ලංකාවෙන් බැහැර කරන විශාල මුදල් ප්‍රමාණයක් අපට ඉතිරි කරගන්න පුළුවන්කම තිබෙනවා කියන එකයි.

අද ලෝකයේ කථා බහ කරනවා, විදුලියෙන් ගමන් කරන වාහන ගැන. ඒ සඳහා අපි දැන් ඉඳලාම සූදානම් විය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුනර්ජනනීය බලශක්තිය ගැන කථා කරන මේ මොහොතේ මා සඳහන් කරන්න කැමැතියි, අද අපට රුපියල් 15කට වඩා අඩුවෙන් විදුලි ඒකකයක් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව තිබෙන බව. එහෙම නම් නව තාක්ෂණය බද්ධ කරගෙන, පුනර්ජනනීය බලශක්තිය මගින් අපේ විදුලි අවශ්‍යතාව සපුරා ගන්න පුළුවන්කම ලැබුණොත්, අනාගතයේදී විදුලිබල මණ්ඩලය ලාභ ලබන ආයතනයක් බවට පත් කරගන්න අපට පුළුවන්කම ලැබෙනවා. එපමණක් නොවෙයි, අනාගතයේදී ජනතාවට අඩු මුදලට විදුලිය ලබා දීමේ හැකියාවත් අපට ලැබෙනවා.

අපි ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයක් විධියට සතුටු වනවා. අපි මීට සති හතරකට, පහකට කලින් මෙගාවොට් 50ට වැඩියෙන් renewable energy නිෂ්පාදනය කරන්න කැමති ආයෝජකයන් සම්බන්ධ වෙන්න කියා proposals call කළා. ඒ සඳහා ලබා දුන් කාලය අද උදේ 10.00ට තමයි අවසන් වුණේ. අපි බලාපොරොත්තු වුණේ නැති විධියට ආයතන 200ක පමණ ආයෝජකයෝ පැමිණිලා හිටියා. දැනුත් මට කථා කර කිව්වා, "සෙනඟ පිරිලා ඉන්නවා. තවම අයදුම් පත භාර දෙන්න විධියක් නැහැ" කියලා. අපි මේ පිළිබඳව වැඩ කටයුතු කළොත් ඕනෑ තරම් ආයෝජකයෝ ඉන්නවා; ඕනෑ තරම් තාක්ෂණය තිබෙනවා; මේ සියල්ලම අපිට ගෙනෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයට විවර වුණොත්, ලෝකය යන පැත්ත ගැන හිතුවොත්, අපේ බොහෝ දේවල් රට ඇතුළත වෙනස් කර ගත්තොත් අපිට මේ කටයුත්ත ජයග්‍රහණය කරන්න පුළුවන්කම තිබෙනවා. මම විශ්වාස කරනවා, අද අපි ඉන්නේ එවැනි තැනක කියලා. අද අපේ රට වැටිලා තිබෙන නිසා හැම දෙයම පිළිබඳව අත්හදා බලන්න අවස්ථාවක් ලැබිලා තිබෙනවා. අද අපි ඉන්නේ එවැනි තැනකයි.

ගොවි ජනතාව ගැනත් මට යමක් කියන්න තිබෙනවා. මොකද, මම නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියයට 80කට වඩා ඉන්නේ ගොවි ජනතාව. අපි දන්නවා, කාබනික පොහොර භාවිත කිරීම සඳහා ගත් තීන්දුවත් එක්ක අද ගොවි ජනතාව යම් කලකිරීමක ඉන්නා බව. ආණ්ඩු පිළිබඳව ඔවුන් තුළ හොඳ දැක්මක් නැහැ. හොඳ වචන නොවෙයි, ආණ්ඩුව වෙනුවෙන් ඔවුන් පාවිච්චි කරන්නේ. හැබැයි, කාබනික පොහොර භාවිත කිරීම ඉතා හොඳ වැඩක්. කාබනික පොහොර භාවිතයට ආණ්ඩුවවත්, විපක්ෂයවත්, ගොවි මහත්වරුවත් -කවුරුවත්- විරුද්ධයි කියා අපි හිතන්නේ නැහැ. හැබැයි, ඉතා කඩිනමින් මේ ක්‍රමවේදයට මාරු වෙන්න ගත් තීරණය පිළිබඳව ගොවි මහත්වරුන්ගේ යම් අසතුටක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට පඩියක් ලැබෙනවා වාගේම ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාරයෙන් මාසික ආදායමක් ලැබෙනවා. නමුත් ගොවි මහත්වරුන්ට තමන්ගේ කන්නයට නිසි අස්වැන්නක් හා නිසි ආදායමක් ලැබුණේ නැත්නම් ඔවුන් ඉතිරි මාස හය ජීවත් වෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය ඔවුන්ට තිබෙනවා. තමන්ගේ පවුල නඩත්තු වෙන්නේ අස්වැන්නෙන් ලැබෙන ආදායමෙන්. ඒ නිසා ඔවුන් තුළ යම් අවිශ්වාසයක් ඇතිවෙලා තිබෙනවා, ක්ෂණිකව කරන මේ වැඩේ එක්ක අපිට නිසි අස්වැන්නක් ලැබෙයිද, අපිට අස්වැන්න ලැබුණේ නැත්නම් ඒ

පාඩුව මේ ආණ්ඩුව භාර ගනීවිද කියලා. ඒ නිසා තමයි ආණ්ඩුව පැත්තෙන් මම හැම විටම කිව්වේ ගොවියා තුළ තිබෙන මේ සැකය දුරු කරන්න ඕනෑ කියලා. ඒ සැකය දුරු කරන්න ආණ්ඩුවට හයියක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුව වෙනුවෙන් යම් වැඩක් කරන්න ඕනෑකම තිබෙනවා. හැබැයි, අපි දන්නවා, අපේ පැත්තෙන් මේ කියන කාරණා ටික අපිට නිසි වෙලාවට කියා ගන්න බැරි වුණු බව.

මම ඊයේ දැක්කා, නැනෝ නයිට්‍රජන් ඉතුරු කොටස ගෙනෙන්න කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී තිබෙන බව. හැබැයි, මේ ටික දැනටත් ගෙනෙන්න ප්‍රමාද වැඩියි. නොයෙක් ආර්ථික ප්‍රශ්න එක්ක ඊයේ හෝ මේ සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳව මම සතුටු වනවා. මම අද උදේත් අදාළ කණ්ඩායම් සමඟ කථා බහ කර කිව්වා, ඉතා ඉක්මනින් නැනෝ නයිට්‍රජන් ඉතිරි කොටස ගෙනැත් දෙන්න කියලා. මොකද, නොවැම්බර් 30 වැනිදා වනකොටවත් අපිට මේ පොහොර ටික ලැබුණේ නැත්නම් අපි ආණ්ඩුවක් විධියට ගත් තීන්දුවෙන් වැඩක් නැති වනවා. TV එකේ කියන දේවල් භූමියේ ක්‍රියාත්මක වුණේ නැත්නම් ගොවි ජනතාවගේ සැකයට භාජන වෙච්ච දේ හරි කියා අපි කියනවා. නැනෝ නයිට්‍රජන් ඉතුරු කොටස ගෙනෙන්න ඊයේ කැබිනට් අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් අපි සතුටු වනවා. ඉතා ඉක්මනින් මේ ටික ගෙන්වා ගන්න අපිට පුළුවන්කම ලැබුණොත්, ගොවි මහත්වරු තුළ තිබෙන සැකය හා අවිශ්වාසය දුරු කරන්නත් අපට පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හොඳ වැඩක්. හැබැයි, ක්‍රමවේදය පිළිබඳව අවිශ්වාසයක් ගොවි ජනතාව තුළ තිබෙනවා. අපි ගොවි ජනතාවගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. දැන් හැමෝම මේ ගමනට සම්බන්ධවෙලා අවසානයි. මේක දැන් වෙනස් කරන්න පුළුවන්කමකුත් නැහැ. මේක ආපස්සට හැරෙව්වා කියා ආපසු වෙන පොහොරක් ගෙනෙන්න පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා අපි ගොවි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා; හරි යන්නත් පුළුවන්, වරදින්නත් පුළුවන්, මේ වතාවේවත් අපි උත්සාහ කර බලමු කියලා. මොකද, මේක reverse කළා කියලා ආපසු වතාවක් වෙන දෙයක් ගෙනෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා උපරිම අන්දමින් තමන්ගේ වගාවට කැපවෙලා, මේ ආණ්ඩුවෙන් දෙන මොනවා හෝ පොහොර ටික -නයිට්‍රජන් ටික- පාවිච්චි කරලා, තමන්ගේ ආදායම හදා ගන්න මහන්සි වන්න කියා අපි ගොවි මහත්වරුන්ගෙන් ඉල්ලීමක් කරනවා.

අය වැය කථාවේ සඳහන් අනෙක් දේවල් ගැන කථා බහ කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම මේ අය වැය තුළ කථා බහ කර තිබෙනවා. මේ ගැන කථා බහ කිරීම ඇතියි කියා මම කියන්නේත් නැහැ. *[බාධා කිරීමක්]* අපි විශ්වාස කරනවා මේ අභියෝගාත්මක අවස්ථාවේ හැමෝටම යම් තරමකට හෝ සතුටු වෙන්න පුළුවන්, යම් තරමකට හෝ සැහෙන්න පුළුවන් දේවල් මෙවර අයවැයෙන් සපයලා තිබෙනවා කියලා. එම නිසා වැටිච්ච තැනෙන් රට ගොඩ ගන්න නම් අපි හැමෝම එකතු වෙලා ජාති, ආගම්, පක්ෂ, කුලමල භේදවලින් තොරව එක ගමනක් යමු කියා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද උදෑසනත් මේ කාරණය ප්‍රකාශ කළා. මීල්ලතේ, කිරිදිවැල තිබෙන මගේ කාර්යාලයට නැවතත් පොලිසියෙන් පැමිණියා. දැන්, වාහන 2ක් සමඟ පොලිස් නිලධාරින් විශාල සංඛ්‍යාවක් එතැන සිටිනවා. මේකට ප්‍රධානතම හේතුව තමයි අද කොළඹ දී පවත්වන විරෝධතාව. එම විරෝධතාව සංවිධානය කරනවා කියලා ලොකු බලපෑමක් කරනවා. මේක සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මගේ වරප්‍රසාද කඩවීමක් සිදු වෙලා තිබෙනවා. අද පාර්ලිමේන්තු දිනයක්. මම පාර්ලිමේන්තුවේ ඉන්න අවස්ථාවේදී මගේ කාර්යාලය අසළ මේ වාගේ තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. මගේ කාර්යාලයට පමණක් නොවෙයි, හැම තැනකම විපක්ෂය නියෝජනය කරන සියලු දෙනාටම විශාල බලපෑමක් සිදු වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී රටක මෙවැනි දෙයක් සිදු විය නොහැකියි. එම නිසා කරුණාකර මේකට විරුද්ධව ඔබතුමන්ලා හඬ නඟන්න. මේක අද මට වෙන්න පුළුවන්. හෙට ඔබට වෙන්න පුළුවන්. කරුණාකර ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න. අපට දේශපාලනය කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.21]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ කොවිඩ් - 19 සෙවණැල්ලේ. ආර්ථික අහේනිය ගැන කථා කරද්දී ඇත්ත වශයෙන්ම අපි එක් කාරණයක් මතක තියා ගන්න ඕනෑ. 2020දී කොවිඩ් වසංගතය නවත්වන්න ක්‍රියා කළා නම්, මේ තරම් ප්‍රශ්නවලට අද අපට මුහුණ දෙන්න සිදු වන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනා සමඟ සාකච්ඡා කරලා ලබන අවුරුද්දේ දී කොවිඩ් වසංගතය පාලනය කරන්න ඉදිරියට යයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මම බලාපොරොත්තු වෙනවා මුදල් ඇමතිතුමා පසුව මේ ගැන පැහැදිලි කරයි කියලා. මොකද, පසුගිය අවුරුද්දේ වියදම් සාරාංශය යටතේ 2021 අවුරුද්දේ මේ වනතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයට රුපියල් බිලියන 301ක් වෙන් කර තිබෙනවා. එහෙත් 2022ට වෙන් කර තිබෙන්නේ රුපියල් බිලියන 234යි. 2020දීත් සෞඛ්‍ය අමාත්‍යාංශයට රුපියල් බිලියන 255ක් වෙන් කර තිබුණා. එහෙත් 2022ට වෙන් කර තිබෙන්නේ රුපියල් බිලියන 234යි. ඒ කියන්නේ රුපියල් බිලියන 67ක් අඩු කරලා තිබෙනවා. මෙහෙම අඩු කළාම අපි කොහොමද කොවිඩ් වසංගතය පාලනය කරන්නේ? වෙනත් වසංගත පාලනය කරන්නේ? මම බලාපොරොත්තු වෙනවා මුදල් ඇමතිතුමාගේ කථාවේදී ඒකට පිළිතුරක් ලැබෙයි කියලා.

අනික් අතට, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අඩු කළාට ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වැඩි කර තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයට මේ අවුරුද්දට රුපියල් බිලියන 402ක් තිබෙනවා. ලබන අවුරුද්දට රුපියල් බිලියන 421ක් වෙන් කර තිබෙනවා. ඒකට කමක් නැහැ. මම එක කාරණයක් කියන්න ඕනෑ. ඒ වෙන් කිරීම රුපියල් බිලියන 19කින් වැඩි වෙලා තිබෙනවා. මොකද, පසු ගිය අවුරුද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ මුදල්වලින් කොවිඩ් වසංගතය පාලනය කිරීම සඳහා යුධ හමුදාවට රුපියල් බිලියන 12ක් දුන්නා. මේ අවුරුද්දේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

කොවිඩ් වසංගතය පාලනය යටතේ ඒ මුදල් නැහැ. ඒ මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයට දීලාත් නැහැ. ඒ මුදල් වැඩියෙන්ම දීලා තිබෙන්නේ අකුරේගොඩ පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේ වියදම් පියවන්න. දැන්, කාටද ප්‍රමුඛත්වය දෙන්නේ? මේ මුදල් ටික සෞඛ්‍ය අමාත්‍යාංශයට ආපසු එවන්න.

ඊළඟට, ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ විශාල බලාපොරොත්තුවක් තිබෙනවා එක එක අංශවල -ක්ෂේත්‍රවල- වැඩ කටයුතු සිදුවෙයි කියලා. එහෙත් මේ අය වැය සමබර නැහැ. අය වැයෙන් සියයට 89ක් වියදම් කරන්නේ අමාත්‍යාංශ 10කට පමණයි. ඉතිරි සියයට 11 අනික් සියලුදෙනාටම අයිතියි. ඒ සියයට 89 බැලුවාම මුළු අය වැයෙන්ම සියයට 74ක් අමාත්‍යාංශ තුනකටයි වියදම් කරන්නේ. ඒ, මුදල් අමාත්‍යාංශයට, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට වාගේම ආරක්ෂක අමාත්‍යාංශයට. පඩි ගෙව්වාට පසුව අනෙක් ඒවාට කීයද ඉතිරි වෙන්නේ? ප්‍රාග්ධනය තිබෙනවාද?

ඇත්ත වශයෙන්ම ප්‍රාග්ධන වියදම් සෑම අංශයකටම තිබෙන්න ඕනෑ. නමුත්, මෙතැනදී මහා මාර්ගවලට සියයට 35ක් වෙන් කර තිබෙනවා. මහා මාර්ග වුවමනායි. නමුත් අනෙක් ක්ෂේත්‍රවලට මුදල් වෙන් නොකළේ ඇයි කියන එක ගැන ඒ වෙලාවේ පැහැදිලි කිරීමට විශේෂයෙන්ම අපේ මුදල් ඇමතිතුමාට යුතුකමක් තිබුණා. අද බොහෝ දෙනෙක් කියන්නේ, කොවිඩ් - 19 වසංගතය අවසන් වෙනවා කියලායි. මට මතකයි, ගරු ඇමතිතුමාත් සඳහන් කළා, "V" හැඩැති ආර්ථිකයක් තිබෙන්නේ, පහළට ගිහින් ආපහු 2021 දී ඉහළට එන ආර්ථිකයක් කියලා. නමුත්, බලාපොරොත්තු වුණාට ඒක 2021 දී ගෝලීය වශයෙන් සිදු වෙලා නැහැ. අපි දන්නා විධියට කොවිඩ් - 19 වසංගතය කොහොමත් තව අවුරුද්දක්, දෙකක් තියේවි. වසංගතයේ එක වටයක් ඉවරයි. ආපසු දෙසැම්බර් මාසයේ තව වටයක් එනවා. ඒ අතරතුරේදී ඇමෙරිකාව, යුරෝපය, ජපානය ඇතුළු රටවල් ගණනාවක සැපයුම් පිළිබඳ කඩා වැටීමක් තිබෙනවා. චීනයේ බලශක්ති ප්‍රශ්නයක් තිබෙනවා. ඒක කොරියාවට, ජපානයට බලපානවා. මම ඊයේ දැක්කා, මේ හැම එකක් නිසාම ජපානයේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය තව සියයට එකකින් අඩු වී තිබෙන බව කියා තිබෙනවා. අපි විශේෂයෙන්ම ඒක මතක තබා ගන්න ඕනෑ. මම කැමැතියි, ඒකේ බලපෑම ගැන සඳහන් කරන්න. විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ තිබෙනවා, "අවිනිශ්චිත ගෝලීය ආර්ථික වාතාවරණයක් තුළ වසංගත තත්ත්වයේ දීර්ඝ කාලීන බලපෑම රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි අතිරේක පීඩනයක් එල්ල කර ඇත" කියලා.

ඒ විතරක් නොවෙයි, අපි දේශීය වශයෙන් ඇති කර ගත් ප්‍රශ්න තිබෙනවා. සමහර රටවල් එවැනි ප්‍රශ්න ඇති කර ගත්තේ නැහැ. නවසීලන්තය වෙන්න පුළුවන්, නෙදර්ලන්තය වෙන්න පුළුවන්. ඒ අය කොවිඩ් - 19 වසංගතය ගැන විතරයි ක්‍රියා කළේ. ඒත් අපි තවත් ප්‍රශ්න ඇති කරගෙන තිබෙනවා. මම ඒවා ගැන විශාල ලෙස වාද කරන්න යන්නේ නැහැ. ඒත් චෝදනා කිහිපයක් ආපු නිසා කෙටියෙන් කියන්නම්. 2019 වනතුරු අපි කොහොම හරි ගැට ගහගෙන ඇවිල්ලා තමයි රට භාර දුන්නේ. ඒත් ඒක ඒ විධියට ගෙනියන්න බැරි වුණා. අන්න, ඒකයි සිදු වෙලා තිබෙන්නේ. සමහර ගත්ත තීරණ වැරදියි. ඒක මම මේ ගරු සභාව තුළදීත් එළියේදීත් කියලා තිබෙනවා. විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුනුත් කියා තිබෙනවා. ඒ නිසා මම ඒ ගැන ආපසු කියන්න යන්නේ නැහැ. ඒත් අන්තිමට ලැබිලා තිබෙන ප්‍රතිඵලය මොකක්ද? මහ බැංකු වාර්තාවේම කියලා තිබෙනවා, "වෙළෙඳ භාණ්ඩ අපනයනයෙන් ලද ඉපැයීම් යථා තත්ත්වයට පත් වුවද, ආනයනය සඳහා වන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් 2021 වර්ෂයේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ වෙළෙඳ හිඟය පුළුල් විය" කියලා. මෙන්න, මේකයි සිදු වෙලා තිබෙන්නේ. මේවා ගැන විශාල විග්‍රහයක් කරන්න වුවමනා නැහැ. ඒක මතක තබා ගන්න.

ඒ විතරක් නොවෙයි. අපි තව එක දෙයක් අමතක කළා. ඒ තමයි මේ රටේ ආර්ථිකය ආනයනය පදනම් කරගත් වෙළෙඳ ආර්ථිකයක් කියන එක. හොඳ හෝ නරක වෙන්න පුළුවන්. ඒත් ඒකයි අපිට තිබෙන්නේ. ඒත් මොකක්ද අද වෙලා තිබෙන්නේ? ආනයනය සීමා කළාම ආර්ථිකය කඩා වැටී තිබෙනවා. මූල්‍ය කළමනාකරණ වාර්තාවේ "වගුව 1.2 ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම" යටතේ සඳහන් කර තිබෙන දත්ත දිහා බැලුවාම, විශේෂයෙන්ම ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා ආදායම් ඇස්තමේන්තුව රුපියල් බිලියන 1,200යි. නමුත්, actual තත්ත්වය රුපියල් බිලියන 948යි. ඒ කියන්නේ, වෙනස රුපියල් බිලියන 290යි. කොහොමද මේක ඇති වුණේ? මේක ඇති වුණේ රේගුවෙන්. රේගුවෙන් බලාපොරොත්තු වුණා, රුපියල් බිලියන 633ක ආදායමක්. නමුත්, රුපියල් බිලියන 431යි ලැබුණේ. එහෙම නම්, බිලියන 202ක ආදායම් හිඟය ආවේ රේගුවෙන්. මේ ප්‍රශ්නය අපිට ඇවිල්ලා තිබෙනවා. වුණු දේ වුණා. නමුත් දැන් අපි මතක තබා ගනිමු අනාගතයේ -ලබන අවුරුද්දට- කොහොමද අපි මුහුණ දෙන්නේ කියන එක. මේ හේතුවෙන් මේ රටේ විදේශ විනිමය අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. අපේ විදේශ විනිමය සංචිතය ඩොලර් බිලියන දෙකයි. එච්චරයි අපිට තිබෙන්නේ. සංචිතය තිබෙන්නේ ඩොලර් බිලියන දෙකයි. ඒකෙන් මිලියන 300ක් රත්තරන්. එතකොට ඉතුරු වෙලා තිබෙන්නේ ඩොලර් බිලියන 1.7යි. මේකෙන් රටක් ගෙනයන්න බැහැ. විදේශ විනිමය හිඟය නිසා ඊළඟට එන්නේ ණය ගෙවීමේ ප්‍රශ්නය. ණය ආපසු ගෙවන්නේ කොහොමද? අපිට ඊළඟ අවුරුදු කිහිපයේ වර්ෂයකට බිලියන පහක්, හයක් ණය වශයෙන් ගෙවන්න තිබෙනවා.

අපි කොහොමද ඒක ගෙවා ගෙන යන්නේ? අද මුදල් නැහැ. අද මහ බැංකුවේ අධිපති කියනවා, “Securitization of foreign currency from foreign employment” කියලා. ඒ කියන්නේ, විදේශ රැකියාවලින් රටට ලැබෙන විදේශ මුදල් සුරක්ෂිත කර ගැනීම පිළිබඳවයි. රුපියල් අගයෙන් තමයි ලංකාවේ ඉන්න අයට ලැබෙන්නේ. ඒත් රටට ලැබෙනවා විදේශ මුදලින්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඒ විදේශ විනිමය දැන් උකස් තියනවා; you are securitizing it. මේකෙන් ණයක් ගන්න බලාපොරොත්තු වෙනවා. එතකොට බිලියන 7ටම හම්බ වෙන්නේ නැහැ. කොටසක් තමයි හම්බ වෙන්නේ. මේ අපේ වැඩිම ආදායම් මාර්ගය. යම් කිසි ප්‍රශ්නයක් ඇති වෙලා මේ ලැබෙන මුදල් ප්‍රමාණය අඩු වුණොත් මොකද වෙන්නේ? ලෝකයේ කොවිඩ් වසංගතය වැඩි වෙලා නැවතත් රට මාස හයක් වැහුවොත් තෙල් මිල අඩු වෙනවා; මැද පෙරදිගින් එන මුදල් අඩු වෙනවා. මේ වාගේ එක එක හේතු තිබෙන්න පුළුවන්. ඒවා අඩු වුණොත් අපට ලැබෙන විදේශ මුදල් ප්‍රමාණයේත් අඩුවීමක් වනවා. නමුත් දැන් මෙතැනදී අපට තිබෙන ප්‍රධානම ආදායම් මාර්ගයෙන් ලැබෙන මුදල් ටික අපි උකස් තියන්නයි යන්නේ. මේකෙදි මොකක්ද වෙන්නේ කියන එක මම හිතන්නේ මට වඩා හොඳට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට තේරෙනවා ඇති. විශේෂයෙන්ම මම එක් කාරණාවක් කියන්න ඕනෑ. මතක තියා ගන්න, මේ කටයුත්ත කරන්න තීරණය ගත යුත්තේ මහ බැංකුවෙන් නොවෙයි කියන එක. රාජ්‍ය මුදල් පාලනය තිබෙන්නේ කණ්ඩායම් දෙකකටයි. එකක් තමයි කැබිනට් මණ්ඩලය. අනෙක තමයි පාර්ලිමේන්තුව. කැබිනට් මණ්ඩලයෙන් අහන්නේ නැතිව මෙම කාරණය ප්‍රකාශ කරන්නේ කොහොමද? මෙවැනි වැදගත් කාරණයක්, බැරෑරුම් කාරණාවක්, අන්තරාවක් තිබෙන කාරණාවක් පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. මහ බැංකුවේ අධිපතිට තනියම

මේ සම්බන්ධව තීරණ ගන්න බැහැ. මම බලාපොරොත්තු වෙනවා අඩුම තරමේ ඔබතුමන්ලා මේ සම්බන්ධව කැබිනට් මණ්ඩලයේ දී සාකච්ඡා කරයි කියලා.

තුන්වැනි කාරණය විධියට තිබෙන්නේ හිඟ ආදායම් පිළිබඳ කාරණයයි. මුදල් ඇමතිතුමා කියන හැටියට අපට ලබන අවුරුද්දට රුපියල් බිලියන 2218ක් වුවමනා වෙලා තිබෙනවා. කොහෙන්ද මේ මුදල් හොයා ගන්නේ? මේ අය වැයෙන් ඒ ආදායම් එන මාර්ග කියලා නැහැ. සාමාන්‍යයෙන් කථා කළා විතරයි. අපි දන්නවා ගොඩනැඟිලි හා දේපොළ - real estate - සම්බන්ධයෙන් බැංකුවල බොල් ණය - non-performing loans - තිබෙනවා. ණය අරගෙන කටයුතු කර ආපසු ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. තට්ටු දෙකේ නොවෙයි තට්ටු 20, තට්ටු 50 ගොඩනැඟිලි හදාගෙන තිබෙනවා. මේ සියල්ලම තිබෙන්නේ බැංකුවල complete non-performing loans විධියටයි. සංචාරක අංශයේ විශාල හෝටල්වල සිට ගත්තාම පොඩි වාහන දක්වාම ලබා ගෙන තිබෙන ණය ගෙවන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේවාත් තිබෙන්නේ බැංකුවලට අදාළ ලැයිස්තුවේ.

ඊළඟට, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරවලට ණය අරගෙන ගෙවා ගන්න බැරි වුණු ඒවා තිබෙනවා. බැංකුවල මේ ඔක්කොම ගෙනයනවා. ඊට අමතරව, finance companiesවලින් ගෙනයනවා. ඊට අමතරව ලංකා බැංකුවෙයි, මහජන බැංකුවෙයි, ආණ්ඩුවේ මේ මුදල් අරගෙන, ණය සහතික කරලා එතැන ප්‍රශ්නයක් තිබෙනවා. Non-performing loans ප්‍රමාණය බිලියන 4000යි, 6000යි අතර තිබෙනවා කියා සඳහන් වනවා. මේ බිලියන 4000යි, 6000යි අතර ප්‍රමාණයක් තිබෙන්නේ, රුපියල් බිලියන 18,000ක දළ දේශීය නිෂ්පාදනයක් තිබෙන රටක. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25කට වඩා ප්‍රමාණයක් තිබෙනවා. එක අංශයක් කඩා වැටුණොත් අනෙක් ඔක්කොම කඩා වැටෙනවා.

ඊළඟට, අපට GSP Plus සහනය ලැබෙන්න ඕනෑ. අපි මානව හිමිකම් ප්‍රශ්න සම්බන්ධයෙන් ගැටලු ඇති කර ගන්න ගියොත් අපට GSP Plus සහනය ලැබෙන්නේ නැහැ. එතකොට අපට ඒක තවත් විශාල ප්‍රශ්නයක් වෙනවා. මේ, එන අවුරුද්දේ අපට මුහුණ දෙන්න තිබෙන ප්‍රශ්න 5ක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හයවැනි ප්‍රශ්නය විධියට ආහාර හිඟය ඇති වෙන්න පුළුවන්. අපට පොහොර නැති නිසා ලබන අවුරුද්දේ මාර්තු වන විට ආහාර හිඟයක් ඇති වෙන්න පුළුවන්. එතකොට පිටින් ආහාර ගෙන්වන්න ඕනෑ. කොහේද, ඒවාට මුදල් තිබෙන්නේ? අනෙක, ආහාර නිෂ්පාදනය කරන සමාගම්වලට ඒ වුවමනා අමුද්‍රව්‍ය කොටස් ආනයනය කරන්න ඉඩ දීලා නැහැ. එහෙනම් සැපයීමේ කඩා වැටීමක් වෙන්න යනවා. මේ ප්‍රශ්න 06 තමයි අපට එන්න තිබෙන්නේ. මේ ප්‍රශ්නවලට විසඳුම් හොයන්න යාමේදී අන්තිමේ දී වෙන්නේ රුපියලේ වටිනාකම අඩුවෙන එකයි. මේ ආණ්ඩුව බලයට එන විට ඇමෙරිකානු ඩොලරයේ අගය රුපියල් 185යි. දැන් එය නිල වශයෙන් පවතින්නේ රුපියල් 202ක් ලෙසයි. බැංකුවෙන් කියන්නේ 240යි කියලා. අපි ඔක්කොම දන්නවා. You cannot have two rates; you must have one rate. තව මාස හයක කාලයක් ඒ තත්ත්වයෙන් ඇදගෙන යන්න බැහැ. එහෙම නම් වෙන්නේ මොකක්ද? අපට සිදු වෙනවා, ආණ්ඩුවට සිදුවෙනවා නිල වශයෙන් එය රුපියල් 240ක් කරන්න. You will have to bring the exchange rate to Rs. 240. එතකොට සිදු වෙන්නේ මොකක්ද? එතැනින් ඒක නවතිනවා ද? You would not be able to stop it. If you have not got foreign exchange reserves, the rate must keep coming down.

ඒක තවත් අඩු වෙන්න ඕනෑ. ඒ ඉහළ යෑම නවත්වන්න නම්, you must put a floor underneath Rs. 240. එහෙම නම් රුපියල් 240 මට්ටමේ ඒක ස්ථාවර කරන්න වැඩසටහනක් ගෙනෙන්න ඕනෑ. මේ ගැන අපි ටිකක් හිතලා බලන්න ඕනෑ. අපි හිතුවොත්, මේ නිසා අපේ අපනයනය වැඩි වෙයි කියලා, ඒකත් සිදු වන්නේ නැහැ. මොකද, තේ නිෂ්පාදනය වැඩි වන්නේ නැහැ. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයෙන් ආදායමක් ලැබෙන්නේ නැහැ. අනික් අතට GSP Plus නැති වෙනවා කියලා දැනගත්තොත්, දැන් ඉඳන්ම අපට ලැබෙන ඇණවුම් ඔක්කොම වෙනත් රටවලට මාරු වෙනවා. එතකොට මේක තවත් කඩා වැටෙනවා. ඉතින්, මේක නවත්වන්න වෙනවා.

අනික, එකවර පමණක් අය කරන බද්දක් මේ වෙලාවේ පැනවීම සුදුසුයි කියා මා හිතන්නේ නැහැ. එක වරක් රටට කියලා 2015 අපි එහෙම බද්දක් ගත්තේ ආර්ථිකය සංවර්ධනය වනකොට, ආර්ථිකය ස්ථාවර කරන්න, ආර්ථිකය වර්ධනය කරන්න. ඒ වාගේම, ප්‍රාථමික අය වැයේ අතිරික්තයක් ඇති කරන්න 2017 වර්ෂයේදී එවැන්නක් කළා. එතකොට ඒ අය හම්බ කළා. එහෙත් දැන් ආර්ථිකය තිබෙන්නේ වර්ධනය වන තැනක නොවෙයි. ආර්ථිකය තවත් පහළ බහින්න පුළුවන්. එතකොට ඒ සමාගම්වල මුදල් නැති වෙනවා. අනාගතයේ රැකියා ඇති කරන්න තිබෙන ප්‍රධානම සමාගම් 20, 30, 40 හි මේ ප්‍රශ්නය ඇති වුණාම, ඒ සමාගම් ගෙන යන්නේ කොහොමද? එක පැත්තකින් ආණ්ඩුව හෙලවෙනවා; අනික් පැත්තෙන්, ඒ සමාගම් හෙලවෙනවා. ආර්ථිකයේ විශාල ප්‍රශ්නයක් තිබෙන්නේ. අපි මේ ගැන හිතලා ක්‍රියා කළේ නැත්නම් මොකක්ද වෙන්නේ? ප්‍රධාන වශයෙන්, මේ රටේ මධ්‍යම පන්තිය විනාශ වෙනවා. අපි ආණ්ඩුවක් හැටියට 1977 සිට මධ්‍යම පන්තියක් ඇති කරන්නට ක්‍රියා කළා. ඒ මධ්‍යම පන්තියේ ඡන්ද අරගෙන තමයි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය බලයට ආවේ. ඊට පසුව ඒක තවත් දියුණු වුණා. දැන් මේ මධ්‍යම පන්තිය නැති කරන්න යනවාද?

අද මිනිස්සු අමාරුවෙන් ජීවත් වෙන්නේ. 1970 ගණන්වල වාගේ නොවෙයි, අද තිබෙන්නේ වෙනත් කාලයක්. අද සිටින තරුණයන්ට මඤ්ඤොක්කා කාලා පුරුදු නැහැ. කොළඹ සිටියත් අපි පොඩි කාලයේ මඤ්ඤොක්කා කෑවා. අද ඒක වෙන්නේ නැහැ. අද අලුත් තැනකට යන්නේ. අපිට මේ වාගේ වියුෂන් පන්ති තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, අපට තිබුණු වියදම් මොනවාද කියලා. අද එහෙම නොවෙයි. කී දෙනෙකුට ටෙලිෆෝන් තිබෙනවාද? අපියි මධ්‍යම පන්තියක් ඇති කරලා තිබෙන්නේ. ඒක නැති කරන්න එපා. ඒක නැති වුණොත් මොනවා වෙයිද දන්නේ නැහැ. මුළු දේශපාලන ක්‍රමයම එපා වෙයි. ඕකයි ජර්මනියේත් වුණේ, 1920 ගණන්වල. හිට්ලර් ආවේ මධ්‍යම පන්තිය නිසා. වෙන එකක් නිසා නොවෙයි. ඒ නිසා මම කියනවා, මූල්‍ය ස්ථාවරභාවය ඇති කරන්න නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට - IMF එකට - ගිහින් කථා කරන්න කියලා. මම හිතන්නේ නැහැ, 'රැකියා ඉවත් කරන්න' වැනි කොන්දේසි දමයි කියලා. ඒක පාර්ලිමේන්තුවටම කියන්න පුළුවන්. එතැනට ගිහින් සාකච්ඡා කරන්න. නැත්නම්, එය අපි හැම කෙනාටම බලපාන්න පුළුවන්; බැංකුවේ තිබෙන මුදල්වල වටිනාකම නැති වෙයි. ඊට පසුව ඔබතුමන්ලාට ගෙදර යන්න බැරි වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ඊට අමතරව මම තව විනාඩි දෙකක් ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම කියන්නේ මේක විසඳාගන්න අනික් රටවල් එක්ක කථා කරන්න කියලායි. චීනය, ඉන්දියාව, ඇමෙරිකාව ආදි ඔක්කොම රටවල් එක්ක කථා කරන්න. ඒ ගොල්ලන්ගෙන් ආධාර ගන්න. අනික, අලුතෙන් ව්‍යාපෘති කරන්න විශාල කාලයක් යනවා. අපේ කාලයේ ඩොලර් බිලියන 4ක විතර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න තිබුණා. සැහැල්ලු දුම්රිය සංක්‍රමණ - LRT- ව්‍යාපෘතියට අදාළව ඩොලර් බිලියන එකහමාරක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
හිටපු අගමැතිතුමනි, දැන් අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා මේ දුෂ්කර තත්ත්වය ගැන කියලා පහසුකමක් ගන්න හැදුවොත්, ඒ අය කොන්දේසි මාලාවක් ඉදිරිපත් කරනවා කියා ඔබතුමා හොඳටම දන්නවා. එවැනි තත්ත්වයක් ඇති වුණොත්, ඒ කොන්දේසි මාලාවේ ඇතිවන ප්‍රතිපත්තිමය තත්ත්වයන්ට ඔබතුමන්ලා විපක්ෂය වශයෙන් එකඟ වෙනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ඒ ගැන මම කියන්නම්. මම කියමින් සිටියේ අපේ LRT ව්‍යාපෘතියට අදාළ ඩොලර් බිලියන එකහමාර ගැනයි.

කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය දුන්නා. දැන් එතැන මුදල් නැහැ. ADB එකෙන් ණය ගන්න හදනවා. මේක ආපසු ගියා නම් තව ඩොලර් මිලියන 500ක් එතැනට හම්බ වෙනවා. ඒ එතැන තිබුණු දෙක මේ new frontier එක්ක හිරවෙලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, මෙතුමා එකඟ නොවෙන්න පුළුවන් ඒකට. එතැන තිබෙනවා ඩොලර් බිලියනයක්. MCC එක අයින් කළා. එතැන තිබෙනවා ඩොලර් මිලියන 400ක් පමණ. මම හිතන්නේ, මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වැනි කොටසේ තිබෙනවා ඩොලර් මිලියන 300ක්. ලෙහෙසියෙන්ම ඩොලර් බිලියන 4ක් සොයාගන්න පුළුවන්, මේ අවස්ථාවේ. IMF එකට යන්න. මම නම් කියන්නේ නැහැ, යන්න එපා කියලා. එතැනට ගියාම, කොන්දේසි දමාවි. නමුත් මම කියන්නේ, 'රැකියා ඉවත් කරන්න' කියන කොන්දේසිය දමන එකක් නැහැ කියලායි. එහෙම නම්, අපිත් කියන්නම්. එහෙත් යම්කිසි මූල්‍ය විනයක් ඇති කරයි. ඒක වුවමනායි. ඒ ගැන ඔබතුමාත් දන්නවා. ඒ මූල්‍ය විනය ඇති කරගන්න. ගිහින් කථා කරන්න. මොකද, මේක විශාල ප්‍රශ්නයක්.

මේ ආර්ථිකය කඩා වැටුණොත් ඔබතුමන්ලාට විතරක් නොවෙයි යන්න වෙන්නේ. නක්ෂත්‍රයට අනුව ග්‍රහයන් ගැන කියනවා වාගේ මේ කිව්ව කරුණු 6ත් ආර්ථිකයට අපල ග්‍රහයෝ හය දෙනෙක්. ඒ ග්‍රහයන්ගෙන් දෙන්නෙක්, නැත්නම් තුන්දෙනෙක් රාශිගත වුණොත්, මේ පාර්ලිමේන්තුවේ අපි කවුරුවත් නැති වෙයි. මේ ගොල්ලෝ කොහොමද කරන්නේ? මේ ප්‍රශ්නය තිබෙන්නේ ආණ්ඩුවට විතරක් නොවෙයි. මිනිසුන්ට සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුව එපා වෙලා තිබෙන්නේ; අප කාගේවත් මුහුණු බලන්න කැමැති නැහැ. අපි මෙතැන කෑ ගහන කොට අපට සහයෝගය දෙන අය ඒකට කැමැතියි; අත්පුඩි ගහනවා. අනික් අයට ඒ ගැන කිසිම උනන්දුවක් නැහැ; අපව පිළිකුල් කරලා බලනවා. මා හිතන්නේ ඇමතිතුමා කිව්ව කාරණය එතැන තිබෙනවා. අපි ඒක දැන ගන්න ඕනෑ. අපි ඉන්නේ හුඟක් අමාරු තැනක. ආර්ථිකය වැටුණොත් වෙන්නේ, ආණ්ඩුව වැටෙන එක විතරක් නොවෙයි. 2001 වර්ෂයේ ආණ්ඩුව වැටුණා. අපි බලය අරගෙන ඇවිල්ලා ආණ්ඩුව කළා. මේක ඊටත් වඩා අමාරු තත්ත්වයක්. අපි ඔක්කෝම එක මතයකට එන්න ඕනෑ. අපේ ක්‍රමවේදය වෙනස් කරන්න ඕනෑ.

මේ අය වැය කථාව ආරම්භ කළේම -එය පටන් ගත්තේම- ගිය ආණ්ඩුවට බැණලා. ඉතින් මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරුයි, ඔය පැත්තේ ඉන්න මැති ඇමතිවරුන් ඇතුළු සියලුදෙනායි මේ ආර්ථිකය ආරක්ෂා කරන්න ඕනෑ. අපි දෙපැත්තම ඒ ගැන බලමු. ඉස්සෙල්ලා කොහොමද, කථා කරන්නේ? මේ ප්‍රශ්නය පැත්තකට දමන්න. අද 'සජබ' උද්ඝෝෂණයක් තිබුණා. කොවිඩ් ප්‍රශ්නයක් බලපා තිබුණා නම්, කථා කරලා කියන්න තිබුණා, "කල් දමන්න" කියලා. එච්චරයි කරන්න තිබුණේ, වෙන දේවල් කරන්නේ නැතිව. දෙමළ පක්ෂවල ප්‍රශ්න තිබෙනවා; ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රශ්න තිබෙනවා. ඒ අය එක්ක කථා කරන්න. කථා කරලා හොඳ වාතාවරණයක් ඇති කරන්න. එහෙම වාතාවරණයක් ඇති කරලා බලමු. මේ ප්‍රශ්නය බලපා තිබෙන්නේ අප හැම කෙනාටම. තරුණ අයටත් ප්‍රශ්න තිබෙනවා.

විශේෂයෙන්ම මම කිව්වේ දැන් තිබෙන ප්‍රශ්න ගැන. ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය, පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට මොකුත් කර ගන්න බැරිකම. ඇමතිතුමා කිව්ව හැටියට අපට දැන් මේ දිහා බලන්න තිබෙනවා, වෙනත් විධියකට; අලුත් විධියකට. ඒකයි මම කියන්නේ. මේ තරුණ පරම්පරාවට හොඳ අනාගතයක් ඇති කරන්න නම්, අප මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ.

මේ අය වැයට කොහොමත් ආණ්ඩුවේ විශ්වාසය තිබෙනවා. ඒ නිසා එය මේ විධියට සම්මත කර ගන්න. ඊට පස්සේ IMF එකත් එක්ක සාකච්ඡා කරලා, අනික් අයත් එක්ක සාකච්ඡා කරලා අලුත් මාර්ගයක යන්න කියලා මම කියන්න කැමැතියි. ස්තුතියි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

අද දවසේ රටේ අනෙකුත් වැඩවලට යන මිනිසුන් පවා ලොකු අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. කට්ටියක් පොළොන්නරුවේඉඳලා මළ ගෙදරකට ඇවිත් තිබෙනවා- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.42]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අලුත් විධියට බලනවා කියන්නේ IMF එකට යන එක නොවෙයි. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමනි, ඔබතුමන්ලා ඒකට ගියා. කී පාරක් නම් ගියාද? අනෙක් එක, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මහා අසත්‍යයක් කිව්වා,

එන්.එම්. පෙරේරා මැතිතුමා තමයි ඉස්සෙල්ලාම IMF එකට කථා කරන්න ගියේ කියලා. ඒක මහා අසත්‍යයක්. එන්.එම්. පෙරේරා සහෝදරයා තමයි ඇවිල්ලා කිව්වේ, "IMF එක කියන ඒවා කළොත් අපි ඉවරයි" කියලා. එන්එම් ඇවිල්ලා කිව්වා, "ඒ ගොල්ලන් ඉල්ලන පළමුවෙනි දේ තමයි අපේ රුපියලේ වටිනාකම අඩු කරපන් කියන එක. ඒකට අපි එකඟ වුණොත්, ඒක හරියට උණකාරයාට වතුර දෙනවා වාගේ වැඩක්." කියලා. ඒ නිසා අපි IMF එක ගැන කථාවට යන්න ඕනෑ ඇත්තටම අන්තිමට හිරේ යනවා වාගේ පමණයි. හිරේ යනවා වාගේ! ඉතින් මම ඒ ගැන අන්තිමට කියන්නම්.

මේ අය වැය ගැන කෙටි හැඳින්වීමක් කරනවා නම්, දහස් ගණනක් වූ දුෂ්කර තත්ත්වයන් මැද්දේ තමයි මේක ගෙනාවේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
හිරේ යනවාට වඩා IMF එකට යන එක හොඳයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හිරේ ගියාම අඩු ගණනේ එතැන කන්න දෙනවා. නමුත් IMF එකට ගියාම කන්න දෙන්නේ නැහැ. IMF එකට ගියාම, ඒ අය අපිව කනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බලමුකෝ, යන්නේ නැද්ද කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක හරි. අන්තිමට කර ගන්න දෙයක් නැති වුණාම හිරේ යන්න වෙන්න පුළුවන්. ඉතින් එහෙම යනකොට යන්නේ මරුවා කරේ බැඳගෙන. *[බාධා කිරීමක්]*

අද ඉතා දුෂ්කර තත්ත්වයක් තිබෙන්නේ. ඉතා දුෂ්කර තත්ත්වයක් මැද මේ අය වැය ගෙනාවේ. හිතන්න කෝ, විපක්ෂයේ ඉන්න ඔබතුමන්ලාට අය වැයක් ගේන්න වුණා නම් කොහොමද කියලා. කොච්චර අමාරුකම් මැද්දේ ද එය ගෙනෙන්න වෙන්නේ? එක පැත්තකින් රාජ්‍ය ආදායම්වල අමාරුව තිබෙනවා. ඒකට නම් රුපියල් අච්චු ගහන්න පුළුවන්. අනික් පැත්තෙන් අපට තිබෙනවා, ඩොලර් එකේ අමාරුව. ජාත්‍යන්තර මිල ගණන් ඉහළ යනවා. ආහාර ද්‍රව්‍ය ඇතුළු හැම දේකම මිල ගණන් ඉහළ යනවා.

ඊළඟට අපේ නැව් ගාස්තු ඉහළ යනවා; කන්ටේනර් ගාස්තු ඉහළ යනවා. මේ ඔක්කොම එකතුවෙලා එනකොට අපේ මිල ගණන් රොකට් එක වාගේ ඉහළට යනවා. මේ ප්‍රශ්නයට විපක්ෂයේ ඔබතුමන්ලා ළඟ උත්තරයක් තිබෙනවාද? මේ අය වැය දහසක් අමාරුකම් මැද ඉදිරිපත් කළ අය වැයක් කියලා මා කියන්නේ ඒ නිසායි. හැබැයි මේ අය වැයෙන් වැඩිදෙනකුට යම් යම් සහන දීලා තිබෙනවා. දුගී දුප්පත් ජනතාවගේ ජීවනෝපායට මුල්තැනක් දීලා තිබෙනවා. මිනිසුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට ග්‍රාම නිලධාරි වසමකට වැඩි මුදලක් දීලා තිබෙනවා. ඊළඟට, ඉහළ ආදායම් ලබන අයගෙන් සීමිත ආකාරයට වුණත් යම් බද්දක් අය කර ගැනීමට යෝජනා කර තිබෙනවා. මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම වික්‍රමයක් හැටියට අපි දකින්න ඕනෑ. මේ අය වැය එක්තරා විධියක වික්‍රමයක්. ඒ නිසා මේ අවස්ථාවේදී අපි මුදල් ඇමතිතුමාට අපේ ප්‍රශංසාව පුද කරන්න ඕනෑ.

කොවිඩ් - 19 වසංගතය තිබුණේ නැත්නම් ඉදිරිපත් කරන්නේ වෙනත් අය වැය ලේඛනයක්. කොවිඩ් - 19 වසංගතයෙන් පසුව ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ වෙනම අය වැය ලේඛනයක්. ඒ නිසා මේ අය වැය ලේඛනය ගැන සාමාන්‍ය ආකාරයට කල්පනා කරන්නට හෝ විවාද කරන්නට අපට පුළුවන්කමක් නැහැ.

බලන්න, මේ කොවිඩ් - 19 වසංගතයත් එක්ක ඇති වුණු විවිධ විපාක නිසා විරැකියාව කොපමණ වැඩිවෙලා තිබෙනවාද කියලා; දුප්පත්කම කොපමණ වැඩිවෙලා තිබෙනවාද කියලා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නවාය කියලා වෙනත් ආකාරයකට ඒවා වළක්වන්න ඔබතුමන්ලාට පුළුවන්ද? මේ දුෂ්කරතා මැද තමයි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ.

දැන් මහා ජීවන අර්බුදයක් තිබෙන්නේ. හැබැයි මේ ජීවන අර්බුදය බලපාන්නේ පන්ති භේදය අනුවයි. ඒක දකින්න පුළුවන් අපට විතරයි. හේතුව, මේ සමාජයේ පන්ති භේදයක් තිබෙනවාය කියලා අපි පිළිගන්නවා. ඒ පන්තිවල වුවමනාවනුත්, ඒ පන්තිවලට ඇතිවන බලපෑමත් පන්ති භේදය අනුවයි සිද්ධ වෙන්නේ. දැන් බලන්න, විශාල වශයෙන් විරැකියාව ඇති වුණා. මිනිසුන්ට ජීවත් වීමට බැරි තරම් බඩුවල මිල ඉහළ ගියා. මේක බලපානවාද, ආදායම් තිබෙන පන්තියට? නැහැ. මේ වසංගතයත් එක්ක ඇති වුණු තත්ත්වය බලපාන්නේ සමාජ පන්ති තීරු අනුවයි කියන එක අපි කවුරුත් දැන ගත යුතුයි. ඒ නිසා අපි දැන් මොකද කරන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාලයේ වසංගතය තිබුණාය කියලා නැහැ, ඉහළ ආදායම් ලබන අයගේ ආදායම් තවත් ඉහළට ගියා. ලංකාවේ විතරක් නොවෙයි, ඇමෙරිකාවේත් ඉහළම ආදායම් තිබෙන අයගේ ආදායම් තවත් ඉහළ ගියා. ඊයේ නැත්නම් පෙරේදා මා දැක්කා, එක සමාගමක් ආණ්ඩුවට බදු ගෙව්වාට පස්සේ මාස 9ක ශුද්ධ ලාභය රුපියල් බිලියන 11යි කියලා පුවත් පතක පළවෙලා තිබුණා. මෙය ලංකාවේ දේශීය සමාගමක්. අපේ රට අලුත් සංවර්ධනයකට යන මාවත හදාගන්න මේ වෙලාවේ මුදල් දෙන්න ඕනෑ, මේ අය නේද? මේ අයගෙන් බදු මුදල් ගන්නේ නැතුව අපි කාගෙන්ද මේ මුදල් ගන්නේ? *[බාධා කිරීමක්]* IMF එකෙන් ගන්න? ඔව්, IMF එකෙන් ගන්න පුළුවන්. හැබැයි ඊළඟට අනෙක් පැත්තෙන්, අපි ලවා මේ රටේ පොදු ජනතාවගේ ඉහ මොළ හූරාකන්න සලස්වනවා. ඒ නිසා මේ දෙක අතරේ මොකක්ද කරන්න ඕනෑ? හැබැයි ඉහළ පන්තියේ වුවමනාව නියෝජනය කරනවා නම්, විපක්ෂයේ ඔබතුමන්ලාට මේ ගැන තීන්දු ගන්න බැරි වෙයි. අපි ඒක එහෙමම නියෝජනය කරන්නේ නැහැ. ඒ නිසා තමයි අපි මේ විධියට සීමිත ආකාරයකට වුණත් ඉහළම ආදායම් ලබන අයගෙන් යම් බද්දක් ගත්තේ. ඒ ගැන මා අපේ මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කරන්න ඕනෑ.

දකුණු ආසියානු තිරසර සංවර්ධන සමුළුවේ පස්වන සැසිවාරය මේ දවස්වල පැවැත්වෙනවා. ඒකේ ආරම්භක අවස්ථාවට අපි ගියා. එහිදී හෙළිදරව් වුණා, ලෝකයේ තවත් මිලියන 89ක් ජනතාව දුප්පත්කමට පත්වෙලා තිබෙනවා කියලා.

කොවිඩ් වසංගතයත් එක්ක ජනතාව අන්ත දුගීභාවයට වැටිලා සිටිනවා. කොවිඩ් වසංගතයෙන් ගොඩ එන මාවතත් එක්ක එකට අමුණලා අපට තිරසර සංවර්ධනය ගැන කථා කරන්න පුළුවන්. මේක තමයි ඒකේ තිබුණු සාකච්ඡාව. මම මේ කියන්න හදන්නේ මේකයි. අපි මේ අය වැය ගැන විවාද කරන්නේ තිරසර සංවර්ධනයේ මාවත සොයන්න දකුණු ආසියානු නියෝජිතයන් එකතු වෙලා කොළඹ නගරයේ අද සාකච්ඡාවක් කරමින් සිටින වෙලාවක. මේ තිරසර සංවර්ධනයේ ප්‍රධාන සටන් පාඨය මොකක්ද? "No one will be left behind". මොන සංවර්ධනයෙන්වත් වැඩක් නැහැ, මොන දියුණුවෙන්වත් වැඩක් නැහැ, ඒ දියුණුවට හැම මිනිහාම ඇතුළත් නොවෙනවා නම්. මේක

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

තමයි තිරසර සංවර්ධනය. මේක තමයි අපේ ඉලක්කය. එහෙම නම් අපි කළ යුත්තේ කුමක්ද? මේ රටේ හැමෝම ඉහළ ජීවන මට්ටමකට ඇතුළත් කරන්න ඕනෑ. ඒ සඳහා එක මාවතයි තිබෙන්නේ. -අපට මාවත් කීපයක් තිබෙනවා. නමුත්, කෙළින්ම බැලුවාම අපට එක මාවතයි තිබෙන්නේ.- අපි කවුරු කවුරුත් අපි අතර බෙදා හදාගෙන ජීවත් වෙමු. බෙදා හදාගෙන ජීවත් වෙන්නේ නැත්නම් අපට මේකට මුහුණ දෙන්න වෙන විධියක් නැහැ. එතැනදී අපි තේරුම් ගන්න ඕනෑ, රජයක් කොහොමද මෙවැනි තත්ත්වයක් හසුරුවන්නේ කියලා.

පසුගිය ආණ්ඩුව කාලයේ බදු අනුපාතය සියයට 85ට සියයට 15යි. සාමාන්‍ය ජනයාගෙන් අය කරන වක්‍ර බද්ද සියයට 85යි. ඉහළ ආදායම් ලබන අයගෙන් අය කරන බද්ද සියයට 15යි. මේ බද්ද මෙහෙම තියෙනතුරු අපට පුළුවන්කමක් නැහැ, සංවර්ධනයේ අලුත් මාවත සොයා ගන්න. ඒක ගැන කිව්වේ නැහැ, අපේ හිටපු අගමැතිතුමා. එතුමාගේ කාලයේ තමයි මේක මේ ගණනට ගෙනාවේ. ඊට ඉස්සෙල්ලා මීට වඩා අඩුවෙන් තමයි වක්‍ර බද්ද ගත්තේ. එතුමාගේ කාලයේ තමයි මේ බදු අය කිරීමේ ක්‍රමය සියයට 85ට සියයට15ක් ලෙස ගෙනාවේ. හැබැයි, පසුගිය කාලය වෙනකොට මේක මීටත් වඩා දරුණු අනුපාතයකයි තිබුණේ. ඒ කියන්නේ වක්‍ර බද්ද වැඩි වෙමින්, ඍජුව ගන්නා බද්ද අඩු වෙමින් තමයි තිබුණේ. ඒ නිසා මේ තත්ත්වය ප්‍රගතිශීලීව වෙනස් කරනතුරු; වෙනස් කිරීමේ මාවතට එනතුරු අපේ රට මේ තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න ක්‍රමයක් ගැන හිතන්න අපට පුළුවන්කමක් නැහැ.

අපි බලමු, මේකට විසඳුම නියෝලිබරල් ධනවාදය ද කියලා. නියෝලිබරල් ධනවාදය අසමත් නේද? චීනයේ, රාජ්‍යය විසින් මෙහෙයවන ආර්ථිකය කොහොම නමුත් ඔරොත්තු දීලා තිබෙනවා. චීනයේ, රාජ්‍යය විසින් මුළු ආර්ථිකයම මෙහෙයවනවා. වෙළෙඳ පොළකුත් තිබෙනවා. නමුත්, ඒ වෙළෙඳ පොළත් ප්‍රබලව නියාමනය කරන්නේ රාජ්‍යයයි. රාජ්‍යය මෙහෙයවන්නේ යම්කිසි දර්ශනයකින්, ඒ වාගේම න්‍යායකින්. ඒ තමයි ජනතාව. ජනතාව කියන්නේ, වැඩ කරන ජනතාව. වැඩ කරන ජනතාව white-collar වේවා, blue-collar වේවා, ඒ මිනිසුන්ගේ ශක්තියෙන් තමයි මේ හැම දෙයක්ම නිර්මාණය වෙන්නේ; හැම දෙයක්ම සිද්ධ වෙන්නේ. අන්න ඒ අය දිහාවටයි චීන රජයේ සියලුම ආර්ථික ක්‍රියාකාරිත්වයන්ගේ ප්‍රයෝජනය, ලාභය බෙදා හැරලා තිබෙන්නේ. ඒ අතර මහා කෝටිපතියන්ටත් ඉඩදීලා තිබෙනවා, ප්‍රකෝටිපතියන් වෙන්න. නමුත්, ඒ සියල්ලම චීන රාජ්‍යයේ සැලසුම තුළ ඇතුළත්. අද වන විට ඇමෙරිකාවේ ජෝ බයිඩන් එරට සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන්, පරිසරය වෙනුවෙන්, රැකියා ඇති කරන්න විශාල ලෙස මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් මොකක්ද ඇතිවෙලා තිබෙන තත්ත්වය? ඒ තරම් විශාල මුදල් වෙන් කරලත් ඒ අයට පුළුවන්කමක් ලැබිලා නැහැ, ඒ රටේ ඇති වෙච්ච මහා විරැකියාවට ඔරොත්තු දෙන්න. ඇමෙරිකාවේ ගෙවල් නැති මිනිස්සු විශාල සංඛ්‍යාවක් පාරේ නිදියනවා, වාහනවල නිදියනවා. ඒ තමයි නියෝලිබරල් ධනපතිවාදය. ඒකයි මම මේ නැවත නැවතත් කියන්නේ, අපි මොකක් හරි මාවතක් තෝරා ගන්න ඕනෑ කියලා.

ඒ තෝරා ගන්නා මාවත අනුවයි අපට අනාගතයක් තිබෙන්නේ. අපි හැම අංශයකම ඵලදායිතාව වැඩි කරන්න ඕනෑ. ඒක අත්‍යවශ්‍ය දෙයක්. මම දන්නේ නැහැ, ඒක විග්‍රහ කරන්න මට වෙලාවක් තිබෙනවාද කියලා. නිෂ්පාදන ඵලදායිතාව, සේවා ඵලදායිතාව වැඩි කරන්න ඕනෑ. ඒක වැඩි කරන තරමට තමයි අපට පුළුවන් වෙන්නේ, මේ රටේ නිෂ්පාදන අතිරික්තය වැඩි කරන්න. ඒ ප්‍රමාණයට තමයි අපට පුළුවන් වෙන්නේ, ජීවන මට්ටම ඉහළ තැනකට ගෙන යන්න. ඵලදායිතාවට අත්‍යවශ්‍ය දෙයක් තමයි, තාක්ෂණය. නමුත්, තාක්ෂණයෙන් පමණක් ඵලදායිතාව වැඩි කරන්න බැහැ. යම් ප්‍රමාණයක් පුළුවන්. තාක්ෂණයත් එක්කම අවශ්‍යයි, වැඩ කරන මිනිසුන්ගේ උද්‍යෝගය. කොහොමද ඒක ඇති කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම නම්, මම ඒ විනාඩි දෙකට හරි යන්න කථා කරන්නම්.

උද්‍යෝගය ඇති කරන්න පුළුවන් ඒ මිනිසුන් ඒවායේ අයිතිකාරයන් කරලා. වෙන මොකක්ද මාවත? මට අයිති දේ ගැන මට උද්‍යෝගයක් තිබෙනවා. මිනිසුන් වැඩ කරන හැම තැනකම ඒ වැඩ කරන මිනිසුන්ගේ අයිතියට අඩුම ගණනේ හිමිකාරිත්වයෙන් පංගුවක් දෙන්න. එහෙම වුණොත් විතරයි අපට පුළුවන් වන්නේ මිනිසුන්ගේ උද්‍යෝගය ඇති කරන්න. හැම දාම කථා කරනවා, අපේ රාජ්‍ය ව්‍යවසායන් ගැන. හැම දාම කනවැන්දුම. "අනේ අම්මේ! ඕවාට ලොකු වියදමක් යනවා. හරිම කරදරයක්. මේක ආර්ථිකයට මහා බරක්" කියනවා. මේ තිබෙන හැටියට බරක් තමයි. ඒකට මොකක්ද කරන්න ඕනෑ? ඒවායේ සේවක සභා ඇති කිරීම, ඒවායේ අයිතියට සේවකයන් එකතු කර ගැනීම කරන්න ඕනෑ. ඒකයි මාවත. ඒ මාවත හැර වෙන මාවතක් නැහැ. මොනවාද කේරළය කළේ? Outgrower system එක ඇති කළා. සේවකයන්ට දුන්නා, "මෙන්න, උඹලාට ඉඩම් කට්ටි. උඹලා වවා ගනිල්ලා. වැටුප් ප්‍රශ්නයක් නැහැ. උඹලා වවා ගන්න කොට උඹලා පුළුවන් තරම් ඵලදාව ඇති කරපන්. අපි ඒවා මිලදී ගන්නම්" කියලා. ඒක නිසා කේරළයේ අලාභයට ගිය ටාටා සමාගම සතු වතු අද ලාභ ලබමින් තිබෙන්නේ. ඒවා අපි තේරුම් ගන්න ඕනෑ. ඒක ඉඩම් පරිහරණයේ එක් ක්‍රමයක්. අපි කොම්පැනියකට දෙනවා, ඕනෑම දෙයක් වවන්න කියලා අක්කර 500ක්. අපි කියන්න ඕනෑ, ඒ ප්‍රදේශයේ මිනිස්සු outgrower ක්‍රමයට ඒ වගාවට සම්බන්ධ කර ගන්න කියලා. ඒ මඟින් මිනිසුන්ට උද්‍යෝගයක් ඇති වෙනවා. වැඩි අස්වැන්නකුත් එනවා. ඒක නිසා wages ප්‍රශ්නයකුත් නැහැ. මෙන්න මෙවැනි ප්‍රවේශයක් ගන්නේ නැතුව මේ තත්ත්වයෙන් ගොඩ එන්න බැහැ. *[බාධා කිරීමක්]*

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා මට විරුද්ධව නැඟිට්ටාද? ඉක්මනට කියන්න ඕනෑ. වෙලාව නැහැ.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු ඇමතිතුමනි, JEDB එකේ outgrower ක්‍රමයට දීලා තිබෙන වතු මේ රජය නැවත ඒ මිනිසුන්ගෙන් උදුරා ගන්නවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි වැරැද්ද.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ඒක කියන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි වැරැද්ද. මම කියන්නේ කවුද කරන්නේ, කුමක්ද නොවෙයි, කළ යුත්තේ කුමක්ද කියන එකයි. ඒකෙන් මොකක්ද ලැබෙන ප්‍රතිඵලය? අපි වෙළෙඳ පොළට හිතුමතේ අයාලෙ යන්න දීලා තිබෙනවා. ඒක නිසා මොකක්ද ප්‍රතිඵලය? හාල් කිලෝ එකක් රුපියල් 140යි. අපට අන්න ඒවාට උත්තරයක් ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මෙච්චරයි. අපි මැරුණත් ණය ගන්න IMF එකට යන්නේ නැහැ. අපේ ආණ්ඩුව විනාශ වුණත් IMF එකට ගිහිල්ලා ණය අරගෙන ජනතාව විනාශ වෙන්න ඉඩ දෙන්න අපි ලැහැස්ති නැහැ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තිස්ස අත්තනායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.58]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහස් ශ්‍රී ලංකාවේ 76වන අය වැය තමයි ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා පසුගිය 12වන දා ඉදිරිපත් කළේ. මේ රටේ මූලිකව මතු වී තිබෙන වර්තමාන ප්‍රශ්නවලට විසඳුමක් හෝ දිගු කාලීනව රටේ ආර්ථික සමෘද්ධිය වෙනුවෙන් යම් යෝජනාවක්, අදහසක් එම අය වැය ලේඛනය තුළ තිබෙනවාද කියලා ලොකු ප්‍රශ්නයක් අපට මතු වෙනවා. අය වැය ලේඛනයක මූලික අපේක්ෂා ගණනාවක් තිබෙනවා. ජනතාවගෙන් උපයා ගන්නා මුදල් වියදම් කරන විධිය, ඒවා හොයා ගන්නා විධිය මහජන නියෝජිතයන්ට ඉදිරිපත් කිරීමක් තමයි අය වැය ලේඛනයෙන් සිදු වෙන්නේ.

නමුත්, ජනතාවගේ බදු ආදායමෙන් හොයා ගන්න ඒ මුදල් නිශ්චිතව සහ සැලසුම් සහගතව වියදම් කරනවාද, එහෙම නැත්නම් දේශපාලන ප්‍රවර්ධනය වෙනුවෙන් පාවිච්චි කරනවාද කියන කාරණය අපි ඉතා සැලකිල්ලෙන් බැලිය යුතුයි. ඒ වාගේම අය වැය ලේඛනයක් අනාගත සංවර්ධනය සඳහා පුරෝකථනයක් විය යුතුව තිබෙනවා. නමුත් එහෙම දෙයක් අපි දකින්නේ නැහැ, මේ ඉදිරිපත් කර තිබෙන 76 වැනි අය වැය ලේඛනයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය එකිනෙකට සම්බන්ධ වෙන්න ඕනෑ. පසුගිය අය වැයේ කියපු දේවල් මේ අය වැයේ සිදු නොවෙනවා නම්, ඒකෙන් ඇති ප්‍රතිඵලය මොකක්ද? මෙහිදී විශේෂයෙන්ම මා කියන්න ඕනෑ, හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් පසුගිය වතාවේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය ගැන. ඒ අය වැය ලේඛනයෙන් එතුමා යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාවලින් කීයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවාද, කීයක් ක්‍රියාත්මක නොවී තිබෙනවාද, සපුරා ගන්න පුළුවන් වුණේ කොපමණද, සපුරා ගන්න බැරි වුණේ මොනවාද කියලා මෙතැනදි බලන්න තිබුණා. හැබැයි, ඒවා ගැන එහෙම එකිනෙකට සම්බන්ධතාවක් තිබෙන බවක් මේ අය වැය ලේඛනයෙන් මම දකින්නේ නැහැ.

ඊළඟ කාරණය තමයි, ප්‍රගති සමාලෝචනය. ඉදිරිපත් කරපු අය වැය ලේඛනවල ප්‍රගති සමාලෝචනයක් සිදු වන්නේ නැහැ. ඒ කිව්වේ, ලබාගත් සාර්ථක සහ අසාර්ථකභාවය පිළිබඳව සමාලෝචනයක්වත් මේ අය වැය ලේඛනය හරහා ඉදිරිපත් කරලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනයක් හැම විටම කොටස් තුනකින් සමන්විත යුතුව තිබෙනවා. ඒ තමයි කෙටි කාලීන, දිගු කාලීන හා මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් සහිතව ඉදිරිපත් වීම. ඒ වාගේම අය වැයේ දැක්ම පැහැදිලි වෙන්න ඕනෑ. නමුත්, මේ අය වැයේ එහෙම දැක්මක් පැහැදිලි වෙන්නේ නැහැ. අඳුරේ අතපත ගා තිබෙන බවක් තමයි පෙනෙන්නේ.

ඊළඟ වැදගත්ම කාරණය මෙයයි. කොවිඩ් වසංගත තත්ත්වය නිසා අප මුහුණ පා තිබෙන මේ ආර්ථික ව්‍යසනයෙන් රට මුදා ගැනීමට මේ අය වැයෙන් ඉදිරි පියවරක් යෝජනා වෙලා තිබෙනවාද? එහෙම දෙයක් අපි දකින්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ අය වැය ලේඛනය ඇස් බැන්දුම් වාර්තාවක් හැටියටයි මම නම් දකින්නේ. ඒක ප්‍රතිඵල රහිතයි. මේ හරහා යෝජනා දෙක තුනක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ ඉදිරිපත් කර තිබෙන යෝජනා දෙක තුන මොනවාද බලන්න. ඒ යෝජනා අතර මම දුටුවා, විශේෂයෙන්ම ත්‍රීවීලර් සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාව. කොවිඩ් වසංගතය හේතුවෙන් ඒ ගොල්ලන්ගේ ආර්ථික තත්ත්වය කඩා වැටිලා තිබෙන නිසා ඒ අයට ආර්ථික සහනාධාර දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ ත්‍රීවීලර් දස දහසක් පමණ තිබෙනවා. ඒ වෙන් කළ මුදල ත්‍රීවීලර් දස දහසටම දුන්නාම එකකට කොපමණ මුදලක් ලැබෙනවාද? ගණන් හදලා බැලුවොත්, ත්‍රීවීලර් එකක් සඳහා රුපියල් 750ක දීමනාවක් තමයි ලැබෙන්නේ. ඒ මුදලෙන් ලැබෙන ආර්ථික ප්‍රතිඵලය මොකක්ද?

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ගරු මුදල් ඇමතිතුමා කිව්වා, ගෝලීය අර්බුද පහක් ගැන. ඒවා තමයි, සමාජ විෂමතාව වැඩිවීම, තිරසර සංවර්ධන වේගය අඩුවීම, පරිසර විපත් වැඩිවීම, බහු සහ ද්විපාර්ශ්වික උපකාර හීනවීම හා කොරෝනා නිසා ඇති වෙච්ච නව සාමාන්‍යකරණය. අපි කියන්නේ මේකයි. මේ කාරණා පිළිගත්තා නම්, අය වැයෙන් සම්පූර්ණයෙන්ම අවධානය දිය යුතුව තිබුණේ මේ මූලික කාරණා පහ කෙරෙහි නේද? කොරෝනා නිසා නව සාමාන්‍යකරණයක් ඇති වුණා නම්, යළි මේ රට අපි බේරා ගන්නේ කොහොමද? බහු හා ද්විපාර්ශ්වික උපකාර හීන වුණා නම්, යළි ඒ තත්ත්වය වැඩිදියුණු කර ගන්න අපි මොකක්ද ගන්නා ක්‍රියා මාර්ගය? මේවාට උත්තර නැතුව, අපි මේ අය වැය ලේඛනය ගැන මහා ලොකුවට කථා කළාට මේකේ ප්‍රතිඵලයක් නැති බව තමයි ඉතා පැහැදිලිව පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ මූලික ප්‍රශ්නය මොකක්ද? මේ වනකොට සමස්ත ජනතාවට දැනෙන ප්‍රධාන කාරණය තමයි, ජීවන වියදම් ප්‍රශ්නය. ජීවන වියදම කවදාවත් නොතිබුණු විධියට ඉතා වේගයෙන් වැඩි වනවා. ඊයේ වනකොට එළවලු මිල වැඩි වෙලා. බෝංචි කිලෝ එකක් රුපියල් 600ට ගිහිල්ලා. හාල් කිලෝවක මිල රුපියල් 150ටත් එහා යනවා. සීනි,

[ගරු තිස්ස අත්තනායක මහතා]

කිරි පිටි, භූමිතෙල් කියන මේ හැම භාණ්ඩයකම මිල වැඩි වෙලා. මිනිසුන්ට එතකොට ජීවන වියදම දරා ගන්න බැහැ. ජීවන වියදම වැඩිවීම පිළිබඳව ඇති සැබෑ අභියෝගය පිළිබඳව මුදල් ඇමතිතුමා අය වැය ලේඛනයෙන් කථා කරනවා.

මොකක්ද කියලා තිබෙන්නේ? එතුමා කියන හැටියට පරිභෝජන රටාව වෙනස් වෙලා තිබෙනවා. එතුමා කියා තිබෙන හැටියට නිෂ්පාදනයේ ඵලදායිතාව අඩු වෙලා තිබෙනවා. එතුමා කියන හැටියට නූතන තාක්ෂණයට අපි අවතීර්ණ වෙලා නැහැ. ප්‍රවාහන, ගබඩාකරණ ගැටලු තිබෙනවා. අතරමැදියන්ගේ බලපෑම් තිබෙනවා. අය වැය ලේඛනයෙන් මේවා පිළිගෙන තිබෙනවා. මේ මූලික කාරණා පහ අනුව ජීවන වියදම වැඩි වීමේ සැබෑ අභියෝගය මුදල් ඇමතිවරයා හැටියට එතුමා තේරුම් අරගෙන තිබෙනවා නම්, ඒ සඳහා මොකක්ද එතුමා ඉදිරිපත් කළ යෝජනා? පරිභෝජන රටාව වෙනස් වෙලා තිබෙනවා නම්, නිෂ්පාදනයේ ඵලදායිතාව අඩු වෙලා තිබෙනවා නම්, නූතන තාක්ෂණයේ අවහිරතා තිබෙනවා නම්, ප්‍රවාහන සහ ගබඩාකරණ පහසුකම්වල ප්‍රශ්න තිබෙනවා නම්, අතරමැදියන්ගේ බලපෑම් තිබෙනවා නම් ඒවා විසඳන්න යෝජනා ගෙනෙන්න එපා යැ. ඒක නේ ආණ්ඩුවකින් බලාපොරොත්තු වෙන්නේ. ආණ්ඩුවකින් ජනතාව බලාපොරොත්තු වෙන්නේ මේ වාගේ නිදහසට කරුණු කියන එක නොවෙයි; කරුණු හඳුනා ගත්තාය කියන එක නොවෙයි. ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සඳහා අය වැය ලේඛනයෙන් කටයුතු කරලා නැත්නම්, එතැන තිබෙන්නේ රැවටීම්; එතැන තිබෙන්නේ බොරුව; එතැන තිබෙන්නේ අඳුරේ අතපත ගෑම විතරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙවර අය වැය යෝජනාවල එතුමා අපූරු කථාවක් කියනවා. එතුමා බඩු මිල වැඩි වීමට හේතු කියා තිබෙනවා.

"විද්‍යානුකූල ක්‍රමවේද වෙනුවට අඳුරේ අතපත ගෑම නිසා ආණ්ඩුව අපහසුතාවට පත් වුණා. සාම්ප්‍රදායික මෙවලම් පාවිච්චි කරමින් වෙළෙඳ පොළ මිල පාලනය කිරීමට උත්සාහ කිරීම ප්‍රතිඵල රහිතයි."

ඒ කියන්නේ, පසුගිය අවුරුදු දෙකම ආණ්ඩුව ෆේල් කියලා මුදල් ඇමතිතුමා පිළිගන්නවා. එහෙම නම්, "ආණ්ඩුව ෆේල්" කිව්වාම කලබල වෙන්නේ ඇයි? පසු ගිය කාල සීමාවේම අපි අඳුරේ අතපත ගෑවා, සාම්ප්‍රදායික මෙවලම් පාවිච්චි කළා, ඒවා සාර්ථක නැහැ කියලා මුදල් ඇමතිතුමා අය වැය ලේඛනයෙන් පෙන්වා දෙනවා කියන්නේ, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා කියන්නේ, පසුගිය අවුරුදු එකහමාරම ආණ්ඩුව ෆේල් කියලා, අසාර්ථකයි කියලා එතුමා පිළිගන්න එක. එහෙම නම් මොකක්ද මේ කියන්නේ? මේකෙන් කියන්නේ ඊට වඩා භයානක දෙයක්. මේ කථාව අස්සේ එතුමා යෝජනා කරන්නේ, මේ සාම්ප්‍රදායික මෙවලම්වලින් බැහැරව යා යුතුයි කියලායි; ආණ්ඩුව මේ රටේ ජීවන වියදම පාලනය කිරීමට යොදා ගන්නා උපායමාර්ගික ක්‍රමවලින් ඈත් වෙන්න ඕනෑ කියලායි. ඒ අනුව, ගැසට් නිවේදන ඉවත් කරන්න ඕනෑ. නිසි බලධාරීන් පත් කිරීම නොකරන්න ඕනෑ. පාරිභෝගික සේවා අධිකාරිය වුවමනා නැහැ. මේවා තමයි කියන්නේ. එතකොට අපි අහන්නේ මේකයි. මේ වාගේ නීති රීති උපයෝගී කර ගන්න තිබෙන්නේ කුමන අවස්ථාවේදීද? මේ වාගේ නීති රීති උපයෝගී කර ගන්න තිබෙන්නේ, ජනතාව අපහසුතාවට පත් වුණු අවස්ථාවක. විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවක, රටේ ආර්ථික පරිහානියක් වනකොට, කඩාගෙන වැටීමක් වනකොට ජනතාව රැක ගැනීම සඳහා තමයි මෙවැනි උපාය මාර්ගික පියවර ගන්න ඕනෑ. ඒවා සාම්ප්‍රදායික මෙවලම්, ඒවා හරහා තවදුරටත් වෙළෙඳ පොළ පාලනය කරන්න බැහැ කියනවා නම්, ඊළඟ උත්තරය තමයි, ඉදිරි කාලය තුළ මේ කිසිවක් පාවිච්චි කරන්නේ නැතුව වෙළෙඳ පොළට ඕනෑ විධියට පරිහරණය වෙන්න, පාලනය වෙන්න ඉඩ දෙනවාය කියන එක. එහෙම නම්, ජනතාවට දෙයියන්ගේම පිහිටයි. ඇයි? ආණ්ඩුව කිසිසේත් හාල් මිලවත්, තෙල් මිලවත්, සීනි මිලවත්, කිරි පිටි මිලවත්, අත්‍යවශ්‍ය භාණ්ඩ මිලවත් පාලනය කරන්න මොනම අවස්ථාවකදීවත් මැදිහත් වෙන්න කැමැති නැහැ කියන එක තමයි එතුමාගේ කථාවෙන් නිල වශයෙන් පිළිගෙන තිබෙන්නේ. ඒවා යල් පැන ගිය ආර්ථික මෙවලම් නම්, පසුගිය කාලයේ ගැසට් නිවේදන නිකුත් කරමින් මොකක්ද කරන්න උත්සාහ කළේ? ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වූ වහාම පාර්ලිමේන්තු මැතිවරණය නිවේදනය කරලා, සැමන් මිල, පරිප්පු මිල අඩු කරන ගැසට් නිවේදනයක් නිකුත් කිරීම තමයි කළේ. ඊට පසුව හාල් මිල පාලනය කරන්න ගැසට් නිවේදන හත-අටක් නිකුත් කරලා උත්සාහ කරලා බැලුවා. නිසි බලධාරීන් පත් කරලා, හමුදාව දමලා, පොලීසිය දමලා බැලුවා. ඒ සියල්ල අසාර්ථක වුණා. එහෙම නම් ඒ අසාර්ථක වෙලා තිබෙන්නේ ඒ ගැසට්වල වරදින් නොවෙයි. ඒවා පරිපාලනය කර ගන්න තිබෙන නොහැකියාව සහ ඒවාට තිබෙන නායකත්වය බිඳ වැටීම මත බව මා ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තව නරක දෙයක් තිබෙනවා. මම මේක මාධ්‍යවලිනුත් දැක්කා. බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඊයේ-පෙරේදා මාධ්‍ය හමුවක් තියලා කිව්වා, "රාජ්‍ය සේවය මේ රටට විශාල බරක්, රාජ්‍ය සේවය තවදුරටත් වැඩි කරන්නේ නැහැ, ප්‍රසාරණය වෙන්න දෙන්නේ නැහැ, සීමා කරනවා, මීට වඩා සත පහක්වත් රාජ්‍ය සේවය සඳහා දෙන්න සූදානම් නැහැ." කියලා. ඒක එක්තරා විධියක හාස්‍යජනක කථාවක්. ඇයි? මේ රටේ රාජ්‍ය සේවකයන්ගෙන් සියයට 75ක් මේ ආණ්ඩුව බලයට පත් කිරීම සඳහා වෙහෙසට පත් වූ අය; බහුතරයක් මේ ආණ්ඩුවෙන්ම පත්වීම් ලැබූ අය. මේ රාජ්‍ය සේවය හැල්ලු කරමින් රටකට ඉස්සරහට යන්න පුළුවන්ද?

රටක් ඉස්සරහට යනකොට ඊට සමගාමීව ආණ්ඩුවක් විධියට මඟ පෙන්වන්න පුළුවන්, උපදෙස් දෙන්න පුළුවන්, මූලාධාර දෙන්න පුළුවන්නේ ඒ වාගේම යෝජනා, සැලසුම් ගේන්න පුළුවන්. හැබැයි, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා තිබෙන රාජ්‍ය තන්ත්‍රය බිඳ වට්ටමින්, රාජ්‍ය තන්ත්‍රයට යම් ආකාරයකට බාධා කරමින් රටකට ඉදිරියට යන්න බැහැ. ඒක හොඳට මතක තබා ගන්නවා නම්, මීට වඩා ප්‍රතිඵලයක් ගන්න තිබුණාය කියන එක ඉතාම පැහැදිලිව කියන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ මූලික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එකක් තමයි ජීවන වියදම් ප්‍රශ්නය. දෙවැනි ප්‍රශ්නය, ගොවි ජනතාව. දැන් ගොවි ජනතාව පාරට බැහැලා ඉන්නේ ඇයි කියන කාරණාව තේරුම් ගන්න එපායැ. මේක පැය විසිහතරෙන් කාබනික වගාවක් සඳහා රටම හරවන්න ගිහින් ඇති කර ගත්ත අර්බුදයක්. මේක ලෝක අර්බුදයක් නොවෙයි. මේක පවතින කොවිඩ් අර්බුදයේ ප්‍රශ්නයකුත් නොවෙයි. මේක සම්පූර්ණයෙන්ම ඉල්ලලා අරගත්ත අර්බුදයක්. මේ අර්බුදයේ ඊළඟ ප්‍රතිඵලය මොකක්ද? පිළිගත්තත්, නැතත් මේ අර්බුදය නිසා ගොවිතැන් කටයුතුවලට ලොකු බාධාවක් තිබෙනවා. තේ වගාවට ලොකු බාධාවක් තිබෙනවා; කුරුඳු වගාවට බාධාවක් තිබෙනවා. එළවලු, පලතුරු ආදි හැම දෙයටම මේ බාධාව ඇති වෙලා තිබෙනවා. මේකෙන් ඇති වෙන ඊළඟ ප්‍රතිඵලය තමයි නිෂ්පාදනය කඩාගෙන වැටීම. ඉදිරි කාලයේ ආහාර නිෂ්පාදනයේ බරපතළ බිඳ වැටීමක් ඇති වෙයි. පසුගිය මාස කිහිපය තුළ තේ වගාවේ නිෂ්පාදනය අඩු වෙනවා කියලා වාර්තා ගණනාවක් තිබෙනවා මම දුටුවා. පොහොර නැති නිසා, බෙහෙත් නැති නිසා කුරුඳු ටික තලා ගන්න බැරි මට්ටමට පත් වෙනවා කියලා කුරුඳු වගා කරන

ගොවීන් ප්‍රකාශ කරනවා. එතකොට මොකක්ද මේ ප්‍රශ්නය? මේක කොවිඩ් නිසාවත්, ලෝක අර්බුදයක් නිසාවත් ඇති කර ගත්ත දෙයක් නොවෙයි. මේ ගොවි ප්‍රශ්නය ඇති කර ගත්තේ ආණ්ඩුව විසින්මයි. ඒ නිසා අපි කරුණාවෙන් ඉල්ලනවා, තවදුරටත් හිතුවක්කාර මට්ටමකින් ඉන්නේ නැතිව, මෙවැනි ප්‍රශ්න හෝ විසඳාලමින් මේ ප්‍රශ්නවලට අවතීර්ණ වෙන්න කියලා. මේ හැම දෙයටම කොවිඩ් හෝ ලෝක අර්බුදයක් කියන්න බැහැ.

විරැකියාව, ආදායම් මාර්ග බිඳ වැටීම, විදේශ ශ්‍රමිකයන්ගේ රැකියා අහිමි වීම ආදි ප්‍රශ්න කොච්චර තිබෙනවාද? සංචාරක ව්‍යාපාරය බිඳ වැටීම නිසා එහි අතුරු රැකියාවල නියැළුණු විශාල පිරිසක් අද අසරණ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනකොට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් ඇමතිතුමා අය වැය කථාවේදී කිව්වා, තේ කඩවලට, බුලත්විට කඩවලට, පුංචි ව්‍යාපාර කරපු අයට ආධාර කරන්න මුදල් වෙන් කරනවා කියලා. ඒ මුදල් වෙන් කිරීම අපට ප්‍රශ්නයක් නොවෙයි. නමුත් අපි අහන්නේ සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීමෙන් අසරණ වෙලා ඉන්න, හෝටල් හා සම්බන්ධ අතුරු රැකියා කරන ලක්ෂ ගණනක් ඉන්නවා. මේ අය වෙනුවෙන් මොකක්ද කරලා තිබෙන්නේ? මූලික වශයෙන් ලංකාවේ ප්‍රධාන ආදායම් මාර්ග තුනක් තිබෙනවා. එකක් තමයි අපට ලැබෙන අපනයන ආදායම. අනෙක තමයි අපට මැදපෙරදිගින් ලැබෙන ශ්‍රමික ආදායම. තුන්වැනි එක තමයි අපට සංචාරක ව්‍යාපාරයෙන් එන ආදායම. කඩා වැටී තිබෙන මේ ආදායම් මාර්ග වැඩිදියුණු කර ගන්න මේ අය වැයෙන් කිසිදු ආයෝජනයක් කර නැති බව ඉතාම පැහැදිලිව කියන්න කැමතියි. ඒකෙන් පෙනෙන්නේ රටේ සැබෑ ප්‍රශ්න තේරුම් අරගෙන නැති බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ පෝලිම්වල ඉන්නේ මොනවාටද? මම දැක්කා, පසුගිය කාලයේ අභ්‍යවකාශයට යන්න නම් ලැයිස්තුගත කරලා පෝලිම්වල ඉන්නවා. ලෝකයේ දියුණුව එතැනට ගිහිල්ලා. නමුත් අපේ රටේ? ඊයේ බලනකොට පෙට්‍රල් ෂෙඩ් දිගේ පෝලිම්. ඒ වාගේම කිරිපිටි ටික ගන්න පෝලිම්. අනෙක් භාණ්ඩ ගන්න පෝලිම්. පෝලිම් යුගයක් ඇති කිරීම අපි කැමති දෙයක් නොවෙයි. නිදහස් ආර්ථිකයක් තිබෙන්න ඕනෑ. ඉතින්, රටේ ජනතාව පෝලිම්වලට තල්ලු කරලා රටක් දියුණුයි කියලා අපි කාටවත් කියන්න පුළුවන්කමක් නැහැ.

ඒත් එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය සංවර්ධනයට ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් මුදල් වෙන් කිරීම පිළිබඳ අපේ විරෝධතාවක් නැහැ. රටේ සල්ලි පහළට යන්න ඕනෑ කියලා හිතනවා නම් ඒක හොඳයි. හැබැයි, ප්‍රමුඛතාව හඳුනා ගත්තාද? රටේ ඉස්සෙල්ලාම සල්ලි යොදවන්න ඕනෑ මොනවාටද? මුලින්ම යොදවන්න ඕනෑ වැටුණු රට යළි ගොඩගන්නයි. මේ සඳහා මිලියන 85,000ක් විතර විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේ මුදල් ප්‍රමුඛතාව හඳුනා ගන්නේ නැතිව දේශපාලන කොන්ත්‍රාත්වලට වෙන් කර ගැනීම හරහා ඉතාම පැහැදිලිව පෙනෙන්නේ තමන්ගේ කණ්ඩායම දියුණු කිරීම මිස, රටේ ජාතික වැඩ පිළිවෙළක් ඇති කිරීමට කිසිම වුවමනාවක් නැතිකමයි. ඒ නිසා අය වැය හිඟය පියවා ගැනීමට පාවිච්චි කරන මෙවලම් සියල්ල අසාර්ථක වෙලා තිබෙනවා. මේ අය වැය හිඟය පියවා ගන්න දේශීය, විදේශීය මුදල් කොපමණ යොදා ගන්නවාද කියන එක පැහැදිලි නැහැ. මොකද, පසුගිය අවුරුද්දේ ඒක සාර්ථක වෙලා නැහැ. VAT ආදායම වැඩි කරනවා කියලා යෝජනා කරනවා. 2021දී තිබුණු රුපියල් බිලියන 650, රුපියල් බිලියන 1031 දක්වා වැඩි කරනවා කියනවා. එතකොට කියන්න පුළුවන්ද, ලබන අවුරුද්ද තුළ බඩු මිල වැඩි වෙන්නේ නැහැයි කියලා? මේක තමයි මේ ආර්ථිකයේ සැබෑ තත්ත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීන ජාතික ආර්ථික හා සමාජ විශේෂඥ කොන්ෆියුසියස්, ආණ්ඩුවක වගකීම ගැන කාරණා තුනක් කිව්වා. එකක් තමයි, ජනතාවට ආරක්ෂාව ලබා දීම - ආරක්ෂාව කියන්නේ තුවක්කු අරගෙන මුර කරන එක නොවෙයි, අධ්‍යාපනය ඇතුළු මේ සියල්ල. - ඊළඟට, ආහාර ලබාදීම සහ විශ්වාසය ගොඩ නැඟීම. මේ කාරණා තුනම මේ ආණ්ඩුව කඩාකප්පල් කරලා තිබෙනවා. ඉන්දියානු ජාතික ආර්ථික හා සමාජ විද්‍යාඥයෙක් වන අමාත්‍ය සෙන් කියනවා, සාගතයක් නිර්මාණය වීම සිදු වන්නේ දේශපාලනඥයන්ගේ අමනෝඥ ක්‍රියා නිසා කියලා. ඒක සිදු වෙමින් පවතින බව මම මේ ගරු සභාවේදී කියන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අරුන්දික ප්‍රනාන්දු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.15]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා (පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து - தென்னை, கித்துல் மற்றும் பனை செய்கைகள் மேம்பாடு மற்றும் அவை சார்ந்த பொறிமுறை பண்டங்களின் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Arundika Fernando - State Minister of Coconut, Kithul and Palmyrah Cultivation Promotion and Related Industrial Product Manufacturing and Export Diversification)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අය වැය ගැන ප්‍රකාශ කළ කාරණා ගැන ඉතාම අපැහැදිලි තැනක තමයි අපි ඉන්නේ. 1970 දී එවකට මුදල් අමාත්‍ය ආචාර්ය එන්.ඇම්. පෙරේරා මැතිතුමා රටට ඉදිරිපත් කළ වැඩසටහන ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා ඇතුළු ඔබතුමන්ලා අදටත් විවේචනය කරනවා මම දැක්කා. ඒ වාගේම, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අය වැය විවාදයට සම්බන්ධ වෙමින් තමන්ගේ කථාව තුළ කියන්නේ අපනයන ගැන නොවෙයි. එතුමා කියන්නේ ආනයන ගැන. ආනයන තුළ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට යන්න කියලා එතුමා කියන්නේ. ඒ කියන්නේ, imports වැඩි කරන්න කියලා. Exports වැඩි කරන එක ගැන නොවෙයි එතුමා කථා කරන්නේ. එන්.ඇම්. පෙරේරා මැතිතුමා 1972 නොවැම්බර් මාසයේ 10වෙනි දා මේ රටට ඉදිරිපත් කළ විසර්ජන පනත් කෙටුම්පතේදී මෙහෙම කියනවා:

> "පස් අවුරුදු සැලැස්මේ මූලික බලාපොරොත්තුව වන්නේ, කෘෂි කාර්මික හා කාර්මික අංශවල නිෂ්පාදනය වැඩිදියුණු කිරීමයි. මෙයින් බලාපොරොත්තු වනුයේ ඒ ඒ අංශවලට යොදවන මූල ධනය වැඩි කිරීම පමණක් නොවේ. යොදන මූල ධනය ප්‍රමාණයට සරිලන පරිදි දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රමාණය වැඩි කිරීමටද එයින් බලාපොරොත්තු වෙනවා. එසේම මුළු නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීම පමණක් නොව නිෂ්පාදනයේ පරිමාණය වැඩි කිරීමද එයින් බලාපොරොත්තු වන අතර, ඒ අනුව නිෂ්පාදන පරිමාණයන් ද වැඩි කළ යුතුමය. ...
>
> මිරිස්, ළූනු, රටළූනු, මුංඇට ආදී අතිරේක ආහාර ද්‍රව්‍ය ගෙන්වීම මුළුමනින්ම පාහේ තහනම් කිරීම නිසා අනිසි අන්දමින් හා ප්‍රමාණවත් අන්දමින් ප්‍රයෝජනය නොගත් ඉඩම්වලින් නිසි ඵල ලබා ගැනීමේ මාර්ගය සලසා තිබේ. ..."

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ඒ සම්පූර්ණ අය වැය කථාව මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට වැරදුණු තැනක් තිබෙනවා. 1961 ඉඳලා අද වනතුරු IMF එකත් එක්ක ගමන් කළ ආණ්ඩු විශාල ප්‍රමාණයක් තිබුණා. අපේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්නේ නැතිව, අපේ නිෂ්පාදන වැවිලි කර්මාන්තය, අපේ අපනයන වැවිලි කර්මාන්තය, අපේ අපනයන කෘෂි කර්මාන්තය, අපේ නිෂ්පාදන කෘෂි කර්මාන්තය සහ අපේ කර්මාන්ත වැඩි දියුණු කරන්නේ නැතිව දිගින් දිගටම ණය අරගෙන තාවකාලික වින්දනයක් ලබමින් රටක් හැටියට ගමන් කළ බව තමයි, IMF එකත් සමඟ කළ ගනුදෙනුවේදී අපි දැක්කේ. මම දැක්කා හිටපු විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා දිගින් දිගටම කියනවා, IMF එකට කථා කරන්න, IMF එක ගාවට යන්න කියලා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා එන්.එම්. පෙරේරා මැතිතුමා කියනවා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ නැත්නම් අවුරුදු 30කට පස්සේ අපට ලෝකයේ රටවල් ඉස්සරහා දණින් වැටෙන්නට සිද්ධ වෙනවා කියලා.

දැන් විදේශ සංචිත ගැන කථා කරනවා. ගරු තිස්ස අත්තනායක මැතිතුමනි, විදේශ සංචිත කොහෙන්ද ලැබෙන්නේ? එක ක්‍රමයක් තමයි, අපේ අහිංසක අම්මලා, නංගිලා -ලක්ෂ 20ක පමණ පිරිසක්- මැද පෙර දිග ගිහිල්ලා හම්බ කරලා මේ රටට එවන ඩොලර් බිලියන ප්‍රමාණය. අනෙක් පැත්තෙන්, ඒ වාගේම තරුණ පිරිසක් ඇඟිලි රිදෙනකම් තමන්ගේ ශ්‍රමය ඇඟලුම් ක්ෂේත්‍රයට දිය කරනවා. ඒ ඇඟලුම් ක්ෂේත්‍රය හරහාත් අපට විශාල මුදලක් ලැබෙනවා. ඊළඟ ක්‍රමය සංචාරක කර්මාන්තය. ඊළඟ එක අපනයන කර්මාන්තය.

අද කොවිඩ්-19 තත්ත්වය තුළ, මේ ගෝලීය වසංගතයත් එක්ක ඉහත කියපු ක්ෂේත්‍ර රැසකට බලපෑම් ඇතිවෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තය බිඳ වැටිලා තිබෙනවා. සංචාරක කර්මාන්තයෙන් ලැබෙන මුදල, විදේශ සංචිතවලට ලැබෙන සෘජු මුදල අපට නැති වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ තත්ත්වය එහෙම වෙනකොට අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ අනුව, සෞභාග්‍යයේ දැක්මේ සැලැස්ම අනුව අපනයන කර්මාන්තයෙන්, අපනයන කෘෂි කර්මාන්තයෙන් සහ අපනයන වැවිලි කර්මාන්තයෙන් ලැබෙන මුදල් වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තවලින් අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් ලැබුණා. සමස්ත එන්නත්කරණ වැඩසටහනට අපට ගියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 600යි.

ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 600 වැවිලි අමාත්‍යාංශයේ පොල් සංවර්ධන අධිකාරියෙන් ලබා දුන්නා හා සමානයි. ඒ වාගේම, තමයි අද වෙනකොට එය ඇමෙරිකානු ඩොලර් මිලියන 800ක් කරලා තිබෙනවා. මේ, අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ. ජනාධිපතිතුමා කිව්වා, "කහ ගේන්න නොවෙයි, කහ මෙහේ වවමු. සීනි ගේන්න නොවෙයි, සීනි මෙහේ හදමු" කියලා. ඒක තමයි ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ. තමුන්නාන්සේලා අද කථා කරනවා කිරිපිටි පෝලිම ගැන. තමුන්නාන්සේලා කියන්නේ කිරිපිටි ගේන්න කියලායි; කිරිපිටි ආනයනය කරලා ඒවා රටේ ජනතාවට දෙන්න කියායි තමුන්නාන්සේලා කියන්නේ. කිරිපිටි හදන සමහර රටවල් පවා අඩු ගණනේ ඒ රටවල දරුවන්ට කිරිපිටි දෙන්නේ නැහැ. ඒ වෙනුවට දියර කිරි දෙන්නේ. හැබැයි මෙහේ ඉන්න දරුවන්ට කිරිපිටි ටික දෙනවා. හැබැයි අපිට අමාරු අවස්ථාවේදී නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක රටක්වත් අපට උදවු කරනවාද? අඩුම ගණනේ ඔය බහුජාතික සමාගම් අපිට උදවු කරනවාද? නැහැ. එහෙනම් මොකක්ද කරන්න ඕනෑ? දේශීය නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. දේශීය කිරි නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ඒක තමයි එදා එන්.ඇම්. පෙරේරා මැතිතුමා කිව්වේ. තමුන්නාන්සේලා දැන්වත් මේක තේරුම් ගන්න ඕනෑ.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද ව්‍යාපාරිකයෝ ගැන කථා කළා. ධනවත් ව්‍යාපාරිකයන් එක්ක අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපි මේ කාරණය කියන්න කැමැතියි. රට අමාරුවේ වැටිලා තියෙන මේ වෙලාවේදී මේ රටේ ස්වදේශික ව්‍යාපාර කෝටි ගණන් මුදල් උපයා තිබෙනවා. අපි ඒ අයගේ ව්‍යාපාරවලට අකුල් හෙළනවා නොවෙයි. හැබැයි ඒ ව්‍යාපාරිකයන්ගෙන් යම්කිසි උදව්වක් සිද්ධ වෙනවා නම් ඒක තමයි අපේ බලාපොරොත්තුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙනකොට අපනයන කර්මාන්ත වැඩි දියුණු කරන්න විශාල ශක්තියක් ලබා දී තිබෙනවා. අපනයන කර්මාන්ත වැඩි කිරීම ගත්තොත්, නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්තයට විතරක් රුපියල් මිලියන 14,000ක් අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ඌන උපයෝජිත වත්කම් සම්බන්ධව තිබෙන පනත යටතේ අඩුම ගණනේ අවුරුදු 10ක් වගා නොකරපු පුරන් කුඹුරු වැවිලි කර්මාන්තයට ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි රටේ තියෙන ඉඩම් ප්‍රමාණය ගත්තොත්, අක්කර ලක්ෂ 11ක පොල් වගාව. හැබැයි මේක සක්‍රිය වගාවක් කරන්න, මේ තුළින් නිෂ්පාදන ආර්ථිකයට ශක්තියක් වෙන්න අපිට හැකියාවක් ලැබිලා නැහැ. දැන් ඒකට කාලය ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නම් අපි යථාර්ථවාදීව කල්පනා කරමු. මේක තමයි, මේ අර්බුදයට අපට තිබෙන අවසාන අවස්ථාව.

අද තෙල් පිළිබඳ අර්බුදයක් තිබෙනවා. තෙල් පිළිබඳ අර්බුදය විදේශ විනිමයත් එක්කයි එන්නේ. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ විනිමය ලබා ගන්න අපි අනිවාර්යයෙන්ම කර්මාන්ත දියුණු කරන්න වුවමනායි. අද බලන්න, මා යටතේ තිබෙන වැවිලි අමාත්‍යාංශයට අයත් පොල් සංවර්ධන අධිකාරියේ පොල්කටු කර්මාන්තය එහෙම නැත්නම් activated carbon කර්මාන්තය. එය අද ලෝකයේ මැණික් තියෙනවා වාගේයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද වස ශරීරගත වුණාම ඒවාට බෙහෙත් හදන්නේ ඒකෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ශීතකරණ හදන්න පොල්කටු අඟුරු පාවිච්චි කරනවා. අනෙක් පැත්තෙන්, වතුර පිරිසිදු කරන්න - water purificationවලට - පාවිච්චි කරනවා. පොල්කටු කර්මාන්තය කියන්නේ, අද ඩොලර් බිලියන ගණනක් ගෙනෙන කර්මාන්තයක්. එහෙම නම් අපි ඒ තැනට නොවෙයිද යන්න ඕනෑ? අපේ රටේ කොහු ආශ්‍රිත කර්මාන්ත තිබෙනවා. කෘෂි කර්මාන්තයෙන් සහ කොහු ආශ්‍රිත කර්මාන්තවලින් අපනයන ආදායම වැඩි කර ගැනීම කියන කාරණාව නොවෙයිද අපි කර ගන්න ඕනෑ? අපි හැමදාමත් මේ විධියට ණය අරගෙන, පරිප්පු ටික පිටරටින් ණයට ගේනවා; කිරිපිටි ටික පිටරටින් ගේනවා; ඉන්ධන ටික පිටරටින් ගේනවා. තව තවත් මේකත් එක්කද රටක් හැටියට අපි ඉස්සරහට යන්න ඕනෑ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ වැවිලි කර්මාන්තය, අපේ කෘෂි කර්මාන්තය, අපේ ඇඟලුම් කර්මාන්තය, අපේ ධීවර කර්මාන්තය සහ අපේ අනෙකුත් නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම කියන කාරණා තමයි අපිට තියෙන අභියෝගය. ඒ අභියෝගය ජය ගැනීමේ කාර්යය ගරු මුදල් ඇමතිතුමා භාරගෙන තිබෙනවා.

අද තමුන්නාන්සේලා රාජ්‍ය සේවකයන් ගැන කථා කළා. රාජ්‍ය සේවකයන් ගැන කථා කරද්දී මා එක කාරණයක් කියන්න

---

*** පුස්තකාලයේ තබා ඇත.**

* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

ඕනෑ. රාජ්‍ය අංශයේ වැටුප් කප්පාදු කළා කියනවා. සමහර වෙලාවට කියනවා, රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කළේ නැහැ කියලා. හැබැයි එදා ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රාජ්‍ය සේවකයන් වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. අද ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත් එවැනිම කාර්ය භාරයක් කරනවා. එතුමන්ලා රාජ්‍ය සේවය පුළුල් කරන්න ප්‍රායෝගිකව වැඩ කරපු නායකයෝ. අද අපි රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නේ කොහොමද? උපාධිධාරීන් 50,000කට රැකියා ලබා දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අය ස්ථිර කිරීම රාජ්‍ය සේවයට සැලකීම නොවෙයිද? එතකොට, ඒ අයගේ වැටුප් වැඩි වෙනවා. ඒ අයගේ වැටුප් වැඩි වෙනවා විතරක් නොවෙයි, ඒ අය ස්ථිර සේවකයන් බවට පත් වෙනවා. ඒක නොවෙයිද, රාජ්‍ය සේවකයින්ට කරන සැලකීම?

මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අය වැය තුළින්, රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කර තිබෙනවා. මගේ අදහස නම්, ඒ අවස්ථාව රාජ්‍ය සේවකයන්ට දෙන්න ඕනෑ කියන එකයි. පොලිසියේ සමහර අය කියනවා, "ලොකු මහත්වරුන්ට හොඳයි, අපි නම් අවුරුදු 65ක් දක්වා ඉන්න බලාපොරොත්තුවක් නැහැ" කියලා. එහෙම නම් මේ අවස්ථාව අපි රාජ්‍ය සේවකයන්ට ලබා දෙමු. රාජ්‍ය සේවකයන්ට තීරණය ගන්න අවස්ථාව දෙමු. අපි සමස්ත රාජ්‍ය සේවය පිළිබඳව කථා කරනකොට, එක වචනයක් විතරක් අල්ලාගන්න එපා. ගරු මුදල් ඇමතිතුමා සමස්ත රාජ්‍ය සේවකයන්ටම සලකලා තිබෙනවාය කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.25]

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, காலஞ்சென்ற பிரதமர் சிறிமாவோ பண்டாரநாயக்க 1973ஆம் ஆண்டில் கூறிய ஒரு விடயத்தை இப்போது நினைவுபடுத்துவது மிகவும் பொருத்தமாக இருக்குமென்று நினைக்கின்றேன். "நாடு எரிமலையின்மீது அமர்ந்திருக்கின்றது; அது எந்த நேரத்திலும் வெடித்துச் சிதறலாம்" - "The country is sitting on a volcano, and it could erupt at any time" - என்று அன்று சிறிமாவோ அம்மையார் கூறியது இப்போதுதான் மிகவும் பொருத்தமாக இருக்கின்றது. அந்தளவிற்கு நாடு அதலபாதாளத்தை நோக்கிச் சரிந்து கொண்டிருக்கின்றது. நாட்டு மக்கள் இருள் சூழலாம் என்ற பயத்தில் இருக்கின்றார்கள். உண்மையில் இந்த நாடு எந்த நிலையில் இருக்கின்றது? பஞ்சத்தில் மக்கள் சாக நேரிடுமோ என்று அஞ்சுமளவிற்குப் பொருட்களின் தட்டுப்பாடு! ஏழை மக்களால் சமாளிக்கவே முடியாதளவிற்கு விலைவாசி உயர்வு! அந்நியச்செலாவணிக் கையிருப்பில் ஏற்பட்டிருக்கும் மோசமான வீழ்ச்சி! மற்றும் மோசமான நிதி நெருக்கடி! என நாட்டின் பொருளாதாரம் வங்குரோத்து நிலையை நோக்கிச் சென்றுகொண்டிருக்கின்றது. இலங்கையின் வரலாற்றில் இது போன்றதொரு நெருக்கடி இதற்கு முன்னர் ஒருபோதுமே ஏற்பட்டதில்லை.

இதற்குக் காரணம் என்ன? என்றொரு கேள்வியை முன்வைத்தால், உடனே பலரும் கூறும் பதில் "கொரோனா பெருந்தொற்று" என்பதாகும். அரசாங்கத் தரப்பிலுள்ளவர்கள் பொதுவாகக் கூறும் பதிலும் இதுதான். ஆனால், இன்றைய நெருக்கடி நிலைக்கு உண்மையிலேயே கொரோனா பெருந்தொற்று மட்டும்தான் காரணமா என நாங்கள் நேர்மையாகக் கேட்டுக்கொள்வோம். கொரோனா பொருந்தொற்று என்பது ஓர் உலகளாவிய நெருக்கடி; பல நாடுகள் இதனால் பாதிக்கப்பட்டிருக்கின்றன என்பதும் உண்மைதான். ஓர் உலகளாவிய நெருக்கடி ஏற்படுகின்றபோது, நிச்சயம் இலங்கையும் பாதிப்படையும்; இதில் ஆச்சரியப்பட ஒன்றுமில்லை. ஆனால், இந்த நெருக்கடி நிலைமையைப் பல நாடுகளும் வெற்றிகரமாகச் சமாளித்திருக்கின்றன. ஓர் அரசாங்கத்தின் வெற்றியென்பது நெருக்கடி நிலையைக் கையாளுவதில்தான் தங்கியிருக்கின்றது. இதற்குச் சிறந்த உதாரணம் பங்களாதேஷ் ஆகும். அந்த நாட்டைச் சேர்ந்தவர்களும் இந்தத் தொற்றினால் பாதிக்கப்பட்டவர்கள் தான். ஆனால், பொருளாதார நெருக்கடியை வெற்றிகரமாகச் சமாளித்திருக்கின்றனர். பெருந்தொற்று நெருக்கடிகளுக்கு மத்தியிலும் அவர்களால் இலங்கைக்குக் கடன் வழங்க முடிந்திருக்கின்றது. ஆனால், இலங்கையின் ஆட்சியாளர்களினால் இந்த நெருக்கடி நிலையைச் சமாளிக்க முடியவில்லை; திணறுகின்றனர். இன்றைய நெருக்கடி நிலைக்குக் கொரோனாவும் ஒரு காரணம்தான் என்பதனை நாம் மறுக்கவில்லை. ஆனால், அதனை மட்டுமே ஒரு காரணமாகப் பார்ப்பதில்தான் நீங்கள் தவறு செய்கின்றீர்கள். உண்மையில், இன்று ஏற்பட்டிருக்கும் பொருளாதார நெருக்கடி திடீரென்று ஏற்பட்ட ஒன்றல்ல. இது ஒரு புற்றுநோய் போன்று வெகுகாலமாக வளர்ந்துவந்த ஒன்றாகும். இப்போது மறைக்க முடியாதளவிற்கு நோய் முற்றிவிட்டது.

இலங்கையை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்கள் எவையுமே தமிழ் மக்களின் இனப்பிரச்சினையைத் தீர்க்க முயற்சிக்கவில்லை. தமிழ் மக்களின் நியாயமான அரசியல் கோரிக்கைகளை நிறைவேற்றுவதற்கான உறுதிப்பாட்டைக் காண்பிக்கவில்லை. மாறாக, தமிழ் மக்கள்மீது மேலும் மேலும் ஒடுக்குமுறைகளைக் கட்டவிழ்த்துவிடுவது பற்றியே சிந்தித்தீர்கள். இலங்கைத் தீவை மாறி மாறி ஆட்சிசெய்த இரண்டு பெரும் கட்சிகளுமே இதற்கு விதிவிலக்கல்ல. எதேச்சதிகாரப் போக்கின்மூலம் பிரச்சினைகளைத் தீர்ப்பது பற்றியே சிந்தித்தீர்கள். தனிநபர்களாகச் சிலர் எங்களுடைய நியாயத்தைப் புரிந்துகொண்டிருந்தாலும், ஏற்றுக்கொண்டிருந்தாலும், தென்னிலங்கையின் ஒட்டுமொத்த அரசியற் போக்கானது எப்போதுமே தமிழ் மக்களை இரண்டாந்தரப் பிரஜைகளாகக் கருதும் ஒன்றாகவே இருந்திருக்கின்றது. தமிழ் மக்களின் நியாயமான அரசியல் கோரிக்கைகள் புறக்கணிக்கப்பட்ட காரணத்தினால்தான் இந்த நாடு ஓர் உள்நாட்டு யுத்தத்திற்குள் சிக்கியது. நாட்டின் ஒட்டுமொத்த வளமும் யுத்தத்திற்காகச் செலவு செய்யப்பட்டது. யுத்த வெற்றிக்காகப் பல நாடுகளிடம் கையேந்தவேண்டிய நிலையேற்பட்டது. இதனால்தான் நாடு பெரும் கடன் சுமைக்குள் சிக்கியது. அத்துடன் பொருளாதார வளர்ச்சியில் பாரிய பின்னடைவையும் கண்டது.

பாதீடு தொடர்பில் நாம் விவாதித்துக்கொண்டிருக்கின்ற போது, உலகில் இரண்டாம் நிலையில் இருக்கக்கூடிய சக்தியான சீனாவினால் நாட்டின் பிரதான அரச வங்கியான மக்கள் வங்கி கறுப்புப் பட்டியலில் சேர்க்கப்பட்டிருக்கின்றது என்பதையும் குறித்துக்கொள்ளுங்கள்! நீங்கள் விரும்பிய யுத்த வெற்றிக்காக முழு நாட்டையும் அடகுவைக்க நீங்கள் தயங்கவில்லை. இதன் காரணமாகத்தான் இந்த நாடு இன்று

[ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා]

வல்லரசுகளின் அதிகாரப் போட்டிக்குள் சிக்கியிருக்கின்றது. நீங்கள் விரும்பிய யுத்த வெற்றி உங்களுக்குக் கிடைத்து விட்டது. ஆனால், உங்களால் நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்ல முடியவில்லை. பொருளாதார ரீதியில் கையேந்தாத இலங்கைச் சமூகமொன்றை உருவாக்குவதில் உங்களால் வெற்றிபெற முடிந்ததா?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා ] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப.1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Dharmalingam Sithadthan, please continue with your speech.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

இந்த நாடு எதிர்கொண்டிருக்கும் வரலாற்று நெருக்கடிக் கான உண்மையான காரணத்தை இந்தப் பின்னணியில்தான் நாம் புரிந்துகொள்ள வேண்டும். கடந்த காலங்களில் எத்தனையோ வாய்ப்புகள் கிடைத்தபோதிலும், ஆட்சியா ளர்கள் தமிழ் மக்களின் நியாயமான பிரச்சினைகளைத் தீர்க்க முயற்சிக்கவில்லை. தமிழ் மக்களின் நியாயமான கோரிக் கைகள் ஆரம்பத்திலேயே பூர்த்திசெய்யப்பட்டிருந்தால், இந்த நாடு யுத்தத்தை நோக்கிச் சென்றிருக்காது. நாட்டின் வளமும் சிதைந்திருக்காது; நாடு கையேந்தும் நிலைக்கும் சென்றிருக்காது; இவ்வாறனதொரு வரலாற்று நெருக்கடிக்கு நாட்டு மக்கள் முகங்கொடுக்கவேண்டிய நிலையும் ஏற்பட் டிருக்காது. தமிழ் மக்களை எப்போதுமே இரண்டாந்தரப் பிரஜைகளாக வைத்திருக்க வேண்டுமென்னும் உங்கள் தீராத ஆசையினால் நீங்கள் சாதித்தது என்ன?

இன்று கொரோனா தொற்றினால் ஆயிரக்கணக்கான மக்கள் இறந்திருக்கின்றனர். நாட்டின் அனைத்து இன மக்களும், குறிப்பாக ஏழை மக்கள், சொல்லொணாத் துயரங்களை அனுபவித்து வருகின்றனர். பொருட்களுக்காக மக்கள் நீண்ட வரிசையில் நிற்கின்றனர்; சிங்கள இளைஞர், யுவதிகள் மத்திய கிழக்கு நாடுகளை நோக்கிச் செல்வதற்காக வரிசையில் நிற்கின்றனர். ஒரு காலத்தில் இராணுவக் கெடுபிடிகளினாலும் பயங்கரவாதத் தடைச்சட்டத்தின் அச்சுறுத்தலினாலும் எமது இளைஞர், யுவதிகள் நாட்டைவிட்டு வெளியேறினர். அவ்வாறானவர்கள்தான் இன்று புலம்பெயர் சமூகமாக வளர்ச்சியுற்றிருக்கின்றனர். இன்று பொருளாதார நெருக்கடியைத் தாங்கிக்கொள்ளமுடியாமல் சிங்கள இளைஞர், யுவதிகள் நாட்டைவிட்டு வெளியேறும் நிலைமை ஏற்பட்டிருக் கின்றது.

உங்களது தவறான கொள்கைகளால் விவசாயிகள் மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அவர்கள் நடுத் தெருவுக்கு வந்திருக்கின்றனர். பாதிக்கப்பட்ட விவசாயி களுக்கான நஷ்ட ஈட்டைக்கூட நீங்கள் வழங்கவில்லை. இந்தப் பாதீட்டில் அதற்கான நிதியும் ஒதுக்கப்படவில்லை.

நாடு வரலாறு காணாத நெருக்கடிக்குள் சிக்கியிருக்கும் இந்தச் சந்தர்ப்பத்தில்கூட, "ஒரே நாடு, ஒரே சட்டம்" என்னும் சுலோகத்தின்கீழ் பௌத்த பிக்கு ஒருவரின் தலைமையில் ஜனாதிபதி செயலணியொன்று உருவாக்கப்பட்டிருக்கின்றது. இந்த நாட்டின் நீதித்துறை அமைச்சருக்கே அந்தச் செயலணி பற்றித் தெரிந்திருக்கவில்லை. ஒருபுறம் புதிய அரசியல் யாப்புத் தொடர்பில் பேசிவரும் அரசாங்கம், மறுபுறம் இப்படி யானதொரு செயலணியையும் உருவாக்கியிருக்கின்றது. இதன் மூலம் நீங்கள் எதைக் கூற முற்படுகின்றீர்கள்? உண்மை யிலேயே நீங்கள் எதைச் செய்ய முயற்சிக்கின்றீர்கள்?

இந்த நாட்டில் நடைமுறையிலிருந்துவரும் தேச வழமைச் சட்டம், கண்டியச் சட்டம், முஸ்லிம் சட்டம் என்பவற்றை இல்லாதொழிப்பதுடன், அரசியல் யாப்பின் 13ஆவது திருத்தத்தினூடாக மாகாண சபைகள், பிரதேச சபைகளுக்குக் கிடைக்கப்பெற்ற அற்ப சொற்ப அதிகாரங்களையும் அபகரித்துவிடும் கபட நோக்கங்கொண்ட இந்த "ஒரே நாடு, ஒரே சட்டம்" என்கிற எண்ணக்கருவை நாம் சந்தேகக் கண்களுடன் நோக்குகின்றோம். அரசாங்கத்தின் நடவடிக்கை பாரிய சந்தேகத்தை ஏற்படுத்துகின்றது. 1972 மற்றும் 1978இல் கொண்டுவரப்பட்ட அரசியல் யாப்புகள் இரண்டுமே எமது மக்களின் பங்குபற்றல் இல்லாமலேயே கொண்டுவரப் பட்டது. எமது தலைவர்கள் அதனை எதிர்த்திருந்தனர். ஆனால், 'பெரும்பான்மை ஜனநாயகம்' என்னும் பெயரால் எங்களது கோரிக்கைகள் நிராகரிக்கப்பட்டன.

1972இல் அரசியல் யாப்புக் கொண்டுவரப்பட்டபோது, எண்ணிக்கையில் சிறுபான்மையான மக்களுக்குச் சாதகமாக இருந்ததாகக் கருதப்பட்ட சோல்பரி யாப்பின் 29ஆவது சரத்து நீக்கப்பட்டது. 29ஆவது சரத்து இருந்தபோதுதான் 1956இல் தனிச் சிங்களச் சட்டம் அன்றைய பிரதமர் எஸ்.டபிள்யு.ஆர்.டி. பண்டாரநாயக்க அவர்களால் கொண்டுவரப்பட்டது. அதற்கு முன்பே இந்திய - பாகிஸ்தானிய குடியுரிமைச் சட்டம் கொண்டுவரப்பட்டு, 10 இலட்சம் இந்திய வம்சாவளித் தமிழ் மக்கள் நாடற்றவர்களாக்கப்பட்டார்கள். எவ்வாறாயினும் அரசியல் யாப்பின்மூலம் எங்களுக்கு இருந்த ஓரளவு பாதுகாப்பைக்கூட இல்லாமலாக்கினீர்கள். இப்போதும் நீங்கள் அப்படியானதோர் உள்நோக்கத்துடன்தான் செயற்படு கின்றீர்களோ என்னும் சந்தேகம் எங்களிடம் உண்டு. நடைபெற்றுக்கொண்டிருக்கும் ஒவ்வொரு விடயமும் எங்களுடைய சந்தேகத்தை ஊர்ஜிதம் செய்கின்றது. இன்று தமிழ் மக்களுக்கு ஓரளவு பாதுகாப்பாக இருப்பது, தமிழ் மக்களும் ஓரளவாவது அதிகாரத்தில் பங்குகொள்வதற்கான வாய்ப்பை வழங்கியிருப்பது, 1987இல் இந்திய - இலங்கை ஒப்பந்தத்தின்மூலம் கிடைக்கப்பெற்ற 13ஆவது திருத்தச் சட்டம் ஒன்றுதான். அதனையும் திட்டமிட்டு இல்லாம லொழிக்கும் நோக்கில் நீங்கள் செயற்படுகின்றீர்கள்? அதுதான் உங்களது புதிய அரசியல் யாப்பிற்குப் பின்னால் ஒழிந்திருக்கும் உள்நோக்கமா?

உண்மையில் இலங்கை ஓர் அதிசயமான நாடு என்பதையும் நான் இந்தச் சந்தர்ப்பத்தில் பதிவுசெய்ய விரும்பு கின்றேன். இந்தப் பதிவானது இந்த நாட்டை நேசிக்கும் அடுத்த தலைமுறைக்கான சமர்ப்பணமாகும். ஏனெனில், வேறு எந்தவொரு நாட்டிலும் நடந்திராத அதிசயம் இந்த

நாட்டில்தான் நடந்திருக்கின்றது, நடந்துகொண்டிருக்கின்றது. அதாவது, அரசியல் யாப்புத்தான் ஒரு நாட்டின் அதியுயர் சட்டம். அதனைப் பாதுகாப்போம் என்னும் சத்தியத்தின் அடிப்படையில்தான் நீங்கள் ஆட்சிப் பொறுப்பை ஏற்றுக் கொள்கின்றீர்கள். ஆனால், நீங்கள் சத்தியம் செய்த அரசியல் சாசனத்தையே எந்தவொரு குற்றவுணர்வுமில்லாமல் மீறி வருகின்றீர்கள். அரசியல் யாப்பிலுள்ள 13ஆவது திருத்தச் சட்டத்தை இன்றுவரையில் நீங்கள் முழுமையாக அமுல்படுத்த வில்லை. அரசியல் யாப்பை மீறுவதில் நீயா, நானா? என்று போட்டிபோடுகின்றீர்கள். 13ஆவது திருத்தச் சட்டத்தை முழுமையாக அமுல்படுத்த மறுப்பதானது அரசியல் யாப்பை அப்பட்டமாக மீறும் ஒரு செயலாகும். இதனை உணர முடியாதளவிற்கு எதேச்சதிகாரம் உங்களின் கண்களை மறைத்திருக்கின்றது. நாட்டின் அதியுயர் சபையிலேயே அத்துமீறல் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. இதற்கு நீங்கள் அனைவரும் துணைபோய்க் கொண்டிருக்கின்றீர்கள்.

முன்னாள் ஜனாதிபதியும் தற்போதைய பிரதமருமான கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்கள் '13 பிளஸ்' தொடர்பில் பேசினார். இந்தியாவுக்கும் சர்வதேசத்துக்கும் அவ்வாறான வாக்குறுதியை வழங்கியிருந்தார். 2009இல் யுத்தம் முடிவுற்றதைத் தொடர்ந்து இலங்கைக்கு விஜயம் செய்திருந்த ஐக்கிய நாடுகள் சபையின் செயலாளர் நாயகத்துடன் இணைந்து வெளியிட்ட கூட்டு அறிக்கையில், 13க்கு அப்பால் சென்று தேசிய இனப் பிரச்சினைக்குத் தீர்வு காண்பதாக முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் வாக்குறுதியளித்திருந்தார். அந்த வாக்குறுதிக்கு என்ன நடந்தது? இப்பொழுது மீண்டும் உள்ளகப் பொறிமுறை தொடர்பில் பேசுகின்றீர்கள். புலம்பெயர் சமூகத்துடன் பேசவுள்ளதாக மேதகு ஜனாதிபதி அவர்கள் கூறியிருக்கின்றார். அரசியல் யாப்பில் இருக்கின்ற 13வது திருத்தத்தையே முழுமையாக அமுல்படுத்த மறுத்து வரும் உங்களது உள்ளகப் பொறிமுறையைச் சித்தசுவாதீனமுள்ள எவராவது நம்புவாரா?

இந்த அரசாங்கத்தினால் நல்லிணக்கத்தைக் கட்டியெழுப்ப முடியுமென்பதில் எந்தவொரு நம்பிக்கையும் என்னிடமில்லை. ஏனெனில், நம்பிக்கையை ஏற்படுத்தக்கூடிய எந்தவொரு காரியத்தையும் நீங்கள் செயலில் காண்பிக்கவில்லை. உண்மையில் நீங்கள் கூறும் புதிய அரசியல் யாப்பானது, ஒற்றையாட்சி முறைமை நீக்கப்பட்ட, தமிழ் மக்களின் சமத்துவம், கௌரவத்தை உறுதிப்படுத்தும் அரசியல் ஏற்பாடு களைக் கொண்டிருக்கின்ற, முக்கியமாக, அவற்றைப் பாராளுமன்றப் பெரும்பான்மையினூடாக மீளவும் பறித்தெடுக்க முடியாத ஏற்பாடுகளைக் கொண்டிருக்குமானால் அப்படியானதோர் அரசியல் யாப்பை நாம் இரு கரம்கூப்பி வரவேற்போம். ஆனால், நடைபெற்றுக்கொண்டிருக்கும் விடயங்களை உற்றுநோக்கினால், அரசாங்கத்திடம் அப்படி யான எந்தவொரு நோக்கமும் இருப்பதாகத் தெரியவில்லை. ஏனெனில், அப்படியான நோக்கம் அரசாங்கத்திடம் இருந்திருந்தால் இன்று இருப்பவற்றையும் பறித்தெடுப்பது பற்றி நீங்கள் சிந்தித்திருக்கமாட்டீர்கள்.

கிழக்கு மாகாணத்தின் தமிழ்ப் பெரும்பான்மையைத் திட்டமிட்ட குடியேற்றங்களால் மாற்றியமைத்தது போன்று, இப்போது வடக்கின்மீதும் கண் வைத்திருக்கின்றீர்கள். வடக்கு மாகாணத்தின் சனத்தொகையையும் மாற்றியமைக்கும் நோக் கத்துடன் திட்டமிட்டுச் செயற்படுகின்றீர்கள். வவுனியாவில் திட்டமிட்ட சிங்களக் குடியேற்றமொன்றை மேற்கொண்டு வருகின்றீர்கள். அநுராதபுர மாவட்டத்தின் கீழுள்ள நான்கு சிங்களக் கிராம சேவையாளர் பிரிவுகளை வவுனியா மாவட்டத்துடன் இணைத்து, இனப்பரம்பலை மாற்றியமைக்க திட்டமிடுகின்றீர்கள். மாகாண எல்லைகளை நிர்வாக ரீதியாக மாற்ற முடியாதென்பது தெரிந்திருந்தும் நாட்டின் சட்டத்திற்கு எந்தவித மதிப்புமளிக்காமல் எதேச்சதிகாரமாக, தான்தோன்றித் தனமாகச் செயற்படுகின்றீர்கள். உங்களுக்கு நல்லிணக்கத்தில் உண்மையான ஈடுபாடு இருந்திருக்குமாயின், இவ்வாறான தொரு நடவடிக்கைக்கு நீங்கள் ஆதரவளிப்பீர்களா? மாகாண சபை செயலற்றிருக்கும் சூழலைப் பயன்படுத்திக்கொண்டு, ஆளுநர்கள்மூலம் திட்டமிட்டு இந்த விடயங்களை மேற் கொண்டு வருகின்றீர்கள்.

மாகாண நிருவாகத்தின் கீழுள்ள பாடசாலைகள், வைத்திய சாலைகளைத் திட்டமிட்டு மத்திய அரசின் கீழ்கொண்டு வருகின்றீர்கள். 'சுகாதார துறையை மத்திய மயப்படுத்துதல்' என்னும் தலைப்பில் 08.11.2021 அன்று அரசாங்க வைத்திய அதிகாரிகள் சங்கத்தின் செயலாளர் டாக்டர் செனகல் பெர்னாண்டோ வடக்கிலுள்ள கிளைகளுக்குக் கடிதமொன்றை அனுப்பியிருக்கின்றார். அரசாங்கத் திற்குத் தெரியாமல் இவ்வாறானதொரு கடிதத்தை அவர் அனுப்பிவைத்திருக்க வாய்ப்பில்லை. இதனால் அரசாங்க வைத்திய அதிகாரிகள் சங்கம்கூட இப்போது 13வது திருத்தச் சட்டத்தை நீர்த்துப் போகச் செய்யும் ஓர் இரகசியப் படையணியாகத் தொழிற்படு கின்றதோ என்னும் சந்தேகம் எழுகின்றது. இந்திய - இலங்கை ஒப்பந்தத்தின்கீழ் கொண்டுவரப்பட்ட 13வது திருத்தச் சட்டத்தை எவ்வாறாயினும் இல்லாமலாக்க வேண்டுமென்னும் இனவாத முனைப்பின் தீவிரத் தன்மையையே இந்தக் கடிதம் உணர்த்துகின்றது. அப்படியாயின் 'ஒரே நாடு, ஒரே சட்டம்' என்பது, நாட்டிலும் நாட்டை நிர்வகிக்கும் சட்டத்திலும் தமிழ் பேசும் மக்களுக்கு எந்தவோர் இடமும் இல்லை; இருக்கவும்கூடாது; தமிழ் மக்கள் இந்த நாட்டில் வேண்டுமானால் இரண்டாம்தரப் பிரஜைகளாக வாழ்ந்து விட்டுப் போகலாம் என்ற நோக்கத்தைக் கொண்டதா? இதுதான் அரசாங்கத்தின் ஒரே நாடு, ஒரே சட்டமா?

இனங்களுக்கிடையில் நல்லிணக்கத்தை ஏற்படுத்தி இந்த நாட்டை முன்னேற்றப் பாதையில் கொண்டுசெல்ல வேண்டு மென்ற கரிசனை இருந்தால், அதற்கான அர்ப்பணிப்பிருந்தால், முதலில் அரசியல் யாப்பில் இருப்பவற்றை நிறைவேற்றுங்கள்! ஏற்கனவே 13இலிருந்து பறிக்கப்பட்ட விடயங்ளை மீளவும் தமிழ் மக்களுக்கு வழங்குங்கள்! எதிர்காலத்திற்கான ஒரு சிறந்த இலங்கையைக் கட்டியெழுப்புவதற்கான உங்களின் அர்ப்பணிப்பை நிரூபித்துக் காட்டுங்கள்! இந்திய - இலங்கை ஒப்பந்தத்தினூடாகக் கிடைக்கப்பெற்ற 13வது திருத்தச் சட்டத்தை இல்லாமலாக்கவேண்டும் என்னும் ஒரேயொரு நோக்கங்கொண்ட உங்களது புதிய யாப்பு முயற்சியைக் கைவிட்டு, முதலில் இந்த நாட்டின் அரசியல் யாப்பிற்கு உண்மையானவர்களாக நடந்துகொள்ளுங்கள்! 13ஐ முழுமையாக அமுல்படுத்துங்கள்!

வலிந்து காணாமலாக்கப்பட்டவர்களின் குடும்பங் களுக்கென இன்று நிதியை ஒதுக்கியிருக்கின்றீர்கள். பாதிக்கப்பட்ட மக்களுக்கு நஷ்ட ஈடு கட்டாயம் வழங்கப்படத்தான் வேண்டும். ஆனால், அந்த மக்கள் உங்களிடம் இப்போது கேட்டுக்கொண்டிருப்பது நஷ்ட ஈடு அல்ல. அவர்கள் தங்களுடைய உறவுகளுக்கு என்ன நடந்தது? என்றே கேட்கின்றனர்; தங்களுக்கான நீதியைக் கோரு கின்றனர். வெறுமனே சில ஆயிரம் ரூபாய்களைக் கொடுப்பதன்மூலம் அவர்களின் துன்பதுயரங்கள் தீர்ந்து விடாது. சுயாதீன விசாரணையொன்றை மேற்கொள்வதன் மூலமே யுத்த காலத்தில் காணாமலாக்கப்பட்ட அனைவருக்கும் நீதி கிடைக்கும். நாங்கள் கோரும் நீதிப் பொறிமுறை என்பது தமிழ் மக்களுக்கானது மட்டுமல்ல, அது சிங்கள மக்களுக் கானதும் என்பதை உணருங்கள்!

[ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා]

பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்படவேண்டுமென்பது தமிழ் மக்களினது மட்டுமல்லாது நாட்டின் முற்போக்குச் சிந்தனையாளர்களினதும் சர்வதேச சமூகத்தினதும் நீண்டநாட் கோரிக்கையாக இருந்துவருகிறது. அனைத்து அரசாங்கங் களும் அரசுக்கு மாறான கருத்துக்களைக் கொண்டவர்களைப் 'பயங்கரவாதிகள்' என்னும் பெயரில் கைது செய்வதற்கும் சிறைகளில் அடைப்பதற்கும் பயன்படுத்தும் ஒரு சட்டமாகவே இந்தப் பயங்கரவாதத் தடைச்சட்டம் காணப்படுகின்றது. எனவே, இந்தச் சட்டத்தை இல்லாதொழிப்பதுடன் இந்தச் சட்டத்தின்கீழ்க் கைது செய்யப்பட்டுச் சிறையில் வைக்கப் பட்டிருக்கும் தமிழ் அரசியற் கைதிகளை உடன் விடுவித்தல் வேண்டுமென வலியுறுத்துகிறேன். அதேவேளை, அண்மையில் அமைச்சர் நாமல் ராஜபக்ஷ அவர்களின் முன்முயற்சியால் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் நீண்டகாலமாகச் சிறையிலிருந்த 16 தமிழ் அரசியற் கைதிகள் ஜனாதிபதியினால் விடுவிக்கப்பட்டிருந்தார்கள். அதற்காக ஜனாதிபதி அவர்களுக்கும் அமைச்சருக்கும் எனது நன்றிகளைத் தெரிவிப் பதோடு, தடுப்பிலுள்ள ஏனைய தமிழ் அரசியற் கைதிகளின் விடுதலைக்கும் தொடர்ந்து நடவடிக்கை எடுக்க வேண்டு மெனக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று இந்து - பௌத்த நல்லுறவு பற்றிப் பேசுகின்றீர்கள். பாரதப் பிரதமர் நரேந்திர மோடியின் தலைமையில் மிகவும் பலமான நிலையிலுள்ள பாரதிய ஜனதா கட்சியைத் திருப்திப் படுத்துவதற்காக இந்துத்வாக் கருத்தியலுக்கு நெருக்கமானவர் களாக உங்களைக் காண்பித்துக்கொள்ள முயற்சிக்கின்றீர்கள். இந்தியாவிற்கான இலங்கைத் தூதுவர் மிலிந்த மொறகொட கண்டியிலுள்ள சீதை அம்மன் ஆலயத்திலிருந்த கல்லை ராமர் கோவில் கட்டுவதற்காக இந்தியாவுக்குக் கொண்டு போகின்றார்.

இறைச்சிக்காக மாடு அறுப்பதைத் தடுப்பது பற்றிய சட்டமூலத்தைக் கொண்டுவருகின்றீர்கள். அமைச்சர் நாமல் ராஜபக்ஷ சிங்களத்தில் மொழிபெயர்க்கப்பட்ட பகவத் கீதையின் பிரதியைப் பிரதமர் மோடிக்குப் பரிசளிக்கின்றார். இதன்மூலம் நீங்கள் கூறவருவது தெளிவாகவே புரிகின்றது. BJPஐத் திருப்திப்படுத்துவதற்காக இந்துத்வா இராஜ தந்திரத்தைக் கையிலெடுத்திருக்கின்றீர்கள். இந்து - பௌத்த ஒற்றுமை பற்றிப் பேசுகின்றீர்கள். ஆனால், மறுபுறம் வடக்கு, கிழக்கில் பெரும்பான்மையாக வாழும் இந்து தமிழ் மக்களின் சமத்துவம், கௌரவத்தை உறுதிப்படுத்துவதை எதிர்க்கின்றீர்கள். பாரம்பரிய இந்து ஆலயங்களைப் பௌத்த விகாரைகளாகப் பிரகடனப்படுத்துகிறீர்கள். அவ்விடங்களைப் பௌத்த பிக்குகள் ஆக்கிரமிப்பதற்கு அரச படைகள் உதவுகின்றனர். இன்று பௌத்த மதத்தின் வளர்ச்சிக்கு நிதி ஒதுக்கியிருக்கின்றீர்கள். ஆனால், இந்து மத்தினதோ அல்லது இலங்கையில் உள்ள ஏனைய மதங்களினதோ வளர்ச்சிக்கு நிதியெதுவும் ஒதுக்கப்படவில்லை. இங்கும் உங்களுடைய உள்நோக்கம் வேறு என்பதை நாமறிவோம். இந்துத்வாக் கருத் தியலுக்கு நெருக்கமானவர்களாக உங்களைக் காண்பித்துக் கொண்டு, இந்தியாவின் ஆதரவுடன் 13ஆவது திருத்தச் சட்டத்தை இல்லாமலாக்கலாம் என்று எண்ணுகின்றீர்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
ஒரு நிமிடம் தாருங்கள்!

13ஆவது திருத்தத்தைத் தூக்கிவிட்டு, தமிழ் மக்களுக்கு இலங்கையின் அதிகாரத்தில் எந்தவொரு பங்கினையும் வழங்க முடியாதென்று கூற முற்படுகின்றீர்கள். அதாவது, இந்தியாவின் இந்து மக்களைப் பயன்படுத்தியே வடக்கு, கிழக்கில் பெரும்பான்மையாக வாழும் இந்துக்களை அதிகார மற்றவர்களாக்கலாம் என்று கணக்குப் போடுகின்றீர்கள். இவ்வளவு அனுபவங்களுக்குப் பின்னருங்கூட, தமிழ் மக்களை எவ்வாறு மேலும் ஒன்றுமில்லாதவர்களாக்கலாம் என்றே சிந்திக்கின்றீர்கள்.

இறுதியாக ஒன்றைமட்டும் கூற விரும்புகின்றேன். பல இனங்களைக் கொண்ட, பல மொழிகளைப் பேசுபவர்களைக் கொண்ட இந்தியா, சுவிட்சர்லாந்து, ஜேர்மனி, கனடா, ஐக்கிய அமெரிக்கா போன்ற நாடுகள் இன, மொழி பாகுபாடுகளுக்கு அப்பால் சமஷ்டி முறையிலான ஒரு நியாயமான அதிகாரப் பகிர்வினைத் தங்களின் அரசியல் யாப்புகளினூடாக உறுதிப்படுத்தி, ஒன்றுபட்டுப் பொருளாதார ரீதியிலும் ஏனைய துறைகளிலும் மிகப்பெரிய வளர்ச்சியையும் அபிவிருத்திகளையும் அடைந்துள்ளதைக் காணமுடியும். இனியாவது கடந்த காலத்திலிருந்து கற்றுக்கொள்ள முயற்சியுங்கள்! எதேச்சாதிகார அரசியலைத் தூக்கி வீசிவிட்டு, தமிழ் மக்களின் சமத்துவம், கௌரவத்தை உறுதிப்படுத்தும் வகையில் செயற்படுங்கள்! ஒரு காலத்தில் தனிநாடு தொடர்பில் சிந்தித்த தமிழ்த் தலைமுறை இப்போதில்லை. ஒன்றுபட்ட இலங்கைக்குள் எங்கள் பகுதிகளில் எமது அலுவல் களை நாமே நிர்வகித்துக் கொள்ளக்கூடிய கௌரவத்துடனான ஒரு சமஷ்டி அமைப்பு முறையிலான அரசியல் தீர்வினூடாக இந்த நாட்டின் சமூக, பொருளாதார, அரசியல் வளர்ச்சியில் பங்காளிகளாவதற்கான வாய்ப்புக்களைப் பற்றித்தான் நாம் இப்போது பேசிக்கொண்டிருக்கின்றோம்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
இப்போது முடிக்கின்றேன்.

ஒரு தனித்துவம் மிக்க தேசிய இனத்தை ஒடுக்குமுறைக்குள் வைத்துக்கொண்டு, இரண்டாந்தரமாக நடத்திக்கொண்டு, இலங்கைத்தீவு ஒருபோதுமே முன்னோக்கிப் பயணிக்க முடியாது என்பதை இனியாவது உணருங்கள்! ஓரினத்தை ஒடுக்கும் மற்றைய இனம் வளர்ச்சியடைந்ததாக வரலா றில்லை. தேர்தல் வெற்றியை விடுத்து நாட்டின் வெற்றி தொடர்பில் சிந்தியுங்கள்! நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Kanaka Herath. You have 10 minutes.

[අ.භා. 1.17]

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப் படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)

(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ 76 වන අය වැය තමයි ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා මේ ඉදිරිපත් කර තිබෙන්නේ. එය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ දෙවැනි අය වැයයි. 2022 වසර සඳහා ඉදිරිපත් කරන ලද මෙම අය වැය, පසු කොවිඩ් තත්ත්වය යටතේ වුණත් රටේ ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා ඉදිරිපත් කළ අය වැයක් හැටියටයි මා දකින්නේ. බොහෝ දෙනෙක් හිතනවා, මේක පොරොන්දු පත්‍රයක් කියලා. අය වැය තුළින් එදිනෙදා වෙළෙඳ පොළේ තිබෙන ගැටලු සියල්ල ක්ෂණිකව විසඳන්න පුළුවන් වෙයි කියා සමහරු හිතනවා. නමුත් අය වැය ලේඛනය තුළ තිබෙන කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන යෝජනා සැලසුමක් ඇතිව තමයි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මුළු ලෝකයේම අර්බුදයක් ඇති වෙලා තිබෙන අවස්ථාවක්, මේක. ලංකාවටත් එහි බලපෑම තිබෙනවා. බොහෝ රටවල උද්ධමනය ඉහළ ගිහිල්ලා තිබෙනවා. එවැනි අවස්ථාවක අපේ ගරු මුදල් ඇමතිතුමා දක්ෂ විධියට, විශේෂයෙන්ම අනාගතය ගැන හිතලා මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අය වැය ලේඛනය දිහා බැලුවොත්, 2022 වසරට අපේක්ෂිත අපේ ආදායම රුපියල් බිලියන 2,284යි. ඒ වාගේම අපේක්ෂිත වියදම රුපියල් බිලියන 3,912ක් වෙනවා. එතකොට අය වැය පරතරය රුපියල් බිලියන 1,628යි. මේ වර්ෂය ගත්තාම යම්තාක් දුරට ගිය අවුරුද්දට වඩා ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා. ඒ වාගේම සෘජු විදේශ ආයෝජන ගත්තාම, මේ වර්ෂයේ මුල් මාස අට තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 398ක් පමණ රට තුළට ගෙනෙන්න හැකියාව ලැබී තිබෙනවා. කෙසේ වෙතත්, ඉතිහාසය දිහා බැලුවාම, රජයේ ආදායම හා වියදම අතර පරතරය හැම දාම අපි ණය අරගෙන තමයි පියවා ගෙන තිබෙන්නේ. ඒකට හැකියාවක් තිබුණා. නමුත් අද වෙනකොට ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. හැම ආණ්ඩුවක්ම ණය අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාල වකවානුවේ කිසිම ගැටලුවක්, අභියෝගයක් නැතුවත්, ලෝකයේ ඛනිජ තෙල් මිල අඩුම වෙලා තිබෙන අවස්ථාවලත් එවකට පැවති රජය ණය කන්දරාවක් අරගෙන තිබෙනවා. එසේ ණය අරගෙන කිසිම සංවර්ධනයක් නොකිරීම නිසා අවසානයේ අද වෙනකොට ණය ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මෙහෙම තිබිලත් අද විපක්ෂය කියනවා, IMF එකෙන් ණය ගන්න කියලා. ණය ගන්නේ නැති හේතුව මොකක්ද කියලාත් අහනවා. IMF එකේ පළමුවැනි ඉල්ලීම තමයි රාජ්‍ය සේවකයන් හරි අඩක් අයින් කරන්න කියන එක. ඊළඟට, විපක්ෂය අද එක වචනයක් අල්ලා ගෙන රාජ්‍ය සේවය ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා දකින විධියට විශේෂයෙන්ම රටේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා මේ අය වැය යෝජනා තුළ ප්‍රමුඛතාව ලබා දීලා තිබෙනවා. රාජ්‍ය වියදම අඩු කිරීම, රාජ්‍ය ආදායම වැඩි කිරීම සඳහා කටයුතු කිරීම, සෘජු විදේශ ආයෝජන ඉහළ නැංවීමට කටයුතු කිරීම, ආනයන අවම කර අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් හැම දෙයක්ම නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කිරීම වැනි යෝජනා මෙයට ඇතුළත් කර තිබෙනවා. ඒ තුළින් එකවරම භාණ්ඩ මිල අඩු කරලා, ජනතාවට -පාරිභෝගිකයාට- සහන ලබා දෙන්න බැරි වුණත්, දීර්ඝ කාලීනව ඉතාම වැදගත් යෝජනා හැටියට තමයි අපි මේවා දකින්නේ.

අපනයනය ඉහළ නංවන්න අද අපට හැකියාව ලැබී තිබෙනවා. අපේ ගරු වෛද්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමාත් ගරු සභාවේ සිටින මොහොතේ මම මේ ගැන කියන්න කැමැතියි. අද වෙනකොට අපේ අමාත්‍යාංශය අපේ රටට විදේශ විනිමය ගෙනෙන ආයතන අතරින් තුන්වැනි තැනට ගෙනෙන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

අපි ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. මිල වැඩි කර තිබෙනවා. ඒ සඳහා නැඹුරු වෙන්න ගොවියා උනන්දු කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ ආර්ථිකය කළමනාකරණය කරනවා වාගේම, ලබන වර්ෂයේදී විශේෂයෙන්ම සමෘද්ධිය ලබන අඩු ආදායම්ලාභීන් ශක්තිමත් කිරීමේ වැඩසටහන, ක්ෂුද්‍ර මූල්‍ය ආර්ථිකය ගොඩ නැඟීමේ වැඩසටහන හොඳ සැලසුමක් ඇතිව ක්‍රියාත්මක කරනවා. සමහර වෙලාවට විරුද්ධ පක්ෂය කියනවා, මේකෙන් කරන්නේ දේශපාලන වාසි ලබා ගැනීම සඳහා මන්ත්‍රීවරුන්ට අල්ලස් ලබා දීමයි කියලා. නැහැ, ඇත්ත තත්ත්වය ඒක නොවෙයි. කොට්ඨාස මට්ටමින් හැම වසමකටම රුපියල් මිලියන තුන බැගින් වෙන් කළොත්, එයින් සියයට 40ක් -ඒ කියන්නේ රුපියල් ලක්ෂ 12ක්- යන්නේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහායි. එනම්, ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය ශක්තිමත් කිරීම සඳහායි. ඒක තමයි වැදගත් වෙන්නේ.

අපි සමෘද්ධිය ගැන කථා කරනවා. හැම ආණ්ඩුවක්ම ඇවිල්ලා සමෘද්ධි සහනාධාරය වැඩි කරනවා; සමෘද්ධිය ලබන ජනතාවගේ ප්‍රමාණය වැඩි කරනවා. කාටද දෙන්න ඕනෑ, කාටද නොදෙන්න ඕනෑ කියලා සොයා බලන්නේ නැතුව පසුගිය රජය ලක්ෂ 5කට සමෘද්ධිය ලබා දුන්නා. විය යුත්තේ ඒක නොවෙයි. අපේ රට සංවර්ධනය කරා යන රටක් නම්, සමෘද්ධි සහනාධාර ටික පුළුවන් තරම් අවම කිරීම, එහෙමත් නැත්නම් එය ක්‍රමක්‍රමයෙන් අඩු කිරීම තමයි කළ යුත්තේ. ඒක තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. අඩු ආදායම් ලබන ග්‍රාමීය ජනතාව ශක්තිමත් කිරීම තුළින් ඒ අයට අමතර ආදායමක් ලබා ගන්න අවස්ථාව සලසන්න ඕනෑ. ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය හැටියට ස්වයං රැකියාවක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් යම් කිසි කුඩා ව්‍යාපාරයක් හෝ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයක් වෙන්න පුළුවන්, ඔවුන්ට මේ මුදල් ටික ලබා දීම ඒවා ආරම්භ කිරීමට හොඳ පිටුවහලක් වෙනවා.

අනෙක් පැත්තෙන්, මෙවර අය වැයෙන් මන්ත්‍රීවරුන්ට තවත් රුපියල් මිලියන 5ක මුදලක් ලබා දීලා තිබෙනවා. ඊට අමතරව කොට්ඨාසයේ සංවර්ධනය සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රුපියල් මිලියන 10ක මුදලක් ද ලබා දෙනවා. ඒ සියල්ලෙන් සියයට 40ක් හෝ ඊට වැඩි මුදලක් වෙන් කරන්නේ පාරවල් හදන්න නොවෙයි. යටිතල පහසුකම් සංවර්ධනය වාගේම, ඊටත් වඩා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහායි එම මුදල් ලබා දීලා තිබෙන්නේ. ඉතින්, මේක හොඳ වැඩ පිළිවෙළක්. ලබන අවුරුද්ද අවසානයේ අය වැයට යද්දී සමෘද්ධිය ලබා ගන්නා පිරිසෙන් ලක්ෂයක් අඩු කරලා තිබුණොත්, ඒක තමයි මේ වැඩ පිළිවෙළ හරහා අපි ලබා ගන්නා ජයග්‍රහණය. එම නිසා අපි ඒ වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කරන ගමන්, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළත්

[ගරු කනක හේරත් මහතා]

ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම අපනයනය ඉලක්ක කර ගත් ආර්ථිකයක් ගොඩ නැඟීම සඳහා පෞද්ගලික අංශයේ මධ්‍යම සහ කුඩා පරිමාණයේ ව්‍යවසායකයන් දිරිමත් කිරීමට රුපියල් මිලියන 5,000ක ප්‍රතිපාදන මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම තරුණ ව්‍යවසායකයන් දිරි ගැන්වීමත් අවශ්‍යයි. ඒ සඳහා ව්‍යාපාර ලියා පදිංචි කිරීමේදී ලබන වර්ෂයේ සිට ගාස්තුවක් අය කරන්නේ නැහැ. ඒක ඉතාම වැදගත් කාරණයක්.

ඊළඟට, අපේ ආර්ථිකය ශක්තිමත් වන වැවිලි කර්මාන්තය සඳහා විසර්ජන පනතෙන් වෙන් කළ මුදලට වඩා තවත් රුපියල් මිලියන 10,000ක මුදලක් වෙන් කර තිබෙනවා. රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ඒක ඉතාම වැදගත් වෙනවා. ඒ අනුව මේ අය වැය තුළින් අපේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කර, ආනයන වියදම් හැකිතාක් අඩු කර අපනයන ශක්තිමත් කරයි කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ සංචාරක කර්මාන්තය බිඳ වැටිලා තිබෙනවා. අපි දැන් එය ගොඩ නඟමින් පවතිනවා. ලබන වර්ෂය වෙද්දී ලෝකය යම්තාක් දුරට හොඳ තත්ත්වයකට පත්වෙලා සංචාරක කර්මාන්තය ශක්තිමත් කරගන්න අපට හැකියාව ලැබෙයි කියලා හිතනවා.

අපේ දිස්ත්‍රික්කය ගත්තාම, අපට ප්‍රධානම ගැටලුවක් තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පසුගිය කාලයේ මහනුවර අධිවේගී මාර්ගය කොටස් වශයෙන් හදා තිබෙනවා. එම අධිවේගී මාර්ගය 2024 වසර වනකොට -වසර දෙකක් ඇතුළත- සාදා අවසන් කිරීමට නියමිතයි. මේ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 260,000ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඊට අමතරව ඒ සඳහා තවත් රුපියල් මිලියන 20,000කුත් ලබාදීලා තිබෙනවා. මහනුවර අධිවේගී මාර්ගය නිමවනවා දැකීම ඒ ප්‍රදේශයට යන හැම කෙනෙකුටම තිබෙන බලාපොරොත්තුවක්.

වතුකරයේ ලයින් කාමර පිළිබඳව හැම දාම අපි කථා කරනවා. වතුකරයේ ජනතාවගේ ලයින් කාමර ඉවත් කර වතු නිවාස වැඩිදියුණුව සඳහා තවත් රුපියල් මිලියන 500ක් ලබා දෙන්න මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා. ඒ ආකාරයෙන් අපේ ප්‍රදේශවලටත් මේ සහයෝගය ලබා දීම පිළිබඳව අපි සතුටු වනවා.

මාස ගණනාවක් තිස්සේ අපේ දරුවන්ට අධ්‍යාපනය ලබා නොදී අපේ රටේ ගුරුවරු අරගළ කළා. අපි කියන්න ඕනෑ, 1981දී මේ විධියට දිගින් දිගටම උද්ඝෝෂණ කළා නම් ඒ ගොල්ලන් රැකියාවලින් එළියට දමන බව. මේක අවුරුදු 24ක් තිස්සේ තිබුණු අරගළයක්. එම ගැටලුව විසඳමින් ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා තවත් රුපියල් මිලියන 30,000ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කිරීම ඉතා වැදගත් කාරණයක්.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අද එක වචනයක් අල්ලාගෙන රාජ්‍ය සේවය ගැන කථා කරනවා. එතුමන්ලාට අද රාජ්‍ය සේවය ගැන කථා කරන්න බැහැ. අපි, රස්සා නැතිව පාරේ හිටපු උපාධිධාරීන් 53,000ක් රාජ්‍ය සේවයට බඳවා ගත්තා. ඒ වාගේම, කවදාවත් රාජ්‍ය සේවයට ඇතුළු කරන්න බැහැ කිව්ව ලක්ෂයක පිරිසකට රැකියා ලබා දුන් රජයක්, අපි. ඒ නිසා අද විපක්ෂයට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් රජයට චෝදනා කරන්න බැහැ.

අද උදේ ඉඳලා විපක්ෂයේ මන්ත්‍රීවරු වාගේම විපක්ෂ නායකතුමාත් මේ ගරු සභාවට ඇවිල්ලා අඬනවා අපි දැක්කා, උද්ඝෝෂණය කරන්න අවස්ථාව දෙන්නේ නැහැ, පොලීසිය දාලා කියලා. නමුත් අපි මතක් කරන්න කැමැතියි, පසුගිය ආණ්ඩුව කාලයේ අපි පාද යාත්‍රා යනකොට අපේ නම් දාලා, අධිකරණයට ගිහිල්ලා, ඒ සියලු උද්ඝෝෂණ නතර කරන්න කටයුතු කළ බව. අපි උද්ඝෝෂණ පවත්වපු හැම තැනකටම ගිහිල්ලා කුණු වතුර ගහලා, කඳුළු ගෑස් ගහලා, ඒ උද්ඝෝෂණ මර්දනය කරන්න මෙතුමන්ලා කටයුතු කළ හැටි අපට මතකයි.

විශේෂයෙන්ම මේ අය වැය අභියෝගාත්මක අවස්ථාවකදී ඉදිරිපත් කළ අය වැයක්. අපට ගැටලු තිබෙනවා, නැතුවා නොවෙයි. එවැනි අභියෝග තිබෙන අවස්ථාවක ඉදිරිපත් කළ හොඳම අය වැයක් හැටියට මම මෙවර අය වැය දකිනවා. මෙම අය වැය ලේඛනයේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා, මුදල් අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේ සියලුදෙනාට ශක්තිය හා ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. D.B. Herath. You have ten minutes.

[අ.භා. 1.28]

**ගරු ඩී. බී. හේරත් මහතා (පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பி. ஹேரத் - கால்நடை வளங்கள், பண்ணைகள் மேம்பாடு, பால் மற்றும் முட்டை சார்ந்த கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock, Farm Promotion and Dairy and Egg Related Industries)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන් 225දෙනෙක් ඉන්න වෙලාවේ වර්තමාන මුදල් ඇමතිතුමා විසින් අසීරුතම කාර්ය භාරය වන අය වැය ලේඛනය මේ ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. අපේ මුදල් අමාත්‍යතුමා අය වැය ලේඛනය හදනකොට ජාත්‍යන්තර අභියෝග රාශියක් තිබුණා. ලෝකයේම නිෂ්පාදන ක්‍රියාවලිය කඩාගෙන වැටිලා, ප්‍රවාහන ගාස්තු ඉහළ ගිහිල්ලා, අපිට ජාත්‍යන්තරය එක්ක ගනුදෙනු කරන්න තිබෙන විදේශ විනිමය හීනවෙලා තිබුණා. එවැනි ගැටලු රාශියක් තිබුණු වෙලාවක තමයි එතුමා මේ අය වැය ලේඛනය හැදුවේ.

කොරෝනා උවදුරට මුහුණ දෙමින්, මේ රටේ සිටින දෙකෝටි විසිපන්ලක්ෂයකගේ ජීවිත සුරක්ෂිත කිරීමේ වගකීම අපේ අතිගරු ජනාධිපතිතුමා භාරගත්තා. එතුමා ඒ කටයුත්ත මැනවින් ඉටු කළා. කොවිඩ් මර්දන එන්නත ලංකාවේ හැම කෙනෙකුටම ලබා දීලා, ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කර, ඉන් ඔබ්බට පියවර ඔසවන්න සූදානම් වන වෙලාවක තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ.

කොරෝනා උවදුරට ලෝකයම ගොදුරු වනකොට අපට, අපේ රටේ ජනතාවගේ ජීවිත පිළිබඳවත් බරපතළ ප්‍රශ්නයක් තිබුණා. අපේ අතිගරු ජනාධිපතිතුමා අනික් සියල්ලටම වඩා මේ රටේ මහ ජනතාවට ආදරය කරන නායකයෙකු හැටියට ලෝක සෞඛ්‍ය සංවිධානයේ විද්වතුන් ලබා දුන් උපදෙස් අනුව ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමේ වගකීම භාර ගත්තා. විශේෂයෙන්ම මේ රට කරවන පාලක පක්ෂය හැටියට ජනතාවට

එන්නත ලබා දීලා, ඉන් ඔබ්බට ජනතාවට සහන සලසමින් රුපියල් 5,000 සහන දීමනාවක් ලබා දුන්නා. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 84ක් වැය කර තිබෙනවා. ඒ වාගේම එන්නත් ගෙන්වීම සඳහා රුපියල් බිලියන 56ක් වැය කර තිබෙනවා. ඊළඟට, නිරෝධායනය වන පවුල්වලට රුපියල් 10,000ක් වටිනා බඩු මල්ලක් ලබා දුන්නා. ඒ කටයුතුවලට රුපියල් බිලියන 500ක් වැය කර තිබෙනවා. මේ විධියට රටේ ආර්ථික ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය මූලික පදනම සකසමින් ජනතාවගේ ජීවිත රකින්න අවශ්‍ය සියලු දේ අපි සිදු කළා.

එවන් රාජ්‍ය නායකයෙකු එක්ක වර්තමාන මුදල් අමාත්‍යතුමා අපේ ඉදිරි ගමන ක්‍රියාවට නංවන්නේ අත්දැකීම් සමුදායක් තිබෙන ජාතික නායකයකු හැටියට. අපි දැක්කා, යුද්ධය තිබෙන වෙලාවේ මේ රට යුද්ධයෙන් නිදහස් කර ගෙන ආර්ථික වශයෙන් රට ගොඩ නඟන්නට එතුමා කරපු දැවැන්ත වැඩ පිළිවෙළ. එදා "අපි වවමු - රට නඟමු" කියන වැඩසටහන සමාජගත කරලා ගම්බද පුංචිම මනුස්සයාගේ ගෙවත්තේ ඉඳලා නාගරිකයාගේ මල් පෝච්චිය දක්වා යමක් වගා කරන තැනට අරගෙන ආවා. ඒ විතරක් නොවෙයි, තමුන්ගේ කෑම මේසයට එන ආහාර වේල ගෞරවාන්විත විධියට භුක්ති විඳින්න පුළුවන් පසුබිමක් හදන මානසිකත්වයක් දේශීය නිෂ්පාදන ක්‍රියාවලියත් එක්ක ආරම්භ කළා. එදා මේ රටට "ආසියාවේ ආශ්චර්යවත්ම දේශය" හැටියට චීනයට පමණක් දෙවැනිවෙන සංවර්ධන වේගයක් ගෙනාවේ එතුමාගේ ආර්ථිකය හැසිරවීමේ ක්‍රියාදාමයත් එක්ක. ඒ ආකාරයට ගොඩ නඟපු රට යහ පාලන ආණ්ඩුව විසින් පසුගිය අවුරුදු 4 1/2ක කාලය තුළ පාලනය කරපු ආකාරය දිහා බැලුවාම, අපට පෙනී යනවා අද විපක්ෂය කොච්චර අවලාද නැඟුවත්, එදා ඔවුන්ගේ කාලය තුළ ආර්ථිකය කඩා වැටිච්ච හැටි.

ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2005දී රට බාර ගන්නකොට දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 20.1යි. එතුමා යුද්ධයත් කරලා ආපසු රට බාර දෙනකොට දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 79.4යි. 2019දී අපි නැවත රට භාර ගන්නකොට දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 84යි. බලන්න, ආර්ථික ඔස්තාර්ලා හැටියට විපක්ෂය අද අපට උපදෙස් දෙන්න කටයුතු කරන වෙලාවක, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබිඹු වෙන්න මේ ආර්ථික සංඛ්‍යාලේඛන, දත්ත ටික හොඳටම ප්‍රමාණවත්. රටේ සංවර්ධන වේගය සියයට 2.3 දක්වා පහළ බැස්සෙව්වා. කොරෝනා උවදුර මැද්දෙන් රට ඉහළින් ඔසවා තබන්න අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා කටයුතු කරන වෙලාවක ඊට ප්‍රායෝගික වැඩ පිළිවෙළක් වශයෙන් 2022 වසරේ රට ගොඩ නඟන්නේ කොහොමද කියන කාරණාව ඉදිරිපත් කරපු වර්තමාන මුදල් අමාත්‍යතුමාගේ වැඩ පිළිවෙළ විවේචනය කරන්න විපක්ෂයට තිබෙන සුදුසුකම මොකක්ද? පසුගිය අවුරුදු 4 1/2ක කාලය තුළ ඔවුන් කරපු ක්‍රියාකාරකම් දිහා බැලුවාම ඒක අපට බරපතළ ප්‍රශ්නයක්. එදා අපේ ඡන්ද දායකයා ඡන්ද පොළට ගියේ මහ බැංකු කොල්ලය, සහරාන්ගේ සිදුවීම, ස්වාභාවික විපත්ති, බ්ලූමැන්ඩල් කුණු කන්ද, සාලාව කඳවුරේ සිදු වූ පිපිරීම කියන මේ වාගේ අසාර්ථක පාලනයක ප්‍රතිඵල සමඟ. එවන් විපතකට ගොදුරු වෙලා තිබෙන වෙලාවක මේ රට බේරා ගන්න. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා, ජනතාව බලාපොරොත්තු වුණු විධියට රට හරි තැනකට ගෙනියන්න. ඒ වගකීම ඉටු කරන්න තමයි එදා "සෞභාග්‍යයේ දැක්ම" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය ජනගත කළේ. ඊට අනුකූල වෙච්ච අය වැය ලේඛනයක් අද ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ලෝකයම දරිද්‍රතාවට පත් වෙලා තිබෙන වෙලාවක, රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙන වෙලාවක නිෂ්පාදන ආර්ථිකයට වටිනාකමක් දෙන්න මෙවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව. දුෂ්කරතා රාශියක් මැද්දේ නවවෙනි පාර්ලිමේන්තුව තුළ මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා. මේ රට අවුරුදු 73කට පෙර නිදහස ලබා ගත්ත රටක්. හැබැයි, මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ අපි අහලා තිබෙනවා එංගලන්තයේ අය වැය ලේඛනය පිරිමහන්න ලංකාවෙන් මුදල් අරගෙන ගියා කියලා. එවන් වැදගත් අතීතයක් තිබුණත් වර්තමානයේ අපි කොතැනද ඉන්නේ? ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අය වැය ලේඛනයේ ප්‍රධාන අරමුණ තමයි නිෂ්පාදන ආර්ථිකයක් කරා රට යොමු කරවීම. එතුමා එක පැත්තකින් මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න අවශ්‍ය පහසුකම් දෙමින්, අනික් පැත්තෙන් දරිද්‍රතාවට පත් වුණු ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් මුදල් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර අය අද කියනවා අපේ ආණ්ඩුව රාජ්‍ය සේවකයන් පිළිබඳව විවිධ මත දරනවා කියලා. නමුත්, පළමුවෙනි පූර්වාදර්ශය තමයි මේ රජය එදා උපාධිධාරීන් 53,000කට එකම වෙලාවක රැකියා ලබා දීම. ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ අය වැය ලේඛනය හරහා උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

ඒ ගැන අවිනිශ්චිතභාවයක් ඇති වන්නේ නැහැ, රාජ්‍ය සේවයේ උපාධිධාරීන්ගේ රැකියාව ස්ථිර වෙනවා. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශ්‍රාම දීමනා ලබාදීම ක්‍රමවත් කිරීමටත් යෝජනා කර තිබෙනවා. පසුගිය කාලයේ කොරෝනා උවදුරට ගොදුරු වෙලා ආදායම් අහිමිව සිටි පාසල් දරුවන් ප්‍රවාහනය කරන රියැදුරන්ට, ත්‍රිරෝද රථ හිමියන්ට, පෞද්ගලික බස් රථ ව්‍යාපාරයේ නිරත වුණු අයගේ වෘත්තීන්ට ගැටලුවක් වුණා නම්, ඒ වෙනුවෙන් විසඳුම් දෙන්නත් වර්තමාන මුදල් ඇමතිතුමා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, විවිධ කාලවල අතුරුදහන් වූ අයගේ පවුල්වලට වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 300ක මුදලක් වෙන් කිරීම, දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට වන්දි වශයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීම, රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා ඉවත් කිරීම ආදී වැදගත්ම යෝජනා එතුමා ඉදිරිපත් කරලා තිබෙනවා.

ගැබිනි මාතාවන්ට රුපියල් 10,000ක් වටිනා පෝෂණ මල්ලක් ලබාදීමටත්, "ගම සමඟ පිළිසඳර" වැඩසටහන සඳහා රුපියල් මිලියන 85,000ක විශාල මුදලක් වෙන් කිරීමටත් මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා. ගුරුවරුන්ගේ වැටුප පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. එතුමා ඒ වගකීම සියතට භාර ගත්තා. ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ උපදෙස් පරිදි රුපියල් මිලියන 30,000ක මුදලක් ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය විසඳන්න වෙන් කරලා තිබෙනවා.

ආයෝජන කලාප 200ක් වෙනුවෙන් එතුමා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා අලුත් වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා. එය අය වැය ලේඛනයට එකතු කර තිබෙනවා. ඒ කාරණා එහෙම කරනකොට පර්පෙචුවල් ට්‍රෙෂරීස් ගනුදෙනුවේ රුපියල් බිලියන 8.5ක් නැවත ජනතාවට ලබා ගැනීමට යෝජනා කර තිබෙනවා.

එදා ආණ්ඩුවේ හිටපු උදවිය ඔක්කොම එකට එකතු වෙලා මහ බැංකුව කොල්ල කාලා ඒ සල්ලි ඔවුන්ගේ පෞද්ගලික දේවලට පරිහරණය කළා. නමුත්, අපේ මුදල් අමාත්‍යතුමා එදා වෙච්ච ඒ අසාධාරණයට, ජාතියට කරපු අසාධාරණය නිවැරදි කරන්නට පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය ඉපැයූ රුපියල් බිලියන 8.5ක් ජනතාගත කරන්න කටයුතු කරලා තිබෙනවා.

තවත් පැත්තකින් එතුමාගේ අය වැය ලේඛනයේ වියදම් සීමා කර තිබෙනවා. ඒ ඇයි? ආර්ථික ගැටලුවකට මුහුණ දී තිබෙන රටක්, සංවර්ධනය කරගෙන යනකොට සංවර්ධන කටයුතු ප්‍රවේශමෙන් කරගෙන යන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please wind up now.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D.B. Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනෙක් පැත්තෙන් සුබසාධන කටයුතු කරන්න ඕනෑ. පාරවල් හදන්න, පාසල් හදන්න, "වාරි සෞභාග්‍යා" වැඩ පිළිවෙළ ආදී අතිවිශාල වැඩ පිළිවෙළ රාශියක් තිබෙනවා. මේ රට නිවැරදි තැනකට ගෙනෙන්න ආර්ථිකය ශක්තිමත් කිරීමට වැඩ කරන ගමන් සුබසාධන කටයුතු කරලා, ජාතික ආරක්ෂාව නිවැරදි තැනකට ගෙනියන්න කටයුතු කිරීම පිළිබඳව අපේ මුදල් අමාත්‍යතුමාට අපගේ ගෞරවනීය ප්‍රශංසාව පුද කරමින් කථා කරන්න මේ අවස්ථාව ලබාදුන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya. You have 20 minutes.

[අ.භා. 1.38]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් රටේ ජනතාව අය වැය ගැන යම්කිසි විධියකට උනන්දුවක් දක්වන්නේ තමන් මුහුණ දෙන දැවෙන ප්‍රශ්නවලට මොන වාගේ පිළිතුරු ලැබෙයිද කියන බලාපොරොත්තුවත් එක්කයි. අය වැයෙන් ලැබෙන උත්තර මොනවාද කියලා ඔවුන් ඉතාම උද්‍යෝගයෙන් අය වැය කිට්ටු වෙනකොට සාකච්ඡා කරනවා. ඒක ගැන බලාපොරොත්තුවක් තබා ගන්නවා. නමුත්, අපි දන්නවා මේ වන විට ඔවුන් ගැටලු රාශියකට මුහුණ පා තිබෙන බව. ඒ ප්‍රශ්නවලට කොච්චර දුරට මේ අය වැයෙන් විසඳුම් ලැබී තිබෙනවා ද කියන එක ගැන අපට බැරෑරුම් ලෙස හිතන්න වෙනවා. අය වැය ඉදිරිපත් කරනකොට ආණ්ඩුව පැත්තෙන් සහ මුදල් ඇමතිතුමා නිතර නිතර කියන කථාවක් තමයි, කොවිඩ් - 19 අර්බුදයත් එක්ක රට ගැටලුවලට මුහුණපාන නිසා මේක ඉතාම අමාරු අවස්ථාවක්, මේ අවස්ථාවේ ලෝකයම මුහුණදෙන අර්බුද රාශියක් තිබෙනවා, එතැනදී ලංකාවට විතරක් වෙනස් විධියට මේකට මුහුණ දෙන්න බැහැ, මේ අර්බුදයට අපටත් මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවාය කියන එක. ඒක හරි. අපි විතරක් නොවෙයි, මේ වන විට මුළු ලෝකයම විශාල අර්බුද රාශියකට මුහුණ දෙමින් සිටිනවා. අපටත් වඩා බලසම්පන්න ආණ්ඩු වුණත්, රටවල් වුණත් මේ වෙලාවේ ආර්ථික වශයෙන් දුර්වල වෙමින් යන්නේ. නමුත්, මේක කොවිඩ් - 19 වසංගතයට විතරක් ලඝු කරන එක හරි කියලා මම හිතන්නේ නැහැ. අපේ රට ගත්තත්, ලෝකය ගත්තත්, අපි මේ මොහොතේ මුහුණ දෙන අර්බුද කොවිඩ් -19 වසංගතය පමණක් නිසා මුහුණ දෙන අර්බුදයක් නොවෙයි. කාලයක් තිස්සේ නිර්මාණය වෙච්ච, අවුරුදු ගණනාවක් තිස්සේ නිර්මාණය වෙමින් පැවතුණ අර්බුදවල උච්චතම අවස්ථාවට 2020, 2021 වර්ෂවලදී අපට මුහුණ පාන්නට සිද්ධ වුණා. ඒක හරි. නමුත්, මෙය කොවිඩ් - 19 වසංගතය පමණක් නිසා ඇති වූ අර්බුදයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ ආර්ථික අර්බුදයට 1987දී එක විධියකට අපට මුහුණ දෙන්න සිද්ධ වුණා.

2008 දී තවත් විධියකට එවැනිම ආර්ථික අර්බුදයකට ගෝලීය වශයෙන් මුහුණ දෙන්න සිද්ධ වුණා. ග්‍රීසිය කඩා වැටුණා. ආර්ජන්ටිනාව කඩා වැටුණා. මෙවැනි උදාහරණ රාශියක් දෙන්න පුළුවන්. පසුගිය දශක දෙකක කාලය තුළම විටින් විට මෙවැනි අර්බුදවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. මෙවැනි අර්බුද නිර්මාණය වෙනකොට, ඒවාට මුහුණ දෙනකොට සාමාන්‍යයෙන් ප්‍රතිචාර දක්වන ක්‍රමවලත් අපට යම් කිසි රටාවක් පෙනෙනවා. විශේෂයෙන්ම අපි වාගේ රටවල් සාම්ප්‍රදායිකව තමයි මෙවැනි දේවල්වලට මැදිහත් වෙන්නේ. ඒ ගැන මේ ගරු සභාවේදීත් කථා වුණා. හිටපු අගමැතිතුමාත් යෝජනා කළා, IMF වැනි ආයතනවලින් ණය ගැනීම වාගේ දේවල්වලට යා යුතුයි කියලා. අපි දන්නවා, එවැනි දේවල්වලට ගිහින් වෙලා තිබෙන දේවල්. ඒ පිළිබඳව මීට පෙරත් ඕනෑ තරම් අත් දැකීම් තිබෙනවා. IMF එකෙන් වුණත් අපේ රටට විතරක් නොවෙයි, වෙනත් රටවල ජනතාවට බලපාන කප්පාදු විශාල වශයෙන් යෝජනා වෙනවා. ඒ package එකත් එක්ක තමයි IMF එකත් මැදිහත් වෙන්නේ. මේ අර්බුදය නිසා IMF එකත් යම්තාක් දුරකට ඔවුන්ගේ ප්‍රතිපත්ති වෙනස් කරලා තිබුණාට, බොහෝ දුරට ඒ මූලික package එක ලොකුවට වෙනස් වෙලා නැහැ. නමුත්, ඒ IMF bailoutsවලින් සහ austerity measures අරගෙන වුණත් මේ අර්බුදය ගෝලීය වශයෙනුත් තවම විසඳිලා නැහැ. ඒකට වෙනත් විධියකට ප්‍රතිචාර හැටියට 'ජාතික ආර්ථිකය ගොඩනැඟීම' වැනි වචන පාවිච්චි කරමින්, ලස්සන මාතෘකා යටතේ slogans එක්ක වෙනත් විධියකටයි කරන්නේ. හැබැයි, ඇත්තටම අඩු වැඩි වශයෙන් අර ව්‍යාපෘතියම තමයි ඉස්සරහට ගෙනියලා තිබෙන්නේ. පසුගිය දශක දෙක තුන තුළ මොන ජාතික ආර්ථිකය කියලා මැදිහත් වුණත්, IMF එකට ගියත්, ගෝලීය වශයෙන් ගත්තත්, රටේ තත්ත්වය ගත්තත් ප්‍රශ්න විසඳිලා නැහැ. ප්‍රශ්න එන්න එන්නම උග්‍ර වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අසමානතාව ඉතාමත් තීව්‍ර ලෙස වැඩි වෙලා තිබෙනවා. ඒක ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා, එතුමාගේ අය වැය කථාව කරන අවස්ථාවේ දී මතක් කළා. නමුත්, ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේ මූලික ගැටලුවලට ඉදිරිපත් වෙලා තිබෙන විසඳුම් මොකක්ද කියන එකයි. උදාහරණයක් හැටියට ගත්තොත්, 2008 වර්ෂයේ දී ඇමෙරිකාවේ මෙවැනිම ආර්ථික අර්බුදයක් ඇති වුණාම රජය මැදිහත් වුණා. සාම්ප්‍රදායිකව එම රාජ්‍ය මැදිහත්වීමට ඇමෙරිකාව තදින්ම විරුද්ධයි. ඒ අය රාජ්‍ය මැදිහත්වීම දකින්නේ ඔවුන්ගේ නිදහස් ආර්ථිකයට බාධාවක් හැටියටයි. නමුත්, ඒ ආර්ථික අර්බුදය වෙලාවේ රජය කළේ මොකක්ද? ඉතාම දැඩි ලෙස මැදිහත් වෙලා බැංකු සහ මූල්‍ය ආයතන බේරා ගත්තා. ඒ බේරා ගැනීමට වියදම් වූ මුදල, ඒ බර සාමාන්‍ය ජනතාව මත තමයි වැටුණේ. අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණය වාගේ ජනතාවට අවශ්‍ය ආරක්ෂණ වැඩ පිළිවෙළ කප්පාදු වීමත් සමඟම, මේ වෙනකොට ඒ රටේ වුණත් අසමානතා වර්ධනය වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම ඒ රටේ සමාජ අසහනයක් වර්ධනය වෙලා තිබෙනවා. ඒකත් එක්ක ඇති වෙලා තිබෙන දේශපාලන අර්බුදය අපිත් හොඳටම දකිනවා.

අපි දශක ගණනක් තිස්සේ ගෝලීය වශයෙන් අනුගමනය කර තිබෙන ආර්ථික ප්‍රතිපත්තිවල විනාශකාරී බව 2021 දී කොවිඩ් වසංගතයත් එක්ක - COVID pandemic එකත් එක්ක - හොඳින් පහදලා දුන්නා. ඒ හා සමානව, ගෝලීය වශයෙන් දේශගුණික විපර්යාස තුළ අපට ලැබෙන අත් දැකීම් ඇසුරෙනුත්, එකිනෙකා, පරිසරය සූරා කන, අසමානතාව වර්ධනය කරන ආර්ථික, දේශපාලන ප්‍රතිපත්තිවල තවදුරටත් යන්න බැරි බව අපට හොඳින් ඔප්පු වෙනවා විතරක් නොවෙයි, ඒකේ තිබෙන අමානුෂික බවත්, විනාශකාරී බවත් අපට හොඳින් තේරුම් ගන්න පුළුවන්.

අද අපේ රටේ ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලු කිහිපයක් දෙස බලමු. අද ජීවන වියදම ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟකමක් තිබෙනවා. හැම තැනම පෝලිම් දකින්න ලැබෙනවා. සමාජ සම්බන්ධතා ගත්තාම, -අපේ පෞද්ගලික සම්බන්ධතා වෙන්න පුළුවන්; වැඩපොළේ තිබෙන

සම්බන්ධතා වෙන්න පුළුවන්- ඒ සම්බන්ධතා සියල්ලම කඩා වැටෙමින්, දුර්වල වෙමින් යනවා. අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත්, සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තත් කඩා වැටීම්, ප්‍රශ්න රාශියක් අපට පෙනෙන්න තිබෙනවා. හැම පැත්තකින්ම අපට පෙනෙන්නේ බහුතරයක් මිනිසුන්ගේ ජීවිතවලට සැනසීමක්, සතුටක් නැහැ කියායි. කිසිම අර්ථවත් විධියකට ඔවුන්ගේ ජීවිත ගත කර ගන්න බැරි තත්ත්වයක් තමයි අපට පෙනෙන්නේ.

ළඟදී දවසක තරුණයෙක් අපේ එක් සහෝදරයෙකුට කියා තිබෙනවා, "ඔව්, අපි විනෝද වෙනවා තමයි. හැබැයි, අපේ ජීවිතවල සතුටක් නැහැ" කියලා. ඒක අපි හරිම බැරෑරුම් ලෙස භාරගන්න ඕනෑ ප්‍රකාශයක්. ඔව්, අපට විනෝද වෙන්න එක එක දේවල් කරන්න පුළුවන්. අපට trips යන්න පුළුවන්; කන්න බොන්න යන්න පුළුවන්. නමුත්, ඇත්තටම අපේ ජීවිත දෙස බැලුවාම ස්ථාවර වශයෙන් තෘප්තිමත් වෙන්න පුළුවන් විධියේ ජීවිත අපට තිබෙනවාද, කොපමණ දුරට අපට සතුටු වෙන්න පුළුවන්ද කියන එක ගැන අප සියලුදෙනාටම ප්‍රශ්න තිබෙනවා. පෞද්ගලික ජීවිත ගත්තත්, ජනතාව ගත්තත්, ආර්ථික නිර්ණායක ගත්තත්, අපට ප්‍රශ්න රාශියක් තිබෙනවා. අපේ ණය බර, deficit එක, ආදායම පහළ වැටීම ආදී සියලුදේම මේ වෙලාවේ අපට තිබෙන දැවෙන ප්‍රශ්න. ජනතාව මුහුණ දෙන ප්‍රශ්න වාගේම, අපේ ආර්ථික නිර්ණායක දිහා බලනකොට ඒ තිබෙන ප්‍රශ්නවලටවත් අපට උත්තර දෙන්න බැහැ. මේ අභියෝගවලට අපට හරිහැටි මුහුණ දෙන්න පුළුවන් වන්නේ ලස්සන වචනවලින් වත්, පැලැස්තර විසඳුම්වලින් වත්, කෙටිකාලීන වැඩ පිළිවෙළවලින් වත් නොවෙයි කියන එක අපිට මේ වෙලාවේ භාර ගන්න වෙනවා.

නමුත් අවාසනාවකට, 2022 අය වැය දෙස බැලුවාම අපට පෙනෙනවා, ප්‍රශ්නවලට විසඳුම් සොයනවාට වඩා, දීර්ඝකාලීනව රට ගොඩනඟනවා වෙනුවට තිබෙන system එකම තවදුරටත් ගැට ගහගෙන යන්නේ කොහොමද කියන අරමුණින් තමයි මේ වතාවේත් අය වැය ඉදිරිපත් වෙලා තිබෙන්නේ කියලා. ලස්සන වචන ගොඩක් තිබෙනවා. කාබනික හරිත වගාව, හරිත technology එක ඉදිරිපත් කිරීම, දේශගුණ විපර්යාසයට පිළිතුරු, ජාතික ආර්ථිකයක් ගොඩනැඟීම, ජාතික සංවර්ධනය වාගේ මේ සියල්ලම මේ ලේඛනයේ ඇතුළත් වෙලා තිබෙන නමුත්, මෙය ගැඹුරින් අධ්‍යයනය කළාම අපිට තේරුම් යනවා, මේ මොහොතට අවශ්‍ය වෙලා තිබුණු ඒ නිර්භීත, පරිවර්තනීය, දේශපාලනික තීරණ අරගෙන නැති බව. ඇත්ත කථාව ඒකයි. මිනිසුන්ගේ ප්‍රශ්නවලට දීර්ඝකාලීන විසඳුම් මේ අය වැයෙන් බලාපොරොත්තු වෙන්න අපට බැහැ. ඇත්ත වශයෙන්ම, මේක සම්ප්‍රදායික අය වැය ලේඛනයක් බව අතිශය කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා. මේක අපි කවදත් දකින අය වැයක්. මම ඒ ගැන පොඩි විස්තරයක් කියන්නම්.

අපි මේ දශක දෙක, තුනේ රටාව දෙස බැලුවොත්, අපිට පෙනෙනවා මේ අවුරුදු 73 අතරම ගත් තීරණ කොච්චර සමානද කියලා. අපි අධ්‍යාපන ක්ෂේත්‍රය දෙස බලමු. අධ්‍යාපන ක්ෂේත්‍රයට අය වැයෙන් වෙන් වෙලා තිබෙන්නේ මුළු වියදමෙන් සියයට 5.9යි. 2019 අවුරුද්දේ එය සියයට 4.54යි; 2018 අවුරුද්දේ සියයට 5.2යි; 2014 අවුරුද්දේ සියයට 4.23යි; 2016 අවුරුද්දේ සියයට 9.97යි; 2015 අවුරුද්දේ සියයට 2.6යි. කොයි වෙලාවක වත් සැලකිය යුතු විධියට, අපට සෑහීමකට පත්වෙන්න පුළුවන් විධියට අධ්‍යාපනයට මුදල් වෙන් කර නැහැ. මෙවරත් සියයට එකකින් පමණ අඩුවෙලා තිබෙනවා.

ඊළඟට, ළමා හා කාන්තා කාර්යාංශයට කොහොමද මුදල් වෙන්වෙලා තිබෙන්නේ කියා අපි බලමු. ළමා හා කාන්තා කාර්යාංශයට අය වැයෙන් සියයට 25ක කප්පාදුවක් තිබෙනවා. ඒකත් මේ අවුරුද්දේ විතරක් නොවෙයි. 2020 අවුරුද්දේ මුළු අය වැයෙන්ම එම ආයතනයට වෙන් වෙලා තිබෙන්නේ සියයට 0.22යි; 2019 අවුරුද්දේ සියයට 0.39යි; 2018 අවුරුද්දේ සියයට 0.12යි; 2017 අවුරුද්දේ සියයට 0.15යි; මේ අවුරුද්දේ සියයට 0.91යි.

ඒ කියන්නේ, අවුරුදු ගණනාවක් තිස්සේ අපේ අය වැය ලේඛනවලින් කාන්තාවන් හා ළමයින් වෙනුවෙන් වෙන් වෙලා තිබෙන්නේ සියයට 1කටත් අඩු ප්‍රමාණයක්. නමුත් පොලීසිය, හමුදාව ඇතුළු අපේ ආරක්ෂක ක්ෂේත්‍රයට Budget එකෙන් සියයට 21.12ක් වැනි ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. පසුගිය දශක ගණනාව පුරාම අඩු වැඩි වශයෙන් මෙම රටාවමයි දකින්න තිබෙන්නේ. මේකෙදී අපට පැන නඟින ප්‍රශ්නයක් වන්නේ, අපේ ප්‍රමුඛතාව මොකක්ද කියන එකයි. රටක් හැටියට, පාලනය කරපු ආණ්ඩු හැටියට මොනවාද අපේ ප්‍රමුඛතා? ගරු ඇමතිතුමනි, සියයට 56ක් වන කාන්තාවන්ට අය වැයකින් සියයට 1ක්වත් වෙන් කරන්න බැරි නම්, මේ රටේ කාන්තාවන් ගැන මොකක්ද, අපේ තිබෙන දැක්ම? දැනට මට ලැබිලා තිබෙන තොරතුරු අනුව අපි ඔක්කෝම දන්නවා, පසුගිය කොවිඩ් කාලයෙත් ගෘහස්ත ප්‍රචණ්ඩත්වය නිසා විවිධ ආතතීන්වලට කාන්තාවන් මුහුණ දුන්නා කියන කාරණය. දැනටත් අපේ රටේ safe houses තිබෙන්නේ 7යි; මුළු රටටම තිබෙන්නේ 7යි. ඒ safe houses හතෙන් මේ අවුරුද්දේ ඒ සේවාවන් ලබාගෙන තිබෙන්නේ 307දෙනායි. ඒ, අවශ්‍යතාව නැති නිසා නොවෙයි. අවශ්‍යතාව තිබෙනවා, නමුත් ඒවායෙහි පහසුකම් නැති නිසා ඒ safe housesවලට ස්ත්‍රීන්, ළමයින් රැක ගන්න පුළුවන්කමක් නැහැ. එතකොට මොනවාද අපේ ප්‍රමුඛතා? අපේ දරුවන්ට, අපේ කාන්තාවන්ට ප්‍රමුඛතාව දෙන්නේ නැති අය වැයක, ආර්ථික ප්‍රතිපත්තියක ඇති ප්‍රයෝජනය මොකක්ද? කාටද අපි ප්‍රමුඛතා දෙන්නේ?

ආණ්ඩුව පැත්තෙන් කියනවා, සහන දීලා තිබෙනවා කියලා; මන්ත්‍රී ප්‍රතිපාදන කපලා තිබෙනවා කියනවා; තෙල් ලීටර 5ක් පමණ අඩු කළා කියනවා. කමක් නැහැ. ඒවා හොඳයි. මන්ත්‍රීන්ගේ pension එක ලබා ගන්න සේවය කළ යුතු කාලය දීර්ඝ කළා. ඒකත් කමක් නැහැ. Pension ඕනෙත් නැහැ. හැබැයි, මේ කිසි දෙයකින් මේ අපි මුහුණපාන මූලික ප්‍රශ්න විසඳෙනවා ද? අපි මුහුණ දෙන ඒ දේශපාලන ප්‍රශ්න අපි විසඳලා තිබෙනවාද? ග්‍රාමීය නිෂ්පාදනය ඉහළ නංවන්න අය වැයේ විවිධ යෝජනා තිබෙනවා. ඉතාම හොඳයි. නමුත් සල්ලි වියදම් කළ පළියට ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වෙන්නේ නැහැ. මොකද, ඒකට වෙළඳ පොළක් අවශ්‍යයි. ඒ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ පහසුකම් අවශ්‍යයි. නිෂ්පාදනය වන භාණ්ඩවලට තත්ත්වයක් තිබෙන්න ඕනෑ. ඒ භාණ්ඩ ගබඩා කිරීමේ හැකියාව තිබෙන්න ඕනෑ. මේවා සියල්ලම සිද්ධ වෙන්න නම්, ජාතික සැලැස්මක් අවශ්‍යයි. ඒ ජාතික සැලැස්ම අනුව තමයි මේ සියලු දේම යොදවා ගන්න පුළුවන් වෙන්නේ.

ගොවීන්ගේ ප්‍රශ්නය ගත්තත්, ඔව් සහනාධාර තිබෙනවා. නමුත් අත්හදා බලලා වැඩේ වැරදුණාම සහනාධාර දෙන එකෙන් ඇති වැඩේ මොකක්ද ? ගොවීන් කියන්නෙත් යම්කිසි විධියක ගරුත්වයක් ඇතිව ජීවත් වෙන මිනිස්සු. ඔවුන්ට සහනාධාර නොවෙයි ඕනෑ. ඔවුන්ට ඕනෑ හරියාකාරව ජීවත් වෙන්නයි.

ඇත්ත වශයෙන්ම මේ අය වැයේ සහ පසුගිය අය වැයවල අපි දැකලා තිබෙන්නේ මොකක්ද ? දේශපාලනඥයන් මත යැපෙන අය වැය තමයි අපි ඉදිරිපත් කරන්නේ. ඒ කියන්නේ, අපි යෝජනා කරන විසඳුම්වලදී, දේශපාලනඥයන් මත යැපිලා තමයි ඔය ගොල්ලන්ගේ ජීවිත ගොඩ ගන්නේ කියන එකයි අපි ජනතාවට කියන්නේ. ඇත්ත වශයෙන්ම අපට පිළිගන්න වෙනවා, ආර්ථිකය තිබෙන්නේ මේ අය වැය ඇතුළේ නොවෙයි, මේ අය වැයෙන් එළියේයි කියන එක. ඒකට පාර්ලිමේන්තුවවත්, අපිවත්

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

හවුල් වෙන්නේ නැහැ. මේ රටේ ජනතාවත් හවුල් වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවට ඒ යෝජනා එන්නෙත් නැහැ; ඒවා විවාද කරන්නෙත් නැහැ; අපි අධීක්ෂණයට ගන්නෙත් නැහැ. අපි මහ ලොකුවට මෙතැන ඉඳගෙන කථා කරනවා. මාධ්‍ය මේ ඔක්කෝම ආවරණය කරනවා. පර්යේෂකයන් මේක ගැන දැන් පිටු ගණන් ලියයි; think tanks විසින් policy papers දමයි. නමුත් ඇත්ත ආර්ථිකය සිද්ධ වෙන්නේ මේකෙන් පිට. ඒවා අපි කවුරුවත් දන්නේ නැති agreements. රටේ සම්පත් විකුණන එක ගැන මේ අය වැයේ කොහේවත් නැහැ. ගහන agreements ගැන මේ අය වැයේ කොහේවත් නැහැ. අන්තිමට අපට තේරුම් ගන්න වෙන්නේ පාර්ලිමේන්තුවටත්, ජනතාවටත් ඉදිරිපත් වෙන්නේ දේශපාලන වශයෙන් පක්ෂ, විපක්ෂ අපි සියලු දෙනාගේම ඡන්ද ව්‍යාපාරයට අවශ්‍ය Budget එකක් මිසක් ඇත්ත Budget එක නොවෙයි කියන කාරණයයි.

හැම අවුරුද්දේම සිද්ධවෙලා තිබෙන්නේ ඒකයි. මේ අවුරුද්දේත් ඒක තමයි සිද්ධවෙලා තිබෙන්නේ. අවසානයේදී අපට අහන්න වෙන්නේ, මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ අපේ ආර්ථික ප්‍රතිපත්තිවලද, අපේ දේශපාලනයේද, අපේ දේශපාලන ක්‍රමයේද, අපි බලය ලබා ගන්න කරන දේශපාලනයේද කියලායි. අපි බලය ලබා ගන්න කරන දේශපාලනය සඳහා අය වැයත්, සහනාධාරත් පාවිච්චි කරනවා නම්, වෙනස් විය යුත්තේ අපේ ආර්ථිකයටත් වඩා අපේ දේශපාලන සංස්කෘතියයි. දේශපාලන සංස්කෘතියේ එවැනි තීරණාත්මක වෙනසක් නැතිව, ඒ කියන්නේ අපි බලය ලබා ගැනීමට, බලය අල්ලා ගැනීමට ක්‍රියාත්මක වන විධියේ වෙනසක් නැතිව අප මුහුණ දෙන ආර්ථික ප්‍රශ්නවලට කවදාවත් මෙවැනි අය වැයවලින් නම් විසඳුම් බලාපොරොත්තු වෙන්න බැහැ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) Ramesh Pathirana. You have 15 minutes.

[අ.භා. 1.56]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்ட அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටත්, ලෝකයත් මෑත ඉතිහාසයේ ඉතාම අපහසු කාල සීමාවක් පසු කරමින් සිටින මොහොතක සමබර අය වැය ලේඛනයක් ඉදිරිපත් කරමින් රටට නැවත ආර්ථික පුනර්ජීවනය උදා කර දෙන්න මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් ගන්නා ලද ධෛර්යය පිළිබඳව සහ මෙම අය වැය ඉතාම සමබරව ඉදිරිපත් කිරීම පිළිබඳව මුලින්ම එතුමාට අපේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

මට පෙර කථා කළ අපේ ගරු ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය ඉදිරිපත් කළ කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මම කථා කරන්න ඕනෑ. අපහසුතා මැද වුවත් අපේ රජය අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් මෑත ඉතිහාසයේ වැඩිම මුදලක් මේ අය වැය තුළින් වෙන් කර තිබෙනවා. අවුරුදු 23ක් පැරණි ගුරු-විදුහල්පති වැටුප් විෂමතා ඉවත් කරන්න රුපියල් බිලියන 30ක ඓතිහාසික මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ වැදගත් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. මේ වසරේ පමණක් විශ්වවිද්‍යාලවලට අලුතින් බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය 10,000කින් වැඩි කර තිබෙනවා. සමස්තය තිබුණේ 31,000ක ප්‍රමාණයක්. අපි ඒ ප්‍රමාණය 41,000 දක්වා වැඩි කර තිබෙනවා. වැඩිපුර වෛද්‍ය සිසුන් 600කට ආසන්න පිරිසක් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නවා. අපි විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කර දියුණු කරන්න කටයුතු කරමින් තිබෙනවා. "පුරවර විශ්වවිද්‍යාල" වැඩසටහන ආරම්භ කර තිබෙනවා. මේ රටේ විශ්වවිද්‍යාලයක් නැති සෑම දිස්ත්‍රික්කයකම අලුතින් විශ්වවිද්‍යාලයක් ඇති කරන්න කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි, අපි මේ රටේ අලුත් පාඨමාලා ගණනාවක් ආරම්භ කරන්න කටයුතු කර තිබෙනවා. මේ රටේ ගුරුවරුන්ට අධ්‍යාපනය ලබා දෙන්න ගුරු විශ්වවිද්‍යාල ඇති කරන්නත් තීන්දු කරලා තිබෙනවා. මේ රටේ හෙද පාඨමාලා හැදෑරීම සඳහා හෙද විශ්වවිද්‍යාල ඇති කරන්න කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපහසුතා මැද වුවත් අධ්‍යාපනය වෙනුවෙන් මෑත ඉතිහාසයේ සුවිසල් ආයෝජනයක් කිරීම පිළිබඳව අපේ ගෞරවනීය ස්තුතිය ගරු මුදල් ඇමතිතුමාටත්, ගරු ජනාධිපතිතුමාටත් පුද කර සිටිනවා.

ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය කාන්තා අයිතිවාසිකම් පිළිබඳවත් කථා කළා. කාන්තා අයිතිවාසිකම්, ඔවුන්ගේ පෝෂණ තත්ත්වයන් පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්න ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය කාලයේ සිට විශාල කැප කිරීමක් කරලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට මේ රටේ මාතෘ මරණ අඩුවෙලා, ළදරු මරණ අඩුවෙලා, ඔවුන්ගේ පෝෂණ මට්ටම ක්‍රමානුකූලව ගොඩ නැඟෙමින් තිබෙනවාය කියන කාරණය මම එතුමියට මතක් කරන්න කැමැතියි. එයට උදව්වක් හැටියට, ගැබිනි මාතාවන්ට දැනට මාස 10කට පමණක් ලබා දෙන පෝෂණ මල්ල මාස 24ක කාලයක් සඳහා -ප්‍රසූතියෙන් පසුවත්- ලබා දෙන්න මෙවර අය වැයෙන් ගරු මුදල් ඇමතිතුමා යෝජනා කර තිබෙනවා. ආර්ථිකමය වශයෙන් ඉතාම අපහසු කාල සීමාවේ අපට පුළුවන් උපරිමයෙන් මෙරට ජනතාවගේ දුක් කඳුළු පිසලන්නට රජය හැටියට කරන්න පුළුවන් සියල්ල කරනවාය කියන කාරණය මා ඉතාම ගෞරවයෙන් මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අපහසු කාල සීමාවේ ජනතාවගේ පැත්තෙන් හිතලා රජය කටයුතු කරන්නේ කැප කිරීමක් කරලායි. ඒ කැප කිරීමේ ආදර්ශය ජනාධිපතිතුමා එතුමාගෙන් දීලා තිබෙනවා. එතුමාගේ වාර්ෂික කාර්යාල වියදම් රුපියල් බිලියන තුනකට අධික මුදලකින් අඩු කර තිබෙනවා. නිල නිවාස ලබාගන්නේ නැතුව, අලුතින් නිල වාහන ලබා ගන්නේ නැතුව ඉතාම ආදර්ශවත් විධියට එතුමා කටයුතු කරනවා. හදිසියෙන් යන විදේශ සංචාරවලදී පවා උපරිම කැප කිරීම් කරලා වියදම් අඩු කරලා තිබෙනවා. ඒ ආදර්ශය මැති ඇමතිවරුනුත් ගන්නවා. අපිත් විදේශ සංචාර සඳහා, නිල නිවාස සඳහා, නිල වාහන සඳහා අනවශ්‍ය වියදම් කිසිවක් කරලා නැහැ. අපි ඒ කාර්යය සද්භාවයෙන් කරන්නේ, මේ රටේ ජනතාව අපහසු කාල සීමාවක් පසු කරන බව දන්නා නිසායි. ඒ අපහසු කාල සීමාව මේ රටේ ජනතාවට විතරක් අදාළ එකක් නොවෙයි. ලෝකයේ සෑම රටකම ජනතාවට විශාල අපහසුකම් දරා ගන්න සිදුවෙලා තිබෙනවා. ලෝකයේ නිෂ්පාදන දාම බිඳ වැටී තිබෙනවා, නිෂ්පාදන බිඳ වැටී තිබෙනවා. හැබැයි ඒ අර්බුදය අපට යම් පමණකට වැඩිපුර දැනෙන්න හේතුවක් තිබෙනවා. ඒකට හේතුව තමයි, දීර්ඝ කාලයක් තිස්සේ ගොඩ නැඟුණු වෙළෙඳ ශේෂයක් තිබීම. මේ රටේ වෙළෙඳ ශේෂය අඩු කරන්න පසුගිය කාලය පුරාම විවිධ රජයන් කටයුතු කළත්, ඒවා සාර්ථකවෙලා තිබුණේ නැහැ.

නමුත්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය බලයට පත් වෙච්ච සැණින් මේ රටේ වගා කරන්න පුළුවන් දේ මේ රටේ වගා කරන්න, මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේ මේ රටේ නිෂ්පාදනය කරන්න, මේ රටේ නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කරන්න අවශ්‍ය ධෛර්යය දුන්නා. ඒක මේ අය වැයෙන් තවත් මූර්තිමත් කරලා, ශක්තිමත් කරලා තිබෙනවා.

ඔබතුමන්ලාට මතක ඇති, වර්ෂ 2015න් ආරම්භ වෙච්ච ආණ්ඩුව පැවැති වකවානුවේ මේ රටට කරදමුංගු, කරාබු නැටි, ගම්මිරිස්, සාදික්කා, වසාවාසි ආදි සියල්ල පිට රටින් ගෙන්නූ බව. අපි ඒක නැවැත්වූවා; මේ රටේ වවන්න පුළුවන් සෑම දෙයක්ම වවන්න පටන් ගත්තා. එදා මේ රටට කුඩය, කොඩිය, පැන, පැන්සල විතරක් නොවෙයි, වෙසක් කූඩුවත් පිට රටින් ගෙනාවේ. අපි ඒක නැවැත්වූවා. එහෙම කරපු නිසා අපට පුළුවන් වුණා ඉතිහාසයේ ප්‍රථම වතාවට 2019 වර්ෂයේදී මේ රටේ ආනයන වියදම ඩොලර් බිලියන 16 දක්වා අඩු කරන්න. 2015 ඉඳලා ඩොලර් බිලයන 20, 18, 19, 16, 17 ලෙස තිබුණු ආනයන වියදම තමයි අපි ආසන්න වශයෙන් ඩොලර් බිලියන 4කින් අඩු කළේ. ඒ අතරේ අපි අපේ රටේ අපනයනය උපරිමයෙන් වර්ධනය කරන්න කටයුතු කළා. එහි ප්‍රතිඵල අපට මේ අවුරුද්දේත් ලැබෙමින් තිබෙනවා. ඒ වෙනුවෙන් අප ස්තුති කරන්න ඕනෑ පිරිසක් ඉන්නවා. පසුගිය වසරේ අවස්ථා ගණනාවකදී රට වසා තිබියදී විවිධ බාධක මැද මේ රටේ කර්මාන්තකරුවෝ වැඩ කළා. මේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රයේ අය අඛණ්ඩව වැඩ කළා. මේ රටේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය, ධීවර ක්ෂේත්‍රය හා අනෙකුත් නිෂ්පාදන අංශවල ජනතාව වැඩ කළා. ඒ අය පුළුවන් උපරිමයෙන් වැඩ කරලා, අපනයනය කරලා මේ රටට පසු ගිය අවුරුද්දේ ඩොලර් බිලියන 10ක් සොයා දුන්නා. මෑත ඉතිහාසයේ අපේ ආනයන හා අපනයන වෙනස අඩුම වෙලා තිබුණේ 2020 වසරේදී. එය ඩොලර් බිලියන 6 යි. අපි විශ්වාස කරනවා, මේ අවුරුද්දේ එතැනින් එහාටත් අපට යන්න පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ක්ෂේත්‍ර ගණනාවක නිෂ්පාදනය අද වැඩි වෙමින් තිබෙනවා. ඒක සතුටට කාරණයක්. ඒ නිෂ්පාදනවලට දායකත්වය ලබාදෙන මේ රටේ පෞද්ගලික, රාජ්‍ය අංශවල සියලුදෙනාට අපේ ගෞරවය පුද කරන්නට මා කැමැතියි. ඔවුන් තමුන්ගේ ශක්තියෙන් රටට ශක්තිය දෙන්න වැඩ කරනවා. ඒ අයට ශක්තිය දෙන්න අපේ රජය අනිවාර්යයෙන් කටයුතු කරන බව මා සිහිපත් කරනවා.

උදය වරුවේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කියනවා අපි දැක්කා, අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ, වැවිලි ක්ෂේත්‍රයේ කඩා වැටීමක් පිළිබඳව. නැහැ, කිසිම කඩා වැටීමක් නැහැ. අපේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම ගිය අවුරුද්දටත් වඩා හොඳින් වැඩ කටයුතු කෙරෙනවා. ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම අපට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලැබෙන්නේ 2021 වසරේදී බව මම ඉතා සතුටින් ඔබතුමාට සඳහන් කරනවා. අපේ රබර් අපනයන ආදායම ඉතිහාසයේ ඉහළම අගයට ළඟා වනවා. අපට මේ අවුරුද්දේ ඩොලර් බිලියනයක් ලැබෙයි. අපේ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල අපනයන ආදායම ඉතිහාසයේ වැඩිම අගයකට ළඟා වෙමින් තිබෙනවා. අපට අඩු ගානේ ඩොලර් මිලියන 900ක් ලැබෙයි. අපේ තේ වල ආදායම වැඩි නොවුණාට, අඩුවක් වෙලා නැහැ. බොහොම පැහැදිලිව ඩොලර් බිලියන 1.3 - 1.4 අතර ප්‍රමාණයක් ලැබෙනවා. කුරුඳු ඇතුළු අපනයන භෝගවල අපනයන ආදායම ඉතිහාසයේ වැඩිම අගය වාර්තා කරන්නේ මේ අවුරුද්දේ. සමස්තයක් හැටියට ගත්තාම, අපට ඩොලර් බිලියන 4ක ඉලක්කයකට යන්න පුළුවන් වෙයි. අපේ අරමුණ තමයි ඉදිරි වසර දෙක තුන තුළ වැවිලි ක්ෂේත්‍රයෙන් අප උපයන අපනයන ආදායම ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීම.

ඒකට විශාල ශක්තියක් මේ රටේ කෘෂි කර්මාන්තය ගැන, වැවිලි කර්මාන්තය ගැන හැඟීමෙන් කටයුතු කරන අපේ ආණ්ඩුවේ මුදල් ඇමතිතුමාගෙන් ලැබිලා තිබෙනවා. ඒ නිසා තමයි මෙතෙක් ඉතිහාසයේ ලබා දුන් වැඩිම මුදල මෙවර එතුමා ලබා දුන්නේ. එතුමා රුපියල් බිලයන 15ක මුදලක් වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට ලබා දීලා තිබෙනවා. වගාව දියුණු කරන්නත්, නිෂ්පාදන ඵලදායිතාව වැඩි කරන්නත්, අගය එකතු කිරීම වැඩි කරන්නත් ඒ මුදල් වෙන් වෙලා තිබෙනවා. ඒ හරහා අපි විශ්වාස කරනවා මේ වසර අවසන් වන විටත්, ලබන වසර තුළදීත් විශාල මුදලක් මේ රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන් වෙයි කියලා.

රාජ්‍ය ආයෝජනය, රජයේ සහයෝගය ලබා දෙන නිසා තමයි අපේ ආර්ථිකය නැවත නඟා සිටුවන්න පුළුවන් වෙලා තිබෙන්නේ. පසුගිය වසරේ පළමු කාර්තුවේදී මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8 ඉක්මවා ගියා. නමුත්, අවාසනාවකට වාගේ දෙවන කාර්තුවේ, තුන්වන කාර්තුවේ කොරෝනා තත්ත්වය වැඩි වීම නිසා අපට මාස එකහමාරක් රට වහලා තබන්න සිදු වුණා. ඒ නිසා අපේ නිෂ්පාදන ක්‍රියාදාමය බිඳ වැටුණා. හැබැයි, පුරෝකථනය කරන පරිදි සමස්තයක් හැටියට මේ වසර තුළ අපට අවම වශයෙන් සියයට 5.5ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ ආර්ථික වර්ධන වේගය ලබන වසරේ එතැන් සිට ඉහළ යනවා මිස -වැඩි වනවා මිස- අඩු වෙන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරමින් අවශ්‍ය ආයෝජන රජය හැටියට අපි කරලා තිබෙනවා.

අපි ලබාගත් ජයග්‍රහණ එකක්වත් සාධාරණීකරණය කරන්න, ඒවාට ස්තුති කරන්න විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කටයුතු කළේ නැහැ. කොරෝනා අර්බුදය හමුවේ අපට කොච්චර අවලාද මේ විරුද්ධ පක්ෂය නැඟුවාද? අපට එන්නත් ගේන්න බැහැ කිව්වා. අපට එම වැඩසටහන සාර්ථක කරගන්න බැහැ කිව්වා. අපි කොරෝනා මර්දනය කරන්නේ නැහැ කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා අද ලෝකයේ ඉතා ඉහළ මට්ටමින් කොරෝනා මර්දනය කරපු සුරක්ෂිත රටක් අපට හදලා දීලා තිබෙන බව. අද ලෝක සෞඛ්‍ය සංවිධානය මේ රට පිළිගන්නේ, ලෝකයේ තිබෙන රටවල් 198 අතරින් පළමු 15 අතරේ තිබෙන රටක් හැටියට. ඒක අපට විශාල ශක්තියක්; ගෞරවයක්. ඒ ගෞරවය ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා මහන්සි වෙලා වැඩ කළා. ලෝකයේ එන්නත් නිෂ්පාදනය කරන සෑම රටකින්ම ගේන්න පුළුවන් සෑම එන්නතක්ම ගෙනැල්ලා, අපේ රටේ ජනතාවට ලබා දුන්නා. ලෝකයේ තවම එක එන්නතක්වත් ලබාගෙන නැති රටවල් රාශියක් තිබෙනවා. අපි එන්නත් මාත්‍රා දෙක ලබා දුන්නා විතරක් නොවෙයි, තුන්වන මාත්‍රාවත් මේ රටේ ජනතාවට ලබා දෙනවා. නමුත් කවුරුවත් එය අගය කරලා කථා කළේ නැහැ. ඒක තමයි මේ රටේ විරුද්ධ පක්ෂයේ කටුක සත්‍යය. අපි ඒ එන්නත්කරණ කාර්යය හොඳින් කරලා තිබෙනවා. ඒක තමයි මේ රටේ සත්‍යය. අපි එතැනින් ඉදිරියට යන්නත් බලාගෙන ඉන්නවා.

මේ රටේ ජනතාවට අපෙන් අවශ්‍ය වුණේ ආරක්ෂාවේ සහතිකයයි. මේ රටේ ජනතාවට අපි එය ලබා දුන්නා. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ ආරක්ෂාව -රාජ්‍ය ආරක්ෂාව- පැත්තේ සහතිකය ජනතාවට ලබා දී තිබෙනවා විතරක් නොවෙයි, සෞඛ්‍ය ආරක්ෂාව පැත්තෙනුත් අවශ්‍ය සහතිකය මේ රටේ ජනතාවට ලබා දෙන්න කටයුතු කළා. ඒ පිළිබඳව අපට තිබෙන්නේ නිහතමානී ආඩම්බරයක්.

රජය පැත්තෙන් කරන්න අවශ්‍ය රාජ්‍ය ආයෝජන කළාට, මේ රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන් සහන සියල්ල ලබා දෙන්න

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

ලැහැස්ති වුණාට, අපේ පාලනයෙන් බැහැර වෙච්ච කරුණු කිහිපයකුත් තිබෙන බව බොහොම පැහැදිලිව කියන්න අවශ්‍යයි. ඒ අතර ප්‍රධාන කාරණය හැටියට අපි දැක්කා, පසුගිය කාලයේ රටේ සංචාරක ව්‍යාපාරය බිඳ වැටීම හරහා ඇති වෙච්ච ගැටලුව. ඒ තුළින් අපට ඩොලර් බිලියන 10ක් අහිමි වෙලා තිබෙනවා. අපේ වාගේ රටකට ඒක දරා ගන්න බැහැ. අපේ විදේශ ප්‍රේෂණ අඩු වෙලා තිබෙනවා. අපේ ශ්‍රමිකයන්ට පිට රට යන්න තිබුණු අවස්ථාව නැති වුණා. හැබැයි, මේ රටේ වාසනාවට, මේ රටේ ජනතාවගේ වාසනාවට දැන් ඒ තත්ත්වය යථාවත් වෙමින් තිබෙනවා.

අපේ සංචාරක ව්‍යාපාරය නැවත පිබිදෙමින් තිබෙනවා. ශ්‍රී ලංකාව සුරක්ෂිත රටක්, සංචාරකයන්ට ආරක්ෂිත ගමනාන්තයක්, ආරක්ෂිත තැනක් හැටියට ලෝකයේ ප්‍රචාරය වෙමින් තිබෙනවා. සංචාරකයන් නැවත මේ රටට එන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා මේ රටේ සංචාරක ව්‍යාපාරය ජීවිකාව කර ගත්, සෘජුව සහ වක්‍රව සංචාරක ව්‍යාපාරය මත යැපෙන ලක්ෂ පහකට අධික පිරිසට අනාගතය පිළිබඳව නැවත බලාපොරොත්තු ඇති වෙලා තිබෙනවා. අපේ ඩොලර් හිඟය පියවා ගැනීම පිළිබඳ යම්කිසි ධනාත්මක සිතිවිල්ලක් අපට ඇති වෙලා තිබෙනවා.

මේ අවුරුද්ද තුළ ශ්‍රමිකයන් විදේශ රැකියාවලට යවන්න අපට බැරි වුණා. අපේ ආදරණීය නංගිලා, මල්ලිලා, සහෝදර, සහෝදරියන් පිට රට ගිහිල්ලා රැකියා කරලා, විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මේ රටට එව්වා. ඒක මේ අවුරුද්දේ හරියට කරගන්න අපට බැරි වුණා. මොකද, විවිධ රටවලින් ඔවුන් භාර ගත්තේ නැහැ. දැන් නැවත ඔවුන් විදේශගත වෙලා, මේ රටට අවශ්‍ය ප්‍රේෂණ ලබා දෙන්න කටයුතු කරනවා. මේ අවුරුද්දේ දැනට 50,000කට ආසන්න පිරිසක් විදේශගත වෙලා තිබෙනවා. එම සංඛ්‍යාව ඉදිරියේදී ක්‍රමානුකූලව වැඩි වන බවට බොහොම පැහැදිලි විශ්වාසයක් අපට තිබෙනවා.

ඉදිරි මාස හතරක, පහක කාලය අපට ටිකක් අමාරු වෙයි. මොකද, සමහර ක්‍රියාදාම, සමහර කටයුතු රජයේ අධීක්ෂණයෙන් තොරයි. ඒවා ලෝකයේ කිසිම රටකට පාලනය කරන්න බැරි මට්ටමට ව්‍යාකූල වෙලා තිබෙනවා. අද චීනයේ සමහර ප්‍රාන්තවල වැඩ කරන්නේ සතියට එක දවසයි. ඔවුන්ගේ නිෂ්පාදන බිඳ වැටිලා. ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාදාමයට, නැව් ගමනාගමනයට පැහැදිලි ලෙස බාධා ඇති වෙලා. සැපයුම් දාමය අක්‍රිය වෙලා. ඒ සියල්ලට අමතරව ලෝක වෙළෙඳ පොළේ සියලු භාණ්ඩවල මිල ඉහළ ගිහිල්ලා. අද තෙල් මිල ඉහළ ගිහිල්ලා; ඖෂධ මිල ඉහළ ගිහිල්ලා; පොහොර මිල ඉහළ ගිහිල්ලා; කිරිපිටි මිල ඉහළ ගිහිල්ලා; වානේ මිල ඉහළ ගිහිල්ලා; සිමෙන්ති මිල ඉහළ ගිහිල්ලා. අපට ඒ ලෝක තත්ත්වයෙන් ගැලවෙන්න බැහැ.

ලංකාවේ දැන් භාණ්ඩ හිඟයක් ඇති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කිසිම රජයක් කැමැති නැහැ, තමන්ගේ ආණ්ඩුව තිබෙන කාලයේ භාණ්ඩ මිල වැඩි වෙනවා දකින්න. කිසිම රජයක් කැමැති නැහැ, තමන්ගේ ආණ්ඩුව තිබෙන කාලයේ ජනතාව පෝලිම්වල සිටිමින් ආණ්ඩුවට බණිනවා දකින්න. හැබැයි, අපට ඒ කටුක යථාර්ථයට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ, ඉදිරි වසරක කාලය තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වැඩි කරන්න; මේ රටේ නිපදවන්න පුළුවන් සෑම දෙයක්ම මේ රටේ නිපදවා ගන්න. අපි ජනතාවට කියනවා, "යම් කිසි අපහසුතා ප්‍රමාණයක් ඇති වෙයි, අපි ඒවා කෙටි කාලීනව විඳ දරා ගනිමු." කියලා. අපට නැවත නැඟී සිටින්න පුළුවන්. අපට නැඟී සිටින්න පුළුවන් බව ඉතිහාසය ඔප්පු කරලා තිබෙනවා.

මේ රට ඉතාම දුක්ඛිත අඩියක තිබෙන කොට, 2015දී ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාර ගෙන ත්‍රස්තවාදයෙන් අපේ රට මුදා ගත්තා විතරක් නොවෙයි, අපේ ජීවිත කාලය තුළ මේ රටේ අපි දැකපු වැඩිම සංවර්ධන වේගය ද ඇති කළා. ඒ බලාපොරොත්තුව, ඒ විශ්වාසය රටේ ජනතාව තුළ තිබෙනවා. ඒ වතාවේ ආර්ථිකය මෙහෙයවන්න උදව් කළ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු කණ්ඩායම ඒ විධියටම ශක්තිමත්ව අද කටයුතු කරනවා. ඒ සඳහා ශක්තිය ලබා දෙන්න මහජන නියෝජිතයන් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් සෑම කෙනෙකුම මේ ගමන යන්නේ කැප කිරීම් කරමින් කියන කාරණය අපි සිහිපත් කරන්න අවශ්‍යයි. කවුරුවත් තමන්ගේ පෞද්ගලික වරදාන බලාගෙන නොවෙයි කටයුතු කරන්නේ. අපි රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් ලබා දෙන්න පුළුවන් සහන ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොන අපහසුතා තිබුණත් පසුගිය රජයන් වාගේම අපේ රජයත් රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් කරලා තිබෙනවා. අපි, කාගේවත් පඩි නඩි අඩු කළේ නැහැ. අපි, කාගේවත් සහනාධාර අඩු කළේ නැහැ. වර්තමානය වන විට මේ රටේ දාහත්ලක්ෂයක් සමෘද්ධි දීමනාව ලබනවා. මේ රටේ ලක්ෂ 20කට ආසන්න පිරිසක් ආබාධිත දීමනාව ඇතුළු විවිධ දීමනා රජයෙන් ලබනවා. මේ රටේ රජයේ වැටුප් ලබන, ලක්ෂ 7කට ආසන්න විශ්‍රාමිකයන් පිරිසක් සහ ලක්ෂ 14ක රාජ්‍ය සේවකයන් පිරිසක් සහිත රාජ්‍ය සේවයක් තිබෙනවා. සමස්තයක් හැටියට ලක්ෂ 40ක පමණ පිරිසක් රජයේ සහනාධාර සහ වැටුප් ලබනවා. මේ කියන පිරිසටත් අයත් නැති, ආදායම් මාර්ග අහිමි වෙච්ච, අන්ත අසරණව සිටින පිරිසක් ඉන්නවා නම්, දැනට සිටින තැනිනුත් එහාට ගිහින් ඔවුන්ටත් සහන සලසන්න අපට අවශ්‍යයි. ඒ වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමා තවත් රුපියල් බිලියන 15ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ආර්ථික වශයෙන් අපහසු මේ කාල සීමාව තුළ ඔවුන්ටත් සහනයක් ලබා දෙන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. එම කටයුතු ජනවාරි මාසයේ සිට ආරම්භ වෙනවා.

සමහර අය චෝදනා කරනවා අපි දැක්කා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට, මහජන නියෝජිතයන්ට වෙන් කරලා තිබෙන මුදල් පිළිබඳව කියමින්. ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, මේ රටේ ග්‍රාමීය කමිටුවලින්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් යෝජනා ලබා ගෙන ජනතාවගේ ව්‍යවසායකත්වය දියුණු කරන්න, නිෂ්පාදන ආර්ථිකය වැඩි දියුණු කරන්න, මේ රටේ නිෂ්පාදනය වැඩි දියුණු කරන්න ඒ මුදල් වියදම් කිරීමට අප ක්‍රියා කරන බව.

රටක මොන හොඳ වැඩක් කරන්න හැදුවත් චෝදනා කරනවා. ඒක ඉතිහාසය පුරාම තිබෙන තත්ත්වයක්. හැබැයි, මේ මුදල් ජනගත වෙනවා කියලා අපි විශ්වාස කරනවා. ජනතාවට ඒහි ප්‍රතිලාභ ලැබෙනවා. අපට ඒක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ ජනතාවගේ ආර්ථික මට්ටම දියුණු කිරීම හරහා පමණයි. නිෂ්පාදනය වැඩි දියුණු කිරීම හරහා පමණයි ජනතාවට දැනෙන පීඩනය අඩු කරන්න පුළුවන් කියන කාරණය සෑම විටම අපි ඉතා පැහැදිලිව විශ්වාස කරනවා. ඉදිරි කාලය තුළදී මේ මුදල් රටට ලැබෙනවා වගේම, රටේ ජනතාවට එහි ප්‍රතිඵල ලැබෙනවා වාගේම, ජනතාවට තිබෙන පීඩනය, ආර්ථික බර ක්‍රමානුකූලව අඩු වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ ගමන අපට විශ්වාසයෙන් යන්න පුළුවන්. මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ ගමන ශක්තිමත්ව යන්නට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන්, මහින්ද රාජපක්ෂ අගමැතිතුමන් සමඟ මුදල් ඇමතිතුමාත්, අපේ ආණ්ඩුවත් කළ හැකි උපරිමය කරන බවත්, 2022 වසරේදී නව යුගයක් සහිත නව ශ්‍රී ලංකාවක් වෙත පිය නඟන්නට අපි බලාපොරොත්තු වන බවත් ඉතාම ගෞරවයෙන් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Dayasiri Jayasekara. You have 15 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Ajith Rajapakse to the Chair?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

Sir, I propose that the Hon. Ajith Rajapakse do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

[අ.භා. 2.12]

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැය විවාදයට එක්වෙන්නට මට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අපේ මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා එතුමාගේ පළමුවැනි අය වැය කථාව ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ රට හොඳ තත්ත්වයක නොවෙයි තිබෙන්නේ. රට විතරක් නොවෙයි ලෝකයම. "World Economic Outlook" වාර්තාවේ බොහොම පැහැදිලිව කියලා තිබෙනවා, 2021දී සියයට 5.9කට තිබුණු ලෝක ආර්ථික වර්ධන වේගය 2022දී සියයට 4.9ක් දක්වා පහළට බහිනවා කියලා. එතකොට, ලෝක තත්ත්වයත් ඒ තරම් හොඳ තැනක නොවෙයි තිබෙන්නේ. රට ඇතුළේ තිබෙන තත්ත්වය මොකක්ද? අද ඉතාම දියුණු රටවල සිට දුප්පත් රටවල් දක්වා ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. සැපයුම් මාර්ග අවහිර වෙලා තිබෙනවා. මිනිස් සම්බන්ධතා දුරස් වෙලා තිබෙනවා. මරණ බිය, රෝග බිය, අවිනිශ්චිතතාවය, අනියත බව රජ කළ කාල වකවානුවක් තමයි අපි පසු කළේ. 2020 සිට 2021 මේ දක්වා සියලු රටවල තවමත් ඒ තත්ත්වය තිබෙනවා. කොයි වේලාවක නැවත මොන විධියේ variant එකක් එයිද, වෙනත් විධියකට ඒක පැතිරෙයිද කියන බිය මුළු ලෝකයේම තිබෙනවා. ඒ නිසා ජනතාව මේ තත්ත්වයෙන් මුදා ගන්න, අනාගතයේ ජනතාවගේ අපේක්ෂා මල් ඵල ගන්වන්න, කඩා වැටුණු ආර්ථිකය ගොඩගන්න, අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ "සෞභාග්‍යයේ දැක්ම" ට අදාළ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන්න, අනාගත උපාය මාර්ග සහ ආර්ථික ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන්න මේ අය වැය තුළ විශාල අරගළයක් කරන්න මුදල් අමාත්‍යතුමාට සිදු වුණා.

පසුගිය කාල වකවානුවේ මුදල් ඇමතිවරයෙක් අය වැය ගෙනෙනකොට තිබුණු ආර්ථික අර්බුදවලට වඩා විශාල ආර්ථික අර්බුද ගණනාවක් මේ අවස්ථාවේ තිබුණා. පළමුව, මරණ භය දැනෙමින් සිටි ජනතාව එයින් ගලවාගෙන, ඔවුන්ට සමෘද්ධිමත් අනාගතයක් හදාගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ අය වැය තුළින් හදන්න ඕනෑ වෙලා තිබුණා. දෙවනුව කඩා වැටුණු ආර්ථිකය ගොඩගන්න වුවමනා වෙලා තිබුණා. තෙවනුව, අපි ගෙනාපු "සෞභාග්‍යයේ දැක්ම" තුළ මේ සියල්ල කළමනාකරණය කිරීමට එතුමාට සිද්ධ වෙලා තිබුණා. ඒ නිසා මේක අපි හැමදාම දැක්ක අය වැයවලට වඩා වෙනස් අය වැයක්. විශේෂයෙන් අපේ ශක්ති මොනවාද, අපේ දුර්වලතා මොනවාද කියලා හොඳ පැහැදිලි කිරීමක් මූලික අය වැයට පිවිසෙන්න පෙරාතුව එතුමා සිදු කළා. අපේ දැන් තත්ත්වය මොකක්ද කියලා පැහැදිලි කළා. මේ පිළිබඳ හොඳ අවබෝධයක් ඇතිව තමයි එතුමා මේ වැඩ පිළිවෙළ තුළ ඊළඟ ක්‍රියාදාමයන්ට ගියේ.

ඊළඟට, වාණිජ ආර්ථිකයක සිට නිෂ්පාදන ආර්ථිකයකට මේ රට අරගෙන යන්නේ කොහොමද කියලා එතුමා කථා කළා. දැන් අපේ රටේ තිබෙන්නේ වාණිජ ආර්ථිකයක්. අපි භාණ්ඩ ආනයනය කරනවා. ඒවා මෙහි ගෙනැවිත් කෑමට, බීමට පාවිච්චි කරනවා. පුළුවන් තරම් පිටරට බඩු ලංකාවට ගෙනෙනවා. අපි පසුගිය අවුරුදු ගණනාවේම අපනයන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයන්න වැඩ පිළිවෙළක් හැදුවේ නැහැ.

මුදල් ඇමතිතුමා එක පැත්තකින් මේ ප්‍රශ්නවලට විසඳුම් සොයනවා වගේම, වාණිජ ආර්ථිකයක සිට නිෂ්පාදන ආර්ථිකයක් දක්වා යන වැඩ පිළිවෙළකට මූලික පදනම මේ ක්‍රියාදාමය තුළ ඇති කරලා තිබෙනවා. විනිමය හිඟය නිසා භාණ්ඩ හිඟ වීම, මිල ඉහළ යෑම, සංචාරක ව්‍යාපාරයේ බිඳ වැටීම, ප්‍රේෂණ පහළ යෑම, විදේශ ආයෝජන පහළ යෑම ඇතුළු බිඳ වැටීම් ගණනාවකට එතුමා මේ ක්‍රියාවලිය තුළ විසඳුම් ගණනාවක් සකස් කරලා තිබෙනවා.

අපේ ගම්වල තැඹිලි විකුණන, බුලත් විට විකුණන පුද්ගලයාගේ ඉඳලා, පාසල් වෑන් රථ හිමිකරුවන්, පෞද්ගලික බස් රථ හිමියන්, ත්‍රී විලර් රියැදුරන්, කඩා වැටුණු ආර්ථිකය තුළ කලාකරුවන්ට, නිර්මාණකරුවන්ට අත් වුණු ඉරණම පිළිබඳව, උත්සව සංවිධානය කරන අයට අත් වෙලා තිබෙන ඉරණම පිළිබඳව කල්පනා කරලා, ඒ වැටුණු මිනිසුන් නැවත ගොඩ ගන්න අවශ්‍ය කටයුතු කරන්නේ කොහොමද කියලා කල්පනා කරලා, ඒ අයට අවශ්‍ය මුදල් ටික තමයි ගරු මුදල් අමාත්‍යතුමා එක එක ප්‍රමාණවලින් මේ වෙන් කරලා තිබෙන්නේ.

විපක්ෂය අහන්න පුළුවන්, අපට මොනවාද මේකෙන් හම්බ වුණේ කියලා. අය වැයකින් රටේ සමස්ත කොටස් සියල්ලට ප්‍රතිලාභ දෙන්න පුළුවන් නම්, නත්තල් සීයා ගෙනැල්ලා දෙනවා වාගේ දෙන්න පුළුවන් නම් හොඳයි. නමුත් තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. කඩා වැටුණු ආර්ථිකයක් තුළ ඉතාම දරුණුවට නාය ගිය පිරිස් ටික අපි බේරා ගන්නේ කොහොමද? මේ සඳහා තමයි එතුමා ඊළඟ වැඩ පිළිවෙළ සකස් කළේ.

ඊළඟට, මූල්‍ය විනය ගැන මම කියන්න කැමැතියි. ලංකාවේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මූල්‍ය විනය බරපතළ ලෙස කඩා වැටීම. ගරු මුදල් ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් ගත යුතු වැඩ පිළිවෙළ රාශියක් ගැන කථා කළා. රජයේ නව කාර්යාල ගොඩනැඟිලි ඉදි කිරීම අත්හිටුවන්න එතුමා යෝජනා කළා. ඒ විතරක් නොවෙයි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවලට කිව්වා, නැවත අතිරේක ප්‍රතිපාදන ඉල්ලන්න එපා කියලා. කැබිනට් මණ්ඩලයට විතරක් නොවෙයි, රාජ්‍ය අමාත්‍යවරුන් ඇතුළු සියලුදෙනාටත් පැහැදිලිව උපදෙස් දීලා තිබෙනවා, ආපහු සල්ලි ඉල්ලන්න එපා; පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්න එපා; අලුත් ගොඩනැඟිලි හදන්න කථා කරන්න එපා කියලා. මොකද හේතුව? අද මේවා අනවශ්‍ය වියදම් බවට පත්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වෙලා තිබෙනවා. ලංකාවේ ඕනෑ තරම් පාච්චියට නොගත් ගොඩනැඟිලි තිබෙනවා. ඉතිහාසයේ දවස ගාණේ ගොඩනැඟිලි හදන සංස්කෘතියක් බිහි වෙලා තිබුණා. ඒක එතුමා නතර කරලා තිබෙනවා.

ඊළඟට, රාජ්‍ය සේවයට බඳවා ගැනීම සීමා කරලා තිබෙනවා. මම දැක්කා, මේ දවස්වල ගරු මුදල් ඇමතිතුමා කළ ප්‍රකාශයක් විවේචනය කරමින් එතුමාට පහර ගහන හැටි. එතුමා කියලා තිබෙන්නේ රාජ්‍ය සේවය රටට බරක් කියලා නොවෙයි. ලක්ෂ 15ක් වන රජයේ සේවකයන්ගේ වේතනවලට විශාල මුදලක් වැය වෙනවා. රාජ්‍ය වියදමින් සියයට 34කට වැඩි ප්‍රමාණයක් අපි මේ රටේ වේතනවලට ගෙවනවා. රාජ්‍ය සේවකයෝ බරක් කියන එක නොවෙයි එතුමා ඒකෙන් අදහස් කළේ. එතුමා අදහස් කළේ, මේ වියදම රටට විශාල බරක් වෙලා තිබෙනවා කියන එකයි. ඇත්ත වශයෙන්ම රාජ්‍ය සේවකයන් ප්‍රමාණය යම්කිසි ප්‍රමාණයකට සීමා කර ගැනීම අත්‍යවශ්‍ය බව එතුමා පැහැදිලිව සඳහන් කළා. ඒක නොයෙක් අය නොයෙක් විධියට අර්ථ කථනය කරමින් විවේචනය කිරීම ගැන අපි කනගාටු වෙනවා.

ඊළඟට, මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප ලබා ගත හැකි කාල සීමාව අවුරුදු 05 සිට අවුරුදු 10 දක්වා කල් දැමීමේ යෝජනාව ගැනත් මම යමක් කිව යුතුයි. ඇත්ත වශයෙන්ම ඒක ඉතාම හොඳ යෝජනාවක්. ඒ විධියට තමන්ගේ පිරිසත් තරහ කරගන්නා යෝජනා ඉදිරිපත් කරමින් තමයි එතුමා මේ අය වැය සකස් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට සමාජ සුබ සාධනය සම්බන්ධව කථා කළොත්, ගැබිනි මව්වරුන් සඳහා සහන මල්ල නැවත හඳුන්වා දෙමින්, එය මාස 24ක් දක්වා දීර්ඝව ලබා දෙන වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දිළිඳු අයට සහන මල්ලක් ලබාදීමේ ක්‍රියාවලිය, විශ්‍රාම වැටුප, සමෘද්ධිය, වැඩිහිටි දීමනාව ඇතුළු මේ සියල්ල ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යන්නට මේ අය වැයෙන් රුපියල් කෝටි 60,000ක් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දියුණු නිෂ්පාදන ආර්ථිකයකට යන්නේ කොහොමද? එතුමා කල්පනා කරලා තිබෙන කාරණය තමයි එක පැත්තකින් කාර්මික ජනපද ඇති කිරීම. කාර්මික ජනපදවල යටිතල පහසුකම් ටික හදලා දුන්නා නම් මිනිස්සු කාර්මික ජනපදවල ආයෝජනය කරන්න එනවා. අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය මොකක්ද? එක පැත්තකින් අද ඉඩම් සොයා ගන්නට බැහැ. ඉඩම් සොයා ගත්තත් ඒකට යන මාර්ගය හදා ගන්න බැහැ. විදුලිය ඇතුළු අනෙක් අවශ්‍යතා ටික සපුරා ගන්න තැන් තැන්වලට යන්න සිදුවෙලා තිබෙනවා. එතුමාගේ අය වැය කථාවේදී කිව්වා වාගේ මේ රටේ කර්මාන්තයක් ආරම්භ කරන්න හදන කෙනෙකුට ඒ අවශ්‍ය කටයුතු ටික කර ගැනීම සඳහා ආයතන 16කට, 17කට විතර යන්න සිදුවෙලා තිබෙනවා. මේ රටේ ව්‍යවසායකයන්ට අලුත් මාර්ග සොයා ගන්න විධියක් නැහැ, ආණ්ඩුවෙන් සහයෝගයක් තිබුණේ නැහැ. මේ සඳහා නිසි ක්‍රියාදාමයක් ඇති කරන්න තමයි එතුමා මේ වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ. එක ස්ථානයකින් ඒ සියලු කටයුතු කර ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදන්න ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. නැත්නම්, පරිසර බලපත්‍රය ගන්නට එක තැනකට, විදුලිය ගන්න තව තැනකට, මාර්ගය හදා ගන්න තව තැනකට යන්නට ව්‍යාපාරිකයන්ට සිදු වනවා. ඒ රස්තියාදු වීම අඩු කරලා, දියුණු නිෂ්පාදන ආර්ථිකයක් හදන වැඩ පිළිවෙළකට අවශ්‍ය ප්‍රතිපාදන එතුමා දීලා තිබෙනවා. ඒ වාගේම දියුණු නිෂ්පාදන ආර්ථිකයක් කරා යන්න පුළුවන් ඉලක්ක ගත තැන් ලෙස කෘෂි කාර්මික අංශය, ධීවර අංශය, වැවිලි, සුළු අපනයන භෝග අංශය සහ සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන පිළිබඳව කල්පනා කරලා තමයි එතුමා ඒ සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළක් මේ අය වැයෙන් හදලා දීලා තිබෙන්නේ.

මේ සියලු කටයුතු අතරේ අපි ග්‍රාමීය සංවර්ධනය අතහැර දාලා නැහැ. එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයකට රුපියල් ලක්ෂ 30 ගණනේ දෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ද, යූඑන්පී ද, ජේවීපී ද, පොදු ජන පෙරමුණ ද, ටීඑන්ඒ ද කියලා ඒ මොනවත් බලන්නේ නැතිව සෑම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුටම ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මේ හැම කෙනෙකුම තමන්ගේ කොට්ඨාසය ජයග්‍රහණය කළා නම්, ඒ මන්ත්‍රීවරයාට රුපියල් ලක්ෂ 40ක මුදලක් ලබා දීලා තිබෙනවා. ඒ, එතුමාගේ ක්‍රියාකාරකම්වලට සහ එතුමාගේ ගම් ප්‍රදේශ දියුණු කරගන්නයි.

ඒ විතරක් නොවෙයි. ඊට අමතරව හැම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම -ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,021ටම- රුපියල් ලක්ෂ 30 බැගින් ලබා දීලා තිබෙනවා. ඒ සියල්ල මන්ත්‍රීවරුන්ට දීලා තිබෙන්නේ පෞද්ගලිකව ගත් එක එක්කෙනාගේ කොන්ත්‍රාත් කරන්න නොවෙයි. මම දැක්කා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, මේ මුදල් දීලා තිබෙන්නේ හොරකම් කරන්න කියලා. ඒක එහෙම නොවෙයි. ගම් ඇතුළේ තිබුණු ගම් සභා, ජන සභාවලින් තමයි මේ යෝජනා තේරුවේ. ගමට මොනවාද ඕනෑ කියන එක ගැන අපි බොහොම පැහැදිලිව කථා කළා. ඒකට ආවේ ඒ ගමේ ඉන්න මිනිස්සු. ඒ මිනිස්සු ඇවිල්ලා තමයි මේ දේවල් තේරුවේ. එහෙම තෝරා ඉවර වුණාට පස්සේ ඒ යෝජනා අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළාම ඒ කමිටුවෙන් ඒක අනුමත කළා. එක් එක් පුද්ගලයාට වුවමනා දේවල් නොවෙයි එහි තිබුණේ. එම නිසා ගමේ ජනතාවගේ යෝජනා ඉදිරියට ගෙන යන්න ග්‍රාමීය මට්ටමින් විශාල වැඩ පිළිවෙළක් අපි මේ තුළ සකස් කර තිබෙනවා. අපට මතකයි, පසුගිය 2015-2019 අවසාන කාලයේ ගෙනා 'ගම්පෙරළිය' වැඩසටහනත් මේ වාගේමයි. ඒකටත් මේ වාගේම මුදල් දුන්නා. මුදල් නොදී හිටියේ නැහැ. එදා අපිත් මෙවැනි වැඩ පිළිවෙළක් තමයි සකස් කර තිබුණේ.

ඒ විතරක් නොවෙයි. මුළු දිස්ත්‍රික්කයකටම වැඩ කරන්න මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල විධියට ලැබුණේ රුපියල් ලක්ෂ 100යි. අපි දන්නවා, ඒ කාලයේ අපි ඒ මුදල බෙදුවේ කොහොමද කියලා. අපට ඒ වැඩ කටයුතු හරියට කර ගන්න විධියක් නැහැ. ඒකෙන් දිස්ත්‍රික්කයේ සමහර ආසනවලට මොකුත්ම ආධාරයක් දෙන්න බැහැ. සමහර ආසනවලට දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ රුපියල් 50,000යි, රුපියල් 100,000යි. ඒ මුදලින් පුටු ගන්නවා, හට් ගන්නවා. මේ ක්‍රියාවලිය අන්තිමට ඒ විධියට ද්‍රව්‍ය බෙදන තැනකට ගියා. අද මන්ත්‍රීවරයකුට රුපියල් ලක්ෂ 100ක් අරගෙන ගිහිල්ලා දෙන්න පුළුවන් දෙයක් නැහැ. ඒ නිසා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඒ මුදල රුපියල් ලක්ෂ 150 දක්වා වැඩි කළා. මම ඒකට එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම, පානීය ජලය, මාර්ග සංවර්ධනය, සෑම ගමකටම නිවාස හදන වැඩ පිළිවෙළ, කාන්තාවන්ගේ ව්‍යවසාය සංවර්ධනයට මුදල් ලබා දීම ආදී සහන ගැන බලන්න. අපේ හරිනි අමරසූරිය මැතිනිය කිව්වා, කාන්තාවන්ට දීලා තියෙන්නේ සියයට 0.9යි -සියයට 1කට අඩුයි- කියලා. ඒ මුදල දුන්නේ කාන්තාවන්ට. ඒ කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට දීලා තිබෙන ප්‍රමාණය. හැබැයි, මට දීලා තිබෙන රුපියල් මිලියන 1,000 කාටද මම වියදම් කරන්නේ? පිරිමින්ටද? ඒ මුදල වැය කරන්නේත් කාන්තාවන්ට. කාන්තාවන්ගේ ව්‍යවසාය සංවර්ධනය සඳහා බතික් ගම්මාන ඇති කරන්න, පේෂකර්ම ගම්මාන ඇති කරන්න, කුඩා කුඩා ඇඟලුම් කර්මාන්තශාලා හදන්න තමයි ඒ මුදල වැය

කරන්නේ. ඒවායේ වැඩ කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, ග්‍රාමීය කාන්තාවන්. ඒ ග්‍රාමීය කාන්තාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කරන තැනකට තමයි අපි මේ ක්‍රියාවලිය ගෙනැල්ලා තිබෙන්නේ. කාන්තාවන්ට නිකම් මුදල් දෙන එක නොවෙයි අපි ක්‍රියාත්මක කර තිබෙන්නේ. මම හිතනවා, ඒ මන්ත්‍රීතුමිය ගෙනා යෝජනාව හොඳ යෝජනාවක් කියලා. කාන්තාවන් ණය ගන්න ආයතන 7යි තියෙන්නේ කියලා එතුමිය කිව්වා. අනාගතයේදී විෂය භාර රාජ්‍ය ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා මීට අදාළ ඉදිරි ක්‍රියා මාර්ග ටික අපට ගන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. ඊළඟට බලන්න, ආදායම් බදුවල තත්ත්වය. 2021 වර්ෂයේ මුළු ආදායම් බදු ප්‍රමාණය රුපියල් බිලියන 1,325යි. 2022 වර්ෂයේ එය රුපියල් බිලියන 1,987 දක්වා රුපියල් බිලියන 662කින් වැඩි කර ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. ආදායම් බදු රුපියල් බිලියන 662කින් වැඩි කර ගන්න විශාල වැඩ කොටසක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා.

2015දී රවි කරුණානායක මැතිතුමා Super Gains Tax එක පැනෙව්වා. හැබැයි, පනත ගෙනාවේ නැහැ. පනත ගේන්නේ නැතුව ඒක හකුළා දමා නිකම් හිටියා. හැබැයි, අපි මේ ක්‍රියාදාමය තුළ රුපියල් මිලියන 2,000කට වැඩි ආදායම් ලබා ගත් කොම්පැනිවලින් මේ මුදල උපයා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. බැංකු, රක්ෂණ ආයතන ඇතුළු මූල්‍ය සමාගම්වලිනුත් විශාල මුදලක් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, පසුගිය කාල වකවානුවේ ඔවුන් තමයි වැඩිම ආදායමක් ලබා ගත්තේ. මම උදාහරණයක් විධියට කිව්වොත්, ලංකා බැංකුව පමණක් රුපියල් බිලියන 35ක විතර ලාභයක් ලබාගෙන තිබුණා. එම නිසා ආණ්ඩුවේ බැංකුවක් වුණත් කමක් නැහැ, ඒ අයගෙන් යම් මුදල් ප්‍රමාණයක් අරගෙන එය කෙළින්ම රටේ ආදායම් මාර්ගවලට යොදන වැඩ පිළිවෙළක් තමයි සකස් කර තිබෙන්නේ. යම්කිසි විධියකට කුඩා කර්මාන්තවලට නැත්නම් කුඩා පුද්ගලයන්ට මේ භාණ්ඩ හා සේවා බද්ද තුළ යම් ප්‍රමාණයක බර පැටවීමක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, අද අපට තිබෙන ප්‍රධානම අභියෝගය තමයි, ලංකාවේ ආදායම් මාර්ග සියයට 9.1කට අඩු වෙලා තිබෙන එක. 1950ත්, 1999ත් අතර කාලය තුළ මේ ප්‍රමාණය තිබුණේ සියයට 28.3ක, 28.4ක. අද ඒක කඩා වැටිලා තිබෙනවා.

අපේ ඊළඟ ඉලක්කය - target එක - මොකක්ද? ඒ අපනයන ප්‍රමාණය වැඩි කර ගැනීමයි. අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 20ක් ආනයනය සඳහා වියදම් කරනකොට, අපට අපනයනයෙන් ලැබෙන්නේ ඩොලර් බිලියන 10යි. එම ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා අපි කවදාවත් වැඩ පිළිවෙළක් සකස් කළේ නැහැ. හැබැයි, අවුරුදු ගණනාවකට පස්සේ -පසුගිය අවුරුදු 10 තුළ- පළමුවැනි වතාවට මේ සැප්තැම්බර් මාසයේ තමයි මාසයක් තුළ අපි වැඩිම අපනයන ආදායමක් ගත්තේ. ගරු මුදල් ඇමතිතුමා ඊට සාක්ෂි දරනවා ඇති. මේ ක්‍රියාදාමය තුළ අපනයන ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් අපි දකිනවා. මම දැකපු හොඳම කාරණය තමයි, එතුමා පසුගිය කාල වකවානුව පුරා අපනයනයට සම්බන්ධ සමාගම් ගෙන්වා, අපනයනයට සම්බන්ධ කණ්ඩායම් ගෙන්වා සාකච්ඡා කිරීම. ධීවර වෙන්න පුළුවන්, ඇඟලුම් වෙන්න පුළුවන්, සුළු අපනයන බෝග වෙන්න පුළුවන්, තේ සහ අනෙකුත් දේවල් වෙන්න පුළුවන්, ඒ අදාළ ක්ෂේත්‍ර ටික හඳුනාගෙන, ඒවාට සම්බන්ධ සියලු අය ගෙන්වා කථා කරමින් ඉලක්කගතව අපනයනය ඉදිරියට තල්ලු කරන්න තමයි අපි මේ වැඩ පිළිවෙළ සකස් කළේ. එම නිසා අපි මෙතැනදී මොන කථා කිව්වත් වැඩක් නැහැ, අපි අපේ ආදායම් මාර්ග වැඩි කර ගත්තේ නැත්නම්. අපේ මූලික පරමාර්ථය විය යුත්තේ එයයි. පළමුව, ආදායම් බදුවලින් රටේ ආදායම වර්ධනය කිරීම. දෙවනුව, අපනයන ආදායම වැඩි කර ගැනීම. අපනයන ආදායම වැඩි කර ගත්තොත් අපට දැන් තිබෙන ඩොලර් හිඟයට මුහුණ දෙන්න පුළුවන්. මේවා තමයි මූලික වශයෙන් ඉදිරිපත් කළ යුතු කාරණා විධියට මා දකින්නේ.

මට ලැබී තිබෙන කාලයේ සීමාසහිතභාවය නිසා මගේ කථාව ඉක්මනින් අවසන් කරනවා. විශේෂයෙන්ම 2022 වර්ෂය ඉතාම හොඳ වර්ෂයක් බවට පත් කර ගන්න තමයි අපි බලන්නේ. එක පැත්තකින් ආණ්ඩුවේ අධික වියදම් අඩු කරන ගමන් අපනයන දිරිගැන්වීම් කිරීම සහ ආනයන වියදම අඩු කර ගැනීම අවශ්‍යයි. ඒ වාගේම, පුළුවන් තරම් දේශීය නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කරගෙන, එවැනි ක්‍රියාදාම තුළින් සමස්ත ආර්ථික වර්ධනයක් ලබා ගැනීම අපේ මූලික පරමාර්ථය වන බවත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය අමාත්‍යතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා (ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன - ஔடத உற்பத்திகள், வழங்குகைகள் மற்றும் ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Prof.) Channa Jayasumana - State Minister of Production, Supply and Regulation of Pharmaceuticals)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ, ලෝකයේ ඉතාම අර්බුද තත්ත්වයක් තිබියදී තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ කියන කථාවට අපි පසුගිය දින කිහිපයේදීම ඇහුම්කන් දුන්නා. අපි හැම කෙනෙක්ම ඒක හොඳින් දන්නා දෙයක්.

මනුෂ්‍ය වර්ගයා මීට පෙර මේ ආකාරයෙන් සමස්ත ලෝකයටම බලපාන ගෝලීය සෞඛ්‍ය ප්‍රශ්නයකට මුහුණ දුන්නේ, 1918 වර්ෂයේදී "ස්පාඤ්ඤ උණ" කියලා හඳුන්වපු රෝගයක් පැතිරුණු කාලයේයි. මම හිතන්නේ නැහැ, මෙතැන සිටින කිසි කෙනෙකුට ඒ පිළිබඳව සජීවී -ජීවමාන- අත්දැකීම් තිබෙනවා කියලා. ඉන්පසු ගෙවී ගිය අවුරුදු 100ක කාලය තුළ ලෝකයේ මිනිස්සුන්ට පොදු ප්‍රශ්නයක් ආවා නම්, ඒ දෙවැනි ලෝක යුද්ධය අවස්ථාවයි. අවුරුදු 100කට පස්සේ මනුෂ්‍ය වර්ගයා පොදුවේ මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි අද තිබෙන මේ කොවිඩ්-19 වසංගතය.

ආරම්භයේදී මෙම වසංගතය චීනයේ පැතිරුණු හැටි අපි දැක්කා. ඊට පස්සේ ඉතාලිය කේන්ද්‍ර කරගෙන පැතිරුණා. ඊට පස්සේ ස්පාඤ්ඤයට ගියා, මහා බ්‍රිතාන්‍යයට ගියා, ඇමෙරිකා එක්සත් ජනපදයට ගියා. පසුව ඉන්දියාව ඇතුළු දකුණු ආසියානු කලාපයට පැමිණියා. අද වන විට නැඟෙනහිර යුරෝපීය රටවල තමයි මේ ප්‍රශ්නය බහුල ලෙසම තිබෙන්නේ. ඊයේ දිනය ගත්තොත්, රුසියාවේ පමණක් නව කොවිඩ් රෝගීන් 38,000ක් වාර්තා වෙලා තිබෙනවා. හංගේරියාවෙන් 21,000ක් වාර්තා වුණා. ඒ වාගේම, ඊයේ දිනයේ රුසියාවේ කොවිඩ් රෝගීන් 1,211ක් මිය ගිහිල්ලා තිබෙනවා, යුක්රේනයේ 442ක් මිය ගිහිල්ලා තිබෙනවා. එතකොට අපට පෙනෙනවා, ලෝකයේ කිසිම රටකට මේ රෝගයෙන් ගැලවීමක් නැහැ, ලොව සිසාරා මේ රෝගය පැතිරෙනවා කියලා. හැබැයි, සමස්තයක් හැටියට ගත්තාම, මේ

[ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා]

ප්‍රශ්නයට ශ්‍රී ලංකාව මුහුණ දීලා කොයි තැනද දැන් අපි ඉන්නේ කියන කාරණය බලන්න ඕනෑ. මොකද, විපක්ෂය මේ සම්බන්ධයෙන් ලොකු විවේචන ඉදිරිපත් කළා. අපේ රටේ මිය යන ප්‍රමාණය වැඩියි, රෝගීන් ප්‍රමාණය වැඩියි, කළමනාකරණයේ අදක්ෂතාවක් තිබෙනවා කිව්වා.

ලෝකයේ පිළිගත් සම්මත වෛද්‍ය විද්‍යානුකූල නිර්ණායක අනුව, මේ වසංගතයේ බරපතළකම ගැන නිර්ණය කරන්නේ මිලියනයක් ජනතාවගෙන් කොපමණ ප්‍රමාණයකට මේ රෝගය වැළඳුණාද, කොපමණ ප්‍රමාණයක් මිය ගියාද කියන කාරණය මතයි. ලෝකයේ අනෙක් රටවල් ගත්තොත්, ඇමෙරිකා එක්සත් ජනපදය ඉන්නේ මේ දර්ශකයේ 16වැනි ස්ථානයේ. ඇමෙරිකාවේ මිලියනයකට 143,618ක් මේ වසංගතයට ගොදුරු වෙලා තිබෙනවා. මහා බ්‍රිතාන්‍ය ගත්තොත් මිලියනයකට 139,835ක්, ප්‍රංශයේ මිලියනයකට 111,311ක්. ඒ අනුව, 33වැනි තැන තමයි ප්‍රංශය ඉන්නේ. ලෝකයේ සාමාන්‍යය - world average - තිබෙන්නේ, මිලියනයකට 32,073ක් විධියටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව මේ ලැයිස්තුවේ ඉන්නේ 133වැනි ස්ථානයේ. අපේ රටේ මිලියනයකට රෝගීන් ඉන්නේ 25,634යි. ලෝකයේ තිබෙන 200කට ආසන්න රටවල් අතරින් රෝගයේ පැතිරීම, එහෙම නැත්නම් රෝගීන් ප්‍රමාණය අනුව 133වැනි ස්ථානයේ තමයි අපේ රට තිබෙන්නේ. ඇත්තටම ඊට පහළින් තිබෙන ගොඩක් රටවල් පොඩි දූපත් රටවල්. ඒ අනුව, සමස්ත කළමනාකරණය ගත්තොත්, ලෝකයේ රටවල් අතරින් අපි ඉදිරියෙන් සිටිනවා.

කොවිඩ් නිසා මිය ගිය ප්‍රමාණය බැලුවොත්, පේරු රාජ්‍යයේ මිලියනයකට 5,971 දෙනෙක් මිය ගිහින් තිබෙනවා. පේරු රාජ්‍යය තමයි වැඩිම රෝගීන් ප්‍රමාණයක් මිය ගිය රට වන්නේ, මිලියනයකට බැලුවොත්. ඇමෙරිකාව 20 වන තැන ඉන්නේ; මිය ගිය ප්‍රමාණය මිලියනයකට 2,348යි. මහා බ්‍රිතාන්‍යයේ මිලියනයකට 2,090ක් මිය ගොස් තිබෙනවා. ඔවුන් සිටින්නේ 28 වන තැන. World average එක අනුව ඒ රට තිබෙන්නේ 656 වන තැන. ශ්‍රී ලංකාව ඊටත් පහළ ඉන්නේ. 102 වන ස්ථානයේ අපි ඉන්නේ.

එහෙම බැලුවාම මේ සමස්ත පින්තූරය ඇතුළේ මේ කාරණය හොඳින් කළමනාකරණය කරගන්න අපේ රජයට පුළුවන් වෙලා තිබෙනවා. මේ සඳහා මූලික වශයෙන්ම සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ මෙහෙයවමින් ලබා දුන් දේශපාලන නායකත්වය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා ගැනත්, ඒ වාගේම කැබිනට් මණ්ඩලය සහ ජනාධිපති කාර්යසාධන බලකාය ගැනත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපි ආපසු හැරී බලනකොට, අපට පෙනී යනවා ඒ ඒ අවස්ථාවලදී අනුගමනය කළ උපක්‍රම සහ ඒවාට දුන් ප්‍රමුඛතාවල නිවැරදිකම නිසා තමයි අපට මෙවැනි තත්ත්වයකට එන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී එන්නත්කරණ වැඩ පිළිවෙළ ගැනත් සඳහන් කළ යුතුයි. එන්නත්කරණ වැඩ පිළිවෙළ තුළින් අද අපි මේ කලාපය තුළත්, ඒ වාගේම ලෝකය තුළත් ඉදිරියෙන්ම සිටින රටක් වෙනවා. අපි ඒක අභිමානයෙන් කියන්නේ. එය කිව යුතුයි. එන්නත්කරණ වැඩ පිළිවෙළ තුළ ඉදිරියෙන්ම සිටින රටවල් ගත්තොත්, එක්සත් අරාබි එමීර් රාජ්‍ය සියයට 89ක් සම්පූර්ණ එන්නත්කරණයට ලක් කර තිබෙනවා, ඒ කියන්නේ එන්නත් මාත්‍රා දෙකම ලබා දීලා තිබෙනවා. මහා බ්‍රිතාන්‍යය සියයට 68.5ක් එන්නත්කරණයට ලක් කර තිබෙනවා. ශ්‍රී ලංකාව මේ වෙනකොට සියයට 62.5ක මට්ටමට ඇවිල්ලා තිබෙනවා. අපට පහළින් තමයි ඇමෙරිකා එක්සත් ජනපදය ඉන්නේ. ඔවුන් සියයට 58.8ක් එන්නත් කර තිබෙනවා.

කලාපීය වශයෙන් ගත්තොත්, ඉන්දියානු ජනතාවගෙන් සියයට 26.8ටයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එන්නත් දෙකම ලබා දීලා තිබෙන්නේ. නේපාලයේ එම ප්‍රමාණය සියයට 25.5යි, පාකිස්තානයේ සියයට 21.8යි, බංග්ලාදේශයේ සියයට 19.9යි. එතකොට අපට පෙනී යනවා, අපි වාගේ රටක් මේ වසංගතයට මුහුණ දීමේදී කලාපීය සහ ලෝක තත්ත්වය හමුවේ අපි බොහොම ඉදිරියෙන් සිටිනවාය කියලා. අපි ගත්ත තීන්දු තීරණ ඒකට බලපානවා. ඒ ඒ මොහොතේදී ගත්ත තීන්දු වැරදියි කියලා කලබල වෙලා, බැණපු හැටි අපට පෙනී ගියා. නමුත් අපි සමස්ත පින්තූරය දිහා තමයි බැලිය යුත්තේ.

අපි මේ වෙනකොට එන්නත්කරණ වැඩසටහනේ පළමු මාත්‍රාව ශ්‍රී ලාංකිකයන් එක්කෝටි පනස්අටලක්ෂ අසූතුන්දහස් හයසියතිහකට ලබා දීලා තිබෙනවා. එන්නත් මාත්‍රා දෙකම සම්පූර්ණ කරලා තිබෙනවා, එක්කෝටි තිස්හයලක්ෂ හැත්තෑහතරදහස් අටසියතිස්හතර දෙනෙක්. එපමණක් නොවෙයි, අපි අවුරුදු 16-19 කාණ්ඩය, විශේෂයෙන්ම පාසල් සිසුන් කේන්ද්‍ර කරගෙන ආරම්භ කළ එන්නත්කරණ වැඩසටහන තුළින් අද දවස වෙනකොට මිලියනයක් ඉක්මවා එන්නත් කර තිබෙනවා.

ඒත් එක්කම, අපි තුන්වැනි මාත්‍රාවත් ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළා. මොකද, ලෝකයේ පර්යේෂණවලින් පෙන්වා දුන්නා, මේ එන්නත් මාත්‍රා දෙකම අරගෙන මාස හයක්, හතක් යනකොට ක්‍රමානුකූලව ශරීරයේ ප්‍රතිශක්තිය අඩු වෙනවා කියලා. අපි මේ ගැන ජනාධිපති කාර්ය සාධන බලකායේදී කථා කළා. එහිදී අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දුන්නා, එම පර්යේෂණ වාර්තාවල එසේ පෙන්වා තිබෙනවා නම් අප්‍රමාදීව ඒ සඳහා පියවර ගන්න, අපේ රටේ මිනිසුන්ටත් තුන්වැනි මාත්‍රාවක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒ අනුව අපි ඉදිරි පෙළ සෞඛ්‍ය සහ ආරක්ෂක අංශවල එක්ලක්ෂ විසිදහස් හාරසිය අසූපස්දෙනෙකුට ඊයේ සවස වෙනකොට තුන්වැනි මාත්‍රාවත් ලබා දුන්නා.

ඒ වාගේම තව විශේෂිත තීරණයක් තිබෙනවා. ඒ තමයි හෙට දවසේ සිට අපි අවුරුදු 60ට වැඩි උදවියටත් එන්නතේ තුන්වැනි මාත්‍රාව ලබා දීම ආරම්භ කරනවා. ආරම්භයේදී නිර්දේශය තිබුණේ දෙවැනි මාත්‍රාව දීලා මාස හයක් ගියාට පසුව තුන්වැනි මාත්‍රාව ලබා දෙන්න කියලායි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විපක්ෂය නටන පිස්සුත් එක්ක අපට බයක් තිබෙනවා. මොකද, මේ වසංගතය පැතිරෙන්න පුළුවන්. එයින් අපේ රටේ ජනතාව ආරක්ෂා කරගන්න ඕනෑ. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ කණ්ඩායම අපට නිර්දේශයක් ලබා දුන්නා, මාස හයක් යනකම් ඉන්න එපා, අවුරුදු 60ට වැඩි උදවිය දෙවැනි මාත්‍රාව අරගෙන මාස තුනක් සම්පූර්ණ කරලා තිබෙනවා නම්, ඒ ගොල්ලන්ටත් හෙට ඉඳලා තුන්වැනි මාත්‍රාව දෙන්න කියලා. ඒ අනුව බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනේත්, දකුණු පළාතේ දිස්ත්‍රික්ක තුනේත්, අම්පාර සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලත් අවුරුදු 60ට වැඩි අයට තුන්වැනි මාත්‍රාව ලබාදීමේ වැඩ පිළිවෙළ අපි හෙට දිනයේ ආරම්භ කරනවා. පළමුවැනි සහ දෙවැනි මාත්‍රාව ලබා ගෙන තිබෙන්නේ කුමන ආකාරයේ එන්නත් වර්ගයක් වුණත්, මේ සියලු දෙනාට ෆයිසර් එන්නත ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ෆයිසර් එන්නත් මිලදී ගෙන තිබෙනවා. අපට ආධාර හැටියට ලැබුණු යම් එන්නත් ප්‍රමාණයක් තිබෙනවා. නමුත් බහුතරයක් එන්නත් අපි මිලදී ගත්ත ඒවා. අපට එන්නත් ප්‍රදානය කළ රටවල් වන්නේ චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව වැනි ඒවා. ලෝක සෞඛ්‍ය

සංවිධානයේ COVAX වැඩ පිළිවෙළ යටතේ අපට එන්නත් ප්‍රදානය කළා. ඒ හැර සියයට 85කට පමණ ආසන්න එන්නත් ප්‍රමාණයක් අපි මිලදී ගත්තා. මේ සඳහා අපි අතිවිශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ගරු මුදල් අමාත්‍යතුමා කිසිම වේලාවක අපට කිව්වේ නැහැ, ඩොලර් නැහැ, එන්නත් ගෙනෙන්න එපා, පරක්කු කරන්න කියලා. කථා කළ හැම වේලාවේම එතුමා පැහැදිලිව කිව්වේ, සෞඛ්‍ය අංශයට යම්කිසි අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ සඳහා ප්‍රමුඛස්ථානය දෙන්න, මූලිකත්වය දෙන්න කියන එකයි. එන්නත් පමණක් නොවෙයි, අද ලෝකයේ එන්නත් ලබා දෙන සිරින්ජර් පවා නැහැ. ගිය සතියේ ලෝක සෞඛ්‍ය සංවිධානය නිවේදනයක් නිකුත් කළා, සිරින්ජර් බිලියන දෙකක - two billion - හිඟයක් තිබෙනවා කියලා. නමුත් අපි ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා කල් වේලා ඇතිව මේ එන්නත්කරණ වැඩ පිළිවෙළ සඳහා, තුන්වැනි මාත්‍රාවත් ලබා දීම සඳහා -පුළුන් කැල්ලේ ඉඳලා- අවශ්‍ය සියලු දේ ගෙනැවිත් තබා ගත්තා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

අපි ඒ සඳහා ක්‍රමානුකූලව වැඩ කටයුතු යොදලා තිබෙනවා. ආර්ථික ප්‍රශ්නය විසඳන්න, සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ ඒ ආශ්‍රිත කටයුතු සඳහා මේ අය වැයෙන් දීලා තිබෙන සහන පිළිබඳව අපි ඉදිරියේදී සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේ වැඩි දුරටත් කරුණු දක්වනවා. මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනැ. අපි සාකච්ඡා කරන වෙලාවේ ගරු මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කළා, ග්‍රාමීය සෞඛ්‍ය ඉහළ නැංවීම සඳහා ළමා හා මාතෘ සායන කරන තැන්, ග්‍රාමීය රෝහල් එක විධියකට හදන්න, වැඩි දියුණු කරන්න කටයුතු යොදන්න කියලා. එතුමා පොළවල් හැදුවා වාගේ මුළු රට පුරාම එක විධියකට ගමේ තිබෙන clinics ටික හදලා වැඩි දියුණු කරන්න කියලා ඉල්ලුවා. ඒ සඳහා රුපියල් මිලියන 37,650ක් වෙන් කරලා තිබෙනවා. අපි විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම පිළිබඳව.

එපමණක් නොවෙයි, පළමුවැනි වතාවට බටහිර වෛද්‍යකම, ආයුර්වේද වාගේම, පාරම්පරික හෙළ වෙදකමටත් එතුමා මේ අය වැය ලේඛනයෙන් විශේෂ අනුග්‍රහයක් දක්වලා තිබෙනවා. වෙදකම් තුනක් මේ රටේ ක්‍රියාත්මක වෙනවාය කියන එක අය වැයකින් පිළිගත්ත පළමුවැනි වතාව මෙයයි. ඒ පිළිබඳවත් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

විපක්ෂය අද උද්ඝෝෂණය කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා. සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ, මේ රටේ මිනිස්සු අසීමිත කැපකිරීම් කරලා බොහොම අමාරුවෙන් තමයි මේ ගණනට මේ අසනීපය පාලනය කර ගත්තේ. හැබැයි, ඒ කිසිම දෙයක් තකන්නේ නැතුව අද මිනිස්සු පාරට, එළියට අරගෙන උද්ඝෝෂණ සඳහා යොමු කරලා තිබෙනවා. මෙය, වීරත්වයට හේතුවක් නොවෙයි; අභිමානයට හේතුවක් නොවෙයි; ලජ්ජාවට කාරණයක්. මේ මොහොතේ මිනිස්සු එළියට බස්සන එකෙන් මොකක්ද වෙන්නේ? මේ රටේ අගෝස්තු මාසයේ ඇති වෙච්ච තත්ත්වය නැවත නොවැම්බර් අන්තිම සතියේ ඇති කර ගන්න අවශ්‍ය නැහැ. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලනවා, මේ වෙලාවේ මේ රට ගැන හිතන්න කියලා. ඔබතුමන්ලාටත් මීට වැඩිය නිර්මාණශීලී වෙන්න පුළුවන් නේ. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, මේ වාගේ වෙලාවක අපි විපක්ෂයේ හිටියා නම්, අපි මෙහෙම මිනිස්සු පාරට බස්සලා ඔය වැඩේ කරන්නේ නැහැ. එහෙම නම් අපි මීට වඩා නිර්මාණශීලී විධියට, ලස්සනට මේ විරෝධය දක්වනවා. හැබැයි, තව එක දෙයක් වෙනවා. මේ විධියට තව උද්ඝෝෂණ දෙක, තුනක් ලෑස්ති කළොත්, "සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කළමනාකරණය දුර්වලයි, මේ රටේ මිනිසුන්ගේ යම් විරෝධයක් තිබෙද්දී ඒක කළමනාකරණය කරගන්න බැහැ" කියලා එතුමාට විපක්ෂ නායකකමත් නැති වෙනවා.

මේ අය වැයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අඩු පාඩුවක් තිබෙනවා නම් ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට කියනවා, shadow Budget එකක් නැත්නම් dummy Budget එකක් ඉදිරිපත් කරන්න කියලා. ඒකෙන් කියන්න, කොහොමද ඩොලර් හොයන්නේ, මොකක්ද ඒ සඳහා තිබෙන ක්‍රමවේදය කියලා. එහෙම නැතුව පාරට බැහැලා ආණ්ඩු බලය ඉල්ලුවාට ඒක දෙන්න ක්‍රමයක් නැහැ නේ. මිනිස්සු අපට ජනවරමක් දීලා තිබෙනවා. මෙතැන ප්‍රතිපත්තියේ වෙනසක් නැහැ, දර්ශනයේ වෙනසක් නැහැ, ගමන් මඟේ වෙනසක් නැහැ, උපක්‍රමවල වෙනසක් නැහැ. ඒ වාගේම පුද්ගලයන්ගේ වෙනසකුත් නැහැ. ඉතින් එහෙම පිරිසකට නැවත බලය දෙන්න මේ රටේ මිනිස්සු සූදානම් නැහැ. අපි එහෙම ආණ්ඩු බලය දෙන්නත් ලෑස්ති නැහැ. මේ කාරණය අපි හොඳින් කළමනාකරණය කරනවා. අපට තව සති කිහිපයක්, මාස කිහිපයක් පමණයි අවශ්‍ය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මැතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.38]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී මා මුලින්ම අපේ නව මුදල් අමාත්‍යතුමන්ගේ මංගල අය වැය ඉදිරිපත් කිරීම පිළිබඳව එතුමන්ට මගේ ශුභාශිංසනය පිරිනමනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මම සුපුරුදු පරිදි මේ අය වැය දිහා විවේචනාත්මකව බැලිය යුතුයි.

මුලින්ම ප්‍රවේශයක් හැටියට මම එතුමන්ගේ කථාවෙන්ම උපුටා ගැනීම් කිහිපයක් කරන්න අවශ්‍යයි. අය වැය කථාවේ "වංචනික ව්‍යාපාරික මෙහෙයුම්" යටතේ එතුමා මෙසේ කියා තිබෙනවා:

> "ඇතැම් අවස්ථාවලදී ජනතාව වෙනුවෙන් උපක්‍රමිකව පසුබැසීමට සිදුවුණු බව ඇත්තක් නමුත්, එය දුර්වලතාවයක් ලෙස නොදකින ලෙස ඉල්ලා සිටිනවා"

"ජීවන වියදම් වැඩිවීමේ සැබෑ අභියෝගය" මාතෘකාව යටතේ එතුමා මෙසේ කියනවා:

> "කාලයක් තිස්සේ දිගින් දිගටම භාණ්ඩ හා සේවා මිල ගණන්වල සිදුවන ඉහළ-පහළ යෑම පිළිබඳව අපි කතා කළා. නමුත් තිරසාර විසඳුමක් සැපයීමට කිසිම රජයකට හැකි වුණේ නැහැ. අපි අවංකව එය පිළිගත යුතුයි.

ඒ වාගේම තවත් තැනක කියනවා:

[ගරු රවුෆ් හකීම් මහතා]

"මේ නිසා තමයි පසුගිය කාලයේ ගැසට් පත්‍ර මුද්‍රණය කිරීම පිළිබඳව අපේ රජයටත් විවිධ විවේචන එල්ල වුණා. ඒ වගේම මිල හා සැපයුම් පාලනය කිරීමට භාවිත කළ සමහර ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවක් ගොඩනැඟුණා"

ඒ වාගේම තවදුරටත් මෙසේ කියනවා:

"විද්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය නොකොට තීන්දු තීරණ ගැනීම නිසා රජය විවිධ විවේචනවලට මුහුණ දුන්නා. එම නිසා අප අඳුරේ අතපත ගාන එක, දැන්වත් නතර කළ යුතු කාලය පැමිණ තිබෙනවා.

ඉතා අවංකව මේ කාරණා එතුමා පිළිගැනීම පිළිබඳව අපි සතුටු වනවා. නමුත් මේ දිහා බැලුවාම මට නම් කියන්න තිබෙන්නේ මේකයි. පෙරේදා උදේ "සිරස" නාලිකාවේ වැඩසටහනක් තිබුණා. ඒ වැඩසටහනට Verité Research ආයතනයේ ප්‍රධානියා වන නිශාන්ත මෙල් මැතිතුමා පැමිණ හිටියා. එතුමාගෙන් අය වැය පිළිබඳව ඇහුවාම එතුමා වචන දෙකෙන් ඒකට පිළිතුරු ලබා දුන්නා. එතුමා අය වැය හැඳින්වූයේ "නොහැකියාවේ පාපොච්චාරණයක්" හැටියටයි. ඇත්ත වශයෙන්ම මේ පිළිබඳව තවත් කාරණා ටිකක් අපි කිව යුතුයි. අපි දන්නවා, අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ගෝල බාලයෝ එතුමාට "මොළහතාණෝ" කියන බව. "මොළහතාණෝ" කියන එතුමාගෙන් අය වැය ඉදිරිපත් කිරීමට පෙර මාධ්‍යවේදියක් අහනවා, "අය වැය ගැන මොනවාද කියන්නේ?" කියලා. "අය වැයෙන් දෙන්න මොකුත් නැහැ, ගන්න විතරයි තිබෙන්නේ" කියලා එතුමා කිව්වා. ඒ කාරණය සැහෙන දුරට දැන් සනාථවෙලා තිබෙනවා. දේශපාලනඥයන්ට ව්‍යාපෘතිවලට ඕනෑ තරම් මුදල් දීලා තිබෙනවා. මුදල් දීලා තිබෙන්නේ ග්‍රාම සංවර්ධනයට වෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* නමුත් ඒකෙන් කුමක්ද සිදු වන්නේ කියලා අපි බලමුකෝ. මින් ඉදිරියට සිදු වන දේවල් දිහා බලමු. අද මොකද වෙලා තිබෙන්නේ? *[බාධා කිරීම්]* අපේ චන්න ජයසුමන රාජ්‍ය ඇමතිතුමා උද්ඝෝෂණය පිළිබඳව කිව්වා. උද්ඝෝෂණයට මෙච්චර භය වෙන්නේ මොකටද? *[බාධා කිරීම්]* ඇත්ත වශයෙන්ම අද හැම ජාතික පුවත් පතකම ශීර්ෂ පාඨයේ තිබෙන්නේ කුමක්ද? හැම ජාතික පුවත් පතකම ශීර්ෂ පාඨයේ තිබෙනවා, 70කට ආසන්න පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරු ගිහිල්ලා තිබෙනවා, මහෙස්ත්‍රාත් උසාවිවල,- *[බාධා කිරීමක්]*

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, මම බිය වුණා කියා කිසිම වෙලාවක කිව්වේ නැහැ. මම කිව්වේ තව උද්ඝෝෂණ දෙක තුනක් සංවිධානය කළොත් සජිත් ප්‍රේමදාස මැතිතුමාට විපක්ෂ නායකකමත් නැති වෙයි කියායි. මේ උද්ඝෝෂණ සංවිධානය කරනවාට පාඨලී චම්පික රණවක මැතිතුමා බොහොම කැමැත්තෙන් ඉන්නේ. මොකද, එතුමා බලාගෙන ඉන්නවා, විපක්ෂ නායකකම ගන්න.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා වසංගතයේ ව්‍යාප්තිය පිළිබඳව නොයෙකුත් කාරණා මතු කරමින්, ඒක දඩමීමා කරගෙන මීට කලිනුත් උද්ඝෝෂණවල නිරත වුණු වෘත්තීය සමිතිවල අය අත්අඩංගුවට අරගෙන, ඔවුන් නිරෝධායන මධ්‍යස්ථානවලට යවලා, මේ රටත්, රජයත් ඉල්ලාගෙන කෑවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට වුණු දේ අපි දකිනවානේ. ඒ වාගේම අපේ නිදහසට බාධා පමුණුවනවා. අධිකරණ බහුතරයක් මේකට තහනම් නියෝග දීමෙන් වැළකී සිටියදී, ඒකට අවනත නොවී දැන් හන්දියක්-හන්දියක් ගාණේ පොලීසිය යවලා සිදු කරන මර්දනය කිරීමේ වැඩ පිළිවෙළින් කිසි ඵලක් වන්නේ නැහැ. මේ තුළින් රටේ ජනතාවගේ නිදහසට බාධා වනවා. රටේ ඇතිවෙලා තිබෙන නොයෙකුත් හානිදායක පිළිවෙත්වලට "අවිද්‍යාත්මක පිළිවෙත්" කියලා කියනවා. එතුමා පිළිගන්නා අවිද්‍යාත්මක පිළිවෙතක් තමයි, කාබනික පොහොර පිළිබඳව ගත්ත තීරණය. අපට මේ මහ කන්නයෙන් පසුව බලා ගන්න පුළුවන් මොනවාද වෙන්නේ කියලා. අපේ රටේ ජනතාව විශාල දරිද්‍රතාවකට ඇදගෙන යන පිළිවෙතක් හැටියටයි අපි මේක දකින්නේ.

ඒ එක්කම, අවිද්‍යාත්මක තවත් පිළිවෙතක් තමයි මුස්ලිම් ජනතාවගේ මළ සිරුරු ආදාහනය කිරීමට ගත්ත තීරණය. අපේ ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. එතුමා වැදගත් අමාත්‍යතුමෙක්. එතුමා දන්නවා, වතුරින් මේ කොරෝනා වසංගතය පැතිරී යනවාය කියන කාරණය සම්පූර්ණයෙන් අවිද්‍යාත්මක බව. ඒ අවිද්‍යාත්මක කාරණය පදනම් කරගෙන දැනුත් මළ සිරුරු දවස් දෙකක් තියාගෙන ඉඳලා ඕට්ටමාවඩිවලට අරගෙන යන්න ඕනෑ. මේක දැන්වත් නවත්වන්න. දැන් එතුමා මේක අවිද්‍යාත්මක පිළිවෙතක් බව පිළිගෙන තිබෙනවා. අඳුරේ අතපත ගාන එක දැන් නවත්වමු කියලා එතුමා පිළිගත්තා; අගමැතිතුමා ඒ කාරණය පිළිගත්තා. ඒ නිසා දැන්වත් ඒ තීරණය අහෝසි කරන්න. අන්තිමට මොකද කළේ? වෙන වැඩක් කරන්න බැරිව අන්තිමට අපේ මළ සිරුරු මාලදිවයිනට පටවන්න ගියා. මාලදිවයිනට මළ සිරුරු පටවලා, එහේ භූමදානය කරන්න ඉඩ දෙනවා කියලා විකල්පයක් යෝජනා කරපු රජයක් තමයි මේ රජය. ඒ කාරණා ගැන නොයෙකුත් විවේචන කරනකොට සමහර අයට පොඩ්ඩක් රිදෙනවා තමයි. නමුත්, මේවා විවේචනය කළ යුතුයි.

ඒත් එක්කම මේ රජය මෑතකදී තීරණයක් ගත්තා. "එකම රටක් - එකම නීතියක්" කියන සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පත් කළා. [බාධා කිරීම්] ඒ බලකායේ සභාපති තනතුරට වෛරය, ක්‍රෝධය වපුරන හිමිනමක් පත් කර තිබෙනවා. ඒ තුළින් රටේ සංහිඳියාව පිළිබඳව යමක් කරන්න පුළුවන්ද? ඒකටද දැන් සූදානම් වෙන්නේ? මේ වාගේ ජනතාව අතර විරසකය මතු කරන, ජාතීන් අතර විරසකය මතු කරන ක්‍රියාවලි හරහා දිනෙන් දින සුළු ජාතීන් ඈත් කරන වැඩ පිළිවෙළින් ඉවත් වෙන්න කියලා අපි ආයාචනය කරනවා. අපි දන්නවා, අපේ අගමැතිතුමා ඇතුළු ප්‍රධාන පෙළේ අමාත්‍යවරු මේක අනුමත කරන්නේ නැහැ කියලා. නමුත්, එතුමන්ලාට කර කියා ගන්න විධියක් නැහැ. එතුමාගෙන් එදා ප්‍රශ්නයක් ඇහුවාම එතුමා නිශ්ශබ්ද වුණා. ඒ අවස්ථාවේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා තමයි ප්‍රශ්න නැඟුවේ. එතුමා ඒකට පිළිතුරු දුන්නේ නැහැ. සරත් වීරසේකර ඇමතිතුමාට පිළිතුරු දෙන්න කිව්වා. ඒක තමයි වුණේ. මේකයි යථාර්ථය. ඒ යථාර්ථය පිළිගෙන හරි මඟකට පැමිණෙන්න කියලා මම ආයාචනය කරනවා.

Now, Sir, I would like to say this. What is more hilarious are some of the Revenue Proposals or the supposed cost cutting methods introduced to cut five litres from the fuel allowance provided to Ministers and government officers, reduce 25 per cent of the telephone expenses of government institutions, reduce 10 per cent out of the provisions for electricity consumption and to charge a fee from vehicles meeting with accidents. The fee charged on accidents is, in fact, a joke! මේක හරියට ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ වැඩක්. සාමාන්‍යයෙන් accident එකක් කියන්නේ අහම්බෙන් වෙන දෙයක්. ඒකටත් charge කරනවා නම්, ඒක විහිළු සහගත වැඩක්.

ඒ විතරක් නොවෙයි, the MPs will be entitled to a pension only if they complete two terms. "Window dressing" කියන්නේ මේවාට තමයි. You are just simply

window dressing in order to please some of those people who might not see a positive side of the Budget. That is why these things are being done.

Of course, the Hon. Minister of Finance has a very difficult job to perform. Everybody knows that the sharp revenue shortfall, the rising expenditure, the excessive money printing and all that has put him into a serious problem. So, the central objective to reduce the fiscal deficit is not fulfilled and there is little prospect of this Budget achieving financial stability and fostering economic recovery is very clear for all of us to see. That is why even the pay warrants are to be issued quarterly. It is because there is difficulty in collecting revenue. We understand that.

These are all problems that were heaped upon the Government by their own actions. As they came, they reduced the VAT from 15 per cent to 8 per cent. So, there has been a revenue shortfall of almost Rs. 700 million by that act alone, and all of that has added onto these problems. Unemployment and poverty is on the increase; the food security of large sections of the people is threatened and also the trade deficit is widening. Foreign reserves are perilously low being inadequate even to meet the essential import expenditure. Foreign reserves have come down to almost US Dollars 2 billion! It is a very difficult situation.

Not only that, but also the interest payments on our foreign loans are almost coming to 70 per cent of GDP of the country; the percentage of the Gross Domestic Product, compared to the interest to be paid on the foreign loans obtained, is coming to almost 70 per cent. Up to last month, it was Lebanon which was in the worst place in loan repayments. Today, Sri Lanka has overtaken Lebanon. That is our situation. In this situation, we can hardly afford to spend. Of course, you have now suspended building projects, various other expenses and have made very strict expenditure cuts, but all of which are still insufficient to meet all these challenges we are faced with. Ill-advised economic policies have ended up in mismanagement of the economy and the unscientific, impractical policy of suddenly switching to organic fertilizer has posed insurmountable economic and fiscal problems.

Then, apart from the underlying reasons for shortages and price hikes of food and essential items, the mismanagement of the economy by inappropriate and faulty monetary fiscal trade and exchange rate management policies have aggravated the severity of the problems. Now, the exchange rate management policies have caused serious problems. Even the price hikes have happened as a result of that. We see, today, in the newspapers that crude oil imports have been suspended and now, they want to go for purchase of refined oil directly. We know spot purchase of refined oil will also incur foreign exchange. So, where are we going to find it? If we are going to suspend crude oil purchases based on foreign exchange scarcity, how are you going to purchase refined oil? So, these problems have created long queues before the petrol sheds. The Government and the Minister, in the morning, gave assurance that there will not be a shortage of fuel in the country.

But the fact is, when you see the reality or the statements by the Ministers in the newspapers, people panic. This panic situation has arisen because of the irresponsible behaviour of the Ministers. I know those Ministers are not well disposed towards our Finance Minister and that they have other issues with him, but then, he has made his attempts, tried his very best but those are absolutely inadequate. All of that will not result in getting the country out of its terrible problems that it is faced with today.

Therefore, I believe that the Hon. Minister may have to resort to some drastic measures including the option of going to the lender of last resort. That is, the International Monetary Fund. There is no option, but to seek the assistance of the IMF. So many people might say, “We do not have to go to the IMF; we need not kneel down before them”, but the fact is very clear. It is the stark reality: we will have no option, but to go and subject ourselves to the conditions and then take the facility from the IMF to tide over this difficult period. Otherwise, we are going to face a very bleak future.

With those words, Sir, I conclude my speech.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.53]

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේදී ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාගේ කථාවට පසු කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. එතුමාට විශේෂයෙන්ම කියන්න ඕනෑ, එතුමාට නොවැටහෙන සත්‍ය එතුමාගේ පක්ෂයේ අනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නම් දැන් වැටහී තිබෙනවාය කියන එක. එතුමාගේ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලුදෙනාම අද ඉන්නේ කොහේද කියන කාරණාව අපි කවුරුත් දන්නවා. එම නිසා එතුමාටත් ඒ සත්‍ය ඉක්මනට අවබෝධ වෙයි කියලා අපි හිතනවා.

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කළා "එක රටක් - එක නීතියක්" නමැති සංකල්පය ක්‍රියාවට නැංවීම සඳහා පත් කරපු කාර්ය සාධක බලකාය පිළිබඳව. මේ කිසිම දෙයක් අපි හදන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඔපපාතිකව පහළ වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා, අපි තර්ක - විතර්ක කරලායි මේවා නීති බවට පත් වෙන්නේ. එම නිසා ඒ පිළිබඳව කිසිදු සැකයක් බියක් තබා ගත යුතු නැහැ. අපට ඡන්දය දුන් ලක්ෂ 69ක්වූ ජනතාවගේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා රජයක් හැටියට අපි හැම වෙලාවේම කැපවෙලා ඉන්නවාය කියන එකත් ඔබතුමාට අපි මතක් කරන්න ඕනෑ.

ඔබතුමා දැන් 'නොහැකියාවේ පාපෝච්චාරණයක්' ගැන කථා කළා. 2015දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි මහ බැංකුව ඉස්සරහට ගිහිල්ලා ලොකු උද්ඝෝෂණයක් කළා මට මතකයි.

[ගරු සාරති දුෂ්මන්ත මහතා]

හිටපු ජනාධිපතිතුමා, ජනාධිපති පරීක්ෂණ කොමිසමක් දැම්මා මහ බැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන්. මෙවර අය වැයෙන් පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගමට අදාළ බිලියන 8.5ක මුදලක් ලබා කටයුතු කර තිබෙනවා. ඒක නොහැකියාවද හැකියාවද කියන එක පිළිබඳව ඔබතුමා හදවතින් තීන්දුවක් ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ - පෙරේදා අපේ රටේ ලොකු ප්‍රශ්නයක් බවට පත් වුණා ගරු - විදුහල්පති වැටුප් විෂමතා පිළිබඳ ප්‍රශ්නය. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 30,000ක් දෙනකොට ඒක හැකියාවද නොහැකියාවද කියන කාරණාව පිළිබඳව අපි අපේ හදවත්වලින් විමසා බැලිය යුතුයි. මේ අය වැය ගෙනාපු මොහොත පිළිබඳව අපි කාටවත් අමුතුවෙන් කියන්න අවශ්‍යතාවක් නැහැ. ආර්ථික අතින් ගත්තාම බොහෝ අපහසුතා තිබෙන, අපේ රට පමණක් නොව ලෝකයේ පවතින අනිකුත් සියලු රටවලට ද මේ හා සමාන ආර්ථික දුෂ්කරතා පවතින කාල සීමාවක තමයි අපි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. මේ මොහොතේ පළමුව අපි රටක් හැටියට දේශපාලනික වශයෙන් ස්ථාවරභාවයකට යා යුතුයි කියා මා විශ්වාස කරනවා. ඒ සඳහා තමයි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම ගැන අද කතිකාවතක් ඇති වෙලා තිබෙන්නේ. ඒක අපේ පොරොන්දුවක්. ඒ වාගේම අනික් පැත්තෙන් ආර්ථික සමෘද්ධිමත්භාවය පිළිබඳව අපේ ක්‍රමෝපාය වඩාත් ඵලදායී ලෙස ඉදිරියට ගෙන යෑම පිළිබඳව අපි කථා කළ යුතුයි. මේ සියල්ල මැද්දේ කොවිඩ් අර්බුදයත් එක්ක පසුගිය කාල සීමාව තුළ අපට, රටට නැති වුණේ මොනවාද කියන කාරණාව පිළිබඳවත් මෙතැන ඉන්න කාටවත් හංගන්න දෙයක් නැහැ.

මට කලින් කථා කරපු ගරු චන්න ජයසුමන රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ අන්දමට අද අපට සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මොකද, අද අපේ රටේ සියයට 70කට ආසන්න ප්‍රමාණයකට එන්නත්කරණය අවසාන කර තිබෙන නිසා. තුන්වැනි මාත්‍රාවකටත් යන්න අවශ්‍ය වැඩකටයුතු ටික කර තිබෙනවා. බැරිවෙලා හෝ මේ vaccines ටික ගැහුවේ නැත්නම් බලාගන්න තිබුණා, අද මෙතැන ඇති වන ගාලගෝට්ටිය.

අපට මතකයි, එන්නත් ලබා දෙන්න පොඩ්ඩක් ප්‍රමාද වෙනකොට විපක්ෂයෙන් එල්ල වුණු චෝදනා. කවුරු මොනවා කිව්වත්, එන්නත්කරණයෙන් අද අපේ රට විශිෂ්ට තැනක ඉන්නවා. ඒක කාටවත් නැහැ කියන්න බැහැ. කොවිඩ් - 19 ප්‍රශ්නය තිබෙන වෙලාවේ, ආර්ථික ප්‍රශ්න හමුවේ තමයි මේ සියලු දේවල් අපි කරන්නේ. විශේෂයෙන් මේ වසංගත තත්ත්වය නිසා අපේ අසල්වැසි ඉන්දියාවේ ඇති වුණු බලපෑම, දකුණු ආසියාවේ ඇති වූ බලපෑම -මේවා එකක්වත්- අපට බැහැර කරන්න බැහැ.

කොවිඩ් - 19 වසංගතය නිසා මොනවාද නැති වුණේ? අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, කොවිඩ් - 19 නිසා අපේ ආර්ථිකයට බලපෑමක් වෙලා නැහැ කියලා. අපේ රටට ප්‍රධාන වශයෙන් එන cash flow එක, ඩොලර් ගැන බැලුවොත්, විදේශ සංචාරකයන්ගෙන් එන ඩොලර් බිලියන 5ක විතර මුදලක් අද අපේ රටට නැති වෙලා තිබෙනවාය කියන එක පළමුවෙන් කියන්න ඕනෑ. මොන තරම් මුදල් ප්‍රමාණයක්ද මේ?

අපේ පළාතේ කිතුල්ගල white-water raftingවලට ප්‍රසිද්ධයි. නමුත්, මේ වසංගත තත්ත්වය නිසා සංචාරකයෝ කවුරුවත් එන්නේ නැහැ. එතකොට ඩොලර් එනවාද රටට? එතකොට කොහොමද කියන්නේ කොවිඩ් - 19 නිසා ආර්ථිකයට බලපෑමක් නැහැ කියලා? කොවිඩ් වසංගතයත් එක්ක මේ වාගේ ප්‍රශ්න ගණනාවක් ගැට ගැසී තිබෙනවා. මෑත කාලයේ මේ වාගේ ප්‍රශ්නයකට කිසිම ආණ්ඩුවකට මුහුණ දෙන්න සිද්ධ වුණේ නැහැ. විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා, සෞඛ්‍ය අංශ, රාජ්‍ය පරිපාලනය, ත්‍රිවිධ හමුදාව ඇතුළු සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ මේ සම්බන්ධයෙන් නොපමාව ගත් ක්‍රමෝපාය සම්බන්ධයෙන්.

ඊළඟට, විදේශ රැකියාවල යෙදී ඉන්න ශ්‍රමිකයන්ගෙන් ලැබෙන මුදල පිළිබඳවත් අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. සමහර වෙලාවට ඒ රටෙන් මේ රටට සල්ලි ටික දමන්න දෙන්නේ නැහැ. අපි පුළුවන් තරම් බලන්නේ අපේ රටේ සල්ලි ටික ඉතුරු කර ගන්නයි. අපි වාහන නොගෙන්වා ඉන්නේ ආශාවකට නොවෙයි නේ. ඒ අද ඩොලර් එක්ක ගැට ගැසුණු ප්‍රශ්නයක් තිබෙන නිසායි. මේ කාල සීමාවේ තමුන්නාන්සේලා බලයේ හිටියා නම්, මේවාට මොන වාගේ තීන්දු-තීරණ ගනියිද, මොන වාගේ විකල්ප වැඩ පිළිවෙළක් තියෙයිද? මේ අය වැය අවස්ථානුකූලව, සමාජයේ සියලු පැතිකඩ පිළිබඳව කල්පනා කර, බොහොම අමාරුවෙන් ජනතාව වෙනුවෙන් හදපු අය වැයක් හැටියට අපිට දකින්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කරන්න නම් නිෂ්පාදනය අනිවාර්යෙන්ම වැඩි කළ යුතු වෙනවා. අද අපේ රටට කොච්චර සීනි ගෙන්වනවාද? කොච්චර කිරි පිටි ගෙන්වනවාද? මේ සඳහා කෝටි කීයක් වියදම් වෙනවාද? මේවා පිළිබඳව අපි සෘජුව කථා බහ කළ යුතුයි. රටේ නිෂ්පාදනය වැඩි කරන්න අවශ්‍ය නිෂ්පාදන සාධක සියල්ල අපි ශක්තිමත් කරන්නට ඕනෑ. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය කියන මේ සියල්ලේම ඵලදායිතාව, කාර්යක්ෂමතාව අපි වැඩි කළ යුතුයි. එහෙම වැඩි කරන්නේ නැතිව අපි බලාපොරොත්තු වන විධියට අය වැය හිඟය පියවා ගැනීම සඳහා ඉදිරි කාලය තුළ අපට ගමනක් යන්නට බැහැ.

අද යෝජනා රාශියක් මේ අය වැය තුළ ඉදිරිපත් කර තිබෙනවා. මම ඒවා ගැන එකින් එක කියන්නේ නැහැ. විශේෂයෙන්ම ව්‍යාපාර ලියා පදිංචිය සඳහා වන ගාස්තුව පවා අද ඉවත් කර තිබෙනවා. ඊළඟට, ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය තාක්ෂණය ලබාදීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට වේවා, අනෙකුත් අමාත්‍යාංශවලට වේවා කොපමණ මුදලක් ලබාදී තිබෙනවාද කියලා විපක්ෂයේ කණ්ඩායම් අය වැය කථාව බලලා පැහැදිලි වැටහීමක් ලබා ගත්තා නම් හොඳයි කියා මම හිතනවා.

අද අපේ පළාතේ තේ කර්මාන්තය ආශ්‍රිතව යම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා; එහෙම නැතිව නොවෙයි. හැබැයි, මීට අවුරුදු දෙකකට කලිනුත් රසායනික පොහොර සියයට 70යි, කාබනික පොහොර සියයට 30යි යොදා කටයුතු කරන්න පටන් ගත් ව්‍යාපාරය ඇතුළේ අද දක්වාත් සමහර ප්‍රදේශවලට කාබනික පොහොර ටික ලැබුණේ නැත්තේ ඇයි කියන එක හොයලා බලන්න ඕනෑ. මොකක් හෝ කමිටුවක් පත් කරලා හෝ ඒ ගැන සොයා බලන්න ඕනෑ. අද තේවලට හොඳ මිලක් ලැබෙනවා. රුපියල් අනූ ගණනක් ලැබෙනවා. අද රබර්වලට රුපියල් 450ට වැඩි ගණනක් ලැබෙනවා. ඔට්ටපාලුවලට හොඳ මිලක් ලැබෙනවා. සුළු අපනයන භෝගවලට හොඳ මිලක් ලැබෙනවා. ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ ලෙස වී වලට සහතික මිලක් තිබෙනවා. ඒ නිසා අද ඒවා ගැන කාටවත් කථා කරන්න බැහැ. වෙන දා මේ ගරු සභාවේ සටන් පාඨ වන්නේ ඒ මාතෘකා. අතිගරු ජනාධිපතිතුමා පටන් ගත් මේ වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යෑම අපි සියලුදෙනාගේම වගකීමක්. ඉදිරි කාලයේදී ඒ සඳහා අපි සියලුදෙනාම සහයෝගය ලබා දිය යුතුයි කියා මා හිතනවා.

මම විශ්වාස කරනවා, අපට විශාල වශයෙන් බදු ආදායම ලබා ගන්න පුළුවන් ආයතනය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බව. එහි නම් ප්‍රතිව්‍යුහගතකරණයක් වෙන්නම ඕනෑ. තමුන්නාන්සේලා

දන්නවා එහි තිබෙන RAMIS එක සහ e-service එක ගැන. ඒවා යාවත්කාලීන කරන්න ඕනෑ. ශ්‍රී ලංකා රේගුවේ තිබෙන ප්‍රශ්න ගත්තත් එහෙමයි. ඒ ප්‍රශ්න පිළිබඳව අපට දවසක් වුණත් කථා කරන්න පුළුවන්. අපට මේ පෙනෙන ආදායම ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම මෙවර අය වැය තුළ ඒ පද්ධතිවල දුර්වලතා ඉවත් කිරීමට ද යෝජනා කර තිබෙනවා. එම දුර්වලතා නිසා අපට බිලියන ගණනක් අහිමි වෙනවා. ඒ කෙරේ අවධානය යොමුවීමත් බොහොම හොඳ කටයුත්තක් හැටියට තමයි මා දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සීනි මිල සියයට 75කින්, බොරතෙල් මිල සියයට 100කින් වැඩි වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙලා තිබෙන්නේ. කථාව අවසන් කරන්න.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගෑස් මිලත් වැඩි වෙලා තිබෙනවා. ගෑස් මෙට්‍රික්ටොන් එකක මිල අවුරුදු 5කට පස්සේ කොච්චර වෙනස් වෙලා තිබෙනවාද කියලා බලන්න; ඇමෙරිකානු ඩොලර් කීයකින් වෙනස් වෙලා තිබෙනවා ද කියලා බලන්න. මේ ප්‍රශ්න ඔක්කෝම එක්ක තමයි මේ පවතින අභියෝගවලට අප මුහුණ දෙන්නේ. මේකෙන් මැජික් එකක් පෙන්වන්න බැහැ. හැබැයි, ගරු මුදල් ඇමතිතුමා සියලු කොටස්වලට ආවරණය වෙන්න හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අය වැයත් එක්ක අපට ජනතාව දීපු ජනවරම ශක්තිමත් කිරීම සඳහා වැඩ කටයුතු කරමු කියා ඉල්ලා සිටිමින්, තමුන්නාන්සේට ස්තුතිය පළ කරමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ෂාන් විජයලාල් ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

**ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා**
(மாண்புமிகு ஷான் விஜயலால் த சில்வா)
(The Hon. Shan Vijayalal De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටට නිදහස ලැබිලා අවුරුදු 73ක් ඉක්ම ගිය මේ මොහොතේ මේ දක්වා ව්‍යවස්ථාදායකය තුළ මෙවැනි අය වැය ලේඛන රැසක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ උදවිය දකින්නේ, ඉදිරිපත් කළ ඒ හැම අය වැය ලේඛනයක්ම හොඳම අය වැය හැටියටයි. විරුද්ධ පාර්ශ්වය හැම දාම දකින්නේ, ඉදිරිපත් කළ අය වැය ලේඛනය, අය වැය අතර දුර්වලම අය වැය හැටියට. මේ හැමදෙනාම දකින්නේ එහෙමයි. එක ගොල්ලක් අය වැය ගැන සර්ව සුබවාදීව දකිද්දී, අනෙක් උදවිය දකින්නේ සර්ව අසුබවාදීව. නමුත්, මා අදහන ප්‍රතිපත්තිය තුළ මම කිසිදාක සර්ව සුබවාදයත් එක්ක හෝ සර්ව අසුබවාදයත් එක්ක එකඟ වන කෙනෙක් නොවෙයි. සර්ව සුබවාදය සහ සර්ව අසුබවාදය යන දෙකම තිබෙන්නේ යථාර්ථයට බොහොම දුරින් කියලායි මම කල්පනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම ඉතාම දුෂ්කර, අසීරුම අවස්ථාවකට පත්ව තිබෙන මොහොතක තමයි වර්තමාන ගරු මුදල් අමාත්‍යතුමා මේ ගරු සභාවට මේ අය වැය ප්‍රකාශය ඉදිරිපත් කළේ. විශේෂයෙන්ම රට තුළ පවතින ආර්ථික වශයෙන් ඉතා බැරෑරුම්, උග්‍රතම අවස්ථාවක, ජනතාවට බර පටවන්නේ නැතිව මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය හා ප්‍රණාමය පුද කළ යුතු වනවා. මේ අය වැය ලේඛනයේ සඳහන් පරිදි අය වැය හිඟය රුපියල් බිලියන 1,628 යි. අපි දන්නවා, අපේ රටේ ඉතිහාසය තුළ අය වැය ලේඛනයක අය සහ වැය අතර අඩුම පරතරයක් තිබෙන අය වැයක් ඉදිරිපත් කළේ 1970 බලයට පත් වුණු සමඟි පෙරමුණු ආණ්ඩුවේ මුදල් ඇමති දිවංගත ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා බව. ඉන් පසුව ඉදිරිපත් කළ හැම අය වැය ලේඛනයක් තුළම අය වැය හිඟය දිගින් දිගට වැඩි වෙලා තිබෙන බව අපි දැක්කා. අය වැය ලේඛනයක් තුළින් අපි දකින්නේ පවතින රජයේ ආර්ථික උපාය මාර්ග සහ ආර්ථික ප්‍රතිපත්ති. ඒ තුළ පිහිටා තමයි හැම රජයකම මුදල් අමාත්‍යවරයා ඉදිරි වසර වෙනුවෙන් අය වැයක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද ලෝකයේ පවතින තත්ත්වය තුළ, ලෝකයේ හැම රටක්ම නිවැරදි ලෙස සංවර්ධන දිශානතියට ගිය ගමන අතර මඟ නතර වෙලා තිබෙනවා. එහෙම නැත්නම්, ඒ ගමන් මඟේ ආපස්සට ගමන් කරන තත්ත්වය තමයි මුළු ලෝකයේ හැම රටකටම බලපාන පොදු ධර්මතාවක් බවට පත් වෙලා තිබෙන්නේ.

භාණ්ඩ මිලදී ගැනීමේදී මුදල් තිබෙන අයට අද වෙළෙඳ පොළ තුළ පවතින භාණ්ඩ හිඟය බලපා තිබෙනවා. භාණ්ඩ මිලදී ගැනීමේදී මුදල් නැති අයට භාණ්ඩවල අධික මිල සුවිශේෂ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. විද්‍යා විෂයයන්වලින් අධ්‍යාපනය ලැබුවත්, මා දන්නා ආර්ථික විද්‍යාව අනුව වෙළෙඳ පොළ ආර්ථිකය ශක්තිමත් වන තරමට වෙළෙඳ පොළ ඒකාධිකාරය දිනාගත් ව්‍යවසායකයන් ඒ වෙළෙඳ පොළ තුළ ඒකාධිකාරයක් ගොඩ නඟන්නට හැම විටම උත්සාහ දරා තිබෙනවා. ඒ අය විශේෂයෙන්ම තමන්ගේ නිෂ්පාදන වෙළෙඳ පොළට ඉදිරිපත් කරන කොට අධික ලාභයක් තබාගෙන තමයි භාණ්ඩවල මිල ලකුණු කරන්නේ. ඒ එක්කම, ඒ උදවිය තමන්ගේ අමු ද්‍රව්‍ය මිලට ගන්න කොට අදාළ නිෂ්පාදකයාගෙන් ඒ අමු ද්‍රව්‍ය මිලට ගන්නේ අවම මිලකට. උදාහරණයක් වශයෙන් සහල් ප්‍රශ්නය ගනිමු. ගොවියාගෙන් වී මිලදී ගැනීමේදී අනුගමනය කරන ක්‍රමවේදය සහ වෙළෙඳ පොළට සහල් නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය තුළ පෞද්ගලික අංශය මෙම වෙළෙඳ පොළ තුළ තම ඒකාධිකාරය තහවුරු කර ගැනීම නිසා පාරිභෝගිකයා විශාල වශයෙන් අපහසුවට පත් වෙලා තිබෙනවා.

අපි දන්නවා, අපේ රජය බලයට ආ මුල් වකවානුව තුළ කිසිවකුගේ ඉල්ලීමකින් තොරව බදු සමා, බදු සහන ලබා දුන් බව. නමුත්, ඒ කිසිවකින් මේ රටේ සාමාන්‍ය පාරිභෝගිකයාට සෙතක් සැලසුණා කියලා මා හිතන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාසිය තනිකරම ඒ ව්‍යාපාරිකයන් පෞද්ගලිකව භුක්ති වින්දා. ඒ නිසා රටක පෞද්ගලික ව්‍යවසායකත්වය වාගේම රාජ්‍ය ව්‍යවසායකත්වයත් ශක්තිමත් විය යුතු වෙනවා. අපි දැක්කා, දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එතුමියගේ පාලන තන්ත්‍රය තුළ රාජ්‍ය ව්‍යවසායකත්වය ශක්තිමත් කරන්නට පියවර රැසක් ගත් ආකාරය. රාජ්‍ය ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම තුළ පෞද්ගලික ව්‍යවසායකත්වය යම් පීඩනයකට ලක් කිරීම මා කොයි වෙලාවකවත් අපේක්ෂා කරන්නේ නැහැ. නමුත්, මේ අතර පවතින තරගය තුළ එහි වාසිය පාරිභෝගිකයාට අනිවාර්යයෙන් ලැබෙනවා. ඒ කාරණය අපි විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

[ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා]

ලෝකයේ බොහෝ රටවල් පෞද්ගලික ව්‍යවසායකත්වය වෙනුවෙන් නිරන්තරව පෙනී සිටිනවා. පසු ගිය කාලයේ අපේ රටේ ආන්දෝලනාත්මක කතා බහකට ලක් වුණු පොහොර නැවේ ප්‍රශ්නයේදී වේවා, නැඟෙනහිර ජැටිය පිළිබඳ ප්‍රශ්නයේදී වේවා, යුගදනවි බලාගාරය පිළිබඳ ප්‍රශ්නයේදී වේවා ඒ ප්‍රශ්නවලට ඒ අදාළ රටවල ආණ්ඩුව හෝ ආණ්ඩුවේ නියෝජිතයා හැටියට රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන් හෝ නිල වශයෙන් ඍජුව මැදිහත් වූ ආකාරය අපි දැක්කා. ඒ නිසා අපිත් රාජ්‍ය ව්‍යවසායකත්වය පවත්වාගෙන යන අතරතුර, පෞද්ගලික ව්‍යවසායකත්වය වෙනුවෙන් ලබා දෙන්නට පුළුවන් සම්පූර්ණ සහයෝගය ලබා දිය යුතු වෙනවා.

මේ අය වැය ලේඛනය මැතිවරණ සහ දේශපාලන අරමුණු ඉලක්ක කරගෙන ඉදිරිපත් වුවක් නොවෙයි. රටේ පවතින වර්තමාන තත්ත්වය පිළිබඳ නිවැරදි තක්සේරුවක් ලබාගෙන, එම තක්සේරුව තුළ ඉදිරියට යා යුත්තේ කවර ආකාරයෙන්ද කියන එක ගැන මනා අවබෝධයකින් යුතුවයි ගරු මුදල් ඇමතිතුමා මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. කවුරුත් බලාපොරොත්තු නොවුණු මොහොතක, බලාපොරොත්තු නොවුණු ආකාරයෙන් අපට මුහුණ දෙන්නට සිදු වුණු කොවිඩ් වසංගතය නිසා අපේ ආර්ථික ගමන ආපස්සට ගියා. අතිගරු ජනාධිපතිතුමා ආරම්භයේ සිට දැරූ මූලික අදහස වුණේ, 'කොවිඩ් වසංගතය වෙනුවෙන් දිය හැකි හොඳම විසඳුම එන්නත්කරණය' කියන එකයි. ඒ ගැන මම සතුටු වෙනවා.

අද වන විට ලෝකයේ රටවල් අතර එන්නත්කරණය අතින් අපි ඉතාම ඉහළ තැනක සිටිනවා. එය ඉතා වැදගත් කාරණයක්. ඒ වාගේම ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දීම, අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් සහන මල්ලක් ලබා දීම, ව්‍යාපාර කටයුතු ආරම්භ කරන තරුණ පිරිස් වෙනුවෙන් බදු සහන ලබා දීම, ඒ වෙනුවෙන් අවශ්‍ය ණය පහසුකම් ලබා දීම ආදී සියලු දේවල් හරහා, පවතින තත්ත්වය යටතේ වුවත්, රටේ ඉදිරි ගමන වෙනුවෙන් ශක්තිමත් අඩි තාලමක් දමන්නට අය වැය ලේඛනය තුළින් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වැටුප් ගැටලුව දීර්ඝ කාලයක් තිස්සේ පැවැති ආණ්ඩු ගණනාවක්, මේ රටේ බලයේ සිටි පාලකයන් ගණනාවක් වුවමනාවෙන්ම නොසලකා හැරි, අවධානයට ලක් නොකළ කාරණයක්. රට ආර්ථික වශයෙන් මේ තරම් ඉතාම තීරණාත්මක තත්ත්වයකට පත්ව තිබියදීත් අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආශීර්වාදය තුළ ගරු මුදල් අමාත්‍යතුමා මේ අය වැය තුළින් දිය හැකි උපරිම සහන වැඩ පිළිවෙළකට යොමුවීමත් ඉතාම වැදගත් ජාතික කර්තව්‍යයක් හැටියට මා දකිනවා.

විශේෂයෙන්ම මේ අය වැයෙන් රාජ්‍ය සේවකයන් විශ්‍රාම යන වයස් සීමාව අවුරුදු 65 දක්වා දීර්ඝ කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ සාමාන්‍ය ආයු අපේක්ෂණය දශක හය හත අතර ප්‍රමාණයක තිබෙන්නේ. ඒ නිසා අත්‍යවශ්‍ය වූ සේවා සඳහා, එම උදවියගෙන් හැර එම සේවාව ඉටු කරවා ගැනීමේ නොහැකියාව පිළිබඳව කල්පනා කරලා බලලා, යම් විශේෂිත වූ පිරිසකට පමණක් ඒ අවස්ථාව ලබා දීම සුදුසුයි කියන එකයි මගේ පෞද්ගලික මතය. එහෙම නොවුණොත් එක පැත්තකින් රැකියා අපේක්ෂාවෙන් සිටින තරුණ පිරිසට රැකියා ලබා ගැනීමේදී යම් ගැටලුවක් ඇති වෙන්න පුළුවන්.

ඒ එක්කම හිටපු ජනාධිපතිවරුන් ඇතුළු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ලබා ගත හැකි කාල සීමාව පිළිබඳව ඉදිරිපත් කර ඇති යෝජනාව ගැනත් යමක් කියන්නට ඕනෑ. විශේෂයෙන් මම නම් ඒ ගැන පෞද්ගලික අවධානය යොමු කරන්නේ නැහැ. වරප්‍රසාද තිබෙන රැකියාවකට ආයුබෝවන් කියලා, රේගු අධිකාරිවරයෙකු හැටියට ලැබිය යුතු විශ්‍රාම වැටුප අමතක කරලා මම දේශපාලනයට ආපු නිසා මට එය වැදගත් නැති වුණත්, රජය හැටියට පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂියෙන් ඒ පිළිබඳවත් යම් කරුණු විමසීමක් කරනවා නම් වැදගත් බව මගේ පෞද්ගලික විශ්වාසයයි.

ඉතාම අමාරු කරුණු කාරණා රැසක් මධ්‍යයේ ජනතාවට බරක් නොදෙන මෙවැනි අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා රටේ සංවර්ධනය වෙනුවෙන් නව ගමනක් යන්න වැඩ ආරම්භ කරපු වර්තමාන රජයට සහ විශේෂයෙන් ඒ වෙනුවෙන් කැපවුණු මුදල් අමාත්‍යතුමාට අපේ ස්තුතිය, ප්‍රණාමය පළ කරනවා. අපි බලාපොරොත්තු වන ආකාරයට සර්ව සුබවාදීව, බොහෝදුරට අපේ අරමුණු ඉටු වන තැනකට යන්නට ඉඩ සැලසේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මට කාල වේලාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.13]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற 76ஆவது வரவு செலவுத் திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின்மீதான விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இலங்கை மக்களின் பல்வேறு எதிர்பார்ப்புகளுக்கு மத்தியில் ஸ்ரீலங்கா பொதுஜன பெரமுன அரசாங்கத்தின் இரண்டாவது மற்றும் நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களின் முதலாவது வரவு செலவுத்திட்டம் கடந்த வாரம் பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டது. இந்த வரவு செலவுத்திட்டம் தொடர்பாக மக்கள் மிகப் பெரிய நம்பிக்கையையும் எதிர்பார்ப்பையும் வைத்திருந்தனர். ஆனால், கொரோனாப் பெருந்தொற்றின் முதலாவது அலை தொடக்கம் தற்போதுவரை மக்கள் முகங்கொடுத்துவருகின்ற பொருளாதாரப் பின்னடைவுகள் மற்றும் ஏனைய முக்கிய பிரச்சினைகளுக்குரிய தீர்வுகள் எதனையும் உள்ளடக்காத ஒரு வரவு செலவுத்திட்டமாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். இன்று அத்தியாவசிய உணவுப் பொருட்கள், மண்ணெண் ணெய், சமையல் எரிவாயு மற்றும் ஏனைய எரிபொருட்கள் போன்றவற்றின் விலையுயர்வு காரணமாக வாழ்க்கைச் செலவு மிகவும் அதிகரித்துள்ளது; இந்நிலைமை கவலையளிக்கின்றது.

கௌரவ நிதி அமைச்சரின் வார்த்தைகள் மிக அழகாக இருந்தாலும், அவர் முன்மொழிந்துள்ள திட்டங்களை நடைமுறைப்படுத்துவது தொடர்பில் கடந்தகால வரலாற்று அனுபவங்களோடு ஒப்பிட்டு, என்னதான் உத்தரவாதங்களைக் கொடுத்தாலும், அவற்றை எம்மால் நம்ப முடியாமல் இருக்கின்றது. மேலும், நாட்டின் கிராமப்புற வளர்ச்சி,

பிரதேசங்களின் அபிவிருத்தி மற்றும் பெருந்தோட்டத்துறை சார்பாக நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதாகக் குறிப்பிட்டார். ஆனாலும், அதற்கான நிதியை ஈட்டுவதற்காக அரசு எவ்வாறு வருமானத்தைத் தேடிக்கொள்ளப்போகின்றது என்ற விடயம் தொடர்பில் தெளிவான விளக்கங்கள் இல்லை. அதேபோல, ஒவ்வொரு காலாண்டிலும் செலவுசெய்யக்கூடிய நிதியை வருவாயாகத் திரட்டிய பின்னரே, செலவினங்களைச் செய்யமுடியுமெனக் கூறுவதிலும் தெளிவான விளக்கம் இல்லாமல் இருக்கின்றது.

மலையகம் மற்றும் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கான அபிவிருத்தித் திட்டங்கள் மற்றும் அவர்களது பொருளாதார, வாழ்வாதாரப் பிரச்சினைகளைத் தீர்ப்பதற்கான யோசனைகள் என்று பெரிதாகச் சொல்லுமளவுக்கு இதில் எதுவுமே இல்லை. "இன்னும் 03 ஆண்டுகளுக்குள் பெருந்தோட்ட மக்களின் 'லயன்' குடியிருப்புகள் முற்றாக மாற்றம் செய்யப்படும்" என்று கௌரவ நிதி அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருக்கிறார். மலையக மக்களின் வீடமைப்பு அபிவிருத்திக்கென 500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இத்தொகை எந்தவிதத்திலும் போதாது என நாங்கள் இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றோம். இதன்மூலம் ஒரு வருடத்திற்கு கிட்டத்தட்ட 100 வீடுகளைத்தான் கட்டக்கூடிய வாய்ப்பு இருக்கின்றது.

மேலும், 2022ஆம் நிதியாண்டுக்கான அரச வருமானம் 2,284 பில்லியன் ரூபாய் எனவும் அரச செலவினம் 3,912 பில்லியன் ரூபாய் எனவும் கடன் 5,245 பில்லியன் ரூபாய் எனவும் துண்டுவிழும் தொகை 1,628 பில்லியன் ரூபாய் எனவும் இதில் வரையறுக்கப்பட்டிருக்கிறது.

இன்று எமது நாடு எதிர்நோக்கும் அந்நியச்செலாவணி நெருக்கடியால், இலங்கை ரூபாயின் பெறுமதி பாரிய அளவில் வீழ்ச்சி அடைந்திருக்கின்றது. ஏற்றுமதி, இறக்குமதிப் பொருளாதாரம் முன்பு ஒருபோதும் இல்லாத அளவுக்குப் பாதிப்படைந்திருக்கிறது; நாட்டின் உற்பத்தியிலும் வளர்ச்சி யிலும் பின்னடைவு ஏற்பட்டிருக்கிறது. அத்துடன், அந்நியச்செலாவணி மாற்று விகிதத்தில் அதாவது ஓர் அமெரிக்க டொலருக்கு நிகரான ரூபாயின் மதிப்பு பாரிய வர்த்தகத் தளம்பலை ஏற்படுத்தியிருக்கின்றது. இன்று ஓர் அமெரிக்க டொலர் 225 இலங்கை ரூபாய் என்ற அடிப்படையில் விற்பனை செய்யப்படுகின்றது. ஏற்றுமதி வருமானத்தைவிட, இறக்குமதிச் செலவு சடுதியாக அதிகரித்துள்ளது. வரிமூலமாகக் கிடைக்கும் வருமானத்தை விட, அரச செலவினம் அதிகரித்துள்ளது. எமது நாட்டின் அந்நியச்செலாவணிக் கையிருப்பானது தற்போது கவலை யளிக்கின்ற நிலையிலேயே இருக்கின்றது. புதிது புதிதாக அறிவிப்புக்கள் செய்யப்படுவதால் இறக்குமதித் தடைகளும் கட்டுப்பாடுகளும் அதிகரித்துள்ளன. இதனால், அத்தியா வசியப் பொருட்களின் விலைகள் நாளாந்தம் உயர்ந்து கொண்டே போகின்றது. இந்த அரசாங்கம் பண்டங்களுக்கான இறக்குமதிச் சலுகையை ஒரு சிலருக்கு மட்டும் வழங்குகின்ற நிலைமையே காணப்படுகின்றது. அமைச்சர்களின் தலையீடுகள், பாகுபாடுகள், பாரபட்சங்கள் காரணமாக அத்தியாவசியப் பொருட்களுக்குக் கட்டுப்பாடும் தட்டுப்பாடும் ஏற்பட்டிருக்கின்றது. இதனால், இன்று பால்மா, அரிசி, சீனி, பருப்பு, சமையல் எரிவாயு போன்றவற்றை வாங்குவதற்காக மக்கள் நீண்ட வரிசையில் நிற்கவேண்டிய ஒரு துர்பாக்கிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. அதேபோல், இன்று மக்கள் பெற்றோல் மற்றும் டீசலுக்கு வரிசையில் நிற்பதையும் நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

நாட்டின் ஏற்றுமதி, இறக்குமதிப் பொருளாதாரம் சீராகக் கையாளப்படாத காரணத்தினால், அரசாங்கம் நிறையக் கடன்களை வாங்குகின்றது. இதனால், வரவு செலவுத் திட்டத்தில் துண்டுவிழும் தொகையைச் சமாளிப்பதற்காக ஏற்கெனவே வெளிநாடுகளிடமிருந்து வாங்கியுள்ள கடன்கள் தொடர்பாகக் கூடிய நிபந்தனைகளுக்கு கட்டுப்படவேண்டிய கட்டாய நிலை ஏற்பட்டுள்ளது. நாட்டினுடைய இறைமைக்குச் சவால்கள் ஏற்படும் அளவுக்கு இன்று நாட்டில் பெருந்தொகைப் பணம் அச்சிடப்படுகின்றது. சனாதிபதி மேதகு கோட்டாபய ராஜபக்ஷ அவர்கள் பதவிக்கு வந்த பின்னர், கடந்த 2020ஆம் ஆண்டில் மட்டும் சுமார் 65,000 கோடி ரூபாய் பணம் அச்சிடப்பட்டிருக்கிறது. இதனால், நாட்டில் பணவீக்கம் அதிகரித்து, பொருளாதார ரீதியாகப் பாரிய பின்னடைவுகள் ஏற்படப்போகின்றன. திறைசேரி, மத்திய வங்கி, அரச வங்கிகள், ஏனைய வர்த்தக வங்கிகள் மற்றும் நிதி நிறுவனங்கள் மீதான நம்பகத்தன்மை இன்று மக்களுக்கு இல்லாமல் போயிருக்கிறது. மத்திய வங்கியின் ஆளுநராக இருந்த பேராசிரியர் லக்ஷ்மன் அவர்கள், தனக்குக் கொடுக்கப்பட்ட அழுத்தங்களைத் தாங்க முடியாமல், கண்ணீர் மல்க ஊடகங்களில் கருத்துக்கூறி, தனது பதவியை இராஜினாமா செய்த நிகழ்வை நாங்கள் பார்த்தோம். இப்பொழுது, அரசியல்வாதியும் முன்னாள் இராஜாங்க அமைச்சருமான அஜித் நிவாட் கப்ரால் அவர்கள் மத்திய வங்கியின் புதிய ஆளுநராகப் பதவியேற்றுள்ளார். தனித் தனியாக நிறைய விடயங்களை முன்னிலைப்படுத்தி புதிய அமைச்சர்கள் நியமனம் செய்யப்பட்டுள்ளனர். 'வியத்மக' நிபுணர்கள் என்று சொல்லிக்கொள்கின்ற நபர்களின் புதிய நியமனங்கள் அல்லது வறுமையை ஒழிக்கும் நோக்கங்களை வெளிப்படுத்துகின்ற வர்த்தமானி அறிவித்தல்கள் நாளுக்கு நாள் அதிகரித்தபொழுதிலும், அதனூடாகச் சாதாரண மக்களுக்கு எந்தவிதப் பயனும் கிடைப்பதில்லை.

மலையக மக்களைப் பொறுத்தவரையில், அவர்கள் அரசியல், சமூக, பொருளாதார ரீதியான பல்வேறு பிரச்சினை களைத் தீர்க்கவேண்டிய கட்டாய சூழ்நிலையில் வாழ்கின்றனர். இவர்கள் சுமார் 200 வருடங்களுக்கும் மேலாக இந்த நாட்டின் வளர்ச்சிக்காகப் பெரிதும் பாடுபட்டுள்ளனர். எனினும், இவர்களின் அர்ப்பணிப்புக்கு ஏற்றவாறு அவர்களுடைய வாழ்க்கை வசதிகளில் பாரிய மாற்றங்கள் ஏற்படவில்லை. குடியிருப்பு, சுகாதாரம், குடிநீர் வசதி, கல்வி, உயர் கல்வி, போக்குவரத்து, தொழில் வளர்ச்சி, அரசாங்கத் தொழில் வாய்ப்புகள், இளைஞர் - யுவதிகள் தொடர்பான சமூக நலன்கள், வாழ்க்கைச் செலவுக்கேற்ற சம்பளம், காணித் தேவைகள், சுயதொழில் முயற்சிகள் மற்றும் வர்த்தகத்துறைக் கைத்தொழில்கள் போன்ற விடயங்களில் ஏனைய சமூகத் தினருடன் ஒப்பிடும்போது இவர்கள் மிகவும் பின்தங்கிய நிலையிலே காணப்படுகின்றார்கள். இந்த நாட்டில் வாழும் சுமார் 20 இலட்சம் இந்திய வம்சாவளி மக்கள் அரசியல் ரீதியாக, அரசியல் யாப்பு ரீதியாக நிர்வாகம் மற்றும் அபிவிருத்திக் கட்டமைப்புகளில் காலனித்துவக் காலம் தொடக்கம் இன்றுவரை பல தசாப்தங்களாக அநீதிகளுக்கு முகங்கொடுத்து வருகின்றனர். 1947ஆம் ஆண்டில் இந்திய வம்சாவளியினர் சார்பாக ஏழு பேர் பாராளுமன்றத்துக்குத் தெரிவானார்கள். அதன் பின்னர், அம்மக்களுடைய பிரஜாவுரிமை பறிக்கப்பட்டு, அவர்கள் நாடற்ற நிலைக்குத் தள்ளப்பட்டனர். இலங்கை - இந்திய ஒப்பந்தம் காரணமாக இலட்சக்கணக்கான மக்கள் இந்தியாவுக்குப் போய்விட்டனர்.

இலங்கையில் இனப்பிரச்சினை காரணமாகப் பல்வேறு பாதிப்புகளுக்கு எமது மக்கள் உள்ளாகியுள்ளனர். அரசியல், சமூக, பொருளாதார ரீதியில் காட்டப்பட்ட பாரபட்சம்

[ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා]

காரணமாக எமது சமூக அந்தஸ்து பாதிக்கப்பட்ட கடந்த கால வரலாற்றை நாங்கள் மறக்க முடியாது . தற்போது எமது மக்களைப் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய வகையில் ஒரு Cabinet அமைச்சர்கூட நியமிக்கப்படவில்லை. 1978ஆம் ஆண்டுக்குப் பிறகு, அமைச்சரவை அந்தஸ்து இல்லாதவொரு நிலையில் நாமும், இந்த நாட்டின் கௌரவ பிரஜைகள் என்ற பெருமை, ஜனநாயகம் மற்றும் அடிப்படை உரிமைகள் பற்றிய நம்பிக்கையானது கேள்விக்குறியாக இருந்தது. கடந்த நல்லாட்சி அரசாங்கத்தில் நாங்களும் அமைச்சர்களாக இருந்தோம். ஆக்கபூர்வமான தீர்மானங்களின் அடிப்படையில் எமது மக்களின் நிர்வாக அபிவிருத்தி மற்றும் சமூக அந்தஸ்து தொடர்பான பல்வேறு வேலைத்திட்டங்களை ஆரம்பித்தோம். இந்திய அரசினுடைய உதவியின்கீழ் 4,000 வீடுகள் கட்டப்பட்டன. இன்னும், 10,000 வீடுகள் கட்டப்பட வேண்டும். அதற்கான காணிகளைப் பெறுவதில் ஏற்படுகின்ற தேவையற்ற காலதாமதம், ஒத்துழைப்பு இன்மை என்பன எமக்கு கவலையளிக்கின்றது.

மலைநாட்டுப் புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையின் உருவாக்கம் முழுமையாக மூழ்கடிக்கப்படும் நிலையில் உள்ளது. நாங்கள் புதிய பிரதேச சபைகளை உருவாக்கினோம். ஆனாலும், இன்று அவை ஒதுக்கீடுகள் இல்லாமல் இருக்கின்றன. முன்னாள் அமைச்சர்களான கௌரவ மனோ கணேசன், கௌரவ பழனி திகாம்பரம் ஆகியோரது முயற்சியால் பல மாவட்டங்களுக்கு நிதி ஒதுக்கீடுகள் செய்யப்பட்டு, பல அபிவிருத்தி வேலைகள் செய்யப்பட்டன. கல்வி வளர்ச்சிக்காக மட்டும் வரலாற்றில் என்றும் மறக்க முடியாதளவுக்குப் பல பில்லியன் ரூபாய் செலவில் புதிய கட்டிடங்கள் உட்பட ஏனைய வளங்களையும், அடிப்படை வசதிகளையும் வழங்கினோம். ஆயிரக்கணக் கானவர்களுக்கு ஆசிரியர் நியமனங்களை வழங்கினோம். மலையகத்தில் புதிய பல்கலைக்கழகம் ஒன்றின் உருவாக்கத் துக்காக காணியை அடையாளப்படுத்தி, அதற்கான பூர்வாங்கப் பணிகளை முன்னெடுத்தோம். ஆனால், இன்று அது கிடப்பிலே போடப்பட்டிருப்பது மிகவும் வேதனை அளிக்கின்றது.

இந்த வரவு செலவுத்திட்டத்தில் மலையக மக்கள் தொடர்பில் வீடமைப்பு ஒதுக்கீட்டைத் தவிர, வேறு எந்த முன்மொழிவும் இல்லை என்பது எங்களுக்கு ஏமாற்றத்தைத் அளித்திருக்கின்றது. ஆகையால், மாகாண சபை, மாவட்ட அபிவிருத்தி ஒருங்கிணைப்பு மற்றும் உள்ளூராட்சி மன்றங்களின் அடிப்படையில் மலையக மக்கள் குறித்து விரிவான பார்வை செலுத்தப்பட வேண்டும்.

பதின்மூன்றாவது திருத்தச் சட்டம் முழுமையாக நடைமுறைப்படுத்தப்பட வேண்டும். அதிகாரப் பரவலாக்கல் அடிப்படையில் மாகாண சபைகளுக்கான தேர்தல் உடனடியாக நடாத்தப்பட வேண்டும் என்பதையும் அந்தத் தேர்தல் முறைமையானது எமது மக்களின் பிரதிநிதித்துவம் பாதிக்கப்படாத வகையில் உருவாக்கப்பட வேண்டும் என்பதையும் நாங்கள் இங்கு சொல்லிக்கொள்ள விரும்பு கின்றோம்.

அத்துடன், தோட்ட உட்கட்மைப்பு வசதிகளை அதிகரிக்க வேண்டும். சம்பள உயர்வு மற்றும் ஏனைய நலன்களைப் பாதுகாப்பதில் அரசாங்கம் கூடுதல் கவனம் செலுத்த வேண்டும். மலையகக் காணிகளை வெளியாருக்குக் கொடுக்க வேண்டாம். எமது மக்களை சிறுதோட்ட உரிமையாளர்களாக மாற்றுவதன்மூலம் தேயிலை உற்பத்தி சார்ந்த விவசாயத் துறையில் வளர்ச்சியடையலாம். பால் வளத்தை அதிகரிக்கச் செய்யும் வகையில், பத்து இலட்சம் கறவைப் பசுக்களை மலையகத் தோட்டபுற மக்களுக்கு வழங்கும் திட்டத்தை ஆரம்பிக்க வேண்டும். அத்துடன், தோட்டங்களில் பயிர்ச் செய்கை செய்யப்படாத காணிகளை கால்நடை வளர்ப்புக்கு ஒதுக்க வேண்டுமெனவும் நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, நான் இங்கு முக்கியமான இரண்டு விடயங்களைச் சொல்ல வேண்டும். முதலாவது, அண்மையில் நுவரெலியா மாவட்டத்தின் லிந்துலை - நாகசேனையில் அமைந்திருந்த Sacred Heart of Jesus என்ற கிறிஸ்தவ மதத்துக்குரிய சிலை உடைக்கப்பட்டிருக்கின்றது. இதனை மிகவும் மோசமானதொரு செயலாகவே அந்த மக்கள் பார்க்கின்றார்கள். ஏனென்றால், கிறிஸ்தவர்களுக்கும் பௌத்தர்களுக்கும் அல்லது கிறிஸ்தவர்களுக்கும் முஸ்லிம் களுக்கும் அல்லது கிறிஸ்தவர்களுக்கும் இந்துக்களுக்கும் இடையிலே ஒரு முரண்பாட்டை ஏற்படுத்துவதற்காகவா இவ்வாறு செய்யப்பட்டது? என அவர்கள் கேள்வி எழுப்புகின்றார்கள். ஆகையால், இதன் பின்னணியில் யார் இருக்கின்றார்கள் என்பதை நாங்கள் தெரிந்துகொள்ள விரும்புகின்றோம் என்பதையும் இந்தச் சபைக்குச் சொல்லிக் கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, முன்னாள் அமைச்சர் அமரர் ஆறுமுகன் தொண்டமான் அவர்களின் காலத்தில் கொட்டகலையில் பத்து ஏக்கர் காணி அங்குள்ள மக்களுக்குப் பிரித்துக் கொடுப்பதற்காக ஒதுக்கப்பட்டிருந்தது. ஆனால், இப்பொழுது அதை இராணுவத்துக்குக் கொடுப்பதற்கு முயற்சிகள் இடம்பெறுவதாக நாங்கள் அறிகின்றோம். அந்த வகையில், அது இராணுவத்துக்கு ஒதுக்கப்பட இருக்கின்றதா? என்பதை நாங்கள் அறிய விரும்புகின்றோம். அதை இராணுவத்துக்குக் கொடுத்தால், நிச்சயமாக நாங்கள் அதனை எதிர்ப்பதற்குப் பின்நிற்கமாட்டோம். ஏனென்றால், கடந்த காலங்களில் commercial போன்ற பகுதிகளிலே இராணுவத்தளம் அமைக்கப்பட்டிருக்கின்றது. இப்பொழுது அந்த 10 ஏக்கர் காணியையும் இராணுவத்துக்கு ஒதுக்கிக் கொடுத்தால், இன்று வடக்கு, கிழக்கிலுள்ள மக்கள் எப்படி இராணுவ அடக்குமுறையின்கீழ் வைக்கப்பட்டிருக்கிறார்களோ, அதே போன்றதொரு சூழ்நிலை தமிழர்கள் அதிகமாக வாழும் மலையகத்திலும் ஏற்படும். மலையகத்தில் வாழ்கின்ற நாங்கள் தனி நாடு - தனி இராச்சியம் கேட்கவில்லை. ஏனைய மக்களோடு சேர்ந்து வாழ்வதையே நாங்கள் விரும்புகின்றோம். அவ்வாறானதொரு சூழ்நிலையில் இவ்வாறானதோர் அடக்கு முறையை எங்களுடைய பகுதியில் பிரயோகிக்க முனைவது என்பது மிக மோசமான ஒரு செயலாக இருக்கும் என நான் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக நான் ஒரு விடயத்தைச் சொல்லி முடிக் கின்றேன். 'ஜனவசம' எனப்படும் JEDBஇன்கீழ் வேலை செய்யும் எமது மக்களுக்குரிய கடந்த மாதச் சம்பளம் இன்றுவரை கொடுக்கப்படவில்லை.

අද වන කල් පඩි දීලා නැහැ, JEDB එක. ඒක ඉතාම අසතුටුදායක තත්ත්වයක්. ඒ නිසා කරුණාකරලා ඒකටත් විසඳුමක් සොයා දෙන්න කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ කථාවේදී සඳහන් කළ පිළිමය කඩා බිඳ දැමීම සම්බන්ධ කාරණය ගරු

කථානායකතුමාගේ අවධානය සඳහා යොමු කරනවා. *[බාධා කිරීමක්]* කුමන ආගමකට අයිති දෙයක් වුණත් ඒ කාරණාව පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියලා ගරු කථානායකතුමාට මේ කාරණය යොමු කරන්නම්.

මී ළඟට, ගරු එම්. රාමේෂ්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.27]

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**
(மாண்புமிகு எம். ராமேஷ்வரன்)
(The Hon. M. Rameshwaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ நிதியமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற முதலாவது வரவு செலவுத் திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் அளித் தமைக்கு உங்களுக்கும் கொரோனா பெருந்தொற்று காரணமாக நாடு பொருளாதார ரீதியாகப் பின்னடைந் திருந்தாலும், நாட்டு மக்கள்மீது மேலும் சுமைகளை ஏற்றாமல் நல்லதொரு வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்திருக்கின்ற எங்களுடைய நிதியமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களுக்கும் முதலில் நன்றி கூறுகின்றேன்.

இன்றும் நேற்றும் இங்கு பேசிய சில பாராளுமன்ற உறுப்பினர்கள் இம்முறை வரவு செலவுத்திட்டத்தில் பெருந் தோட்ட மக்களுக்கு வீடுகளை அமைப்பதற்கென எதிர்வரும் 03 வருடங்களுக்குள் 500 மில்லியன் ரூபாய்தான் ஒதுக்கியிருப் பதாகக் கூறியிருந்தார்கள். அது முற்றிலும் தவறான ஒரு கருத்தாகும். தோட்ட வீடமைப்பு மற்றும் சமுதாய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர் கௌரவ ஜீவன் தொண்டமான் அவர்களுடைய அமைச்சுக்கு 2,000 மில்லியன் ரூபாய்க்கும் மேற்பட்ட நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அதற்கு மேலதிகமாகத்தான் கௌரவ நிதியமைச்சர் அவர்கள் பெருந்தோட்ட மக்களின் வீடமைப்புக்கென 500 மில்லியன் ரூபாய் நிதியை ஒதுக்கீடு செய்திருக்கின்றார். கடந்த வருடமும் பல மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, பெருந்தோட்ட மக்களுக்குப் பல்வேறு சேவையாற்றியதை நாங்கள் இங்கு நினைவுகூர வேண்டும். இவ்வாறானதொரு நிலையில், "இந்த வரவு செலவுத்திட்டத்தில் பெருந்தேட்ட மக்களுக்கு ஒன்றும் இல்லை" என்று நேற்றும் இன்றும் பேசிய சில பாராளுமன்ற உறுப்பினர்கள் கருத்துக் கூறியிருந்தார்கள். அது முற்றிலும் பிழையான கருத்தாகும். பெருந்தோட்ட மக்கள்சார்ந்த இராஜாங்க அமைச்சுக்கு ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்ற நிதிக்கு மேலதிகமாகத்தான் அங்கிருக்கின்ற 'லயன்' அறைகளை நீக்கிவிட்டுத் தனி வீடுகளை அமைக்கவென 500 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது.

முன்னாள் சனாதிபதி கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில்தான் பெருந்தோட்ட மக்களுக்குப் பல்வேறு சேவைகள் ஆற்றப்பட்டன என்பதை நாங்கள் மறந்துவிட முடியாது. அதிலும் குறிப்பாக, மறைந்த தலைவர் ஆறுமுகன் தொண்டமான் ஐயா அவர்கள் அமைச்சராக இருந்தபொழுதுதான் மலையகத்திலே பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் மேற்கொள்ளப்பட்டன. தனிவீட்டுத் திட்டம், கல்வி வளர்ச்சிக்குத் தேவையான பாடசாலைக் கட்டிடங்கள் மற்றும் ஆசிரியர் நியமனங்கள் எனப் பல்வேறு விடயங்கள் மேற்கொள்ளப்பட்டன. அதேபோன்றுதான், இந்த ஆட்சிக் காலத்திலும் கௌரவ இராஜங்க அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்களுடைய அமைச்சுக்குப் பல மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, பல்வேறு வேலைத் திட்டங்களை நாங்கள் மலையகத்திலே நடைமுறைப்படுத்தி வருகின்றோம்.

கடந்த நல்லாட்சி அரசாங்கத்தின் நான்கரை வருட காலத்தில் பெருந்தோட்டப் பகுதியில் 3,000 வீடுகள் மாத்திரமே நிர்மாணிக்கப்பட்டு இருக்கின்றன. எங்களுடைய இராஜாங்க அமைச்சினூடாக இந்த வருடம் 700க்கும் மேற்பட்ட தனி வீடுகளுக்கான நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்டிருக்கின்றன. அதேபோன்று, இந்திய அரசாங்கத்தால் வழங்கப்பட்ட 4,000 வீடுகளில் 3,000க்கும் மேற்பட்ட வீடுகளுக்குத் தேவையான குடிநீர், போக்குவரத்து போன்ற உட்கட்டமைப்பு வசதிகளுக்கென எங்களுடைய இராஜாங்க அமைச்சர் கௌரவ ஜீவன் தொண்டமான் அவர்களின் அமைச்சினூடாக இந்த வருடம் 522 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு, அவை பூர்த்தியாக்கப் பட்டிருக்கின்றன. அதேபோன்று, 10,000 வீடுகளைக் கொண்ட இந்திய வீட்டுத் திட்டம் கிடப்பில் இருப்பதாகக் கூறினார்கள். அவ்வாறல்ல, எதிர்வரும் வாரங்களிலே எங்களது அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்களுடைய அமைச்சுக்கும் இந்திய அரசாங்கத்துக்கும் இடையே ஒரு புரிந்துணர்வு ஒப்பந்தம் கைச்சாத்திடப்பட இருக்கின்றது. அதற்குப் பிற்பாடு, நாங்கள் இந்த வீட்டுத் திட்டத்தை ஆரம்பிப்பதற்குத் தயாராக இருக்கின்றோம்.

பாராளுமன்றத்தில் சிலர் தமிழில் உரையாற்றும்பொழுது, அரசாங்கத்தைப் பல்வேறு விதமாக விமர்சிக்கின்றார்கள். ஆனால், வெளியில் சென்று சிங்களத்தில் உரையாற்றும் பொழுது, அரசாங்கத்துக்கு ஆதரவு போன்று பேசுகின்றார்கள். இவர்களது அரசியல் இவ்வாறுதான் இருக்கின்றது. எங்களைப் பொறுத்தவரையில், நாங்கள் அரசாங்கத்துடன் இருந்தாலும் சரி, வெளியில் இருந்தாலும் சரி, இருக்கின்ற அரசாங்கத்தோடு பேசி, எங்களுடைய மக்களுக்கு என்னென்ன தேவையோ அவற்றைத்தான் செய்துவந்திருக்கின்றோம். அந்தவகையில், மலையக மக்களுக்குச் சேவையாற்றிய அரசாங்கம் என்றால், அது மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கம் என்பதை யாரும் மறந்துவிட முடியாது. அவருடைய ஆட்சிக் காலத்தில்தான் - அவர் இரண்டுமுறை சனாதிபதியாக இருந்தபொழுதுதான் - எங்களுடைய மறைந்த தலைவர் ஆறுமுகன் தொண்டமான் அவர்களால் பல்வேறு சேவைகள் ஆற்றப்பட்டன.

இங்கு பிரஜாவுரிமை சட்டம் பற்றிக் கூறப்பட்டது. மலையக மக்களுக்குப் பிரஜாவுரிமையைப் பெற்றுக் கொடுத்ததும் தொண்டமான் ஐயாதான். அதேபோன்று, தற்போதை நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள் பொருளாதார அபிவிருத்தி அமைச்சராக இருந்த பொழுது, மலையக மக்களுக்குப் பல்வேறு சேவைகளை ஆற்றியிருக்கின்றார். ஆறுமுகன் தொண்டமான் ஐயா என்னென்ன அபிவிருத்தித் திட்டங்களைக் கேட்டாரோ, அவற்றுக்கெல்லாம் நிதியை ஒதுக்கீடு செய்துகொடுத்து, அவற்றை மலையகப் பகுதியில் மேற்கொண்டிருக்கிறார். அதேபோன்றுதான் இன்று எங்களுடைய தலைவர் கௌரவ ஜீவன் தொண்டமான் அவர்களுடைய இராஜாங்க அமைச்சுக்குச் செய்யப்பட்டுள்ள நிதி ஒதுக்கீட்டுக்கு மேலதிகமாகத்தான் இந்த 500 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது.

நேற்றைய தினம் இங்கு உறுப்பினர் ஒருவர் உரையாற்றும் போது, "உள்ளூராட்சி மன்ற உறுப்பினர்களுக்கு ஒதுக்கப்படு கின்ற நிதியைப் போன்றுதான் ஜீவன் தொண்டமான்

[ගරු එම්. රාමේෂ්වරන් මහතා]

அவர்களுடைய அமைச்சுக்கும் இந்த அரசாங்கம் நிதி ஒதுக்கி இருக்கின்றது" என்று கூறியிருந்தார். அவர் இந்தப் பாதீட்டை முழுமையாகப் பார்க்காமல்தான் இவ்வாறு கூறியிருக்கின்றார் என்று நான் நினைக்கின்றேன். உள்ளூராட்சி மன்ற உறுப்பினர்களுக்கும் அமைச்சர்களுக்கும் வித்தியாசம் தெரியாமல் இங்கு சில பாராளுமன்ற உறுப்பினர்கள் பேசுகின்றார்கள். ஒவ்வோர் உள்ளூராட்சிப் பிரிவும் அபிவிருத்தி செய்யப்பட வேண்டும் என்பதற்காக இந்த வரவு செலவுத்திட்டத்திலே எல்லா உள்ளூராட்சிப் பிரிவுகளுக்கும் நிதியொதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அதையும் இவர்கள் மறந்துவிட்டார்கள். நாட்டின் பொருளாதாரம் எந்தளவுக்கு வீழ்ச்சியடைந்திருந்தபோதிலும், அந்தச் சுமையை மக்கள்மீது ஏற்றாமல், இந்த அரசாங்கம் பல்வேறு அபிவிருத்தித் திட்டங்களுக்கு நிதியொதுக்கீடு செய்திருக்கின்றது.

இந்த நாட்டிலே அதிபர்கள், ஆசிரியர்களின் சம்பளப் பிரச்சினை 20 வருடங்களுக்கும் மேலாக இருந்துவருகின்றது. இக்காலப்பகுதியிலே பல அரசாங்கங்கள் ஆட்சியில் இருந்திருக்கின்றன. எனினும், இன்று அந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு பல மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப் பட்டிருக்கின்றது. பெருந்தோட்டப் பகுதியின் கல்வி வளர்ச்சிக்கும் கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கம்தான் பல்வேறு உதவிகளைச் செய்திருக்கின்றது.

மறைந்த தலைவர் அமரர் தொண்டமான் ஐயா அவர்கள் அமைச்சராக இருந்தபொழுது, ஆசிரியர் நியமனங்கள், பட்டதாரி ஆசிரியர் நியமனங்கள், உதவி ஆசிரியர் நியமனங்கள் என 7,000க்கும் மேற்பட்டவர்களுக்கு ஆசிரியர் நியமனங்களைப் பெற்றுக்கொடுத்தார். கடந்த நான்கரை வருட நல்லாட்சிக் காலத்தில் இவர்களால் உதவி ஆசிரியர் நியமனங்களைக்கூடச் சரியாகப் பெற்றுக்கொடுக்க முடியவில்லை. நாங்கள் மீண்டும் ஆட்சிக்கு வந்த பிற்பாடுதான் 2,000க்கும் மேற்பட்டவர்களை அரச சேவைக்குள் உள்வாங்கினோம். இன்னும் 800க்கும் மேற்பட்டவர்கள் அரச சேவைக்குள் உள்வாங்கப்படாமல் இருக்கின்றார்கள். இது தொடர்பில் எங்களுடைய தலைவர் ஜீவன் தொண்டமான் அவர்கள் கௌரவ நிதியமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களுடன் கலந்துரையாடி, கூடிய விரைவில் அவர்களுக்கும் நிரந்தர நியமனங்களைப் பெற்றுக்கொடுக்க ஆவன செய்யவிருக்கிறார்.

மலையகத்துக்குச் சேவை ஆற்றப்பட்டிருக்கின்றது என்றால், அது முன்னாள் சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களது ஆட்சிக் காலத்தில் இலங்கைத் தொழிலாளர் காங்கிரஸினால்தான் என்பதை யாரும் மறந்துவிடக்கூடாது. முன்னாள் சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில், தொண்டமான் ஐயா அவர்கள் பெருந்தோட்டப் பகுதிகளிலுள்ள பாதைகளுக்கு 'கார்பட்' இடும் வேலைத்திட்டத்தைக் கொண்டுவந்தார். நல்லாட்சி அரசாங்கக் காலத்தில் அதுவும் நிறுத்தப்பட்டிருந்தது. இன்று பல தோட்டங்களிலுள்ள பாதைகள் 'கார்பட்' பாதைகளாக மாற்றப்பட்டிருக்கின்றன. இவ்வாறான அபிவிருத்திகளை நாங்கள் மலையகத்தில் மேற்கொண்டது முன்னாள் சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களின் ஆட்சிக் காலத்தில்தான்.

தற்போதைய சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்கள் மலையக மக்களுக்குப் பல வாக்குறுதிகளைக் கொடுத்திருக் கின்றார். அவற்றை கௌரவ நிதியமைச்சர் அவர்களுடன் இணைந்து கலந்துரையாடி, எங்களுடைய தலைவர் ஜீவன் தொண்டமான் அவர்களுடைய அமைச்சினூடாக நிச்சயமாக இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் நிறைவேற்றிக்கொடுக்கும் என்று நான் கூறுகின்றேன். நல்லாட்சி அரசாங்கக் காலத்தில் தோட்டத் தொழிலாளர்களுக்கு வெறுமனே 50 ரூபாய் அதிகரிப்பதாக வாக்குறுதியளிக்கப்பட்டது. அப்போது அரசாங்கத்திலிருந்த இவர்களால் அதைக்கூடப் பெற்றுக் கொடுக்க முடியவில்லை. இவ்வாறானதொரு சூழ்நிலையில், அண்மையிலே இவர்கள் 'தொண்டமான் பவுண்டேசன்'இனால் நடாத்தப்படும் 'பிரஜா சக்தி' நிலையத்தில் பணிபுரிகின்றவர் களுக்குச் சம்பளம் வழங்கவில்லை என்றும் அதனால் நாங்கள் அரசாங்கத்திலிருந்து வெளியேறவேண்டுமென்றும் கூறினார்கள். அரசாங்கத்திலிருந்து வெளியேற வேண்டியவர்கள் நாங்கள் அல்லர். அந்த 50 ரூபாயைக்கூட பெற்றுக்கொடுக்க முடியாத இவர்கள்தான் அன்று நல்லாட்சி அரசாங்கத்திலிருந்து வெளியேறியிருக்க வேண்டும். ஆகையால், எங்களுடைய மலையக மக்களுக்கு எவற்றை யெல்லாம் செய்யவேண்டுமோ, அவற்றை எங்களுடைய இராஜாங்க அமைச்சினூடாகவும் சரி, அரசாங்கத்தினூடாகவும் சரி நிச்சயமாக இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் செய்துகொடுக்கும் என்று கூறி, சந்தர்ப்பமளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රෝහණ දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වුණු මහජන නියෝජිතයෙකු විධියට, ලංකාවේ 76වැනි අය වැය ලේඛනය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන විශේෂයෙන්ම මම සතුටු වෙනවා. ඒ වාගේම මම සතුටු වෙනවා, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ මුදල් ඇමතිතුමා ඇතුළු මේ රජය අපේ රටේ දමිළ ජනතාවට සිදු කරන සේවාව පිළිබඳව අපේ ගරු රාමේෂ්වරන් මන්ත්‍රීතුමා සඳහන් කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයම භීෂණයෙන් වෙළාගත් කොවිඩ්-19 ව්‍යසනයට එරෙහි මහා සෞඛ්‍ය අරගළයක් කරමින්, එය ඉතා ප්‍රශස්ත ලෙස කළමනාකරණය කර ගත් රටක පාර්ලිමේන්තුව නියෝජනය කරමින් එහි 76වැනි අය වැය වෙනුවෙන් කථා කිරීමට ලැබීම ගැන මා සතුටු වෙනවා. අනපේක්ෂිත ලෙස සියල්ල උඩු යටිකුරු වී ගිය පරිසරයක් තුළ ජාතික ආර්ථිකය සමතුලිත ලෙස කළමනාකරණය කිරීම ඉතා දුෂ්කර බව අද වෙනතෙක් විපක්ෂය තේරුම් අරගෙන නැහැ. නමුත් මේ රටේ බුද්ධිමත් ජනතාව දන්නවා, මෙවැනි ස්වාභාවික විපතක් සිදු නොවුණේ නම් මේ රට අද වන විට පවතින තත්ත්වය පිළිබඳව. මෙවැනි ව්‍යසනයක් නොතිබුණා නම්, අපේ රට සුවිශේෂී ආර්ථික, සාමාජික සහ දේශපාලනික ස්ථාවරභාවයකට පැමිණීමට නියමිතව තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු ක්‍රමයට ඉතා වැදගත් සංශෝධන එකතු කිරීම, සහන අවශ්‍ය වන අංශ හඳුනාගෙන ඒ සඳහා ක්‍රියා මාර්ග ගැනීම, මූල්‍ය විනය ස්ථාපනය සඳහා ක්‍රියා කරමින් අත්‍යවශ්‍ය කටයුතුවලට ප්‍රමුඛතාව දීම, ග්‍රාමීය ආර්ථික පුනර්ජීවනය සඳහා විශාල ලෙස ප්‍රතිපාදන වෙන් කිරීම, ගරු

විදුහල්පතිවරුන්ගේ සාධාරණ වැටුප් ප්‍රශ්නයට සර්ව සුබවාදී ක්‍රියා මාර්ගයකට එළඹීම වැනි ඉතාම වැදගත් තීරණ රාශියක් සහිතව මෙම අය වැය ඉදිරිපත් කර තිබෙනවා. මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" මෙන්ම, ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමාගේ එදා "මහින්ද චින්තන" සංග්‍රාමික ජාතික සංවර්ධන සැලසුම් තවදුරටත් සවිබල ගන්වනු පිණිස මෙම අය වැය හරහා ක්‍රියා කර ඇති බව ඉතා පැහැදිලිව පෙනෙනවා. සමස්ත ලෝක ආර්ථිකයම සංකම්පනය වී තිබියදී වුවද, අපේ රට තුළ යෝධ අනාගත සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ප්‍රගතිශීලී කාර්ය සැලැස්ම අය වැය තුළින් බල ගැන්වීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාටත්, ගරු ජනාධිපතිතුමාටත් අපේ ගෞරවය පිරිනමනවා.

Hon. Presiding Member, everyone of this country should be very happy with this Budget because all the possible measures have been taken to strengthen the economy by making budgetary allocations for all the sections which are important for the stabilization of our economy. අපේ ආර්ථිකය ස්ථාවර කර ගන්න ඒ ගත්ත ක්‍රියා මාර්ග පිළිබඳව අපි හැමෝම ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ බදු ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී "සරදියෙල් න්‍යාය" ක්‍රියාත්මක කරන්න බැහැ. පෞද්ගලික අංශයේ ලක්ෂ 70කට වඩා විවිධ ක්ෂේත්‍රවල රැකියා කරනවා. ඔවුන් වැඩ කරන සමාගම්වල හිමිකරුවන්, ධනවතුන් බව සත්‍යයි. එහෙත් අසීමිත බදු බරක් ඔවුන් මත පටවා එම සමාගම් කඩා වැටීමට සලස්වන්න බැහැ. මල නොතළා රොන් ගත්ත ආකාරයට බදු ගත්ත ගරු මුදල් ඇමතිවරයකු වශයෙන් තමයි මම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දකින්නේ. එම නිසායි ඉතා ක්‍රමවත්ව අධ්‍යයනය කොට මෙම බදු සංශෝධන යෝජනා කර තිබෙන්නේ. කෙටිකාලීන සැනසිල්ලකට වඩා දිගුකාලීන සමාජ ආර්ථික ප්‍රගමනය අරමුණු කරගෙනයි මෙම අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. කුණාටුවකට හසුවූ නැවක කිසිම දෙයක් නිශ්චිතව තබන්නට බැහැ වාගේ කොවිඩ්-19 කියන කුණාටුවට හසුවූ ලෝක ආර්ථිකය කියන නැව තුළත් කිසිම රටක් ස්ථාවර නැහැ. එහෙත්, ශ්‍රී ලාංකීය රාජ්‍ය කළමනාකරණ උපාය මාර්ග හේතුවෙන් අප මේ තත්ත්වයේ හෝ සිටිමින් මෙවැනි ආකාරයේ අය වැයක් ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. ඒ නිසා මම මෙය දකින්නේ, ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ ධනාත්මක අය වැය ලේඛනයක් විධියටයි. විශිෂ්ට ඉන්දියානු නායකයකු වූ ලාල් බහදූර් ශාස්ත්‍රී මහතා ප්‍රකාශ කළා, සංවර්ධනයක් අපේක්ෂා කරන රටවල් අනාගත අභියෝග පරාජය කිරීමේදී "අධ්‍යාපනයට එන අභියෝග" පරාජය කිරීමට ප්‍රමුඛතාව දිය යුතු බව. මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට බිලියන 109ක් වැනි මුදලක් ලබා දෙන්නත්, ගුරු-විදුහල්පති වැටුප් ප්‍රශ්නය වෙනුවෙන් බිලියන 30ක මුදලක් වෙන් කරන්නත් මේ අය වැය හරහා කටයුතු කරලා තිබෙනවා. අවුරුදු 24ක් පුරා පැවති මේ රටේ ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳන්න කාටවත් බැරි වුණා. රාජ්‍ය නායකයන් කිහිප දෙනෙකුට, ආණ්ඩු කිහිපයකට විසඳන්න නොහැකි වුණු මේ ප්‍රශ්නය අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු මුදල් ඇමතිතුමාත් මැදිහත් වෙලා විසඳීම පිළිබඳව අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ.

එවන් විශිෂ්ට ලෝක නායකයකුගේ මඟ ගනිමින් සමස්ත පාසල් පද්ධතියටම අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැලසීම සඳහා ක්‍රියා කිරීම මඟින් අපට දේශයේ අනාගතය පිළිබඳව ශුභවාදීව සිතීමට අවශ්‍ය පදනම දමා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Sir, let me give a big thank you to the Hon. Basil Rajapaksa for the timely step that has been taken to empower the entire system of education with modern technology. It is the best investment that the country can make, which is necessary for the country to achieve its development goals in the long run.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිව යුතු කරුණු කාරණා බොහොමයක් තිබෙනවා.

රතු ඉන්දියානු නායක සියැටල් ප්‍රකාශ කළ පරිදි, මේ පොළොව අපේ මව හා සමානයි. අපේ භූමිය සුරක්ෂා කිරීම සඳහා කළ යුතු වැදගත්ම කාර්යය වන්නේ රසායනිකව සිදුවන විනාශය වැළැක්වීමයි. ඔහු දස පනත - Ten Commandments - ඉදිරිපත් කළා. සියැටල් පරිසරයට ආදරය කළ වැදගත් නායකයෙක්. ඒ නායකයා කියපු කාරණයත් එක්ක "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉදිරියට ගෙනෙන්න කටයුතු කිරීම වැදගත් කාරණයක්. ඒ සඳහා කාබනික වගාව දිරි ගැන්වීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුයි. ඒ වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. සමහරු ප්‍රශ්න කරනවා, අනාගතයේදී සිදුවන අස්වැන්න අඩුවීමට වන්දි ගෙවීම සඳහා මුදල් වෙන් කළේ නැහැයි කියලා. එහෙම අස්වැන්න අඩු වේවායි කියලා අපි හිතන්නේ නැහැ. එහෙම විපතක් මේ රටට සිද්ධ වේවායි කියලාත් අපි කල්පනා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අපේ රජය හැම විටම සූදානම්. එය ඉතිහාසය විසින් ඔප්පු කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ අපේ කැබිනට් මණ්ඩලය තීරණවලට එළඹෙන්නේ සියලු සාධක සලකා බලායි. එම නිසා අපේ රටේ ජනතාවට යම් දුර්භාග්‍යයක් එළඹේ නම්, එහිදී අපේ රජය කොන්දේසි විරහිතව ඔවුන් රැක ගැනීම සඳහා ක්‍රියා කරන බව ජනතාව දන්නවා. පවතින ලෝක ආර්ථික අර්බුදය හමුවේ අප රටද දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටියත් ඒවා සමනය කර ගනිමින් රටේ අනාගත අභිවෘද්ධිය උදෙසා මෙන්ම ජනතාවගේ ප්‍රාර්ථනා ඉෂ්ට කිරීම සඳහා අපි මේ අය වැය හරහා ක්‍රියාත්මක වන බව මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ. ඒ තුළින් අපේ ජාතික සංවර්ධන ඉලක්කවලට ළඟා වීමෙන් නිරෝගී දේශයක් නිර්මාණය කිරීමට ක්‍රියා කරන බවත් මෙම අය වැය තුළින් ජනතාව වෙත දන්වා තිබෙනවා.

ඔබතුමන්ලාට මතක ඇති, 2015 දී අපි ආර්ථික සංවර්ධන වේගය සියයට 7.5 සීමාව පහුකර තිබුණ බව. 2019 වනකොට එවකට තිබුණු කාලකණ්ණි ආණ්ඩුව එය සියයට 2.5ක් බවට පත් කළා. ආණ්ඩුව භාරගෙන මාසයයි දවස 14ක් යනකොට පළමුවන හොරකම පටන් ගත්තා. ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ල කන්න පටන් ගත්තා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වංචාව රුපියල් මිලියන 26,000යි. රවි කරුණානායක මහත්මයාගේ ප්‍රාඩෝ වංචාව රුපියල් බිලියන 2යි. ඒ පිළිබඳව ගැටලුවක් තිබුණා. එදා ඒ හොරකම් තිබුණා. මලික් සමරවික්‍රම මහත්මයාගේ, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය සීමාවෙලා තිබෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
රක්ෂණ වංචාව රුපියල් බිලියන 1යි. වී අලෙවි මණ්ඩලයේ වංචාව රුපියල් මිලියන 2යි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ Airbus ගනුදෙනුව සම්බන්ධයෙන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වංචාව, විශ්වවිද්‍යාල මුදල් වංචාව රුපියල් බිලියන 54යි. ඒ වාගේම වරායේ වංචා සිදු කළා. ඒ වාගේම රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ වංචා තිබුණා, වාහන කැබලි කිරීමේ වංචා තිබුණා. ඒ වාගේම සෞඛ්‍ය වංචා තිබුණා. රටේ මෙතෙක් තිබුණු ආණ්ඩු, පසුගිය ආණ්ඩුව සහ වර්තමාන ආණ්ඩුව ගැන කල්පනා කර බලන්න. පසුගිය ආණ්ඩුව ඩොලර් මිලියන 5,500ක් ගත්තා. ඒ මුදල්වලින් කිසිවක් කරන්න බැරි වුණා. හැබැයි අපේ ආණ්ඩුව ඒ ණයත් අරගෙන, රටේ ජනතාවගේ අනාගත ශුභ සිද්ධිය සඳහා, රටේ සංවර්ධනය සඳහා කටයුතු කරන බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.44]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஃரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பத்தை அளித்தமைக்காகத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இலங்கை மக்களின் குரல் வளைகள் நசுக்கப்பட்டு, அவர்கள் சுவாசிக்கக் கஷ்டப்பட்டுக்கொண்டிருக்கின்ற வேளையிலே, இந்தப் பாதீட்டின்மூலம் செயற்கைச் சுவாசமாவது வழங்குவார்கள் என்று இந்த நாட்டின் மக்கள் எதிர்பார்த்தவேளை, உங்களுக்குச் செயற்கைச் சுவாசங்கூட வழங்கமாட்டோம் என்பதை நிதியமைச்சர் பெஸில் ரோஹண ராஜபக்ஷ அவர்கள் இந்தப் பாதீட்டின்மூலம் மக்களுக்குக் கூறியிருக்கின்றார். பெஸில் ரோஹண ராஜபக்ஷ அவர்கள் பாராளுமன்றத்துக்கு வருகின்ற சந்தர்ப்பத்திலே, "அவருக்கு 7 அறிவு உள்ளது" என்றார்கள்; "அவர் மக்களுக்கு நிவாரணம் வழங்குவதற்காக வருகின்றார்" என்றார்கள்; "எரிபொருட்களின் விலையைக் குறைப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பார்" என்றார்கள். இவ்வாறு பல கதைகள் சொன்னார்கள். இன்று எவ்வாறான நிவாரணம் வழங்கப் பட்டிருக்கின்றது? இன்று பெற்றோலுக்கும் டீசலுக்கும் வாகனங்கள் வரிசையிலே நிற்கவேண்டிய ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. எனக்குத் தெரிந்து விஞ்ஞான ரீதியில் மனிதர்கள் யாருக்கும் 7 அறிவு இல்லை. ஆனால், "7 அறிவு உள்ளவர்" என்று சொன்னவர்களுக்கு எத்தனை அறிவு இருக்கின்றது என்பதை மக்கள் விளங்கியிருப்பார்கள் என்று நான் நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாதீட்டை எடுத்து நோக்கினால், கிழவி ஒருவரை அலங்கரித்து மணப்பெண்ணாக்கும் கதைதான் நடைபெற்றிருக்கின்றது என்பது புரிகின்றது. குறிப்பாக, விவசாயிகளின் பசளைப் பிரச்சினைக்குத் தீர்வு முன்வைக்கப்பட்டிருக்கின்றதா? இல்லை! அரிசி மாபியாக்களை ஒழித்து, அரிசி விலையை அரசாங்கத்தினால் தீர்மானிக்கின்ற தீர்வு முன்வைக்கப் பட்டிருக்கின்றதா? இல்லை! Gas தட்டுப்பாட்டுக்குத் தீர்வு முன்வைக்கப்பட்டிருக்கின்றதா? இல்லை! பால்மா தட்டுப்பாட்டுக்குத் தீர்வு முன்வைக்கப்பட்டிருக்கின்றதா? இல்லை! அடுத்த ஆண்டில் ஏற்படவிருக்கின்ற டொலர் தட்டுப்பாட்டுக்கான தீர்வு முன்வைக்கப்பட்டிருக்கின்றதா? இல்லை! அரச ஊழியர்களுக்கான சம்பள அதிகரிப்பு உள்வாங்கப்பட்டிருக்கின்றதா? இல்லை! சமுர்த்தி பெறும் மக்களுக்கான நிவாரணம் வழங்குவதற்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றனவா? இல்லை! மலையக மக்களுடைய சம்பள விடயம் தொடர்பான பிரச்சினையைத் தீர்ப்பதற்கான நடவடிக்கை எடுக்கப்பட்டிருக்கின்றதா? இல்லை! ஆனால், என்ன செய்திருக்கின்றார்கள்? 'என்ஜின்' இல்லாத வாகனத்திற்கு 'ரயர்' வாங்குவது போன்று இந்தப் பாதீட்டைத் தயாரித்திருக்கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முச்சக்கரவண்டி ஓட்டுநர்களுக்கு நிவாரணம் வழங்குவதற் காகச் சுமார் 600 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப் பட்டிருக்கின்றது. இலங்கையில் சுமார் 10 இலட்சம் முச்சக்கரவண்டிகள் உள்ளதாகப் புள்ளிவிபரம் குறிப்பிடு கின்றது. அதில் சொந்தப் பாவனை, பழுதடைந்தவை எனக் கிட்டத்தட்ட 02 இலட்சத்தைக் கழித்தால், சுமார் 08 இலட்சம் முச்சக்கரவண்டிச் சாரதிகள் இருக்கின்றார்கள். அந்த வகையில் பார்த்தால், ஒரு சாரதிக்கு ஒரு வருடத்திற்கு 750/- ரூபாயும் மாதம் ஒன்றுக்கு 62/- ரூபாயும் நிவாரணமாக வழங்கப்பட விருக்கின்றது.

அதேபோல், இந்த வரவு செலவுத்திட்டத்திலே தனியார் பஸ் வண்டி உரிமையாளர்களுக்கு நிவாரணம் வழங்குவதற் காக 1,500 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக் கின்றது. இலங்கையில் சுமார் 19,000 தனியார் பஸ் வண்டிகள் உள்ளதாகப் புள்ளிவிபரம் குறிப்படுகின்றது. ஆகவே, ஒரு தனியார் பஸ் வண்டி உரிமையாளருக்கு மாதம் ஒன்றுக்குச் சுமார் 6,500 ரூபாய் நிவாரணமாகக் கிடைக்கக்கூடியதாக இருக்கின்றது. அதேபோன்று, பாடசாலை பஸ், வான் ஓட்டுநர்களுக்கு நிவாரணம் வழங்குவதற்காக 400 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இலங்கையில்

சுமார் 40,000 பாடசாலை பஸ், வான் ஓட்டுநர்கள் உள்ளார்களெனப் புள்ளிவிபரம் குறிப்பிடுகின்றது. அதன்படி ஒருவருக்கு மாதத்திற்கு 833/- ரூபாய் நிவாரணமாகக் கிடைக்கக்கூடியதாக இருக்கின்றது. இதுதான் இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி அமைச்சரினால் அவர்களுக்கு வழங்கப்பட்டுள்ள நிவாரணங்களாகும். இது எதற்கு? இந்தப் பணம் அவர்களின் ஒரு நாளைக்கான எரிபொருள் செலவுக்குக் கூடப் போதாதவொரு நிலைமை காணப்படுகின்றது.

கௌரவ தலைமைதாங்குகின்ற உறுப்பினர் அவர்களே, அரச ஊழியர்களின் சம்பள அதிகரிப்புப்பற்றி நிதி அமைச்சர் தெரிவித்த கருத்தானது, முழு அரச ஊழியர்களுக்கும் அபகீர்த்தியை ஏற்படுத்தியுள்ளது. குறிப்பாக, 'கொவிட்-19' அனர்த்தத்தின்போது உயிரைப் பணயம் வைத்து மக்களைக் காப்பாற்றியது சுகாதாரத்துறையைச் சார்ந்த அரச ஊழியர்களே! அதுமட்டுமல்ல, நாட்டில் ஏற்படுகின்ற வெள்ளப்பெருக்கு, மண்சரிவு போன்ற ஒவ்வோர் அனர்த்தத்தின்போதும் மக்களைக் காப்பாற்றியது இந்த அரச ஊழியர்கள்தான் என்பதை அவர்கள் மறந்திருக்கின்றார்கள். ஆனால், அரசாங்கம் தகுதியில்லாதவர்களுக்கு வழங்குகின்ற அரசியல் நியமனங்களே அதிக செலவுக்கான பிரதான காரணமாகக் காணப்படுகின்றது. அதற்குச் சிறந்த உதாரணமாக, அரசாங்கம் தற்போது வழங்கிக்கொண்டிருக்கும் ஓரிலட்சம் வேலை வாய்ப்புக்களை நாங்கள் கூறலாம். குறிப்பாக, சமுர்த்தி பெறத் தகுதியானவர்களுக்கு வேலை தருவதாகப் பிரதேசச் செயலகங்களிலே அவர்களுக்கு நேர்முகப்பரீட்சை நடாத்தப்பட்டது. அவர்கள் பல நாட்களாக அங்குமிங்கும் அலைக்கழிக்கப்பட்டார்கள். ஆனால், இறுதியிலே நேர்முகப் பரீட்சையில் கலந்து கொள்ளாதவர் களுக்கு அந்த நியமனம் வழங்கப்பட்டிருக்கின்றது. இதனால்தான் அதிக சுமை ஏற்பட்டிருக்கின்றது என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். ஆகவே, தியாகங்கள் செய்து, அர்ப்பணிப்புடன் பணியாற்றும் அரச ஊழியர்களைச் சாதாரண தரம்கூடச் சித்தியடையாத அமைச்சர்கள் விமர்சிப்பதை ஏற்றுக்கொள்ளமுடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, "அரசின் செலவினங்களைக் குறைக்க அமைச்சர்களினதும் அரச அதிகாரிகளினதும் செலவைக் குறைக்கின்றோம்" எனக்கூறி, மாதம் ஒன்றுக்கு 05 லீற்றர் பெற்றோல் கொடுப்பனவைக் குறைப்பதாக நிதி அமைச்சர் கூறுகின்றார். யாரை ஏமாற்ற இந்தச் சிறுபிள்ளைத்தனமான குறைப்பு? அமைச்சர்களின் எரிபொருளுக்கான கொடுப்பனவைக் குறைத்தால், மாதம் ஒன்றுக்கு 350 லீற்றர் பெற்றோல் கொடுப்பனவையே குறைக்கக்கூடிய வாய்ப்பு இருக்கின்றது. அவ்வாறு பார்த்தால் வெறும் 55,000/- ரூபாய் மட்டுமே அதற்கான செலவிலிருந்து குறைக்கப்படும். குறிப்பாக, இங்கிருக்கின்ற அமைச்சர்களுடைய மாதமொன்றுக்கான தேநீர் செலவுகூட இன்று ஓரிலட்சம் ரூபாவைத் தாண்டுகின்ற அளவில் காணப்படுகின்றது. இவற்றைப் பார்க்கும்போது ஏழு மூளை உள்ளவர்களின் செலவுக் குறைப்பு இப்படித்தான் இருக்குமோ! என நினைக்கத் தோன்றுகின்றது.

கௌரவ தலைமைதாங்குகின்ற உறுப்பினர் அவர்களே, கிழக்கு மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர் என்றரீதியில், யுத்தத்தினால் பாதிக்கப்பட்டு அபிவிருத்திகளில் பின்தங்கியிருக்கும் வடக்கு, கிழக்கு மாகாண அபிவிருத்திக்கான விசேட திட்டங்கள் எதுவும் இந்தப் பாதீட்டிலே உள்வாங்கப்படாமையை நான் ஒரு குறையாகக் காண்கின்றேன். நல்லாட்சி அரசாங்கத்தின் வரவு செலவுத் திட்டத்திலே வடக்கு, கிழக்கு மாகாண மக்களின் மீள்குடியேற்றத்திற்கென நிதிகள் ஒதுக்கப்பட்டிருக்கின்றன. அரசுக்கு ஆதரவளிக்கும் வடக்கு, கிழக்கு மாகாணத்தைச் சேர்ந்த தமிழ், முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இங்கு இருக்கின்றார்கள். அவர்கள் கையை உயர்த்தி இந்த வரவு செலவுத்திட்டத்திற்கு ஆதரவளிப்பார்கள் என நான் நினைக்கின்றேன். அவ்வாறு ஆதரவளிப்பதற்கு முன்னர் - உங்களுடைய கையை உயர்த்துவதற்கு முன்னர் - மீள்குடியேற்றத்திற்கான ஒதுக்கீடுகளைப் பெற்றதன் பின்னர் உங்களுடைய ஆதரவை வழங்குங்கள் என்று கூறிக்கொள் கின்றோம்.

அது மாத்திரமல்ல, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று இந்த அரசாங்கம் அராஜகத்தைக் கையிலே எடுத்திருக்கின்றது; அட்டகாசத்தை ஆரம்பித்திருக்கின்றது. இன்று எங்களுடைய ஐக்கிய மக்கள் சக்தியினால் ஏற்பாடு செய்யப்பட்டிருக்கின்ற மக்களுக்கான போராட்டத்தில் இணைந்துகொள்வதற்காகப் பலரும் எங்களுடைய பிரதேசங்களிலே இருந்து வருகின்ற சந்தர்ப்பத்திலே பல தடைகள் விதிக்கப்படுகின்றன; சாரதிகள் பயமுறுத்தப்பட்டிருக் கின்றார்கள். இன்று வருகைதரவிருந்தவர்களை, 'நாங்கள் உங்களைத் தனிமைப்படுத்துவோம்' என்று அச்சுறுத்தியிருக் கின்றார்கள்; போக்குவரத்துக்கு இடையூறு செய்திருக் கின்றார்கள். இவ்வாறான பல பிரச்சினைகளுக்கு அவர்கள் முகங்கொடுத்திருக்கின்றார்கள்.

இன்று 'ஒரே நாடு, ஒரே சட்டம்' என்று சொல்லுகின்றார்கள். ஆனால், இந்த நாட்டிலே மூன்று வகையான சட்டங்கள் காணப்படுகின்றன. ஒன்று, அலி சப்ரி அவர்களுடைய சட்டம்; மற்றையது ஞானசார தேரர் அவர்களுடைய சட்டம்; அதேபோன்று, சரத் வீரசேகர அவர்களுடைய சட்டம். SLPPஇனுடைய ஐந்து வருடப் பூர்த்தியைக் கொண்டாடுவதற்கு மக்கள் வர முடியும். UNPஇனுடைய ஆர்ப்பாட்டத்திலே மக்கள் கலந்துகொள்ள முடியும். பஸ், புகையிரதங்களிலே பல்லாயிரக்கணக்கான மக்கள் செல்லக்கூடிய ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கின்றன. அரசாங்கத்தினுடைய கூட்டங்களுக்கு மக்கள் வருகின்றார்கள். ஆனால், ஐக்கிய மக்கள் சக்தியின் கூட்டத்திற்கு அல்லது மக்களுடைய தேவைப்பாட்டுக்கான இந்தப் போராட்டத்திற்கு மக்களை வரவிடாமல், அராஜகம் செய்கின்ற இந்த அரசாங்கத்தினுடைய செயற்பாட்டை எவ்வாறு நாங்கள் எடுத்துக்கொள்ள முடியும்? இதுவா உங்களுடைய சட்டம்? இதுவா உங்களுடைய நிலைப்பாடு? ஏன் இவ்வாறான செயற்பாடுகளை முன்னெடுக்கின்றீர்கள்? என்று நாங்கள் அரசாங்கத்திடம் கேட்டுக்கொள்கிறோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இவ்வாறான செயற்பாடுகளை ஆரம்பித்திருக்கின்ற காரணத்தினால், இந்த அரசாங்கத்திற்கு மிக விரைவிலே இறைவனுடைய கோபப் பார்வையும் இந்த மக்களுடைய எதிர்ப்பும் உருவாகும் என்பதை இந்த இடத்திலே கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.54]

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 වර්ෂය සඳහා අය වැය ඉදිරිපත් කර තිබෙන වෙලාවේ ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

විශේෂයෙන්ම මම මේ අය වැය අභියෝගාත්මක අය වැයක් විධියට හඳුන්වන්න කැමැතියි. මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ අභියෝගාත්මක අය වැයක් කියලා මා කියන්නේ හේතු ඇතිවයි. පසුගිය රජය විසින් අවුරුදු 5ක කාලයකින් පස්සේ අපට ලබා දුන්නු ආර්ථිකයත්, ඒ ආර්ථිකයට සමානවම මේ ලෝක වසංගතයත් එක්ක පසුගිය අවුරුදු දෙක තුළ අපේ රටට වෙච්ච ආර්ථික ප්‍රශ්නත් එක්ක අනාගතය සැලසුම් කරලා අය වැයක් හදද්දී කොච්චර බලපෑමකින්ද ඒ අය වැය හදන්නේ කියන එකත් අපි කවුරුත් තේරුම් ගන්න ඕනෑ.

විශේෂයෙන්ම අපි අය වැයක් හදද්දී කල්පනා කරලා බලනවා, පසුගිය අවුරුදු දෙකක්, තුනක් තුළ අපේ රටේ ආර්ථිකය කොහොමද, අපේ රටේ ආදායම කොහොමද, අපේ රටේ වියදම කොහොම, අපට අනාගතයේදී මොනවාද කරන්න පුළුවන් කියලා. අපි කල්පනා කරලා බලන්න ඕනෑ, පසුගිය ආණ්ඩුවේ අවුරුදු 5 තුළත්, ඊට පස්සේ අවුරුදු 2 තුළත් අපේ ආර්ථිකයට වෙච්ච බලපෑම නිසා අපේ රට කොච්චර පල්ලෙහාට ගියාද කියලා. විශේෂයෙන්ම ඒ කාලවකවානුව තුළ අපේ සියලුම ආදායම් මාර්ග අපට අහිමි වුණා. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන්න තිබුණු ආදායම, ඒ වාගේම විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන්න තිබුණු ආදායම, ආයෝජනවලින් අපට ලැබෙන්න තිබුණු ආදායම, අපේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් අපට ලැබෙන්න තිබුණු ආදායම් සියල්ල අපට අහිමි වුණා. ඒ වාගේම, පසුගිය කාලය තුළ අපේ වියදම විශාල ලෙස වැඩි වුණා. විශේෂයෙන්ම කොවිඩ් වසංගතයෙන් රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගන්න රජයක් විධියට අපි විශාල වියදමක් දැරුවා. ඒ වාගේම, අපේ සෞඛ්‍ය සේවා යළි සක්‍රිය කරලා ඒ ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්න අපි තවත් විශාල මුදලක් සෞඛ්‍ය සේවයට යට කළා. ඒ වාගේම, අපට තිබුණු සංචිත ප්‍රමාණය අඩු වුණා. ඒ හරහා අපට විශාල ආර්ථික බලපෑමක් සිදු වුණා. එවැනි අවස්ථාවක තමයි ගරු මුදල් අමාත්‍යවරයා මේ අය වැය ඉදිරිපත් කරන්න කටයුතු කෙරුවේ. ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ, මේ තුළින් අපි කොහොමද අපේ මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනියන්නේ කියලා.

මම දවස් කීපයක්ම දැක්කා විපක්ෂය කරන චෝදනා පිළිබඳව. ඔවුන් කියන එක දෙයක් තමයි මේ රටේ පසුගිය කාලයේ බඩු මිල පාලනය කර ගන්න අපට බැරිව ගියා කියන එක. විශේෂයෙන්ම කිරි පිටි, ඉන්ධන, ගෑස් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉතාම ඉහළ මට්ටමකට ගියා. ජනතාවට පීඩනයක් ඇති වුණා. ජනතාව අසහනයට පත් වුණා. ඒ නිසා මේ රජය ඒ අසහනයට වග කියන්න ඕනෑ කියන එක විපක්ෂය පුන පුනා ප්‍රකාශ කළා.

අපි කවුරුත් පිළිගන්න ඕනෑ, මේ වසංගත තත්ත්වය තුළ ලෝකයේ ආර්ථික අතින් ඉහළින්ම දියුණු රටවලින් සහ අනෙකුත් රටවලින් ආනයනය කරන භාණ්ඩවල මිලත් විශාල ලෙස වැඩිවීමක් දක්නට ලැබුණු බව. ඒ වාගේම, නැව් ගාස්තු සහ මෙහෙයුම් ගාස්තු ඉතාම ඉහළ තත්ත්වයකින් වැඩි වුණා. ඒ වාගේම, අපට ඩොලර් සම්බන්ධයෙන් ප්‍රශ්න තිබුණා. එවැනි තත්ත්වයකදී සාමාන්‍යයෙන් ලෝක ස්වභාවය තමයි භාණ්ඩවල මිල වැඩිවෙන එක. එක්සත් ජාතික පක්ෂය තමයි අපේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නේ. ඒ වාගේම, පසුගිය අවුරුදු 30ක්, 40ක් පුරාවටම පැවති ආණ්ඩු හැම එකක්ම ඒ විවෘත ආර්ථිකය පිළිගත්තා. විවෘත ආර්ථිකය පිළිගෙන තමයි අපි මේ රට ඉස්සහට ගෙනිච්චේ. එතකොට ලෝක තත්ත්වය තුළ මේ මිල වැඩි කිරීම සිද්ධ වෙද්දී, අපේ රටටත් ඒ අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වුණා. යම් යම් අවස්ථාවලදී අපි මේ සම්බන්ධයෙන් පියවර ගත්තා. නමුත්, මේ තුළින් අපට තවත් ඉස්සරහට යන්න බැරිව ගියා. හැබැයි, රජයක් විධියට අපි යම් යම් මිල පාලනය කිරීම්වලට ගියා. හැබැයි, ඒ මිල පාලනය කිරීම් විවෘත ආර්ථිකයක් තුළ පවත්වා ගන්න අමාරුයි. ඒ නිසා අපි මිල පාලනය අත හැරියා. භාණ්ඩවලට යම් මිලක් ලබා දුන්නා. ඒ හේතුවෙන් අඩුම තරමින් අපේ රටේ භාණ්ඩ සුලභ කරන්න හෝ හැකියාව ලැබුණා.

අපි මේක තේරුම් ගන්න ඕනෑ. රටේ ජනතාවට අපි මේක පැහැදිලි කරන්න ඕනෑ. උදාහරණයක් විධියට, අපි මේ රටේ ගෑස් මිල වැඩියි කිව්වාට, එංගලන්තයේත් ගෑස් මිල සියයට 300කින් වැඩි කරලා තිබෙනවා. ඉන්ධන මිලත් වැඩි කර තිබෙනවා. ලෝක වසංගතයක් තුළ ඒ වාගේ රටවල තත්ත්වයත් එහෙමයි. අපේ රටටත් ඒක දරාගෙන ඉන්න අමාරුයි. මේ නිසා රාජ්‍ය ආයතන කඩා වැටෙනවා; ඉන්ධන ගෙනෙන, ගෑස් ගෙනෙන සමාගම් කඩා වැටෙනවා. එහෙම නම් ඒවාට රජය විසින් මුදල් ලබා දෙන්න ඕනෑ. ඒක කරන්න බැහැ. ඒක දිගටම කර ගෙන යන්න පුළුවන් වැඩක් නොවෙයි. ඒ නිසා අපි මෙය තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මේ සම්බන්ධව අපේ අවධානය යොමු කරන්නේ. ඒ නිසා පක්ෂ, විපක්ෂ භේදයෙන් මේ දිහා බලලා ජනතාව මුළා කරන්න එපා කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම විපක්ෂයේ අය කිව්වා, මේ අය වැයේ දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් නැහැ කියලා. දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා තමයි මේ අය වැයෙන් බිලියන 85ක් මුදල් මේ රටේ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න වෙන් කෙරුවේ. ඒ හරහා සමාජ සුබසාධනය, යටිතල පහසුකම්, ස්වයං රැකියා ලබා දීම ආදී කාරණා ඇතුළත් තිරසර සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා. මේ මුදල ගමට ලැබෙද්දී, ගමේ ආර්ථිකය ශක්තිමත් වෙද්දී, ජනතාවගේ ආර්ථික සංවර්ධනය ඇති කරලා ඒ අයගේ ආදායම වැඩි කරන්න අපට පුළුවන්.

විශේෂයෙන් මේ අය වැයෙන් අපි රටේ සංවර්ධනය ගැන වාගේම අධ්‍යාපනය ගැනත් විශේෂ අවධානය යොමු කර තිබෙනවා. රාජ්‍ය ආදායමෙන් සියයට 7කට ආසන්න මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කෙරුවේ රටේ අනාගතය වෙනුවෙන්.

පාසල් දරුවන් අයත් පාසල් පද්ධතිය, විශ්වවිද්‍යාල දරුවන්, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ආචාර්ය මහාචාර්යවරුන් අයත් විශ්වවිද්‍යාල පද්ධතිය වාගේම පෙරපාසල් අධ්‍යාපනය දියුණු කරන්නත් මේ අය වැයෙන් මුදල් ලබා දී තිබෙනවා. ඒ මඟින් මේ රටේ අනාගත පරපුර වෙනුවෙන් ආයෝජනය කරන්න අපට අවස්ථාව ලැබුණා. ඒ නිසා අපි මේ ගැනත් කල්පනා කරන්න ඕනෑ. අපි මේ අය වැයෙහි තිබෙන හොඳ සහ නරක කියන දෙකම ගැන කල්පනා කරන්න ඕනෑ. අපට තිබෙන ආර්ථික ශක්තියත් එක්ක, මේ අය වැය හදද්දී විවිධ ගැටලුවලට මුහුණ දෙන්න අපට සිදු වුණා.

අවසාන වශයෙන්, මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. මේ අවුරුද්දේ ඉඳලා ඊළඟ අවුරුද්දට යද්දී මේ අය වැය තුළින් යම් අඩිතාලමක් - foundation එකක් - දා ගන්න අපට අවශ්‍ය වුණා. ඒ නිසා තමයි ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමාත්, මුදල් අමාත්‍යාංශයත් මේ අඩිතාලම දාලා දුන්නේ. ඒ නිසා මම නැවත වාරයක් ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම මෙවැනි අභියෝගාත්මක වෙලාවක රටේ ආර්ථිකයට ඉදිරි පිම්මක් පනින්න අවශ්‍ය ශක්තිය ලබාදෙන අය වැයක් සකස් කිරීම ගැන. ඊට දායක වූ සියලු දෙනාට මගේ ස්තුතිය පුද කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩයනා ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[4.02 p.m.]

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
Hon. Presiding Member, thank you very much for providing me a few minutes to speak a few words on the Budget.

First, I would like to wish good luck and congratulate the Hon. Minister of Finance on his maiden Budget Speech. At a juncture where the whole world is in an economic crisis, Sri Lanka, being a Third World country in South Asia, has also been hit hard by that. I know, in such a situation, it is very difficult to bring forward a Budget, but with the best of intentions, the Hon. Minister of Finance has managed to bring in a Budget however difficult it has been.

Sir, I was listening to our young MP, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, yesterday and I think he made some good ideas, which we should really take in to uplift the economy. That is what we expect from the Opposition. Although he is in the Opposition, he brought forward some good ideas for us to uplift the economy.

But, unfortunately, what does the Opposition do?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අවාසනාවකට අපේ විපක්ෂය අද ඇත්තටම කොහේද ඉන්නේ? අද විපක්ෂය පාරවල උද්ඝෝෂණය කරනවා, රටේ ජනතාවගේ ජීවිත පුදුමාකාර භයංකර තත්ත්වයකට ඇද දමලා. අපි කොරෝනා වසංගතයේ තවත් රැල්ලක් අවසාන කළා විතරයි. නමුත් අවාසනාවකට විපක්ෂය ජනතාවගේ ජීවිත කොවිඩ් වසංගත අනතුරට දාලා ජනතාවත් අරගෙන අද පාරවල් ගණනේ ඇවිදිනවා. ඇත්තෙන්ම කිව්වොත්, මට මතක නැහැ, මගේ පක්ෂයෙන් -ටෙලිෆෝනය ලකුණ පක්ෂයෙන්- ඒ ගොල්ලන්ට උද්ඝෝෂණය කරන්න අවසර දුන් බවක්. මා ඒ කාරණයත් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගරු සභාවට සහ අපේ ගරු මුදල් ඇමතිතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. ඒ යෝජනාව මෙයයි. අද අපේ රටට වාණිජ භෝගයක් නැහැ. අපට කාලයක් වාණිජ භෝග හැටියට තේ, රබර්, පොල් තිබුණා. නමුත් අද අපි පොල් පිට රටින් ආනයනය කරනවා. ඒකට හේතුව තමයි, පොල් ඉඩම් ටික කට්ටි කරලා විකුණන එක. ඒ වාගේම තමයි රබර් ඉඩම් ටිකත්. රබර් ඉඩම් ටිකත් කට්ටි කරලා විකුණනවා. ඒ කාලයේ බ්‍රිතාන්‍ය ජාතිකයෝ අපේ රටේ තේ හොඳට market කළා. ඒ ගොල්ලන් තේ වවපු කාලයේ ඉඳලා "Ceylon Tea" කියන නමින් market කරපු අපේ තේ ඉහළම තත්ත්වයකට ගෙනැල්ලා අපනයන කළා. නමුත් අද අපට ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. දැන් චීනය සහ කෙන්යාව කියන රටවල තේ වගා කරනවා. ඒ ගොල්ලන් ඒවා පිට රටවලට යවනවා. ඒ ගොල්ලන් ඒකෙන් විදේශ විනිමය උපයා ගන්නවා. අපට වාණිජ භෝගයක් ඉතිරි වෙලා නැහැ. නමුත් අපට ස්වභාව ධර්මයෙන් සහ දෙවියන්ගෙන් වාණිජ භෝගයක් ලැබිලා තිබෙනවා. ඒ තමයි, "කංසා". මම යෝජනා කරනවා, අප රජයේ අනුග්‍රහයෙන් මේ රට තුළ කංසා වගාව නීතිගත කර වගා කළ යුතුය කියලා. මම කැමැතියි, ඒ ගැන වචන කිහිපයක් කියන්නට.

අද ලෝකයේ වෙනත් රටවල් කංසා අපනයනයෙන් අතිවිශාල ආදායමක් ලබනවා. යුරෝපා ආයෝජන බැංකුවට අනුව ගෝලීය කංසා වෙළෙඳ පොළ ඊළඟ දශකයේදී සියයට දහසකින් ඉහළ යන බවත්, එය 2027 වසරේ ඩොලර් බිලියන 140ක් වන බවත් පුරෝකථනය කර තිබෙනවා. ඉන් ඩොලර් බිලියන 57ක් නීත්‍යනුකූල කංසාවලින් ලැබෙන බවත්, ඉන් වැඩි කොටස උතුරු ඇමෙරිකාවෙන් සහ යුරෝපයෙන් සැපයෙන බවත් සඳහන් වෙනවා. ඒ වාගේම 2018 වසරේ ලෝක වෙළෙඳ පොළේ කංසා නිෂ්පාදනය සඳහා ඇස්තමේන්තුගත වෙළෙඳ පොළ අගය ඇමෙරිකානු ඩොලර් බිලියන 4 - 5 අගයක පැවැති තිබෙනවා. 2025 වසර වන විට කංසා සඳහා ලෝක වෙළෙඳ පොළ අගය ඩොලර් බිලියන 8.6 - 10.5 වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව සර්ම කලාපීය රටක් වීම නිසා බොහෝ ඖෂධ පැළෑටි නිසි පරිදි වගා කර, ඒවා අපනයනය කර අපට විදේශ විනිමය ලබාගත හැකියි. අපි IMF එකට යන්න ඕනෑ නැහැ සල්ලි ඉල්ලාගන්න. අපි IMF එකට යන්න ඕනෑත් නැහැ; කාගෙන්වත් ණය ඉල්ලන්න ඕනෑත් නැහැ. මේ භෝගය වගා කරන්න පුළුවන් නම් ඒකෙන් විදේශ විනිමය උපයා ගන්න අපට පුළුවන්.

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 8 වන වගන්තියට අනුව, ඖෂධ සඳහා පමණක් කංසා වගා කිරීමට ආයුර්වේද කොමසාරිස්වරයා වෙත බලය ලබා දීලා තිබෙනවා. කංසා යොදාගෙන, විවිධ රෝග වෙනුවෙන් විවිධ ඖෂධ හදනවා. පිළිකාව, multiple sclerosis, විෂාදය, post-traumatic stress disorder වැනි ලෙඩ රෝගවලට CBD oil පාවිච්චි කරනවා. මේ රට තුළ ව්‍යවසායකයන් සැහෙන්න බිහි කරන්න පුළුවන්, කංසා වගාවෙන් විතරක්.

අද මම මේ ගරු සභාවට පෙන්වන්න ගෙනාවා, කංසාවලින් හදලා තිබෙන රූප ලාවණ්‍ය කටයුතු සඳහා පාවිච්චි කරන ක්‍රීම් වර්ග හා දත් බෙහෙත්. නමුත් නීත්‍යනුකූල හේතු මත ඒවා ගෙනැල්ලා මෙහි ප්‍රදර්ශනය කරන්න මට අවස්ථාව ලැබුණේ නැහැ. ඒවා ප්‍රදර්ශනය කළා නම් රටේ ජනතාවට කරුණු කාරණා වැටහෙයි. කංසා මත් ද්‍රව්‍යයක් හැටියට නීතිගත කරන්න නොවෙයි, අප කියන්නේ. මත් ද්‍රව්‍යයක් හැටියට, තහනම් උත්තේජකයක් හැටියට කංසාවලට තිබෙන තහනම ඒ විදියටම තිබිය යුතුයි. නමුත්, Dravet syndromeවලට අදටත් ඇමෙරිකාවේ වයස අවුරුදු දෙකට, දෙකහමාරට වැඩි දරුවන්ට අනුමත කරලා තිබෙන ඖෂධයක්. එහෙම නම්, මෙය එතරම් ඖෂධීය ගුණයක්

[ගරු ඩයනා ගමගේ මහත්මිය]

තිබෙන දෙයක්. ඒ හින්දා අපේ ගරු මුදල් ඇමතිතුමාට මම යෝජනාවක් කරන්න කැමැතියි. ඇත්තටම කංසාවලින් හොඳ income එකක්, ඩොලර් බිලියන ගණනක විදේශ විනිමයක් අපේ රටට ගෙන එන්න පුළුවන්. අපේ දරුවෝ ඉදිරියේදී ණයකාරයන් විය යුතු නැහැ. ඊළඟ අවුරුදු තුන හතරේදී අපේ රටට පුළුවන්, මේ තිබෙන ණය බේරලා, ණයෙන් තොර රටක් වෙන්න. අපි කා ළඟටවත් හිඟා කන්න යන්න ඕනෑ නැහැ; කා ළඟවත් දෙකට නැමෙන්න ඕනෑ නැහැ. මේ කියන විධියට, IMF loans ගන්න අප යන්න ඕනෑ නැහැ. ස්වභාව ධර්මය අපේ රටට දීලා තිබෙන මේ සම්පත -මේ භෝගය- පාවිච්චි කරලා අපට පුළුවන් මේ රට ගොඩ ගන්න. ඒ හින්දා මම යෝජනා කරනවා, අනිවාර්යෙන්ම කංසා වගාව නීතිගත කරලා රජයේ අනුග්‍රහයෙන් වගා කටයුතු කරලා, පිට රටවලට යවලා - export කරලා - විදේශ විනිමය උපයාගත යුතුයි කියලා. ඒක කළ හැකි දෙයක්. ඒ සඳහා කළ යුතුව තිබෙන්නේ, 1800 ගණන්වල බ්‍රිතාන්‍ය ජාතිකයන් ගෙන ආ මීට අදාළ ආඥා පනත අහෝසි කරන එක විතරයි. අපි නිදහස් රටක් නොවෙයි. අපි තවමත් 1800 ගණන්වල ගෙනා අණ පනත්වලට යට වෙලා ජීවත් වන පිරිසක්. නිදහස ලබා අවුරුදු 73ක් කිව්වාට, 1800 ගණන්වල ගෙන ආ අණ පනත්වලින් අපි තවමත් පීඩා විඳිනවා. ඒ සියලු දේවල් වෙනස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා. අපේ අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා දැන් ඇතැම් අණ පනත්, නීති රීති වෙනස් කරගෙන යනවා. 1800 ගණන්වල ගෙන ආ මේ වාගේ අණ පනත් පවා වෙනස් කරයි කියා මම බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ Debate එකේදී කථා කරන්න කාලය ලබා දුන්නාට, ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඉදිරි අවුරුද්දේ එතුමා මේ රටේ ආර්ථිකය ගොඩ ගන්නා බවට මට විශ්වාසයක් තිබෙනවා. එතුමාට සුබ පතමින්, මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෝකිලා ගුණවර්ධන මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.11]

**ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன)
(The Hon. (Mrs.) Kokila Gunawardene)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

2022 අය වැය විවාදයට එක් වෙමින් මම මුලින්ම මේ කාරණය මතක් කරන්න කැමැතියි. අතීතයේ ඉඳන්ම මේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් වුණා. ඒ ඉදිරිපත් වුණු හැම අය වැයකම අපි දැක්කේ, සාම්ප්‍රදායිකව රාජ්‍ය ආදායම මොකක්ද, එය එදිනෙදා වියදම් කරන්නේ කොහොමද කියන කාරණාව ගැන සඳහන් වුණු බවයි. හැබැයි, ඒ ඉතිහාසය වෙනස් කරමින් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ අය වැය මඟින් අපේ රටේ ආර්ථිකය වෙනස් කරන වැඩ පිළිවෙළ ඉදිරිපත් කර තිබෙන බව අපට දැනෙනවා.

අපේ රට විවෘත ආර්ථිකයක් තිබෙන රටක්. අපි කැමැති වුණත්, අකැමැති වුණත් අපට එය පිළිගන්න සිද්ධ වනවා. විශේෂයෙන්ම විවෘත ආර්ථිකයක් එක්ක යනකොට, අද ගෝලීය කොවිඩ් වසංගතය මුළු ලෝකයම වෙළාගෙන තිබෙන වෙලාවක පුංචි රටක් වන ශ්‍රී ලංකාවේ අපටත් ඒ වසංගතය ඒ ආකාරයටම බලපා තිබෙනවා. අද ලෝකයේ සිදු වන සියලු දේවල් අපේ රටටත් ඒ විධියටම බලපානවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලෝකයේ බඩු මිල ඉහළ යාම, නැව් ගාස්තු ඉහළ යාම, handling charges ඉහළ යාම අපේ රටේ භාණ්ඩ හා සේවාවල මිල වැඩිවීමට හේතුවක් වෙලා තිබෙනවා. එහෙම නම් රජයක් හැටියට අපට වගකීමක් තිබෙනවා, ඒ තත්ත්වය වෙනස් කර ගන්න. අන්න ඒ අනුව තමයි මුදල් අමාත්‍යවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මෙවර අය වැය යෝජනාවලිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි දන්නවා, ලෝකයේ දියුණු යයි කියන බොහෝ රටවල අද උද්ධමන තත්ත්වයක් ඇතිවෙලා තිබෙන බව. උදාහරණයක් හැටියට ඇමෙරිකාව ගත්තොත්, අවුරුදු තිහකට පසුව අද එහි වැඩිම උද්ධමනයක් ඇති වෙලා තිබෙනවා. ඉතිහාසයේ කිසිම දවසක නොවූ විධියට අද ඉන්දියාවේ තෙල් මිල වැඩි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු කොරියාවේ අද කෙසෙල් කිලෝ එකක් රුපියල් 3,500කට එහා මුදලකට අලෙවි වෙනවා. ඒ නිසා භාණ්ඩ මිල වැඩි වීමේ ප්‍රශ්නය, ආර්ථිකයට ඇති වී තිබෙන බලපෑම අපට විතරක් තිබෙන ප්‍රශ්න නොවෙයි. සාමාන්‍යයෙන් වසංගතයකට පසුව මෙවැනි තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදුවන බව අපි දන්නවා. එහෙම නම් අපි මේ තත්ත්වයෙන් එළියට එන්නේ කොහොමද? ඒ සඳහා වන වැඩ පිළිවෙළ මොකක්ද? අන්න ඒ සඳහා තමයි අපි සූදානම් විය යුත්තේ.

ඊළඟට මම කියන්නේ දිළිඳු බවේ විෂම චක්‍රය ගැන. ආර්ථික විද්‍යාව දන්නා ඕනෑම කෙනෙක් එය දන්නවා. ආයෝජන අඩු වනකොට නිෂ්පාදන අඩු වෙනවා. නිෂ්පාදන අඩු වනකොට ආදායම් අඩු වෙනවා. ආදායම් අඩු වනකොට ඉතිරිය අඩු වෙනවා. නැවතත් ආයෝජන අඩු වෙනවා. ඒ නිසා රජයක් හැටියට මෙවර අය වැයෙන් අපි වැඩිම මුදලක් වෙන් කරලා තිබෙන්නේ, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා වන වැඩ පිළිවෙළටයි. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. කාන්තාවක්ද, පිරිමියෙක්ද කියලා බලන්නේ නැතුව ගම තුළ ඉන්න ව්‍යවසායකයන් එළියට අරගෙන, ඒ ව්‍යවසායකයා ශක්තිමත් ව්‍යාපාරිකයෙක්, ව්‍යවසායකයෙක් බවට පත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරලා තිබෙනවා. 2022 වසර සඳහා වන අය වැය යෝජනාවලියේ තිබෙන මූලික පරමාර්ථවලින් එකක් තමයි ගමේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ. එහිදී සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ දාහකට ආසන්න මුදලක්, ඊට අමතරව සෑම ග්‍රාම නිලධාරි වසමකටම තවත් රුපියල් මිලියන තුනක මුදලක් ලබා දීමට කටයුතු කර තිබීම ගැන මා සතුටු වෙනවා. පක්ෂ භේදයකින් තොරව එම මුදල් ලබා දෙන්නට කටයුතු කරලා තිබෙනවා. ඉතිහාසයේ මේ තාක්කල් ප්‍රාදේශීය සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරයි මුදල් ලබා දුන්නේ. හැබැයි, ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා ඒක වෙනස් කළා. පක්ෂ භේදයකින් තොරව උතුරේ සිටින TNA එකේ මන්ත්‍රීවරුන්ටත් එම මුදල ලබා දෙන්න එතුමා කටයුතු කරලා තිබෙනවා. එහි බලාපොරොත්තුව, අවසාන පරමාර්ථය අපේ රටේ දේශීය කර්මාන්ත නඟා සිටුවීමයි. අපේ රටේ අපනයන වැඩි කර ගන්න නම්, දේශීය නිෂ්පාදනය වැඩි කර ගන්න ඕනෑ. ආනයන අඩු කර ගන්න නම්, අපි දේශීය නිෂ්පාදනය වැඩි කර ගන්න ඕනෑ. විවෘත ආර්ථිකය ඇති වුණාට පසුව හැම දේම -ඉඳිකටුව පවා- පිට රටින් ගෙනෙනකල් අපි බලාගෙන හිටියා. ඒ තත්ත්වය නැවත කණපිට හරවන්න නම්, අපි අනිවාර්යයෙන්ම නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑ.

අද මැටි කර්මාන්තය කරන ගම්මාන තිබෙනවා; වේවැල් කර්මාන්තය කරන ගම්මාන තිබෙනවා; ගඩොල් නිෂ්පාදනය කරන ගම්මාන තිබෙනවා. ඒ කර්මාන්ත සඳහා මෙවර අය වැයෙන් වෙනදාට වඩා මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ගමේ ඉන්න කාන්තාවන්ට තවත් කාන්තාවන් කිහිපදෙනෙකු එකතු කරගෙන බතික් කර්මාන්තයේ යෙදෙන්න, අත්යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තවලට තමන්ගේ ශක්තිය ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ කාන්තාවන්ගේ නිෂ්පාදන දේශීය වෙළෙඳ පොළට විතරක් නොවෙයි, විදේශීය වෙළෙඳ පොළ දක්වාම ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මම ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමියගේ කථාව අහගෙන හිටියා. කාන්තාවට දක්වා තිබෙන්නේ අඩු සැලකිල්ලක් කියලා එතුමිය කිව්වා. මම ඒ ගැන කනගාටු වෙනවා. මෙවර අය වැය කාන්තාවට වැඩිම සැලකිල්ලක් දක්වපු අය වැය හැටියටයි මා දකින්නේ.

අධ්‍යාපන ක්ෂේත්‍රය ගැනත් මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපේ රටේ අධ්‍යාපනයට එදා ඉඳලාම දක්වා තිබෙන්නේ කුඩම්මාගේ සැලකිලි. ඉතිහාසය වෙනස් කරමින්, ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා මධ්‍යම රජයෙන් විතරක් සියයට 7.5ක් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපනය කියන්නේ අනාගත ආයෝජනයක්. එය බරක් නොවෙයි. ඒ ආයෝජනය හරහා අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ඉදිරියේ දී ව්‍යවසායකයන් බිහි කරනවා නම්, ඒ ව්‍යවසායකයන්ට ගැළපෙන අධ්‍යාපනයක් ලැබුණොත්, ඒ තුළින් ඔවුන්ට ලෝකය ජය ගන්න හැකියාව ලැබෙනවා. අන්න එතැනට අපේ රටේ ආර්ථිකය ගෙන යන වැඩ පිළිවෙළක් එක්ක තමයි අපි එකතු වෙලා ඉන්නේ.

ජනතාව පාරට බස්සලා, එළියට ඇද දමලා, උද්ඝෝෂණ කරවලා, ඒ අයගේ ජීවිතවලට මරණ සහතිකය දෙන්න විපක්ෂය අද උත්සාහ දරනවා.

ආපස්සට ගිය ආර්ථිකය නැවත 2022 වර්ෂය තුළදී කණපිට හරවලා, අපේ රට ජයග්‍රහණවලින් පිරුණු රටක් බවට පත් කරන්නත්, හැම දාමත් "සංවර්ධනය වෙමින් පවතින රටක්" යනුවෙන් හැඳින්වෙන අපේ රට සංවර්ධිත රටක් බවට පත් කරන්නත් අපට පුළුවන්කම ලැබෙයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මම සුබ පතනවා. ඉතාම හොඳ අය වැයක්; අපේ රටට ගැළපෙන අය වැයක්; අපේ දේශීය ආර්ථිකයට ගැළපෙන අය වැයක් ඉදිරිපත් කළ එතුමාට රට සංවර්ධනය කරන්න හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයාෂාන් නවනන්ද මැතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.18]

**ගරු ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு கயாஷான் நவனந்த)
(The Hon. Gayashan Nawananda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොන්දක් ඇති ජාතියක් වශයෙන් රට වෙනුවෙන් හඬ නැඟූ වෙල්ලස්ස ජනතාව නියෝජනය කරමින් මට මේ අය වැය වෙනුවෙන් කථා කිරීමට අවස්ථාව ලැබීම උතුම්කොට සලකනවා. මේ රටේ සිටින පරමාදර්ශීම නායකයකු වන ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ පක්ෂය නියෝජනය කරමින්, අපේ පක්ෂය අය වැය සඳහා ඉදිරිපත් කළ යෝජනාවලිය මම මේ වේලාවේ **table*** කරනවා.

අද අපේ රට ඉන්නේ කුමන ස්ථානයකද කියලා මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ. අපේ රට වැටී තිබෙන අගාධයේ නිර්මාපකයා වන්නේ රාජ්‍ය ණය බරයි. රජයන් විසින් ගත්ත ණය. ලක්ෂ්මී බායි මහත්මිය ගායනා කළ ගීතයක් මට මේ වෙලාවේ සිහිපත් වෙනවා. එහි මුල් පදයෙන් කියැවෙනවා, "ආදී සිංහලුන් පිට දීප දේශ ජයගත්තා, තම රට දේවල් පිටරට පටවා පිට කාසිය මෙහි ඇද්දා" කියලා. ඊළඟ පදයෙන් කියනවා, "කන්ට අදින්ටා පිටරටින් එනතුරු මුහුදට දත නියවන්නා" කියලා. ඒ කියන්නේ, දැන් අපි හැමදේම පිටරටින් එනකම් බලාගෙන ඉන්නවා. මේ කියන කථාවට හේතුව වුණේ 1978 දී ඇති කළ විවෘත ආර්ථිකය. විවෘත ආර්ථිකයත් සමඟ ගමන් කළ මේ රට අද වෙද්දී ණය බරේ උච්චතම අවස්ථාවට ඇවිත් තිබෙනවා. එදා, 1978දී විවෘත ආර්ථිකය ගෙනාපු රජය පවත්වා ගෙන ගිය පක්ෂය අද විපක්ෂය විධියට අප ඉදිරියේ ඉන්නවා. විපක්ෂයට කිසි ලෙසකින්වත් මෙකෙන් කරඅරින්න බැහැ. මේ රට මේ අගාධයට වැටීමට වගකිව යුතු මූලික සාධකය නිර්මාණය කළ එම පක්ෂය අද විපක්ෂය විධියට අප ඉදිරියේ ඉන්නවා. 1978 ඉඳලා අවුරුදු 43ක් යනකම් විවෘත ආර්ථිකයට අභියෝග කරන්න, විවෘත ආර්ථිකයෙන් වෙනස් මාවතක් ගැන කථා කරන්න බය වුණු දේශපාලනයක් අපට තිබුණේ. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් එයින් ඔබ්බට ගිහින් විවෘත ආර්ථිකයේ සමහර න්‍යාය ධර්මවල වෙනස්කම් ඇති කරමින්, ආනයනය සීමා කර අපනයන තුළින් රට ගොඩ නැඟෙන්න ඕනෑ කියන සංකල්පය පළමුවැනි වතාවට මේ රටට ගෙනාවා. මෙච්චර කල් මිනිසුන් දේශපාලනය කරපු බව ඇත්ත. එහෙම කරපු දේශපාලනයේ දී මේ රට ගැන හිතුවා නම්, දේශීය ආර්ථිකය ගොඩ නඟන්නට ක්‍රියාත්මක වෙන්න තිබුණා. නූල් පොටට යනකම් හැමදාම පිටරටින් ගෙනාපු රටක් දියුණු වෙන්නේ නැහැ. එහෙම හිතන්න බැරි වුණු අතීත දේශපාලනය ගැන දුක් වෙමින් තමයි මම මේ කථා කරන්නේ.

විපක්ෂය හැම වේලාවේම අපේ අය වැය හිඟය ගැන කථා කරනවා. අය වැය හිඟයක් තිබෙන බව ඇත්ත. ඉතින්, ඒ අය වැය වැය හිඟයකට හේතුව කුමක්ද? ඒකට පිළිතුර මෙච්චර කාලයක් කිසිම පක්ෂයක්, කිසිම ආණ්ඩුවක් ලබා දුන්නාද? විපක්ෂයේ අපේ ආදරණීය මන්ත්‍රීවරුනි, එහෙම නම් මේ වෙලාවේ අපි කරගෙන යන වැඩ පිළිවෙළට උදවු කරන්න. 1977 ඉඳලාම අය වැය හිඟයක් තිබුණු බව ඔබතුමන්ලා දන්නවා. ඒ වාගේම 1988, 1989 කාලයේ තමයි ඒ හිඟය සියයට සියයක් වැඩි වුණේ. ඊට පසුවත් ඒ අය වැය හිඟය වැඩි වුණා.

මේ අවස්ථාවේ ගෝලීය අර්බුදයක් තිබෙනවා. ඇමෙරිකාව, එංගලන්තය, යුක්රේනය ඇතුළු හැම රටකම වාගේ අය වැය හිඟය තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්, විපක්ෂයේ නායකයින්ගෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ වෙලාවේ ඒ ගැන කථා කරන්න ලැහැස්ති වෙන්න එපා කියලා. මෙක ගෝලීය වසංගතයක් තිබෙන වේලාවක්. ඒ නිසා ඒ මාතෘකාවෙන් ඔබ්බට යන්න කියලා විපක්ෂයේ සහෝදර සහෝදරියන්ගෙන් මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම හැම වේලාවේම " IMF එකට යන්න, IMF එකට යන්න" කියලා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගයාෂාන් නවනන්ද මහතා]

කියනවා. අපේ රට ණය උගුලක හිර කරපු එක්තරා තැනක් තමයි ඔය IMF එක කියන්නේ. ඔවුන් කෙටිකාලීන සැලසුම්වලට විතරයි ණය දෙන්නේ. මේක තේරුම් ගන්නේ නැත්තේ ඇයි? දිගුකාලීන සංවර්ධන ක්‍රමවේද, අපේ රටේ ආයෝජන, අපේ රටේ ආර්ථිකයට ඉපැයීමට තිබෙන ක්‍රමවේද වළක්වලා තමයි IMF එක මුදල් දෙන්නේ. එතකොට රට ගොඩනැඟෙන්නේ නැහැ. සදහටම ණය ගන්න වෙන යුගයක් ඇති කිරීම තමයි IMF එක කරන්නේ. මගේ නායක ගරු වාසුදේව නානායක්කාර සහෝදරයා කිව්වේ, ආණ්ඩුව විධියට අපි කැපකිරීම් කරලා, IMF එකට නොයා ඉන්න ලැහැස්තියි කියලායි. මොකද, අපි රට හදන්න ලැහැස්තියි. ඉදිරියට ආණ්ඩුව ගන්න ඔබත් එහෙම කරන්න කියලා මම මතක් කරනවා. අපට ඕනෑ රට හදන්නයි. අය වැයෙන් හැමදේම මිනිසුන්ට සිල්ලරට ලබා දීලා; බත් පතේ ඉඳලා ලබා දීලා ආණ්ඩුව තියා ගන්න හදන යුගයක් නොවෙයි මේ තිබෙන්නේ. මේක, රට හදන යුගයක්.

ඒ වාගේම ආදරණීය මිත්‍රවරුනි, ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට තමයි අය වැයකින් අධ්‍යාපනය වෙනුවෙන් මෙවැනි ප්‍රතිශතයක් වෙන් වන්නේ. එසේ කිරීම ගැන මම මේ වෙලාවේ ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රට හදන එකම නිර්ණායකය අධ්‍යාපනයමයි. මේ, මම මේක කියන තුන්වෙනි වතාව. ඉතින් මට බොහොම සතුටුයි, ලංකාවේ පළමුවෙනි වතාවට අධ්‍යාපනය වෙනුවෙන් මෙතරම් මුදලක් වෙන් වූ වෙලාවක අය වැය විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන.

ඒ වාගේම ගරු මුදල් අමාත්‍යතුමා කියන්නේ රාජ්‍ය සේවකයෝ අපේ අය වැයට බරක් කියලා විතරයි. ඒ ගැන කරන වැරදි අර්ථ කථන අපේ ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේදී නිදොස් කරලා දුන්නා. මුදල් අමාත්‍යතුමා එයින් අදහස් කළේ අපට රාජ්‍ය සේවය වෙනුවෙන් වැඩි මුදලක් වෙන් කරන්න සිදු වෙනවා කියලායි. මගේ වචනයෙන් කියනවා නම්, රාජ්‍ය සේවකයෝ කියන්නේ මේ රටේ ඉන්න ජාතික සම්පතක්. මොකද, මම හිටපු රාජ්‍ය සේවකයෙක් නිසා ඒක කියන්නම ඕනෑ.

මේක මගේ වාග් ප්‍රහාරය. මේ රට කෑවා නම් කෑවේ දේශපාලනඥයා සියයට 20යි, ඔය ඔබ සහ මම හිටපු රාජ්‍ය සේවයේ සියයට 80ක් මේ රට කෑවා. ඒකට හේතුව මොකක්ද කියලා හොඳ මනසක් තිබෙනවා නම් හිතලා බලන්න. 1977 ඉඳලාම ජනාධිපතිවරුන්ට උපදෙස් දුන්නේ කවුද? කොහේ හරි ඉන්න එක්තරා ලේකම්වරයෙක්, එක්තරා උපදේශකවරයෙක්. ඇමතිවරුන්ට කවුද උපදෙස් දෙන්නේ? ඇමතිවරුන්ට නිර්ණායක ලබා දෙන ලේකම්වරු නැද්ද? සෞඛ්‍ය අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය, විදුලිබල අමාත්‍යාංශය වාගේ මම කිව්ව, නොකිව්ව සියලු අමාත්‍යාංශවල හොරු විතරක් ඉන්න යුගයක් මේක. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිසාපතිතුමායි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමායි, ග්‍රාම නිලධාරි ගැනයි මම කියන්න යන්නේ නැහැ. ඒ හැම තැනම මේ රට කෑවා නම් කෑවේ නිලධාරින් සියයට 80ක්, සියයට 20ක් දේශපාලනඥයෝ. මේ දෙගොල්ලන් එක්ක කාපු රටේ අද අපට ඉතිරිවෙලා තිබෙන්නේ සුනුබුලක් විතරයි කියලා මම බොහොම කනගාටුවෙන් මතක් කරනවා.

මම මොනරාගලට -මේ වෙද්දි මම පත්වෙලා අවුරුදු එකහමාරයි.- ව්‍යාපෘතියක් ගෙනාවා, රජයේ සීනි කර්මාන්තශාලාව ගැන. මම ස්තුතිවන්ත වෙනවා, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට සහ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට. එතුමන්ලා මේ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න සූදානමින් ඉන්නවා. ඒ වාගේම මම මොනරාගලට තව අලුත් සංකල්පයක් ගෙනාවා, අලි වැට නිර්මාණය කරන්න. මම සෙවණගල පස් කපන එක නැවැත්වූවා. සෙවණගල තවත් දේවල් නවත්වනකොට, තණමල්විල පස් කපන්න පර්මිට් දීම නවත්වනකොට, මට දැනුණු දේ තමයි මට ඒවා ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැයි කියන එක. කොහේවත් නැති කොමිස් මුදල් ගත්තා කියලා, මේ අවුරුදු එකහමාරට ශත පහක් හොරාට ගත්තේ නැති මිනිහෙක් වූ මට අපවාදාත්මක චෝදනා එල්ල වුණත්, මම මා නියෝජනය කරන ප්‍රදේශය, මේ රට ගොඩ නඟන්න ආ දේශපාලන ජීවියෙකු බව මතක් කර සිටිනවා.

සෞඛ්‍ය සේවය ගැනත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මෙවර සෞඛ්‍ය සේවයට වෙන් කළ මුදල් ප්‍රමාණය යම්කිසි විධියකට අඩු වෙලා තිබෙනවා. හැබැයි, ඒ ගොඩනැඟිලි හදන්න මුදල් නොදීපු නිසා මිස වෙනත් කාරණයක් නිසා නොවෙයි. වෙන හැම අය වැයකටම වඩා මෙවර සෞඛ්‍ය සේවයට මුදල් දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිගරට් මිල රුපියල් 5කින් ඉහළ දැමීම ගැනත් මතක් කරන්න ඕනෑ. ඒක ඊට වැඩි ප්‍රමාණයකින් ඉහළ දාන්න ඕනෑ එකක්. හේතුව, ලංකාවේ තිබෙන ප්‍රධාන සෞඛ්‍ය ගැටලුව non-communicable diseases. ඒ තුළ රජයට රටේ මිනිසුන් වෙනුවෙන් නොසෑහෙන්න වියදම් කරන්න වෙලා තිබෙනවා. ඒ වාගේම, මිනිසුන්ගේ ක්‍රය ශක්තිය නැති වෙලා තිබෙනවා. අපේ රටේ non-communicable diseasesවලට බලපාන සිගරට්වලට විතරක් නොවෙයි, අරක්කුවලටත් බද්දක් ගහන්න. එසේ නොකරනවා නම්, ඒ සඳහා හේතු සාධක හෝ දක්වන්න ඕනෑ. රාජ්‍ය නිලධාරින් ඒක කරන්න ඕනෑ. එහෙම කරලා අපේ රටෙන් non-communicable diseases අයින් කළොත්, එය මේ රටේ යහ පැවැත්මට හොඳයි කියලා මම මතක් කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිර්ධන පන්තියේ මිනිහෙක් විධියටයි මම මේ සභාවට ආවේ කියන එක විශේෂයෙන්ම මම මතක් කර සිටිනවා. අපේ ලොකු සල්ලිකාරයන්ගෙන් ගන්නේ සියයට 15යි. අහිංසක නැති බැරි මිනිහාගෙන් ගන්නවා, සියයට 85ක්. මගේ දැක්ම තමයි, ඒක අනෙක් පැත්ත ගැහෙන්න ඕනෑ කියන එක. සියයට 50, 50 නොවෙයි. සල්ලි තිබෙන මනුස්සයා හොඳට කාලා බීලා ඉන්න කොට නැති බැරි මිනිහාගේ පාන් ගෙඩියෙන් ගන්න රුපියලේ වෙනස අපි දැන් නැති කරන්න ඕනෑ. ඕනෑ කෙනෙකුට කන්න දෙන්න ඕනෑ, ඒක වෙනම දෙයක්. හැබැයි, කෝටි ප්‍රකෝටි ගණන් හම්බ කරන අයගෙන් භාගෙට භාගයක් ගත්තත් කමක්නැහැයි කියන දැක්මකයි මම ජීවත් වෙන්නේ.

මේ වෙලාවේ ආහාරවල ප්‍රශ්නයකුත් තිබෙනවා. එම නිසා කළු කඩකාරයෝ රට පුරා ඇති වී ගෙන යනවා. ඒක නිසාවෙන්ම මම අපේ රජයට ආරාධනා කරනවා, මේ වෙලාවේ සමුපකාරය සහ සතොස කාර්යක්ෂමව ක්‍රියාත්මක කරලා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමට රජය මැදිහත් වෙන්න කියලා. ඒකත් එක්ක තමයි මේ රට ගොඩ නඟන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ මට සාධාරණීකරණය කරන්න පුළුවන් කාරණා විධියට සැමට ජලය ව්‍යාපෘතිය, සමුපකාරය, නව කර්මාන්ත ආයෝජන, මහා කර්මාන්ත සහ උමා ඔය, කුඹුක් ඔය සංවර්ධනය වැනි වෙල්ලස්සේ ව්‍යාපෘතිවලට මුදල් වෙන් කිරීම දකින්න පුළුවන්. ඒ වාගේම, වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයටත් මුදල් වෙන් වෙලා තිබෙනවා.

මෙවර අය වැයෙන් ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන 3ක් දුන්නා. ඔබතුමන්ලා දන්නවාද, දේශපාලනඥයෙකු වූ මම දවස් දෙකක් ඒ වෙනුවෙන් නිදි වැරුවා කියලා. ප්‍රාදේශීය ලේකම්ලා ඇතුළු නිලධාරින් ඒ ලේඛන හැදුවා තමයි. ඒ ලේඛන මගේ ළඟට ගෙනැල්ලා, සෝදුපත් බලා නිවැරදි කිරීමේ කර්තව්‍යය කරන්න මට දවස් දෙකක් නිදි වරන්න සිදු වුණා. ඒක තමයි යථාර්ථය. හැබැයි, මම රුපියලකටවත් දේශපාලනය කරන කෙනෙකු නොවන බව මතක් කරනවා. ඒ වාගේම දේශපාලනඥයාට අවශ්‍ය නැහැ, pension එකක්. අපි ආවේ සමාජ සේවයට. මේක රජයේ රැකියාවක් නොවෙයි. රැකියාවකින් ඔබ්බට ගිය සමාජ සේවාවක් කරන්න ආ මම, ඔබ ඉදිරියේදී සමාජ සේවය කරන්න තවත් කැප වෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගුණතිලක රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය අපේ මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල අය වැය. එතුමාගේ මේ මංගල අය වැය ඉදිරිපත් කරන්නේ ලෝකයම ආර්ථික අර්බුදයකට මැදි වෙච්ච අවස්ථාවක බව අපි කවුරුත් දන්නවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වුණාට අපිවත් හිතුවේ නැහැ, මේ වාගේ ජනතාවාදී අය වැයක් මේ කරදර අස්සේ ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි කියලා. නමුත්, අපේ මුදල් ඇමතිතුමා අපි නොසිතූ ආකාරයට සියලු ක්ෂේත්‍ර නියෝජනය වෙන ආකාරයට මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙනවා. මේ අය වැය තුළින් විපක්ෂය බලාපොරොත්තු වුණේ මොකක්ද? විපක්ෂ නායකතුමා පුවත් පතකට කියා තිබෙනවා මම දැක්කා, "මෙවර අය වැය සෝමාලියානු, ඉතියෝපියානු පන්නයේ අය වැයක්" කියලා. එතුමන්ලා බලාපොරොත්තු වුණේ එහෙම අය වැයක් තමයි. නමුත්, ජනතාව බලාපොරොත්තු වූ ඒ නියම අය වැය ඕනෑවටත් වඩා අද ජනතාව වෙනුවෙන් අපේ මුදල් ඇමතිතුමා ලබා දීලා තිබෙනවා. පළමුවෙන්ම, ඒ පිළිබඳව මුදල් ඇමතිතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා.

අද මෙතුමන්ලා පෙළපාළි යනවා. මෙතුමන්ලා අධිකරණ තීන්දු ගණන් ගන්නේ නැහැ. නමුත් අපට මතකයි, අපි විපක්ෂයේ ඉන්න කාලයේ මහනුවර සිට කොළඹ දක්වා පා ගමනක් ආ බව. එදා කොරෝනා වසංගතය තිබුණේ නැහැ. අද කොරෝනා වසංගතය තිබෙනවා. එදා මහනුවර දළදා මාළිගාව අසළින් පටන් ගන්න තිබුණු ඒ පෙළපාළිය අධිකරණ නියෝගයකින් පේරාදෙනියට තල්ලු කර යැව්වා. අපි නීතියට ගරු කළා. අපේ පා ගමන පේරාදෙනියෙන් පටන් ගත්තා. පේරාදෙනියෙන් පටන්ගෙන කඩුගන්නාව පහු කරලා මාවනැල්ලට කිට්ටු වෙනකොට මාවනැල්ලේ හිටපු විපක්ෂයේ බලවතා වන කබීර් හෂීම් මහත්මයා අපට යන්න දුන්නේ නැහැ. එතුමා උසාවි නියෝගයක් අරගෙන ඒ ගමන නැවැත්තුවා. එදා කොරෝනා වසංගතය තිබුණාද? නැහැ. එදා තිබුණු ඒ රාජ්‍ය භීෂණය එතුමන්ලාට හොඳයි. මේ කොරෝනා වසංගතය අස්සේ අපි උසාවි තීන්දු ගන්නකොට, එතුමන්ලා තමන්ගේ නීතිය අතට ගන්න අද කටයුතු කරනවා. එදා මට මතකයි, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු අපි කඩුගන්නාවට කිට්ටු වෙනකොට එකවර ඇම්බියුලන්ස් 5ක් ආවා. ඒ, ඇයි? "මෙන්න, හදිසි ලෙඩුන් අරගෙන යනවා, මේ පෙළපාළි නිසා ලෙඩුන්ගේ ජීවිත අනතුරේ" කියලා වැරදි චිත්‍රයක් රටට පෙන්වන්න එදා ඇම්බියුලන්ස් 5ක් එව්වා. අපි පොඩ්ඩක් හෙමිහිට ඇම්බියුලන්ස්වල ඇතුළ බැලුවා, ලෙඩුන් හිටියාද කියලා. එක ලෙඩෙක්වත් හිටියේ නැහැ. එදා එහෙමයි විපක්ෂය අපට අරියාදු කළේ. අද ඔවුන්ට ඒ සියල්ල අමතක වෙලා.

මම දැක්කා, ඊයේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු කථා කරලා අහනවා, "පොදුජන පෙරමුණේ 5වැනි සංවත්සරය සඳහා විශාල සෙනඟක් ගෙනාවා. ඇයි, අපට ගේන්න නොදෙන්නේ?" කියලා. ඒ මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවෙන් මැයි රැලියට, එහෙම නැත්නම් පක්ෂයේ මොනවා හරි උත්සවයකට වෙනදා බස් 20ක්, 25ක් එනවා. හැබැයි, මෙවර පොදුජන පෙරමුණේ 5වැනි සමුළුවට අපේ ආසනයෙන් ආවේ 4දෙනායි. මම සහ සභාපතිවරු තුන්දෙනා පමණයි. සෞඛ්‍ය නීති-රීතිවලට අනුගත වෙලා අපි එහෙමයි ඒ සංවත්සරය සැමරුවේ. නමුත්, එතුමන්ලාට ඒක තේරෙන්නේ නැහැ. අපට මතකයි, එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ එදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යටතේ ක්‍රියාත්මක වූ "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහන. විපක්ෂයට ඒක මතක ඇති. ඒකෙන් යෝජනා කළා, ලක්ෂ 14ක රාජ්‍ය සේවය ලක්ෂ 6 දක්වා කප්පාදු කරන්න. අන්න එහෙමයි, රජයේ සේවකයන්ට එදා එතුමන්ලා සැලකුවේ. අපට මතකයි, 1980 පැවැති ජූලි වැඩ වර්ජනය. එහිදී රුපියල් 100ක් ඉල්ලා වැඩ වර්ජනය කරපු රාජ්‍ය සේවකයන් 40,356ක් ගෙදර යැව්වා. එතුමන්ලාට ඒවා අමතකයි. එදා ඒ සටනේදී සමහර රාජ්‍ය සේවකයන් හිතේ අමාරුවට වස බිව්වා. සමහර අය එල්ලී මැරුණා.

නමුත්, අපේ රජය ආවාට පස්සේ වැඩ කරන්න පුළුවන් අයට නැවතත් රස්සා දුන්නා; වන්දි ගෙව්වා. එහෙමයි අපි රාජ්‍ය සේවකයන්ට සලකන්නේ. නමුත්, ඊයේ පෙරේදා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මාධ්‍ය සාකච්ඡාවකදී කරපු ප්‍රකාශයක කෑල්ලක් අල්ලාගෙන අද මේ රජයට ගහන්න පටන් අරගෙන තිබෙනවා, "අපි තමයි රාජ්‍ය සේවකයන්ට සැලකුවේ, මේ ආණ්ඩුව සලකන්නේ නැහැ" කියලා. මේ රටේ ලක්ෂ 6ක්, 7ක්ව පැවැති රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය ලක්ෂ 15, 16 දක්වා අරගෙන ගියේ වෙන කවුරුවත් නොවෙයි, අපේ ආණ්ඩුවෙන් කියන එක මම එතුමන්ලාට මතක් කරන්න කැමැතියි.

මේ අය වැයේ තිබෙන යෝජනා සහ සහන ගැන කථා කරන්න ගියොත්, මට ලැබී තිබෙන්නේ විනාඩි 8ක කාලයක් නිසා කථා කරන්න වෙලාව මදි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

මම තව එක් කරුණක් දෙකක් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බැඳුම්කර වංචාව නිසා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ රුපියල් කෝටි 850ක් රාජසන්තකයි. ඊයේ පෙරේදා මේකටත් නොයෙක්, නොයෙක් කථා කියනවා මම දැක්කා. ඒ කථා කරන්නේ කවුද? එදා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් සල්ලි ගත් අය. එදා පැවැති election එකට ඔවුන්ගෙන් සල්ලි නොගත් කෙනෙක් අද මේ විපක්ෂයේ නැහැ. හැම කෙනාම සල්ලි ගත්තා. ඒ හින්දා, බැඳුම්කර මගඩියට අදාළ සල්ලි රාජසන්තක කළාට ඒ අයට පුංචි හිතේ අමාරුවක් ඇති. එදා

[ගරු ගුණතිලක රාජපක්ෂ මහතා]

'ඉවිනෝ්ටිකාරයෝ' ඒ අය ආරක්ෂා කරන්න කල්ලි ගැහුණු ආකාරය, දඟලපු ආකාරය අපි හොඳට දැක්කා. "කප්පරයක් ජරාව ගිල්ල මිනිහා අහිංසක උපාසක අම්මා කෙනෙකුට පොඩි වාතයක් ගියාම ගඳයි, ගඳයි කියනවා" කියලා කථාවක් තිබෙනවා නේ. අද මුළු විපක්ෂයම ඒ වාගේ තමයි.

අපි කියනවා, 2022 වර්ෂය කියන්නේ, අපේ සංවර්ධන ඉලක්ක ජයග්‍රහණය කරන වර්ෂයක් කියලා. 2022 වර්ෂයේ අපි ඕනෑම මැතිවරණයකට මුහුණ දෙන්න සූදානම්. අපේ පක්ෂයෙන් අවසර දෙනවා නම්, එක්සත් ජාතික පක්ෂයේ වේවා, එහෙම නැත්නම් සමගි ජන බලවේගයේ වේවා නුවර සිටින ඕනෑම ජගතෙක් එක්ක මධ්‍යම පළාත් සභාවේ මහ ඇමතිකමට මහනුවර දිස්ත්‍රික්කයෙන් තරග කරලා කරට කර සටනක් දීලා මධ්‍යම පළාත් සභාව ජයග්‍රහණය කිරීමට, මේ මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වෙන්න වුණත් මම ලැහැස්තියි.

මම ඊයේ "හිරු" නාළිකාවේ "සලකුණ" වැඩසටහන බැලුවා. ගරු මුදල් ඇමතිතුමා කියන්න ඕනෑ කරුණු සියල්ල ඊයේ "සලකුණ" වැඩ සටහනේදී පැහැදිලිව සහ නිරවුල්ව ප්‍රකාශ කළා. එම නිසා අද විපක්ෂය මොන දේ කළත්, ජනතාව ඉන්නේ අපිත් එක්ක. අපි කියනවා, අපි මැතිවරණවලට භය අය නොවෙයි. මෙදාපාර අය වැයෙන් ග්‍රාමීය ආර්ථිකය නංවන්න ලබා දුන් සහන ගැන මම ඊයේ පෙරේදා ගමට ගිය වෙලාවේ ගමේ කාන්තාවෝ කථා කළා. අපේ ගමේ කාන්තාවෝ කිව්වා, "අනේ මන්ත්‍රීතුමෝ, සිගරට් එකට රුපියල් 5ක් වැඩි කරපු එක මදි, අඩුම ගණනේ ඒක රුපියල් 10කින්වත් වැඩි කරන්න තිබුණානේ" කියලා. ඒ වාගේම, "අරක්කුවලට රුපියල් 100ක්, 105ක්, 125ක් වැඩි කළාට මදි, අඩු ගණනේ රුපියල් 200කින්වත් වැඩි කළා නම් හොඳයි" කියලා. කාන්තාවෝ එහෙම කියන්නේ. පසුගිය කාලයේ මේ රටේ ජනතාව මත්පැන් බීපු ආකාරය, ඒවාට මුදල් වියදම් කරපු ආකාරය අපි දැක්කා. මුළු රටේම ත්‍රිරෝද රථ මල්ලිලා, බස් හිමියෝ, ඒ ඔක්කෝම මේ අය වැයට ගොඩක් ගරු කරනවා. මට තව කථා කරන්න කාලය නැහැ. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.36]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்!*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வரவு செலவுத்திட்டத்தை ஆளுங்கட்சியினர் பாராட்டியும், எதிர்க் கட்சியினர் எதிர்த்தும் பேசுகின்ற வழமையான கலாசாரத் தையே இம்முறையும் நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் பார்க்கின்றோம். உண்மையிலே இன்று இந்த நாட்டில் வாழுகின்ற மக்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். நீங்கள் உங்களுடைய தொகுதிகளுக்குச் சென்று, நேரடியாக மக்களுடன் கலந்துரையாடினால் அது உங்களுக்குப் புரியும்! இந்த அரசாங்கத்தைக் கொண்டுவருவதற்கு அதிகமாகப் பாடுபட்ட விவசாயிகள்கூட, இன்று தங்களுடைய எதிர்காலம் சூனியமாகிவிடுமோ? தங்களுடைய பிள்ளைகளின் கல்வி, சுகாதாரம் உட்பட இன்னோரன்ன அடிப்படைத் தேவைகளை நிறைவேற்றுவதற்குத் தங்களால் முடியாமல் போய்விடுமோ? என்ற அச்சத்துடன்தான் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். இன்று வீதிக்கு இறங்கிப் போராடுகின்ற அத்தனை பேரும் இந்த அரசாங்கத்துக்கு எதிரானவர்கள் அல்லர். ஆனாலும், இந்த அரசாங்கத்துக்கு வாக்களித்த பெரும்பான்மையினர் இன்று வீதிக்கு இறங்கி ஆர்ப்பாட்டம் செய்கின்றார்கள் என்பதை ஆளுங்கட்சியினராக இருக்கின்ற நீங்கள் புரிந்து கொண்டு, அவர்களுடைய தேவைப்பாட்டையும் எதிர் பார்ப்பையும் நிறைவேற்றுகின்ற வகையில், உங்களுடைய நிலைப்பாட்டில் மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்பதுதான் எங்களுடைய வேண்டுகோளாகும்.

அடுத்து, இந்த வரவு செலவுத்திட்டத்தில் பாதுகாப்புக்கு அதிக நிதி ஒதுக்கப்பட்டிருக்கிறது. பாதுகாப்பு என்று சொல்கின்றபொழுது, அதில் ஆயுத ரீதியான பாதுகாப்பு மாத்திரமல்ல, உணவுத் தேவையைப் பூர்த்திசெய்தல், வறுமையைப் போக்குதல், இருப்பிட வசதிகளைச் செய்து கொடுத்தல், சுகாதார ரீதியிலான பாதுகாப்பு, கல்வி அறிவை வழங்குதல் என்பனவும் அடங்குகின்றன. இவை மனிதப் பாதுகாப்போடு சம்பந்தப்பட்ட விடயங்களாகும். இவற்றுக் காக இந்த வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்டிருக்கின்ற நிதியானது போதுமானதாக இல்லை.

இந்த அரசாங்க காலத்தில் மாத்திரமல்ல, கடந்த காலங்களில்கூட, வரவு செலவுத்திட்டத்தை முன்வைக்கின்ற பொழுது ஒரு தேர்தலை மையப்படுத்தி முன்வைப்பார்கள். இவ்வாறு தங்களுடைய கட்சியை வளர்க்க வேண்டும் என்பதற்காகச் சிந்தித்துச் செயற்படுகின்ற ஒரு நிலைமை இருப்பதனால்தான் இந்த நாடு 70 வருடங்களுக்கு முன்னர் சுதந்திரம் பெற்றும், இன்றுவரை பொருளாதாரத்தில் முன்னேற முடியாமல் இருக்கின்றது. நாட்டின் பொருளாதாரம் சீரழிந்து அதலபாதலத்தை நோக்கிச் சென்றுகொண்டிருக்கிறது. ஒவ்வொரு வருடமும் தனிநபர் கடன் தொகை அதிகரித்துக் கொண்டிருக்கிறது. இதனால், உலகின் ஏனைய வறிய நாடுகளைப்போன்று இந்த நாட்டின் நிலையும் சென்று கொண்டிருக்கிறது. இந்த நிலைமையை தற்போதைய சனாதிபதி மேதகு கோட்டாபய ராஜபக்ஷ அவர்கள் மாற்றுவார் என்ற பெரிய எதிர்பார்ப்போடுதான், கடந்த சனாதிபதித் தேர்தலில் அவருக்கு இந்த நாட்டிலுள்ள 69 இலட்சம் மக்கள் வாக்களித்தார்கள். அதேபோல, கடந்த பாராளுமன்றத் தேர்தலில் இந்த அரசாங்கத்துக்கு 142 ஆசனங்களை - கிட்டத்தட்ட மூன்றில் இரண்டு பெரும் பான்மைப் பலத்தை - மக்கள் தங்களது ஆணைமூலம் பெற்றுக் கொடுத்தார்கள்.

இந்த அரசாங்கத்தில் இருக்கின்ற அல்லது இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற ஒரு மூத்த அரசியல்வாதிதான் கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்கள்! அவரிடத்திலும் இந்தப் பாராளுமன்றத்திடமும் இருந்த அதிகாரங்களில் 90 சதவீதமான அதிகாரங்கள் 20ஆவது திருத்தத்தினூடாகப் பறித்தெடுக்கப்பட்டது. "மஹிந்த ராஜபக்ஷ" என்ற நாமம் கடந்த காலங்களில் அதிகளவில் பேசப்பட்ட ஒரு நாமம்! இந்த நாட்டை ஒன்பது வருடங்கள் ஆண்டவர். அவர் வேட்பாளராக நின்ற சனாதிபதித் தேர்தல்களிலும் அதன் பிறகு நடந்த ஏனைய தேர்தல்களிலும் அவருக்குப் பக்கபலமாக இருந்தவன் என்ற வகையில், அவருடைய அமைச்சரவையில் 09 வருடங்கள் அங்கம்வகித்தவன் என்ற வகையில், அவரிடத்தில் தூரநோக்குடைய சிந்தனை இருந்ததைக் கண்டேன்; இந்த நாட்டைப் பற்றிய கவலை இருந்ததைக் கண்டேன். இந்த நாட்டினுடைய பொருளாதாரத்தை முன்னேற்றுவது

தொடர்பிலான ஒரு திட்டம் அவரிடத்தில் இருந்ததை நாங்கள் கண்டோம். இந்த நாட்டிலே புரையோடிப்போயிருந்த பயங்கரவாதத்தை ஒழித்து, தமிழ், முஸ்லிம் மற்றும் சிங்கள மக்கள் ஒற்றுமையாக வாழவேண்டும் என்ற சிந்தனை அவரிடம் இருந்தது. அப்படிப்பட்ட மஹிந்த ராஜபக்ஷ அவர்கள் இன்று ஓரங்கட்டப்பட்டுவிட்டாரா? அல்லது அவருடைய கருத்துக்களுக்கு இங்கு இடமில்லையா? போன்ற கேள்விகள் எங்களிடத்தில் இருக்கின்றன. ஏனென்றால், தற்போதைய இரண்டு வருட கால ஆட்சியை கடந்த ஒன்பது வருட கால ஆட்சியுடன் ஒப்பிட்டுப்பார்க்கின்றபொழுது, அவை இரண்டுக்கும் இடையில் 'மலையும் மடுவும் போல' பாரிய வித்தியாசம் இருக்கின்றது. மிகக் குறுகிய காலத்தில் மக்களுடைய வெறுப்பைச் சம்பாதித்த ஓர் அரசாங்கமாக இன்று இந்த அரசாங்கம் மாறியிருக்கின்றது. எதைப் பேசினாலும் இனவாதமாகவும் மதவாதமாகவும் பார்க்கின்ற, எல்லா விடயத்திலும் இனவாதத்தைத் திணிப்பதனூடாகத் தங்களுடைய எதிர்கால அரசியல் இருப்பைத் தக்கவைத்துக் கொள்ளலாம் என்று சிந்திக்கின்ற ஒரு நிலைமையை நாங்கள் இந்த ஆட்சியாளர்களிடம் பார்க்கின்றோம்.

இந்த நாட்டிலே சமத்துவத்தை ஏற்படுத்தப் போவதாகக் கூறினீர்கள். அந்த வகையில், நீங்கள் அளித்த தேர்தல் வாக்குறுதிகளில் ஒன்றான 'ஒரே நாடு, ஒரே சட்டம்' என்ற எண்ணக்கருவை நாங்கள் ஏற்றுக்கொள்கிறோம். இது ஒரு நாடுதான்; இரண்டு நாடு அல்ல. நீங்கள் இந்த நாட்டை ஒரு நாடு என்று சொன்னாலும் சொல்லாவிட்டாலும் இது ஒரு நாடுதான்! இந்த நாடு ஒரு நாடாக இருக்கவேண்டும் என்பதற்காகத்தான் நான் சார்ந்த முஸ்லிம் சமூகத்தினரும், தமிழ் சமூகத்தினரும், சிங்களச் சமூகத்தினரும் சேர்ந்து பாடுபட்டு, இந்த நாட்டுக்கு சுதந்திரத்தைப் பெற்றுக் கொடுத்தார்கள். முஸ்லிம்கள் தமது மதத்தை, கலாசாரத்தைப் பின்பற்றுகின்ற வகையில் அவர்களுக்கென இந்த நாட்டிலே தனிப்பட்ட சட்டங்கள் உருவாக்கப்பட்டிருக்கின்றன. தனியார்ச் சட்டம், தேச வழமைச் சட்டம், கண்டியச் சட்டம் என்பவற்றை நாட்டின் சுதந்திரத்துக்காகப் பாடுபட்ட எங்களுடைய மூதாதையர்கள் அங்கீகரித்ததனால், அவற்றை நீதிமன்றங்கள் ஏற்றுக்கொண்டதனால் இந்த நாட்டிலே பல்லினத்தவர்களும் ஒற்றுமையாக வாழ்ந்தார்கள்.

வடக்கிலும் கிழக்கிலும் தெற்கிலும் பயங்கரவாதம் உருவெடுத்தபொழுது, அதற்கு எதிராக தமிழ், முஸ்லிம், சிங்கள மக்கள் குரல்கொடுத்தார்கள். அவர்கள் இந்த நாட்டின் ஒற்றுமைக்காக எல்லா வகையிலும் உழைத்திருக்கிறார்கள். அதேபோல, இந்த நாட்டைப் பொருளாதார ரீதியாகக் கட்டியெழுப்ப வேண்டும் என்பதற்காக ஒற்றுமையுடன் நிதானமாக அவர்கள் செயற்பட்டிருக்கின்றார்கள். அவ்வாறானவர்களை எல்லாம் புறந்தள்ளிவிட்டு, இந்த நாட்டிலே நடந்த 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரி 'அல்லாஹ்' என்று சொன்ன ஒருவரை, கடந்த காலங்களில் நீதிமன்றத்தினால் தண்டனை வழங்கப்பட்டு பின்னர் முன்னாள் சனாதிபதியால் பொதுமன்னிப்பு வழங்கப்பட்ட ஒருவரை தூர சிந்தனை இல்லாமல் 'ஒரே நாடு, ஒரே சட்டம்' என்ற சனாதிபதிச் செயலணியின் தலைவராக நியமித்ததன் அர்த்தம் என்ன? என்று நாங்கள் கேட்கிறோம். இன்று உலகில் அல்லாஹ்வை ஏற்றுக்கொண்ட முஸ்லிம்கள் சுமார் 02 பில்லியன் இருக்கிறார்கள். அல்லாஹ்வை வஞ்சிப்பதை, அல்லாஹ்வை ஏசுவதை, அல்லாஹ்வுக்கு எதிராகப் பேசுவதை அவர்கள் வன்மையாகக் கண்டிக்கின்றார்கள். அதேபோல், இன்று உலகில் 54 முஸ்லிம் நாடுகள் இருக்கின்றன. அவ்வாறு இருக்கின்றபொழுது, அல்லாஹ்வைக் கேவலப்படுத்திய ஒருவரை நீங்கள் அந்தச் செயலணியின் தலைவராக நியமித்ததன் ஊடாக எதை எதிர்பார்க்கின்றீர்கள்? அதன்மூலம் இந்த நாட்டிலே வாழுகின்ற சுமார் 20 இலட்சம் முஸ்லிம்களைப் பயமுறுத்தாலாம் என்று நினைக்கிறீர்களா? அல்லது இதனால் பெரும்பான்மை இன மக்கள் சந்தோசப் படுவார்கள் என்று நினைக்கிறீர்களா? இன்று பெரும் பான்மைச் சிங்களச் சகோதரர்கள்கூட, இந்த நியமனத்தை எதிர்த்துப் பேசுகின்ற நிலைமை ஏற்பட்டிருக்கிறது.

கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்த 09 வருட காலத்தில் இந்த நாட்டில் எத்தனையோ புரட்சிகளைச் செய்தார். அக்காலத்தில் நாங்கள் அவருக்குப் பக்கபலமாக இருந்து செயற்பட்டோம். அவரிடம் இருந்த அதிகாரங்களையெல்லாம் உங்களுடைய இரண்டு வருட காலத்துக்குள் பறித்தீர்கள்; மிகவும் சண்டித்தனமாக நடந்து கொள்கின்றீர்கள். சிறையில் இருந்தபொழுது இந்தப் பாராளுமன்றத்திலே என்னுடைய கருத்தைச் சொல்வதற்குக் கூட சந்தர்ப்பம் மறுக்கப்பட்டது. அதாவது, மக்கள் எனக்குத் தந்த உரிமைகூட மறுக்கப்பட்டது. இவ்வாறான செயற்பாடு நியாயமானதா? என்று நான் கேட்கின்றேன்.

ஒரு ஜனநாயகக் கட்சியுடைய தலைவரும், ஜனநாயகவாதியும், மக்களால் தெரிவு செய்யப்பட்டவருமான எனக்கு நடந்த அநியாயத்தை - என்னை அநியாயமாகக் கைதுசெய்ததை, எனக்கு சிறையில் மலசலங் கழிக்கச் செல்வதற்குக்கூட அனுமதி மறுக்கப்பட்டதை - இங்கு சொல்ல முடியாதளவுக்கு என்னுடைய குரலை அடக்க நினைத்தீர்கள்! இவ்வாறான செயற்பாடுகளால் உங்களால் நீண்டகாலத்திற்கு அரசியலில் நிலைத்துநிற்க முடியாது என்பதை நீங்கள் தெரிந்து வைத்துக்கொள்ளுங்கள்! கடந்த கால ஆட்சியாளர்கள் உங்களில் ஒருசிலரைச் சிறையிலே அடைத்ததாகச் சொன்னீர்கள். அவற்றுக்கு நாங்களா காரணமாக இருந்தோம்? நாங்கள் உங்களோடும் ஆட்சியின் பங்காளிகளாக இருந்திருக் கின்றோம்; இவர்களோடும் ஆட்சியின் பங்காளிகளாக இருந்திருக்கின்றோம். நாங்கள் எல்லாக் காலங்களிலும் நியாயத்துக்காகச் செயற்பட்டிருக்கின்றோம்; நாட்டினுடைய அபிவிருத்திக்காகச் செயற்பட்டிருக்கின்றோம்; நாட்டினுடைய பாதுகாப்புக்காகச் செயற்பட்டிருக்கின்றோம்; இந்த நாட்டிலே பயங்கரவாதம் இருக்கக்கூடாது என்பதற்காகச் செயற்பட்டிருக் கின்றோம். நல்ல விடயங்களுக்காகத்தான் நாங்கள் எங்களுடைய அரசியல் பலத்தைப் பயன்படுத்தியிருக் கின்றோம்.

இந்த Budget இலே நீங்கள் மறைமுகமாக சில வரிகளை மக்கள்மீது சுமத்தியிருக்கின்றீர்கள். டொலர் தட்டுப்பாடு இந்த நாட்டிலே இருக்கின்றது. இன்னும் 4 - 5 மாதங்களில் இந்த நாட்டிலே என்ன நடக்குமென்று தெரியாத ஒரு நிலைமை இருக்கின்றது. ஆகையால், மென்மேலும் இனவாதத்தை விதைக்காதீர்கள்! இனவாதிகளுடைய கைகளை ஓங்கச் செய்யாதீர்கள்! இனவாதம், மதவாதம் பேசுகின்றவர்களைத் தலையிலே தூக்கி வைக்காதீர்கள்! சட்டத்தை எல்லோருக்கும் சமமாகப் பிரயோகியுங்கள்! அவ்வாறு செய்கின்றபோதுதான் வெளிநாட்டவர்கள் இந்த நாட்டில் முதலீடுகளைச் செய்ய முன்வருவார்கள்.

இந்த நாட்டிலே பாரிய முதலீட்டை மலேசியா செய்திருக்கின்றது என்பது உங்களுக்குத் தெரியும்! அதேபோல, ஐக்கிய அரபு அமீரகம் - அபுதாபி - செய்திருக்கின்றது. நான் கடந்த அரசாங்கத்திலே அமைச்சராக இருந்தபோது கட்டாருக்கு விஜயம் செய்தேன். அப்பொழுது, அவர்கள் இந்த நாட்டிலே US

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

Dollars 1 billionஐ முதலீடு செய்வதாகச் சொன்னார்கள். அவ்வாறே, ஓமானுக்குச் சென்றபொழுது, அவர்களும் இந்த நாட்டிலே பல பில்லியன் டொலர்களை முதலீடுசெய்ய இருப்பதாகச் சொன்னார்கள். இப்படி எத்தனையோ முஸ்லிம் நாடுகள் இங்கே வந்து முதலீடுசெய்ய ஆசையோடு இருந்தன. அவர்களுக்கு இந்த நாட்டினுடைய வளங்களைச் சூறையாடுகின்ற எண்ணமோ, வேறு எந்தவித தீய எண்ணமோ கிடையாது. இந்த நாட்டினுடைய அபிவிருத்தி, சமாதானம், சமத்துவம் என்பன பற்றியே அவர்கள் சிந்திக்கின்றார்கள். 'ஈஸ்டர்' தாக்குதலின் சூத்திரதாரி அல்லாஹ்தான் என்று சொன்னவரை நீங்கள் 'ஒரே நாடு, ஒரே சட்டம்' என்ற சனாதிபதி செயலணிக்குத் தலைவராக நியமித்த பிறகு, அவ்வாறான இஸ்லாமிய நாடுகள் இந்த நாட்டைத் திரும்பிப் பார்க்குமா? இந்த நாட்டில் முதலீடு செய்வதைப் பற்றி அவர்கள் சிந்திப்பார்களா? இந்த நாட்டுக்குச் சுற்றுலாப் பயணிகளாக அவர்கள் வருவார்களா? எனவே, நீங்கள் மிக ஆழமாகச் சிந்திக்க வேண்டும். இந்த நாடு எல்லோருக்கும் - பௌத்தர்களுக்கும் இந்துக்களுக்கும் கத்தோலிக்கர் களுக்கும் முஸ்லிம்களுக்கும் - சொந்தமான நாடு! இந்த நாட்டிலே நாங்கள் அனைவரும் ஒற்றுமையாக வாழ வேண்டும். இந்த நாட்டிலே இனவாதத்தை மூலதனமாக வைத்து ஒரு குறுகிய காலத்திற்கு அரசியல் செய்யலாம்! ஆனால், இந்த நாட்டினுடைய பொருளாதாரம் சீரழிந்துவிடும். நமது பிள்ளைகள் கடன்காரர்களாக மாறிவிடுவார்கள். இதனால், நாங்கள் வெளிநாடுகளிடம் கையேந்தவேண்டிய மிக மோசமான நிலையேற்படும். எனவே, நாட்டின் நலனையும், எதிர்காலத்தையும் மையமாக வைத்துச் செயற்படுங்கள்! என்று நான் உங்களிடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන් වෙනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තු දෙකක් ලබා දෙන්න. මේ පැත්තේ මන්ත්‍රීවරුන් නැහැ නේ. මම විතරයි ඉන්නේ. ඒ නිසා මට තව මිනිත්තු දෙකක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසන්. දැන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
LLB பட்டப்படிப்புக்கான பரீட்சை வினாத்தாள்கள் உரிய தினத்துக்கு முதலே வெளிவந்ததாக நான் அண்மையிலே கேள்விப்பட்டேன். எனவே, உயர் கல்வி அமைச்சர் அல்லது அதற்குப் பொறுப்பான நீதி அமைச்சர் கௌரவ அலி சப்ரி அவர்கள் தயவுசெய்து இதில் கவனம் செலுத்த வேண்டும். உண்மையிலே, தவறு நடந்திருந்தால் அப்பரீட்சையை மீளநடாத்த நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, புத்தளத்திலே அண்மையில் ஏற்பட்ட வெள்ளப் பெருக்குக் காரணமாக அந்தப் பிரதேசத்தில் வாழுகின்ற மக்கள் மிகவும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். அவர்களுக்கு எந்தவித நஷ்டஈடோ, உலருணவோ அல்லது கொடுப்பனவோ வழங்கப்படவில்லை. எனவே, இந்த விடயத்திலும் அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
"அரச உத்தியோகத்தர்கள் இந்த நாட்டுக்குச் சுமை" என்று அண்மையில் நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள் சொல்லியிருந்தார். ஆனால், அரச உத்தியோகத்தர் கள் ஓய்வுபெறும் வயதை 60இலிருந்து 65ஆக உயர்த்தியதன் மர்மம் என்னவென்று தெரியவில்லை. இது மிக ஆழமாகவும் தூரநோக்குடனும் சிந்திக்கவேண்டிய ஒரு விடயமாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමා වැඩිපුර මිනිත්තුවක කාලයක් අරගෙන තිබෙනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
தயவுசெய்து விலைவாசி உயர்வைக் கட்டுப்படுத்த நடவடிக்கையெடுங்கள்! இறுதியாக, டொலர் பிரச்சினையைத் தீர்ப்பதற்கு ஒரு நீண்டகாலத் திட்டத்தை வகுத்துக் கொள்ளுங்களென்று கேட்டு விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහමඩ් මුසම්මිල් මැතිතුමා. ඔබතුමාට විනාඩි එකොළහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මෙම අය වැයේ සන්දර්භය ගත්තාම, ගෝලීය වශයෙන් හා ජාතික වශයෙන් මේ තුළ කෙබඳු සන්දර්භයක්ද තිබෙන්නේ කියන එක මුලින්ම අපි කවුරුත් තේරුම් ගන්න ඕනෑ. ව්‍යාපාර ගත්තත්, ආණ්ඩු වශයෙන් ගත්තත්, රටවල් වශයෙන් ගත්තත්, පවුල් ඒකක වශයෙන් ගත්තත් survival mode එකකට, එහෙම නැත්නම් ආරක්ෂණවාදී පියවරකට තමයි අද අපි හැම දෙනාටම ගමන් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම ලෝකයේ රටවල් ගත්තාම, 1990න් පසුව ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉහළම උද්ධමනයක් පසුගිය ඔක්තෝබර් මාසයේ වාර්තා වුණා. ලෝකයේ හැම රටකම ඉතාම දැවැන්ත ආර්ථික අර්බුදයක් පැන නැගෙමින් පවතිනවා. අද පමණක් නොවෙයි, ඉදිරි වසර කිහිපයත් ඉතාම තීරණාත්මක අභියෝගවලට මුහුණ දීමට ඇති කාලයක් විධියට අපි කල්පනා කරන්න ඕනෑ. නිදහසින් පසුව අපි ගමන් කළ ආර්ථික ගමනේ ප්‍රතිඵලවලට තමයි අද අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැයක් ඉදිරිපත් කළාට පසු ඒ අය වැයේ ආදායමට වඩා වියදම වැඩි වුණාම, බාහිරෙන් ණය අරගෙන තමයි අපි හැම දාම ඒ අය වැය හිඟය පියවා ගත්තේ. අපි දැන් එහි උපරිම සීමාව පැන තිබෙන්නේ. ඒ නිසා මේ අවුරුදු 72ක ගමන තුළ ආපස්සට හැරී බලද්දී මේ ආපු ගමනේ අසාර්ථකත්වය අද අපට පෙනෙන්න තිබෙනවා.

ආර්ථිකයක් තුළ තිබෙන්නේ සීමිත සම්පත් අසීමිත වුවමනා, අසීමිත අවශ්‍යතා සඳහා බෙදා හරින ක්‍රමවේදය. ඒක ධනවාදය ඇතුළත "වෙළෙඳ පොළ ක්‍රමවේදය" කියලා ඉල්ලුම හා සැපයුම මත තීරණය කරන්න ඉඩ හරිනවා. සමාජවාදය තුළ රාජ්‍ය මැදිහත්වීමෙන් නිෂ්පාදන සාධක කළමනාකරණය කර එය සිදු කරනවා. මිශ්‍ර ක්‍රමයක් කියන්නේ මේ දෙකම පාවිච්චි කිරීමෙන් කටයුතු කිරීමයි. රටක් විධියට හා ජාත්‍යන්තර පරිමාණයෙන් මුහුණ දී තිබෙන මේ අභියෝගය අවුරුද්දකට වතාවක් ඉදිරිපත් කරන අය වැය ලේඛනයකින් පමණක් විසඳන්න පුළුවන් ගැටලුවක් කියා මා විශ්වාස කරන්නේ නැහැ. මේ අර්බුදය ඒ තරම්ම දරුණුයි. පැවත ගෙන ආ ආර්ථික අර්බුදය මතට සෞඛ්‍ය අර්බුදයක් කඩා වැටුණා. ඒ සෞඛ්‍ය අර්බුදය, ආර්ථික අර්බුදය තීව්‍ර කළා; ගෙවුම් ශේෂ අර්බුදය තීව්‍ර කළා. ඒක සමාජ අර්බුදයක් බවට පත් වුණා.

එපමණක් නොවෙයි. අපි අද පිළිගන්න ඕනෑ, ඒ සමාජ අර්බුදය හා ආර්ථික අර්බුදය මඟින් ජනිත කරන දැවැන්ත දේශපාලන අර්බුදයකටත් අද ලෝකයාටත්, රටක් වශයෙන් අපටත් මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන බව. ඒ නිසා කලින් හිටපු විධියට පක්ෂ භේදයකින් අපට මේ අභියෝගය ජයග්‍රහණය කරන්න බැහැ; කලින් හිටපු මානසිකත්වවලින් අපට මේ අභියෝගය ජයග්‍රහණය කරන්න බැහැ. රටක් වශයෙන් මේ අභියෝගය නිවැරදිව තේරුම් අරගෙන ඒ සඳහා ගත යුතු පියවර මොනවාද කියන එක පිළිබඳ හොඳ සාකච්ඡාවක් සිදු කර, ජනතාව අවදි කිරීමක් තුළින් තමයි අපට මේ අභියෝගය ජයග්‍රහණය කරන්න පුළුවන් වන්නේ.

ඒ වාගේම අද ලෝකයේ ආහාර, බලශක්තිය, සෞඛ්‍යය සම්බන්ධයෙන් ඇති ඉල්ලුම ඉතාම අධික වෙලා තිබෙනවා. සමාජයක් ගත්තොත්, සල්ලි තිබෙන කෙනා වැඩිපුර කෑම වර්ග රැස් කර ගන්නවා; මධ්‍යම පන්තියේ කෙනා තමන්ට හැකි පමණින් කෑම වර්ග රැස් කර ගන්නවා; දුප්පත්ම කෙනා -නොහැකි කෙනා- තවත් දුෂ්කරතාවට පත්වෙලා, අන්ත දුප්පත්කමට පත් වනවා. රටවල් ගත්තත් එහෙමයි. වැඩිපුර ධනය රැස් කර ගත් බලගතු රටවල් බලශක්තිය, ආහාර -මේ සියල්ල- වැඩිපුර රැස් කර ගන්නවා. හැබැයි, අපි වාගේ අමාරු ආර්ථිකයක් තිබෙන රටවල් දුෂ්කරතාවේ පතුලටම ඇද වැටෙනවා. ඒ නිසා අපි එක පැත්තකින් රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ගත යුතු මහ පිළිබඳව නිවැරදි සංවාදයක් මේ රටේ ජනතාව සමඟ ගොඩ නැඟිය යුතු වනවා.

අපට යුද්ධය ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ යුද්ධය පිළිබඳ නිවැරදි සංවාදයක් මේ රටේ ජනතාව සමඟ ගොඩ නඟා ගැනීමත්, නිවැරදි මාර්ගයක් තෝරාගෙන, ජනතාව ඒ මාර්ගය සම්බන්ධයෙන් අවදි කර ගැනීමට හැකි වීමත් නිසායි. ඒ කාරණා යුද ජයග්‍රහණයට ප්‍රබල ලෙස බලපෑවා. ආර්ථික යුද්ධය ජයග්‍රහණය කිරීමේදීත් ඉතා ප්‍රබල සාධකයක් බවට පත් වනවා, ජනතාව සමඟ අපි ඇති කර ගන්නා සංවාදය. ඒ වාගේම සමාජයේ පහළම ස්තරයේ රැකවරණය සම්පූර්ණයෙන් අහිමි වන තත්ත්වයක් මේ ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය තුළ පැන නඟින බව අපි දන්නවා. ඒ රැකවරණය සැලසීම රජයේ වගකීමක් පමණක් බවට පත් කර ගත යුතු නැහැ. ඒ සම්බන්ධයෙන් රජයට සියයට සියයක පූර්ණ වගකීමක් තිබෙනවා. හැබැයි, එය රජයට පමණක් කරන්න පුළුවන් කාර්යයක් නොවෙයි. මේ රටේ පෞද්ගලික අංශය, ව්‍යාපාර, ජනතාව ඒක රාශි කරගෙන ඒ අමාරුවේ වැටෙන කණ්ඩායම් ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.

අපි දන්නවා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් - MSMEs - තමයි අද ආර්ථිකයේ විශාල පංගුවක් නියෝජනය කරන්නේ කියලා. ඇත්තටම මේ ව්‍යවසායකයන් අද බරපතළ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලක පැටලිලා ඉන්නවා. සමහර අයට තම ජීවිතය අහිමි කර ගැනීමට පවා සිදුවෙලා තිබෙනවා. සමහර ව්‍යවසායක කාන්තාවන් තමන්ගේ ඇඟ විකුණන තත්ත්වයට පත් කරන්න මේ පොලීකරුවන් -ක්ෂුද්‍ර මූල්‍යකරුවන්- ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ඒ නිසා මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රශ්නයට කඩිනම් විසඳුමක් සෙවීමේ කාරණය සම්බන්ධයෙන් අද රාජ්‍යයක් විධියට අපට බරපතළ අභියෝගයක් ඇති කරමින් තිබෙනවා.

MSME sector එක තමයි අපේ ශ්‍රම බලකායෙන් විශාල පංගුවක් නියෝජනය කරන්නේ. ඒ වාගේම ඒ අය සියයට 52ක දායකත්වයක් අපේ ආර්ථිකයට සපයනවා. මේ ආයතනවලින් සියයට 91.8ක් micro enterprises වලින්, සියයට 7ක් small enterprisesවලින්, සියයට 1ක් medium enterprisesවලින්, සියයට දශම 2ක් large enterprisesවලින් දායකත්වය සපයනවා. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟා සිටුවීම අපේ රටේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රධාන පදනම බව අපි හඳුනා ගන්න ඕනෑ. මොකද, අපේ රැකියා වෙළෙඳ පොළින් සියයට 75ක් සම්පූර්ණයෙන් සපයන්නේ මේ Micro, Small, and Medium Enterprises - MSMEs - කියන ව්‍යවසායක sector එකෙන්. ග්‍රාමීය ආර්ථිකයෙන් සියයට 75ක් නියෝජනය කරන මේ sector එකට අපේ බැංකු අද කුඩම්මාගේ සැලකිලි තමයි දක්වන්නේ. විශේෂයෙන්ම 2020 මහ බැංකු වාර්තාව සහ ලෝක බැංකු වාර්තා අනුව අපේ කලාපයේ තිබෙන රටක් වන කොරියාවේ, බැංකු සහ මූල්‍ය ආයතනවලින් ලබා දෙන ණයවලින් සියයට 80.2ක් මේ MSME කියන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට තමයි ලබා දෙන්නේ.

අපි දන්නවා, කොරියාව කියන්නේ "Samsung", "Hyundai" වාගේ දැවැන්ත සන්නාම බිහි කර ගත් රාජ්‍යයක් බව. එවැනි රාජ්‍යයක් ඒ දැවැන්ත සන්නාමවලට නොවෙයි, උත්සාහ කරන්නේ. කොරියාව, ජපානය වාගේ රාජ්‍යයන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නඟා සිටුවීම සඳහා තමයි වැඩිපුර loans ලබාදෙන්නේ. මැලේසියාව ගත්තොත් ඒක සියයට 50.6යි. තායිලන්තය ගත්තොත් සියයට 50.5යි. නමුත්, අවාසනාවකට අපේ ග්‍රාමීය ආර්ථිකයෙන් සියයට 75ක් නියෝජනය කරන, අපේ ග්‍රාමීය ආර්ථිකයේ කොඳු නාරටිය බවට පත් වුණු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අපේ බැංකුවලින් ලබා දෙන්නේ සියයට 14.1ක් පමණයි.

අපේ රටේ බැංකුවලින් loan එකක් ගන්න ගියාම සම්පූර්ණයෙන්ම -මුතුන් මිත්තන්ගේ ඉඳන්ම- විස්තර ඉල්ලනවා. ඒ නිසා ව්‍යවසායකයෙකුට නැඟී සිටීම සඳහා මේ බැංකු පද්ධතියෙන් ලබා දෙන ශක්තිමත්භාවය කොයිතරම් ද කියන ප්‍රශ්නය තිබෙනවා. එම නිසා අපේ බැංකු ප්‍රතිපත්ති වෙනස්

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

කරන්න ඕනෑ. එසේ කටයුතු කරලා මේ ආර්ථිකයේ කොඳු නාරටිය වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නඟා සිටුවීම සඳහා ගත හැකි උපරිම ක්‍රියා මාර්ගය ගත යුතුයි කියලා අපි යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා තමයි අය වැය විවාදයේ ප්‍රධාන කථාව කළේ. එතුමා ප්‍රශ්න ටික ඔක්කෝම කිව්වා. අපි අහන්නේ ප්‍රශ්න නොවෙයි. කෝ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒවාට යෝජනා කරන උත්තර? ප්‍රශ්න ඔක්කෝම කියලා ගියාට කිසිම දෙයකට උත්තර දුන්නේ නැහැ. අපේ විසඳුම් මේවායි කියලා විසඳුම් යෝජනාවලියක් ඉදිරිපත් කළේ නැහැ. සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා බලය ඉල්ලුවාට, අපට බලය දෙන්න කියලා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා බලය ඉල්ලුවාට බලය අරගෙන කරන්නේ මොනවාද කිව්වේ නැහැ. එම නිසා එතුමන්ලාට වැඩ පිළිවෙළක් නැහැ. එතුමන්ලාට තිබෙන එකම කාර්යය, රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා උදේ කිව්වා වාගේ IMF එකට යන වැඩ පිළිවෙළ තමයි. ඒ IMF එකට යන වැඩ පිළිවෙළ ඇතුළේ අපේ රටේ වැටුප් කප්පාදු කරන්න වෙනවා. රාජ්‍ය සේවය කප්පාදු කරන්න වෙනවා. රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කරන්න වෙනවා. ඒකෙන් වන්නේ මේ රට තවත් අර්බුදයෙන් අර්බුදයට යන එකයි. එම නිසා ඒ වෙනුවට මේ රටේ ජනතාව බලගන්වමින් ක්‍රියාත්මක කරන ආර්ථික වැඩ පිළිවෙළකට අපි යා යුතුයි කියලා යෝජනා කරමින්, තම මංගල අය වැය ඉදිරිපත් කළ ගරු මුදල් අමාත්‍යතුමාට සුබ පැතුම් පිරිනමමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2020 නොවැම්බර් මස 17 වන බදාදා පවත්වනු ලැබේ.***

*அப்பொழுது பி.ப. 5.00 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2021 நவம்பர் 17, புதன்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Wednesday, 17th November, 2021.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මන්ත්‍රීතුමිය.

## සංචාරක ආකර්ෂණ ස්ථාන වැඩිදියුණු කිරීම
## சுற்றுலாக் கவர்ச்சிமிகு இடங்களின் மேம்பாடு
## UPGRADING TOURIST ATTRACTIONS

[අ.භා. 5.01]

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙන එන්නට ඔබතුමා ඇතුළු මේ ගරු සභාවේ සියලුම මැති ඇමතිවරුන්ගෙන් මා අවසර ඉල්ලනවා. ඒ අනුව පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

> "සංචාරක කර්මාන්තය, අපේ රටට විදේශ විනිමය රැගෙන එන ආදායම් මාර්ග අතුරින් සුවිශේෂී එකකි. පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් වාගේම කොරෝනා වසංගතය නිසා සංචාරක කර්මාන්තයට විශාල බලපෑමක් එල්ල වී ඇත. මේ නිසා දේශීය ආර්ථිකයට සිදුවූ හානිය කිව නොහැකි තරම් විය.
>
> සංචාරක කර්මාන්තය ගත්විට විදේශීය සංචාරකයෝ වාගේම දේශීය සංචාරකයෝ ද කර්මාන්තයේ කොටසකි.
>
> අවුරුදු 2500කටත් වඩා ලිඛිත ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ පෞරාණික වටිනාකම් ඇති ස්ථාන වෙත, ඒ වගේම විවිධ දේශගුණික කලාප සහිත ස්වභාව සෞන්දර්යයෙන් පිරුණු තැන්වලට සංචාරක ආකර්ෂණය අප යොමුකර ගත යුතුයි. නමුත් මෙම ස්ථාන නිවැරැදිව හඳුනා ගනිමින්, සංචාරකයන්ට සුවපහසු ස්ථාන ඇති කරමින් ආදායම් උත්පාදනය කිරීමට තවමත් ක්‍රියාත්මක වී නැත.
>
> ඒ නිසා විශේෂයෙන්ම සංචාරක ස්ථාන හඳුනා ගනිමින් එම ස්ථාන සියලු පහසුකම් ඇති ස්ථාන බවට පත් කිරීමට සංචාරක කටයුතු විශේෂඥයින්, විශ්වවිද්‍යාලය, ව්‍යාපාරිකයන් සහ පළාත් පාලන ආයතන එක්ව වැඩ පිළිවෙළක් සකස් කිරීමටත්, ඒවායේ ආදායම් පළාත් පාලන ආයතනවලට ලැබෙන වැඩ පිළිවෙළක් සකස් කිරීමටත්, මෙම ස්ථාන සංවර්ධනය සඳහා ඉදිකිරීම, පවත්වාගෙන යාම හා පැවරීම Build-Operate-Transfer - BOT ක්‍රමය යටතේ පෞද්ගලික අංශයේ සහාය ලබා ගැනීමටත් කටයුතු කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය අපේ රටේ ප්‍රධානතම මුදල් ලැබීමේ ක්‍රමෝපායක් බව අපි සියලුදෙනා දන්නවා. නමුත්, මේ වන කොට කොරෝනා වසංගතය නිසා සංචාරක කර්මාන්තය ඉතාම පහළ තත්ත්වයකට ඇද වැටී තිබෙනවා. සියලු සංචාරකයන්ගේ පැමිණීම ඉතාම අවාසනාවන්ත ලෙස අඩු වී ගියා. එයින් අපේ ආර්ථිකයට මරු පහරක් වැදිලා තිබෙනවා. මම අපේ ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, අය වැයෙන් ලැබුණු මුදල්වලින් අපේ බේරුවල, මොරගල්ල සිට ගාල්ල දක්වා තිබෙන, ලෝකයේ ඉතාම සුන්දර වෙරළ තීරයේ පිහිටා ඇති සංචාරක පුරවරවලට දියුණුවක් ලබා දෙන්නටත්, එම පළාත්වල දරුවන්ට විවිධ භාෂා කථා කරන්න පුළුවන් භාෂා මධ්‍යස්ථාන ලබා දෙන්නටත් කටයුතු කළ යුතුයි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන් වනවා.

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)

ඒ වාගේම, මම ඉතාම ඕනෑකමින් හා සතුටින් පවසනවා, මේ වන විටත් පිටරට ආයෝජනයක් බෙන්තර ප්‍රදේශයේ සිදු කිරීමට අවස්ථාව ලැබිලා තිබෙන බව, "New World Power" කියලා. එය යුරෝ මිලියන 3,000කට වැඩි ප්‍රමාණයක ආයෝජනයක්. එය මා නියෝජනය කරන බෙන්තර, ඇල්පිටිය ප්‍රදේශයේ

ගොඩනැඟීමට සියලු කටයුතු සූදානම් කරමින් පවතිනවා. මම ගරු සංචාරක ඇමතිතුමා ඇතුළු රජයෙන් ඉල්ලා සිටිනවා, ජපානයෙන් පැමිණ එය ස්ථාපිත කරන්න හදන සියලුදෙනාට උදව් කරන්න කියලා. අපේ රටේ අනාගත අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකාවේ ඉදිරි දියුණුව වෙනුවෙන් කරන එම කටයුත්ත සඳහා දිය හැකි උපරිම සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය විසින් ගෙන එන ලද අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා. අද මේ ගරු සභාවේ දී සංචාරක ව්‍යාපාරය පිළිබඳ අදහස් ඉදිරිපත් වන මේ මොහොතේ මා කරුණු කීපයක් සඳහන් කළ යුතුයි.

විශේෂයෙන්ම තුන්වැනි කොවිඩ් රැල්ල ආරම්භ කිරීමට පෙරාතුව විපක්ෂ නායකතුමා ප්‍රධාන විපක්ෂය උද්ඝෝෂණ 850කට වැඩි ප්‍රමාණයක් මේ රටේ පැවැත්වුවා. උද්ඝෝෂණ 850කට වැඩි ප්‍රමාණයක් පවත්වා තමයි නැවත වතාවක් මේ රට lockdown එකකට ගෙන යන්න, නැවත වතාවක් මේ රටේ කොවිඩ් වසංගතය පැතිරෙන්නට සලස්වන්න විපක්ෂයේ සියලුදෙනා උනන්දුවෙන් කටයුතු කළේ. මේ රට නැවත වතාවක් සංචාරකයන් සඳහා විවෘත කරපු වෙලාවක තමයි, කොවිඩ් වසංගතය පිළිබඳ අනතුරු අඟවා තිබෙන වෙලාවක තමයි, රට විවෘත කිරීමෙන් පසුව කොවිඩ් ව්‍යාප්තියේ වැඩිවීමක් තිබෙන මොහොතක තමයි විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම ඉතාම කැත විධියට මේ රටේ ජනතාව එකතු කරගෙන අද උද්ඝෝෂණ කරන්නේ. ජනතාව ඉතා හොඳින් කරුණු කාරණා පැහැදිලි කරගෙන ඉන්න වෙලාවක තමයි එතුමන්ලා නැවත උද්ඝෝෂණ පවත්වන්නේ. මේ රට විවෘත කරලා අප නැවත ආරම්භ කර තිබෙන සංචාරක ව්‍යාපාරය නැවත වසා දමන්නටයි එතුමන්ලා කටයුතු කරමින් ඉන්නේ.

මේ රටේ ජනතාවට රැකියා ලක්ෂ ගණනක් අහිමි වුණා. ඇමෙරිකානු ඩොලර් බිලියන ගණනක මුදලක් අපේ රටට පසුගිය වසර එකහමාර තුළ අහිමි වුණා. අතිගරු ජනාධිපතිතුමා, අපේ රජය, වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය අංශ, ආරක්ෂක හමුදා, රාජ්‍ය නිලධාරින් යනාදී සියලුදෙනාගේ මැදිහත් වීමෙන් තමයි කොවිඩ් වසංගතය පාලනය කරමින් ඉන්නේ. ලෝකයේ එන්නත් නිෂ්පාදනය නොකරන රටක් විධියට, ලෝකයේ ආර්ථික වශයෙන් ඉතාම පහළ ආර්ථික තත්ත්වයක් තිබෙන රටක් විධියට සිටින නමුත් අපි එන්නත් කිරීම පැත්තෙන්, ජනතාවගේ ආරක්ෂාව සැලසීම පැත්තෙන් ඉතා ඉහළ මට්ටමක ඉන්නවා. ලෝකයේ එන්නත් කිරීම අතින් සාර්ථකම රටවල් 10ක් තෝරද්දී ඒ රටවල් 10 අතරට එන්න අපට අවස්ථාව ලැබී තිබෙනවා. මේ වන විට සමස්ත ජනගහනයෙන් සියයට 65කට වැඩි ප්‍රමාණයක් එන්නත් කර තිබෙනවා.

ශ්‍රී ලංකාව සංචාරකයන් වෙනුවෙන් සුරක්ෂිත ගමනාන්තයක් ලෙස ලෝකයේ රටවල් පිළිගෙන තිබෙනවා. ඒ වාගේම, මේ මොහොත වෙද්දී සමස්ත ජනගහනයෙන් බහුතර පිරිසක් එන්නත්කරණයට ලක් කළ රටක් විධියටත් ලෝකයේ රටවල් අපේ රට පිළිගෙන තිබෙනවා. මේ වාගේ මොහොතක තමයි විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම අද උද්ඝෝෂණ කරමින් ඉන්නේ; ජනතාව දහස් ගණනින් පෙළ ගස්වන කටයුත්ත කරමින් මේ රට නැවත වතාවක් අනතුරේ හෙළන්නේ.

පසුගිය සතියේ විතරක් සංචාරකයන් 12,000කට වැඩි පිරිසක් මේ රටට ආවා. ගරු සංචාරක ඇමතිතුමා ඇතුළු අපේ රටේ සංචාරක අමාත්‍යාංශය, ලෝකයේ මාධ්‍ය ආයතන, ඒ වාගේම විවිධ ආයතන සම්බන්ධ කරගෙන හොඳ සංචාරක ගමනාන්තයක් ලෙස අපේ රට පිළිගැනීම පිළිබඳව, මේ රටෙහි ඇති සුරක්ෂිතභාවය පිළිබඳව ප්‍රචාරය කරමින් ඉන්නවා. ඒ වාගේම, අපේ ශ්‍රීලන්කන් ගුවන් සේවය විශේෂ ගමනාන්ත 8ක් සඳහා ගුවන් ගමන් ආරම්භ කර තිබෙනවා. ප්‍රංශය ඇතුළු ගමනාන්ත 8ක් සඳහා අලුතින් ගුවන් ගමන් ආරම්භ කර තිබෙනවා. පසුගිය සතියේ පමණක් ලංකාවට ආ සංචාරකයන් ප්‍රමාණය ගත්තාම අපට විශ්වාසයක් තිබෙනවා, අපේ රටේ සංචාරක ව්‍යාපාරය නැඟිටිනවා කියලා. මේ රටේ ඒ නැඟිටින සංචාරක ව්‍යාපාරය නැවත වතාවක් විනාශ කිරීමට විපක්ෂය උත්සාහ ගන්නා මොහොතක තමයි අප ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කය ගත්තාම, මා ජීවත් වන නෙළුව ප්‍රදේශය, සිංහරාජය, කන්නෙලිය ඇතුළු ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව, සංචාරකයන් සඳහා අපි විශේෂ වැඩ පිළිවෙළක් නිර්මාණය කරමින් ඉන්නවා. ඒ වැඩ පිළිවෙළ සමඟ ප්‍රජා පාදක සංචාරක ගම්මාන, හෙළ වෙදකම, කාබනික වගාවෙන් ලැබෙන ආහාර ආදි සියල්ල ප්‍රචලිත කිරීමට අපි කටයුතු සූදානම් කරමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි විශ්වාස කරනවා, විපක්ෂය කරන කුමන්ත්‍රණ මැද්දේ වුවද අපේ රට නැඟිටිනවාමයි කියන එක. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.10]

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு வாய்ப்பளித்தமைக்காக முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். சுற்றுலாத்துறை அபிவிருத்தி தொடர்பாக இந்த Adjournment Motionஐக் கொண்டுவந்த மாண்புமிகு (திருமதி) கீதா குமாரசிங்ஹ அவர்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இது மிக முக்கியமான ஒரு விடயம்; நிச்சயமாகப் பேசப்பட வேண்டிய விடயம்.

2019ஆம் ஆண்டு Lonely Planet's top ten countries to travel to in 2019 என்கிற அந்த list இலே இலங்கை முதல் 10 இடங்களுக்குள் வந்தது. 2018 - 2019 காலகட்டங்களை நாம் எடுத்துப்பார்ப்போமேயானால், அதாவது, 2018 மார்ச்சி லிருந்து 2019 மார்ச் வரையிலும் எமது நாட்டிலே சுற்றுலாத் துறையுடைய வளர்ச்சியைப் பார்க்கின்றபோது, அதில் திடீர் அதிகரிப்பு ஏற்பட்டிருந்ததைக் காணமுடியும். எமது நாடு பல்வேறு அம்சங்களால் எல்லா வகையான சுற்றுலாத் துறையினரையும் கவரக்கூடியதாக இருக்கின்றது. 2019ஆம் ஆண்டு Lonely Planet வழங்கிய தகவலின்படி, புவியியல் அமைவிடம், காலநிலை, இயற்கை அழகு, கொட்டிக்கிடக்கும்

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

வளங்கள், விருந்தினர்களை உபசரிக்கும் தன்மை போன்ற காரணங்களுக்காக இலங்கை சிறந்த ஒரு சுற்றுலாத்தளம் என்பதாக அங்கே சொல்லப்பட்டிருந்தது.

இத்தகைய ஒரு சூழலிலே எமது நாட்டினுடைய துரதிருஷ்டம்தான் இந்த 'ஈஸ்டர்' தாக்குதல் மற்றும் அதனைத் தொடர்ந்து வந்திருக்கின்ற 'கொவிட்-19' நிலைமைகள். இந்த நிலைமைகளின் காரணமாக ஏறத்தாழ 4.5 பில்லியன் டொலர்களை நாங்கள் வருமான இழப்பாகப் பார்க்கின்றோம். இன்று ஏற்பட்டிருக்கின்ற டொலர் தட்டுப்பாட்டுக்கும் பிரதான காரணம் இதுவாகும். இந்த நிலையில் எமது நாட்டிலே ஒரு புதிய நம்பிக்கை பிறக்கவேண்டுமாக இருந்தால், அது சுற்றுலாத்துறையினுடைய வளர்ச்சியினூடாக மட்டும்தான் ஏற்படும் என்ற எண்ணம் இந்த அரசாங்கத்திற்கு மட்டுமல்ல, இந்த நாட்டின் மக்களுக்கும் உண்டு என்பதில் மாற்றுக் கருத்து இல்லை. இந்தச் சந்தர்ப்பத்தில், துறைசார்ந்த அமைச்சர் அவர்கள் இருக்கின்ற சூழலில், முக்கியமான சில விடயங் களைச் சொல்லிக்கொள்ள ஆசைப்படுகின்றேன்.

அண்மையிலே துபாய் 'எக்ஸ்போ'விற்கு நானும் சென்றிருந்தேன். அங்கே அத்தனை பெரிய இடத்திலே எமது இலங்கையினுடைய சுற்றுலாத்துறை சம்பந்தமான stallஐயும் பார்க்கக் கிடைத்தது. உண்மையாகச் சொல்லப்போனால் இவ்வாறான 'எக்ஸ்போ'களில் கலந்துகொள்கின்ற சுற்றுலாப் பயணிகளை அந்தந்த நாட்டுக்குக் கொண்டுவருவதற்காக ஒவ்வொரு நாட்டுக்குரிய சுற்றுலாத்துறை அமைச்சும் எத்தகைய முயற்சிகளை எடுத்திருந்தது என்பதைப் பார்க்கக் கூடியதாக இருந்தது. அவற்றைப் பார்க்கும்போது, இலங்கையைப் பொறுத்தளவிலே எமது stall அவ்வளவுதூரம் வீரியமாக இல்லையோ என்பதான ஒரு கவலை எமக்குள் ஏற்பட்டது.

உண்மையில் எமது நாட்டைப் போன்ற ஒரு சுற்றுலாத் தளத்தை வேறெங்கும் நாம் இலகுவில் கண்டடையமுடியாது. ஒரு குறிப்பிட்ட நேரத்திற்குள் பல்வேறு தரைத்தோற்றம், வேறுபடும் காலநிலை என்பவற்றைக் கண்டுகொள்ள வேண்டுமாக இருந்தால், இலங்கைக்குத்தான் வரவேண்டும். அதேபோன்று மிகக்குறைந்த செலவில் சுற்றுலாப் பயணிகளைக் கவரக்கூடிய ஓரிடமாக இலங்கை இருந்தாலும், எம்மிடையே பல குறைபாடுகள் இருக்கத்தான் செய்கின்றன. குறிப்பாக இந்தச் சுற்றுலாத் தளங்களின் அபிவிருத்தியை நாங்கள் கவனிப்பதில்லையோ என்பதான ஒரு கவலையும் எனக்கிருக்கின்றது. எமது வளங்களை நோக்கிச் சுற்றுலாப் பயணிகளை ஈர்க்கக்கூடிய விடயங்களை நாங்கள் செய்கிறோமா, இல்லையா? என்கின்ற கேள்விகள் எழுகின்றன. குறிப்பாக நாம் டுபாய், மலேசியா, சிங்கப்பூர், போன்ற நாடுகளைப் பார்த்தால், அவர்கள் செயற்கையான முறையிலே உருவாக்கியுள்ள விடயங்களை நோக்கிச் சுற்றுலாப் பயணிகளை ஈர்ப்பதற்கான advertisement மிகச் சிறப்பாக இருக்கின்றது, marketing சிறப்பாக இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்லாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
Sir, please give me one more minute.

அறுகம்பைப் பிரதேசத்தைச் சார்ந்தவன் நான். நீர்ச்சறுக்கல் விளையாட்டு - surfingஇற்கு உலகத்திலே காணப்படுகின்ற top ten பிரதேசங்களில் ஒன்று இந்த அறுகம்பைப் பிரதேசம். இந்த அறுகம்பைப் பிரதேசத்தில் நடைபெறுகின்ற surfing competitionஇற்கு இந்த அரசாங்கம் எவ்வளவு முக்கியத்துவம் கொடுக்கின்றதென்று பார்த்தால், மிகக் கவலையாக இருக்கின்றது. நான் சொல்வது World Championship பற்றி; ஒரு World Championship இந்த நாட்டிலே நடக்கின்றதென்றால், அது மிகப் பெரிய ஒரு விடயம். சாதாரணமாக ஏனைய நாடுகளை எடுத்துப் பார்க்கின்றபோது, அங்கிருக்கின்ற சின்னச் சின்ன விடயங்களைக்கூட மிகப் பூதாகரமாகக் காட்டுகின்ற ஒரு நிலைமையிருக்கின்றது. Touristsஐக் கவர்ந்திழுப்பதற்கான, அவர்களிடமிருந்து அதிகமான பணத்தை வசூலித்துக் கொள்வதற்கான அத்தனை அம்சங்களும் அங்கே செய்யப்பட்டிருக்கும். ஆனால், இங்குள்ள நிலைமையைப் பார்த்தால், நாம் என்னவோ எம்முடைய வளங்கள் இருக்கின்றன, எங்களுடைய இடங்கள் இருக்கின்றன, வாருங்கள்! செல்லுங்கள்! என்று திறந்துவிட்டிருப்பது போன்ற ஓர் உணர்வு வருகின்றது. அவர்களிடமிருந்து எமது நாட்டுக்கு அதிகமான பணத்தைச் சம்பாதித்துக் கொள்வதற்கான mechanism இங்கே உருவாகவில்லை என்பது மிகக் கவலையான ஒரு விடயம். எனவே, இந்த surfing competition ஏனோதானோ என்று நடப்பதைத் தவிர்க்கவேண்டும். World tourism நடக்கின்ற இந்த அறுகம்பைப் பிரதேசத்தில் குடிப்பதற்குக்கூட தண்ணீர் இல்லாத நிலைமையிருக்கின்றது. எனவே, அந்தத் தண்ணீர்த் தேவையைப் பூர்த்தி செய்து, அந்த World Championship நடக்கின்றபோது, அது மிகப் பிரமாண்டமாக நடைபெறுவதற் குரிய வழிவகைகளை அமைச்சர் செய்யவேண்டும்.

தொடர்ந்தும் இந்தச் சுற்றுலாத்துறை சார்ந்த விடயங்கள் பேசப்படுமாக இருந்தால், ஒரு சுற்றுலாப் பிரதேசத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் நான் உங்களோடு இணைந்து பணியாற்றத் தயாராக இருக்கின்றேன். எனவே, அமைச்சரிடமிருந்து அதற்கான அழைப்பினை எதிர்பார்த்து, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸான்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද සභාව කල් තබන අවස්ථාවේ ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාව කාලෝචිත යෝජනාවක්. ඇත්තටම සංචාරක කර්මාන්තය අපේ රටට විදේශ විනිමය රැගෙන එන ආදායම් මාර්ග අතුරින් සුවිශේෂී එකක්. පසුගිය කාලය තුළ පාස්කු ප්‍රහාරය නිසාත්, කොරෝනා වසංගතය නිසාත් සංචාරක කර්මාන්තය විශාල ලෙස කඩා වැටීමකට ලක්වෙලා තිබෙනවා. ඒ නිසා දේශීය ආර්ථිකයට සිදු වුණු හානිය වචනයෙන් කිව නොහැකියි. සංචාරක ව්‍යාපාරය ගත්විට විදේශීය සංචාරකයන් වාගේම දේශීය සංචාරකයන්ද එම කර්මාන්තයේ

කොටසක්. මම ජීවත් වන රත්නපුර දිස්ත්‍රික්කය මැණික් ව්‍යාපාර කරන ප්‍රදේශයක් බව ඔබතුමන්ලා දන්නවා. එය සංචාරක ව්‍යාපාරයේ තෝතැන්නක්. නමුත්, අද මේ කොරෝනා ව්‍යසනය නිසා එම ව්‍යාපාරය අඩපණ වෙලා තිබෙනවා. අපි රත්නපුර නගරයේ මැණික් කුලුනක් ඉදිකිරීමට මුල්ගල් තැබීමට පසුගිය වසරේ අඩිතාලම දැම්මා. එය ගොඩනඟමින් යනවා. එය ඉදිකර, විවෘත කිරීමෙන් පසු නැවත සංචාරකයන් මේ රටට ගෙන්වාගෙන අපේ ඩොලර් වැඩි කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකාවේ සුන්දරත්වය හා සුවිශේෂී තත්ත්වය පිළිබඳ රට රටවල ප්‍රචාරය විය යුතුයි. සංචාරක කර්මාන්තයට ආකර්ෂණය දිනාගත හැක්කේ එවිටයි. විදේශ සංචාරකයන් තුළ මෙරට සංචාරක කර්මාන්තය පිළිබඳ විශ්වාසයක් සේම විශේෂ කැමැත්තක් ඇති කරවිය හැක්කේ එවිටයි. ශ්‍රී ලංකාව ආරක්ෂිත සේම සුවදායී පරිසරයකින් හෙබි සංචාරයට සුදුසු රටක් යන පණිවුඩය ලෝකයට සන්නිවේදනය කිරීමේ වැඩ පිළිවෙළ අප විසින් දිගින් දිගටම පවත්වාගෙන යා යුතුයි. පාස්කු ප්‍රහාරයෙන් පසුව සංචාරකයන්ගේ පැමිණීම සියයට 70 දක්වා පහත වැටී තිබෙනවා. ඒ අනුව, මෙම වසරේ අප ලබන සංචාරක ආදායම ඇමෙරිකන් ඩොලර් බිලියන 1.5කින් පමණ අඩුවනු ඇති බවද පවසනවා. මේ සංචාරක කර්මාන්තය දියුණු කර අපේ රටට නැවත සංචාරකයන් ගෙන්වන්නට වැඩ පිළිවෙළක් යොදන්න කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.18]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுற்றுலாத்துறை தொடர்பான சபை ஒத்திவைப்புவேளைப் பிரேரணைமீதான விவாதத்திலே உரையாற்றச் சந்தர்ப்பமளித்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இலங்கை நான்கு பக்கமும் கடலால் சூழப்பட்டிருந்தாலும், 'ரின்' மீனை இறக்குமதி செய்கின்ற நாடாக இருக்கின்றது. அதேபோல் இயற்கை வளங்கள் நிறைந்திருந்தாலும் சுற்றுலாத்துறையிலே உச்சப் பயனைப் பெறமுடியாத நாடாகவும் இருந்துகொண்டிருக்கின்றது. குறிப்பாக, யுத்தத்திற்குப் பின்னர் சுற்றுலாத்துறையிலே ஓரளவுக்கு வளர்ச்சியடைந்து வந்த எங்களுடைய நாடு, 2019ஆம் ஆண்டு ஏற்பட்ட உயிர்த்த ஞாயிறுத் தாக்குதலுக்குப் பின்னர் முற்றாகச் செயலிழந்தது. அதன் பின்னர் மீண்டெழ ஆரம்பித்த சுற்றுலாத்துறை, 2020ஆம் ஆண்டிலே 'கொவிட்-19' தாக்கத்தினால் மீண்டும் செயலிழந்தது.

இலங்கைச் சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின் தரவுகளுக்கமைய, இலங்கையில் 2019ஆம் ஆண்டு மார்ச் மாதம் 244,328 சுற்றுலாப் பயணிகள் வருகை தந்ததுடன், 2020ஆம் ஆண்டு மார்ச் மாதம் 71,370 சுற்றுலாப் பயணிகள் மாத்திரமே வருகை தந்திருக்கிறார்கள். 2019ஆம் ஆண்டு ஏப்ரல் மாதம் 166,975 சுற்றுலாப் பயணிகள் நாட்டுக்கு வருகைதந்த நிலையில், 2020ஆம் ஆண்டு ஏப்ரல் மாதம் ஒரு சுற்றுலாப் பயணிகூட நாட்டுக்கு வருகை தரவில்லையென இலங்கைச் சுற்றுலாத்துறை அபிவிருத்தி அதிகாரசபை தெரிவிக்கின்றது.

இலங்கையில் எந்தவித பாரதூரமான பிரச்சினைகளும் இல்லாத காலமாகக் காணப்பட்ட 2018ஆம் ஆண்டு மார்ச் மாதம் முதல் ஆகஸ்ட் மாதம் வரையான காலப்பகுதியில் 1,108,293 சுற்றுலாப் பயணிகள் நாட்டிற்கு வருகைதந்திருந்தனர். 2019ஆம் ஆண்டு 'ஈஸ்டர்' தாக்குதல் நடத்தப்பட்ட காலப்பகுதியில் இலங்கைக்கு வருகைதந்த சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கை 771,465 ஆகும். எனினும், கொரோனா அச்சுறுத்தல் காணப்பட்ட 2020ஆம் ஆண்டு மார்ச் மாதம் முதல் ஆகஸ்ட் மாத இறுதிவரை இலங்கைக்கு 71,370 சுற்றுலாப் பயணிகள் மாத்திரமே வருகைதந்துள்ளதாக இலங்கைச் சுற்றுலாத்துறை அபிவிருத்தி அதிகாரசபையின் இணையத்தளத்தில் குறிப்பிடப்பட்டுள்ளது.

இதன்படி, கொரோனா அச்சுறுத்தலை இலங்கை எதிர்நோக்குவதற்கு முன்னர் 2019ஆம் ஆண்டு 1,113,702 சுற்றுலாப் பயணிகள் நாட்டுக்கு வருகைதந்திருக்கின்றார்கள். குறிப்பாக, 2019ஆம் ஆண்டு சுற்றுலாத்துறையின்மூலமாக இலங்கைக்கு 3,606.9 மில்லியன் அமெரிக்க டொலர் வருமானமாகக் கிடைத்திருக்கின்றது. இலங்கை வரலாற்றிலே சுற்றுலாத்துறையின்மூலம் அதிகளவிலான வருமானம் கிடைத்த காலப்பகுதியாக 2018ஆம் ஆண்டு பதிவாகியுள்ளது. 2018ஆம் ஆண்டு 2,333,796 சுற்றுலாப் பயணிகள் இலங்கைக்கு வருகைதந்ததுடன், அவர்களினூடாக அந்த ஆண்டில் 4,386.6 மில்லியன் அமெரிக்க டொலர் வருமானமாகக் கிடைத்திருக்கின்றது. இந்தத் தரவுகளை வைத்துப் பார்க்கும்போது 'ஈஸ்டர்' தாக்குதலுக்குப் பின்னர் ஏற்பட்ட பின்னடைவிலிருந்து எம்மால் குறுகிய காலத்தில் மீண்டும் எழக்கூடியதாக இருந்துள்ளது. எனவே, 'கொவிட்' தாக்கத்தின் மத்தியில் சுற்றுலாத்துறையை மீண்டும் கட்டியெழுப்ப விசேட செயற்றிட்டங்களை உருவாக்க வேண்டிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாணத்திலே பல்வேறு சுற்றுலாத் தளங்கள் காணப்படுகின்றன. குறிப்பாக, கடற்கரையோரங்கள் மிகவும் அழகாகக் காட்சியளிக்கின்ற இடங்களாக இருந்தாலும், அவற்றால் சரியான முறையிலே சுற்றுலாப் பயணிகளைக் கவர முடியாத ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. அதேபோன்று, பல மத ஸ்தானங்கள் அங்கே காணப்படுகின்றன. அதாவது, பழைமைவாய்ந்த 'பன்சல', கோயில், பள்ளிகள் போன்றன அமைந்திருக்கும் புராதன இடங்கள் அங்கே காணப்படுகின்றன. அவற்றைச் சுற்றுலாத் தளங்களாக உருவாக்கிச் சரியான முறையிலே பயன்படுத்துவதன்மூலம் சுற்றுலாத்துறையை அபிவிருத்தி யடைகின்ற ஒரு நிலைக்குக் கொண்டுவருகின்ற வாய்ப்புக்கள் எம்மிடம் இருக்கின்றன என நான் நினைக்கின்றேன். இன்று மீண்டும் சுற்றுலாத்துறை ஓரளவுக்கு எழுச்சிபெற்றுச் சுற்றுலாப் பயணிகள் இந்த நாட்டுக்கு வருகின்ற இந்தச் சந்தர்ப்பத்தை நாங்கள் சரியாகப் பயன்படுத்திக்கொண்டால், வருகின்ற ஆண்டிலே எமது சுற்றுலாத்துறையை மீண்டும் ஒரு நல்ல நிலைக்குக் கொண்டுவருவதற்கான வாய்ப்புக்கள் இருக்கின்றதென்று கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ශ්‍රී ලංකාව වාගේ රටක් මේ තත්ත්වයට මුහුණ පා තිබෙන්නේ පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් වසංගතය තුළ අපේ රටට එන්න සිටි සංචාරකයන් නොපැමිණීම මතයි. අපේ ආර්ථික අපහසුතාවට ප්‍රධානම හේතුව වුණේත් එය බව අපි කවුරුත් පිළිගන්නවා. විශේෂයෙන්ම අපට ගොඩ එන්න තිබෙන්නේ මේ ළිං කටින්ම පමණයි. ඒකට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න මොන වාගේ නව අදහස් ගැළපෙන්න ඕනෑද කියන සාකච්ඡාව ඇති කරන්න සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙන ඒම ගැන ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

බොහෝ වෙලාවට අපේ නටබුන් බලන්න සංචාරකයන් එනවා වාගේම, අපට තිබෙන මුහුදු තීරයේ රස විඳින්නත් සංචාරකයන් එනවාය කියන කාරණයට එහා ගිහින් නව අදහස් එක්ක එකතු වෙන්න අපට පුළුවන් නම් වඩා හොඳයි කියන කාරණාව මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම අපේ රටේ ගොවිතැනේ තිබෙන කෙම් ක්‍රම, අපටම උරුම වෙච්ච අපේ සංස්කෘතික ගුණාංග ගැනත් අපට ආකර්ෂණය ඇති කරන්න පුළුවන්. අපේ දරුවෙක් ඉපදුණු දවසේ ඉඳලා අපට උරුම වෙච්ච සංස්කෘතික ගුණාංග තිබෙනවා. කුඩා දැරියක් වැඩිවියට පත්වෙනකොට කොටහළු මඟුල් උත්සවය, එතැනින් එහාට ගියාම දීර්ඝ බැඳීමකට අඩිතාලම දමන විවාහ මංගල්‍යයට අදාළ උත්සව, ඒ වාගේම ආගමික වශයෙන් ඇති කාරණා සම්බන්ධයෙන් පවත්වන උත්සව සහ අවසානයේ අවමංගල්‍ය උත්සවයක කාරණා සම්බන්ධයෙන් පවා අපට පුළුවන් නම් ඒ රටවලට සංස්කෘතික වශයෙන් ඒ සබැඳියා ඇති කරන්න එය සංචාරක ප්‍රවර්ධනයට වැදගත් වනවා. මාර්කට් කරන්න පුළුවන් දේවල් ඒ තුළ තිබෙනවා. අපේ සංස්කෘතිය ඒ තරමම පිරුණු සංස්කෘතියක්. නමුත්, මේ කාරණා ගැන අපි වැඩිය කථා කරන්නේ නැහැ.

කොළඹ දිස්ත්‍රික්කයේ ගත්තාමත් යුරෝපා රටවලින් එන සංචාරකයන්ට පෙන්වන්න පුළුවන් දේවල් තිබෙනවා. විශේෂයෙන් එංගලන්තයේ සුද්දන්ට පෙන්වන්න පුළුවන් දේවල්. පෘතුගීසින් විසින් හදපු කර්මාන්තශාලා ඇතුළු ගොඩනැඟිලි පෘතුගාලයේ සුද්දන්ට පෙන්වන්න පුළුවන්. අපි කයිමන් දොරටුව ගැන කථා කරනවා. නමුත්, අපි කයිමන් දොරටුව යුරෝපාකරයේ සුද්දන්ට කවදාවත් පෙන්වන්නේ නැහැ. හැබැයි, කොළඹ තිබෙන කයිමන් දොරටුව වාගේ තැන් සංචාරක කර්මාන්තය නඟාසිටුවීමට ප්‍රයෝජනයට ගත හැකියි. ඒක විය යුත්තක් කියලා මම විශ්වාස කරනවා.

මම මේ තොරතුරු ගත්තේ සංචාරක ආර්ථික විද්‍යාව හා හෝටල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ සම්බන්ධීකාරක ආචාර්ය සුරංග ද සිල්වා මහතාගේ ලිපියකට අදාළවයි. අද මම ඒ කාරණා පිළිබඳ තමයි වැඩිපුරම පාර්ලිමේන්තුවේදී කිව්වේ. ගරු ඇමතිතුමනි, එතුමාගේ ලිපියෙන් රට සංවර්ධනය කිරීමට සංචාරක ව්‍යාපාරය අදාළ කර ගත හැකි ආකාරය කථා කරලා තිබෙනවා. ඒ එක්කම කොළඹ තිබෙන බ්‍රිතාන්‍ය, පෘතුගීසි, ලන්දේසි සිහිවටන දින 10කින් සංචාරකයන්ට පෙන්විය හැකි ආකාරය ගැන කථා කරලා තිබෙනවා. ඒනිසා මම හිතනවා, මේ ලිපිය ඉතා වැදගත් ලිපියක් කියලා. මම මේ අවස්ථාවේදී හැමෝගේම අවධානය යොමු කිරීම සඳහා එකී ලිපිය **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණතුංග අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.25]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය අද සභාව කල් තබන අවස්ථාවේදී සංචාරක කර්මාන්තය නංවාලීම වෙනුවෙන් ඉදිරිපත් කළ මේ යෝජනාව පිළිබඳව මගේ ස්තුතිය මුලින්ම පුද කරනවා. අපි සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විධියට මේ වන විට සංචාරක ආකර්ෂණ ස්ථාන 5,500ක් පමණ අලුතින් හඳුනාගෙන තිබෙනවා. ඒවා ජාතික උරුම, ආගමික, පාරිසරික, ස්වභාව සෞන්දර්ය, ජල මූලාශ, ජාතික වනෝද්‍යාන, වනජීවී උද්‍යාන සහ මුහුදු තීර වැනි තේමා රැසක් යටතේ මෙන්ම දිස්ත්‍රික් වශයෙන් ද වර්ගීකරණය කර තිබෙනවා.

දිස්ත්‍රික්ක වශයෙන් හඳුනාගත් නව සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබඳ ලේඛනයක් මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියනි, ඔබතුමිය නියෝජනය කරන දිස්ත්‍රික්කයේ එවැනි නව සංචාරක ආකර්ෂණ ස්ථාන 252ක් අපි හඳුනාගෙන තිබෙනවා. මේ ලැයිස්තුව සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් ප්‍රමුඛතා අදියර තුනක් යටතේ වර්ගීකරණය කර ප්‍රවර්ධනය කිරීමට අපි කටයුතු කර තිබෙනවා. ප්‍රවර්ධන කටයුතුවල ප්‍රථම පියවර වශයෙන් වීඩියෝ 130ක නිෂ්පාදන කටයුතු කරගෙන යෑමටත්, එහි දෙවන පියවර වශයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණීය ස්ථාන සතිපතා අන්තර්ජාලය හරහා ගෝලීයව සජීව විකාශනය කිරීමටත් අපේක්ෂා කරනවා. එය 2022 වසරේ ජනවාරි මස සිට ආරම්භ කිරීමට කටයුතු සිදු කරන බව මා මේ සභාවට දැනුම් දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට පස්වැදෑරුම් වැඩ පිළිවෙළක් අපි මේ වෙනකොට ක්‍රියාත්මක කර තිබෙනවා. සංචාරක ගමනාන්ත සංවර්ධනය කිරීම, සංචාරක ආකර්ෂණීය දුම්රිය ස්ථාන වැඩිදියුණු කිරීම, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත බලකොටු සංවර්ධනය කිරීම, ප්‍රජාසත්කාරක ගම්මාන ස්ථාපිත කිරීම සහ සංචාරක මානව ප්‍රාග්ධනය සංවර්ධනය මේ යටතේ සිදු කරනවා. උදාහරණයක් ලෙස සංචාරක ආකර්ෂණීය දුම්රිය ස්ථාන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ගාල්ල, කළුතර, මීගමුව හා ඇල්ල දුම්රිය ස්ථාන

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නවීකරණය කළා. මේ වසරේ බණ්ඩාරවෙල හා නානුඔය දුම්රිය ස්ථාන සංවර්ධනය සඳහා රුපියල් මිලියන 62ක මුදලක් අපි වැය කරනවා.

පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත බලකොටු සංවර්ධනය යටතේ කල්පිටිය, මන්නාරම, මඩකලපුව වැනි බලකොටු සංවර්ධනය කිරීම සඳහා අපි කටයුතු කර තිබෙනවා. මේ වන විට රට තුළ සංචාරක කලාප 16ක් ක්‍රියාත්මකයි. ඊට අමතරව, අලුතින් සංචාරක කලාප 3ක් හඳුන්වා දී තිබෙනවා. ඒ, නුවරඑළිය, හික්කඩුව හා දෙනියායයි. මේවා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනවා. ඒ වාගේම සංචාරක කලාප ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අපි අන්තර් අමාත්‍යාංශ කමිටුවක් හරහා කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හඳුනාගත් මෙවැනි සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා BOT ක්‍රමය යටතේ පෞද්ගලික අංශයේ සහාය ලබා ගැනීමට කටයුතු කරන්න කියලා ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවේ සඳහන් වෙනවා. අපි දැනටමත් ඒ ගැන අවධානය යොමු කර තිබෙනවා. අපි සංචාරක ආයෝජන සඳහා වැඩි ඉඩප්‍රස්ථා ලබා දීමට කටයුතු කරමින් තිබෙනවා. පසුගිය කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ වුණත් අපේ රටේ සංචාරක ආයෝජන සඳහා යෝජනා ලැබුණා. මේ වසරේ පළමු මාස 9 තුළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට නව සංචාරක ආයෝජන ව්‍යාපෘති 33ක් ලැබී තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් මිලියන 101ක් වටිනා මෙම ව්‍යාපෘතිවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 92ක් සඳහා වූ සංචාරක ආයෝජන 22ක් සඳහා මේ වන විටත් අනුමැතිය ලබා දී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියගේ යෝජනාව සංචාරක අමාත්‍යාංශය මඟින් මේ වන විටත් ක්‍රියාවට නංවා තිබෙන බව සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 හා 2019 වර්ෂවල පැමිණි සංචාරකයන් ප්‍රමාණය පිළිබඳව මෙහිදී සාකච්ඡා වුණා. අපි පිළිගන්න ඕනෑ, යුද්ධය පැවැති කාල සීමාව තුළ සංචාරකයන් ලක්ෂ 4ක් පමණ තමයි අපේ රටට පැමිණියේ කියලා. යුද්ධයෙන් පස්සේ 2018 වනකොට ක්‍රමක්‍රමයෙන් මිලියන 2.3කට -ලක්ෂ 23කට- වැඩි සංචාරකයන් ප්‍රමාණයක් පැමිණියා. ඒ හරහා ඇමෙරිකානු ඩොලර් බිලියන 4.3ක ආදායමක් අපට ලබාගන්න පුළුවන්කම ලැබුණා. 2019 පාස්කු ප්‍රහාරයෙන් පසුවත් මිලියන 1.9ක් පමණ සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට පැමිණියා. ඒ තුළින් ඩොලර් බිලියන 3ක පමණ ආදායමක් ලැබුණා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට තවත් රුපියල් ලක්ෂ 50ක් ලබාදෙන්න මේ අය වැය මඟින් කටයුතු කර තිබෙනවා. ඒ අනුව, දිස්ත්‍රික්කයක් හැටියට ගත්තොත් ඒ දිස්ත්‍රික්කයේ සංවර්ධනයට විශාල මුදලක් ලැබෙනවා. හඳුනාගත් ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා වූ වැඩ පිළිවෙළ දිස්ත්‍රික් කමිටුවල සභාපතිවරුන්ට යොමු කරන්න මා බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට ඒ මන්ත්‍රීවරුන්ට පුළුවන්, තමන්ට ලැබෙන ප්‍රතිපාදන තමන්ගේ දිස්ත්‍රික්කය තුළ සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් හඳුනාගත් ප්‍රදේශ සංවර්ධන කිරීම සඳහා යොමු කරන්න. ඒ වාගේම ව්‍යාවසායකයන් ඇති කිරීම සඳහා ඒ ප්‍රදේශවල අලුත් වැඩසටහන් ඇති කිරීම සඳහාත් ප්‍රතිපාදන වෙන් කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 21වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 17වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2021 ஒக்ரோபர் 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 17, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Wednesday, 17th November, 2021, pursuant to the Resolution of Parliament of 21st October, 2021.*

286 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 286 - இல. 5
Volume 286 - No. 5

2021 නොවැම්බර් 17 වන බදාදා
2021 நவம்பர் 17, புதன்கிழமை
Wednesday, 17th November, 2021

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**2021 නොවැම්බර් 17 වන බදාදා**
**2021 நவம்பர் 17, புதன்கிழமை**
**Wednesday, 17th November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**බලංගොඩ කැල්සයිට් නිධිය:**
පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 - [හතරවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
පුත්තලම දිස්ත්‍රික්කයේ වනාන්තර ආරක්ෂා කරගැනීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**பலங்கொடையிலுள்ள சுண்ணாம்புக்கல் படிவு:**
சுற்றாடல் அமைச்சரினது கூற்று

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
புத்தளம் மாவட்ட வனங்களைப் பாதுகாத்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

CALCITE DEPOSIT IN BALANGODA:
Statement by Minister of Environment

APPROPRIATION BILL, 2022 - [Fourth Allotted Day]:
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
Protection of Forests in Puttalam District

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2021 නොවැම්බර් 17වන බදාදා***
*2021 நவம்பர் 17, புதன்கிழமை*
*Wednesday, 17th November, 2021*

---

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 නොවැම්බර් 17, එනම් අද දින මවිසින් "සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස" සහ "කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)" යන පනත් කෙටුම්පත්වල සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XVI කොටස;
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XV හා XVI කොටස්; සහ
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ II, III, IV, V හා VI කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ I, II හා III කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 සහ 2016 වර්ෂ සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වරාය හා නාවික අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අනුරාධපුරය, උට්ටිමඩුව යන ලිපිනයෙහි පදිංචි ඒ.පී. කුමාරසිංහ මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බත්තරමුල්ල, තලංගම-උතුර, මාධ්‍යවේදී නිවාස සංකීර්ණය, අංක 14 දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී.ජී. සමරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)

ගරු කථානායකතුමනි, බේරුවල, මංගල පාර, අංක 53 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ජේ.ඒ. ගයි ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නාවල, කොස්වත්ත පාර, අංක 160/4 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එස්. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අම්පාර, සාමපුර, අංක 07/ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්.කේ. ශාන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරගරු කථානායකතුමනි, කඩුවෙල, පහළ බෝමිරිය, යාකාල, "සිරිනිවස" අංක 305/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඊ.එම්.ඩී.පී.කේ. ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, පනාදරගම, යහලේගෙදර දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ. අනිල් ප්‍රේමචන්ද්‍ර ජයලත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### 2015-2019 දක්වා ආනයනය කළ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන: විස්තර
### 2015-2019 வரை இறக்குமதி செய்யப்பட்ட பால் மற்றும் பால்சார் உற்பத்திகள்: விபரம்
### MILK AND MILK-RELATED PRODUCTS IMPORTED FROM 2015-2019: DETAILS

246/2020

**1. ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ -

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையிலான ஒவ்வொரு வருடத்திலும் -

(i) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட பால் மற்றும் பால்சார் உற்பத்திகளின் அளவு யாதென்பதையும்;

(ii) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி பால் மற்றும் பால்சார் உற்பத்திகள் எந்தெந்த நாடுகளிலிருந்து இறக்குமதி செய்யப் பட்டன என்பதையும்;

(iv) மேற்படி பால் மற்றும் பால்சார் உற்பத்திகளை இறக்குமதி செய்த கம்பனிகள் யாவையென் பதையும்;

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி காலப்பகுதியில் இலங்கைக்குப் பால் மற்றும் பால்சார் உற்பத்திகளை இறக்குமதி செய்வதற்காகச் செலவாகிய மொத்தத் தொகை எவ்வளவென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House, separately pertaining to each of the years during the period from 2015 to 2019 -

(i) the quantity of milk and milk-related products imported into Sri Lanka;

(ii) the money that has been incurred on that;

(iii) the countries from which those milk and milk-related products were imported; and

(iv) the companies which imported those milk and milk-related products?

(b) Will he also inform this House of the total expenditure on importing milk and milk-related products into Sri Lanka during the period concerned?

(c) If not, why?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|
| 2015 | 86,327,485 |
| 2016 | 99,593,434 |
| 2017 | 98,863,895 |
| 2018 | 104,861,871 |
| 2019 | 98,837,755 |
| මුළු ප්‍රමාණය | (මිලියන 488.48) 488,484,440 |

(ii)

| වර්ෂය | වටිනාකම (රුපියල්) |
|---|---|
| 2015 | 53,080,359,426 |
| 2016 | 60,833,456,838 |
| 2017 | 66,147,191,492 |
| 2018 | 71,393,961,149 |
| 2019 | 73,776,921,807 |
| මුළු වටිනාකම | (රු. බිලියන 325.23) 325,231,887,712 |

(iii) ඇමුණුම 01හි දක්වා ඇත.

(iv) ඇමුණුම 02හි දක්වා ඇත.

ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

(ආ) මුළු මුදල රුපියල් 325,231,887,712 (රුපියල් බිලියන 325.23)

(ඇ) පැන නොනඟී.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීම සඳහා අපි කළ යුත්තේ මොකක්ද? කෘෂි කර්මාන්තය සහ කිරි කර්මාන්තය කියන්නේ අතීතයේ පටන් එකට බැඳුණු සංකල්ප දෙකක් සහ එකට යන ක්‍රියාවලියක්. විශේෂයෙන්ම ඉන්දියාව කිරිවලින් ස්වයංපෝෂිත වෙලා තිබෙන්නේ, ගොවියා කිරි කර්මාන්තය සඳහා යොමු කරන වැඩ පිළිවෙළක් දියත් කර තිබෙන නිසායි. එහෙම නැතිව, මහා පරිමාණ සමාගම් හෝ මහා පරිමාණ ගොවිපොළවල් නිසා නොවෙයි. මේ සඳහා අය වැයෙනුත් යම් කිසි දිරි ගැන්වීමක් කරලා තිබෙන බව අපි දන්නවා. එහිදී ප්‍රතිපත්තිමය වශයෙන් කෘෂි කාර්මික ගොවියාම කිරි ගොවියා බවට පත් කරන වැඩ පිළිවෙළක් තිබෙනවා නම් හොඳයි. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් තමයි කාබනික ගොවිතැන ව්‍යාප්ත කිරීම. මේ වැඩ පිළිවෙළ ඒකටත් ඉතාම හොඳින් ගැළපෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ප්‍රතිපත්තිමය වෙනස ඇති කිරීම සඳහා යම් කිසි තීන්දුවක් අරගෙන තිබෙනවාද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, අපේ රටේ දියර කිරි ප්‍රවර්ධනයට රජය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සඳහා සුවිශේෂ වූ රාජ්‍ය අමාත්‍යාංශයකුත් පිහිටුවා තිබෙනවා. ඒ අනුව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයට එළැඹෙන අය වැයෙන් රුපියල් මිලියන 1,773ක් වෙන් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් බිලියන එකකුත්, සුළු හා මධ්‍ය පරිමාණ සත්ත්ව ගොවිපොළවල් පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 315කුත්, පශු සම්පත් ආශ්‍රිත රෝග පාලනය සඳහා තවත් රුපියල් මිලියන 245කුත්, පශු සම්පත් අංශය සඳහා උසස් තත්ත්වයේ පෝෂණ ද්‍රව්‍ය ලබා ගැනීම සහ එය තහවුරු කිරීම සඳහා රුපියල් මිලියන 275කුත්, ඒ වාගේම අගය එකතු කිරීම මත කල් තබා ගැනීමේ ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 40කුත් වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. සමස්ත රාජ්‍ය වියදම තුළ ඒ ඒ අමාත්‍යාංශවලට වෙන් කර තිබෙන මුදල්වලින් පශු සම්පත් ක්ෂේත්‍රය ඇතුළුව කෘෂි කාර්මික ක්ෂේත්‍රයට වෙන් කර තිබෙන මුදලින් සියයට 7ක මුදලක් කෘෂිකර්මය සහ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නයත් අහනවා.

අපි දැක්කා, හිරේ ඉන්න ඕනෑ අයත් ඊයේ තිබුණු උද්ඝෝෂණයට ඇවිල්ලා තිබුණු බව. විශේෂයෙන් පසුගිය ආණ්ඩුවේ - *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද?

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
කවුද කියලා නේ අහන්නේ. හොඳයි කියන්නම්. කිරි දෙනුන් ගෙන්වීමේදී රුපියල් මිලියන 400කට වැඩි වංචාවක් පසුගිය ආණ්ඩුව කාලයේ සිද්ධවෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. පොඩ්ඩක් අහගන්නකෝ. *[බාධා කිරීමක්]* කිරි දෙනුන් ගෙන්වීමේදී රුපියල් මිලියන 400කට වැඩි වංචාවක් සිද්ධ වුණාය කියලා ජනාධිපති විමර්ශන වාර්තාවකින් හෙළිවෙලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේත් අනුරාධපුර දිස්ත්‍රික්කය. කිරි දෙනුන් ලැබුණු කෙනෙක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැහැ. ඒ වාගේම කිරි දෙනුන් import කරනවාය කිව්ව ප්‍රමාණය ගෙන්වලාත් නැහැ. ඊයේ පී. හැරිසන් මහත්මයා මාධ්‍ය ඉදිරියට ඇවිත් මොනවත් වුණේ නැහැ වාගේ කැලණිය වඳින්න යනවා අපි දැක්කා. ඒ නිසා අපි පැහැදිලිව අහනවා, මේ සම්බන්ධයෙන් - *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි.

කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* මේක අහලා උත්තරයක් දෙන්න. *[බාධා කිරීම්]* ඔබතුමා කලබල වෙන්න එපා. මේක අහගෙන ඉඳලා උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* හරි. හරි. මගේ බයිලාව මම කියන්නම්. ගරු කථානායකතුමනි, මම රාජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා, මේ දේවල් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරනවාද, නීතිමය ක්‍රියාමාර්ග ගන්නවාද කියලා

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, කිරිදෙනුන් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහද්දී සමගි ජන බලවේගයේ මහ ලේකම්තුමා කලබල වුණේ ඇයි කියලා මම දන්නේ නැහැ. මොකද, එතුමා සම්බන්ධයෙන් නොවෙයි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ඇහුවා නම්, එතුමා ඒ වෙලාවේ නිදාගෙන හිටපු එක ගැන එතුමා කලබල වුණාට කමක් නැහැ.

ගරු කථානායකතුමනි, කිරිදෙනුන් ආනයනය කිරීම සම්බන්ධයෙන් පසුගිය රජයට විශාල චෝදනා තිබෙනවා. එකක් තමයි රජය විසින් දැරූ වැය බරට සමාන කිරිදෙනුන් ප්‍රමාණයක් නොලැබීම. ඒ ලැබුණු කිරිදෙනුන් ජීවිතක්ෂයට පත් වෙලා තිබුණා. මන්ත්‍රීතුමා කිව්වා වාගේ, කිරිදෙනුන් ලැබුණු කිරිගොවීන් සම්බන්ධයෙනුත් අද සමාජය තුළ කථා වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා මේ සම්බන්ධව විමර්ශනයක් කරලා ඒ ගැන පැහැදිලි පිළිතුරක් මේ ගරු සභාවට ලබා දෙන්න අපි කටයුතු කරන්නම්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

ගරු රාජ්‍ය ඇමතිතුමා මගේ නම කිව්වා. මට කලබල වෙන්න දෙයක් නැහැ. කිරිදෙනුන් ගැන නොවෙයි, හරක් ගැන අපි කථා කළේ නැහැ. කිරිදෙනුන් ඇණවුම් කළේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇමති වෙලා ඉන්නකොට 2015ට කලින් තිබුණු ආණ්ඩුව.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි,-*[බාධා කිරීමක්]* මම නේ, ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ.

ඒ සතුන් ආනයනය කළේ යහ පාලන ආණ්ඩුව කාලයේ, ගරු කථානායකතුමනි. ඒ හින්දා එම ආනයනයත්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් අතර කිසිම සම්බන්ධයක් නැහැ. අද හරක් කවුද කියන එක රටටම ප්‍රදර්ශනය කරලා තිබෙනවා. ආණ්ඩුව මේ රටේ කොරෝනා මර්දනය කරන්න උත්සාහ කරද්දී කොරෝනා ප්‍රවර්ධනය කරන්න කටයුතු කරන අය තමයි විපක්ෂය පැත්තේ ඔය නැගිටලා කථා කරන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 31 යටතේයි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ. මම ඊයේ දින කථා කළ කාරණාව ගැන, ඒ අසාධාරණය ගැන අද පැහැදිලි කරන්නම්. අපේ ගරු මොහොමඩ් මුසම්මිල් මන්ත්‍රීතුමා අදත් ප්‍රශ්නයක් ඇහුවා. ඒක හොඳයි. එතුමා ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන ප්‍රශ්න අහලා ආණ්ඩු පක්ෂය ඉහළ තලයකට ගෙනෙන්න යම් වැඩ පිළිවෙළක යෙදෙනවා. 08වැනි දා සහ 11වැනි දාත් එතුමාට එක ප්‍රශ්නය බැගින් ප්‍රශ්න දෙකක් අහන්න ඉඩ දීලා තිබුණා. එතුමාට එකම සතියේ ප්‍රශ්න දෙකක් අහන්න අවස්ථාව දීලා තිබුණා. ගරු කථානායකතුමනි, අදත් එතුමාට ප්‍රශ්නයක් අහන්න දීලා තිබෙනවා. අපට ඒක ගැටලුවක් නැහැ. ඒ මන්ත්‍රීතුමා අපි වාගේ ප්‍රශ්න අහනවා. හොඳයි. නමුත්, බලන්න ආණ්ඩුව කරන්න යන දේ. දැන් මේ වෙලාවේත්, පසුගිය ආණ්ඩුව කාලයේ වුණු සිදුවීමක් අල්ලාගෙන, මේ ආණ්ඩුවේ සුදු හුණු ගාන්න හදනවා. හවසට පාළු ගෙයි වළං බිඳිනවා වාගේ ආණ්ඩුව තමන්ගේ ගුණ තමන්ගේ මන්ත්‍රීවරු ලවා ප්‍රකාශ කරවා ගන්නයි, මේ ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සීමා කරලා තිබෙන්නේ. මම ගරු කථානායකතුමාට ඒක ඔප්පු කරලා පෙන්නුවා. අපේ විපක්ෂයේ ප්‍රශ්න ටික පැත්තක තියලා, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න ටික අහන්න අවස්ථාව දීලා ආණ්ඩුවේ ගුණ වර්ණනාව කරන්නයි, පසුගිය ආණ්ඩුව කාලයේ වැරැදි ටික කියන්නයි උත්සාහ කරනවා. ආණ්ඩුවේ මන්ත්‍රීවරයා අහන්නේ ආණ්ඩුවේ වැරැදි ගැන නොවෙයි, ආණ්ඩුවේ හොඳ ගැනයි, පහුගිය කාලයේ කුණු ටික ගැනයි. ඒක කරගන්න අපේ ප්‍රශ්න ටික යට ගහනවා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ අපේ වගකීම් භාරව ඉන්න නායකයා හැටියට මෙයට සාධාරණයක් කරන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙවැනි අසාධාරණකම් කරන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. ඔබතුමා පාර්ලිමේන්තුව පිළිබඳව ගොඩක් අත්දැකීම් තිබෙන, ජ්‍යෙෂ්ඨ නායකයෙක්. ඉතින්, මේ අසාධාරණය කරන්න ඉඩ දෙන්න එපා. එක පැත්තකින් සමාජ

ප්‍රජාතන්ත්‍රවාදය කඩා දමා තිබෙනවා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කඩා දමා තිබෙනවා. තමුන්නාන්සේත් ඒ විනාශයේ හවුල්කාරයෙක් වෙන්න එපා, ගරු කථානායකතුමනි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු මුල් සතිය ඇතුළත මම ප්‍රශ්න 672ක් Table Office එකට භාර දුන්නා. අලුත් මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව දෙන එක හොඳයි.

ගරු මොහමඩ් මුසම්මිල් මන්ත්‍රීතුමාත් මෙම ගරු සභාවේ මන්ත්‍රීවරයෙක්. එතුමාට ඒ අවස්ථාව දෙන එකේ වරදක් නැහැ. හැබැයි පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා වගකීම භාර ගන්න ඕනෑ, මේකේ criterion එක මොකක්ද, මේ ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන ක්‍රමවේදය මොකක්ද කියන එක සම්බන්ධයෙන්. එහෙම කිසිම ක්‍රමවේදයක් නැතුව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරක් ප්‍රශ්න අහන්න අවස්ථාව දීලා තිබෙනවා. විපක්ෂයේ අපට ප්‍රශ්න අහන්න තිබෙන අයිතියත් නැහැ. එක මන්ත්‍රීවරයෙකුට එක ප්‍රශ්නයයි අහන්න පුළුවන් කිව්වා. අපි මේක ගරු කථානායකතුමාට නොවෙයි කියන්නේ. මහ ලේකම්තුමා දේශපාලනය කරන්න එපා. මහ ලේකම්තුමාට දේශපාලනය කරන්න ඕනෑ නම් වෙන තැනක් හොයා ගන්න. කරුණාකර මේ පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයට තියෙන අයිතිය නැති කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order .

ගරු කථානායකතුමනි, අපි දන්නවා පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීමේදී ප්‍රමුඛතාව තියෙන්න ඕනෑ විපක්ෂයට බව. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට තිබෙන ප්‍රශ්න ආණ්ඩුව ඇතුළේ විසඳාගන්න පුළුවන්. නමුත් අපි කියන්නේ නැහැ, ආණ්ඩුවේ මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශ්නවලට අවස්ථාව දෙන්න එපා කියලා. අද බැලුවාම, ප්‍රශ්න 5න් ප්‍රශ්න 3ක්ම දීලා තියෙන්නේ ආණ්ඩු පාර්ශ්වයට. මොකක්ද මේකේ තිබෙන සාධාරණය? මේක අසාධාරණයි. ගරු කථානායකතුමනි, ඔබතුමා මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳුවේ නැත්නම් මේක බරපතළ ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමා මේක විසඳන්න.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට විශේෂයෙන් සැලකුවා කියා ඔබතුමා කියන කාරණයට මා එකඟ නැහැ. නමුත්, අපි ඒ ගැන හොයලා බලන්නම්. *[බාධා කිරීම්]*

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, කලින් පක්ෂ නායක රැස්වීමක් කැඳවපු අවස්ථාවේ මේ පිළිබඳව සාකච්ඡා වුණා. *[බාධා කිරීම්]* එහිදී ප්‍රශ්න අසන මන්ත්‍රීවරුන්ට එන්න කියලා ඔබතුමා අවස්ථාවක් දුන්නා එතුමන්ලාට අදහස් ඉදිරිපත් කරන්න. එතැනදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න කියලා වෙන් කරලා තීරණයක් ගත්තේ නැහැ. *[බාධා කිරීම්]* මම ඉදිරිපත් කරපු ප්‍රශ්න පසුගිය දවස් දෙක තුනේම න්‍යාය පත්‍රයට ඇතුළත් වුණේ නැහැ. මේ දෙවැනි වතාවට එන්නේ. ඒ නිසා අභූත චෝදනාවක් මේ කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, අදත් ප්‍රශ්න පහෙන් තුනක් දීලා තිබෙන්නේ විපක්ෂයට.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අද? එහෙම නැහැ නේ, ගරු කථානායකතුමනි *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂයට ප්‍රශ්න තුනක් නැහැ. ගරු මාණික්කියන් මන්ත්‍රීතුමා සහ අපේ- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැමදාම එකම මන්ත්‍රීතුමාට ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -632/2020- (1), ගරු මාණික්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.*[බාධා කිරීම්]* එහෙම කරන්න එපා. මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, ඔබතුමාගේ ප්‍රශ්නය අපි තේරුම් ගත්තා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Table Office එකෙන් කිව්වේ, සතියකට එක ප්‍රශ්නයක් පමණක් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙනවා කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, එක අවස්ථාවයි දෙන්නේ. ඒක ගැන තව හොඳට හොයලා බලන්න, එක අවස්ථාවයි දෙන්නේ.

ප්‍රශ්න අංක 3 -735/2020- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, විදුලිබල අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1086/2020- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## ගම්මිරිස් අස්වැන්න: විස්තර
மிளகு அறுவடை: விபரம்
PEPPER HARVEST: DETAILS

1280/2020

**5. ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)
වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ඉහළ ගම්මිරිස් අස්වැන්නක් ලබන දිස්ත්‍රික්ක කවරේද;

(iii) එම එක් එක් දිස්ත්‍රික්කයේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගම්මිරිස් හැර වෙනත් කුළුබඩු වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අවශ්‍යතාව සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආනයනය කරනු ලබන කුළුබඩු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் வருடாந்த மிளகு அறுவடை மெட்ரிக் டொன்களில் எவ்வளவு என்பதையும்;

(ii) அதிகப்படியாக மிளகு அறுவடை செய்யும் மாவட்டங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு மாவட்டத்தின் வருடாந்த மிளகு அறுவடை மெட்ரிக் டொன்களில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மிளகு தவிர்ந்த வேறு வகையான வாசனைத் திரவியங்கள் இலங்கைக்கு இறக்குமதி செய்யப் படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அவை யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு வாசனைத் திரவியத்தின் வருடாந்த தேவைப்பாடு மற்றும் இறக்குமதி செய்யப்படுகின்ற அளவு மெட்ரிக் டொன்களில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) இறக்குமதி செய்யப்படுகின்ற வாசனைத் திரவியங்களின் உள்நாட்டு உற்பத்தியை அதிகரிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation:

(a) Will he inform this House -

(i) the annual pepper harvest of Sri Lanka in metric tons;

(ii) the districts that record a bountiful pepper harvest; and

(iii) separately, the annual pepper harvest recorded in each district in metric tons?

(b) Will he also inform this House -

(i) whether other types of spices in addition to pepper are being imported to Sri Lanka;

(ii) if so, what they are;

(iii) separately, the annual requirement of each of the spices and quantity imported in metric tons; and

(iv) the measures that will be taken to increase the local production of the spices that are imported?

(c) If not, why?

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura -State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)
ගරු කථානායකතුමනි, වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | අස්වැන්න (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2018 | 22,551 |
| 2019 | 22,156 |
| 2020 | 23,970 |

*මූලාශ්‍රය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය*

(ii) රත්නපුරය, මාතලේ, මහනුවර, බදුල්ල, මොණරාගල, කුරුණෑගල, හම්බන්තොට දිස්ත්‍රික්කවලින් ඉහළ ගම්මිරිස් අස්වැන්නක් ලැබේ.

(iii)

| දිස්ත්‍රික්කය | අස්වැන්න (2020) මෙට්‍රික් ටොන් |
|---|---|
| රත්නපුරය | 4,126 |
| මාතලේ | 3,952 |
| මහනුවර | 3,341 |
| බදුල්ල | 3,368 |
| මොණරාගල | 1,992 |
| කුරුණෑගල | 1,858 |
| හම්බන්තොට | 1,314 |

*මූලාශ්‍රය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය*

(ආ) (i) ගම්මිරිස් ඇතුළු අනෙකුත් කුළුබඩු මේ වනවිට මෙරටට ආනයනය නවතා ඇත.

2019.12.06 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2152/63 හා 2020.05.22 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2176/19 ප්‍රකාරව කුරුඳු, ගම්මිරිස්, කරාබු, සාදික්කා, වසාවාසි, කරදමුංගු (එනසාල්), පුවක්, ඉඟුරු සහ කහ යන භෝග නිෂ්පාදන මෙරටට ආනයනය කිරීම අත් හිටුවනු ලැබූ අතර 2020.08.18 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2189/4 මගින් එම තහනම නැවත දැනුම් දෙන තුරු දීර්ඝ කරනු ලැබිණි.

2020.04.16 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2171/5 මගින් අපනයන කෘෂි භෝග ආශ්‍රිතව නිෂ්පාදනය කරන තෙල් හා ඔලියොරෙසින මෙරටට ආනයනය සඳහා වාරණ නිකුත් කර ඇත.

එමෙන්ම බුලත් මෙරටට ආනයනය කිරීම ශාක නිරෝධායන පනත (Plant Quarantine Act) යටතේ තහනම් කර ඇත.

කුළු බඩු වර්ග ආනයනය කිරීම වාරණය කර ඇති අතර ඒවා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන පමණක් සුළු පරිමාණවලින් ආනයනය කිරීම නිරීක්ෂණය වේ. නමුත් පානීය භෝග වශයෙන් සැලකෙන කෝපි (බදින ලද), කොකෝවා සහ වැනිලා යන අපනයන භෝග නිෂ්පාදන මෙරටට ආනයනය සඳහා ඉහත ගැසට් නිවේදන මගින් වාරණ නිකුත් කර නොමැත.

(ii) කුළු බඩු භෝග ආනයනය නොකරන නමුත් පානීය භෝග ලෙස සැලකෙන කෝපි (බදින ලද), කොකෝවා හා වැනිලා ආනයනය සඳහා අවකාශ ඇත.

(iii) පහත වගුවේ දැක්වේ.

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව*

| භෝගය | වාර්ෂික ජාතික අවශ්‍යතා (මෙට්‍රික්ටොන්) | වාර්ෂික ආනයන පරිමාව (මෙට්‍රික්ටොන්) | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 | 2020 | 2021 (up to 30th Sep.) |
| කුරුඳු | 1,181 | 61.6 | 112.5 | 1.3 | 0.15 | 0.07 |
| ගම්මිරිස් | 7,197 | 1,398.1 | 3,179.0 | 152.6 | 5.75 | 55.59 |
| කරාබු | 93 | 9.5 | 11.6 | 13.6 | 0.001 | 0.01 |
| කොකෝවා | 5,400 | 4,828.1 | 4,866.5 | 4,887.8 | 4,521.17 | 4,217.74 |
| කෝපි | 2,781 | 75.0 | 95.7 | 127.3 | 104.87 | 162.53 |
| එනසාල් | 32 | 321.9 | 34.0 | 63.1 | 0.59 | 0.51 |
| සාදික්කා | 8 | 10.2 | 0.3 | 0.1 | 19.82 | 0.00 |
| වසාවාසි | - | - | 0.02 | 1.8 | - | 0.01 |
| බුලත් | 7,000 | - | - | - | - | - |
| පුවක් | 7,000 | 242.3 | 211.6 | 36.0 | 135.00 | 239.00 |
| පැඟිරි | 5 | 2.5 | 16.1 | 1.4 | 0.57 | 0.77 |
| කහ | අමු 56,000 (වියළි 8,000) | 4,958.3 | 5,386.7 | 5,288.9 | 814.89 | 0.78 |
| ඉඟුරු | 18,000 (අමු) | 1,731.2 | 1,395.4 | 822.1 | 204.32 | 0.36 |
| වැනිලා | 5 | 5.28 | 4.75 | 1.12 | 4.24 | 0.23 |
| ඝේර | - | - | 0.49 | 0.7 | 1.12 | 0.21 |

[ගරු කුමාරසිරි රත්නායක මහතා]

(iv) ආනයනය සඳහා වාරණ නිකුත් කිරීමත් සමඟ දේශීය කහ, ඉඟුරු සහ එනසාල්වල හිඟතාවක් ඇතිවීම මඟහරවා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ,

- කහ සහ ඉඟුරු වගා සංවර්ධනය සඳහා ආයෝජන ආධාර ක්‍රමයක් ක්‍රියාවට නැංවේ. සක්‍රීය වගා වපසරිය හෙක්ටෙයාර එකක් දක්වා සපයා ගනු ලබන කහ බීජ අල කිලෝග්‍රෑම් එකකට රුපියල් 150.00 බැගින් උපරිම බීජ අල කිලෝග්‍රෑම් 1,500ක් දක්වා ද, සක්‍රිය වගා වපසරිය හෙක්ටෙයාර එකක් දක්වා සපයා ගනු ලබන ඉඟුරු බීජ අල කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 150.00 බැගින් ඉඟුරු බීජ අල කිලෝග්‍රෑම් 1,250ක උපරිමයක් දක්වා ආධාර මුදල් ගෙවනු ලැබේ.

ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් කහ වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් සිටිනවා. අපේ දේශීය කහ අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 8,000ක් වනවා. ඒ වෙනුවට අමු කහ මෙට්‍රික් ටොන් 70,000ක් ලබා ගැනීමට අපි ඒ වගා කටයුතු කර තිබෙනවා. පවුල් ලක්ෂ 15කට කහ පැළ ලබා දී තිබෙනවා. ඒ වාගේම, සහනාධාරය දෙගුණ කර දී තිබෙනවා. ඒ නිසා 2021 අවුරුද්ද අවසානයේත්, මහ කන්නයේ අස්වැන්න ලැබෙන විටත් කහවලින් මේ රට ස්වයංපෝෂිත වෙනවා. කහ මිල අඩු කිරීම සඳහා කුළුබඩු සංස්ථාව මැදිහත් කරගෙන සතොස හා සමූපකාර සමිතිවලින් කහ ලබා දීම තුළින් අපි කහ මිල පාලනය කර තිබෙනවා. සියලු භෝග වර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා පසුගිය අවුරුද්දේ රුපියල් මිලියන 1,200ක් සහනාධාර හැටියට ජනතාවට ලබා දීමට අපි කටයුතු කර තිබෙනවා.

- කහ, ඉඟුරු සහ එනසාල් ගෙවතු වගා සඳහා නොමිලේ පැළ/බීජ සහ ගෘහස්ථ පරිභෝජනය සඳහා කහ සහ ඉඟුරු ගෘහාශ්‍රිතව සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලැබේ.
- දේශීය එනසාල් නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රමෝපායක් ලෙස පොකුරු ගම්මාන (Cluster Villages) ඇති කිරීමට මේ වනවිට පියවර ගෙන ඇත.

ආනයනය කරනු ලබන පානීය භෝග වර්ග නිෂ්පාදනය ඉහළ නැංවීමට දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර පහත පරිදි වේ.

- නව වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ කෝපි සහ කොකෝවා පැළ වගාකරුවන් වෙත නොමිලේ (හෙක්ටෙයාර දෙකක උපරිමයකට යටත්ව) ලබා දෙන අතර අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම, වගා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සහ අවශ්‍ය විටකදී පාංශු පරීක්ෂාවන් සිදු කරදීම වැනි තවත් සේවාවන් දෙපාර්තමේන්තුව විසින් නොමිලේ සපයනු ලැබේ.
- අපනයන කෘෂි භෝග වගාවන්හි ඵලදායීතාව නැංවීමේ වැඩසටහන (PIP) යටතේ වගා ක්ෂේත්‍රය තුළ පවතින පාළු ප්‍රමාණය මත පදනම්ව සියයට 50ක උපරිම පාළු ප්‍රතිශතයකට යටත්ව නොමිලේ පැළ නිකුත් කෙරේ. ඵලදායිතා ප්‍රවර්ධන ආයෝජන යෝජනා ක්‍රමය යටතේ කොකෝවා සහ කෝපි වගා හෙක්ටෙයාර එකක් සඳහා රුපියල් 75,000ක ආධාර මුදලක් වගාකරුවන් වෙත ලබා දෙනු ලැබේ.
- ඉහත භෝග සකස් කිරීම හා අගය නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දීම පිණිස පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.
- ගොවීන් කණ්ඩායම්ගත කිරීම සහ ඔවුන් ගැනුම්කරුවන් සහ අපනයනකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා ද දෙපාර්තමේන්තුව මැදිහත් වී ක්‍රියා කරමින් පවතියි.
- මෙම අපනයන කෘෂි භෝගවලට සිදුවිය හැකි පළිබෝධ/සත්ත්ව හානි වළක්වා ගැනීමේ උපාංග/පද්ධති හඳුන්වා දීම හා ඒ සඳහා පහත පරිදි ආයෝජන ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතියි.

| වපසරිය | අ.කෘ.දෙ. මඟින් ගෙවන මුදල (රුපියල්) |
|---|---|
| අක්කර ¼ (හෙක්ටෙයාර 0.1) | 35,000.00 |
| අක්කර ½ (හෙක්ටෙයාර 0.2) | 40,000.00 |
| අක්කර ¾ (හෙක්ටෙයාර 0.3) | 45,000.00 |
| අක්කර 01 (හෙක්ටෙයාර 0.4) | 50,000.00 |
| අක්කර 01 (හෙක්ටෙයාර 0.4)ට වඩා වැඩි ඉඩම් සඳහා පද්ධතිය සවිකර ඇති විට අක්කර 05 (හෙක්ටෙයාර 2)ක උපරිමය දක්වා වැඩි වන සෑම අක්කරයකටම රුපියල් 20,000.00 බැගින් ගෙවිය හැකිය. අක්කරයකට අඩු කොටස් වශයෙන් වැඩි වනවිට අනුපාතිකව ගණනය කර ගෙවිය යුතුය. | |

- පසු අස්වනු තාක්ෂණ වැඩසටහන යටතේ ඉහත භෝග සැකසීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මෙන්ම සැකසුම් මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා ආයෝජන ආධාර ලබා දෙනු ලැබේ.
- යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP), ISO22000 තත්ත්ව සහතිකකරණය, HACCP සහතිකකරණය සහ කාබනික වගා සහතිකකරණය සඳහා වන ආයෝජන ආධාර ක්‍රමයක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරමින් පවතී.

a) යහපත් නිෂ්පාදන පිළිවෙත් (ГМП) සඳහා යෝජිත ආයෝජන ආධාර ක්‍රමය

| | සැකසුම් මධ්‍යස්ථානයේ / ව්‍යාපාරයේ වාණිජ වටිනාකම (රුපියල් මිලියන) | ආයෝජන ආධාර මුදල (රුපියල්) |
|---|---|---|
| 1 | රුපියල් මිලියන 01ට අඩු | 50,000.00 |
| 2 | රුපියල් මිලියන 01ත් 05ත් අතර | 75,000.00 |
| 3 | රුපියල් මිලියන 05ත් 10ත් අතර | 100,000.00 |
| 4 | රුපියල් මිලියන 10ට වැඩි | 125,000.00 |

b) ISO 22000/HACCP/FSSC 22000/ BRCGS සඳහා යෝජිත ආයෝජන ආධාර මුදල - Rs. 2,50,000.00

c) කාබනික සහතිකකරණය -

| සහතිකකරණ වර්ෂය ආයෝජන ආධාර මුදල (රුපියල්) | | |
|---|---|---|
| 1 | පළමු වර්ෂය | 200,000.00 |
| 2 | දෙවන වර්ෂය | 150,000.00 |
| 3 | තුන්වන වර්ෂය | 100,000.00 |

d) කාබනික වගා වැඩසටහන

අපනයන කෘෂි භෝගවල සාමාන්‍ය වගා භූමි කාබනික වගා බවට පරිවර්තනය කිරීම සඳහා මෙම ආධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ. එහිදී වගා පරිවර්තන අවදියේදී සිදු වන අස්වනු අඩුවීම සඳහා වන වන්දියක් ලෙස සලකා මෙම ආධාරය ලබා දෙනු ලැබේ.

| කාල සීමාව | ආධාර මුදල (හෙක්ටෙයාරයට රුපියල්) |
|---|---|
| අවුරුදු 1 | 40,000.00 |
| අවුරුදු 2 | 40,000.00 |

(ඇ) අදාළ නොවේ.

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)
ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ඔබතුමා දන්නවා, 2015න් පස්සේ මේ රටට ගම්මිරිස් ආනයනය කිරීම නිසා ගම්මිරිස් ගොවියා විශාල අපහසුතාවකට පත් වුණු බව. එදා ගම්මිරිස් කිලෝවක මිල රුපියල් 1,000ක්, 1,200ක් වාගේ මට්ටමක තිබිලා රුපියල් 300ක් වැනි මිලක් දක්වා පහත වැටුණා. ඒ මිල නැවත හදා ගන්න අප උත්සාහ කළත් අපට ඒකට අවස්ථාවක් ලැබුණේ නැහැ. පසුගිය වසර දෙකක කාලය තුළ ගම්මිරිස් මිල යම් ප්‍රමාණයකට වැඩි වුණත්, එදා තිබුණු මිල මේ මොහොත දක්වාම ලබා ගන්න ගම්මිරිස් ගොවියාට බැරි වෙලා තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, 2017 සහ 2018 වසරවල මේ රටට කොපමණ ගම්මිරිස් ප්‍රමාණයක් ආනයනය කර තිබෙනවාද?

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகுஜானகவக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු කථානායකතුමනි, 2017 වසරේ ගම්මිරිස් මෙට්‍රික්ටොන් 1,398කුත්, 2018 වසරේ මෙට්‍රික්ටොන් 3,179කුත් මේ රටට ආනයනය කර තිබෙනවා. ගම්මිරිස් මෙට්‍රික්ටොන් 5යි, අපි 2020 වර්ෂයේ ආනයනය කර තිබෙන්නේ. ඒකත් අප යම් යම් අවශ්‍යතා සඳහා ගෙන්වපු ප්‍රමාණයක් විතරයි. දැන් ගම්මිරිස් ආනයනය සම්පූර්ණයෙන් නතර කරලා තිබෙන නිසා, එදා රුපියල් 390ට තිබුණු ගම්මිරිස් කිලෝව අද වනකොට රුපියල් 1,000ත්, රුපියල් 1,100ත් අතර මිලකට විකිණෙනවා.

කුළු බඩු සංස්ථාවෙන් ගම්මිරිස් කිලෝවක් රුපියල් 1,060 බැගින් ගිය සතියේත් මිලට ගත්තා. කලින් ගම්මිරිස් කිලෝවක් රුපියල් 400ක් වැනි මිලකටයි තිබුණේ. ඒකට දැන් රුපියල් 600කට වැඩි ගණනක් එකතු වෙලා, අද ගම්මිරිස් කිලෝවක් රුපියල් 1,000කට වැඩි මුදලකට විකිණෙනවා. අතිගරු ජනාධිපතිතුමා ගම්මිරිස් ආනයනය නතර කිරීමට ගත් තීන්දුව නිසා මේ මිල ගොවියාට ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)
ගරු ඇමතිතුමනි, මුළු රටේම කහ වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඔබතුමා දිස්ත්‍රික්ක ගණනාවකටම කහ පැළ ලබා දෙමින් විශාල කාර්ය භාරයක් කරගෙන යනවා. එම නිසා අපි විශ්වාස කරනවා, ඉදිරි කාලය තුළ කහවලින් අපේ රට ස්වයංපෝෂිත කරන්න පුළුවන්කම ලැබෙයි කියලා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, 2017, 2018 සහ 2019 වසරවල කොපමණ කහ ප්‍රමාණයක් මේ රටට ආනයනය කර තිබෙනවාද?

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු මන්ත්‍රීතුමනි, 2017 අවුරුද්දේ වියළි කහ මෙට්‍රික්ටොන් 4,958කුත්, 2018 අවුරුද්දේ මෙට්‍රික්ටොන් 5,386කුත්, 2019 අවුරුද්දේ මෙට්‍රික්ටොන් 5,288කුත් මේ රටට ආනයනය කර තිබෙනවා. අපි ඒක දැන් සම්පූර්ණයෙන් නතර කරලා, ශ්‍රී ලංකාවේ අවශ්‍යතාව සම්පූර්ණ කර තිබෙනවා. අස්වැන්න ලැබෙන කොට කහ ගොවියාට ලොකු ආදායමක් ලැබී තිබෙනවා. අමු කහ කිලෝ එකක් රුපියල් 55ට තමයි මුලින්ම වෙළෙඳ පොළේ විකුණුවේ. හැබැයි අද, කහ කිලෝ එක රුපියල් 200ට වැඩි මිලකට -රුපියල් 400ක් වාගේ මිලකට- විකුණා කහ ගොවියෝ විශාල ලාභයක් ලබා තිබෙනවා. මේ රටේ ගොවි ජනතාව තමයි ඒ ලාභය ලබන්නේ. නමුත්, පාරිභෝගික ජනතාවට සහනයක් දෙන්න අවශ්‍ය නිසා අතිගරු ජනාධිපතිතුමා කිව්වා, කුළු බඩු සංස්ථාවෙන් ඒවා අරගෙන අඩු මිලට දෙන්න කියලා. සාමාන්‍ය වෙළෙඳ පොළේ වියළි කහ කිලෝ එක රුපියල් 4,000ට ගියත්, අපි කුළු බඩු සංස්ථාවෙන් කහ මිලදී ගෙන කිලෝවක් රුපියල් 2,000 ගණනේ සතොස සහ සමුපකාර සමිති හරහා ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## කලවංචිකුඩි රෝහල: සම්පත් හිඟය
## களுவாஞ்சிக்குடி வைத்தியசாலை: வளப் பற்றாக்குறை
## KALAWANCHIKUDY HOSPITAL: SHORTAGE OF RESOURCES

632/2020

**2. ගරු ඉෂාක් රහුමාන් මහතා (ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)**
(மாண்புமிகு இஷாக் ரஹுமான் - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Ishak Rahuman on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කලවංචිකුඩි මූලික රෝහල සහ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

ඇති දෙහිඅත්තකණ්ඩිය රෝහල පළාත් අමාත්‍යාංශය යටතේ එකම අවස්ථාවේදී උත්ශ්‍රේණි ගත කරන ලද බවත්;

(ii) ඒ අතරින් දෙහිඅත්තකණ්ඩිය රෝහල මධ්‍යම රජය යටතට පවරා ගැනීමට පියවර ගනිමින් පවතින නමුත් කලවංචිකුඩි රෝහල තවමත් පළාත් අමාත්‍යාංශය යටතේ පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) කලවංචිකුඩි රෝහල මේ වනතෙක් මධ්‍යම රජය යටතට පවරා නොගැනීමට හේතු කවරේද;

(ii) කලවංචිකුඩි රෝහලේ මානව හා භෞතික සම්පත් හිඟයක් පැවතීමට හේතු කවරේද;

(iii) එම හිඟයන් සම්පූර්ණ කිරීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில் அமைந்துள்ள களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலையும் அம்பாறை மாவட்டத்தில் அமைந்துள்ள தெஹிஅத்தகண்டிய வைத்தியசாலையும் மாகாண அமைச்சின்மூலம் ஒரே சமயத்தில் தரமுயர்த்தப்பட்டவை என்பதையும்;

(ii) தெஹிஅத்தகண்டிய வைத்தியசாலையை மத்திய அரசாங்கம் பொறுப்பேற்பதற்கான நடவடிக் கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்ற போதிலும், களுவாஞ்சிக்குடி வைத்தியசாலை இதுவரையிலும் மாகாண அமைச்சின் கீழேயே இருக்கின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இதுவரையிலும் களுவாஞ்சிக்குடி வைத்திய சாலையை மத்திய அரசாங்கம் பொறுப்பேற் காமைக்கான காரணங்கள் யாவையென் பதையும்;

(ii) களுவாஞ்சிக்குடி வைத்தியசாலையில் மனித மற்றும் பௌதிக வளங்களின் பற்றாக்குறை நிலவுவதற்கான காரணங்கள் யாவையென் பதையும்;

(iii) அவ்வளப்பற்றாக்குறையை நிவர்த்தி செய்வதற் குத் துரிதமாக நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the Kalawanchikudy Base Hospital in the Batticaloa District and the Dehiattakandiya Hospital in the Ampara District were upgraded under the Provincial Ministry at the same time; and

(ii) of them, arrangements are being made to take over the Dehiattakandiya Hospital by the Central Government, but the Kalawanchikudy Hospital still remains under the Provincial Ministry?

(b) Will he inform this House -

(i) the reasons for not taking over the Kalawanchikudy Hospital by the Central Government so far;

(ii) the reasons for the prevalent shortage of human and physical resources in the Kalawanchikudy Hospital; and

(iii) whether speedy steps would be taken to address those shortages?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) දෙහිඅත්තකණ්ඩිය රෝහල 2017.10.26 දින හා කලවංචිකුඩි රෝහල 2020.03.03 දින A කාණ්ඩයේ මූලික රෝහල් ලෙස උත්ශ්‍රේණිගත කර ඇත.

(ii) දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහල සහ කලවංචිකුඩි මූලික රෝහල නැගෙනහිර පළාත් සභාව යටතේ පාලනය වන අතර මධ්‍යම රජය යටතට පවරා ගැනීමට පියවර ගෙන නොමැත.

(ආ) (i) පැන නොනඟී.

(ii) වෛද්‍ය, හෙද, අතුරු සහ පරිපූරක සේවාවන්හි කාර්ය මණ්ඩල පුරප්පාඩු පොදුවේ සැලකිය යුතු ප්‍රමාණයක් පැවතීමත්, සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල මූලික පුහුණුව සඳහා යම් කාලයක් ගතවීමත් මානව සම්පත් ඌනතාවට හේතු වී ඇත.

කලවංචිකුඩි මූලික රෝහල පළාත් සභාව යටතේ පාලනය වුවද, කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රුපියල් මිලියන 17ක වෛද්‍ය උපකරණ රේඛීය අමාත්‍යාංශයෙන් ලබා දී ඇත.

(iii) මානව සම්පත් හිඟය අවම කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග

සේවා අවශ්‍යතාව අනුව වාර්ෂික ස්ථාන මාරු හා අනුප්‍රාප්තික ලැයිස්තුව මත විශේෂඥ වෛද්‍යවරුන් අදාළ රෝහල් වෙත අනුයුක්ත කිරීම වාර්ෂිකව සිදු කෙරේ. තවද විශේෂඥ පුහුණුව අවසන් කර දිවයිනට පැමිණෙන විශේෂඥ වෛද්‍ය නිලධාරීන් හඳුනා ගන්නා ලද ප්‍රමුඛතාව අනුව අනුයුක්ත කරනු ලැබේ.

පසුගිය මස ස්ථිර පත්වීම් ලබාදෙන ලද වෛද්‍ය නිලධාරීන් 08ක් කලවංචිකුඩි මූලික රෝහලට අනුයුක්ත කර ඇත. තවද පශ්චාත් සීමා වාසික පුහුණුව අවසන් කරන ලද නිලධාරීන් 1,501කට ස්ථිර පත්වීම් ලබා දීමට නියමිත අතර ඒ අවස්ථාවේදී මෙම රෝහල සඳහා වෛද්‍ය නිලධාරීන් අනුයුක්ත කරනු ඇත.

පසුගිය අප්‍රේල් මස ස්ථිර පත්වීම් ලබා දෙන ලද හෙද නිලධාරීන් 110ක් නැගෙනහිර පළාතට අනුයුක්ත කර ඇත. තවද හෙද පුහුණු අවසන් විභාගයට පෙනී සිටින ලද 2,685ක කණ්ඩායම සඳහා 2022 ජනවාරි මස පත්වීම් ලබා දීමේදී හෙද කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීමට අපේක්ෂා කෙරේ.

අනුස්ථාපන හා සමායෝජන පුහුණුව අවසන් කළ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී සහ විකිරණ ශිල්පී උපාධිධාරින් ඉදිරි වසරේ අනුයුක්ත කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) පැන නොනගී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1086/2020- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, විදේශ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

## බලංගොඩ කැල්සයිට් නිධිය: පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## பலங்கொடையிலுள்ள சுண்ணாம்புக்கல் படிவு: சுற்றாடல் அமைச்சரினது கூற்று
## CALCITE DEPOSIT IN BALANGODA: STATEMENT BY MINISTER OF ENVIRONMENT

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)
ගරු කථානායකතුමනි, නොවැම්බර් මස 15 වන සඳුදා දිනයේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද බලංගොඩ කල්තොට කැල්සයිට් නිධිය පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් පිළිතුරු ලබාදීමට මම බලාපොරොත්තු වනවා. සඳුදා දිනයේ කැබිනට් මණ්ඩල රැස්වීමට සහභාගි වීමට තිබූ නිසා මට ඒ අවස්ථාවට සම්බන්ධ වීමට නොහැකි වුණත්, එතුමා ඉදිරිපත් කර තිබෙන්නේ වැදගත් යෝජනාවක්. එම නිසා ඒ පිළිබඳව පිළිතුරක් ලබා දිය යුතුයි කියා මා හිතුවා.

ගරු කථානායකතුමනි, අපේ රටෙහි ඇති වටිනා ස්වාභාවික සම්පත් අතර බලංගොඩ කැල්සයිට් නිධිය ලෝකයේ තිබෙන හොඳම කැල්සයිට් නිධිය වෙනවා. ඊට සමාන කළ හැකි කැල්සයිට් නිධියක් ලෝකයේ කිසිදු රටකින් මෙතෙක් වාර්තා වී නැති බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල මහතා, මා සමඟ පැවති සාකච්ඡාවකදී කරුණු ඉදිරිපත් කළා.

ඒ වාගේම මෙම කැල්සයිට් නිධිය තුළ මේ වන විට එම ප්‍රදේශයේ ජීවත් වන පුද්ගලයින් සුළු වශයෙන් කැණීම් කටයුතු කරමින් යම් යම් කර්මාන්තවල යෙදෙන ආකාරයක් අපි දැක්කා. මම මේ ප්‍රදේශය නිරීක්ෂණය කරන්න ගියා. ඒ අවස්ථාවේත් මට එය නිරීක්ෂණය වුණා. ඒ අය දැනට ලබා ගන්නා මේ ඉතාම වටිනා කැල්සයිට්, කුකුළු කෑම නිෂ්පාදනය වාගේ සුළු කටයුතුවලට පමණයි යොදා ගන්නේ. ඒ නිසා අපේ අමාත්‍යාංශයත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයත් මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ අය කරන ලද සමීක්ෂණවල ප්‍රතිඵල අනුව අපිට වාර්තා කර තිබෙනවා, මෙම අතිවිශිෂ්ට කැල්සයිට් නිධියෙන් මේ රටට මහඟු සම්පත් ප්‍රමාණයක් සහ විදේශ විනිමය එකතු කර ගන්න පුළුවන් කියලා.

මෙමඟින් අපට විදේශ විනිමය ලබා ගන්නවා වාගේම එයින් කොටසක් ඉතිරි කර ගන්නත් පුළුවන් බවට එම විශ්වවිද්‍යාලයේ කණ්ඩායම කරුණු ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම බෙහෙත් පෙති වර්ග, තීන්ත, ඇඟලුම්වලට අවශ්‍ය රබර්, කඩදාසි, දත් බෙහෙත් නිෂ්පාදනය වැනි අංශ ගණනාවකට මේ කැල්සයිට් යොදාගත හැකි බව අපට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශේෂඥයින් ප්‍රකාශ කර තිබෙනවා. අපි ඒ අය සමඟ සාකච්ඡා වට ගණනාවක් පැවැත්වූවා. අවසාන වශයෙන් අපි තීන්දු කළා, මේ වටිනා සම්පත ප්‍රයෝජනයට අරගෙන ඒ කටයුතු නිසි පරිදි කළමනාකරණය කරමින්, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට රැකියා අවස්ථා නිර්මාණය කරමින් එම ප්‍රදේශයේ කර්මාන්තශාලාවක් ඉදිකිරීමේ කටයුතුවලට ප්‍රවේශ වෙන්න ඕනෑ කියලා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයත්, ඒ වාගේම GSMB ආයතනය යටතේ තිබෙන GSMB Technical Services (Pvt.) Ltd. යන තාක්ෂණික සේවා සමාගමත් සමඟ ඒකාබද්ධව අපි දැනටමත් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබෙනවා. මූල්‍යමය තක්සේරුවක් මේ වන විට සිදු කරමින් යනවා. අවශ්‍යතාවක් ඇති වුණොත්, මූල්‍යමය ගැටලුවක් තිබුණොත්, පෞද්ගලික අංශයෙන් තෝරාගත් කෙනෙකු සමඟ ඒකාබද්ධව හෝ විනිවිදභාවයෙන් යුතුව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මෙහි පළමු අදියර විධියට අපි කරන්න බලාපොරොත්තු වන්නේ මේකයි. විවිධ පුද්ගලයන් විසින් කැල්සයිට් ඉවත් කර ගැනීමෙන් පසු පැත්තකට දමා තිබෙන, ප්‍රයෝජනයට නොගන්නවා යයි කියා අයින් කළ කොටස් මේ ස්ථානයේ තිබෙනවා.

ඒ විධියට මෙට්‍රික් ටොන් 20,000ක විතර විශාල කැල්සයිට් ප්‍රමාණයක් දැනට ඒ ප්‍රදේශයේ රඳවා තිබෙන බව මට නිරීක්ෂණය වුණා. ඒක අත්හැරපු ප්‍රදේශයක්. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. එක පැත්තකින් බැලුවොත් ඒක පරිසරයටත් හානියක්. ඒ නිසා අපේ පළමු උත්සාහය තමයි මුලින්ම මේ වටිනා සම්පතට අත තබන්නේ නැතිව, දැනට අත් හැරලා තිබෙන, ඉවත් කරන ලද මේ කොටස ප්‍රයෝජනයට අරගෙන ඒවායෙන් මූලික කර්මාන්තශාලාවක් අරඹම කිරීම. ඊට අතිරේකව ඒ වටිනා සම්පත නිසියාකාරයෙන් ප්‍රයෝජනයට ගනිමින් මේ රටට විදේශ විනිමය ගෙනෙන මහා සම්පතක් බවට පත් කර ගන්නත් අපි අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා. මේ සඳහා අවශ්‍ය සාකච්ඡා වටවලට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයත්, මධ්‍යම පරිසර අධිකාරියත්, පරිසර අමාත්‍යාංශයත්, විශ්වවිද්‍යාලයත් මේ පිළිබඳ අවධානය යොමු කරන කණ්ඩායම් සියල්ල සහභාගි කර ගන්න හැකියාව ලැබුණා. ඒ වාගේම මම ඒ ප්‍රදේශයට ගිය අවස්ථාවේ දී ඒ ප්‍රදේශයේ ස්වාමීන් වහන්සේලාත්, ජනතාවත්, ප්‍රාදේශීය ලේකම් ඇතුළු රාජ්‍ය නිලධාරිනුත් මුණ ගැහුණා. ඒ අයගේ ඉල්ලීම තමයි පළමුවෙනි අදියර විධියට, දැනට ඉවත් කර තිබෙන මෙට්‍රික් ටොන් 20,000ක් පමණ වන මේ කැල්සයිට් ප්‍රමාණය උපයෝගි කරගෙන යම් කාර්යයක් ඉෂ්ට කරන්න කියන එක. දෙවැනි කාර්යය විධියට, සැලසුම් සහගතව මේ කටයුත්තට

[ගරු මහින්ද අමරවීර මහතා]

ප්‍රවේශ වෙන්නය කියන ඉල්ලීම තමයි කළේ. මේ කටයුත්ත ඉටු කළොත්, ඒ ප්‍රදේශයේ තරුණ-තරුණියන්ට රැකියා අවස්ථා උදා කර ගන්න අවස්ථාව ලැබෙනවා වාගේම, අපේ රටට විතරක් නොවෙයි මේ තිබෙන සම්පතෙන් -ධන නිධානයෙන්- මුළු ලෝකයටම නිසි ප්‍රයෝජනයක් ගන්නත් හැකියාව ලැබෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. අපේ උත්සාහය අනිවාර්යෙන්ම ලබන අවුරුද්දේ දී -2022 වසරේ දී- මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමයි.

ඒ සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා වාගේම රත්නපුර දිස්ත්‍රික්කයේ සියලු මැති ඇමතිවරුන්ගේ සහයෝගය අපට ලැබෙයි කියා විශ්වාස කරනවා. දැනටමත් ඒ ප්‍රදේශයේ සිටින මහජන නියෝජිතයන්ගෙනුත් විශාල ඉල්ලීමක් තිබෙනවා, කඩිනමින් මේ කටයුත්ත ආරම්භ කරන්න කියලා. ඒ වාගේම දැනට විදේශ සමාගම් කිහිපයක්ම අපෙන් මේ නිධිය ඉල්ලා තිබෙනවා. නමුත්, අපි ඒ කිසිම කෙනෙකුට දෙන්න එකඟතාවක් නැහැ. අපි බලන්නේ මේක අරගෙන අගය වැඩි කරලා ඉහළ මිලකට ලබා දීලා රටට අවශ්‍ය විදේශ විනිමය සොයා ගන්න. ඒ වාගේම අමුද්‍රව්‍ය ආනයනය කරලා නිෂ්පාදනය කරන බොහෝ දේවල් මේ රටේම මේ අමුද්‍රව්‍යවලින් නිෂ්පාදනය කර ගැනීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපි පරිසර අමාත්‍යාංශය විධියට අපි මේ වන විට පොළොව යට තිබෙන සියලු සම්පත් පිළිබඳව ගවේෂණ සහ සමීක්ෂණ කරගෙන යන බවත් මම කියන්න ඕනෑ. මොකද, මහා ධන නිධාන මේ පොළොව යට තිබෙනවා. මේවා නිසියාකාරයෙන් ප්‍රයෝජනයට ගෙන මේ රටේ ආර්ථිකයට ශක්තියක් ලබාදෙන වැඩ පිළිවෙළකට දායක වෙන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ කර්මාන්ත බොහොමයක් අපට කරන්න නොවෙයි, මේවා සොයා බලා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම තමයි අපේ බලාපොරොත්තුව. අපේ රටේ තිබෙන සමහර සම්පත් නිකම්ම විදේශ රටවලට ගෙනයනවා. ඒවාට කිසිම අගය එකතු කිරීමක් නැහැ. නිසි මිලක් ලැබෙන්නේ නැහැ. අඩුම ගණනේ වටිනාකමින් සියයට පහක්වත් නැතුව තමයි මෙතෙක් කාලයක් අපනයනය සිද්ධ වුණේ. ඒ නිසාවෙන් මේ රටින් ගෙනයන සියලුම ඛනිජ ද්‍රව්‍යවලට ඉතාම ඉහළ මිලක් ලැබෙන ආකාරයට අගය එකතු කිරීමකින් පසු ඒවා ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, මේ වන විට එප්පාවල පිහිටි පොස්පේට් නිධිය පිළිබඳ ගවේෂණ කටයුතු අපේ GSMB ආයතනය මඟින් සිදු කර තිබෙන බව. එම නිධියේ තිබෙන පොස්පේට් ප්‍රමාණයෙන් අපිට අවුරුදු 100කට ප්‍රමාණවත් පොහොර රට තුළ නිෂ්පාදනය කරගන්න පුළුවන් බව තමයි ඒ අය මට වාර්තා කර තිබෙන්නේ. මේකත් අපේ රටට තිබෙන මහා සම්පතක්. මේ පොස්පේට් ටික අපි ගත්තොත් අපේ රටේ පොහොර අවශ්‍යතාව සැලකිය යුතු මට්ටමකට සපුරා කර ගන්න පුළුවන්. අපට අවශ්‍ය නම්, වැඩිපුර තිබෙන ප්‍රමාණය අපනයනය කරලා විදේශ විනිමය සොයා ගන්නත් පුළුවන්කම තිබෙනවා. අප ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු අදාළ අංශ සමඟ සාකච්ඡා කරගෙන යනවා. ඒ වැඩ පිළිවෙළ දියත් කරන්න අපි කඩිනමින් පියවර ගන්නවා. මේ රටේ තිබෙන සියලු භූ සම්පත්වලින් නිසි ප්‍රයෝජනයක් ගන්නා සැලසුම් සහගත වැඩ පිළිවෙළකට ඉදිරියේදී අපි ප්‍රවේශ වන බවත් මම මතක් කරන්න කැමැතියි.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගිය සතියේ ගරු විදුලිබල ඇමතිතුමා පාර්ලිමේන්තුවට පොරොන්දු වුණා, යුගදනවි ගිවිසුමත්, ඒ වාගේම LNG terminal එකයි, නළ පද්ධතියට අදාළ ටෙන්ඩර්වල documents ටිකයි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. නමුත්, මේ වෙනතුරු ඒවා ඉදිරිපත් කර නැහැ. මේ සතියේ ඒ ලියකියවිලි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (විදුලිබල අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - மின்சக்தி அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Power)
ගරු මන්ත්‍රීතුමනි, ඒවා ඉදිරිපත් කරනවා. ලබන සතිය විතර වෙයි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් මට පැහැදිලි කර ගැනීමක් කරගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරක් ලබාදීම පිළිබඳව ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර තුළ සඳහන් වුණා, GSMB එක සහ තව පෞද්ගලික ආයතනයක් මේ කැණීම් කටයුතුවලට සම්බන්ධයි වාගේ කථාවක්. GSMB එක විතරයිද, මේකේ කැණීම් කටයුතු කරන්නේ? නැත්නම් තවත් ආයතනයක් මේකට සම්බන්ධයිද? මට ඒ ගැන පොඩි අපැහැදිලිතාවක් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, දැනට අපි මේ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයත්, GSMB තාක්ෂණික සේවා සමාගමත් සමඟ. ඒ කියන්නේ, GSMB යටතේ තිබෙන, සියයට සියයක් රජය සතු සමාගම සමඟ. දැනට අපේ බලාපොරොත්තුව තිබෙන්නේ මේ ආයතන දෙක පමණක් එකතු වෙලා රජයේ මුදල්වලින් මේ කටයුත්ත ආරම්භ කරන්න. හැබැයි, මේකට කොච්චර මුදලක් වැය වෙනවාද කියලා තවම ඇස්තමේන්තු කරලා නැහැ. යම් ආකාරයකින් වෙනත් පාර්ශ්වයක් මේකට සම්බන්ධ කර ගන්නවා නම් අපි ඒ පිළිබඳව පාර්ලිමේන්තුවත්, ඔබතුමන්ලාත් දැනුවත් කර තමයි ඒ කටයුත්ත කරන්නේ. දැනට අපේ සූදානම සම්පූර්ණයෙන්ම රජයෙන් මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්නයි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මේ සිදුවීම පිළිබඳව පාර්ලිමේන්තුවේ කියන්න වෙච්ච එක ගැන මම කනගාටු වෙනවා. ඊයේ ඇති වෙච්ච සිදුවීම් එක්ක පොලීසියේ මර්දනය හමුවේ ඇඹිලිපිටියේ මා

නියෝජනය කරන කොළොන්න ප්‍රදේශය ආසන්නයේ පනාමුරේ පොලිස් බල ප්‍රදේශයේ තරුණයෙකුට පොලීසිය ගහලා, ඔහුව පොලිසිය ඇතුළට අරගෙන ගිහින් තිබෙනවා. මේ වනකොට ඔහු මිය ගොස් තිබෙනවා. ඉන්දික ජයරත්න කියන තරුණයාගේ දේහය මේ වන විට පනාමුර පොලිසියේ තිබෙනවා. මේ වන විට පොලිසිය වට කරලා තිබෙන්නේ. පොලීසිය භාර ඇමතිතුමා දැන් මෙතැන ඉඳලා ගියා. අපි මේ කාරණය අද පාර්ලිමේන්තුවට දැනුම් දෙනවා. මේ විධියට ආරම්භ කරලා තිබෙන්නේ, මේ ගමන කොතැනට යන්නද කියන එක ඔබතුමා ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු විධියට අවබෝධ කර ගන්න. අහිංසක තරුණයෙක් මරලා තමයි පටන් ගත්තේ. ඒ තරම් නරක තැනකට පොලිසිය පත් කරන්න පාලකයෝ කටයුතු කළාද කියන එක මම අහනවා. මේ වෙන කොට මිනිසුන් දාහක්, දෙදාහක් පොලිසිය වටකරලා තිබෙනවා. රාජ්‍ය සම්පත් විනාශ වෙනවා; ගමක් කුපිත වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය අහන නිසා ඇමතිතුමා මහ ඇරලා ගියා. ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර ඒ පිළිබඳව ඉතාම කඩිනමින් පරීක්ෂණයක් පවත්වලා, සාධාරණය ඉටු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මිනීමරුවන් අල්ලන්න. මිනීමරුවන් කවුද කියලා - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. දැන් ඒ ප්‍රශ්නය යොමු කළා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම වැදගත් සාක්ෂියක් දෙන්න හදන්නේ, ගරු කථානායකතුමනි. අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒ ප්‍රශ්නය යොමු කළා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මිනීමරුවා කවුද කියලා කියන්නම්. ඔබතුමා ඒකට ඉඩ දෙන්න. ගරු කථානායකතුමනි, විනාඩියක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමනි, අපි මේ උද්සෝෂණය නීත්‍යානුකූලව කළා. ඒකට අපට අධිකරණයෙන් අවසරය දුන්නා. පොලිසිය භාර ඇමතිවරයා තමයි ඒ උද්සෝෂණය කරන්න ඉඩ නොදී ඒක වළක්වන්න පොලීසිය දැම්මේ. ඒක නිසා මිනීමරුවා වෙන කවුරුවත් නොවෙයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන කාරණය මේ වෙලාවේ කියනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ජනතාවගේ අධිකරණ බලය පාර්ලිමේන්තුව විසින් තමයි උසාවිවලට දෙන්නේ. ඔබතුමා ඒක හොඳට දන්නවා. උසාවිවලින් දෙන තීන්දු ගැන අපි පාර්ලිමේන්තුවක් හැටියට අවධානයෙන් ඉන්න ඕනෑ. ඊයේ සමඟි ජනබලවේගයේ ප්‍රබලයන් විරෝධතා ව්‍යාපාරයක් සංවිධානය කළා. උසාවිවලින් ඒ එකක් දෙකක් තහනම් කළා. උසාවි එකකින්, දෙකකින් තමයි ඒ තහනම් හම්බ වුණේ. සියයට 90ක්ම ඒ විරෝධතා ව්‍යාපාරය තහනම් කළේ නැහැ. එහෙම තිබෙද්දී, පොලිස්පතිවරයා බලය අතට අරගෙන ඒ උද්සෝෂණ වළක්වන්න පියවර අරගෙන තිබෙනවා. මහනුවර, මගේ ආසනයේත් "මේක උසාවියෙන් තහනම් කරලා තිබෙනවා" කියලා මිනිස්සු භය කරලා ඇත්ත වශයෙන්ම අවුල් ජාලාවක් ඇති කළා. අපි තමයි ඒක සංවිධානය කළේ. ඒවා වැළැක්වීම අපේ වරප්‍රසාද කඩවීමක්. මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමා තමයි අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. පොලිස්පතිවරයාට බැහැ බලය අතට ගන්න.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඊයේ වෙච්ච සිද්ධි තුළ විශාල හිරිහැරයක් ජනතාවට සිද්ධ වුණා. මොන නීතිය යටතේද පොලිස්පති චක්‍රලේඛ නිකුත් කරලා ඒ උද්සෝෂණ වළක්වන්න ක්‍රියාත්මක කළේ? මේ රටේ ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය කරනවා, පොලීසිය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් ඇති. මොකද, මෙය දැන් විවාදයකට යනවා. විවාදයකට වෙන දවසක් ගන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, දක්ෂිණ ලංකාවට ප්‍රවිෂ්ට වන තැන ඔබතුමා හොඳට දන්නවා. ඒ තමයි, බෙන්තර. බෙන්තර පාලම ගිලා බහිනකොට අපේ රජය කාලයේ අලුත් පාලමක් හදපු තැන. බෙන්තර කියන්නේ, සංචාරක පුරවරයක්. රජයේ අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා ඊයේ අතිවිශාල පිරිසක් හිරිහැරයට පත් වුණා. එතැන barriers දාලා නිසා වාහන විශාල ප්‍රමාණයක් එක දිගට පෝළිමේ පැය ගණනක් නතර කරලා තිබුණා. අපේ මිනිස්සු නිරායුධව, බොහොම අවිහිංසාවාදී විධියට තමන්ගේ දුක කියන්න කොළඹට එන්න හදනකොට ඒ බස්වලින් බස්සවලා, පැය ගණනක් රස්තියාදු කරවලා මුළු ප්‍රදේශයේම ජනතාවටත්, ඒ හරහා යන-එන මිනිසුන්ටත් විශාල හිරිහැරයක් කළා. අපි ඔබතුමාට කියනවා ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඔබතුමන්ලා ඒ කාරණය සම්බන්ධයෙන් විවාදයක් ඉල්ලා ගන්න. අද ඒ ගැන කථා කරන්න බැහැ.

[ගරු කථානායකතුමා]

ප්‍රධාන වැඩ කටයුතු. විසර්ජන පනත් කෙටුම්පත 2022, සිව්වැනි වෙන් කළ දිනය.

විවාදය ඇරඹීම, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
## APPROPRIATION BILL, 2022

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***

***ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12]***

***"පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]***

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ]*

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [12th November]*

*"That the Bill be now read a Second time".- [The Hon. Basil Rohana Rajapaksa]*

*Question again proposed.*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් points of Orderවලට අවස්ථාව දුන්නා. වෙනත් දිනයක ඒ ගැන විවාදයක් ගන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, වෙනත් දවසක නොවෙයි. අද කියන්න ඕනෑ. හැම වෙලාවේම- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න. මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, අපි මේ කථා කරන්නේ මන්ත්‍රීවරුන් වන අපගේ අයිතිවාසිකමක් ගැන. ඊයේ පවත්වපු ඒ උද්ඝෝෂණයට විරුද්ධව තහනම් නියෝග ගන්න පොලිසිය උසාවි ගියාට උසාවිය ඒක පිළිගත්තේ නැහැ. කොළඹ නගරයේ කිසිම උසාවියක් තහනම් නියෝගය දෙන්නේ නැති නිසා, පොලිස්පතිතුමා ඊයේ මුළු දවසේම කොළඹ නගරයේ එක වාහනයක් නවත්වන්න දුන්නේ නැහැ. කොළඹ නගරයේ වාහන නවත්වන්න දුන්නේ නැහැ, අයින් කළා; parking නැවැත්තුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඒ කාරණය ගැන දැන් පොලීසියට පැමිණිල්ලක් කරලා තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

***(මේ අවස්ථාවේදී සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් පිරිසක් පුවරු ප්‍රදර්ශනය කරමින් නැඟී සිටියහ.)***

*(இச்சந்தர்ப்பத்தில் ஐக்கிய மக்கள் சக்தி உறுப்பினர்கள் பதாகை களைக் காட்சிப்படுத்திவாறு எழுந்து நின்றனர்.)*

*(At this stage, some Members of the Samagi Jana Balawegaya rose displaying placards.)*

[පූ.භා. 10.12]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, අද මට කථා කරන්න විනාඩි 15ක කාලයක් වෙන් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි දැක්කා මේ රටේ ගොවියෝ, රජයේ සේවකයෝ, කර්මාන්තකරුවෝ ඇතුළු සියලු ජනතාව නැඟී ඉඳලා රජයට විරුද්ධව උද්ඝෝෂණය කරනකොට මේ රජය මොනවාද කළේ කියලා. මේ රජය පොලීසිය දාලා ඒක මර්දනය කරන්න ගියා. රජය අද හොඳටම සමගි ජන බලවේගයටයි, ජනතා රැල්ලටයි භය වෙලා තිබෙනවා. පොලීසිය ගියා තහනම් නියෝග ගන්න අධිකරණයට. පොලීසිය අධිකරණයට ගියාට පස්සේ අධිකරණය ඒවා ප්‍රතික්ෂේප කළා; අධිකරණය පොලීසියේ කියපු දේවල් ප්‍රතික්ෂේප කළා. *[බාධා කිරීම්]* පොලීසිය කියපු දේවල් ප්‍රතික්ෂේප කළාම පොලිස්පති මොනවාද කළේ? පොලීසිය භාර ඇමතිතුමනි, බොහොම ලජ්ජයි. තමුන්නාන්සේලා දේශපාලනය කළාට කමක් නැහැ. දැන් පොලීසියේ උදවිය දමලා මේ රටේ දේශපාලනය කරන්න යනවා. *[බාධා කිරීම්]* අද ඇමතිතුමා පැනලා ගියා. පොලීසිය දමලා තිබෙනවා, දැන් දේශපාලනය කරන්න. අපි දන්නවා, තමුන්නාන්සේලාට -පොහොට්ටුවට- මිනිස්සු නැහැ. මිනිස්සු නැති වුණාම අද පොලීසිය දමලා අපේ නායකයන්ගේ, අපේ ප්‍රාදේශීය නායකයන්ගේ ගෙවල්වලට ගිහිල්ලා තමුන්නාන්සේලා තර්ජනය කළා. බොහොම ලජ්ජයි. බොහොම ලජ්ජයි. ඒ විතරක් නොවෙයි. එන බස් මඟදී නැවැත්තුවා. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාත් කිව්වා, ඊයේ ඒකට එන්න ආපු ළමයෙකුට ඇඹිලිපිටියේදී පොලීසිය ගහලා, මරලා තිබෙනවා. මේකද, ප්‍රජාතන්ත්‍රවාදය? මේකද, තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදය? මෙන්න පොලිස්පතිගේ චක්‍රලේඛය. පොලිස්පති පත් කරලා තිබෙන්නේ මේ රටේ නීතිය හා සාමය

ආරක්ෂා කරන්න. පොලිස්පතියි, ඒ හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරුයි වැඩි පිරිසක් 'සිරිකොතේ' නිදා ගත්ත මිනිස්සු. *[ඝෝෂා කිරීම්]* එක පොලිස්පතිවරයෙක්- *[ඝෝෂා කිරීම්]* ඒ දවස්වල එක්සත් ජාතික පක්ෂයේ, ඒ කාලයේ සමගි ජන බලවේගයේ. දැන් තමුන්නාන්සේලා කරන්න තිබෙන ඔක්කොම තුප්පහිකම්, ඔක්කොම දේවල් කරනවා. මොනවාද මේකේ තිබෙන්නේ? කොළඹට, බස්නාහිරට පැමිණෙන සියලු බස් නවත්වන්න කියලා තිබෙනවා. *[ඝෝෂා කිරීම්]* අයියෝ! *[ඝෝෂා කිරීම්]* ලජ්ජයි. *[ඝෝෂා කිරීම්]* ඔන්න එනවා! මා තමුන්නාන්සේගෙන් අහනවා,- *[ඝෝෂා කිරීම්]* තමුන්නාන්සේලාට මේ මහජන රැල්ල පොලීසිය දාලා නවත්වන්න බැහැ. *[ඝෝෂා කිරීම්]* අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. එක උද්ඝෝෂණයක් වෙනුවට උද්ඝෝෂණ සියයක් පවත්වන්න අපට පුළුවන්කම ලැබුණා. උද්ඝෝෂණ සියයක් පවත්වන්න පුළුවන්කම ලැබුණා. *[ඝෝෂා කිරීම්]* අන්න,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කථා කරනවා. *[ඝෝෂා කිරීම්]* තමුන්නාන්සේලාගෙන් අපි අහනවා,- *[ඝෝෂා කිරීම්]* අණ්ඩුවට පුළුවන්ද අප වළක්වන්න? *[ඝෝෂා කිරීම්]* අප මර්දනය කරන්න පුළුවන්ද? *[ඝෝෂා කිරීම්]* අපි පොලීසියට කියනවා, කරුණාකරලා රාජකාරිය කරන්න කියලා. *[ඝෝෂා කිරීම්]* අපේ උද්ඝෝෂණයට, ජනතාවගේ විරෝධතාවට, ජනතාවගේ භාෂණයේ නිදහසට විරුද්ධව කටයුතු කරපු අයට නීති මාර්ගයෙන් කටයුතු කරන්න අවශ්‍ය පියවර අපි ගන්නවා. *[ඝෝෂා කිරීම්]* ආණ්ඩුව භයයි. ආණ්ඩුව භයයි. *[ඝෝෂා කිරීම්]* භයයි, භයයි. *[ඝෝෂා කිරීම්]* මේ චක්‍රලේඛයේ තිබෙන්නේ මොනවාද? කොළඹට පැමිණෙන බස් රථ නවත්වන්න ඕනෑය කියා තිබෙනවා. මොනවාද මේ චක්‍රලේඛයේ තිබෙන්නේ? පොලීසිය යොදවා බස් ටික ආපසු හරවා යැව්වා. උසාවිය මේ උද්ඝෝෂණය තහනම් කරලා නැහැ. ලංකාවේ අධිකරණවලින් සියයට 90ක් අපට අවසර දීලා තිබෙනවා, පොලීසිය ඉල්ලා තිබෙන ඉල්ලීම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. අධිකරණය එසේ කරද්දී, මහජන ආරක්ෂක ඇමතිතුමනි, තමුන්නාන්සේ පොලීසිය යොදවා අපේ විරෝධතාව කඩාකප්පල් කරන්න ගියා. නමුත් දසදහස් ගණනක පිරිසක් කොළඹට ඇවිල්ලා ආණ්ඩු විරෝධී බව පෙන්නුවා. *[ඝෝෂා කිරීම්]*

ඒ විතරක් නොවෙයි. ලක්ෂ ගණනක පිරිසක් මඟ සිටියා. බෙන්තර පාලම ළඟ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් එක්ක, මහනුවර ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් එක්ක, අනුරාධපුරය, ගල්නෑව, කුරුණෑගල, මොනරාගල, ගිනිගත්හේන, කලුතර, පොළොන්නරුව යන හැම තැනකම දහස් ගණනක පිරිසක් සිටියා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව අපි තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. අපි එක උද්ඝෝෂණයයි කරන්න ගියේ. තමුන්නාන්සේ අපට උද්ඝෝෂණ 100ක් කරලා දුන්නා. අපේ ගරු සරත් වීරසේකර ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, අපේ උද්ඝෝෂණය සාර්ථක කර ගන්න, වඩ-වඩාත් සාර්ථක කර ගන්න එතුමා අපට ලොකු උදව්වක් කිරීම ගැන. මා හිතන්නේ තමුන්නාන්සේ එහෙම කළේ අපේ පාසලේ යාළුවෙක් නිසා වෙන්න ඇති කියලායි. එක උද්ඝෝෂණය, උද්ඝෝෂණ සියයක් කළා. පෙනෙනවා නේද, රජයට තිබෙන විරෝධය? ආණ්ඩුවට තිබෙන විරෝධය? *[ඝෝෂා කිරීම්]* ගොවියෝ පාරට බැහැලා, රජයේ සේවකයෝ පාරට බැහැලා, රටේ සාමාන්‍ය ජනතාව පාරට බැහැලා. *[ඝෝෂා කිරීම්]* ඒ අස්සේ තමුන්නාන්සේලා රටේ දේපොළ විකුණනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කොමිස් ගන්නවා. *[ඝෝෂා කිරීම්]* තෙල් ටික ගෙනෙන්න, බොර තෙල් ගෙනෙන්න ටෙන්ඩර් කැඳෙව්වාම ලෝකයේ ටෙන්ඩර්කරුවෝ ටෙන්ඩර් දමන්නේ නැහැ. ඒ අය ටෙන්ඩර් දමන්නේ නැත්තේ ඇයි? තමුන්නාන්සේලාගේ රජය කෙරෙහි විශ්වාසයක් නැති නිසායි. මේ රට බංකොලොත් කරලා තිබෙනවා. බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ටෙන්ඩර් නැතුව මේවා ගෙනෙන්න බොහොම කැමැතියි. භාණ්ඩාගාරය භාර දීලා තිබෙන්නේ කාටද? භාණ්ඩාගාරය භාර දීලා තිබෙන්නේ, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටයි, අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයාටයි. නියම දෙන්නා. රටේ ඉතුරු ටිකත් ඉවර කරලා තමයි මේ ගොල්ලෝ නවතින්නේ. සමගි ජන බලවේගය මේ ආරම්භ කළා විතරයි, අපි ඊළඟ වතාවේ ආණ්ඩුව එළවන්න කොළඹ පිරෙන්න සෙනඟ ගෙනෙන්න කටයුතු කරනවා. *[ඝෝෂා කිරීම්]* අපි ලැහැස්තියි. *[ඝෝෂා කිරීම්]* අපි ලැහැස්තියි. අද මට පේනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එක්කෙනෙක් දෙදෙනෙක් ඇරෙන්න කවුරුවත් මේක බේරා ගන්න කටයුතු කරන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලාගෙන් අපි නැවත, නැවත ඉල්ලනවා,*[ඝෝෂා කිරීම්]* නැවත නැවත ඉල්ලනවා, ජනතාවගේ හඬට ඇහුම්කන් දෙන්න කියලා. අපි ඊයේ පාරට බැහැලා කිව්වේ ගොවීන්ට පොහොර ටික දෙන්න කියලායි. ආණ්ඩුවට අපි දැන් පාර්ලිමේන්තුවේදී කියනවා ගොවීන්ට පොහොර ටික දෙන්න කියලා. හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් කියනවා, පොහොර ටික දෙන්න කියලා. අන්න එතුමා අත්පුඩි ගහනවා. *[ඝෝෂා කිරීම්]* අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හතළිහකට වැඩිය එළියට බහින්න ලැහැස්ති වෙලයි ඉන්නේ. අපි කියනවා මේ ආණ්ඩුවට එච්චර ආයුෂ නැහැ කියලා. ඒක තමයි අද කට වහගෙන ඉන්නේ. අර මුසම්මිල් මන්ත්‍රීතුමා වාගේ එක්කෙනෙක්, දෙදෙනෙක් බොරුවට කෑගහනවා. එක්කෙනෙක් දෙදෙනෙක් යන එන මං නැතිව බොරුවට කෑගහනවා. *[ඝෝෂා කිරීම්]* යන එන මං නැතිව. ඔබතුමාගේ නායකයා කියනවා, මේක තක්කඩි ආණ්ඩුව කියලා. කවුද කියන්නේ? විමල් වීරවංශ ඇමතිතුමා. ආණ්ඩුවේම කට්ටිය කියනවා අද- *[ඝෝෂා කිරීම්]* මම අහන්නේ තමුන්නාන්සේලාගෙන්. ඔබතුමන්ලා කරගත්ත ලොකුම දේශපාලන මෝඩකම ඊයේ කරගත්තා.*[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිතව තිබුණු කාලය අවසානයි.*[ඝෝෂා කිරීම්]* ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි. ගරු මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා. *[ඝෝෂා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

එතුමාට අපේ වෙලාවෙන් විනාඩි පහක් දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි සන්තෝෂ වෙනවා. සමඟි ජන බලවේගයට කොච්චර හයද කිව්වොත් රටේ හැම නගරයකම, හැම පාරකම barriers දමලා *[ඝෝෂා කිරීම්]* Barriers දමලා තමුන්නාන්සේලා කටයුතු කළේ. ලජ්ජයි. ආණ්ඩුව හොඳටම භය වෙලා. ආණ්ඩුවට කටඋත්තර නැතිව ඉන්නේ. මම කියන්නේ, පාස්කු ඉරිදා සිද්ධිය සම්බන්ධ අය අල්ලන්නේ නැහැ. Barriers දමන්නේ අපිව අල්ලන්න. අල්ලන්නකො පාස්කු ඉරිදා ඒවා. ඇඹිලිපිටියේ තරුණයා මරපු එකේ වගකීම ආණ්ඩුව, මේ ඇමතිවරයා භාර ගන්න ඕනෑ. පොලිසිය ගහලා මැරිලා තිබෙන්නේ. *[ඝෝෂා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]* මරු බොඩි ගාඩ්ලා ටික.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අනේ! අද ආරක්ෂා කරන්නත් කට්ටිය නැහැ. අපි කියනවා, තමුන්නාන්සේලාට අවුරුදු 5ක් මේ රටේ ආණ්ඩු බලයේ ඉන්න දෙන්නේ නැහැ කියලා. අවුරුදු 5ක් යන්න ඉස්සල්ලා මේ ආණ්ඩුව ගෙදර යවලා රටට අවශ්‍ය, ජනතාව ඉල්ලන ආණ්ඩුවක් ගේන්න කටයුතු කරන බව තමුන්නාන්සේලාට මම මතක් කරනවා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අනාගත අගමැතිතුමා දැන් වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.

[පූ.භා. 10.22]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
ගරු කථානායකතුමනි, 2022, විසර්ජන පනත් කෙටුම්පතේ දෙවනවර කියවීමේ විවාදයට සම්බන්ධ වෙමින් අද රටේ පවතින ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් සහ රජයේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මූලික වශයෙන් අවධානය යොමු කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අපි රටක් විධියට අද මුහුණ පා තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි දුගී භාවය. දුගීභාවය තුරන් කිරීම සඳහා පසු ගිය වසර 50කට 60කට වැඩි කාලයක් රටේ සෑම ආණ්ඩුවක්ම නොයෙකුත් අත්හදා බැලීම්, විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. සහනාධාර දීම් කළා, තවමත් කරනවා. ඒ අනුව දුගීභාවය සම්බන්ධයෙන් සෑම රජයක්ම විවිධ වැඩසටහන් -ජනසවිය වෙන්න පුළුවන්, සමෘද්ධි වෙන්න පුළුවන්,සහනාධාර වෙන්න පුළුවන්- ක්‍රියාත්මක කළා. මේ කුමන කරුණු සැලකිල්ලට ගත්තත් අද වෙනකොට ජනතාව දුගීභාවය කියන ප්‍රධාන ප්‍රශ්නය තුළ පීඩාවට පත් වෙලා සිටිනවා. මේක දවසකින් දෙකකින්, ඊයේ පෙරේදා ඇති වුණු දෙයක් නොවෙයි. ප්‍රධාන වශයෙන්ම දුගීභාවය සඳහා බලපෑ කරුණු කාරණා පිටුපස ලෙඩ රෝග, සෞඛ්‍ය ප්‍රශ්න බරපතළ විධියට බලපා තිබෙනවා. ඕනෑම දුප්පත් රටක ආර්ථික අමාරුකම් හා දුගීභාවය වැඩි වෙන්න වැඩි වෙන්න ලෙඩ රෝග, වසංගත වැනි නොයෙකුත් තත්ත්වයන් ඇති වෙනවා. ගරු කථානායකතුමනි, අද අපේ රටේ ජනගහනයෙන් මන්ද පෝෂණයට ලක් වූ ජනතාවගේ ප්‍රමාණය සියයට 17කට වැඩියි. එය මීට වසර 15ක, 20ක විතර සිට තිබෙන තත්ත්වයක්. මූලික වශයෙන්ම රටක මන්ද පෝෂණය තුරන් කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීම ඉතා වැදගත් වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රමුඛ රජයේ විවිධ අංශ පසුගිය අවුරුදු 25ක, 30ක කාලය තුළ මන්ද පෝෂණය සම්බන්ධයෙනුත් යම් යම් පර්යේෂණ කරලා තිබෙනවා; ඒ සඳහා පිළියම් යොදා තිබෙනවා; යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. නමුත් අපේ රටේ මන්ද පෝෂණ තත්ත්වය අඩු කර ගන්න අපට පුළුවන්කමක් ලැබිලා නැහැ. සියයට 17කට වැඩි පිරිසක් මන්ද පෝෂයෙන් පෙළෙනවා වාගේම, රටේ ජනගහනයෙන් සියයට 35කට වඩා දියවැඩියා රෝගයට ගොදුරු තිබෙනවා. දියවැඩියාව, අධි රුධිර පීඩනය රටේ එන්න එන්න වර්ධනය වෙනවා. පසුගිය දශක කිහිපයේ ජාතික සෞඛ්‍ය දර්ශක ගත් විට සෑම අවුරුද්දකම ඒවායේ තිබෙන්නේ බරපතළ වැඩිවීමක්, වර්ධනයක් නැත්නම් ප්‍රවණතාවක්.

ගරු කථානායකතුමනි, පිළිකා රෝගීන්ගේ තත්ත්වය ගත්තත් ඒ වාගේම තමයි. අද සාමාන්‍ය උණක් හෙම්බිරිස්සාවක් හැදෙන රෝගීන්ගේ ගණනට පිළිකා රෝගීන් වැඩි වෙන්න පටන් ගෙන තිබෙනවා. වකුගඩු රෝගීන්ගේ තත්ත්වය ගත් විට මූලික වශයෙන්ම අපි අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්ත සහ තොරතුරු අනුව, වකුගඩු රෝගීන් වැඩියෙන්ම බස්නාහිර පළාතෙන් වාර්තා වෙන්නේ. බස්නාහිර පළාතෙන් වකුගඩු රෝගීන් වැඩියෙන්ම වාර්තා වීමට ප්‍රධානම හේතුව තමයි, දියවැඩියාව, අධි රුධිර පීඩනය, විෂ මත් ද්‍රව්‍ය, කසිප්පු, අරක්කු, වෙනත් විෂ මත් ද්‍රව්‍ය, දුම්බීම, මත්කුඩු භාවිතය වැනි තත්ත්වයන්. ඒ වාගේම, ශරීරයේ ඇති වෙන විවිධ ආසාදන, වෙනත් විවිධ රෝග නිසාත් වකුගඩු රෝගයට ලක් වෙනවා. මේ තත්ත්වය සැලකිල්ලට අරගෙන එක එක රෝගීන් - දියවැඩියා රෝගීන්, මන්ද පෝෂණයට ලක් වූ රෝගීන්, පිළිකා රෝගීන්, වකුගඩු රෝගීන්, ආඝාතයට ලක් වූ රෝගීන්, හෘදය රෝගීන්- කොච්චර ඉන්නවාද කියලා අපි ගණන් හදලා බැලුවොත් අපට සෘජුවම කියන්න පුළුවන් ගරු කථානායකතුමනි, අපේ ජනගහනයෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක් අවම වශයෙන් දවසකට පැරසිටමෝල් පෙත්තක් හෝ ගන්නවා කියලා. ඒ විධියට, මේ රටේ ජනගහනයෙන් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් විවිධ රෝගාබාධවලට, ආබාධිත තත්ත්වයන්ට ලක්වෙලා තිබෙනවා. දුගීභාවය කියන ප්‍රශ්නය එම සියලු රෝගවලට තදින්ම බලපාන කාරණයක් වෙලා තිබෙනවා. සෑම විටම සෑම ආණ්ඩුවක්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා මේ තත්ත්වයන්ට පිළියම් යෙදීම කරලා තිබෙනවා. මේ ආණ්ඩුවත් කරනවා. නමුත්, අපට තිබෙන ප්‍රශ්නය මේකයි. අපි අතිවිශාල වශයෙන් සල්ලි වියදම් කරන්නේ -වෙන් කරන්නේ- ප්‍රතිකාර සඳහායි. ඒ කියන්නේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය ගොඩනැඟිලි හදන්න, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය බෙහෙත් ගෙන්වන්න, අධි තාක්ෂණික උපකරණ ගෙන්වන්න, අවශ්‍ය මානව සම්පත ඇති කරන්න. වාර්ෂික අය වැයකින් සෞඛ්‍ය සඳහා වෙන් කරන මුදලින් සියයට 95ක්ම ලබා දෙන්නේ ප්‍රතිකාර අංශ සඳහායි. නමුත්, රටේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් වේගයෙන් රෝගීන් වීම වැළැක්වීම සඳහා ලෝකයේ සංවර්ධනය

වූ රටවල් අනුගමනය කළ ප්‍රතිපත්තිවලදී මූලික වශයෙන්ම ප්‍රාථමික සෞඛ්‍ය සේවාවට ප්‍රධානත්වය දීලා තිබෙනවා.

අපේ රටේ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවට වෙන් කරන මුදල ඉතාම අඩුයි. ප්‍රාථමික සෞඛ්‍ය සේවාව තුළ තමයි, රෝග නිවාරණය, රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය උපදෙස් ග්‍රාමීය මට්ටමේ සිට ලබා දෙන්නේ. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි වෙන්න පුළුවන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙන්න පුළුවන්, MOH, නැත්නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙන්න පුළුවන්, ඔවුන් කරන සේවය සැලකිල්ලට ගත් විට දැනට ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ කටයුතුවලට අප විසින් මීට වඩා දායකත්වයක්, වැඩි ආයෝජනයක් කිරීම අනාගතයේදී මේ රටේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම සඳහා ඉතාම වැදගත් වෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

මේ රටේ දුගීභාවය නැති කිරීමට එක් පැත්තකින් ලෙඩ රෝග අවම කරගැනීම අවශ්‍යයි. අනෙක් පැත්තෙන්, සුදුසු ආහාර පාවිච්චි කිරීම සහ පිට රටින් ආහාර ගෙන්වීම වළක්වා ගැනීම කළ යුතුයි. දැන් රජය බොහෝ දේවල් පිට රටින් ගෙන්වීම අවම කර තිබෙනවා. එසේ කළේ ඩොලර් ප්‍රශ්නය මත වුණත්, ප්‍රතිපත්තියක් වශයෙන් වුණත් එය ඉතාම හොඳ දෙයක්. අපි වාර්ෂිකව වියළි මිරිස් මෙට්‍රික් ටොන් 10,000කට වඩා පිටරටින් මෙරටට ගෙනෙනවා. ඒ වාගේම අපේ රටේ වගා කළ හැකි බොහෝ දේවල් අපි පිටරටින් ගෙනෙනවා. අද රට තුළ තිබෙන සහල් ප්‍රශ්නය සහ අනෙක් ආහාර ප්‍රශ්න සැලකිල්ලට ගත් විට පසුගිය දශක පහ-හය තුළ අපිට ඒ සම්බන්ධයෙන් යම් ඉතිහාසයක් තිබෙන බව පෙනී යනවා.

1965-70 ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ කාලයේ -ඒ ආණ්ඩුව තුළ- අපේ රටේ ආහාර නිෂ්පාදනයට, විශේෂයෙන්ම සහල් නිෂ්පාදනය සඳහා ගොවි හමුදාවක් හැදුවා. ඒ ගොවි හමුදාව තුළ ප්‍රමුඛත්වය දුන්නේ රටේ ආහාර නිෂ්පාදනයටයි. 1970දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය බලයට පත් වුණා. ඒ කාලය වනවිටත් මේ රටේ ප්‍රධාන වශයෙන්ම ආහාර හිඟයක් තිබුණා; සහල් ප්‍රශ්නයක් තිබුණා. ඔබට මතක ඇති, 1970 මැතිවරණයේදී බණ්ඩාරනායක මැතිනිය සහල් සේරු දෙකක් නොමිලේ දෙනවාය කියපු වේලාවේ එදා විපක්ෂය ඇහුවා, "මෙච්චර හාල් හිඟයක් තියෙද්දී සිරිමා කොහොමද, හාල් සේරු දෙකක් නිකම් දෙන්නේ?" කියලා. ඒ වේලාවේ බණ්ඩාරනායක මැතිනිය විහිළුවට වාගේ මැතිවරණ වේදිකාවලදී කිව්වා, "හඳෙන් ගෙනැල්ලා හරි හාල් සේරු දෙකක් දෙනවා" කියලා.

විශේෂයෙන්ම බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව මේ රටේ ආහාර නිෂ්පාදනය සඳහා ගත් වැදගත් තීන්දු තීරණ රාශියක් තිබෙනවා. අද සහල් ඒකාධිකාරය, ආහාර හිඟය, විදේශවලින් සහල් ඇතුළු අනෙක් බඩු භාණ්ඩ හා ආහාර ගෙන්වන එක ගැන කථා කරනවා. ඒ කාලයේත් මේ සියලු දේවල් මුල්කර ගෙන තමයි බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ ආහාර නිෂ්පාදන සංග්‍රාමයක් පටන් ගත්තේ. විශේෂයෙන් ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා කියන්නේ මේ රට තුළ සහ ජාත්‍යන්තර වශයෙන් ඉතාම ගෞරවයට පත් වෙච්ච අර්ථ ශාස්ත්‍රඥයෙක්. එදා එතුමා පැහැදිලි කළා, රට ඉස්සරහට ගෙනයන්න ඕනෑ නම් මොන විධියේ ආර්ථික ප්‍රතිපත්තියක් ද අනුගමනය කළ යුත්තේ කියලා.

ගරු කථානායකතුමනි, මම ප්‍රධාන වශයෙන් කිව යුතු තවත් කාරණාවක් තිබෙනවා. වත්මන් අගමැති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ගරු ජනාධිපති වශයෙන් කටයුතු කළ 2005-2010 කාල සීමාවේදී, "අපි වවමු-රට නගමු" වැඩසටහන දියත් කළා. ඒ තුළින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිෂ්පාදනය විශාල වශයෙන් ඉහළ ගියා. ඒ කාලයේ එක පැත්තකින් යුද්ධය තිබුණා. අනෙක් පැත්තෙන්, අපි මේ රටේ ජනතාවට අඩුවක් නැතිව ආහාර ලබා දීම සඳහා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ඒවා ඉතාම සාර්ථක වුණු වැඩසටහන්; සාර්ථක වුණු ගොවි ව්‍යාපාර.

මට මතකයි, මම කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට කටයුතු කළ කාලයේ "අපි වවමු - රට නඟමු" වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක ගණනේ මේ රටේ වප් මඟුල් උත්සව පමණක් 300කට වඩා පවත්වපු බව. ගොවි ජනතාව වාගේම නිලධාරින් උනන්දු කරවලා, ඒ අයට අවශ්‍ය මූලික සම්පත් ලබා දීලා, ඒ කටයුත්ත අපි සිදු කළා.

අද වස විෂ නැති ආහාර පිළිබඳව කථා කරනවා. අපි මේ පිළිබඳව වැඩිපුර අවධානය යොමු කිරීම අවශ්‍ය වනවා. රසායනික පොහොර යෙදූ ආහාර විෂ සහිතයි කියලා අද අපි කියනවා. ඒ වාගේම අපි ආහාරයට ගන්නා වෙනත් ආහාර විෂ සහිතයි කියනවා. ඊයේ "මව්බිම" පුවත් පතේ හොඳ ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. එම ප්‍රවෘත්තියේ මෙසේ සඳහන් වෙනවා:

"අනුරපුර ශික්ෂණ රෝහලේ පිළිකා රෝගීන් ගණන 20,000 සීමාවට
පිළිකා රෝගීන් වැඩිදෙනා තරුණ තරුණියන්
වකුගඩු රෝගීන් ගණන විසිදහස ඉක්මවලා
මාස 10ට පිළිකා රෝගීන් 1,400ක් හඳුනාගෙන
සම්පත් හිඟ අපේ රෝහලට මේ තත්ත්වය සුනාමියක්
- වෛද්‍යවරු පවසති"

මේ විධියට පිළිකා රෝගීන් වැඩි වන්නේ ඇයි? වකුගඩු රෝගීන් වැඩි වන්නේ ඇයි? මේ රෝගීන් වැඩි වන්නේ ආහාරවල තිබෙන ප්‍රශ්න නිසාමද? එහෙම නැත්නම් මේ රෝගවලට ලක් වන ජනතාවගේ ගතිපැවතුම් නිසාද? මේ කියන කරුණු කාරණා පිළිබඳව අපි රජයක් විධියට පුළුල් අධ්‍යයනයක් කළ යුතු වනවා. විශාල වශයෙන් වැඩි වන මේ පිළිකා, වකුගඩු තත්ත්ව මෙන්ම වෙනත් බෝ නොවන රෝග පිළිබඳව අපි රජයක් විධියට මීට වඩා මූලිකත්වය ගෙන කටයුතු කිරීම අවශ්‍ය වනවා. එහෙම නැති වුණොත් තව අවුරුදු 20ක්, 25ක් ගත වනවිට මේ රටේ සෑම කෙනෙකුම ලෙඩ්ඩු බවට පත් වන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

පොහොර ප්‍රශ්නය පිළිබඳවත් මම පැහැදිලි කරන්න ඕනෑ. මාධ්‍ය තුළත්, පාර්ලිමේන්තුවේදීත් -කිහිප තැනකම- කිහිප දෙනෙකු කියනවා මම අහගෙන හිටියා, රසායනික පොහොර ප්‍රශ්නය අවසන් කර රටම කාබනික පොහොරවලට යොමු වුණාම චීන පරිත්‍යාගවලින් හදපු පොළොන්නරුව වකුගඩු රෝහලෙන් වැඩක් නැහැ කියලා. වකුගඩු රෝගය පිළිබඳව කථා කරන විට මම මේ කාරණයත් කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, වෛද්‍යවරයෙකුගෙන් ඇහුවොත් කියයි, වකුගඩු රෝග කොච්චර තිබෙනවාද කියලා. වකුගඩු රෝග සිය ගණනක් තිබෙනවා. ඒ නිසා රජරට, එහෙම නැත්නම් හඳුනා නොගත් වකුගඩු රෝගයටම නොවෙයි, පොළොන්නරුවේ වකුගඩු රෝහල හැදුවේ. වර්තමාන රජය යටතේ එය "ජාතික වෘක්කවේද විශේෂිත රෝහල" ලෙසත් නම් කර තිබෙනවා. එසේ කිරීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. මොකද, දැන් මුළු රටේම වකුගඩු රෝගීන් එතැනට යනවා.

වකුගඩු රෝහල පිළිබඳව කියන විට මම ප්‍රධාන වශයෙන් කාරණා කිහිපයක් මතක් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එය විවෘත කරන්න ගිහිල්ලා අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරින්ට එදා උපදෙස් දුන්නා, එම රෝහල මාස 3ක් ඇතුළත සියලු සේවා ඉෂ්ට වන තත්ත්වයට පත් කරන්න කියලා. එතුමා එය නියෝගයක් වශයෙන් තමයි කළේ. නමුත්, මම ඉතා කනගාටුවෙන් කියන්න ඕනෑ, ඒ රෝහලේ X-ray කාමර අද වනතුරු විවෘත කර නැති බව. එම රෝහලට

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

අධ්‍යක්ෂවරයෙකු පත් කරලා නැහැ. එහි රසායනාගාර - laboratories - විවෘත කරලා නැහැ. එහි කෝටි 15ක විතර CT scan යන්ත්‍රයක් තිබෙනවා. නමුත්, තවම ඒ කාමරය වසා තිබෙනවා. තවම ඒවා පටන් ගෙන නැහැ. ඒ වාගේම, වකුගඩු බද්ධ කරන - kidney transplant කරන - operation theatres 6ක් තිබෙනවා. අද වනතුරු ඒවා ක්‍රියාත්මක නැහැ. අඩුම වශයෙන් එම රෝහලට අධ්‍යක්ෂවරයෙකු පත් නොකිරීම ඉතා බරපතළ ප්‍රශ්නයක්. මේ රටේම ජනතාව පොළොන්නරුව වකුගඩු රෝහල දිහා බලාගෙන ඉන්නවා, එයින් ප්‍රයෝජන ගැනීම සඳහා; ප්‍රතිකාර ගැනීම සඳහා. මම පසුගිය සතියේ අමාත්‍යාංශයටම ගිහිල්ලා සෞඛ්‍ය ඇමතිතුමාත් හමු වුණා. මම මේ තත්ත්වය පැහැදිලි කළා. මේ කාරණා සම්බන්ධයෙන් අප මොන විධියට ද කටයුතු කළ යුත්තේ කියන කාරණාවේදී මේ ප්‍රශ්නවලට අප ගන්නා වූ ක්‍රියා මාර්ග ඉතා වැදගත් වෙනවා.

පොහොර පිළිබඳව කථා කරන විට, රසායනික පොහොර සහ කාබනික පොහොර භාවිතය සම්බන්ධයෙන් අද ගොවි ජනතාවගේ පැත්තෙන් බරපතළ, අසහනකාරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මා හිතනවා, පොහොර සම්බන්ධයෙන් රජයේ ඉදිරි වැඩ පිළිවෙළ මොකක්ද කියන එක ගැන ගොවි ජනතාවට පැහැදිලි කර දීම රජයේ වගකීමක් කියලා. දැන් පිට රටින් nano fertilizer ආවා; ඒ වාගේම, කාබනික පොහොර ආවා. ඒවා බෙදා හැරීම කරලා තිබෙනවා. නමුත් ඒ ගොවි ජනතාව සමඟ කථා කරන විට පෙනී යනවා, ඔවුන් එයින් තෘප්තිමත්භාවයට පත් වෙලා නැති බව. විශේෂයෙන්ම මේ කන්නයට වාගේම ඉදිරි කන්නවලටත් පොහොර ලබා දෙන්නේ මොන විධියටද කියන කාරණාව සම්බන්ධයෙන් -ඉදිරියේදී ගොවීන්ට පොහොර සැපයීම සම්බන්ධයෙන්- ගොවි ජනතාවට විශ්වාස කළ හැකි වැඩ පිළිවෙළක් ප්‍රකාශයට පත් කිරීම ඉතා අවශ්‍යයි, ගරු කථානායකතුමනි. ගොවි ජනතාව පත් වෙලා තිබෙන පීඩාව, දුක්ඛිත තත්ත්වය ගැන මම කලිනුත් කියා තිබෙනවා. එය ඉතා බරපතළ ඛේදවාචකයක තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. මේ තිබෙන ප්‍රශ්නවලට අප විසඳුම් දුන්නේ නැත්නම් රටේ ආහාර නිෂ්පාදනයේ විශාල අඩුවීමක් වෙන්න ඉඩ තිබෙනවා.

ඒත් එක්කම අපි බලන්න ඕනෑ, මේ තිබෙන තත්ත්වයන් සමඟ අපේ අනෙක් කටයුතු පිළිබඳව අවධානය යොමු කරන්නේ කොහොමද කියලා. අමාත්‍යාංශවල වැය ශීර්ෂවලට අදාළව එක් එක් අමාත්‍යාංශය සම්බන්ධයෙන් තිබෙන සටහන් බලන විට මා දැකපු දෙයක් තමයි, සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ මුදල් ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කිරීම. කොරෝනා වසංගත තත්ත්වය සම්බන්ධයෙන් -කොරෝනා තත්ත්වය මොන විධියට බලපායිද කියන කාරණය සම්බන්ධයෙන්- අපට තවම කියන්න පුළුවන්කමක් නැහැ. අද බටහිර රටවල් එම වසංගතයට නැවත මුහුණ දීම සඳහා කටයුතු පටන් ගෙන තිබෙනවා. බටහිර රටවල කොවිඩ් ව්‍යාප්තිය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තත්, එහි යම් යම් ප්‍රදේශවල අද දවසේත් කොරෝනා රෝගීන් සැහෙන ප්‍රමාණයක් ඉන්නවා. ප්‍රධාන වශයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයට මුදල් වෙන් කිරීමේදී දැනට තිබෙන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් වෙන් කිරීම අත්‍යවශ්‍ය කාරණයක්.

දුගීභාවය කියන ප්‍රශ්නය, ලෙඩ රෝග, වසංගත ආදි සියලු කරුණු සැලකිල්ලට ගනිමින් මගේ රජය කාලයේ අපි "ග්‍රාම ශක්ති" නමින් ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. අපි ගම්මාන 10,000ක් තෝරාගෙන, ඒ ගම්මානවලට සල්ලි දීලා, පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන, පෞද්ගලික අංශයත්, රාජ්‍ය අංශයත් ඒකාබද්ධ වූ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. ඒ "ග්‍රාම ශක්ති" ව්‍යාපාරය, මගේ ආණ්ඩුව කාලයේ ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම කළ යුතුයි. දැන් තිබෙන ජීවනෝපාය වැඩසටහන්, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් මුදල් ලබා දෙන අතරතුර එවැනි වැඩසටහන් ද සෘජුව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මම දකිනවා.

ගරු කථානායකතුමනි, මම තවත් විශේෂ කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ රටේ මිනිසුන්ගේ දුගීභාවය, දුප්පත්කම, නැති බැරිකම පිළිබඳ ප්‍රශ්නය ගැන කථා කරද්දී මම අලුත්ම ප්‍රශ්නයක් කෙරෙහි රජයේත්, රටේ ජනතාවගේත්, විපක්ෂයේත් අවධානය යොමු කරවනවා. මොකක්ද ඒ අලුත්ම ප්‍රශ්නය? ඒක ඊයේ-පෙරේදා ආ ප්‍රශ්නයක් නොවෙයි. පසුගිය දශක කිහිපය තුළම තිබුණු, මේ වන විට බොහෝ වර්ධනය වෙලා තිබෙන ප්‍රශ්නයක්, මේක. මොකක්ද ඒ ප්‍රශ්නය? ඒ ප්‍රශ්නය තමයි, මේ රටේ තිබෙන බැංකු, මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම්, ලීසිං සමාගම් ජනතාවගේ දේපළ කොල්ල කන ආකාරයෙන් අද කටයුතු කිරීම.

බැංකුවලට අදාළව පනත් හදනකොට, මූල්‍ය සමාගම්, ෆිනෑන්ස් සමාගම් ආදිය සම්බන්ධයෙන් නීති රීති හදනකොට, රක්ෂණ සමාගම් සම්බන්ධයෙන් පනත්, නීති රීති හදනකොට, ලීසිං සමාගම් සම්බන්ධයෙන් නීති රීති හදනකොට, ඒ සෑම අවස්ථාවකදීම පසුගිය දශක කිහිපය තුළ මේ පාර්ලිමේන්තුවේදී කළේ ඒ ආයතන සම්පූර්ණයෙන් ශක්තිමත් කරන්න අවශ්‍ය පනත්, නීති රීති හදන එකයි. ඒ මිස ඒ ආයතනවලින් සේවය ලබා ගන්නාගේ -ගනුදෙනුකරුවාගේ- ණය ගැනීම්, උකස් තැබීම් වැනි කරුණු සැලකිල්ලට ගෙන නැහැ. ඒ කරුණු අතින්, ඉතාම දුක්ඛිත තත්ත්වයක් මේ රටේ තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, රක්ෂණ සමාගම් ආදිය සම්බන්ධයෙන් මා ඊයේ පෙරේදා සොයා ගත් කාරණයක් තිබෙනවා. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විශ්‍රාම ගියාම ඒ බොහෝ අය ලොකු පඩියක් දීලා රක්ෂණ සමාගම්වලට ගන්නවා. ඒ වාගේම, රක්ෂණ සමාගම්, එහි සේවය කරන ඇතැම් අය සේවය කරන අවස්ථාවේදීම වැඩි පඩියක් දීලා ඒකෙන් ඇදලා ගන්නවා. ඒ අනුව, රක්ෂණ සමාගම්වල ප්‍රධාන තනතුරුවල ඉන්නේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වැඩ කරපු අයයි. ගොඩනැඟිල්ලක් ගිනි ගත්තොත්, මිනී මැරුමක් වුණොත්, අපරාධයක්, මංකොල්ලයක් වුණොත්, වාහන අනතුරක් වුණොත්, ගෙයක් ගිනි ගත්තොත් ඒ හැම දෙයකටම රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාව ගන්න ඕනෑ. රස පරීක්ෂකවරයාගේ වාර්තාව අරගෙන, අදාළ දේපළ රක්ෂණය කරලා නම් ඒ වෙනුවෙන් ඒ වාර්තාව පදනම් කරගෙන වන්දි ගෙවීමක් කරනවා. මේක හරියට දැන් හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක් බවට වෙලා තිබෙනවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් රක්ෂණ සමාගම්වල ඉන්නවා. ඒ ගොල්ලන් එකතු වෙලා තමයි මේ වාර්තා සකස් කරන්නේ. මෙය මේ රටේ බරපතළ ප්‍රශ්නයක්. මේ තත්ත්වය තුළ දේපොළ උකස් කිරීම, ණය ගෙවන්න බැරිකම නිසා ඇති වෙලා තිබෙන අර්බුදය ආදී කාරණා නිසා මේ රටේ වාර්ෂිකව සිය දිවිනසා ගැනීම් ගණනාවක් වාර්තා වෙනවා. ලීසිං ප්‍රශ්න, ගෙවල් උකස් තැබීම්, ණය ගෙවා ගන්න බැරි වීම් වැනි තත්ත්වයන් නිසා වාර්තා වන සිය දිවි නසා ගැනීම් කොච්චරද කියලා පොලිස් දෙපාර්තමේන්තුවෙන් ඇහුවොත්, එවැනි සිය දිවි නසාගැනීම් සෑම වර්ෂයකම විශාල ප්‍රමාණයක් තිබෙන බව දැනගන්න පුළුවන් වෙයි.

ගරු කථානායකතුමනි, මේ කියන කරුණු අප සැලකිල්ලට ගත යුතුයි. එක්තරා ව්‍යාපාරිකයෙකු උදාහරණයට ගෙන මම මේ කාරණය ගැන කියන්නම්. මම අදාළ රක්ෂණ සමාගමේ නම කියන්නේ නැහැ. ඒ ව්‍යාපාරිකයා තමයි ඉන්දික තුෂාර කියන

මහත්මයා; ඔලිව් ආයතනය, අංක 521, පේරාදෙණිය. මෙය, 2020.10.29 සිදු වූ ගිනි ගැනීමක් සම්බන්ධවයි. ඔහු අදාළ රක්ෂණ සමාගමේ රක්ෂණය කරලා තිබෙනවා, ඔහුගේ වත්කම්වලින් රුපියල් බිලියනයක්. රුපියල් බිලියනයක වත්කම් රක්ෂණය කරලා තිබෙනවා. හැබැයි, බිලියනයක් රක්ෂණය සඳහා දුන්නාට අද වනතුරු ඒ රක්ෂණ සමාගම -මම ඒ සමාගමේ නම කියන්න කැමැති නැහැ.- රුපියලක්වත් මේ මනුස්සයාට ගෙවලා නැහැ. පොලිස් පරීක්ෂණවලින් සහ අනෙකුත් සියලු පරීක්ෂණවලින් පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා මේ ව්‍යාපාරික ස්ථානය ගිනි ගැනීමක් තුළ මේ හානිය සිදුවෙලා තිබෙනවා කියලා. නමුත් රක්ෂණ සමාගම කියනවා, "ගිනි ගත්තේ මොන හේතුවක් නිසාද කියා පැහැදිලි නැහැ, ඒ නිසා අපට ගෙවන්න බැහැ" කියලා. මේ සිද්ධිය වුණේ ඉන්දික තුෂාර කියන ව්‍යාපාරික මහත්මයෙකුට. මේ තත්ත්වය මම කිව්වේ, රක්ෂණ සමාගම් විසින් සිදු කරන මේ මහා කොල්ල කෑම ගැන පැහැදිලි කරන්නයි. මේ කරන පීඩාව මේ රටේ දුගීභාවය, ව්‍යාපාරිකයන් කඩා වැට්ටවීම කියන කරුණු සඳහා ඉතාම බරපතළ විධියට බලපානවා.

අනෙක් කාරණය මෙයයි. මේ කාරණා පිළිබඳව අවධානය යොමු කිරීමේ දී අපට පෙනී යන සමහර දේවල් තිබෙනවා. මම මේ කියන්නේ අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් ගැන නොවෙයි. දීර්ඝ කාලයක් තුළ මහ බැංකුවේ නිලධාරිනුත් හංගන කරුණු කාරණා රාශියක් තිබෙනවා. බැංකු පිළිබඳව අණ පනත් හදනකොට, රක්ෂණ අණ පනත් හදනකොට, ලීසිං අණ පනත් හදනකොට, ෆිනෑන්ස් සමාගම්වල, මූල්‍ය ආයතනවල අණ පනත් හදනකොට වාගේම මේ හැම එකකදීම මහ බැංකුවේ නිලධාරිනුත් මුල්වෙලා තමයි ඒවා හදන්නේ. ඒක තමුන්නාන්සේලා, අපි කවුරුත් දන්නා දෙයක්. ඒ හදපු නීති-රීති වාගේම, අද මේ රටේ ප්‍රධාන වශයෙන් ව්‍යාපාරික අංශවලින් යම් යම් ගනුදෙනු කළ අයට තිබෙන ප්‍රශ්න පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී, බැංකුවලින් පොලී අනුපාතය අවිධිමත් ලෙස ඉහළ දැමීම, -හැම ආණ්ඩුවකින්ම- බැංකුවල සේවා ගාස්තු කිසිදු නියාමනයකට යටත් නොවීම, ඒ වාගේම අහිතකර බැංකු අණ පනත් මඟින් මූල්‍ය ආයතනවලට බලය ලබා දීම කියන කරුණු කාරණා බරපතළ විධියට පෙනෙන්න තිබෙනවා. මේ පනතෙහි හානිකර සහ අහිතකර බව ලංකාවේ නීති අධ්‍යාපන කේන්ද්‍රයේ ලංකා නීතිඥ සංගමයෙන්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයෙන් මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් නඩු තීන්දුවලිනුත් පැහැදිලි කර තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය උපදේශක මහාචාර්යවරයෙකුත් ඒ ගැන පැහැදිලි කර තිබෙනවා. මේ සියල්ල ගත් විට ඉතාම විශ්මයට පත්වන කාරණයක් තිබෙනවා, මේ ඇතිවෙලා තිබෙන පීඩා, කරදර, හිරිහැර පිළිබඳව. ඒ වාගේම අවසානයේ දී මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ නිලධාරින්ගේ අභිමතයට අනුව ණයගැතියාගේ සියලු දේපොළ අසාධාරණ ලෙස අත්පත් කර ගැනීමට නීතිමය රාමුවක් සකසා දී තිබෙනවා. ණය ගත්තාම ණය ගෙවන්න ඕනෑ තමයි. ඒක වෙනම කාරණයක්.

අපි දුප්පත් රටක්. සහනයක් බලාපොරොත්තු වන අහිංසක ගනුදෙනුකරුවාට මේ නීති රීති, අණපනත් තුළ ඉතාම බරපතළ අවාසිසහගත තත්ත්වයක් ඇති වෙනවා. මේ නිසා දැන් සිදුවන සියදිවි නසාගැනීම් තව තවත් වැඩිවෙන්න බැරිකමක් නැහැ. රක්ෂණ නියාමන කොමිෂන් සභාව මඟින් නියාමනය පැහැර හැරීමක් කරලා තිබෙනවා. ඒ නිසා රක්ෂණ පාරිභෝගිකයන්ට ගැටලු රාශියකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. මම ඒවා විස්තර වශයෙන් කියන්නේ නැහැ. රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත උල්ලංඝනය කරමින්, යොමු කිරීමේ ආකෘතිය පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කරලා තිබෙනවා. කාලෝචිත ආකාරයකින් නියාමන ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්වීම පිළිබඳව ප්‍රධාන වශයෙන්ම කරුණු රාශියක් මුල් වෙලා තිබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්ෂික වාර්තාවල හිතාමතාම අසත්‍ය ප්‍රකාශ සඳහන් කිරීම හරහා උත්තරීතර පාර්ලිමේන්තුව, රක්ෂණ කර්මාන්තකරුවන් සහ මහජනතාව නොමඟ යැවීම කරනු ලබනවා. මේ කරුණු සැලකිල්ලට ගත්තාම, මෙය ඉතාම බරපතළ තත්ත්වයක්, ගරු කථානායකතුමනි. රක්ෂණ නියාමන කොමිෂන් සභාව මඟින් නියාමනය පැහැර හැරීම සහ රක්ෂණ පාරිභෝගිකයන්හට මතු වී ඇති ගැටලු රාශියක් සම්බන්ධයෙන් විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කර යම් සහනදායී නීතිමය රාමුවක් තුළ අවශ්‍ය සංශෝධන කරන්න කියලා මේ රටේ අහිංසක, දුප්පත් ජනතාව වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, අද රටේ තිබෙන තත්ත්වයන් සැලකිල්ලට ගත්විට අපි මුහුණ දෙන ආර්ථික අර්බුදය තුළ මේ රටේ සංචාරක ව්‍යාපාරය තිබෙන තැන පිළිබඳවත් මම කියන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරයේ නියැලුණු ඉහළ ව්‍යාපාරිකයන්ට ආණ්ඩුවෙන් සහන හුඟක් ලැබිලා තිබෙනවා. නමුත් පහළ මට්ටමේ පුංචි හෝටලයක්, පොඩි rest house එකක්, පුංචි ආයතනයක් පවත්වාගෙන ගිය අය සම්බන්ධයෙන් මේ සහන වැඩ පිළිවෙළ තුළ කිසිදු සහනයක් ලැබිලා නැහැ. නමුත් ලොකු හෝටල්වලට, ලොකු ව්‍යාපාරික ආයතනවලට සහන ලැබෙනවා. ඒ නිසා පහළ මට්ටමේ සිටින අයටත්, විශේෂයෙන්ම සුළු ව්‍යාපාර ආරම්භ කරලා පවත්වාගෙන යන අයටත් සහන දීමේ යම්කිසි වැඩ පිළිවෙළක අවශ්‍යතාව ගැන මම අවධානය යොමු කරවනවා. මම කියපු දුගීභාවය, ලෙඩ රෝග වැනි තත්ත්වයන් හමුවේ මේ නීති රීතිවලින් ජනතාව තව තවත් දුෂ්කරතාවලට පත්වෙලා තිබෙනවා.

ඊළඟට, වාර්ෂික වාර්තා තුළ, විසර්ජන පනත් කෙටුම්පත තුළ වාගේම අපි මේ පාර්ලිමේන්තුවේ කථා කරන නොයෙකුත් ප්‍රශ්න ගත්තාම අපට පෙනෙන දෙයක් තමයි පසුගිය දශක කිහිපය තුළ රාජ්‍ය අංශයේ බරපතළ දූෂිත තත්ත්වය එන්න එන්නම වර්ධනය වෙමින් තිබෙනවාය කියන කාරණය. ගරු කථානායකතුමනි, රාජ්‍ය අංශයේ දූෂිත තත්ත්වයන් වර්ධනය වන විට මූලික වශයෙන්ම සිදු වන්නේ මොකක්ද කියලා අපි දන්නවා. මේ රටේ රාජ්‍ය වාණිජ ආයතන ගණනාවක මේ ප්‍රශ්නය තිබෙනවා. අපේ රටේ ජනතාවගේ බදුවලින් තමයි වාණිජ ආයතන හුඟාක් පවත්වාගෙන යන්නේ. එහෙත් වාණිජ ආයතන රාශියක් පවත්වාගෙන යන්නේ පාඩුවට. එතකොට රජය විශාල වශයෙන් පොදු ජනතාවගේ බදු මුදල්වලින් ඒ ආයතන නඩත්තු කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, රාජ්‍ය ආයතනවල වංචාව, දූෂණය, අක්‍රමිකතාව ගැන කථා කරද්දී; මේ රටේ වංචාව, දූෂණය නැති කරන්න පටන් ගන්නේ කොතැනින් ද කියලා ඇහුවොත්, ඒකට ඉතාම හොඳ තැනක් තමයි කොළඹ මහ නගර සභාව. අපේ රටේ මොන ආණ්ඩුව බලයට පත් වුණත්, කොළඹ මහ නගර සභාවේ කවුරු නගරාධිපති වෙලා හිටියත්, එම නගර සභාවේ සිදුවෙන බරපතළ දූෂණ හා අක්‍රමිකතා සොයන්න, හරි නම් වෙනම කොමිසමක් පත් කරන්න ඕනෑ. මේ රටේ අද පළාත් පාලන ආයතන ගත් විට ගොඩනැගිල්ලක් අනුමත කර ගන්න, ඉඩම් කැබැල්ලක් කඩලා අනුමත කර ගන්න, ගෙදර ගේට්ටුව දා ගන්න, පයිප්ප ලයින් එක දා ගන්න, ගෙදර තාප්පය බැඳගන්න, පළාත් පාලන ආයතනවලට අත යට සල්ලි දෙන්න ඕනෑ. මේක රහසක් නොවෙයි. මේ ආයතනවල බරපතළ දූෂිත තත්ත්වයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
හොඳයි, ගරු කථානායකතුමනි. මට තව විනාඩියක් දෙන්න, මම අවසන් කරන්නම්.

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

අපේ රටේ රාජ්‍ය සේවකයන් ලක්ෂ 16ක් ඉන්නවා. මේ රාජ්‍ය සේවය මූලික වශයෙන්ම නිෂ්පාදන බලකායක් කරන්න ඕනෑ. ඵලදායිතා සම්මාන දීම, සේවය අගය කිරීම, සම්මාන දීලා දිරිමත් කිරීම වැනි දේ කරන්න ඕනෑ. රටේ ආර්ථිකයේ ප්‍රධාන බලවේගය රාජ්‍ය සේවයයි. ඒ තුළ වගකීම් නොපවරපු විශාල පිරිසක් ඉන්නවා. ඒ අය පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි.

ගරු කථානායකතුමනි, මම තව එක කාරණයක් කියන්න ඕනෑ. මම මේ ගරු සභාවේදී දැකපු දෙයක් තමයි, වාද විවාදවලදී සමහර මන්ත්‍රීවරු අද රටේ තිබෙන ප්‍රශ්න සියල්ලම යහ පාලන ආණ්ඩුව පැත්තට තල්ලු කරන එක. යහ පාලන ආණ්ඩුව කාලයේ සිදුවීම් නිසා තමයි මේ දේවල් වුණේ කියලා කියනවා. යහ පාලන ආණ්ඩුවේ නායකයාත් දැන් ඉන්නේ මේ ආණ්ඩුවේ. එම නිසා, අද තිබෙන මේ ප්‍රශ්න යහ පාලන ආණ්ඩුවේ ක්‍රියා මාර්ග තුළ ඇති වෙච්ච ප්‍රශ්න නොවෙයි, දීර්ඝ කාලයක් තිස්සේ ඇති වෙමින් තිබුණු ප්‍රශ්න බව මම කියන්න ඕනෑ. විවෘත ආර්ථිකයේ අහිසි ප්‍රතිඵල නිසයි අද ජනතාව දුක් විඳින්නේ. විවෘත ආර්ථිකයේ හොඳ පැත්ත වාගේම, විශේෂයෙන්ම විදේශ වත්කම් සහ මූල්‍ය කටයුතුවල තිබුණු අනිසි කළමනාකරණය, විධිමත් කළමනාකරණයක් නොතිබීම තමයි මේකට ප්‍රධාන හේතුව. දේශපාලනඥයන්ට ඕනෑ ලෙස වැරදි විධියට කටයුතු කිරීම, අනවශ්‍ය අධිසුඛෝපභෝගී දේවල් පිට රටින් ගෙන ඒම වැනි දේවල් සැලකිල්ලට ගත් විට මූලික වශයෙන්ම මේක අවුරුදු 30ක්, 40ක් තිස්සේ ඇති වෙමින් ආපු ප්‍රශ්නයක්. මේ රටේ සාමාන්‍ය සම්ප්‍රදාය තමයි, ඕනෑම ආණ්ඩුවක් බලයට ආවාම තිබුණු ආණ්ඩුවට දොස් කියන එක. හැම ආණ්ඩුවක්ම එහෙම තමයි. ඒක දැන් සම්ප්‍රදායික සටන් පාඨයක් වෙලා. යහ පාලන ආණ්ඩුව තුළත් විශාල වැඩ කොටසක් මේ රටේ ජනතාවට අපි ඉෂ්ට කළා. අඩු පාඩුකම් තිබුණා. වැඩ කරද්දී ඕනෑ තරම් අඩු පාඩුකම් සිද්ධ වෙනවා. මම තවත් කරුණු රාශියක් කීමට බලාපොරොත්තුවෙන් සිටියත්, කාල වේලාව අවසන් වුණු නිසා මම මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න මට අවස්ථාව දෙන්න. අද දිනයේ විරුද්ධ පක්ෂය ඉතාම බරපතළ චෝදනාවක් කළා, ඊයේ උද්ඝෝෂණය කරපු කෙනෙකුව අත් අඩංගුවට අරගෙන පොලීසිය පහරදීලා මරා දමලා කියලා. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. මේ පුද්ගලයාගේ නම ඉන්දික ජයරත්න. ඔහුගේ වයස අවුරුදු 37යි. ඔහුගේ පදිංචිය වැලිගෙයාය, පනාමුරේ. මොහු මත් ද්‍රව්‍යවලට ඉතාම දැඩි ලෙස ඇබ්බැහිවූ කෙනෙක්. ඔහු නිතරම බිරිඳට සහ දරුවන්ට පහර දෙනවා. ඒ ගැන බිරිඳගෙන් සහ දරුවන්ගෙන් පැමිණිලි තොගයක් ලැබිලා තිබෙනවා. 2021.11.12 වන දින ඔහුගේ දුව මේ පුද්ගලයාට විරුද්ධව පැමිණිලි කර තිබෙනවා, තමන්ට පොල්ලකින් සහ අතින් පයින් පහරදී බරපතළ තුවාල සිදු කළා කියලා. දුව ගිහිල්ලා රෝහල්ගත වෙනවා. එදා සිට පොලීසියෙන් මොහුව සොයනවා. නමුත්, මොහු හැංගෙනවා. ඊට පස්සේ පොලීසිය ඔහුව අත් අඩංගුවට ගන්නේ ඊයේ රාත්‍රී 10.30ටයි. ඒ කියන්නේ, මේ සිදුවීම ඊයේ තිබුණු පෙළපාළියට කිසිම සම්බන්ධයක් නැහැ. පොලීසිය සොය සොයා හිටපු කෙනාව ඊයේ රාත්‍රී අත් අඩංගුවට ගත්තාට පස්සේ, පාන්දර 3.30ට පමණ ඔහු තමාගේ කමිසය -ෂර්ට් එක- කූඩුවේ තිබෙන කම්බියක ගැට ගහලා ගෙල වැළ ලාගෙන මිය යන්න ඔන්න මෙන්න තිබෙනකොට තමයි පොලිස් රාළහාමි කෙනෙක් ඒක දැකලා ඔහුව වහාම රෝහලට ගෙනියන්න කටයුතු කරලා තිබෙන්නේ. නමුත්, රෝහලට ගෙනයන අතරතුර ඔහු මිය ගිහින් තිබෙනවා. මේ සිදුවීම ඊයේ තිබුණු පෙළපාළියටවත්, උද්ඝෝෂණයටවත් කිසිම සම්බන්ධයක් නැහැ. පොලීසියට විරුද්ධව කරන ඒ චෝදනාව සම්පූර්ණ අසත්‍යයක් කියලා මම ඔබතුමාට මේ අවස්ථාවේදී කියා සිටිනවා.

[පූ.භා. 10.56]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, අද අපි කියනවා, "එක රටක් - එක නීතියක්" කියලා. බලය ගත් ආණ්ඩුව එය ක්‍රියාත්මක කරන හැටි ඊයේ -නොවැම්බර් මාසයේ 16වැනි දා- අපි දැක්කා. අපි පළමුවෙන්ම ඉන්දික ජයරත්නගේ පවුලේ අයට අපේ ශෝකය ප්‍රකාශ කළ යුතුයි. මම කථා කරන්න ප්‍රථමයෙන් ඇමතිතුමා නැඟිටලා ඒක ගැන විස්තරයක් කිව්වා. නමුත්, අපට තිබෙන විස්තර ඊට වඩා වෙනස්. ඒක නිසා ඇමතිතුමා කියන එක අපි සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්නේ නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. ඒ හේතුව මෙයයි. රාජ්‍ය භාරයේ, ඒ කියන්නේ පොලීසියක හෝ හිරගෙදරක කවුරු හරි ඉන්නවා නම්, ඒ පුද්ගලයා කවුරු වුණත් කමක් නැහැ, ඔහුගේ ජීවිතය පොලීසියේදී හෝ හිරගෙදරදී අහිමි වෙනවා නම්, ඒකට වග කියන්න ඕනෑ රජයයි. ඒක අපි පැහැදිලි කරන්නම අවශ්‍යයි. ඒක රජයේ වග කීමක්. ඒ, මධුෂ් වෙන්න පුළුවන්. කථාවක් තිබෙනවා, කුඩුකාරයෙක් කියලා. මිනීමරුවෙකු වෙන්න පුළුවන්, දේශපාලනඥයෙකු වෙන්න පුළුවන්. කවුරු වුණත් අත් අඩංගුවට ගත්තාම රජය ඒ තැනැත්තා සම්බන්ධයෙන් වග කියන්න ඕනෑ. අනෙක් බන්ධනාගාරවල වෙන සිදුවීම් ගැන මම කථා කරන්න යන්නේ නැහැ. සමහර දේවල් කියන පළියටම මෙතැනට ඇවිල්ලා කිව්වාට වැඩක් නැහැ. අපි කියනවා, ඒ ගැන ස්වාධීනව හොයා බලා ක්‍රියා කරන්න ඕනෑ කියලා. මේ රටේ තවත් ඉන්දිකලා ඇති කරන්න එපා කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* A guilty conscience needs no accuser; වැරදි හෘදය සාක්ෂියකට චෝදකයෙකු අවශ්‍ය නැහැ. *[බාධා කිරීම්]* "එක රටක් - එක නීතියක්" කිව්වාට මේ රටේ නැත්තේම ඒක. *[බාධා කිරීම්]* නොමිලේ පොහොර දෙනවා කියලා දැන් බෙහෙතකටවත් පොහොර හොයා ගන්න බැහැ. සිමෙන්ති දෙනවා කිව්වා. ඉතිහාසයේ පළමුවැනි වතාවට සපුගස්කන්ද වහලා තිබෙන්නේ, බොර තෙල් ගේන්න විධියක් නැතුව. ඕමානයෙන් ණයක් ගන්නවා කිව්වා. නමුත් කෝ, ණය ලැබුණාද? *[බාධා කිරීම්]* බඩු මිල අහස උසට යනවා. *[බාධා කිරීම්]* කෝ, ණය? මිනිසුන්ගේ ආදායම ගල් ගැහිලා. නැත්නම් reverse වෙලා. හැබැයි, වියදම් ඉහළ ගිහිල්ලා.

ලංකාවේ මූල්‍ය අර්බුදයක් තිබෙනවා. *[බාධා කිරීම්]* දැවැන්ත ආර්ථික කඩා වැටීමක්, බංකොලොත් වීමක් විතරක් නොවෙයි. සාගතයකටත් පාර හදාගෙනයි යන්නේ. ලක්ෂ 69ක ජනවරමක් දීලා තුනෙන් දෙකක ආණ්ඩුවක් ඉල්ලුවේ මේකටද? *[බාධා කිරීම්]* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළේ මේකටද? මේ ගරු සභාවට මතක ඇති, අපේ අලුත් මුදල් ඇමතිතුමාට තනතුරු දෙනකොට, එතුමා ගෙනෙනකොට කිව්වේ, "මොළ හතක්" තිබෙනවා කියලා. තනි මොළයකට රටේ අර්බුදය විසඳන්න බැහැ කිව්වා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා වෙනස් කළා. ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය අපි බැලුවා. *[බාධා කිරීම්]* අපි බය නැතුව කියනවා, ඉදිරිපත් කර තිබෙන මේ අය වැය යෝජනාවලට මේ රට මුහුණ දීලා තිබෙන කිසිම ආර්ථික අභියෝගයක් ජය ගන්න බැහැ කියලා. *[බාධා කිරීම්]* මේක, අසමත්; අසාර්ථක; විශ්වාසයෙන් තොර අය වැයක් කියලා මම සඳහන් කරනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අපි වියත් සභිකයන් විධියට දන්නවා, භාණ්ඩයක මිල නියම කරන එක මුදල් ඇමතිතුමාට කරන්න බැරි දෙයක් කියලා. මුදල් ඇමතිතුමාට බදු පනවන්න පුළුවන්. හැබැයි, මිල තීරණය කරන්න බැහැ. එහෙම කරනවා නම්, ඒක නීති විරෝධියි. මේ සරල කරුණ පවා එක්කෝ මුදල් ඇමතිතුමා දන්නේ නැහැ. නැත්නම් කවුරු හරි ඒක එතුමාට කියා දීලා නැහැ. ඕක තමයි ඇත්තටම වෙලා තිබෙන්නේ. මේ අය වැය අසමත්, විශ්වාසයෙන් තොර බව තහවුරු කර ගන්න ඒ නිදර්ශනයම ඇති. මම එක කාරණයක් විතරයි කිව්වේ. නීති හදන මේ උත්තරීතර ආයතනය නීති කඩන්න අනුමැතිය දෙන්නේ කොහොමද? ඒවාට අපි සහාය දෙන්නේ නැහැ.

2022 අය වැය යෝජනා දිහා බලන්න. මේක තීරණාත්මක අය වැයක් කිව්වා.

හැබැයි, ප්‍රධාන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, අය වැය පරතරය අඩු කර ගන්නේ කොහොමද කියන එක. අනෙක, විදේශ විනිමය ප්‍රශ්නය. මේ ආණ්ඩුව ආරම්භයේ ඉඳලාම නිශ්චිත ආර්ථික ප්‍රතිපත්තියක් නැතුව, එදාවේල පිරිමහ ගන්නා ගමනක යන්නේ. ඒක මම පැහැදිලි කරන්නම්. රෝගයකට බෙහෙත් නියම කරන්න නම්,රෝගය මොකක්ද කියලා හරියට හඳුනා ගන්න ඕනෑ. මේ ආණ්ඩුව රෝගය හරියට හඳුනා නොගෙන, වැරදි බෙහෙත් තමයි දීලා තිබෙන්නේ. එතකොට ලෙඩා මැරෙනවා. ඒක අමුතුවෙන් කියන්න දෙයක් නොවෙයි. මේ, අපේ රට. ඒ අයගේ වැරදි බෙහෙත් නිසා මේ මොහොතේ රටේ ආර්ථිකය පණ අදිමින් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, තීරණාත්මක ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. අය වැය පරතරය පියවීමේදී රාජ්‍ය ආදායම ඉහළ දමන්න අවශ්‍යයි. මෙහිදී පොඩ්ඩක් ඉතිහාසය මතක් කරන්න වෙනවා. 2015දී අපි රජය භාර ගන්නකොට රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,000යි. 2019දී අපි පිට වනකොට රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,997යි. *[බාධා කිරීම්]* තව විධියකට කිව්වොත්, රාජ්‍ය ආදායම දෙගුණයකට ආසන්නව වැඩි කළා, අපේ ආණ්ඩුව කාලයේදී. නමුත්, මේ ආණ්ඩුව යන්නේ reverse එකට. 2021 වෙනුවෙන් මේ ආණ්ඩුවේ ආදායම තක්සේරු කළේ රුපියල් බිලියන 2,029කට. නමුත්, ලැබුණේ රුපියල් බිලියන 1,561යි. ඒ අනුව, බිලියන 500ක අඩු වීමක් තිබෙනවා. 2022 වනකොට රාජ්‍ය ආදායම බිලියන 2,284ට වැඩි වෙනවා කියනවා. තව විධියකට කිව්වොත්, රුපියල් බිලියන 800කින් වැඩි වෙනවා කියනවා. ඒ කියන්නේ, සියයට 45කින් වැඩි වෙනවා කියලා. අනේ, මේ ගැන කියන්න ආර්ථික විද්‍යාව ඉගෙනගෙන ඉන්න ඕනෑ නැහැ. මූල්‍ය ක්‍රම ගැන දැනගන්න ඕනෑ නැහැ. තේ කඩයක් කරපු පුද්ගලයෙකු වුණත් දන්නවා, සියයට 10කින් හෝ 15කින් අළෙවිය වැඩි කර ගන්න පුළුවන් නම්, ව්‍යාපාරය සාර්ථකයි කියලා. *[බාධා කිරීම්]* තේ කඩයක්වත් කරලා නැතිකොට ආර්ථිකයක් ගෙන යන්නේ කොහොමද? කාවද, මේ රවටන්න හදන්නේ? මෙතුමන්ලා හැම දාම අසත්‍ය ප්‍රකාශ කරලා තමයි රජය ගෙන යන්නේ. රජයේ ආදායම වැඩි කර ගන්න ඕනෑ. ඒ නිසා මේ ඉදිරිපත් කළ යෝජනා නැවත බලන්න වෙනවා. මට නම් හිතෙන්නේ, මේවා දවල් හීන කියලා. මේවා, ජනතාව රවටන දවල් හීන.

2015දී අපි රජය භාර ගන්නකොට රාජ්‍ය බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 10ට තිබුණේ. එය අපි සියයට 13ට වැඩි කළා. මේ අවස්ථාවේදී දිවංගත මංගල සමරවීර මැතිතුමා මතක් කරන්න අවශ්‍යයි. එතුමා බොහොම සැලසුම් සහගතව ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන ගියා. නමුත් ඔබතුමන්ලාට මතකද, මේ ආණ්ඩුව බලය ගන්න පෙර නිතරම අසත්‍ය පතුරවමින් ගිය හැටි. ඒ තමයි, "ආණ්ඩුව හැම දේකටම බදු ගහනවා, බදු ගහනවා" කියලා කථාවක් හදාගෙන ගියා. ඒ රීනියා සටන් පාඨවල නිර්මාතෘ කවුද? 2019 ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ කටයුතු ප්‍රධානියා. එහෙම නැත්නම්, මෙහෙයුම් ප්‍රධානියා. ඒ, බැසිල් රාජපක්ෂ මැතිතුමා. එතුමා තමයි එදා ප්‍රධානියා. Campaign කරලා සාමාන්‍ය ජනතාව අතර විතරක් නොවෙයි, ව්‍යාපාරික ප්‍රජාව පවා දිනා ගන්න ඒ අය සමත් වුණා. ඡන්ද 69 ලක්ෂයක් ගන්න බොහෝ අසත්‍ය කිව්වා. එතුමන්ලා දිනපු මොහොතේ පටන් රාජ්‍ය ආදායම අඩු වුණා. ඒ මොකද? ගජ මිතුරන්ට VAT සහන දීලා, රාජ්‍ය ආදායම නැති කර ගත්තා. අර්බුදයේ මුල ඒකයි. දැන් බලන්න, රාජ්‍ය ආදායම නැති කරන්න මැදිහත් වූ පුද්ගලයාට මුදල් අමාත්‍ය ධුරය ලබා දීලා තිබෙනවා. මම මේ කියන්නේ මොකක්ද කියලා, අධිකරණ ඇමතිතුමා දන්නවා. අධිකරණ ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා මේ වෙලාවේ හිටියා නම් හොඳයි. මොකද, හරියට සහ හොඳට වැඩක් කළොත්, මේ ආණ්ඩුවේ පහළට යනවා. වැරදි වැඩක් කළොත්, මේ ආණ්ඩුවේ ඉහළට යනවා. මේක තමයි ඇත්තටම සිදු වෙන්නේ. මේක තමයි system එක. *[බාධා කිරීම්]* අධිකරණ ඇමතිතුමා මේ ගැන දන්නවා. හොඳ වැඩක් කරගෙන යනකොට කාර්ය සාධක බලකායක් හදනවා. එහෙම තමයි මේ ආණ්ඩුවේ වැඩ. ඇත්තටම මේ ආණ්ඩුවේ කිසිම දෙයක් සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හොයා ගන්න බැහැ. 2020දී මොනවාද කිව්වේ? අපි නිෂ්පාදන ආර්ථිකයක් හදනවා කිව්වා. කහ ආනයනය තහනම් කළා. කහවලින් ස්වයංපෝෂිත වෙනවා කියලායි කිව්වේ. අන්තිමට කහ කිලෝව රුපියල් 7,000ට ගියා. ඔන්න, නිෂ්පාදන ආර්ථිකයේ හැසිරවීම!

ඒ විතරක් නොවෙයි. සීනි කිලෝවක් සඳහා බද්ද වැඩි කළා. රුපියල් 35 සිට රුපියල් 50ට වැඩි කළා. ඇයි, වැඩි කළේ? සීනිවලින් රට ස්වයංපෝෂිත කරනවා කිව්වා. නමුත් 2021දී මොනවාද කළේ? සීනි බද්ද රුපියල් 50 සිට සත විසිපහට ගෙනාවා. ගජ මිතුරන්ට රුපියල් බිලියන -බිලියන- 15.9ක අධික ලාභයක් ලබා දුන්නා. කුප්‍රකට සීනි බදු වංචාව කියන්නේ, අන්න ඒකට. එදා කිව්වේ කොහොමද? "නිෂ්පාදන ආර්ථිකයක්" නොවෙයි, අපේ ප්‍රතිපත්තිය "වෙළෙඳ හා සේවා ආර්ථිකයක්" කියලායි. 2021දී අයියා කිව්වා, "වෙළෙඳ හා සේවා ආර්ථිකයක්" කියලා. දැන් මල්ලී කියනවා, "නිෂ්පාදන ආර්ථිකයක්" කියලා. දැන් බලනකොට 2022දී ආයෙත් 2020ට ගිහිල්ලා! A boat does not go forward if each rows his own way; එක එක්කෙනා තමන්ට ඕනෑ ඕනෑ පැත්තට හබල් ගානකොට ඔරුවක් ඉස්සරහට යන්නේ කොහොමද? අයියා එක ප්‍රතිපත්තියක; මල්ලී තවත් ප්‍රතිපත්තියක; අනෙක් මල්ලී තවත් ප්‍රතිපත්තියක. ඇත්තටම ඕනෑම පවුලක එක් එක් පුද්ගලයන්ට තමන්ට ඕනෑ ඕනෑ පැත්තට යන්න පුළුවන්. ඒ අයගේ පෞද්ගලික තීරණ ගන්න පුළුවන්. නමුත් මේක පවුල් ප්‍රශ්නයක් නොවෙයි. රටක පාලනය ගැනයි අපි මෙතැනදී කථා කරන්නේ. අවාසනාවකට පවුල තමයි ආණ්ඩුවේ බහුතරය. එතකොට එක එක්කෙනාට ඕනෑ ඕනෑ විධියට වෙනස් ප්‍රතිපත්තිවලට ගියාම රටට මොකක්ද වෙන්නේ ගරු කථානායකතුමනි? ජනතාවට මොකක්ද වෙන්නේ කියලා අපට අහන්න වෙනවා.

මම තවත් නිදර්ශනයක් දෙන්නම්. පසුගිය ජනාධිපතිවරණය අවස්ථාවේදී ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

කිව්වා, ගොවීන්ට පොහොර නිකම් දෙන්න කියලා. මහින්ද මහත්මයා කිව්වාය කියලායි කිව්වේ. -මැතිවරණය නිසා- හරි. අපි කියමු, ඒක මහින්ද මහත්මයාගේ ප්‍රතිපත්තිය කියලා. නමුත් ජනාධිපති ගෝඨාභය මැතිතුමාගේ ප්‍රතිපත්තිය මොකක්ද? එතුමා එක රැයකින් රසායනික පොහොර තහනම් කරලා, ඊළඟ කන්නය සම්පූර්ණයෙන්ම කාබනික පොහොර භාවිතයෙන් කරනවා කිව්වා. අන්න ඒක තමයි පවුලක් විසින් රටක් පාලනය කිරීමේදී තිබෙන හානිය. පවුලේ කී දෙනෙක් දේශපාලනඥයන් ඉන්නවාද? එක්කෙනෙකුට කට අරින්න අවස්ථාවක් නැහැ. අපට කැ ගැහුවාට, කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා කට අරින්නවත්, Group Meeting එකේදී කට අරින්නවත් අවස්ථාවක් නැහැ. පුළුවන් නම් කට ඇරලා බලන්න, මෙතැන තිබෙන නිදහස එතැන තිබෙනවාද කියලා. මේ ආණ්ඩුවට ස්ථිර ප්‍රතිපත්තියක් නැති එක තමයි ලොකුම ගැටලුව. ප්‍රතිපත්තියක් නැතුව බලය ගත්ත මේ පොහොට්ටු සන්ධානය ආර්ථික දැක්මක්, වැඩ පිළිවෙළක් නොමැතිකම නිසා බදු ආදායම් අඛණ්ඩව අහිමි කර ගත්තා. 2019 දෙසැම්බර් 31වැනි දා වනකොට, අපි පාලන බලය පවරනකොට ලංකාවේ බදු ලිපිගොනු ප්‍රමාණය ලක්ෂ 17යි. නමුත් 2020 වනකොට ලක්ෂ 11යි. බදු ගෙවන ජනතාව ලක්ෂ 6ක් ඉවත් වෙලා තිබෙනවා. ඒ වාගේම උපයන විට බදු ගෙව්වා, ලක්ෂ 11ක්. 2020 වන විට PAYE Tax ගෙවන සංඛ්‍යාව ලක්ෂ 6 දක්වා අඩුවෙලා තිබෙනවා. VAT ගෙවන්නන් 29,000 සිට 8,000ට අඩු වෙලා තිබෙනවා. ඔන්න, රජයේ ආදායමට සිදු කළ දේ. වත්මන් ආණ්ඩුව බදු ආදායම් අඩු කළා විතරක් නොවෙයි, they have destroyed the tax net in this country. The tax net provides social justice to the poor and that has been destroyed by this Government. මේ අය කරලා තිබෙන්නේ, අපි ඉතාම කැපවීමෙන් සැලසුම් සහගතව කෙටි කලකින් ගොඩ නඟපු දේ ඉතාම ඉක්මනින් නැති කරලා දැමීමයි. දැන් බදු ගෙවන්නන් අඩු වුණාට ලැබුණු සහනයක් තිබෙනවාද කියලා මම මේ රටේ ජනතාවගෙන් අහන්න කැමැතියි. බදු ගෙවන ප්‍රමාණය අඩු වුණා. නමුත් සහනයක් ලැබුණාද කියලා මම ජනතාවගෙන් අහන්න කැමැතියි. ඒ වෙනුවට සිදු වෙලා තිබෙන්නේ, භාණ්ඩ හා සේවා මිල අහස උසට යෑමයි. දැන් තේරෙනවාද වෙලා තිබෙන දේ? තෝරුන්ට, මෝරුන්ට බදු දැලෙන් පනින්න ඉඩ දුන් නිසා ආදායම අහිමිවෙලා තිබෙනවා. මේ රටේ අහිංසක පොදු ජනතාවට ගෙවන්න සිද්ධවෙලා තිබෙන්නේ ඒ අඩු වුණු ආදායමයි. දැන් බලන්න, අපි බදු මත දුවනවා කියලා අපට චෝදනා කළ අය කරලා තිබෙන්නේ මොකක්ද කියලා. අපි ඍජු බදු වැඩි කරගන්න කැපවුණු වෙලාවේ මේ ආණ්ඩුව ඒක නැති කරවන්න කැප වුණා. අපේ උත්සාහය තිබුණේ වක්‍ර බදු අඩු කරලා ඍජු බදු වැඩි කරන්නයි. වක්‍ර බදු ආදායම සියයට 80යි. ඍජු බදු ආදායම සියයට 20යි. ඒක වෙනස් කරන්න තමයි, අපි උත්සාහ කළේ. නමුත් ඔබතුමන්ලා ජනතාව නොමඟ යවලා ඍජු බදු ප්‍රතිශතය වැඩි කරන ඒ ප්‍රතිපත්තිය කණපිට පෙරළුවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? මාසිකව රුපියල් 30,000ක් උපයන කෙනාත්, රුපියල් ලක්ෂ 3ක් උපයන කෙනාත්, රුපියල් ලක්ෂ 30ක් උපයන කෙනාත් එකම මිලකට තමයි, සීනි ටික, පාන් ගෙඩිය, පැනඩෝල් පෙත්ත, හාල් ටික, පරිප්පු ටික, උඳු ටික, මුං ඇට ටික ගන්නේ. මාසයට රුපියල් 30,000ක් හෙව්වත්, රුපියල් ලක්ෂ 3ක් හෙව්වත්, රුපියල් ලක්ෂ 30ක් හෙව්වත් දුප්පත් අයට තමයි පීඩනය ඇතිවෙලා තිබෙන්නේ. වක්‍ර බදු අඩු කරලා සමාජ සාධාරණත්වය ඇති කරන්න අපි කටයුතු කළා. නමුත් ඔබතුමන්ලා ඒක reverse කළා. ඔබතුමන්ලා වක්‍ර බදු වැඩි කළා. දැන් තේරෙනවාද ඇත්තටම ජනතා හිතවාදී කවුද කියලා?

ඒ විතරක් නොවෙයි. 2021 අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් ඔබතුමන්ලා කිව්වා, 2020 ආදායම රුපියල් බිලියන 1,588යි, වියදම රුපියල් බිලියන 2,854යි, හිඟය රුපියල් බිලියන 1,266යි කියලා. නමුත් විගණකාධිපති වාර්තාවේ කියන්නේ ආදායම රුපියල් බිලියන 1,378යි, වියදම රුපියල් බිලියන 3,493යි, පරතරය 2,115යි කියලා. එතකොට ආණ්ඩුවෙන් මොනවාද කිව්වේ? අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 7.9ක් කියලායි කිව්වේ. ඇත්තටම අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 14.1යි. ඒක ලංකා ඉතිහාසයේ තිබුණු වැඩිම අය වැය පරතරයයි. මේ අසත්‍ය ප්‍රකාශ කරන්නේ එක තැනකදී නොවෙයි, දිගටම අසත්‍ය ප්‍රකාශ කරමින් යනවා.

2021 අය වැය ලේඛනයේ ආණ්ඩුවේ තක්සේරුව කොහොමද තිබුණේ? ආදායම රුපියල් බිලියන 2,029යි කියලායි. *[බාධා කිරීමක්]*

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, ඇෆ්ඝනිස්ථානයට විතරක් දෙවන ස්ථානයට පත්වන විදියට ආර්ථිකය බස්සපු විදිය හිටපු මුදල් රාජ්‍ය ඇමතිතුමා විදියට පොඩ්ඩක් උගන්වන්න බැරිද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, ඇෆ්ඝනිස්ථානය තිබෙන්නේ අප්‍රිකාවේද, ආසියාවේද කියලා මම එතුමාගෙන් අහන්න කැමැතියි.

2021 අය වැය ලේඛනයේ ආණ්ඩුවේ තක්සේරුව කොහොමද තිබුණේ? ආදායම රුපියල් බිලියන 2,029යි, වියදම රුපියල් බිලියන 3,594යි, පරතරය රුපියල් බිලියන 1,565යි. නමුත් 2021 වර්ෂයේ තත්ත්වය මොකක්ද? *[බාධා කිරීම්]* ආදායම රුපියල් බිලියන 1,561යි, වියදම රුපියල් බිලියන 3,386යි, පරතරය රුපියල් බිලියන 1,825යි. ප්‍රතිශතය සියයට 11.1ක් කියලා කියනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, නිශ්ශබ්ද වෙන්න. ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* එතුමාට බාධා කරන්නේ නැතුව කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
2021 වර්ෂයේ ආදායම රුපියල් බිලියන 1,561ක් වනකොට 2022 වර්ෂයේ තක්සේරුව මොකක්ද? රුපියල් බිලියන 800කින් පමණ වැඩි වෙනවාය කියලා සඳහන් කරලා තිබෙනවා. "සුදු කරපටි කුරහන් කරපටි සමඟ එකතුවෙලා කරන ජනතා ඇන්දිලි" කියලා කියන්නේ මේවාට තමයි.

මෙන්න තවත් අසත්‍යයක්. අහගෙන ඉන්න. අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 500කින් අඩුවෙලා. මුදල් ඇමතිතුමා කියන්නේ, ඒක එකතු කිරීමේ අවුලක් තිබුණාය කියලායි. නමුත්

හරි පැහැදිලියි, මේ ප්‍රශ්නය තිබෙන්නේ තක්සේරුවේ කියලා. මගේ ඇස්තමේන්තුව අනුව 2021 වර්ෂයේ ආදායම රුපියල් බිලියන 1,800ක් වාගේ වෙයි. ඊට වඩා වැඩි වෙන්න විධියක් නැහැ.

අපි මතු කරන කරුණු වරදින්න නම් ප්‍රාතිහාර්යයක් වෙන්න ඕනෑ. A miracle has to happen to believe the numbers that the Finance Minister has projected for the revenue in this country. Even if you did not run a supermarket, but only a small boutique, you know that these numbers are not tenable at all. මේ ව්‍යාජ තක්සේරුව දිහා බලන්න. 2022දී අය වැය හිඟය සියයට 8.88ක් වෙනවා කිව්වා. නීතිය අනුව, ඒ කියන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අනුව අය වැය හිඟය සියයට 5ක් කියලා කියනවා. නමුත් මේක කරන්න බැහැ. මේවා නීති විරෝධියි. පාර්ලිමේන්තුවේ නීති පනවලා තිබෙනවා. එතකොට ඇමතිවරයෙකුට නැඟිටලා නීතියට විරුද්ධ දේවල් ඉදිරිපත් කරන්න බැහැ. එහෙම නම් ඉස්සරවෙලා නීතිය වෙනස් කරලා තමයි ඉදිරිපත් කරන්න ඕනෑ. නැත්නම් අපි නීතිගරුක නැහැ. නීති සම්පාදනයයි අපේ මූලික වගකීම වන්නේ. මේක මේ අයට මීට වැඩිය කොහොම විස්තර කරන්නද කියලා මම දන්නේ නැහැ.

ඊළඟට මම කථා කරන්නේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම පිළිබඳවයි. එතකොට මේක ඉදිරියට ගෙන යන්නේ කොහොමද? බදු ක්‍රමය සරල වෙන්න ඕනෑ. A one-time tax surcharge of 25 per cent has been proposed on persons or companies with a taxable income of over Rs. 2,000 million. VAT එක වැඩි කළා. බදු අඩු කරනවා කියපු රජය සමාජ ආරක්ෂණය කියලා තවත් බද්දක් දමලා බදු වැඩි කරගෙන, වැඩිකරගෙන ගිහින් තිබෙනවා. බැංකුවල ප්‍රධානීන් ඒ අයගේ නියම බද්ද සියයට 70 කියලා සඳහන් කරලා තිබෙනවා. ඍජු බදු ප්‍රතිපත්තියක්, කාලයෙන් කාලයට වෙනස් නොවන ස්ථාවර බදු ක්‍රමයක් දිහා අපි බලන්න ඕනෑ. මේ ආණ්ඩුව බලයට ආපු ගමන් VAT එක සියයට 15ට වැඩි කළා. මෙවර අය වැයෙන් එය සියයට 18 දක්වා වැඩි කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි VAT එක අවුරුදු 23ක් තුළදී 11වතාවක් වෙනස් කරලා තිබෙනවා. නවසීලන්තය අවුරුදු 22ක කාලයකදී දෙවතාවයි VAT එක වෙනස් කරලා තිබෙන්නේ. ආණ්ඩු මාරු වුණාම කිසිම සොයා බැලීමක් කරන්නේ නැතිව එකපාර, සම්පූර්ණයෙන් මේ බදු වෙනස් කරලා පෞද්ගලික අංශයේ ව්‍යාපාර නැති කරලා රට ඉදිරියට ගන්න බැහැ.

ඒ විතරක් නොවෙයි. Turnover Tax එකත් දැම්මා. ඒක දැම්මේ පිරිවැය අනුවයි. මාසයකට ලක්ෂ 100ක - මිලියන 10ක - පිරිවැයක් තිබෙනවා නම්, ඒ අයට කියනවා, තවත් Turnover Tax එකක් ගෙවන්න කියලා. මේක අදාළ වන්නේ සාමාන්‍යයෙන් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවලටයි. ලොකු ඒවාට නොවෙයි, කුඩා ඒවාටත් බදු ගහලා තිබෙනවා. ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය මේ කුඩා ව්‍යාපාරිකයෝ තමයි. මේ වේලාවේ අපට කරන්න තිබුණේ මේ අයට අත දීමයි. ලංකාව තුළ විතරක් නොවෙයි, ඒ අයගේ භාණ්ඩ හා සේවාවන් විකුණන්නේ. ඒ අය ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගෙනයන්න, ආනයන කටයුතු කරගෙන යන්න අපෙන් ඒ අයට ඉටු විය යුතු කරුණු දෙකක් තිබෙනවා. අපට ඒ අයට තාක්ෂණය ලබා දෙන්න තිබුණා. ලොකු සමාගම්කාරයන්ට වාගේ වෙළෙඳ පොළ සොයන්න ඒ අයට බැහැ. රජය මැදිහත් වෙලා ඒ වෙළෙඳ පොළවල් සොයා දෙන්න තිබුණා. ඔන්න බලන්න, වෙලා තිබෙන වැඩේ. ඇත්තටම ප්‍රශ්නය වන්නේ බදු ගහන එක නොවෙයි. සමාජ සාධාරණත්වය රකින්න ඕනෑ. බදු නිසි ලෙස අය කරන්න ඕනෑ. ඒ ගැන වාදයක් නැහැ. නමුත් නිසි නිවැරැදි ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. මෙලෝ හසරක් නොදන්නා අය වැඩ කරන්න ගියාම බදු ගෙවනවා තියා කිසිම ආයෝජකයෙක් මේ රටට එන්නේ නැහැ. මෙහෙම ඇහුවාට තරහා වෙන්න එපා. අද හම්බ කරන්න අවස්ථාව තිබෙන්නේ එක පවුලකට හා ඒ පවුලේ ගජමිතුරන්ට විතරද කියලා මට අහන්න වෙනවා. අපි නම් මේවාට පුදුම වෙන්නේ නැහැ.

මතකයි නේද, සීට් එකක් වෙන් කර ගන්න බැරිවෙලා, රාජපක්ෂ උදහස නිසා, බිලියන ගණන් අලාභ ලැබූ ගුවන් සේවය 2008දී එමිරේට්ස් ආයෝජකයන්ගෙන් මහින්ද රාජපක්ෂ පාලනයට නැවත පවරා ගත්. බව. මේක සිදු වුණේ ඇයි? එමිරේට්ස් ගුවන් සමාගමට අයත් ගුවන් යානයක සීට් එකක් දෙන්න බැහැ කිව්වා කියලා එදා එමිරේට්ස් ගුවන් සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරිගේ වීසා එක අයින් කරලා දැම්මා. දැන් 2021 වසර වනවිට මොනවාද වෙලා තිබෙන්නේ? 2021 වෙනකොට ශ්‍රීලන්කන් ගුවන් සේවාවේ අලාභය පමණක් රුපියල් බිලියන 250කට අධිකයි. මේ වාගේ අලාභ තිබෙනකොට අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයට, සෞඛ්‍ය ක්ෂේත්‍රයට සිදු වෙලා තිබෙන්නේ මොනවාද ? මේක වුණේ ඇයි? හිටපු ජනාධිපතිතුමා මේක කළේ ඇයි? මේ ආර්ථිකය මෙහෙම දුර්වල කළේ ඇයි? දැන් මේ පාඩුව ගෙවන්නේ මැදමුලනේ කාබනික ගොවිතැනින් නොවෙයි, රාජපක්ෂ පවුලේ ව්‍යාපාරිකයන්ගෙන් නොවෙයි. කවදාවත් ගුවන් යානයකට පය තබලා නැති අහිංසක ජනතාව තමයි මේ අලාභයට ගෙවන්නේ. දැන් හිතන්න, එමිරේට්ස් ගුවන් සේවයට වුණු දේ දැක්කාම අනෙක් ආයෝජකයෝ මේ රටට එයිද කියලා. දැන් ලොකුවට හිතාගෙන බදු ප්‍රතිපත්තිය ගැන පම්පෝරි ගහනවා. මේවාගේ තමයි පැටලිලා තිබෙන්නේ. තමුන්නාන්සේලා Colombo Port City එක ගැනත් සිහින දකින්නේ බලාගෙනයි. මොකද, ඒ වාගේ කථා කිව්වාට තිබෙන්නේ මේ වාගේ ප්‍රතිපත්ති නම්, Colombo Port City එකට ආයෝජකයන් එන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මතක තියා ගන්න ඕනෑ ආයෝජකයන් හැමෝම මේ රටට එන්නේ කොමිස් දීලා නොවෙයි. ක්‍රමවේදයෙන් පිට, ටෙන්ඩර් එකෙන් පිට එන්නේ කොමිස් දීලා එන ආයෝජකයන්. අපි රට ගොඩ නඟන්න යනවා නම් ඒ අයට අවශ්‍ය විධියට ප්‍රතිපත්ති හදලා හරියන්නේ නැහැ. සාමාන්‍ය ආයෝජකයන්ට අදාළ ප්‍රතිපත්ති අපි හදන්න ඕනෑ; විශ්වාසය හදා ගන්න ඕනෑ; මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ; නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න ඕනෑ; මානව හිමිකම් ආරක්ෂා කරන්න ඕනෑ. රටේ දේශීය ව්‍යාපාරිකයාට සලකන ආකාරය තමයි විදේශ ව්‍යාපාරිකයා බලන්නේ. මේ කිසිම දෙයක් ගැන මෙවර අය වැයේ අවධානය යොමු කරලා නැහැ. ඒ විතරක් නොවෙයි, ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තුළින් මේ වටිනාකම්වලට - valuesවලට - ඉඩක් නැහැ.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ආයෝජකයන් ගැන කියන නිසා මට මේ කාරණයත් මතක් වෙනවා. පසු ගිය ආණ්ඩුව සමයේ ඔබතුමන්ලා ආයෝජකයන්ට තර්ජනය කළා. තමුන්නාන්සේලාට බලය ආවාම සියල්ල යළි පවරා ගන්නවා කියලා එදා කිව්වා. ඒ වාගේම තමයි ස්වර්ණවාහිනියේ, ඊජ්පී මාධ්‍ය ජාලයේ ආයෝජනය කළ සුභාෂ්කරන් අලිරාජා මහතා සම්බන්ධයෙන් දක්වපු විරෝධය. එදා ඒකාබද්ධ විපක්ෂය කිව්වේ අපි කොටියෙකුට රටේ සංඛ්‍යාත දුන්නා කියලා. හැබැයි, එදා විපක්ෂයේ මහත්වරු මෙහෙම කිව්වේ නැහැ. අද අපි ඒක කියන්නෙත් නැහැ. සුභාෂ්කරන් අලිරාජා මහතාව මේ ළඟදී VIP පර්යන්තයෙන් රටට ගෙන්වලා, ඔබතුමන්ලා ඉහළ පෙළේ සාකච්ඡා තැබුවා. ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් හරහා ඔහුට ගමන් පහසුකම් ලබා දුන්නා. අපි ඔහු ආයෝජකයෙක් කියලා කියන්නේ. ඔහු ආයෝජකයෙක්. ආයෝජනයට පාටක් නැහැ. ඇමෙරිකාවෙන්ද, යුරෝපයෙන්ද, ඉන්දියාවෙන්ද, චීනයෙන්ද කියන එක අදාළ නැහැ. අපි ඩයස්පෝරාව සලකන්නේ රටට තිබෙන වගකීමක් හැටියට නොවෙයි, වත්කමක් හැටියටයි. All wrongs will be made right. හැම වරදකටම අවසානයක් තිබෙන්න ඕනෑ. ඒ නිසා විදෙස් ප්‍රතිපත්තිය හදා ගන්න. මානව හිමිකම්වලට ගරු කරන්න. ලංකාව ජාත්‍යන්තර ගිවිසුම්වලට අත්සන් කරලා තිබෙනවා, අවුරුදු 75කට; ඒවාට ගරු කරන්න. යුරෝපීය GSP Plus සහනය, ඇමෙරිකානු GSP Plus සහනය අපට අත්‍යවශ්‍යයි. විශේෂයෙන්ම ඇමෙරිකාව, යුරෝපය, මැද පෙරදිග තමයි අපේ අපනයන වෙළෙඳ පොළවල්. මේ හරහා තමයි රටට ඩොලර් එන්නේ. මේක නැති කර ගන්න එපා කියලා රජයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපනයන ක්ෂේත්‍රයට තැන දෙන්න. ඔවුන්ට සම්පූර්ණයෙන්ම තැන දෙන්න. පුනර්ජනනීය බලශක්තිය සියයට 70කින් වැඩි කරනවා කියලා කිව්වා. අය වැයේ එහෙම කිසිම දෙයක් නැහැ; කිසිම දෙයක් නැහැ. කාන්තාවන් ගැන මේ අය වැයේ කථා කරලා නැහැ. ලංකාවේ ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන්. නමුත්, කැබිනට් මණ්ඩලයට කාන්තා නියෝජනයක් නැහැ. කැබිනට් මණ්ඩලයේ කාන්තා අමාත්‍යාංශයක් නැහැ. අද කාන්තාවන් මේ විධියට අතපසු කරලා තිබෙන්නේ. වසංගතයත් තවම ඉවර නැහැ. *[බාධා කිරීමක්]* මම රජයෙන් ඉල්ලනවා මේ හැම දෙයක් ගැනම නැවත හිතන්න කියලා. තේ, රබර්, පොල්, ඇඟලුම් හා තොරතුරු තාක්ෂණය පමණක් නොවෙයි නවීකරණයට අවස්ථාව දෙන්න. මෙවර අය වැයෙන් නව නිපැයුම්වලට, පර්යේෂණවලට මුදල් වෙන් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්නේ මෙහෙමයි. අපි ජනතාවට ස්ථිර පොරොන්දුවක් දෙනවා. මේක වාසනාවන්ත රටක්. මේ අවුරුදු 5ට රාජපක්ෂ පවුල මේ රට මොන විධියට පාලනය කළත්, අපට ලැබුණු පළමු අවස්ථාවේදී නිවැරදි දැක්මකින්, නිවැරදි වැඩ පිළිවෙළකින්, කණ්ඩායමක් සතුව, මතු පරම්පරාව වෙනුවෙන් මේ රට ගොඩනැඟීමේ අභියෝගය, වගකීම අපි භාර ගන්නවා කියමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.27]

**ගරු විමල් වීරවංශ මහතා (කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ஸ - கைத்தொழில் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Industries)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වසර සඳහා ඉදිරිපත් කර ඇති අය වැය පිළිබඳ විවාදයේදී අදහස් කිහිපයක් එකතු කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කථාව අවසන් කරමින් කිව්වා, එතුමන්ලාට අවස්ථාව දෙන්න, බොහොම බැරෑරුම් පාලනයක් කරලා, මේ රට නිසිමඟට ගන්නවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා අවුරුදු 4, 1/2 ක් මේ රට පාලනය කළා. 2015 ජනවාරි 8වැනි දා තමුන්නාන්සේලාට භාර දුන්නේ සියයට 6කට වැඩි ආර්ථික වර්ධන වේගයක් තිබුණු රටක්; ත්‍රස්තවාදයකින් තොර රටක්. තමුන්නාන්සේලා 2019 වර්ෂයේ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට භාර දෙන්නේ සියයට 2.5ටත් වඩා අඩු ආර්ථික වර්ධන වේගයක් තිබෙන රටක්; නැති ත්‍රස්තවාදයක් අලුතින් බිහි කර දීපු රටක්.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහසින් පස්සේ 2015 වනතුරු මේ රට ණය වුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7යි. යහපාලන ආණ්ඩුව කාලයේ අවුරුදු 4 1/2 ඇතුළත එම ණය ප්‍රමාණය දෙගුණයකට ආසන්න ප්‍රමාණයකට වැඩි කළා. නිදහස ලබාගත් දින ඉඳලා 2015 ජනවාරි 08 වෙනතුරුම ණය වුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7යි. අවුරුදු 4 1/2ක යහ පාලන ආණ්ඩුව කාලයේ ආසන්න වශයෙන් තව ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක් ඒකට එකතු කළා. එහෙම කරපු කට්ටියක් "දෙන්න අපිට. අපි මේක නියමෙට කරලා පෙන්වන්නම්" කියනකොට රටේ මහජනයා කල්පනා කරනවා, කොහෙන්ද හිනා වෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැමෝම පුරුදු වෙච්ච දේශපාලන සෙල්ලමක් තිබෙනවා. ඒ දේශපාලන සෙල්ලම කරන්න පුළුවන් කාලයක් තියෙනවා. අපි දැන් මුහුණ දීලා ඉන්නේ එහෙම කාලයකට නොවෙයි. තමුන්නාන්සේලා අපි කවුරුත් දන්නවා, 1977දී ජේ.ආර් ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගෙනාපු ප්‍රතිපත්තිය බල්ලට දාලා, මේ රටේ නිෂ්පාදනය බල ගන්වන ප්‍රතිපත්තිය බල්ලට දාලා, දේශීය ආර්ථිකය බලගන්වන ප්‍රතිපත්තිය බල්ලට දාලා, විවෘත ආර්ථික ප්‍රතිපත්තියට මේ රට හරවපු බව. ඒ විවෘත ආර්ථික ප්‍රතිපත්තියට මේ රට හරවලා විදේශ ණය ප්‍රාග්ධනයට දොරටු විවෘත කරලා, ඕනෑ එකටයි, එපා එකටයි ණය අරගෙන, නාස්තිකාර සමාජ, ආර්ථික ගමනකට මුල පිරුවා. ලෝකයේ ගොඩක් රටවල් විවෘත වෙළෙඳ පොළ ආර්ථිකය භාර ගන්නේ තමන් ශක්තිමත් පදනමකට ඇවිල්ලායි. ජපානය නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකයට මාරු වුණේ, ඉතා බලවත් නිෂ්පාදන ආර්ථික පදනමක් හදාගෙනයි. අදත් ජපානයට වෙන රටකින් හාල් ගෙනයන්න බැහැ. බාහිර ප්‍රාග්ධනයට විවෘත වෙන්න පුළුවන්; නිදහස් වෙළෙඳ පොළ ක්‍රමයකට යන්න පුළුවන්. හැබැයි, ඒකට ඔරොත්තු දෙන තත්ත්වයක් සහිතව. එහෙම ඔරොත්තු දෙන තත්ත්වයක් හදාගන්නේ නැතුව එතුමා නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකයකට මාරු වුණා. ඒකේ මුල් කාලය ඉතා චූන් කාලයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මුල් කාලයේදී හම්බ වෙන

ඕනෑම ව්‍යාපෘතියක ණයවලින් කුට්ටියක්වත් කඩා ගන්නවා. ඒ ව්‍යාපෘතිය කෙරෙනවා. එහි ප්‍රතිලාභ ලැබෙනවාද, නැද්ද කියලා දන්නේ නැහැ. මෙන්න මෙහෙම ආපු ගමනක්; ආණ්ඩුවෙන් ආණ්ඩුවට මෙහෙම ආපු ගමනක් තිබෙන්නේ. ඒ ගමනේ මුල් කාලයේ ඉතා සතුටින් යන්න පුළුවන්. මධ්‍යම පන්තිය අලුතෙන් හැදෙනවා. ඒ අලුත් මධ්‍යම පන්තියට අලුත් ජීවන රටාවක් ලැබෙනවා. ඒ අලුත් මධ්‍යම පන්තියට සමාජ තත්ත්වය, පිළිගැනීම නැහැ. ඒකට සිංහ සමාජය - Lions Club - හැදෙනවා; අර club හැදෙනවා; Rotary Club හැදෙනවා. ඒ අලුත් මධ්‍යම පන්තිය ඒවායේ සාමාජිකයන් වෙනවා. ඒවායේ සාමාජිකයෝ වුණාම ඉතිරි කර ගත්ත සල්ලිවලින් ඇමෙරිකාවේ යන්න ඉක්මනට වීසා ගන්න පුළුවන් වෙනවා. මේ විධියේ සමාජ, ආර්ථික පරිවර්තනයක් මේක ඇතුළේ ඇති වුණා; ඉතා බලවත් මධ්‍යම පන්තියක් නිර්මාණය වුණා. ඒ උත්පාත අවධියේ. වෙළෙඳ පොළ ධනවාදයේ උත්පාත අවධිය හරිම චූන්. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි ඉන්නේ අවපාත අවධියේ කෙළවර. මේ කෙළවර මීට පොඩ්ඩක් ප්‍රමාද වෙලා හම්බ වෙන්න තිබුණා. හැබැයි හිතුවාට වඩා කලින් අපට ඒ කෙළවර මුණ ගැහිලා තියෙනවා.

මොකක්ද හේතුව? විශේෂිත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ කොවිඩ් වසංගත තත්ත්වය නිසා සාමාන්‍යයෙන් මේ රටට ලැබෙන ඩොලර් ආදායම හීන වුණා. විදේශ සංචාරකයන්ගෙන් ලැබෙන ඩොලර් ආදායම හීන වුණා, විදේශ රැකියාලාභීන්ගෙන් ලැබෙන ඩොලර් ආදායම හීන වුණා. ඩොලර් ආදායම හීන වීමත් එක්ක, මීට ටික කාලයකට පසුව මුණගැහෙන්න තිබුණු අවපාත අවධියේ තීරණාත්මක කඩඉමට අපට දැන් මුහුණ දෙන්න වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා කියනවා, මේක වර්තමාන පාලකයන්ගේ නිර්මාණයක් කියලා. නැහැ. 1977 ඉඳලා ණය මත යැපෙන, ණය අරගෙන අය වැය පරතරය පියවන, ණය අරගෙන රාජ්‍ය සේවකයාගේ වැටුප ගෙවන, ණය අරගෙන ඵලදායී නොවන ව්‍යාපෘති වෙනුවෙන් යොදවන, ඒ නාස්තිකාර ක්‍රමවේදය පවත්වාගෙන ආපු සියලු දෙනා වගකිව යුතුයි අද මේ වෙලා තිබෙන තත්ත්වයට. කොවිඩ්-19ත් එක්ක අපි හිතුවාට වඩා වේගයෙන් මේ තත්ත්වය බරපතළ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ අවපාත අවධියේ අපට පරණ සෙල්ලම කරන්න බැහැ. අවපාත අවධියේ කෙළවරට ඇවිල්ලා තිබෙන වෙලාවක "අපි ආවොත් මේක නග්ගලා ගන්නවා" කියලා බොරු චූන් කථා කියන්න බැහැ. විපක්ෂයේ සිටින නායකයෙක් එක වතාවක් කිව්වා, "යුද්ධයක් වුණාම ඒක කොයි වෙලාවේ හෝ ඉවර වෙනවා, යුද්ධය ඉවර වන වෙලාවේ මහින්ද රාජපක්ෂ ජනාධිපති වෙලා හිටියා, එච්චරයි" කියලා. මම මේක එතුමාට ගරහන්න කිව්වා නොවෙයි, අවස්ථාවට ගැළපෙන නිසායි කිව්වේ.

ඒ තර්කය අනුව මට කියන්න තිබෙන්නේ, "විවෘත වෙළෙඳ පොළ ආර්ථිකයේ උත්පාත අවධියක් තිබෙනවා වාගේම, අවපාත අවධියකුත් එනවා. අවපාත අවධියේ කෙළවර වෙනකොට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වෙලා සිටියා" කියලා. මක් කරන්නද? කොහොමත් අවපාත අවධියක් එනවා නේ. අවපාත අවධියේ කෙළවරක් එනවා. කෙළවරට එනකොට මේ ආණ්ඩුව තිබෙනවා. ඒ වෙලාවේ විපක්ෂයේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණා නම්, "තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණා" කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරණ දේශපාලන සූදුවෙන් මේකට මුහුණ දෙන්න බැහැ, ඒ සූදුවට යන්න පුළුවන් උපරිම දුර ඇවිල්ලා ඉවරයි කියන එක අපි පිළිගන්න ඕනෑ. එම නිසා, මේ තීරණාත්මක වෙලාවේ ඩොලර් ආදායම උපදවා ගන්න විධි ගැන සොයන්න, මේ රටේ නිෂ්පාදන බලගන්වන්න, ආනයන වෙළෙඳ පොළ ඇතුළේ අපේ නිෂ්පාදනවලට තිබෙන අවකාශය වැඩි කර ගන්න, ඒ සඳහා දැවැන්ත නිෂ්පාදන පුනරුදයකට ගමන් කරන්න අපට අලුතින් කල්පනා කරන්න සිද්ධවෙලා තිබෙනවා. එවැනි පියවරකට බලසම්පන්නව යෑම තමයි රජයක් හැටියට අපි කවුරුත් එකතුවෙලා කළ යුතුව තිබෙන්නේ.

අද අපේ ගොවිතැන පිළිබඳව විශාල සංවාදයක් ඇතිවෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා මේ රටේ කෘෂි කර්මාන්තයට කාබනික ගොවිතැන හඳුන්වාදෙන්න කටයුතු කළේ සද්භාවයෙන් කියන එක අපි දන්නවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී සද්භාවය පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මෙතැන මොකක් හෝ වරදවා ගැනීමක් තිබෙනවා. රසායනික පොහොර කෘෂි කර්මාන්තය, වාණිජ කෘෂි කර්මාන්තය, කාබනික කෘෂි කර්මාන්තය වෙනුවට මේක ස්වාභාවික කෘෂි කර්මාන්තය විධියට තේරුම් ගන්න ඕනෑ.

අපි ලෙඩක් හැදුණාම දොස්තර මහත්මයා ළඟට යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දොස්තර මහත්මයා කියනවා, "ඔබගේ ඇඟේ අහවල් විටමින් එක නැහැ, ඒ විටමින් එක ගන්න" කියලා. එතකොට අපි ඒ විටමින් එක ගන්නවා. හැබැයි, සමහර දොස්තරලා අහවල් බෙහෙත වැඩි වැඩියෙන් නියම කරන කොට ඒ ප්‍රමාණයට ඒ ගොල්ලන්ට ඖෂධ සමාගම්වලින් ගෙවනවා. ඒ ගෙවන නිසා රෝගියාගේ ඇඟේ "සී" විටමින් තිබුණත්, "සී" විටමින් බොන්න කියලා ඒ දොස්තරලා කියනවා. මම මේ කියන්නේ, සද්ගුණවත් දොස්තරලා ගැන නොවෙයි, එසේ නොවන දොස්තරලා ගැනයි. ගොවිතැන කියන්නේත් එහෙම එකක්.

1977ට කලින් "වගා මහත්තයා" කියලා කෙනෙක් සිටියා. වගා මහත්තයා තමයි වගා කරන කෙනාගේ ගෙදරට එන්නේ. ඇවිල්ලා පස ගැන බලනවා. "මේ පසට අහවල් පොහොර මෙච්චර දැම්මාම ඇති, මීට වඩා දාන්න එපා" කියනවා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මුලින්ම කළේ "වගා මහත්තයා" තනතුර නැති කරන එක. එතුමා "වගා මහත්තයා" කියන තනතුර අයින් කළා. අයින් කරලා මොකක්ද කළේ? "වගා මහත්තයා" අයින් කරලා, පොහොර සමාගම්, පොහොර වෙළෙන්දා ගොවියාගේ වගා සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය නියම කරන කෙනා බවට පත් කළා. වගා මහත්තයාගේ උපදේශය නැති වුණා. නයිට්‍රජන් තිබෙන පසට නයිට්‍රජන් පටවන්න පටන් ගත්තා. පොස්පේට් තිබෙන පසට පොස්පේට් පටවන්න පටන් ගත්තා. වෙන්න ඕනෑ ඒක නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්වාභාවික ගොවිතැන කියන්නේ වෙන එකක්. මගේ ශරීරයේ විටමින් අඩු නම්, ඒ අඩු විටමින් ප්‍රමාණය නියමිත මාත්‍රාවෙන් දෙන්න ඕනෑ. වගාවේදී නම්, ඒ නියමිත මාත්‍රාව රසායනික පොහොරවලින් දුන්නත් කමක් නැහැ, කාබනික පොහොරවලින් දුන්නත් කමක් නැහැ. එතකොට පස නියම ප්‍රමාණයට ආරක්ෂා වෙනවා, පසේ සාරවත්භාවය රැකෙනවා. අපට ලෙඩක් හැදුණාම සමහර වෙලාවට අපි ආයුර්වේද බෙහෙත් ගන්නවා, නැත්නම් දේශීය වෙදකමට අදාළ බෙහෙත් ගන්නවා.

සමහර ලෙඩවලට දේශීය වෙදකමේ ප්‍රතිකාර අපට සුදුසු නැහැ වාගේ නම්, අපි බටහිර වෛද්‍යකමෙන් ප්‍රතිකාර ගන්නවා. ඒ දෙකෙන් එකක් අපට තෝරාගන්න පුළුවන්. හැබැයි, මිනිස් ශරීරයට අවශ්‍ය ප්‍රමාණයටයි ඒක වෙන්න ඕනෑ. නමුත්, මෙතැනදී සම්පූර්ණයෙන් සිදු වුණේ රසායනික පොහොර සමාගම්වලට අවශ්‍ය දේයි. රසායනික පොහොර සමාගම් trips දෙනවා, වැඩියෙන්ම පොහොර විකුණන කඩයට. අහවල් ගමේ, අහවල් කඩේ මුදලාලි අහවල් පොහොර වැඩියෙන්ම විකුණා තිබෙනවා නම්, ඔහුට අවුරුද්ද අන්තිමට තායිලන්තයේ සතියක සවාරියක් ලබා දෙනවා. සමහර දොස්තරලාටත් එහෙමයි. අහවල් ඖෂධ සමාගමේ බෙහෙත් වැඩිපුර නියම කළාම, ඒ පවුලටම රට සවාරියක් හම්බ වෙනවා, අවුරුද්ද අන්තිමට. මම මේ කියන්නේ

[ගරු විමල් වීරවංශ මහතා]

හොඳ දොස්තරලා ගැන නොවෙයි, එතුමන්ලා මා ගැන උදහස් වෙන්න එපා. මම මේ කියන්නේ එතුමන්ලාට වෙනස් දොස්තරලා ගැන. එදා මේ සමාගම් මාෆියාවට පොහොර පිළිබඳ සම්පූර්ණ පාලනය බාර දුන්නා. "වගා මහත්තයා" අයින් කළා. රසායනික පොහොර සමාගම්කාරයාට සම්පූර්ණ බලය දුන්නා. ඒ මඟින් මේ රටේ මහා විනාශයක් වුණා. ඒ විනාශය වළක්වන්න එකවර කාබනික පොහොරවලට ගියාට බැහැ. ඒ විනාශය වළක්වන්න නම් කරන්න ඕනෑ ස්වාභාවික ගොවිතැනට යන එකයි. ස්වාභාවික ගොවිතැනේදී ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන් රසායනික පොහොරවලින් නම්, ඒකට ඉඩ තිබෙන්න ඕනෑ; ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කාබනික පොහොරවලින් නම්, ඒකට ඉඩ තිබෙන්නත් ඕනෑ. අපි උදාහරණයක් ගනිමු. අපේ ශරීරයට විටමින් "බී" ඕනෑ නම්, විටමින් "බී" කෑමවලින් ගන්න පුළුවන්; යකඩ ඕනෑ නම් ඒ අවශ්‍ය යකඩ ප්‍රමාණය කෑමවලින් ගන්න පුළුවන්. තම්පලා, නිවිති ආදිය කෑවාම එය ලැබෙනවා. ඒවා කන්නත් පුළුවන්. ඒවා කන්න බැරි නම් ඒ වෙනුවට ෆාමසියට ගිහින් පෙත්තක් ගන්නත් පුළුවන්. වඩා හොඳ, ඒ දේවල් කෑමවලින් ගන්නා එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාභාවික ගොවිතැනයි අප මෙහිදී මූලෝපායක් හැටියට ගෙනෙන්න ඕනෑ. එහෙම නැතිව සියයට සියයක් රසායනික, සියයට සියයක් කාබනික කියලා අපට මේක කරන්න බැහැ. මම අතිගරු ජනාධිපතිතුමාගේ සද්භාවයේ ප්‍රතිපත්තියට අභියෝග කරනවා නොවෙයි, මේ. නමුත් අපි මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. එහෙම කළොත් තමයි අපට පුළුවන් වන්නේ වාණිජ ගොවිතැනක් කරන්න. අපේ ගෙදර, අපේ ගෙවත්තේ වගා කරගෙන අපට කන්න හදා ගන්නවා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් මේක වාණිජ ව්‍යාපාරයක්; වාණිජ ගොවිතැනක්. වෙන අය වෙනුවෙන් නිපදවන්නේ. ඒකට තිබෙන්න ඕනෑ, ඒ ඉඩ ප්‍රස්ථාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, අද ලෝකයේම නිෂ්පාදනය බිඳ වැටී තිබෙන බව. චීනයේ නිෂ්පාදනය බිඳ වැටිලා. කොවිඩ්-19 වසංගතයත් එක්ක ලෝකයේ සැපයුම් මාර්ග අඩාළ වෙලා. වෙනදා භාණ්ඩ ප්‍රවාහන නැවක කන්ටේනර් 100ක් ගෙන ගියා නම්, අද ගෙන යන්නේ 10යි. අද ඒ සැපයුම් මාර්ග බිඳ වැටිලා. ඒවාට ගෙවන්න තිබෙන මිල සියයට 200කින්, 300කින් ඉහළ ගිහිල්ලා. අමු ද්‍රව්‍යවල මිල ඉහළ ගිහිල්ලා. මේ වාගේ හේතු මත අද නිෂ්පාදනය අඩාළ වෙලා සහ කෙරෙන නිෂ්පාදනයේ පිරිවැයත් වැඩි වෙලා. ඒ නිසාම අපේ රටට විදේශ රටවලින් ගෙනෙන නිෂ්පාදනවල, අමු ද්‍රව්‍යවල මිල වෙන කවරදාටත් වඩා අද ඉහළ ගිහිල්ලා. ජාත්‍යන්තර වශයෙන් මේ තත්ත්වය තවත් වැඩි වන ලකුණු මිස අඩු වන ලකුණු අප ඉස්සරහා පිට විද්‍යමාන වන්නේ නැහැ. අපි දැන් මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක කාලයක මේ සම්බන්ධයෙන් සූත්‍රගත වෙලා තිබුණේ, "රටින් තමයි අඩුම වියදමට බඩු ටික එන්නේ. ඒ නිසා අපි වවලා වැඩක් නැහැ. අපේ පිරිවැය වැඩියි. එහේ පිරිවැය අඩුයි. අපිට අහවල් එක හදන්න රුපියල් 100ක් යනවා නම් එහේ එක එනවා රුපියල් 50ට. ඒ නිසා මෙහේ හදන එක බොරු වැඩක්. එහේ හදන එක ගෙනැල්ලා කන එක තමයි නියම වැඩේ." කියලායි. දැන් ඒ සූත්‍රය අභියෝගයට ලක් වෙමින් යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් නැවෙන් වෙනදා එන තරම් තොග එන්නේ නැහැ, ටිකයි එන්නේ. ඒ ටිකත් ගණන්. ඒ ටික හැමෝටම බෙදන්නත් බැහැ.

දැන් අපේ රජය සහල් මිල දී ගන්න උත්සාහ කරනවා, වෙනත් රටවලින්. මා දන්නා තොරතුරු අනුව දැන් ගොඩක් රටවල් තමන් සතුව තිබෙන සහල් වෙන රටවලට දෙන්නේ නැහැ. ඇයි, ඒ? ඔවුන් හිතනවා, ඉදිරියේදී ආහාර අර්බුදයක් එයි, ආහාර සැපයීම පිළිබඳ අභියෝගයක් එයි කියලා. ඒ නිසා ඔවුන් ඒවා තමන්ගේ අතිරික්තයක් හැටියට ගොඩගසා ගන්නවා මිස ඒවා එළියට දෙන්නේ නැහැ. මෙන්න මේ විධියේ තැනක අපි ඉන්නේ. ඒ නිසා "පිටින් ගෙනෙන එකේ පිරිවැය අඩුයි, ඒක හොඳයි, ඒක රහයි" කියලා කාපු යුගය ඉවරයි.

දැන් අපට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? විවෘත වෙළෙඳ පොළ ආර්ථිකයේ උත්පාත අවදියේ ගොඩනගා ගත් ජීවන රටාව, මධ්‍යම පාන්තික ජීවන රටාව, ආනයනික භාණ්ඩ, branded භාණ්ඩ පරිභෝජනය කළ ජීවන රටාව දැන් අභියෝගයට ලක් වෙන්න පටන් ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක අභියෝගයට ලක් වෙන්නේ ලංකාවේ විතරක් නොවෙයි. සිංගප්පූරුවත් සියයට 10කට ආසන්න අගයකින් ඉන්ධන සහ ගෑස් මිල ඉහළ දැම්මා. ඔවුන්ට ඒක නොකර ඉන්න බැහැ. ඒ නිසා එකවර සියයට 10කට ආසන්න ගණනකින් මිල ඉහළ දැම්මා. දැන් ඒ රටේ සියලු පරිභෝජන භාණ්ඩවල මිල ගණන් ඉහළ ගිහිල්ලා; සේවාවල මිල ඉහළ ගිහිල්ලා.

ඒ නිසා සිංගප්පූරුව කියන රටේ අද ජීවත් වීම අභියෝගයක් බවට පත්වෙලා. ඇමෙරිකා එක්සත් ජනපදයේ -විපක්ෂයේ ඉන්න මහත්වරුන්ගේ පරමාදර්ශී යුටෝපියාවේ- තමයි මේ වකවානුවේ වැඩිම homeless people ඉන්නේ. ඒ ගොල්ලෝ ඒ අයට "හිඟන්නෝ" කියන්නේ නැහැ. ඒ ගොල්ලන් කියන්නේ "homeless people" කියලායි. හරි වැදගත්! ඉතිහාසයේ වැඩිම homeless people ඉන්නේ මේ වකවානුවේ ඇමෙරිකාවේ. ඒ, ඉන්න හිටින්න තැනක් නැතිව මහ පාරට වැටිච්ච අය. *[බාධා කිරීම්]* මොකක්ද? ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* එක් කෙනෙකු කිව්වා නම් හරි. *[බාධා කිරීම්]* මොකක්ද?

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ජනාධිපතිතුමායි, මුදල් ඇමතිතුමායි,- *[බාධා කිරීම්]*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ජනාධිපතිතුමාට ඒ චෝදනාව අදාළ වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව කියනවා, මෙය, ලෝක පරිමාණව බරපතළ සුළියක් කැරකෙන වෙලාවක් බව. කොවිඩ් - 19 වසංගතය අද අපට කියනවා, "නව යථාර්ථය" කියා දෙයක් ගැන. අපට අලුත් වචනයක් එකතු වුණා, "නව යථාර්ථය" කියලා. තමුන්නාන්සේලා දැන් "නව යථාර්ථය" තේරුම් ගෙන ඉන්න නිසා තමයි නහයයි, කටයි වැහෙන්න මාස්ක් එක දමාගෙන ඉන්නේ. මම කථා කරන කොට මාස්ක් එක ගැලෙව්වේ, ඒක දමාගෙන කථා කළොත් මහන්සිය වැඩි නිසා. දැන් නව යථාර්ථයක් තිබෙනවා. ඒ නව යථාර්ථය තුළ ජීවත් වෙන්න අද අපට බල කර තිබෙනවා. ඒක තේරුම් ගන්නේ නැතිව තමුන්නාන්සේලා ඔය දෙතුන්දාහක් ගෙනැල්ලා, පොඩි පෙළපාළියක් කරනවා. වැඩේ කියන්නේ, ඒක හරිම අපූරුයි! *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක හරිම අපූරුයි කියන්නේ මේකයි. ඒ පෙළපාළියේ කට්ටිය ඉන්නවා, කිටි කිටියේ ළංවෙලා. හැබැයි, මාස්ක් එකත් දමාගෙන. මාස්ක් එකකුත් දමාගෙන ඉන්නවා; ඒත් කිටි කිටියේ ළංවෙලා. මම හිතනවා, මේ දේවල් කියනවාට තමුන්නාන්සේලා කැමැති නැතිව ඇති කියා. මොන අඩු පාඩු ගැන තමුන්නාන්සේලා කිව්වත් vaccine කිරීමේ

කටයුත්ත මේ රජය බලසම්පන්නව කළා කියන එක පිළිගන්න වෙනවා නේ. *[බාධා කිරීම්]* අනේ මන්ත්‍රීවරුනි, ඒකත් කළේ නැහැ කියා පිළිගන්නේ නැත්නම් තමුන්නාන්සේලා ගැන කථා කරන්න දෙයක් නැහැ.

කොවිඩ් මර්දනය අතින් හරිත කලාපයට - green zone එකට - වැටිලා තිබෙන රටට කුමක් කරන්නද තමුන්නාන්සේලාට ඕනෑ? මේ නව යථාර්ථය තුළ අලුතින් විරෝධතා පවත්වන විධිය සොයන්න. පරණ, සාම්ප්‍රදායික මැට් මෝල් ක්‍රමයම අනුගමනය කරන්න එපා. මේ නව යථාර්ථය තුළ අලුත් ක්‍රම සොයන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඕක අපි ඊයේ කිව්වා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகுவிமல்வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
අලුත් ක්‍රම සොයන්න. ලෝකයේ එහෙම සොයාගෙන තිබෙනවා. ලෝකයේ එහෙම අලුත් ක්‍රම තිබෙනවා. එය, පරණ සාම්ප්‍රදායික ක්‍රමයම නොවෙයි; දහස් ගණනක් ජනතාව අරගෙන ඇවිල්ලා කොවිඩ් බෝ කරන ක්‍රමය නොවෙයි. සාම්ප්‍රදායික ක්‍රමයෙන් වෙන්නේ හරිත කලාපයේ තිබෙන මේ රට නැවත රතු කලාපයට යැමයි. එතකොට මොකද වෙන්නේ? සංචාරකයන් අපේ රටට එන එක නතර වෙනවා. එතකොට තමුන්නාන්සේලාට හොඳයි. සංචාරක ව්‍යාපාරය නතර වනවා. දැන් එය පොඩ්ඩක් පණ ගහලා එනවා. ඒක නැවත රතු කලාපයට ගියාම මොකද වෙන්නේ? මේ රටේ ගුවන් තොටු පොළවල් නැවත වහන්න වෙනවා. ඒ විධියේ තත්ත්වයකට නැවත මේ රට වැටෙනවා. එතැනට මේ රට වට්ටන එක නොවෙයි තමුන්නාන්සේලාගේත්, අපේත් යුතුකම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇමතිතුමා, New Fortress Energy එක ගැන,-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
New Fortress Energy එක ගැන මම ප්‍රසිද්ධියේ කියා තිබෙනවා. ඒ කථාව මට නැවත මෙතැන කියන්න පුළුවන්. මොකක්ද, ප්‍රශ්නය? *[බාධා කිරීමක්]* New Fortress Energy එක ගැන උසාවියේ නඩුවක් විභාග වෙනවා. ඒ විභාග වන නඩුවට මමත්, වාසුදේව නානායක්කාර ඇමතිතුමාත්, උදය ගම්මන්පිල ඇමතිතුමාත් වෙනුවෙන් වෙනම නීතිඥවරයෙකු ඉදිරිපත් කරලා, අපේ මතය අපි උසාවියට ඉදිරිපත් කරනවා. ඒක තමුන්නාන්සේලා පටලගන්න එපා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක ප්‍රශ්නයක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகுவிமல்வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
New Fortress Energy එකේ ප්‍රශ්නය මේකත් එක්ක පටලගන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඕක ජනාධිපතිතුමාට කියන්න කෝ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමන්ලා කියන්න ඕනෑ නැහැ, ජනාධිපතිතුමාට කියන්න ඕනෑ ඒවා. ඒවා අපි කර ගන්නම්.

අපි මේ කියන්නේ පොදු දෙයක්. මේ රටේ කර්මාන්තකරුවන් ටික වැඩ පටන් ගත්තා. ආයෙත් මේ රට රතු කලාපයට ඇදගෙන ගිහින් කර්මාන්ත ටික වස්සවන්න එපා. මේ රටට සංචාරකයන් එන්න පටන්ගත්තා විතරයි. ආයෙත් මේ රට රතු කලාපයට ඇදගෙන ගිහිල්ලා, සංචාරක ව්‍යාපාරය වට්ටන්න එපා. මේ රටේ සුළු ව්‍යාපාරිකයා කඩේ ඇරියා; ආපසු මේ රට රතු කලාපයට අරගෙන ගිහිල්ලා, ඒ කඩේ වස්සන්න එපා. ඒ අපරාධය කරන්න එපා. විරෝධතාවලට නව ක්‍රමෝපායයන් සොයන්න. නව යථාර්ථයට ගැළපෙන විරෝධතා ක්‍රම සොයන්න. ඒකටවත් නිර්මාණශීලි බවක් නැත්නම් මොකටද ආණ්ඩුවක් ඉල්ලන්නේ? නව යථාර්ථයට ගැළපෙන විරෝධතා පවත්වන ක්‍රමය ගැනවත් සොයා ගන්න තරම් චින්තන ශක්තියක් නැත්නම්, සිතීමේ පරාසයක් නැත්නම් එහෙම අය ආණ්ඩු ඉල්ලන්නේ කොහොමද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අහගන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகுவிமல்வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මේ පවතින ආණ්ඩුව සමඟ තමුන්නාන්සේලාට ගැටුම් ඇති. අප අතරත් එවැනි ගැටුම් තිබෙන්න පුළුවන්. ඒ මොන ගැටුම් තිබුණත්, මේ රට සෞඛ්‍ය සම්පන්නව, නිරෝගීව සහ මේ රටේ ජනතාවගේ ජන ජීවිතය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යන්න උදවු වන එක අප කාගේත් වගකීමක්. ඒක නොකර, අපි මුහුණත් එක්ක තරහ වෙලා, නහය කපා ගත යුතු නැහැ. ආණ්ඩුවක් එක්ක තිබෙන ප්‍රතිවිරෝධයට මුළුමහත් සමාජයම නැවත කොවිඩ්-19 රෝගීන්ගෙන් පිරිලා ඉතිරිලා යන ඉරණමකට ඇද වැට්ටිය යුතු නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු ඇමතිතුමා, -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමා, මට පොඩි වෙලාවයි තිබෙන්නේ.

අපි මේ ආණ්ඩුවේ අපාය සහාය මිත්‍රයෝ නොවෙයි; අපාය සහාය ඥාතියෝ නොවෙයි. අපිට ඕනෑ ආණ්ඩුව නිසි මඟක රැගෙන යන්න. අපිට ඕනෑ රටට, ජනතාවට හිතකරව ඒ ගමන යන්න මිසක් ආණ්ඩුවට ලැබිච්ච ජනවරමට පටහැනි වෙන දෙයක් බලා ගෙන ඉන්න නොවෙයි. ඒක අපාය සහාය මිත්‍රයන්ගේ වගකීමක්. අපාය සහාය මිත්‍රයෝ කවදාවත් ආණ්ඩුවක් හරි පැත්තට ගෙනියලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා අපි මේ නව යථාර්ථය - සෞඛ්‍යමය පැත්තෙන් එල්ල වෙලා තිබෙන අභියෝගය - පිළිගත යුතුයි.

[ගරු විමල් වීරවංශ මහතා]

ඊළඟ කාරණය තමයි, ආර්ථිකයේ තිබෙන අභියෝගය. විවෘත වෙළඳපොළ ආර්ථිකය අවපාත අවධියේ කෙළවරට ආපු රටක්, මේ. එතැනදී අපට සෙල්ලම් කරන්න බැහැ. ඔබතුමන්ලා ආවත් මේ යථාර්ථයට මුහුණ දෙන්න වෙනවා. වෙනදා විධියට ණය හම්බ වෙන්නේ නැහැ. වෙනදා විධියට ආධාර හම්බ වන්නේ නැහැ. ඩොලර් ආදායම උපදවා ගැනීමට වෙනත් විකල්ප මාර්ග නැහැ. එම නිසා අපට සිද්ධ වෙලා තිබෙනවා, නිෂ්පාදනය බලගන්වන ආර්ථික මූලෝපායකට ගමන් කරන්න. ඒ හැර වෙන උත්තරයක් නැහැ. එම නිසා නිෂ්පාදන ආර්ථික මූලෝපාය බලගැන්වීමේ අවශ්‍යතාව වෙනුවෙන් තමයි හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම කර්මාන්ත කලාප එක බැගින් ඇති කිරීම සඳහා ගරු මුදල් ඇමතිතුමා මේ අයවැයෙන් මුදල් වෙන් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පුළුවන් හැමදාම ගහපු තුරුම්පු අදින්න. ඔබතුමන්ලා අරක කියයි; මේක කියයි. කියන කථාවලින් මේ රටට සෙතක් වෙන්නේ නැහැ. අපේ රටේ ජනතාවට අද පරණ පුරුදු ජීවන රටාව පවත්වා ගෙන යන්න හම්බ වෙන්නේ නැහැ. ඒකෙන් එළියට එන්න වෙනවා. බල කරලා තිබෙනවා. මේක තමයි අපි ආපු ගමනේ තර්කානුකූල කෙළවර. ඒ ආපු ගමන හොඳනම් එහෙම කෙළවරක් අපිට මුණ ගැහෙන්නේ නැහැ. නමුත් මේක තමයි ආපු ගමනේ තර්කානුකූල කෙළවර, 1977 ඉඳන් මේ රට ආපු ගමනේ තර්කානුකූල කෙළවර. එදා සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනියගේ ගමනට වළ කපලා, සමච්චල් කරලා, "පෝලිම් යුගය" කියලා නැති අවලාද නඟලා, දේශීය නිෂ්පාදනය, නතර කරන්න මොන තරම් උත්සාහ කළාද? දෙයියනේ! අර උපාලි රේඩියෝ එක හැදිච්ච කාලයේ, ෆියට් කාර් එක හැදිච්ච කාලයේ, කෘෂිකර්මාන්තයට පණ දීපු කාලයේ මේ රටේ සියලුම නිෂ්පාදන, රාජ්‍ය ආයතන, වානේ සංස්ථාව වෙන්න පුළුවන්, එහෙම නැත්නම් Paranthan Chemicals Company Limited වෙන්න පුළුවන්, වාලච්චේන කඩදාසි කම්හල වෙන්න පුළුවන්, - *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Paranthan Chemicals Company Limited එක ඒ කාලයේ මියන්මාරයට, බංග්ලාදේශයට පවා අපේ chemicals යවා තිබෙනවා; විකුණලා තිබෙනවා. එහෙම තිබිච්ච ආයතන. ඒ, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නැඟිටීම. මේ රටේ දාස මුදලාලිගේ තිබුණු ඇඟළුම් නිෂ්පාදන, ඒ ඔක්කෝම සුනු විසුනු කරලා, වෙළඳ පොළ විවෘත ආර්ථිකයට අරගෙන ඇවිල්ලා බදා ගෙන, ඒකේ ණයවලින් "චූන්" වෙලා ආපු ගමනේ අවසානයේ මුණ ගැහෙන කෙළවර තමයි දැන් අපි ඉන්නේ. එම නිසා මුල් කාලයේ දේශපාලනයෙන් මේ අභියෝග ජය ගන්න බැහැ. මේකට වෙනස් විධියකට හිතන්න ඕනෑ; මේකට වෙනස් විධියකට ප්‍රවේශ වෙන්න ඕනෑ. සම්ප්‍රදායික දේශපාලන උපාය, උපක්‍රමවල පැවැත්මක් නැහැ. අද මේ රට ඉල්ලන්නේ එහෙම ගමනක් නොවෙයි. පවතින ආණ්ඩුව පිළිබඳව මිනිසුන්ට වේදනාවක්, කනගාටුවක් තිබුණත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මෙතුමන්ලාගේ නාස්තිකාර දේශපාලන ව්‍යාපෘතිය මේ රටේ ජනතාව බදා වැළඳ ගන්නවාය කියලා. එහෙම නම් බුදු අම්මේ! ඊයේ ඉන්න එපාය කෙළකෝටියක් ජනතාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දාහයි, දාහයි හිටියේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මම දැක්කා 100ක්, 200ක් ජනාධිපති ලේකම් කාර්යාලය පැත්තට යනවා. ගරු මුජිබර් රහුමාන් මන්ත්‍රීතුමනි, අපි ආවේ නැහැ කිරි පිටි බෙදන්න. බඩ බුරුල් වෙන කිරි පිටි බෙදන්න අපේ කවුරුත් ආවේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මැයි දින රැළියට ගාලු මුවදොර පිටිය පිරෙව්වා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඇත්තටම ඔබතුමන්ලා, - *[බාධා කිරීම්]* මොකක්ද? *[බාධා කිරීමක්]* ආ! ඒකද? පරීක්ෂා කර බලන්න එපාය, ඔබතුමන්ලා ෂුවර් නැහැ නේ, කොහොම එනවාද කියලා. හොඳ ඉතිහාසයක් නොවෙයි නේ තිබෙන්නේ. කඩු හංගපු ඉතිහාසයක් නේ තිබෙන්නේ. පොඩ්ඩක් හොයලා බලන්න එපායැ. ඒක සාමාන්‍යයෙන් නීතියේ පැවැත්ම වෙනුවෙන් කරන දෙයක්. බස් නවත්වන්න තරම් සෙනඟක් හිටියේ නැහැ නේ අප්පා! *[බාධා කිරීම්]* දුකයි තමයි. මට තේරෙනවා, හිතේ තිබෙන වේදනාව. "ඉවසපන් පපුව!" කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එම නිසා අපි හැමෝම, -*[බාධා කිරීමක්]* මොකක්ද? මම දැන් ඔබතුමන්ලාට සතුටු වෙන කථාවක්ද කරන්න ඕනෑ. මට කලින් කියන්න එපායැ. මම හොඳට හදා ගෙන එනවා නේ ඔබතුමන්ලාට "චූන්" වෙන කථාවක්. අපි ඇත්තට මුහුණ දෙමු. *[බාධා කිරීමක්]* විරුද්ධ පක්ෂය බොරු, චූන් කථාවලින් පිනවන්න නොවෙයි අපි ඉන්නේ.

මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් අපි භාරගත් වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉෂ්ට කරන්නයි අපි කැප වෙලා ඉන්නේ. ඒක අපි දිවි හිමියෙන් ඉටු කරනවා. තමුන්නාන්සේලාව චූන් කරන්නේ නැහැ. අවුරුදු හතරහමාරක් මේ රට බංකොලොත් කරපු, තිබුණු ණය බර එකට එකක් වැඩි කරපු, *[බාධා කිරීමක්]* නැති ත්‍රස්තවාදයකට පණ දීපු, *[බාධා කිරීමක්]* ඉස්ලාම් ත්‍රස්තවාදයට පණ දීපු *[බාධා කිරීමක්]* මේ කට්ටිය චූන් කරන්න අපි මොකටද දේශපාලනය කරන්නේ? ඊට වඩා හොඳයි, ගමට ගිහිල්ලා කුඹුරක් කොටාගෙන ඉන්නවා. මේ නසරානි රැළට අපි මොකටද චූන් දෙන්නේ? [බාධා කිරීමක්] අද උත්තරය ඒක නොවෙයි. මේ රටට අවශ්‍ය උත්තරය ඒක නොවෙයි. එහෙම උත්තරවලට අපි ගින්දර සපයන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටට සාධාරණය ඉටු කරන්න ඕනෑ. මේ රට තිබෙන තීරණාත්මක තැනින් උඩට ගන්න ඕනෑ. මේක වළ පල්ලට ගියාම සතුටු වෙන්න නොවෙයි අපි ඉන්නේ. එතැනට වැටෙන එක වළක්වා මේ රට

ගොඩගන්නයි අපි ඉන්නේ. ඒ සඳහා අපි සියලුදෙනාම හැකි උපරිමයෙන් කැපවෙමු කියන ආරාධනාව කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තවරාජා කලෛයි අරසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[மு.ப. 11.52]

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2022ஆம் ஆண்டுக்காகச் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே எனக்கும் பேசக் கிடைத்தமையை யிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இந்த வரவு செலவுத்திட்டத்தில் சுகாதாரத்துக்காக ஏறக்குறைய 153.53 பில்லியனும், கல்விக்காக 127.61 பில்லியனும் ஒதுக்கப் பட்டுள்ளதை நாங்கள் பார்க்கமுடிகின்றது. அவ்வாறு பார்க்கிறபொழுது, இந்த ஆண்டிலே பாதுகாப்பு அமைச்சுக் காகக் கிட்டத்தட்ட 373.05 பில்லியனும், பொதுமக்கள் பாதுகாப்பு அமைச்சுக்காக ஏறக்குறைய 106.56 பில்லியனும் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இந்த இரண்டு ஒதுக்கீடு களையும் நாங்கள் பார்க்கின்றபோது, ஒட்டுமொத்தமாகப் பாதுகாப்புச் செலவுக்காக மொத்த நிதியில் 19.2 வீதம் - கிட்டத்தட்ட 479 பில்லியன் - ஒதுக்கீடு செய்யப்பட்டிருப் பதைக் காணமுடிகின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டிலே தற்பொழுது 'கொவிட்' தொற்றினால் ஏற்பட்ட பொருளாதார வீழ்ச்சியினால் மக்கள் மத்தியிலே பாரிய சுமைகள் சுமத்தப்பட்டிருக்கின்ற இந்தக் காலகட்டத்தில் இவ்வாறு பாதுகாப்புக்காக அதிக நிதி ஒதுக்கீடு செய்வது எந்தவகையில் நியாயம்? என்பதை இந்தச் சபையிலே கேள்வியாக நான் தொடுக்கின்றேன். குறிப்பாக, இந்த நாட்டிலே ஒரு யுத்தம் நடைபெற்றபோது ஒதுக்கப்பட்டளவு நிதியே இப்போதும் இங்கு ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. உண்மையிலே இதனை ஏற்புடைய விடயமாக நாங்கள் பார்க்கவில்லை. இந்த நாட்டிலே கல்விக்காக ஒரு பிரஜைக்கு 5,253 ரூபாய் 44 சதம், சுகாதாரத்துக்காக 7,042 ரூபாய் 61 சதம் என்ற வகையில் இரண்டுக்குமாக 12,295 ரூபாய் ஒதுக்கீடு செய்யப் பட்டிருக்கின்ற அதேவேளை, பாதுகாப்புக்காக ஒரு தனி மனிதனுக்கு 22,000 ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டிலே யுத்தம் நடைபெற்றிருக்கின்றது; பல பாதிப்புக்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. இந்த விடயங்களை யெல்லாம் பொருட்படுத்தாது, பாதுகாப்புக்காக இவ்வாறு நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்ற விடயம் எங்கள் மனதில் அச்சத்தை ஏற்படுத்துகின்றது. ஏனென்றால், யுத்தம் முடிந்த கையோடு எமது வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே பல முன்னெடுப்புக்கள் மேற்கொள்ளப்படுகின்றன. குறிப்பாக, தொல்பொருள் திணைக்களம், வன பரிபாலன இலாகா போன்றவற்றின் பின்னணியிலிருந்து இராணுவத்தினர் செயற் படுகின்றனர். இவ்வாறான நிதி ஒதுக்கீடுகள் எங்களுடைய பிரதேசங்களை ஆக்கிரமிக்கின்ற விடயத்துக்காகக் கையாளப் படுமோ என்ற அச்சம் எங்கள் மனதிலிருக்கின்றது.

இந்த நாட்டின் கடன் சுமையின் காரணமாக ஒவ்வொரு குடிமகனும் 72,429 ரூபாய் கடனாகவும் 50,033 ரூபாய் வட்டியாகவும் செலுத்தவேண்டிய ஒரு நிலைமையிருக்கின்றது. ஆக மொத்தத்தில், இந்த நாட்டிலே ஒவ்வொரு குடிமகனும் கிட்டத்தட்ட 122,762 ரூபாய் கடன்காரனாக இருந்து கொண்டிருக்கின்றான். இவ்வாறு பாதுகாப்புக்கு ஒதுக்கப்பட்ட நிதியில் ஒரு குறிப்பிட்ட வீதத்தையாவது இந்த நாட்டிலே தமது கணவன்மாரை இழந்து வாழ முடியாமல் தத்தளிக்கின்ற அந்த உறவுகளுக்கு ஒதுக்கீடு செய்திருந்தால், உண்மையிலே நாங்கள் பாராட்டியிருக்கலாம். காணாமலாக்கப்பட்டோர் சம்பந்தமாக இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் சபையின் அமர்வில் பேசியிருந்தார். குறிப்பாக, காணாமலாக் கப்பட்டோர் தொடர்பில் இந்த வரவு செலவுத்திட்டத்திலே 300 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. ஆனால், கடந்த 12 வருடங்களாக இந்தக் காணாமலாக்கப்பட்டோரின் உறவுகள் தமது போராட்டங்களை முன்னெடுத்துக் கொண்டிருக்கின்றார்கள். இந்த நாட்டில் அவர்களுக்குரிய நீதியோ, நியாயமோ இற்றைவரைக்கும் கிடைக்கவில்லை. குறிப்பாக, இப்பொழுது மரணச் சான்றிதழ் சமர்ப்பிக்கப் பட்டால், 25,000 ரூபாய், 40,000 ரூபாய், 75,000 ரூபாய், 100,000 ரூபாய் என்ற அடிப்படையில் நட்ட ஈடு வழங்கப்பட்டுக்கொண்டிருக்கிறது. இந்தப் பணத்திற்காக எங்களுடைய காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவுகள் போராடவில்லை. மாறாக, அவர்களுக்கு இந்த நாட்டிலே ஒரு நியாயமான தீர்வு கிடைக்க வேண்டுமென்ற அடிப்படையிலே தான் போராடுகிறார்கள். அவர்களுக்கு ஏற்பட்ட இழப்பு இன்னுமொரு சந்ததியினருக்கு ஏற்படக்கூடாது என்பதன் அடிப்படையிலேதான் இந்தப் போராட்டத்தை முன்னெடுத்துக் கொண்டிருக்கிறார்கள்.

ஐக்கிய நாடுகள் சபையினூடாக இந்த அரசாங்கத்திற்குப் பல நிபந்தனைகள் விதிக்கப்பட்டிருந்தன. குறிப்பாக, 30/1 தீர்மானம், 34/1 தீர்மானம், 40/1 தீர்மானம், 46/1 தீர்மானம் போன்றவற்றின்மூலம் ஐக்கிய நாடுகள் சபையினால் இலங்கைக்குப் பல நிபந்தனைகள் விதிக்கப்பட்டிருந்தாலும் அந்த விடயங்களை ஏற்று, எந்தப் பணிகளையும் செய்யும் நிலையில் இந்த அரசாங்கம் இல்லை. ஐக்கிய நாடுகள் சபையினால் சொல்லப்படுவது ஒன்று! இந்த நாட்டிலே செய்யப்படுவது வேறொன்று! உள்ளகப் பொறிமுறை யினூடாக இந்த மக்களுக்குத் தீர்வுகளை வழங்குவது என்ற அடிப்படையிலேயே இந்த அரசாங்கம் செயற்படுகின்றது. ஆனால், இந்த நாட்டிலே கடந்த 12 வருடங்களாக உள்ளகப் பொறிமுறையினூடாக ஏதாவதொரு நல்ல விடயம் - போராட்டம் நடத்துகின்ற காணாமலாக்கப்பட்டவர்களின் உறவுகளுக்காக ஏதாவது நல்ல விடயம் - நடந்தேறி யிருக்கிறாதா? என்றால், அதற்கு "இல்லை" என்ற விடைதான் சொல்ல முடியும். அந்த அடிப்படையில், பாதிக்கப்பட்ட மக்களுக்கு குறிப்பாக, காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவுகளுக்குச் சர்வதேச சாசனத்தின்படி, வழங்கப்படும் எந்தவிதமான உதவிகளும் இந்த மக்களுக்கு இற்றைவரைக்கும் கிடைக்கப்பெறவில்லை என்பது அவர்களுடைய மனரீதியான ஆதங்கமாக இருக்கின்றது.

இந்த நாட்டிலே 1980ஆம் ஆண்டிலிருந்து 2009ஆம் ஆண்டு வரையான காலகட்டத்தில் 80,000 - 100,000 பேர் வரையில் காணாமலாக்கப்பட்டிருக்கிறார்கள். 2009ஆம் ஆண்டு சுமார் 146,700 பேர் காணாமலாக்கப்பட்டிருக் கின்றார்கள். எமது உறவுகள் இந்த நாட்டிலே நிலையான

[ගරු තවරාජා කලෛයි අරසන් මහතා]

சமாதானம் ஏற்பட வேண்டும்; காணாமலாக்கப்பட்டவர்கள் தொடர்பில் சர்வதேசம் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு தீர்வு கிடைக்க வேண்டும் என்ற அடிப்படையிலேதான் போராடு கின்றார்கள். ஏனென்றால், சுமார் 70 வருடங்களாக எமது இனம் சந்தித்த இழப்புகள் - பாதிப்புக்கள் எந்தவோர் அரசாங்கத்தினாலும் ஈடுசெய்ய முடியாதவையாகவே இருக்கின்றன. அந்தவகையிலே, இந்த நாட்டிலே ஒரு நிலையான சமாதானம் ஏற்படுத்தப்பட வேண்டும் என்பதிலே அவர்கள் உறுதியாக இருக்கிறார்கள்.

இந்த நாட்டில் காணாமலாக்கப்பட்டவர்களின் விடயம் சம்பந்தமாக ஐக்கிய நாடுகள் அமர்வில் இந்த நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் ஒரு கருத்தைக் கூறியிருக்கின்றார். அதாவது, "காணாமல் ஆக்கப்பட்ட அனைவருக்கும் நான் மரண சான்றிதழ் வழங்குவேன்" என்ற கருத்தை முன்வைத்திருந்தார். இந்தக் கருத்தின் பின்னணி என்ன? அப்படியாயின், இந்த நாட்டிலே காணாமல் ஆக்கப்பட்ட அனைவரும் மரணித்துவிட்டார்காளா? என்ற கேள்வி எழுகின்றது. அவ்வாறாயின், இந்த மக்களுக்கு நியாய பூர்வமான தீர்வு வழங்கப்பட வேண்டும். நாங்களும் இந்த நாட்டிலே சிறந்த பிரஜைகளாக, ஏனைய சமூகத்தோடு இணைந்து, ஏனைய சமூகத்தைப் போன்று சம உரிமையுடன் வாழவேண்டுமென்று நினைக்கின்றோம். இந்தக் காணாமலாக் கப்பட்ட உறவுகளின் போராட்டமென்பது ஒரு நியாய பூர்வமான போராட்டமாகும். இந்தப் பிரச்சினைக்கு ஒரு நியாயபூர்வமான தீர்வு கிடைக்கப்பெற வேண்டுமென்று சுமார் 12 வருடங்களாக அவர்கள் போராடிக்கொண்டிருக்கிறார்கள். இது சம்பந்தமாக இந்த அரசாங்கம் அவர்களுக்கு எந்தவிதமான கருணையும் காட்டவில்லை. ஆனால், இவ்வருடம் மாத்திரம் 300 மில்லியன் ரூபாவை ஒதுக்கியிருக்கின்றது. எங்களுடைய சமூகம் இந்தச் சலுகைகளுக்குச் சோரம்போகின்ற சமூகம் அல்ல; தமது உரிமைக்காகப் போராடுகின்ற இனம். ஒரு நிலையான சமாதானம் - சமத்துவம் இந்த நாட்டிலே நிலைநிறுத்தப்பட வேண்டும்; கடந்த 2009ஆம் ஆண்டு சந்தித்த அழிவைப் போன்ற ஓர் அழிவைத் தங்களுடைய எதிர்காலச் சந்ததியினர் சந்திக்கக்கூடாது என்ற அடிப்படையிலே எமது உறவுகள் போராட்டங்களை நடத்திக்கொண்டிருக்கிறார்கள். இந்த நாட்டில் நிலையான சமாதனம் கிடைப்பெற வேண்டும் என்ற அடிப்படையிலே நாங்களும் உறுதியாக இருக்கின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சுதந்திர மடைந்ததன் பிற்பாடு இந்த நாட்டில் தமிழர்கள் தொடர்ச்சி யாகப் பல இன்னல்களுக்கு முகங்கொடுத்து வருகிறார்கள். குறிப்பாக, கிழக்கு மாகாணத்தின் திருகோணமலை மாவட் டத்திலே ஆரம்பத்தில் 1871ஆம் ஆண்டு மேற்கொள்ளப்பட்ட முதலாவது குடிசன மதிப்பீட்டின்படி அங்கு கிட்டத்தட்ட 81 சதவீதமான தமிழர்கள் இருந்திருக்கின்றார்கள். கிழக்கு மாகாணம் முழுவதும் கிட்டதட்ட 74.52 சதவீதமான தமிழர்கள் இருந்திருக்கின்றார்கள். ஆனால், இந்த நாட்டிலே ஆட்சிக்கு வந்த பெரும்பான்மைத் தலைவர்கள் திட்டமிட்ட குடியேற் றங்களை பரீட்சார்த்தமாக, குறிப்பாகத் திருகோணமலையிலே ஆரம்பித்தார்கள். விவசாயக் குடியேற்றம் என்றும், அல்லைக் குடியேற்றம் என்றும், கந்தளாய்க் குடியேற்றம் என்றும், மொறவெவ குடியேற்றம் என்றும், மகா திவுல குடியேற்றம் என்றும், பதவியா குடியேற்றம் என்றும் பல குடியேற்றங்களை ஆரம்பித்து, அந்தப் பிரதேசங்களிலே தமிழர்களுடைய செறிவைக் குறைத்தார்கள். அதன் அடுத்த கட்டமாகக் கிழக்கு மாகாணம் முழுவதுமாக அந்தத் திட்டங்கள் நடைமுறைப் படுத்தப்பட்டன. அதன்படி அம்பாறை மாவட்டத்திலே இச்செயற்பாடு நடைமுறைப்படுத்தப்பட்டு, அந்த மாவட் டத்திலும் கூட எங்களுடைய இனத்தின் செறிவு படிப்படியாகக் குறைக்கப்பட்டிருக்கின்றது.

அந்த அடிப்படையிற் பார்க்கின்றபொழுது, 1881ஆம் ஆண்டு கிழக்கு மாகாணத்திலே தமிழர்களின் விகிதாசாரம் 58.96 வீதமாக இருந்திருக்கின்றது. 1891ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே அது 58.41 வீதமாகவும், 1901ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே 55.53 வீதமாகவும், 1911ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே 55.08 வீதமாகவும், 1921ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே தமிழர்களின் விகிதாசாரம் 53.54 வீதமாகவும், 1946ஆம் ஆண்டுக் குடிசன மதிப்பீட்டிலே 48.75 வீதமாகவும், 1953ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே 47.37 வீதமாகவும், 1963ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டில் 45.3 வீதமாகவும், 1971ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே 43.98 வீதமாகவும், 1981ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே 42.6 வீதமாகவும், 2007ஆம் ஆண்டு நடைபெற்ற குடிசன மதிப்பீட்டிலே 40.09 வீதமாகவும் பதிவாகியிருக்கின்ற அதேவேளையில், இறுதியாக நடைபெற்ற குடிசன மதிப்பீட்டின்படி 31.79 வீதமான தமிழர்கள் கிழக்கு மாகாணத்திலே இப்பொழுது குடியிருக்கின்றார்கள். இந்த நாட்டிலே மாறி மாறி வந்த எந்த அரசாங்கமும் தமிழர்களைப் பாதுகாக்கக்கூடிய வகையிலே, இந்த நாட்டிலே ஒரு சமாதானத்தை ஏற்படுத்தக்கூடிய வகையிலே தங்களுடைய செயற்பாடுகளைக் கையாளவில்லை. இன்று ஒவ்வொரு சமூகமும் மாவட்ட ரீதியாகத் தங்களுடைய இனரீதியான பரம்பலை அதிகரிக்கவேண்டும் அல்லது தாங்கள் ஆள வேண்டும் என்ற துடிப்பைக் கொண்டிருக்கின்றன.

இந்த நாட்டில் 1956ஆம், 1958ஆம், 1977ஆம், 1983ஆம் ஆண்டுகளில் தமிழ் மக்களுக்கெதிரான கொடிய வன்முறை கட்டவிழ்த்துவிடப்பட்டிருந்தது. 2009ஆம் இந்த நாட்டில் ஒரு பாரிய கொடிய யுத்தம் நடைபெற்றிருந்தது. இதன் காரணமாக, இன்றுங்கூட இந்தியாவிலே ஓரிலட்சத்திற்கு மேற்பட்ட தமிழ் மக்கள் அகதிகளாக இருக்கின்றார்கள். ஆனால், "ஒரே நாடு, ஒரே சட்டம்", "ஐக்கிய இலங்கை" என்று மார்தட்டிக் கூறுகின்ற இந்த நாட்டின் தலைவர்களோ அல்லது இந்த அரசாங்கமோ இந்த நாட்டிலேயிருந்து சென்று அகதிகளாக இந்தியாவிலே தஞ்சம் புகுந்திருக்கின்ற மக்களை மீண்டும் இந்த நாட்டுக்கு அழைத்துவரவேண்டும் என்பதற்கான எந்த அடிப்படை வேலைத்திட்டத்தையும் முன்னெடுக்கவில்லை. அவர்கள் அங்கு இப்பொழுது மிகவும் மோசமான ஒரு சூழலை அனுபவித்துக்கொண்டு இருக்கின்றார்கள். தொழில் வாய்ப்புக்களைப் பெறுவதில் பாரிய சிரமங்களை எதிர்கொண்டிருக்கின்றார்கள். ஆனால், அந்த மக்களை மீளவும் இங்கு குடியமர்த்தக்கூடிய எந்தச் செயற்பாட்டையும் இந்த அரசாங்கம் முன்னெடுக்கவில்லை. அவ்வாறு அங்கிருக்கின்ற மக்கள் இங்கு வரவேண்டுமென்ற அடிப் படையிற் செயற்பாட்டாலும்கூட, அவர்கள் குறிப்பிட்டளவு நிதியினைச் செலுத்தவேண்டும் என்ற ஓர் நிலைமை காணப்படுவதுடன், இங்கு வருகின்றபொழுது அவர்களுக் கான பாதுகாப்பு மற்றும் அவர்களுக்கான அடிப்படை வசதி என்பவற்றை ஏற்படுத்திக்கொடுப்பதற்கு இந்த அரசாங்கம் தயார் இல்லாத ஒரு நிலைமையும் காணப்படுகின்றது. எனவே, இந்த நாட்டிலேயிருந்து சென்று அகதிகளாக இந்தியாவிலே இருக்கின்ற மக்களைப் பற்றிச் சிந்திக்க முடியாத தலைவர்களாக இந்த நாட்டின் தலைவர்கள் இருப்பது மனவேதனையான ஒரு விடயம்.

வரவு செலவுத்திட்டம் தொடர்பான இன்றைய விவாதத்திலே, குறிப்பாக உள்ளூராட்சி சம்பந்தமாக இங்கு பேசுவது பொருத்தமாக இருக்கும் என்று நான் நினைக்கின்றேன். கிழக்கு மாகாணத்திலே திருகோணமலை, மட்டக்களப்பு, அம்பாறை என்ற அடிப்படையில் 3 மாவட்டங்களை உள்ளடக்கியதாகக் கிழக்கு மாகாண சபை இருக்கிறது. இப்பொழுதும் அமய அடிப்படையில் 980க்கு மேற்பட்ட ஊழியர்கள் அந்த மாகாண சபையில் பணிபுரி கின்றார்கள். ஆனால், அவர்களுக்கு உரிய நிரந்தர நியமனம் வழங்கப்படாது இருப்பது மனவேதனைக்குரிய விடயமாக விருக்கின்றது. ஆனால், இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தவுடன் பழிவாங்குகின்ற செயற்பாட்டைத்தான் செய்து கொண்டிருக்கின்றது. இந்த உள்ளூராட்சிச் சபைகளிலே சிறந்த நிர்வாகக் கட்டமைப்பை உருவாக்கவேண்டுமென்றால், அந்தச் சபைகளில் வேலை செய்கின்ற சிற்றூழியர்களுக்குரிய நிரந்தர நியமனங்களை வழங்கவேண்டும். அவ்வாறு வழங்குவத னூடாகத்தான் அந்தப் பிரதேசத்திலே சுற்றுச்சூழல் பாதுகாப்பு மற்றும் நோய்த் தொற்றிலிருந்து பாதுகாப்புக் கிடைக்கும். குறிப்பாக, இந்த நாட்டிலே ஏற்பட்ட கொரோனா தொற்றின்போதுகூட இந்த ஊழியர்களின் பங்களிப்பு பெறுமதி கணிப்பிடமுடியாத ஒன்றாகப் பார்க்கப்படுகின்றது. ஆகவே, இவ்வாறு பணிபுரிகின்ற அந்த ஊழியர்கள்மீதும் பழிவாங்கலை மேற்கொள்ளாமல், அவர்களுக்கு நிரந்தர நியமனத்தை வழங்குவதற்கு இந்த உயரிய சபை, குறிப்பாக அரசாங்க சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்கள் கவனமெடுக்கவேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். உள்ளூராட்சிச் சபை என்பது சிறந்த ஓர் உள்ளக அரசியல் கட்டமைப்பை உருவாக்குவதற்காக நிறுவப்பட்ட ஒன்றாகும். உள்ளூராட்சி மன்றங்களை வளப்படுத்த வேண்டியது, கட்சி பேதங்களுக்கு அப்பால், ஒவ்வோர் அரசியல் பிரமுகரினதும் கடமையாக இருந்துகொண்டிருக்கின்றது. அந்த அடிப்படையில் செயற் படுவது பொருத்தமாக இருக்குமென்று நினைக்கின்றேன்.

அடுத்து, இலங்கை திறந்த பல்கலைக்கழக சட்டமானிக் கற்கைநெறி அனுமதிக்கான போட்டிப் பரீட்சை 14.11.2021 அன்று நடைபெற்றது. அந்தப் போட்டிப் பரீட்சையிலே பல குளறுபடிகள் நடந்திருப்பதாகப் பரீட்சார்த்திகள் சிலர் எனக்கு முறையீடு செய்திருக்கிறார்கள். இதன் காரணமாக அந்த மாணவர்கள் மன உளைச்சலுக்கு ஆளாகியுள்ளார்கள். இவ்வாறான செயற்பாடானது பின்தங்கிய பிரதேசங்களி லிருந்து சட்டத்துறைக்கு உள்நுழைகின்ற மாணவர்களுக்குத் தடையாக இருக்கும். கடந்த காலங்களில் பிராந்திய ரீதியாக 'கோட்டா' அடிப்படையிலேதான் சட்டத்துறைக்கு மாணவர்கள் உள்ளீர்க்கப்பட்டார்கள். ஆனால், இப்பொழுது அவ்வாறான செயற்பாடுகளை நீக்கிவிட்டு, அகில இலங்கை ரீதியாகத் தெரிவுசெய்யப்பட வேண்டுமென்ற அடிப்படை முன்வைக்கப் பட்டிருக்கின்றது. ஏற்கெனவே இந்தப் போட்டிப் பரீட்சைக் குரிய வினாத்தாள்கள் வெளியாகியுள்ளதனால் அந்த மாணவர்கள் பாதிப்புக்குள்ளாகியுள்ளார்கள். இதனால் எதிர் காலத்தில் தமிழ் பேசும் மக்கள் மத்தியிலிருந்து சட்டத்துறைக்கு மாணவர்களை உள்ளீர்க்கக்கூடிய சந்தர்ப்பம் இல்லாமல் ஆக்கப்படக்கூடிய சூழல் இருக்கின்றது. ஆகவே, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இதில் கவனமெடுத்து, இப்பரீட்சை வினாத்தாள்கள் பரீட்சை நடைபெறுகின்ற காலத்திற்கு முன்னராகவே வெளியாகியிருப்பதாகக் கூறப் படுவது உண்மையா? என்பதை ஒரு விசாரணைக் கமிஷன் அமைத்து ஆராய்ந்து, பாதிக்கப்பட்ட மாணவர்களுக்கு சரியான ஒரு தீர்வை வழங்கவேண்டுமென்று வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු තවරාජා කලෙයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
විනාඩියයි.

வெட்டுப்புள்ளியானது பிராந்திய ரீதியாக ஏற்கனவே யிருந்த 'கோட்டா'வின் அடிப்படையிலேயே கையாளப்பட வேண்டும். குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்திலே 60 பேரும், யாழ்ப்பாணம் மாவட்டத்திலே 60 பேரும் என்றவாறு பதுளை, கொழும்பு, கண்டி போன்ற மாவட்டங்களுக்கும் 'கோட்டா' அடிப்படையிலேயே தெரிவுசெய்யும் முறை ஏற்கனவே இருந்தது. இதையெல்லாம் நீக்கிவிட்டு, இப்பொழுது அகில இலங்கை ரீதியாக இவ்வாறான காரியங்கள் கையாளப்படுகின்றபோது சிறுபான்மையின மக்களாக இருக் கின்ற தமிழ் பேசும் மக்களுக்கு இது பாதிப்பாக அமையும் என்ற கருத்தினையும் கூறி, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ඩග්ලස් දේවානන්ද අමාත්‍යතුමා.

[பி.ப. 12.11]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் கலை அரசன் அவர்களுடைய கருத்துக்கள் தொடர்பான பதில்களும் அதற் கான வழிகாட்டல்களும் என்னிடம் இருக்கின்றன; அதுதொடர்பாக இன்னுமொரு சந்தர்ப்பத்தில் சொல்ல நான் எதிர்பார்க்கின்றேன். சரியானதைப் பிழையென்றும், பிழை யானதைச் சரியென்றும் 'எதிர்க்கட்சி' என்ற நிலைப் பாட்டிலிருந்து விமர்சனம் செய்து கொண்டிப்பதே தமது பணியென நினைத்துச் செயற்பட்டு, எதிர்க்கட்சி என்ற நிலைப்பாட்டிலிருந்து தமது பார்வையை நியாயமாகச் செலுத்த இங்குள்ள எதிர்க் கட்சிகள் தவறுவதையே இந்த வரவு செலவுத்திட்ட முன்மொழிவுகள் குறித்த அவர்களது கருத்துக்கள் எடுத்துக்காட்டுகின்றன. சரியானதை ஏற்பதும் பிழையானதை எதிர்ப்பதுமே ஆரோக்கியமான அரசியலாகும்.

இன்று கொவிட்-19 உலக நாடுகள் சகலவற்றுக்குமே ஓர் இடர்காலத்தைத் தந்துள்ளது. இந்த இடர்காலத்தை எதிர்கொண்டு எதிர்காலத்தை உருவாக்க அரசியல் பேதங் களைக் கடந்து நாம் ஒன்றுபட்டு உழைக்க வேண்டும். உலக நாடுகள் யாவும் மனித குலத்திற்கு எதிரான சவாலாகவே இன்றைய இடர்காலத்தை எதிர்கொள்கின்றன. அந்த நிலையே இங்கும் நிலவவேண்டும். தற்போதைய காலச்சூழ்நிலையைத் தாண்டி முன்னேற்றத்தையும் இக்காலச் சூழ்நிலையிலிருந்து மீட்சி பெறக்கூடிய வகையிலும் நிதி அமைச்சர் கௌரவ பெஸில் ரோஹன ராஜபக்ஷ அவர்களால் தயாரிக்கப்பட்டுள்ள இந்த முதலாவது வரவு செலவுத்திட்டமானது மிகவும் வரவேற்கத்தக்கதாக இருக்கின்றது. காலத்தை வெல்கின்ற,

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

பல்வேறு இயற்கை மற்றும் செயற்கைச் சவால்களை முறியடித்த முன்னேற்றகரமான இந்த வரவு செலவுத்திட்டத்தை எமக்குத் தந்துள்ளமை குறித்து நிதி அமைச்சர் அவர்களுக்கு எமது மக்கள் சார்பாக எனது பாராட்டுதல்களையும் நன்றியையும் தெரிவித்துக்கொள்கின்றேன்.

நாங்கள் இந்த ஆட்சியைப் பொறுப்பேற்றதிலிருந்து உலகளாவிய கொடும் அனர்த்தமான கொவிட்- 19 கொரோனாவின் பிடி இன்றுவரையில் தளர்ந்ததாக இல்லை. இன்று கொவிட்-19 கொரோனா அனர்த்தமும் ஓர் இயற்கை அனர்த்தமாக மாறியுள்ளது. ஏனைய இயற்கை அனர்த்தங்கள் சில நாட்களில் அகன்றுபோனாலும் இது அகலா அனர்த்தமாகவே தொடர்கிறது. இந்த அனர்த்தத்திலிருந்து பாதுகாப்புப் பெறும்வகையில் இதுவரையில் நாட்டின் சனத்தொகையில் 80 சதவீதத்திற்கும் அதிகமான மக்களுக்குத் தடுப்பூசிகளை ஏற்றும் நடவடிக்கைகள் முன்னேற்றகரமாக மேற்கொள்ளப்பட்டுள்ளது. இதனை நான் எமது மக்களின் உயிர்ப் பாதுகாப்புக்குக் கிடைத்துள்ள பெரும் வெற்றியாகவே கருதுகின்றேன். அந்தவகையில், இந்தச் சந்தர்ப்பத்தில் மேதகு சனாதிபதி அவர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் நச்சுத் தன்மையற்ற உணவு உற்பத்தி தொடர்பில் நாம் முன்னெடுத்து வருகின்ற செயற்பாடுகளுக்கு இசைவாக, சேதனப் பசளை மற்றும் சேதனக் கிருமிநாசினி உள்ளிட்ட விவசாய உள்ளீடுகளைத் தேசிய மட்டத்தில் உற்பத்தி செய்வது குறித்துப் போதிய அவதானம் செலுத்தப்பட்டிருப்பது குறிப்பிடத்தக்கது. இதற்கென 35,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இரசாயனப் பசளை மற்றும் விவசாய உள்ளீடுகளின் இறக்குமதிக்கென வருடாந்தம் செலவிடப்பட்டு வருகின்ற சுமார் ஓரிலட்சத்து இருபதாயிரம் மில்லியன் ரூபாயை இதனால் மீதப்படுத்திக் கொள்ளமுடியும் என்பதுடன், இத்தகைய இரசாயன நச்சுத் தன்மைகளினால் ஏற்படுகின்ற நோய்த் தாக்கத்திலிருந்தும் நாம் விடுபட முடியும். ஆரம்பத்தில் சில இடையூறுகள் இருந்தாலும், சில காலத்தில் சேதனப் பசளைகள் முழுமையான பயன்பாட்டுக்கு வருகின்றபோது, ஓர் ஆரோக்கியமான மக்கள் சமுதாயத்தை உருவாக்குவதற்கான ஒரு சிறந்த நோக்கச் செயற்பாடாக இது உணரப்படும் என்பதனையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மேலும், எமது விவசாயத்துறையின் முன்னேற்றம் கருதி 70.7 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. அதேபோன்று கால்நடைகள் அபிவிருத்திக்கென 1.7 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. நாட்டில் திரவப் பால் உற்பத்தி தற்போது பெருமளவில் முன்னேற்றம்கண்டு வருகின்றது; பண்ணைகள் அபிவிருத்தியடைந்து வருகின்றன. பாலில் நம் நாடு தன்னிறைவு காணுகின்றபோது, பாலுக்கென எமது மக்கள் வெளிநாடுகளை நம்பி இருக்கின்ற நிலைமை மாறுமென நான் நினைக்கின்றேன். ஏனென்றால், அண்மையில் பால் மாவுக்காக எமது மக்கள் அடைந்திருந்த நெருக்கடி நிலைமைகளை நாம் மறந்துவிடக்கூடாது.

இந்த வரவு செலவுத்திட்டத்தில் கடற்றொழிலுக்கென 3,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இதன்மூலம் அடுத்த வருடத்தில் இரண்டு இலட்சம் ஹெக்டயர் நீர்நிலைகளில் நன்னீர் வேளாண்மைக்கான வசதிகளை மேற்கொள்வதற்கென 196 மில்லியன் மீனினக் குஞ்சுகள் அளவில் வைப்பிலிடப் பட்டு, அதன்மூலம் சுமார் 18,000 மில்லியன் ரூபாய் பெறுமதியான 125,000 மெற்றிக்தொன் அறுவடை எதிர்பார்க் கப்படுகின்றது. அதேநேரம், மூலவளங்களின் எண்ணிக் கையை இரட்டிப்பாக்கிக் கொள்வதற்கான வாய்ப்புகள் அதிகம் என்பதால், நிறையவே பலன்களை நாம் எதிர்பார்க்க முடியுமென நம்புகின்றேன்.

மேலும், வடக்கு மாகாணத்திற்கான நிலைபேறான கடற்றொழில் அபிவிருத்தித் திட்டம், கடற்றொழில் துறைமுகங் களின் அபிவிருத்தி, நீர்வள ஊக்கம், கடன் திட்டத்திற்கான நிதிப் பங்களிப்பு, பலநாட் கலங்களுக்கான வழித்தடக் கண்காணிப்புக் கருவிகள், கடற்றொழில் மற்றும் நன்னீர் வேளாண்மைகளில் ஈடுபடுகின்ற மக்களின் வாழ்வியலை மேம்படுத்தல் போன்ற நடவடிக்கைகளை மேற்கொள்வதற்கும் நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ளன. இவற்றுக்கென ஒதுக்கீட்டுச் சட்டமூலத்தில் ஒதுக்கீடு செய்யப்பட்ட தொகைக்கு மேலதிகமாக 1,000 மில்லியன் ரூபாயை ஒதுக்கு வதற்கும் முன்மொழியப்பட்டுள்ளதால், அடுத்த வருடத்தில் நீர் வேளாண்மை தொடர்பில் மிக அதிகளவிலான செயற் றிட்டங்களை நாம் நாடளாவிய ரீதியில் மேற்கொள்ள முடியும் என்பதையும் இங்கு நான் நம்பிக்கையோடு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அண்மைக்காலம் வரையில் போராட்டக் களம் கண்டிருந்த பாடசாலை அதிபர்கள், ஆசிரியர்கள் பிரச்சினைக்கு முற்றுப்புள்ளி வைக்கப்பட்டு, அதற்கென 30,000 மில்லியன் ரூபாய் அவர்களது ஊதியத்துக்கான ஒதுக்கீட்டில் உள்வாங்கப் பட்டுள்ளது. மேலும், கல்வித்துறை மேம்பாடு தொடர்பிலும் உரிய அவதானங்கள் செலுத்தப்பட்டு, போதிய நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ளன.

சுகாதாரத் துறையின் மேம்பாடு தொடர்பிலும் விரிவான கவனம் செலுத்தப்பட்டு நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப் பட்டுள்ளன.

காணி அமைச்சுக்கென ஒதுக்கப்பட்டுள்ள நிதி மானியத்தில் இயற்கை அனர்த்தங்கள் காரணமாகக் காணி இழப்புக்கள் ஏற்படுகின்றவர்களுக்கு மாற்றுக் காணிகளை வழங்குவதென்பது நல்லதொரு திட்டமாக அமைந்திருக் கின்றது. மழைக்காலங்களில் மக்களின் இடப்பெயர்வுகள், நாளாந்த தேவைகளுக்கான பிரச்சினைகள் போன்ற வற்றிலிருந்து நிலையானதொரு தீர்வுக்கு இது வழிவகுக்கும் என்று நம்புகின்றேன்.

அதேநேரம், ‘நிலச்சக்தி’ திட்டத்திற்கெனவும் 518 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்த வருடத்தில் ஓரிலட்சம் காணி உறுதிகள் வழங்கப்படவேண்டிய இலக்கில் எமது அரசாங்கம் இருக்கின்றபோதிலும், உலகளாவிய அனர்த்தம் காரணமாக 60,000 காணி உறுதிகளே இது வரையில் வழங்கப்பட்டுள்ளதாகத் தெரியவருகின்றது. காணி உறுதிகள், காணிப் பிணக்குகள் தொடர்பான பிரச்சினைகள் வடக்கு, கிழக்கு மாகாணங்களில் அதிகமாகக் காணப்படு கின்றன. அவற்றை விரைந்து தீர்ப்பதற்கான நடவடிக்கை களைக் காணி அமைச்சர் அவர்கள் மேற்கொள்வார் என எதிர்பார்க்கின்றேன்.

கைத்தொழில் சார்ந்த பெருந்தோட்டச் செய்கை மற்றும் வேளாண் பொருட்கள் உற்பத்தி மேம்பாட்டுக்காக வன ஜீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சுக்கென 800 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டுள்ளது.

எமது பகுதிகளிலே நீண்டகால இடப்பெயர்வுகள் காரண மாகப் பயன்பாட்டு நிலங்கள் மற்றும் குடியிருப்புக் காணிகள் என்பன காடுமண்டிக் காணப்படுகின்றன. அத்தகைய

நிலங்கள் வன இலாகா அல்லது வன ஜீவராசிகள் திணைக்களங்களின் ஆளுகைக்கு உட்பட்ட நிலங்களாகக் கணிக்கப்பட்டு வருகின்றன. அந்த நிலங்களில் எமது மக்கள் யுத்தத்துக்கு முற்பட்ட காலங்களில் பல்வேறு பயிர்ச் செய்கைகளில் ஈடுபட்டு வந்துள்ளனர். எனவே, அவ்வாறு இனங்காணப்படுகின்ற நிலங்களில் சூழல் மற்றும் வன ஜீவராசிகளுக்குப் பாதிப்புக்கள் ஏற்படாத வகையில், மண் வேளாண்மை மற்றும் நீர் வேளாண்மைச் செய்கைகளில் ஈடுபடுவதற்கான வசதிகள் தொடர்பில் துறைசார்ந்த அமைச்சர்களோடு நான் கதைத்துக்கொண்டிருக்கின்றேன். அவையும் இந்த வருட இறுதியில் அல்லது அடுத்த வருட நடுப்பகுதிக்குள் சாத்தியமாகும் என்பதையும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அண்மையில் கிழக்கு மாகாணத்திற்கான எனது விஜயத்தின்போது, பல்வேறு கடற்கரையோரப் பகுதிகள் கடலரிப்புக்கு உட்படுவதை அவதானிக்கக்கூடியதாக இருந்தது. அப்பகுதிகளில் மட்டுமல்லாது கடலரிப்பானது நாட்டின் பல்வேறு பகுதிகளிலும் விரைவானதொரு மட்டத்தில் ஏற்பட்டு வருவதையும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இத்தகைய கடலரிப்பிலிருந்து அப்பகுதிகளைப் பாதுகாப் பதற்காக நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சுக்கென நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

வடக்கு, கிழக்கு மாகாணங்களில் இதுவரையில் மீளக் குடியேறாமல் இருந்துவருகின்ற குடும்பங்களை மீள்குடியமர் த்துவதற்கென 1,259 மில்லியன் ரூபாயும் வடக்கு, கிழக்கு மாகாணங்களில் மேலும் 1,200 புதிய வீடுகளை நிர்மாணிப் பதற்கும் யாழ். மாநகர சபைக் கட்டிட நிர்மாணிப்பிற்குமென மேற்படி அமைச்சுக்கு நிதி ஒதுக்கப்பட்டுள்ளமை குறிப்பிடத் தக்கது.

அதைவிட, இன்று எனக்கு முன்னால் பேசிய உறுப்பினர் கலையரசன் அவர்கள், இங்கிருந்து இடம்பெயர்ந்து இந்தியாவில் தமிழ் நாட்டில் வாழும் தமிழ் மக்களை மீளக் குடியமர்த்துவது தொடர்பில் தன்னுடைய கருத்தைச் சொல்லியிருந்தார். இன்று காலையில்கூட நான் சென்னை யிலுள்ள எங்களுடைய தூதுவரோடு இது தொடர்பில் கதைத்திருந்தேன். அந்தவகையில், வருகின்ற வருடம் இந்தியா வில், தமிழ் நாட்டில் தங்கியிருக்கின்றவர்கள் விரும்புகின்ற பொழுது எங்களுடைய தூதரகத்தில் பதிந்து, இங்கு வரலாம். அவர்களை வரவேற்பதற்கும் அவர்களை மீள்குடியேற்று வதற்கும் எங்களுடைய அரசு தயாராக இருக்கின்றது என்பதையும் கூறிக்கொள்கின்றேன்.

மேலும், நீர்ப்பாசனத் துறையைப் பொறுத்தவரையில், கீழ் மல்வத்து ஓயாத் திட்டம், வட மத்திய பிரதான கால்வாய் போன்ற அபிவிருத்தித் திட்டங்கள் எமது மக்களுக்குப் பெரிதும் பயன்படத்தக்கவை. எமது பகுதிகளைப் பொறுத்தவரை மக்களின் குடிநீர்த் தேவைக்கும் விவசாயத் துறைக்கும் கால்நடை அபிவிருத்திக்கும் எமது நிலத்தடி நீர் வளத்தைப் பாதுகாப்பதற்கும் பெரிதும் நன்மை பயக்கின்ற அபிவிருத்திகளாக இவற்றைக் கருத முடிகின்றது. அதேநேரம், இத்திட்டங்களின்கீழான குடியேற்றங்களில் அப்பகுதியைச் சேர்ந்த மக்களுக்கே முன்னுரிமை கொடுக்கப்படும் என்ப தையும் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

அத்துடன் எமது பகுதிகளில் உவர் நீர் உட்புகும் பகுதிகளில் அவற்றைத் தடுப்பதற்கான ஏற்பாடுகள் மேற் கொள்ளப்பட வேண்டியுள்ளதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

குடிநீர் வசதிகளைப் பொறுத்தவரையில், வடக்கு, கிழக்கு மாகாணங்கள் உள்ளிட்டதாக மழை நீர் சேகரிப்பு ஏற்பாடுகளுக்கான வசதிகள் மற்றும் நீர் சுத்திகரிப்பு ஏற்பாடு களை மேற்கொள்ளத்தக்க வகையில் மேலும் நிதி மானியம் ஒதுக்கப்பட்டுள்ளது.

கைத்தொழிற்துறையைப் பொறுத்தமட்டில், திருகோண மலைக் கைத்தொழிற்பேட்டை உள்ளடங்கலான மேம்பாடுகள் மற்றும் ஏறாவூர் விசேட புடைவை உற்பத்தி வலய உருவாக்கம் என்பன எமது பகுதிகளுக்கு முக்கியத்துவம் வாய்ந்தனவாக அமைகின்றன. ஏறாவூர் புடைவை உற்பத்தி வலயம் என்பது நீண்டகால எதிர்பார்ப்புக்களில் ஒன்றாகும் என்பது குறிப்பிடத்தக்கது.

அதேநேரம், தற்போது செயற்பாட்டிலுள்ள வவுனியா மற்றும் அச்சுவேலி கைத்தொழிற்பேட்டைகளின் மேம்பாடு தொடர்பிலும், ஏற்கனவே செயற்பட்டுத் தற்போது செயற்பாடுகளை இழந்துள்ள காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை, உப் பளங்கள், ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை போன்ற ஏனைய கைத்தொழிற்றுறை சார்ந்த தொழிற்சாலைகளை மீள ஆரம்பிப்பதற்கும், பத்திக் கைத்தொழிலை மேலும் ஊக்குவிப்பதற்கும் துறைசார்ந்த அமைச்சர்களுடன் கலந்துரை யாடி அதற்கான திட்டங்களையும் நான் முன்னெடுத்து வருகின்றேன்.

யாழ்ப்பாணம், முல்லைத்தீவு, மாங்குளம், கிளிநொச்சி உள்ளிட்ட நீதிமன்றங்களின் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்துவதற்கும் இம்முறை வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்டுள்ளது.

மின்சாரத்துறை தொடர்பில், மன்னார், முசலி, கிளிநொச்சி, பூநகரி போன்ற பகுதிகளில் கலப்பு, புதுப்பிக்கத்தக்க மின் உற்பத்தி நிலையங்கள் அமைக்கப்படுவதற்கான நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ளன.

துறைமுகங்களைப் பொறுத்தவரையில், காங்கேசன்துறை இறங்குதுறைப் பணிகளுக்கென 797 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இத்துறைமுகம் அபிவிருத்தியடையும் நிலையில், இந்தியாவில் இருந்து நேரடியாகவே எமது பகுதிக்கு அத்தியாவசியப் பொருட்கள் அடங்கலாக ஏனைய தேவைகளுக்கேற்ற பொருட்களையும் கொண்டுவருவதன் மூலம் குறைந்த விலையில் இலகுவாக அவற்றைக் கொள்வனவு செய்யக்கூடிய வாய்ப்பு எமது மக்களுக்கு ஏற்படும். இத்தகைய அபிவிருத்திகளின்மூலம் எமது பகுதிகளில் பல்வகை வாழ்வாதார வசதிகளும் தொழில் வாய்ப்புக்களும் பெருகுவதற்கான சந்தர்ப்பங்கள் உருவாகின்றன.

மட்டக்களப்பு புதிய தபாலகக் கட்டிடத் தொகுதியை நிர்மாணிப்பதற்கென ஊடக அமைச்சின்கீழ் 100 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. யாழ்ப்பாணத்திலே சுன்னாகம் தபாலகம் மற்றும் தபால் அதிபர் தங்குமிட கட்டிட நிர்மாணத்திற்கென 2019ஆம் ஆண்டு மார்ச் மாதம் 19ஆம் திகதி 26.5 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டதாகவும் அதன் பணிகள் இதுவரையில் பூர்த்தி செய்யப்படவில்லை என்றும் கூறப்படுகின்றது. இவ்விடயம் தொடர்பில் ஊடக அமைச்சரின் அவதானத்திற்குக் கொண்டுவந்திருக்கின்றேன். அதுவும் வருகின்ற வரவு செலவுத்திட்டத்தில் சேர்க்கப்படும் என்பதையும் கூறிக்கொள்கிறேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

மேலும், உலகளாவிய அனர்த்தம் காரணமாக வாழ்வாதார ரீதியில் அதிகம் பாதிக்கப்பட்டுள்ள பாடசாலை மாணவர்களின் போக்குவரத்து வாகன உரிமையாளர்கள், முச்சக்கரவண்டி உரிமையாளர்கள் மற்றும் தனியார் போக்குவரத்துப் பேருந்து உரிமையாளர்கள் போன்றோருக்கான சலுகைகள், நிவாரணங்கள் போன்ற செயற்றிட்டங்கள் பெரிதும் வரவேற்கத்தக்க திட்டங்களாகும்.

அதேபோன்று, பட்டதாரிகளுக்கான வேலைவாய்ப்பு என்ற விடயமும் பட்டதாரிகளுக்கான நியமன நிரந்தமாக்கலும் காலத்தின் தேவையாகவுள்ளன. எமது மேதகு ஜனாதிபதி அவர்கள் பதவியேற்றதன் பின்னர் இதுவரையில் 63,000 பட்டதாரிகளுக்கான வேலைவாய்ப்புக்கள் வழங்கப்பட்டுள்ளமை குறிப்பிடத்தக்கது.

அத்துடன், 1,793,533 சமுர்த்திப் பயனாளிக் குடும்பங்களுக்கென 50,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. மேலும், சமுர்த்தி நிவாரணம் பெறுவதற்கான எதிர்பார்ப்புப் பட்டியலில் பெருமளவினர் காத்திருப்பதாகவும் தெரியவருகின்றது. எனவே, தற்போது நடைமுறையில் உள்ள சமுர்த்திப் பயனாளிகள் பட்டியலை மீளாய்வுக்கு உட்படுத்துவது நல்லதென நினைக்கின்றேன். அத்துடன், இத்திட்டத்தைப் பயன்படுத்தி, எமது மக்கள் கையேந்தும் நிலையிலேயே தொடர்ந்தும் இருக்காமல், பொருளாதார ரீதியில் சுயமாக எழுந்துநிற்கக்கூடிய மக்களாக மாறவேண்டும் எனவும் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், இந்த அரசாங்கம் காணாமற்போனவர்கள் தொடர்பில் பரிகாரம் காண்பதற்கான ஒரு மனிதாபிமானச் செயலாக 300 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டை மேற்கொண்டுள்ளது. இது தொடர்பில் தற்போது பல்வேறு கருத்துக்கள் தெரிவிக்கப்பட்டாலும், இப்பிரச்சினை தொடர்பில் அரசாங்கம் தனது அவதானத்தைச் செலுத்தியிருப்பது வரவேற்கத்தக்கது. எனது உறவுகள், தோழர்கள், என்னோடு கூட இருந்தவர்கள், பழகியவர்கள் காணாமற்போனதன் வலியை நான் உளமார உணர்ந்தவன் என்ற வகையில் காணமற்போன உறவுகளது உறவினர்களின் உணர்வுகளையும் நான் அறிவேன். காணமற்போனோரது உறவுகள் என்னைச் சந்தித்து என்னிடம் வெளிப்படுத்தியுள்ள எதிர்பார்ப்புக்களை மேன்மைதங்கிய ஜனாதிபதி அவர்களிடமும் வெளிப்படுத்தி, நியாயமான கலந்துரையாடலுக்கு முன்வரவேண்டும் என இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ளுகின்றேன்.

இம்முறை வரவு செலவுத்திட்டமானது தேசிய உற்பத்தியை இலக்காகக்கொண்ட, பிரதேச அபிவிருத்திகளின்பாலான முதன்மைத்துவங்களைக் கொண்ட வரவு செலவுத்திட்டமாக அமைந்திருக்கின்றது. அந்தவகையில், படிப்படியாக வெளிநாட்டு இறக்குமதி மோகத்திலிருந்து விடுபட்டு, தேசிய உற்பத்தியின்பால் மக்கள் நாட்டம் கொள்ளவேண்டியது அவசியமாகும். இன்றைய உலக நடத்தைகள் அவ்வாறான தொரு பாடத்தையே ஒவ்வொரு நாட்டு மக்களுக்கும் உணர்த்தி வருகின்றன. அந்தவகையில், இந்த வரவு செலவுத்திட்டத்தை எமது மக்கள் சார்பாக வரவேற்று, எனது உரையை முடித்துக்கொள்வதற்கு முன்பாக, மீண்டும் இந்த வரவு செலவுத்திட்டத்தை முன்வைத்த எங்களது நிதியமைச்சர் கௌரவ பெஸில் ரோஹண ராஜபக்ஷ அவர்களுக்கு நன்றி சொல்லி, சந்தர்ப்பம் வழங்கியமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Hon. (Mrs.) Thalata Athukorala. You have 13 minutes.

[අ.භා. 1.00]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවර ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැය කථාවේ අවසාන කොටසට එනකොට එතුමා සඳහන් කළා, "ධර්මිෂ්ඨ පාලන කාලය තුළ මෙන්ම යහ පාලන කාලය තුළ වූ අපේ රටේ ගමන් මඟ රටට වාසිදායක වුණේ නැහැ" කියලා. එතුමාගේ එක් සහෝදරයෙකු අවුරුදු ගණනාවක් -අවුරුදු දහයක් වාගේ- මේ රටේ ජනාධිපති වෙලා සිටිද්දී "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ගරු ඇමතිතුමා හිතා මතා ඒක අමතක කළාද, නැත්නම් නොදැනුවත්කම නිසා ඒ අවුරුදු දහය තුළ "මහින්ද චින්තන" යටතේ ක්‍රියාත්මක වෙච්ච ඒවා එතුමාට අමතක වුණාද කියලා ඇත්තටම අපි දන්නේ නැහැ. ඒ වාගේම, ධර්මිෂ්ඨ සමාජය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මුවා වෙලා තවමත් ඒ වැඩ පිළිවෙළ නොයෙකුත් විධියට ඉදිරියට ගෙන යනවා. හැබැයි, ඡන්දයක් එන හැම වෙලාවකම කියන්නේ, "අපි මේ ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා" කියලා. එම ක්‍රමයට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරපු යම් යම් සීමා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා නැවතත් ඉවත් කරගෙන තවත් බලවත් විධියට ක්‍රියා කරන්න හැකි වන පරිදි කටයුතු සලස්වා ගත්තා. ධර්මිෂ්ඨ සමාජය පැවැති ඒ යුගය, මේ රට ගෝලීයකරණයත් එක්ක බද්ධ කරලා රටේ විදේශ සංචිතය වැඩි කරන්න, ඇඟලුම් කර්මාන්තය ඇති කරන්න, එහෙම නැත්නම් විදෙස් රැකියා ප්‍රමාණය වැඩි කරන්න විශාල වශයෙන් වැඩ කරපු යුගයක්. කවුරුවත් ඒ ගැන සැකයක් තබා ගන්න ඕනෑ නැහැ; අද ඒ ගැන විවාදයක් කරන්නත් අවශ්‍ය නැහැ.

ගරු විමල් වීරවංශ ඇමතිතුමාත් බොහොම උජාරුවෙන් කිව්වා, 1977ට ඉස්සෙල්ලා තිබුණු යුගය ධර්මිෂ්ඨ සමාජය තුළ වෙනස් කරපු හැටි සහ වෙච්ච දේවල්. ඒ වාගේම එතුමා කිව්වා, කොවිඩ් වසංගතය පාලනය කරපු එක ගැනත්. අපි දන්නවා, කොවිඩ් වසංගතය පාලනය කරන කොට අපේ රටේ 14,000ක් පමණ මේ වනකොට මිය ගිහින් තිබෙන බව. ඇත්ත කියනවා නම්, එතුමාත් මේ රටේ මිථ්‍යාව පසුපස ගිහිල්ලා, පැණියක් වර්ධනය කරලා, මේ වසංගතය මර්දනය වෙනුවෙන් කළ යුතු

එන්නත්කරණය වුවමනාවෙන්ම ප්‍රමාද කරන්න දායක වෙච්ච කෙනෙක්. ඒ පැණිය තවත් ව්‍යාප්ත කරන්න එතුමා මැසිමකුත් දෙනවා කිව්වා. මම දන්නේ නැහැ, ගරු විමල් වීරවංශ ඇමතිතුමා කථා කරපු වෙලාවේ ඒක මතක තිබුණාද කියලා. පැණිය ව්‍යාප්ත කරන්න ලොකු මැසිමකුත් එතුමා ගානේ හදලා දෙනවා කිව්වා, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන්. ඒ වාගේම, New Fortress Energy සිද්ධිය සම්බන්ධයෙන් උසාවියට ගිය, එතුමාගේ හිතවතා වන ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා මේ ගරු සභාවේ ඔය පැත්තේම ඉඳන් කිව්වා, එන්නත් ඕනෑ නැහැ කියලා. ඒ වෙලාවේ එහෙම කියලා අද කියනවා, "අපි එන්නත්කරණය වෙලාවට කළා" කියලා. ඒ ඔක්කොම කරපු හින්දා තමයි 14,000ක පිරිසක් මිය ගිහින් තිබෙන්නේ. විමල් වීරවංශ මහත්මයලාගේ හැම තිස්සේම තිබෙන්නේ "ඊ. දනියෙල් දවල් මිගෙල්" කේස් තමයි. අපට එතුමා එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. නමුත්, සාමාන්‍යයෙන් මේවා සම්බන්ධයෙන් මීට වඩා සොයා බලා කථා කරනවා නම් හොඳයි කියන එක තමයි මගේ අදහස.

ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා, එතුමාගේ මංගල අය වැය ඉදිරිපත් කරන කොට ගොඩක් වෙලාවට උත්සාහ කළා, තවත් අය මත වැරැදි පටවන්න, එහෙම නැත්නම් සමහර ක්ෂේත්‍රවලට අපහාසාත්මක වන විධියට ගොඩක් කතන්දර කියන්න. එතුමාගේ අය වැය කථාවේ 10 වන පිටුවේ සඳහන්ව තිබෙනවා, "වංචනික ව්‍යාපාරික මෙහෙයුම්" කියලා. එහිදී එතුමා සඳහන් කරන්නේ, වංචනික ව්‍යාපාර කටයුතුවලින් අයුතු ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරන පුද්ගලයන් සහ ආයතන සිය ව්‍යාපාරික කටයුතු හරහා මෙරට ජන ජීවිතයට සිදු කරන බලපෑම පිළිබඳවයි.

මේ රටේ ප්‍රධාන පුරවැසියා වන ජනාධිපතිවරයාගේ ප්‍රධානම හිතවතෙක් තමයි අද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති. අඩු ගානේ අද ඒකවත් පාලනය කරගන්න බැරි වෙලා. නමුත්, රටේ ආරක්ෂාව තහවුරු කරනවා කියලායි බලයට ආවේ. සමහරු වංචනික ක්‍රියා කරනවා, භාණ්ඩ හංගනවා, භාණ්ඩ හිඟයක් ඇති කරනවා, වෙළෙඳ පොළ පාලනය කරනවා කියන එක මේ ගරු සභාවට ඇවිල්ලා ප්‍රකාශ කිරීම මුදල් ඇමතිවරයෙකුට තරම් දෙයක් නොවෙයි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා ඒ සඳහා අවශ්‍ය පිළියම් යොදා, අවශ්‍ය කරන කිරි පිටි, සිමෙන්ති ආදී හැම භාණ්ඩයකම හිඟයක් ඇති නොවන විධියට කටයුතු කිරීම තමයි වගකිව යුතු රජයක් හැටියට කළ යුතු වන්නේ. එහෙම නොකර වෙළෙඳ පොළේ සිටින ව්‍යාපාරිකයන්ගේ වංචනික කටයුතු ගැන මේ වෙලාවේ කථා කරලා වැඩක් නැහැ.

රටට වින කරන බලවේග පිළිබඳවත් එතුමා සඳහන් කළා. සමාජ ක්‍රියාකාරීන් ලෙස වෙස් ගත් විදේශ බලවේග වෙනුවෙන් කටයුතු කරන ඒජන්තවරුන් අපේ ජන සමාජයට කරන බලපෑමක් පිළිබඳව එතුමා ඒ යටතේ සඳහන් කළා. එහෙම අය ඉන්නවා නම්, තුනෙන් දෙකක බලයක් තිබෙන, ශක්තිමත් ආණ්ඩුවක් තිබෙන වෙලාවක ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේවා නිදහසට කරුණු හැටියට මේ සභාවේදී කිව්වාට තේරුමක් නැහැ. පසු ගිය අවුරුදු හතරහමාර, පහ තුළ ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න වෙලාවේත් මැතිරුවේ ඔය කථාවමයි. ඉතින්, දැනුත් ඕකම කියන්න නම් එතුමා මුදල් ඇමතිවරයා හැටියට මෙතැනට එන්න අවශ්‍ය නැහැ. ඒ වාගේම, එතුමා රාජ්‍ය සේවයේ විශ්‍රාම යන වයස අවුරුදු 65 කරන ගමන්ම පොඩි අපහාසයකුත් කළා, රාජ්‍ය සේවය රටට බරක් කියලා.

ඇත්තටම කියනවා නම්, ගරු මුදල් ඇමතිතුමාගේ මංගල අය වැය නිකම් පුස් වෙඩිල්ලක් වාගේ. එතුමා ලොකු සද්දයක් කරලා, මොළ හතක් එක්ක ඇවිල්ලා ඉදිරිපත් කළ මේ අය වැයෙන් අද රටේ තිබෙන කිසිම ප්‍රශ්නයකට උත්තරයක් දීලා නැහැ. මිනිස්සු මිල පාලනයක් ගැන බලාගෙන සිටියා. රටේ ජනතාව බලාගෙන සිටියා මේ අය වැයෙන් අඩු ගණනේ මොකක් හෝ සහනයක් දෙයි කියලා; පරිභෝජනයට ගන්නා අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන්, විදුලි බිල, පෙට්‍රල් මිල සම්බන්ධයෙන් යම් සහනයක් දෙයි කියලා. ඉන්ධන මිල සම්බන්ධයෙන් අනිවාර්යයෙන් මිල සූත්‍රය ගෙනෙන්න ඕනෑ කියලා අධිකරණ ඇමති අලි සබ්රි මැතිතුමා කියා තිබෙනවා අපි දැක්කා. කාගේත් අදහස් අරගෙන මීට වඩා යමක් කරාවි කියා බලාපොරොත්තු වෙච්ච අය වැයක් අද කිසිම දෙයක් නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

කුඩා ව්‍යාපාරිකයන්ට -ක්ෂුද්‍ර ව්‍යාපාරිකයන්ට-, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන සැලසීමට එතුමා යෝජනා ඉදිරිපත් කළා. කොවිඩ්-19 වසංගතය වෙලාවේදී නොයෙකුත් අපහසුතාවලට පත් වෙච්ච මෙම ව්‍යාපාරිකයන්ට සහන සැලසීම සඳහා ණය කපා හැරීමක් කරන්න එතුමා යෝජනා කළා. එතුමා ඒ සම්බන්ධයෙන් මුදල් වෙන් කළා. හැබැයි, ඒ රුපියල් මිලියන 15,000ක මුදල කොහෙන්ද එන්නේ, කොයි බැංකුවෙන් ද, මොන මූල්‍ය ආයතනයෙන්ද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ඒ ණය කපා හරින්නේ කියන එක එතුමා පැහැදිලිව සඳහන් කළේ නැහැ. එතුමා ඒ කාරණය පේළි දෙක තුනකින් පමණක් කියා තිබෙනවා.

ඒ වාගේම එතුමා අය වැය කථාවේදී කිව්වා, රට වසා තැබූ කාලයේ ආදායම් නොලබපු ත්‍රිරෝද රථ හිමිකරුවන් සඳහා සහන සලසන්න රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ත්‍රිරෝද රථ ලක්ෂ 11ක් පමණ තිබෙනවා. එයින් ලක්ෂ 8ක් පමණ ප්‍රවාහන සේවාව සැපයීම මඟින් ජීවිකාව කරගෙන යෑමට යොදාගන්නා ත්‍රිරෝද රථ. එතකොට මේ වෙන් කරපු රුපියල් මිලියන 600 අර ලක්ෂ අටෙන් බෙදලා බැලුවාම එක් ත්‍රිරෝද රථ හිමියෙකුට ලැබෙන්නේ රුපියල් 750යි. ඒ ගොල්ලන්ට ඒ රුපියල් 750න් දවසේ වාරිකයවත් ගෙවා ගන්න බැහැ. "මේ අය වැයෙන් අපි ත්‍රිරෝද රථ රියැදුරන් ගැන කථා කළා, පුද්ගලික බස් හිමියන් ගැන කථා කළා, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ගැන කථා කළා" කියන්න විතරක් අය වැයක් ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ.

ගරු මුදල් ඇමතිතුමා විදේශ සංචිත කළමනාකරණය පිළිබඳත් කථා කළා. එහිදී එතුමා සඳහන් කළේ 1970/71 කාලයේ එවකට හිටපු මුදල් අමාත්‍ය ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා කියූ අදහසක්. නමුත්, 1977න් පසු විවෘත ආර්ථිකයත් එක්ක ඒක සම්පූර්ණයෙන් වෙනස් වුණා විතරක් නොවෙයි, මා කලින් කිව්වා වාගේ ඇඟලුම් ක්ෂේත්‍රය සහ විදෙස්ගත ශ්‍රමිකයන් නිසා විශාල විදේශ මුදල් ප්‍රමාණයක් මේ රටට ආවා. ඒක තමයි විනිමය සංචිතය හැටියට මේ රටේ තිබුණේ.

ඊළඟට, විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් අපේ රටට ලැබෙන ආදායම ගැන අපි බලමු. විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ආදායම අද එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. අද විදෙස්ගත ශ්‍රමිකයෙක් ඒ ගොල්ලන්ගේ අනේවාසික ගිණුමකට ඩොලර්වලින් මුදල් එව්වාම ඒකෙන් සියයට 10ක් මහ බැංකුවට යන්න ඕනෑ. අපි හිතමු, ශ්‍රමිකයෙන් ඩොලර් 1,000ක් එවනවා කියලා. ඒකෙන් සියයට 10ක්, ඒ කියන්නේ ඩොලර් 100ක් මහ බැංකුව ගන්නවා. ඒ මුදල අරගෙන, ඩොලර් එකකට ඒ ගොල්ලන්ගේ rate එකෙන් රුපියල් 200ක් දෙනවා. හැබැයි, මහ බැංකුවට මුදල් යන්නේ නැතිව නීත්‍යානුකූල නොවන උණ්ඩියල් ක්‍රමයට මේ රටට සල්ලි එනකොට ඒ ගොල්ලන්ට ඩොලර් එකට රුපියල් 240ක්

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

ලැබෙනවා. ඇයි, මෙහෙම කරන්නේ? ඩොලර් හිඟය නිසා මෙවැනි දේවල් කරනවා. මේ අහිංසක මිනිස්සු මහන්සි වෙලා එවන සල්ලි ටිකෙනුත් ගසා කනවා, මහ බැංකුව. අපි අහනවා, මහ බැංකුවට මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා. මේ ශ්‍රමිකයන් තමන්ගේ පවුල, දරුවෝ ලංකාවේ දාලා තමයි විදෙස්ගත වෙලා ඉන්නේ. ඒ ගොල්ලන් යමක් හම්බ කරලා මේ රටට දීලා තිබෙනවා. ඒ ගොල්ලන් ගැන මේ අය වැය තුළ කිසිම සඳහනක් නැහැ. නමුත්, කියන්නේ නම් ඒ ගොල්ලන් ගැන ලොකු සුබසාධනයක් කිරීමට කටයුතු කරන්න උත්සාහ කරනවා කියලායි. අපේ විදෙස්ගත ශ්‍රමිකයන් අවුරුද්දකට රුපියල් බිලියන හතක් විතර එවනවා. ඒක ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් විතර වෙනවා. ඒක මේ රටට විශාල ආදායමක්. ඒ නිසා මේ අය සම්බන්ධයෙන් මීට වඩා අවධානය යොමු කරලා, ඒ මිනිස්සු එවන ඩොලර්වලින් ගසා කන්න එපා කියලා අපි මේ වෙලාවේ මතක් කරනවා.

ඊළඟට, අද සමුපකාර ග්‍රාමීය බැංකුවල තැන්පත්කරුවන්ට සිදුව ඇතැයි කියන වංචා පිළිබඳවත් සොයා බලා, එම බැංකු වඩා ශක්තිමත් ව්‍යාපාරයක් බවට පත් කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන්ට "home shop" කියලා අවස්ථාවක් දෙන්න හදනවා. Home shop නොවෙයි, දැනට ගම්වල, නගරවල තිබෙන සතොසට අවශ්‍ය බඩු ටිකවත් ලබා දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කවුරුත් දන්නවා නේ, 2015-2016 කාලය තුළ මහ බැංකුවේ ලොකු වංචාවක් සිදු වුණා කියලා. හිටපු ජනාධිපතිතුමාත් ඒක හැම වෙලාවේම කිව්වා, සියලු දෙනාම කිව්වා. ඒ ගැන විභාග කළා. Justice Chitrasiriට ඒ සම්බන්ධයෙන් සොයා බලන්න දීලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් දැනට අධිකරණයේ නඩුවක් පවතිනවා. "අයියයි, මල්ලියි අපි පවුලේ කට්ටිය තමයි ආණ්ඩුව කරන්නේ" කියලා නඩු භාණ්ඩයක් හැටියට තිබෙන මහ බැංකුවේ මුදල් කාටවත් ගන්න බැහැ. හැබැයි, අපි ඉල්ලා සිටින්නේ මේකයි. ඊට වඩා ලොකු හානියක් කරපු ඒවා තමයි සීනි වංචාව සහ පොල්තෙල් වංචාව. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව සොයා බලනවා වාගේ ඒවා සම්බන්ධයෙනුත් සොයා බලා කටයුතු කරන්නේ නැත්තේ ඇයි? මහ බැංකුවේ සිදුවුණු වංචාව හරියි කියලා අපි කියන්නේ නැහැ. අපි එය අනිවාර්යෙන්ම ප්‍රතික්ෂේප කරනවා. කවුරු කළත් ඒ අයට දඬුවම් දෙන්න ඕනෑ. මහ බැංකු සිද්ධිය පමණක් නොවෙයි, අර්ජුන් ඇලෝසියස්ලාගේ මෙන්ඩිස් සමාගමෙන් වැටුප් ගත්ත අය ඉන්නවා නම්, ඒ අය අපේ පැත්තේ හිටියත් කමක් නැහැ ඒ අයටත් දඬුවම් දෙන්න ඕනෑ. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ඒ පිළිබඳව සියලු දෙනා නිවැරදිව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සීනි වංචාවෙන් සහ පොල්තෙල් වංචාවෙන් මේ රටට සිදු වෙච්ච අලාභය, මේ රටට අහිමි වෙච්ච බදු ප්‍රමාණය සම්බන්ධයෙනුත්, ගජ මිතුරු කල්ලිවලින් ඒ මුදල් අය කර ගන්න වැඩ පිළිවෙළක් මුදල් ඇමතිවරයා හැටියට එතුමා මේ අය වැයෙන්ම ඉදිරිපත් කළොත් හොඳයි කියලා මම හිතනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Dr. Susil Premajayantha. You have 15 minutes.

[අ.භා. 1.13]

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2022 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයයි මේ පැවැත්වෙන්නේ. මෑත කාලීන ඉතිහාසයේ ඉදිරිපත් කළ අය වැය ලේඛනත්, වර්තමාන තත්ත්වයත්, ඒ වාගේම නිදහසින් පසු අපේ රටේ මුදල් ඇමතිවරු ඉදිරිපත් කරපු සෑම අය වැයක් දෙසත් බැලුවාම අපට පෙනී යන එක දෙයක් තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා මෙම අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ ඉතා අභියෝගාත්මක දුෂ්කරම අවස්ථාවකයි. ඒක කියන ගමන්ම මම තවත් කරුණු දෙකක් පෙන්වා දෙන්න කැමතියි. 1970 වර්ෂය දක්වා පැවැති රජයන්ගෙන් සාම්ප්‍රදායික අය වැයවල් ඉදිරිපත් වුණා. අය වැය හිඟය පියවා ගැනීම සඳහා දේශීය ආදායම් වැඩි කර ගැනීම, නිෂ්පාදනය වැඩි කර ගැනීම වැනි දේවල්වලට තමයි ඒ අවස්ථාවලදී අවධානය යොමු වුණේ. හැබැයි, 1973 වර්ෂය සඳහා ඉදිරිපත් කරපු විසර්ජන පනත් කෙටුම්පතට අදාළව ආචාර්ය එන්.එම්.පෙරේරා මැතිතුමා 1972 නොවැම්බර් මාසයේ 10 වෙනිදා ඉදිරිපත් කළ අය වැය කථාවේ සඳහන් කරුණු කීපයක් මම උපුටා දක්වන්න කැමතියි. මා ළඟ තිබෙනවා, 1973 වර්ෂයට ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ අය වැයට අදාළ සම්පූර්ණ හැන්සාඩ් වාර්තාව. මේක, 1972-73, හැන්සාඩ් වාර්තාවේ 3වන වෙළුම.

එදා, අපේ රටට විතරක් නොවෙයි, ලෝකයේ ම බලශක්ති අර්බුදයක් තිබුණු වෙලාවක්. තෙල් පිළිබඳව, අනෙකුත් බලශක්තීන් පිළිබඳව, නැව්, ගමනාගමනය යන මේ සියල්ල පිළිබඳව බරපතළ අර්බුදයක් ලෝකයේ තිබුණා. ඒ නිසා එදා මේ තරම්ම නොවුණත්, ඉතාම දුෂ්කර අය වැයක් තමයි ඉදිරිපත් කරන්න සිදු වුණේ. හැබැයි, ඒ රජයේ ප්‍රතිපත්තියක් තිබුණා, සංවෘත ආර්ථික ක්‍රමයකට යන්න. ඒක තමයි, සියලු දේ රාජ්‍යයේ මැදිහත්වීම මත නිෂ්පාදනය කිරීම, රජය මුදල් ආයෝජනය කරලා රාජ්‍ය ව්‍යවසායන් මඟින් ඒ නිෂ්පාදන කිරීමේ ප්‍රතිපත්තිය. ඒකටත් හේතුවක් තිබුණා, බණ්ඩාරනායක මැතිතුමාගේ යුගයේ ඉඳලා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලය දක්වා. මොකද, ආයෝජනයන් කරන්න, මහජන අවශ්‍යතා ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් ලබා දෙන්න පෞද්ගලික අංශය ශක්තිමත්ව තිබුණේ නැහැ. ඒ නිසා සිද්ධ වුණා, රාජ්‍ය ව්‍යවසායන් ඇති කරන්න. මම ඒ කාරණයට පසුව එන්නම්. එතැනදී සංවෘත ආර්ථිකයකට ගියා. අදත් මම දැක්කා, පෝලිම් යුගයක් ගැන කථා කරනවා. මඤ්ඤොක්කා, බතල කාපු යුගය ගැන කථා කළා. එහෙම කරන්න සිදු වුණේ, එදා විදේශ විනිමය ඉපැයීම් මාර්ග හැටියට තිබුණේ සාම්ප්‍රදායික අපනයන් විතරයි. ඒ, තේ, පොල්, රබර්, ගම්මිරිස් වැනි දේවල්. හැබැයි, දැන් තත්ත්වය ඊට වඩා වෙනස්. නමුත්, ඒකටත් මේ තිබෙන කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ යම් බලපෑමක් ඇති වෙලා තිබෙනවා. එදා - 1970 ඉඳලා 1977ක් දක්වා අවුරුදු 7ක්- සංවෘත ආර්ථිකයක් තමයි තිබුණේ. ඒ, තුනෙන් දෙකක බලයක් තිබුණු ආණ්ඩුවක්. 1971 කැරැල්ලටත් මුහුණ දුන් ආණ්ඩුවක්. 1975, 1976 වෙනකොට හවුල්කාර පක්ෂ දෙකක් ඒ රජයෙන් ඉවත් වුණා. 1977 ජූලි 20 වෙනිදා මැතිවරණයට ගිහින්, එදා ඒ ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ තිබුණු ආසන ගණන 8ට බැස්සා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඒ මැතිවරණයෙන් හයෙන් පහක බලයක් ගත්තා.

එතුමාගේ රජයේ ප්‍රථම මුදල් ඇමති රොනී ද මැල් මැතිතුමා තමයි 1978ට අදාළ අය වැය 1977 දී ඉදිරිපත් කළේ. ආචාර්ය එන්.එම්. පෙරේරා කියන්නේ, ආචාර්ය උපාධි දෙකක් තිබෙන පුද්ගලයෙක්. London School of Economics and Political Scienceහි ආර්ථික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධියත්, දේශපාලන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියත් එතුමාට තිබුණා. ඒ වාගේම එවකට බ්‍රිතාන්‍යයේ Labour Party එකේ ප්‍රබල සාමාජිකයෙක් වෙච්ච හැරල්ඩ් ලැස්කිගේ ප්‍රධානම ගෝලයෙක් තමයි මේ එන්. එම්. පෙරේරා කියන්නේ. එදා එතුමාගේ අය වැය ඉදිරිපත් කළා. ඊළඟට, රොනී ද මැල් මහත්මයා එතුමාගේ පළමුවැනි අය වැය ඉදිරිපත් කරමින් කළ කථාවේ වැඩිහරියක් තිබුණේ බණ්ඩාරනායක කියන නම. මා ළඟ තිබෙනවා, එතුමාගේ අය වැය කථාව ඇතුළත් හැන්සාඩ් වාර්තාව. මම ඒක මෙතැන කියවන්න යන්නේ නැහැ. හැබැයි, ආණ්ඩු පක්ෂයේ වුණත්, විපක්ෂයේ වුණත් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මෙවැනි අය වැය විවාදවලට සහභාගී වනකොට මේ හැන්සාඩ් වාර්තා ටික පොඩ්ඩක් බලලා ආවා නම්, ඒක ඉතා වැදගත් වෙයි කියලා මම හිතනවා. මොකද, අද මේ රට මුහුණ දෙන අභියෝගත් එක්ක ඒ වකවානුවල ක්‍රියා කළේ කොහොමද කියන කාරණය ගැන අවබෝධයක් ලබා ගැනීමට ඒ තුළින් හැකියාවක් ලැබෙනවා. රොනී ද මැල් මැතිතුමා එදා අය වැය කථාව කරන වකවානුව වනකොට, රොනල්ඩ් රේගන් මැතිතුමා තමයි ඇමෙරිකාවේ ජනාධිපති. මාග්‍රට් තැචර් මැතිනිය තමයි බ්‍රිතාන්‍යයේ අගමැති. මේ ගොල්ලන් තමයි වෙළඳපොළ ආර්ථික ක්‍රමය ව්‍යාප්ත කිරීමේ පුරෝගාමීන් - pioneers - වුණේ. ඒක රැල්ලක් වාගේ ගියා. 1978 අය වැයෙන් පසුව මෙක සම්පූර්ණ විවෘත ආර්ථිකයකට ගිහිල්ලා, වෙළඳපොළ ආර්ථික ක්‍රමයකට ගිහිල්ලා, සංවෘත ආර්ථික ක්‍රමයෙන් සම්පූර්ණයෙන් වෙනස් වෙලා, යම් යම් සංශෝධන සහිතව අද දක්වා වෙළඳපොළ ආර්ථිකය තමයි අපේ රටෙත් ක්‍රියාත්මක වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයම මුහුණ දෙන කොවිඩ් - 19 වසංගතයට අද අපිත් මුහුණ දී සිටිනවා. මේ සන්දර්භය තුළ තමයි අපි මේ ගැන කථා කරන්න ඕනෑ. මම කලින් සඳහන් කළ අය වැයට අදාළ හැන්සාඩ් වාර්තාවේ දිනය 1977.11.15, වෙළුම 24. මම මේ කාරණා කියන්නේ හැන්සාඩ්ගත වීම සඳහායි. මම ඊට වඩා ඒ ගැන කියන්න යන්නේ නැහැ. ඒ තිබුණු තත්ත්වය දැන් වෙනස් වෙලා. දැන් මොකක්ද, තිබෙන තත්ත්වය? 1977 වෙනකොට විදේශ ණය ප්‍රමාණය යූඑස් ඩොලර්වලින් ගත්තොත්, ඩොලර් මිලියන 750යි. රොනී ද මැල් මුදල් ඇමතිතුමාගේ අවසාන අය වැයේ, - එතුමාගේ නියෝජ්‍ය මුදල් ඇමතිවරයා වශයෙන් හිටියේ නයිනමරික්කාර් මැතිතුමා. එතුමා තමයි ඒකේ ඉතුරු ටික කළේ. එතුමා කිව්වා, "මට හිහා කකා ලෝකේ වටේ යන්න බැහැ" කියලා. එදා - 1988, 1989 වෙනකොට - ඩොලර් මිලියන 750ක් ලෙස තිබිච්ච ණය ප්‍රමාණය අද ඩොලර් බිලියන 15යි. අන්න එතැනට තමයි දැන් අපි ඇවිල්ලා තිබෙන්නේ. මම දැක්කා, අද මාධ්‍ය වාර්තා කරලා තිබෙනවා, 2021 වර්ෂයේ පළමුවෙනි මාස නවයේ වෙළඳ හිඟය - trade deficit එක - ඇමරිකානු ඩොලර් බිලියන 6යි කියලා. කොවිඩ් වසංගතය නැති කාලයේත් trade deficit එක බිලියන 11යි. මේක තමයි දිගින් දිගටම ආපු තත්ත්වය. අපි කථා කරනවා, මෙච්චර ආයෝජන එනවා; direct investments මෙච්චරයි කියලා.

හැබැයි, කොවිඩ්-19 ව්‍යසනයට හැමදේම ලඝු නොකළත් මේවාට ඒකෙනුත් බරපතළ බලපෑමක් තිබෙනවා. මොකද, විදේශ වෙළෙඳාම එදා වූ ආකාරයෙන් අද වෙන්නේ නැහැ. හැම රටේම එහෙමයි. හැම රටම ආනයන සීමා කරන්න යනවා. ආනයන සීමා කරනකොට අපනයනවලටත් ප්‍රශ්නයක් එනවා. අද අපනයනය කරන්න කන්ටේනර් නැහැ, ආනයනය කරන්නේ නැති නිසා. සමහර අපනයනකරුවන්ට ඒ ප්‍රශ්නය තිබෙනවා. සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට තිබෙන ප්‍රශ්නය, අමුද්‍රව්‍ය නොමැතිවීම. එතකොට නිමි භාණ්ඩ වෙළෙඳ පොළට යවන්න බැහැ. එවිට අපනයන පාඩු වනවා. ආනයන සහ අපනයන අපට ඕනෑ ඕනෑ විධියට හසුරවන්න බැහැ. ඒක සිදුවන්නේ ජාත්‍යන්තර වෙළෙඳාම - foreign trade - මත. මම ඒක කිව්වේ, දැනගෙනයි. මම foreign trade විෂයයක් හැටියට කළේ ලංකා බැංකුවේ වැඩ කරන කාලයේ, bankingවලට. මම ඒ ගැන ඊට වඩා කියන්න යන්නේ නැහැ.

ඊළඟ කාරණය, දැන් අපි මොනවාද කරන්න ඕනෑ කියන එකයි. දැන් බලන්න, වෙළෙඳ පොළ ආර්ථිකයක් තිබිච්ච රටක එදා නම් මිල පාලනය කරලා ගැසට් ගැහුවා. එතකොට සතොසෙන් සහ සමුපකාරයෙන් බඩු බෙදුවා. අද ඒක ගැළපෙනවාද? දැන් අපි ගැසට් නිවේදන කීයක් නිකුත් කළාද? නිකුත් කළ ගැසට් ඔක්කෝම අපි withdraw කළා. එහෙම නම්, මොන ආර්ථික මූල ධර්මය මතද අපි කටයුතු කරන්නේ? ඒක නොගැළපීම. මේවා කරන්න කලින් සාකච්ඡා කරලා, සංවාදයක් ඇති කරලා, අදහස් අරගෙන කළා නම්, ගැසට් නිවේදන නිකුත් කර කර ඉවත් කර ගන්න සිද්ධ වෙන්නේ නැහැ. අද ඒකේ ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ මොකක්ද? මහජන නියෝජිතයෝ හැටියට අපි මේක කියන්න ඕනෑ. අද ඉතා අමාරු අඩියක මේ රටේ සාමාන්‍ය ජනතාව ඉන්නේ. ගමේ පොළකට ගියොත් අපි දන්නවා, එළවලු මිල කොහොමද කියලා. වැස්ස නිසා අස්වැන්නේ අඩුවක් වෙන්න පුළුවන්. එයට තවත් හේතු තිබෙන්න පුළුවන්. පොහොර නිසා වෙන්න පුළුවන්. කෘමි නාශක නැති නිසා වෙන්න පුළුවන්. හැබැයි, මේවා කළමනාකරණය කරන්න තමයි අදාළ අමාත්‍යාංශ, පර්යේෂණ ආයතන සහ නිලධාරින් ඉන්නේ. ඒ ගොල්ලන් මේවා කළමනාකරණය කරලා තීන්දු ගන්න අය feed කරන්න ඕනෑ. මම මීට වඩා ඒ ගැන කියන්න යන්නේ නැහැ. නමුත්, සාමාන්‍ය ජනතාවට තිබෙන ජීවන වියදම පිළිබඳ ඇඩි ප්‍රශ්නය ගැන අපි අවබෝධයෙන් යුතුව කථා කරන්න ඕනෑ.

ඊළඟ කාරණය, අද ජාත්‍යන්තර වෙළෙඳාම පසුබෑමට ලක් වී තිබීම. මම ඒක කිව්වා. 2021 ජූලි වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති ණය ඇතුළුව බැංකු වෙත ගෙවිය යුතු ණය ප්‍රමාණය රුපියල් බිලියන 365.5යි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන්ට ගෙවිය යුතු බැදීම රුපියල් බිලියන 128යි. රුපියල් බිලියන 365.5ට බිලියන 128ක් එකතු කරන්න ඕනෑ. එතකොට ගණන එනවා. ඊළඟට, 2021 ජූලි වනකොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් මිලියන 61,886ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබෙනවා. රාජ්‍ය බැංකුවලට ගෙවිය යුතු ණය ප්‍රමාණය ඩොලර්වලින් ගත්තොත් බිලියන 3,000ක් වනවා. 2022 - රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ 67 වන පිටුවේ රාජ්‍ය බැංකුවලට ගෙවිය යුතු ණය ප්‍රමාණය රුපියල්වලින් සඳහන් කර තිබෙනවා, රුපියල් මිලියන 707,505යි කියලා. ඒ කියන්නේ, රුපියල් බිලියන 707ක්. මෙන්න මේ හේතුව නිසා තමයි තෙල් ඇමතිතුමා ඊයේ-පෙරේදා කිව්වේ, "ඉන්ධන ගේන්න විදේශ විනිමය නැහැ" කියලා. ගිය අවුරුද්දේ සැප්තැම්බර් වනකොට බොර තෙල් බැරල් එකක මිල ඩොලර් 38යි. අද ඩොලර් 82යි. යුරෝපයේ Winter එකත් එක්ක ඒ මිල තව වැඩි වන බව පුරෝකථනය කරනවා. එතකොට මොකද වෙන්නේ? බොර තෙල් බැරල් එකක මිල තව ඉහළ යනවා. හැබැයි එදා අපට උපක්‍රමශීලීව කරන්න තිබුණා, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කථා කරලා long-term contract එකකට යන්න, deferred payments එක්ක. එහෙම වුණාද, නැද්ද කියලා මම දන්නේ නැහැ.

මීට පෙරත් මෙවැනි අවස්ථාවලට අපි මුහුණ දුන්නා. 2011දී ඇමෙරිකා එක්සත් ජනපදය ඉරානයට තහංචි දැම්මා. අපි අවුරුදු 20ක් තිස්සේ ඉරානයෙන් බොර තෙල් ගෙනාවා. අපට ඒක

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

නවත්වන්න වුණා. මොකද, Chase Manhattan Bank එක payments කළේ නැහැ. ඒ හරහා තමයි සියලු dollar payments යන්නේ. අපි මොකක්ද කළේ? මම කථා කළා, ලංකාවේ ඉන්න ඉරාන තානාපතිතුමාට. LCs විවෘත නොකර, විශ්වාසය මත තෙල් නැව් දෙකක් ගෙනාවා. ඒ මුදල තවම අපි ගෙවනවා. ඩොලර් මිලියන 280ක් අපි ගෙවන්න ඕනෑ. හැබැයි, අපි Refinery එක වැහුවේ නැහැ. ඒ අතරතුර වෙනත් arrangements දමාගත්තා. ඒ නිසා මම යෝජනා කරනවා, මේ කාරණාවලදී රාජ්‍ය තාන්ත්‍රිකභාවය අපි යොදා ගන්න ඕනෑ කියලා. අපේ තානාපතිවරු ඒ රටවල ඉන්නවා. මේ සඳහා ඒ අයට මැදිහත් වෙන්න කියන්න. ඒ රටේ විතරක් නොවෙයි, අරාබිකරයේ අනෙක් රටවලත් ඉන්නවා. එවැනි වැඩ පිළිවෙළකට අපි වහාම යා යුතුව තිබෙනවා.

ඊළඟට, මේ අය වැය මඟින් ප්‍රාග්ධන යෙදවුම් අඩු කර තිබුණත් ජීවනෝපාය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළකට ගිහින් තිබෙනවා. ඒ වෙනුවෙන් තවත් රුපියල් මිලියන 19,894ක් වෙන් කර තිබෙනවා. මොකද, අද දවසේ ප්‍රමුඛ කාර්ය භාරයක් වෙන්නේ ග්‍රාමීය සහ නාගරික අඩු ආදායම්ලාභී ජනතාවගේ ජන ජීවිතය නඟාසිටුවීම. ඒක ඉතා හොඳ ප්‍රවණතාවක්. මෙය සාර්ථක කර ගන්න නම්, ඒවායේ ඉන්න බලධාරින්, ප්‍රාදේශීය වශයෙන් නිලධාරින් හා ග්‍රාමීය මට්ටමේ අය ඉතා මහන්සියෙන් එකාවන්ව වැඩ තළ යුතුයි.

දැන් තෙල් පිරිපහදුව වැහුවා. මම දැක්කා කියනවා, භූමිතෙල් ප්‍රශ්නයක් නැහැ කියලා. පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමනි, ලංකාවේ හැර වෙන කොහේවත් refinery එකක භූමිතෙල් නිෂ්පාදයන කරන්නේ නැති බව ඔබතුමාත් දන්නවා ඇති. Jet A-1 තමයි එන්නේ. Jet A-1 කියන්නේ භූමිතෙල්වලට වඩා උඩින් තිබෙන refined product එකක්. Jet A-1 - ජෙට්වලට ගහන තෙල් - තමයි භූමිතෙල් ගඳ ගහන්නේ. භූමිතෙල් ටොන් 500ක් නැති වනකොට එහි බලපෑම කාටද තිබෙන්නේ? සුළු කර්මාන්තවලට මෙය අවශ්‍ය නැහැ. ධීවරයන්ට අවශ්‍යයි, කෘෂිකර්මයට අවශ්‍යයි. දැන් ඩීසල් එක්ක භූමිතෙල් කලවම් කරලා බස්වලටත් ගහනවා. අපි මේක සුළුවෙන් තකන්න නරකයි. Jet A-1 නැති වුණොත් මොකක්ද වෙන්නේ? SriLankan Airlines තෙල් ගහන්නේ ණයට. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඒ ණයම ගෙවන්න තිබෙනවා, රුපියල් බිලියන 25කට, 30කට වඩා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු ලබන්නේ ඒකේ ප්‍රශ්නයක් නිසාම නොවෙයි. ඒවාත් තිබෙනවා තමයි. හෙජින් ගනුදෙනුවෙන් පාඩු වුණා. ඒ වාගේ ඉතිහාසයක් තිබෙනවා. මේ ආයතනය තුනට කැඩුවා. ඊට පසු තුනෙන් එකක් වික්කා. යන්තම් ඉතුරු තුනෙන් එක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේදී ගත්තා. ඒ නිසා දැන් තුනෙන් දෙකක් තිබෙනවා. තෙල් ටැංකි සියය බදු දුන්නා. නමුත්, බදු දුන්නේ නැහැ කියනවා. නැහැ, දුන්නා. හැබැයි, පැවරීමක් කළේ නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, ඉතිහාසයේ මේ හා සම්බන්ධව සිදුවීම් ගණනාවක් තිබෙන බව. මේවා ගැන මම වෙනම පොතක් ලියා තිබෙනවා. මේ මගේ ආචාර්ය උපාධිය පදනම් කරගෙන ලියපු පොත. "Making Public Enterprises Industry Leaders: The Role of Governors and Legislative Control" මේ පොතේ මම ඉතාම හොඳින් විදුලිබල මණ්ඩලය හා තෙල් සංස්ථාව ගැනත්, SOBEs ගැනත් පැහැදිලි කරලා තිබෙනවා. අද රටේ ආර්ථිකයේ ප්‍රබලම තැනක් ගන්නේ, බලශක්තිය. ඕනෑම රටක බලශක්තිය මත තමයි ආර්ථික ක්‍රියාවලිය ඉස්සරහට යනවාද, නැද්ද කියන එක තීන්දු වෙන්නේ. එහෙම නම්, අපි ප්‍රමුඛතාව දිය යුත්තේ අපේ බලශක්ති ප්‍රශ්නය විසඳන්නයි. බලශක්තිය පිළිබඳ විෂය භාර හිටපු ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. එතුමා ඒ පිළිබඳ ඉංජිනේරුවරයෙක්. එතුමාත් මේ ගැන දන්නවා. ඉතිහාසයේ කරපු වැරදි තිබෙනවා. දැන් ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. දැන් අපි මොනවාද කරන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, you have two more minutes.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
දැන් මම මගේ කථාවේ අන්තිම හරියට එනවා. වැදගත්ම කොටස තමයි, මම මෙතැනදී පෙන්වුයේ.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1961දී Shell, Caltex, Esso සමාගම් තුනම ජනසතු කරලා තෙල් සංස්ථාව හැදුවා. ඇමෙරිකාවෙන් තහංචි දැම්මා. ශිෂ්‍යත්වයට ගිය අය මඟදි හරවා එව්වා. හැබැයි, මැතිනිය මොකක්ද කළේ? ගමාල් අබ්දුල් නසාර් වැනි නායකයන් සම්බන්ධ කරගෙන, අරාබිකරය සම්බන්ධ කරගෙන, Soviet Union එක සම්බන්ධ කරගෙන කටයුතු කළා. තෙල් නැති වුණොත් දෙන්න ඒ අය එකඟ වුණා. මොකක්ද, කරන්න පුළුවන් වුණේ? අන්න, ගත් එඩිතර තීන්දු. කච්චතිවු දූපත ගත්තා. දැන් තිබෙන ඒවා විකිණුවාය කියනවා නේ. පසුගිය කාලයෙත් වික්කා, දැනුත් එහෙමයි කියලා මේ සභාවේ කියනවා. හැබැයි, එදා හිටපු නායකයෝ රටට වත්කම් එකතු කළා. ඒකයි වෙන්න ඕනෑ. භාණ්ඩ මිල අඩු කරන්න නම්, මිල පාලනයකුත් නැත්නම්, නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ප්‍රමුඛතාව දෙන්න ඕනෑ ඒකටයි. ඒ සඳහා මෙවර අය වැයේ යම් යම් යෝජනා තිබෙනවා. ප්‍රශ්නය, ඒක මේ වෙලාවේ ප්‍රමාණවත්ද කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම අමාරු, අභියෝගාත්මක අවස්ථාවක තමයි මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒක අපි කවුරුත් පිළිගන්න ඕනෑ. දැන් ඒකට දොස් කිය කියා ඉඳලා වැඩක් නැහැ. බලයේ ඉන්න අයට බලය ගන්න ඉන්න අය දොස් කියනවා. බලය ගන්න ඉන්න අය ඉතිහාසයේ කරපු ඒවාට බලයේ ඉන්න අය දොස් කියනවා. ඒකෙන් මේ රටේ සාමාන්‍ය ජනතාවට කිසිම වැඩක් නැහැ. දැන්, අවශ්‍ය වන විසඳුම මොකක්ද? දැන් කියමු, මම බැංකුවක ගිණුම් හිමිකරුවෙක් කියලා. මට ආර්ථික අර්බුදයක් එනවා. මට loan එකක් ඕනෑ වෙනවා. මම බැංකුවට ගිහිල්ලා loan එකක් ගන්නවා. ඒක ලජ්ජා වෙන්න දෙයක්ද? මූල්‍ය ආයතනවලට ගිහිල්ලා මේ තිබෙන ණය reschedule කරගෙන, අවුරුදු දෙක තුනකට හුස්ම ගන්න ඉඩක් හදා ගන්න ඕනෑ. එසේ නොකර මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මොකද, ජාත්‍යන්තර වෙළෙඳාම පසු බැහැලායි තිබෙන්නේ. අපේ ඇඟලුම්වලින් එදා ලැබුණු ආදායම දැන් ලැබෙන්නේ නැහැ. ශ්‍රමිකයන්ගේ remittances ඒ විධියට ලැබෙන්නේ නැහැ. අපනයනවල පමණක් වර්ධනයක් තිබෙනවා. ඒක හැම රටකම තිබෙනවා. බංග්ලාදේශයේ මීටත් වඩා වර්ධනයක් තිබෙනවා. වියට්නාමයේ ඊටත් වඩා වර්ධනයක් තිබෙනවා. නමුත්, ජාත්‍යන්තර වෙළෙඳාම පසු බැහැලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන වැඩිය බලාපොරොත්තු තියා ගන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please wind up now.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලය අවසන් නිසා මගේ සම්පූර්ණ කථාව **සභාගත*** කරනවා. මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දැන් මම කල්පනා කරන්නේ, සාර්ව ආර්ථික ප්‍රශ්නවලට ක්ෂුද්‍ර ආර්ථික විසඳුම් ලබා දීමෙන් කොයි තරම් දුරට ප්‍රතිඵලයක් අත් කර ගන්න පුළුවන්ද කියන කාරණයයි. Can we address macroeconomic issues with microeconomic solutions? අපි ඔක්කොම මෙන්න මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Dr.) Sarath Weerasekara. You have 15 minutes.

[අ.භා. 1.29]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයක අය වැය ලේඛනයක් කියලා කියන්නේ ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තාවක්. වියදම, ආදායමට වඩා වැඩි නම් ඇත්ත වශයෙන්ම ඒ වියදම අඩු කර ගන්නේ කොහොමද සහ ආදායම වැඩි කර ගන්නේ කොහොමද කියන එක තමයි අය වැය ලේඛනයක් තුළින් පෙන්නුම් කරන්නේ. ඒ අතින් බලන කොට ඒක කරන්නත් ඕනෑ, ජනතාවට අවම පීඩනයක් ඇති වන විධියට. ඒ අතින් බලන කොට මෙවර අය වැය ලේඛනය මෑත ඉතිහාසයේ අති දුෂ්කරම තත්ත්වයක් මත සම්පාදනය වුණු අය වැය ලේඛනයක් හැටියට අපට කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටක් ඉදිරියට යන්න නම් රටට විදේශ විනිමය අවශ්‍යයි. ඒ වාගේම ආදායම් මාර්ග අවශ්‍යයි. අපට ප්‍රධාන ආදායම් මාර්ග හතරක් පමණ තිබෙනවා. පළමුවැනි එක තමයි, සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා. සංචාරක ව්‍යාපාරයෙන් වසරකට ඩොලර් බිලියන 4.5ක්, එහෙම නැත්නම් ඩොලර් බිලියන 5ක් පමණ උපයා ගත්තා. වසර දෙකක් තිස්සේ ඒ සංචාරක ව්‍යාපාරය කඩාගෙන වැටුණු නිසා අපට ඩොලර් බිලියන 10ක් පමණ අහිමි වුණා. ඒ වාගේම තමයි විදේශ සේවා නියුක්තිකයන් ලක්ෂ ගණනින් ලංකාවට ආවා. ඔවුන්ගේ රැකියා අහිමි වෙලා ඔවුන්ගෙන් ලැබුණු විදේශ විනිමයත් රටට අහිමි වුණා. ඒ වාගේම තමයි මේ වසංගතය මුළු ලෝකයේ හැම රටකටම බලපාපු නිසා සෘජු විදේශ ආයෝජන පවා අපේ ලංකාවට ආවේ නැහැ. මේ වසංගතය නිසාම දේශීය වශයෙන් නිෂ්පාදය අඩු වුණා. ඒ වාගේම දේශීය වශයෙන් ආදායමත් අඩු වුණා.

ආදායම මේ විධියට නැති වෙන කොට අපේ වියදමත් නොසිතූ අයුරින් වැඩි වෙන්න පටන් ගත්තා.කොවිඩ් එන්නත් සඳහා අපට ඩොලර් මිලියන 700ක් වියදම් කරන්න වුණා. ඒක අමතර වියදමක්. ඊට අමතරව ඒ හා සම්බන්ධව නිරෝධායන මධ්‍යස්ථාන, වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන, PCR, Antigen වාගේ testsවලට විශාල මුදලක් අමතරව වැය කරන්නට අපේ රජයට සිද්ධ වුණා. ඒ වාගේම තමයි රට වැහුවාට පස්සේ - lock down කළාට පස්සේ- අඩු ආදායම්ලාභී පවුල්වලට රුපියල් 5,000 ගණනේ පවුල් ලක්ෂ ගණනකට අපට මුදල් දෙන්න සිදු වුණා. ඒ වාගේම කොවිඩ් ආසාදිත වෙච්ච අයට රුපියල් 10,000ක සහන මල්ලක් ලබා දුන්නා. මේ සියල්ලක්ම වෙනත් රජයන් මුහුණ නොදුන්, වෙනත් රජයන් වියදම් නොකළ මුදල් හැටියට තමයි අපි සලකන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බරපතළ කාරණය මෙයයි. 2015දී මහින්ද රාජපක්ෂ රජය, යහ පාලන රජයට රට භාරදෙන කොට අපේ තිබුණු මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 7,487යි. නමුත් 2019 වසරේදී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ රජය භාර ගන්න කොට ඒ ණය ප්‍රමාණය රුපියල් බිලියන 13,032 දක්වා වැඩි වෙලා තිබුණා. මෙකේ තිබෙන බරපතළකම තමයි 2018 අප්‍රේල් ඉඳන් 2019 ජූලි මාසය වෙන කොට -ඒ මාස 15දී පමණක්- ඩොලර් බිලියන 6.9ක් ණය අරගෙන තිබීම. මේ රජයට ඒ ණයත් පොලී සමඟ ගෙවන්න වෙලා තිබෙනවා. එහෙම නම් බුද්ධියක් තිබෙන ඕනෑම කෙනෙකුට තේරෙනවා මේ වාගේ තත්ත්වයක් මත මේ වාගේ අය වැයක් හදන්න මොන තරම් අමාරුද කියලා. මෙවැනි අය වැයක් සම්පාදනය කරන්නේ මොන තරම් දුෂ්කරතා මධ්‍යයේද කියලා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද උදේ කිව්වා, මේ රජය ව්‍යාපාරිකයන් සම්පූර්ණයෙන්ම අමතක කළා කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදි මතයක්. ව්‍යාපාර කඩාගෙන වැටිලා, ආදායම් නැති වුණත් සේවකයන්ට පඩි ගෙවන්න වෙනවා; විදුලිය සහ වතුර බිල ගෙවන්න වෙනවා. ඒ නිසා ණය අරගෙන නන්නත්තාර වෙලා හිටපු ඒ ව්‍යාපාරිකයන්ට මහ බැංකුව අත දුන්නා. ඔවුන්ගේ තිබෙන ඒ ණය වාරික සහ පොලිය ගෙවන එක මාස හය ගණනේ තුන් වතාවක් දික් කළා. ඒ ණය වාරිකය සහ පොලිය ගෙවන්න අවශ්‍ය නැහැයි කියලා ඒ චක්‍රලේඛය නිකුත් කළා. ඒ අතින් අවුරුදු එකහමාරක් තිස්සේ ඒ ව්‍යාපාරිකයන්ට විශාල සහනයක් ලබා දුන්නා. ඒ වාගේම තමයි කාරක ප්‍රාග්ධන ණය සියයට හතරක් කියන ඉතාම සුළු පොලියකට ඔවුන්ට ලබා දුන්නා, ඒ තුළින් ඔවුන්ගේ ව්‍යාපාර නැවත නංවා ගන්න. ව්‍යාපාරිකයාට මේ වාගේ සහන දෙන කොට බැංකුවලට සල්ලි අවශ්‍ය නිසා මහ බැංකුව විසින් බැංකුවලටත් ඉතාම ලොකු සහනයක් දුන්නා. වාණිජ බැංකු 24ක් අපේ රටේ තිබෙනවා. ඒ සෑම බැංකුවක්ම මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිතයට ඒ බැංකුවේ මුදල්වලින් යම් කිසි ප්‍රතිශතයක් -සියයට 7ක්- බැර කළ යුතුයි. නමුත් ඒ සියයට හත මීට කලින් සියයට 5 දක්වා අඩු කළා. ඒ තුළින් බැංකුවලට රුපියල් බිලියන 130ක් ඉතුරු කර ගන්න පුළුවන් වුණා. සියයට එකක් කියන්නේ රුපියල් බිලියන 65යි.

ඊට පස්සේ ඒ සියයට 5ත්, සියයට 2 දක්වා අඩු කළා, ඒ බැංකු ස්ථාවර කිරීම සඳහා. මම හිතන විධියට ඒ තුළින් බැංකුවලට රුපියල් බිලියන 325ක් පමණ ඉතිරි කර ගන්න පුළුවන් වුණා. ඒ වාගේ තමයි අපේ රජය ව්‍යාපාරිකයන්ව පණ ගන්වන ගමන්, ව්‍යාපාරිකයන්ට අතහිත දෙන ගමන්, බැංකු ස්ථාපිත කළේත් අන්න ඒ විධියටයි. මේ වසංගතය නිසා මුළු ලෝකයේම ආර්ථිකය වැටුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය සියයට සෘණ 10යි; එංගලන්තයේ සෘණ 10යි; යුරෝපයේ සෘණ 8යි; ජපානයේ සෘණ 5යි; ඇමෙරිකාවේ සෘණ 3.5යි; අපේ රටේ සෘණ 3.5යි. ඒ අතින් අනෙක් රටවල් සමඟ සංසන්දනය කරනකොට අපේ රට හොඳ තැනක ඉන්නවා කියලා කියන්න පුළුවන්.

ඒ වාගේම, අපි පුදුම විය යුතු කරුණක් තිබෙනවා. මේ තත්ත්වයන් යටතේ වුවත්, මෙච්චර ආර්ථික දුෂ්කරතා තිබෙන තත්ත්වයක වුණත් අපි International Sovereign Bonds දෙකක, ඒ කියන්නේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක ණය පියවලා තිබෙනවා, ඩොලර් බිලියන 2ක්. ඒ අතින් තවමත් ණය ගෙවිය හැකි රටක් ලෙස ලෝකය අප පිළිගන්නවා.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැයෙන් දේශීය නිෂ්පාදනයට, නිෂ්පාදන ආර්ථිකයට ඉතා විශාල ලෙස මුල් තැනක් දීලා තිබෙනවා. අපි ඉතා සාර්ථකව සුනාමි ව්‍යසනයට මුහුණ දුන්නු රටක්. ඒ වාගේම, ලෝකයේම බැංකු කඩා වැටෙද්දී අපි කෙළින් හිටපු රටක්. ඒක නිසා දක්ෂ වෘත්තිකයන් තවමත් අපේ ආණ්ඩුවේ, අපේ රජයේ ඉන්නවා. ඒ අතින් බලනකොට මේ රජය නව නිෂ්පාදනවලට, නව ව්‍යවසායකයන්ට ඉතාම හොඳින් තැනක් දෙන රජයක් හැටියට අපට ආඩම්බර වෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්වකර්ම වැඩ කරපු ජාතියක් ඉන්න රටක් තමයි අපේ මේ රට. ඒ විශ්වකර්ම වැඩ කරපු මුතුන්මිත්තන්ගේ ජාන තවමත් අපේ ජාතිය තුළ තිබෙනවා. මේ අය වැයෙන් එවැනි ජාන තිබෙන පුද්ගලයන් උද්දීපනය කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ විශ්වකර්ම වැඩවලින් කීපයක් මම කියන්නම්. බලන්න, අපේ යෝධ ඇළ. මීට අවුරුදු 1,800කට ඉස්සෙල්ලා හදපු යෝධ ඇළේ දිග සැතපුම් 57යි. එහි පළමු සැතපුම් 17හි බෑවුම යොදුනකට රියනයි. ඒ කියන්නේ, සැතපුමකට අඟල් තුන්කාලයි. සැතපුමකට බෑවුම අඟලකට වඩා ටිකක් අඩුයි. ඒ වාගේ ආනතියක් තිබෙන canal එකක්, නැත්නම් ඇළක් හදන්න මුළු ලෝකයේම තාක්ෂණයෙන් අනූන වූ රටවලටවත් බැහැ. ඒකට ත්‍රිකෝණමිතිය නැත්නම්, - trigonometry - කියන ගණිත ක්‍රමයේ කෙළ පැමිණෙන්න ඕනෑ. ඒ වාගේ දක්ෂ ඉංජිනේරුවරු හිටපු රටක් තමයි අපේ රට. සීගිරිය අඩි 600ක් උසයි. සීගිරිය උඩ පිහිණුම් තටාකවලට රාජ කුමාරිකාවන්ට නාන්න වතුර ගෙනිච්චේ කොහොමද? ආතති බලයෙන් කියලා තමයි කියන්නේ. ඒ වාගේ තාක්ෂණයක් එදා තිබුණා. නමුත්, අද නැහැ. ඒ දේවල් කළේ කොහොමද කියලා අදටත් හොයා ගන්න බැහැ. ඒ නිසා තමයි, ලෝකයේ විද්‍යාඥයෝ ඒක 8වැනි පුදුමය හැටියට සලකන්නේ.

ඊළඟට, මාදුරුඔය ජලාශයේ ජල ව්‍යාපෘතිය කරනකොට කැනේඩියානු විද්‍යාඥයෝ මාස 6ක් පමණ ගණනය කරලා කිව්වා, මෙතැන තමයි දියහැරුම, sluice gate එක හදන්න ඕනෑ කියලා. එතැන කණින කොට අවුරුදු 2,000ක් පැරණි බිසෝකොටුවක් මතු වුණා. ඒ කියන්නේ, එදා හිටපු අපේ මුතුන්මිත්තන්ට අද කැනේඩියානු විද්‍යාඥයන්ට තිබෙන තාක්ෂණයටත් වඩා ලොකු තාක්ෂණයක් තිබිලා ඇති. අපි රුවන්වැලි සෑයේ ජේසා වළලුවලින් අඩි 3ක් ඇතට ගිහිල්ලා වටේට ගියාම ජේන්නේ වූඩා මාණික්‍යයේ මධ්‍ය ලක්ෂ්‍ය පමණයි. ඒක එච්චරට සමමිතිකයි. ජ්‍යාමිතියේ කෙළ පැමිණෙන්නන්ට පමණයි ඒ වාගේ structure එකක් හදන්න පුළුවන්. අභයගිරියේ වූඩා මාණික්‍යයේ මධ්‍ය ලක්ෂ්‍යයයි, ජේසා වළලුවල මධ්‍ය ලක්ෂ්‍යයයි, හතරැස් කොටුවේ මධ්‍ය ලක්ෂ්‍යයයි එකතු කරලා ලම්භක රේඛාවක් ගැහුවොත් ඒක වැටෙන්නේ අඟලක කොටුවකට. එච්චරට සමමිතිකයි. ඒ වාගේ ජ්‍යාමිතිය ගැන කෙළ පැමිණිච්ච අපේ මුතුන්මිත්තන් බොහෝ පිරිසක් හිටියා. ලෝකයේ වාර්තාගත පළමු රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙවර විධියට ක්‍රි.පූ. 3වැනි සියවසේදී දේවානම්පියතිස්ස රජ්ජුරුවෝ පාටලීපුත්‍ර නගරයේ අශෝක රජතුමන්ට දූත මෙහෙවරක් යැව්වා. - The historically recorded first diplomatic mission was to India when King Devanampiyatissa sent a special envoy to Pataliputra for King Asoka. ඒ වාගේම, රෝමයේ ක්ලෝඩියස් රජ්ජුරුවෝ හිටපු ක්‍රි.ව. 4වැනි සියවසේත් අපේ දූත පිරිසක් රෝමයට යවලා තිබෙනවා. අපි ඒ වාගේ ජාතියක්. ඒ වාගේ ප්‍රෞඪ ඉතිහාසයක් අපට තිබුණා. අද දියුණුයි කියන රටවල ඉන්න සුද්දන්ට අක්ෂර භාවිතය පවා නැති කාලේ තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ පරෙවි සංදේශය ලිව්වා; සැළලිහිණි සංදේශය ලිව්වා; කාව්‍යශේකරය ලිව්වා; පංචිකාප්‍රදීපය ලිව්වා; බුද්ධිප්පසාධනියට ටීකාවක් ලිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පංචිකාප්‍රදීපයේ තිබෙනවා භාරතීය පාලි ව්‍යාකරණ පොතක්. ඒකේ භාරතීය වේද පොත් 80ක යොමුවක් තිබෙනවා.

අද දියුණු යයි කියන රටවල සුද්දන්ට ලියන්නවත්, කියවන්නවත් බැරි කාලයේ, අවුරුදු 600කට පෙර අපේ තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ අඩුම ගණනේ වේද පොත් 80ක්වත් පරිශීලනය කර තිබෙනවා. උන්වහන්සේට කියන්නේ, ත්‍රිපිටක වාගීස්වර -ත්‍රිපිටකය පිළිබඳ හසළ දැනුමක් ඇති- සකල කලා සර්වඥ -සියලු ම කලාවන්හි අගතැන්පත්- සහ ෂඩ් භාෂා පරමේෂ්වර -භාෂා 6ක් හැකි- කියලායි. ඒ භාෂා 6 තමයි, සංස්කෘත, ප්‍රාකෘත, ශෞරසේනී, පෛශාචි, අපභ්‍රංස සහ මාගධී. ප්‍රෞඪ ජාතියක්, අපි. ප්‍රෞඪ ඉතිහාසයක් අපට තිබෙනවා. 15වන ශත වර්ෂයේ දකුණු ආසියාවේ ප්‍රථම විශ්වවිද්‍යාලය වශයෙන් තිබුණේ විජයබා පිරිවෙනයි. එහි විදුහල්පති - Principal - වශයෙන් සිටියේ තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝයි. එහි ශිෂ්‍යයන් 5,000ක් සිටියා. එහි ත්‍රිපිටකය, ජ්‍යොතිෂය, තාරකා විද්‍යාව, ගණිතය, සාහිත්‍යය, කලාව හා නාට්‍ය ඉගැන්වූවා. මේ ප්‍රෞඪ ඉතිහාසය, ප්‍රෞඪ ශිෂ්ටාචාරය සම්පූර්ණයෙන්ම වනසා දැම්මේ පෘතුගීසින්, ලන්දේසින් සහ ඉංග්‍රීසින්. ඔවුන් තමයි අපේ ශිෂ්ටාචාරය සම්පූර්ණයෙන්ම වනසා දැම්මේ. පෘතුගීසින් විජයබා පිරිවෙන බිමට සමතලා කරලා එහි තිබුණු ගල්වලින් තමයි ගාල්ලේ කොටුව හැදුවේ. ඔවුන් මේ විධියට ඒවා විනාශ කළත්, ඒ ජාන තවමත් අපට තිබෙනවා. ඒ ජාන උද්දීපනය කරන්න මෙවර අය වැය ලේඛනය අපට විශාල අත් වැලක් සපයනවා.

අපට මතකයි, මෑත ඉතිහාසයේ අපි කිඹුලා උදැල්ල හැදුවා. කිඹුලා සලකුණ සහිත උදැල්ල අපි අපනයනය කළා. අපි හැදුවා, යුනික් රේඩියෝ එක. අපි හැදුවා, ෆියට් කාර් එක. අපි හැදුවා, කැලණි ටයර්. ඒක මිචෙලින් ටයර් එකට වඩා හොඳයි. අපි හැදුවා, රාණි සඳුන් සබන්. මෙවැනි දේවල් රාශියක් අපි හැදුවා. නමුත් මේ විවෘත ආර්ථිකය ඒවා සම්පූර්ණයෙන්ම විනාශ කළා. විවෘත ආර්ථිකය නිසා නව ව්‍යාවසායකයන්ට කිසිම තැනක් දුන්නේ නැහැ.

වර්තමාන ජනාධිපතිතුමා නව ව්‍යවසායකයන්ට ඉතාම හොඳින් අතහිත දෙනවා. අපි දන්නවා, මේ වසංගතය ආවාට පස්සේ රොබෝ යන්ත්‍රයක් හැදුව බව. රොබෝ යන්ත්‍රයෙන් ගිහින් තමයි ආසාදිත වුණු අයට බෙහෙත් දෙන්නේ. ඒක හැදුවේ අපේ වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයෙක්. වෛද්‍ය විද්‍යාලයේ අවසාන වසරේ ශිෂ්‍යයෙක් හැදුවා, හදවත නැවතුණාට පස්සේ හදවත සම්බාහනය කරලා නැවත වරක් හදවත ප්‍රාණවත් කරන උපකරණයක්, equipment එකක්. ඒ උපකරණය රුපියල් ලක්ෂ ගණනක් වටිනවා. නමුත් ඒ උපකරණය ඉතාම සුළු මුදලකටයි නිෂ්පාදනය කළේ. අපි අද සේලයින් හදනවා. අපි අද වෙනම ඖෂධ හදනවා. අපි දැඩි සත්කාර ඇඳන් හදනවා. එහෙම කරන්නේ, ඒ ජාන අපට තිබෙන නිසායි. ඒ ජාන උද්දීපනය කරලා, නව ව්‍යවසායකයින්ට දේශීය නිෂ්පාදනය වැඩි කරන්න මේ අය වැය ඉතාම හොඳින් උදවු වෙන බව තමයි මට මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. විපක්ෂය ඊයේ ඉතාම අසාර්ථක උද්ඝෝෂණයක් කළා. වෙනත් රටවල සියලු ම පක්ෂ එකතුවෙලා, ඒ රටවල් මේ වසංගතයෙන් ගොඩ ගන්න හදනකොට විපක්ෂය කළේ ඒකයි. ඇත්ත වශයෙන් ඒක නොවෙයි විපක්ෂය කළ යුත්තේ. මා ඊයේත් ඒකයි කිව්වේ, විපක්ෂය ආණ්ඩුව සමඟ එකතුවෙලා වයිරසය පරාජය කරනවා වෙනුවට වයිරසයත් සමඟ එකතුවෙලා ආණ්ඩුව පෙරළන්න හදන එක ඇත්ත වශයෙන්ම නින්දිතයි, නින්දා සහගතයි, ලජ්ජා සහගතයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොලීසිය කටයුතු කරන්නේ එතුමන්ලාට අවශ්‍ය විධියට නොවෙයි, දේශපාලනඥයන්ගේ නියෝග මත නොවෙයි. මේ අවස්ථාවේදී පොලීසිය කටයුතු කරන්නේ සෞඛ්‍ය බලධාරීන්ගේ නියෝග

මතයි. මෙවැනි ජන රැස්වීම් පවත්වන්න එපාය, ඒ තුළින් මේ වසංගතය ව්‍යාප්ත වෙනවාය කියලා සෞඛ්‍ය බලධාරින් කියනවා නම්, මහජන සෞඛ්‍ය නිලධාරින් කියනවා නම්, විපක්ෂයට කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ මෙවැනි ජන රැලි පවත්වන්න. ඉදිරියටත් මෙවැනි ජන රැලි පවත්වා, තවත් කොරෝනා රැල්ලක් ඇතිවෙලා මේ රට lockdown කරන්න සිද්ධ වුණොත් එහි සම්පූර්ණ වගකීම විපක්ෂය භාර ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අණ දෙන පොලීසියට ආත්ම ගෞරවයක් තිබෙනවා. පොලීසියේ ආත්ම ගෞරවය කෙලෙසන කිසිම කෙනෙකුට අපි සමාවක් දෙන්නේ නැහැ. ඔවුන්ට විරුද්ධව නීති මඟින් කටයුතු කරනවා. අපි දන්නවා, පොලීසිය ඉතාම දුෂ්කර කාර්යයක් කරන බව. පොලීසිය කොරෝනා වසංගතය මර්දනය කිරීම සඳහා මේ ජන රැලි නවත්වන්න ගිහින් අද වනකොට මගේ පොලිස් නිලධාරින් 15,700ක් ආසාදිතවෙලා තිබෙනවා. ඔවුන්ගෙන් 44 දෙනෙකු මිය ගිහින් තිබෙනවා. මෙවැනි කැප කිරීමක් කරන පොලීසියට අවමන් කරනවා නම්, පොලීසියේ රාජකාරියට බාධා කරනවා නම් ඒක වැරැදියි. රට ගැන අංශු මාත්‍රයකවත් හැඟීමක් තිබෙනවා නම්, වැදගත් දේශපාලනඥයන් හැටියට මෙවැනි ජන රැලි නවත්වා රට ගොඩ නඟන්න රජයට සහාය දෙන්න කියලා මා ඉතාමත් ආදරයෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Patali Champika Ranawaka. You have 13 minutes.

[අ.භා. 1.44]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2022 අය වැය ගැන කථා කරන්න පෙර මම මේ කාරණය කියන්න ඕනෑ. පසුගිය සඳුදා මම දුර පළාතකට ගිහින් අපේ නිවසට ආවා. කවදාවත් නැතිව අපේ කෑම මේසයේ කඩෙන් ගෙනාපු බත් මුලක් තිබෙනවා මම දැක්කා.

මම ඇහුවා, "ඇයි" කියලා. ගෑස් හිඟය අද අපේ ගෙවල්වලටත් බලපා තිබෙනවා. දැන් ගරු ඇමතිතුමා කිව්වා, උද්ඝෝෂණ නිසා රෝග බෝ වෙනවා කියලා. හැබැයි, ගෑස් පෝලිම, භූමිතෙල් පෝලිම, සීනි ගන්න යන පෝලිම, කිරිපිටි පෝලිම, සිමෙන්ති පෝලිම, යකඩ පෝලිම ආදී හැම තැනකම අද ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් හිර වෙලා ඉන්නවා. ඒ වාගේම රට අනුක්‍රමයෙන් සාගතයක් කරා ගමන් කරමින් තිබෙනවා. මම පසුගිය දා වැලිමඩ, කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයට ගියා. එතැනම බෝංචි කිලෝව රුපියල් 400යි. මේක වෙලා තිබෙන්නේ ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ ගිය නිසා නොවෙයි, ලෝක වෙළෙඳ පොළේ ප්‍රශ්නයක් නිසා නොවෙයි.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගංවතුර නිසා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අපේ පොලීසියේ ඇමතිතුමාට නම් රටේ ගංවතුර. වැලිමඩ ගංවතුරක් නැහැ. කරුණාකර පොලීසියෙන් විමසලා බලන්න, ගංවතුරක් තිබෙනවාද, නැද්ද කියලා. ලැබෙන තොරතුරුවල සාවද්‍යභාවය නිසා ඔබතුමාත් බොහොම නොමඟ ගිහින් තිබෙන බව පෙනෙනවා. ඒකට අනාගතයේ දේශපාලන වශයෙන් වන්දි ගෙවන්න වෙයි. කොහොම වුණත්, අද මේ අය වැයෙන් එක මූලික ප්‍රශ්නයකටවත් විසඳුම් ලැබී තිබෙනවාද? අද තෙල් පිරිපහදුව නවත්වලා. හොඳ වෙලාවට වර්ෂාව නිසා සියයට 60කට වඩා විදුලිය ජනනය කරන්නේ ජල විදුලි ක්‍රමයෙන්. අද ගල් අඟුරු සඳහා තිබෙන ක්ෂණික ටෙන්ඩරයට කිසිම කෙනෙක් ඉදිරිපත් වෙලා නැහැ. ඒ වාගේම තෙල් පිරිපහදුවේ බොරතෙල් වෙනුවෙන් දමපු ටෙන්ඩර් 14කින් ප්‍රතිචාර තිබෙන්නේ එක ටෙන්ඩරයකට විතරයි. ඒ නිසා ඉදිරි කෙටි කාලය ඇතුළත පිරිපහදුව විවෘත කිරීමක් ගැන හිතන්නේවත් නැහැ. පිරිපහදුවත් එක්ක අනිවාර්යයෙන්ම තවත් මෙගාවොට් 320ක් නිපදවීමට ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර වැඩ කරනවා. මේ වැස්ස නතර වුණු හැටියේ සති 6කින් තෙල් අර්බුදයත් එක්කම විදුලි අර්බුදයත් එනවා. මුදල් ඇමතිතුමාගේ 2022 අය වැයෙන් මේ කිසිම දෙයකට විසඳුමක් නැහැ. ඩොලර් නැහැ, ඩොලර් නැහැ කිව්වාට ඒ සඳහා වැඩ පිළිවෙළක්, වැඩසටහනක් ලබා දීලා නැහැ. මේ දැනුත් ප්‍රකාශ කළා, යහ පාලන ආණ්ඩුවෙන් ණය ගත්තාය කියලා. යහ පාලන ආණ්ඩුවේ එවකට මුදල් ඇමති මංගල සමරවීර මැතිතුමා, ඒ වාගේම භාණ්ඩාගාරය භාරව සිටි සමරතුංග මහත්මයා, අපේ මහ බැංකු අධිපතිතුමා එදා 2019 ඩොලර් බිලියන 7.2ක් ඉතිරි කරලා ගියා. ඒ ඩොලර් බිලියන 7.2 නොවෙන්න මේ රට මෙලහකටත් බංකොලොත් වෙලා ඉවරයි. ඒ වාගේම මේ රජය බලයට ආවාට පසුව මාස 18කට රුපියල් බිලියන 3,740ක් ණය අරගෙන තිබෙනවා. මාස 18කට රුපියල් බිලියන 3,740ක්. එයින් කළ දෙය මොකක්ද, ආරම්භ කළ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිය මොකක්ද කියලා මම දැන ගන්න කැමතියි.

නැවත වතාවක් අලුත් බදු හඳුන්වා දී තිබෙනවා. රටේ මීට කලින් තිබුණු GST වාගේ බදු, ඉපැයුමට ගහන බදු, turnover taxes වෙනුවට ගොඩක් වාද විවාද කරලා තමයි දියුණු වර්ගයේ VAT එක ගෙනාවේ. දැන් නැවතත් මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මේ බද්ද හඳුන්වලා දීලා තිබෙනවා. ඉහළ ගණයේ ව්‍යාපාරිකයන්ට බද්දක් හඳුන්වලා දීලා තිබෙනවා. මේ ගැන අපි කිව්වා. 2019 දෙසැම්බර් පළමුවැනි දා රටේ ධන කුවේරයන්ට ඉහළම ගණයේ බදු සහනයක් ලබා දීලා ආණ්ඩුවේ ආදායමින් සියයට 40ක් නැති කරගන්නකොට අපි කිව්වා, ඕකේ ප්‍රතිඵලය අනිවාර්යයෙන්ම රට බංකොලොත්භාවයට ගමන් කිරීමය කියලා. දැන් ඒ ඇත්තෝම අලුතෙන් බදු හඳුන්වා දෙන්න කටයුතු කරනවා. හැබැයි, මේ ඉලක්කම් විජ්ජාවක් විතරයි. මම ඒක කියන්න ඕනෑ. පසුගිය අය වැය ලේඛනය කියවනකොට කිව්වා, ට්‍රිලියන 2කට - බිලියන 2,000කට- ආසන්න ගණනක් ආදායම තිබෙනවා කියලා. හැබැයි, මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට කියනවා, 2021 ආදායම බිලියන 1,500යි කියලා. දැන් කියනවා, ට්‍රිලියන 2.3කට ආසන්න ආදායමක් අනාගතයේ එනවා කියලා. නමුත් මම කියනවා, ලබන දෙසැම්බර් මාසයේ ආණ්ඩුව තිබුණොත් අපට ඒක අහගන්න පුළුවන් කියලා. මේක නම් කවදාවත් යථාර්ථවාදීව ලබාගන්න බැහැ. මොකද, සියයට 45ක ආදායම් වර්ධනයක් කිසිම විධියකට ලබා ගන්න බැහැ. මොකද, මේ ඉදිරිපත් කර තිබෙන බදුවලින් අපේක්ෂිත ප්‍රමාණය රුපියල් බිලියන 333යි. නමුත් ඔය කියන ආදායම ලබා ගන්න රුපියල් බිලියන 800ක් සොයන්න ඕනෑ.

"වැඩ කරන අපේ විරුවා" කියලා ආවේ වැඩ කරන්න. හැබැයි, 2020, 2021 ප්‍රාග්ධන වියදම් දෙකම එකතු කළත්, 2019 යහ පාලන ආණ්ඩුවේ ප්‍රාග්ධන වියදම වුණු රුපියල් බිලියන 900ට කිට්ටු කරලා නැහැ. මේ අවුරුද්දේ ට්‍රිලියනයකට කිට්ටු ප්‍රාග්ධන

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

වියදමක් දමලා තිබෙනවා. නමුත් ඒකත් කිසිම යථාර්ථවාදී ඉලක්කමක් නොවන බව ප්‍රකාශ කරන්න ඕනෑ. මේ රජය යටතේ අපේ බැංකු පද්ධතිය ඉතාම භයානක ඉරණමකට පත් කළා. ලංකා බැංකුව, මහජන බැංකුව ඩොලර් සංචිතවලින් ඒ අයගේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය ඍණ ඩොලර් බිලියන තුන දක්වා පහළට ගෙනිච්චා.

ඒ වාගේම, ආණ්ඩුවට ණය දීලා, ආණ්ඩුව විසින් විවිධාකාර රාජ්‍ය ආයතන හරහා ණය අරගෙන, අද ඒ ගිණුම්කරුවන්ගෙන් රුපියල් බිලියන 2,000කට වඩා රාජ්‍ය බැංකු දෙක බර කරලා තිබෙනවා. ඒ අතරට අලුත් VAT එකකුත් ගෙනැල්ලා අද බැංකු පද්ධතියම අමාරුවේ දාලා තිබෙනවා. ඒ නිසා ඒ බැංකු පද්ධතියේ අනාගත බිඳ වැටීමට අනිවාර්යයෙන්ම මේ රජය වග කිව යුතුයි, මේ නව බදු ප්‍රතිපත්තිය වග කිව යුතුයි කියන එක මම ප්‍රකාශ කරන්න ඕනෑ.

රාජ්‍ය සේවය රටට බරක් කියලා අපේ මුදල් ඇමතිතුමා කියා තිබෙනවා. 2006දී මේ රටේ රාජ්‍ය සේවකයන් සිටියේ 750,284යි. අද -2021 වන විට- රාජ්‍ය සේවකයන් ඉන්නවා 1,195,803ක්. ඔය කාලය තුළ ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් විශ්‍රාම ගිහින් තිබෙනවා. ඒ අනුව අපට පේනවා මේ කාලය ඇතුළත ලක්ෂ 7කට ආසන්න ප්‍රමාණයක් අලුතෙන් රාජ්‍ය සේවයට බඳවා ගෙන තිබෙන බව. ඒ බඳවා ගැනීම්වලින් සියයට 86ක්ම ගරු මුදල් ඇමතිතුමාත් සිටි ආණ්ඩුවකින් තමයි සිද්ධ කර තිබෙන්නේ. රාජ්‍ය සේවය පළල් කළේ ඒ කාලයේයි. කොටින්ම 2020දී විතරක් රාජ්‍ය සේවයට 55,000ක් ඇතුළු කළා. දැන් "රාජ්‍ය සේවය බරක්, රාජ්‍ය සේවය අකාර්යක්ෂමයි, රාජ්‍ය සේවය මෙහෙමයි" කියනවා. ඇත්තටම අද මේ රටට තිබෙන ලොකුම බර රාජපක්ෂ පවුල් පාලනයයි කියන එක අපි බොහොම බැරෑරුම්ව, වගකීමෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරගෙන යන ක්‍රියාවලියත් එක්ක ඇති වෙමින් තිබුණු මූල්‍ය අර්බුදය ආර්ථික අර්බුදයක් බවට පත් වෙමින්, අනුක්‍රමයෙන් රට බංකොලොත්භාවයේ ඉම දක්වා තල්ලු වෙමින් යන මොහොතක්, මේක. මේකට විසඳුමක් සොයා ගන්න මූල්‍ය පාලනය සතු පාර්ලිමේන්තුව හෝ අනාගතයේදී සමත් විය යුතුයි. මොකද, අනාගතයේ මේ රට බංකොලොත්භාවය කරා ගමන් කිරීම වැළැක්වීමට මුදල් අමාත්‍යාංශයට හෝ ආණ්ඩුවට කිසිසේත්ම වැඩ පිළිවෙළක් නැහැ.

විශේෂයෙන්ම තමන්ගේ පක්ෂයේ පහළ මට්ටමේ, බිම් මට්ටමේ ඉන්න සාමාජිකයක්, ක්‍රියාකාරීන්, ජාවාරම්කාරයන් සනසන්න ග්‍රාම නිලධාරි වසමකට ලක්ෂ 30ක් දුන්නා කියලා, අනෙක් පැත්තෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ලක්ෂ 40ක් දුන්නා කියලා රටේ තිබෙන දැවැන්ත, මහා පරිමාණ ආර්ථික අර්බුදය හෝ මූල්‍ය අර්බුදය විසඳෙන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා කිව්වා වාගේ ඔය වාගේ චූටි චූටි ක්ෂුද්‍ර වැඩවලින් අර සාර්ව ප්‍රශ්නය, ඒ කියන්නේ micro වැඩවලින් macro ප්‍රශ්නය ජය ගැනීමට කිසිම හැකියාවක් නැහැ. එම නිසා මේ පාර්ලිමේන්තුවටත් වගකීමක් තිබෙනවා, ගමන් කරමින් තිබෙන මේ තීරණාත්මක අර්බුදයෙන්, මේ තීරණාත්මක බංකොලොත්භාවයෙන් අපේ රට ගලවා ගැනීමට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමාගේ අය වැය තුළිනුත් "පංචබල කේන්ද්‍රය" ඉදිරිපත් කළා. එතුමා දන්නවා, මම තමයි ඔය අදහස 2010දී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශයට ඉදිරිපත් කළේ කියන එක. ලංකාවේ පිහිටීමත්, ලංකාවේ උගත් ජනතාවගේ දැනුමත් පදනම් කරලා ශ්‍රී ලංකාවේ ඊළඟ ආර්ථික පිම්ම ගැනීම සඳහා 2010දී අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශනයට "පංචබල කේන්ද්‍රය" ඇතුළත් කළා. දැන් අවුරුදු 11කට පසුව ආයෙත් ඒ ටික ඒ විධියටම මෙවර අය වැයෙනුත් මුදල් ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා.

කෙසේ නමුත්, අප මතක තබා ගන්න ඕනෑ, මේ රටේ රාජ්‍ය ණය බරට ප්‍රධාන වශයෙන් වග කිව යුත්තේ කවුද කියන එක. 2005 ඉඳන් 2015 වෙනකම් වාණිජ ණය අරගෙන, ඒ වාණිජ ණය ආදායම් ඉපදවෙන්නේ නැති දැවැන්ත ව්‍යාපෘතිවලට යොදවලා, ඒ දැවැන්ත ව්‍යාපෘතිවල ඇත්ත ඉංජිනේරු ඇස්තමේන්තු වාගේ සියයට 400 ගුණයක්, සියයට 2,000 ගුණයක් ආදී වශයෙන් ඒවාට බර තබපු ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් හැටියටයි අපි අද මේ අත්විඳින ණය අර්බුදය ඇති වෙලා තිබෙන්නේ. මට මතකයි එදා උතුරේ A-9 මාර්ගය තනන වෙලාවේ එහි ඉංජිනේරු ඇස්තමේන්තුව වාගේ හතර ගුණයකට තමයි චීන CATIC එකට කොන්ත්‍රාත්තුව ලබා දුන්නේ. ඒ වාගේම යාල්දේවී දුම්රිය මාර්ගයට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව වාගේ 400 ගුණයකටයි ඉර්කෝන් කියන ඉන්දියානු සමාගමට කොන්ත්‍රාත්තුව ලබා දුන්නේ.

ඊළඟට, අධිවේගී මාර්ගවලින් විශේෂයෙන් කඩවත-කෙරවලපිටිය පාරට ඇත්තටම වැය විය යුතු මුදලට වඩා විසි ගුණයක් වැඩියෙන් වැය කළා. ඒ විතරක් නොවෙයි, දැනුත් කරන්නේ ඒ සෙල්ලමමයි. අපි මේ රටට දශම එකේ පොලියට ගෙනාව සැහැල්ලු දුම්රිය සේවය ව්‍යාපෘතිය නතර කරලා අලුතෙන් වැඩ පිළිවෙළක් ගෙනාවා, දෙමටගොඩ ඉඳන් අතුරුගිරියට පාරක් දානවා කියලා. ඒකේ ඇත්ත ගණන ඩොලර් මිලියන 475යි. හැබැයි, අපට අවුරුදු 15කින් ගෙවන්න වෙනවා ඩොලර් මිලියන 1,620ක්. මෙන්න මෙවැනි ගසාකෑම් නිසා තමයි රට ආර්ථික වශයෙන් බරපතළ අර්බුදයකට යන්නේ. අපි ගෙනාපු ඒ ඩොලර් මිලියන 2.2 ව්‍යාපෘතිය තිබුණා නම් ඩොලර් මිලියන 600 ගණනේ 2020, 2021, 2022 දී රට තුළට ඇතුළු වෙනවා. ඒක නතර කරලා, ඒ වෙනුවට ජාවාරම්කාර ව්‍යාපෘතියකට ගියා.

හැබැයි තවම කළු ගලක්වත්, මුල් ගලක්වත් තියාගන්න බැරි වුණා. එවැනි කාරණා නිසා තමයි, 2005 ඉඳලා 2015 වෙද්දී මේ රට මේ අර්බුදයට මුහුණ දුන්නේ.

ඇත්තටම අද හදලා තිබෙන ඇතැම් අධිවේගී මාර්ගවලින් ආර්ථිකයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වාගේම, ඇතැම් ගුවන් තොටුපොළවලින් ආර්ථිකයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඇතැම් ක්‍රීඩාංගණවලින් ආර්ථිකයක් ඇති වෙන්නේ නැහැ, ආදායමක් ඉපදවෙන්නේ නැහැ. ඇතැම් වරායවලින් ආදායමක් ඉපදවෙන්නේ නැහැ. ආඩම්බරයෙන් කියපු වැඩබිම තමයි මේ ආකාරයට අද අපේ හිස් මත කඩා පාත් වෙලා තිබෙන්නේ. දක්ෂිණ අධිවේගී මාර්ගය හදපු වෙලාවේ එදා අපි ආඩම්බරයෙන් කිව්වා, "දැන් අපිට කිරි පැණි ගේන්න පුළුවන්; ඇඹුල්තියල් ගේන්න පුළුවන්; දොදොල් ගේන්න පුළුවන්" කියලා. ඒ අධිවේගී මාර්ගවලට අධික මිල ගණන් වැය කළ නිසා තමයි, කිරි පැණි කන්න මාතර ගිය අය අද කිරි පිටි පෝලිම්වල ලැගලා ඉන්නේ. ඒ වාගේම, ඇඹුල්තියල් කන්න ගිය අයට අද භූමිතෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල ලගින්න වෙලා තිබෙන්නේ. මෙන්න මේ අර්බුදයෙන් රට ගොඩ ගන්න අපට අවශ්‍යයි, වැඩ පිළිවෙළක්. අපට අවශ්‍යයි, මේ රටේ උගත් බුද්ධිමත්, වැඩ කරන, රටට ආදරය කරන පිරිසකගේ ඉදිරිපත්වීමක්. මම බොහොම පැහැදිලිව කියනවා, ඊළඟ මාස කිහිපය -2022 මුල් මාස කිහිපය- මේ රටට

අතිශයින් තීරණාත්මකයි කියලා. මොකද, ජනවාරි මාසයේ ඉඳලා බරපතළ ණය කිහිපයක් ගෙවන්න තිබෙනවා. ඒ සඳහා වූ නිශ්චිත වැඩ පිළිවෙළක් රජය ඉදිරිපත් කළ යුතුමයි. නැත්නම් අනිවාර්යයෙන්ම මේ රටේ බලශක්ති අර්බුදයක් හා ඒ හා බැඳුණු දැවැන්ත සමාජ පිපිරීමකට රට ගමන් කරනවා. සරත් වීරසේකර ඇමතිතුමාගේ පොලීසියට, police barricadesවලට ඒ සමාජ පිපිරීම නතර කරන්න බැරි බව විතරක් මතක තබා ගත යුතුයි.

"අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සූර සරදියෙල් වාගේ ඇති හැකි අයගෙන් අරගෙන නැති බැරි අයට දීලා තිබෙනවා" කියලා කවුද කියා තිබුණා. මේ අය වැය බැලුවාම පෙනෙනවා, මේක සූර සරදියෙල් අය වැයක් නොවෙයි, "හූර සරදියෙල් අය වැයක්" බව. මෙය, ජනතාව පතුලටම හූරගෙන කාලා, ජනතාවගේ බඩගින්න, ජනතාවගේ දුක් ගින්න, ජනතාවගේ කෝපයේ ගින්න වැඩි කරන්න ගෙන ආ අය වැයක් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Premitha Bandara Tennakoon. You have 15 minutes.

Before that, will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)

Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 1.56]

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"යුද්ධය පැවතුණත් රට කවදද වැහුවේ
මුහුමුහුදත් ගොඩ ගලා එනමුත් රට දිව්වේ
මින් පෙර නොවිඳි අඳුරුම යුගයකි ගෙව්වේ
එය යළි නොවන්නයි මේ අය වැය ලිව්වේ....

වැඩ නොකෙරුවත් පහුගිය යුග ගත්ත ණය
සිය රට නිපැයුමෙන් රට ගොඩනැඟෙන බිය
මුහුදෙන් ගෙනත් කන්නට හුරු කරපු අය
පොදු ජන අය වැයට මෙච්චර මොකද හය..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කර තිබෙන නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි අය වැය පිළිබඳව අදහස් දක්වන්නත්, දඹුලු කවියෙන් මේ සභාවෙහි මගේ කථාව ආරම්භ කරන්න ලැබීමත් පිළිබඳව මා සතුටු වෙනවා. මේ අය වැය ඉදිරිපත් කරන්නේ ඉතාම බිහිසුණු ඉතාම සංකීර්ණ, ඉතාම කටුක, අභියෝගාත්මක යුගයකයි කියන එක අපි අමතක නොකළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාවක් තිබෙනවා, "සියලුම කුණු බේරුවල බොක්කට" කියලා. වසර ගණනාවක් තුළ පැවැති සියලු ආණ්ඩු කරපු, කියපු දේවල්වල ප්‍රතිඵල තමයි බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරපු මේ අය වැයේදී අපට අද අහන්න, දකින්න ලැබෙන්නේ. ඒ නිසා බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාට මේ රටේ බොහොම සංකීර්ණ, වැදගත්, අභියෝගාත්මක කාර්යයක් පැවරී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ගැන කථා කරද්දී අපට මුහුණ දෙන්න සිදු වී තිබෙන දේශීය ආර්ථික බලපෑම් වාගේම, විදේශීය ආර්ථික බලපෑම් ගැනත් අපි තේරුම් ගන්න ඕනෑ. රටේ ආදායම් උත්පාදනය වැඩි කර ගන්න විදේශ ආයෝජන රටට ගේන්න, විදේශ සංචිත තර කරගන්න, රැකියා උත්පාදනය කර ගන්න හැකියාව ලැබුණොත් පමණයි අපිට අපේ රටේ මහජනතාවට මෙහි ප්‍රතිඵල, මෙහි වාසි ලබාදෙන්න හැකියාව ලැබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආදායම් උත්පාදනය කර ගැනීමේදී අපිට තනිවම අපි ගැන හිතලා, අපේ රට ගැන විතරක් හිතලා තීන්දු ගන්න පුළුවන්කමක් නැහැ.

අපි ලෝක ආර්ථික තත්ත්වය, ලෝක දේශපාලන තත්ත්වය අවබෝධ කරගන්න ඕනෑ. බංග්ලාදේශයේ ෂෙයික් හසීනා අග්‍රාමාත්‍යතුමිය කියනවා, "Nowadays, one country cannot go alone. This is a global village" යනුවෙන්. "කිසිම රටකට තනිව ගමන් කරන්න පුළුවන් ලෝකයක නොවෙයි අපි ජීවත් වෙන්නේ. අපි ජීවත් වෙන්නේ විශ්ව ගම්මානයක" කියලායි එතුමිය කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ ඉඳලා බීජිං නගරයට දුර කිලෝමීටර් 5,157යි. හැබැයි, පළමුවැනි COVID-19 රෝගියාගෙන් මේ ලෝකයට වෙච්ච බලපෑම පිළිබඳව අපට අවබෝධයක් තිබෙන්න ඕනෑ. ඒ පළමුවැනි රෝගියාගෙන් මේ රටේ ආර්ථිකයට, ලෝක ආර්ථිකයට වෙච්ච බලපෑම පිළිබඳව අපට අවබෝධයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම, ඊජිප්තුවේ Suez Canal එකට මෙතැන ඉඳලා කිලෝමීටර් 5,688ක් දුරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Suez Canal එකේ අර්බුදයක් ඇති වුණාම මේ රටට දැනෙන පීඩනය, වේදනාව පිළිබඳව අපට අවබෝධයක් තිබෙන්න ඕනෑ. අපි ලෝක ආර්ථික තත්ත්වය අවබෝධ කර ගන්න ඕනෑ.

[ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තේරුම් ගන්න ඕනෑ තව කාරණා කිහිපයක් තිබෙනවා. අපි මේ රටේ මොන භාණ්ඩය නිෂ්පාදනය කළත්, අපි මොන සේවාව ලබා දුන්නත්, අපේ වෙළෙඳ පොළ තිබෙන්නේ ඇමෙරිකාවේ, යුරෝපයේ, අරාබියේ කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. අපි ඒ ගැන අවබෝධයක් ලබා ගත්තේ නැත්නම්, අපට මේ වැඩේ කරන්න හැකියාව ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ලෝකයේ රටවල් අතරින් අතිරික්ත මුදල් තිබෙන්නේ චීනයට කියන එක අපි අවබෝධ කර ගන්න ඕනෑ. කලාපීය බලවතා, අපේ ළඟම අසල්වැසියා ඉන්දියාවයි කියන එකත්, ඉන්දියාව සමඟ තිබෙන අපේ ඓතිහාසික බැඳීම පිළිබඳවත් අප අමතක නොකළ යුතුයි. මූල්‍ය ශක්තිය තිබෙන්නේ චීනයට වුණාට, වෙළෙඳ පොළ තිබෙන්නේ ඇමෙරිකාවෙයි, යුරෝපයේයි, අරාබියේයි කියන එක අපි හොඳට හිතට ගන්න ඕනෑ කියලා මා කියනවා.

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ ලෝක ආර්ථික තත්ත්වය වාගේම දේශපාලන තත්ත්වයත් අවබෝධ කරගෙන මේ අය වැය ඉදිරිපත් කළා කියන හැඟීමක් අපට ඇති වෙලා තිබෙනවා. අපේ අසල්වැසි රට වාගේම, ලෝකයේ අනෙකුත් රටවල් එක්ක අපට යම් කිසි ප්‍රශ්නයක්, අනවබෝධයක්, ගැටලුවක් තිබෙනවා නම්, ඒවා සාකච්ඡාවෙන්, සම්මුතියෙන්, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් විසඳා ගැනීම අපේ රජයේ මූලික ප්‍රතිපත්තිය විධියට අපි හඳුනාගෙන තිබෙනවාය කියන එකත් මා මෙම ගරු සභාවට කියන්න ඕනෑ. ඒ වාගේම, ගෝලීය බලවතුන් අපේ මිතුරන් මිස, සතුරන් විධියට අප සලකන්නේ නැති බවත් අපි මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්න හදන කථාව පිළිබඳව කවුරුවත් හිත නරක් කරගත යුතු නැහැ. හැබැයි, අපේ රටේ තිබෙනවා, බොරු ඇමෙරිකන් විරෝධයක්, බොරු චීන විරෝධයක්, බොරු ඉන්දියානු විරෝධයක්. එහෙම කියන්න හේතු කාරණා ගණනාවක් තිබෙනවා. මා එහෙම කියන අයගේ දැක්ම, ඒ අයගේ සටන භාෂ්‍යයට ලක් කරනවා නොවෙයි; ඒ මතයට අගෞරවයක් කරනවා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ අයගේ පාරිභෝජනය දිහා බලන්න ඕනෑ. ඒ අය පාවිච්චි කරන්නේ මොනවාද කියලා අපි බලන්න ඕනෑ. ඒ අය පාවිච්චි කරන Facebook එක American නම්, Apple phone එක American නම්, Hutch phone එක Chinese නම්, ත්‍රිරෝද රථය Indian නම්, අතේ බැඳ තිබෙන ඔරලෝසුව Swiss නම් මේ රටේ බොරු විරෝධයක් ඇති කරන එක පිළිබඳව නැවත වතාවක් කල්පනා කරන්න ඕනෑ. කටින් පිට වන දේ වාගේම, කටට දමාගන්නා දේ ගැනත් අපි සලකා බලන්න ඕනෑ. එහෙම කළොත් තමයි අපට මේ විරෝධයේ තිබෙන ඇත්ත නැත්ත දැන ගන්න ලැබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි මේ ලෝකයේ සියලු රටවල් එක්ක එකතු වෙලා ගෝලීයකරණයත් එක්ක ඇති වෙලා තිබෙන තත්ත්වය හඳුනාගෙන කටයුතු කරන්න ඕනෑ කියලා මා කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දේශපාලනයයි, ආර්ථිකයයි පටලාගන්න නරකයි. මේ සඳහා ලෝකයේ හොඳ උදාහරණ තිබෙනවා. චීනය දේශපාලනයයි, ආර්ථිකයයි පටලාගෙන නැහැ. ඒ වාගේම, වියට්නාමයත් දේශපාලනයයි, ආර්ථිකයයි පටලාගෙන නැහැ. දේශපාලන ප්‍රතිපත්තිය එකක් වෙද්දී, ආර්ථික ප්‍රතිපත්තිය තව එකක් වෙන්නත් පුළුවන් කියලා එම රටවල් අපට, මේ ලෝකයට හොඳින් කියා දීලා තිබෙනවා.

චීනයේ දේශපාලන ප්‍රතිපත්තිය කොමියුනිස්ට් වුණාට ආර්ථික ප්‍රතිපත්තිය අද වන කොට ධනවාදී අන්තය කරා ගමන් කරමින් තිබෙන බව ලෝකයට රහසක් නොවෙයි. රට විවෘත කරලා අද වන කොට ඩොලර් බිලියන 220ක අපනයන ආදායමක් සහිත ආර්ථිකයක් ගොඩ නඟන්න වියට්නාමයට හැකි වී තිබෙනවා. මෙන්න මේ දේශපාලන කරුණු ගැන අවබෝධයෙන් යුතුව ගරු මුදල් ඇමතිතුමාත්, අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපේ රජයත් මේ අය වැය, ප්‍රශ්න කෝටියක් මැද්දේ ඉදිරිපත් කළාය කියන එක මම මේ වෙලාවේ බොහොම වගකීමෙන් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අලුත් දේශපාලන පරම්පරාවක මන්ත්‍රීවරු. අපි ලිංමැඩි මානසිකත්වයෙන් එළියට ආ පිරිසක්. අපි ආවේගශීලීව හැඟීම්වලට බර වෙලා දේශපාලනය කරන පිරිසක් නොවෙයි. අපි ලෝකය ගැන අවබෝධයකින්, දැනුමකින්, තක්සේරුවකින් වැඩ කරන පිරිසක්. ඒ නිසා අපි මෙන්න මේ කරුණු කාරණා තේරුම් ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලෝකයේ තිබෙන ලොකුම ටැක්සි කොම්පැනියට එක ටැක්සියක්වත් අයිති නැහැ. Uber සමාගමට මේ රටේ එක ටැක්සියකවත් හිමිකාරිත්වය නැහැ. හැබැයි, අපේ රටින් පවා එම සමාගම මුදල් උපයනවා, මම මේ කථා කරන වෙලාවේත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ තිබෙන ලොකුම හෝටල් කොම්පැනිය තමයි Airbnb. ඒකට අපේ රටේ එක හෝටලයකවත් අයිතිය නැහැ. හැබැයි, අපේ රටේ හෝටල් කර්මාන්තයෙන් ඒ කොම්පැනිය මේ වෙලාවේත් මුදල් උපයනවාය කියන එක අපි සිහි තබා ගන්න ඕනෑ. මේ වෙනස් වන ලෝකය ගැන අවබෝධ කරගෙන ආර්ථිකය හසුරුවන්න අපට සිදු වෙලා තිබෙන බව මා කියනවා.

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ අය වැය තුළින් සාධනීය කරුණු රාශියක් ඉදිරිපත් කරනවා අපි දැක්කා. ව්‍යාපාර ආරම්භ කිරීමේදී ඒවා ලියා පදිංචිය සඳහා වන ගාස්තු ලබන වසරේදී අය නොකිරීමට එතුමා මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. ඒ පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, අපේ රටේ ව්‍යාපාරයක් ආරම්භ කරලා පවත්වාගෙන යද්දී ඒ ව්‍යාපාරිකයාට ප්‍රශ්න කෝටියකට මැදි වෙන්න සිද්ධ වෙනවා. ඔහුට ප්‍රශ්න රාශියක් එනවා. නොයෙක් approval ගනිද්දී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් කටයුතු කරගැනීමේදී ඇති වන ප්‍රශ්න, පරිසර ප්‍රශ්න, BOI ප්‍රශ්න යනාදි වශයෙන් ප්‍රශ්න රාශියක් ඇති වෙනවා. ඒ නිසා අපි ගරු මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ රට business-friendly රටක්, ඒ වාගේම ව්‍යාපාර කරන්න පුළුවන් පරිසරයක් තිබෙන රටක් බවට පත් කරන්න තවතවත් සාධනීය යෝජනා ඉදිරි කාලයේදී ඉදිරිපත් කරන්න කියලා.

ඒ වාගේම අපි තේරුම් ගන්න ඕනෑ, අපට ලෝකය ජය ගන්න හැකියාව ලැබෙන්නේ අපි අනෙකුත් රටවල වෙළෙඳ පොළ ජය ගත්තොත් පමණයි කියන කාරණය. ඇමෙරිකාවේ වෙළෙඳ පොළ ජයගත හැකි, යුරෝපයේ වෙළෙඳ පොළ ජයගත හැකි, අරාබියේ වෙළෙඳ පොළ ජයගත හැකි ව්‍යවසායකයන් බිහි කරන්න පුළුවන් වටා පිටාව අපි අපේ රටේ හදා ගන්න ඕනෑ. ව්‍යවසායකයන් විතරක් නොවෙයි, ක්‍රීඩකයන්, නිර්මාණකරුවන් වැනි අයත් අපේ රටේ බිහි කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපේ රජය සතුව තිබෙනවාය කියන එකත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අපේ ආර්ථිකය ශක්තිමත් කරගැනීම සඳහා මුහුදෙන් එපිට වෙළෙඳ පොළ ජය ගන්න හැකි වන පරිදි අපි අපේ දරු පරපුර වෙනුවෙන් ආයෝජනය කරන්න ඕනෑ. ඒ අනුව, ගරු මුදල් අමාත්‍යතුමාගේ මෙම අය වැය තුළින් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය

වෙනුවෙන් රුපියල් බිලියන 115.2කුත්, පළාත් සභා යටතේ අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 191.87කුත්, විශ්වවිද්‍යාල වෙනුවෙන් රුපියල් බිලියන 77.5කුත්, ඒ වාගේම නිපුණතා සංවර්ධන පුහුණුව වෙනුවෙන් රුපියල් බිලියන 14.36කුත් වශයෙන් අධ්‍යාපනය සඳහා මුළු එකතුව ලෙස රුපියල් බිලියන 398.9ක් වෙන් කර තිබෙනවා. ලංකා ඉතිහාසයේ අය වැයක රජයේ සමස්ත වියදමින් සියයට 7.36ක්, ඒ කියන්නේ සමස්ත වියදම් ප්‍රමාණයෙන් වැඩිම ප්‍රතිශතයක් මේ රටේ අනාගත පරපුර වෙනුවෙන්, ඔවුන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ අය වැයක් විධියට මේ අය වැය ඉතිහාසගත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සහනවලින් පමණක් දරිද්‍රතාව, දුප්පත්කම නැති කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා අපේ දරුවන්ට ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට, තාක්ෂණික දැනුම ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතුයි. අනාගත ලෝකය ජය ගැනීමට ඔවුන්ට හැකියාව ලැබෙන්නේ ඔවුන්ට ඒ අවස්ථාව ලබා දුන්නොත් පමණයි කියා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ඉන්නේ හෙට යන යුගයක. හෙට යන යුගයේ තාක්ෂණය ඉතා දියුණු තත්ත්වයක තිබෙනවා. තාක්ෂණික විෂයයට අදාළ අමාත්‍යාංශය වෙනුවෙනුත් රුපියල් මිලියන 5,612ක් ගරු මුදල් ඇමතිතුමා විසින් අනාගතය වෙනුවෙන් ආයෝජනය කර තිබෙනවාය කියන කාරණයත් අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවාසනාවන්ත, කටුක, ඒ වාගේම අභියෝගාත්මක යුගයේ ලෝකයේ වෙන කිසිම තැනක දකින්නේ නැති ආකාරයේ දේශපාලනයක් අපි දකිනවා. ඒ ගැන අපි කනගාටු වනවා. අපි සියලුදෙනාම අවබෝධයෙන්, වගකීමෙන් වැඩ කරන්න ඕනෑ. පරිණත දේශපාලනඥයකු, පරිණත දේශපාලන ව්‍යාපාරයක් වගකීමෙන් යුතුව හැසිරෙන්න ඕනෑ කියන කාරණය තරුණ, පසුපෙළ මන්ත්‍රීවරයකු විධියට මම මතක් කරන්න කැමැතියි. පරිණත දේශපාලන ව්‍යාපාරයක් විධියට විපක්ෂයත් හැසිරෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. හුදු බලය පමණක් කේන්ද්‍ර කර ගත් වැඩ පිළිවෙළක් පරිණත දේශපාලන ව්‍යාපාරයකට තිබෙන්න පුළුවන්කමක් නැහැ. එහෙම ව්‍යාපාරයකට පැවැත්මකුත් නැහැ කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. අභියෝගවලට මුහුණ දෙමින් සිටින මෙවැනි වෙලාවක දේශපාලන පක්ෂයකට එහා ගිහිල්ලා, පුරවැසියන් විධියට කටයුතු කරන්න අපි සියලුදෙනාටම වගකීමක් තිබෙන්න ඕනෑ. නමුත් මේ වෙලාවේ විපක්ෂය කටයුතු කරන ආකාරය පිළිබඳව අපි කනගාටු වනවා.

මේ වාගේ වසංගතයක් පවතින අවස්ථාවක උද්ඝෝෂණ වාගේම වැඩ වර්ජන සිදු කරන ලෝකයේ එකම රට විධියට අපේ රට ගිනස් වාර්තා පොතට ඇතුළත් වනවා. මෙහෙම රටක් මේ ලෝකයේ කොහේවත් නැහැ. අපි ඒ සම්බන්ධයෙන් සතුටු වෙන්න නොවෙයි, අඬන්න ඕනෑ කියායි මම කල්පනා කරන්නේ. අපි ආවේගශීලීවෙලා, හැඟීම්වලට වහල්වෙලා, අනවබෝධයෙන්, ළිං මැඩි මානසිකත්වයෙන් කථා කරන, වැඩ කරන දේශපාලන සංස්කෘතියට තිත තියමු කියා යෝජනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Shasheendra Rajapaksa. You have 12 minutes.

[අ.භා. 2.12]

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷஷீந்திர ராஜபக்ஷ - சேதனப் பசளை உற்பத்தி மேம்பாடு மற்றும் விநியோக ஒழுங்குறுத்துகை மற்றும் நெல், தானிய வகைகள், சேதன உணவுகள், மரக்கறிகள், பழவகைகள், மிளகாய், வெங்காயம் மற்றும் உருளைக்கிழங்குச் செய்கை மேம்பாடு, விதை உற்பத்திகள் மற்றும் உயர் தொழில்நுட்ப கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Shasheendra Rajapaksa - State Minister of Promoting the Production and Regulating the Supply of Organic Fertilizer and Paddy and Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය පිළිබඳව කරුණු කීපයක් සඳහන් කරන්නට මම බලාපොරොත්තු වනවා. විශේෂයෙන් අද අපි පක්ෂ-විපක්ෂ වශයෙන් මේ අය වැය පිළිබඳව අදහස් ඉදිරිපත් කරනවා. අය සහ වැය කියන්නේ කුමක්ද කියන කාරණය පිළිබඳව අවබෝධයක් මේ සියලු මන්ත්‍රීවරුන්ට තිබෙනවා. අපි ආදායමක් ගැන සඳහන් කර, ඒ ආදායම ජනතාව අතරේ බෙදා දෙන්නේ කොහොමද කියන කාරණය පැහැදිලි කිරීම නොවෙයි, අය වැයකින් අපි බලාපොරොත්තු වන්න ඕනෑ. මෙවර අය වැය හරහා ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමා ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ පමණක් නොවෙයි, අද අපට තිබෙන ශක්තිය පිළිබඳවත් එතුමා අය වැය තුළින් කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම රටක් හැටියට, රජයක් හැටියට අපට තිබෙන දුර්වලකම් මොනවාද කියන කාරණය පිළිබඳවත් එතුමා ඉතා සාර්ථකව කරුණු ඉදිරිපත් කළා. මේ දුර්වලකම් පිළිබඳව, අපට තිබෙන ශක්තිය පිළිබඳව සාකච්ඡා කරලා මේ අභියෝග ජය ගන්නේ කොහොමද කියන කාරණයයි අපි අය වැයකින් බලාපොරොත්තු වන්නේ. ඒ සඳහා අපේ රජය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන ක්‍රමවේද මොනවාද කියන එක තමයි අපි රජයක් හැටියට ඉදිරිපත් කරන්නේ. ගරු මුදල් අමාත්‍යතුමා ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක්, දැක්මක් ඇතිව ඉදිරිපත් කර තිබෙනවා. මේ දැක්ම කෙටි කාලීනව, මධ්‍ය කාලීනව සහ දීර්ඝ කාලීනව සාර්ථක ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපි සාකච්ඡා කරනවා.

මම විශ්වාස කරන විධියට විපක්ෂයේ කාර්යභාරය වන්නේ මේ ඉදිරිපත් කරන යෝජනාවල අඩුපාඩු තිබෙනවා නම්, මේ යෝජනාවලට වඩා වැඩියෙන් යමක් කියන්න තිබෙනවා නම්, ඒවා ඉදිරිපත් කිරීමයි. ඒක තමයි විපක්ෂයේ වගකීම වන්නේ.

මගේ සහෝදර ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට, ගෝලීය වශයෙන් වර්තමානයේ අපි මුහුණ පා තිබෙන ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම ඉතා වැදගත් වනවා. වර්තමානයේ ගෝලීයකරණයත් සමඟ අපට තනිවම ජීවත් වෙන්න බැහැ. සමහර අය පටු දේශපාලන අරමුණු නිසා මේ කාරණා පිළිබඳව නිවැරැදිව දකින්නේ නැහැ. "රජය අර වැඩේ කළේ නැහැ; මේ වැඩේ කළේ නැහැ, අර සහනාධාරය දුන්නේ නැහැ" කියනවාට වඩා විපක්ෂයක් හැටියට ඒ අයට ඒ පිළිබඳව තිබෙන අදහස් ඉදිරිපත් කිරීම තමයි අපි බලාපොරොත්තු වන්නේ. මීට වඩා හොඳ යෝජනා ඉදිරිපත් කිරීම තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. එවැනි යෝජනා තිබුණා නම්, පසුගිය අවුරුදු පහ තුළ පැවති යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ යෝජනා ඉදිරිපත් කරලා ඒ කටයුතු කරන්න තිබුණා.

[ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා]

කෙසේ වෙතත්, මේ අය වැය ඉදිරිපත් කරන අවස්ථාව වන විට ගෝලීය වශයෙන් අප මුහුණ දුන් පොදු අභියෝගවලට අමතරව, අපට ආවේණික වූ, අපේ රට තුළ කාලයක් තිස්සේ විසඳීමට නොහැකිව තිබුණු ප්‍රශ්න, අභියෝග ගණනාවක් අපට තිබෙනවා. ඒ ප්‍රධාන කාරණා අතරින් ජීවන වියදම වැඩි වීමේ අභියෝගය පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. එතැන ඉඳලා තමයි අපේ ආර්ථිකය ගොඩ නැඟීමේ ක්‍රමවේද සහ කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ පිළිබඳව සාකච්ඡා කරන්නේ. ජීවන වියදම වැඩිවීමට හේතු මොනවාද? ගරු මුදල් අමාත්‍යතුමා ඉතා පැහැදිලිව මේ හේතු හඳුනාගෙන තිබෙනවා. එකක් තමයි, රටේ ජනතාවගේ අවශ්‍යතා. රටේ ජනතාවට අවශ්‍ය මොනවාද කියන එක රජයක් හැටියට අපි නිවැරදිව හඳුනා ගන්න ලොකු උත්සාහයක් ගන්නවා. නිෂ්පාදනය වැඩි කරන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපි අද යෝජනා ගණනාවක් ඉදිරිපත් කරනවා. රාජ්‍ය අංශය ක්‍රමවත් හා කාර්යක්ෂම කිරීම ඉතාම වැදගත් කියලාත් අපි හඳුනාගෙන තිබෙනවා. නූතන තාක්ෂණයට ප්‍රමාණවත් ලෙස යොමු නොවීමත් ගැටලුවක් හැටියට හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම, වෙළෙඳ පොළේ මිල පාලනය කරන අතරමැදියන්ගේ බලපෑම් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ගරු මුදල් ඇමතිතුමා හඳුනාගත් සමහර කාරණා පමණයි මා අද ඉදිරිපත් කළේ.

ඒ විතරක් නොවෙයි. දැන් මේ අභියෝග ජය ගන්න යෝජනා කරන්නේ මොනවාද? විශේෂයෙන්ම මා දකින විදියට, රජයකට තිබෙන ණය බර අඩු කර ගැනීම සඳහා වන ක්‍රමවේද සොයන්න ඕනෑ. කාර්යක්ෂමව රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි දැඩි අවධානයක් යොමු කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම වැඩිපුර විදේශ විනිමය ඉපයීමේ ක්‍රමවේද පිළිබඳවත් අපි අවධානය යොමු කළ යුතුයි. දේශීය නිෂ්පාදනවලට වැඩි අවධානයක් යොමු කර දේශීය නිෂ්පාදකයා දිරි ගැන්වීම පිළිබඳවත් අපි අවධානය යොමු කළ යුතුයි. මේ අභියෝග ජය ගන්න නම් මේ සඳහන් කළ යෝජනා ක්‍රියාත්මක කළ යුතුයි.

ඒ වාගේම පොදුවේ සමාජයීය වශයෙනුත්, ආර්ථිකමය වශයෙනුත් තිබෙන ජනතාවගේ ගැටලු නිරාකරණය කිරීම ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. මේ අභියෝග ජය ගැනීමට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි දැන් කළ යුත්තේ මේ යෝජනාවලට අදහස් එකතු කිරීමයි; නව යෝජනා ඉදිරිපත් කිරීමයි.

මේ සියලු කාරණා පිළිබඳව නොවෙයි, විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශයට සහ මගේ විෂය පථයට අදාළ වන අදහස් ඉදිරිපත් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන්ම කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමා ඉතාම පැහැදිලිව හොඳ දැක්මක් ඉදිරිපත් කර තිබෙනවා. අපි හැමදාම කියනවා, අපි හැමදාම බලාපොරොත්තු වෙනවා, අපේ රටේ ජනතාවටත්, ඒ වාගේම අනාගතයේ ඉපදෙන්න ඉන්න දරුවන්ටත් වස විස නොමැති පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා දෙන්න ඕනෑය කියලා. වැඩිහිටියන් හැටියට අපි හැමදෙනාම මේ පිළිබඳව සාකච්ඡා කරනවා; කථිකා කරනවා; යෝජනා කරනවා. නමුත් අපට මේ කටයුත්ත කර ගන්න බැරි වුණා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රටේ ජනතාව වෙනුවෙන් ඊට අවශ්‍ය දැඩි තීන්දුව නිවැරදිව ගන්නවා. හැබැයි සමහර අය පෙන්වනවා, මෙය හදිසියේ ගත්ත තීරණයක් කියලා. නැහැ, ඒක එහෙම නොවෙයි. 2019 ඉඳලා කන්න තුනක්, මේ රටේ ගොවි ජනතාවට කාබනික පොහොර සියයට 30ක් සහ රසායනික පොහොර සියයට 70ක් යොදවා වගා කරන්නේ කොහොමද කියන එක පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දීර්ඝ වශයෙන් අධ්‍යයනය කරලා තිබෙනවා; අධීක්ෂණය කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අත්දැකීම් තිබෙනවා; නිරීක්ෂණ තිබෙනවා. ඒ අනුව තමයි මේ තීන්දු ඉදිරියට එන්නේ. ඒ අනුව ගරු මුදල් අමාත්‍යතුමා යෝජනා කරනවා, රසායනික පොහොර වෙනුවට කාබනික පොහොරට සහනාධාරය ලබා දිය යුතුයි කියලා. මොකද, මෙතෙක් කල් එවැනි සහනාධාරයක් තිබුණේ නැහැ. පොහොර සහනාධාරය තිබුණේ රසායනික පොහොරවලට විතරයි. කාබනික පොහොරවලට සහනාධාරයක් නොතිබීම නිසා මේ රටේ කාබනික පොහොර දිරි ගැන්වීමක් කරන්න හැකියාවක් තිබුණේ නැහැ.

ඒ වාගේම කෘෂි කර්මාන්තයට නව තාක්ෂණය යොදා ගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් හඳුන්වා දෙනවා. නව තාක්ෂණය කිව්වාම, විශේෂයෙන්ම අපේ රටට ආවේණික, අපේ රටේ ක්‍රියාත්මක කරන්න පුළුවන්, අපේ රටට ගැළපෙන තාක්ෂණය අපි හඳුනා ගත යුතුයි. දැන් සිද්ධ වෙන්නේ මොකක්ද? පෞද්ගලික ආයතනයක් යම්කිසි යන්ත්‍රෝපකරණයක් හෝ යම්කිසි නව තාක්ෂණික හඳුන්වා දීමක් කළාම ඒ තාක්ෂණය හොඳද, නරකද කියා සොයා බලා ඒකට අනුමැතිය දෙන එකයි. දැන් එහෙම නැතිව, ඉන් ඔබ්බට යන්න වෙනමම ප්‍රතිපාදන අපේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා.

අපි ඉන් ඔබ්බට ගිහිල්ලා වෙන රටවල දැනට යොදා ගන්නා නව තාක්ෂණය පිළිබඳව අධ්‍යයනය කරලා, ඒ නව තාක්ෂණය අපේ රටට යොදා ගන්න පුළුවන්ද, අපේ කුඹුරුවලට ගැළපෙනවාද, අපේ ගොවියාට ඒකට අනුගත වෙන්න පුළුවන්ද කියන එක කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා බලලා, ඒක මේ රටේ ක්‍රියාත්මක කරන්න වෙනමම වැඩ පිළිවෙළක් ඉදිරියේදී අපි දියත් කරනවා. ඒ වාගේම අපනයන භෝග වගාවේ අඩුපාඩු හඳුනාගෙන, ඒකට හේතුව මොකක්ද, විසඳුම් මොනවාද කියා සොයා බැලීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය, අපනයන ප්‍රවර්ධන විෂය භාර රාජ්‍ය අමාත්‍යාංශයත් සමඟ සම්බන්ධ වෙලා දැනටම ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම අපි අපනයන වෙළෙඳ පොළ නිවැරදිව හඳුනාගන්න ඕනෑ. අපේ නිෂ්පාදන සම්බන්ධයෙන් කියමනක් තිබෙනවා, "මේවා නිෂ්පාදනය කරන්නේ පිටරට යවන්න" කියලා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ අපේ නිෂ්පාදන, ප්‍රමිතිය, ප්‍රමාණය පිට රටට ගැළපෙනවාද කියන එකයි. විදේශීය රටවලින් මේවා අපෙන් මිලදී ගනීවිද කියන එක පිළිබඳව අපට අධ්‍යයනයක් කරන්න වෙනවා. මේ සඳහා වෙනමම අංශයක් අපේ අමාත්‍යාංශයේ පිහිටුවා තිබෙනවා. නමුත්, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. නැවත ඒ අංශය පණගන්වා ඒ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. 2022 අවුරුද්දේ සිට විශේෂ ව්‍යාපෘතියක් සඳහා ලෝක බැංකු ආධාරත් අපට ලැබී තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, අවශ්‍යතාව හඳුනාගෙන, අවශ්‍යතාවට අනුව අපේ රටේ වගා කරලා අපනයනය කරන්න.

නව කෘෂි නිෂ්පාදන ආයෝජන කලාප ගැනත් සඳහන් කරන්න මම කැමැතියි. ආයෝජන කලාප ගත්තාම, ඇඳුම් නිෂ්පාදන වෙන්න පුළුවන්, වෙනත් යම්කිසි නිෂ්පාදනයක් වෙන්න පුළුවන්. නමුත්, කෘෂිකර්මය හා අදාළ නිෂ්පාදනවලට වෙනමම ආයෝජන කලාපයක් පිහිටුවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ ආයෝජන කලාපයට වෙන රටවල කෘෂිකර්මාන්තයේ යෙදී සිටින, කෘෂිකර්ම ව්‍යාපාරවල යෙදී සිටින ආයෝජකයන්ට ආරාධනා කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඔවුන්ට මේ රටට ඇවිල්ලා

ඒ ආයෝජන කලාපයේ ආයෝජන කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අපි යෝජනා කරන සියලු කාරණා පිළිබඳව එකින් එක කියන්න මම උත්සාහ කරන්නේ නැහැ. නමුත්, තවත් එක දෙයක් ගැන විශේෂයෙන්ම මම කියන්න ඕනෑ.

එදා රසායනික පොහොර ආනයනයට වියදම් කරපු සියලු මුදල් අද ගොවියා අතට ලැබෙනවා. මේ වෙනකොට ගොවියා කාබනික සන පොහොර නිෂ්පාදනය කරනවා. අද වන විට රුපියල් 12,500ක් ගොවියාට ලබා දෙන්න අවශ්‍ය කටයුතු අපි සැලසුම් කර, ඒ මුදලින් පළමුවෙනි වාරිකය වන රුපියල් 7,500ක මුදල ලක්ෂ හයහමාරකට වඩා අධික ගොවීන් පිරිසකට ලබාදී තිබෙනවා. ඒ අනුව, ඉතාම සාර්ථක ලෙස අද ඒ කටයුත්ත සිදු වෙනවා.

ජෛව තාක්ෂණය යොදා ගනිමින් ජෛව දියර පොහොර නිෂ්පාදනය කරන දේශීය නිෂ්පාදකයන් 67දෙනෙකු පමණ ඉන්නවා. ඒ අය ගැන සොයා බලා, ඔවුන්ට අවශ්‍ය මුදල් සහ අනෙකුත් සියලු පහසුකම් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. මම හිතනවා, මේ කටයුත්ත ඉතා සාර්ථකයි කියලා. නමුත්, මම මෙතැනදී ඉතාම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, සමහර රාජ්‍ය නිලධාරින්ගෙන් මේ සඳහා අපට සහයෝගය නොලැබුණු බව. මේ පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුයි. මොකද, වැඩ කරන නිලධාරින්, වැඩ නොකරන නිලධාරින් පිළිබඳව වෙන වෙනම හඳුනා ගැනීම අවශ්‍යයි කියා මා හිතනවා. මෙය ඉතා බැරෑරුම් තත්ත්වයක්.

අපි යෝජනා කර තිබෙනවා, වයස අවුරුදු 65 දක්වා රජයේ නිලධාරින්ගේ සේවා කාලය දීර්ඝ කරන්න. මේ පිළිබඳව අපි සැලකිලිමත් විය යුතුයි. මම හිතනවා, වැඩ කරන නිලධාරින්ට අවුරුදු 85ක් වැඩ කළත් මේ යෝජනාවේ කිසිම ගැටලුවක් නැහැ කියලා. නමුත්, වැඩ නොකරන අය පැත්තකින් තැබිය යුතුයි. රජයක් හැටියට අපි මේ කාරණය පිළිබඳව ඉතාම සංවේදීව බලන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා. මොකද, වැඩ කරන නිලධාරියාට අවශ්‍ය මානසික ශක්තිය ලබා නොදුන්නොත්, ඔහු ආරක්ෂා නොකළොත්, දිරිගැන්වීමක් නොකළොත් කාලයක් යනකොට ඒ නිලධාරියාත් වැඩ නොකරන තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා නිවැරදි වැඩ පිළිවෙළක් නොමැතිව මේ රටේ කිසිම හොඳ වැඩක් කරන්න බැහැ. මොන වෙලාවේ හොඳ වැඩක් කරන්න ගියත් විනාඩියයි, දෙකයි. කවුරු හෝ ප්‍රධාන කෙනෙක් - ආචාර්ය හෝ මහාචාර්ය කෙනෙක්- රූපවාහිනියට ඇවිල්ලා කියනවා, "අරක හරියන්නේ නැහැ, මේක හරියන්නේ නැහැ, මේක තමයි නව තාක්ෂණය" කියලා. එහෙම කියලා ඕනෑම හොඳ යෝජනාවක් විනාශ කර දමනවා. මම හිතනවා, එහෙම නොවෙන්න, මේ කටයුතු කඩාකප්පල් නොකෙරෙන ආකාරයට, කටයුතු කළ යුතුයි කියා. මේවා කඩාකප්පල් කරන්න වෙනමම කණ්ඩායම් ඉන්නවා. එහෙම කඩාකප්පල් නොකරන වැඩ පිළිවෙළක් හදන්න කියා යෝජනා කරමින්, මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have 10 minutes.

[අ.භා. 2.24]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදය අහගෙන ඉන්නකොට ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු කියන විධියට වර්තමාන රජය සහ මේ රට තිබෙන්නේ සෞභාග්‍යයෙන් ස්වයංපෝෂිත වෙලා.

මේ රජය සහ මේ රජය නියෝජනය කරන මැති ඇමතිවරුන්ගේ කථා අහනකොට මට හිතෙන්නේ අද මේ රටේ ප්‍රශ්න නැහැ කියලායි. අද ගොවියා ඇතුළු ශ්‍රමිකයා පාරට බැහැලා ඉන්නේ දේශපාලන චුවමනාවක් නිසා කියන එක තමයි එතුමන්ලා ඒත්තු ගන්වන්න උත්සාහ කරන්නේ. එතුමන්ලා කියන්නේ මොකක්ද? "එන්නත විදලා තිබෙන්නේ, ඒත් එක්කම දැන් සංචාරකයෝ එනවා, අපට ඩොලර් එනවා, කුඹුරුවලට 'නයිට්‍රෝ රජා' ගහලා තිබෙන්නේ, දැන් පස සාරවත් වෙලා තිබෙන්නේ. ඒක නිසා රට ස්වයංපෝෂිත වෙලා තිබෙන්නේ" කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපි යථාර්ථය තේරුම්ගත යුතුයි. වර්තමාන රජයට අද ඍජු ප්‍රතිපත්තියක් නැහැ. ඍජු ප්‍රතිපත්තියක් නැති නිසා, ජනතාවට නිවැරදි දැක්මක් ලබා දීලා නැති නිසා ගාල කඩා ගත්ත හරක් ටික වාගේ තමයි ගමන් කරන්නේ. අද එක පැත්තකින් කියනවා, "අපි පොහොර නිෂ්පාදනය කරනවා, අපි ගොවියාට පොහොර ලබා දෙනවා" කියලා. ඒ වාගේම කියනවා, "කාබනික පොහොර පිටරටින් ගෙන්වනවා" කියලා. ඊට පස්සේ නැවත කියනවා, "පොහොර නැති නිසා එලදාව අඩු වුණොත් ඒකට වන්දි දෙනවා" කියලා. තවත් පැත්තකින් කියනවා, "වී ටික රුපියල් 100ට ගන්නවා" කියලා. අද කිසිම දැක්මක් නැහැ. එක පැත්තකින් කියනවා, "එළවලු මිල ඉහළ ගියොත් එළවලු පිටරටින් ගෙන්වනවා" කියලා. මම දැක්කා අද පත්තරයක තිබෙනවා, "එළවලු ආනයනය රජය කිසිම අවස්ථාවක කරන්නේ නැහැ" කියලා. එහෙම කියන රජය අනෙක් පැත්තෙන් කියනවා, "එළවලු ගෙන්වනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම අපි මේ අය වැය අධ්‍යයනය කරනකොට පෙනෙන දෙයක් තමයි, මේ අය වැය පුස්සක් බව. මේ අය වැය තුළ කිසිම දෙයක් නැහැ. අපි දන්නේ නැහැ අද ඇමතිතුමාත් නැත්තේ ඒ නිසාද කියලා, මේ අය වැය විවාද කරන අතරතුර. අද තවත් පත්තරක තිබෙනවා, "එළවලු මිල ඉහළට. එළවලු කිලෝවක් රුපියල් 400 දක්වා වැඩි වෙලා. මේ අනුව බෝංචි, දෙහි, මාළුමිරිස්, තක්කාලි කිලෝවක තොග මිල පවා රුපියල් 350ත්, 400ත් අතරට පත් වෙලා" කියලා. එතකොට මේක තමයි රටේ යථාර්ථය. මේ පත්තර කර්තෘවරු අපි නොවෙයි. අද රටේ යථාර්ථය තේරුම් ගන්න බැහැ. අද රජයේ සේවකයාගේ පඩි වැඩි වෙලා නැහැ. පෞද්ගලික සේවකයාගේ පඩි වැඩි වෙලා නැහැ. ඒ අයට කිසිම සහනයක් මේ රජය දීලා නැහැ. මිනිස්සු කබලෙන් ළිපට වැටිලා. හැබැයි, මේ අය කියනවා, රට ස්වයංපෝෂිතයි කියලා. ආර්ථික වශයෙන් රට කඩා වැටිලා තිබෙන්නේ. මේක තේරුම් ගන්න බැරි රජයක්. අද පිටරටකට යන පුද්ගලයෙකුට ඩොලර් 100ක්, 200ක් ගන්න බැංකු ගණනේ හිඟා කන්න වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හෙට රට යනවා නම් ලංකා බැංකුවෙන් ඔබතුමාට දෙන්නේ ඩොලර් 500යි. මේක තමයි ඇත්ත. අද මේ තත්ත්වයට රට පත් වෙලා තිබෙනවා. රටට යම් කිසි අමුද්‍රව්‍යයක් ගෙනැල්ලා නිෂ්පාදනයක් ආරම්භ කරන්න රටේ අහිංසක මිනිස්සුන්ට අද LC එකක් open කර ගන්න විධියක් නැහැ. නිෂ්පාදන ආර්ථිකයට වෙන්නේ මොකක්ද?

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

අද මේ රටේ හාල් හිඟයක් තිබෙනවා. අරලියගහ මන්දිරයේදී කිව්වා, අපි ළඟ අතිරික්තයක් තිබෙනවා, අපි හාල් මිල පාලනය කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හාල් මිල තීරණය කරන්නේ හාල් මෝල් හිමියන් සහ හාල් විකුණන කඩ හිමියන් කියන එක අපි පැහැදිලිව කියනවා. අද කිරි පිටි හිඟයක් තිබෙනවා. අද රට පුරා කිරි පිටි පෝලිම්. ඒ වාගේම තෙල් නැහැ. පොහොර නැහැ. සීනි නැහැ. අවම වශයෙන් ටයිල් කැටයක්, වැසිකිළි පෝච්චියක් ගන්න තැනක් නැහැ. මේ විධියට අද රට බිංදුවට වට්ටලා තිබෙන්නේ.

සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, මා නියෝජනය කරන මීගමුව ආසනයේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන ජනතාවට මේ රජය දීලා තිබෙන සහන මොනවාද? සංචාරක ක්ෂේත්‍රයෙන් යැපෙන මිලියන 2කට ආසන්න මේ රටේ අහිංසක ජනතාවට මේ රජය දීලා තිබෙන්නේ මොනවාද? මෙවර අය වැයෙන් ඔවුන්ට දීපු සහනයක් නැහැ. අපි දැක්කා, moratorium එකක් දුන්නා. ඒක දුන් දවසේ ඉඳන් ණයයි, පොලියයි වැඩිවෙමින්, වැඩිවෙමින් යනවා. මේ මිනිස්සුන්ට ඒක ගෙවා ගන්න බැරිව ඔවුන්ගේ හෝටල් පවා දැන් විකුණන්න දමා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීගමුව ආසනය මේ වන විට ජාත්‍යන්තර නිරෝධායන මධ්‍යස්ථානයක් කර තිබෙන බවත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. පාකිස්තානයෙන්, ඉන්දියාවෙන් එන අය දින 14ක් මීගමුවේ නිරෝධායනය කරනවා. ඒ නිරෝධායනය කරන මිනිස්සු මීගමුව පුරා හැම තැනම ඇවිද ඇවිද යනවා, කිසිම ආරක්ෂාවක් නැහැ. අපේ දරුවන්ට මොකද වෙන්නේ, මීගමුවේ ජීවත් වන මිනිසුන්ට මොකද වෙන්නේ කියලා හිතලා, ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් මේ රජය ක්‍රියාත්මක කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක මිනිසුන්ගේ ජීවිත එක්ක සෙල්ලම් කරන ආණ්ඩුවක්. රුපියල්, ඩොලර්වලට මේ රටේ මිනිසුන්ගේ සෞඛ්‍යාරක්ෂාව විකුණන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත්වෙලා. ජාවාරම් කරන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත්වෙලා.

එහෙම තිබෙනකොට අද ධීවරයාට ගහලා තිබෙන ගැහිල්ල බලන්න. ලාම්පු තෙල් නැතිව ධීවර ජනතාවට අද ධීවර කර්මාන්තය කර ගන්න විධියක් නැහැ. අපේ ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. ධීවරයන්ට ලාම්පු තෙල් ටික ගන්න පෝලිමේ ඉන්න සිදුවෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙන්න අය වැය! අරුම පුදුම අය වැයක්. අද පෙදරේරුවාට සිමෙන්ති ටිකක් ගන්න නැහැ. සිමෙන්ති ටිකක් ගන්න නැතිව පෙදරේරුවා මහ පාරේ හිඟා නොකා හිඟා කන තත්ත්වයට අද පත් කර තිබෙනවා. අද මිනිසුන්ට ගෑස් ටිකක් ගන්න තැනක් නැහැ. අද පොහොර නැතිව ගොවියා මහ පාරේ ඉන්නවා. එහෙම තත්ත්වයක් තිබියදීත් මේ අය වැයෙන් කොවිඩ්වලින් දරුවන් ආරක්ෂා කරන්න පාසල්වලට මුදල් වෙන් කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මතක තියා ගන්න, අපේ දරුවෝ තමයි පාසල්වලට යන්නේ. ඒ දරුවන්ට අත් දෙක සෝදා ගන්න sink එකක් දෙන්න, sanitizer ටිකක් දෙන්න, මුඛ ආවරණ ලබා දෙන්න වාගේ කිසිම දෙයකට මේ අය වැයෙන් මුදල් වෙන් කර නැහැ. ඒ වාගේ තත්ත්වයකට මේ අය වැය පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයෙන් මිනිසුන්ට සහන දෙන්න රජයට පුළුවන් වුණා නම්, අපි ඒ ගැන පුදුම වෙන්නේ නැහැ. හැබැයි, වන්න ජයසුමන රාජ්‍ය ඇමතිතුමා කියනවා, විපක්ෂ නායකතුමාගේ විපක්ෂ නායකකමත් අහිමි වෙයිලු අපි කරන්නා වූ මේ වැඩ පිළිවෙළත් එක්ක. එතුමා බලාගෙන ඇති විපක්ෂ නායකතුමාගේ විපක්ෂ නායකකම අහිමි වනකල්. අපි වන්න ජයසුමන රාජ්‍ය ඇමතිතුමාට පැහැදිලිව කියනවා, හෙට අනිද්දා එතුමාගේ ඇමතිකම ගැලවෙයි කියලා. හැබැයි, විපක්ෂ නායකතුමා අනිවාර්යයෙන්ම මේ රටේ ජනාධිපතිවරයා හැටියට දිවුරුම් දීලා මේ රටේ ප්‍රශ්න ටික විසඳනවා. එතුමාට මේ රට ගැන දැක්මක් තිබෙනවා. *[බාධා කිරීම්]* එතුමාට මේ රට ගැන කැක්කුමක් තිබෙනවා. එතුමාට බයවෙලා තමයි, ඊයේ පොලිසිය දමලා මහ පාරේ ආපු බස් ටික නතර කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සීදුව පොලිසියට ගියා; දඬුගමට ගියා. එහෙම යනකොට මහ පාරේ එන හැම බස් එකක්ම නතර කරනවා. *[බාධා කිරීම්]* ඇයි, මෙච්චර බය? මහ පාරේ බස් නවත්තලා ඊයේ වැඩට ගිය මිනිස්සු, පාසල් ගිය දරුවෝ check කරනවා, අර උද්ඝෝෂණයට යනවාද කියලා. මතක තියා ගන්න, මේ උද්ඝෝෂණ කරන්නේ රටේ ජනතාවගේ පීඩනය නිසා බව. බලන්න, වැඩ කරන විරුවාගේ සිත්දුව දාගෙන එක් කෙනෙක් යනවා ගෑස් පෝලිම ළඟින්. තවත් කෙනෙක් යනවා සීනි පෝලිම ළඟින්. තවත් කෙනෙක් යනවා හාල් පෝලිම ළඟින්. තවත් කෙනෙක් යනවා කිරි පිටි පෝලිම ළඟින්. විරුවාගේ සිත්දුව දාගෙන යන්නේ. මේවා බලන්න; ජනමාධ්‍ය බලන්න. මේ ගරු සභාවේ කෑ ගැහුවාට කමක් නැහැ. හැබැයි, පාරට බැහැලා බලන්න, ගුටි කන්නයි වෙන්නේ. ඡන්දය දුන් හැටනව ලක්ෂය නැහැ අද. මේ අයට ඡන්දය දුන් හැටනව ලක්ෂය අද නැහැ. මම අභියෝග කරනවා, පුළුවන් නම් ඡන්දයක් තියන්න කියලා. හැටනව ලක්ෂය නොවෙයි, ඔබතුමන්ලාට රෙදිත් නැතිව යන්නයි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය බලයට ආවේ පාස්කු ඉරිදා එල්ල කළ මරාගෙන මැරෙන ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉෂ්ට කරනවා කියලා. නමුත් මොනවාද කළේ? අපේ සිරිල් ගාමිණී පියතුමා දවස් දෙකක්, පැය අට ගණනේ CID එකේ තියාගෙන ප්‍රශ්න කළා. 22වැනි දා නැවත වතාවක් එන්න කියලා තිබෙනවා. සිරිල් ගාමිණී පියතුමාද බෝම්බ අරගෙන පල්ලිවලට පැන්නේ? "බෝම්බ තිබෙන තැන දන්නවා, බෝම්බ ගහන දවස දන්නවා, බෝම්බ තියාගෙන ඉන්න අය දන්නවා" කියලා ඥානසාර ස්වාමීන් වහන්සේ කියනකොට, ඒ ගොල්ලන්ගෙන් ප්‍රශ්න කරන්න කොන්දක් නැති ආණ්ඩුව සිරිල් ගාමිණී පියතුමාගෙන් ප්‍රශ්න කරනවා. උන්වහන්සේ හිර කර ගෙන ඉන්නවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මාගේ මිත්‍රයා. අපේ Dr. Jayalath Jayawardhanaගේ පුතා. මම ඔබතුමාට කියන්න කැමැතියි, මමත් කතෝලිකයෙක් බව.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මගේ වෙලාව ගන්න එපා, ගරු ඇමතිතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ, අපේ වෙලාවෙන් ගන්නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
හොඳයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමාත් කතෝලිකයෙක්. සිරිල් ගාමිණී පියතුමා මොනවා හරි දන්නවා නම්, එතුමාගෙන් ඒ ගැන අහන එක වැරදිද? අහන්න ඕනෑ. ඔබතුමා මොනවා හරි දන්නවා නම්, මමත් දන්නවා නම්, CID එක තිබෙන්නේ ඒ ගැන හොයන්න. ඒකට බය වෙන්න හොඳ නැහැ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඥානසාර හාමුදුරුවන්-,

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඥානසාර හාමුදුරුවන් ගැන නොවෙයි මම කියන්නේ. මම මේ බෞද්ධ භික්ෂු නමක් ගැන නොවෙයි කථා කරන්නේ. ඔබතුමාත් කතෝලික මන්ත්‍රීවරයෙක්. මමත් කතෝලික මන්ත්‍රීවරයෙක්. ඒ නිසායි මම කියන්නේ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා වෙන්න පුළුවන්, මම වෙන්න පුළුවන්, කවුරු හෝ මේ ගැන මොනවා හෝ දන්නා දෙයක් තිබෙනවා නම් ඒ ගැන හොයන එක හරි. හේතුව, ඔබතුමන්ලා කළේ බෝම්බ ගහපු මිනිස්සු ගෙන්වලා කොමිසමක් පත් කරලා හොයපු එක සහ බොරු කරපු එක.

අපි එහෙම කරන්නේ නැහැ. ඒ නිසා මේක දේශපාලනයට හරවා ගන්න එපා. කතෝලික ආගමේ පූජකතුමන්ලා කියලා මේකට ආගම් භේදයක් ඇති කරන්න එපා, මන්ත්‍රීතුමා. අපි ඔක්කෝම එකතු වෙලා මේක හොයමු. අපි කියන්නේත් දඬුවම් කරන්න ඕනෑ කියලා. අනිවාර්යයෙන්ම මේ වැරදි කරපු අයට දඬුවම් කරන්න ඕනෑ. ඔබතුමා ඉන්න තැන තමයි මාත් ඉන්නේ. හැබැයි, මේක දේශපාලනයට හරවා ගන්න එපා; කුණු කරන්න හදන්න එපා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේක දේශපාලනයට හරවා ගෙන නැහැ. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වෙළුම් 21ක් තිබෙනවා. ඒ වෙළුම් 21 තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. ඇයි ඒක හංගාගෙන ඉන්නේ? ඒ විතරක් නොවෙයි, ඇයි තවමත් ඥානසාර ස්වාමින්වහන්සේගෙන් ප්‍රශ්න කරන්න බැරි? ඇයි ජනාධිපති පරීක්ෂණ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරලා නිලන්ත ජයවර්ධනලාගෙන් ප්‍රශ්න කරන්න බැරි? ඇයි බැරි මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් ප්‍රශ්න කරන්න? ඇයි මේ වෙනකොට නිලන්ත ජයවර්ධනලාට උසස්වීම් දීලා තියාගෙන ඉන්නේ? මේ සිරිල් ගාමිණී පියතුමා මේ විධියට මඩව මඩවා, CID එකට ගෙනැල්ලා ප්‍රශ්න කර කර උන්වහන්සේගේ කාලය නාස්ති කරමින් උන්වහන්සේ පීඩනයට ලක් කරන්නේ ඇයි? ඒ නිසා පැහැදිලිවම මේ අයට ලොකු ඕනෑකමක් තිබෙනවා, අප නිශ්ශබ්ද කරන්න කියන එක කියමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාව අපේ වේලාවෙන් අඩු කරන්න.

අපි කිසිම කෙනෙක් නිශ්ශබ්ද කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ගැන මට කනගාටුවක් තිබෙනවා. ඔබතුමාගේ තාත්තා ඉතාම වැදගත් දේශපාලනඥයෙක්; මගේ හොඳ මිත්‍රයෙක්. අපි දේශපාලන වශයෙන් වෙනස් වුණත් ඔබතුමාත් එහෙමයි. ගරු මන්ත්‍රීතුමනි, අපි පියතුමන්ලා ගෙනැල්ලා මඩවන ආණ්ඩුවක් නොවෙයි. තමුන්නාන්සේලා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කර ගත්තේ. දැන් දොස් කියනවා. තමුන්නාන්සේලාගේ කාලයේ තමයි ආරක්ෂාව දෙන්න බැරුව මේ රටේ අහිංසක කතෝලික ජනතාව විතරක් නොවෙයි, අනික් ආගම්වල ජනතාවත් හෝටල්වල මැරුණේ. ඒක තමයි ඇත්ත. තමුන්නාන්සේලාගේ හරින් ප්‍රනාන්දු එදා තාත්තා ඒක කියපුවාම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගෙදර ඇතුළේ බූදියා ගත්තා, මිනිස්සු මැරෙන්න ඇරලා. අද ඇවිල්ලා බොරුවට කියනවා. අපි ඡන්ද දිනුවේ පාස්කු ප්‍රහාරයට ඉස්සෙල්ලා. අපි තමුන්නාන්සේලා පැරැද්දුවේ පාස්කු ප්‍රහාරයට ඉස්සෙල්ලා. ඒ නිසා කරුණාකරලා මේ කාරණය දේශපාලනයට හරවා ගන්න එපා. ඒක අපි වැදගත් විධියට කියන්නේ. මේක අපි එකතු වෙලා හොයමු. කවුරු හරි යමක් දන්නවා නම්, සිරිල් පියතුමා දන්නවා නම්, ඒ දන්නා දේවල් කියන්න ඕනෑ. ඒක පියතුමෙක් වෙන්න පුළුවන්, වෙන කවුරු හරි වෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයෙන් වෙලාව අරගෙනයි මම මේවා කියන්නේ. මොකද, මේවා නිවැරදි කරන්න ඕනෑ.

කරුණාකරලා මේ පියතුමා විකුණන්න එපා. තමුන්නාන්සේලා කාදිනල් හිමිපාණන්ටත් මඩ ගහපු අය නේ. මතකද? කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටියේ අපි. හරිද? තමුන්නාන්සේලා තමයි කාදිනල් හිමිපාණන්ටත් නින්දා අපහාස කෙරුවේ. ඔබතුමා නොවෙයි. ඔබතුමා කවදාවත් එහෙම කෙරුවේ නැහැ. හැබැයි, හරින් ප්‍රනාන්දුලා නින්දා අපහාස කෙරුවා. ප්‍රේමදාස මහත්තයා එක්කගෙන ගිහිල්ලා තමයි සමාව ගත්තේ. ඒ නිසා නිකම් බොරුවට ආණ්ඩුවට මඩ ගහන්න හදන්න එපා. අපි කියන්නේත් වැරදිකාරයන්ට දඬුවම් කරන්න ඕනෑ කියලායි. නීත්‍යනුකූලව එය විය යුතුයි. පියතුමාද කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. කවුරු හරි මේ ගැන දන්නවා නම්, ඒ අය අනිවාර්යයෙන්ම මේ ප්‍රශ්නවලට උත්තර දිය යුතුයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමා අපේ පියතුමා යුක්තියයි ඉල්ලුවේ. උන්වහන්සේ චෝදනාක් කළේ නැහැ. උන්වහන්සේ යුක්තිය ඉල්ලුවේ. යුක්තිය ඉල්ලපු කෙනා මේ විධියට ගෙනැල්ලා අපහසුතාවයට පත් කරන එකට විරුද්ධව තමයි අපි කථා කරන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පියතුමා යුක්තිය ඉල්ලලා විතරක් නොවෙයි. උන්වහන්සේ පැහැදිලිව කියලා තිබෙනවා; අනිත්

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

අයත් කියලා තිබෙනවා, අද ඉන්න අපේ SIS එකේ නායකයාටත් විරුද්ධව චෝදනා කරනවා. ඉතින් ඒවාට සාක්ෂි තිබෙනවා නම් එවන්න ඕනෑ. ඒක උන්වහන්සේගේ යුතුකමක්. ඒ පියතුමාගේ යුතුකමක්. එහෙම නැත්නම් ඒක කරන ලොකු අගෞරවයක්. ඒකයි අපි කියන්නේ. තමුන්නාන්සේටත් මම කියන්නේ තමුන්නාන්සේලාගේ මේ මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන හැංගිලා කථා කරන්නේ නැතුව -ඔබතුමා එහෙම කරලා නැහැ- මහ මොළකරුවා ගැන දන්නවා නම්, ඒ ගැන ගිහිල්ලා කියන්න, කියන්න. බොරුවට මේවායින් දේශපාලනය කරන්න හදන්න එපා. ඒකයි අපි කියන්නේ. *[බාධා කිරීමක්]* දැන් ඇති. නැත්නම් අපි දෙන්නාට කථා කර කර ඉන්නයි වෙන්නේ ඉවර වෙනතුරු. ඒ නිසා නිකම් අපරාදේ ඉල්ලාගෙන කන්න හදන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 2.39]

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura -State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාගේ රජයේ දෙවැනි අය වැය, අපේ බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිතුමාගේ මංගල අය වැය ලෙස ඉදිරිපත් කළා. මේ අය වැයෙන් මේ රටේ ජනතාවට විශාල වැඩකොටසක් කරන්න ලබන අවුරුද්දට මුදල් වෙන් කරලා තිබෙනවා. අපේ පළමුවෙනි අය වැයෙන් වෙන් කරපු මුදල මේ රටේ යථාර්ථයක් බවට පත් කරන්න 2021 අවුරුද්දේ මොන බාධක තිබුණත් අපි කටයුතු කළා.

ඒ කටයුතු කරපු එකේ ප්‍රතිඵල අද ලැබිලා තිබෙනවා. පසුගිය කාලයේ අපේ රටට සෑම දෙයක්ම පිට රටින් ගෙනාවා. පසුගිය ආණ්ඩුව කාලයේ අපේ රටේ වැවෙන කිසිම දෙයක් වවන්න උත්සාහ ගත්තේ නැහැ. පිට රට ගොවියා කෙරෙහි විශ්වාසය තියලා ඒ ගොවියන්ගේ දේවල් තමයි මේ රටට ගෙනාවේ. ලංකාවේ වවන්න පුළුවන් සෑම දෙයක්ම පිට රටින් ගෙනාවා. ලංකාවේ වැඩිපුරම ගම්මිරිස් තිබෙන්නේ රත්නපුරය දිස්ත්‍රික්කයේ, කොළොන්නේ. ඒ මිනිස්සුන්ගේ ගම්මිරිස් කිලෝග්‍රෑම් එකක් රුපියල් 400කට විකුණා ගන්න බැරිව එදා පාරට ඇවිල්ලා කෑ ගැහුවා; උද්ඝෝෂණ කළා. තමුන්නාන්සේලා එදා වියට්නාමයෙන් ගම්මිරිස් ගෙනාවා. එහෙම ගෙනැල්ලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ යුගයේ රුපියල් 1,000කට තිබුණු ගම්මිරිස් කිලෝග්‍රෑම් එක තමුන්නාන්සේලා රුපියල් 400 දක්වා අඩු කළා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කළේ ගම්මිරිස් පිට රටින් ගෙන්වන එක නතර කරලා, දේශීය නිෂ්පාදකයාට සහන දීලා ගම්මිරිස් කිලෝග්‍රෑම් එක රුපියල් 1,000ක් දක්වා වැඩි කරපු එකයි. මේ රටේ ගම්මිරිස් ගොවීන් 250,000කට වැඩි පිරිසක් ඉන්නවා. තමුන්නාන්සේලාගේ කාලයේ රුපියල් 1,400කටවත් කුරුඳු කිලෝග්‍රෑම් එකක් විකුණා ගන්න බැරිව තිබුණා. අද කුරුඳු කිලෝග්‍රෑම් එකක් රුපියල් 2,800යි; රුපියල් 3,000යි; රුපියල් 3,200යි. අපේ රටේ අද වන විට කුරුඳු වගා කරන ගොවියෝ 350,000කට වඩා ඉන්නවා. අපේ ආණ්ඩුවෙන් තමයි ගොවියාට මේ මිල හදලා දෙන්න කටයුතු කළේ. 2021 අවුරුද්දේ සුළු අපනයන භෝග ගොවීන්ට සහනාධාර විධියට රුපියල් මිලියන 1,200ක් අපි ලබා දුන්නා. ලෝකයේ හොඳම කහ අපේ රටේ වැවෙන්නේ. නමුත්, පසුගිය කාලය පුරාම අපි කහ ටිකත් ඉන්දියාවෙන් ගෙනාවේ. අපි ඒක නතර කරලා, දේශීය ගොවියා කෙරෙහි විශ්වාසය තියලා සහනාධාර දීලා, මහ කන්නයේ අස්වැන්න එනකොට කහවලින් රට ස්වයංපෝෂිත කරන්න කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ කර්මාන්ත කඩා හැලෙන්න වැඩ කළේ පසුගිය ආණ්ඩුවයි. සීනි කර්මාන්තශාලා විකුණන තත්ත්වයට පත් කළා. මිලියන 1,400ක් පාඩු කරලා තිබුණා. අපි ඒ පාඩුව පියවලා ලාභ ඇති කළා. රටින් එතනෝල් ගෙනාපු එකත් අතිගරු ජනාධිපතිතුමා නතර කරලා, මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් නිෂ්පාදන අපි ඇති කරලා තිබෙනවා. ඒක නිසා අපේ ආණ්ඩුව කෘෂි කර්මාන්තයට විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. පොහොර සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන බව අපි දන්නවා. අපි ඒ ප්‍රශ්නයත් විසඳනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල ගුරු-විදුහල්පති වැටුප් පිළිබඳ ලොකු ප්‍රශ්නයක් තිබුණා. ඒ ප්‍රශ්නය එතැනට ගේන්න පොදුජන පෙරමුණේ අපේ වෘත්තීය සමිතිය තමයි ඒ ඉල්ලීම ඉල්ලුවේ. ගුරු-විදුහල්පති වැටුප් වැඩි කිරීම වෙනුවෙන් අපේ ආණ්ඩුව මිලියන 30,000ක් මේ අය වැයෙන් ලබන අවුරුද්දට වෙන් කර දීලා තිබෙනවා. එතකොට අය වැයෙන් නොවෙයි ද මේක කෙරෙන්නේ? මේ අය වැයෙන් තමයි ඒක කෙරෙන්නේ. ඒ වාගේම, ගම්බද සතොස සහ සමුපකාර තිබුණාට ගමේ ජනතාවට සහන මිලට හරියට බඩු බෙදා ගන්න ක්‍රමවේදයක් තවම නැහැ. මම කිව්වා, ලෝක වෙළෙඳ පොළේ කොච්චර සීනි මිල වැඩි වුණත් ලංකා සීනි සමාගම නිෂ්පාදනය කරන සීනිවල මිල වැඩි කරන්නේ නැහැ කියලා. අදටත් සතොස, සමුපකාර රුපියල් 125කට සීනි කිලෝග්‍රෑම් එකක් දෙනවා. හැබැයි, හැම තැනම සතොස සහ සමුපකාර නැහැ කියලා අපි දන්නවා. ඒ නිසා බැසිල් රාජපක්ෂ මැතිතුමා අය වැය හරහා ග්‍රාම ආර්ථිකය නංවන්න ග්‍රාම නිලධාරි වසමකට එක ගානේ අලුතින් Budget Shops 15,000ක් ඇති කරන්න මුදල් වෙන් කර දීලා තිබෙනවා. අපි ඒකෙන් බලාපොරොත්තු වෙනවා, ගමේ ජනතාවට සහන මිලට තෝරා ගත්ත භාණ්ඩ කීපයක් ලබා දෙන්න. ඒ වෙනුවෙන් මේ වාගේ විශාල මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවින්ද ජයවර්ධන අපේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වා, ඊයේ උද්ඝෝෂණයට මිනිස්සු 7,500ක් විතර කොළඹට ගෙනාවා කියලා. විපක්ෂ නායකතුමාට පසුගිය ජනාධිපතිවරණයේදී ලක්ෂ 54ක් ඡන්දය දුන්නා. හැබැයි, උද්ඝෝෂණයට ගේන්න පුළුවන් වුණේ 7,500කටත් වඩා අඩු ගණනක්. *[බාධා කිරීම්]* දැන් තමුන්නාන්සේලා කෑ ගහනවා. *[බාධා කිරීම්]* කෑ ගහන්නේ නැතිව පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ.

තමුන්නාන්සේලා බස් 500 ගෙනාවත් එක බස් එකක මිනිස්සු 25 ගණනේ මිනිස්සු 12,500යි. ඔබතුමන්ලාට පනස්හතර ලක්ෂයක් ඡන්දය දීපු එකෙන් 12,500ක් ගෙනැල්ලාද ආණ්ඩු

පෙරළන්න කථා කරන්නේ? අපි එදා ගාලු මුවදොර පුරවනවා කිව්වා; පුරවලා පෙන්නුවා. අපි නුවර ඉඳලා කොළඹට එනවා කිව්වා; ඇවිල්ලා පෙන්නුවා. තමුන්නාන්සේලා පොලීසිය දාලා එදා අධිකරණ කීයකට ගියාද? හැම අධිකරණයකටම ගියා. හැබැයි, අපි එදා කොළඹට ආවා. ඔය වාගේ ඇඬුවේ නැහැ. හිරේ දානවා කිව්වත් අපි වැඩේ කළා. තමුන්නාන්සේලා නහයෙන් අඬනවා. විපක්ෂයේ ඉඳගෙන නහයෙන් අඬලා කියනවා, "අනේ, පොලීසිය දාලා. අපේ සිරිකොතේ හිටපු පොලීසිය නේ දැන් ඉන්නේ" කියලා. එහෙම නම්, ඒ කාලයේ සිරිකොතේ පොලීසිය තියාගෙන හිටියා නම් වැරැදියි නේ. ඒ කාලයේ වැරැදි වැඩක් නේ කරලා තිබෙන්නේ. පොලීසිය භාර හිටපු ඇමති කියනවා, එදා පොලීසියේ අය හිටියේ සිරිකොතේ ලු. ඒ කියන්නේ රනිල් මහත්තයාට ගහන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කාර්යභාරය කර ගන්න, ප්‍රශ්නයක් නැහැ. ඡන්දය දිනන හැටි ඡන්දය තිබෙන කාලයට බලමු. අපේ රජය රටේ ජනතාවට කරන්න තිබෙන වැඩ කොටස නොපිරිහෙලා ඉෂ්ට කරනවා.

ආණ්ඩුව ගත්තු දවසේ ඉඳලා කොවිඩ් එකත් එක්ක ජීවත් වෙන්නයි අපට සිදු වුණේ.

මෙවර අය වැය කථාවේදී බැසිල් රාජපක්ෂ මැතිතුමා වැවිලි ක්ෂේත්‍රය නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 10,000ක් අපේ අමාත්‍යාංශයට වෙන් කරලා දුන්නා. අපි බලාපොරොත්තු වෙනවා, වැවිලි ක්ෂේත්‍රයේ ඉන්න ජනතාවට ලබන අවුරුද්දේ විශාල සහන රාශියක් ලබා දෙන්න; ඒ අයට ජලය නැත්නම් ජලය ලබා ගන්න අවශ්‍ය ක්‍රමවේදය සකස් කරලා දෙන්න; සියලු පැළ වර්ග ජනතාවට නොමිලේ ලබා දෙන්න. ඒවා නොමිලේ ලබා දෙනවා වාගේම ඉඩම් සකස් කර ගන්නත් අපි මුදලක් ලබා දෙනවා. පසු ගිය 2019 අවුරුද්දේ සුළු අපනයන භෝගවලින් මේ රටට විදේශ විනිමය ගෙනැල්ලා තිබුණේ රුපියල් මිලියන 63,000යි. පසු ගිය මාසයේ 30වැනි දා වෙන කොට මිලියන 82,000ක් ගෙනැල්ලා තිබෙනවා. දෙසැම්බර් 31වන විට අපි මිලියන ලක්ෂයක් මේ රටට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. රටට අවශ්‍ය කරන ඩොලර් ප්‍රමාණය සුළු අපනයන භෝගවලින් අපි මේ රටට ගෙනෙනවා. ජනාධිපතිතුමාගේ දැක්ම, අගමැතිතුමාගේ දැක්ම, මුදල් ඇමතිතුමාගේ දැක්ම රටට වැඩියෙන් ඩොලර් ගෙන එන එක නම්, අපේ අපනයන භෝග වගාව දිරිමත් කරලා ඒ හරහා ඩොලර් ගෙනෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමාගේ කථාවේදී කිව්වා, අය වැයෙන් සල්ලි වෙන් කරලා තිබෙන්නේ පාලම් හදන්න, බෝක්කු හදන්න, පාරවල් කාපට් කරන්න කියලා. *[බාධා කිරීමක්]*

මගේ දිස්ත්‍රික්කයේ මගේ ආසනයේ විතරක් මේ වෙන කොට පාලම් හතක් හදලා තිබෙනවා. 2003 අවුරුද්දේ ගෙදගල පාලම කැඩිලා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදටත් ඒ ගමේ මිනිසුන්ට යන්න විධියක් නැහැ. ඒ පාලම හදලා දෙන්න සල්ලි වෙන් කරලා දීලා තිබෙනවා. මම ගිය සතියේ ඒ ගමට ගියා, පාර හදලා දෙන්න. ඒ රත්නපුර දිස්ත්‍රික්කය වෙන් වෙන තැන. අද ඒ මිනිසුන් යන්නේ අපේ දිස්ත්‍රික්කයට නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයට. ඒ ගමේ මිනිසුන්ගෙන් මම ඇහුවා, මුජිබුර් මන්ත්‍රීතුමා කියන 'පාරවල් ඕනෑ නැහැ කියන එක තමුන්නාන්සේලාට වටිනවාද' කියලා. *[බාධා කිරීමක්]* කොළඹ අයට පාරවල් ඕනෑ නැති වුණාට ගමේ මිනිසුන්ට පාලම්, බෝක්කු, පාරවල් ඕනෑ. කොළඹ ඉන්න තමුන්නාන්සේලාට අවශ්‍ය නැති වුණාට, ගමේ ඉන්න අපේ මිනිසුන්ට ඕනෑ. ඒකට තමයි -

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, කොන්ක්‍රීට් එකට උඩින් කාපට් දාන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේ එක්කගෙන ගිහිල්ලා පෙන්වන්නම්, අපේ පැත්තේ තිබෙන පාරවල්. ඔබතුමන්ලාට පාලම් ඕනෑ නැති වුණාට රත්නපුරයේ අයට ඕනෑ. තලතා අතුකෝරල හිටපු ඇමතිතුමියගෙන් අහන්න. එතුමිය දන්නවා, ගංවතුරට කැඩිච්ච පාලම්. *[බාධා කිරීමක්]*

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා පාරවල් ගැන කථා කරනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට අවුරුදු දෙක, තුනකට කලින් කොන්ක්‍රීට් දමපු පාරවල් කඩලා ඒක උඩින් කාපට් දමනවා; අපරාධ කරන්නේ.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
"ගම්පෙරළිය" වැඩසටහන යටතේ හොරා කාපු පාරවල් තිබෙනවා. ඒවා කැඩිච්ච පාරවල් නිසා අලුතින් හදන්න ඕනෑ. හරියට වැඩ කරලා නැත්නම් ඒවා කඩලා දාන්න ඕනෑ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

එතුමා කිව්වා, මම කියපු පාලම් කථාවක් ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ මේකයි. කෝටි ගණනක් වියදම් කරලා, කොම්පඤ්ඤ වීදියේ රේල් ගේට්ටුව තිබෙන තැන උඩින් ගිහිල්ලා බහින්න පුළුවන් විධියේ පාලමක් දමනවා. එහෙම පාලමක් කොම්පඤ්ඤ වීදියට අවශ්‍ය නැහැ. ඒ ප්‍රදේශයේ traffic එක වැඩියි කියලා කෝච්චිය-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමා කථාව කෙටියෙන් අවසන් කරන්න.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පාලම හදන එක එතුමාට අවශ්‍ය නැතුව ඇති. හැබැයි, රටට අවශ්‍යයි. අපේ මහාමාර්ග අමාත්‍යාංශයෙන් රටට විශාල වැඩ කොටසක් කරනවා. මේ අය වැයෙන් 2022 අවුරුද්දේ මේ රටේ ජනතාවට අපි විශාල වැඩ කොටසක් කරලා පෙන්වන්නම්. තමුන්නාන්සේලා එදා 100ක්, 200ක් ගෙනාවට, ඕනෑ නම් අපි නැවත ගෝල් ෆේස් එක පුරවලා පෙන්වන්නම් කියමින්, මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Mrs.) Rajika Wickramasinghe. You have eight minutes.

[අ.භා. 2.50]

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ රාජ්‍යයන්වලට මෑත ඉතිහාසයේ මුහුණ දෙන්නට සිදු වූ ඉතා දරුණු අර්බුදය තමයි කොවිඩ් ව්‍යසනය. එම ගෝලීය වසංගතය නිසා ඇති වූ දැඩි අභියෝගවලට නිර්භයව මුහුණ දෙමින්, මේ අවදානම් තත්ත්වය හමුවේ වුවද රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගත වෙමින් අන් කවරදාකටත් වඩා ජනතා හිතවාදී අය වැයක් 2022 වසර සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම තුළ, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පූර්ණ ආශිර්වාදය තුළ, අපේ රජයේ වත්මන් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය සම්බන්ධයෙන් කථා කිරීමට ලැබීම ගැන මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම සතුටු වනවා.

කොවිඩ් වසංගතය තුළ රටේ ආර්ථිකය කඩා වැටිලා දැඩි බලපෑමක් රටට එල්ල වුණත්, රටේ ජනතාවගේ ආර්ථිකය වාගේම, රටේ යටිතල පහසුකම් වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරමින් අපේ නව මුදල් අමාත්‍යතුමා මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙනවා. රටේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරනවා කියන්නේ, රටේ ආර්ථිකයට ලොකු ශක්තියක් ලබා දීමක්. එතුමා ජනතාවගේ ආර්ථිකය ගොඩනංවන වැඩ පිළිවෙළට විශාල දායකත්වයක් මෙවර අය වැයෙන් ලබා දීම ගැන විශේෂයෙන්ම අපි සතුටු වනවා. විශේෂයෙන් පාසල් වෑන් රථ, පෞද්ගලික බස් රථ හා ත්‍රිරෝද රථ හිමියන්ට කොවිඩ් වසංගතය නිසා පසුගිය කාලයේ ආදායම් අහිමි වුණා. ඒ ජනතාව ගැන සිතා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ මේ අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. ඔවුන්ට මේ අය වැය හරහා විශේෂ උදවු උපකාර කරන්න, වරප්‍රසාද ලබා දෙන්න, අහිමි වූ ආදායමට ශක්තියක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

ලෝක ආර්ථිකය කඩා වැටී, අපේ රටත් මේ ගත කරන්නේ අමාරු කාල වකවානුවක වුණත්, දශක දෙකහමාරකට ආසන්න කාලයක් විසඳීමට නොහැකි වූ ගුරු වැටුප් ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න අපේ වත්මන් මුදල් ඇමතිතුමා කටයුතු කර තිබෙනවා. එතුමා විශේෂයෙන් සඳහන් කළා, අපේ රජය යටතේ බඳවාගත් උපාධිධාරීන් 53,000ක් පිළිබඳව. ඒ රැකියාලාභීන් ස්ථිර කිරීමේ වැඩ පිළිවෙළ එතුමා මේ අය වැය තුළින් ඉදිරිපත් කළා. ඒ උපාධිධාරීන්ගේ රැකියා ස්ථිර කරන්න අද සැලසුම් කර තිබෙනවා. ඒවා ක්‍රියාවට නංවන්න යෝජනා එතුමා ඉදිරිපත් කර තිබෙනවා.

ඒ වාගේම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පළාතේ සංවර්ධන වැඩකටයුතු වෙනුවෙන් අවුරුද්දකට වරක් ලැබෙන ඒ මුදල මෙවර අය වැයෙන් වැඩි කර තිබෙනවා. ඒ ගැන අපි විශේෂයෙන්ම ස්තුතිය පුද කරන්න ඕනෑ. ජනතාවගේ සහ තම ප්‍රදේශවල යටිතල පහසුකම් නඟා සිටුවන්න අපට පසුගිය අවුරුද්දේ දුන්නාට වඩා මිලියන 5ක් වැඩි කර දෙන්න මෙවර යෝජනා කර තිබෙනවා.

පළාත් පාලන කොට්ඨාස 4,917න් එක් කොට්ඨාසයකට මිලියන 4 බැගින් ලබා දෙන්නත්, ඉතා කුඩා පරිපාලන ඒකකය වන 14,021ක් වූ හැම ග්‍රාම නිලධාරි වසමකටම ප්‍රදේශයේ සංවර්ධන වැඩකටයුතු වාගේම, ජීවනෝපාය සංවර්ධනය වැඩිදියුණු කරන වැඩ පිළිවෙළකට මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මම හිතන්නේ, අපේ ඉතිහාසයේ නගර සංවර්ධනය ගමට ගෙනාපු යුගය නැවත ශක්තිමත් කරන්න හොඳ අවස්ථාවක් මේ යෝජනාව හරහා ඉදිරිපත් වෙලා තිබෙනවා කියලායි.

ගමත්, නගරයත් එකතු කරමින්, ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවන්න පුළුවන් ආකාරයට මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා තිබුණාටත් වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන තව තවත් ජනතාව අතරට ගෙන යන්න කටයුතු කරලා තිබෙනවා. ගම්වල පාරවල් ටික සෑදීම අපේ ආර්ථිකයට ලොකු පිටුවහලක් වෙනවා. ඒ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම ගැන අතිදුෂ්කර ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් විධියට අපි විශේෂයෙන්ම සතුටු වෙනවා. ඒ යෝජනා සම්බන්ධයෙන් අපි අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා. මොකද, යටිතල පහසුකම් දියුණු කරන්න ඕනෑ. විශේෂයෙන් කෑගල්ල දිස්ත්‍රික්කය කියන්නේ, කෘෂිකර්මාන්තයට වැඩි නැඹුරුතාවක් තිබෙන දිස්ත්‍රික්කයක්. තේ, රබර් ආශ්‍රිතව ජීවනෝපාය ගෙන යන පිරිසක් විධියට, ප්‍රවාහන කටයුතු සඳහා පාරවල් වැඩි දියුණු කර ගැනීමේ දැඩි අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඒ අවශ්‍යතා වෙනුවෙනුත්, රටේම මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහාත් විශාල මුදල් කන්දරාවක් වෙන්කර තිබීම ගැන අපි නැවතත් ස්තුතිවන්ත වෙනවා.

ගර්භිණී කාන්තාවන් වෙනුවෙන් දෙන පෝෂණ මල්ල ලබා දෙන කාලය වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. ගමේ ආර්ථිකය ගොඩ නඟන්න, ගම් තුළ ව්‍යාපාරිකයන් සහ ව්‍යවසායකයන් බිහි කරන්න විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. වෙනත් අවුරුදුවලට වඩා මේ අවුරුද්ද තුළ ව්‍යාපාර නඟා සිටුවන්නත්, ස්වයං රැකියා වෙනුවෙනුත් විශාල මුදල් කන්දරාවක් වෙන් කරලා තිබෙන මේ අවස්ථාවේදී මම යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ වෙනුවෙන්ම දෙපාර්තමේන්තුවක් පිහිටුවා කටයුතු කිරීම නිසා මේ කටයුතු ක්‍රමවත් ආකාරයෙන් සිදු කරන්න පුළුවන්. ඒ වාගේම ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැලෙන පිරිස මනාව හඳුනා ගැනීමට අවස්ථාව ලැබීම තුළ, වෙන් කර ඇති මුදල් ප්‍රතිපාදනවලින් ජනතාවට නිසි ආකාරයෙන් ප්‍රතිලාභ ලබා දෙන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම තවත් පිරිසක් ඒ ගොන්නට එකතු කර ගන්න හැකියාව ලැබෙනවා. ඒ තුළින් තවත් අලුත් පිරිසක් හඳුනාගෙන, ආර්ථිකයට තවත් දැවැන්ත ශක්තියක් ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් ගොඩ නඟා ගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

මෙවර අය වැයෙන් ජනතාවගේ සහ ගමේ ආර්ථිකය ගොඩ නඟන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා වාගේම කෘෂිකර්මාන්තය වෙනුවෙනුත් විශාල මුදල් කන්දරාවක් වෙන් කර තිබෙන්නේ සැබෑ ලෙසම මේ රටේ දේශීයත්වයට මුල් තැන දෙමින් සහ කඩා වැටුණු ආර්ථිකයට දේශීයත්වය හරහා දේශීය කෘෂිකර්මාන්තය හරහා ශක්තියක් දීම සඳහායි. ඒ හරහා විශාල වශයෙන් ආදායමක් උත්පාදනය කර දිය හැකි ආකාරයේ වැඩ පිළිවෙළක් සඳහා මෙවර අය වැයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. එම වැඩ පිළිවෙළ දියත් කිරීමේදී වගකිව යුතු විපක්ෂයක් විධියට සහයෝගය දිය යුතු අවස්ථාවක් මේක. එහෙම නැතුව වගකීම් රහිත විපක්ෂයක් විධියට පාරට බැහැලා කෑ ගහන එක නොවෙයි, මේ මොහොතේ කළ යුත්තේ.

රටට ආදරේ නම්, ඔබ නියෝජනය කරන ජනතාවට ආදරේ නම්, ඒ ජනතාව වෙනුවෙන් මේ මොහොතේ කළ යුත්තේ මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න, කොවිඩ් වසංගතය නිම කරන්න රජය ගන්නා වැඩ පිළිවෙළට ඔබේ සහයෝගය ලබා දීමයි. එහෙම නැතුව මේ වසංගතය තව තවත් ව්‍යාප්ත කිරීම නොවෙයි කළ යුත්තේ. රටට ආදරය කරන ජනතා නියෝජිතයන් නම් අපි ඒ කාර්යය තමයි මේ මොහොතේ කළ යුතු වන්නේ. කවුරු කොහොම කිව්වත්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ යථාර්ථයක් බවට පත්

කරන්න පුළුවන් හොඳ අය වැයක් 2022 වසර සඳහා යෝජනා කරලා තිබෙනවා. මෙහි අඩු පාඩු තිබෙන්න පුළුවන්. විපක්ෂයක් විධියට ඔබත් ශක්තිමත්ව ගොඩ නැඟෙන්න ඕනෑ නම්, මේ අය වැය තුළ යම් අඩු පාඩුවක් තිබෙනවා නම් පෙන්වා දීම සහ එකතු වෙන්න ඕනෑ තවත් දේවල් තිබෙනවා නම්, ඒවා එකතු කිරීම තමයි කළ යුතු වන්නේ.

ගමේ ජනතාවගේ ජීවිත ගොඩ නඟන්න පුළුවන් හොඳ අය වැයක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ නවක මන්ත්‍රීවරියක් විධියට ඒ සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මූලාසනාරූඪ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අය වැය ලේඛනය කියන්නේ, රජයේ ඉදිරි වියදම් සහ ආදායම් පිළිබඳ වැඩ පිළිවෙළ ඇතුළත් ලියවිල්ල. නමුත් අපට නම් එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ, වචන හරඹයක් මිසක්. ආදායම හා වියදම අතර විශාල පරතරයක් තිබෙනවා. ආදායම වාගේ දෙගුණයක වියදමක් තිබෙන අය වැයක් ගැන තමයි අපට අද කථා කරන්න සිදු වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ බරපතළ වසංගතයක් තිබෙනවා. ඒ බරපතළ වසංගත තත්ත්වය තුළ අපේ රටේ විදේශ සංචිත තව මාසයක්-දෙකක් වාගේ බොහොම කෙටි කාලයකට සීමා වෙලා තිබෙනවා. බොහොම අමාරු අවස්ථාවක තමයි අපි ඉන්නේ.

ඉතින් මෙහිදී වග කිව යුතු රජයක් විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව. නමුත්, අපට පෙනෙන්නට නැහැ, ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ අල්ප මාත්‍රයක කල්පනාවක් ඔබතුමන්ලාට තිබෙන බවක්; ආහාර නිෂ්පාදනය වැඩිදියුණු කරගන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබෙන බවක්. ඔබතුමන්ලා තවදුරටත් කාබනික පොහොර ප්‍රතිපත්තියේම එල්බගෙන ඉන්නවා මිසක් ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ කිසිම අවධානයක් මේ අය වැය මඟින් යොමු කරලා නැහැ.

අපේ අපනයන ආදායම්, විදේශයෙන් අපට ලැබෙන ඩොලර් ලබා ගැනීමේ මාර්ග දවසින් දවස අවහිර කර ගන්නා තත්ත්වයක් තිබෙන්නේ. මේ පොහොර හිඟය නිසා තේ කර්මාන්තයටත් විශාල බලපෑමක් සිදු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන්, යොදන පොහොරවල වටිනාකම මෙන් නව ගුණයක ආදායමක් ලබා දෙන කර්මාන්තයක් තමයි තේ කර්මාන්තය. අපේ අපනයන ආදායම දවස ගණනේ අඩු වෙමින් යනවා. අපේ රටට ආදායම් ගෙනෙන තේ, පොල්, රබර්, සුළු අපනයන භෝග ඇතුළු වැවිලි භෝග සියල්ලෙන් ලැබෙන ආදායම් මාර්ග සියල්ල අද අවිනිශ්චිත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳ කිසිම වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනය තුළින් අපට දකින්න ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිරි වෙලා තිබෙන ඩොලර් ටිකෙනුත්, මහා පරිමාණයෙන් ගසා කෑමේ ව්‍යාපාර තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ. ණය ශ්‍රේණිගත කිරීම්වලින් අපේ රට පහළට ගිහින් තිබෙනවා. ඉන්ධන ටික ගෙනෙන්න LCs open කර ගන්න බැරිව අද උදය ගම්මන්පිල ඇමතිතුමා දඟලනවා. උදය ගම්මන්පිල ඇමතිවරයා සහ මේ ආණ්ඩුව දරන විදේශ ප්‍රතිපත්ති නිසා තමයි ඉන්ධන ටික ගෙනෙන්න බැරි තත්ත්වයකට අද අපේ රට පත් වෙමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව අද ආහාර අර්බුදයක ඉන්නවා; සෞඛ්‍ය අතින් විශාල අර්බුදයක ඉන්නවා. ආර්ථිකය තුළ විශාල මූල්‍ය අර්බුදයක් තිබෙනවා; විදේශ සංචිත අර්බුදයක් තිබෙනවා; නිෂ්පාදනය අතින් විශාල වශයෙන් අර්බුදයක් තිබෙනවා. දැන් ඉන්ධන නැහැ. ඉන්ධන නැහැ කියන්නේ, සියල්ල කඩා වැටෙනවා කියන එක. මේ ආර්ථික යාන්ත්‍රණය ඉන්ධන එක්ක බැඳිලා තිබෙනවා. ඉන්ධන නැත්නම් ප්‍රවාහනය අඩ පණ වෙනවා; විදුලිය විසන්ධි වෙනවා. මේ ආණ්ඩුවේ සෞභාග්‍යයේ දැක්මට පින් සිද්ධ වෙන්න තව මාසයකින් දෙකකින් අපේ රටේ ජනතාව කළුවරේ ඉන්න යුගයකට, කළුවරේ පෝලිම්වල ඉන්න යුගයකට දවස ගානේ ළඟා වෙමින් ඉන්නවාය කියන එක මම මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

ඒ වාගේම, අද මානව ශක්තිය අර්බුදයක. ජනතාවට ආහාර නැහැ. ජීවන වියදම ඉහළයි. බලශක්ති අර්බුදයක් තිබෙනවා. නමුත්, අපි අඳුරේ අතපත ගානවා. අද තිබෙන්නේ "රෝමය ගිනි ගනිද්දී නීරෝ වීනා වාදනය කරනවා වාගේ" තත්ත්වයක්. එවන් තත්ත්වයක් යටතේ ඉදිරිපත් කළ අය වැය ලේඛනයක් ගැන තමයි අද අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මේ සියලු ප්‍රශ්න තිබියදී මහා පරිමාණයෙන් දූෂණත් සිද්ධ වෙනවා. සීනිවලින් විතරක් රුපියල් මිලියන 15,900ක සහ නැනෝ යූරියාවලින් විතරක් රුපියල් කෝටි 800ක දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා. Pfizer, Moderna එන්නත් ඩොලර් 2කට, ඩොලර් 4කට ගෙනෙන්න පුළුවන්කම තිබියදී, Sinopharm vaccine එක ඩොලර් 15කට ගෙන්වනවා. සහල්, සිමෙන්ති, ගෑස්, Antigen Tests, PCR Tests, පොහොර ආදී සියල්ලෙන්ම ගසා කන ආණ්ඩුවක් තමයි මේ අර්බුදය මැද්දේ අපේ රටට ලැබිලා තිබෙන්නේ. හැබැයි මහා මාර්ග නම් හදනවා. අනෙකුත් මාර්ගත් හදනවා. ගම්වලට සල්ලි යවනවා. මෙච්චර අර්බුදයක් තිබෙන අවස්ථාවක සෞඛ්‍ය වෙනුවෙන් සල්ලි වෙන් කරන්නේ නැතිව පාරවල් හදන්න තිබෙන වුවමනාව මොකක්ද? අපට පෙනෙනවා, මේ තුළින් නිර්මාණය කරන්නේ තමන්ගේ ගම්වල ඉන්න ගෝල බාල හෙංචයියන්ට කීයක් හරි සොයා ගන්නට අවශ්‍ය පරිසරයයි කියලා.

කථාවක් තිබෙනවා නේ, "මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑය" කියලා. මේක, අපේ රටටත් මරණ තුනක් තිබෙන අවස්ථාවක්. දැන් කොවිඩ් නිසා අපේ ජනතාව මරණයට පත් වෙලා; අපේ ආර්ථිකය මරණයට පත් වෙලා; රටේ ස්වෛරීභාවය මරණයට පත් වෙලා. අපේ රටේ තිබෙන ජාතික උරුමයන් දවස ගානේ විකුණනවා. රටේ ආර්ථිකය මරණයට පත් වෙලා තිබියදී, ජනතාව මරණයට පත් වෙලා තිබියදී, රටේ භෞමික අඛණ්ඩතාව මරණයට පත් වෙලා තිබියදී තමයි මේ ගොල්ලෝ මේ පැණි කන්නේ. ඒ නිසා තමයි කියන්නේ, "මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑය" කියලා.

විශ්‍රාමිකයන්ගේ පාරිතෝෂිකය දෙන්න බැරි නිසා විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරනවා. රජයේ සේවකයන් මෙවර අය වැයෙන් සහනයක් බලාපොරොත්තුවෙන් සිටියා. නමුත්, ලැබුණේ නැහැ. ජීවන වියදම ඉහළ යනවා. ඒ

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

එක්කම, බඳු සහන බලාපොරොත්තුවෙන් සිටියා. ඒ මොකවත් ලැබුණේත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සෞඛ්‍ය ගැනත් කියන්න ඕනෑ. අද තිබෙන බරපතළ මාතෘකාවක් තමයි, සෞඛ්‍යය. පසුගිය අවුරුද්දේ සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරලා තිබුණා, රුපියල් බිලියන 301ක්. මේ අවස්ථාවේ වෙන් කරන්නේ, රුපියල් බිලියන 204 යි. පසුගිය අවුරුද්දට වඩා රුපියල් බිලියන 67ක් අඩුවෙන් තමයි, මෙවැනි අත්‍යවශ්‍ය වෙලාවක, සෞඛ්‍ය කියන කාරණය වැදගත්ම අවස්ථාවක සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ.

හැබැයි, ආරක්ෂක අමාත්‍යාංශයට? ආරක්ෂක අමාත්‍යාංශයට පසුගිය අය වැයෙන් වෙන් කළේ රුපියල් බිලියන 402යි; මෙවර අය වැයෙන් රුපියල් බිලියන 421 යි. ඔන්න, රුපියල් බිලියන 19ක් වැඩි කරලා! ඒක තමයි අපි කියන්නේ මේ ආණ්ඩුවට 'මක්දෑං' කියලා. දැන් අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කරන එකද, ආරක්ෂක ක්ෂේත්‍රය ශක්තිමත් කරන එකද? ඇත්ත තමයි, අපට මේක ගණන් ගන්න දෙයක් නැහැ. මොකද, මෙය vaccines වෙනුවට පැණි පොවපු ආණ්ඩුවක්, ආහාර සුරක්ෂිතතාව වෙනුවට ආහාර හිඟය මවන ආණ්ඩුවක්, අරපිරිමැස්ම වෙනුවට දූෂණය, ගසාකෑම කරන ආණ්ඩුවක්. මොළය මක්දෑං මේ ආණ්ඩුව, සෞඛ්‍ය සේවය ශක්තිමත් කළ යුතු මේ අවස්ථාවේ සෞඛ්‍ය සේවය පැත්තකින් තියලා ආරක්ෂක අංශ ශක්තිමත් කරන්න හදන එක ගැන අපි විශේෂයෙන් කනගාටු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විමල් වීරවංශ ඇමතිතුමා කථා කරනවා අපි දැක්කා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා තමයි, මේ රටේ ඉන්න මිනිස්සු හඳුන්වන්නේ. විමල් වීරවංශ ඇමතිවරයාට වේදනාවක් ඇති වෙලා අද උදේ එතුමා බොහොම හයියෙන්, සද්දෙට කථා කළා. ඊයේ තිබ්බ උද්ඝෝෂණය ගැන එතුමා බය වෙලා. සෞඛ්‍ය පිළිබඳ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා ලු. මම විමල් වීරවංශට කියන්නේ "දෙකේ මැන්" කියලා. මොකද, එතුමාට passports දෙකයි; හැඳුනුම්පත් දෙකයි; උප්පැන්න දෙකයි; දිව දෙකයි; මුහුණු දෙකයි; තව දෙකේ ඒවා ගොඩයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපි එතුමාට "දෙකේ මැන්" කියන්නේ. පාර්ලිමේන්තුවේ කෑ ගහන්නේත් "දෙක, දෙක! දෙක, දෙක!!" කියලා. දෙකේ මැන්ට අද ලොකු හිතේ අමාරුවක් ඇවිල්ලා. ඊයේ ඒ මර්දනය මධ්‍යයේ අපි නොවෙයි ඒ ජනතාව ගෙන්නුවේ. අපි ගෙන්නපු සෙනඟ පොලීසිය අතර මඟදී හරවා යැව්වා. හැබැයි, ඒ ජනතාව ආවේ ස්වකැමැත්තෙන්. ඒ ආවේ ආණ්ඩු පෙරළන්න නොවෙයි. ඒ ආවේ ජනතාවට ජීවත් වීමේ අයිතිය ඉල්ලන්න. විමල් වීරවංශ ඇමතිතුමා අද කිව්වා, මේ වාගේ අර්බුදයක් තුළ ඒ උද්ඝෝෂණය නිර්මාණශීලීව කරන්න තිබුණා කියලා. ඒ කොහොමද? එතුමා අර උද්ඝෝෂණය කළා වාගේද? හොරෙන් බිස්කට් කමින්, හොරෙන් නෙස්කැෆේ බොමින් මාරාන්තික උපවාසයක් කළා වාගේ මානුෂිකව, නිර්මාණශීලීව උද්ඝෝෂණය කරන්න කියලාද කියන්නේ? ඊළඟට, ද්විත්ව පුරවැසියන්ට එරෙහිව කෑගහලා ආයෙත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන් ආකාරයට නිර්මාණශීලීව දිව දෙකේ විධියටද අපට උද්ඝෝෂණය කරන්න කියන්නේ? දවල් මේ ආණ්ඩුවට බැණලා, දවල් ජනාධිපතිවරයා ඇතුළු මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළට බැණලා හැන්දෑවට ෂේප් වෙන ටෝක් එකක් දෙනවා වාගේ උද්ඝෝෂණයක් කරන්නද කියන්නේ? එක වෙලාවකට ෂොට් එකක් දෙනවා. අනෙක් වෙලාවට ෂේප් එකක් දෙනවා. එතකොට ෂොට් එකයි, ෂේප් එකයිද නිර්මාණශීලී වැඩසටහන? ඒ නිසා විමල් වීරවංශ ඇතුළු ඒ වාගේම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටිකක් මේකේ ඉන්නවා.- අපි කියනවා, කරුණාකර ආණ්ඩුවේ නම් ආණ්ඩුවේ ඉන්න; විපක්ෂයේ නම් විපක්ෂයේ ඉන්න කියලා. ආණ්ඩුවටයි, විපක්ෂයටයි දෙපැත්තටම කථා කරන දෙකේ මැන් කෙනෙක් වෙලා, දෙකේ කොළයට වැටිලා, දෙකයි පනහේ මිනිහෙක් වෙන්න එපා කියන එකත් මේ අවස්ථාවේදී අපි කියනවා.

ඒ එක්කම, සරත් වීරසේකර ඇමතිතුමාටත් මම කාරණයක් කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර තිහක් දෙන්න.

සරත් වීරසේකර ඇමතිතුමා අපට ලොකු උදව්වක් කළා. ඊයේ තිබ්බ අපේ උද්ඝෝෂණය පිළිබඳව එතුමා රට පුරා විශාල ප්‍රචාරයක් ලබා දුන්නා; හැම පාලමකම, හැම මංසන්ධියකම පොලීසියෙන් දමලා අපේ විරෝධතාව ගැන ජනතාවට ලොකු උත්තේජනයක් ලබා දුන්නා. ඒ නිසා අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ අස්සෙන් රිංගලා ආපු ජන ගඟකින් කොළඹ පිරුණා. සරත් වීරසේකර ඇමතිතුමාට ඒ ටික කියන ගමන්, සරත් වීරසේකර ඇමතිතුමාට හිතවත් පොලීසියේ ලොකු ලොක්කන්ට ඒක කියන ගමන් පොලීසියේ ඉන්න සුළු නිලධාරින්ට මම කියනවා, ඔබ මේ කඩේ යන්නේ ඔබගේ ගෞරවය කෙලෙසූ අමන දේශපාලකයන් රැළක් ආරක්ෂා කරන්නයි; ඔබ මේ කඩේ යන්නේ ඔබට මිරිස් කුඩු ගහපු අමන දේශපාලකයන් රැළක් ආරක්ෂා කරන්නයි කියලා. අපි ඒ පොලිස් නිලධාරින්ට කියනවා, ඔබ මේ කඩේ යන්නේ ඔබට පුටුවලින් නින්දිත විධියට ගහපු අමන දේශපාලකයන් රැළක් ආරක්ෂා කරන්නයි කියලා. අපි ඒ පොලිස් නිලධාරින්ට කියනවා, ගමේ සිටින, මේ අයගේ අන්තිම ඇම්බැට්ටයාටත් බාල්දු වෙන්න පුළුවන් පොලීසියක් නිර්මාණය කර තිබෙන බව. අද පොලිස් නිලධාරින්ගේ කොන්ද කඩලා තිබෙන්නේ. වැලි, මැටි, පස් ජාවාරම්වලට, කසිප්පු, එතනෝල්, කුඩු ජාවාරම් ආදි කිසි දේකට විරුද්ධව අද පොලිස් නිලධාරින්ට කටයුතු කරන්න බැහැ. පොලීසියේ කොන්ද කඩලා ඉවරයි. 2015 ආණ්ඩුව -අපි- ස්වාධීන කළ පොලීසිය අද සම්පූර්ණයෙන් දේශපාලනීකරණය කරලා ඉවරයි. සරත් වීරසේකර ඇමතිතුමාට විතරක් නොවෙයි, ගමේ ඉන්න, මේ ආණ්ඩුවට කත් අදින අන්තිම බත් බැළයාටත් අද

පොලීසිය නිවට වෙලා ඉවරයි. ඒ නිසා පොලීසියේ මහත්වරුන්ට අපි කියනවා, ඔබ ඊයේ වැළැක්වූයේ මේ රටේ ජීවත් වෙන්න අයිතිය ඉල්ලාගෙන ආ ඒ අහිංසක ජනතාවයි කියලා. ඔබ ඊයේ කටයුතු කළේ ඔබට මිරිස් කුඩු ගහපු, ඔබට පුටුවෙන් ගහපු, ඔබගේ නිල ඇඳුමට අගෞරව කරපු, පොලීසිය කෙලෙසපු අමන දේශපාලනඥයන් ආරක්ෂා කරන්නයි කියන එක මම මේ අවස්ථාවේදී කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ வியாழேந்திரன் அவர்கள்.

[பி.ப. 3.09]

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ச. வியாழேந்திரன் - பின்தங்கிய கிராம பிரதேச அபிவிருத்தி, வீட்டு விலங்கின வளர்ப்பு மற்றும் சிறுபொருளாதார பயிர்ச்செய்கை மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. S. Viyalanderan - State Minister of Backward Rural Areas Development and Promotion of Domestic Animal Husbandry and Minor Economic Crop Cultivation)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர்கள் அவர்களே, வரவு செலவுத்திட்டம் தொடர்பான இந்த விவாதத்தில் பேச வாய்ப்பளித்தமைக்கு மிக்க நன்றி. உண்மையிலே, கடந்த 2020ஆம் ஆண்டு மார்ச் மாதத்தில் இந்த நாட்டிலே இனங் காணப்பட்ட கொரோனா தொற்று முதலாம், இரண்டாம், மூன்றாம் அலைகளைக் கடந்து தற்போதும் நாட்டில் இடம்பெற்றுக்கொண்டிருக்கின்றது. இது எமது நாட்டுக்கு மாத்திரம் உரித்தான ஒரு பிரச்சினையல்ல, உலக நாடுகள் அனைத்துக்கும் பொதுவான ஒரு பிரச்சினையாகும். இதன் தாக்கத்தினால் அபிவிருத்தி அடைந்த வல்லரசு நாடுகள்கூடப் பொருளாதார ரீதியாகப் பாரிய நெருக்கடிகளுக்கும் பிரச்சனைகளுக்கும் முகங்கொடுக்கின்ற ஒரு சூழல் காணப்படுகின்றது. எமது நாடு ஓர் அபிவிருத்தியடைந்த நாடு அல்ல; அபிவிருத்தி அடைந்துகொண்டு வருகின்ற நாடு. ஆகவேதான் மிகப்பெரியதொரு பொருளாதார நெருக்கடியை நாமும் எதிர்நோக்கவேண்டிய சூழல் ஏற்பட்டது.

கடந்த ஆட்சிக் காலத்திலே இடம்பெற்ற மத்திய வங்கி நிதி மோசடி மற்றும் உலகப் பயங்கரவாதத் தாக்குதலைத் தொடர்ந்து, 2020ஆம் ஆண்டு மார்ச் மாதம் முதல் கொரோனா என்ற கண்ணுக்குத் தெரியாத நோய்க் கிருமியோடு போராடவேண்டிய ஓர் இக்கட்டான சூழ்நிலைக்கு நாம் தள்ளப்பட்டமை உங்களுக்குத் தெரியும். இவ்வாறு தொடர்ச்சியாக ஏற்பட்டு வந்ததான இந்த நெருக்கடிகளினால், குறிப்பாக இந்தக் கொரோனா தொற்றினால், எமது நாட்டின் சுற்றுலாத்துறை பாரிய வீழ்ச்சியைக் கண்டிருக்கின்றது. சுற்றுலாத் துறையினை நம்பியிருந்த 3.5 மில்லியன் மக்கள் தங்களுடைய தொழில் வாய்ப்புக்களை இழந்திருக்கிறார்கள். இவ்வாறான ஒரு சூழலில் எமது நாட்டைப் பொருளாதார ரீதியாகக் கட்டியெழுப்பவேண்டிய தேவை ஏற்பட்டிருக் கின்றது. அந்த வகையில் எமது கிராமங்கள் தன்னிறைவுடைய னவாக மாற்றியமைக்கப்பட வேண்டும். அவ்வாறு கிராமங்கள் தன்னிறைவு அடைகின்றபொழுதுதான் ஒரு நாட்டை அபிவிருத்தி சார்ந்த பாதையிலே நாம் வழிநடத்த முடியும். அந்த அடிப்படையில், முன்பு பொருளாதார அபிவிருத்தி அமைச்ச ராக இருந்த தற்போதைய நிதியமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள், பல துறைசார்ந்த நிபுணர்களினதும் பல தர மட்டங்களைச் சார்ந்தவர்களினதும் ஆலோசனைகளை உள்வாங்கி, அவற்றின் அடிப்படையிலும் அவருடைய சிந்தனையின் பிரகாரமும் உருவாக்கப்பட்ட இந்த வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்திருக்கின்றார்.

எமது நாடு ஒரு விவசாய நாடாக இருப்பதுடன், அதனோடு இணைந்து மீன்பிடி, கால்நடை, சிறு கைத்தொழில்கள் போன்றவற்றை உள்ளடக்கியதாகப் பல்துறை சார்ந்து காணப்படுவது உங்களுக்குத் தெரியும். இந்தச் சூழலிலே இப்பொழுது விவசாயத் துறை சார்ந்த அபிவிருத்தியை மேற்கொள்வதற்காகப் பாரியளவிலான நிதி ஒதுக்கப் பட்டிருக்கின்றது. சேதனப் பசளை தொடர்பான விடயம் உண்மையிலே ஒரு சவாலாகக் கருதப்பட்டாலும், ஆரோக்கிய மான ஒரு சமுதாயத்தைக் கட்டியெழுப்ப வேண்டும் என்ற உயரிய நோக்கத்தோடு, இந்த நாட்டிலே அடுத்த தலைமுறையாவது ஆரோக்கியமாக வாழவேண்டும் என்ற உயரிய நோக்கிலேதான் இந்த சேதனப் பசளை தொடர்பான விடயம் முன்மொழியப்பட்டு, இம்முறை வரவு செலவுத்திட்டத்திலே அதற்காகப் பாரியவிலான நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. அதனடிப்படையிலே, குறிப்பாகச் சேதனப் பசளை தொடர்பான விடயத்திலே நாட்டினுடைய ஜனாதிபதி கூடுதலான கவனத்தைச் செலுத்திவருவதன் பயனாகவும், அரசாங்கம் அதிலே கூடுதலான கவனத்தைச் செலுத்துவதன் பயனாகவும் இன்று நஞ்சற்ற களை நாசினியைப் பயன்படுத்துவதற்கு விவசாயிகளை ஊக்குவிப் பதற்காகச் சுமார் 4,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டிருக்கிறது.

அதுமாத்திரமல்ல, சேதனப் பசளைப் பாவனைக்காக, குறிப்பாக வயல்களில் களை பிடுங்குவதற்கும் விவசாயி களுக்கு ஏற்படுகின்ற மேலதிகச் செலவினை ஈடுசெய்யும் நோக்கில் நிவாரணம் வழங்குவதற்கும் 35,000 மில்லியன் நிதி ஒதுக்கப்பட்டிருப்பது என்பது மிகப் பெரிய விடயமாகும். அத்தோடு, புதிய விவசாயத் தொழில்நுட்பத்தை அறிமுகப் படுத்துவதற்காக ஒதுக்கீட்டுச் சட்டமூலத்தில் ஒதுக்கப்பட்ட ரூபாய் 17,005 பில்லியனுக்கு மேலதிகமாக மேலும் ரூபாய் 5,000 பில்லியன் நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆகவே, விவசாயத் தொழிற்றுறை சார்ந்து ஒரு பாரிய மாற்றத்தை ஏற்படுத்தவேண்டும் என்பதற்காக அரசாங்கம் இம்முறை வரவு செலவுத்திட்டத்திலே பாரியளவிலான நிதியை ஒதுக்கி இருப்பதனை நாம் பார்க்கக் கூடியதாக இருக்கின்றது.

நீர் வாழ் உயிரினங்கள் தொடர்பிலும் மீன்பிடித் துறை சார்ந்தும் அதிகளவிலான நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. அத்தோடு, கால்நடை வளத்துறை மேம்பாட்டுக்காகப் பாரிய அளவிலான கால்நடை உற்பத்திக்கும் ஒவ்வொரு மனைசார் பொருளாதாரத்தைக் கட்டியெழுப்புகின்ற வகையிலும் ஏற்கெனவே ஒதுக்கப்பட்ட தொகைக்கு மேலதிகமாக 1,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர்கள் அவர்களே, இந்த நாட்டிலே அதிகளவான தொழில் வாய்ப்புகளை வழங்கும்பொருட்டுக் கைத்தொழில் உற்பத்தி வலயங்களை உருவாக்குவதென்பது மிகவும் வரவேற்கத்தக்கதும் சிறப்பாகப் பாராட்டப்பட வேண்டியதுமான விடயமாகும். நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற எமது மட்டக்களப்பு மாவட்டத்தில்கூட சுமார் 265 ஏக்கரிலே இலங்கையின் முதலாவது ஆடைக் கைத்தொழில் பூங்கா அமைப்பதற்காக

[ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා]

நிதி ஒதுக்கப்பட்டு வேலைத்திட்டங்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. நான் நினைக்கின்றேன், வருகின்ற வருட இறுதிக்குள்ளே அதன் வேலைத்திட்டங்கள் முடிவுக்கு வருகின்றபோது, சுமார் 10,000க்கு மேற்பட்ட இளைஞர், யுவதிகளுக்கான வேலைவாய்ப்புகளைப் பெற்றுக்கொடுக்கக் கூடிய வாய்ப்பு இருக்கின்றது என்று.

கடந்த வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்ட தகவல் தொழில்நுட்பப் பூங்கா பற்றிய கருத்திட்டத்தை நடைமுறைக்குக் கொண்டுவருவதற்காக இலங்கையிலுள்ள 25 மாவட்டங்களிலே 5 மாவட்டங்கள் தெரிவுசெய்யப்பட்ட வேளையிலே, அவற்றுள் ஒன்றாக எமது மட்டக்களப்பு மாவட்டமும் தெரிவுசெய்யப்பட்டுள்ளது. அதற்காகச் சுமார் 10,000 மில்லியன் நிதி முதற்கட்டமாக 5 மாவட்டங்களுக்கும் ஒதுக்கப்பட்டுள்ளது.

அதுமாத்திரமல்ல, ஏற்றுமதி விவசாயப் பதனிடல் வலயம் யாழ்ப்பாணத்திலும், கிராமிய பொருளாதார உற்பத்தி வலயம் புல்மோட்டையிலும் வரவிருக்கிறது. அத்தோடு, திருகோண மலைத் துறைமுகத்தை industrial harbourஆக உருவாக்கு வதற்குமான அமைச்சரவைப் பத்திரமும் சமர்ப்பிக்கப் பட்டிருக்கின்றது. இவ்வாறான கைத்தொழில் உற்பத்தி வலயங்கள் வருகின்றபொழுது நாட்டிலே வேலைவாய்ப் பற்றிருக்கின்ற அதிகளவான இளைஞர், யுவதிகள் நிச்சயமாக வேலைவாய்ப்புகளைப் பெற்றுக்கொள்ள முடியும். அத்தோடு, புதிய உற்பத்தி முதலீட்டு வலயங்களிலே தனியார் முதலீடுகளைக் கொண்டுவருவதற்காக, குறிப்பாக அவர் களுக்கு அதற்கான ஆரம்பக்கட்ட வேலைகளைச் செய்து கொடுப்பதற்காக, அரசாங்கம் சுமார் 5,000 மில்லியன் நிதியை ஒதுக்கியிருக்கின்றது.

எமது நாடு விவசாயத்தில் தங்கியிருப்பதனால் சிறிய குளங்கள், அணைக்கட்டுக்களை அமைப்பதற்காக ஒதுக்கீட்டுச் சட்டமூலத்தில் 48,237 மில்லியனும் அதற்கு மேலதிகமாக 20,000 மில்லியனும் ஒதுக்கப்பட்டுள்ளது. 5,000 குளங்களைப் புனரமைக்கின்ற செயற்றிட்டத்தின்கீழ் 2021ஆம் ஆண்டிலே 1,050 குளங்கள் புனரமைக்கப்பட்டிருக்கின்றன. மேலதிகமாக இருக்கின்ற குளங்கள் நிச்சயமாகப் புனரமைக்கப்படும். அத்தோடு, எமது முன்மொழிவிலே கிழக்கு மாகாணத்திலே மட்டக்களப்பில் றூகம் - கித்துல் இணைப்பை நாங்கள் முன்னிலைப்படுத்தியிருக்கின்றோம். கிரான்புல் அணைக்கட்டு உட்படப் பல்வேறுபட்ட அணைக்கட்டுகளின் நிர்மாணத்தை முன்னிலைப்படுத்தியிருக்கின்றோம். எமது மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு 410க்கு மேற்பட்ட குளங்கள் காணப்படுகின்றன. அவற்றில் சுமார் 88 குளங்களை இந்த வருடத்தில் புனரமைப்புச் செய்திருக்கின்றோம்.

அத்துடன், "அனைவருக்கும் குடிநீர்" என்ற நிகழ்ச்சித் திட்டத்தின் ஊடாக இன்று நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்திலே உன்னிச்சைக் குடிநீர் நகர்ப்புறங்களை நோக்கிச் சென்றாலும், அதிகளவான கிராம மக்களுக்குக் கிடைக்காமல் இருந்தது. கடந்த ஆட்சிக் காலத்திலே நான் பல முன்மொழிவுகளைக் கொடுத்திருந்தாலும் அவை நிறைவேற்றப்படவில்லை. ஆனால், இன்று நாடளாவிய ரீதியிலே சுத்தமான குடிநீரை அனைவருக்கும் வழங்குகின்ற திட்டத்திற்கு 33,963 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்ற வேளையில், அதற்கு மேலதிகமாக 15,000 மில்லியன் ரூபாய் நிதி "அனைவருக்கும் குடிநீர்" என்ற அத்திட்டத்திற்கு ஒதுக்கப்பட்டிருப்பது வரவேற்கத்தக்க விடயமாகும்.

வீட்டுத் திட்டம் தொடர்பாகப் பார்க்கும்போது, கடந்த அரசுக் காலத்திலே தேர்தலை மையப்படுத்தி அவசர அவசரமாக ஒரு கிராமத்திலிருந்த மக்களை வேறு இடத்திற்குக் கொண்டுசென்று, 'கொத்தணி வீட்டுத் திட்டம்' என்ற அடிப்படையிலே அவர்களிடம் 2½ இலட்சம் ரூபாய் நிதியை வாங்கி, அந்த வீடுகளைக் கட்டியும் கட்டாமலும் விட்டு அவர்களைக் கடனாளிகளாக்கி அலைக்கழித்த சூழலிலே, இன்று அவர்களுடைய சொந்த வளவுக்குள் வீட்டுத்திட்ட அமைப்புக்காக, குறிப்பாகக் கிராமிய மட்ட வீடமைப்பு அபிவிருத்திக்காக 5,000 மில்லியன் ரூபாய் நிதியும் நகர்ப்புறங்களில் வாழுகின்ற வீடற்றவர்களுக்காக 2,000 மில்லியன் நிதியும் மேலதிகமாக ஒதுக்கப்பட்டிருப்பது வரவேற்கத்தக்க விடயமாக இருக்கின்றது.

வீதி அபிவிருத்தி தொடர்பாக எடுத்துக்கொண்டால், சகல கிராமங்களையும் உள்ளடக்கும்விதமாக நடைமுறைப்படுத்தப் படுகின்ற 100,000 கிலோமீற்றர் வீதி அபிவிருத்தித் திட்டத்தின்கீழ் இந்த வருடத்திற்குள் முடிவடைகின்ற 18,000 கிலோமீற்றர் வீதிகளுக்கு மேலதிகமாக, எதிர்வரும் ஆண்டு முதல் வருடத்தில் 25,000 கிலோமீற்றர் வீதம் வீதிகள் அபிவிருத்தி செய்யப்படவிருக்கின்றன. இதற்காக ஒதுக்கீடு செய்யப்பட்டுள்ள 260,000 மில்லியன் ரூபாய் நிதிக்கு மேலதிகமாக 20,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப் பட்டிருக்கின்றது. இவ்வாறு பல்வேறுபட்ட வேலைத் திட்டங்களை அடிப்படையாகக்கொண்டு இந்த வரவு செலவுத்திட்டம் தயாரிக்கப்பட்டுள்ளது.

அதேபோன்று, 1886ஆம் ஆண்டிலிருந்து பார்க்கின்ற போது, கிராமிய அபிவிருத்தி நிகழ்ச்சித்திட்டத்திற்காக இதுவரை ஒதுக்கப்படாதளவு பாரிய நிதி, அதாவது, 85,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. ஆகவே, இவை எல்லாவற்றையும் முடிந்தளவு நாட்டு மக்களுக்குக் கொண்டு செல்லும் அதேவேளையில், 3 தசாப்த காலமாக யுத்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்ற எமது மக்களுக்கு இருக்கின்ற தேவைகளை நிறைவேற்றும்வகையிலே இவற்றை நாம் அவர்களிடம் கொண்டுசேர்ப்பதற்கான பாரிய கடமையும் பொறுப்பும் எங்களுக்கு இருக்கின்றது என்று கூறி, வாய்ப்பளித்தமைக்கு மீண்டும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. K. Sujith Sanjaya Perera. You have 12 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon.Weerasumana Weerasinghe to the Chair?

**ගරු ෂෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

Sir, I propose that the Hon. Weerasumana Weerasinghe do now take the Chair.

**ගරු පියංකර ජයරත්න මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳ පොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - வெளிநாட்டு தொழில் வாய்ப்பு மேம்பாடு மற்றும் சந்தைப் பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Priyankara Jayaratne - State Minister of Foreign Employment Promotion and Market Diversification)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

[අ.භා. 3.19]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට මම පළමුකොටම ස්තුතිවන්ත වෙනවා. 2022 අය වැය ගැන කථා කරන්න ඉස්සෙල්ලා 2021 අය වැය සම්බන්ධව කථා කළොත් වඩා කාලෝචිතයි කියා මම හිතනවා. මොකද, මීට සමානුපාතික ක්‍රමයකට තමයි 2021දීත් අය වැය ඉදිරිපත් කළේ කියා අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒ ඉදිරිපත් කළ අය වැය යෝජනාවලින් සියයට 20ක්වත් මේ ආණ්ඩුවට සපුරා ගන්න පුළුවන්කම ලැබුණාද කියා අපි කල්පනා කර බලන්න ඕනෑ. ඒක තමයි අපට තිබෙන ලොකුම ප්‍රශ්නය. අවස්ථානුකූලව ඒ අය වැයෙන් යෝජනා කළ එක කාරණාවක් සම්බන්ධව මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මොකද, ඉටු නොකරපු කාරණා කිහිපයක්ම එහි තිබෙන නිසා. ඒ අතරින් ප්‍රධාන ලෙසම ගන්න ඕනෑ, තොරතුරු තාක්ෂණය සම්බන්ධ කාරණය. තාක්ෂණ ක්ෂේත්‍රය පුළුල් කිරීමට රුපියල් මිලියන 8,000ක් වෙන් කරන බව 2021 අය වැයේදී කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා රුපියල් මිලියන 8,000ක් වෙන් කළත් තොරතුරු තාක්ෂණය සම්බන්ධව, අන්තර්ජාල පහසුකම් සම්බන්ධව කිසිම වැඩ පිළිවෙළක් පසුගිය වකවානුව තුළ සිද්ධ කළේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඒකට හොඳම උදාහරණය අපි - තමුන්නාන්සේලා කවුරුත් දන්නවා.

පසුගිය කාලයේ පාසල් වසා දමා තිබෙන විට අවස්ථානුකූලව අපේ දරුවන්ට අන්තර්ජාලය පාවිච්චි කරලා අධ්‍යාපනය ලබා ගැනීමේ කටයුතු යෙදී තිබුණා. නමුත් අපි දන්නවා, ටික කාලයක් ඒක කරගෙන ගියත් අපේ දරුවන්ට ඒ සම්බන්ධව නොයෙකුත් ආකාරයේ දුෂ්කරතාවලට පත් වෙන්න සිදු වූ බව. 'ටැබ්' එකක් නැතිව, දුරකථනයක් නැතිව නොයෙකුත් ආකාරයේ අපහසුතාවලට අපේ ගම්බද දරුවෝ මුහුණපෑවා. මා නියෝජනය කරන ප්‍රදේශය විතරක් නොවෙයි, ලංකාවේ දුෂ්කර ප්‍රදේශ රාශියක දරුවන්ට නිසියාකාරව අන්තර්ජාල පහසුකම් ලබා ගන්න, තොරතුරු තාක්ෂණ දැනුම ලබා ගන්න පුළුවන්කමක් ලැබුණේත් නැහැ, අවස්ථාවක් ලැබුණේත් නැහැ. ඒ තත්ත්වය තුළ අධ්‍යාපනය පැත්තෙන් දරුවන්ට විශාල අසාධාරණයක් සිද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කාල සීමාවක් පාසල් වසා තබා නැවත විවෘත කළත්, ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව නිසා අපේ දරුවන්ට ලොකු අසාධාරණයක් වූ බවත් අපි දන්නවා. ඒකට හේතුව, ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය කලට වේලාවට විසඳන්න මේ රජය අපොහොසත් වීම. අවස්ථානුකූලව ගුරුවරුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, ගුරුවරුන්ගේ අභිමානය ආරක්ෂා කරන්න මේ රජයට නොහැකි වුණා. අන්තිමට ගුරුවරුන්ට වැටුප් ප්‍රශ්නය විසඳා ගන්න සිද්ධ වුණේ මහ පාරට ඇවිල්ලා. මේ විධියට ගුරුවරු වැඩ වර්ජනය කළ යුගයක් ගැන අපි මීට පෙර අහලා නැහැ. ඒ අය මේ විධියට පාරට ඇවිල්ලා වර්ජනය කළ, මේ විධියට උපවාස කළ අවස්ථා අපි දැකලා නැහැ. මේ තත්ත්වය ඉතා කනගාටුදායකයි. අපේ ගුරුවරුන්ට නොයෙකුත් අපහසුතා, නොයෙකුත් ප්‍රශ්න ඇති කිරීමෙන් පසු තමයි අද ඒ අයගේ වැටුප් ප්‍රශ්නය විසඳන්න කටයුතු කරලා තිබෙන්නේ කියන එකත් මම කියන්න ඕනෑ. අධ්‍යාපනය පැත්තෙන් අද ඒ අසාධාරණය සිද්ධවෙනවා.

විශේෂයෙන්ම බොහෝ අවස්ථාවලදී මේ අය වැය සම්බන්ධව කථා කරන කොට මේ ආණ්ඩුව නියෝජනය කරන බොහෝදෙනා කිව්වේ මොකක්ද? දේශීය ආර්ථිකය ගැන කථා කළා; හරිත කෘෂිකර්මය ගැන කථා කළා. ඒ වාගේම කාබනික පොහොර දාලා වස විසෙන් තොර කෘෂිකර්මයක් අපි මේ රටේ ඇති කරනවා, භෝග වගාවක් ඇති කරනවා කියලා තමයි ඔබතුමන්ලා පම්පෝරි ගැහුවේ. විශේෂයෙන්ම තමුන්නාන්සේලාට මතක ඇති, මහින්ද රාජපක්ෂ මහත්මයා මුදල් ඇමතිවරයා හැටියට පසු ගිය අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේදී කිව්වේ මොකක්ද කියලා. එතුමා කිව්වා, පොහොර මිටිය රුපියල් 1,500ට දෙනවා කියලා. තවත් තැනක එතුමා ප්‍රකාශ කරනවා, පොහොර ටික නොමිලේ ලබා දෙනවා කියලා. මට හිතාගන්න පුළුවන්කමක් නැහැ, මේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද, ඒ වාගේම කෘෂි කාර්මික ප්‍රතිපත්තිය මොකක්ද කියලා.

ඒ අය වැය ඉදිරිපත් කරලා මාස කිහිපයකට පසු ජනාධිපතිතුමා කිව්වා, සම්පූර්ණයෙන්ම රසායනික පොහොර අයින් කරන්න කටයුතු කරනවා කියලා. ආයෙත් ප්‍රකාශ කළා, අපි රසායනික පොහොර ගේන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලා දන්නවා, අද මේ රටේ කෘෂි කර්මාන්තයට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. පසුගිය කාල සීමාව තුළ අපට යල කන්නය වැඩ කරන්න, මහ කන්නය වැඩ කරන්න අවශ්‍ය පොහොර ටික ලබා දෙන්න කියලා ගොවියෝ උද්ඝෝෂණය කරමින් මහ පාරට ආවා. අපි දන්නවා, ඒ අවස්ථාවල ආණ්ඩුව කිසිම ප්‍රතිචාරයක් නොදැක්වූ බව.

වී වගාව විතරක් නොවෙයි. අපි නියෝජනය කරන ප්‍රදේශවල විශාල වශයෙන් තේ වගාව කරනවා. ඒ වාගේම උඩරට ප්‍රදේශවල එළවලු වගාව කරනවා. මේ හැම ගොවියෙක්ම උද්ඝෝෂණය කරලා කිව්වේ අපට කාබනික පොහොර හෝ රසායනික පොහොර ලබා දෙන්න කියලා.

නමුත්, පොහොර සම්බන්ධව ආණ්ඩුවට කිසිම ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. අපිත් කියනවා, කාබනික පොහොර ලබා දෙන්න පුළුවන් නම් හොඳයි, කාබනික පොහොරවලින් මේ වගාව කරන්න පුළුවන් නම් හොඳයි කියලා. නමුත්, ජනාධිපතිතුමා මෙවැනි තීරණයක් ගන්නකොට ජනාධිපතිතුමාට කිසිම ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ, වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ලෝකයේ කිසිම රටක් සියයට සියයක් කාබනික පොහොරවලට ගිහිල්ලා නැහැ. ඒ වාගේම එකපාරට මේක කරන්න

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

පුළුවන්කමකුත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අඩුම තරමින් අවුරුදු 10ක, 20ක සැලැස්මකට අනුවයි මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම කිසිම වැඩ පිළිවෙළක් නැතුව තමයි රසායනික පොහොර ගෙන්වීම එකවරම තහනම් කරන්න කටයුතු කළේ.

දැන් එහි ප්‍රතිඵල අපට දකින්න තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, මේ වනකොට කුඩා තේ වතු හිමියන් අසරණ වෙලා තිබෙන බව. ඒ වාගේම වී ගොවියෝත් අසරණ වෙලා. අද එළවලු මිල දිහා බලනකොට මෙහි ප්‍රතිඵල හොඳට අත්දකින්න තිබෙනවා. පසුගිය කාලයේ පැවැති උද්ඝෝෂණත් එක්ක නැවත වරක් රසායනික පොහොර ගෙනැත් දෙනවා කියලා දැන් අපට ආරංචි වෙලා තිබෙනවා. මම දන්නා තරමින් තේ සමාගම්වල නිලධාරි මහත්වරු හම්බ වෙලා කථා කළාට පස්සේ වැවිලි ඇමතිතුමා පොරොන්දු වුණා ලු, අනිවාර්යයෙන්ම රසායනික පොහොර ගෙනැල්ලා තේ වගාවට ලබා දෙනවා කියලා. ඒකෙන්ම තේරෙනවා, මේ තුළ කිසිම ප්‍රතිපත්තියක් නැහැ, කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියලා. පසුගිය කාලයේ ජනාධිපතිතුමා නිකුත් කරපු ගැසට් නිවේදන වාගේම තමයි, මේ කටයුත්තත්. ජනාධිපතිතුමා ගැසට් නිවේදන 10ක් විතර නිකුත් කළා. සහල් මිල සම්බන්ධයෙන් ගැසට් නිවේදන නිකුත් කළා; බඩු මිල අඩු කරන්න ගැසට් නිවේදන නිකුත් කළා. ඒ වාගේ නොයෙකුත් අවස්ථාවලදී ගැසට් නිවේදන නිකුත් කළාට ඒ ඒක ගැසට් නිවේදනයක්වත් ක්‍රියාත්මක කරන්න ජනාධිපතිතුමාට ශක්තියක් තිබුණේ නැහැ; හැකියාවක් තිබුණේ නැහැ. අපි ජනාධිපතිතුමාගෙන් බලාපොරොත්තු වුණේ ඒක නොවෙයි. හැටනව ලක්ෂයක ජනතාව හිතුවේ මොකක්ද? ජනාධිපතිතුමා ආවොත්, කෙළින් වැඩ කරන, නිලධාරින්, ව්‍යාපාරිකයන් ඇතුළු හැමකෙනාම පාලනය කරන හොඳ නායකත්වයක් ගෙනෙයි කියලා ජනතාව බලාපොරොත්තු වුණා. නමුත් දැන් තේරුම් ගිහිල්ලා තිබෙනවා, ජනාධිපතිතුමාට ඒක කරන්න බැහැ කියන එක. ඒක එතුමාම ප්‍රකාශ කරලාත් තිබෙනවා. ඒ වාගේම මේ කටයුතුවලිනුත් ඒක ඔප්පු වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මා මේ කාරණයත් කියන්න ඕනෑ. අද මේ තත්ත්වය උඩ වැවිලි ආර්ථිකය ගැන කථා කරන්න බැහැ. අද අපි බොහොම ලොකුවට කථා කරනවා, "Ceylon Tea" නාමය ගැන, තේ අපනයනයෙන් අපට විශාල මුදලක් ලබා ගන්න පුළුවන් වෙයි කියන කාරණය ගැන. ඒ වාගේම අපේ රටේ දැන් තිබෙන විදේශ සංචිත ප්‍රශ්නයට, විදේශ විනිමය ප්‍රශ්නයට එය ලොකු පිටුවහලක් කරගන්න පුළුවන් වෙයි කියලා නොයෙකුත් විධියේ කථා කියනවා. එම නිසා අපි තේ කර්මාන්තය වැඩිදියුණු කරන්න ඕනෑ කියලා කියනවා. නමුත් තමුන්නාන්සේලාගෙන් මම අහන්න කැමැතියි, පොහොර ටික ලබා නොදී තේ කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද කියලා. අද කුඩා තේ වතුහිමියෝ අන්ත අසරණ වෙලා තිබෙනවා. ඒ අයගේ අස්වැන්න අඩු වෙලා. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේවල මිලත් අඩු වෙලා තිබෙන බව අපි දන්නවා. මොකද, පසුගිය දවස්වල ගුණාත්මකභාවයෙන් යුක්ත තේ ටිකක් ලබා දෙන්න අපට පුළුවන්කමක් තිබුණේ නැහැ. තේ කර්මාන්තශාලා හිමියෝ ඉන්නවා නම්, ඒ සම්බන්ධ වැදගත් අය ඉන්නවා නම්, තත්ත්වය කොහොමද කියලා ඒ අය ප්‍රකාශ කරයි. අද තේ දල්ලේ ගුණාත්මකභාවයත් අඩු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තත්ත්වය තුළ අපි පැහැදිලිවම කියනවා, සම්පූර්ණයෙන්ම අපේ ආදායම් අඩු වෙන තත්ත්වයට දැන් පත් වෙලා තිබෙන බව. 2019දී අපි ආණ්ඩුව භාරදෙනකොට තේ කිලෝවක මිල රුපියල් 100ට ආසන්නව තිබුණේ. නමුත්, අද එය රුපියල් 85ට, 88ට, 89ට ගිහිල්ලා තිබෙනවා. ඒකෙන් මොකක්ද කියන්නේ? අපේ රටේ ජනතාවගේ ආදායම අහිමි වෙලා තිබෙනවා. අද අපි දන්නවා, මේ ආර්ථික ප්‍රශ්නත් එක්ක, අනෙකුත් දේවල් එක්ක නොයෙකුත් ආකාරයේ සට්ටන මධ්‍යයේ තමයි ගොවි ජනතාව ජීවත් වෙන්නේ කියලා. අපි අහන්නේ මේකයි. මේ තත්ත්වය උඩ තමුන්නාන්සේලා කල්පනා කර බලන්න ඕනෑ, අපි මේ ආර්ථිකය නඟා සිටුවන්න කථා කරන්නේ කොහොමද කියලා. වැවිලි ආර්ථිකය නඟා සිටුවන්න කථා කරනවා නම්, කෘෂිකර්මය පැත්තෙන් අපි ආහාර සුරක්ෂිතභාවය ගැන කථා කරනවා නම්, මේ වාගේ වැඩ පිළිවෙළක් තුළ අපේ ඉලක්කවලට යන්න අපට පුළුවන් වෙයිද? ඒ වාගේම අපි දන්නවා, ගෝලීය වශයෙන් මේ වසංගතයත් එක්ක නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න තිබෙන බව.

ඊට අමතරව වතු සමාගම් සම්බන්ධවත් මේ අවස්ථාවේදී කථා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ අර්බුදයත් එක්ක ඒ පැත්තෙනුත් තැළෙන්නේ වතු කම්කරුවන් බව අපි දන්නවා. ඔවුන්ටත් අද දැඩි ලෙස ප්‍රශ්න තිබෙනවා. මොකද, ඔවුන්ට නිසියාකාරව වැඩ ලැබෙන්නේ නැහැ. එම නිසා ඔවුන්ට නිසියාකාරව ආදායමක් ලබා ගන්න පුළුවන්කමක් නැහැ. මොකද, අද වතු සමාගම්වල ආදායම අඩු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා පසුගිය දවස්වල වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කරලා රුපියල් 1,000ක වැටුපක් ලබා දුන්නාට, ඒකෙන් අද වතු කම්කරු ජනතාවට නිසියාකාර ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. අපේ කාලයේදී වතු කම්කරුවන්ට රුපියල් 750ක් දුන්නා වුණත්, දින 25ක් වැඩ දුන්නා. නමුත්, අද එහෙම වැඩ දෙන්නේ නැහැ. ඔවුන්ට රුපියල් 1,000ක් දෙනවා. නමුත්, දින 15ක් විතරක් වැඩ දුන්නොත් මොකක්ද වෙන්නේ? රුපියල් 15,000යි, වතු කම්කරුවන්ගේ මාසික ආදායම. අපි එදා රුපියල් 750 ගණනේ වැටුප දීලා දින 25ක් වැඩ දුන්නා. එතකොට රුපියල් 18,750ක් වැනි මුදලක් ඒ අය වැටුප හැටියට ලබා ගත්තා. අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම අහිමි වෙලා තිබෙන බව මා කියන්න ඕනෑ.

වතු සමාගම්වල පාලනය පිළිබඳව කිව්වොත් අද වෘත්තීය සමිතිවලට ඉඩක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ වතු කම්කරුවනුත්, වතු වෘත්තීය සමිතිත්, වතු සමාගම් අතරත් සාමූහික ගිවිසුමක් කියලා එකක් තිබුණා. වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 1,000 දක්වා වැඩිවීමත් එක්ක වතු සමාගම් හිමියෝ සම්පූර්ණයෙන්ම මේ සාමූහික ගිවිසුමෙන් අයින් වෙන්න කටයුතු කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම වතු කම්කරුවන්ට යම්කිසි අසාධාරණයක් වුණොත්, ඒ වෙනුවෙන් කථා කරන්න අද වෘත්තීය සමිතිවලට හැකියාවක් නැහැ. මොකද, ඒ අයගේ සාමාජික මුදල් එකතු කරලා ඒ අදාළ කොම්පැනිවලින් යැවීමේ අවස්ථාව අද වන විට අහිමි වෙලා තිබෙනවා.

ඊට අමතරව, ඒ සාමූහික ගිවිසුම යටතේ විශේෂයෙන් වතු කම්කරුවන්ගේ welfare එක, ඒ කියන්නේ වතු කම්කරුවන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් ලොකු වැඩ කොටසක් වතු සමාගම්වලට පැවරිලා තිබුණා. අද ඒක ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ඉතින්, ඒ සම්බන්ධයෙන් රජයේ, විශේෂයෙන්ම කම්කරු අමාත්‍යාංශයේත්, ඒ වාගේම වැවිලි අමාත්‍යතුමාගේත් අවධානය යොමු වෙන්න ඕනෑ. එහෙම නැත්නම් වතු කම්කරු ජනතාව නොයෙකුත් ආකාරයට අසරණභාවයට ලක් වෙනවාය කියන එක මම කියන්න ඕනෑ. මොකද, ඒ අයට අසාධාරණයක් වුණොත්, පෙනී සිටින්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒක ඉතාම වැදගත්. ඒ පිළිබඳව මේ රජයේ අවධානය යොමු වෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

2022 අය වැය ගැන කථා කරනකොට අපි හුඟක් වෙලාවට කථා කරනවා, කොවිඩ් වසංගතයත් එක්ක ආපදාවට ලක් වුණු ක්ෂේත්‍රවලට යම් යම් සහන දීලා තිබෙනවා කියලා.

ඉලක්කම්වලින් ඒ සහන ලබා දුන්නාට, ඒවා ප්‍රායෝගිකව ලබා දෙන්න ගියාම නොයෙකුත් ආකාරයේ ගැටලු තිබෙනවා. හොඳම උදාහරණය තමයි, ත්‍රිවීලර් සඳහා වෙන් කළ මුදල. ඒ මුදල හරියට බෙදුවොත්, එක ත්‍රිවීලරයකට ලැබෙන්නේ රුපියල් 750යි. එවැනි සහන තමයි මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි අමතක කරපු පැත්තක් තිබෙනවා. විශේෂයෙන්ම අපි විදේශ විනිමය ගැන කථා කරනවා. විදේශ විනිමය ගේන්න සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑ කියලා කියනවා. සංචාරක ව්‍යාපාරයට සම්බන්ධවෙලා සිටින හෝටල් හිමියන්ට, ඒවායේ සේවය කරන සේවකයන්ට, ඒ මාර්ගෝපදේශක සේවය සැපයූ අයට, වාහන සැපයූ අයට මොකක්ද මේ අය වැයෙන් මොකක්ද දීලා තිබෙන සහනය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුද්ද පුරාම විවිධ සංවිධාන විසින්, ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධවෙලා සිටින හැම කෙනාම රජයෙන් ඉල්ලීම් කළා, අපට සහනයක් දෙන්න කියලා. අපි විශාල වශයෙන් බැංකු ණය අරගෙන තිබෙනවා, ඒ බැංකු ණයවලට සහනයක් දෙන්න කියලා ඉල්លුවා. නමුත්, ඒ එකක්වත් කෙරිලා නැහැ. මම දන්නා සංචාරක හෝටල් පවත්වාගෙන ගිය අය ඊයේත් මට කථා කළා. ඒ අය කියනවා, "අපි මේවා දියුණු කරන්න ණය අරගෙන තිබෙනවා. රජයෙන් මාස 6ක විතර ණය සහනයක් දුන්නා. නමුත්, පොලිය අය කරනවා. ඊට පස්සේ ඒ පොලියටත් තව පොලියක් අය කරනවා" කියලා. අද ඒ කටයුතු සම්පූර්ණයෙන් ඇණ හිටලා තිබෙනවා. එහෙම බැලුවොත්, සංචාරක ක්ෂේත්‍රයට මේ අය වැයෙන් කිසිම සහනයක් ලබා දෙන්න කටයුතු කරලා නැහැ කියන එකත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

මට අද කථා කරන්න තවත් කරුණු කාරණා රාශියක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අතර මට තව එක කාරණයක් කියන්න අවශ්‍යයි. අපි හුඟක් අවස්ථාවල පරිසරය ගැන කථා කරනවා. පරිසරය ගැන කථා කරනවා, වනාන්තර ගැන කථා කරනවා. ඒවා සම්බන්ධයෙනුත් වචනයක් කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම, ජනාධිපතිතුමා පරිසර කලාපයීය සමුළුවලට, කාලගුණ සමුළුවලට ගිහිල්ලා ප්‍රකාශ කළේ මොනවාද? "අපි මේ රටේ පරිසරය ආරක්ෂා කරනවා, වනාන්තර ටික ආරක්ෂා කරනවා" කිව්වා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය බලයට පත් වුණාට පස්සේ මේ අවුරුදු දෙක ඇතුළත තමයි වනාන්තරවලට, පරිසරයට කරන ලොකුම හානිය කළේ. උදාහරණයක් හැටියට කිව්වොත්, මම නියෝජනය කරන ප්‍රදේශය ගත්තොත්, එය තෙත් කලාපයට අයත් ප්‍රදේශයක්. විශේෂයෙන්ම යටියන්තොට, කෑගල්ල, ඒ වාගේම නුවරඑළිය දිස්ත්‍රික්කයට මායිම්ව ඇති ප්‍රදේශ වාගේ පරිසර සංවේදී කලාප හැටියට නම් කරපු ප්‍රදේශ තිබෙනවා. විශේෂයෙන්ම "යද්දෙස්ස" කියලා ප්‍රදේශයක් තිබෙනවා. කිසිම අනුදැනුමක් නැතුව, කාගේවත් අනුමැතියක් නැතුව, ඒ ප්‍රදේශයේ හෝටල් ව්‍යාපෘතියක් හදන්න දේශපාලන හයිය පාවිච්චි කරලා ඒ ඉඩම් සුද්ද කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම, "නෙලුවතුකන්ද" කියලා රක්ෂිතයක් තිබෙනවා. එම රක්ෂිතයේත් එවැනිම වැඩ කටයුතු සිද්ධ වෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව කලුපහනවත්තට උඩින් තවත් ප්‍රදේශයක් තිබෙනවා. ඒ ප්‍රදේශවල ලොකු පරිසර හානි අද සිද්ධ වෙනවා. ඒවා නවත්වන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. මේ කාරණා ගැන විවිධ තැන්වලදී මාධ්‍ය මඟින් අදහස් ප්‍රකාශ කරනවා, ඒ වාගේම ජනාධිපතිතුමා ලෝක සම්මේලනවලට ගිහිල්ලා ප්‍රකාශ කරනවා, "අපි, අපේ රටේ වනාන්තර ආරක්ෂා කරනවා, පරිසර සංවේදී ප්‍රදේශ ආරක්ෂා කරනවා" කියලා. ඒවා ඔක්කෝම කටින් විතරයි. තමන්ගේ දේශපාලන ගෝලබාල හෙංචයියන් තමයි ගිහිල්ලා ඒවා ඔක්කෝම විනාශ කරන්නේ. ඒ සම්බන්ධයෙනුත් රජයේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු පියංකර ජයරත්න මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.33]

**ගරු පියංකර ජයරත්න මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳ පොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - வெளிநாட்டு தொழில் வாய்ப்பு மேம்பாடு மற்றும் சந்தைப் பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Priyankara Jayaratne - State Minister of Foreign Employment Promotion and Market Diversification)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය දරුණු ආර්ථික අවපාතයකට සහ බිහිසුණු කොරෝනා වසංගතයට මුහුණ දී තිබෙන මෙවන් වකවානුවක අපේ රටේ 76වන අය වැය ලේඛනය, ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල අය වැය ලේඛනය ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව මා සතුටු වෙනවා.

වෙන කවරදාකටත් වඩා සමාජ ආර්ථික විෂමතා මෙන්ම, ස්වාභාවික හා පරිසර විපත් වැඩි වී තිබෙන අවස්ථාවක, විශේෂයෙන් කොරෝනා වසංගතය නිසා බිඳ වැටී ඇති ජන ජීවිත සාමාන්‍ය තත්ත්වයට පත් කර ගැනීම සඳහා අභියෝග රැසක් මැද සමබර අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

මුළු ලෝකයම තිරසර සංවර්ධනයක අපේක්ෂාවෙන් කටයුතු කරන මෙවන් යුගයක, ස්වාභාවික සම්පත්වලින් සහ ජෛව විවිධත්වයෙන් පොහොසත් වාසනාවන්ත රටක් වන අපේ මව්බිම තුළ දේශීය නිෂ්පාදිත ආර්ථිකයක් ගොඩනැඟීම අරමුණු කරගෙන ඉදිරිපත් කළ අය වැයක් ලෙස මෙය හඳුන්වන්න පුළුවන්.

විශේෂයෙන්ම දේශීය ව්‍යාපාරික ප්‍රජාව කෙරෙහි දැඩි විශ්වාසයකින් යුතුව ඔවුන්ට අවශ්‍ය පහසුකම් සපයමින් නිෂ්පාදන අංශය රටේ තීරණාත්මක අංශයක් බවට පත් කිරීමට හා ඒ තුළින් ආනයන වියදම් අඩු කර, අපනයන නිෂ්පාදන රටාවක් බිහි කිරීමට මෙම අය වැය තුළින් හැකි වෙලා තිබෙනවා.

පසුගිය යහපාලන රජය කාලයේ අපේ රටේ නිෂ්පාදනය කළ හැකි 700කට අධික භාණ්ඩ සංඛ්‍යාවක් ආනයනය කරමින් පිටරටවලට වසරක් පාසා ඇදී ගිය විදේශ විනිමය ප්‍රමාණය ඉතිරි කර ගැනීමේ අරමුණින් - *[බාධා කිරීමක්]* ඔබතුමියත් වග කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ පසුගිය කාලයේ භාණ්ඩ ආනයනය කිරීමට වසරක් පාසා ඇදී ගිය විදේශ විනිමය ප්‍රමාණය ඉතිරි කර ගැනීමේ අරමුණින් එම භාණ්ඩ බොහොමයක් දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අඩිතාලම දමා තිබීම නිසා රටේ ඉදිරිය යහපත් කර ගැනීමේ බලාපොරොත්තුවක් ඇති වෙලා තිබෙනවා කියන කාරණයයි.

මේ අය වැය තුළින් හඳුන්වා දී ඇත්තේ දිගු කාලීන ඉලක්කගත වැඩ පිළිවෙළක්. කෙටි කාලීනව අප හුරුපුරුදු වී සිටින ඕනෑ එපාකම් සපුරා ගැනීමේදී අපහසුතාවක් පෙනෙන්නට

[ගරු පියංකර ජයරත්න මහතා]

තිබුණත්, රටේ ඉදිරි පරම්පරාවට ශක්තිමත් රටක් ගොඩනැගිය යුතු නිසා ඒ සඳහා අද අපට යම්කිසි කැප කිරීමක් කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම රටට ආදරය කරන ජනතා අපේක්ෂා සැබෑ ලෙස සපුරාලීමට කැප වෙන විපක්ෂයේ ප්‍රගතිශීලී ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් රජයේ මෙම යහපත් වැඩ පිළිවෙළට සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලනවා.

ඒ වාගේම මේ වේලාවේ මතක් කළ යුතුයි, අපේ හිටපු ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය දේශීය නිෂ්පාදනය වැඩි කර රට ස්වයංපෝෂිත තත්ත්වයට පත් කර ගැනීමට උත්සාහ කළ අවස්ථාවේ එදාත් විපක්ෂයේ තමුන්නාන්සේලා විරුද්ධ වුණු බව. මතක නේ, ඇට අටක් පෙන්වා පෙන්වා ගිය හැටි.

එදා ඇට අටක් පෙන්වා රටේ මිනිසුන් නොමඟ යවා එම ක්‍රියාවලිය සම්පූර්ණයෙන් විනාශ කර දැම්මා. එහි ප්‍රතිඵල අදත් අපි අත්විඳිමින් ඉන්නවා. අපේ රටේ වවන්න පුළුවන් බොහෝ දේවල් පිටරටින් ගෙන්වා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් නැති කර ගත්තා. එහි අතුරු ප්‍රතිඵල ලෙස තමයි අද අපට ඩොලර් හිඟා කන්න වෙලා තිබෙන්නේ.

වර්තමානයේ අපේ ජනාධිපතිතුමාගේ රජය උත්සාහ කරන්නේ මෙසේ බිඳවැටී ගිය නිෂ්පාදන ආර්ථිකය යළි ශක්තිමත් කරන්නයි. එසේ කරනකොට, එදා වාගේම අදත් විපක්ෂය සුරංගනා ලෝක මවා ඒවා කඩාකප්පල් කරන්න හදන එක ගැන මා කනගාටු වෙනවා. අපට නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල් කන්න බොන්න පිටරටින් ගෙනෙන එක කවර රජයකින් හෝ වේවා නවතා දැමිය යුතුයි කියා මා විශ්වාස කරනවා.

කොරෝනා වසංගතය අපට කියා දුන්නේ හොඳ පාඩමක්. ගතානුගතික දේශපාලනයෙන් ඈත් වෙලා රටේ අනාගත පරපුර වෙනුවෙන් නිවැරදි තීරණ ගත යුතු කාලය පැමිණ ඇතැයි මා විශ්වාස කරනවා. ඒවා අමිහිරි තීරණ වෙන්න පුළුවන්. නමුත් කවුරු හරි රට වෙනුවෙන් ඒ යුතුකම කරන්න ඕනෑ කියා අපි දන්නවා. "සෞභාග්‍යයේ දැක්ම" තුළින් අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණු දේ තමයි ගරු මුදල් අමාත්‍යතුමා මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම හදා රට හදන වැඩ පිළිවෙළ හැම දාම ක්‍රියාත්මක කළේ අපේ රජයක් තුළින්. අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරය දැරූ 2010-2015 කාලසීමාව තුළ ඉදිරිපත් කළ මහින්ද චින්තනය තුළින් පවා ගම සංවර්ධනය කළ ආකාරය මේ වේලාවේ මතක් කළ යුතු වෙනවා. එදා ආරම්භ කළ එම ක්‍රියාදාමය තවදුරටත් වැඩිදියුණු කරමින් රටේ ග්‍රාම නිලධාරි වසම් 14,021ටම රුපියල් ලක්ෂ තිහ බැගින් ලබා දී ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේට, පල්ලියේ, කෝවිලේ පූජකතුමන්ලාට, ගමේ ප්‍රජා නායකයන්ට එක්ව ගම හදන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට මේ අය වැයෙන් ද නැවත අවස්ථාව උදා කර තිබෙනවා.

ඒ තුළින් මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයට අයත් දුෂ්කර ගම්මානවල ජනතාවට යහපතක් සිදුකිරීමට හැකිවීම ගැන අපේ ජනතාව වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ විතරක් නොවෙයි, පළාත් පාලන කොට්ඨාසයකට රුපියල් ලක්ෂ 40කුත්, පක්ෂ භේදයෙන් තොරව සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම රුපියල් මිලියන 15 බැගිනුත් ලබා දී තිබීම මේ අය වැයේ දකින්න තිබෙන විශේෂ කාරණයක්.

පසුගිය කාලයේ අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගෙන සිටි උපාධිධාරීන් 53,000කට ලබන ජනවාරි මස සිට ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධවත් ප්‍රශංසා කළ යුතුයි. අපේ රටේ හදවත බඳු උගත්, උපාධිධාරි දූ දරුවන්ට රාජ්‍ය සේවයට පිය නගන්නට හැම දාම අත හිත දුන්නේ අපේ රජයක් තුළින් පමණක් බවත් සතුටින් සිහිපත් කරනවා.

දශක දෙකකට වැඩි කාලයක් කිසිදු රජයක අවධානය යොමු නොවුණු ගුරුවරුන්ගේ දැවෙන ගැටලුවක් වුණු ගුරු වැටුප් විෂමතා ගැටලු විසඳීමට අපේ රජය කටයුතු කිරීම පිළිබඳව සමස්ත ගුරු පරපුරේම ප්‍රශංසාව හිමි විය යුතු වෙනවා.

ලෝක වසංගත තත්ත්වය හමුවේ විදේශ රැකියා තුළින් අපේ ජනතාව උපයා දුන් විදේශ ආදායම් නොසිතූ ලෙස සීමා වුණා. සෘජු විදේශ ආයෝජන ප්‍රමාණවත් ලෙස රට තුළට ගලා ඒම අඩු වුණු නිසා දේශීය වශයෙනුත් රටට ආදායම් උපයා ගැනීමේ අවස්ථාව ගිලිහී ගියා. එවන් තත්ත්වයක වුවද ග්‍රාමීය සංවර්ධනයට විශාල වැඩ කොටසක් කරන්නට මෙම රජය සමත්ව තිබෙනවා. විශේෂයෙන් "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ උතුරු මැද මහ ඇළ, වයඹ පළාත් මහ ඇළ, මිණිපේ වම් ඉවුරු ඇළ, පහළ මල්වතු ඔය ජලාශය, උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය, බස්නාගොඩ ජලාශය, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධනය, කළුගල් ඔය ජලාශය සහ කුඹුක්කන් ඔය ජලාශය වැනි විශාල වාරි කර්මාන්ත රැසක් මේ වනවිට ක්‍රියාත්මක වනවා. මේ වනවිට සමහර ව්‍යාපෘති අවසන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් මෑත ඉතිහාසයේ අපේ රට විපතකට පත්වන හැම අවස්ථාවකදීම රටට නායකත්වය ලබා දුන්නේ රාජපක්ෂවරු බව අප සිහිපත් කළ යුතුයි. එදා තිස් අවුරුදු යුද්ධයෙන් මාතෘ භූමිය පීඩා විඳින වෙලාවේ එම සාපලත් යුද්ධය නිමා කර, ජනතාවට අභය දානය දෙන්න නායකත්වය ලබා දුන්නේ රාජපක්ෂවරු කියා අද සමහරුන්ට අමතකවෙලා තිබුණත්, මේ වෙලාවේ මම ඒ කාරණයත් මතක් කර දෙන්න ඕනෑ. මිනීමරු ත්‍රස්තවාදීන් ගම්වල ජීවත් වෙච්ච අහිංසක මිනිස්සු මරා දමා, ගම් පිටින් විනාශ කර, මුළු රටම බියෙන් සලිත කරද්දී ඊට නොබියව මුහුණ දීලා, විදේශ බලවේගවල තර්ජන ඉදිරියේ දණ නොගසා ගමට සැනසිල්ල ගෙනාවේ රාජපක්ෂවරු කියා මුළු ලෝකයම දන්නවා. ඒ වාගේම අදත් කොරෝනා වසංගතය නිසා මරණ බියෙන් ගම් දනව්වල මිනිසුන් බියෙන් සලිතවෙලා ඉන්නකොට විරුද්ධවාදී බලවේගවල තර්ජනවලට මුහුණ දෙමින් ජනතාව මුදා ගන්න යොදා ඇති වැඩ පිළිවෙළ පිළිබඳව මුළු ලෝකයේම ඇගැයීමට ලක්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එන්නත්කරණය අතින් අපි ආසියානු කලාපයේ ඉදිරි පෙළේ රටක් බවට පත්වෙලා තිබෙනවා. ඒ තුළින් කොරෝනා වසංගතය පාලනයවෙලා, මරණ අනුපාතය අඩු කරගෙන, ජනතාවට සතුටින් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ගොඩ නඟන්න රජය සෑම අවස්ථාවකම උත්සාහ දරනවා. හැබැයි, මළ මිනී උඩින් දේශපාලනය කරන්නට හැම දාම උත්සාහ කරන විපක්ෂය, සෞඛ්‍ය අංශ විසින් දමා ඇති තහංචි බිඳ දමමින් ජනතාව ඒකරාශී කර වසංගතය ගම් නියම් ගම්වල පතුරුවා හැර ඒ තුළින් කාලකණ්ණි සතුටක් ලබන්නට උත්සාහ දරන එක ජාතියේ අවාසනාවක් කියායි මට හිතෙන්නේ. විපක්ෂයේ සියලුදෙනාටම මම මතක් කර දෙන්න කැමතියි, රටක දේශපාලනය කරන්නත් නිරෝගී රටක් වාගේම යහපත් සනීපාරක්ෂාවක් තිබෙන්න ඕනෑ බව. නොපෙනෙන සතුරු බලවේග සමඟ රජය සටන් කර, ජනතාව මරණයෙන් බේරා ගන්න හදනකොට, රජයක් පිහිටුවන්නට දවල් හීන දකින විපක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී ත්‍රස්තවාදයක් මුදා හරින්නට සූක්ෂ්මව සැලසුම් කරනවා. අපි මේ ගෙවන්නේ ඉතිහාසයේ දරුණු බිඳ වැටීම් සහිත කාල වකවානුවක්. එක් රැයකින් ඊට විසඳුම්

සොයන්න බැරි වේවි. අපි සියලු දෙනා එක්වෙලා, ඊට විසඳුම් හොයලා, රට යථා තත්ත්වයට පත් කරගෙන ඊට පස්සේ දේශපාලනය කරමු කියා විපක්ෂයට යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් වසංගතය හමුවේ ලෝකයේ බලවත් රටවල් පවා ආර්ථික හා සමාජයීය වශයෙන් බිඳ වැටී ඇති මෙම අවස්ථාවේ වෛර සහගත දේශපාලන අරමුණු මුදුන් පත් කර ගනිමින් ජනතාව අපහසුතාවට පත් කරනවාට වඩා අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නිවැරැදි තීන්දු කෙරෙහි විශ්වාසය තබා "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ යථාර්ථයක් බවට පත් කර ගනිමින් අපගේ මාතෘ භූමිය සමෘද්ධිමත් රටක් බවට පත්කොට අනාගත පරපුරට භාර කරන්නට එක් වෙමු කියා මා යෝජනා කරනවා.

එසේම රටේ සෑම ජන කොටසක් මෙන්ම සංවර්ධන අවශ්‍යතාවක්ම ස්පර්ශ කරමින් සකස් කර ඇති මෙම අය වැය ලේඛනය තුළින් අපි බලාපොරොත්තු වනවා, 2022 වර්ෂය තුළ මේ රටේ යහපත් වාතාවරණයක් ඇති කර, විපක්ෂයට සතුටු වෙන්න පුළුවන් රටක් ගොඩ නඟන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙනුවෙන් අපි කටයුතු කරමු කියන පණිවුඩය තබමින්, මට කථා කරන්න වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් මම ස්තුතිවන්ත වනවා.

තලතා අතුකෝරල මැතිනියත්, ගයන්ත කරුණාතිලක මැතිතුමාත් කෙරෙහි මම දැඩි අවධානය යොමු කරනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala)
ජය වේවා!

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Priyankara Jayaratne)
මොකද, මේ දෙදෙනා අපේ පැත්තට එන්න ඉන්නේ. ඒ නිසා මම ඒ දෙදෙනාට මොකුත් කියන්නේ නැහැ. අපේ පැත්තට එන්න කියා ඒ දෙදෙනාට ආරාධනා කරමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. M. Udayakumar. You have 13 minutes.

[3.43 p.m.]

**ගරු එම්. උදයකුමාර් මහතා**
(மாண்புமிகு எம். உதயகுமார்)
(The Hon. M. Udayakumar)
Hon. Presiding Member, the Budget for 2022 presented in Parliament can be summed up as rational on paper and not practical in terms of execution. The country is facing many challenges due to economic mismanagement and the COVID pandemic. So, the Government should have adopted a much more meaningful and proper approach towards managing the Budget deficit, which is a major reason for Sri Lanka to be at crossroads with most of international agencies downgrading Sri Lanka's credit rating to the lowest in the history of our country. The Government has always been window dressing most of the pressing issues that the country is facing today. As we understand, none of the last Budget Proposals had any impact on the economy and I have no reason to believe that this false and impractical Budget will resolve or address the issues of the country for the next twelve months.

Sir, slashing the Budget deficit to two-thirds means, the Government will abolish the meagre subsidies given to the small farmers and the poor. That will drive up the prices of essential items. Sir, since early last year, the Government has printed close to Rs. 3 trillion to bridge the Budget gap, triggering a sharp 27 per cent devaluation of the rupee. In addition to that, Sri Lanka's official year-on-year food inflation has hit almost 13 per cent last month. So, I see that there has been no concrete measures taken to address the common man's grievances, which should be the priority of any government. This kind of economic management by the Government has resulted in all Sri Lankans to suffer and face more hardships, which we see in the streets all around the country.

Sir, late last month, Moody's Investors Service further downgraded Sri Lanka's credit rating, putting it in the same league as Ethiopia, Laos and the Republic of Congo. The agency said the Government was too reliant on piecemeal funding such as swap lines and bilateral loans in the context of very low foreign exchange reserves, which posed default risks.

Sir, the need to control price increases and the rising cost of living is one of main objectives this Budget has failed to address. Import curbs, currency depreciation and the dollar shortage have driven the prices up. The Government has failed in this front and has no clear direction to move forward. We see no evidence of any other source of improving revenue in this Budget. That means, crises management or addressing the decreasing foreign reserves, which are sufficient only to cover the next two months' imports, and the forthcoming committed settlement of the US Dollars 4.6 billion debt have totally been neglected in this Budget. So, when it comes to solutions for economic recovery, there is a blank in this Budget.

This Budget gives no confidence to foreign investors, encouraging them to make Foreign Direct Investment. The GDP has dropped close to 3 per cent, the trade deficit is widening and the inflow of remittances is showing a declining trend. With all the economic indicators going against us, I see no clue as to how we could curb the Budget deficit to 8.8 per cent, as proposed in the Budget. There is a saying "Unrealistic expectations often lead to disappointment, while simple, unbiased attention and detachment to outcome often lead to pleasant surprises". Sir, I can really assure you that this Budget has no pleasant surprises, only disappointments to carry on for another year with no roadmap for economic recovery.

In addition to that, there is also nothing in relation to the estate sector, which generates one-third of the country's revenue, in this Budget. I do not understand why the Government has yet again failed to address issues of the estate sector, which proves the Government's continued policy of neglecting the estate sector year after year.

[ගරු එම්. උදයකුමාර් මහතා]

The Government has proposed a support package of Rs. 700 million to the three-wheeler drivers in the country. Rs. 700 million for 800,000 three-wheeler drivers means, only Rs. 750 per three-wheeler, which is less than the price of five litres of petrol. That is the Proposal by the Government for the three-wheeler drivers.

As showcased by the Government's ambitious plans, bringing the fiscal deficit down to 8 per cent of GDP is far from reality. That is the reason why I say that this Budget is impractical. Sir, next year, we will again hear the same "*baila"* from this Government, which lacks vision for the future of the common man, whose pressing issues the Government should have addressed without window dressing through this Budget.

Finally, I would like to say that I only see this Budget as an activity of passing the baton from the elder brother to the younger brother to manage another year with false promises, which will again lead to a disaster, and the country, I say, is going in the wrong direction, probably in the reverse direction, at high speed.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஆட்சிக்கு வந்த குறுகிய காலத்திலேயே வாக்களித்த மக்களால் வெறுத்தொதுக்கப்பட்ட அரசாங்கம் என்ற சாதனையைப் படைத்த இந்த அரசாங்கம், நாட்டு மக்களுக்கு எவ்வித நிவாரணமுமின்றிய வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்த அரசாங்கம் என்ற சாதனையையும் படைத்திருக்கின்றது. எமது பாராளுமன்ற வரலாற்றிலே ஒவ்வொரு வரவு செலவுத் திட்டத்திலும் பொருட்களின் விலைக்குறைப்பு, வீடமைப்புக் கடன் சலுகை, வங்கிக் கடன் சலுகை, விவசாயக் கடன் சலுகை, வியாபாரக் கடன் சலுகை, சுயதொழில் கடன் சலுகை என்று பல சலுகைகள் நாட்டு மக்களுக்கு அறிவிக்கப்படும். ஆனால், 'ஏழு அறிவு கொண்டவர்' என்று ஆளுந்தரப்பினரால் அறிமுகஞ் செய்யப்பட்ட நிதி அமைச்சர் அவர்களால் சமர்ப்பிக்கப்பட்ட இந்த வரவு செலவுத் திட்டத்திலே, சாதாரண மக்களுக்கு எவ்வித சலுகைகளும் இல்லை. மாறாகப் புதுப்புது வரிகளை அறிமுகஞ்செய்து, அத்தியாவசியப் பொருட்களின் விலைகளை மேலும் அதிகரிக்கக்கூடிய ஓர் அபாய நிலைதான் காணப்படுகின்றது.

குறிப்பாக, இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தபோது 95 ரூபாயாக இருந்த நாட்டரிசி, தற்போது 140 - 150 ரூபாய் வரை விற்கப்படுகின்றது. 100 ரூபாயாக இருந்த சம்பா அரிசி, தற்போது 170 - 190 ரூபாய் வரை விற்கப்படுகின்றது. அதேபோல, 100 ரூபாயாக இருந்த சீனி தற்போது 150 ரூபாயாகவும், 130 ரூபாயாக இருந்த பருப்பு தற்போது 250 ரூபாய்க்கும் விற்கப்படுகின்றது. அத்துடன், 380 ரூபாயாக இருந்த பால் மா 480 ரூபாயாகவும், 945 ரூபாயாக இருந்த பால் மா 1,250 ரூபாயாகவும் விற்கப்படுகின்றது. மேலும், 1,493 ரூபாயாக இருந்த gas தற்போது 2,675 ரூபாயாக 1,182 ரூபாய் அதிகரிப்புடன் விற்கப்படுகின்றது; இது கிட்டத்தட்ட 80 சதவீத விலை அதிகரிப்பாகக் காணப்படுகின்றது. அத்தோடு, gasஇற்கும் மண்ணெண்ணெய்க்கும் எரிபொருளுக்கும் மக்கள் வரிசையில் நிற்கும் ஓர் அவலநிலையை நாங்கள் காணக்கூடியதாகவுள்ளது.

தற்போது மரக்கறி, பழங்கள் மற்றும் தானிய வகைகளின் விலைகள் பலமடங்கு அதிகரித்துள்ளன. அதாவது இறக்குமதி செய்யப்பட்ட பொருட்களின் விலைதான் அதிகரித்துத் தட்டுப் பாட்டுடன் காணப்பட்டதென்றால், தற்போது உள்ளூரில் உற்பத்தி செய்யப்படும் பொருட்களுக்கும் தட்டுப்பாடும் விலை அதிகரிப்பும் காணப்படுகின்றது. அத்துடன், உள்நாட்டு உற்பத்தி பாரியளவில் குறைந்துள்ளது. இதன்மூலம் நாட்டிலே எதிர்காலத்தில் பஞ்சம், பட்டினி போன்ற நிலையேற் படக்கூடிய அபாயகரமான ஒரு சூழ்நிலை காணப்படுகின்றது.

இந்த நாட்டு மக்கள் இந்த அரசாங்கத்தின் வரவு செலவுத்திட்டத்தினூடாக அத்தியாவசியப் பொருட்களின் விலை குறைக்கப்படும் என்பதைத்தான் எதிர்பார்த்தார்கள். ஆனால், அரசாங்கம் அவர்களின் எதிர்பார்ப்பில் ஏமாற் றத்தைத்தான் அள்ளிக்குவித்துள்ளது. சிறைக் கைதிகளின் மலசலகூடங்கள் மற்றும் நலன்புரி விடயங்களுக்கு ஏற்கெனவே ஒதுக்கப்பட்ட தொகையைவிட இந்த வரவு செலவுத்திட்டத்தினூடாக மேலதிகமாக 20 கோடி ரூபாய் ஒதுக்கத் தெரிந்த அரசாங்கத்திற்கு நியாயமான விலையிலே பொதுமக்களுக்குப் பொருட்களை வழங்குவதற்காக நிதி ஒதுக்கீடு செய்ய முடியவில்லை.

மேலும், இந்த வரவு செலவுத்திட்டத்தினூடாகப் பாராளுமன்ற உறுப்பினர்களுக்கு மேலதிகமாக 50 இலட்சம் ரூபாய் நிதி ஒதுக்கப்பட்டுள்ளதாக நிதி அமைச்சர் அறிவித்துள்ளார். ஆனால், தற்போது சீமெந்து மற்றும் அதனுடன் தொடர்புடைய கட்டுமானப் பொருட்களான கம்பி, மணல் போன்றவை விற்கப்படும் விலைக்கு இதனைப் 'பன்முகப்படுத்தப்பட்ட நிதி அதிகரிப்பு' என்று கூறமுடியாது. இந்தத் தொகை, குறித்த பொருட்களின் விலை அதிகரிப் புக்கான நிதி ஒதுக்கீடாக மட்டும்தான் காணப்படுகின்றது. இதன்மூலமாக மக்களுக்கு மேலதிக சேவைகளைக்கொண்டு செல்லமுடியாததொரு சூழ்நிலை காணப்படுகின்றது.

இந்த வரவு செலவுத்திட்டத்தினூடாக அரச ஊழியர்களுக்கு மோட்டர் சைக்கிள் வழங்குவதாகவும், அரச ஊழியர்களின் சேவை இந்நாட்டிற்குத் தேவையென்றும் நிதி அமைச்சர் இச்சபையிலே அறிவித்துவிட்டு, வெளியே சென்று "அரச ஊழியர்கள் இந்த நாட்டிற்குச் சுமை" என்று கூறி ஒட்டுமொத்த அரச ஊழியர்களையும் காயப்படுத்தியுள்ளார். இந்த அரசாங்கத்தை ஆட்சிக்குக் கொண்டுவர அரச ஊழியர்கள் பெரும்பாலானோர் தங்களை அர்ப்பணித்துள்ளார்கள் என்பதனையும் அவர்களால் கிடைத்த தபால் வாக்குகளையும் மறந்துவிட்டு நிதி அமைச்சர் இந்தக் கருத்தை வெளியிட் டிருப்பது மிகவும் வேதனையளிக்கின்றது. இந்தக் கருத்தை நாங்கள் மிகவும் வன்மையாகக் கண்டிக்கின்றோம். இந்த அரசாங்கத்தின் முகத்தை அரச ஊழியர்கள் புரிந்துகொள்ள வேண்டுமென்று நான் அவர்களிடம் கோரிக்கையாக முன்வைக்கின்றேன். மேலும், அரச ஊழியர்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்திலே ஒரு சதம்கூடச் சம்பள அதிகரிப்பு வழங்கப்படவில்லை. போதியளவு சம்பளமின்றி இந்த நாட்டுக்காக உழைக்கும் அரச ஊழியர்களை இந்த அரசாங்கம் கைவிட்டுள்ளமை மிகவும் கவலைக்குரியதொரு விடயமாகும்.

மேலும், அரச ஊழியர்களின் ஓய்வூதிய வயதெல்லையை 65 ஆக அதிகரித்துள்ள இந்த அரசாங்கம் இளைஞர், யுவதிகளின் அரச சேவை எதிர்பார்ப்பைப் பூர்த்தி செய்வதற் கான வேலைத்திட்டங்கள் எதனையும் இந்த வரவு செலவுத் திட்டத்தில் முன்வைக்கவில்லை. இதன்மூலம் இளைஞர்களின் எதிர்காலம் பாதிக்கப்படுவது மட்டுமல்லாது, அது கேள்விக் குறியாக்கப்படும் நிலையும் காணப்படுகின்றது. அவர்கள்தான்

எங்களுடைய எதிர்காலச் சந்ததியினர் என்பது மட்டுமல்லாது எங்களுடைய எதிர்காலத் தலைவர்களும் ஆவார்கள். தற்போது இளைஞர், யுவதிகள் நாட்டிலே தொழில்வாய்ப்பு இல்லாமல், வாழ வழியில்லாமல், நாட்டைவிட்டு வெளியேறத் துடித்துக் கொண்டிருக்கின்றார்கள். இதனால், அவர்களுடைய சேவை நாட்டிற்குக் கிடைக்காமற்போகும் சூழ்நிலை காணப்படு கின்றது. சுவரில் சித்திரம் வரைந்த இளைஞர்கள் முதல் இந்த அரசாங்கத்திற்கு ஆதரவளிக்கும் அனைவருமே தற்போது விரக்தியடைந்துள்ளனர். இந்த விரக்தியின் வெளிப்பாடாகத் தாய்நாட்டைவிட்டு வேறு நாடுகளுக்குப் படையெடுத்துக் கொண்டு செல்வதற்காக கடவுச்சீட்டு அலுவலகங்களிலே அவர்கள் வரிசையாக நிற்பதைக் காணக்கூடியதாக இருக்கின்றது.

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்தினூடாகப் பெருந் தோட்ட மக்களும் பாரியளவில் ஏமாற்றப்பட்டுள்ளார்கள். 200 வருட 'லயன்' வாழ்க்கையிலிருந்து விடுபட நினைக்கும் அவர்களுக்கு, 'யானைப் பசிக்குச் சோளப்பொரி' என்பதுபோல மேலதிகமாக 50 கோடி ரூபாவை ஒதுக்கி, மூன்று வருடங்களிலே 'லயன்' வீடுகளை மாற்றியமைத்து வீடமைப்புத் திட்டங்களை முன்னெடுப்பதாக இந்த வரவு செலவுத் திட்டத்தில் அறிவிக்கப்பட்டிருப்பது எம்மை அதிர்ச்சியடையச் செய்வது மட்டுமன்றி, வேடிக்கையாகவும் இருக்கின்றது. இந்த நிதியை வைத்து, உடைந்துபோன வீடுகளுக்கு நிறப்பூச்சு பூசுவது மற்றும் தகரங்களை மாற்றுவது என மீண்டும் மீண்டும் மக்களை அந்த 'லயன்' வீடுகளுக்குள்ளேயே முடக்கி, அங்கேயே அவர்களை வாழவைப்பதற்கு இந்த அரசாங்கமும் அவர்களோடு கூட்டுச்சேர்ந்தவர்களும் முயற்சிக்கிறார்களா? என்று நான் கேள்வியெழுப்ப விரும்புகின்றேன்.

மேலும், கடந்த வரவு செலவுத்திட்டத்திலே மலையகத்தில், அதுவும் குறிப்பாக நுவரெலியா மாவட்டத்தில் அமைக்கப்படும் என்று கூறிய பல்கலைக்கழகம் எங்கே? அதற்குக் காணி பார்க்கும் படலம் இன்னும் முடிவடையவில்லையா? பல்கலைக்கழகத்திற்கு ஒரு வருடமாக காணி தேடும் கூட்டம் இதுவாகத்தான் இருக்கும். ஆகவே, இவை அனைத்துமே பொய் வாக்குறுதிகளாகவும் வெற்று வார்த்தைகளாகவுமே இருக்கின்றன. இவற்றில் எந்தவிதச் செயற்பாடுகளையுமே இங்கு காணமுடியவில்லை.

இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பிற்பாடு, பெருந் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை 1,000 ரூபாயாக அதிகரிப்பதாகக் கூறப்பட்டது. ஆனால், தற்போதுவரை அந்தத் தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பளம் முழுமையாக வழங்கப்படுவதில்லை. அத்தோடு, அவர்களுக் கான வேலை நாட்களும் குறைக்கப்பட்டுள்ளது. அதுமட்டு மன்றி, மாதாந்தம் அவர்களுக்குக் கிடைக்கும் சம்பளமென்று பார்க்கும்போது, அதிகபட்சமாக 10,000 ரூபாய் அல்லது 12,000 ரூபாய் மட்டும்தான் கிடைக்கப்பெறுகின்றது. தற்போது இந்த நாட்டிலுள்ள பொருள்களின் விலைவாசி, வாழ்க்கைச் செலவு என்பவற்றுடன் ஒப்பிடும்போது இத்தொகை அவர்களுக்கு எந்தவகையிலும் போதுமானதாக இல்லை. தொழில் அமைச்சர் என்ற வகையில், அமைச்சர் அவர்கள் வாரந்தோறும் இச்சபையிலே பல திருத்தச் சட்டமூலங்களைக் கொண்டுவருகின்றார். ஆனால், அவரால் இந்தப் பெருந் தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கைத் தரத்தை மேம்படுத்து வதற்கோ அல்லது அவர்களுக்கான நியாயமான சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதற்கான எந்தவிதமான வேலைத் திட்டங்களோ முன்னெடுக்கப்படுவதில்லை. ஏற்கெனவே நான்ன கூறியதுபோல், இந்த நாட்டுக்கு மூன்றிலொரு பங்கு வருமானத்தை ஈட்டித்தருபவர்கள் இந்தப் பெருந்தோட்டத் தொழிலாளர்கள்தான். ஆனால், ஒவ்வொரு வரவு செலவுத் திட்டத்திலும் இந்த மக்கள் ஏமாற்றப்படுகின்றார்கள்; வர்த்தமானி அறிவித்தல்கள் மூலமாகவும் ஏமாற்றப்படு கின்றார்கள். ஆகவே, அவர்கள் வாழ வழியில்லாதவொரு நிலைமை காணப்படுகின்றது.

தற்போது நாட்டினைப் பொருளாதார ரீதியாக மேம்படுத்து வதற்கு ஒரே வழி எமது ஏற்றுமதியை மேம்படுத்துவது மட்டும்தான். ஏற்றுமதியை மேம்படுத்துவதற்குத் தற்போது ஒரே வழி பெருந்தோட்டத் துறை மட்டும்தான். ஏனென்றால், எமக்கு அதிக அந்நியச் செலாவணியை ஈட்டித்தரும் சுற்றுலாத்துறை முற்றுமுழுதாகப் பாதிக்கப்பட்டுள்ளது. ஆகவே, அதனால் கிடைக்கவேண்டிய 5 பில்லியன் அமெரிக்க டொலர் இல்லாமற்போயுள்ளது. அதேபோல, ஆடை ஏற்றுமதியும் பாதிக்கப்பட்டுள்ளது. மேலும், வெளிநாட்டு வேலைவாய்ப்பின்மூலமாகக் கிடைக்கும் அந்நியச் செலாவணி வருமானமும் பாதிக்கப்பட்டுள்ளது. ஆகவே, இந்தப் பொருளாதாரச் சிக்கலிலிருந்து நம்மை மீட்டெடுக்க ஒரே வழி இந்தப் பெருந்தோட்டத்துறை மட்டும்தான். ஆகவே, அதற்கு முக்கியத்துவம் கொடுக்காமல் பெருந்தோட்டக் காணிகளை விற்பனை செய்வதிலும் அதனை மாற்றுத் தேவைகளுக்குப் பயன்படுத்துவதிலும் மட்டும்தான் அக்கறை செலுத்துவீர் களென்றால், நீங்களாகவே இந்த நாட்டைப் படுபாதாளத்துக்குத் தள்ளும் ஒரு செயற்பாடாகத்தான் அதை நான் பார்க்கிறேன். தற்போது தோட்டங்கள் காடுகளாகக் காணப்படுகின்றன. ஆகவே, தற்போதாவது விழித்தெழுந்து இதற்கொரு தீர்வைப் பெற்றுக்கொள்வதை முன்னிறுத்திச் செயற்படவேண்டும் என்று கேட்டுக்கொள்வதோடு, இந்த வரவு செலவுத்திட்டத்திலே உள்ள இன்னும் ஒரு சில விடயங்களை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

குறிப்பாக, கர்ப்பிணித் தாய்மார்களுக்கான போசணை, குறைந்த வருமானம் கொண்ட குடும்பங்களுக்கான நிவாரணப் பொதி, பாடசாலை வான் உரிமையாளர்களுக்கான சலுகை போன்ற குறைந்தளவான வரவேற்கத்தக்க திட்டங்கள் மட்டுமே வரவு செலவுத்திட்டத்தில் முன்வைக்கப்பட்டுள்ள போதும் இந்தத் திட்டங்களை மக்களிடம் வரி அறவிட்டுச் செயற்படுத்துவதற்கு அரசாங்கம் எத்தனித்துள்ளது. கடந்த வரவு செலவுத்திட்டத்திலே சமர்ப்பிக்கப்பட்ட பல விடயங்கள் நிறைவேற்றப்படாத வாக்குறுதிகளாகவே காணப்படுகின்றன. ஏனெனில், அதற்காக எதிர்பார்க்கப்பட்ட வருமானம் கிடைக்க வில்லை; மேலதிகமாக அதிகமான செலவுகள்தான் ஏற்பட்டன. இம்முறையும் அரசாங்கத்தால் முன்வைக்கப்பட்டுள்ள இந்த உத்தேச வருமானத்தை நிச்சயமாக ஈட்ட முடியாத ஒரு சூழ்நிலைதான் காணப்படுகின்றது.

அதுமட்டுமல்லாமல், மேலும் இந்த நாடு கடன் சுமைக்குள் தள்ளப்படும் ஒரு நிலை காணப்படுகின்றது. ஏனென்றால், தற்போதுள்ள பொருளாதார நிலையிலே நாங்கள் நாட்டின் கடனைச் செலுத்த முடியாத ஒரு நிலை காணப்படுகின்றது. குறிப்பாக, இந்த வருடத்திலே சுமார் 4.6 பில்லியன் அமெரிக்க டொலரைச் செலுத்தவேண்டிய நிலை காணப்படுகின்றது. ஆனால், நாட்டிலே தற்போது கையிருப்பில் இருப்பது 2 பில்லியன் அமெரிக்க டொலர் மாத்திரம்தான். அது அடுத்த இரண்டு மாதங்களுக்கான அத்தியாவசியப் பொருட்களின் இறக்குமதித் தேவைக்கு மட்டுமே போதுமானதாகக் காணப்படுகின்றது. அதாவது, தற்போதுள்ள நிலையிலே அத்தியாவசிய உணவுப் பொருட்கள் மற்றும் மருந்துப் பொருட்களை மட்டும் இறக்குமதி செய்வதற்குத்தான் அது போதுமானதாக இருக்கின்றது. எரிபொருளை இறக்குமதி

[ගරු එම්. උදයකුමාර් මහතා]

செய்வதற்கு அது போதுமானதல்ல. தற்போது நாட்டில் எரிபொருட் தட்டுப்பாடு ஏற்பட்டுள்ளது. வலுசக்தி அமைச்சரே "நாட்டிலுள்ள டொலரின்மூலமாக எரிபொருளை இறக்குமதி செய்வது ஒரு பாரிய பிரச்சினையாக இருக்கும்" என்று தெளிவாகக் கூறியிருக்கிறார். ஆகவே, எரிபொருளை இறக்குமதி செய்ய முடியாத நிலை ஏற்பட்டு, போக்குவரத்து முற்றாகத் தடைப்பட்டால், நாட்டில் அனைத்துத் துறைகளும் முடக்கப்படும். அனைத்துத் துறைகளும் முடக்கப்பட்டால், நாடு செயலிழந்து காணப்படும். அப்படிச் செயலிழந்து காணப்படும்போது நாட்டில் எந்த முன்னேற்றமும் இருக்காது. சர்வதேச நிறுவனங்கள் நாடுகளைத் தரப்படுத்தும்போது எதியோப்பியா, லாவோஸ் மற்றும் கொங்கோ போன்ற நாடுகளின் இடத்துக்கு எமது நாடு தள்ளப்படும். தற்போதே நாங்கள் 'கடனைச் செலுத்த முடியாத நாடுகள்' என்ற பட்டியலிலே கடைசி நிலைக்கு மேல்நிலையிலேதான் இருக்கிறோம்.

இந்த நிலையில், நாங்கள் கைகோர்த்து மிகவும் திடமாக இந்த வரவு செலவுத்திட்டத்தின் மூலமாகவாவது இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கான ஒரு வேலைத்திட்டத்தை முன்வைக்க வேண்டுமே தவிர, பொய்யான வாக்குறுதிகளைக் கூறி மக்களை ஏமாற்றக்கூடாதென மீண்டும் கேட்டுக் கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. S.M.M. Muszhaaraff. You have ten minutes.

[பி.ப. 4.00]

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு என்னுடைய நன்றிகள். ஓர் இளம் பாராளுமன்ற உறுப்பினராக நான் ஒரு புதுமையான பாராளுமன்றத்தில் இருக்கிறேன் என்கின்ற உணர்வு மேலோங்க எனது உரையை ஆற்றலாமென்று நினைக்கின்றேன்.

எமது நாட்டைப் பொறுத்தளவிலே, இந்த விவாதங்கள், இந்த வாக்கெடுப்புக்கள் இந்தப் பாராளுமன்றத்துக்கு அவசியமா? என்கின்ற கேள்வி எனக்குள் எப்போதும் எழுவதுண்டு. ஏனென்றால், எத்தகையதான ஒரு சட்டமூலம் வந்தாலோ, எத்தகைய முக்கியமான வாக்கெடுப்புக்கள் இங்கு கோரப்பட்டாலோ, இரண்டேயிரண்டு நிலைமைகளைத்தான் இந்தப் பாராளுமன்றத்தில் பார்க்கின்றேன். ஒன்று, ஆளுந் தரப்பிலுள்ளவர்கள் எல்லோரும் அதனை ஆதரிப்பது; மற்றொன்று, எதிர்த்தரப்பிலிருந்தால் முற்றுமுழுதாக எதிர்மறையாகவே பேசிக்கொண்டு செல்வது. இந்த இரண்டு நிலைப்பாடுகளைத் தாண்டி, நாடு இக்கட்டிலே - இடரிலே மாட்டிக்கொள்கிறபோது, நாட்டை மீட்டெடுப்பதற்காக எல்லோருமாக இணைந்து பயணிக்கின்ற ஒரு முறைமை தேவை. இந்தத் தேர்வு முறை, இங்கிருக்கின்ற வாக்கெடுப்பு முறை, இங்கிருக்கின்ற விவாத முறை போன்றவற்றிலே ஒரு முறைமை மாற்றமொன்று இந்த நாட்டுக்குத் தேவையோ! என்கின்ற ஓர் எண்ணம்தான் முன்னாள் ஊடகவியலாளராக, ஒரு பாராளுமன்ற உறுப்பினராக இந்த விவாதங்களைக் கேட்கிறபோது எனக்குள் தோன்றுகின்றது.

இன்று Budget மீதான இரண்டாம் வாசிப்பிலே நாங்கள் கலந்துகொண்டிருக்கின்றோம். எமது நாட்டைப் பொறுத்தளவில் ஒரு மிக முக்கியமான காலகட்டம் இது; ஓர் இடர்மிகுந்த காலகட்டத்தில் நாங்கள் இருக்கின்றோம். இது எமது நாட்டைப் பொறுத்தளவில் மாத்திரமல்ல, 2020ஆம் ஆண்டு யூன் மாதம் உலக வங்கியினுடைய கணிப்பீடுகளின் படி, 2021ஆம் ஆண்டு உலகப் பொருளாதார வளர்ச்சி வீதம் 5 வீதமாகச் சுருங்கும் என்று சொல்லப்பட்டிருந்தது. அதற்கமைவாக உலகப் பொருளாதாரம் சுருங்கியிருக்கின்றது. அமெரிக்காவினுடைய பொருளாதார வளர்ச்சி வீதம் 2021இல் 6.1 வீதமாகச் சுருங்கியிருக்கின்றது; ஜப்பானின் பொருளாதாரம் 6.1 ஆகச் சுருங்கியிருக்கின்றது. இதே போன்று, எல்லா மேற்குலக நாடுகளையும் எடுத்துப் பார்க்கின்றபோது, அந்த நாடுகளிலெல்லாம் பொருளாதாரத்திலே மிகப் பெரிய சுருக்கம் ஏற்பட்டிருக்கின்றது. அதுமாத்திரமல்ல, ஜூன் 30ஆம் திகதி வெளியிடப்பட்ட UNCTADஇன் அறிக்கையின்படி, 2020 மற்றும் 2021ஆம் ஆண்டுகளில் கொரோனா வைரஸ் தொற்றின் காரணமாகச் சர்வதேசச் சுற்றுலா வருமானத்தில் 4 ட்ரில்லியன் டொலர் வீழ்ச்சி - குறைவு ஏற்படுமென்று சொல்லப்பட்டிருந்தது; அது நடந்தும் இருக்கிறது. அண்மையிலே ஜேர்மன் புதிய நாணயத்தாள்களை அச்சிடத் தொடங்கியிருக்கிறது. எனவே, இன்று உலகம் பொருளாதார ரீதியாக இக்கட்டான நிலைமையில் இருக்கின்றது. வளர்ச்சி அடைந்த நாடுகளே என்ன செய்வதென்று தெரியாமல் திக்குமுக்காடிக் கொண்டிருக்கின்ற சூழலிலும் இலங்கை போன்ற அபிவிருத்தியடைந்துவரும் நாடுகள் மிகப் பெரிய சிக்கலைச் சந்தித்திருக்கின்ற சூழலிலும்தான் இந்த Budget கொண்டுவரப்பட்டிருக்கின்றது. நாங்கள் சுற்றுலாத்துறை வருமானத்தில் வருடாந்தம் 4.5 பில்லியன் டொலரை இழந்திருக்கின்றோம்; ஆடை ஏற்றுமதி வருமானத்தில் கிட்டத்தட்ட 5 பில்லியன் டொலரை இழந்திருக்கிறோம். வெளிநாட்டு வேலைவாய்ப்புகள் மூலமான அந்நியச் செலாவணி குறைந்திருக்கின்ற நிலையில் வெளிநாடுகளுக்குச் சென்ற எமது வேலையாட்களை மீண்டும் நாட்டுக்கு அனுப்புகின்ற நிலைமை உருவாகியிருக்கின்றது. இத்தகைய ஒரு சூழ்நிலையில்தான் இந்த வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டிருக்கிறது. எனவே, இந்த வரவு செலவுத்திட்டத்தை நாம் எந்தக் கண்ணோட்டத்தோடு பார்ப்பது? இதில் எத்தகைய விடயங்களை எதிர்பார்ப்பது? வழமையாகப் பொருளாதாரம் வளர்ச்சியடைந்த நாட்களிலே மிக மேம்பட்ட நிலைமையில் தயாரிக்கப்பட்ட ஒரு வரவு செலவுத்திட்டமாக இதையும் எதிர்பார்ப்பதா?

இன்று, உலகில் பல பாகங்களிலும் பொருட்களின் விலையேற்றம் சாதாரணமாக மாறியிருக்கிறது. மத்திய கிழக்கு நாடுகளில்கூட பெற்றோல் விலை அதிகரிப்பை நாம் பார்க்கக்கூடியதாக இருக்கிறது. அதேபோன்று, 6 திர்ஹமுக்கு விற்கப்பட்ட பொருட்கள் இன்று 15 திர்ஹமுக்கு விற்கப்படுவதாக அந்த நாட்டு மக்கள் சர்வசாதாரணமாகப் பேசுகின்றார்கள். இதுதான் உலகப் பொருளாதார நிலைமை! இப்படிப்பட்ட ஒரு சூழலிலேதான் எமது நாடும் சிக்கியிருக்கின்றது. யுத்தத்தின்போது நாட்டை மீட்டெடுப்பதற்காக எல்லோரும் இணைந்து பயணித்து வெற்றிபெறச் செய்வது ஓர் ஆரோக்கியமான பார்வையாக இருக்குமா? அல்லது 'அலிமங்கட'வுக்குப் போவதாகப் பாமன் கடைக்குத்தான் போவார்கள் என்று சொல்லும் விமர்சனங்கள் அறிவுபூர்வமாக இருக்குமா? என்று நாம் சிந்தித்துப் பார்க்க

வேண்டும். அதேபோன்றதொரு நிலைமையைத்தான் இன்று நாம் பார்க்கின்றோம். உலகப் பொருளாதாரம் ஒரு தேக்கநிலையில் இருக்கின்றபோது கொண்டுவரப் பட்டிருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்தை, மிகவும் வசதியோடு இருக்கின்ற ஒரு தேசத்தில் இப்படியொரு வரவு செலவுத்திட்டமா? என்ற கண்ணோட்டத்தோடு விமர்சிப்பது உண்மையிலேயே மனச்சாட்சியின்படி ஏற்றுக் கொள்ள முடியாதவொரு விடயமாகும் என்பதை நான் இந்த இடத்திலே தாழ்மையாகப் பதிவு செய்துகொள்ள விரும்பு கின்றேன். அதனைக் கடந்து, நாம் இந்த வரவு செலவுத் திட்டத்தைப் பார்க்கின்றபோது, குறிப்பிட்டுச் சொல்லக்கூடிய தான சில நல்ல விடயங்கள் இருக்கின்றன என்பதையும் நான் குறிப்பிட விரும்புகின்றேன்.

அதற்கு முன்னர், இந்த வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்த நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களை நான் பாராட்டுகின்றேன். குறிப்பாக, இந்த நாடு பொருளாதாரத்தில் மிகப் பின்னடைவைச் சந்தித்திருக்கின்ற சூழலில் பாராளுமன்றத்திற்கு வருகைதந்து, நிதி அமைச்சர் பதவியைப் பொறுப்பேற்று, இந்த நாட்டைத் தன்னால் நிமிர்த்த முடியும் என்ற நம்பிக்கையோடு அவர் பயணிப்பதையிட்டு அவருக்கு என்னுடைய பாராட்டுக்களைத் தெரிவிப்பதிலே நான் எந்தவிதமான தாழ்வு மனப்பான்மையையும் கொண்டிருக்கவில்லை; மிகவும் தைரியமாக எனது பாராட்டைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இங்கு மிக முக்கியமான விடயம் என்னவென்றால், எமது நாட்டிலே ஓர் ஆட்சி மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்பதில் காட்டப்படுகின்ற அக்கறை, நாட்டை வளப்படுத்த வேண்டும் என்பதில் எவருக்கும் இருப்பதாகத் தெரியவில்லை. அவ்வாறு ஆட்சி மாற்றத்தை ஏற்படுத்த வேண்டுமென்ற எண்ணத்தோடு 49 சிவில் சமூக அமைப்புக்கள் மற்றும் சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் அனைவரும் சேர்ந்து, பேதங்களை மறந்து, 'நல்லாட்சி' அரசாங்கத்தினூடாக ஒரு மாற்றத்தைக் கொண்டுவந்தும்கூட அந்த மாற்றத்தினுடைய நம்பிக்கை விதையை அடித்து நொருக்கியவர்கள் அந்த ஆட்சியாளர்கள் என்பதை இங்கே மறுப்பதற்கு இல்லை. வருகின்றபோதே பெரும் ஊழலின் ஊடாக - பிணைமுறி மோசடி ஊழல் ஊடாக, எந்தக் கட்சியையும் சாராத, நாட்டை நேசிக்கின்ற பொதுமக்களுடைய, சிவில் சமூகத்தினுடைய நம்பிக்கைகளை அடித்து நொருக்கியவர்கள், "மீண்டும் ஆட்சியைத் தாருங்கள், செய்து காண்பிக்கின்றோம்!" என்று கூறுவது பார்ப்பதற்கும் கேட்பதற்கும் நன்றாக இருந்தாலும் practical ஆகச் சிந்திக்கவேண்டும் என்பதை இந்த இடத்தில் நான் வலியுறுத்திக்கொள்ள விரும்புகின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்திலே நல்ல பல விடயங்களை என்னால் பார்க்கக்கூடியதாக இருக்கின்றது என்று கூறினேன். குறிப்பாக, கல்விக்கான ஒதுக்கீட்டை 6 வீதமாக அதிகரியுங்கள் என்று தசாப்தங்களாக கல்வியலாளர்கள் இந்த நாட்டிலே போராடிக்கொண்டிருந்தார்கள். அதற்கான ஏற்பாட்டைக் கடந்த ஆட்சியின் Budgetஇலே உள்வாங்கி யிருந்தாலும், உண்மையாகவே அதை 3 சதவீதமாக அதிகரிப்பதற்குக்கூட முடியாமல் இருந்தது என்பதுதான் யதார்த்தம். இப்படிப்பட்ட ஒரு சூழலிலும் இடர் மிகுந்த நிலைமையிலும் ஆசிரியர், அதிபர்களுடைய சம்பளப் பிரச்சினைகள் தொடர்பான கோஷங்கள் முன்வைக்கப் பட்டதன் அடிப்படையில், வரலாற்றில் என்றும் இல்லாதவாறு கல்விக்கான ஒதுக்கீடு 7.5 சதவீதமாக அதிகரிக்கப் பட்டமைக்காக இந்த அரசாங்கத்திற்கு நான் என்னுடைய பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்கிறேன். 7.5 சதவீதம் மாத்திரமல்ல, அதனைவிட அதிகமாகவே ஒதுக்கப் பட்டிருப்பதாக நான் கருதுகின்றேன். ஏனென்றால், உள்ளூராட்சி மன்ற உறுப்பினர்களுக்கும், மாகாண சபை உறுப்பினர்களுக்கும், பாராளுமன்ற உறுப்பினர்களுக்கும் ஒதுக்கீடுகள் வழங்கப்பட்டிருப்பதனால், அந்தப் பணத்தினூ டாகவும் கல்வித்துறையில் பாரிய வளர்ச்சி ஏற்படுவதற்கான வாய்ப்பிருக்கிறது. இதன் அடிப்படையில், கல்விக்காக 7.5 சதவீதத்திற்கும் அதிகமாக ஒதுக்கப்பட்டிருப்பதை நான் இங்கே பாராட்டுகின்றேன். அதுமாத்திரமல்ல, மிக முக்கியமாக இம்முறை Budget தயாரிக்கப்பட்ட முறையினைப் பார்க்கின்றபோது, ஒதுக்கப்படும் நிதி செலவீட்டு அலகுகளின் செயலாற்றுத்திறன் அடிப்படையில் கட்டங்கட்டமாக வழங்கப்படும் என்கின்ற அந்த விடயத்தை, ஒரு தேர்ந்த Budget தயாரிப்பினுடைய நுட்பமாகவே நான் பார்க்கின்றேன்.

அதேபோன்று நுண்ணிய, சிறு, நடுத்தர முயற்சி யாளர்களுக்கான நிவாரணம் வழங்கப்படுவதில் ஓர் அக்கறை காண்பிக்கப்பட்டிருக்கின்றது. "ஏறச் சொன்னால் எருதுக்குக் கோபம், இறங்கச் சொன்னால் முடவனுக்குக் கோபம்" என்று சொல்வார்கள். இப்படிச் செய்தால் அப்படி, அப்படிச் செய்தால் இப்படி என்று சொல்கின்ற நிலைமை போன்று, இந்த நாட்டிலே பேசப்படுகின்ற முக்கியமான ஒரு விடயமாக இருப்பது "IMF இடம் சென்றுவிடுங்கள்!" என்பதாகும். முன்னாள் பிரதமர் கௌரவ ரணில் விக்கிரமசிங்ஹ அவர்களும் சொன்னார், "IMF இடம் சென்றால் உங்களுடைய அனைத்துப் பிரச்சினைகளையும் தீர்த்துவிட முடியும்" என்பதாக. உண்மையில் இது நல்லதோர் ஆலோசனையாகும். ஆனால், IIMF இடம் செல்கின்றபோது அவர்கள் விதிக்கின்ற நிபந்தனைகள், கட்டுப்பாடுகளுக்கு எப்படி நாம் கட்டுப் படுவது? என்பதுதான் இங்கிருக்கின்ற பிரச்சினையாகும். IMF இற்குச் செல்வதா, இல்லையா? என்பதற்கான பிரத்தியேக மான ஒரு கலந்துரையாடலைச் செய்தாலே போதுமானதாக இருக்குமென நான் நம்புகின்றேன். சரி, IMF செல்வதாகவே எடுத்துக்கொள்வோம்! அவ்வாறு செல்வதாக இருந்தால், 'சமுர்த்திக் கொடுப்பனவை நிறுத்துங்கள்!' என்று அவர்கள் நிபந்தனை வைப்பார்கள். 'அரச துறையிலே அதிகமானவர்கள் பணிக்கு அமர்த்தப்பட்டிருக்கின்றார்கள்; எனவே, அவர்களை நீக்குங்கள்!' என்ற நிபந்தனையை வைப்பார்கள். அவர்களுடைய பேச்சைக்கேட்டு, IMF இடம் நிதியைப் பெறுவதற்காக அவ்வாறு நாம் நீக்கினாலும் மறுபுறத்தில் எதிர்த்தரப்பில் இருந்து, "பாருங்கள்! அநியாயமாகச் சமுர்த்தி நிவாரணம் பெற்றவர்களை நீக்கியிருக்கின்றார்கள்" அல்லது "இந்த அரசாங்கத்திலே வேலைவாய்ப்புப் பெற்றிருந் தவர்களைக் குறைத்திருக்கின்றார்கள்" என்பதான ஒரு விமர்சனம் வரும். எனவே, நான் இந்த அரசாங்கம், அந்த அரசாங்கம் என்பதாகப் பேச வரவில்லை. இந்த நாட்டினுடைய நிலையே அதுதான்!

எமது நிதியமைச்சர் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். அதாவது, "அரச துறை என்பது ஒரு நாட்டிற்குச் சுமையாக இருக்கின்றது" என்கின்ற ஒரு கருத்தைச் சொல்லியிருந்தார். அவர் சொன்ன அந்தக் கருத்து ஆழமான ஒன்றாகும். அவர் சொன்னதன் அர்த்தம் தொடர்பில் எனக்கும் தெரியும்; ஏனென்றால், IMF கூட அந்த விடயத்தைத்தான் வலியுறுத்திச் சொல்லியிருக்கின்றது.

எமது நாட்டைப் பொறுத்தளவிலே, அரசாங்கக் கூட்டுத்தாபனங்களை எடுத்துப் பார்த்தால் எல்லா அரசாங்கக் கூட்டுத்தாபனங்களும் நஷ்டத்தில்தான் சென்றுகொண்டிருக் கின்றன. குறிப்பாக 55 பேர் செய்ய வேண்டிய வேலைக்காக 1,600 பேர் நியமிக்கப்பட்டிருக்கின்றார்கள். இது ஒருவர் செய்த

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

தவறு அல்ல. அரசியல் கட்சிகளினுடைய செல்வாக்கினைக் கூட்டுவதற்காக ஒவ்வொருவரும் தொடர்ந்தேர்ச்சியாக அரசியல் ரீதியாக நியமனங்களை வழங்கியதன் விளைவாக எல்லா அரச கூட்டுத்தாபனங்களுமே நஷ்டத்திலே இயங்குகின்றன. சர்வதேச நிதி நிறுவனங்களிடம் பணம் கேட்கின்றபோது, "நீங்கள் இதனைக் கட்டுப்படுத்துங்கள்!" என்று சொல்கின்றார்கள். எனவே, அரச சேவை இப்பொழுது சுமையாக மாறியிருக்கின்றது. அந்தவகையில், private partnershipஐக் கொண்டுவருதற்கான தேவை இங்கே உணரப்படுகின்றது என்று சொல்லப்போனால், அதனை நாம் ஏற்றுக்கொள்கின்றோமா, இல்லையா? என்றால், நிலைமைக் கேற்ற வகையில், அதாவது நான் ஆரம்பத்தில் சொன்னது போன்று எந்தத் தரப்பில் இருக்கின்றோம் என்பதைப் பொறுத்துத்தான் கருத்துச் சொல்கின்ற ஒரு நிலைமை இந்த நாட்டில் இருப்பது மிகப்பெரிய ஓர் அபத்தம் என்றுதான் சொல்லவேண்டும்.

உதாரணமாக, ஒரே வகையான சட்டமூலங்களை நாங்கள் பல்வேறு ஆட்சிகளில் பார்க்கின்றோம்; அவை வெவ்வேறு வடிவங்களில் வருகின்றன. சட்டமூலத்திற்கு ஆதரவை வழங்கும்போது, எந்தத் தரப்பில் - எந்தப் பக்கத்தில் இருக்கின்றோம் என்பதைக் கொண்டுதான் நாம் தீர்மானிக்கின்றோம். அதனால்தான் அரசியலமைப்புக்கான 18ஆம் திருத்தத்திற்கும் ஆதரவளித்து, 19ஆம் திருத்தத்திற்கும் ஆதரவளித்தவர்களை இன்று பாராளுமன்றத்தில் காண்கின்றோம். அத்துடன், 18க்கும் ஆதரவளித்து 19க்கும் ஆதரவளித்து 20க்கும் ஆதரவளித்தவர்களையும் இந்தப் பாராளுமன்றத்திலே காண்கின்றோம். பதினெட்டாவது திருத்தச் சட்டமூலத்திற்கு ஆதரவளித்துவிட்டு, இருபதாவது திருத்தச் சட்டமூலத்தை விமர்சிப்பவர்களைக் காண்கின்றோம். இருபதாவது திருத்தச் சட்டமூலத்தைவிடச் செறிமானம் கூடிய பதினெட்டாவது திருத்தச் சட்டமூலத்தை ஆதரித்துவிட்டு இருபதாவது திருத்தச் சட்டமூலத்தை விமர்சிப்பவர்களைக் காண்கிறோம். நாம் எங்கிருக்கிறோம் என்பதைப் பொறுத்து நல்லது, கெட்டது என்பதற்கான தீர்மானம் இங்கு மேற்கொள்ளப்படுவதால்தான் இந்த நிலை இந்த நாட்டில் உருவாகின்றது. இது மிக அபத்தமான ஒரு விடயமாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please, wind up.

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)

இறுதியாக, தற்போது கொண்டுவரப்பட்டிருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்தில் பல்வேறு நல்ல விடயங்கள் இருக்கின்றன. சாதாரண எளிய மக்களுக்கு நிவாரணங்கள் சென்றடையக்கூடியதான வழிவகைகள் செய்யப்பட்டிருக் கின்றன. அதேபோன்று, ஏனைய பல நல்ல விடயங்களும் இருக்கின்றன. அதேசமயம், அடுத்த வரவு செலவுத் திட்டத்திற்குள் இந்த நாட்டைக் கட்டியெழுப்ப வேண்டும். கடன் செலுத்த வேண்டியிருக்கின்றது. எம்மைப் பொறுத்தவரையில், 2.5 பில்லியன் டொலர் இப்பொழுது எம்மிடம் இருப்பாக இருந்தால், 4.5 பில்லியன் டொலரை எவ்வாறு ஈட்டுவது? என்பது தொடர்பான உயர்தரமான ஆலோசனையை இங்குள்ளவர்கள் கட்சி பேதங்களுக்கப்பால், நாட்டை நேசிக்கின்ற வகையில் சொல்லுகின்றவிடத்து, நிச்சயம் அது மிகப் பிரயோசனமளிக்கும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Kulasingam Dhileeban. You have ten minutes.

[பி.ப. 4.11]

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான இன்றைய விவாதத்திலே எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்ப மளித்தமைக்கு மிகவும் நன்றி. இந்த வரவு செலவுத் திட்டமானது மக்கள் பயனடையக்கூடியவகையில் சிறந்த முறையில் தயாரிக்கப்பட்டுள்ளது. இதற்காக எமது அன்புக்குரிய நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களுக்கு முதற்கண் எனது நன்றியினையும் வாழ்த்துக் களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்திலே கல்வி, விவசாயம், சுகாதாரம் போன்ற துறைகளுக்கு அதிகளவான நிதி ஒதுக்கப்பட்டுள்ளது. எமது வன்னிப் பிரதேசத்துக்கு, அதாவது, வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மாவட்டங் களிலுள்ள பிரதேச செயலகப் பிரிவுகளுக்குத் தலா ஒரு கைத்தொழிற் பேட்டையை உருவாக்கவேண்டுமென்ற எமது நீண்டநாட் கோரிக்கை அங்கீகரிக்கப்பட்டுள்ளது. அதையிட்டு நான் நிதி அமைச்சருக்கு நன்றியினைத் தெரிவித்துக் கொள்கின்றேன். அத்தோடு, அனைத்துக் கிராமப்புறப் பாடசாலைகளுக்கும் கட்டிடங்களுடன் கூடிய நூலக வசதியை ஏற்படுத்தித் தரவேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் எமது மதிப்புக்குரிய அமைச்சரிடம் எனது கோரிக்கையை முன்வைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது மேன்மைதங்கிய ஜனாதிபதி அவர்கள் கொண்டுவந்திருக்கின்ற சேதனப் பசளைத் திட்டமானது உண்மையில் வரவேற்கக் கூடிய ஒரு திட்டம். அதனை நான் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையிலும், வன்னிப் பிரதேசத்தைச் சேர்ந்தவன் என்ற வகையிலும் வரவேற்கின்றேன். இன்று பலர் இத்திட்டத்துக்கு அரசியல் சாயம் பூசிக் குளிர்காய முனைகின்றனர். நான் வன்னி மண்ணைச் சேர்ந்தவன். எமது மன்னார், முல்லைத்தீவு, வவுனியா போன்ற மாவட்டங்களில் அதிகளவான சிறுநீரக நோயாளர்கள் காணப்படுகின்றனர். குறிப்பாக, அநுராதபுரம் மாவட்டத்துக்கு அடுத்தபடியாக எமது வவுனியா மாவட்டமே அதிகளவான சிறுநீரக நோயாளர்களைக் கொண்டுள்ளது. வருடத்துக்கு 2,500 - 3,000 பேர் வரை சிறுநீரக நோயாளர்கள் புதிதாக இனங்காணப்படுகின்றனர். ஒரு வருடத்துக்குக் குறைந்தது 50 பேர் வரை சிறுநீரக நோயால் மரணமடைகின்றனர். வவுனியா மாவட்டத்தில் மட்டும் ஒரு மாதத்தில் 700 பேர் வரை இரத்தச் சுத்திகரிப்பினைச் செய்துகொள்கின்றனர். இதற்குக் காரணம் என்ன? எதனால் இந்தப் பாதிப்பு ஏற்படுகின்றது? வவுனியா மாவட்டத்தில் சிறுநீரக நோய்க்குச் சிகிச்சையளிக்கின்ற வைத்தியரைச் சந்தித்து நான் இதுபற்றிக் கலந்துரையாடியபொழுது, அவரால் தரப்பட்ட துண்டுப் பிரசுரத்தில் முதலாவதாகத் தெரிவிக்கப்

பட்ட விடயம் என்னவென்றால், "இரசாயனம் கலந்த விவசாய உற்பத்திப் பொருட்களினாலே இந்தச் சிறுநீரக நோய் ஏற்படுகின்றது" என்பதாகும். எனவே, நாங்கள் இதனைப் புரிந்துகொள்ள வேண்டும். யார் இறந்தாலும் பரவாயில்லை; இலாபம் மட்டும்தான் முக்கியம் என்ற ஒரு பகுதியினரும், கஜேந்திரகுமார் அல்லது கஜேந்திரன் போன்ற அரசியல் இலாபம் தேடும் ஒரு பகுதியினரும் என்னுடன் எனது மாவட்டத்துக்கு வருகை தாருங்கள்! அங்கு சிறுநீரக நோயால் பாதிக்கப்பட்டவர்களையும் இரத்த சுத்திகரிப்புச் செய்து கொள்பவர்களையும் அல்லது மரணத்தை எதிர்பார்த்துக் காத்திருப்பவர்களையும் நான் உங்கள்முன் காட்டுகின்றேன். அப்பொழுதாவது எமது மேன்மைதங்கிய ஜனாதிபதி அவர்கள் கொண்டுவந்திருக்கின்ற இந்தத் திட்டத்தின் தாற்பரியத்தை உணர்வீர்கள் என்று நம்புகின்றேன்.

அத்துடன், தொடர்ந்து சில நாட்களாக எமது மாவட்டத்தில் ஒரு விடயம் தொடர்பில் பல போராட்டங்கள் முன்னெடுக்கப்படுகின்றன. அதிலும், குறிப்பாகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த உறுப்பினர்கள் பாராளு மன்றத்தில் தொடர்ந்தும் இது தொடர்பில் கேள்விகளை எழுப்பியவண்ணம் உள்ளனர். அதாவது, “போகஸ்வெவ கிராமத்தில் சிங்களக் குடியேற்றம் நடைபெறுகின்றது” என்று கூறுகின்றார்கள். நான் வவுனியா மாவட்ட ஒருங்கிணைப்புக் குழு இணைத் தலைவர் என்ற வகையில் அதற்குப் பதில் சொல்லவேண்டிய கடமையுள்ளது. உண்மையில் மாமடுச் சந்தியிலிருந்து போகஸ்வெவ என்ற அந்தச் சிங்களக் கிராமம் நோக்கிச் செல்கின்ற அந்தத் தார் வீதிக்கு வலது, இடது என்ற இருபுறங்களும் குடியேற்றங்கள் உள்ளன. போகஸ்வெவ என்ற கிராமத்தை அண்மித்த அந்தக் குடியேற்றப் பகுதி அதாவது, இடது பக்கமுள்ள குடியேற்றங்கள் அனைத்தும் வவுனியா மாவட்டத்துக்கும் வலது பக்கமுள்ள குடியேற்றங்கள் அதாவது, குடிசைகள் அனைத்தும் அநுராதபுர மாவட்டத்துக்கும் கீழ் வருகின்றது. உண்மையில், நான் அந்த இடத்துக்கு நேரடியாகச் சென்று அந்த மக்களுடைய நிலைமையைப் பார்வையிட்டுள்ளேன்; கௌரவ உறுப்பினர்கள்கூடச் சென்று பார்வையிடலாம். அதாவது, ‘கிளிசேறியா’ தடியால் அமைக்கப்பட்டு, மண்சுவர் கட்டப்பட்டு, அந்த மக்கள் குடியிருக்கின்றனர். அவர்களுக்குரிய மலசலகூடத்தைப் பார்த்தால் தெரியும் அது எப்படிப்பட்டதென்று. நான்கு தடிகளை ஊன்றி, சேலையால் சுற்றி மறைக்கப்பட்டு, நடுவில் குழிவெட்டி, அதில் புழங்கக்கூடிய நிலைமையில் அந்த மக்கள் உள்ளனர். அவர்களுக்குரிய வீட்டுத் திட்டத்தை வழங்குவதற்கு எமது மாவட்டத்தால் இயலாமலுள்ளது. காரணம், அந்தப் பகுதி அநுராதபுர மாவட்டத்திற்குள் வருகின்றபடியினால், அவர்களுக்கு எமது மாவட்டத்தினூடாக வீட்டுத் திட்டத்தை வழங்குவதற்கு இயலாமலுள்ளது. அதனால், எமது மாவட்டச் செயலாளர் அந்த மக்களுக்குத் தீர்வை பெற்றுக்கொடுக்கும் நோக்கில் ஒரு கலந்துரையாடலை மேற்கொண்டார். அந்தக் கலந்துரையாடல் மேற்கொள்ள முன்னரே இங்குள்ள உறுப்பினர்கள், ‘சிங்கள மக்களைக் குடியேற்றிவிட்டனர்’ என்று கூறத் தொடங்கிவிட்டார்கள். நான் சிங்களம், தமிழ், முஸ்லிம் என்று பேச வரவில்லை. ஆனால், அங்கிருக்கின்ற மக்களை மனிதர்களாப் பார்க்க வேண்டும். அவர்களுக்குரிய அடிப்படை வசதிகளைப் பூர்த்திசெய்ய வேண்டும். அதைத்தான் இங்குள்ள கௌரவ உறுப்பினர்களிடம் நான் கேட்டுக்கொள்கிறேன்.

கௌரவ சுமந்திரன் போன்ற பாராளுமன்ற உறுப்பினர்கள் இதைச் ‘சிங்களக் குடியேற்றம்’ என்று கூறுவார்கள். ஆனால், கடந்த ஆட்சிக் காலத்தில் போஹஸ்வெவ கிராமத்திலுள்ள சிங்கள மக்களுக்குக் காணி உரிமப் பத்திரங்களை கௌரவ மைத்திரிபால சிறிசேன அவர்களோடு சேர்ந்து கௌரவ சுமந்திரன் அவர்கள்தான் வழங்கினார். இதோ அதற்கான ஆதாரம் என்னிடமுள்ளது. இதைப் பார்த்தால் தெரியும்! இதில் சுமந்திரன் ஐயா அவர்கள் வெள்ளையும் சொள்ளையுமாக நிற்கிறார். ‘படிப்பது தேவாரம் இடிப்பதோ சிவன் கோவில்’ என்று தமிழிலே ஒரு பழமொழி சொல்வார்கள். உங்கள் சுயலாப அரசியல் நோக்கத்திற்காகச் செய்கின்ற ஆர்ப்பாட்டங் களாலும் வீரப் பேச்சுக்களாலும் பாதிக்கப்படுவது தமிழ் மக்கள் என்பதை மறக்கவேண்டாம்.

வவுனியா மாவட்டத்தின் ஆசிகுளம் கிராம சேவையாளர் பிரிவிலுள்ள கற்குளம் 4 கிராமத்தில் சில குடியேற்றங்கள் உள்ளன. அதைக் ‘குடியேற்றங்கள்’ என்று சொல்வதைவிட ‘குடிசைகள்’ என்றுதான் சொல்ல முடியும். ஏனென்றால், அவை தரப்பாளினாலும் தகரத்தாலும் கட்டப்பட்டுள்ள குடிசைகள். அந்தத் தமிழ் மக்களுக்கு வீட்டுத் திட்டத்தை வழங்க முடியாமல் உள்ளது. காரணம், அந்தப் பகுதிகள் அனைத்தும் அநுராதபுர மாவட்டத்துக்குள் வருகின்றது. நீங்கள் செய்கின்ற சுயலாப அரசியலால் அந்த மக்களுக்குக் கிடைக்கக்கூடிய பல திட்டங்கள் இல்லாமல் போகக்கூடிய சூழல் நிலவுகிறது.

கௌரவ அமைச்சரும் எனது தோழருமான டக்ளஸ் தேவானந்தா அவர்கள்மூலமாக வவுனியா மற்றும் அநுராதபுர மாவட்ட அரசாங்க அதிபர்களுடன் பேச்சுவார்த்தை நடத்தி, அந்தப் பகுதியினை வவுனியா மாவட்டத்துடன் இணைப் பதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டுள்ளோம். ஆனால், உங்களுடைய நடவடிக்கைகளினால் அநுராதபுர மாவட் டத்தைச் சேர்ந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர்களோ, அமைச்சர்களோ, அந்த மாவட்டத்தைச் சேர்ந்த சிங்கள மக்களோ, “எமது அநுராதபுர மாவட்டத்திற்குரிய பகுதியை வவுனியா மாவட்டத்துடன் இணைக்க வேண்டாம்” என்று போராட்டத்தை மேற்கொண்டால், கற்குளம் 4 கிராம மக்களுக்குரிய தீர்வை யார் பெற்றுக்கொடுப்பது? இதுபற்றிச் சிந்திக்க வேண்டும்.

அதைவிடுத்து, “ஆமைக்கறி, பூனைக்கறி, AK-47” என்று சொல்லி, எமது தமிழினத்தை வைத்து, தமிழினத்தின் துன்பத்தை வைத்துப் பிழைப்பு நடத்தும் இந்தியாவிலுள்ள சீமான் போல, சுமந்திரன் அவர்களும் உருவெடுத்துள்ளார். இலங்கையின் சீமான் - தமிழர்களின் சீமான் என்றுதான் அவரைச் சொல்ல வேண்டும். அவர் விளைந்த நெல் வயலுக்குள் மாட்டை இறக்கி உழவு அடிக்கிறார். அதாவது, தமிழர்களுடைய பாரம்பரிய பொங்கலின்போது பொங்கல் பானையை அடுப்பில் வைத்து பொங்குவோம். அப்பொழுது, பொங்கல் பானையைச் சுற்றி மாவிலைகள் கட்டுவோம். பால் பொங்கி வரும் நேரம் அந்த மாவிலைகளெல்லாம் நெருப்பில் கருகிவிடும் அல்லது காய்ந்து இருக்கும். கௌரவ சுமந்திரன் ஐயா அவர்கள் சமீபத்தில் வெளியிட்ட அந்த வீடியோவைப் பார்த்தால் தெரியும் அந்த மாவிலைகளெல்லாம் அப்படியே freshஆக இருக்கின்றன. ஏன் இந்தப் பித்தலாட்ட அரசியலைச் செய்கிறாரோ தெரியவில்லை.

அடுத்தது, எமது

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

சாணக்கியன் - மன்னிக்கவும், இராசமாணிக்கம் சாணக்கியன். அவரது பெயர்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[ගරු කුලසිංහම් තිලීපන් මහතා]

என்று வந்துவிட்டது. இராசமாணிக்கம் சாணக்கியன் அவர்கள், "மக்கள் சேவைக்காக வருகின்ற பாராளுமன்ற உறுப்பினர் களுக்கு ஏன் ஓய்வூதியம்?" என்று கேட்கின்றார். இதுவொரு நல்ல விடயம். அதேபோல, நான் அதே

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

சாணக்கியனிடம் சொல்வது என்னவென்றால், நீங்கள் மக்கள் சேவைக்காக வந்தவர். உங்களுக்கு ஒதுக்கப்பட்ட அரச சலுகைகள், உங்களுக்குரிய சம்பளம், ஏனைய வசதிகள் மற்றும் இந்தப் பாராளுமன்றத்தில் வழங்கப்படுகின்ற உயர்தர உணவைக்கூட நிறுத்திவிடுங்கள்!

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sie, Sir, I rise to a point of Order.

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
அவருக்குச் சந்தர்ப்பம் கொடுங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is your point of Order?

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
ஐயா, சும்மா உட்காருங்கள்!

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சபையிலே அவர் பெயர் கூறிய கௌரவ உறுப்பினர் அவர்கள் இல்லை. அவருடைய பெயர் சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம். ஆனால், அந்தப் பெயரை மாற்றி அவரை

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

சாணக்கியன் என்று ஒருவர் சொல்கிறாறென்றால், இவர் ஒரு கீழ்த்தரமான பாராளுமன்ற உறுப்பினர்; எந்தவிதமான தகுதியும் இல்லாத ஒரு பாராளுமன்ற உறுப்பினர். இதனை நீங்கள் ஹன்சாட் அறிக்கையிலிருந்து நீக்கிவிட வேண்டும் என்று கேட்டுக்கொள்கிறேன். சாணக்கியன் இராஜபுத்திரன் இராசமாணிக்கம் என்கின்ற அவருடைய பெயரைச் சரியான முறையில் பயன்படுத்தவேண்டும். அவ்வாறு அவருடைய பெயரை மாற்றுவது இந்தப் பாராளுமன்றத்தினுடைய சட்டதிட்டங்களுக்கு முரணானது என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்வதுடன், அவரது பெயரைத் தவறாகச் சொன்னமைக்காக நான் இந்தப் பாராளுமன்ற உறுப்பினரை வன்மையாகக் கண்டிக்கின்றேன். படிக்காத முட்டாளான இந்தப் பாராளுமன்ற உறுப்பினரை முதலில் திருத்துவதற்கு முயற்சிசெய்ய வேண்டும் என்பதையும் நான் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
நாங்கள் படிக்காத முட்டாள்களாகவே இருக்கட்டும்! வன்னியில் இறுதி யுத்தத்தின்போது இறந்த பிணங்களிலே யிருந்து நகைகளைக் களவெடுத்துக்கொண்டு -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]* Order, please! ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම යම් ප්‍රමාණයකට වෙනස් කරලා ප්‍රකාශ කිරීමෙන් එතුමාට යම් අපහසුතාවක් සිදු වුණා නම්, එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ කියලා මම හිතනවා.

ගරු කුලසිංහම් මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් නිසා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வன்னியில் இறந்து கிடந்த பிணங்களினுடைய நகைகளைக் கழற்றி எடுத்துக்கொண்டு வந்தவர்தான் இந்தப் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன். இவர் பாராளுமன்ற உறுப்பினராக வரக்கூடிய தகுதி இல்லாத ஒரு மனிதன். சிறார்களின் செஞ்சோலையை விடுதலைப் புலிகளினுடைய பயிற்சிப் பட்டறை என்று கூறிக் காட்டிக்கொடுத்து, அந்தச் சிறுவர்கள் கொல்லப்படக் காரணமாக இருந்தவர்தான் இந்தச் சிறிதரன் அவர்கள். அதை மறுப்பதற்கில்லை. நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.23]

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය ඉදිරිපත් වන්නේ අපේ රටේ අනාගතය පිළිබඳ තීරණාත්මක මංසන්ධියක බවට සැකයක් නැහැ. අද මේ ගරු සභාව ගන්නා තීන්දු-තීරණ මත අපේ රටේ අනාගතය තීන්දු වනු ඇත. 70 දශකයේ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන නොයෑම ගැන අද බොහෝ දෙනෙකු අදහස් දක්වනු දක්නට ලැබේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය ගත් ක්‍රියා මාර්ග ඉදිරියට ගෙන නොයෑමේ විපාක ගැන අද බොහෝ අදහස් ඉදිරිපත් වනු අසන්න ලැබේ. එහෙත්, ඒ 70 සමගි පෙරමුණු රජයේ දේශීය ආර්ථිකය මත නැඟී සිටීමේ ප්‍රයත්නය බිඳ වැටුණේ 1977දී ද? එනම්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නායකත්වය දුන් එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණීමත් සමඟද? නැත්නම් ඒ සමගි පෙරමුණු රජයේ සමගිය 1975දී බිඳ වැටීමත් සමඟද? එම රජයේ මුදල් ඇමති වූ එන්.එම්. පෙරේරා මහතා ප්‍රමුඛ ලංකා සමසමාජ පක්ෂය ඒ රජයෙන් ඉවත්වීමත් සමඟද? ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා මුදල් ඇමති වශයෙන් ක්‍රියාවට නැඟුවේ අපි අද අගයන ඒ සමගි පෙරමුණු රජය ස්වදේශිකත්වය මත

පදනම්ව ගත් ආර්ථික ප්‍රතිපත්තිද? මේ පිළිබඳව 1976 වසරේදී එළිදුටු ගුණදාස අමරසේකර මහතාගේ "අබුද්දස්ස යුගයක්" කෘතියේ ආරම්භයේදීම අවධානය යොමුකොට තිබේ. පසුබෑම්, ජයග්‍රහණ, බොරු වළවල්, වල්මත්වීම් අස්සෙන් ආ ගමන, මෙතෙක් අල්ලාගෙන ආ කණවැල අතහැර පැහැදිලි දර්ශනයකින් යුතුව කර ගෙන යෑම හෝ අතහැර දැමීම හෝ මේ තීරණාත්මක අවස්ථාව විසින් විසඳනු ඇතැයි මම විශ්වාස කරමි. ඒ ගමන අතහැර දැමීම යනු, ආසියාවේ බොහෝ රටවල් පත්ව ඇති ශෝචනීය දූර්භාග්‍ය ඉරණම වෙත අපද පත්වීමයි. එවැන්නක් වීමට මෙහි ඉඩකඩ නැතැයි සිතුවොත්, එය අතිශයින් මුළාවකි. එවැනි ශෝචනීය ඉරණමක් ගැන ඉඟියක් දක්වන කළු වලාකුළු අප හිස මත එක්රැස් වන අයුරු අපට පෙනී යා යුතුය.

අද අප රජයත් මෙවැනි තීරණාත්මක අවස්ථාවකට මුහුණ දී සිටින බවට සැකයක් තිබිය නොහැකිය. ඒ බව මේ අය වැය තුළම ගරු මුදල් ඇමතිතුමාම විවෘතව සාකච්ඡා කර තිබේ. ඒ වාගේම අපේ සංවර්ධනයේ පදනම විය යුත්තේ ගමද, නගරයද යන සංවාදයද අද නැවතත් කරළියට පැමිණ ඇත. මේ සම්බන්ධයෙන්ද ගුණදාස අමරසේකර ප්‍රාඥයා නැවත නැවතත් අපගේ අවධානය යොමුකොට ඇත. අනගාරික ධර්මපාලතුමා මේ රට පුරා ගෙන ගිය සංවාදයේ මූලික හරය වූයේ, අපගේ සභ්‍යත්වය ගොඩනැඟී ඇත්තේ ගම මූලික කර ගෙන බවය. එදා පිලිප් ගුණවර්ධන මහතාගේ ප්‍රධාන ආර්ථික උපදේශකයකු වූ ජී.වී.එස්. ද සිල්වා මහතා විසින් රචිත "Some Heretical Thoughts on Economic Development" වැනි කෘති මඟින්ද පෙන්වාදී ඇත්තේ අප රටේ සංවර්ධන එළඹුම මූලික විය යුත්තේ ගම සංවර්ධනය කිරීම මඟින් බවය. මේ සම්බන්ධයෙන් මේ අය වැය තුළ තීරණාත්මක පියවර ගෙන ඇති බව අපට දක්නට ලැබේ. ගම සමඟ පිළිසඳර, ග්‍රාමීය සංවර්ධනය, ග්‍රාමීය ජනයා විවිධ වූ නිෂ්පාදන ක්‍රියාවලට යොමු කරවීම, ග්‍රාමීය කර්මාන්ත හා ග්‍රාමීය නිෂ්පාදන සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම පිළිබඳව මේ අය වැයේ විශාල වශයෙන් අවධාරණය කර ඇති බව පැහැදිලිය. "ගම සමඟ පිළිසඳර" සම්බන්ධයෙන් ගත් කල සමස්තය වශයෙන් රුපියල් මිලියන 85,000ක් වෙන්කොට ඇති බව අපට දැක ගැනීමට පුළුවන්. සමස්ත අය වැයේම මුදල් වෙන් කිරීම් හා සසඳන කල එය අතිවිශාල මුදලක්. අපි සංසන්දනාත්මකව බැලුවොත්, විශාල ඇළ මාර්ග, එමෙන්ම විශාල ජලාශ සහ ග්‍රාමීය ජලාශ සඳහා විශාල වශයෙන් මුදල් වෙන් කර තිබියදීත්, "වාරි සෞභාග්‍යා" සමස්ත ක්‍රියාවලිය සඳහා වෙන්ව ඇත්තේ රුපියල් මිලියන 68,237ක් වැනි මුදලකි.

ඒ සමඟ සසඳන කල 'ගම සමඟ පිළිසඳර' සඳහා සමස්තයක් වශයෙන් රුපියල් මිලියන 85000ක් වෙන්වීම තුළ ගම මුල් කරගත් සංවර්ධනය, නැත්නම් ග්‍රාමීය ජනයාගේ ජීවන රටාව ඔසවා තැබීම තුළ අපේ රටේ අනාගත සෞභාග්‍ය උදා කර ගැනීමේ බලාපොරොත්තුව අපට දක්නට ලැබෙනවා. ඒ හා සමඟම මූලික වශයෙන් ග්‍රාම නිලධාරි වසම් වශයෙන්, පළාත් පාලන කොට්ඨාස වශයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වෙන් වෙන අය වැය වශයෙන් සහ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ආයෝජන වශයෙන් මුදල් වෙන් වී තිබෙනවා. ඒ හා සමඟම මූලික වශයෙන් ගත් කළ නිෂ්පාදන ආර්ථිකය හා ජීවනෝපාය සංවර්ධනය සම්බන්ධයෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ද ග්‍රාමීය ආර්ථිකය නැංවීම හා බැඳී පවතින බව ද පෙනෙන්නට ඇත. ඒ යටතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය වස විසවලින් තොර වල් නාශක පරිහරණ ක්‍රම දිරි ගැන්වීම හරහා ගොවි ජනතාව වෙත සහන සැලසීම, කාබනික පොහොර ප්‍රවර්ධනය, නව කෘෂි තාක්ෂණය හඳුන්වා දීම, වැවිලි ක්ෂේත්‍රය, ධීවර හා ජල ජීවී ක්ෂේත්‍රය, පශු සම්පත් ක්ෂේත්‍රය, පාරම්පරික ගෘහ කර්මාන්ත ක්ෂේත්‍රය, අත්යන්ත්‍ර බතික් ඇතුළු පේෂ කර්මාන්ත ක්ෂේත්‍ර ආදී නිෂ්පාදන ක්ෂේත්‍ර රැසකටම වෙන් වී ඇති මුදල් ග්‍රාමීය ආර්ථිකය, ග්‍රාමීය ජන ජීවිතය ඔසවා තැබීමට හේතුවනු ඇති බව අපගේ විශ්වාසයයි.

එහෙත් මේ ගම මුල් කරගත් සංවර්ධනය මේ අය වැයෙහි ප්‍රමුඛතාව ද කියන ප්‍රශ්නය ද අය වැයේ ඇතැම් කරුණු සැලකිල්ලට ගැනීමේ දී පෙනේ. අද අපි මුහුණ දෙමින් පවතින විදේශ විනිමය පිළිබඳ ගැඹුරු අර්බුදයට අපි මුහුණ දෙන්නේ කෙසේද යන ප්‍රශ්නයට මේ අය වැය තුළින් නිසි පිළිතුරු ලැබී තිබේද යන්න සැක සහිතය. නැතිනම් ඒ සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු අපහැදිලිය. බලශක්ති ක්ෂේත්‍රය තුළ ආයෝජනය කෙරෙන්නේ කවරාකාරයකට ද යන්න, ඒ සඳහා කෙතරම් මුදල් යොදවන්නේ ද යන්න, පුනර්ජනනීය බලශක්තියේ ක්ෂේත්‍ර කරා අපේ සමස්ත බලශක්ති ක්ෂේත්‍රය සියයට 70ක යෙදැවුම් යොදා ගන්නේ කවර ආයෝජනයක් මත ද යන්න මේ අය වැය තුළ අපට අපහැදිලිය.

එලෙසම, ඇතැම් ප්‍රමුඛතා සම්බන්ධයෙන් ද මේ අය වැයෙහි යම් යම් මූලික එළැඹුම හා විසංවාදී කරුණු පවතින බව ද පෙනී යන බව කිව යුතුය. අන් සියලු ක්ෂේත්‍රවලට වඩා ගම සමඟ පිළිසඳර නැත්නම් ග්‍රාමීය ආර්ථිකය සඳහා වෙන් වූ රුපියල් මිලියන 85,000 මෙන් හතර ගුණයක මුදලක් මාර්ග සංවර්ධනය සඳහා යෙදැවී තිබීම එක්තරා ආකාරයකට අපගේ ප්‍රවාහන ගැටලු විසඳා ගැනීම සඳහා මහා මාර්ග සංවර්ධනය කෙරෙහි මූලික අවධාරණය යොදවා තිබීම ඛනිජ තෙල් පිළිබඳ අර්බුදයකට මුහුණ දෙමින් සිටින අවස්ථාවක, විදේශ විනිමය පිළිබඳ අර්බුදයකට මුහුණ දෙමින් සිටින අවස්ථාවක, නිවැරදි එළැඹුමක් ද යන්න සැක සහිතය. එමෙන්ම, මේ අය වැය අවසාන කරන අවස්ථාවේ දී දක්වා ඇති ඇතැම් කරුණු ද, අයිතිය කාගේදැයි සටන් පාඨවලට හසු නොවී රාජ්‍ය හා පෞද්ගලික ව්‍යාපාර ලාභදායී තත්ත්වයකට පත් කරන කළමනාකරණය ද එම රටවල සමෘද්ධිමත් බවේ දක්නට ලැබෙනවා. විදේශ රටවල සිසුන්ට එම රටවල තිබෙන පහසුකම් ආදී දේවල් ගැන ද -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
'රාජ්‍ය සේවය රටට බරක්' යැයි පැවසීම යනාදිය ගැන අපි නැවතත් ගැඹුරින් සිතා බැලිය යුතු බව අපගේ අදහසයි.

අපි ත්‍රස්තවාදය පරාජය කිරීමට පෙර අපගේ සන්නද්ධ හමුදාවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ද නොයෙකුත් මතවාද අප සමාජය පුරා ප්‍රචලිත වූ බව අපි කවුරුත් දන්නවා. එහෙත් සංවිධානාත්මක සැලසුම් සහගත ක්‍රියාවලියක් තුළ අපි මේ රටේ ත්‍රස්තවාදය සහමුලින් අවසන් කිරීම සඳහා ඒ හමුදා යොදා ගත් ආකාරය අද අප රට මුහුණ දී සිටින අභියෝගය ජය ගැනීම සම්බන්ධයෙන් ද ආදර්ශයට ගත හැකි බව මාගේ අදහසයි. ජාතික සංවාදයක් තුළ මේ රටේ ගරුතර භික්ෂූන්වහන්සේලා, ජාතික සංවිධාන ඇතුළු ඒ ජාතික මතවාද විසින් ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට හමුදා වාගේම පැවතුණු රජය ද යොමු කර ගත් ආකාරය සහ ඒ සඳහා ඇති කළ දැවැන්ත සමාජ සංවාදය මේ අවස්ථාවේ දී අප රට නිවැරදි මාවත කරා ගෙන යෑමට අත්‍යවශ්‍ය බව මගේ අදහසයි.

එවැනි සංවාදයකින් තොරව අප විශාල වශයෙන් බලාපොරොත්තු තැබූ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් නොවූ තරුණයන් ලක්ෂයකට රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වැනි ක්‍රියාමාර්ග ගත්තත්, මේ අය වැයෙන් විශාල ලෙස ප්‍රතිපාදන වෙන් වී ඇති "ගම සමඟ පිළිසඳර" වැඩසටහනත්

[ගරු ගෙවිඳු කුමාරතුංග මහතා]

එවැනි දැවැන්ත ජාතික සංවාදයකින් තොරව, නිවැරදි මහ පෙන්වීමකින් තොරව සාක්ෂාත් කර ගත හැකිවේද යන්න අප හමුවේ තිබෙන බලවත් ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මං අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා මෙම අය වැය තුළ ඇති ඒ ද්විත්ව යොමුවීම් මතින් ජාතික ආර්ථිකය සහ ජාතික අපේක්ෂා පෙරමුණට ගෙන එන ජාතික සංවාදයක් මත නිවැරදි වෙමින් අපේ රටේ අනාගතය ගොඩ නඟා ගත යුතු බව අපගේ අදහසයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මේජර් ප්‍රදීප් උඳුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ දී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**
(மாண்புமிகு (மேஜர்) பிரதீப் உந்துகொட)
(The Hon. (Major) Pradeep Undugoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. WEERASUMANA WEERASINGHE *left the Chair and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

[අ.භා. 4.35]

**ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**
(மாண்புமிகு (மேஜர்) பிரதீப் உந்துகொட)
(The Hon. (Major) Pradeep Undugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් ශ්‍රී ලංකාවේ ඉදිරිපත් කරන 76වන අය වැය ලේඛනය වශයෙනුත්, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ දෙවන අය වැය ලේඛනය වශයෙනුත්, වත්මන් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල අය වැය ලේඛනය වශයෙනුත් සලකන මෙම අය වැය විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය ඔබතුමාට පුද කරනවා.

ශ්‍රී ලාංකිකයන් හැටියටත්, ඒ වාගේම ලෝකවාසී ජනතාව හැටියටත් මානව ශිෂ්ටාචාරය තුළ ඉතාම ඛේදජනක අවස්ථාවකට අද අපි මුහුණ දී තිබෙනවා. කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ ලෝකවාසී ජනතාව සමාජයීය වශයෙනුත්, ආර්ථිකමය වශයෙනුත් විවිධ ගැටලු රාශියකට මුහුණ දීලා තිබෙනවා. නිදහස් ශ්‍රී ලංකාව තුළ ඉදිරිපත් කරන ලද අය වැය ලේඛන 76 අතරින්ම අභියෝගාත්මකම අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අවධිය තුළයි කියන එක අපි හොඳාකාරවම දන්නවා.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව කථා කරනකොට ශ්‍රී ලංකාවාසී ජනතාව හැටියට අපි මුහුණ දුන් ප්‍රධාන අභියෝග දෙකක් තිබෙනවා. ඒකෙන් ප්‍රධානතම අභියෝගයක් හැටියට සලකන්නේ මේ රටේ දශක තුනක් තිස්සේ පැවති අන්තවාදී ජන වාර්ගික අරගලයයි. ඒ අරගලය නිසා අපේ රටේ සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් යන ජන වර්ගවලට අයත් ජනතාවගෙන් විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් වුණා. යුද ජයග්‍රහණයෙන් පස්සේ, 2009 වර්ෂයේ ශ්‍රී ලංකාව නිදහස්, නිවහල්, ස්වෛරී රාජ්‍යයක් බවට පත් වුණා. ඉන් අනතුරුව අප නොසිතූ ආකාරයට පැතිරී ගිය මේ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සමාජයීය, ආර්ථිකමය හා සංස්කෘතිකමය වශයෙන් විශාල අභියෝග රාශියකට අප මුහුණ දීලා තිබෙනවා. පසුගිය කාලයේ පැවති ප්‍රධානතම අභියෝගය හැටියට සලකන ත්‍රස්තවාදයට මුහුණ දෙනකොට ත්‍රස්තවාදියා කවුද කියන එක අපි හොඳාකාරවම දැනගෙන සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ අද ලෝකයේ කිසිම රටකට මේ කොවිඩ් - 19 වසංගතයට නියමිත වූ ප්‍රතිකාරයක් සොයා ගන්නට පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ වාගේම, මේ කොවිඩ් - 19 වසංගතයේ දිනෙන් දින වෙනස්වන ප්‍රභේදවලට මුහුණ දෙන අවධියක තමයි අද මේ ලෝකවාසී ජනතාව ජීවත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දියුණු වෙමින් පවතින රටක් හැටියට පැවතුණත්, ලෝකයේ ප්‍රමුඛතම, ප්‍රබලම රාජ්‍යයන්ට පවා අද කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහමුලින්ම අවසන් කරන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ.

අපට තිබෙන එකම උපකාරය අපි සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත්ව සෞඛ්‍ය අංශවලින් ලබාදෙන උපදෙස් නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමයි. ඒ නිසා කොවිඩ් - 19 වසංගත තත්ත්වයෙන් බේරීමට පුළුවන් එකම උපාය මාර්ගය හැටියට අපි දකින්නේ සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත්ව ජීවත් වීමයි.

2020 වර්ෂයේ මැද භාගයේදී අපි කොවිඩ් වසංගත තත්ත්වයට මුහුණ දුන්නා. ඒ කොවිඩ් වසංගත තත්ත්වයට මුහුණ දෙනකොට අපිට අවබෝධ වුණා, ශ්‍රී ලංකාවාසී ජනතාව හැටියටත්, මහජන නියෝජිතයන් හැටියටත් අපි ස්වයං විනයක් ඇති කරගත යුතුයි කියන එක. එහිදී යම්කිසි ආකාරයකින් අපට පළමුවෙනි රැල්ල පාලනය කරගන්න පුළුවන්කම ලැබුණා. නමුත්, කොවිඩ් වසංගත තත්ත්වයේ පළමුවෙනි රැල්ලට වඩා දෙවන රැල්ල ශක්තිමත්ව නැඟී හිටපු ආකාරය අපි දැක්කා. එහෙම අවධියකයි අපි දෙවන රැල්ලට මුහුණ දුන්නේ. ඉන් අනතුරුව තෙවන රැල්ල ආරම්භ වූ අවධිය තුළ මහජන නියෝජිතයන් හැටියට විශේෂයෙන්ම

විපක්ෂයේ සහෝදර ගරු නායකතුමන්ලා සමහර අවස්ථාවලදී කටයුතු කරපු ආකාරය අපට දකින්නට ලැබුණා.

සමහර අවස්ථාවල සෞඛ්‍ය මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කරමින්, ජනතාව විදි කරා බස්සමින්, කොවිඩ් - 19 රැල්ලට තවත් පණ දෙමින්, මේ කටයුත්ත පාලනය කළ නොහැකි තත්ත්වයට රජය අපහසුතාවට පත් කරන ගමන් ජනතාව අපහසුතාවට පත් කරන්නට පෙලඹීම පිළිබඳව ඇත්තෙන්ම අපි කනගාටුවට පත් වන්නට ඕනෑ.

ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම දන්නවා, මන්ත්‍රීවරුන් හැටියට අපටත්, රටේ සිටින සියලු රාජ්‍ය නිලධාරින්ටත්, විශ්‍රාමිකයන්ටත් -මේ හැමෝටම- තමන්ට නියමිත වැටුප නියමිත දිනට ලැබෙන බව. විපක්ෂය හොඳකාරව හිතාගන්න ඕනෑ, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ අපි සෞඛ්‍ය මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කළාම, අවසන් ප්‍රතිඵලය විධියට මේකෙන් දුක් විඳින්නේ අහිංසක මහජනතාව කියන එක. ඒ නිසා කුමන ආකාරයෙන් කටයුතු කළත් කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රජයක් හැටියට අපට එන්නත් ලබා දීම කරන්න පුළුවන්. මේ වන විට සියයට 72කට අධික සංඛ්‍යාවකට අපි එන්නත් ලබා දී තිබෙනවා. අපි දෙවන එන්නතත් ලබාදීලා, ඉන් අනතුරුව මීට දින දෙකකට පෙර සිට වයස අවුරුදු 60ට වැඩි ජනතාව වෙනුවෙන් බූස්ටර් එන්නතක් ලබාදීමට කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුමන ප්‍රශ්නයක් රටේ පැවතුණත් අපි මූලිකත්වය ලබා දුන්නේ, ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්නයි. 2009 වසරේ මේ රට භාර ගන්නකොට "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ජනතාවට විශාල පොරොන්දු රාශියක් අපි ලබා දුන්නා. නමුත්, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාරගෙන මාස තුනක් යන්නට මත්තෙන් අපේ අවාසනාවකට වාගේම රටේ ජනතාවගේ අවාසනාවකට කොවිඩ් - 19 වසංගත තත්ත්වයට මුහුණ දෙන්නට අපට සිද්ධ වුණා. ඉන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමා දුරදක්නා නුවණින් ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ කුමකටද යන්න පිළිබඳව රජයක් හැටියට තීන්දු කළා. ඒ නිසා අපි සෑම කටයුත්තකටම වඩා මූලිකත්වය ලබාදුන්නේ මේ රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීමේ අරමුණ ඉටු කර ගැනීමටයි. අපට ඉන් ඉහළට යෑමට පුළුවන්කම ලැබෙන්නේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගැනීමෙන් පමණයි කියන එක මේ අවස්ථාවේදී මා කියන්නට ඕනෑ.

අපට කුමන දේශපාලනයක් කරන්නත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් ඉතිරි වෙන්නට ඕනෑ. නමුත් අපි අද මේ රටේ ජනතාවගේ ජීවිත බේරා ගත්තේ නැත්නම්, අපට රටක් ඉතුරු වුණේ නැත්නම්, කුමන පක්ෂයක හිටියත්, කුමන ආගමක හිටියත්, කුමන ජාතිකයක හිටියත් අපට දේශපාලනය කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රධානම ආදායම් මාර්ගයක් වූ සංචාරක ව්‍යාපාරය අද කඩාගෙන වැටිලා තිබෙනවා. ඒ වාගේම විදේශිකයන් ආයෝජනය කරන ආයෝජන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, විදෙස් ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් කොවිඩ් වසංගතය හමුවේ රැකියා අහිමි වෙලා නැවත ශ්‍රී ලංකාවට පැමිණීම හේතුවෙන් විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ලැබිය යුතු විශාල මුදලක් මේ වෙනකොට අපට අහිමි වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**
(மாண்புமிகு (மேஜர்) பிரதீப் உந்துகொட)
(The Hon. (Major) Pradeep Undugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

අද විපක්ෂය කුමන ආකාරයෙන් චෝදනා ඉදිරිපත් කළත්, මේ රටේ පොළොවේ පය ගහලා ජීවත් වෙන මිනිස්සු හැටියට, රජයක් හැටියට මේ අය වැය ඉදිරිපත් කිරීමේදී අපි බලන්න ඕනෑ ජනතාව පීඩාවට පත් නොකර ජනතා හිතවාදී අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳවයි. ඒ කාර්යය කිරීම පිළිබඳව ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුති කරන ගමන් මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා.

[අ.භා. 4.45]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයම වසංගත තත්ත්වයකට මුහුණ දීලා තිබෙන වෙලාවේ 76වැනි අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අය වැය ජනතාවාදීව ඉතා ආකර්ෂණීය විධියට ඉදිරිපත් කරන්න කටයුතු කළ අපේ රටේ ජනාධිපතිවරයා වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, අපේ අගමැති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, විශේෂයෙන් මේ අමාරු අවස්ථාවේ ඉතාම හොඳ අය වැයක් ජනතාවට ලබා දෙන්න ඇප කැප වෙලා වැඩ කරපු අපේ බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් අපි ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන් රටක අය වැයක් තුළින් මූලිකවම ජනතාව සතුටින් තබන්න ඕනෑ. ලෝකයේ සංවර්ධනය මනිනකොට අද ප්‍රධානම ඉලක්කය වෙලා තිබෙන්නේ සතුට කියන කාරණය. මේ සතුට මොන විධියටද අපට ඇති කරන්න පුළුවන්කම ලැබෙන්නේ? අන්න ඒ සතුට ගෙන දෙන්න තමයි අපට අද වුවමනා වෙලා තිබෙන්නේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මටත්, අපේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ටත් මේ අය වැයෙන් ලොකු කාර්යභාරයක් පැවරී තිබෙනවා. මේ අය වැයෙන් ලබා දෙන මුදල් ප්‍රතිපාදන අපි ගමට අරගෙන ගිහිල්ලා, ගමේ ජනතාවත් එක්ක බද්ධ වෙලා ඒ සංවර්ධන ඉලක්ක සාර්ථක කර ගැනීම වෙනුවෙන් අපට ලොකු වගකීමක් තිබෙනවා. ඒ නිසා අපි ඒ වගකීම හොඳින් තේරුම් ගන්නට ඕනෑ. අය වැය විවේචනය කරමින් කටයුතු කළාට මම හිතන්නේ ඊට වඩා අපට පැවරිච්ච වගකීම තමයි, මේ වසංගතයත් එක්ක අසරණභාවයට පත්වෙලා ඉන්න ජනතාව ළඟට අපි යන එක. එහෙම යන්නට පුළුවන් වන අය වැයක් තමයි අපට හඳුන්වාදීලා තිබෙන්නේ.

මම නවක මන්ත්‍රීවරයකු විධියට පාර්ලිමේන්තුවට නිතරම සහභාගි වෙනවා. මේ විපක්ෂය දිහා බලනකොට මට වෙලාවකට හරි පුදුම හිතෙනවා. මොකද, ඒ අය ලොකු යෝජනා ගෙනෙනවා. මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්න, ගෙවුම් ශේෂය පියවා ගන්න, වෙළඳ ශේෂය පිළිබඳව සහ ආර්ථිකය ශක්තිමත් කරන්න. ඒ වැඩ පිළිවෙළ ගැන එතුමන්ලා කථා කරනවා. හැබැයි, අපි දන්නවා රටට මේ තත්ත්වය උදා

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා]

කරන්න 1978දී රටේ ආර්ථික ක්‍රමය වෙනස් කරලා, විවෘත ආර්ථිකයක් මේ රටට හඳුන්වා දීලා, අධර්මිෂ්ට ආණ්ඩුවක් මේ රටට ගෙනැල්ලා කටයුතු කළ බව. 1983 ජනවාරි මේ රටේ අර්බුදයක් ඇති කරලා පුස්තකාල කඩලා, සාපලත් යුද්ධයක් මේ රටට හිමිකරලා දීලා මේ රටේ තිබුණු දේශීයත්වය, අපේකම සියල්ල විනාශ කරපු 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක කටයුතු කළ ආණ්ඩු ගැන අපි දන්නවා. 1988 -1989 කාලයේ කොල්ලෝ කෙල්ලෝ දහස් ගණනක් මරණයට පත් කරලා මේ රට අගාධයට ඇදලා දැම්මා. 1994දී අපට භාරගන්න ලැබුණේ එවැනි රටක්. 2002 පොඩි කාලයකට නැවතත් බලයට ආවාට පස්සේ මේ රට එල්ටීටීඊ එකට, කොටින්ට ලියලා දුන් ආණ්ඩුවක් තිබුණා. අද විපක්ෂයේ ඉන්න අය 2015දී බලයට ආවාට පස්සේ "යළි පුබුදමු ශ්‍රී ලංකා" කියලා වැඩසටහනක් ගෙනැල්ලා මේ රට විකුණන්න, -අළෙවි කරන්න- උත්සාහ කරලා රට ආර්ථික වශයෙන් ප්‍රපාතයටම ඇදලා දැම්මා.

ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල අඩු වෙලා තිබුණු කාලයේ එයින් ඉතිරි වුණු මුදල කළමනාකරණය කළේ නැහැ. විපක්ෂය බලයේ සිටියදී මේ රටේ බෝක්කුවක්, පාලමක්වත් හදා ගන්න බැරි වෙච්ච නිසායි ජනතාව අපට ආණ්ඩුව බාර දුන්නේ. ඒ විධියට කටයුතු කරපු අය තමයි, "අපට මේවා කරන්න පුළුවන්, මෙහෙම කරන්න පුළුවන්." කියලා අද විවිධ යෝජනා ඉදිරිපත් කරන්නේ. ඒ අයට රට පාලනය කරන්න ලැබුණු වෙලාවේ ඒවා කරලා පෙන්වන්න ඕනෑ. 2009දී ත්‍රස්තවාදයෙන් රට බේරා දුන්නු නායකයාගේ ආණ්ඩුව 2015දී ගලවලා මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට දුන්නේ මේ රටට වැඩක් කරන්නයි. තමුන්නාන්සේලා රටට වැඩක් කරයි කියලා ජනතාව විශ්වාස කළා.

නමුත්, මොනවාද කළේ කියලා තමුන්නාන්සේලා දන්නවා. එදා බැඳුම්කරය හරහා මහා මුදල් වංචාවක් කරලා මේ රට බංකොලොත් කර දැම්මා මිසක් වෙන කරපු දෙයක් නැහැ. ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ, අද අපට මේ ලැබී තිබෙන අවස්ථාව මොකක්ද, අද අපට තිබෙන කාර්යභාරය මොකක්ද කියලා. අද අපේ රටේ ත්‍රී වීලර් එළවන කෙනා ළඟට ගියාම ඔහුගේ සිතේ සතුටක් නැහැ; අද පාසල් දරුවාගේ සිතේ සතුටක් නැහැ; බස් රථ හිමියාගේ සිතේ සතුටක් නැහැ; ගොවියාගේ සිතේ සතුටක් නැහැ. මේ වසංගතයත් එක්ක ඔවුන්ගේ සියලු කටයුතු බිඳ වැටිලා. කඩයප්පම් හදන කෙනා, බුලත් විට හදන කෙනා කියන මෙන්න මේ අයට සතුට ගෙන දෙන්න, ඔවුන්ගේ ජීවන රටාව නැවත ගොඩ නඟන්න අපට මොකක්ද කරන්න පුළුවන්කම තිබෙන්නේ?

අන්න ඒ වෙනුවෙන් තමයි ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අය වැය හරහා මුදල් යෙදවෙන්නේ. මේ මුදල් ටික අපි ගමට අරගෙන ගිහිල්ලා මේ මිනිස්සුන්ගේ ජීවන රටාව නඟා සිටුවා, නිෂ්පාදකයා නඟා සිටුවා, හැඹිලියට ආපු සල්ලි ටික, සාක්කුවට ආපු සල්ලි ටික නැවතත් ඔවුන්ට ලබා දීම සඳහා අපට යමක් කරන්න පුළුවන්ද, අන්න ඒ දේ කරන්නයි මෙවර අය වැයෙන් මුදල් වෙන් කර තිබෙන්නේ. ඒ සඳහා අපි ගම තුළ නිෂ්පාදන ඇති කරන්න ඕනෑ. ගමේ කුඩා කණ්ඩායම්වල සාමූහික ක්‍රියාදාමයක් තුළින් තමයි ආර්ථිකය ගොඩ නඟන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ. ඒ දේ කරන්න තමයි මේ අය වැයෙන් අවස්ථාව උදාවෙලා තිබෙන්නේ. ගම ගොඩ නඟලා, ගැමියාගේ ආර්ථිකය ශක්තිමත් කිරීම හරහා රට සංවර්ධනය කරන්න පුළුවන් කියන තේමාව යටතේයි මෙවර මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු විධියට තේරී පත්වී එන්නේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස ඉඳලා, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයකු ලෙස ඉඳලා, පළාත් සභාවේත් මන්ත්‍රීවරයකු ලෙස ඉඳලායි. ප්‍රාදේශීය සභාවේ අය වැය කියවන වෙලාවේත් මම සභාවේ හිටපු කෙනෙක්. මම අවුරුදු 11ක් සභාපති තනතුරේ කටයුතු කරමින් සභාවේ අය වැය හදපු කෙනෙක්. මම පළාත් සභාවේ අය වැයට යෝජනා දුන්නු කෙනෙක්. හැබැයි, මගේ දැනුමේ හැටියට කවදාවත් අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවක් වන රට තුළ මෙවැනි තත්ත්වයක් ඇති වී තිබුණේ නැහැ. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට මේ අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේයි.

ගමේ ත්‍රී වීලර් එළවන මාමාගේ පණිවුඩය මෙහි තිබෙනවා; ගමේ අප්පුහාමි මාමාගේ, ගමේ ගොවි මහත්මයාගේ, ගමේ මුදියන්සේ මාමාගේ, ගමේ සෙව්වන්දිලාගේ, ප්‍රබෝධ්‍යලාගේ පණිවුඩය මෙතැන තිබෙනවා. පාසල් දරුවන්ගේ ඔන්ලයින් අධ්‍යාපනයේ තිබෙන අඩු පාඩු ටික, ඔවුන්ට තාක්ෂණය පැත්තෙන් තිබෙන අවශ්‍යතා ටික, ගොවියාගේ හඬ, ගමේ ඉඳිආප්ප තම්බන කෙනාගේ හඬ, ආප්ප උයන කෙනාගේ හඬ මෙහි තිබෙනවා. මේ හැම කෙනාගේම හඬට සවන් දෙන්න අතිගරු ජනාධිපතිතුමා "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන ආරම්භ කළා. ඒ වැඩසටහන තුළින් ගත්ත යෝජනා, අදහස් සියල්ල කැටි කරලායි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. මේ අය වැය කොයි වෙලාවකවත් ණය ගන්න බලාගෙන, එහෙම නැත්නම් ඒවාට යටවෙලා සකස් කරපු අය වැයක් නොවෙයි. ස්වයංව නැඟී සිට ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්නත්, ජනතාවගේ ඒකපුද්ගල ආදායම් වැඩි කරලා, ඔවුන්ට සතුටින් ජීවත් වෙන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්නත් අවශ්‍ය යෝජනා මේ තුළ ඉදිරිපත් කර තිබෙනවා. ගමකට ගිහිල්ලා "ඔබලාට කොහොමද " කියලා මේ වසංගතයෙන් පීඩනයට ලක් වෙලා ඉන්න කෙනාගෙන් අපි අහනකොට, "අපට ආණ්ඩුවෙන් නැඟිටින්න හයිය දුන්නා; අපි නැවතත් ගොඩ නැඟෙනවා, නැඟිටිනවා." කියන පණිවුඩය ඒ ජනතාවගෙන් අහන්න තමයි අද අපට වුවමනා වෙලා තිබෙන්නේ. ඒ දේ කරන්න තමයි අපට වගකීම තිබෙන්නේ. ඒ නිසා මෙය තවත් සාම්ප්‍රදායික අය වැයක් නොකර, අපි කෙරෙහි ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා තිබ්බ විශ්වාසය අපි රකින්නට ඕනෑ. තව බොහෝ කාරණා කියන්න තිබුණත් කාල වේලාව අවසන් නිසා මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

මේ අවස්ථාවේ මම යෝජනාවක් කරන්න කැමැතියි. ඒ තමයි, අවුරුදු 65 දක්වා රාජ්‍ය සේවය කරන කාලය වැඩි කරනකොට ඔවුන්ගේ කාර්යක්ෂමතාවත්, ඔවුන්ගේ විනයත්, ඔවුන්ට තිබෙන හැකියාවත් පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතුයි; ඒ ගැන අපි තවදුරටත් සමාලෝචනය කළ යුතුයි කියන කාරණය. ඒ වාගේම, මේ අය වැයෙන් මත් ද්‍රව්‍ය මිල වැඩි කරන්න ගත්ත තීන්දුව මම අත් දෙකම ඔසවා අනුමත කරනවා. මේ රටේ සිගරැට් මිල වැඩි කරනකොට මම අත් දෙකම ඔසවා ඒක අනුමත කරන කෙනෙක්.

හරක් මස් අළෙවියත් නවත්වා, මස් කඩ ටිකත් වහලා දාලා, ගව සම්පතත් ආරක්ෂා කරන්න අපට පුළුවන් නම් ඒකත් ඉතාම වැදගත්. සිංහල බෞද්ධයකු වශයෙන්, ගම නියෝජනය කරලා පාර්ලිමේන්තුවට ආපු කෙනෙකු වශයෙන්, ඒ සතුට අපේ ගමේ මිනිසුන්ට අරගෙන යන්න පුළුවන් නම් හොඳයි කියන එකත් මතක් කරන්න ඕනෑ. එසේ කටයුතු කරනවා නම් ඒ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවට මගේ ගෞරවය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමා.

[අ.භා. 4.53]

**ගරු අකිල එල්ලාවල මහතා**
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය විවාදයට එක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විවාදයට සම්බන්ධ වෙන්න කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අද උදෑසන පාර්ලිමේන්තුවට ඇවිල්ලා මිනිසුන් නොමඟ යවන ප්‍රකාශයක් කළා. මම නියෝජනය කරන්නේත් රත්නපුර දිස්ත්‍රික්කයයි. එතුමා පළාත් සභාවේ ඉන්න කොටත් අසත්‍ය කියලා මිනිස්සු නොමඟ යැව්වා. එතුමා ඉතාම භයානක ප්‍රකාශයක් කළා, එතුමන්ලාගේ උද්ඝෝෂණයට සහභාගි වුණු පුද්ගලයෙකුට පොලීසිය විසින් පහර දීලා, ඝාතනයට ලක් වුණා කියලා. ඒක ඉතාම සාවද්‍ය ප්‍රකාශයක් බව මම පැහැදිලිව කියන්න ඕනෑ. අපේ ගරු සරත් වීරසේකර ඇමතිතුමා ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළා. මම රත්නපුර දිස්ත්‍රික්කයේ පුරවැසියෙක් හැටියට ඉතාම කනගාටුවට පත් වෙනවා, එතුමා ජනතා නියෝජිතයකු හැටියට මෙවැනි අසත්‍ය ප්‍රකාශ කරලා, ජනතාව නොමඟ යවන්න කටයුතු කිරීම පිළිබඳව. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් විධියට එතුමා ඒ පිළිබඳව ලජ්ජා වෙන්න ඕනෑ.

අපි විපක්ෂයේ ඉන්න කාලයේදී අපේ පක්ෂයේ නිර්මාතෘ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අපට වැඩසටහනක් හඳුන්වා දුන්නා, "ගම සමඟ පිළිසඳර" කියලා. අපි එදා ඒ තුළින් කළේ ගමේ ජනතාවගේ භෞතික සම්පත් සංවර්ධනය, සමාජයීය සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය වැඩිදියුණු කරන්නේ කොහොමද කියලා සුහද සාකච්ඡාවක් කරන එකයි. අපි රජයක් පිහිටුවා ගත්තාට පස්සේ -අපි ආණ්ඩුව පිහිටුවා ගත්තාට පස්සේ- ඒ ජනතාවගේ ඉල්ලීම් යථාර්ථයක් බවට පත් කරන්න ඕනෑ. ඒ සඳහා අය වැය යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. මම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එදා අපි විපක්ෂයේ ඉන්න කොට ජනතාව අපෙන් ඉල්ලූ ඉල්ලීම් 2022 - 2023 වසරවල යථාර්ථයක් බවට පත් කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මේ වන විට ග්‍රාම නිලධාරි වසම් 14,021ක් තිබෙනවා. ඒ ග්‍රාම නිලධාරි වසම් 14,021ටම මෙවර අය වැයෙන් රුපියල් මිලියන තුන ගණනේ ලැබිලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට රුපියල් මිලියන 100 ගණනේ ලැබිලා තිබෙනවා. අපේ රටේ ප්‍රාථමික මැතිවරණ කොට්ඨාස 4,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ සෑම නියෝජිතයෙකුටම රුපියල් මිලියන හතර ගණනේ මෙවර අය වැයෙන් ලබා දීලා තිබෙනවා. ඒ සියලු මුදල් එකතු කරලා බැලුවාම මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 3,980ක් හම්බ වෙනවා. විපක්ෂය මොන කථා කිව්වත්, මොන තරම් මඩ ගැහුවත් ඒ සියලු මූල්‍ය පහසුකම් ලබා දෙන්නේ අපේ බිම් මට්ටමේ ඉන්න ජනතාවගේ ජන ජීවිත ශක්තිමත් කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු සියලු මන්ත්‍රීතුමන්ලා කථා කළේ, කොවිඩ් වසංගතය තුළ අපේ තිබුණු ආදායම් නොලැබුණු ආකාරය ගැනයි. අපට සංචාරක කර්මාන්තයෙන් එන ආදායම නැති වුණා. විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ආදායම නැති වුණා. ඒ සියලු ආදායම් නැති වෙච්ච එකයි වුණේ. අද වන විට අපේ ග්‍රාමීය ජනතාවගේ වාගේම නාගරික ජනතාවගේ පවා ආර්ථිකය බිංදුවට වැටිලායි තිබෙන්නේ. මේ වෙලාවේ කඩිනමින්ම අපට කරන්න තිබෙන දේ තමයි අපේ ජනතාවගේ අතමිට සරු කරන එක. අපට එක රැයෙන්, එක දවසින් ඒක කරන්න බැහැ. නමුත් ගරු මුදල් ඇමතිතුමා මේ අය වැය යෝජනා මඟින් ඒ සඳහා හොඳ තීන්දුවක් අරගෙන තිබෙනවා. ගමේ බුලත් විට විකුණන මනුෂ්‍යයාගේ, ගමේ පාර අයිනේ තැඹිලි ගෙඩියක් විකුණන මනුෂ්‍යයාගේ, සුළු සහ මධ්‍ය පරිමාණ සියලු ව්‍යාපාරිකයන්ගේ දැත් ශක්තිමත් කරන්න මේ අය වැය මඟින් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. හැම ක්ෂේත්‍රයක්ම නියෝජනය වන ආකාරයෙන් සියලු දෙනාට සහන ලබා දෙන්න එතුමා කටයුතු කර තිබෙනවා. ඒ නිසා ඉතාම කාලෝචිත සහ යථාර්ථවාදී අය වැයක් හැටියට මට මේ අය වැය හඳුන්වා දෙන්න පුළුවන්. , ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. කොවිඩ් වසංගතය නිසා ත්‍රිරෝද රථ හිමියන් විශාල සංඛ්‍යාවක් අද ආර්ථික වශයෙන් ඉතාම පහත් මට්ටමකට වැටිලා ඉන්නවා. ඒ ත්‍රිරෝද රථ අයිතිකරුවන් වෙනුවෙන් රුපියල් මිලියන 600ක් වෙන් කරන කොට, එක් අයෙකුට රුපියල් 750ක වාගේ මුදලක් තමයි ලැබෙන්නේ කියලා විපක්ෂය කියනවා.

එතුමන්ලා හිතන දේ නොවෙයි රජය එයින් බලාපොරොත්තු වන්නේ. රජය බලාපොරොත්තු වන්නේ, යම්කිසි අත දීමක් කරන්නයි. ඔවුන් නියැලි ක්ෂේත්‍රය වෙනුවෙන්, ඔවුන්ගේ ව්‍යාපාරය වෙනුවෙන්, ඔවුන්ගේ වෘත්තිය වෙනුවෙන් යම්කිසි අත දීමක් කිරීමට තමයි ගරු මුදල් ඇමතිතුමා එසේ යෝජනා කර තිබෙන්නේ.

ඒ වාගේමයි, පාසල් වෑන් රථ හිමියන්. අපි දන්නවා, විශේෂයෙන්ම පාසල් ප්‍රවාහන සේවයේ නියුතු වෙච්ච වෑන් රථ හිමියන්ට මාස ගණනාවක් යන කල් මුදල් ලැබුණේ නැති බව; ඔවුන්ට ලැබිය යුතු ආදායම ලැබුණේ නැති බව. එම නිසා පාසල් වෑන් රථ හිමියන්ට සහන දෙන්නත් මෙහි යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, ආදායම් අහිමි වූ පෞද්ගලික බස් රථ හිමියන් වෙනුවෙන් පහසුකම් සහ සහන සැලසීමටත් මෙම අය වැයෙන් රුපියල් මිලියන 1,500ක් වෙන් කර තිබෙනවා.

විශ්‍රාම වැටුප් නොලබන අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් මෙවර අය වැයෙන් හඳුන්වා දී තිබෙනවා. ගැබිනි මව්වරුන්ට මාස 10ක් දක්වා පමණක් ලබා දුන් පෝෂණ මල්ල මාස 24ක් දක්වා දීර්ඝ කර අඛණ්ඩව ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. මේ ආකාරයෙන් සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අද මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න. පස් වරු 5.00ට ප්‍රධාන වැඩකටයුතු අවසන් කරන්න ඕනෑ.

**ගරු අකිල එල්ලාවල මහතා**
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව පටන් ගත්තා විතරයි. මට තව සුළු වෙලාවක් ලබා දෙන්න.

මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තය ආශ්‍රිතව ඍජු සහ වක්‍ර රැකියා කරන පවුල් 25,000ක් විතර ඉන්නවා. ඒ පුද්ගලයන් සඳහා අද විශේෂ වැඩ පිළිවෙළක් රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙනවා. ඒ පිළිබඳව මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. ඒ වාගේම සබරගමුව විශ්වවිද්‍යාලයත්, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයත් එකතු වෙලා 2022 වසරේ සිට එම ක්ෂේත්‍රය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සහ ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු කර තිබෙනවා. මේ වන විටත් MoU එක අත්සන් කරලා ඉවරයි. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යාපනය

[ගරු අකිල එල්ලාවල මහතා]

ලබා දීම සඳහා එම විශ්වවිද්‍යාලයට අවශ්‍ය උපකරණ ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. මොකද, ඒ මඟින් අපට පුළුවන් වෙයි එම ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් විශාල පිරිසකට ලබා දීමට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න ගොඩක් දේවල් තිබුණත්, කාලය නැහැ. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

***එකල්හි වේලාව අ.භා. 5.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2021 නොවැම්බර් 19 වන සිකුරාදා පවත්වනු ලැබේ.***

*பி.ப. 5.00 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2021 நவம்பர் 19, வெள்ளிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 19th November, 2021.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

## පුත්තලම දිස්ත්‍රික්කයේ වනාන්තර ආරක්ෂා කරගැනීම
### புத்தளம் மாவட்ட வனங்களைப் பாதுகாத்தல்
### PROTECTION OF FORESTS IN PUTTALAM DISTRICT

[අ.භා. 5.01]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පුත්තලම දිස්ත්‍රික්කය සුවිශේෂී හූ විෂමතාවකින් සමන්විත දිස්ත්‍රික්කයකි. පසෙකින් මුහුදින් හා තවත් පසෙකින් කලපුවක් සේම දැවැන්ත වැව් පද්ධතියක් හා වී, පොල් ඇතුළු භෝග රැසකින් පොහොසත් භූමි තීරයකි. එසේම මෙම පුත්තලම දිස්ත්‍රික්කයට සුවිශේෂ වනාන්තර පද්ධතියක් ද ඇත. වනජීවී දෙපාර්තමේන්තුවට අයත් තබ්බෝව අභය භූමිය ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගැසට් කළ වන රක්ෂිත ද, එසේ නොකළ සංරක්ෂිත වනාන්තර පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි වන වියනට ඇතුළත් වේ. අද වන විට දිස්ත්‍රික්කය තුළ දැඩි වනාන්තර විනාශයක් සිදු වෙමින් පවතින අතර, අනාගත පරපුර වෙනුවෙන් එකී වනාන්තර ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් සකස් කළ යුතු බවට මෙම ගරු සභාව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමස්ත ශ්‍රී ලංකාව ගත් කල පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ ඉතාම සුවිශේෂී දිස්ත්‍රික්කයක් බව මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. එහි වන සනත්වය - වනාන්තර-, හෙක්ටෙයාර 84,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ කියන්නේ, භූමියෙන් සියයට 27.6ක ප්‍රමාණයක්. භූමියට සාපේක්ෂව ගත් විට එය විශාල ප්‍රමාණයක්. එම වනාන්තරවල විනාශ වෙච්ච තැන් බොහොමයක් තිබෙනවා. එම වනාන්තර, සුළු වශයෙන් විනාශ වෙනවා; සමහර වෙලාවට මහා පරිමාණ වශයෙන් විනාශ වෙනවා. සමහර අවස්ථාවල වගා කිරීම වාගේ කටයුතුවලට කියා සමහර ඉඩම් ලබා දී තිබෙනවා.

මේ කාරණාත් එක්ක ගත්තාම, සමහර වෙලාවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉඩම්වලට මායිම් ගල් දැමීමේ වැරැදි ක්‍රමය නිසා ඒ ඉඩම්වල පදිංචි අයගෙන් සමහර විට ඒ වනයට යම් කිසි හානියක් සිද්ධ වනවා. ඒ, එහි පරිපාලනයේ තිබෙන වැරැද්දක් නිසා. ඒ වාගේම බොරලු කැපීම යනාදී වෙනත් සංවර්ධන කටයුත්තකට අවශ්‍ය අමු ද්‍රව්‍ය ගන්න යැමේදීත් වනය විනාශ වෙච්ච අවස්ථා තිබෙනවා.

මගේ යෝජනාව වන්නේ, පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙන වනාන්තර පද්ධතිය ආරක්ෂා කරගන්න වැඩ පිළිවෙළක් හැදිය යුතුය කියන එකයි. එතැනදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය කියන ආයතන දෙක සම්බන්ධයෙන් ප්‍රශ්න සහගත තැන් කිහිපයක් තිබෙනවා. මොකද, ඒ අය තමන්ට අයිති ඉඩම් ප්‍රමාණය නිවැරැදි විධියට වෙන් කරගෙන නැහැ. ඒවායේ පදිංචි වෙලා හිටපු අය ඒ ඉඩම් දාලා ගිහින්, යුද්ධයෙන් පසුව නැවත ඇවිත් බලන විට තමන්ගේ ඉඩම නැහැ. මායිම් ගල් දමලා එය වනජීවී එකට වෙන් කරලා. සමහර වෙලාවට ඒ ඉඩම් ගැසට් කරලා නැහැ. වනජීවී එකට ගැසට් කරපු සමහර තැන්වල තිබෙන කඩොලාන සමහර නිලධාරින් සම්බන්ධීකරණය කරගෙන කපලා, ඒ ඉඩම් තමන් වෙත අරගෙන තිබෙනවා, ඒවා ආණ්ඩුවට අයත් නැහැ කියලා. මේ වාගේ ප්‍රශ්න කිහිපයක් මතු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මට කාරණා කිහිපයක් කියන්න තිබෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කය ගත්තාම, සුන්දර වෙරළ තීරයකින් සමන්විතයි; ඒ වාගේම, විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ කළපුවත්, වැව්, ගංගා ආදි සියල්ලත් පිහිටා තිබෙනවා. විල්පත්තුව ඊට එහා පැත්තෙන් පිහිටා තිබෙනවා. අපේ ප්‍රදේශයේ තමයි ලංකාවේ විශාලම ගසත් පිහිටා තිබෙන්නේ. ඒ වාගේමයි, තම්බපන්නිය. විජය රජ්ජුරුවන් ගොඩ බැස්සා කියන තම්බපන්නිය ප්‍රදේශයේ පස තඹ පාටයි. එය සුවිශේෂී වූ තැනක්. මේ සියල්ල සංරක්ෂණය කරන වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

අපට ඔක්සිජන් ඕනෑ. අපට ඔක්සිජන් ලබා ගන්න නම් වනය අවශ්‍යයි. ඒ වාගේම වර්ෂාවත් එක්ක සම්බන්ධ වෙච්ච පාරිසරික වැදගත්කම් විශාල වශයෙන් එහි තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මේ කරුණු කාරණා සියල්ල එකට ගෙන මේ වෙලාවේ මා ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. කාලාන්තරයක් තිස්සේ දේශපාලනඥයන් අල්ලා ගත් ඉඩම් විශාල ප්‍රමාණයකුත් එහි තිබෙනවා. අපි දන්නවා, එවැනි ඉඩම් සමහර අමාත්‍යවරුන්ට තිබෙන බව. සමහර අය මීට පෙර අක්කර 50ක් අරගෙන, ඒ අක්කර 50ට අක්කර 100ක් යා කරගෙන තිබෙනවා. ඒ අතරේ ඒ වාගේ තැනුත් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාට මා නැවත නැවතත් කියන්නේ, පළමුවෙන්ම ඒ පුංචි මිනිසුන්ගේ ඉඩම් ටික බේරා දෙන්න කියලායි. මොකද, ඒ පුංචි මිනිසුන්ගේ ඉඩම් ටික බේරා දුන්නාට පසුව මේ ගොඩක් ප්‍රශ්නවලට විසඳුම්

ලැබෙනවා. ඒ අයත් එක්ක සාකච්ඡා කරලා, නිවැරැදි විධියට තීන්දුවක් ගන්න ඕනෑ, ඒ අය ජීවත් වන ප්‍රදේශය හරි විධියට මායිම් ගල් දමලා වෙන් කළාද, නැද්ද කියන කාරණය සම්බන්ධයෙන්. සමහර තැන්වල වැව මැද්දෙන් මායිම් ගල් දමා තිබෙනවා. වනජීවී එක වැව මැද්දෙන් මායිම් ගල් දැම්මාට පස්සේ එහි ජීවත් වන ජනතාවට වැවට ගිහිල්ලා තමන්ගේ වැඩ ටික කර ගන්න බැහැ. එතැනදී විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එතැනදී ඒ ජනතාව සහ ඒ ආයතන, ඒ අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන් අතර විශාල ගැටුමක් ඇති වෙනවා. ඒකේ එක පැත්තකින් මුහුද, කළපුව, සුන්දර වූ වෙරළ, ගංගා, ඇළ දොළ සහ විශේෂයෙන්ම මා කියූ වනාන්තර කොටස තිබෙනවා. ඊළඟට, විල්පත්තුව අභය භූමිය තිබෙනවා. හොඳම කොරල් පරය පිහිටා තිබෙන්නේ අපේ ප්‍රදේශයේ කියලායි අප දැඩිව විශ්වාස කරන්නේ. මත්ස්‍ය සම්පත ගත් විට, ජනතාව හැම තිස්සේම බලන්න යන ඩොල්ෆින් සහ තල්මසුන් - whales - කියන මත්ස්‍ය වර්ග දෙකම එහි ඉන්නවා. ඒ වාගේම හොඳින් සුළඟ තිබෙන නිසා kitesurfing ඇතුළු ජල ක්‍රීඩා කරන්නත් පුළුවන්. ඒ සියල්ලට හොඳම ප්‍රදේශයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව කාලයකට පෙර ඉදිරිපත් කර තිබුණු යෝජනාවක්. ගරු අමාත්‍යතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාට හරියටම කරුණු කාරණා ඉදිරිපත් කරන්න තිබිච්ච අවස්ථාවක් තමයි මඟ හැරිලා තිබෙන්නේ. මොකද, කාලයකට පසුවයි මෙම යෝජනාවට අවස්ථාව ආවේ. නමුත් මම ගරු අමාත්‍යතුමාගෙන් ඉතාම කාරුණිකව, ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අපේ දිස්ත්‍රික්කය සමස්ත ශ්‍රී ලංකාවෙන්ම සුවිශේෂ වූ දිස්ත්‍රික්කයක්. ඒ නිසා ඒ දිස්ත්‍රික්කයේ තිබෙන වනාන්තර පද්ධතිය ආරක්ෂා කර දෙන්න; ස්වාභාවික සම්පත් ටිකත් හරියට ආරක්ෂා කර දෙන්න; පරිසරයට සම්බන්ධ සියලු දේ හරියට ආරක්ෂා කර දෙන්න; ඒ සුන්දරත්වයත් එක්ක අපේ ජනතාවට හොඳින් ජීවත් වෙන්න පුළුවන්, ඔවුන්ගේ අත මිට සරු වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් ද හරි විධියට හදලා දෙන්න කියන ඉල්ලීම තමයි මේ යෝජනාව ඉදිරිපත් කරමින් මා කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය හොඳ යෝජනාවක්, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, යෝජනාව ස්ථිර කිරීම, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

[අ.භා. 5.08]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ, වයඹ පළාතේ ඉතාම වැදගත් දිස්ත්‍රික්කයක්. ඒ වාගේම පරිසර විවිධත්වයකින් යුතු, කළපුව ආශ්‍රිතව ඉතාම වටිනා පරිසර පද්ධතියක් තිබෙන දිස්ත්‍රික්කයක්. පුත්තලම දිස්ත්‍රික්කයේ පරිසරය සම්බන්ධයෙන් කථා කිරීමේදී මේ කාරණය මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ දිස්ත්‍රික්කයේ රජය සතු ඉඩම් විශාල ප්‍රමාණයක් යම් යම් බලපෑම් මත, විශේෂයෙන් දේශපාලන බලපෑම් මත අයථා විධියට පාවිච්චි කරන ආකාරය අපි දකිනවා. පුත්තම කියන්නේ, ඉඩම් සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් තිබෙන දිස්ත්‍රික්කයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ටික කාලයකට පෙර යම්කිසි සිද්ධියක් අපි දැක්කා. මා හිතන හැටියට මේ යෝජනාව ගෙනෙන්න ඇත්තේත් ඒ සම්බන්ධව වෙන්න ඇති. ටිකක් කල් ගිහිල්ලා නේ මේ යෝජනා විවාදයට ගැනෙන්නේ. අපි දැක්කා, රැම්සා තෙත් බිම් කලාපය. රැම්සා තෙත් බිම් හැටියට නම් කර තිබෙන කලාපය ඉස්සන් කොටු සඳහා නැවත ශුද්ධ කරලා ඒ කටයුතු කළා. අපි ඒවාට සහභාගි වුණා. දැන් ඒවා නැවතිලා ආපසු රැම්සා තෙත් බිම් හැටියට ක්‍රියාත්මක වෙනවා. එවැනි ඉතාම වටිනා ස්ථාන පවා යම් යම් මැදිහත්වීම් නිසා විනාශ වෙනවා. මේවා පෙරදී රැම්සා තෙත් බිම් ලෙස තිබුණාය කියනවා. ඒ තත්ත්වය තුළ නිවැරැදි කිරීමක් කරලා, ඒවා නැවතත් තෙත් බිම් හැටියට පවත්වාගෙන යෑම සඳහා ඒවා අලුතින් වෙනස් කිරීමට තැත් කිරීමක් අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසරය ගැන කථා කිරීමේදී මේ කාරණය නොකියාම බැහැ. ගරු ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. පස්, වැලි, ගල් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් විශේෂ චක්‍රලේඛ තිබෙනවා. 2019 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරයා බලයට පත් වුණාට පස්සේ මේ චක්‍රලේඛ සියල්ල ඉවත් කරලා, පස්, වැලි, ගල් සියල්ලම ප්‍රවාහනය කරන්න ලබා දී තිබුණු බලපත්‍ර ඉවත් කළා. අපේ රටේ ඉතිහාසයේ මේ චක්‍රලේඛ සියල්ලම නිකුත් කර තිබෙන්නේ පරිසරය ආරක්ෂා කර ගන්නයි. මාස 6ක කාලයක් තුළ හෝ ජනාධිපතිවරණය අවසන්වෙලා මහ මැතිවරණය පැවැත්වුණු කාලය දක්වා මේ චක්‍රලේඛ ඉවත් කිරීම කර තිබුණා. අපේ පරිසරයට එයින් විශාල හානියක් සිදු වුණා. එක පැත්තකින්, ගල්, පස් සීමාවකින් තොරව ප්‍රවාහනය කළා. එදා අපි මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කථා කළාම, මේ කාල සීමාව තුළ මේ රටේ පරිසරයට විශාල හානියක් සිද්ධ වුණාය කියලා පරිසර ඇමතිවරයා පිළිගත්තා. ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන්න අපි වග බලා ගන්න ඕනෑ.

විශේෂයෙන්ම මෙම ඉඩම් වනජීවී අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වශයෙන් ආයතන දෙකකට වෙන් කරලා තිබෙනවා. ජනතාවගේ පැත්තෙන් ගත්තාම සමහර කොටස් ගැසට් කිරීමේදී යම් යම් අඩුපාඩු සිද්ධවෙලා තිබෙනවා. ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ පදිංචිවෙලා සිටින ස්ථාන වනජීවී අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගැසට් කරලා තිබෙනවා. මේ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, විශේෂයෙන් පරිසරයට හානියක් නොවෙන්නත්, එහි ජීවත්වන ජනතාවට හානියක් නොවෙන්නත්, ඒ අයට යම් ස්ථිර තත්ත්වයක් ඇතිවන විධියටත් අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මෙය හැම තැනම තිබෙන ප්‍රශ්නයක්. පුත්තලම දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තත්, එහෙම නැත්නම් අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තත්, සමස්තයක් වශයෙන් රට පුරාමත් මේ තත්ත්වය ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම පරිසරයත් අපට වැදගත් වෙනවා. වනයේ සතුනුත් ජීවත් වෙන්න ඕනෑ, ඒ වාගේම

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ජනතාවත් ජීවත් වෙන්න ඕනෑ. ඒ තත්ත්වය තුළ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, කාටවත් හානි නොවෙන්න හොඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, මේවා නිරවුල් කර දෙනවා නම් ඉතාම වැදගත්ය කියන එකත් මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම පස්, වැලි, ගල් සඳහා ලබා දීලා තිබෙන බලපත්‍ර ඉවත් කරන්නේ නැතුව, ඒවාට නීතිරීති පනවා පාලනයකින් ඒ කටයුතු කළේ නැත්නම් අපේ වටිනා පරිසර පද්ධති විනාශ වෙන්න පුළුවන්. මා හිතන හැටියට එය පසුගිය කාල සීමාව තුළ මේ රජය ආරම්භයේදී සිදු වී තිබෙන වැරැද්දක්. දැන් එය තේරුම් ගෙන තිබෙනවා. එදා පරිසර අමාත්‍යවරයා කිව්වා, ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන්න වග බලා ගන්නවාය කියලා. ඒ සම්බන්ධයෙනුත් ඇමතිතුමාට මතක් කරනවා. පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ අපට ඉතාම වටිනා ස්වාභාවික සම්පත් ගණනාවක් තිබෙන පරිසර පද්ධතියක්. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්නය කියා මතක් කරමින්, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාටත් ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සනත් නිශාන්ත රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු සනත් නිශාන්ත මහතා (ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனத் நிசாந்த - கிராமிய மற்றும் பிரதேச நீர்க் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha - State Minister of Rural and Divisional Drinking Water Supply Projects Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසියේ නමුත් කථා කරන්න අවස්ථාවක් සලසා දීම සම්බන්ධව හදවතින්ම ස්තුතිය පුද කරනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කියන කථාව මමත් පිළිගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් සී.බී. රත්නායක අමාත්‍යතුමාත් සභා ගර්භයේ සිටින මේ අවස්ථාවේ මෙම කාරණය අපි කථා කරන එක සුදුසුයි. දිස්ත්‍රික්කයක් හැටියට, ප්‍රදේශයක් හැටියට අපට මේ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වුණු හේතුවක් තිබෙනවා. මගේ මතකයට අනුව 2002 වසරේ ජාත්‍යන්තර සම්මුතීන්වලට අත්සන් කරන වේලාවේ අපේ සමස්ත භූමියෙන් යම්කිසි ප්‍රතිශතයක් වන සංරක්ෂණ ප්‍රදේශ හැටියට නම් කළ යුතුයි කියලා රජය තීන්දුවක් ගත්තා. එවකට තිබූ එක්සත් ජාතික පක්ෂ රජය තමයි ඒ තීන්දුව ගත්තේ. ඒ වේලාවේදී ඇත්තටම ගමට, බිමට බහින්නේ නැතිව, ප්‍රදේශයට යන්නේ නැතිව, ගොවිපොළට යන්නේ නැතිව සමහර නිලධාරින් පරිගණකය තුළින් අන්තර්ජාල තාක්ෂණය හරහා තමයි සීමා මායිම් ලකුණු කළේ. මෙන්න මේ කාරණය නිසා අපේ ගම්බිම්වල, අපේ ප්‍රදේශවල සමහර ජනතාවගේ නිවස තිබෙන්නේ වනජීවි වන සංරක්ෂණ ප්‍රදේශයෙන් එළියේ; මුළුතැන්ගෙය තිබෙන්නේ වනජීවී වන සංරක්ෂණ ප්‍රදේශයේ; වැසිකිළිය තිබෙන්නේත් වනජීවී වනසංරක්ෂණ ප්‍රදේශයේ. හැබැයි, වැසිකිළි වළ පිරුණාම අලුතින් වළක් හාරා ගන්න වනජීවී අධ්‍යක්ෂ ජනරාල්තුමා ළඟට ඇවිත් අවසර ගන්න ඕනෑ. මෙවැනි ස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙනවා.

මට පෙර කථා කළ ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා කිව්වා, රැම්සා තෙත් බිමේ යම් කිසි හානියක් සිදු වෙලා තිබෙනවා කියලා. රැම්සා තෙත් බිම කියන එක පුංචි අක්කර 50ක විතර එකක් නොවෙයි. මේක ග්‍රාම නිලධාරි වසම් හතරක් පුරා විසිරි පැතිරි තිබෙන රජමහ විහාරයක් ප්‍රමුඛ විහාරස්ථාන දෙකක් තිබෙන, කතෝලික දේවස්ථාන තුනක් තිබෙන, පවුල් විශාල ප්‍රමාණයක් සිටින තැනක්. ෆෙස්ටස් පෙරේරා කැබිනට් අමාත්‍යතුමා සිටි කාලයේ ඉස්සන් කර්මාන්තය කරගෙන යාම සඳහා එවකට තිබූ විශාල මහා පරිමාණ සමාගමක් වන කාසන් කියන සමාගමට Block A, Block B සහ Block C කියලා කොටස් තුනකට වෙන් කරලා මේ ඉඩම් දුන්නා. මේකේ Block C කියන කොටසේ 1996 ඉස්සන් කර්මාන්තය පාඩු වුණු වෙලාවේ කාසන් කියන බහුජාතික සමාගම ඒක දාලා ගියාම, ඒ ප්‍රදේශයේ ජනතාව ප්‍රාදේශීය ලේකම්ගෙන් බලපත්‍ර අරගෙන මේ ගොවිපළවල් කරගෙන ගියා. හැබැයි, මේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත යටතේ රජය ගත් තීන්දුවත් එක්ක, ගොවීන්ට නැවත වතාවක් මේ ප්‍රදේශවලට වාර්ෂික බලපත්‍ර නිකුත් කරන්නේ නැහැ කියන තීන්දුවත් එක්ක මේ ඉස්සන් ගොවිපළවල් රැම්සා තෙත්බිම් හැටියට නම් කළා. ඒ නිසා දැවැන්ත ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා. අද මේ වෙනකොටත්, මේ කථා කරන මොහොත වෙද්දීත් විශාල ගොවිපළ ප්‍රමාණයක් රැම්සා තෙත්බිම ඇතුළේ පවත්වාගෙන යනවා. ඒ නිසා අපි මේක තෝරා බේරා ගන්න ඕනෑ. එක පැත්තකින් රටට අවශ්‍ය කරන විදේශ විනිමය ගෙනෙන මේ ව්‍යාපාර ගම්වල ජනතාව කරන්න ඕනෑ, එහෙම නැත්නම් සමාගම් කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, අපේ පරිසරය ආරක්ෂා කර ගන්නත් ඕනෑ. රාජ්‍ය නිලධාරි නෝනාවරු, මහත්වරු මේවායේ මායිම් ලකුණු කරන වේලාවේ නිසියාකාරව මායිම් ලකුණු නොකළ නිසා, එදා හේන, කුඹුර කළ ප්‍රදේශ අද වනජීවී, වනසංරක්ෂණ ප්‍රදේශ බවට පත් වුණු නිසා කඳුළු බොන ගොවීන් අදත් ආනමඩුව ආසනයේ විශාල ප්‍රමාණයක් ඉන්නවා. එදා ඔවුන් මුං, කව්පි, උඳු, බඩඉරිඟු වගා කළ ගොවිපළවල් වනජීවී කලාප බවට පත් වෙච්ච නිසා, වන සංරක්ෂණ ප්‍රදේශ බවට පත් වෙච්ච නිසා එහි ප්‍රතිඵලයක් හැටියට බඩගින්නේ ඉන්න මිනිස්සුත් අපේ ආසනයේ ඉන්නවා. ඒ නිසා මේකට අපි යම් කිසි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. අපි පරිසරයට ආදරෙයි. පරිසරය ආරක්ෂා කරන රජයක් හැටියට අපේ මුදල් අමාත්‍යතුමා ලබන වර්ෂයේ ගමට මුදල් වෙන කරනකොට පරිසර ක්‍රියාකාරකම්වලට වෙනම මුදලක්, සමස්ත සංවර්ධන ව්‍යාපෘතිවලින් සියයට 10ක මුදලක් පරිසර ක්‍රියාකාරකම්වලට - ගස් හිටවන්න,පරිසර පද්ධතිය ආරක්ෂා කරන්න, ජෛව විවිධත්වය ආරක්ෂා කරන්න- වෙන් කරලා තිබෙනවා.

2002 වසරේ මේ ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරු හැටියට කටයුතු කළේ එවකට එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ හිතවතෙක්. එතුමන්ලා සම්බන්ධ වෙලා මේ මායිම් ලකුණු කළ නිසා අපේ අහිංසක ජනතාවට මේ විපතට මුහුණ දෙන්න සිද්ධ වුණා කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සී.බී. රත්නායක ඇමතිතුමා.

[අ.භා. 5.08]

**ගරු සී.බී. රත්නායක මහතා (වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Wildlife and Forest Conservation)

මූලාසනාරූඪ මා හිතවත් ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමනි, මේ මොහොතේ අපේ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කාලෝචිත -කාලානුරූප- මාතෘකාවකට අප අවතීර්ණ කර තිබෙනවා. ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ කාරණය පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වාම ඔබු දුවපු කාරණයක්. මේ මායිම් නිදහස් කර ගන්න, නිර්ණය කර ගන්න ගියාම විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. එක පැත්තකින් යුද්ධය නිසා අවතැන් වූ ජනතාව අත්හැර දමා තිබුණු ප්‍රදේශ අද ඝන කැලෑ බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අපේ වන ගහනය සියයට 29යි කිව්වාට, වවුනියාව දිස්ත්‍රික්කයේ වන ගහනය සියයට 59ක් විතර වෙනවා. ඒ දිස්ත්‍රික්කවල ජන ශූන්‍ය වූ ප්‍රදේශ ඝන කැලෑ බවට පරිවර්තනය වෙලා තිබෙනවා. එහෙම වුණේ ඒ වෙලාවේ ගොවීන් ඒ වගා බිම් අත්හැර ආ නිසා. දැන් ඒ අයට නැවත පදිංචි වීම සඳහා අවස්ථාව සලසා දීමත් එක්ක, ඒ අය ඒ ප්‍රදේශවලට යා යුතුයි. ඒ වාගේම මෙතැනදී මට "ගෙදර ගියොත් අඹු නසී - මග හිටියොත් තෝ නසී" කියන කියමන මතක් වනවා. මොකද, වන ගහනය සියයට 29යි කියලා කිව්වාට, මේ ඉඩම් ඒ ජනතාව අතර බෙදනකොට වන ගහනය තවත් අඩු වුණොත් අපට හොඳ හුස්ම පොදක් ගන්න තිබෙන අවස්ථාව අඩු වෙනවා.

අපි දූපත් රාජ්‍යයක්. මේ දූපත සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කිව්වා වාගේ තම්බපන්නිය ගැන අපේ ඉතිහාසයේ කථා කරනවා. ඒ, අපේ පළමුවෙනි රජු ගොඩ බැහැපු තැන වාගේම විශාලම වෘක්ෂය තිබෙන ප්‍රදේශය. ඒ වාගේම පුත්තලම කියන්නේ සංචාරක ආකර්ෂණය තිබෙන දිස්ත්‍රික්කයක් වාගේම වගා බිම් තිබෙන දිස්ත්‍රික්කයක්. ඒ විතරක් නොවෙයි, පුත්තලම කියන්නේ අපට වැඩිපුර පොල් සපයන දිස්ත්‍රික්කයක්.

සමහර සිද්ධිවලදී සමහර නිලධාරි කරපු වැරදි දේශපාලනඥයා මතට තමයි එන්නේ. දේශපාලනඥයන් එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගන්න ඉස්සෙල්ලා ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. අපි බලයට එන්නේ අවුරුදු 5කට. අපට ඒ ජන වරම අවුරුදු 5කට දුන්නාම අපි රටේ අයිතිකාරයෝ නොවෙයි, භාරකාරයෝ. දීර්ඝ කාලීනව ආයතනවල සිටින සමහර නිලධාරි අවශ්‍ය කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කරන්නේ නැහැ. ආණ්ඩුවක් හැටියට ගත් තීන්දු ක්‍රියාත්මක කරන්න යනකොට මෙවැනි බාධා තිබෙනවා කියන එක අපි අවබෝධ කර ගත යුතු වෙනවා. රැකියා ගිවිසුම් වෙන්න පුළුවන්, අභය භූමි වෙන්න පුළුවන්, ඒවාට අදාළ චක්‍රලේඛන, වගන්ති, නීති, අණ පනත් තිබෙනවා. මේ නීති, අණ පනත්වල කුඹුරු බිම් සහ ජනාවාස භූමි නිදහස් කර ගත හැකි අවස්ථා පැහැදිලි කර තිබෙනවා. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, තමන්ගේ ඉඩම්වලට එන්න බැරිව ඉන්න ගොවීන්ගේ නාම ලේඛනය සහ ඒ ප්‍රදේශවල පදිංචි කළ යුතු අයගේ නාම ලේඛනය මා වෙත එවන්න. මම ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්නම්. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න සූදානම් බව මම ඉතාම වගකීමෙන් කියනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, මුල් දවස්වල රැකියා ගිවිසුමත් එක්ක ආ ප්‍රශ්නය ඔබතුමාත් දැක්කා. ඒ විතරක් නොවෙයි. වන විනාශයක් ගැනත් කථා කරලා තිබුණා. මම ඒ ස්ථාන පරීක්ෂාවට ගියා. එහිදී මම දැක්කා, සමහර අවස්ථාවල කියපු පැත්තෙන් නොවෙයි ඒ ඉඩම් දීලා තිබෙන්නේ කියලා. එවැනි කටයුතු කළ අය ගැන අපි තනතුරු -තානාන්තර- බලන්නේ නැතිව ක්‍රියාත්මක වුණා; නීතිය ක්‍රියාත්මක කළා. පුද්ගලයෙකු රකිනවාට වඩා සමස්ත ජනතාව රැකීමේ වගකීම අප වෙත පැවරී තිබෙනවා. ඒ වාගේම සතුන් ආරක්ෂා කර ගැනීමත් අප සතු වගකීමක්. මේ ප්‍රදේශය සතුන් ජීවත් වන ප්‍රදේශයක් බවට පරිවර්තනය කිරීමටත් අපට අවශ්‍ය වෙලා තිබෙනවා. සමහර වෙලාවට ජනතාව හැම පැත්තකින්ම බැට කනවා. නියඟය නිසා හුස්ම පොදක් ගන්න බැරිව, වගා කර ගන්න බැරිව, වනඅලි ඇතුළු වන සතුන්ගෙන් ඇති වෙන ප්‍රශ්න නිසා මිනිසුන් විශාල වශයෙන් බැට කනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේ විල්පත්තුවට මායිම් වෙන තැන තිබෙන තම්බපන්නියට යන පාලම අපි තවම හදලා නැහැ. ඒ පාලම හැදුවොත් ඒක ප්‍රධාන මාර්ගයක් බවට පරිවර්තනය වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ මාර්ගය ප්‍රධාන මාර්ගයක් වුණොත් වන සතුන්ට ප්‍රශ්නයක් ඇති වෙනවා.

එහෙම වුණොත් වන සතුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. එම ප්‍රදේශයේ දැන් දිවියන් නිදහසේ ඉන්නවා. මේ පාලම හැදුවොත් නිදහසේ ඉන්න ඒ දිවියන්ටත් නිදහසේ ඉන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම එම ප්‍රදේශයේ වලසුන් ඉන්නවා. ඒ වලසුන් ඒ පැත්තේම ඉන්නේත් නැහැ, එහාට මෙහාට යනවා. කොහොම වුණත්, මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීම අවබෝධයෙන් කළ යුතු වෙනවා.

අපි කඩොලාන ශාකත් රැක ගන්න ඕනෑ. ඒවා හිටෙව්වාට පසු සමහර අය පහුවදා ගිහිල්ලා ගලවා දමනවා. ඒ, රුපියල් ශත සඳහා. මෙන්න මේ තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමත් මගේ යුතුකමක් හා වගකීමක් කියා මා හිතනවා, ගරු මන්ත්‍රීතුමනි. නැත්නම් මේ කාරණය ගැන අනවබෝධයක් ඇති වෙන්න පුළුවන්. අපට මෙතැනදී පාටක්, පක්ෂයක් නැහැ. අපට බලය දීලා තියෙන්නේ අවුරුදු පහකට. මේ අවුරුදු පහ තුළ අපි හරියාකාරව දෙයක් ක්‍රියාත්මක කරලා, එතැනින් ඉස්සරහට යන්න ඕනෑ.

මගේ යෝජනාව නම් වෙන මොකක්වත් නොවෙයි. වන සම්පත්, වන සංරක්ෂණය වාගේ දේවල්වලට ජාතික ප්‍රතිපත්තියක් තියෙන්න ඕනෑ. මොන ඇමති ආවත්, මොන ආණ්ඩුව ආවත්, ජාතික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක් අපට තියෙන්න ඕනෑ. ඉදිරියේදී ඒක ක්‍රියාත්මක කරන්න මම නිරන්තරයෙන්ම සූදානම් වෙනවා කියන එකත් මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේක දීර්ඝ වශයෙන් කථා කරන්න ඕනෑ මාතෘකාවක්.

ඒ විතරක් නොවෙයි. අද නව තාක්ෂණයත් එක්ක - Google එකත් එක්ක, GPS තාක්ෂණයත් එක්ක - මැනුම් කටයුතු කරන්න ඕනෑ. ඒවායේ අඩුපාඩු තියෙන්න පුළුවන්. හැබැයි, මේ දේවල් ක්ෂණිකව ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව ඇති කරන්න ඕනෑ. සමහර වෙලාවට ජනතාවගේත් වැරදි තියෙනවා. ඒ අය මොනවා වුණත්, ඉඩකඩක් හම්බ වූ ගමන් ගිහිල්ලා එතැන මොකක් හෝ අටවා ගන්නවා. එහෙම නැත්නම් ආණ්ඩුවක් ආ ගමන් ගිහිල්ලා බලෙන් ඉඩම් අල්ලා ගන්නවා. එක පක්ෂයක හිටපු එක්කෙනාගේ ගල් කොරිය මේ පැත්තේ එක්කෙනා ගිහිල්ලා ගහලා එළවලා අල්ලා ගන්නවා. ඡන්දය දුන් නිසා ඒ මිනිහා රැකෙනවා. මෙන්න මේ කාරණය නිසා පරිසරය විනාශ වෙනවා. පරිසරය විනාශ කිරීම නතර කර ගැනීමට අපි දැන් නිසියාකාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. ඉදිරියේදී වන ජීවී හා වන සංරක්ෂණ කලාප තුළ වැලි ගොඩ

[ගරු සී.බී. රත්නායක මහතා]

දැමීම්, ගල් කැඩීම් නිසියාකාරයෙන් ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළක් 2022දී ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා, ගරු අලවතුවල මන්ත්‍රීතුමනි. ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම වුණේ නැත්නම් මේකෙන් මුදල් යන්නේ නිලධාරින්ට විතරයි. එක උදාහරණයක් මම ඔබතුමාට කියන්නම්. මම පොඩි survey එකක් කළා. ඒ survey එක කළේ මාවනැල්ල ආශ්‍රිතව. ගරු මන්ත්‍රීතුමනි, ලොරියකට කඳන් පටවන්න රජයේ ගාස්තුව රුපියල් එකසිය හැටගණනක්. හැබැයි, VAT ආදී ඔක්කෝම tax එකතු කර ගත්තාම රුපියල් 212යි. ලොරියකට දෙන පර්මිට් එකකින් රජයට ලැබෙන්නේ රුපියල් 212යි. දවසකට කඳන් ලොරි 25ක් පටවනවා. ආණ්ඩුවට එන්නේ රුපියල් 212 ඒවා 25යි. හැබැයි, පර්මිට් එක දෙන්න රුපියල් 10,000ක් ඕනෑ. නිලධාරින් රුපියල් 10,000 ඒවා 25ක් ගන්නවා. මේ ගැන කියන්නේ කාටද? කවුද මේවා කියන්නේ? මේ ගැන කථා කරන්න, වැටලීම් කරන්න ගියාම, වෘත්තීය අයිතිවාසිකම් ගැන කථා කරන්න සූදානම් වෙනවා. නමුත්, මම මේක රටට කියන්න ඕනෑ. නැත්නම් කවදාවත් මේ වැරදි හදන්න බැහැ. මේ කාරණයට අදාළ වැටලීම් සඳහා මම flying squad එකක් හදලා තියෙනවා. මම ඒක ක්‍රියාත්මක කරන්න සූදානම් කරනවා. ඒ අතරතුර පොලිසියේ සමහර මහත්වරු ඒ වාගේ තැන් හොයාගෙන තමයි, ස්ථානාධිපතිවරු හැටියට යන්නේත්. මන්ත්‍රීවරු ගැන තමයි මේ රටේ මිනිස්සු කථා කරන්නේ. අපි 225දෙනාට තමයි, "හෙණ ගහපන්" කියන්නේ. නමුත් එතැන ඉන්න පොලිස් ස්ථානාධිපතිවරයාගේ ආදායම රුපියල් ලක්ෂ 10ක් විතර -රුපියල් මිලියනයක් විතර- වෙනවා.

ඊළඟට, විශ්වවිද්‍යාලයේ ළමයි ගෙනැල්ලා දුන්නා, කුඩු, ගංජා සහ ස්පා වාගේ අනෙකුත් දේවල්වලින් මාසයකට එන මුදල සම්බන්ධ තොරතුරු. මේ වාගේ දේවල් වෙනකොට විශේෂ පරීක්ෂණයක් කළ යුතු වෙනවා. අපට ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. එම නිසා තමුන්නාන්සේලාගේ උදවු අපට දෙන්න. කාගෙන්වත් පළිගන්න නොවෙයි. අපි දෙගොල්ලන්ම එකතු වෙලා මේ වන ජීවී කලාපය හදලා දරුවන්ට මේ රට භාර දීමේ වගකීමක් තිබෙනවා. ඒ කාරණය ඉෂ්ට කිරීමයි අපේ වගකීම. මෙම ප්‍රදේශය සංචාරක පුරයක් බවට පරිවර්තනය කරමින්, ආදායම් උත්පාදනය කරන තැනක් මෙන්ම, සතුන් ජීවත් වෙන ප්‍රදේශයක් බවට පරිවර්තනය කරන්නත් අපි සූදානම්. අහිංසක ගොවි ජනතාවගේ රැකවරණයත් එක්ක ඉදිරියේදී තවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි සූදානම්, ගරු මන්ත්‍රීතුමනි. ඒ කාරණය සඳහා මම පුත්තලමට එන්නම්. ඇවිල්ලා පාට, පක්ෂ නොබලා සංවර්ධන කමිටු හරහා ඔබතුමන්ලාගේ යෝජනා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම අපි සකස් කරමු. මම දැන් දිසාපතිවරුන්ට උපදෙස් දීලා තිබෙනවා, හැම සංවර්ධන කමිටුවකටම අමතරව කෘෂිකර්ම කමිටුවක් තියෙනවා වාගේ, මේ වන ජීවී හා වන සංරක්ෂණ ගැටලු තියෙන ප්‍රදේශවලට සිටින හැම මන්ත්‍රීවරයෙකුම ගෙනැල්ලා, සාකච්ඡා කරලා, මට වාර්තාවක් එවන්න කියලා. ඒක 2022දී ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාර්තා හොයන්නේ දිසාපතිතුමා මාර්ගයෙන්. ඒකට එහේ ඉන්න සාමාන්‍ය පුද්ගලයකු ගිහිල්ලා හරි යන්නේ නැහැ. වන සංරක්ෂණ හෝ වන ජීවී කලාපයේ ඉන්න ප්‍රධානියා ගිහිල්ලායි ඒ තීන්දු ගන්න ඕනෑ. ඔහුට තීන්දු ගන්න බැරි නම් කොළඹට එවන්න ඕනෑ. කොළඹට එවන්න බැරි වුණොත්, ඔබතුමන්ලා මට කියන්න. මම දේශපාලන අධිකාරිය හැටියට ඒ ගැන ක්‍රියාත්මක වෙන්න සූදානම්.

Google එකෙන්, නැත්නම් GPS හරහා අපි ගන්න පුළුවන් තීන්දු ගන්නවා. එතකොට කරන්න පුළුවන් දේ අපට පැහැදිලිව කරන්න පුළුවන් වෙයි. එහිදී මුතුරාජවෙල සම්බන්ධයෙන් ගත්ත ක්‍රියා මාර්ගය අරගෙන බැලුවොත්, GPS මඟින් තමයි මුතුරාජවෙල මැනලා තිබෙන්නේ. හැබැයි, කලපුවේ තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ ප්‍රශ්නයට අදාළව ග්‍රාම නිලධාරි වසම් ගණනාවක් තිබෙනවා. ඒ සියල්ල මේ යටතට අරගෙන තිබෙන බවට වැරදි මතයක් තිබෙනවා. හැබැයි, නිර්ණායක විධියට තිබෙන්නේ සීමා නිර්ණ මඟින් ඒ ග්‍රාම නිලධාරි වසම් නිවැරදි කර තිබෙන බවයි. නිලධාරින් ඒක කිව්වේ නැහැ. ග්‍රාම නිලධාරි වසම් ගැන තමයි ප්‍රකාශයට පත් කළේ. මේ ප්‍රශ්නය ඔඩුදුවනකොට තමයි අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ. පසුව කාදිනල්තුමාටත් මේ තත්ත්වය අවබෝධ වුණා. මේ කාරණය තමයි ඇත්ත කථාව කියලා. කළපුවක් විනාශ කරන්න කිසිසේත්ම ඉඩ දෙන්න බැහැ. ඒක ආරක්ෂා කර ගන්න ඕනෑ. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, එම නිසා ඔබතුමාගේ මේ යෝජනාවට අදාළ ප්‍රශ්නයට පිළිතුර දෙන්න මට අවසර දෙන්න. මම ඒ පිළිතුර දෙන්නම්. මම පැහැදිලි කිරීමක් තමයි මෙතෙක් කළේ, ගරු මන්ත්‍රීතුමනි.

පුත්තලම දිස්ත්‍රික්කයේ තබ්බෝව අභය භූමිය තුළ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග පහත දක්වමි.

1. සංරක්ෂණ කටයුතු

- වන ජීවීන් සඳහා වාසස්ථානවල ගුණාත්මකභාවය වැඩි කිරීම.
- තබ්බෝව අභය භූමිය තුළ පිහිටි වැව් ප්‍රතිසංස්කරණය හා ආක්‍රමණශීලී ආගන්තුක ශාක ඉවත් කිරීම සිදු කරනු ලබන අතර, එම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත දැක්වේ.

| **ක්‍රියාකාරකම** | **2021 දක්වා ප්‍රගතිය** |
|---|---|
| වැව් ප්‍රතිසංස්කරණය | වැව් 03කි. (සියඹලාගස් වැව/කිරිය වැව/ නාම්බාකඩ වැව) |
| ආක්‍රමණශීලී ආගන්තුක ශාක ඉවත් කිරීම | දැනට හෙක්ටෙයාර 200යි. තව ඉවත් කරමින් පවතිනවා. |

2. නීතිය ක්‍රියාත්මක කිරීම.

- අභය භූමිය තුළ නිරන්තර මුර සංචාර සිදු කරමින් වන ජීවී අපරාධ මැඩලීම සඳහා කටයුතු කිරීම.
- තබ්බෝව අභය භූමිය හා ඒ අවට වන සංරක්ෂණ රක්ෂිත ආවරණය කරමින් ඉදිකර ඇති විදුලි වැට නඩත්තුව සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් සහ සිවිල් ආරක්ෂක භටයින් යොදවා විදුලි වැට පවත්වාගෙන යන අතර, වන ජීවී අපරාධ සම්බන්ධව තොරතුරු රැස් කිරීමේ ජාලයක් ලෙසද එම පිරිස් යොදා ගැනීම තුළින් අපරාධ අඩු කර ගැනීමට කටයුතු කිරීම.
- තබ්බෝව අභය භූමියේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම්, ගිනි අවි සහ වෙනත් තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබා දීම මඟින් එම රක්ෂිතයේ ආරක්ෂාව තහවුරු කිරීමට නිලධාරින්ගේ හැකියාව වර්ධනය කර ඇත.
- ඉහත කී විදුලි වැට පද්ධතිය, වන ජීවී හා වන සංරක්ෂණ රක්ෂිත ආවරණය කරමින් ස්ථාපිත කර ඇති බැවින්, අනවසර ඉඩම් පරිහරණ රටා වැනි කටයුතු අවම කර ගැනීමට කටයුතු කර ඇත.

- රක්ෂිත මායිම් ඔස්සේ නීතිය සහ රක්ෂිත මායිම් පිළිබඳ දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම මඟින් ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කරමින් පවතී.

- රජයේ නිලධාරින්, මහ ජනතාව සහ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් මෙම රක්ෂිතය පිළිබඳ ජනතාවගේ අවබෝධය වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් පවතී.

  ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධානත් සම්බන්ධ කරගෙන තිබෙනවා. ඔබතුමන්ලාටත් ඒකට ආරාධනා කරනවා. ජාත්‍යන්තර වශයෙන් තිබෙන රාජ්‍ය නොවන සංවිධානත් ඒකට අනුයුක්ත කර තිබෙනවා. පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුස්තකාලවලටත් ඒ පිළිබඳ දැනුවත් කරන්න සූදානම් කර තිබෙනවා.

3. වන ජීවී කළමනාකරණ සැලසුම්

   - තබ්බෝව අභය භූමිය සඳහා කළමනාකරණ සැලසුමක් පිළියෙල කර, එය කෙටුම්පත් අවස්ථාවේ පවතී. එම සැලසුම පාර්ශ්වකරුවන්ට ඉදිරිපත් කර එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මේ සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත දක්වමි.

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි වීරක්කොඩිචෝලේ, වන්නියාගම සහ ඉපලෝගම යන වනාන්තර ආරම්භයේ සිට වන සංරක්ෂණ ජනරාල් යටතේ පාලනය වූ රජයේ වෙනත් වනාන්තර ගණයට අයත් වුණු විශාල වනාන්තර තුනකි.

i. එකී වනාන්තරවලින් වීරක්කොඩිචෝලේ සහ ඉපලෝගම රජයේ වනාන්තරවල කොටසක් සහ වන්නියාගම වනාන්තරය සම්පූර්ණයෙන්ම ඇතුළත් වන පරිදි (469වන අධිකාරිය වූ) 1937 අංක 2 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත යටතේ 2002.07.19 වැනි දින අංක 1245/31 දරන ගැසට් පත්‍රය මගින් තබ්බෝව අභය භූමිය වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත. එහි ප්‍රමාණය හෙක්ටෙයාර 21,933කි.

ii. අභය භූමියක් තුළට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වනාන්තර, රජයේ වෙනත් ආයතනවලට අයත් භූමි ප්‍රදේශ සහ පෞද්ගලික ඉඩම් ද ඇතුළත් විය හැක. එය හුදෙක් බහුල වශයෙන් වන අලි ඇතුළු වනජීවීන් සංචරණය කරන ප්‍රදේශ ආවරණය වන පරිදි සිදු කරනු ලබන්නකි.

iii. අනතුරුව මෙහි සඳහන් වනාන්තර තුන මැන සලකුණු කොට (451වන අධිකාරිය වූ) 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥාපනත යටතේ රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

| රක්ෂිතයේ නම | ගැසට් අංකය | දිනය | ප්‍රමාණය හෙක්ටෙයාර |
|---|---|---|---|
| වීරක්කොඩිචෝලේ රක්ෂිත වනය | 1834/13 | 2013.10.08 | 22,764 |
| වන්නියාගම රක්ෂිත වනය | 1818/5 | 2013.07.08 | 9,501 |
| ඉපලෝගම රක්ෂිත වනය | 1784/9 | 2012.11.12 | 2,676 |

iv. දැනට සෘජුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ පවතින මෙම රක්ෂිත වනාන්තර වන සංරක්ෂණ ආඥාපනත යටතේ කළමනාකරණය කරන අතර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තබ්බෝව අභය භූමියට අයත් ප්‍රදේශයේ වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ විධිවිධාන යටතේ කටයුතු කරන අතර, අවස්ථාවෝචිතව ආයතන දෙකම අදාළ පනත්වලට අනුව ඒකාබද්ධව කටයුතු ඉටු කරනු ලබයි.

v. පුත්තලම දිස්ත්‍රික්කයේ දැනට හෙක්ටෙයාර 40,496ක් රක්ෂිත වනාන්තර ලෙසත්, හෙක්ටෙයාර 1,179ක් සංරක්ෂිත වනාන්තර ලෙසත් ප්‍රකාශයට පත් කර වෙනත් වනාන්තර 7,950ක් පමණ තිබෙන අතර, ඒවායින් හඳුනා ගත් වනාන්තර කොටස් තවදුරටත් රක්ෂිත හා සංරක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

vi. පුත්තලම දිසාවේ මෙම වසර තුළ පමණක් වන අපරාධ වාර්තා 152ක් ලේඛනගත කර නීතිමය කටයුතු කරමින් පවතින අතර, ඉන් වන අපරාධ 109ක්ම වාර්තා වී ඇත්තේ මෙහි ඉහත සඳහන් වනාන්තර තුළය. ඊට අනවසර ඉඩම් අල්ලා ගැනීම් 56ක් ඇතුළත්ය.

vii. පුත්තලම දිස්ත්‍රික්කයේ දැඩි ලෙස සිදුවන වන විනාශ පිළිබඳ තොරතුරු වාර්තා වී නැත. වන අපරාධ වැළැක්වීම සඳහා ජංගම මුර සංචාර තවදුරටත් විධිමත් කර ඇති අතර, ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා අතිරේක වැටලීම් අංශයක් ද පිහිටුවීමට කටයුතු කරමින් පවතී. ඒ අතර වනාන්තර මායිම් නැවත නිශ්චය කොට මැන කණු යොදා සලකුණු කිරීමට ද පරිහානියට පත් ප්‍රදේශ නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ විශේෂයෙන් කඩොලාන ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා ද විශේෂ අවධානයක් යොමු කර ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී.

ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ඔබතුමා ඇසූ ප්‍රශ්නයට උත්තරය. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මෙම වැටලීම් කිරීමේදී විශේෂ කාර්ය බලකායේ සහයෝගය මට ලැබෙන බව. ඒ සහයෝගයත් අවශ්‍යයි, පිරිස් බලය අඩුකම නිසා.

බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමනි, මෙතැන හෙක්ටෙයාර 84,680 ගණනක් තිබෙනවා. ඔබතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛනවල හෙක්ටෙයාර 84,000 ගණනක් නැහැ. මට මේ වනාන්තර සම්බන්ධව තිබෙන ගැටලුව ගැන කථා කරන්න අද වේලාව නැතිනම්, අපි ඒ ගැන වෙනම දවසක කථා කරමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අද දිනට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

කාලය අවසන් නිසා, අපි වෙනම දවසක කථා කරමු. *[බාධා කිරීමක්]* මට research section එකෙන් දීලා තිබෙන වාර්තාව මුළු ගණනක් හැටියට දීලා තිබෙන්නේ.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon.C.B. Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, මම වෙන වෙනම දීලා තිබෙන්නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, ඔබතුමා වෙන වෙනම කියපු ප්‍රමාණය මම දළ වශයෙන් එකතු කළා. නමුත් 84,000 ගණනක් එන්නේ නැහැ. කමක් නැහැ, අපි ඒ ගැන වෙනම කථා කරමු, අද වේලාව නැති නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා හොඳයි, උත්තර දෙයි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 21වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 19 වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2021 ஒக்ரோபர் 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 19, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 19th November, 2021, pursuant to the Resolution of Parliament of 21st October, 2021.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

286 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 286 - இல. 6
Volume 286 - No. 6

2021 නොවැම්බර් 19 වන සිකුරාදා
2021 நவம்பர் 19, வெள்ளிக்கிழமை
Friday, 19th November, 2021

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**2021 නොවැම්බර් 19 වන සිකුරාදා**
**2021 நவம்பர் 19, வெள்ளிக்கிழமை**
**Friday, 19th November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළු කිරීම

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 - [පස්වන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
පාසල් විෂය මාලාවට වෘත්තීය මාර්ගෝපදේශ ඇතුළත් කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
வாய்மூல விடைக்கான வினாக்களை ஒழுங்குப் பத்திரத்தில் சேர்த்தல்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட ஐந்தாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
தொழில் வழிகாட்டல்களைப் பாடசாலைப் பாடத்திட்டத்தில் சேர்த்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Inclusion of Questions for Oral Answers in the Order Paper

AUDITOR-GENERAL'S REPORT

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2022 - [Fifth Allotted Day]:
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
Inclusion of Career Guidance in School Curricula

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021 නොවැම්බර් 19 වන සිකුරාදා***
*2021 நவம்பர் 19, வெள்ளிக்கிழமை*
*Friday, 19th November, 2021*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළු කිරීම
### வாய்மூல விடைக்கான வினாக்களை ஒழுங்குப் பத்திரத்தில் சேர்த்தல்
### INCLUSION OF QUESTIONS FOR ORAL ANSWERS IN THE ORDER PAPER

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

2021.11.17 වන බදාදා දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අසනු ලබන අවස්ථාවේදී ගරු චමින්ද විජේසිරි සහ ගරු හේෂා විතානගේ යන මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට එතුමන්ලාගේ ප්‍රශ්න ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් සභා ගර්භයේදී මතු කරන ලද කරුණු පිළිබඳව පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

පසුගිය කාලයේ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන දින ගණන සීමා වීම, පැවති සීමිත රැස්වීම් දිනවලදී ද විවිධ හේතු නිසා වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඉදිරි දිනවලට කල් දැමීම සහ දිනකට අසනු ලබන ප්‍රශ්න සංඛ්‍යාව 15 සිට 10 දක්වා අඩු කිරීම හේතුවෙන් මන්ත්‍රීවරයන්ගේ ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සැලකිය යුතු ලෙස සීමා වූ බව දැනුම් දීමට කැමැත්තෙමි.

මෙම තත්ත්වයට යම් පිළියමක් ලෙස පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළැඹි තීරණය පරිදි ප්‍රශ්න ඇසීම සඳහාම වෙන් වූ විශේෂ පාර්ලිමේන්තු රැස්වීම් දින 3ක් -2021.04.05, 2021.10.04 හා 2021.11.08 දිනවලදී- පවත්වා එලෙස එකතු වී තිබූ ප්‍රශ්න 140ක් ඇසීමට අවස්ථාව සලසා දුන් බවත් මෙහිලා විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

2021 ඔක්තෝබර් 07 දින පවත්වනු ලැබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී "විසර්ජන" (2022) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය සහ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන දිනවලදී දිනකට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පහක් පමණක් ඇසීමට තීරණය කරන ලදී.



මෙම තත්ත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කොට මන්ත්‍රීවරයන් සැලකිය යුතු සංඛ්‍යාවකට ප්‍රශ්න ඇසීමට ඉඩකඩ සැලසීමේ අරමුණ පෙරදැරි කරගෙන 2022 අය වැය විවාදය පැවැත්වෙන කාලසීමාව තුළදී පමණක් ප්‍රශ්න සඳහා වෙන්කරන ලද පැය භාගයක කාලය තුළදී සතියකට එක් මන්ත්‍රීවරයෙකුට එක් ප්‍රශ්නයක් පමණක් වන පරිදි සතියකට මන්ත්‍රීවරයන් තිස්දෙනෙකුගේ ප්‍රශ්න ඇතුළත් කිරීමටත්, එමඟින් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් 36 දෙනෙකුගේ ප්‍රශ්න 69ක්ද, ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් 31දෙනෙකුගේ ප්‍රශ්න 46ක්ද වශයෙන් මුළු මන්ත්‍රීවරයන් 67 දෙනෙකුට ප්‍රශ්න 115ක් ඇසීමට අවස්ථාව සැලසීමට 2021 ඔක්තෝබර් 21 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී දෙපාර්ශ්වයේම එකඟතාවෙන් තීරණය කරන ලදුව අදාළ දිනවලදී න්‍යාය පත්‍රයට ප්‍රශ්න ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

එසේ නොමැතිව, ප්‍රශ්න සංඛ්‍යාව දිනකට 05කට සීමා කිරීමේ තත්ත්වය තුළ සාමාන්‍ය ක්‍රියා පිළිවෙත අනුගමනය කරමින් ප්‍රශ්න ඇතුළත් කරන ලද්දේ නම් සෑම දිනකම එකම මන්ත්‍රීවරයන් 05 දෙනෙකුගේ ප්‍රශ්න ඇතුළත් වන අතර, ඒ අනුව සමස්ත අය වැය විවාදය පැවැත්වෙන කාලය තුළ එකී මන්ත්‍රීවරයන් 05 දෙනෙකුගේ ප්‍රශ්න පමණක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සිදුව තිබුණ බවත් මෙම ගරු සභාවේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නා විධියට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තුළ වෙනස් කළ හැකි සියලු දේ වෙනස් කර තිබෙනවා. ඒක තමයි නීත්‍යානුකූල තත්ත්වය. හැබැයි වෙනස් වෙලා නැති, දෝෂයක් තිබෙන කාරණයක් තිබෙනවා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය මෙයයි. මන්ත්‍රීවරයා Table Office එකට ලබා දෙන ප්‍රශ්න පිළිවෙළට තමයි Table Office එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ.

දැන් එයින් ඔබ්බට ගිහින් තිබෙනවා. ඒ කියන්නේ, කැමැති පස්දෙනාට කැමැති ප්‍රශ්නයක් ලබාදීම කියන කාරණය තමයි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සඳහන් වෙලා තිබෙන්නේ. හැබැයි, ඒක නිවැරදි වෙන්න ඕනෑ. පාර්ලිමේන්තු සම්ප්‍රදායානුකූලව අපි ලබාදෙන ප්‍රශ්න පිළිවෙළට තිබුණත්, "කැමැති පස් දෙනෙකුට" කියන කාරණය සඳහන් නොවීම තුළ තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. අපි පාර්ලිමේන්තුවේ නිතර ප්‍රශ්න අහනවා, අපි ප්‍රශ්න භාර දීලා තිබෙනවා, අපේ ප්‍රශ්න අමාත්‍යාංශයට ගිහින් තිබෙනවා, ඒවාට පිළිතුරු ලැබී තිබෙනවා. ඒ අනුව අපට ප්‍රමුඛතාව එනවා. අපි කලින් ලබාදුන් නිසා ප්‍රශ්න ටික පාර්ලිමේන්තුවෙන් යවලා තිබෙනවා. ඒ නිසා අපට පිළිතුරු ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා තමයි, න්‍යාය පත්‍රයට නිරන්තරයෙන්ම අපේ ප්‍රශ්න ඇතුළත් වන්නේ. නමුත්, මට දැනුණු විධියට, ඔබතුමාගේ නිවේදනය වෙනස් වෙන්න ඕනෑ, ඒ ක්‍රමවේදයට ලබා දුන්නත් අවශ්‍යතාව මත මෙය සිදු විය යුතුයි කියන එක. මට තේරෙන හැටියට පාර්ලිමේන්තු සම්ප්‍රදාය බිඳලා ගත්ත තීන්දුව ඒ කාරක සභාව තුළ අරගෙන නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පැහැදිලියි ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා මීට පෙරත් මේ ගැන දීර්ඝව කරුණු දැක්වූවා. ඒ සියල්ල සලකා බලා තමයි නිවේදනය සකස් වෙලා තිබෙන්නේ. කෙසේ වුවත්, ඔබතුමාට අවශ්‍ය නම්, තවදුරටත් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමා ඉදිරිපත් කරපු මේ කරුණුත් අපි එතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම වැදගත් කාරණාවක් මට කියන්න තිබෙනවා. සමහර වෙලාවට ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ආණ්ඩුව පැත්තෙන් සති දෙකක් හෝ සති තුනක් කල් ගන්නවා. සති දෙකක් කිව්වාම, අපි කියන්නේ නැහැ සති දෙකෙන්ම හරියට ඕනෑ කියලා. හැබැයි, මම එහෙම අහපු ප්‍රශ්න ගණනාවක් තිබෙනවා, දැන් මාස දෙකත් පසුවෙලා. එක්කෝ අපට තොරතුරු දෙනවා නම් හොඳයි. නැත්නම්, සමහර විට අපටත් හොරා ඒ ප්‍රශ්න යට යන්න පුළුවන්. ජාතික වැදගත්කමකින් යුතු ඉතා වැදගත් ප්‍රශ්න කිහිපයක් ඒ අතර තිබෙනවා. අපට සැකයක් තිබෙනවා, කල් ලබා ගත්ත ප්‍රශ්න කාලයේ වැලි තලාවට යට වෙයිද කියලා. ඒ නිසා අඩුම ගණනේ ඔබතුමන්ලා අපට තොරතුරු දෙන්න කල් ලබා ගත්ත ප්‍රශ්නවලට උත්තර ලබා දෙන්නේ කවදාද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන මහ ලේකම්තුමා දැනුවත් කළොත් හොඳයි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXVII කොටස;
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVII සහ නවවැනි කාණ්ඩයේ XIX හා XX කොටස්; සහ
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ V කොටස සහ තෙවැනි කාණ්ඩයේ III කොටස ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙක් ප්‍රශ්න හා යෝජනා ගැන සඳහන් කළා. ගරු කථානායකතුමා වෙනුවෙන් දැන් ඔබතුමා ඒ පිළිබඳ ප්‍රකාශයක් කළා. ඒක අපි අගය කරනවා. මේ සෑම තීරණයකටම අපි එළඹෙන්නේ පක්ෂ නායක කමිටුවේදියි. ඒ සඳහා ආණ්ඩුවත්, විපක්ෂයත් සියලුදෙනා සහභාගි වෙනවා. විරුද්ධ පක්ෂයේ යම් පක්ෂවල නායකයන්ට ඒ අවස්ථාව ලැබුණේ නැහැ කිව්වාට පසු එය ද වෙනස් කර අපි අවස්ථාව ලබා දුන්නා. ඒ ආකාරයෙන් එකඟතාවෙන් තමයි පාර්ලිමේන්තු කටයුතු පවත්වාගෙන යන්නේ. කාලය පිළිබඳව ප්‍රායෝගිකව මතුවන ගැටලුව ගැන ගරු කථානායකතුමා අවධානය යොමු කර තිබෙනවා. අය වැය කාලසීමාව තුළ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අඩු කිරීම සාමාන්‍යයෙන් පිළිගත් සම්ප්‍රදායක්. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙන යෝජනා -පෞද්ගලික මන්ත්‍රී යෝජනා- විවාද කිරීමට මේ කාල සීමාව තුළ අපට දිනයක් ලබා ගන්න බැරි වුණා. විමර්ශනය කිරීමේදී විශාල අඩුවක් අපේ පසුපෙළ සිටින මන්ත්‍රීවරු විශාල සංඛ්‍යාවකට සිදු වුණ බව ලේඛනගතව තිබෙනවා.

නමුත්, ඒවා ගැන කරුණු කියන්න අපි උත්සාහ දරන්නේ නැහැ. යම්කිසි පිළිවෙතක් තිබෙනවා නම් ඒ පිළිවෙත අනුගමනය කරන්න. මමත්, සංවිධායකතුමාත් විශේෂ සභාවාර තුනක් පැවැත්වූවා. යෝජනා කළා, එකඟ වුණා. අපේ කටයුතුවලට අතිරේකව ප්‍රශ්න 45ක්, 50ක් ලේඛනගත කළා. රටේ පැවැති තත්ත්වය නිසා එක දවසක් අවලංගු කරන්න වුණා. මම හිතන්නේ ලංකා ඉතිහාසයේ පළමු වරට වෙන්න ඇති මෙවැනි ප්‍රමාද වුණු ප්‍රශ්නවලට සම්පූර්ණයෙන්ම එක දිනයක් මේ විධියට පාර්ලිමේන්තුවේ වෙන් කරනු ලැබුවේ. ඒ, අපේ යෝජනාව හා පක්ෂ නායක කමිටුව පැමිණි එකඟතාව මතයි. ඒ නිසා අපේ අභ්‍යන්තරව තිබෙන කරුණු, අපේ කණ්ඩායම්වල සාකච්ඡා කරලා පක්ෂ නායකයෝ එතැන දී තමයි තීරණය ගන්නේ. මම ඒක සඳහන් කරන්න කැමතියි. ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාත් දන්නවා, කිසි දවසක ප්‍රශ්න 50කට ඉඩ දී නැහැ කියන එක. ඒ සුවිශේෂී දොරටුව විවෘත කළේ මේ තිබෙන ප්‍රමාදය ඉවත් කර ගැනීම සඳහායි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ලිපිලේඛනාදිය පිළිගැන්වීම. *[බාධා කිරීමක්]* මොකක්ද, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වේ, ප්‍රශ්න අඩු කළත් භාර දෙන දිනය අනුව තීරණය කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා කියන කාරණය අපට පැහැදිලියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Even if you reduce the number of Questions, the order should be decided on the date the Question was handed over.

එතුමා අදහස් කළේ ඒකයි. දෙන දිනය අනුව තීරණය කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, අපි මේක විවාදයක් කර ගන්න අවශ්‍ය නැහැ. ගරු කථානායකතුමාගේ නිවේදනයට අමතර

යමක් ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්න තිබෙනවා නම් පක්ෂ නායක රැස්වීමේ දී කරුණාකර ඒක ගන්න. දැන් අපි අද දවසේ වැඩකටයුතුවලට යමු. *[බාධා කිරීමක්]*

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

ගරු සභානායකතුමාට අපි ස්තුතිවන්ත වෙනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න අහන්න සම්පූර්ණ දිනයක් ලබාදීම පිළිබඳව. නමුත් අපට තිබෙන ගැටලුව මෙයයි. ප්‍රශ්න අහන එකේ වැඩි අවශ්‍යතාව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටයි තිබෙන්නේ. අපි ගිය වතාවේ පසුපෙළ මන්ත්‍රීවරු විධියට ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට අපට මතකයි, ප්‍රශ්න අහන්න තිබෙන අවස්ථාව ගොඩක් අඩු වුණු බව. හැබැයි, අපි කියන්නේ ක්‍රමවේදයේ අවුලක් තිබෙනවා කියලායි. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කිව්වේ ඒ ක්‍රමවේදය විනිවිද පෙනෙන ආකාරයට හදන්න පුළුවන් කියන එකයි. මේ තෝරා ගත් විධියට අපට පෙනෙනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රමුඛතාවක් දීලා තිබෙන ආකාරයත් අපට ඒ ප්‍රමුඛතාව නැති බවත්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, පක්ෂ නායක රැස්වීමේදී මේ සම්බන්ධයෙන් කථා කරමු.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අවසන් කරනවා.

මේ පාර්ලිමේන්තුව පත් වෙලා දැන් අවුරුදු එකහමාරකට ආසන්නයි. ගරු සභානායකතුමා කිව්වා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ යෝජනා තවම එකක්වත් ගත්තේ නැහැ කියලා. එක දවසකදීවත්, එකක්වත් ගත්තේ නැහැ. ඒ වෙනුවෙනුත් අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, ප්‍රශ්න ගත යුත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ප්‍රශ්න දාපු පිළිවෙළට කියලා. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාට කණ්ඩායම් රැස්වීමේදී -පක්ෂ නායක රැස්වීමේදී- කියන්න තිබුණා. එතැනදී එක තීන්දුවක් අරගෙන මෙතැන ඇවිල්ලා, තමන්ගේ මන්ත්‍රීවරු එයට විරුද්ධව නැඟිටිද්දී තව එකක් කියන එක වැරදියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අපිත් එක්ක එදා එකඟ වුණා; ගරු කථානායකතුමාත් එක්ක ගරු මන්ත්‍රීතුමන්ලාත් එකඟ වුණා. ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු ඒ රැස්වීමේදී එදා ඒකට එකඟ වෙලා, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන සභානායකතුමා කිව්ව විධියට, අපි දවස් තුනක් ප්‍රශ්න 50, බැගින් යොමු කරලා, ඒවායින් ප්‍රශ්න 35කට, 40කට උත්තරත් ලබා දුන්නා. සමහර මන්ත්‍රීවරු ඇවිල්ලා හිටියේ නැහැ, ප්‍රශ්න අහන්න. විපක්ෂයේ මන්ත්‍රීවරු වාගේම අපෙත් පසු පෙළ මන්ත්‍රීවරු 65ක්, 68ක් විතර ඉන්නවා; එතුමන්ලා හා සමාන ගණනක් අපේ පසුපෙළෙත් ඉන්නවා. ඒකට හේතුව මේකයි. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලය ඇමතිවරු තිහකට සීමා කෙරුවා; රාජ්‍ය ඇමතිවරුන්ගේ ගණනත් සීමා කෙරුවා.

ඒ නිසා අපේ මන්ත්‍රීවරුත් විශාල පිරිසක් ඉන්නවා. ඒ අයත් අපට කියනවා, "අපට ප්‍රශ්න අහන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ." කියලා. ඒ නිසා අපි එකඟතාවක් ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ ගැන ගරු සභාව ඇතුළේ කථා නොකර, ඒ කණ්ඩායම්වල ප්‍රශ්න අපි පක්ෂ නායක රැස්වීමේදී කථා කර ගත්තොත් පාර්ලිමේන්තුවේ කාලය අපට තවදුරටත් කළමනාකරණය කර ගන්න පුළුවන් වෙයි. ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාටත් අපි කියනවා, අපි ප්‍රශ්නවලින් පැනලා යන්නේ නැහැ කියලා. විෂය භාර ඇමතිවරයා මේ ගරු සභාවේ නැත්නම් හෝ උත්තරය ලැබිලා නැත්නම් පමණයි අපි ප්‍රශ්නයකට පිළිතුර දීම සඳහා කල් ගන්නේ. අපි ප්‍රශ්නවලට පිළිතුරු දීම කල් දාලා, ප්‍රශ්නවලින් පැනලා යන ආණ්ඩුවක්, රජයක් නොවෙයි කියලා මම ඉතාම වගකීමෙන් කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ස්තුතියි. එක් වතාවක පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු අතර ඇති වූ නොසන්සුන්තාවක් පිළිබඳව සොයා බැලීමට ගරු කථානායකතුමා කමිටුවක් පත් කළා. මම ඒ කමිටුවේ සභාපතිත්වය දැරුවා. පක්ෂ, විපක්ෂ සාමාජික සියලුම මන්ත්‍රීවරු එයට සහභාගි වුණා. එහි එක් ඉල්ලීමක් වුණෙත් සියලුම මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න ඇසීමේදී සමාන අවස්ථාවක් ලබා දෙන්න කියන එකයි. ඒ අනුපිළිවෙළට තමයි මේක කෙරෙන්නේ කියලා මම විශ්වාස කරනවා. කෙසේ වුවත්, එකඟ නොවන යමක් ඇත්නම් අපි පක්ෂ නායක රැස්වීමේදී නැවත කථා කරමු.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2020 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තාව සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 19 දිනැති අංක 2241/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(iii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 සැප්තැම්බර් 04 දිනැති අංක 2243/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම වාර්තාව සහ නියෝග සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියෝග සහ වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117 (2)(ඛ) වන වගන්තිය යටතේ සංචාරක අමාත්‍යවරයා විසින් සාදන ලද 2020 සැප්තැම්බර් 08 දිනැති අංක 2192/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vi) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(viii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(x) 2018 වර්ෂය සඳහා ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව;

(xi) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව; සහ

(xii) 2018/2019 වර්ෂය සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැලණිය, දළුගම, ලුම්බිණි මාවත, අංක 4/15 දරන ස්ථානයෙහි පදිංචි දොන් මහින්ද දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අලවතුර, "දිනසිරි" යන ලිපිනයෙහි පදිංචි යූ.ඩී. විමල්සිරි උඩවත්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 1 -312/2020- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නය දෙවැනි වතාවටයි ඉදිරිපත් වුණේ. තව වතාවක් ඉදිරිපත් වෙන්න පුළුවන්.

මේ රටේ අද තිබෙන දැවෙන ප්‍රශ්නය වන බලශක්තිය පිළිබඳවයි මෙම ප්‍රශ්නයෙන් මා අසා තිබෙන්නේ. අද ගෑස් නැහැ; ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් නැහැ. සමහර කට්ටිය කියනවා, විවිධ

ආයතන මාධ්‍යයට ඇවිත් අසත්‍ය පවසන බව. අද ඇමතිතුමා පිළිතුරු දෙන්න ආවා නම් සැබෑ තත්ත්වය කුමක්ද කියන එක රටටම කියන්න තිබුණා. මෙය කාලීන ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා ඊළඟ අවස්ථාවේදී පිළිතුර ලබා දෙයි, ගරු මන්ත්‍රීතුමා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2 -583/2020- (1), ගරු වේලු කුමාර් මහතා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -990/2020- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1431/2021- (2), ගරු උද්දික ප්‍රේමරත්න මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1734/2021- (1), ගරු ගුණතිලක රාජපක්ෂ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 3 -990/2020- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හබරණ සංචාරක කලාපය: විස්තර
ஹபரண சுற்றுலா வலயம்: விபரம்
HABARANA TOURIST ZONE: DETAILS

1431/2021

**4. ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (ගරු උද්දික ප්‍රේමරත්න මහතා වෙනුවට)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர - மாண்புமிகு உத்திக பிரேமரத்ன சார்பாக)
(The Hon. Premalal Jayasekara on behalf of the Uddika Premarathne)
සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ හබරණ නගරය කේන්ද්‍ර කර ගනිමින් සංචාරක කලාපයක් ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම කලාපයට අයත් වනාන්තර සහ එම කලාපය තුළ සැරිසරන වන අලින් ආරක්ෂා වන ආකාරයෙන් එම සංචාරක කලාපයේ භෞතික සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එවැනි අධ්‍යයනයක් තුළින් විධිමත් හා විද්‍යානුකූල ලෙස දියුණු කරන ලද සංචාරක කලාපයක් ලෙස හබරණ නගරය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(iv) එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සැලසුම් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனுராதபுர மாவட்டத்தின் ஹபரண நகரை மையப்படுத்தி சுற்றுலா வலயமொன்று நிறுவப் பட்டுள்ளதென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வலயத்துக்குரிய காடுகளையும் அந்த வலயத்தில் நடமாடும் காட்டு யானைகளையும் பாதுகாக்கும் வகையில், மேற்படி சுற்றுலா வலயத்தில் பௌதிக அபிவிருத்தியை மேற் கொள்வதற்குச் சாத்தியக்கூறு ஆய்வு மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறான ஆய்வொன்றின்மூலம் முறைசார்ந் ததாகவும் விஞ்ஞானபூர்வமாகவும் மேம்படுத்தப் பட்ட சுற்றுலா வலயமாக ஹபரண நகரை அபிவிருத்தி செய்வதற்கு வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்படுமா என்பதையும்;

(iv) மேற்படி வேலைத்திட்டங்களை நடைமுறைப் படுத்துவதற்குரிய திட்டங்கள் தயாரிக்கப்பட்டுள் ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that a tourists zone has been established in Habarana Town of the Anuradhapura District;

[ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා]

(ii) whether a feasibility study has been conducted for the physical development of the aforesaid tourists zone, saving the forests and the roaming wild elephants;

(iii) whether programmes are implemented to develop the Habarana Town as a tourists zone in a systematic and scientific manner with the help of such a study; and

(iv) whether applicable plans have been made to implement aforesaid programmes?

(b) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) සංචාරක කලාපයක් ලෙස ගැසට් කර නොමැත.

(ii) නැත.

(iii) නැත.

(iv) නොමැත.

(ආ) සංචාරක ආකර්ෂණීය කලාපයක් ලෙස සංවර්ධනය කළ හැකි විභවයන් පවතින හෙයින් ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව ඉදිරි සැලසුම් සකස් කිරීමට පියවර ගත යුතු වේ. දැනට සංචාරක කලාප ලෙස හඳුනාගෙන නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සැලසුම් සකස් කිරීමට නියමිත නුවරඑළිය, කල්පිටිය හා හික්කඩුව අධ්‍යයනයන් අවසන් කිරීමෙන් පසුව මෙම යෝජනාව පිළිබඳව කටයුතු කළ හැකි වනු ඇත.

## අයිටීඑන්හි 2015-2019 අතර විකාශය වූ විශේෂ වැඩසටහන්: මුදල් ගෙවීම

## 2015 - 2019 காலப்பகுதியில் ஐ.ரீ.என்.இல் ஒளிபரப்பான விசேட நிகழ்ச்சிகள்: செலுத்தப்பட்ட பணம்

## SPECIAL PROGRAMMES TELECAST ON ITN DURING 2015-2019: PAYMENTS MADE

1734/2021

**5. ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (ගරු ගුණතිලක රාජපක්ෂ මහතා වෙනුවට)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர - மாண்புமிகு குணதிலக ராஜபக்ஷ சார்பாக)
(The Hon. Premalal Jayasekara on behalf of the Hon. Gunathilaka Rajapaksha)

ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වර්ෂ 2015-2019 කාලය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ මෝටර් රථ ධාවන ශූරයෙකු, ඔහු විසින්ම මුදල් ගෙවා ස්වාධීන රූපවාහිනිය මඟින් විකාශය කරන ලද වැඩසටහනේ නම කවරේද;

(ii) පසුව එම වැඩසටහන් මාලාව වෙනුවෙන් ස්වාධීන රූපවාහිනී සේවය මඟින් ඉහත සඳහන් පුද්ගලයාට මුදල් ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම එක් වැඩසටහනක් වෙනුවෙන් ගෙවන ලද මුදල සහ සියලු වැඩසටහන් වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත කාලය තුළ "අනෝමාස් කිචන්" නැමැති වැඩසටහන, ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීම වෙනුවෙන් මුදල් ගෙවා ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉහත (අ) (i) සහ (ආ) (i) හි සඳහන් කරන ලද වැඩසටහන් දෙක සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මුදල, ඉහත නිලධාරින්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் இலங்கையில் பிரசித்தமான மோட்டார் வாகனப் பந்தய வெற்றி வீரரொருவரால் பணம் செலுத்தப்பட்டு, சுயாதீன தொலைக்காட்சி அலைவரிசையூடாக ஒளிபரப் பப்பட்ட நிகழ்ச்சியின் பெயர் யாதென்பதையும்;

(ii) அதன் பின்னர் மேற்படி நிகழ்ச்சித்தொடருக்காக சுயாதீன தொலைக்காட்சிச் சேவையினால் மேற்குறிப்பிட்ட நபருக்குப் பணம் செலுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அந்த ஒவ்வொரு நிகழ்ச்சிக்காகவும் குறித்த நபருக்குச் செலுத்தப்பட்ட தொகையும், ஒட்டுமொத்த நிகழ்ச்சிகளுக்காகக் குறித்த நபருக்குச் செலுத்தப்பட்ட தொகையும் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) மேற்படி காலப்பகுதியில் "அனோமாஸ் கிச்சன்" எனும் நிகழ்ச்சியை சுயாதீன தொலைக்காட்சிச் சேவையினூடாக ஒளிபரப்புவதற்குப் பணம் செலுத்தப்பட்டுள்ளது என்பதை ஏற்றுக்கொள் வாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்தொகை எவ்வளவென் பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) (i) மேற்படி (அ)(i) மற்றும் (ஆ)(i)இல் குறிப்பிடப் பட்டுள்ள இரண்டு நிகழ்ச்சிகளுக்காகப் பணம் செலுத்தியமை தொடர்பில் பொறுப்புக் கூறவேண்டிய உத்தியோகத்தர்களின் பெயர்கள் வெவ்வேறாக யாவையென்பதையும்;

(ii) மேற்படி உத்தியோகத்தர்களிடமிருந்து அப்பணத்தை அறவிடுவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் மேலும் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media:

(a) Will he inform this House -

(i) the name of the programme, which was telecast on ITN during the period from 2015 to 2019, personally sponsored by a motor racing champion of Sri Lanka;

(ii) whether the ITN had paid the same amount to the aforesaid person subsequently for the said programme series; and

(iii) if so, separately, the amount paid for each programme and the total amount paid for all the programmes to the said person?

(b) Will he also inform this House -

(i) whether he admits that a payment has been made for telecasting the programme titled "Anoma's Kitchen" on ITN during the aforesaid period; and

(ii) if so, the said amount is?

(c) Will he further inform this House -

(i) separately, the names of the officers responsible for making payments for the two programmes mentioned in (a)(i) and (b)(i); and

(ii) whether measures will be taken to recover the amount from the aforesaid officers?

(d) If not, why?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும - வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ප්‍රසිද්ධ මෝටර් රථ ධාවන ශූරයෙකු වන ඩිලන්ත මාලගමුව මහතා සම්බන්ධ "Racing Life With Dilantha Malagamuwa (Season 3)" වැඩසටහන නිෂ්පාදක එස්.එම්. විජේසේකර මහතා විසින් මුදල් ගෙවා 2018 වසරේදී ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය කර ඇත.

(ii) "Racing Life With Dilantha Malagamuwa (Season 2)" වැඩසටහන එම වැඩසටහනෙහි නිෂ්පාදක එස්.එම්. විජේසේකර මහතාගෙන් එක් වැඩසටහනක් සඳහා රුපියල් 100,000ක මුදලකට 2017 වසරේදී මිලදී ගෙන විකාශය කර ඇත.

(iii) එම වැඩසටහන සඳහා 2017.06.17 දින සිට 2017.12.08 දක්වා කාල පරිච්ඡේදය තුළ එක් වැඩසටහනක් සඳහා රුපියල් 100,000 බැගින් වැඩසටහන් 26ක් සඳහා රුපියල් 2,600,000ක් නිෂ්පාදක එස්.එම්. විජේසේකර මහතාට ගෙවීම් සිදු කර ඇත.

(ආ) (i) "අනෝමාස් කිචන්" නමැති වැඩසටහන ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය කිරීම වෙනුවෙන් මුදල් ගෙවා නැත.

ආයතනය විසින් මෙම වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කර ඇත. මෙම වැඩසටහන් නිෂ්පාදනයේදී ඉවුම් පිහුම් සඳහා වන අමු ද්‍රව්‍ය, විදුලිය, ස්ථානය හා වැඩසටහන ඉදිරිපත් කිරීම වෙනුවෙන් වන සියලු වියදම් වශයෙන් එක් වැඩසටහනකට රුපියල් 3,000ක් බැගින් මුදල් ගෙවා ඇත. අනුග්‍රාහක දැන්වීම් මඟින් මුදල් උපයාගෙන ඇත.

(ii) වැඩසටහන විකාශය සඳහා මුදල් ගෙවා නැත. එක් වැඩසටහනකට රුපියල් 3,000/- බැගින් 2018 ජනවාරි මස සිට 2019 ජනවාරි මස දක්වා විකාශය වූ වැඩසටහන් නිෂ්පාදන කටයුතු වෙනුවෙන් ඉහත දක්වා ඇති පරිදි රුපියල් 735,000ක් අනෝමා ද සිල්වා මහත්මියට ගෙවීම් සිදු කර ඇත.

(ඇ) (i) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කර ඇති මූල්‍ය බලතල පැවරීමේ විධි විධාන අනුව නියමිත ක්‍රමවේදය මත මෙම වැඩසටහන් නොමිලයේ ලබාගෙන / මිලදී ගෙන / නිෂ්පාදනය කර විකාශය කර ඇත. එම වැසඩහන් නියමිත පරිදි විකාශය කිරීම අනුව අනුමත මුදල ගෙවා ඇත. එම ක්‍රියාවලියේදී අදාළ නිලධාරීන් නියමිත රාජකාරි ඉටු කර ඇත. එම වැඩසටහන් විකාශය මඟින් අනුග්‍රාහක වෙළෙඳ දැන්වීම් ප්‍රචාරයෙන් ආදායම් උපයාගෙන ඇත.

(ii) ආයතනික මූල්‍ය ක්‍රමවේදය අනුව නීත්‍යානුකූලව මෙම වියදම් දරා ඇති බව දන්වමි. ඒ අනුව මෙම ප්‍රශ්නය අදාළ නොවේ.

(ඈ) අදාළ නැත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුර සභාගත කළාම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වන නිසා මා මේ කාරණය ගැන පැහැදිලි කරන්න ඕනෑ. මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ, 2015-2019 කාලය තුළ ඩිලන්ත මාලගමුව කියන ලෝක ප්‍රකට ධාවන ශූරයා සම්බන්ධ වැඩසටහනක් සහ ITN නාළිකාවේ විකාශය වූ තවත් වැඩසටහනක් සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිලන්ත මාලගමුව මැතිතුමාට මේ ගෙවීම කරලා තිබෙන්නේ ඉතාම යුක්ති සහගත ක්‍රමවේදයකටයි. අනෙක් අතට, එතුමා ශ්‍රී ලංකා රජයේ කිසිදු අනුග්‍රාහකත්වයක් - sponsorship එකක් - නැතිව අපේ ජාතික ධජය ප්‍රදර්ශනය කරමින් ජාත්‍යන්තර තරග 143කට වැඩි ප්‍රමාණයකට සහභාගි වෙලා රටට කීර්තියක් අත් කර දුන් ශ්‍රී ලාංකීය පුරවැසියෙක්. ඇත්තටම මෙවැනි වැඩසටහනක් මීට වඩා වැඩි මුදලකට ජාත්‍යන්තර මාධ්‍යවලට දීමට ඕනෑ තරම් ඉඩ කඩ ඔහුට තිබෙනවා. සියලු වියදම් දරලා මුළු team එකම ඒ රටට ගෙන ගොස් record කරලාත්, episode එකක් රුපියල් ලක්ෂය ගණනේ තමයි ගිහින් තිබෙන්නේ. මා හිතනවා, ඩිලන්ත මාලගමුව මැතිතුමාට මේ ගරු සභාව සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ කියලා. මේ ප්‍රශ්නය ඇසීම ගැන නොවෙයි, මගේ මේ පැහැදිලි කිරීම. මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන ගරු මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැති නිසා මා මේ කරුණු පැහැදිලි කළේ නැත්නම්, ශ්‍රී ලංකාව එතෙක් මෙතෙක් බිහි කර තිබෙන විශිෂ්ටතම මෝටර් රථ ධාවන ශූරයාට මේ උත්තරීතර සභාව අගෞරවයක් කළා වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මගේ යුතුකමක් විධියටයි මේ අවස්ථාවේදී මා ඒ ප්‍රකාශය කළේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, මේ සම්බන්ධව අදහසක් ඉදිරිපත් කරන්න.

අපේ ගරු ඇමතිතුමා හොඳ යෝජනාවක් ඉදිරිපත් කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඩිලන්ත මාලගමුව කියන්නේ, අපේ රටට ඉතාම හොඳ කීර්ති නාමයක් ගෙන ආ ක්‍රීඩකයෙක්. ඔහු internationally car racesවලින් අපේ රටට නමක් ගෙනැවිත් තිබෙනවා. අපේ ලංකාවේ කොඩිය ගහගෙන තමයි, ඔහු ඉතාලියේ, ඕස්ට්‍රේලියාවේ, එංගලන්තයේ, ඇමෙරිකාවේ ධාවන පථවල ඔහුගේ මෝටර් රථය ධාවනය කරන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් උපරිම සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා මා යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමනි, ජනමාධ්‍ය ඇමතිවරයා විධියට මාත් එය තමයි සඳහන් කළේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන කටයුතු. විසර්ජන පනත් කෙටුම්පත 2022, පස්වැනි වෙන් කළ දිනය.

විවාදය ආරම්භ කිරීම, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 18ක් තිබෙනවා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
## APPROPRIATION BILL, 2022

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී*
*ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12]*
*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" [ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]*
*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பஸில் ரோஹண ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [12th November]*
*"That the Bill be now read a Second time".- [The Hon. Basil Rohana Rajapaksa]*
*Question again proposed.*

[පූ.භා. 9.54]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

2022 අය වැය කථාවේදී ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මූලික අභියෝග පහක් ගැන කිව්වා. සමාජ හා ආර්ථික විෂමතා වැඩිවීම, තිරසර අරමුණු සාක්ෂාත් කර ගැනීමේ මන්දගාමිත්වය, පාරිසරික ව්‍යසනය හා ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආයතනයන්ගේ සීමිත ආධාර, නව සාමාන්‍යකරණයට අනුවර්තනය වීම තමයි එතුමා කියපු ඒ අභියෝග පහ. එතුමා මේ අය වැය හදන්න ඇත්තේ මේ අභියෝග පහ ජය ගන්න. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ. මේ අය වැය ඇතුළේ කොන්ත්‍රාත්කරුවන් පෝෂණය කිරීමට ඉඩ හැදීම මිස මිනිසුන්ගේ බඩගින්නට කථා කරලා නැති බව අපට පෙනෙනවා. වක්‍ර බදු තුනක් මේ අය වැය තුළින් ගෙනැත් තිබෙනවා. රටකට ජනතාව මත එතරම් බදු පටවන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්. මොකද, VAT තිබෙනවා; GST තිබෙනවා; Super Gain Tax එක තිබෙනවා.

දැන් හාල්, සීනි, පරිප්පු, කිරිපිටි, ගෑස් ආදියෙහි මිල ඉහළ ගිහින්. පෙරේදා අපේ ගෙදර -මේ මාදිවෙල- ගෑස් එක ඉවර වුණා. අද වනකල් අපට ගෑස් එකක් ගන්න විධියක් නැහැ. කොළඹ ප්‍රදේශයේ මිනිසුන්ට ගෑස් එකක් නැති වුණොත් ඇති වන්නේ ලොකු ගැටලුවක්. ගමේ නම් වත්තෙන් දර කෝටුවක් කඩලා අරගෙන ලිප පත්තු කරලා බත් ටිකක් උයා ගන්න පුළුවන්. අද හැම දෙයටම පෝලිම් යුගයක් ගෙනැත් තිබෙනවා. පෝලිමේ හිටියාට බඩුත් නැහැ. තිබෙන බඩු ගන්න මේ රටේ ජනතාවට සල්ලිත් නැහැ. මේ අය වැය සම්පූර්ණයෙන් ඇස් බැන්දුමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම, එමඟින් ජාවාරම් ආර්ථිකයක් ගොඩ නඟනවා. මෙය මැතිවරණය ඉලක්ක කරගත් අය වැයක් විධියට අපි දකිනවා.

මෙවර අය වැයෙන් මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන ලක්ෂ 50 ගණනේ වැඩි කරලා තිබෙනවා අපි දැක්කා.

එතකොට 225 දෙනෙකුට කොපමණ මුදල් වෙන් වෙනවාද බලන්න. ඊළඟට, ග්‍රාම නිලධාරි වසමකට රුපියල් ලක්ෂ 30 ගණනේ වසම් 14,022කට මුදල් වෙන් කරලා තිබුණා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 40 ගණනේ 4,197දෙනෙකුට මුදල් වෙන් කරලා තිබුණා. රජයේ සේවකයන්ට මෝටර් බයිසිකල් ලබා දීමට යෝජනා කරලා තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික සැලසුම් නැති, එහෙම නැත්නම් දේශපාලනඥයන්ට මුදල් බෙදන අය වැයක් විධියට තමයි අපි මේක දකින්නේ. රුපියල් බිලියන 71ක මුදල් ප්‍රමාණයක්, මම ඉස්සෙල්ලා කියපු යෝජනා කිහිපයට වෙන් කර තිබෙනවා. ඉතින් අපි අහනවා, පාර්ලිමේන්තුව මේවා අනුමත කරනවාද කියලා. මොකද මිනිසුන්ගේ බදු මුදල් සහ විදේශවලින් ගන්නා ණය මේ විධියට ආප්ප කන්න වාගේ සිල්ලරට බෙදලා දෙන්න පුළුවන්ද කියන එක අපට මේ රජයෙන් අහන්න වෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, අපි දැක්කා.

මේ අය වැයෙන් රජයේ සේවකයා අමතක කරලා තිබෙනවා. එදා යහ පාලන රජය සියයට 106කින් ඒ අයගේ වැටුප වැඩි කරලා නොදුන්නා නම් අද රජයේ සේවකයාට හිඟා කන්න වෙනවා. ගුරු අරගලය නිසා ඒ අයට හිමි වැටුප ලැබුණා මිස වැටුප් වැඩි කළා කියලා කාටවත් පුරසාරම් දොඩන්න හැකියාවක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම ගුරු වෘත්තියට තිබුණු ගෞරවය මේ රජය නැති කරලා දැම්මා. ගොවීන්ට පොහොර ටික නොමිලයේ නොවෙයි, මුදලටවත් දෙන්න බැරි ආණ්ඩුවකින් ගොවීන්ට වැඩක් නැහැයි කියන එක අපි මේ වෙලාවේ කියන්න ඕනෑ. අධ්‍යාපනයට, සෞඛ්‍යයට මුදල් වෙන්න කරන්න බැරි අය වැයකින් රටට වැඩක් නැහැ. ඉහළ යන ජීවන වියදමට තිබෙන සහන මොනවාද? එදිනෙදා ජීවන වෘත්තීන් ගැන මේ අය වැය තුළ කථා කරලාම නැහැ. මොළ හතක් ගැන කිව්වාම අපි හිතුවා සුපිරි අය වැයක් ගෙනෙයි, සෞභාග්‍යය උතුරයි කියලා. නමුත් හිස් ඔළුවක් කියන එක තමයි අපට කියන්නට වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් වැඩිම මුදල් වෙන් කිරීම තිබෙන්නේ ජාතික ආරක්ෂාවට. ඒ සඳහා රුපියල් බිලියන 373.5ක් වෙන් කර තිබෙනවා. ඒ, සමස්ත අය වැයෙන් සියයට 14.9ක්. එක් පුද්ගලයෙක් මත යෙදෙන මුදල රුපියල් 17,112ක්.

මාර්ටින් ලූතර් කිං කියනවා, "සමාජ සංවර්ධනයට වඩා හමුදාමය ආරක්ෂාවට වසරින් වසර වැඩි වශයෙන් මුදල් වැය කරන ජාතියක් ටිකෙන් ටික ළං වෙන්නේ ආධ්‍යාත්මික මරණයකටයි" කියලා. අද මේ ආණ්ඩුව ඒ කියමන හොඳට සනාථ කරනවා. මේ අයගේ දේශපාලන සටන් පාඨය "ජාතික ආරක්ෂාව." අද යුද්ධයක් නැහැ; ජනවාර්ගික අර්බුදයක් නැහැ. ඒක තමයි ආණ්ඩුවට තිබෙන ප්‍රශ්නය. ආණ්ඩුවේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය. යුදමය වියදම් වැඩි කිරීම තුළ මනුෂ්‍ය සිත තුළ ආධ්‍යාත්මික මරණයක් මිස ඊට වඩා වැඩි දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ලේ වැගිරීම් බලාපොරොත්තු වෙන මානසිකත්වයක් හදන්න තමයි, මේ අය වැය හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂාව සුරක්ෂිත වෙන්නේ දැනුමෙන්, කුසලතාවෙන් සහ ආකල්පවලින්. ජනතාව දැනුවත් කළ යුතුයි, ඒ සඳහා අධ්‍යාපනයේ ප්‍රමාණාත්මකභාවය වාගේම ගුණාත්මකභාවයත් වැදගත්. අධ්‍යාපනයට මුදල් වෙන් කරන්නේ නැතුව ඒක කරන්නේ කොහොමද? අධ්‍යාපනයට අය වැයෙන් වෙන් කර තිබෙන්නේ, රුපියල් බිලියන 127යි. එය සමස්ත අය වැයෙන් සියයට 5.1යි. එතකොට එක් පුද්ගලයෙකු මත යෙදෙන මුදල රුපියල් 5,853ක් වාගේ වෙනවා. ගරු නියෝජ්‍ය

කථානායකතුමනි, ජාතික ආරක්ෂාව සුරක්ෂිත වෙන්න අවශ්‍ය අනෙක් කාරණාව තමයි, නිරෝගී ජාතියක් සිටීම. මනස හදනවා නම් ලේ දකින්න, නිරෝගී සම්පන්න වෙන්නේ කොහොමද? අය වැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කර තිබෙන්නේ රුපියල් බිලියන 153යි. එය සමස්ත අය වැයෙන් සියයට 6.1යි. මේ අනුව එක් පුද්ගලයෙකු මත යෙදෙන මුදල් ප්‍රමාණය රුපියල් 7,042ක් වෙනවා.

අය වැයෙන් අධ්‍යාපනයටත්, සෞඛ්‍යයටත් දෙකටම වෙන් කළ මුදල එකතු කළත්, ජාතික ආරක්ෂාවට වෙන් කළ මුදලට සමාන වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අධ්‍යාපනයටත්, සෞඛ්‍යයටත් වඩා මහා මාර්ගවලට මුදල් වෙන් කර තිබෙනවාය කියන එක බොහොම කනගාටුවෙන් මම කියන්න ඕනෑ. විදේශ ණය අරගෙන පාරවල් හදලා, ආර්ථිකය දියුණු කරන්න පුළුවන් ද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. ජාතික ආරක්ෂාව කරුණු 3ක් මත පිහිටනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පළමුවැනි කාරණය තමයි, දේශපාලන නිදහස ආරක්ෂා කර පවත්වා ගැනීම. දෙවැනි කාරණය, දේශසීමා නිදහස ආරක්ෂා කර ගැනීම. තුන්වැනි කාරණය රටකට අයත් භූමියේ භෞමික අඛණ්ඩතාව පවත්වා ගැනීම. දැන් මේවා සිද්ධ වෙනවාද? දේශපාලන නිදහස ආරක්ෂා කළාද? ආසන්නතම උදාහරණය විධියට 16 වැනි දා සමගි ජන බලවේගය පැවැත් වූ විරෝධතාව ගනිමු. ඒකට බය වුණා; මර්දනය කළා; කොවිඩ් පොකුරු හැදෙනවා කිව්වා. ඊයේ සඳ හිරු සැය අභියස උත්සවයක් පැවැත්වුවා. එතැනදී කොවිඩ් පොකුරු හැදෙන්නේ නැද්ද? එතැන ලොකු ජනකායක් සිටියා. ඊයේ සඳ හිරු සැය ළඟ කොවිඩ් වයිරසය තිබුණා නම්, ඒ කොවිඩ් වයිරසය සිල් අරගෙන ද හිටියේ, මිනිසුන්ගේ ශරීරවලට යන්නේ නැතුව?

ඊළඟට, අද දේශසීමා නිදහස ආරක්ෂා වෙලා තිබෙනවාද? අසූචි නැව රට වටේ කැරකෙනවා. ඒක අද එක තැනක; හෙට තව තැනක; අනිද්දා තවත් තැනක. අධිකරණය තහනම් කළ අසූචි නැව අද එක තැනක; හෙට ලංකාවට ආසන්නම තවත් තැනක එය තිබේවි. අද උසාවියේ පැවැත්වෙන බේරුම්කරණයකට රජය එකඟ වෙන්න යනවාය කියා ආරංචියක් තිබෙනවා. අසූචි නම් අසූචිම තමයි. ආයෙත් මොකක්ද, ඒකේ තිබෙන බේරුම? කියන ගණනක් දීලා චීනයටම යවනවා මිසක, ඊට එහා බේරුමක් නැහැ. මේ රට ඒ විනාශයෙන් බේරා ගන්න ඕනෑ. පාඩුව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අය කර ගන්න. මොකද, අසූචි නැවෙන්, නැනෝ පොහොරවලින් හොරා කාපුවා, කොමිස් ගහපුවා ඒ ගොල්ලන් ළඟ තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ඊයේ මාධ්‍ය සාකච්ඡාවකදී කිව්වා, "මේකට මම සම්බන්ධ නැහැ. වංචාවක් තිබෙනවා කියලා අපට පැහැදිලිව පෙනෙනවා. ඉන්දියාවේ ඩොලර් තුනට තිබෙන පොහොර මිලි ලීටර් 500, ඩොලර් 12.5ට ගෙනා බව පිළිගන්නවා. අපි දැන් ඒක 10ට අඩු කරන්න යනවා" කියලා. ඒත් ඩොලර් 7ක් වැඩියි. නැනෝ නයිට්‍රජන් පොහොර මිලි ලීටර් 500 රුපියල් 2,500ක් වැනි මිලකට ගෙනාවා කියන එක තුළ වංචාවක් තමයි සිදු වෙලා තිබෙන්නේ.

එතුමා පොහොර ගේන එකට සම්බන්ධ නැහැ, ජාතික පොහොර ලේකම් කාර්යාලය තමයි මේකට සම්බන්ධ, ඒ කාර්යාලයෙන් දෙන තොරතුරු තමයි එතුමා කියන්නේ කිව්වා. එතකොට කවුද හොරකම් කර තිබෙන්නේ? මේ හොරකම කළේ කවුද කියන එක රටට හෙළිදරව් වෙන්න ඕනෑ. මේ ගනුදෙනුවේදී හොරා කෑවේ කවුද, මේවායෙන් කොමිස් ගත්තේ කවුද කියන එක මේ ගරු සභාවට හෙළි කරන්න කියලා මම ගරු ඇමතිතුමාට කියනවා. වංචාවක් සිදු වෙලා තිබෙන බව අපි කලින්ම කිව්වාම අපට අභියෝග කළා. අපට අභියෝග කළ ඒ සියලු පින්වතුන් සුවපත් වේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා.

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා මීට කලින් ඇල්සේෂන් කථාවක් කිව්වා මට මතකයි. ස්වාමියා වෙනුවෙන් කැප වුණාට කමක් නැහැ, ස්වාමියාගේ අයියාගේ පුතා වෙනුවෙන් හොරා හංගන්න ඕනෑ නැහැ. ස්වාමියාගේ අයියාගේ පුතා හොරා නම් බිරුවාට කමක් නැහැ. රටේ ජනතාව එතුමාට දොස් කියන්නේ නැහැ කියන කාරණය මම මේ වෙලාවේදී කියනවා. අද ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට සිද්ධ වෙලා තිබෙන්නේ සිරිසහබෝ වාගේ වෙන්නයි. තමන් නොකරපු වරදක් වෙනුවෙන් අනුන් රකින්න ගිහිල්ලා එතුමාට, එතුමාගේ බෙල්ල දෙන්න සිද්ධ වෙලා තිබෙනවා කියන කාරණය මම මේ වෙලාවේ බොහොම කනගාටුවෙන් වුණත් මතක් කරනවා.

ඊළඟ කාරණය මෙයයි. අපේ රටට අයත් භූමියේ භෞමික පිහිටීම ආරක්ෂා කර තිබෙනවාද? නැහැ, රටට අයත් භූමියේ භෞමික පිහිටීමත් විනාශ කර තිබෙනවා. අපේ රටේ එක්තරා නගරයක් හැදුවා. දැන් අපට ඒ නගරය අයිතිද? ඇමෙරිකාව තෙල් ටැංකි බලන්න ගියාම, ඒ තෙල් ටැංකි බලන්න ඔවුන්ට අයිතියක් තිබෙනවා කියා විෂය භාර ඇමතිතුමා කිව්වා. සින්නක්කර ලබා දුන් වරාය නගරය අනූනව අවුරුදු බද්දකට හරවා, යන්තම් එහි අයිතිය තහවුරු වන ආකාරයට ඒ ගිවිසුම සංශෝධනය කර ගන්න අපට පුළුවන් වුණා. ඒ, යහ පාලන රජයට පින්සිද්ධ වෙන්නයි.

ඊළඟට, දැන් සීමාසහිත සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් (පෞද්ගලික) සමාගම හරහා ලංකාවේ තිබෙන ඉඩම් ටික විකුණන්න යනවා. ඇමතිතුමා කිව්ව විධියට ජාතික ආරක්ෂාව තුළ භූමිය ආරක්ෂා වෙලා තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් අපට ගැටලුවක් තිබෙනවා. රුපියල් බිලියන 373.05ක් ආරක්ෂක අමාත්‍යාංශයට ඇත්තටම ඕනෑද? මේ රටේ යුද්ධයකුත් නැතිව සමස්ත අය වැයෙන් සියයට 14.9ක් -සියයට 15ක් විතර- ලබා දෙන්නේ මිග් ගනුදෙනුවේ දෙවැනි ජවනිකාව නැවතත් රඟ දක්වන්නද කියා මේ රටේ ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මය ගැන කථා කළොත්, මහ කන්නයේ වී වගා කර තිබෙන්නේ භූමියෙන් තුනෙන් එකක විතරයි. මහ කන්නය විනාශයි. සක්කරයාට තියා ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියනවා වාගේ වයිමාටවත් අද මහ කන්නය ගොඩ දමන්න බැහැ. අපි කියන්නේ ඊළඟ කන්නයටවත් පොහොර ටික ගෙන්වන්න දැන් ලැහැස්ති වුණොත් ඒ කන්නයවත් වගා කරන්න පුළුවන් කියායි. *[බාධා කිරීමක්]* මගේ කථාවට බාධා කරන්න එපා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒ පිළිබඳව කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, පැහැදිලි කිරීමක්ද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු මන්ත්‍රීතුමියනි, අපේ ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් ඔබතුමිය මේ විනාඩි දෙක ගන්න.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

සඳහිරු සෑය මහා පුණ්‍යෝත්සවය උද්ඝෝෂණයකට සමාන කරන්න එපා, ගරු මන්ත්‍රීතුමියනි. සඳහිරු සෑය මේ රටේ යුද්ධය අවසන් කළ රණ විරුවන්ට කරපු ගෞරවයක්; සාමයට කරපු ගෞරවයක්. මේ ආණ්ඩුව තමයි, ඒ හිටපු කට්ටිය තමයි, හැම තිස්සේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දෙන්න. ගරු රාජ්‍ය ඇමතිතුමනි, කොවිඩ් වයිරස් එකට උද්ඝෝෂණය ද, පින්කම ද කියලා එකක් නැහැ. මම ඒකයි ඇහුවේ, මේ වයිරස් එක සඳහිරු සෑයේදී සිල් අරගෙනද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කාලය දෙන්න එපා. *[බාධා කිරීම්]* අද මේ රටේ වී වගාව ඉවරයි. *[බාධා කිරීම්]*

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]* විපක්ෂයට බෞද්ධාගමත් එක්ක වෛරයක් තිබෙනවා. *[බාධා කිරීම්]* ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියනි, කරුණාකර මෙතැන ආගම්වාදය, ජාතිවාදය පතුරන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර මේ ඇමතිවරුන්ට, රාජ්‍ය ඇමතිවරුන්ට තමන්ගේ පිළිතුරු කථාවේදී පිළිතුරු ලබා දීමේ සංස්කෘතියක් හදන්න; සදාචාරයක් හදන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order.

මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර ගරු මන්ත්‍රීතුමියට කථා කරන්න ඉඩ දෙන්න කියලා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා චාරිත්‍ර ඉගෙන ගන්න. *[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]* කඨින උත්සව ආදී පින්කම් ටික ඔක්කෝම නැවැත්තුවා. *[බාධා කිරීම්]* අද මේ කරන දේ හරිම කැතයි. ඇත්තටම වී වගාව ඉවරයි. *[බාධා කිරීම්]* මේ රටේ මැදමුලන, එහෙම නැත්නම් බෙලිඅත්ත, තිස්සමහාරාමය, මොනරාගල තිබෙන කුඹුරු ටික වපුරලාද කියා මම මේ වෙලාවේ අහනවා. පොහොර ඇමතිතුමාගේ අප්පච්චිගේ කුඹුරු ටිකත් වැපුරුවාද කියා අපි අහන්න ඕනෑ. මොකද, අද බඩ ඉරිඟු වගාව ඉවරයි. ඒ වාගේම උඩරට එළවලු වගාව, තේ වගාව විනාශ වෙලා යනවා. අර්තාපල් වගාව ඉවරයි. මල් වගාව ගැන දැන් කථා කරලා වැඩක් නැහැ. එළවලු කිලෝව රුපියල් 500 සිට රුපියල් 900 දක්වා ඉහළ මිලකට දැන් අළෙවි කරනවා. ලබන ජනවාරිවලින් පසු රුපියල් 1,000ට, රුපියල් 1,200ට අපට එළවලු කිලෝවක් ගන්න වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ, වෙයන්ගොඩ ප්‍රදේශයේ බෝංචි කිලෝ එකක් රුපියල් 560යි. එතකොට මේ රටේ ජනතාව කන්නේ, බොන්නේ කොහොමද කියන එක තමුන්නාන්සේලා හිතන්න. මේ ආණ්ඩුවේ මෝඩකම, එහෙම නැත්නම් උද්ධච්චකම කෘෂිකර්ම ප්‍රතිපත්තියෙන්ම පෙනෙනවා. එම නිසා අය වැය කථාවෙන් මොනවා කිව්වත් වැඩක් නැහැ.

කෘමිනාශක ටික, දිලීරනාශක ටික, වල්නාශක ටික නැතිව ලංකාවේ ගොවිතැන, සත්ත්ව ආහාර නිෂ්පාදනය අද සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. මේ අපරාධය කරන්න එපා. අපි කියන්නේ දැන් හරි ඊළඟ කන්නයට අවශ්‍ය පොහොර ටික අරගෙන දෙන්න, කෘමිනාශක ටික, වල්නාශක ටික ගේන්න කටයුතු කරන්න කියලායි. පොහොර විෂයභාර ඇමතිතුමාට කොඩි ඇදපු මොනරාගල ප්‍රදේශයේ එළවලු කඩවල අය මේ වෙනකොට නන්නත්තාර වෙලා ඉන්නවා. එතුමා අද හිටියා නම් තමයි හොඳ.

ඊළඟට, රජයේ සේවකයා ගැන කිව යුතුයි. රජයේ සේවකයා ජීවත් වෙන්නේ කොහොමද කියලා නොහිතපු අය වැයක් තමයි මේක. රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වයස අවුරුදු 65 දක්වා වැඩි කරන්න යෝජනා කිරීම මම දකින්නේ විහිළුවක් විධියට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන හැටියට මේක රුපියල් බිලියන 15ක් ඉතිරි කර ගන්න ලංකාවේ රාජ්‍ය සේවයම අවුල් කරන යෝජනාවක්. චීන අසූචි නැව ගෙනෙනකොට ඒකට ගෙවපු ගණන, හතර ගුණයක් වැඩිපුර ගෙවලා ඉන්දියාවෙන් ගෙන්වන නැනෝ පොහොර හොරකමට වැය වූ මුදල,- ඒකපොඩි ගණනක්, මේ ගොල්ලන්ගේ හැටියට.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අවුරුදු ගණනාවක් මහන්සි වෙලා ලංකාවේ විශ්‍රාම වයස අවුරුදු 63ක් කරන්න යෝජනා කළා. එය කළ යුතු ආකාරයත් යෝජනා කළා. ඒ නිසා කරුණාකර මේ අපරාධය කරන්න එපා, නවත්වන්න. මේකෙන් රටේ තාප්පවල චිත්‍ර ඇන්ද තරුණයන්ට මොකද වෙන්නේ? තරුණයන්ට රාජ්‍ය සේවයට එන්න තිබෙන ඉඩකඩ තමයි මේ වහන්නේ. Passport පෝළිම තව දික් වෙයි. තරුණයන්ගේ හීන තාප්පවල චිත්‍ර වාගේම බොඳ වෙලා යාවි. "රාජ්‍ය සේවය රටට බරක්" කියලා මුදල් ඇමතිතුමා කිව්වා. රාජ්‍ය සේවය රටට බරක් කළේ කවුද කියන එක තමන්ගේ පැත්තට ඇඟිල්ල දික් කරලා අහන්න. ලක්ෂ 5ක් හිටපු රාජ්‍ය සේවයට දේශපාලන වාසි බලාගෙන, දේශපාලන පත්වීම් දුන්නු සංස්කෘතියක් බිහි කළේ කවුද කියන එක මේ රටේ ජනතාව දන්නවා. අද ලක්ෂ 17ක් රාජ්‍ය සේවයේ. ජනගහනයෙන් සියයට දහතුනෙන් එකකට ආසන්නයි ඒ ගණන. System එක වරද්දා ගෙන අද තිබෙන systems අනන්නයි මේ අය හදන්නේ. ආණ්ඩුව දිගින් දිගටම සල්ලි අච්චු ගැහුවාට, විශ්‍රාම පාරිතෝෂිතය ගෙවා ගන්න බැරි තරමට ආණ්ඩුව බංකොළොත්. ඒකයි මේ යෝජනාව ගෙනෙන්නේ. දැන් මාස 6කින්, 7කින් විශ්‍රාමික පාරිතෝෂිතය ගෙවීම ප්‍රමාද වුණු අවස්ථා දක්නට ලැබෙනවා. අපි හිතන්නේ ඒකත් හොරා කාලා කියලායි. අවුරුද්දකට 30,000ක් පමණ පිරිසක් විශ්‍රාම යනවා. ඔවුන්ට රුපියල් බිලියන 15කට ආසන්න මුදලක් පාරිතෝෂිත ලෙස ගෙවන්න නියමිතව තිබෙනවා. ඒකට ආණ්ඩුවට සල්ලි නැහැ. ඒකයි මේ 'දහන්ගැට' කියන එක මේ රටේ හැමෝම දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, මේ සල්ලි ගෙවීම ප්‍රමාද කරලා නිවැරදි ලෙස ආයෝජනය කළොත්, වසර හතරකින්, පහකින් ඒ මුදලින්ම පාරිතෝෂිත මුදල් ගෙවන්න පුළුවන්කම තිබෙනවා. නමුත්, මේ ආණ්ඩුව පාරවල් හදන්න, චීන අසූචි ගෙන්වන්න, කොමිස් ගහන්න, මන්ත්‍රීවරු හරහා ගමට බෙදලා දේශපාලනය කරන්න ඒ මුදල් වැය කළොත් රජයේ සේවකයාට විශ්‍රාම වැටුපත් නැති වෙලා යනවා; උසස්වීම් නැති වෙනවා. මේ වැඩේ නිසා රාජ්‍ය සේවයේ උසස්වීම් අවුරුදු 5කින් අහිමිවෙලා ගිහිල්ලා ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. දැන් පරිපාලන සේවයේ ඉන්න අයට උසස් තනතුරුවලට යන්න අවුරුදු 55 විතර වෙනතෙක් ඉන්න වෙනවා. මේක ලෝක අපරාධයක්. බෝධිසත්වයාණන් වහන්සේ බුද්ධත්වයට පත් වුණේ, ජේසුස් වහන්සේ ධර්මය දේශනා කළේ, මහම්මද්තුමා තම උතුම් දහම දේශනා කළේ තරුණ වයසේ දී මිස, විශ්‍රාම ගියාම නොවෙයි. රාජ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ හා විශේෂ ශ්‍රේණියේ දැඩි පරතරයක් උසස්වීම් නැති නිසා ඇති වෙනවා. ඒ නිසා මෙන්න මේ කතන්දරය මම ඔබතුමාට කියනවා. ඒ, මොකක්ද?

නිල ඇඳුම් අඳින නිලධාරින් ගැන හිතන්න. අවුරුදු 65 පොලිස් සාජන් මහත්මයා කොහොමද හැරමිටියෙන් බූරු පොළ වටලන්න යන්නේ? වයස අවුරුදු 65 වුණාම සුරාබදු නිලධාරියා කසිප්පු අල්ලන්න කසිප්පුකාරයන් පස්සේ කොහොමද දුවන්නේ? වනජීවී නිලධාරින්, වන සංරක්ෂණ නිලධාරින් කැලෑ පාළුවෝ පස්සේ දුවන්නේ කොහොමද?

ගුරු සේවය ගැන හිතන්න. දරුවන් කැමැතියි, තරුණ ගුරුවරුන්ගෙන් ඉගෙන ගන්න. වයසට යන ගුරුවරුන්ට ලෙඩ රෝග හැදෙනවා. ඒ විතරක් නොවෙයි, අවුරුදු දෙකකින් විද්‍යා පීඨවලට ශිෂ්‍ය ගුරුවරුන් බඳවාගෙන නැහැ. ඒ තුළින් මේ ගැටලු තව තීව්‍ර වෙනවා. ඒ නිසා මේවා ක්‍රමිකව කරන්න. මේකත් අර චීන කක්කුස්සි පොහොර දිහා බලාගෙන රසායනික පොහොර තහනම් කළා වාගේ වැඩක්. එහෙම වුණොත් රාජ්‍ය සේවයත් කාබනික පොහොර වාගාව වාගේ වේවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ පින්තූරය අද පුවත් පතක තිබෙනවා. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ගැන මේ අය වැයේදී අපි දකින්න බලාපොරොත්තු වුණා. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයක් අය වැයෙන් අපි කොහොමද දකින්නේ? ඊයේ සඳහිරු සෑය විවෘත කරපු උත්සවයේදී තමන්ගේ බිරිඳට සමාන පුටුවක් දෙන්න අකැමැති වුණු රජවරු තමයි අපට ඉන්නේ. ස්වර්ණමාලි මහා සෑය හදනකොට ස්වර්ණමාලි දෙවඟනට කන්නලව් කළා ගහෙන් බිමට බහින්න, විමානයෙන් බිමට බහින්න කියලා. නමුත්, තමන්ගේ බිරිඳට සම පුටුවක් දෙන්නේ නැති අය රටේ කාන්තාවන්ට සමාන අයිතිය ලබා දෙයිද, සමානතාවක් පෙන්වයිද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ලෝකය යුද ස්මාරක ඉවත් කරන කාලයක වෛරය වපුරන, පරාජිත ජන කොට්ඨාසයක් තුළ ඉඳගෙන මේ අය අද කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

යුද්ධයෙන් වැන්දඹු වෙච්ච, දූ පුතුන් අහිමි වෙච්ච කාන්තාවන් උතුරෙත් - දකුණෙත් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සෑය හදන්න වෙන් කරපු මුදල් මේ අයට බෙදා දුන්නා නම්, එය තමයි සැබෑ යුද විරුවන් සැමරීම. යුද්ධයක් තුළ ප්‍රේමවතී මනම්පේරිගේ සිට ඉසිප්‍රියා දක්වා කාන්තාවගේ තත්ත්වය මේකයි කියලා මේ පින්තූරය පෙන්වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මම අහපු ධම්ම දිසානායක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යතුමා කියපු වදන් පෙළකින් මගේ කථාව අවසන් කරන්නම්.

"හත් දා හත් දුරුත්තේ
ඇත්තෝ කති බොති
නැත්තෝ හුල්ලති - මැරෙති"

මේ අය වැයත් එසේමය.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් අමාත්‍යතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමා අදත් නැහැ. ඊයේත් හිටියේ නැහැ. එතුමා පෙරේදා ඇවිල්ලා විනාඩි පහක් ඉඳලා ගියා. මේක පාර්ලිමේන්තුවට කරන නිග්‍රහයක්. වැදගත් ප්‍රශ්න අපි අහනවා. නමුත්, උත්තර දෙන්න කෙනෙක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම හිතන හැටියට රෝගයක් තිබෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යාංශය පැත්තෙන් අපි ඒ සම්පූර්ණ වගකීම ගන්නවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කිරීමට අවශ්‍යයි. විශේෂයෙන්ම ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් වැඩි කර තිබෙනවා කියලා. ඒක විපක්ෂයටත් හිමිවෙනවා. කරුණාකර, ඔබතුමන්ලා ඒකට එකඟ නැත්නම් විරුද්ධයි කියලා කියන්න. එහෙම නම් අපි විමධ්‍යගත මුදල් වැඩි කරන්නේ නැතිව ඉන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කථා කරන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන. අය වැය විවාදයේදී මුදල් ඇමතිතුමා මේ සභාවේ ඉන්න ඕනෑ. මට මතකයි, අපි පාසල් යන කාලයේත් වන්නිනායක මැතිතුමා, එන්.එම්. පෙරේරා මැතිතුමන්ලා මේ සභාවේ ඉඳගෙන විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන ඒවා සටහන් කර ගන්නවා. සටහන් කර ගෙන උත්තර දෙනවා. දැන් කිසිම උත්තරයක් දෙන්නේ නැහැ. එදා මම ප්‍රශ්න දෙකක් ඇහුවා මේ ආණ්ඩුව ණය ගෙවන්නේ කොහොමද, ඩොලර් සොයන්නේ කොහොමද කියලා. උත්තරයක් නැහැ. ඒක පාර්ලිමේන්තුවට කරන අපහාසයක්.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ කථාව ඔතැනින් නිමා කරන්න. මේ විවාදය වෙනත් පැත්තකට හරවන්න එපා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව ගැන ඔය වාගේ දේවල් කියන්නේ ලක්ෂ්මන් කිරිඇල්ල විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. එතුමාට තිබෙන ප්‍රශ්න ටික ඉදිරිපත් කරන්න කියලා අපි කිව්වා. එතුමාට ඒවා ඉදිරිපත් කරන්න බැහැ. ආණ්ඩු පක්ෂයෙන් මම මේ වෙලාව ගන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පැහැදිලියි. විවාදය වෙනත් පැත්තකට හරවන්න එපා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව එක ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පමණක් නොවෙයි ජයග්‍රහණය කළේ. පළාත් පාලන ආයතන 3,200ක් පමණ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරද්දී, 1,000කට ආසන්න පළාත් පාලන කොට්ඨාස ප්‍රමාණයක් අද විරුද්ධ පක්ෂයේ සිටින පක්ෂ ජයග්‍රහණය කරලා තිබෙනවා. ගමේ දේ දන්නේ ගමේ මන්ත්‍රීවරයා. ඒ නිසා ගමේ ජනතාවගේ අවශ්‍යතාවලට වෙන් කළ මුදල් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට දෙන්න එපා නම්, ඒවා දෙන්න එපා කියලා ඔබතුමන්ලා ප්‍රකාශයක් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]* දැන් අලුත් විවාදයකට යන්න එපා. ප්‍රධාන වැඩ කටයුතුවලට අවතීර්ණ වෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

යන්නේ කොහෙද, මල්ලෙ පොල්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.16]

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (විදේශ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Foreign)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා මෙම ගරු සභාවට ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ ප්‍රධාන තේමා කිහිපයක් තිබෙනවා. එක තේමාවක් තමයි, දිගින් දිගටම මේ රටට ණය ගන්න බැහැ කියන එක. එහෙම නම් රට සංවර්ධනය කිරීම සඳහා වෙන ක්‍රමවේදවලින් අපි ප්‍රාග්ධනය ලබා ගන්න ඕනෑ. That is, not debt, but non-debt capital inflows. එතකොට non-debt capital inflows කියන්නේ මොනවාද? තව තව ණය වෙන්නේ නැතුව, රටේ සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා ගැනීමට අපට තිබෙන ක්‍රමවේද මොනවාද? ප්‍රධාන ක්‍රමවේද හතරක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ක්‍රමවේද හතර මෙසේයි. ආයෝජනය, වෙළඳාම, සංචාරක කර්මාන්තය හා අපේ ශ්‍රමිකයන් පිටරට ගිහිල්ලා වැඩ කරලා අපේ රටට එවන විදේශ විනිමය. ක්‍රමවේද හතරෙන්ම උපරිම ප්‍රයෝජන ගැනීම තමයි අද කාලීන අවශ්‍යතාව වෙලා තිබෙන්නේ. මේ රටට ආයෝජන ලබා ගැනීමට පුළුවන්. මම ළඟදී මහා බ්‍රිතාන්‍යයට ගියා. ඒ වාගේම මම ඊයේ හවස ආවේ බංග්ලාදේශයේ ඉඳලා. මම බංග්ලාදේශයේ අග්‍රාමාත්‍යතුමිය වන ෂෙයික් හසීනා මැතිනිය හමු වුණා; ඒ වාගේම බංග්ලාදේශයේ විදේශ කටයුතු ඇමතිවරයාත් හමු වුණා. ඒක ළඟදී විශාල ප්‍රගතියක් ලබාගෙන තිබෙන රටක්. අපේ රටට ආයෝජන ලබා ගන්න පුළුවන්. හැබැයි, හැමදෙනාම යථාර්ථවාදීව වටහාගත යුතු කාරණයක් තමයි ආයෝජන නිකම්ම එන්නේ නැහැ කියන එක. අද අප තරගකාරී ලෝකයක තමයි ජීවත් වන්නේ. එහෙම අපට ආයෝජන අවශ්‍ය නම්, ආයෝජකයන්ට දිරිගැන්වීම් - incentives to investors - දෙන්න ඕනෑ. ඒ දිරි ගැන්වීම් නැතුව අපේ රටට ආයෝජන එන්නේ නැහැ. හැබැයි, අපේ රටට ආයෝජන ලබා ගැනීමට සහජ ශක්තියක් තිබෙනවා. එකක් තමයි අපේ භූගෝලීය පිහිටීම. ඒක ඉතාම වැදගත්. හැබැයි, ඒක විතරක් නොවෙයි, අතිගරු ජනාධිපතිතුමා ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නගරයේ පැවති "COP26" සම්මේලනයට සහභාගී වූ අවස්ථාවේ සියලු රටවල් අපේ රට අගය කළා, ශ්‍රී ලංකාව සීමිත සම්පත් සමඟ කොවිඩ් 19 සාර්ථකව පාලනය කිරීම පිළිබඳව. එතකොට එය කෙරිලා තිබෙනවා. අපි ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත කරලා තිබෙනවා. දැන් සංචාරකයන් එන්න පටන් අරගෙන තිබෙනවා. එතකොට ලෝකය සමඟ ගනුදෙනු කිරීම යළි ආරම්භ කිරීමට පුළුවන් වාතාවරණයක් අද අපේ රටේ නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ ඇරෙන්න, ආයෝජකයන්ට මේ රටේ ගනුදෙනු කරලා පුරුදුයි. අපේ රටේ නීති පද්ධතිය, මුදල් පද්ධතිය, පරිපාලන ක්‍රමවේද කියන මේ සියල්ලක්ම ආයෝජකයන්ට හුරු පුරුදු දේවල්. වෙළෙඳාම හා ආයෝජන සම්බන්ධයෙන් මම බ්‍රිතාන්‍ය විදේශ ඇමතිනිය වන එලිසබෙත් ට්‍රස් සමඟ කරපු සාකච්ඡාවේදී එතුමිය පෙන්වා දුන්නා, දැන් බ්‍රිතාන්‍යය යුරෝපයෙන් වෙන් වෙලා කියලා. එතකොට අද මහා බ්‍රිතාන්‍යයට දැඩි අවශ්‍යතාවක් තිබෙනවා, අලුත් වෙළෙඳ පොළවල් සොයන්න. ඒ අයගේ කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය වෙන මූලාශ්‍රවලින් ලබා ගැනීමේ අවශ්‍යතාවක් අද මහා බ්‍රිතාන්‍යයට තිබෙනවා. ඒ නිසා මීට පෙර කවදාවත් නොතිබුණු තරමට පොදු රාජ්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් දැක්වීමට මහා බ්‍රිතාන්‍යය අද උත්සුක වෙනවා. එතුමිය ඒක මට පැහැදිලිව කිව්වා. ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ කටයුතු සඳහා මහා බ්‍රිතාන්‍යයේ අග්‍රාමාත්‍යතුමා Lord Davies of Abersoch කියලා වෙනම නියෝජිතයෙක් පත් කරලා තිබෙනවා. බොරිස් ජොන්සන් අගමැතිතුමාගේ ඒ විශේෂ නියෝජිතයා මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන්හි පිහිටි අපේ මහ කොමසාරිස් කාර්යාලයට මා හමුවීමට පැමිණියා. එතුමා පෞද්ගලික වශයෙන් තමයි මා හමුවෙන්න පැමිණියේ. අපි දෙදෙනා Sri Lanka-United Kingdom Chamber of Commerce විවෘත කළා. ඒකට මහා බ්‍රිතාන්‍යයේ විශාලතම සමාගම් පැමිණියා. Hong Kong and Shanghai Banking Corporation හිටියා; De La Rue හිටියා; බැංකු හිටියා; විශාලතම සමාගම් ඇවිල්ලා හිටියා. එතුමා හා මම එකට මේක විවෘත කළා. එම නිසා අපට දැන් අලුත් අවස්ථාවක් තිබෙනවා. බ්‍රිතාන්‍යයේ හිටපු අගමැතිනිය වන තෙරේසා මේ 2016 Conservative Party සම්මේලනය අමතමින් "Global Britain" - ගෝලීය බ්‍රිතාන්‍යය - කියන වචනය ප්‍රථම වතාවට පාවිච්චි කළා. ගෝලීය බ්‍රිතාන්‍යය කියන එම සංකල්පයට යථාර්ථවාදී අර්ථයක් දීමට වර්තමාන බ්‍රිතාන්‍ය රජය උනන්දුවක් දක්වනවා. ඒ නිසා ලංකාවට විශේෂ අවස්ථා තිබෙනවා. ඒ අවකාශවලින් අපි ප්‍රයෝජන ගන්න ඕනෑ.

ඊළඟ කාරණය සංචාරක කර්මාන්තය. ගරු ප්‍රසන්න රණතුංග අමාත්‍යතුමා සහ මම එන සතියේ එකතු වෙලා "Zoom" තාක්ෂණය ඔස්සේ යුරෝපයේ අපේ සියලු තානාපති කාර්යාල

අමතනවා. ඔවුන්ට කියනවා, සංචාරක කර්මාන්තය දියුණු කිරීමට විශේෂ ප්‍රමුඛත්වයක් දෙන්න කියලා. සංචාරක කර්මාන්තය කියන්නේ, අර ඉස්සර වාගේ සංචාරකයන් ඇවිල්ලා අපේ මුහුදු වෙරළෙහි විනෝද වෙලා දවස් තුනක් හතරක් ගත කරලා යන එක නොවෙයි. ඊට වඩා ගොඩක් දේවල් කරලා ඒ කර්මාන්තය තුළින් හුඟක් විදේශ විනිමය මේ රටට ලබාගන්න පුළුවන්, අපට මේ රට ශක්තිමත් කිරීමට. අලුත් විධියේ සංචාරකයන් අද මෙහි පැමිණෙනවා.

There are specialized forms of tourism. සෞඛ්‍ය පැත්තෙන් ගත්තාම, health tourism. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජර්මනියේ හිටපු චාන්සලර් හෙල්මුට් කෝල් මැතිතුමාගේ අතින් බර්ලින් නගරයේ සිද්ධාලේප spa එකක් විවෘත කළා. අද යුරෝපයෙන් විශාල සංචාරකයන් සංඛ්‍යාවක් එනවා; ආයුර්වේද, සිද්ධ, යුනානි කියන පැරණි පෙරදිග ක්‍රමවලින් ප්‍රයෝජන අරගෙන තමන්ගේ සෞඛ්‍ය දියුණු කර ගන්න. ඒ සඳහා සංචාරකයන් විශාල සංඛ්‍යාවක් මේ රටට පැමිණීමට උනන්දුවක්, උද්‍යෝගයක් දක්වනවා. ඒ තුළින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපට ලබා ගන්න පුළුවන්. යුරෝපයේ අපේ තානාපති කාර්යාලවලට - අපේ Embassiesවලට - කියනවා, environmental tourism ප්‍රවර්ධනය කරන්න කියලා. ඒකට ලෝකයේ ලොකු ඉල්ලුමක්, ලොකු demand එකක් තිබෙනවා. අපේ සිංහරාජ වනාන්තරයට ලොකු ආකර්ෂණයක් තිබෙනවා. අනෙක් එක, religious tourism කියන එක. ථේරවාදී බුද්ධාගම පිළිබඳ ලොකු උනන්දුවක් යුරෝපයේ මෙන්ම බටහිර රටවල තිබෙනවා. මේ විධියට අපට පුළුවන්, විදේශ විනිමය ලබා ගන්න.

අපේ ශ්‍රමිකයන්ට තව තව අවස්ථා ලබා දීම සඳහා අපි විශේෂ උනන්දුවක් දක්වනවා. අතිගරු ජනාධිපතිතුමා ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නගරයේ සිටින විට අපට කුවේට් අග්‍රාමාත්‍යවරයා හම්බ වුණා. එතුමා අපට කිව්වා, "අපි සම්පූර්ණයෙන් තෘප්තිමත් වෙනවා ශ්‍රී ලංකාවෙන් එන ශ්‍රමිකයන් පිළිබඳව. මහන්සි වෙලා වැඩ කරනවා. කිසිම ප්‍රශ්නයක් අපට ඇති කරන්නේ නැහැ. එම නිසා තව තව ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවෙන් කුවේට්වලට ගෙන ඒමට අපි සූදානම්" කියලා. කුවේට් රටේ අග්‍රාමාත්‍යතුමා ඒ බව අපේ ජනාධිපතිතුමාට කිව්වා. මම උත්සාහයක් දරනවා, කොරියාව සමඟ සාකච්ඡා කරලා වැඩි ශ්‍රමිකයන් සංඛ්‍යාවක් ඒ රටට යවන්න. කොරියාව කිව්වා, "කොවිඩ් 19 තත්ත්වය නිසා ආපසු ඒ රටට එන්නට ඒ ගොල්ලන් අවසර දෙන්නේ කොරියාවේ කලින් හිටපු ශ්‍රමිකයන්ට පමණයි" කියලා. අපි එයට විරුද්ධව ආයාචනයක් කළා. දැන් ඒක පුළුල් කරලා, අනෙක් අයටත් අවස්ථාව සලසා දීලා තිබෙනවා. අපේ ශ්‍රමිකයන් දකුණු කොරියාවේ බොහොම සතුටින් වැඩ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොවිඩ්-19 වසංගතය තුළදීත් අපේ අපනයන ආදායම කිසිසේත් අඩු වුණේ නැහැ. අපට ඒ ගැන ආඩම්බර වෙන්න පුළුවන්. සංචාරක කර්මාන්තය බිඳ වැටුණා. සංචාරක කර්මාන්තයෙන් අපි වර්ෂයකට ලබා ගන්නා මුදල දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.2යි. ඒ ආදායම සම්පූර්ණයෙන් නැති වුණා. හැබැයි, අපනයන ආදායම - export income එක - කිසිසේත් අඩු වුණේ නැහැ. ඒකට හේතුව තමයි, අපේ අපනයනවලට - exportsවලට - වඩ වඩා අගය එකතු කිරීම - value addition - කරනවා.

එතැන වුණේ මේකයි. If you look at the history of the apparel industry in this country, a strategic decision was taken by our companies to concentrate on niche products like lingerie, swimwear and sportswear for niche markets. Our large companies like Brandix, MAS Holdings and Omega Line became not just regional leaders, Sir, but world leaders. They were producing certain commodities for niche markets. But, after COVID - 19, the demand dropped for those kinds of goods. But, those companies had the resilience, the flexibility to shift to other kinds of commodities they produced. For personal protection equipment, gloves, facemasks, they had huge orders from the National Health Service in the United Kingdom. They had massive orders for personal protection equipment. The large companies could not cope with these orders. So, they farmed them out to smaller apparel companies. The result was that the production lines could be kept open. There was no retrenchment. That was a major achievement, and the dynamism and the creativity of our private sector played a major role in that.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය තමයි GSP Plus සහනය. GSP Plus සහනය ලබා දීම සම්බන්ධව සාකච්ඡා කිරීම පිණිස අපේ රටට පැමිණියා බ්‍රසල්ස් නගරයේ පිහිටි යුරෝපීය සංවිධානයේ ඉහළ පෙළේ කණ්ඩායමක්. ඔවුන් මා සමඟ විස්තර සහිතව සාකච්ඡාවක් පැවැත්වූවා. Nikolaos කියන නිලධාරියා තමයි එම කණ්ඩායමේ ප්‍රධානියා. අපි ඔවුන්ට කරුණු පෙන්වා දුන්නා. අපි පිළිගන්නවා, GSP Plus කියන්නේ පරිත්‍යාගයක් නොවන බව; GSP Plus is not a gift. It is a contract. There are conditions which have to be fulfilled in order to establish entitlement to the benefits flowing from GSP Plus. හැබැයි, අපි ඒ නියෝජිත කණ්ඩායමට පෙන්වා දුන්නා, "ඒ කොන්දේසි සපුරාලීම සඳහා අපි අංග සම්පූර්ණ වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා, මෙන්න අපි ලබා ගත්ත ප්‍රගතිය, අනාගතයේ අපි කරන්න බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ මේකයි, මේක අපට අහිමි කළොත් ඒකෙන් පාඩු වෙන්නේ ශ්‍රී ලංකා රජයට නොවෙයි, මේ රටේ දිළිඳුම ජනතාවට" කියලා. අද ඇඟලුම් කර්මාන්තශාලාවල කවුද වැඩ කරන්නේ? සියයට 95ක් ගැහැනු ළමයි -කාන්තාවන්- ඒවායේ වැඩ කරන්නේ. කිසිම දවසක බුක්ති නොවිඳි ජීවිතයක් ඒ අයට ඒ තුළින් ලැබෙනවා. අනාගතය සම්බන්ධයෙන් බලාපොරොත්තු ඇති කර ගන්න පුළුවන්. "X-Press Pearl" ඛේදවාචකයෙන් පසුව බැට කාපු ධීවර ජනතාවට GSP Plus විශාල සහනක් වෙනවා. මොකද, අපේ රටේ මත්ස්‍ය සම්පත යුරෝපයට යවන්නේ GSP Plus හරහා. ඒක ඒ ගොල්ලන් පිළිගත්තා. ඒ නිසා මේ අවස්ථාවේදී GSP Plus සහනය අපේ රටට අහිමි කිරීම කිසිසේත් සාධාරණ ප්‍රතිපත්තියක් වන්නේ නැහැ. මේ සතියේත් මම EU Ambassador Denis Chaibi මැතිතුමා හමු වෙනවා. අපි ඒ අය සමඟ අඛණ්ඩව සාකච්ඡා පවත්වනවා. මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා, මේ සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ කියලා. කළ යුතු දේවල් අපි කරගෙන යනවා. ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු අපි බ්‍රසල්ස් නගරයට සපයා දෙනවා.

ශ්‍රී ලංකාවේ විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණය තමයි අපි එක රටක් එක්ක පමණක් සම්බන්ධතා ඇති කර නොගැනීම. That, I would say, Sir, is the cornerstone of Sri Lanka's Foreign Policy under this Government. There is no exclusivity in our foreign relations. We do not do business or have cordial relations with one country only and we continue to believe in the vitality and the justification for the Non-aligned Movement. යහ පාලන රජයේ හිටපු විදේශ කටයුතු ඇමතිවරයා ගිය අවුරුද්දේ ප්‍රකාශ කළා, "නොබැඳි ප්‍රතිපත්තිය වර්තමාන ලෝකයට ගැළපෙන්නේ නැහැ" කියලා. "ඒක ඉතිහාසයට සම්බන්ධ දෙයක් පමණයි, යල් පැන ගිය සංකල්පයක්, ශ්‍රී ලංකාවට ඒ පිළිබඳව කිසිම විශ්වාසයක් නැහැ" කියලා යහ පාලන රජයේ හිටපු විදේශ ඇමතිවරයා ලෝකයට ප්‍රකාශ කළා. අපි ඒ සමඟ එකඟ වන්නේ නැහැ. It is true that Non-aligned Movement evolved in a different context, in the context of a bipolar world. That geopolitical context has now

[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

changed. But, it is my firm conviction that the Non-Aligned Movement is based upon a rationale which has immediate relevance to the contemporary world.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොබැඳි පිළිවෙතේ හරය තමයි එක කඳවුරකට සදාකාලිකව හේත්තු වෙන්නේ නැතුව යම්කිසි ප්‍රශ්නයක් පැන නැඟුණාම ඒ සම්බන්ධයෙන් නිවැරදි දේ මොකක්ද, what is the right approach කියා සොයා බැලීම. It must be based on morality and convictions, not on expediency, cynicism and opportunism. ඒ අදහස් හා සංකල්ප වෙන කවරදාටත් වඩා වර්තමාන ලෝකයට අවශ්‍යයි, අදාළයි කියලා මා තරයේ විශ්වාස කරනවා. අපේ සියලු මිත්‍ර රටවල් සමඟ අපි සුහද සම්බන්ධතා පවත්වාගෙන යනවා. එක රටකට හානිවන පරිදි වෙන රටක් සමඟ ගනු දෙනු කිරීම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන් පටහැනියි. නිදර්ශනයක් හැටියට ඉන්දියාව ගනිමු. ඉන්දියාව අපේ අසල්වැසි රට. ඉන්දියාව සමඟ සුහද සම්බන්ධතා අත්‍යවශ්‍යයි. මා කියනවා, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ අඩිතාලම හැටියට ඒක සලකන්න පුළුවන් කියලා. ඒ කියන්නේ, රටවල් දෙක අතර ගනුදෙනු පමණක් නොවෙයි, නව දිල්ලිය හා කොළඹ ආණ්ඩු දෙක අතර සම්බන්ධතා පමණක් නොවෙයි, අද ලංකාවේ ජනතාව හා ඉන්දියාවේ ජනතාව අතරත් ඉතාම සුහද සම්බන්ධතාවක් තිබෙනවා. දැන් සති දෙකකට පෙර කුෂිනගර් ගුවන් තොටුපොළ -බෞද්ධ සංස්කෘතියට අනුව බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානය.- ඉන්දීය අගමැති ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ප්‍රථම වතාවට ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට දියුණු කළා. අපේ භික්ෂූන් වහන්සේලා සිය නමක් රැගත් ගුවන් යානය එම ස්ථානයට ළඟා වනකොට ඉන්දීය අගමැතිතුමා පෞද්ගලිකව පැමිණියා. ස්කොට්ලන්තයේදී එතුමා හමු වුණාම මා එතුමාට ඒ සම්බන්ධයෙන් ස්තුති කළා. එම අවස්ථාවේදී අපේ ජනාධිපතිතුමාත් සිටියා. ඉන්දීය අගමැතිතුමාට මම ස්තුති කළා, "ඔබතුමා එම අවස්ථාවට පැමිණීම අපි අතිශයින් අගය කරනවා" කියලා. ඒකට පිළිතුර හැටියට එතුමා කිව්වා, "නැහැ. එය මගේ භාග්‍යයක්. බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානයට පෞද්ගලිකව පැමිණ, ඒ වැඩ කටයුතුවලට සෘජුවම සම්බන්ධ වීමට අවකාශ ලැබීම මා ලත් විශේෂ භාග්‍යයක් හැටියට සලකනවා" කියලා. එතුමා ඒක බොහොම සතුටින් කළ බව කිව්වා. නවදිල්ලිය සමඟ පමණක් නොවෙයි, ඉන්දියාවේ ප්‍රාන්ත සමඟ අපි වැඩ කටයුතු කරගෙන යනවා. Connectivity with India is of the utmost importance in the context of Sri Lankan Foreign Policy. Social connectivity, grid connectivity, all that is important.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

Hon. Johnston Fernando, can I have a few more minutes?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

Sir, give him five more minutes.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

අපට ඉන්දියාව සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමක් තිබෙනවා. අපිට බටහිර රටවල් උදාහරණයක් හැටියට අරගෙන, ලංකාවට ආයෝජනය කරලා මෙහේ නිෂ්පාදනය කරන භාණ්ඩ කිසිම තීරු බද්දක් ගෙවන්නේ නැතිව ඉන්දියාවට යවන්න පුළුවන්. So long as they comply with the rules relating to origin and value addition, those goods are entitled to duty-free entry into the markets of the Indian Subcontinent. So, these are all advantages available to Sri Lanka.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීනය අපට ගොඩක් උදවු කළා, අපේ යටිතල පහසුකම් දියුණු කිරීමට. Belt and Road Initiative එක නිසා අපට රටවල් රාශියක් සමඟ සම්බන්ධ වෙන්න පුළුවන් වුණා. අපේ අපනයන සියයට 65ක් යවන්නේ බටහිර යුරෝපයට හා ඇමෙරිකා එක්සත් ජනපදයට. ඒ සම්බන්ධතා වැදගත් වෙනවා. ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ මම විදේශ ඇමති හැටියට කටයුතු කළ කාලයේ අපි විශේෂ අවධානයක් දැක්වූවා, අප්‍රිකාව සමඟ සම්බන්ධතා දියුණු කර ගැනීමට. ඒකට එදා පැවැති යහ පාලන රජය හිනා වුණා. හැබැයි, අපි ටැන්සානියාවට ගිහින් සති දෙකකට පස්සේ ඔබාමා ජනාධිපතිතුමාත් ටැන්සානියාවට ආවා. අප්‍රිකාව අද හරි වැදගත්. ඒ එහි ඛනිජ සම්පත් ආදී නොයෙක් දේවල් තිබෙන නිසා. අපි අලුත් සම්බන්ධතා අලුත් රටවල් සමඟ ගොඩ නඟා ගන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ කුරුඳු ලෝකයේ ඉස්තරම් කුරුඳු. ලෝකයේ සියයට 80කට වඩා ගුණාත්මක කුරුඳු අපි තමයි නිෂ්පාදනය කරන්නේ. ඒවාට අලුත් වෙළෙඳ පොළවල් තිබෙන්නේ කැරිබියන් දූපත්, ලතින් ඇමෙරිකා සහ දකුණු ඇමෙරිකාවේ මෙක්සිකෝව වැනි රටවල. එතකොට බෞද්ධ උරුමයක් තිබෙන තායිලන්තය, වියට්නාමය, කාම්බෝජය, ලාඕසය වැනි රටවල් සමඟ අපි අපේ සම්බන්ධතා තරකර ගන්න ඕනෑ. ඕස්ට්‍රේලියාවේ කලින් සිටි විදේශ ඇමතිනිය මට කිව්වා, "We must remember that Perth is closer to Singapore than it is to Sydney" කියලා. එතකොට ඕස්ට්‍රේලියාව සමඟ ඉන්දියානු සාගරය වටා පිහිටා තිබෙන රටවල් සමීප සම්බන්ධතා පවත්වා ගෙන යන්න ඕනෑ. Sri Lanka is a member of regional organizations like SAARC, BIMSTEC, IORA and ACD. Yesterday, Sri Lanka was elected the Vice Chair of IORA - Indian Ocean Rim Association - and I presided over that assembly yesterday in the temporary absence of the Foreign Minister of Bangladesh.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාරාංශයක් හැටියට කියනවා නම්, අපි උපදෙස් දෙනවා, අපේ සියලු මහ කොමසාරිස් කාර්යාලවලට සහ තානාපති කාර්යාලවලට, that economic diplomacy is the priority. ඒ ගොල්ලන්ට අපි භාර දීලා තිබෙන සියලු කාර්ය භාරය අතරින් වැදගත් වන්නේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඒ අයගේ දායකත්වයයි. ඒක තමයි ඒ ගොල්ලන්ගේ අරමුණ. ආයෝජන, වෙළෙඳාම, සංචාරක කටයුතු ආදියට අවධානය යොමු කරලා මොකක්ද කළේ, මොනවාද ලබා ගත් ප්‍රතිඵල ආදී වශයෙන් සඳහන් කරලා එක් එක් තානාපති කාර්යාලයේ වැඩ පිළිවෙළ ගැන මාසයෙන් මාසයට අපට වාර්තා එවන ලෙස කියා තිබෙනවා. මම ඉතාම ඕනෑකමින් මේ ගරු සභාවේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, පක්ෂ භේදය නොතකා විදේශ ප්‍රතිපත්තියට සහයෝගය දෙන්න කියලා. අනෙක් සියලු දේවල් ගැන වාද විවාද, ගැටුම්, උද්ඝෝෂණ ආදි ඕනෑ එකක් තිබුණාට කමක් නැහැ. හැබැයි, විදේශ ප්‍රතිපත්තිය මුළු රටටම බලපාන දෙයක්, කවුරු ආණ්ඩු කළත්. එම නිසා අපේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා රට වෙනුවෙන් එක තැනකට එන ලෙසත්, මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා මේ ගරු සභාවේ සියලු ගරු

මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙසත් මම ඉතාම නිහතමානී ලෙස රජය වෙනුවෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ සිටින විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු mask එක දාගෙනත් නැහැ. මෙතැන ඉඳලා බලන කොට පෙනෙනවා, ඒ අය masks දාගෙන නැති බව. පසුගිය දවස්වල ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් COVID positive වුණා. ඊයේ තිබුණු මෝඩ රැල්ල හින්දා positive වන ප්‍රමාණය වැඩි වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමන්ලාට masks දාගන්න කියන්න. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එක් කෙනෙක් කථා කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ රාත්‍රියේ අනුරාධපුරයේ ජනාධිපති නිල නිවසේ birthday party එකක් තිබුණා. ඒකේ 2,000කට වඩා ඉඳලා තිබෙනවා. අද දවල් දෙවෙනි පදවි ප්‍රාප්තිය නිමිති කරගෙන දහසකට, දෙදහසකට වඩා පිරිසකට lunch එකක් සූදානම් කර තිබෙනවා. එතුමන්ලාට සෞඛ්‍ය පවත්වන්න පුළුවන්. මේ රටේ තිබෙන්නේ එක රටක්, එක නීතියක් ද? එක රටක එක නීතියක් තිබෙන කොට ආණ්ඩු පක්ෂයට එක නීතියකුත්, විපක්ෂයට තව නීතියකුත් ක්‍රියාත්මක කරන්න බැහැ නේ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එතුමන්ලාට කලබල වෙන්න දෙයක් නොවෙයි කිව්වේ. දැන් බලන්න, එතුමන්ලා බොහෝදෙනෙක් masks දාගෙන නැහැ. පත්‍රිකාවක් අපේ මේසය උඩ තබා තිබෙනවා, masks දාගෙන ඉන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔය වාදය නිමා කරමු.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කරන ඉල්ලීම මෙයයි. *[බාධා කිරීම්]* ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා දැන් COVID positive වෙලා තිබෙනවා. මෙතුමන්ලාත් positive වෙන්න ඉඩ තිබෙනවා. එම නිසා අපේ ආරක්ෂාව වෙනුවෙන් මෙතුමන්ලා සියලුදෙනාටම PCR කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස් දැක්වීමෙන් ඔය වාදය අවසන් කරන්න. කෙටියෙන් කියන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රසන්න රණතුංග ඇමතිතුමා දැන් කිව්වා, කොවිඩ්-19 වයිරසය පැතිරීම ගැන. ගරු ඇමතිතුමනි, විශේෂයෙන් ඔබතුමාත් මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. උද්ඝෝෂණය කරන කොට කොවිඩ් වයිරසය පැතිරෙනවා කිව්වා. එතකොට, උපන්දින සාද පවත්වන කොට කොවිඩ් වයිරසය පැතිරෙන්නේ නැද්ද? *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි දැන් මේ වාදය නිමා කරමු.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අනුරාධපුරයේ birthday party දැම්මාම කොවිඩ් වයිරසය පැතිරෙන්නේ නැද්ද? එතකොටත් ඒ වයිරසය පැතිරෙනවා නේද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]*

විශේෂයෙන් අපි මේ සභා ගර්භයේ රැඳෙන මොහොතේ හෝ සෞඛ්‍ය නීති හරියාකාර පිළිපදිනවා නම්, ඒක මේ රටේ අපේ ජනතාවට ආදර්ශයක් වෙනවා. ඒ කාරණය මම ඔබතුමන්ලාට මතක් කරනවා.

මීළඟට, ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 25ක් තිබෙනවා.

[மு.ப. 10.41]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நடைபெறுகின்ற வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்திலே கலந்துகொண்டு சில கருத்துக்களைச் சொல்லலாமென்று விழைகின்றேன். இந்த வரவு செலவுத்திட்டமானது "ஆண்டிகள் கூடி மடம் கட்டிய" நிலைக்கு ஒப்பானதாகத்தான் இருக்கின்றது. ஏற்கெனவே கஜானாவிலே பணம் இல்லையென்று சொல்கின்ற அரசு,

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட நிதிகளைத் திணைக்களங்களி லிருந்து மீளப்பெறுவதற்காக வர்த்தமானி அறிவித்தலை வெளியிட்ட அரசு, அபிவிருத்தி சம்பந்தமான எல்லா விடயங் களையும் நிறுத்திவிட்டு இப்பொழுது வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்து பாராளுமன்றத்திலே விவாதத்தை நடத்துகின்றதென்றால், அது வேடிக்கையாக இருக்கின்றது. இங்கு மனவருத்தப்படவேண்டிய விடயம் என்னவென்றால், "அரச ஊழியர்கள் நாட்டுக்குச் சுமை" என்ற நிதியமைச் சருடைய கருத்தாகும். இதை ஏற்றுக்கொள்ள முடியாது. ஆகவே, இந்த அரசாங்கம் எந்தளவுக்கு நிதி நெருக்கடியிலே இருக்கின்றது என்பது இதிலிருந்து தெரிகின்றது. இது உலகம் அறிந்த உண்மையாக இருக்கின்றது. அந்தவகையிலே, இந்த வரவு செலவுத்திட்ட விவாதம் தேவையற்றது என்பது எங்களுடைய கருத்தாகும்.

இப்போது ஏற்பட்டிருக்கின்ற விலைவாசி உயர்வால் எங்களுடைய சாதாரண மக்களுடைய வாழ்க்கை மிகவும் பாதிக்கப்பட்டிருக்கின்றது. அத்துடன், விலைவாசி இன்னும் உயரும் என்றும் சொல்லப்படுகின்றது. அந்த நிலைமையை மாற்றுவதற்கான வல்லமை இந்த அரசிடம் இல்லை என்பதைத்தான் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அரசாங்கம் பொருட்களுக்கான கட்டுப்பாட்டு விலைகளைத் தளர்த்தியிருக்கின்றது. இதனால், எந்தப் பொருளையும் என்ன விலைக்கும் விற்கலாமென்ற ஒரு நிலைமை ஏற்பட்டி ருக்கின்றது. இதன் காரணமாக, சாதாரண மக்களுடைய வாழ்க்கையானது படுமோசமான ஒரு நிலையில் இருக்கின்றது என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

அடுத்து, இந்த வரவு செலவுத்திட்டத்தில் இராணுவத்துக் குப் பல கோடி ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. நாடு மிக மோசமான வறுமை நிலையில் இருக்கின்ற இச்சூழ்நிலையிலே, இராணுவத்துக்கு ஏன் கூடுதலான நிதி ஒதுக்கப் பட்டிருக்கின்றது? என்ற கேள்வியை நான் கேட்கின்றேன். இவ்வாறு இராணுவத்துக்கு ஒதுக்கப்பட்ட நிதியின் அடிப்படையில் ஒருசில சந்தேகங்கள் எனக்கு ஏற்படுகின்றன. அதில் ஒன்று, இந்த நாட்டிலே இராணுவ ஆட்சி வரக்கூடிய வாய்ப்புகள் இருக்குமா? என்பதாகும். இன்றைக்குப் பல வழிகளிலும் போராட்டங்கள் வெடித்துக்கொண்டிருக்கின்ற சூழலில் அரசாங்கம் அலட்சியமாக இருப்பதைப் பார்க்கின்ற போது எனக்கு அச்சந்தேகம் எழுகின்றது. இன்றைக்கு விடுதலைப் புலிகள் அழிக்கப்பட்டுவிட்டார்கள்; ஆயுதப் போராட்டம் மௌனமாக்கப்பட்டுவிட்டது என்றெல்லாம் சொல்லிக்கொண்டிருக்கின்ற நீங்கள், பல கோடி ரூபாயை இராணுவத்துக்கு ஒதுக்கிய நீங்கள் யாருடன் போரிடப் போகிறீர்கள்? இந்தியாவோடு போரிடப் போகிறீர்களாக? அல்லது பாகிஸ்தானோடு போரிடப் போகிறீர்களா? அல்லது தமிழர்களோடு போரிடப் போகிறீர்களா? எனக்கு முன்பு பேசிய வெளிநாட்டு அலுவல்கள் அமைச்சர் அவர்கள், இந்தியாவோடு எங்களுடைய உறவு எப்படி இருக்கவேண்டும் என்பதை மிக அழகாகச் சொன்னார்.

நான் வெளிநாட்டு அலுவல்கள் அமைச்சர் அவர்களிடம் முக்கியமான ஒரு விடயத்தை வினவலாம் என்று எண்ணுகின்றேன். பயங்கரவாதத் தடைச் சட்டம் திருத்தப்பட வேண்டும்; அது இல்லாதொழிக்கப்பட வேண்டும் என்பது எங்களுடைய கருத்தாகும். ஐ.நா. சபையின் தீர்மானத்தில்கூட, அது இல்லாதொழிக்கப்பட வேண்டும் என்றுதான் சொல்லப் பட்டிருக்கின்றது. இருந்தாலும், இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவதற்கான அல்லது அதை மீளாய்வு செய்வதற்கான நடவடிக்கைகளை அரசு செய்து கொண்டிருக்கின்றது. அரசியலமைப்புக்கான 13ஆவது திருத்தம் என்பது இந்தியாவின் தலையீட்டால் கொண்டு வரப்பட்டது. அது ஒரு சட்டமாக இருக்கின்றது. அதனை அமுல்படுத்தி, மாகாண சபைக்குரிய அதிகாரங்களைக் கொடுப்பதனூடாக இந்தியாவுடனான உறவை இன்னும் பலப்படுத்துவதற்கான - வலுப்படுத்துவதற்கான வாய்ப்பை உங்களால் ஏற்படுத்த முடியும். ஆகவே, அதற்கு முயற்சி செய்யுங்களென்ற கோரிக்கையை நாங்கள் ஒற்றுமையாக இந்திய அரசாங்கத்திடமும் இலங்கை அரசாங்கத்திடமும் இந்தச் சபையினூடாக முன்வைக்கின்றோம். இனிவரப் போகின்ற மாகாண சபை முறையும் வெறும் எலும்புக்கூடு போன்று அதிகாரமற்றதாகத்தான் இருக்கப்போகின்றது. அதனை நாங்கள் ஏற்றுக்கொள்ளத் தயாராக இல்லை. பலர் சொல்கிறார்கள், இதுவொரு தீர்வாக அமைந்துவிடுமென்று. எங்களைப் பொறுத்தமட்டிலே, நாங்கள் இதை ஒரு தீர்வாகப் பார்க்கவில்லை. மாறாக, ஒரு புள்ளியாகவே பார்க்கின்றோம். இந்தப் புள்ளியைச் சரியான முறையில் ஆரம்பிக்கின்ற போதுதான் -

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කියන්න, ගරු ඇමතිතුමා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. මම එතුමා කියපු කාරණයට පිළිතුරු දෙන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණය පවත්වන්නට සම්පූර්ණයෙන් බැරි තත්ත්වයක් ඇති කළේ යහ පාලන රජය. එතුමන්ලා, තිබුණු නීතිය අහෝසි කළා. ඒ වෙනුවට අලුත් නීතියක් ආදේශ කළේ නැහැ. ඊට පසුව තර්ක කළා, මැතිවරණ ක්‍රමය පිළිබඳව එකඟත්වයක් නැති නිසා මැතිවරණය පවත්වන්න බැහැ කියලා. එදා දෙමළ ජාතික සන්ධානය ඒකට සම්පූර්ණ සහයෝගය දුන්නා. නීතිපතිතුමා කිව්වා, එදා ඒක කරන්න තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍යයි කියලා. යහ පාලන රජයට තුනෙන් දෙකක බහුතරයක් තිබුණේ නැහැ. එදා දෙමළ ජාතික සන්ධානයට ආසන 16ක් තිබුණා. එතුමන්ලා ඒ ඡන්ද 16ම දුන්නා, ඒක කරන්න. ඒ කියන්නේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නොහැකි තත්ත්වයක් ඇති කළේ පසුගිය රජය. ඒ අය සම්පූර්ණයෙන් චේතනාන්විතව, සැලසුම් සහගතවයි ඒක කළේ. දැන් ඒ ගැන කථා කරලා වැඩක් නැහැ.

පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා අලුත් නීතියක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. දැන් ඒ සම්බන්ධව ගරු දිනේෂ් ගුණවර්ධන සභානායකතුමාගේ සභාපතිත්වයෙන් පැවැත්වෙන විශේෂ කාරක සභාව සතියට දෙවතාවක් රැස් වෙලා සාකච්ඡා කරනවා. ඒ එක සාකච්ඡාවක් පැය දෙකහමාරක් විතර පැවැත්වෙනවා. අපි උපරිම උත්සාහ දරනවා; මහන්සි වෙනවා, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න. එම පනත් කෙටුම්පත ගෙනෙන්නේ නැතුව පළාත් සභා මැතිවරණය පවත්වන්න බැහැ කියලා නීතිපතිතුමා ඉතාම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. ඒක කරන්න අපි උපරිම වෙහෙස දරනවා.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதுபோல, மாகாண சபைத் தேர்தல் முறைமை தொடர்பில் ஒரு தெரிகுழு நியமிக்கப்பட்டு, அது தொடர்பில் ஓர் அறிக்கை தயாரிக்கின்ற செயற்பாட்டை நான் சட்ட ரீதியாகத் தேர்தல் நடாத்தப்படுவதற்கான ஒரு முயற்சியாகவே கருது கின்றேன். அத்தெரிகுழுவில் மாகாண சபைகளுக்குரிய அதிகாரங்களை முழுமையாகக் கொடுப்பது சம்பந்தமாக ஆராயப்படுகிறதா? என்ற கேள்வி எழுகிறது. மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்காகச் சட்டமாற்றம் ஒன்றைக் கொண்டுவருவதற்கு எடுக்கப்படுகின்ற முயற்சியை நான் ஏற்றுக்கொள்கிறேன். அது இந்தச் சபைக்குக் கொண்டுவரப்பட வேண்டும். ஆனால், மாகாண சபைக்குரிய அதிகாரங்களை முழுமையாகக் கொடுப்பதற்கு இந்த அரசு தயாராக இருக்கிறதா? என்ற கேள்வியைத்தான் நான் இப்பொழுது கேட்கிறேன். அதை இந்த அரசு செய்ய வேண்டும். ஏற்கெனவே, நீங்கள் மாகாண சபையிடமிருந்த அதிகாரங் களை மீளப் பெற்றிருக்கின்றீர்கள். அவற்றைத் திரும்பவும் மாகாண சபையிடம் ஒப்படைக்க வேண்டும் என்ற கோரிக்கையை நான் இந்தியாவிடமும் உங்களிடமும் முன்வைக்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் பௌத்த விகாரைகள் கட்டுவதற்காக நிதி ஒதுக்கப்பட்டிருக்கின்ற அதேவேளை, ஏனைய மதங்கள் புறக்கணிக்கப்பட்டிருக்கின்றன. தொல் பொருள் திணைக்களமானது எங்களுடைய பிரதேசத்திலே பூர்வீக வரலாற்றைக்கொண்ட சின்னங்கள் இருக்கின்ற இடங்களை எங்களுடைய மக்கள் பயன்படுத்த முடியாதவாறு ஒரு சூழலை உருவாக்கி, அங்கு பௌத்த விகாரைகளைக் கட்டுவதற்கான முயற்சிகளை மேற்கொள்ளப் போகின்றது என்பது இதன்மூலம் தெட்டத் தெளிவாகத் தெரிகின்றது. ஏன், இந்த நாட்டிலே வாழ்கின்ற ஏனைய இன மக்களால் பின்பற்றப்படுகின்ற சமயங்களுக்குச் சம அந்தஸ்து வழங்கப்படவில்லை? ஏன், அவற்றுக்காக நிதி ஒதுக்கப் படவில்லை? எனக் கேட்கின்றேன். ஆகவே, "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற எண்ணக்கருவின் அடிப்படையில், இலங்கையை "ஒரு பௌத்த நாடு" என்று சொல்லவேண்டும் என்ற உங்களுடைய சிந்தனையை நிலைநாட்டுவதற்காக, அதனை நடைமுறைப்படுத்துவதற்காக, தமிழ் மக்கள் கூடுதலாக வாழ்கின்ற பகுதிகளில் அவர்களின் பரம்பலைக் குறைப்பதற்கு நீங்கள் இதன்மூலம் வழியமைக்கின்றீர்கள் என்ற உண்மையை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, ஏனைய சமயங்களையும் நீங்கள் சமமாகக் கருதவேண்டும் என்பது எங்களுடைய பிரதான கோரிக்கையாக இருக்கின்றது. இந்த விடயத்தை அரசாங்கம் சரியான முறையிலே கையாளவேண்டும்.

இன்றைக்கு இந்த அரசுக்கு எதிராக எல்லா விதத்திலும் போராட்டங்கள் உருவாகிக்கொண்டிருக்கின்றன. விவசாயி களுடைய போராட்டத்தை எடுத்துக்கொண்டால், அது மிகவும் வலுப்பெற்றிருக்கின்றது. இதற்குக் காரணம், இலங்கை அரசாங்கத்திடம் சரியான ஒரு திட்டமிடல் இல்லை. நான் ஓர் உதாரணத்தைச் சொல்ல விரும்புகின்றேன். 10 ஏக்கரில் விவசாயம் செய்கின்ற ஒரு விவசாயியிடம், 03 ஏக்கரில் இயற்கைப் பசளையைப் பயன்படுத்தி விவசாயத்தைச் செய்ய வேண்டுமென்று கட்டாயப்படுத்தியிருந்தால், அதனூடாக அந்த விவசாயி பயிற்சியைப் பெறுகின்ற அதேவேளை, ஏனைய பசளையைப் பயன்படுத்திச் செய்யப்படுகின்ற விவசாயமும் நடைபெற்றிருக்கும். இதனால், பிரச்சினைகளோ, போராட் டங்களோ உருவாகின்ற நிலைமை இல்லாமல் போயிருக்கும். ஆகவே, திட்டமிடல் இல்லாது, இயற்கைப் பசளையைப் பயன்படுத்தித்தான் விவசாயம் செய்யவேண்டும் என்பதை விவசாயிகள்மீது திணிக்கின்றபோது, அவர்களால் ஒன்றும் செய்யமுடியாத நிலையே ஏற்படும். ஏனென்றால், அவர்களுக்கு அது தொடர்பில் பயிற்சியளிக்கப்படவில்லை. அவர்கள் இவ்வளவு நாளும் இரசாயனப் பசளையைப் பயன் படுத்தித்தான் விவசாயம் செய்து பலன் கண்டார்கள். ஆகவே, அவர்களைப் பயிற்றுவிக்கவேண்டிய கடப்பாடு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. எனவே, அவர்களுக்கு வழிகாட்ட வேண்டும். அது எப்படியென்றால், ஒருவர் 02 ஏக்கரில் விவசாயம் செய்தால், ஓர் ஏக்கரில் இயற்கைப் பசளையைப் பயன்படுத்தி விவசாயம் செய்யவேண்டுமென்று வலியுறுத்துங்கள்! அதைவிடுத்து, இன்றைக்கு விவசாயி களுடைய வயிற்றிலடித்திருக்கிறீர்கள். "விவசாயிகள் சேற்றிலே கால்வைத்தால்தான் நாங்கள் சோற்றிலே கை வைக்க முடியும்" என்ற மரபு இன்று சிதைக்கப்பட்டிருக் கின்றது.

தற்போது, மரக்கறிகளின் விலைகள் உயர்வடைந்திருக் கின்றன. உதாரணமாக, தக்காளி ஒரு கிலோகிராம் 600 ரூபாய்க்கு விற்கப்படுகின்றது. தேங்காய் ஒன்றின் விலை 100 ரூபாயைத் தாண்டியுள்ளது. ஆனால், அன்றாடம் உழைக்கின்ற கூலித் தொழிலாளியின் கூலியானது அதிகரிக்கப்படவில்லை. ஒரு தொழிலாளியின் அன்றாடக் கூலி 1,000 ரூபாய் என்று வைத்துக்கொண்டால், அவருடைய குடும்பத்தில் 4 பேர் இருக்கின்றார்கள் என்றால், அவர்களுடைய நாளாந்த வாழ்க்கை எப்படி அமையப் போகின்றது? என்பதைச் சற்று சிந்தித்துப் பாருங்கள்! பொருளாதார ரீதியிலே -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

நாடு பொருளாதார ரீதியிலே வீழ்ச்சியடைந்து கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், அதனைக் கட்டியெழுப்புவதற்குரிய எந்தவொரு முன்னேற்றகரமான செயற்பாட்டையும் இந்த வரவு செலவுத்திட்டத்தினூடாக அரசாங்கம் முன்வைக்கவில்லை என்ற குற்றச்சாட்டை நான் இங்கு முன்வைக்கின்றேன். இவர்கள் ஆட்சிக்கு வருவதற்கு

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

எதைக் கையாண்டார்கள் என்றால், இனவெறியையும் மதவெறியையும்தான்! அதனடிப்படையிலே, அவர்கள் பிரசாரங்களையும் மேற்கொண்டார்கள். இவ்வாறு ஆட்சிக்கு வந்த இந்த அரசாங்கம், இப்பொழுது பொருளாதார ரீதியிலே மிகவும் இக்கட்டானதொரு சூழ்நிலையைச் சந்தித்துக் கொண்டிருக்கின்றது. கொரோனாத் தொற்று என்பது உலக நாடுகள் எல்லாவற்றிலும் இருக்கின்றது; எங்களுடைய நாட்டிலும் இருக்கின்றது. அதனால், பாதிப்புகள் ஏற்படு கின்றன என்பதை நான் ஒத்துக்கொள்கின்றேன். ஆனாலும், விவசாயிகளுடன் தொடர்புடைய இந்தச் சிறிய விடயத்தில் மெத்தனப்போக்கைக் காட்டிய காரணத்தால்தான், இன்றைக்கு நாங்கள் இவ்வளவு பிரச்சினைகளை எதிர்நோக்கவேண்டி இருக்கின்றது. ஆகவே, சாமானிய மக்களுடைய பிரச்சினை தொடர்பிலும் அரசாங்கம் கூடுதல் கவனம் செலுத்த வேண்டும்.

அடுத்து, இம்முறை வரவு செலவுத்திட்டத்தில் பட்டதாரி களுக்கு வேலைவாய்ப்பு வழங்கப்படும் என்று சொல்லப் பட்டிருக்கிறது. உண்மையிலே இது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். நீங்கள் பட்டதாரிகளுக்கு வேலைவாய்ப்புக் கொடுப்பதாகச் சொல்லுகின்ற அதேசமயத்தில், அரசாங்க உத்தியோகத்தரின் ஓய்வுபெறும் வயதை 65ஆக அதிகரித்திருக்கிறீர்கள். இவ்வாறிருந்தால், எப்படி ஓர் இளைஞன் அரச சேவைக்குள் நுழைய முடியும்? அவனால் எப்படி வாழ்க்கையில் முன்னேற முடியும்? என்பதை நான் இந்த அரசாங்கத்திடம் கேட்க விரும்புகின்றேன். அதேநேரத்தில், நான் இன்னுமொரு விடயத்தையும் இந்த அரசாங்கத்திடம் முன்வைக்க விரும்புகின்றேன். போர்ச் சூழல் காரணமாக வெளிநாடுகளுக்குச் சென்று, அங்கு கல்வி பயின்று, மீண்டும் இலங்கைக்கு வந்து மீள்குடியேறுகின்ற எங்களுடைய மக்களின் பிள்ளைகள் வேலைவாய்ப்பைப் பெற்றுக் கொள்வதற்குச் சிரமப்படுகின்றார்கள். அவர்கள் வெளிநாடு களிலே உயர் கல்வியைக் கற்றிருக்கின்றார்கள். ஆனால், அவர்களுக்கு வேலைவாய்ப்பு என்பது கேள்விக்குறியாக இருக்கின்றது. உதாரணமாக, இன்று இந்தியாவிலிருந்து இங்கு வந்து மீள்குடியேறி இருக்கின்ற எங்களுடைய பெரும்பாலான இளைஞர்கள் பட்டப்படிப்பை முடித்தும் வேலையில்லாது இருக்கின்றார்கள். காரணம், அப்படிப் பட்டம் பெற்றவர்களை அரசாங்க சேவைக்குள் உள்வாங்க முடியாது என்று சொல்லி அரசாங்கம் அவர்களைப் புறந்தள்ளியிருக்கின்றது. ஆகவே, இது தொடர்பாகக் கவனம் செலுத்த வேண்டும் என்றும், அரச உத்தியோகத்தர்களின் ஓய்வுபெறும் வயதையும் மீள்பரிசீலனை செய்யவேண்டும் என்றும் நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். ஏனெனில், இதன்மூலம் இளைஞர்கள் அரசதுறைக்குள் வருவதற்கான வாய்ப்பு மறுக்கப்படுகின்றது.

எங்களுடைய தேசத்திலே இந்த அரசு செய்கின்ற அநியாயம் என்னவென்றால், பறவைகள் சரணாலயம் என்று சொல்லி வன சீவராசிகள் திணைக்களம் எங்களுடைய பூர்வீக நிலங்களைக் கைப்பற்றுவதுதான். அரச காணிகளைக் கைப் பற்றுவதில் எங்களுக்கு மாற்றுக் கருத்து இல்லை. அது உங்களுடைய கடமை! ஆனால், எங்களுடைய மக்களின் சொந்தக் காணிகளை அதுவும் உறுதிக் காணிகளை அவர்கள் பயன்படுத்த முடியாதபடி எல்லைகளைப் போடுவதென்பது கண்டிக்கத்தக்கது. இப்படியாக ஒவ்வொரு திணைக்களத் தையும் வைத்துக்கொண்டு, எங்களுடைய பூர்வீக நிலங்களைக் கைப்பற்றுவதற்கான காரணம் என்ன? என்பதை இன்னும் இந்த அரசு சொல்லவில்லை. இதனால், எங்களுடைய மக்கள் திண்டாட்டத்துடன் இருக்கின்றார்கள்.

இந்த வரவு செலவுத்திட்டத்திலே மீனவச் சமூகத்துக்கெனப் பெரிதாக எந்தவொரு நிதி ஒதுக்கீடும் செய்யப்படவில்லை. ஏன் இந்தப் பாகுபாடு? இன்று இந்த இலங்கை நாட்டில் வருமானத்தை ஈட்டித்தரக்கூடிய சமூகத்தினராக 3 துறையினர் இருக்கின்றார்கள். ஒன்று, மீனவச் சமூகத்தினர், அடுத்தது விவசாயிகள், அதற்கு அடுத்தது மலையகத்திலே தேயிலைத் தொழிற்றுறையில் ஈடுபடுகின்ற தோட்டத் தொழிலாளர்கள். இவ்வாறு நாட்டுக்கு வருமானத்தை ஈட்டித்தரக்கூடிய எங்களுடைய மீனவச் சமூகத்துக்கு என்ன கைம்மாறை, என்ன சலுகையை இந்த அரசு செய்திருக்கின்றது, அவர்களின் வாழ்க்கையில் முன்னேற்றத்தை ஏற்படுத்துவதற்கு என்ன வாய்ப்பை இந்த வரவு செலவுத்திட்டத்திலே கொடுத்திருக்கின்றது என்று பார்த்தால், ஒன்றுமில்லை!

மன்னாராக இருக்கலாம், முல்லைத்தீவாக இருக்கலாம், யாழ்ப்பாணமாக இருக்கலாம், மட்டக்களப்பாக இருக்கலாம், இன்றைக்கு எங்களுடைய மீனவர்கள் எல்லாவிதத்திலும் பிரச்சினைகளை எதிர்கொள்கின்றார்கள்; எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களில் இருக்கின்ற மீனவர் களுடைய பிரச்சினைகள் மேலோங்கி இருக்கின்றன. இந்திய 'ரோலர்' களின் வருகையானது எங்களுடைய மீனவர்களைப் பாதிக்கின்றது. அதேநேரத்தில், தென்னிலங்கையிலிருந்து வருகின்ற மீனவர்கள் இராணுவத்தினதும், கடற்படையினதும் உதவியுடன் தடைசெய்யப்பட்ட மீன்பிடி முறைமைகளைப் பயன்படுத்தி மீன்பிடிப்பதால், எங்களுடைய கடல் வளமானது பாதிக்கப்படுகின்றது. இதன் காரணமாக, எங்களுடைய பிரதேச மக்கள் பாதிக்கப்படுகின்ற நிலைமை காணப்படு கின்றது. இதனைச் சொல்கின்றபோது, நாங்கள் தொடர்ந்தும் இனவாதம் பேசுவதாக நீங்கள் கூறுகின்றீர்கள். அது உண்மையல்ல! எங்களுடைய மீனவச் சமூகத்தினுடைய பிரச்சினைதான் உண்மையானது! அதை நீங்கள் கண்டுகொள்வதில்லை.

அந்த அடிப்படையில், நான் நல்லாட்சி அரசாங்கத்தையும் குற்றம் சாட்டுகின்றேன். அந்த அரசாங்கமும் எங்களுடைய மீனவச் சமூகத்தின் பிரச்சினைகளைக் கண்டுகொள்ளவில்லை. போரினால் பாதிக்கப்பட்ட எங்களுடைய மக்கள் இந்தத் தொழிலினூடாக முன்னேற்றம் அடைவதற்கான வாய்ப்பை ஏற்படுத்த வேண்டும்; அதற்கான சூழலை உருவாக்க வேண்டும். அதைவிடுத்து, அவர்களைத் தொடர்ந்தும் நசுக்கு கின்ற செயற்பாடுகளை மேற்கொள்ளக்கூடாது. இந்திய 'ரோலர்' படகுகளைத் தடை செய்ய வேண்டும். அத்தோடு, உள்ளூர் மீனவர்கள் 'ரோலர்' படகுகளைப் பயன்படுத்தித் தொழில் செய்வதற்கான வாய்ப்பை மற்றைய மீனவர்கள் பாதிக்கப்படாத வகையில் ஏற்படுத்திக்கொடுக்க வேண்டும்.

அரசானது இந்த வரவு செலவுத்திட்டத்தில் கல்விக்கோ, மீனவ சமூகத்துக்கோ, விவசாயத்துக்கோ எந்தவொரு சலுகையையும் கொடுக்கவில்லை. இன்று எங்களுடைய மாணவர்கள் electronic சாதனங்களைப் பயன்படுத்தி, "Zoom" meeting மூலம்தான் கல்வி கற்கின்றார்கள். ஆனால், இன்று கைத்தொலைபேசிக்கு விதிக்கப்படுகின்ற வரியானது கூடுதலாக இருக்கின்றது. இதனால், ஒரு கைத்தொலை பேசியை அதிக விலை கொடுத்துத்தான் வாங்கவேண்டி இருக்கின்றது. சாதாரணமாக உழைக்கின்ற பெற்றோர் எப்படித் தன்னுடைய பிள்ளைக்கு ஒரு கைத்தொலைபேசியை வாங்கிக் கொடுக்க முடியும்? பொருட்களின் விலைகளை உயர்த்தும் போது, நீங்கள் அதன் விலையையும் உயர்த்தியிருக்கிறீர்கள். இன்று கல்வித் திட்டத்தில் electronic system முக்கிய ஓர் இடத்தை வகிக்கிறது. ஆகையால்,

சாதாரண குடும்பங்களி லுள்ள பிள்ளைகளும் அதனைப் பயன்படுத்துவதற்கு ஏற்ற வகையில், நீங்கள் விலை உயர்வு விடயத்தைக் கையாளவில்லை.

கொரோனாத் தொற்று என்பது முற்றாக ஒழிக்கப்பட முடியாத ஒரு விடயம். ஆனபடியால், இனிவரும் காலங்களிலே கல்வி நடவடிக்கைகளைத் தொடர்கின்றபோது, இந்த விடயத்திலே கவனம்செலுத்த வேண்டுமென நான் அரசாங் கத்தைக் கேட்டுக்கொள்கின்றேன். உங்களுடைய கல்வித் திட்டத்தில் electronic முறைமை இருக்கின்றபோது, அதனைச் சாமானிய மக்களுடைய பிள்ளைகளும் பயன்படுத்தக்கூடிய நிலை இருக்க வேண்டுமென்பது எனது கோரிக்கையாக இருக்கிறது. அந்தவகையில், கல்வி, விவசாயம், மீன்பிடித்துறை போன்ற துறைகள்மீது இந்த அரசு கவனம் செலுத்தவில்லை என்பதை நான் இங்கு ஒரு குற்றச்சாட்டாக முன்வைக்கின்றேன். ஆகவே, இதனை மீள்பரிசீலனை செய்ய வேண்டும். ஏனெனில், இன்றைக்கு எங்களுடைய மக்கள் வருமானத்தை அதிகமாக ஈட்டித்தரக்கூடிய தொழில்களைச் செய்து கொண்டிருக்கிறார்கள்.

அடுத்து, கால்நடைகளை அறுப்பதைத் தடைசெய்யும் வகையில் சட்டம் இயற்றப்பட இருக்கின்றது. எங்களுடைய விவசாயிகளைப் பொறுத்தமட்டில், கால்நடை வளர்ப்புத்தான் அவர்களுக்கு வருமானத்தை ஈட்டிக்கொடுக்கின்றது. அவர்கள் தமது பிள்ளைகளின் திருமணத்தைச் செய்வதாக இருந்தாலும் சரி, அதன்போது சீதனத்தைக் கொடுப்பதாக இருந்தாலும் சரி, கால்நடைகளை விற்றுத்தான் செய்கின்றார்கள். இது அவர்க ளுடைய பொருளாதாரப் பிரச்சினைகளைத் தீர்ப்பதற்குரிய ஒரு தொழிலாகத்தான் இன்றைக்கும் இருந்து வருகின்றது. இதை எங்களுடைய பிரதேசத்திலுள்ள மக்கள் மாத்திரமல்ல, இலங்கை பூராவுமுள்ள பெரும்பாலான சிங்கள மக்களும் செய்து கொண்டிருக்கிறார்கள். ஆகவே, இவ்வாறான பல முக்கிய விடயங்களை அரசு இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கவில்லை என்பதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன்.

இறுதியாக, நான் ஒரு விடயத்தைச் சொல்லி முடிக் கின்றேன். இன்று போர் முடிவுக்குக் கொண்டுவரப்பட்டி ருக்கிறது. இது கார்த்திகை மாதம்! எதனையும் எதிர்பார்க்காமல் தன்னுடைய இனம், தன்னுடைய மண் என்று போராடி, மரித்தவர்களை நினைவுகூரவிடாமல், நீதிமன்றத் தடை உத்தரவு பொலிசாரினால் வழங்கப்பட்டு வருகின்றது. அது எங்களுடைய கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் களுக்கும் கொடுக்கப்படுகின்றது. இவ்வாறு, தடுப்பதனூடாக எதனைச் சாதிக்கப் போகின்றீர்கள்? நீங்கள் இதனைச் சாதாரணமாக விட்டுவிடுவீர்கள் என்றால், எங்களுடைய மக்கள் அந்த நாட்களிலே இறந்தவர்களுடைய ஆத்மா சாந்தியடையப் பிரார்த்தித்து, அழுது தீர்த்துவிட்டு இருந்து விடுவார்கள். ஆனால், நீங்கள் தடுக்கத்தடுக்க எங்களுடைய மக்கள் வீறுகொண்டு எழுவார்கள் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, இனப் பிரச்சினைக்கான தீர்வு என்பது, பேச்சுவார்த்தையினூடாக, எழுத்தினூடாக, அதிகாரங்களைக் கொடுப்பதனூடாக முடிவடைந்து விடு மென்று நீங்கள் நினைக்கக்கூடாது. இந்த நாட்டிலே வாழுகின்ற அத்தனை இனமும் சுதந்திரமாக வாழ்வதற்கான சூழலை ஏற்படுத்த வேண்டும். 'திருக்கார்த்திகை விளக்கு' ஏற்றும் நிகழ்வு என்பது சைவ மக்களுடைய ஒரு பாரம்பரிய நிகழ்வாகும். இன்று அதற்குக்கூட தடை விதிக்கப்பட்டுள்ளது. ஆகவே, விதிக்கப்பட்டுள்ள இத்தடை உத்தரவை நீக்குவதற்கு அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up, Hon. Member. Your time is up.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
இந்த நாட்டில் எந்தவொரு பிரச்சினையும் இல்லாது சுதந்திரமாக வாழுகின்றோமென்ற உணர்வு எங்களுடைய மக்களிடத்தில் உருவாகினால் மட்டும்தான், இந்த நாட்டிலே சமாதானம் நிலவும். நீங்கள் நினைத்தபடி செயற்பட நினைப்பீர்களாக இருந்தால், இந்த நாட்டிலுள்ள இனப் பிரச்சினையை எந்த விதத்திலும் தீர்க்க முடியாது என்று கூறி, விடைபெறுகின்றேன்.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන ගැනීම පිණිස, ඔබතුමාගේ සහ ගරු කථානායකතුමාගේ අවධානය යොමු කිරීම සඳහායි මා මෙය කියන්නේ. මේ දිනවල රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරින් සෑම රාජ්‍ය ආයතනයකටම යනවා. ඒ ගිහිල්ලා පසුගිය 16වැනි දා කොළඹ පැවති සමගි ජන බලවේගයේ උද්ඝෝෂණයට සහභාගි වූ අයගේ නම් ගන්නවා. මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකර මේ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු යදාමිණී ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු යදාමිණී ගුණවර්ධන මහතා**
(மாண்புமிகு யதாமினீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)
මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අද මේ කාරණය දැක්කා. මම ජී.එල්. පීරිස් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ පාර්ලිමේන්තුවේදී දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ප්‍රශ්න ඉදිරිපත් කළාම, එතුමා උත්තර දුන්නා. ඒක තමයි, අපි මුදල් ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙන්නේත්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු යදාමිණී ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු යදාමිණී ගුණවර්ධන මහතා**
(மாண்புமிகு யதாமினீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුවට -

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සමාවෙන්න, ගරු යදාමිණී ගුණවර්ධන මන්ත්‍රීතුමනි.

ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශය පැත්තෙන් අපි මුදල් ඇමතිතුමා වෙනුවෙන් අහපු හැම ප්‍රශ්නයකටම පැහැදිලි කිරීමක් කළා. ඒ වාගේම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීමට යම් කාරණයක් තිබෙනවා නම්, ඒක ඉදිරිපත් කළොත් අපට පැහැදිලි කරන්න පුළුවන්. හැබැයි පැහැදිලි කරන්න කාරණය ඉදිරිපත් කරන්නේ නැත්නම් අපට එතුමන්ලාගේ හිතේ තියෙන දේවල් පැහැදිලි කරන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු යදාමිණී ගුණවර්ධන මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.08]

**ගරු යදාමිණී ගුණවර්ධන මහතා**
(மாண்புமிகு யதாமிணீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට අද දවසේ වසර දෙකක් පිරෙනවා. කඩා වැටුණු ආර්ථිකයක්, අනාරක්ෂිත දේශයක්, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් කරා ඉදිරියට ගෙනියන්න තිබුණු අභියෝගයක් මැද්දේ තමා මේ රටේ ජනතාව අතිගරු ජනාධිපතිතුමා ගැන විශ්වාසයෙන් පාලනය භාර දුන්නේ. නමුත් ඒ සියල්ල මතට කොවිඩ් කියලා කිසිම කෙනෙක් අහලා නැති, දැකලා නැති, හිතලා නැති ලෝක අමාරුවක් කඩන් වැටුණේ.

ඒ හින්දා තමයි අද දවසේ විශේෂයෙන් 2022ට මේ අයවැය පිළිබඳ විවාදයේදී අපි ඉතාම ශක්තිමත්ව ගමන් කරන්න ඕන කාලයක් පිළිබඳව කථා කරන්නේ.

"න හි සුප්තස්‍ය සිංහස්‍ය ප්‍රවිශන්ති මුඛේ මෘගාඃ" මහජන එක්සත් පෙරමුණේ අපි නිරන්තරයෙන් විශ්වාස කරපු වාක්‍යයක්.

ඒ කියන්නේ අමාරුවෙන් ගත කරන්න ඕන කාල පරිච්ඡේදයක් හරහා එක මොහොතක්වත් අපි ආපස්ස ගැන, කාලය නාස්ති කරන්නේ නැතුව ඉදිරියේ තියෙන අභියෝගයන් දිහා බලලා ගමන් කරන්ට ඕන කාලයක්. ඒ අතරතුර මම පොඩ්ඩක් මොහොතක් ගන්නවා මතක් කරන්න ලබන වසරේ මේ පාර්ලිමේන්තුව, 75 වන වරට නිදහසේ යෝජනාව සම්මත කරපු කාලය සමරන්ට යෙදෙනවා ඇති.

අපි නියෝජනය කරන තරුණ සංවිධානයේ ඉතිහාසය අනුව අවුරුදු 75කට ඉස්සෙල්ලා මේ රටේ අහස ගැනවත්, මුහුද ගැනවත්, මහ පොළොව ගැනවත් තීරණයක් ගන්ට පුළුවන් කාල පරිච්ඡේදයක් තිබුණේ නෑ.

ඒ වකවානුව නිර්මාණය කරලා අද අපිට අවස්ථාව ලැබිලා තියෙනවා ලෝකයේ තියෙන අභියෝගයන් සියල්ල හරහා ඉදිරියට අලුත් කාල පරිච්ඡේදයක් බිහි කරගන්ට.

ඒ හින්දා තමයි අපේ රටේ තියෙන ලොකුම සම්පත වන මානව සම්පත ජන ජීවිතය අගනා ලෙස සුරකමින් ලෝකයේ කාටවත් නොදෙවෙනි ලෙස ප්‍රජාවගේ ප්‍රතිශක්තිය වැඩි කරගනිමින් අපේ රජය පසුගිය වසර දෙකට ආසන්න කාලයක් ගමන් කළේ.

අඩු ආදායම්ලාභී ජනතාව වෙත, ගැබිනි මව්වරුන් වෙත, වැඩිහිටි අසරණ අඩු ආදායම්ලාභී පිරිස් වෙත ලබා දිය හැකි සෑම සහනයක්ම මේ කාල පරිච්ඡේදය තුළ ලබා දුන්නා. ඒ වෙනුවෙන් නැවත වරක් විශේෂයෙන් රජයට ස්තුතිවන්ත වෙමින්, ඒ වගේම ලබන වසරේ 2022 අය වැය දිහා බැලුවමත් අපේ රජයත් රටක ආරක්ෂා කරන්න ඕන සහන ලබා දිය යුතු පිරිස් වෙනුවෙන් අය වැයේ මොන අමාරුකම් තිබුණත් ඒ පිරිස අමතක කරන්නේ නැතුව අවධානය යොමු කිරීම ගැන විශේෂයෙන් නැවත ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්ට ඕන.

ආර්ථිකය සම්බන්ධයෙන් රටක් හැටියට අපිට විසඳගන්න තියෙන මූලික ප්‍රශ්න දෙකයි තියෙන්නේ. එකක් තමා අපිට තියෙන ආහාරය පිළිබඳ, ආහාරය ලබා දීම පිළිබඳ සමීකරණය. අනිත් සමීකරණය තමයි බලශක්තිය අවශ්‍යතාවය හැටියට ආර්ථිකය හැටියට ලබා ගන්න තියෙන සමීකරණය.

මේක ඉතාම වැදගත් සමීකරණ දෙකක්. අවුරුදු 75ක් නිදහසින් පසු සමරන්න සූදානම් වන කාල වකවානුවක් අභියස සිටගෙන අපි නැවත විමසා බලන්නට ඕන. මොකද මෙතනින් ඉස්සරහට තියෙන අනාගත අභියෝග දිගටම මේ දෙක වැදගත්. ආහාරය සහ බලශක්තිය.

මේ දෙකටම වැදගත් වන වැදගත්ම කාරණාව තමා, මේ අපිට ස්වභාවධර්මයෙන් ලැබෙන ජලය කළමනාකරණය කරගන්න එක.

මා පසු ගිය දවසක අපේ රටේ සුවිශේෂී වාර්තාවක්, "The Soil Survey of Ceylon" වාර්තාව, හදපු මහාචාර්ය පානබොක්කේ මැතිතුමා හමුවුණා. එතුමා මගේ අතට පොතක් පත් කළා. ලංකාවේ 32,000ක් කුඩා හා මධ්‍ය වැව් සම්බන්ධයෙන් හදා තියෙන වාර්තාව. අපේ රටේ ගම් 14,000ක ගම් නියම් ගම් ඒකාබද්ධ කරන මහා වියමන තමා මේ කුඩා හා මධ්‍ය පරිමාණ වැව් 32,000.

මේ සම්බන්ධයෙන් ලබන වසරේ ආයෝජනය කරන්නට වාරිමාර්ග කෘෂිකර්ම අමාත්‍යාංශ හරහා බලාපොරොත්තු වෙන ප්‍රතිපාදන ප්‍රමාණය දිහා බැලුවාම අපේ රටේ අනාගතය වෙනුවෙන් ඒ අනාගත ආහාර නිෂ්පාදනය උදෙසා සිදු කරන ආයෝජනයක් පිළිබඳව විශ්වාසය තබන්නට පුළුවන්.

ඒ වාගේම තමයි අතිරේක හෝ පරිවාර ජලාශයන් ඇති කිරීමට ඇති හැකියාව විමසා බලන්ට ඕනෑ. විදුලි උත්පාදනය වෙනුවෙන් ගංවතුර කළමනාකරණය කිරීම වාරි කෘෂිකර්මාන්තය වෙනුවෙන් දැනට ඇති කර තිබෙන ජලාශ පද්ධතියට තව පරිවාර ජලාශ ඇති කිරීම ජල විදුලිය උත්පාදනය පරිසරයට හිතකාමී බලශක්ති ආරෝපණයක් ලබා ගන්න අනිවාර්යයෙන් අවස්ථාව එනවා.

ඒ වගේම තමයි අපේ ගරු මහා මාර්ග ඇමතිතුමා මෙතන ඉන්න නිසා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ ඉදිරි කාල පරිච්ඡේදය වෙනකොට වයඹින් පටන් ගත්තම බටහිර හරහා නිරිත හරහා දකුණ දක්වා යන අධිවේගී මාර්ග පද්ධතිය අපේ රටේ කඳුකරය වටේ වළල්ලක් හැටියට හදා අවසන් වෙනවා. මෙය හරිම වැදගත් ආර්ථිකයට. අපේ රටේ අස්වද්දන්න තියෙන මහා විශාල භූමියක් ඒකාබද්ධ කරන්න පුළුවන් අධිවේගී මාර්ගයක් මේක.

රටේ ආර්ථිකයට වාගේම අපේ වාරිමාර්ගයටත් මේකෙ අවස්ථාවක් තියෙන්ට පුළුවන්. රුවන්පුර අධිවේගී මාර්ගයේ ප්‍රධාන ඉංජිනේරුවරියට මා කථා කළාම, ඒ අධිවේගී මාර්ගය හරහා වාරි ඇළක් ගෙනයන්ට ඉඩක් තියෙනවයි කියන එකත් මම මතක් කරන්ට ඕනෑ. මේක විශේෂයෙන් මතක් කරන්නේ, අලුත් බලශක්තිය වාගේම ජල විදුලිය උත්පාදනය සඳහා කෘෂි කර්මාන්තයට ඕනෑ ඒ ජලය ටික ඒ කර්මාන්තයේ යෙදෙන පිරිස් අතට ගෙනියන්න පුළුවන් අවස්ථාවල් නිර්මාණය කරන්ට අධිවේගී මාර්ග පද්ධතියත් උදව් වෙන්ට පුළුවන්.

පුනර්ජනනීය විදුලිය ගැන මම මොහොතක් කථා කරන්න ඕනෑ. විශේෂයෙන් ජලය සුළං හා සූර්ය වැනි පුනර්ජනනීය විදුලි නිෂ්පාදනයේ කොටස් වෙත අලුත් පරිවර්තනයක් වෙන්ට අවස්ථාවක් ලබා දෙන්ට ඕනෑ. We could allow thermal power generation to bundle renewable energy at the same unit prices and amounts. දැනට තාප බලාගාර හරහා බලශක්ති උත්පාදනය කරන්නට අත්සන් කර තිබෙන ගිවිසුම්, ඒ ගිවිසුමුත් මුදල් හා කොන්දේසි ඇතුළත්ව නමුත්, ඔවුන්ට පුනර්ජනනීය බලශක්තිය ඒ සඳහා එකතු කරගන්ට අවස්ථාවක් ලබාදුන්නොත් අපේ අනාගත බලශක්ති සමීකරණයට ඉතාමත්ම වැදගත් අලුත් පරිවර්තනයක් ඇති වෙනවා කියන එක විශේෂයෙන් කියන්ට ඕනෑ.

ඒ වාගේම තමයි මේ පරිසරය ගැන කථා කළාම සමහර අයට ඒ පිළිබඳ විශාල ප්‍රශ්න ඇතිවෙනවා. වෙන ඕනෑම දෙයක් පිළිබඳව Plan B, Plan C, Plan D තියෙන්න පුළුවන්. නමුත්, there is no Planet D, Planet C or not even a Planet B. There is only one Planet. ඒ හින්දා මේ පරිසරය විශේෂයෙන් ආරක්ෂා කර ගන්නට අපි කටයුතු කර ගන්නට ඕනෑ කියන එක විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

The green economy has to be given priority. Most of the major nations are already doing it and I think Sri Lanka is a pioneer in this sector and the Government has given clear indication that it will in 2022 give more recognition and initiation to a green economy.

මා තව දීර්ඝව කථා කරන්ට බලාපොරොත්තු වෙන්නෙ නෑ. නමුත් මේ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳව කථා කරන්න විනාඩියක් කාලය ගත කරනවා.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් සඳහන් කළා, අපේ රටේ රාජ්‍ය ව්‍යවසාය අතරින් 35ක් එක් ලක්ෂ පනස් දාහක් (150,000) පමණ සේවකයින් සමඟ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10ක් නිෂ්පාදනය කරනවා කියලා. මේ රාජ්‍ය ව්‍යවසායක 35ට පුළුවන් නම් මෙවැනි මහා දැවැන්ත ආර්ථික දායකත්වයක් දෙන්ට ඒ කියන්නේ ඒවායෙ ඉන්නෙත් අපේ රටේ හැම තැනම ඉන්න අපේම මිනිස්සු. එහෙනම් අනික් රාජ්‍ය ආයතනවලට අනික් සියලු නිෂ්පාදන කර්තව්‍යයට එකතු වෙන්නට පුළුවන් කොටස්වලටත් පුළුවන් වෙනවා, මේ ඉලක්කයට එන්නට. ඒ සඳහා මොකක්ද බාධාවෙලා තියෙන්නේ කියන දේ හඳුනාගෙන එය ඉස්සරහට තල්ලු කරන්න පුළුවන් නම් තමයි අපිට 2022 විශේෂයෙන් ජයග්‍රාහී වර්ෂයක් හැටියට පරිවර්තනය කරන්ට පුළුවන් වෙන්නේ.

අපේ රටේ විදේශ වෙළෙඳ පොළට විශේෂයෙන් අපනයන තරගකාරී නිෂ්පාදන ආර්ථිකයක් ගෙනියන්නට වැඩි දායකත්වයක් මේ වසරේ අයවැයෙන් ලබාදීලා තියෙනවා. ඒ විශාල අභියෝගයට තරුණ පරම්පරාව නිසැකයෙන් ඉදිරිපත් වෙනවා ඇති. විශේෂයෙන් අපේ remittances. නැවත ලංකාවට මේ ප්‍රේෂණ ගෙන්වා ගැනීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් වාගේම අලුත් ඉතිරි කිරීම් ගිණුම් හඳුන්වා දිය යුතුයි. මේවායින් තමා අපේ තරුණ පරම්පරාව අමාරුවෙන් උත්පාදනය කරන ඒ විදේශ මුදල් සංචිතයන් නැවත ලංකාවට ගෙන එන්නට පුළුවන් වෙන්නේ. විදේශ රටවල ක්‍රියාකරනවා වාගේම අපේ රටේ දේශීය ආර්ථිකය නිෂ්පාදන ආර්ථිකයක් බවට පෞද්ගලික අංශය සමඟ අත්වැල් බැඳගෙන නිෂ්පාදන ඉලක්ක කරා ගෙනියන්න පුළුවන් කුසලතා සම්පූර්ණ නව ඉසව්වක් කරා තරුණ පරම්පරාව ගෙනියන්නට මේ නිපුණතා අධ්‍යාපනයට විශාල මුදලක් වෙන් කරලා තියෙන එක ගැන විශේෂයෙන් සතුටු වෙන්න ඕනෑ.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනාගත පරම්පරාව සඳහා විශේෂ ආයෝජනයක් කරලා තියෙනවා. පසු ගිය අවුරුදු 24-25ටම සිදු කර නැති තරම් ආයෝජනයක්, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආයෝජන ඇති කිරීම අපි දකින්නේ විශේෂයෙන් අනාගත පරම්පරාව, අනාගත ශ්‍රී ලංකාව වෙනුවෙන් කරන දැවැන්ත ආයෝජනයක් හැටියට.

ඒ වාගේම පසුගිය දශක දෙක තුන සමස්තයක් හැටියට ගත්තාම අධික ශුෂ්ක කටුක ආර්ථිකයක් මේ රටේ පැවතුණා. එයට නව තෙතමනයක් ලබා දෙන්ට පුළුවන් නිෂ්පාදන ආර්ථිකයක් කෙරෙහි විශ්වාසය ඇති කරනවා වාගේම, සේවා හා තාක්ෂණ ආර්ථිකයන් කෙරෙහි අය වැයෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන යොමු කරගන්නට ඕනෑ. ඒ සඳහා තරුණ පරම්පරාව බලගන්වන යුගයක, විශේෂයෙන් අපි බලාපොරොත්තු වෙනවා, අස්වද්දන්ට නොහැකි වෙච්චි ඉඩකඩම් රාශියක් තියෙනවා. ඒ ඉඩකඩම් කෙටිකාලීන පදනමක් මත හෝ අපේ තරුණ පරම්පරාවට තරුණ ගොවි සංවිධාන වෙතට භාර දෙන්ට ඕනෑ. මේ රටේ කෘෂි කර්මාන්තයේ නව පෙරළියක් ඇති කරන්නට අහරින් මේ රට ස්වයංපෝෂිත කරන ඉලක්කයන් කරා යන්නට මෙරටේ තරුණ පරම්පරාව නොපැකිළව කටයුතු කරනවා ඇතැයි කියන විශ්වාසය අපි හැම දාම විශ්වාස කරපු දෙයක්.

අවසාන වශයෙන් මම කියන්ට ඕනෑ විශේෂයෙන් අපේ සභානායකතුමා මතක් කළා -දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මතක් කළා- මේ අවම වැටුප - minimum wage එක- සම්බන්ධව. මෙය ඉතාමත්ම වැදගත් නව සොයා ගැනීමක්; පසුගිය කාලයේ, මේ අවුරුද්ද තුළ සිද්ධ වෙච්ච.

මේ න්‍යාය, මෙතෙක් කල් අපිව විශ්වාස කරපු න්‍යාය, අපිට කියපු සංඛ්‍යා දත්ත මිනුම් දණ්ඩ මේ සියල්ල උඩු යටිකුරු කරපු න්‍යායක් තමා මෙවර නොබෙල් ආර්ථික තෑග්ග දිනපු ආර්ථික විශේෂඥයා ප්‍රකාශ කරන්නේ. අවම වැටුප - minimum wage එක - තුළින් අලුත් පරම්පරාවක් විශේෂයෙන් තරුණ පරම්පරාව විශාල පිරිසක් නැවත ආර්ථික ක්‍රමවේදය පිළිබඳව අලුතෙන් හිතලා ඇතුල් වෙන්න පුළුවන්, විශ්වාසයක් ජනිත කරන්න පුළුවන්. අපි minimum wages එහෙම නැත්නම් අවම වැටුප් සම්බන්ධයෙන් ස්ථිරසාර ප්‍රතිපත්තියකට රට ගමන් කළොත් තමයි අපිට පුළුවන් වෙන්නේ අලුත් විශ්වාසයක් තරුණ පරම්පරාව තුළ ඇති කරන්න, මේ නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළු වෙන්න.

ඒ සඳහා විශේෂයෙන් ring-fencing taxes අපි දන්නවා ක්ෂේත්‍රයන් ඇතුලේ අපනයන ආදේශකයන් ගේනවා වෙනුවට ආනයන වෙනුවෙන් වැය කරන මුදල් දේශීය කර්මාන්ත වෙනුවෙන්ම අපට ආයෝජනය කරන්න පුළුවන් කාල පරිච්ඡේදයක්. මේවා නැවත හැරී බලන්න කියන ඉල්ලීම කරමින් විශේෂයෙන් 2022 අය වැය හරහා ඉදිරි වසරේ ධෛර්ය සම්පන්නව වීර්යයක් කර රටට ජනතාවට එරෙහිව තියෙන සංඛ්‍යා දත්ත, මිනුම් දඬු සියල්ල මම විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ; මේ උත්තරීතර සභාවේ ඇසෙන හුහක් දත්ත, සංඛ්‍යා ලේඛන, මිනුම් දඬු යල් පැන ගිය න්‍යාය මත ඇති කර ගත්ත ඒවා. මේවා යාවත්කාලීන වෙන්න ඕනෑ. අලුත් සංඛ්‍යා දත්ත ඇති වෙන්න

[ගරු යදාමිණි ගුණවර්ධන මහතා]

ඕනෑ, විශ්වාසය තියන්න පුළුවන්. ඒ වාගේම තමයි අලුත් ආර්ථික මිනුම් දඬු එන්නට ඕනෑ. මේ යල් පැන ගිය දෙවන ලෝක යුද්ධ සංග්‍රාමය කාලයේ ආරම්භ කරපු මිනුම් දඬුවලින් නව ලෝකයේ ආර්ථිකය මනින්න බැහැ. ඒ නව ආර්ථික මිනුම් දඬු එක්ක මේ සභාවේ ඇති වන විවාදයන්ට පිවිසෙන්න ආරාධනා කරමින්, විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත් ඒ වාගේම කැබිනට් මණ්ඩලය ඇතුළු රජයට අපි අපේ ශුභාශිංසනය එකතු කරනවා.

What we need is not aid but trade, Sri Lanka needs trade. And I think the next generation, especially the youth of this country are willing to engage in this exercise irrespective of whatever the difficulties that they have to face in 2022.

ඒ අනුව අප ආණ්ඩුවට විශ්වාසය දිනා දුන්නු ජනතාවට අලුත් කාල පරිච්ඡේදයක් මොන යම් අභියෝගය තිබුණත් එයත් ජයග්‍රහණය කරන්න පුළුවන් ඇතැයි විශ්වාසයෙන් 2022 වසරට එකතු වෙමුයි කියන ආරාධනාව, ප්‍රාර්ථනාව ඇතිව ඔබ සියලුදෙනාටම ස්තුතිය පතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.23]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයකට පස්සේ මට කථා කරන්න විනාඩි 18ක් තිබෙනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

අපි කෙළින්ම අය වැය කථාවට බහිමු. මේ අය වැයෙන් දුප්පත් මිනිහා ගැන හිතලා නැහැ. අපි මුලින්ම දුප්පත් මිනිහා ගැන හිතන්න ඕනෑ. මොකද, ඒ මිනිහාට තමයි දරිද්‍රතාව -දුප්පත්කම- වැඩියෙන්ම දැනෙන්නේ. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ අය වැය ඇමෙරිකාවේ ඉඳලා ලිව්වාද කොහේ ඉඳලා ලිව්වාද කියා මම දන්නේ නැහැ. නමුත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාට මම කියන්න ඕනෑ, ඡන්දය දුන් හැටනව ලක්ෂයක ජනතාවගෙන් සියයට 75ක්ම දුප්පත් මිනිස්සු බව.

අද තේ දළු කඩන මිනිහාට පොහොර නැහැ. එතකොට ඒ මිනිහාගේ ආර්ථිකය කඩා වැටිලා. රබර් කිරි කපන්න බැහැ, වහිනවා. මොනම රස්සාවක්වත් කරගන්න බැහැ. පොල් කඩන මිනිහාට ගහට යන්නත් බැහැ.

ඉතින් මේ මිනිස්සු ගැන කල්පනා කළා නම් හොඳයි. අඩුම තරමේ පෞද්ගලික අංශයට හෝ රාජ්‍ය සේවයට පඩිය ටිකක් වැඩි කළා නම් අනෙක් ඒවා ඉබේම වැඩි වෙනවා. කම්කරුවාට දැන් රුපියල් 1,500ක් හම්බ වෙනවා නම්, පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය සේවයේ පඩි වැඩි වෙනකොට ඒ අයටත් රුපියල් 2,000ක් ලැබෙනවා. එතකොට ඒ මිනිහාට අඩුම ගණනේ ජීවත් වෙන්න පුළුවන්. අද ඒ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද? අද ගෑස් එකක් ගන්න බැහැ; පරිප්පු ටිකක් ගන්න බැහැ; සීනි ටිකක් ගන්න බැහැ. මේ අතින් බලනකොට දුප්පත් මිනිහා කබලෙන් ළිපට වැටිලා තිබෙන්නේ. මම බැසිල් ඇමතිතුමාට කියනවා, උතුවන්කන්දේ සූර සරදියෙල්ව ඔළුවේ තියා ගත්තා නම්, ඔහු මතක් වුණා නම් ඔයිට වඩා හොඳයි කියලා. මොකද, සරදියෙල් තිබෙන මිනිහාගෙන් අරගෙන නැති මිනිහාට දුන්නා.

අද මුදල් ඇමතිතුමා කොම්පැනි 62ක් ගැන කථා කරනවා. ඒවාට සියයට 25ක tax surcharge එකක් ගහන්න යනවා. හැබැයි, ඒක අරගෙන දුප්පත් මිනිහාට දෙන්නේ නැහැනේ. ඒ නිසා ඒක සම්පූර්ණයෙන් ෆේල්. අනෙක, finance companies ගැන කථා කළා. හරියට කොරෝනා වසංගතය හේතු කරගෙන finance companies වලින් ලොකු සහනයක් දුන්නා වාගෙයි. ඒ අය කිසිම සහනයක් දුන්නේ නැහැ. Finance companiesවලින් මොකක්ද කළේ? එන්න එන්නම ඒ ගොල්ලන්ගේ බිස්නස් එක වැඩි කර ගත්තා. බැංකුත් එහෙමයි. ලංකා බැංකුව ද, මහජන බැංකුව ද, පෞද්ගලික බැංකු ද -මේ ඔක්කෝම- අර මිනිසුන්ට ගෙවා ගන්න බැරි වුණාම පොලියත් අරගෙන, වාරිකයත් අරගෙන, මේ දෙකම එකතු කරලා, තව ණයක් දුන්නා. ඒ මිනිහා තවත් අමාරුවේ දැම්මා. ඒක තමයි මේ වතාවේ කොරෝනා වෙනුවෙන් ජනාධිපතිතුමා දීපු සහනය. ඊට වැඩිය හොඳයි නොදී හිටියා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තව කාරණයක් ගැන කිව යුතුයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට pension එක ලබා ගන්න සේවය කළ යුතු කාලය අවුරුදු 10 තෙක් දීර්ඝ කළා. බොහොම හොඳයි. ඒක ගැහුවේ පබාට නේ. මට දුකත් හිතෙනවා පබා ගැන. නමුත්, ඒක පබාට තමයි ගැහුවේ. මොකද, පබා නේ අවුරුදු 5ක් හිටියේ. නමුත්, ඒක මේ ගරු සභාවේ ඉන්න අනෙක් මන්ත්‍රීවරුන්ටත් වදිනවා. ඒකත් මතක තියා ගන්න. කොහොම නමුත්, මන්ත්‍රීවරු විශ්‍රාම වැටුප ලැබීමට සේවය කළ යුතු කාලය අවුරුදු 10 කළ එක හොඳයි.

ඒත් එක්කම කිව්වා, ජනාධිපතිතුමන්ලා අවුරුදු 10ක් සේවය කරලා නැත්නම් ඒ ගොල්ලන්ටත් මේක හම්බ වෙන්නේ නැහැ කියලා. හැබැයි, එතැන එක කොස්සක් තිබෙනවා. ඒ තමයි මේක අතීතයට බලපාන විධියට ගෙනාවේ නැහැ. එතුමාට ඒ සම්බන්ධයෙන් යෝජනාවක් කරන්න තිබුණා. පාර්ලිමේන්තුවේ සම්මත වන එක හෝ නොවෙන එක වෙනම කාරණයක්. නමුත්, එතුමාට යෝජනාව ගෙනෙන්න තිබුණා, "මේ අවුරුදු 10 මම අතීතයට බලපාන ආකාරයට යෝජනා කරනවා, මෙය සම්මත කරන්න" කියලා. ඇයි, එහෙම නොකළේ? එහෙම කළොත්, එකක්, සිරිසේන මහත්මයාට කොහොමත් මේක හම්බ වෙන්නේ නැහැ. අනෙක, මහින්ද රාජපක්ෂ මහත්මයාට හම්බ වෙන්නෙත් නැහැ. ඒක නිසා තමයි "අතීතයට බලපාන" කියන එක නොදැම්මේ. මම දැක්කා "සලකුණ" වැඩසටහනේදී එතුමා කියනවා, "නැහැ, ඒක පාර්ලිමේන්තුවෙන් කරයි නේ" කියලා. පාර්ලිමේන්තුවෙන් කරන්න ඕනෑ නම් ඒක කියවන්නේ මොකටද? එහෙම නම් අය වැය යෝජනාවල දමන්න තිබුණානේ, "අතීතයට බලපාන විධියට මම යෝජනා කරනවා. මේක සම්මත කරන්න" කියලා. නමුත්, එහෙම කළේ නැහැ. මේ වාගේ දේවල් ගත්තාම මේ අය වැය ඇත්තටම කථා කළ යුතු අය වැයක් නම් නොවෙයි. ඇත්තටම මේ ගැන කථා කරලා වැඩක් නැහැ. මම නම් කථා කරන්න යන්නෙත් නැහැ. මට කථා කරන්න ඊට වැඩිය දේවල් තිබෙනවා.

තමුන්නාන්සේලා දන්නවා, අපි ආණ්ඩු පක්ෂයට චෝදනා කරනවා කියලා. මොකටද චෝදනා කරන්නේ? පසුගිය දිනක බොහොම සාර්ථක රැලියක් තිබුණා. මම ටිකක් අසනීපයෙන් හිටියේ. නමුත්, එය අතිසාර්ථකයි. ආණ්ඩුව කළ වැඩෙන් එක රැලියක් නොවෙයි රැලි 15ක් විතර තිබුණා. ඔක්කෝම පෙන්නුවා, "ටීවී" එකේ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, එක රැලියක් නොවෙයි තිබුණේ. ඔබතුමන්ලා කරපු වැඩෙන් මේ ගොල්ලන්ට ඕනෑවට වඩා publicity එක දුන්නා. ඒ වාගේ දෙයක් කරන්න ඔය පැත්තේ මොන ඔළ මොට්ටළයෙක් හිටියා ද මම දන්නේ නැහැ. ඒ කළ දේ අතිසාර්ථකයි. සජිත් ප්‍රේමදාස මහත්මයා ඒක හොඳට

කළා. එයාගේ සගයෝ ටික මෙතැන ඉන්නවා. ඒ අයට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේගොල්ලන් ආණ්ඩුවට පෙන්නුවා, "උඹලා කරන විධිය හරි නැහැ. හරියට කළේ නැත්නම් උඹලාට ළඟදිම ගෙදර යන්න සිද්ධ වෙයි" කියලා. මොකද, මහජන උද්ඝෝෂණය කියන එක කොහෙත් ඒවිද දන්නේ නැහැ. අපි හිතනවා, දැන් මේ ගරු සභාවේ 150දෙනෙක් ඉන්නවා, 130දෙනෙක් ඉන්නවා, 140දෙනෙක් ඉන්නවා, විමල් වීරවංශ මැතිතුමන්ලා ගියොත් 135දෙනෙක් ඉන්නවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලා ගියොත් 128දෙනෙක් ඉන්නවා කියලා.

ඒ 128දෙනාට වැඩිය මහජන උද්ඝෝෂණය දරුණුයි. එයින් ආණ්ඩු පෙරළා තිබෙනවා. හරි ද? හරියට සංවිධානය කරලා සුමානයක් කොළඹ ඉන්න ආවොත්, ඔය ඔක්කොම අප්පුහාමිලාට රට දාලා ඔය ද්විත්ව පුරවැසිභාවයත් අරගෙන ඇමෙරිකාවට යන්න සිද්ධ වෙනවා. ඒක හොඳට මතක තියාගන්න. මට කියන්න ඕනෑකම තිබුණේ ඒක නොවෙයි.

ඇත්තටම තමුන්නාන්සේලාට ඒ කාලයේ අසාධාරණයක් වුණා. මම ඒක කියන්න ඕනෑ. මොකක්ද, වෙච්ච අසාධාරණය? යහ පාලනය ආවා. රනිල් වික්‍රමසිංහ මහත්තයායි, සිරිසේන මහත්තයායි ආණ්ඩු කළා. ඒ කාලයේ සම්මත නොවුණු, FCID එකක් දැම්මා. ඒ FCID එක දැම්මේ වෙන මොකකටවත් නොවෙයි, විපක්ෂයේ හිටිය අය මර්දනය කරන්නයි. විපක්ෂයේ අයව මර්දනය කරන්න තමයි FCID එක දැම්මේ. ඒ FCID එක දාලා අපේ වැඩි දෙනෙක් සිර භාරයට ගත්තා. මේ සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු මහත්තයා හිර ගෙවල් ගණනාවකට මාරු කළා. මාත් ගියා එතුමා බලන්න කෑගල්ලට. එතුමාට යන්න හරියට වැසිකිළියක්වත් තිබුණේ නැහැ. ඒ කාලයේ සතොසේ මොකක් හෝ චෝදනාවක් දාලා එතුමා හැම තැනටම යැව්වා. එතකොට එතුමාගේ හිතේ වෛරයක් ඇති වෙන්නේ නැද්ද? වෛරයක් ඇති වෙනවා. අනික සම්මත නොවුණු FCID එකක්, බොරු FCID එකක් දාලා මොකක්ද කළේ? අර රවී විද්‍යාලංකාර කියන මනුස්සයා ඒකට දාලා ඒ මිනිහාට හම්බ කරන්න දුන්නා. වෙන මොකක්වත් කළේ නැහැ. ඒ මිනිහාට හම්බ කරන්න දුන්නා. *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ, කවුරු කිව්වාද කියලා. *[බාධා කිරීමක්]* ඔක්කොම එකයි. හරි ද? ඒ මිනිහාට හම්බ කරන්න දුන්නා.

එතකොට ඊට ඉස්සරින් තිබුණු ආණ්ඩුව කාලයේ අපේ සරත් ෆොන්සේකා මහත්මයා සිරගත කළා. මොකක්ද, සරත් ෆොන්සේකා මහත්මයාට තිබුණු චෝදනාව? ජනාධිපතිවරණයට ඉල්ලුවාය කියන එකයි. ජනාධිපතිවරණයට ඉල්ලුවාය කියලා එතුමා සිරගත කළා. එතුමා අපේ හමුදාවේ හිටපු හමුදාපතිතුමා. යුද්ධයට කෙළින්ම මුහුණ දීපු එක්කෙනා. අනික් අය ගැන මම කථා කරන්නේ නැහැ. අනික් අය හිටියේ සීත කාමරවල. සරත් ෆොන්සේකා මහත්මයා හමුදාවට බැඳිච්ච දවසේ ඉඳන් කෙළින්ම යුද්දෙට මුහුණ දීපු මිනිහා. හමුදාවට බැඳුණු දවසේ ඉඳන් විජය විමලරත්න මහත්මයා, අපේ කොබ්බෑකඩුව මහත්මයා, මේ සරත් ෆොන්සේකා මහත්තයලා කෙළින්ම යුද්ධයට මුහුණ දුන්නා. ඒ හින්දා තමයි යුද්ධය අවසන් වුණේ. හැබැයි, ඒ වෙලාවේ මහින්ද මහත්මයා කෙළින් හිටියා. මහින්ද මහත්මයා කෙළින් ඉඳලා political leadership එක දීපු නිසා තමයි යුද්ධය අවසන් කරන්න පුළුවන් වුණේ. නමුත්, වැඩි කොටසක් කළේ අර ගොල්ලන්. කෙසේ හෝ ජනාධිපතිවරණයට ඉල්ලුවාය කියලා සරත් ෆොන්සේකා මහත්මයා හිරේ දැම්මා. එතුමාට හිර ගෙදර ජම්පර් එක ඇන්දෙව්වා. ඒකෙන් මොකද වුණේ? සරත් ෆොන්සේකා කියන පුද්ගලයා නැති වුණාද? අපි දන්නේ නැහැ, එතුමා ගිහිල්ලා කොහේ නවතීවිද කියලා. මම මේ අනාවැකියක් කියන්නේ. හරි ද? එදාට ආණ්ඩු පක්ෂයේ අයට දුවන්න පාර මදිවෙයි. ඒක විතරක් මතක තියාගන්න.

ඒ විධියට ආණ්ඩු දෙකම වැරදි කළා. යහ පාලන ආණ්ඩුව කාලයේ FCID එකක් දාලා ජොන්ස්ටන් මහත්තයලා සිරගත කළා. එවැනි ප්‍රශ්නවලට මුහුණ දුන්නු තව බොහෝ දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා. ප්‍රසන්න රණතුංග මහත්මයාත් ඉන්නවා. මොකක්ද, ප්‍රසන්න රණතුංග මහත්තයා කළේ? එතුමා මහ ඇමති කාලයේ මහින්ද මහත්මයාට උදව් කළා. මහින්ද මහත්මයාට උදව් කළාය කියලා යහ පාලනය ආපු ගමන් එතුමාට විරුද්ධව චෝදනා දැම්මා. එතුමා "මහින්ද සුළඟ" හදන්න මුල් වෙච්ච කිහිපදෙනාගෙන් එක් කෙනෙක්. ඒ අයට චෝදනා දැම්මා.

ඊළඟට, මේ ගරු සභාවේ ඉන්න රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා, මගේ යහළුවා. ආණ්ඩුව පෙරළුණාට පසු පැවැති පළමු විවාදයට එතුමා ගියා. ගිහිල්ලා එතුමා මහින්ද මහත්මයා වෙනුවෙන් කථා කළා. ඊටපසු මාස 3ක් හැංගුණා. මාස 3ක්. ඕනෑ නම් අහන්න, මම බොරුද කියන්නේ කියලා. එතුමා මාස 3ක් හැංගුණා. මොකද, එතුමාට එළියට එන්න බැහැ. එතුමා හය වුණා. "අනේ! කුමාර අයියේ, ඔයාට පුළුවන් නම්, ඔයා ආණ්ඩුවට ගිහින් කැබිනට් ඇමතිකමක් අරගෙන මාවත් බේරාගන්න" කිව්වා. මේ ඇත්ත. එතුමා එහෙම කිව්වා. මම කිව්වා, "මොකටද, ආණ්ඩුවට යන්නේ, පිස්සුද, ඔයා හය නැතිව ඉන්න" කියලා. එතුමා මාස 3ක් හැංගුණා. මොකද, හයට.

ඒ වාගේම ඩෙනිස්ටන් වත්තේ මගේ ගෙදරදී මම රැවුල කපමින් ඉන්නකොට පොලීසියෙන් 100ක් විතර ඇවිත් වට කළා. හැබැයි, උසාවි නියෝගයක් තිබුණා. මොකක්ද, ඒකේ තිබුණේ? මහින්ද මහත්මයාගේ වෙඩි වදින්නේ නැති කාර් දෙකක් මම වත්තේ හංගාගෙන ඉන්නවාය කියලා. පොලීසියෙන් 100ක් විතර පැනලා, මාව එළියට ඇදලා අරගෙන, ඊට පසු ගිහින් මුළු වත්තම හෑරුවා, වෙඩි වදින්නේ නැති කාර් දෙකක් හොයන්න. මගේ වත්තේ කාර් තිබෙනවා. ඔක්කෝම රේසිං කාර්. Roof ගලවලා, අර සුදියට යන්නේ තව එක් කෙනෙක් එහා පැත්තෙන් තබාගෙන.

අන්න ඒ වාගේ ඒවා තමයි මට තිබෙන්නේ. හරි ද? මම ඉතින් ඒ ගැන තමුන්නාන්සේලාට කියන්න ඕනෑ නැහැ නේ. මම ඒක පිළිගන්නවා නේ. මම "නැහැ" කියන්නේ නැහැ. මම හොඳ ශක්ති සම්පන්න මිනිහෙක්. මට හොඳට හයිය තිබෙනවා. හයිය තිබෙන කොට අනෙක් ඒවාත් ඒ වාගේම හයියට තිබෙන්න ඕනෑ. හරි ද? එදා මුළු වත්තම හෑරුවා. හෑරුවා, හෑරුවා, මුළු දවස තිස්සේම හෑරුවා, කාන්තා සහ පිරිමි පොලිස් නිලධාරින් ඔක්කෝම ඇවිල්ලා. එතකොට මම භාගෙට රැවුල කපලා. ඊට පස්සේ මට කිව්වා, "කිසි හානියක් වුණේ නැහැ කියලා අත්සන් කරන්න" කියලා. මම කිව්වා, "මම අත්සන් කරන්නේ නැහැ. ඔයාට ඕනෑ මඟුලක් ලියාගෙන යන්න" කියලා. ඊට පස්සේ නිකම් අත් දෙක පිහදාගෙන යන්න ගියා. ඒ අය ආවේ, මහින්ද මහත්මයාගේ වෙඩි වදින්නේ නැති කාර් දෙකක් මම හංගාගෙන ඉන්නවා කියලායි. මට නඩු දැම්මා. ඒ ඔක්කෝම මේ පැත්තේ අය දාපු ඒවා තමයි. ඒකට අත උස්සපු අය තමයි මෙතැන ඉන්නේ. මම අසත්‍ය කියන්නේ නැහැ. *[බාධා කිරීම්]* ඉන්න පොඩ්ඩක්, මම තවම කියලා ඉවර නැහැ. මේ ඔක්කෝම, අත් උස්සපු අය තමයි. මට Supreme Court එකේ නඩු දැම්මා; මහේස්ත්‍රාත් උසාවියේ නඩු දැම්මා. විමලරත්න කියන, දකුණේ මිනිහෙක් Vice-Chairman කළා කියලා අදටත් නඩුවක් තිබෙනවා. හැබැයි, අපි බය වුණේ නැහැ. අපි කවදාවත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ගාවට ගියේත් නැහැ; රනිල් වික්‍රමසිංහ මහත්මයා ගාවට ගියේත් නැහැ. අපි ඒවාට මුහුණ දුන්නා. අපි උසාවි ගියා. සල්ලි වියදම් වුණා තමයි. සල්ලි වියදම් වුණාට, අපි පෙරකදෝරු මහත්වරුන් අල්ලා ඒවාට මුහුණ දුන්නා, බය නැතිව. නමුත් දැන් ඉන්න අය බයයි නේ. දැන් ඉන්න අය එළියට ගිහිල්ලා එකක් කියනවා. ඊට පස්සේ කියනවා, "අපෝ, මේ මාව අල්ලන්න එනවා!" කියලා. එයාව පොලීසියෙන් අල්ලන්න එනවා ලු. ඊට පස්සේ "නවලෝක" එකේ. එහෙම අය මෙහේ ඉන්නේ. *[බාධා කිරීම්]* එහෙම අය තමයි මෙහේ ඉන්නේ! මේ අය බයයි. නම් කියන්න යන්නේ නැහැ, මම. *[බාධා කිරීම්]* නම් කියන්නත් එපා. අනාගතයේදී මට ඕනෑ වෙනවා, ඔය ගොල්ලන්. හරි ද? නම් කියන්න එපා, ඒක හින්දා. නමුත් දැන් ලොක්කෝ වාගේ කෑ ගහනවා. අරකයි, මේකයි,

[ගරු කුමාර වෙල්ගම මහතා]

ඒකයි කියලා කෑ ගහනවා. අන්තිමට CID එකෙන් එනවා නේ, කට උත්තර ගන්න. ඔන්න ගිහිල්ලා හැංගෙනවා! මම දැක්කා, දැන් දෙතුන් දෙනෙක්ම ඒ වාගේ වුණා. එහෙම වෙන්න එපා. අපි වාගේ ජොෂ්ඨයන්ගෙන් ඔය ගොල්ලන් ඉගෙන ගන්න. අපි කවදාවත් හැංගුනේ නැහැ. අපි හැංගුනා නම් මට කළුතර මිනිස්සු "කළු ගංතොට සිංහයා" කියන්නේ නැහැ. එහෙම නම් කියන්නේ "වයසක ලොම් හැලිච්ච සිංහයා" කියලා. ඒ ගොල්ලන් මට "කළු ගංතොට සිංහයා" කියන්නේ, කළු ගංතොට සිංහයා කෙළින් හිටි හින්දා. අපි CID එකට බයේ හැංගුනේ නැහැ. අපි CID එකට ගියා; කට උත්තර දුන්නා. අපි FCID එකට ගියා; කට උත්තර දුන්නා. අපි උසාවි ගියා. මේ මෙතැන ඉන්න හුඟ දෙනෙකුට එහෙමයි. නම් වශයෙන් කියන්න මට පුළුවන්. සමහරු අද ඇවිල්ලා නැහැ. මුහුණු දැක්කා නම් මම කියනවා. හුඟ දෙනෙකුට ඔය දේ සිද්ධ වුණා. ඒක අන්තිම වැරැදියි.

ඒ සමහර දවස්වල රෑට මම උඩ යන planes ගණන් කළා. මොකද, මට නින්ද ගියේ නැහැ. පාන්දර 2.00ට plane එකක් යනවා; පාන්දර 3.00ට එකක් යනවා. ඒ විධියට අපි planes ගණන් කර කර හිටියා. මොකද, නින්ද ගියේ නැහැ. ඒ තරම් pressure එකක් අපට යහ පාලන ආණ්ඩුවෙන් දුන්නේ. මහින්ද මහත්මයාටත් ඒ pressure එකම දුන්නා; දරුවන්ටත් දුන්නා. ඉතින් ඒ නිසා මම කියන්නේ ඒ වැරැද්ද ආයෙත් කරන්න එපා කියලා.

දැන් අවුරුදු 71 ක් ගැන කථා කරනවා. අවුරුදු 71 ආපසු අද්දාගන්න පුළුවන්ද? බැහැ නේ. ඒ අවුරුදු 71 ආයෙත් ගන්න බැහැ. අවුරුදු 71 කරපු හොරකම් අල්ලන්න පුළුවන් ද? බැහැ නේ. හොරකම් කරන එකා හොරකම් කරන්නේ අහුවෙන්න නොවෙයි. හරි ද? හොරකම් කරන එකා අහුවෙන්න නොවෙයි හොරකම් කරන්නේ. අර සිංගප්පූරුවේ ඉන්න මහේන්ද්‍රන් ගෙනාවොත් නම් කියයි. එයා ගෙනාවොත්, එයා කියයි, අන්න අහවලාට අහවල් තැන account එකක් තිබෙනවා; අහවලාට අහවල් තැන account එකක් තිබෙනවා කියලා. ඒවා කියයි. නමුත් මහේන්ද්‍රන්ව ගේන්නේ නැහැ නේ. මහේන්ද්‍රන්ව ගේන්නේ නැත්තේ ඇයි? අර හිටපු ආමරිකයෝ ඔළුවට පිස්තෝලය තියලා ගෙනාවා නම්, මහේන්ද්‍රන්ව ගේන්න බැරි මොකද? මහේන්ද්‍රන්ව ගේන්න පුළුවන්. ගෙනාවොත් ඒ මනුස්සයා කියනවා ඔක්කෝම; කොහේද accounts තිබෙන්නේ කියලා. ඒක හින්දා මහේන්ද්‍රන්ව ගේන්නේ නැහැ. මම තමුන්නාන්සේලාට කියන්නේ මේ වැරැද්ද ආයෙත් කවදාවත් කරන්න එපා කියලා.

දැන් බලන්න, මේ ආණ්ඩුවට කී දෙනෙකු ශාප කරනවාද කියලා. මේ ආණ්ඩුවට විරුද්ධව අත් දෙක උස්සලා මිනිස්සු කොච්චර ශාප කරනවාද? "අපට පොහොර නැහැ. යූරියා ටිකක් දියන්!" කියනවා. "කුමාර මහත්තයා, අපට දාන්න යූරියා කොට්ටයක් අරන් දෙන්න" කියනවා. ඒ ගොල්ලන් සල්ලි දෙනවා ලු. අද යූරියා කොට්ටයක් රුපියල් 10,000 යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය තව කාගෙන් හරි වෙලාව අරගෙන මට දෙන්න කෝ. මේ වාගේ ලස්සන කථාවක් කරන කොට ඔබතුමා කාගෙන් හරි අරගෙන හෝ වෙලාවක් දෙන්න. අර සරදියෙල් මතක් කරගන්න. ඔන්න ඔය කවුරු හරි දීලා දාන්න කෝ, තව ටික වෙලාවක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට කාලය ලබා දෙන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ නිසා මම කියන්නේ, ඒ ගොල්ලෝ කළා වාගේ වැරැදි ආයෙත් කරන්න එපා කියලා.

දැන් බලන්න, මිනිසුන්ට යූරියා පොහොර නැහැ; තේ පොහොර නැහැ. මේක මිනිසුන්ට දැනෙන්නේ නැද්ද? ඒ අය දෙන දෙස් වදින්නේ නැද්ද?

පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන පොඩ්ඩක් කල්පනා කරන්න. ඒ පාස්කු ප්‍රහාරය තමයි කැරකිලා අද මේ ආපහු එන්නේ. හොඳට මතක තියාගන්න. නීතියෙන් බේරෙයි. නීතියෙන් බේරුවාට දෙවියන් වහන්සේගෙන් බේරෙන්නත් බැහැ; විශ්වයෙන් බේරෙන්නත් බැහැ. මේ අයට දඬුවම් හම්බ වෙනවා. ඒක තමයි මේ ආණ්ඩුවට පිස්සු හැදිලා තිබෙන්නේ. ඒක කියන්න ඕනෑ. මිනිසුන්ගෙන් ඇහුවාම, "යකෝ, පිස්සු නේ" කියනවා. භය නැතිව එහෙම කියනවා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට එහෙම කිව්වා ද? චන්ද්‍රිකා නෝනාට එහෙම කිව්වා ද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ 2005 -2010 පළමු කාලයේ එහෙම කිව්වා ද? නැහැ. දැන් මිනිස්සු භය නැතිව කියනවා, "මුන්ට පිස්සු" කියලා. ඒ ඇවිල්ලා, පාස්කු ප්‍රහාරය, ඒ කරපු වැරැදි, ඒ කරපු දේවල්වලට. අපි පඩි ගෙව්වේ නැහැ නේ, ඒ මිනිසුන් මරපු උන්ට. ඔය බෝම්බ පුපුරුවාගෙන මැරිච්ච උන්ට අපි පඩි ගෙව්වේ නැහැ. ෆොන්සේකා මහත්මයා මේක නිතරම කියනවා. ආණ්ඩුවෙන් පඩි ගෙව්වේ. හරියට. දැන් අර නිකම් ඉන්න අර ඥානසාර හාමුදුරුවෝ දාගෙන ඉන්නවා වාගේ. සමාවෙන්න එහෙම කිව්වාට! සිවුරක් දා ගත්තාට මට කරන්න දෙයක් නැහැ. ඇත්ත කථා කරන්න ඕනෑ. ත්‍රස්තවාදී නායකයෙකු හැටියට ඇමෙරිකාවේ දැන් හංවඩු ගැහිලා. ඒ වාගේ කෙනෙකු දමනවා කොමිටියක සභාපති විධියට. ඉතින් එහෙම නොකියා ඉඳියි ද? මම අහන්නේ එච්චරයි.

එදා ඒ දාන්න යනකොට, නම් කරනකොට මම කිව්වා, එයා දාන්න එපා කියලා. මොකද, එයාට කරන්න බැහැ. එයා ප්‍රාදේශීය සභාවකවත් ඉඳලා නැහැ. අනෙක් එක, එයා දන්නේ නැහැ රටක් පාලනය කරන්න. එයාට හමුදාවේ කොටසක් පුළුවන්. ඔක්කෝම නොවෙයි. ඊට පස්සේ ඇමෙරිකාවට ගියා නේ. ඊට වඩා හොඳ ශ්‍රේෂ්ඨ ඇමතිවරු ඉන්නවා නේ මේ පාර්ලිමේන්තුවේ. එහේ filling station එකක කොම්පියුටර් වැඩ කරන කොට, මෙහේ හොඳට ඇමතිකම් කරපු ඇමතිවරු ඔය පැත්තේ ඉන්නවා. ඒ අය කොන්ද කෙළින් තියාගෙන ඇමතිකම් කරපු අය. ඒ අය අද මෙතැන නැහැ. හිටියා නම් මම නම් වශයෙන් කියනවා. හොඳට හිටපු අය ඉන්නවා. හරි ද? අද ඒ එක් කෙනෙකුටවත් තැනක් තිබෙනවාද? අර කොහේවත් හිටපු මනුස්සයෙක් ගෙනාවා.

මෙතැන ඉන්න ජී.එල්. පීරිස් මහත්මයාගේ ගෙදරත් රැස්වීම් තිබ්බා. මම මහින්ද මහත්මයාට එදා කිව්වා, "මෙයාව දාන්න එපා. ජොෂ්ඨත්වයට දෙන්න" කියලා. මම කිව්වා, "ඇයි, ඔබතුමාගේ තාත්තා බණ්ඩාරනායක මහත්මයා එක්ක විපක්ෂය පැත්තට ගියේ? ඔබතුමාගේ තාත්තා බණ්ඩාරනායක මහත්මයා එක්ක විපක්ෂය පැත්තට ගියේ- ඩී.එස්. සේනානායක මහත්මයා මැරෙන කොට ඊළඟට ජොෂ්ඨත්වය තිබුණේ බණ්ඩාරනායක මහත්මයාට. නමුත්, එතුමාට අගමැතිකම දුන්නේ නැහැ. ඊට පහළින් ඉඳපු ඩඩ්ලි සේනානායක මහත්මයාට එදා හිටපු ආණ්ඩුකාරවරයා එම තනතුර දුන්නා. ඒක හින්දා තමයි බණ්ඩාරනායක මහත්මයා ගිහින් විපක්ෂය පැත්තේ වාඩි වුණේ, සෞඛ්‍ය හා පළාත් පාලන කියන විෂයය දෙකම අයත් ඇමතිකම

දාලා." කියලා. එතුමා යනකොට ඩී.ඒ. රාජපක්ෂ මහත්මයාත් ඒ පැත්තට ගියා. ජොෂ්ඨත්වය ඒක තමයි. ඒ ජොෂ්ඨත්වයට තැන දෙන්න එපායැ. මම කිව්වා, "ජොෂ්ඨත්වය දෙනවා නම්, මේක දෙන්න දිනේෂ් ගුණවර්ධන මහත්මයාට" කියලා. අහන්න, මම කිව්වා ද, නැද්ද කියලා. ඔබතුමා කියන්න. ඔබතුමා මෙතැනදී කියන්න මම කිව්වා ද, නැද්ද කියලා. ඔබතුමා කොන්ද කෙළින් තියාගෙන කියන්න මම කිව්වේ නැද්ද කියලා, සිරිසේන මහත්මයා හිටපු ගෙදර කාමරේ ඇතුළේදී. මම කථා කරලා කිව්වා. හැම රැස්වීමකදීම කිව්වා, මෙතුමාට දෙන්න කියලා. මෙතුමාට දුන්නා නම්, මෙතුමාට අත් දැකීම් තිබෙනවා නේ. මෙතුමාට එහෙම එකක් නැහැ නේ. මෙතුමා බොරළුගොඩ සිංහයාගේ පුතා. ඒ ආභාසය තිබෙනවා. බොරළුගොඩ සිංහයාගේ තවත් මුණුබුරෙක් ආණ්ඩුව පැත්තේ ඉන්නවා. මම කථා කරලා ඒ ටික කිව්වා. හැබැයි, දුන්නේ නැහැ. "නැහැ, මේක අපේ පවුලේ ප්‍රශ්නයක්" කිව්වා. ඔන්න දැන් ආවා නේද, පවුලේ ප්‍රශ්නය? වැඩේ වැරදුණා නේද?

ජී.එල්. පීරිස් මහත්මයාගේ ගෙදර තිබුණා රැස්වීමක්. එතුමා ඔය ඉන්නවා ඉස්සරහා. ඕනෑ නම් අහන්න. ඒ මොකක් ගැනද? දින 52 අගමැතිකම ගන්න. අකමැති සිරිසේන මහත්මයා, දෙනවා අගමැතිකම. චමල් රාජපක්ෂ මහත්මයා නැඟිටලා කිව්වා, "ගන්න එපා" කියලා. මමත් නැඟිටලා කිව්වා, "ගන්න එපා" කියලා. අනෙක් ඔක්කෝම කිව්වා, "ගන්න" කියලා. ඒ, ජී.එල්. පීරිස් මහත්මයාගේ ගෙදරදී. මම ඕනෑ තරම් මෙතුමාගේ ගෙදර ගිහින් පැටිස්, කට්ලට් කාලා තිබෙනවා. ඇත්ත. ඒ දවස්වල අපට යන්න තැනක් නැහැ. ගියේ එතුමාගේ ගෙදරට තමයි. ඔන්න ඉන්නවා එතුමා; ඕනෑ නම් අහගන්න. එහේ ගිහිල්ලා තමයි අපි කෑවේ.

ඊට පස්සේ මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "නැහැ, නැහැ. අනෙක් ඔක්කෝම කැමැතියි. මම අගමැතිකම අරගෙන පෙන්වනවා" කියලා. මම කිව්වා, "අපිත් එක්ක ඉන්නේ ඔක්කෝම 53යි. ඒ මමත් එක්කම. මම අනෙක් පැත්තට ගියොත් 52ක් වෙනවා. කොහොමද කරන්නේ" කියලා. "නැහැ, නැහැ. මම නේ ඒක කරලා පෙන්වන්නේ" කියලා එතුමා කිව්වා. සුප්‍රිම් උසාවියේ තීන්දුව ආවා, වැඩේ වැරදුණා. මෙතැනදී මන්ත්‍රීවරුන් ගහ ගත්තු, ඒ ගාලගෝට්ටිය හැම දාම වාගේ රූපවාහිනියේ පෙන්වනවා. මෙතැන ගහ ගත්තු එක මුළු ලෝකයටම පෙන්නුවා. සරම් උඩ ගිය ඒවා, මහින්දානන්ද වැටුණු ඒවා, ගහ ගත්තු ඒවා ඔක්කෝම පෙන්වනවා, ලජ්ජාවේ බැහැ. මිරිස් කුඩු ගහගත්තු ඒවා, කථානායකතුමාගේ පුටුවට කරපු ඒවා, ඔක්කෝම පෙන්වනවා. ලජ්ජාවේ බැහැ. එදා මම කියපු දේ ඇහුවා නම් ඒක වෙන්නේ නැහැ. මට හොඳට අනාවැකි කියන්න පුළුවන්. මම අවුරුදු 40ක් තිස්සේ දේශපාලනය කරන කෙනෙක්. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පහළම ඉඳලා -තණ කොළ ගහේ ඉඳලා- ආපු මිනිහෙක්. හොඳට අනාවැකි කියන්න පුළුවන්. බන්දුල ගුණවර්ධන මහත්මයා බලාගෙන හිටියා, මුදල් ඇමතිකම ගන්න. ඒක තමයි ඇත්ත. අපි විපක්ෂයේ ලොබියේ ඉඳගෙන සිටි වෙලාවේ ඔක්කෝම වාගේ කිව්වා, "බන්දුල ඔයා තමයි මුදල් ඇමති" කියලා. මම බන්දුලට කිව්වා, "ඒ කියන ඒවාට ඔබතුමා ඇදෙන්න එපා. ඔබතුමාට මුදල් ඇමතිකම ජීවිතයට හම්බ වෙන්නේ නැහැ ඒක යන්නේ රාජපක්ෂ කෙනෙකුට. රාජපක්ෂලාගෙන් මෙහා, ඔබතුමාට ඕක හම්බ වෙන්නේ නැහැ. ඔබතුමාට ඕනෑ නම් වෙළඳ ඇමති වාගේ කට්ටක් හම්බ වෙයි" කියලා. ඊට පස්සේ මහින්ද මහත්මයා හෝමාගම රැස්වීමේදී කිව්වා, "කුමාර වෙල්ගම මාව බේරා ගත්තා. මට ඉස්සෙල්ලා කුමාර වෙල්ගම කිව්වා, බන්දුලට මුදල් ඇමතිකම හම්බ වෙන්නේ නැහැ කියලා. ඒක හින්දා මම බේරුණා" කියලා. මේ ඇත්ත. මේ ගොල්ලන්ගේ ඔක්කොගේම පැටිකිරිය මම නේ දන්නේ.

මමයි, දිනේෂ් ගුණවර්ධන මහත්මයායි, තව එක්කෙනෙකුයි එකතු වෙලා අපි දිනේෂ් ගුණවර්ධන මහත්මයාගේ ගෙදරක රැස්වීමක් තිබ්බා. අපේ එස්.බී. දිසානායක මහත්තයාත් ඒකට ආවා. ඒ, අපි පැරදුණු හැටියේම. එතැනදී මොකක්ද වුණේ? අපි තුන් හතර දෙනා එකතු වෙලා හෙට කරන වැඩ පිළිවෙළ දාගත්තා. එහෙම දාගෙන ඊළඟ දවසේ බලනකොට එස්.බී. මහත්තයා නැහැ. එතුමා ගිහිල්ලා, ආණ්ඩුවට. එස්.බී. මහත්තයා ආණ්ඩුවට ගිහිල්ලා. එහෙම නේද, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි? එස්.බී. මහත්තයා ගිහිල්ලා ආණ්ඩුවට. අපි තුන්දෙනා උඩ බලාගෙන ඉන්නවා, එස්.බී. එනකල්. ඉතින් බලන්න, මේ වාගේ මිනිස්සුත් එක්ක නේ අපි වැඩ කළේ. ඒ නිසා අපි කියන්නේ මෙතැනදී හොඳ වැඩ පිළිවෙළක් එක්ක යන්න කියලා. අපි සෙල්ලම් කරන්නේ අපේ දරුවන්ගේ අනාගතය එක්ක. හොඳට මතක තියා ගන්න. මෙතැන සිටින ඔක්කෝම කථා කරන්නේ, ජනාධිපති වෙන්න. මේ කථා කරන ඔක්කෝම ජනාධිපතිලා. "සර් ෆේල්" නිසා ඔක්කෝම ගිහිල්ලා කියනවා, "මමයි ජනාධිපති" කියලා. සජිත් මහත්මයා කිව්වාට කමක් නැහැ. සජිත් මහත්මයාට වැඩි කොටසක් ඉන්නවා නේ. ඇත්තටම වැඩි කොටසක් ඉන්නවා. ඒක නිසා එතුමා එහෙම කිව්වාට ප්‍රශ්නයක් නැහැ. ඔක්කෝම ජනාධිපතිලා. ජනාධිපතිලා වෙන්න ඉස්සෙල්ලා මේ ඉන්න එක්කෙනා පන්න ගන්නත් ඕනෑ. ඒ විතරක් නොවෙයි. මේ ජනාධිපති ක්‍රමය තිබුණොත් අපි තවත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බෝකරන්නේ? මේ ජනාධිපති ක්‍රමය ඉදිරියට යන කොට ඊළඟට තව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ආවොත්? ඒ එන එක්කෙනාත් මුළු පවුලම වට කර ගත්තොත් මොකක්ද කරන්නේ? එතකොට මොකක්ද මේ රටට වෙන්නේ? අපි අනාගතය ගැන හිතන්න ඕනෑ. අපේ දරුවෝ ගැන හිතන්න ඕනෑ.

අපි තව අවුරුදු 10ක් ඉඳලා මැරිලා යයි. අපේ කාලය ඉවරයි. අපට ජනාධිපති වෙන්න ඕනෑත් නැහැ; අපට අගමැති වෙන්නත් ඕනෑ නැහැ. මෙච්චර කාලයක් දේශපාලනය කළ අපට යුතුකමක් තිබෙනවා, අපේ දරුවෝ ගැන හිතන්න; අපේ දරුවන්ට හොඳ මාර්ගයක් හදලා දෙන්න. මෙන්න මේකයි දැන් අපි කළ යුත්තේ. අපි ඔක්කෝම හොඳ ජාතික ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. හකීම් මහත්මයා, රිසාඩ් බදියුදීන් මහත්මයා, අපේ දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරුන් මේ සියලුදෙනා එකතු කරගෙන අපේ රටට ගැළපෙන ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ. We all are Sri Lankans. අපි පිට මිනිස්සු නොවෙයි. අපි සිංහල, මුස්ලිම්, දෙමළ, Sri Lankans. මට මතකයි නේ, ඥානසාර හාමුදුරුවෝ අලුත්ගමට ගිහිල්ලා කරපු දේවල්. ඕනෑනම් මම ඒ ගැනත් කියන්නම්. මම තමයි ඒ සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම පොලීසියට ගියේ.

අපි හිතන්න ඕනෑ, we are Sri Lankans කියලා. අපේ දරුවෝ ගැන නේ බලන්න ඕනෑ. දිනේෂ් ගුණවර්ධන මහත්මයා දැන් බලන්න ඕනෑ දිනේෂ් ගුණවර්ධන මහත්මයාගේ දරුවෝ ගැන. අපි බලන්න ඕනෑ, අපේ දරුවෝ ගැන. අපි හැමෝම කියනවා නම්, "මම ජනාධිපති" කියලා, අපි කොහොමද දන්නේ තව අවුරුද්දක් යන කොට අපි මැරිලා තියෙයිද කියලා? කොරෝනා වසංගතයත් එක්ක අපි ජීවත් වෙලා ඉඳීවිද? අපි දන්නේ නැහැ. ඒක නිසා අපේ යුතුකම අපි ඉෂ්ට කරමු. අපි ජාතික ප්‍රතිපත්තියක් හදමු. අපි ඔක්කෝම එකතු වෙමු. අනුර දිසානායක මහත්මයාලට තිබෙන්නේ හොඳ පක්ෂයක්. එය දැන් එන්න එන්නම වර්ධනය වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ලොකු vacuum එකක් තිබෙනවා. ඒ vacuum එක නිසා JVP එක ඉස්සරහට යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. තමුන්නාන්සේගේයි, මගෙයි ගෙවල් එක ළඟ නේ තිබෙන්නේ. ඕවා බේරා ගන්න පුළුවන්. නුවරඑළියේ ගියත් අපි දෙන්නා එක ළඟ; කොළඹ ආවත් අපි දෙන්නා එක ළඟ.

අපි හංගන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* මෙතුමාට නොවෙයි, මෙතුමාගේ තාත්තාට තිබුණේ. මෙතුමාගේ තාත්තා, දිවංගත සරත්චන්ද්‍ර රාජකරුණා මහත්මයා. මගේ හොඳ යහළුවා. මගේ තාත්තාගෙත් හොඳ යහළුවෙක් තමයි රාජකරුණා මහත්මයා. මෙතුමා නොවෙයි. මෙතුමා ගත්ත දෙයක් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, තිබෙන ඒවාත් නැතිකළා. සමාවෙන්න, සමාවෙන්න. ඔබතුමා කථානායක පුටුවේ නේද ඉන්නේ. මට ඒක අමතක වුණා නේ. මට සමාවෙන්න. ඔබතුමාටයි, මටයි ගනුදෙනුව බේරා ගන්න පුළුවන්. මම කියන්නේ, තමුන්නාන්සේගේ තාත්තා හොඳ මනුස්සයෙක්; පොළොවේ පය ගහලා හිටපු හොඳ, රත්තරන් මනුස්සයෙක්. ඔබතුමාත් ඒ වාගේම හොඳයි. ඔබතුමාටත් හොඳ අනාගතයක් තිබෙනවා. ඔබතුමා යන මාර්ගයත් හොඳයි; ඔබතුමා ඉන්න පැත්තත් හොඳයි. මම නම් ඉන්නේ නරක පැත්තේ කියන කාරණය මම කියන්න ඕනෑ. මම වාගේ නම් හැදෙන්න එපා. *[බාධා කිරීමක්]* අල්ලපු ආසනවලට පැන්නාට නම් කමක් නැහැ, මම වාගේ නම් හැදෙන්න එපා. මම එච්චරයි කියන්නේ. ඒවා කරන්න පුළුවන් එක්කෙනායි ඉන්නේ. ඒ කුමාර වෙල්ගම. මේවා හැම මිනිහාටම කරන්න බැහැ. හැම මිනිහාම කරන්න ගියාම, ඊට පස්සේ ඇන ගන්නවා. නේද? *[බාධා කිරීම්]* ඔබතුමා නරක වැඩ කරන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා භය වෙන්න එපා. මම මීට වඩා ගරු සභාවේ කාලය ගන්නේ නැහැ. කියන්න නම් ඕනෑ තරම් දේවල් තිබෙනවා. නමුත්, වෙලාව නැහැ.

අද මිනිස්සු හෙණ ඉල්ලනවා. අපි දන්නවා නේ, එදා රිවඩ් ද සොයිසාගේ අම්මා පාරට බැහැලා ගැහැනු ටිකකුත් එක්ක අහසට අත් දෙක දික් කරලා හෙණ ඉල්ලුවා. අන්තිමට මොකද වුණේ? වැඩේ වැරදුණා නේ. මහින්දානන්ද, දැන්වත් යූරියා ටික දෙන්න වෙයි. නැත්නම්, ඔයාටත් දරු පවුලක් ඉන්නවා නේද? අපේ ජනාධිපතිතුමාටත් මම කියනවා, ඔබතුමාටත් දරු පවුලක් ඉන්නවා නේද? මුහුදෙන් එතෙර හෙණ වදින්නේ නැහැ කියන්නේ බොරු. නැත්නම් කියයි, මුහුදෙන් එතෙර ගියාට පස්සේ හෙණ වදින්නේ නැහැ කියලා. හැබැයි, ලංකාවේ ඉන්නකොට හෙණ වදිනවා. ජනාධිපතිතුමනි, මේ මිනිස්සු අත් දෙක උස්සලා, කෑ ගහලා යූරියා ඉල්ලනවා. දැන්වත් යූරියා ටික දෙන්න. දුන්නේ නැත්නම්, පාස්කු ප්‍රහාරයේ ශාපය පිටුපසින් එයි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.51]

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය දෙවන වර කියවීමේ විවාදයේ දී අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත්, ඔබතුමාටත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මම බන්ධනාගාරගත වෙලා සිටියදී වුණත් 2020 පාර්ලිමේන්තු මැතිවරණයෙන් මාව ජයග්‍රහණය කරවන්න රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව කටයුතු කළා. ඒ වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික් ජනතාවට මගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. වසර එකහමාරක පමණ කාලයක සිට බන්ධනාගාරගත වෙලා සිටිමින්, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට බන්ධනාගාරය තුළ ඉඳගෙන හෝ සේවය කරන්නට අවස්ථාව ලැබීම මා ලද විශාල භාග්‍යයක් ලෙස සලකනවා. යහ පාලන රජය කාලයේ අපෙන් දේශපාලන වශයෙන් පළිගත්තා. CID එක වාගේම පොලීසියේ ඇතැම් නිලධාරිනුත් සම්බන්ධ කරගෙන, දේශපාලන අධිකාරියේ සමහර අයගේ ගෙවල්වල ඉඳලා තමයි සාක්ෂි හැදුවේ. නොකරපු වැරදිවලට අපව සිරගත කරන්න එදා යහ පාලන ආණ්ඩුව කටයුතු කළා. ගරු කුමාර වෙල්ගම හිටපු ඇමතිතුමාට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා, ඒ ගැන මතක් කිරීම පිළිබඳව. මොකද, මට අමතක වෙලා තිබුණේ.

අපි දන්නවා එදා යහ පාලන රජය පුදුමාකාර විධියට පළිගත්ත බව. එතුමා කිව්වා වාගේ, FCID එක වාගේ නිල නොලත් කණ්ඩායම් යොදාගෙන පටු දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්න කටයුතු කළා. එදා විපක්ෂයේ සිටි අපේ පාක්ෂිකයන්ගෙන් පළිගන්න විවිධ කුමන්ත්‍රණ දියත් කළා. ඒ අය එලෙස කටයුතු කළේ, අපේ දේශපාලන ගමන නවත්වන්න. සමහර අය හිතුවා, ඒ නිසා අපි දේශපාලන ගමන නවතියි කියලා. නමුත්, අද අපට සාධාරණයක් ඉෂ්ට වෙලා තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, "මේවා විශ්ව ශක්තිය බලනවා. දෙවියෝ උඩ ඉන්නවා නම්, දෙවියෝ බලනවා" කියලා. මමත් කියනවා, නොකරපු දේවල් කළා යයි අපට දඬුවම් දීපු අයට කවදා හෝ දවසක ශාප වනවා කියලා. මේ ගැන ගොඩක් දේවල් කථා කරන්න තිබුණත්, කාලය සීමිත නිසා මම ඒ ගැන දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කොරෝනා වසංගතය ගැනත් සඳහන් කළ යුතුයි. එය අපේ රටේ විතරක් ඇති වූ වසංගතයක් නොවෙයි, ගෝලීය වසංගතයක්. කොරෝනා වසංගතය නිසා ලෝකයේ අපට වඩා දියුණු රටවලටත් භයානක ඉරණමකට මුහුණ දෙන්න සිද්ධ වුණා.

මේ වසංගතය නිසා ජීවිත ලක්ෂ ගණනක් අහිමි වුණා. අපට වඩා ආර්ථික වශයෙන් දියුණු ඇමෙරිකාව, රුසියාව, ඒ වාගේම යුරෝපීය රටවල මා හිතන විධියට අදටත් දිනකට දහසකට වැඩි සංඛ්‍යාවක් මිය යනවා. එවැනි තත්ත්වයක් තුළ මේ රටේ රාජ්‍ය නායකයා හැටියට අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ රජයත්, විශේෂයෙන්ම සෞඛ්‍ය අංශ, සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, හමුදාපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාව, පොලීසිය යන සියලුදෙනා

එකට එකතු වෙලා මේ වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කළ නිසා තමයි මේ තත්ත්වයට මේ රටේ කොවිඩ් පාලනය කරන්න පුළුවන් වුණේ. මේ වනකොට අපේ රටේ පහළොස්දහස් ගණනක් මිය ගිහිල්ලා තිබෙනවා. මිය ගිය සංඛ්‍යාව අපට ඊට වඩා අඩු කර ගන්න තිබුණා. නමුත්, එහෙම කරගන්න බැරි වුණු ප්‍රධාන හේතුව මොකක්ද? සමගි ජන බලවේගයත්, ජනතා විමුක්ති පෙරමුණත් එකට එකතු වෙලා අද මොකක්ද කරන්නේ? හැබැයි මේ ගොල්ලන් දෙගොල්ලක් විධියට යනවා කියා අපට පෙනුණාට, මේ ගොල්ලන් යන්නේ වෙන වෙනම වුණාට අන්තිමේදී ඇතුළේ සාකච්ඡා යනවා. රාජ්‍ය නොවන සංවිධාන ඒවාට වියදම් කරනවා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කළ දවසේ ඉඳලා එතුමාගෙන් පළි ගන්න බලාගෙන ඉන්නවා. රජය එදා යුද්ධය අවසන් කළ කේන්තියට අද විවිධ රටවල් අපට විරුද්ධව කැරලි ගහන්න, කුමන්ත්‍රණ ක්‍රියාත්මක කරන්න බලාගෙන ඉන්නවා. ඒවායේ පිළිල තමයි පසුගිය කාලයේ ක්‍රියාත්මක වෙලා, කොරෝනා වසංගතය ව්‍යාප්ත කිරීම සඳහා විවිධ උද්ඝෝෂණ මාලා ඇති කළේ. ජෝසප් ස්ටාලින්, මහින්ද ජයසිංහ, පුබුදු ජාගොඩ ඇතුළු කණ්ඩායමක් එකතු වෙලා උද්ඝෝෂණ රැල්ලක් දියත් කළා. ඒ තුළින් මොකක්ද වුණේ? අපේ සෞඛ්‍ය අංශ කිව්වා, ජනතාව එකතු කරන්න එපා, ඒ තුළින් නැවතත් කොවිඩ් රැල්ලක්, එහෙම නැත්නම් කොවිඩ් පොකුරු ඇති වෙන්න ඉඩ තිබෙනවා කියලා. නමුත්, ඇහුවේ නැහැ. ජනතාව එකතු කළා. මේ ඊයේ-පෙරේදාත් මා දැක්කා, ආයෙත් දැවැන්ත උද්ඝෝෂණයක් කළා. ඒ, ගොවීන්ට ආදරේට නොවෙයි.

මේ රටේ ජනතාවට දරා ගන්න බැරි තරමට මේ වනකොට භාණ්ඩ මිල අධිකයි කියන එක අපිත් පිළිගන්නවා. මොකද, මේ අවස්ථාවේ මේ රට ලොකු අර්බුදයකට මුහුණ දීලා තිබෙන්නේ. කොරෝනා වසංගතය නිසා අද මේ රටේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම ආර්ථිකය කඩා වැටිලා. විදේශ විනිමය අහිමි වෙලා. එවන් අවස්ථාවක අපට විතරක් නොවෙයි, හැම රටකටම ඉදිරියට යන්න බැරි වෙලා තිබෙනවා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් නැති වුණා නම් මොකක්ද වෙන්නේ? සමගි ජන බලවේගයේ ඔය කියන නායකයා එහෙම මේ රට පාලනය කළා නම්, අද මිය ගිය සංඛ්‍යාව 30,000ට වඩා වැඩි වෙනවා. එහෙම නම්, මේ රට ආර්ථික වශයෙන් මීට වඩා වැටෙනවා. මේ රට පිස්සන් කොටුවක් බවට පත් වෙනවා. අපේ රට විරුවන් විදේශ විනිමය හොයලා රටේ ආර්ථිකය ගොඩ නඟන්න කටයුතු කළා. විදේශීය සංචාරකයන්ගෙන් එන ආදායම නිසා රටේ ආර්ථිකය දියුණු වුණා. අද ඒ සියල්ල නැවතිලා තිබෙනවා. මේ තත්ත්වය තුළ මේ රට දැඩි අර්බුදයක ඉන්න අවස්ථාවක තමයි තමුන්නාන්සේලා කියන්නේ, "අරක කරන්න, මේක කරන්න" කියලා. නමුත්, තමුන්නාන්සේලා බලයට ආවත් අනිවාර්යයෙන්ම මේ විධියට තමයි කටයුතු කරන්න වෙන්නේ කියලා තමුන්නාන්සේලාත් දන්නවා. ඒ නිසා මේ රජය අපහසුතාවට පත් කරන්න, කොරෝනා ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. මේ රට බේරා ගත්, මේ රටේ පැවැති යුද්ධය ජයග්‍රහණය කරවන්න කැප වූ, කෙළින් තීන්දු ගත් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බෝර්ඩ් අල්ලාගෙන පයින් ගහනවා. මේවා මහ අශික්ෂිත වැඩ. ඇමතිවරුන්ට නම් කමක් නැහැ කියමු. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ, ආරක්ෂක ලේකම්වරයා හැටියට ඒ වෙලාවේ කටයුතු කළ වර්තමාන ජනාධිපතිතුමාගේ බෝර්ඩ් අල්ලාගෙන පයින් ගහනවා. එතකොට සමගි ජන බලවේගයේ මහ ලොකු නායකයන් යැයි කියා ගන්නා කට්ටිය ඉන්නවා නම් එතුමන්ලාට කියන්න වටිනවා, යුද්ධය අවසන් කරපු නායකයා හැටියට එතුමාට මෙහෙම කරන්න හොඳ නැහැ කියලා. ඒ වාගේ ක්‍රියා තුළින් තමුන්නාන්සේලා ගැන ජනතාවට තවත් කලකිරෙන එක විතරයි වෙන්නේ.

අද මේ කොරෝනා වසංගතය සම්බන්ධයෙන් එතුමන්ලා ඒ ආකාරයෙන් කටයුතු කරනවා වාගේම මම මතක් කරන්න ඕනෑ, එදා vaccines සම්බන්ධයෙන් එතුමන්ලා කියපු කාරණයත්. අපට vaccines ගේන්න සල්ලි නැහැ කිව්වා. අපි vaccines ගෙනැල්ලා ගහනකොට කිව්වා, රට lock down කරන්නේ නැතුව හරි යන්නේ නැහැ කියලා. Lock down කළාට පසු කියනවා, රට open කරන්න, නැත්නම් මිනිසුන්ට කන්න නැහැ කියලා. මේ විධියට මේ රට අරාජික කරන්න කටයුතු කරන්න එපා කියලා විපක්ෂයේ තමුන්නාන්සේලා සියලුදෙනාගෙන් මම ඉල්ලා සිටිනවා. මේ වෙලාවේ අපි ඔක්කොම එකතු වෙන්න ඕනෑ. මේ කොරෝනා වසංගතය අවසන් වුණාට පසු අපි වෙන් වෙන්ව කටයුතු කරමු; පාර්ලිමේන්තුවේ වාද විවාද කරමු. නැවත කොරෝනා රැල්ලක් ඇති වුණොත්, ගම්වල ඉන්න අහිංසක ජනතාව ඇතුළු මේ රටේ සමස්ත ජනතාවට තමයි ඒකෙන් හානි වෙන්නේ. උද්ඝෝෂණ කරන්න එන කණ්ඩායම් මකබෑවුණත් අපට කමක් නැහැ. හැබැයි, ඒ අය ගම්වලට ගියාම ඒ ගම්වල ඉන්න වයසක අයගේ ජීවිත අවදානම් තත්ත්වයට පත් වන බව මම විශේෂයෙන්ම කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාවක් ලබා දෙනවා නම් තව කියන්න බොහෝ කරුණු තිබෙනවා. අපට කථා කරන්න ලැබෙන්නේ කලාතුරකින්. එම නිසා විනාඩි 10ක කාලයක් ප්‍රමාණවත් නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලාට නියම කර තිබෙන කාලයෙන් මට විනාඩි කිහිපයක් දෙන්න පුළුවන් නම්, ඒ සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, මේ වසංගත තත්ත්වය නිසා රැකියා අහිමි වූ අය විශාල සංඛ්‍යාවක් ඉන්නවා කියලා. ඒ වාගේම පාසල් නැවත ආරම්භ වුණා විතරයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කිව්වා, ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන මුදල රුපියල් ලක්ෂ 50කින් වැඩි කර තිබෙනවා කියලා, මේ අය වැයෙන්. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඒ ගැන සතුටු වෙන්න. ඒ වාගේම පළාත් පාලන කොට්ඨාසයක් සඳහා සෑම මන්ත්‍රීවරයකුටම රුපියල් ලක්ෂ 40ක් දෙනවා කිව්වා. ඒක දෙන්නේ ආණ්ඩු පක්ෂයට විතරක් නොවෙයි. ඒ මුදල් එතුමියට එපා නම්, මුදල් අමාත්‍යතුමාට අපි යෝජනා කරනවා, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ ඉල්ලීම අනුව කටයුතු කරමින් විපක්ෂයට ලබා දුන් මුදල් කපා හරින්න කියලා. එසේ කපා හැර ඒ මුදල් ටිකත් අපට ලබා දෙන්න කියා අපිත් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව ගැනත් මා වචනයක් කථා කරන්න ඕනෑ. මොකද, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව අද ජීවත් වෙන්නේ මැණික් කර්මාන්තයෙන්. මේ මැණික් කර්මාන්තයේ යම් කොටසක් ව්‍යාපාරිකයන්ට ගියාට අපට කමක් නැහැ. අඩු ගණනේ ඒ ගම්වල ඉන්න අඩු ආදායම්ලාභී පවුල්වල එක තරුණයකු හෝ සම්බන්ධ කර ගෙන නියාමක ක්‍රමයක් යටතේ හෝ ඒ හැම කෙනකුටම විහිදී යන වැඩ පිළිවෙළක් මේ සම්බන්ධයෙන් සකස් කර දුන්නොත් හොඳයි. හැබැයි, පරිසර හානි අවම වන විධියට කටයුතු කරන්න ඕනෑ. මොකද, රටේ පරිසර පද්ධතිය අද විනාශ වෙමින් යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)
මා හිතනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුගෙන් මට තව විනාඩි කිහිපයක් ලබාදෙයි කියලා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තව ටික වෙලාවක් ලබාදෙන්න.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)
බොහොම ස්තුතියි. මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ.

ව්‍යවසාය සංවර්ධන වැඩ පිළිවෙළ ගැනත් මම මතක් කරන්න ඕනෑ. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ අද විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරන්න රුපියල් මිලියන 15,000ක මුදලක් ලබා දීලා තිබෙනවා. කොරෝනා වසංගත කාලයේදී මේ රටේ ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු සියලු දේවල් ගන්න බැරි වූ අවස්ථා ද තිබුණා. අද හැම තැනම "Home Shop" ව්‍යාපෘතිය ආරම්භ කිරීම තුළින් ඒ අයගේ ආර්ථිකය දියුණු කර ගන්නත්, මුළු රටේම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යසනයක් ඇති වූ අවස්ථාවක ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා ගන්නත් පුළුවන්කම ලැබෙනවා.

අද ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඇතුළු සමහර කථිකයන් ඇහුවා, මාර්ග කන්නද කියලා. මාර්ග කිලෝමීටර ලක්ෂයේ ජාතික වැඩසටහන අද ක්‍රියාත්මක වෙනවා. මේ සංවර්ධන වැඩ කටයුතු නවත්වන්න බැහැ. මොකද, මාර්ග සංවර්ධනය සඳහා අපට විදේශ ආධාර ලැබුණා නම්, ඒ මුදල් වෙනත් දෙයකට යොමු කරන්න පුළුවන්කමක් නැහැ. මේ මුදල්වලින් මාර්ග 1,500ක වැඩ අවසන් කර තිබෙනවා. තව මාර්ග ගණනාවක වැඩ කරන්නත් තිබෙනවා. මාර්ග වැඩ පිළිවෙළ සඳහා මෙවර අය වැයෙන් තවත් රුපියල් මිලියන 20,000ක් ලබා දීලා තිබෙනවා. මාර්ග පද්ධතිය, විදුලිය, ජලය යන මේ සියල්ල අංග සම්පූර්ණ වුණොත් තමයි, ගමේ තිබෙන නිෂ්පාදන නගරයට ගෙනැවිත්, නගරය හරහා ඒවා පිටරට යවා ඒ තුළින් අපට විදේශ විනිමය ලබා ගන්න පුළුවන් වෙන්නේ. රටක් දියුණු වෙන්න, ගමක් දියුණු වෙන්න අනිවාර්යයෙන්ම මේ ප්‍රධාන කරුණු තුන මූලික වෙන්න ඕනෑ. පාරවල් හැදුවොත් ඒවා එපා කියනවා, හදන්නේ නැතුව තිබුණොත් ඒවා හදන්න කියනවා. මෙවැනි දුර්වල විපක්ෂයක් මා මීට කලින් දැකලා නැහැ. පටු දේශපාලන වාසි බලාපොරොත්තුවෙන් මේ රට අරාජික කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න එපා, මැදිහත් වෙන්න එපා කියා මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි, ගැබිනි මාතාවන්ට මාස 10ක කාලයක් සඳහා පමණයි පෝෂණ මල්ල ලබා දුන්නේ. මෙවර අය වැයෙන් එම කාලය මාස 24ක් දක්වා දීර්ඝ කර තිබෙනවා. ගැබිනි මාතාවක් පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීමෙන් නුවණැති බුද්ධිමත් දරුවන් මේ රටේ අනාගතයට බිහි කළ හැකියි. ඒ නිසා දරුවා ප්‍රසූත කළ පසු මාස ගණනක් යන කල් පෝෂණ මල්ල ලබා දීම තුළින් ඔවුන් හොඳින් පෝෂණය වෙනවා. එවැනි වැදගත් කාර්ය භාරයක් මේ අය වැය ලේඛනය තුළින් ඉෂ්ට කර තිබෙනවා. ඒ වාගේම "ගම සමඟ පිළිසඳර" වැඩසටහනටත් මෙවර අය වැයෙන් අතිවිශාල මුදලක් වෙන් කර තිබෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට දිස්ත්‍රික්කයෙන් පිට සේවය කිරීම අපහසු වී ඇති අවස්ථාවක මාර්ග ව්‍යාපෘතිය සඳහා අපට වැඩි මුදලක් වෙන් කර දීම සම්බන්ධයෙන් විශේෂයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාටත්, ගරු නිමල් ලාන්සා රාජ්‍ය ඇමතිතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලා මේ කාර්ය භාරය ඉමහත් සහයෝගයක් ලබා දෙනවා. රට අරාජික වෙලා තිබෙන මොහොතක, රට ආර්ථික වශයෙන් කඩා වැටිලා මොහොතක මේ රට ගොඩ ගන්න අප සියලුදෙනා එකතු වෙන්න ඕනෑ.

ඒ නිසා මෙවැනි වෙලාවක පාරට බැහැලා උද්ඝෝෂණ කරන එක නොවෙයි, අපේ අඩු පාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දීමයි අප කළ යුත්තේ. ඒ අනුව, මේ ගමන නිවැරදිව යන්න ඔබ සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම මට කළ අසාධාරණයට දෙවියන් වහන්සේත්, විශ්ව ශක්තියත් කවදා හෝ පිළිතුරු ලබා දෙයි කියන එක මතක් කරමින් සියලුදෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ සම්පූර්ණ කථාවත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලසන්ත අලගියවන්න ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.05]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (සමුපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සහභාගි වීමට ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා, 2004 ඉඳන් සෑම වර්ෂයකම. අවුරුදු 17කට ආසන්න කාලයක් මම අය වැය විවාදවලට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායේ 75වෙනි සංවත්සරය ඉදිරි වර්ෂයට යෙදී තිබෙනවා.

අපේ රටේ ඉතිහාසයේ ඉඳලා වර්තමානය දක්වාම සිද්ධ වෙන්නේ ආණ්ඩු පක්ෂය අය වැය ගැන සුබවාදීව කථා කිරීම සහ විපක්ෂය අය වැය ගැන අසුබවාදීව කථා කිරීමයි. ඒක අපි සියලුදෙනාම පිළිගත යුතුව තිබෙනවා. අද අපි දෙගොල්ල දෙපැත්තට වෙලා හිටියාට, අපි විපක්ෂයේ ඉන්නකොට ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරන අය වැයට විරුද්ධව කථා කරනවා. අපි ආණ්ඩුවට ආවාම ආණ්ඩුව තුළ ඉඳගෙන අය වැයට පක්ෂව කථා කරනවා. නමුත් දැන් ලෝකයේ දියුණු රටවල විධියට නිවැරදි වීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. රටක් විධියට හිතනවා නම් අපි ඒ අවබෝධය ලබා ගත යුතුයි. එහෙම නොවුණොත් මෙහි අහිතකර ප්‍රතිඵල භුක්ති විඳින්නට වෙන්නේ රටටත්, ජනතාවටත් කියන එක අපි පිළිගත යුතුයි.

විශේෂයෙන්ම මම පෞද්ගලිකව මෙවර අය වැය සුබවාදී අය වැයක්, හොඳ අය වැයක් ලෙස දකිනවා. එම නිසා ගරු

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ජනාධිපතිතුමාටත්, මුදල් අමාත්‍යතුමාටත් මගේ ස්තුතිය සහ ගෞරවය පළ කරනවා, මෙම අභියෝග මැද, අපහසුතා මැද සමාජයේ විවිධ කොටස්වලට සේවා ලැබෙන පරිදි, වරප්‍රසාද ලැබෙන පරිදි මේ අය වැය ඉදිරිපත් කිරීම පිළිබඳව.

මගේ රාජ්‍ය අමාත්‍යාංශය භාර ගත්තාට පසුව දැකපු දෙයක් මම මුලින්ම සඳහන් කරන්නට ඕනෑ. කවුරු කොහොම මොනවා කිව්වත්, අද සමුපකාර ව්‍යාපාරය මම පෞද්ගලිකව දකින්නේ නිදාගෙන ඉන්න යෝධයකු විධියටයි. මේකේ සාමාජිකයෝ ලක්ෂ 90ක් විතර ඉන්නවා. ඒ වාගේම අදත් වාර්ෂික පිරිවැටුම සුපිරි වෙළෙඳ සැල් ජාලවලටත් වඩා වැඩියි, ඒ ප්‍රමාණය බිලියන 75ක් පමණ වෙනවා. ඒ වාගේම මේ වන විට ග්‍රාමීය බැංකු සහ සමුපකාර ව්‍යාපාරයට අයත් බැංකුවලින් රුපියල් බිලියන 600ක් විතර ණය ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ ව්‍යාපාරය ශක්තිමත් කිරීම රජයේ වගකීමක් සහ යුතුකමක් බව අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

මේ අය වැය යෝජනාවල තිබෙනවා තැන්පතුකරුවන්ට අසාධාරණයක් සිදු වූ සමුපකාර ව්‍යාපාරය සතු බැංකු ගැන විමර්ශනයක් කරලා, තැන්පතුකරුවන්ට යම් අසාධාරණයක් සිදු වී තිබෙනවා නම් එය නිවැරදි කිරීමේ වගකීම රජය භාර ගන්නවා කියලා. ඒක ඉතාම හොඳ ඵලදායී යෝජනාවක්. විශේෂයෙන්ම හේවාගම්කෝරළය ගත්තත්, ගම්පහ ගත්තත් සියයට 80ක්, 90ක් පමණ මේ බැංකු සාර්ථකව තම කටයුතු පවත්වාගෙන යනවා. ඒ එක්කම, සියයට 15ක්, 20ක් බැංකුවල පාලන අධිකාරියේ සහ පාලනයේ අක්‍රමිකතා, වංචා සහ දූෂණ නිසා තැන්පත්කරුවන් අසාධාරණයට ලක් වෙලා තිබෙනවා.

ගම්පහ දිස්ත්‍රික්කයේ සණස බැංකු 600ක් විතර තිබෙනවා. මෙයින් බැංකු 30ක් විතර විශාල ප්‍රශ්නවලට මුහුණ පාලා තිබෙනවා. මේ බැංකු 30 නිසා අනෙක් බැංකු පන්සිය ගණනම නරකයි කියලා කියන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අර හොඳට කරගෙන යන බැංකු පන්සිය ගණනටත් අද ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අවිධිමත් ආකාරයට කටයුතු කළ, දූෂණය, වංචාව කළ බැංකු සුළු ප්‍රමාණයක් නිසා අද සමස්ත සමුපකාර ව්‍යාපාරයේම තැන්පතුකරුවන්, ගණුදෙනුකරුවන් යම් යම් ප්‍රශ්නවලට මුහුණ පාලා තිබෙනවා. ඒ ප්‍රශ්නසහගත බැංකුවල තැන්පතුකරුවන්ට යම් අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා නම්, එය නිවැරදි කිරීම සඳහා රජය මැදිහත් වෙනවාය කියන යෝජනාව මෙවර අය වැය යෝජනා තුළ ඇතුළත් වීම ඒ ගනුදෙනුකරුවන්ට වගේම සමස්ත සමුපකාර ව්‍යාපාරයට ලබා දීපු ශක්තියක් විධියටයි මං පෞද්ගලිකව දකින්නේ.

ඒ වාගේම සෑම ග්‍රාම නිලධාරි වසමකම අඩු ආදායම්ලාභීන්ට සහන මල්ලක් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 30,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, "Home Shop" සංකල්පය යටතේ සෑම ගමකම තෝරා ගත් කාන්තාවකට තමන්ගේ නිවස තුළ කඩයක් ඉදි කරගැනීම වෙනුවෙන් තවත් රුපියල් මිලියන 15,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

පසුගිය දවස්වලත්, වර්තමානයේත් ජීවන වියදම වැඩියි කියන එක අපි පිළිගත යුතුයි. අපි ඒක පිළිගන්න ඕනෑ. ජනතාවට ප්‍රශ්නයක් නැහැ, ජනතාවට අඩු මිලට බඩු තිබෙනවා කියන තැන අපි නැහැ. ඒ ප්‍රශ්නය තිබෙනවා. අද මුළු ලෝකයම ගත්තත් බලශක්තිය පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ගල් අඟුරු, ඛනිජ තෙල්, ගෑස් මිල අද සියයට තුන්හාරසියයකින් වැඩි වෙලා තිබෙනවා. බලශක්ති මිල වැඩි වුණාම ප්‍රවාහනය වියදම වැඩි වෙනවා. කර්මාන්තශාලාවල නිෂ්පාදන පිරිවැය වැඩි වෙනවා. මෙම තත්ත්වය නිසා අද අපේ රටටත් බලපෑම් ඇති වෙලා තිබෙනවා. අද නැව් ගාස්තු සියයට 300කින්, 400කින් විතර වැඩි වෙලා තිබෙනවා. අද නැව් නියමිත පරිදි ඉඩ පහසුකම් ලබා ගැනීම පිළිබඳ ප්‍රශ්නවලට මුහුණ පාලා තිබෙනවා. එම නිසා තමයි පසුගිය කාලසීමාව තුළදී පාලන මිලෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඉවත් වුණේ. මිල පාලනය කිරීමෙන් හෝ ජනතාවට සහනයක් දෙන්න ඕනෑ කියන අවංක චේතනාව තුළ තමයි අපි කටයුතු කළේ. නමුත් අපට ඒක කරන්න බැරි වුණා. අපි ඒක පිළිගන්න ඕනෑ. ජනතාව වෙනුවෙන් සද්භාවයෙන් යමක් කරන්න ගිහින් ඒක කරන්න බැරිවුණාම, රජය ගත්ත තීරණයක් නිසා ඒ මතම ඉන්නවා කියන තැන රජය විධියට අපි හිටියේ නැහැ. අපි පාලන මිලෙන් ඉවත් වුණා. මොන ආකාරයකට හෝ පාරිභෝගිකයාට අසාධාරණයක් සිද්ධ වෙනවා නම්, ඒ සඳහා රජයට මැදිහත් වීමට ඉඩ තබාගෙනයි අපි පාලන මිල කියන සංකල්පයෙන් අද ඉවත් වෙලා තිබෙන්නේ. අද අපි ඒකෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගෙන තිබෙනවා. අපි සීනි සඳහා පාලන මිලක් පැනෙව්වා. ඉන් පසුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙළෙඳ පොළේ වැටලීම් කළා. නමුත් අපි ගහපු ගැසට් එකට වෙළෙඳ පොළේ සීනි තිබුණේ නැහැ. ඒ පාලන මිල නිසා සීනි කිලෝව රුපියල් දෙසිය ගණන්වලටත් සීනි ගියා. ඒ වාගේම අපි ආනයනය සීමා කරලා තිබුණා. ආනයනය ලිහිල් කරලා, පාලන මිල ඉවත් කළාට අද දිනයේදී කොටුව තොග වෙළඳ පොළේ සීනි කිලෝවක් රුපියල් 125යි. නමුත් මිල පාලනය කරන්න ගිහින් සීනි කිලෝව රුපියල් 210ට, රුපියල් 220ට ගියා. ඒ පාලනය ලිහිල් වුණා විතරයි, ආනයනකරුවන් තරගකාරිත්වයක් ඇති කරගෙන ඒ අයගේ සීනි ටික විකුණා ගන්න කටයුතු කරනවා. කලින් ඒ අය ණයට දුන්නේ නැහැ. කොළඹ ආනයනකරුවන් තොග වෙළෙන්දන් පිටිපස්සෙන් ගිහින් ණය පදනම මත ඒ අයට සීනි ලබා දීමට කටයුතු කරනවා. ඒ නිසා අද වෙළෙන්දන් අතර තරගයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා පාලන මිල ඉවත් කිරීමෙන් මොනම ආකාරයකින්වත් පාරිභෝගිකයාට අසාධාරණයක් සිද්ධ වෙලා නැහැ කියන එක මම මේ අවස්ථාවේ විශේෂයෙන් සඳහන් කරනවා.

අද ගෑස් හිඟයක් තිබෙනවා. පාලන මිල ඉවත් වුණාට පස්සේ සිමෙන්ති හිඟය අද ක්‍රම ක්‍රමයෙන් අඩු වෙමින් පවතිනවා. මේ තිබෙන තත්ත්වය තුළ ගැසට් එකක් මඟින් මිල පාලනය කිරීමේ කාර්ය භාරය කරන්න පුළුවන්කමක් නැති වුණත්, අපි මේ සියලු දේවල් කරන්නේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ වගකීම අපට තිබෙන නිසායි.

අද අපි මේ සහන මල්ලක් ලබා දෙන්නේ ඇයි? පාලන මිල ඉවත් වුණත්, යම්කිසි ආකාරයකින් වෙළෙඳ පොළේ බඩු මිල ඉහළ ගියත්, සෑම ග්‍රාම සේවක වසමකම ජනතාවට මාසයකට නොමිලේ සහන මල්ලක් ලබා දීම අපේ එක වැඩ පිළිවෙළක්. භාණ්ඩ මිල ඉහළ යෑම නිසා මේ රටේ දුගී දුප්පත් ජනතාව මුහුණ පාන ප්‍රශ්නවලට යම්කිසි ආකාරයක විසඳුමක් මේකෙන් ලබා දී තිබෙනවා. ඒ සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, අපි විවෘත කරන අලුත් කඩය තුළින් බලාපොරොත්තු වෙන්නේ හුදෙක්ම මේ සහන මල්ල ලබාදීම ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ අඩු මිලකට ලබාදීමයි. මේ වෙනුවෙන් අපි එක නියාමක ව්‍යාපෘතියක් ආරම්භ කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

මට තව විනාඩි කිහිපයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

එම ව්‍යාපෘතිය ඉතා සාර්ථකයි. ඒ අනුව අපි මේ විවෘත කරන 10,000කට ආසන්න නව කඩ ජාලය තුළින් ගම් මට්ටමෙන් සහන මිලට බඩු ලබාදීමට කටයුතු කරනවා වාගේම, දුප්පත් අයට නොමිලේ ආහාර මල්ලක් ලබාදීමේ වැඩ පිළිවෙළත් මේ අය වැය යෝජනා තුළ තිබෙනවා. එම නිසා තමයි මම මුලින්ම සඳහන් කළේ අය වැය පිළිබඳව අපට සුබවාදීව කථා කරන්න පුළුවන් කියලා.

සමස්ත පාසල් පද්ධතියට තොරතුරු තාක්ෂණය සම්බන්ධ අන්තර්ජාල පහසුකම් ලබාදීමත් ඉතාම හොඳ යෝජනාවක්. ඒ වාගේම, තමයි සංඛ්‍යාත වෙන්දේසි කිරීම. අද සංඛ්‍යාත අයිති ජනතාවට. අද අපේ රටේ මාධ්‍ය ආයතන තුළින් විශාල සේවයක් සිද්ධ වෙනවා. මම ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් ඉන්නකොට මට මතකයි, සියලු රාජ්‍ය මාධ්‍ය ඇතුළු පෞද්ගලික මාධ්‍ය ඒ වෙලාවේ ඩෙංගු මර්දනය වෙනුවෙන් සතියක කාලයක් නොමිලේ සිය සහයෝගය ලබා දුන් බව. අපි ඒකට මුහුණ දුන්නා. එහෙම වුණත්, අද මේ සංඛ්‍යාත වෙන්දේසි කිරීමේ ක්‍රමය තුළින් රටට, ජනතාවට අයිති ඒ සංඛ්‍යාත සඳහා සාධාරණයක් ඉටු වෙනවාය කියා කියන්න පුළුවන්. අද මාධ්‍ය ආයතනයක් පටන් ගත්තාම, ඒ මාධ්‍ය ආයතනය ප්‍රසිද්ධ වුණාට පස්සේ ඒ මාධ්‍ය ආයතනයේ වටිනාකම රුපියල් බිලියන 15ක්, 20ක් බවට පත් වෙනවා. ඒ සංඛ්‍යාත අයිති ජනතාවට. ඒ සංඛ්‍යාතවලට ඒ මාධ්‍ය ආයතනවලින් එච්චර ගෙවීමක් කරන්නේ නැහැ. එම නිසා මේ සංඛ්‍යාත වෙන්දේසි කිරීමේ වැඩ පිළිවෙළ ඉතා ඵලදායී වැඩ පිළිවෙළක් විධියටයි අපි දකින්නේ. ඒ වාගේම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අයිති අමාත්‍යාංශය විධියට මා සඳහන් කරන්න ඕනෑ, අද රාජ්‍ය ආයතනවල කාර්ය සාධනය පිළිබඳව. *[බාධා කිරීමක්]*

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ ගෙනෙන සංකල්පය අලුත් සංකල්පයක් නොවෙයි. මේක චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුවෙත් තිබුණා. ඔබතුමාට මතක ඇති, franchise shops. හැම ගමකටම සමුපකාරයෙන් franchise shop එකක් දුන්නා. ඒකම තමයි දැන් ඔය ගේන්නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
නැහැ මන්ත්‍රීතුමා. අපි ඒ ගැන වෙනමම කථා කරමු. සමුපකාරයෙන් franchises දුන්නේ නැහැ. සතොසෙන් franchises දුන්නේ කිංස්ලි ටී. වික්‍රමරත්න හිටපු ඇමතිතුමා. *[බාධා කිරීමක්]* කමක් නැහැ. ඒක හොඳයි නේ. *[බාධා කිරීමක්]* හොඳ දේ කරන එක හොඳයි නේ. *[බාධා කිරීමක්]* හොඳ දේ කරන එක හොඳයි නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* හරි හරි. ඒක ඔබතුමාගේ මතය නේ. ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරු හෝ හොඳ දෙයක් කරනවා නම් ඒක හොඳයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා මගේ වෙලාව ගත්තා.

පාර්ලිමේන්තුවේ කවුරු හෝ මතයක් ඉදිරිපත් කළොත්, ඇහුම්කන් දීමට පුරුද්දක් ඇති කර ගැනීම තමයි, විනයගරුකභාවය. ඒක නිසා අපි ඇහුම්කන් දෙන්න ඕනෑ. අපි සුබවාදී දත්ත කියනකොට අහගෙන ඉන්න බැරි නම්, ඒක හොඳ දෙයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරනකොට අපි අහගෙන හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව පිළිබඳව කථා කිරීමේදී, අපි අය වැයෙන් ඒවාට මුදල් වෙන් කළත්, ඒ ඒ ආයතනවලින් එම වගකීම ඉටු වෙනවාද කියන එක පිළිබඳව මැනීමක් සිද්ධ වෙන්නේ නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. අද මේ තිබෙන තත්ත්වයත් එක්ක බැලුවාම, අපි මෙවර සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙන බව කියන්න පුළුවන්. මෙම අය වැය තුළින් අපේ අමාත්‍යාංශවලට පැවරී තිබෙන කාර්ය භාරය, වගකීම අපි අවංකව, ඉලක්ක සහගතව ඉටු කරනවා කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දහසයක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.20]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැයෙන් මේ රටේ ජනතාව සහන සහ ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් බලාපොරොත්තු වුණා. නමුත් ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැයෙන් මේ රජය නැවත ෆේල් කියා ඔප්පු වෙලා හමාරයි. අපි ඒ ගැන මෙතැන කථා කරන්න ඕනෑ නැහැ. පාරට ගිහිල්ලා කථා කළාම, නැත්නම් ගෑස් පෝලිමට ගිහිල්ලා කථා කළාම, එහෙම නැත්නම් supermarket එකට ගිහිල්ලා කථා කළාම ජනතාව හොඳට කියා දෙයි, මේ අය වැයෙන් ඒ ගොල්ලන්ට ලැබුණේ මොනවාද කියලා.

බලන්න, මේ රජය මේ රටේ අර්බුද ගණනාවක් නිර්මාණය කර තිබෙනවා. පළමුවැන්න, ජීවන වියදමේ අර්බුදය. අපේ ගරු රාජ්‍ය ඇමතිතුමාත් පිළිගත් පරිදි සහල්, එළවලු, ගෑස්, සිමෙන්ති කියන මේ සියලු දේකම මිල පාලනය කරන්න යෑම තුළින් ඒවායේ මිල ජනතාවගේ ඔළු උඩට කඩා වැටී තිබෙනවා. ගැසට් පිට ගැසට් ගැහුවා. නමුත් ඒ ගැසට් reverse කරන්න සිද්ධ වුණා. හාල් මෝල්වලට පැන්නා; කඩවලට පැන්නා. නමුත් ඒ කිසිවකින් ජනතාවට සහනයක් හම්බ වුණේ නැහැ. වෙළෙන්දෝ හිතුමතේ භාණ්ඩ මිල තීරණය කරන්න පටන් ගත්තා. අවසානයේ අද වනවිට මැරෙන්නේ නැතුව ජීවත් වෙන්නේ කොහොමද, කියන එක ගැන ජනතාවට හිතන්න වෙලා තිබෙනවා. නමුත් අපි දැක්කේ නැහැ, මේ අය වැයෙන් මේ ප්‍රශ්නවලට, මේ ජීවන වියදමේ ප්‍රශ්නවලට උත්තර තිබෙන බවක්.

ඊළඟට, පොහොර අර්බුදයක් නිර්මාණය කරලා ගොවියාට ගැහුවා. අද වනවිට චීන අසූචි නැවක් මේ රට වටා කැරකෙනවා. අද මේ රජය මොනවා කරගන්නද, මේක පාලනය කරන්නේ කොහොමද කියා තීරණය කරන්න කොන්දක් නැතුවයි ඉන්නේ. අද අස්වැන්න වැටී තිබෙන්නේ. ඉදිරියේදී සාගතයක් නිර්මාණය වෙනවා. මේ අය වැයෙන් මේවාට විසඳුම් හොයන්න මුදල් ඇමතිතුමාට බැරි වෙලා තිබෙනවා.

ඊළඟට, "X-Press Pearl" නෞකාවේ අර්බුදයෙන් ධීවරයාට ගැහුවා. විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ එහෙම වන්දි ලබා දිය යුතු ධීවරයන්ට තවම වන්දි ලබා දීලා නැහැ. "X-Press Pearl" නෞකාවේ අර්බුදය නිසා ධීවර කර්මාන්තයේ යෙදෙන පරම්පරා ගණනාවකට මත්ස්‍ය අස්වැන්න නෙළා ගැනීමට නොහැකි වන අයුරින් හානි වීම නිසා තවත් අර්බුදයක් නිර්මාණය වුණා. එම නෞකාවේ සුන්බුන් අයින් කරන්නේ කොහොමද, ඒ ධීවරයින්ට හරි වන්දියක් දෙන්නේ කොහොමද කියා කටයුතු කිරීමට මේ අය වැය අපොහොසත් වෙලා තිබෙනවා.

ඊළඟට බලන්න, බලශක්ති අර්බුදය. අද ජනතාව ගෑස් සිලින්ඩර අරගෙන ගිහිල්ලා පෝලිමේ ඉන්න ඕනෑ. මොකද, කොහේවත් ගෑස් නැහැ. ඒ වාගේම තවත් අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ තමයි තෙල් අර්බුදය. සපුගස්කන්ද තෙල් පිරිපහදුව වසා තැබීමෙන් අද ඉන්ධන හිඟයක් නිර්මාණය කරලා. වැස්ස අඩු වුණොත්, ඉදිරියේදී විදුලිබල අර්බුදයකුත් ඇති වෙයි. ඒ වාගේම විදුලිබල මණ්ඩලය ඇතුළත අද වනවිට වර්ජනය කරන තත්ත්වයක් මතු වී තිබෙනවා. New Fortress Energy සමාගමත් එක්ක මුදල් ඇමතිතුමා හිතුමතේ ගිවිසුමක් අත්සන් කිරීම නිසා රජය ඇතුළත අර්බුදයක් නිර්මාණය කරගෙන, ඒ විදුලි අර්බුදය තුළින් අද වනවිට ආර්ථික අර්බුදයකටත් පාර කපා තිබෙනවා.

අද මේ රට තුළ මූල්‍ය අර්බුදයක් නිර්මාණය කර තිබෙනවා. පසුගිය රජය ඇමෙරිකානු ඩොලර් බිලියන 7.2ක සංචිත ඉතුරු කර ගියේ. නමුත් අද එම සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.2ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඉදිරි මාස 12දී ඇමෙරිකානු ඩොලර් බිලියන හතක ණය ගෙවන්න අපට සිද්ධ වෙනවා. නමුත් දැන් වනවිට විදේශීය රටවල් අපට ණය දෙනවාද? අපිට විදේශ බැංකුවලින්, IMF එකෙන් ණය දෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් විශාල අර්බුදයක් පැන නැඟී තිබෙනවා. ඒ කොහෙන්වත් අද වනවිට අපට ණයක් ගන්න බැරි විධියට රටේ මූල්‍ය අර්බුදය ඔඩු දුවා තිබෙනවා. අපි කොච්චර වැටිලාද කිව්වොත්, බංග්ලාදේශයෙන් පවා ණය අරගෙන, බංග්ලාදේශයෙනුත් හිඟා කන තත්ත්වයට අපට වැටෙන්න සිද්ධ වුණා. ශ්‍රේණිගත කිරීම්වලින් පවා අපේ රට පහත වැටී තිබෙනවා.

Moody's, Fitch වැනි ආයතන "මේ රටේ මූල්‍ය විනයක් නැහැ. මේ රජයේ මූල්‍ය ආදායමක් නැහැ" කියා තක්සේරු කර, ඒ ශ්‍රේණිගත කිරීම්වලදී අපේ රට පහළට දමා තිබෙනවා. අපි ඉන්නේ බංකොලොත්භාවයට ඔන්න මෙන්න. අද මූල්‍ය අර්බුදය, ආර්ථික අර්බුදයක් බවට පරිවර්තනය වෙලා, ඒ ආර්ථික අර්බුදය බංකොලොත්භාවය කරා ගෙන යන යුගයක තමයි අද අපි මේ අය වැයෙන් ඒකට යම්කිසි සහනයක්, විසඳුමක් බලාපොරොත්තු වුණේ. නමුත් අය වැයෙන් ඒකට විසඳුමක් ලැබෙනවා අපි දැක්කේ නැහැ. විසඳුමක් ලබා දෙනවා වෙනුවට අපේ බැංකු පද්ධතියට තවත් බර පටවලා, බැංකු පද්ධතිය අනතුරේ හෙළන්න අද මේ අය වැය තුළින් මුදල් ඇමතිතුමා සහ රජය කටයුතු කර තිබෙනවා.

අද ලංකා බැංකුව, මහජන බැංකුව ඇතුළු අනිකුත් බැංකු විශාල පීඩනයක ඉන්නවා. අද ඩොලර් අර්බුදය මේ බැංකුවලට විශාල වශයෙන් බලපා තිබෙනවා. ඒ මදිවාට මේ අය වැයෙන් ඒ බැංකුවලට තවත් බදු ගහලා, VAT එකත් වැඩි කරලා, ඒ තුළින් බැංකුවලින් ණය ගන්න අයට, බැංකුවල පාරිභෝගිකයන්ට, මේ රටේ සමස්ත ජනතාවට තවත් බර පටවා තිබෙනවා. අපි දකිනවා, මේ අය වැය තුළින් විශේෂයෙන්ම පාරවල් හැදීමට තමයි යෝජනා කර තිබෙන්නේ කියන කාරණය. 2015ට පෙර ණය යොදවා, ආදායම් නැති ව්‍යාපාර පටන් ගෙන, ඇස්තමේන්තු දෙගුණ තෙගුණ නොවෙයි සමහර විට විසි ගුණයකින් වැඩි කරලා කටයුතු කළා. ඒ ණය අර්බුදය තමයි අද අපේ කකුල් දෙක ළඟට ඇවිල්ලා තිබෙන්නේ. තමන්ගේ මන්ත්‍රීවරුන්ට සල්ලි දීමෙන් පමණක් මේ අර්බුද විසඳන්න පුළුවන් කියා මුදල් ඇමතිතුමා හිතනවා නම් ඒක මම හිතන්නේ සිහිනයක් පමණයි. රජය නිර්මාණය කළ මේ අර්බුදවලට විසඳුම් නැතිව ගමන් කරන රටක් බවට මේ අය වැයෙන් පස්සේ අපේ රට පත් වනවා.

ඒ එක්කම මතක තියා ගන්න, මේ අර්බුද දිගින් දිගටම එන්නේ පාස්කු ප්‍රහාරයේ සාපය නිසායි. පාස්කු ප්‍රහාරයට සාධාරණයක් ඉටු කරන්නේ නැතිව මේ රජයට අනාගතයේ ගමනක් නැති බව හොඳට මතක තියා ගන්න. දැන් සහරාන්ලා වෙනුවට, නැත්නම් ත්‍රස්තවාදීන් වෙනුවට සිරිල් ගාමිණී පියතුමන්ලා වැනි අය පසුපස හඹා යනවා. උන්වහන්සේලා CID එකට කැඳවනවා. බෝම්බ ගැහුවේ හරියට මේ රටේ කතෝලික සභාව, නැත්නම් කතෝලික පියතුමන්ලා වාගේ තමයි අද රජය හැසිරෙන්නේ. මේ යන විධියට කාදිනල් හිමිපාණන්වත් අත්අඩංගුවට අරගෙන ඉදිරියේදී ප්‍රශ්න කිරීමට යයිද කියා අපට ලොකු සැකයක් තිබෙනවා.

නමුත් මතක තියා ගන්න, මේ රටේ කතෝලිකයන්ට ගහලා, කතෝලිකයන් වූදිතයන් කර, කතෝලිකයන් පසුපස එළවලා මේ ප්‍රශ්නය කවදාවත් විසඳන්න බැහැ. දෙවියන් වහන්සේගෙන් අනිවාර්යයෙන් ඒ ප්‍රහාරය සිදු කරපු සියලුදෙනාටම දඬුවම් ලැබෙනවා. ඒ එක්කම මේ රට නැවත දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබන රටක් හැටියට ඉදිරියට යන්න ඕනෑ නම් අනිවාර්යයෙන්ම මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ කියන මතයේ අපි ඉන්නවා කියන කාරණයත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි.

අපි පිළිගන්නවා, කොරෝනා අර්බුදය ගෝලීය අර්බුදයක් බව. නමුත් ඒ ගෝලීය අර්බුදය මේ රටේ මීටත් වඩා හොඳට කළමනාකරණය කළා නම් 14,000කට වඩා නැති වුණු ජීවිත බේරා ගන්න තිබුණා. මතක තියා ගන්න, එදා එන්නත වෙනුවට පැණිය තමයි ඉදිරියට දැම්මේ; මුට්ටිය තමයි ඉදිරියට දැම්මේ. මේවා ඉදිරියට දමා අපේ රටේ වටිනා ජීවිත නැති කර ගත්තා.

විශේෂයෙන් අපි මතක් කරන්න ඕනෑ, අපේ රටේ ප්‍රසිද්ධ චරිත -සුනිල් පෙරේරා, මංගල සමරවීර, කිළි මහාරාජා වැනි අය- පවා මේ කොරෝනා වසංගතය නිසා අපට අහිමි වුණු බව. කොරෝනා වසංගතය -ඒ අනතුර- තවම තිබෙන වෙලාවේ රජය මොනවාද මේ අය වැයෙන් කරන්නේ? සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන කපනවා. ඉදිරියේදී නව රැල්ලක්, නව ප්‍රභේදයක් ගෝලීය වශයෙන් පැතිරුණොත් ඒකට මුහුණ දෙන්න තිබෙන සූදානම, ඒකට මුහුණ දෙන්න තිබෙන ශක්තිය නැති කරන්න අද මේ රජය කටයුතු කර තිබෙනවා කියලා මේ අය වැයෙන් ඔප්පු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! The Sitting is suspended for lunch till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)

කරුණාකර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

"ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. KINS NELSON *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ. භා. 1.00]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා අර්බුදයට මේ රටේ අනෙකුත් අර්බුද එකතු වෙලා අපේ රටේ ජනතාව මේ වන කොට දරන්න බැරි පීඩනයකට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන කපා හැරීම තුළින් අපේ රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂාව ඇතුළු සියලු දේ නොසලකා හරිමින් මුදල් ඇමතිතුමා ඔවුන් අනතුරේ දමා තිබෙනවා කියලා තමයි මේ අවස්ථාවේදී අපට කියන්න තිබෙන්නේ.

කොරෝනා අර්බුදය නිසා විශාල වශයෙන් බලපෑමට ලක් වූ එක ක්ෂේත්‍රයක් තමයි අපේ සංචාරක ව්‍යාපාරය. මේ රටේ සංචාරක ව්‍යාපාරය තුළින් ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක, 5ක පමණ ආදායමක් අපට ලැබුණා. අප සංචාරක ව්‍යාපාරය තුළින් මේ රටේ විශාල පිරිසකට රැකී රක්ෂා ලබා දුන්නා. මෙම කර්මාන්තය තුළින් අපි විදේශ විනිමය උපයා ගත්තා. මුළු ලෝකයේම සංචාරක ව්‍යාපාරය ඇද වැටෙන කොට, ඇතැම් රටවල් තම රටවල සංචාරක ව්‍යාපාරය නැවත ගොඩ නඟන්න කටයුතු කරන කොට අපේ කට්ටිය මොනවාද කළේ කියා අපි දැක්කා. එයින් තව අර්බුදයක් නිර්මාණය කළා. කිසිම සැලසුමක් නැතිව යුක්රේනයෙන් සංචාරකයන් ගෙනැල්ලා, අපේ රටේ ජනතාවගේ ජීවිත අනතුරට දමලා යම් යම් බලගතු උදවිය කටයුතු කළ හැටි අපි දැක්කා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ සංචාරක හෝටල්වලට, ඒ වාගේම සංචාරක ව්‍යාපාරයෙන් යැපුණු කුඩා වෙළෙන්දාගේ ඉඳලා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයා දක්වා වන පිරිසට සහන දීමට රජය අපොහොසත් වුණා. ඉතාම සුළු සහන දුන්නත්, වෙනත් රටවල් එක්ක සංසන්දනය කරන කොට අපේ සංචාරක ව්‍යාපාරය නිසි කළමනාකරණයක් නැතිව, නිසි වැඩ පිළිවෙළක් නැතිව, යන විදියටම එහෙමම යන්න ඉඩ හැරියා, එයට වැටෙන්න ඉඩ හැරියා කියා මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරනවා. ඒ වාගේම, විදේශ රැකියාවල නියුතු, අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන 7කටත් වඩා මුදලක් එවපු අපේම ශ්‍රී ලාංකිකයන්ට ආණ්ඩුව සැලකුවේ කොහොමද? කොරෝනා රෙගුලාසි කියලා නිරෝධායන නීති සකසා මේ රටේ ජනතාවගෙන් සූරා කන්නට රජය කටයුතු කළා කියන එක විදේශ රැකියා කරන සියලු ශ්‍රී ලාංකිකයෝ දන්නවා.

වත්මන් ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ වෙලාවේ විදේශ රටවල ජීවත් වන සමහර ශ්‍රී ලාංකිකයන් තමන්ගේ මුදලින් ටිකට් අරගෙන ඇවිල්ලා එතුමාට ඡන්දය දුන්නා. අද ඒ අයට මේ රජය කෙරෙහි මුළුමනින් වෛරයක් ඇති වෙලා, ඒක තවත් අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. අපි මේ රටේ මේ වාගේ අර්බුද දිගින් දිගටම දැක්කා. ඒ අර්බුද සියල්ල නිර්මාණය කළේ රජය. රජය අර්බුද නිර්මාණය කළා නම් රජයටම වගකීමක් තිබුණා ඒ අර්බුදවලට මේ අය වැයෙන් විසඳුම් දෙන්න.

ඒ අර්බුද විසඳන්න අවශ්‍ය මුදල් දීලා, ඒ වාගේම අවශ්‍ය සැලසුම් හදලා මේ රටේ ජනතාවගේ ජීවන බර, පීඩනය අවම කරන්න මේ රජයට හැකියාව තිබුණා. නමුත්, මේ අය වැය මුළුමනින් තමන්ගේ බලය රඳවාගන්නට, තමන්ගේ මන්ත්‍රීවරුන් සතුටු කරන්න තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ මඟින් වෙන් වන ප්‍රතිපාදන හරහා උඩ ඉඳලා පහළ ඉන්න මන්ත්‍රීවරයාට, නැත්නම් සංවිධායකවරයාට මුදල් යන්නේ කොහොමද, කොමිස් යන්නේ කොහොමද කියන එක සැලසුම් කරලා තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ හින්දා විපක්ෂයක් හැටියට අපි මේ රටේ ජනතාවත් සමඟ එකට සිට ගනිමින්, මේ අය වැයට විරුද්ධව මේ අය වැය පරාජය කිරීම සඳහා අනිවාර්යයෙන් අපේ ඡන්දය භාවිත කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජයරත්න හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.05]

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය ඉතාම අමාරු වෙලාවක ඉදිරිපත් කරපු අය වැයක් කියලායි මම හිතන්නේ. අවුරුදු දෙකකට ආසන්න කාලයක් කොවිඩ් - 19 වසංගතය අපේ රට වෙළාගෙන තිබෙන නිසා අපේ රටේ ආර්ථික ව්‍යාපෘති සියල්ල කඩා වැටිලා, මිනිසුන්ගේ ජීවිත බරපතළ විධියේ නරක තැනකට තල්ලු වෙලා රජයක් විධියට අපි බරපතළ අසීරු තත්ත්වයකට පත් වුණා.

මෙවැනි අසීරු වෙලාවක අය වැයක් ඉදිරිපත් කරපු ලංකා දේශපාලන ඉතිහාසයේ පළමුවෙනි අවස්ථාව මේකයි කියා මම විශ්වාස කරනවා. ඒ නිසා මේ අය වැයේ අඩු පාඩුකම් ඇති. හැබැයි, අඩු පාඩුකම් තිබුණාට මේ තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක මීට වඩා යමක් කරන්න පුළුවන් තත්ත්වයක අද රජය නැහැ කියන එක තමයි අපට පැහැදිලි වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප වෙනදා කිව්වේ, 'මුළු ලෝකයේම අපි විශ්ව ගම්මානයක් විධියට එකට අත් වැල් බැඳගෙන කටයුතු කරන්න ඕනෑ. අපි භාණ්ඩ හා සේවා හුවමාරු කරගෙන බොහොම සහජීවනයෙන් කටයුතු කරන්න ඕනෑ.' කියන කථාවයි. නමුත්, මේ කොවිඩ් වසංගතයත් එක්ක සියලු රටවල් තමතමන්ගේ වරායවල්, ගුවන් තොටුපොළවල් වහගෙන, තනි තනිව තමයි ජීවත් වන්නට හුරු පුරුදු වුණේ. ඒ නිසා කොරෝනා ඊළඟ රැල්ල -හතරවෙනි රැල්ල- ආවොත් අපි රටක් විධියට ඊළඟට මොකක්ද කරන්නේ කියන කාරණය ගැන හිතලා තමයි අපට කටයුතු කරන්න සිදු වෙන්නේ. මේ සියල්ල හොඳින් කල්පනා කර බලා, කළමනාකරණය කරලා තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක සියයට සියයක් සාර්ථක තත්ත්වයට ගෙනෙන්නට උත්සාහ කළත්, මේ තිබෙන

තත්ත්වයන් උඩ විපක්ෂය චෝදනා කරමින් ඉදිරිපත් කරන යම් යම් කාරණා එක්ක අපට ගැටලු සහගත තත්ත්වයක් මතුව තිබෙනවා.

කොවිඩ් වසංගත තත්ත්වය ඇති වීමත් එක්ක අපේ ජීවන වියදම -උද්ධමනය- වැඩි වුණා. OPEC සංවිධානය, රුසියාව වාගේ බලවතුන් එකතු වෙලා එදා කොවිඩ් වසංගතය තදින් තිබූ වෙලාවේ ඔවුන්ගේ තෙල් නිෂ්පාදනය බෙහෙවින් අඩු කරන්න තීන්දු කළා. වෙළෙඳාම අඩු වන කොට නිෂ්පාදනය අඩු කරලා ඔවුන් ඒක කළමනාකරණය කර ගත්තා. ඒ තුළ මිල ස්ථායීකරණයක් ඇති කරගන්න ඔවුන්ට පුළුවන්කම ලැබුණා. හැබැයි, දැන් කොවිඩ් වසංගත තත්ත්වයෙන් මිදිලා ලෝකය නිදහස් වුණත් OPEC සංවිධානය, රුසියාව වාගේ රටවල් ඔවුන්ගේ පාඩුව පිරිමහගන්න, ඔවුන්ගේ නිෂ්පාදන ඉහළ තත්ත්වයකට ගෙන එන්න කටයුතු කළේ නැහැ. ඒ නිසා අද නැව් ගාස්තු වැඩි වෙලා; රක්ෂණ ගාස්තු වැඩි වෙලා. මේ ඉන්ධන අර්බුදයත් එක්ක සමස්ත ජීවන තත්ත්වය බරපතළ අර්බුදයකට තල්ලු වීම වළක්වන්න පුළුවන්කමක් නැහැ. මෙන්න, මේ තත්ත්වයන් යටතේ තමයි, අපට අය වැය ගැන කථා කරන්න සිදු වෙන්නේ. අපි සම්පූර්ණයෙන්ම නිෂ්පාදන ඉලක්ක කරගත් අය වැයක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඊළඟට කොවිඩ් හතරවෙනි රැල්ල ආවත් අපට මෙහේ මොනවා හෝ කර කියාගෙන ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ගොඩනඟා ගැනීම තමයි ආණ්ඩුවේ පරමාර්ථය සහ අරමුණ. මා එය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

උද්ධමනය කියන එක ලංකාවට විතරක් බලපාන කාරණාවක් නොවෙයි. මා හිතන විධියට, පොදුවේ ඇමෙරිකාවේත් අද මේ තත්ත්වය තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය අනතුරු ඇඟවීමක් කරනවා, 2022 අවුරුද්ද තුළ මුළු ලෝකයටම මේ තත්ත්වය බරපතළ විධියට බලපායි කියලා. ඒ නිසා, අපේ රට විපත්තියට පත් වෙච්ච මේ වෙලාවේ පක්ෂ විපක්ෂ භේදයක් නැතිව, සාධනීය කරුණු එක්ක අප සියලුදෙනා එකඟ වීම තමයි, ශීලාචාර මහජන නියෝජිතයන්ගේ වගකීම සහ යුතුකම විධියට මා සලකන්නේ.

ඒ නිසා මේ වෙලාවේ මේ තත්ත්වය යම් ප්‍රමාණයකට හෝ සමනය කරන්න රජය විශාල පරිශ්‍රමයක් ගන්නවා. දේශගුණික විපර්යාස පිළිබඳව ලෝක බලවතුන්ගේ සමුළුවක් ඊයේ-පෙරේදා පැවතුණා. ඒකෙදී කිව්වා, පොසිල ඉන්ධන භාවිතය අඩු කරමු කියලා. හැබැයි චීනයයි, ඉන්දියාවයි, ඇමෙරිකාවයි ඒකට එකඟ වුණේ නැහැ. ඒ ගොල්ලන් බොහොම සැහැල්ලුවෙන් ලිස්සලා ගියා. ඒ ගොල්ලන්ගේ ආදායම් මාර්ගයට, ආර්ථිකයට මේක කොයි විධියට ද බලපාන්නේ කියලා ඒ අය ගළපා බැලුවා. ඒ නිසා මේ වෙලාවේ මට කියන්න තිබෙන්නේ, ලෝක බලවතුන් හැසිරෙන්නේ එක විධියකට කියන එකයි. ඒ නිසා ඊට ගැළපෙන විධියට තමයි අපට කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දේශගුණික විපර්යාස පිළිබඳ මාතෘකාව මේ ගරු සභාවේදී මතක් කළේ මේ නිසායි. අද අපට තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි පොහොර භාවිතය. අපේ රජය කාබනික පොහොර සම්බන්ධයෙන් තීන්දුවක් ගත් බව ඇත්ත. ඒ පිළිබඳව යම් ගැටලුසහගත තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මම නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කය. එහි සියයට 80ක් පමණ ගොවිතැන්බත් කරන ජනතාවක් සිටිනවා. කාබනික පොහොර භාවිතය අද අපේ බඩඉරිඟු වගාවට බරපතළ විධියට බලපාලා තිබෙනවා. පසුගිය දශක තුන හතරක කාල සීමාව තුළ රසායනික පොහොර භාවිතය නිසා ඇති වූ මෙම දැවැන්ත ඛේදවාචකයට විසඳුමක් විධියට රජය - ජනාධිපතිතුමා - තීන්දු කරන්න ඇති, රසායනික පොහොර භාවිතය, යූරියා මඟින් ලබා දෙන නයිට්‍රජන් භාවිතය සීමා කරන්න ඕනෑ කියලා. හැබැයි එහෙම තීන්දු ගත්තත්, බිමේ තිබෙන තත්ත්වය ප්‍රායෝගිකව හුඟක් වෙනස් වෙලා තිබෙනවා. මම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයකු වුණත් මේ ඉල්ලීම කළ යුතු වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට තිබෙන දැඩි කම්පනය වාගේම, ඉදිරි කන්නයේදී මේ වගාවලට තිබෙන යම් අනතුරුදායක තත්ත්වයත්, අස්වැන්න පිළිබඳ තිබෙන ප්‍රශ්නයත් එක්ක මම විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. මේ පිළිබඳ කරුණු සමාලෝචනය කරලා, නැවත කල්පනා කර බලලා මේ ගොවි ජනතාවගේ ප්‍රශ්නයට සාධනීය පිළිතුරක් ලබා දෙන්න. වකුගඩු රෝග සහ අනෙකුත් රෝග පිළිබඳව යම් යම් විද්වතුන් කියන කරුණු කාරණා කෙරෙහි අපි ලොකු තර්කයකට යන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරණ කථාවක් තිබෙනවා, 'තැල්ල බදින්න බෙල්ල තිබෙන්න ඕනෑ' කියලා. බෙල්ල නැත්නම් තැල්ල බදින්න වෙන්නේ නැහැ. ඒ වාගේ වැඩක් තමයි මේ පොහොර භාවිතයේදී අපට සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කළ යුතු තව දෙයක් තිබෙනවා. සමඟි ජන බලවේගය ඊයේ-පෙරේදා ලොකු උද්ඝෝෂණයක් කළා. භාෂණයේ නිදහස පිළිබඳ තර්කයක් නැහැ. උද්ඝෝෂණ කරන්න ඕනෑ. හැබැයි ප්‍රශ්නයක් තිබෙනවා. මම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරන්න ඕනෑ, කොවිඩ් වසංගතය දැන් නැවතත් බුර බුරා එන තත්ත්වයක් තිබෙන බව. ඊයේ දවස වන විට ජර්මනියේ දවසකට කොරෝනා රෝගීන් 12,000ක් හඳුනාගෙන තිබෙනවා. ජර්මනියේ සියයට 68කට එන්නත්කරණය කරලා තිබෙනවා. මම හිතන විධියට දැන් හතරවෙනි රැල්ල බටහිරින් එළියට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ ඔබතුමන්ලාට අපි යෝජනා කරනවා, මේ උද්ඝෝෂණවලට විකල්ප ක්‍රමයක් සකස් කර ගන්න කියලා. මට මතකයි, අපි අවුරුදු 17ක් ආණ්ඩුවක් නැතිව විපක්ෂයේ සිටි වෙලාවේ, එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා -අපේ වත්මන් අගමැතිතුමා- යෝජනා කළා, එදා තිබුණු ආණ්ඩුවට විරුද්ධව පෙළපාළි යන්නේ නැතිව, ගමක් ගමක් ගානේ ගිහිල්ලා ගෙදර තිබෙන වළං, පිඟන්, හැඳි ටික, හිරමණය ගෙනැල්ලා නගරවල සද්ද කරලා ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කරමු කියලා. ඒකත් ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කිරීමක් තමයි. එවැනි යම් කිසි සාධනීය වැඩ පිළිවෙළකට යනවා මිසක්, මේ සෙනඟ කොළඹට ගෙනැල්ලා එකතු කරන වැඩේ කරන්න එපා. ඔබතුමන්ලාගේ උද්ඝෝෂණ ව්‍යාපාරවලට, ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට අපි අවහිර කරනවා නොවෙයි. නමුත් මේ වසංගතය නැවත අප වෙළා ගත්තොත්, ඒක බරපතළ අර්බුදයක් වෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ එක එක අන්වර්ථ නාම දැම්මා වාගේ ඊළඟ රැල්ලට කියයි, 'සමගි ජන බලවේගයේ සජිත් මහත්තයාගේ රැල්ල' කියලා. ඒ නිසා ඉදිරියේ දී තමුන්නාන්සේලා පවත්වන්න බලාපොරොත්තුවන විරෝධතා ව්‍යාපාර, මේ කොවිඩ් වසංගතයට ඔරොත්තු දෙන විධියේ වැඩ පිළිවෙළක් අනුව ඉතා බුද්ධිමත් විධියට පවත්වනවා නම් වටිනවා කියන කාරණය මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම පළාත් සභා ඡන්දය පවත්වා නැති නිසා මේ අවස්ථාවේ පළාත් සභා අක්‍රියයි. පළාත් සභා අක්‍රිය නිසා ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයන් විධියට ආණ්ඩුකාරවරුන් පත් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මට තප්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි දහයක් තිබුණා, එයින් එක් විනාඩියක් අඩු කර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයට මතක් කරන්න ඕනෑ, මහජන

[ගරු ජයරත්න හේරත් මහතා]

මන්ත්‍රීවරුන් විධියට අපට කථා කරන්න ලැබෙන අවස්ථාව අඩුයි කියන එක. කරුණාකර, 2022 අවුරුද්දේ වත් අපි ගැන මීට වඩා ටිකක් සැලකිල්ලෙන් කටයුතු කළොත් වඩාත් හොඳයි කියලා මම මතක් කරන්න කැමැතියි.

මේ ආණ්ඩුකාරවරුන්ගේ පාලනය යටතේ තිබෙන අපේ පළාත් සභා පරිපාලනයේ යම් යම් දුෂ්කරතා තිබෙන බව මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. පළාත් පාලන ආයතන පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ යම් යම් විගණන කරුණු අනාවරණ කරනවා. ඒ නිසා මේ පළාත් සභා සක්‍රිය කරන තෙක් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් හෝ ඊට වගකිවයුතු පිරිසක් යොදා, පළාත් රාජ්‍ය සේවය මීට වඩා විධිමත්ව සහ විනයානුකූලව පවත්වාගෙන යෑම සඳහා යම් නිසි ක්‍රමවේදයක් ආරම්භ කරනවා නම් වඩා හොඳයි කියා මම හිතනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කෙසේ කීවත් මේ අය වැය අපි ඉතා ඉහළ ඡන්ද ප්‍රමාණයකින් සම්මත කරනවා. එසේ සම්මත කරනවා පමණක් නොවෙයි, මේ දුෂ්කර අවස්ථාවේ මේ රට ගොඩනැඟීම සඳහා කළ හැකි සෑම අභ්‍යාසයක්ම කරලා, මේ රටේ ජනතාව මීට වඩා හොඳ ජීවන තත්ත්වයකට ඔසවා තබන්න අපි බොහොම වගකීමෙන් කටයුතු කරන බවත් මම මතක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.15]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா - கரையோரப் பாதுகாப்பு மற்றும் தாழ்நில அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva -State Minister of Coast Conservation and Low-Lying Lands Development)
ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ දෙවැනි අය වැය, එහෙම නැත්නම් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමන්ගේ පළමුවෙනි අය වැය, එහෙම නැත්නම් සමස්තයක් හැටියට අපේ රටේ 76 වැනි අය වැය මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ අපට අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම සන්තෝෂයට කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ඉදිරිපත් කළාට පසු විශේෂයෙන්ම අපේ විපක්ෂය විවේචන ඉදිරිපත් කරනවා, අපි දැක්කා. ඒ කිසිම විවේචනයක් සාධනීය තත්ත්වයේ නැහැයි කියන එක බොහොම කනගාටුවෙන් කියන්න ඕනෑ. සමහර අය කිව්වා, මේක ඉතියෝපියානු, සෝමාලියානු වර්ගයේ අය වැයක් කියලා. එසේ කියන පුද්ගලයන් දන්නේ නැහැ, අද ඉතියෝපියාවේ තිබෙන තත්ත්වය මොකක්ද කියලා. ඒ වාගේම සමහර අය කිව්වා, මේක ජනතාව අපේක්ෂා කළ කිසි දෙයක් නැති හිස් ලියවිල්ලක් කියලා. ඒ අය ඒ කාලයේ ජනතාවගේ අපේක්ෂා ඉෂ්ට කරපු හැටි අපි දන්නවා. ඊළඟට, ජනතාවට හීන් ආඩිය දමන අය වැයක් කියලා සමහර අය කිව්වා. ඇත්තටම අද රටේ යම් ආර්ථික අර්බුදයක් තිබෙන බව අපි පිළිගන්න ඕනෑ. එය සම්පූර්ණයෙන්ම මේ ආණ්ඩුවේ වැරදි කළමනාකරණය නිසා ඇති වුණු දෙයක් කියලා සමහර අය කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී මහින්ද රාජපක්ෂ මැතිතුමා යහ පාලන ආණ්ඩුවට මේ රට භාර දෙනකොට මේ රටේ ශක්තිමත් ආර්ථිකයක් තිබුණු බව අපි කියන්න ඕනෑ. ජාතික ආරක්ෂාව ශක්තිමත් තත්ත්වයක තිබුණා. හැබැයි, 2019දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගන්නකොට ඊට හාත්පසින් වෙනස් තත්ත්වයක් තමයි තිබුණේ. එදා දකුණු ආසියානු කලාපයේ වේගවත්ම ආර්ථිකය තිබුණේ අපට. හැබැයි, 2019දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට භාරගන්නකොට මේ රට ඇෆ්ගනිස්ථානයටත් වඩා පහළ තැනක තිබුණේ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. අද අපේ විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්, නායකයන් ලොකු ලොකු දේවල් ගැන කථා කළ හැටි අපි දැක්කා. හැබැයි, එදා සිද්ධ වුණු පාස්කු ප්‍රහාරය වළක්වා ගන්න ඒ උදවියට බැරි වුණා.

අපේ සමහර මන්ත්‍රීතුමන්ලා මේ සභාවේදී සංචාරක ව්‍යාපාරය පිළිබඳව කථා කළා. මම ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට කියන්න කැමැතියි, රත්ගම ආසනය තුළ තමයි හික්කඩුව සංචාරක පුරවරය තිබෙන්නේ කියලා. අපට මතකයි, එදා යුද්ධය කාලයේවත් අපේ රටේ සංචාරක ව්‍යාපාරය වැටිලා තිබුණේ නැති බව. එදා අපේ හික්කඩුව වෙරළ තීරයේ සංචාරක ව්‍යාපාරය ඉතාම ශක්තිමත් තැනක තිබුණා. හැබැයි, පාස්කු ප්‍රහාරයෙන් පසුව අපේ රටේ සංචාරක ව්‍යාපාරයේ මළගම ඇති වුණාය කියන කාරණය අපි කියන්න ඕනෑ. ඒ වාගේ පසුබිමක ඉඳගෙන තමයි අපට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන දෙවැනි අය වැය ගැන කථා කරන්න වෙන්නේ. අපි පිළිගන්න ඕනෑ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා ලෙස පත්වීමෙන් පසු රටේ ජාතික ආරක්ෂාව ශක්තිමත් කරන්න එතුමාට පුළුවන්කම ලැබුණු බව. ඒ වාගේම අපි නොහිතපු අවස්ථාවක තමයි කොවිඩ් වසංගතය ආවේ. අද සමහරු කියනවා, මේ ඇති වුණු ආර්ථික තත්ත්වය කොවිඩ්වලට ලඝු කරන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් කොවිඩ්-19 බලපෑම නිසා 2021 මැද භාගය වනකොට මුළු ලෝකයටම ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 3.5කට ආසන්න ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. ඒක අපටත් බලපෑවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, අපේ රට කිහිප වතාවක් වහන්න - lock down කිරීමට - අපට සිදු වුණු බව. අපි කිහිප වතාවක් පළාත් අතර සංචරණ සීමා පැනෙව්වා. රට වහපු ඒ හැම අවස්ථාවකම ජනතාවට සහන ලබා දෙන්න අපට සිද්ධ වුණා. අපේ ගුවන් තොටුපොළ වැහුවා. ඒ තත්ත්වය හේතුවෙන් සංචාරක ව්‍යාපාරය නිසා අපට අවුරුද්දකට ලැබෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 5කට ආසන්න මුදල අහිමි වුණා. ඒ වාගේම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙන්, ශ්‍රී ලංකා රේගුවෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු සියලු ආදායම් අපට අහිමි වුණා.

ඒ පැත්තෙන් ආදායම් අහිමි වෙනකොට අපට සිද්ධ වුණා, කොවිඩ් තත්ත්වය පාලනය කරන්න විශාල මුදල් ප්‍රමාණයක් වැය කරන්න. අපි ඇත්තටම අතිගරු ජනාධිපතිතුමා ගැන සන්තෝෂ වෙනවා. ඒ වාගේම අපි කනගාටු වෙනවා, අපේ විපක්ෂය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය පුදුම විධියට කුහක වීම තමයි ඒකට හේතුව. අද අතිගරු ජනාධිපතිතුමා නොහිටින්න, එන්නත් ලබා දීම සාර්ථකව නොකරන්න අපේ රට ඉතාම බේදනීය තැනකට පත් වෙනවා. විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සෞඛ්‍ය ක්ෂේත්‍රය මූලික වෙලා එන්නත් ලබා දීම හරහා කොවිඩ් තත්ත්වය මැඩලන්න කටයුතු කළේ නැත්නම් අපේ රට ඉතාම බේදනීය තැනකට පත් වෙනවා. අද අපේ විපක්ෂය ඒක අමතක කරමින් කථා කිරීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා වසංගතය පැතිරෙන්න පෙර, අය වැයක් සකස් කරන්න සැලකිල්ලට ගන්න වුණේ සාර්ව ආර්ථික කළමනාකරණයට අදාළ කරුණු සහ ආදායම් වියදම් තුලනය කිරීමට අදාළ කරුණු පමණයි. නමුත්, කොරෝනා වසංගත තත්ත්වයත් එක්ක ඒ සියල්ල වෙනස් කළා. ඒ තත්ත්වය මහා බලවත්, ධනවත්, තාක්ෂණය ඉතා ඉහළ රටවලට වාගේම ඉතාම නොදියුණු දුප්පත් රටවලට වාගේම සංවර්ධනය වෙමින් පවතින රටවලටත් පොදු වුණා. අද කොරෝනා නිසා ආර්ථිකය කඩා වැටී සැපයුම් මාර්ග අවහිර වෙලා තිබෙනවා. මිනිස් සබඳතා දුරස් වෙලා රෝග බිය, මරණ බිය, අවිනිශ්චිතතාව සහ අනියත බව රජයන සමාජ වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මෙවර ඇය වැය ඉදිරිපත් කිරීමේදී සාම්ප්‍රදායික තත්ත්වයෙන් බැහැරව ජනතාවට ජීවය ලබා දිය හැකි තත්ත්වයක් ඇති කිරීමේ අභියෝගය මුදල් අමාත්‍යවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට තිබුණා. ඇත්තටම මේ තත්ත්වය මීට පෙර අය වැය ඉදිරිපත් කරපු කිසිම මුදල් ඇමතිවරයෙකුට නොතිබුණු අභියෝගයක්.

මේ කොරෝනා අභියෝගය හමුවේ තිබෙන ගැටලුවලට පිළිතුරු හොයන ගමන් එතුමාට සිදුවුණා, "සෞභාග්‍යයේ දැක්ම" යථාර්ථයක් බවට පත් කරන්න. මොකද, සෞභාග්‍යයේ දැක්ම මේ රටේ ජනතාව අතිවිශාල බහුතරයකින් සම්මත කර තිබුණු එකක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට විශ්වාසයෙන් කියන්න පුළුවන්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ රටේ මුදල් අමාත්‍යවරයා හැටියට මේ සම්බන්ධයෙන් එතුමාගේ දැඩි අවධානය යොමු කර විශේෂ කාරණා 4ක් මත මේ අය වැය ඉදිරිපත් කර තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන් පළමු කාරණය හැටියට මම දකින්නේ නිෂ්පාදන වැඩ පිළිවෙළක් තිබෙන ග්‍රාමීය ආර්ථිකය නැංවීමට අවශ්‍ය පියවර ගෙන තිබීමයි. විශේෂයෙන්ම අපි කවුරුත් දන්නවා, අපට තිබෙන්නේ සේවා මත පදනම් වූ ආර්ථිකයක් බව. නමුත්, පසුගිය කොරෝනා තත්ත්වයත් එක්ක එය බරපතළ ලෙස හානියට ලක් වුණා. උදාහරණයක් හැටියට මම ඉස්සෙල්ලා කියපු අපේ සංචාරක ව්‍යාපාරය පෙන්වන්න පුළුවන්. නමුත්, අපට යන්තම් හරි ශක්තිමත්ව ඉන්න පුළුවන් වුණේ අපේ ග්‍රාමීය කෘෂි කර්මාන්තය ශක්තිමත්ව තිබුණු නිසා සහ ඊට බද්ධව අපේ ආහාර නිෂ්පාදනයත්, අපනයන කර්මාන්තත් ගොඩනැඟී තිබුණු නිසායි.

මෙවර අය වැයෙන් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න වැඩි ඉඩ කඩක් ලබාදී තිබෙනවා. හැම ග්‍රාම නිලධාරි වසමකටම රුපියල් ලක්ෂ 30ක් වෙන් කර තිබෙනවා. අපේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ හැම වසමකටම රුපියල් ලක්ෂ 30 බැගින් වෙන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ රටේ පළාත් පාලන කොට්ඨාස 4,917ක් තිබෙනවා. එක් කොට්ඨාසයකට රුපියල් ලක්ෂ 40ක් වෙන් කර තිබෙනවා. මෙවර අය වැයේ මේ විධියේ කරුණු කාරණා බොහොමයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා අපට පෙනෙනවා, මේ මුදල් වෙන් කර දී තිබෙන්නේ අපේ දේශපාලන හෙංචයියන්ට, එහෙම නැත්නම් ආණ්ඩුවේ දේශපාලන හිතවතුන්ට කොමිස් ගන්න කියලා. අපි පැහැදිලිව කියනවා, පසුගිය යහ පාලන ආණ්ඩුව කරපු වැඩ අපි කරන්නේ නැහැ කියන කාරණය. ඒක තමයි ඇත්ත කාරණය. අද අපේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන විමධ්‍යගත මුදල වැඩි කර ඒ හරහා ග්‍රාමීය ආර්ථිකය විශාල වශයෙන් ශක්තිමත් කරන්න අවශ්‍ය කටයුතු යොදා තිබෙනවා.

ඒ වාගේම, කාබනික පොහොර මත පදනම් වූ කෘෂි ආර්ථිකය ශක්තිමත් කරන්නත් ලොකු වැඩ පිළිවෙළක් නිර්මාණය කර තිබෙනවා. කොහොම වුණත් ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම අද විවිධ අභියෝග මධ්‍යයේ අපේ රටේ කාබනික කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්න වෙර දරන අපේ කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට, ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා ඇතුළු සියලුදෙනාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මෙයයි. අද අපි ආණ්ඩුවක් හැටියට අධ්‍යාපනය ශක්තිමත් කරන්න අතිවිශාල මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. රටක සංවර්ධනයේ ඉදිරි ගමන තීන්දු කරන ප්‍රධාන සාධකය වෙන්නේ රටේ අධ්‍යාපනයයි. අපට මතකයි, එදා යහ පාලන ආණ්ඩුව බලයට පත් වෙනකොට විශ්වවිද්‍යාල ආචාර්යවරු එකතු කරගෙන කිව්වා, අපේ රටේ අධ්‍යාපනයට ජාතික ආදායමෙන් සියයට 6ක් වෙන් කරනවා කියලා. හැබැයි, ඒක පුස්සක් බවට පත් වුණා. ඒ පසුගිය කාලයේ ගුරු-විදුහල්පතිවරු එක්ක විපක්ෂයේ නායකයෝ ටික පාරට බැහැලා ලොකු-ලොකු සටන් පාඨ කිව්වා. හැබැයි, අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු මුදල් ඇමතිතුමා වාගේම අධ්‍යාපන ඇමතිතුමා මූලික වෙලා අවුරුදු 25ක් තිස්සේ නොවිසඳී තිබුණු ගුරු-විදුහල්පති වැටුප් විෂමතා නිරාකරණය කරන්න කටයුතු කර තිබීම ගැන අපි අද සන්තෝෂ වෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ වාගේම රජයක් හැටියට ඉතිහාසයේ පළමු වතාවට ජාතික ආදායමෙන් සියයට 7.5කට වැඩි මුදලක් අධ්‍යාපන කටයුතුවලට වෙන් කර තිබෙනවා. අද අපේ සමහර මන්ත්‍රීවරු කථා කරනවා, සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරන මුදල කපා හැරලා කියලා. ඇත්තටම අද ජනතාව තුළ ඉතාම හොඳ සෞඛ්‍ය මට්ටමක් තිබෙන නිසා සෞඛ්‍යය ක්ෂේත්‍රයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

තුන්වන කාරණය මෙයයි. රාජ්‍ය අංශය විධිමත් කර ඉලක්ක කරා මෙහෙයවන්නත් මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා.

ඊළඟ කාරණය, ව්‍යවසායකයන් ශක්තිමත් කරන්න කටයුතු කර තිබීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ව්‍යාපාර සංවර්ධනය කරලා පුළුවන් තරම් ශක්තිමත්ව ජනතාවට සහන ලබා දීමට අපි කටයුතු කරන බවත් කියන්න ඕනෑ.

අපි මෙවරත් විශාල සහන මල්ලක් දීලා තිබෙනවා. කරුණු කාරණා බොහොමයක් කියන්න තිබුණත්, මට ලැබී තිබෙන කාලය සීමිත නිසා අවසාන වශයෙන් මම මේ දේ කියන්න ඕනෑ. සමස්තයක් හැටියට බලනකොට මේ පවත්නා වසංගත තත්ත්වය හමුවේ ඇතිවී තිබෙන දුෂ්කරතා පිළිබඳව සංවේදී වෙමින්, නිෂ්පාදන ආර්ථිකයක් කරා රට යොමු කරමින්, ආර්ථික ඉලක්ක ජය ගැනීමට 2022 වර්ෂය සඳහා අය වැය යෝජනාවලිය ඉදිරිපත් කොට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා ඇතුළු රජයට නැවත වරක් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මේ සම්බන්ධයෙන් සාධනීය විවේචන ඉදිරිපත් කරන්න කියන ගෞරවනීය ඉල්ලීමත් විපක්ෂයෙන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 24ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.25]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය 12වැනි දා ඉදිරිපත් කළ වර්තමාන රජයේ අය වැය කථාව අපි අහගෙන හිටියා. ඒ කථාවේ තේමාව පාර්ලිමේන්තුවේදී නොකිව්වත්, ගරු මුදල් ඇමතිතුමාගේ හෘදය සාක්ෂියට අනුව ඒ අය වැය කථාවේ තේමාව, ''ජනතාවට දීමට නොව, ජනතාවගෙන් ගැනීමට'' යන්නයි. මොකද අපි දැක්කා, මුදල් ඇමතිතුමා ඒ මතය යම්කිසි ස්ථානවලදී ප්‍රකාශ කරනවා. අපි දන්නා විධියට අය වැයකින් සිදු වෙන්න ඕනෑ දර්ශනයක් එළිදැක්වීම නොවෙයි. අය වැය කථාවකදී අනිවාර්යයෙන්ම සංඛ්‍යාලේඛන අඩංගුව කියන,

[ගරු සරත් ෆොන්සේකා මහතා]

ඒ වාගේම එය ක්‍රියාත්මක කරන ජාතික ගනුදෙනුව සාධාරණීකරණය වෙන්න ඕනෑ. නමුත්, එදා කියවූ බොහෝ සංඛ්‍යා විසර්ජන පනතට අමතරව ලබා දෙන ඒවා විධියටයි කිව්වේ. ඊට අමතරව "මෙච්චර දෙනවා, මෙච්චර දෙනවා, මෙච්චර දෙනවා" කිව්වා. එම නිසා ඒ කියපු දේවල් ගැන අපට විශ්වාසයක් ඇති වුණේ නැහැ.

අය වැය කථාවක තිබිය යුතු අනෙක් ප්‍රධාන ලක්ෂණයක් තමයි, ඒ කථාව ගැන ජනතාවට විශ්වාසයක් ගොඩ නැඟීම. නමුත්, මේ අය වැය කථාවෙන් ජනතාව තුළ ඒ විශ්වාසය ඇති වෙලා නැහැ. ඊළඟට අපි දැක්කා, මුදල් ඇමතිතුමා ප්‍රධාන ප්‍රතිපත්ති කීපයක් කියාගෙන ගිය බව. මේ ප්‍රතිපත්තිවලින් කෙළින්ම මගේ හිතට වැදුණු එක තමයි, එතුමා ආහාර සුරක්ෂිතතාව ගැන කථා කරපු එක. මේ වෙලාවේ නම් ආහාර සුරක්ෂිතතාව මේ රටේ සියලුදෙනා උපරිමයෙන් භුක්ති විඳිනවා. ඒකේ තත්ත්වය ජනතාවගෙන් අහලා බලන්න ඕනෑ. අතීතයේ ඉඳලා ලංකාවේ කියන පොඩි කථාවක් තිබෙනවා, "අපි කන හැටි ළිපා දනී" කියලා. ඒ කියන්නේ, කන්න බොන්න නැහැ; හට්ටි මුට්ටි හිස්; කුස්සියේ කෑම බීම නැහැ කියන එකයි. මේ දවස්වල ආහාර සුරක්ෂිතතාව ගැන කථා කරනකොට මම කියන්න ඕනෑ, මාසයකට ඉස්සෙල්ලා රුපියල් 500කට තිබුණු කුකුළු මස් කිලෝග්‍රෑම් එක, අද වන විට රුපියල් 700 දක්වා වැඩි වෙලා තිබෙන බව. ව්‍යාපාරික මහත්මයෙක් කියනවා මම අහගෙන හිටියා, තව මාසයක් යනකොට කුකුළු මස් කිලෝග්‍රෑම් එකක් රුපියල් 3,000කට ආසන්න මිලකට යයි කියලා. ඒ නිසා තමුන්නාන්සේලාට දැන්ම ඉඳන් කුකුළු මස් නොකා පතෝල කන්න පුරුදු වෙන්න වෙනවා. ඒ වාගේම රුපියල් 120ට තිබුණු අර්තාපල් කිලෝග්‍රෑම් එක මේ වන විට රුපියල් 320යි. අපේ රටේ ආහාර සුරක්ෂිතතාව සිද්ධ වෙන ආකාරය අපට මේ දේවල්වලින් පේනවා.

ඊළඟට, මුදල් ඇමතිතුමා හීන මාලාවක් ගැන කථා කළා. මුදල් ඇමතිතුමායි, මමයි එක පන්තියේ එකට හිටියේ. එතුමා මට වඩා මාස 3කින් බාලයි. එතුමාට හොඳ සෞඛ්‍ය තත්ත්වයක් තිබෙනවා කියලා මම දන්නවා. හැබැයි, එවැනි හොඳ සෞඛ්‍ය තත්ත්වයක් තිබියදීත් එදා එතුමා අය වැය කථාව ටිකක් වෙලා කරගෙන යන විට හීන පේන්න අරගෙනද මම දන්නේ නැහැ, එතුමාට වාඩි වෙන්න හිතුණා. ඒ හීනවලින් ප්‍රධාන එකක් තමයි, මේ රටේ ඇඟලුම් කර්මාන්තයට ඕනෑ fabrics අපේ රටේම නිෂ්පාදනය කරනවා කියපු එක. තමුන්නාන්සේලා ඔක්කෝම අද-හෙට ඉඳලා මේ රටේ කපු වවන්න පටන් ගන්න. මොකද, දැන් මේ fabrics ඔක්කෝම ලංකාවේ නිෂ්පාදනය කරන්න පටන් ගන්න යනවා. කපු වැවිල්ල කෙසේ වෙතත්, කපු වැවිල්ල පිටින් දාලා වියළි කලාපයේ තිබෙන ළඳු කැලෑ ටිකටත් තට්ටුවෙන ක්‍රියා මාර්ගයක් තමයි සිද්ධ වෙන්න යන්නේ. ඊළඟට එතුමාගේ තවත් සිහිනයක් තමයි, රබර් නිෂ්පාදනය වැඩි කරනවා කියන එක. අපට ඇහුණා, පසුගිය දවස්වල වාරිමාර්ග ඇමතිතුමාත් කියනවා, සිංහරාජ වනාන්තරයේ කොටස් කපා රබර් වවනවා කියලා. මට පේන විධියට ඒකට තමයි මේ හොරගල් අහුලන්නේ. ක්‍රමානුකූලව ඒවා වටින් වටින් ගේනවා, අවශ්‍ය තැනට යොමු කරන්න. ඒ වාගේම අපි මුදල් ඇමතිතුමාගෙන් අහන්න ඕනෑ, කාබනික පොහොර දාලා ද රබර් නිෂ්පාදනය වැඩි කරන්නේ කියලා. මොකද, මේ දවස්වල හැම නිෂ්පාදනයක්ම හොඳට කිරියෙන් පැණියෙන් උතුරන කාලයක් තිබෙන්නේ.

ඊට පසු එතුමා කිව්වා, සංචාරකයන්ට ලංකාව ගමනාන්තය කරනවා කියලා. අපි දන්නවා, අද මේ රටේ සංචාරක ක්ෂේත්‍රය කොහොමද තිබෙන්නේ කියලා. අපට තිබෙන මුහුදු වෙරළ නැත්නම් සංචාරකයන්ට දෙන්න අපේ රටේ කිසිම දෙයක් නැහැ.

සංචාරකයන් විධියට අපේ රටට එන්නේ ලෝකයේ අනෙක් රටවලට යන්න බැරි හිඟන්නෝ විතරයි. පාර අයිනේ ඉඳගෙන ප්ලේන්ටියක් බීලා, වඩේ එකක් කාලා යන අය අපේ රටට එන්නේ. චීනයෙන් එන සංචාරකයන්ගෙන් සියයට 80ක් යනවා, මාලදිවයිනට. හිඟන්නෝ සියයට 20ක් මෙහාට එනවා. පව් කියලත් මට හිතෙනවා. සංචාරක ක්ෂේත්‍රයේ ගමනාන්තය බවට අපේ රට පත් කළොත්, අනේ පව්, මාලදිවයින එහෙම කඩාගෙන වැටෙන්න ඉඩ තියෙනවා! මාලදිවයිනේ සියලුදෙනාම ලංකාවට එන්න පටන්න ගනීවි.

එතුමා කිව්වා, කෘෂි නිෂ්පාදන අපනයනය කරනවා කියලා. ඒක නම් මේ කාලයේත් හොඳට සිද්ධ වෙනවා. මේ කාලයේ අපි දකිනවා, ගොවි මහත්වරු පාර දිගේ කෘෂි නිෂ්පාදනය අපනයනය කරන හැටි. මේ කාලයේ අපේ රටේ ගොවි මහත්වරු පාර දිගේ උද්ඝෝෂණය කරමින්, පාර දිගේ පඹයෝ පුච්චා පුච්චා කෘෂි නිෂ්පාදනය අපනයනය කරනවා. ඊට පස්සේ අය වැයෙන් කියනවා, ගොවීන්ගේ අදහස් විමසලා කෘෂිකර්මය දියුණු කරනවා ලු; ගොවියාගෙන් අදහස් විමසලා කෘෂිකර්මය දියුණු කරනවා ලු. නමුත් මේ අය වැයෙන් පොහොර ප්‍රශ්නයට විසඳුමක් දීලා නැහැ. පොහොර ප්‍රශ්නයට විසඳුමක් දෙන්නේ නැතුව ගොවීන්ගෙන් අදහස් විමසන්න ගියොත් මේ අයට ගොවියෙකුන් හොඳ උදලු පාරක් තමයි කන්න වෙන්නේ. ගොවියෝ මේ කාලයේ දිගට හරහට පඹයෝ පුච්චනවා. පඹයාටත් උදැල්ලෙන් කොටනවා; මුහුණට ගහනවා. මේ කාලයේ ඉතා ජනප්‍රිය වෙලා තිබෙනවා පඹයෝ පුච්චන එකයි, පඹයන්ට ගහන එකයි. ඒවා ඔක්කෝම තමුන්නාන්සේලාට ගොවීන්ගෙන් ලැබෙන ආශිර්වාද තමයි.

මේ වේලාවේ අපේ රටේ ඩොලර් ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ ඩොලර් ප්‍රශ්නයට මේ අය වැයෙන් පිළිතුරු ලැබෙනවා අපි දැක්කේ නැහැ. අපේ රටේ ඩොලර් ප්‍රශ්නයට මේ අවස්ථාවේ පිළිතුරක් හැටියට අපට විදේශ ණයක්වත් ගන්න බැරි වෙලා තිබෙනවා. Moody's ශ්‍රේණිගත කිරීම්වලට අනුව අපේ රට පල්ලෙහාටම වැටිලා තිබෙනවා. මොකද, අපේ රටේ විදේශ ණය බර වැඩියි. ඒක හන්දා ශ්‍රේණිගත කිරීම්වලින් අපි පල්ලෙහාට වැටිලා තිබෙනවා. ඒ පල්ලෙහාට වැටිලා තිබෙන නිසා අපට විදේශ රටවල් මේ වෙලාවේ ණය දෙන්නේ නැහැ. ණය දීම අනුමත කර ගන්න බැහැ. ලෝකයේ කිසිම අංශයකින් ණයක් ගැනීම අමාරුයි ඒ ශ්‍රේණිගතවලින් පල්ලෙහාට වැටිලා හින්දා. ඒ ශ්‍රේණිගත කිරීම්වලින් පහළට වැටෙන්න ප්‍රධාන හේතුව වුණේ, අපි ලෝකයට ණය වෙලා තිබෙන නිසා අපට දරා ගන්න බැරි විධියට.

මම මේ කාරණයත් මතක් කරලා දෙන්න ඕනෑ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ රජය අවසන් වෙන කොට -2005 අග වෙන කොට- අපි ලෝකයට ණය වෙලා තිබුණා, බිලියන 2,225ක්. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය අවසන් වෙන කොට ඒක බිලියන 7,500ක් වුණා. ලෝකයට ණයයි. ඒ කාලයේ බිලියන 5,275කින් ණය වැඩි වුණා. ඊට පස්සේ අපේ රජය අවසන් වෙන කොට බිලියන 13,000ක් දක්වා ණය වෙලා හිටියා. හැබැයි, ඒ බිලියන 13,000න් සියයට 70ක්ම අපි වියදම් කරලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ රජය සමයේ ගත්තු ණයවල පොලිය ගෙවන්න. ඒ ණයවල පොලිය ගෙවන්න තමයි අපේ සමයේ වැඩි වෙච්ච ඒ ඩොලර් බිලියන 5,500න් සියයට 70ක්ම අපි වියදම් කරලා තිබෙන්නේ.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, අපි යුද්ධ කාලයේ සියලු අවිආයුධ ගත්තේ චීනයෙන් ණයට. චීනයෙන් ණයට අවිආයුධ ගත්තාම ඒවාට ගෙවීම් ආරම්භ කළේ 2012 වර්ෂයේ. 2012 වසරේ ගෙවීම් ආරම්භ කරලා ඒ ණය උපරිම ගෙවන්න තිබුණේ 2018 සහ 2019 වසරවල. එතකොට ඒ ගෙවීම් සිද්ධ කළේ අපි ණයට ගත්තු මුදල්වලින් තමයි. අපි ණය ගත්තාට,

ඒකෙන් විශාල කොටසක් වෙන් කරලා තිබෙනවා, වියදම් කරලා තිබෙනවා තමුන්නාන්සේලාගේ කාලයේ ගත්තු ණය ගෙවන්න. වර්තමාන රජයේ ගරු ජනාධිපතිතුමා බලයට පැමිණියාට පසු ඩොලර් බිලියන 3,750ක් මේ වෙන කොට ණයට අරගෙන තිබෙනවා. මට පෙනෙන විධියට ජනාධිපතිතුමාගේ සහ තමුන්නාන්සේලාගේ රජයේ ඉතිරි අවුරුදු තුන, හතර ඇතුළත ඩොලර් බිලියන දහදාහක්වත් ණයට ගනියි. එතකොට මේ ණය උගුලේ අපි එන්න එන්නම හිර වෙනවා. රටේ ජනතාව තමයි මේවාට වන්දි ගෙවන්නේ. මේ රටේ ජනතාවගේ දරු පරම්පරා ගණනාවක් දැනටම ලෝකයට ණයකාරයන් වෙලා ඉවරයි.

මේ අතරේත් එක එක සෙල්ලම් යනවා; එක එක ගේම් යනවා. වතුවල ජීවත් වෙන ජනතාවට මේ අය වැයෙන් ආපසු ලණුවක් දුන්නා. ඒ අහිංසක මිනිස්සු හැම දාම රැවට්ටුවා. මොනවා වුණත් ඒ මිනිස්සු විශාල සේවයක් කරනවා මේ රටට. තේ දළු නෙළීම සිංහල ජනතාව අතර එච්චර ජනප්‍රිය නැහැ. ඒ ද්‍රවිඩ ජනතාව ඒ සේවය කරනවා. ඒ ගොල්ලන්ට ගෙවල් හදන්න කියලා මුදල් ඇමතිතුමා වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 500ක්. මේ වෙන කොට වතු ජනතාවගේ නිවාස අවශ්‍යතාව නිවාස ලක්ෂයක්. නිවාස ලක්ෂයක් හදන්න රුපියල් මිලියන 500ක් වෙන් කළාම, එක ගෙයක් හදන්න වෙන් වෙන්නේ රුපියල් 5,000යි.

ඒ තිබෙන ගෙදර කක්කුස්සියවත් හදා ගන්න හම්බ වෙන්නේ නැහැ. ගෙයකට වෙන් වෙන්නේ රුපියල් 5,000යි. ඇත්ත තත්ත්වය අනුව, ගෙයක් හදන්න මිලියන එකහමාරක මුදලක් අවශ්‍ය වනවා. එක ගෙයකට. නමුත්, ඔබතුමන්ලා එක ගෙයකට රුපියල් 5,000 ගණනේ ගෙවල් ලක්ෂය හදන්න රුපියල් මිලියන 500ක් වෙන් කරනවා. මේක තමයි වර්තමාන රජය ගෙන යන බොරුව. රජය බොරුවෙන්ම අය වැය ගෙනි යනවා; බොරුවෙන් ජීවත් වනවා. මෙතැනදීත් ජනතාව රවට්ටන්න බොරු ප්‍රකාශ කරගෙන යනවා.

ඊළඟට අපි තව දෙයක් දැක්කා. තමුන්නාන්සේලාට සල්ලි නැහැ කියනවා. ඒ නිසා ජනතාවට කන්න බොන්න දෙන්න බැහැ; ජනතාවගේ අවශ්‍යතා සපුරන්න බැහැ. හැබැයි, තමුන්නාන්සේලා මේ වෙලාවේ මුදල් වෙන් කරනවා, පළාත් පාලන ආයතන සහ පළාත් සභා මඟ හැරලා, ප්‍රාදේශීය ලේකම්ලාගේ යන්ත්‍රණයත් මඟ හැරලා, ගම් දියුණු කරන්න -ග්‍රාමීය මට්ටමේ සංවර්ධනයට- කියලා කෝටි 10,000ක්. මේකෙන් තමුන්නාන්සේලා අනිවාර්යයෙන්ම සූදානම් වෙන්නේ මොකටද? මේකේ ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාවට ලැබෙන්නේ නැහැ. ඒක මට සක්සුදක්සේ පැහැදිලියි. මේකේ ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාවට ලබා දෙනවා වෙනුවට, මේ රජය ගම් මට්ටමේ හෙංචයියලාටත් පුරුදු කරලා තිබෙන්නේ පගා ගහන්න, අල්ලස් ගන්න, අරක්කු බෝතලය හරි නිකම් ගන්න. කුකුළු මස් කෑල්ල, පාන් ගෙඩිය නිකම් ගන්න. ඒ ගොල්ලන්ට ජාවාරම් කර ගන්න මාර්ගයක් මෙතැනින් කපනවා කියලා, අපට පැහැදිලියි.

ඊළඟට, රජයේ මුළු ආදායම බිලියන 2,284යි. ඒකෙන් බිලියන 900ක් වෙන් කරලා තිබෙන්නේ ප්‍රාග්ධන වියදම්වලට. ඒ බිලියන 900න් සියයට 50ක් වෙන් කරලා තිබෙන්නේ ප්‍රධාන ඉදිකිරීම්වලට. ඒ කියන්නේ, බිලියන 450ක් ප්‍රධාන ඉදිකිරීම්වලට. ඒකෙන් සියයට 40ක්ම තිබෙන්නේ මාර්ග සංවර්ධනයට; බිලියන 180ක් මාර්ග සංවර්ධනයට. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා මේ වෙලාවේ මෙතැන හිටියා නම් කනෙනුයි, කටෙනුයි, ඇස්වලිනුයි ඔක්කොගෙන්ම හිනා වෙයි මම මේක කියනකොට. මාර්ග සංවර්ධන ඇමතිට දෙයියන්ගේ පිහිටයි. එතුමාට මඟුල් මේ කාලේ. බිලියන 180ක මාර්ග සංවර්ධනයක් කරනවා, ජනතාව කන්න, බොන්න නැතුව ජීවත් වන මේ කාලයේ.

මම අහගෙන හිටියා, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, අපි බංකොලොත් රටක් ඒ ගොල්ලන්ට භාර දුන්නා ලු. ඒකට උත්තර මා ළඟ තිබෙනවා. 2015 අපි මේ රට භාර ගන්නකොට, රටේ රාජ්‍ය ආදායම තිබුණේ වර්ෂයකට කෝටි 125,000යි. අපි නැවත භාර දෙනකොට රාජ්‍ය ආදායම වර්ෂයකට කෝටි ලක්ෂ දෙකයි. ඒ ගරු මන්ත්‍රීතුමා ඉන්නවාද දන්නේ නැහැ කොහේ හෝ ඉඳගෙන. අපි බංකොලොත් රටක් භාර දුන්නේ නැහැ. 2021 වර්ෂයේ මේ වනකොට ඔබතුමන්ලා රාජ්‍ය ආදායම බස්සලා තිබෙනවා, කෝටි 156,000කට. කෝටි ලක්ෂ 2ක් රාජ්‍ය ආදායම ඇතිව භාර දුන් රටේ අවුරුද්දක් ඇතුළත රාජ්‍ය ආදායම කෝටි 156,000කට බැහැලා තිබෙනවා. මේකෙන් පෙනෙනවා, තමුන්නාන්සේලා කටයුතු කර තිබෙන විධිය. තමුන්නාන්සේලා ජාවාරම්කාරයන්ට වාසි ලබා දෙන්න, ජාවාරම්කාරයෝ ගොඩනඟන්න බදු අඩු කළා. ඒවා හරහා තමුන්නාන්සේලා රාජ්‍ය ආදායම නැති කරගෙන තිබෙනවා. අද රාජ්‍ය ආදායම කඩා වැටිලා තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල තමයි මේ වනකොට ලැබෙන්නේ. ඒවා බලපාන්නේ තමුන්නාන්සේලාට නොවෙයි. තමුන්නාන්සේලා සැපසේ ජීවත් වනවා. රටේ ජනතාව ඒවායේ ප්‍රතිඵල භුක්ති විඳිනවා. ඒක තමයි වර්තමාන තත්ත්වය.

ඊළඟට තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිතුමා කියාගෙන, කියාගෙන ගියා දෙන සහන ගැන. පෞද්ගලික බස් රථ හිමියන්ට, ත්‍රිරෝද රථ හිමියන්ට ආධාර කරනවා කිව්වා. අපි ඒ යෝජනාව බැලුවාම, ත්‍රිරෝද රථ හිමියෙකුට හම්බ වෙන්නේ රුපියල් 800ක් පමණ මුදලක්. පාසල් වෑන් රථවලටත් ඒ වාගේ සොච්චම් මුදලක් හම්බ වෙනවා. මේවා ඇස්බැන්දුම් විතරයි. මේවායින් ජනතාවගේ ජීවිතවලට හයියක් හම්බ වෙන්නේ නැහැ. මේ අය වැයෙන් ආපණශාලා හිමියන්ට සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන්ටත් සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවල නිරත අයටත් කිසිම සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ.

ඊළඟට, "අපේ රට ආසියාවේ නාවික කේන්ද්‍රය කරනවා" කිව්වා. ඒක ඇහුණාම මට මතක් වුණා ඒ කාලයේ අපි ආරක්ෂක කවුන්සලයේ ඉන්නකොට තමුන්නාන්සේලාගේ ගරු අගමැතිතුමා කියපු දෙයක්. එතුමා කියනවා, "සරත් මම Navy එකේ බෝට්ටුවක නැඟලා මුහුදට ගියා. මුහුදේ නැව් යනවා නේ සරත් ගාලු පාරේ බස් යනවා වාගේ" කියලා. එහෙම කියලා තමයි හම්බන්තොට වරාය හැදුවේ. ඒ වරාය අදටත් වේළී වේළී තිබෙනවා. නැවක් තියා ඒකට මාළු ඔරුවක්වත් එන්නේ නැහැ. දැන් කියනවා මුදල් ඇමති, අපේ රට ආසියාවේ නාවික කේන්ද්‍රය කරනවා ලු. නරක නැහැ නේද? එතකොට මේ රට වටේම නැව් හිරවෙලා, හිරවෙලා, හිරවෙලා අපේ රටේ මාළු අල්ලන්න ඔරුවකටවත් යන්න බැරි වනවා.

අපේ රට නාවික කේන්ද්‍රය වෙනවා ලු. ඊළඟට කියනවා, අපේ රට ඉන්දියාවේ ගුවන් ගමන් කේන්ද්‍රය කරනවා ලු. ඒ කියන්නේ ඉන්දියාවේ තිබෙන ඔක්කොම ගුවන් තොටුපොළ වහනවා ඇති. මා හිතන විධියට ඉන්දියාවේ ගුවන් තොටුපොළ ලක්ෂ ගණනක් තිබෙනවා. අපි මෙතැන එකක් තියාගෙන -මත්තල වේළී වේළී එකක් තිබෙනවා.- අපේ රට ඉන්දියාවේ ගුවන් කේන්ද්‍රස්ථානය කරන්න හදනවා. "මේව අහලා පණ යනකල් මටම හිනා..." කියලා ෆ්‍රෙඩී සිල්වා මහත්මයාගේ සින්දුවක් තිබෙනවා නේද? මේවා ඇහෙනකොට මට ඒ සින්දුව මතක් වෙනවා. තමුන්නාන්සේලා පොඩ්ඩක් කිති කවාගෙන හිනාවෙලාවත් ඇඟට පොඩි ජවයක් ගන්න.

ඊළඟට කියා තිබෙනවා, ග්‍රාමීය මට්ටමේ සුපිරි වෙළෙඳ සැල් ස්ථාපිත කිරීම සඳහා රුපියල් කෝටි සියයක් වෙන් කරනවාය කියලා. නරක නැහැ නේද? මේ කාලයේ ග්‍රාමීය මට්ටමේ සමුපකාර කඩයක්වත් නැහැ. සුපිරි වෙළෙඳ සැල් ස්ථාපිත කිරීම සඳහා රුපියල් කෝටි සියයක් වෙන් කරනවාය කියලා තිබෙනවා. මේ කාලයේ මේ රට පුරා තිබෙන සුපිරි වෙළෙඳ සැල්වලත් කන බොන දේවල් නැහැ; බඩු භාණ්ඩ නැහැ; සීනි කිලෝ එකක් ගත්තේ නැත්නම් වෙන දෙයක් ගන්න බැහැ. ඒ වාගේ තත්ත්වයක්

[ගරු සරත් ෆොන්සේකා මහතා]

තිබෙද්දී තමුන්නාන්සේලා හීන ලෝකයක ජීවත් වෙනවා. ගම්වලටත් සුපිරි වෙළෙඳ සැල් ගෙන යන්න හදනවා.

ඊළඟට අපි දැක්කා, පසුගිය දවස්වල අපේ ගරු මුදල් ඇමතිතුමා රාජ්‍ය සේවය ගැන ඉතාම කැත විධියට කථා කළ හැටි. තමුන්නාන්සේට මම මතක් කරලා දෙන්න ඕනෑ, මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අඩු ගණනේ සියයට අනූවකගේවත් දෙමව්පියන් රාජ්‍ය සේවයේ හිටපු අය. මේ රටේ අද වනකොට ඉන්න ඉංජිනේරුවරුන්, දොස්තරවරුන්, නීතිඥවරුන්ගෙන් සියයට 90කගේ දෙමව්පියන් රාජ්‍ය සේවයේ හිටපු අය. ඒ නිසා රාජ්‍ය සේවයට අපහාස කරන්න එපා. රාජ්‍ය සේවයට අපි පොරොන්දුවක් දෙනවා, අපේ රජයක් ආවාම අපි අනිවාර්යයෙන් රාජ්‍ය සේවය තවත් ශක්තිමත් කරනවා කියලා. අපි රජයේ සේවයේ ඉඳලා තිබෙනවා. මමත් අවුරුදු 40ක් රාජ්‍ය සේවයේ ඉඳලා තිබෙනවා. මගේ දෙමව්පියන් රාජ්‍ය සේවයේ හිටියේ. ඒ ගොල්ලන් දරුවෝ පස්දෙනෙක් හැදුවා. අපි රාජ්‍ය සේවය ගරා වැටෙන්න ඉඩ දෙන්නේ නැහැ. රාජ්‍ය සේවකයාට අවනම්බු කරන්න, ඔවුන් හැල්ලුවට ලක් කරන්න කවදාවත් අපි ඉඩ තියන්නේ නැහැ.

ඊළඟට තමුන්නාන්සේලා කියා තිබෙනවා, රාජ්‍ය ව්‍යවසායකයන් රජයට බරක් ලු. රාජ්‍ය ව්‍යවසායකයන් රජයට බරක් කියලා මේ හදන්නේ ඒ ආයතන ටික විකුණලා දමන්න. ඒ ටික විදේශිකයන්ට, ජාවාරම්කරුවන්ට විකුණලා දමන්නයි හදන්නේ. අපේ ලාභ ලබන ආයතන සියල්ලම විකුණලා විනාශ කරන්න තමුන්නාන්සේලා හොර ගල් අහුලනවා.

ඊළඟට, අධ්‍යාපනය. අධ්‍යාපනයට ඉතාම සොච්චම් මුදලක් තමයි වැඩි කරලා තිබෙන්නේ. දහම් පාසල්, පිරිවෙන්, භික්ෂු අධ්‍යාපනය සඳහා රුපියල් මිලියන 90ක් වැඩි කරලා තිබෙනවා. පර්යේෂණ සහ නව නිපැයුම් සඳහා වෙන් කළ මුදලින් රුපියල් මිලියන 140ක් කපලා තිබෙනවා. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපනයට රුපියල් මිලියන 300ක් වැඩි කරලා තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල සඳහා වෙන් කළ මුදලින් රුපියල් මිලියන 700ක් කපලා තිබෙනවා. ඊළඟට, කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල්, පාසල් යටිතල පහසුකම් සඳහා වෙන් කළ මුදලින් රුපියල් මිලියන 500ක් කපලා තිබෙනවා. විශ්වවිද්‍යාල සඳහා රුපියල් මිලියන 1,300ක් වැඩි කරලා තිබෙනවා. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදලින් රුපියල් මිලියන 200ක් කපලා තිබෙනවා. අන්තිමට ඇත්තටම අධ්‍යාපනයට වැඩි කරලා තිබෙන්නේ කොච්චරද බලන්න. අවුරුද්දෙන් අවුරුද්දට අධ්‍යාපනයට කොච්චර වැඩි කරන්න ඕනෑද? අන්තිමට වැඩි වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 150යි. නමුත් තමුන්නාන්සේලා මේවා ලොකුවට පුම්බලා පෙන්වනවා.

ඊළඟට, සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් ඒ කණ කොකාමයි අඬලා තිබෙන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ රුපියල් මිලියන 6,000ක් අඩු කරලා තිබෙනවා. ඊළඟට, ඖෂධ නිෂ්පාදන හා සැපයීම්වලින් රුපියල් මිලියන 60,000ක් අඩු කරලා තිබෙනවා. තමුන්නාන්සේලා මේක හොඳට අහ ගන්න. දේශීය වෛද්‍යකමෙන් රුපියල් මිලියන 600ක් අඩු කරලා තිබෙනවා. ප්‍රාථමික සෞඛ්‍ය, වසංගත රෝග මර්දන කටයුතු වෙනුවෙන් මුදලක් තිබෙනවා. කොවිඩ් නිසා ඒකට රුපියල් මිලියන 450ක් වැඩි කරලා තිබෙනවා. ඊළඟට, ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටමට දියුණු කිරීම, රුපියල් මිලියන 600ක් අඩු කරලා තිබෙනවා. ඊළඟට, සෑම දිස්ත්‍රික්කයකම එක් රෝහලක් දියුණු කිරීම. එතැනදීත් රුපියල් මිලියන 1,500ක් අඩු කරලා තිබෙනවා. අන්තිමට සෞඛ්‍යය සඳහා රුපියල් මිලියන 450ක් වැඩි කරලා, රුපියල් මිලියන 68,700ක් අඩු කරලා තිබෙනවා. ඒකෙන් බහුතරයක් -වැඩිම ප්‍රමාණයක්- අඩු කරලා තිබෙන්නේ, බෙහෙත් නොමිලේ ලබා දීම සඳහා වෙන් කළ මුදලෙන්. රජයේ රෝහල්වල බෙහෙත් නොමිලේ ලබා දීම සඳහා වෙන් කරන මුදලෙන් තමයි රුපියල් මිලියන 68,700ක් අඩු කරලා තිබෙන්නේ. තමුන්නාන්සේලා හදන්නේ මේ රටේ ජනතාව රෝගීන් කරලා මරලා දමන්න. තමුන්නාන්සේලාගේ මුදල් ඇමති නම් මෙතැනදී කිව්වා, තවත් රුපියල් බිලියන 5,000ක් දෙනවා කියලා. රුපියල් බිලියන 5,000ක් දීලා මොනවා කරන්නද? රුපියල් මිලියන 68,700ක් අඩු කරලා තිබෙනවා. තමුන්නාන්සේලා අද රටේ ජනතාවට කන්න දෙන්නේ නැහැ. රටේ ජනතාවට බෙහෙත් පෙත් දෙන්නේ නැහැ. මේ රටේ ජනතාවට මන්ද පෝෂණය හදලා, රෝගී කරලා මේ රට විනාශකාරී රටක් බවට පත් කරන්නයි හදන්නේ. අපි අහලා තිබෙනවා, අතීතයේ අර විනාශකාරී භීෂණ තිබුණු බව. ඒ තත්ත්වයට මේ රට ඇද දමන්නයි තමුන්නාන්සේලා හදන්නේ.

ඊළඟට, ගුරු-විදුහල්පති වැටුප් වැඩි කිරීම සඳහා අය වැයෙන් රුපියල් බිලියන 30ක් වෙන් කරනවා කිව්වා. නමුත් ඒ රුපියල් බිලියන 30 වෙන් කරන්නේ ආදායම් ලෙස ලැබෙන මුදල්වලින්. රජයේ ආදායම මේකේ පෙන්වලා තිබෙනවා.

අය වැයෙන් පෙන්වන විධියට ඓතිහාසිකව කවදාවත් මේ රටේ රජයේ ආදායම ලැබිලා නැහැ. එහෙම නම්, ගුරු-විදුහල්පති වැටුප් සඳහා රුපියල් බිලියන 30ක් වැඩි කරලා එකතු කර තිබෙන එක යථාර්ථයක් වෙනවාද, නැද්ද කියන එක ගැන අපට විශාල සැකයක් තිබෙනවා.

ඊට අමතරව මුදල් ඇමති ප්‍රකාශ කළා, මීට පස්සේ භාණ්ඩාගාරයට වරෙන්තු නිකුත් කරන්නේ කාර්තුවකට වරක්ය කියලා. ඒකෙන්ම තේරෙනවා, මේ ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක කරන්න ආදායම් මාර්ග තිබෙනවාද, ඒ තුළින් රජයට ආදායම් ලැබෙනවාද, නැද්ද කියන එක ගැන මුදල් ඇමතිතුමාට පෞද්ගලිකව විශ්වාසයක් නැහැයි කියලා.

ඊළඟට කියනවා, ග්‍රාමීය පාලම් 10,000ක් හදනවා ලු. අවුරුදු එකහමාරක් තුළ තවම හදලා තිබෙන්නේ පාලම් 200යි. ඉතුරු ටික හැදෙන කල් බලාගෙන ඉන්න. මේ ගොල්ලෝ අවුරුදු එකහමාරකට හදලා තිබෙන්නේ පාලම් 200යි. එතකොට ඉතුරු අවුරුදු තුනේදී පාලම් 9,800ක් හදනවා! මාර වැඩක් සිද්ධ වෙන්නේ. එතකොට මේ පාලම් ටික හදන එක ලෝක වාර්තාවක් වෙනවා.

ඊළඟට කියනවා, බන්ධනාගාර රැඳවියන්ගේ සනීපාරක්ෂක කටයුතු දියුණු කරනවා ලු. බන්ධනාගාරය භාරව හිටපු රාජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. අපරාදේ, එතුමා සිටියා නම් එතුමාට කියලා කට්ටිය දම්මලා වැසිකිළි වළවල් ටිකවත් කපාගන්න තිබුණා. මොකද, බන්ධනාගාරවල වැසිකිළිවල විශාල අඩුවක් තිබෙනවා. ඔළුවට පිස්තෝලේ අල්ලාගෙන වැසිකිළි වළවල් කප්පවාවි. එහෙම තමයි එතුමා කරන්නේ. එතුමා ආපසු ඒ ධුරයට පත් කරලා හෝ වැසිකිළි බිස්නස් එක එතුමාට භාර දෙන්න කියලා මා ගෞරවයෙන් යෝජනා කරනවා.

ඊළඟට, ලිට්‍රෝ ගෑස් සමාගමේ සභාපතිතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා අපි දැක්කා. එතුමා කියා තිබුණා, ගෑස් කොන්ත්‍රාත්තුව යම්කිසි සමාගමකට දෙන්න වර්තමාන රජයේ බලධාරීන් ප්‍රබල යෝජනා ඉදිරිපත් කරනවාය, ඒ හරහා රුපියල් බිලියන 10ක් රටට අහිමි වෙනවාය කියලා. මෙවැනි දේවල් තමුන්නාන්සේලා අත හරින්නේ නැහැ. ගැරිල්ල හොඳට සිද්ධ වෙනවා. එක එක දේවල් කිව්වාට කන්න බොන්න නැහැ. ගැරිල්ල නවත්වන්න එපා. ඒක එහෙමම ඉදිරියට කරගෙන යන්න. එතකොට අපට අපේ කාර්යය පහසු වෙනවා. තව අවුරුදු දෙක තුනකින් අපට අපේ යුතුකම් ඉෂ්ට කරන්න ඔය පැත්තේ වාඩි වෙන්න පුළුවන්.

තමුන්නාන්සේලාගේ අනික් මැති ඇමතිවරුන් කියපු දේවල් අපි දැක්කා. මීට කලින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා අස්වෙලා ගියා. එතුමාට වැඩ කරන්න බැරි නිසා ගියා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සභාපති කලකිරිලා යන්න ගියා. ඊළඟට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිතුමා කලකිරිලා යන්න ගියා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති කලකිරිලා යන්න ගියා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති යනකොට කිව්වා, රට සංවර්ධනය කරන්න තමුන්නාන්සේලාට විඥානයක් නැහැ, ඒ නිසා එතුමා අස්වෙලා යනවා කියලා. මේ තමයි වර්තමාන තත්ත්වය. තමුන්නාන්සේලා වැඩ කරන්නේ මෙහෙමයි. "කථාව දෝලාවෙන්, ගමන පයින්" නොවෙයි, දැන් තමුන්නාන්සේලාගේ ගමන පස්ස පැත්තෙන්. ඒ තත්ත්වයට පත්වෙලා පස්ස බිම ඇනිලායි තමුන්නාන්සේලා ඉන්නේ. ඉන්දියාවේ අගමැති ගරු මෝදි මැතිතුමා ගොවි උද්ඝෝෂණ මර්දනය කරන්න නීති ගෙනාවාය කියලා අද ප්‍රවෘත්තිවල තිබෙනවා අපි දැක්කා. ඒ ගෙනාපු නීති එතුමා දැන් හකුළාගෙන තිබෙනවා. එතුමා තේරුම් ගත්තා, එය ප්‍රජාතන්ත්‍ර විරෝධියි කියලා.

මේ දවස්වල තමුන්නාන්සේලා උද්ඝෝෂණවලට භයයි; විපක්ෂයට භයයි. ඒ නිසා ගැසට් නිවේදන නිකුත් කරමින් එක එක නීති ගෙනෙනවා. එහෙම කරලා තමුන්නාන්සේලාට අප නවත්වන්න බැහැ. තමුන්නාන්සේලා අපව මර්දනය කළත්, මේ සභාව තුළ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන් මර්දනය කළත්, තමුන්නාන්සේලාට රටේ ජනතාව මර්දනය කරන්න ලැබෙන්නේ නැහැ. ජනතාව හෙට අනිද්දාට තමුන්නාන්සේලාට හොඳ පාඩමක් කියලා දෙයි.

අය වැය පරතරය රුපියල් බිලියන 3,000යි. එහෙම තිබියදී, මුදල් ඇමතිතුමා මේ සභාවට හැම දෙයක්ම කියලා අන්තිමට කියනවා, තව රුපියල් මිලියන 5,000ක් දෙනවාය කියලා. ඒ කියන්නේ, රුපියල් බිලියන 5ක්. මේවා ප්‍රායෝගික නැහැ. මේ කියපු දේවල් එකක්වත් යථාර්ථයක් වෙන්නේ නැහැ. ඒ නිසා මේ අය වැය ගැන අපට කිසිම විශ්වාසයක් නැහැ. මේ අය වැය තුළින් රටට සේවයක් වෙනවාය කියා අපට කිසිම බලාපොරොත්තුවක් තබා ගන්න බැහැ.

මා හිතන හැටියට මට තව විනාඩියක පමණ කාලයක් තිබෙනවා. අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. ආණ්ඩුව පැත්තේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ දවස්වල කනස්සල්ලෙන් ඉන්නේ. එතුමාගේ බෙල්ල කඩාගෙන වැටිලා, බෙල්ල සාක්කුවේ. එසේ වුණත් එතුමා විපක්ෂයට කියනවා, නිර්මාණශීලී වෙන්න කියලා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ පැත්තේ ඉස්සර හිටපු එක් කෙනෙක් කියනවා, විපක්ෂයට නිර්මාණශීලී වෙන්න ලු. මා එතුමාට මේ කාරණය කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ නිර්මාණශීලීයි. තමුන්නාන්සේ නිර්මාණශීලී නිසා තමයි පාස්පෝර්ට් දෙකක් හදා ගත්තේ.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
තමුන්නාන්සේ වාඩි වෙන්න. හිතට අමාරුද? *[බාධා කිරීමක්]* වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* බයිලා කියන්නේ නැතුව වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* මේවා අහගන්න. *[බාධා කිරීමක්]* හිහන කථා කිව්ව අයට උත්තර දෙනකොට තමුන්නාන්සේට අමාරුද? *[බාධා කිරීමක්]* වාඩිවෙලා අහගන්න, නිකම් දොඩවන්නේ නැතුව. *[බාධා කිරීමක්]* එතුමාට උප්පැන්න සහතික දෙකක් තිබෙනවා. *[බාධා කිරීමක්]* එක උප්පැන්න සහතිකයක නෝනා වැඩිමහල්, අනික් උප්පැන්න සහතිකයේ මහත්තයා වැඩිමහල්. මෙතුමන්ලා කලබල වෙනවා, මේවා කියනකොට.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දේශපාලනය කරන අය කලබල වෙනවා. අද මා එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට තව සුළු වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජේවීපී එකේ කොල්ලෝ කට්ට කාලා කාලා ඔය පුද්ගලයා දේශපාලනයට ගෙනාවා. ඒකෙන් තමයි එතුමා චරිතයක් වුණේ. කලිසම අඳින්න ඉගෙන ගත්තේ ඒකෙන් තමයි. ජේවීපී එකේ කට්ට කාලා මෙතැනට ඇවිල්ලා, මෙතැන බඩගෝස්තරය දැක්කා; පගාව දැක්කා; අල්ලස දැක්කා, පැන්නා අනෙක් පැත්තට. ඒවා තමයි ඔහු කරපු නිර්මාණශීලී වැඩ. *[බාධා කිරීමක්]* කොහේද යන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඊට පසුව නිවාස හැදුවා. මධ්‍යම පන්තියට කියලා නිවාස හදලා නිවාස ටික බෙදලා දුන්නා. *[බාධා කිරීමක්]* අයියාට දුන්නා; නැඳැයින්ට දුන්නා; නැනාට දුන්නා; මස්සිනාට දුන්නා. *[බාධා කිරීමක්]* මෙතුමාට හම්බ වෙලා නැහැ. ඒකයි මේ කෑගහන්නේ. ඊළඟට, ආණ්ඩුවට ඉඳලා හිටලා පොඩ්ඩක් ගහනවා අපි දැක්කා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට තව විනාඩියක් දෙන්න, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, please give him one more minute.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ඊළඟට, බොරුවට ආණ්ඩුවට පොඩ්ඩක් අතැන මෙතැනදී පහර ගහලා කියනවා, අපි මේ කියන්නේ ආණ්ඩුව හදා ගන්නලු.

[ගරු සරත් ෆොන්සේකා මහතා]

අනිවාර්යයෙන් අය වැය විවාදයෙන් පස්සේ ඇවිල්ලා දෙකට නැමිලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වගේ අත උස්සාවි මෙතැන. බොරුවට කහිනවා වටේ. අපි දකිනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දැන් නළියනවා. මේවා කියනකොට අහගෙන ඉන්න බැහැ.

ඊළඟට, පොලීසිය භාර ඇමතිතුමාටත් මම වචනයක් කියන්න ඕනෑ. තමුන්නාන්සේ මිලේනියම් සිටි සිද්ධිය ගැන කථා කළා. මිලේනියම් සිටි සිද්ධිය වෙනකොට මම යාපනයේ ආඥාපති. මම එතකොට ජෙනරාල් කෙනෙක්. ඇත්ත වශයෙන්ම කොළඹ safe house එකක් තිබුණා. දිගු දුර විහිදුම් කටයුතු කරන අවි ආයුධ එහි තිබුණා කිව්වා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. හමුදාවේ බුද්ධි අංශ කවදාවත් දිගු දුර විහිදුම් කටයුතු කළේ නැහැ. කොළඹට RPGs ගේන්න, ක්ලේමෝ බෝම්බ ගේන්න අවශ්‍ය නැහැ. ඒවා කළේ විශේෂ බලකාය. එතැන ඒවා තියාගෙන හිටපු එක හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් කරපු අයථා වැඩක්. ඒක රජයක් පිටින් දමලා මඩ ගහන්න මේ ගොල්ලන් හැම දාම උත්සාහ කළා. රණ විරු පාවාදීම් වාගේම ඒකත් විකුණලා ඒ වෙලාවේ තිබුණු රජය පෙරළන්න ක්‍රියා කළා. නමුත්, මිලේනියම් සිටි සිද්ධියේදී ඒ අය අත් අඩංගුවට ගත්ත එක ගැන මම රණ විරුවෙක් හැටියට මේ කාරණය කියනවා. කිසිම නීති විරෝධී සිද්ධියක් එතැන වුණේ නැහැ. බොහොම ස්තුතියි. ජය වේවා!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19 කාලයක් තිබෙනවා.

[අ.භා. 1.53]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ ඉතිහාසයේ ඔබේත්, මගේත් ජීවිත කාලය තුළ ඛේදවාචක රාශියක් සිද්ධ වුණා. 1971 තරුණ නැඟිටීම, 1988-89 තරුණ නැඟිටීම් අපේ දූ පුතුන්ගේ ජීවිත ලක්ෂ ගණනක් බිලි ගත්තා. උතුර, නැඟෙනහිර තිබුණු යුද්ධයත් තරුණ නැඟිටීමක්. ඒ තුළින් අපේ රටේ පුරවැසියන්ගේ ජීවිත තවත් ලක්ෂ ගණනක් බිලි ගත්තා. ඊළඟට සුනාමිය ආවා. ඒකත් මහා ඛේදවාචකයක්. අපේ රටේ විශාලම ස්වාභාවික උපද්‍රවය ඉන් පසුව පැමිණියා. ඒ, මේ කොවිඩ් වසංගත තත්ත්වය. මේක තමයි, අපේ රට නිදහසින් පසුව මුහුණ දුන් දරුණුම වසංගත තත්ත්වය.

1970 ඉඳලා අවුරුදු 50ක් -දශක පහක්- ඇතුළත, පරම්පරා පහක් අපේ රටේ ඉතිහාසයේ දරුණුම ස්වාභාවික සහ දේශපාලන ඛේදවාචකවලට මුහුණ දුන්නා. කොවිඩ් වසංගතයේ උච්චතම අවස්ථාවට අපට මුහුණ දෙන්න සිදු වුණා. ඒක නිසා මුළු රටම අක්‍රිය වුණා. ආර්ථිකය, අධ්‍යාපනය පමණක් නොවෙයි, සාමාන්‍ය ජීවිත පවා අක්‍රිය වුණා. අපේ රට විතරක් නොවෙයි. ලෝකයම අක්‍රිය කරපු, ශත වර්ෂයකට පසුව පැමිණි බිහිසුණුම වසංගත කාලයක් ගෙවමින් තමයි අපි මේ ඉන්නේ. මෙන්න මේ පසුබිම තුළ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ඉදිරිපත් කරන්න සිදු වෙලා තිබෙන්නේ. මේ අය වැය ඉතාම අවාසිදායක කොන්දේසි යටතේ, අගුළු වැටුණු ආර්ථිකයක් ඇතුළේ, ඔත්පළ වෙච්ච අධ්‍යාපනයක් මැද්දේ ඉදිරිපත් වුණු අය වැයක් නිසා අපි මේ දුෂ්කරතාව තේරුම් ගනිමු කියන ඉල්ලීමයි, මම පළමුවෙන්ම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

අය වැය ලේඛනයේ අඩු පාඩුකම් ඇති. එය විවේචනය කරන්න. චරිත ඝාතනය කරන්නේ නැතිව එය විවේචනය කරන්න. අපව විවේචනය කරන්න. හැබැයි, මේ දුෂ්කරතාව අවබෝධ කර ගනිමු කියන එකයි මගේ ඉල්ලීම. ඒ නිසා මෙම අය වැය ඉතිහාසයත් සමඟ සංසන්දනය නොකර, වත්මන් අභියෝගාත්මක තත්ත්වයන් සැලකිල්ලට ගෙන සංසන්දනය කරන ලෙස මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

වර්තමානයේ අපි එක පැත්තකින් මේ වසංගත අර්බුදයෙන් බැට කාලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, රටක් ලෙස අපි ජාත්‍යන්තරය තුළ කොතැනද ඉන්නේ? මේ අය වැය විවාදයට එක් වෙන සියලු පක්ෂවල සියලුදෙනා රටක් විධියට අපි කොතැනද ඉන්නේ කියන කාරණය තේරුම් ගැනීම අතිශයින්ම වැදගත්, අනාගතය පිළිබඳව අවංක හැඟීමක් තිබෙනවා නම්.

රටකට ජාත්‍යන්තරයේ තිබෙන පිළිගැනීම මනින දර්ශක රාශියක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එයින් එක දර්ශකයක් ඉදිරිපත් කරන්න කැමැතියි. ඒක තමයි රටවල විදේශ ගමන් බලපත්‍ර - passports - ශ්‍රේණිගත කිරීම. Passport ශ්‍රේණිගත කිරීම්වලට අනුව අපේ රට තිබෙන්නේ ලෝකයේ පහළම සියයට 10 තුළයි. අපට පහළින් තිබෙන්නේ තව රටවල් 17යි. ඒකෙන්ම තේරුම් ගන්න පුළුවන් අපි ඉන්න තත්ත්වය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් පැහැදිලි කළොත් වීසා නොමැතිව අපේ රටේ පුරවැසියකුට සංචාරය කළ හැකි රටවල් තිබෙන්නේ 41යි. එයිනුත් සංවර්ධිත රටකට තිබෙන්නේ සිංගප්පූරුව පමණයි. අපේ රටේ කිසිම පුරවැසියෙකුට වීසා නොමැතිව වෙනත් කිසිම සංවර්ධිත රටකට යන්න බැහැ. ඔන්න ඕකයි සත්‍යය. එහෙම නම් කවුද ඉහළින් ඉන්නේ? විශ්වාස කරන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ passport ශ්‍රේණිගත කිරීම්වල එක, දෙක, තුන කියන ස්ථානවලට ඇවිල්ලා තිබෙන්නේ ජපානය, සිංගප්පූරුව සහ දකුණු කොරියාව. මේ රටවල් තුනම ආසියාතික රටවල්.

ලෝකයේ රටවල් 191කට වීසා නැතිව නිදහසේ සංචාරය කරන්න ඒ රටවල් තුනේම පුරවැසියන්ට පුළුවන්. ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, කැනඩාව සහ ජර්මනිය පවා ඔවුන්ට පහළින් සිටින්නේ. මම පාසල් යන කාලයේ අපි "මුඩුක්කු" කියලා හඳුන්වපු පැල්පත් නිවාස පෙදෙසට කිව්වේ "කොරියාව" කියලා. හැබැයි, අද කොරියාවේ passport එක මුළු ලෝකයටම නිදහසේ යන්න පුළුවන් passport එකක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරුවේ සිටි කීර්තිමත් අගමැතිවරයකු වන ලී ක්වාන් යූ ලංකාවට ඇවිල්ලා, ලංකාවෙන් ආදර්ශයක් ගන්නවා කිව්වා. හැබැයි, සිංගප්පූරුව අද ලෝකයේ ඕනෑම රටකට නිදහසේ යන්න පුළුවන් විශිෂ්ටතම ගුවන් ගමන් බලපත්‍රයක් තම පුරවැසියන්ට ලබාදීලා තිබෙනවා. මෙන්න, පිළිගැනීම. මෙන්න, වෙනස. එතකොට අපට මොකද වුණේ, ඇයි අපට මෙහෙම වුණේ? ඇයි, අපි මෙතැනට වැටුණේ? කවුද, මේකට වග කියන්න ඕනෑ? ඉතිහාසයේ තිබුණු කොළ පාට ආණ්ඩු ද, නිල් පාට ආණ්ඩු ද, නිල්-රතු ආණ්ඩු ද, එහෙම නැත්නම් වර්තමාන ආණ්ඩුව ද? නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි

සියලුදෙනාම සම සමව මෙහි විත්තිකරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඕනෑ නම් විත්ති කූඩුවේ පළමුවෙනි විත්තිකාරයා කවුද, දෙවැනියා කවුද, තුන්වෙනියා කවුද කියලා අපි අතර විවාදයක් තිබෙන්න පුළුවන්. හැබැයි, අමතක කරන්න එපා, අපි සියලුදෙනා ජනතාව ඉදිරියේ විත්තිකරුවන් බවට පත් වෙලා තිබෙනවා කියන එක. මෙයින් මිදී විත්ති කූඩුවෙන් බහින්නට අවසර තිබෙනවා නම් තිබෙන්නේ, මේ පාර්ලිමේන්තුව මුල් වරට නියෝජනය කරන මේ දෙපැත්තේම සිටින නවක මන්ත්‍රීවරු 58දෙනාට පමණමයි. අපි, අපි විසින්ම මෙහි වගකීම භාර ගත යුතුයි. "අපි වෙනුවෙන් අපි" වාගේම තමයි ඒකත්. මේ වගකීමත් අපි භාර ගන්න ඕනෑ. ප්‍රශ්නයකට විසඳුම් සොයන්න නම් කළ යුතු පළමු දේ තමයි ඒ ප්‍රශ්නය හඳුනා ගැනීම. දෙවැන්න, එහි වගකීම භාර ගැනීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය තමයි විසඳුමේ ආරම්භය. ඉතින් අපි සියලුදෙනා නිහතමානීව එහි වගකීම භාර ගනිමු. අපි තවමත් පරක්කු නැහැ කියලා මම විශ්වාස කරනවා.

අඩුම ගානේ අපේ අනාගතයේ නාමයෙන්, අද ඉන්න දරුවන්, මතු උපදින්න ඉන්න දරුවන් වෙනුවෙන් රටේ ජාතික න්‍යාය පත්‍රයත් එක්ක, ජාතික ආර්ථික න්‍යාය පත්‍රයත් එක්ක, ජාතික අධ්‍යාපනික න්‍යාය පත්‍රයත් එක්ක අපි 225දෙනාම එකට හිටගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් මෙවර අය වැය දෙසට හැරෙන්නම්. අදට දවස් 5ක් අපි අය වැය ලේඛනය ගැන විවාද කර තිබෙනවා. මේ දින 5 තුළ එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගැනීම හැරෙන්නට අප කළේ කුමක්ද? එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගැනීම හැරෙන්නට, මීට මොහොතකට පෙර සිදු වුණේත් මොකක්ද? හැම පක්ෂයම විපක්ෂයේ ඉන්න කොට බෝසතුන් බවට පත් වෙනවා; ආණ්ඩුවට එනකොට දේවදත්තලා බවට පත් වෙනවා. මේක තමයි, අවුරුදු 73ක ඉතිහාසය අපට කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප සියලුදෙනා මේ ගරු සභාවේ සාධාරණය ඉටු කරන්න උත්සාහ ගන්නේ, එකිනෙකාට ඇඟිල්ල දිගු කිරීමේ, අප්‍රසන්න, වගකීම් විරහිත ඉතිහාසයට විනා මේ රටේ අනාගතයට නොවෙයි. දවස් 5ක් තිස්සේ මේ විවාදය පැවැත්වුණා. තව දවස් දෙකයි අය වැය දෙවන වර කියවීමේ විවාදය තිබෙන්නේ. ඊට පස්සේ අපි අය වැය දෙවනවර කියවීමේ ඡන්ද විමසීමට යනවා. මේ ගත වෙච්ච කාල සීමාවේදී අපි මෙවර අය වැය ගැන විවිධ පැතිකඩවලින් කථා කර තිබෙනවා.

මෙහිදී ඉතාම ස්වල්ප වශයෙන් සාකච්ඡා වුණු නමුත් වැදගත්ම කාරණා දෙකක් තමයි, අධ්‍යාපනය සහ අධිකරණය. ඒ දෙකම මේ සමාජයට දැඩි ලෙස බලපාන, සමාජය රඳා පවතින කාරණා දෙකක් වුණත්, මා විශ්වාස කරනවා ඒ කාරණා දෙක සඳහා අවශ්‍ය අවධානය අවශ්‍ය ප්‍රමාණයට ලැබුණේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මම කැමැතියි, අය වැය සම්බන්ධයෙන් වන මගේ කථාව සඳහා ඔබතුමා මට ලබා දුන් විනාඩි 19ක කාලය මේ ක්ෂේත්‍ර දෙක ගැන කථා කිරීමට පාවිච්චි කරන්න. දැනටත් ඒ කාලයෙන් විනාඩි 9ක් විතර ගෙවී ගිහින්.

මෙම වසංගත තත්ත්වය ඇතුළේ සිදු වුණු බරපතළම ඛේදවාචකය වුණේ, දරුවන්ගේ අධ්‍යාපනයට වූ බාධාවයි. මෙම වසංගතයෙන් බරපතළම පාඩුව සිදු වුණේ, නැවත හරවන්න බැරි පාඩුව සිදු වුණේ, ජීවිතයේ නැවත ලබා ගන්න බැරි දෙයක් අහිමි වුණේ මේ රටේ මිලියන සංඛ්‍යාත දූලා, පුතාලාටයි; ඒ අහිංසක දරුවන්ටයි. මේ වසංගතයෙන් දරුණුම බලපෑමට මුහුණ දුන්නේ දරුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් තමයි, මේ ඛේදවාචකයේ ලොකුම වින්දිතයන් බවට පත් වුණේ. වසර 24ක් පුරාවට දිග්ගැසෙමින් පැවතුණු ගුරු වැටුප් විෂමතා ප්‍රශ්නය උග්‍රම අතට හැරුණේ, පාසල් දරුවන් ජීවිතයේ අසීරුම අවස්ථාවට මුහුණ දී සිටි මොහොතකදී. මාස 9ක් වාගේ පුංචි කාලයක් වුණත්, මේ රටේ අධ්‍යාපන ඇමති විධියට සිටිමින් මේ තත්ත්වය අවබෝධ කර ගත් මම කැමැතියි, වසර 24ක ගුරු වැටුප් විෂමතාව තුරන් කරන්නට රුපියල් බිලියන 30ක මුදලක් මේ දුෂ්කර අවස්ථාවේ වෙන් කරමින් ගත් පියවර පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු මුදල් ඇමතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට අවංකව ස්තුති කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, ගුරු සේවයට හිමි වෘත්තීය ගරුත්වය ලබා දීමත් අපේ වගකීමක්. අපි රජයක් විධියට වාගේම, රටක් විධියටත් තරයේ සිතට ගත යුතුයි, මෙවැනි තත්ත්වයක් යළි කිසිදාක ඇති නොවන්නට වග බලා ගන්න. මෙවැනි තත්ත්වයක් තවත් වසර 5කින්, 10කින් හෝ 20කින් පැන නොනැඟීම සඳහා සාධනීය විසඳුමක්, ස්ථිරසාර විසඳුමක් අප ඉදිරිපත් කළ යුතුයි. ගුරු වෘත්තියට හිමි නිසි වෘත්තීය ගරුත්වය ලබා දීම මෙන්ම ගුණාත්මකභාවයෙන් යුතු තෘප්තිමත් ගුරු සේවයක් රටේ දරුවන් වෙනුවෙන් ඇති කිරීම පාලකයන් වශයෙන් අප හැමදෙනාගේ වගකීමක්. ප්‍රතිපත්ති සම්පාදකයන් විධියට ඒ වගකීමෙන් බැහැර වෙන්න අප කාටවත් බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසලක ගේට්ටුව වැහෙනවා කියන්නේ, දරුවන්ට නිකම් පාසල් භූමියට ඇතුළු වෙන්න තිබෙන අවස්ථාව අහිමි වීම විතරක් නොවෙයි. පාසල් ගේට්ටුව වැසෙනවා කියන්නේ සංස්කෘතික දොරගුළු වැසීමක්; ශිෂ්ටාචාරයක දොරගුළු වැසීමක්. එම නිසා ප්‍රතිපත්ති සම්පාදකයන් විධියට ඒ පිළිබඳව නිසි ලෙස අධ්‍යයනය කළ යුතුය කියලායි මා ඔබතුමාට යෝජනා කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දියුණු රටවල දියුණුවේ දර්ශකයක් වන ගුණාත්මක ගුරු සේවය අපේ රටටත් ළඟා කර ගැනීමට අපි ඉදිරි පියවර සැලසුම් කළ යුතුමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටක දරුවන්ගේ දැස් පාදන වෘත්තියවේදීන්හට පැහැදිලි නිර්ණායක තිබිය යුතුයි. මේ වනවිට අපේ ගුරු සේවයේ ගුරුවරුන් වර්ග කිහිපයක් සිටිනවා. මම අධ්‍යාපන අමාත්‍ය ධුරය දැරූ කාලයේ ගුරුවරුන් වර්ග 13ක් පමණ සිටියා. පුහුණු ගුරුවරු සහ නුපුහුණු ගුරුවරු කියලා ගුරුවරුන් වර්ග රාශියක් ඉන්නවා. මා ඉදිරි පිට ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමාත් සිටින නිසා උදාහරණයක් හැටියට උතුර පළාත ගන්නම්. ඒ කාලයේ උතුර පළාතේ සිටි ප්‍රාථමික ගුරුවරුන්ගෙන් සියයට 53ක් පමණ නුපුහුණු ගුරුවරුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට මොකක්ද, ඒ දරුවන්ගේ තත්ත්වය? ඒ නිසා ගුරු වෘත්තියට ඇතුළත් වීමේදී තිබෙන මේ පැහැදිලි විෂමතාව අප වෙනස් කළ යුතුව තිබෙනවා.

'අය වැය' කිව්වාම සිහියට එන්නේ, භෞතික දේවල්; භාණ්ඩ හා සේවා. නමුත් එතැනින් එහාට ගිය ආකල්පමය වශයෙන් ගුණාත්මක දේවල් තිබෙනවා, රටකට යහපත් ලෙස බලපාන; ආයෝජන ලෙස බලපාන. අනාගත ආයෝජන මෙන්න මෙවැනි දේවල් මත රැඳී තිබෙනවා. ගුරුවරයා උපාධිධාරී පුහුණු වෘත්තිකයෙකු කරන එක අප දරුවන් වෙනුවෙන් කරන ආයෝජනයක්. දරුවන්ගේ දැස් පාදන එක අනාගතයට ආයෝජනයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය, රටටම ආයෝජනයක්. එම නිසා ගුරු සුදුසුකම් විෂමතාව තුරන් කිරීමේ එක් විසඳුමක් ලෙස ගුරු විද්‍යා පීඨ 19 විශ්වවිද්‍යාල පීඨ බවට පත් කරන්නට ඊළඟ අය වැයේදී ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු වන බව මට විශ්වාසයි. එය පාර්ලිමේන්තුවේ අප හැමදෙනාගේම වගකීම බව මා නැවත සිහිපත් කරන්නට ඕනෑ.

මේ රටේ ජ්‍යෙෂ්ඨතම ජනතාවාදී දේශපාලනඥයෙකු වන ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ, අප එදා සැලසුම් කළ විධියටම අප රටේ වර්තමාන පාසල් පද්ධතිය තුළ දැන් සිටින ගුරුවරුන් වාගේම, බාහිරින් එන සියලු ගුරුවරුන් වර්ෂ 2027 වන විට පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කරන්නට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න කියලායි. ඒක, අපේ ජාතියේ දරුවන්ට කරන්න පුළුවන් ඉහළම සාධාරණ දේවල් අතරින් එක සාධාරණයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගුරු සේවයට නිසි

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

වැටුපක් වාගේම ගුණාත්මකභාවයක් තිබිය යුතුයි. ඒ සඳහා ගුරුවරුන්, විදුහල්පතිවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු සියලු පාර්ශ්වයන්ට එකතු වෙන්න කියා මා ආරාධනා කරනවා.

ඊළඟ කාරණය මේකයි. රටේ පාසල් දරුවන් මිලියන හතරකට වැඩි වුවත්, ඉන්ටර්නෙට් පහසුකම තිබෙන්නේ මිලියන 1.4කට පමණයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට රටක් විධියට Starlink වාගේ සැටලයිට් ඉන්ටර්නෙට් සේවාවක් ලබා ගෙන රටම ආවරණය කර ගැනීමේ හැකියාවක් මේ මොහොතේ නැහැ. නමුත්, මේ අය වැයේ මා අගය කරන විශේෂ ගුණාංගයක් තිබෙනවා. ඒ තමයි මුළු රටේම බිම් ප්‍රදේශ ආවරණය වන පරිදි ඉන්ටර්නෙට් පහසුකම් සැලසීමට සම්ප්‍රේෂණ කුලුනු 998ක් ඉදි කිරීමට මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබීම. ඊට අමතරව, සෑම පාසලකටම broadband connection ලබා දෙන්නට තීරණය කර තිබෙනවා. එය අගය කළ යුතු කාරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඒක හොඳ ආරම්භයක්. මොකද, මේ වසංගත කාලය තුළ ඉගෙනීම සඳහා නව platform එකක්, එහෙම නැත්නම් නව මානයක් ඒ තුළින් විවෘත වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි පහක් විතර දෙන්න.

එමගින් අපේ සමාජයේම නව මානයක් විවෘත වුණා. අපේ සමාජයම එයට විවෘත වුණා. ගුරුවරුන්, දරුවන් පමණක් නොවෙයි, වැඩිහිටියන් පවා එයට විවෘත වුණා. එය ඉතාම ධනාත්මක පරිවර්තනයක්. මගේ විග්‍රහයේ හැටියට මේ වසංගත කළු වලාව තුළ මතු වුණු එකම රිදී රේඛාව ඒකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දියුණු වන රටක් හැටියට අප අනාගතයට යන ගමන වේගවත් කරන්නට මේ මාර්ගස්ත - online - අධ්‍යාපනය කියන එක අත්‍යවශ්‍ය කාරණයක්. ඒ හරහා කාලය, ශ්‍රමය, වැය වැනි බොහෝ දේවල් ඉතිරි වෙනවා. ඒ වාගේම යම් විශිෂ්ට ගුරුවරයෙකුගේ මග පෙන්වීම අසීමිතව දරුවන් විශාල සංඛ්‍යාවකට ලැබීමේ හැකියාවත් ලැබෙනවා. ඒ නින්දා මේ අසීරු අවස්ථාවේ අපි විකල්පයක් ලෙසට ගත් එම ක්‍රියා මාර්ගය විධිමත්භාවයට පත් කර දියුණු කරමු. මම මේ online අධ්‍යාපනය සලකන්නේ අපේ රටේ ඔත්පළ වුණු - ගිලන් වුණු - අධ්‍යාපනයට ලැබුණු විශ්වසනීය එන්නතක් විධියටයි.

මම කැමතියි, මගේ කථාව අවසාන භාගයේ අධිකරණය දෙසට හැරෙන්න. උසාවි සහ බන්ධනාගාර සම්බන්ධයෙන් ධනාත්මක පියවර කීපයක් මේ අය වැය තුළින් තබා තිබෙනවා. උසාවි, විනිසුරුවරුන්, රජයේ නීතිඥයන්ගේ සැලකිය යුතු වැඩි කිරීමක් කර තිබෙනවා. අලි සබ්රි ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී පැහැදිලි කළා, මේ අධිකරණ පද්ධතියේ නඩුවල තිබෙන ප්‍රමාදය පිළිබඳව. ඒ නිසා මේ යෝජනා ඉතා මන්දගාමීව ක්‍රියාත්මක වන අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කිරීමට ගත් එලදායී පියවරක්. ඒක සමාජයට වැදගත්. මම ඒ බව උදාහරණයකින් පැහැදිලි කරන්නම්. ඔබතුමන්ලා සියලුදෙනාම දන්නවා ඇති කියලා මම හිතනවා, ලංකාවේ මිනී මැරුම් සිදුවීමට වැඩියෙන්ම බලපාන හේතුව. වැඩියෙන්ම මිනී මැරුම් සිදු වන්නේ කුමක් නිසාද? ඒ තමයි, ඉඩම් ආරාවුල් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අධිකරණයෙන් ඉඩම් නඩුවක් විසඳා ගන්න පරම්පරාවක, දෙකක කාලයක් ගත වනවා. ඒ නිසා මිනිසුන් ඒ ආරාවුල් විසඳීම තමන් අතට ගන්න යෑමේ ප්‍රතිඵලයක් ලෙස ජීවිත හානි සිදුවනවා. දෙවැනියට වැඩියෙන්ම මිනී මැරුම්වලට හේතුව, අනියම් සබඳතා. වාසනාවට අපේ පාර්ලිමේන්තුවේ කිසි මන්ත්‍රීවරයෙක් ඒ හේතුවෙන් ඝාතනයට පත්වෙලා නැහැ. ඒක වාසනාවක්. අධිකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සමාජයට යහපත් ලෙස බලපානවා. ඊට අමතරව අවුරුදු 90, 100, 107 පරණ, යල් පැන ගිය පනත් සංශෝධනය කරමින්, යාවත්කාලීන කරන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා. කාර්යක්ෂම අධිකරණ සේවාවක් සඳහා කැප වෙමින් සහ වේගයෙන් ක්‍රියා කරන මා මිත්‍ර අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි ඇමතිතුමාට මේ අය වැය යෝධ ශක්තියක් වනු ඇතැයි මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් කල් අය වැයකදී අවධානය යොමු නොකළ චරිතයක් ඉන්නවා. මෙතෙක් කල් අය වැයකදී මොවුන් ගැන අවධානය යොමු කරලා නැහැ. ඒ, කවුද? ඒ තමයි, සිරකරුවන්. අය වැයකදී සිරකරුවාට අවධානයක් යොමු වන්නේම නැහැ. අපේ සමාජයේ සිටිනවා, වරදට පෙළඹෙන මිනිසුන්; වැරදි කරන මිනිසුන්; හැබැයි, ඒ අයත් මිනිස්සු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වරද වෙනුවෙන් ඔවුන් සමාජයට වන්දියක් ගෙවිය යුතුයි. ඒ වන්දිය ගෙවීම සඳහා තමයි ඔවුන්ට බන්ධනාගාරගත වීමට සිදු වන්නේ. අපි හුදෙක් බිත්තියක විතරක් ලියනවා, "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා. හැබැයි, අපි සිරකරුවන්ට සලකන්නේ මනුෂ්‍යයන් විධියටද? රුසියානු ගත්කතුවරයෙකු වූ, මගේ ජීවිතය ආලෝකමත් කළ දොස්තොයෙව්ස්කි, කෙටි කාලයක් සාර් පාලනය යටතේ සිරගතවෙලා ලැබූ අත්දැකීම් තුළ ඔහු මෙසේ කියනවා:

"The degree of civilization in a society can be judged by entering its prisons."

ශිෂ්ටාචාරයේ තරම මැන ගන්න පුළුවන්, එහි සිරකරුවන් නිරීක්ෂණය කළොත් පමණයි කියලා ඔහු කියනවා. මේ කාරණය අවබෝධ කරගෙන සිරකරුවන්ට මානුෂීය ලෙස තම බන්ධනාගාරගත කාලය ගෙවා දැමීමට අවශ්‍ය පහසුකම් සැලැසීමට මේ අය වැයෙන් පියවර ගෙන තිබෙනවා. මේ කරුණු දෙකම අගය කළ යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. මම කලිනුත් සඳහන් කළා, අය වැයක් කියපු සැණින් සිහියට එන්නේ භෞතික දේවල් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් එතැනින් එහාට ගිය රටකට යහපත් වශයෙන් බලපාන ආකල්පමය වශයෙන් ගුණාත්මක දේවල් තිබෙන බව මම සඳහන් කළා. අධිකරණ විෂයය සැලකූ විට අපේ අවධානයට ලක් නොවන තවත් වැදගත් කරුණක් තමයි මේ අවස්ථාවේ මා ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්නේ. අපේ රටේ සැලකිය යුතු මට්ටමකින් සිදු වන ළමා අපචාර - child abuse - ගැන අපි දැඩි අවධානයක් යොමු කරමින්, දැඩි පියවර ගත යුතුමයි. ශාරීරික, මානසික සහ ලිංගික යන තුන් ආකාරයෙන්ම ළමා අපචාර සිදු වනවා. මූලාසනයේ සිටින ගරු කිංස් නෙල්සන් මැතිතුමා ප්‍රමුඛ මේ උත්තරීතර සභාවේ ඉන්න තාත්තලා, අම්මලා දන්නවා ඇති, අපේ රටේ සෑම පැයකට වරක්ම ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් වන බව. මතක තබා ගන්න, මේ පැමිණිලි කරන ප්‍රමාණය පමණයි. පැමිණිල්ලක්වත් නොමැතිව වැළලී යන, දරාගෙන සිටින ගණන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ලැබී ඇති කාලය අවසානයි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
තව මොහොතක් මට ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ කථාවේ අවසාන පරිච්ඡේදයේ මම ඉන්නේ. මම විනාඩි 25ක කථාවකට සූදානම් වෙලා තමයි ආවේ. එම නිසා මට සමාවෙලා ඔබතුමා ඒ අවස්ථාව ලබා දෙයි කියා මම විශ්වාස කරනවා.

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පැමිණිලි කරන ප්‍රමාණය පමණයි. පැමිණිල්ලක්වත් නොමැතිව වැළලී යන, සියල්ල දරාගෙන සිටින ගණන ඊට වඩා දස ගුණයකින්, සිය ගුණයකින් වැඩි විය හැකියි. සමාජයේ දරුවන් ආරක්ෂා කර ගන්නා ආකාරය, දරුවන්ට සලකන ආකාරය වර්තමානයේ ශිෂ්ට සමාජයක් මනින දර්ශක බවට පත් වෙලා තිබෙනවා; රටක් නිර්ණය කරන ප්‍රධානතම නිර්ණායකයන් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා පළමුවෙන්ම අපි මේ ගැන දරුවන් දැනුවත් කළ යුතුයි. අපි මේ සංවාදයට විවෘත විය යුතුයි. අපි ගුප්ත විය යුතු නැහැ; හැංගිය යුතු නැහැ. අධ්‍යාපන පද්ධතිය තුළින් දරුවන් නිසි දැනුවත් කිරීමක් කළ යුතුයි.

දෙවනුව, අධිකරණ පද්ධතිය මේ දරුවන් ආරක්ෂා කර ගත යුතුයි. මේ දරුවන්ට අධිකරණ පද්ධතිය හරහා නිසි ආරක්ෂාවක් ලැබෙනවා නම්, වින්දිත දරුවන් යුක්තිය අපේක්ෂාවෙන් ඉදිරියට එන්නත්, එවැනි ක්‍රියා සිදු කරන්නන් එයට අධෛර්යවීමත් යන දෙකම එක විට සිද්ධ වෙනවා. වින්දිත දරුවන් ආරක්ෂා වීම වෙනුවට ඔවුන්ගේ ජීවිත අඳුරු වන වටපිටාවක් නිර්මාණය වීම හරහා මේ අපචාරවලට ලක් වුණු දරුවන් අවාසනාවන්ත ඉරණමකට මුහුණපානවා. මේ පාර්ලිමේන්තුවේ අපි 225දෙනා අතරේ ළමා කාලයේ අපයෝජනයට ලක් වූ කී දෙනෙක් නම් ඇද්ද? අපි ඒවාට ප්‍රතිකර්ම නොකොට ඒවා ඉතිහාසයේ ගැඹුරු පතුලේ වළ දමන්නටයි කටයුතු කරන්නේ. අවසාන වශයෙන් මා කියන්නේ, දරුවන් දැනුවත් කිරීම හරහා දරුවන් එයින් වළක්වා ගන්නට, ඒ වාගේම අධ්‍යාපන පද්ධතිය හරහා දරුවන් දැනුවත් කරන්නට, ඒ වාගේම නීති පද්ධතිය හරහා දරුවන් ආරක්ෂා කර ගන්නට අපි කටයුතු කළොත් පමණයි අපට මේ සමාජ ව්‍යසනයෙන් ගොඩ එන්න පුළුවන් වන්නේ. මනසින් නිරෝගී සමාජයක් නිර්මාණය කරන්න නම් දරුවන් මේ ආපදාවෙන් මුදවා ගැනීම අතිශය වැදගත්. මොකද, මේ වින්දිත දරුවන් මුහුණ දුන් ඒ අභාග්‍යසම්පන්න අත්දැකීම් සමඟ වැඩිවිය පත් වී සමාජගත වූ පසු සමාජයටත්, ඔවුන්ගේ පවුල්වල අයටත්, ඒ අයටත් වන හානිය අප අත්දැක තිබෙනවා. මෙන්න මේ ආකල්පමය වෙනස ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම අය වැයක් තුළින් සිදුවිය යුතු වාගේම, මේ පාර්ලිමේන්තුවේ ප්‍රතිපත්ති සම්පාදකයන් විධියට එය අපේ පරම පූජනීය වගකීම බව මම අවසන් වශයෙන් ඔබතුමාට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ආරම්භයේදීම පැවසුවා, මේ අය වැය ඉතිහාසයත් සමඟ සසඳන්නේ නැතිව වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගෙන විනිශ්චය කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
නමුත් ඉතිහාසයට හැරෙමින්, එකිනෙකාට ඇඟිලි දිගු කරමින් තවදුරටත් සිටීමේ වරප්‍රසාදයක් අප කිසිම කෙනෙකුට නැහැ. අඩු පාඩු සකස් කරගෙන, වැරැදි හදා ගෙන ඉදිරියට යෑම මිස අපට වෙන විකල්පයක් නැහැ. අප එක්ව ඉදිරියට නොගියොත් සිදු වන්නේ වෙන්ව වැළලී යෑම පමණමයි. බාධක මැද වුණත් රටක් ලෙස නොසැලී ඉදිරියට යෑමට අවශ්‍ය අභිප්‍රේරණය කුමක්ද? අසංඛ්‍යාත සුබවාදී භාවයයි; නිර්දය උද්යෝගයයි - countless optimism and relentless enthusiasm - පමණමයි තිබෙන්නේ. ඇමෙරිකාවේ ප්‍රාරම්භක පීතෘවරයෙකු මෙන්ම තුන්වන ජනාධිපතිද වූ තෝමස් ජෙෆර්සන් මැතිතුමා විසින් පැවසූ වැකියක් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

"I like the dreams of the future better than the history of the past."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මන්ත්‍රීවරුන් විධියට ඉතිහාසයට වඩා අනාගතයේ සිහින තෝරා ගනිමු. අපි එකතුවෙලා ඒ සිහින හඹා ගෙන යමු.

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

76 වෙනි ජාතික අය වැය පිළිබඳ විවාදයේදී මට කලින් කථා කළ සිංහල භාෂාව පිළිබඳවත්, අධ්‍යාපනය පිළිබඳවත් ඉතාම ළෙන්ගතුකමකින් ඉන්න මා හිතවත් ඇමතිවරයාගේ කථාවෙන් පසුව මට කථා කිරීමට අවස්ථාව ලැබීම එක්තරා විධියක අභියෝගයක්.

මේ විවාදයට මා සහභාගි වන්නේ ප්‍රීතියෙන් නොවෙයි; සැහීමකින් නොවෙයි; සතුටකින් නොවෙයි. ඒ, කාරණා දෙකක් නිසා. ඒ මන්දයත්, පශ්චාත් නිදහස් අවුරුදු 72ක කාලයෙන් පසු මේ වෙනකොට අපේ රටේ ජනගහනය මිලියන 22ක් පමණ වනවා. අපි නිදහස ලබද්දී අපේ ජනගහනය මිලියන 7ක් පමණ වුණා. ඇමතිතුමා කිව්ව ආකාරයට මේ මිලියන 22න්, මිලියන 4ක්ම ඉන්නේ මේ මාතෘ භූමියේ අනාගතය සකසන්න යන අවුරුදු 19න් පහළ දරුවන්. මේ ජනගහනය, සමාජය හා ආර්ථිකය මැද තවමත් අපි කථා කරන්නේ මේ අය වැය හිඟය පියවා ගන්නේ කෙසේද යන කාරණයයි. ආර්ථික අවපාතයක් සහ ආර්ථික අවදානමක් තිබෙන මොහොතක ඒ ගැන සිතීම මට සතුටක් ගෙන දෙන කාරණයක් නොවෙයි.

දෙවනුව, 21වන සියවසේ අවුරුදු 22ක කාලයක් ගත වූ පසු අනාගතය පිළිබඳව ශුභවාදීව සිතිය යුතු ජාතියක් අය වැය පිළිබඳව විවාද කරන මේ මොහොතේ මේ මුළු පාර්ලිමේන්තුවේ ආසනවලින් සියයට 95ක් හිස්ව තිබීම පාර්ලිමේන්තු සම්ප්‍රදායටත්, පාර්ලිමේන්තුවටත් කරන අගෞරවයක්. අපි මෙයින් මහ ජනයාට යවන පණිවුඩය කුමක්ද? දේශපාලන විද්‍යාඥයකු හැටියට, ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන කෙනෙකු හැටියට මේ ගැන මට අසතුටක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ආර්ථික විද්‍යාඥයකු නොවෙයි. දේශපාලන වේදිකාව දෙදරවන දේශපාලනඥයකුත් නොවෙයි. දේශපාලන විද්‍යාව ඉගෙන ගන්නා හා උගන්වන කෙනෙකු හැටියට පමණයි මට මේ අය වැය දිහා බලා විශ්ලේෂණයක් කරන්න පුළුවන් වන්නේ.

මේ මොහොතේදී මා කියන්න කැමැතියි, මීට ටික වෙලාවකට කලින් කථා කළ අපේ රටේ එකම ෆීල්ඩ් මාර්ෂල්වරයා වන සරත්

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

ෆොන්සේකා මහත්මයා, එතුමාගේ කථාවේදී කළ එක්තරා අසත්‍යයක් නිවැරදි කරන බව. එතුමා සභාවෙන් පිටවන්න කලින් මම කිව්වා, මේක එතුමා නැති වෙලාවේ කරන අපහාසයක් නොවෙයි, එතුමාගේ දත්ත නිවැරදි කරගන්නයි මේ කරුණු කියන්නේ කියලා. විදේශික හිඟන්නන්ගේ ගමනාන්තය ශ්‍රී ලංකාව නොවෙයි. මෙයට සාක්ෂි දරන්නේ පසුගිය සතියේ -දවස් දහයකට කලින්- අවුරුදු 35කට වඩා නවතා තිබුණු ස්විස් ගුවන් සේවාව ස්විස් නගරයේ සිට ශ්‍රී ලංකාවට -කොළඹට- නැවත තමන්ගේ ගුවන් ගමන් දෙකක් ආරම්භ කර තිබීමයි. එය අපට දෙන හොඳ සංඥාවක්. එතුමා මතක් කරගත යුතුයි, ශ්‍රී ලංකාව -මගේ මාතෘ භූමිය- හුදෙක් වෙරළකට පමණක් නොවෙයි, ලෝක ප්‍රසිද්ධ වන්නේ කියන එක. අපි සිංහල, දෙමළ සහ අනෙක් ජාතීන් හැටියට ගොඩනඟාගෙන තිබෙන සංස්කෘතික ත්‍රිකෝණයක් තිබෙනවා. ඒ සංස්කෘතික ත්‍රිකෝණය තමයි, අවුරුදු 2,500ක ඉතිහාසය ලෝකයට කියාපාන අපේ සංස්කෘතිය. ඒක බලන්නයි, සුදු ජාතිකයන් එන්නේ. ඒ නිසා අපි හිඟන්නන් ගෙන්වන රටක් නොවෙයි. බුද්ධිය තිබෙන, තමන් කැමැති ආකාරයෙන් තමන්ගේ ජීවිතය ගත කරන්න සහ අලුත් යමක් හොයාගන්න, ශිෂ්ටාචාරය ගැන ඉගෙන ගන්න කැමැති විදේශිකයන් බහුතරයක් මේ රටට එන බව එතුමා මතක් කරගත යුතුයි. මා මේ කථාවේදී දේශපාලන වාසි ගන්න උත්සාහ කරන්නේ නැහැ. මන්දයත්, එය මාගේ ගුරුවරුන්ට සහ මා ලබා ගත් උපාධියට අගෞරවයක් වන නිසා. නමුත්, ඇතැම් වෙලාවට දේශපාලන යථාර්ථ ගැන අපට කථා කරන්න වෙනවා.

මා බැසිල් රාජපක්ෂ ඇමතිවරයාගේ උපදේශකයකු බව ඇතැම් මාධ්‍ය කියා තිබෙනවා. මම නියෝජනය කරන නිදහස් පක්ෂයේ ඇතැම් අය හිතනවා, මම බැසිල් රාජක්ෂ මැතිතුමාගේ නියෝජිතයකු කියලා, ඒ පක්ෂය ඇතුළේ. ඒ නිසා මා ඇතැම් වෙලාවට කියන්න යන දේවල් ඒ මත දෙකටම පරිබාහිර හා විරුද්ධ වෙන්න පුළුවන්. මන්දයත්, මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙන, අපට ලබා දී තිබෙන සිතියම, ශ්‍රී ලංකාව -අපේ මාතෘ භූමිය- අනාගතයේ යා හැකි දිශානතියේදී හමුවන මධ්‍යස්ථාන, මංසන්ධි ඇතුළත් මාර්ග සිතියමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ග සිතියමක් කියවන ඕනෑම දරුවෙකු දන්නවා, සිතියම කියවන්න පටන් ගන්න කලින් තමන් කොහෙද ඉන්නේ කියා සිතියමෙන් දැනගන්න ඕනෑ බව. දවස් 5කට කලින් ඉදිරිපත් කළ ආර්ථික අය වැයේ තිබෙන වැදගත්කම ගැන කථා කරන්න නම්, මේ රටේ ආර්ථිකය අද පත්වී තිබෙන තත්ත්වය පිළිබඳව යමක් කිව යුතුයි.

1948 වසරේ ශ්‍රී ලංකාව නිදහස ලබා ගන්නකොට ඩොලරයේ වටිනාකම කීයද කියා ඇහුවොත්, ඇතැම් වෙලාවට ඒක මතක් කරලා පිළිතුරු දෙන්න පුළුවන් කිහිපදෙනායි ඉන්නේ. එතකොට ඩොලරයේ වටිනාකම රුපියල් දෙකයි ශත නවයයි. අද වෙනකොට නිල වශයෙන් හා නිල නොවන වශයෙන් තිබෙන අගය ඒ හා සමානව සංසන්දනය කරන විට සියයට 200ක් පමණ වැඩි වී තිබෙනවා.

ඇමෙරිකානු ඩොලරය නොවෙයි වෙනස්වෙලා තිබෙන්නේ. ශ්‍රී ලංකාවේ රුපියල වෙනස් වී තිබෙනවා. මෙයට හේතුව, නිෂ්පාදන ආර්ථිකයක් වෙනුවට අර්ථයක් විරහිතව අපි සුබ සාධක ආර්ථිකයට යෑමයි. මුදල් ඇමතිතුමා කිව්වා සේම, නිදහස ලබද්දි ජනගහනයෙන් එකොළොස් දෙනෙකුටයි සිවිල් සේවකයකු හිටියේ. මම නැවතත් ඒ සංඛ්‍යා පරීක්ෂා කර බැලුවා. අද මේ දේවල් තනිකර දේශපාලනීකරණය වෙලා තිබෙනවා. ඒ නිසා ලාභ ලැබිය යුතු ආයතනවලට නුසුදුසු පුද්ගලයන් පත් කිරීම, ප්‍රමාණය ඉක්මවා පත් කිරීම සිදු කර තිබෙනවා. මා අසුන් ගන්නා පේළියේම ගරු යදාමිණී ගුණවර්ධන මැතිතුමා වාඩි වෙලා ඉන්නවා. එතුමාගේ සීයා, තාත්තා මේ රටේ ප්‍රබල ජාතිකවාදී දේශපාලනඥයන්. එතුමන්ලා පෙරමුණු කර ගත්තා වූ ලංගම අපි 1965 වාගේ කාල සීමාවේදී ජනසතු කළා. අද වන විට ලංගමට වෙලා තිබෙන්නේ මොකක්ද? පාඩු වෙන ආයතනයක් හැටියට, ජනතාවට සේවය සපයන්න බැරි ආයතනයක් හැටියට ලංගම පත් වෙලා තිබෙන්නේ ඇයි? ඒ, වෙළෙඳ පොළ නිසා නොවෙයි. මේ ආයතන දේශපාලනීකරණය වීම නිසායි. ඒ අනුව, නුසුදුසු පුද්ගලයන් නුසුදුසු ආයතනවලට පත් වෙමින් තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමනි, අද ඔබතුමා මේ රට භාර අරගෙන දෙවසර පූර්ණ වෙන දවස. අවාසනාවකට වාගේ ඔබතුමාගේ නායකත්වය තුළත් මෙය සිදුවෙමින් තිබීම මේ රටේ ජනතාවට දුන් පොරොන්දුවෙන් අපි ආපස්සට යෑමක් දෝ කියා මට සැක හිතෙනවා. ඒ නිසා රාජ්‍ය ආයතනවල පාඩුව රුපියල් ට්‍රිලියන 1.1ක්. රාජ්‍ය සතු ව්‍යාපාරවල පාඩුව රුපියල් බිලියන 500ක් ඉක්මවනවා. මේ ආයතන ව්‍යුහගත විධියට වෙනස් කරන්නේ නැතිව අපි ආර්ථික විද්‍යාව ගැන කථා කරලා වැඩක් නැහැ. කොච්චර ඉපැයුවත් වැඩක් නැහැ, අපි වියදම පරිපාලනය කර ගන්නේ නැත්නම්. ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවේ 21, 22 පිටුවල සඳහන් කර තිබෙනවා, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ලබන වසරේ සිට පටන් ගන්නවා කියලා. ඒ සම්බන්ධයෙන් මම ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවයෙන් රුපියල් කෝටි තිස්පන්දහසක් පාඩු වෙලා තිබෙනවා. නමුත්, ඔබට, මට, මැද පෙරදිග ගිහිල්ලා වසර කිහිපයක් -අවුරුදු 10ක්, අවුරුදු 15ක්- කඳුළු හෙළන කිසිදු ගෘහ සේවිකාවකට නොමිලේ ටිකට් එකක් නොදුන් මේ SriLankan Airlines එකේ ප්‍රධාන විධායක නිලධාරියා තවමත් රුපියල් ලක්ෂ ගණනින් පඩි ගන්න කෙනෙකු බවට පත් වුණේ කොහොමද? එය ඇසීමේ අයිතිය මට තිබෙනවා. මන්දයත්, මම අයිති වන්නේ පරම්පරාවක් තිබෙන, මහ වලව්වක් තිබෙන, 'බණ්ඩාර' හෝ 'නායක' කියලා නාමයකින් අවසන් වන වාසගමක් තිබෙන පවුලකට නොවන නිසා. මේ රටේ බහුතරය වාගේම දුක් විඳිමින් බඩගින්නේ පාසල් ගිය කෙනකු තමයි, මම. පාර්ලිමේන්තුවට එන්න මට ලැබුණු ආරාධනය ඇතැම් අය කියන්නේ, "පින් මන්ත්‍රී ආරාධනයක්" කියලා. ඔව්, මම පින් කරපු නිසා ආවා. රුපියල් කෝටි 50ක් වියදම් කරමින්, පංච ශීලය කඩමින්, අසත්‍ය පවසා මම පාර්ලිමේන්තුවට ආවේ නැහැ. ඒ නිසා මට මේ ගැන ප්‍රශ්න කරන්න වග කීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වවිද්‍යාලයේ සිටියදී දෙල්කඳ ප්‍රදේශයේ නැවතී හිටියා. දෙල්කඳ ප්‍රදේශයේ "ඉරිදා පොළ" ඉතා ප්‍රසිද්ධයි. ඒ කාලයේ දෙල්කඳ ඉරිදා පොළේ හෙරලි විකුණපු නැන්දා මට මෑතකදී හමු වුණා. කොහොමද මට ඇය හමු වුණේ? ඒ නැන්දාගේ පුතා කරන්නේත් හෙරලි විකිණීම. ඔහු සාමාන්‍ය පෙළ සමත් වුණා. නමුත්, උසස් පෙළ කරන්න බැරි වුණා. අද වන විට ඔහුත් හෙරලි විකුණනවා. මේකයි තත්ත්වය. මේ ආර්ථික තත්ත්වය මේ වසර 2 තුළ අපි බිහි කරපු එකක් නොවෙයි. එහෙම නැත්නම් පොදු පෙරමුණු ආණ්ඩුව බිහි කරපු එකක් නොවෙයි. මීට කලින් තිබුණු යහ පාලන ආණ්ඩුව, ඊටත් කලින් තිබුණු ආණ්ඩුව, ඊටත් කලින් තිබුණු ආණ්ඩුව යනාදී සියලු ආණ්ඩු එකතු වී අද මේ රටේ ජනතාවට මෙවැනි වූ ආර්ථික තත්ත්වයක් උදා කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමනි, ගරු අගමැතිතුමනි, ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමන්ලාගෙන් අපි ඉල්ලීමක් කරනවා. මේ රටේ ආර්ථික, සමාජ, දේශපාලන, සංස්කෘතික වෙනසක් ඇති කරන්න නම්, රාජ්‍ය සංස්ථාත්, රාජ්‍ය සංස්ථාව තුළ තිබෙන ආකල්පත් වෙනස් කළ යුතුයි.

There should be a political will for reform. Numbers and statistics, we can present and represent. But, where is the political will for us to reform? Where is the political will to say what is wrong is wrong and to correct ourselves? I see there is a light, a distant light in this Budget, particularly regarding appointment and

restructuring of State-owned organizations that are incurring billions, if not trillions of rupees in losses. The innocent citizens of this country are asking questions from us.

මම සාමාන්‍යයෙන් වෙළෙඳ පොළට යන්නේ, මගේ දෛනික කටයුතු කර ගන්නේ ආරක්ෂක භටයින් නැතිවයි. මමයි මගේ රිය පදවාගෙන යන්නේ. ඒ නිසා වෙළෙඳ පොළේදී මට සාමාන්‍ය මිනිසුන් හමු වෙනවා. ඒගොල්ලන් මා සමඟ කථා කරනවා. "ඔබතුමා ආචාර්යවරයෙක්, ඔබතුමා සියලු දේ අතහැරලා - කැනඩාවේ passport එක අතහැරලා, කැනඩාවේ විශ්‍රාම වැටුප අතහැරලා, කැනඩාවේ තිබෙන ආරෝග්‍යශාලා පහසුකම් අතහැරලා- පාර්ලිමේන්තුවට ආවේ ඇයි" කියලා අහනවා. මම ඒ අයට කියනවා, ඔබ වැනි අය වෙනුවෙන් කථා කරන්නට මට අවස්ථාවක් ලැබේ නම්, මම තවත් දේවල් අතහැරලා පාර්ලිමේන්තුවේ ඉන්න කැමැතියි කියලා. ඒ අය නඟන හඬක් තිබෙනවා - අලුත් ලෝකයක් මවන්නට; අලුතින් ආර්ථික ස්වාධීනත්වයක් ඇතිව මේ රටේ අභිමානයෙන් ජීවත් වීමේ රටාවක් ඇති කරන්නට. මේ ඉදිරිපත් කර තිබෙන ආර්ථික වැඩ පිළිවෙළ යටතේ පළමුවරට ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන 3ක්ද, පළාත් පාලන කොට්ඨාසයකට රුපියල් මිලියන 4ක්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියන 15 දක්වා දෙමින් මේ කර ඇත්තේ රටේ මිනිසාගේ, ගැහැණියගේ, දරුවාගේ, ශිෂ්‍යයාගේ, තරුණයාගේ ප්‍රශ්නය එතැනින්ම විසඳන්නට කරන උත්සාහයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
බොහොම ස්තුතියි.

ඒ වැඩ පිළිවෙළට අපි යා යුතුයි. ළඟදී ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා එතුමාගේ ආචාර්ය උපාධි නිබන්ධනයේදී සොයාගත් දේවල් ඉදිරිපත් කළා. මා එතුමාට කිව්වා, ඇතැම් වෙලාවට ආචාර්ය උපාධියක් ලබා ගන්නට ශාස්ත්‍රීය වශයෙන් ඒ දේවල් ඉදිරිපත් කළත්, මේ සියලු දේවල් මහ ජනයා දන්නා දේවල් කියලා. මොනවාද දන්නේ? රජයේ යහපත්කම රැක ගන්නට නම් දූෂණයෙන් තොරව, දේශපාලනීකරණයෙන් තොරව රාජ්‍ය ආයතන නඩත්තු කළ යුතුයි. ලංගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, තැපැල් කන්තෝරුව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා මේ නොකී සියලු ආයතන අද මානව අයිතිය උල්ලංඝනය කරමින් සිටිනවා. ඇයි? මේ රටේ මානවයාට අවශ්‍ය කරන, දිය යුතු සේවාව නොදී පාඩු ලබන ආයතන හැටියට ඒ ආයතන පවත්වාගෙන යෑම නිසා. ඒ නිසා මේ අය වැයේ මා දකින ප්‍රගතිශීලී ඉතාම පැහැදිලි බලාපොරොත්තුව නම්, ඒ ආයතන පිළිබඳව, මාසිකව, කාර්තුවකට, වාර්ෂිකව -හැම මොහොතේම- ප්‍රගති වාර්තා ඉල්ලා සිටීම සහ ඔවුන් ගණන් දිය යුතු පුද්ගලයන් බවට පත් කිරීමයි.

මම ළඟදී කෝප් කමිටුවේ වාඩිවුණා. ශ්‍රී ලංකා සිනමාව සම්බන්ධ ආයතනය වන ජාතික චිත්‍රපට සංස්ථාව අවුරුදු හතකින් Annual Reports හදලා නැහැ. වාර්ෂික ගිණුම් වාර්තා දීලා නැහැ අවුරුදු හතකින්. කොහොමද, මේක වන්නේ? දේශපාලන විද්‍යාව උගන්වන කෙනකු හැටියට මා දකිනවා, මහජන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය රැක ගන්නට සේවාදායක ආර්ථිකයක් ලබා දෙන්න නම්, මේ ආයතන නැවත දේශපාලනීකරණයකින් තොරව නිර්භීතව ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය බව. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, මුදල් ඇමතිතුමාත් නායකත්වය ගන්නවා ඇති. ඒ වැඩ පිළිවෙළට මේ රටේ සියලු ජනතාව මෙන්ම මාත් එකතු වන බව ඉතා සතුටින් කියා නිහඬ වීමට කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருள் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Rural Housing and Construction and Building Material Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மதுர விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. KINS NELSON *left the Chair, and* THE HON. MADHURA WITHANAGE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 2.34]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ දෙවැනි අය වැය, වාගේම බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු පළමුවන අය වැය ගැන මම කථා කරන්න කැමැතියි. මේ අය වැයෙන් අපේ රටේ ඉන්න අහිංසක දුප්පත් ජනතාවට කිසිම සහනයක් නැහැ. රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කිරීමක් කළේ නැහැ. ඒ නිසා මේ අය වැය ජනතාව රවට්ටපු අය වැයක්. මේ රටේ දුප්පත් අහිංසක ජනතාව තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති කරන්න ඡන්දය දුන්නේ. නමුත් අද ඒ මිනිසුන්ගේ ජීවන වියදම අඩු කරන

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා මේ අය වැය පුස්සක්. අද රටේ ජනතාවට ජීවත් වෙන්න විධියක් නැහැ. කන්න බොන්න විධියක් නැහැ. අම්මලා දරුවන්ට වස පොවලා ජීවිතය නැති කර ගන්නා කාලයක් උදාවෙලා තිබෙන්නේ. ගොවියාට පොහොර නැහැ. රටේ ජනතාවට මිලදී ගන්න බඩු නැහැ. කන්න බඩු මුට්ටු ගන්න සල්ලි නැහැ. කෑම උයාගන්න ගෑස් ටික නැහැ. දරුවන්ට කිරි පිටි ටික නැහැ. දරුවන්ට මන්දපෝෂණය හැදෙනවා. ඉදි කිරීම් කටයුතු කරන්න සිමෙන්ති ටික නැහැ. මේසන් බාස්වරුන්ට වැඩ නැහැ. වඩු බාස්ලාට වැඩ නැහැ. චිත්‍ර ඇඳපු තරුණයන්ට රැකියා නැහැ. අද ඒ අය රට යන්න පෝලිම්වල ඉන්නවා. ආණ්ඩුවට දැන් ඩොලර් නැහැ. ඩොලර් හිඟා කනවා. බැංකුවල ඩොලර් නැහැ අපනයනකරුවන්ගේ ඒ අපනයන කටයුතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව වටේ ඉන්න සුළු කර්මාන්ත කරන ධීවරයෝ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ලාම්පු තෙල් හොය හොයා මුහුදු යන්න. හැම වෙරළකම එහෙමයි. අපට දුකයි. ඒ ඇයි? අපට දුක මේකයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, අපේ විමල් රාජපක්ෂ මැතිතුමාත් අපට සමීප පුද්ගලයෝ. එතුමන්ලාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ. නමුත් අර දෙපළගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැන අපට දුකයි. මොකද, අපි ආශ්‍රිය කරපු මනුෂ්‍යයෝ නිසා. *[බාධා කිරීමක්]* ගමේ මනුෂ්‍යයෝ නිසා. ඒ නිසා අපට වේදනායි.

මේ ප්‍රශ්නය ඇති වුණේ ඇයි? මේ ප්‍රශ්නය ඇති වුණේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණාම, ඒ ගොල්ලන්ගේ හෙංචයියන්ට ඒ ගොල්ලන්ගේ ව්‍යාපාරිකයන්ට බදු සහන දුන්නා, රුපියල් බිලියන 600ක්. ඒ නිසා තමයි අද මේ රට මේ තත්ත්වයට වැටිලා තිබෙන්නේ. දැන් බලන්න, අපේ ගෙදරක වියදමට රුපියල් 1,000ක් යනවා නම්, එයින් රුපියල් 700ක් අයින් කළොත් කොහොමද ගෙදර වැඩ කර ගන්නේ? ඒ වාගේ තමයි මේ ආණ්ඩුව දුවන්නත් සල්ලි නැහැ. යාළුවන්ට බදු සහන දුන්නා. එහෙම දුන්න නිසා තමයි අද මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද මේ කවුරුත් එක්ක ඉල්ලාගෙන කන්නේ.

දැන් බහුදින යාත්‍රා හිමියන්ටත් ඩීසල් නැති තත්ත්වයක් උදාවෙමින් පවතිනවා. ඒ ගැනත් කියන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමාගේ පළමුවන වගකීම තමයි මේ රටේ ජනතාව ජීවත් කරවීම. ඒ ගැන දන්නේ නැත්නම් මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් අහන්න ඕනෑ. ඒ වාගේම ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීම එතුමාගේ වගකීම. ඒ කිසි දෙයක් කරන්නේ නැහැ. ඒකාධිපතිකම, උද්දච්චකම, අභිමතය පරිදි කටයුතු කිරීම නිසා තමයි අද අපේ රට හිඟන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ; බංකොලොත් වෙලා තිබෙන්නේ. අද ඩොලර් හිඟා කකා යනවා. අද පිට රටවලින් වැඳ වැඳ ආධාර ඉල්ලනවා. මොකක්ද මේකේ තේරුම? මොකක්ද, මේ සෞභාග්‍යයේ දැක්ම?

ජනාධිපතිතුමාට මම මේ වෙලාවේ කියන්න කැමැතියි, අද මුළු ලංකාවම කළු කඩයක් වෙලා තිබෙන බව. මහා පරිමාණයෙන් ආණ්ඩුවේ හෙංචයියලා, සල්ලිකාරයෝ ජාවාරම් කරනවා. හිතුණු හිතුණු ගණන්වලට බඩු මුට්ටු විකුණනවා. රුපියල් 1,000ක් අරගෙන ගියාම ෂොපිං බෑග් එකක් පිරෙන්න බඩු ගේන්න බැහැ. කන්නේ කොහොමද මිනිස්සු? අද තිබෙන මිල නොවෙයි, හෙට තිබෙන්නේ. හෙට තිබෙන මිල නොවෙයි අනිද්දා තිබෙන්නේ. මේ ආණ්ඩුව අපේ අහිංසක දුප්පත් ජනතාවගේ ලේ උරා බොන ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. අද හාල් කීයද? යහ පාලන ආණ්ඩුව කාලයේ අපි හාල් කීයටද දුන්නේ? අද මිරිස් කීයද, සීනි, පරිප්පු, කිරිපිටි කීයද? අද ගෑස්, ටින් මාළු, එළවලු, පොහොර, සිමෙන්ති කීයද? අද කක්කුස්සි කටක් ගන්න නැහැ. ඉතින් අර පරණ ක්‍රමයට තමයි යන්න වෙලා තිබෙන්නේ. Jungle එකට නැත්නම් beachside එකට තමයි මිනිසුන්ට කක්කුස්සි යන්න වෙලා තිබෙන්නේ. මොකද, අද ගන්න කක්කුස්සි කටවල් නැහැ. *[බාධා කිරීමක්]* ඒ වාගේම ලයිට් බිල, වතුර බිල, ෆෝන් බිල, බේකරි කෑම මිල ඔක්කෝම වැඩි වෙලා. ඉතින් රජයේ සේවකයා කොහොමද ජීවත් වෙන්නේ? කම්කරුවා කොහොමද ජීවත් වෙන්නේ? අපි අහන්නේ ඒකයි. අපි මහ පොළොවේ පය ගහලා ඉන්න මිනිස්සු. අපි මහ ජනතාව අතර ඉන්න මිනිස්සු. අපට ඒ නිසා මේ තත්ත්වය තේරෙනවා. ඒ මිනිස්සු කන්නේ කොහොමද? ඒ මිනිස්සු බොන්නේ කොහොමද?

මේ යන විධියට ගියොත් ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය වෙනකොට මේ රටේ ජනතාව බඩගින්නේ මැරෙන්නත් පුළුවන්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හදන්නේ ජනතාව බඩගින්නේ මරලා, අයියලා දෙදෙනා අනාථ කරලා, මල්ලිලා දෙන්නා මේ රටින් පැනලා යන්නයි. ඒ තත්ත්වය තමයි අද අපේ රටට උදා කරන්න හදන්නේ. අපට කියන්න තිබෙන්නේත් ඒ ගැන තමයි. මහ බැංකු අධිපතිතුමා මුදල් අච්චු ගහනවා. ඇති වනතුරු සල්ලි අච්චු ගහනවා. රටේ උද්ධමනය වැඩිවෙලා. මේ ජනාධිපතිතුමා යුද්ධ කාලයේත් පිට රටට පැනලා ගියා. මේ පවතින දරුණු යුද්ධයේදීත්, මේ වෙලාවේදීත් මේ රට විනාශ කරලා පැනලා යන්න තමයි හදන්නේ. අයියලා දෙදෙනා තනි කරලා මල්ලිලා දෙදෙනා මේ රටින් පැනලා යනවා.

මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මුදල් ඇමතිතුමා කාර්තුවෙන් කාර්තුවට මුදල් ගැනීම සම්බන්ධයෙන් කළ යෝජනාව පිළිබඳව. ඒ කියන්නේ, අවුරුද්දට 4 වතාවකට තමයි අපේ රජයේ ආයතනවලට සල්ලි වෙන් කරන්නේ. අපේ විමධ්‍යගත සල්ලි වෙන් කරන්නේ මේ විධියට. එතකොට රජයේ නිලධාරින්ට මේක ලොකු ප්‍රශ්නයක්. කාර්තුවෙන් කාර්තුවට මුදල් වෙන් කරනකොට කිසිම රජයේ ආයතනයක වැඩ කෙරෙන්නේ නැහැ. ඒ නිසා මේ ක්‍රමය වෙනස් කරන්න කියලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

අද උපාධිධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිගැනීමේ නිලධාරින් හැටියට වැඩ කරනවා. ඒ අය ග්‍රාම නිලධාරිලාගේ පස්සෙන් යනවා, ඒ අයට උදව් කරන්න. ඒ අයට මාසිකව රුපියල් 25,000ක, 30,000ක පඩියක් දෙනවා. දැන් රජයේ සේවකයන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව අවුරුදු 60 සිට අවුරුදු 65 කළා. රජයේ සේවකයාගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව අවුරුදු 5කින් වැඩි කළා. එසේ අවුරුදු 5ක් වැඩි නොකර අවුරුදු 60න් ඒ අය විශ්‍රාම යවලා, උපාධිධාරින්ට ඒ රැකියා ටික ලබා දෙනවා නම් ඒ අයට අභිමානයෙන් රැකියාවක් කරන්න පුළුවන්. අද උපාධිධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වේළෙනවා. ඒ වාගේම තමයි, ත්‍රිරෝද රථ නියාමන අධිකාරියක් පිහිටුවන්න කටයුතු කරලා තිබෙනවා, අවුරුද්දට රුපියල් 750ක් ගෙවන්න. ඒකත් කාර්තු ක්‍රමයට වෙන්න ඇති ගෙවනවා ඇත්තේ. මේ අවුරුද්දේ රුපියල්

750 ගෙවලා register වුණාට පස්සේ, ලබන අවුරුද්දේ ත්‍රිරෝද රථවලටත් පාරේ යන්න බැහැ, ටැක්ස් එකක් ගහනවාය කියන එකත් මම අද කිව්වාය කියලා හිතා ගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න අද කිසිම වැඩ පිළිවෙළක් නැහැ. සංචාරක ව්‍යාපාරය හරහා මහා පරිමාණ ව්‍යාපාරිකයන් නම් කොරෝනා වසංගතය දැඩිව තිබූ පසුගිය අවුරුදු දෙකේදී හොඳට හරිහම්බ කර ගත්තා. උදයංග වීරතුංගලා ඇතුළු ඒ පරම්පරාවේ කට්ටිය, හත්මුතු පරම්පරාවම විදේශ සංචාරකයන් අපේ රටට ගෙන්වලා හම්බ කර ගත්තා. කාමර 3ක්, 4ක් තිබෙන අපේ දකුණු පළාත ඇතුළු රට වටේ තිබෙන අහිංසක දුප්පත් පොඩි සංචාරක ව්‍යාපාරවලට රජයෙන් මොනවාද දුන්නේ? මොකක්ද දුන්නේ? ණයක් දුන්නා. ඒ ණය ආයෙත් ගෙවන්න වුණා. ඒවාත් එකතු කරලා ආයෙත් ගෙවන්න වුණා. අද ඒ මිනිස්සු හිඟන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ ව්‍යාපාරික ස්ථානවල අද ලයිට් කපලා; වතුර කපලා. හෝටල් repair කරන්න බැහැ. සුද්දෝ එක්කෙනා, දෙන්නා එනවා. ඒ සුද්දාත් ගන්න විධියක් නැහැ, මකුළු දැල් කඩලා ඒ ස්ථාන repair කරගන්න විධියක් නැති නිසා. ඒ වාගේ තත්ත්වයක් අද උදා වෙලා තිබෙන්නේ. මොනවාද මේ කරන්නේ? ඇඟලුම් කර්මාන්තය හැරුණු විට සංචාරක ව්‍යාපාරය තමයි මේ රටට විශාල වශයෙන් ආර්ථිකය උත්පාදනය කරන්නේ. මේ දේවල් ඒ අදාළ අය කියන්න ඕනෑ. එහෙම නැත්නම් ජනාධිපතිතුමා මේවා හිතලා කරන්න ඕනෑ. මේ අය අපේ රටට මොකක්ද කරන්නේ කියලා අපට නම් තේරෙන්නේ නැහැ.

දැන් තෙල් පෝලිම තිබෙනවා; ගෑස් පෝලිම තිබෙනවා; සීනි පෝලිම තිබෙනවා; බඩු පෝලිම තිබෙනවා. මේ හැම පෝලිමකම විරුවාගේ ගීතය දාගෙන තමයි ජනතාව ඉන්නේ. විරුවාගේ ගීතය දාගෙන තමයි අද ගෑස් පෝලිම් ඇතුළු හැම පෝලිමකම මිනිස්සු ඉන්නේ. තුනෙන් දෙකක බලයක් ගත්ත ආණ්ඩුවත්, ජනාධිපතිතුමාත් අද ඒ තරම් ජනප්‍රිය වෙලා! මන්ත්‍රීවරු එකසිය හැට ගණනක් ඉන්න ආණ්ඩුව අද ඒ තරම් ජනප්‍රිය වෙලා, විරුවාගේ සිංදුව දාගෙන තමයි අද ගෑස් පෝලිම්වල ඉන්නේ. බොහොම කනගාටුයි.

මේ දේවල් යහ පාලන ආණ්ඩුව කාලයේ තිබුණේ නැහැ.

යහ පාලන ආණ්ඩුව කාලයේ අපේ ජනාධිපතිතුමා රෝහලක් හැදුවා කිව්වා. නමුත්, ඒ රෝහලට තවම උපකරණ දීලා නැහැ. ඒ වාගේම, ඒ රෝහලට වෛද්‍යවරු නැහැ. ඊට අමතරව අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා හම්බන්තොට ඇතුළුව ලංකාවේ පළාත් අට තුළ මධ්‍යම බෙහෙත් ශාලා 8ක් පෞද්ගලික ධනය වියදම් කරලා හැදුවා. ඒ අටම එතුමා පරිත්‍යාග කළා. නමුත්, ඒවා බාර ගත්තේ නැහැ. විශාල මධ්‍යම බෙහෙත් ශාලා 8ක් පළාත් 8 තුළ හැදුවා. අපි දැන් ඒ ගැන ප්‍රකාශ කළා, දැනුම් දුන්නා, නමුත් ගන්නේ නැහැ.

මේ අවුරුද්දේ ග්‍රාමීය පාලම් 1,000ක් හදනවා කිව්වා. ඒ පාලම් දහසේ වැඩ කටයුතු තවම අවසන් කරලා නැහැ. ඒවා භාගෙටයි හදලා තිබෙන්නේ. මම අගමැතිතුමාට මේවා ලිඛිතව දැනුම් දුන්නා. අගමැතිතුමාගේ ගෙවල් ළඟ තිබෙන කටුගම්පොත පාලම බාගෙට හදලා තිබෙන්නේ. මිනිස්සු බැණ බැණ යනවා. හම්බන්තොට පාලම් 18ක් තිබෙනවා. කෝ අපේ ජොන්ස්ටන් ඇමතිතුමා? රටේ පාලම් 1,000ක් හදන්න ඉස්සෙල්ලා ජනාධිපතිතුමාගේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒ පාලම් 18 හදන්න. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා දැනට අවුරුදු දෙකක් වෙනවා. ඒ පාලම් ගිය අවුරුද්දේ හදනවා කිව්වා. මේ අවුරුද්දේ හදනවා කිව්වා. මේ අවුරුද්දේවත් හදලා ඉවර කරන්න. ජනාධිපතිතුමාගේ ගෙවල් ළඟ තිබෙන කටුගම්පොත පාලම හදන්න. ඒ වැඩ කෙරෙනවාද කියලා ගිහින් බලන්න.

අපට මතකයි, 1970 මොකක්ද වුණේ කියලා. සිකුරාදා, අඟහරුවාදා කඩවල බත් උයන්න තහනම් කළා. අපට හොඳට මතකයි. අඟහරුවාදාට කඩවල, හෝටල්වල, ගෙවල්වල මඤ්ඤොක්කා උයන්නේ. මම මඩකලපුවේ ශාන්ත මයිකල් විද්‍යාලයට ගියේ. මම ඉස්කෝලේ ගිහිල්ලා ගෙදර යන කොට පොලීසිය මහ පාරේ පිරිලා. බලන කොට, කඩේ ඉන්න මුදලාලිගේ හට්ටි, මුට්ටි පොලීසියට අරගෙන යනවා. ඇයි? අඟහරුවාදා බත් උයලා! අන්න ඒ යුගය තමයි දැන් මේ උදාවෙගෙන එන්නේ. ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ සහෝදර සමාගම සහ මේ ඉන්න මැති ඇමතිවරු ටික නඩත්තු කරන කොට, හොරකම් කරන කොට, මංකොල්ල කන කොට මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැරුව මහ පාරට බහින්න වෙනවා. මේ රටේ ජනතාවගේ බදු සල්ලි ඉදිරියේදී එන මැතිවරණයට වැඩ කරන්න, තමන්ගේ ගොඩ වැඩ කර ගන්න, හෙංචයියලා පාලනය කරන්න ග්‍රාම නිලධාරි වසමකට ලක්ෂ 40ක්, ප්‍රාදේශීය මන්ත්‍රීවරයෙකුට තවත් ලක්ෂ 30ක් දෙනවා.

මිනිසුන්ට අද කන්න, බොන්න විධියක් නැහැ. බඩු මුට්ටුවල මිල අඩු කරලා මිනිසුන්ට යම් සහනයක් ලබා දෙන්න. පාර තොටවල් හදනවා වාගේ නොවෙයි, ගම්වලට ගිහිල්ලා ඒවාත් බලන්න. අද කුඹුරු වැඩ කරන්නේ නැහැ. අද රටේ මොන වගාවක්වත් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඔබතුමන්ලාට මේක තේරෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සු පුදුම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අපි මහ පොළොවේ පය ගහගෙන ඉන්න නිසා අපට ඒක තේරෙනවා. අහිංසක මිනිසුන්ට කන්න, බොන්න විධියක් නැහැ. මේ විධියට තව මාසයක්, දෙකක් ගියොත් මිනිස්සු මැරිලා යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගෙන් මම අහනවා, ඔබතුමා අපේ රටේ ජනතාව බඩ ගින්නේ තියලා මරන්නද හදන්නේ කියලා. මම ඒ කාරණය ජනාධිපතිතුමාගෙන් අහනවා. මම කෙළින්ම ඇඟිල්ල දික් කරලා අහනවා, "ඇයි මෙහෙම කරන්නේ, අපේ දිස්ත්‍රික්කයේ ජීවත් වුණු කෙනෙකු විධියට ඇයි මේ වාගේ දේවල් කරන්නේ කියලා. මේ රටේ දුප්පත් මිනිසුන්ට කන්න බොන්න විධියක් නැතුව, ජීවත් වෙන්න විධියක් නැතුව අද අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපේ දකුණේ සංචාරක ව්‍යාපාරිකයෝ අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වැඩ කටයුතු හොයලා බලන්න කෙනෙක් නැහැ. දැන් මේ ගරු සභාවේ මුදල් ඇමති නැහැ. මුදල් ඇමති කොහේ ගිහිල්ලාද දන්නේ නැහැ. පෙරේදා ආවේත් නැහැ. මොකක්ද මේකේ තේරුම? රජය කරන්න බැරි නම් භාර දෙන්න. සමහර කට්ටිය කියනවා, "උනුත් එකයි, මුනුත් එකයි" කියලා. අපි උන්ගේ පැත්තේත් නොවෙයි; මුන්ගේ පැත්තේත් නොවෙයි. "උන්" කියන්නේ පොහොට්ටුව. "මුන්" කියන්නේ එක්සත් ජාතික පක්ෂය. අපි සමඟි ජනබලවේගය. අපි සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පැත්තේ. අපි පිරිසිදු මිනිස්සු. අපි හොරු නොවෙයි. අපි හොරුන්ගේ ගණනට වැටිලා නැහැ. [බාධා කිරීමක්] අපේ පක්ෂයේ කිසි මිනිහෙක් හොරකම් කරලා නැහැ. ඒක නිසා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මම කියන්නේ ඇත්ත කථාව. අපි අලුත් පක්ෂයක්. මේ පක්ෂය පිහිටුවලා මාස දෙකෙන් අපි මන්ත්‍රීවරුන් 54දෙනෙක් එක්ක විපක්ෂයේ ප්‍රධාන පක්ෂය බවට පත් වුණා. විපක්ෂ නායකයා හැටියට පත් වුණේත් අපේ පක්ෂයෙන්. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්තයා එක්සත් ජාතික පක්ෂය කඩාගෙන මැතිවරණයට ගිහිල්ලා මන්ත්‍රීවරුන් අට දෙනයි දිනාගත්තේ. අන්න ඒක හොඳට මතක තියා ගන්න. සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැන රටේ ජනතාවට විශ්වාසයක් තිබෙනවා, හොරකම් කරන්නේත් නැහැ. හොරකම් කරන්න ඉඩ දෙන්නේත් නැහැ කියලා. හොරු අපේ ළඟ ඇත්තේත් නැහැ. ඒක නිසා හොරකම් නොකරන නායකයෙක් අපි -

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මධ්‍යම සංස්කෘතික අරමුදලේ සල්ලි ටික ගෙනැත් දෙන්න කියන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මධ්‍යම සංස්කෘතික අරමුදලේ සල්ලි ගෙදර අරගෙන ගියේ නැහැ. ඒ මුදල්වලින් ගොඩනැඟිලි හැදුවා. ඒ වාගේ ජරා වැඩ කරන මිනිහෙක් නොවෙයි, සජිත් ප්‍රේමදාස. හොරකම් කරන්නේ නැහැ. එන්න පෙන්වන්න. හම්බන්තොටට ඇවිල්ලා බලන්න. සජිත් ප්‍රේමදාස හැදුව ඒවා කියලා තමුන්නාන්සේලා ඒවා හදන්නේ නැහැ. පට්ට හොරු නොවෙයි, සජිත් ලා. සජිත් ලා නියම පිරිසිදු මිනිස්සු. අපේ අත්වල ජරාව ගෑවිලා නැහැ. පන්සල් ටික හදලා භාගෙට නිම වෙලා; පාරවල් ටිකේ වැඩ භාගෙට නිම වෙලා; පෙර පාසල් ටිකේ වැඩ භාගෙට නිම කරලා; ඉස්කෝලේ වැඩ භාගෙට නිම කරලා. සජිත් හදපුවා කියලා දැන් ඒවා හදන්නේ නැහැ. රජයේ සල්ලිවලින් ඒවා හදලා තිබෙන්නේ. ඒවා හදන්නේ හොරකම් කරලා නොවෙයි. පන්සල් හදන්නේ හොරකම් කරලා නොවෙයි. සංස්කෘතික අමාත්‍යාංශයේ සල්ලි තිබුණා නම්, ඒ නිකම් තිබෙන සල්ලි අරගෙන වැඩ කරන්න ඕනෑ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
කොණ්ඩේ කපන වැඩේ කවුද කරන්නේ?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
කොණ්ඩේ කපන තැනින් කොණ්ඩේ කපා ගනීවි. සජිත් ප්‍රේමදාස කොණ්ඩේ කපන්න ගියේ නැහැ නේ. සජිත් ප්‍රේමදාස වැඩ කළා. පිස්සු හැදිලා වාගේ ඔබතුමන්ලා කථා කරනවා. සජිත් ප්‍රේමදාස වාගේ මිනිහෙකුට මේ රටේ පාලන බලය දෙන්න ඕනෑ. අපි රටේ පාලන බලය අරගෙන අවුරුදු දෙකක් යන කොට මේ රට හරිගස්සලා පෙන්වනවා කියන එක මම තමුන්නාන්සේලාට මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කෙරෙහි විශ්වාසයක් අද රටේ ජනතාවට තිබෙනවා. රටේ ජනතාවට අපි කියනවා, මේ පක්ෂ දෙක වාගේ නොවෙයි කියලා සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සමඟි ජනබලවේගය පක්ෂය. ඒකේ ඉන්නේ පිරිසිදු කණ්ඩායමක්. ජනතාවගේ ආදරය අපට තිබෙනවා. අපි අවුරුද්දක්, දෙකක් ඇතුළත මේ රට සංවර්ධනය කරලා පෙන්වනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

[අ.භා. 2.49]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 76 වසරක් තිස්සේ මේ රටේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් වුණා. අපිත් අවුරුදු ගානක් තිස්සේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඒ අය වැය කථාවලට සවන් දීලා, සමහර කාලවල විරුද්ධ වුණා; සමහර කාලවල පක්ෂ වුණා. නිදහස ලබා දශක ගණනාවකට පස්සේ අද අපි රටක් හැටියට අතිශය අමාරු ආර්ථික අර්බුදයකට මුහුණ පාලා සිටිනවා. එවන් මොහොතකයි මේ අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මෙය අපි රට ගැන හිතා කටයුතු කරන්න ඕනෑ වෙලාවක්. මේ තත්ත්වයේ තිබෙන රටක ආණ්ඩුවක් භාර ගන්නත් කවුරුත් ඉදිරිපත් වෙයිද කියන ප්‍රශ්නයකුත් තිබෙන මට්ටමට අද අපේ ආර්ථිකය වැටිලා තිබෙනවා. අපි පළමුව සිතිය යුත්තේ රට ගැනයි. රට ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය විසඳුම් සෙවීම සඳහා හැම දෙනාම එකතු වෙන්න ඕනෑ. ඒ ගමනේදී අද අපි ප්‍රධාන වශයෙන් දකින්නේ මොකක්ද? අපේ විදේශ සංචිත හිතා ගන්න බැරි විධියට පහළ වැටී තිබෙනවා. එහෙම නම් අපි කරන්න ඕනෑ මොකක්ද? විදේශ විනිමය උපයන ක්‍රම සහ විදේශ විනිමය අපතේ යෑම නවත්වා ගන්නා ක්‍රම ක්‍රියාත්මක කිරීමට, අනවශ්‍ය ලෙස කෙරෙන නාස්තිකාර වියදම් අඩු කිරීමට කටයුතු කිරීමයි. ඒ සඳහා දැක්මක් එක්ක වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. අපේ අපනයන ඉහළ දමන, අපේ ආයෝජන වැඩි කරන හා ආයෝජකයන් ආකර්ෂණය කරන වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

පත්තරේ විස්තරේ අහන්න අද උදේ රූපවාහිනිය බලනකොට, පත්තරේ පළවී තිබුණේ මොනවාද? ඒ සඳහන් වන විස්තර අනුව ආනයන වියදම පසුගිය වසරට සාපේක්ෂව සියයට 26කින් වැඩි වෙලා තිබෙනවා. වාහන ගෙනෙන එක නවත්වලා, සුඛෝපභෝගී භාණ්ඩ ගෙනෙන එක නවත්වලා, බොහෝ ආනයන සීමා කරලා තිබෙන විටත් ආනයන වියදම විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මෙහිදී අපි තේරුම් ගන්න ඕනෑ, මේ වැඩ පිළිවෙළේ යම්කිසි ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙන බව. ඒ ප්‍රායෝගික ප්‍රශ්නය කුමක්ද කියලා අපි අවධානය යොමු කළ යුතුමයි. ඒ සඳහා අප මූල්‍ය විනය ඇති කරගත යුතුයි. මූල්‍ය විනය ඇති කරගෙන, මේ මොහොතේ තිබෙන ප්‍රශ්නයෙන්, අභියෝගයෙන් රට ගොඩගැනීමට කටයුතු කළ යුතුයි. ඒ සඳහා අපට පැහැදිලි ආර්ථික ප්‍රතිපත්තියක් එක්ක, පැහැදිලි විදේශ ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. අපි මූල්‍ය විනයක් තිබෙන රටක් හැටියට පිළිගන්න මට්ටමට පැවැත්මක් ඇති කරගෙන, විදේශ ණය ගත්ත ආයතන එක්ක, රටවල් එක්ක මිත්‍රයකු හැටියට කථා කරලා, ඔවුන්ගෙන් ණය ගෙවීම සඳහා කාලයක් ඉල්ලා ගත්තේ නැත්නම් සහ ණය ගෙවීම සඳහා දිගු කාලීන වැඩ පිළිවෙළකට ගියේ නැත්නම්, මේ මොන කාරණා අපි කථා කළත්, ඉදිරිපත් කළත්, මට දැනෙන විධියට ඉදිරි මාස කීපය තුළ අතිශය බරපතළ තත්ත්වයකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

මේ රටේ වැඩිම ආදායම ලබන්න පුළුවන් ව්‍යාපාරය තමයි, තෙල් පිරිපහදුව. මම මේ කටට එන වචන නොවෙයි කියන්නේ. 1969දී මේ රටේ දිනකට බැරල් 50,000ක් නිෂ්පාදනය කෙරෙන පිරිපහදුවක් ආරම්භ කළා. අදටත් තිබෙන්නේ ඒ පිරිපහදුව. ජනාධිපතිතුමා පත් වෙලා, අපේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු දෙකක් ගත වන මොහොතේ බලශක්ති අමාත්‍යාංශය කියනවා, "පිරිපහදුව දුවන්නේ පාඩුවට" කියලා. පිරිපහදුව පාඩුවට දිව්වා නම්, ඒකට අපි හැම දෙනාම වග කියන්න ඕනෑ. මම කියන්නේ, මේ ආණ්ඩුවත් අවුරුදු දෙකක් ඒක තේරුම් ගන්න කල් ගත්ත එකට වග කියන්න ඕනෑ. ඊට කලින් තිබුණු ආණ්ඩුත් ඒකට වග කියන්න ඕනෑ. ලෝකයේ ඊට පස්සේ පිරිපහදු ආරම්භ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩි කීයක් කථා කරලා තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා මිනිත්තු හතක් කථා කරලා තිබෙනවා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මට තවත් විනාඩි හතරක්, පහක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතකොට අනෙක් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හැම දාම කථා කරන්න අවස්ථාව දෙන්නේත් නැහැ. ඒ නිසා අපි රටට වැදගත් දෙයක් කියනකොට ඒකට අවස්ථාවක් දෙන්න. *[බාධා කිරීමක්]* ඒවා නම් එපා. *[බාධා කිරීමක්]* ඒවා අවශ්‍ය නැහැ. ජනතාව වෙනුවෙන් කරුණු ටික කියන්න අවස්ථාවක් දෙන්න කියලායි ඉල්ලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016දී මේ රටේ හිටපු වෘත්තිකයන්ගෙන්, මූල්‍ය විශේෂඥයන්ගෙන්, පෙට්‍රෝලියම් ක්ෂේත්‍රයේ පිළිගත් විශේෂඥයන්ගෙන් සමන්විත වූ කමිටුවක් පත් කරලා අපි අධ්‍යයනයක් කළා. ඒ අධ්‍යයනයට අනුව ලංකාවේ අවශ්‍යතාව වන බැරල් ලක්ෂයකට අපේ පවතින පිරිපහදුව වැඩි දියුණු කිරීමට ඒ මොහොතේ අවශ්‍ය වුණේ, ඩොලර් බිලියන 2.1යි. ඒ ඩොලර් බිලියන 2.1 ආයෝජනය කරලා, hydrocracker යන්ත්‍රයක් එක්ක අලුත් තාක්ෂණය හඳුන්වා දුන්නා නම් අපට වසරකට ලබන්න පුළුවන් ලාභය, වසරකට කරන්න පුළුවන් ඉතිරිය අවම වශයෙන් ඩොලර් මිලියන 345යි; වැඩිම ඩොලර් මිලියන 460යි. මේක අපි කරපු අධ්‍යයනයක්, අපේ හිතලුවක් නොවෙයි. මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් මේ අවස්ථාවේ රජයේ නිලධාරින්ගේ මැදිරියේ ඉන්නවා. මුදල් අමාත්‍යාංශයේත් කමිටුවක් පත් කරලා, 2011 සිට 2015 වෙනකල් මේ රටේ තිබුණු actual පරිභෝජනය උපයෝගී කරගෙනයි ඒ වාර්තාව හැදුවේ. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණා නම්, අවුරුදු හතරක්, පහක් යන්න කලින් ඒ මුදලත් ගෙවලා, මේ රටට පිරිපහදුවක් දායාද කරලා, අද වනකොට විශාල මුදලක් උපයනවා. මම අභියෝග කරනවා, ලංකාවේ ඩොලර් මිලියන 460ක ලාභයක් උපයන කිසිම ව්‍යාපාරයක් නැහැ කියලා. අපට මොකක්ද වෙලා තිබෙන්නේ? සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතියට අදාළ එම වාර්තාව මම **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රට ඉදිරියට ගෙන යෑම සඳහා උපයෝගී කර ගත හැකි කාරණාවක් හැටියට වර්තමානයේදීවත් මේ වාර්තාව ප්‍රයෝජනයට ගන්න.

විශේෂයෙන්ම ගාලු දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා මේ වෙලාවේ කියන්න ඕනෑ, අද තේවලට, කුරුඳුවලට පොහොර ටික නැතුව, යූරියා ටික නැතුව අපේ ජනතාව දුක් විඳින බව. අපි දිගින් දිගටම ඉල්ලුවා, මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කියලා.

අද යූරියා පොහොර මිටියක් කීයද? මට ඊයේ ගමේ කෙනෙක් මුණ ගැහුණා. ඔහු කිව්වා, යූරියා පොහොර මිටි 10ක් ඇවිල්ලා තිබෙනවා, එක පොහොර මිටියක් රුපියල් 10,000යි කියලා. අපේ අපනයන ආදායම තවදුරටත් වර්ධනය කරන්න නම් පොහොර ටික අවශ්‍යයි. පොහොරවලට වියදම් කරන මුදලත් එක්ක බලනකොට තේවලින් ලබන වාර්ෂික අපනයන ආදායම සොච්චමක්. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියා ගරු ඇමතිතුමාගෙන් මා ඉතාම ඕනෑකමින් ඉල්ලනවා.

මේ වර්ෂය වර්ෂාපතනය වැඩිම වර්ෂයයි. වර්ෂාපතනය වැඩිම වර්ෂයේ අපි ඒකෙන් ප්‍රයෝජන ගත්තේ නැහැ. හදිසි තීරණ ගත් නිසා කෘෂි කර්මාන්තයෙන්, වැවිලි කර්මාන්තයෙන් ඓතිහාසික ආදායමක් ලබන්න තිබුණු අවුරුද්ද අපි අතහැරියා. අපි මේ පිළිබඳව අවධානය යොමු කරන්න අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශයේ කරන සංචාරක කර්මාන්තය අද බිමටම වැටිලා තිබෙනවා. සංචාරකයකුට ලංකාවේ ගුවන් තොටුපොළෙන් පිටතට එන්න විශාල කාලයක් ගතවෙනවා. මා ඉල්ලා සිටිනවා, කරුණාකර, ඒ අයට ගුවන් තොටුපොළෙන් කඩිනමින් පිටතට එන්න අවස්ථාව සලසා දෙන්න කියලා. ඊයේත් මට හබරාදූවේදී ප්‍රංශයේ සංචාරකයන් කණ්ඩායමක් මුණ ගැහුණා. ඒ අය කිව්වා, ඔවුන්ට ගුවන් තොටුපොළෙන් පිටතට එන්න විනාඩි 30කට, විනාඩි 45කට වැඩි කාලයක් ගත වුණා කියලා. ඒ නිසා විනාඩි 10ක් ඇතුළත පිටතට එන්න හැකිවන ආකාරයට වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

අපි මේ කථා කරන්නේ, රටට ආදායම ගෙනෙන ක්‍රම ගැනයි. වියදම, විනාශය, නාස්තිය නවත්වන්න ඕනෑ. ජනාධිපතිතුමා පාවිච්චි කරන්නේ වාහන තුනයි. අපි ඒක අගය කරනවා. හොඳ දේ හොඳයි කියන්න ඕනෑ. හැබැයි, එතුමාගේ පහළ ඉන්න නිලධාරින් පාරේ යනකොට සමහර වෙලාවට ඒ වාහන පෙළපාළිය "රුහුණු කුමාරි" දුම්රියටත් වඩා දිගයි. ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ නාස්තිය නවත්වා දූප්පත්, අහිංසක සොල්දාදුවන්ගේ ශුභ සාධනයට ඒ මුදල් යොමු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කරුණු රාශියක් කියන්න තිබෙනවා. රටේ අනාගතය වෙනුවෙන් විදේශ රටවලට යන්න පෝලිමේ ඉන්න දරුවන්ට අපි ආරම්භ කරපු skills passports ලබා දීලා, ඒ අය ශක්තිමත් කරලා, හැකියාවක් එක්ක රැකියාගත කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න කියා මා කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැඩිපුරත් කාලය ලබාගෙන තිබෙනවා. කරුණාකරලා ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මේ කාරණයත් කෙටියෙන් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රතිපත්ති, අරමුණු හොඳයි. සිංහල බෞද්ධයන් වශයෙන් අපි හැම විටම කියන්නේ, "නිවන් සැප ලබන්න, නිවන් ලබන්න" කියලායි. නමුත් ගාල්ලේ හෝ ලංකාවේ සිංහල බෞද්ධයන් නිවන් සැප ලබා නැතිව ඇති. ඒ වාගේ තමයි. මේ රට සංවර්ධනය කරන්න ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළත් හොඳයි; අපේ අරමුණුත් හොඳයි. ඒ අරමුණ කරා ගමන් කරන වැඩ පිළිවෙළේ යම් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තේරුම්ගෙන සංවර්ධනය කරා මේ රට මෙහෙයවන්නට අවශ්‍ය, ජනතාවට උත්තරය දිය හැකි, විනිවිදභාවයෙන් යුතු වැඩ පිළිවෙළක් මේ වර්ෂයේදී ක්‍රියාත්මක කරන්න රජයට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජයන්ත සමරවීර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු ජයන්ත සමරවීර මහතා (ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயந்த சமரவீர - களஞ்சிய வசதிகள், கொள்கலன் முனையங்கள், துறைமுக வழங்கல் வசதிகள், இயந்திரப் படகுகள் மற்றும் கப்பற்றொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Jayantha Samaraweera - State Minister of Warehouse Facilities, Container Yards, Port Supply Facilities and Boats and Shipping Industry Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ දෙවර්ෂ පූර්ණය සිදුවන අවස්ථාවේදී, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට මේ රටේ හැටනව ලක්ෂයක ජනතාව ඓතිහාසික ජන වරමක් ලබා දෙමින් මේ රට භාරදීලා, දෙවර්ෂ පූර්ණය සම්පූර්ණ වන අවස්ථාවේ, ශ්‍රී ලංකාවේ 76වන අය වැය විවාදයට එකතු වෙන්න ලැබීම සතුටක් කොට සලකනවා. ඒ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මගේ ගෞරවය, ප්‍රණාමය පුද කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ 76වන අය වැය ලේඛනය ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමන් ඉදිරිපත් කරන්නේ, මට පෙර කථා කළ මැති ඇමතිතුමන්ලා සඳහන් කළ පරිදි මුළු මහත් ලෝකයම නව සාමාන්‍ය තත්ත්වයකට මුහුණ දෙමින් සිටින අවස්ථාවකයි.

අපි දන්නවා, ශ්‍රී ලංකාව කොවිඩ් - 19 වසංගතයට ගොදුරු වුණේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර ගත්තාට පසුව බව. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගත්තේ 2019.11.19වන දා. ඊට හරියටම මාස දෙකයි, දවස් නවයකට පසුව, ඒ කියන්නේ 2020 ජනවාරි 28වන දා තමයි ශ්‍රී ලංකාවේ පළමු කොවිඩ් ආසාදිතයා ලෙස චීන කාන්තාවක් ශ්‍රී ලංකාවෙන් හමු වුණේ. එතැන් සිට අප තවමත් මේ ගමන් කරන්නේ, කොවිඩ් වසංගත තත්ත්වය තුළයි කියන එක මා අමුතුවෙන් කිව යුතු නැහැ. එහෙම නම්, මේ අය වැය විවාදයේදී අප කරුණු සලකා බලන්න ඕනෑ, මේ අය වැය සම්බන්ධයෙන් අප විවාද කරන්න ඕනෑ, මේ අය වැයේදී අප තර්ක විතර්ක කරගන්න ඕනෑ, මේ අය වැය ඉදිරිපත් කරන කාල වකවානුව පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව බවයි මම විශ්වාස කරන්නේ. මේ කාල වකවානුවට සාපේක්ෂව, මේ අය වැය ඉදිරිපත් කරන නව සාමාන්‍ය තත්ත්වයට සාපේක්ෂව තමයි මේ අය වැය පිළිබඳ පක්ෂ, විපක්ෂ මත දැක්වීම අප කළ යුතු වන්නේ.

මෙවැනි තත්ත්වයක නොවෙයි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා, රොනී ද මැල් මැතිතුමා, සරත් අමුණුගම මැතිතුමා, රවි කරුණානායක මැතිතුමා, මංගල සමරවීර මැතිතුමා ආදි පූර්වගාමී මුදල් අමාත්‍යවරුන් අය වැය ඉදිරිපත් කළේ. අපේ රටේ පූර්වගාමී මුදල් අමාත්‍යවරුන් අය වැය ඉදිරිපත් කළේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළා වාගේ අභියෝගාත්මක තත්ත්වයක සිට නොවෙයි. රට වසා තිබෙන තත්ත්වයක් තුළ, සංචරණ සීමා පනවන තත්ත්වයක් තුළ, ලෝකයේත්, ශ්‍රී ලංකාවේත් ආර්ථික ක්‍රියාකාරිත්වය, සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය මුළුමනින් අඩ පණ වෙච්ච, දුර්මුඛ වෙච්ච තත්ත්වයක් තුළ තමයි මේ අය වැය ලේඛනය මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ. ඒ තත්ත්වයට සාපේක්ෂව තමයි විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීවරුන් මේ අය වැය දිහා බලන්න ඕනෑ. හීනෙන් බය වෙලා වාගේ මේ දිහා බලලා හරියන්නේ නැහැ.

අපි දන්නවා, අපේ රටේ සංචාරක කර්මාන්තය මුළුමනින් බිඳ වැටුණු බව. එම තත්ත්වය මට පෙර කථා කළ මන්ත්‍රීවරු සංඛ්‍යාලේඛන සහිතව ඉදිරිපත් කළා. ඒකෙන් ඩොලර් බිලියන 5ක් ශ්‍රී ලංකාවට අහිමි වුණා. අපේ අපනයන කර්මාන්තය සැලකිය යුතු මට්ටමකින් අඩ පණ වුණා. විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැප්තැම්බර් මාසය වන කොටත් සියයට තිහහතළිහකින් අඩු වෙලා තිබෙනවා. මීට සාපේක්ෂව නොවෙයිද, මේ ගැන සලකා බලන්න ඕනෑ? මීට සාපේක්ෂවයි මේ ගැන සලකා බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට 2019 නොවැම්බර් මාසයේ 19වන දින මේ රට භාර දෙනකොට අප සිටියේ කවර ආර්ථික තත්ත්වයකද? අපේ රටේ ණයබර අනුව, ඉතිහාසයේ අප ලබාගත් මුළුමහත් ණය ප්‍රමාණය ඩොලර් බිලියන 7යි. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට යහ පාලන ආණ්ඩුව මේ රට භාර දෙනකොට එය ඩොලර් බිලියන 14 යි. ණයබර සියයට සියයකින් වැඩියි. ඒ විතරක් නොවෙයි. සියයට 6ට තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 2.3ට, 2.5ට වට්ටපු තත්ත්යක් තිබුණේ. දියවැඩියාවෙන් පෙළෙන රෝගියෙකුට හදිසි අනතුරක් වුණා වාගේ දෙයක් තමයි කොවිඩ්-19 හැදුණාම අපට වුණේ. බරපතළ ආර්ථික අර්බුදයක් සහිත රටකට තමයි, ආර්ථික වර්ධන වේගය පත්ලට කඩා වැටුණු රටකට තමයි, ණයබර සියයට 100කින් වැඩි වෙච්ච රටකට තමයි කොවිඩ්-19 වසංගතය හැදුණේ. ඒ නිසා මුළු මහත් රටම වසා දමන්න සිද්ධ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තත්ත්වයට සාපේක්ෂවයි මේ අය වැය ගැන කරුණු දක්වන්න ඕනෑ; මේ අය වැය ගැන සලකා බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් - 19 ශ්‍රී ලංකා ආර්ථික දේහයට වැලඳුණාට පස්සේ, මේ ආර්ථික දේහයට ප්‍රතිකාර කරන්න පටන් ගත්තාට පස්සේ තමයි මේ ආර්ථික දේහය තුළ තිබෙන තව තවත් රෝගාබාධ හරියට හඳුනා ගන්න පුළුවන් වුණේ. මම හිතනවා, අපට තිබෙන ඇත්ත ලෙඩේ සොයා ගන්න පුළුවන් වීම අප කවුරුත් ලබපු ජයග්‍රහණයක් කියලා. වළකට වැටෙන්න ඕනෑ ලු, මොළයට ලාභයක් එන්න. කොවිඩ් වසංගතය නිසා ශ්‍රී ලංකා ආර්ථික දේහයට වෙච්ච ආතුරභාවය පරීක්ෂා කරන කොට ශ්‍රී ලංකා ආර්ථික දේහයට වැලඳී තිබෙන ඊට වඩා භයානක රෝග හඳුනා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දෙපැත්තේ අය වාද විවාද කර ගන්නවා; දඹරහිල්ල දිගුකර ගන්නවා. ඇත්තටම අපේ රටට වෙලා තිබෙන්නේ මොකක්ද? කොවිඩ් වසංගතයත් එක්ක අපට ඒක ඉතා මැනවින් පිළිබිඹු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අන් කිසිවක් නොව, ශ්‍රී ලාංකීය ජාතියේ, ජාතික ආර්ථිකයේ පදනම සම්පූර්ණයෙන් කඩා බිඳ දැමීමයි, දුර්වල කර දැමීමයි. මෙය ආරම්භ වන්නේ කවදාද?

1977 වනකොට මොන අඩු පාඩු තිබුණත් සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් මේ රට ජාතික ආර්ථික, නිෂ්පාදන ආර්ථික මහක ගමන් කළා. "සිය රට දේ - සිරි සැප දේ" කියලා අපට ඕනෑ කරන, අප කන බොන, අඳින පළඳින සියල්ල මේ රටේ නිපදවීම ආරම්භ කරනු ලැබුවා. එදා ඒ සඳහා වන දැවන්ත රාජ්‍ය ව්‍යවසාය පද්ධතියක්, හැම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ආරම්භ කළා. කැලණි ටයර් සංස්ථාව අපට මුණ ගැහෙන්නේ, ඔරුවල වානේ සංස්ථාව අපට මුණ ගැහෙන්නේ, තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය අපට මුණ ගැහෙන්නේ, තුනී ලෑලි සංස්ථාව අපට මුණ ගැහෙන්නේ, පූගොඩ, වේයන්ගොඩ සහ තුල්හිරිය පෙහෙකම්හල් අපට මුණ

ගැහෙන්නේ එහි ප්‍රතිඵල වශයෙන්. රජය මැදිහත් වෙලා, ආණ්ඩුව මැදිහත් වෙලා බැර කර්මාන්ත ගණනාවක් මේ රටේ ආරම්භ කරලා, ආනයන ආදේශන - අපනයන අභිමුඛ කර්මාන්ත ආරම්භ කරලා නිෂ්පාදන ආර්ථික ගමනකට මේ රට, මේ රටේ ජාතික ආර්ථිකය හැරෙව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් පෞද්ගලික අංශයෙන් බිහි වුණා. කුඩා කර්මාන්තකරුවන්, ගෘහ කර්මාන්තකරුවන් මේ රටේ ගම් බිම්වලින් බිහි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශයේ, වාද්දුවේ තිබුණා, පේදුරුතුඩුවට යැවූ, පේදුරුතුඩුවේ දෙමළ ගොවියාත් පාවිච්චි කළ "ගොවියා සබන්" කියලා සබන් කැටයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශයේ, වාද්දුවේ තිබුණා, මඩකලපුවේ මුස්ලිම් ජනයා පාවිච්චි කළ "දයානන්ද හකුරු" කියලා හකුරු කැටයක්. එදා මේ විධියට මුළුමහත් රටේම සුළු කර්මාන්තකරුවන් ධෛර්යයෙන් නිෂ්පාදන කාර්යයට අත ගැහුවා; ගෘහ කර්මාන්තකරුවන් ධෛර්යයෙන් ගෘහ කර්මාන්තවලට අත ගැහුවා. දාස මුදලාලි "ඩියුරෝ" නිෂ්පාදන වෙළෙඳ පොළට එළි දැක්වූවා. එදා මේ විධියට මහා ජාතික කර්මාන්ත පුනරුදයක් සමඟ නිෂ්පාදන ආර්ථික ගමනකට මේ රට හැරෙව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා උතුරේ ගොවි ජනතාව වැව්වා, අපට ඕනෑ කරන එළවලු ටික, පලතුරු ටික. ආඩියා ළිඳෙන් වතුර ඇදලා අපට ඕනෑ කරන එළවලු ටික, පලතුරු ටික, අපට ඕනෑ කරන මිදි ටික, ලූනු ටික ඒ ප්‍රදේශවල වැව්වා. නමුත් මොකද වුණේ? 1977 ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ඒකට ගිනි බින්දා; මේ රටේ ජාතික ආර්ථික ගමන වැනසුවා; කොල්ලකාරී විවෘත ආර්ථික ප්‍රතිපත්තියට, නැත්නම් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට මේ රට හැරෙව්වා; මේ රටේ ජාතික ආර්ථික ගමන මුළුමනින් වැනසුවා. එතැනින් පස්සේ මේ රටේ ගෘහ කර්මාන්ත ටික වැනසි වැනසී යනවා. එතැනින් පස්සේ මේ රටේ කුඩා කර්මාන්ත ටික වැනසි වැනසී යනවා. එතැනින් පස්සේ මේ රටේ රාජ්‍ය ව්‍යවසාය ටික වැනසි වැනසී යනවා.

අද කැලණි ටයර් කෝ? නැහැ. අද ඔරුවල වානේ කෝ? නැහැ. අද තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය කෝ? නැහැ. අද තුනී ලෑලි සංස්ථාව කෝ? නැහැ. ඒ විතරක් නොවෙයි, එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ දූරදර්ශී නායකත්වයෙන්, ආචාර්ය එන්.එම්. පෙරේරා මුදල් අමාත්‍යතුමාගේ නායකත්වයෙන් තවත් දේවල් නිෂ්පාදනය කළා. අපේ රටේ ජනතාවට අරක්කු බොන්න ඕනෑ වුණා නම්, ජාතික ස්කාගාර සංස්ථාව අරක්කු ටිකත් පෙරා දුන්නා. අරක්කු ටිකත් පෙරුවා ස්කාගාර සංස්ථාව හරහා. එහෙම ජාතික ආර්ථික ගමනකට මේ රට හරවා තිබුණු තත්ත්වය තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන්ලා වනසලා, විනාශ කරලා දැම්මේ. ඒකේ ආදීනව තමයි අද කොවිඩ් වසංගත තත්ත්වය ඇතුළේ අප මේ භුක්ති විඳින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ඔබතුමා මට තව විනාඩි දෙකක් දෙන්න, මේ කථාව අවසන් කරන්න.

අපි මේ කාරණය විශ්වාස කරනවා. අපි වළකට වැටීම අපට ලාභයක් කර ගන්න ඕනෑ. මේ කොවිඩ් -19 වසංගත තත්ත්වයෙන් අපි ඉගෙන ගත්ත පාඩම අන් කවරක්වත් නොවෙයි. මේ නව ලිබරල්වාදී ආර්ථික ගමනට අද ලංකාවේත්, ලෝකයේත් මානව සංහතියට කිසිදු යහපත් ජයග්‍රහණයක් ලබා දෙන්න බැහැ කියන එක අද ඔප්පු වෙලා ඉවරයි. අද ඒකට දෙන්න පුළුවන් විනාශය විතරයි. අද ශ්‍රී ලංකාවට මේ නව ලිබරල්වාදී ආර්ථිකය උරුම කරලා තියෙන්නේ මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අස්වැන්නට මිලක් නැති වී ගොවියෝ, කිරි ගොවියෝ, එළවලු ගොවියෝ, පලතුරු ගොවියෝ ඉන්නවා. උතුරේ ගොවීන්ගේ අස්වැන්නට මිලක් නැහැ.

ඒ විතරක් නොවෙයි. විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියෝ, කුස ගින්දරේ ජීවත් වෙන මහා ජනගහනයක්, දරුවෝ නොසලකා මහ පාරට වැටුණු වැඩිහිටියෝ ඉන්නවා. දූව දූෂණය කරන තාත්තලා, දරුවෝ විකුණන අම්මලා ගැන නොවෙයිද අද අපට අහන්න ලැබිලා තිබෙන්නේ? අද හිතක් පපුවක් නැති මිනිස් සමාජයක්, එකෙකුට එකෙක් නැති මිනිස් සමාජයක්, අසංස්කෘතික මිනිහෙක් අපට ලැබිලා තිබෙන්නේ.

මට මතක් වෙනවා, මේ නව ලිබරල්වාදී ආර්ථිකය ගැන නෝම් චොම්ස්කි කියන දාර්ශනිකයා කියපු කථාවක්. ඔහු කියනවා, "නව ලිබරල්වාදී ප්‍රජාතන්ත්‍රවාදය යනු, පුරවැසියා වෙනුවට පාරිභෝගිකයෙකු බිහි කරන, ප්‍රජාව වෙනුවට සාප්පු සංකීර්ණ බිහි කරන, මිනිසුන්ගේ සාමූහිකත්වය අකා මකා දාන, ශුද්ධ වශයෙන් මිනිසා නොමිනිසෙකු බවට පත් කරන, ජන සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයට මුළුමනින්ම හතුරු සමාජ ආර්ථික ක්‍රමයක්" කියලා. මේක තමයි ඇත්ත. මම අහගෙන හිටියා, අද රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ කථාව. එතුමිය කිව්වා, "සඳහිරු සෑයට වෙන් කරපු මුදල් හොඳයි ලු, යුද්ධයේදී මිය ගිය රණ විරුවන්ගේ සහ එල්ටීටීඊ සමාජිකයන්ගේ වැන්දඹුවන්ට ලබා දුන්නා නම්" කියලා. ඔන්න පාරිභෝගිකයා! චොම්ස්කි කියන විද්වතා නව ලිබරල්වාදය විධියට හඳලා තිබෙන්නේ මිනිහෙක් නොවෙයි, පාරිභෝගිකයෙක්. පුරවැසියෙක් නොවෙයි, පාරිභෝගිකයෙක්. මිලදී ගැනීම නමැති අයිස් වතුරේ සියල්ල ගිල්වා මරා දමා තිබෙන අමුම අමු ගනුදෙනුකරුවෙක්. ඒක තමයි මේ ඔප්පු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි මේ කොවිඩ් -19 වසංගතයෙන් උගත යුතු පාඩම නම්, අන් කවරක්වත් නොවෙයි, මේකයි. "ගෝඨාභය රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම් වුණු ජාතික ආර්ථික ගමනකට මේ රට හරවලා, අපට ඕනෑ දේ අපේ පොළොවෙන්, අපේ දෑතින් අප නිපදවන ජාතික ආර්ථික ගමනකට හැරවූවොත්, අපට ඕනෑ ඩොලර් ටික හොයාගන්න පුළුවන්, අපට ඕනෑ කරන ආර්ථික තත්ත්වයට මේ රට ගෙනයන්න පුළුවන්. එහෙම නැතුව රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා වාගේ, හර්ෂ ද සිල්වා මහත්මයා කියනවා වාගේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF- පිටිපස්සේ ගාටලා මේක කරන්න බැහැ. ඒ වට්ටෝරු පත අට එකට හින්දලා, බීලා හරි යන්නේ නැහැ කියන එක මා අවධාරණය කරනවා. ජාතික ආර්ථික ගමනකට මේ රට හැරවීම මේ අය වැයේ ප්‍රමුඛතම කාර්යභාරය බවට පත් වී තිබෙන වෙලාවේ ඉදිරි දෙවසර තුළ "ගෝඨාභය රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් බවට පත් කර ගැනීමට අපට හැකියාව ලැබේවා යි පතමින්, ඔබතුමාට කෘතවේදීත්වය පළ කරමින් මම නවතිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සියලුදෙනාටම බොහොම ස්තුතියි,

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මැතිතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මධුර විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு மதுர விதானகே அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MADHURA WITHANAGE *left the Chair, and* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please commence your speech.

[3.16 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I must say that I am quite privileged to speak when you, one of the most honourable Members and also one who consistently and intellectually delivers to the Debates of this House, are in the Chair. So, in that way, I am quite privileged to speak now.

Last year, when the Gotabaya Rajapaksa Government presented its first Budget, I made it a point to state that the country cannot look upon the North-East as the same as the rest and the most important instrument that must reflect that difference is the Budget. I said that one year ago, Madam, because the North-East has been a region that had been affected by war; it had been completely destroyed and the economies of the people there lag behind some 35 years, not only with regard to genuine capital, but also with regard to capacity. So, just because the war is over, to essentially treat that part of the country in an equal footing with the rest is to perpetuate their disadvantage because you have already created a situation where they are in a rut and without recognizing the fact that they are in that rut, you are trying to treat them that way. Therefore, first, in some way, protect whatever that they have and then come up with some sort of policy that can strengthen their economies so that at some point during the course of the incumbent Government's term, they can reach a stage where they can thereafter try to compete with the rest of the country. If you do not adopt such an approach, but rather continue to simply forget the fact that they are 35 years lagging behind and treat them on an equal footing with the rest of the country, you would be perpetuating their pauperization and disadvantage. By creating a situation, like what you are doing now, where you build infrastructure facilities like roads and various other facilities in the North-East, you are only creating a situation where people from outside the North-East can quite simply come to that area and take over the economy.

I am not a person who essentially takes after protectionism, but in a situation where peoples are not equal, in a situation where regions are not equal, you have to resort to such protectionism if you are to protect those vulnerable people. The previous Budget failed to do that; this Budget goes even further in failing to do that. The justification, if at all, that this Government can give is that the rest of the country has also been suffering because of the COVID pandemic and the whole country's economy is in a bad footing. But, you cannot compare the negativities of the rest of the country with that of the North-East. The situation in the North-East is ten times worse, at least ten times worse, because of the COVID situation. But this Government does not care; not one utterance from the Government Benches has tried to, in some way, address those concerns.

Hon. Presiding Member, you know that the North-East stands on three pillars economically: fishing, farming and to some extent, trade.

But, fishing continues to be an area where the Government systematically destroys livelihoods. The Navy works in a way where it protects illegal fishermen coming into the North and the East from other areas and using banned methods of fishing and in the process, destroying the fishing nets and the various other assets of the local fishermen. Not only that, you also have the Navy deliberately allowing foreign fishermen, fishermen belonging to India, to come to the northern waters and once again use illegal fishing means and in the process, destroying all the assets. We, my Colleague, the Hon. Selvarajah Kajendren and myself and many other Hon. Members of Parliament belonging to the North and the East, have repeatedly brought this matter up, but the Government takes no action. During the 34 to 35 years of war, you had a ban on fishing and now, once the war is over, those fishermen, who are still fishing only with techniques 35 years old, are asked to compete with the rest of fishermen who come into their own area, use illegal means - those illegal means maybe lucrative - and destroy their assets in the process. What is this? What is the outcome? Those people cannot continue to survive.

Farming has the same story. Hundreds of acres of lands, because the owners of which were chased off due to military activities, have turned into forests. Now, the Forest Department comes and declares private land, permit land - hundreds of acres! - that were used by those people as forest areas. When we bring it up to the notice of the Minister, the Minister is not bothered. On the contrary, if there is a reallocation of those State lands through permits, they are given to border villagers, members who belong to other districts other than the North and the East. Why? To systematically try and change the demography of the North and the East. This is

what is happening. But, when we tell these truths, the Members opposite - even the Members on this side when they were on the opposite side last time did the same, turn around and say that we are racists, that we are communal-minded or that we do not want Sinhalese to come and be a part of the North and the East. No, that is not the reason. You cannot pauperize the people of the North and the East to the benefit of people outside so that they can come and take over the entire area. But, that is what is happening. If that is happening despite the fact that we repeatedly bring it to the notice of this House and nothing happens and, in fact, things are exacerbated the wrong way, then it can only mean that it is another arm of the racist agenda that plagues this House.

Hon. Presiding Member, we talk in terms of a unitary State. I was listening very patiently to the Hon. Dullas Alahapperuma. I was impressed by his honesty. He was honest in the sense that he said every consecutive Government, after, maybe, the first ten years since Independence, must take the blame for the appalling situation to which this country has fallen. That is true. This country began to fall not because of COVID-19, but because whichever Government that came into power ten years after Independence chose to look upon another population that inhabits this country as an enemy and because you chose to deliberately pursue policies, first and foremost, to destroy that perceived enemy so that they can claim no part of this Island, cannot say that the North and the East is their homeland and that it can only be the Sinhalese who can call this entire Island their homeland.

That was the policy that was pursued, which resulted in creating enemies within the State and eventually, the State itself had to spend vast amounts of its money in trying to pursue a military option in order to continue to pursue that idea of this being purely a Sinhala Buddhist country. Well, you succeeded in the sense that you made sure that the war was brought to an end. But, you had 12 years since the war came to an end. What are your achievements? There is no LTTE now for you to blame. Have you achieved anything in the last 12 years? First, there was the Mahinda Rajapaksa Government for five or six years and thereafter, the Ranil Wickremasinghe-Maithreepala Sirisena Government. But, what have you achieved? Every year, you went down! The following year was worse than the previous and now, you have the COVID-19 pandemic, where you have taken a nosedive, you are scraping the barrel.

Even now, you would rather not reconsider your past. We say that Sri Lanka has to change, take a new path. Seventy four years of this unitary State has been a disaster; you have systematically plummeted the country to ground zero. So, rethink! You have nothing to lose because you have hit rock bottom. Rethink, make every part of this Island plurinational where everyone can contribute. Rethink so that the Tamil nation can ask its diaspora to contribute, to invest. But, no, you would rather not do that. You would rather cling to this notion of a unitary State, that Sri Lanka only belongs to the Sinhala Buddhists and go down the path of not only destroying the Tamils - now, you have started that against the Muslims also - but also that selfishness destroying your own soul. In committing the most heinous crimes known to mankind, fighting the war and winning the war against the Tamils, you became indebted to countries. Now, what is happening? To pay that debt, you are selling off your country to those countries. In the process, you have created a geopolitical contestation. Now, you cannot sell off only to one particular global power, but spread it out and sell it to quite a few others. Are you not ashamed? Honestly, are you not ashamed? Touch your heart and say whether you actually think that your children have a future in this country. I can assure you, Hon. Presiding Member, that every member of this country, if given a choice, would rather have their children go abroad and get educated. Are you not ashamed? After 74 years, this is what you have to show. Well, you have hit rock bottom, but sadly, you can even hit a lower bottom. If you go down the path that you have been going, you are going to sink even further and sink to such a point that your own ideal Sinhala Buddhist nation will decamp, and they are decamping. Listening to the speeches made in the House on this Budget, I think quite a few Hon. Members, both from the Government as well as from the Opposition, were saying how so many citizens are lining up to get passports to go abroad. They all are not Tamils, the vast majority of them are Sinhalese. So, rethink, put an end to the 74 years of stupidity that has brought this country to this stage. You want a unitary State and you are not prepared to consider this as a plurinational federal State because you think that federalism reaches to separation. For 74 years, you clung on to the unitary State and created a separatist war that came up under your unitary State.

There was a *de facto* State when you were claiming it to be a unitary State. The State structure, whether it be unitary or federal, is not going to be the determining factor of whether there is a separate State or not. That decision is going to be made only by making sure that you convince, in some way, all the peoples of this country to say that this is, in fact, their country. By failing to do that and simply saying that this State is Sinhala Buddhist, you will make sure, no matter whether you have it as a unitary State till perpetuity, that your State will never be stable, that its legitimacy will constantly be called into question and one day, when the geopolitical realities create a situation where strong global powers feel that Sri Lanka need not be looked upon as one unit, that is when separation will take place.

So, you, as the 75 per cent of the population of the country, decide whether you want to go down the path of 74 years of mayhem, hell and disaster, where even 12 years after the end of the war, you are still scraping the barrel year after year, creating not new heights but new depths, I should say, or whether you want to start anew and genuinely put this country on a newer footing where all its members can contribute to the upliftment of the country as a whole.

Thank you.

[අ.භා. 3.33]

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

2022 අය වැය විවාදයට සහභාගි වීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මම ඔබතුමාට කෘතඥතාව පළ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

දේශීයව මෙන්ම ගෝලීයව සෞඛ්‍යමය, ආර්ථිකමය, සමාජයීයමය අර්බුද රැසක් ඇති මොහොතක ගෞරවාන්විත ආර්ථික සංවර්ධනයක් උදෙසා නව මානයකින් යුක්තව, නව දැක්මකින් යුක්තව දේශීය ආර්ථිකය නඟා සිටුවීමට මේ අවස්ථාවේ ගත හැකි ප්‍රායෝගික විසඳුම් සොයමින් යන ගමනට 2022 අය වැය හේතු සාධක වේවා කියා මම පතනවා. අභියෝගය භාර ගනිමින් 2022 අය වැය ලේඛනය ඉදිරිපත් කළ නව මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මගේ කෘතඥතාව පළ කිරීමටත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මේ අය වැය විවාදයේදී අය වැයේ සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් කථා නොකොට අය වැය ලේඛනය තුළ ඇති සාධාරණීත්වය, එය සංශෝධනය විය යුත්තේ කෙසේද, අපි කුමන කරුණු සම්බන්ධයෙන් වෙනස් විය යුත්තේද යන්න සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු යැයි මා විශ්වාස කරනවා. ශ්‍රී ලංකාව කොවිඩ්-19 අර්බුදය තුළ හිර වී සිටින මොහොතේ අපි දන්නවා, මේ රටේ ආර්ථිකයට ඉතා විශාල පහරක් වැදිලා තිබෙන බව. විශේෂයෙන් විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නය අද හැම තැනකම කථා කරන මාතෘකාවක් බවට පත්වෙලා තිබෙනවා. මේ තත්ත්වය ඇති වෙන්න හේතු සාධක වෙච්ච මූලික දේ තමයි, සංචාරක ව්‍යාපාරය බිඳ වැටීම. 2019 පාස්කු ප්‍රහාරයෙන් පසුව මේ රටේ බිඳ වැටුණු සංචාරක ව්‍යාපාරය නිසා වාර්ෂිකව ඩොලර් බිලියන පහක පමණ ප්‍රමාණයකින් ආර්ථිකයට පහරක් වැදුණු බව අපි හැමදෙනාම දන්නා කරුණක්.

ඒ වාගේම, විදේශගත ශ්‍රමිකයන්ගෙන් කොවිඩ් වසංගතය හේතුවෙන් ලැබෙන්නා වූ ප්‍රේෂණ ප්‍රමාණය අවම වීම, ආනයන වියදම ඉහළ යෑම ආදී හේතු රැසක් මේ විදේශ විනිමය අර්බුදයට හේතුවෙලා තිබෙනවා. මේ තත්ත්වයෙන් ගොඩ ඒමට නම් රාජ්‍ය මුදල් වර්ධනය කර ගැනීමටත්, ඒ තුළින් රටට ලැබෙන විදේශ විනිමය වර්ධනය කර ගැනීමටත් ලංකාව ගත යුතු ක්‍රියාමාර්ග කීපයක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් මෙවර අය වැය ලේඛනය තුළින් විශේෂ අවධානයක් යොමුවෙලා තිබෙනවා. විශේෂයෙන් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමටත්, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කර ගැනීමටත්. අපට මතකයි, මීට වසර පහ හයකට පෙර මහින්ද රාජපක්ෂ මැතිතුමා අතිගරු ජනාධිපතිවරයා වශයෙන් හිටපු කාල සීමාව තුළ -2010 සිට 2015 කාල සීමාව තුළ - ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් තරු පන්තිය මත ගාස්තු අය කර ගැනීමේ අවම ගාස්තු පිළිබඳ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණු බව. මේ තුළින් සංචාරක ක්ෂේත්‍රයේ හෝටල්වල තරු පන්තිය මත ඔවුන් අය කළ යුතු අවම ගාස්තුව තීන්දු තීරණ කර තිබුණා. නමුත් පසුගිය යහ පාලන කාල සීමාව තුළ ඒක ඉවත් කරනු ලැබුවා. මා හිතන හැටියට ඒක රජයක් විධියට ගන්නා ලද ඉතා අහිතකර ක්‍රියාමාර්ගයක්.

කොවිඩ් වසංගතය අවසානවෙලා -සමනය වෙලා- ඉදිරියේදී සංචාරක කර්මාන්තය වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තුවෙන් තමන්ගේ හෝටල් ක්ෂේත්‍රයට වාගේම සංචාරක කර්මාන්තයේ ඉදිරි වැඩසටහන්වලට එකතු වන ජනතාවට සහ ව්‍යාපාරිකයන්ට මෙම හෝටල්වල තරු පන්තිය මත ගාස්තු ශ්‍රේණිගත කිරීම, අවම ගාස්තු හඳුන්වා දීමේ ක්‍රමවේදය නැවතත් ක්‍රියාත්මක කිරීම තුළින් සංචාරක ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති කර ගන්නට පුළුවන්. ඒ තුළින් සංචාරක ව්‍යාපාරය වඩාත් ආකර්ෂණීය, ජනප්‍රිය, ඉහළ සංචාරක වෙළෙඳ පොළක් ආකර්ෂණය කර ගත හැකි තත්ත්වයට වර්ධනය කරන්න පුළුවන්. අද වනවිට හෝටල් කර්මාන්තය අර්බුද රැසකට මුහුණ දීලා තිබෙනවා. බැංකුවලින් ගන්නා ලද ණය ගෙවීමේදී පසුගිය කාලයේ ලබා දුන් බැංකු සහන -moratorium facilities - මත වුවද ගෙවිය යුතු පොලිය මත නැවතත් පොලී ගෙවීමට සිදු වීම නිසා සංචාරක කර්මාන්තයට විශාල අගතියක් සිදුවෙලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, අත්දැකීම් සපිරි පුහුණු ශ්‍රමිකයන් සංචාරක ක්ෂේත්‍රය අත්හැර ගිහිල්ලා තිබෙන බව. ඔවුන් නැවතත් මේ ක්ෂේත්‍රයට අපි එකතු කර ගත යුතුයි. එසේ නොකළොත් අලුතින් එන්නා වූ සංචාරකයන්ට ආකර්ෂණීය සංචාරක වෙළෙඳ පොළක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීමේ හැකියාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි මම යෝජනා කරන්නේ ඇත්තටම මේ අවස්ථාව තුළ සංචාරක හෝටල්වලට ප්‍රමිතිගත අවම සේවා ගාස්තු හඳුන්වා දීම සඳහා මුදල් අමාත්‍යාංශය ක්‍රියාත්මක විය යුතුයි කියලා. ඒ වාගේම ඒ ක්‍රියාමාර්ගය දැඩි සේ නියාමනය කළ යුතුයි. එය නියාමනය කිරීමෙන් පමණක් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය අර්බුදයට විශාල සහනයක් ලබා ගැනීමේ හැකියාව තිබෙන බව මේ අවස්ථාවේ මා යෝජනා කරනවා.

අපි දන්නවා, මේ කාලය කොවිඩ් වසංගතය හේතුවෙන් ගෙවල්වලට හිර වෙලා හිටපු ජනතාව සංචාරක උන්මාදයකින් පෙළෙන කාලයක් බව. ඒ නිසා මම හිතන විධියට මේ ගාස්තු පිළිබඳ තීන්දු තීරණ ගැනීමේදී අපි භයවෙන්න අවශ්‍ය නැහැ. ලැබෙන දෙයින් සෑහීමකට පත්වීම නොව, සාධාරණ සේවයක් සැලසීමට හැකි ආකාරයෙන් ගාස්තු අය කළ යුතුයි කියන එකයි මම යෝජනා කරන්නේ.

අපි දන්නවා, කොවිඩ් අර්බුදය හේතුවෙන් අවුරුදු දෙකක පමණ කාලයක් සංචාරක හෝටල් ආදිය වැසී තිබුණු නිසා, සංචාරකයන් නවාතැන් සොයා ගැනීමේදී එම සංචාරක හෝටල් නිසි ප්‍රමිතියෙන් තිබෙනවා ද, ඒවායේ කොවිඩ් මර්දනය සඳහා සහ කොවිඩ් ආශ්‍රිත ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ඇතැයි කියා බලාපොරොත්තු වෙන බව. මේ සියල්ල සඳහා සංචාරක ආයතනවලට අවශ්‍ය පිටුබලය ලබා දීමටත් මේ යෝජනා තුළින් හැකියාව ලැබෙනවා කියා මා විශ්වාස කරනවා. අපි දන්නවා, සංචාරක ක්ෂේත්‍රයේ නියුතුවූවන්ට පසුගිය කාල සීමාව තුළ විශාල අගතියක් සිද්ධ වුණු බව. වගකිව යුතු රජයක් විධියට අපි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි.

ඊළඟට, ආයෝජන ප්‍රවර්ධනය ගැනත් සඳහන් කළ යුතුයි. ආයෝජකයන් ලංකාවට එන්න කැමැත්තක් නැත්තේ, විශේෂයෙන්ම ආයෝජන සඳහා අනුමැතිය ලබා ගැනීමේදී ඇති වන්නා වූ ගැටලු නිසායි. ඒවාට මුහුණ දීම සඳහා මා යෝජනා කරන්නේ ඒ අදාළ සංවේදී ප්‍රදේශවල කළ හැකි ව්‍යාපෘති හඳුනා ගෙන, ඒවා රතු, කොළ සහ කහ පැහැයෙන් හඳුන්වා දීමක් සිදු කළ යුතු බවයි. එසේ කළහොත් ආයෝජන සඳහා අනුමැතිය ලබා ගැනීමේදී ආයෝජකයන්ට එයින් විශාල පිටුවහලක් ලැබෙනවා. උදාහරණයක් විධියට, අනුමැතිය අවම වශයෙන් අවශ්‍ය ව්‍යාපෘති green projects විධියට හඳුනා ගෙන ඒවායේ ආයෝජනය කිරීමට එම ආයෝජකයන්ට ක්‍රමවේදය සකස් කර දිය හැකියි. රජයක් විධියට අපි එය කළ යුතුයි.

ඊළඟට, රාජ්‍ය සේවකයන් විශ්‍රාම යන වයස අවුරුදු 65ක් කිරීමට මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. එහි යම් වෙනස්කමක් කළ යුතුයි කියා මා යෝජනා කරනවා. අපි දන්නවා, 1990 දශකයේ පැවැති තරුණ අසහනය ගැන. ඒ කාලයේ තරුණයන්ට රැකියා පිළිබඳ තිබුණා වූ විශ්වාසය පලුදුවීම හේතුවෙන් ඔවුන් රාජ්‍ය විරෝධී ක්‍රියාවලට යොමු වුණු බව හඳුනා

ගෙන තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, මේ අවස්ථාවේත් තරුණයන් බිලී බා ගැනීමට බලාපොරොත්තුව සිටින යම් යම් දේශපාලන කොට්ඨාසවලට මෙහිදී සිය අභිමතාර්ථ ඉටු කර ගැනීමේ හැකියාව තිබෙන බව. විශ්‍රාම යන වයස ඉහළ දැමීමත් සමඟම ඊට පසුපසින් සිටින නිලධාරීන්ගේ උසස්වීම් සම්බන්ධයෙන් පවා විශාල ගැටලුවක් මතු වී තිබෙනවා. ඒ නිසා මේ යෝජනාව සලකා බැලීමේදී මේ සියලු කරුණු ගැනත් අපි සලකා බැලිය යුතුයි. ඒ නිසා, එසේ තබා ගැනීමේ අවශ්‍යතාව තිබෙන පුද්ගලයන්ගේ පසුගිය සේවා කාලය තුළ ඔවුන්ගේ ක්‍රියාදාමය, ඒ වාගේම රටේ උන්නතිය සඳහා ඔවුන් කරන ලද කැප කිරීම, ඔවුන්ගේ නිවැරදිතාව කියන සියලු කරුණු සලකා බලා අවශ්‍ය නම් පමණක් ඔවුන් ඉදිරියටත් සේවයේ තබා ගැනීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුයි කියා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම වැඩිපුර කාලය ගන්නේ නැහැ. නමුත් මම මේ ගැනත් කිව යුතුයි. පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේදී විනයක් නැහැ. කථා කරන මන්ත්‍රීවරුන් උදේ ඉඳලාම වැඩිපුර විනාඩිය, දෙක, තුන, හතර, පහ අර ගත්තාම, අවසානයේ කථා කරන්න සිටින අයට කථා කරන්න තිබෙන කාලයෙන් සියයට 50ක්වත් ලැබෙන්නේ නැහැ. මේ තත්ත්වය අපි හඳුනා ගත යුතුයි. ඇත්තටම මම හිතාගෙන හිටියේ අද මට විනාඩි දෙක, තුනක කාලයක් ලැබුණොත් අද කථා නොකර ඒ විනාඩි දෙක, තුන තුළ මේ තත්ත්වයට විරෝධතාව පා ඉන්නවා කියලායි. ඒ නිසා මේ විනය මූලාසනයෙන් ඇති කළ යුතුයි. එහෙම නැත්නම් පසුපෙළ මන්ත්‍රීවරුන්ට හැම දාම වෙන්නේ කථා කරන්නට කිව්වාම, කථා කරන්න තිබෙන දේ පැත්තක තබා බුම්මාගෙන ඉන්න විතරයි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 17ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 3.42]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතියි.

හිටපු පරිසර අමාත්‍ය, ඒ වාගේම හිටපු ජනාධිපතිතුමා මේ ගරු සභාවේ සිටින වේලාවකම මෙම කරුණු ප්‍රකාශ කරන්න ලැබීම ගැන මට සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "අද" පත්තරයේ සඳහන් වෙලා තිබෙනවා, මුතුරාජවෙල හෙලිකොප්ටර් අංගණ, ගොල්ෆ් පිටි හෝ හෝටල් ඉදිකරන්නේ නැහැ කියලා. එසේ කියලා තිබෙන්නේ පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා. පරිසර අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවකදී එතුමා කළ ප්‍රකාශය 2021.11.18 දිනැති "අද" පුවත් පතේ සඳහන් වන්නේ මෙසේයි:

> "මුතුරාජවෙල තෙත් බිම් සංරක්ෂිත කලාපය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පවරා ගනු ලබන්නේ ඒ අවට වගුරු බිම් පමණයි. ඒ හැර ඒ අවට පදිංචි කිසිම අයෙකුගේ නිවාස හෝ ඉඩම් පවරා ගැනීමක් සිදු නොකරන බව මම අනිවාර්යයෙන්ම කියනවා...."

එහිදී එතුමා තවදුරටත් මෙහෙමත් කියා තිබෙනවා:

> "....එසේ වගුරු බිම් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමෙන් අනතුරුව රැම්සා තෙත් බිමක් ලෙස සංරක්ෂණය කර වනජීවී දෙපාර්තමේන්තුවට පවරනවා."

මම හිතන්නේ හිටපු පරිසර ඇමතිවරයකු වන අපේ හිටපු ජනාධිපතිතුමාත් මේක අනුමත කරන්නේ නැහැ. පරිසර අමාත්‍යාංශයක් තිබියදී නාගරික සංවර්ධන අධිකාරියෙන් මොකටද මේ මුතුරාජවෙල පවරා ගන්නේ? මේක ගොඩුරකට ගිහිල්ලා වැඩේ වැරදුණාම කරන ප්‍රකාශයක්ද, එහෙම නැත්නම් මේ ඇමතිතුමාට කොන්ද පණ නැද්ද? හිටපු ගරු ජනාධිපතිතුමනි, මට මතකයි, ඔබතුමා පරිසර ඇමතිවරයා වශයෙන් සිටියදී මම රාජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියදී ලෝක වාර්තාවක් තබන්න අපි සංරක්ෂිතවලට ඉඩම් පවරා ගත් ආකාරය.

එච්චර බලයක් පරිසර අමාත්‍යාංශයට තිබෙනවා. රැම්සා තෙත් බිම් සංරක්ෂණය කිරීමේ වගකීම තිබෙන්නේ පරිසර අමාත්‍යාංශයට. එහෙම නැතිව නාගරික සංවර්ධන අධිකාරියට නොවෙයි. එතකොට පරිසර ඇමතිවරයා රෙද්දක් ඇඳගෙන ද ප්‍රකාශ කරන්නේ, නාගරික සංවර්ධන අධිකාරියට මුතුරාජවෙල පවරා ගත්තේ මේ වැඩේටයි කියලා? එතුමාගේ විෂය නේද මේ කියලා මම වගකීමෙන් අහනවා. ඒ වාගේම මේ ඇමතිවරයාට තිබෙන බලතලවලටත් හානි කරලා, රාජපක්ෂලා නටන නැටුමට, රාජපක්ෂලා ගහන බෙරයට නටන්න ලෑස්ති වෙලා වැඩකටයුතු කරනවා කියලා මම විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය ලේඛනයේ තිබෙනවා, "විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම" කියලා. නමුත් රජය,- *[බාධා කිරීමක්]* ඔබතුමාට අදාළ නැහැ නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා දැන් මතු කරපු කාරණාව නිසායි මම අහන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඔබතුමා ඇමති විධියට සිටියදී තමයි ඒ ඉඩම පවරා ගෙන ගොඩ කළේ. එතකොට ඔබතුමන්ලාට ඒ නීති ක්‍රියාත්මක කරන්න ඉඩ තිබුණේ නැද්ද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
දැන් ඔබතුමන්ලා කරන්නේත් ඒක නේ.

මේ අය වැය ගැන කථා කරනකොට "අඳුරට ශාප කරනවා විනා පහනක් දල්වන්නේ නැහැ" කියන කථාව තමයි මතක් වෙන්නේ. ඔබතුමා ඉතිහාසයට දෝෂ කිය කියා ඉන්නවා මිසක්, දැනට අවුරුදු 2ක් තිස්සේ බලයේ සිටින ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ඒ වැරදි නිවැරදි කරන්න විධියක් නැද්ද? මේ අය වැය විවාදයේදී අපට අහන්න ලැබුණේ මොනවාද? එදා වෙච්ච දේවල්; කොවිඩ් වසංගතයේ දී වෙච්ච දේවල්. දෙයියනේ, අනෙක් රටවල් කොවිඩ් වසංගතය ඉස්සරහ මේ වාගේ වැටුණේ නැහැ. ඉන්දියාව, බංග්ලාදේශය වාගේ අප වටේ තිබෙන රටවල් - ආසියාවේ තිබෙන රටවල් - දිහා බැලුවොත්, ඒ රටවල් කොවිඩ් වසංගතය නිසා ඩොලර් නැති කර ගත්තේ නැහැ. ඉන්දියාවේ කොවිඩ් වසංගතයෙන් පසුව තිබුණාටත් වඩා පෙට්‍රල්, ඩීසල් මිල අඩුවෙලා. නමුත් ඔබතුමන්ලා එක එක දේවල්,- *[බාධා කිරීම්]* ලැජ්ජා නැතිව ගිහිල්ලා ඉඳගන්න. දොඩවන්නේ නැතිව; භූමිතෙල් ගහපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ දඟලන්නේ නැතිව ගිහිල්ලා ඉඳගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ වෙලාව නාස්ති කරන්න ඉඩ දෙන්න එපා. *[බාධා කිරීමක්]* විධියට නටන්න එපා. ගම්පහටත් ලජ්ජයි. *[බාධා කිරීමක්]*

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශ්‍රාම යැමේ වයස අවුරුදු 65ක් දක්වා දීර්ඝ කිරීම ගත්තොත්, ආණ්ඩුව බලනවා මිලියන 60ක් 70ක් ඉතුරු කර ගන්න. *[බාධා කිරීමක්]* නමුත් මේකෙන් මතුවන ප්‍රශ්න? මේ රටේ අමාත්‍යාංශවල cadre එක වැඩි වෙලාද? *[බාධා කිරීම්]*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
අමාත්‍යාංශවල cadre එක වැඩි වෙන්නේ නැහැ.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බංග්ලාදේශය වැටුණේ නැත්තේ, ඉන්දියාව වැටුණේ නැත්තේ මේ වාගේ වහුකුණු විපක්ෂයක් ඒ රටවල තිබුණේ නැති නිසායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න වෙලාව දෙනවාද? *[බාධා කිරීමක්]* මගේ කථාවට බාධා කරන්න දෙන්න එපා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කොච්චර බංකොලොත් වුණාද කියනවා නම් පොඩි මුදලක් ඉතුරු කර ගැනීමේ අරමුණින් විශ්‍රාම යැමේ වයස අවුරුදු 65 දක්වා ඉස්සරහට දමනවා. ඒකෙන් මොකක්ද වෙන්නේ? තරුණ රාජ්‍ය සේවකයන් ඉන්නවා, ඉදිරියට යා ගන්න විධියක් නැතිව. මේ අවුරුදු 5 තුළ ආයතනවල cadre එක වැඩි වෙන්නේ නැහැ. Cadre එක වැඩිවෙන්නේ නැතිව සේවකයන් බඳවා ගන්නේ නැහැ. අවු 5ක් යනතුරු අලුත් අයට රාජ්‍ය සේවයට යන්න විධියක් නැහැ. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ආණ්ඩුවේ තිබෙන බංකොලොත්භාවය නිසා, ETF, EPF ගෙවා ගන්න බැරි නිසා විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරනවා. මේ නිසා අලුත් පරම්පරාව රජයේ සේවයට යන්නේ කොහොමද? රජයේ ආයතනවල cadre එක වැඩි වෙන්නේ කොහොමද? මේ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාමාන්‍යයෙන් මහ බැංකුව වසරකට බිලියන 100ක් පෞද්ගලික අංශයේ retire වෙන අයට EPF, ETF release කරනවා. දැන් ඒකත් නවත්වා ගත්තා. එතකොට වසරකට බිලියන 100 ගණනේ වසර 5කට බිලියන 500ක් නවත්වා ගන්න පෞද්ගලික අංශයේ සේවකයන් විශ්‍රාම යන වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කළා. අවුරුදු 60ක් වෙලා වයසට ගියාම තමයි ඒ මනුස්සයාට කීයක් හරි හම්බ වෙන්නේ. මෙතෙක් කල් වුණේ පෞද්ගලික අංශයේ අය EPF, ETF ටික අරගෙන ඒකෙන් තමුන්ගේ ගේ හදාගන්නවා; දුව කසාද බන්දලා දෙනවා; යාන - වාහන ගන්නවා; ජීවිතය වෙනස් කර ගන්නවා. ඒ අයට වෙනත් තැන්වලට ගිහින් රස්සාවක් කරන්න පුළුවන්කමත් තිබුණා. නමුත් ආණ්ඩුව මොකක්ද කළේ? ඒ අයටත් EPF, ETF ගෙවන එක අවුරුදු 5ක් යනතුරු block කළා. එයින් සමාජ අසාධාරණකම් දෙකක් සිද්ධ වෙනවා. එකක් තමයි, ඒ අයගේ අතට මුදලක් ලැබෙන්නේ අවුරුදු 60 පැන්නාට පසුවයි. තමුන්ගේ දරුවන්ගේ කටයුතු සිදු කරන්න වෙන්නේ අවුරුදු 60 පැන්නාට පසුවයි. දැන් ඒ දෙකම කෙරෙන්නේ නැහැ. මේ විධියට ගියොත්, ඒ මනුස්සයා ඉතුරු වෙයිද දන්නේත් නැහැ. මේ ආණ්ඩුව තව අවුරුදු 5කට තියා ගත්තොත්- එන්නේ නැහැ. බැරිවෙලා හෝ ආවොත් - අවුරුදු 65 කරයි; 70 කරයි. එහෙම තමයි යන්නේ. ඇයි ඒ? සේවකයන්ට ගෙවා ගන්න සල්ලි නැහැ.

ආණ්ඩුවේ බංකොලොත්භාවය මේ රටේ ව්‍යවසායකයා නැත්නම් රැකියාවක් කරන රාජ්‍ය සේවකයා හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කරන පුද්ගලයා මත දමන්න එපා කියලා මම වගකීමෙන් කියනවා. සල්ලි නැත්නම් ඒක ආණ්ඩුව බලාගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. මේ රජය තවත් වැඩක් කරනවා. පම්පෝරි ගහලා කියනවා, "ග්‍රාම නිලධාරි වසම් 14,021යි තිබෙන්නේ. ඒවාට රුපියල් මිලියන තුන බැගින් මිලියන 42,000ක් වෙන් කරනවා" කියලා. පළාත් පාලන කොට්ඨාස 4,917ක් තිබෙනවා. එක් කොට්ඨාසයකට රුපියල් මිලියන හතර බැගින් රුපියල් මිලියන 19,668කුත්, දිස්ත්‍රික්ක 25ට රුපියල් මිලියන 19,894ක් වෙන් කරනවා කියලා තිබෙනවා. මම දැකපු විධියට මේ මුදල, මේ අය වැයෙන් වෙන් කරන ලද ලොකුම ගණන. නමුත්, මේකට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන්න කෝ? මේ ආණ්ඩුව කරන්නේ රටේ තිබෙන ප්‍රශ්නවලට උත්තර හොයන එකද? නැහැ. දැන් ආණ්ඩුව පළාත් පාලන මැතිවරණයට සූදානම් වෙනවා. ඒ වෙනුවෙන් ගමට සල්ලි දෙන්න හදනවා. ප්‍රාදේශීය සභාවේ TOsලා ඉන්නේ කී දෙනාද? මම හිතන විධියට තුන් දෙනෙක් විතර ඇති. නගර සභාවේ TOsලා තුන් හතර දෙනෙක් ඇති. මෙච්චර සල්ලි ගොඩක් එකවර දැමීම තුළ ඒ අයට ඒ කටයුතු නිසියාකාරව කරගෙන යන්න පුළුවන්ද? මේ මොකක්ද කරන්න හදන්නේ? ගමට සල්ලි යවලා, හොරකම් කරන්න අවස්ථාවක් හදලා, තමන්ගේ හෙංචයියෝ, තමන්ට විසිල් ගහන මිනිස්සු ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ගෙනයන එකයි රජය කරන්න හදන්නේ. [බාධා කිරීමක්] මේකෙන් රට තවත් බංකොලොත් වෙනවා. අද ගමේ මිනිහාගේ ප්‍රශ්නය පාරට තාර දමා ගන්න එකද? [බාධා කිරීමක්] ගමේ මිනිහාට ජීවත් වෙන්න විධියක් නැහැ. එළවලු ටිකක් ගන්න, බඩු මුට්ටු ටිකක් ගන්න විධියක් නැහැ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි අපේ වෙලාවෙන් ගන්නම්. [බාධා කිරීමක්] නැහැ, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ වෙලාව ගන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු -විපක්ෂය නියෝජනය කරමින් කොට්ඨාස දිනපු මන්ත්‍රීවරු- 1,200ක් විතර ඉන්නවා. එතකොට ඒ රුපියල් මිලියන හතරක මුදල කොට්ඨාස දිනපු ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් දෙනවා. ඔබතුමන්ලා එයට අකමැති නම් ඔබතුමන්ලා පක්ෂයක් හැටියට ලිඛිතව ඉල්ලීමක් කරන්න, මේ මුදල ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ට එපා කියලා. ඊට පසසේ අපි විකල්ප ක්‍රමවේදයක් හදා ගන්නම්. ගමේ මන්ත්‍රීවරුන්ට ගමේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්න අවස්ථාව දෙන්න, ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු රාජ්‍ය අමාත්‍යතුමාට මම විශේෂයෙන් කියනවා, අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ අපේ මන්ත්‍රීවරුන්ට සල්ලි අරගෙන දෙන්න නොවෙයි, රට හදන්නයි කියන එක. [බාධා

කිරීමක්] ඔබතුමන්ලා ඇවිල්ලා ඉන්නේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ට සල්ලි අරගෙන දෙන්න නම්, ඒ ගැන කනගාටුයි. [බාධා කිරීමක්] මම ඇවිල්ලා ඉන්නේ, අපේ සමගි ජන බලවේගය පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ අපේ මන්ත්‍රීවරුන්ට සල්ලි අරගෙන දෙන්නද? අපි ඉන්නේ අපේ අයට හොරකම් කරන්න දෙන්නද? අපි මෙතැනට ආවේ අපේ ගමේ ඉන්න මිනිසුන්ට හොරකම් කරන්න දෙන්න නොවෙයි, රට හදන්නයි. ඒක මතක තියා ගන්න. ඒ නිසා මගේද, ඔබේද කියලා වැඩක් නැහැ. ඒකට ගමේ යාන්ත්‍රණයක් නැහැ. එදා යහ පාලන රජය කාලයේ රජයේ කාර්යාල හදලා ගමේ නිලධාරින් දැම්මා. [බාධා කිරීමක්] අද මොනවාද වෙන්නේ? අපි "නිල සෙවණ" ව්‍යාපෘතිය ඇති කරලා, ග්‍රාම නිලධාරි වසම්වල ඉන්න රාජ්‍ය නිලධාරින් පස්දෙනා එක කාර්යාලයක තියන්න වැඩ කටයුතු කළා. ගම ශක්තිමත් කරන්නේ නැතිව, ගමේ වැඩ කටයුතුවල අධීක්ෂණය ශක්තිමත් කරන්නේ නැතිව සල්ලි ගොඩක් දීලා කරන්න හදන්නේ මොකක්ද? ඒ නිසා සල්ලි වෙන් කරන්න ඉස්සෙල්ලා ගම ශක්තිමත් කරන්න, ගමේ පරිපාලනය ශක්තිමත් කරන්න. මේ කරන්න හදන්නේ, පළාත් පාලන මැතිවරණය දැක දැක සල්ලි ටික නාස්ති කරන්න කටයුතු කරන එකයි.

මම ඉංජිනේරුවරයකු වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමන්ලා කාර්මික නිලධාරින්ට -TOs- වැඩ කරන්න දෙන්නේ නැහැ. අපට ඒ චෝදනා අහන්න ලැබෙනවා. තාර දමපු පාර උඩින් කොන්ක්‍රීට් දමනවා. කාර්මික නිලධාරින් - TOs - තාර දමපු පාර උඩින් කොන්ක්‍රීට් දමන්න එපා කිව්වාට ඔබතුමන්ලා අහන්නේ නැහැ. [බාධා කිරීමක්] ඇයි ඒ? අද නිලධාරින්ගේ බලයට වඩා දේශපාලන බලය ඉස්මතු වෙලා තිබෙනවා. අද නිලධාරින්ට වැඩ කරන්න බැහැ. ප්‍රාදේශීය නිලධාරින් අද කියනවා, දේශපාලනඥයන් ඒ ගොල්ලන්ට වැඩ කරන්න ඉඩ දෙන්නේ නැහැ කියලා.

ඔබතුමන්ලා බලයට ආපු ගමන් ගෙනාවේ මොකක්ද? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා රාජ්‍ය සේවකයා නිදහසේ වැඩ කිරීමේ අයිතිය හකුළා දැම්මා. දැන් මේ සල්ලි ටික දෙනකොට ගමේ මන්ත්‍රීවරුන්ටම මේ සල්ලි ටික දීලා දැම්මා නම් හොඳයි. රජයේ නිලධාරින්ට සල්ලි දමන්න ඕනෑ නැහැ.

අද ගමේ මිනිසුන්ට කන්න බැහැ, වගා කරගන්න පොහොර ටික නැහැ. ඇළේ වතුර ටික නැහැ. හැබැයි, jogging tracks හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගමේ ගොවියාට වගා කරගන්න විධියක් නැහැ. ගමේ ගොවියා හුල්ලනවා, පඹයෝ පුච්චනවා. හැබැයි, වෙල මැද්දෙන් jogging track එක හදනවා. අද මෙන්න මේ සංස්කෘතියයි තිබෙන්නේ. ඉස්සෙල්ලා හොරකම් කිරීම පැත්තකට දමලා මිනිස්සු ජීවත් කරවන්න කටයුතු කරන්න කියලා මම විශේෂයෙන් කියනවා. [බාධා කිරීම්]

ඊළඟට, මේ අය වැයේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර තිබෙන මුදල කීයද? රුපියල් බිලියන 900යි. ඒකෙන් බිලියන 225ක්ම ආලා තිබෙන්නේ අධිවේගී මාර්ගවලට. ඒවා හදන්න තමයි දීලා තිබෙන්නේ. මේ රටේ ඩොලර් නැහැ. සීනි ගෙන්වන්න සල්ලි නැහැ, සිමෙන්ති ටික ගෙන්වන්න සල්ලි නැහැ, මිනිසුන්ට හාල් ටික මිලදී ගන්න බැහැ. ගෑස් නැතිව මිනිස්සු අදත් පෝලිමේ ඉන්නවා.

ගෑස් ටික දෙනකම් නැඟිටින්නේ නැහැ කියලා කාන්තාවක් පාරේ බුදියාගෙන ඉන්න හැටි මම newsවල දැක්කා. ඒ වාගේ තත්ත්වයක් තමයි රටේ තියෙන්නේ. අපි පාරේ යනකොට පෙට්‍රල් පෝලිම්, ඩීසල් පෝලිම් දකින්න තිබෙනවා. ඩොලර් නැහැ. ඒ අස්සේ අධිවේගී මාර්ග හදන්න සල්ලි වෙන් කර ගන්නවා. ඒවා ගන්නේ ණයට නොවෙයි ද? ඩොලර් ගන්නේ ණයට නොවෙයි ද? ඔබතුමන්ලා එදාත් රට කෑවා. කෝටි-ප්‍රකෝටි ගණන් ඩොලර් වියදම් කරලා නෙළුම් කුලුන හැදුවා. එයින් රටේ ජනතාවට තිබෙන වැඩේ මොකක්ද? කෝටි-ප්‍රකෝටි ගණන් වියදම් කරලා හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාවක් හැදුවා. ඒකෙන් රටේ ජනතාවට තිබෙන වැඩේ මොකක්ද? මත්තල ගුවන් තොටුපොළ හැදුවා. වැඩක් තිබෙනවාද? කිරි පිටි ගේනවාද? සීනි ටික එනවාද? නැහැ. එක වැඩයි වුණේ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සල්ලි ටික Pandora Papersවලින් එළියට ආවා. අන්න! සල්ලි කෝටි ගණනක් වෙන රටක තිබෙනවා කියලා එළියට ආවා. එච්චරයි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම විශේෂයෙන් කියනවා මේ ආණ්ඩුව බලයට පත් වුණේත් බොරු කියලා, රවට්ටලා කියන එක. මගේ දිස්ත්‍රික්කයේ කැලණිය පන්සලට නාගයෙක් ඇවිල්ලා ධාතූන් වහන්සේලා වැඩමෙව්වා කියලා ජනතාව රවට්ටලා ජනතාවට නෙළුම් පොහොට්ටු දුන්නා, "ගිහිල්ලා වන්දනා කරන්න. හොඳ කාලයක් රටට එනවා" කියලා. ඒ විධියට බොරුවෙන් තමයි පටන් ගත්තේ.

කොවිඩ් වසංගතය ආවාම වෙන රටවල් මොනවාද කළේ? එන්නත ගැන හෙව්වා. එන්නත්කරණය ගැන හෙව්වා. විද්‍යාත්මක විසඳුමක් හෙව්වා. නමුත් මේ රටට කොවිඩ් වසංගතය ආවාම මොනවාද කළේ? ගඟට මුට්ටි දැම්මා. ඔන්න කොවිඩ් ප්‍රශ්නය විසඳන්න කටයුතු කරපු හැටි! ගඟට මුට්ටි දාලා කොවිඩ් ප්‍රශ්නය විසඳන්න හැදුවා. ඊට පස්සේ කළේ මොකක්ද? හිටපු සෞඛ්‍ය ඇමතිතුමිය මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කාලි අම්මාගේ පැණිය බීලා පෙන්නුවා. ඔන්න කොවිඩ් ප්‍රශ්නය විසඳන්න කටයුතු කරපු හැටි! මේ රටේ මෙතරම් ජනතාවක් මැරුණේ කොවිඩ් ප්‍රශ්නය විසඳන්න එදා විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය නොකරපු නිසායි. අද ප්‍රශ්න විසඳන්න බැරි හැම වෙලාවේම, කොවිඩ් වසංගතය ගැන කියනවා. අනෙක් රටවලත් කොවිඩ් වසංගතය තිබුණා. නමුත් කිසි ප්‍රශ්නයක් වුණේ නැහැ. ඒ රටවල් කළමනාකරණය කළා. ඒ නිසා තමුන්ගේ අසාර්ථකභාවය, කළමනාකරණයේ නොහැකියාව කොවිඩ් වසංගතය පිටින් දාන්න එපා කියලා මම විශේෂයෙන් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. අද මේ රටේ තිබෙන ප්‍රශ්න මොනවාද? අද කියනවා, තෙල් පිරිපහදුවෙන් පාඩුයි ලු; වහන එක හොඳයි ලු. හෙට අනිද්දා වෙනකොට තෙල් පිරිපහදුව ඉන්දියාවට විකුණයි ද දන්නෙත් නැහැ, "මේක වැඩක් නැහැ නේ. මේකෙන් පාඩුයි නේ" කියලා. ඊට වැඩිය ලාභයි ලු, පෙට්‍රල්, ඩීසල් මිල දී ගන්න එක. එහෙම වුණොත් මොකද වෙන්නේ? තෙල් පිරිපහදුව වහලා නිසා අද වන විටත් ඩීසල් පෝලිම්, පෙට්‍රල් පෝලිම්, භූමිතෙල් පෝලිම් තිබෙනවා. නමුත්, මේ ගොල්ලන් කියනවා, මේකෙන් පාඩු නිසා වහනවා කියලා. හෙට අනිද්දා වෙනකොට අපට ආරංචි වෙයි, "මේකෙන් පාඩුයි. මේක සුදු අලියෙක්" කියලා Ceylon Petroleum Corporation එකත් ඉන්දියාවට විකුණුවා කියලා. ඒ විධියට රට කනවා, ආයෙත් තව මිනිහෙකුට හදන්න බැරි විධියටම. ඒකයි අපට තිබෙන දුක. මේ රජය අද ඉඳලා හෙට යයි. හැබැයි, අපට දේශපාලනය කරන්න රටක් තිබෙන්න ඕනෑ. මේ රටේ ජනතාවට අනාගතයක් තිබෙන්න ඕනෑ. දරුවන්ට අනාගතයක් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙවර අය වැය තුළ රටේ තිබෙන ප්‍රශ්නවලට කිසිම උත්තරයක් නැහැ. ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරලා නැහැ. අඩු ගානේ ටීවී එක බලනවා නම්, පත්තරයක් හෝ බලනවා නම් මේ රටේ ජනතාවගේ දුක, සාගින්න, ඔවුන්ට තිබෙන ප්‍රශ්න පෙනෙනවා. මේ අය වැය ඒවාට කිසිම උත්තරයක් දීලා නැති පුහු අය වැයක් කියන එක මම විශේෂයෙන් ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රාජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருள் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Rural Housing and Construction and Building Material Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම රට 2015න් පස්සේ බොහොම දරුණු ආගාධයකට ඇද දාලා 2019 වනතුරු ඒ තත්ත්වය තව තවත් වැඩි කරලා ජනතාවට දුන්නු බලාපොරොත්තු ඉෂ්ට කර ගන්න බැරි වුණු අය ගෙදර ඉන්න තිබියදීත් පාර්ලිමේන්තු එච්චාට පස්සේ ඇවිත් තප්පුලනවා. ඒකට ඉතින් කරන්න දෙයක් නැහැ. මම මෙහෙම කියන්නේ ඇත්තටම ලොකු කනගාටුවක්, දුකක් ඇතිවයි. මොකද, එතුමන්ලා මුතුරාජවෙල රක්ෂිත භූමිය සම්බන්ධයෙන් ඇද බාපු පට්ටපල් බොරුව අපි දැක්කා. එදා ජෝන් අමරතුංගට ඕනෑ විධියට කෑලි කෑලි දුන්නා. එතකොට මෙතුමා පරිසරය සම්බන්ධ නියෝජ්‍ය ඇමති හෝ රාජ්‍ය ඇමති. හැබැයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගඟා හිටියා මිසක් වචනයක්වත් එදා කථා කළේ නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මම දැන් "මෙතුමා" කිව්වේ ඔබතුමාට ද? මම නම කිව්වේ නැහැ. හරිද? ඒ නිසා වාඩි වෙන්න. නැට්ට පස්ස පැත්තේ ගහ ගත්තා කිව්ව එකට නැඟිට්ටා නම් මොනවා හෝ උත්තරයක් දෙන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පක්ෂයේ සභාපතිතුමා, - මේ රටේ හිටපු ජනාධිපතිවරයා- ඇවිල්ලා පැය 24න් ගැසට් අවලංගු කරලා, ඉන්න නිලධාරීන් ගෙදර යවලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "නැට්ට පස්ස පැත්තේ ගහගෙන හිටියා" කිව්වාම නැඟිටිනවා නම්, "තප්පුලනවා" කිව්වාම නැඟිටිනවා නම්, මා හිතන හැටියට ඒ පැත්තේ කෙනෙක් තමයි නැඟිටින්න ඕනෑ. ඒ නිසා ඒ නැඟිටීම ගැන බලා සිටින අය දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ කියන්නේ 2016 වර්ෂයේදී අක්කර 600කට වැඩි ප්‍රමාණයක් රුපියල් 500 ගණනේ දීපු එක ගැනයි. මේ ගැන COPA වාර්තාවේ සඳහන්ව තිබෙනවා. ඒ හිටපු පරිසර නියෝජ්‍ය ඇමතිවරයා මේ සබාගැබේ දැන් ඉන්නවා නේ. පසු ගිය ආණ්ඩුව කාලයේ ජනාධිපතිවරයා සිටියදීත්, පරිසර නියෝජ්‍ය ඇමතිවරයා සිටියදීත් තමයි ඒවා අල්ලා ගත්තේ. ඒවා අල්ලා ගත්තාට පසුව මොන ගැසට් ගැහුවත් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය වනකල් එළවාගන්න පුළුවන් වුණාද කියන්න. එළවාගන්න පුළුවන් වුණාද? ඒ අය අදටත් ඉන්නවා. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විවාදවලදී මෙහෙම බාධා කරන්න බැහැ. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් නම් පමණක් ඉදිරිපත් කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒ ජනතාව එළවනවාද දැන්? ඒ ජනතාව එළවනවාද කියන ප්‍රශ්නයට පැහැදිලිව උත්තර දෙන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිඋතුම් කාදිනල් හිමිපාණන් ජනාධිපතිතුමාගෙන් පැහැදිලිවම ඉල්ලුවේ එක දෙයයි. එතුමා ඉල්ලුවේ, මේ මුතුරාජවෙල පසු ගිය ආණ්ඩුවේ අය කොල්ල කෑවා, මුතුරාජවෙල විකුණාගත්තා, අපි පල්ලිවලින් පාරට ආවාම ගහලා පැන්නුවා, මුතුරාජවෙල විනාශ වුණා, මේක ආරක්ෂා කරන්න කියලායි. හැබැයි, වනජීවී කලාපයකට-*[බාධා කිරීම්]* හිටපු පරිසර නියෝජ්‍ය ඇමතිවරයෙක් ඒ උත්තර දුන්නේ. ඒ නිසා කරුණාකර-, *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරුණාකර-

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් නම් පමණක් මතු කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
රීති ප්‍රශ්නයක්. කාදිනල්තුමා ගැන කියපු හින්දා. [බාධා කිරීම්] කාදිනල්තුමා ගැන කියපු හින්දා. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය? *[බාධා කිරීම්]*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔන්න පරිසර ඇමතිවරු ආණ්ඩු කරපු විධිය, පරිසර ඇමතිවරු අමාත්‍යාංශ කරපු විධිය. තමන්ගේ විෂය පථය දන්නේ නැහැ. දැන් අහනවා, ඒක UDA එකටද අයිති කියලා. අනේ! හිටපු නියෝජ්‍ය ඇමතිතුමෝ, වන සංරක්ෂණ කලාපයක් වශයෙන් යම් භූමියක් ගැසට් කළාම, ඒ භූමියේ ඉන්න අය ඕනෑ ඕනෑ දේවල් කරනවා. හැබැයි, නාගරික සංවර්ධන අධිකාරියට ගැසට් කළාට පසුව නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළේ තමයි ඒ නීති රීති හැදෙන්නේ. ඒ නිසා ඒ අත් පත් කරගත් අක්කර 600 තුළ ඉදි කිරීමක් කරන්න ගන්නවා නම්, ඒ ඉදිකිරීම කරන්න දෙන්නේ නැහැ කියන එක සියයට සියයක් විශ්වාසයි. එහෙම කොන්ද පණ තිබෙන නායකයෙක් තමයි වත්මන් ජනාධිපතිතුමා. එදා ජෝන්ට නැමුණා වාගේ කෙනෙක් නොවෙයි, එතුමා. එදා කැළෑ ජෝන්ලාට නැමුණා වාගේ කෙනෙක් නොවෙයි එතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් නම් පමණක් ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අනෙක් අය නැඟුවේ රීති ප්‍රශ්නද? මම කථා කරන විට විතරද- *[බාධා කිරීම්]*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මේක ඇත්තටම හරිම කරදරයක් නේ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට රීති ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා නම් විතරක් මතු කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් එතුමන්ලාට තිබෙන ප්‍රශ්නය මේකයි. එතුමන්ලා පොඩි දෙයක් වුණත් දුවගෙන-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් නම් පමණක් මතු කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
කියන්න දෙන්නේ නැති එක නේ ප්‍රශ්නය. රීති ප්‍රශ්නය මේකයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා මේ රටේ තිබෙන ගැසට් එකක් ගැනවත් දන්නේ නැතිව කථා කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මෝඩකම තවත් ප්‍රකාශ කරන්නේ නැතිව වාඩි වෙන්න. මොකද, ඔහොම පාවිවල් වෙද්දී, ගම්පහ දිස්ත්‍රික්කයේ මටත් දුකයි. ඒ නිසා කරුණාකර, වාඩි වෙන්න. ගම්පහ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට එන පුද්ගලයෝ මෙහෙම අය නොවෙයි. එහෙම අය දෙතුන් දෙනෙක් සිටියා. දැන් ඒ ගොල්ලෝ ගෙවල්වලට යවලා. ඒ වෙනුවට තමයි ඔබතුමන්ලා ආවේ. ඒ එන අයත් මෙහෙම නම් ඉතින් දුකයි! ඒ නිසා ඔය පාට් දමන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් විපක්ෂය බොහෝ බංකොලොත් වෙලා. මීගමුව, කටාන ප්‍රදේශවල දේවස්ථානවල පියතුමන්ලා සමඟ අපි කටයුතු කරද්දී එතුමන්ලා කියනවා, "අනේ ඇමතිතුමා හරි කරදරයි. මේ විපක්ෂයේ මන්ත්‍රීවරු පල්ලිවලට එනවා. අපට කියන්නේ වෙන දෙයක්." කියලා. ඇයි, මේ බොරු බෙගල් ඇද බාන්නේ? පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් කරන්න පුළුවන් ඔක්කොම දේවල් ආණ්ඩුව කරද්දී, ඒ වෙලාවේ ආරක්ෂාව දීගන්න බැරිව ගිහිල්ලා පල්ලියේ පියතුමාට කියන්න ගත්තා, වෙනත් දෙයක්. කාදිනල්තුමාට කියන්න ගත්තා, වෙනත් දෙයක්. අද ජනතාවට යථාර්ථය අවබෝධ වේගෙන එනවා. ඒ නිසා මුතුරාජවෙලත්, මුතුරාජවෙල ආශ්‍රිත කළපුවක් ගැසට් කරලා අතිගරු ජනාධිපතිතුමා මූලික පියවර ගෙන තිබෙන්නේ, වංචනික ව්‍යාපාරිකයන් අත් පත් කර ගත් භූමිය තුළ ඉදි කිරීම් කරන එක නැවැත්වීම සඳහායි. ඒ ගැන තමයි විපක්ෂයේ අය පල්ලියට ගිහින් පියතුමන්ලාට කිව්වේ, අන්න ඔබතුමන්ලාගේ ගම් පිටින් ගැසට් කරලා අරගන්න යනවා කියලා. ඒක මහා අසත්‍යයක්. ඒ වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, විශේෂයෙන් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් වෙනම ම සාකච්ඡාවක් පවත්වා දැන් ඒ වැඩ කටයුතු කරගෙන යනවා. මම ඒක පැහැදිලිව මේ ගරු සභාවට කියන්න ඕනෑ.

මා අය වැය ගැන කථා කරන්නයි ආවේ. මා අය වැය ගැන කථා කරද්දී ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ සිටින එක හොඳයි. මොකද, එතුමාගේ නම කිව්වාම එතුමා උත්තරයක් දෙයි. එතුමා 2021 හත්වැනි මාසයේ පමණ කිව්වා, මේ ආණ්ඩුව කරගත් ලොකුම වැරැද්ද තමයි තමන්ගේ හිතවතුන්ගෙන්, තමන්ගේ ව්‍යාපාරිකයන්ගෙන්, තමන්ගේ කෝටිපතියන්ගෙන්, තමන්ගේ දානපතියන්ගෙන් අය කරගත් බදු මුදල කපා හරින්න වැඩ පිළිවෙළක් ගෙන ආ එක කියලා. හැබැයි, දැන් 60ක්, 70ක් පමණ වන මහා පරිමාණයෙන් ආදායම් උපයන්නන්ගේ ආදායමෙන් බද්දක් අය කරගන්නවා කිව්වාම, එතුමා නැඟිටලා අහනවා, මේ රටේ බදු අය කිරීම තරම් පාපයක් තිබෙනවාද, බදු අය කිරීම තරම් සාපයක් තිබෙනවාද කියලා.

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

මම තවම ඒ දිව නම් දැකලා නැහැ. මම දන්නේ නැහැ, කථා කරද්දී දිව දෙකක් එළියට එනවාද කියලා. දිව දෙකක් එළියට එන අයගෙන් තමයි ඒ වාගේ කථා එළියට එන්නේ. මොකද, එතුමා හැදුවා එක කාලයක් ශක්ති-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔය ඉතින් තව එක්කෙනෙක් නැඟිට්ටා නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අසත්‍ය කියන කොට අහගෙන සිටිය හැකි ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය ඇමතිතුමා මගේ නම කියලා ප්‍රශ්නයක් ඇහුවා. *[බාධා කිරීමක්]* එතුමා කියනවා, එතුමන්ලා බලාපොරොත්තු වන ආදායම රුපියල් බිලියන 724ක් කියලා. ඒ හැටදෙදෙනාගෙන් ගෙනෙන්නේ රුපියල් බිලියන 100යි. එතකොට ඉතිරි රුපියල් බිලියන-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හරි. ඒ, එතුමාගේ අදහස්.

මම පැහැදිලිවම කිව්වේ මේකයි. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමා යන්න එපා; තව ටිකක් තිබෙනවා, කියන්න. *[බාධා කිරීමක්]* ඔහොම තමයි. කිව්වා; පැන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ කිසිම කෙනෙක් මේ වෙලාවේ මේ විවාදයට සම්බන්ධ වෙන්නේ නැහැ. මොකද, එතුමන්ලා මොනවා හරි කියලා එළියට දුවනවා. ඒක තමයි එතුමන්ලාගේ හැටි. හැබැයි, මේ ආර්ථික ඔස්තාර්ලාට අපි භාර දුන්නේ සියයට 7කට ආසන්න ආර්ථික වර්ධන වේගයක් තිබුණු රටක්. ඒ වෙලාවේ සියයට 7කට ආසන්න ආර්ථික වර්ධන වේගයක් තිබුණා. එදා මේ රටේ සංචාරක ක්ෂේත්‍රයේ හෝටල් කාමර පිරී ගියා. සංචාරකයන් ලක්ෂ 25කට ආසන්න පිරිසක් මේ රටට ආවා. මේ රට බඩ ඉරිඟු, වී ඇතුළු කෘෂි කර්මාන්තයෙන්, කර්මාන්තවලින්, ඉදි කිරීම් ක්ෂේත්‍රය තුළින් විශාල ලෙස ඉදිරියට ආවා. අනේ අම්මේ! එතුමන්ලා බලයට ආ ගමන් මොකද කළේ? පාරවල් හදන එක නැවැත්තුවා; අධිවේගී මාර්ග හදන එක නැවැත්තුවා; Port City එක නැවැත්තුවා. ඒ වාගේම හම්බන්තොට වරාය විකුණුවා. කරපු ව්‍යාපෘති භාගෙට භාගයක් නවත්වලා ඉස්සෙල්ලාම කරපු කටයුත්ත තමයි මහ බැංකුව ඇතුළට ගිහිල්ලා බඩු කීයක් තිබෙනවාද, මේ එන කොන්ත්‍රාත්කාරයන්ට ගෙවලා commission කීයක් ගහන්න පුළුවන්ද කියලා බලපු එක. අන්න ඒක බලලා, කවුරුත් දන්නා මහ බැංකු බැඳුම්කර වංචාව තමයි මේ ගොල්ලන්ට කර ගන්න පුළුවන් වුණේ. ඒ ආණ්ඩුවේ හිටපු සමහර ඇමතිවරු අද කියනවා, "මම හදපු ක්‍රමවේදය, මගේ වැඩ පිළිවෙළ..." කියලා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ශක්ති සහල් සමුපකාර සමිතිය ඔබතුමා නේ හැදුවේ. ඒ ශක්ති සහල් සමුපකාර සමිතියේ සභාපතිවරයා කරපු වංචා, දූෂණ තිබෙනවා. ශක්ති සහල් සමුපකාර සමිතියේ සභාපතිවරයා මොකක්ද කළේ? ඒ සභාපතිවරයා කළේ ඔබතුමාට දේශපාලනය කරපු එක. එදා මම ඔබතුමා ළඟට ගිහින් ඉල්ලීමක් කළා. ඒ වෙලාවේ අපි විපක්ෂයේ. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කිව්වා, "හම්බන්තොට මිනිසුන්ට වී ටික ගන්න සල්ලි නැහැ, ඔබතුමන්ලාගේ මේ ව්‍යාපෘතියෙන් සල්ලි දෙන්න" කියලා. මම කිව්වා, "ගම්පහ මිනිසුන්ට වී ටික ගන්න සල්ලි නැහැ. කුඩා මෝල් හිමියන්ගේ සංගමය තිබෙන්නේ ගම්පහ මරදගහමුල. මරදගහමුල ඒ කුඩා මෝල් හිමියන්ගේ සංගමයට සල්ලි ටිකක් දෙන්න." කියලා. ඔබතුමා සැලකුවේ නැහැ. මෙන්න මේ විධියට ඔබතුමාගේ පින්තූරය දාලා campaign එක කළා. හර්ෂ ද සිල්වා කියන මන්ත්‍රීතුමා, හිටපු ඇමතිතුමා මේ තත්ත්වයට බාල්දු වන කෙනෙක් කියලා මම දන්නේ නැහැ. හැබැයි, සමහර සිල්වලා නම් ඔය වාගේ වැඩ කරනවා. මොන සිල්වා ද කියන්න මම දන්නේ නැහැ. මේ වාර්තාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ඉතාම කැතට මඩ ප්‍රහාරයක් එල්ල කරනවා. *[බාධා කිරීමක්]* මම පොළොන්නරුවේ ඡන්ද කළේ නැහැ. *[බාධා කිරීම්]* මට කිසිම විධියකට ඒ කියන විධියේ සම්බන්ධතාවක් නැහැ. මම අභියෝග කරනවා-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ වාර්තාව සභාගත කරන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I have the right to reply. එතුමාට එවැනි මොකක් හරි දෙයක් තිබෙනවා නම්, කරුණාකර පොලීසියට හරි කොහේට හරි ගිහිල්ලා ඒ සභාපති ගැන complain කරන්න කියන්න, මෙතැන මඩ ගහන්නේ නැතිව.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ළඟ දැනට තිබෙනවා, වාර්තාව. මා කැතට කියපු, එතුමා ලස්සනට කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැන- මම කැතට නේ කිව්වේ. මම කැතට කිව්වා, එතුමා ලස්සනට කළා. මා ළඟ තිබෙන මේ වාර්තාවේ සඳහන් වනවා, "සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත" කියලා. උතුරු මැද පළාතේ, ඒ සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතියේ කටයුතු ගැන විගණනයක් කරලා තිබෙනවා. ඒ විගණන වාර්තාව මා ළඟ තිබෙනවා. හාල් සම්බන්ධයෙන් පිහිටුවා තිබුණු ඒ සමුපකාර සමිතිය "සුවසැරිය සංග්‍රහ වැය" ලෙස අධ්‍යක්ෂ

මණ්ඩලයේ අනුමැතියෙන් තොරව රුපියල් 43,000ක පමණ මුදලක් වැය කර තිබෙනවා. ශත පහක් හොරකම් කළත් හොරකම ම තමයි. රුපියල් 43,000ක් වියදම් කළා කියලා සඳහන් වාර්තාව මා අත තිබෙනවා. මා දැන් එම වාර්තාව **සභාගත*** කරනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම බෙහෙවින්ම කනගාටු වෙනවා, මේ වාගේ කථාවක් එතුමා මෙතැන කියන එක ගැන. එතුමා කියනවා නම්, ශක්ති සහල් ව්‍යාපාරයෙන් සුවසැරියට වියදම් කළා කියලා, ඒක සම්පූර්ණ අසත්‍යයක්. එතුමා මේ වාගේ මඩ ගහන එක ගැන මම සම්පූර්ණයෙන් මගේ විරුද්ධතාව ප්‍රකාශ කරනවා. මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා- *[බාධා කිරීමක්]*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියලාගේ අදහස් එකට ගැළපුනාට කරුණාකර මේ විදියේ අසාධාරණකම් කරන්න එපා. ඔබතුමියලාගේ අදහස් එකට ගැළපෙනවා වෙන්න පුළුවන්. හැබැයි මෙවැනි රීති ප්‍රශ්න යොමු කරලා මේ විවාදය කඩාකප්පල් කරන්න බැහැ. මට ලැබෙන්නේ සීමිත කාලයක්. ඒ සීමිත කාලය තුළ මේ කරපු හොරකම්, වංචා වාගේම මේ අය කරපු විනාශය ගැනත් කියන්න ඕනෑ. ශුද්ධවන්තයෝ වාගේ, මහා ප්‍රාඥයෝ වාගේ අද මෙතැනට ඇවිල්ලා කථා කරනවා. ඔබතුමියත් ඒකට පුළුවන් තරම් ඉඩ දෙනවා. ඔබතුමිය ගැන විශ්වාසයකින් තමයි මේ සභාවෙන් යෝජනා කරලා ඔය උත්තරීතර ආසනයට ඔබතුමිය පත් කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ වැරැද්ද කරන්න එපා.

ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා, එතුමාගේ පළමුවැනි අය වැය පාවිච්චි කරලා තිබෙන්නේ ග්‍රාමීය සංවර්ධනයට මුදල් යවන්නයි. අපි ඒක අත්දැක්කා. අපි පළාත් පාලන සභාපතිවරු, ප්‍රාදේශීය සභා සභාපතිවරු විධියට ඒක අත්දැක්කා. 2011 - 2014 කාලය තුළ අපි දැක්කා, ගමට මුදල් ආපුවාම ගම කොහොමද දියුණු වුණේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහර මන්ත්‍රීතුමන්ලා කිව්වා ඒ මුදල් යන්නේ ගමේ හෙංචයියලාට කියලා. ඔව්, මේ පළාත් පාලන ආයතනවලට ගමේ හෙංචයියලා ලැයිස්තුවෙන් පත් කළා. ඒක ඇත්ත. හැබැයි, අපි පත්වුණේ මහජන ඡන්දයෙන්. මහජන ඡන්දයෙන් පත්වුණු ගරු මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියන 3ක් -ලක්ෂ 30ක්- ගමට ගියාම ඒ මන්ත්‍රීවරයා ඒ මුදල වියදම් කරන්න ඕනෑ විධිය කියලා දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඒක කරන්න ඕනෑ කොහොමද කියලා ලස්සනට කියලා දීලා තිබෙනවා. ගමේ ජනතාවගේ ජීවනෝපාය, ගමේ ආර්ථිකය ගොඩ නඟා ගැනීම වෙනුවෙන් එයින් ලක්ෂ 12ක මුදලක්, එහෙම නැත්නම් සියයට 40ක මුදලක් වියදම් කරන්න කියලා අනිවාර්ය කරලා තිබෙනවා. මාර්ග සහ යටිතල පහසුකම් වෙනුවෙන් ඒ ලක්ෂ 30න් තවත් සියයට 40ක මුදලක්, -ලක්ෂ 12ක්- යොමු කරන්න කියලා අනිවාර්ය කරලා තිබෙනවා. ඒ වාගේම සමාජ සුබ සාධනයටත්, පරිසර සංරක්ෂණයටත් ලක්ෂ 3 ගණනේ ලක්ෂ 6ක් යොදවන්න කියලා කියා තිබෙනවා. මෙහෙම ලස්සනට, කළමනාකාරිත්වයක් ඇතිව මුදල් ගමට ගිය විධියක් කලින් තිබුණේ නැහැ.

2015-2019 කාලය තුළ අපි දැක්කා, ඕනෑ ඕනෑ මන්ත්‍රීවරයාගේ ගෙවල්වලට යන පාරවල් හදා ගන්නා විධිය; ඕනෑ ඕනෑ කෙනාට රස්සාව ලබා දෙන විධිය. මම ඊයේ පෙරේදා දිනයක කෝප් කමිටු රැස්වීමකට සහභාගි වුණා. එතැනදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විගණන වාර්තාව අපි සාකච්ඡාවට ගත්තා. අනේ දුකයි! හොඳට, සුදුවට ඇඳන් ආවාම අපි හිතනවා ගරු ගාම්භීරයි කියලා. ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නැතිව පත්වීම් 215ක් ලබා දීලා, විශාල විධියට ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙනවා, ඔප්පු ලක්ෂයක් දෙන්න. දැන් අපි පාරවල් ලක්ෂයක් හදනවා. ගෙවල් ලක්ෂ දෙකක් හදනවා. අපට ඒවාට තිබෙනවා වැඩ පිළිවෙළක්. පාරවල් ලක්ෂය සම්බන්ධයෙන් ඊයේ-පෙරේදා ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා අපට ඒ විස්තර ගෙනැල්ලා පෙන්නලා කිව්වා, එක දිස්ත්‍රික්කයකට මෙච්චරයි, මේ වෙද්දී පාරවල් කිලෝමීටර ලක්ෂයෙන් 20,000ක වැඩ අවසන් වෙමින් පවතිනවා කියලා. ඒක හරි පිළිවෙළයි. නිවාස ඇමතිවරයා විධියට ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් උපදෙස් අරගෙන අපි මේ වෙද්දී නිවාස 20,000ක් හදලා ඉවරයි. ඒ නිවාස 20,000 තුළ දරුවන් ඇතුළු ඒ පවුල්වල සියලුදෙනා ජීවත් වෙනවා. මේ ලබා ගන්නා මුදල්වලින්, අපි එම වැඩ පිළිවෙළ ඒ විධියට ක්‍රමානුකූලව කරගෙන ගිහිල්ලා තිබෙනවා. හැබැයි, මේ ගොල්ලන්ට තිබෙන්නේ හීතිකාවක්; භයක්. ඔප්පු ලක්ෂයක් දෙන්න ආපු අයගෙන් අපි ඇහුවා, ඔප්පු කීයක් හදලා ඉවරද කියලා. ඔප්පු 600ක් වත් හදාගන්න පුළුවන්කමක් තිබිලා නැහැ. අන්න මෙහෙමයි ඒ අය මුදල් නාස්ති කළේ.

අර බැලුන් ඇරපු මහත්මයෙකුත් හිටියා නේ. එතුමා මෙතැනට ඇවිල්ලා පාස්කු ප්‍රහාරය ගැන මහා විද්වතෙක් වාගේ කථා කරනවා. හරින් ප්‍රනාන්දු මහත්මයා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. එතුමා හරියට බැලුම ඇරියා නම්, ඒ බැලුම හරියට ගිහින් ක්‍රියාත්මක වුණා නම්; free Wi-Fi ලැබුණා නම්, අනිවාර්යයෙන්ම අපේ දරුවන්ට අද පාසල්වල තොරතුරු තාක්ෂණය ඔස්සේ, නැත්නම් පරිගණක තාක්ෂණය ඔස්සේ දැනුම ලබාගන්න පුළුවන්කම තිබුණා නේ. ඔබතුමන්ලා නැති කරපු, ඔබතුමන්ලා විනාශ කරපු 2015-2019 කාලය තමයි මේ රටේ අභාග්‍යසම්පන්නම යුගය. ඒක මතක තියා ගන්න. ඒ 2015-2019 කාලයේ මෙතුමන්ලා නැති කරපු දේවල් අල්ලන්න තමයි අපට දැන් මේ විධියට දුවන්න සිදු වෙලා තිබෙන්නේ. කේක් එකට අයිසිං එක ලස්සනට දාලා නැහැ; අයිසිං කරලා නැහැ. ඒ නිසා කේක් එක තිබෙනවා, කන අයගේ බඩ කට පිරෙනවා. රස දැනෙනවා, අයිසිං විතරයි නැත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ගොල්ලන් අයිසිං කරලා "Enterprise Sri Lanka" programme එක ගෙනාවා. ඒක කාටද දුන්නේ? ප්‍රකෝටිපතියන්ට දුන්නේ. කොහේද ඉඳගෙනද ඒ ගිවිසුම් කථා කළේ? ෂැන්ග්‍රි-ලා එකේ, හිල්ටන් එකේ ඉඳගෙන. මේ හෝටල්වලට තමයි ව්‍යාපාරිකයෝ ගෙන්වාගෙන ඒ මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට enterprisesවලින් මිලියන 1,000, 2,000 බෙදලා දුන්නේ. අනේ! ගමේ අහිංසක ගොවියාට මුදලක් යද්දී, ගමේ ව්‍යවසායකයාට මුදලක් යද්දී මෙතුමන්ලා මොනවාද මේ කියන්නේ?

අද මෙතුමන්ලා ගමට ලබා දෙන රුපියල් ලක්ෂ 30, 40 ගැන තමයි කථා කළේ; ගමට ලබා දෙන රුපියල් මිලියන 85,000 ගැන තමයි කථා කළේ. ඊළඟට, ගමට ලබා දෙන නිවාස ගැන, පාරවල් ගැන තමයි කථා කළේ. ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා, ආර්ථික සංවර්ධන ඇමතිවරයා විධියට ජනතාවගේ ආර්ථිකය උත්පාදනය කරන මේ ක්‍රමවේදය උතුරේත් කළා; දකුණේත් කළා; නැඟෙනහිරත් කළා; මුළු රටේම කළා. දමිළ මන්ත්‍රීවරයකු කිව්වා, "අද අපට ව්‍යසනයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා" කියලා. තව දමිළ මන්ත්‍රීවරයකු කිව්වා, "අපේ වැඩ කටයුතු වෙන්නේ නැහැ" කියලා. උතුරේ මන්ත්‍රීවරුන් අද ඒ ප්‍රදේශවල නැහැ. ඒ මන්ත්‍රීවරුන් ඉන්නේ කොළඹ. එතුමන්ලාගේ දරුවෝ, ඥාතීන් ඉන්නේ පිටරට. අපි ගිය සතියේත් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා බිම් බෝම්බ අයින් කරපු අක්කර 400ක, 500ක භූමි ප්‍රමාණයක් ඒ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

ජනතාවට වගා කරන්න, කෘෂි කර්මාන්තය කරන්න කියලා ලබා දුන්නා. ඒ දේවල්වලට මේ අය වැය තුළ හරි ලස්සනට මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි ඊයේ පෙරේදා දැක්කා බාන කඩා ගත් පිරිසක් කොළඹට එනවා. මම ඒකට කියන්නේ "බාන කඩාගත්" කියලායි. බාන කියන්නේ මොකක්ද කියලා කියන්න ඕනෑ නැහැ නේ. මට පුළුවන් විධියට මම කියනවා, බාන කඩා ගත් පිරිස කියලා. මහ බානේ ඉන්න මහ උන්දෑ ඇවිල්ලා කියනවා, "අපි රක්ෂා දෙන්නේ රාජපක්ෂලා කියන විධියටවත්, ප්‍රේමදාසලා කියන විධියටවත්, බණ්ඩාරනායකලා කියන විධියටවත්, අපට කඩේ ගිය අයටවත් නොවෙයි. අපි රක්ෂා දෙන්න ලස්සන වැඩ පිළිවෙළක් හදනවා" කියලා. එතුමා තමයි, "උස අයයි, මිටි අයයි, මට රැස්වීම් කරපු අයයි, මට පෝලිම් බුත් ගිය අයයි, මට ශාඛා සමිති හදපු අයයි" කිය කියා රක්ෂා දුන්නේ. එහෙම දීලා තමයි නිවාස සංවර්ධන අධිකාරිය විනාශ කළේ. ඒවා තමයි අපට දැන් ගොඩගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ සියලු ආයතන ගොඩගන්න පුළුවන්, රාජ්‍ය ආයතන සඳහා ආදායම් එකතු කරගන්න පුළුවන් අය වැයක් මේ වෙලාවේ ඉදිරිපත් කර තිබෙනවා. ජනතාවට ක්ෂණිකව දැනෙන දේ මේකේ නොතිබුණා වෙන්න පුළුවන්. අපේ ආණ්ඩු කාල සීමාව තුළ ඒ දියුණුව ක්ෂණිකව ළඟා කර ගන්න පුළුවන් වටපිටාවක් අපට තිබෙනවා. ජනතාව රෝගී කරන්නේ නැතිව, ඔවුන් පීඩාවට පත් කරන්නේ නැතිව, කොවිඩ් රෝගය නැවත පාසලට ගිහිල්ලා පාසල වහන තත්ත්වයට පත් කරන්නේ නැතිව, කරුණාකර බලාගෙන ඉන්න කියලා විපක්ෂයෙන් මම ඉල්ලා සිටිනවා.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මුලින්ම මේ කාරණයෙන් මගේ කථාව පටන් ගන්න කැමැතියි. ලෝකයේ තිබෙන ආර්ථික අර්බුදය හා සමානව නොවෙයි, කුඩා රටක් වන අපේ රටට ඊට වඩා දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ එක්කම, කොවිඩ් වසංගතය පිළිබඳ ප්‍රශ්නයටත් අපට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. එක පැත්තකින්, දරුණු වසංගත තත්ත්වයකට මුහුණ දෙමින් කටයුතු කරන ගමන්, අනෙක් පැත්තෙන් අපේ රටේ සංවර්ධනය සඳහා බර දාලා මුදල් වෙන් කරලා කටයුතු කිරීම ගැන මම මුලින්ම ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාට මගේ ප්‍රශංසාව පළ කරන්න කැමැතියි. ගම්වල ජීවත් වන ජනතාවගේ පීඩනය සැලකිල්ලට ගෙන, අය වැය ලේඛනයෙන් ගමේ ආර්ථිකය දියුණු කිරීමට වැඩි බරක් දාලා තිබෙන එක ගැන අපි කවුරුත් සතුටු වෙනවා.

මීට මාස හයකට විතර කලින් මට ලැබුණු වාර්තාවලට අනුව, අපේ රටේ ජනතාවගෙන් සියයට 50ක් පමණ දරිද්‍රතා රේඛාවේ වඩා පහළ මට්ටමක ආදායම් ලබන පවුල්. ඒ එක්කම මන්ද පෝෂණය සියයට 18ක් පමණ තිබෙනවා. මෙවැනි අමාරු තත්ත්වයක් තිබෙන අපේ රටේ ජනතාවගේ ප්‍රශ්නවලට ක්ෂණික විසඳුම් ලබා දෙන්නත්, ඉදිරියේදී රට සංවර්ධනය කිරීම සඳහාත් මුදල් ඇමතිතුමා කටයුතු කරලා තිබෙනවා.

එතුමා මෙවර අය වැයෙන් වැදගත් තැනක් දීලා තිබෙනවා, කර්මාන්ත දියුණුවට. ඒ ගැන මම ඉතා සතුටු වෙනවා. මොකද, කර්මාන්ත සංවර්ධනයත් එක්ක රැකියා නියුක්තිය වැඩි වනවා. අප වැනි රටවල් පමණක් නොවෙයි, ඇමෙරිකාව වාගේ රටක් අරගෙන බැලුවත් මහා පරිමාණ කර්මාන්ත තිබුණත්, ඒ රටවලත් රැකියා වැඩි ප්‍රමාණයක් ලබා දෙන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හරහායි. මෙවර මුදල් ඇමතිතුමා වැඩි බරක් දමා තිබෙනවා, කර්මාන්ත දියුණුව පැත්තට. අප රට තුළ කුඩා කර්මාන්ත දියුණු කිරීම ඉතාම වැදගත්. මොකද, ඒ සඳහා අපට අමුද්‍රව්‍යත් තිබෙනවා. ඒ වාගේම ගම් මට්ටමෙන් ඒ කර්මාන්ත දියුණු කිරීමට හැකියාවත් තිබෙනවා.

මම විද්‍යා හා තාක්ෂණ විෂයය භාර ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී විද්‍යා සම්පත් මධ්‍යස්ථාන 244ක් පිහිටුවා ගම් මට්ටමට තාක්ෂණය ගෙන යන්න සැලැස්වූවාම, ව්‍යවසායකයන් මතු වූ ආකාරය දැක මම පුදුම වුණා. මෙවර අය වැයෙන් ඒ පදනමින්ම කුඩා කර්මාන්ත දියුණු කිරීමට වැඩි බරක් දැමීම ගැන මම සන්තෝෂ වනවා.

ඊළඟට, අපනයන ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති කරන්න ඕනෑ බවත් ගරු මුදල් ඇමතිතුමා පිළිගෙන මේ අය වැයෙන් ඒකටත් යම් බරක් දමා තිබෙනවා. මම එතුමාට මේ අවස්ථාවේ SLINTEC ආයතනය පිළිබඳව මතක් කරන්න කැමැතියි. ඒ ආයතනය නැනෝ තාක්ෂණය දියුණු කිරීමේ කටයුතු කරනවා. නැනෝ තාක්ෂණය කියන්නේ උසස් තාක්ෂණයක්. එය උපයෝගී කරගෙන අප වැනි රටවලට මතු වෙන්න හැකියාව තිබෙනවා. විශේෂයෙන්ම අපනයන වර්ධනය කිරීම සඳහා ඒ පැත්තට බරක් දමා කටයුතු කළොත් ඒක ප්‍රතිඵලදායක වෙයි.

වෛද්‍යවරයෙකු හැටියට මම එන්නත් ප්‍රශ්නය පිළිබඳවත් වචනයක් කියන්න කැමැතියි. පිට රටවල වෙළෙඳ තරගයක් තිබියදීත් කොවිඩ් වයිරස් රෝගය පාලනයට අප රටේ ජනතාවට අවශ්‍ය එන්නත් සැලකිය යුතු ප්‍රමාණයක් - රටට අවශ්‍ය මට්ටමට කිට්ටු ප්‍රමාණයක්- ලබා දීම ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත්, මේ වෙලාවේ මම නොකියා බැරි දෙයක් තිබෙනවා. ෆයිසර් එන්නත තමයි අපි වැඩි වශයෙන් තෝරා ගෙන තිබෙන්නේ. ෆයිසර් එන්නත ගැන මගේ හිතේ නම්, යම් ප්‍රශ්නයක් තිබෙනවා. කොවිඩ් රෝගයට ලබා දෙන තවත් එන්නත් තිබෙනවා. සාමාන්‍ය ක්‍රමවේදය අනුව වයිරසය සම්පූර්ණයෙන් අක්‍රිය කිරීමට පාවිච්චි කරන සයිනොෆාම් වාගේ එන්නත් තිබෙනවා.

බ්‍රිතාන්‍යයෙන් හා නොයෙකුත් රටවලින් ගෙන්වා ගන්න පුළුවන්, ඒ හා සමාන වෙනත් එන්නත් පවා තිබෙනවා. ඒවාත් අපි ලබාගෙන තිබෙනවා. නමුත්, ෆයිසර් එන්නතේ විද්‍යානුකූල තත්ත්වය සම්බන්ධයෙන් නම් මට සැකයක් තිබෙනවා. ඒ කියන්නේ, ඒක අලුත් එන්නත් වර්ගයක්. Messenger RNA භාවිත වන එන්නතක්. RNA කියන ජාන කොටස් පාවිච්චි කරන එන්නත් මේ කොවිඩ් රෝගයත් එක්ක තමයි ප්‍රථම වරට මිනිසුන්ට පාවිච්චි කර තිබෙන්නේ. ඒ ජාන සෘජුව ශරීරයට ඇතුළු කිරීමෙන් පසු හැසිරෙන ආකාරය ගැන කාටවත් අනාවැකි කියන්න බැහැ. යම් හානිකර දේවලුත් සිද්ධ වෙන්න ඉඩක් තිබෙනවා. මා කියන්නේ නැහැ, එහෙම සිද්ධ වෙයි කියලා. නමුත් ඒ සඳහා ඉඩකඩ තිබෙන නිසා මා ඉල්ලීමක් කරනවා, අපි ෆයිසර් එන්නත ගෙන්වීම පුළුවන් තරම් අඩු කර, විකල්ප එන්නත් පාවිච්චි කරමු කියලා.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Sivanesathurai Santhirakanthan. You have seven minutes.

[பி.ப. 4.26]

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා**
(மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன்)
(The Hon. Sivanesathurai Santhirakanthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்திலே பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் கிடைத்தமைக்கு மகிழ்ச்சியடைகின்றேன். குறிப்பாக, இந்த நாட்டினுடைய புதிய நிதி அமைச்சராகப் பொறுப்பேற்றிருக்கின்ற கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள், இந்த வரவு செலவுத்திட்டத்தை முன்மொழிந்த பின்னர், விசேடமாக எங்களுடைய ஆளும் கட்சிப் பிரதிநிதிகளை அழைத்துப் பேசியபொழுது, "நான் ஒரு நிதியில்லாத நிதி அமைச்சராகப் பொறுப்பேற்றிருக்கின்றேன்; இந்த வரவு செலவுத்திட்டத்திற்கு ஆதரவு வழங்குங்கள்!" எனக் கேட்டிருந்தார். அந்த நேரத்தில் உண்மையிலேயே நான் பயந்தேன்; என்ன நடக்கப்போகின்றது என்ற அச்சம் எனக்குள் இருந்தது. இருந்தாலும், இன்று உலகளாவிய ரீதியிலே கொவிட்-19 தொற்றுக் காரணமாக பெரும் உற்பத்திப் பெருக்கமுள்ள நாடுகளே பொருளாதாரத்தில் தள்ளாடிக் கொண்டிருக்கின்ற வேளையிலே, எங்களுடைய நாடும் 20,000 கோடி சுற்றுலாத்துறை மற்றும் வெளிநாட்டு வருமானங்களை இழந்திருக்கின்ற இந்தச் சூழலிலே, கௌரவ நிதி அமைச்சர் அவர்களால் கிராமப் புறங்களுக்கான வாழ்வாதார உயர்ச்சி, உட்கட்டுமானம், வட்டாரத்திற்கான நிதியொதுக்கீடு, விவசாயம், மீன்பிடி, கல்வித்துறை என்பவற்றுக்காக மேற் கொள்ளப்பட்ட நிதியொதுக்கீடுகளைப் பார்க்கின்றபோது, உண்மையிலே நான் மகிழ்ச்சியடைகின்றேன். அந்த அடிப் படையிலே எங்களுடைய கௌரவ நிதி அமைச்சர் அவர்களுக்கு நான் இந்த இடத்திலே பாராட்டுக்களையும் வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

என்னைப்பொறுத்தவரைக்கும் நிதி அமைச்சரால் செய்யப் பட்ட ஒதுக்கீடுகளில் மிகப் பாரியளவான நிதி ஒதுக்கீடு உட்கட்டுமான வசதிகளை ஒட்டியதாக, உள்ளூர் உற்பத்திகளை அதிகரிக்கும் நோக்கிலே இடம்பெற்றிருக் கின்றது. இந்த உற்பத்திப் பெருக்கத்தினூடாக எங்களுடைய மாவட்டமும் நன்மையடைய வேண்டும். குறிப்பாக, என்னுடைய மாவட்டமான மட்டக்களப்பு ஒரு விவசாய மாவட்டம். அந்தவகையில், விவசாயத்துறை மேம்பாட்டிலே அதிகூடிய கவனஞ்செலுத்தவேண்டுமென்று நாம் எதிர்பார்க் கின்றோம்.

குறிப்பாக, இந்த நாட்டிலே உற்பத்தித்துறையில் மாற்றம் வரவேண்டுமாக இருந்தால், அதற்கு நீர்ப்பாசனத் திட்டங்கள் மிகவும் இன்றியமையாதவையாக இருக்கின்றன. எங்களுடைய நாட்டிலே ஏற்பட்ட நீர் செழுமைப் புரட்சி காரணமாகப் பெருமளவு மாற்றங்கள் கிழக்கு மாகாணத்திலே ஏற்பட்டி ருந்தது உங்களுக்குத் தெரியும். 1960ஆம் ஆண்டுக்கு முன்னர் அம்பாறையில் பெருமளவு மாற்றங்கள் ஏற்பட்டன. கடந்த யுத்த சூழல் காரணமாக மட்டக்களப்பு மாவட்டத்திலே நீர் திட்டமிடல் சம்பந்தமாகப் பெரிய குறைபாடு இருந்துவந்தது. இருந்தாலும், இப்பொழுது பொறுப்பேற்றிருக்கின்ற அரசாங்கம் எங்களுடைய மாவட்டத்திற்கான நீர் வழங்கல் தேவைகளைப் பூர்த்திசெய்யுமுகமாகப் பல வேலைத்திட்டங்களை ஆரம்பித் திருக்கின்றது. இதனூடாக மட்டக்களப்பு மாவட்டத்தில் வருடந்தோறும் கிட்டத்தட்ட 4 - 5 இலட்சம் ஏக்கரில் விவசாயத்தை, குறிப்பாக நெல் உற்பத்தியைச் செய்யக்கூடிய நிலைமையைக் கொண்டுவர வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். அதற்கு உதவி செய்யவேண்டிய பொறுப்பு அரசாங்கத்திற்கு இருக்கின்றது.

குறிப்பாக, எங்களுடைய மாவட்டத்திற்குள் வருகின்ற மகாவலி 'பி' வலயத்திலே, 'ஆர்பி' திட்டத்தின்கீழான 44,500 ஹெக்டெயர் நிலங்களும், அதேபோன்று வாகரைப் பகுதியை ஒட்டியதாக 24,700 ஹெக்டெயர் நிலங்களும் விவசாயக் காணிகளாக இருக்கின்றன. இந்த விவசாயக் காணிகளை மேம்படுத்த வேண்டுமாகவிருந்தால், அதற்கு நீர்ப்பாசனத் திட்டங்கள் மிக இன்றியமையாதவையாக இருக்கின்றன. அதில் மகாவலி நீர்ப்பாசனத் திட்டமும் ஒன்றாக அமைகின்றது. இருந்தாலும், இந்த நாட்டிலே கடந்த காலங்களிலே உருவாக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள் எல்லாமே எமது மக்களின் இன விகிதாசாரத்தைக் குறைக்கின்ற நோக்கில், குறிப்பாகச் சிங்கள மக்களைக் குடியேற்றுவதற்கான திட்டங்கள் என்று தமிழ் மக்களுக்கு அச்சமூட்டப்பட்டிருந்தது உங்களுக்குத் தெரியும். ஆகையால் இந்தத் திட்டங்களை முன்மொழிகின்றபொழுது நிச்சயமாக அந்த மாவட்டத்தில் இருக்கின்ற மக்கள் பிரதிநிதிகளை முன்னுரிமைப்படுத்திச் செயற்பட வேண்டும். குறிப்பாக, மகாவலித் திட்டத்திலே புதிய ஒரு மாற்றத்தைக் கொண்டுவர வேண்டும். ஏனென்றால், மட்டக்களப்பு மாவட்டத்திலே பெரும் பான்மையாகத் தமிழர்கள் இருக்கின்ற காரணத்தால், அவர்களை அதிகமாக வேலைக்கு அமர்த்தி, அவர்களுக்கான வலயமாக இதைக்கொண்டுவருகின்றபொழுது நிச்சயமாக அதிலே மாற்றங்கள் ஏற்படும்.

மேலும், கால்நடை உற்பத்தி அதிகரிக்கவேண்டுமாக விருந்தால், திணைக்களங்களுக்குள்ளே பலத்த ஒற்றுமை ஏற்படவேண்டுமென்று நான் நம்புகின்றேன். குறிப்பாக, எல்லைப் புறங்களிலேயிருக்கின்ற கால்நடை வளர்ப்பாளர் களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்குக்கூடச் சம்பந்தப்பட்ட திணைக்களங்கள் முன்வருவதில்லை. சிறிய சிறிய விடயங்களைப் பெரிதாக்கி அவர்களை வன பரிபாலனத் திணைக்களம் கைதுசெய்வதும், எல்லைப்புறங்களிலிருக்கின்ற பொலிஸார் அவர்களைக் கைதுசெய்வதுமான விடயங்கள் மக்கள் மத்தியில் அதிருப்திகளைத் தோற்றுவிக்கின்றன. எனவே, அவற்றைத் தடுப்பதற்கான வேலைத்திட்டங்களை முன்வைக்கவேண்டுமென்று எதிர்பார்க்கின்றேன்.

உண்மையிலே, எனக்கு இங்கு பேசுவதற்காகப் பத்து நிமிடங்கள் ஒதுக்கியிருப்பதாக நான் எண்ணியிருந்தேன். நான் பாராளுமன்ற உறுப்பினராகி ஒரு வருடம் பூர்த்தியாகியுள்ள நிலையிலும் என்னுடைய கருத்துக்களை இங்கு முன்வைக்க முடியாத சூழ்நிலை இருக்கின்றது. இதற்கு இந்தப் பாராளுமன்றத்தை வழிநடத்துபவர்கள் பொறுப்பேற்க வேண்டும். எனவே, நான் என்னுடைய கருத்தைச் சுருக்கமாகச் சொல்லிமுடிக்க முயல்கின்றேன்.

எங்களுடைய மாவட்டத்திற்குத் தேவையான வளங்களைப் பெற்றுக்கொடுப்பதில் நிர்வாக ரீதியாகப் பல முன்னேற் பாடுகள் இருக்கவேண்டுமென நான் எதிர்பார்க்கின்றேன். கால்நடை வளர்ப்பு, பால் உற்பத்தி, மீன் உற்பத்தி, விவசாய உற்பத்தி போன்றவற்றுக்குச் சேவை வழங்கும் நிறுவனங்கள் எல்லாம் மக்கள் செறிந்துவாழும் நகரப் புறங்களில் இருப்பதனால் மக்கள் தமது தேவைகளைப் பூர்த்தி செய்துகொள்வதில் பல இடர்பாடுகளைச் சந்தித்து வருகின்றார்கள். அதனால் பொருத்தமான இடங்களில் பொருத்தமான நிறுவனங்கள், காரியாலயங்களை அமைப் பதற்கு அந்தந்த அமைச்சர்கள் இந்த வரவு செலவுத் திட்டத்தினூடாகத் தரப்படுகின்ற நிதிகளை ஒதுக்குவார் களென நான் நம்புகின்றேன்.

நிதி அமைச்சர் வரவு செலவுத்திட்ட உரையின் முடிவுரையை, நாட்டில் பிரபல்யமான இலக்கியவாதியான மஹகமசேகர என்பவரின் "தர்மே காசிம் இராஜசுந்தரம்

[ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා]

அனைவரும் இங்கு வாருங்கள்! நாம் ஒன்று சேர்ந்து இவ் வுலகைத் தற்போதிருப்பதைவிடச் சிறந்த இடமொன் றாக்குவோம்!" என்ற சிந்தனையை மேற்கோள்காட்டிச் சிறப்பாக முடித்திருந்தார். இந்தப் பாதீட்டு உரையை மையமாக வைத்துப் பார்க்கின்றபொழுது, வடக்கு, கிழக்கைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் இங்கு கடும்போக்கான தொனி யிலேயே தங்களுடைய கருத்துக்களை முன்வைக்கின்றார்கள் என்பது உங்களுக்குத் தெரியும். என்னைப்பொறுத்தவரை 2005ஆம் ஆண்டு கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்திலிருந்து - நான் 'நோட்டீஸ்' ஒட்டிய காலத்திலிருந்து - முதலமைச்சராகி, இன்று பாராளுமன்ற உறுப்பினராக இந்த அரசாங்கத்துடன் இணைந்து இயங்கிவருகின்றேன். அரசாங்கத்துடன் ஒத்து எங்கள் கட்சியினூடாக மக்களுக்கான வேலைத்திட்டங்களை முன்னெடுக்கின்ற எங்களைப்போன்றவர்களை அரசியல் ரீதியாக வளர்த்தெடுக்க வேண்டும். கடும்போக்கானவர் களுக்குத் தீனி போடுகின்ற அளவிலே எங்களுடைய அரசியல் நிருவாகம் செயற்படக்கூடாது. அந்த அடிப்படையிலே உங்களுடன் சேர்ந்திருக்கும் நாங்கள், மக்கள் முகஞ்சுளிக் காதளவில் எங்களுடைய தனித்துவமான அரசியலை வளர்த்தெடுப்பதற்குரிய சூழலை எங்களுடைய மாவட்டத்தில் உருவாக்கித் தரவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன். நன்றி, வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකාවේ 76වන අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා.

2022 වසරේ සමස්ත ආදායම රුපියල් මිලියන විසිලක්ෂ හතළිස්අටදහසක් හා සමස්ත වියදම රුපියල් මිලියන පනස්එක්ලක්ෂ විසිඅටදහස් හාරසිය හැත්තෑවක් වෙනවා. සමස්ත ආදායම ඇස්තමේන්තු කරලා තිබෙන්නේ, බදු ආදායමින් රුපියල් මිලියන දාහත්ලක්ෂ හතළිස්අටදහසකුත්, බදු නොවන ආදායමින් රුපියල් මිලියන දෙලක්ෂ විසිනවදහස් පන්සියයකුත්, පළාත් සභා ආදායමින් රුපියල් මිලියන හැටදහස් පන්සියයකුත්, ප්‍රදාන වශයෙන් රුපියල් මිලියන දසදහසකුත් වශයෙන්.

සමස්ත වියදම ඇස්තමේන්තු කරලා තිබෙන්නේ, පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන විසිඅටලක්ෂ හැත්තෑඅටදහස් පන්සිය විසිඑකකුත්, දැවැන්ත සංවර්ධනයක් මේ රටේ ඇති කරන්න මූලධන වියදම් හැටියට රුපියල් මිලියන හත්ලක්ෂ දහඅටදහස් හාරසිය හැත්තෑහතරකුත්, රාජ්‍ය ණය ආපසු ගෙවීම සඳහා රුපියල් මිලියන පහළොස්ලක්ෂ තිස්එක්දහස් හාරසිය හැත්තෑවකුත් වශයෙන්.

ශීර්ෂ 115ක් යටතේ මිලියන විසිලක්ෂයට අධික මුදල එකතු කරන්න කටයුතු කරනවා. බදු ආදායම් ශීර්ෂ 51ක්, බදු නොවන ආදායම් ශීර්ෂ 12ක්, පළාත් සභා ආදායම් ශීර්ෂ 51ක් සහ ප්‍රධාන ශීර්ෂ 1ක් තිබෙනවා. මේ ශීර්ෂ 115න් තමයි ආදායම් එකතු කිරීමේ කටයුත්ත කරන්නේ. ඒ වාගේම සමස්ත වැය ශීර්ෂ 233ක් තිබෙනවා. වියදම් ඒකක 25ක් සහ අමාත්‍යාංශ වැය ශීර්ෂ 208ක් එක්ක සමස්ත වැය ශීර්ෂ 233කින් තමයි මේ වියදම කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බදු ආදායම එකතු කිරීම ඉතාම වැදගත්. මේ කාර්යය කරන්නේ අපේ රාජ්‍ය නිලධාරින්. ඒ ඒ වර්ෂය තුළ නියමිත කාර්තුවට, නියමිත වෙලාවට මේ ආදායම එකතු කළේ නැත්නම්, අය වැය ලේඛනයෙන් බලාපොරොත්තුවන ජයග්‍රහණ ජනතාවට ලබාදෙන්න අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා විශේෂයෙන් උපදේශක කාරක සභාවලදී මේ ආදායම් එකතු කිරීම පිළිබඳව සාකච්ඡා කරන්න අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වග කීමක් තිබෙනවා. එහෙම සාකච්ඡා කරලා, මේ ආදායම එකතු වෙනවාද, නැද්ද කියන එක පිළිබඳව සොයා බැලීමේ වගකීමක් තිබෙනවා. ඒ සඳහා රාජ්‍ය නිලධාරින්ගේ කැපවීම අවශ්‍යයි. ඒ නිසා ආදායම් එකතු කර ගැනීම ඉතාම වැදගත් කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අමාත්‍යාංශවල හා රාජ්‍ය අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව පාර්ලිමේන්තුව පවත්වන සෑම දිනයකම තර්ක විතර්ක ගොඩ නැඟෙන්නට ඕනෑ. සෑම උපදේශක කාරක සභාවකම මේ පිළිබඳව සොයා බැලීම් කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි, 2022 වර්ෂය තුළ අප බලාපොරොත්තු වන ඉලක්ක කරා ගිහින් ඒ සමස්ත මුදල 2022 වර්ෂය තුළ වියදම් කිරීමේ හැකියාව තිබෙන්නේ. ඵලදායී ලෙස ජනතාවට මේ මුදල් ගලා යන්න පුළුවන්කම තිබෙන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි ඒ පිළිබඳව සොයා බැලුවොත් විතරයි. ඒ පිළිබඳව අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ දැඩි අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේදී මා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2022 අය වැය ලේඛනය තුළ වියදම් කළමනාකරණය සඳහා යෝජනා 52ක් ඉදිරිපත් කර තිබෙනවා. මේ යෝජනා 52 හරහා තමයි, 2022 අවුරුද්ද තුළ මූලධන වියදම් තුළින් ජනතාවට දැවැන්ත සංවර්ධනයක් ළඟා කර දෙන්න කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ; පුනරාවර්තන වියදම් තුළින් දැවැන්ත සේවාවක් මේ රටට ලබා දෙන්න කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ කිහිපයක් පිළිබඳව අදහස් දක්වන්න මා බලාපොරොත්තු වෙනවා.

ත්‍රිරෝද රථ නියාමන අධිකාරියක් පිහිටුවීම, අපනයනකරුවන් සඳහා රේගු සහන ලබාදීම, 2022 වර්ෂය තුළ ව්‍යාපාර ලියා පදිංචිකරුවන්ගෙන් ගාස්තු අය නොකිරීම, කාන්තාවන්ට සහ තරුණයන්ට විශේෂිත පදනමක් මත වගා කරන්න ඉඩම් ලබා දීම, විශේෂයෙන්ම ආසියාවේ ගුවන් කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පත් කරන්නට ගුවන් තොටුපොළවල් සංවර්ධනයට මුදල් යෙදවීම, කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල හා හම්බන්තොට යන වරාය සංවර්ධනය සඳහා මුදල් යෙදවීම, රටේ දරුවන්ගේ අධ්‍යාපනයට සියයට 7.5ක මුදලක් වෙන් කර දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වැඩි ඉඩ කඩක් ලබාදීම ප්‍රමුඛ කාර්යයන් කිහිපයක් බව මේ අවස්ථාවේදී මා මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ක්ෂේත්‍ර 11ක් යටතේ අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 1,75,294ක් -රුපියල් කෝටි 1,752ක් - වෙන් කරලා තිබෙනවා. ඒ වෙන් කරලා තිබෙන්නේ විශේෂිත වූ ක්ෂේත්‍ර යටතේ දැවැන්ත සංවර්ධනයක් මේ රටට ළඟා කර ගන්නයි. කොවිඩ් - 19 රෝගයෙන් බිඳ වැටුණු රටේ ජනතාව යළි නඟා සිටුවීමටත්, මේ රටේ සංවර්ධනයටත් විශාල මුදලක් යොදවා තිබෙනවා. මේ රටේ බිඳ වැටුණු නිෂ්පාදනය වැඩි කරලා ආර්ථිකය ගොඩ නඟා ගැනීම සඳහා විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, මේ රටේ සුළු පරිමාණ කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයන් නඟා සිටුවන්න විශාල මුදලක් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 2022 වර්ෂය තුළ මේ රටේ ව්‍යවසායකයන් දහස් ගණනක් ඇති කරන්න අවශ්‍ය මුදල් ප්‍රමාණය වෙන් කරලා තිබෙනවා. ඒ තුළින් මේ රටේ ජීවනෝපාය සංවර්ධනය හරහා ව්‍යවසායකයන් විශාල ප්‍රමාණයක් ගොඩ නඟන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

තරුණ තරුණියන්ට, ක්‍රීඩකයන්ට තමන්ගේ අනාගතය ගොඩ නඟා ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය මෙම අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මම විශේෂයෙන් මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දුප්පත්, අහිංසක මිනිසුන්ගෙන් බදු අය නොකර, ඉතා සීරුවට බදු ආදායම් එකතු කිරීමේ වැඩ පිළිවෙළ මේ අය වැය ලේඛනය තුළින් ක්‍රියාත්මක කරලා තිබෙනවා. කොවිඩ් වසංගතය නිසා රටේ ආර්ථිකය කඩා වැටී ඇති මෙවන් අසීරු අවස්ථාවකදීත් ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඉතාම සාර්ථක, ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරලා තිබෙනවා. විපක්ෂය බලාපොරොත්තු වුණේ මෙවැනි අය වැයක් නොවෙයි, මීට වඩා වෙනස්, අච්චාරු වුණු අය වැයක්. නමුත් එතුමා අද සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. එම නිසා අද විපක්ෂයේ හඬ නිහඬ කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

නවක මන්ත්‍රීවරු හැටියට මේ වෙලාවේ අප විශේෂයෙන් මතක් කළ යුතු කරුණක් තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා මෙවර අය වැයෙන් අපි විශ්‍රාම වැටුප ලැබීමට නම් පාර්ලිමේන්තුව නියෝජනය කළ යුතු කාලය අවුරුදු පහේ සිට අවුරුදු 10 දක්වා දීර්ඝ කළා. නවක මන්ත්‍රීවරු හැටියට අපට රුපියල් 17,000ක විශ්‍රාම වැටුපක් තමයි ලැබෙන්නේ. විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන් නැති කරනවා නම් නවක මන්ත්‍රීවරු හැටියට අපි එයට කැමැතියි, අපි ඒ ආදර්ශයත් රටට ලබා දෙන්න සූදානම් කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Faizal Cassim. You have seven minutes.

[பி.ப. 4.41]

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ நிதி அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற 2022ஆம் வருடத்திற்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் முன்வைப்பதற்கு நேரம் ஒதுக்கித்தந்தமைக்கு முதற்கண் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

මම මුලින්ම අපේ රාජ්‍ය ඇමති ඉන්දික අනුරුද්ධ මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. පසුගිය ආණ්ඩුවෙන් අපේ පළාතේ coastal belt එකේ හදපු ගෙවල්වලට තව රුපියල් මිලියන 150ක් දෙන්න තිබෙනවා. අපට ඒ මුදල් ක්‍රම ක්‍රමයෙන් දෙනවා කියලා පොරොන්දු වෙලා, මුලින් රුපියල් මිලියන 25ක් දීපු රාජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් කථා කරනකොට පසුගිය ආණ්ඩුව හදපු ගෙවල්වලට සල්ලි දුන්නේ නැති කථාවක් කියනවා මට ඇහුණා. ඒ නිසා මම ඉන්දික අනුරුද්ධ රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාටත්, අපේ නිමල් ලාන්සා රාජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මාර්ග කිලෝමීටර ලක්ෂයේ ව්‍යාපෘතියේදී අපේ මන්ත්‍රීතුමන්ලාට කිලෝමීටර 50ක් දීලා අපට මේ වැඩ ටික කරන්න උදවු වීම ගැන. ඒ වාගේම ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, "අපි කොන්ක්‍රීට් පාරවල් කාපට් කරනවා. අනෙක් පාරවලුත් හදනවා" කියලා. නමුත් සාමාන්‍යයෙන් පාර බලලා තමයි කරන්න පුළුවන්ද, බැරිද කියලා තීරණයක් ගන්නේ. ඒක RDA එකේ නිලධාරින්ගේ වැඩක්.

මම දැන් අය වැය විවාදයට එකතු වෙන්න කැමතියි. මට ලැබී තිබෙන්නේ විනාඩි හතයි. ඒ නිසා මම මගේ කථාව කෙටි කර ගන්න ඕනෑ. අපට තිබෙන ප්‍රධානම ආර්ථික ප්‍රශ්නයක් තමයි foreign exchange ලංකාවට ගෙනෙන්නේ කොහොමද කියන එක. මුලින්ම අපේ ආර්ථිකය ස්ථාවර කළ යුතුයි. ඒ සඳහා අපි ලංකාවේ export industries පටන් ගන්න ඕනෑ. අපට ලෙහෙසියෙන්, ඉක්මනින්, කෙටි කාලයකින් පටන් ගන්න පුළුවන් දෙයක් තමයි garment factories. අපි 1990වල පටන් ගත්ත garment factories ටික 2004දී නැති වුණා. දැන් ඒක බංග්ලාදේශයට ගිහින්. නමුත් ලංකාවෙන් තවමත් orders ගෙනෙන්න buyersලා ඉන්නවා. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, එක දිස්ත්‍රික්කයකට garment factories දෙක ගණනේ ලංකාවේ දිස්ත්‍රික්ක විසිපහේම garment factories 50ක් පටන් ගන්න කියලා. එහෙම පටන් ගන්න garment factoriesවලට අඩු interest ratesවලට ණය දීලා, අවශ්‍ය පහසුකම් ටික දීලා නැවත අපේ export industry එක නඟා සිටුවන්න කියා මම ඉල්ලීමක් කරනවා.

නමුත්, කියන්න කනගාටුයි, ජෝර්දානයේ ලංකාවට අයිතිව තිබුණු ෆැක්ටරියක් වහලා තිබෙනවා. ඒ වාගේම, මැෂින් 2,000ක් සහිත ෆැක්ටරියක් ලංකාවේ කුරුණෑගල ප්‍රදේශයේ හදන්න ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා උදවු කරලා තිබෙනවා. ඒකට ඉඩම ගන්න මාස තුනක හතරක සිට එතුමන්ලා වෙහෙසෙනවා. ආයෝජකයෙක් ලංකාවට එනකොට ඒ ගොල්ලන්ට මෙවැනි ප්‍රශ්න තිබුණොත් ලංකාවේ export industry එක පටන් ගන්න බැහැ. පසුගිය ආණ්ඩුවේදීත් මම දැක්කා, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය බෙහෙත් හදන්න කියලා 35 දෙනෙකුට permission දුන්නා. අන්තිමට ඒ අවුරුදු හතරේ දෙන්නෙක්, තුන්දෙනෙක් විතරයි බෙහෙත් හැදුවේ. ඒ කියන්නේ ඒ කාලයේ හරියට වැඩේ කළේ නැහැ. මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, මේ ව්‍යාපෘති කරන්න එන investorsලාට උදවු කරන්න කියලා.

අනෙක් කාරණය තමයි tourism. Tourism ගැන කථා කරනකොට කියන්න ඕනෑ, දැන් අපි කොවිඩ්වලට භයෙන් ඉන්නේ. අපි මෙහෙන් ඩුබායිවලට යනකොට ඩුබායිවලින් PCR Test එක කරනවා. ඒ PCR Test එක ආණ්ඩුවෙන් කරන එකක්. නමුත් මම ගිහින් අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක කථා කළාම කිව්වා, "ඒක අපට කරන්න බැහැ, ආණ්ඩුවේ නීතියක්" කියලා. කනගාටුයි කියන්න, ලංකාවේ හොරට PCR Test වාර්තා දෙනවා. ඩුබායි ඉඳලා එනකොටත් හොර PCR test වාර්තා දෙනවා. මේක අවදානම්, මේ වගකීම ගන්න කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. ආණ්ඩුව ලංකාවට එන හැමෝගේම PCR Tests කරන්න ඕනෑමයි. නැත්නම් මේ ආණ්ඩුවට ආයෙත් කොවිඩ් ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙනවා.

අනෙක් කාරණය තමයි foreign employment. මම දැක්කා මේ දවස්වල ගොඩක් අය Middle East යනවා. මම හිතන විධියට තව මාස දෙකක්, තුනක් යනකොට ඒ ගොල්ලන්ගේ පඩි

[ගරු ෆයිසාල් කාසිම් මහතා]

ලංකාවට එවන්න පුළුවන්. නමුත් එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් ඒ ගොල්ලන් උණ්ඩියල් ක්‍රමයට තමයි සල්ලි එවන්නේ. ඒකේ exchange rate එක වැඩියි. සාමාන්‍යයෙන් ඩුබායිවල වැඩ කරන කෙනෙකුට, Dubai exchange rate එක රුපියල් 51යි කියලා හිතුවොත්, දැන් ඒ ගොල්ලන්ට රුපියල් 62ට විකුණන්න පුළුවන්. මේ ප්‍රශ්නයටත් ආණ්ඩුව විසඳුමක් දෙන්න ඕනෑ. ඒ වාගේම Middle East විතරක් නොවෙයි Japan and Korea ගියත් එහෙම තමයි.

මගේ අනෙක් යෝජනාව මේකයි. දැන් යුනියන්කාරයෝ තමයි ලංකාව පාලනය කරන්නේ. මම ඉල්ලීමක් කරනවා, ලංකාවේ ඔක්කොම Public-Private Partnership එකට ගේන්න කියලා. දැන් අපි බිලියන 300ක් වියදම් කරනවා health අංශයට. මම කියන්නේ Public-Private Partnerships ගෙනැල්ලා, සෞඛ්‍ය අංශයට වියදම් කරන ඒ බිලියන 300න් බිලියන 100ක් health insurance එකකට යන ක්‍රමයක් හදන්න පුළුවන් නම්, ලංකාවේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. Health Ministry එක, Education Ministry එක සහ CEB එක වාගේ පාඩුවට යන හැම ආයතනයකටම අපි Public-Private Partnerships ගේන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාවට විනාඩි 10ක් නියම කරලා තිබුණත්, ලැබුණේ විනාඩි 7යි. බොහෝ දේ ගැන කථා කරන්න හිතාගෙන ආවත්, කාලය සීමිත වුණා. එම නිසා මගේ කථාව **සභාගත*** කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජගත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබාදුන්නාට ස්තුතියි.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා, ඉතාම අර්බුදකාරී මොහොතක ජනතාවට දෙන්න පුළුවන් සහන සියල්ල ලබා දෙමින් හොඳ අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන කැබිනට් මණ්ඩලයට ඒ වෙනුවෙන් ස්තුතිය පළ කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මේ අය වැය තුළින් සැමට පානීය ජලය ලබා දීම සඳහා මුදල් වෙන් කිරීම ගැන මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ හිතවත් ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමාත් දන්නවා "පුර නැඟුම" ව්‍යාපෘතියේ මම විශේෂ ව්‍යාපෘති අධ්‍යක්ෂතුමා හැටියට කටයුතු කළ කාලයේ පැල්වත්ත ජනාවාස සියල්ලටම ජලය සපයා දෙන්න කටයුතු කළ බව. ඒ වාගේම මමත්, හිටපු නියෝජ්‍ය කථානායකතුමාත් හම්බෙගමුව ජල යෝජනා ක්‍රමය සඳහා ජල මූලාශ්‍ර හඳුනාගෙන, සියලු සැලසුම් සකස් කරලා, අවශ්‍ය කටයුතු කරලා තිබෙන්නේ. පසුගිය රජයට ඒ සඳහා මුදල් සපයා ගැනීමට නොහැකි වුණත්, වත්මන් මුදල් අමාත්‍යතුමා හම්බෙගමුව ජල යෝජනා ක්‍රමය සඳහා මුදල් වෙන් කර දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ධීවර හා ජලජීවී වැඩසටහන යටතේ අද නොයෙක් ප්‍රදේශවල විසිතුරු මත්ස්‍ය වගාව කරනවා. අපට තවත් සියයට 90කට වඩා විසිතුරු මසුන් අපනයනය කරන්න හැකියාව තිබෙනවා. ඒ සඳහා "සෞභාග්‍යා ගම්මාන ව්‍යාපෘතිය" යටතේ බුත්තල, වගුරුවෙල ප්‍රදේශයේ ව්‍යවසායකයන් 50දෙනෙකු හඳුනාගෙන, විසිතුරු මසුන් ඇති කිරීම කරගෙන යනවා. ඒ වාගේම, "ගම සමඟ පිළිසඳර" වැඩසටහන හරහාත් මුදල් දීලා, එම ව්‍යාපෘති 80ක් දක්වා වැඩි කරන්න ගරු මුදල් අමාත්‍යතුමා අපට සහාය ලබා දී තිබෙනවා.

වැවිලි ආර්ථිකය සම්බන්ධයෙන් ලබා දී තිබෙන සංවර්ධන සහන ගැනත් අපි ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2010 වර්ෂයේ රටට ආවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 46යි. අද ඒ ප්‍රමාණය ඒ වාගේ හතර ගුණයකින් - ඇමෙරිකානු ඩොලර් බිලියන 160 දක්වා- වැඩි වෙලා තිබෙනවා. මේක, අපට විදේශ විනිමය අවශ්‍ය මොහොතක්. අපි 2010 ඉඳලා සැලසුම්සහගතව පොල් වගා කිරීම වැඩි කරපු නිසා අද ඒ ප්‍රතිඵල අපට ලැබෙමින් පවතිනවා. හිටපු පොල් සංවර්ධන ඇමතිවරයා හැටියට මම ඒ ගැන ආඩම්බර වෙනවා.

2012 වර්ෂයේ පොල් පැළ ලක්ෂ 40කුත්, 2013 වර්ෂයේ පොල් පැළ ලක්ෂ 60කුත්, 2014 වර්ෂයේ පොල් පැළ ලක්ෂ 90කුත් අපි වගා කර තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට -වෙනදා ගාල්ලෙන්, මාතරින්, හම්බන්තොටින්, වලස්මුල්ලෙන්, මිද්දෙනියෙන් තමයි මොනරාගලට පොල් ගෙනාවේ- අද පොල් ගෙඩියක්වත් අපි පිටින් ගේන්නේ නැහැ. අද මොනරාගල දිස්ත්‍රික්කය පොල්වලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. අද ඒ ගෙවල්වල පොල්තෙල් හදලා බෝතලයක් රුපියල් 400ට, 420ට විකුණනවා. අද කොළඹ වාගේ නගරවල පොල්තෙල් බෝතලයක් රුපියල් 500ක්, 600ක් වුණාට, මොනරාගල අපිට ඒ මට්ටමට පොල්තෙල් ටික විකුණන්න පුළුවන්. ඒ වාගේම පොල්කටු එකතු කරලා මීට පෙර රුපියල් 5කටයි කිලෝවක් විකුණුවේ. අද රුපියල් 25, 30 දක්වා වූ ආදායමක් පොල්කටුවලිනුත් ගන්නවා. මම මේ කාරණා කෙටියෙන් කියන්නේ.

ගරු මුදල් ඇමතිතුමා පශු සම්පත් සංවර්ධනයටත් මුදල් වෙන් කර තිබෙනවා. ඒ ගැනත් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. වැල්ලවාය ආසනයේ බුත්තල ප්‍රදේශයේ අපේ දේශීය ව්‍යාපාරිකයෙකු වන ආරියශීල වික්‍රමනායක මැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමා මුදල් ආයෝජනය කරලා, අද පැල්වත්ත කිරිපිටි විශාල වශයෙන් ව්‍යාප්ත කර තිබෙනවා. කිරිපිටි හිඟය වෙලාවේත් ඒ හිඟය නැති කරන්න පුළුවන් ආකාරයට එතුමා කටයුතු කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තවම විනාඩි 3යි ගත වෙලා තිබෙන්නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ රජය විසින් "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේත් විශාල වැඩ කොටසක් කර තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා එදා හිටපු ජනාධිපතිතුමා හැටියට ඉරාන රජයත් එක්ක සාකච්ඡා කර ලබා ගත් ආධාර යටතේ, උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කළා. පසුගිය කාලයේ හඳපානාගල ජලාශය ආශ්‍රිත ගොවිබිම්වල වැඩ කටයුතු කන්න 5ක් අතහැරිලායි තිබුණේ. ඒ ජලාශය අඩි 8ක් උස්සලා, අද යල මහ දෙකන්නයේ කුඹුරු කරන මට්ටමට ගෙන එන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම, වෙලි ඔය සිට හම්බෙගමුව වැව දක්වා වැව් 50කට ආසන්න සංඛ්‍යාවකට ඒ තුළින් ජලය සපයන්න හැකියාව ලැබුණා. 1994 මම පාර්ලිමේන්තුවට ආපු අවස්ථාවේ වාරිමාර්ග අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ, දිවංගත ගරු අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමා මම ගෞරවයෙන් සිහිපත් කරනවා. මොකද, එතුමා ඒ වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කළා. ඒ ප්‍රදේශයේ යල, මහ සහ අතුරු කන්නයකුත් වගා කරන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම, කුඹුක්කන් ඔය ව්‍යාපෘතියේ මූලික සැලසුම් ටික සකස් කර දැන් ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනවා.

අතිගරු ජනාධිපතිතුමා හරිත බලශක්ති නිෂ්පාදනය යටතේ සූර්ය බලශක්තිය සඳහා විශේෂ අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ නිවසේත් සූර්ය කෝෂ පැනල සවි කර තිබෙනවා. මේ නිසා ගෙදර ලයිට් බිල අඩු කරගෙන මටත් රුපියල් 25,000ක් පමණ මාසයකට ඉතුරු වෙන තත්ත්වයක් තිබෙනවා. මේ සඳහා ජාතික මට්ටමින් අපි හැමෝම පුළුවන් තරම් සහන ලබා දීලා කටයුතු කළොත්, ජාතික ආදායම වැඩි කරගන්න හැකියාව ලැබෙන බවත් මා මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන දැන් සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, "ගම සමඟ පිළිසඳර" වැඩසටහන යටතේ අතිගරු ජනාධිපතිතුමා හම්බෙගමුව ප්‍රදේශයට පැමිණීමෙන් අනතුරුව මාර්ග විශාල ප්‍රමාණයක් කාපට් කරන්නත්, පාසල් ක්‍රීඩා පිටි සකස් කරන්නත් කටයුතු කළා. "දැයක් නඟන සියක් නගර" සංවර්ධන වැඩසටහන යටතේ, මගේ යෝජනාව පරිදි ඔක්කම්පිටිය හා තණමල්විල නගර ඒ සඳහා හඳුනාගෙන තිබෙනවා. ඒ කටයුතු සැලසුම් කරලා, ළඟදීම අපි ඒ සංවර්ධන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මොනරාගල කියන්නේ අති දුෂ්කර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ සේවයේ නියුතු අපේ රාජ්‍ය සේවකයන් ඉතා කැපවීමෙන් කටයුතු කරනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු සියලු රාජ්‍ය නිලධාරින් අපහසුතා මැද්දේයි කටයුතු කරගෙන යන්නේ. ඒ අය ඉතා අවංකව ඒ කටයුතු කරගෙන යනවා. ඒ ශක්තිය සම්බන්ධයෙන් මම එතුමන්ලාට ස්තුතිය පුද කරන්න ඕනෑ. මොකද, සමහර කථාවලදී කියැවෙනවා, "රාජ්‍ය සේවකයන් වංචාකාරයෝ" කියලා. සුළුතරයක් -අතේ ඇඟිලි ගානට වාගේ- ඒ වාගේ වැඩ කරනවා ඇති. නමුත් අපේ දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයෝ විශාල පිරිසක් ඉතාම අවංකව කටයුතු කරගෙන යනවා.

මම අවසාන විනාඩිය ගන්නේ මෙම කාරණය කියන්නයි. සෙවණගල, පැල්වත්ත සීනි සමාගම් 1993 ඉඳලා පෞද්ගලීකරණය කරන්න උත්සාහ ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. නමුත් අපි ඒකට ඉඩ දුන්නේ නැහැ. 2003 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂය බලයට පත් වූ අවස්ථාවේ ඒවා පෞද්ගලීකරණය කරලා, එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙකුට වංචාසහගත ලෙස එය දුන්නා. 2011 දී ඌන උපයෝජිත වත්කම් යටතේ ඒ සමාගම් දෙක ආපහු රජයට පවරා ගත්තා. ඒ සඳහා කැප වූ කෙනෙකු හැටියට මා විශේෂයෙන් ඒ කාරණය මතක් කරනවා. ඒ කටයුතු කරපු ආකාරය ගැන ගරු අග්‍රාමාත්‍යතුමාත්, එවකට හිටි කැබිනට් මණ්ඩලයක් දන්නවා. කෝප් එකේ සාමාජිකයෙක් හැටියට මා මතක් කරන්න ඕනෑ, දැනටමත් රජයේ ආයතනයක් ලෙස තිබෙන ඒ ආයතනයේ විශාල දූෂණ සිද්ධ වෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් furnace oil රුපියල් 97ක් වන නිසා ඒ වෙනුවට කළුතෙල් අරගෙන තියෙනවා. මා ළඟ තිබෙන මේ ලේඛන සියල්ල මා **සභාගත*** කරනවා. මේ ගැන පැහැදිලි කරන්න මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. වෙලාව අවසන්.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
ඒ ප්‍රදේශයේ රිප්ප අඩියක් රුපියල් 10ට ගන්න තිබියදී, කොළඹින් රුපියල් 30කට අරගෙන තිබෙනවා. මේවා දූෂණ. කවුරු කළත් මේවා වැරැදියි. මේවා හදන්න තමයි අපට බලය දීලා තිබෙන්නේ. ඒ වාගේම hume pipes- *[බාධා කිරීමක්]* හොඳයි. ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකාවේ 76වැනි අය වැය පිළිබඳ විවාදයට එක් වෙමින් කථා කරන්න මට ලැබුණේ, විනාඩි හයක කාලයක්. කමක් නැහැ. මේ අය වැය විවාදයේදී විපක්ෂයේ අය "මේ අය වැය පුස් අය වැයක්; හිස් අය වැයක්" කියලා චෝදනා කරනවා. නමුත් මම විපක්ෂයට කියන්න ඕනෑ, විවාහ වෙච්ච ගමන් දරුවෝ හම්බ වෙන්නේ නැහැ. දරුවෝ හම්බ වෙන්න මාස දහයක් හෝ අවුරුද්දක් පමණ ගත වෙනවා කියන එක. නිකම් හිටියොත් ඒකත් නැහැ.

ගමට, අපේ පළාත්වලට මේ අය වැයේ වැදගත් දේවල් ගොඩක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ලංකාවේ පාසල් 10,155කට අවශ්‍ය අන්තර්ජාල සම්බන්ධතා ටෙලිකොම් ආයතනය හරහා ලබා දෙනවා කියා මෙම අය වැයේ සඳහන්ව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකම ඇති. මේ රටේ සමස්ත දරු පරපුර වෙනුවෙන් එම වැඩ පිළිවෙළට මෙවර අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම ගැන දරුවෝ ඉන්නා දෙමව්පියන් විධියට අපි සතුටු වෙනවා.

අද උදේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමියක් කිව්වා මාදිවෙල ගෑස් නැහැ, දර හොයන්න යන්නයි වෙන්නේ කියලා. දර හොයන්න යන්න ඕනෑ නැහැ. අපි අල්ලපු ගෙවල්වල ඉන්නේ. ගෑස් එකක් හුවමාරු කරගන්න පුළුවන්. ඕනෑ නම් අපේ ගෑස් එකෙන් අපි ඉව්වාට පසුව ඒක බෙදා හදා ගන්න පුළුවන්.

---

* *ලේඛන ඉදිරිපත් නොකරන ලදී.*
* *ஆவணங்கள் சமர்ப்பிக்கப்படவில்லை.*
* *Documents not tendered.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ විශ්‍රාම වැටුප ලබා දීමට, සේවය කළ යුතු කාලසීමාව අවුරුදු පහ සිට දහය දක්වා දීර්ඝ කළා. අපිට ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒක කාටත් සාධාරණ වෙන්න ඕනෑ. මොකද, 1989 ඉඳලා බැලුවාම මේ තිබෙන්නේ නවවැනි පාර්ලිමේන්තුව. දැන් පාර්ලිමේන්තු අටක කාලසීමාව ඉවර වෙලා තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයලා වාගේ 1989 සිට පාර්ලිමේන්තු අටේම සිටි අය මෙතැන ඉන්නවා. ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයා, නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා වාගේ නොපැරදී දිගටම අට වතාවක් පාර්ලිමේන්තුවට තේරී පත් වුණු අය ඉන්නවා. ඒ වාගේම ඒ පාර්ලිමේන්තු කාලසීමාවලදී වාහන බලපත්‍ර අටක් ගත් අයත් ඉන්නවා; හතක් ගත් අයත් ඉන්නවා; හයක් ගත් අයත් ඉන්නවා. ඒක නිසා මේක හැමෝටම සාධාරණ වෙන්න ඕනෑ. අද වනවිට අපේ විශ්‍රාම වැටුප ගැන කවුරුත් කථා කරන්නේ නැහැ; මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාගෙන් කිසි කෙනෙක් ඒ ගැන කථා කරන්නේ නැහැ. නමුත් අපි කථා කළ යුතු තැන කථා කරනවා. මේ කාරණයේදී කාටත් සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය සේවයට වාහන බලපත්‍ර 14,000ක් දෙනවා. ඒ වාගේම රජයේ නිලධාරින් වාහන 80,000ක් පාවිච්චි කරනවා. ඒ විතරක් නොවෙයි. 1989 ඉඳලා දිගටම පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන් වාහන බලපත්‍ර හය, හත අරගෙන තිබෙනවා. හැබැයි, පසුගිය මැතිවරණයෙන් නවවැනි පාර්ලිමේන්තුවට නවක මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වුණු අයට විතරයි, ලොකුම අසාධාරණය වෙලා තිබෙන්නේ. මම ඒ ගැන කෙළින් කථා කරනවා. කවුරු කථා නොකළත් කමක් නැහැ. කථා කරන්න ඕනෑ දේ කථා කරන්න ඕනෑ; ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ.

මේ අය වැය හොඳ අය වැයක්. මේ අය වැයෙන් රජය හැමෝටම පොඩ්ඩ පොඩ්ඩ හරි උදව් කර තිබෙනවා. ත්‍රිරෝද රථ රියැදුරන්, පෞද්ගලික බස් රථ හිමියන් වැනි සෑම කෙනෙකුටම මේ අය වැය තුළින් සහන ලැබී තිබෙනවා. හැබැයි, ඒ දේවල් අද ලැබෙන්නේ නැහැ; හෙට ලැබෙන්නේත් නැහැ. කොහොමත් විපක්ෂය මේ අය වැයට හොඳ කියන්නේ නැහැ. අපි පොඩි කාලයේ රොනී ද මැල් මහත්මයාගේ අය වැය අපි අසා තිබෙනවා. රොනී ද මැල් මහත්මයා අය වැය ඉදිරිපත් කළ කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විපක්ෂයේ සිටියේ. අපි කවදාවත් රොනී ද මැල් මහත්මයාගේ අය වැය හොඳයි කිව්වේ නැහැ. ඒ වාගේමයි මේ විපක්ෂයේ අයත්. අපි මොනවා දුන්නත්, මේ අය වැය කොච්චර හොඳ වුණත් "මේක හොඳ නැහැ" කියන එක තමයි විපක්ෂයේ අය දිගින් දිගටම කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ අවස්ථාවේ බණ්ඩාරවෙල, උඩරට එළවලු ගොවීන් ගැනත් යමක් කියන්න කැමැතියි. බදුල්ල දිස්ත්‍රික්කය කියන්නේ එළවලු ගොවීන් ඉන්නා ප්‍රදේශයක්. ලංකාවට අර්තාපල් වැඩියෙන්ම සපයන්නේ අපේ බදුල්ල දිස්ත්‍රික්කයෙන්. ලංකාවට වැඩියෙන්ම එළවලු සපයන්නේත් අපේ බදුල්ල දිස්ත්‍රික්කයෙන්. ඌව-පරණගම, වැලිමඩ වාගේම හපුතලේ, හාලිඇල සහ බණ්ඩාරවෙල කියන ප්‍රදේශවල ගොවි ජනතාවට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, කෘෂි රසායනික ද්‍රව්‍ය නොමැති ගැටලුව. කෘෂි රසායනික පොහොර නැතුව අපේ පළාතේ ගොවීන්ට කොහොමත් එළවලු ටික හදන්න බැහැ, නරක් වෙනවා. මේ කාලයේ දිගින් දිගටම වර්ෂාව. ඒ නිසා අද එළවලු මිල අධික ලෙස ඉහළ ගිහින් තිබෙන්නේ. මේ කෘෂි රසායනික ප්‍රශ්නය අපේ පළාතට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. වී ගොවිතැනට හා අනෙක් ගොවිතැන්වලට වඩා එළවලු ගොවිතැනේ යෙදෙන බදුල්ල දිස්ත්‍රික්කය වාගේ ප්‍රදේශවල ජීවත් වෙන උඩරට එළවලු ගොවීන්ට මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපි ආණ්ඩුව නියෝජනය කරමින් ආණ්ඩු පක්ෂයේ සිටින්නේ. අපේ පළාතේ මිනිසුන් වෙනුවෙන් කථා කරන්න තමයි අපි පාර්ලිමේන්තුවට එවා තිබෙන්නේ. ඒ නිසා අපි ඒ අය වෙනුවෙන් කථා කරන්න ඕනෑ; ඒ අය වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ.

අද වනකොට වැලිමඩ ප්‍රදේශයේ ගොවීන් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙනවා. කොම්පෝස්ට් පොහොර යෙදුවාම අල ගහ හොඳට හැදෙනවා. අල ගහ කෙළින් වෙලා හැදුණාට වැඩක් නැහැ; හාරන කොට අල නැහැ. එහෙම ප්‍රශ්නයක් රටේ අද තිබෙනවා. ඒ වෙනුවෙන් අපි කථා කරන්න ඕනෑ; පෙනී සිටින්න ඕනෑ. ඒ නිසා තමයි මම අද පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් කථා කරන්න සිතුවේ.

සාර්ථක අය වැයක් මෙවර අපට ලබා දී තිබෙනවා. එමඟින් හැම ක්ෂේත්‍රයක්ම ආවරණය කර තිබෙනවා; හැම කෙනෙකුටම සාධාරණය ඉෂ්ට වෙලා තිබෙනවා. රටේ පවතින කොවිඩ් වසංගතය වැනි ප්‍රශ්න මැද මෙවැනි අය වැයක් ඉදිරිපත් කරයි කියා අපි කවුරුවත් හිතුවේ නැහැ. ජනතාව බලාපොරොත්තු නොවුණු - කවුරුවත් හිතපු නැති- විධියේ අය වැයක් අපේ ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා.

පසුගිය කාලයේ අපට ලොකු ප්‍රශ්නයක් තිබුණා. මට පාසල් යන වයසේ දරුවෝ දෙදෙනෙක් ඉන්නවා. මගේ දරුවන්ටත්, මටත් ප්‍රශ්නයක් තිබුණා. ඒ ප්‍රශ්නය තමයි, ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය එකවර විසඳයි කියා මේ රටේ කවුරුවත් හිතුවේ නැහැ. ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නයත් විසඳීම ගැන ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

සියලු දෙනාට ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.00 වුයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***
***එතැන් සිට විවාදය 2021 නොවැම්බර් 20 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.***

*பி. ப. 5.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம், 2021 நவம்பர் 20, சனிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*
*Debate to be resumed on Saturday, 20th November, 2021.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා.

## පාසල් විෂය මාලාවට වෘත්තීය මාර්ගෝපදේශ ඇතුළත් කිරීම
தொழில் வழிகாட்டல்களைப் பாடசாலைப் பாடத்திட்டத்தில் சேர்த்தல்
INCLUSION OF CAREER GUIDANCE IN SCHOOL CURRICULA

[අ.භා. 5.02]

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon.GaminiWaleboda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි. අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1943 වසරේදී නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමත් සමඟ අද වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දීම රාජ්‍ය ප්‍රතිපත්තියයි. විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනයේදී දරුවන් මුහුණ දෙන මුල් හා දෙවන කඩ ඉම් විභාග වන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට මුහුණ දීමෙන් පසුව දරුවන්ට තම අනාගත මාර්ගය තෝරා ගැනීමට සිදු වේ.
>
> එම අභියෝගය කඩ ඉම් විභාග සමත් දරුවන්ට මෙන්ම විශාල වශයෙන් කඩ ඉම් සමත්වීමට නොහැකි වූ දරුවන් ද මුහුණ දෙන ගැටලුවක් වී තිබේ. විභාග ප්‍රතිඵල සමඟ තමන්ගේ අනාගතය පිළිබඳව භීතියට සහ ආතතියට පත්වීමත්, නිවස තුළ පවා අවශ්‍ය සහාය නොමැතිකමෙන් අවාසනාවන්ත ලෙස දරුවන් සිය දිවි හානි කර ගන්නා අවස්ථාවන් සෑම වර්ෂයකදීම වාර්තා වේ.
>
> මේ හේතුවෙන් දරුවන්ට සිය කඩ ඉම් විභාගයන්ගේ ප්‍රතිඵලය අනුව සිය අනාගතය හැඩගස්වා ගැනීමට නිශ්චිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුව තිබේ. එයින් රටට වඩාත් ඵලදායී මානව සම්පතක් නිර්මාණය කර ගැනීමට ද අවස්ථාව හිමි වේ.
>
> ඒ නිසා පාසල් දරුවන්ගේ මූලික කඩ ඉම් විභාගයන්ට ප්‍රථම විෂය මාලා සඳහා නව ලොව ප්‍රවණතා අනුව සකස් කළ වෘත්තීය මාර්ගෝපදේශයන් ඇතුළත් කර ඔවුන් ඒ සඳහා යොමු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මම මේ ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා කැමැතියි, මේ පිළිබඳව කාරණා කීපයක් කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න. අපේ ලංකාවේ පාසල් පද්ධතිය තුළ සාමාන්‍යයෙන් පළමු වසරට ළමුන් ලක්ෂ 3කට වැඩි ප්‍රමාණයක් ඇතුළත් වෙනවා. 2010 වර්ෂයේදී ළමුන් 337,591ක් පළමු වසරට ඇතුළත් වුණා. 2010 වර්ෂයේදී පළමු වසරට ඇතුළත් වෙච්ච ළමයින් තමයි 2020 අපොස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියේ. ඒ ළමයින් සංඛ්‍යාව 305,500යි. සාමාන්‍යයෙන් 1, 2, 3, 4, 5 වසරවලදී ළමයි පාසල් හැර යන්නේ නැහැ. 5වන වසරෙන් පසු 6, 7, 8, 9, 10 වසරවලදී තමයි ළමයින් පාසල් හැර යන්නේ. 2010 දී පළමු වසරට ඇතුළු වුණු ළමයින්ගෙන් ළමයි 32,025දෙනෙක් 2020 වර්ෂයේ අපොස සාමාන්‍ය පෙළ විභාගය කළේ නැහැ. ඒ අය පාසල් හැර ගොස් තිබුණා. ඒ අයගේ සංඛ්‍යාව සැලකිල්ලට ගත් විට, ඒ පිළිබඳ ගණනය කිරීමක් කර බැලුවොත් සාමාන්‍යයෙන් වසරකට ළමයි 8,000ක් පමණ පාසල් හැර යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපොස සාමාන්‍ය පෙළ විභාගයවත් නොකර වාර්ෂිකව පාසල් හැර යන ප්‍රමාණය ඉතා විශාලයි.

A/L විභාගය කරනවා, ළමයි 251,000ක්. ඒ අයගෙන් විශ්වවිද්‍යාලවලට ගන්නේ 41,000යි. 337,000කින් 41,000ක් විශ්වවිද්‍යාලවලට ගත්තාම 296,000ක් ඉතුරු වනවා. 296,000න් 36,000ක් රාජ්‍ය අංශයේ වෘත්තීය පාඨමාලාවලට බඳවා ගත්තාම තව 260,000ක් ඉතුරු වෙනවා. පෞද්ගලික අංශයට සහ විදේශ අධ්‍යාපනය සඳහා රට හැර යන ප්‍රමාණය ගණනය කර 60,000ක් අඩු කළත් තවත් ලක්ෂ 2ක් රට තුළ ඉතිරි වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අප ඒ අය පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ නැද්ද? මෙන්න මේ හේතුව නිසා දරුවන්ට සිය කඩ ඉම් විභාගයේ ප්‍රතිඵල අනුව සිය අනාගතය හැඩ ගස්වා ගැනීමට නිශ්චිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. ඒ විතරක් නොවෙයි, එමඟින් රටට වඩාත් ඵලදායී මානව සම්පතක් නිර්මාණය කර ගැනීමටත් අවස්ථාව හිමි වන බව නොඅනුමානයි.

ඒ නිසා පාසල් දරුවන්ගේ මූලික කඩ ඉම් විභාගවලට -අපොස සාමාන්‍ය පෙළ සහ අපොස උසස් පෙළ විභාගවලට- ප්‍රථම විෂයමාලා සඳහා නව ලොව ප්‍රවණතා අනුව සකස් කළ වෘත්තීය මාර්ගෝපදේශන ඇතුළත් කර ඔවුන් ඒ සඳහා යොමු කරවීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මම මේ ගරු සභාවට යෝජනා කර සිටිනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.08]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාලෝචිත මාතෘකාවක් යටතේ වන යෝජනාවක් තමයි ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා අද දවසේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව වශයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ. මුලින්ම, මම එතුමාගේ යෝජනාව ස්ථිර කරනවා. මෙහිදී එතුමා යෝජනා කරන්නේ, විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමට නොහැකි වන; උසස් අධ්‍යාපනයට, ශාස්ත්‍රීය අධ්‍යාපනයට යොමු වීමට නොහැකි වන අතිබහුතර දරුවන් පිරිස වෙනුවෙන් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න කියලායි.

අධ්‍යාපන විශේෂඥයකු වන ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම මේ අධ්‍යාපනය තුළින් බිහි වෙච්ච වෘත්තීයවේදිනියක වන ගරු සීතා අරඹේපොළ මැතිනියනි, ඉතා වැදගත් කාලීන යෝජනාවක් තමයි ඔබ වෙත අද මේ ගෙනැවිත් තිබෙන්නේ. ඔබතුමාගේත්, ඔබතුමියගේත් රාජ්‍ය අමාත්‍ය ධුර කාලය තුළ මේ යෝජනාව පිළිබඳ අතිශය සැලකිල්ල යොමු කරන්න කියන ගෞරවණීය ඉල්ලීම මා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපොස උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට අවුරුදු 30කට ආසන්න කාලයක් මුළුල්ලේ මම ඉගැන්වූවා. අප හමුවට ආ ඒ දරුවන් අති බහුතරය අතරින් ඉතාම සුළුතරයක් තමයි විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීම සඳහා අවස්ථාව දිනා ගත්තේ. ලංකාවේ නීතිය පිළිබඳ අධ්‍යාපනය හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයට පිවිසෙන්නේ සාමාන්‍යයෙන් ළමයින් 400ක වාගේ ප්‍රමාණයක්. වෛද්‍ය විද්‍යාව ගත්තොත්, එම සංඛ්‍යාව 900ක් වාගේ ප්‍රමාණයක්. නමුත් අපි දන්නවා ලක්ෂ තුනකට ආසන්න ළමුන් පිරිසක් අපොස උසස් පෙළ විභාගයට ප්‍රවේශ වනවා කියලා. ඒ අතරින් සියයට 10ක වාගේ පිරිසකට තමයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අවස්ථා ලැබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා අහන්නේ, අපේ රටේ හදලා තිබෙන -නිර්මාණය කරලා තිබෙන- මේ අධ්‍යාපන ක්‍රමය තුළ එහි ඉලක්ක කරා යන්න පුළුවන් වන්නේ සියයට 10ක පිරිසකට පමණක් ද; මේ රටේ අධ්‍යාපන ක්‍රමය සැදිය යුතු වන්නේ විභාග සමත් වන සියයට 10 වෙනුවෙන් පමණක්ද කියලායි.

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

විභාග අසමත් වෙනවා කියලා අප කියන්නේ මොකක්ද? කට පාඩම් කිරීමට නොහැකි වන, මතක තබා ගැනීමට අසීරු වන, එක තැනක ඉඳගෙන යම් අධ්‍යයන කටයුත්තක් කරන්න බැරි පිරිසක් කියා අපි ඒ දරුවන්ගෙන් සියයට 90ක් දෙනා නෙරපා හරිනවා, මේ අධ්‍යාපන ධාරාව තුළින්. හැබැයි, විෂය කරුණු මතක තබා ගැනීමක් අවශ්‍ය නොවන නිර්මාණාත්මක ගති ලක්ෂණ සහිත වෙනස් දේවල් ද තිබෙනවා. ක්‍රිකට් ගහන එක මතක තබාගෙන කරන්න පුළුවන්ද? වඩු කර්මාන්තය මතක තබාගෙන කරන්න පුළුවන්ද? ඒ වාගේමයි ගොඩනැඟිලි ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ගෘහ නිර්මාණ ශිල්පයත්. මතක තබා ගැනීමෙන්, කට පාඩම් කිරීමෙන් එවැනි ක්ෂේත්‍රවලට යන්න පුළුවන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් විය යුතුයි. විශේෂයෙන්ම මේ රටට ඕනෑ වෙන්නේ වෘත්තීය අධ්‍යාපනයයි. එම නිසා ගරු සීතා අරඹෙපොළ රාජ්‍ය අමාත්‍යතුමියනි, මේ අධ්‍යාපනයේ තිබෙන සාම්ප්‍රදායික නිම් වළලු වෙනස් කරන්න කියා මා ඔබතුමියට යෝජනා කරනවා.

මේ පවතින තත්ත්වය තුළ තවදුරටත් විදේශ විශ්වවිද්‍යාලවලට අපේ ළමයි යන්නේ ඇයි? අද තිබෙන කාර්මික විද්‍යාල ජනප්‍රිය, ආකර්ෂණීය මධ්‍යස්ථාන නොවෙයි කියා මම කියනවා. එම නිසා ඔබතුමියට අපි යෝජනා කරනවා, ඒ කෙරෙහිත් අවධානය යොමු කරන්න කියලා. මේ පවතින සම්ප්‍රදාය තුළ සිදු වන්නේ අපි අවුරුදු 12ක් වීර්යය කරලා, අන්තිමේදී සියයට 10ක් පමණක් විශ්වවිද්‍යාලයට යවලා, සියයට 90ක් නෙරපා දමන එකයි. මේක අපරාධයක්!

එම නිසා මේ ගෞරවනීය සභාවේදී මම කියනවා, වෘත්තීය අධ්‍යාපනය විධිමත් කරන්න, එය විධිමත් කරලා මේ රටේ දරුවන්ට ගෞරවනීය තත්ත්වයක් ලබා දෙන්න කියලා. අපොස උසස් පෙළ විභාගය අසමත් වෙනවා කියන මෝඩ තර්කය ඉවත් කරන්න. අසමත් වීමක් නැහැ. මේ අධ්‍යාපනය තුළ අසමත් වෙලා තිබෙන්නේ ඇගයීමේ ක්‍රමවේදයයි. ඉහත කී නිර්මාණශීලී කුසලතා අගයන්නේ නැතිව අපි ඒ දරුවන්ට කියනවා, "උඹ අසමත්" කියලා. එම නිසා කරුණාකර වෘත්තීය අධ්‍යාපනය ශක්තිමත් කරන්න. ඒ සඳහා ඔබතුමාගේත්, ඔබතුමියගේත් ධුර කාලය තුළ වැදගත් පියවර කඩිනමින් ගන්න. මම කනගාටුවෙන් වුණත් නැවත කියනවා, වෘත්තීය අධ්‍යාපන ආයතන තවමත් ආකර්ෂණීය නැති බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.10]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතාම වැදගත් එකක් කියලා මම හිතනවා. මොකද, මේ රටේ තාරුණ්‍යය අධ්‍යාපනයෙන් ඔබ්බට ගිහිල්ලා මොනවාද කරන්නේ කියන ලොකු ප්‍රශ්නයක ඉන්නවා.

අපි දන්නවා, මේ රටේ නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීලා අවුරුදු 80කට වැඩි බව. ඒ කාලයේ තිබුණු ලෝකය නොවෙයි අද තිබෙන්නේ. අද වෙනකොට ලෝකය සංකීර්ණ වෙලා තාක්ෂණය අතින්, දැනුම අතින් ඉස්සරහට ගිහින් තිබෙනවා. ඒ නිසා අලුත් විධියට කොහොමද මේ රට ඉස්සරහට ගෙනියන්නේ කියලා අපට හිතන්න සිද්ධ වෙලා තිබෙනවා.

අද වෙනකොට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික යොවුන් සේනාංකය, ජාතික තරුණ සේවා සභාව වැනි ආයතන තිබුණාට, සමහර වෙලාවට තාරුණ්‍ය ඒවාට ආකර්ෂණය වන්නේ නැහැ. අද නිදහස් අධ්‍යාපනය තුළින් විශ්වවිද්‍යාලයට යන්නේ ඉතාම සුළු ප්‍රමාණයක් කියන එක අපි දන්නවා. එතකොට අනෙක් අයට මොනවාද කරන්නේ කියලා විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තුළින් තමයි මේ රටේ තරුණ අසහනය පටන් ගත්තේ. ඒ නිසා තමයි මේ රටේ තාරුණ්‍ය මොනවාද කරන්නේ කියලා ඉලක්කයක් නැතිව ළත වෙමින් ඉඳලා, ඒ ගොල්ලන් දරුණු මාර්ගවලට පිවිසුණේ. ඒ නිසා අපේ තාරුණ්‍ය නිවැරදි මඟට ගෙනියන්නේ කොහොමද කියලා මේ අවස්ථාවේ දී අපට අලුතින් හිතන්න වෙනවා.

වෙනත් රටවල නම් යම්කිසි වයස් සීමාවක ඉඳලා - පොඩි කාලයේ ඉඳලා - career track එක හදා ගන්නේ කොහොමද, වෘත්තීය සකස් කරන්නේ කොහොමද කියලා ඒ ගොල්ලන්ට වෘත්තීය මාර්ගෝපදේශ දෙනවා. නමුත්, හුඟක් වෙලාවට අපේ රටේ පාසල් ළමයින්ට කුමන මාර්ගයේද යන්න ඕනෑ, කුමන විෂයයන්ද හදාරන්න ඕනෑ කියන එක දැනගන්න අවස්ථාවක් නැහැ. ඒකට ඒ අයට දැනුමක් නැහැ. හුඟක් වෙලාවට අපි ළඟටත් යම්කිසි රක්ෂා ඉල්ලාගෙන එන අය ඉන්නවා. ඒ ගොල්ලන් තැනින් තැනින් අහුලාගෙන තමයි අධ්‍යාපනය කරලා තිබෙන්නේ. යම් යම් පාඨමාලා හැදෑරුවාට නිවැරදි වෘත්තිමය සංස්කෘතියකට ඒ ගොල්ලන් යොමු වෙලා නැහැ. ඒ නිසා අපි අපේ අමාත්‍යතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන අලුතින් හිතන්න කියලා. මේ ලෝකයට සරිලන මාර්ගෝපදේශ හදලා, අපේ අධ්‍යාපන පද්ධතියට career guidance officer කෙනෙකු යොදවලා, ඒ career guidance officer මඟින් කුඩා කාලයේ පටන්ම සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම ඉලක්ක කරමින් career guidance දෙන්න ඕනෑ. ඒ career guidance දීලා යම්කිසි දුරකට යනකොට ඒ දරුවන්ට ඒක ගැළපෙනවාද, තව දුරටත් ඒකට අනුගත වෙනවාද, නැත්නම් ඒකෙන් බැහැරව යනවාද කියලා වසරක් පාසා සමීක්ෂණයක් කරන්නට ඕනෑ.

සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම නිවැරදි මාර්ගයේ යැව්වොත් මේ රට මීට වඩා දියුණු කරගන්න පුළුවන්. අපේ තරුණ-තරුණියන් මේ රට අතහැර යනවා වෙනුවට ඔවුන් මේ රට තුළ රඳවා ගැනීමෙන් ඔවුන්ගෙන් ආර්ථිකයට සහ සමාජයට විශාල දායකත්වයක් ලබා ගන්න පුළුවන්. මම හිතන විධියට අධ්‍යාපනය තමයි මෙයට ඉලක්ක කර ගන්න ඕනෑ. අපි දශක අටකට -ඒ කියන්නේ අවුරුදු 80කට- ඉස්සෙල්ලා කරපු නිදහස් අධ්‍යාපන ක්‍රමය හොඳයි. ඒ මූලික පරමාර්ථ තියාගෙන මේ ලෝකයට ගැළපෙන අන්දමට දැන් එය වෙනස් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම career guidance counsellorsලා හරහා ලංකාවේ තාරුණ්‍ය ගැන සමීක්ෂණයක් කරලා, මොන මට්ටමෙන්ද ඒ ගොල්ලන්ට වෘත්තීය පුහුණුව ලබා දෙන්න ඕනෑ කියන එක බලන්න ඕනෑ. ඒ වාගේම ලෝකය ගැන සමීක්ෂණයක් කරලා, අපේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව කුමන අංශ කෙරෙහිද මේ ගොල්ලන් දිරිගන්වන්න ඕනෑ කියන තැනට අපේ අධ්‍යාපන ක්‍රමය career guidance උපදේශකවරුන් හරහා ඉදිරියට යා යුතුයි. විශේෂයෙන්ම අපි මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු වෙනවා. මොකද, අද වන විට තාරුණ්‍ය විශාල පීඩනයකින් ඉන්නේ. ඒ පීඩනය තවත් එහාට ගියොත් ඉදිරියේ දී අහිතකර ඵල විපාක ඇති වන්නට ඉඩ තිබෙනවා. ඉතිහාසයේ ඇති වූ ඵල විපාක අප දැක තිබෙනවා. ඒ නිසා තරුණ පීඩනය අවම කරලා, ඒ ගොල්ලන් අපේ රටේ ආර්ථිකයට, සමාජය කටයුතුවලට දායක කරගන්නා ලෙස ඉල්ලා සිටිමින්, අද ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අනුමත කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මැතිතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව දීර්ඝ කාලීනව මේ සමාජය තුළ සාකච්ඡා වන කාරණාවක්. ඒ තමයි, අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාගවලින් අසමත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අනාගතය පිළිබඳව සෑම වකවානුවකම සාකච්ඡා වුණාය කියන කාරණය.

අපේ පසුගිය ආණ්ඩුව කාලයේ හිටපු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමා 'සියලු දරුවන් 13 වසර දක්වා අනිවාර්යෙන්ම ඉගෙනුම ලැබිය යුතුයි' කියන එක නීතියක් හැටියට ගෙනාවා. ඒ කියන්නේ, වසර 13ක අධ්‍යාපනය ලැබිය යුතුයි කියන එක. විශේෂයෙන්ම අපොස සාමාන්‍ය පෙළ විභාගයේ දී අසමත් වෙන ශිෂ්‍යයන්ගේ අනාගතය ගැන හිතලා, ඔවුන් අනිවාර්යෙන්ම ඉතිරි අවුරුදු 2ත් පාසලේ ඉගෙන ගත යුතුයි කියන ඒ තීන්දුව ගත්තා. ඔවුන් අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත් වුණත්, ඔවුන්ට අනෙකුත් විෂයයන් එක්ක සම්බන්ධ වෙලා තාක්ෂණ විද්‍යාලයට යන්න පුළුවන්, තාක්ෂණය පැත්තෙන් ඉස්සරහට යන්න පුළුවන් විෂයයන් 26ක් අපි තෝරා ගත්තා. ඒ විෂයන් 26 එකතු කරලා අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත් වෙන ශිෂ්‍යයන්ට තවත් විෂයන් දෙකක් එක්ක තාක්ෂණ විෂය හදාරන්න අවස්ථාව දුන්නා. ඒ අනුව, ඉදිරියේ දී ස්වයං රැකියාවක් කරන්න හෝ එහෙම නැත්නම් එවැනි ක්ෂේත්‍රයකින් ඉදිරියට යන්න පුළුවන් හැකියාවක් ලබා ගත හැකි විෂයයන් 26ක් අපි එකතු කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව ඔවුන් විභාගය ලියලා අවුරුදු දෙකකින් පස්සේ NVQ Level 3 සහතිකය ලබා ගත්තාම, ඊළඟට තාක්ෂණ විද්‍යාලයට යන්න පුළුවන්. රටේ තිබෙන අනෙකුත් තාක්ෂණ විද්‍යාලවලට සම්බන්ධ වෙලා ඩිප්ලෝමා පාඨමාලා හදාරන්න පුළුවන් අවස්ථාව එයින් සලසා දුන්නා. ඒ යන්න පුළුවන් මඟ අපි එදා හදලා දුන්නා.

මේ ලෝකයේ තිබෙන අලුත් තත්ත්වයත් එක්ක, මේ ලෝකයේ තිබෙන අලුත් දියුණුවත් එක්ක, තාක්ෂණයත් එක්ක විභාග අසමත් වෙන ශිෂ්‍යයන්ට ඉදිරියට යන්න පුළුවන් සැකැස්මක් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පසුගිය කාලයේ දී ගොඩනැඟුවා. දැන් තිබෙන ගැටලුව තමයි ඒ තුළින් ඉස්සරහට යනවාද, නැද්ද කියන එක. අපට ලැබිලා තිබෙන තොරතුරු අනුව නම් එම කටයුත්ත ඉස්සරහට යන්නේ නැහැ. මම හිතන විධියට සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා දන්නවා, -

**ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல - திறன்கள் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola - State Minister of Skills Development, Vocational Education, Research and Innovation)
ගරු මන්ත්‍රීතුමනි, සිසුන්ට 13 වසරක අධ්‍යාපනය ලබා දීමේ කාර්යය ඉතාම උසස් කාර්යයක්. මේ වෙනකොට ඒ ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයක් කරලා මේ වසරේ 11,000ක් බඳවා ගෙන තිබෙනවා. ඔවුන්ට අපේ වෘත්තීය පුහුණු ආයතනවල සෘජු අධ්‍යයන කටයුතු කරන්න අවස්ථාව සලසා දීලා තිබෙනවා. කිසිදු විධියකට අපි ඒ කර්තව්‍ය නවත්වලා නැහැ. ඒක තවත් වැඩි දියුණු කරලා පවත්වා ගෙන යනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ කියන්නේ 13 වසරක අධ්‍යාපනයත් එක්ක ඒ කර්තව්‍ය ඉදිරියට යනවා?

**ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) ( Mrs.) Seetha Arambepola)
ඔව්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම හොඳයි, ගරු රාජ්‍ය ඇමතිතුමිය. අපට ඕනෑ වෙලා තිබෙන්නේ ඒක තවත් දියුණු වීමේ පැත්තකට තල්ලු කරන්නයි.

ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා දන්නවා, මීට කලිනුත් තාක්ෂණ විෂය කියලා විෂයක් හඳුන්වා දුන්නා කියලා. අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත් වෙලා කලා විෂයයන් කරන්න බැරි ශිෂ්‍යයන්ට තාක්ෂණ විෂය කියලා විෂයක් 2015ට කලින් හඳුන්වා දුන්නා, ඔබතුමාට මතක ඇති. නමුත් එහිදී අන්තිමට වුණේ අනෙක් විෂයයන් කරන ශිෂ්‍යයෝත් ඇවිල්ලා තාක්ෂණ විෂය කරන්න පටන් ගත්ත එක. අසමත් වෙච්ච ළමුන්ට තිබෙන ඒ විෂය ධාරාවට අනෙක් අයත් එකතු වීමේ ප්‍රමාණය වැඩි වුණා. මම හිතන විධියට ඒ ශිෂ්‍ය වැඩිවීමත් එක්කම ඒ ක්‍රමයත් අර්බුදයකට ලක් වුණා. නමුත්, මේ ක්‍රමය පටන් ගත් එක හොඳයි. මේ ක්‍රියාවලියේ අඩු පාඩු තිබෙනවා නම් ඒවා සකස් කළ යුතුයි. මේ ක්‍රමය ඉතාම හොඳ දෙයක්. ඇත්තටම මේ රටේ දුවා දරුවන්ට තමන්ගේ අනාගතය, තමන්ගේ වෘත්තීය හදා ගැනීමේ ප්‍රාථමික පියවරක් හැටියට අපට මේ ක්‍රමය දකින්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මේ විෂයයන් 26 තුළ ගෘහ නිර්මාණ ශිල්පය, motor mechanism, ඇතුළුව, කාන්තාවන්ට ස්වයං රැකියා පිළිබඳව දැනුම ලබා දීම වශයෙන් හැම එකක්ම අඩංගු වෙලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙනුත්, ගරු රාජ්‍ය ඇමතිතුමියගෙනුත් ඉල්ලා සිටිනවා, ඒ හඳුන්වා දීපු තාක්ෂණ විද්‍යාල ශක්තිමත් කරන්න කියලා. ඒවායේ අඩු පාඩු තිබෙනවා නම් ඒ අඩු පාඩු හදා ගෙන, අඩුම තරමින් එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක එක පාසලක්වත් මෙම විෂය හදාරන්න පුළුවන් තාක්ෂණ පාසලක් ලෙස ගොඩනැඟිය යුතුයි. මොකද, අපේ කාලයේ එවැනි පාසල් අඩුවෙන් තමයි ගොඩනැඟුණේ. මේ සියලු විෂයයන් තිබුණු පාසල් තිබුණේ නැහැ. එක පළාතක් ගත්තොත්, එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ගත්තොත්, සාමාන්‍යයෙන් එක පාසලක් වාගේ තමයි තිබුණේ. ඒ නිසා මම හිතන විධියට ඒකට කරන ඉල්ලුම් ප්‍රමාණය වැඩි වුණා. ඒ වැඩිවීමත් එක්කම ඒ ඉල්ලුමට අදාළ සැපයුම කර ගන්න බැරි වුණා.

මම ඔබතුමන්ලා දෙපළට විශේෂයෙන් මතක් කරනවා, තවත් ධනාත්මක පැත්තට මේ ක්‍රියාදාමය තල්ලු කිරීමෙන් ඉදිරි අනාගතයේදී වෘත්තීය දක්ෂතා පැත්තෙන් ඉදිරියට යන ශිෂ්‍යයන්ට මේ ප්‍රාථමික අධ්‍යාපනය ඉතාම වැදගත් වන බව.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සීතා අරඹෙපොළ රාජ්‍ය අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல - திறன்கள் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola - State Minister of Skills Development, Vocational Education, Research and Innovation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විනාඩි පහක කාලයක් තුළදී සියල්ල විස්තර කළ නොහැකි වුණත්, කතාබහට ලක් වූ මේ කාරණාවත්, කල් තැබීමේ විවාදයෙන් මතු වූ මූලික කරුණුත් පිළිබඳව මා කථා කරන්නම්.

ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ මූලික අරමුණ වන්නේ, පළමු වසරට පාසලට ඇතුළු වන දරුවන්ගේ අධ්‍යාපනය සාමාන්‍ය පෙළ, උසස් පෙළ යන කඩඉම්වලින් අවසන් කරන්න නොදී, එනම් එම විභාගවලින් අසමත්ව ඉහළට යන අවස්ථාව අහිමි වන දරුවන්ට පවා තවත් ඉදිරියට කටයුතු කර ගෙන යන්න සහ ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනත් මාන ඔස්සේ කර ගෙන යන්න අවශ්‍ය පහසුකම් සහ කටයුතු සලසා දෙන්න කියන එකයි. වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව වගකීම දරන අමාත්‍යාංශය විධියට එම වගකීමේ කොටසක් මටත් පැවරෙන නිසා ඒ පිළිබඳ අදහස් දක්වන්න මම කැමැතියි.

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා සඳහන් කළ දේ ගැන මා මුලින්ම සඳහන් කරන්නම්. ඒ ආරම්භ කළේ ඉතාම විශිෂ්ට කර්තව්‍යයක්. එය කිසිසේත්ම අඩාළ කරන්න හෝ මඟ නවත්වන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. ඒ පාඨමාලාවලට බැඳෙන සිසුන් ප්‍රමාණය දැන් දෙගුණයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ සිසුන්ට ඉදිරියේදී අපේ ආයතන තුළින් NVQ Level 4, Level 5 විධියට අදාළ ක්‍රමවේදයේ ඉදිරියට යන්න අවශ්‍ය සැලසුම් අපි සකස් කර තිබෙනවා වාගේම ඒ සඳහා අවස්ථාවත් ලබා දෙනවා. එහි වෙනසක් කිරීමටත් අපේ අදහසක් තිබෙනවා. එනම්, දරුවන්ට පාසල් කාලය තුළදීම NVQ Level 3 ලබා ගන්න පුළුවන්ද කියලා බලන එක. ඒ නිසා මේ ක්‍රමවේදය නැවැත්වීමේ කිසිදු යෝජනාවක් නැහැ.

ඊට අමතරව මා සරලව තවත් අදහසක් දක්වන්න කැමැතියි. මේ කථා කළ බොහෝ ක්‍රියාකාරකම් අවුරුදු ගණනාවක් තිස්සේ සිද්ධ වෙච්ච දේවල්. ඔබතුමන්ලා යෝජනා කරන්නේ අලුතින් එක්විය යුතු යැයි අදහස් කරන දේවල්. මෙය සරලව ගත්තොත්, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ප්‍රාදේශීය ලේකම් හරහා, එහෙම නැත්නම් වෘත්තීය පුහුණු ආයතන හා සම්බන්ධ නිලධාරීන් හරහා පාසල් තුළ මාර්ගෝපදේශන සේවය සිදු වුණත් එය ක්‍රමවත්ව සිදු වන්නේ නැහැ, කාර්යක්ෂම නැහැ, නිසි ප්‍රමිතියට සිදු වන්නේ නැහැ කියන එක තමයි මෙවැනි කාලයක මෙවැනි විවාදයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් තේරුම් යන්නේ. පසුගිය වසර තුළ අමාත්‍යාංශයක් විධියට මේ කාරණය ඉතාම හොඳින් තේරුම් ගත් නිසා එයට අවශ්‍ය නව වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. පසුගිය වසරම කොවිඩ් වසංගතය හේතුවෙන් පාසල් වසා තිබූ නිසා, ඒ වැඩ පිළිවෙළ පාසල් තුළ සක්‍රියව ක්‍රියාත්මක කිරීමට නොහැකි වුණත්, ඒ සඳහා වූ ක්‍රියා මාර්ගයක් හැටියට කොවිඩ් කාලය තුළදී අප ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය හරහා සියලු දරුවන්ට විවිධ පාඨමාලා පිළිබඳ මාර්ගෝපදේශනය ලබා ගන්න රූපවාහිනී තිරය ඔස්සේ සතියේ දින පහ පුරාම ඔවුන්ට අවශ්‍ය වැඩසටහන් ප්‍රචාරය කරමින්, ඔවුන්ට මාර්ගෝපදේශන සේවය ලබා දෙන්න උත්සාහ කළා. නමුත්, එතැනින් එහාට ගියාම පාසල් පටන් ගත් පසු පාසල් මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පාසල් තුළ විවිධ වූ දැනුවත් කිරීමේ ක්‍රියා මාර්ග ඇති කිරීමටත්, මේ වෘත්තීය පුහුණු ආයතන ඉතාම ආකර්ෂණීය හා කාර්යක්ෂම ස්ථාන බවට පත් කරන්නත් මේ අය වැය තුළින් ලබා දුන්නා වූ ඒ මූල්‍ය යෙදවීම් භාවිත කරමින්, තිබෙන ආයතන ඉතා කාර්යක්ෂම කරන්න, තිබෙන පාඨමාලා නවීකරණය කරමින් නව කර්මාන්තවලට සුදුසු වන ආකාරයට පෞද්ගලික අංශය සමඟ එකතු වී පෞද්ගලික අංශයේ රැකියා අවස්ථාවලට සුදුසු ලෙස පාඨමාලා අලුත් කරන්නත්, පාඨමාලා සකස් කරන්නත්, ඒ සඳහා අවශ්‍ය නවීන උපකරණ ලබා දීමටත් කටයුතු සකස් කරමින් සිටිනවා. ඇත්තටම දැන් ඒ සියලු කටයුතු ආරම්භ වෙලා තිබෙනවා. බොහෝ දරුවන් -පාසල් හැර ගිය දරුවන් සහ අධ්‍යාපනය අවසන් කළ දරුවන්- පෞද්ගලික අංශය එක්ක එකතු වෙලා ඒ කර්මාන්තශාලා, එහෙම නැත්නම් තමන්ගේ වැඩ බිම, පුහුණු බිම බවට පත් කර ගනිමින් ඒ අධ්‍යයන කටයුතු ආරම්භ කර තිබෙනවා. එමඟින් ඔවුන්ගේ රැකියා අවස්ථා සුරක්ෂිත කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මොකද, රැකියා තිබෙන්නේ කුමන ක්ෂේත්‍රයේද කියා හඳුනාගෙන ඒවාට අවශ්‍ය පාඨමාලා ඇති කරන්නත්, ඒ වාගේම ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කරමින් ඔවුන් මේ නවීන තාක්ෂණය ඔස්සේ ඉදිරියට ගෙන යන්නත්, දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන ක්‍රමවේදය ඉදිරියට ගෙන යන්නත්, තාක්ෂණවේදය හදාරන උසස් පෙළ දරුවන්ට උසස් පෙළින් පසු විශ්වවිද්‍යාල වරම් අහිමි වුණත්, ඒ ලැබූ අවුරුදු දෙකක තාක්ෂණවේද දැනුම යොදාගෙන ඔවුන්ට NVQ සහතික පත්‍රයක් ලබා දෙන්නත්, එමඟින් ඔවුන්ට ඒ ක්‍රමවේදය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය පාර හදා දෙන්නත් අපි සූදානම් වෙලා ඉන්නවා. ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද සකස් කර දැනටමත් ක්‍රියාත්මක වෙනවා. පාසල් ආරම්භ කළ පසු පාසල් මට්ටමින් සාමාන්‍ය පෙළ දක්වා සිටින දරුවන්ටත්, උසස් පෙළ දරුවන්ටත් ඒ අධ්‍යාපන කටයුතු අතරතුරම මේ පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උසස් පෙළ අසමත් හෝ සාමාන්‍ය පෙළ අසමත් දරුවන්ට පමණක් නොවෙයි, සියලුදෙනාට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් තමන් කැමැති ක්ෂේත්‍රයක් තෝරා ගත හැකි විධියට මේ අධ්‍යාපන ක්‍රමවේදය සකස් වෙන්න ඕනෑ.

මම හිතනවා, ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද දැනටමත් සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ අමාත්‍යාංශය තුළින් සකස් කරමින් තිබෙන බව. ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේදත් එක්ක, දරුවන් පාසල් කාලය තුළ ඒ ප්‍රාථමික අවබෝධය ලබාගෙන එතැනින් එහාට ඔවුන්ගේ ක්ෂේත්‍රය ඔවුන්ගේ අභිරුචිය පරිදි තෝරා ගන්නත්, ඔවුන්ගේ දක්ෂතාව මත තෝරා ගන්නත් අවශ්‍ය සැකැස්ම සකස් කර තිබෙනවා. එය ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න ඔබ සියලුදෙනාගේ සහයෝගය මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගයාෂාන් නවනන්ද මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.26]

**ගරු ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு கயாஷான் நவனந்த)
(The Hon. Gayashan Nawananda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් කථා කරන්න මම විනාඩි පහක් ඉල්ලුවා. නමුත්, විනාඩි දෙකයි ලැබෙන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ වෙලාවේ මේ කරුණ මතක් කරනවා. 2020දී මේ රටේ 305,000ක් O/Level විභාගයට පෙනී සිට ඉන් සියයට 73ක් සමත් වන අතර, සියයට 27ක් අසමත් වෙනවා. අසමත් වන ඒ සියයට 27 ගණනය කළාම 80,000ක්. ඒ 80,000න් මා දැනුවත් පරිදි 35,000කට විතර හැදෑරිය හැකි පාඨමාලා මේ රටේ තිබෙනවා. ඉතිරි 45,000ට වෘත්තීය පුහුණුවක් හෝ ලබා දීමේ හැකියාවක් දැනට නැති බවත් දැනගන්න තිබෙනවා. අපේ රජය තුළින් මේ වෙලාවේ කළ යුත්ත තමයි, මේ රටේ වෘත්තීය පුහුණුව ලබා දීමේ හැකියාව වැඩි කිරීම. මේකේ එක් අන්තයක් තිබෙනවා. අපේ රටේ ගෘහිණියන් ගෘහ සේවිකාවන් වශයෙන් පිටරට යනවා. ඇත්තටම එතුමියන්ලාට අපි ගරු කරන්න ඕනෑ. මොකද, එතුමියන්ලා ගෘහ සේවයට පිටරට ගිහිල්ලා තමයි රටට ආදායම ලබා ගෙන එන්නේ. අද රට පවතින්නේ ඔවුන් මත. හැබැයි, රුපියල් 80,000ට, 100,000ට රට යන්නේ නැතිව, වෘත්තීය පුහුණුව ලත් අපේ රටේ තරුණයන් ටික පිටරට යවලා රුපියල් ලක්ෂ 8ට, 10ට ශ්‍රමය සපයා මේ රටට ආදායම ගේනවා නම් නරකද? එහෙම වුණොත්, මේ රටේ ඩොලර් හිඟයට, මේ රටේ ණයබරට උත්තර දෙන්න වාගේම මේ රට ඔසවා තබන්නත් ඔවුන්ට හැකි වේවි.

ඒ වාගේම මම මේ කාරණයත් කියනවා. හැම කෙනෙක්ම දොස්තර කෙනෙක් වෙන්නයි හදන්නේ. මම වෛද්‍යවරයෙක්. මේ රටේ ජනතාව අතර අදහස තිබෙන්නේ දොස්තරම වෙන්න ඕනෑ, ඉංජිනේරුවෙක්ම වෙන්න ඕනෑ කියන එකයි. මට මතකයි, මා දන්නා පුද්ගලයකුට වෛද්‍යවරයකු වෙන්න -වෛද්‍ය විභාගයට යන්න- බැරි වුණා කියලා මියැදුණු බව. එවැනි අදහස් නැති වෙන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවාද, සමහර දියුණු රටවල වැඩිම ආදායම ගන්නේ වෘත්තිකයන් බව? ඒ රටවල වැඩිම ආදායම ගන්නේ මේසන් බාස්. එහෙම රටක් බවට මේ රට පත් වුණා නම් කොයිතරම් හොඳද? එහෙම රටක් බවට මේ රට පත් වෙන්න ඕනෑ. Carpenter, ජේන්ටි බාස් වාගේ වෘත්තින් රටේ ඉහළ පිළිගැනීමක් තිබෙන වෘත්තින් වෙන්න ඕනෑ. දොස්තරට, ඉංජිනේරුවාට විතරක් නොවෙයි, මේසන් බාස්ටත් බෙන්ස් එකකින් බැහැලා එන්න පුළුවන් රටක් ඇති වෙන්න ඕනෑ. එතැනට යන්න පුළුවන්කම අපට තිබෙනවා. ඒ සඳහා අපි වෘත්තීය පුහුණු පාඨමාලා ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම හැමෝම කියනවා, "අසමත්, අසමත්, O/Level අසමත්" කියලා. රටේ අසමත් කියලා කිසිම දෙයක් නැහැ. මගේ මිත්‍රයකු මට වඩා ඉහළ rank එකක් අරගෙන වෛද්‍ය පීඨයට යනවා. නමුත්, ඔහු O/Level අසමත් වෙලා හිටියේ. හැබැයි, දෙවන වර O/Level සමත් වෙනවා. එතකොට මේ රටේ O/Level අසමත් සියලුදෙනා වෛද්‍යවරු වෙන්න බැරි අයද? නැහැ, පුළුවන්. අන්න ඒකයි අපි තේරුම් ගන්න ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, O/Level අසමත් අයට වෘත්තීය පුහුණුවක් දෙන්න කියන එක නොවෙයි, මගේ යෝජනාව. අපි 8 වසරේදී විතර වෘත්තීය පුහුණුව පටන් ගන්න ඕනෑ. එතකොට O/Level අසමත් පිරිසක් බිහි වෙන්නේ නැහැ. වෘත්තියෙන් සමත් අය ඒ විධියට ඉදිරියේදී බිහිවේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කථාව කියන්න මට තත්පර තිහක් දෙන්න. ඊයේ මම අදහසක් ඉදිරිපත් කළා, මේ රටේ විනාශයට වගකියන්න ඕනෑ රාජ්‍ය සේවකයන්ගෙන් හොරා කාපු ප්‍රමාණය ගැන. රටෙන් සියයට 80ක් විනාශ වුණේ ඒ නිසාය කියලා පාර්ලිමේන්තුවේ මම කථා කරද්දී, ඒක සමහර ජඩ මාධ්‍ය, සමහර social mediaවල වැරදි ලෙස අර්ථ කථනය කරනවා, "රටේ රාජ්‍ය සේවකයන්ගෙන් සියයට 80ක්" කියලා. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඒක නැවතත් නිවැරදි කරනවා, රටේ රාජ්‍ය සේවකයන් රටට සම්පතක් කියලා පටන් ගත් කථාවයි ඊයේ තිබුණේ. අදත් කියනවා, රටේ රාජ්‍ය සේවකයන් රටට සම්පතක්. හැබැයි, හොරකම් කරපු රාජ්‍ය සේවකයෝ රටේ විනාශයට මුල පිරුවා කියලා. අවංකව, දාඩිය මහන්සියෙන් වැඩ කරන රාජ්‍ය සේවකයන් මේ රටේ ඉන්නවා. මම මේ කථා කරන්නේ ඒ රාජ්‍ය සේවකයන් වෙනුවෙන්. ඔවුන් වෙනුවෙන් පෙනී ඉන්න මම සූදානම්. රාජ්‍ය සේවයේ ඉන්න හොරුන්ගේ තැපැල් ඡන්දය මට එපා. මම ආවේ තැපැල් ඡන්ද ගන්න නොවෙයි. මම ආවේ රට ගොඩනඟන්නයි. මට පාර්ලිමේන්තුවේ හිටියත් කමක් නැහැ, නැතත් කමක් නැහැ. මම ආවේ රට හදන්න. මම ආයෙත් පාර්ලිමේන්තු එන්න කරන දේශපාලනයක් නොවෙයි මේක කියලා මම කියනවා. හැබැයි, ඒක ජනතාව තීරණය කරයි කියන එකත් මතක් කරමින් මගේ කථාව නතර කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 5.29]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙය කාලීන මාතෘකාවක්. හැබැයි, මේ ගැන පැහැදිලි කරනවා නම්, මට පැයකවත් කථාවක් අවශ්‍යයි. නමුත්, අද එතරම් වෙලාවක් නැහැ. අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ මේ සම්බන්ධයෙන් අපි වැඩිදුරටත් කරුණු දක්වන්න සූදානම්.

නිදහස් අධ්‍යාපනය ආරම්භ වෙච්ච 1945 සිට මේ දක්වා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රබල ප්‍රතිසංස්කරණයක් සිදු වුණේ නැහැ. සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා 1945දී නිදහස් අධ්‍යාපන පනත ගෙනාවා. එදා නිදහස් අධ්‍යාපන පනත ගෙන ඒමේදී ප්‍රධාන අරමුණ වුණේ, පළමුවෙනි ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධිය දක්වා ගාස්තු ගෙවීමකින් තොරව අධ්‍යාපනය ලබාදීමත්, පාසලේ පන්ති කාමරය තුළ ඉගැන්වීමට අදාළ වන්නා වූ උපකරණ සහ අනෙකුත් ඒවා සඳහා රජයෙන් වියදම් දැරීමත්ය.

මේ කාරණයත් එක්ක මධ්‍ය විද්‍යාල 52ක් ඇති කරලා, ඒ වටා clusters ඇති කරලා පොකුරු හදලා, 6වැනි ශ්‍රේණියේ සිට 13වැනි ශ්‍රේණිය දක්වා සිංහල මාධ්‍ය, දමිළ මාධ්‍ය, ඉංග්‍රීසි මාධ්‍ය කියන සියලු මාධ්‍ය එක්ක මේ අධ්‍යාපනය ඉදිරියට ගෙනියන්නත් වෘත්තීය පුහුණුවත් ඉතා වැදගත් වුණා. අධ්‍යාපනයේ ප්‍රධාන කරුණු 3ක් වන දැනුම, කුසලතා, ආකල්ප කියන මේ තුනෙන් දැනුම අපේ රටේ ඉතා විශිෂ්ටයි. ඉතිහාසයේ ඉඳලාම එහෙමයි. ඒ ගැන ගැටලුවක් නැහැ. අදත් ඒක එහෙමයි. හැබැයි, කුසලතා පිළිබඳව තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා තමයි skills development සඳහා වෙනම රාජ්‍ය අමාත්‍යාංශයකුත් හදලා තිබෙන්නේ, ඒ පැත්තට වැඩි අවධානයක් යොමු කරන්න.

අතිගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමටත් ප්‍රථම සම්පත්දායකයන් 200කට ආසන්න සංඛ්‍යාවක් යොදාගෙන, සියලු ක්ෂේත්‍ර ආවරණය වෙන විධියට අවුරුදු දෙකහමාරක් තිස්සේ සමීක්ෂණ කරලා තොරතුරු අරගෙන, පසුගිය වාර්තා කීපයක් මේ පාර්ලිමේන්තුවේ සකස් කරලා, වරින් වර ඒවා පරිශීලනය කරලා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව ප්‍රතිපත්ති රාමුවක් සකස් කළා. ඒ නිසා තමයි මානව සම්පත් සංවර්ධනය

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

කියන එක, එක අමාත්‍යාංශයකට ගෙනැල්ලා ඒක වෘත්තීය අධ්‍යාපනය, innovations සහ විද්‍යාව එක රාජ්‍ය අමාත්‍යාංශයකටත්, ප්‍රතිසංස්කරණ සහ දුරස්ථ අධ්‍යාපනය තවත් රාජ්‍ය අමාත්‍යාංශයකටත්, ළමා හා කාන්තා කටයුතු එක්ක primary education තවත් රාජ්‍ය අමාත්‍යාංශයකටත්, දහම් අධ්‍යාපනය සහ බුද්ධ ශාසනය තවත් රාජ්‍ය අමාත්‍යාංශයකටත් විධියට තමයි වෙන් කරලා තිබෙන්නේ. මානව සම්පත් සංවර්ධනය කියන එක, එක කැබිනට් අමාත්‍යාංශයක් යටතේ රාජ්‍ය අමාත්‍යාංශ 4ක් හදලා සැලසුම් කරලා තිබෙන්නේ kindergarten ඉඳලා, ඒ කියන්නේ පූර්ව ළමා අවධියේ සිට 13 දක්වා සාමාන්‍ය අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කිරීමට. ඊළඟට, ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා මතක් කරපු ආකාරයට වෘත්තීය පුහුණුව සහ innovations පැත්තත් එක්ක ඒක සම්බන්ධ වෙනවා, 6 ශ්‍රේණියේ සිට ඉහළට යන career guidance එක්ක. ඒක විධිමත් ආකාරයට සිද්ධ වෙනවා.

ඊළඟට, උසස් අධ්‍යාපනය විශ්වවිද්‍යාල මට්ටමින් වෙනම ප්‍රතිසංස්කරණයක් යනවා. ඒ නිසා මේ සියල්ල එකට අරගෙන තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාව කරලා තිබෙන්නේ. මේ සඳහා ජනතාවගේ අදහස් අපි ලබා ගත්තා. යෝජනා 2,400ක් ආවා. ඒක අනුව හැදුවා, Analysis of Educational Reforms: Proposals Submitted on the Digital Platform. දැන් මේ සියල්ල අරගෙන ජාතික අධ්‍යාපන කොමිසමට අපි යොමු කරලා තිබෙනවා. එමගින් අවසාන ප්‍රතිපත්තිය සකස් කරනවා. මම බලාපොරොත්තු වුණා ඒක පාර්ලිමේන්තුවටත් ගේන්න. මොකද, මේ අධ්‍යාපන ප්‍රතිපත්තිය වරින් වර වෙනස් වෙන්න බැහැ. ආණ්ඩු පක්ෂ සහ විපක්ෂ සියලුදෙනාගේ සහයෝගයෙන් මේක ඉදිරිපත් කළොත් හොඳයි. සාමාන්‍යයෙන් අවුරුදු දෙක තුනකින් මෙවැනි ප්‍රතිසංස්කරණයක් කරන්න බැහැ. විෂය මාලා සංවර්ධනයට පවා අවුරුදු 8ක circle එකක් යනවා. ඒ නිසා අපට හදිසියක් නැහැ. ඒ නිසා ක්‍රමානුකූලව මේ වැඩ පිළිවෙළ සිද්ධ විය යුතුයි. දැනටත් මේකේ යම් යම් කොටස් සම්බන්ධයෙන් දැනුම ලබාදීම සඳහා විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයට වැඩසටහන් ආරම්භ වෙලා තිබෙනවා. තවදුරටත් එන අදහස් ලබා ගන්නවා. ඒ අනුව මේ කටයුතු සැලසුම් කරනවා. මේකේ වැදගත්ම දේ තමයි, Human Development Index එකක් අපේ රටේ තවම හදලා නැති එක. මානව සම්පත් දර්ශකයක් අපට නැහැ. දැන් ඒ කටයුතු කෙරේවි. එතකොට අපට පුළුවන් අවශ්‍ය වෛද්‍යවරු සංඛ්‍යාව කොච්චර ද, ඉංජිනේරුවෝ කොච්චර ද, කම්කරුවෝ කොච්චර ද කියලා සෑම මානව සම්පතකම අවශ්‍යතාව හඳුනා ගන්න. අන්න ඒකට ගැළපෙන ආකාරයට මේ කටයුතු කළොත් අතර dropouts එන්නේ නැහැ. Career guidance පටන් ගන්නවා 6වැනි ශ්‍රේණියේ ඉඳලා දෙන්න. 9වැනි ශ්‍රේණිය වෙනකොට, කනිෂ්ඨ, ද්විතීයික අධ්‍යාපනය අවසන් වෙනකොට යම් ආකාරයක තක්සේරුවකට ලක් වෙනවා. ඒ තක්සේරුවෙන් පස්සේ දරුවාටත්, දෙමව්පියන්ටත්, ගුරුවරුන්ටත් දෙන උපදෙස් අනුව තීන්දු කළ හැකියි, කුමන දිසාවට ද යන්නේ කියන කාරණය. මෙයින් කොහේවත් curtail කරන්නේ නැහැ. වෘත්තීය අධ්‍යාපනය අපේ රටේ කරන්නේ සාමාන්‍ය පෙළ තුන් පාරක් විතර අසමත් වුණාම. එතකොට මේ සියල්ල ඒ දරුවාට එපා වෙලා. අවුරුදු 15න් විභාගයට පෙනී ඉන්නවා නම්, අවුරුදු 16,17,18 වෙලා, සාමාන්‍ය පෙළත් අසමත් වෙලා, එතැනින් එහාට වෘත්තීය පුහුණුවත් එපාවෙලා තිබෙන්නේ. ඒ තත්ත්වයට යන්නේ නැතිව අපි මේ කටයුතු කරන්න ඕනෑ.

අපි දැන් රටවල් ගණනාවක අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳව අධ්‍යයනය කරලා තමයි මේ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ බන්දුල ගුණවර්ධන මැතිතුමා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දුන්නා. බලන්න, කොයිතරම් සාර්ථකත්වයක් ඒකේ තිබෙනවා ද කියලා? ඒ වාගේ තාක්ෂණික විද්‍යාගාර 200ක් රට පුරා හැදුවා. දැන් ජාතික පාසල් 1,000 අලුත් ව්‍යාපෘතිය යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ජාතික පාසල් 3ක් ලබා දෙන්නත්, ඒ වටා පෝෂක පාසල් හදන්නත්, පාසල් 3,000ක් ද්විතීයික මට්ටමට ගෙන එන්නත්, මේ සියල්ල ඉදිරි වසර 3 තුළදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් හදලා, ඒ මාර්ග සිතියමක් හදලා ඒ අනුව අපි කටයුතු කරගෙන යනවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ඉතාම ප්‍රබල අභියෝගයක්. ඒ සඳහා බොහෝදෙනෙකුගේ සහයෝගය අපට අවශ්‍ය වෙනවා. මොකද, තිබෙන ආකාරය වෙනස් කරන කොට තමයි හැම තිස්සේම ප්‍රතිරෝධයක් එන්නේ. අපි ඒක සමනය කර ගන්න ඕනෑ. ක්‍රමානුකූලව යන වැඩ පිළිවෙළක් තුළ විභාග බර අඩු කරමින්, කුසලතාව වැඩි කරන කොට ඔබතුමා මතු කරපු කාරණය සාක්ෂාත් කර ගන්න පුළුවන්. Outline එක ගැන විතරයි මම කිව්වේ. Detailsවලට යන්න දැන් වෙලාවක් නැහැ. ඒ වෙනුවෙන් මේ රජය කැප වී කටයුතු කරනවා කියන කාරණයත් සඳහන් කරනවා. අධ්‍යාපන වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී අපි මේ කාරණය පුළුල්ව පැහැදිලි කරලා දෙන්න බලාපොරොත්තු වෙනවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

***එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 21වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 20වන සෙනසුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி. ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2021 ஒக்ரோபர் 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 20, சனிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Saturday, 20th November, 2021, pursuant to the Resolution of Parliament of 21st October, 2021.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

286 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 286 - இல. 07
Volume 286 - No. 07

2021 නොවැම්බර් 20 වන සෙනසුරාදා
2021 நவம்பர் 20, சனிக்கிழமை
Saturday, 20th November, 2021

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**2021 නොවැම්බර් 20 වන සෙනසුරාදා**
**2021 நவம்பர் 20, சனிக்கிழமை**
**Saturday, 20th November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද යෝජනා:**
"BATTI TV" නාලිකාවේ විකාශය වූ වීඩියෝ දර්ශනය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) -[ගරු බුද්ධික පතිරණ මහතා]- පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 [හයවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
විදේශගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් සහ සමාජ රක්ෂණ ක්‍රමයක්

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
"BATTI TV" அலைவரிசையில் வெளியான வீடியோ காட்சி

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை பட்டயக் கப்பற் தரகர்கள் நிறுவகம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு புத்திக பத்திரண] – முதன்முறை மதிப்பிடப்பட்டது.

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட ஆறாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
புலம்பெயர் தொழிலாளர்களுக்கான ஓய்வூதியத் திட்டமும் சமூகக் காப்புறுதித் திட்டமும்

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE MOTIONS:
Video Footage Published on "BATTI TV"

PRIVATE MEMBERS' BILLS:
Institute of Chartered Shipbrokers of Sri Lanka (Incorporation) - [The Hon. Buddhika Pathirana] - Read the First time.

APPROPRIATION BILL, 2022 - [Sixth Allotted Day]:
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
Pension Scheme and Social Security Programme for Migrant Workers

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2021* නොවැම්බර් *20* වන සෙනසුරාදා**
*2021 நவம்பர் 20, சனிக்கிழமை*
*Saturday, 20th November, 2021*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2020 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. - [අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.



මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும - வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාලටුව, වැල්ලතොට, උඩවත්ත යන ලිපිනයෙහි පදිංචි විතාරණගේ සුනිල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රඹුක්කන, කොටවැල්ල, පහළ හිඟුරුවක, අංක අයි 9/4 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්.බී. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුල්ලේරියාව නව නගරය, උඩුමුල්ල පාර, මෝලවත්ත, අංක 71/3 ජී දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්.ඒ. පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතුගම, හත්හවුල, අලුත්ගම පාර දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.කේ. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ඩෙංගු මදුරුවන් මර්දනය: BTI බැක්ටීරියා භාවිතය
### டெங்கு நுளம்புகளைக் கட்டுப்படுத்தல்: BTI பக்றீரியாவின் பயன்பாடு
### CONTROL OF DENGUE MOSQUITOES: USE OF BTI BACTERIA

731/2020

**1. ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් Bti බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ ලෙස උත්සාහ ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමා දන්නේද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා Bti බැක්ටීරියාව භාවිත කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා Bti බැක්ටීරියාව භාවිත කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) Bti බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිත කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பரவிவரும் டெங்கு நோயைக் கட்டுப்படுத்துவதற்கு அரசாங்கத்தினால் பல்வேறு வேலைத்திட்டங்கள் முன்னெடுக்கப் படுகின்றன என்பதையும்;

(ii) அநுராதபுரம் மற்றும் பொலன்னறுவை போன்ற மாவட்டங்களில் நிலவுகின்ற வறட்சியான காலநிலை மாறி, மீள மழை பெய்யத் தொடங்கியதும் நுளம்புப் பெருக்கம் அதிகரிக்கும் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கையில் இதுவரை டெங்கு நோய்க்கு ஆளானவர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) டெங்கு நோயை ஒழிப்பதற்கு அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) டெங்கு நுளம்புக் குடம்பிகளை ஒழிப்பதற்கு 2008/2009ஆம் ஆண்டு காலப்பகுதியில் அப்போதைய அரசாங்கத்தினால் Bti பக்றீரியாவை கியூபாவிலிருந்து இறக்குமதி செய்வதற்குப் பல்வேறு முயற்சிகள் மேற்கொள்ளப்பட்டபோதிலும் அது தோல்வியடைந்த தென்பதை அவர் அறிவாரா?

(ஈ) (i) இலங்கையில் டெங்கு நுளம்புகளை ஒழிப்பதற்கு Bti பக்றீரியாவைப் பயன்படுத்துவதற்கான சாத்தியம் தொடர்பாக ஆய்வு நடாத்தப் பட்டுள்ளதா என்பதையும்;

(ii) இலங்கையில் டெங்கு நுளம்புகளை ஒழிப்பதற்கு Bti பக்றீரியாவைப் பயன்படுத்துவதற்குச் சாத்தி யமில்லாதபட்சத்தில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) Bti பக்றீரியாவுக்குப் பதிலாக டெங்கு நுளம்பு களை அழிப்பதற்குப் பயன்படுத்தக்கூடிய மாற்று வழி என்ன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) various programmes are implemented by the Government to control the dengue menace spreading in Sri Lanka; and

(ii) the population of mosquitoes start to increase when it rains after the drought in Anuradhapura and Polonnaruwa Districts?

(b) Will he inform this House -

(i) the number of dengue positive cases in Sri Lanka up to now; and

(ii) the courses of action taken by the Government to control the dengue menace?

(c) Is he also aware that various efforts made by the then Government failed during the period 2008/2009 to import Bti bacteria from Cuba to destroy dengue mosquito larvae?

(d) Will he also inform this House -

(i) whether any research has been conducted with regard to the aptness of using Bti bacteria to control dengue mosquitoes in Sri Lanka;

(ii) if it is not possible to use the Bti bacteria to control dengue mosquitoes in Sri Lanka, the reasons for that; and

(iii) the alternative that can be used to control the dengue mosquitoes instead of Bti bacteria?

(e) If not, why?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) 2010 වර්ෂයේ සිට ඩෙංගු රෝගයට ගොදුරු වූවන්ගේ සංඛ්‍යාව පහත පරිදි වේ.

| වර්ෂය | ඩෙංගු රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| 2010 | 34,188 |
| 2011 | 28,473 |
| 2012 | 44,461 |
| 2013 | 32,063 |
| 2014 | 47,502 |
| 2015 | 29,777 |
| 2016 | 55,150 |
| 2017 | 186,101 |
| 2018 | 51,659 |
| 2019 | 105,049 |
| 2020 | 31,139 |
| 2021 | 15,615 |

(ii) රජය විසින් මේ වන විට,

* ආවේක්ෂණය (Surveillance)

විශේෂයෙන්ම රෝගීන් වාර්තා වීම පිළිබඳව රෝහල්වලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිටත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගෙන් ඩෙංගු මර්දන ඒකකයටත් එවනවා. ඒ නිසා රෝගීන් වැඩි තැන් ආවේක්ෂණය වනවා. ඊට අමතරව මදුරු කීටයන් හා මදුරු සනත්වයත් surveys මඟින් ආවේක්ෂණය වනවා.

* ඒකාබද්ධ වාහක පාලනය (Integrated Vector Management)

* අන්තර් පාර්ශ්වීය සම්බන්ධීකරණය (Intersectoral Management)

* වසංගත තත්ත්ව පුරෝකථනය කිරීමට අදාළ පියවර ගැනීම (Outbreak Forecast and Response)

* සායනික කළමනාකරණය (Clinical Management)

යන කරුණු පදනම් කර ගනිමින් ගෙන ඇති ක්‍රියාමාර්ග ඇමුණුමෙහි විස්තර කර ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(ඇ) ඔව්.

(ඈ) (i) ඔව්.

2013 වසරේදී ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා Bti බැක්ටීරියා ස්ඵටික යොදා ගැනීමේ ඵලදායිතාව පරීක්ෂා කිරීමේ පර්යේෂණය බස්නාහිර පළාතේ තෝරාගත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස හයක සිදු කෙරිණි.

2016 වසරේදී ඩෙංගු මදුරුවන් පාලනය සඳහා ඒකාබද්ධ වාහක පාලන ක්‍රමයක් ලෙස දියර Bti යොදා ගැනීමේ පර්යේෂණය කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් නාගරික, තදාසන්න සහ ග්‍රාමීය ප්‍රදේශ කිහිපයක සිදු කෙරිණි.

(ii) Bti බැක්ටීරියාව භාවිත කිරීම නිර්දේශ වන්නේ පරිභෝජනයට නොගන්නා ජලය රැඳෙන ස්ථාන සඳහාය. පානීය ජලය සඳහා මෙය භාවිත කළ නොහැක.

කීට විද්‍යා සමීක්ෂණ දත්ත අනුව ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් බොහොමයක් -60%කට වඩා- බෝ වන්නේ වතුර රැඳෙන, ඉවතලන බඳුන්වල. ඉතාම කුඩා ප්‍රමාණයෙන් වතුර රැඳෙන තැන්වල. එක් වරක් යෙදීමෙන් පසු Bti බැක්ටීරියාවෙහි ක්‍රියාකාරිත්වය රඳා පවතින්නේ සති 2ක් වැනි කාල සීමාවක් පමණක් නිසා සති දෙකකට වරක් මෙය යෙදිය යුතු වන බැවින් වඩා ඵලදායී සහ ප්‍රායෝගික ක්‍රමවේදය වන්නේ ජලය රැඳෙන ස්ථාන ඉවත් කිරීමට කටයුතු කිරීමයි.

(iii) * ඩෙංගු මදුරුවන් මර්දනයට මදුරුවන් බෝ වන ස්ථාන ඉවත් කිරීම.

කීට විද්‍යා සමීක්ෂණ දත්ත අනුව ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිත කළ හැකි සුදුසුම ක්‍රමෝපාය බවට තහවුරු වී ඇත. එබැවින් ටයර්, ප්ලාස්ටික්, වීදුරු, පොලිතින්, ටින්, ෂොපින් බෑග්, කිරි හට්ටි, බෝතල්, පොල්කටු, තැඹිලි කෝම්බ වැනි ජලය එක්රැස් වන ස්ථාන ඉවත් කිරීම.

* පරිසර කළමනාකරණය.

තාවකාලික හෝ ස්ථිර ක්‍රමවේද භාවිත කරමින් පරිසරය වෙනස් කිරීම මඟින් වාහක මදුරුවන් බෝවිය හැකි ස්ථාන විනාශ කිරීම.

තවද එවැනි ස්ථාන ඉවත් කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම, ව්‍යුහය වෙනස් කිරීම හෝ මිනිස් - වාහක ගැටීම අවම කිරීම සිදු වේ.

**රසායනික වාහක පාලන ක්‍රම භාවිතය**

ජලය තුළ සිටින කීටයන් සහ පිලවුන් විනාශ කිරීම සඳහා කීටනාශක භාවිත කිරීම සහ කෘමිනාශක භාවිතකොට ධූමනය මඟින් වැඩිහිටි මදුරුවන් පාලනය කිරීම.

මේවායින් එක් ක්‍රමයක් පමණක් යෙදීමට වඩා ක්‍රම කීපයක් එකවර යෙදීම උචිත වේ.

(ඉ) පැන නොනඟී.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුර ලබාදීම පිළිබඳව ගරු රාජ්‍ය ඇමතිතුමියට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය දන්නවා, මේ වන විට පවතින මෝසම් කාලගුණ තත්ත්වය නිසා රටේ හැම තැනකටම විශාල වශයෙන් වැසි ලැබෙමින් පවතින බව. විශේෂයෙන්

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් අමුණු සියල්ල පිරී ඉතිරී යන පරිදි අධික වර්ෂාපතනයක් අපට ලැබුණා. කොවිඩ් - 19 මර්දනය සඳහා ගෙන යන වැඩ පිළිවෙළ වාගේම ඩෙංගු උවදුර පිළිබඳවත් අපේ ජනතාවට අමතක වෙමින් යනවා. පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ Bti පරීක්ෂණ සඳහා සහ ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා විශාල මුදලක් වියදම් කරලා පිටරට ගියා. මේ වන විට Bti බැක්ටීරියාව ශ්‍රී ලංකාවට ආනයනය කර තිබෙනවාද? ආනයනය කර තිබේ නම් ඒ සඳහා කොපමණ මුදලක් වැය වෙලා තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණය එතුමාගේ මේ ප්‍රධාන ප්‍රශ්නය තුළ අන්තර්ගතවෙලා නැහැ. ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විමසා කරුණු ඉදිරිපත් කරන්නම්, ගරු මන්ත්‍රීතුමා. හැබැයි Bti සාර්ථක ක්‍රමයක් නොවෙයි කියන එක තමයි කියන්න තිබෙන්නේ.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඊළඟට මම ප්‍රශ්නයකට වඩා පුංචි අදහසක් ඉදිරිපත් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. ඊයේ දිනයේ පාර්ලිමේන්තුවේදී සමගි ජන බලවේගයේ මන්ත්‍රීතුමන්ලා දැවැන්ත විධියට කෑගැසුවා, සඳහිරු සෑය විවෘත කිරීමේ උත්සවය පිළිබඳව සඳහන් කරමින්. එවැනි උත්සවවලදී කොවිඩ්-19 වර්ධනය වෙන්නේ නැද්ද කියලා එතුමන්ලා ඇහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණය කරලා තමයි අපි සියලුදෙනා ඒ උත්සවයට සහභාගි වුණේ. ඒ තොරතුරු මා සතුව තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ උත්සවයට සියලුදෙනා සහභාගි වුණේත් රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණය කරලායි. ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට මට අවශ්‍යව තිබුණා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, එතුමා පැහැදිලි කිරීමක් කළේ.

ප්‍රශ්න අංක 2 -933/2020- (1), ගරු චාල්ස් නිර්මලනාදන් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් මිල පහත වැටීම: වගාකරුවන්ට මූල්‍ය ආධාර

### ஏலம், கராம்பு மற்றும் மிளகு விலைகளில் வீழ்ச்சி: பயிரிடுபவர்களுக்கு நிதி உதவி

### DROP IN CARDAMOM, CLOVE AND PEPPER PRICES: FINANCIAL ASSISTANCE FOR CULTIVATORS

1102/2020

3. **ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සුළු අපනයන බෝග වගාකරුවන් අතර ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් විදේශ විනිමය උපයා දෙනු ලබන කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් සිටින බවත්;

(ii) කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් යන සුළු අපනයන බෝගවල ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී එම වගාකරුවන්ට අසාධාරණයක් සිදු වන බවත්;

(iii) ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී, කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් එම සුළු අපනයන බෝග වගා කිරීමෙන් ඉවත් වන බවත්;

එතුමා දන්නේද?

(ආ) ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී, කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් සඳහා සහනාධාර මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறு ஏற்றுமதிப் பயிர்ச்செய்கையாளர்கள் மத்தியில் இலங்கைக்கு அதிகமான அந்நியச் செலாவணியை ஈட்டித்தரும் ஏலக்காய், கராம்பு மற்றும் மிளகுச் செய்கையாளர்கள் உள்ளனர் என்பதையும்;

(ii) ஏலக்காய், கராம்பு மற்றும் மிளகு முதலிய சிறு ஏற்றுமதிப் பயிர்களின் கொள்விலை வீழ்ச்சி யடையும் சந்தர்ப்பங்களில் இப்பயிர்ச்செய்கை யாளர்களுக்கு அநீதி ஏற்படுகின்றதென்பதையும்;

(iii) கொள்விலை வீழ்ச்சியடையும் சந்தர்ப்பங்களில் ஏலக்காய், கராம்பு மற்றும் மிளகுச் செய்கை யாளர்கள் மேற்படி சிறு ஏற்றுமதிப் பயிர்ச் செய்கையைக் கைவிடுகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) கொள்விலை வீழ்ச்சியடையும் சந்தர்ப்பங்களில் ஏலக்காய், கராம்பு மற்றும் மிளகுச் செய்கை யாளர்களுக்கு நிவாரண நிதியுதவியைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation:

(a) Is he aware that -

(i) there are cultivators of cardamom, cloves and pepper who earn a significant foreign exchange to Sri Lanka among the cultivators of minor export crops;

(ii) an injustice is caused to the cultivators of the minor export crops such as cloves, cardamom and pepper when the buying price of those crops drops; and

(iii) the cultivators of cardamom, cloves and pepper quit the cultivation of those minor export crops when the buying price drops?

(b) Will he inform this House whether arrangements would be made to provide the cultivators of cloves, cardamom and pepper with some financial assistance when the buying price drops?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்ட அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දක්වා අපනයන කෘෂි බෝගවලින් උපයා ගන්නා ලද සමස්ත විදේශ විනිමය රුපියල් මිලියන 71,856.26කි. මෙරට අපනයන කෘෂි බෝග වගාකරුවන් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් ගම්මිරිස්, කරාබුනැටි සහ කරදමුංගු වගාවන්හි නියැලෙන අතර, ඔවුන්ගේ නිෂ්පාදනයන් අපනයනය කිරීමෙන් 2021 වසරේ රුපියල් මිලියන 23,837ක විදේශ විනිමයක් උපයාගෙන ඇත. එය අපනයන කෘෂි බෝගවලින් උපයාගන්නා ලද සමස්ත විදේශ විනිමයෙන් සියයට 33.18ක් වේ.

(ii) මෙම කෘෂි බෝග නිෂ්පාදන අපනයන වෙළෙඳ පොළ ඉලක්ක කරගනිමින් නිෂ්පාදනය කරනු ලබන අතර, අන්තර්ජාතික වෙළෙඳ පොළේ මිල ගණන් උච්චාවචනය වීම මත දේශීය ගැනුම් මිලද වරින්වර වෙනස් වීමට භාජනය වේ. නමුත් සමස්තයක් ලෙස ගත්විට මෙම බෝග නිෂ්පාදනය වගාකරුවන්හට ලාබදායි වන අතර නිෂ්පාදන වියදමට සාපේක්ෂව ඉහළ වෙළෙඳ පොළ මිලක් ලබාගැනීමේ හැකියාව පවතී.

තවද, මේ වන විට අපනයන කෘෂි බෝග නිෂ්පාදන සඳහා සැලකිය යුතු ඉහළ ගැනුම් මිලක් දේශීය වෙළෙඳ පොළ තුළ පවතින අතර, ගම්මිරිස් කිලෝ එකක් සඳහා රුපියල් 1,061ක මිලක්ද, කරාබුනැටි කිලෝ එකක් සඳහා රුපියල් 1,308.43ක මිලක්ද, කරදමුංගු කිලෝ එකක් සඳහා රුපියල් 8,041.67ක මිලක්ද ලැබේ.

(iii) මෙම බෝගවල ගැනුම් මිල පහත බසින අවස්ථාවල සමහර වගාකරුවන් වගා කටයුතුවලින් ඉවත්වීම සිදු වුවද, අපනයන කෘෂි බෝගවල පවතින ලාභදායී බව සැලකිල්ලට ගෙන බොහෝ විට ගොවීන් අඛණ්ඩව වගා කටයුතුවල රැඳී සිටින බව නිරීක්ෂණය වෙයි.

එසේම, උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් කෘෂි අපනයන කලාප වැඩසටහන යටතේ කලාප 1,000ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර, මේ වන විට කලාප 260ක වැඩ ආරම්භ කොට ඇත. අපනයන කෘෂි භෝග වගා සංවර්ධනය හා ගුණාත්මක භාවයෙන් ඉහළ නිෂ්පාදන සඳහා අවශ්‍ය ගුණාත්මක බීජ, රෝපණ ද්‍රව්‍ය, තාක්ෂණික සහාය, තාක්ෂණික දැනුම, ජල සම්පාදනය වැනි පහසුකම් සපයා දෙනු ලබයි. මෙම වැඩසටහන යටතේ නව වගාකරුවන් මෙම ක්ෂේත්‍රයට යොමු කර ගැනීම සිදු වේ.

එමෙන්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය මඟින් අගය එකතු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුළින්ද, නව වගාකරුවන් මෙම ක්ෂේත්‍රයට යොමු කර ගැනීමත් සිදු වේ.

(ආ) අපනයන කෘෂි බෝග වගා සංවර්ධනය හා ගුණාත්මක භාවයෙන් ඉහළ නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා වන ආයෝජන ආධාර වැඩසටහන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ කුළුබඩු හා ආශ්‍රිත භෝග වගාවන්ගේ වෙළෙඳ පොළ ස්ථායීතාව සඳහාත්, අලෙවිකරණ පහසුව සඳහාත් කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත. ඒ අනුව ගොවීන්ගෙන් සෘජුවම නිෂ්පාදන මිලදී ගැනීමටත්, අගය එකතු කළ නිෂ්පාදන ලෙස පාරිභෝගිකයන්ට අලෙවි කිරීමටත් කටයුතු කෙරේ. මේ සඳහා නිෂ්පාදන අලෙවි සැලක්ද ආරම්භ කර ඇත. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය මේ වසරේ අප්‍රේල් මස සිට ගම්මිරිස් වෙළෙඳ පොළ මිල පාලනය වෙනුවෙන් ගම්මිරිස් කිලෝ එකක් රුපියල් 800ක් බැගින් මෙට්‍රික් ටොන් 25.80ක් දැනටමත් මිලදී ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු ඇමතිතුමනි, සවිස්තරාත්මකව පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එදා ඔබතුමාගේ කථාවේදී කිව්වා, මේ අපනයන කෘෂි භෝගවලින් අපට විදේශ විනිමය ලැබෙන බව. මේ වෙලාවේ අපට ඩොලර් නැතිවයි ඉන්නේ. මේ වන විට 2022 වසර සඳහා අය වැය ඉදිරිපත් කර තිබෙනවා. අය වැයෙන් මේ සඳහා විශේෂ වැඩ පිළිවෙළක්, දිරිගැන්වීමක් තිබෙනවාද? ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේවත් එවැනි යෝජනා ඉදිරිපත් කරනවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය ඇහුවාට ස්තුතියි. ශ්‍රී ලංකා ඉතිහාසයේ සුළු අපනයන භෝග අංශයට වැඩිම අපනයන ආදායම ලැබෙන්නේ 2021 වසරේදී. ඒ කියන්නේ, මේ වසරේදී. 2020 වසරේදී අපේ කුරුඳු, ගම්මිරිස් ඇතුළු සුළු අපනයන භෝග අංශයේ සමස්ත අපනයන ආදායම රුපියල් බිලියන 72යි. මේ වසරේ සැප්තැම්බර් අවසානය වෙනකොටම අපි රුපියල් බිලියන 72ක් උපයා තිබෙනවා. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඉතිහාසයේ වැඩිම මුදල විධියට රුපියල් බිලියන 100කට ආසන්න දැවැන්ත මුදලක් අපට මේ අවුරුද්දේ අනිවාර්යයෙන්ම ලැබෙයි කියලා. ඒ නිසා ඉතිහාසයේ වැඩිම මුදල සුළු අපනයන භෝග අංශයෙන් ලැබෙන්නේ 2021 වසරේ. ඒ වාගේම ඉතිහාසය තුළ මෙතෙක් අය වැයකින් වෙන් කළ වැඩිම මුදල වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට වෙන් වෙන්නේ 2022 වසර සඳහා වූ අය වැයෙන්. ලබන අවුරුද්ද වෙනුවෙන් තේ, රබර්, පොල්, කුරුඳු ගම්මිරිස් ඇතුළු සියලු වගාවන් සඳහා ගරු මුදල් ඇමතිතුමා රුපියල් බිලියන 15ක් වෙන් කරලා තියෙනවා. ඒක, ඉතිහාසයේ අය වැයකින් වෙන් වන වැඩිම මුදල. ඒ වාගේම, අපි ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම ලබන්නේ මේ වසරේ බව මම ඉතා සතුටින් නැවතත් ඔබතුමාට සිහිපත් කරනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

අද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශාල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඔබතුමාම දන්නවා, මේ කොවිඩ් -19 තත්ත්වයත් එක්ක ජනතාවට කරන්න පහසුම දේ විධියට තිබුණේ කෘෂිකර්මාන්තය බව. කෘෂිකර්මාන්තය සඳහා පොහොර අවශ්‍යයි. විශේෂයෙන් තේ, රබර් ආදී හැම වගාවක්ම ඔබතුමා නියෝජනය කරන අමාත්‍යාංශය යටතේයි තියෙන්නේ.

අපි දන්නවා, මේ වනකොට තේ පැළවලට අවශ්‍ය පොහොර නැතිකම නිසා කොළ කහ පාට වෙලා තිබෙන බව. ඔබතුමා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේත් මේ තත්ත්වය විශාල වශයෙන් තිබෙනවා. අපේ තේ නිෂ්පාදකයන්ගෙන් සියයට 75ක් විතර කුඩා තේ වතුහිමියන්. ඒ අය තමන්ගේ ආදායම රටටත් බරක් නැතිව, ආණ්ඩුවටත් බරක් නැතිව හොයා ගත්තා. මේ පොහොර ප්‍රශ්නයත් එක්ක 'කාබනික' කියන මායා තත්ත්වයට ගිය නිසා, ඒ මිථ්‍යාවට ගිය නිසා අද තේ වගාකරුවන් විතරක් නොවෙයි, සුළු අපනයන භෝග නිෂ්පාදකයන් පවා ඉතාම අමාරු තැනකට වැටී තිබෙනවා.

මේ වෙනකොට නැනෝ නයිට්‍රජන් පොහොර ගෙනැවිත් තිබෙනවා. යූරියා පොහොර වෙනුවට ගෙනැවිත් තිබෙන මේ පොහොර සම්බන්ධයෙන් අද ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට අදාළ නොවුණත්, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් මේවා ගෙන්වූවත් මා මේ කාරණය ඔබතුමාට කියන්න කැමැතියි. ඉන්දියාවේ රුපියල් අපේ රුපියල්වලට හැරෙව්වාම රුපියල් 654ක් වෙන නැනෝ නයිට්‍රජන් දියර පොහොර ලීටරයක් අපි අරගෙන තිබෙන්නේ රුපියල් 2,520ට. එතකොට මිල තුන්-හතර ගුණයකින් වැඩියි. කෘෂිකර්ම ඇමතිතුමාත් මාධ්‍ය සාකච්ඡාවකදී පිළිගත්තා, වැඩි මිලකට තමයි අපි ඒවා අරගෙන තිබෙන්නේ කියලා. එහෙම නම්, මොකක්ද මේ කරලා තිබෙන්නේ? කොරෝනා තත්ත්වයක් පවතින මොහොතක, ඩොලර් නැහැ කියමින් සිටින වේලාවක මේ විධියට තුන්-හතර ගුණයක් වැඩිපුර මුදල් දීලා පොහොර ගෙන්වන්න අපට හැකියාවක් තිබෙනවාද? මේවා කාගේ මුදල්ද? මේ, රටේ ජනතාවගේ සල්ලි.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න දෙකක් ඇහුවා. ඉන් පළමුවැනි ප්‍රශ්නයට පිළිතුර මේකයි. තේ, රබර්, පොල් ඇතුළු වගා කටයුතු සඳහා අවශ්‍ය පොහොර ලබා දීමට රජය දැනටමත් තීන්දු කර තිබෙනවා. රටේ ජනතාවගේ සහ උප-නූපන් පරපුරේ අනාගතය වෙනුවෙන් ගත් සෞඛ්‍ය හා සම්බන්ධ වැදගත් තීන්දුවක්, මෙය. එය ක්‍රියාත්මක කිරීමේදී නම්‍යශීලී විය යුතු ස්ථානයක් තිබෙනවා නම්, එතැනදී නම්‍යශීලී වෙන්න අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු අපේ රජය පසුබට වෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් බොහොම පැහැදිලි සහතිකයක් අපි ලබා දීලා තිබෙනවා.

තේ වගාවට අවශ්‍ය පොහොර ආනයනය කර තිබෙනවා; ඒවා ලැබෙමින් පවතිනවා. ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් සඳහන් කරන්න අවශ්‍යයි. අපේ පුරෝකථනවලට අනුව, ගිය වසරට සාපේක්ෂව දැනටමත් තේ නිෂ්පාදනය ඉහළ ගිහින් තිබෙනවා. ගිය අවුරුද්දේ තේ කර්මාන්තයෙන් මේ රටේ නිෂ්පාදනය කළේ තේ කිලෝග්‍රෑම් මිලියන 280යි.

දැනටමත් අපි තේ කිලෝග්‍රෑම් මිලියන 280 ඉක්මවා ගොස් තිබෙනවා. මේ අවුරුද්දේ අපි තේ කිලෝග්‍රෑම් මිලියන 310ක ප්‍රමාණයක් බලාපොරොත්තු වනවා. ඒ නිසා පොහොර පිළිබඳ ගැටලුවක් නැහැ. ඒ විතරක් නොවෙයි, පොල්වලින් ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම ලැබෙන්නේත් මේ අවුරුද්දේ. ඒ අනුව පොල්වලින් අපට ඩොලර් බිලියනයක ආදායමක් මේ අවුරුද්දේ ලැබෙනවා. රබර්වලින් ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම ලැබෙන්නේත් මේ අවුරුද්දේ. ඒකෙනුත් ඩොලර් බිලියනය ඉක්ම වූ ආදායමක් ලැබෙනවා. අපනයන කෘෂි භෝග අංශයෙන් ඉතිහාසයේ වැඩිම ආදායම ලැබෙන්නේත් මේ අවුරුද්දේ. ඒකෙන් ඩොලර් මිලියන 800ක ආදායමක් ලැබෙනවා. තේවල ආදායම වැඩි වුණේ නැති වුණාට මිල ස්ථාවර මට්ටමක පවතිනවා.

ගරු මන්ත්‍රීතුමනි, පොහොර පිළිබඳ කාරණයේදී ඔබතුමා නැනෝ නයිට්‍රජන් පිළිබඳව සඳහන් කළා. නැනෝ නයිට්‍රජන් ඔබතුමා ගණනය කරන්නේ ඉන්දියාවේ සහනාධාරය සමඟ දෙන මිල ප්‍රමාණය එක්කයි. මේ සම්බන්ධයෙන් ඉතා විනිවිද පෙනෙනසුලුභාවයෙන් රජය කටයුතු කරනවා. මෙවැනි තීන්දුවක් ගන්නකොට යම් යම් ගැටලු මතු වෙන්න පුළුවන්. ඒ තීන්දු අරගෙන තිබෙන්නේ රටේ ජනතාවගේ අනාගතය වෙනුවෙනුයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පළාතේත් වකුගඩු වාගේම වෙනත් පිළිකා රෝගවලින් පෙළෙන අය විශාල පිරිසක් ඉන්නවා. මේ තත්ත්වය අපි අනාගතයේදී අනිවාර්යයෙන්ම පාලනය කරන්න අවශ්‍යයි. එය පාලනය කිරීම සඳහා අපි විවිධ ක්‍රමවේද භාවිත කරනවා. හරිත කෘෂි කර්මාන්තය එහි එක් පියවරක් විතරයි. අපි මේ රෝග පාලනය කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කරනවා. හැබැයි, ඉතිහාසයේ කෘෂි කර්මාන්තයේ යෙදී සිටින මේ රටේ ගොවි මහත්වරුන්ට වැඩිම සහනාධාර දීලා, -ආධාර කරලා- තිබෙන්නේ, කෘෂි ආර්ථිකයේ ඵලදායිතාව මේ රටේ ඉහළින්ම ඇති වුණේ ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී බව මම මතක් කරනවා. ඒ කටයුතු ඉදිරියට කරගෙන යනවා මිසක් ආපස්සට හැරවීමක් අපි සිදු කරන්නේ නැහැ. ඒ සහතිකය මේ රටේ ගොවි ජනතාවට අපි ලබා දෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු ඇමතිතුමනි, අපේ කන්ද උඩරට පළාත්වලත් තේ ගොවියෝ විශාල අර්බුදයක ඉන්නවා. ඒ අයගේ අස්වැන්න සියයට 50කින් විතර අඩුවෙලා තිබෙනවා. මේ රසායනික, කාබනික ප්‍රතිපත්තිය වෙනස් කරනවාද කියා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. මොකද, ඉන්දියාවේ අගමැති මෝදි මැතිතුමා විසින් ඉදිරිපත් කළ පනත් තුනට විරුද්ධව ගොවි ජනතාව අවුරුද්දක් තිස්සේ පාර්ලිමේන්තුව වට කරගෙන හිටියා. ඊයේ එතුමා ඒ පනත් තුන ඉල්ලා අස් කරගෙන ජනතාවගෙන් සමාව ඉල්ලුවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා කියන කාරණය පැහැදිලියි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ගරු ඇමතිතුමා, ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙනවාද? *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

මේ සම්බන්ධයෙන් නම්‍යශීලී විය යුතු ස්ථානවලදී නම්‍යශීලී වෙන්න ආණ්ඩුව කටයුතු කරනවා. මම සඳහන් කළා, ඉතිහාසගත

ආදායමක් තේ, පොල්, රබර් සහ සුළු අපනයන භෝග අංශයෙන් අපට ලැබුණු බව. ඒක ඉතිහාසයේ වැඩිම ආදායම. 2021 වර්ෂයේදී අප වාර්තා කරන්නේ ඉතිහාසයේ වැඩිම ආදායම. සමස්තයක් හැටියට ඩොලර් බිලියන 4ක ආදායමක් 2021 වසරේ අපි බලාපොරොත්තු වෙනවා. ඒක ගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 15ක වැඩිවීමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. එතුමාට මම වැඩිය උත්තර දෙන්න යන්නේ නැහැ. මොකද, මාව විශ්වවිද්‍යාලයට එක්කරගෙන ගියේත් එතුමා. එදා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබුණු රාජ්‍ය වැවිලි සංස්ථාවේත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේත් නිෂ්පාදන ඵලදායිතාව සම්බන්ධයෙන් කටයුතු සිදු වෙච්ච ආකාරය ගැන මම එතුමාට කියන්න යන්නේ නැහැ. ඒ, එතුමාට මා තුළ ගෞරවයක් තිබෙන නිසා. මොකද, මාව විශ්වවිද්‍යාලයට එක්කරගෙන ගියේ එතුමා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4 -2031/2021- (1), ගරු තිස්ස අත්තනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -2177/2021- (1), ගරු ගාමිණී වලේබොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරගන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අදාළ ප්‍රශ්න ටික ඔබතුමා ඇහුවා නේ. අද දවසේ ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කරන්න තිබෙනවා. *[බාධා කිරීමක්]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -933/2020- (1), ගරු චාල්ස් නිර්මලනාදන් මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4 -2031/2021- (1), ගරු තිස්ස අත්තනායක මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2015-2019 දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදේශකවරු: විස්තර

### 2015-2019 வரை பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சுக்கு நியமிக்கப்பட்ட ஆலோசகர்கள்: விபரம்

ADVISERS TO MINISTRY OF PLANTATION FROM 2015-2019: DETAILS

2177/2021

**5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ගාමිණී වලේබොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு காமினி வலேபொட சார்பாக )
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Gamini Waleboda)
වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையில் பெருந்தோட்டக் கைத்தொழில் விடயப்பொறுப்பு அமைச்சராகப் பணியாற்றிய ஒவ்வோர் அமைச்சரினதும் பெயர் மற்றும் பதவிக்காலம் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வோர் அமைச்சரும் தமது பதவிக்காலத்தில் நியமித்துள்ள ஆலோசகர்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வோர் ஆலோசகரினதும் பெயர், வயது, கல்வி மற்றும் தொழில்சார் தகைமைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) ஒவ்வோர் ஆலோசகருக்கும் செலுத்தப்பட்ட மாதாந்தச் சம்பளம், கொடுப்பனவுகள் மற்றும் வழங்கப்பட்டிருந்த ஏனைய வசதிகள் யாவை என்பதையும்;

(v) மேற்படி ஒவ்வோர் ஆலோசகருக்கும் ஒப்படைக்கப்பட்டிருந்த பொறுப்புகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(vi) மேற்படி ஒவ்வோர் ஆலோசகரும் மேற்கொண்டுள்ள வெளிநாட்டு விஜயங்கள், அவ்வாறு வெளிநாட்டு விஜயங்களை மேற்கொண்டமைக்கான காரணங்கள், அதற்காகச் செய்யப்பட்ட செலவுகள் மற்றும் அதன்மூலமாக அமைச்சுக்கு கிடைக்கப்பெற்ற நன்மைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation:

(a) Will he state -

(i) the name and tenure of each Minister who had been in charge of the subject of plantations from 2015 to 2019, separately;

(ii) the number of advisers appointed by each of the said Ministers during his/her tenure;

(iii) the name, age and educational and professional qualifications of each of the said advisers, separately;

(iv) the monthly salary, allowances and other facilities that had been provided to each adviser, separately;

(v) the responsibilities assigned to each of the said advisers, separately; and

(vi) the foreign tours each of the said advisers had engaged in, the reasons for engaging in the said foreign tours, the expenditure borne in that regard and the benefits received by the Ministry through the said tours, separately?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

| ගරු අමාත්‍යතුමාගේ නම | ධුර කාලය |
|---|---|
| ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා | 2015.01.01 - 2015.08.16 |
| ගරු නවීන් දිසානායක මැතිතුමා | 2015.09.07 - 2018.10.26 |
| ගරු **එස්.එම්.** චන්ද්‍රසේන මැතිතුමා | 2018.11.09 - 2018.12.15 |
| ගරු නවීන් දිසානායක මැතිතුමා | 2018.12.20 - 2019.11.22 |
| ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා | 2019.11.25 සිට මේ දක්වා |

(ii)

| | ගරු අමාත්‍යතුමාගේ නම | උපදේශකවරුන් සංඛ්‍යාව | කාලය |
|---|---|---|---|
| 01 | ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා | නැත | - |
| 02 | ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා | නැත | - |
| 03 | ගරු නවීන් දිසානායක මැතිතුමා | ලක්නා පරණවිතාන මහතා | 2015.11.01 - 2018.10.31 |
| | | ඒ.බී. ටයිටස් සුනිල් සිල්වා මහතා | 2019.01.21 - 2019.11.20 |

(iii)

| උපදේශකවරයාගේ නම | වයස (පත්වීම් දිනට) | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | කාල සීමාව |
|---|---|---|---|---|
| ලක්නා පරණවිතාන මහතා | අවුරුදු 65 1950.01.09 | · ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) · ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව (කොළඹ විශ්වවිද්‍යාලය) · මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් සහතික පත්‍ර පාඨමාලාව · ස්වාභාවික රබර් නිෂ්පාදන පිළිබඳ ඩිප්ලෝමාව (රබර් පර්යේෂණ ආයතනය- මැලේසියාව) | 1971 වසරේ සිට රබර් වැවිලි ක්ෂේත්‍රයට අදාළව දේශීය හා විදේශීය ආයතනවල විවිධ තනතුරු දරා ඇත. | 2015.11.01 - 2018.10.31 |

| උපදේශකවරයාගේ නම | වයස (පත්වීම් දිනට) | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | කාල සීමාව |
|---|---|---|---|---|
| ඒ.බී. ටයිටස් සුනිල් සිල්වා මහතා | අවුරුදු 66 1953.03.28 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) | ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ නිලධාරි (1994 ජූනි සිට සැප්තැම්බර් දක්වා), අලෙවි නිලධාරි (1986 අප්‍රේල් සිට 1994 ජූනි දක්වා) - මහවැලි අධිකාරිය සහකාර සාමාන්‍යාධිකාරිගේ සම්බන්ධීකරණ නිලධාරි - 1980 මැයි සිට 1986 අප්‍රේල් දක්වා (ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය) වතු අධිකාරි, කොටගල වැවිලි සමාගම - 1978 අප්‍රේල් සිට 1980 මැයි දක්වා | 2019.01.21 - 2019.11.20 |

·උපදේශක - ලක්නා පරණවිතාන මහතාගේ ජීව දත්ත තොරතුරු පත්‍රිකාව ඇමුණුම 01** ලෙස ද,

·උපදේශක - ඒ.බී. ටයිටස් සුනිල් සිල්වා මහතාගේ ජීව දත්ත තොරතුරු පත්‍රිකාව ඇමුණුම 02** ලෙස ද අමුණා ඇත.

(iv)

| අංකය | උපදේශකගේ නම | මාසික වැටුප | දීමනා සහ ලබා දී ඇති වෙනත් පහසුකම් | කාල සීමාව |
|---|---|---|---|---|
| 01 | ලක්නා පරණවිතාන මහතා | රුපියල් 100,000/- | අමාත්‍යාංශ අතිරේක ලේකම්වරයෙකුට හිමි පහසුකම් ලබා දී ඇත. (අංක අමප/15/0180/613/008 හා 2015.04.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 03 වගන්තියට අදාලව) | 2015.11.01 - 2017.10.31 |
| | | රුපියල් 125,000/- | අමාත්‍යාංශ අතිරේක ලේකම්වරයෙකුට හිමි පහසුකම් ලබා දී ඇත. (අංක අමප/17/2391/726/050 හා 2017.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව) | 2017.11.01 - 2018.10.31 |
| 02 | ඒ.බී. ටයිටස් සුනිල් සිල්වා මහතා | රුපියල් 75,000/- | අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුට හිමි පහසුකම් ලබා දී ඇත. (අංක අමප/19/0087/117/001 හා 2019.01.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව) | 2019.01.21 - 2019.11.20 |

(v) අමාත්‍යාංශය මගින් රාජකාරි පැවරීමක් සිදු කර නොමැති අතර ගරු අමාත්‍යතුමාගේ උපදේශක ලෙස කටයුතු කර ඇත.

| උපදේශකගේ නම | විදේශ සංචාරය | සංචාරයේ නිරතවීමට හේතුව | දරන ලද වියදම් | අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ |
|---|---|---|---|---|
| ලක්නා පරණවිතාන මහතා | චීනය Boao Forum for Asia 2019 සහභාගි වීමට (2019.03.24 සිට 2019.03.31 දක්වා) | ගරු අමාත්‍යතුමාගේ විශේෂ නියෝජිතයෙකු ලෙස | චීන රජයෙන් ලද ආරාධනාවක් පරිදි විදේශගත වී ඇති අතර අමාත්‍යාංශයෙන් ඒ සඳහා වියදම් දරා නොමැත. | ශ්‍රී ලංකාවේ වැවිලි භෝගවල සංවර්ධනය සඳහා චීන රජයේ සහයෝගිතාව ලබා ගැනීම පිණිස, නිවර්තන කෘෂිකාර්මික සංවර්ධනය සහ වැවිලි භෝගවල අගය එකතු කිරීම සඳහා සහයෝගිතාව සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමකට වැවිලි අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ හයිනාන් පළාත් මහජන රජය අතර අත්සන් කිරීමට මූලික කටයුතු සිදු කිරීම |

***** පුස්තකාලයේ තබා ඇත.***

*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

*** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

| උපදේශක ගේ නම | විදේශ සංචාරය | සංචාරයේ නිරතවීමට හේතුව | දරන ලද වියදම් | අමාත්‍යාංශ යට අත් වූ ප්‍රතිලාභ |
|---|---|---|---|---|
| ඒ.බී. ටයිටස් සුනිල් සිල්වා මහතා | විදේශ සංචාර සඳහා සහභාගි වී නැත. | | | |

· මීට අමතරව ලක්නා පරණවිතාන මහතා විවිධ අවස්ථාවලදී පෞද්ගලික මට්ටමින් විදේශ සංචාර සිදු කර ඇති අතර ඒ සඳහා අමාත්‍යාංශයෙන් කිසිදු වියදමක් දරා නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 නොවැම්බර් 23 අඟහරුවාදා, 24 බදාදා, 25 බ්‍රහස්පතින්දා, 26 සිකුරාදා, 27 සෙනසුරාදා, 29 සඳුදා, 30 අඟහරුවාදා සහ 2021 දෙසැම්බර් 01 බදාදා, 02 බ්‍රහස්පතින්දා, 03 සිකුරාදා, 04 සෙනසුරාදා, 06 සඳුදා, 07 අඟහරුවාදා, 08 බදාදා, 09 බ්‍රහස්පතින්දා, 10 සිකුරාදා "විසර්ජන" (2022) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" (2022) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා 2021 නොවැම්බර් 23 අඟහරුවාදා සිට 30 අඟහරුවාදා දක්වා ද, 2021 දෙසැම්බර් 01 බදාදා සිට 09 බ්‍රහස්පතින්දා දක්වා ද, වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.30 දක්වා ද විය යුතු ය:

එසේ වුවද, අ. භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (4), (5) සහ (6) ඡේදයන් හි විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" (2022) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කළ, 2021 දෙසැම්බර් 10 සිකුරාදා පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### "BATTI TV" නාලිකාවේ විකාශය වූ වීඩියෝ දර්ශනය
### "BATTI TV" அலைவரிசையில் வெளியான வீடியோ காட்சி
### VIDEO FOOTAGE PUBLISHED ON "BATTI TV"

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2021 අගෝස්තු 06 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
### தனி உறுப்பினர் சட்டமூலங்கள்
### PRIVATE MEMBERS' BILLS

## ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை பட்டயக் கப்பற் தரகர்கள் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### INSTITUTE OF CHARTERED SHIPBROKERS OF SRI LANKA (INCORPORATION) BILL

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත වරාය හා නාවික අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Ports and Shipping for report.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විසර්ජන පනත් කෙටුම්පත 2022, හයවැනි වෙන් කළ දිනය.

විවාදය ආරම්භ කිරීම, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 35 කාලයක් තිබෙනවා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
### APPROPRIATION BILL, 2022

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***
***ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" [ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [12th November]*
*"That the Bill be now read a Second time".- [The Hon. Basil Rohana Rajapaksa]*
*Question again proposed.*

[පූ.භා. 9.52]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විවාදය ටිකක් වේලාසනින් පටන් ගත් නිසා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ වැඩි වෙච්ච කාලය මට ලබා දෙයි කියා මා හිතනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එතකොට අනෙක් මන්ත්‍රීවරුන්ගේ කාලයත් වැඩි වෙනවා නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මෙවර අය වැය විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. දැන් තිබෙන ආර්ථික තත්ත්වය පිළිබඳව මා මුලින්ම කියන්නම්. මම දැක්කා, එක සටහනක්. එහි තිබුණා, "තාත්තා තෙල් පෝලිමේ, අම්මා ගෑස් පෝලිමේ, දුව කිරි පිටි පෝලිමේ, පුතා passport පෝලිමේ" කියලා. මේ ආර්ථිකය පවුලකට දැනෙන ආකාරය තමයි එයින් පිළිබිඹු වන්නේ. ඒ වාගේම, ගොවි ජනතාව තමන්ගේ සාධාරණ ඉල්ලීම් පෙරටු කරගෙන පාරට ඇවිල්ලා ඉන්නවා. සාමාන්‍ය ජනතාව තමන්ගේ ජීවන වියදම දරා ගන්න බැරිව අඳෝනා නගමින් ඉන්නවා. බන්දුල ගුණවර්ධන වෙළෙඳ අමාත්‍යවරයා කියනවා මම දැක්කා, "විශාල ඩොලර් හිඟයක් තිබෙනවා, අනාගතයේදී තෙල් ගෙන්වා ගැනීමට අපහසුතාවක් ඇති වෙයි" කියලා.

තෙල් සංස්ථාව භාර අමාත්‍යවරයා කියනවා, "විශාල කන්ටේනර් තොගයක් වරායේ හිර වෙලා තිබෙනවා. නිදහස් කරගන්න ඩොලර් නැහැ" කියලා. ගරු සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය

[ගරු අනුර දිසානායක මහතා]

අමාත්‍යතුමාත් බොහෝ කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම, අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමාත් බොහෝ කරුණු ඉදිරිපත් කළා. මේ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ රට විශාලතම ආර්ථික ප්‍රපාතයකට ඇද වැටී තිබෙන බවයි. මෙම අය වැය ලේඛනයෙන් කළ යුතුව තිබුණේ ජනතාව පත් වී තිබෙන මේ ප්‍රපාතයෙන් ගොඩ ඒම සඳහා කෙටි කාලීන දැක්මක් සහ මේ ඇති වී තිබෙන අර්බුදයෙන් ගොඩ ඒම සඳහා දිගු කාලීන දැක්මක් යෝජනා කිරීමයි. නමුත්, මේ අය වැය ලේඛනය තුළ එවැනි කෙටි කාලීන දැක්මක් හෝ දිගු කාලීන දැක්මක් නොමැති බව අපි කවුරුත් පොදුවේ පිළිගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දැන් තිබෙන අර්බුද කිහිපයක් ගනිමු. විශාල ඩොලර් හිඟයකට අපේ රට මුහුණ දී තිබෙනවා. ඒ, දිගු කාලයක් තිස්සේ අප විසින් අනුගමනය කරන ලද අපේ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාකයි. එම ප්‍රතිවිපාකවලට අද අපි මුහුණ දෙමින් ඉන්නවා. ඉතිහාසයේ බරපතළම විදෙස් සංචිත කඩා වැටීමට අප ලක් වී තිබෙනවා. ඔක්තෝබර් මාසයේ 31වන දා වන විට විදෙස් සංචිත ඩොලර් බිලියන 2.2ට හිඳිලා තිබෙනවා. ඒ වාගේම, අප අරගෙන තිබෙන ඩොලර් ණය ප්‍රමාණය සඳහා අප රටක් හැටියට වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් බිලියන 7කවත් ණය වාරිකයක් ගෙවිය යුතුව තිබෙනවා. අපේ ආනයන සහ අපනයන අතර පරතරය විශාල ලෙස වර්ධනය වෙලා තිබෙනවා. මුදල් අමාත්‍යවරයා අය වැය කථාවේදී කියනවා මා දැක්කා, "මේ අවුරුද්දේ වෙළෙඳ ශේෂය බිලියන 7ක් අපේක්ෂා කරනවා" කියලා. මගේ උපකල්පනය නම් එය බිලියන 7 ඉක්මවා යන බවයි. මොකද, පසුගිය මාස 8ට ආනයන හා අපනයන පරතරය බිලියන 5.58ක් තිබෙනවා.

ඉදිරි මාස හතර සංසන්දනය කර බැලුවොත්, මේ වෙළෙඳ පරතරය බිලියන 8 ඉක්මවනවා. ඒ නිසා අපිට අතිරේක වශයෙන් භාණ්ඩ ආනයනය කර ගැනීම වෙනුවෙන් ඩොලර් බිලියන 8ක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම රටක් ලෙස අපට අතිරේක වශයෙන් ණය වාරික ගෙවීම සඳහා වසරකට ආසන්න වශයෙන් ඩොලර් බිලියන 7ක් අවශ්‍ය වෙනවා. ඒ කියන්නේ මේ කරුණු දෙකට පමණක් අපි ඩොලර් බිලියන 15ක් උපයාගත යුතුයි. හැබැයි, අපේ ඩොලර් ලැබෙන මාවත්වලට මොකක්ද සිදු වී තිබෙන්නේ? මා දැක්කා මුදල් අමාත්‍යතුමා කියනවා, මේ අවුරුද්දේ ඩොලර් බිලියන 11.9ක අපනයන ආදායමක් අපේක්ෂා කරනවා කියලා. ඔව්, එතැනට යන්න පුළුවන් වේවි. හැබැයි, අපේ ආනයන වියදම ඩොලර් බිලියන 20ට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වීම වළක්වන්න බැහැ. ඒ නිසා අපේ අපනයන ආදායම වර්ධනය වනවාට සාපේක්ෂව අපේ ආනයන වියදම වර්ධනය වීම වඩා වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා එය තිබෙන්නේත් ඉතාම අහිතකර තත්ත්වයකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මා කියන්නම්, අපේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වුණු විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් අපට ලැබෙන ලැබීම් පිළිබඳව. ඔබතුමා දන්නවා, විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ලැබීම් ආසන්න වශයෙන් ගත්තොත්, ඩොලර් බිලියන 7.5ක, ඩොලර් බිලියන 7.8ක වාගේ ප්‍රමාණයක් අපට තිබුණු බව. නමුත්, මේ අවුරුද්දේ එය විශාල ප්‍රමාණයකින් කඩා වැටෙමින් තිබෙනවා. උදාහරණයක් හැටියට ජූලි මාසය ගැන කිව්වොත්, 2020 ජූලි මාසයේ අපට විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ඩොලර් මිලියන 702ක් ලැබුණා. හැබැයි, 2021 ජූලි මාසයේ අපට ලැබෙන්නේ ඩොලර් මිලියන 453යි. ඒ කියන්නේ 2020 වර්ෂය හා සංසන්දනය කර බලනකොට 2021 ජූලි මාසයේ විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ආදායම ඩොලර් මිලියන 249කින් අඩු වී තිබෙනවා. ඒ වාගේම අගෝස්තු මාසය ගත්තාම, 2020 අගෝස්තු මාසයේ අපට විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ඩොලර් මිලියන 665ක් ලැබුණා. මේ අවුරුද්දේ අගෝස්තු මාසයේ ලැබී තිබෙන්නේ ඩොලර් මිලියන 447යි. ආසන්න වශයෙන් ගත්තොත්, එතැන ඩොලර් මිලියන 218ක අඩුවීමක් තිබෙනවා. ඒ කියන්නේ මේ මාස දෙක පමණක් සංසන්දනය කර බැලුවොත්, ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ ඩොලර් මිලියන 467ක අඩුවීමක් තිබෙනවා.

ඒ නිසා විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ආදායම ඩොලර් බිලියන 6ත්, 6.5ත් අතර ප්‍රමාණයක තමයි රැඳෙන්නේ. අපට ඩොලර් බිලියන 15ක් අවශ්‍ය වී තිබෙනවා. මෙය උපයා ගන්නේ කොහොමද? ඒ සඳහා කෙටි කාලීන සැලැස්මක් අවශ්‍යයි. මොකද, අපි දන්නවා ජනවාරි 27 වෙනිදාට ISB එකක් සම්පූර්ණ වෙන බව, ඩොලර් මිලියන 500ක. බොහෝ ආර්ථික විශේෂඥයන් කියනවා, එය ඉතාම අනතුරුදායක තත්ත්වයක් අපට ඇති කරාවි කියලා. ලබන අවුරුද්දේ ජූලි මාසය වෙනකොට අපට ISB එකක් ගෙවන්න තිබෙනවා, ඩොලර් බිලියනයක. ඩොලර් බිලියනයක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරයක් - ISB එකක් - අපි ලබන අවුරුද්දේ ජූලි මාසයේ ගෙවිය යුතුව තිබෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, මාසයකට ඩොලර් මිලියන 300ක වගේ ණය වාරිකයක් අපි ගෙවිය යුතුව තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඩොලර්වලින් හිඳුණු, පතුළටම වැටිච්ච ආර්ථිකයක් අද අප හමුවේ තිබෙනවා. ඒ වාගේම අපේ නිෂ්පාදනය වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවා. කෘෂිකර්මාන්තය ගත්තොත්, එහි විශාලම අර්බුදයක් නිර්මාණය විය හැකියි කියලා මා හිතනවා. ඒ නිසා මේ රට තුළ ඇති වී තිබෙන දැවැන්ත ආර්ථික කඩා වැටීමටත්, ඒ වාගේම ජනතාවගේ ජන ජීවිත තුළ ඇති වී තිබෙන විශාල බිඳ වැටීමටත් සාපේක්ෂව ගත්තොත්, මේ අය වැය ලේඛනය ඒ සඳහා කිසිම විසඳුමක් නැති හිස් සහ පුස් දැක්මක් කියලා තමයි අපට කියන්න තිබෙන්නේ. මේ අර්බුදය පිළිබඳව මීට වඩා අවධානය යොමු කළ යුතුව තිබුණා කියා මා විශ්වාස කරනවා.

ඊළඟට මුදල් අමාත්‍යවරයා වැදගත් කරුණක් ඉදිරිපත් කරනවා. එතුමා කියනවා, දැනට මේ ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂවලට අමතරව කිසිදු වැය ශීර්ෂයක් පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන බව. අපි එයට ස්තුතිවන්ත වෙනවා. ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා පසුගිය දා කරන ලද එම ප්‍රකාශය මේ විධියටම ලබන වසර පුරාම පවත්වා ගනීවි කියලා මා හිතනවා. හැබැයි, ඔබතුමාට සහතිකයක් දෙන්න පුළුවන්ද? ඔබතුමා අපේක්ෂා කරනවා, ට්‍රිලියන 2.2ක ආදායමක්. කෝටි දෙලක්ෂ විසිදහසක ආදායමක් අපේක්ෂා කරනවා. ඔබතුමාට මේ පාර්ලිමේන්තුවට සහතිකයක් දෙන්න පුළුවන්ද, ඒ ආදායම ලැබේවි කියලා?

මේ අය වැය ලේඛනය සම්මත කරන වෙලාවේදී මේ පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා සිටින ණය ලබා ගැනීමේ සීමාව ඉක්මවන්නේ නැහැ කියලා ඔබතුමාට මේ පාර්ලිමේන්තුවට සහතිකයක් දෙන්න පුළුවන්ද? මා ඉතාම සහතික වශයෙන් කියනවා, තමුන්නාන්සේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් නොකළාට, ණය සීමාව වැඩි කිරීමේ යෝජනාව තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවට සහතික වශයෙන්ම ඉදිරිපත් කරන බව. බලමු, ගිය අවුරුද්දේත් රුපියල් බිලියන 1,919ක ආදායමක් අපේක්ෂා කළා, ඔබතුමාට මතක ඇති. හැබැයි, අය වැය ලේඛනයෙන් කියනවා, ආදායම ලැබෙන්නේ රුපියල් බිලියන 1,561යි කියලා. එහෙම නම් ආසන්න වශයෙන් ගත්තොත් සියයට 80කටත් වඩා අඩු ආදායමක් තමයි ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ආර්ථිකය පිළිබඳව යම් දැනුමක් තිබෙන, අධ්‍යාපනයක් තිබෙන කෙනෙක්. ඔබතුමා දන්නවා, සාමාන්‍යයෙන් ඕනෑම උපකල්පනයකදී සියයට 5ක ධන, ඍණ වෙනස්වීමක් සිද්ධ වෙන්න පුළුවන් බව. හැබැයි, සියයට 20ක, 25ක වෙනස්වීමක් සිද්ධ වීමෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද? ඒ දත්ත මුළුමනින්ම අසත්‍ය සහ ඒ පුරෝකථනයන් මුළුමනින්ම අසාර්ථක බවයි එයින් පෙන්නුම් කරන්නේ. ඒක නොවෙයි ද

පෙන්නුම් කරලා තිබෙන්නේ? රුපියල් බිලියන 1,919ක ආදායමක් ගිය අවුරුද්දේ අපේක්ෂා කරනකොට, ඔබතුමා මේ අවුරුද්දේ ආදායම් වාර්තාව ඉදිරිපත් කරලා කියනවා, රුපියල් බිලියන 1,561යි ලැබෙන්නේ කියලා. ඒ වාගේම, ඔබතුමා මේ අවුරුද්දේදී කියනවා රුපියල් බිලියන 2,200ක ආදායමක් ලැබෙනවා කියලා. මේ ඉදිරිපත් කොට තිබෙන ණය සීමාව වැඩි නොකරන බවට ඔබට මේ පාර්ලිමේන්තුවට සහතිකයක් දිය හැකිද? කිසිසේත්ම සහතිකයක් දෙන්න බැහැ. ලබන අවුරුද්දේ ජූලි, අගෝස්තු වන විට යළිත් රුපියල් බිලියන 400ත්, 600ත් අතර ප්‍රමාණයකින් ණය සීමාව වැඩි කිරීම සඳහා සහතික වශයෙන්ම මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන්න වෙනවා. ඔබතුමා ද, මම ද හරි කියලා බලමු. ඒ නිසා අය වැය ලේඛනයක් යම් ප්‍රමාණයකට අපේ රටේ ආර්ථිකයේත්, අපේ රටේ පුරෝකථනවලත් සාධාරණ යථාර්ථවාදී පිළිබිඹුවක් විය යුතුයි. හැබැයි මා විශ්වාස කරනවා, කිසිසේත්ම සාධාරණ හා යථාර්ථවාදී පිළිබිඹුවක් මෙම අය වැය ලේඛනයේ සංඛ්‍යා දත්ත තුළ නැහැ කියලා. ඒ විතරක් නොවෙයි. මා කියවපු ලේඛනයේ තිබුණා, ඔබතුමා ලබන අවුරුද්දේ -2022 අවුරුද්දේ- රුපියල් බිලියන 19ක අපනයන ආදායමක් අපේක්ෂා කරනවා කියලා.

රුපියල් බිලියන 19ක අපනයන ආදායමක්? මේ අවුරුද්දේ අපනයන ආදායම විධියට තිබෙන්නේ රුපියල් බිලියන 11.9යි. ගරු මුදල් ඇමතිතුමනි, ඒක රුපියල් බිලියන 19 දක්වා වැඩි කරනවා නම්, ඔබතුමා විශ්වකර්මයෙක්. රටේ ජනතාව හැම වෙලාවේම ප්‍රාර්ථනා කරනවා, විශ්වකර්මයා ඇවිල්ලා රට බේරයි කියලා; ඉන්ද්‍රජාලිකයා ඇවිල්ලා රට බේරයි කියලා; මන්තරකාරයෝ ඇවිල්ලා රට බේරයි කියලා. එහෙම රට බේරන්න බැහැ. ඒක නිසා මම හිතනවා, රුපියල් බිලියන 11.9ක අපනයන ආදායම රුපියල් බිලියන 19 දක්වා වැඩි කිරීමේ තමුන්නාන්සේගේ පුරෝකථනය මුළුමනින්ම යථාර්ථවාදී නොවන පුරෝකථනයක් බව. ඒක නිසා තමයි මා නැවත නැවත පෙන්නුම් කරන්නේ, මේ අය වැය ලේඛනයේ අර්බුද තුනක් තිබෙන බව. එයින් පළමුවැනි කාරණය මෙයයි. මේ අය වැය ලේඛනයෙන් රටේ ජනතාව මේ මොහොතේදී මුහුණ දී තිබෙන කෙටි කාලීන ගැටලුවලට කිසිදු විසඳුමක් ලබා දී නැහැ. ඒ වාගේම අපේ රට මුහුණ දී තිබෙන දිගු කාලීන ආර්ථික අර්බුදයෙන් ගිලිහීම සඳහාත් දැක්මක් හෝ සැලැස්මක් මෙහි නැහැ. එය දෙවැනි කාරණයයි. තුන්වැනි කාරණය තමයි, මේ අය වැය ලේඛනයේ සංඛ්‍යා දත්තවල, පුරෝකථනවල මුළුමනින්ම යථාර්ථවාදී නොවන, අසාර්ථක සහ අසත්‍ය ප්‍රකාශ ගැබ් වී තිබීම. අය වැය ලේඛන පිළිබඳව, එහි සංඛ්‍යා දත්ත පිළිබඳව, එහි අඩංගුවීම් පිළිබඳව අපි දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කර තිබෙනවා. මම හිතනවා, තවදුරටත් සාකච්ඡා කිරීමටවත් ප්‍රමාණවත් නොවන ලියවිලි බවට අය වැය ලේඛන පත් වී තිබෙනවා කියලා. ඒකයි මේ පාර්ලිමේන්තුවේ තිබෙන යථාර්ථය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අය වැය ලේඛනවලදී සංඛ්‍යා දත්ත එක්ක කරන පොරබැදීම්, සංඛ්‍යා දත්ත එක්ක කරන විශ්ලේෂණ, සංඛ්‍යා දත්ත එක්ක කරන පුරෝකථන, සංඛ්‍යා දත්ත එක්ක කරනු ලබන විග්‍රහ සියල්ල අසාර්ථකත්වයට පත් වී තිබෙනවා. අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ඉදිරිපත් කරනු ලබන සංඛ්‍යා දත්තත්, අය වැය ලේඛනය අවුරුද්දක් පුරා ක්‍රියාත්මක වූ පසු ඒ පිළිබඳව ඇති කරනු ලබන පසුවිපරමත් දිහා බැලුවොත් හාත්පසින්ම වෙනස් තත්ත්වයක් දකින්න තිබෙනවා. මේ අය වැය ලේඛනයෙනුත් ඊට වඩා අමුතු තත්ත්වයක් උදා වෙයි කියා අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි, මේ අය වැය ලේඛනයෙන් එක දෙයක් මේ රටේ ජනතාවට පෙන්නුම් කරනවා. ඒ පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ අය වැය ලේඛනයෙන් මේ රටේ ජනතාවට ඉගෙන ගත යුතු පාඩමක් තිබෙනවා. ඒ පාඩම අන් කවරක්වත් නොවෙයි, දිගු කාලයක් තිස්සේ අනුගමනය කරන ලද දේශපාලන, සමාජයීය, ආර්ථික ප්‍රතිපත්තිය අපේ රට ඉතාම විනාශකාරී ප්‍රපාතයකට ඇද දමා තිබීමයි. ඒක තමයි ඇත්ත.

කාට හරි මෙතැනදි නැඟිටලා කියන්න පුළුවන්ද, අපි මේ ක්ෂේත්‍රවලින් අත්පත් කරගෙන තිබෙන වර්ධනය මොකක්ද කියලා? අපේ නිෂ්පාදනයේදී, ණය ගැනීම්වලදී, ඩොලර් උපයා ගැනීමේදී, විදෙස් සංචිත වැඩි කර ගැනීමේදී, ආනයන - අපනයන වෙළෙඳාමේදී අපි සාර්ථකත්වයක් අත්පත් කරගෙන තිබෙනවා කියා කාට හරි කියන්න පුළුවන්ද? කියන්න බැහැ. මේ දිගු කාලීන ආර්ථික ගමන අපේ රට දැවැන්ත ප්‍රපාතයකට හෙළා තිබෙනවා. අපේ රට ඉතාම සුන්දර රටක්. ජනතාව අතර සාමූහිකත්වය කුළු ගන්වන්න පුළුවන් ආධ්‍යාත්මයක් තිබෙන රටක්; ඉතාම වාසනාවන්ත රටක්. අපේ රට වර්ග කිලෝමීටර 65,610ක ගොඩබිමක්. ඒකට අනුන වන පරිදි විවිධ දේශගුණික කලාප තිබෙනවා; විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. අපට රට වාගේ අට ගුණයක මහමුහුදක් තිබෙනවා. මේක, බුදු දහමෙන්, කිතුණු දහමෙන්, හින්දු දහමෙන්, ඉස්ලාම් දහමෙන් පෝෂණය වූ රටක්; සොයා නොගත් විශාල සම්පත්වලින් පිරුණු රාජ්‍යයක්. නමුත් අපේ මව් බිම අද ඇයගේ ඉතිහාසයේ අසරණමභාවයට හෙළපු මව් බිමක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

දශක ගණනාවක් තිස්සේ අපේ රට දූෂිත කණ්ඩායමකගේ ග්‍රහණයට ලක් වෙලා තිබෙනවා. ඒ අනුව, දශක ගණනාවක් තිස්සේ වරින් වර, සාමූහිකව අපේ මාතෘ භූමිය දූෂණයට ලක් කර තිබෙනවා. ඒ දූෂණයේ ප්‍රතිවිපාක ඇත ගම්වල ජීවත් වන ජනතාවගේ කර පිට පටවා තිබෙනවා. මේකයි යථාර්ථය. මේ මාතෘ භූමිය ගොඩ ගත යුතු නැද්ද? මේ මාතෘ භූමිය ගොඩ ගැනීම සඳහා නව මාවතකට අපේ රට පරිවර්තනය කළ යුතුයි. එය කළ යුතු වන්නේ හුදු අය වැය ලේඛනයෙන්, සංඛ්‍යා දත්තවලින්, පාර්ලිමේන්තු ඔළු ගෙඩිවලින්, තුනෙන් දෙකේ බලයෙන් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය කළ යුත්තේ, අපේ රටේ තීරණාත්මක දේශපාලන පරිවර්තනයකින්. එය අවශ්‍යයි. මොකක්ද, ඒ දේශපාලන පරිවර්තනය? අපේ රට මේ වෙළාගෙන තිබෙන දූෂිත දේශපාලනය වෙනුවට, අදූෂිත දේශපාලනයක් අවශ්‍යයි. මේ රට මෙවැනි ප්‍රපාතයකට හෙළීම සඳහා මේ දූෂිත දේශපාලනය විසින් විශාල පංගුවක දායකත්වයක් දක්වා තිබෙනවා.

මම හිතන විධියට පළමු වතාවට එක් දූෂිත ගනුදෙනුවක රුපියල් බිලියන 8.5ක් -කෝටි 850ක්- අද රඳවාගෙන තිබෙනවා. මම ඒ පිළිබඳව මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. එය මහා භාණ්ඩාගාරයට බැර කිරීම සඳහා එතුමා යෝජනාවක් ගෙනාවා. ඒක බොහොම හොඳයි. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම අයථා ලෙස උපයන ලද රුපියල් කෝටි 850ක මුදල භාණ්ඩාගාරයට ගැනීම සඳහා එතුමා යෝජනා කරනවා. හැබැයි, එතුමාට අමතක වෙනවා, Pandora Papers මඟින් හෙළිදරව් වූ තොරතුරු. එහෙම වුණේ නිරුපමා රාජපක්ෂ සමඟ ඥාති සම්බන්ධයක් තිබෙන නිසාද මම දන්නේ නැහැ. එතැන තිබෙනවා, රුපියල් කෝටි 3,500ක්. ඒ ගැන එතුමාගේ ස්ථාවරය මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2014 වසරේදී අපේ රටට Airbus මිලදී ගැනීමේදී ලන්ඩන්වල සිදු වූ විශාල ගනුදෙනුවක් හෙළිදරව් වුණා. ඒ තමයි, එයාර්ලංකා සමාගමේ එවකට හිටපු ප්‍රධාන විධායක නිලධාරි කපිල චන්ද්‍රසේනගේ බිරිඳගේ account එකට ප්‍රංශ එයාර් බස් සමාගමෙන් ඩොලර් මිලියන 2ක් බැර වූ බව. ඒ ගැන ඇති තරම් තොරතුරු එකතු වී තිබෙනවා. හැබැයි, මුදල් ඇමතිතුමා ඒ යෝජනාව කරන්නේ නැහැ. ඒ වාගේම එතුමාත් සම්බන්ධ, එතුමාටත් චෝදනාවක් එල්ල වී තිබෙනවා, මල්වානේ නිවසක් සහ අක්කර ගණනක ඉඩමක් සම්බන්ධව.

[ගරු අනුර දිසානායක මහතා]

මුදල් ඇමතිතුමා කියනවා, ඒක එතුමාගේ නොවෙයි කියලා. ඊට පස්සේ මුදිත ජයකොඩි කියනවා, ඒක ඔහුගේත් නොවෙයි කියලා. ඊට පස්සේ තිරුනඩේෂන් කියනවා, ඒක ඔහුගේත් නොවෙයි කියලා. ඒ අනුව, කාටවත් අයිති නැති මහා දේපළක් එතැන තිබෙනවා. මේවාත් රජයට පවරා ගන්න. අපේ රට දූෂිතභාවයට පත් කර තිබෙන දේශපාලනයෙන් උපයා ගන්නා ලද දේපළ පවරා ගැනීම සඳහා සැබැවින්ම අවංක චේතනාවක් තිබෙනවා නම්, මීට වඩා බොහෝ දිශාවකට ඔබතුමාගේ යෝජනා සහ නිරීක්ෂණ ඉදිරිපත් විය යුතුයි කියා මා කල්පනා කරනවා. ඒ, ඇයි? මේ රට විශාල දුප්පත්භාවයකට පත් වී තිබෙනවා. ජනතාව එදාවේල - ආහාර වේලක්- සපයා ගන්නේ කෙසේද කියා කල්පනා කරමින් සිටිනවා. දරුවාට කිරි පැකට් එකක් අරන් දෙන්නේ කොහොමද, නිවසට ගෑස් සිලින්ඩරය ගන්නේ කොහොමද, තමන්ගේ කුඹුර වගා කරන්න පොහොර ටිකක් ගන්නේ කොහොමද, තමන්ගේ දුවා දරුවන්ට අරපිරිමැස්මෙන් යුතුව හෝ තුන්වේල කන්න දෙන්නේ කොහොමද කියලා අද විශාල අඳෝනාවක් තිබෙනවා. හැබැයි, රටේ ජනතාව එසේ අඳෝනාවක සිටියදී, රටේ පාලකයන්ගේ අඳෝනාව මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හිතන්නේ මේකයි. ලෝකයේ දුප්පත් වූ රටක් තිබෙනවා, ඒ රටේ දුප්පත් වූ ජනතාවක් ඉන්නවා, හැබැයි, පොහොසත් වූ පාලකයන් ඉන්නවා. මේකයි සිදු වී තිබෙන්නේ.

රටත් දුප්පත්; ජනතාවත් දුප්පත්; පාලකයන් පොහොසත්. අපේ රටේ අතිශය ලෙස ධනය පොදි බැඳ ගත්ත දේශපාලනයක් තිබෙනවා. අපේ රට ඉදිරි සංවර්ධන මාවතක් ගැන කල්පනා කරනවා නම්, මේ දූෂිත දේශපාලනය පරාජයට පත් කළ යුතුයි. අදූෂිත දේශපාලනයක් අපේ රටේ ස්ථාපිත කිරීමෙන් තොරව සංඛ්‍යා දත්ත පිළිබඳව, පුරෝකථන පිළිබඳව, ඉලක්කම් පිළිබඳව මොන විග්‍රයක් කළත් වැඩක් නැහැ. ගරු මුදල් අමාත්‍යතුමාට ඒ වෙනස කළ හැකිද? කරන්න බැහැ.

කොරෝනා වසංගතය කියන්නේ අපේ රටේ පොදු ජනතාව මුහුණ දීපු ඉතාම නීරස ප්‍රශ්නයක්. ඒකෙන් හැමදෙනාම කම්පනයට පත් වුණා. හැමදෙනාම බියට පත් වුණා. හැමදෙනාම තමන්ගේ ජීවිතය පිළිබඳව අනියත බියකට පත් වුණා. එවැනි සමාජ ව්‍යසනයක් වෙලාවේදීත් වංචාව ඒක ඇතුළට ගෙනෙන පාලකයන් ඉන්නේ. Antigen Test kits මිලදී ගැනීමේදී, නිරෝධායනයේදී, හෝටල් නිරෝධායනයේදී වංචා සිදු වුණේ නැද්ද? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. අපි කියන එක පසෙකින් තබන්න. එවැනි සමාජ ව්‍යසනයක් තිබෙන වෙලාවකත්, මහජනතාව තමන්ගේ ජීවිතය පිළිබඳව අනියත බියකින් ඉන්න වෙලාවකත් ඒකෙනුත් හොරකම් කරන්න පුළුවන්, දූෂණය කරන්න පුළුවන් මානසිකත්වයක් තිබෙන මිනිස්සු මේ රට හදයිද? මම අහන්නේ එච්චරයි. ඒ අදූෂිත දේශපාලනය අපේ රටේ න්‍යාය පත්‍රයේ අංක එක බවට පත් කර ගන්නේ නැතුව මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ.

ඊළඟ කාරණය තමයි පොහොර ප්‍රශ්නය. අද ගොවි ජනතාව විශාල ව්‍යසනයකට මුහුණ දීලා තිබෙනවා. පොහොර පිළිබඳව ගනු ලැබූ තීන්දුව ගැන අපි ඉතාම සභ්‍ය භාෂාවෙන් ප්‍රකාශ කර තිබෙනවා; විද්‍යාත්මකව ඔප්පුකොට තිබෙනවා; තාක්ෂණයෙන් ඔප්පුකොට තිබෙනවා; එය අසාර්ථකම තීන්දුවක් කියලා තිබෙනවා. ඒත් කිසිවක් අහන්නේ නැහැ කියන්නේ, එතැන තිබෙන්නේ උමතු මනසක්. මේ රටේ කෘෂිකර්මාන්තයත්, වැවිලි ක්ෂේත්‍රයත් මුහුණ දී තිබෙන මේ ඛේදවාචකය පිළිබඳව, එය ආර්ථිකයට කරන බලපෑම, කෘෂිකර්මය ජීවනෝපාය බවට පත් කර ගත්ත ජනතාවට කරන බලපෑම පිළිබඳව හැඟීමක්, සිතුවිල්ලක්, දැනීමක් නැත්නම්, ඔහුට තිබෙන්නේ සාමාන්‍ය සන්නිවේදන සෛල නොවෙයි; සාමාන්‍ය හැඟුම් නොවෙයි. ඔහුට තිබෙන්නේ උමතු හැඟුම්; උමතු සෛල. ඒකයි පෙන්නුම් කරන්නේ. කල්පනා කරලා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි ව්‍යසනයක් තිබෙන වෙලාවකදීත් මේ පාලකයන් එය විසඳන්න සමත් වුණාද? එය විසඳීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග දෙස බලන්න.

චීනයෙන් පොහොර ගෙනාවා. අපේ රටේ ශාක ආරක්ෂක පනත අනුව අපට ඉතාම ශක්තිමත් ශාක නිරෝධායන සේවයක් තිබෙනවා. අපි ඒ නිලධාරින්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ අය විවිධ ආක්‍රමණික පැළෑටිවලින්, බැක්ටීරියා ඇතුළු විවිධ ආක්‍රමණික ක්ෂුද්‍ර ජීවීන්ගෙන් අපේ මාතෘ භූමිය බේරාගෙන තිබෙනවා. අපේ ශාක නිරෝධායන සේවය විශාල කාර්ය භාරයක් කළා. ඔවුන් තමන්ගේ දැනුම, තමන්ගේ පර්යේෂණ උපයෝගි කරගෙන සාම්පල් දෙකක් ප්‍රතික්ෂේප කළා. ඒවායේ ඉතාම අහිතකර ක්ෂුද්‍ර ජීවීන් සිටින බව ප්‍රකාශ කළා. හැබැයි, මම අහන්නේ එක දෙයයි. එවැනි ක්ෂුද්‍ර ජීවීන් සහිත සාම්පල් පරීක්ෂා කිරීමට පෙර ණයවර ලිපිය නිකුත් කළේ කවුද? එහෙම කොහොමද කරන්නේ? රටට ගෙනෙන්න සුදුසුද, නැද්ද කියලා නිසි පරීක්ෂාවකින් තොරව LC විවෘත කළේ කවුද? ඒ නිසා අද චීන රජයට දොස් කීමෙන් ඵලක් නැහැ. ඔවුන් කියන්නේ සාධාරණ කාරණයක්. මොකක්ද ඔවුන් කියන්නේ?

ඔවුන් කියන්නේ, "අපට ණයවර ලිපි නිකුත් කළා. අපෙන් භාණ්ඩ ඇණවුම් කළා. අපේ නැව පිටත් වුණා. ඔය ගොල්ලන් LC open කරලා තිබෙන්නේ. අපේ නැව ආවා. දැන් සල්ලි දෙන්න. සල්ලි දෙන කල් යන්නේ නැහැ"යි කියලායි. කවුද මෙතැන මේ ගනුදෙනුව කළේ? සාම්පල් පරීක්ෂා කිරීමට කලින් කවුද LC open කරන්න නියෝග දුන්නේ? මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිවරයා පසුගිය දවස්වල පොහොර පිළිබඳ බදාගෙන කථා කළා. නමුත් දැන් සතියක ඉඳලා කියනවා, "පොහොර මගේ නොවෙයි, ශෂීන්ද්‍රගේ" කියලා. මා දැන්නේ නැහැ, ඒ කාරණය ඇතුළේ තිබෙන්නේ මොකක්ද කියලා. මා දන්නේ නැහැ, ඊට කලින් තිබුණේ මොකක්ද කියලා. ඊට කලින් පොහොර ගැන කථා කරනකොට මේ පාර්ලිමේන්තුවේ, රටේ හැම තැනම වීරයා එතුමා. හැබැයි එතුමා අද කියනවා, "පොහොර මගේ නොවෙයි. ශෂීන්ද්‍ර රාජපක්ෂගේ" කියලා.

ඊට පස්සේ ඉන්දියාවෙන් නැනෝ යූරියා ගෙනාවා. නයිට්‍රජන් කියන එක මොකක් හෝ ද්‍රව්‍යයක තැන්පත් කරන්න ඕනෑ. ඒ තැන්පත් කරන ප්‍රභේදය යූරියා. ඒක විද්‍යාත්මකයි. දැන් නැනෝ යූරියා ආනයනය කරනවා. ඉන්දියාවේ නැනෝ යූරියා මිලිලීටර් 500ක මිල රුපියල් 654යි. හැබැයි මිලිලීටර් 500ක් ලංකාවට ගෙනැවිත් තිබෙන්නේ රුපියල් 2,550ට. හතර ගුණයකට වඩා අධික මිලකට ගෙනැවිත් තිබෙනවා. ඒකට LC open කළේ කොහොමද? අමාත්‍යවරු දන්නවා, සාමාන්‍යයෙන් ඕනෑම ණයවර ලිපියක් නිකුත් කරන්නේ කාගේ නමටද කියලා. සැපයුම්කරුගේ - supplier - නමට තමයි නිකුත් කරන්නේ. හැබැයි මේ සල්ලි තැන්පත් කරන්නේ කාටද? මොහාන් ටී. පෙරේරා කියන කුප්‍රකට ජාවාරම්කරුවකුගේ, ටවුන්හෝල් එකේ තිබෙන මහජන බැංකු ශාඛාවේ ගිණුමකට. ඒ නමට ගිණුමක් තිබුණේ නැහැ. පී.බී. ජයසුන්දර නියෝගයක් නිකුත් කළා, ගිණුම අරින්න කියලා. ඒක එහි දෙවන කළමනාකාරතුමිය CID එකට දීපු ප්‍රකාශයේ තිබෙනවා. සඳුදා හදිසියේ account එකක් ඇරලා, මේ සල්ලි ඒ ගිණුමට තැන්පත් කරනවා. ඒ තීරණය ගන්නේ, සඳුදා රෑ කැබිනට් මණ්ඩලයේදී. සඳුදා රෑ කැබිනට් මණ්ඩලය එකතු වනකොට, සඳුදා දවල් ඒ සල්ලි මාරු කරලාත් ඉවරයි! මෙවැනි ව්‍යසනයක් වෙලාවේදීත් වංචා හිත එළියට එන පාලක කණ්ඩායමක් මේ රට හදයිද? ඒකයි අපි අහන්නේ. පොහොර ප්‍රශ්නය ව්‍යසනයක්.

කොවිඩ් - 19 වසංගතය ව්‍යසනයක්. ව්‍යසනයක් වෙලාවකදී තමන්ගේ මනස වැඩ කරන්නේ ඒකෙන් කීයක් හෝ ගසාගන්න නම්, දූෂිතභාවයකින් නම්, කීයක් හෝ හම්බ කර ගැනීමේ වුවමනාවෙන් නම් එවැනි පාලකයන් මේ රට හදන්නේ නැහැ. ඒ නිසා මේ රට හැදීම සඳහා ඉතාම වැදගත් ප්‍රවේශයක් අපේ රටට අවශ්‍යයි. මේ දූෂිත දේශපාලනය වෙනුවට අදූෂිත දේශපාලනයක් අපේ රටට අවශ්‍යයි.

ඊළඟට, මේ රට වැටී තිබෙන ප්‍රපාතය සරල තැනක නොවෙයි තිබෙන්නේ. මේ රට ගොඩ නැඟීම සඳහා සියලුදෙනා සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතුයි. ඒ නිසා මා මේ රටේ පොදු ජනාවගෙන් මේ දේ ඉල්ලා හිටිනවා. ඔබ හැම දාමත් විශ්වාස කළා, තනි තනි පුද්ගලයන් කෙරෙහි. ඔබ හැම දාමත් බලාපොරොත්තු තබාගෙන සිටියා, මා කලින් කිව්ව පරිදි ඉන්ද්‍රජාලිකයෝ ඇවිල්ලා රට ගොඩ ගනියි, දියසෙන් කුමාරයා ඇවිල්ලා රට ගොඩ ගනියි කියලා. මොන කට්ටියද ආවේ නැත්තේ? දුප්පතාගේ හිතවතෙක් ආවා. මතකද? විහාර මහා දේවි ආවා. දුටුගැමුණු ආවා, පොළොන්නරුවේ ගැමියා ආවා. ආසියාවේ ලොකුම මොළය ආවා. වැඩ කරන විරුවෝ ආවා. එන්න පුළුවන් හැම වර්ගයේම ඉන්ද්‍රජාලිකයෝ ආවා නේ.

නමුත් මොකක්ද රටට අත්පත් වෙලා තිබෙන්නේ? රටට අත්පත් වෙලා තිබෙන්නේ ව්‍යසනය, රටට අත්පත් වෙලා තිබෙන්නේ විනාශය. ඒ නිසා මේ රට ගොඩ නැඟීම තනි, තනි පුද්ගලයන්ගේ විශ්මකර්ම වැඩක් නොවෙයි. මේ රට ගොඩ නැඟීම සාමූහික ප්‍රයත්නයක්. කැබිනට් මණ්ඩලය සාමූහිකව, ආණ්ඩුව සාමූහිකව, දේශපාලනය සාමූහිකව, රාජ්‍ය සේවකයන් සාමූහිකව, පෞද්ගලික අංශය සාමූහිකව, රටේ තරුණ පරම්පරාව සාමූහිකව, ගොවියා, ධීවරයා, වැඩ කරන ජනතාව සාමූහිකව කටයුතු කළ යුතුයි. මේ හැමදෙනාම සාමූහික පොර බැදීමක් කළේ නැත්නම් මේ රට ගොඩ නඟන්න බැහැ. සාමූහික ප්‍රයත්නයක් යොදන්න නම් මොකක්ද කරන්න ඕනෑ? පළමුකොටම දේශපාලන වරප්‍රසාද ලත් තනතුරක සිට -සිහසුනේ සිට- පහළට බහින්න ඕනෑ. අහසේ සිට පහළට බහින්න ඕනෑ. දේශපාලනය කියන්නේ වරප්‍රසාද ලත් තනතුරු නොවෙයි. දේශපාලනය කියන්නේ සම සමව පුරවැසියන් එක්ක ඉඳගෙන, සම සමව පුරවැසියන් එක්ක කටයුතු කරන, සම සමව පුරවැසියන්ගේ දුක, සතුට බෙදාගෙන රට ගොඩ නඟන ව්‍යායාමයක් බවට පත් කරන්න ඕනෑ. ඒ නිසා අපි සාමූහිකත්වය කැඳවන්න ඕනෑ මේ රටට. තමුන්නාන්සේලාට සාමූහිකත්වය කැඳවන්න පුළුවන්ද? තමුන්නාන්සේලාට ඒ සාමූහිකත්වය කැඳවන්න බැහැ. ඇයි? මේ අය වැය ලේඛනය බලන්න. මම ඒ ගැන ගොඩක් විස්තර කරන්නේ නැහැ, මට ලැබී තිබෙන කාලය සීමිත නිසා.

රාජපක්ෂවරු හතරදෙනෙක් කැබිනට් මණ්ඩලයේ නියෝජනය කරනවා. මම නිවැරදි ඇති. ඊට අමතරව රාජ්‍ය අමාත්‍යවරයෙක් ඉන්නවා. එතකොට විශාල ප්‍රමාණයක් කැබිනට් මණ්ඩලය නියෝජනය කරනවා. ඒ පවුල වෙත, ඔවුන් නියෝජනය කරන අමාත්‍යාංශවලට කොච්චර මුදලක් වෙන්කොට තිබෙනවාද? සම්පූර්ණ අමාත්‍යාංශවල වියදම් බිලියන 5,200යි; ට්‍රිලියන 5.2යි. හැබැයි, එතුමන්ලාගේ අමාත්‍යාංශ සඳහා වෙන් කරන මුදල රුපියල් බිලියන 3, 470යි. මුළු වියදම රුපියල් බිලියන 5,200ක් වෙනකොට රුපියල් බිලියන 3,470ක් වැය කරන්නේ එක කණ්ඩායමක් අතට; පවුලක් අතට. ඒ මුළු රාජ්‍ය වියදමින් සියයට 62ක්. ඉතින්, කොහොමද කැබිනට් මණ්ඩලය අතර සාමූහිකත්වයක් නිර්මාණය කරන්නේ? අනෙක් අමාත්‍යාංශ නිකම් සූප්පු කර කර ඉන්න පුළුවන් මස් කටු. හැබැයි, ඒවා අපේ සංවර්ධනයේ උපාය මාර්ග නොවෙයිද? අධ්‍යාපනය අපේ රටේ සංවර්ධන උපාය මාර්ගයක් නොවෙයිද? සෞඛ්‍ය අපේ රටේ සංවර්ධන උපාය මාර්ගයක් නොවෙයිද? අපේ රටේ කෘෂි කර්මාන්තය සංවර්ධන උපාය මාර්ගයක් නොවෙයිද? ඒවා තමයි වැදගත් සංවර්ධන උපාය මාර්ග. ධීවර ක්ෂේත්‍රය අපේ රටේ සංවර්ධනයට විශාල වැඩ කොටසක් කරනවා. ඒ නිසා වැඩ කොටස්වලට අනුව තමයි අපි මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතුව තිබුණේ. ඒ වැඩ කොටස්වල ඉලක්කය, අපේ ඉලක්කය ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය වෙන මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතුව තිබුණා. හැබැයි, එවැනි සාමූහිකත්වයක් කැබිනට් මණ්ඩලය තුළ නැහැ. ඒ ගැන ඇමතිවරු එක එක ඒවා කියනවා. මෙහෙම රටකට යන්න පුළුවන්ද? මෙහෙම රටකට යන්න පුළුවන්ද? සමහර කැබිනට් ඇමතිවරු කියනවා, එහෙම කැබිනට් පත්‍රිකාවක් දැක්කේ නැති බව; එහෙම එකක් සම්මත නොවූ බව. අනෙක් අය කියනවා, එහෙම සිදුවූ බව. කවුරු කියන එකද අපි විශ්වාස කරන්නේ? තුනෙන් දෙකේ බලය කියන්නේ දේශපාලන ස්ථාවරත්වය නොවෙයි. ඒවා නිකම් අලුයම හෙලූ කෙළ පිඩක් සේ සෙලවෙනවා; වැටෙනවා. ස්ථාවරත්වය තිබෙන්නේ සාමූහිකත්වය මත. ඒ නිසා පළමුකොටම ආණ්ඩුවක් ඇතුළේ දේශපාලන සාමූහිකත්වය නිර්මාණය වෙන්න ඕනෑ. ඊළඟට දේශපාලනය සමත් වෙන්න ඕනෑ, සමාජ සාමූහිකත්වය කැඳවා ගැනීමට. මේ සමාජය මේ රට ගොඩ නැඟීම පිළිබඳ ඉතාම වේදනාවකින්, අපේක්ෂාවකින් පෙළෙනවා.

මම දන්නවා, අපේ රටේ විදෙස්ගත පුරවැසියන් මේ රට ගොඩ නැඟීම පිළිබඳ මහත් අභිලාෂයක්, බලාපොරොත්තුවක් ඇතිව මේ රටට එන්න ලැහැස්තිවෙලා සිටින බව. ඔවුන් මේ රට ගොඩ නැඟීම සඳහා මුදල් එවන්න ලැහැස්තියි. හැබැයි, පාලකයා පෙන්වන්න ඕනෑකම තිබෙනවා මේ රට ගොඩ නැඟීම සඳහා ඇත්ත ප්‍රයත්නයක් තමන්ට තිබෙන බව; ඇත්ත දැක්මක් තිබෙන බව; ඇත්ත වුවමනාවක් තිබෙන බව.

ඔබතුමන්ලාට මතක ඇති, අපේ රටේ පුරවැසියන් ලක්ෂ දෙක තුන වියදම් කරලා charter flights අරගෙන කතිරයක් ගහලා යන්න ලංකාවට ආවා. මම කියන්නේ ඔවුන්ගේ රැවටීම නොවෙයි, එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කරවීම සඳහා මේ රටට පැමිණ ඡන්දය දීපු සාතිශය බහුතර ජනතාව තුළ දේශපාලනය කෙරෙහි විශ්වාසය බිඳ වැටිලායි තිබුණේ. ඔවුන් තුළ මේ රට ගොඩ නැඟීම පිළිබඳ අපේක්ෂා බිඳ වැටිලා තිබුණේ. නමුත්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තම අපේක්ෂා ඉටු කරයි කියන නැවුම් බලාපොරොත්තුව ඔවුන් තුළ තිබුණා. ඒ නිසා ඔවුන් charter flights අරගෙන ආවා, කතිරයක් ගහලා යන්න. එතුමා දිනුවාට පසුව තරුණයන් තාප්පවල චිත්‍ර අඳින්න පටන් ගත්තා; ඔවුන් පුරන් කුඹුරු අස්වද්දන්නට පටන් ගත්තා. ඔවුන්ට මේ රට ගොඩ නැඟීම පිළිබඳ විශාල අභිලාෂයක් තිබුණා. හැබැයි, කෝ අද ඒ අභිලාෂය? තමුන්නාන්සේලාට ඒක පවත්වාගෙන යන්න පුළුවන් වුණාද? පවත්වාගෙන යන්න බැරි වුණා.

පළමුවෙන්ම තමුන්නාන්සේලා මේ දේශපාලනය, වරප්‍රසාද ලත් තනතුරක සිට මහජන සේවයක් බවට පරිවර්තනය කරන්න ඕනෑ. ඒ ආදර්ශය දෙන්න ඕනෑ. ඒ ආදර්ශය දිය හැක්කේ කෙසේද? හැම මන්ත්‍රීවරයෙකුටම පොලිස් නිලධාරින් ඉන්නවා. මොකටද මේ පොලීසිය තියාගෙන ඉන්නේ? මම අවුරුදු 21ක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. අමාත්‍යවරයෙක් විධියට මාස 15ක් වැඩ කරලා තිබෙනවා. ඒ එක දිනකවත් මම ආරක්ෂාවට එක පොලිස් නිලධාරියෙක් අරගෙන නැහැ. *[බාධා කිරීම්]* ගත්තේ නැති අය ඉන්නවා නම්, බොහොම හොඳයි. හැබැයි, මම අහන්නේ මොකටද පොලිස් නිලධාරින්? මම දැක්කා පුවත්පත් වාර්තාවක්; මම ඒකට වග කියන්නේ නැහැ. එහි තිබුණා, පොලීසියේ 85,000ක් ඉන්නවා, එයින් 40,000ක් ප්‍රධාන ප්‍රභූ ආරක්ෂාව සඳහා යොදවා තිබෙනවා කියලා. මොකක්ද රටේ පොලීසියෙන් ඇති වැඩේ? මේවාට ධනය නාස්ති කරන්න ඕනෑද? එතැනින් අපි බහින්න ඕනෑ.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අමාත්‍යවරුන්ට ගෙවල් දෙන්න ඕනෑද? ලයිට් බිල, වතුර බිල ගෙවලා අමාත්‍යවරුන්ට ගෙවල් දෙන්න ඕනෑද? මේ ගොඩක් අයට කොළඹ ගෙවල් තිබෙනවා. තමන්ගේ ගෙදර ඉඳලා වැඩට යන්න පුළුවන්. ඇමති ධුර නැති කාලයේ ගෙදර ඉන්නවා. ඇමති ධුර ලැබුණාම මොකටද ගෙවල්වලට යන්නේ? මේවා අත් හරින්න ඕනෑ.

ජනාධිපතිවරයාට මම ස්තුතිවන්ත වෙනවා, එතුමා මිරිහානේ නිවසේ ඉන්නේ. හැබැයි, එතුමා ජනාධිපති මන්දිරයට යනවා නම් මම කැමැතියි. ඒක එතුමාට ලේසියි. එතුමා මිරිහානේ ඉඳලා යනකොට පාරට පොලීසිය දමනවා; හැම කඩයකම CID එකෙන් දමනවා; කොත්තු කඩේක කාටවත් ඉන්න බැහැ, සැලුන් එකක වැඩක් කරන්න බැහැ. ඒක මිරිහාන ප්‍රදේශයේ මිනිසුන්ට ඊට වඩා ප්‍රශ්නයක්. මම දන්න මගේ යාළුවෙක් ඉන්නවා, ඒ යාළුවාගේ ගෙදරට මාසයකට සැරයක් පොලීසියෙන් ඇවිල්ලා අහනවා, කවුද ගෙදර ඉන්නේ කියලා. මම දන්න නිසා කියන්නේ, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි. ඒ මහත්තයා කියන්නේ මොකක්ද? ජනාධිපතිතුමාට නිල නිවසක් තිබෙනවා, කරුණාකර එතුමාට ඒ ගෙදරට යන්න කියන්න කියලා ඔහු කියන්නේ. ඒ මිනිසුන්ට එහේ ඉන්න, ජනාධිපතිතුමා නිල නිවසට යන්න. හැබැයි, රට වටේම තිබෙන ගෙවල් අයින් කරන්න. රට වටේම තිබෙනවා නේ ගෙවල් හත අටක්. අවුරුද්දකට එක දවසක් යන්නේ නැහැ; යාළු මිත්‍රයෝ, ගජ මිත්‍රයෝ තමයි ගිහින් ඒවායේ ඉන්නේ. ඒවාට පොලීසිය දාලා තිබෙනවා, ආරක්ෂාව සපයලා තිබෙනවා. ඇමති නිවාස ඇතුළු මේ ඔක්කොම අරගෙන එක සංස්ථාවක් හදලා, ලෝකයේ ඉන්න ධන කුවේරයන්, සංචාරකයන් ඒවාට ගේන්න ක්‍රමයක් හදන්න.

තමුන්නාන්සේලා ලොකු විප්ලවීය පියවරක් ගත්තා, අමාත්‍යවරුන්ගේ ඉන්ධන දීමනාව ලීටර් 5කින් අඩු කරලා. ඒ වාගේ දේවලින් මේක වහන්න බැහැ. මට මතකයි ඉස්සර තෙල් ගහන්න රුපියල් ලක්ෂ එකහමාරක් දුන්නා.

තෙල් මිල ඉහළ යනකොට එවකට කැබිනට් මණ්ඩලයම තීරණයක් ගත්තා, සල්ලි නොවෙයි තෙල් දෙනවා කියලා. එතකොට කොච්චර තෙල් ගණන් ගියත් ඇමතිවරුන්ට ප්‍රශ්නයක් නැහැ. ඇමතිවරුන්ට ඉස්සර රුපියල් ලක්ෂ 1 1/2ක තෙල් දුන්නා. එතකොට රුපියල් ලක්ෂ 1 1/2ට සරිලන තෙල් තමයි හම්බ වෙන්නේ. ඊට පස්සේ තෙල් මිල ඉහළ යනකොට මොකක්ද වුණේ? තෙල් මිල ඉහළ යන්න යන්න තෙල් ප්‍රමාණය අඩු වුණා. ඊට පස්සේ තෙල්වලින් ප්‍රතිපාදන දෙන්න තීන්දු කළා. අන්න එහෙමයි බෙදා ගන්නේ. එම නිසා, "මේ දේශපාලනයේ වරප්‍රසාද ලත් තනතුරක සිට බිමට බහිනු. පොදු පුරවැසියන් එක්ක කරට කර සිටිමින් සාමූහිකව මේ රට ගොඩනහන්න පුළුවන්" කියන පණිවුඩය දෙන්න. අන්න ඒක තමයි, අපේ රටේ දේශපාලනයේ දෙවැනි පරිවර්තනය. එහෙම නැතුව වෙන ක්‍රමවලින් මේ රට ගොඩගන්න බැහැ. එකක් අදූෂිත දේශපාලනය. දෙක, මේ රට ගොඩ නැඟීම සඳහා සාමූහික ලෙස මහජනයා බද්ධ කර ගැනීම. තුන, ආර්ථික වැඩ පිළිවෙළක්. මේ කෙටිකාලීන අර්බුදයට දිගු කාලීනව විසඳුම් ලබා ගත යුතු වෙනවා. අපි දන්නවා, ඕනෑම රටක් තමන්ගේ ආර්ථික සංවර්ධන මාවත හදා ගන්නේ කොහොමද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ අය අපට කිව්වා, අපේ රට අපි සිංගප්පූරුවක් කරනවා කියලා. සිංගප්පූරුවක් විය හැක්කේ සිංගප්පූරුවට විතරයි. අපේ රට මැලේසියාවක් කරනවා කිව්වා. මැලේසියාවක් කළ හැක්කේ මැලේසියාවට විතරයි. ඇයි? හැම රටක්ම ඒ රටේ තිබෙන විශේෂතා මත තමන්ගේ සංවර්ධන උපාය මාර්ගය සකස් කර ගන්නවා. අපි දන්නවා, සිංගප්පූරුව කියන්නේ වර්ග කිලෝමීටර හයසිය ගණනක් තිබෙන, කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රමාණයට ආසන්න කුඩා භූමියක් බව. එහි විශාල නැව් මාර්ගයක් තිබෙනවා. ඒක හයිලෙවල් පාර අයිනේ පර්චස් 10ක් තියෙනවා වාගේයි. හයිලෙවල් පාර අයිනේ පර්චස් 10ක් තියෙනකොට කවුරුවත් යන්නේ නැහැ, බතල හිටවන්න; කවුරුවත් යන්නේ නැහැ මඤ්ඤොක්කා හිටවන්න. හයිලෙවල් පාරේ පර්චස් 10ක් තියෙනවා නම්, supermarket එකක් හදනවා. සිංගප්පූරුව විශාල නැව් මාවතක් අයිනේ පිහිටලා තිබුණා. ඒ නිසා ඔවුන් ලොකුම supermarket එක හැදුවා. ඒක ලෝකයේ ලොකුම supermarket එක. ඒ නිසා සිංගප්පූරුව supermarket එකට අවශ්‍ය වෙන කරුණු තමයි දියුණු කළේ. Supermarket එකට ඕනෑ, ඉතා හොඳ බැංකු පද්ධතියක්. ඒ නිසා සිංගප්පූරුව දියුණු කරන්න ලෝකයේ කාර්යක්ෂම බැංකු පද්ධතිය හැදුවා, "සිංගප්පූරු ඩිවලොප්මන්ට් බැන්ක්" නමින්. ඇයි? Supermarket එකක මුලා ගනුදෙනු වෙන්න ඕනෑ නිසයි. ඊළඟට, supermarket එකකට මිනිස්සු එන්න යන්න ඕනෑ. ඒ නිසා ලෝකයේ කාර්යක්ෂම ගුවන් සේවය හැදුවා, "Singapore Airlines" නමින්. ඊළඟට, ලෝකයේ කාර්යක්ෂම වරාය පද්ධතිය හැදුවා. ඒක තමයි, "සිංගප්පූරු වරාය" කියන්නේ. මොකටද? Supermarket එකක් දියුණු කරන්න. අපේ රට supermarket එකක් කරන්න බැහැ. ඒ නිසා ඕනෑම රටක් තමන්ගේ ආර්ථික උපාය මාර්ගය තෝරා ගන්නේ ඒ රටේ පිහිටීම, ඒ රටේ සම්පත්, ඒ රටේ මානව සම්පත, ලෝක දේශපාලනය, ඒ රටේ ශිෂ්ටාචාරය ගොඩනැඟුණු ආකාරය අනුවයි. අපේ රටේ ශිෂ්ටාචාරය ගොඩනැඟුණේ කොහොමද? ඒක වැදගත්. ඒ නිසා අපේ රට ගොඩනගනවා නම්, අපේ රටේ පිහිටීම අතිශය වැදගත්. අපි කවුරුත් දන්නවා, ප්‍රධාන මුහුදු මාර්ග 4ක් අපේ රටට ආසන්නයෙන් පිහිටලා තිබෙන බව. ඒ තමයි, ඕස්ට්‍රේලියාවට, යුරෝපයට, ඈත පෙරදිග රටවලට සහ ඉන්දියාවට යන මුහුදු මාර්ග. මෙහි වසරකට නැව් 36,000ක් ගමන් කරනවා. ලෝක වෙළෙඳාමෙන් සියයට 30ක භාණ්ඩ ප්‍රවාහනය වෙන්නේ මේ මුහුදු කලාපයෙන්. ඒ නිසා ඉතා වැදගත් තැනක අපේ රට පිහිටා තිබෙනවා. ඒ නිසා අපේ රටේ ආර්ථිකයේ වැදගත්ම ක්ෂේත්‍රය "නාවික කර්මාන්තය ප්‍රති නැව්ගත කිරීම" තමයි. ඒක තමයි වැදගත්ම ක්ෂේත්‍රය. අපි ඒ සඳහා සංවර්ධන උපාය මාර්ගයක් සකස් කළාද? එය අපට වඩා ඔවුන් දන්නවා. ඒ නිසා තමයි, චීනය වරායන් අත්පත් කර ගන්නේ; ඒ නිසා තමයි, ඉන්දියාව වරායන් අත්පත් කර ගන්නේ. ඒ නිසා තමයි, අද තමුන්නාන්සේලා වරාය අධිකාරිය සතුව තිබෙන පහසුකම් සේවා ඒ කියන්නේ, logistic services සැපයීමේ අයිතිය චීන සමාගමකට ලබාදීම සඳහා පෝර්ට් සිටි එක අයිනේ අක්කර 13ක භූමියක් දෙන්න යෝජනා කර තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ පිහිටීමත් එක්ක සංවර්ධන මාවතක්, අප රටේ ස්වාභාවික සම්පත් එක්ක සංවර්ධන මාවතක්, අපේ රටේ මානව සම්පතත් එක්ක සංවර්ධන මාවතක් බිහි කරගත යුතුයි. අපිට විශාල මානව සම්පතක් තිබෙනවා. මේක දියුණු කළ හැකි මානව සම්පතක්. විශේෂයෙන්ම අපිට දිගු කාලයක සිට සංවිධිත අධ්‍යාපනයක් තිබෙනවා. මිහිඳු මහ රහතන් වහන්සේගේ ආගමනයත් එක්ක අපට සංස්කෘතියක් ආවා; අධ්‍යාපනයක් ආවා; ආර්ථික රටාවක්

ආවා. ඒ මත ගොඩනැඟුණු ලෝකයේ මහා විශ්වකර්ම නිර්මාණ කරන්න පුළුවන් මහා දැනුම් සම්භාරයක් තිබෙන ජන ප්‍රජාවක් අපට ඉන්නවා. මේ ජන ප්‍රජාව දියුණු කළ යුතුයි. මේක තමයි අපේ සම්පත. අපට තෙල් නැහැ; ගෑස් නැහැ; ගල් අඟුරු නැහැ; රත්තරන් නිධි නැහැ; තුත්තනාගම් නිධි නැහැ; තඹ නිධි නැහැ. ඒවා තමයි ලෝකයේ වාණිජ සම්පත්. අපිට තිබෙන ලොකුම සම්පත මානව සම්පත. ඒ නිසා අපේ ආර්ථිකයේ වැඩිම පංගුව යෙදිය යුත්තේ මේ මානව සම්පත සංවර්ධනය කරන්නයි. මානව සම්පතේ සංවර්ධනය කරන්නේ මොනවාද? පළමුවැනි එක, අධ්‍යාපනය. වැඩිම බර තබන්න ඕනෑ, අධ්‍යාපනයට. දෙවැනි එක, සෞඛ්‍යය; නිරෝගී සම්පන්න ජීවිතයක්. තුන්වැනි එක, ක්‍රීඩාව. අද අපි ක්‍රීඩාවෙන් කොතැනද ඉන්නේ? පසුගිය ඔලිම්පික් උළෙල දිහා බැලුවොත් රටවල් 85ක් කුමක් හෝ පදක්කමක් ගත්තා. අපේ දරුවෝ ගණනාවක් ඔලිම්පික් උළෙලට සහභාගි වුණා. ඒ දරුවන්ගෙන් වැඩි සංඛ්‍යාවක් සහභාගි වුණේ White Card එකෙන්; අපට ලැබෙන විශේෂ වරප්‍රසාදයකින්. එහෙම නැතුව පරිසාධන මට්ටම සම්පූර්ණ කර නොවෙයි. අපේ කිසි දරුවෙකුට මූලික වටයෙන් උඩට යන්න බැරි වුණා. අපි එහෙම අසරණ වෙච්ච රටක් ද? අපේ ක්‍රීඩා සැලැස්ම මොකක්ද? ඒ නිසා අපේ මානව සම්පත දියුණු කිරීමේදී අධ්‍යාපනය, සෞඛ්‍යය, ක්‍රීඩාව ප්‍රමුඛ කරගෙන මානව සම්පත දියුණු කිරීමේ සංවර්ධන මාවතකට අපි යන්න ඕනෑ.

ඊළඟට, ලෝක දේශපාලනය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ක්‍රමානුකූලව චීන ගුලට රිංගුවා; වේගයෙන් රිංගුවා. රිංගුවාට වඩා සල්ලි දීලා ගුලට ඇදලා ගත්තා. චීන සමාගම් විසින් අපේ රටේ නායකයන්ට සල්ලි දීලා චීන ගුලට ඇදලා ගත්තා. අද ලෝකයේ බල ගැටුම නම් ප්‍රධාන පාපන්දු පිටියේ විශාලතම දඩ බිම බවට ශ්‍රී ලංකාව පත් වී තිබෙනවා. අද මොකක්ද, අපේ රටට වෙලා තිබෙන්නේ? හම්බන්තොට වරාය චීනයේ නම්, කොළඹ ජැටිය චීනයේ නම්, Port City එක චීනයේ නම්, logistics කර්මාන්ත පවත්වාගෙන යන්න වරාය අධිකාරියෙන් අක්කර 13ක් චීනයට දෙනවා නම්, ඒ චීන පංගුව. ඊට ප්‍රතිපක්ෂව බටහිර ජැටිය ඉන්දියාවට දෙනවා; තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියාවට දෙනවා; ත්‍රිකුණාමල ජැටිය ඉන්දියාවට දෙනවා. ලෝකයේ බල තුලනයේ පැතිකඩ අපි ලංකා භූමියට ගෙනාවා. ඒ අනුව තමයි කෙරවලපිටිය බලාගාරය ඇමෙරිකාවට දෙන්නේ. ඒකට නම් අපේ මුදල් ඇමතිතුමා සතුටු වෙනවා ඇති. කෙරවලපිටිය බලාගාරය, එහි නළ පද්ධතිය ඇමෙරිකාවට දෙනවා; එහි ගබඩා සංකීර්ණය ඇමෙරිකාවට දෙනවා; ගෑස් සැපයුම ඇමෙරිකාවට දෙනවා. කල්පනා කර බලන්න, මොකක්ද, වෙලා තිබෙන්නේ?

අද ලෝකයේ බල ගැටුමක් තිබෙනවා. එහි විශාල ආර්ථික ගැටුමක් තිබෙනවා. එහි වෙළෙඳ පොළ ගැටුමක් තිබෙනවා. වෙළෙඳ පොළ බෙදා ගැනීම පිළිබඳ ගැටුමක් තිබෙනවා. ලෝකයේ මහ බලවත් රාජ්‍යයන් එම ගැටුම්වලට අවතීර්ණ වී තිබෙනවා. අපේ වැරදි විදෙස් ප්‍රතිපත්තිය - විදෙස් ප්‍රතිපත්තියට වඩා අපේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය - නිසා චීන සමාගම් විසින් අපේ නායකයන් මිලදී අරගෙන ක්‍රමානුකූලව අපේ රටේ ආර්ථිකයත්, අපේ රටේ දේශපාලනයත් චීන ගුල අස්සට ගෙන ගියා. එහි ප්‍රතිවිපාක අද අපි බුක්ති විඳිමින් තිබෙනවා. ඒ නිසා ලෝක දේශපාලනය සැලකිල්ලක් කරගත් ආර්ථික උපාය මාර්ගයක් අපි සංවර්ධනය කරන්න ඕනෑ.

ඊළඟට, අපේ රටේ ශිෂ්ටාචාරය ගැන බලන්න. ඕනෑම රටක් කල්පනා කරන්නේ ඒ රට ගොඩනැඟුණේ කොහොමද කියලායි. අපේ රටේ එය ගොඩනැඟුණේ කොහොමද? අපි දන්නවා යුරෝපය කාර්මීකරණය වුණේ නිකම් නොවෙයි. ඔවුන්ට ස්වාභාවිකවම ශීත ඍතුවක් තිබෙනවා; විශාල ශීත කාලයක් තිබෙනවා.

ඔවුන්ට රස්නය ඕනෑ වෙනවා. ඒ නිසා ගල් අඟුරු ඕනෑ වෙනවා. ඔවුන් ගල් අඟුරු කර්මාන්තය ආරම්භ කරනවා. ඉස්සෙල්ලා පතල් කර්මාන්තය තමයි යුරෝපයේ ප්‍රධාන කර්මාන්තය බවට පත් වුණේ. ඒකට තමයි එදා වාෂ්ප එන්ජිම හොයා ගන්නේ; විද්‍යුතය හොයා ගන්නේ; රසදිය හොයා ගන්නේ. ඔවුන් කාර්මීකරණයෙන් ඉදිරියට එනවා. හැබැයි, අපි එහෙම ඉදිරියට ගියේ නැහැ. අපේ ශිෂ්ටාචාරය ගොඩ නැඟුණේ එහෙම නොවෙයි. අපේ ශිෂ්ටාචාරය ගොඩ නැඟෙන්නේ කොහොමද? අපේ ශිෂ්ටාචාරය ගොඩ නැඟෙන්නේ කලා ඔය අසබඩ, මල්වතුඔය අසබඩ, අනුරාධ ග්‍රාම, විජිත ග්‍රාම වශයෙනුයි. කෘෂි කර්මාන්තය මත පදනම්වෙලා තමයි අපේ ශිෂ්ටාචාරය ගොඩ නැඟෙන්නේ. ඒ නිසා තමයි අපේ ආදිතම මුතුන් මිත්තන් වැව් 32,000ක් හැදුවේ. ඒ වාගේම මතක තියා ගන්න, ඒ වැව් 32,000 හදනකොට අපේ ආදිතම කිසිදු මුතුන් මිත්තෙක් මධ්‍ය කඳුකරයේ වැව් හැදුවේ නැහැ කියන එක. අපි හැම දාම මධ්‍ය කඳුකරය සංරක්ෂණය කළා; ආරක්ෂා කළා; එහි වන ලැහැබ ආරක්ෂා කළා. ඒ කාලයේ අලි හිටියේ වියළි කලාපයේ නොවෙයි, මධ්‍ය කඳුකරයේ. සුද්දා හෝර්ටන් තැන්නේදී අලි 108ක් ඝාතනය කළ බව කියනවා. ඒ අනුව අලි හිටියේ කොහේද? අලි හිටියේ මධ්‍ය කඳුකරයේ. අපි මොකද කළේ? මධ්‍ය කඳුකරය ආරක්ෂා කර, එහි රූරා ගලන ගංගා තැන්නෙන් හරස් කළා. අංගම්මැඩිල්ල වේල්ල බැන්දා. මිනිපේ වේල්ල බැඳලා උඩට වතුර ගත්තා. අපි මොකද කළේ? පැරැණි රජ දරුවන් අපේ මධ්‍ය කඳුකරය හදවත වාගේ ආරක්ෂා කළා. වර්තමාන රජ දරුවන් මධ්‍ය කඳුකරය විනාශ කළා. අපේ සුළු හා මධ්‍ය පරිමාණ වැව් පද්ධතිය විනාශ කළා. අපේ රට, වැව් 32,000ක් තිබුණු රටක්. අද ඉතුරුවෙලා තිබෙන්නේ වැව් 14,000යි. ඒකෙන් වැව් 12,000ක් අභාවයට යමින් තිබෙනවා. අපේ ශිෂ්ටාචාරය ගොඩ නැඟුණු පදනම ඒකයි.

ලෝකය වාෂ්ප එන්ජිම හොයා ගන්නකොට අපි බිසෝ කොටුව හොයා ගන්නවා; ලෝකය විද්‍යුතය හොයා ගන්නකොට අපි මඩ සොරොව්ව හොයා ගන්නවා; ලෝකය කාර්මික නිෂ්පාදන කරනකොට අපි කලා වැවේ ඉඳලා තිසා වැව දක්වා හැතැප්ම 28ක් අඟලකට බෑස්මක් සහිත යෝධ ඇළ නිර්මාණය කරනවා. අපේ ශිෂ්ටාචාරය ඒක. ඒ නිසා අපේ ශිෂ්ටාචාරයේ පංගුවක් අපේ ආර්ථිකය නියෝජනය කරන්න ඕනෑ. ඒ ශිෂ්ටාචාරය, වළක්වන්න බැරි විධියටම අපේ ගැමි කෘෂි කර්මාන්තය මත පදනම් වෙච්ච ශිෂ්ටාචාරයක්. ඒ නිසා අපි ග්‍රාමීය ජනතාවගේ ජීවිත උසස් කරන්නත්, කෘෂි කර්මාන්තය, නඟා සිටුවන්නත් කටයුතු කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසානයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ග්‍රාමීය ජනතාවගේ ජීවිත උසස් කරන්න නම් ඔවුන්ගේ ප්‍රධාන ආර්ථික ප්‍රභවය වන කෘෂි කර්මාන්තය දියුණු කරන්න ඕනෑ. වී නිෂ්පාදනය ලාභ ලබන්නේ නැතිව, එළවලු නිෂ්පාදනය ලාභ ලබන්නේ නැතිව, කුඩා තේ වත්ත, කුඩා කුරුඳු වත්ත, ගම්මිරිස් වත්ත, එනසාල් වත්ත ලාභ ලබන්නේ නැතිව ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්න බැහැ. ඒ නිසා අපේ ශිෂ්ටාචාරය මත පදනම් වනවා නම්, කෘෂි කර්මාන්තය අපේ රටේ ආර්ථිකයේ විශාල පංගුවක්. හැබැයි, වත්මන් රජය ඒ ඉතා වැදගත් ආර්ථික පංගුවට හෙණයක් ඇති කර තිබෙන බව මතක තබා ගන්න. ඒ අය අද මේ කෘෂි කර්මාන්තයට ඇති කර තිබෙන තත්ත්වය හෙණයක් බව මතක තබා ගන්න.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ මොන ගොවියාද, මොන කාලයේද තමන්ට වගා කරන්න අවශ්‍ය වන පහසුකම් ටික ලබා දෙන්න කියා පාරට බැස්සේ? අද ගොවි ජනතාව පාරට බැහැලා, කෑ ගහලා කියන්නේ වෙන මොකුත් නොවෙයි. තමන් මේ වගා බිම් අස්වද්දන්න ලැහැස්තියි, රටට බත සපයන්න ලැහැස්තියි, කරුණාකර අපට අවශ්‍ය පහසුකම් ටික දෙන්න කියා තමයි ඔවුන් පාරට බැහැලා කෑ ගහන්නේ. ඒ පිළිබඳව වත් අවධානය යොමු නොකරන අය වැය ලේඛනයකින් අපට ඇති ඵලය කිම, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. මේ අය වැය ලේඛනයෙන් අපට පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ අය වැය, අපේ රට මෙතෙක් ගමන් කර තිබෙන මාවත අසාර්ථක කරන්නත්, ඒ මාවත වෙනස් කිරීම සඳහා මේ රටේ පුරවැසියන්ට බල කර සිටින, මහ පෙන්වන අය වැයක් බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අංගජන් රාමනාදන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[மு.ப. 10.27]

**ගරු අංගජන් රාමනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு அங்கஜன் இராமநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Angajan Ramanathan - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்ட விவாதத்தில் பேசச் சந்தர்ப்பமளித்தமைக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டம் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற இந்தவேளையில், உண்மையிலேயே மக்கள் பல சவால்களைச் சந்தித்துக் கொண்டிருக்கின்றார்கள்; இன்னல்களைச் சந்தித்துக் கொண்டிருக்கிறார்கள்; பல துன்பங்களைச் சந்தித்துக் கொண்டிருக்கிறார்கள். 2019ஆம் ஆண்டு ஏப்ரல் குண்டுவெடிப்புக் காலகட்டத்திலிருந்து இந்த நிலைமை தொடங்கியது. இதனால் எங்களுடைய நாட்டின் சுற்றுலாத்துறைக்கும் பொருளாதாரத் துறைக்கும் ஓர் இழுக்கு ஏற்பட்டது. அதற்குப் பிறகு யாருமே எதிர்பார்க்காத கொரோனா தொற்று 1ஆவது அலை, 2ஆவது அலை, 3ஆவது அலை என உலகமெங்கும் பரவிய நிலையில் இலங்கையும் அதற்கு விதிவிலக்கல்ல. அதன் காரணமாகவும் எங்களுடைய சுகாதாரத்துறைக்கும் பொருளாதாரத் துறைக்கும் ஒரு பாரிய நெருக்கடி ஏற்பட்டது. இந்தக் கொரோனா தொற்றிலிருந்து மீண்டுவருவதற்கு எங்களுக்குத் தேவைப்பட்டது தடுப்பூசி. அந்தத் தடுப்பூசியைப் பெறுவதற்குத் தேவைப்பட்டது டொலர். அதன்படி, 1ஆம் கட்டம், 2ஆம் கட்டம் என்ற அடிப்படையில் தடுப்பூசிகள் ஏற்றுகின்ற செயற்பாடு மேற்கொள்ளப்பட்டு, 3ஆம் கட்டம் என்ற வகையில் தற்போது booster தடுப்பூசி ஏற்றுகின்ற செயற்பாடுவரை நடைபெற்றுக்கொண்டிருக் கின்றது.

இன்னுமொரு மிகப்பெரிய நெருக்கடியாக அதிக விலைவாசிப் பிரச்சினையை எங்களுடைய மக்கள் சந்தித்துக்கொண்டிருக்கின்றார்கள். இன்றைக்குத் தட்டுப்பாடு, பதுக்கல் என்ற நிலைமை காணப்படுகின்றது. ஆனால், அது யாழ். மாவட்டத்தில் மட்டுமல்ல, இலங்கை முழுவதும் காணப்படுகின்ற அதேவேளையில், உலகமெங்கும் இன்றைக்கு உணவுப் பற்றாக்குறை நிலவுகின்றது. அதனால், எங்களுடைய மக்களும் அத்தகைய பற்றாக்குறையைச் சந்தித்துக்கொண்டிருக்கின்றார்கள். அதற்கான தீர்வுகளை இம்முறை வரவு செலவுத்திட்டத்தில் எங்களுடைய மக்கள் எதிர்பார்க்கின்றார்கள். இதற்குப் பல தீர்வுகள் இந்த வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட்டிருக்கின்றதென நானும் நம்புகின்றேன். பல சுமைகளைத் தாங்கிக்கொண்டிருக்கின்ற எங்களுடைய மக்களுக்கு மேலும் ஒரு சுமையைக் கொடுக்காமல் இருப்பதே முதற் தீர்வாக அமையும். அந்தவகையில், வழமையான வரவு செலவுத் திட்டங்களை நாங்கள் பார்க்கின்றபொழுது, அனைத்து மக்களிடமிருந்தும் பணத்தை வருமானமாக எடுத்து, மறுபடியும் வரவு செலவுத் திட்டத்தினூடாக அபிவிருத்தித் திட்டங்களுக்குக் கொடுப்பது சகஜமான நடைமுறையாகக் காணப்படுகின்றது. ஆனால், இந்தமுறை சொற்ப நபர்களிடமிருந்து நிதியை எடுத்து, இந்த நாட்டு மக்கள் அனைவருக்கும் அபிவிருத்தித் திட்டங்களாகப் பிரித்துக் கொடுக்கத் திட்டமிடப்பட்டிருக்கின்றது. மக்களுடைய வலியை அறிந்து, மக்களுடைய சுமையை அறிந்து மேற்கொள்ளப்பட்ட ஒரு வேலைத்திட்டமாக இதனை நான் பார்க்கின்றேன்.

இன்றைக்கு விலைவாசிகள் அதிகமாக இருக்கின்றன; உற்பத்தித் தடைகள் இருக்கின்றன; தட்டுப்பாடுகள், பதுக்கல்கள் இருக்கின்றன. அதற்கான உடனடித் தீர்வுகள் இல்லாதபோதிலும், நீண்டகாலத் தீர்வுகள் இம்முறை வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கப்பட்டிருப்பதனை நான் பார்க்கின்றேன். அந்தவகையில், இன்றைக்கு உற்பத்திகளை அதிகரிக்கின்ற அதேவேளையில், இந்த monopoly என்ற விடயத்தை இல்லாமற்செய்யும்போது நிச்சயமாகப் பொருட்களினுடைய விலைகள் குறைவதற்கான வாய்ப்புக்கள் அதிகம் இருக்கின்றது.

உண்மையிலே இந்த வரவு செலவுத்திட்டத்தைச் சுதந்திரத்திற்குப் பிறகு வந்த புரட்சிகரமான ஒரு வரவு செலவுத்திட்டமாக நான் பார்க்கின்றேன். அதாவது, கிராமிய அபிவிருத்தியில் அதிக அக்கறைகொண்டு, உள்ளூர் உற்பத்தியில் அதிக அக்கறைகொண்டு, நேர்மையாகவும் உண்மையாகவும் தயாரிக்கப்பட்ட, சாத்தியமாகக்கூடிய ஒரு வரவு செலவுத்திட்டமாக இது இருக்கின்றது. அந்தவகையில், ஜனாதிபதி அவர்களுடைய சுபிட்சத்தை நோக்கிய கொள்கைக்கு அமைய, கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அனுபவத்தை உள்ளடக்கியதாக இந்த இக்கட்டான காலகட்டத்திலே எது நடைமுறைச் சாத்தியமோ அதனை ஒரு வரவு செலவுத்திட்டமாக கௌரவ நிதியமைச்சர் அவர்கள் சமர்ப்பித்திருக்கின்றார். அதனையிட்டு அவர்களுக்கு என்னுடைய பாராட்டுக்களைத் தெரிவிக்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் எங்களுடைய மக்களுக்கு என்ன நன்மை இருக்கின்றது என்று பேசுவதற்கு முன்னர், கடந்த ஒன்றரை வருடத்தில் எங்களுடைய மக்களுக்கு இந்த அரசாங்கமும் நாமும் என்னென்ன வேலைத்திட்டங்களைச் செய்திருக்கின்றோம் என்பதைச் சிறிதளவு ஞாபகமூட்ட விரும்புகின்றேன். இந்த அரசாங்கம் வந்தவுடனேயே முதற்கட்டமாக ஒவ்வொரு கிராம சேவையாளர் பிரிவுக்கும் 20 இலட்சம் ரூபாய் வீதம் நிதி ஒதுக்கப்பட்டு, 'சப்பிரி கம' என்ற

நிறைவான கிராம வேலைத்திட்டத்தின்மூலமாகக் கிராமங்களினுடைய நீண்டகாலத் தேவைகளைப் பூர்த்திசெய்வதற்கான திட்டம் செயற்படுத்தப்பட்டு வருகின்றது. பாதையாக இருக்கட்டும், குளங்களாக இருக்கட்டும், விவசாயக் கிணறுகளாக இருக்கட்டும் - இவையெல்லாம் இந்தத் திட்டத்தினூடாகச் செய்துகொடுக்கப்பட்டது. இந்த ஒன்றரை வருடத்திற்குள் யாழ். மாவட்டத்தில் மட்டும் வறுமையில் இருப்பவர்களுக்கென 3,100க்கும் மேற்பட்ட வீடுகள் அமைத்துக் கொடுக்கப்பட்டிருக்கின்றன.

அதற்கு மேலாக, யாழ். மாவட்டத்தில் ஒவ்வொரு பிரதேச செயலக வாரியாக 3 தேசிய பாடசாலைகள் வீதம் கிட்டத்தட்ட 26 பாடசாலைகளை ஒரே தடவையில் தேசிய பாடசாலைகளாகத் தரமுயர்த்தக்கூடிய வாய்ப்புக் கிடைத்தது. அதுவும், இன்றைக்கு எங்களுடைய பிரதேசத்தில் கல்வித் தரம் வீழ்ச்சியடைந்து கொண்டிருக்கின்ற இந்த வேளையில், இந்தத் தரமுயர்த்தல் எங்களுடைய மாணவர்களின் கல்வி மறுபடியும் முதலிடத்தில் வருவதற்கு மிகப்பெரிய ஊன்றுகோலாக இருக்கின்றது. இது எங்களுடைய பாடசாலைச் சமூகங்கள் நீண்ட காலமாகக் கேட்டுக்கொண்டிருந்த கோரிக்கையாகும். அதாவது, எங்களுடைய மாணவர்கள், பெற்றோர்கள், அந்தப் பாடசாலையினுடைய பழைய மாணவர்கள் கேட்டுக் கொண்டிருந்த நீண்டகாலக் கோரிக்கை இன்றைக்கு நிறைவேற்றப்பட்டிருக்கின்றது. மேலும், இந்த அரசு யாழ். பல்கலைக்கழகத்தின் வவுனியா வளாகத்தை வவுனியாப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்தி இருக்கிறது.

எங்களுடைய பிரதேசங்களில் தண்ணீர்ப் பிரச்சினையானது நீண்டகாலப் பிரச்சினையாக இருந்தது. கடந்தகால அரசாங்கங்கள் தண்ணீரை வைத்து அரசியல் செய்து வந்தவேளையில், இந்த அரசாங்கம் அதற்கு முற்றுப்புள்ளி வைத்திருக்கின்றது. அதாவது, 24,000 cubic metre நீர் சுத்திகரிப்பு இயந்திரத்தின்மூலம் 2023க்குள் 50 சதவீதமான மக்களுக்கு, கிட்டத்தட்ட 300,000 மக்களுக்குக் குடிநீரை வழங்குவதற்கான தீர்வை இந்த அரசாங்கம் முன்வைத்திருக்கின்றது.

அடுத்து, இன்று ஆயிரக்கணக்கான பட்டதாரிகளுக்கு வேலைவாய்ப்புகள் வழங்கப்பட்டிருக்கின்றன. முதற்கட்டமாக O/L முடிக்காதவர்கள்கூட ஓரிலட்சம் வேலைவாய்ப்புக்குள் உள்வாங்கப்பட்டிருக்கிறார்கள். அதைத்தாண்டி, தனியார் துறைகளிலும் வேலைவாய்ப்புகளை உருவாக்குவதற்கான ஊக்குவிப்புகள் செய்யப்பட்டிருக்கின்றன. இருந்தாலும், இந்தக் 'கொவிட்' காலகட்டத்தில் அது முழுமையாகச் சாத்தியப்படவில்லை. ஆனாலும், இன்று உலகலாவிய ரீதியில் வேலைவாய்ப்புகள் இல்லாமல் போய்க்கொண்டிருக்கின்ற நேரத்தில், எமது நாட்டில் அரச வேலைவாய்ப்புகளோ, தனியார்துறை வேலைவாய்ப்புகளோ இல்லாமலாக்கப் படவில்லை என்பது குறித்து நாம் சந்தோசப்பட வேண்டும்.

'சமுர்த்தி' என்ற அடிப்படையில் பார்த்தால், யாழ். மாவட்டத்தில் மாத்திரம் கிட்டத்தட்ட 16 உற்பத்திக் கிராமங்கள் உருவாக்கப்படுகின்றன. கருவாடு உற்பத்திக் கிராமம், நல்லெண்ணெய் உற்பத்திக் கிராமம், 'பத்திக்' உற்பத்திக் கிராமம், பால் உற்பத்திக் கிராமம் எனப் பல உற்பத்திக் கிராமங்கள் உருவாக்கப்பட்டுவருகின்றன. அதேநேரம், ஒவ்வொரு கிராம சேவகர் பிரிவிலும் கிட்டத்தட்ட 20 இளைஞர் - யுவதிகள், பெண் தலைமைத்துவக் குடும்பங்களுக்குச் சுயதொழில் ஊக்குவிப்பு மற்றும் வாழ்வாதாரத்தை உயர்த்தக்கூடிய வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்படுகின்றன.

நாட்டில் 100 நகரங்களைப் பல்பரிமாண அபிவிருத்தித் திட்டத்தின்கீழ் விருத்தி செய்வதென்ற புதிதாக ஏற்படுத்தப்பட்ட திட்டத்தின்கீழ் யாழ். மாவட்டத்தில் மட்டும் ஆறு நகரங்கள் தெரிவுசெய்யப்பட்டுள்ளன. சாவகச்சேரி, கொடிகாமம், நாவற்குழி, மருதனார்மடம், வேலணை, நெல்லியடி போன்ற நகரங்களைப் பல்பரிமாண நகரங்களாகத் தரமுயர்த்தி, அங்கிருக்கின்ற நுகர்வோர்களுக்கும் வியாபாரிகளுக்கும் வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுப்பதே இதன் நோக்கமாகும்.

முப்பது விளையாட்டு மைதானங்கள் புனரமைப்புத் திட்டத்தின்கீழ் யாழ்ப்பாணத்தில் மாத்திரம் கிட்டத்தட்ட 88,500,000 ரூபாய் செலவில் விளையாட்டு மைதானங்கள் புனரமைக்கப்படுகின்றன. அதற்கு நாங்கள் அமைச்சர் கௌரவ நாமல் ராஜபக்ஷ அவர்களுக்கு நன்றி சொல்லவேண்டும். ஏனென்றால், இது எங்களுடைய இளந் தலைமுறையினர் வழிதவறிப் போதைவஸ்துப் பாவனை, அரிவாள் கலாசாரம் போன்ற கலாசாரச் சீரழிவுகளுக்குள் போய்க்கொண்டிருக்கும் வேளையில் அவர்களை மறுபடியும் கட்டுப்பாட்டுக்குள் கொண்டுவரக்கூடிய ஒரு வேலைத்திட்டமாகும்.

நாடு முழுவதும் உள்ள ஏராளமான விவசாயக் குளங்களில் 5,000 குளங்கள் புனரமைக்கப்படுகின்றவேளை, யாழ் மாவட்டத்திலுமுள்ள பாரிய குளங்கள் விவசாயத் தேவைகளைப் பூர்த்தி செய்வதற்காக புனரமைக்கப்பட்டுக் கொண்டிருக்கின்றன.

அடுத்ததாக, ஏராளமான பாதைகள் புனரமைக்கப்பட்டு வருகின்றன. குறிப்பாக, நீண்டகாலக் கோரிக்கையாக இருந்த யாழ்ப்பாணம் - மானிப்பாய் வீதி, வல்வெட்டித்துறை - உடுப்பிட்டி வீதி, புத்தூர் - கந்தரோடை வீதி போன்ற வீதிகள் புனரமைக்கப்படுகின்ற அதேநேரம், மாகாண சபையின் கீழுள்ள வீதிகள், கிராமிய வீதிகள் என ஏராளமான வீதிகள் அமைக்கப்பட்டு வருகின்றன. அதைத்தாண்டி முன்னேற்றமான ஒரு நடவடிக்கை, நீண்ட காலமாகக் கேட்டுக்கொண்டிருந்த அரசியல் கைதிகளின் விடுதலையும் இன்று சாத்தியமாகி இருப்பதாகும்.

அடுத்ததாக, தடுப்பூசி செலுத்தும் விடயத்தில், முதலாவது, இரண்டாவது தடுப்பூசிகள் செலுத்தப்பட்டுள்ள நிலையில் இப்பொழுது மூன்றாவதாக booster தடுப்பூசியும் செலுத்தப்பட்டுக்கொண்டிருக்கிறது. இந்த இக்கட்டான சூழ்நிலையிலும் இவை அனைத்தும் சாத்தியமாகி இருக்கின்றன. அதாவது, கொரோனாவின் தாக்கத்தினால் உலகமெங்கும் பொருளாதார நெருக்கடி நிலைமை காணப்பட்டபோதிலும் இவ்வளவு பாரிய அபிவிருத்தித் திட்டங்களை நடைமுறைப்படுத்தியிருக்கின்றோம். ஆனாலும், எதிர்க்கட்சியினர் பாரிய குற்றச்சாட்டுக்களை முன்வைக்கின்றனர். நான் அவர்களிடம் ஒரேயொரு கேள்வியைக் கேட்கிறேன், அதாவது, சிறுபான் மையினருக்கான ஆட்சி என்று சொல்லப்பட்ட அந்த நல்லாட்சிக் காலகட்டத்தில் இந்த அரசாங்கம் செய்தவற்றில் ஒரு கால்பங்கைக்கூட, ஏன் உங்களால் செய்ய முடியவில்லை? என்று.

இந்த வரவு செலவுதிட்டத்தில் நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களால் கிராமிய அபிவிருத்திக்காகக் கிட்டத்தட்ட 85,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பதை நான் முக்கியமான ஒரு வேலைத்திட்டமாகப் பார்க்கிறேன். ஒவ்வொரு கிராம சேவகர் பிரிவுக்கும் கிட்டத்தட்ட 30 இலட்சம் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனாலும், எங்களுடைய

[ගරු අංගජන් රාමනාදන් මහතා ]

வடக்கு, கிழக்குப் பிரதேசங்களுக்கு ஒதுக்கப்பட்ட நிதி போதாது என்று எதிர்க்கட்சியினர் குற்றம் சாட்டுகின்றனர். இது தொடர்பில் நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புறேன். உதாரணமாக, கடந்த 2019ஆம் ஆண்டு ஜனாதிபதித் தேர்தலின்போது தற்போதைய ஜனாதிபதி அவர்களுக்கு மாத்தறை மாவட்டத்தில் அளிக்கப்பட்ட வாக்குகள் 374,481. ஆனால், யாழ். மாவட்டத்தில் அவருக்கு அளிக்கப்பட்ட வாக்குகள் 23,261. வாக்குகளில் வித்தியாசம் இருந்தாலும் நிதி ஒதுக்கீட்டில் வித்தியாசம் இல்லையென்பதை என்னால் அடித்துச் சொல்ல முடியும். ஏனென்றால், இன்றைக்கு 14,021 கிராம சேவகர் பிரிவுகளுக்கும் சரிசமமான ஒதுக்கீடு 3,000,000 ரூபாய்! அது அரசியல் ரீதியாக இல்லை. கடந்த காலத்தில் 'கம்பெரலிய' என்று அரசியல் ரீதியாகக் கொடுக்கப்பட்டிருந்தாலும், அதை அரசியல்வாதிகள் தீர்மானித் திருந்தாலும், இந்தமுறை மக்களால் தீர்மானிக்கப்பட்டு, மக்களை முன்னுரிமைப்படுத்தி, அவர்களுடைய வாழ்வாதாரத் தேவைகளுக்கு 40 சதவீதமும், உட்கட்டமைப்பு அபிவிருத் திக்காக 40 சதவீதமும், 10 சதவீதம் அழகுபடுத்தலுக்காகவும், 10 சதவீதம் சுற்றுச் சூழலைப் பாதுகாப்பதற்காகவும் ஒதுக்கப்பட்டுள்ளது.

இந்த வேலைத்திட்டம் ஓர் அற்புதமான வேலைத்திட்டம்! பல நாடுகளில் இதை நடைமுறைப்படுத்தி வெற்றிகண்டிருக்கிறார்கள். கொரியா போன்ற நாடுகளில் நாட்டினுடைய முன்னேற்றத்துக்கான ஓர் அடிக்கல்லாக இதனைப் பயன்படுத்தியிருக்கின்றார்கள். அந்த அடிப்படையில், கௌரவ நிதியமைச்சருடைய இந்தத் திட்டத்தை வெற்றியடையச் செய்யவேண்டும் என்ற அடிப்படையில், எங்களுடைய மாவட்டம் அதில் முழுமையான பயனை அடையவேண்டும் என்ற அடிப்படையில், இந்த வேலைத்திட்டத்துக்கான தெரிவுகளின்போது நான் ஒவ்வொரு கிராம சேவகர் பிரிவாகப் போனேன். அதாவது, யாழ். மாவட்டத்தில் 435 கிராம சேவகர் பிரிவுகள் இருக்கின்றன. 18 நாட்களில் 216 மணித்தியாலங்கள் செலவழித்து, கிட்டத்தட்ட 3,000 கிலோமீற்றர் பயணஞ்செய்து, 15 பிரதேச செயலகப் பிரிவுகளிலும் உள்ள 435 கிராம சேவகர் பிரிவுகளிலும் கிட்டத்தட்ட 1,300 மில்லியன் ரூபாய் பெறுமதியான, கிட்டத்தட்ட 3,000க்கு மேற்பட்ட வேலைத்திட்டங்கள் தெரிவுசெய்யப்பட்டிருக்கின்றன. இந்தத் திட்டங்களினுடைய வெற்றியில் எங்களுடைய கிராம சேவகர் பிரிவுகளிலே இருக்கின்ற மக்களுடைய வருமானம் அதிகரிக்கும் அதேநேரம், இந்த நாட்டினுடைய மொத்த உற்பத்தியும் - GDP - அதிகரிக்கும். அதேநேரம், இன்று உட்கட்டமைப்பு வேலைத்திட்டத்தில் பாரியளவு நிதி கிராமங்களிலுள்ள பாடசாலைகள், முன்பள்ளிகள் மற்றும் அவற்றுக்குத் தேவையான smart classrooms என்பவற்றுக்குச் செலவழிக்கப்பட்டிருக்கின்றது.

அடுத்து, இந்த human capital - மனித மூலதனம் என்று சொல்கின்ற விடயத்திலே இன்று இலங்கை முன்னணியில் இருந்தாலும், வட மாகாணம், கிழக்கு மாகாணம் ஆகியவை இன்னும் பின்னடைந்தே காணப்படுகின்றன. ஆகவே, இந்த அபிவிருத்தித் திட்டங்கள் ஊடாக மறுபடியும் இந்த மனித மூலதனத்தை எங்களுடைய மாவட்டங்களிலும் எங்களுடைய பிரதேசங்களிலும் அதிகரிப்பதற்கான வாய்ப்புகள் இருக் கின்றன. அதேநேரம், இன்று பின்தங்கியுள்ள கிராமங்கள் மற்றைய கிராமங்களின் நிலைமைக்கு முன்னேறி வருவதற்கு மிகப் பெரிய ஓர் ஊன்றுகோலாக இது அமைகிறது.

அதையும்தாண்டி, இன்னும் 40 இலட்சம் ரூபாய் ஒவ்வோர் உள்ளூராட்சிப் பிரிவுக்கும் மக்களுடைய தேவைகளைப் பூர்த்தி செய்வதற்காகக் கட்சி பேதமின்றி ஒதுக்கப்பட்டிருக்கின்றது. அதைவிட, ஒவ்வொரு பிரதேச அபிவிருத்திக்காகவும் நிதிகள் ஒதுக்கப்பட்டிருக்கின்றது. அதாவது, அந்தப் பிரதேசங்களின் நீண்டகாலத் தேவைகளைப் பூர்த்தி செய்வதற்காகவும் மக்களுடைய வாழ்வாதாரங்களை மேம்படுத்துவதற்காகவும் நிதிகள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

இந்தப் பிரதேச அபிவிருத்தியில் நாங்கள் இன்னுமொரு விடயத்தை முக்கியமாகப் பார்க்க வேண்டும். இந்த வரவு செலவுத்திட்டத்தில் எங்களுடைய வீதிகளுக்காகக் கிட்டத்தட்ட 253 பில்லியன் நிதி ஒதுக்கப்பட்டுள்ளது. "வீதிகளுக்கு அதிகளவான நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது" என்பது எதிர்க்கட்சியிலிருப்பவர்கள் பலருடைய குற்றச்சாட்டாகக் காணப்படுகின்றது. இன்னும் சொல்லப்போனால், "வீதிகளைச் சாப்பிட முடியுமா?" என்றுகூடக் கேட்கின்றார்கள். ஆனால், நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். எங்களுடைய பிரதேசங்களிலே, யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட் டங்களிலே 50 - 60 வருடங்களாக வீதிகள் போடப்படாததால், வீதிகள் இருந்ததற்கான எந்தவோர் அடையாளமும் இல்லாத இடங்கள் பல இருக்கின்றன. அதாவது, ஒரு சில இடங்களில் அந்த இடத்தின் வறுமைக்கு அடையாளமாக வீதிகள் இல்லாத கிராமங்கள் இருக்கின்றன. ஆகவே, "ஏன் இந்த வீதிகளைப் போடவேண்டும்?" என்று கேட்பது அர்த்தமற்றது.

இன்றைக்கு நாங்கள் கௌரவ நிதியமைச்சர் அவர்களுடைய 'கிராமத்துடன் ஓர் உரையாடல்' என்ற வேலைத்திட்டத்தின்கீழ் ஒவ்வொரு கிராமமாகப் போகும்போது, அந்தக் கிராம மக்கள் தங்கள் வாழ்வாதாரத்துக்கு ஒதுக்கப்பட்ட நிதியையும் வீதிக்காக ஒதுக்க முடியுமா? என்று கேட்கின்றார்கள். அப்போது நாங்கள் "இல்லை! இல்லை! உங்களுக்கு வாழ்வாதாரத்துக்கு ஒதுக்கப்பட்ட நிதி வாழ்வாதாரத்துக்கு மட்டுமே! நாங்கள் வீதிகளுக்கு வேறாக நிதிகளை ஒதுக்கித் தருகிறோம்" என்று சொன்னோம். அவர்கள் ஏன் இவ்வாறு கேட்கின்றார்கள் என்றால், அவர்களுடைய பிள்ளைகள் சேற்றை மிதிக்காமல் பாடசாலைக்குப் போகவேண்டும் என்று. தங்களுடைய வயல் நிலத்துக்குப் போக வீதி வேண்டும் என்று விவசாயிகள் கேட்கின்றார்கள்; கடற்றொழிலாளர்கள் தங்களுடைய தொழிலைச் செய்வதற்குக் கடலுக்குப் போவதற்கும் தங்களது உற்பத்திகளைச் சந்தைக்குக் கொண்டுசெல்லவும் வீதி வேண்டும் என்று கேட்கின்றார்கள். ஆகவே, இந்த வேலைத்திட்டங்களை நியாயமாகச் செய்து தந்த எங்களுடைய கௌரவ அமைச்சர் ஜோன்ஸ்டன் பர்னாந்து அவர்களுக்கும் என்னுடைய நன்றிகளை இந்த நேரத்தில் தெரிவிக்க விரும்புகின்றேன்.

மேலும், அண்மையில் பெய்த மழையினால் வெள்ளம் வந்தபோது, "வீதிகள் போடுவதால்தான் வெள்ளம் வருகின்றது" என்று சொன்னார்கள். நான் இதில் ஒரு வேடிக்கையான விடயத்தைச் சொல்கிறேன். அதாவது, இந்த வீதிகளுக்கு வாய்க்கால்கள் அமைத்துத் தண்ணீர் ஓட்டங்களைச் சீர்செய்வதுதான் உள்ளூராட்சி மன்றங்களின் வேலை. ஆனால், எங்களுடைய பிரதேசங்களில் இந்த உள்ளூராட்சி மன்ற அதிகாரம் இருப்பது தமிழ்த் தேசியக் கூட்டமைப்பிடம். ஆகவே, அவர்கள் தங்களுடைய வேலையை ஒழுங்காகச் செய்திருந்தால், இன்றைக்கு வெள்ளம் வந்திருப்பதற்கு வாய்ப்பில்லை. அவர்களுடைய வேலையை ஒழுங்காகச் செய்யாதபடியால் அதிக வெள்ளம் வருகின்றது.

ஆனால், வீதி போடுவதால்தான் வெள்ளம் வருகின்றது எனக் குற்றஞ் சொல்கின்றார்கள். நான் ஓர் உதாரணத்தைச் சொல்கின்றேன். அதாவது, யாழ். மாநகரில் கடந்த கிழமை பெய்த மழை உடனடியாக வழிந்து ஓடியது. அது எவ்வாறு? இந்த வருட முற்பகுதியிலே அவர்கள் உண்மையிலே அக்கறைகொண்டு வாய்க்கால்களைத் துப்புரவாக்குவதற்கான பல நடவடிக்கைகளை எடுத்திருந்தார்கள். அதன் காரணமாக நீர் தேங்கி நிற்காது ஓடியது. அதற்காக எங்களுடைய மக்களின் சார்பில் மாநகர சபை முதல்வருக்கும் உறுப்பினர்களுக்கும் அங்கு வேலைசெய்த களப் பணியாளர்களுக்கும் என்னுடைய நன்றிகளை இவ்வேளையிலே தெரிவித்துக்கொள்கின்றேன். அவர்களைப்போன்று அனைத்து உள்ளூராட்சிச் சபைகளும் வேலை செய்தால், நிச்சயமாக நீரும் தேங்கி நிற்காது, மக்களுக்கான வீதிகளும் அழிவடையாமலிருக்கும், எங்களுடைய பிரதேசங்கள் மேலும் அபிவிருத்தியடையும் என்பதைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

தமிழ்க் கட்சிகள் அதிகமாக முன்வைக்கக்கூடிய இன்னுமொரு பாரிய குற்றச்சாட்டு என்னவென்றால், "அரசாங்கத்தின் வேலை அபிவிருத்தி செய்வதுதானே! இவர்கள் ஏன் ஆளுங்கட்சியில் இணைந்துகொண்டு இந்த வேலைத்திட்டத்தைச் செய்யப்போகிறார்கள்?" என்பது. இந்தளவு அபிவிருத்தித் திட்டங்களை நாங்கள் அடுக்கடுக்காகச் சொன்னோம். அதை ஏன் அவர்கள் நல்லாட்சியில் இருக்கும்போது செய்யவில்லை? ஏன் நல்லாட்சி அரசாங்கம் அதைச் செய்யவில்லை? என்று நான் கேட்க விரும்புகின்றேன். அவர்கள் செய்தது வெறுமனே 'கம்பெரலிய' வேலைத்திட்டம் மட்டும்தான். அதாவது, தங்களுடைய விருப்பு வாக்குகளை எப்படி அதிகரிக்க முடியும் என்ற எண்ணத்துடன் அத்தகைய வேலைத்திட்டங்களில் மட்டும்தான் அக்கறைப்பட்டார்களே தவிர, தங்களுடைய சமூகத்தை, தங்களுடைய மாவட்டத்தை, தங்களுடைய நாட்டை எப்படி முன்னேற்றுவது என்பதில் அக்கறைகொள்ளவில்லை. அதுதான் உண்மை!

நல்லாட்சிக் காலத்தில் யாழ்ப்பாணம், கச்சேரியூடாக cooperative development என்ற வகையில் கிட்டத்தட்ட 10,000 இலட்சம் ரூபாய் - 1,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டது. உதாரணமாக, ஓர் அரிசி ஆலையை அமைத்தல், boat போக்குவரத்துக்கான ஏற்பாடு, வாழைக்காய்ப் பொரியல் போன்ற உணவுப் பண்டங்களின் உற்பத்தி போன்ற கூட்டுறவு அபிவிருத்திச் செயற்பாடுகளுக்கென ஒதுக்கப்பட்டது. ஆனால் அவை அனைத்துமே failure. நிதி ஒதுக்கப்பட்டது; அது செலவழிக்கப்பட்டது; அந்த project இனுடைய வெற்றி எங்குமே இல்லை.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අංගජන් රාමනාදන් මහතා**
(மாண்புமிகு அங்கஜன் இராமநாதன்)
(The Hon. Angajan Ramanathan)

சொல்லுங்கோ! என்னுடைய நேரம் குறைவாக இருக்கின்றது.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

உண்மையிலே நீங்கள் அபிவிருத்தி சம்பந்தமாகப் பேசுகின்ற விடயத்தில் நான் குறுக்கிட விரும்பவில்லை. நல்லாட்சி அரசாங்கத்தில் தவறுகள் நடந்திருக்கின்றது என்று சொல்லுகின்ற அதேநேரத்தில், இந்த அரசாங்கத்திலும் அபிவிருத்தி சம்பந்தமாகக் கூட்டப்படுகின்ற கூட்டங்களுக்கு மற்றைய நாடாளுமன்ற உறுப்பினர்கள் அழைக்கப் படுவதில்லை.

**ගරු අංගජන් රාමනාදන් මහතා**
(மாண்புமிகு அங்கஜன் இராமநாதன்)
(The Hon. Angajan Ramanathan)

மற்றைய மாவட்டங்களில் எவ்வாறு நடைபெறுகின்றது என்பதுபற்றித் தெரியவில்லை. ஆனால், யாழ். மாவட்டத்தில் நாங்கள் அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களையும் அழைத்துத்தான் எங்களுடைய வேலைத்திட்டங்களைச் செய்கின்றோம். ஏனென்றால், எங்களுடைய அபிவிருத்தியைத் தனி ஒருவர் செய்ய முடியாது; இந்த அரசாங்கமும் வெறுமனே தனியாகச் செய்ய முடியாது; அனைவரையும் உள்வாங்கித்தான் செய்ய வேண்டுமென்பதில் நாங்கள் மிகவும் தெளிவாக இருக்கிறோம்.

நான் சொன்னதுபோல், யாழ்ப்பாணம் கச்சேரியால் cooperative sectorக்குக் கொடுக்கப்பட்ட இந்த 1,000 மில்லியன் ரூபாய் நிதி முழுமையாக அநியாயமாக்கப்பட்டு, இன்று அந்தத் திட்டமும் இல்லை; அந்தத் திட்டத்தால் மக்களுக்குப் பயனுமில்லை. அதில் பாரிய ஊழல் நடைபெற்று அந்த நிதி வீணடிக்கப்பட்டிருக்கின்றது. அதேமாதிரித்தான் RBC Plantக்கு வந்த நிதியும் பாரிய ஊழலில் சிக்கி, அந்தப் பணமும் செலவழிக்கப்பட்டிருக்கின்றது. ஆனால், மக்களுக்கு எந்தவகையிலும் பயன்படவில்லை. இப்படியான வேலைத் திட்டங்கள்தான் கடந்த காலத்தில் நடைபெற்றிருக்கின்றன என்பதையும் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, இந்த வரவு செலவுத்திட்டம் சம்பந்தமாக முக்கியமான ஒரு விடயத்தை நான் சொல்ல வேண்டும். யார் யாரெல்லாம் இந்த அரசாங்கத்துக்கு உதவ முன்வருகிறார் களோ, அவர்களுக்கு மேலும் உதவ அது தயாராக இருக்கின்றது என்பது இந்த வரவு செலவுத்திட்டத்திலே தெட்டத்தெளிவாகத் தெரிகின்றது. ஆகவே, நாங்கள் ஓரத்திலிருந்து எங்களுடைய மக்களின் வீழ்ச்சியை, எங்களுடைய பிரதேசத்தினுடைய வீழ்ச்சியை, எங்களுடைய நாட்டினுடைய வீழ்ச்சியை வேடிக்கை பார்க்காமல், அனைவரும் இந்த வரவு செலவுத்திட்டத்தினூடாக வருகின்ற நல்ல திட்டங்களை உள்வாங்கி, எங்களுடைய பிரதேசத்தை, எங்களுடைய மக்களை, எங்களுடைய நாட்டைக் கட்டியெழுப்ப முன்வரவேண்டுமென்று கேட்டுக்கொண்டு, இந்த வரவு செலவுத்திட்டத்தை மக்களுக்குக் கொடுத்த எங்களுடைய நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களுக்கு மனமார்ந்த நன்றியைத் தெரிவித்து, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සූ. නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[மு.ப. 10.48]

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சுதந்திரத்தின் பின்னரான இலங்கையின் 76ஆவது வரவு செலவுத் திட்டமாகவும், இந்த அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத் திட்டமாகவும் சமர்ப்பிக்கப்பட்டிருக்கும் இந்த வரவு செலவுத்திட்டம் தொடர்பாக இன்று நாம் விவாதித்துக் கொண்டிருக்கின்றோம். எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் அங்கஜன் இராமநாதன் அவர்கள் யாழ். மாவட்டத்திலே, கிளிநொச்சி மாவட்டத்தில் நடைபெற்றுக் கொண்டிருக்கின்ற அபிவிருத்தித் திட்டங்கள் சம்பந்தமாக -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව* ගරු නියෝජ්‍ය කථානායකතුමා *මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமைவகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, please continue.

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, “ஏனைய மாவட்டங்களிலே அபிவிருத்தித் திட்டங்களுக்கு அந்தப் பாராளுமன்ற உறுப்பினர்கள் ஒத்துழைக்கின்றார்களோ இல்லையோ என்று தெரியாது” என்று நீங்கள் உங்களுடைய உரையில் கூறியிருந்தீர்கள். வன்னி மாவட்டத்தைப் பொறுத்த வரையில் மாவட்டச் செயலகங்களில் அல்லது பிரதேசச் செயலகங்களிலே அனைத்துப் பாராளுமன்ற உறுப்பினர் களையும் அழைத்து அங்குள்ள அபிவிருத்தித் திட்டங்கள் சம்பந்தமாகவோ, ஏனைய விடயங்கள் சம்பந்தமாகவோ எந்தவித ஆலோசனைகளும் நடாத்தப்படுவதில்லை. மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களைத் தவிர, மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களைத் தவிர, பிரதேச செயலக ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களைத் தவிர, அங்கு வேறு எந்த முக்கிய கூட்டங்களிலும் எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் கலந்துகொள்வதற்கு ஏதுவாக எந்தவித நடவடிக்கைகளும் எடுக்கப்படுவதில்லை. அங்குள்ள இணைத் தலைவர்கள் - மாவட்ட அல்லது பிரதேச ஒருங்கிணைப்புக் குழுத் தலைவர்கள் - அபிவிருத்தி விடயங்களிலே தன்னிச்சையாகத் தாங்களே முடிவெடுத்து வருகின்றார்கள். மக்களால் அதிகப்படியான ஆதரவுடன் தெரிவுசெய்யப்பட்ட, குறிப்பாகத் தமிழ் தேசியக் கூட்டமைப்பினுடைய பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் அரச அதிகாரி களுடன் கலந்துரையாட முடியாதவாறான செயற்பாடு களைச்செய்து, அந்த மாவட்ட மக்களினுடைய பிரச்சினைகள் சம்பந்தமாகப் பேசுவதற்கு, அபிவிருத்தி சம்பந்தமாகப் பேசுவதற்குத் தடையாக இருப்பதோடு, அதற்கான வாய்ப்புக்களையும் வழங்க மறுக்கின்றார்கள் என்பதனை நான் இந்த நேரத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இன்று இந்த நாடு வரலாற்றில் என்றுமில்லாதவாறு பொருளாதாரச் சுமைக்குள்ளும் பொருளாதார நெருக் கடிக்குள்ளும் சிக்கித் திணறிக்கொண்டு இருக்கின்றது. இதிலிருந்து விடுபட அல்லது மீட்சியடைய முடியாதளவுக்கு அனைத்துக் கதவுகளும் மூடப்பட்டுவிட்டன; எந்தக் கடவுளாலும் திறக்கப்பட முடியாத அளவுக்கு இறுக மூடப்பட்டுவிட்டன. அதிசயமான மாற்றங்கள் நிகழ்ந்தாலே தவிர, இந்த நாட்டை மீட்டெடுப்பதென்பது இயலாத விடயமாகத்தான் தென்படுகின்றது. இந்த நாடு இன்று இருண்ட யுகத்திற்குள் சென்றுகொண்டு இருக்கின்றது. பொதுவாக வரவு செலவுத்திட்டத்திற்கு முன்பாக சாமானிய பாமர மக்கள் ஏதாவது சலுகைகள் வழங்கப்படுமா, பொருட்களின் விலைகள் குறைக்கப்படுமா, சம்பள அதிகரிப்புக் கிடைக்குமா எனப் பல எதிர்பார்ப்புக்களுடனேயே காத்துக்கொண்டிருப்பார்கள். ஆனால், இன்று அவர்களின் எண்ணங்களில் மண்ணைத் தூவிவிட்டு, ஏமாற்றங்களை மட்டுமே கொடுத்திருக்கின்றீர்கள். இந்த budgetஐ ஆதரித்துப் பேசுவதற்கோ அல்லது ஆதரித்து வாக்களிப்பதற்கோ முடியாதளவுக்குத்தான் இதனைச் சமர்ப்பித்துள்ளீர்கள். இதற்கு ஆதரவு தெரிவித்துவிட்டு நாங்கள் எங்கள் மாவட்டங்களுக்குச் செல்லமுடியாது, மக்களுக்குப் பதில் சொல்லமுடியாது, கற்களாலும் பொல்லுகளாலும் அடித்துத் துரத்துவார்கள். ஆதரவு கேட்பதற்கான, ஆதரவு வழங்கக்கூடிய ஒரு வரவு செலவுத்திட்டத்தை நீங்கள் தயாரிக்கவில்லை. நடைமுறைக்கு ஒத்துவராத சாதாரண அறிக்கை ஒன்றையே வரவு செலவுத்திட்டமாக வெளியிட்டிருக்கின்றீர்கள்.

இன்று இந்த நாடு மிக மோசமான அரசியல், பொருளாதார, சமூக நெருக்கடிக்குள் புதையுண்டு போய்க் கொண்டிருக்கின்றது. அரசியல் ரீதியாகத் தீர்க்கப்படாத, முடிவுறுத்தப்படாத சிறுபான்மைத் தேசிய இனத்தின் பிரச்சினைகள் விடயத்தில் காட்டப்படும் கால இழுத்தடிப்பும் மெத்தனமான மௌனப்போக்கும் அரசியல் தீர்வுக்கான, பிரச்சினைக்கு முற்றுப்புள்ளியிடலுக்கான அரசின் ஆர்வத்தில் எமக்கான சந்தேகங்களை வலுவாக்கியே செல்கின்றன. தமிழ் மக்கள் எதற்காக ஆயுதம் தூக்கிப் போராடினார்கள்? எதற்காக இரத்தம் சிந்திப் போராடினார்கள்? எதற்காக அத்தனை உயிர்ப்பலித் தியாகங்களைச் செய்தார்கள்? ஈழம் என்ற இந்த மண்ணிலே சுதந்திரமாக, பாதுகாப்பாக, விடுதலை பெற்ற ஓர் இனமாக எங்களுடைய சிங்களச் சகோதர மக்கள் அனுபவிக்கின்ற அத்தனை உரிமைகளையும் தாமும் அனுபவிக்க வேண்டும் என்பதற்காகத்தானே! தெற்கிலுள்ள மக்களுக்குப் பொருளாதாரப் பிரச்சினை முக்கியப் படுத்தப்படுவதுபோல் வடக்கு, கிழக்கில் பொருளாதாரப் பிரச்சினையோடு அரசியல் பிரச்சினையே அதிமுக் கியமானதாகும். 2009ஆம் ஆண்டு மே மாதம் முள்ளிவாய்க்கால் வரை நாம் இழந்த அனைத்தும் அரசியல் காரணங்களுக்காகவே! அரசியல் விடுதலைக்காகவே! அரசியல் உரிமைக்காகவே!

தமிழ் பேசும் மக்களின் அரசியல் பிரச்சினையைத் தீர்ப்பீர்கள் என்று நாம் எண்ணுவதற்கு, நம்பிக்கை கொள்வதற்கு ஆட்சிபீடம் ஏறும் எந்த அரசாங்கங்களுக்கும் சிங்களத் தலைமைகளுக்கும் ஏன் முடியாமல் போயிருக்கின்றது? தமிழர் தரப்புக்களுடன், தமிழ்த்

தலைமைகளுடன் எத்தனை ஒப்பந்தங்கள்! எத்தனை சுற்றுப் பேச்சுவார்த்தைகள் 1956இன் பண்டா - செல்வா ஒப்பந்தம்! பின்னர் டட்லி - செல்வா ஒப்பந்தம்! இப்படியாக இலங்கை - இந்திய ஒப்பந்தம் வரை நாம் ஏமாற்றப்பட்ட வரலாறு தொடர்கின்றது. ஏமாற்றும் கலையில் விற்பன்னர்களான சிங்களத் தலைவர்கள் காலத்துக்குக்காலம் உருவாகிவந் தமையும் இந்த நாட்டின் சாபக்கேடாகத்தான் இருக்கின்றது. இந்திய - இலங்கை ஒப்பந்தம் தமிழ் மக்களின் பாதுகாப்புக்கு ஓரளவேனும் கவசமிட்ட, வடக்கு - கிழக்கு தமிழ் மக்களின் பூர்வீகத் தாயகம் என்பதை உலகிற்கு எடுத்துச்சொன்ன, ஆயுத விடுதலைப் போராட்டத்தினூடாகக் கிடைத்த ஆரம்ப வெற்றி எனவும் அதனூடாகக் கிடைத்த அரசியலமைப்புக்கான 13வது திருத்தம், இனப் பிரச்சினைத் தீர்வுக்காகப் பல தியாகங்களின் பின்னர் கிடைத்த ஆரம்பப் புள்ளி எனவும் கருதி அதனை ஏற்றுச் செயற்பட்ட வரலாறு இன்று பெரும்பான்மைப் பௌத்த மேலாதிக்கச் சிந்தனையாளர்களாலும் பெருந் தேசியவாத ஆட்சியாளர்களாலும் சவப்பெட்டிக்குள் போட்டு ஆணி அடிக்கப்பட்டுக்கொண்டிருக்கின்றது.

1978இல் ஓர் இனத்தின் நலனுக்காக மட்டும், பெரும்பான்மை இனத்தவர்களைத் திருப்திப்படுத்துவதற்காக, சிறுபான்மையினத் தலைவர்களினதும் மக்களினதும் விருப்பு வெறுப்புக்களை நிராகரித்து, அவர்களின் எண்ணங்களை, அபிலாசைகளை, உணர்வுகளை உதறித் தள்ளிவிட்டு எதேச்சதிகாரமாகக் கொண்டுவரப்பட்ட சுதந்திரத்தின் பின்னரான இலங்கையின் இரண்டாவது அரசியலமைப்புக்குப் பதின்மூன்றாவது திருத்தச் சட்டமாகக் கொண்டுவரப்பட்ட மாகாண சபைகள் சட்டத்தைக் கொள்ளிவைத்து எரிக்கும் நிலைக்குத் தள்ளிவிட இன்று இன, மத கோலோச்சும் சிங்கள, பௌத்த தலைவர்கள் முயன்றுகொண்டிருக்கின்றார்கள். 'நல்லாட்சி' என்று கூறிய மைத்திரி - ரணில் கூட்டரசாங்கம் எவ்வாறு தமிழ் மக்களை, தமிழ்த் தலைமைகளை ஏமாற்றி, நாடகமாடி, அரசியல் தீர்வுப் பாசாங்கு காட்டியதோ, அதற்கு முந்திய மஹிந்த ராஜபக்ஷ அரசாங்கம் தீர்வுக்காகவென்று 18 சுற்றுப் பேச்சுவார்த்தைகளை நடாத்தி ஏமாற்றியதோ, அதே நிலைமையைத்தான் தற்போதைய மேதகு ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களும் தொடர நினைக்கின்றார்.

இந்தியாவுடன் நீங்கள் விளையாடவேண்டாம் என்று சொல்வதற்கு நான் தயங்கவில்லை. இந்தியாவுடன் செய்துகொண்ட ஒப்பந்தத்தை நீங்கள் நினைத்தமாதிரித் தூக்கிக் குப்பையில்போட முடியாது. இரு நாடுகளுக் கிடையிலான ஓர் ஒப்பந்தத்தின் விளைவாகத்தான் அரசியலமைப்பிலும் திருத்தம் கொண்டுவரப்பட்டது. இறைமை, தேசியம், நாட்டு நலன், நாட்டுப்பற்று என மூச்சுக்கொரு தடவை முழங்கும் நீங்கள், இலங்கையின் அரசியலமைப்பைப் பேணுகின்றீர்களா, மதிக்கின்றீர்களா? "இலங்கை அரசியலமைப்பை முற்றாகப் பேணிக்காப்பேன்" என்றல்லவா நீங்கள், மேதகு ஜனாதிபதி, கௌரவ பிரதமர் மற்றும் கௌரவ அமைச்சர்கள் எல்லோரும் சத்தியம் செய்து இந்தச் சபையிலே இருக்கின்றீர்கள்! இந்த அரசியலமைப்புக் குள்ளேதானே 13ஆவதாகத் திருத்தப்பட்ட சட்டமும் இருக்கின்றது! அதைப் பேண ஏன் தவறுகின்றீர்கள்? இது இந்த நாட்டுக்கும் இறைமைக்கும் நீங்கள் செய்யும் துரோகம், காட்டிக் கொடுப்பு என உங்களுக்குத் தெரியவில்லையா?

ஐக்கிய நாடுகள் மனித உரிமைகள் ஆணையத்தின் இறுதி அமர்வில் மாகாண சபைகளுக்கு அதிகாரங்களை வழங்கி, தேர்தல்களை நடத்துமாறு சகல நாடுகளும் ஒன்றித்து, இந்தியாவின் நிலைப்பாட்டுக்குச் சாதகமாகத் தீர்மானம் நிறைவேற்றியதை மறந்துவிட்டீர்கள். அங்கே "ஆம்" என்று சொல்லித் தப்பிவிட்டு இங்கு வந்து, ஆணையத்தையும் அனைத்துலக நாடுகளையும் ஏமாற்றப்பார்க்கிறீர்கள். தூரத்துத் தண்ணீர் ஆபத்துக்கு உதவாது; அவசர தாகத்துக்கு உதவாது. எட்டிப் பார்த்தால் கிட்டிய தூரத்தில் தெரியும் இந்தியாவை நம்ப மறுக்கின்றீர்கள். இந்தியாவின் அரசியல், பொருளாதார ரீதியான ஆதரவின்றி இந்த நாட்டை நடத்திச்செல்ல முடியாது. இந்தியா ஒரு தடவை சொன்னால் அது 100 தடவை சொன்னதாகக் கருத முடியும்.

சிறுபான்மைக் கட்சிகள், சிறிய கட்சிகள் பழைய விகிதாசார முறைமையின்கீழ் மாகாண சபைகளுக்கான தேர்தல்களை நடாத்தக் கோருகின்றன. இந்தியாவின் நிலைப்பாடும் அதுவே! எனவே, சிறுபான்மை மக்களின் அரசியல் பிரதிநிதித்துவத்தைப் பூச்சியமாக்கும் விதத்தில் ஜனநாயக அரசியல் உரிமையில் கை வைக்க வேண்டாம் என இங்கு நான் கேட்டுக்கொள்கின்றேன். இருக்கின்ற சொற்ப அரசியல் உரிமைகளையும் பிரதிநிதித்துவ உரிமைகளையும் இழக்க எமது மக்கள் தயாரில்லை. மாகாண சபை மற்றும் உள்ளூராட்சித் தேர்தல்களை உரிய காலத்தில் நடாத்தாது, மக்களின் ஜனநாய வாக்குரிமையைப் பறித்த கடந்த ஆட்சியாளர்கள் எவ்வாறு மக்களால் தூக்கி எறியப் பட்டார்களோ, அதே நிலைமை உங்களுக்கும் வருவதற்கு நாட்கள் செல்லாது. கைவிரல்களின் - பேனாக்களின் புள்ளடியிடல் பலம் 2015இல் உங்களுக்குப் பாடத்தைத் தந்திருக்கும் என நம்புகின்றேன். எனவே, இந்திய - இலங்கை ஒப்பந்தத்துக்கு, அரசியலமைப்புக்கான 13வது திருத்தத்துக்கு - மாகாண சபைகள் முறைமைக்கு முழுமையான ஆதரவை வழங்கி, இந்திய நாட்டுக்கு உங்களால் வழங்கக்கூடிய அதியுச்சக் கௌரவத்தையும் நம்பிக்கையையும் கொடுப்பதற்கு ஏதுவாக உடனடியாக மாகாண சபைத் தேர்தல்களை நடாத்துமாறு நான் கேட்டுக்கொள்கின்றேன். அரசியலமைப்பில் இருக்கின்ற மாகாண சபைச் சட்டங்களை, அதிகாரங்களை மாகாண மக்கள் அனுபவிக்கக்கூடியதாக - பெற்றுக்கொள்ளக்கூடியதாக, முழுமையான அதிகாரங் களுடன் தெரிவுசெய்யப்படும் மக்கள் பிரதிநிதிகளூடாக மக்களின் மாகாண சபையாக அவை ஆட்சிசெய்யும் வகையில், காலந்தாழ்த்தாது தேர்தல்கள் நடத்தப்படவேண்டுமென இங்கே நான் கோரிக்கை விடுக்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எதிர்வரும் 30ஆம் திகதிவரை ஒன்றுகூடல்களுக்குப் புதிதாகத் தடை விதிக்கப்பட்டிருக்கின்றது. சஜித் பிரேமதாஸ அவர்களின் தலைமையிலான எதிர்க்கட்சியினர் கொழும்பிலே பாரிய ஆர்ப்பாட்டமொன்றை நடாத்தவிருப்பதாக எண்ணிப் பேரணிகளையும் போராட்டங்களையும், அதேபோன்று வடக்கு, கிழக்கெங்கும் நாளையிலிருந்து மாவீரர் வாரம் அனுஷ்டிக்கப்பட இருப்பதனால் அந்த நினைவேந்தல்களையும் ஒன்றுகூடல்களையும் தடைசெய்வதற்கு, ஒரே கல்லில் இரண்டு மாங்காய்களாகப் புதிய வர்த்தமானி அறிவித்தலூடாக இந்த அரசாங்கம் முயற்சி செய்வதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாளைய தினம் முதல் 27ஆந் திகதி வரையிலான மாவீரர் வாரத்தில் வடக்கு, கிழக்கிலே தமிழ் இனத்திற்காக இரத்தம் சிந்திய எங்களுடைய உறவுகளை நினைவுகூர்ந்து அஞ்சலி செய்வதற்கு அந்த மாவீரர் களினுடைய உறவுகள் தயாராக இருக்கின்ற இந்த வேளையிலே, அதற்கு நீதிமன்றங்களினால் தடையுத்தரவுகள் பிறப்பிக்கப்பட்டிருக்கின்றன. வடக்கு மாகாணத்திலே இருக் கின்ற ஒவ்வொரு நீதிமன்றத்தினூடாகவும் தடையுத்தரவைப் பெற்று, அந்தந்தப் பிரதேசங்களில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள், முன்னாள் மாகாண சபை உறுப்பினர்கள், பிரதேச சபை மற்றும் உள்ளூராட்சி மன்ற உறுப்பினர்கள்

[ගරු සු. නෝගරාදලිංගම් මහතා]

போன்றவர்களுக்கும் தமிழ்த் தேசியத்தின்பால் பற்றுறுதிகொண்ட தமிழ்த் தேசப்பற்றாளர்களுக்கும் பொலிஸ் நிலையங்களினூடாக notice வழங்கிக்கொண்டிருக் கின்றார்கள். இந்தச் செயற்பாடு எதற்காக?

கடந்த காலங்களிலே நாங்கள் எண்ணற்ற போராளிகளினுடைய உயிர்த் தியாகங்களையும் கோடிக் கணக்கான சொத்து இழப்புக்களையும் சந்தித்திருக்கின்றோம். அத்தகைய போராளிகளினுடைய இழப்புக்காக நாடளாவிய ரீதியில் மட்டுமல்லாது, உலக நாடுகள் முழுவதுமுள்ள ஒவ்வொரு தமிழனும் அஞ்சலி செலுத்துகின்ற இந்த வார நாட்களிலே, 'கொவிட்-19' சுற்றறிக்கையைக் காட்டித் திட்டமிட்டு இப்படியான ஒரு தடையைச் செய்கின்ற மிகவும் கேவலமான ஓர் அரசாட்சியைத்தான் நாங்கள் இங்கே பார்க்கின்றோம். அன்று பல்லாயிரக்கணக்கான மக்கள் எதிர்க்கட்சியினால் ஏற்பாடு செய்யப்பட்ட ஆர்ப்பாட்டத்தில் கலந்துகொண்டபோது அவர்களுக்கு எந்தவித 'கொவிட்' தொற்றுப் பிரச்சினைகளும் ஏற்படுத்தப்படவில்லை. ஆனால் வடக்கு, கிழக்கிலே எங்களுடைய போராளிகளுக்கு, தியாகிகளுக்கு, தமிழ்த் தேசிய வீரர்களுக்கு, மாவீரர்களுக்கு அஞ்சலி செலுத்த முற்படுபடுகின்றவேளையிலே இப்படியான தடைகளை விதித்து முட்டுக்கட்டைகளை இடுகின்றார்கள். நேற்று முன்தினம்கூட மன்னார் மாவட்டத்தின் ஆட்காட்டி வெளியிலே உள்ள மாவீரர் துயிலுமில்லத்தினுடைய பிரதான பொதுச்சுடர் ஏற்றும் பீடம் சில காடையர்களால் காட்டுமிராண்டித்தனமாக அடித்து நொறுக்கப்பட்டது. இந்த நினைவுச் சின்னங்களை அழிப்பதனூடாகத் தமிழ் மக்களினுடைய உணர்வுகளை அழித்துவிடலாம் என்ற எண்ணத்தில் இந்த அரசாங்கமோ அல்லது பாதுகாப்புத் தரப்பினரோ அல்லது அவர்களுக்கு ஆதரவாகச் செயற்பட்டுக் காட்டிக்கொடுக்கின்றவர்களோ செயற்பட்டால், அது ஒருபோதும் நடைபெறப்போவதில்லை.

இந்த நாட்டிலே நாங்களும் ஒரு போராட்ட இயக்கத்தின் பின்னணியிலே வந்தவர்கள் என்ற ரீதியிலே, எங்களுடைய போராட்ட இயக்கத்தினுடைய முதற் களப்பலியாக 36 வருடங்களுக்கு முன்பாக இதே மாதத்தில் எங்களுடைய தளபதி நிக்கலஸ் அவர்கள் வீர மரணத்தைத் தழுவிக்கொண்டதை நினைவுகூர்ந்து நான் இந்த நேரத்திலே இச்சபையிலே அவருக்கு என்னுடைய அஞ்சலியைச் செலுத்திக் கொள்கின்றேன். அதேவேளை, நாங்கள் ஒவ்வொருவரும் எந்த அமைப்பைச் சேர்ந்தவர்களாக இருந்தாலும், எந்தக் கட்சியைச் சேர்ந்தவர்களாக இருந்தாலும், எந்தப் போராட்ட இயக்கங்களைச் சேர்ந்தவர்களாக இருந்தாலும் எங்களுடைய போராட்ட வரலாற்றிலே எங்களுடைய மண்ணினுடைய விடுதலைக்காக, அரசியல் விடுதலைக்காக, பாதுகாப்புக்காக, எங்களுடைய சுதந்திரத்திற்காகப் போராடி மடிந்த ஒவ்வொருவரையும் - ஒவ்வொரு வீரரையும், ஒவ்வொரு போராளியையும் தமிழ்த் தேசிய வீரர்களையும் மாவீரர்களையும் தியாகிகளையும் - நினைவுகூர்ந்து அஞ்சலி செலுத்துவதற்கு எங்களுக்கு உரிமை இருக்கின்றது; எங்களுடைய மக்களுக்கு உரிமை இருக்கின்றது. அதற்கு நீங்கள் எந்தச் சந்தர்ப்பத்திலும் தடைபோடக்கூடாது என்று நான் இந்த அரசாங்கத்தை மீண்டும் வலியுறுத்திக் கேட்க விரும்புகின்றேன்.

இன்று 'ஒரே நாடு, ஒரே சட்டம்' பற்றிப் பேசப்படுகின்றது. அதற்கென ஒரு ஜனாதிபதி செயலணி உருவாக்கப்பட்டுள்ளது. அதில் தமிழ்ப் பிரதிநிதிகள் இல்லை என்பதால் கண்துடைப்புக்காக மூவர் நியமிக்கப்பட்டிருக்கின்றார்கள். அவர்கள் பாவம் என்றுதான் நாங்கள் கூறவேண்டும். ஒரே நாடு, ஒரே சட்டத்திற்கு ஒரு கோட்பாட்டை உருவாக்கி, அதைச் சட்டரீதியாக்கி நடைமுறைப்படுத்துவதுதான் ஆரம்பத்தில் இந்தச் செயலணியின் நோக்கமாக இருந்தது. பல்வேறு தரப்புக்களிலிருந்தும் எதிர்ப்பலைகள் வந்தவுடன், 'செயலணியின் வேலை முன்மொழிவுகளைச் சமர்ப்பிப் பதுதான்' என முடிவெடுத்துள்ளார்கள். இந்தச் செயலணியின் தலைவர் யாரென்று பார்த்தால், கலகொட அத்தே ஞானசார தேரர்தான். நீதிமன்றத்தில் ஒரு குற்றவாளி எனத் தீர்ப்பளிக்கப்பட்டு, தண்டனை பெற்று, பின்னர் பொதுமன்னிப்பின்கீழ் விடுதலையான அவர் இலங்கையின் சட்ட உருவாக்கத்துக்குத் தலைமை வகிக்கப்போகின்றார். இந்தச் சின்னஞ்சிறிய நாட்டில் எத்தனை ஜனாதிபதி செயலணிகள் அமைக்கப்பட்டுள்ளன! 'கொவிட்-19'க்கு ஒரு ஜனாதிபதி செயலணி; அதன் தலைவர் ஓர் இராணுவத் தளபதி. கிழக்கில் தொல்பொருள் இடங்களைப் பாதுகாக்க ஒரு ஜனாதிபதி செயலணி; அதன் தலைவர் எல்லாவல மேதானந்த தேரர் என்ற ஒரு பௌத்த பிக்கு. இயற்கை விவசாயத்துக்கு ஒரு செயலணி! பசுமைப் பொருளாதாரம், காலநிலை மாற்றம் என்பவற்றுக்கு ஒரு செயலணி! இப்படி எத்தனை ஜனாதிபதி செயலணிகள்! எத்தனை ஜனாதிபதி செயலணிகள் இருக்கின்றன என்றும் அவற்றின் தலைவர்கள் யார் யாரென்றும் அமைச்சர்களுக்குத் தெரியுமா? இந்தச் செயலணிகளால் நாட்டில் நடைபெற்ற மாற்றங்கள் என்னவென்று அறிக்கையிடப்படுகின்றனவா?

இலங்கையின் இரண்டாவது அரசியலமைப்பு பௌத்த மதத்துக்கான முன்னுரிமையை யாப்பு ரீதியாக, சட்ட ரீதியாக உறுதிப்படுத்துகின்றது. இந்தப் பௌத்த மேலாதிக்கத்தை இன்னுமின்னும் வலுப்படுத்த ஒரு ஞானசாரர் தேவைப் படுகின்றார். புதிய அரசியலமைப்பு உருவாக்கத்துக்கென நிபுணர் குழு, பாராளுமன்றத் தெரிவுக்குழு என்பன இருக்க, இன்னுமொரு குழு எதற்கு? என்று நான் கேட்க விரும்புகின்றேன். புதிய அரசியலமைப்புக்குச் சமாந்தரமாகப் பிறிதொரு சட்ட அமைப்பு எதைச் சாதிக்கப்போகின்றது? தேவையற்ற தலையீடுகளை, விபரீதங்களைத்தான் இந்த 'ஒரே நாடு, ஒரே சட்டம்' என்ற ஜனாதிபதி செயலணிமூலம் நாட்டு மக்கள் அனுபவிக்கப்போகின்றார்கள் என்பதே உண்மை.

அரசின் முறையற்ற திட்டங்களால் இன்று நிதி இழப்புக்கள், நிதி நெருக்கடிகள் ஏற்பட்டு நாடு அதலபாதாளத்துக்குள் சென்றுகொண்டிருக்கின்றது. 2003இல் திறக்கப்பட்ட அம்பாந்தோட்டை, மத்தள சர்வதேச விமான நிலையத்துக்கு எத்தனை விமானங்கள் வருகின்றன? அதன் ஓடுபாதைகள் நெல் காயவிடப்படும் இடங்களாகப் பாவிக்கப்படுகின்றனவா? 245 மில்லியன் டொலர் எதற்காகச் செலவிடப்பட்டது? அம்பாந்தோட்டை, சூரியவெவ விளையாட்டு மைதானத்தில் எத்தனை விளையாட்டுப் போட்டிகள் நடந்தன? 300 கோடி ரூபாய் செலவு செய்தது எதற்காக? கொழும்பில் தாமரைக்கோபுரம் அமைக்கப் பட்டுள்ளது. வட்டிக்குக் கடன் பெற்று மக்களைக் கடன்காரர்களாக்கி மேற்கொள்ளப்பட்ட இவ்வாறான திட்டமிடாத அபிவிருத்திகளால்தான் நாடு இந்த நிலைமைக்கு வந்துள்ளது.

உள்ளிப்பூண்டு முதல் உரவகைகள், கிருமிநாசினிகள், காய்கறிகள், ஏனைய அத்தியாவசியப் பொருட்கள் என அனைத்துக்கும் தட்டுப்பாடு! அதனூடாக நடைபெறுகின்ற விலை மோசடிகள்! யூரியா ஓர் அந்தரின் விலை 22,000 ரூபாய் வரை செல்கின்றது; அதுகூடக் கிடைப்பதில்லை. விவசாயிகள் உரம் கேட்டு வீதிக்கு வந்தால் துப்பாக்கி தருகிறோம் என்று அரசாங்கம் சொல்கின்றது. இன்று இலங்கையில் விவசாயிகள், மீனவர்கள், ஆசிரியர்கள், தொழிலாளர்கள், ஊழியர்கள்,

மக்கள் என அனைவரும் வீதிக்கு வந்துவிட்டார்கள். இந்த நிலைமையில் அடுத்த வருடம் விவசாயிகள் நெற்செய்கையில் ஈடுபடப்போவதில்லை என்பதை இங்கே நான் தெரிவிக்க விரும்புகின்றேன். இரசாயன உரம், கிருமிநாசினி போன்றவற்றின் தட்டுப்பாடுகளுடன் மழை, வெள்ளம் காரணமாகவும் நாடு முழுவதும் விவசாயிகள் பாதிக்கப் பட்டுள்ளனர். எதிர்பார்த்த அறுவடைகள் கிடைக்கப் போவதில்லை. அவர்கள் கேட்பதை நீங்கள் கொடுத்தே ஆகவேண்டும் என்ற நிலை வரும்; அந்தளவுக்குப் போராட்டம் வீரியம் பெறும். விவசாயிகளுடன் விளையாட முடியாது. அவர்கள் வலுமிக்கவர்கள் என்பதற்கு இந்தியப் பிரதமர் மோடி நேற்றுப் பணிந்ததை இங்கே ஞாபகப்படுத்த விரும்புகின்றேன். இந்திய மத்திய அரசின் 3 வேளாண் சட்டங்களை மீளப் பெறுவதாக நேற்றைய தினம் இந்தியப் பிரதமர் மோடி அவர்கள் அறிவித்திருக்கின்றார். 150க்கும் மேற்பட்ட விவசாயிகளின் உயிரைக் கொடுத்தேனும் அவர்கள் இன்று அந்தப் போராட்டத்தில் வெற்றி பெற்றிருக்கிறார்கள். இங்கும் எமது ஒட்டுமொத்த விவசாயிகள் வீதிக்கு வந்தால், நீங்கள் வீட்டுக்குப் போவதை யாராலும் தடுக்க முடியாது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
Please give me one more minute, Sir.

மலையக மக்களுக்கு வீட்டுத் திட்டத்திற்கென 500 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்கிறீர்கள். இதில் எத்தனை வீடுகளை உங்களால் கட்டிக்கொடுக்க முடியும்? எத்தனை வீடுகள் அவர்களுக்குத் தேவை என்பதைத் தெரிந்துமா நீங்கள் இந்தச் சிறிய தொகையை ஒதுக்குகின்றீர்கள் என்று நான் கேட்கின்றேன்.

அதேபோல், இனப்பிரச்சினைத் தீர்வுக்காக, நிரந்தர சமாதானம் இந்த நாட்டிலே ஏற்பட வேண்டும் என்பதற்காக இந்தப் புதிய அரசாங்கத்துடன், ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷவுடன் நாம் பேசத் தயாராக இருப்பதாகப் பலமுறை தமிழ் மக்களின் சார்பாகக் கோரிக்கை விடுத்துக்கொண்டே இருக்கின்றோம். ஆனால், அரசிடமிருந்து நம்பிக்கை தரும் பதில்கள் இல்லை. நல்லெண்ண வெளிப்பாட்டுக்கான சமிக்ஞை எதுவும் இல்லை. நிபந்தனைகள் இன்றிய பேச்சுவார்த்தைகள்கூடக் கடந்த காலங்களில் பலனேதும் தரவில்லை. எமது மக்களை நாம் ஏமாற்ற விரும்பவில்லை. அரசியலமைப்பில் இருக்கின்ற மாகாண சபை அதிகாரங்களையே வழங்காமல் இருக்கும் உங்களுடன் எப்படிப் பேச முடியும்? மாகாண சபைத் தேர்தலை நடாத்த எவ்வித முன்னாயத்த நடவடிக்கையையும் எடுக்காத உங்களுடன் எப்படிப் பேச முடியும்? நன்றி.

[පූ.භා. 11.08]

**ගරු උදය ගම්මන්පිල මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு உதய கம்மன்பில - வலுசக்தி அமைச்சர்)
(The Hon. Udaya Gammanpila - Minister of Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි ඉන්නේ අර්බුදයක. ඉතිහාසයේ නොවූ විරූ දැවැන්ත අර්බුදයක. ආර්ථික අර්බුදය, විදේශ විනිමය අර්බුදය, උද්ධමනය, විරැකියාව, ශෙවුම් ශේෂ හිඟය, අය වැය හිඟය වාගේ බරපතළ වචනවලින් කථා කළේ නැති වුණාට, ආර්ථික විද්‍යාව තේරෙන්නේ නැති වුණාට, දුප්පත්ම දුප්පත් පුද්ගලයාටත් මේ අර්බුදය ඇඟට දැනෙනවා. කුලියක් සොයා ගන්න දවස පුරාම කම්මලක් කම්මලක් ගානේ ඇවිදලා, වත්තක් වත්තක් ගානේ ඇවිදලා රුපියල් සීයක්වත් සොයා ගන්න බැරිවෙලා, ඇඟ දහඩියෙන් තෙමිලා, කකුල් කඩුත්තුව හැදිලා, ගෙදර බඩගින්නේ ඉන්න පුංචි දරුවෝ සිහිපත් කරමින්, පපුව පිච්චි පිච්චී ගෙදර යන තාත්තා කෙනෙකුට මේ අර්බුදය ඇඟට දැනෙනවා. මල්ලක් අරගෙන කඩේට ගිහිල්ලා, පොළට ගිහිල්ලා බඩු මිල දැකලා අල්ලට බඩු අරගෙන එන්න සිද්ධ වෙන අම්මා කෙනෙකුට මේ අර්බුදය ඇඟට දැනෙනවා. ඒ නිසා මේ අර්බුදය දැන් අපේ සැමගේම ඇඟට දැනෙමින් තිබෙනවා. මේ අර්බුදය විසඳා ගැනීමේ පළමු පියවර වන්නේ, අපි මුහුණ දෙමින් සිටින්නේ දැවැන්ත අර්බුදයකට බව පිළිගැනීමයි. පළමු කොන්දේසිය, අපි අර්බුදයක සිටින බව පිළිගැනීමයි. දුකක් තිබෙන බව පිළිගන්නේ නැත්නම්, දුකෙන් මිදීමේ මාර්ගය සෙවීම එතැන සිද්ධ වන්නේ නැහැ. පැස්බරා වැල්ලේ ඔලුව ගහගෙන "ඕං දැන් මම හැංගුණා" කියලා හිතනවා වාගේ, ඩොලර් අර්බුදයක් නැහැ, මුදල් අර්බුදයක් නැහැ, අපට හොඳට සල්ලි තිබෙනවා කියන මානසිකත්වයෙන් සිටියොත්, අපට මේ අර්බුදයෙන් කවදාවත් ගොඩ යන්න හම්බවෙන්නේ නැහැ. ඒ නිසා තමයි මම ජූනි මාසය තරම් ඈතක, "අපේ රට අද ආර්ථික අර්බුදයක ඉන්නේ, දැවැන්ත විදේශ විනිමය අර්බුදයක් පාමුල ඉන්නේ" කියන කාරණය මේ රටට ප්‍රකාශ කළේ. මොකක්ද මේ අර්බුදය? බරපතළ ආර්ථික න්‍යායන් පැත්තකට දමා ඉතාම සරලව අපි මේ ප්‍රශ්නය තේරුම් ගන්න උත්සාහ කළොත්, අද තිබෙන ප්‍රශ්නය තමයි ආණ්ඩුවට රුපියල් නැහැ; රටට ඩොලර් නැහැ. කොහොමද මේ ප්‍රශ්නය ඇති වුණේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි හරිම ජේත්තුකාර ජාතියක්. ආදායමට වඩා වියදම් කරන්න කැමැති ජාතියක්.

අපි 1955 සිටම ඉදිරිපත් කළේ හිඟ අය වැය. අයට වඩා වැය තිබෙන අය වැය. අය වැය පියවා ගන්න අපි රුපියල්වලින් ණය ගත්තා. එහෙම නම් මේ ණය බර පිළිබඳ අර්බුදයට, අය වැය හිඟය පිළිබඳ අර්බුදයට, ආණ්ඩුවට රුපියල් නැති වීම පිළිබඳ අර්බුදයට 1955 සිට පැවති සැම ආණ්ඩුවක්ම වගකිව යුතුයි. ඒ ආණ්ඩුව කොළ පාටද, නිල් පාටද, රතු පාටද, කහ පාටද, දම් පාටද, ගුරු පාටද කියන එක අදාළ නැහැ. මේ සියලුදෙනා මේ අර්බුදයට අඩුවැඩි වශයෙන් දායකවෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ආදායමට වඩා වියදම් කරනවා කියන්නේ, ණය අරගෙන වියදම් කරනවා කියන්නේ, අනාගත ආදායම දැන් වියදම් කරනවා කියන එකයි; අනාගත පරම්පරාව උගසට තබා අපට අයිති නැති ජීවන මට්ටමක් අප විසින් බුක්ති විඳිමින් සිටිනවා කියන එකයි. 1955 සිට අපි රුපියල්වලින් ණය ගත්තා. නමුත් 1978 සිට මොකද කළේ? බරපතළ ලෙස ඩොලර්වලින් ණය ගන්න පටන් ගත්තා. මේ සැම ආණ්ඩුවක්ම තමන්ගේ ධුර කාලය ගැන කල්පනා කරලා වැඩ කළා මිසක් අනාගතය ගැන හිතුවේ නැහැ. කියමනක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "දේශපාලනඥයා ඊළඟ මැතිවරණය ඉලක්ක කරගෙන තීන්දු ගන්නා අතර, රාජ්‍ය තාන්ත්‍රිකයා ඊළඟ පරම්පරාව ගැන සිතා තීන්දු ගනියි" කියලා. එහෙම බලද්දී, අපේ රටේ රාජ්‍ය තාන්ත්‍රිකයන් ඉඳලා තිබෙන්නේ ඉතාම අතළොස්සක් කියන එක ඉතාම කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පෙබරවාරි 04වැනි දා ජාතික නිදහස් දිනය සමරන්නේ චීනයෙන් ගෙනාපු ජාතික කොඩිය වනලා. නන්දා මාලිනිය වරක් පැවසුවා, "කොඩිය චීනාගේ ඒත් කොඩි ගහ අපගේ" කියලා. එහෙම තමයි අපට උදන් අනන්න සිද්ධ වෙන්නේ. අපි පුංචි කාලයේ බට පතුරු කපලා වෙසක් කූඩු හදන්න වෙසක් උදා වෙනතුරු ඇඹිලි ගනිමින් සිටියා.

[ගරු උදය ගම්මන්පිල මහතා ]

අද වෙසක් සමරන්න අපට වෙසක් කූඩුවත් එන්නේ පිටරටින්. ඒ නිසා විදේශ විනිමය අර්බුදයක් ඇතිවීම පුදුමයක් නොවෙයි. විදේශ විනිමය අර්බුදයක් ඇති නොවුණා නම් තමයි පුදුමය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ කර්මාන්තශාලා විනාශ කරගෙන, රටේ කර්මාන්තකරුවන්ට අත දෙන ප්‍රතිපත්තියක් පවත්වා ගන්නේ නැතුව, "සිරිලක දේ සිරි සැප දේ" කියනවා වෙනුවට "පිටරට දේ සිරි සැප දේ" කියලා දීර්ඝ කාලයක් ගායනා කිරීමේ ආනිසංස තමයි අද අපි බුක්ති විඳිමින් ඉන්නේ.

මේ අර්බුදය කොවිඩ් නිසා ඇති වුණු අර්බුදයක් නොවෙයි. මේක 1955 සිටම මෝරපු අර්බුදයක්. 1978 සිටම තීව්‍ර වුණු අර්බුදයක්. 2019 වන විට ආර්ථික වර්ධන වේගය සියයට 2ට වැටිලා, ණය අනුපාතය සියයට 87ට නැඟලා පෙන්නුම් කළේ මේ අර්බුදයේ රෝග ලක්ෂණ. උණ හැදෙනකොට දැනෙන්න ඕනෑ, ආහ්! ලෙඩක් හැදෙන්න එනවා තමයි කියලා. මේ බෝම්බය කොහොමත් පුපුරන්න තිබුණු බෝම්බයක්. කොවිඩ් නිසා ටිකක් ඉක්මනට පුපුරලා ගියා. අවාසනාවකට ආර්ථික අර්බුදය පුපුරලා හැළෙන විට බලයේ සිටියේ අපේ ආණ්ඩුව. 2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙනුවට සජිත් ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළා නම්, මේ අර්බුදය මතු වෙන්නේ නැද්ද? 2019 වසරේ ආනයන වියදම සහ අපනයන ආදායම අතර පරතරය ඩොලර් බිලියන 8ක්. ණය වාරික සහ පොලී ටිකත් එකතු කළාම ඩොලර් බිලියන 13ක්. මේ ඩොලර් බිලියන 13 පරතරය පියවා ගත්තේ සංචාරක ව්‍යාපාරයෙන්, විදෙස්ගත ශ්‍රමිකයන් එවන ඩොලර්වලින්, ආයෝජකයන් මේ රටට ගෙනාපු ඩොලර්වලින් සහ ඉතුරු ටික ණයට අරගෙන. කොවිඩ් වසංගතය ආවාම, 2020, 2021 වසරවලදී මේ ආදායම් මාර්ග අපට අහිමි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සජිත් ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළා නම් කොවිඩ් වසංගතය එන්නේ නැද්ද? සංචාරක ව්‍යාපාරය බිඳ වැටෙන්නේ නැද්ද? වසරකට පිටරට යන 180,000ක් පමණ -විදෙස් ගතවෙන- රැකියා ලාභීන්ගේ රැකියා අවස්ථා අහිමිවීම සිදු වන්නේ නැද්ද? මේ ලෝක අර්බුදය මඟ හරින්න ඔබට පුළුවන්ද? කවුරු බලයේ හිටියත් මේ අර්බුදයට මුහුණ දෙන්න ඕනෑය කියන එක අපි පිළිගන්න ඕනෑ. ජාතක කථා පොත නම් අපට කියන්නේ, අර්බුදයක් ඇති වුණාම සමඟිවෙලා, වටු කුරුලු රැන දැල ඔසවා ගෙන පියඹා ගිය අයුරින් තමයි මෙවැනි අර්බුදවලට මුහුණ දෙන්න ඕනෑ කියලා. නමුත් අපි එහෙමද? අපි ජාතිවලට බෙදිලා; ආගම්වලට බෙදිලා; පක්ෂවලට බෙදිලා. ඒ මදිවාට පක්ෂ ඇතුළේ පුංචි, පුංචි කල්ලිවලටත් බෙදිලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කරන්නේ ප්‍රශ්නයට උත්තරය හොයනවා වෙනුවට එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගැනීමයි. What we are doing is playing the blame game; blaming each other. That is what we have been doing since Independence. The Hon. Minister of Youth and Sports is not here, but I would like to propose him to declare the "blame game" as our national game because it is an inseparable part of our culture.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විනාශ වන්නේ අපේ රට. මේ විනාශ වෙන්නේ පොහොට්ටු සන්ධානයේ රට නොවෙයි. සජබ, ජවිපෙ, දෙමළ ජාතික සන්ධානය ඇතුළු අපි හැමෝගෙම රට මේ විනාශ වෙන්නේ. ඒ නිසා, "උන්ගේ රට විනාශ වෙනවා, ඔන්න ඔහේ විනාශ වුණාදෙන්. ඒකට අපිත් පොහොර ටිකක් දමනවා" කියලා අපි කාටවත් බලාගෙන ඉන්න බැහැ. මේ රට විනාශ වුණොත් අපි ඔක්කොම විනාශ වෙනවා.

කොවිඩ් වසංගතය තුළ තමන්ගේ දේශපාලනයක් කරලා තමන්ගේ ගොඩ වැඩි කරගන්නේ කොහොමද කියන එක වෙනුවට, අපි ඔක්කොම එකතු වෙලා ලංකාව කොවිඩ් වසංගත තත්ත්වයෙන් ගොඩ දමන්නේ කොහොමද කියන එක ගැන හිතන එකයි මේ මොහොතේ රටට ආදරය කරන දේශපාලනඥයාගේ වගකීම වන්නේ. අද ලෝකය පුරාම සිදු වන්නේ විපක්ෂය, ආණ්ඩුවත් එක්ක එකතු වෙලා කොරෝනා වයිරසය පරාජය කිරීම මිස, කොරෝනා වයිරසයත් එක්ක එකතු වෙලා ආණ්ඩුව පරාජය කිරීම නොවන බව අපි මතක් කරගන්න ඕනෑ. අවාසනාවකට මෙම තීරණාත්මක අවස්ථාවේ අපේ රටේ විපක්ෂය තමන්ගේ වගකීම් අමතක කරලා, සෞඛ්‍ය මාර්ගෝපදේශ දූවිල්ලකටවත් මායිම් නොකර, වෙලක් වෙලක් ගානේ, පාරක් පාරක් ගානේ, හන්දියක් හන්දියක් ගානේ උද්ඝෝෂණ පවත්වමින් කොවිඩ් සිව්වන රැල්ල කරා රට ගෙනයමින් තිබෙනවා. අපේ පුංචි දරු පැටවු වසර දෙකක් තමන්ගේ නිවෙස්වල හිරවෙලා හිටියේ; නිවාස අඩස්සියේ හිටියේ. ඒ අය යන්තම් ගෙදරින් එළියට ඇවිල්ලා, සම වයසේ පාසල් මිතුරන් හඳුනාගෙන සෙල්ලම් කරන්න පටන් ගත්තා විතරයි. ඒ පුංචි දරුවන්ගේ හිතේ තිබෙන සතුට, පුංචි දරුවන්ගේ මූණේ රැඳෙන සිනහව ඔවුන්ගෙන් උදුරා ගන්න එපා කියලා හැමෝගෙන්ම මම ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා. අපිට ඒ වාගේම සිහිපත් විය යුතු දෙයක් තිබෙනවා. අපිට මතකයි, යුද්ධයේ උච්චතම අවස්ථාවේදී අපේ විපක්ෂය හැසිරුණු ආකාරය. ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කිව්වා, අලිමංකඩ යනවා කියලා පාමංකඩ යනවා කිව්වා, තොප්පිගල කියන්නේ නිකම්ම නිකම් කැලයක් කිව්වා. අන්තිමට මොකක්ද වුණේ? යුද්ධයෙන් පසු පැවැත්වුණු පාර්ලිමේන්තු මැතිවරණයේදී -2010 මැතිවරණයේදී- ආණ්ඩුවට මන්ත්‍රී ධුර 144ක් ලබාදීලා -එවකට දැවැන්තම මන්ත්‍රී ධුර ගණන ලබාදීලා- විපක්ෂයට පාඩමක් ඉගැන්වූවා.

කොවිඩ් වසංගතය ආවා. ආණ්ඩුව පාර්ලිමේන්තු මැතිවරණය කල් දැම්මා. විපක්ෂය පාර්ලිමේන්තු මැතිවරණයක් ඉල්ලා උද්ඝෝෂණය කළා, උසාවියට ගියා, තමන්ගේ මිත්‍ර ජාත්‍යන්තර රැළ පාවිච්චි කරලා ආණ්ඩුවට බලපෑම් කළා. ප්‍රතිඵලය වුණේ මොකක්ද? විපක්ෂය වගකීම් විරහිතව හැසිරුණාම, රටේ ජනතාව ආණ්ඩුවට මන්ත්‍රී ධුර 149ක් ලබාදීලා විපක්ෂයට පාඩමක් ඉගැන්වූවා. අද තත්ත්වය එදාට වඩා දරුණුයි.

ජනතාව අපි ගැන තීන්දු දෙන්නේ මේ අර්බුදයේ දී අපි කෙතරම් වගකීම් සහගතව හැසිරෙනවා ද කියන එක බලලායි. මම මේ පූර්විකාව කිව්වේ මෙන්න මේ කාරණය නිසායි. තෙල් සංස්ථාවේ පාලිත සමාගමක සේවය කරලා විශ්‍රාම ගත් අට සමත් සේවකයෙකු විපක්ෂ නායකවරයාගේ ලේකම්වරයෙක් වෙලා විපක්ෂ නායක කාර්යාලයේ ඉඳලා මාධ්‍ය හමු පවත්වමින් රටේ තෙල් හිඟයක් පිළිබඳ, ඉන්ධන අර්බුදයක් පිළිබඳ තමන්ට නොතේරෙන විෂයක් පිළිබඳ කථා කරමින්, මේ රට නොමඟ යවමින් රට අර්බුදයකට තල්ලු කරමින් ඉන්නවා. මේ පුද්ගලයා, වසංගතයෙන්, ආර්ථික අර්බුදයෙන් ඉච්ඡා භංගත්වයට පත්වුණු, අවිශ්වාසයෙන් පෙළෙන ජන මනස සමඟ සෙල්ලම් කරමින් මේ වසංගතය මැද, අයහපත් කාලගුණ මැද ජනතාව ඉන්ධන පිරවුම්හල්වල පෝලිම්වල ගාල් කරමින් ඉන්නවා. ඉන්ධන හිඟයක් පිළිබඳ බොරුව පවසලා මේ පුද්ගලයා වරක් දෙවරක් නොවෙයි, හතර වතාවක් මේ රටේ ජනතාව ඉන්ධනහල් ඉදිරියේ පෝලිම් ගැස්සුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂ නායක කාර්යාලයේ මාධ්‍ය හමුවක් පැවැත්වූවා ම මාධ්‍ය ආයතන සඳහා ඉඩක් වෙන් කරනවා. ඒ තමන්ට වෙන් වූ ඉඩ අවභාවිත කරමින් මේ පුද්ගලයා බොරු බේගල් ඇද බානවා. තමන් විශ්වාස කරන මාධ්‍ය නාළිකාවෙන් ඉන්ධන හිඟයක් ඇති වෙනවා කියලා ප්‍රචාරය

ගියාම රටේම ජනතාව ඉන්ධනහල්වලට යනවා. රටේම ජනතාව එකවර ඉන්ධනහල්වලට ගියාම එතැන දිගු පෝලිමක් ඇති වෙනවා තමයි. සාමාන්‍යයෙන් ඉන්ධන පිරවුම්හලක තෙල් තිබෙන්නේ දවස් දෙක තුනකට සෑහෙන්න. මුළු රටම එක දවසේ ඇවිත් ටැංකිය පිරෙන්න තෙල් ගහ ගත්තාම ඒ ඉන්ධන හලේ තෙල් හිඟයක් ඇති වෙනවා. අපේ යටිතල පහසුකම් තිබෙන්නේ දවස් 6ක් පුරා රටේ තෙල් බෙදන්න. සමස්ත රටේම ඉන්ධන පිරවුම්හල්වල එකම දවසේ තෙල් හිඟයක් ඇති වුණාම නැවත ඒවා යථා තත්ත්වයට ගෙනෙන්න අපට දවස් තුන හතරක් ගත වෙනවා. ඇත්තටම ඉන්ධන හිඟය පිළිබඳ බොරු ප්‍රචාර කළේ නැත්නම් එවැනි තාවකාලික තෙල් හිඟයක්වත් ඇති වෙන්නේ නැහැ. මම දැන් ඔබතුමන්ලාට ඇත්ත කතන්දරය කියන්නම්. සැබෑ තෙල් හිඟයක් ඇති වෙනවා නම්, ඒ තෙල් හිඟය ඇති වෙන්නේ ඉන්ධන පිරවුම්හල්වල නොවෙයි, තෙල් ගබඩාවලයි. තෙල් ගබඩාවලට ඉන්ධන පටවා ගන්න යන බවුසර්වලට තෙල් නැහැ කියලා හරවලා එවනවා නම්, අන්න එතැන තිබෙන්නේ ඇත්තම තෙල් හිඟයක්. එවැනි තෙල් හිඟයක් ඇති වුණෙත් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ඉන්ධන හිඟයක් ඇති වුණේ නැති බවත්, ලෝකයේ බොහෝ රටවල් තමන්ගේ සැපයුම් දාම බිඳ වැටීම නිසා ඉන්ධන අර්බුදයකට, බලශක්ති අර්බුදයකට මුහුණ දී තිබෙන මොහොතේ ශ්‍රී ලංකාවේ අඛණ්ඩ බලශක්ති සැපයුමක් අපි සහතික කරලා තිබෙන බවත් ඉතා විශ්වාසයෙන් මේ රටටත්, ගෞරවනීය පාර්ලිමේන්තුවටත් මම දැනුම් දෙන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පුද්ගලයා ඉන්ධන හිඟයක් ගැන හතර වතාවක්ම අසත්‍ය කිව්වා නේ. ඒවා ඉන්ධන හිඟයෙන් නතර වුණේ නැහැ. මේ පුද්ගලයා 2021 මැයි මාසයේ කිව්වා, තෙල් සංස්ථාවේ කොවිඩ් පොකුරක් ඇති වෙනවා කියලා. ඒකට, "තෙල් පොකුර" කියලා කිව්වා. එහෙම එකක් ඇති වුණාද? නැහැ. ඒ වාගේම, රටේ තෙල් ගවේෂණයට අධිකාරයක් පිහිටුවන්න පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම මේ පුද්ගලයා මාධ්‍ය හමුවක් පවත්වා ගිය මාසයේ කියනවා, ඔන්න! තෙල් සංස්ථාව පෞද්ගලීකරණය කරන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනාවා කියලා. මා මිත්‍ර කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා, තෙල් සංස්ථාව පෞද්ගලීකරණය නොකළ යුත්තේ ඇයි කියන එක සම්බන්ධවයි එතුමාගේ කථාවේදී කිව්වේ. මම එතුමාට කිව්වා, මේ පනත් කෙටුම්පතින් එවැනි දෙයක් වෙන්නේ නැහැ, තෙල් සංස්ථාව කියන වචන දෙකවත් මේ පනත් කෙටුම්පතේ කොතැනකවත් සඳහන් වෙන්නේ නැහැ කියලා. "එහෙම නම්, ඔය TVවල කිව්වේ" කියලා ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්න කරනවා. විපක්ෂයේම මන්ත්‍රීවරුන් රැවටෙන ආකාරයට මේ බොරුව අරගෙන ගියා. ඊළඟට, ඉන්දියානු විදේශ ලේකම්වරයා ලංකාවට ආවාම කිව්වා, "ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික ඉන්දියාවට විකිණීමට මාත් සමඟ ගිවිසුමක් අත්සන් කරන්නයි එතුමා ලංකාවට ආවේ" කියලා. ඔවුන්ට අමතක වුණා, 2003 පෙබරවාරි 7වැනි දා තෙල් ටැංකි 99ම වසර 35කට එවකට පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ඉන්දියාවට දුන්නා කියලා. "එහෙම වුණේ නැහැ; වෙන ගිවිසුමක් තිබෙනවා. දුන්නේ තෙල් ටැංකි 14යි" කියලා කබීර් හෂීම් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා. මම එතුමාට එදා ආරාධනා කළා, "ඒ ටැංකි 14ක් දුන්නු ගිවිසුම ඔබතුමා සභාගත කරන්න, ටැංකි 99ක් දුන්නු ඔබේ ගිවිසුම මම අද සභාගත කරනවා" කියලා මම ඒ ගිවිසුමේ පිටපතක් සභාගත කළා. කබීර් හෂීම් මන්ත්‍රීතුමා ගියා ගියාමයි තවම ඒ ගිවිසුම අරගෙන ආවේ නැහැ; එතුමාට ඒක ගේන්නත් බැහැ. ඇයි, එවැනි ගිවිසුමක් අත්සන් කරලා නැති නිසා. විපක්ෂ නායකතුමා මගේ දීර්ඝ කාලීන මිත්‍රයෙක්; මම බොහෝ කාලයක් තිස්සේ දන්නා කෙනෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මා නැති අතරේ අගමැතිතුමාගෙන් ප්‍රශ්නයක් අසා තිබෙනවා, "පිරිපහදුව වැහුවේ හදිසි මිලදී ගැනීම්වලින් කොමිස් ගහන්න ද?" කියලා. ඊට පස්සේ මම මාධ්‍ය හමුවකදී එතුමාට කිව්වා, මේ මිලදී ගැනීම්වලින් කවුරු හෝ කොමිස් ගහනවා නම් වහාම හෙළි කරන්න කියලා. රටේ විපක්ෂ නායකතුමා එවැනි කථාවක් කියන්නේ සාක්ෂි ඇතිව, වගකීමක් ඇතිව නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have two more minutes.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මම එතුමාගෙන් ඉල්ලීමක් කළා, "වහාම ඒ අයගේ නම් හෙළිකරන්න, ඒ නිලධාරීන් කවුරු හරි කොමිස් ගහලා තිබෙනවා නම් ඔවුන්ට දඬුවම් කරන්න අපි සූදානම්" කියලා. ඒ වාගේම මම කිව්වා, "ඒ තෙල් ගන්නේ කොමිස් ගහලා නම් අනිවාර්යයෙන්ම ඒ තෙල්වල මිල වැඩි වෙන්න ඕනෑ" කියලා. ඇයි? කොමිස් එකත් ඒ මිලට එකතු වෙලා තිබෙනවා නේ. ඒක නිසා මම විපක්ෂ නායකතුමාට ආරාධනා කළා, "අපි මිලදී ගන්න මිලට වඩා අඩු මිලකට තෙල් සංස්ථාවට තෙල් සපයන්න කවුරු හරි අරගෙන එන්න. ඒ පුද්ගලයාගෙන් තෙල් මිලදී ගන්න අපි සූදානම්" කියලා. එතුමා තවම නම් එහෙම ගෙනාවේ නැහැ.

මේක ජාතික අර්බුදයක්, ආණ්ඩුවේ අර්බුදයක් නොවෙයි. මේ අර්බුදයෙන් ගොඩයන්න අපි සමස්ත ජාතියක් විධියට එකට කටයුතු කරමු කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. Next speaker is the Hon. U.K. Sumith Udukumbura. You have 10 minutes.

[පූ.භා. 11.26]

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිංහල-බෞද්ධ තරුණ දේශපාලනඥයෙකු හැටියට ධම්ම පදයේ ගාථාවක් උපුටා දක්වමින් 2022 අය වැය විවාදයේදී මගේ කථාව ආරම්භ කරන්නම්.

> "අසාරෙ සාරමතිනො - සාරෙ චාසාරදස්සිනො; තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡාසංකප්පගොචරා"

"නිසරු දේ සරු දේ ලෙස සිතන්නෝ, සරු දේ නිසරු දේ ලෙස දකින්නෝ, වැරැදි කල්පනා ගොදුරු කරගෙන, සාරත්වයට නොපැමිණෙති" කියන එක තමයි එහි තේරුම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. *[බාධා කිරීමක්]* ධම්ම පදයේ. ඔබතුමා බෞද්ධයෙක් නේද? ගිහිල්ලා බලන්න.

ලෝක කොවිඩ් වසංගතය හමුවේ 2022 වසරට අදාළ අය වැය ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉදිරිපත් කළාම විපක්ෂයට බොහොම රිදිලා තිබෙනවා. විපක්ෂය අද වියරුවෙන් ඉන්නේ. අද උදේ විවාදය පටන් ගත් අනුර දිසානායක මන්ත්‍රීතුමා අසත්‍ය කාරණා ගොඩක් කියලා යන්න ගියා. අපි කියන ඒවා අහගන්න

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

එතුමා සභාවේ හිටියේ නැහැ. එතුමා කිව්වා, රාජපක්ෂවරුන්ට සියයට 50කට වැඩිය අය වැයෙන් මුදල් වෙන් කළා කියලා. මේවා සම්පූර්ණයෙන් අසත්‍ය. සියයට 69ක් වෙන් කළා කිව්වා. වෙන් කරලා තිබෙන්නේ සියයට 29.5යි. ඒකෙනුත් සියයට 15ක් ආරක්ෂක අමාත්‍යාංශයටයි වෙන් කරලා තිබෙන්නේ. ඒවා හැම දාම අය වැයෙන් වෙන් කරන මුදල්. මෙහෙම තමයි අනුර දිසානායකලා මේ රටේ මිනිසුන් තුළ අසත්‍යය වැපුරුවේ. අද ඒ අයට රාජපක්ෂ භීතිකාවක් ඇති වෙලා. වරාය නගරය -Colombo Port City එක- ආරම්භ කරද්දීත් අසත්‍ය කිව්වේ. ලංකාවේම කළු ගල් කඩලා පිරෙව්වත් Colombo Port City එකේ බිම පුරවන්න බැහැ කිව්වා. මහ මුහුදේ කොටසක් පුරවලා අපි ඒක හැදුවා. එය පුරවන්න ලංකාවේම ගල් කැඩුවත් මදි කිව්වා. එහෙමයි එතුමන්ලා කිව්වේ. හැබැයි, රාජපක්ෂලා ඒක හැදුවා. මේ රටේ සිතියමට තවත් කොටසක් එකතු කරලා දුන්නා. ඒක තමයි ඇත්ත.

ඒ විතරක් නොවෙයි, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ලැම්බෝගිනි 12ක් වරායෙන් එළියට දමනවා දැක්කා කිව්වා; ඇහැට දැක්කා කිව්වා. එහෙම තමයි එතුමන්ලා අසත්‍යය වැපුරුවේ. අද මහ ලොකු සුද්දවන්තයෝ වෙන්න හදනවා. මේ රටේ මිනිස්සු මැරිලා ඉපදිලා නැහැ. එතුමන්ලාගේ පක්ෂය 1989දී මේ රටට කරපු විනාශය අපට අමතක නැහැ. 1971 දී ආවේ. ධනපති පන්තිය, නිර්ධන පන්තිය කියලායි ඒ වෙලාවේ මිනිස්සු ඝාතනය කළේ. 1988-89 කාලයේ මොකක්ද කරපු විනාශය? එතුමන්ලා ලජ්ජා නැතිව අද මේ රටේ ආර්ථිකය ගැන කථා කරනවා. ආර්ථිකයට මරු පහර එල්ල කළේ ජනතා විමුක්ති පෙරමුණ. එදා ගමේ තිබුණු ගොවිජන සේවා මධ්‍යස්ථාන ටිකට ගිනි තිබ්බා; බස් ටිකට ගිනි තිබ්බා; රාජ්‍ය දේපළ විනාශ කෙරුවා; කෝච්චි ටික ගිනි තිබ්බා. අද කථා කරනවා, බෞද්ධ ආගම ගැන. අද මහ ලොකු ප්‍රජාතන්ත්‍රවාදී නායකයෝ විධියට පෙනී ඉන්න හදනවා. ගමේ රාජ්‍ය සේවකයෝ ඝාතනය කළා. අහිංසක දෙමව්පියන්ගේ දරුවන් ඉගෙන ගෙන රාජ්‍ය සේවයට බැඳුණාම ඒ අයට වහාම ඉල්ලා අස්වෙන්න කිව්වා. ඉල්ලා අස්වුණේ නැත්නම් මැරුවා. තමන්ගේ මිනී වළ තමන්ටම කපා ගන්න කියලා වෙඩි තියලා ඒකෙම වැළලුවා. එහෙම පහත් විධියට දේශපාලනය කළේ.

අද මේ රටේ මිනිසුන් මුළා කරන්න හදනවා. 1989දී ගමේ ජීවත් වුණු අහිංසක මිනිසුන්ගේ දේපළ කොල්ල කෑවා. කරාබු ටික, රත්රන් ටික කොල්ල කෑවා. ඒ සල්ලිවලින් හොර FB accounts හදාගෙන තිබෙනවා. දැන් කියන්නේ මොකක්ද? සංවර්ධනය ගමෙන් ආරම්භ කරනවා ලු. එදා ඒ කරපු විනාශය මේ රටේ මිනිසුන්ට හොඳට මතකයි. ඒක නිසා තමයි 30ක්ව හිටපු මන්ත්‍රී ගණන තුන දක්වා බැස්සුවේ. රට විකුණද්දී, වරාය විකුණද්දී එක්සත් ජාතික පක්ෂයට එකතු වෙලා ඒකට උදව් කරපු හැටි මේ රටේ මිනිස්සු දැක්කා.

පසු ගිය රජයේ හිටපු සෞඛ්‍ය ඇමති රුපියල් 300ට තිබුණු බෙහෙත රුපියල් 16,700ට තමයි මේ රටට ගෙනාවේ.

අද ආර්ථිකය ගැන කථා කරනවා. එදා රුපියල් 16,000ක් වන බෙහෙත් එක රුපියල් 45,000කටයි ගෙනාවේ. මේ විධියට හොරකම් කරලා රට විනාශ කරපු මහ ලොකු හිටපු සෞඛ්‍ය ඇමතිවරුනුත් එක්ක තමයි අද විපක්ෂයේ ඔක්කොම එකතුවෙලා ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොවිඩ් වසංගතය මුළු ලෝකයම වෙළාගත් මොහොතක, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ රටේ 76වන අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා. අපි ඉන්නේ ඉතාම අමාරු අවස්ථාවකයි. නමුත් එතුමා මේ රට මේ තිබෙන තැනින් ගොඩගන්න අවශ්‍ය වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සඳහා හැම ක්ෂේත්‍රයකටම අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා. 2015 ජනවාරි 08වන දා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සියයට 6.5ක ආර්ථික වර්ධන වේගයක් එක්කයි විපක්ෂයේ මෙතුමන්ලාට රට භාර දුන්නේ. මෙතුමන්ලා අවුරුදු හතරහමාරක් රට පාලනය කරලා, විනාශ කරලා, සියයට 2.5කට ආර්ථිකය වැට්ටුවා. එහෙම විනාශ කරපු රට නැවත ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අද ආරම්භ කර තිබෙනවා. ඒ නිසා අද විපක්ෂය භයවෙලා ඉන්නවා.

මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඊයේ මහින්ද රාජපක්ෂ මහත්මයාට අපහාස කළා. එතුමිය "සඳහිරු සෑය" ගැන කිව්වා; ඉඳ ගත්ත පුටුව ගැන කිව්වා. "සඳහිරු සෑය" හැදුවේ, අවුරුදු 30ක් තිස්සේ යුද්ධයෙන් බැට කාපු, අපව බේරාගත් රණ විරුවන් සිහිපත් කරන්නයි; සඳ හිරු පවතින තාක් කල් අපේ රණ විරුවන්ගේ අභිමානය ආරක්ෂා කරන්නයි; ඒ ගෞරවය ලබා දෙන්නයි. ඒකටත් සෙනඟ ආවාය කියලා මේ මන්ත්‍රීවරු අසත්‍ය කථා කිව්වා. කවුරුවත් සෙනඟ ගෙන්වූයේ නැහැ. මේ රටේ යුද්ධයට ගිය අපේ තරුණයන් -සෙබළුන්- 29,000ක් මැරුණා. ඒ සෙබළුන්ගේ දෙමව්පියෝ මේ ආරංචියට එතැනට ආවා, තමන්ගේ දරුවන්ට තිබෙන ගෞරවය, අභිමානය නිසා. මේවා අල්ලාගෙන මඩ ගහන්න ලැහැස්ති වෙන්න එපා. ඒ වාගේම ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආර්යාව ගැනත් කිව්වා. අපි දැක්කා, එතුමියගේ පක්ෂ නායකයාගේ මැතිනිය කොහොමද හැසිරුණේ කියලා. ආර්යාව වෙන්න කලින් ආර්යාව වෙයි කියලා හිතාගෙන කටයුතු කළ ආකාරය අපි දැක්කා. හැබැයි ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාවත්, එම මැතිනියවත් මේ රටේ එහෙම වැඩ කළේ නැහැ. එතුමිය නිවැරදි ආදර්ශයක් දුන්නා; හොඳ අම්මා කෙනෙක් වුණා; හොඳ බිරිඳක් විධියට රටටම ආදර්ශයක් දුන්නා. ඒ නිසා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මඩ ගහන්න ලැහැස්ති වෙන්න එපා.

තමුන්නාන්සේලාගේ පක්ෂයේ ඉන්න ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ තාත්තා එල්ටීටීඊ එක විසින් මරා දැමූ විධිය මතක් කර ගන්න. තමුන්නාන්සේලාගේ නායකයාගේ තාත්තා එල්ටීටීඊ එකට අවි ආයුධ දුන්නා; පොලිසියේ 600ක් යටත් කරලා මැරෙන්න ඉඩ හැරියා. මේ රටේ මිනිසුන්ට ඒවා අමතක නැහැ. එල්ටීටීඊ එකත් එක්ක එහෙම ගනුදෙනු කරපු ප්‍රේමදාස මහත්මයා කෑලි කෑලිවලට වෙන් වන විධියට මැරුවේ මහ පාරේ බෝම්බයක් තියලායි. ඒ කොටියා විනාශ කළේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාය කියන එක තමුන්නාන්සේලා අමතක කරන්න එපා. ඔබතුමන්ලාටත්, මටත් නිදහසේ හුස්ම ගන්න පුළුවන් විධියට මේ රට හදලා දීලා, මේ මුළුමහත් ජාතියටම අභය දානය දුන්නේ වෙන කිසි කෙනෙක් නොවෙයි, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ නිසා තුට්ටුවේ දේශපාලනය කරන්න එපාය කියලා අපි විපක්ෂයට කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විපක්ෂය ගැන අපට හොඳක් කියන්න බැහැ. අවුරුදු හතරහමාරක් රට පාලනය කරමින් මහ බැංකුවෙන් හොරකම් කළා. ඒ විතරක් නොවෙයි. අවසානයේදී බෝම්බ ගහලා මිනිසුන් මැරෙන තුරු ගෙවල්වලට වෙලා බලාගෙන සිටියා. අද මහ ලොකුවට කයිවාරු ගහන හරින් ප්‍රනාන්දුලා තාත්තා කිව්වාය කියලා පල්ලියට යන්නේ නැතිව ගෙදර සිටියේ. ඒවා මේ රටේ මිනිස්සු දන්නවා.

ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, සෞඛ්‍ය බලධාරීන්, රාජ්‍ය සේවකයන්, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය ඇතුළු හැමදෙනාම ඒක රාශි කරගෙන කොවිඩ් වසංගතයෙන් අපේ රට බේරාගෙන, මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කර ගනිමින් ඉදිරියට යද්දී විපක්ෂය මොකක්ද කළේ? විපක්ෂය ඒ වැඩ පිළිවෙළත් කකුලෙන් ඇද්දා.;

ඒකට අපහාස කළා. විපක්ෂය බලාගෙන සිටියේ හතරවටින් මිනී කඳු ගොඩ ගැහෙයි කියලායි. නමුත්, එහෙම වුණේ නැහැ. ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉතාම නිවැරැදිව රට පාලනය කළා.

එතුමා මොන අමාරුකම් මැද්දේ වුණත් මිනිසුන්ගේ ජීවිත බේරාගන්න අවශ්‍ය එන්නත් ටික දුන්නා; අනිකුත් පහසුකම් ටික දුන්නා. රට කාපු විපක්ෂයට මේවා බලාගෙන ඉන්න බැරිව අද මේ සභාවට ඇවිල්ලා මහ ලොකුවට පුරසාරම් දොඩනවා.

මහාමාර්ග අමාත්‍යාංශයට රුපියල් බිලියන 260ක් ලබා දුන්නාම, පාරවල් හදන්නේ කන්නද කියලා ඇහුවා. අපට මතකයි, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ගෙනාවාම, මේ ගොල්ලන් තමන්ට හිතවත් ජාවාරම්කාර කොන්ත්‍රාත්කරුවකුට ඒක දීලා ඒ මාර්ගය ඉදිකිරීම අඩාළ කළා; නැවැත්වූවා; කඩාකප්පල් කළා. හැබැයි, අපේ දිස්ත්‍රික්කයේ නායකයා හැටියට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා කොන්ද කෙළින් තබාගෙන තමන් දරන අමාත්‍යාංශයේ නිවැරැදි තීන්දු අරගෙන, ඒ ජාවාරම්කාර කොන්ත්‍රාත්කරු ඉවත් කරලා නව කොන්ත්‍රාත්කරුවන්ට ඒ කාර්යය භාර දුන්නා. තව සතියක් යද්දී අපේ රටට, අපේ ජාතියට තවත් අධිවේගී මාර්ගයක් ලබා දෙනවාය කියන කාරණයත් මම අද විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

එහෙම වැඩ කරද්දී, මෙතුමන්ලාට රිදිලා. ගිය සතියේ මාර්ග 1,500ක් ජනතා අයිතියට පැවරුවා. ජනතාව අවුරුදු ගණනක් ඉතා දුෂ්කරව ගමන් ගත් මාර්ග 1,500ක් හදලා, ජනතාවට ලබා දුන්නා. ලබන සතිය හෝ ඊළඟ සතිය වෙද්දි, තවත් මාර්ග 2,500ක් හැදෙනවා. ගමේ අහිංසක මිනිස්සු කැඩිච්ච පාරේ රස්තියාදු වනවා නම් තමයි මෙතුමන්ලා කැමැති. මෙතුමන්ලා අවුරුදු හතරහමාරක් රට පාලනය කළා, අපේ පළාතේ එක පාරක් හැදුවේ නැහැ. ඒක තමයි ඇත්ත. එක පාරක් හැදුවේ නැහැ. හැබැයි, එදා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා හදලා දුන් වැඩ පිළිවෙළ, මගේත් දේශපාලන නායකයා වන අපේ දිස්ත්‍රික්කයේ නායක ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා ඉතා සාර්ථකව සහ නිවැරැදිව අද අපේ රටේ ක්‍රියාත්මක කරනවා. ඒ වෙනුවෙන් විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත්, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාටත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ගෞරවය පුද කරන්න මා කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය විවාදය පටන් ගත් දවසේ ඉඳන් මෙතුමන්ලා කළේ මොකක්ද? ගමට මුදල් වෙන් කළ එකට තමයි මෙතුමන්ලා විරුද්ධ වුණේ. ගමේ ජනතාවට සල්ලි වෙන් කළ එකට ඊයේ රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කිව්වා, ජාවාරම් කරන්න මුදල් දුන්නා කියලා. ගමට දුන්නු සල්ලිවලින් වැඩි කොටසක්, ගමේ අහිංසක ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවන්න දුන්නේ; ගමේ ඉන්න හැම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරන අය නඟා සිටුවන්න දුන්නේ. ධීවර ක්ෂේත්‍රය, පශු සම්පත් ක්ෂේත්‍රය, වැවිලි ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය කියන හැම ක්ෂේත්‍රයක් වෙනුවෙන් තමයි ඒ මුදල් වෙන් කළේ. කොවිඩ් වසංගතය නිසා අපේ ආර්ථිකය කඩා වැටුණා. ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය කඩා වැටුණා. ඒ අය නඟා සිටුවන්න මුදල් වෙන් කළාම, ගම්වල දෙපයින් නැඟී සිටින්න හදන ව්‍යවසායකයන්ට මුදල් ටික වෙන් කළාම ඒකට කියනවා, ජාවාරම් කරන්න මුදල් දුන්නා කියලා. ඒ වාගේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට මුදල් දුන්නා කියලා අපහාස කරනවා.

මමත් ගමකින් ආපු දේශපාලනඥයෙක්. ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා, එහි විපක්ෂ නායක සහ සභාපති හැටියට කටයුතු කරලායි අද මම පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්නේ. අපි ගම්වල මිනිස්සු. අපි ජීවත් වෙන්නේ ගමේ මිනිස්සු එක්ක. අපි ඒ මිනිසුන්ගේ දුක හඳුනනවා. ඒ නිසා තමයි ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ගමේ පුංචි මිනිහාගේ ආර්ථිකය නඟා සිටුවන්න කටයුතු කර තිබෙන්නේ. කිරි ගොවියා, තැඹිලි ගෙඩියක් විකුණන මනුස්සයා, බුලත් විටක් හදලා විකුණන මනුස්සයා, ගමේ සිල්ලර කඩයක් කරන, පලතුරු ටිකක් විකුණන මනුස්සයා නඟා සිටුවන්නයි මේ අය වැයෙන් මුදල් වෙන් කර දී තිබෙන්නේ. විපක්ෂයේ ඔබතුමන්ලා මේවාට ඊර්ෂ්‍යා කරනවා. මේ වෙන කිසි දෙයක් නොවෙයි, කුහකකම. මම විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, කුහක වෙන්න එපා, ඔය පටු දේශපාලනය කරන්න එපා කියලා. සරු දේ සරු විදියට දකින්න කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you. The next speaker is the Hon. (Dr.) Rajitha Senarathne. You have 28 minutes.

[පූ.භා. 11.38]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2022 අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛන සහ ආර්ථික දත්ත ආශ්‍රයෙන් අද රටේ තිබෙන ආර්ථික තත්ත්වය ගැන කෙටි හැඳින්වීමක් කිරීමට මම අද බලාපොරොත්තු වෙනවා.

මුලින්ම මම ගන්නේ අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය. 2020 වර්ෂයේ අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 81.1යි. කාලයක් මේ රටේ ඉහළ, මධ්‍යම ආර්ථිකයක් තිබුණා. 2020 වර්ෂයේදී ඒ ආර්ථිකය පහළ මධ්‍යම ආර්ථිකයක් දක්වා කඩා වැටුණා. ඒ මොකද? අපේ රටේ ඒකපුද්ගල ආදායම කලින් තිබුණා, ඩොලර් 4,000කට වඩා. ඒක -මිනිසුන්ගේ ආදායම- ඩොලර් 3,682ක් දක්වා අඩු වුණා. මහ බැංකුව 2021 වර්ෂයේ ආර්ථික වර්ධනය, සියයට 5ක් ලෙස පුරෝකථනය කර තිබෙනවා. නමුත් ලෝක බැංකුව එය පුරෝකථනය කර තිබෙන්නේ සියයට 3.4යි කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එය පුරෝකථනය කර තිබෙන්නේ සියයට 4යි කියලා. ඒකෙන් තේරෙනවා මහ බැංකුවේ බොහෝ සංඛ්‍යා ලේඛන අතාත්විකයි කියන කාරණය. ඇත්තටම තිබෙන තත්ත්වයට වඩා ඉහළ මට්ටමින් එහි දත්ත තිබෙන්නේ.

ඊළඟට, විරැකියාව. මේ වන කොට විරැකියා මට්ටම සියයට 5.7 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඇත්තටම කලින් විරැකියා මට්ටම සියයට 4.2යි. යුද්ධය පැවැති කාලයේ වුණත් සියයට 4.2ක විරැකියා මට්ටමකින් රට ගෙන යන්න පුළුවන් වුණා. නමුත් අද, විරැකියා මට්ටම සියයට 5.7 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේමයි, උද්ධමනය. වර්ෂ 2020 වනකොට උද්ධමනය සියයට 6.2ක් වෙලා තිබෙනවා. ඒකත් තිබුණේ, සියයට 4ක පමණ ප්‍රමාණයක. නමුත් අද උද්ධමනයත් ඉතා ඉහළ මට්ටමකට යනවා. ආහාරවල උද්ධමනය සියයට 12.2ක් බවට පත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ මුළු වැඩිවීම සියයට 12.2යි.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඒ වාගේම මාසික වැඩි වීම බැලුවොත්, 2021 ජනවාරි වනකොට සියයට 5.6යි; සැප්තැම්බර් වනකොට සියයට 4.5යි. ඒ කියන්නේ, මාසිකව උද්ධමනය වැඩි වීමේ තත්ත්වයක් ඇති වෙලා තිබෙන බවයි. ඒකට ප්‍රධාන හේතුව ආනයන සීමා කිරීමයි.

අය වැය හිඟය ගත්තොත්, මේ අය වැය ලේඛනය අනුව 2019 වර්ෂයේදී අය වැය හිඟය සියයට 9.6යි. වර්ෂ 2020 වනකොට අය වැය හිඟය සියයට 11.1 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඇත්තටම මේ අගයන් මීටත් වඩා වැඩියි. ඇත්ත තත්ත්වය මම පසුව පෙන්වා දෙන්නම්.

2002-2003 කාලයේදී අය වැය හිඟය සියයට 5කට අඩුවෙන් තබා ගත යුතුයි කියා එදා පැවැති අපේ රජය පනත් කෙටුම්පතක් සම්මත කළා. ඒ නිසා අපේ රජය කාලයේ 2016, 2017, 2018 අවුරුදු තුනේදීම අය වැය හිඟය සියයට පහක මට්ටමේ තබා ගත්තා. නමුත් 2019 වර්ෂයේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයත්, 2018 වර්ෂයේ සිදු වූ ආණ්ඩු කුමන්ත්‍රණයත් නිසා 2019 වර්ෂයේදී එම අගය ඊට වඩා ඉහළ මට්ටමකට -සියයට නවයකට විතර- ගියා. මැතිවරණයෙන් පසුව දුන් බදු සහන නිසා, ඇත්තටම කොම්ප්‍රදෝරු ධනපති පන්තියට ලබා දුන් බදු සහන නිසා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 12.6ක් ලෙස තිබුණු බදු ආදායම සියයට 9.2 දක්වා කඩා වැටුණා.

2020 වර්ෂයේදී රාජ්‍ය ණය වශයෙන් අපට ඩොලර් බිලියන 4.3ක් ගෙවන්න තිබුණා. ඒ කියන්නේ, ණය ඩොලර් බිලියන 2.8යි; පොලිය ඩොලර් බිලියන 1.58යි. ඉතිහාසයේ ප්‍රථම වතාවට, 2020 වර්ෂයේදී ණය, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට 101 දක්වා ඉහළ ගියා. ඒ කියන්නේ මේ රටේ ආදායමට වඩා ණය වැඩියි. මුළු ආදායම ගත්තත් ණය ගෙවන්න බැහැ. ණය ගෙවන්න තවත් ණය ගන්න ඕනෑ. රටක් වශයෙන් බැලුවොත්, 2021 අප්‍රේල් වනකොට මුළු ණය ප්‍රමාණය තිබුණා, ඩොලර් බිලියන 35.1ක්, ජාත්‍යන්තර බැඳුම්කරත් එක්ක. ජාත්‍යන්තර බැඳුම්කර සියයට 46.7ක් තිබුණා. 2022 වර්ෂයේදී -ඉදිරි අවුරුද්දේ- ගෙවිය යුතු ණය ඩොලර් බිලියන 5ක් තිබෙනවා. එය මේ අය වැය ලේඛනයෙන් වෙන් කරන්න වෙනවා. නමුත් අද අපේ විදේශ සංචිත අන්තිම පහළටම බැහැලා. අපේ විදේශ සංචිත ගත්තොත්, 2020 අවසාන වනකොට ඩොලර් බිලියන 5.7ක්ව තිබුණා. ඒ අවුරුද්දේ ඩොලර් බිලියනයක Sovereign Bonds ගෙවන්න තිබුණා. ඒකත් ගෙවලා. ඒ වාගේම විදේශ ශ්‍රමික විනිමය ගිය අවුරුද්දේ සාර්ථක මට්ටමක තිබුණා. මොකද, 2020 වර්ෂයේදී එය සියයට 5.8කින් වැඩි වුණා. නමුත් මේ අවුරුද්දේ තත්ත්වය ඉතා නරකයි. මේ අවුරුද්දේ අපට ශ්‍රමිකයන්ගෙන් ලැබෙන විනිමය දැනට සියයට 50කින් අඩු වෙලා තිබෙනවා.

එතකොට මීටත් වඩා අමාරු තත්ත්වයකයි තිබෙන්නේ, වෙළෙඳ හිඟය. ඇත්තටම අපි ආනයනය සීමා කිරීම තුළ වෙළෙඳ හිඟය අඩු කර ගත්තා, සියයට 25කින් පමණ. නමුත් මේවා ඔක්කෝම වෙනස් වන තත්ත්වයක් 2022 වර්ෂයේදී ඇති වෙනවා. ඇත්තටම ගත්තාම 2021 වනකොට මහ බැංකු සංචිත ඉතාම නරක තත්ත්වයකට ගමන් කරනවා. මේ තිබෙන්නේ ඒ වාර්තාව. මෙහි සඳහන්ව තිබෙනවා, "The Central Bank Dollar reserves negative for first time in history." යනුවෙන්. ඉතිහාසයේ ප්‍රථම වරට ඩොලර් සංචිතය බින්දුවට වඩා අඩු ගණනකට ගියා. ඩොලර් මිලියන 400ක් ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇති වුණා. තවත් ණය තිබුණා.

Moody's ආයතනයට අනුව rating එක Caa2 ලෙස මේ රට පහළට දැම්මා. ඒ වාගේම S & P rating එක CCC අංකයට දැම්මා. මොකක්ද, මේ දෙකෙන් කියන්නේ? මේ දෙකේ අගය extremely speculative. ආර්ථිකයේ ඉතාම අවිනිශ්චිත නරකම තත්ත්වයක් තිබෙනවා කියන එකයි කියන්නේ. මේකේ එක කට්ටක් පහු වුණු හැටියේ මොකද වෙන්නේ? ලබන අවුරුද්දට ගෙවන්න තිබෙන ඩොලර් බිලියන පහ ගෙවා ගන්න අපට බැරි වුණොත්, එතැන ඉඳලා අපි කෙළින්ම ඊට පසුව තිබෙන කට්ටයට වැටෙනවා. ඒකට වැටුණොත් මොකද වෙන්නේ? Default imminent with little prospect for recovery. එතැනදී බංකොලොත් වෙනවා, recover වෙන්න ඉතා අපහසු තත්ත්වයකට. මෙන්න මේක තමයි අපේ ආර්ථිකයේ අද තිබෙන තත්ත්වය.

ඒ වාගේම Damocles score එක අනුව - මේක මීට පෙර අපේ මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා පවා ඉදිරිපත් කළා. - මේ අවුරුද්දේ බංකොලොත් රටවලින් ලංකාව අංක එක බවට පත් වුණා. ලෝකයේ බංකොලොත් රාජ්‍යයන් හතක් තිබෙනවා. ඒ රටවල් හතෙන් අංක එකේ නරකම රට ශ්‍රී ලංකාව බව ඔවුන් ඉදිරිපත් කළා. දැන් මම කියනවා, මේ තත්ත්වය ඇති වුණේ කොරෝනා වසංගතය නිසාම නොවෙයි කියලා. අපේ උදය ප්‍රභාත් ගම්මන්පිල ඇමතිතුමා කළ ප්‍රකාශයක් මම අහගෙන හිටියා. එතුමාත් කිව්වා කොරෝනා වසංගතය නිසාම නොවෙයි මේ අර්බුදය ඇති වුණේ කියලා. ඔව්, ඒක මමත් පිළිගන්නවා. මේ අර්බුදය ඇති වී තිබෙන්නේ කොරෝනා වසංගතය නිසා නම් අපට ආසන්න දකුණු ආසියානු රටවලටත් මේක බලපාන්න ඕනෑ. දකුණු ආසියාතික රටවල ඩොලර් එක කොහොමද තිබුණේ කියලා මම පෙන්වන්නම්. 2021 සැප්තැම්බර් වෙනකොට අපේ රටේ රුපියල කඩා වැටීමේ වේගය සියයට 11.9යි; පාකිස්තානයේ සියයට 8යි; බංග්ලාදේශයේ සියයට 0.44යි; නේපාලයේ සියයට 2.48යි; ඉන්දියාවේ සියයට 2.23යි; භූතානයේ 2.48යි; මෝල්ටාව 0.33යි; ඇෆ්ගනිස්ථානයේ සියයට 3.3යි. ඒ කියන්නේ ඇෆ්ගනිස්ථානයටත් වඩා නරක තත්ත්වයකින් ඩොලරයට සාපේක්ෂව අපේ රුපියල කඩාගෙන වැටෙමින් තිබෙනවා. මේ ආසන්න රටවලින් වැඩිම වේගයකින් එවැනි කඩා වැටීමක් සිදු වෙලා තිබෙන්නේ අපේ රටේ. මේ සංඛ්‍යා දෙස බැලුවාම පෙනෙනවා, කොරෝනා වසංගතය නිසාම නොවෙයි මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ කියලා. ඇත්තටම 2021 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා, ඒ මාස ගණන තුළ පමණක් රුපියල කඩාගෙන වැටිලා තිබෙනවා, සියයට 8.9ක වේගයකින්. Euro, Australian Dollar, Sterling Pound, Indian Rupee යන මුදල් ඒකක සියල්ලට සාපේක්ෂව රුපියල කඩා වැටිලා තිබෙනවා. මේ නිසා තමයි රථ වාහන ආනයනය තහනම් කළේ; අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය ලංකාවට ගෙන ඒම නතර කළේ. ඒ වාගේම දැන් අලුතින් ඉදිරිපත් වෙලා තිබෙනවා, ලංකාවට ඩොලර් ගෙන ඒම සඳහා ද්විත්ව පුරවැසියන්ට විශේෂ පොලී අනුපාත. විශේෂ තැන්පත් ගිණුම් ආරම්භ කරලා තිබෙනවා. ආනයන ආදායම්වලට විශේෂ නීති ගේන්න කටයුතු කරලා තිබෙනවා.

මේවාගේම තමයි බදු අය කිරීම. බදු ගැන බැලුවොත්, 2021දී VAT එක සියයට 15 සිට සියයට 18 දක්වා බැංකු පද්ධතියට දමනවා. බැංකුවලට කියනවා, මේක පාරිභෝගිකයාට පටවන්න එපා කියලා. එතකොට බැංකු කරන්නේ මොකක්ද? බැංකු ඒ බද්ද, බද්දක් හැටියට වැඩි කරන්නේ නැහැ. බැංකු ගාස්තු වශයෙන් වැඩි කරනවා. මේක තමයි බැංකු කරන්නේ. බැංකු නොයෙකුත් ඒවාට ගාස්තු අය කරනවා. Loan එකක් ගත්තොත් රුපියල් දහසකට රුපියල් පහක් ගන්නවා. ඒ ගාස්තුව දැන් රුපියල් හයක් කරාවි. VAT එක බද්දක් හැටියට අය නොකළාට බැංකු ගාස්තු වශයෙන් නැවත පාරිභෝගිකයාට ඒක ගලාගෙන එනවා. ඒ වාගේම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට විශේෂ GST එකක් ගෙනැවිත් තිබෙනවා. මෝටර් රථවලට තිබෙනවා. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට දැනට VAT එක තිබෙනවා; TRC

එකේ levy එකක් තිබෙනවා. ඒකට අමතරව තමයි මේ GST එක අය කරන්නේ. මොටර් රථවලට රේගු බදු තිබෙනවා; වරාය ගාස්තු තිබෙනවා; ගුවන් තොටුපළ සංවර්ධන ගාස්තු තිබෙනවා; සංයුක්ත බදු තිබෙනවා. මේවා ගහලා GST එකත් ගහනවා. එතකොට මේ සියල්ලගේම වටිනාකම වැඩි වෙනවා. ඒ එක්කම තිබෙන නරකම ප්‍රශ්නය තමයි, සමාජ ආරක්ෂණ බද්දක් ඉදිරිපත් කර තිබීම. ඒක turnover tax එකක්. ඒක තමන්ගේ ලාභ අලාභ මත නොවෙයි අය කරන්නේ. අවුරුද්දකට රුපියල් මිලියන 120යි. ඒ කියන්නේ, මාසයකට රුපියල් මිලියන 10යි. අද මධ්‍යම පාන්තික ආර්ථිකයක වුණත් කඩයක් දමලා තිබෙන කෙනෙකුට මාසයකට රුපියල් මිලියන 10ක් ලැබෙනවා. ඒ හැමකෙනාටම සියයට 2.5ක් බදු ගෙවන්න වෙනවා. බදු ගෙවන්න වුණාම මොකද වෙන්නේ? ඒක පාරිභෝගිකයා පිටට දමනවා.

මම ස්තුතිවන්ත වෙනවා, සිගරැට්වලට රුපියල් පහක් වැඩි කිරීම පිළිබඳව. මෙච්චර කල් හැම එකටම බදු ගැහුවා. අත්‍යවශ්‍ය බොහෝ ආහාර ද්‍රව්‍යවලට බදු ගැහුවා. නමුත් මේ ආණ්ඩුව ආපු දවසේ සිට කවදාවත් සිගරැට්වලට බදු ගැහුවේ නැහැ; අරක්කුවලට බදු ගැහුවේ නැහැ. අද මුල්වරට සිගරැට් එකක මිල රුපියල් පහකින් වැඩි වෙලා. ඇත්තෙන්ම ආණ්ඩුවක් රුපියල්වලින් මිල වැඩි කරන එක නොවෙයි කරන්න ඕනෑ. ප්‍රතිශතයක් වශයෙන් බද්දක් අය කරන්න ඕනෑ. මම ඒ කාලයේ ආණ්ඩුවට යෝජනා කරලා, දුම්කොළ නිෂ්පාදනවලට සියයට 90ක් බදු ගැහුවා. එතකොට කොම්පැනිය කිව්වා ඒ ගොල්ලන්ගේ ලාභය සියයට 1යි කියලා. අපි පෙන්වලා දුන්නා, නැහැ එහෙම නොවෙයි කියලා. අපි ගැහුවා, සියයට 90ක බද්දක්. මේකෙන් වෙන්නේ මොකක්ද? ආණ්ඩුවට සියයට 7ක් ලාභ එනකොට, ඒ සමාගමට සියයට 10ක ලාභයක් එනවා; සියයට 10ක ලාභයක් කොම්පැනියට ලැබෙනවා. මෙන්න මෙහෙමයි, මේ අය වැයෙන් බදු ගහලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාලයේ අපේ ආණ්ඩුව තිබෙනකොට, ඇමතිවරයා විධියට මම දියවැඩියාව අවම කරන්න පැණි බීමවලට බදු ගැහුවා. කොකාකෝලා, පෙප්සිකෝලා වාගේ බීම හදන සමාගම්වලට බීමවල අඩංගු සෑම සීනි ග්‍රෑම් එකකටම සත 50 ගණනේ බදු ගැහුවා. මේ ආණ්ඩුව මොකක්ද කළේ? ඒක සත 30කට අඩු කළා. මොකටද ඒ? මිනිසුන්ට දියවැඩියාව හදලා, සමාගම්වලට වාසි සලසන්න. ඒ විතරක් නොවෙයි, ඒ ගොල්ලන්ට කිව්වා, පළමුවෙනි සීනි ග්‍රෑම් හයට සත පහක්වත් ගෙවන්න ඕනෑ නැහැ කියලා. මේ සහන දෙන්නේ කාටද? මේ සහන ජනතාවටද, කොම්පැනිකාරයන්ටද? අපි බදු ගැහුවේ කොම්පැනිකාරයන්ට.

ඊළඟට කියනවා, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මුදල් රුපියල් බිලියන අටහමාරක් රජයට ගත්තා කියලා. මොකක්ද මේ කථාවේ ඇත්ත? බිලියන අටහමාරක් කොහෙන්ද ගත්තේ? අපේ රජය ඒ වෙලාවේ රුපියල් බිලියන 12ක් මහ බැංකුවේ රඳවා තබා ගත්තා. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම ගැන හොයන්න ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළා. අපේ එදා හිටපු අග්‍රාමාත්‍යතුමා ඒ ජනාධිපති කොමිෂන් සභාවට ගිහින් සාක්ෂි දුන්නා. ඉතිහාසයේ පළමුවෙනි වරට අග්‍රාමාත්‍යවරයෙක් කූඩුවට නැඟලා සාක්ෂි දුන්නා. හිටපු ජනාධිපතිතුමා තමයි ඒ කොමිසම පත් කළේ. ඒ විතරක් නොවෙයි, සියලු වැරදිකාරයෝ රිමාන්ඩ් කළා. මේ ආණ්ඩුව ආවාට පස්සේ තමයි ඒ අය රිමාන්ඩ් එකෙන් එළියට ආවේ. එතකොට අර්ජුන් මහේන්ද්‍රන්ට Red Notice යැව්වා. අර්ජුන් මහේන්ද්‍රන් ගෙන්වන්නේ නැත්තේ ඇයි කියලා ඇහුවා. දැන් අවුරුදු දෙකක් ගතවුණා, අර්ජුන් මහේන්ද්‍රන්ව ගෙන්වූවාද? මේ සැරේ ඒ රුපියල් බිලියන අටහමාර ගන්න පුළුවන් වුණේ, අපි රුපියල් බිලියන 12ක් තියාගත් නිසා. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ගනුදෙනුව නිසා ආණ්ඩුවට සත පහක පාඩුවක් සිදු වුණේ නැහැ. ඇත්තටම දැන් බිලියන තුනහමාරක් ඇලෝසියස්ලාට ආණ්ඩුව ගෙවනවා, බිලියන අටහමාර ආණ්ඩුව අරගෙන. එතකොට ආදායම් ගත්තා වාගේ. ඒක නේ ඇත්ත කථාව. දැන් ඒ ගොල්ලන්ට රුපියල් බිලියන තුනහමාරක් හම්බ වෙනවා. සත පහක්වත් නැතිව තිබුණු එකට බිලියන තුනහමාරක් හම්බ වුණාම ලොකු දෙයක් නේ. රුපියල් මිලියන 3,500ක්; කෝටි 350ක්. මේකට තමයි කියන්නේ, එකක් පෙන්වලා තව එකක් කරනවා කියලා.

ඊළඟට, රාජ්‍ය ආදායම ගැන බලන්න. පසු ගිය අය වැය ලේඛනයේ ආදායම තිබුණේ කීයද? 2021 අය වැය කථාවේ රටේ ආදායම විධියට තිබුණේ රුපියල් බිලියන 2,029ක්. මේ සැරේ අය වැය ලේඛනයේ ආදායම විධියට සඳහන් කරලා තිබෙන්නේ කීයද? රුපියල් බිලියන 1,561යි. මේක තමයි සත්‍යය. එතකොට බොරුවට ආදායම වැඩි කරලා පෙන්වලා මොකක්ද මේ කරන්නේ? අය වැය හිඟය අඩු කරනවා. මහ බැංකුව සංඛ්‍යා ලේඛන විජ්ජාවෙන් කරන්නේ මොකක්ද? හැමදාම ආදායම ලෙස තිබෙන්නේ රුපියල් බිලියන 1,500 ගණන් තමයි. රුපියල් බිලියන 1,561ක ආදායම, එක පාරටම රුපියල් බිලියන 2,029ක් කරනවා. නමුත් ඇත්ත කථාව මොකක්ද? මේ සැරේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරනවා, ආදායම රුපියල් බිලියන 1,561යි කියලා. බිලියන 500ක් විතර වැඩියෙන් දාලා, එතකොට අය වැය හිඟය කීයද? අය වැය හිඟය බිලියන 1,565යි කියනවා. නමුත්, මේ අවුරුද්දේ අය වැය ලේඛනයේ කියනවා, පෙර අවුරුද්දේ අය වැය හිඟය බිලියන 1,826යි. එතකොට, පෙන්වූවාට වඩා රුපියල් බිලියන 300ක් විතර අය වැය හිඟය වැඩියි. ඒ අනුව ඒක සියයට 8.9 සිට -ගිය අවුරුද්දේ පෙන්වපු ගණන වාගේ- සියයට 11.1කට ගමන් කරනවා.

මේ වාගේම තමයි වියදම් පැත්තත්. පොලී ගෙවීම පෙන්වන්නේ බිලියන 860යි කියලා. ඇත්තටම මෙවර අය වැය ලේඛනයේ කියනවා, 2021 අවුරුද්දට පොලිය වශයෙන් ගෙවලා තිබෙනවා කියලා බිලියන 1,055ක්. ඒ කියන්නේ බිලියන එකසිය ගණනක් වැඩියි. ඒකෙන් මොකක්ද වුණේ?

අනෙක් කාරණය තමයි, මහජන වියදම. නොයෙකුත් සංවර්ධන වැඩ සඳහා මේ සැරෙත් විශාල ගණන් වෙන් කළා නේ. ගිය සැරේ වෙන් කරලා තිබෙනවා, රුපියල් බිලියන 1,070ක්. නමුත් මේ සැරේ අය වැය ලේඛනයේ කියන්නේ මොකක්ද? වියදම. ඒක රුපියල් බිලියන 582යි. ඒ කියන්නේ සංවර්ධනය සඳහා. ගමේ පාරවල් හදන්න අරවා මේවා ඔක්කොම ඒවාට රුපියල් බිලියන 1,070ක් වෙන් කළාට, වියදම් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 582යි. හරියටම සියයට 50ක් විතර. මේක තමයි සත්‍ය කථාව. මේ සැරේ අය වැය ලේඛනයෙනුත් ඔක තමයි වෙන්නේ.

අද ලොකුවට කථා කරනවා, අච්චරක් හම්බවුණා, මෙච්චරක් හම්බවුණා, ගමේ සංවර්ධනයට මෙච්චරක් හම්බ වුණා, මේක ඉතා හොඳයි කියලා. මේ තියෙන ආර්ථික අර්බුදය අනුව ලබන වර අය වැය ලේඛනයෙන් බලන්න පුළුවන්, ඕකෙන් කීයක් ඇත්තටම ගමට ආවාද කියලා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්තොත්, 2020දි අපේ ආදායම සියයට 9.9යි. 2021දි සියයට 9.5යි. 2022දි සියයට 12.3ක් වෙයි කියා පුරෝකථනය කරනවා. මේවා හරිම අතාත්විකයි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත්, බදු ආදායම සාමාන්‍යයෙන් තිබෙන්නේ සියයට 8යි, 8.5යි. ආණ්ඩුව කියනවා, අපි සියයට 10.7කට යනවා කියලා. මේ පෙන්වන්නේ මොකක්ද? අපට මේ අර්බුදයෙන් මිදෙන්න පුළුවන් කියලා තමයි මේ කියන්නේ. නමුත්, මේ වාගේ ඉලක්කම්වලින් කවදාවත් මේ අර්බුදයෙන් මිදෙන්න බැහැ.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

මේ ආර්ථිකයේ තියෙනවා, "උපචිත ක්‍රමය" කියලා එකක්. ඒ මොකක්ද? අය වැයෙන් මේ අවුරුද්දේ මුදල් වෙන් කරනවා. නමුත්, මේ අවුරුද්දේ මුදල් මේ අවුරුද්දේ වියදම් වෙන්නේ නැහැ. ඒ මුදල වියදම් වෙන්නේ 2022 වර්ෂයේදී. ඒ වියදම් වෙච්ච මුදල සඳහන් වෙන්නේ 2022 වර්ෂයට. ඒ අය වැය ලේඛනය 2022ට තමයි වියදම වශයෙන් සලකන්නේ. නමුත්, ඉතිහාසයේ පළමුවැනි වරට මහ බැංකුව මෙහෙම වැඩක් කරනවා. එතුමන්ලා 2020 වසරේ රුපියල් බිලියන 421ක වියදම හංගනවා, 2019 වැය ශීර්ෂයට. එතකොට වෙන්නේ මොකක්ද? අය වැය හිඟය අඩු වෙනවා. ඒ බොරුව අනුව සංඛ්‍යාවලින් අය වැය හිඟය අඩු වෙලා තිබෙනවා. නමුත් යථාර්ථය බැලුවාම, එහෙම අඩුවීමක් නැහැ. මේක කවදාවත් ලංකාවේ නොකරපු වැඩක්. මේ රුපියල් බිලියන 421, 2020 වර්ෂයේ වියදම් කරපු මුදලක්, 2019 වසරේ වියදම් කිරීමට සැලසුම් කරපු ඒවා. ඒක 2019 වර්ෂයට දාලා. එතකොට 2019 Budget එක හදලා ඉවරයි. ඒ රුපියල් බිලියන 421 මේ Budget එකේ කොහේවත් නැහැ. එතකොට අය වැය හිඟය හොඳ තත්ත්වයක තිබෙනවා. මෙවරත් මේ වාගේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අය වැය තුළින් මෙවැනි ආර්ථික තත්ත්වයක් ගැන අද කථා කළාට මේ රට අද කුමන තත්ත්වයකද තිබෙන්නේ?

අපේ රටේ බඩු මිල ඉහළ යන වේගය බලන්න. සීනි ගත්තොත්, අගෝස්තු මාසයේ 8වැනි දා වන විට සීනි කිලෝවක් රුපියල් 140යි; 8වැනි දා ඉඳලා 10වැනි දා වෙනකොට සීනි කිලෝව රුපියල් 180යි; 20වැනි දා වෙනකොට රුපියල් 200යි; 22වැනි දා වෙනකොට රුපියල් 210යි; 24වැනි දා වෙනකොට රුපියල් 220යි. මෙන්න, බඩු මිල ඉහළ යන වේගය.

ඊළඟට බලන්න, එළවලු මිල දිහා. පසුගිය මාසයේ එළවලු මිලයි, මේ මාසයේ එළවලු මිලයි අතර වෙනස බලන්න. බලන්න, බෝංචි මිල. පසුගිය මාසයේ බෝංචි කිලෝවක මිල රුපියල් 240යි. නොවැම්බර් 5වැනි දා වෙනකොට ඒක රුපියල් 340යි. කැරට් කිලෝවක මිල දැන් රුපියල් 190යි, 280යි. මේවායේ මිල වැඩි වුණේ මාසයක් ඇතුළතයි. රුපියල් 80ට තිබුණු බීට්රූට් කිලෝවක් දැන් රුපියල් 150යි. රුපියල් 140ට තිබුණු තක්කාලි කිලෝවක් දැන් රුපියල් 360යි. රුපියල් 150ට තිබුණු රාබු කිලෝවක් දැන් රුපියල් 240යි. රුපියල් 40ට තිබුණු කැකිරි කිලෝවක් දැන් රුපියල් 60යි. රුපියල් 80ට තිබුණු පිපිඤ්ඤා කිලෝවක් දැන් රුපියල් 130යි. මුරුංගා කිලෝවක් රුපියල් 230ට තිබුණා, දැන් රුපියල් 310යි. රුපියල් 230ට තිබුණු කරවිල කිලෝවක් දැන් රුපියල් 390යි. රුපියල් 270ට තිබුණු වම්බටු කිලෝවක් දැන් රුපියල් 330යි. රුපියල් 190ට තිබුණු දඹල කිලෝවක් දැන් රුපියල් 320යි. රුපියල් 350ට තිබුණු දෙහි කිලෝවක් දැන් රුපියල් 810යි. රුපියල් 340ට තිබුණු capsicum කිලෝවක් දැන් රුපියල් 540යි. රුපියල් 170ට තිබුණු ලොකු ලූනු කිලෝවක් දැන් රුපියල් 260යි. රුපියල් 330ට තිබුණු cauliflower කිලෝවක් දැන් රුපියල් 690යි. මේ මාසයක් ඇතුළත සිදු වූ වෙනස්කම්. මාසයකට උද්ධමනය කීයද? මාසයකට උද්ධමනය සියයට 50ක්, 60ක් වෙලා. සමහර ඒවා සියයට 150කින් වැඩි වෙලා. එතකොට කොහොමද මිනිස්සු ජීවත් වෙන්නේ? 2019 ඔක්තෝබර් මාසයේ තිබුණු එළවලු මිලත්, 2021 අගෝස්තු මාසයේ එළවලු මිලත් බලන්න. රුපියල් 244ට තිබුණු රතු ලූනු කිලෝවක් දැන් රුපියල් 432යි. රුපියල් 109ට තිබුණු අර්තාපල් කිලෝවක් දැන් රුපියල් 295යි. රුපියල් 40ට තිබුණු පොල් ගෙඩියක් දැන් රුපියල් 90යි. රුපියල් 320ට තිබුණු පොල්තෙල් බෝතලයක් දැන් රුපියල් 710යි. මේ විධියට, මේ මිල ගණන් ඔක්කෝම අපිට පෙන්වන්න පුළුවන්. මාළු ගත්තොත්, රුපියල් 608ට තිබුණු කෙළවල්ලා කිලෝවක් දැන් රුපියල් 1,380යි. මේ වාගේ හැම පාරිභෝගික ද්‍රව්‍යයකම මිල අද ආකාසෙට වැඩිවෙලා තියෙනවා.

දැන් ආණ්ඩුව තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවෙයි, ප්‍රාදේශීය සභාවලයි විතරයි. ලංකාවේ වෙන කොහේවත් මේ ආණ්ඩුව නැහැ. මෙතුමන්ලා කෑ ගහමින්, චූන් කරමින්, බෙර ගහමින්, නාගසලම් ගහමින් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ වාගේම තමයි, ප්‍රාදේශීය සභාවලත්. මොකද, ඒ ගොල්ලන්ටත් හම්බ කර ගන්න දීලා තිබෙනවා. එතකොට ඒ ගොල්ලොත් ඉන්නවා. ඒ හැර රටේ වෙන කොහේවත් ආණ්ඩුවක් කියලා එකක් නැහැ. දැන් මේ රජය ඒ තත්ත්වයට පත් වෙලා. බලන්න, අපේ පාලන කාලය කොහොමද කියලා.

ඊළඟට, ගොඩනැඟිලි ද්‍රව්‍යවල මිල දිහා බලන්න. එදා රුපියල් 810ට තිබුණු සිමෙන්ති කොට්ටයක් දැන් රුපියල් 1,500යි. රුපියල් 420ට තිබුණු මිලිමීටර් 10 කම්බි දැන් රුපියල් 910යි. රුපියල් 680ට තිබුණු මිලිමීටර් 12 කම්බි දැන් රුපියල් 1,350යි. රුපියල් 200ට තිබුණු යකඩ ඇණ දැන් රුපියල් 400යි. රුපියල් 2ට තිබුණු අඟල් 2 කොන්ක්‍රීට් ඇණ දැන් රුපියල් 5යි. රුපියල් 2,200ට තිබුණු අඟල් භාගයේ ප්ලයිවුඩ් බෝඩ් එක දැන් රුපියල් 4,750යි. රුපියල් 720ට තිබුණු 2"x2" කළු ටයිල් එකක් දැන් රුපියල් 1,800යි. රුපියල් 200ට තිබුණු බයින්ඩින් කම්බි කිලෝග්‍රෑම් එකක් දැන් රුපියල් 450යි. කලින්, බාස් කෙනෙකුගේ දවසේ පඩිය රුපියල් 2,000යි. දැන් ඒක රුපියල් 3,000යි. එතකොට මනුස්සයෙක් ගෙයක් හදන්නේ කොහොමද?

ගෑස් මිලත් එහෙම තමයි. 2015 වර්ෂයේ අපි බලයට එනකොට ගෑස් සිලින්ඩරයක් තිබුණේ රුපියල් 2,540ට. අපේ ආණ්ඩුව 2015දී ඒ මිල රුපියල් 1,567 දක්වා අඩු කළා. 2016 වර්ෂය වෙනකොට අපි ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,342ක් දක්වා අඩු කළා. ඒ කියන්නේ, භාගෙට භාගයක් අඩු කළා. රුපියල් දෙදහස්හයසිය ගණනට තිබුණු ගෑස් සිලින්ඩරයක මිල අපි රුපියල් එක්දහස්තුන්සිය ගණනක් දක්වා අඩු කළා. අද ගෑස් සිලින්ඩරයක් කීයද? 2019 වර්ෂය වෙනකොටත් ගෑස් සිලින්ඩරයක් තිබුණේ රුපියල් 1,673ට. ඒ කියන්නේ රුපියල් තුන්සිය ගණනයි වැඩි වෙලා තිබුණේ. අද මිල කීයද? අද ගෑස් සිලින්ඩරයක් රුපියල් 2,675යි. මෙන්න තත්ත්වය.

හැබැයි, සිගරට් මිල වැඩි වුණේ නැහැ. ඒකයි මම මේ පෙන්වන්නේ, ආර්ථිකයේ තත්ත්වය ගැන. 2017දී සිගරට් එක රුපියල් 50 දක්වා වැඩි වුණා. ඒ, අපි සියයට 90ක් බදු ගැහුවාම. 2018දී ඒක රුපියල් 55ක් වුණා. මොකද, අපි බදු ගසා තිබුණේ සියයට 90කින්, රුපියල් පහකින් නොවෙයි. මේ වතාවේ බදු ගහලා තිබෙන්නේ ආදරේට. අපි බදු ගැහුවා, සියයට 90ක්. 2017දී සිගරට් එකක මිල රුපියල් 50යි; 2018දී රුපියල් 55යි; 2019දී රුපියල් 65යි; 2020දීත් රුපියල් 65යි; 2021දීත් රුපියල් 65යි. මේ ආණ්ඩුව පත් වුණාට පසුවත් සිගරට් එකේ මිල එහෙමමයි. කොම්පැනිකාරයන්ට ෂෝක්. මම මේ කිව්වේ පාරිභෝගික භාණ්ඩවල මිල ගැන විස්තරයක්.

අපි 2015දී බලයට පත් වුණාම, අපේ ආණ්ඩුවට බැන්නා. නමුත්, බැණුම් අහපු අපේ ආණ්ඩුව මේ රටේ ජනතාවට ලබා දුන් භාණ්ඩ මිල සහනය ගැනත් බලන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි තුනක් ලබා දුන්නා, අපේ ගරු දිගම්බරම් මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Including that, you have only two more minutes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රාජිත සේනාරත්න මැතිතුමාට තව විනාඩි තුනක කාලයක් ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
අපි බලයට එනකොට කිරිපිටි පැකට් එක තිබුණේ රුපියල් 410ට, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි ඒක අඩු කළා, රුපියල් 325ට. අපි මැතිවරණයේදී පොරොන්දු වුණා, අත්‍යවශ්‍ය ආහාර වර්ග 10ක මිල අඩු කරනවා කියලා. අපි ආහාර ද්‍රව්‍ය 13ක මිල අඩු කළා, දැන් මා ඉදිරිපිට සිටින හිටපු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවපු ආණ්ඩුව තුළ. කිරිපිටි පැකට් එකක් තිබුණේ රුපියල් 410ට. අපි ඒ මිල රුපියල් 325ට අඩු කළා. රුපියල් 162ට තිබුණු පෙට්‍රල් ලීටරය අපි රුපියල් 117ට ගෙනාවා. රුපියල් 118ට තිබුණු ඩීසල් ලීටරය අපි රුපියල් 95 දක්වා අඩු කළා. රැපියල් 2,650ට තිබුණු ගෑස් සිලින්ඩරයක මිල අපි රුපියල් 1,431ට ගෙනාවා. රුපියල් 110ට තිබුණු භූමිතෙල් අපි රුපියල් 44ට ගෙනාවා. රුපියල් 275ට තිබුණු සැමන් රුපියල් 125ට ගෙනාවා. රුපියල් 120ට තිබුණු පාන් පිටි රුපියල් 85ට ගෙනාවා. රුපියල් 240ට තිබුණු පරිප්පු රුපියල් 130ට දුන්නා. රුපියල් 600ට තිබුණු කොත්තමල්ලි අපි රුපියල් 325ක් කළා. විදුලි බිල සියයට 25කින් අඩු කළා. ඊළඟට, රාජ්‍ය සේවකයන්ගේ වැටුප අපි රුපියල් 10,000කින් වැඩි කළා. සමෘද්ධිය දෙගුණ කළා. මහපොළ ශිෂ්‍යත්වය දෙගුණ කළා. රුපියල් 2,500ක් වූ වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව රුපියල් 3,500ක් කළා. දැන් මේ බඩු මිල වැඩි වී තිබෙන්නේ කොරෝනා නිසාද? එහෙම නම්, අපට ආසන්න රාජ්‍යවලත් මෙහෙම වෙන්න එපායැ.

බලන්න, මාලදිවයිනේ තත්ත්වය. අපේ රටේ හාල් කිලෝ එක රුපියල් 105 වෙනකොට, මාලදිවයිනේ හාල් කිලෝ එක රුපියල් 52යි. මෙහේ පිටි කිලෝ එක රුපියල් 110ක් වෙනකොට මාලදිවයිනේ රුපියල් 52යි. අපේ රටේ සීනි කිලෝ එක රුපියල් 125යි. ඒ ගොල්ලන්ගේ රුපියල් 65යි. මතක තබාගන්න, මාලදිවයිනේ උපාධිධාරී පළමුවැනි ගුරු පත්වීමට රුපියල් 170,000ක් පඩිය හම්බ වෙන බව. අපේ අයට හම්බවෙන්නේ රුපියල් 32,200යි. මේ නිසා තමයි ගුරුවරු සහ විදුහල්පතිවරු මෙච්චර කල් පාරේ හිටියේ. ඒ ගොල්ලන්ට නොයෙක් කථා කියා බැන්නා. මෙහේ රුපියල් 32,200ක පඩියක් අරගෙන මම මුලින් සඳහන් කළ භාණ්ඩවලට රුපියල් 105, 110, 125 කියන මිල ගණන් ගෙවනකොට, මාලදිවයිනේ රුපියල්වලින් 170,000ක් පඩි අරගෙන ඒ මිනිස්සු ඒ බඩුවලට ගෙවන්නේ රුපියල්වලින් 52යි, 65යි. මෙන්න මේකයි අද තත්ත්වය.

මේ රටේ දරිද්‍රතාව ගැනත් මම වචනයක් කථා කළ යුතුයි. ලෝක බැංකුව කියා තිබෙනවා, ලංකාවේ දරිද්‍රතාව සියයට 11.7ක් කියලා. ඒ කියන්නේ සියයට 12ක් විතර. ඒ අනුව ලංකාවේ ජනගහනයෙන් සියයට 12ක් මේ කාලයේ දිළින්දන් බවට පත් වෙලා. මේ ආණ්ඩුව පත් වුණාට පසු දිළින්දන් ප්‍රමාණය සියයට හතහමාරකින් පමණ වැඩි වෙලා තිබෙනවා. මේකයි ඉතා දරුණු තත්ත්වය. දැන් මේකට කරන්නේ මොකක්ද? කබ්රාල් මහත්මයා, අපේ මිත්‍රයා නේ. එතුමා ලෝස් නැතුව සල්ලි අච්චු ගහනවා. මෙහෙම සල්ලි අච්චු ගහපු කාලයක් මම ඉතිහාසයේ කවදාවත් දැක නැහැ. බලන්න, මේ සල්ලි අච්චු ගැහුවේ කොහොමද කියලා. 2021 සැප්තැම්බර් 15 වැනි දා විතරක් රුපියල් මිලියන 13,092ක සල්ලි අච්චු ගැහුවා.

බුදු අම්මේ! අතත් රිදෙනවා ඇති සල්ලි අච්චු ගහලා. 2021 සැප්තැම්බර් 15වන දා වනකොට මුදල් අච්චු ගහලා තිබෙනවා, රුපියල් ට්‍රිලියන එකහමාරකට වැඩිය. ඒ කියන්නේ, රුපියල් බිලියන 1,550 ගණනක සල්ලි මේ දවස්වල ආණ්ඩුව අච්චු ගහලා තිබෙනවා. මෙහෙම සල්ලි අච්චු ගහපු කාලයක් මම නම් කවදාවත් දැකලා නැහැ. ඇත්තටම අන්තිමට මොකදවෙලා තිබෙන්නේ? "the Sunday Times" පුවත් පතේ "Business Times" අතිරේකයේ සඳහන්වෙලා තිබෙනවා, "Overseas banks refused to honour Sri Lankan LCs" කියලා. මේ තත්ත්වයට අද අපේ රට පත්වෙලා. අද අපේ බැංකුවක LC එකක් පිළිගන්නේ නැහැ. ඒ ගොල්ලන් කියනවා, ජාත්‍යන්තර බැංකුවකින් සහතික කරලා එවන්න කියලා. එතකොට මොකද කරන්නේ? ජාත්‍යන්තර බැංකුවකින් සහතික කරනකොට ජාත්‍යන්තර බැංකුව සියයට 5ක් ඉල්ලනවා. ජාත්‍යන්තර බැංකුවට සියයට 5ක් සල්ලි දෙන්න ඕනෑ. ඒ සියයට 5 ගෙව්වාම කෝටි ගණනක LC එකකට මිලියන,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ආනයනකරු වැඩිපුර සියයට 5ක් ගෙවන්න ඕනෑ. අද අපේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම නොවෙයි, මෙහෙම කියන්නේ. මෙහෙම කියන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. හොඳ හදවතක් තිබෙන, මිනිසුන්ගේ අමාරුව දකින, මිනිසුන් එක්ක ජීවත් වන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වරප්‍රසාදවලට යට වෙන්නේ නැතිව කියපු කථාවක් මම දැන් කියන්නම්. ඒ ප්‍රවෘත්තියේ කියන්නේ මෙහෙමයි.

"ගොවීන් විශාල පිරිසක් විසින් නිර්මාණය කරන ලද මෙම ආණ්ඩුවේ පවතින ක්‍රියාකලාපය හේතුවෙන් ගොවීන් ඉදිරියට රෙදි ඇඳගෙන යන්න බැරි තැනකට පත්ව ඇතැයි, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී නිමල් පියතිස්ස මහතා පවසයි..."

එතුමා එහි කියා තිබෙනවා, "ගොවීන්ගෙන් විශාල ප්‍රමාණයකින් තමයි මේ ආණ්ඩුව නිර්මාණය වුණේ. රට පුරා සියයට 70ට වැඩි ජනගහනය ගොවියෝ. ගොවියෝ නිර්මාණය කළ ආණ්ඩුවක් යටතේ අද අපිට සමාජයට රෙදි ඇඳගෙන යන්න බැරි තැනකට, අපි එළවලා දමන තැනකට, උත්සවයකටවත් ගමකට යන්න බැරි තැනකට, ආණ්ඩුවේ වැඩසටහන් විවෘත කරන්න යන වෙලාවට ගොවියෝ එකතුවෙලා පලවා හරින තත්ත්වයක් දැන් නිර්මාණය වෙලා තියෙනවා." කියලා.

බොහෝ තැන්වල අපි දකිනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට සෙරෙප්පුවලින් ගහනවා. සෙරෙප්පුවලින් ගහන්න ගිහිල්ලා, වාහනයේ දොරවල් වහගෙන බොහොම අමාරුවෙන් පැන ගන්නවා. සමහර තැන්වලදී හෙල්මට් එකෙන් ගහනවා. කුණුහරුපයෙන් බණිනවා. ඒ අසරණ මන්ත්‍රීවරුන් මේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ මෙන්න මේ ආර්ථික තත්ත්වය නිසායි. ඒ නිසා අපි ඔක්කොම එක තැනකට එක්කහුවෙලා, යම් කතිකාවකට එමු. නැත්නම් මේ රට අද පත්වෙලා තිබෙන තත්ත්වයෙන් ගොඩ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ගන්න කාටවත් පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා යම් කතිකාවක් ආරම්භ කරන්න, මේ අය වැය ලේඛනය අවසන් වනකොට මේ රට මෙතැනින් ගොඩ ගන්නේ කෙහොමද කියලා. ඒකට හැම කණ්ඩායමක්ම කැඳවන්න. දේශපාලනඥයන් විතරක් නොවෙයි ගරු මුදල් ඇමතිතුමනි, වෘත්තීයවේදීන්, වාණිජ මණ්ඩල ආදී සියලුදෙනාම වහාම කැඳවලා, ඒ අය සමඟ කථා කරලා, අපි ජාතික කතිකාවකට එමු. එහෙම නැති වුණොත් මේ රටට හෙට දවසේ මොන විනාශයක් සිදු වෙයිද දන්නේ නැහැ. මිනිස්සු කී දෙනෙක් සාගතයෙන් මැරෙයිද දන්නේ නැහැ. එහෙම මිනිසුන් මැරෙද්දී දේශපාලනය කිරීමෙන් අපට කිසිම සුගතියක් ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle. You have 10 minute.

[අ.භා. 12.08]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ඇත්තටම අපි ඉන්නේ ලොකු ආර්ථික ගැටලුවක. විශේෂයෙන්ම මට කලින් කථා කළ ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ බඩු මිල පාලනය කරපු හැටි.

අපි විශේෂයෙන්ම මතක තියා ගන්න ඕනෑ, මේ අවස්ථාව, අපි ගෝලීය වශයෙන් විශාල අර්බුදයකට මුහුණ දෙන වෙලාවක් බව. UNDP ආයතනයේ "COVID-19 Socio-Economic Impact" පිළිබඳව වාර්තාවක සඳහන් කර තිබෙනවා. මම ඒ කාරණය කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමතියි. I quote:

> "The COVID-19 pandemic is far more than a health crisis: it is affecting societies and econ-omies at their core. While the impact of the pandemic will vary from country to country, it will most likely increase poverty and inequalities at a global scale, making achievement of SDGs even more urgent."

මේ කොවිඩ්-19 වසංගතය රටවලට විවිධ ආකාරයෙන් බලපෑම් ඇති කරනවා. ඒ නිසා මේ ගෝලීය ආර්ථික අර්බුදය ලංකාව වාගේ රටකට ඉතා තදින්ම දැනෙනවා කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. තවත් වාර්තාවක් පිළිබඳව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. That is "Revised forecasted GDP growth due to COVID-19 APAC 2020, by country or region" which is published by Statista Research Department on the 09th of November, 2021.

ඒ වාර්තාවට අනුව, ඉන්දියාවේ ආර්ථික වර්ධනය සියයට සෘණ 4.5යි. ජපානයේ සියයට සෘණ 5.8යි. ආසියානු රටවල් 5ක - ඉන්දුනීසියාව, මැලේසියාව, තායිලන්තය, පිලිපීනය, සිංගප්පූරුව- ආර්ථික වර්ධනය එකතු කළ විට එය සියයට සෘණ 2යි. අපේ රටේ ආර්ථික වර්ධනය සියයට සෘණ 3.6යි. මේක අපේ රටේ තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මේ ගෝලීය ආර්ථික ගැටලුව ලංකාවටත් ඒ ආකාරයෙන්ම බලපානවා. ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානය පුරෝකථනය කරලා තිබෙනවා, 2021දී ආර්ථිකය සියයට 3.4කින් වර්ධනය වෙයි කියලා.

විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා, සංචාරක ක්ෂේත්‍රය, සෘජු විදේශ ආයෝජනය, මේ අය වැයේ සඳහන් කර තිබෙන value-added industries හරහා ඉදිරියේදී මේ ආර්ථිකය වර්ධනය වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බඩු මිල ගැනත් කථා කළා. අපි දන්නවා, බඩු මිල වැඩි වෙලා, ගෑස් මිල වැඩි වෙලා, අපි ආනයනය කරන ආහාර ද්‍රව්‍යවල, පාරිභෝගික ද්‍රව්‍යවල මිල ගණන් වැඩිවෙලා තිබෙන බව. ඒක අපේ රටට පමණක් පොදු වෙච්ච දෙයක් නොවෙයි. "The New York Times" වාර්තාවක් මම ඉදිරිපත් කරන්න කැමැතියි. ඒකේ තිබෙනවා "How the World Ran Out of Everything" කියලා. මේ කොවිඩ් වසංගතය ලෝකයටම විශාල බලපෑමක් ඇති කරලා තිබෙනවා. US Newsවල තිබෙනවා කොවිඩ් බලපෑම නිසා බ්‍රිතාන්‍යය තුළ ආහාර බෙදා හැරීමේ, ඉන්ධන බෙදා හැරීමේ ගැටලු ඇති වුණේ කොහොමද කියලා. සිංගප්පූරුවේ "The Straits Times" පුවත් පත මෙසේ වාර්තා කර තිබෙනවා: "Singapore inflation picks up in September as food, electricity and gas prices see sharper rise" මේක තමයි කොවිඩ් වසංගතය නිසා ගෝලීය ආර්ථිකයට ඇති වෙච්ච බලපෑම. එහි තවදුරටත් සඳහන් වෙනවා: "Singapore's consumer prices rose faster last month on the back of sharper increases in electricity and gas prices, food costs and housing rents" කියලා. එම නිසා මේක ලංකාවට පමණක් සුවිශේෂී වෙච්ච බලපෑමක් නොවෙයි කියන එක මම කියන්න ඕනෑ. මේ අය වැය ලොකු ආර්ථික අර්බුදයක් මැද්දේ ගෙනාපු අය වැයක්. ඒක අපි ඇත්තටම පිළිගන්න ඕනෑ.

දරිද්‍රතාව පිළිබඳවත් මේ අය වැයේදී අවධානය යොමු කරලා තිබෙනවා. දරිද්‍රතාව වැඩි වෙන බව අපි කිව්වා. දරිද්‍රතාව වැඩි වෙනකොට ඒක වැඩියෙන්ම කාන්තාවන්ටත් බලපාන බව මේ අවස්ථාවේදී මම මතක් කරනවා. අද සියයට 73ක්ම පිරිමි පුද්ගලයන් විධිමත් ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්නවා. කාන්තාවන්ගෙන් සියයට 35යි. ආදායම අතර ලොකු පරතරයක් තිබෙනවා. කාන්තා මූලික පවුල් සියයට 26ක් තිබෙනවා. එම නිසා මේ දරිද්‍රතාව, ගෝලීය වසංගතයත් එක්ක වැඩි වෙනකොට ඒක කාන්තාවන්ට වැඩි වශයෙන් බලපාන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවර අය වැයෙන් ග්‍රාම නිලධාරි වසමකට මිලියන 3ක් වෙන් කරලා තිබෙනවා. මේ මිලියන 3න් සියයට 40ක්ම කුඩා ව්‍යවසායකත්වය, මධ්‍යම ව්‍යවසායකත්වය සංවර්ධනය කරන්න වෙන් කරන්නය කියන පණිවුඩය පැහැදිලිවම දීලා තිබෙනවා. ප්‍රජා නායකත්වය, ප්‍රජා මූලික සංවිධානවලින් තමයි මේ යෝජනා, තීන්දු, තීරණ ගන්නේ. එම නිසා ග්‍රාම නිලධාරි වසමකට වෙන් වූ මුදල්වලින් සහ මන්ත්‍රී කොට්ඨාසයකට වෙන් වූ මුදල්වලින් සියයට 40ක්ම ව්‍යවසාය සංවර්ධනය වෙනුවෙන් ආර්ථික ශක්තිය ඇති කරන්න පාවිච්චි කරනවාය කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම වෙනුවෙන් දරිද්‍රතාවෙන් පෙළෙන පවුල් සඳහා සහන මල්ලක් ලබා දීමට

මෙවර අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මම හිතන්නේ ඒක ඉතාම හොඳයි. ඒ වාගේම මේ අය වැයෙන් මානව සම්පත, මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මානව ප්‍රාග්ධනය ආරම්භ වෙන්නේ පිළිසිඳ ගැනීමත් එක්ක. එම නිසා මෙතෙක් ගර්භිනී මවුවරුන්ට මාස 10ක් -ගර්භිනී සමයේ මාස 6කුත්, කිරි දෙන සමයේ මාස 4කුත් ඇතුළුව මාස 10ක්- මසකට රුපියල් 10,000 බැගින් වූ පෝෂක ආහාර ලබා ගැනීම සඳහා වෙන් වුණු මුදල තවත් මාස 14කින් දීර්ඝ කරලා මාස 24ක් වෙනතුරු - ගර්භිනී සමයේ සහ කිරි දෙන සමයේ මාස 10කුත් දරුවාට මාස 4 සිට මාස 14 දක්වාත් - අවශ්‍ය පෝෂණය ලබා දීම සඳහා අද මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටක් හැටියට අපි මුදල් වෙන් කරන්නේ අපේ මානව ප්‍රාග්ධනය ශක්තිමත් කරන්න; මානව ප්‍රාග්ධනයේ නිරෝගිකම ආරක්ෂා කර ගන්න. එය ඉතා සාධනීය කාරණාවක් හැටියට මම දකිනවා. අපට ගැටලුවක් තිබෙනවා. අපේ රටේ අද උපදින දරුවන්ගෙන් සම්පූර්ණ විභවයෙන් සියයට 60ක් තමයි අද ළඟා කර ගන්නේ. සියයට 40ක් අපතේ යනවා. විශේෂයෙන්ම අඩු උපත් බර සියයට 17ක්. අවුරුදු 20ක් 30ක් තිස්සේ මේ තත්ත්වය ස්ථාවරව පවතිනවා.

ඒ වාගේම අවුරුදු පහේදී වයසට නියමිත උස නොමැතිකම නිසා දරුවන්ගේ මොළය වර්ධනය ආරම්භයේදීම අඩාළ වෙනවා. ඒ නිසා දරුවන්ගේ ජීවිතයේ පළමුවැනි අවුරුදු දෙකක කාලය තුළ ඔවුන්ගේ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා පෝෂණ මල්ලක් ලබාදීමට මසකට රුපියල් 10,000 බැගින් මුදලක් වෙන් කිරීම අනාගතයේදී මේ රටට කරන විශාල ආයෝජනයක් හැටියට අපි දකිනවා.

ඒ වාගේම ඉතාම සන්තෝෂයෙන් කියන්න ඕනෑ, ගුරු-විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා නිවැරදි කරන්න, අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර තිබෙන බව. මානව ප්‍රාග්ධනයේදී අධ්‍යාපනය ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කළ යුතු වෙනවා. රටක් හැටියට අපි දීර්ඝ කාලීනව ඉදිරියට යන්න නම්, ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම හරහා මානව ප්‍රාග්ධනය ආරක්ෂා කර ගැනීමත්, දියුණු කර ගැනීමත් කළ යුතුයි. තමන්ගේ විභවයෙන් අඩුම ගණනේ සියයට 80ක් දක්වා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම ඉලක්ක කරගත් අය වැයක් හැටියට මා මේ අය වැය දකිනවා. මීට වඩා කථා කරන්න කරුණු තිබුණත්, කාලය සීමිත නිසා ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Jeevan Thondaman. You have 15 minutes.

[පි.ව. 12.17]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා (වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் தொண்டமான் - தோட்ட வீடமைப்பு மற்றும் சமுதாய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Jeevan Thondaman - State Minister of Estate Housing and Community Infrastructure)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்தமைக்காக முதலில் கௌரவ நிதியமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களுக்கு எங்களுடைய பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கடந்த 2021ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் எனது அமைச்சினூடாகப் பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் முன்மொழியப்பட்டன. நான் இந்த நேரத்தில் ஓர் உண்மையைச் சொல்லியாக வேண்டும். அதாவது, இந்தக் காலகட்டத்தில் நாங்கள் நினைத்ததுபோல் வேலைசெய்ய முடியவில்லை. காரணம் என்னவென்றால், கொரோனா என்ற கொடிய தொற்று நோய் எங்களுடைய மக்களை அதிகளவில் பாதித்திருப்பதாகும். இதனால், என்னுடைய அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதியின் பெரும்பகுதி இந்நோயைக் கட்டுப்படுத்துவதற்குப் பயன்படுத்தப்பட்டது. நான் இந்த அமைச்சைப் பொறுப்பேற்ற சந்தர்ப்பத்தில், நுவரெலியா மாவட்டத்தில் நாளாந்தம் கிட்டத்தட்ட 175 கொரோனாத் தொற்றாளர்கள் பதிவானார்கள். இதனால், பொருளாதார ரீதியில் மிகவும் கஷ்டத்தில் இருக்கின்ற எங்களுடைய மக்கள் தனிமைப்படுத்தல் நிலையங்களுக்கும் கொரோனா சிகிச்சை நிலையங்களுக்கும் அனுப்பப்பட்டார்கள். அதன் காரணமாக நாங்கள் முக்கியமான ஒரு முடிவை எடுத்தோம். அதாவது, எனது அமைச்சின்மூலமாக ரம்பொடவிலுள்ள தொண்டமான் கலாசார நிலையத்தையும், தொண்டமான் தொழிற்பயிற்சி நிலையத்தையும் COVID centresஆக மாற்றினோம். அதுமட்டுமல்லாமல், நாங்கள் Maskeliya Hospital ஐயும் Glanken Hospital ஐயும் புனரமைத்தோம். இவ்வாறான நடவடிக்கைகள்மூலம் நாங்கள் நாளாந்தம் பதிவாகின்ற 'கொவிட்' தொற்றாளர்களின் எண்ணிக்கையை 35க்குக் கீழ் பேணிவந்தோம். ஆனாலும், எங்களால் முடிந்தளவு அபிவிருத்திகளைச் செய்தோம்.

இந்த நேரத்தில் கௌரவ அமைச்சர் ஜோன்ஸ்டன் பர்னாந்து மற்றும் கௌரவ இராஜாங்க அமைச்சர் நிமல் லான்சா ஆகியோருக்கு என்னுடைய நன்றியைத் தெரிவித்தாக வேண்டும். ஏனென்றால், நீண்ட காலமாக மலையகத்தில் பாதை அபிவிருத்தி நடைபெறாதிருந்த நிலையில், சனாதிபதி யின் வழிகாட்டலின்கீழ் அவர்களுடைய அமைச்சுக்களின் மூலமாக எங்களுடைய மலையகத்தில் வீதி அபிவிருத்திப் பணிகளைச் செய்ய முடிந்தது. இன்றைக்குக் கிட்டத்தட்ட 354 கிலோமீற்றர் பாதையின் புனரமைப்பு வேலைகளை நாங்கள் ஆரம்பித்திருக்கின்றோம்.

அதுமட்டுமல்லாமல், 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் நாங்கள் கல்வி, சுகாதாரம் மற்றும் விளையாட்டு ஆகிய 03 துறைகளுக்கு முக்கியத்துவம் வழங்கி இருக்கின்றோம். ஏனென்றால், மலையகத்தில் இந்த மூன்று துறைகளுமே பாரியளவில் வீழ்ச்சியடைந்திருக்கின்றன. இந்த 03 துறைகளுக்கும் முக்கியத்துவம் வழங்கினால், கட்டாயம் எங்களால் முன்னேற முடியும். குறிப்பாகச் சொல்வதென்றால், இம்முறை Budget மதிப்பீட்டில் smart classrooms உருவாக்குவதற்காக கிட்டத்தட்ட 205 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறது.

சமீபத்தில் என்மீது ஒரு குற்றச்சாட்டு முன்வைக்கப்பட்ட தாக நான் கேள்விப்பட்டேன். அதேபோல, அரசாங்கத்தின் மீதும் ஒரு குற்றச்சாட்டு முன்வைக்கப்பட்டது. அது என்னவென்றால், அரசாங்கம் தோட்ட வீடமைப்பு இராஜாங்க அமைச்சுக்கு வெறுமனே 500 மில்லியன் ரூபாயைத்தான் ஒதுக்கியிருக்கின்றது என்று. இது ஒரு தவறான கருத்து! எனவே, இது தொடர்பில் நான் கட்டாயம் எடுத்துச் சொல்லியாக வேண்டும். கௌரவ நிதி அமைச்சர் அவர்கள் சொல்லியுள்ள விடயம் என்னவெனில், மலையக மக்களின்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා ]

வீடமைப்புக்கு 500 மில்லியன் ரூபாய் மேலதிகமாக ஒதுக்கப்பட்டிருக்கின்றது என்றுதான். ஆனால், இந்த வரவு செலவுத்திட்ட மதிப்பீட்டுப் புத்தகத்தின் 330ஆவது பக்கத்தில் என்னுடைய அமைச்சுக்கு 2,471 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது என்று மிகத் தெளிவாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இந்த நிதி ஒதுக்கீட்டின்மூலம் நாங்கள் மலையக மக்களுக்கு என்னென்ன வேலைத் திட்டங்களைக் கொண்டுவரப்போகிறோம் என்பதை எதிர்வரு கின்ற 6ஆம் திகதி நான் தெளிவாகச் சொல்வேன். ஏனென்றால், எனது அமைச்சின் குழுநிலை விவாதத்துக்கு ஒதுக்கப்பட்ட நாள் அன்றாகும். அதுமட்டுமல்ல, இந்தக் 'கொவிட்' காலகட்டத்தில் எங்களால் முடிந்தளவு நாங்கள் வேலை செய்திருக்கிறோம்.

இன்று மலையகத்தைப் பார்த்தீர்களென்றால், அங்கு பல்வேறு இடங்களில் அபிவிருத்தி நடைபெற்றிருப்பதைக் காணலாம். அங்கு அபிவிருத்தி நடைபெறவில்லையென்று யாராலும் சொல்லமுடியாது. எங்களைப் பொறுத்தவரைக்கும், எங்களுக்கு அரசாங்கத்தோடு அல்ல பிரச்சினை, முழுமை யாகப் பெருந்தோட்டக் கம்பனிகளுடன்தான்! ஏனென்றால், இன்று கூட்டு ஒப்பந்தத்திலிருந்து இரு தரப்புகளும் வெளியேறிவிட்டன. அதாவது, பெருந்தோட்டக் கம்பனிகளும் வெளியேறிவிட்டன; தொழிற்சங்கங்களும் வெளியேறி விட்டன. இதன்காரணமாக இன்று பல்வேறு இடங்களில் பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன.

குறிப்பாக, மஸ்கெலியாவிலுள்ள மக்கள் இன்று மிகவும் மோசமான நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். இதற்குக் காரணம், எதிர்த் தரப்பினரோ, ஆளும் தரப்பினரோ - அரசாங்கமோ அல்ல. மாறாக, பெருந்தோட்டக் கம்பனிகளின் அடக்குமுறைதான் இதற்குக் காரணமாக இருக்கின்றது. கூட்டு ஒப்பந்தம் இல்லையென்றால், அவர்கள் எந்தளவிற்குப் போவார்கள் என்பதைக் காண்பித்திருக்கிறார்கள். கூட்டு ஒப்பந்தம் வேண்டாம் என்று நிறையப் பேர் சொன்னார்கள். இதற்காகத்தான் நாங்கள் கூட்டு ஒப்பந்தம் வேண்டுமென்று சொன்னோம். இன்றைக்கு கூட்டு ஒப்பந்தம் இல்லாத காரணத்தால், மக்கள் அவஸ்தைப்படுகின்றார்கள். "கூட்டு ஒப்பந்தம் இருந்தால், எங்களால் பேசமுடியாது" என்று சிலர் சொல்லியிருந்தார்கள். இன்றைக்கு கூட்டு ஒப்பந்தம் இல்லை. ஆனால், மக்கள் கஷ்டப்பட்டுக் கொண்டிருக்கிறார்கள். அதனால்தான், இலங்கை தொழிலாளர் காங்கிரஸ் திரும்பவும் முன்வந்து, மக்களுக்குத் தீர்வைப் பெற்றுக்கொடுப்பதற்காகத் தொழிற்சங்க நடவடிக்கைகளை முன்னெடுக்க இருக்கிறது. எதிர்வரும் 22ஆம் திகதி நாங்கள் கம்பனி முதலாளிமாருடன் பேச்சுவார்த்தை நடத்தவிருக்கிறோம். அதன்போது, நாங்கள் கட்டாயமாக இது சம்பந்தமாகப் பேசுவோம்.

அடுத்து, முக்கியமான ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். வீடமைப்பு சம்பந்தமாக நீங்கள் எல்லோரும் ஒரு விடயத்தைச் சிந்தித்துப் பார்க்க வேண்டும். வடக்கு, கிழக்கிலே வீடு இல்லாப் பிரச்சினையிருக்கிறது. அது எங்களுக்குப் புரிகிறது. ஏனென்றால், அங்கு போர் நடந்தது; மக்கள் கஷ்டத்தில் இருக்கிறார்கள். ஆனால், மலையகத்துக்கென வீடமைப்பு ஏன் இருக்கிறது? என்று எங்களுக்கே தெரியாது. இந்த வேளையிலே உண்மையைப் பேசியாக வேண்டும். எங்களுக்கு இருக்கின்ற பிரதான பிரச்சினை வீடமைப்புக் கிடையாது. இது எல்லோருக்கும் தெரிய வேண்டும். எங்களுக்குள்ள பிரதான பிரச்சினை காணி உரிமை! இதைப்பற்றி யாரும் கவனம் செலுத்துவதில்லை.

இந்திய அரசாங்கத்துக்கு நான் நன்றி சொல்லியாக வேண்டும். இந்திய அரசாங்கத்தின்மூலம் மொத்தம் 14,000 வீடுகள் மலையகத்துக்கு வழங்கப்பட்டு இருக்கின்றது. நாங்கள் எவ்வளவுதான் முயற்சி செய்தாலும், என்னுடைய அமைச்சினூடாக ஒரு வருடத்திற்கு 1,000 வீடுகளைத்தான் கட்ட முடியும். மலையகத்துக்கு கிட்டத்தட்ட ஓரிலட்சம் வீடுகள் தேவையென நேற்று கௌரவ சரத் பொன்சேகா அவர்கள்கூட சொல்லியிருந்தார். அப்படியிருக்கும்போது, ஏன் இந்த 14,000 வீடுகளுக்கு இருதரப்பினரும் சண்டைபோட்டுக்கொண்டு இருக்கின்றோம்? ஏன், இதை வைத்து அரசியல் நடாத்திக்கொண்டு இருக்கிறோம்? ஆனால், அந்த மக்களுக்குத் தேவை காணி உரிமை! 158 வருடங்களாக அங்கு வாழுகின்ற மக்களுக்கு காணியுரிமை இல்லை. இது பெரிய கொடுமை! நான் ஏற்கெனவே சொல்லி இருக்கிறேன், எங்களுடைய மக்கள் பொருளாதாரத்தில் மிகவும் மோசமான நிலையில் இருப்பவர்கள் அல்லர் என்று. அவர்கள் நினைத்தால் வீடு கட்ட முடியும். இன்றைக்கு அவர்களுடைய பிள்ளைகள் வெளிநாடுகளில் நன்றாகச் சம்பாதித்துக் கொண்டிருக்கிறார்கள்; கொழும்பிலே சம்பாதிக்கிறார்கள்; சிலர் அங்கேயே சுயதொழில் செய்து கௌரவமாக வாழ்ந்து கொண்டிருக்கிறார்கள். தங்களுடைய பூர்வீக இடத்தில் வீடுகட்ட வேண்டுமென்று அவர்களுக்கும் இஷ்டம் இருக்கும். 158 வருடங்களாக அங்கே இருக்கின்றவர்களுக்கு காணி உரிமையில்லை. ஆனால், 30 வருடங்களுக்கு முன்னர் வந்த துரைமாருக்கு காணியுரிமை இருக்கிறது. இது எந்த வகையில் நியாயம்? இதற்கொரு தீர்வு வரவேண்டுமென்றால், அந்த மக்களுக்கு வீடமைப்பைவிட காணியை வழங்குவது தான் உசிதம்; வேறு ஒன்றும் தேவையில்லை; அவர்கள் வாழுகின்ற இடத்தை ஒப்படைத்தால் போதும்; அவர்களுடைய முன்னோர்கள் காலத்திலிருந்து அங்கு அவர்கள் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். இந்த நாட்டில் இலவசக் கல்வியை வழங்க முடிந்தது அவர்களுடைய முதுகில் ஏறிச் சம்பாதித்ததன் பலனாகத்தான். ஆனால், அவர்களுக்குக் காணி உரிமை கிடையாது! ஆகவே, நாம் அந்த இலக்கை நோக்கித்தான் பயணிக்கவேண்டும். இதுதான் இலங்கை தொழிலாளர் காங்கிரஸின் இலக்கும்கூட!

அதுமட்டுமல்ல, மலையகத்தில் அமையவுள்ள பல்கலைக் கழகத்துக்கு இன்னும் இடம் தேடிக்கொண்டிருக்கி றார்கள் என்று நிறையப் பேர் குற்றஞ்சுமத்தினார்கள். ஆமாம்! நாங்கள் இன்னும் இடம் தேடிக்கொண்டிருக்கின்றோம். "நாங்கள் பல்கலைக்கழகத்தை அமைத்துத் தருகிறோம்; அதற்கு நீங்கள் existing building ஒன்றைத் தாருங்கள்!" என்றுதான் ஆரம்பத்தில் சொல்லிக்கொண்டிருந்தார்கள். நாங்கள் நினைத் திருந்தால், அன்றே TVTCஐ பல்கலைக்கழகமாக மாற்றியிருக்க முடியும்! நாங்கள் நினைத்திருந்தால், இப்போது ஹற்றனில் பல்கலைக்கழகம் வந்திருக்கும்! ஆனால், நாங்கள் அப்படி நினைக்கவில்லை. "எங்களுக்குப் புதிதாக ஓரிடம் வேண்டும்; அதற்காக காணியை எடுத்துத் தருகிறோம்" என்று நாங்கள் தெளிவாகச் சொல்லி இருக்கின்றோம். எங்களைப் பொறுத்த வரைக்கும், பல்கலைக்கழகம் என்பது பெயரளவில் மட்டும் வந்தால் போதாது. நாங்கள் கொண்டுவர இருப்பது, இலங்கையின் முதல் self-sufficient university. இதற்காக நாங்கள் Rosita Farmஐத் தேர்த்தெடுத்திருக்கிறோம். அதற்குக் காரணம் என்னவென்றால், நகர பல்கலைக்கழகம் வரும்போது அது அங்கிருக்கின்ற studentsக்கு மட்டும் useஆக இருக்காமல், அங்கிருக்கின்ற மக்களுக்கும் பயனுள்ளதாக இருக்க வேண்டும் என்பதற்காகத்தான். அதனால், அந்த farmஐச் சுற்றி பல்கலைக்கழகம் அமைய வேண்டும். அங்கு agricultural university ஒன்றை அமைக்க முடியும். நாங்கள் கொடுத்திருக்கின்ற தேர்தல் வாக்குறுதிகளில் இதுவும் ஒன்று.

அதில் Agriculture மட்டுமல்லாது, IT subjects ஐயும் உள்வாங்க முடியும். இப்படிப் பண்ணினால், practical exposureஉம் இருக்கும். மலையகத்திலே பல்கலைக்கழகம் கட்டாயம் வரும்; அதுவும் இ.தொ.கா.வின் முயற்சியால்தான் வரும். அதை யாராலும் தடுக்க முடியாது என்று நான் இன்றைக்கு இந்த உயர் சபையிலே சொல்லுகின்றேன்.

நான் எதிர்த்தரப்பினரிடம் ஒரு கோரிக்கையை விடுக்கிறேன். குறிப்பாக, எதிர்தரப்பிலுள்ள மலையகத்தைச் சேர்ந்த பிரதிநிதிகளிடம் விடுக்கிறேன். நான் கடந்த சில ஆண்டுகளாக ஒரு விடயத்தை அவதானித்து வந்தேன். அதாவது, எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும் எங்களுக்குள் இருந்துதான் பிரச்சினைகள் வருமே தவிர, அரசாங்கத்தால் அல்ல. நாங்கள் மக்களுக்காகப் பேசுவதில்லை! இந்தத் தவறை நாம் ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். நான் பெரியவனா? நீ பெரியவனா? என்று பேசிப் பேசி, கடைசியில் மக்கள்தான் பாதிக்கப்படுகிறார்கள். இப்பொழுது, எதிர்த் தரப்பில் நீங்கள் இருக்கிறீர்கள்; ஆளும் தரப்பில் நாங்கள் இருக்கிறோம். அடுத்தமுறை நாங்கள் எதிர்த்தரப்பில் இருக்கலாம்; நீங்கள் ஆளும் தரப்பில் இருக்கலாம்! ஆனால், மக்கள் பொதுவானவர்கள். அவர்களுக்கு உதவி செய்யவேண்டும் என்றால், நாங்கள் ஒன்றிணைய வேண்டும். நான் அரசியல் ரீதியாக யாரையும் ஒன்றிணைய வேண்டும் என்று சொல்ல வில்லை. ஆனால், நாம் எல்லோரும் பொதுவானதொரு platformக்கு வந்து மக்களுக்கு இருக்கின்ற பிரச்சினைகள் சம்பந்தமாகப் பேச வேண்டும்.

இந்த வரவு செலவுத் திட்டத்தில் தோட்ட வீடமைப்பு மற்றும் சமுதாய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சுக்கு வெறுமனே 500 மில்லியன் ரூபாய்தான் ஒதுக்கப்பட்டிருப்பதாக இங்கு சொல்லப்பட்டது. இதைச் சொன்னவர், படித்த ஒருவர்! அவருடைய மேசையில்கூட வரவு செலவுத் திட்ட மதிப்பீட்டுப் அறிக்கை இருக்கிறது. அதில் கிட்டத்தட்ட 2,471 மில்லியன் ரூபாய் ஒதுக்கி இருப்பதாகக் குறிப்பிடப்பட்டிருக்கிறது. அது அவருக்கும் நன்றாகத் தெரியும்! அப்படி இருக்கும்போது, ஏன் 500 மில்லியன் ரூபாய்தான் ஒதுக்கப்பட்டிருக்கின்றது என்று சொல்ல வேண்டும்? மக்களைத் திசை திருப்புவதற்காகத்தான்!

அதேமாதிரி, "சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றத்தில் வேலைசெய்கிற ஊழியர்களுக்கு அரசாங்கம் சம்பளம் கொடுக்கவில்லை" என்று இன்னுமோர் உறுப்பினர் சொல்லியிருந்தார். சம்பளம் கொடுக்கவில்லை என்று யார் சொன்னது? நாங்கள் சம்பளம் கொடுத்து பத்து நாட்கள் ஆகிவிட்டன. ஆகவே, இவ்வாறு தவறான வதந்திகளைப் பரப்புவதை நிறுத்தவேண்டும். எல்லாவற்றிலும் அரசியல் செய்வது கூடாது. உண்மையிலே அது எனக்கு வருத்த மளிக்கிறது. ஏனைய இடங்களில் அவ்வாறுதான் அரசியல் செய்கிறார்கள்; அதை நான் ஏற்றுக்கொள்கிறேன். ஏனென்றால், இங்கு அப்படித்தான் அரசியல் செய்கிறார்கள்; இது அந்த மாதிரியான ஒரு நாடுதான்! மலையகத்தைப் பொறுத்தவரையில், அங்குள்ள மக்கள் கஷ்டத்தில் இருக்கிறார்கள். ஆனால், இங்கு அப்படி அரசியல் செய்து செய்து கடைசியில் நாங்கள் பின்தங்கிய கூட்டமாகவே ஆகிவிட்டோம். நான் மீண்டும் சொல்கிறேன். நாங்கள் அரசியல் ரீதியாக ஒன்றிணையத் தேவையில்லை; தொழிற் சங்க ரீதியாகக்கூட ஒன்றிணையத் தேவையில்லை. தொழிற்சங்க நடவடிக்கைகளினூடாக எங்களுடைய மக்களைக் காப்பாற்றுவதற்கு எங்களுக்குத் தெரியும்! ஆனால், பொதுவான ஒரு பிரச்சினை வந்தால், அதற்கு எல்லோரும் ஒன்றிணைந்து குரல்கொடுக்க வேண்டும் என்பதுதான் எங்களது அபிப்பிராயம்.

அதுமட்டுமல்ல, இன்னும் சில முக்கியமான விடயங்களை நான் இங்கு சொல்ல வேண்டும். இந்த வரவு செலவுத்திட்டம் மக்கள்மீது சுமையை ஏற்படுத்தியிருக்கின்றது என்று நேற்று இங்கு சிலர் குறிப்பிட்டார்கள். அதாவது, வரி விதிப்பு செய்யப்பட்டிருப்பதால் நிறையப் பிரச்சினைகள் ஏற்படுவதாகக் குறிப்பிட்டார்கள். குறித்த வரி விதிப்பானது, அதிக வருமானம் உழைக்கும் நிறுவனங்களுக்கு மட்டும்தான். மாறாக, இது ஏழைகளுக்கோ, வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கின்றவர்களுக்கோ அல்லது middle class, upper and lowerஇனருக்கோ அல்ல. இந்தக் 'கொவிட்' காலத்தில், காசு இருந்தவர்கள் இன்னும் சம்பாதித்தார்கள்; காசு இல்லாதவர்கள் இன்னும் மோசமான நிலைக்குத் தள்ளப்பட்டார்கள் என்பது எல்லோருக்கும் நன்றாகத் தெரியும். The rich became richer and the poor became poorer. அப்படி இருக்கும்போது, வசதிபடைத்தவர்கள் மீது வரி விதிப்பதில் என்ன தவறு இருக்கிறது? இதில் எந்தத் தவறும் கிடையாது.

அடுத்து, கௌரவ நிதி அமைச்சர் அவர்களுக்கு நாங்கள் நன்றி சொல்லியாக வேண்டும். ஏனெனில், அவர் தனது முதலாவது வரவு செலவுத்திட்டத்தை மக்கள்மீது எந்தச் சுமையையும் சுமத்தாமல் தயாரித்திருக்கிறார். உண்மையிலே இது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். "சொல்லைவிடச் சிறந்தது செயல்" என்று கூறுவார்கள். அதன்படி, வரவு செலவுத்திட்டத்தில் எவ்வளவுதான் நிதி ஒதுக்கப்பட்டிருந் தாலும், நாங்கள் அதைச் செயலில் செய்துகாட்ட வேண்டும். மக்கள் ஒரு வருடமாக அதிருப்தியில் இருக்கிறார்கள் என்பதை நாங்கள் ஏற்றுக்கொள்கிறோம். இந்தக் கொரோனாத் தொற்றின் பாதிப்பிலிருந்து எப்படி மீண்டு வருவதென்று எங்களுக்கும் புரியவில்லை! இப்பொழுது, கொஞ்சம் கொஞ்சமாக மீண்டு வருகின்றோம். Rate of vaccinationஐப் பார்த்தீர்கள் என்றால், அது 70 சதவீதத்தைத் தாண்டி இருக்கும். நிச்சயமாக எங்களால் இதிலிருந்து மீளமுடியும்! கடந்த இரண்டு வாரங்களில் எமது நாட்டுக்குக் கிட்டத்தட்ட 19,000 tourists வந்திருக்கிறார்கள். அந்த வகையில், எங்களுடைய tourist industryஉம் கொஞ்சம் கொஞ்சமாக முன்னேறி வருகின்றது. இவ்வளவு காலமும் மக்கள் பொறுமையாக இருந்ததற்கு ஆளும் தரப்பு சார்பாக நான் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எதிர்காலத்தில் எங்களால் இந்த நிலைமையிலிருந்து கட்டாயம் மீளமுடியும். எங்களுக்கு எங்கள்மீது நம்பிக்கை இருக்கின்றது. அதனால்தான் மக்கள் எங்களுக்கு வாக்களித்து, இங்கு அனுப்பி வைத்திருக்கிறார்கள். இந்தச் சபையிலுள்ள தமிழ் உறுப்பினர்கள் பெற்ற வாக்குகளை எடுத்துப் பார்க்கின்ற போது, அவற்றில் அதிகூடிய வாக்குகளை - கிட்டத்தட்ட 109,000 வாக்குகளை - நான்தான் பெற்றிருக்கின்றேன். அதனடிப்படையில், இந்த நிலைமையை எங்களால் மாற்ற முடியும் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. பிரச்சினைகள் இருக்கின்றன; அவற்றைத் தாண்டிப் போவதுதான் சாமர்த்தியம். அது எங்களால் முடியும்.

அரச தரப்பாக இருக்கட்டும், எதிர்த்தரப்பாக இருக்கட்டும், நான் அவர்களிடம் ஒரேயொரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். சுகாதாரத்துறையினருக்குத்தான் - health authorities - இந்தக் 'கொவிட்'டினுடைய பாதிப்புக்கள் பற்றி அதிகம் தெரியும். அவர்கள்தான் உண்மையான experts! "தயவுசெய்து, கூட்டமாகக் கூட வேண்டாம்; அதற்கு மாறாகச் செயற்பட்டால், clusters formஆகும்; 'கொவிட்' தொற்று பரவும்" என்று அவர்கள் advice பண்ணியிருக்கிறார்கள். எனினும், நாங்கள் அவர்களுடைய adviceஐக் கேட்பதாக இல்லை. அது யாராக இருந்தாலும் சரி! சமீபத்தில் எதிர்த்தரப்பினர் கொழும்பில் protests ஒன்றை நடத்தினார்கள்.

[ගරු ජීවන් තොන්ඩමන් මහතා ]

அதுதொடர்பில் அவர்களிடம் கேட்டால், "UNPஇனரும் நடத்துகிறார்கள்; JVP இனரும் நடத்துகிறார்கள். நாங்கள் நடத்தினால் என்ன தப்பு?" என்று கேட்கிறார்கள். அவ்வாறு சொல்வது என்பது, அவர்களுடைய சமூகப் பொறுப்பற்ற தன்மையே எடுத்துக் காட்டுகின்றது.

I would like to say this finally to all the people who are watching; the general public. It is just a simple statement that needs to be known. Regardless of these protests and all that, tomorrow, if anybody in your family - let it be your aging grandmother, your infant or whoever - contracts COVID -19, not one politician is going to come and make sure that everything is okay in your family. You have to look after your own family at this point of time. Instead of protesting this way, there are innovative ways to protest. Nobody is saying that you should not protest. You can come up with innovative ways of how to protest; but that does not mean that you should bring people and put them together and create an environment to spread the disease. This is highly irresponsible. Honestly, I am very disappointed as a young Member of Parliament to witness all this in the past one year.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please wind up.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Okay, Sir.

However, I would like to say that we have tried our best to control COVID-19 and as far as I am aware, we have successfully increased our rate of vaccination to 70 per cent. But still, I believe, that is not enough. I believe we should let go of political differences and come together regardless of whether we are in the Opposition or in the ruling party to find a solution.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! The Sitting is suspended for lunch till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කරුණාකර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
"ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.00]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் இந்த நாட்டினுடைய 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் இரண்டாம் வாசிப்பு மீதான விவாதத்திலே கலந்துகொண்டுள்ளோம். நாட்டினுடைய வருமானம் பாதாளத்தில் வீழ்ச்சியடைந் துள்ளதுடன், அந்நியச் செலாவணிக் கையிருப்பும் தீர்ந்துள்ள கையறு நிலையில் நின்றவாறு இந்த வரவு செலவுத் திட்டத்தை அரசு சமர்ப்பித்துள்ளது.

நாடு பிளவுபடுவதனைத் தடுத்தல் என்ற போர்வையில், ஒற்றையாட்சியைப் பாதுகாக்கின்றோம் என்கின்ற ஒரு கோஷத்தோடு, தமிழ்த் தேசத்தின்மீது இன அழிப்பை மேற்கொண்டு, போரை வென்றுவிட்டதாகவும் ஒற்றையாட்சி யைப் பாதுகாத்துவிட்டதாகவும் எகத்தாளமிட்டுப் பிரகடனம் செய்து 12 ஆண்டுகளின் பின்னர் இந்த வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்துள்ளீர்கள். ஆனால், இன்று நாட்டினுடைய நிலைமை என்ன? நாடு கடனில் மூழ்கியுள்ள துடன், கழுதை தேய்ந்து கட்டெறும்பானதுபோல ஒட்டுமொத்த மக்களும் பட்டினிச்சாவை எதிர்நோக்கியுள்ள ஒரு நிலையிலே நாட்டின் பொருளாதாரம் பாதாளத்தில் வீழ்ச்சியடைந்து கிடக்கின்றது. இதில் தமிழ்த் தேசத்தினுடைய நிலை மிகவும் மோசமடைந்துள்ளது.

கடந்த 2009இல் இன அழிப்பின்மூலம் யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்ட பின்னர் கடந்த காலத்திலே 13 வரவு செலவுத் திட்டங்கள் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றன. அவை அனைத்தும் தமிழ்த் தேசத்தை முற்றாகப் புறக்கணிக்கப்பட்டுத்

தயாரிக்கப்பட்டே சமர்ப்பிக்கப்பட்டிருந்தன. அதேபோன்று தான் இந்த வரவு செலவுத் திட்டமும் தமிழ்த் தேசத்தை முற்றாகப் புறக்கணித்துத்தான் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. தமிழர் தேசம் அபிவிருத்தியில் புறக்கணிக்கப்பட்டது மட்டுமல்ல, இந்த வரவு செலவுத்திட்டங்களூடாக அரச திணைக்களங்களுக்கு நிதி ஒதுக்கப்பட்டு, அந்த அரச திணைக்களங்களூடாகத் தமிழர் தேசத்தின்மீது ஒடுக்கு முறைகள் கட்டவிழ்த்துவிடப்பட்டிருக்கின்றன. குறிப்பாக, பாதுகாப்பு அமைச்சினுடைய முப்படைகள், பொதுமக்கள் பாதுகாப்புத் துறை மற்றும் பௌத்த கலாசாரத் திணைக்களம், மகாவலி அபிவிருத்தி அதிகாரசபை, எல்லை நிர்ணய சபை, வன ஜீவராசிகள் திணைக்களம், வனப் பாதுகாப்புத் திணைக்களம், தொல்பொருள் திணைக்களம், மீன்பிடி அமைச்சு, துறைமுக அபிவிருத்தி அதிகாரசபை, வெளிநாட்டு அமைச்சு, வர்த்தக அமைச்சு போன்றவற்றை நான் உதாரணமாகக் குறிப்பிடுகிறேன். துறைமுக அபிவிருத்தி அதிகாரசபையினூடாக வடக்கிலே மயிலிட்டித் துறைமுகம் அபிவிருத்தி செய்யப்பட்டு, அது தமிழ் மக்களிடமிருந்து பறித்தெடுக்கப்பட்டு, இன்று முழுமையாகச் சிங்கள மக்களிடம் கையளிக்கப்பட்டிருக்கின்றது என்பதை ஓர் உதாரணமாகக் காட்டிக்கொள்கின்றேன்.

இவற்றினூடாகப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழான கைதுகள், சித்திரவதைகள், தடுத்துவைப்புக்கள் மற்றும் நீண்டகாலமாகக் கைதிகள் தடுத்து வைக்கப்பட்டிருத்தல், காணாமலாக்கப்பட்டவர்களுக்கு நீதியின்மை, முன்னாள் போராளிகள் மீதான ஒடுக்குமுறைகள், சிங்களக் குடியேற்றங்கள், பௌத்த மயமாக்கல்கள் போன்றன இடம்பெறுகின்றன. அத்துடன், எமது மீன்பிடித் துறை முற்றாக ஒடுக்கப்பட்டு அழிக்கப்படுகின்றது. உங்களுடைய கொள்கை யினால் விவசாயத்துறை அழிக்கப்படுகிறது; வர்த்தகத்துறை அழிக்கப்படுகிறது. இது ஒட்டுமொத்தமாகத் தமிழ்த் தேசத்தைக் கடந்த யுத்த காலத்தில் இருந்ததைவிட மோசமான ஓரிடத்துக்குக் கொண்டுசென்றுகொண்டிருக்கின்றது. அரசாங் கத்தின் வரவு செலவுத் திட்டங்களும் கொள்கைகளும் எங்களுடைய தேசத்தை முழுமையாகச் சிங்கள, பௌத்த மயமாக்குகின்ற நோக்கத்தோடுதான் வகுக்கப்பட்டிருக்கின்ற காரணத்தினால், கடந்த காலங்களைப் போன்றும் இந்த வருடமும் நாங்கள் இந்த வரவு செலவுத்திட்டத்தை ஆதரிக்க முடியாதது மட்டுமல்ல, எதிர்த்தே ஆகவேண்டும் என்கின்ற ஒரு நிலைமைக்கு வந்திருக்கின்றோம்.

இது ஒருபுறமிருக்க, 1948ஆம் ஆண்டிலிருந்து இந்த நாட்டில் தமிழர்களுக்குச் சமஷ்டி வழங்கினால், அதிகாரங்கள் வழங்கினால், நாடு பிரிந்துவிடும் என்று கூறி, இனவாதமாகச் செயற்பட ஆரம்பித்திருந்தீர்கள். குடித்தொகைப் பரம்பலை மாற்றியமைத்துக் குடியேற்றங்களை மேற்கொள்ளுதல், பௌத்தமயமாக்கல், சிங்கள மயமாக்கல், கல்வித் தரப்படுத்தல், தெற்கிலிருந்து வன்முறைகள் மூலமாகத் தமிழர்களை வடக்குக்குக் கப்பலேற்றி அனுப்புதல் போன்ற செயற்பாடுகளை மேற்கொண்டுவந்தீர்கள். தமிழர்கள் நாட்டைப் பிரிக்கப்போகிறார்கள் எனக் கூறி, ஆறாந் திருத்தச் சட்டத்தைக் கொண்டுவந்தீர்கள்; பயங்கரவாதத் தடைச் சட்டத்தைக் கொண்டுவந்தீர்கள். ஆனால், தமிழர்கள் ஒடுக்குமுறைக்கு எதிராகவும் அரசியல் உரிமைகளுக்காகவும் ஆயுதம் ஏந்திப் போராடும் நிலைமையை உங்களால் தடுக்க முடியவில்லை. அதுமட்டுமல்லாமல், அப்போராட்டத்தை உங்களால் அழிக்க முடியவில்லை. ஏனெனில், அது அரசியல் உரிமைக்கான, நீதிக்கான நியாமான போராட்டம்! இறுதியில் இன அழிப்பு ஒன்றின் மூலமாகத்தான் உங்களால் அந்த உரிமைப் போராட்டத்தை முடிவுக்குக் கொண்டுவரக்கூடியதாக இருந்தது.

அவ்வாறு இன அழிப்பை அரங்கேற்றியபோது இனிமேல் இத்தீவானது படிப்படியாகத் தூய பௌத்த தீவாக மாற்றப்படும் என்று சிங்கள மக்களைக் கனவு காண வைத்தீர்கள். ஆனால், இன்றைய நிலை என்ன என்பதை நீங்கள் சிந்தித்துப் பாருங்கள்! இன்று நாடு பாரிய கடனில் மூழ்கியிருப்பது மட்டுமல்லாமல், சீனாவுக்கும் ஏனைய நாடுகளுக்கும் இந்த நாடு விற்கப்பட்டு, சிங்கள மக்களுக்கே இந்த நாடு சொந்தமாக இருக்குமா? என்கின்ற ஒரு கேள்வியை ஏற்படுத்துகின்ற அளவுக்கு நிலைமை மோசமடைந்துள்ளது. நாட்டின் பொருளாதாரம் அதலபாதாளத்தில் வீழ்ச்சி யடைந்துள்ளது. மனிதனுடைய அடிப்படைத் தேவை உணவு, உடை, உறையுள் என்று சொல்வார்கள். உங்களால் உடையை வழங்க முடியாத நிலைமை மட்டுமல்ல, உறையுளை வழங்க முடியாத நிலைமை மட்டுமல்ல, உணவைக்கூட வழங்க முடியாது என்ற நிலைமைக்கு இந்த நாடு இன்று வந்திருக்கின்றது. நாட்டின் பொருளாதாரத்தை அபிவிருத்திப் பாதையில் கொண்டுசெல்வதிலும் இனங்களுக்கிடையில் ஐக்கியத்தை ஏற்படுத்துவதிலும் நீங்கள் முழுமையாகத் தோல்வியடைந்துள்ளீர்கள்.

கடந்த 30 ஆண்டுகால யுத்தத்தில் உங்களது நயவஞ்சகத்தால் முஸ்லிம் மக்களைத் தமிழர்களுக்கெதிராகத் திருப்பிப் பயன்படுத்தியிருந்தீர்கள். ஆனால், இன்று ஒட்டுமொத்த முஸ்லிம் சகோதரர்களையும் ஓர் இனமாக நீங்கள் குறிவைத்துள்ளீர்கள். சமஷ்டி ஆட்சி முறையின்மூலம் அதிகாரங்களைப் பகிர்ந்தளிப்பதனால் நாடு பிளவுபட்டுவிடும் என்றவாறான பொய்களைச் சிங்கள மக்களுக்குக் கூறி, அவர்களை ஏமாற்றி உங்களோடு வைத்துக்கொண்டு, அரச அதிகாரங்களைப் பயன்படுத்தி நிர்வாக ரீதியாகவும், கலாசார, பண்பாட்டு ரீதியாகவும் தமிழர்களுக்கு எதிராக ஒடுக்கு முறைகளை மட்டுமே மேற்கொண்டீர்கள். இவை அனைத்தும் நாட்டை ஐக்கியப்படுத்தவில்லை. பதிலாக, மேலும் சமூகங்களைப் பிளவுபடுத்தித் துருவமயப்படுத்தியுள்ளது என்பதை இந்த இடத்திலே பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன். எனவே, சமஷ்டி ஆட்சி முறை கொடுத்தால் நாடு பிளவுபட்டுவிடும் என்ற எண்ணத்திலிருந்து நீங்கள் விடுபடுங்கள்!

இந்த நாட்டில் ஆரம்ப காலத்திலிருந்து ஆட்சிபீடம் ஏறியவர்கள் அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொண்டு, மக்களை ஒரு முன்னேற்றப் பாதையில் கொண்டு செல்வதனூடாக அவர்களுடைய செல்வாக்கைப் பெற்றுத் தொடர்ந்தும் ஆட்சிபீடம் ஏறுவதற்குப் பதிலாக, அவர்கள் கையாண்ட அணுகுமுறை தமிழர்களுக்கு எதிரானவையாகக் காணப்பட்டன. அதாவது, இனவாதத்தைக் கக்கி, தமிழ் மக்களைக் கொன்று, தமிழ்ப் பெண்களைப் பாலியல் வல்லுறவுக்கு உட்படுத்தி, தமிழ்க் கிராமங்களை அழித்துச் சிங்களக் குடியேற்றங்களை மேற்கொண்டு, பௌத்த மயமாக்கல், தனிச் சிங்களச் சட்டம், கல்வித் தரப்படுத்தல்கள் மற்றும் கலவரங்கள் போன்றவற்றினூடாகச் சிங்கள மக்களுடைய ஆதரவைத் திரட்டித் தங்களைத் தேச பக்தர்களாகக் காட்டி ஆட்சிபீடம் ஏறிவந்தார்கள்.

2009இலே நீங்கள் போரை முடிவுக்குக் கொண்டுவந்ததன் பிற்பாடு இன்று உங்களிடம் எஞ்சியிருப்பது என்ன? இன்று இந்த நாடு முழுமையாக அந்நிய சக்திகளுடைய ஒரு பூகோளப் போட்டிக்குள் சிக்குண்டு சின்னாபின்னமாகிக் கொண்டிருக்கின்றது என்பதை இப்பொழுதாவது நீங்கள் விளங்கிக்கொள்கின்றீர்களா? ஆகவே, உங்களுடைய அணுகுமுறை முற்றாகத் தோல்வியடைந்திருக்கின்றது. நாங்கள் ஒற்றையாட்சியை ஒருபொழுதும் ஏற்றுக்கொள்ள

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

முடியாது. இந்த ஒற்றையாட்சியைப் பாதுகாப்பதற்காக 70 ஆண்டுகளாக நீங்கள் மேற்கொண்ட அணுகுமுறைகள் அனைத்தும் தோல்வியடைந்திருக்கின்றன. ஆகவே, தயவுசெய்து உங்களுடைய அணுகுமுறையை மாற்றுங்கள்! ஒற்றையாட்சியையோ 13ஆவது திருத்தச் சட்டத்தையோ நாங்கள் ஒருபொழுதும் தீர்வாக ஏற்றுக்கொள்ளப் போவதில்லை. எங்களுடைய உரிமைக்காக நாங்கள் தொடர்ந்து போராடுவோம். எனவே, தமிழர் தேசத்தையும் தமிழ்த் தேசத்தினுடைய இறைமையையும், சுயநிர்ணய உரிமையையும் அங்கீகரிக்கின்ற ஒரு சமஷ்டித் தீர்வைப் புதிய அரசியல் அமைப்பினூடாகக் கொண்டுவருவதைப் பற்றிச் சிந்தியுங்கள்! அதன்மூலமாக இலங்கைத் தீவிலே தமிழ்த் தேசமும் சிங்களத் தேசமும் ஐக்கியமாக, ஆனந்தமாகக் கூடிவாழக்கூடிய சூழலை உருவாக்கமுடியும். இதை எங்களுடைய தேசியத் தலைவர் மேதகு வேலுப்பிள்ளை பிரபாகரன் அவர்கள் 2001ஆம் ஆண்டு மாவீரர் தின உரையிலே சொல்லியிருக்கின்றார். ஆனால், இந்தத் தீவை மையப்படுத்தி நடக்கின்ற பூகோளப் போட்டியிலே இந்த நாடு சிக்குண்டு, அந்நிய சக்திகளினுடைய போட்டி காரணமாகப் பிளவுண்டுபோவதை நோக்கித்தான் உங்களுடைய நகர்வுகள் நடந்துகொண்டிருக்கின்றன.

ஒன்றை விளங்கிக்கொள்ளுங்கள்! தேசியக் கொடியிலே சிங்கத்தை வைத்திருக்கிறீர்கள் என்பதற்காக நீங்கள் சிங்கங்களும் அல்ல, சிங்கத்தினுடைய தலையும் அல்ல. இந்தப் பிராந்தியப் பூகோள ஆதிக்கப் போட்டியிலே நீங்கள் சிங்கத்தினுடைய வாலில் இருக்கின்ற உரோமம்தான் என்பதைத் தெளிவாகப் புரிந்துகொள்ளுங்கள்! 'வியத்மக' என்ற பெயரிலே பல புத்திஜீவிகள் அரசாங்கத்தோடு இணைக்கப் பட்டிருக்கிறார்கள். அவர்களுக்கு நான் ஒன்றைச் சொல்கிறேன், "வீடு கொளுத்தும் இராசாவுக்கு நெருப்பு எடுத்துக்கொடுக்கும் மந்திரிகள்" போன்று நீங்கள் இருக்காதீர்கள்! தயவுசெய்து வித்தியாசமாகச் சிந்தியுங்கள்! நீங்கள் எப்பொழுது இந்த ஒற்றையாட்சி எண்ணத்தைக் கைவிட்டு, தமிழ்த் தேசத்தை அங்கீகரித்து, தமிழ் மக்களை அரவணைப்பதற்கும் முஸ்லிம் மக்களை அரவணைப்பதற்கும் தயாராகிறீர்களோ, அப்பொழுதுதான் இந்தத் தீவு இந்த அழிவிலிருந்து மீண்டெழமுடியுமென்று ஆணித்தரமாகப் பதிவுசெய்து விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එච්.එම්.එම්. හරීස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.10]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். உண்மையிலே, தற்போது இந்த நாட்டில் நிலவும் 'கொவிட்' சூழ்நிலை காரணமாகப் பொதுமக்கள் பல்வேறு அசௌகரியங்களைச் சந்தித்துக் கொண்டிருக்கின்ற இந்த வேளையிலே, இந்த வரவு செலவுத் திட்டமானது இந்த நாட்டு மக்களின் பல்வேறு பிரச்சினைகளைப் பல்வேறு கோணங்களில் அணுகித் தயாரிக்கப்பட்டுள்ளது.

வரவு செலவுத்திட்ட விடயத்திற்கு அப்பால் சென்று நான் சில விடயங்களைப் பேசவேண்டியிருக்கின்றது. ஏனென்றால், நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற அம்பாறை மாவட்டத் திலும் சரி, கிழக்கு மாகாணத்திலும் சரி, ஏன், இலங்கை பூராவும் ஒருசில அமைப்புக்களைச் சேர்ந்த சில நபர்கள் முஸ்லிம் அரசியலை வேறு ஒரு திசையை நோக்கிக் கொண்டுசெல்ல வேண்டுமென்று எண்ணிக்கொண்டிருக் கிறார்கள். இன்று முஸ்லிம் சமூகம் பல்வேறு காரணங்களுக்காக சவால்களை எதிர்நோக்கிக் கொண்டிருக்கின்றது. இன்று எங்களுடைய சமூகம் சார்ந்த பல விடயங்கள் சவாலுக்கு உட்படுத்தப்படுகின்றன. வரலாற்றிலே எப்போதும் இல்லாதவாறு, பல நூற்றாண்டு காலமாக நாங்கள் அனுபவித்துவந்த எங்களுடைய தனியார் சட்டம் இன்று கேள்விக்கு உட்படுத்தப்படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. முஸ்லிம் பாராளுமன்றப் பிரதிநிதிகள் என்ற அடிப்படையில், நாங்கள் இவற்றுக்குத் தீர்வுகளைக் காண்பதா? அல்லது இந்தப் பிரச்சினைகளை வைத்து முஸ்லிம் சமூகத்தின் மத்தியில் பிரசாரம் செய்து, எங்களுடைய பிரபல்யத்தை - வாக்கு வங்கியை - கூட்டுவதா? சிறந்தது என்ற கேள்வி எங்கள் முன்னிலையில் இருந்துகொண்டிருக்கின்றது.

ஆனால், எங்களுக்கு முன்பு இந்த நாட்டில் அரசியல் செய்த அரசியல் தலைவர்கள் வழிகாட்டுதல்களைச் செய்துவிட்டுச் சென்றுள்ளனர். இந்த நாட்டின் முதலாவது முஸ்லிம் சட்டசபை உறுப்பினரான எம்.சி. அப்துல் ரஹுமான் அவர்கள், இதைவிடச் சவால் மிக்கதொரு சூழ்நிலையில், அன்றிருந்த ஆட்சியாளர்களுடன் சமரசமாகப் பேசி, கொழும்பிலிருந்த தன்னுடைய பெறுமதிவாய்ந்த நிலங்களை அரசுக்குக் கொடுத்து, சுமுகமான முறையில் தனது சமூகத்தின் பிரச்சினைகளைத் தீர்த்த வரலாறு இருக்கின்றது. அவரைத் தொடர்ந்து சேர் ராசிக் பரீத், ரி.பி. ஜாயா, எம்.சி.எம். கலீல், பதியுத்தீன் மஹ்மூத், எம்.எச்.எம். அஷ்ரப் எனப் பல முஸ்லிம் தலைவர்கள் இந்த நாட்டின் ஆட்சியாளர்களுடன் பேசி, எமது சமூகத்தின் பிரச்சினைகளைத் தீர்த்த வரலாறு இருக்கின்றது.

அதேபோன்றுதான், நாங்கள் இம்முறை பாராளுமன்றத் திற்குத் தெரிவாகிவந்த ஆரம்பக் காலகட்டத்தில் 'கொவிட்' இனால் மரணமடைந்த முஸ்லிம்களின் ஜனாஸாக்களை எரிக்கின்ற பிரச்சினை இருந்தது. இந்த அரசு 20ஆவது திருத்தச் சட்டமூலத்தை நிறைவேற்ற முற்பட்டபொழுது, எங்களுடைய மக்களின் ஜனாஸா எரிப்பு விடயம், முஸ்லிம் தனியார் சட்டம் மற்றும் எமது பிராந்தியப் பிரச்சினைகள் பற்றி அரசின் உயர்மட்டத் தலைவர்களுடன் பேசி, அவற்றுக்கான தீர்வுகளை யதார்த்த ரீதியாகக் காண்பதற்கு உரிய பொறிமுறைகள் உருவாக்கப்படவேண்டுமென நாங்கள் கோரினோம். அந்த வகையிலேயே நாங்கள் - முஸ்லிம் காங்கிரஸைச் சேர்ந்த 04 பேரும் மக்கள் காங்கிரஸைச் சேர்ந்த 03 பேரும் - அச்சட்டமூலத்துக்கு ஆதரவாக வாக்களித்தோம். அப்போது, இந்த நாட்டில் பல விமர்சனங்கள் எழுந்தன. எனினும், நாங்கள் கோழைகளாக ஓடி ஒழிந்துவிடவில்லை. ஈற்றிலே இறைவனின் உதவியால் ஜனாஸா எரிப்பு விடயத்துக்குத் தீர்வு கிடைத்தது.

அதேபோன்றுதான், MMD சட்டத்திலுள்ள விடயங்கள் தொடர்பில் பிரச்சினை ஏற்பட்டபொழுது, அது தொடர்பில் நாங்கள் கௌரவ நீதி அமைச்சர் எம்.யூ.எம். அலி சப்ரி அவர்களுடன் பேசினோம். அவர் பல சவால்களுக்கு மத்தியில் அதில் முன்னேற்றகரமான சில விடயங்களைச் செய்து கொண்டிருந்தபொழுதுதான், துரதிருஷ்டவசமாக "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற சனாதிபதி செயலணியின் தலைவராக ஞானசார தேரர் அவர்கள் நியமிக்கப்பட்டார். இதனால், எங்களது சமூகத்தினருக்கு மென்மேலும் ஆத்திரமும் ஆவேசமும் ஏற்பட்டது. இச்செயலணியால் ஏற்படப்போகின்ற ஆபத்துக்கள் பற்றி எங்களுடைய முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் கௌரவ அலி சப்ரி அவர்களிடமும், அரசின் உயர் மட்டத் தலைவர்களிடமும் எடுத்துக் கூறினார்கள். அதன் பின்னர், நீதி அமைச்சர் அவர்கள் சனாதிபதி, பிரதமர் போன்றவர்களுடன் சாமர்த்தியமாகப் பேசியதன் விளைவாகத் தற்பொழுது அந்தச் செயலணியின் அதிகாரங்கள் குறைக்கப் பட்டிருக்கின்றன. இதுதான் சாமானியமாக இந்த நாட்டில் முஸ்லிம் பிரதிநிதிகள் செய்கின்ற அரசியல்!

அதேபோன்றுதான், இப்போது மாடறுப்புப் பிரச்சினை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. நாங்கள் இவ்விடயம் தொடர்பில் சமூகக் கண்ணோட்டத்தில் அல்ல, பொருளாதார ரீதியாக நாட்டுக்கு ஏற்படப்போகின்ற சவால்களையும் நட்டங்களையும் பற்றி அரசிலுள்ள முக்கிய தலைவர்களுக்கு எடுத்துக் கூறினோம். இதற்கு நல்லதொரு தீர்வு வருமென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

எங்களுடைய பிராந்தியத்தில் காணிப் பிரச்சினைகள் இன்னும் இருந்துகொண்டிருக்கின்றன. மிகமுக்கியமாக, இன்று அரசினால் "எல்லை நிர்ணய ஆணைக்குழு" நியமிக்கப்பட்டு இருக்கின்றது. இது இந்த நாட்டில் புதிய பிரதேச செயலகப் பிரிவுகளையும் புதிய கிராம சேவகர் பிரிவுகளையும் உருவாக்குவதற்காக உருவாக்கப்பட்ட ஓர் ஆணைக்குழு வாகும். மக்களின் அடிப்படைப் பிரச்சினைகளைத் தீர்க்கப்போகின்ற ஓர் ஆணைக்குழு இது! இந்த ஆணைக்குழுவின் பரிந்துரைகளின் அடிப்படையில்தான், எதிர்காலத்தில் இந்த நாட்டில் சிவில் நிர்வாகம் சம்பந்தமான கட்டமைப்புக்கள் உருவாகப் போகின்றன. அந்த ஆணைக்குழு பிரதேச இணைப்புக் குழுத் தலைவர்களுடைய சிபாரிசுகளுடன் வருகின்ற யோசனைகளை ஏற்று, அவற்றைத் தீர்வாக நடைமுறைப்படுத்தவிருக்கின்றது. இவ்வாறானதொரு கால கட்டத்தில், எங்களுடைய கல்முனை, வாழைச்சேனை, தோப்பூர், மூதூர் ஆகிய பிரதேசங்கள் தொடர்பான விவகாரங்களைக் கையாளவேண்டுமென்றால், நாங்கள் அரசின் தலைவர்களுடனும் முக்கியஸ்தர்களுடனும் பேச வேண்டும். அவ்வாறு செய்வதன்மூலமாகத்தான் எங்களுடைய பூர்வீக நகரங்கள் பாதுகாக்கப்படும்; அந்த மக்களுடைய தேவைகளை நிறைவேற்ற முடியும். இதனை உணராத ஒருசாரார் எங்களைக் கடுமையாக விமர்சிக்கின்றார்கள். அரசோடு எதிர்வினை அரசியல் செய்தால் இந்த விடயங்களைத் தீர்ப்பது யார்? என்பதுதான் நாங்கள் கேட்கின்ற கேள்வி. எல்லை நிர்ணய ஆணைக்குழுவுடன் தொடர்புபட்ட விவகாரங்களைக் கையாளப்போவது யார்? இவற்றுக்குப் பதிலளிக்க வேண்டுமென்று நாங்கள் இந்த சமூகத்திலுள்ள ஒரு சிலரிடம் கேட்டுக்கொள்கின்றோம். இன்று இந்த நாட்டில் இனவாதம் என்பது, பச்சையாகவே பேசப்படுகின்ற விடயமாக மாறியிருக்கின்றது.

அண்மையில், இந்த நாட்டைச் சேர்ந்தவரும் 'லைக்கா மொபைல்' நிறுவனத்தின் தலைவருமான சுபாஸ்கரன் அவர்கள் பற்றி இந்தப் பாராளுமன்றத்திலும் பாராளுமன்றத்துக்கு வெளியிலும் பேசப்பட்டது. அவரைப் பயங்கரவாத அமைப்புடன் சம்பந்தப்படுத்தி, அதன் நிதிகளைக் கையாண்டு தன்னுடைய நிறுவனத்தை நடாத்துகின்றாரென்று அவர்மீது பாரிய குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. சில ஊடகங்கள் அவர்மீது பச்சையாகவே அபாண்டங்களைச் சுமத்தின. இவ்வாறான முதலீட்டாளர்களை - தொழில் அதிபர்களை இந்த நாட்டில் முதலீடு செய்யவிடாது தடுக்கும் வகையில்தான் அக்குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. ஒரு தமிழ் மகன் அல்லது சிறுபான்மை இனத்தவர் என்பதற்காக அவரால் ஒரு நிறுவனத்தை நடாத்த முடியாதா? என்று நான் கேட்க விரும்புகின்றேன். உலகளாவிய ரீதியில் ஒரு பெரும் நிறுவனத்தை நடாத்தி, அதனூடாகக் கிடைக்கின்ற வருமானத்தை இலங்கையில் முதலீடு செய்வது மாத்திரமல்லாமல், இந்த நாட்டிலுள்ள ஏழை மக்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுத்தும், கல்வி கற்கின்ற மாணவர்களுக்கு உதவிகளைச் செய்தும், தானதருமங்களைச் செய்தும் வருகின்ற அவர்மீது இவ்வாறான குற்றச் சாட்டுக்களைச் சுமத்துகின்றவர்களை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். எனவே, ஊடக நிறுவனங்கள் எமது நாட்டின் பொருளாதார வளர்ச்சி பற்றிச் சிந்தித்து, இவ்வாறானவர்களை வரவேற்று, இந்த நாட்டில் நிரந்தரமாக முதலீடு செய்வதற்கு அவர்களை ஊக்கப்படுத்த வேண்டுமே ஒழிய, அவர்களை இந்த நாட்டிலிருந்து விரட்டியடிக்கின்ற வேலையைச் செய்யக்கூடாது என்று கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.20]

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1943දී පළමුවන මුදල් අමාත්‍යවරයා විධියට සිටි දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සිට යහ පාලන ආණ්ඩුවේ අවසාන මුදල් ඇමති විධියට සිටි දිවංගත මංගල සමරවීර මැතිතුමා දක්වාම මේ රටේ මුදල් අමාත්‍යවරු හදපු අය වැයවලට වඩා මෙවර, 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන අය වැය ඉතා සුවිශේෂයි. අපි එහෙම කියන්නේ ලෝක ආර්ථිකය කඩා වැටී තිබෙන අවස්ථාවක, ලෝකයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහී තිබෙන අවස්ථාවක, භයානකම දේ වන මිනිසුන්ගේ මානසික ශක්තිය, ආත්ම ශක්තිය වැටී තිබෙන අවස්ථාවක ගරු බැසිල් රෝහණ රාජපක්ෂ ඇමතිතුමා 2022 අය වැය වාර්තාව හදපු නිසායි. අපේ විදේශ සංචිත අහිමි වූ වෙලාවක, රටට සංචාරකයෝ නොඑන වෙලාවක, නිෂ්පාදන කර ගන්න මිනිසුන්ට එළියට බහින්න බැරි වෙලාවක, රට lockdown කර තිබෙන වෙලාවක තමයි අපි බලාපොරොත්තු නොවූ ආකාරයට ජනතාව මත බදු බර පටවන්නේත් නැතිව, වසංගතයෙන් ජනතාවට සිදු වූ හානි සඳහා වන්දි පූරණය කරන වැඩ පිළිවෙළකුත් සකස් කර, මේ රට නිෂ්පාදන ආර්ථිකය කරා ගෙන යන්න පුළුවන් විධියට මේ අය වැය හදා තිබෙන්නේ. මේ තුළින් ගමේ ලීලාට, කමලාට, චම්පාට, රේඛාට, භානුමතීට, නයනාට, සඳරේඛාට පමණක් නොවෙයි, කමල්ට, සමන්ට, චමින්දලාටත් ඩොලරයක් හම්බ කර ගන්න පුළුවන් ආර්ථික වැඩ පිළිවෙළක් ගමට ගෙන යන්න එතුමා යෝජනා කර තිබෙනවා.

[ගරු මිලාන් ජයතිලක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමේ පැරණි කථාවක් තිබෙනවා නේ, "අම්මා දිහා බලා තමයි දුව සහේට ගන්න ඕනෑ" කියලා. පසුගිය කාල සීමාවේ අපි දැක්කා, මේ රට පාලනය කර ගෙන ආවේ කොහොමද කියලා. 1977දී විවෘත ආර්ථිකය ගෙනැල්ලා එක්සත් ජාතික පක්ෂය මේ රටේ ආර්ථිකය සුන්නද්දූලි කරලා දැම්මා. එදා සිට මේ වනතෙක් ගණනය කර බැලුවොත්, මේ රටේ සිටින හිඟන්නන් ප්‍රතිශතය වැඩිවීමට වගකියන්න ඕනෑත් දැන් විපක්ෂයේ වාඩිවෙලා ඉන්න එක්සත් ජාතික පක්ෂයට කඩේ ගිය අයයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හදලා එහි රස්නය යන්නත් කලින් නයිලෝන් යන්ත්‍රාගාරය යකඩවලට විකුණා දැම්මා. යූරියා කර්මාන්තශාලාව යකඩවලට විකුණා දැම්මා. ලිහිසි තෙල් අංශය විකිණුවා. CEYPETCO කෘෂි රසායන අංශය කියලා එකක් තිබුණා, ඒකත් විකුණා දැම්මා. ඒ විතරක් නොවෙයි. තෙල් බෙදීමේ අංශය Lanka IOC එකට වික්කා. වේයන්ගොඩ, තුල්හිරිය, පූගොඩ රෙදි කම්හල් ටික විකුණා දැම්මා. කැලණි ටයර් නිෂ්පාදනාගාරය වික්කා. ඔරුවල වානේ සංස්ථාව වික්කා. රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව වික්කා. වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාව යකඩවලට විකුණා දැම්මා. එප්පාවල පොස්පේට් නිධිය වික්කා. පිළියන්දල තිබුණු පිහන් සංස්ථාව විකුණා දැම්මා. ලංකාවේ අපි සිසිල් ශීතකරණය හදනකොට, උපාලි ෆියට් කාර් එක හදනකොට, යුනික් රේඩියෝ එක හදනකොට, දාස මුදලාලි දේශීය රෙදි කර්මාන්තය දියුණු කරනකොට ඉන්දියාවේ push bicycle එකක්වත් හදලා තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ කාලය වෙනකොට ලංකාවේ බී ලූනු වගාව, අර්තාපල් වගාව ආරම්භ කර තිබුණේ නැහැ. මේ රටේ ඉස්සෙල්ලාම බී ලූනු වගාව සහ අර්තාපල් වගාව ආරම්භ කළේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින්. ඒ විතරක් නොවෙයි, මා නියෝජනය කරන දොම්පෙ ආසනයේ පට පණු වගාව ආරම්භ කරලා සේද ගොවිපොළවල් හැදුවා. එක්සත් ජාතික පක්ෂයේ අදූරදර්ශී නායකයෝ ඒ සියල්ල විනාශ කර දැම්මා. මේවාට ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ඉඳලා පියාණෝ, පුතාණෝ ඇතුළු සියලුදෙනා වග කියන්න ඕනෑ. අන්තිමේදී මේ සියලුදෙනා එකතු වෙලා මේ රට විනාශ කළා. ඒ මදිවාට, කෙප්ප කයිවාරු ගහන ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමන්ලා කහ මලෙන් නාලා ඇවිල්ලා වාගේ මෙතැනත් අද කට උල් කරගෙන කථා කරනවා. වැඩිය ඕනෑ නැහැ, ජනතා විමුක්ති පෙරමුණ ඒ කාලයේ මගේ ආසනයේ තිබුණු ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලයටත් ගිනි තිබ්බා. ඒ වාගේම ට්‍රාන්ස්ෆෝමර් ටිකට ගිනි තිබ්බා, බස් ටිකට ගිනි තිබ්බා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මරපුවා, ගහපුවා ගැන කියන්න මට මේ තිබෙන වෙලාව මදි.

පසුගිය කාලයේ මේ අය ගුරුවරුන්ට මහා කරුණාවක් තිබෙනවා කියලා පෙන්වන්න දඟලුවා. හැබැයි, 88 - 89 කාලයේ විදුහල්පතිවරු පාසල්වලට ගිහිල්ලා දරුවන්ට ඉගැන්නුවා කියලා 56දෙනෙකුගේ බෙලි කපලා කෝටුවල ගහලා ප්‍රදර්ශනය කළා. අද ඒවා මතක නැහැ. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ස්ටැන්ලි විජේසුන්දර මැතිතුමාත් මරා දැම්මා. ඒ විතරක් නොවෙයි, එදා ශාසනයටත් ලොකු මෙහෙවරක් කළා! එදා කොටිකාවත්තේ සද්ධාතිස්ස හාමුදුරුවෝ, පොහොද්දරමුල්ලේ පේමාලෝක හාමුදුරුවෝ ඇතුළු මහා සංඝරත්නය අතිවිශාල පිරිසක් අමු අමුවේ ඝාතනය කළා. මේවා කළේ වෙන කවුරුවත් නොවෙයි, අද මෙතැනට ඇවිල්ලා අපට උපදෙස් දෙන්න එන අනුර කුමාර දිසානායකගේ ජනතා විමුක්ති පෙරමුණ තමයි මේවා කළේ. ඒ වාගේම එදා මේ රටේ හිටපු විජය කුමාරණතුංග වාගේ නායකයන් මරා දැම්මා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට වැඩක් කරලා තිබෙනවා නම්, ඒ රාජපක්ෂවරු සහ අපේ හිටපු මැතිනිය ඇතුළු රටට ආදරය කරපු පිරිස විතරයි. අද විපක්ෂයේ කයිවාරු ගහන පිරිස මේ රටේ ජාතික දේපළ විකුණා විනාශ කර දැම්මා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ආර්ථික ඔස්තාර් නේ. එතුමාගේ දිව ඕනෑම පැත්තකට හැරෙනවා. පසුගිය කාල සීමාවේ යහ පාලන ආණ්ඩුවේ හිටපු රවි කරුණානායකලා, මංගල සමරවීරලා අය වැය ගෙනාවා. ඒ අය වැය හරියට අටපිරිකරට පනාව දැම්මා වගේයි. ශත පහක වැඩක් තිබුණේ නැහැ. ඒවායේ වැඩක් තිබුණා නම්, අද මේ රටේ ජනතාවට පේන්න ඕනෑ, ඒ අය වැයවලින් මේ රටට වෙච්ච සෙත මොකක්ද කියලා. නමුත්, එතුමන්ලා ඒ අය වැය බොහොම ඉහළින් අර්ථ දැක්වුවා. හැබැයි, එතුමාට ඒ වෙලාවේත් අවස්ථාවක් හම්බ වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැය මේ රටේ ජනතාවට ශුභවාදී, මේ රටේ නිෂ්පාදන ආර්ථිකයට පණ දෙන අය වැයක්. නමුත්, මේ අය වැය හොඳයි කියන්න හර්ෂ මන්ත්‍රීතුමන්ලාගේ දිව කෙළින් වෙන්නේ නැති එක තමයි අරුමය.

රටේ නිෂ්පාදනයට මුල් තැන දීලා ස්වයංපෝෂිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න, අපනයන දිරිගන්වන්න, ජනතාවට බදු බර පටවන්නේ නැති ආර්ථික වැඩසටහනක් මේ අය වැය තුළින් අපි ගමට ගෙනිහිල්ලා තිබෙනවා. බිම් මට්ටමේ ඉන්න ගමේ ජනතාවට ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන්න අපි කටයුතු කරනවා. ඔවුන්ගේ යෝජනා තුළින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එක් ග්‍රාම නිලධාරි වසමකට අපි රුපියල් මිලියන තුනක මුදලක් මෙවර අය වැයෙන් ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීවරයා කිව්වා, රාජපක්ෂවරුන්ට මේ අය වැයෙන් සියයට 67ක් වෙන් කර තිබෙනවා කියලා. රාජපක්ෂවරු නියෝජනය කරන අමාත්‍යාංශවලට මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙන්නේ සියයට 26යි. ඒකෙනුත් සියයට 15ක මුදල් ප්‍රතිපාදනයක් ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කර තිබෙනවා. අසත්‍ය තොරතුරු, වහසි බස් කිය කියා විපක්ෂය හැම දාම කයිවාරු ගහනවා. ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට අද හත් අට දෙනෙක් විතර ඉන්නවා. එතුමාට ඒ අයවත් පාලනය කරගන්න බැහැ. එහෙම විපක්ෂ නායකයෙක් අද ඉන්නේ. එතුමන්ලා ගමින් ගමට යනවා. ගිහින් මොනවාද කරන්නේ? මේ රටේ බලයට එන්න දඟලනවා. හැබැයි, ඒක හීනයක් විතරයි. සජිත් ප්‍රේමදාස මහත්මයාට නැවත මේ රටේ බලයට එන්න බැරි බව අපි පැහැදිලිවම දන්නවා. අපි විතරක් නොවෙයි. ඔය පිටුපස ආසනයේ ඉන්න ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමාත් ඒක හොඳටම දන්නවා. අපි එක්ක මේ දේවල් කියන ගමන් තමයි ගිහිල්ලා අනෙක් පැත්තට වැඩේ කරන්නේ.

අපි යුද ජයග්‍රහණය කළා වාගේම පසුගිය කාලයේ කොවිඩ් - 19 වසංගත තත්ත්වය පාලනය කරලා මේ රට නැවත වැඩබිමක් කරන්න අවශ්‍ය කටයුතු අද ආරම්භ කර තිබෙනවා. විශේෂයෙන්ම, "ළමයි කාපු රටේ බළල්ලු හොයන්න එපා" කියනවා නේ. ඒ වාගේ, ලොකු වසංගතයක් -ව්‍යසනයක්- ඇවිල්ලා, රටේ නිෂ්පාදනය ඇනහිටලා, නැවත සංවර්ධන කටයුතු ආරම්භ කරනකොට මේ රටේ ආර්ථික අර්බුදයක් එනවා කියන එක ඕනෑම පොඩි ළමයෙකු පවා දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒකට විසඳුමක් ලබා දෙන්න වැඩ පිළිවෙළක් මේ රට තුළ අපි ආරම්භ කර තිබෙනවා. මේ වන විට අපේ රටේ නිෂ්පාදනය ආරම්භ කර තිබෙනවා. මේ නිෂ්පාදන

තුළින් මේ රටේ ආර්ථිකයට පණ දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න, පුනර්ජනනීය බලශක්තිය මේ රටේ ස්ථාපනය කරන්න අද වැඩසටහන් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒවාට අකුල් හෙළන විපක්ෂයක් තමයි අද ඉන්නේ.

TNA එකේ ගරු මන්ත්‍රීවරයෙක් අද ජාතිවාදය ගැන කථා කළා. අපි ඉතාම ඕනෑකමින් මේ කාරණය කියනවා. එතුමාගේ කථාවේදී කිව්වා, එල්ටීටීඊ ප්‍රභාකරන් එතුමාගේ නායකයා කියලා. ඒ වාගේ ත්‍රස්තවාදී, ම්ලේච්ඡ පුද්ගලයකු එතුමන්ලාගේ නායකයා කියලා කියනවා නම්, ආයෙත් එවැනි හීන දකින්න බැහැ කියන එක මම විශේෂයෙන්ම මතක් කරනවා. රාජපක්ෂවරු මේ රටේ ඉන්නකල්, පොදුජන පෙරමුණේ ආණ්ඩුවක් තිබෙන කල් ත්‍රස්තවාදයට, වර්ණවාදයට, වෙනත් කිසිම භේදයකට අපි ඉඩ තියන්නේ නැති බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සිකුරාදා -නොවැම්බර් මාසයේ 12 වනදා- ඉදිරිපත් කරන්න යෙදුණේ නිදහස් ලංකාවේ 76 වන අය වැය ලේඛනයයි. නිදහසින් පසු අවුරුදු 73ක් ගතවෙලා තිබෙන වෙලාවේ ඉදිරිපත් වූ අය වැය ලේඛනය අනෙකුත් අය වැය ලේඛනත් එක්ක බැලුවාම ප්‍රගතිශීලී අය වැය ලේඛනයක් වන්නේද, එහෙම නැත්නම් ජනතා ද්‍රෝහී අය වැය ලේඛනයක් වන්නේ ද කියන කාරණය අපි තීරණය කරන්නේ කොහොමද? මීට ප්‍රථමත් මම මේ ගරු සභාවේදී මේ කරුණ මතු කර තිබෙනවා. එය තීරණය වන්නේ, පළමුවර අය වැය ලේඛනය ඉදිරිපත් කරලා, දෙවන වර අය වැය ලේඛනයට අදාළ කථාව පවත්වා, සංඛ්‍යා ලේඛන ටික සභාගත කරලා, ඉන් පස්සේ දවස් හතක් අය වැය ලේඛනය පිළිබඳව දෙවන වර කියැවීමේ විවාදය පවත්වා, ඉන් පසු තුන්වන වර කියවීම හෙවත් කාරක සභා අවස්ථාවේදී සති ගණනක් කථා පවත්වා, අන්තිමේදී අය වැය තුන්වන වර කියැවීම පිළිබඳ විවාදය අවසන් කරලා ඡන්ද විමසීමෙන් පසුව නොවෙයි.

අය වැය ලේඛනය ප්‍රගතිශීලී ද, ජනතා ද්‍රෝහී ද කියන තීන්දුව ගන්න අපට පුළුවන් වෙන්නේ වසරකට පසුව. ඒ නිසා, අද ලෝකයේ බොහෝ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල ක්‍රියාත්මක වෙන, අපිත් ක්‍රියාත්මක කළ යුතුව තිබෙන වැදගත්ම අවස්ථාවක් තමයි අය වැය ලේඛනය ඉදිරිපත් කරලා වසරකට පස්සේ ඒ අය වැය ලේඛනය පිළිබඳ විවාදයක් ඇති කිරීම. අපි අපේ රටේ system change එකක් පිළිබඳ කථා කරනවා නම්, අපි අපේ රටේ අය වැය ලේඛනය සහ සමස්ත රාජ්‍ය මූල්‍ය වියදම් කිරීම සහ කළමනාකරණය පිළිබඳ කථා කරනවා නම්, ඇත්තටම අපට වැදගත් වෙන්නේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාට පසුව පවත්වන දීර්ඝ විවාදය වාගේම, ඊටත් වඩා වැදගත් වෙන්නේ වසරකට පසුව -ගිය වසරේ- අය වැය ලේඛනය පිළිබඳ සංවාදයක් ඇති කිරීමයි. අපි ඒ සඳහායි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සකස් කර ගත යුතුව තිබෙන්නේ. ඒ සඳහායි අපි පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යා යුතුව තිබෙන්නේ. පාර්ලිමේන්තුව තුළ එවැනි සම්ප්‍රදායක් හඳුන්වා දීමේ වැදගත්කම තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගියවර අය වැය ලේඛනය ඉදිරිපත් කළා. අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සේ මෙතැනින් එළියට යන මන්ත්‍රීතුමන්ලාට ගේට්ටුව ළඟදී මයික්‍රොෆෝනය දික් කළාම විවිධ මාධ්‍යයට විවිධ අදහස් කියනවා. ආණ්ඩු පක්ෂයේ අය කියනවා, "අය වැය හොඳයි, හොඳයි ඉතිහාසයේ ඉදිරිපත් වෙච්ච හොඳම අය වැය" කියලා. විපක්ෂය ඒ අය වැයේ අඩුපාඩු දකිනවා. මේ විධියට වරින් වර පත් වෙන ආණ්ඩුව සහ විපක්ෂය අය වැය ලේඛන 75ක හොඳ නරක දැකලා තිබෙනවා. හැබැයි, අවුරුද්දකට පස්සේ කාටවත් මතක නැහැ, ගියවර අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරපු ඒ ප්‍රගතිශීලීයැයි කියපු, තවත් පිරිසක් ජනතා ද්‍රෝහීයැයි කියපු අය වැය ලේඛනයේ තිබුණේ මොනවා ද, එයින් ක්‍රියාත්මක වුණු ප්‍රතිශතය කොපමණද, කිසිසේත්ම ක්‍රියාත්මක නොකළ ප්‍රමාණය කොපමණ ද, අඩක් ක්‍රියාත්මක වුණු ප්‍රමාණය කොපමණ ද, ක්‍රියාත්මක කරලා අවසාන වුණු ව්‍යාපෘති මොනවාද කියලා. එහෙම දෙයක් නැහැ. ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් - National Evaluation Policy එකක් - ඇති කිරීමේ වැදගත්කම බොහෝ රටවල් තේරුම් ගත්තේ මේ නිසායි. අපට වඩා සමාජ ආර්ථික දර්ශනවලින් පහළ නේපාලයේත් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ඒ රටේ ව්‍යවස්ථාවේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, අපේ රටේ ජාතික ඇගයීමේ ක්‍රමවේදයක් නැහැ; ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් නැහැ. සමහර වෙලාවට ලංකාවේ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ වාර්ෂික වාර්තාව තුළ පවා ඇගයීමේ ක්‍රමවේදය - evaluation policy එක - පිළිබඳ වාක්‍ය කිහිපයක් සඳහන් කරලා තිබෙනවා. හැබැයි, අපේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් නැහැ. ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් මේ වන විට නීතිගත වෙලා තිබෙනවා. එතැනින් එහාට ඒ ආයතනික ව්‍යුහය සහ ක්‍රියාදාමය හදලා නැහැ. ඒ නිසා අපේ සමස්ත සංවර්ධන වැඩ පිළිවෙළ, නැත්නම් මේ අය වැයෙන් වෙන් කරන පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලට අදාළ ඇගයීමේ ක්‍රියාවලියක් නැහැ. එහෙම තත්ත්වයක් තුළ හැම සාම්ප්‍රදායික අය වැයකින්ම පසු තව ඉදිරියටත් මේ විධියටම යනවා නම්, ඉදිරිපත් වෙන හැම අය වැයක්ම ප්‍රගතිශීලී අය වැයක් විධියට ආණ්ඩුව දකියි; ද්‍රෝහී අය වැයක් විධියට විපක්ෂය දකියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවෙයි, විපක්ෂයෙයි අපි කවුරුත් වැඩිම අවධානය යොමු කළ යුත්තේ මේ අය වැය විවාදයට වෙන් කරන කාලය වාගේම, වසරකට පෙර ඉදිරිපත් කරපු අය වැය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කරන්නයි; ඒ පිළිබඳ ගැඹුරු ඇගයීමක් කරන්නයි. එයින් එකතු කර ගන්න පුළුවන් වුණු සාධනීය ප්‍රතිඵල මොනවාද, නිෂේධනාත්මක කාරණා මොනාවාද කියන කාරණයට අවධානය යොමු කරන්න. හැබැයි, එහෙම නොවීමේ ඛේදනීය තත්ත්වය අපි විඳිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ඩොලර් ගෙනෙන්න දායක වන පිරිස රටේ සමස්ත ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය සියයට 50ක් ඉක්මවලා තිබෙනවා. අපේ රටට ඩොලර් ගෙනෙන පිරිස බැලුවොත්, ප්‍රධාන අංශ තුනක් නියෝජනය කරන්නේ කාන්තාවෝ. වැවිලි නිෂ්පාදනයේ -තේ නිෂ්පාදනය සහ අනෙකුත් වැවිලි ක්ෂේත්‍රයේ- වැඩ කරන සාතිශය බහුතරයක් කාන්තාවෝ. මැද පෙරදිග ඇතුළු බොහෝ විදේශ රටවල සිට අපට ඩොලර් එවන සාතිශය බහුතරයක් කාන්තාවෝ. ලංකාවේ ඇඟලුම් ඇතුළු නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ ශ්‍රමය කැප කරන සාතිශය බහුතරය කාන්තාවෝ. කාන්තාවන්ගේ ශ්‍රමය නිසා අපට ඩොලර් ලැබෙනවා.

අද අපේ මේ මන්ත්‍රීවරුන්ගේ මේසය මත වැදගත් පොතක් තියලා තිබෙනවා. මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ, පාර්ලිමේන්තු කාන්තා සංසදය. එය ඉදිරිපත් කර තිබෙන්නේ, ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව

[ගරු බුද්ධික පතිරණ මහතා]

විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාව තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ විශේෂ කාරක සභාවේ 2021 වසරේ ප්‍රකාශනයක් විධියට.

මේ තුළ, "ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අන්තර්ග්‍රහණීය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිබඳ සරල මාර්ගෝපදේශය." සඳහන්ව තිබෙනවා. Gender-based budgeting පිළිබඳව අද ලෝකය කථා කරනවා. හැබැයි, අපි ඒ පිළිබඳව යොමු කරලා තිබෙන අවධානය ඉතාම අඩුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ කථිකාචාර්යවරුන්ට සාමාන්‍යයෙන් අවුරුදු 65 වනතෙක් වැඩ කරන්න පුළුවන්. ශ්‍රේෂ්ඨාධිකරණය තුළ සිටින විනිශ්චයකාරවරුන්ට වයස අවුරුදු 65 වනතෙක් වැඩ කරන්න පුළුවන්. අභියාචනාධිකරණය තුළ සිටින විනිශ්චයකාරවරුන්ටත් වයස අවුරුදු 63 වනතෙක් වැඩ කරන්න පුළුවන්. මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේත් එහෙමයි. මේ වාගේ යම්කිසි ආයතනික පද්ධතියක් තුළට පමණක් තිබුණු මේ වයස අවුරුදු 65ක සීමාව සමස්ත ව්‍යූහය තුළට ගෙන ඒම නිසා විය හැකි දේවල් තිබෙනවා. දැනට ත්‍රිවිධ හමුදාවේ වැඩ කරන අයගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව දීර්ඝවීම නිසා ඒක හමුදාවට අදාළ වෛද්‍ය ක්ෂේත්‍රයට කොයි විධියට ද බලපාන්නේ කියන කාරණය පිළිබඳව සකස් කරපු ලියවිල්ලක් - "Impact of extension of compulsory retirement age of medical officers in militaries" - මම මේ අවස්ථාවේ **සභාගත*** කරන්න කැමැතියි.

අද රටක් විධියට අපට තිබෙන අර්බුදයක් තමයි, මේ ජනගහන පිරමීඩය අපේ රටේ තිබෙන්නේ වෙනස් විධියකට වීම. දැන් අපේ රටේ වෘද්ධ ජනගහනය, නැත්නම් වැඩිහිටි ජනගහනය වේගයෙන් ප්‍රසාරණය වෙද්දී, තාරුණ්‍යයට අදාළ තරුණ ජනගහනය වේගයෙන් හැකිළෙන තත්ත්වයක් තමයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව පේන්නේ. අපේ රටේ අවුරුදු 10කට සැරයක් සංගණනය කරන්න ඕනෑ. 2021 කියන්නේ සංගණනයක් කරන්න ඕනෑ වර්ෂය. මීට කලින් 2011 වර්ෂයේදී, ඊට කලින් 2001 වර්ෂයේදී, ඊටත් කලින් 1991 සහ 1981 ආදී වශයෙන් අවුරුදු 10කට සැරයක් සංගණනයක් වුණා. නැවතත් ජාතික සංගණනයක් සිදුවිය යුතු අවුරුද්ද තමයි, මේ 2021 අවුරුද්ද. හැබැයි මම දන්නේ නැහැ, මේ කොරෝනා වසංගතයත් එක්ක ජාතික සංගණන ක්‍රියාවලිය කොයි විධියට සිද්ධ වෙනවා ද කියලා. ඇත්ත වශයෙන් බැලුවොත්, 1981න් පස්සේ උතුරේ සහ දකුණේ තිබුණු විවිධ අරගළ නිසාත්, ඉන් පසුව ඇති වුණු තත්ත්වත් එක්කත් අපට 1991 සංගණනය විධිමත්ව රටේ පවත්වන්න බැරි වුණා. 2001 සංගණනය විධිමත්ව පැවැත්වුණේ නැහැ. 2011 සංගණනය තිබුණා. නමුත්, 2011 ජාතික සංගණනයට අදාළ සම්පූර්ණ වාර්තාව සහමුලින් එළියට දැම්මේ නැහැ. එදා ගරු හර්ෂ ද සිල්වා මැතිතුමන්ලා, අපි විපක්ෂයේ ඉඳගෙන 2011 සංගණනයේ සම්පූර්ණ වාර්තාව පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කළා. මට ඒක මතකයි. 2021 සංගණනයට මොකද වෙන්නේ? මොකද, මේ දත්ත උඩ තමයි අද ලෝකයක් දුවන්නේ. නිවැරදි නිරවුල් දත්ත ඉතා වැදගත්. හැබැයි, ඒ කාරණය පිළිබඳව මට නම් පේන්නේ නැහැ, මේ අය වැය ලේඛනය තුළ සාධනීය අවධානයක් යොමු කර තිබෙනවා කියලා. විදේශ

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අත්දැකීම් එක්ක බලනකොට ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉගෙන ගන්නා දරුවන් ගැන බලමු. අපේ දරුවෝ විදේශ රටක ඉගෙන ගන්න ගියාම ඒ අයට අධ්‍යාපනය ලබන ගමන් කරන්න අතුරු රැකියා තිබෙනවා. එවැනි සංස්කෘතියක් තිබෙනවා. හැබැයි, ලංකාවේ එවැනි සංස්කෘතියක් නැහැ. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉන්න දරුවන්ට, රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යාපන කටයුතුවලට දායක වෙමින්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දායක වෙමින් රැකියා කරන්න පුළුවන් වාතාවරණයක් නැහැ. එවැනි සංස්කෘතියක් නැහැ. විදේශ රටවල නම් අවුරුදු 60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට, නැත්නම් වැඩිහිටි පිරිස් සඳහා රැකියා ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, ලංකාවේ ඒ සංස්කෘති දෙකම නැහැ. එවැනි තත්ත්වයක් තුළ ඒ අයට විකල්ප රැකියා සොයා දෙන, ඒ සංස්කෘතිය ඇති කරන්න යන ක්‍රියා මාර්ගය පසෙක තියලා, විශ්‍රාම යෑමේ වයස් සීමාව අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම තුළ, නව ජවයකින් නිර්මාණශීලිව කටයුතු කරන සෑම ක්ෂේත්‍රයකම තරුණ කණ්ඩායම්වලට ඇති වෙන්නේ ඉතා කනගාටුදායක තත්ත්වයක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිස්ත්‍රික්කයකට ජාත්‍යන්තර පාසලක් හැදීම ගැන කථා වුණා. මම රජයට කියන්නේ මෙයයි. රජය තේරුම් ගන්න ඕනෑ, ප්‍රමුඛතා. ජාත්‍යන්තර මට්ටමේ පාසලක් පෞද්ගලික ව්‍යවසායක් විධියට ඇති වෙනවා නම්, අපි ඉස්සෙල්ලාම බලන්න ඕනෑ, දැනට ඇතිවෙලා තිබෙන මේ ජාත්‍යන්තර පාසල් පිළිබඳව. ඒ ජාත්‍යන්තර පාසල් නියාමනයට අධ්‍යාපන අමාත්‍යාංශය මීට වඩා දායකත්වයක් ලබා දෙන්න ඕනෑ. මොකද, ඒවා ලියා පදිංචි වෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ නොවෙයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා විධියට කටයුතු කරපු 2010-2014 කාලයේ පක්ෂ, විපක්ෂ සියලුදෙනාම එකතු වෙලා 1930 දශකයේ හඳුන්වා දුන්නු අධ්‍යාපන ආඥාපනත සංශෝධනය කිරීම පිළිබඳව පුළුල් සංවාදයක් ඇති වුණා. හැබැයි, ඒක එතැනින් එහාට ගියේ නැහැ. ඒ තුළ ජාත්‍යන්තර පාසල් නියාමනය සහ අධීක්ෂණය පිළිබඳව බලවත් අදහස් ගණනාවක් ඉදිරිපත් වුණා.

ලංකාව තුළ අද තිබෙන බරපතළ ගැටලුව මෙයයි. ජාතික පාසල් පද්ධතිය, පළාත් සභා පාසල් පද්ධතිය අපි ප්‍රමිතියකින් පවත්වාගෙන යනවා වාගේම ජාත්‍යන්තර පාසල් නියාමනය කිරීමේ ක්‍රමවේදයකුත් ඇති කරන්න ඕනෑ. එලෙස නියාමනයක් නොමැතිකම නිසා කොරෝනා වසංගත සමයේත් ජාත්‍යන්තර පාසල්වලින් දරුවන්ගේ දෙමව්පියන්ට බලවත් අසාධාරණකම් වුණාය කියලා බොහෝ මාධ්‍යවල වාර්තා පළ වෙනවා. අපට දුරකථන ඇමතුම් දෙනවා. අපට වාර්තා ගෙනැත් දෙනවා. ඉතා පැහැදිලිව, සමහර අවස්ථාවලදී ජාත්‍යන්තර පාසල් ක්ෂේත්‍රය තුළ ඇති වෙලා තිබෙන ඒ තත්ත්වය ගැනවත් අඩු ගණනේ විමර්ශනයක් නොකර අලුත් ජාත්‍යන්තර-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මට විනාඩි 15ක් තිබෙනවා කියලා ඔබතුමා කිව්වා නේ. දැන් විනාඩි 11යි, තත්පර 49යි ගත වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පස් වරු 1.30ට නේ පටන් ගත්තේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මම stopwatch එකත් තියාගෙන කථා කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම ඉතා පැහැදිලිව කියනවා, ජාත්‍යන්තර පාසල් අලුතෙන් ඇති කරන්න ප්‍රථම, තිබෙන ජාත්‍යන්තර පාසල් පිළිබඳව සහ ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳව, ඒ තුළ දෙමව්පියන්ට සිදුවන අගතීන් පිළිබඳව විමර්ශනය කිරීම සහ ඒ පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන විනාඩි කිහිපය තුළ මම විශේෂ අවධානයක් යොමු කරන්න කැමැතියි, සුරාබද්ද සහ සිගරැට් බද්ද සම්බන්ධයෙන්. පාර්ලිමේන්තුවේ පසු ගිය වකවානුවේ මම යෝජනා කළා, සිගරැට්ටුවක මිල රුපියල් 20කින් වැඩි කළොත් රුපියල් බිලියන 55ක් අපට හොයා ගන්න පුළුවන්කම තිබෙනවා කියලා. රුපියල් බිලියන අටක් හොයන්න සිගරැට්ටුවක් රුපියල් 5කින් වැඩි කරලා තිබෙනවා. මම එදා ඒ කාරණය සඳහන් කළා. 2019න් පස්සේ සිගරැට්ටුවක මිල වැඩි වෙච්ච නැති නිසා තමයි එය රුපියල් 20කින් වැඩි කරන්න කිව්වේ. එහෙම වැඩි කළා නම් ගරු වැටුප් ප්‍රශ්නයට අවශ්‍ය මුදල එතැනින්ම අපට ආවරණය කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම තමයි සුරාබද්දත්.

මේ කාරණා දෙක සම්බන්ධයෙන් 2011 වසරේදී පාර්ලිමේන්තුවේදී මම කරපු කථාවක් හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. මම ඒ කථාවේදී පෙන්වා දෙනවා, සිගරැට් බද්ද වැඩි වුණාය කියලා ඒ වැඩි කරන මුදල් සියල්ලම රජයට ලැබෙන්නේ නැහැ කියලා. 2012 අය වැය ලේඛනය පිළිබඳ විවාදයේදී මම මේ වාගේ කථා කරන වෙලාවක ආචාර්ය නිශාන් ද මෙල් කරපු සමීක්ෂණ වාර්තාවක් සභාගත කර තිබෙනවා. ඒ ලේඛනයට අනුව 2011 වසරේ රුපියල් බිලියන 100ක් රටට අහිමි වෙලා තිබුණා. සිගරැට් බද්ද වැඩි කිරීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල රටේ මහා භාණ්ඩාගාරයට එන්නේ නැහැ. එයින් කොටසක් කොම්පැනියට තමයි යන්නේ. ඒ ආකාරයට කොම්පැනියට ගිය මුදල ගණනය කරලා ආචාර්ය නිශාන් ද මෙල් කරපු ඒ සමීක්ෂණ වාර්තාවේ මම සභාගත කළ ඇමුණුමක් පාර්ලිමේන්තු පුස්තකාලයේ තිබෙනවා. එහි තිබෙනවා, රුපියල් බිලියන 100ක් අපට අහිමි වෙලා තිබෙන ආකාරය. මේ රුපියල් පහ වැඩි කිරීමේ කාරණයේදීත් සත්‍ය වශයෙන්ම ඒ සම්පූර්ණ මුදල මහා භාණ්ඩාගාරයට ලැබෙන්නේ නැහැ. එයින් කොටසක් සිගරැට් කොම්පැනියට යන්නේ. එහෙම ගත්තාම, මේ වැඩිකිරීම තුළින් අප බලාපොරොත්තු වෙන ප්‍රමාණය ලබා ගන්න පුළුවන්කමක් නැහැ. රුපියල් බිලියන 100ක් කියන්නේ මේ රටේ ගුරු වැටුප් විෂමතාවට අවුරුදු දෙකකට අදාළ සම්පූර්ණ මුදල ආවරණය කරන්න පුළුවන් මුදල් ප්‍රමාණයක්. ඒ වාගේම තමයි සුරාබද්දත්. මත් වතුර බෝතලය මත ස්ටිකරය ඇලවීමේ ක්‍රියාවලිය අනිවාර්යයෙන්ම විය යුතු දෙයක්. මොකද නීති විරෝධී මත් වතුර සමාජගත වීම නවත්වන්නත්, ඒ සම්බන්ධ අයථා ක්‍රියා නවත්වන්නත් ඒක වැදගත් වෙනවා. *[බාධා කිරීමක්]* එදා යහ පාලන ආණ්ඩුව ඒක කරන්න භාර දුන්නේ කාටද? අසාදු ලේඛනයේ තිබෙන ඉන්දියානු සමාගමකට දුන්නේ. හැබැයි, මේ ආණ්ඩුවත් ඒක ඒ විධියටම කිසි වෙනසක් නැතුව ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා. මුට්ට කාසි එකතු කරනවා වාගේ රටක මහා භාණ්ඩාගාරයට මුදල් එකතු කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය ඉතා පැහැදිලිව තමුන්ගේ ප්‍රමුඛතා හඳුනාගත යුතුව තිබෙනවා. ඒ ප්‍රමුඛතාවලට මුදල් වෙන් කළ යුතුව තිබෙනවා.

නිදහසෙන් පස්සේ අවුරුදු 73ක් තුළ අපේ රටේ අය වැය ලේඛන 76ක් ඉදිරිපත් කර තිබෙනවා. මම මුදල් ඇමතිතුමාට කියනවා, ඊළඟ අවුරුද්දේ ඔබතුමා අය වැය ඉදිරිපත් කරනවා නම්, පාර්ලිමේන්තුව තුළ අලුත් සංස්කෘතියක් ඇති කරන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. මේ සභාවට ඒක ඉදිරිපත් කරන්න ප්‍රථම අවුරුද්දක් තුළ කෙරුණු කාරණා පිළිබඳව ගැඹුරු සාකච්ඡාවකට යන්න. ලෝකයේ දියුණු රටවල එහෙමයි වෙන්නේ. ඒක නිසා pre-budgetary debate එකක්, නැත්නම් අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට පළමුව විවාදයක් ඇති කරන්න. ඒ තුළ අලුත් අදහස් ගන්න පුළුවන්. ඒ පිළිබඳව අපට ගැඹුරින් විශ්ලේෂණය කරන්න පුළුවන්. මහජන මුදලට සාධාරණයක් ඉෂ්ට කරන්න එවැනි සංස්කෘතියකට රට සහ පාර්ලිමේන්තුව යා යුතුයි.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිසකුට්ටි ආරච්චි මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.46]

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභියෝග මැද රට ගමන් කරන මේ මොහොතේ ඒ අභියෝගවලට මුහුණ දෙන ආකාරය බොහොම පැහැදිලි ලෙස දක්වමින්, 2022 වර්ෂය වෙනුවෙන් අභියෝගාත්මක අය වැයක් ගරු බැසිල් රෝහණ රාජපක්ෂ ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා.

මම මෙන්න මේ පුංචි කථාව කියලා අය වැය විවාදයට ප්‍රවේශය ගන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජලයෙන් වට වුණ පුංචි නගරයක් තිබුණා. ඒ නගරයේ ව්‍යාපාරිකයෝ කීප දෙනෙක් හිටියා. එක ව්‍යාපාරිකයෙක් තමයි බී. රෝහණ කියන පුද්ගලයා. අනෙක් ව්‍යාපාරිකයා තමයි අනුර. අනෙක් ව්‍යාපාරිකයා තමයි සජිත්. ඒ නගරයේ ඉන්න ව්‍යාපාරිකයෝ අතරේ හරි ප්‍රසිද්ධයි, ඇපල් ව්‍යාපාරය. බී. රෝහණ කියන පුද්ගලයාත් ඇපල් ව්‍යාපාරය කරනවා. අනුර-සජිත් සහ පුත්‍රයෝ කියන සමාගමත් ඇපල් ව්‍යාපාරය කරගෙන යනවා. බී.රෝහණ කියන පුද්ගලයා ගාව තිබෙනවා බොහොම සුපිරිසිදු, හොඳ quality එකක් තිබෙන, ගුණාත්මකභාවයෙන් යුතු හොඳම වර්ගයේ ඇපල්. දැන් එයා ඒ ඇපල් ටික විකුණාගෙන යනවා. කොහොමද එයා ඒ ඇපල් ටික විකුණන්නේ? "ඇපල් ගෙඩි තුනක් රුපියල් 100යි. ඇපල් ගෙඩි තුනක් රුපියල් 100" කියලා ඇත්ත කථාව කියලා, ඔහු ඇපල් ටික විකුණනවා. එහෙම තමයි ඇපල් විකුණන්න පුළුවන්. හැම කෙනෙකුටම ඇපල් ගේන්න පුළුවන් එකම තැනින්; එකම ගණනට තමයි විකුණන්නේ. ඊළඟට, අනුර-සජිත් සහ පුත්‍රයෝ කියන සමාගම ළඟත් ඇපල් තිබෙනවා. ඒවා ටිකක් පරණයි. හැබැයි, විකුණන්නත් ඕනෑ. ඒ ගොල්ලන්ටත් විකුණන්න පුළුවන්කම තිබෙන්නේ ගෙඩි තුනම රුපියල් 100ට තමයි.

දැන් අනුරට ලොකු ප්‍රශ්නයක්. ඇයි, බී. රෝහණ සුපිරිසිදු ඇපල් විකුණන්නේ? සුපිරිසිදු, quality එකේ ඇපල් විකුණන්නේ තුනම රුපියල් 100ට. අනුර මොකක්ද කරන්නේ? සජිත්ගේ කනට කරලා යමක් කියනවා. කනට කරලා යමක් කියලා, සජිත්ගේ අතට එක ඇපල් ගෙඩියක් දීලා, අනුර ගන්නවා ඇපල් ගෙඩි දෙකක්. අරගෙන අනුර ඇපල් ගෙඩි දෙකක් උඩ දාලා කියනවා, "දෙකක් 100යි. දෙකක් 100යි" කියලා. සජිත් ඒ අතර

[ගරු තිසකුට්ටි ආරච්චි මහතා]

එකක් උඩ දාලා කියනවා, "එකක් නොමිලේ..." කියලා. දැන් මොකක්ද වුණේ? බී. රෝහණ ඇත්ත කථාව කියලා quality එකේ ඇපල් තුනම 100යි කියලා විකුණනකොට අනුර-සජිත් සහ පුත්‍රයෝ සමාගම, "දෙකක් 100යි; එකක් නොමිලේ. දෙකක් 100යි; එකක් නොමිලේ." කියලා විකුණනවා. එතැනත් තුනම 100 තමයි. දැන් අනුර සජිත්ට කනට කරලා කීවේ මොකක්ද? මේක ශිෂ්‍යත්ව ප්‍රශ්නයක්. අනුර, සජිත්ට කනට කරලා කීවේ මොකක්ද? "බී. රෝහණත් එක්ක එල්ලෙන්න, පැද්දෙන්න අමාරුයි. සුපිරිසිදු ඇපල් ටික තිබෙන්නේ. පුද්ගලයා තුනම 100ට විකුණනවා, සජිත්. අපිටත් තුනම 100ට තමයි විකුණන්න වෙලා තිබෙන්නේ. ඒක නම් එහා මෙහා කරන්න බැහැ, මේ තිබෙන තත්ත්වය හැටියට. ඒ නිසා මේකට වචන හරඹයක් ගේන්න ඕනෑ. මම දෙකක් උඩ දාන්නම් 'රුපියල් 100යි' කියලා. උඹ ළඟ තිබෙනවා ඒකට වචන හරඹය. උඹ එකක් උඩ දාපන් 'නොමිලේ' කියලා. එහෙම කෑ ගහපන්". කිව්වා. අන්න ඒ 'නොමිලේ' කියන වචනයට සෙනඟ අද්දවා ගන්න පුළුවන් කියලා අනුර, සජිත්ට කියනවා.

එහෙම කියලා දැන් ඇපල් ටික විකුණනවා. දැන් ජනතාව, දරුවෝ ටික අරගෙන ගිහින් සුපිරිසිදු ඇපල් ටිකක් කනවා. දැන් අනුර-සජිත් සහ පුත්‍රයෝ සමාගමේ ඇපල් ටිකත් කනවා. අනේ, අනුර-සජිත් සහ පුත්‍රයෝ සමාගමේ ඇපල් කාපු දරුවෝ ටිකට බඩේ අමාරුව හැදෙනවා; පිස්සු හැදෙනවා; කුඩේ තියාගෙන ඒ දරුවෝ වැස්සේ තෙමෙනවා. ඒ දරුවෝ vaccine එක තියාගෙන Plaquenil බොනවා. ඇස්ට්‍රාසෙනිකා එන්නත එනකොට, "මම නම් එන්නත විද ගන්නේ නැහැ" කියනවා. ෆයිසර් එන්නත එනකොට, නෝනාගේ අතින් අල්ලාගෙන දුවලා ගිහිල්ලා, නංගිගේ අතින් අල්ලාගෙන දුවලා ගිහිල්ලා ෆයිසර් එන්නත විද ගන්නවා. පාලම තියාගෙන ජිදණ්ඩේ යනවා. පුංචි කාර් එකක නැගලා අත වන වනා ආරක්ෂකයෝ පිරිවරාගෙන නගරය මැද්දෙන් පැනලා යනවා. කොරෝනා මර්දනය කරපු රට තුළ කොරෝනා බෝ කරන්න හිතාගෙන උද්ඝෝෂණ පවත්වාගෙන යනවා.

දරුවෝ ටිකක් අනුරගේ ඇපල් කාලා, උද්ඝෝෂණ කර කර, කැට හොල්ලන වෙලාවේ, අධ්‍යාපන කප්පාදුව තුළ තමන්ගේ අධ්‍යාපනය ආපස්සට ගෙන යන වෙලාවේ, තමන්ගේ දරුවා ගිහිල්ලා 350 බියර් එක 3,500ට බොනවා, ඒ ඇපල් ගෙඩිය කාලා. අර "දෙකම 100යි, එකක් නොමිලේ" කියලා දෙකම උඩ දාපු, ඇපල් ගෙඩිය කාලා ටිකිරි ටිකිරි ටිකිරි ලියා මතක් කරගෙන, රෙද්දයි හැට්ටෙයි අන්දවපු කෙළි පැංචියෙක් එක්ක 3,500 බියර් එක බීලා, ඒ දරු පැටව් ටික හොඳ ජොලියක් ගන්නවා. හැබැයි, බී. රෝහණගේ ඇපල් කාපු දරුවෝ ටික Port City ව්‍යාපෘතිය එනතුරු බලාගෙන ඉන්නවා, රැකියා ටික ගන්න.

ග්‍රාමීය ජනතාවගේ රත්තරන් දරු පැටව් ටික අද ලක්ෂ තිහ, ලක්ෂ හතළිහ, ලක්ෂ දාහ ගමට එනකල් බලාගෙන ඉන්නවා, සංවර්ධන කටයුතු ටික ආරම්භ කරන්න. අධිවේගී මාර්ග ටික හැදීගෙන එනකල්, ග්‍රාමීය පාරවල් ටික හැදීගෙන එනකල්, වසම්වල ගෙවල් ටික හැදීගෙන එනකල් ඒ අය බලාගෙන ඉන්නවා. ත්‍රීවීලර් එළවන මල්ලිලා ටික බලාගෙන ඉන්නවා, මිලියන 700ක් ගමට එනකල්. පුනර්ජනනීය බලශක්තිය ගමට එනකල් බලාගෙන ඉන්නවා. පාරම්පරික ගෘහ නිර්මාණකරුවන් මිලියන දාහ එනකල් බලාගෙන ඉන්නවා. සෑමට පානීය ජලය ව්‍යාපෘතියෙන් මිලියන පහළොස්දාහ ගමට එනකල් බලාගෙන ඉන්නවා. මෙන්න මේ වැඩ පිළිවෙළ තමයි අද අපි රටට ඉදිරිපත් කර තිබෙන්නේ. මේ වැඩ පිළිවෙළ හොඳ නැත්නම්, මොන ඇපල් හරහාද මේ රට ගොඩනඟන්න පුළුවන්, මොන ක්‍රමවේදය හරහාද ගොඩනඟන්න පුළුවන් කියලා මේ ආර්ථික විශේෂඥයන් එක්කෙනෙකුවත් හරියාකාරව, පැහැදිලිව කිව්වේ නැහැ. අපි බලාගෙන හිටියා.

ඊළඟට, හර්ෂ ද සිල්වා සහ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමන්ලා දැන් මේ බස්සපු එකක් ගැන කිව්වා. නග්ගන්න අපට දෙන්න කිව්වා. කොහොම නැග්ගිල්ලක්ද හර්ෂ මහත්තයෝ නග්ගන්නේ? 2015 වනතුරු ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ සියයට 5.1ට නඟපු ආර්ථික වර්ධන වේගය ඔබතුමන්ලා 2016දී බස්සනවා, සියයට 4.46ට. ඊළඟට, 2017 වසරේදී 3.58ට; 2018 වසරේදී 3.27ට; 2019 වසරේදී 2.26ට බස්සනවා. ඇෆ්ගනිස්ථානයට පමණක් දෙවැනි වෙන්න බස්සපු බැස්සිල්ල හර්ෂ මහත්තයෝ කියලා දෙන්න කෝ අපට. නග්ගන එක අපි කර ගන්නම්. දැන් ඔබතුමා කියනවා නේ නග්ගන හැටි ඔබතුමාගෙන් අහගන්න කියලා. එදා ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා නග්ගන හැටි එතුමන්ලාගෙන් අහගන්න කියලා. නග්ගන හැටි අපි ඔබතුමන්ලාගෙන් අහගන්න ඕනෑ නැහැ. අපි නග්ග ගන්නම්. හැබැයි, තමුන්නාන්සේලාට 2015 දී රට භාර දෙන කොට තිබුණු සියයට 5.1ක ආර්ථික වර්ධනය 2019 වනකොට සියයට 2.26ට බස්සපු විධිය අපට කියන්න කෝ, හර්ෂ මහත්තයෝ. ජාතික රූපවාහිනියේ පැය තුනක කාලයක් අපි අරගෙන දෙන්නම්. බස්සපු බැස්සිල්ල අපට කියලා දෙන්න කෝ. ඒක කියා ගන්න බැරි වුණා. දැන් ලජ්ජා නැතුව එක එක දේවල් අහනවා. පොල් ගෙඩිය පෙන්වලා අහනවා, "දැන් පොල් කීයද, දැන් සැපද, ලූනු කැවාද, අල එහෙම තිබෙනවාද?" කියලා. හැබැයි, මතක තියා ගන්න, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට එහෙම අහන්න අයිතියක් තිබුණා. ඒ, තිස් වසරක යුද්ධය නිමා කරලා, යුද ගිනි දැල් මැද තිබුණු මේ රට සාමයේ සිසිලැල් මතට ගෙනාපු ආදරණීය අප්පච්චි. එක පැත්තකින් වරායවල්, ගුවන් තොටුපොළවල් හදලා, අධිවේගී මාර්ග හදලා, අටුකොටු ධාන්‍යවලින් පිරෙව්වා. තමුන්නාන්සේලාට මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් බවට පත් කරන්න පුළුවන් වන විධියට අපේ රට ධාන්‍යවලින් පිරෙව්වා. එළවලු ටිකෙන් රට ස්වයංපෝෂිත කරලා, පලතුරුවලින් ස්වයංපෝෂිත කරලා, මේ රටේ ඩොලර් මිලියන 8,200ක සංචිතයක් ඇති කරලා, ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,821ට ගෙනැල්ලා, රට ස්වයංපෝෂිත කරලා දුන්නාට පස්සේ තමුන්නාන්සේලා නැවත යුද බියක් ඇති කරලා මේ රටේ ආර්ථිකය වැට්ටුවා. කොහොමද, ආර්ථිකය වැට්ටුවේ?

2015දී රුපියල් බිලියන 7,000ක්ව තිබුණු ණයබරතාව මෙතුමන්ලා 2019දී බිලියන 13,031කට නැග්ගුවා. එදා ඩොලර් මිලියන 8,200ක්ව තිබුණු රටේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන 7,500ට බැස්සුවා. ඩොලර් 3,821ක් වූ ඒක පුද්ගල ආදායම 3,852ට ගෙනෙන්න විතරයි "යමපාලන" ආණ්ඩුවේ තමුන්නාන්සේලාට පුළුවන්කම ලැබුණේ. අන්න ඒක බලාගෙන හිටපු ගරු මහින්ද රාජපක්ෂ දැයේ ආදරණීය අප්පච්චිට එදා අයිතියක් තිබුණා, "දැන් සැපද?" කියලා යම පාලුවන්ගෙන් අහන්න. "දැන් පොල් කීයද, අල කීයද?" කියලා අහන්න එදා මහින්ද රාජපක්ෂ අප්පච්චිට අයිතියක් තිබුණා. දැන් ඔබතුමන්ලාට එහෙම අයිතියක් තිබෙනවාද? රට කාලා, සුප්පු කරලා, ඇටෙත් කපලා, ලුණු දාලා අව්වේ වේළලා දුන්නේ අපට. එහෙම දීපු රට. දැන් ලජ්ජා නැතුව අපෙන් නැවත අහනවා, "දැන් සැපද, පොල් කීයද, අල තිබෙනවාද, ලූනු කීයද?" කියලා. සැප රටක්ද මහත්තයෝ අපට දුන්නේ? ඊයේ රෝහිණී කවිරත්න ලජ්ජා නැතුව අපෙන් ඇහුවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***

*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*

*[Expunged on the order of the Chair.]*

දැන් අර කාලකණ්ණි ජනතා විමුක්ති පෙරමුණේ -ජේවීපී එකේ- අය ගමෙන් පටන් ගන්න කියලා කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න, මේකත් කියලා දාන්න. මේ ජේවීපී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

රට කනවා. [බාධා කිරීම්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තව විනාඩි පහක කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් දෙන්න කියලා.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ජනතා විමුක්ති පෙරමුණ අද ගමෙන් පටන් ගන්න කියනවා. බම්බුව තමයි ගමෙන් පටන් ගන්නේ. *[බාධා කිරීම්]*

ගමෙන් මොකක්ද පටන් ගන්නේ? හැඳුනුම්පත් ටික එකතු කරගෙන රටේ ආර්ථිකය කාලා- *[බාධා කිරීම්]* ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ගමෙන් පටන් ගන්න කියන්නේ මොකක්ද? රටේ ආදරණීය ජනතාවගේ අනන්‍යතාව පෙන්වන්න තිබුණු හැඳුනුම්පත් ගමෙන් එකතු කරපු යුගය නැවත මතක් කරගන්න. දැන් කියනවා, ගමෙන් පටන් ගනිමු කියලා.

පුංචි කුප්පි ලාම්පුව පැත්තකින් තියලා රත්තරන් දරු පැටවුන්ට විදුලි ආලෝකයෙන් පාඩම් කරන්න තිබුණු යුගය අහිමි කරපු, ට්‍රාන්ස්ෆෝමර් පුපුරවා දමපු අතීතය සිහිපත් කරමින් මුන්නැහේලා ලජ්ජා නැතුව කියනවා, නැවත ගමෙන් පටන් ගනිමු කියලා.

මගේ බාප්පා එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරයකු වශයෙන් කටයුතු කළ කාලය මට මතකයි. ඒ කාලයේ ලුණුගම්වෙහෙර එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතියේ සභාපති වූ පියදාස මාමාගේ බෙල්ල කපලා ඔහුගේ දරු පැටවුන් දෙදෙනාට පෙනෙන්න ගෙදර ඉස්සරහා වැටේ බෙල්ල ගහලා තිබුණා. කඳ කොටස ශාඛා සමිතිය ඉදිරිපිට දමලා තිබුණා. එහෙම පක්ෂයක් තමයි අනුර කුමාර දිසානායක මහත්තයාගේ ජනතා විමුක්ති පෙරමුණ. එහෙව් ජනතා විමුක්ති පෙරමුණ අද ලජ්ජා නැතුව කියනවා, ගමෙන් පටන් ගනිමු කියලා. මොකක්ද, අනුර කුමාර දිසානායක මහත්තයෝ මේ කියන්නේ? අම්මාපල්ලා, පුංචි අම්මාපල්ලා, ලජ්ජයි අනුර කුමාර මහත්තයෝ. හැම දාම මේ සභාවට එනවා, විනාඩි 15ක්, විනාඩි 20ක් ඉල්ලා ගන්නවා. ඊට පස්සේ කට උල් කරලා වීරයකු වාගේ කෑගහලා කථා කරලා, මාධ්‍යයට වචන 10ක්, 15ක් දාගෙන, Facebook එකට දමාගෙන, එතුමා හිතනවා, එතුමා තමයි මේ රටේ ඉන්න හොඳම කථිකයා, එතුමා තමයි දක්ෂම කථිකයා, එතුමා තමයි දක්ෂම පරිවර්තකයා, එතුමාට තමයි හොඳම අදහස් තිබෙන්නේ කියලා. ලජ්ජයි. තමන් කරපු කථාවට පිළිතුරවත් අහගෙන ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අනුර කුමාර දිසානායකගේ පුතා අද පිටරට ගිහින් අධ්‍යාපනය ලබනවා. ඔහුට පුළුවන් නම් රුපියල් 350ට තිබෙන බියර් එක රුපියල් 3,500කට අරගෙන බොන්න, අනුර කුමාර දිසානායකගේ පුතාට පුළුවන් නම් night club ගිහිල්ලා, රෙද්දයි හැට්ටෙයි ඇඳපු දරුවත් එක්ක නටන්න, මේ රටේ ඉඳගෙන සමාජවාදය පිළිබඳ කථා කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපි දකින්නේ. සමාජවාදය පිළිබඳව කථා කරන අනුර කුමාර දිසානායකගේ පක්ෂයේ තව පුද්ගලයකුගේ නෝනායි, දරුවායි යන්නේ BMW එකේ. එහෙව් සමාජවාදය ගැනයි කථා කරන්නේ?

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගෙන් අපි අහනවා, එදා පක්ෂ නායක වශයෙන් සිටි රෝහණ විජේවීර සහෝදරයාගේ ආදරණීය බිරිඳට කරපු උදව්ව මොකක්ද කියලා. රෝහණ විජේවීර සහෝදරයාගේ දරුවන් අද කොහේද ඉන්නේ? ඒ පවුලට සලකන්න බැරි වෙලා තිබෙනවා; තමන්ගේ පක්ෂයේ නායකයාගේ දරුවන්ට සලකන්න බැරි වෙලා තිබෙනවා. බණ්ඩාරනායකවරු තවමත් තමන්ගේ ඉතිහාස කථාවේ පරම්පරාවට සලකනවා; අනුස්මරණය කරනවා. රණසිංහ ප්‍රේමදාස පරම්පරාවේ පවුලට සලකනවා; අනුස්මරණය කරනවා. ඒ වාගේම ජේ. ආර්. ජයවර්ධන පරම්පරාව අනුස්මරණය කරනවා, ඒ පවුල ගැන කථා කරනවා. හැබැයි අද ජනතා විමුක්ති පෙරමුණට බැරි වෙලා තිබෙනවා, තමන්ගේ නායකයාගේ පවුල ආරක්ෂා -සුරක්ෂා- කරන්න. ඊට පස්සේ පක්ෂ නායකයා වශයෙන් සිටි සෝමවංශ අමරසිංහ ආදරණීය නායකයාගේ පස්සට පයින් ගැහුවා, අනුර කුමාර දිසානායක. පස්සට පයින් ගහලා නායකත්වය ලබා ගත්තා. නායකත්වය ලබා ගැනීමේ තණ්හාවට පක්ෂයේ බලය අල්ලන්න විතරයි, අනුර කුමාර දිසානායකට වුවමනාව තිබුණේ. එහෙමයි ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක අද පක්ෂයට සලකන්නේ. ඊළඟට, විමල් වීරවංශ මහත්මයා තමයි, එදා පක්ෂයේ හිටපු දක්ෂම කථිකයා. අඩු තරමේ විමල් වීරවංශ මහත්මයාවත් ආරක්ෂා කර ගන්න බැරි වුණා.

[ගරු තිසකුට්ටි ආරච්චි මහතා]

අද ඇවිල්ලා කියනවා විකල්පය ගැන. මේ රටේ එකම විකල්පය කියලායි අනුර කුමාර දිසානායක කථා කරන්නේ. අපි අහනවා, තමන්ගේ පක්ෂයේ නායකයන් රැක ගන්න බැරි වුණු, පක්ෂයේ මිනිසුන් රැක ගන්න බැරි වුණු අනුර කුමාර දිසානායක මේ රටට මොනවාද කරලා තිබෙන්නේ කියලා. මේ රටේ අනික් සෑම පක්ෂයකම පුද්ගලයන්, මන්ත්‍රීවරු අඩු තරමේ වැසිකිළියක් හෝ හදලා පෙන්වා තිබෙනවා; bus halt එකක් හෝ හදලා පෙන්වා තිබෙනවා. අනුර කුමාර දිසානායක හදපු bus halt එකක් හෝ තිබෙනවා නම් පෙන්වන්න මහත්තයෝ. නායකත්වයට ඒකත් සුදුසුකමක්. කටින් බතල හිටවන්න පුළුවන් මහත්තයෝ. සනත් ජයසූරිය ලකුණු 100ක් ගහනකොට අපි අත්පුඩි ගහනවා. ඊළඟ match එකේ පළමුවන බෝලය full toss බෝලයක්. ඒ full toss බෝලයට හරියට shot එක ගහගන්න බැරිවෙලා out වෙනකොට එළියේ ඉඳගෙන අපට කියන්න පුළුවන්, "අයියෝ, ඕක නොවෙයි ගහන්න තිබුණේ. ඕකට වෙනත් shot එකක් ගැහුවා නම් ලකුණු හයයි නේ" කියලා. කියන්න ලේසියි මහත්තයෝ, කරන්නයි අමාරු.

අද මේ රට මුහුණ දීලා තිබෙන තත්ත්වය අපි හැමෝම තේරුම් ගන්න ඕනෑ. මොන ජගතා ආවත් මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ; මේ රටේ ආර්ථිකයේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ; ඇති වෙලා තිබෙන ලෝක ව්‍යසනය තේරුම් ගන්න ඕනෑ. ඒ තත්ත්වය තේරුම් ගැනීම තුළ පමණයි ඉදිරියට යන්න පුළුවන් වන්නේ. ඒ තත්ත්වය මනාව තේරුම්ගෙන ගරු බැසිල් රෝහණ රාජපක්ෂ ඇමතිතුමා මේ රටට කාලෝචිත අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාය කියන කාරණාව පමණක් මා මතක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට-

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රීති ප්‍රශ්නය මොකක්ද, ඔබතුමාගේ?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවේදී-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රීති ප්‍රශ්නය නඟන්න කෝ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මේ ඒක තමයි. එතුමාගේ කථාවේ අපහාසාත්මක වචන ඇතුළත් වුණා; නොගැළපෙන වචන ඇතුළත් වුණා; කාන්තාවන්ට නොගැළපෙන වචන තිබුණා. ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම කියනවා. මොකද, කාන්තාවන්ටවත් ගෞරවයක් නැති මන්ත්‍රීවරුන් කරන ප්‍රකාශවලින් සමස්ත පාර්ලිමේන්තුවේම ගෞරවය නැති වෙනවා. ඒකයි මම ඔබතුමාට මේ කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මට නම් එහෙම කථාවක් ඇහුණේ නැහැ. මම ගරු කථානායකතුමාට යෝජනා කරනවා, එහෙම දෙයක් තිබෙනවා නම් ඉවත් කරන්න කියලා. මා දන්නා විධියට එහෙම දෙයක් සිදු වුණේ නැහැ.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ මා කළ කථාව තුළ කිසියම් පුද්ගලයෙකු හෝ කාන්තාවක් අපහසුතාවට පත් වන විධියේ අව කැපෙන වචනයක් මගෙන් පිට වුණා කියලා ඒ මන්ත්‍රීවරයා දැන් ඔප්පු කළොත්, මේ දැන් මගේ මන්ත්‍රී ධුරයෙන් මම ඉල්ලා අස් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ, ඔබතුමා ඔප්පු කළොත්. හැබැයි, නැතිනම් ඔබතුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ. පුළුවන්ද? අභියෝගය භාර ගන්නවාද? පිස්සු කථා කරන්න එපා, මහත්තයෝ. බොරු කථා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමා අහන්නේ? රීති ප්‍රශ්නයක්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
රීති ප්‍රශ්නය මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඉදිරියේ මට ඔප්පු කරන්න ඕනෑ නැහැ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට කියනවා ඔබතුමාගේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, බොහොම ස්තුතියි. මම ඒ නියෝගය දීලා තිබෙන්නේ. ගරු කථානායකතුමාට යොමු කරලා, සොයා බලා කටයුතු කරන්න කියලා-

මීළඟට, ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.03]

**ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*
*நஹ்மதுஹு வநுஸல்லி அலா ரஸூலிஹில் கரீம். அம்மாபஃத்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அரசாங்கம் 2022ஆம் வருடத்திற்கான வரவு செலவுத் திட்டத்தினை முன்வைத்திருக்கின்றது. இந்த வேளையிலே வழமைபோல் ஆளும் கட்சியையும் எதிர்க்கட்சிகளையும் சேர்ந்த பலரும் பல்வேறு கருத்துக்களை முன்வைக் கின்றார்கள். வழக்கமாக ஆளும் கட்சி வரவு செலவுத்திட்டத் தினை முன்வைக்கின்றபோது, எதிர்க்கட்சியினர் அதன் குறைபாடுகளைப் பற்றிப் பேசுவார்களே தவிர, அதன் நன்மைகளைப் பற்றிப் பேசமாட்டார்கள். வரவு செலவுத் திட்டத்துக்கான அங்கீகாரம் இந்தப் பாராளுமன்றத்திடம்தான் கேட்கப்படுகின்றது. இந்த நாட்டினுடைய எல்லா மாவட்டங்களிலிருந்தும் பலதரப்பட்ட மக்களும் தேர்ந் தெடுத்து அனுப்பிய பாராளுமன்ற உறுப்பினர்கள் இந்த வரவு செலவுத்திட்டத்தை அங்கீகரிப்பதன்மூலம் 2022ஆம் வருடத்திற்கான அல்லது இந்த நாட்டின் மக்களுக்கான அரசாங்கத்தின் வரவு செலவுத்திட்டம் நிறைவேற்றப் படுகின்றது.

உண்மையில் இந்த நாட்டில் ஒவ்வொரு காலகட்டத்திலும் நாம் பல இடர்களைச் சந்தித்திருக்கிறோம். சுனாமியைச் சந்தித்திருக்கின்றோம்; முப்பது வருடங்களுக்கும் மேலான நீண்டகால யுத்தத்தினைச் சந்தித்திருக்கின்றோம்; உலக நாடுகளின் யுத்தங்களைச் சந்தித்திருக்கின்றோம். அந்தக் காலங்களிலும் இந்த வரவு செலவுத் திட்டங்கள் முன்வைக்கப் பட்டிருக்கின்றன. இந்த உலகத்தையே உலுக்குகின்ற இந்தக் கொரோனா நோய்ப் பிரச்சினை வருவதற்கு முன்பு நமது நாட்டின் பொருளாதாரம் ஒரு நிலையில் இருந்தது.

இந்தப் பாராளுமன்றம் கூடுவதற்கு முன்பு மேன்மைதங்கிய ஜனாதிபதி அவர்களின் தலைமையிலே கூட்டப்பட்ட ஒரு கூட்டத்தில் நாங்கள் கலந்துரையாடியதை இந்த இடத்திலே ஞாபகப்படுத்தலாம் என்று நினைக்கின்றேன். நாங்கள் மேதகு ஜனாதிபதி அவர்களிடம் அந்தக் கூட்டத்தில் வைத்துச் சொன்னோம், "நாம் யாரும் எதிர்பார்த்திருக்காத நிலையில் ஏற்பட்டிருக்கின்ற இந்தக் கொரோனாத் தொற்றுப் பிரச்சினை காரணமாக உலகளாவிய ரீதியிலான பொருளாதாரம் முடங்கிப்போயிருக்கின்றது. உலகளாவிய ரீதியில் உற்பத்திகள் தடைப்பட்டிருக்கின்றன. ஆயினும், இலங்கை மக்களைப் பொறுத்தவரையில், நமக்கு இந்த நாட்டில் நில வளம், குளங்கள், கடல் என எல்லா வளங்களும் நிறைந்திருக்கின்றன. எமது நாட்டின் ஒவ்வோர் அங்குல நிலமும் பெறுமதியானது. எமது நாட்டில் சிறந்த விவசாயிகள் இருக்கின்றார்கள். ஆகவே, உணவு உற்பத்திகள் தொடர்பில் குறுகிய கால ஏற்பாடு, நீண்டகால ஏற்பாடு என்று இரண்டு வகையாகத் திட்டமிட்டுச் செயற்படுகின்றபோது, நமது நாட்டில் உணவுக்குப் பஞ்சம் இருக்காது" என்று. ஆகவே, விவசாயிகளைப் பலப்படுத்துகின்ற விடயத்தில் நாம் கவனஞ்செலுத்தவேண்டும்.

பால் உற்பத்தியில் எப்பொழுதுமே நாம் அசமந்தமாக இருந்திருக்கின்றோம். அதனால் எமது நாட்டில் பால் தட்டுப்பாடு ஏற்படும் சாத்தியம் உள்ளது. குறிப்பாக, இந்தப் பால் மா இறக்குமதியைச் செய்வதற்காக வருடாவருடம் பல கோடி டொலர்களை நாம் செலவழித்து வருகின்றோம். எனவே, விவசாய உற்பத்தியை அதிகரிக்கின்ற அதேவேளை, பால் உற்பத்தியையும் ஊக்குவிக்க வேண்டும்.

உண்மையிலே நாங்கள் எதற்கும் பயப்படவேண்டிய அவசியமில்லை. අපට හාල් තිබුණා, අපට කිරි තිබුණා, අපට එළවලු තිබුණා. අත්‍යවශ්‍ය දේවල් හදන්න පුළුවන්කමක් අපට තිබුණා. අදත් පුළුවන්කම තියෙනවා. මේ ශ්‍රී ලංකා භූමිය නිකම් භූමියක් නොවෙයි. මේ ලෝකයේම ඉන්න බලවත් රටවල් කීපයක් අපේ රටට ඇවිල්ලා, අපෙන් අහලක් හරි අරගෙන ලාභ ගන්න, ප්‍රයෝජන ගන්න බලාපොරොත්තු වන අවස්ථාවක, අපේ ජනතාවගේ ඡන්ද අරගෙන පාර්ලිමේන්තුව ඇතුළට ආපු අපි අපේ මිනිස්සුන්ගේ කෑම බීම ගැන තවමත් හරියට සැලසුමක් කරලා නැති බව පේනවා. අපි එක එක්කෙනා නැඟිටලා එක එක අදහස් කියනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. මම අහනවා, අපට ඡන්දය දීපු මිනිස්සුන්ට, ජනතාවට මොකක්ද අපි මේ මොහොතේ කරන්න යන්නේ කියලා.

අපි දන්නවා, ලෝකයටම ආර්ථික ප්‍රශ්න තිබෙනවා කියලා. හැබැයි, අපට ප්‍රශ්න එන්න කිසි හේතුවක් නැහැ. අපේ රටේ ඕනෑම එකක් තිබෙනවා. අපේ රටේ වැඩ කරන්න ගොවි මහත්තුරු ලෑස්තියි. අපේ ධීවරයෝ ලෑස්තියි. අපේ හමුදාව ලෑස්තියි. අපේ ජනතාව ලෑස්තියි. අපි ගොවිපොළ ශක්තිමත් කරන්න ඕනෑ. අද තිබෙන ප්‍රශ්න උඩ අපට කෑම ගෙන්වන්න ඩොලර් වියදම් කරන්න බැහැ. අපි ඩොලර් වියදම් කරනවා නම් අත්‍යවශ්‍ය දේවල්වලට විතරක් වියදම් කරන්න ඕනෑ. අපේ ව්‍යවසායකයන්ට, අපේ ගොවීන්ට දිය හැකි සහන ටික දෙන්න පුළුවන් නම්, අපට ආර්ථික ප්‍රශ්න එන්නේ නැහැ; අපට කෑම ප්‍රශ්න එන්නේ නැහැ.

මට මතක් වෙනවා, එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලය. ඒ කාලයේ එන්.එම්. පෙරේරා මහත්මයලා නිෂ්පාදනයට වැඩි මුදලක් වෙන් කළා; වැඩි කාලයක් වෙන් කළා. අපේ ගොවි මහත්තුරු පුළුවන් තරම් ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒත්, දැන් ඉදිකටු, කොළ කෑල්ල පවා අපි පිට රටින් ගෙන්නගන්නවා. අපිට raw materials තිබෙනවා. අපිට කඩදාසි හදන්න පුළුවන්, ඉදිකටු හදන්න පුළුවන්. ඒත් ඒ ඔක්කොම පිට රටින් ගෙන්නලා අපි අපේ ආර්ථිකය විනාශ කරලා තිබෙනවා. ඒ, අද ඊයේ ඉඳලා නොවෙයි, නිදහසින් පස්සේ ඉඳලා. නිදහසට කලින් බලවත් රටවල් අපේ රට ආක්‍රමණය කරලා අපේ ආර්ථිකය මංකොල්ල කාලා ගියා. හැබැයි, ඒ සම්පත් ටික අපි තියාගෙන "අපිට කරන්න බැහැ" කියලා කියන්නත් බැහැ.

අපි කාලයෙන් කාලයට ජාතිවාදය අවුස්සනවා. කාලයෙන් කාලයට වෙන රටවලින් ඇවිල්ලා අපට උපදේශ දෙනවා. "මෙන්න, ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරන්න. මේ පුංචි රට කෑලි නවයකට වෙන් කරන්න. වියදම වැඩි කරන්න" කියලා. මේ පොඩි රටේ අපේ ජනතාවට වැඩ කරන්න පාර්ලිමේන්තුව තියෙද්දී, ඒ වාගේම ප්‍රාදේශීය සභා තියෙද්දී මැදින් පළාත් සභාවකුත් ඇති කළා. ඒ පළාත් සභාව සුදු අලියෙක් වාගේ. අද ඒක සුදු අලියෙක්.

මෙවන් අවස්ථාවක මුදල් ඇමතිතුමා ඇවිල්ලා කියනවා, "අපි මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප ලබා දීමේ කාලය අවුරුදු 10කට දීර්ඝ කරනවා" කියලා. ඒ වාගේම ජනාධිපතිවරුන්ගේ pension එකත් කපන්න යනවා. ඒවා ඇත්ත. එහෙම කරමු. හැබැයි, අපේ රටේ

[ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා]

recurrent expenditureවලට කොච්චර සල්ලි වියදම් කරනවාද? එක වැඩකට කොච්චර සල්ලි වියදම් කරනවාද? පාර්ලිමේන්තුව, අගමැතිතුමා, ජනාධිපතිතුමා, ඇමති ධුර, ඇමති මණ්ඩලය, කොමිෂන් සභා තිබෙනවා. ඊට සමාන්තරව හැම පළාත් සභාවකටම වියදම් දරන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකක්ද මේ? මේ වාගේ පොඩි රටකට මොකක්ද ඕනෑ? අපට ඕනෑ මේ ප්‍රශ්නයට විසඳුමක්.

අපි ශ්‍රී ලාංකිකයන් හැටියට බලන්න ඕනෑ. සිංහල ජනතාව - අපේ සහෝදරයෝ- සියයට 75කට වඩා ඉන්නවා. දෙමළ අය ඉන්නවා, මුස්ලිම් ජනතාව ඉන්නවා, ක්‍රිස්තියානි ආගම අදහන ජනතාව ඉන්නවා. අපි කිහිප දෙනායි, අපි ටික දෙනායි ඉන්නේ. අපට අපේ සම්පත් ටික තිබෙනවා. අපි කථා බහ කරලා අපට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදමු. අපි පිට රටවලට යට වෙන්න යන්න ඕනෑ නැහැ.

ඒ නිසා මේ වැදගත් අවස්ථාවේ මම මේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ආර්ථිකය වෙනුවෙන් අපි හොඳ ව්‍යවස්ථාවක් හදමු; හොඳ ප්‍රතිපත්තියක් හදමු. Budget එක ඉදිරිපත් කළාම, එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඇමතිවරු ඇවිල්ලා කියනවා, "අපි මෙන්න මේක කළා, අරක කළා" කියලා. ඉදිරියේ දී කවුරු හෝ කෙනෙකු ජනාධිපති අපේක්ෂකයෙකු වෙන්න බලාගෙන ඉන්නවා නම්, එතුමා උපදෙස් දෙනවා. මම මේ කාරණය අහන්නම්. නිදහසෙන් පස්සේ විතරක් නොවෙයි, පසුගිය කාලයේත් තමුන්නාන්සේලා, මේ නායකතුමන්ලා පාර්ලිමේන්තුවේ වාඩි වෙලා සිටියා නේ. මෙච්චර කල් කිව්වේ නැත්තේ ඇයි, "අපේ වියදම අඩු කරමු, අපට තියෙන ප්‍රශ්න ටික අපි නැති කරමු, අපි සාකච්ඡා කරමු" කියලා? පිටරටින් ඇවිල්ලා අර ගිවිසුම මේ ගිවිසුම කියලා අපට කියන්න ඕනෑ නැහැ. අපට අවශ්‍ය නැහැ, "එක රටක් - එක නීතියක්" කියලා නිකම් කාලය විනාශ කරන්න. මෙතැන සිටින ඩිලාන් පෙරේරා, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමන්ලා ඇතුළු අප සියලුදෙනාම එකට වාඩි වෙලා එකට කටයුතු කරන්න ඕනෑ. අපේ රටට මොකක්ද අවශ්‍ය? අපේ රටේ මුස්ලිම්, සිංහල දෙමළ, ක්‍රිස්තියානි සියලුදෙනා ජීවත් වෙන ක්‍රමය මොකක්ද? අපට අඩු කරන්න පුළුවන් දේ මොනවාද, අපේ ආර්ථිකය ගොඩනඟන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කරන්න ඕනෑ. ඒ ගැන මේ පාර්ලිමේන්තුවට තීන්දුවක් ගන්න පුළුවන්. ඩොලර් නැත්නම් අපි ජීවත් වෙන්නේ නැද්ද? අපට ඩොලර් නොවෙයි ජීවත් වෙන්න අවශ්‍ය කෑම බීම. ඒවා අපේ රටේ තියෙනවා. මොකක්ද නැත්තේ? අන්න, ඒවා ගැන කථා කරන්න. "අපි අරක දුන්නා. මේක දුන්නා. දෙන්න යනවා" කියලා විරුද්ධ පක්ෂය කියන්න අවශ්‍ය නැහැ. මේ හොඳම අවස්ථාවක්. අපේ නිෂ්පාදන ආර්ථිකය නඟාසිටුවන්න හොඳ අවස්ථාවක් මේක. අපි කනගාටු වෙනවා. අපේ ගොවි මහත්තුරුන්ට දැන් සැකයක් ඇති වෙලා තිබෙනවා. ඉදිරියට යන්න පුළුවන්ද, වතුර දෙයිද, පොහොර දෙයිද කියලා ඔවුන් සැකයෙන් ඉන්නවා. ඒ සැකය ඕනෑ නැහැ. අපේ මුහුදේ ඕනෑ තරම් මාළු ඉන්නවා. ඇයි බය වෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

පාර්ලිමේන්තුවේ ඉන්න අපට ජනතාව ඡන්දය දීලා තිබෙනවා. අපි එකට වාඩි වෙමු. Budget එක ගැන මෙහෙම කෑ ගහලා වැඩක් නැහැ. අපි හම්බවෙලා කථා කරමු. අපේ ජනතාව ගැන අපට කථා කරන්න අවස්ථාව තිබෙනවා. ජනතාවගේ බඩගින්න ගැන අපට කථා කරන්න පුළුවන්; අපේ ආර්ථිකය ගැන අපට කියන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ කාරක සභාවක් පත් කරලා, ප්‍රතිපත්තියක් හදන්න පුළුවන්, අපට ඩොලර් ඕනෑද, ඩොලර් ඕනෑ මොන වාගේ බඩු ගෙනෙන්නද, මෙන්න මේ වාගේ බඩු අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්ද, බැරිද කියන ඒ කාරණා ගැන.

අපේ රටේ තිබෙන වැව් වතුරවලින් උපරිම ප්‍රයෝජන අපි ගත්තේ නැහැ; අපේ ගොවියෝ ගත්තේ නැහැ. අපි නිතරම "පොහොර මිල අඩු කරනවා; වැඩි කරනවා; අඩුවෙන් දෙනවා; නොමිලේ දෙනවා" කියලා කථා කරනවා. හැබැයි, ඒක ගැන නොවෙයි අපි බලන්න ඕනෑ. මේ රටේ සම්පත් තියාගෙන අපට හිඟාකන්න බැහැ. අපට පිටරටින් භාණ්ඩ ගෙන්වන්න අවශ්‍ය නැහැ. අපේ ජනතාවට කන්න අපි කෑම නිෂ්පාදනය කරලා තියෙනවාද? අපි හාල් නිෂ්පාදනය කරනවා. හැබැයි, ඒවා පිට රටට export කරන්න බැහැ. ගොවිජන කේන්ද්‍රස්ථානවල officersලා කිහිපදෙනෙක් ඉන්නවා. හැබැයි අද වෙනතුරු අපේ රටේ ඉඩම්වල soil test කරලා, මෙන්න මේ ඉඩම්වල ඔයගොල්ලන් වගා කරන්න, උක්ගස් වගා කරන්න, නැත්නම් වී වගා කරන්න කියලා කවුරුවත් උපදෙස් දීලා නැහැ. ඕනෑ, ඕනෑ මිනිහා ඕනෑ ඕනෑ විධියට වගා කරගෙන යනවා. මෙම ගරු සභාව හරහා ලංකාවේ සියලු ගොවි මහත්වරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා, අපට හොඳ සම්පත් තිබෙන නිසා ඒ කෘෂිකාර්මික ඉඩම්වලින් උපරිම ලාභ ගන්න බලාපොරොත්තු වෙන්න, උපරිම ප්‍රයෝජන ගන්න බලාපොරොත්තු වෙන්න කියලා. අපි පිටරටින් ගෙන්වලා කන්න ඕනෑ කියලා හැමෝම හිතන්න එපා.

ගොවීන් ශක්තිමත් වුණේ නැත්නම් අපටත් කෑම නැහැ. ඩොලර් නැත්නම් අපට හාල් නැහැ; පිටි නැහැ. ඒ නිසා කරුණාකරලා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

අපි ගොවීන් ශක්තිමත් කරන්න ඕනෑ කියලා මම හිතනවා. ගොවීන්ට තිබෙන සැකය නැති කරන්න ඕනෑ. කෑම වෙනුවෙන් අපට තිබෙන short-term plan එක මොකක්ද? ඒ නිසා ගොවීන් ශක්තිමත් කරලා අපේ ඉඩම් ටික වගා කරන්නට බලාපොරොත්තු වෙන්න. හැබැයි, පිටරට ඉන්න මිනිසුන්ගේ ලාභයට කටයුතු කරන්න එපා. ඉඩම් ටික අපේ මිනිසුන්ට ලබා දීලා, අපි නිෂ්පාදනය කරගෙන යනකොට අපේ ආර්ථිකය දියුණු වෙයි කියලා හිතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

මෙන්න මෙවැනි අවස්ථාවක, தமிழ் பேசுகின்ற நாம் எல்லோரும் குல பேதம், கட்சி பேதங்களுக்கப்பால், இலங்கையின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கான, முறையான constitutionஐ உருவாக்குவதற்கு ஆயத்தப் படவேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු පී. දිගම්බරම් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.18]

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்து குறுகிய காலத்துக்குள்ளேயே மக்கள் எதிர்ப்பினைத் தேடிக்கொண்ட நிலையில் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்டம் பெரிதும் எதிர்பார்க்கப்பட்டபோதும், ஏமாற்றம் தரும் வரவு செலவுத் திட்டமாகவே காணப்படுகிறது. நல்லாட்சி அரசாங்கத்தைக் குறைகூறி, இனவாதம் பேசி ஆட்சிக்கு வந்த அரசாங்கம், தனது சுயரூபத்தினைக் காட்டத் தொடங்கியுள்ளது. நாட்டுப்பற்று உள்ளவர்கள்போல் பேசினாலும் நாட்டுக்கான நல்லவை நடப்பதாக இல்லை. இன்று பெரும்பான்மையான மக்கள் அரச எதிர்ப்பு மனப்பாங்கிலேயே உள்ளனர். இன்று எல்லாத்துறை சார்ந் தவர்களும் தங்களது உரிமைகளுக்காகவும் தேவைகளுக் காகவும் போராடும் நிலைமையே காணப்படுகிறது.

மலையகத்தில் வரலாற்று முக்கியத்துவம் வாய்ந்த அபிவிருத்திப் பணிகளைக் கடந்த அரசாங்கக் காலத்தில் நாம் முன்னெடுத்தோம். நாங்கள் முன்னெடுத்த பணிகளெல்லாம் கிடப்பில் போடப்பட்டுள்ளன. மலையகத்தில் புதிய கிராமங்களை உருவாக்கி, புதிய கிராமப் புரட்சியினை உருவாக்கினோம்; பிரதேச சபைகளை அதிகரித்தோம்; மலையகத்திற்குச் சேவை செய்வதற்காகப் புதிய அதிகார சபையினை உருவாக்கினோம். ஆனால், அதனைக் கொண்டு நடாத்துவதற்குப் போதுமான நிதி ஒதுக்கீடு செய்யப்பட வில்லை. நுவரெலியா மாவட்டத்தில் பிரதேச செயலகங்களை அதிகரிக்க முயற்சித்து வர்த்தமானியும் வெளியிடப்பட்டு விட்டது. ஆனால், அதிகரிக்கப்பட்ட பிரதேச செயலகங்களை இன்றுவரை இந்த அரசாங்கம் இயங்கும் நிலைக்குக் கொண்டுவரவில்லை. இதன் காரணமாக அம்பகமுவ, நுவரெலியா பிரதேச செயலகப் பிரிவுகளில் வாழும் சுமார் 4 இலட்சத்துக்கும் அதிகமான மக்களுக்கு அரச வளங்கள் முறையாகச் சென்றடைவதில்லை. அதற்காகவே பிரதேச செயலகங்களை அதிகரிக்க நடவடிக்கை எடுத்தோம். எனவே, இந்த அரசாங்கம் உடனடியாக வர்த்தமானியில் வெளியிடப்பட்ட பிரதேச செயலகங்களை நடைமுறைக்குக் கொண்டுவர வேண்டும்.

தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பளம் வழங்க வேண்டுமென அரசாங்கம் வர்த்தமானியை வெளியிட்டது. இந்த அரசாங்கத்தின் எல்லா வர்த்தமானிகள் போலவே இதுவும் இன்றுவரை நடைமுறைக்கு வரவில்லை. தொழிலாளர்களுக்கு இன்றுவரையும் முறையாகச் சம்பளம் கிடைக்கவில்லை. மாறாக, முகாமைத்துவங்களின் அடக்குமுறை அதிகரித்துள்ளது; கெடுபிடிகள் அதிகரித் துள்ளன. JEDB, SPC கம்பனிகளில் மாதாந்தக் கொடுப் பனவுகள் எதுவுமே உரிய திகதியில் வழங்கப்படுவதில்லை. இத்தகைய பிரச்சினைகளை இந்த அரசாங்கம் கண்டுகொள்வதுமில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெருந்தோட்டக் கம்பனிகளை ஊக்குவிக்கும் அதேவேளை, திருப்தியளிக்காத, அதாவது 1,000 ரூபாய் சம்பளம் வழங்காத பெருந்தோட்டக் கம்பனிகளின் தனியார்மயப்படுத்தல் ஒப்பந்தத்தினை மீளாய்வு செய்து, வர்த்தக ரீதியில் அபிவிருத்தி செய்யக்கூடிய மாற்று முதலீடுகளைச் செய்வதற்கு நடவடிக்கை எடுப்பதாக இம்முறை வரவு செலவுத் திட்டத்தில் சொல்லப்பட்டிருக்கின்றது. ஆனால், மாற்று முதலீடு என்ற பெயரில் பெருந்தோட்டக் காணிகளை வெளியாருக்கு வழங்குவதை அனுமதிக்க முடியாது. அந்தவகையில், பெருந்தோட்ட மக்களைப் பாதிக்காத வகையில் முதலீடுகளை முன்னெடுக்க வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

நாட்டின் தற்போதைய நிலைமை காரணமாக உணவுப் பொருட்களுக்குத் தட்டுப்பாடு நிலவக்கூடும். அதாவது, உரம் இல்லாமல் விவசாயிகள் பெரிதும் பாதிக்கப்பட்ட நிலையில் அவர்களின் உற்பத்தி குறைவடைந்துள்ளது. இதனால் பாரிய பஞ்சங்கூட ஏற்படலாம். எனவே, இந்த அரசாங்கம் இத்தகைய பிரச்சினைகளில் வரட்டுப் பிடிவாதம் பிடிக்காமல் மக்களின் அபிலாஷைகளைத் தீர்க்கும்வகையில் செயற்படவேண்டும். மீதியிருக்கின்ற காலப்பகுதியிலாவது மக்களாட்சி செய்ய இந்த அரசாங்கம் முயற்சிக்கவேண்டும்.

இலங்கை நாட்டின் வளங்களை வெளிநாடுகளுக்கு விற்று நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புகின்ற நிலைமையே இன்று காணப்படுகின்றது. பொருளாதாரத்தின் பின்னடைவுக்குக் கொரோனாவைக் காரணம் காட்டினாலும், இன்று இலங்கையைப் போன்ற அபிவிருத்தியடைந்துவரும் நாடுகள் பலவும் பொருளாதார ரீதியில் ஸ்திரத்தன்மை அடைந்துள்ளன. இலங்கை மட்டுமே கொரோனாவைக் காரணங்காட்டி மக்களின் வாழ்க்கைச் செலவினத்தை அதிகரித்துள்ளது.

இன்று அத்தியாவசியப் பொருட்களின் விலையானது அரசாங்கத்தின் கைமீறிச் சென்றுள்ளது. தற்போது இறக்குமதியாளர்களும் உற்பத்தியாளர்களும் பொருட்களின் விலையினைத் தீர்மானிக்கும் நிலைதான் காணப்படுகின்றது. இதற்கு அரசாங்கத்தின் இடைத்தரகர்களும் ஒரு காரணமாகும். இந்த வரவு செலவுத் திட்டத்திலாவது ஏதாவது நன்மை கிடைக்கும் என எதிர்பார்த்தவர்களுக்கு ஏமாற்றமே கிடைத்துள்ளது.

தற்போது அரசின் செயற்பாடுகளுக்கு அரசின் பக்கமிருந்தே எதிர்ப்புகள் வெளிவரத் தொடங்கியுள்ளது. எனவே, வருங்காலத்திலாவது இந்த அரசாங்கம் பொறுப்புடன் செயற்பட்டு மக்களுக்கு நல்லது செய்யவேண்டும் எனக் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා 2.23]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍ය ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා කැඳවා ගෙන යන පරිවර්තනීය අය වැයක් මේ ගරු සභාවට ඉදිරිපත් කළ වෙලාවේ, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන නවක මන්ත්‍රීවරු 58දෙනා අතරින් මම සතුටු වෙනවා, ඒ පරිවර්තනීය අය වැය, සාධනීය අය වැය පිළිබඳව අපේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මේ ගරු සභාවේදී කාරණා කිහිපයක් කියන්න අවස්ථාව ලැබීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව තුළ සිදු වන සාධනීය කටයුතු සඳහා විපක්ෂයේ සියලුදෙනා මොන විධියේ සහයෝගයක්ද ලබා දෙන්නේ කියලා අපි මේ වසර පුරාම බලාගෙන සිටියා. මේ වසර පුරාම අපි දැක්කේ මොකක්ද? මේ වසංගතය තුළින් හෝ වෙනයම් විධියකින් හෝ ජනතාව පීඩාවට පත් වූ ඕනෑම අවස්ථාවක් පාවිච්චි කරලා තමන්ට නැති වූ බලය ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කරන, ඒ වෙනුවෙන් ඕනෑම කැත වැඩක් කරන විපක්ෂයක් තමයි අපි දැක්කේ. මේ අය වැය විවාදය පැවැති දින කිහිපය තුළ ඔවුන් කළ කථා අහගෙන හිටියාමත් අපි දැක්කේ ඒ කාරණයම පමණයි. නිෂ්පාදන ආර්ථිකයක් කරා රට ගෙනයන්න සූදානම් කරන මේ වේලාවේත්, ඉතාම කුහක විධියට, කැත විධියට ඒ පිළිබඳව විවේචන එල්ල කිරීම පමණමයි මේ විපක්ෂය කරන්නේ.

පසුගිය මාස ගණනාවක් තිස්සේ කොවිඩ් වසංගතය පාලනය කිරීමට ජනතාව එන්නත් කිරීමේ කටයුත්ත සිද්ධ වුණා. මේ වනකොට ජනගහනයෙන් සියයට 62ක් පමණ එන්නත් කර තිබෙනවා. ඒ සඳහා අපේ රටේ සෞඛ්‍ය අංශ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉඳලා ග්‍රාම නිලධාරිතුමා හෝ නිලධාරිතුමිය, ආර්ථික සංවර්ධන නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරිතුමා, සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා හෝ නිලධාරිතුමිය හා ගමේ මහජන නියෝජිතයා විශාල කැප කිරීමක් කරද්දි, මේ අය පාර්ලිමේන්තුව තුළදීත් උත්සාහ කළේ මේ එන්නත් කිරීමේ කටයුත්ත අඩාළ කිරීමට මිසක්, සයිනොෆාම් එන්නත ගෙනැල්ලා තිබියදීත් මාස තුනක් යනකම් එන්නත් කිරීමේ කටයුතු කරන්න බැරි විධියට ඒවා ගබඩාවල හිර කළා මිසක් ඒ වෙනුවෙන් ලබා දුන් උදව්වක් නම් නැහැ.

පාර්ලිමේන්තුව තුළ මේ විපක්ෂය කළ කැත වැඩේම ගමේ සිටින ඒ ගොල්ලන්ගේ පාක්ෂිකයාත් ඒ විධියටම කළා. එන්නත ලබා දෙන තැන්වල යම් යම් කලබල ඇති කරන්න, ජනතාව නොමඟ යවන්න, ඒ ස්ථානවල අඩ දබර ඇති කරන්න මේ කණ්ඩායම නියෝජනය කරන ග්‍රාමීය නායකයන් කටයුතු කළා මිසක්, එන්නත් කිරීමේ කටයුත්තේ නියැළුණු කිසිම නිලධාරි මහත්මයෙකුට තේ කහට කෝප්පයක්වත් දෙන්න කටයුතු කළ බවක් අපි දැක්කේ නැහැ.

ඒ කටයුතු එසේ සිදුවෙද්දි තමයි, මේ මොහොත වෙනකොට ලෝකයේ සියලු රටවල් සුරක්ෂිත සංචාරක ගමනාන්තයක් තිබෙනවා කියා විශ්වාස කරන තැනට මේ රට ගේන්න අපට අවස්ථාව ලැබී තිබෙන්නේ. අද වනවිට අපට පාසල් නැවත විවෘත කරන්න, කර්මාන්තශාලා නැවත විවෘත කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ සුළු අපනයන භෝග නිෂ්පාදනය තුළින් ඉතිහාසයේ පළමුවැනි වතාවට වැඩිම අපනයනය වාර්තා කරන්නේ. තේ නිෂ්පාදනයේ වැඩිම අපනයනය වාර්තා කරන්නේ, රබර්වලින්, පොල්වලින්, ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනවලින් වැඩිම අපනයන ආදායම වාර්තා කරන්නේ මේ වසරේ. ඒ නිසා කොවිඩ් වසංගතය මැද්දේත් මේ රටේ වැඩ කරපු ජනතාවට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඇඟලුම් කර්මාන්තශාලා, තේ කර්මාන්තශාලා ඇතුළු සියලු කර්මාන්තශාලාවල වැඩ කළ ජනතාව මේ අවුරුද්දේ කොවිඩ් වසංගතය මැද්දේ ඩොලර් බිලියන දහයක් ඉපයුවා. හැබැයි, මේ විපක්ෂයේ කවුරුවත් ඒක අගය කළේ නැහැ. අපි දැනගෙන සිටියා, අපේ රට අමාරු තැනක තිබෙන්නේ කියලා. අතිගරු ජනාධිපතිතුමා මේ රට භාර ගනිද්දි මේ රටේ සියලු දර්ශක පහළට වැටිලා තිබුණේ. අන්තිමට ඇෆ්ඝනිස්ථානය සමඟ තමයි අපට තරගයක් තිබුණේ.

එහෙම රටක් තමයි අපි භාර ගත්තේ. සියලු දර්ශක පහත වැටී තිබුණු, හිඟන්නාගේ ඉඳලා මහල්ලා, තරුණයා දක්වා - සියලුදෙනාට- බදු ගහපු, පින් පෙට්ටියටත් බදු ගහපු රටක් තමයි අපි භාර ගත්තේ. ඒ රටේ කර්මාන්ත ටික නැවත ආරම්භ කරන්න අපට සිද්ධ වුණා. අපේ රජය පත් වූ වහාම රැකියා නැති වූ ලක්ෂ ගණනකට නැවත රැකියා ලැබෙන විධියට කර්මාන්ත ටික පණ ගන්වන්න බදු සහන දෙන්න අපට වුවමනා වුණා.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, ඒ බදු සහන දීපු නිසා අපි ආදායම අහිමි කර ගත්තා කියලා. අද රුපියල් මිලියන 2,000ට වැඩි ආදායම් ගන්න ආයතන 60කට, 63කට බදු ගහනකොට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, "ඒකත් වැරැදියි" කියලා. අය වැය තුළින් ජනතාවට සහන දෙන්න කටයුතු කරනකොට ඒ වාගේ විවේචන කරනවා පමණමයි අපි දැක්කේ. අපි මේ පොළොවේ වවන්න පුළුවන් ආහාර වර්ග 17ක් පිටරටින් ගෙනෙන එක නතර කළාම මුංඇට ගැන කියලා, කහ ගැන කියලා මේ පාර්ලිමේන්තුව දෙවනත් වෙන්න කෑ ගැහුවා. හැබැයි, මේ රටේ වවන්න පුළුවන් බෝග වර්ග ටික වවන්න අපි පටන් ගත්තා. මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් සරුංගලය, හඳුන්කූර වැනි විවිධ වූ උපකරණ මේ රටට ගෙන ඒම නතර කළා. එහෙම කළාම ඔබතුමන්ලා ඒ සියලු දෙයට විරුද්ධ වුණා. ඒ විතරක් නොවෙයි. ආණ්ඩුව භාර ගනිද්දි අතිගරු ජනාධිපතිතුමා දැනගෙන හිටියා, අපේ වියදම් අපි අවම කර ගන්න ඕනෑ කියලා. ඒ වෙනුවෙන් ජනාධිපතිතුමාගේ වියදම් එතුමා විසින්ම කපා හැරියා. ආරක්ෂක වියදම, නිලධාරින්ගේ, ලේකම්වරුන්ගේ වාගේම තමන්ගේ වාහනවල සියලු වියදම් කපා හැර රුපියල් බිලියන 3ක් එතුමා ඉතුරු කර පෙන්නුවා. කැබිනට් ඇමතිවරයාගේ, රාජ්‍ය ඇමතිවරයාගේ ඉඳලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා දක්වා හැම කෙනාම තමන්ගේ වියදම් අවම කරගෙන අපේ රට යන මේ ගමනට උදවු කළා. හැබැයි, විපක්ෂය කවදාවත් මේවා අගය කළේ නැහැ.

අවුරුදු 24ක් තිස්සේ විසඳපු නැති, ආණ්ඩු 5කට විසඳන්න බැරි වුණු ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව විසඳන්න මේ රජය මැදිහත් වුණා. හැබැයි, විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකු මේ පාර්ලිමේන්තුවේදී ඒක අගය කරනවා අපට ඇහුණේ නැහැ. මේ සියලු කාරණා තුළින් අපි දකින්නේ මෙයයි. කොවිඩ් වසංගතය මැද්දේ හෝ මේ වසංගතය තුළින් සිදු වන මළ මිනී මතින් හෝ ආණ්ඩු බලය ලබා ගැනීම තමයි මේ කණ්ඩායමේ අභිප්‍රාය - බලාපොරොත්තුව- වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නිෂ්පාදනය වැඩි කළ යුතුයි කියලා අපි දැනගෙන හිටියා. ඒ නිසා තමයි පසුගිය අය වැයෙන් අපි ඒ කටයුත්ත ආරම්භ කළේ. ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනකොට නිෂ්පාදන ගම්මාන 152ක් අපි හදලා තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ තේ වගා ගම්මාන, කුරුඳු වගා ගම්මාන, ගම්මිරිස් වගා ගම්මාන, කිතුල් වගා ගම්මාන අපි හදලා තිබෙනවා. අපි ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් විධියට මාර්ග කිලෝමීටර 700කට වැඩි ප්‍රමාණයක් කාපට් කරලා තිබෙනවා. ග්‍රාමීය ජනතාවගේ නිෂ්පාදන මිලට ගන්න, කාන්තා ව්‍යවසායකයන් හරහා home shops ඇති කරන්න අපි මෙවර අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර

තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට විතරක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 871දෙනෙකුටත් අය වැයෙන් මුදල් වෙන් වනවා.

හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ නිෂ්පාදනය වෙනුවෙන් පරිවර්තන අය වැයක් ගෙනා වෙලාවේ ඒක විවේචනය කරනවා හැරෙන්න විපක්ෂය ඒ වෙනුවෙන් සාධනීය එකතු කිරීම් කරනවා අපි දැක්කේ නැහැ. කවිරත්න මන්ත්‍රීතුමිය මේ අය වැය විවේචනය කරනවා අපි දැක්කා. ඒ විතරක් නොවෙයි. වන්දනා මාන කිරීම සඳහා 'සඳහිරුසෑය' ජනතා අයිතියට පත් කරන වෙලාවේදී ගත් ඡායාරූපයක් එතුමිය ගෙනැල්ලා, පහළ ආසන සපයා තිබුණා කියලා ජනාධිපතිතුමාගේ ආර්යාව සහ අගමැතිතුමාගේ ආර්යාව විවේචනය කරනවා අපි දැක්කා. අපි ඒ මන්ත්‍රීතුමියට කියනවා, ඔබතුමියන්ලාට අතීතයේ සිදු වූ දේවල් අමතක වෙලා තිබෙන බව. මේ පුතාණන්ගේ පියාණෝ -ශ්‍රීමත් උතුමාණන්- මේ රට කරපු වෙලාවේ, කොට ඇඳුමක් ඇඳගෙන හිටපු ආර්යාවකගේ ඡායාරූපයක් ගත් ඡායාරූප ශිල්පියෙකු අතුරුදහන් වුණා. ඒ ඡායාරූප ශිල්පියාගේ හෙල්මට් එක හමු වුණා, කුණු ඇළක තිබිලා. ඒවා එතුමියන්ලාට අමතකයි. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියනවා, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ රුපියල් බිලියන අටහමාර ගත්ත එක වැරැදියි කියලා. අපට ලජ්ජයි ලු, මේ රුපියල් බිලියන අටහමාර ගත්ත එකට. හැබැයි, එතුමාට වාගේම එදා මේ එක්සත් ජාතික පක්ෂයටම ඒ සම්බන්ධයෙන් ලජ්ජාවක් තිබුණේ නැහැ. මහ බැංකුව කඩා රුපියල් බිලියන 12කට වැඩිය බෙදා ගනිද්දි ලජ්ජාවක් තිබුණේ නැහැ, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමන්ලාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා ගෙන යන බව අපි කියනවා. අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, මුදල් ඇමතිතුමා මේ රටට නායකත්වය දෙන මේ රජය ගැන ගොවි ජනතාව තවමත් විශ්වාසය තබාගෙන ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මේ රට ආරක්ෂිතයි; සුරක්ෂිතයි. ගොවි ජනතාව රැකගෙන, රටේ නිෂ්පාදනය වැඩි කරගෙන, නිෂ්පාදන ආර්ථිකයක් මෙහෙයවන්න අපි සූදානම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මැතිනිය. ඔබතුමියට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.33]

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු ඇමතිතුමන්ලා සියලුදෙනාගෙන්ම අවසරයි. මුළු ලෝකයම කොරෝනා වෛරසයෙන් වෙළාගෙන, ලෝකයේම ආර්ථිකය කිසියම් විධියකට කඩා වැටෙද්දී, අපේ රටේ සංචාරක ව්‍යාපාරය බින්දුවටම කඩා වැටී තිබෙන වෙලාවක අපි අභියෝගාත්මකව මේ අය වැයට මුහුණ දී සිටිනවා. මට වෙලාවකට පුදුම හිතෙනවා, ඇත්ත වශයෙන්ම ඉතාම කටුක අවස්ථාවක, රටක දුර්භික්ෂයක් තිබෙන අවස්ථාවක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ විධියට මේ අය වැය ඉදිරිපත් කිරීම ගැන.

වසර ගණනාවක් අතීතයට ගිහින් බලනකොට අපට දකින්න පුළුවන් දෙයක් තිබෙනවා. හැම අය වැය ලේඛනයක්ම ඉදිරිපත් කළාට පස්සේ චෝදනා, අඩු පාඩු, ප්‍රශ්න ආපු එක ඇත්ත. හැබැයි, අය වැය ණය වැයක් කරපු ඒ අතීත අය වැය ලේඛන තුළින් මේ රට ගමන් කළේ කෙළින්ම ණය උගුලකට.

මම සතුටින් කථා කරන්නේ ගමක් නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට. මා ඇත්ත වශයෙන්ම සතුටු වෙනවා, සෑම ගමකටම, සෑම ග්‍රාම නිලධාරි වසමකටම රුපියල් ලක්ෂ 30 බැගින් වෙන් කරමින් ග්‍රාමීය ජනතාවට පහසුකම් සලසන්නට, ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය නංවාලන්නට විශාල මුදලක් වෙන් කිරීම ගැන. ඒ වාගේම, අනාගත පරපුර බිහි කරන්නට මාතෘත්වයේ නමින් සිය ජීවිතය කැප කර සිටින ගැබිනි මවුවරුන් වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරමින් මාස 24කට පෝෂණ මල්ලක් ලබා දෙන්නට කටයුතු කිරීම ගැන මා සතුටු වෙනවා.

අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඊට වඩා විශාල මුදලක් රටේ ආරක්ෂාවට වෙන් කරලා තිබෙනවා. රට ආරක්ෂා කර ගත යුතුයි. ඒ වාගේම, නිර්මල බුද්ධාගම තිබෙන ශ්‍රී ලංකාවේ බුද්ධාගම ඇතුළු සියලු ආගම් ආරක්ෂා කර ගත යුතුයි. ඒ සඳහා මුදල් වෙන් කිරීම පිළිබඳව අපි සතුටට පත් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකින් එක කාරණා ගැන දැන් මා කථා කරන්නම්. පළමුවෙන්ම අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ. ජාතික පාසල් දහසක් බිහි කිරීමේ විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මේ වැඩ පිළිවෙළේ වඩාත් වටිනාකමක් ඇති වෙන්නේ, දහසක් පාසල් බිහිවීමත් සමඟ ඒ පාසල් දහසට අත්‍යවශ්‍ය ගුරුවරුන්ට -ගණිත ගුරුවරුන්, ඉංග්‍රීසි ගුරුවරුන්- වහාම පුහුණු වීමට අවස්ථාව ලබාදීම නිසායි. ඒ අවශ්‍යතා වහාම සකසාගෙන, ගමේ පාසලේ ගමේ දරුවන්ට උපරිම සේවයක් කරන්නට අවස්ථාව ලබාදීම ගැන මා සතුටට පත්වෙනවා.

ඒ වාගේම සෞඛ්‍ය ගැනත් කියන්න ඕනෑ. සැමට පානීය ජලය අවශ්‍යයි. මා වසර 12ක් දේශපාලනයේ ඉන්න කෙනෙක්. හැම වෙලාවේම මා ආණ්ඩුවෙන් ඉල්ලුවා, පානීය ජල ප්‍රශ්නය විසඳලා දෙන්න කියලා. බෙන්තර ජනතාව වතුර කඳුළක් නැතුව ඉන්නවා. මා හිතන හැටියට, පානීය ජල සැපයුම සඳහා මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. පානීය ජල හිඟයක් තිබෙන තැන්වලට ඒ අවශ්‍යතාව ඉටු කර දෙන්න කියලා මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම විශ්වවිද්‍යාලයට ගිහින්, රැකියාවක් නැතිව සිටි උපාධිධාරීන්ගේ රැකියා දීලා, ස්ථිර කරලා ඔවුන්ට යම් යහපතක් ලබා දීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන්කර තිබෙන විනාඩි 10න් විනාඩි කිහිපයක් ගතකරන්න ඕනෑ, කාන්තාව ගැන කථා කරන්න. කාන්තාවන්ට වෙන් කරලා තිබෙනවා සියයට 3ක්. මේ සියයට තුනේ කථාව කියද්දී මට නිතැතින්ම මතක් වන දෙයක් තිබෙනවා. මම තමයි දකුණු පළාත නියෝජනය කරන එකම කාන්තාව.

එදා 2015දී මම මේ පාර්ලිමේන්තුවට ආවේ ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරමින්. එදා අපට හිටියේ කාන්තාවන් තුන්දෙනයි. මේ සියයට තුන වාගේ තමයි. ඒ තුන්දෙනාගෙනුත් අම්පාරෙන් ආපු මන්ත්‍රීතුමිය, 'අම්පාරේ සඳ' බැසගෙන ගියා, අනෙක් පැත්තට. 'රත්නපුරේ මැණිකත්' එහෙමම පාස් වුණා, ඇමතිකමක් අරගෙන. ඉතුරු වුණේ මම විතරයි. එදා ඒකාබද්ධ විපක්ෂයට මේ පාර්ලිමේන්තුවේ කළු පටි බඳින්න කළු පටියක් ගෙනෙන්න කෙනෙක් හිටියේ නැහැ. ඒක ගෙනාවේත් මම

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය]

විතරයි, එදා ඒකාබද්ධ විපක්ෂයේ ඉඳගෙන. ගොඩක් අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගියා. ඒකට වැරැද්දක් කියන්නේ නැහැ. මටත් කථා කළා. අදත් මම ඒකට ස්තුතිවන්ත වෙනවා.

2010දී මම දේශපාලනයට ආවේ. අපේ ලේකම් ගරු සාගර කාරියවසම් මැතිතුමායි, මමයි තමයි එදා බෙන්තර-ඇල්පිටිය ආසනයට තරග කළේ. මම පාර්ලිමේන්තුවට ආවා. එතුමා පක්ෂයේ ලේකම්. එදා අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රිවරුන් 53දෙනෙක් හිටියා. 53 වෙනියා මම. ඒ මන්ත්‍රීවරුන්ගෙන් 52ක් දැන් ඇමතිවරු. මම ඉන්නවා පිටුපස්සේ. ඔන්න ඔහොමයි සියයට තුන කාන්තාවට සලකන්නේ. දේශපාලනය නාමයෙන් මම ඉල්ලා සිටිනවා - උඩ ඉන්නවා, දෙවිවරු. මට මොනවා හරි- Every action has a reaction. When you make an action, then there is a reaction. I want to tell everybody, it is very unfair. But, I have to tell you this.

අපි මේ pandemic අවධිය ගැන හිතනකොට අපිට විශ්වාසයක් ඇති වන්නට ඕනෑ, මෙහෙම හරි මේ අය වැය ඉදිරිපත් කර ගැනීම ලොකු දෙයක් කියලා. මේ අය වැය තුළින් කාන්තාවට විශේෂ දෙයක් වෙන් කරගන්න බැරි වුණාට, සමෘද්ධිය හරහා, සෞඛ්‍ය හරහා, අධ්‍යාපනය හරහා, මේ සියල්ල හරහා අපි ඉල්ලා සිටිනවා, මේ රටේ කාන්තාව ගැන තවදුරටත් සිතන්න කියලා. සියයට 52ක් ඡන්දය දෙන්නේ මේ රටේ කාන්තාව. අන්න, ඒ කාන්තාවන් විතරක් නොවෙයි, අඩ අඩා මමත් එක දෙයක් කියනවා. අනේ දෙයියනේ! අහිංසක මිනිස්සු ඉන්නවා, එක වේලක් කන්න නැතිව. එක වේල කන මිනිස්සුන්ට වේල් තුන කන්න අපි මොනවා හෝ කරලා හරිගස්වා දෙන්න ඕනෑ. පාරවල් හදන එක හොඳයි. කාපට් පාරවල් හදන්න. ඊට කලින් මිනිස්සුන්ගේ බඩගින්න නිවලා, ඔවුන්ට බඩගින්න නිවාගන්න ක්‍රමයක් හදලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

සිංහල සිනමාව වෙනුවෙන්, කලාව වෙනුවෙන් අපිට විශේෂ දෙයක් මේ අය වැයෙන් ඉදිරිපත් කර නැහැ. රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා කලාවටයි, මඟුල් ගෙවල් ගන්න reception hallsවලටයි ඔක්කොටම. කලාවේත් මඟුල් එකක් දෙකක් තිබෙනවා. නමුත්, එහෙමම කියලා මේක පාර්ලිමේන්තුවේ දමන්න ඕනෑ නැහැ නේ. සිංහල සිනමාවයි, television එකයි ඔක්කොම අර පොදියට දාලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මැතිතුමනි, ඔබතුමාටත්, මගේ අසහාය නායකයා වන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, අපේ සිංහල සිනමාව කර්මාන්තයක් බවට පත් කරපු එක ගැන. කලාවක් විධියට පමණක් නොවෙයි, අනිවාර්යයෙන්ම සිනමාව කර්මාන්තයක් හැටියට රැකිය යුතුයි. කර්මාන්තයක් වුණොත් විතරයි එය ලෝකය හරහා යන්නේ. ලෝකයට ගිහිල්ලා ඉදිරියට යන කටයුත්තක් හැටියට කරන්න පුළුවන් වන්නේ. Pandemic අවධියේදී ගොඩක් සංගීතවේදීන් දුකට පත්වෙලා තිබෙනවා. කෝටි ගණන් හොයපු මිනිස්සු අද අතේ සතේ නැතිව ඉන්නවා. සිනමා කලාකරුවන්ද ඒ විධියට වැටිලා තිබෙනවා. ඔවුන් ගැනත් ඇහැක් ඇර බලන්න. බොහෝ දෙනෙක් ඡන්දය කාලයට විතරක් නළු නිළියෝ, ගායක ගායිකාවෝ පස්සේ එනවා. ඒ අයටත් හොඳ වැඩේ ඒ විධියට ගියාට.

ඒ නිසා එක දෙයක් මම කියනවා. ඊළඟ පාර එහේ මෙහේ යනකොට පොඩ්ඩක් කල්පනා කරලා පලයල්ලා. ඔය මඟුල් ගෙවල් නතර කරපල්ලා, රවුම් ගැහිලි, දැහැලිලි නතර කරපල්ලා. මොකද, මේ කොරෝනා වයිරසය හැම තැනම තිබෙනවා. අපි මරණය අතේ තියාගෙන ඉන්නේ. තවම ඒක ගණන් ගත්තේ නැහැ. මට අන්තිමට පොඩි කවියක් මතක් වුණා. ඒක නම් නොකියා බැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
අනේ! මට මේ කවිය කියලා අවසන් කරන්න දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම් කවිය කියලා ඉක්මනට අවසන් කරන්න.

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
"Yes sir, yes sir, three bags full" අනෙක් ටික මතක තියා ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ධර්මසේන විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.2.43]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් ශ්‍රී ලංකාවේ 76 වන අය වැය ඉදිරිපත් කරන මේ අවස්ථාවේ නවක මන්ත්‍රීවරයකු විධියට අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අපේ ගම්වල මිනිස්සු සිරිතක් විධියට අය වැය ඉදිරිපත් කරන දවසට ගුවන් විදුලිය, රූපවාහිනිය ළඟට වෙලා බලාගෙන ඉන්නේ ඒ අයට තිබෙන දැවෙන ප්‍රශ්නවලට මොකක් හෝ සහනයක් ලැබෙයි කියන බලාපොරොත්තුවෙන්. මේ අය වැයේ දී මිනිස්සු බලාගෙන හිටියේ අලුත් මුදල් ඇමතිතුමා අය වැයෙන් යම් ප්‍රමාණයකින් හෝ බඩු මිල අඩු කරලා ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මිනිස්සු මුහුණ දෙන දුෂ්කර ජීවිතය, ඔවුන් දවසින් දවස කබලෙන් ලිපට වැටෙන හැටි කථා කරන එක ගමේ ජනතාව අතරින් බිහි වූ මහජන නියෝජිතයකු වන මගේ වගකීමක් කියලා මා විශ්වාස කරනවා. වෙනදාට මේ වෙනකොට අපේ ගම්වල කුඹුරු යායවල්වලට බැහැලා රටට බත සපයන දහඩිය හෙළන අපේ ගොවියෝ අද කුඹුරු දිහා බලාගෙන සුසුම් හෙළනවා. එදා වේල හම්බ කරපු පෙදරේරුවන්, අත් උදව්කරුවන් අද සිමෙන්ති නැතිව අසරණ වෙලා. මේ රටට බරක් නැතිව තමන්ගේ දහඩිය මහන්සියෙන් ජීවත් වෙන මිනිස්සු සියලුදෙනා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය සිමෙන්ති නැති නිසා අසරණ වෙලා. ඒ මිනිසුන්ගේ ගෙවල්වල බතක් ඉදෙන්නේ නැත්නම්, ඒ අයගේ දරුවන්ට පොතක් පෑනක් අරගෙන දෙන්න බැරි නම් ඒ ප්‍රශ්න පාර්ලිමේන්තුවට අරගෙන එන එක මගේ යුතුකමක්. ඒක දේශපාලනය නොවෙයි. ගෙවල් හදන්න හීන දැකපු මිනිස්සු අද ෂීට්, ටයිල්, සිමෙන්ති, කම්බි

නැතිව අසරණ වෙලා. වාහනයක් ගන්න හීන දැකපු සමහරුන්ට ඒක හීනයක්ම වෙලා. රෝහණ මන්ත්‍රීතුමා, අපි වාගේ මන්ත්‍රීවරුන්ටත් ඒක හීනයක්ම වෙලා වාගේ තමයි දැන් අපටත් දැනෙන්නේ. මම කියන්නේ ජනතාව මේ මුහුණ දෙන ප්‍රශ්නවලට මොකක් හෝ සහනයක් තිබෙන්න ඕනෑ කියන එකයි. ගිය සතියේ ඉදිරිපත් කරපු අය වැය, මේ මොන ප්‍රශ්නයක්වත් නැති රටක පුද්ගලයෙක් ඉදිරිපත් කරපු අය වැයක් ද? එහෙම නැත්නම් රටේ ප්‍රශ්න තිබෙන බව නොදැන ඉදිරිපත් කළ අය වැයක් ද කියලා මට අහන්න හිතෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව කියන විධියට ලෝක වෙළෙඳ පොළේ ප්‍රශ්න තිබෙන එක හරි. ඩොලර් නැති එකත් හරි. සිමෙන්ති එන්න පරක්කු ඒ නිසා නම්, ගෑස් එන්න පරක්කු ඒ නිසා නම්, ඇණවුම් කරන්නත් කලින් පොහොර නැව් ඇවිත් රට වටේ කැරකෙන්නේ කොහොමද? අපේ ගම්වල මිනිස්සු දන්නවා, හොඳ දේවල් බලෙන් ඇඟේ ගහන්නේ නැහැ කියලා. හොඳ දේවල් නම් රට වටේ කැරකි කැරකී බලෙන් ඇඟේ ගහන්න දෙයක් නැහැ. බාල දේවල් නිසා තමයි බලෙන් ඇඟේ ගහන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිසුන්ගේ ජීවිත දවසින් දවස කඩා වැටෙනවා නම්, මිනිස්සු තවදුරටත් ප්‍රශ්නවලට හිර වෙලා සිටිනවා නම්, මේ කවුරුන් වෙනුවෙන් හදපු අය වැයක් ද කියලා අපට අහන්න වෙනවා. 1960 දශකයේ සිට පැවති සෑම රජයක් මඟින්ම ගොවියා රසායනික පොහොරවලට තමයි හුරු කළේ. එක පාරටම රසායනික පොහොර නතර කරලා කාබනික පොහොරවලට යොමු වෙන්න කිව්වාම, ගොවියෝ සෑහෙන්න අසරණ වුණා. අඩුම ගණනේ රසායනික පොහොර සියයට 50ක්වත් සපයන්න කියලා ආණ්ඩුවේ ඇමතිතුමන්ලාම කරන ඉල්ලීම්වත් මේ වනකොට අවධානයට ලක් කරලා තිබෙනවාද කියලා මම අහන්න කැමතියි. මහ කන්නය විනාශ කිරීමේ ප්‍රතිඵලය විධියට අස්වැන්න සියයට 50කට වඩා පැහැදිලි ලෙසම අඩු වෙනවා. මේකේ ප්‍රතිඵලය පෙබරවාරි, මාර්තු මාසවලදී තමයි ගොවියාට වඩාත් දැනෙන්න පටන් ගන්නේ. විශේෂයෙන්ම සිංහල අවුරුදු කාලයට ගොවියා ගෙට ගන්න අස්වැන්නක් නැති වෙයි.

ඒ නිසා මෙවර සිංහල අලුත් අවුරුද්ද අසරණ ගොවීන්ට බඩගින්නේ තමයි සමරන්න සිද්ධ වෙන්නේ. රටේ වසංගතයක් ඇති වූ බව ඇත්ත. හැබැයි, කෘෂිකර්මය විනාශ වුණේ, ගොවියා මේ තත්ත්වයට ඇද වැටුණේ මේ වසංගතය නිසා නොවෙයි. ඒක වුණේ ආණ්ඩුවේම දන්නා අය කෘෂිකර්මය ගැන කියන දේවල් අහන්නේ නැතිව, ගොවියාගේ ජීවිතය ගැන අවබෝධයක් නැතිව ගත් මුරණ්ඩු තීරණය නිසා බව පැහැදිලි වෙලා තිබෙනවාය කියන එක කියන්න වෙනවා. ඉදිරි කාලයේ පියවරින් පියවරට හෝ කාබනික පොහොර හදනවා නම්, ඒ ගැන කෘෂි ක්ෂේත්‍ර නිලධාරින්ට දීලා තිබෙන පුහුණුව මොකක්ද? අඩුම ගණනේ දැන් ගෙනැල්ලා තිබෙන නැනෝ නයිට්‍රජන් පාවිච්චි කරන ආකාරය ගොවියෝ දන්නේ නැහැ, නිලධාරින් දන්නේත් නැහැ. කාබනික පොහොරවල තිබෙන්න ඕනෑ සංයුතිය මොකක්ද? අඩු වියදමකින් ගුණාත්මක පොහොර හදන්නේ කොහොමද? ඇත්තටම කාබනික පොහොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවංක චේතනාවක් තිබෙන රජයක් නම්, මේ පිළිබඳව ගොවියාට හැඟීමක් ලබා දෙන්න අඩු තරමින් ජනමාධ්‍යයෙන් විශාල කාර්යභාරයක් කරන්න ඕනෑ කියන එකයි මගේ හැඟීම. ගම්වල මිනිස්සු දන්නවා ඇල්බීසියා, වල් සූරියකාන්ත, පොහොර වැල් වාගේ දේවල් යොදාගෙන සුළු පරිමාණයෙන් කාබනික පොහොර හදන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟ කන්නයට හෝ යම් ප්‍රමාණයක් කාබනික පොහොර හදන්න වුවමනාවක් තිබෙනවා නම් මේ දේවල් දැන්ම වවාගන්න ඕනෑ. මේ වගා සංවිධානාත්මකව දියුණු කරන්න අවශ්‍යයි. ඒකයි කාබනික පොහොර ප්‍රතිපත්තියට දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියලා අපි කියන්නේ. හදිසි නීතිය පනවනවා වාගේ, ඇඳිරි නීතිය පනවනවා වාගේ රටක කෘෂි කාර්මික ප්‍රතිපත්තිය හදන්න බැහැ. මේක මිනිසුන්ගේ බඩගින්නට සම්බන්ධ ප්‍රශ්නයක් කියන එක මම සිහිපත් කරන්න කැමැතියි. අද ගොවීන්ට විශ්වාසය නැති ප්‍රශ්නයක් තිබෙන්නේ. වගා පාලු වුණොත් වන්දි ගෙවනවා කිව්වාට ඒ සඳහා පැහැදිලිව මුදල් වෙන් කිරීමක් මේ අය වැයෙන් සිද්ධ කරලා නැහැ. එහෙමනම්, කොහොමද ගොවියා විශ්වාස කරන්නේ වගා හානියට වන්දි දෙනවා කියලා?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වාසය බිඳ වැටුණු ආණ්ඩුවක් මොන පොරොන්දු දුන්නත් ජනතාව අද ඒවා විශ්වාස කරන්නේ නැහැ. අපි දැක්කා, පසු ගිය දවසක ජනාධිපතිතුමා කියනවා රට කහවලින් ස්වයංපෝෂිත කරලා තිබෙන්නේ කියලා. කහවලින් රට ස්වයංපෝෂිත කරනකොට සහල්වලින් තිබුණු ස්වයංපෝෂිත තත්ත්වය නැති කරනවා නම් ඇති වැඩේ මොකක්ද? මිනිසුන්ට වැඩියෙන් අවශ්‍ය වන්නේ කහද, සහල්ද කියලා මම අහන්න කැමැතියි. ඒ නිසා අද ගොවියෝ, පෙදරේරුවෝ, කම්කරුවෝ ඇතුළු එදා වේල හම්බ කර ගන්නා මිනිස්සු මුහුණ පා තිබෙන කනගාටුදායක තත්ත්වය මහ පොළොවට බැස හඳුනාගන්න කියා ඉල්ලා සිටිමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව මූලාසනාරූඪ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නසීර් අහමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු විස්සක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍යකර්ම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. AJITH RAJAPAKSE *left the Chair, and* THE HON.WEERASUMANA WEERASINGHE *took the Chair.*

[2.51 p.m.]

**ගරු නසීර් අහමඩ් මහතා**
(மாண்புமிகு நஸீர் அஹமட்)
(The Hon. Naseer Ahamed)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, thank you for giving me the opportunity to speak in the Debate on the Second Reading of the Budget 2022.

Sir, at the outset, I wish to congratulate the Hon. Basil Rajapaksa for taking upon himself, the herculean task of presenting the most challenging national Budget in the history of Sri Lanka in his maiden Budget as the Minister of Finance. Never in the history of Sri Lanka has a Budget been presented in such grim economic conditions and environment of uncertainty as the Budget of 2022. Yet, it is quite appreciable how measures proposed for fiscal consolidation, infrastructure development and public welfare have been balanced specially at this crisis time where there is not only a financial crisis, but also worldwide COVID-19 pandemic which has impacted all the countries irrespective of their level of economic development.

However, it is sad that the Opposition's criticism is only directed at condemning the Budget *in toto,* without offering alternative solutions. It only reminds me Mark Twain's famous quote, "if you have no will to change, you have no right to criticize it", which is well-suited to Opposition's criticism.

In the forthcoming year with the new challenges brought by the pandemic, the Government hopes to finance a total expenditure of Rs. 3.9 trillion with an annual revenue of Rs. 2.2 trillion which leaves a budget deficit of Rs. 1.6 trillion. The real challenge the Government is facing is increasing government revenue whilst keeping the expenditure at the lowest possible level and maintaining public welfare at a satisfactory level. The macro framework within which the Budget 2022 is presented include reducing the Budget deficit from 10 per cent of the national income at present to 1.5 per cent by 2027.

Mr. Presiding Member, I congratulate the Government for keeping its policy of long-term stability and consistency by not changing the direction set by the last Budget in the midst of heavy criticism, which laid a strong structural foundation facilitating faster, liberal economic development and attraction of FDIs. Going further, it is very encouraging to see an island-wide development Budget being presented with a long-term strategic development vision rather than year-by-year plan even in the middle of the current extremely stressful difficult economic conditions.

It is laudable that promoting local manufacturing has been a priority with a number of investment zones proposed to set up in different districts in the Budget this year. The underlining economic strategy of developing the industrial sector involving all provinces will pay dividends in terms of resurgence in the manufacturing sector and enhancing its contribution to national GDP which will help breaking the vicious cycle of manufacturing sector contribution being stagnated at an unsatisfactory average of 16 per cent since Independence.

As a Member representing the Batticaloa District, I am happy to mention that the proposed fabric park in Eravur is fast coming up and once completed, it will transform the textile and apparel industry landscape in the country in an unprecedented manner. I am also encouraged by the allocation of another Rs. 1,000 million for the development of traditional cottage industries and handloom fabric and batik industries which include a significant number of women business owners in the Batticaloa District.

It is admirable the proposal for the establishment of a mini-supermarket chain for women entrepreneurs which will assist a lot of women who are into micro-businesses and also promotion of the new hi-tech agro parks to produce new agro-entrepreneurs by providing uncultivated lands to women and youth. Such proposals stand to benefit the people of Batticaloa District in significant ways.

In terms of revenue management, I wish to mention that the Government has very rightly and strongly considered to effectively maximize tax revenue, non-tax revenue and Foreign Direct Investment and to place relatively low priority to internal and external borrowings. The Government came under severe criticism when it introduced far-reaching tax reforms in January last year stating that the Government has slashed its main revenue without considering the consequences. However, that was a right move in line with modern day economic and fiscal policy formulation which has today transformed Sri Lanka into a tax competitive and tax-friendly country with a simplified tax structure making it one of the lowest tax territories in the world. From tax point of view, Sri Lanka now is a virgin territory.

Hon. Finance Minister has also proposed restructuring of Inland Revenue Department and other revenue authorities in a bid to make institutional functioning of tax authorities more efficient and effective so that tax evasion also be curbed. I commend the Government in its effort of introducing non-traditional sources of tax income and adhering to the principle of "capacity to pay" in broad basing the tax net in the country.

In the area of non-tax revenue, Government's effort in professionalizing the management of State-Owned Enterprises -SOEs- have proven to be the way forward. A number of loss-making and Treasury-dependent SOEs are now on the way towards making profits and contributing to the Treasury.

Reducing the Treasury burden is a looming challenge this Government is facing. In this context, due consideration should be given to developing stronger diplomatic ties, particularly with the Middle Eastern Countries. Through the formation of such ties, we open the doors to stronger, long-term financial and economic ties as well, such as receiving concessional loans, government-to-government projects and people-to-people investment et cetera. Recent large-scale credit support and investment opportunities granted by the Arab World to our own neighbouring countries such as India, Pakistan and Bangladesh are unprecedented and overwhelming and it is sad that Sri Lanka has not been benefited by such generous considerations by the Middle East.

Cash rich nations such as the Arab nations, for example, offer opportunities to open permanent or long-term credit lines for petroleum and petroleum by-products, which is timely, as there is a grave need for Sri Lanka. These nations do not have ulterior motives and agendas except their commercial interest and they offer facilities in a friendly, respectful and mutually rewarding partnership environment.

In our efforts to develop healthier and mutually benefiting relations with the Middle East, I advise the Government not to get carried away with the ideologies and perceptions that "terrorism or extremism being nurtured" by the 50 Muslim majority countries in the world. It may be true in respect of one or two countries, but the vast majority of Arab nations are all violently against such ideologies and have been long-term friends and well-wishers of Sri Lanka. They spend a lot of money in eliminating terrorism in their own countries. So, we should of course have a very strong relationship and ties with them in order to achieve all these facilities which I have mentioned.

In the meantime, it is easy to present a Budget when there is adequate money with the Government Treasury. However, for the last two years, Sri Lanka's export earnings dropped drastically to nine per cent due to the global pandemic. In contrast, oil, gas and other essential imports skyrocketed and freight charges were at an all-time high. Considering these facts, presenting a Budget with a large allocation to key thrust sectors such as education, roads and other infrastructure along with plans spelt out to increase Government revenue and cost-cutting measures for the public sector is unexpected and highly creditable.

இந்த நேரத்தில் நடந்துகொண்டிக்கின்ற ஒருசில அரசியல் மாற்றங்கள் பற்றியும் கதைக்கவேண்டிய தேவை எனக்கிருக் கின்றது. நாங்கள் இருபதாவது திருத்தத்துக்கு ஆதரவளித்த நாளிலிருந்து எங்களை விமர்சிப்பதற்கென்றே ஒருசில கூட்டங்கள் இருக்கின்றன. அவை வெளியிலிருந்து எங்களை விமர்சித்துக்கொண்டிருக்கின்றன. எங்களுடைய சமூகத்தின் அரசியல் உரிமைகளை எவ்வாறு வெல்ல வேண்டும்? அதற்காக எவ்வாறு ஜனநாயக ரீதியில் இராஜதந்திரமாகக் காய்நகர்த்த வேண்டும்? என்பதைப் பற்றிப் புரிந்து கொள்ளாமலும் நாட்டினுடைய நிலைமையைப் புரிந்து கொள்ளாமலும் வெறுமனே வெளியிலிருந்து பேசிக் கொண்டிருப்பதால் மாத்திரம் எங்களால் எந்தவொரு பயனையும் அடைந்துவிட முடியாது.

சஹ்ரான் குழுவினரால் மேற்கொள்ளப்பட்ட குண்டுத் தாக்குதல் காணரமாக இன்று இந்த நாட்டிலே வாழுகின்ற முஸ்லிம் சமூகம் பாரிய பின்னடைவைச் சந்தித்திருக்கின்றது என்பது எங்களுக்கு நன்றாகத் தெரியும்! இச்செயற்பாடானது கச்சிதமாகச் செய்துமுடிக்கப்பட்டிருக்கிறது. இந்தச் சம்பவம் நல்லாட்சிக் காலத்திலே நடந்தேறியது என்பதை நாங்கள் ஒருபோதும் மறந்துவிட முடியாது. கடந்த நல்லாட்சி அரசாங்க காலத்தில் சஹ்ரானுக்கு எதிராக நூற்றுக்கும் மேற்பட்ட complaints கொடுக்கப்பட்டிருந்தபோதிலும், அவற்றை யாருமே inquiry பண்ணாததன் காரணமாக அல்லது அவற்றை யாருமே கருத்திலே எடுக்காததன் காரணமாக ஏற்பட்ட விளைவுதான் இது என்பதை நாங்கள் புரிந்துகொண்டாக வேண்டும். குறிப்பாக, முஸ்லிம் சமூகம் புரிந்துகொண்டாக வேண்டும். ஆகவே, வெறுமனே அரசாங்கத்தை மாத்திரம் விமர்சிப்பதால் அல்லது அரசாங்கத்தை எதிர்த்து நிற்பதால் எதையும் சாதித்துவிட முடியுமென்று ஒருபோதும் நினைக்கக் கூடாது. அந்தச் சம்பவத்தின் பின்னர் எங்களுடைய இளைஞர்கள் சிறையில் அடைக்கப்பட்டார்கள். அவர்களில் இச்சம்பவத்துடன் சம்பந்தப்படாத ஒருசிலரும் இருக்கலாம்! அப்போது நல்லாட்சி அரசாங்கத்தில் எமது சமூகம் சார்ந்த எத்தனையோ அமைச்சர்கள் இருந்தார்கள் என்பதை நாங்கள் ஒருபோதும் மறந்துவிட முடியாது. அவர்களால்கூட எதையுமே செய்ய முடியாத ஒரு சூழ்நிலைதான் அன்று இருந்தது என்பதையும் நாங்கள் மறந்துவிட முடியாது. நல்லாட்சி அரசாங்க காலத்தில்தான் திகனயிலும் பிரச்சினை ஏற்படுத்தப்பட்டது. அப்போதும் எங்களால் எதையுமே செய்யமுடியாமலிருந்தது.

ஆகவே, இந்த நாட்டிலே ஒரு சிறுபான்மைச் சமூகமாக இருக்கின்ற நாங்கள், அரசாங்கத்துடன் இராஜதந்திர ரீதியில் காய்நகர்த்தல்களை மேற்கொண்டு, எங்களுடைய விடயங்களைச் சாதித்துக்கொள்கின்ற அதேவேளை, இந்த நாட்டுக்கு நாங்கள் தேவையென்பதையும் உணர்த்த வேண்டும். நாங்கள் இந்த நாட்டுக்குப் பங்களிப்புச் செய்கின்ற ஒரு சமூகமாக ஆயிரம் வருடங்களுக்கும் மேலாக இருந்திருக்கிறோம். இந்த நாட்டுக்கு முஸ்லிம் சமூகம் எல்லாவகையிலும் பங்களிப்புச் செய்திருக்கின்றது. அதைத் தொடர்ந்தும் செய்கின்ற அதேவேளை, எங்களுடைய கௌரவத்தையும் கண்ணியத்தையும் பாதுகாப்பதற்காக நாங்கள் அரசியல் காய்நகர்த்தல்களை மேற்கொள்ளவேண்டிய தேவையிருக்கின்றது. நாங்கள் வெறுமனே அரசியல் இலாபங்களுக்காக இந்த அரசாங்கத்துடன் இணைந்து செயற்படுபவர்கள் அல்லர் என்பதை இந்த நாட்டு மக்களுக்குச் சொல்லவேண்டிய தேவையிருக்கின்றது. இதற்கு எங்களுக்கு ஐந்து சதமும் தேவைப்படாது. எங்களுடைய சமூகத்துக்காக இந்தப் பாராளுமன்றப் பதவியைத் தூக்கி எறிவதற்கும் நாங்கள் அஞ்சப்போவதில்லை. அந்த வகையில், இராஜதந்திர முறையிலான ஓர் அணுகுமுறையையே நாங்கள் கடைபிடித்து வருகின்றோம். இன்று நாங்கள் இந்த அரசாங்கத்துடன் இணைந்து செயற்படுவதன் காரணமாகத்தான் எங்களால் எங்களுடைய சமூகம் சார்ந்த பல விடயங்களைப் பேசித் தீர்க்கக்கூடியதாக இருக்கின்றது. ஆகவே, எங்களை விமர்சித்து, அரசாங்கத்தைத் தூற்றுவதால் மாத்திரம் எதையுமே சாதிக்க முடியாது என்ற யதார்த்தத்தை இங்கு சொல்லுகின்றேன்.

கடந்த காலங்களில் 'கொவிட்' தொற்றினால் இறந்த எங்களுடைய சகோதரர்களின் ஜனாஸாக்கள் எரிக்கப்பட்ட போது, எங்களுடைய இரத்தம் கொதித்தது; அதற்கெதிராக நாங்கள் கொதித்தெழுந்தோம்; அதை எண்ணி இன்னும் அழுதுகொண்டிருக்கிறோம்; அவ்வாறான விடயம்

[ගරු නසීර් අහමඩ් මහතා]

நடந்திருக்கக் கூடாது என்று எண்ணுகிறோம். இவ்விடயத்துடன் சம்பந்தப்பட்ட ஒரு முக்கியமான விடயத்தை நான் இந்த உயர் சபையிலே பதிவுசெய்ய விரும்புகின்றேன். 2002ஆம் ஆண்டு கௌரவ ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் ஆட்சிக் காலத்தில்தான் இந்த நாட்டிலே முதன்முதலாக இரண்டு முஸ்லிம் ஜனாஸாக்கள் ஓட்டமாவடியில் எரிக்கப்பட்டன என்ற யதார்த்தத்தை நான் இவ்விடத்தில் பதிவுசெய்தே ஆக வேண்டும். அப்போதிருந்த முஸ்லிம் அமைச்சர்கள் அதனைக் கைகட்டிப் பார்த்துக்கொண்டிருந்த வரலாற்றையும் நான் இவ்விடத்தில் நினைவுகூரியே ஆக வேண்டும். இன்று நாங்கள் பல விடயங்களை மிகக் கவனமாக handle பண்ணிக்கொண்டு வருகின்றோம்.

'கொவிட்' தொற்றினால் இறக்கின்ற எங்களுடைய சகோதரர்களின் ஜனாஸாக்கள் அடக்கப்படுகின்ற காணியை மிகவும் இலகுவாக என்னால் எடுத்துக்கொடுக்க முடிந்தது என்பதை இவ்விடத்தில் பதிவுசெய்தே ஆக வேண்டும். அதுமாத்திரமல்ல, இடப்பற்றாக்குறை காரணமாக அதை மேலும் 05 ஏக்கரால் அதிகரித்துக் கொடுப்பதற்கும் என்னால் முடிந்தது. இவற்றை எல்லாம் KPW என்று சொல்லப்படுகின்ற Koralai Pattu Westஇன் DCC Chairman என்ற முறையில்தான் என்னால் செய்யமுடிந்தது என்பதை எமது சமூகத்துக்குச் சொல்லவேண்டிய தேவையிருக்கின்றது. இவ்வாறான ஜனாஸாக்களை வேறு பல இடங்களில் அடக்கம் செய்வதற்கான முயற்சிகளையும் நாங்கள் எடுத்து வருகின்றோம்; அது தொடர்பில் கலந்துரையாடி வருகின்றோம். அதுமாத்திரமல்ல, கௌரவ அமைச்சர் அலி சப்ரி, கௌரவ மர்ஜான் பளீல் ஆகியோருடன் நாங்களும் சேர்ந்து ஞானசார தேரர் அவர்கள் தலைவராக நியமிக்கப் பட்டிருக்கின்ற 'ஒரே நாடு, ஒரே சட்டம்' என்ற சனாதிபதி செயலணியின் அதிகாரத்தைக் குறைப்பது தொடர்பில் அரசாங்கத்துடன் சுமுகமாகக் கலந்துரையாடியதன் பலனாக அதன் அதிகாரம் குறைக்கப்பட்டிருக்கின்றது. இதன் காரணமாக இன்று எமது சமூகம் ஓரளவு நிம்மதி யடைந்திருக்கின்றது. இவ்வாறாக எமது சமூகத்தை வாழவைப்பதற்காக நாங்கள் பாடுபட்டுக்கொண்டிருக்கிறோம் என்பதை நடைமுறையில் நிரூபித்துக் காட்டியிருக்கிறோம். அதேபோல, இந்த நாட்டில் மாடறுப்பு தடைசெய்யப்பட்டால் அது எவ்வாறு இந்த நாட்டினுடைய பொருளாதாரத்தைப் பாதிக்கும் என்பது தொடர்பில் நாங்கள் அரசாங்கத்துக்கு எடுத்துக்கூறி இருக்கிறோம். அது தொடர்பான சட்ட உருவாக்கத்தைப் பிற்போடுவதற்காக அல்லது அதை இல்லாமல் ஆக்குவதற்காக நாங்கள் தொடர்ந்தும் அரசாங்கத்துடன் சுமுகமான முறையில் பேச்சுவார்த்தைகளை மேற்கொண்டு வருகின்றோம். மேலும், முஸ்லிம்களுக்கு எதிரான சட்டங்களை இல்லாமல் ஆக்குவதற்காகவும் நாங்கள் முயற்சிகளை எடுத்து வருகின்றோம்.

இந்த நாட்டிலே எல்லை நிர்ணயம் என்பது ஒரு முக்கிய விடயமாகப் பார்க்கப்படுகின்றது. மட்டக்களப்பு மாவட் டத்திலுள்ள முஸ்லிம்களுக்கு இருக்கின்ற மிகப்பெரிய பிரச்சினை காணிப் பிரச்சினையாகும். மட்டக்களப்பு மாவட்டத்திலே 26.4 சதவீதமாக வாழ்கின்ற முஸ்லிம்களுக்கு முஸ்லிம் பிரதேச எல்லைக்குள் 1.2 சதவீதமான காணிகள் மாத்திரமே இருக்கின்றன. ஆகையால், இந்த நிலைமை மாற்றியமைக்கப்பட வேண்டும். 2000ஆம் ஆண்டு யூன் மாதம் வெளிவந்த Panambalana Commission Reportஇலே KPWக்கு - கோரளைப்பற்று மேற்குக்கு 240 சதுர கிலோமீற்றர் காணி கொடுக்கப்பட வேண்டுமென்று குறிப்பிடப்பட்டபோதிலும், அது இன்றுவரை கொடுக்கப்படாமல் இருக்கிறது. 2000ஆம் ஆண்டிலும் எங்களுடைய பிரதிநிதிகள் அமைச்சரவையில் இருந்தார்கள். அந்த வகையில் 2001ஆம் ஆண்டு அதை இரவோடு இரவாக Gazette பண்ணியிருக்க வேண்டும். அப்படிச் செய்யாத காரணத்தினால்தான், இன்றுவரைக்கும் எங்களால் அதைச் செய்ய முடியாமல் இருக்கிறது. இவ்விடயம் தொடர்பில் நேர்மையாக, நிதானமாகச் செயற்பட வேண்டும். அந்த வகையில், statisticsஐக் காட்டி, அரசாங்கத்துடன் சுமுகமாகப் பேசி இதை வென்றெடுப்பதற்குரிய முயற்சிகளை எடுத்துக்கொண்டிருக்கின்றோம். நிச்சயமாக நாங்கள் அதை இந்த ஆட்சிக் காலத்திலே வென்றெடுப்போம் என்பதை இவ்விடத்தில் கூற விரும்புகின்றேன்.

அதேபோன்று, அரபு நாடுகளுடன் எங்களுடைய இராஜதந்திர உறவுகளை மேம்படுத்த வேண்டுமாயின் முஸ்லிம்களும் பங்களிப்புச் செய்ய வேண்டும். அந்த வகையில், அந்நாடுகளுடனான எமது அரசாங்கத்தின் relationshipஐப் பலப்படுத்திக்கொள்வதற்காக நாங்கள் உழைத்து வருகின்றோம். இந்த நாட்டை முன்னேற்றுவதற்கும் பலப் படுத்துவதற்கும் எங்களுடைய பங்களிப்பு நிச்சயமாக இருக்கும். அதேநேரத்தில், இந்த நாட்டிலே முஸ்லிம் சமூகமும் கௌரவமாக வாழ்வதற்குரிய வழிவகைகளைச் செய்து கொடுக்கின்ற வகையிலேயே எங்களுடைய அரசியல் பயணம் இருக்கும் என்பதை இவ்விடத்தில் பதிவுசெய்தவனாக விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මම මේ පාර්ලිමේන්තුවට පත් වෙලා ආවාට පසුව, දෙවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ ඒ පිළිබඳ වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. මේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුව ගන්නා තීන්දු තීරණ මත තමයි මේ රටේ පොදු මහජනතාවගේ සුබ සිද්ධිය ඇතුළු සියලු කාර්යභාරය සිද්ධ වෙන්නේ. ඒ නිසා ම අපටත් ඒ පිළිබඳ වගකීමක් තිබෙනවා. අපේ රට ඇතුළු ලෝකයේ බොහෝ රටවල ආර්ථිකය බිඳ වැටිච්ච මොහොතක, අය වැය ලේඛනයක් ගැන හිතන්නවත් බැරි මොහොතක මේ රටේ පොදු මහජනතාව වෙනුවෙන් ඉතාම සාර්ථක අය වැය ලේඛනයක් කාලයේ හැටියට ඉදිරිපත් කරන්න ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ රටේ ජනතාවගේ වාසනාවට ශක්තිමත් ආණ්ඩුවක් බිහිවෙච්ච නිසා රටේ ජනතාව වෙනුවෙන් පැහැදිලි තීන්දු ගන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. පසුගිය කාලයේ වාගේ පණ නැති දුර්වල ආණ්ඩුවක් මේ රටේ තිබුණු මොහොතක මේ වසංගතයට මුහුණ දෙන්න සිද්ධ වුණා නම්, අද මේ රටේ සාමාන්‍ය පාලනය බිඳ වැටිලා, රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා, රටේ පොදු මහජනතාවට වෙන්නේ මොකක්ද කියලා හිතා ගන්නවත් බැරි තත්ත්වයකට පත්වෙන්න ඉඩ තිබුණා. හැබැයි, ගෝලීය වශයෙන් මේ වසංගතයට මුහුණ දෙනකොට, රටේ වාසනාවකට අද මේ තිබෙන වටපිටාව තුළ සාර්ථක අය වැයක් නිර්මාණය කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ රාත්‍රී රූපවාහිනිය බලනකොට අපි දැක්ක දෙයක් තමයි ජර්මනියේ එක දවසකට කොරෝනා රෝගීන් 65,000ක් හමු වෙනවාය කියන කාරණය. මේ වසංගතය දුරු කරන්න ඒ රටවල් ගොඩක් උත්සාහ දරනවා. ලෝකයේ තිබෙන සාර්ථක එන්නත් ඕනෑ තරම් පාවිච්චි කරන්න ඒ අයට හැකියාව තිබෙනවා. නමුත් ඒ රටවලට තවමත් මේ තත්ත්වය කළමනාකරණය කර ගන්න බැරි වෙලා තිබෙනවා.

පසුගිය කාලයේ චීනයේ ප්‍රාන්ත පහ හයක දවසට පැය ගණනේ විදුලිය කැපුවා. ඒ රටවලට විදුලිය කළමනාකරණය කර ගන්න බැරි වෙලා තිබෙනවා. ලෝකයේ සමහර රටවල මාස ගණන් ගෑස් නැතුව තිබෙනවා. හැබැයි, මේ තිබෙන අර්බුද හමුවේත් යම්තාක් දුරට ප්‍රශ්න ඇති වුණත්, ඒ ප්‍රශ්න යටපත් කරගෙන ජනතාවට යම් විධියක සේවාවක් කරන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. විශේෂයෙන්ම ඩොලරය ඉතාම ඉහළ මට්ටමකට ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම නැව් ගාස්තු වැඩිවීම නිසා රටේ සාමාන්‍ය බඩු මිල පවත්වාගෙන යන්න බැරි අසීරු අවස්ථාවක් තමයි උදා වෙලා තිබෙන්නේ. මේ තිබෙන ගෝලීය වසංගතය හමුවේ ජනතාවට ප්‍රශ්න තිබුණත්, යම්තාක් දුරකට මේ තත්ත්වය පාලනය කරගෙන ජනතාවට සැබෑ ලෙස වගකීම් ඉෂ්ට කරන්නට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

සාමාන්‍යයෙන් මේ තිබෙන පරිසරය දිහා බැලුවාම, අද අපි ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය ලේසියෙන් පෙළ ගස්වන්න පුළුවන් එකක් නොවෙයි. නමුත් රටේ සෑම අංශයක්ම නියෝජනය වෙන විධියට මේ කටයුත්ත කරන්න අපේ ආණ්ඩුව ලොකු උත්සාහයක් අරගෙන තිබෙනවා. මුදල් ඇමතිතුමා, ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු මේ සියලුදෙනාගේ කැපවීම මත මේ කටයුතු තීරණය කරන්න පුළුවන් අවස්ථාවක් ලැබිලා තිබෙනවා.

අපි දැක්කා, වැව් අමුණු 5,000ක් හදන්න මුදල් වෙන් කරලා තිබෙන බව. ඉතිහාසයේ අපි අහලා තිබෙනවා, සිංහල රජ කාලයේ හිටපු රජවරු වැව් බැඳි රාජ්‍යයක් හැටියට අපේ රට සංවර්ධනය කරන්න, පෝෂණය කරන්න උත්සාහ කළ බව. පසුගිය කාලයේ මොන තරම් ආණ්ඩු මේ රටේ තිබුණත්, ඒ හදපු වැව් පද්ධතිය හරියට ප්‍රතිසංස්කරණය කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ.

හැබැයි, මේ දුර්වල අවස්ථාවේත් අද අපි ඉලක්කයක් තියාගෙන වැව් 5,000ක් ප්‍රතිසංස්කරණය කරන්න පටන්ගෙන තිබෙනවා. අපි මේ වසරේ වැව් 1,050ක් හදලා අවසන් කරලා තිබෙනවා. ඒ සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන ගණනකින් තවත් වැඩි කරගන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඉලක්ක කරපු ප්‍රමාණයටත් වඩා එහාට යන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා එදා සිංහල රජ දවසින් පස්සේ මේ වාරි පද්ධතිය ශක්තිමත් කරගත් ප්‍රථම අවස්ථාව මෙය යැයි කියන්නට අද අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුරයේ 'සඳහිරු සෑය' විවෘත කරන ඒ මහා දැවැන්ත උත්සවයට ඔබතුමාත්, අපිත් ඊයේ සහභාගි වුණා. එතැනට ගියාම අපේ ඇඟට යමක් දැනුණා. එතැන මහා නිර්මාණයක් කරලා තිබෙනවා. ඉතිහාසයේ අවුරුදු 1,700කට පස්සේ මේ වාගේ නිර්මාණයක් කරපු ප්‍රථම අවස්ථාව මෙයයි. හැබැයි, අපේ රටේ තිබෙන කුහක දේශපාලනයේ ප්‍රතිඵලයක් විධියට ඒක ඇති තරම් විවේචනය කරන්න පක්ෂ දේශපාලනය කරන අය කටයුතු කරනවා. හැබැයි, එතැනට ගියාම අපට පෙනෙන්නේ මොකක්ද? අපට මේ රටේ නිදහසේ ජීවත් වෙන්න අයිතිය ලබා දීපු අපේ රණවිරුවන් සිහි කරන්න තමයි එය ඉදිකරලා තිබෙන්නේ. ඒ රණවිරුවෝ ජීවිත දුන්නේ ඔබට- අපට මේ විධියට මේ රටේ නිදහසේ ජීවත් වෙන්නයි. ඒ දීපු අයිතියට ඔවුන්ට කරන උපහාරයක් විධියට තමයි එය ඉදිකරලා තිබෙන්නේ. හැබැයි, අද අපේ පටු දේශපාලනය ඒකත් විවේචනය කරන්න සූදානම් වෙලා සිටිනවා. අපට ලජ්ජයි. මේ රටේ පුරවැසියන් හැටියට මේ වාගේ දෙයක්වත් අගය කරන්න බැරි තරම් මේ රටේ දේශපාලනය මේ මට්ටමට නම් වැටිලා තිබෙන්නේ, ඒ ගැන අප ලජ්ජා විය යුතුයි. මේ රටේ පුරවැසියන්ට නැවතත් හිතන්න වෙයි, මේ රට ගමන් කරන්නේ මොන පාරේද කියලා. අපේ රටේ ජනතාවට හිතන්න වේවි, මේ රට යන්නේ හරි පාරේ ද, වැරදි පාරේ ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනට ගියාම අපි දැක්කේ මොනවාද? ඉතිහාසයේ මේ රටේ හිටපු රජවරු මේ වාගේ ස්තූප හදලා, මේ වාගේ මහා වෙහෙර විහාර හදලා අපේ උරුමය රකින්න කටයුතු කළා. මෑත යුගයේ මෙවැනි නිර්මාණයක් කරන්න පුළුවන් වුණු එකම ශක්තිමත් නායකයා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බව අපි කියන්න ඕනෑ. මේ රටේ පුරවැසියන්ට අවුරුදු 1,716කට පස්සේ මේ මහ පොළොවේ නැවතත් ඒ ගැන කියන්න පුළුවන්කම අද හදලා දීලා තිබෙනවා. වර්තමානයේ නිදහසේ ජීවත් වෙන අපට, මේ රටේ රණවිරුවන් ඇති කරලා දීපු ඒ නිදහස මතක් කරන්න, සිහි කරන්න හදපු ස්තූපය තමයි ඒක. ඒ නිසා ඒකට වෛර කරන අයට අපි කියනවා, එතැනට ගිහිල්ලා මලක්, පහනක් පූජා කරලා, වන්දනාමාන කරලා සමාව අරගෙන එන්න කියලා. එතැන ඒ තරම් අතිපූජනීය ස්ථානයක්. මෙවැනි දේවල් මේ රටේ අපි හැමෝම අගය කරන්න ඕනෑ. අපට පක්ෂ දේශපාලනයක් තිබෙන්න පුළුවන්, විවිධ ආගම් තිබෙන්න පුළුවන්. නමුත් මේ රටේ පුරවැසියන් වෙනුවෙන් කරපු ඒ මහා ව්‍යාපාරය, එහෙම නැත්නම් ඒ මහා යෝධ සංවර්ධනය අපි දකින්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අගය කරන්න තරම් අපේ රටේ මිනිස්සු බුද්ධිමත්. හැබැයි, කුහක දේශපාලනය තුළ ඒකට ඉඩක් නැති බව නම් අපට පෙනෙන්න තිබෙනවා.

මේ විධියට මහා සංවර්ධනයක් ඉලක්ක කරගෙන යන අතරේ, ගිය අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට මේ රටේ මාර්ග කිලෝමීටර් ලක්ෂයක් හදන වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබුණු බව අපි දැක්කා. අපි ඒ වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක කළා. දැන් අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් එක්දහස් ගණනක් හදලා දීලා තිබෙනවා. අපට තවත් සැලසුම් විශාල ප්‍රමාණයක් හදලා දීලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට ආවාට පස්සේ තමයි ගම්වල මිනිසුන් කොන්ක්‍රීට් පාරවල් දැක්කේ; ගම්වල මිනිසුන් කොන්ක්‍රීට් කැට අල්ලපු පාරවල් දැක්කේ. අපි ඒ සංවර්ධනය ගමට ගෙනාවා. එදා මාර්ගවල කොන්ක්‍රීට් කැට අල්ලන සංස්කෘතිය මිනිස්සුන්ට හඳුන්වා දුන්නා වාගේම, ගමේ පාරත් කොන්ක්‍රීට් කරන, ගමේ පාරත් කාපට් කරන සංස්කෘතිය ආරම්භ කළේත් අපේ වර්තමාන රජය බලයේ සිටියදී. ඒ නිසා අද අපට සතුටු වෙන්න පුළුවන්. අද අපි ගම්වලට ගියාම මිනිස්සු කියන්නේ මොකක්ද? එදා බොරලු ටිකක් දාලා පාරේ වළ වහලා දෙන්න කියපු මිනිස්සු, දැන් කියනවා, "අනේ! මන්ත්‍රීතුමා අපට ගමේ පාර කාපට් කරලා දෙන්න" කියලා. ඒ තරම් අභිමානයෙන් ඒ මිනිස්සුන්ගේ සිහිනය සැබෑ කරගන්න පුළුවන් මට්ටමේ ශක්තිමත් වැඩ පිළිවෙළක් මේ රටේ නිර්මාණය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල පාරවල් ගොඩක් දුෂ්කර තත්ත්වයේ තිබුණු බව ඔබතුමාත්, අපිත් දන්නවා. ඒ පාරවල්වල යන්න බැරිව තිබෙනකොට අපේ ආණ්ඩුව ඒ මාර්ග හැදුවා. හැබැයි, පටු දේශපාලනය මේවා විවිධ විධියට විවේචනය කළ බව අපි දැක්කා.

එදා Southern Highway එක, එහෙම නැත්නම් දකුණු අධිවේගී මාර්ගය විවෘත කරනකොට සමහර නායකයෝ කිව්වේ කොළඹට ඇඹුල් තියල් ගේන්නයි මේ පාරවල් හදන්නේ කියලා.

[ගරු අජිත් රාජපක්ෂ මහතා]

Port City එක හදනකොට රටේ කළු ගල් ඉවර වෙයි කිව්වා. වැරදිලා හරි සඳහිරුසෑය හදන පැත්තට ගියා නම් කියයි, ඒක හදලා ඉවර වෙනකොට මේ රටේ ගඩොල් ටික ඉවරයි කියලා. ඒවා ඒ තරම් පටු විධියට දැකපු දේශපාලනයක් තමයි මේ රටේ තිබෙන්නේ. ඒ නිසා අපි කියනවා, පටු විධියට දකින අයට මේවා කරන්න බැහැ කියලා.

පසුගිය දවස්වල ගුරුවරු පාරට බැස්සාම ඒ වේදිකාව ඉස්සරහට ඇවිල්ලා අඩ අඩා මේ රටේ අසත්‍ය පතුරුවන්න කටයුතු කළා. මේ තිබෙන අර්බුදය හමුවේත් ගුරු-විදුහල්පති ගැටලුව අපි විසඳා තිබෙනවා. ඒක නිසා මේ රටේ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් අපට කරන්න තිබෙන යුතුකම් සියල්ලම අපි ඉදිරි කාල පරිච්ඡේදයේදී ඉෂ්ට කරන්න සූදානමින් ඉන්නවා. කථාවක් තිබෙනවා, "රැල්ලට බය නම් වැල්ලට යන්නේ නැහැ" කියලා. අපි මේ ආණ්ඩුව ගත්තේ කාටවත් බයේ කටයුතු කරන්න නොවෙයි. අපි මේ රටේ පොදු ජනතාවගේ යුතුකම් ඉෂ්ට කරන්න නිර්භීතව තීන්දු අරගෙන කටයුතු කරන්න සූදානම් කියන පණිවුඩය මේ උත්තරීතර සභාව හමුවේ තබමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුප පස්කුවල් මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.23]

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
ආයුබෝවන්!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අය වැය ලේඛනය ගැන කථා කරන්න ලැබීම පිළිබඳව මා පළමුව සතුටු වෙනවා. අය වැයකින් ප්‍රධාන වශයෙන්ම රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා තමයි කටයුතු කරන්නේ. අභියෝගයකට මුහුණ දී තිබෙන මොහොතක ඒ අභියෝගය ජයගෙන, අය වැය තුළින් සාර්ථකව අපේ ඉලක්ක සපුරා ගැනීම තමයි අපේ පරමාර්ථය. බිඳ වැටුණු දළ දේශීය නිෂ්පාදනය වැඩි කර ගැනීම ඉලක්ක කරගත් නිෂ්පාදන අය වැයක් තමයි මෙවර අය වැය විධියට අපි ඉදිරිපත් කළේ. ජනතාවගේ සහභාගිත්වය තුළින් ඒ වැඩ පිළිවෙළ ඉතා සාර්ථකව ජයග්‍රහණය කිරීම තමයි, අපේ බලාපොරොත්තුව.

අපේ දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු ඇමතිතුමා, ඒ වාගේම හිටපු දිස්ත්‍රික් නායකතුමා ඊයේ උදේ වරුවේ මේ අය වැය ගැන ප්‍රබල විවේචනයක් එල්ල කළා. එතුමා දැන් ඉන්නේ අපිත් එක්ක නොවෙයි. එතුමා අපි දාලා ගියා. මතුගම සංවර්ධන කමිටුවේ සහ දොඩන්ගොඩ සංවර්ධන කමිටුවේ සභාපතිවරයා හැටියට, මම ඒ තත්ත්වය නිවැරැදිද යන්න පිළිබඳව විවරණය කිරීම ඉතාම වැදගත්. අපි මෙතෙක් කල් එතුමාගේ දේශපාලනය ගැන කථා කළේ නැහැ. ජනාධිපතිවරණය කාලයේ සිට මේ දක්වා අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා විවේචනය කරපු එක ගැන අපි කථා කළේ නැහැ. නමුත්, අද වනකොට ඒ පිළිබඳව විවරණය කිරීම මතුගම සහ දොඩන්ගොඩ සංවර්ධන කමිටුවේ සභාපති විධියට මට අයිති රාජකාරියක් කියලා මම හිතනවා. එතුමා කිව්වා, වසර 40ක දේශපාලන අත්දැකීම් පිළිබඳව. එය විශිෂ්ට කාල පරිච්ඡේදයක් කිව්වා. අද මේ කාල පරිච්ඡේදය විශිෂ්ට නැහැ කියලාත් කිව්වා.

පස්යොදුන් කෝරළයේ නායකයා විධියට දන්නවා, ඒ පළාත අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රධාන වන බව. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා උපන් කලාපය, ජීවත් වූ කලාපය තමයි, ඒ කලාපය. ඒ කලාපයට විශ්වවිද්‍යාලයක් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම කළුතර දිස්ත්‍රික්කයටම විශ්වවිද්‍යාලයක් තිබුණේ නැහැ. ඉත්තෑපානේ ධම්මාලංකාර හාමුදුරුවෝ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නව රජයෙන් ඉල්ලුවා, ඒ කලාපයට විශ්වවිද්‍යාලයක් දෙන්න කියලා. අපි දන්නා විධියට වසර 40ටම මේ ගරු මන්ත්‍රීතුමා රජයෙන් උසස් අධ්‍යාපන ආයතනයක් ඉල්ලුවේ නැහැ. ඉල්ලුවා නම්, අනිවාර්යයෙන්ම ලැබෙනවා. නමුත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙනුත්, මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ බැසිල් රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ මේ නව රජයෙනුත් අපි ඉල්ලා සිටියා, කළුතර ඉත්තෑපානට විශ්වවිද්‍යාලයක් දෙන්න කියලා. ඒක ලැබුණා. දැන් ඒ සම්බන්ධ කටයුතු සිද්ධ වෙනවා. නමුත්, පසුගිය වසර 40ටම එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ.

අධ්‍යාපනය නැතුව, ශිල්ප දැනුම නැතුව, සාර්ථක දැනුමක් නැතුව පළාතක් විධියට සංවර්ධනය වෙන්න බැහැ; අභියෝග ජයගන්න බැහැ; ආර්ථිකය වර්ධනය කරගන්න බැහැ. ඒක සත්‍යයක්. දළ දේශීය නිෂ්පාදනය -GDP- වර්ධනය කිරීම සඳහා දැනුමෙන් පිරිපුන් පිරිසක් අපට අවශ්‍යයි. ඒ සඳහා අපට විශ්වවිද්‍යාලයක් ලැබුණා. ඒ වාගේම තාක්ෂණික විශ්වවිද්‍යාලයකුත් ඉල්ලුවා. එයත් මෙතෙක් ඉල්ලා තිබුණේ නැහැ. දැන් තාක්ෂණික විශ්වවිද්‍යාලයකුත් කළුතරට ලැබෙනවා. සිල්පර කොටන් කර ගහන පිරිසකගෙන්, කොන්දොස්තරලා පිරිසකගෙන් එහෙම නැත්නම් කොස්තාපල්වරුන්ගෙන් විතරක් රටේ ආර්ථිකය, පස්යොදුන් කෝරළයේ ආර්ථිකය ශක්තිමත් කරන්න බැහැ. මේ පරම්පරාවත්, ඊළඟ පරම්පරාවත් ඉහළ අඩියකට ගෙන යන්න තමයි ඒ අධ්‍යාපන පහසුකම් දීලා තිබෙන්නේ. පස්යොදුන් කෝරළයට කාර්මික විද්‍යාලයක්වත්, NAITA එකට සම්බන්ධ ආයතනයක්වත්, VTA එකට සම්බන්ධ ආයතනයක්වත් නැහැ. එහෙම එකක් ඉල්ලලාත් නැහැ. කනගාටුවෙන් වුණත් මේවා කියන්න වෙනවා. අපි දන්නා හැටියට පසුගිය වසර 40ක කාලය තුළදී ඒවා අපට ලැබුණේ නැහැ.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත දැන් රට පුරා NAITA එකට සම්බන්ධ ආයතන ආරම්භ වනවා. බුලත්සිංහල ප්‍රදේශයේත් ජනවාරි මාසයේ VTA එකක් විවෘත වෙනවා. තාක්ෂණික දැනුම ලබා දෙන NAITA එකට සම්බන්ධ ආයතනයක් අවශ්‍ය ප්‍රධානම නගරයක් තමයි, මතුගම කියන්නේ. ආනන්ද ශාස්ත්‍රාලය, ජාතික පාසලක්. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර විද්‍යාලය, ජාතික පාසලක්. නමුත්, ඒ පාසල්වල ශිෂ්‍යයන්ට පාසල් අධ්‍යාපනයෙන් පස්සේ උසස් අධ්‍යාපනය ලබා ගන්න තැනක් නැහැ. අඩු ගණනේ කාර්මික විද්‍යාලයක්වත් නැහැ. ඒ මන්ත්‍රීතුමා පස්යොදුන් කෝරළයට ජාතික පාසලක් දායාද කළේ නැහැ. පස්යොදුන් කෝරළයට දායාද කළ දේවල් කීපයක් තිබෙනවා. හැබැයි, ඒවා දායාද කළේත් වෙනත් මන්ත්‍රීවරු. පස්යොදුන් කෝරළයේ අගලවත්ත ආසනයට එකම එක ජාතික පාසලක්වත් තිබුණේ නැහැ. මතුගමට ජාතික පාසල් තුනක් තිබුණා. ජාතික පාසල් 1,000 වැඩසටහන යටතේ මේ අය වැයෙන්, පස්යොදුන් කෝරළයේ අගලවත්ත ආසනයට ජාතික පාසල් තුනක් ලැබෙනවා. සමස්තයක් විධියට ගත්තාම පස්යොදුන් කෝරළයට ජාතික පාසල් 10ක් විතර ලැබෙනවා. ඒවා ජයග්‍රහණ නොවෙයිද?

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ඉලක්කය දැනුමෙන් පිරිපුන් සමාජයක් සහ ශක්තිමත් වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේත් සැලැස්ම ඒකයි. අපේ ජාතියේ මුදුන් මල්කඩ වාගේ තිබෙන රාජපක්ෂ සහෝදරත්වය බිඳ දැමීම සඳහාත් ඒ මන්ත්‍රීතුමා කුමන්ත්‍රණ කරනවා. ඒ වාගේම ඒ සඳහා යම් යම් ප්‍රකාශත් කරනවා. එතුමා කථාව අවසානයේදී දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ මොනවාද? එතුමා දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියා, "ශාප වෙන්න" කියලා. පස්යොදුන් කෝරළේ 'කළුගංතොට සිංහයා' කියපු ඒ නායකයා "ශාප වෙන්න" කියලා දෙවියන් වහන්සේගෙන් ඉල්ලුවේ ඇයි කියලා මට කුකුසක් ඇති වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිතුල් කර්මාන්තයේ යෙදෙන සහ කිතුල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනවල යෙදෙන විශාල පිරිසක් පස්යොදුන් කෝරළයේ ඉන්නවා. ඔබතුමාත් කාලයක් තිස්සේ කිතුල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනවල යෙදෙන අයට සහනයක් සලසන්න කථා කළා. නමුත්, කිසිවක් සිදු වුණේ නැහැ. කිතුල් කර්මාන්තයේ යෙදෙන්නන්ට පොලීසියෙන් කරන අඩන්තේට්ටම් නතර කර දෙන්න කියලා අපි මැතිවරණ කාලයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. එතුමා ඒ ඉල්ලීම ඒ වෙලාවේම ඉෂ්ට කළා. ඒ ගැන පොලිස්පතිතුමා මාර්ගයෙන් පොලීසිවලට චක්‍රලේඛයක් යැව්වා. ඊළඟට අපි ඉල්ලා සිටියා, කිතුල් ව්‍යාපාරිකයන්ට හා නිෂ්පාදකයන්ට උපරිම ශක්තිය ලබා දෙන්න කිතුල් සංවර්ධන මණ්ඩලයක් හදන්න කියලා. මාස 6ක් යන්න කලින් ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඒකත් ඉටු වුණා. ඒ අනුව, දැන් ඒ ප්‍රදේශයට කිතුල් කර්මාන්තය සඳහා කර්මාන්තශාලාවක් හැදෙනවා. නමුත්, අතීතයේ ලැබුණේ මොනවාද? අගලවත්ත ආසනයට තැබෑරුම් 5ක් ලැබුණා. අපි ගත්තොත්, හොරණ කර්මාන්ත පද්ධතියක්ම තිබෙනවා. ඒ වාගේම පානදුරත් තිබෙනවා, කළුතරත් තිබෙනවා, බේරුවලත් තිබෙනවා. නැත්තේ පස්යොදුන් කෝරළයටයි. දුප්පත්ම කලාපය, පස්යොදුන් කෝරළයයි. ඒ සංඛ්‍යාලේඛන හා දත්ත පරිශීලනය කරලා බලන්න. දුප්පත්ම කලාපය තිබෙන්නේ පස්යොදුන් කෝරළයේ. ඒ බුලත්සිංහල, මතුගම සහ අගලවත්ත. අගලවත්ත සහ බුලත්සිංහල කියන ප්‍රදේශවල දුප්පත්කම වැඩියි. නමුත්, මේ නව රජයේ ග්‍රාමීය සංවර්ධනය කියන නව සැලැස්ම තුළින් ඒ ගම්මාන සංවර්ධනය වෙනවා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේත්, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේත් නව රජයේ සැලැස්ම තුළ දුෂ්කරතා මැඩගෙන තමයි අපි මේ රාජ්‍ය ගොඩනඟන්නේ.

යුද්ධයෙන් පස්සේ තමයි, ජපානය ගොඩනැඟුණේ, දකුණු කොරියාව ගොඩනැඟුණේ, ජර්මනිය ගොඩනැඟුණේ. ඒ සියලු රාජ්‍ය ගොඩනැඟුණේ අතිශයින්ම අභියෝගාත්මක තත්ත්ව මැද්දේ, ජනතාවගේ සහභාගිත්වයෙන් හා ජනතාවගේ කැපවීමෙන්. මේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් සකස් කිරීම සඳහා රජයේ දැවැන්ත වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ සඳහා ජනතා සහභාගිත්වය අවශ්‍යයි; ජනතා කැපවීම අවශ්‍යයි. ඒ වාගේම, මන්ත්‍රීවරුන්ගේ කැප කිරීමත් අවශ්‍යයි. මේ රටේ සියලුදෙනාගේ කැප කිරීම මත යන ගමනක් තුළින් පමණයි, අපට ඒ ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මේ විශිෂ්ට නායකත්වයට අපහාස කරන්නේ නැතුව, මේ ගමනට ශක්තිමත්ව දායක වෙන්න. ඉතිහාසය අමතක කරන්න. නමුත්, සියලු දූෂණ අමතක කරන්න එපා. කරපු දූෂණ, වංචා හා හොරකම් පිළිබඳව හොයා බලා, ඒවා නැවතත් නොකරන තත්ත්වයට මේ රට පත් කරලා, ශක්තිමත් රාජ්‍යයක් ගොඩනැඟීම සඳහා අයෝමය නායකත්වයක් ලබා දෙන අපේ පොදුජන පෙරමුණ ඇතුළු සියලු පක්ෂවලට ඒ ශක්තිය ලැබෙන්න කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාත් ඇමෙරිකාවට ගිය එක ගැනත් එතුමා කථා කළා.

අපි දන්නවා, චීනයේ හිටපු නායකයකු වන මාඕ සේතුං මැතිතුමා රට ගියේ නැති වුණාට, ඩෙං ෂියාඕපිං ප්‍රංශයට ගිහිල්ලා, ප්‍රංශයේ ඉගෙන ගෙන ඇවිල්ලා තමයි බටහිරටත් රට විවෘත කරලා, ආයෝජකයන්ටත් රට විවෘත කරලා, 1992දී චීනයේ දැවැන්ත ආර්ථික පෙරළියක් ඇති කරලා, රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කළේ. මාඕ සේතුංගේ නව ජාතිකවාදයේ දැක්ම, ඩෙං ෂියාඕපිංගේ නව ජාතිකවාදයේ දැක්මට අනුව ව්‍යවසායකත්වයට අත දීලා, ව්‍යවසායකත්වයට තැන දීලා, ආයෝජකයන්ට රට විවෘත කරලා, චීන ජනතාවගේ ශක්තිය දැවැන්ත විධියට නඟාසිටුවලා, ඒ ව්‍යවසායකත්වය තුළින් තමයි ලෝකය ජය ගත්තේ. ඒ වාගේ සැලැස්මක් තමයි අපට අවශ්‍ය කරන්නේ. එහෙම නැතුව හිඟා කන ක්‍රමයක් නොවෙයි. ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම සඳහාත්, නව ආයෝජන ලබා ගැනීම සඳහාත් වන සැලැස්ම මෙවර අය වැය යෝජනාවලිය තුළ තිබෙනවා. ඒ නිසා ඒ සඳහා ශක්තිය, බලය, ධෛර්ය, කැපවීම ලබා දෙන ලෙස සියලුදෙනාගෙන් මා ඉල්ලා සිටිනවා. ව්‍යවසායකත්වය සඳහා ආර්ථිකය විවෘත කරලා තිබෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඔබ සැමට ජය වේවා!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කිංස් නෙල්සන් මැතිතුමා. ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා.3.33]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ 76 වැනි අය වැය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් ඇමතිවරයා එතුමාගේ අය වැය කථාවේදී මේ රටේ ජනගහනයෙන් සියයට 80ක් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැළෙන බව ප්‍රකාශ කළා. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම, සියයට 75ක් ජීවත් වන්නේ ගොවි ජනතාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ගොවියා පොහොර ටික ඉල්ලන කොට පොහොර ටික ලබා දුන්නේ නැහැ. දැන් මේ වනකොට වැව් ටික පිරිලා තිබෙනවා. මේ අවස්ථාවේ පොහොර ටික ලබා දුන්නා නම් මේ රජයට ලොකු ගෞරවයක් ලැබෙනවා. වී අතිරික්තයක් ඇති වෙන්න තිබුණා. ගොවි ජනපදයකින් ආපු මන්ත්‍රීවරයකු විධියට මම ඒ පිළිබඳව කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, ඔක්තෝබර් මාසයේ 16 වැනි දා වන විට මේ රටේ සියලු ගබඩා පොහොරවලින් පුරවනවා කියලා. නමුත් අදටත් පොළොන්නරුව දිස්ත්‍රික්කයට කිසිම පොහොරක් ලැබිලා නැහැ. අදටත් ඒ ගොවියෝ මඩ වැඩ කරලා බලාගෙන ඉන්නවා, කවදාද අපට පොහොර ටික ලබා දෙන්නේ කියලා. අපේ තවත් මන්ත්‍රීතුමෙක් කියපු ආකාරයට ඉන්දියාවෙන් ගෙනාපු නැනෝ නයිට්‍රජන් පොහොර ගැන අපේ ගොවි ජනතාවට කිසිම අවබෝධයක් නැහැ. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රසිද්ධ නාළිකාවකට ඇවිල්ලා කිව්වා, "මේ නැනෝ නයිට්‍රජන් පොහොර අධික වර්ෂාවේදී පාවිච්චි කරන්න බැහැ, අධික අව් රශ්නයේදී පාවිච්චි කරන්න බැහැ, හවසට විතරයි පාවිච්චි කරන්න පුළුවන්." කියලා. එහෙම නම්, පසු ගිය කාලයේ ලැබුණු වරුසාවත් එක්ක ඒ

[ගරු කිංස් නෙල්සන් මහතා]

පොහොර ලැබුණු ප්‍රදේශවල ගොවීන් ඒ පොහොර පාවිච්චි කළා නම්, ඒ පොහොර ටික විනාශ වෙලා ගිහිල්ලා ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විතරක් නොවෙයි. අද කෘෂිකර්ම ඇමතිතුමා කියනවා, "අපි දෙන පොහොර පාවිච්චි කරන්න. පොහොර පාවිච්චි කරලා නිසි ඵලදාවක් නොලැබුණොත් අපි ගොවියාට වන්දි ලබා දෙනවා." කියලා. ඒ වන්දි දෙන ක්‍රමවේදය මේ අය වැය කථාවේ කිසිම තැනක ලියවිලා නැහැ. අද මේ රටේ වී පොරොන්දුවට වැඩ කරන ගොවියෝ ඉන්නවා. අක්කර දෙකහමාරක් අස්වද්දන ගොවියෝ ඉන්නවා. හවුලේ ගොවිතැන් කරන ගොවියෝ ඉන්නවා. මුදල් ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, වගා හානි වුණොත් ඔබතුමා ඒ ගොවීන්ට ආධාර ලබා දෙන්නේ කොහොමද කියලා. ඒ විතරක් නොවෙයි. මේ රටේ සියයට 80ක් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැළෙනවා කියලා කෘෂිකර්ම ඇමතිතුමා කියනවා නම්, මේ රටේ බහුතරයකට අද එතුමා බොරු කියලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගොවියා හිඟා කන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගොවියා හිඟා කන තත්ත්වයට පත් නොකර, ගොවියාට වගා කරන්න ගොවියා ඉල්ලන පොහොර ටික ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේ ගරු සභාවට යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් නැනෝ නයිට්‍රජන් පොහොරක් ගැන කථා කරනවා. අපි ඒ ගැන හොයලා බැලුවා. ඉන්දියන් සමාගමෙන් ගෙනාපු නැනෝ නයිට්‍රජන් පොහොරවලට පේටන්ට් බලපත්‍රය ලබා දීලා හරියටම මාස තුනයි. පේටන්ට් බලපත්‍රය ලබා දීලා මාස තුනක් ඇතුළත තමයි මේ පොහොර අපේ රටට ගෙනෙන්නේ. මේ පොහොර කිසිම රටක පාවිච්චි කරලා නැහැ. අඩුම ගණනේ ඉන්දියාවේ කිසිම තැනකවත් මේ පොහොර පාවිච්චි කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට අද ඉන්දියාව අපේ භූමිය, අපේ සුන්දර රට පාවිච්චි කරනවා ඒ ගොල්ලන්ගේ පොහොර පරීක්ෂණ කරන්න. මේකද, කෘෂිකර්ම ඇමතිවරයාගේ තත්ත්වය?

ඒ විතරක් නොවෙයි. මේ පොහොර නැවැත්වූවේ කොහොමද කියලා බලන්න. පසුගිය කාලයේ ගොවියාට කිව්වේ, මේ පොහොර විසයි, ඒ නිසා රසායනික පොහොර පාවිච්චි කරන්න එපා කියලා. රසායනික පොහොර පාවිච්චි කිරීමෙන් වකුගඩු රෝගය හැදෙනවා කිව්වා; පිළිකා රෝගය හැදෙනවා කිව්වා. එවැනි නොයෙකුත් දේවල් කියලා, ඒ පොහොර විසයි කියලා ගොවියාට පොහොර දෙන එක නැවැත්වූවා. හැබැයි ඒ ආයතනයෙන් ඇහුවාම ඒ ආයතනයේ කිසිම කෙනෙක් ඒ ගැන කියන්නේ නැහැ. නැනෝ නයිට්‍රජන් පොහොර රසායනික පොහොරද, කාබනික පොහොරද කියලා ඇහුවොත් ඒ ගොල්ලන්ට දෙන්න උත්තරයක් නැහැ. එහෙම නම් මොනවාද මේ පොහොර? අද කෘෂිකර්ම ඇමතිතුමා කියනවා, මේ වනකොට ගෙන්වපු පොහොරවලට ඒ ගොල්ලෝ කිව්ව මිලට වඩා රුපියල් මිලියන 70,000ක් වැඩිපුර ගෙවන්න වෙනවා කියලා. එතුමා කියනවා, "මේ සම්බන්ධව මා කිසිම දෙයක් දන්නේ නැහැ. පොහොර භාරව ඉන්නේ ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමා. එතුමාගෙන් අහන්න ඕනෑ"යි කියලා. එහෙම නම් අද මොකටද මේ ඇමතිවරු? ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, ඇමතිවරුන්ගේ වියදම් අඩු කරනවා, රජයේ නිලධාරින්ගේ වියදම් අඩු කරනවා කියලා. එහෙම කියනකොට අනික් පැත්තෙන්, මේ පොහොරවලට රුපියල් මිලියන 70,000ක් වැඩිපුර ගෙවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බලන්න, මේ තත්ත්වය නිසා අද අපේ රට ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට ලක්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ රටේ පිළිගත් බැංකුවක් වන මහජන බැංකුව අද ජාත්‍යන්තර වශයෙන් අප්‍රසාදයට ලක්වෙලා තිබෙනවා. මේ පොහොර පිළිබඳ පරීක්ෂණ කරන්නේ නැතුව වෙලාසනින් සල්ලි යවපු නිසා තමයි, අද අපේ රටේ බැංකු මේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. දැන් අපේ රටට අශූචි නැවක් ඇවිල්ලා තිබෙනවා. මේ අශූචි නැව අපේ රටේ මුහුදු සීමාවේ එහාට මෙහාට සැරිසරනවා. මේ නැව ශාක නිරෝධායන මධ්‍යස්ථාන දෙකකින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. අද මොකටද, තුන්වන පාර්ශ්වයක්? දැන් තුන්වන පාර්ශ්වයක් ගැන කථාවක් කරන්න අවශ්‍ය නැහැ. 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත යටතේ රටේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒ බලය පැවරෙනවා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ශාක නිරෝධායන මධ්‍යස්ථාන රටවල් 184ක සම්මුතියට අනුව තමයි, කාබනික පොහොර රටවලට ගෙනෙනකොට ඒවා හොඳද, නැද්ද කියන එක පරීක්ෂා කරලා බලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදෑසන ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා කිව්වා, අද අපේ රට ලොකු අර්බුදයකට ලක්වෙලා තිබෙනවා කියලා. එතුමාගේ කථාවේදී වැඩිපුර කියවුණේ මේ අර්බුදය ගැන. දැන් පොහොරවලට වැඩිපුර විශාල මුදලක් ගෙවන්න යනවා. එහෙම නම් මා අහන්න කැමැතියි, රට අර්බුදයකට ලක්වෙලා තිබෙනවා නම්, මේ අර්බුද අස්සේ මේ මුදල නාස්ති කළේ කවුද, මේවායින් කොමිෂන් ගැහුවේ කවුද කියලා. මේවා රටේ ජනතාවට කියන්න වෙනවා. ඒ විතරක් නොවෙයි. එතුමා අපෙන් අහනවා, අපි බලයේ සිටියා නම් මොකද කරන්නේ කියලා. අපි බලයේ සිටියා නම් ගොවියාට පොහොර ටික දෙනවා. ඒක තමයි අපි කරන්නේ. මේ අර්බුද තත්ත්වය තුළ අපි ගොවියාට පොහොර ටික දෙන්න ඕනෑ. කොවිඩ් - 19 වසංගතය නිසා නොවෙයි, අද ගොවියා අසරණවෙලා ඉන්නේ. මේ රටේ අහිංසක ගොවි ජනතාව කිව්වේ, "අපට පොහොර ටික දෙන්න" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අහිංසක ගොවියා වී ඇටය මඩට දැම්මොත් තමයි ඒ පවුල නඩත්තු වෙන්නේ. ඒ පවුලේ දරුවන්ගේ පාසල් පොත් ටික අරගෙන දෙන්නේ, පාසල් යන්න සපත්තු කුට්ටම ඇතුළු අවශ්‍ය දේවල් අරගෙන දෙන්නේ ගොවියා වී ඇටය මඩට දැම්මොත් තමයි. පන්සලට දානය දෙන්නේ, කෝවිලට දානය දෙන්නේ, ඒ දේවල් ඉෂ්ට සිද්ධ කරන්නේ ඒ අහිංසක ගොවියා වී ඇටය මඩට දැම්මොත් විතරයි. අද ගොවියා අහස බලාගෙන දෙස් තියනවා. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් 225දෙනාටම හෙණ ඉල්ලනවා. දැන් මේකට අපිත් අයිතිවෙලා. ඒ නිසා මා ගරු මුදල් ඇමතිතුමාට කියනවා, මේ අහිංසක ගොවියාට අනිවාර්යයෙන්ම ලොකු වන්දියක් දෙන්න වෙනවා කියලා. ඒ වන්දිය ගැන කිසිම තැනක සටහන්වෙලා නැහැ. ඒ නිසා ඒ වන්දිය දෙන ක්‍රමවේදයත් දියත් කරන්න කියලා මා මේ ගරු සභාවට යෝජනා කරනවා.

විමල් වීරවංශ ඇමතිතුමා කියනවා, මේ පොළොව පරීක්ෂා කරලා පොළොවට අවශ්‍ය පොහොර ටික දෙන්න ඕනෑ කියලා. අපිත් කියන්නේ, මේ පොළොව පරීක්ෂා කරලා ගොවියාට අවශ්‍ය පොහොර ටික දෙන්න කියලා. එතුමා ඊයේ මේ සභාවට ඇවිල්ලා මහ ලොකුවට පම්පෝරි ගහලා, පොළොවට අවශ්‍ය පොහොර ටික දෙන්න ඕනෑ කියලා ගියා.

කෝ, දැන් පොළොවට අවශ්‍ය පොහොර? පොළොවට අවශ්‍ය පොහොර ටික ලැබිලා තිබෙනවාද? කිසිම ගොවියෙකුට පොහොර ටික ලැබිලා නැහැ. අද පලතුරු ගොවියාට පොහොර ටික ලැබිලා නැහැ; එළවලු ගොවියාට පොහොර ලැබිලා නැහැ; තේ ගොවියාට පොහොර ලැබිලා නැහැ; වී ගොවියාට පොහොර ලැබිලා නැහැ. සමස්ත ගොවි ජනතාවට අද පොහොර ටික ලැබිලා නැහැ. ඒ විතරක් නොවෙයි. එතුමා කියනවා, හාල් නිෂ්පාදනය කරන

රටවල් හාල් අපනයනය කරන්නේ නැතිලු. ඇයි එහෙම කරන්නේ නැත්තේ? ඒ රටවල් පිළිගෙන තිබෙනවා, ඉදිරියේදී විශාල ආහාර හිඟයක් එනවා කියලා. හැබැයි, එහෙම කිය කියා අපේ රටේ මොකක්ද කරන්නේ? අද අපේ රටේ වී ඇටය නිෂ්පාදනය කරන වී ගොවියාගේ, පලතුරු ගොවියාගේ බඩට ගහලා. අපට පිටරටින් හාල් ගෙන්වන්නත් බැරිනම්, ඒ අය අපට හාල් දෙන්නේත් නැත්නම් ඉදිරියේදී අපට බඩගින්නේ තමයි මැරෙන්න වෙන්නේ.

අද බඩු මිල අහස උසට ගිහිල්ලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නාඩු හාල් කිලෝවක් රුපියල් 150යි. කිරි පිටි කිලෝවක් රුපියල් 1,195යි. සීනි කිලෝව රුපියල් 155යි. පරිප්පු කිලෝව රුපියල් 245යි. ඒ වාගේම අද ගෑස් සිලින්ඩරයක් සොයා ගන්න බැහැ. පාර්ලිමේන්තුවේ කථා කරපු මැති ඇමතිවරු, මන්ත්‍රීවරු මේ සම්බන්ධව වචනයක්වත් කිව්වේ නැහැ. හැමදාම ප්‍රසිද්ධ රූපවාහිනී නාළිකාවල පෙන්වනවා, ගෑස් පෝලිම්. කොහෙන්ද ගෑස් සිලින්ඩරයක් ගන්නේ? පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අපට දර කෑල්ලක්වත් තිබෙනවා, ලිප පත්තුකරගෙන බත් ටිකක් උයාගන්න. හැබැයි, නගරබද ජීවත් වෙන ජනතාව අද අසරණභාවයට පත් වෙලා තිබෙනවා. අද මේ ගැන කිසිම මන්ත්‍රීවරයෙක් කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට බැඳිලා ඉන්නවා, මේ අය වැය ගැන හොඳ කියන්න. ඒක අපි පිළිගන්නවා. හැබැයි, රටේ ජනතාව වෙනුවෙන් මේ දේවලුත් කථා කරන්න වෙනවා. මෙතැනට ඡන්දයෙන් පත්වෙලා ආපු මන්ත්‍රීවරු මේවා ගැන කථා කරන්න. විපක්ෂය විධියට අපි මේවා සද්භාවයෙන් කියන්නේ. අපි බොර දියේ මාළු අල්ලන්න හදන්නේ නැහැ.

අද ගෙයක් හදන එක රටේ ජනතාවට හීනයක් වෙලා. අද සිමෙන්ති කොට්ටයක් සොයා ගන්න නැහැ. අද අඩි 12 ෂීට් එකක් රුපියල් 1,000කින් වැඩි වෙලා. යකඩ ටොන් එකක් රුපියල් 40,000කින් වැඩි වෙලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද අපේ රටේ තෙල් පිරිපහදුව වහලා. මේවා අපේ රටේ සම්පත්. කවුරු ආණ්ඩු කළත්, මේවා අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඩඩ්ලි සේනානායක මැතිතුමා 1967 මුල් ගල් තියලා 1969 ආරම්භ කරපු අපේ රටේ තෙල් පිරිපහදුව එදා මෙදාතුර කිසිම දවසක වැහුවේ නැහැ. හදිසියෙන් අලුත්වැඩියාවක් කරන්න වැහුවා මිසක්, කවදාවත් මේ තෙල් පිරිපහදුව වැහුවේ නැහැ. අද රටේ තිබෙන දේපළ විකුණනවා. රටේ තිබෙන සම්පත් වහලා දමනවා. මොකක්ද මේ කරන්නේ?

මුදල් ඇමතිවරයා කියනවා, රජයේ සේවකයා කරදරයක් වෙලාලු. මට කලින් කථා කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු රජයේ සේවකයන් ගැන බොහොම අගය කරමින් කථා කරනවා මම දැක්කා. එක්කෙනෙක් එකක් කියනවා. තව කෙනෙක් තව එකක් කියනවා. කොවිඩ්-19 වසංගතයත් එක්ක රජයේ සේවකයන් මොන තරම් කැපවීමක් කළාද? මේ රටේ රජයේ සේවකයා කියන්නේ අපි ඇගැයීමට ලක් කරන්න ඕනෑ සේවකයෙක්. දරු උත්පත්තියේ ඉඳලා මරණ සහතිකය ලිවීම දක්වා රජයේ සේවකයා තමයි ඇප කැප වෙලා වැඩ කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා, ත්‍රිරෝද රථවලට රුපියල් මිලියන 600ක් වෙන් කරලා තිබෙනවා. අපේ රටේ ලියා පදිංචි ත්‍රිරෝද රථ 175,000ක් තිබෙනවා. මේ රුපියල් මිලියන හයසියය 175,000න් බෙදලා බැලුවොත් අවුරුද්දකට එක ත්‍රිරෝද රථයකට රුපියල් 510යි ලැබෙන්නේ. මේ රුපියල් 510න් මොනවාද කරන්න පුළුවන්? අය වැය කථාවේ ඉලක්කම් පුරවන්න නම් මේ යෝජනා හොඳයි. ඒ වාගේම මේ රටේ ලියා පදිංචි කළ පෞද්ගලික බස් රථ 112,000ක් තිබෙනවා. ඒවාට රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා. බස් එකකට ලැබෙන්නේ රුපියල් 13,392යි. රුපියල් 13,000කින් බස් එකකට ටයර් එකක්වත් ගන්න පුළුවන්ද? ටයර් එකක් තියා ඩීසල් full tank ගහගන්නත් බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා විශ්වවිද්‍යාල ගැන කිව්වා. 2021 අය වැයේදී වත්මන් අග්‍රාමාත්‍යතුමා කිව්වා, හැම දිස්ත්‍රික්කයටම විශ්වවිද්‍යාලයක් ලබා දෙනවා කියලා. අපි බොහොම සතුටු වුණා, අනේ, පොළොන්නරුවටත් විශ්වවිද්‍යාලයක් ලැබෙනවා කියලා. තවමත් ඒ විශ්වවිද්‍යාලය ලැබුණේ නැහැ. වර්තමාන මුදල් ඇමතිතුමා කියනවා, 2022දී හැම දිස්ත්‍රික්කයකටම ජාත්‍යන්තර මට්ටමේ පාසලක් දෙනවා කියලා. මේ අවුරුද්දේ අපි විශ්වවිද්‍යාලයකුත් බලාපොරොත්තු වෙනවා. එහෙම නම් ජාත්‍යන්තර පාසලකුත් අපි බලාපොරොත්තු වෙනවා. මේවා කරන්න ඕනෑ. නිකම් බොරු වචන කියලා වැඩක් නැහැ. අය වැය කථාවේදී මේවා කියලා වැඩක් නැහැ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගොවියාට පොහොර දෙන්න සල්ලි නැහැ. ගොවියා ඉල්ලපු සහන දෙන්න-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගොවියාට පොහොර දෙන්න සල්ලි නැහැ. හැබැයි, දේශපාලන වශයෙන් බිම් මට්ටමින් දැල එළන්න රුපියල් මිලියන 81,625ක් වෙන් කරනවා. ඒකට කමක් නැහැ. හැබැයි, මේවා balance වෙන්න ඕනෑ. අහිංසක ගොවි ජනතාව ගැනත් බලන්න වෙනවා.

මීට පෙර විමධ්‍යගත මුදල් ලෙස අපට රුපියල් මිලියන 10ක් හම්බ වුණා. දැන් ඒ ප්‍රමාණය ලක්ෂ 50කින් වැඩි කරලා තිබෙනවා. ඒක බොහොම හොඳයි. මන්ත්‍රීවරු විධියට අපිත් වැඩ කරන්න ඕනෑ, අපිත් වැඩ කරන්න ආසයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි පසුගිය අවුරුද්දේ හම්බ වුණු රුපියල් මිලියන 10න් සියයට 50කින් ඉදි කිරීම් කරන්න කියනවා. ලක්ෂ 50කින් මොනවාද කරන්න පුළුවන් ඉදි කිරීම්? පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රුපියල් මිලියන 15ක් ලබාදීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ඒ රුපියල් මිලියන 15 ඒ ප්‍රදේශයේ, තමන් නියෝජනය කරන දිස්ත්‍රික්කයේ තමන්ට අවශ්‍ය විධියට, -ඉදි කිරීම් කටයුතුවලට හෝ වෙනත් කටයුතුවලට- විමධ්‍යගත කටයුතු කරන්න අවස්ථාව ලබා දුන්නොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අය වැය දකින්නේ ප්‍රශ්න පත්තරයක් ලෙස. උත්තර නැති ප්‍රශ්න පත්තරයක්. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, නවවෙනි පාර්ලිමේන්තුවේ 76වෙනි අය වැයට සම්බන්ධ වෙන්නට මට අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාව මට ලබා දුන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාවත් සිහිපත් කරමින්, අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාදාස කොඩිතුවක්කු මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.49]

**ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு)
(The Hon. Karunadasa Kodithuwakku)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝලීය වසංගතය හමුවේ, ලෝක ආර්ථික අර්බුදයක් පවතින අවස්ථාවේ නිදහස් ශ්‍රී ලංකාවේ 76වෙනි අය වැය, ඉතාම සාධනීය අය වැයක් ලෙස ඉදිරිපත් කිරීම සම්බන්ධව මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

නිෂ්පාදන ආර්ථිකයක් සහ ජීවනෝපාය සංවර්ධනය මූලික කරගෙන ඉදිරිපත් කළ මෙම අය වැය තුළින්, ශ්‍රී ලාංකික ජනතාවගේ ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් අවස්ථාවක් ලබා දී තිබෙනවා. ග්‍රාම නිලධාරි වසම් 14,021ක් ආවරණය වන පරිදි රුපියල් මිලියන 3 බැගින් රුපියල් මිලියන 42,063ක් සහ පළාත් පාලන මන්ත්‍රී කොට්ඨාසයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 4ක් වෙන් කිරීම ඉතාම ඵලදායී යෝජනාවක්. ඉතිහාසයේ කවරදාවත් නොවූ ලෙස කොට්ඨාසයක් නියෝජනය කරන ප්‍රාදේශීය සභා නියෝජිතයෙකුට සෘජුව ජනතා ගැටලු විසඳීමට ලබා දුන් මහඟු අවස්ථාවක් එය. ඒ අනුව පළාත් පාලන කොට්ඨාස 4,917ක් ආවරණය වන පරිදි රුපියල් මිලියන 4 බැගින් රුපියල් මිලියන 19,668ක් වෙන් කිරීම මේ මොහොතේ කළ ආශ්චර්යවත් වැඩක් බව අපි සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම සම්බන්ධීකරණ සභාපතිවරයෙකුට රුපියල් මිලියන 100ක් ලබා දීමත්, උප සභාපතිවරයෙකුට රුපියල් මිලියන 20ක මුදලක් ලබා දීමත් ඉතා අගය කොට සලකන්න ඕනෑ යෝජනාවක් ලෙස අපි දකිනවා. මොකද, මේ මුදල් සියල්ලම ග්‍රාම නිලධාරි වසම්වලට සහ කොට්ඨාස සංවර්ධනයට යෙදවෙනවා.

මේ මුදල්වලින් කොරෝනා වසංගතය හමුවේ ජීවනෝපාය අහිමි වූ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට යම් සහනයක් සලසා දීමට හැකියාවක් ලැබෙනවා. මහා පරිමාණ ව්‍යවසායකයන් දිරි ගන්වන අතරතුර, කුඩා ව්‍යවසායකයන්ටත් අත දී ඔවුන් ශක්තිමත් කිරීමෙන් ශ්‍රී ලාංකීය ආර්ථිකයට විශාල ශක්තියක් ඇති වෙනවා. ඒ වාගේම සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම තම දිස්ත්‍රික්කයේ ජනතා අවශ්‍යතා ඉටු කර ලීම සඳහා මීත් පෙර ලබා දුන් රුපියල් මිලියන 10ක මුදල රුපියල් මිලියන 15ක් දක්වා වැඩි කිරීම ඉතා හොඳ තීන්දුවක්. රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන විවිධ සංවර්ධන කටයුතුවලට අමතරව, මෙම විමධ්‍යගත අරමුදල් වැය කරලා ග්‍රාමීය ජනතාවට වඩාත් ඵලදායී සේවා ලබා දිය හැකි බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අහිමි වූ ආදායම් මාර්ග නැවත ආරම්භ කිරීම, පවතින ආදායම් මාර්ග වඩාත් වැඩි දියුණු කර ගැනීම හා නව ජීවනෝපාය මාර්ග ආරම්භ කිරීම පිළිබඳව මෙම අය වැය තුළින් අවධානය යොමු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර මාර්ග සංවර්ධනය කිව්වේ, පාරට පස් ටිකක් දමා ගන්න, පාරට බොරලු ටිකක් දමා ගන්න එකට. එහෙම නැත්නම් කානුවක්, බෝක්කුවක් හදා ගන්න එකට. අද එහෙම නොවෙයි. අලුත් මන්ත්‍රීවරුන් වශයෙන් අපි සෑහීමකට පත් වෙනවා. මොකද, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු ජනාධිපතිතුමා එකතුවෙලා ගම සංවර්ධනය කිරීම සඳහා සෑම ගමකටම කාපට් පාරවල් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම පාරවල්වලට කැට ගල් අල්ලන්න ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. අපේ ප්‍රදේශය ඉතා දුෂ්කර ප්‍රදේශයක්. මේ වන විට ඒ ප්‍රදේශවලත් විශාල ලෙස මාර්ග සංවර්ධනයක් වෙලා තිබෙනවා. මේ වෙනකොට අකුරැස්ස ආසනයේ බොහෝ ප්‍රදේශවල පාරවල් විශාල ප්‍රමාණයක් කාපට් කරන්න කටයුතු කරලා තිබෙනවා. දැන් සමහර ඒවායේ වැඩ අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම, මේ අය වැයෙන් ත්‍රි රෝද රථ හිමියන්ට, බස් රථ හිමියන්ට, පාසල් වෑන් රථ හිමියන්ට විශාල මුදලක් වෙන් කර තිබෙනවා.

අපි මේ අවස්ථාවේ තවත් කාරණයක් අපේ අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ. කොරෝනා වසංගතය හේතුවෙන් අඩපණ වූ තවත් වැදගත්ම කර්මාන්තයක් තමයි, සංචාරක කර්මාන්තය. අපේ විදේශ විනිමය ආදායමට තීරණාත්මක විධියට බලපාන, අපේ ආර්ථික දියුණුවේ වැදගත් පංගුකාරයකු විධියට අපි හඳුනාගෙන ඉන්න සංචාරක කර්මාන්තය පසුගිය කාලයේ සම්පූර්ණයෙන්ම බිඳ වැටුණා. විදේශීය සංචාරකයන් පමණක් නොවෙයි, දේශීය සංචාරකයන් පවා අහිමි වීම හේතුවෙන් සංචාරක කර්මාන්තයේ නිරතවන්නන් බලවත් සේ පීඩා විඳි, සංචාරක කර්මාන්තයේ සෘජුව නියැළී ඉන්න කණ්ඩායම්වලට අමතරව සංචාරක කර්මාන්තය හා බැඳි වක්‍ර රැකියා අවස්ථාවල නිරතව ඉඳපු කණ්ඩායම්වලටත් විශාල පීඩාවක් ගෙන දුන් සමයක් තමයි, පසුගිය දෙවසරකට ආසන්න කාල සීමාව.

ඇත්තවශයෙන්ම කියනවා නම්, කොරෝනා වසංගතය පැමිණෙන්න පෙර පාස්කු ප්‍රහාරය හේතුවෙන් ඇති වූ තත්ත්වයත් සංචාරක කර්මාන්තයේ යම්කිසි පසුබෑමකට හේතු වුණාය කියන එක අපි කවුරුත් පිළිගන්නා සත්‍යයක්. එම නිසා ගරු මුදල් අමාත්‍යතුමාගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මෙම සංචාරක කර්මාන්තයේ අනාගත අභිවෘද්ධිය උදෙසා වාගේම, පසුගිය කාලයේ ඔවුන්ගේ ආදායම් අහිමිවීම පිළිබඳව සලකා යම් සහනයක් ලබාදෙන්න කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම ඔවුන්ගේ ණය වාරිකවල පොලිය කපා හැරීම, විදුලි හා ජල බිල්පත් සඳහා යම්කිසි සහනයක් ලබාදීම පිළිබඳව ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

මෙවර ජාතික අය වැයෙන් ඓතිහාසික වරදක් නිවැරැදි කරන්න දැවැන්ත මුදල් කන්දරාවක් -ඒ කියන්නේ අමතර රුපියල් මිලියන 30,000කට අධික මුදලක් - වෙන් කර තියෙන්නේ ගුරු-විදුහල්පති වැටුප් විෂමතා ඉවත් කරන්නයි. ඒ අය නොගැළපෙන වෙලාවක් අරගළ කරන්න තෝරා ගත්තා වුණත්, දරුවන්ගේ අනාගතය උගසට තබා අරගළ කළා වුණත්, ඒ ඉල්ලීමේ තිබුණු සාධාරණත්වය තේරුම් ගන්න, අවබෝධ කරගන්න අපේ රජයට පුළුවන්කම තිබුණා. ඒ නිසා තමයි, මොන තරම් දුෂ්කරතා තිබුණත්, මොන තරම් මුදල් අවහිරතා තිබුණත් ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන්න මේ තරම් දැවැන්ත මුදලක් මේ අය වැය මඟින් යෝජනා කළේ. වෘත්තීය අරගළවලට නායකත්වය දුන්නු අය පවා, ඒවාට සහභාගි වූ ගුරුවරු පවා විශ්වාස කළේ නැහැ, මේකට විසඳුමක් ලැබෙයි කියලා. දේශපාලන න්‍යාය පත්‍ර මුල් කරගෙන නොගැළපෙන වෙලාවක, නුසුදුසු වෙලාවක මේ අරගළය පටන් ගත්ත කණ්ඩායම අපේක්ෂා කළේ ගුරුවරුන්ගේ අයිතිවාසිකම් කොහොම වුණත්, ගුරු බිල්ලක් දෙකක් ගන්න පුළුවන් වෙයි කියලායි. එහෙම කරලා, දේශපාලන වාසියක් ගන්න පුළුවන් කියායි ඔවුන් හිතුවේ. ඔවුන් හීනෙකින්වත් හිතුවේ නැහැ, අපේ ආණ්ඩුව මේ ප්‍රශ්නය විසඳන්න මේ තරම් ප්‍රමුඛත්වයක් ලබා දෙයි කියලා. මොකද, ඔවුන් දැනගෙන හිටියා, රටේ පවතින තත්ත්වය හේතුවෙන් මේ තරම් දැවැන්ත මුදලක් මේකට වියදම් කරන්න අමාරුයි කියලා. ඒ දේ දැන දැන තමයි ඉල්ලීම් ඉල්ලුවේ. කොහොම වුණත්, අපේ රජයේ නිවැරැදි ආර්ථික කළමනාකරණ දැක්ම නිසා අපට ඒ අභියෝගය ජයගන්න පුළුවන්කම ලැබුණා. මේ ඓතිහාසික ජයග්‍රහණය සේවාවක් විධියට, වෘත්තියක් විධියට ලබපු ජයග්‍රහණයක් වාගේම අහිංසක සිසු දරු දැරියන්ගේත් විශාල

ජයග්‍රහණයක්. අධ්‍යාපනය තමන්ගේ එකම දායාදය වශයෙන් සලකන, අනාගත සුරක්ෂිතභාවය සඳහා ඇති එකම මාවත වශයෙන් සලකන අප සියලුදෙනාගේ ජයග්‍රහණය මෙවර අය වැයෙන් සහතික කර දෙන්න පුළුවන් වුණා.

අසාර්ථක නිල්වලා යෝජනා ක්‍රමය ගත්තොත්, නිල්වලා ව්‍යාපාරය නිසා හෙම්බත්ව සිටින මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට අස්වැසිල්ලක් වන්නට නිල්වලා ගඟ පහළ නිම්නය සංවර්ධන ව්‍යාපෘතියට අවධානය යොමු කිරීම ගැන මගේ ස්තුතිය පිරිනමනවා. යල මහ කන්න දෙක වැඩ කරමින් රටට බත සැපයූ නිල්වලාවේ ගොවි මහත්ම මහත්මීන්ගේ කුඹුරු යායවල් පුරන් වීමට එක් හේතුවක් ලෙස හඳුනාගෙන ඇති මෙම අසාර්ථක නිල්වලා ව්‍යාපෘතිය නිවැරදි කළ යුතුයි.

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ කුඩා වැව් අමුණු ප්‍රතිසංස්කරණයට කටයුතු යෙදීම ඉතා වැදගත්. විශේෂයෙන්ම මේ වැඩසටහන යටතේ වැව ජනතාවගේ ජීවනෝපාය මාර්ගය බවට පත් කරගතහොත්, ජනතාව වැව ආරක්ෂා කරනවා. ඒ නිසා වැව තුළින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්. ඒ සඳහා මෙම අය වැයෙන් ලබා දී ඇති ප්‍රතිපාදන වෙනුවෙන් ගොවි ජනතාවගේ ප්‍රණාමයත්, මාගේ ස්තුතියත් ගරු ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ රජයට පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශක්තිමත් ජාතික ආර්ථිකයකට හා ජනතාවගේ දෛනික අවශ්‍යතා සඳහා වඩාත් සංවර්ධනය වූ මංමාවත් අවශ්‍යයි.

පස්වන විධායක ජනාධිපති ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අධිවේගී මාර්ග සිහිනය මග නොහැර යථාර්ථයක් බවට පත් කිරීම නිසා අධිවේගී මාර්ග ජන ජීවිතයට අත්‍යවශ්‍ය අංගයක් වී තිබෙනවා. ඒ තුළින් ගමනාගමනය වෙනුවෙන් මහ මග කා දැමූ කාලය ඉතිරි කර දී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතුරු වෙලා තිබෙන්නේ.

**ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு)
(The Hon. Karunadasa Kodithuwakku)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

දැනට ආරම්භ කර ඇති මාර්ග කිලෝමීටර් ලක්ෂයක් කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය මේ අය වැය තුළින් තවත් ශක්තිමත් කර තිබෙනවා. මා නියෝජනය කරන අකුරැස්ස ආසනයේ තිබෙන අතිදුෂ්කර මාර්ග ඇතුළු රට පුරා තිබෙන දුෂ්කර මාර්ග සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම දුෂ්කර ගම්මාන යා කරන ග්‍රාමීය පාලම් ඉදිකිරීම තුළින් ජන ජීවිතය වඩාත් කාර්යක්ෂම කිරීමට අවස්ථාවක් ලැබී තිබෙනවා. නගරයේ සංවර්ධනය ගමේ ජනතාවටත් අවශ්‍යයි. ඒ සඳහා 2022 වර්ෂයට රුපියල් මිලියන 260,000ක් වෙන් කිරීම පැසසිය යුතු කරුණක්.

ජනතාවගේ මූලික අවශ්‍යතාවලින් එකක් තමයි ආරක්ෂාකාරී ලෙස ජීවත් විය හැකි වාසස්ථානයක් ලබා ගැනීම. විශේෂයෙන්ම එදිනෙදා කුලී වැඩ කරමින් ජීවනෝපාය සොයා ගන්නා ජනතාවට ඉඩම් කැබැල්ලක් තිබුණත් නිවසක් සාදා ගැනීම සිහිනයක් බවට පත් වෙලා තිබෙනවා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව යමින් දුගී දුප්පත් අහිංසක ජනතාවගේ හිසට සෙවණක් ලබා දෙන්නට, ඉඩමක් හිමි එහෙත් නිවසක් තනා ගැනීමට ප්‍රාග්ධනය නොමැති ජනතාවට නිවසක් ඉදිකර ගැනීමට නිවාස ආධාර ලබා දීම ඇතුළු නිවාස සංවර්ධන කටයුතු වෙනුවෙන් මෙම අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. අපේ අකුරැස්ස ආසනයේ ග්‍රාම නිලධාරි වසම් 103ක් තිබෙනවා. ඒ වසම් 103 තුළ මේ වෙනකොට ගෙවල් 615කට වඩා වැඩි ප්‍රමාණයක් අපි හදා අවසන් කර තිබෙනවා. පසුගිය යහපාලන ආණ්ඩුවේ හිටපු වර්තමාන විපක්ෂ නායකතුමා හදපු ගෙවල් ප්‍රමාණය වාගේ සිය ගුණයකට වැඩි ගෙවල් ප්‍රමාණයක් මේ කාලය තුළ අපි හදා අවසන් කර ඇති බවත් සඳහන් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு)
(The Hon. Karunadasa Kodithuwakku)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙතෙක් කිසිදු රාජ්‍ය පාලනයකට හඳුනා ගන්න අපහසු වෙලා තිබුණු, එහෙම නැත්නම් හඳුනා නොගත් වැදගත් කර්මාන්තයක් හඳුනා ගන්න මේ අය වැය යෝජනාවලියේදී පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ තමයි ත්‍රි රෝද රථ ව්‍යාපාරය. අපේ රටේ සියලු ප්‍රදේශවල පාහේ ගම්-නගරබද භේදයක් නැතුව, උගත්-නූගත් භේදයක් නැතුව, දුප්පත්-පොහොසත් භේදයක් නැතුව, ජාති-ආගම් -කුල භේදයක් නැතුව හැමෝටම එක වාගේ සේවය සලසන වැදගත් ස්වයං රැකියාවක් වුණු ත්‍රි රෝද රථ ව්‍යාපාරය යම්කිසි නියාමනයකට ලක් කොට, ප්‍රමිතියක් සහිත පොදු මගී ප්‍රවාහන සේවාවක් බවට පත් කරන්න අවධානය යොමු කිරීම ඉතාම ප්‍රගතිශීලී යෝජනාවක් වශයෙන් තමයි මම තේරුම් ගන්නේ.

සාමාන්‍ය පොදු ප්‍රවාහන සේවාවක් වශයෙන් පමණක් නොවෙයි, පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයක් විධියටත් ත්‍රි රෝද රථ භාවිත කිරීම නිසා ත්‍රි රෝද රථ අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ වැදගත් තීරුවක් ආවරණ කරනවා. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල මගී ප්‍රවාහනයට අමතරව භාණ්ඩ ප්‍රවාහනයටත් ත්‍රි රෝද රථ මඟින් ඉටු කරන සේවාව අතිමහත්. ඒ වාගේම යම් විපතකදී, අනතුරකදී ත්‍රි රෝද රථ ව්‍යාපාරයේ නියැළී සිටින සහෝදරවරුන්ගේ ඉදිරිපත් වීම, කැපවීම ඉතාම ප්‍රශංසනීය බව ප්‍රකාශ කරමින්, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දුන් ඔබ සැමට මගේ ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දහයක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.4.01]

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெட்டகொட)
(The Hon. Jayantha Ketagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නවවැනි පාර්ලිමේන්තුවට දෙවන වරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පැමිණෙන්න ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. මන්ත්‍රීවරයකු හැටියට මම නවවැනි පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් වුණේ, මාස ගණනාවක

[ගරු ජයන්ත කැටගොඩ මහතා ]

සිට අපේ අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපේ පක්ෂයත් බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවට පැමිණිය යුතුයි, එතුමා මුදල් අමාත්‍ය ධුරය වැනි ප්‍රබල අමාත්‍ය ධුරයක් භාර ගෙන මේ රට ඉදිරියට ගෙන යන්න කටයුතු කළ යුතුයි කියලා තීන්දුවක් ගත් නිසායි. ඒ තීන්දුව මත, ඒ අවස්ථාවේදී ඉල්ලා අස්වෙලා එතුමා මේ සභාවට කැඳවාගෙන ඒමට හැකි වීම පිළිබඳව මම සතුටු වෙනවා.

2022 අය වැය දෙවැනිවර කියවූ අවස්ථාවේ සිටම අපි දැක්කා එතුමාගේ තිබෙන පරිණතභාවය, එතුමාගේ තිබෙන දක්ෂකම. මෙවැනි අවස්ථාවක අය වැයක් ඉදිරිපත් කරනකොට, තිබෙන ප්‍රබලම අභියෝගය තමයි රටේ තිබෙන ප්‍රශ්න; ලෝකයේ තිබෙන ප්‍රශ්න. ලෝකයේ තිබෙන ප්‍රශ්න අද අපටත් බලපා තිබෙනවා.

එතුමාගේ පරිණතභාවය දුටු යහ පාලන රජයේ හිටපු ඇමතිවරයෙක් තමයි හිටපු ඇමති දිවංගත මංගල සමරවීර මැතිතුමා. එතුමා දවසක් කියපු හැටි මම දැක්කා, බැසිල් රාජපක්ෂ කියන චරිතය මේ පාර්ලිමේන්තුවේ සිටිය යුතුම චරිතයක් කියලා. එතුමා පවා දැක්කා, බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමාගේ දක්ෂතාව. එවැනි දක්ෂතා ඇති එතුමා තමයි අද මුදල් අමාත්‍ය ධුරයේ කටයුත්ත ආරම්භ කරලා තිබෙන්නේ.

නැවත වතාවක් මට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව සැලසුණේ අපේ අජිත් නිවාඩ් කබ්රාල් හිටපු මුදල් රාජ්‍ය ඇමතිතුමා ජනාධිපතිතුමාගේ ආරාධනය මත නිර්ලෝභීව මන්ත්‍රී ධුරයෙන් ඉවත් වෙලා, මහ බැංකු අධිපතිවරයා වශයෙන් වැඩ භාර ගත් නිසායි. එතුමා ඒ ස්ථානයට ගියා. එහි ප්‍රතිඵලයක් හැටියට අපේ අතිගරු ජනාධිපතිතුමාත්, අපේ ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාත්, අපේ පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නිර්මාතෘ සහ ජාතික සංවිධායක ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමාත්, අපේ පක්ෂයේ මහ ලේකම් ගරු සාගර කාරියවසම් මැතිතුමා ඇතුළු අපේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයත් ඒකමතිකව තීන්දුවක් ගත්තා, නැවත වතාවක් මට පාර්ලිමේන්තුවට ඒමේ අවස්ථාව ලබා දිය යුතුයි කියලා. මම ඒ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා.

මෙවර අය වැය අප තේරුම් ගත යුත්තේ පසු කම්පන දරා ගැනීම එක් අතකත්, සංවර්ධන ඉලක්ක අනෙක් අතේත් තබාගෙන යන ගමනක් ලෙසයි. යහ පාලනයේ අතිශය දුර්වල ආර්ථික කළමනාකරණය, පාස්කු ඉරුදින ප්‍රහාරය සහ කොවිඩ්-19 යන පසු කම්පන හේතුවෙන් අප වැටී සිටින ආර්ථික අගාධයෙන් ගොඩ ගැනීම මෙම අය වැයේ පළමු අභිප්‍රාය වී තිබුණා.

අතිගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රාජ්‍ය පාලන කටයුතු කරලා භාර දුන්නේ ආර්ථික අතින් සමෘද්ධිමත් දේශයක්. නමුත්, ඊට වසර පහකට පසු අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට භාර ගන්න වුණේ විශාල ණය බරක් තිබෙන රටක්. පැවැති ආණ්ඩුව හාන්සි කරපු ආර්ථිකය ගොඩ ගන්න අද බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට විශාල මහන්සියක් දරනවා. ඒ නිසා තමයි එතුමා ජනතාවට බරක් නොවන පරිදි මේ අය වැය ඉදිරිපත් කරලා, මේ රටේ සුබසිද්ධිය සඳහා කටයුතු කරන්නේ.

අපේ රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සාම්ප්‍රදායික විපක්ෂයක් හැටියට තමුන්නාන්සේලා මේ අය වැයට විරුද්ධයි. ඒක එදා ඉඳන්ම එහෙමයි. ආණ්ඩුව අය වැය ඉදිරිපත් කරන කොට විපක්ෂය ඊට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මම විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමැතියි, මේ අය වැය යෝජනාවලියේ ගන්න දෙයක් ඇත්තේම නැද්ද කියලා; එක හොඳ දෙයක්වත් නැද්ද කියලා. කට ඇරලා අඩු ගණනේ එක දෙයක් ගැන හෝ කියන්න, "මේ දේ හොඳයි" කියලා.

අවුරුදු 25ක් තිස්සේ මේ රටේ ගුරුවරු, විදුහල්පතිවරු ඒ අයගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කියලා ඉල්ලුවත් එය ඉටු කරගන්න බැරි වුණා. අපේ දරුවන්ගේ අධ්‍යාපනය උගසට තියලා ඒ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් පාරට ගෙන ආ විපක්ෂයේ මන්ත්‍රීවරුනි, මේ ප්‍රශ්නය විසඳුවාට පසු, "හොඳ වැඩක් කළේ" කියන්නවත් තමුන්නාන්සේලාගේ කටවල් ඇරෙන්නේ නැද්ද? එදා අය වැයෙන් අධ්‍යාපනයට සියයට හයක් වෙන් කරන්න ඕනෑ කියලා පෙළපාළි ගියා; පා ගමන් ගියා. එදා මහින්ද රාජපක්ෂ රජයට විරුද්ධව, අය වැයෙන් අධ්‍යාපනයට සියයට හයක් වෙන් කරන්න කියලා පැවැති උද්ඝෝෂණයට විපක්ෂය නියෝජනය කරමින් මමත් ගාල්ලේ ඉඳන් ආවා. අද අධ්‍යාපනය වෙනුවෙන් සියයට 7.51ක් බැසිල් රාජපක්ෂ මැතිතුමා වෙන් කරන කොට ඒ පිළිබඳව කථා කරන්න හෝ ඒ ගැන සතුටු වෙන්න හෝ එය අගය කරන්න හෝ කවුරුවත් විපක්ෂයේ නැහැ. ඉන්දියාව ප්‍රබල රටක් වුණත් අද අධ්‍යාපනයට වෙන් කර තිබෙන්නේ සියයට 0.35 යි. කොවිඩ් වසංගතයෙන් මුළු ලෝකයම වෙළාගන්න කොට අද ඒ රටටත් ඒ වසංගතයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි මේ අය වැය යෝජනාවලිය ගෙනෙන්නේ මේ රටේ ජනතාව පීඩාවට පත් කරන්න නොවෙයි. මේ රට මේ ව්‍යසනයෙන් ගොඩ ගෙන ආර්ථිකය නඟා සිටුවන්නයි.

මේ ගරු සභාවේ ඉන්නවා, මන්ත්‍රීවරු 225දෙනෙක්. මා හිතන විධියට, මෙතුමන්ලා සියලුදෙනාට පාර්ලිමේන්තුවට එන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, කොට්ඨාස මන්ත්‍රීවරු උදවු කරලා තිබෙනවා. දිවයිනේම පළාත් පාලන කොට්ඨාස 4,917ක් තිබෙනවා. ඒවායෙන් 1,620ක පමණ විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා. ටීඑන්ඒ එකේ වැඩිපුර පිරිසක් -600 ගණනක්- ඉන්නවා. එක්සත් ජාතික පක්ෂය ඇතුළු අනෙක් පක්ෂවල අය තමයි ඒ අනෙක් කොට්ඨාසවල ඉන්නේ. කොට්ඨාසයක් ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරයෙක් ජනතා විමුක්ති පෙරමුණේත් ඉන්නවා. මේ හැම කෙනාටම තමන්ගේ කොට්ඨාසයට වැඩ කිරීම සඳහා පක්ෂ භේදයක් නැතිව රුපියල් මිලියන 4ක් ලබා දෙනවා. "ඒක හොඳයි" කියන්නේ නැහැ, විපක්ෂයේ කවුරුවත්. ඉස්සර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරයි මුදල් වෙන් කළේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන තවත් රුපියල් මිලියන 5කින් වැඩි කළාම, 'මිලියන 5 බැගින් වැඩි කළ ඒ මුදලින් ගෑස් ගෙනාවා නම් ඊට වඩා හොඳයි' කියලා ඊයේ කියනවා මා අහගෙනයි. ඒකවත් අගය කරන්නේ නැහැ.

ඒ වාගේම, ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන 3 ගණනේ වෙන් කරලා තිබෙනවා, ගමේ ප්‍රජා සංවර්ධනය, ගමේ ආර්ථිකය නඟා සිටුවන්න, ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. ඒක අගය කරන්නේත් නැහැ. මේ අය වැය යෝජනාවලියේ ගත යුත්තක් ඇත්තේම නැද්ද? මා අහන්නේ ඒකයි. ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය විසඳපු එකට, ඒ විෂමතාව නැති කරපු එකට තමුන්නාන්සේලා විරුද්ධ නම් කියන්න. ඒක හොඳ නැහැ කියනවා නම් "හොඳ නැහැ" කියන්න. තමුන්නාන්සේලාගේ නගර සභා, ප්‍රාදේශීය සභා, කොට්ඨාස මන්ත්‍රීවරුන්ටත් රුපියල් මිලියන 4 බැගින් දෙනවාට විරුද්ධ නම් කියන්න, "මේ යෝජනාවට විරුද්ධයි" කියලා. ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ල ලබා දුන් මාස 10 කාලය මාස 24ක් කරලා තිබෙනවා. ඒකට විරුද්ධ නම් කියන්න. කිසිම ආදායමක් නැති, සමෘද්ධි සහනාධාරයත් නැති අසරණ පවුල්වල ආර්ථිකය නඟා සිටුවන්න සහන මල්ලක් දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරනවා. ඒකට විරුද්ධ නම් කියන්න, "අපි විරුද්ධයි" කියලා. මේ සාම්ප්‍රදායික විරුද්ධ වීම හැමදාම මේ රටට ශාපයක්. හොඳ වැඩක් කරනවා නම්, කියන්න "මේක හොඳයි" කියලා. වැරැදි නම් කියන්න, "මේක වැරැදියි" කියලා. මා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ අය වැය යෝජනාවලිය පිළිබඳ අධ්‍යයනය කරන්න කියලා.

අප්‍රිකාවේ මසායි මාරා ගෝත්‍රිකයන් අතර කියමනක් තිබෙනවා. මා මේ වෙලාවේ එය සඳහන් කරන්න කැමැතියි. ඒ තමයි, "ඔබ සැලසුම් කරන්නේ වසරකට නම් ධාන්‍ය වපුරන්න. ඔබ සැලසුම් කරන්නේ දශකයකට නම් ගස් සිටුවන්න. ඔබ සැලසුම් කරන්නේ ජීවිත කාලයටම නම් ජනතාවට අධ්‍යාපනය දෙන්න." කියන එක. ඒ පරමාර්ථය අනුව තමයි බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා මේ අය වැය යෝජනාවලිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. "ඇලඩින්ගේ පුදුම පහන" කියලා කිව්වාට, ඇලඩින්ටත් බැහැ මේ වෙලාවේ මේ වැඩේ කරන්න. ඔබතුමන්ලා කියනවා, එතුමාට මොළ හතක් තිබෙනවා කියලා අපි කිව්වා කියලා. ඔව්, මොළ හතක්ම තිබෙනවා තමයි. එහෙම නැත්නම් විපක්ෂය හොල්ලලා, හොල්ලලා පොළොවේ ගහවියැ, අවුරුදු හතරෙන්? අද විපක්ෂය කුඩේ කුඩු වෙලා ඉන්නවා. ඒ, බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමාගේ මොළයෙන් කරපු වැඩ නිසායි.

ඔබතුමන්ලා අද මොන තරම් පෙළපාළි ගියත්, මොන තරම් උද්ඝෝෂණ කළත්, අපි ඒ ගොවීන් ගැනත් බලා ගන්නවා. ගොවීන්ට පාඩුවක් වුණොත් කෘෂි රක්ෂණය හරහා වන්දි ගෙවන්න අපි සූදානම් වෙලායි ඉන්නේ. මේ රටේ නියං කාලයක් තිබුණේ නැද්ද? පොහොර හිඟය වාගේම ගොවිතැන් විනාශ වන නියං කාල තිබුණා. ගංවතුර ඇවිත් ගොවිතැන් පාලු වෙලා තිබෙනවා. ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති හැටියට බැසිල් රාජපක්ෂ මැතිතුමා කොරෝනා කාලයේදී ඒ හව භෝග මිලදී ගත්තා. ඒ කාලයේ කවුරුවත් වහ බිව්වේ නැහැ; වහ කෑවේ නැහැ. විපක්ෂය මේ රටේ ජනතාව පාරට බස්වාගෙන මොන සෙල්ලම් දැම්මත්, ඉදිරි අවුරුදු හතර තුළ මේ ආණ්ඩුව හොල්ලන්න බැහැ. ඉදිරි අවුරුදු හතරෙන් පස්සේ ඊළඟට පවත්වන මැතිවරණත් අපි විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெட்டகொட)
(The Hon. Jayantha Ketagoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. WEERASUMANA WEERASINGHE *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

[අ.භා.4.13]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පසු ලංකා ඉතිහාසයේ ඇති වූ දැවැන්ත ගෝලීය වසංගතයත් සමඟ ආර්ථික වශයෙන් මාරාන්තික, බරපතළ කාලයක, රට සෞභාග්‍ය කරා ගෙනයන්න වෙර දරන මොහොතක, ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් එතුමාගේ මංගල අය වැය පසුගිය 12 වන දින මේ ගරු සභාවට ඉදිරිපත් කළා.

ඒ වාගේම නිදහස් ලංකාවේ 76වන අය වැය සාර්ථක අය වැයක් කියා මා විශ්වාසයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරියක් විධියට අද දින ඒ පිළිබඳව කථා කරන්න මට මේ අවස්ථාව ලැබීම මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට ලැබුණු ගෞරවයක් බව ඉතා ඕනෑකමින් යුතුව ප්‍රකාශ කරනවා.

මෙහිදී විශේෂයෙන්ම මට මේ කාරණා ඉදිරිපත් කිරීමට අවශ්‍යයි. එදා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ 30 වසරක යුද්ධය නිමා කරලා, රටේ ජාතික ආර්ථිකය මැනවින් කළමනාකරණය කරලා, මේ රටේ දැවැන්ත ආර්ථිකයක් ගොඩනැඟුවා. යටිතල පහසුකම් සඳහා විශාල වශයෙන් මුල්තැනක් ලබා දුන්නා. ජනතාවට වගකීමෙන් යුක්තව ජාතික ආරක්ෂාව තහවුරු කළා. ඒ ගොඩනැඟූ රට තමයි, 2015දී යහපාලන ආණ්ඩුව බලයට ඇවිත් ආර්ථිකය බරපතළ ලෙස විනාශයට පත් කරලා, ජාතික ආර්ථිකය තුළින් රට ගොඩනැංවිය හැකි සියලු දේ පහත දැමුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂයේ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පැමිණ මාස කිහිපයක් යන්නට මත්තෙන් රට තුළ දැවැන්ත වසංගතයක් ව්‍යාප්ත වුණා. මේ වන විට ලෝකයටම බලපාන වසංගතයක් බවට කොරෝනා වසංගතය පත් වෙලා තිබෙනවා. ඒ තුළින් ආර්ථිකය දැඩි ලෙස අර්බුදයකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය මේවාට ආඩපාලි කියමින් සිටින මොහොතක, කොවිඩ් - 19 වසංගතය පාලනය කරගෙන, ජනතාව බේරාගන්න එතුමා ගත් වෙහෙස මහන්සිය ඔබතුමන්ලා සියලුදෙනා දන්නවා. ජනතාවට එන්නත් ලබා දීලා, මේ වන විට තුන්වෙනි එන්නතත් ලබාදීමට කටයුතු කර තිබෙනවා. ජනතාවට අවශ්‍ය පහසුකම් ලබාදීලා ජනතාවගේ ආර්ථිකය නංවන්න එතුමා විශාල වෙහෙස මහන්සියක් ගන්නවා. අපේ හිටපු සෞඛ්‍ය අමාත්‍ය ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමිය විශාල වෙහෙස මහන්සියක් ගත්තා, මේ කොරෝනා ව්‍යසනය මැඩලන්න. ඒ වාගේම වත්මන් සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු සෞඛ්‍ය අංශයට, හමුදාවට ඒ ගෞරවය හිමි විය යුතුයි.

අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමා විසින් පෙරේදා ගිහිල්ලා පූජනීය අනුරාධපුරයේ සඳහිරු සෑය විවෘත කළා. වසර 1,716කට පසුව තමයි මේ වාගේ යෝධ නිර්මාණයක් කරලා විවෘත කළේ. නමුත්, විපක්ෂය ඒකෙන් දේශපාලනය කරනවා. එක එක ප්‍රශ්න කියලා ජනතාව මුලාවට පත් කරනවා. අපේ රට, ජාතිය බේරාගත් රණවිරුවන් වෙනුවෙන් තමයි මේ ස්මාරකය ඉදි කළේ. ඒ ස්ථානයට ගිහිල්ලා මලක්, පහනක් පූජා කරලා, ඔබතුමන්ලා යන්න ඉන්න ගමනට හොඳ පිනක් දහමක් කරගන්න කියලා මා ඉල්ලා සිටිනවා.

[ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසංගතයක් පැවති කාලයක වුවද අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක වුණා. ඒ තුළ රැකියා ලක්ෂයේ වැඩසටහන, අභ්‍යාසලාභී උපාධිධාරීන්ට රැකියා ලබා දීම, වාරි සෞභාග්‍යා වැඩසටහන ක්‍රියාත්මක කිරීම, රජයේ ඉඩම්වල පදිංචි ඉඩම් ඔප්පු නොමැති ඉඩම් හිමියන්ට සින්නක්කර ඔප්පු ලබා දීම, සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන, පානීය ජලය, විදුලිය, ගමනාගමන පහසුකම් ලබා දීම හා ස්වයං රැකියාලාභීන්ට, වැවිලි ක්ෂේත්‍රයට සහනාධාර ලබා දීම, "ඔබට ගෙයක්-රටට හෙටක්" නිවාස සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීම, බතික් කර්මාන්තය නඟාසිටුවීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම, "දැයක් නඟන සියක් නගර" වැඩසටහන ක්‍රියාත්මක කිරීම, කාපට් මාර්ග ලක්ෂයේ වැඩසටහන ක්‍රියාත්මක වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය 6වන දින කිලෝමීටර් 1500ක මාර්ග වැඩ නිම කර ජනතා අයිතියට පත් කළා. විශේෂයෙන්ම ඒ සම්බන්ධව ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමාට හා නිමල් ලාන්සා රාජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිය පුද කරනවා. ඒ වාගේම පාසල් 1,000ක් ජාතික පාසල් බවට පත් කළා. මගේ ආසනයෙත් පාසල් 8ක් ජාතික පාසල් බවට පත් කළා. ඇත්තටම මම ඒ ගැන සතුටු වෙනවා. ඒ වාගේම මා ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්තුමනි, රට සෞභාග්‍යය කරා යන ගමනේ දී අතිගරු ජනාධිපතිතුමාට යෝධ ශක්තියක් වන්නට අපේ ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් මෙවර ඉදිරිපත් කළ සාර්ථක අය වැයේ දී සෑම පළාත් පාලන කොට්ඨාසයකටම රුපියල් මිලියන 4ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ග්‍රාම නිලධාරි වසම් 14,021ටම රුපියල් මිලියන 03 බැගින් මුදල් වෙන් කරලා තිබෙනවා. ඉතිහාසයේ පළමු වතාවට තමයි පක්ෂ භේදයකින් තොරව මෙවැනි මුදලක් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම ජීවනෝපාය නංවාලීමට, යටිතල පහසුකම් සංවර්ධනයට, සමාජ සුබසාධන කටයුතුවලට, පරිසරය, තිරසාර සංවර්ධනය වැනි ක්ෂේත්‍ර ඔස්සේ ජනතා සුබසිද්ධිය උදෙසා කටයුතු සම්පාදනය කර තිබීම ඉතා වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වසර 24ක් පුරාවට දැවැන්ත වැටුප් විෂමතාවකට මුහුණ දුන් ගුරු - විදුහල්පති වැටුප් ප්‍රශ්නයට විසඳුම් ලබා දුන්නා. විශේෂයෙන්ම මේ සහන ලබා දුන් නායකයාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම පසුගිය කාලය තුළ ආදායම් අහිමි වූ ත්‍රිරෝද රථ හිමියන්ට සහන සැලසීම සඳහා මෙම අය වැයෙන් රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා. ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. පෞද්ගලික බස් රථ හිමියන් සඳහා පහසුකම් සහ සහන සැලසීම වෙනුවෙන් රුපියල් මිලියන 1500ක් වෙන් කර තිබෙනවා. මම ජීවත් වෙන රත්නපුර දිස්ත්‍රික්කය වතු කම්කරුවන් ජීවත් වෙන ප්‍රදේශයක්. ඒ වතු නිවාස සංවර්ධනය කිරීමට රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තය වෙනුවෙනුත් කටයුතු කරලා තිබෙන බව. මැණික් ආශ්‍රිතව දැනට උපයන ආදායම ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව මැණික් මිලදී ගත හැකි ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට යෝජනා කරලා තිබෙනවා. ඇත්තටම රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරියක් හැටියට ඒ ගැන සතුටු වෙන අතර, ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම කෘෂි කර්මාන්තය ඇතුළු වැවිලි ක්ෂේත්‍රයට විශාල තැනක් ලබා දීලා තිබෙනවා. තරුණයන්ට, කාන්තාවන්ට වගා කටයුතු සඳහා ඉඩම් ලබා දීම හා රජයේ වතු සමාගම්වලට අයත් මුඩු ඉඩම් ලබා දී නව ව්‍යවසායකයන් ගොඩනැංවීමට යෝජනා කර තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් වශයෙන් උක්ත සහන ලබා දීම පිළිබඳව ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ සහ ඌන සංවර්ධිත ආසනයක් වන රක්වාන ආසනයේ ජනතාවටද විශාල සහන රැසක් මේ 76වන ජනතාවාදී අය වැයෙන් ලබා දීමට හැකිවීම පිළිබඳව රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් වශයෙන් මා නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

මෙවැනි සුබදායී අය වැයකට අකුල් නොහෙලා, අභියෝගාත්මක අවස්ථාවක රට ගොඩනඟන්න සිදු කරන කටයුතු සඳහා එකතු වී සහාය ලබා දෙන්න කියලා බුද්ධිමත් මන්ත්‍රීවරුන් වශයෙන් විපක්ෂයේ ඔබටත් අපි ආරාධනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.23]

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය නිසා විශාල බලපෑමක් ඇති වූ රටක් විධියට, රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව නිවැරදි දැක්මකින් වාගේම, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් රටේ සංවර්ධනයට අවශ්‍ය යෝජනාවලට ප්‍රමුඛතාව ලබා දෙමින්, ජනතාව බලාපොරොත්තු වන මට්ටමේ අය වැයක් ඉදිරිපත් කරන්න කටයුතු කිරීම පිළිබඳව මුදල් අමාත්‍ය ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමන්ට ප්‍රථමයෙන් මගේ ස්තුතිය පිරිනමනවා. එතුමා එදා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විධියට කටයුතු කරද්දි අපේ රටේ සෑම ග්‍රාම නිලධාරි වසමක් ම ආවරණය වන විධියට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ගමේ සංවර්ධනයට ප්‍රමුඛතාව දුන් අමාත්‍යවරයකු, දේශපාලනඥයකු විධියට මෙවර අය වැය තුළින්ද ගම සංවර්ධනය කිරීමේ දැවැන්ත සංග්‍රාමය නැවතත් රට තුළ ආරම්භ කර තිබෙනවා. කොරෝනා වසංගතය පැවතුණත් එය පාලනය කරන්න ඉතාම ශක්තිමත් අයුරින් සෞඛ්‍ය අංශ, ත්‍රිවිධ හමුදාව, ආරක්ෂක අංශ, රාජ්‍ය සේවයේ අනෙකුත් සියලු ක්ෂේත්‍රවල කටයුතු කරන නිලධාරීන් සියලුදෙනා ඒකරාශි කර ගෙන ඒ කාර්ය භාරය ඉතාම නිවැරදිව ඉටු කරන අතර ගම සංවර්ධනය කිරීමේ දැවැන්ත කාර්යභාරයත් එතුමා භාරගෙන තිබෙනවා.

එතුමා එදා පාර්ලිමේන්තුවට එන්න සූදානම් වන වෙලාවේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු ආණ්ඩුව අතර බෙදීම් ඇති කරන්න එතුමාගේ ද්විත්ව පුරවැසිභාවය වැනි දේ ප්‍රකාශ කරමින් එතුමා මේ පාර්ලිමේන්තුවට එන එක වළක්වන්න නොයෙකුත් උත්සාහ ගත් බව අපට මතකයි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන වෙලාවේත් විපක්ෂයේ මන්ත්‍රීවරු ඉතාම වැරදි

සහගත විධියට යම් යම් විවේචන ඉදිරිපත් කළ බව අපි දැක්කා. අද එතුමා මේ ආණ්ඩුවේ ඉදිරි ගමනට ලොකු දායකත්වයක් ලබා දෙනවාය කියන කාරණය ආණ්ඩුව නියෝජනය කරන අපි විතරක් නොවෙයි, මුළු රටම කථා කරනවා. ඒ නිසා අභියෝග තිබුණත් ඉතාම සාර්ථක අය වැයක් විධියට මේ අය වැය අපි දකිනවා.

පසුගිය දින කිහිපය තුළ මේ පාර්ලිමේන්තුවේ කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ අය වැය තුළ තිබෙන සාධනීය ලක්ෂණ පිළිබඳව කථා කළ බවක් අපි දැක්කේ නැහැ. ඒ වෙනුවට නොයෙකුත් පුද්ගලික අවලාද, මඩ ප්‍රහාර, සාවද්‍ය තොරතුරු සමාජගත කරන්න -මේ සමාජයට එවැනි පණිවුඩ ලබා දෙන්න- තමන්ට වෙන් වූ කාලය පාවිච්චි කළ බව අපි දැක්කා. ඒ අය වැඩි දෙනෙක් කිව්වා, මේ අය වැය පුස් අය වැයක් කියලා. මේ අය වැයෙන් රටේ ජනතාවට කිසිම ප්‍රයෝජනයක් නැහැයි කිව්වා. මේ අය වැය වෙනදා වාගේම රටේ ජනතාව මත නැවත ණය බරක් පැටවූ වෙනදා ඉදිරිපත් කරන අය වැය හා සමාන අය වැයක් කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය පිළිබඳ ඉතිහාසයට අපි අවධානය යොමු කළොත්, අපි ණය ලබා ගන්නේ 1948න් පසුව බව අපට පෙනෙනවා. අධිරාජ්‍යවාදීන් අපේ රට ආක්‍රමණය කරලා රටේ වැවිලි භෝග ආර්ථිකය තුළින් රටට අවශ්‍ය ආදායම ලබා ගත්තා. 1948දී අපි මේ රටට නිදහස ලබා ගත් පසු, ඒ ක්‍රමවේදය තවදුරටත් ක්‍රියාත්මක කරමින් මේ රට පාලනය කළ පාලක පක්ෂය රටේ නිෂ්පාදන අපනයනය කරනවා වාගේම රටට අත්‍යවශ්‍ය දේවල් ආනයනය කරමින් රටේ ආර්ථිකය පවත්වාගෙන ගියා. ජනතාවගේ අවශ්‍යතා වැඩි වනකොට, ජනගහනය වැඩිවීමත් එක්ක ඒ ආර්ථික ක්‍රමය තුළින් රටේ මූල්‍ය ස්ථාවරයක්, සහ ශක්තිමත් ආර්ථික පදනමක් හදාගන්න බැරි වුණා.

ඒ නිසා වෙනත් කර්මාන්තවලට යොමු වීමේ වුවමනාව තිබුණා. ඒ නිසාම, 1960න් පසු බලයට පත් වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රටේ කර්මාන්ත ආරම්භ කළා. එදා දේශීය සම්පත් උපයෝගි කරගෙන, මානව සම්පත් උපයෝගි කරගෙන මේ රටේ ආරම්භ කළ කර්මාන්තවලින් රටට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කළා. රබර් ආශ්‍රිත නිෂ්පාදන විධියට ටයර් කර්මාන්තශාලාවක් එදා ආරම්භ වුණා. අපට අවශ්‍ය රෙදි පිළි නිෂ්පාදනය කිරීම සඳහා තුල්හිරිය සහ වෙයන්ගොඩ පේශ කර්මාන්තශාලා එදා ආරම්භ වුණා. එදා ග්‍රාමීය මට්ටමින් අත්යන්ත්‍ර පේශකර්ම මධ්‍යස්ථාන මේ රටේ ආරම්භ වුණා. ඒ හරහා රටට අවශ්‍ය රෙදි පිළි එදා නිෂ්පාදනය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා රටේ කඩදාසි අවශ්‍යතාව වෙනුවෙන් ඇඹිලිපිටිය සහ වාලච්චේන කඩදාසි කර්මාන්තශාලා ආරම්භ කළා. ඒ වාගේම තුනී ලෑලි, ලෝහ භාණ්ඩ මේ ආදී වශයෙන් වූ රටේ අවශ්‍යතා වෙනුවෙන් විශාල ආයෝජනයක් කරලා රටට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කරන්න එදා ඒ ආණ්ඩුවට පුළුවන්කම ලැබුණා. මේ නිෂ්පාදන ආර්ථිකය දිගින් දිගටම පවත්වාගෙන යමින් රටට මූල්‍ය ස්ථාවරත්වයක් හදන්න එතුමියට -ඒ ආණ්ඩුවට- වුවමනාව තිබුණා. රටේ ජනතාවටත් ඒ ගැන උනන්දුවක් තිබුණා.

නමුත්, සමහර අවස්ථාවල සිදුවූ යම් යම් අඩු පාඩු නිසා රටේ ජනතාව 1977 පැවැති මහ මැතිවරණයෙන් එතුමිය පරාජයට පත් කර ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට එදා මේ රට භාර දුන්නා. එතුමා මේ රට භාර ගත් පසු මේ රටේ ආර්ථිකය ලෝකයට විවෘත කළා. ඒ අනුව, විවෘත ආර්ථික ප්‍රතිපත්තිවලට ගිහිල්ලා රටට අවශ්‍ය දේවල් ආනයනය කරන තැනට පත් වුණා. ඒ නිසා එදා මේ රටේ තිබුණු කර්මාන්ත වැඩි ප්‍රමාණයක් පෞද්ගලීකරණය කළා. එදා සිදු කළ ඒ පෞද්ගලීකරණය කිරීමත් එක්ක ඒ සියලු දේ ආනයනය කරන්න සිද්ධ වුණා. මේ රටේ ව්‍යාපාරිකයන් ඒ සියල්ල එදා ආනයනය කිරීමට පටන් ගැනීමත් එක්ක දේශීය කර්මාන්ත බිඳ වැටෙන්න ගත්තා. දේශීය කර්මාන්තවල නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මුදලකින් එදා ඒ භාණ්ඩ ආනයනය කිරීම නිසා දේශීය කර්මාන්ත සම්පූර්ණයෙන්ම ඇද වැටුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා එදා අපේ රටට ශක්තිමත් ආර්ථික පදනමක්, මූල්‍ය ස්ථාවරත්වයක් හදා ගන්න ගත් උත්සාහය නැති වෙලා ගියා. මේ රට වැඩි වශයෙන් ණය ලබා ගන්න යොමු වෙන්නේ 1977න් පසුවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1977 වසර වෙනකොට මේ රට ණය වෙලා තිබුණේ රුපියල් මිලියන 25,000කට අඩු ප්‍රමාණයක්. 1977න් පස්සේ මේ රටේ පැවැති ආණ්ඩු සියල්ලම විශාල ණය මුදල් ලබා ගත්තා. ඒවා රටේ සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් යොදා ගත්තත්, 2015-2018 වසරවල ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 5ක්. නමුත් ඒ මුදලින් මේ රටේ ජනතාවට පෙනෙන හෝ දැනෙන දෙයක් කළා කියලා නම් අපි දැක්කේ නැහැ. රටේ සංවර්ධනය ගැන කොච්චර කථා කළත්, රටේ මූල්‍ය ස්ථාවරත්වයක් හදා ගත්තේ නැති නිසා තමයි අපට අද වනකොට විශාල ණය බරක් දරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ රටේ අපනයන ප්‍රමාණය වැඩි කරලා අපනයන ආදායම වැඩි කර ගැනීම තුළින් පමණයි අපට මේ ණය ගෙවීමේ හැකියාව, මේ අය වැය හිඟය පියවා ගැනීමේ හැකියාව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළින් රටේ අපනයන ආදායම වැඩි කර ගන්න ක්‍රමෝපායයන් යෝජනා කර තිබෙනවා. ඒ නිසා නිෂ්පාදන ආර්ථිකයට මුල්තැනක් දෙන අය වැයක් විධියට අපි මේ අය වැය දකිනවා. ඒ වාගේම මේ අය වැය තුළ රටේ අනෙකුත් අවශ්‍යතා පිළිබඳවත් අවධානය යොමු කළා. කාලයක් තිස්සේ විසඳන්න බැරිව තිබුණු ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කරන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මේ අය වැය තුළින් ලබා දුන්නා. ඒ වාගේම ජාතික පාසල් 1,000 වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කර තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේත් සමහර කොට්ඨාසවල ජාතික පාසල් තිබුණේ නැහැ. නමුත්, අද ඒ අවශ්‍යතාව සම්පූර්ණ කර තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන් සියලුදෙනා ස්ථිර සේවයට බඳවා ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මේ අය වැය තුළින් වෙන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම තවත් කරුණක් සඳහන් කළ යුතුයි. මේ වනකොට සේවය කරන රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වයස් සීමාව වැඩි කරන්න යෝජනා කර තිබෙනවා. නමුත්, ඒ ගැන නැවත අවධානය යොමු කළ යුතුයි කියා මා හිතනවා. විශේෂයෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩ කරන සේවකයන්ට වයස අවුරුදු 60 ඉක්මවූ පසු තමන්ගේ සේවා කටයුතු කරගෙන යෑමේ අපහසුතා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව නැවත අවධානය යොමු විය යුතුයි කියන කාරණය විශේෂයෙන්ම මම සිහිපත් කරනවා. ඒ වාගේම වයස් සීමාව වැඩි කිරීමේදී ඔවුන්ගේ කැමැත්ත පිළිබඳ අවධානය යොමු කරමින් මේ පිළිබඳව කටයුතු කළොත් හොඳයි කියන පණිවුඩයත් මා ලබා දෙනවා.

විපක්ෂය මොන දේවල් කිව්වත් හෙට දවසේ මේ වසංගත තත්ත්වය පාලනය කරන්න අවශ්‍ය කටයුතු අපි මේ වන විටත් කරලා තිබෙනවා. මේ රටේ ජනතාව බලාපොරොත්තු වන සංවර්ධනය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් ඉෂ්ට කරන්න කටයුතු කරනවාය කියන පණිවුඩය ලබා දෙමින්, ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.33]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 9වැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන 76වැනි අය වැයට මා සම්බන්ධ කරවන්න, මට ඒ වෙනුවෙන් අවස්ථාව උදා කර දුන්නු අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව සිහිපත් කරමින්, ඒ ජනතාවට උපහාරය පුද කරමින් මගේ කථාව මම ආරම්භ කරන්නම්.

නිදහස් ශ්‍රී ලංකාවේ 76වැනි අය වැය යෝජනාව මේ වන විට ඉදිරිපත් කරලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජයේ දෙවැනි අය වැය වාගේම, බැසිල් රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මංගල අය වැය මෙයයි. මේ අය වැය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල වාගේම රටේ ජනතාවගේ අවමංගල අය වැය කියලා තමයි අද රටේ ජනතාව කියන්නේ. මේ අය වැය ඉවර වෙනකොට අය වැයක් කෙසේ වෙතත්, අවයව ටිකවත් ඉතිරි වෙයි ද කියන ප්‍රශ්නයක මේ රටේ ජනතාව ඉන්නේ. දැන් ගොවියෝ කියන්නේ, බැසිල් රාජපක්ෂ මැතිතුමා එන්න කලින් පසුගිය අවුරුදු දෙක තුළ අපේ අමුඩයට එනකම් ගලවලා ගත්තා කියලායි. මේ අය වැය ලබන වසර තුළ ක්‍රියාත්මක වෙනකොට අපේ අවයව ටිකවත් ඉතිරි වෙලා තියෙයි ද යන බරපතළ භය, සැකය මේ රටේ ගොවි ජනතාව තුළ තිබෙනවා. ඒ විධියට ජීවත් වෙන කාලයක් තමයි අද උදා කරලා තිබෙන්නේ.

මේ අය වැය ඉදිරිපත් කරලා අද කථා කරනවා, මහා ලොකු විප්ලවයක් කරපු, නැත්නම් ලොකු අවස්ථාවක් උදා කරපු අය වැයක් විධියට. පසුගිය කාලය තුළ විනාශ කරපු රටක් නැවත ගොඩ නඟන්න ගත්ත තීන්දුවක් විධියටයි දැන් මේ අය කථා කරන්නේ. අපි බලන්න ඕනෑ, මේ රටේ පෝලිම් යුගය නිර්මාණය වුණේ කොතැනද කියලා. මේ රටේ ජනතාව හයෙන් පහක බලයක් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට දීලා, 1977දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය බලයෙන් පිටත් කරන්න තීරණය ගත්තේ මේ රටේ පෝලිම් යුගයක් නිර්මාණය වුණාට පස්සේ. අපි 1994 වෙනකම් වසර 17ක් මේ රටේ පෝලිම් යුගයක් නැවත ඇති නොවන විධියට රට නිර්මාණය කළා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ රටේ සප්තමහා ව්‍යාපාර ඇති කරලා මේ රට සහලින් ස්වයංපෝෂිත කළා. එතුමා මේ රටේ ජලවිදුලි බලාගාර ඇති කළා. එසේ කළාට පස්සේ, 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ඇතුළු අද ආණ්ඩුව නියෝජනය කරන හැම උත්තමයෙක්ම නියෝජනය කරපු පක්ෂයට එදා ආණ්ඩුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. එදා සිට අද වෙනකම් වසර 27ක් මේ රටේ ප්‍රධාන පුටුව හොබවන්නේ මේ පක්ෂය නියෝජනය කරපු උදවිය. බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මේ අය වැය ඉදිරිපත් කරනකොට එදා සිට මේ රට පාලනය කරන්න කටයුතු කරපු චරිත බොහොමයක් -චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය හැර- අද තමන්ගේ පුටුවල වාඩිවෙලා අහගෙන ඉන්නවා. ඒ සියලුදෙනාම මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන අද මේ අය වැය වර්ණනා කරනවා. හැබැයි, වසර 27ක් මේ රටේ මුල් පුටුවේ ඉඳගෙන තමයි තමුන්නාන්සේලා රට මේ තත්ත්වයට ගෙනාවේ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා බවට පත් වෙනකොට මේ රටේ හැම තැනකම හන්දියක්, හන්දියක් ගානේ කිරි ඉතිරුවා. තාත්තලා, අම්මලා හැම හන්දියකම කිරි උතුරුවනකොට, දරුවෝ තාප්පවල චිත්‍ර ඇන්දා. මහා ලොකු විප්ලවයක් රටේ ඇති වුණා වාගේ, බලාපොරොත්තු කන්දක් තියාගෙන අපේ රටේ මිනිස්සු මේ රටේ පුරන් වෙච්ච කුඹුරු ටික අස්වද්දලා මේ රට සහලින් ස්වයංපෝෂිත කරන්න පියවර ගත්තා. මේ රටේ නිෂ්පාදනය කළ හැකි හැම භෝගයක්ම මේ රටේ නිෂ්පාදනය කරලා, මේ රට ස්වයංපෝෂිත කරන්න තරුණයෝ පෙළ ගැහිලා තිබුණා.

අද ඒ සියලුදෙනාටම මොකක්ද වෙලා තිබෙන්නේ? අද අම්මා ඉන්නවා ගෑස් පෝලිමේ; තාත්තා ඉන්නවා තෙල් පෝලිමේ; දුව ඉන්නවා කිරි පිටි පෝලිමේ; පුතා ඉන්නවා පාස්පෝට් පෝලිමේ. ඔබතුමන්ලා වසර දෙකක් තුළ මේ රටේ ජනතාවගේ අපේක්ෂා සියල්ලම භංගත්වයට පත් කරලා ඉවරයි. දැන් මේ අය වැය ඉදිරිපත් කරලා කථා කරනවා. මේ අය වැය එන්න කලින් කිව්වේ මොනවාද? බැසිල් රාජපක්ෂ මැතිතුමා රට ඉඳලා පාර්ලිමේන්තුවේ දිවුරුම් දෙන්න එනකොට කිව්වේ, "බැසිල් ආවාම සියලු ප්‍රශ්න නිවාරණයයි" කියලායි. ඊට පස්සේ බැසිල් මහත්මයා කිව්වා, "මම ආවාට වැඩක් නැහැ, දැනට තිබෙන්නේ අයියා ගෙනාපු අය වැය. මේකේ මට කරණම් ගහන්න බැහැ. මම අය වැය ගෙනාපුවාම මේ රටේ සියලු විප්ලව ටික ඇති කරලා දෙන්නම්." කියලා. ඊට පස්සේ මොළ 7ක් එකතු කරගෙන මේ රටේ මහා විප්ලවයක් කරන්න සුපර්මෑන් කෙනෙක් එනවා වාගේ එතුමා එයි කියලායි අපි බලාපොරොත්තුවෙන් හිටියේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියපු විධියට අපි හිතුවා, මේ අය වැය ඉදිරිපත් කරනකොට මේ රටේ මහා විප්ලවයක් වෙයි කියලා. හැබැයි, මේ අය වැය ඉදිරිපත් කළාම දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ අය වැය නිකම් අලියා ගිලපු දිවුල් ගෙඩියක් ගාණට පත් වෙලා. පළලා බලපුවාම මේක ඇතුළේ ඇති දෙයක් නැහැ. බදු ආදායම් වැඩි කිරීම පිළිබඳව මේ අය වැයෙන් දැන් එතුමා කථා කරනවා. එතුමා කියන්නේ මොකක්ද? මේ බදු ආදායම අපි වැඩි කරනවා කියලා කියනවා. හැබැයි, වැඩි කරන ක්‍රමය ගැන දැන්මම කියන්නේ නැහැ. දැන්ම කිව්වොත් ව්‍යාපාරිකයෝ ඒකෙන් අනවශ්‍ය ලාබ ලබනවාලු.

මේ රටේ බදු කියන්නේ සීතාම්බර පට සේලය වාගේ හංගලා කියන එකක්ද? ඔබතුමන්ලා දන්නවා, 2019 තමයි මේ රටේ විශාලම ආදායම් ලබපු වර්ෂය බවට පත් වුණේ කියලා. අපි එදා බදු ආදයම රුපියල් බිලියන 1997ක් ලබනකොට ඔබතුමන්ලා චෝදනා කළේ, "බදු පිට බදු ගහනවා. මේ රටේ ජනතාව පීඩාවෙන් පීඩාවට පත් කරනවා. මළ බද්ද ඇරෙන්න අනෙකුත් සියලු බදු මේ රටේ ජනතාවට ගහලා තිබෙනවා" කියලා. ඔබතුමන්ලා කියපු විධියට බදු ගහලා මේ රටේ ජනතාවට සහන දෙන්න, මේ රටේ රාජ්‍ය සේවකයාට වැටුප් ගෙවන්න රුපියල් බිලියන 1997ක් රාජ්‍ය ආදායම එකතු කර ගන්න කොට මේ රටේ ඉන්ධන මිල කීයටද තිබුණේ? අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල කීයටද තිබුණේ? අත්‍යවශ්‍ය ඖෂධ වර්ගවල මිල කීයටද තිබුණේ? හැබැයි, ඔබතුමන්ලා බලයට ඇවිල්ලා ඒ බදු ආදායම පහළ දාන්න, අපි වැඩි කරලා තිබුණාය කියපු වැට් එක අඩු කළා; සෙස් එක අඩු කළා. ඒ සියලු බදු අඩු කරලා ඔබතුමන්ලා කළේ මොකක්ද? මේ රටේ තිබුණු රාජ්‍ය ආදායම අඩු කරලා දැම්මා. රුපියල් බිලියන 700කට ආසන්න ප්‍රමාණයක් මේ රටට අහිමි කළා. එහෙම අහිමි කරලා අද කියනවා, ආර්ථිකය කඩා ගෙන වැටුණේ කොරෝනා නිසා කියලා. ඒක කොරෝනා නිසා මේ රටේ ඇති වෙච්ච ප්‍රශ්නයක් නොවෙයි කියන එක ඔබතුමන්ලා වගකීමෙන් හිතන්න. ගෝලීය ව්‍යසනයක් වෙච්ච කොරෝනා ආවේ අපේ රටට විතරක් නොවෙයි. කොරෝනා ලෝකයේ හැම රටකටම ආවා. හැබැයි, අනෙකුත් සියලු රටවල් ක්‍රමානුකූලව ඒකට මුහුණ දෙමින් ඉන්නවා. ඒ රටවල අපේ රටේ වාගේ ආර්ථිකය දණ ගස්සලා නැහැ. ඒ රටවල ආහාර හිඟයක් නැහැ. ඒ අයට ජීවත් වෙන්න පුළුවන් ශක්තිය තිබෙනවා. අපේ රටේ මේ උත්තමයා ගත්තු ඔළමොට්ටල, තකතීරු තීන්දු නිසා අද අපේ රටේ ආර්ථිකය කඩාගෙන වැටෙනවා.

අපේ රටේ ඉතිහාසයේ ඉඳලා ජීවත් වෙන්න ආහාර පිළිබඳ ප්‍රශ්නයක් අපට තිබුණේ නැහැ. අපි ආහාර සුරක්ෂිතතා පිළිබඳ දර්ශකයේ දකුණු ආසියාවේ ඉහළින්ම හිටපු රට. අපි 66වන ස්ථානයේ හිටියේ. මේ ඔළමොට්ටල වැඩේ නිසා දැන් අපි 75වන ස්ථානයට පත් වෙලා තිබෙනවා. පොහොර ටික ගෙන්වන්නේ නැතුව මේ කරපු වැඩේ නිසා ලබන වසරේ අවසන් වෙන කොට - 2022 අවසන් වෙන කොට- අපි ආහාර සුරක්ෂිතතා පිළිබඳ දර්ශකයේ කොයි ස්ථානයේ ඉඳීවිද? මේ රටේ මන්දපෝෂණය කොතැනට යයිද? මේ රටේ අලගෙඩියක්, කොස් ගෙඩියක් වෙනුවෙන් මිනී මරා ගන්න යුගයක් නිර්මාණය නොවී තිබුණොත් ඒක වාසනාවක් විධියට අපට දකින්න වෙයි. ඒ නිසා මේ රට කොතැනටද ගෙන ගොස් තිබෙන්නේ කියන එක අපට බොහොම පැහැදිලිව පෙනෙන්න තිබෙනවා.

අය වැය ඉදිරිපත් කරලා එළියට යන කොට මාධ්‍යවේදීන් පහළදී මේ අය වැය ගැන ඇහුවාම සමහරු කිව්වා, "මේක රොබින්හුඩ් පන්නයේ අය වැයක්" කියලා. සමහරු කිව්වා, "මේක සරදියල් පන්නයේ අය වැයක්" කියලා. සමහරු කිව්වා, "මේක බිලී බිත්ත අතට දීපු අය වැයක්" කියලා. බොහොම පැහැදිලිව පෙනෙනවා මේකෙන් බිලී පිත්ත ලැබුණු උදවිය කවුද කියලා. පාරවල් හදන්නේ කන්නද කියලා ඇහුවා. පාරවල් හදන්න මේ වෙන් කරලා තිබෙන මුදල් ටික කන්න බිලී පිත්ත තමයි මේ දීලා තිබෙන්නේ.

මේ රටේ ප්‍රමුඛතාව දිය යුත්තේ කොතැනටද? මේ රටේ තිබෙන ප්‍රශ්න ටික හඳුනා ගන්න බැරි රජයක් බවට අද මේ රජය පත් වෙලා අවසානයි. ඒ නිසා අපි කියන්නේ මේ අය වැය රොබින්හුඩ් පන්නයේවත්, සරදියල් පන්නයේවත් එකක් වෙන්නේ නැහැ කියලා. රොබින්හුඩ් කළේත් පොහොසතුන්ගෙන් හොරකම් කරලා දුප්පතුන්ට බෙදලා දුන්නු එක. ලංකා පන්නයෙන් කියනවා නම් සරදියල් කළේත් ඒක. මේ අය වැය සෝමාලියානු මහා මුහුදු කොල්ලකරුවන්ට ගළපන්නත් බැහැ. සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් කොල්ල කෑවේත් තියෙන එකාගෙන්. අපි කියන්නේ, මේක 'ෂෙරීෆ්' අය වැයක් කියලා. මේ අය වැය, දුප්පතාගෙන් හොරකම් කරගෙන මහා බලවතුන් නැත්නම් තමන්ගේ ගජමිතුරන් පෝෂණය කරන්න ලබා දෙන අය වැයක් කියන එකයි අපට බොහොම පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ. මේ අය වැයේ හැටියට පොහොසතුන්ගෙන් ගන්නේ කොහෙන්ද? මේ අය වැයෙන් නැවත අලුත් බදු හඳුන්වා දෙනවා. VAT එක නැවත ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලාවත් කියන්න ඔබතුමන්ලාට ක්‍රමවේදයක් නැහැ. ගෙනෙන බදු ටික කොයි විධියෙන්ද ක්‍රියාත්මක කරන්නේ කියලා කියන්න බැහැ.

මම දැක්කා, අය වැයෙන් වැඩි කරපු දෙයක් ගැන බොහොම අමාරුවෙන් කියනවා. සිගරට් එක රුපියල් පහකින් වැඩි කරනවා කිව්වා. සිගරට් එක රුපියල් 5කින් වැඩි කරන කොට ඒක ඇතුළේ තිබෙන බද්ද වැඩි වුණේ කීයකින්ද කියලා එතුමා කියන්නේ නැහැ. රුපියල් පහ ඇතුළේ බද්ද කීයක්ද තිබෙන්නේ කියලා එතුමා කිව්වේ නැහැ. ඒක කියලා එතුමා ලජ්ජාවෙන් වාගේ කියනවා අවුරුදු තුනකට පස්සේ තමයි මේ වැඩි කළේ කියලා. එතුමන්ලා කථා කරන්නේ මේ රටේ ජනතාව පිළිකා රෝගයෙන් බේරා ගන්න තමයි කාබනික වගාවට ගියේ කියලා. හැබැයි, සිගරට් එක රුපියල් පහකින් වැඩි කරපු එක ගැන හරිම ලජ්ජාවකින් වාගේ කියනවා, අවුරුදු තුනකට පස්සේයි සිගරට් එකක මිල වැඩි කළේ කියලා. හාල් කිලෝ එක රුපියල් 98 ඉඳලා රුපියල් 150ට වැඩි වෙලා. කිරි පිටි පැකට් එකේ මිල වැඩි වෙලා. ගෑස් සිලින්ඩරයේ මිල වැඩි වෙලා. තෙල් ටිකේ මිල වැඩි වෙලා. ඖෂධ මිල වැඩි වෙලා. ඒ එකක් ගැනවත් විළිලජ්ජාවක් නැහැ. හැබැයි, සිගරට් එකේ මිල රුපියල් පහකින් වැඩි කරන කොට එතුමාට ලජ්ජාවක් තිබෙනවා. අපි අවුරුදු තුනකට පස්සේ තමයි සිගරට් එකේ මිල වැඩි කරන්නේ කියලා කියනවා. පිළිකා රෝගය ගැන, වකුගඩු රෝගය ගැන මහා කිඹුල් කඳුළු හෙළන මහා උත්තමයන්ට අනෙක් ඒවා වැඩි වෙනවාට සාපේක්ෂව ඒ සිගරට් එකේ මිලත් වැඩි කරන්න තිබුණේ නැද්ද?

මෙලෙස කටයුතු කරන්නේ කවුරු නඩත්තු කරන්නද, කවුරු වෙනුවෙන්ද කියන කාරණය අපට බොහොම පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, මේ සෙල්ලම් ඔක්කෝම නතර කරන්න කියලා. මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණි මන්ත්‍රීවරයෙක්. එසේම මම අනුරාධපුර දිස්ත්‍රික්කයේම ජීවත් වන නිසා දන්නවා එම ජනතාව ජීවත් වන තත්ත්වය. එම ජනතාව ලබන වසර මොන විධියෙන් ගත කරන්නද, තමන්ගේ දරුවන්ගේ අනාගතය මොන විධියෙන් සකස් කර දෙන්නද කියන අවිනිශ්චිතතාවකින් සහ දෙගිඩියාවකින්, දෙලොවක් අතර ජීවත් වන තත්ත්වයට පත් කර තිබෙනවා.

අද ඔවුන්ට පොහොර ටික නැහැ. හැබැයි, අද අපට වාසනාවන්ත විධියට වර්ෂාව ලැබෙනවා. මේ වර්ෂාව වෙනදා ලැබුණා නම්, දෙවියන්ගේ පිහිටෙන් අපට යල කන්නයටත් සෑහෙන ජලය ඉතිරි කර ගැනීමට තිබුණ බවට ලොකු විශ්වාසයක් තිබෙනවා. නියම වෙලාවට ජලය දීලා, අපට කන්න වැඩකටයුතු කර ගන්න අවස්ථාව උදා කර දීලා තිබුණා නම්, අද අපේ ජලාශවල තිබෙන ජලය මේ විධියට උතුරා පිටාර යන්නේ නැහැ. එම ජලයෙන්ම වැඩකටයුතු කර ගන්න තිබුණා. අහස් ජලයෙන්ම තමන්ගේ කුඹුර මඩවන කටයුතු ටික ගොවියාට කර ගන්න තිබුණා. ඒ අවස්ථාව ගොවීන්ට ලබා දුන්නේ නැහැ. ගොවීන් අද කුඹුරු සකස් කරලා ඒ කටයුතු කරනකොට මේ කොහේවත් නැති, ලෝකයේ බොහෝ රටවල නොකරන දේවල් අපේ රටට හඳුන්වා දෙන්න පටන් ගත්තා. "ලෝකයේ අනෙක් රටවලට වැඩිය අපි තමයි හොඳටම කළේ" කියන්න, ගත් තකතීරු තීන්දු නිසා අද අපේ රට ආහාරවලින් මෙන්ම, වෘත්තීමය වශයෙන් ලොකු ගැටලුවකට මුහුණ පා තිබෙනවා.

අපේ දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවගෙන් බහුතරයක් කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ සෘජු හෝ වක්‍ර රැකියාවලින් තමයි ජීවත් වන්නේ. අද ඒ ඔක්කෝම අසීරුතාවට පත් වෙලා. පොහොර ගැන නිශ්චිතතාවක් නැහැ. පොහොර නිෂ්පාදනය කරන්න කියලා කැලැ ටික එළිපෙහෙළි කරනවා; රක්ෂිත ටික එළිපෙහෙළි කරනවා. තමන්ගේ හිත මිත්‍රයන් ටිකකට මිලියන 350කට වැඩි මුදල් ප්‍රමාණයක් LRC එක හරහා කොහොමද ලබා දෙන්නේ? පෙහොර නිෂ්පාදනය කරන්න LRC එකට තිබෙන වගකීම මොකක්ද? ඒ කටයුත්තේ තිබෙන විශ්වසනීයභාවය කුමක්ද? එහෙම කිසි දෙයක් නැතුව ඒ කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පොහොර නැහැ කියලා නිතරම කියන කොට, කෘෂිකර්ම ඇමතිතුමා කාබනික කතන්දරය කියලා, පොටෑසියම් ක්ලෝරයිඩ් ගෙනාවා. එතකොට ප්‍රශ්නයක් නැහැ. ඒක ගෙනාවේ අවශ්‍ය වෙලාවට නොවෙයි. මඩ පොහොර ගහන්න ඕනෑ වෙලාවේ, බණ්ඩි පොහොර ටික ගෙනැල්ලා දෙනවා. යෙදිය යුතු පොහොර මොනවාද කියලා හඳුනා ගත්තේ නැහැ. යූරියා ගේන්න තහනම් කරලා මොකක්ද කළේ? අද තහනම් වෙලා තිබෙන්නේ යූරියා විතරයි. ඒවා ඇට විධියට ගේනවා වෙනුවට, දියර වශයෙන් ගේන්න කටයුතු කරනවා. හදිසියේ, අවසාන මොහොතේ ඒවා ගේන්න මෙච්චර උනන්දු වුණේ මොකද? අපේ රටේ දැන් තිබෙන්නේ හදිසි මිලදී ගැනීම් තමයි. හදිසි මිලදී ගැනීම්වලට යන්න මේ ආණ්ඩුව හරි ආසයි; හරි ශූරයෝ. ඒ මොකද? හදිසි මිලදී ගැනීම්වලට ගියාම මිල ගණන් පිළිබඳව කවුරුවත් තැකීමක් කරන්නේ නැහැ. ඔවුන්ට ඕනෑ, ඒ ද්‍රව්‍ය ඉක්මනින් ගෙන්වා ගන්නයි. ඒ වෙනුවෙන් කටයුතු කරනවා. හදිසි මිලදී ගැනීම්වලට ගිහිල්ලා, අද මොකක්ද කරලා තිබෙන්නේ?

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

ඉන්දියාව මැයි මාසයේ 31වන දා තමයි නැනෝ නයිට්‍රජන්, නැනෝ යූරියා හඳුනා ගත්තේ. ඒ පොහොර වර්ගය ඉන්දියාවේවත් ක්ෂේත්‍ර පරීක්ෂණයට ලක් කරලා නැහැ. හැබැයි, ඒ අය බොහොම කඩිමුඩියේ අපේ රටට ඒවා ගේන්න උදවු වනවා. ඒ ගැන අද කථිකාවක් ඇති වෙලා, අපි ප්‍රශ්න කළා. මේ හරහා විශාල දූෂණයක්, වංචාවක් සිදු වෙලා තිබෙනවා නේද කියලා අපි කෘෂි කර්ම ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළා. එවිට එතුමා කිව්වේ, "ඒකේ කිසිම වංචාවක් වෙලා නැහැ. ඉන්දියාවේ හැදුවේ නැනෝ යූරියා. අපි ගෙනාවේ නැනෝ නයිට්‍රජන්. ඒකේ මිල ටිකක් වැඩියි" කියලා. මේ කාරණය එතුමා CID එකට පවා ගෙනිච්චා. ඒ පිළිබඳව ප්‍රශ්න කරපු, කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කරන්න CID එකට කැඳෙව්වා. හැබැයි, අද එතුමා කියනවා, "මේ ගනුදෙනුව ඇතුළත වංචාවක් වෙලා තිබෙනවා. ඒ සමාගම ලාභ ලබාගෙන තිබෙනවා වැඩියි" කියලා. මොකක්ද ඒ කියන කථාව? එතුමන්ලා ලැස්ති වුණේ, කටින් භය කරලා, බොරු කියලා, හොරකම වහගන්නයි. අද එතුමාටම එය පිළිගන්න වෙලා තිබෙනවා.

ඉන්දියාවේ නැනෝ නයිට්‍රජන් විකුණන්නේ, ඉන්දියානු රුපියල් 240කට. අපට එය රුපියල් 654ක් වැනි මුදලකට ගේන්න පුළුවන්කම තිබුණා. ඔබතුමන්ලා දන්නවා, ඕනෑම බඩුවක් සිල්ලරට -එකක් හෝ දෙකක්- ගන්නවාට වැඩිය තොගයක් ගන්නකොට මිල අඩු වන බව. ඒ නිසා එපමණ ප්‍රමාණයක් මිලදී ගන්නකොට මිල අඩු කර ගන්න තිබුණා. අනෙක් පැත්තෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් නොකරපු පොහොර ගෙනෙන කොට ඒ හරහා අපට මිල අඩු කර ගන්න තිබුණා. ඒ කිසි දෙයක් කර ගත්තේ නැතුව, තමන්ගේ commission එක ගැන හිතලා, තමන්ට ලැබෙන වාසිය ගැන හිතලා කඩිමුඩියේ ගෙනාපු එකේ ප්‍රතිඵලය, අද මේ රටේ සමස්ත ජනතාවට භුක්ති විඳින්න වෙලා තිබෙනවා. හොරකම සහ නිවැරදි දැක්මක් නැතිකම නිසා මේ රට අද අර්බුදවලට මුහුණ පා තිබෙනවා. කොරෝනා පිට දාලා ඒවා වහ ගන්න උත්සාහ ගන්න එපා කියලායි අපි රජයට කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීවරයෙකුට උත්තරයක් දීමේ අවශ්‍යතාව මට තිබෙනවා. එතුමා කිව්වා, පසුගිය කාලයේ බඩුවල මිල ගණන් කොහොමද කියලා. අපි නම් නොවෙයි වෙළෙඳ පොළට ගිහිල්ලා අල, ලූනු ඇතුළු බඩුවල ගණන් අහන්නේ. එතුමා කියාගෙන ගියා, අල ගත්තාද, බටු ගත්තාද, පලා ගත්තාද කියලා. ඊළඟට, කාන්තාවන්ගේ නම් පවා ඇඳාගෙන කථා කළා. අපි කියන්න කැමැතියි, ඒ උත්තමයාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තිබුණා නම්, අද මේ වාගේ වාචාල කථා කියන්න, මේ වාගේ උත්තරීතර සභාවකට එන්න ලැබෙන්නේ නැහැ කියලා. එවැනි වාචාල කථා කියන මිනිසුන්ට අපි කියනවා, "වාචාල කථා කියලා මේ රටේ ජනතාවගේ මනස විකෘති කරන්න එපා" කියලා. අද බලයේ ඉන්නේ ඔබතුමන්ලා. 69 ලක්ෂයකගේ ඡන්දයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති කරලා, රටේ ජනතාව මේ රජය නිර්මාණ කළේ, සුවිශාල වූ බලාපොරොත්තු ඇතිවයි.

මේ අය වැය ලේඛනය හරියට පොඩි එකාගේ රචනාවක් වාගෙයි. පහේ පන්තියේ කියන්නත් බැහැ. ඒකේවත් මෙහෙම අඩු පාඩු නැහැ. අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොටත් පොඩි එකා රචනාවක් කියවනවා වාගේ තමයි අපට ඇහුණේ. ඇමෙරිකානු චින්තනය තුළ ඉඳලා ලංකාවට ඉදිරිපත් කළ අය වැයක් නිසා මීට වඩා දෙයක් අපට බලාපොරොත්තු වෙන්න බැහැ. මේ අය වැය ලේඛනය අනුව මේ රටේ ජනතාවට ලබන වසර මොන විධියට ගෙවා ගන්න ලැබෙයිද කියලා දන්නේ නැහැ. කථා කරන්න තවත් කරුණු තිබුණත් වෙලාව නැහැ. උද්ඝෝෂණය ගැන කථා කරන්න වෙලාවක් නැහැ. ඒ නිසා මේ රටේ බුද්ධිමත් ජනතාවට මා කියනවා, මේ ශාපලත් ආණ්ඩුවට ලබා දීපු කාලය හොඳටම ඇති කියලා. අපි ඔබ සියලුදෙනා වෙනුවෙන් වග කියන, මේ රටේ හොරකමට, දූෂණයට තිත තබන රජයක් නිර්මාණය කරන්න සූදානම්. ඒ නිසා අපට ශක්තිය, ධෛර්යය ලබා දෙන්න, අප සමඟ එකතු වෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.49]

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රජයේ දෙවර්ෂ පූර්ණ සැමරුම පවත්වමින්, අපට ජනවරම ලබා දුන් හැටනවලක්ෂයක් ජනතාවගේ අපේක්ෂා ඉටු කිරීම අරමුණු කරගෙන අපි ඉදිරිපත් කර තිබෙන දෙවැනි අය වැය ලේඛනය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මෙය මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල අය වැය ලේඛනය. මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේ එතුමාට විශාල අභියෝග රාශියකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ අභියෝග හමුවේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය තුළ, මේ රටේ ආර්ථිකයේ තිබෙන ගැටලු ගණනාවක්, අභියෝග ගණනාවක් අධ්‍යයනය කරලා ඒවා විසඳන්න යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව මා එතුමාට ශුභාශිංසන එක් කරමින්, මගේ කරුණු දැක්වීම ආරම්භ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ මීට කලින් මෙවැනි අය වැය ලේඛන හැත්තෑ ගණනක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ හැත්තෑහය වැනි අය වැය ලේඛනය. හැත්තෑපස් වැනි අය වැය ලේඛනය දක්වා අය වැය ලේඛන හදලා රටේ සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යෑම සඳහා සැලසුම් සකස් කරලා ඉදිරිපත් කරනකොට තිබුණු අභියෝග මේ හැත්තෑහය වැනි අය වැය ලේඛනය පිළියෙල කරනකොටත් ඒ හා සමානවම තිබුණා. ඒ නිසා මේ අය වැය ලේඛනය විශේෂ, අභියෝගාත්මක අය වැය ලේඛනයක් බවට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කැබිනට් මණ්ඩලයටත්, ආණ්ඩුවටත් -දෙකටම- මේ පවතින තත්ත්වයත් එක්ක අනිවාර්යයෙන්ම ඒ අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ඒ වාගේම තුන්වැනි ලෝකයේ, දියුණු වෙමින් පවතිනවාය කියන රටවල අය වැය ලේඛන ඉදිරිපත් කරනකොට මුහුණ දෙන්න සිදු වන සියලු ගැටලු කලින් අය වැය ලේඛන ඉදිරිපත් කරද්දී තිබුණාට වඩා තීව්‍ර විධියට මේ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී ඇවිල්ලා තිබුණා. ඒ සියලු කරුණු මේ අය වැය ලේඛනය තුළ සමාලෝචනය කරලා තිබෙනවා. එය ප්‍රබල අභියෝගයක් විධියට අපි හඳුනා ගෙන තිබෙන බව ප්‍රකාශ කරන්න අවශ්‍යයි. ඒ

වාගේම අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී ඒ තිබෙන අභියෝග සමතික්‍රමණය කරනවාට අමතරව මානව සංහතියේ, මානව ඉතිහාසයේ විශාලම අභියෝගය වුණු කොවිඩ් වසංගතය හරහා නිර්මාණය වූ ආර්ථික අවපාතයේ ප්‍රතිඵලත් ප්‍රබල අභියෝගයක් වුණා. පසු ගිය අය වැය ලේඛන, විශේෂයෙන්ම 1977න් පසුව ඉදිරිපත් කළ අය වැය ලේඛනවලින්, ඉදිරිපත් කරන්න යෙදුණු විදේශ වත්කම්වලින්, එහෙම නැත්නම් විදේශ ණය ගැනීම්, විදේශ ආයෝජන, විදේශ රටවල් සමඟ ගනුදෙනු කිරීම යන ඇස් බැන්දුම් හරහා මුදා හැරලා තිබුණු, වහලා දමලා තිබුණු ලංකාවේ ආර්ථිකයේ සැබෑ තත්ත්වය, කොවිඩ් වසංගත තත්ත්වය හරහා ලංකාවට උදා වූ තත්ත්වයත් සමඟ හෙළිදරව් වුණා. ඒ හෙළිදරව් වීම තුළින් පැන නැඟුණු ආර්ථික, සමාජයීය, දේශපාලන කරුණු මේ අය වැය ලේඛනය පිළියෙල කිරීමේදී අභියෝගාත්මක කරුණු විධියට ගරු මුදල් ඇමතිතුමාට සැලකිල්ලට භාජන කරන්න සිදු වුණා; රටට සැලකිල්ලට ගන්න සිදු වුණා; ආණ්ඩුවට සැලකිල්ලට ගන්න සිදු වුණා; ඒ විතරක් නොවෙයි, අමාත්‍ය මණ්ඩලයටත් විශාල වශයෙන් ඒ කරුණු සැලකිල්ලට ගන්න සිදු වුණා. පසුගිය අය වැය ලේඛන හැත්තෑ ගණනකට නොතිබුණු එම අභියෝග තමයි මේ හැත්තෑහය වැනි අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට සැලකිල්ලට ගත්තේ.

1977න් පස්සේ ඉදිරිපත් කළ අය වැය තුළින් හඳුන්වා දුන් යල්පැනගිය ආර්ථික මූලධර්ම, යල්පැනගිය ආර්ථික න්‍යායයන් වැලඳගත් ආචාර්යවරුන්ගේ, මහාචාර්යවරුන්ගේ සුන්දර න්‍යායවලින් වාගේම, ජනමූල රාජ්‍ය නායකයන්ගේ තුලනාත්මක ඇහුම් කන් දීම, තුලනාත්මක එකඟ වීම -ජනමූල රාජ්‍ය නායකයන් ළඟ තිබුණු සවන් දීමේ හැකියාව, එහෙම නැත්නම් එකඟ වීම- අවභාවිත කරමින්, ඒ උත්තම ගුණාංග අවභාවිත කරමින් ප්‍රායෝගිකත්වයට ගන්න බැරි ආර්ථික න්‍යාය අය වැය ලේඛන හරහා රටට හඳුන්වා දීම තුළින් රටේ ආර්ථිකය කාබාසිනියා කරලා තිබුණු තත්ත්වය මේ අය වැය ලේඛනය පිළියෙළ කිරීමේදී අභියෝගයක් බවට පත් වුණා.

ඒ අනුව ගත් විට මේ අය වැය ලේඛනය පිළියෙළ කිරීම, මේ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම, මේ අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කළ සැලැස්ම රට තුළ ක්‍රියාත්මක කිරීම යන සියලු කාරණා ඉතාම අභියෝගාත්මක කාරණා බව මේ අවස්ථාවේදී මේ සභාවට ප්‍රකාශ කරන්න අවශ්‍යයි. ගරු මුදල් ඇමතිතුමාට තිබුණු විශාලම අභියෝගය තමයි, මේ ඇස් බැන්දුම් සහ සුන්දර ආර්ථික න්‍යායවලින් හා උපදේශකත්වයෙන් මිදී, හැටනව ලක්ෂයේ ජන වරමට ගැළපෙන ආර්ථික සන්දර්භයක් තුළ ඉඳගෙන මේ අය වැය ලේඛනය පිළියෙළ කිරීම.

ග්‍රාමීය ආර්ථිකයට අවධානය යොමු කරලා, ග්‍රාමීය සංවර්ධනයට අවධානය යොමු කරලා, ක්ෂුද්‍ර කර්මාන්ත ක්ෂේත්‍රය, සුළු කර්මාන්ත ක්ෂේත්‍රය, මහා පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය දක්වා කර්මාන්ත ක්ෂේත්‍රය ඉහළ නංවන්න අවශ්‍ය වන්නා වූ ක්‍රමෝපාය සහ ඒ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය වන්නා වූ අමුද්‍රව්‍ය යෙදවුම් විධියට නිර්මාණය කරගන්න පුළුවන් යටිතල පහසුකම් ව්‍යුහයක් නිර්මාණය කිරීම සඳහා අවධානය යොමු කිරීම තමයි මේ අය වැය ලේඛනය පිළියෙළ කිරීමේදී තිබුණු ප්‍රධානම අභියෝගය හැටියට අපි දකින්නේ. මේ කියන බොහෝ අභියෝග ජය ගැනීම සඳහා වන පදනම මෙම අය වැය ලේඛනය පිළියෙළ කිරීමේදී සැලකිල්ලට ගෙන තිබෙනවාය කියන කාරණාව මා තමුන්නාන්සේලාට සිහිපත් කරන්න කැමැතියි.

විපක්ෂයේ මන්ත්‍රීවරු මේ සභාවේ ඉඳගෙන මොනවා කිව්වත්, මේ කරුණු කාරණා සමඟ ආර්ථිකයේ විනාශවෙලා තිබුණු ගෘහ ආර්ථික කර්මාන්ත සමූහයම පණ ගන්වා, එදා වේල පිරිමහගෙන අමාරුවෙන් ජීවත්වන ජනතාවගේ ආදායම සරිකර ගන්න පුළුවන් ක්‍රමවේදයක් හරහා ග්‍රාමීය ආර්ථිකය පණ ගන්වා, ක්ෂේත්‍ර 50ක් පමණ හරහා සශ්‍රීකත්වයට පත් කරන්න පුළුවන් ක්‍රමවේද ගණනාවකුත්, ගම, අර්ධ නාගරික ප්‍රදේශ විතරක් නොවෙයි, නාගරික ප්‍රදේශත් මුහුණ පාන ගැටලුවලට ප්‍රමාණාත්මක ප්‍රවේශයක් ගන්න පුළුවන් ක්‍රමවේදයකුත් මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තිබෙන අභියෝගය තමයි, මේ සැලැස්ම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරගන්න පුළුවන් ක්‍රමවේදයක් නිර්මාණය කර ගැනීම. අපි දන්නවා, ඉතා හොඳට, සුමටව ඕනෑ තරම් යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්, ඕනෑ තරම් සැලසුම් හදන්න පුළුවන් කියලා. ඒ යෝජනා, ඒ සැලසුම් යථාර්ථයක් බවට පත් කර ගැනීමට නම් නිවැරැදිව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර ගත යුතු වෙනවා. වෘත්තිකයන් විධියට මේ පාර්ලිමේන්තුවට අලුතින් පැමිණ සිටින අපගේ අවධානය යොමු කරන්න වෙන්නේ අන්න ඒ ක්‍රමවේදය පිළිබඳව, ඒ ක්‍රමවේදය මොන ආකාරයෙන්ද ක්‍රියාත්මක කරන්නේ කියන එක පිළිබඳවයි.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන්නට යෙදුණු යථාර්ථය ක්‍රියාත්මක කර ගැනීම උදෙසා වූ ක්‍රියාමාර්ග මේ අය වැය ලේඛනය තුළ කොපමණ ප්‍රමාණයක් අන්තර්ගතද, ඒ මුළු ප්‍රමාණයම ඒ අයුරින් ක්‍රියාත්මක කරන්න අපගේ නොමඳ සහාය, දායකත්වය හා නොමඳ කැපවීම ලබා දෙන බව ප්‍රකාශ කරන්න අවශ්‍යයි.

විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනකොට බදු ක්‍රමය පිළිබඳව කරුණු කාරණා ඉදිරිපත් කළා. ලංකාවේ බදු ආදායම නියම ආකාරයෙන් අය කර ගැනීම සම්බන්ධ මූල ධර්ම ගණනාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයට ආදායම් ඕනෑ තමයි. හැබැයි රජයට ආදායම් ඕනෑ වුණාට, ව්‍යවසායකයන් අතේ තිබෙන මුදල් ප්‍රමාණය ව්‍යවසායකයා ආයෝජනය කරනවා. ඒ මඟින් රැකියා නිර්මාණය කරනවා; කර්මාන්ත ඇති කරනවා. ඒවා හරහා ආර්ථික ප්‍රසාරණයක් ඇති වෙනවා. ඒ මුදල් ටික බදු විධියට රජයට ගැනීම තුළින් ආර්ථිකය හැකිළෙනවා; ආර්ථිකය ප්‍රසාරණය වීම නතර වෙනවා; රැකියා උත්පාදනය නතර වෙනවා; කර්මාන්ත අලුතින් බිහිවන එක නතර වෙනවා. ඒ නිසා අපේ රජය කල්පනා කරපු දේ තමයි, මේ බදු ක්‍රමය සරල කරන්න ඕනෑය කියන එක. සරල බදු ක්‍රමයක් හරහා ආයෝජකයන්, නිෂ්පාදකයන්, කර්මාන්තකරුවන් උත්පාදනය කරන මුදල් ප්‍රමාණය ඔවුන් තුළ ඉතිරි වෙන්න හැරලා, ඔවුන් දළ ජාතික නිෂ්පාදනයට දායකවන ප්‍රමාණය වැඩි කරලා ඒ තුළ රටේ ආර්ථික වෘද්ධියක්, ආර්ථික සංවර්ධනයක්, දිගු කාලීන ආර්ථිකයේ ප්‍රසාරණයක් ඇති කිරීමේ මූලධර්ම ක්‍රියාත්මක කරවීමට මේ අය වැය ලේඛනය තුළින් බලාපොරොත්තු වෙනවා.

මෙය අරමුණු කරගෙන තමයි, පසුගිය රජය -2015 යහ පාලනය රජය- විසින් ඊට කලින් තිබුණු බදු ක්‍රමය සමූල ඝාතනය කරලා සානාව කියන රටට හදපු බදු ප්‍රතිපත්තිය ගෙනැවිත් ලංකාවට හඳුන්වා දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු කියන කාරණාවක් තමයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න, ලෝක බැංකුවට යන්න, ගිහින් කියලා ණය ගන්න, මේ ණය කළමනාකරණය කර ගන්න ඒ ගොල්ලන්ගෙන් උපදෙස් ගන්න කියන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි කීයක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක්.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
විනාඩි දෙකක් වෙන්න විධියක් නැහැ. විනාඩි පහක් වෙන්න ඕනෑ. මට විනාඩි 15ක කාලයක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. පස්වරු 5.00ට කථාව නතර කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
එතුමන්ලා ගියා, IMF එකට. දුන්නා පොතක්; මොනවාද ඒ පොතේ තිබුණේ?ගෙනැවිත් හඳුන්වා දුන්නා, අර සානාව කියන රටට හදපු බදු ක්‍රමය. ඒකෙන් ලංකාවේ ව්‍යාපාරිකයන්ට බෙල්ලේ වැල දාගන්න වුණා. ලංකාවේ ව්‍යාපාර වහන්න පටන් ගත්තා. ලංකාවේ ආයෝජකයන් රට ඇරලා යන්න පටන් ගත්තා. මෙන්න මෙහෙම ව්‍යසනයකට අපේ ආර්ථිකය පත් කරපු මේ මහ ලොකු අර්ථික ඔස්තාර්ලා, අපේ ආචාර්යතුමා දැන් කෑගහනවා, "මෙන්න බදු අය කරනවෝ" කියලා. ඒ දවස්වල මොකක්ද කිව්වේ? "බදු ආදායම නැති කරගත්තෝ, නැතිකර ගත්තෝ" කියලා කෑ ගැහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද, විපක්ෂයේ මේ දෙබිඩි පිළිවෙත. මොකක්ද, මේ දෙබිඩ්ඩෝ කරන්නේ? ඇයි මේක රටක් හැටියට දකින්න බැරි? මේ ප්‍රශ්නය සදාකාලික ප්‍රශ්නයක් බවට පත් කරගෙන, ඒ ප්‍රශ්නය විකුණලා ඒකෙන් බලයට එන්නද ඒ අය කල්පනා කරන්නේ? මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, තව අවුරුද්දක්, දෙකක් බලමු කියලා. මන්ත්‍රීතුමනි, අවුරුද්දක්, දෙකක් නොවෙයි. තමුන්නාන්සේලාට ඔය කියන අදූරදර්ශී, අධම මූලධර්මවල ඉඳගෙන කරන දේශපාලනය හරහා තව චිරාත් කාලයක් විපක්ෂයේ ඉන්න පුළුවන් කියන කාරණාව මම මේ අවස්ථාවේ මතක් කර දෙන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මට කාරණාවක් කියන්න තිබෙනවා. අපි දන්නවා, මිනිසුන් වයසට යනකොට පරිණත වෙනවා. රජයේ රැකියා කරලා උසස් වීම් අරගෙන ඉහළට යනකොට පරිණත වෙනවා. ගම්වල සිටින අහිංසක වැසියන් තමන්ගේ අත්දැකීම් තුළින් පරිණත වෙලා කථා කරන භාෂාව දියුණු කර ගන්නවා. ඉදිරිපත් කරන කරුණු තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂයට, දේශපාලන න්‍යායට ගරු වෙන විධියට, මිනිසුන්ට ශීලාචාර විධියට කථා කරනවා. අපි දැක්කා, ඊයේ මේ ගරු සභාවේ කෙනෙක් කථා කළ ආකාරය. මොන පැත්තකින් ගත්තත් අශීලාචාර, අශිෂ්ට, මේ සභාවට නොගැළපෙන ආකාරයට කරුණු කාරණා ඉදිරිපත් කළා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන කාරණාව තමයි, විපක්ෂය මොන මැසිවිලි නැඟුවා වුණත්, සෞභාග්‍යයේ දැක්ම කේන්ද්‍ර කර ගනිමින්, හැටනවලක්ෂයේ ජනවරම කේන්ද්‍ර කර ගනිමින්, සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන්න අපි කටයුතු කරනවාය කියන එක. ඊළඟ පරම්පරාව වෙනුවෙන් දියුණු වූ ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීම සඳහා දිගුකාලීන දාර්ශනික දැක්මක් ඇතිව ඉදිරිපත් කර තිබෙන මේ අය වැය ලේඛනය ඉදිරියට ක්‍රියාත්මක වීම සැලකිල්ලට ගෙන, ජනතාව අපි කෙරෙහි තැබූ විශ්වාසය රකිමින්, අතිභයානක කොවිඩ් වසංගත තත්ත්වය සමතික්‍රමණය කර ජයග්‍රහණය කරා යමින්, රටේ සංවර්ධන ක්‍රියාවලිය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා. ඒ වෙනුවෙන් අපි සහාය වෙනවා; දායකත්වය සපයනවා. මේ අය වැය ක්‍රියාත්මක කිරීමට බදු එකතු කර ගැනීම, බදු කළමනාකරණය කර ගැනීම සම්බන්ධයෙන් අපට දිය හැකි සියලු සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින්, මේ කාලය ලබා දීම පිළිබඳ මූලාසනාරූඪ මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

*එකල්හි වේලාව අ.භා. 5.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.*
*එතැන් සිට විවාදය 2021 නොවැම්බර් 22වන සඳුදා පවත්වනු ලැබේ.*

*அப்பொழுது நேரம் பி.ப. 5.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம், 2021 நவம்பர் 22, திங்கட்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*
*Debate to be resumed on Monday, 22nd November, 2021.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. HESHA WITHANAGE left the Chair, and THE HON. SANJEEVA EDIRIMANNA took the Chair.*

## විදේශගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් සහ සමාජ රක්ෂණ ක්‍රමයක්

## புலம்பெயர் தொழிலாளர்களுக்கான ஓய்வூதியத் திட்டமும் சமூகக் காப்புறுதித் திட்டமும்

## PENSION SCHEME AND SOCIAL SECURITY PROGRAMME FOR MIGRANT WORKERS

[අ.භා.5.02]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අප රටේ ආර්ථිකයට විදේශගත ශ්‍රමිකයින්ගෙන් ලැබෙන දායකත්වය මිල කළ නොහැකිය. අපේ විදේශ ඉපැයුම්වලින් ඔවුන්ගේ දායකත්වය අතිවිශාලය. එම විදේශගත ශ්‍රමිකයින් සඳහා මෙතෙක් ක්‍රියාත්මක නොවී තිබෙන විශ්‍රාම වැටුපක් සහ පුළුල් සමාජ රක්ෂණ ක්‍රමයක් ඇති කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, විදේශ ශ්‍රමිකයන් කියනවාට වඩා මම ඒ අය ආමන්ත්‍රණය කරන්න කැමතියි, ආණ්ඩුව ලබා ගැනීම වෙනුවෙන් ඔබතුමන්ලා ඒ අයට ලබා දුන් ඒ ගෞරවණීය නාමයෙන්.

ඒ නාමය තමයි, රට විරුවෝ කියන නාමය. ඔබතුමා නොවෙයි ඒ නම දැම්මේ. අපි ඒ බව දන්නවා. අපි දැක්කා, රට විරුවන් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා දිනවීම සඳහා, මේ ආණ්ඩුව නිර්මාණය කරගැනීම සඳහා අතින් කාලා මේ රටට ඇවිල්ලා ඇප වෙච්ච, කැප වෙච්ච විධිය. නමුත්, ඒ රට විරුවන් වෙනුවෙන් ඉටු විය යුතු නමුත්, දීර්ඝ කාලයක් තිස්සේ ඉටු නොවුණු මහා භාරදූර කාර්යයක් පිළිබඳව තමයි මම ඔබතුමාට යෝජනා කරන්නේ.

ගරු ඇමතිතුමනි, මම දන්නවා, ඔබතුමා අපේ දිස්ත්‍රික්කයේ දේශපාලනඥයකු ලෙස මහා විශාල වැඩ කරපු, වැඩ කරන ඇමතිවරයෙක් බව. එම නිසා ඔබතුමාට මේ කටයුත්ත කිරීම අභියෝගයක් නොවෙයි. නමුත් මේ කටයුත්ත සාධාරණ ලෙස ඉටු කිරීම සඳහා ඔබතුමාට ආණ්ඩුවෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලැබෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා, ගරු ඇමතිතුමනි. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කියන්නේ, ලැබුණු ඕනෑම අමාත්‍යාංශයක යම් වැඩ කොටසක් කළ ඇමතිවරයෙක්. නමුත් ගරු ඇමතිතුමනි, අද අපි දකිනවා, ඒ කාර්යභාරය කිරීමට නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමාට ප්‍රමාණවත් සහායක් ලබා නොදීම තුළ රට විරුවන්ගේ මේ ප්‍රශ්නය විසඳීම අකර්මණ්‍ය වී තිබෙන බවක්.

ගරු ඇමතිතුමනි, වර්තමාන ආණ්ඩුවට -ඔබතුමාගේ ආණ්ඩුවට- විදේශ විනිමය නොලැබීම නිසා, ඩොලර් නොලැබීම නිසා, විදේශ සංචිත හිඟ වීම නිසා බරපතළ අර්බුදයක් උද්ගත වෙලා තිබෙන බව අපි දන්නවා. ඩොලර් බිලියන 6කට එහා ගිය විදේශ විනිමය ලබා දෙන ඒ රට විරුවන්ගේ ශුභ සිද්ධිය සහ ඔවුන්ගේ කටයුතු පිළිබඳව නිශ්චිත අවධානයක් යොමු වී නැහැ. එම නිසා ඒ අවධානය යොමු කිරීම සඳහා තමයි මම මේ කාලෝචිත යෝජනාව ඉදිරිපත් කරන්න අදහස් කළේ, ගරු ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පුරවැසියන් විදේශවලට ගිහින් මහත් දුෂ්කරතා මැද තමන්ගේ දැනුම, ශ්‍රමය කැප කරලා උපයන මුදල් ඩොලර් වශයෙන් තමයි අපේ රටට ලැබෙන්නේ. ඒ වෙනුවෙන් අපි ඔවුන්ට යම් ගෞරවයක් දෙන්නට ඕනෑ, ඔවුන් රකින්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි දකිනවා, අපේ රටේ පුද්ගලයන් විදේශ රටවලට ගිහින් ඒ රටවල පුරවැසිභාවය අරගෙන මේ රටට ඇවිල්ලා මේ රටේ ධනය ඒ රටවලට ගෙන යන බවත්. ගරු ඇමතිතුමනි, ඒ දෙකෙන් වඩාත්ම ඵලදායි සහ ගුණාත්මක වැඩ පිළිවෙළ තමයි අපේ රටේ පුරවැසියන් පිට රටවලට ගිහින් මේ රටට මුදල් ගෙන ඒම. අනෙක් ඒවා මහා හොරකම්, දූෂණ, වංචනික ක්‍රියා බව තමයි අපි නිරන්තරයෙන් දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අය වැය ලේඛනය ගැන අද කථා කරන දේවල් ගත්තාම, ඒවා විහිළුසහගත කාරණා ලෙසයි පෙනෙන්නේ. මන්ත්‍රීවරුන් කථා කරන්නේ, මුදල් ඇමතිවරයා ගැන, අගමැතිවරයා ගැන සහ ජනාධිපතිවරයා ගැන මිස මේ රටේ පොළොවේ පය ගහලා ඉන්න පුංචි මිනිහා ඉල්ලන දේ ගැන නොවෙයි. එම නිසා මම ගරු ඇමතිතුමාට යෝජනාවක් කරනවා.

අපි ඊයේ, "සිරස" මාධ්‍ය ඇතුළු තවත් මාධ්‍ය ගණනාවක දැක්කා, රටේ ජනතාවට දැන් මේ රට එපා වෙලා තිබෙන බව කියැවෙන ප්‍රවෘත්ති. ඒ නිසා තමයි මිනිස්සු රට හැර යමින් ඉන්නේ. හැබැයි, මේ රටේ පුරවැසියන් වාගේම විදේශගත ශ්‍රී ලාංකිකයන් -රට විරුවන්- මේ පාලන බලය නිර්මාණය කරගනිද්දී ඔවුන්ට දහසක් බලාපොරොත්තු තිබුණා. ඔවුන් කිව්වේ, "කන්න නැතත් ඉන්න රටක් හදා ගන්න ඕනෑ" කියලායි ගරු ඇමතිතුමනි. නමුත් අද කන්නත් නැහැ, ඉන්නත් නැහැ, ඉන්න රටකුත් නැහැ, තුන් වේල කන්න විධියකුත් නැහැ. අද ඒ තත්ත්වය උදා වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. කෙසේ වෙතත් මම හිතනවා, ඔබතුමා මේ විදේශ ශ්‍රමිකයන් පිළිබඳ වැඩි අවධානයක් තිබෙන, ඇල්මක් තිබෙන, කැමැත්තක් තිබෙන, විශ්වාසයක් තිබෙන ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිලාභ, අගය ගැන මැනවින් දන්නා ඇමතිවරයෙක් කියලා. ඔවුන්ට රැකියා කරගෙන යැමේදී තිබෙන බාධා, ඒ වාගේම රැකියා අහිමි වනකොට, රැකියාව කරද්දී සිදු වන යම් අනතුරකදී -ඒ සියල්ලේදී- රජය ලබා දෙන දායකත්වය ප්‍රමාණවත් නැහැ, ගරු ඇමතිතුමනි. අපි උදාහරණයක් ගනිමු. කොරෝනා වසංගතය නිසා විදේශ රටවල සිටි බොහෝ ශ්‍රමිකයන් අපේ රටට එන්න බැරිව සිටියා. නමුත් ඒ අය බොහොම අමාරුවෙන් ආවා. ඔබතුමන්ලා මැදිහත් වෙලා ඔවුන් යම් ක්‍රමවේදයක් මඟින් ගෙන්වා ගත්තා. බොහෝ වෙලාවට ඔවුන් ඔවුන්ගේ සල්ලි වියදම් කරගෙන ආවේ. එහිදී අතරමැදියන් සිදු කළ වංචනික ගනුදෙනු නිසා ඔවුන්ට සිද්ධ වෙච්ච අපහසුතා අපි මාධ්‍ය තුළින් දැක්කා.

තමන් හම්බ කරගත් දේ quarantine මධ්‍යස්ථාන කියලා හඳුපු ආයතනවලට ගෙවන්න සිදු වන තත්ත්වයට ඔවුන් සමහර වෙලාවට පත් වුණා. ගරු අමාත්‍යතුමනි, එහෙම නොවන පරිදි අමාත්‍යාංශය හරහා ක්‍රමවේදයක් හදන්න ඕනෑ. මෙවන් විපතකදී, මෙවන් අනතුරකදී ඒ ශ්‍රමිකයන් රැක ගන්න පුළුවන් මැදිහත්වීමක් කළ යුත්තේ ඔබතුමාගේ අමාත්‍යාංශයයි, ඔබතුමාගේ ආණ්ඩුවයි. නමුත් ඒ කාර්යය අපට කරන්න බැරි වුණා; අපෙන් ගිලිහී ගියා. එය නොවීම තුළ තමයි එවන් අක්‍රමිකතා, අපහසුතා ඇති වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මම කියන්නට ඕනෑ, විශේෂයෙන්ම සේවය කිරීමේ අවස්ථාව ඔවුන්ට අහිමි වන කොට එම කාලය තුළ දෛනික වැටුපක් හෝ ලබා දී ඔවුන් සුරක්ෂිත කරන්න පුළුවන් රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාව තිබෙන බව. ඒ වාගේම, ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලබා දීමේ අවශ්‍යතාවත් තිබෙනවා.

බලය ලබා ගැනීම වෙනුවෙන් අපි සමහර වෙලාවට අපේ දේශපාලන වේදිකාවල මේවා ගැන කථා කරනවා. හැබැයි බලය

[ගරු චමින්ද විජේසිරි මහතා]

ලබා ගත්තාට පස්සේ ඒවා අමතක වෙනවා. ගරු ඇමතිතුමා හැටියට ඔබතුමා මේ කියන අපහසුතා තේරුම් අරගෙන, විදේශ ශ්‍රමිකයන් -රට විරුවන්- රැක ගැනීමට අවශ්‍ය සාධාරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියන ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.08]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මිත්‍ර ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අද ඉතා වටිනා, වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මගේ අදහස් දැක්වීම ආරම්භ කිරීමට පෙර, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කරපු මේ වැදගත් යෝජනාව මා ස්ථිර කරනවා.

මට මතකයි, මෙවැනිම ආකාරයේ යෝජනාවක් මීට මාස 6කට විතර පෙරත් අපි ඉදිරිපත් කළ බව. ගරු පියංකර ජයරත්න හිටපු රාජ්‍ය ඇමතිතුමාම ඒකට පිළිතුරු ලබා දුන්නා. එදින හැන්සාඩ් වාර්තාවත් මා සතුව තිබෙනවා. අපි මේ විධියේ යෝජනා ඉදිරිපත් කළත් ඒවා කොතෙක් දුරට යථාර්ථයක් බවට පත් වෙනවාද කියන කාරණාව එමඟින් තේරුම් ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අද වනකොට ඇති වෙලා තිබෙන මේ විදේශ විනිමය හිඟය මඟ හරවන්න, කඩා වැටෙන ආර්ථිකයට පොඩ්ඩක් හරි හුස්ම ගන්න පුළුවන් හයිය ලැබෙන එකම මාර්ගය තමයි, විදෙස් ශ්‍රමිකයන්ගෙන් අපට ලැබෙන විදෙස් මුදල් ටික; ඩොලර් ටික. හැබැයි අපි දැක්කා, සමහර අවස්ථාවල, යම් යම් අවශ්‍යතා පැන නඟින අවස්ථාවල මේ රටේ විදෙස් ශ්‍රමිකයන්ට ගරු නම්බු නාම දීලා, අන්වර්ථ නාම යොදලා කථා කළ හැටි. මට මතකයි, "රට විරුවෝ" කියමින් අපේ විදෙස් ශ්‍රමිකයන් ඉතාම ජනප්‍රිය මාතෘකාවක් බවට පත් කළ ආකාරය. ඒක බොහොම හොඳයි. හැබැයි එවැනි තැනක් ලබා දුන් විදෙස් ශ්‍රමිකයන්, ඒ අන්වර්ථ නාමයෙන්ම කියනවා නම්, "රට විරුවන්" අද වනකොට බලු වෙලා තිබෙනවා කියන එක මේ රටේ මේ ගත වූ කාල සීමාවේ පාලකයන්ගේ හැසිරීමත් එක්ක පැහැදිලිව අවබෝධ වෙනවා. එහෙම කියන්න හේතුවක් තිබෙනවා. "රට විරුවන්" නමින් හඳුන්වන අපේ රටට අදටත් සම්පතක් වන අපේම ආදරණීය දෙමවුපියන්, සහෝදර සහෝදරියන්, මේ මොහොතේත් මේ රටට හුස්ම පොවන ඒ පිරිස අපි පසුගිය කොවිඩ්-19 වසංගත සමයේ බලා ගත්තේ කොහොමද? අපි උදාහරණයක් ගනිමු. අපට මතකයි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා චීනයේ ඉගෙන ගන්න ගිය විශ්වවිද්‍යාල දරුවන් -ඒ ශිෂ්‍යයන්- කිහිපදෙනෙකු ගෙන්වා ගැනීමට කටයුතු කළ බව. වෙනමම ගුවන් යානයක් සූදානම් කරලා ඔවුන් අරගෙන ඇවිල්ලා, නිරෝධායනය කරලා මුල් අවස්ථාවේදී එතුමා මේ රටට ලොකු පණිවුඩයක් දුන්නා. ඒක හොඳයි. ඒ වාගේ දේවල් වෙන්න ඕනෑ. ඒක රාජ්‍ය නායකයාගේ වගකීම. එතුමා වගකීමට වඩා යුතුකමක් කළාය කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එදා "රට විරුවෝ" කියලා හඳුන්වපු, තමන්ගේ අතින් සල්ලි දීගෙන ගුවන් ටිකට්පත් අරගෙන ඇවිත් ඡන්දය දාලා මේ රටේ වර්තමාන ආණ්ඩුව බලයට පත් කරපු ඒ උදවිය කොවිඩ් වසංගතය හමුවේ ඒ අයගේ ජීවිතය යදින කොට, ඔවුන් රැකියා කරපු සමහර රටවල පාලකයෝ ඔවුන් ගැන සොයා බැලුවේ නැහැ; අපේ රටේ පාලකයෝත් ඔවුන් ගැන සොයා බැලුවේ නැහැ. ඔවුන් මහා බරක් විධියට දැක්කා. "රට විරුවෝ" කාලකණ්ණි බවට පත් වුණා. මම මේ කථාව කියන්නේ නිවැරදි විස්තර ඇතිව. මගේ මිත්‍රයන් කණ්ඩායමක් ඉන්නවා, වසර ගණනාවක් තිස්සේ කුවේට් දේශයේ වෘත්තිකයන් විධියට සේවය කරන. කුවේට් දේශයට යන මේ රටේ අහිංසක ශ්‍රමිකයන්ට ප්‍රශ්නයක් වුණාම බලා ගන්නේ ඔවුන්. අපේ ගරු ඇමතිතුමනි, ඒ ශ්‍රමිකයන් ගැන බලන්න අපේ රට වෙනුවෙන් පිහිටුවා තිබෙන කිසිම ආයතනයකින්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යාලවලින් කිසිම සේවයක් වෙන්නේ නැහැ. ඒ බොහෝ දෙනා මේ රටින් ඒ රටවලට ගිහින් සැප ගන්න එක තමයි කරන්නේ. අපේ ඒ අහිංසක ශ්‍රමිකයන්ට ප්‍රශ්නයක් ආවාම විසඳා දෙන්න ඒ ඒ රටවල සමාජමය වශයෙන් හැඩ ගැහිච්ච, මේ රටට ආදරය කරන අපේම ශ්‍රී ලාංකිකයන් ඉන්නවා. කුවේට් දේශයේ ඉන්න මගේ ඒ මිත්‍රයන් කණ්ඩායම කිව්වා, "අද අපේ තානාපති කාර්යාල අපේ ඒ ශ්‍රමිකයන් ගැන සොයා බලන්නේ නැහැ. ඒ අහිංසක මිනිසුන්ගෙන් සමහරුන් කොවිඩ්-19 වයිරසය හැදිලා මැරිලා වැටෙනවා. සමහරුන් ගෙවල්වලින් එළවා දමා තිබෙනවා" කියලා. එවැනි වටපිටාවක් තිබියදී ආණ්ඩුව ඔවුන් ගෙන්වාගන්න කටයුතු කළේ නැහැ; ඒකට අවශ්‍ය වටපිටාව හැදුවේ නැහැ. අඩුම තරමින් ඒ ශ්‍රමිකයන් වෙනුවෙන් කරන්නේ මොකක්ද කියලා හිතාගන්න හෝ තානාපති කාර්යාල සම්බන්ධීකරණයක් නිවැරැදිව සිදු වුණේ නැහැ. එහෙම නම් අපි අහනවා, ඒ ශ්‍රමිකයන් "රට විරුවෝ" බවට පත් වන්නේ ඡන්දය ලබාගන්නා කාලයේදී විතරද කියලා. ඒ නිසා රටට බරක් කියලා දැනිච්ච වෙලාවට රට විරුවන් කාලකණ්ණි බවට පත් වනවාය කියන එක මම විශේෂයෙන් මතක් කරනවා. ඒක එහෙම නොවිය යුතුයි කියන කාරණයත් මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඇමතිතුමාත් මා කියන මේ කාරණයට එකඟ වෙයි කියා මා හිතනවා. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් එදා අපේ රටට එනකොට ඒ අයට සැලකුවේ කොහොමද? මේ රටේ ව්‍යාපාරික පන්තියේ සමහර උදවියට අවශ්‍ය විධියට ලාභ ප්‍රයෝජන ගන්න පුළුවන් ආකාරයට තමයි අපේ විදෙස්ගත ශ්‍රමිකයන් මේ රටට එන වේලාවේ රටේ කොවිඩ් නීතිය සැකසී තිබුණේ. නමුත් එහෙම විය යුතුව තිබුණේ නැහැ.

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අද සභාව කල්තබන අවස්ථාවේ ගෙනා යෝජනාවේ හරය වන්නේ මේ රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධාන මාර්ගයක් වන විදේශ ශ්‍රමිකයන්ට වටිනාකමක් දෙන්න, රක්ෂණයක් දෙන්න, විශ්‍රාම වැටුපක් දෙන්න කියන එකයි. මේවා හුදු යෝජනා බවට පත් කරන්න එපා; මැතිවරණ ලියවිලිවලට සීමා කර තබාගන්න එපා. මේ ශ්‍රමිකයන් ගෙනෙන මුදල් මේ රටට ඵලදායී විධියට ආයෝජනය කරන්න. ඒ වාගේම ඒ අයට වටිනාකමක් දෙන්න. පසුගිය දවස්වල බැසිල් රාජපක්ෂ මහත්මයා කිව්වා, වාහනයක් ගන්න හීනයක් තිබෙන, ගෙයක් හදාගන්න හීනයක් තිබෙන ඒ ශ්‍රමිකයන්ට ඒ අය උපයා ගත් සල්ලි ටික ගෙනැල්ලා වාහනයක් ගන්න අවස්ථාව දෙනවා කියලා. නමුත් අද ඒ ගැන කථාබහක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමා මූලාසනයේ සිටින වේලාවේ මා සඳහන් කරන මේ කාරණයට, ඔබතුමා වගකියන ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු විධියට ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ රටට ශ්‍රමිකයන්ගේ සල්ලි කෙසේ ආවත්, මේ මහා මංකොල්ලය සිද්ධ වෙනවා. මෙන්න මේ කියන කාරණය ලියාගන්න. මේක recording එකේත් තිබෙනවා. අපි මේ කියන දේවල්, මුදල් ඇමතිතුමා අහගෙන ඉන්නවාද දන්නේ නැහැ. එහෙම නැත්නම් මුදල් ඇමතිතුමාට මේ කරුණු ගිහින් දෙන්න. හැටන් නැෂනල් බැංකුවට ඊයේ පෙරේදා ප්‍රේෂණ ටිකක් ඇවිල්ලා තිබෙනවා. මේවා ආවේ කොහෙන්ද, කාගෙන්ද, මේවා හොර සල්ලිද, මොනවාද කියලා රටට හෙළි කරන්න. හැටන් නැෂනල් බැංකුවේ 076020165935 දරන ගිණුම් අංකයට මේ මුදල් ටික ඇවිත් තිබෙනවා. නම, රෝහිත එච්.එන්. ඒ කවුද කියලා අපි දන්නේ නැහැ. මේ ගැන සොයා බලන්න. එවා තිබෙන මුදල රුපියල් කෝටි 1,658ක්. මම ළඟ එම ගිණුමට අදාළ පිටපතක් තිබෙනවා. මේවා කොහොම වෙනවාද, මේවායින් කාගේ සාක්කු පිරෙනවාද කියලා සොයා බලන්න.

විදෙස්ගතව සිටින අපේ අහිංසක ශ්‍රමිකයන්ට සාධාරණය ඉටු කරන්න කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගාමිණී වලේබොඩ මැතිතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව විනාඩි තුනකින් අවසන් කරන්න.

[අ.භා. 5.14]

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේස්ගත ශ්‍රමිකයන් පිළිබඳව සහ ඔවුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කිරීම පිළිබඳව අද සභාව කල්තබන අවස්ථාවේ විපක්ෂයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ හොඳ යෝජනාවක්. හොඳ දෙයක් යෝජනා කළාම, අපේ මනුස්සකම තමයි ඒකට අපේ අනුග්‍රහය ලබා දීම; හොඳ දේට හොඳයි කීම. එතුමන්ලා වාගේ හැම දේටම නරකයි, නරකයි කියලා අපි බැණ වදින්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සිසු දරුවන්ගෙන් වසරකදී සාමාන්‍ය පෙළ විභාගයට 300,000ක විතර පිරිසක් පෙනී සිටිනවා. වසරක් පාසා එක වසරට ඇතුළත් වන ළමයින් ප්‍රමාණය 350,000ක් විතර වෙනවා. මේ ළමුන්ගෙන් විශ්වවිද්‍යාලයට ගන්නේ 41,000ක විතර ප්‍රමාණයක්. ඒ වාගේම වසරක් පාසා ලක්ෂ දෙකකට විතර ආසන්න තරුණ-තරුණියන් ප්‍රමාණයක් රැකියා නොමැති ගොඩට එකතු වෙනවා.

දැනට විදේශ රැකියාවල නිරත වෙලා සිටින පිරිස් ගත්තාම, රට නියෝජනය කරමින් විදෙස්ගතව අපට විදේශ විනිමය සොයා දෙන මේ රට විරුවන්ගෙන් වැඩි කොටස ඉහළ ආදායම් උත්පාදනය කරන ලොකු වැටුප් ලබන වෘත්තීය මට්ටමේ රැකියාවල නිරත වුණු කොටසක් නොවෙයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. අපි විදේශ රටවල තිබෙන රැකියා අවස්ථා හඳුනා ගෙන පාසල් අධ්‍යාපන පද්ධතිය තුළදීම ඒ සඳහා පුහුණුවක් ලබා දීමට කටයුතු කළ යුතුයි. මේ වෙනකොට විශේෂයෙන්ම ජපානයේ ක්ෂේත්‍ර 14ක් කේන්ද්‍ර කර ගනිමින් රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ වෙනකොටත් ඒ සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීමේ කර්තව්‍යයේ නිරත වෙලා සිටින විත්තිය අපි දන්නවා. නමුත් මේ සඳහා ඊට වඩා එහාට ගිය ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයි. ඒ අනුව එම වැඩසටහන් ගමට අරගෙන ගිහිල්ලා, ඒ සඳහා සුදුසුකම් තිබෙන තරුණ-තරුණියන්ට, කැමැත්තක් දක්වන තරුණ-තරුණියන්ට අවස්ථාවක් ලබා දීලා, ඒ අය රට විරුවන් විධියට විදේශ රැකියාවලට යවලා, අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේ ක්‍රියාවලියකට අපි අවතීර්ණ වෙන්න ඕනෑය කියන යෝජනාව, ඒ අදහස මම ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කරනවා.

ගරු ඇමතිතුමනි, මම හිතන විධියට කොරියාවට ශ්‍රමිකයන් යැවීමේ දී පවත්වන විභාගයට පසුගිය කාලයේ හත්-අටදහසක පමණ පිරිසක් පෙනී සිටියා. තවම ඒ රජය විසින් නැවත ඇතුළත්වීමට අවස්ථාව තිබෙන අය විතරයි රැකියාවලට බඳවා ගනිමින් සිටින්නේ. ඉතුරු අය බඳවා ගැනීමේ කටයුතු දැනට නතර කර තිබෙනවා. මම හිතන විධියට මෙය රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් විසඳා ගත යුතු ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් රටේ හැම තැනකම වාගේ අද විශාල ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මගේ දිස්ත්‍රික්කය තුළ මේ විභාගය සමත් වූ විශාල පිරිසක් ඉන්නවා. ඒ අය නිරන්තරයෙන් ඒ ගැන මැසිවිලි නඟනවා. ඒ නිසා මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි තිබෙන වැදගත්කම මෙයයි. ඒ අයට නිවැරැදි ආකාරයේ ජීවන වෘත්තියක් සකස් කර ගන්න පුළුවන් උපදේශන ක්‍රියාවලියක් සකස් කරලා, ඒ අය එවන මුදල් ඒ පවුල්වලට ආර්ථික ශක්තියක් ලැබෙන විධියට ආයෝජනය කරන්න සුදුසු ක්‍රමවේදයක් අපි සකස් කර දෙන්න ඕනෑ. ඒ සඳහාත් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය. ඔබතුමියට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ ශ්‍රමිකයන්ට රක්ෂණ ආවරණයක් සහ pension එකක් ලබා දීම පිළිබඳව විපක්ෂයේ ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අපි අනුමත කරනවා. අපේ රටට විදේශ විනිමය ගෙන ඒම සඳහා තරුණ තරුණියන් වැඩි පිරිසක් අද විදේශගතවෙලා ඉන්නවා. මේ වනකොට ලක්ෂ අටකට අධික සංඛ්‍යාවක් විදේශගතව, රැකියාවල නිරතවෙලා සිටිනවා කියලා මම හිතනවා. ඒ වාගේම, මේ අවුරුද්ද ඇතුළත 88,000ක් රැකියා වෙනුවෙන් විදේශගතවෙලා සිටිනවා. අපේ රටට විදේශ විනිමය ගෙනෙන පිරිස පිළිබඳව තමයි අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව යටතේ කථා කරන්නේ. පිටරටවලින් එවන මුදල්වලට රාජ්‍ය බැංකුවල පොලී අනුපාතය වැඩි කරලා, ආකර්ෂණීය ආකාරයෙන් මේ මුදල් ගෙන්වා ගන්න ඒගොල්ලන්ට

[ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය]

ක්‍රමවේදයක් සකසනවා නම් රාජ්‍ය ආදායම තව තවත් වැඩි කර ගන්න පුළුවන් කියලා මම හිතනවා. "යෝජනා විතරක් ඉදිරිපත් කරනවා, ඒ ගැන විවාද කරනවා, නමුත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ" කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා. මම දැනුවත්වෙලා සිටින ආකාරයට අපේ විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳ පොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය ගරු පියංකර ජයරත්න මැතිතුමා මේ වනකොට ඒ ශ්‍රමිකයන්ට රක්ෂණ ආවරණයක් ලබා දීමේ සහ විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා පවත්වමින් සිටිනවා. එය මේ වනකොට ක්‍රියාත්මක වන මට්ටමක තිබෙනවාය කියන කාරණය අපි හොඳාකාරවම දන්නවා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය ශක්තිමත් කරන්න විදේශ රටවල හිටපු අපේ රටේ දහස් ගණනක් ජනතාව තමන්ගේ අතින් වියදම් කරගෙන අපේ රටට ආවා, අපට මතකයි. ඔවුන් එදා අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ලබා දුන් ගරුත්වය අදත් එලෙසම ලබා දෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, " ඒ අය කාලකණ්ණි බවට පත් කරන්න එපා" කියලා. එතුමා ඒ වචනය පාවිච්චි කිරීම ගැන අපි කනගාටු වනවා. මොකද, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත් කරන්න විදේශ රටවල හිටපු මේ ජනතාව අපේ රටට ආවා වාගේම, එතුමා ඔවුන් වෙනුවෙනුත් කටයුතු කරමින් ඉන්න නිසා.

අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා වාගේම, ගරු පියංකර ජයරත්න රාජ්‍ය ඇමතිතුමා නියත වශයෙන්ම මේ රටට විදේශ විනිමය ගෙනෙන ජනතාව ආරක්ෂා කරන්න, ඔවුන් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න, ඒගොල්ලන්ට දීමනාවක් ලබා දෙන්න ක්‍රියා කරනවා. අපේ ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට මේ ජනතාව විදේශ රටක රැකියාව අවසන් කරලා, අපේ රටට ආවාට පස්සේ අපේ රට තුළ මොනවා හෝ ව්‍යාපාරයක් ආරම්භ කරන්න පුළුවන් වන විධියේ ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. එම ව්‍යාපාර තව තවත් දියුණු කරගෙන ඔවුන්ට ආදායම් ලබන්න අවස්ථාව සලසා දිය යුතුයි කියන කාරණයත් මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා.

[අ.භා. 5.21]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා, විදේශ ශ්‍රමිකයන් සඳහා රක්ෂණ ක්‍රමයක් හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීම වෙනුවෙන් මෙවැනි සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ගෙන ඒම පිළිබඳව. මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසු මේ කාරණය පිළිබඳව දීර්ඝ වශයෙන් සොයා බැලීම් කළා. ඒ වාගේම ගරු තලතා අතුකෝරල මහත්මිය ඒ දවස්වල රක්ෂණ ක්‍රමයක් හදන්න ගිහිල්ලා අමාරුවේත් වැටුණා. ඒ නිසා ඉතා පරිස්සමින් මේ ගැන මම කටයුතු කළා. ශ්‍රී ලාංකික විගමන ශ්‍රමිකයන් සඳහා නීත්‍යානුකූලව රක්ෂණ හිමිකම් ලබා දීමේ අරමුණින් අංක 12/2021 හා 2021.04.28 දින අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මා ඉදිරිපත් කළා. ඒ, විශේෂයෙන් මැද පෙරදිග කලාපවල සේවය කරන අපේ ශ්‍රමිකයන් වෙනුවෙන් ඉතා ශක්තිමත් රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම සඳහා. දැනට මාස ගණනාවකට පෙර මම අමාත්‍ය මණ්ඩලයට ගිහිල්ලා ඒ අනුමැතිය ලබාගෙන TEC එකක් වාගේම, Tender Board එකක් පත් කරලා මේ කටයුත්ත ආරම්භ කළා.

සෑම ශ්‍රමිකයකු සඳහාම අපේ කාර්යාංශය මඟින් දැනට රුපියල් ලක්ෂ 5ක රක්ෂණයක් දෙනවා. නමුත්, ඒක කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. කරුණු සොයා බැලීමේදී මට දැනගන්න ලැබුණා, කාන්තාවක් මැද පෙරදිගට යනකොට ඒජන්සිකරුවන් මේ ශ්‍රමිකයා වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක් -ඩොලර් 5,000ක්- හාම්පුතාගෙන් ලබා ගන්නවා කියලා. ඒ විධියට ලබා ගත්ත මුදල්වලින් මේ ශ්‍රමිකයාගේ මහත්තයාට අරක්කු බෝතලයක් අරගෙන දීලා, සල්ලි දීලා, කැමැත්ත ප්‍රකාශ කරගෙන, රුපියල් ලක්ෂයක්, දෙකක් වියදම් කරලා ඉතුරු ටික සාක්කුවේ දමා ගන්නවා. මේක ඉතාම අසාධාරණයි. එහෙම නම්, අපි කොහොමද මේ ශ්‍රමිකයාගේ ආරක්ෂාව සලසන්නේ? ඔවුන්ට ආරක්ෂාව සැලසීම සඳහා මම විශාල සටනක් ගෙන ගියා. එම නිසා ඒජන්සිකරුවන් ඔක්කෝම මට විරුද්ධව පෙත්සම් ගැහුවා. නමුත්, මම ඒ වැඩ පිළිවෙළ අත්හැරියේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි මේ රක්ෂණ ක්‍රමය හදලා තිබෙන්නේ හදිසි අවස්ථාවකදී අසනීප වුණොත්, වෛද්‍යාධාර දෙන්න වුණොත්, ලංකාවට ගෙන එන්න වුණොත් ඒ සඳහා අවශ්‍ය මුදල් ඒ රක්ෂණය මඟින් ගෙවීමටයි. ලබන අවුරුද්දේ ජනවාරි මාසයෙන් පසු හාම්පුතා විසින් ඩොලර් 15,000ක රක්ෂණයක් ලබා ගත්තේ නැත්නම් ශ්‍රමිකයෙකුට මැදපෙරදිගට යන්න බැහැ. ඒ විධියට තමයි මේ රක්ෂණ ක්‍රමය දැන් අපි හදා ගෙන යන්නේ. එක් එක් රටවලට යන ශ්‍රමිකයන්ට රක්ෂණ හිමිකම් ලබා දීමේ අරමුණින්, පාරදෘශ්‍යභාවයකින් යුතු මැද පෙරදිග රක්ෂණ සමාගම් ගණනාවක් අපි තෝරා ගන්නවා. ඒ පිළිබඳව හෙට-අනිද්දා අපි පත්තරේ තොරතුරු පළ කරනවා. ඒ හාම්පුතා විසින් රක්ෂණයක් ලබා දෙන තෙක් ශ්‍රමිකයෙකුට පිටරට යෑමට අපේ කාර්යාංශයේ ලියාපදිංචිය දෙන්නේ නැහැ. මැදපෙරදිග යන ශ්‍රමිකයන් සඳහා එම රක්ෂණය අනිවාර්යයෙන්ම ලබා දීමේ වැඩ පිළිවෙළ අපේ රජය යටතේ ආරම්භ කරලා තිබෙනවා. නමුත්, මේ නිලධාරිවාදය විසින් මාස ගණනාවක් එය ප්‍රමාද කළා. ඒ සම්බන්ධයෙන් මම හැම වෙලාවකම ඔවුන්ට කථා කළා. දැන් ඒ කටයුතු අවසාන අදියරට ඇවිත් තිබෙනවා. මේ වැඩ පිළිවෙළට අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු රජයේ පූර්ණ සහයෝගය අපට ලබා දීලා තිබෙන බවත් මම ප්‍රකාශ කරන්න කැමැතියි. ඒක තමයි, පළමුවෙනි කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය තමයි විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රශ්නය. විශේෂයෙන්ම විගමනික ශ්‍රමිකයන් සඳහා අපි දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙනවා. විශ්‍රාම වැටුපක් දෙනකොට පිටරට ඉන්න අයත් ඒකට දායක වෙන්න ඕනෑ; අපිත් දායක වෙන්න ඕනෑ. අපි එකඟ වෙලා තිබෙනවා, කුවේට් අරමුදලින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති රුපියල් බිලියන 2ක මුදලක් මේ දායක විශ්‍රාම වැටුප සඳහා මූලික මුදලක් වශයෙන් මහ බැංකුවේ තැන්පත් කරන්න. ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා. ඒ සම්බන්ධ ඉතාම ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස් කිරීමට අපි විද්වත් කණ්ඩායමක් පත් කළා. ඒ අනුව, විශ්‍රාම වැටුප් සකස් කිරීම සහ එවැනි අරමුදලක් - fund එකක්- ඇති කිරීම සඳහා අත්දැකීම් තිබෙන කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මැතිතුමා, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳ පොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් යමුනා පෙරේරා මහත්මිය, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මහාචාර්ය බිලේෂා වීරරත්න මහත්මිය, විශ්‍රාමික සහකාර මහ බැංකු අධිපති දේවගේ වසන්ත මැතිතුමා,

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සංගමයේ කළමනාකාර අධ්‍යක්ෂ විජය උඳුපිටිය මැතිතුමා, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳ පොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම්, කේ. නිකරිල්කාන්ත් මහතා යන අයගෙන් සමන්විත විද්වත් මණ්ඩලයක් අපි පත් කර තිබෙනවා. ඒ විද්වත් මණ්ඩලය විසින් අපට වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව අනුව, මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා සමඟ ගිය සතියේ සාකච්ඡා කළා. එතුමා කිව්වා, මේක ඉතා විශිෂ්ට වාර්තාවක්, මේක අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා. එම නිසා ඒ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට මැද පෙරදිග සේවය කරන, කොරියාවේ සේවය කරන, ජපානයේ හෝ ලෝකයේ ඕනෑම තැනක සේවය කරන සේවකයෙකුට දායක වෙන්න පුළුවන්. ඒ කාරණයත් "සෞභාග්‍යයේ දැක්ම" නම් වූ ජනාධිපතිතුමාගේ දර්ශනය යටතේ ක්‍රියාත්මක කිරීමට මමත්, මාගේ රාජ්‍ය ඇමතිතුමාත් කටයුතු කරන බව මේ ගරු සභාවට දන්වන්න කැමැතියි.

විශේෂයෙන්ම මේ ශ්‍රමිකයන්ට කොවිඩ් වසංගතය අවස්ථාවේදී මුහුණ පාන්න සිදුවූ කරදර හා කාරණා පිළිබඳවත් කිව්වා. ඒ පිළිබඳ තත්ත්වය පැහැදිලි කරලා මම මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ගණනාවකට උත්තර දීලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව මම තවදුරටත් උත්තර දෙන්න යන්නේ නැහැ.

අපේ ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමාත් මතු කළා, කොරියාව සහ ජපානය යන රටවලින් ඉතාම සුබදායක ආරංචියක් ලැබී තිබෙන බව. දැන් ඒ රටවල් අපගේ අලුත් ශ්‍රමිකයන් භාර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. හැබැයි, ඒ රැකියාවලට ඉල්ලුම් කරන අය නැවත විභාගය පාස් වෙන්න ඕනෑ. අපේ අය හිතනවා, විභාගය පාස් වෙන්නේ නැතිව නිකම්ම ජපානයට යන්න පුළුවන් කියලා. එහෙම බැහැ. භාෂාව පිළිබඳ ප්‍රවීණතාව, NVQ 4 හෝ NVQ 5 ප්‍රවීණතාවක් තිබෙනවා නම් ඉදිරියේදී අපට ජපානයටත්, කොරියාවටත්, ඊශ්‍රායලයටත් හොඳ පඩියකට විශාල පිරිසක් යවන්න හැකියාව තිබෙනවා. නමුත්, අපේ තරුණ-තරුණියන් මේ සඳහා යොමුවන්න ඕනෑ; භාෂාව ඉගෙන ගන්න ඕනෑ; ඒ පිළිබඳ ප්‍රවීණතාවක් දක්වන්න ඕනෑ. එහෙම නැතිව නිකම්ම ගෙදර ඉඳලා ඒජන්සිකාරයන්ට රැවටිලා සල්ලි දීලා ගේ දොර නැති කරගන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ඒජන්සිකරුවන්ගේ මාෆියාවට විරුද්ධව මම හැම වෙලාවෙම වැඩ කරනවා. ඔවුන්ට රැවටෙන්න එපා. රජය මඟින් කොරියාවට, ජපානයට සහ ඊශ්‍රායලයට ශ්‍රමිකයන් යැවීමටත් අවශ්‍ය ගිවිසුම් සකස් කරලා තිබෙනවා.

මගේ ඊළඟ ප්‍රයත්නය වන්නේ, මැද පෙරදිග රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ සම්බන්ධව කටයුතු කිරීමයි. පිලිපීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ ඔවුන්ගේ පඩි-නඩි පිළිබඳව, ඔවුන්ගේ සේවා අවස්ථා පිළිබඳව, ඔවුන්ගේ සුරක්ෂිතතාව පිළිබඳව ගිවිසුමකට එළඹී තිබෙනවා. නමුත්, මෙතෙක් හිටපු කිසිම කම්කරු ඇමතිවරයකු මේ පිළිබඳ නෙත, සිත යොමු කර නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, අපි මේ රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තුළින් මෙවැනි ගිවිසුමකට කෙසේ හෝ ඇතුළු වෙන්න ඕනෑ. එතකොට තමයි, ඒ රාජ්‍යවල ආරක්ෂාවත් ශ්‍රමිකයන්ට ලැබෙන්නේ. ඒ නිසා දූරදර්ශීව මේ පිළිබඳව කල්පනා කරලා ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සඳහා අපි වැඩ කටයුතු කරනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, මේ වන විට මොන කොවිඩ් ප්‍රශ්නය තිබුණත්, අපේ රාජ්‍ය අමාත්‍යාංශය ඇතුළු අපි ඔක්කෝම එකතු වෙලා ශ්‍රමිකයන් 88,000ක් මේ අවුරුද්දේ විදේශ රටවලට යවා තිබෙන බව. අපට දීලා තිබුණු target එක ලක්ෂයයි. අපි ඒ ලක්ෂය අනිවාර්යයෙන්ම ඉෂ්ට කරනවා. ඒ වාගේම අපට සමාජ වගකීමක් තිබෙනවා, මේ ශ්‍රමිකයන් වෙනුවෙන් අපට කරන්න පුළුවන් උපරිම සේවාව කරන්න. ඒ සඳහා අපට ඡන්දය දුන්නාද, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්දය දුන්නාද, නැද්ද කියන එක අදාළ නැහැ. ඔවුන්ගේ ආරක්ෂාව -රැකවරණය- සලසන එක මානුෂික අයිතිවාසිකමක්. දේශපාලනයෙන් තොරව ඒක හදවතේ තබාගෙන, විදේශ රැකියා සඳහා ගිය හැම දෙනාගේම ශුභ සිද්ධිය සඳහා අපේ අමාත්‍යාංශයත්, අපේ රාජ්‍ය අමාත්‍යාංශයත් එකතු වෙලා කටයුතු කරන බවට සහතික වෙනවා.

නැවත වතාවක් චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, අපි මේ ගන්නා ක්‍රියා මාර්ගය පිළිබඳව මේ රටේ ජනතාව දැනුවත් කරන්න මට අවස්ථාවක් ලබා දීම ගැන.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 21 වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 22වන සඳුදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி. ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2021 ஒக்ரோபர் 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 22, திங்கட்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Monday, 22nd November, 2021, pursuant to the Resolution of Parliament of 21st October, 2021.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

286 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 286 - இல. 8
Volume 286 - No. 8

2021 නොවැම්බර් 22වන සඳුදා
2021 நவம்பர் 22, திங்கட்கிழமை
Monday, 22nd November, 2021

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

**2021 නොවැම්බර් 22වන සඳුදා**
**2021 நவம்பர் 22, திங்கட்கிழமை**
**Monday, 22nd November, 2021**

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන**

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වර්තා**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද:**
2021.11.19 වන දින ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් කරන ලද ප්‍රකාශය
2021.11.19 වන දින ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා විසින් කරන ලද ප්‍රකාශය
2021.11.20 වන දින ගරු තිසකුට්ටි ආරච්චි මහතා විසින් කරන ලද ප්‍රකාශය

**සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 – [හත්වන වෙන් කළ දිනය] :**
දෙවන වර කියවීම - විවාදය අවසන් කරන ලදී
පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**தேசிய கணக்காய்வு அலுவலகத்தின் வருடாந்த வேலை நிகழ்ச்சித்திட்டம்**

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**
2021.11.19ஆம் திகதிய மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்னவினது கூற்று
2021.11.19ஆம் திகதிய மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்தினது கூற்று
2021.11.20ஆம் திகதிய மாண்புமிகு திஸகுட்டி ஆரச்சியினது கூற்று

**குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது.

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட ஏழாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் முடிவுற்றது.
சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNUAL WORK PROGRAMME OF NATIONAL AUDIT OFFICE

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:
Statement made by Hon. (Mrs.) Rohini Kumari Wijerathna on 19.11.2021
Statement made by Hon. Indika Anuruddha Herath on 19.11.2021
Statement made by Hon. Thisakutti Arachchi on 20.11.2021

CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL:
Read the First time

APPROPRIATION BILL, 2022 - [Seventh Allotted Day]:
Second Reading - Debate Concluded
Bill Committed to a Committee of the Whole Parliament

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021 නොවැම්බර් 22වන සඳුදා***
*2021 நவம்பர் 22, திங்கட்கிழமை*
*Monday, 22nd November, 2021*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2021 නොවැම්බර් මස 16 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**



## ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන
## தேசிய கணக்காய்வு அலுவலகத்தின் வருடாந்த வேலை நிகழ்ச்சித்திட்டம்
## ANNUAL WORK PROGRAMME OF NATIONAL AUDIT OFFICE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 35(1) වගන්තිය යටතේ, විගණකාධිපතිවරයා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය වැඩසටහන, එකී පනතේ 35(3) වගන්තිය ප්‍රකාරව මම සභාගත කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 සහ 2018 වර්ෂ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)

ගරු කථානායකතුමනි, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ධීවර

[ගරු කංචන විජේසේකර මහතා]

කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියෝග සහ වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඍඅ) සහ (ඍආ) වගන්තිය යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 ජූනි 03 දිනැති අංක 2126/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 මාර්තු 12 දිනැති අංක 2218/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) 2017 වර්ෂය සඳහා සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2018 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) (52 අධිකාරය වන) සුරාබදු ආඥාපනත යටතේ නිවේදන;

(ii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය;

(iv) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි;

(v) 2022 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන; සහ

(vi) 2022 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සී.බී. රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු ප්‍රසන්න රණතුංග මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු එම්.එස්. තවුෆික් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මන්නාරම, මඩු, කෝවිල්මෝට්ටෙයි පෙරිය පන්ඩිවිරිච්චාන් (බටහිර) යන ලිපිනයෙහි පදිංචි ගුණරත්නම් ජූඩ් විමල්රාජ් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මන්නාරම, මඩු, කෝවිල්මෝට්ටෙයි පෙරිය පන්ඩිවිරිච්චාන් (බටහිර) යන ලිපිනයෙහි පදිංචි එස්. වික්‍රමරත්නම් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මන්නාරම, මඩු, කෝවිල්මෝට්ටෙයි පෙරිය පන්ඩිවිරිච්චාන් (බටහිර) යන ලිපිනයෙහි පදිංචි තම්බිරාසා ලිංගේස්වරන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ නව වාට්ටු සංකීර්ණය: විස්තර
### கொழும்பு தெற்கு போதனா வைத்தியசாலைப் புதிய வாட்டுத் தொகுதி: விபரம்
### NEW WARD COMPLEX AT COLOMBO SOUTH TEACHING HOSPITAL: DETAILS

177/2020

**1. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ඉදිකරමින් පවතින මහල් 13කින් සමන්විත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමීව සිදු කරනු ලබන බව එතුමා දන්නේද?

(ආ) (i) එම වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) ඊට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையின் பிரதான வைத்தியசாலையொன்றாகிய கொழும்பு தெற்கு போதனா வைத்தியசாலை வளாகத்தில் நிர்மாணிக்கப்பட்டு வருகின்ற பதின் மூன்று மாடிகளைக்கொண்ட வாட்டுத் தொகுதியின் நிர்மாணப் பணிகள் மிகவும் மந்த கதியில் இடம்பெறுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாட்டுத் தொகுதியை நிர்மாணிப்பதற் காக மதிப்பீடு செய்யப்பட்ட செலவுத் தொகை எவ்வளவென்பதையும்;

(ii) குறித்த நிர்மாணப் பணிக்கான ஒப்பந்தம் வழங்கப்பட்டுள்ள நிறுவனம் யாதென்பதையும்;

(iii) மேற்படி நிர்மாணப் பணிகளை நிறைவுசெய்ய எதிர்பார்க்கும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that the construction work of the ward complex consisting of 13 storeys at the Colombo South Teaching Hospital premises, one of the leading hospitals in Sri Lanka, is moving very slowly?

(b) Will he inform this House -

(i) the estimated cost of the construction of that ward complex;

(ii) the name of the institution that obtained the contract of that construction; and

(iii) the date on which the construction work is expected to be completed?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ඉදිකිරීම්වලට අදාළව ඇති වූ දුර්වල ප්‍රගතිය හේතුවෙන් ප්‍රථම කොන්ත්‍රාත්කරුගෙන් ගිවිසුම අවලංගු කිරීමට සිදු වීමෙන් වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය.

(ආ) (i) වාට්ටු සංකීර්ණය ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් හත්සියහතළිස්තුන් මිලියන එකොළොස්දහස් පන්සියතිස්දෙකයි ශත පනහකි. (743,011,532.50) (බදු සහිත).

(ii) 2006.08.14 වන දින ගුණතිලක කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ප්‍රථම කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර එම කොන්ත්‍රාත් ගිවිසුම 2014.02.21 දින අවලංගු කරන ලදී. මෙම වැඩ බිමෙහි ඉතිරි වැඩ කටයුතු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත 2017.05.31 වන දින පවරා ඇති අතර, උපදේශක ආයතනය වශයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය කටයුතු කරයි.

(iii) මෙම ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කර ඇති 03, 04, 05 සහ 06 වන මහල් දැනටමත් රෝගී සත්කාර සේවා වෙනුවෙන් යොදවා ඇති අතර, 2022.01.31 දින වන විට කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන් අවසන් කර භාර දීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව එකඟ වී ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය කියපු ආකාරයට 2006දී පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2014දී තමයි අවලංගු කරන්නේ. එතකොට අවුරුදු 8ක් තිස්සේ ඒ ආයතනයට ඒ කටයුත්ත කර ගන්න බැරි වෙලා තිබෙනවා. දැන් උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම බඩු මිල වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම බාස් ගාස්තුත් වැඩිවෙලා තිබෙනවා. මේ හරහා රෝහලට විශාල පාඩුවක් සිදු වෙලා තිබෙනවා. එතකොට ඒ ආයතනය නිකම්ම agreement එක cancel කරලා තිබෙනවාද? නැත්නම් ඒ ගොල්ලන්ගෙන් රෝහලට වෙච්ච පාඩුව පියවා ගැනීම සඳහා යම් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ඇත්තටම 11 වතාවක් දින දීර්ඝ කිරීම් කරලා තිබෙනවා. ඒ වාගේම, කිසිම අනුමැතියක් නැතිව මුල් ඇස්තමේන්තුවට වඩා වෙනස් කිරීම් කරලා තිබෙනවා. ඇස්තමේන්තු මුදලින් පරිබාහිරව කිසිම අනුමැතියක් නැතිව තට්ටුවක් වැඩි කරන්නත්, වෙන වෙන සංශෝධන සඳහාත් කටයුතු කරලා තිබෙනවා. ඒ වැඩිපුර වැඩ කරන්න දින 500 ගණනක් ඒ කොන්ත්‍රාත්කරු අරගෙන තිබෙනවා. ඒ නිසා තමයි අවලංගු කරලා තිබෙන්නේ. ඊට පස්සේ තමයි කැබිනට් අනුමැතිය අනුව ටෙන්ඩර් කරලා දීලා තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඒ කියන්නේ, කිසිම පියවරක් අරගෙන නැහැ කියන එක. කමක් නැහැ.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ස්තුතියි.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා පසුගිය සතියේ, විශේෂයෙන්ම සමගි ජන බලවේගයේ උද්ඝෝෂණයට දවස් දෙකකට කලින් අලුත් රෙගුලාසි වගයක් නිකුත් කළ බව ඔබතුමිය දන්නවා. එතුමාගේ රෙගුලාසිවල තිබුණු එක දෙයක් තමයි, ක්‍රීඩා තරග පවත්වන්න පුළුවන්, ප්‍රේක්ෂකයන්ට තරග නැරඹීමට ඉඩ දිය නොහැකියි කියන කාරණය. සමගි ජන බලවේගය උද්ඝෝෂණය කරනකොට පොලිස්පතිතුමා චක්‍රලේඛන ගහලා හැම දිස්ත්‍රික්, පළාත් මායිම්කින්ම මගීන් 50ක් විතර රැගත් බස් එකක් එනකොට ඒවා පවා නැවැත්තුවා, එන්න දුන්නේ නැහැ. ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු පවා කිව්වා, මේ වෙලාවේ මේ උද්ඝෝෂණය කරන්න හොඳ නැහැ, මේක නවත්වා ගන්න කියලා. ක්‍රීඩා ඇමතිතුමා පවා කිව්වා, මේ වෙලාවේ උද්ඝෝෂණය කරන්න ජනතාව ඒක රාශි කිරීම තුළින් කොවිඩ් වසංගතය පැතිරෙන්න පුළුවන් කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ නිර්දේශවලට පටහැනිව පසුගිය සිකුරාදා කොළඹ Racecourse ක්‍රීඩාංගණයේදී මහින්ද රාජපක්ෂ කුසලාන පාපන්දු තරගාවලියේ අවසාන තරගය පැවැත්වූවා.

ඒකට 5,000ක් විතර ප්‍රේක්ෂකයන් සහභාගි වුණා. ඒ තරගයට රුපියල් 1,000ක රුපියල් 100ක ටිකට් පවා වික්කා. කුරුඳුවත්ත පොලීසිය ඉස්සරහ තමයි ඒ match එක පැවැත්වූයේ. ඒ තරගය වෙනුවෙන් ඒ කියපු රෙගුලාසි එකක්වත් ක්‍රියාත්මක වුණේත් නැහැ. අද ගාල්ලේ ජාත්‍යන්තර ක්‍රිකට් තරගයක් පැවැත්වෙනවා, බටහිර ඉන්දීය කොදෙව් පිලයි, ශ්‍රී ලංකා පිලයි අතර. ඒ තරගය නැරඹීමට ප්‍රේක්ෂකයන්ට අවස්ථාව ලබාදීලා නැහැ. මම ඔබතුමියගෙන් අහනවා, ඇයි මේ නීති දෙකක්? මහින්ද රාජපක්ෂ කුසලාන තරගය බලන්න ප්‍රේක්ෂකයන්ට අවසර දෙන්න පුළුවන් නම්, ගාල්ලේ පවත්වන බටහිර ඉන්දීය කොදෙව් පිලයි, ශ්‍රී ලංකාවයි අතර පැවැත්වෙන මයිකල් තිසේරා කුසලානයි, සර් ගාර්ෆීල්ඩ් සෝබර්ස් කුසලානයයි බලන්න අවසර දෙන්න ඕනෑ. ඇයි, මේ අවසරය නොදෙන්නේ? ගාල්ලේ තරගයත් "රාජපක්ෂ කුසලානය" කියලා ගැහුවා නම්, සමහර විට අවසර දෙන්න ඉඩ තිබුණා නේද කියන කාරණය මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු කථානායකතුමනි, ඒ අතුරු ප්‍රශ්නය මුල් ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අදාළ නැත්තේ ඇයි? මේක සෞඛ්‍යය සම්බන්ධ ප්‍රශ්නයක් නේ.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ කළුබෝවිල රෝහලේ ගොඩනැගිල්ලක් සම්බන්ධව නේ. ඒකට අදාළ අතුරු ප්‍රශ්නයක් අහන්න. එතකොට මම උත්තර දෙන්නම්.

## මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් නිධිය: විස්තර
### மன்னார் வடிநில எண்ணெய்ப் படிவு: விபரம்
### PETROLEUM DEPOSIT IN MANNAR BASIN: DETAILS

313/2020

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මන්නාරම් ද්‍රෝණිය අසළ විශාල ඛනිජ තෙල් නිධියක් පවතින බවට සනාථ කර ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම නිධිය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පර්යේෂණ කිරීම සඳහා භාර දෙන ලද ආයතනවල හා සංවිධානවල නම් කවරේද;

(iv) අදාළ පර්යේෂණ කිරීම සඳහා මේ වනතෙක් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ඛනිජ තෙල් සහ ගෑස් නිධියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා මේ වනතෙක් අමාත්‍යාංශය විසින් ගනු ලැබූ සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) மன்னார் வடிநிலத்திற்கு அருகாமையில் பாரிய எண்ணெய்ப் படிவு காணப்படுகின்றமை உறுதி செய்யப்பட்ட வருடம் யாது;

(ii) மேற்படி படிவு தொடர்பில் ஆராய்ச்சி நடவடிக் கைகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாது;

(iii) மேற்படி ஆராய்ச்சிகளை மேற்கொள்வதற்காகக் கையளிக்கப்பட்டுள்ள நிறுவனங்கள் மற்றும் அமைப்புக்களின் பெயர்கள் யாவை;

(iv) மேற்படி ஆராய்ச்சிகளை மேற்கொள்வதற்காக இதுவரையில் செலவிடப்பட்டுள்ள நிதித்தொகை யாது;

(v) மேற்படி கனிய எண்ணெய் மற்றும் எரிவாயுப் படிவுகளிலிருந்து உச்ச பயனைப் பெற்றுக் கொள்வது தொடர்பில் இதுவரையில் அமைச்சினால் மேற்கொள்ளப்பட்டுள்ள மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் வெவ்வேறாக யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the year in which it was confirmed that there is a huge petroleum deposit near Mannar Basin;

(ii) the date on which it was commenced to conduct researches in regard to that deposit;

(iii) the names of the institutions and organizations to which the task of conducting the aforesaid researches was assigned;

(iv) the amount that has been spent by now for conducting the aforesaid researches; and

(v) the courses of action that have been taken up to now and will be taken in the future in regard to making maximum use of the aforesaid petroleum and gas deposit, separately?

(b) If not, why?

**ගරු උදය ගම්මන්පිල මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு உதய கம்மன்பில - வலுசக்தி அமைச்சர்)
(The Hon. Udaya Gammanpila - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2011 වර්ෂයේ.

(ii) 2008 ජූලි 07වන දා මන්නාරම් ද්‍රෝණියේ M2 බිම් කොටස සඳහා ඛනිජ තෙල් සම්පත් ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ කෙයාර්න් ඉන්දියා සමාගමට පූර්ණ අයිතිය හිමි අනුබද්ධ සමාගමක් වන කෙයාර්න් ලංකා (පුද්ගලික) සමාගම (Cairn Lanka (Pvt.) Ltd. ) අතර අත්සන් කරනු ලැබිය. ඊට අනුකූලව 2009 වසරේදී ගවේෂණ වැඩසටහන ආරම්භ කරන ලදී.

(iii) 1. කෙයාර්න් ලංකා (පුද්.) සමාගම.

2. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය.

මේ වන විට එය ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය ලෙස හඳුන්වනවා.

(iv) ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 231කි. (සම්පූර්ණ වියදම ආයෝජකයා විසින් දරන ලදී.)

(v) 1. මේ වනතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග. මේ සම්බන්ධ දීර්ඝ විස්තරයක් තිබෙනවා.

1.1. 2013 සහ 2015 අතර කාලය තුළ ගෑස් සොයා ගැනීම් දෙක වාණිජකරණය සම්බන්ධයෙන් කෙයාන් ලංකා (පුද්ගලික) සමාගම සමඟ සාකච්ඡා කරන ලදී. කෙසේ වෙතත්, මෙම සාකච්ඡා අවසන්වීමට පෙර 2015 ඔක්තෝබර් මාසයේ දී කෙයාන් ලංකා (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකාව ඇතුළු සියලු විදේශ මෙහෙයුම්වලින් ඉවත් විය.

1.2. 2012 දී අමාත්‍ය මණ්ඩලය විසින් ස්වාභාවික වායු සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අළෙවි ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම අනුමත කරන ලද අතර, ඊට අනුගතව 2019 ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර ලංසු වටයක් පැවැත්විය. කෙසේ වෙතත්, මෙමඟින් ගැඹුරු ජලයේ මෙහෙයුම් පිළිබඳ මනා පළපුරුද්දක් සහිත, සුදුසු ක්‍රියාකරුවන් ආකර්ෂණය කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් එම ලංසුව තවදුරටත් ඉදිරියට ගෙන නොයෑමට ඇමති මණ්ඩලය තීරණය කළේය.

1.3. ප්‍රතිපත්ති, නීති, මූල්‍ය හා නියාමන රාමුවල පවතින දිගු කාලීන අඩුපාඩු නිවැරදි කරන තුරු නැවත ලංසු කැඳවීම නොකිරීමට ද ඇමති මණ්ඩලය තීරණය කළේය. එවැනි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අතර, පහත සඳහන් දෑ වැදගත් වේ.

1.3.1. ස්වාභාවික වායු ක්ෂේත්‍රය සඳහා නිර්වචනය සහ තිරසරභාවය සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම. (2020 ඔක්තෝබර් මාසයේ දී ගැසට් කරන ලදී.)

1.3.2. ශ්‍රී ලංකාවේ නව ඛනිජ තෙල් සම්පත් ගවේෂණ බිම් කොටස් සිතියම කෙටුම්පත් කිරීම, නවතම කර්මාන්ත දැක්ම ස්ථාපනය කිරීම සහ කුඩා කොටස අර්පණය කිරීම තුළින් ආයෝජන අවදානම අඩු කිරීම. (2021 ජූලි මාසයේ දී ගැසට් කරන ලදී.)

1.3.3. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, නියාමනය සැපයීම සහ මෙහෙයුම් සිදු කිරීම මෙන්ම අනාගත ආයෝජකයන් සම්බන්ධ කර ගැනීම සඳහා වඩාත් නම්‍යශීලි ගිවිසුම් කොන්දේසි මාලාවක් ලබා දීම සඳහා ස්ථාවර සහ ස්වාධීන ආයතන ස්ථාපනය කිරීමට නව ඛනිජ තෙල් සම්පත් පනතක් කෙටුම්පත් කිරීම. (2021 නව ඛනිජ තෙල් පනත, 2021 ඔක්තෝබර් මස මුලදී පාර්ලිමේන්තු විවාදයට ගැනීමට නියමිතය.)

2. ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග

2.1. M2 බිම් කොටසෙහි ඩොරාඩෝ ගවේෂණ ළිඳෙහි ස්වාභාවික වායු සම්පත් සංවර්ධනය වේගවත් කිරීම සඳහා ශක්‍ය විකල්ප සකස් කිරීමට ක්ෂේත්‍රයේ පළපුරුදු උපදේශකයෙකුගේ සේවය ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ලබා ගෙන ඇත.

2.2. ප්‍රමුඛතම ඛනිජ තෙල් හා ස්වාභාවික වායු සේවා සමාගමක් වන Schlumberger, කෙටි කාලයක් තුළදී ඔවුන්ගේ නිපුණතාව සහ කර්මාන්ත ප්‍රමුඛ මෘදුකාංග උපයෝගී කර ගනිමින් M2 බිම් කොටසෙහි ඛනිජ තෙල් දත්ත නැවත සැකසීම ආරම්භ කිරීමට නියමිතය. මෙම කාර්යය බහු සේවාදායක අළෙවිකරණය සහ බලපත්‍ර පදනම මත සිදු කෙරෙන අතර, එම නිසා ශ්‍රී ලංකා රජයට කිසිදු වියදමක් දැරීමට සිදු නොවේ.

[ගරු උදය ගම්මන්පිල මහතා]

2.3. 2021 අග භාගයේ සිට ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය දිගු කාලීන ගවේෂණ වැඩසටහනක් දියත් කිරීමට නියමිතය. බිම් කොටස් අර්පණය කිරීමේ කිරීමේ නව උපායමාර්ගය යටතේ M2 බිම් කොටස ඇතුළු සියලු අක්වෙරළ ගවේෂණ බිම් කොටස් සඳහා පළපුරුද්දක් ඇති හා දක්ෂ ක්‍රියාකරුවන් කිහිප දෙනෙකු ආකර්ෂණය කර ගැනීම එහි අරමුණයි.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු අමාත්‍යතුමනි, පිළිතුරු ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා දීර්ඝ විස්තරයක් තිබෙනවාය කියපු කොටසේ විශේෂයෙන්ම අපට වැදගත් වන කාරණා ටික තිබෙනවා කියලා මම හිතනවා. අපි ඒ පිළිබඳව දන්නවා. ගරු ඇමතිතුමනි, මේ රටේ අනාගතය වෙනුවෙන්, මේ තිබෙන සම්පත පිළිබඳ වටිනාකම් පිළිබඳ අපට නොතේරෙනවා නොවෙයි. ඒක ඉතා වැදගත්. ඒ නිසා ඔබතුමා මේ පාර්ලිමේන්තුවට යම් පනතක් ගෙනැල්ලා මේ සම්බන්ධ අයිතිවාසිකම් පිළිබඳ, මේ ක්‍රියාදාමය පිළිබඳ වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කිව්වා. ඒ මොහොත, අපට ලෝකයේ දියුණු වී තිබෙන රටවල ඒ ඒ ජනතාව භුක්ති විඳින සමාජයීය, දේශපාලන පරිසරය පිළිබඳ හිතන්නට අවස්ථාවක් වුණා.

කෙසේ වෙතත්, මම දකින කාරණය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා යම් උත්සාහයක යෙදෙනවා. ඒ සියලු දේට බාධා තිබෙන බව පෙනෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ අවුරුද්දේ හත්වැනි මාසයේ අටවැනි දා මම අහපු ප්‍රශ්නය. මම එදා ඇමතිතුමාගෙන් අහපු කාරණය හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ, යුගදනවි බලාගාරය ගැන. මම උදාහරණයක් කියන්නේ. ඒක කිසි විටෙකත් කාටවත් දෙන්නේ නැහැ කිව්වාට අද දීලා තිබෙනවා. ඔබතුමන්ලාත් ඒ සම්බන්ධයෙන් නඩු මහට යන බව කියනවා. ඔබතුමා කොතෙක් පනත් කෙටුම්පත් අනුමත කර ගත්තත් ඔබතුමා කරපු වැරැද්ද සහ ඔබතුමාගේ ආණ්ඩුව කරපු වැරැද්ද නිසා මේ කියන කාරණයේ යහපත්භාවය, ගුණාත්මකභාවය සහ අනාගතය පිළිබඳව සිහින දකින අපි සහ අපේ අනාගතය බරපතළ විපතක තිබෙනවා. ඒ වැරැද්ද තමයි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 17වන වගන්තියට අත එසවීම. ගරු ඇමතිතුමනි, ඒකේ බලපෑම තමයි එදා ඔබතුමාට හරස් වෙලා, අද ඔබතුමා ආණ්ඩුවේ ඉඳගෙනත් නඩු මහට යන්නට වෙලා තිබෙන්නේ. ඒ කැණීම් කරලා තෙල් ටික අරගෙන අපේ රටට ප්‍රයෝජනයට ගැනීම සඳහා ඔබතුමා කොච්චර වීර්යය දැරුවත්, උත්සාහ කළත් බාහිර බලපෑමක් තුළ - විශේෂයෙන් ඇමෙරිකාවේ බලපෑම තුළ- ඒ සම්පත ඔබතුමාට සහ අප රටට අහිමි වීම පිළිබඳ අවිනිශ්චිතතාවක් තිබෙනවා. ඒ අවිනිශ්චිතතාව වළක්වා ගැනීම වෙනුවෙන් සාධාරණ වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලා අරගෙන තිබෙනවාද? ඔබතුමන්ලා යම් වැඩ පිළිවෙළක් අරගෙන තිබෙනවා. නමුත් විසිවන සංශෝධනයේ 17වන වගන්තිය අනුමත වීම තුළ බලපෑමක් වුණා. සමහර දේවල් රු. 12ට අත්සන් කරලා දුන්නා. තවම ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේ යම් පීඩනයකින් ගලවා ගැනීම සඳහා, එම 17වන වගන්තිය අහෝසි කරලා, රටේ සම්පත් රටට උරුම වන, රටින් බැහැර නොවන විධියේ වගකීමක් සහිත යම් වැඩ පිළිවෙළක් හදන්න ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු කථානායකතුමනි, ජූලි මාසයේ 8වැනි දා මෙතුමා මගෙන් සහතිකයක් ඉල්ලුවේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පෞද්ගලීකරණය කරනවාද, නැද්ද කියන එකටයි. මම කිව්වා, මම ඇමති ධුරයේ සිටින තුරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පෞද්ගලීකරණය කරන්නේත් නැහැ; කරන්න ඉඩ තබන්නේත් නැහැ කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, කරන්නේ නැහැ නොවෙයි. විශේෂයෙන්ම තානාපතිතුමාගේ බලපෑම කෝටි- *[බාධා කිරීමක්]*

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ඔව්, මට මතකයි. ඔය ඊට කලින් දවසේ ඔබතුමා අහපු ප්‍රශ්නය. ඔබතුමා එක ළඟ ප්‍රශ්න කීපයක් ඇහුවා නේ. මට දවස මාරු වුණා.

ගරු කථානායකතුමනි, යුගදනවි විදුලි බලාගාරය බලශක්ති අමාත්‍යාංශයට නොවෙයි අයත් වෙන්නේ. එය මම නැවත වතාවක් අවධාරණය කරනවා. මම නමින් බලශක්ති ඇමති වුණාට අපේ ආකෘතිය තුළ 'විදුලිබල' කියලා වෙනම අමාත්‍යාංශයක් තිබෙනවා; වෙනම කැබිනට් අමාත්‍යාංශයක් තිබෙනවා. ඒ නිසා විදුලි බලාගාර පිළිබඳ විෂයය මට අයත් වෙන්නේ නැහැ. නමුත්, අමාත්‍ය මණ්ඩල සාමාජිකයෙක් විධියට අපි අමාත්‍ය මණ්ඩලය තුළදීත් සංවාද කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතක් කළා වාගේ මේ ආණ්ඩුවේ ඇමතිවරු තුන්දෙනෙක් උසාවියට නීතිපතිතුමා වෙනුවට පෞද්ගලික නීතිඥයෙකු මාර්ගයෙන් කරුණු දැක්වීම කෙතරම් සදාචාර සම්පන්නද කියන ප්‍රශ්නය මතු වෙන්න පුළුවන්. අපි ඇමතිවරු විධියට ආණ්ඩුව තුළ සාමූහික වගකීමෙන් බැඳිලා ඉන්නවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ නිසා තමයි අමාත්‍ය මණ්ඩල තීරණයක් සම්බන්ධයෙන් ඉතිහාසය පුරාම නීතිපතිවරයා සමස්ත අමාත්‍ය මණ්ඩලය වෙනුවෙන්ම පෙනී සිටියේ. මෙම කාරණයේදී ඒකට යුගදනවි ප්‍රශ්නය කියනවාට වඩා මම කැමැතියි, New Fortress Energy ප්‍රශ්නය කියලා කියන්න. එතැන ඊට වඩා ලොකු කතන්දරයක් තිබෙනවා. ස්වාභාවික වායු සැපයීමේ ඒකාධිකාරිය එම සමාගමට හිමි වන ආකාරයේ තීන්දුව ගැනීමේදී, අමාත්‍ය මණ්ඩලය තීන්දුව ගත්තාය කියන ආකාරය පිළිබඳවත්, ඒ තීන්දුව පිළිබඳවත්, ගත්ත ආකාරය සහ තීන්දුව කියන දෙකම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ බහුතරයේ මතයත්, විමල් වීරවංශ ඇමතිතුමා, වාසුදේව නානායක්කාර ඇමතිතුමා සහ මම දරන මතයත් අතර පරස්පරයක් තිබෙනවා. ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ සංවාදයක් නොවුණ නිසා, අපි රට ඉදිරියට ඇවිල්ලා ඒ කාරණය ගැන කථා කළා. ශ්‍රේෂ්ඨාධිකරණය පවා පිළිගෙන තිබෙනවා, අමාත්‍ය මණ්ඩලය තුළ සංවාදයක් නොවුණොත්, ඒ පිළිබඳ එළියට ඇවිල්ලා අමාත්‍යවරුන්ට කථා කරන්න පුළුවන් කියලා. පරස්පරයක් තිබෙන නිසා තමයි අපි, අපේ නීතිඥයෙක් හරහා වෙනම උසාවියේ කරුණු දක්වන්න තීරණය කළේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, මම ඇහුවේ ඒකත් නැති වෙයිද, ඒකට මොනවා හරි පිළියමක් තිබෙනවාද කියලායි.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු කථානායකතුමනි, බොහෝ අප්‍රිකානු රටවල, ලතින් ඇමෙරිකානු රටවල ඛනිජ තෙල් සොයා ගත්තාට පසුව ධනවත් වුණේ ඒ රට නොවෙයි. රටේ දේශපාලනඥයන් සහ නිලධාරින් අතළොස්සක් තමයි ධනවත් වුණේ. එවැනි දේවල් වැළැක්වීමට අවශ්‍ය නීතිමය විධිවිධාන ඛනිජතෙල් සම්පත් පනත තුළ ගැබ් වෙලා තිබෙනවාය කියලා පනත් කෙටුම්පත සම්මත කළ දවසේ මම පනත විස්තර කරමින් පැහැදිලි කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ හැන්සාඩ් වාර්තාව කියවා බලන්න. ඔබතුමා කියන අවදානම සියයට සියයක් නැති කරන්න අපට බැහැ. නමුත් ඒවා අවම කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි එහි ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම රටේ ජනතාව අවදියෙන් සිටිමින් අනාගතයේදී එවැනි ප්‍රශ්නවලදී කටයුතු කරාවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරයෙක්. කැබිනට් මණ්ඩලයේ සාමාජික, අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මැතිතුමා ඊයේ ඔබතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව ප්‍රකාශයක් කරනවා අපි දැක්කා. එතුමා මේ රටේ තෙල් අර්බුදය ගැන අමුතුම ආකාරයේ විග්‍රහයක් කළා. මම දැකපු විධියට එය ඔබතුමාගේ විග්‍රහයට පරස්පරයි. සපුගස්කන්ද බොරතෙල් පිරිපහදු මධ්‍යස්ථානය වසා දැමීම හරහා රටට ලාභයක් එනවා වාගේ කථාවක් තමයි එතුමා කිව්වේ. පිරිපහදු කළ නිමි තෙල් ආනයනය කිරීම වඩා ලාභයි කියලා තමයි එතුමා කිව්වේ. ඒක තේරෙන්නේ නැත්තේ හරක්ට කියලා එතුමා කිව්වා. මම දන්නේ නැහැ, එතුමා එහෙම කිව්වේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන්ටද, රටේ පුරවැසියන්ටද කියලා.

එම නිසා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් අහනවා, ඒ ජාතියේ අය එක් කෙනෙකු හෝ දෙදෙනකු කැබිනට් මණ්ඩලය තුළ ඉන්නවාද කියලා. මේ රටට වග කියන ගරු රමේෂ් පතිරණ මැතිතුමා වැනි වෛද්‍යවරුන්, ඔබතුමා වැනි නීතිඥවරුන් වැනි වැදගත් පිරිසක් අතර එහෙම ජාතියේ අයත් ඉන්නවාද කියලා මා දන්නේ නැහැ. රටේ මිනිසුන්ට එහෙම කිව්වා නම් මා ඒ පැත්තෙන් කථා කරනවා.

ගරු ඇමතිතුමනි, ඉන්ධන පිළිබඳ අර්බුදයක් මේ රටේ නිර්මාණය වෙනවා කියා මහා කතිකාවක් තිබෙනවා. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි ඩොලර් කථාව පැත්තකින් තියමු. මොකද, එය මේ රටේ කවුරුත් දන්නා කාරණයක්. ඒ පිළිබඳව ඔබතුමා කියා තිබෙනවා. නමුත්, ඉන්ධන පිළිබඳ කාරණයේදී මේ වන විට තිබෙන සංචිත කොපමණ කාලයකට ප්‍රමාණවත්ද, නිමි තෙල් මේ රටට පැමිණීම ඉදිරියේදී ක්‍රියාත්මක වෙනවාද, කුමන හෝ ආකාරයකින් මේ රටේ ඉන්ධන හිඟයක් නිර්මාණය නොවෙනවාය කියන කාල සීමාවක් සහතික කරන්න පුළුවන්ද කියන කාරණාවලට මම ඔබතුමාගෙන් පිළිතුරු දැනගන්න කැමැතියි.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු කථානායකතුමනි, මේ මොහොතේ ජනතාවට ඉතාම සංවේදී ප්‍රශ්නයක් ඇසීම පිළිබඳව එතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමා යම් අනවබෝධයකින් ඒ කාරණය ප්‍රකාශ කරන්න ඇති. මොකද, බොර තෙල් පිරිපහදු කරලා අපේ රටේ ඉන්ධන නිපදවා ගැනීම අවාසි නම්, අපේ තෙල් පිරිපහදුව වසා දැමිය යුත්තේ තාවකාලිකව නොවෙයි, සදාකාලිකවයි. පිරිපහදු කරන එක පාඩුයි නම් තවදුරටත් පිරිපහදු කරලා වැඩක් නැහැ. අපි කිව්වේ, මේ මොහොතේ අපේ රටට බොර තෙල් ගෙනැවිත් පිරිපහදු කරනවාට වඩා සෘජුවම පෙට්‍රල් සහ ඩීසල් මිලදී ගැනීම සීමිත විදේශ විනිමය කළමනාකරණයේදී වාසියි කියලායි. කොහොමද ඒක වෙන්නේ? ගරු කථානායකතුමනි, අපේ තෙල් පිරිපහදුව වසර 51ක් පරණයි. මේ තෙල් පිරිපහදුවේ සියයට 37ක්ම හැදෙන්නේ නැප්තා සහ දැවිතෙල්. දැවි තෙල් කියන්නේ furnace oilවලටයි. එතකොට සියයට 43යි හැදෙන්නේ, පෙට්‍රල් සහ ඩීසල්.

මේ දිනවල දැවැන්ත වර්ෂාවක් තිබෙන නිසා විදුලිබල මණ්ඩලය අපට දැනුම්දීලා තිබෙනවා, "ජල විදුලියෙන් තමයි සියයට 50ක් ඉක්මවලා නිපදවන්නේ, මේ අවස්ථාවේ දැවි තෙල් අවශ්‍ය වන්නේ නැහැ" කියලා. 15වෙනි දා අපි පිරිපහදුව වහන විටත්, පිරිපහදුවේ දැවි තෙල් මෙට්‍රික්ටොන් 13,500ක් තිබුණා. අපේ සියලු ගබඩාවල දැවි තෙල් මෙට්‍රික්ටොන් 79,000ක් තිබෙනවා. මේ මොහොතේ අපේ රටේ විදේශ විනිමය අර්බුදයක් තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ ටික රට ඇතුළට ගේන්න බැරිවීම නිසා වරින් වර කිරි පිටි හිඟය, ගෑස් හිඟය, සීනි හිඟය, සිමෙන්ති හිඟය ඇති වෙනවා. ඒ අතරේ අපි ඩොලර්වලින් සියයට 37ක් වැය කරලා බොර තෙල් ගෙනැල්ලා පාවිච්චි නොකර තෙල් ටැංකිවල දාලා තිබෙනවා. එතකොට සීමිත විදේශ විනිමය කළමනාකරණයේදී ඒ තීරණය එතරම් ප්‍රඥාගෝචර වෙන්නේ නැහැ. අපට මේ විදේශ විනිමය අර්බුදය විසඳා ගන්න බැරි වුණොත් "බොහෝ විට බොර තෙල් ආනයනය නතර කරන්න සිදු වේවි, සපුගස්කන්ද තෙල් පිරිපහදුව වහන්න වේවි" කියලා මම කිව්වේ සැප්තැම්බර් මාසයේ 29වෙනි දා. ඒක මේ හදිසියේ වෙච්ච දෙයක් නොවෙයි. ඒ කථාව මාධ්‍යවල වාර්තා වුණා. සැප්තැම්බර් 29වෙනි දා මා පැවැත්වූ මාධ්‍ය හමුවේ සම්පූර්ණ කථාව සමාජ මාධ්‍යවල තිබෙනවා. එහිදී මම පැහැදිලිව කිව්වා, "නුදුරු දිනෙක මේක වහන්න වේවි, විදේශ විනිමය අර්බුදය නුදුරු අනාගතයේදී විසඳා ගන්න බැරි වුණොත්" කියලා.

ඇයි අපි එහෙම කියන්නේ? ගරු කථානායකතුමනි, මට මේ කාරණාව පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. රටම බලන් ඉන්න, වැදගත් ප්‍රශ්නයක් එතුමා මතු කළේ. බොර තෙල් බැරලයක් ගන්න අපි ඩොලර් 85ක් වැය කරනවා. පෙට්‍රල් නම් ඩොලර් 95යි, ඩීසල් නම් ඩොලර් 93යි. බොර තෙල් බැරලයකින් පෙට්‍රල් සහ ඩීසල් හැදෙන්නේ සියයට 43යි නම්, -ඩීසල් සියයට 30ක් සහ පෙට්‍රල් සියයට 13ක් විධියට.- 100, 43න් බෙදුවාම එන පිළිතුර අනුව, අපි බොර තෙල් බැරල් 2.32ක් ආනයනය කරන්න ඕනෑ පෙට්‍රල් සහ ඩීසල් බැරලයක් හදා ගන්නට. 13ට, 30 අනුපාතයට හදලා ගත්තාම පෙට්‍රල් සහ ඩීසල්වලින් බැරලයක් හදා ගන්න අපට යනවා ඩොලර් 93.75ක්.

හැබැයි, අපි ඒ ප්‍රමාණය හදාගන්න බොරතෙල් ගේන්න ඩොලර් 197ක් වැය කරනවා. ඒ මුදල, දෙගුණයකටත් වඩා වැඩියි. ඒ නිසා තමයි ටැංකිවල ගොඩ ගහලා තිබෙන දැවි තෙල් සකස් කරගන්න අවශ්‍ය වන, පෙට්‍රල් සහ ඩීසල් සියයට 43ක් පමණක් හැදෙන බොරතෙල් ගේනවා වෙනුවට සෘජුව ආනයනය කිරීම විදේශ විනිමය කළමනාකරණයේදී වාසියි කියන කාරණය අපි ගණන් හදලා, විග්‍රහ කරලා පෙන්නුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -506/2020- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 4 -1735/2021- (1), ගරු ගුණතිලක රාජපක්ෂ මහතා.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1794/2021- (1), ගරු රෝහණ දිසානායක මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති: කුරුණෑගල දිස්ත්‍රික්කය
## சமுதாய நீர்வழங்கல் கருத்திட்டங்கள்: குருநாகல் மாவட்டம்
## COMMUNITY-BASED WATER SUPPLY PROJECTS: KURUNEGALA DISTRICT

506/2020

**3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக )
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Thushara Indunil Amarasena)
ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගම්මාන අතරින් පිරිසිදු පානීය ජලය සපයා ගැනීමේ ගැටලුවට මුහුණ දී ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;
(ii) එම දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ක්‍රියාත්මක වන ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;
(iii) ඒවායේ නම් කවරේද;
(iv) ඉහත සඳහන් එක් එක් ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ගම්මාන සංඛ්‍යාව හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත සඳහන් ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘතිවල පවතින ධාරිතාවය තවදුරටත් වැඩි කිරීමට ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்திலுள்ள கிராமங்களில் சுத்தமான குடிநீரைப் பெற்றுக்கொள்ளும் பிரச்சினையை எதிர்கொண்டுள்ள கிராமங்களின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) அந்த மாவட்டத்தில் தற்போது நடைமுறையிலுள்ள சமுதாய நீர்வழங்கல் கருத்திட்டங்களின் எண்ணிக்கை யாது என்பதையும்;
(iii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;
(iv) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தின்மூலம் உள்ளடக்கப்படும் கிராமங்களின் மற்றும் குடும்ப அலகுகளின் எண்ணிக்கை தனித்தனியாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) மேற்படி சமுதாய நீர்வழங்கல் திட்டங்களில் காணப்படுகின்ற இயலளவை மேலும் அதிகரித்துக்கொள்ள எடுக்கப்படும் நடவடிக்கை யாதென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply:

(a) Will he inform this House -
(i) out of the villages in Kurunegala District, the number of villages that are faced with the problem of finding clean drinking water; and
(ii) the number of community-based water supply projects in operation in that district at present;
(iii) their names; and
(iv) the number of villages and families that are covered by each of the above projects, separately?

(b) Will he also inform this House of the steps that will be taken to expand the capacity of the above-mentioned community-based water supply projects further?

(c) If not, why?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගම්මාන අතරින් පිරිසිදු පානීය ජලය සපයා ගැනීමේ ගැටලුවට මුහුණ දී ඇති ගම්මාන සංඛ්‍යාව 293කි. (ඇමුණුම 01හි** දක්වා ඇත.)

(ii) එම දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ක්‍රියාත්මක වන ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව 415කි. දිස්ත්‍රික්කය තුළ දැනට ඉදිවෙමින් පවතින ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව 30කි.

(iii) එම ජල ව්‍යාපෘතිවල නම් අමුණුම් අංක 02** සහ 03හි ** දක්වා ඇත.

(iv) ඉහත සඳහන් ව්‍යාපෘති මඟින් ආවරණය වන ගම්මාන සහ පවුල් සංඛ්‍යාවද ඇමුණුම් අංක 02 සහ 03 හි දක්වා ඇත.

(ආ) මෙම ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘතිවල පවතින ධාරිතාව තවදුරටත් වැඩි කිරීම සඳහා පහත සඳහන් පියවර මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතී.

- නව ජල මූලාශ්‍ර ලබා දීම (නළ ළිං සහ නොගැඹුරු ළිං ඉදිකිරීම)
- ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිවල පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම.

1. ගබඩා ටැංකි ඉදිකිරීම
2. නව ජල දිගු ලබාදීම
3. පිරිපහදු පද්ධති ලබාදීම
4. වැසි ජල ටැංකි ලබාදීම
5. ජල පොම්ප ලබා දීම
6. විදුලි පහසුකම් සැපයීම

මෙම නව ජල මූලාශ්‍ර ලබා දීම සහ පුනරුත්ථාපන කටයුතු සිදු කරන ව්‍යාපෘති සහ ආවරණය වන ගම්මාන ඇමුණුම 04හි** දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

## රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අනුබද්ධ කෘෂි විද්‍යා පීඨ: විස්තර

## அரச பல்கலைக்கழகங்களுடன் இணைந்த விவசாய பீடங்கள்: விபரம்

## AGRICULTURE FACULTIES AFFILIATED TO STATE UNIVERSITIES: DETAILS

1794/2021

**5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු රෝහණ දිසානායක මහතා වෙනුවට)**

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு றோஹண திஸாநாயக்க சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Rohana Dissanayaka)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවලට අනුබද්ධව ස්ථාපිත කර ඇති කෘෂි විද්‍යා පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) එම කෘෂි විද්‍යා පීඨ ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාලවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කෘෂිකර්මාන්තය සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාලයක් තිබේද;

(ii) නොඑසේ නම්, කෘෂිකර්මාන්තය සඳහා වෙන් වූ විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදහස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

*** පුස්තකාලයේ තබා ඇත.*

*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

*** Placed in the Library.*

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அரச பல்கலைக்கழகங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அப்பல்கலைக்கழகங்களுடன் இணைந்ததாக அமைக்கப்பட்டுள்ள விவசாய பீடங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அவ்விவசாய பீடங்கள் அமைக்கப்பட்டுள்ள பல்கலைக்கழகங்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) (i) விவசாயத்திற்கென ஒதுக்கப்பட்ட பல்கலைக் கழகமொன்று உள்ளதா என்பதையும்;

(ii) இன்றேல், விவசாயத்திற்கென ஒதுக்கப்பட்ட பல்கலைக்கழகமொன்றை அமைப்பதற்கு எதிர் பார்க்கப்படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minster of Education:

(a) Will he inform this House -

(i) the number of State universities in Sri Lanka;

(ii) the number of agriculture faculties affiliated to the aforesaid universities; and

(iii) the names of the universities in which the aforesaid agriculture faculties are established?

(b) Will he also inform this House -

(i) whether there is a university dedicated for agriculture; and

(ii) if not, whether it is intended to establish a university dedicated for agriculture?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)

(The Hon. (Dr.) Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*

** Answer tabled:*

(අ) (i) 1978 වර්ෂයේ අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක් පිහිටුවා ඇත.

(ii) එම විශ්වවිද්‍යාලවලට අනුබද්ධව කෘෂි විද්‍යා පීඨ 09ක්, විශ්වවිද්‍යාල 08ක් තුළ පිහිටුවා ඇත.

(iii) එම කෘෂි විද්‍යා පීඨ ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාල පහත සඳහන් වේ.

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය (පීඨ 02කින් සමන්විතය)
- සබරගමුව විශ්වවිද්‍යාලය
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය
- රජරට විශ්වවිද්‍යාලය

(ආ) (i) කෘෂි කර්මාන්තය සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාලයක් නොමැත.

(ii) කෘෂි කර්මාන්තය සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදහස් කර නොමැති වුවත්, චීනයේ අරමුදල් යටතේ තොරතුරු තාක්ෂණය හා තාක්ෂණ භූමවාරුව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් කෘෂි කාර්මික හා තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවීමට අපේක්ෂා කෙරේ. පත් කරන ලද කාරක සභාව විසින් අධ්‍යයන යෝජනාවලිය මේ වනවිට අධ්‍යයනය කරමින් පවතී.

මේ පිළිබඳව චීන තානාපති කාර්යාලයත්, චීනයේ අදාළ ආයතන සමඟත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමා.

## වරප්‍රසාද: 2021.11.19 වන දින ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: 2021.11.19ஆம் திகதிய மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்னவினது கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA ON 19.11.2021

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷஷீந்திர ராஜபக்ஷ - சேதனப் பசளை உற்பத்தி மேம்பாடு மற்றும் விநியோக ஒழுங்குறுத்துகை மற்றும் நெல், தானிய வகைகள், சேதன உணவுகள், மரக்கறிகள், பழவகைகள், மிளகாய், வெங்காயம் மற்றும் உருளைக்கிழங்குச் செய்கை மேம்பாடு, விதை உற்பத்திகள் மற்றும் உயர் தொழில்நுட்ப கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Shasheendra Rajapaksa - State Minister of Promoting the Production and Regulating the Supply of Organic Fertilizer and Paddy and Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture)

ගරු කථානායකතුමනි, 2021 නොවැම්බර් මස 19 වන දින මා මේ සභා ගර්භයේ නොසිටි අවස්ථාවකදී මගේ නම සඳහන් කරමින් සමගි ජන බලවේගය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු රෝහිණී කවිරත්න මහත්මිය විසින් කරන ලද ප්‍රකාශයක් මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මාගේ වරප්‍රසාද කඩ වී ඇති බව ද, මාහට පෞද්ගලිකව අපහාසයක් සිදු වී ඇති බව ද, එකී ප්‍රකාශය මඟින් එම මන්ත්‍රීතුමිය පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත හා ස්ථාවර නියෝග 91 (ඌ) උල්ලංඝනය කොට ඇති බව ද මා විශ්වාස කරනවා.

එබැවින්, ස්ථාවර නියෝග 22 (10) යටතේ පෞද්ගලික පැහැදිලි කිරීමක් සිදු කිරීමටත්, ස්ථාවර නියෝග 22 (11) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීමටත් හා ස්ථාවර නියෝග 118 අනුව එකී වරප්‍රසාද ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමටත් මා අපේක්ෂා කරනවා. ගරු කථානායකතුමනි, මේ සඳහා අවස්ථාවක් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් ඔබතුමා වෙත ස්තුතිය පුද කරනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළත් "සෞභාග්‍යයේ දැක්ම" යටතේ රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර භාවිතයට ගොවීන් හුරු කිරීමේ ජාතික වැඩ පිළිවෙළෙහි කොටසක් වශයෙන් නැනෝ නයිට්‍රජන් දියර පොහොර ඉන්දියාවෙන් ආනයනය කොට දේශීය ගොවීන් වෙත පොහොර සහනාධාරය වෙනුවට නොමිලේ ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන බව මෙම ගරු සභාව මේ වන විටත් දන්නා කරුණකි. මෙම නැනෝ නයිට්‍රජන් දියර පොහොර ඉන්දියාවෙන් ආනයනය කිරීමේ ක්‍රියාවලිය හා බෙදා හැරීම සිදු කරනු ලබන්නේ, පූර්ණ රාජ්‍ය සමාගමක් වන කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - Colombo Commercial Fertilizers Ltd. - මඟිනි. එහිදී රජයේ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙකී දියර පොහොර ආනයනය කිරීම සිදු කොට ඇත. විශේෂයෙන්ම මෙම ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම සිදු කොට ඇත්තේ, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ණ අධීක්ෂණය හා නිර්දේශය සහිතවය.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ දිනවල මහත් ආන්දෝලනයකට ලක් වී තිබෙන චීන කාබනික පොහොර ගෙන්වීමේ ක්‍රියාවලිය ද සිදු කොට ඇත්තේ මේ ආකාරයටම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ද යොමු කිරීමෙන් අනතුරුව බව මා සඳහන් කරන්න කැමැතියි. රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මා මේ කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සඳහා කිසිදු දායකත්වයක්, බලපෑමක් හෝ නියම් හෝ අනියම් ආකාරයේ කිසිදු ඇඟිලි ගැසීමක් සිදුකොට නොමැති බව ද මේ අවස්ථාවේදී ඉතාම වගකීමෙන් යුතුව ප්‍රකාශ කර සිටිනවා.

මෙම නැනෝ නයිට්‍රජන් පොහොර ලංකාවට ආනයනය කළ යුනයිටඩ් ෆාමර්ස් ට්‍රස්ට් සමාගමේ - United Farmers Trust Ltd. - සභාපති වන මොහාන් පෙරේරා යන අය විසින් පසුගිය දා පවත්වන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවකදී මෙම නැනෝ නයිට්‍රජන් පොහොර ආනයනය සම්බන්ධයෙන් මා සමඟ කිසිදු සම්බන්ධතාවක් නොතිබූ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද අතර, මා එම කාරණය මේ ගරු සභාවේ අවධානයට යොමු කිරීමට කැමැතියි.

ගරු කථානායකතුමනි, පසුගිය 19 වන දින ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය විසින් මගේ නම පෞද්ගලිකවම සඳහන් කරමින් මෙම දියර පොහොර ගෙන්වීමේ ක්‍රියාවලියේදී වංචාවක් සිදු වී ඇති බවත්, ඒ සඳහා මා සම්බන්ධ වී ඇති බවත් ප්‍රකාශ කළා. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වී මා නොමැති අවස්ථාවකදී මා හිතවත් මන්ත්‍රීතුමිය විසින් කරන ලද මේ ප්‍රකාශය මම තරයේ

ප්‍රතික්ෂේප කරනවා; එය හෙළා දකිනවා. තවද, එය 91 (ඌ) ස්ථාවර නියෝගය ප්‍රධාන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීමක් ලෙස මා විශ්වාස කරනවා. එසේම ගරු මන්ත්‍රීතුමිය විසින් කරන ලද ප්‍රකාශයට මේ වනවිට විශේෂයෙන්ම "සිරස" මාධ්‍ය ජාලය ඇතුළු සමහරක් මාධ්‍ය ජාල මගින් හා සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දී තිබීම තුළින් ද මාහට පෞද්ගලික අපහාසයක් සිදු වී ඇති අතර, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත අනුව මාගේ මන්ත්‍රී වරප්‍රසාද කඩවී ඇති බව ද, එමගින් පෞද්ගලිකව මාහට අගතියක් සිදු කොට ඇති බව ද මා තරයේ විශ්වාස කරනවා.

නැනෝ නයිට්‍රජන් දියර පොහොර ගෙන්වීමේ ක්‍රියාවලියේදී කිසියම් අක්‍රමිකතාවක් සිදු වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කොට වග කිව යුත්තන්ට නීති මඟින් කටයුතු කරන ලෙස මේ වනවිටත් අප රජය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනවා. ඒ නිසා මා කාරුණිකව හා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය දන්නා තොරතුරු හා සාක්ෂි තිබෙනවා නම්, මන්ත්‍රී වරප්‍රසාද යටතේ මේ පාර්ලිමේන්තුව තුළ පෞද්ගලිකව අපහාස සිදු නොකොට නීත්‍යානුකූල පුරවැසියෙකු ලෙස එකී තොරතුරු හා සාක්ෂි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙසයි. ඒ වාගේම මෙම නැනෝ නයිට්‍රජන් පොහොර ආනයනය සම්බන්ධයෙන් මා පෞද්ගලිකව මැදිහත් වීමක් සිදු කළ බවත්, එකී ආනයන ගනුදෙනුවේදී කිසියම් වංචාවක් සිදු වී ඇති බවත්, ඒ සඳහා මා මැදිහත් වී ඇති බවත් මේ දිනවල මෙම ගරු සභාව නියෝජනය කරන සමහරක් මන්ත්‍රීවරුන් මාධ්‍යය ඉදිරියේ ප්‍රකාශ කරනවා. එසේ අසත්‍ය හා අපහාසාත්මක ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගන්නා ලෙස මේ වනවිටත් මගේ නීතිඥවරුන්ට මම උපදෙස් ලබා දී තිබෙන බව මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ වාගේම මෙම නැනෝ නයිට්‍රජන් පොහොර ගෙන්වීමේදී කිසියම් වංචාවක් සිදු වී ඇත්නම් හා ඒ පිළිබඳව තමන් තොරතුරු දන්නේ නම් මා පක්ෂ-විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටින්නේ මාධ්‍ය ඉදිරියේ වීරයන් නොවී තමන් දන්නා එකී තොරතුරු හා සාක්ෂි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙසයි.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඕනෑම සාධාරණ හා අපක්ෂපාතී පරීක්ෂණයකට මුහුණ දීමට මා සූදානම් බවත්, මේ නවවන පාර්ලිමේන්තුවට මා නවකයෙකු වුවද උපන් දා සිටම දේශපාලන පරිසරයක හැදුණු වැඩුණු මාහට මේ සියලු තනතුරු තානාන්තරවලට වඩා මෙතෙක් මා ආරක්ෂා කරගත් මගේ හොඳ නම වටිනා බවත් මේ අවස්ථාවේදී මා අවධාරණයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ, 2021 නොවැම්බර් මස 19 වන දින ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් මගේ නම සඳහන් කරමින් සිදු කරන ලද ප්‍රකාශය ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීමක් වන බැවින්, එකී ප්‍රකාශයේ මගේ නම සඳහන් කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙසත්, එමඟින් මගේ වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා මෙය ආචාරධර්ම හා වරප්‍රසාද පිළිබඳව පාර්ලිමේන්තු කාරක සභාව වෙත යොමු කරන ලෙසත්, එතුමිය වරප්‍රසාදවලට මුවා වී කරන ලද ප්‍රකාශය ප්‍රචාරය කරන ලද මාධ්‍ය ආයතන මඟින්ද මගේ පාර්ලිමේන්තු වරප්‍රසාද කඩවී ඇති බව මා විශ්වාස කරන බැවින් ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීම් කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දෙන ලෙසත්ය.

බොරු මඩ ප්‍රචාර නිවැරැදි කිරීම සඳහා මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා නැවත වතාවක් ඔබතුමාට මගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා, ගරු කථානායකතුමනි.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා.

## වරප්‍රසාද: 2021.11.19 වන දින ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා විසින් කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: 2021.11.19ஆம் திகதிய மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்தினது கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY HON. INDIKA ANURUDDHA HERATH ON 19.11.2021

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේ අවස්ථාව ලබාදුන්නාට ස්තුතියි, ගරු කථානායකතුමනි. රාජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා ඉදිරිපත් කළ සාවද්‍ය කරුණුවලට පිළිතුරු ලබා දීමට මම බලාපොරොත්තු වෙනවා.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ "සුවසැරිය" සමාරම්භක උත්සවයට පැමිණි ජනතාවට කිරි පැකට් සහ වතුර බෝතල් ලබා දීමට රුපියල් 43,200ක් වියදම් කර තිබීම වංචාවක් යැයි කියමින් එයට මා සම්බන්ධ යැයි මතයක් ප්‍රචාරය කිරීමට රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතා පසුගියදා පාර්ලිමේන්තුවේ දී උත්සාහ කළා. එය මා තරයේ ප්‍රතික්ෂේප කරන අතර, මෙම සිදුවීම මගේ කිසිදු අනුදැනුමකින් තොරව සිදුවූවක් බව මා මේ ගරු සභාවට මුලින්ම සඳහන් කරනවා. මෙය දේශපාලන වැඩසටහනක් නොවූ අතර, එයට දිස්ත්‍රික් ලේකම්වරයා, ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරින් සහ පොලිස් නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින් සහභාගි වී තිබුණා. කෙසේ වෙතත්, රාජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ කරුණුවලට පිළිතුරක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ එවකට සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිවුරුම් ප්‍රකාශ 5ක් මඟින් ලබා දී තිබෙනවා.

එහිදී ඔවුන් සඳහන් කර තිබෙන්නේ, මෙම මුදල් රජයේ මුදල් නොවන බවත්, සමිතියේ සාමාජිකයන්ගේ මුදල්වලින් මෙම වියදම සිදු කළේ සමිති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් බවත් ය. "සුවසැරිය" පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබ සාධනයට හේතු වන නිසා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට එවැනි සත්කාරයක් කිරීම සුදුසු යැයි මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ බව ඔවුන් සඳහන් කර තිබෙනවා. එසේම, පොළොන්නරුව ජනතාවගේ සුබ සාධනය සහ ආගමික වියදම් සඳහා මෙම සමිතිය මඟින් මීට වඩා මුදල් වියදම් කර තිබෙන බවත් ඔවුන් සිය දිවුරුම් ප්‍රකාශ මඟින් වැඩි දුරටත් සඳහන් කර තිබෙනවා. කෙසේ වෙතත්, මෙම සමිතියේ වර්තමාන නිලධාරි මණ්ඩලය විසින් පෝෂණ මල්ල නොමිලයේ ලබා දීමට මෙම සමිතියේ මුදල් භාවිත කර ඇතැයි අනාවරණය වන අතර, එය

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මුදල් අවභාවිත කිරීමක් නොවේදැයි මම විමසා සිටිනවා. මෙම පෝෂණ මල්ල ලබා දී තිබෙන්නේ පළාතේ දේශපාලනඥයන්ගේ නියෝගය මත බවයි අනාවරණය වෙන්නේ, ගරු කථානායකතුමනි.

මා පොළොන්නරුවේ දේශපාලනය කළා යැයි රාජ්‍ය අමාත්‍යවරයා සිදු කළ ප්‍රකාශය සම්පූර්ණ වැරැදි ප්‍රකාශයක්. පොළොන්නරුවේ දේශපාලනය කිරීමට මට කිසිදු වුවමනාවක් තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. අපි පොළොන්නරුව ජනතාවට "සුවසැරිය" ගිලන් රථ සේවය හඳුන්වා දුන්නේත්, සුළු හා මධ්‍යම පරිමාණ සහල් නිෂ්පාදකයින් සම්බන්ධ කරගෙන "ශක්ති සහල්" වැඩසටහන හඳුන්වා දුන්නේත් ජනතා සුබ සිද්ධියට විනා, පොළොන්නරුවේ දේශපාලනය කරන්න නොවෙයි කියා ජනතාව දන්නවා. නමුත්, පොළොන්නරුවේ දේශපාලනය කරන ඇතැම් දේශපාලනඥයන්ට වඩා අපි පොළොන්නරුවට සිදු කළ සේවය ගැන ඔවුන් වෛරයකින් සිටින බවත් මා දන්නවා. ඒ වාගේම, මෙම රුපියල් 43,200ක වියදම ගැන එම සමිතියේ සහ සමුපකාර සමිති සංවර්ධන දෙපාර්තමේන්තුවේ කිසිම බාහිර සහ අභ්‍යන්තර විගණනයක් මඟින් චෝදනා එල්ල වී නොමැති බව අධ්‍යක්ෂවරුන් සිය දිවුරුම් ප්‍රකාශ මඟින් සඳහන් කර තිබෙනවා. මා එම දිවුරුම් ප්‍රකාශ **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

ජනතාවගේ මුදල් කෝටි ගණන් ගසා කන සමහර දූෂිත දේශපාලනඥයන් සිටින රටක, පොළොන්නරුව ජනතාවගේ යහපත වෙනුවෙන් සිදු කළ "සුවසැරිය" ගිලන් රථ සේවය හඳුන්වා දීමේ වැඩසටහනට තුන්වැනි පාර්ශ්වයක් විසින් සිදු කළ මෙම රුපියල් 43,200ක වියදම මා විසින් සිදු කළ හොරකමක් යැයි හුවා දැක්වීමට උත්සාහ කිරීම කොතරම් බංකොලොත්, ලජ්ජාශීලී උත්සාහයක්දැයි ඕනෑම කෙනෙකුට වැටහෙනවා. ඒ පිළිබඳව මා කනගාටු වන අතර, මා කිසිම දිනක මේ රටේ ජනතාවගේ තඹ සතයක්වත් වංචා කර නොමැති බව ඉමහත් ගෞරවයෙන් සහ අභිමානයෙන් මෙම ගරු සභාවට දැනුම් දෙනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

## වරප්‍රසාද: 2021.11.20 වන දින ගරු තිසකුට්ටි ආරච්චි මහතා විසින් කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: 2021.11.20ஆம் திகதிய மாண்புமிகு திஸகுட்டி ஆரச்சியினது கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY HON. THISAKUTTI ARACHCHI ON 20.11.2021

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මා මෙම ගරු සභාවේ නොසිටි මොහොතක ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් පසුගිය 20වනදා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවීමට මට මේ අවස්ථාව ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙය, ලංකාවේ කාන්තාව ලෝකය පුරා ගෞරවයට පාත්‍ර වන අවස්ථාවක්. එහි අලුත්ම අත්දැකීම තමයි, ශ්‍රී ලාංකික නර්තන ක්ෂේත්‍රය වෙනුවෙන් සිදු කළා වූ අපරිමිත සේවාව අගයනු වස් ප්‍රවීණ නර්තන ශිල්පිනී දේශබන්දු ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය වෙත ඉන්දියානු රජයෙන් පිරිනැමුණු ඉහළම සිවිල් ගෞරව සම්මානයක් වන "පද්ම ශ්‍රී සම්මානය" ප්‍රදානය කරනු ලැබීම. අද මම මෙය අවස්ථාවක් කර ගන්නවා, සමගි ජන බලවේගය ඇතුළු සමස්ත විපක්ෂයේත්, කාන්තාවන්ට ගෞරව කරන, කාන්තාවගේ අගය දන්නා මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ හා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ගෞරවය එතුමියට පුද කරන්න.

ගරු කථානායකතුමනි, යමෙකුගේ වචන, යමෙකුගේ සිතීමේත්, ක්‍රියාවේත් සාරය බව බටහිර වාග් විද්‍යාඥයකු ප්‍රකාශ කර තිබෙනවා. ඒ වාගේම බුදුරජාණන් වහන්සේ නිවනට මාර්ගය විධියට දේශනා කරපු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පළමුවෙන්ම සඳහන් කරන්නේ 'සම්මා වාචා' නැතහොත් 'යහපත් වචනය' නිවනට, යහපත් දිවි පැවැත්මට වැදගත් වන බවයි. ගරු කථානායකතුමනි, මෙම ගරු සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු මෙහෙවර සඳහා භාවිත කරන ප්‍රබලම අවිය සහ සවිය වන්නේ වචනයයි. ඒ නිසා වචන භාවිතයේදී අපේ වගකීම, වගවීම මෙන්ම රටේ සංස්කෘතිය, පුද්ගලයකු සතු ආත්ම ගෞරවය වැනි උතුම් සාධක පිළිබඳව දැඩි සැලකිල්ලක් යොමු කළ යුතු වෙනවා. ගරු කථානායකතුමනි, භාෂාව භාවිතයේදී අපහාසය, උපහාසය, නින්දාව, ව්‍යංගයෙන් කරනු ලබන අර්ථ විකෘති කිරීම් අපට භාවිත කරන්න පුළුවන්. ඒ තුළින් සත්‍ය මෙන්ම, අසත්‍යයත් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, මගේ කථාව තුළ මම ඒ වචන මේ වෙලාවේ භාවිත කරන්නේ නැහැ. මොකද, මම හොඳ වැදගත් දෙමව්පියන්ට ජාතක වූ අයෙක් නිසා. මම එතුමාගේ ජාතකය ගැන කථා නොකරන්නේ ගරු මන්ත්‍රීතුමාගේ මවට මම අගෞරව නොකළ යුතු නිසායි. මොකද, ඇයත් කාන්තාවක්.

ගරු කථානායකතුමනි, පසුගිය දා ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශ තුළ මෙම ගරු සභාවට පමණක් නොව, කිසිදු සභාවක භාවිත නොකළ යුතු වචන මාලාවක් -වාග් මාලාවක් - භාවිත කර අසත්‍ය, නින්දා කිරීම, අපහාසය වක්‍රෝක්තියෙන් ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මා මෙය කිව යුතුයි. එතුමා ප්‍රකාශ කළා, මා ඉදිරිපත් නොකළ අදහස් ගොන්නක් මා විසින් ඉදිරිපත් කළා කියලා.

20 වෙනිදා මා සිදු කළ කථාවේ කිසිදු අවස්ථාවක භාණ්ඩවල නම් සඳහන් කරමින්, මිල සඳහන් කරමින්, සැපද යනුවෙන් ප්‍රකාශ කර නැහැ. දෙවනුව, එතුමා එම භාණ්ඩවල නාම භාවිත කරමින් මතුපිට අරුතට හාත්පසින්ම වෙනස් අර්ථයක් ගෙන දෙන, යටි පෙළ අරුත තුළ අසභ්‍ය, අශීලාචාර අර්ථ කථනයක් සිද්ධ කරනවා. මේක අද සමාජයේ සිටින ඕනෑම දරුවෙකුගෙන් ඇහුවත් කියන තැනට වැටහෙන අශීලාචාර කථාවක්. එම වාක්‍යයේ යටි පෙළ අරුත බලන්න කියා මා ඉල්ලා සිටිනවා. තුන්වෙනුව, මෙම සභාවේ නොසිටින, මෙම සභාව තුළ සිදු කරන කිසිදු ප්‍රකාශයකට පිළිතුරු දීමට හැකියාවක් නොමැති ජලනි ප්‍රේමදාස මැතිනිය පිළිබඳව සඳහන් කරමින්, එතුමියට ඉතාම පහත් පෙළේ අපහාසයක් සිද්ධ කරනවා. එතුමියට මේ සභාවට ඇවිල්ලා ඒකට උත්තර දෙන්න විධියක් නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, කෙනෙකුගේ පෞරුෂයට බලපාන සාධක දෙකක් තිබෙනවා. ඒ ගැන සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. එක සාධකයක් තමයි, ආරය. අනික් සාධකය, පරිසරය. ආරය කියන්නේ මනුස්සයෙකුට ජානවලින් එන දේ. ඒක මට වෙනස් කරන්න බැහැ. පරිසරය කියන්නේ ආශ්‍රය කරන පිරිස නිසා ඇතිවන පෞරුෂය. ආශ්‍රය කරන පිරිස තුළින් එතුමාට නොමඟ යන තත්ත්වයක් ඇති කර දී තිබෙනවා කියා මා හිතනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙම කථාව සිදු කරන මොහොතේ මට මතක් වෙනවා, පරිසරය නිසා වෙනස් වූ ගිරා පෝතකයෝ දෙන්නා ගැන කියැවෙන සත්පිකුම්භ ජාතකය ගැන. මේ සිදුවීම දැක්කාම එකම ජානවලින් බිහිවූ ගිරා පෝතකයෝ දෙදෙනාගෙන් සොර මුළක් ළඟ හැදුණු ගිරා පෝතකයා සහ තාපසයන් ළඟ හැදුණු ගිරා පෝතකයා පිළිබඳ කථාව අද සමාජය තේරුම් ගන්නවා ඇති කියා මම හිතනවා.

ගරු කථානායකතුමනි, මෙම කථාව සිදු කරන මොහොතේ මූලසුන හෙබවූ ගරු මන්ත්‍රීතුමාට, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා විසින් එම ප්‍රකාශය කළ අශීලාචාර ස්වභාවය පෙන්වා දීලා ඒ වචන ඉවත් කරන්න කියා කියනවා. ඒ අශීලාචාර ස්වභාවය පිළිබඳව පෙන්වා දුන්නත්, එතුමාට එය නොවැටහීම ඛේදවාචකයක් විධියට මා දකිනවා. ඒ වාගේම ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. ගරු කථානායකතුමනි, සමහර අවස්ථාවලදී මමත් මූලාසනයේ වාඩිවෙනවා. ගරු කථානායකතුමනි, මේ පුටුවේ වගකීම ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමාට පැහැදිලි කර දෙන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඔය පුටුවේ වාඩි කරනකොට ඇස් පෙනෙන, කන් ඇහෙන, නීතිය ගැන දන්නා, තීරණ ගන්න පුළුවන් අය ඔය පුටුවේ වාඩි කරවන්න. මොකද, එහෙම නොවුණොත් ඔය පුටුවට අගෞරවයක් සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය හුදු දේශපාලනික අවශ්‍යතාවක් මත සිදු කළ බව මට පැහැදිලියි.

එය පොදු ජන පෙරමුණේ දේශපාලනය ද යන්න එහි නායක ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මම අහන්න කැමැතියි. එතුමා ජනාධිපති ලෙස සිටියදී කාන්තා දිනයක කළ ප්‍රකාශයක් මට මතකයි. එතුමා කිව්වා, "රටක, සමාජයක ස්වරූපය මැනිය හැකි මිනුම් දණ්ඩක් වනුයේ රටක් කාන්තාවන්ට සලකන ආකාරය" කියලා. මම එතුමාගෙන් අහනවා, ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය තුළින් කාන්තාවන්ට සලකා ඇති ආකාරය එතුමන්ලාට අනුමත කරන්න පුළුවන්ද කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා එම ප්‍රකාශය අනුමත කරනවාද කියා මම ඔබතුමාගෙන් අහනවා. ගරු සභානායකතුමනි, ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු හැටියට ඔබතුමා එම ප්‍රකාශය අනුමත කරනවාද? මේ වෙලාවේ සභාවේ නොසිටියත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම අහනවා, ඔබතුමා එම ප්‍රකාශය අනුමත කරනවාද කියලා. *[බාධා කිරීම්]* ඒ මන්ත්‍රීතුමාට තව විනාඩි පහකුත් වැඩිපුර දුන්නා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, රාජපක්ෂවරු එවැනි ප්‍රකාශ අනුමත කරනවාද කියලා ඔබතුමා මේ ගරු සභාවට දැනුම් දෙන්න. ඒ වාගේම දීර්ඝ කාලයක් දේශපාලනයේ හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාත් සභාවේ ඉන්නවා. *[බාධා කිරීම්]* ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාගෙන් මම අහනවා, ඔබතුමා එම ප්‍රකාශය අනුමත කරනවාද කියලා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගෙන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වගේ. [බාධා කිරීම්]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමාගේ මවත් කාන්තාවක්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමියට ඒ ප්‍රකාශය කරන්න ඉඩ දීලා කරුණාකර දෙපැත්තම නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඇහුම්කන් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමාගේ මවත් කාන්තාවක්. එතුමාගේ බිරිඳත් කාන්තාවක්. එතුමාට දියණියක්, සොයුරියක් සිටී නම්, ඒ අයත් කාන්තාවන්. එතුමා කළ කථාවේ ඇතුළත් එම වාක්‍ය කොටස මා කලින් සඳහන් කළ එතුමාට සමීපතම කාන්තාවකගෙන් අහන්න කියලා කිව්වොත් එතුමා එයට එකඟ වෙනවාද කියා මම අහනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දා මම පාර්ලිමේන්තුවේ සිදු කළ ප්‍රකාශයත්, තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයත් හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන ඔබතුමා කරුණාකර පෞද්ගලිකවම ඒ කථා දෙක සංසන්දනය කර බලන්න. ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා ප්‍රකාශකොට ඇති එකම වචනයක් හෝ මම පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කර ඇත්දැයි විමසා බලන්න. ගරු කථානායකතුමනි, ඔබතුමා මගේ පියතුමා සමඟ පාර්ලිමේන්තුවට පිවිසි වැඩිහිටි ගුණගරුක පියෙක්. කරුණාකර මේ උත්තරීතර සභාවේ වරප්‍රසාදවලට මුවාවී මෙවැනි අශීලාචාර ප්‍රකාශ කිරීම තුළින් ඔබතුමාගේම දියණිවරු වැනි කාන්තාවන්ට අපහාස කිරීම වැළැක්වීමට ඔබතුමා පියවර ගන්න.

ගරු කථානායකතුමනි, අද සමාජය මෙම පාර්ලිමේන්තුව පිළිබඳව කරන විවේචනවලට ප්‍රධාන හේතුව, මෙවැනි මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශයි. අද මේ "225ටම ගෙණ ගහන්න" කියන්නේ ඒකයි.

මෙම කථාව පිළිබඳව සමාජ මාධ්‍ය තුළ දක්වන අදහස් විමසා බලන්න. සමාජ මාධ්‍ය අද මොකක්ද කියන්නේ කියලා බලන්න. මෙවැනි ප්‍රකාශන පිළිබඳ මාධ්‍ය තුළ හඬක් නඟන්නට පෙරට එන්න කියලා මම මේ වෙලාවේ මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුවේ සිටින පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරියන්ගෙන් මම ඉල්ලා සිටින්නේ, මෙය පටු දේශපාලන කෝණයකින් නොබලන ලෙසයි. පාර්ලිමේන්තු කාන්තා සංසදයේ සියලුදෙනාම අද ගරු කථානායකතුමා හමුවෙලා මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්නත්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නත් කියලා ඉල්ලා සිටියා. ඒ සම්බන්ධයෙන් සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා. මෙය හුදෙක් රෝහිණී කුමාරි විජේරත්නට, -රෝහිණී කවිරත්නට- එහෙම නැත්නම්, ජලනි ප්‍රේමදාස මැතිනියට එල්ල කරපු අපහාස ප්‍රකාශයක් ලෙස නොසලකන්න කියලා මම ඉල්ලනවා. මෙය සමස්ත කාන්තා පරපුරටම කරපු දැඩි අවමානයක් බව මම කියා සිටිනවා. ගරු කථානායකතුමනි, එබැවින් ගරු මන්ත්‍රීතුමියලා සියලුදෙනාට කුමන අවස්ථාවක හෝ මෙවැනි දේ සිදු වන විට, ඊට එරෙහිව නැඟී සිටින ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ නොවුණහොත් සිදු වන්නේ, අද මා වෙත එල්ල කළ ප්‍රහාරය හෙට ඔබ වෙත ද, ඔබේ දියණිය වෙත ද එල්ල වන්නට ඉඩ තිබීමයි. ගරු කථානායකතුමනි, ඔබතුමා මෙම ප්‍රකාශය පිළිබඳව සොයා බලා මෙම ගරු සභාවේ මන්ත්‍රීවරියක වන මගේ වරප්‍රසාද සුරක්ෂිත කරන්න සහ කාන්තාවන්ගේ ගෞරවය සුරක්ෂිත කරන තීරණයක්

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙන ගමන්, අවසාන වශයෙන් ජර්මන් ජාතික කවියකු වන ජේ. මුලර් ලියූ වදනක් උපුටා දක්වමින් මගේ ප්‍රකාශය අවසන් කරනවා. ගරු කථානායකතුමනි, එතුමා මෙසේ කියා තිබෙනවා:

"පළමුව ඔවුන් පැමිණියා, සමාජවාදීන් සොයා. මම කථා නොකළෙමි. මම සමාජවාදියෙක් නොවන නිසා. අනතුරුව ඔවුන් පැමිණියා, වෘත්තීය සමිති නියෝජිතයන් සොයා. මම කථා නොකළෙමි. මම වෘත්තීය සමිති නියෝජිතයෙක් නොවන නිසා. ඔවුන් යළිත් පැමිණියා, යුදෙව්වන් සොයා. මම කථා නොකළෙමි. මම යුදෙව්වෙක් නොවන නිසා. අවසානයේ ඔවුන් මා සොයා පැමිණ ඇත. එවිට, කිසිවකු කථා නොකරනු ඇත මා වෙනුවෙන්." ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමියගේ ප්‍රකාශය ගැන මම හෙට,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]* Please, පොඩ්ඩක් ඉන්න. රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ කථාවේ සඳහන් කරුණු, මම ඔබතුමාට පක්ෂ නායක රැස්වීමේදීත් කියලා තිබෙනවා. මූලාසනයේ ඉන්න මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග ආරක්ෂා කරන්න ඕනෑ; මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න ඕනෑ. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ නම් මන්ත්‍රීවරයෙක් කථා කරනකොට නිලධාරින් ඒ කථාව අහගෙන ඉඳලා ගරු කථානායකතුමාට උපදෙස් දෙනවා, "මේ වචන වැරදියි." කියලා. නමුත් අපේ පාර්ලිමේන්තුවේ ඒක සිද්ධ වෙන්නේ නැහැ. නමුත්, මම ඔබතුමාට කියන්නේ,- *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මේ ප්‍රකාශය කරන්න ඉඩ දීලා නිශ්ශබ්ද වෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තිසකුට්ටිආරච්චි මන්ත්‍රීතුමා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමාට කථා කරන්න හෙට අවස්ථාවක් දෙන්නම්. ඔබතුමා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, රෝහිණී කුමාරි කවිරත්න මැතිනියටත්, ජලනි ප්‍රේමදාස මැතිනියටත් අපහාස කළාම *[බාධා කිරීමක්]* අපේ නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා නැඟිටලා මූලාසනයට කිව්වා, -මේකයි වැදගත් දේ.- ඒ වචන ටික ඉවත් කරන්න කියලා. මොකක්ද මූලාසනයෙන් කිව්වේ? මට එහෙම කථාවක් ඇහුණේ නැහැ කිව්වා.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මොකක්ද කථාව?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට එහෙම කථාවක් ඇහුණේ නැහැ කියලා මූලාසනයේ හිටපු මන්ත්‍රීතුමා ඒ වෙලාවේ කිව්වා. එතුමා අනුබල දුන්නා. වැඩිපුර වෙලාවකුත් දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන සොයලා බලන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කියන්නේ, එතුමා මූලාසනයේ ඉන්න සුදුසු නැහැ කියලායි. මොකද, පක්ෂග්‍රාහීව කටයුතු කරපු නිසා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මේ ගැන සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට වෙනම අවස්ථාවක් දෙනවා. අද ඒ සම්බන්ධයෙන් කථා කරන්න බැහැ.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ගරු කථානායකතුමනි, දැන් මගේ නම කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම කියපු බව ඇත්ත. *[බාධා කිරීමක්]* ඒ වෙනත් ප්‍රශ්නයක්. ඒ නිසා ඒ ගැන වෙනම කථා කරන්න.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ගරු කථානායකතුමනි, මගේ නම කියලා කථා කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම, - *[බාධා කිරීමක්]* ඒකට වෙනම දවසක් යොදාගන්න.

ප්‍රධාන වැඩ කටයුතු. පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
### குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
### CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL

"(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.***
***2021 නොවැම්බර් 29වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி அமைச்சர் சார்பாக மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2021 நவம்பர் 29, திங்கட்கிழமை, இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Dinesh Gunawardena on behalf of the Minister of Justice;*
*to be read a Second time upon Monday, 29th November, 2021 and to be printed.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවලින් සහ 2020 ඔක්තෝබර් 06 හා 2021 ඔක්තෝබර් 21 යන දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මා කරපු ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය පිළිබඳව, -*[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මම හෙට පැහැදිලි කරන්නම්.

ප්‍රධාන වැඩකටයුතු.

විසර්ජන පනත් කෙටුම්පත - 2022, හත්වන වෙන් කළ දිනය. විවාදය ආරම්භ කිරීම, ගරු විපක්ෂ නායකතුමා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
## APPROPRIATION BILL, 2022

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය -[නොවැම්බර් 12]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" -[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Order read for resuming Adjourned Debate on Question - [12th November]*
*"That the Bill be now read a Second time". - [The Hon. Basil Rohana Rajapaksa]*
*Question again proposed.*

[පූ.භා. 10.22]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
ගරු කථානායකතුමනි, අපි හැමෝම දන්නවා, විශේෂයෙන්ම 1920 දශකයේ අගභාගයේ සහ 1930 දශකයේ අපේ රටේ පමණක් නොව ලෝකයේ මහා ආර්ථික අවපාතයක් ඇති වුණු බව. It was called the Great Depression. ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත්, රටවල් මට්ටමිනුත් ඒ කාල වකවානුවේ ආර්ථික ඛේදවාචක රැසක් නිර්මාණය වුණා. නමුත් ඒ ආර්ථික අර්බුද සහ ඛේදවාචක නිවැරදි දැක්මක් තුළින්, නිර්මාණශීලී විසඳුම් තුළින් මහහරවා ගන්නට ඒ රටවලටත්, ලෝකයටත් හැකියාව ලැබුණා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇමෙරිකාවේ ජනාධිපතිව සිටි ෆ්‍රෑන්ක්ලින් ඩිලානෝ රූස්වෙල්ට් "නව ගනුදෙනු" - New Deal - නමින් වැඩසටහනක් ඉදිරිපත් කරලා විශේෂයෙන්ම සෘජු රාජ්‍ය මැදිහත් වීම තුළ ඒ ආර්ථික අවපාතයෙන් ගොඩ එන්නට පිළියම් යෙදුවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම මේ කාරණය සඳහන් කරන්නට කැමැතියි. හිටපු ප්‍රංශ ජනාධිපති චාල්ස් ඩි ගෝල් වරෙක මෙන්න මේ ආකාරයට ප්‍රකාශ කරනවා:

> "Faced with crisis, the man of character falls back on himself. He imposes his own stamp of action, takes responsibility for it, makes it his own."

"අර්බුදයකට මුහුණ පෑ කල්හි මනා චරිතයකින් හෙබි පුද්ගලයා ස්වයං විමසුමක නිරත වේ. සිය ක්‍රියාකාරිත්වය තුළින් තමාගේ අනන්‍යතාව පළ කරන ඔහු ඒ සඳහා වගකීම භාරගනිමින් එය ඔහුගේම කාර්යයක් බවට පෙරළා ගනී."

ගරු කථානායකතුමනි, අද අප මාතෘ භූමියත් දැවැන්ත ආර්ථික ව්‍යසනයකට, මහා ඛේදවාචකයකට මුහුණ දෙමින් සිටින මොහොතක එදා ලෝක ආර්ථික අවපාතය සිදු වුණු මොහොතේ ෆ්‍රෑන්ක්ලින් ඩිලානෝ රූස්වෙල්ට්, එවකට ඇමෙරිකාවේ ජනාධිපතිතුමා කටයුතු කළ ආකාරය, ඒ වාගේම චාල්ස් ඩි ගෝල් ප්‍රංශයේ හිටපු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට අපි මේ ප්‍රශ්නයට නිවැරදි දැක්මක් තුළින් මුහුණ දුන්නොත් අපට එයින් ගොඩ එන්නට හැකියාව තිබෙනවාය කියන එක මගේ කථාව ආරම්භයේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අද සම්ප්‍රදායෙන් බැහැරව ගිහිල්ලා අය වැය පිළිබඳව තිබෙන යෝජනා විවේචනය කරනවා වෙනුවට, රට මුහුණ දෙන ප්‍රශ්නවලට අප විශ්වාස කරන විසඳුම් ලබා දෙන්නට මේ අවස්ථාවේ අපි උත්සාහ කරනවා.

අපි විවිධ ආර්ථික න්‍යාය දිහා බැලුවාම, ඒ බොහෝ න්‍යාය අසමත් වෙලා තිබෙනවා, රටේ ප්‍රශ්නත්, ජනතා ප්‍රශ්නත් විසඳන්න. විටෙක නව ලිබරල්වාදය, තවත් විටෙක අන්තවාදී සමාජවාදය, තවත් විටෙක අන්ත දක්ෂිණාංශක කොන්සර්වේටිව් ප්‍රතිපත්තිය, තවත් විටෙක command economy කියන economic system එක, තවත් විටෙක නව ලිබරල්වාදයෙන් නිර්මාණය වුණ ලුම්පන් ධනවාදය කියන මේවා තුළින් ප්‍රශ්න විසඳනවා වෙනුවට රට තුළ තිබෙන ආර්ථික අර්බුද වර්ධනය වෙලා තිබෙනවා. අද අපේ රටේ තිබෙන මේ බරපතළ ප්‍රශ්නවලට මොනවාද විසඳුම්?

ප්‍රමුඛව ගරු කථානායකතුමනි, ආර්ථිකය පිළිබඳව හොඳ අවබෝධයකින් රජයක් කටයුතු කරන්නට ඕනෑ; the Governement should have a proper comprehension of the economic fundamentals and principles.

අද රටේ තිබෙන ප්‍රශ්නයෙන් ගොඩ එන්නට, ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට අප විශ්වාස කරනවා ශීඝ්‍ර ආර්ථික වර්ධනයක්, වේගවත් ආර්ථික වර්ධනයක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ බව. හැබැයි, ඒ ආර්ථික වර්ධනය සමබරව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. රට තුළ විෂමතා, බෙදීම් ඇති නොකොට, ඌනතා ඇති නොකොට, සැමට සෞභාග්‍යය, සැමට ආදායම, සැමට වර්ධනය ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ, වෙළෙඳ පොළ බලවේගවලට පමණක්, -ඉල්ලුම හා සැපයුමට පමණක් - මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා. මේකට සෘජු රාජ්‍ය මැදිහත් වීම අවශ්‍යයි; we need proactive State intervention. We also need strong leadership by the Executive of the country; මෙය, සෘජු රාජ්‍ය නායකත්වයක් රටට අවශ්‍ය වෙලාවක්.

විශේෂයෙන්ම පෞද්ගලික ව්‍යවසායකත්වය තුළ රටේ ධන උත්පාදන ක්‍රියාවලිය මානුෂීය ධනවාදී ප්‍රතිපත්ති තුළින් සිදු වනකොට, සමාජවාදී ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත්, සමසේ ආදායම් සම්පත් බෙදී යන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ගමනක් මේ රටට අත්‍යවශ්‍ය වී තිබෙනවා. සමාජ ආරක්ෂණය, සමාජ රැකවරණය හා සමාජ සුබසාධනය - social security, social protection and social welfare - යන සියල්ලක්ම ගම්‍ය වුණු ජනහිතකාමී, ජනතාවාදී, මානුෂීය, ධනවාදී ප්‍රතිපත්තියක් හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට අද කාලය එළැඹිලා තිබෙනවා.

Hon. Speaker, we have to drive growth; අපි ආර්ථික වර්ධනය ශක්තිමත්ව කරගෙන යාම සඳහා මූලිකත්වය ලබා දෙන්න ඕනෑ. This cannot be a single effort. It has to be a combined effort. මේක එක පුද්ගලයෙකුට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ ක්‍රියාවලිය සියලුදෙනාම - මුළු රටම - ඒක රාශි වෙලා කළ යුතු ක්‍රියාවලියක්. මේ ක්‍රියාවලියේ අවසාන ඉලක්කය කුමක්ද? What is our ultimate aim and objective? Shared prosperity - ජන සමාජය තුළ සමෘද්ධිය සමසේ බෙදා ගැනීම; equitable growth - සාධාරණ වර්ධනය. ඒ වාගේම අපි වගබලා ගන්න ඕනෑ, රාජ්‍ය මැදිහත් වීම තුළ පෞද්ගලික ව්‍යවසායකත්වයට අගතියක් සිදු නොවන ආකාරයට කටයුතු කරන්න. State or government intervention should not crowd out private entrepreneurship. So, Sir, we need to formulate a unique growth strategy to come out of this economic mess. Most call the present situation an economic quagmire; we are in a maze. We have to extricate ourselves from this disastrous situation; අද මුහුණ දෙන්නට සිදු වී තිබෙන මේ මහා ව්‍යසනකාරී තත්ත්වයෙන් අපි ගොඩ එන්න ඕනෑ.

අපට ගොඩ එන්න පුළුවන්. නිවැරදි දැක්මක් සහිත එක ප්‍රතිපත්තියක ඉඳගෙන, එහාට මෙහාට වැනෙන්නේ නැතිව, *ad hoc* තීන්දු තීරණ ගන්නේ නැතිව, knee-jerk reactions හරහා වැඩ කටයුතු කරන්නේ නැතිව අපි එක consistent ගමනක්, එක ස්ථාවර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑ.

ආර්ථික වර්ධනය ශක්තිමත් කරනවා වාගේම අද රට තුළ තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි උද්ධමනය. අද උද්ධමන වේගය දළ වශයෙන් සියයට 7.6ක් පමණ වෙනවා. ඒ වාගේම ආහාර ක්ෂේත්‍රය කේන්ද්‍ර කර ගත් උද්ධමනය දිහා බැලුවොත් සියයට 12.8ක් වෙනවා. අපි උද්ධමනයට විසඳුම් ලබා දෙන්නේ කොහොමද? How do we tackle inflation? If we are to tackle inflation, we have to comprehend the various aspects of inflation. Is it cost-push inflation? Is it demand -pull inflation? Is it inflation generated by excessive printing of money? මේ න්‍යායයන් පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන්නට ඕනෑ. One must have the requisite intellectual capabilities to fathom the inflationary issues in our society. නූතන මුදල් න්‍යාය - modern monetarism - කියලා, Modern Monetary Theory කියලා අද ඉතාම ශීඝ්‍ර ලෙස මුදල් අච්චු ගහනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපට ජාත්‍යන්තර මුදල් ඒකකයක් නැහැ. ජාත්‍යන්තර මුදල් ඒකකයක් නොමැති රටක මෙලෙස අසීමිත ලෙස මුදල් අච්චු ගැසීම තුළින් සිද්ධ වන්නේ මොකක්ද? ජීවන බර වැඩිවීම, ජීවන වියදම වැඩිවීම හා inflation ඉහළ යැමයි ඒ තුළින් සිදු වෙන්නේ. ලතින් ඇමෙරිකානු රටක් වන ආර්ජන්ටිනාවේ මුදල් අච්චු ගැසීම නිසා මුහුණ දෙන්නට සිදු වුණු ඒ දැවැන්ත ආර්ථික අර්බුදය ගැන

අපි හැමදෙනාම දන්නවා. රට තුළ සිදු විය යුත්තේ මුදල් මුද්‍රණය නොව මුදල් උත්පාදනයයි. ගරු කථානායකතුමනි, උද්ධමනය තුළින් මුළු ජන සමාජයම දුබල වෙනවා. මුදල්වල ක්‍රය ශක්තිය - purchasing power එක - පහළ වැටෙනවා.

Sir, inflation has a massive debilitating impact on the lives of the people of our country. The purchasing power of our currency gets diminished; the real value of money gets degraded, devalued.

ගරු කථානායකතුමනි, එදා දේශපාලන ක්ෂේත්‍රයේ පරුෂ වචනයක් හැටියට සලකපු මිල සූත්‍රය ගැන දැන් දැන් නිලධාරින් කථා කරනවා. එදා මිල සූත්‍රය කිව්වාම, අපේ ප්‍රතිපක්ෂ ආර්ථික විශේෂඥයන් එක දවසට ප්‍රවෘත්ති සාකච්ඡා තුන, හතර පැවැත්වූවා. ප්‍රවෘත්ති සාකච්ඡා තුන, හතර තියලා තමන්ගේ ටියුෂන් පන්තිය කරනකොට අදහස් ඉදිරිපත් කළා වාගේ බොරු බේගල් ඇද දැම්මා. දැන් භාණ්ඩාගාරයේ ලේකම්තුමා - ආටිගල මහත්මයා - කියනවා, "මිල සූත්‍රයක් අපි කරමු. හැබැයි, ආණ්ඩුව එකඟද, නැද්ද කියන එක ප්‍රශ්නයක්" කියලා. Sir, it is indispensable, it is vital that we adopt these policies through realism. We have to forget about our ideological idiosyncrasies. අපි අපේ න්‍යායවලට යට වෙලා, මුරණ්ඩු වෙලා, නොවෙනස්ව, නම්‍යශීලි නොවී එක තැනක ඉඳීම තුළ සිදුවන්නේ රටට ඉමහත් හානියක්. විරැකියාව - unemployment - ප්‍රශ්නයට ඉක්මන් විසඳුමක් අවශ්‍යයි. ඇත්ත වශයෙන්ම මෙයට තිබෙන එකම විකල්පය තමයි රට තුළ කාර්මික නිෂ්පාදන විප්ලවයක් දියත් වීම. එය රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් යන දෙකම මූලිකත්වය අරගෙන ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් වන්නට ඕනෑ. කර්මාන්තශාලා බිහිවීම තුළ, කර්මාන්ත කලාප නිර්මාණය වීම තුළ, ධන උත්පාදන ක්‍රියාවලිය තුළ ආර්ථිකය වර්ධනය වෙනවා; කර්මාන්තශාලා බිහි වෙනවා; රැකියා ප්‍රශ්නය විසඳෙනවා. ඒ වාගේම අපනයන කර්මාන්ත ක්ෂේත්‍රය ශක්තිමත් වීම තුළ රටට අත්‍යවශ්‍යම දෙයක් වන විදේශ විනිමය උපයන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, අද අපි හැමෝම දන්නවා අපේ රට මේ තරම්වත් පොඩ්ඩක් හුස්ම ගන්නේ ඇඟලුම් කම්හල් 200 වැඩසටහනේ සාර්ථකත්වය නිසායි කියලා. ඒ කාලයේ ඒවාට අපේ ප්‍රතිපක්ෂ කණ්ඩායම් කිව්වේ මොනවාද? "ප්‍රේමදාස ගමේ කොල්ලො කෙල්ලො ලව්වා සුද්දියන්ට යට අඳුම් මහන කර්මාන්තය ගෙනාවා" කිව්වා. දැන් හැමෝටම තේරෙනවා, මේ අර්බුදකාරී තත්ත්වය තුළ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය හරහා විදේශ විනිමය ප්‍රශ්නයට ලැබෙන ඉමහත් සහයෝගය ගැන.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ රට මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්නට නම් අපේ ආයෝජන වර්ධනය කරන්න ඕනෑ, අපේ ඉතිරි කිරීම් වර්ධනය කරන්න ඕනෑ. අද බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, කොහොමද ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කරන්නේ කියලා. අද මේ රජයට උද්ධමනය පාලනය කරන්න බැරි වෙලා තිබෙනවා. ඉතිරි කිරීම් වර්ධනය වන්නේ මූර්ත පොලී අනුපාතය ධන තැනක තිබෙනවා නම්. අද උද්ධමනය වර්ධනය වීම නිසා, නාමික පොලී අනුපාතයෙන් උද්ධමනයේ ප්‍රතිශතය අඩු කළාම පේනවා ඇත්ත වශයෙන්ම රටේ තිබෙන්නේ සෘණ මූර්ත පොලී අනුපාතයක් බව. එවන් තත්ත්වයක් තුළ කොහොමද අපි ඉතිරි කිරීම් වර්ධනය කරන්නේ? අපි හැමෝම දන්නවා 60 දශකයේ, 70 දශකයේ ජපානය දැවැන්ත අපනයන ආර්ථිකයක් නිර්මාණය කළේ කොහොමද කියලා. ආයෝජනය වැඩි කරලායි එහෙම කළේ. කොහොමද ආයෝජනය වැඩි වුණේ? ඉහළ ඉතිරි කිරීමේ ප්‍රතිශතයක් නඩත්තු කළ නිසායි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම රට තුළ ආයෝජනය ප්‍රවර්ධනය කරන්න ඕනෑ. සෘජු විදේශ ආයෝජනවලට අපි මුල් තැනක් ලබා දෙන්න ඕනෑ; පහසුකම් සපයන්න ඕනෑ. We have to facilitate Foreign Direct Investments.

ගරු කථානායකතුමනි, මම කැමැතියි මේ අවස්ථාවේ 2020 වසරේ ලෝකයේ කොරෝනා වසංගතය පැතිර යමින් තිබුණු මොහොතේ, විවිධ රටවල් ලැබූ සෘජු විදේශ ආයෝජන පිළිබඳ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න. World Investment Report එකේ UNCTAD data අනුව බංග්ලාදේශයට 2020දී සෘජු විදේශ ආයෝජන ලෙස - FDI inflows - ඇමෙරිකානු ඩොලර් මිලියන 2,600ක් - US Dollars 2,600 million - ලැබුණා. කාම්බෝජයට ඇමෙරිකානු ඩොලර් මිලියන 3,600ක් ලැබුණා.

චීනයට ඩොලර් බිලියන 149.3ක්, හොංකොංවලට ඩොලර් බිලියන 119.1ක්, ඉන්දියාවට ඩොලර් බිලියන 64.1ක් ලැබුණා. මේ ඔක්කොම ඇමෙරිකානු ඩොලර්. මැලේසියාවට ඩොලර් බිලියන 3.5ක්, සිංගප්පූරුවට ඩොලර් බිලියන 90.6ක්, වියට්නාමයට ඩොලර් බිලියන 15.8ක් ලැබුණා. එතකොට ශ්‍රී ලංකාවට කීයද? ඇමෙරිකානු ඩොලර් මිලියන 400යි. වියට්නාමය, සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දියාව, හොංකොං, චීනය, කාම්බෝජය, බංග්ලාදේශය ඉහළ සෘජු ආයෝජන ප්‍රමාණයක් ලබන්නත් අපේ රට නොලබන්නත් හේතුව මොකක්ද? මේ කාරණාව පිළිබඳව ගැඹුරින් හිතලා බලන්න ඕනෑ; ගැඹුරින් සොයා බලන්න ඕනෑ. මේ තත්ත්වය නිවැරදි කර ගන්න මොකක්ද අපි කරන්න ඕනෑ? ගරු කථානායකතුමනි, අපේ රටේ ව්‍යාපාරවල නිරතවීම සඳහා පහසුකම් සැපයීමේ දර්ශකයේ - Ease of Doing Business Indexහි - අපි ඉහළම තැනකට එන්න ඕනෑ. බලන්න, 2014-2019 කාල වකවානුව තුළ 2014 වර්ෂයේදී රටවල් 190කින් එම දර්ශකයේ 142වැනි තැන හිටපු ඉන්දියාව 2019 වර්ෂය වෙනකොට 63වැනි තැන දක්වා ඉහළට ආවා. Ease of Doing Business Index එකේ ඉහළට එන්න මොනවාද ඒ ගොල්ලන් කළේ? ව්‍යාපාරයක් පටන් ගන්නකොට ඒගොල්ලන් පහසුකම් ලබා දුන්නා; ඉදිකිරීමේ අවසර පත්‍ර ලබා දුන්නා; විදුලිබල පහසුකම් ලබා දුන්නා; දේපළක් register කරනකොට පහසුකම් ලබා දුන්නා. Access to credit, protecting investors, lesser taxes, trading across borders and enforcing contracts ආදී වශයෙන් පුදුම විධියේ පහසුකම් ප්‍රමාණයක් ලබා දුන්නා. එදා ඉන්දියාව එසේ කළා නම් ඇයි අපේ රටේ කරන්න බැරි? අපටත් Ease of Doing Business Index එකේ ඉහළ තැනකට එන්න බැරි ඇයි?

ඒ වාගේම Corruption Perception Index එක තිබෙනවා. රට තුළ දූෂණය, වංචාව, හොරකම අවම කෙරෙන වැඩ පිළිවෙළක්, යන්ත්‍රණයක්, ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. දූෂණය අවම කිරීමේ ක්‍රියාවලිය නිර්දේශපාලනීකරණයට ලක් කරන්න ඕනෑ. එක් එක් පුද්ගලයින් කේන්ද්‍ර කරගෙන, දූෂණය අවම කිරීමේ වැඩසටහන් දේශපාලනඥයන් විසින් ක්‍රියාත්මක කිරීම රටට සුදුසු නැහැ. ඒ සඳහා විනිවිදභාවයෙන් යුක්ත වූ යන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ, දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව.

විශේෂයෙන්ම රට දූෂිත රටක් නොවන බවට ලෝකයේ ප්‍රචලිත වෙනකොට, ඕනෑම ආයෝජකයෙකුගේ කැමැත්ත පළ වෙනවා, අපේ රටට ඇවිල්ලා ඒ ආයෝජනය ශක්තිමත් කරන්න. Sir, we need a champion. We need a champion to promote Foreign Direct Investments. රටේ රාජ්‍ය නායකයා ප්‍රමුඛ ආණ්ඩුව මේ රටට සෘජු විදේශ ආයෝජන ගෙන ඒමේ ප්‍රමුඛතම ක්‍රියාවලිය පෞද්ගලිකව මෙහෙයවන්න ඕනෑ. තමුන්නාන්සේලාට මතක ඇති, එදා දෙපැත්ත පත්තු වෙන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

විලක්කුවක් විධියටයි රට තිබුණේ. රට තුළ යුද්ධ දෙකක් ක්‍රියාත්මක වෙද්දී, විදේශ ආයෝජකයෝ පෝලිමට ආවා, ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට. ඒකට හේතුව මොකක්ද? රටේ රාජ්‍ය නායකයා සෘජු විදේශ ආයෝජන ප්‍රවලිත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛම තැන හිටියා. සෘජුවම හමු වුණා; පැය 24න්, 48න්, 72න් අනුමැතිය ලබා දුන්නා. මුළු ලෝකයම දැන ගත්තා, කෙතරම් දේශපාලන, ආරක්ෂක ප්‍රශ්න තිබුණත් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරනකොට, යම් ප්‍රතිලාභයක් ලැබෙනවා කියලා. එවන් වාතාවරණයක් අපේ රටට අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම කියනවා නම්, ජනාධිපති ලේකම් කාර්යාලයට one-stop shop එකක් අවශ්‍යයි. ජනාධිපති ලේකම් කාර්යාලයේ one-stop shop එකක් ස්ථාපනය කිරීමෙන්, මේ රට තුළ සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්න හැකියාව ලැබෙනවා. අපි අහන්න ඕනෑ, වියට්නාමයට පුළුවන් නම්, කාම්බෝජයට පුළුවන් නම්, ඉන්දියාවට පුළුවන් නම් ඇයි අපට බැරි කියලා. අලුත් ආයෝජන ව්‍යුහයක් රට තුළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ආකර්ෂණීය ආයෝජන පැකේජයක් ආයෝජකයන්ට ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඇත්ත වශයෙන්ම මම කියන්න කැමැතියි, අනභිභවනීය අවස්ථාවක් මේ කොවිඩ් සමයේ අපේ රටට ලැබුණු බව.

නමුත් ඒ අවස්ථාව අහිමි කරගත්තා. අපි හැමෝම දන්නවා, කොවිඩ් - 19 ආරම්භයේදී, ඒ වාගේම එම අර්බුදය උත්සන්න වනකොට බොහෝ ඇමෙරිකානු, දකුණු කොරියානු වාගේම ජපන් ආයෝජන චීනයෙන් පිටතට ගිය බව. ඒකට කිව්වේ, capital flight out of China කියලායි. මොකක්ද, ඉන්දියාව කළේ? ඉන්දියාවේ අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ වෙනමම one-stop shop එකක් හැදුවා; වෙනමම team එකක් හැදුවා. ඒ team එක ලැයිස්තුගත කළා, චීනයෙන් එළියට යන ආයෝජන. ඒ team එක ඒ ආයෝජකයන් සමඟ සාකච්ඡා කරලා බහුතර ආයෝජනය ඉන්දියාවට ගෙන්වාගත්තා. මේ දෙයම වියට්නාමයත් කළා; මේ දෙයම කැම්බෝඩියාවත් කළා. ඇයි, ශ්‍රී ලංකාව නොකළේ? ඇයි, මේ රටේ ආණ්ඩුව ඒක නොකළේ? අවස්ථා ගණනාවකදී මේ පාර්ලිමේන්තුවේදී මම ඒ යෝජනාව ඉදිරිපත් කළා. එදාත් මට සුපුරුදු ආකාරයට විහිළු කළා; සුපුරුදු ආකාරයට හිනා වුණා. නමුත් එදා විහිළු කරපු, හිනාවෙන් සංග්‍රහයක් කරපු හැමෝටම දුක් වෙන්න සිදු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, රට මුහුණ දෙන තවත් ආර්ථික අර්බුදයක් තමයි, ත්‍රිත්ව හිඟය. We have triple deficits. අපට අය වැය හිඟය - Budget deficit එකක් - තිබෙනවා; වෙළෙඳ හිඟය - trade deficit එකක් - තිබෙනවා; ගෙවුම් ශේෂ හිඟය - balance of payment deficit එකක් - තිබෙනවා. මේ ප්‍රශ්නවලට ඉක්මන් විසඳුම් අවශ්‍යයි. අනවශ්‍ය වියදම් කප්පාදු කරන්න ඕනෑ. කේන්ද්‍රගත ආයෝජන ක්‍රියාදාමවලට රාජ්‍ය සම්පත්, රාජ්‍ය මූල්‍ය ශක්තිය යොදවන්න ඕනෑ. කාර්යක්ෂම, ප්‍රගතිශීලී බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. බදු කොමිසමේ යෝජනා ටික ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගිය ආණ්ඩුවෙනුත් ඒක කෙරුණේ නැහැ; මේ ආණ්ඩුවෙනුත් ඒක කෙරෙන පාටක් නැහැ. බදු ප්‍රතිපත්තියේ සහමුලින් වෙනසක් සිදු වෙන්න ඕනෑ. එයට තිබෙන්නා වූ සියලු බාධක අපි ඉවත් කර ගන්න ඕනෑ. අනවශ්‍ය වියදම් අවම කිරීම තුළින් සමස්ත රාජ්‍ය වියදමෙන් සියයට 10ක්, සියයට 15ක්, දළ වශයෙන් බිලියන 400ක්, 500ක් ඉතිරි කර ගන්න පුළුවන්. ඒ තුළින්, සෘජු රාජ්‍ය මැදිහත්වීම තුළ රට තුළ ආයෝජනය ප්‍රවර්ධනය කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, අපි මුහුණ දෙන තවත් බරපතළ ප්‍රශ්නයක් තමයි, විදේශ විනිමය ප්‍රශ්නය. Foreign exchange reserves are dwindling.

අපේ විදේශ සංචිත පහළ වැටෙමින් තිබෙනවා. ඔක්තෝබර් මාසයේ අග වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 2,268යි තිබුණේ. හැබැයි මතක තබා ගන්න, ඉදිරි මාස 3 තුළ අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 1,047ක් ණය ගෙවන්න තිබෙන බව. ඉදිරි මාස 3ත් මාස 12ත් අතර තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 5,674ක් ගෙවන්න තිබෙනවා. ඉදිරි වසර තුළ මුළුමනින්ම ඩොලර් මිලියන 6,721ක් ගෙවන්න තිබෙනවා. නමුත්, රටේ තිබෙන සංචිත ප්‍රමාණය ආනයන ප්‍රමාණයෙන් ගත්තොත් මාස 1 ½යි තිබෙන්නේ. ඒක තමයි ප්‍රශ්නය. ඒක තමයි තත්ත්වය. මොකක්ද ඒකට විසඳුම? ගරු කථානායකතුමනි, බොහෝ ආර්ථික විද්‍යාඥයන් කියන ආකාරයට මේ fixed exchange rate ක්‍රමවේදය හරියන්නේ නැහැ. එයින් සිදු වෙනවා නම් සිදු වෙන්නේ මොකක්ද? ඇත්ත වශයෙන්ම remittances පවා අඩු වෙලා තිබෙන බව සංඛ්‍යා ලේඛනවලින් ඔප්පු වී තිබෙනවා. ගිය වසරේදී ඩොලර් මිලියන 700ක්ව තිබුණු ඒ remittances - මම මේ කියන්නේ මාසයක figure එක - මේ වසරත් එක්ක සංසන්දනය කරන කොට හරි අඩකින් අඩු වෙලා තිබෙනවා; ඩොලර් මිලියන 300ක් වෙලා තිබෙනවා. මොකක්ද මේකෙන් ඇති වන ඵල විපාක? සැපයුම් ජාලය සම්පූර්ණයෙන් අකර්මණ්‍ය වෙනවා. අද පෝලිම් යුගය නිර්මාණය වෙලා තිබෙනවා. 1970 - 1977 අවතාරය අද යළිත් යථාර්ථයක් බවට පත් වෙලා තිබෙනවා. අද ගෑස් පෝලිම, භූමිතෙල් පෝලිම, තෙල් පෝලිම, කිරි පිටි පෝලිම, හාල් පෝලිම, පරිප්පු පෝලිම, අත්‍යවශ්‍ය භාණ්ඩ පෝලිම් තිබෙනවා. මිනිසුන්ට මේවා දරාගන්න බැහැ. මිනිස්සු අන්ත දුක්ඛිත තත්ත්වයට පත් වෙලා සිටින්නේ. මේවාට විසඳුම් අවශ්‍යයි.

අපි දැන් මොකක්ද කරන්න ඕනෑ? ශක්තිමත් ස්ථාවරයක ඉඳගෙන අපි නැවත සාකච්ඡා කරන්න ඕනෑ loan rescheduling ගැන. We have to go for a renegotiation to reschedule our loans. අපි මූල්‍ය ආයතනවලට කථා කරන්න ඕනෑ; ජාත්‍යන්තර ආයතනත් එක්ක ගනුදෙනු කරන්න ඕනෑ. ජාත්‍යන්තර ආයතන එක්ක ගනුදෙනු කිරීම වරදක් නොවෙයි. හැබැයි ගනුදෙනු කරන කොට ශක්තිමත් ස්ථාවරයක ඉඳගෙන, අපේකම, රටේකම, අපේ අයිතිය, අපේ අවශ්‍යතාව, ජාතික අවශ්‍යතාව - national interest එක - රැකගෙන, විදේශ ආයතන ඉදිරියේ පින්සෙණ්ඩු වෙන්න යන්නේ නැතිව, හිඟා කන්න යන්නේ නැතිව, වඩා ශක්තිමත් තැනක ඉඳගෙන, හොඳ සාකච්ඡාවකට යන්න ඕනෑ.

We have to do that. අපි අපේ loans ටික renegotiate කරන්න ඕනෑ; අපි අපේ loans ටික reschedule කරන්න ඕනෑ. මේක තමයි සත්‍යය; මේක තමයි යථාර්ථය. විපක්ෂයේ සිටින අපි සූදානම්, එයට සහයෝගය ලබා දෙන්න. අපි පිට රටවලට කියන්නේ නැහැ, අපේ රටට ආධාර උපකාර කරන්න එපා කියලා. එහෙම කාලයක් තිබෙන්නට ඇති. ඒ සංස්කෘතිය අපි අනුගමනය කරන්නේ නැහැ. යුරෝපා සංගමය GSP Plus ගැන අපෙන් අහන කොට, මොකක්ද අපි කිව්වේ? අපි කිව්වා, "කරුණාකර ඒක දිගටම ක්‍රියාත්මක කරන්න" කියලා. ඒ වාගේම, අපි යුරෝපා සංගමයට කිව්වා, "GSP Plus දෙනවා වාගේම කරුණාකර මේ රටේ මානව අයිතිවාසිකම්, සිවිල් අයිතිවාසිකම්, ආර්ථික අයිතිවාසිකම්, සමාජයීය අයිතිවාසිකම්, ආගමික අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයට රජයට උපදෙස් දෙන්න" කියලාත්. සමාවෙන්න, "උපදෙස්" නොවෙයි. වැරැදියි ඒ වචනය. "රජයට යෝජනා කරන්න" කියලා අපි කිව්වා. අපි ඒක කිව්වා. ඒ කියන දේවල් අපි හංගන්න යන්නේ නැහැ. මොකද, ඒක තමයි තිත්ත ඇත්ත. රට විනාශ කරලා, රට

අකර්මණ්‍ය කරලා කවුරු ආණ්ඩු බලය ගත්තත් කවදාවත් ඒකෙන් රටට හොඳක් වෙන්නේ නැහැ; ජනතාවට හොඳක් වෙන්නේත් නැහැ; කාටවත් හොඳක් වෙන්නේ නැහැ. අපි මේ රට රැක ගන්න ඕනෑ; ආරක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා, ගත යුතු තීන්දු තීරණවලට කඩිනමින් ප්‍රවේශ වෙන්න. දැන් තටම තටමා සිටියා ඇති. You have to talk with the international financial institutions and international monetary agencies. You have to ask for a fresh financial assistance programme. අලුත් මුදල් ආධාරක වැඩ පිළිවෙළක් ගැන සාකච්ඡා කරන්න. එහෙම නැතිව මේකෙන් ගොඩ එන්න බැහැ. "එදාවේල ටුවර්ස්" මේ යන්නේ. මොහොතින් මොහොත, තත්පරයෙන් තත්පරය හුස්ම ගන්නා ක්‍රමයක් මේ යන්නේ. කොතැනක හෝ මේකේ අවසානය එනවා. අවසානය එනකොට මහා ආර්ථික විනාශයක් සිදු වෙනවා; it will be an economic catastrophe. The country will face an economic Armageddon. මම මේ වචන දෙක පාවිච්චි කරනවා. It will be a cataclysmic disaster. මේ වචන භාවිතයට සමහරෙක් අකමැතියි. අකමැති අයට මම කියනවා, තේරෙන්නේ නැත්නම් ශබ්ද කෝෂයක් අරගෙන ඉගෙන ගන්න කියලා. මොකද, රටක් හැටියට අපි ඉදිරියට යන්න ඕනෑ. ප්‍රගතිය, ඉදිරි දැක්ම, දියුණුව තිබෙන්න ඕනෑ. We have to progress. We must not have a retardation mentality; ප්‍රතිගාමී මානසිකත්වයකින් රටකට ඉදිරි ගමනක් නැහැ.

ගරු කථානායකතුමනි, අපි ශ්‍රමික ප්‍රේෂණ වැඩි කරන්න ඕනෑ; අපනයන ඉපැයීම් මාර්ග වැඩි කරන්න ඕනෑ. අපි සංචාරක ක්ෂේත්‍රයේ ඉපැයීම ඉහළට ගෙන යන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාත් සිටින මේ මොහොතේ මා සංචාරක ක්ෂේත්‍රය ගැනත් කියන්න ඕනෑ. ඔබතුමාත් දන්නවා, සංචාරක ක්ෂේත්‍රය රටට කොයි තරම් ආදායකත්වයක් ලබා දෙනවාද කියලා. 2018 වර්ෂය ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 4,381ක්, 2019 වර්ෂය ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 3,687ක් inbound tourism sector එකෙන් අපට ලැබුණා. නමුත්, අය වැයෙන් සංචාරක ක්ෂේත්‍රයට ලබා දී තිබෙන ශක්තිය මොකක්ද? කිසිම දෙයක් ලබා දීලා නැහැ; කිසිම සහනයක් ලබා දීලා නැහැ. එම ක්ෂේත්‍රයේ ඍජු සහ වක්‍ර රැකියා ලක්ෂ 10ක් පමණ තිබෙනවා.

ගරු මුදල් ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අඩු පාඩුවක් තිබෙන කොට පොඩ්ඩක් නතර වෙලා ඒක සංශෝධනය කරන්න කියලා. එහෙම කරන එක වරදක් නොවෙයි. අපිත් ඔබතුමන්ලාට සහයෝගය ලබා දෙන්නම්. මේ සංචාරක ක්ෂේත්‍රයට දිරි ගැන්වීමක් ලබා දෙන්න ඔබතුමාගේ අය වැය යෝජනා සංශෝධනය කරන්න. සංචාරක ක්ෂේත්‍රය අපේ රටට වැදගත්. එය විදේශ විනිමය ඉපැයීමට අතිවැදගත් ක්ෂේත්‍රයක්. අද මුළු සංචාරක ක්ෂේත්‍රයම කඩා වැටිලා. සංචාරක ක්ෂේත්‍රයේ බොහෝදෙනා මානසිකව වැටිලා. ඒ අය කියනවා, අපේ ප්‍රශ්නය යම්කිසි කල් දැමීමක් නම් සිදු වෙලා තිබෙනවා කියලා; there has been a postponement of our problem. "අපේ ප්‍රශ්නය කල් දාලා තිබෙනවා" යැයි කියනවා. හැබැයි, moratoriums හරහා නතර කරපු loans ඔක්කෝම අගට එකතු වෙලා ඉදිරියේදී අලුත් -වැඩිපුර- පොලියක් එක්ක තමයි ගෙවන්න සිදු වෙන්නේ.

ඒක ප්‍රශ්නයට විසඳුමක් නොවෙයි නේ; it is not a solution to the problem. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අපේ සංචාරක ක්ෂේත්‍රය ගැන දැඩි අවධානයක් යොමු කරලා අය වැය යෝජනාවල නොමැති සහන වහාම ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒක මදිපුංචිකමක් කියලා හිතන්න එපා. නම්‍යශීලීත්වය, සත්‍යය අවබෝධ කරගෙන වෙනස්වීම කියන්නේ මදිකමක් නොවෙයි. අපි හැමෝටම වරදින තැන් තිබෙනවා. ආණ්ඩුවට විතරක් නොවෙයි, අපටත් වරදිනවා. වැරදුණු තැන වැරැද්ද පිළිගෙන, පොඩ්ඩක් ආපස්සට හැරිලා බලලා ඒක සංශෝධනය කරගෙන යන එක හොඳ දෙයක්. ඒක සමච්චලයට කාරණාවක් නොවෙයි.

ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමනි, බොහෝ රටවල කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත සහ ව්‍යවසායකයන් රටේ ආර්ථිකයේ එන්ජිම බව ඔබතුමන්ලා, අප සියලු දෙනා දන්නා කාරණයක්; small and medium-sized enterprises are the engine of economic growth. අපේ රටේ දත්තවලට අනුකූලව දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 52කට දායකත්වය ලබා දෙන්නේ කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත. එවන් ඒකක ලක්ෂ 10කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. මේ තිබෙන දත්ත අනුව සමස්තයක් හැටියට ලක්ෂ 22ක පමණ ප්‍රමාණයක් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල නියැලෙනවා. මේවා, 300කට අඩු ප්‍රමාණයකට රැකියා ලබා දෙන, වාර්ෂික ආදායම මිලියන 750කටත් අඩු කර්මාන්ත ක්ෂේත්‍රයක්. මේ කර්මාන්ත දිරි ගන්වන්න අපි කටයුතු කරන්න ඕනෑ. මේ අංශය පිළිබඳව අවධානය යොමු කිරීම ප්‍රමාණවත් පරිදි සිදු වෙලා නැහැ කියන එකයි අපේ අදහස.

ගරු කථානායකතුමනි, අපේ රට තුළ ඉතාම ඉක්මනින් ඩිජිටල් විප්ලවය ක්‍රියාත්මක කරන්නට ඕනෑ බව මම තරයේ විශ්වාස කරනවා. අපට ඉහළ මට්ටමේ රැකියා විශාල සංඛ්‍යාවක් උත්පාදනය කරන්නට පුළුවන්. Fibre-optic සම්බන්ධතා පුළුල් කරන්න ඕනෑ. ස්ථාවර මාර්ග, ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවල ජංගම සම්බන්ධතා පුළුල් කිරීම, බහු සේවා සම්පාදන ආයතනවලට පහසුකම් සැපයීම, චන්ද්‍රිකා සම්බන්ධතා යනාදිය ප්‍රවර්ධනය කරන්නට ඕනෑ. උපකරණවලට විශේෂ අවධානයක් යොමු කරලා, බොහෝ දෙනෙකුට උපකරණ ලබා ගැනීමේ හැකියාව ලබා දෙන්නට ඕනෑ. පාසල්වල තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය පුළුල් කරන්න ඕනෑ. ඊට සමගාමීව සියලුම ජාතික අධ්‍යාපන විද්‍යායතනවල විෂය ධාරාව නොසලකා, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සමඟින් තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ක්‍රියාත්මක කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි තොරතුරු තාක්ෂණ විෂය ප්‍රවර්ධනය කරන්න ඕනෑ; ව්‍යාප්ත කරන්න ඕනෑ. උසස් අධ්‍යාපන ආයතනවල විෂයධාරා නව යුගයේ විෂයයන්, විෂය පැතිකඩ තුළට ඇතුළත් කරලා ඒවා ඉගැන්වීමට සුදුසු කථිකාචාර්යවරු බඳවා ගන්නට ඕනෑ. ඒ සඳහා අපේ ඉලක්කයක් තිබෙන්න ඕනෑ. 2020 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියනයක ශක්තියක් ලබපු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය 2022, 2023 වන විට අඩුම ගණනේ ඩොලර් බිලියන 5ක් දක්වා වර්ධනය කිරීමේ සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරන්න ඕනෑ.

ඊළඟට, නව ව්‍යාපාර සඳහා සුදුසු පරිසරයක් බිහි කරන්න ඕනෑ. ඔබතුමාත් දන්නවා, unicorn firms, unicorn industries ගැන. ඇමෙරිකානු ඩොලර් බිලියන ගණනක ආදායමක්, turnover එකක් තිබෙන එම unicorn industries ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් අපේ රටේත් හදන්න ඕනෑ. ඒ සඳහා ඍජු රාජ්‍ය මැදිහත්වීම ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම බුද්ධි ගලනය ආපසු හරවන පැහැදිලි විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සිදු වී තිබෙන ඒ දැවැන්ත ප්‍රශ්නය, ඒ මහා ඛේදවාචකය ගැනත් මේ අවස්ථාවේ මා සඳහන් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මගේ මතකයේ හැටියට මේ වසරේ අප්‍රේල් හෝ මැයි මාසයේ ආණ්ඩුව එකවරම තීන්දු කළා, රසායනික පොහොර තහනම් කරන්න. ඒකෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට පුදුම තිගැස්මක්; පුදුම shock එකක් සිදු වුණා. ඒක තමයි සත්‍යය; ඒක තමයි යථාර්ථය.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ විද්‍යාඥයන් කියන්නේ මොකක්ද? හොඳම අස්වැන්න ලබන්න නම් කාබනික පොහොර, රසායනික පොහොර මිශ්‍රණයක් ලබා දෙන්න ඕනෑ. බතලේගොඩ පර්යේෂණ ආයතනයත් ඒක ඔප්පු කරලා තිබෙනවා. කාබනික පොහොර පමණක් පාවිච්චි කළොත්, සියයට 21.5 සිට සියයට 31 දක්වා අස්වැන්නේ අඩුවීමක් සිද්ධ වෙනවා. ඒක පාලකයෝ පිළිගන්න ඕනෑ. මේක තමයි සත්‍යය; මේවා තමයි නිවැරදි දත්ත; මේක තමයි විද්‍යාව; මේක තමයි විද්‍යාත්මක තීන්දුව. ගරු කථානායකතුමනි, නමුත් මොකක්ද සිද්ධ වුණේ? සත්‍යය ඉදිරියේ සෘජුව සිටියා. හැබැයි, ඒ සත්‍යය වෙනුවෙන් නොවෙයි, මිථ්‍යාව වෙනුවෙන්; වැරදි දත්ත වෙනුවෙන්. එයින් මහා ඛේදවාචකයක් සිදුවෙලා තිබෙනවා. අද කෘෂි කර්මාන්තයේ දැවැන්ත ඛේදවාචකයක් සිද්ධ වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, අද රටවල් අපට අභියෝග කරනවා. ඒ රටවල බහුජාතික සමාගම් අභියෝග කරනවා. මේ රටේ ශාක නිරෝධායන සේවය මඟින් පවා නුසුදුසුයි කියූ පොහොර නැව පිටමං කරලා යැව්වාට පසු ඒක ආපසු එනවා. ආපසු ඇවිල්ලා ඒ නැව වෙරළ තීරයේ සංචාරය කරනවා. විවිධ නියෝජිතයින් දමා බලපෑම් කරනවා. ඇමතිවරුන්ට යන්න සිද්ධ වෙනවා, තානාපතිවරු හමුවෙන්න. ඒකේ අනෙක් පැත්තයි සිද්ධ වෙන්න ඕනෑ; the reverse should happen. The Ambassadors and the High Commissioners should pay courtesy calls on the Ministers. But, it is the other way round that happens. නමුත්, ඒකේ අනෙක් පැත්තයි සිද්ධ වෙන්නේ. අවසානයේ මේ පොහොර ඛේදවාචකය තුළ මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අපේ රටේ මහා විදේශ විනිමය අර්බුදයක් තිබෙන මොහොතක අපට ආරංචි වෙනවා, අර බාල පොහොර සමාගමට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 67ක් ගෙවන්නට සිද්ධ වෙලා තිබෙනවා කියලා. කවුරු හෝ අහන්න ඕනෑ, මේකට ශාක නිරෝධායන සේවයේ සහතිකය ලැබෙන්නට පෙර ණයවර ලිපි නිකුත් කළේ කොහොමද කියලා. කවුද, ඒකට උපදෙස් දුන්නේ? ඒ ක්‍රියාවලිය දියත් කළේ, කවුද? ඒක නිවැරදි ක්‍රියාවලියක්ද? බලන්න, මේකෙන් රටට සිදුවන හානිය.

ගරු කථානායකතුමනි, එතැනින් නතර වන්නේ නැහැ. තවත් ඛේදවාචකයක් සිද්ධ වෙනවා, මේ නැනෝ නයිට්‍රජන් ජාවාරම තුළ. ඇයි, ඒකට ජාවාරම කියන්නේ? අපට දැනගන්නට ලැබී තිබෙන දත්තවලට අනුව ඒ රටේ මේවා විකුණන්නේ රුපියල් 654කට. නමුත් අපේ රටට විකුණනවා රුපියල් 2,520ට. ඒ කියන්නේ, අපි රුපියල් 1,866ක වැඩිපුර මුදලක් ගෙවනවා. මේ තුළින් රුපියල් බිලියන 7.8ක -මිලියන 7,800ක, ලක්ෂ 78,000ක- පාඩුවක් අපේ රටට සිදුවෙනවා. මෙන්න, පොහොර ඛේදවාචකය. මෙන්න, නැනෝ නයිට්‍රජන් ඛේදවාචකය. ඒ ඔක්කොටම පසුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඊයේ දවසේ කිව්වා, "කාබනික පොහොර තීන්දුව අපි වෙනස් කර ගත්තා, ආපසු හරවා ගත්තා" කියලා. අපි විශ්වාස කරනවා, ඒක මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් ගත් නිවැරදි තීන්දුවක් කියලා. හැබැයි, ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ලේකම්තුමා එහෙම කිව්වාට පසු කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රකාශ කරනවා, "නැහැ, තවම එහෙම තීන්දුවක් අරගෙන නැහැ" කියලා. එතකොට ගරු ඇමතිතුමා එක දෙයක් කියනවා, අමාත්‍යාංශයේ ලේකම්තුමා තවත් දෙයක් කියනවා. ඒ ඔක්කොම කියන අතරතුර කෘෂිකර්ම ඇමතිතුමා කියනවා, "මේ පොහොර ගෙන්වන එකට මම සම්බන්ධ නැහැ, ඒකට සම්බන්ධ පොහොර ගෙන්වන ඇමති" කියලා. පොහොර ගෙන්වන ඇමතිතුමා මේ සභාවට ඇවිල්ලා අද උදේ කියනවා, "නැහැ, මේකට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්" කියලා. දැන් පේනවා නේද, කැඳ හැළිය. ගරු කථානායකතුමනි, මම කනගාටුවෙන් වුණත් කියන්නට ඕනෑ, ආණ්ඩුවේ මධ්‍ය ස්නායු පද්ධතිය වැඩ කරන්නේ නැහැ කියලා. ඔලුව දන්නේ නැහැ, කඳ කරන දේ; කඳ දන්නේ නැහැ, කකුල් දෙක කරන දේ; කකුල් දෙක දන්නේ නැහැ, අත් දෙක කරන දේ. කිසිම සන්නිවේදනයක් නැහැ; අදහස් හුවමාරුවක් නැහැ. මම ඉල්ලා සිටිනවා, මේ අවසාන මොහොතේ හෝ නිවැරදි තීන්දුව ගන්න කියලා. එක් එක්කෙනා සතුටු කරන්න වැරදි තීන්දු ගන්න යන්න එපා.

නිවැරදි තීන්දු ගන්න. උද්ධච්ච වෙන්න එපා. මම පෙර කිව්වා වාගේ වැරදි තීන්දුවක් අරගෙන වැරදියි කියලා හිතෙනකොට රටට කියන්න, "අපට වැරදුණා, අපි ඒකට සමාව ඉල්ලා සිටිනවා. අපි දැන් හරි මේක නිවැරදි කර ගන්නම්" කියලා. වැරැද්ද නිවැරැදි කර ගන්නවා කියලා ලේකම්තුමා කිව්වාට පස්සේ ඇමතිවරයා තවත් කථාවක් කියනවා. මේක නිර්ලජ්ජිතයි, ගරු කථානායකතුමනි. මේක දැවැන්ත ඛේදවාචකයක්. දැන්වත් මේ ඛේදවාචකයට නැවතීමේ ලකුණ තබන්න.

ගරු කථානායකතුමනි, අප්‍රිකානු මහාද්වීපයේ රටක් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න ඊළඟට මම කැමැතියි. ඔබතුමා දන්නවා නේ, 'රුවන්ඩාව' කියන රට ගැන. පසුගිය කාලයේ ගෝත්‍ර දෙකක් අතර ඒ රට අභ්‍යන්තරයේ තිබුණු මහා යුද ක්‍රියාදාමය නිසා ජීවිත ලක්ෂ 8ක් නැති වුණා. 'හුටු' සහ 'ටුට්සි' කියන ගෝත්‍ර දෙක අතර තමයි මේ මහා යුදමය තත්ත්වය ඇති වෙලා ඒ ඛේදවාචකය සිද්ධ වුණේ. මේ නිසා ලක්ෂ 10ක පිරිසක් රට අතහැර ගියා. ගරු කථානායකතුමනි, දැන් රුවන්ඩාව හඳුන්වන්නේ "අප්‍රිකානු මහාද්වීපයේ සිංගප්පූරුව" හැටියට බව ඔබතුමා දන්නවාද? ඒ ඇයි? දැන් 'හුටු' සහ 'ටුට්සි' ගෝත්‍ර දෙකම එකතු වෙලා ගෝත්‍රික වාද භේද ඔක්කෝම අමතක කරලා සහෝදරත්වයෙන්, එකමුතුභාවයෙන්, සංහිඳියාවෙන්, මිත්‍රශීලිත්වයෙන් රට ගොඩ නඟන ගමනේ ඉන්නවා. රට අතහැරලා ගිය ලක්ෂ 10ක පිරිසට වෙනමම financial incentive package එකක් දීලා තිබෙනවා, ආපසු තමන්ගේ රටට එන්න. ගරු කථානායකතුමනි, රුවන්ඩාව කරපු දේ අපේ රටේ කරන්න අපට බැරිද? ඇයි, බැරි? "එක රටක් - එක නීතියක්" කිව්ව ගමන්ම එක ජන කොට්ඨාසයක් සම්පූර්ණයෙන්ම අමතක කර දමා, වැඩක් කරන්න බැරිකම -නොහැකියාව- තුළ ජනප්‍රිය වීම සඳහා ජාති භේදය, ආගම් භේදය, වර්ණ භේදය, වර්ග භේදය, කුල භේදය, ගෝත්‍ර භේදය අවුස්සා මෙහෙම කටයුතු කරමින් රටකට ඉදිරියට යන්න පුළුවන්ද? මොකක්ද, මේ කරන විනාශය?

"එක රටක් - එක නීතියක්" කියලා මේ කරන්න හදන්නේ ගොවීන්ට නිර්මාණය කරපු ඛේදවාචකය වාගේ ඛේදවාචකයක්, එහෙම නැත්නම් තවත් ව්‍යසනයක් මේ මහා අන්ධකාරය තුළ නිර්මාණය කරන්නද? මොකක්ද, මේ කරන්නේ? මම පැහැදිලිව ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, තමුන්නාන්සේලාගේ නියෝජිත කණ්ඩායමක් රුවන්ඩාවට යවන්න කියලා. ගිහිල්ලා බලන්න, ඒ රට එක්සේසත් වෙලා කටයුතු කරන ආකාරය. ඒ රටේ සිදුවන හැම දෙයකටම මම එකඟ වෙන්නේ නැහැ. මොකද, ඇත්ත වශයෙන්ම ඒ රටේ මානව හිමිකම් උල්ලංඝනය වීම් ගණනාවක් සිද්ධ වෙනවා. ඒකට අපට එකඟ වෙන්න බැහැ. මානව හිමිකම් ආරක්ෂා කිරීම, සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ආර්ථික අයිතිය, සමාජයීය අයිතිය, සංස්කෘතික අයිතිය, ආගමික අයිතිය කියන මේ ඔක්කෝම එකට යන්න ඕනෑ. අපි පිළිනොගන්නා දේවල් රුවන්ඩාවේ තිබෙනවා. නමුත්, පුදුම ආර්ථික සමෘද්ධියක් ඔවුන් ලබන්නේ. ඔවුන් ඒ එකමුතුභාවය ශක්තියක් කරගෙන තිබෙනවා. අද ඒ රටේ ගෝත්‍රික සටන් නැහැ. මම යෝජනා කරනවා, අපි රට තුළ ස්ථාවරත්වයක් ඇති කර ගන්න ඕනෑ කියලා. රට තුළ ජාති භේදය අවුස්සන්නේ නැතුව, ආගම් භේදය අවුස්සන්නේ නැතුව, වර්ණ භේදය, වර්ග භේදය, කුල භේදය, ගෝත්‍ර භේදය අවුස්සන්නේ නැතුව අපි එක රටක් හැටියට, එක පියෙකුගේ, මවකගේ දූ දරුවන් හැටියට, එක පවුලේ

සාමාජිකයන් හැටියට එකට ඉඳිමු. අපි එක්සත්ව කටයුතු කරමු. එක්සත්කමෙන් රටේ ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාව ශක්තිමත් වෙනවා. ඒ ඔක්කෝටම වැඩිය ජාතික ආරක්ෂාව ශක්තිමත් වෙනවා. ගරු කථානායකතුමනි, දැන් ඉතින් ජාතික ආරක්ෂාව වැඩක් නැහැ නේ, තානාපතිවරු ඇවිල්ලා බලපුළුවන්කාරකම් කරලා, තානාපති කාර්යාල නියෝජිතයෝ අපේ රටේ බැංකුවලට තහංචි දමනවා නම්, අසාදු ලේඛනගත - blacklist - කරනවා නම්, මොන ස්වෛරීත්වයක්ද? මොන ජාතික ආරක්ෂාවක්ද? රට වටේ කුණු පොහොර නැව්, බාල පොහොර නැව් කැරකෙනවා නම්, මොන ජාතික ආරක්ෂාවක්ද? කෝ, ජාතික ආරක්ෂාව? කෝ, දේශ ප්‍රේමීත්වය? කෝ, දේශාභිමානය? කෝ, ජාති හිතෛෂීභාවය? මේවා නිකම් බොරු වචන නේ. ජාතික ආරක්ෂාව මහ පොළොවේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මම තවත් කරුණු දෙකක් ගැන විතරක් කථා කරලා මගේ අදහස් දැක්වීම අවසන් කරන්නම්.

මේ කොවිඩ් ප්‍රශ්නයත් සමඟ අලුත් දුප්පත්කමක් නිර්මාණය වෙලා තිබෙනවා. කොවිඩ් ප්‍රශ්නය, ආණ්ඩුවේ අදක්ෂතාව, නොහැකියාව, සැලසුම්සහගත ආර්ථික කළමනාකරණයක් නොමැතිකම තුළ අලුත් දුප්පත්කමක් නිර්මාණය වෙලා තිබෙනවා. අද මේ රටේ බහුතරයක් දුප්පත්. Income poverty තිබෙනවා. ඒ කියන්නේ, ආදායම් දුප්පත්කම. Consumption poverty තිබෙනවා. ඒ කියන්නේ, පරිභෝජන දුප්පත්කම. Food poverty තිබෙනවා. ඒ කියන්නේ, ආහාර දුප්පත්කම. මව්වරුන්ගේ, ළදරුවන්ගේ මන්දපෝෂණ ප්‍රතිශත ඉහළට යනවා. එය ජාතික ඛේදවාචකයක්, එහෙම නැත්නම් ජාතික ගැටලුවක්. ගරු කථානායකතුමනි, එහෙම නම් අපට දුප්පත්කම තුරන් කරන්න වඩාත් කාර්යක්ෂම වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මේ රටේ පවුල් ලක්ෂ 15ක්, 16ක්, 17ක් රාජ්‍ය තන්ත්‍රයේ සදාකාලික වහලුන්, එහෙයියන්, දේශපාලන අතකොළු බවට පත් කිරීම දුප්පත්කම තුරන් කිරීමක් කියා මම හිතන්නේ නැහැ. ඒ සඳහා, ඔවුන් සවිබල ගැන්වීමේ ප්‍රායෝගික ක්‍රියාවලියක් අවශ්‍යයි. ඒ වාගේම අපි යැපුම් මානසිකත්වයෙන් මිදෙන්න ඕනෑ. ඔබතුමා දන්නවාද, මෑත කාලයේ ප්‍රථම වතාවට ලෝක බැංකුව ආධාර ලබා දුන් එකම වැඩසටහන "ජනසවිය" කියලා? ලෝක බැංකුව කවදාවත් සහනාධාර - subsidies - දෙන වැඩසටහනකට තවත් ආධාර ලබා දෙන්නේ නැහැ. නමුත්, ජනසවියට ලෝක බැංකුව ආධාර දුන්නා. ඒ, ඇයි? ජනසවියට තිබුණා, පැහැදිලි වැඩසටහනක්. හැබැයි, ඒක වර්තමානයට නොගැළපෙන්න පුළුවන්. මොකද, කාලයෙන් කාලයට අලුත්, නිර්මාණශීලී වැඩ පිළිවෙළ අවශ්‍යයි. ඒ නිසා පැහැදිලිවම අද නිර්මාණය වෙලා තිබෙන මේ අලුත් දුප්පත්කමට මේ රජයේ අවධානය අනිවාර්යයෙන්ම යොමු වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම අදහස් කරනවා, මාර්ටින් ලූතර් කිං මැතිතුමා කරපු ප්‍රකාශයක් ඉදිරිපත් කරන්න. එතුමා කියා තිබෙනවා, "The ultimate measure of a man is not where he stands in moments of comfort and convenience, but where he stands at times of challenge and controversy" කියලා. ඒකේ තේරුම මොකක්ද? "මිනිසෙකු සම්බන්ධ අවසන් මිනුම ලබා ගත හැකි වනුයේ ඔහු සුවපහසු අවස්ථාවන්හි දරන ස්ථාවරය අනුව නොව, අභියෝගාත්මක හා මතභේදාත්මක අවස්ථාවන්හි දරන ස්ථාවරය හෙවත් සිටගන්නා ස්ථානය අනුවයි" කියන එක තමයි එහි තේරුම.

අද රට තිබෙන්නේ අභියෝගාත්මක අවස්ථාවක. අපි ඒක පිළිගන්නවා. අද රටේ තිබෙන්නේ අර්බුදකාරී අවස්ථාවක්. අපි ඒකත් පිළිගන්නවා. නමුත්, ඒ අවස්ථා තුළ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටින්න කියලා. එහෙම නැත්නම් නිවැරදි තැන හිටගන්න කියලා. සත්‍යවාදයට ශක්තිය ලබා දෙන්න. විද්‍යාවට මුල් තැන දෙන්න. මෙතෙක් කල් අනුගමනය කරපු මිථ්‍යාවාදී ක්‍රියාවලිය නතර කරන්න. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම දුප්පත්කම -නැතිබැරිකම, අගහිඟතා- වර්ධනය වෙලා, පෝලිම් යුගයක් බිහි වෙලා තිබෙන අවස්ථාවක මම මතක් කරන්න කැමැතියි, ෆ්‍රැන්ක්ලින් ඩිලානෝ රූස්වෙල්ට් ජනාධිපතිතුමාගේ ප්‍රකාශයක්. එතුමා කියනවා, "The test of our progress is not whether we add more to the abundance of those who have much; it is whether we provide enough for those who have too little" කියලා. ඒකෙන් කියන්නේ, "අපගේ ප්‍රගති පරීක්ෂණය සිදු වුණේ බොහෝ සෙයින් ඇති හැකි අය වෙත තවතවත් ධන ධාන්‍ය ලබා දෙන්නේ ද යන කරුණ මත නොව, නැති බැරි අය වෙත ජීවත් වීමේ හැකියාව ලබා දෙන්නේ ද යන කරුණ මතයි." කියලා.

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ රටට නව ගනුදෙනුවක් - new deal එකක් - අවශ්‍යයි. දසරාජ ධර්ම මත පදනම් වූ දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතාව මත කේන්ද්‍රගත වූ රාජ්‍ය පාලනයක් අපේ රටට අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අද වන විටත් සිරිල් ගාමිණී පියතුමාගෙන් CID එක ප්‍රශ්න කරනවා. සිරිල් ගාමිණී පියතුමා ප්‍රමුඛ සමස්ත කතෝලික ප්‍රජාව පාස්කු ප්‍රහාරයේ, පාස්කු ත්‍රස්තවාදයේ, පාස්කු නිව ක්‍රියාවේ අසහනයට පත් වුණු අය. සිරිල් ගාමිණී පියතුමා නියෝජනය කරන්නේ විපතට පත් වුණු කොට්ඨාසය. ජීවිත නැති වුණු කොට්ඨාසය; ඇස්, ඉස්, මස්, ලේ පරිත්‍යාග කරපු කොට්ඨාසය. අද දෛවයේ සරදමක් විධියට එතුමාට සිද්ධ වෙලා තිබෙනවා, CID එකට ගිහිල්ලා රස්තියාදු වෙන්න. මොකක්ද මේ කරන්නේ? මොකක්ද සිදු විය යුත්තේ? සිදු විය යුත්තේ පාස්කු ප්‍රහාරය පසුපස හිටපු මහ මොළකරුවන්, පුද්ගලයන් හෝ කණ්ඩායම් නිවැරැදිව, පිරිසිදුව, විනිවිදභාවයකින් යුක්තව අපක්ෂපාතී පරීක්ෂණයක් තුළින් සොයා ගැනීම. කාගේවත් අත්වල ලේ තැවරිලා නැත්නම් ඇයි ඒවාට භය වන්නේ? භය වෙන්න හොඳ නැහැ. තමන් නිවැරැදි තැනක ඉන්නවා නම්, තමන්ට හැකියාව තිබෙන්නට ඕනෑ, මේ ජන සමාජයේ තිබෙන සැක සංකා සියල්ලක්ම බැහැර කෙරෙන අපක්ෂපාතී පරීක්ෂණයකට යන්න. විශේෂයෙන්ම කාදිනල්තුමා ප්‍රමුඛ කතෝලික ප්‍රජාව සහ රටේ ප්‍රජාව තුළ තිබෙන්නා වූ කුකුස, කුතුහලය, විචිකිච්ඡාව, සැකය දුරුවන ආකාරයෙන් නිවැරැදි පරීක්ෂණයක් පැවැත්වීම අත්‍යවශ්‍යයි.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ අපි හැමෝගෙම ප්‍රාර්ථනාව තමයි මේ වැටී තිබෙන ආර්ථික, සමාජයීය අගාධයෙන් රටක් හැටියට ගොඩ එන්නට කටයුතු කරන එක. බංකොලොත් රටක් නිර්මාණය කිරීම අපි කිසිම කෙනෙකුගේ අභිලාෂය නොවෙයි. අරාජික රටක්, අසාර්ථක රටක්, පරාජිත රටක් නිර්මාණය කිරීමක් අපි කිසිම කෙනෙකුගේ හිතේ නැහැ. මේ රටට අපි ආදරෙයි. මේ රට අපි රැක ගන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ කාලයකට එක කණ්ඩායමකට, කාලයකට තව කණ්ඩායමකට, තවත් කාලයකට තවත් කණ්ඩායමකට රාජ්‍ය බලය ලැබෙනවා. අපි හැමෝටම තිබෙන්න ඕනෑ, එක අරමුණක්. ඒ අරමුණ තමයි, රට ආරක්ෂා කිරීම; රට දියුණු කිරීම; රට ගොඩනැංවීම. ඒ උදෙසා ප්‍රායෝගික, ප්‍රගතිශීලී විපක්ෂයක් හැටියට අපේ උපරිම සහයෝගය ලබා දෙන්න අපි සූදානම්.

අපි උද්ඝෝෂණයක් පැවැත්වූවා. අපි උද්ඝෝෂණ ගණනාවක් පවත්වලා ලොකු උද්ඝෝෂණයක් පැවැත්වූවා, ගරු කථානායකතුමනි. එහෙම කළේ රටේ ජනතාව වෙනුවෙන්, ගොවි ජනතාව වෙනුවෙන්, සාමාන්‍ය මිනිස්සු වෙනුවෙන්. අපි සතුටු වෙනවා, අපි ඒ උද්ඝෝෂණය පවත්වලා දින පහකට පස්සේ ඒ ලේකම්තුමා කියනවා, අපි U-turn එකක් දමනවා කියලා. ඒක බොහොම හොඳ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දෙයක්. මම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ ලේකම්තුමාගේ මතයේ ඉන්න කියලා. ගොවියාට අවශ්‍ය පොහොර ටික ගෙනෙන්නට කටයුතු කරන්න. දැන් ගොවියා වින්දෙව්වා ඇති. මේ වින්ද අසහනය, පීඩනය, දුක, කඳුළ, වේදනාව ඇති. මිනිසුන්ට මේවා උහුලාගන්න බැහැ, දරාගන්න බැහැ. එක වේලක් කෑවාම ඊළඟ වේල කන්නේ කොහොමද කියලායි මිනිස්සු හිතන්නේ. දරුවාට කිරි පිටි ටික අරන් දෙන්නට හැකියාවක් නැහැ. මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, මනුෂ්‍යත්වයට, -මනුස්සකමට- මිනිසුන්ගේ ඉල්ලීමට, හැඟීම්වලට ඇහුම්කන් දීලා ඒ වෙනුවෙන් කටයුතු කරන්නට කාරුණික වන්න, නම්‍යශීලී වන්න කියලා. මෙච්චර තද, දරදඬු නීති රීති ගෙනෙන්න එපා. මේ තද තැනින් පොඩ්ඩක් ඉවත් වෙලා මොළොක්භාවයක් ඇති කරගන්න. පොඩ්ඩක් මෘදු වෙන්න. ශක්තිමත්ව ඉන්න ඕනෑ තැන් තිබෙනවා. ඒක නැහැයි කියන්නේ නැහැ. ජාතික ආරක්ෂාව සුරක්ෂා කරනකොට ඒවා ගැන සාකච්ඡා බැහැ, සෘජුව ඉන්නට ඕනෑ. නමුත්, මිනිසුන්ගේ දුක ඉදිරියේ ඔවුන්ගේ දුකට පිහිටවන්න කියලා මම ආණ්ඩුවෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ජනතාවගේ කඳුළු පිසදමන යුගය නිර්මාණය කරන්න, ජන හදවතේ තිබෙන ඒ අඳෝනාව නැති කරන්න ප්‍රගතිශීලී, ප්‍රායෝගික සහනයක්, සංවර්ධනයක් උදා කරන්න. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන් ඔබතුමාටත්, මට සවන් දුන් සියලුදෙනාටත් තුති පුදනවා. ජයග්‍රාහී රටක් අපි නිර්මාණය කරමු.

[පූ.භා. 11.23]

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා (නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா - நகர அபிவிருத்தி, கழிவுப்பொருள் அகற்றுகை மற்றும் சமுதாயத் துப்புரவேற்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Nalaka Godahewa - State Minister of Urban Development, Waste Disposal and Community Cleanliness)

ගරු කථානායකතුමනි, අපේ විපක්ෂ නායකතුමාගේ දීර්ඝ දේශනයට පස්සේ කථා කරන්න ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා. අපේ විපක්ෂ නායකතුමා මේ දවස්වල හුඟක් පොතපත කියනවා. එතුමාගේ කථාවේදී අපට dictionary එක කියවන්න කියලා පවා අවවාද කළා. මට පෙනෙනවා, එතුමා ආර්ථිකය ගැන පොතපත හදාරනවා කියලා. එතුමා මේ ලෝකයේ තිබෙන ආර්ථික ප්‍රතිපත්ති රාශියක නම් කිව්වා. එහෙම කියලා කිව්වා, ඒ සියල්ල අසාර්ථක වුණා කියලා. ගරු විපක්ෂ නායකතුමනි, හුඟක් පොතපත කියවන කොට තිබෙන ප්‍රශ්නයක් තමයි සමහර වෙලාවට ඒවා අතර පටලැවිල්ලක් ඇති වෙන එක. තමුන්ගේ දර්ශනය මොකක්ද කියලා හරියාකාරව වටහා ගන්න බැරි වෙනවා.

ඔබතුමාගේ කථාව අහගෙන ඉන්න කොට මට ඇති වෙච්ච පැටලිල්ල මෙයයි, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමා එක අවස්ථාවක කියනවා, ආර්ථිකයට සෘජු රාජ්‍ය බලපෑමක් තිබෙන්න ඕනෑ කියලා. සැමට සමානව ආදායම් බෙදී යන සමාජවාදී ආර්ථික ක්‍රමයක් තිබෙන්න ඕනෑ කියලා එක වෙලාවක කියලා, අවසානයේදී ව්‍යවසායකත්වයට මුල් තැන දෙන ධනවාදී ආර්ථික ක්‍රමයක් ගැනත් කථා කරනවා. ඉතින් මෙතැන තිබෙන පටලැවිල්ල මෙයයි. විවිධ ආර්ථික ක්‍රම ගැන කථා කර කර තමුන්ගේ ආර්ථික ක්‍රමයක් ගැන වැටහීමක් නැතුව ඉන්න කොට තමයි පසු ගිය වසර පහක් තුළ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශන දහයක් ඉදිරිපත් කළා වාගේ ප්‍රශ්න ඇති වෙන්නේ.

ගරු කථානායකතුමනි, අපේ පැත්තේ කථාව නම් ඊට වඩා වෙනස්. අපි ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් කියලා එක ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළා. දැන් අපේ අය වැය දෙකක් ඇවිල්ලා තිබෙනවා. ඒ හැම එකේදීම අපි ඒ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශය පදනම් කරගෙන තමයි අපේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මුදල් ඇමතිවරයෙක් අය වැයක් ඉදිරිපත් කරන කොට රටේ බදු ගෙවන ජනතාව බලාගෙන ඉන්නවා, අය වැයෙන් මොන ආකාරයටද බදු වැඩි වෙන්නේ, නැත්නම් අඩු වෙන්නේ කියලා. රටේ සාමාන්‍ය ජනතාව බලාගෙන ඉන්නවා, අය වැයෙන් මොන ආකාරයේ සහන ඔවුන්ට ලැබේවිද කියලා. පසු ගිය අවුරුදු දෙකේ ගෝලීය කොරෝනා වසංගතය නිසා රජයේ ආදායමත් අඩු වෙලා අපි මුහුණු දුන්නු ආර්ථික දුෂ්කරතා නිසා බොහෝ දෙනෙක් විශේෂයෙන් විපක්ෂයේ -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ බොහෝ දෙනෙක් බලාපොරොත්තු වුණා, මේ අය වැයෙන් විශාල වශයෙන් බදු වැඩි වෙයි කියලා. නමුත් අපේ නව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඉතාම අභියෝගාත්මක කාලපරිච්ඡේදයක මුදල් ඇමතිකම භාර අරගෙන ජනතාවට බරක් නොවන අය වැයක් ඉදිරිපත් කිරීම ගැන. මෙවර අය වැයෙන් සාමාන්‍ය ජනතාවට කිසිදු ආකාරයකින් බදු වැඩි කිරීමක් කරලා නැහැ. ව්‍යාපාර මත පනවා තිබෙන එකවර පමණක් අය කරන අධිභාර බද්දත් බලපාන්නේ සීමිත සමාගම් ප්‍රමාණයකට. මූල්‍ය සමාගම් මත එකතු කළ අගය මත බද්ද සියයට තුනකින් වැඩි කරලා තිබෙනවා. ඒ හැරුණු විට ව්‍යාපාරවලට අලුතෙන් හඳුන්වා දී තිබෙන එකම බද්ද සියයට තුනේ සමාජ සංරක්ෂණ දායක මුදලයි. කොවිඩ් වසංගතය නිසා බලපෑමට ලක් වූ ආර්ථිකය යළි යථා තත්ත්වයට පත් කිරීමට දායකත්වයක් ලෙසයි එය යෝජනා කරලා තිබෙන්නේ.

ඒ එක්කම, ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන, වෑන් රථහිමියන්, ත්‍රිරෝද රථ හිමියන් හා පෞද්ගලික බස් හිමියන් සඳහා සහන, කොවිඩ් නිසා රැකියා අහිමි වූවන්ට සහන, ගෘහ ආර්ථික සුරක්ෂිතතා වැඩසටහන යටතේ ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ මල්ල, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා ඇති අයට පහසුකම්, රාජ්‍ය නිලධාරීන් සඳහා යතුරු පැදි, විශ්‍රාමිකයන්ගේ සහ ගුරුවරුන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම ආදී වශයෙන් තෝරා ගත් ක්ෂේත්‍ර ගණනාවකට මුදල් ඇමතිතුමා සහන ලබා දීලා

තිබෙනවා. මට කලින් කථා කරපු විපක්ෂ නායකතුමා ආර්ථිකය ගැන ගොඩක් කථා කළා කියලා මම කිව්වා. ඒවා අහගෙන ඉන්න කොට අපට එන ගැටලුව තමයි, මේ විශාල ආර්ථික දැනුම ඇයි එතුමන්ලාගේ පාලන කාලයේ පාවිච්චි කරන්න බැරි වුණේ කියලා. පසු ගිය සතියේ මේ විවාදය පුරා අප විවේචනය කරපු -මේ අය වැය විවේචනය කරපු- විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා බහුතරය 2015 -2019 කාලයේ යහ පාලන රජයේ කොටස්කරුවන්. අද අපට වැදි බණ කියන, ආර්ථික විශේෂඥයන් කියලා තමුන් හඳුන්වා ගන්න ඒ අය ඉදිරිපත් කරපු වාර්ෂික අය වැය පහෙන් අවසානයේ මොකක්ද එතුමන්ලා අපට ඉතුරු කළේ කියලා අපි පොඩ්ඩක් බලමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසරින් වසර අපේ ආර්ථික වර්ධන වේගය පහළට ඇවිල්ලා 2019 වන විට අපට ඉතුරු වෙලා තිබුණේ ආසියාවේ පහළතම ආර්ථික වර්ධන වේගය වන සියයට 2.3ක්. ඒ වසරේ අපේ අසල්වැසි මාලදිවයිනේ ආර්ථික වර්ධන වේගය සියයට 7යි; බංග්ලාදේශයේ සියයට 8.3යි; නේපාලයේ සියයට 6.7යි; ඉන්දියාවේ සියයට 4යි; වියට්නාමයේ සියයට 7යි; පිලිපීනයේ සියයට 6යි. අන්න ඒක තමයි මේ ගොල්ලන්ගේ ආර්ථික කළමනාකරණය.

නිදහස ලබාගත් දිනයේ සිට වසර 66ක් තිස්සේ ක්‍රමයෙන් වැඩි වූ අපේ රටේ ණය බර 2014 වන විට රුපියල් බිලියන 7,400ක මට්ටමට පැමිණ තිබුණා. ඉතිරි වසර 5 තුළ යහ පාලන ආණ්ඩුව මේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 13,000 දක්වා ඉහළ දමා තිබුණා. ඒ කියන්නේ, වසර 5ක් තුළ සියයට 76ක වැඩි වීමක්. වසර 5ක් තුළ අපේ රටේ කිරි දරුවාගේ ඉඳලා මහල්ලා දක්වා අලුතින් රුපියල් 254,000කින් ලෝකයට ණය කළා. ඒ ප්‍රමාණයත් එකතු වුණාම, 2019 අවසන් වන විට අපේ රටේ ඒකපුද්ගල ණය ප්‍රමාණය රුපියල් 590,000ක් වෙලා තිබුණා.

ඒ කාලය තුළ රුපියලේ අගය බරපතළ ලෙස කඩා වැටීමකට ලක් වුණා. වසර 5ක් තුළ සියයට 40ක පමණ කඩා වැටීමකට ලක් වුණා. 2014දී ඩොලරය රුපියල් 131යි. 2019 අවසන් වන විට ඩොලරය රුපියල් 186යි. ඔබතුමන්ලාගේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ඉතා දුර්වල වුණා. 2014 වන විට රුපියල් බිලියන 600 දක්වා අඩු කර තිබූ අය වැය පරතරය, 2019 වන විට රුපියල් බිලියන 1,000 දක්වා වැඩි කරලා තිබුණා. 2014 දී රුපියල් බිලියන 1,195ක් වෙච්ච බදු ප්‍රමාණය, 2019 වන විට රුපියල් බිලියන 1,735 දක්වා වැඩි වී තිබුණා. එය සියයට 70ක වැඩි වීමක්. නමුත්, ඊට සාපේක්ෂව ආර්ථිකයේ වර්ධනයක් සිදු වුණේ නැහැ. මේ කාලය තුළ රාජ්‍ය බදු, දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 9.5 සිට සියයට 11.5 දක්වා වැඩි වී තිබුණා. අපේ මුදල් ඇමතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා, මේ ප්‍රමාණය ඉදිරි වසර කීපය තුළ ක්‍රමක්‍රමයෙන් අඩු කරනවා කියලා.

ව්‍යාපාර මත බදු වැඩි වීමට අමතරව ඔවුන්ට ණය සඳහාත් විශාල පොලියක් ගෙවන්න සිදු වුණා. අපට මතකයි, 2014 වන කොට රටේ පොලී අනුපාතය තනි ඉලක්කමේ තිබුණේ. නමුත්, 2019 තමුන්නාන්සේලා අපට රට භාර දෙනකොට පොලී අනුපාතය දෙගුණයකට වඩා වැඩි වෙලා තිබුණා.

බදු බර හා පොලී අනුපාතයේ වැඩි වීම මේ රටේ ව්‍යාපාරවලට, විශේෂයෙන්ම කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවලට බලපෑවා. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් නඟා සිටුවීම ගැන ගරු විපක්ෂ නායකතුමා කථා කරනවා. නමුත්, එතුමන්ලාගේ අවුරුදු පහක පාලන කාලය තුළ මොකක්ද වුණේ? බොහෝ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර බංකොලොත් වුණා. බොහෝ ව්‍යාපාර අතහැර දමනු ලැබුවා.

ගරු විපක්ෂ නායකතුමා අපේ විදේශ සංචිත ගැනත් කථා කළා. සංචිතවල තත්ත්වය කොහොමද කියලා මම කියන්නම්. 2005දී අපට තිබුණේ ඩොලර් බිලියන 2.7ක සංචිත පමණයි. යුද්ධයකුත් අවසන් කරලා වසර 9ක් තුළ ඒ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 8.3 දක්වා ඉහළ ගෙනයන්නට ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නායකත්වය දුන් 2005-2014 රජයට පුළුවන් වුණා. එම වර්ධන වේගය දිගටම පවත්වාගෙන ගියා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 වන විට බිලියන 13ක් හෝ 14ක විදේශ සංචිත අප සතුව තිබිය යුතුව තිබුණා. හම්බන්තොට වරාය අවුරුදු 200කට බදු දීලා ගත්තයි කියන ඩොලර් බිලියනයත් ඒකට එකතු වුණා නම් අඩු ගණනේ ඩොලර් බිලියන 15ක සංචිත 2019 වන විට තිබිය යුතුයි. නමුත්, එතුමන්ලා කීයද අපට භාර දුන්නේ? තිබිච්ච ප්‍රමාණයට වඩා අඩු කරලා ඩොලර් බිලියන 7.2යි. එයිනුත් වැඩි කොටසක් කෙටි කාලීන ණය වශයෙන් ලබාගත් මුදල්.

අද අපිට උපදෙස් දෙන මේ ආර්ථික විශේෂඥයෝ, ගමේ භාෂාවෙන් කියනවා නම් ඔස්තාර්ලා, එදා මේ විදියට ආර්ථිකය අවකළමනාකරණය කරන විට එය සාධාරණීකරණය කරන්න උත්සාහ කළා. එදා කිසිදු ආකාරයක ගෝලීය අර්බුදයක් තිබුණේ නැහැ, ලෝකයේ තෙල් අර්බුදයක් තිබුණේ නැහැ, මූල්‍ය අර්බුදයක් තිබුණේ නැහැ, ආහාර අර්බුදයක් තිබුණේ නැහැ, අද වාගේ ගෝලීය වසංගතයක් තිබුණේ නැහැ. මෙතුමන්ලාගේ නොහැකියාව තමයි තිබුණු එකම වසංගතය.

වර්තමාන රජය බලයට එනවිට මේ තත්ත්වයෙන් රට මුදා ගන්නට පැහැදිලි සැලැස්මක් ඇතිවයි ආවේ. කරන්න ඕනෑ දේ අපි පැහැදිලිව කිව්වා. ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දැම්මා. ඒක අපි ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. වත්මන් රජය බලයට පැමිණි විගසම ජනතාව මත පනවා තිබූ අසීමාන්තික බදු අඩු කළා. බදු ක්‍රමය සරල කළා. ව්‍යාපාරිකයන්ට සහනයක් දීම සඳහා පොලී අනුපාතයෙන් අඩු කළා. නවතා දමා තිබූ ව්‍යාපෘති රාශියක් යළි ආරම්භ කොට ආර්ථිකයට උත්තේජනයක් ලබා දුන්නා. මෙතුමන්ලා කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ ඉඳලා තිබෙන ව්‍යාපෘති ඔක්කෝම නතර කරලා තමයි වැඩේ පටන් ගත්තේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා තමයි ආර්ථික ව්‍යසනය පටන් ගත්තේ. අපි ප්‍රතිඅපනයන නතර කරලා දේශීය අපනයන භාණ්ඩ නිෂ්පාදකයන්ට හොඳ මිලක් ලබා දුන්නා. නමුත්, ගෝලීය වසංගත තත්ත්වය නිසා අපට මෙතෙක් පාලනය කර ගන්න බැරි වූ එක දෙයක් තිබෙනවා නම් ඒ තමයි අද රට මුහුණ පා තිබෙන ඩොලර් අර්බුදය. මේක මුදල් ඇමතිතුමා නැවත නැවත කියලා තිබෙනවා. අපි සත්‍යය ප්‍රකාශ කරනවා. අපට අර්බුදයක් තිබෙනවා කියලා අපි කියනවා. හැබැයි, මේ අර්බුදය අපි නිර්මාණය කරපු දෙයක් නොවෙයි. නමුත්, අද මේ රටේ තිබෙන ආර්ථික ප්‍රශ්න රාශියකට මුල තිබෙන්නේ මෙතැනයි.

අද මේ රටේ සාමාන්‍ය ජනතාව කථා කරන ප්‍රධාන ආර්ථික ගැටලු දෙකක් තිබෙනවා. එකක් තමයි, භාණ්ඩ මිල ඉහළ යාම. දෙවැනි එක තමයි, වෙළෙඳ පොළේ භාණ්ඩ හිඟකම. මේ දෙකම අපි පිළිගන්නවා. අපි සත්‍යවාදී වනවා. අපි මේවා නැහැ කියන්නේ නැහැ. ජනතාව අහනවා, ඇයි මේ ප්‍රශ්නවලට ආණ්ඩුවට තවම විසඳුම් දෙන්න බැරි කියලා. අන්න ඒ කාරණය අපි බුද්ධිමත්ව විග්‍රහ කරන්නට ඕනෑ. මම උත්සාහ කරන්නම් මේක සරලව පැහැදිලි කරන්න.

අපි දන්නවා 1977ට කලින් මේ රටේ තිබුණේ සංවෘත ආර්ථික ක්‍රමයක් බව. නමුත්, 1977න් පස්සේ නිදහස් ආර්ථික ප්‍රතිපත්තියක් මේ රටට හඳුන්වා දෙනු ලැබුවා. අදත් අඩු වැඩි වශයෙන් මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ 1977දී හඳුන්වා දුන් නිදහස් ආර්ථික ප්‍රතිපත්තියමයි. ඔබතුමන්ලා මොනවා කථා කළත් ඇත්ත කථාව

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

ඒක තමයි; යථාර්ථය ඒකයි. අද නිදහස් ආර්ථික ක්‍රමයක් තිබෙන්නේ. ඒ නිදහස් ආර්ථික ක්‍රමය තුළ භාණ්ඩ හා සේවා මිල තීරණය වන්නේ, ඉල්ලුම හා සැපයුම මතයි.

අද රටේ නිෂ්පාදනය මෙන්ම වෙළෙඳාම බහුතරයක් කරනු ලබන්නේ පෞද්ගලික අංශය විසින් නිසා ඉල්ලුම හා සැපයුම මුළුමනින්ම පාලනය කරන්න රජයට හැකියාවක් නැහැ. ඒකට ඍජුව මැදිහත් වීමට රජයට හැකියාවක් නැහැ. නමුත් වක්‍ර ආකාරයට මිල පාලනය කරන්න පුළුවන් මෙවලම් තවමත් රජය සතුව තිබෙනවා. මීට පෙරත් සෑම රජයක්ම භාවිත කළ මෙවලම වන්නේ, ආනයන අපනයන බදු හරහා යම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම හා සැපයුම තුලනය කිරීමයි. ඒක තමයි සාමාන්‍යයෙන් වෙළෙඳ ඇමතිතුමන්ලා කරන්නේ. මිල පාලනය කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. අපි ඒක ප්‍රායෝගිකව දැකලා තිබෙනවා. නමුත් අවාසනාවකට වාගේ, මේක අද කරන්න අසීරුතාවක් තිබෙනවා. භාණ්ඩයක මිල වැඩි වනකොට සාමාන්‍යයෙන් කරන්නේ පෞද්ගලික වෙළෙන්දන් දිරි ගන්වන්න, රජය එම භාණ්ඩය මත ආනයන බදු අඩු කිරීමයි. එතකොට වෙළෙන්දෝ වැඩි වශයෙන් එම භාණ්ඩය ආනයනය කරනවා. සැපයුම වැඩි වනකොට වෙළෙඳ පොළේ මිල අඩු වෙනවා. නමුත් ඩොලර් අර්බුදය නිසා අද ඒක කර ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. බදු අඩු කළත් වෙළෙඳ පොළේ විදේශ විනිමය ඌනතාවක් තිබෙනවා නම්, භාණ්ඩ ආනයනය කරන්න බැහැ.

මේ තත්ත්වය ඇති වුණේ කොහොමද? අපි බැලුවොත්, පසුගිය වසර ගණනාවක ආනයන අපනයන දත්ත විමර්ශනය කළාම අපට පෙනෙනවා, සෑම වසරකම ඩොලර් බිලියන අටක, ඩොලර් බිලියන නවයක විතර වෙළෙඳ පරතරයක් තිබිලා තිබෙනවා. ඒ කියන්නේ අපේ අපනයන ආදායමට වඩා ආනයන වියදම වැඩියි. උදාහරණයක් කියනවා නම්, 2019දී අපි ඩොලර් බිලියන 12ක් වටිනා නිෂ්පාදන පිට රට යවනකොට ඩොලර් බිලියන 20ක් වටිනා නිෂ්පාදන ආනයනය කරලා තිබෙනවා. 2019-2020 වසර දෙක තුළ පමණක් වෙළෙඳ පරතරය එකතු කළාම ඩොලර් බිලියන 14ක් වෙනවා. ඒවා පිට රටට ගිය මුදල්. සාමාන්‍යයෙන් මේ පරතරය අපි පියවා ගන්නේ සංචාරක ව්‍යාපාරයෙන් එන ආදායමෙන්, විදේශ ශ්‍රමිකයන් එවන ප්‍රේෂණවලින්, විදේශ ආයෝජනවලින් ලැබෙන ආදායමෙන්, අලුතෙන් ලබා ගන්නා ණයවලින් සහ විදේශ ආධාරවලිනුයි. සාමාන්‍ය තත්ත්වයක් යටතේ සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 4.5ක් පමණ, විදේශ ශ්‍රමිකයන්ගෙන් ඩොලර් බිලියන 7ක් පමණ, විදේශ ආයෝජන සාමාන්‍යයෙන් වසරකට ඩොලර් බිලියන 1.5ක් පමණ බලාපොරොත්තු වෙන්න පුළුවන්. නමුත් පසුගිය වසර කිහිපයේදී ගෝලීය කොරෝනා වසංගතය නිසා මේ සියලු අංශ කඩා වැටුණා.

සංචාරක ව්‍යාපාරය කඩා වැටීම නිසා පමණක් වසර දෙකක් තුළ අපට ඩොලර් බිලියන අටක පමණ ආදායමක් අහිමි වුණා. කොරෝනා නිසා විදේශ ශ්‍රමිකයන් ලක්ෂ දෙකක් පමණ ලංකාවට ආවා. ගෝලීය වසංගත තත්ත්වය තුළ අපට ප්‍රමාණවත් විදේශ ආයෝජන අලුතෙන් ආවෙත් නැහැ. ඒ නිසා රජය රට භාර ගන්නා විටත් ඊට අමතරව විශාල ණය බරක් තිබුණා. ඒ නිසා තවදුරටත් විදේශ ණය ලබා ගැනීමේ අසීරුතාවකුත් තිබුණා. ඊට අමතරව මින් පෙර රජයන් ගණනාවක් විසින් ගත්ත ණය නිසා 2020-2021 වසරවල අපට ඩොලර් බිලියන 11ක විතර විදේශ ණය වාරික ගෙවිය යුතුව තිබුණා. මෙන්න මේ සියලු දේවල්වල ප්‍රතිඵලයක් වශයෙන් තමයි විදේශ සංචිත ප්‍රමාණය මේ වන විට ඩොලර් බිලියන 2.8කට පමණ අඩු වෙලා තිබෙන්නේ. භාණ්ඩ ආනයනය කරන ලද වෙළෙන්දන් ළඟ ඩොලර් නැහැ. ඔවුන් රුපියල් දීලා බැංකුවලින් ඩොලර් ඉල්ලා ගන්න ඕනෑ. බැංකුවේ ඩොලර් නැත්නම් ඒ බැංකුව මහ බැංකුවට කියලා ඩොලර් මාරු කර ගන්න ඕනෑ. නමුත් මහ බැංකුවේ ඩොලර් නැත්නම්, සංචිත අඩු වෙලා නම්, ඒක රටට ප්‍රශ්නයක්. ඒක තමයි මේ වෙලාවේ භාණ්ඩ මිල ඉහළ යාමට හා භාණ්ඩ හිඟයට ක්ෂණික විසඳුම් ලබා දීමට රජයට ඇති අපහසුතාව. නමුත් 2014දී මහ බැංකුව පුරෝකථනය කළ ආර්ථික වර්ධනය දිගටම පවත්වාගෙන යන්න පසුගිය රජය සමත් වුණා නම්, අද මේ තත්ත්වය ඇති නොවෙන්න තිබුණා. අපි එදා පුරෝකථනය කළේ මොකක්ද? 2019 වසර වන විට ඩොලර් බිලියන 145ක ආර්ථිකයක්. නමුත් යහ පාලන රජය අපට භාර දුන්නේ, ඩොලර් බිලියන 81ක ආර්ථිකයක්, ඉලක්කයට වඩා ඩොලර් බිලියන 64ක් පිටුපසින්. 2014දී ඩොලර් බිලියන 8.3ක්ව තිබූ ඩොලර් සංචිත පසු ගිය අවුරුදු පහ තුළ වැඩි කරන්නට පසුගිය රජය සමත් වුණා නම්, අද මේ තත්ත්වය ඇති නොවෙන්න තිබුණා. අපි පුරෝකථනය කළේ ඩොලර් බිලියන 15ක පමණ සංචිත. නමුත් තමුන්නාන්සේලා අපට භාර දුන්නේ ඩොලර් බිලියන 7.2ක් පමණයි. පසු ගිය වසර පහ තුළ විශාල වශයෙන් කෙටි කාලීන විදේශ ණය ලබා නොගත්තා නම්, අද මේ තත්ත්වය ඇති නොවන්න තිබුණා. ඒ විතරක් නොවෙයි, 2014දී රටේ ණය බර රුපියල් බිලියන 7,400යි. 2019 වන විට ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 13,000ට ගෙනිහිල්ලා තිබුණා. අපි ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වලින් පහළට වැටිලා, ණය ලබා ගැනීමට අපහසු වෙලා තිබෙන්නේ ඒ නිසායි. පසු ගිය වසර පහ තුළ එදා අපි සැලසුම් කළ ආකාරයට අපනයනය වැඩි කර ගත්තා නම්, මේ තත්ත්වය ඇති නොවෙන්න තිබුණා. 2014 වසර අවසාන වන විට රටේ අපනයන ආදායම ඩොලර් බිලියන 11.2ක් තිබුණා. නමුත් අවුරුදු පහකට පසුවත් තමුන්නාන්සේලා අපට රට භාර දෙන විට අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 11.9යි. එතකොට කොහොමද සංචිත වැඩි වෙන්නේ?

යහ පාලන රජයේ පස් වසරක කාලය තුළ ඒ කිසිවක් සැලසුම් කළ ආකාරයට සිදු නොවීම තමයි අද අපි මේ මුහුණ දෙන ඩොලර් අර්බුදයට හේතුව වෙලා තිබෙන්නේ. මේවාට අවශ්‍ය විසඳුම් ගැන අපි හැමෝම කථා කරනවා. අපි විසඳුම් දන්නවා. රටට විදේශ විනිමය ගෙන එන්න පුළුවන් මාර්ග කිහිපයක් තිබෙනවා. ඒවා තමයි, ලෝකය තුළ ඉල්ලුමක් තිබෙන, ලංකාවට සැපයුම්කරුවෙක් විය හැකි ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවා දිරිමත් කිරීම, සංචාරක ක්ෂේත්‍රය අවම වශයෙන් 2018 තිබුණු තත්ත්වයට ගෙන ඒම, විදේශ ශ්‍රමිකයන්ගෙන් එන ආදායම වැඩි කර ගැනීම සඳහා පරිසරය සකස් කිරීම, විදේශ ආයෝජනවලට රට තුළ තිබෙන ආකල්පමය හා පරිපාලන බාධක ඉවත් කරලා හැකිතාක් ඉක්මනින් ප්‍රමාණවත් විදේශ ආයෝජන රටට ආකර්ෂණය කර ගැනීමට කටයුතු කිරීම වැනි ක්‍රම. තවදුරටත් ණය ලබා ගැනීම මේ වෙලාවේ අපි අනුමත නොකළත්, අපට සමහර විට වෙනත් විකල්පයක් නැහැ. කෙටි කාලීන විසඳුමක් විධියට සමහර විට විදේශ ණය පහසුකම් දිහාත් බලන්න වෙනවා. අපි දන්නවා, අපේ මුදල් ඇමතිතුමා මේ කරුණු ඉතාම හොඳින් අධ්‍යයනය කරලා තිබෙන බව. එතුමා මේ ක්ෂේත්‍ර ගැන අය වැය තුළ සාකච්ඡා කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ප්‍රායෝගිකව එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා විශාල උත්සාහයක් දරමින් ඉන්නවා. මේ මොනවා කළත්, දීර්ඝ කාලීනව බඩු මිල ඉහළ යෑම පාලනය කරන්න පුළුවන් හොඳම ක්‍රමය තමයි, තමුන්නාන්සේලාත්, අපිත් දෙගොල්ලන්ම කියන ආකාරයට නිෂ්පාදනය වැඩි කිරීම. ඒ නිසා තමයි එතුමා නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කරන්නේ. ලෝකයේ දියුණු හැම රටකම වාගේ ඉතාම ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයක් තිබෙනවා. හැබැයි, අපි එක දෙයක් මතක තබා ගන්න ඕනෑ. මොනම රටකටවත් තමන්ගේ රට වැසියන්ට අවශ්‍ය සෑම භාණ්ඩයක්ම සාධාරණ මිලකට දේශීය වශයෙන් නිෂ්පාදනය කරන්න බැහැයි කියන යථාර්ථයත් අපි වටහා ගන්න ඕනෑ. සමහර

භාණ්ඩ රට තුළ නිෂ්පාදනය කරනවාට වඩා සුදුසුයි ඒ භාණ්ඩ අපට වඩා අඩු මිලකට නිෂ්පාදනය කරන්න පුළුවන් රටකින් ගෙන්වා ගැනීම. ඒ ගැනත් රජය සැලකිලිමත් විය යුතුයි කියා මා විශ්වාස කරනවා.

නිෂ්පාදනය වැඩි කිරීම ගැන කථා කරන විට අපෙනුත් යම් යම් අඩුපාඩු සිදු වුණා නම් රජය මැදිහත්වෙලා ඒවා විසඳන්න ඕනෑ. ස්වයං විවේචන මෙන්ම ජනතාවට ඇහුම් කන් දීම ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගයක්. ඒවා ගැන ලජ්ජා වෙන්න ඕනෑ නැහැ. ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන සියලු අරමුණු ඉටු කර ගැනීම දේශපාලනඥයන්ට පමණක් කළ හැකි දෙයක් නොවෙයි. දේශපාලනඥයන්ට ප්‍රතිපත්ති තීරණය කරන්න පුළුවන්. නමුත් ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී නිලධාරින්ටත් විශාල වග කීමක් පැවරෙනවා. ඒ නිසා අපි මේ රටේ ප්‍රධන තනතුරු දරන සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලනවා, මේ අසීරු අවස්ථාවේ ඔබගේ උපරිම සහාය රජයට ලබා දෙන්න කියලා. රට රැකුණොත් අපි සියලුදෙනාම රැකෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රට සංවර්ධනය වුණොත් අප සියලුදෙනාගේම ජීවිත යහපත් වෙනවා. ඒ නිසා විවේචනයට යොදවන කාලයෙන් වැඩි කොටසක් රටේ අවශ්‍යතා වෙනුවෙන් වැය කරමුයි කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ප්‍රමාණවත් නැති නිසා කථාවේ නිරවද්‍යතාව සඳහා මගේ සම්පූර්ණ කථාව **සභාගත*** කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[மு.ப. 11.39]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
நன்றி, பிரதிச் சபாநாயகர் அவர்களே!

இலங்கையின் தற்போதைய பொருளாதார வீழ்ச்சிக்குக் 'கொவிட்' தொற்று ஒரு காரணமாக இருந்தாலும், தவறான நிதி முகாமைத்துவமும் தவறான கொள்கைகளுமே மிகமுக்கிய காரணங்களாக அமைகின்றன. இலங்கை போன்ற சிறிய நாட்டில், வருமானத்தை மீறிய மிகப்பெருந்தொகையை நாட்டில் மாறி மாறி வரும் அரசாங்கங்கள் ஒவ்வோர் ஆண்டும் பாதுகாப்புக்காக ஒதுக்குவதும் இலங்கையின் தொடர்ச்சியான பொருளாதாரப் பாதிப்புக்கு மிகவும் முக்கிய காரணமாக அமைகின்றது என்பதை நான் இந்த நேரத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அந்தவகையில், யுத்தம் முடிந்ததன் பிற்பாடு 2010ஆம் ஆண்டு 202.22 பில்லியன், 2011ஆம் ஆண்டு 215.21 பில்லியன், 2012ஆம் ஆண்டு 229.9 பில்லியன், 2013ஆம் ஆண்டு 289.5 பில்லியன், 2014ஆம் ஆண்டு 253.9 பில்லியன், 2015இல் 285 பில்லியன், 2016ஆம் ஆண்டு 306.66 பில்லியன், 2017ஆம் ஆண்டு 284.04 பில்லியன், 2018ஆம் ஆண்டு 290.71 பில்லியன், 2019ஆம் ஆண்டு 393.07 பில்லியன், 2020ஆம் ஆண்டு 312.38 பில்லியன், 2021ஆம் ஆண்டு 355.16 பில்லியன் என்றவகையில் ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்ட அதேவேளை, தற்பொழுது 2022ஆம் ஆண்டுக்காக 373.05 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. அதாவது, யுத்தம் முடிவடைந்த பின்பு மொத்தமாக 3,790.8 பில்லியன் ரூபாய் - முப்பத்தேழு இலட்சத்துத் தொண்ணூறாயிரத்து எண்ணூறு மில்லியன் ரூபாய் - ஒதுக்கப்பட்டிருக்கின்றது என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

"அரச சேவையாளர்கள் நாட்டுக்குச் சுமை" என்று அரசாங்கம் கூறுகின்றது. ஆனால், படைத்தரப்பே நாட்டிற்குச் சுமை என நான் கூறுகின்றேன். ஆட்சியாளர்கள் தங்களுடைய ஆட்சியைக் கொண்டுசெல்வதற்கு இராணுவத்தினரின் ஒத்துழைப்பினைப் பெறுவதற்கும், இராணுவத்தின் வாக்கு வங்கிக்காகவும்தான் பாதுகாப்பின்பேரில் நிதி ஒதுக்கீடு செய்கின்றார்கள். அரச சேவையில் நிபுணத்துவம்கொண்ட அரச சேவையாளர்களைத் தவிர்த்து, ஓய்வுநிலை இராணுவ அதிகாரிகளை அமைச்சுக்களின் செயலாளர்களாகவும், பணிப்பாளர்களாகவும் நியமித்து, நிபுணத்துவ அரச சேவையாளர்களைக் கட்டுப்படுத்த முயற்சிசெய்வதனால்தான் இன்று பல அமைச்சுக்களில் இருந்து பல நிபுணர்கள் தாமாகவே பதவி விலகியுள்ளார்கள் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நாட்டில் உள்ள பயங்கரவாதத் தடைச்சட்டம், வெளிநாட்டு முதலீட்டாளர்கள் இலங்கையில் முதலீடு செய்வதைத் தடுக்கிறது. குறிப்பாக, உலகப் பரப்பில் உள்ள ஈழத் தமிழர்கள் சொந்த மண்ணில் மிகவும் பற்றுக்கொண்டவர்கள். அவர்கள் இங்கு முதலீடு செய்ய முன்வந்தால் அவர்களைப் பயமுறுத்திப் பணம் பறிப்பது, பயங்கரவாதப் பிரிவுக்கு அழைத்துப் பயமுறுத்துவது போன்ற செயற்பாடுகள் இந்த நாட்டில் அவர்களுடைய முதலீட்டைத் தடுக்கிறது. இலங்கைக்கு மிக முக்கியமான வருமானத்தை ஈட்டித் தருகின்ற துறையாகச் சுற்றுலாத்துறை காணப்படுகின்றது. அந்தவகையில், இலங்கைக்குச் சுற்றுலாப் பயணிகளாக வருபவர்களில் 50 வீதத்திற்கு மேற்பட்டவர்கள் வடக்கு, கிழக்கைச் சேர்ந்த புலம்பெயர் தமிழர்கள் என்பதை இச்சந்தர்ப்பத்தில் நினைவுபடுத்த விரும்புகின்றேன். புலம்பெயர் தமிழர்கள் பொருளாதாரத்தில் மிகவும் பலமாக உள்ளார்கள். ஆகவே, அவர்களால் மட்டுந்தான் இலங்கையைக் காப்பாற்ற முடியும் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இந்த அரசாங்கம் அதிரடியாக முடிவெடுத்த பசளைக் கொள்கை காரணமாக விவசாயிகள் இன்று வீதியில் இறங்கி நிற்கின்றார்கள். வடக்கு மீனவர்கள், இந்திய மீனவர்களின் இழுவைப் படகுகள் காரணமாகவும் தென்பகுதி மீனவர்களின் அத்துமீறல் காரணமாகவும் பட்டினிச்சாவுக்குள் தள்ளப்பட்டுள்ளார்கள். மேய்ச்சல் நிலம் பறிபோகின்றமை காரணமாக கால்நடைப் பண்ணையாளர்களும் வீதியில் உள்ளார்கள். அத்தியாவசியப் பொருட்களின் விலையேற்றம், எரிபொருள், எரிவாயு, பால் மா, சீமெந்து, கட்டடப் பொருட்கள் போன்ற பொருட்களின் விலையேற்றம் மற்றும் பொருட்களின் தட்டுப்பாடு காரணமாகச் சாதாரண மக்கள் முதல் அரச சேவையாளர்கள் வரை எப்படி வாழப்போகின்றோம் எனப் பதட்டமான சூழ்நிலைக்குள் தள்ளப்பட்டுள்ளார்கள். கட்டட ஒப்பந்தக்காரர்கள் கட்டடப் பொருட்களின் விலை அதிகரிப்பினால் என்ன செய்வதென்று தெரியாமல் உள்ளார்கள்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

இந்த அரசாங்கம் தமிழர்களுடைய இருப்பை அழிப்பதற்கு வடக்கு, கிழக்கில் எங்களுடைய நிலங்களை அபகரித்துச் சிங்கள மக்களுக்கு வழங்கி வருகின்றது. வடக்கு, கிழக்கின் எல்லை மாவட்டங்களான முல்லைத்தீவையும் திருகோணமலையையும் பிரிக்கின்றவகையில் மகாவலி அதிகாரசபையினூடாகவும் வன பரிபாலனத் திணைக்களத்தி னூடாகவும் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தி னூடாகவும் தமிழர்களுக்குப் பல்வேறு தடைகளை ஏற்படுத்திச் சிங்கள மக்களுக்குக் காணிகளை வழங்கி வருகின்ற நடவடிக்கை மிக அவசரமாக மேற்கொள்ளப்படுகின்றது.

வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களில் 2010ஆம் ஆண்டுக்குப் பிறகு குடியேறிய சிங்கள மக்களுக்கு விவசாய நிலம் வழங்குவதற்காக ஹிபுல்ஓயா திட்டத்தை அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. இவை தமிழர்களுடைய பூர்வீக நிலங்களாகும். வட மாகாணத்தில் தமிழர்களுடைய இன விகிதாசாரத்தைக் குறைப்பதற்கு, அநுராதபுர மாவட்டத்தில் இருக்கின்ற 1,030 சிங்களக் குடும்பங்களை வவுனியா மாவட்டத்திற்கு மாற்றுகின்ற செயற்பாடு அரசாங்கத்தால் முன்னெடுக்கப்பட்டு வருகின்றது.

இறுதியாக, மிக முக்கியமான ஒரு விடயத்தைக்கூறி முடித்துக்கொள்கின்றேன். கடந்த 18ஆம் திகதி மன்னார் மாவட்டத்தில் ஆண்டான்குளம் மாவீரர் துயிலும் இல்லத்தி லிருந்த பிரதான சுடரேற்றும் பீடத்தை இரவோடிரவாக இடித்தழித்துள்ளார்கள். அரசாங்கத்தின் இந்தச் செயற்பாட்டை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். தமிழர்களுடைய இன விடுதலைக்காகப் போராடி, வீர காவியமாகிய மாவீரர்களின் வித்துடல்கள் விதைக்கப்பட்ட புனிதமான இடம்தான் மாவீரர் துயிலும் இல்லம். மாவீரர்களின் பெற்றோர்கள், உறவினர்கள், நண்பர்கள் அங்கு சென்று தீபமேற்றி, அவர்களுக்கு மலரஞ்சலி செலுத்துவதை ஏன் இந்த அரசாங்கம் தடுக்கின்றது? இதை ஏன் உலக நாடுகள் கண்மூடித்தனமாகப் பார்த்துக் கொண்டிருக்கின்றன? என்பதை இந்த இடத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.44]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා ඩයස්පෝරාවේ අයගේ ආයෝජන ගැන තමයි කථා කළේ. මා ඒ ගැන විශේෂයෙන් මොනවත් කියන්න කැමැති නැහැ. නමුත්, එතුමා බඩු මිල ගැනත් කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ ආයෝජන පිළිබඳව, විදේශ ආයෝජනවල අවශ්‍යතාව පිළිබඳව විපක්ෂ නායකතුමා දිගින් දිගටම කථා කළා. උදාහරණ දෙමින් කථා කළා. හැබැයි, එදා විපක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් අපේ වරාය නගර ව්‍යාපෘතිය පටන් ගත්ත වෙලාවේ ඉඳලා පහර ගැහුවා. වරාය නගරය නිර්මාණය කරපු ඒ සමාගමට අනුනව අවුරුදු බද්දකට ඉඩම් කොටසක් දුන්නාම ඒ ගැන කියමින් දිගට හරහට ඒකටත් පහර ගැහුවා. ඊළඟට, New Fortress Energy සමාගම යුගදනවි සමාගමත් එක්ක හවුල්කාර ව්‍යාපෘතියක් කරන්න යනකොට ඒකටත් දිගට හරහට පහර ගැහුවා; තවම ගහනවා. ඒ වාගේම තමයි, අපේ කොළඹ වරායේ බටහිර පර්යන්තයේ සංවර්ධනයට අදානි ආවාම ඒකටත් දිගට හරහට පහර ගැහුවා.

ඒ විතරක් නොවෙයි, අපේ රාජ්‍ය අමාත්‍යවරයකු චීන තානාපති කාර්යාලයට ගිය එක ගැනත් එතුමා ලොකු ප්‍රශ්නයක් මතු කළා. Protocol එක, ඇමතිවරයා හම්බ වෙන්න තානාපතිවරු එන එක තමයි. හැබැයි මිත්‍රකම, සහෝදරත්වය මත ඕනෑ තරම් එහෙම වෙන්න පුළුවන්. 1994 ඉඳලා දිගටම මා කැබිනට් අමාත්‍යවරයකු හැටියට සිටියා. ඒ කාලයේ අපි ඕනෑ තරම් තානාපතිවරුන්ගේ ගෙවල්වලට ගිහින් කෑම කාලා තිබෙනවා; තානාපතිවරු හම්බවෙන්න ගිහිල්ලා තිබෙනවා. ඉතින් මේ ආකාරයට කරුණු කාරණා මතු කිරීම තුළත් විදේශීය ආයෝජකයන්, විදේශීය රටවල්, විදේශීය තානාපති කාර්යාල අපේ රටට එන්න භය වෙනවාය කියන කාරණය අපි අමතක කරන්න හොඳ නැහැ.

Ease of Doing Business Index එකේ අපි ඉන්න තැන පිළිබඳව එතුමා කථා කළා. ඇත්තටම ලෝක ආර්ථිකයම කඩා වැටිලා තිබෙන වෙලාවක්, මේක. මහා බ්‍රිතාන්‍යයේ ආර්ථිකය සියයට 22කින්, ඇමෙරිකාව සියයට 12.7කින්, ඉන්දියාව සියයට 9.7කින්, ජර්මනිය සියයට 19.1කින් කඩා වැටිලා. අපේ රටේ ආර්ථිකය සියයට 3.8කින් තමයි කඩා වැටුණේ. ලෝක ආර්ථිකය මෙසේ කඩා වැටිච්ච මොහොතක, ඇමෙරිකාව වැඩට එන්නේ නැති රජයේ නිලධාරින්ට පඩියෙන් සියයට 40යි ගෙවන්නේ. මහා බ්‍රිතාන්‍යය වැඩට එන්නේ නැතිව ගෙදර ඉන්න නිලධාරින්ට පඩි ගෙවන්නේ සියයට 40යි; සියයට 60යි. අපේ රටේ නිලධාරින්ට පඩි ඉල්ලා ඔවුන් මහ පාරට අරගෙන විශාල උද්ඝෝෂණ කරමින් පෙළපාළි යන එකත් Ease of Doing Business Index එකේ අපේ රට පහළට යන්න ප්‍රධාන හේතුවක් වෙනවා. ඒක අමතක කරන්න එපා. Ease of Doing Business Index එකේ 99වැනි ස්ථානයේ තිබෙන අපේ රට අපි එහි ඉදිරියට ගෙන එන්න ඕනෑ.

විදේශීය ආයෝජනවලදී අපට ඉන්න ප්‍රධානම තරගකරුවන් දෙදෙනා තමයි සිංගප්පූරුව සහ හොංකොං. සිංගප්පූරුව Ease of Doing Business Index එකේ 1 හෝ 2වැනි තැන. හොංකොං ඉන්නේ 3වැනි තැන. මැලේසියාව ඉන්නේ 11ට. අපේ රටට එම දර්ශකයේ උඩට එන්න ඕනෑ නම්, අපේ රජයේ කාර්යක්ෂමතාව වැඩි කරන්න ඕනෑ. විපක්ෂ නායකතුමා කිව්වා වාගේ ආයෝජකයන්ගේ වැඩ කටයුතු ටක් ටක් ගාලා කරලා දෙන වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එක තැනකින් ඒ ටික සේරම කරලා දෙන්න පුළුවන් නම් ඉතාම හොඳයි. හැබැයි, පසුගිය අවුරුදු දෙකතුන තුළ -එතුමා ගණන් හිලව් කිව්වා.- ලෝකයේ විදේශ ආයෝජන ගලා ගිය විධිය බලන්න. 2020 වර්ෂයේ ඩොලර් ට්‍රිලියන 1.8ක් ලෝකය පුරා ගිහින් තිබෙනවා. ඒකෙන් වැඩියෙන්ම ගිහින් තිබෙන්නේ චීනයට. ඉහත දර්ශකය අනුව චීනය ඉන්නේ 31වන ස්ථානයේ. ඊළඟට ඇවිත් තිබෙන්නේ ඉන්දියාවට. ඉන්දියාව ඉන්නේ 63වන ස්ථානයේ. හැබැයි, ඒ රටවල විශාල වෙළෙඳ පොළක් තිබෙනවා. එහෙම වෙළෙඳ පොළක් නැති හොංකොං, සිංගප්පූරුව වාගේ තැන්වලට ආයෝජකයන් යන්නේ ඒවා Ease of Doing Business Index එකේ ඉතාම ඉහළින් ඉන්න නිසා. ඒ අයට ගිහින් ඉතා ලෙහෙසියෙන්, ඉතා පහසුවෙන් ඒවායේ ව්‍යාපාර කරගන්න පුළුවන්. ඒ විදේශ ආයෝජන වියට්නාමයටත් ගියා. විපක්ෂ නායකතුමා ඒ ගණන් හිලව් පවා කිව්වා. ඒ විදේශ ආයෝජන වියට්නාමයට ගියා; බංග්ලාදේශයට ගියා. හැබැයි, ඒ රටවල් ඒ ආයෝජකයන් ආදරයෙන් භාර ගන්නවා; ආදරයෙන් පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්ෂ 1965 දී ඇමෙරිකාව පැරදිලා වියට්නාමයෙන් යනකොට වියට්නාමයේ එක මනුස්සයෙකුගේ ඔළුවට කිලෝග්‍රෑම් 50ක් වෙන්න බෝම්බ දාලා ගියේ. වියට්නාමයේ ගම්මාන 9,000ක් සහමුලින් ගිනිබත් කරලා, විනාශ කරලා දාලා ගියේ. හැබැයි, 1977 දී මහා ආර්ථික අවපාතය හා ආහාර හිඟය -ආහාර අහේනිය- ලෝකයේ මතු වෙලා සමාජවාදී රටවල් කඩාගෙන වැටෙද්දී, චීනය හා වියට්නාමය වෙනස් වුණා. වියට්නාමය විදේශ ආයෝජකයන්ට ආරාධනා කරන කොට ඉස්සෙල්ලාම ඇමෙරිකානු ව්‍යාපාරිකයන් තමයි කෝට් දාලා බෑග් අරගෙන වියට්නාමයට ගියේ. වියට්නාමය ඉතාම ආදරයෙන් පිළිගත්තා, ඒ විදේශ ආයෝජකයන්. ඔවුන් එළවාගත්තේ නැහැ. ඒ නිසා අද වියට්නාමය බොහොම වේගයෙන් ඉහළට එනවා.

අපේ රටේ විපක්ෂයෙන් කථා කළ හැම කෙනෙකුම වාගේ කියපු ප්‍රධාන කාරණා අතර තිබුණේ, විදේශ ආයෝජකයන්ට ගැරහීම, රටේ දේපළ විකුණනවා කියලා චෝදනා කිරීම, වරාය විකුණුවා කියලා චෝදනා කිරීම, අපේ තෙල් ටැංකි විකුණුවා කියලා චෝදනා කිරීම, චීන කොලනියක් හදනවා කියලා චෝදනා කිරීම ආදියයි. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේ සියල්ල ගැන දිගින් දිගටම කථා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිංගප්පූරුව කොළඹ දිස්ත්‍රික්කයට වඩා වර්ග කිලෝමීටර් නවයයි ලොකු. එය, ගම්පහ දිස්ත්‍රික්කයෙන් භාගයයි; කළුතර දිස්ත්‍රික්කයෙන් භාගයටත් වඩා අඩුයි. ලී ක්වාන් යූ ඒ පුංචි රටට එන ලෙස විදේශ ආයෝජකයන්ට ආරාධනා කළේ ඇවිල්ලා සල්ලි දීලා ඉඩම් අරගෙන ආයෝජනය කරන්න කියලායි. අදත් ඕනෑම කෙනෙකුට සිංගප්පූරුවේ ඉඩමක් සල්ලි දීලා ගන්න පුළුවන්. එදා, 1965 වර්ෂයේ ලී ක්වාන් යූ එහෙම කියන කොට සිංගප්පූරුව අපට වඩා දුප්පත්.

අද සිංගප්පූරුවේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 64,000යි; අපේ රටේ 3,600යි. මැලේසියාවේ මහතීර් මොහොමඩ් මැතිතුමාම හඳුන්වා දුන් "භූමිපුත්‍ර" නීතිය නිසා මැලේසියාවේ ඉඩම් සින්නක්කර දෙන්න බැහැ. හැබැයි, ආයෝජකයන්ට ආරාධනා කරලා මහතීර් මොහොමඩ් මොකක්ද කිව්වේ? "99 අවුරුදු බද්දට මදි නම් 199 අවුරුද්දට දෙන්නම්, 199 අවුරුද්දට මදි නම් 299 අවුරුද්දට දෙන්නම්, 299 අවුරුද්දට මදි නම් 999 අවුරුද්දට දෙන්නම්, එන්න" කියලායි එතුමා කිව්වේ. විදේශීය විශ්වවිද්‍යාල වාගේ දේවල්, විදේශීය ව්‍යාපාරිකයෝ විශාල වශයෙන් මැලේසියාවට යන්න පටන් ගත්තා. අද මැලේසියාවේ ඒක පුද්ගල ආදායම ඩොලර් 11,900ට ගිහින් තිබෙන්නේ. අපේ රටේ තවම 3,600යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙනෙක් ඕස්ට්‍රේලියාවට business visa එකකින් ගියොත්, ඒ මනුස්සයාට ඕස්ට්‍රේලියාවෙන් ඉඩමක් මිලදී ගන්න පුළුවන්. ඕස්ට්‍රේලියාව මහා විශාල රටක් වුණාට මිනිසුන්ට වාසය කරන්න පුළුවන් භූමි ප්‍රමාණය ලොකු, අපේ ලංකාවට වඩා බොහොම පොඩ්ඩයි. හැබැයි, ඕනෑ කෙනෙකුට ඉඩම් ගන්න පුළුවන්. ඕස්ට්‍රේලියාවේ අද ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 54,000යි.

අපි විදේශ ආයෝජකයන් භය ගන්වන්න හොඳ නැහැ; විදේශ ආයෝජකයන්ට සැක බිය හදන්න හොඳ නැහැ. පළමුවෙනි දේ, ඉතාම වැදගත් දේ ඒකයි. මේ වාගේ ව්‍යසනයක් වෙලාවක, මුළු ලෝකයම කොරෝනා වසංගතයෙන් පීඩා විඳිද්දී, අපේ රටටත් ඒ තර්ජනය බොහෝ සෙයින් තිබියදී මේ රටේ වෘත්තීය සමිතිත් එක්ක එළියට බැහැලා කෑ ගහලා, උද්ඝෝෂණ කරලා විරෝධතා පවත්වන ආකාරය පෙන්වන කොට අපට Ease of Doing Business Index එකේ උඩට එන්න පුළුවන්ද? එතකොට මොකක්ද ආයෝජකයන් හිතන්නේ?

විපක්ෂ නායකතුමා කිව්වා කෙළින් ඉන්න ඕනෑ කියලා. මමත් කියන්නේ කෙළින් ඉන්න කියලා තමයි. කෙළින් හිටියේ නැති එකයි වැරැද්ද. හැබැයි, මේ වාගේ වෙලාවක මේ රට තුළ නොයෙකුත් කලබල ඇතිවීම නිතැතින්ම විදේශ ආයෝජකයන් භය ගන්වන්න හේතුවක් වෙනවා. එවිට විදේශ ආයෝජකයෝ මේ රටට එන්නේ නැහැ, සල්ලි අරගෙන ඇවිල්ලා මේ රටේ ආයෝජනය කරන්නේ නැහැ. නමුත් විදේශ ආයෝජකයන් අපට අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කොරෝනා වසංගතය වෙලාවේ විදේශ ආයෝජන ට්‍රිලියන 1.2ක් ලෝකය පුරා ගියා. කොහේටද ඒවා ගියේ? සියයට 90ක් ආවේ ආසියාවට. ආසියාවේ කොහේටද? ප්‍රධාන වශයෙන් චීනයට, ඊළඟට ඉන්දියාවට, ඊළඟට සිංගප්පූරුවට, ඊළඟට හොංකොංවලට. වියට්නාමයට හා බංග්ලාදේශයටත් ගියා. විපක්ෂ නායකතුමා ඒ ගණන් හිලව් පවා කිව්වා. විදේශ ආයෝජකයන් මේ රටට ගෙන්වා ගන්න ඕනෑ නම්, Ease of Doing Business Index එකේ අපේ රට උඩට එන්න ඕනෑ නම්, විපක්ෂය මහා විශාල උදව්වක් කරන්න ඕනෑ. විදේශ ආයෝජකයෙකුට ඉඩමක් 99 අවුරුදු බද්දට දුන්නාම, විදේශීය ආයෝජකයෙකුට ව්‍යාපාරයක හවුල්කාර පංගුවක් දුන්නාම, වරායක් ගොඩ නඟන්න කියලා ව්‍යාපාරිකයකු මේ රටට ගෙන්වා ගත්තාම, -එම ව්‍යාපාරිකයා විශාල මුදල් ප්‍රමාණයක් කොළඹ වරායේ බටහිර පර්යන්තයට වැය කළා.- ඒ ගැන විපක්ෂයෙන් දැඩි විවේචන එල්ල කරන කොට ඒ මිනිස්සු භය වෙනවා. අපේ එවැනි ඉතාම නරක ආදර්ශ තිබෙනවා. යහ පාලන ආණ්ඩුව ආ ගමන් වරාය නගර ව්‍යාපෘතිය නැවැත්වූවා. ඒ සමාගමට ඩොලර් මිලියන 500ක, 600ක පමණ පාඩුවක් වුණා; ඒක ගෙවන්න වුණා.

ඇත්තටම මම පිළිගන්නවා, අප මේ වෙලාවේ විදේශ අයෝජන ගෙන්වා ගන්න ඕනෑ බව. ඒ සඳහා අපේ රට Ease of Doing Business Index එකේ ඉහළට ගැනීම සඳහා අප කළ යුතු ප්‍රධාන දෙයක් තමයි, රාජ්‍යයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම. රාජ්‍යයේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට අද අපට බාධාවක් තිබෙනවා. ඒ බාධාව තමයි, ආණ්ඩුව වෙනස් වෙච්ච ගමන් රජයේ නිලධාරින් අල්ලා හිරේට දමන එක. රජයේ නිලධාරින් හිරේ දමන හින්දා රජයේ නිලධාරින් තීන්දු ගන්නේ නැහැ; රජයේ නිලධාරින් බයයි. ඒ නිසා රජයේ නිලධාරින්ගේ බය නැති කරන්න අපේ ඇමතිවරු කටයුතු කරන්න ඕනෑ; අපේ ඇමතිවරු ඒ වගකීම භාර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (2) ව්‍යවස්ථාව යටතේ ඇමතිවරුන්ට බලය දීලා තිබෙනවා තීරණ ගන්න; තීරණ ක්‍රියාත්මක කරන්න.

ඒ නිසා ඇමතිවරයාගෙන් වරදක් වුණත්, ඇමතිවරයාට දඬුවම් කරන්න බැහැ. තීරණයක් අරගෙන, ඒ තීරණයෙන් යම් වරදක්, අලාභයක් සිදු වුණත්, ඇමතිවරයාට දඬුවම් කරන්න බැහැ. ඒ නිසා "බයවෙන්න එපා, තීන්දු ගන්න. ප්‍රමාද වෙන්නේ නැතිව තීන්දු ගන්න, එක එක්කෙනාට පාස් කරන්න එපා" කියලා ඒ නිලධාරින්ට අපි ශක්තිය දෙන්න ඕනෑ. එහෙම කළොත්, අපට මේ Index එකෙන් උඩට එන්න පුළුවන්. එහෙම කර ගත්තොත්, අපේ රට තුළ විදේශීය ආයෝජකයන්ට වාසිදායක තත්ත්වයක් හදන්න පුළුවන්. එහෙම කළොත්, රටට මුදල් එයි; ඩොලර් එයි. එහෙම කළොත්, අලුත් ව්‍යාපාර රටේ පටන් ගනීවි, වරාය නගරය හරහා අපට මහා පිම්මක් පැනගන්න පුළුවන් වෙයි. මුළු ලෝකයේම නැව ගිලෙන වෙලාවක්, මේක. එවැනි වෙලාවක විපක්ෂය ඇතුළු අප සියලුදෙනා එකට එකතු වෙලා, මේ තත්ත්වයෙන් ගොඩ එන්න වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒක ලෝකයට පෙන්වන්න ඕනෑ. අපි එකට එකතු වෙලා මේ ප්‍රශ්නයට මුහුණ දෙනවා කියලා ලෝකයට පෙන්වන්න ඕනෑ.

[ගරු එස්.බී. දිසානායක මහතා]

මේ මොහොතේ බෙදිලා, පාරට බැහැලා උද්ඝෝෂණ කරලා, කෑ ගහලා, පෙළපාළි ගිහිල්ලා, මිනිස්සු අවුස්සලා මේ කරන හැම දේකින්ම මේ රටේ ප්‍රශ්න තව වැඩි වෙන එකයි සිදු වෙන්නේ. මෙහෙම කරනකොට කොවිඩ්-19 වසංගතය තව වැඩි වෙනවා; රෝගීන් තව වැඩි වෙනවා; සෞඛ්‍ය වියදම වැඩි වෙනවා. අන්තිමේදී ආයෝජකයෝ බය වෙලා දුවන එක විතරයි වෙන්නේ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.59]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 අය වැය පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මෙවර අය වැය; බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමාගේ මංගල අය වැය, රටේ වර්තමාන අර්බුද කිසිවකට පිළිතුරු සපයන්නේ නැති, ජනතා අපේක්ෂා බිඳ වැටුණු අය වැයක් ලෙස තමයි අපට හඳුන්වන්න වෙන්නේ. රටේ ජනතාව තවදුරටත් අපහසුතාවට පත්වීම මෙයින් වළක්වන්න බැහැ. ජනතාව බලාපොරොත්තු වුණේ, සහනදායී අය වැයක්. ඔවුන්ට මේ තියෙන ප්‍රශ්නවලින් මිදෙන්න යම්කිසි සහනයක් මේ අය වැය තුළින් ලැබෙයි කියලා ඔවුන් බලාපොරොත්තු වුණා. නමුත් මේ අය වැය තුළින් 2021ට සාපේක්ෂව 2022 වසරේ භාණ්ඩ හා සේවා බද්ද රුපියල් බිලියන 381කින් -රුපියල් කෝටි 38,000කින්- වැඩි කරලා, ජනතාව තව තවත් අපහසුතාවට පත් කරන තත්ත්වයක් තිබෙනවා.

මෙම අය වැයේ සංඛ්‍යා ලේඛනවල ගැටලු රාශියක් තිබෙනවා. මේ දත්ත බහුතරයක් නිවැරදි නැහැ. සංඛ්‍යා ලේඛන ප්‍රායෝගික නැති වුණාම, අය වැය කෙරෙහි ඇති ජනතා විශ්වාසය බිඳ වැටෙනවා. ඒක තමයි දැන් සිදුවෙමින් තිබෙන්නේ. රජයේ ආදායම වැඩියෙන් පෙන්වලා, වියදම අඩුවෙන් පෙන්වලා, අය වැය පරතරය අඩු කිරීම සඳහා මෙම අය වැය තුළින් සමහර දත්ත වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම, සාමාන්‍යයෙන් දියුණු වෙමින් පවතින රටක සහනාධාරත් සමඟ -සුබසාධනයත් සමඟ- රටේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18ක්වත් වෙන්න ඕනෑ. අපේ පසුගිය රජය 2019දී මෙම රජයට පාලන බලය ලබා දෙද්දි, රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.6යි. නමුත් මේ වන විට එය සියයට 9ක් දක්වා අඩු වෙලා තිබෙනවා. මුදල් ඇමතිතුමා පසුගිය දිනයක කියලා තිබුණා, "රට විශාල මූල්‍ය අර්බුදයක" කියලා. මේ මූල්‍ය අර්බුදයට මේ රට ඇද දැමුවේ කවුද? පසුගිය රජය 2019 දී රට භාර දෙනකොට ලංකා ඉතිහාසයේ වැඩිම රාජ්‍ය ආදායම 2018 වසරේ තිබුණා. ඒ, රුපියල් බිලියන 1,980ක් - රුපියල් කෝටි 198,000ක්. නමුත් පසුගිය 2020 වසරේ රාජ්‍ය ආදයම රුපියල් බිලියන 1,350ට අඩු වෙලා තිබුණා. 2021 වසරේ මේ වන විට එය රුපියල් බිලියන 1,560ට අඩු වෙලා තිබෙනවා. පසුගිය රජය ලබා දුන් ඒ රාජ්‍ය ආදායම, 2019 වසරේ විශාල බදු සහනයක් දීලා අඩු කර ගැනීම තමයි සිදු වුණේ.

පසුගිය රජය කාලයේ ඩොලර් එක රුපියල් 186යි. දැන් ඒක රුපියල් 203 දක්වා වැඩි වෙලා තියෙනවා. පසුගිය රජය කාලයේ ණය ශ්‍රේණිගත කිරීම්වලින් අපේ රට තිබුණේ "B" කාණ්ඩයේ. නමුත් මේ වන විට එය Moody's ආයතනය විසින් "Caa2" තත්ත්වයට පත් කර තිබෙනවා. ඒවා සියල්ල වර්තමාන රජය විසින් කර ගත්ත දේවල්. ඒ වාගේම "Damocles" පරිමාණය අනුව, අපේ රට කඩා වැටෙන රටවල් අතරට එකතු වෙලා තිබෙනවා කියලා ප්‍රකාශ කරනවා. ඒකත් මේ රජය විසින් කර ගත්ත දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්න ඔක්කොටම මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ, අපේ විදේශ විනිමය ප්‍රශ්නය නිසායි. අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක පමණ ප්‍රේෂණ එනවා. ඒ වාගේම, සංචාරක ව්‍යාපාරයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5ක් පමණ එනවා. 2018 වසරේ ලංකාවට සංචාරකයන් ලක්ෂ 23ක් ආවා. ඒ අනුව ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5ක විදේශ විනිමයක් ආවා. කොවිඩ්-19 වසංගතයත් එක්ක සංචාරක ව්‍යාපාරයේ යෙදෙන 250,000ක් 275,000ක් වන සෘජු රැකියා කරන අයට කිසිම සහනයක් ලබා දීලා නැහැ. ඔවුන්ගේ ණය පොලිය කපා හැරීමක් කරලා නැහැ. අපි බලාපොරොත්තු වුණා, ඔවුන්ගේ ණය පොලිය කපා හරීවි, ඔවුන්ගේ ණය වාරිකවලට යම්කිසි සහන කාලයක් ලබා දෙයි කියලා. නමුත් එහෙම සහනයක් ලබා දීලා නැහැ.

ඒ වාගේම ආපාන ශාලා හිමියන්ට, බේකරි හිමියන්ට මෙම අය වැයෙන් කිසිම සහනයක් ලබා දීලා නැහැ. එහෙම තත්ත්වයක් තුළ ඔවුන් කබලෙන් ළිපට වැටී තිබෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය ණය ගත් කාන්තාවන් විශාල ප්‍රමාණයක් අද ගම්වල සිටිනවා. එම ණය ප්‍රමාණය ගණනය කළාම බිලියන 20ක් විතර වෙනවා. අපි හිතුවා මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය කපා හැරීමක් සිදු වෙයි කියලා. නමුත් එහෙම සිදු වෙලා නැහැ. ඒ නිසා තමයි මම කිව්වේ, මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු විධියේ අය වැයක් ඉදිරිපත් කරලා නැහැ කියලා.

මේ අය වැයෙන් ත්‍රිරෝද රථ හිමියන්ට, පාසල් වෑන් රථ හිමියන්ට, බස් රථ හිමියන්ට යම්කිසි මුදලක් වෙන් කර තිබෙන බව අපි දැක්කා. නමුත් මෙවැනි කුඩා මුදලක් වෙන් කර තිබෙන්නේ තෝරාගත් පිරිසකට ලබා දෙන්නද කියා මට හිතෙනවා. ලංකාවේ ත්‍රිරෝද රථ දොළොස්ලක්ෂ පනස්දහසක් තිබෙනවා. මේ දොළොස්ලක්ෂ පනස්දහසෙන් අටලක්ෂයක් පමණ හැමදාම පාරවල්වල ධාවනය වෙනවා. මේ කොවිඩ් වසංගතය නිසා අවුරුද්දක් වාගේ කාලයක් ඒ අයට කිසිම සහනයක් ලැබුණේ නැහැ. නමුත් මේ අය වැයෙන් ඒ අයට වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 600යි. රුපියල් මිලියන 600ක් කියන්නේ, කෝටි 60ක්. එම මුදල අර ලක්ෂ අටෙන් තෝරා ගත් අය නැතුව හැම කෙනාටම දුන්නොත්, දවසකට එක ත්‍රිරෝද රථ හිමියෙකුට හිමි වෙන්නේ රුපියල් දෙකයි ශත පහයි. මේ රුපියල් දෙකයි ශත පහක් දීලා රවටන්න යන්නේ කාවද? අපි දැක්කා, ත්‍රිරෝද රථ හිමියන් කිව්වා, "මේක හොඳ වැඩක්" කියලා. නමුත් හරි විධියට ඒ අට ලක්ෂයටම මේ මුදල බෙදා වෙන් කළොත්, එක්කෙනෙකුට හම්බවෙන්නේ රුපියල් දෙකයි ශත පහයි. ලංකාවේ පාසල් වෑන් රථ හතළිස්දහසක් තිබෙනවා. මේ හතළිස්දහසට වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන කීයද? රුපියල් මිලියන 400යි -කෝටි 40යි. මේ කෝටි 40 සියලුම පාසල් වෑන් රථ හිමියන්ට බෙදා වෙන් කරන්න පුළුවන්ද? මොකද, අවුරුද්දක් විතර ඔවුන්ට ඒ රැකියාව අහිමි වෙලා තිබුණා. එතකොට ඒ හැම කෙනාටම බෙදා දෙනවා නම්, ඔවුන්ට දවසකට හම්බවෙන්නේ රුපියල් 27යි. රුපියල් 27ක මුදලක් තමයි දවසකට ලැබෙන්නේ. ඒ ප්‍රමාණය ඇතිද? හැබැයි, තෝරා ගත් කොටසකට දෙනවා නම්, ඒක එහෙම වෙන්නේ නැහැ. අපිට ආරංචි වෙලා තිබෙනවා, තෝරා ගත් පිරිසකට තමයි මේවා දෙන්න යන්නේ කියලා. ඊළඟට, ලංකාවේ පෞද්ගලික බස් රථ 20,000ක් පමණ තිබෙනවා. ඔවුන්ට රුපියල් මිලියන 15,000ක්; කෝටි 1,500ක් වෙන් කර තිබෙනවා. එතකොට එක බස් රථ

හිමියෙකුට රුපියල් 75,000ක් වෙන් වෙලා තිබෙනවා. නමුත් දවසකට ඔවුන්ට හම්බවෙන්නේ රුපියල් 250ක මුදලක්. මේක ඇතිද? මෙන්න මේ විධියට මේ අය වැය තුළින් මේ රටේ ජනතාව විශාල රැවටීමකට ලක්කර තිබෙන බව අපට පෙනී යනවා.

රජයේ සංඛ්‍යා ලේඛන අනුව හතර දෙනෙකු සිටින පවුලකට ජීවත් වෙන්න මාසයකට රුපියල් 58,000ක් ඕනෑ කියනවා. ලංකාවේ ශ්‍රම බලකාය අසූපන්ලක්ෂයක්. මේ අසූපන්ලක්ෂයෙන්, පහළොස්ලක්ෂයක් රජයේ සේවකයන්. රජයේ සේවකයන්ගෙන් සියයට 80කට පමණ රුපියල් 58,000ක් ලැබෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් රුපියල් 30,000යි, 40,000යි ඔවුන්ට ලැබෙන්නේ. එතකොට තව රුපියල් 15,000ක්, 17,000ක්, 18,000 මදි වෙනවා, මාසික වියදමට. හැබැයි, ඒ මදි වෙන මුදල සොයා ගැනීම සඳහා මේ අය වැය යෝජනා තුළ රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමක් කර නැහැ; පෞද්ගලික අංශයට වැටුප් වැඩිවීමක් ලබා දීලා නැහැ. ස්වයං රැකියා කරන අය, කුලී වැඩ කරන අය සාමාන්‍යයෙන් දවසකට රුපියල් 2,000ක් ඉපැයුවත්, දවස් 20ක්, 25ක් පමණ වැඩ කළොත් රුපියල් තිස්-හතළිස්දහසයි හම්බවෙන්නේ. හැබැයි, ඒ අයට මාසයක් ජීවත් වෙන්න රුපියල් 58,000ක් අවශ්‍ය වෙලා තිබෙනවා. අපේ රටේ මේ සාමාන්‍ය ජනතාවට මේ අය වැය තුළින් කිසිම දෙයක් ලබා දීලා නැහැ. මේ නිසා රටේ ජනතාව ඉච්ඡා භංගත්වයට පත් වෙලා සිටිනවා.

අපේ රජය මේ ආණ්ඩුවට රට භාර දෙනකොට, මහ බැංකුවේ ඩොලර් බිලියන 7.6ක් තිබුණා. අනෙක් බැංකුවල තිබුණු ඩොලර් බිලියන 2.8ත් එක්ක සමස්තය ඩොලර් බිලියන 10.4ක් පමණ තිබුණා. නමුත් දැන් ඒක බිලියන 2.8ට අඩු වෙලා. මේවා කළේ අපිද? නැහැ. මේ රජයම තමයි මේ රටේ ජනතාවට විශාල වශයෙන් ප්‍රශ්න ඇති කරලා තිබෙන්නේ. දැන් මේ රටේ ජනතාව කබලෙන් ලිපට වැටිලා ඉන්නේ. රාජ්‍ය සේවකයා වාගේම ගොවි ජනතාව ගත්තත් තත්ත්වය ඒකයි. අද වනවිට ලංකාවේ ගොවි පවුල් දහඅටලක්ෂයක් සිටිනවා. මේ පවුල් දහඅටලක්ෂය මේ අය වැයෙන් ඒ අයට යම්කිසි සහනයක් ලබා දෙයි කියා බලාපොරොත්තු වුණා. නමුත් එහෙම ලබා දීලා නැහැ. ඊයේ කිව්වා, කෘෂි රසායන ගෙනෙනවා, ශාක පෝෂක පොහොර ගෙනෙනවා කියලා. මේ ශාක පෝෂක පොහොර කියන එක ගැන පැහැදිලි කිරීමක් කර නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා එක දෙයක් කියනවා; ඇමතිවරයා තව දෙයක් කියනවා. මේක විශාල ප්‍රශ්නයක්. මේ නිසා ලබන වසරේ විශාල ආහාර හිඟයක් ඇති වෙයි කියලා අපට හිතෙනවා. මේකට යම් විසඳුමක් අනිවාර්යයෙන්ම ලබා දුන්නේ නැත්නම්, විශාල ප්‍රශ්නයක් මතු වෙනවා. අපි ඉල්ලා සිටිනවා, මේ සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

මේ අය වැයෙන් රටේ ජනතාව බලාපොරොත්තු වුණේ මොනවාද? ප්‍රශ්න රාශියක් තිබෙන රටේ ජනතාව මේ අය වැයෙන් විශාල සහනයක් බලාපොරොත්තු වුණා. නමුත් සිදු වී තිබෙන වංචා ප්‍රමාණය බලන්න. සීනි වංචාව කෝටි 1,600යි, ගෑස් වංචාව කෝටි 1,000යි, පොල් තෙල් වංචාව කෝටි 700යි, නැනෝ නයිට්‍රජන් වංචාව කෝටි 780යි. වංචා නම් තොගයක් තිබෙනවා. මෙතැන වෙලා තිබෙන්නේ මේකයි. රුපියල් දසලක්ෂයෙන් කරන්න පුළුවන් එක, රුපියල් පනස්ලක්ෂයෙන් කරන්න යනවා. එහෙම කිරීම තුළින් රටේ වර්ධනයක් ඇති වෙනවා. වර්ධනයක් වුණාට, මේ රටේ වත්කම්වලට වඩා වගකීම් වැඩි වෙලා තිබෙනවා. මේ වනවිට එක් පුද්ගලයෙක් රුපියල් නවලක්ෂයක් පමණ ණය වෙලා තිබෙනවා. 2005දී මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට එද්දී කෝටි දෙලක්ෂ විසිපන්දහසයි, අපේ රටේ ණය ප්‍රමාණය. දැන් ඒක වැඩි වෙලා තිබෙනවා, කෝටි දහඅටලක්ෂයකට වඩා. ඒ, සමස්ත ණය ප්‍රමාණය. රාජපක්ෂ පවුල අවුරුදු දොළහක් මේ රට පාලනය කර තිබෙනවා.

1950 සිට මේ දක්වා දක්වා ගත්තාම, එයින් අවුරුදු දොළහක් රාජපක්ෂ පවුල මේ රට පාලනය කර තිබෙනවා. මේ අවුරුදු දොළහ තුළ අපේ රටේ ණයබරතාව රුපියල් බිලියන දහදාහකින් - රුපියල් කෝටි ලක්ෂ දහයකින්- වැඩි කර තිබෙනවා. ඒ අනුව, එක් පුද්ගලයෙකුගේ ණයබරතාව රුපියල් ලක්ෂ පහකින් වැඩි කර තිබෙනවා, මේ අවුරුදු දොළහ තුළ. අනික් අවුරුදු හැට තුළම එක් පුද්ගලයෙකුගේ ණය බරතාව වැඩිවෙලා තිබෙන්නේ රුපියල් ලක්ෂ හතරකින් පමණයි. අය වැය කාරක සභා අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරනකොට මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න මම බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම මේ රටේ ජනතාව ණය බරතාවට පත් කර, රටේ වත්කම්වලට වඩා වගකීම් වැඩි කර, මේ තත්ත්වය ඉදිරියට ගෙන ගියොත් ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න අපට සිදු වනවා. මේ වසර තුන තමයි ලංකා ඉතිහාසයේ වැඩියෙන්ම ණය ගත් වසර තුන. 2020දී රුපියල් බිලියන 2,650ක් -රුපියල් කෝටි 265,000ක්-, 2021දී රුපියල් බිලියන 3,400ක් -රුපියල් කෝටි 340,000ක්-, 2022දී රුපියල් බිලියන 3,200ක් -රුපියල් කෝටි 320,000ක්- අපි ණය අරගෙන තිබෙනවා. එහෙම බලනකොට රුපියල් කෝටි 925,000ක් මේ වසර තුනට විතරක් අපි ණය වශයෙන් අරගෙන තිබෙනවා. මේ ණය, අපේ ණය ගොඩට එකතු වනවා. මෙයින් කොටසක් ගෙවූ පසු සමස්ත ණය කලඹට මේක එකතු වනවා. මේ තත්ත්වය තුළ ප්‍රශ්න රාශියක් ඇති වනවා.

අවසාන වශයෙන් මට මේ කාරණයත් කියන්න අවසර ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට මතක් වනවා, අස්වර් මැතිතුමා ඒ දවස්වල කිව්ව කථාවක්. ඔබතුමාත් ඒ කාලයේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඇති, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලංකාවේ ඇමති කෙනෙක් ඇමෙරිකාවට ගියා ලු. ඇමෙරිකාවට ගියාම එතුමාට ඇමෙරිකාවේ ඇමති කෙනෙකු හමු වුණා ලු. එතුමා ඇමෙරිකාවේ ඒ ඇමතිතුමාගේ ගෙදරටත් ගියා ලු. "ඔබතුමාට විශාල, ලස්සන ගෙයක් තිබෙනවා. ඔබතුමා මේ ගෙදර හැදුවේ කොහොමද?" කියා ලංකාවේ ඇමතිතුමා එතුමාගෙන් ඇහුවාම, එතුමා අපේ ඇමතිතුමා ගඟක් ළඟට එක්කගෙන ගියා ලු. ගඟක් ළඟට එක්කගෙන ගිහිල්ලා, ඒ ගඟේ තිබෙන පාලමක් පෙන්නුවා ලු, "අන්න අර පාලම තමයි මට ගේ හදන්න උදවු වුණේ" කියලා. එතුමා ඒක අහලා බොහොම සන්තෝෂ වුණා ලු. ඇමෙරිකාවේ ඇමතිවරයා ඊට පස්සේ ලංකාවට ආවා ලු. එතුමා ලංකාවට ඇවිල්ලා, ලංකාවේ ඇමතිතුමාගෙන් ඇහුවා ලු, "මට වැඩිය හොඳ ගෙයක් ඔබතුමා හදා තිබෙනවා. ඔබතුමා කොහොමද මේ ගෙදර හැදුවේ?" කියලා. එතකොට ලංකාවේ ඇමතිවරයා ගඟ ළඟට එක්කගෙන ගිහිල්ලා ගඟ පෙන්නුවා ලු. "කෝ, මුකුත් නැහැනේ. ගඟ විතරයිනේ තිබෙන්නේ. කෝ, පාලම?" කියා ඇමෙරිකාවේ ඇමතිවරයා ලංකාවේ ඇමතිවරයාගෙන් ඇහුවා ලු. "පාලම නැති එක තමයි මගේ ගෙදර හදන්න හේතුව" කියා ලංකාවේ ඇමතිතුමා කිව්වා ලු. මෙන්න, මේක තමයි අද මේ රටට වෙලා තිබෙන්නේ? මේ රටේ දේශපාලනඥයන් කරන්නේ ඒක තමයි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ කාන්තා මන්ත්‍රීතුමියකට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු බටු ගැන කථාවක් කිව්වා. මම එතුමාට කියනවා, ඉදිරියේදී ඔබතුමාට ලැබෙන්නේ බටු නොවෙයි, දූරියන් කියලා. ඉදිරියේදී එතුමාට දූරියන් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.09]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. යම් යම් ආකාරයෙන් මතු වෙච්ච සමහර මඩ කතන්දරවලට පිළිතුරු දෙන්න මම මේ වෙලාවේ බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, ඌරන් එක්ක පොර බදන්න ගිහිල්ලා, මගේ ඇඟේ මඩ ගෑවුණාම තෘප්තිය තිබෙන්නේ ඌරාට. ඒ නිසා මම ඒ මඩවලට උත්තර දෙන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විවිධ මුදල් ඇමතිවරු හිටියා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් පටන්ගෙන, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා, වැඩිම කාලයක් මුදල් ඇමති ධුරය දැරූ රොනී ද මැල් මැතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා, අභාවප්‍රාප්ත මංගල සමරවීර මැතිතුමා තෙක් විවිධ මුදල් ඇමතිවරු, විවිධ කාල වකවානුවල, විවිධ ආණ්ඩු යටතේ අය වැය ඉදිරිපත් කළා. හැබැයි, මේ වාගේ ගෝලීය වසංගත තත්ත්වයක් -මුළු ලෝකයම මිනිස්සු ජීවත් කරවන්න පොර බදන, මුළු ලෝකයේම ආර්ථික කඩා වැටෙන, අනික් පැත්තෙන් ලෝක වෙළෙඳ පොළ තුළ තෙල් මිල ඉහළ යන තත්ත්වයක්- මැද්දේ නොවෙයි, ඒ කිසිම මුදල් ඇමතිවරයෙකු තමන්ගේ අය වැය ඉදිරිපත් කළේ. ඒ නිසා ඒ ඒ වකවානුවල හිටපු විවිධ මුදල් ඇමතිවරු තමන්ගේ අය වැය නිදහසේ ඉදිරිපත් කළා. සමහර මුදල් ඇමතිවරුන්ට තමන්ගේ අය වැය ඉදිරිපත් කරන්න තිබුණේ සුමට තාර පාරක්. සමහර ඇමතිවරුන්ට තිබුණේ බොරලු පාරක්. සමහර ඇමතිවරුන්ට තිබුණේ වළවල් අඩු පාරක්. හැබැයි, මෙවර බැසිල් රාජපක්ෂ මැතිතුමා කම්බියක බයිසිකලයෙන් යනවා වාගේ තමයි මේ අය වැය ඉදිරිපත් කළේ. පයිනුත් නොවෙයි, බයිසිකලයෙන් යනවා වාගේයි එතුමා මේ අය වැය ඉදිරිපත් කළේ. කොරෝනා වසංගත තත්ත්වය මුළු ලෝකයම වෙළාගෙන තිබෙන නිසා මිනිස්සු ජීවත් කරවන්න බොහෝ රටවල් පොර බදනවා. කොරෝනා වසංගත තත්ත්වය පාලනය කර ගන්න ඕනෑ. අනික් පැත්තෙන්, ලෝක වෙළෙඳ පොළ තුළ තෙල් මිල ඉහළ ගිහිල්ලා, බඩු මිල ඉහළ ගිහිල්ලා, ලෝකයේ හැම රටකම වාගේ ආර්ථික කඩාගෙන වැටිලා තිබෙන තත්ත්වයක් තුළ බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ අය වැය ඉදිරිපත් කිරීම මම දකින්නේ හරියට කම්බියක බයිසිකලයෙන් යනවා වාගේයි. කාටවත් තුවාල නොකර, සාමාන්‍ය ජනතාවට ඉතා අඩුවෙන් බදු බර පටවා, ලංකාවේ ඉන්න ධනවතුන්ට විශාල වශයෙන් බදු ගහලා, ඒ බදු ටික අරගෙන සාමාන්‍ය ජනතාවට සහන දෙන්න තමයි මේ අය වැයෙන් එතුමා උත්සාහ කර තිබෙන්නේ.

කොරෝනා වසංගත තත්ත්වයක් නොමැති පරිසරයක සිට මේ දිහා බලනවා නම්, ඇත්තටම මේ අය වැයට චෝදනා කරන්න පුළුවන්. නමුත්, දැන් තිබෙන තත්ත්වය මත මීට වඩා වෙනස් අය වැයක් මොන පැත්තකින්වත් ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවා කියා මම විශ්වාස කරන්නේ නැහැ. මේ අය වැය පිළිබඳව කථා කරනකොට අපි කියනවා, කොරෝනා වසංගතය තමයි මේකට බලපෑවේ කියලා. නමුත් මම දැක්කා, ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා ඊයේ කියනවා, ආර්ථිකය හරිහැටි කළමනාකරණය කර ගන්න බැරි නිසා තමයි මේ තත්ත්වය උදා වුණේ කියලා. මම හිතන්නේ, එතුමා කිව්වේ "කට බොරු කිව්වත්, දිව බොරු කියන්නේ නැහැ" වාගේ කථාවක්. මම 2015 ඉඳලා අවුරුදු දෙකහමාරක් විතර ඒ හවුල් ආණ්ඩුවේ හිටියා. 2015 ඉඳලා 2019 දක්වා කොරෝනා වසංගතය තිබුණේත් නැහැ; ලෝක වෙළෙඳ පොළ තුළ තෙල් මිල ඉහළ යාමක් තිබුණේත් නැහැ; ලෝකයේ ආර්ථික කඩා වැටුණේත් නැහැ. 2015දී අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5.01යි; 2016දී සියයට 4.49යි; 2017දී සියයට 3.5යි; 2018දී සියයට 3.27යි; 2019දී සියයට 2.28යි. ඒක ඇත්ත. කොරෝනා වසංගතයකුත් නැතිව අපේ ආර්ථික වර්ධන වේගය පහළට ගෙන යන ආර්ථිකයක් තමයි රාජිත සේනාරත්න මැතිතුමන්ලාගේ කාලයේ කළමනාකරණය කළේ. එම නිසා මේ වෙලාවේ ආණ්ඩු පක්ෂය අය වැය ගේනකොට සුපුරුදු පරිදි විරුද්ධ පක්ෂය විරුද්ධ කථා කියන්නත්, විරුද්ධ පක්ෂය ආණ්ඩුවට ඇවිල්ලා අය වැයක් ගේනකොට අපට ඒ අය වැයට නොයෙක් දේවල් කියන්නත් පුළුවන්. නමුත්, ඇත්ත කථාව මොකක්ද? ඇත්ත කථාව මේකයි. නිදහසින් පසු අවුරුදු 73ක් තිස්සේ මේ රට පාලනය කරපු විවිධ ආණ්ඩු විවිධ අයවැය ලේඛන ගෙනාවා. විවිධ කාල වකවානුවල විවිධ ආණ්ඩු ණය ගත්තා. ඒ සියලු කාරණා එකතු වෙලා තමයි අද මේ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනාගෙන් එක්කෙනෙකුටවත් කියන්න බැහැ, "මම කිසිම කාලයක ආණ්ඩුවක හිටියේ නැහැ" කියලා. මේ 225දෙනා කුමන කාලයක හරි අඩු වැඩි වශයෙන් ආණ්ඩුවේ ඉඳලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ පවා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ජනාධිපතිවරණය යටතේ කැබිනට් මණ්ඩලයේ හිටියා. ඊට පසු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ජනාධිපතිවරණයට වැඩ කර, එතුමාගේ ආණ්ඩුව කාලයේ කැබිනට් මණ්ඩලයෙන් පිට ඉඳලා උදව් කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ විධායක කමිටුවේ හිටියා. රතන හාමුදුරුවොත් ආණ්ඩුවේ කොටස්කරුවකු වශයෙන් හිටියා. එම නිසා මේ 225දෙනාගෙන් කිසිම කෙනෙකුට කියන්න බැහැ, "අනේ! අපි නම් ආණ්ඩු කළේ නැහැ" කියලා. එහෙම කියලා කිසි කෙනෙකුට අත හෝදා ගන්න බැහැ. සමහර වෙලාවට, සමාජ වෙබ් අඩවිවලින් මිනිස්සු බණින්නේ ආණ්ඩුවට කියා විරුද්ධ පක්ෂය හිතුවාට, එහෙම එකක් නැහැ. මේ "225දෙනාටම හෙණ ගහපන්" කියලායි මිනිස්සු කියන්නේ; "මේ පාර්ලිමේන්තුව එපා" කියලායි මිනිස්සු කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අය වැය යෝජනාවලියේ ජනතාව අතරේ තිබෙන ජනප්‍රියම යෝජනාව මොකක්ද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප දෙන කාල සීමාව කලින් අවුරුදු 5යි නේ තිබුණේ, දැන් ඒක අවුරුදු 10ට වැඩි කරපු එක. අනික් ඔක්කෝටම වැඩිය ජනප්‍රියම යෝජනාව ඒක. ඇයි, ඒ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කපනවා නම්, එහෙම නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මොනවා හරි දුෂ්කරතාවක් ගෙන එනවා නම් ඔවුන් කැමැතියි. මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගැන තමයි විරෝධය තිබෙන්නේ; වෛරය තිබෙන්නේ. ඒකට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ද විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු ද කියා භේදයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආර්ථික අර්බුදය ලෝකයේම තිබෙන එකක්. අපි කොරෝනා වසංගත තත්ත්වය ගනිමු. ලංකාවේ ජනගහනය මිලියන 21යි. ඒකෙන් එන්නත ලබා දෙන්න හැකියාව තිබෙන අය ඉන්නේ මිලියන 16යි. එයින් මිලියන 15කට අපි පළමුවෙනි dose එක දීලා තිබෙනවා. ඒ ප්‍රමාණය සියයට 98යි. දෙවැනි මාත්‍රාව මිලියන 13කට දීලා තිබෙනවා. ඒ ප්‍රමාණය සියයට 84යි. එම නිසා මේ එන්නත ලබා දීම පිළිබඳවවත් විපක්ෂයෙන් ආණ්ඩුවට හොඳක් කියන්නේ නැහැ නේ. එතකොට සියඹලා ගෙනැල්ලාම නැද්ද? ලෝකයේ වෙනත් රටවල් එක්ක බලනකොට එන්නත් කිරීම නිවැරැදිව අපි කළමනාකරණය කළා නේද? අපි ඒකට හොඳ කියලා, ඉන් පසු ආණ්ඩුවට වැරදුණු තැන් කියමු. මොකද, ආණ්ඩුවට වැරදුණු තැනුත් තිබෙනවා.

කාබනික පොහොර ලබා දීලා ගොවියාට උදව් කරන එක, කාබනික පොහොර වගාව ඉතාම හොඳ සංකල්පයක්. නමුත්, එන්නත් කිරීමේ සැලසුම වාගේ නිවැරැදි සැලසුමක් ඒ පොහොර ගෙන්වූ ක්‍රමයේ තිබුණේ නැහැ. එන්නත් කිරීමේ සැලසුම වාගේ මේ පොහොර ගෙන්වීමේදීත් සැලසුම් කර තිබුණා නම්, මිනිසුන්ට කාබනික පොහොර එපා වෙන්නේ නැහැ. කාබනික පොහොර වගාව ඉතා හොඳ වැඩක්. එම නිසා එය ලබා දීමේදී මතු වූ ගැටලු අපි නිරාකරණය කර ගන්න ඕනෑ. එය නිරාකරණය කර ගැනීමේදී අදාළ ගැසට් පත්‍රය reverse කරනවා කියා අපි කිව්වාම, ඒක reverse කරන්නේ මොකටද කියා අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලනයේ හොඳම දේ තමයි, ස්වයං විවේචනය. විපක්ෂය කියන තෙක් ඉන්නේ නැතිව, අපට අභවල් තැනදී අහවල් සැලසුමේ පොඩි අඩුපාඩුවක් වුණා, එම නිසා ඒක නිවැරැදි කරනවා කියන එක තමයි දේශපාලනය කියලා කියන්නේ. ඒ දවස්වල ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන පන්තිවලට ගිය මිත්‍රයන් දන්නවා ඇති, ස්වයං විවේචනය තමයි එහි පළමුවෙනි පාඩම කියලා. එම නිසා ඒක නිවැරැදි කර ගන්න ගියාම කියනවා, “දැන් කරලා වැඩක් නැහැ” කියා. එහෙම කියලා වැඩක් වෙන්නේ නැහැ. ඒක නිවැරැදි කර ගන්න ඕනෑ. ඒක නිවැරැදි කර කාබනික පොහොර ලබා දීමේ කටයුත්ත ලංකාවේ ගොවියා අතර ව්‍යාප්ත කරන්න ඕනෑ. එය කළ යුත්තේ, ඔවුන්ගේ වගාවලට හානියක් නොකරයි.

තේ වගාව ගත්තොත්, ලෝකයේ කොහේවත් තේ වගාව කාබනික නැහැ. ඒ නිසා, තේ වගාවට අවශ්‍ය රසායනික පොහොර දෙන්නට ඕනෑ; ඒකට පිළියමක් ගේන්න ඕනෑ. ඒ පිළියම ගේන්න හදනකොට, ඒ වාගේම සැලසුම්වල කොහේ හෝ වරදක් වුණා, ඒක නිවැරදි කරන්න හදනකොට, ඒ නිවැරදි කිරීම වැරැදියි කියලා කියනවා නම්, ඒක දේශපාලනයක් නොවෙයි, ඒක පටු කුහකකමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාග ආණ්ඩු, තනි පක්ෂයේ ආණ්ඩු වාගේ ලංකාවේ විවිධ වර්ගයේ ආණ්ඩු පිළිබඳ පරීක්ෂණ කරලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ තිබුණු ආණ්ඩුව ජාතික ආණ්ඩුවක් කියලා නොකිව්වාට, කරු ජයසූරිය මැතිතුමා ඇතුළු පිරිසක් එක්සත් ජාතික පක්ෂයෙන් ඇවිල්ලා හදාගත් ආණ්ඩුව පක්ෂ 19කින් සමන්විත වූ ආණ්ඩුවක්. ඊළඟට, 2015 හදාගත්ත ආණ්ඩුව ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ එකතුවෙලා හදාගත්ත ආණ්ඩුවක්. ආණ්ඩු කිරීමේ ක්‍රම පිළිබඳව විවිධ පරීක්ෂණ කරලා තිබෙනවා. ඒ සමහර පරීක්ෂණ සාර්ථක වුණා, සමහර පරීක්ෂණ අසාර්ථක වුණා. 2015දී ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකතු වුණාම අඩු ගණනේ අපට අලුත් ව්‍යවස්ථාවක් හදාගන්න පුළුවන් වෙයි, ජනවාර්ගික අර්බුදයට දේශපාලන විසඳුමක් ගේන්න අලුත් ව්‍යවස්ථාවක් හදාගන්න පුළුවන් වෙයි, මැතිවරණ ක්‍රමය වෙනස් කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතුවා. නමුත්, බැරි වුණා. අපි හිතපු සමහර දේවල් අපි හිතපු විධියටම කර ගන්න බැරි වුණා. එහෙම කර ගන්න බැරි වුණා කියලා මේ කොරෝනා වසංගත තත්ත්වයත් එක්ක නව සාමාන්‍යකරණයක් - new normal - කරා යන ගමන අපට ආපස්සට හරවන්න බැහැ. එම නිසා දැන්වත් අපි ද්වේශයෙන්, වෛරයෙන් එකිනෙකා දෙස බලන එක නවත්වමු. දැන්වත් ආණ්ඩු පක්ෂයේ අපි විරුද්ධ පක්ෂයේ අයට ද්වේශ කරන එකත්, විරුද්ධ පක්ෂයේ අය ආණ්ඩු පක්ෂයේ අයට ද්වේශ කරන එකත් නවත්වමු. පාට කණ්ණාඩි දාලා ප්‍රශ්න දිහා බලන්නේ නැතුව, දැන්වත් පාට කණ්ණාඩිය ගලවලා ප්‍රශ්නය දෙස බලා ඒ ප්‍රශ්නයට තියෙන විසඳුම සොයමු. එහෙම නැත්නම් අනාගතයේ රටේ ආණ්ඩු කරන එක කෙසේ වෙතත්, ආණ්ඩු කරන්න රටක් ඉතුරු වෙන එකක් නැහැ.

මුළු ලෝකයම අද එන්නත දී ගන්න බැරුව දඟලනවා. ළඟදී මම ගියා කොලොම්බියාවේ ජාත්‍යන්තර සමුළුවකට. කොලොම්බියාව වාගේ රටකත් එන්නත්කරණය ඉතාම පහත මට්ටමක තිබෙන්නේ. අද ඕස්ට්‍රේලියාවේ මිනිස්සු පාරට බැහැලා පෙළපාළි යනවා එන්නත්කරණ කළමනාකරණයට විරුද්ධව. ඔස්ට්‍රියාව නැවතත් lockdown එකකට ගිහිල්ලා. ඒ වාගේම, අද නෙදර්ලන්තයේත් ප්‍රශ්න මතුවෙලා තිබෙනවා. ඒ, අපට මානව හිමිකම් පිළිබඳව දේශනා කරපු රටවල්; රට පාලනය කරන්නේ කොහොමද කියලා අපට ආදර්ශය පෙන්වපු රටවල්. ඒ රටවල කොරෝනා කළමනාකරණයට විරුද්ධව මිනිස්සු පාරට බැහැලා පෙළපාළි යනවා. ඒ මිනිසුන්ට tear gas ගහනවා, බැටන් පොලුවලින් ගහනවා, තුවාල කරනවා. නමුත්, අපේ රටේ කොරෝනා කළමනාකරණය හරියට කරන නිසා කොරෝනා නැහැ වාගේ හිතාගෙන තමයි මිනිස්සු පඩි වැඩිවීම් ඉල්ලන්නේ. කොරෝනා නැහැ වාගේ හිතාගෙන තමයි මිනිස්සු පෙළපාළි යන්නේ. නමුත්, අපි ඔවුන්ට ගහන්නේ නැහැ, තලන්නේ නැහැ, තුවාල කරන්නේ නැහැ, ඔවුන් මර්දනය කරන්නේ නැහැ. ඇත්ත, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙනකොට සමහර අය හිතුවේ දැඩි පාලකයෙක් වෙයි කියලා. හැබැයි, එතුමා ජනාධිපති වුණු විගස එතුමාගේ military suit එක ගලවලා හිටපු සමහර රාජ්‍ය නායකයන්ට වඩා එතුමා සිවිල්, සරල නායකයෙක් වුණා. එතුමා ජනාධිපති කිරීමෙන් මිනිස්සු බලාපොරොත්තු වුණේ මොකක්ද? සාම්ප්‍රදායික - traditional - දේශපාලනය නොකරපු කෙනෙක් ජනාධිපති කළොත් වැඩේ හරියයි කියලා මිනිස්සු හිතුවා. එතුමා ඇවිල්ලා ගෙනාපු සමහර අලුත් දේවල් මිනිසුන්ට තේරුණේ නැහැ. එතුමාගේ ආරක්ෂක අංශය අඩු කරපු එක, ජනාධිපති නිල නිවසට යන්නේ නැතුව එතුමාගේ ගෙදර ඉඳලා වැඩ කරන එක. වෙන රටක ජනාධිපති කෙනෙක් එහෙම කළාම, ඒ ගැන ලොකුවට පුම්බලා කියනවා. හැබැයි, අපේ රටේ ජනාධිපතිතුමා නිල නිවසේ ඉන්නේ නැතුව එතුමාගේ සාමාන්‍ය ගෙදර ඉඳලා වැඩට යනකොට ගරු අනුර දිසානායක මහත්මයා කියනවා, "පලයන්, නිල නිවසට" කියලා. ඒ වාගේම, මන්ත්‍රීවරුන්ට නිල නිවාස දෙන්න එපා කියනවා, නිල නිවසට යන්නේ නැති ජනාධිපතිතුමාට කියනවා, "පලයන්, නිල නිවසට" කියලා. මේ වාගේ අදාළ ප්‍රශ්නය දිහා බලන්නේ නැතුව, පාට කණ්ණාඩියෙන් බලා කටයුතු කිරීම තමයි මේ රට අද පත්වෙලා තිබෙන තත්ත්වයට ප්‍රධාන හේතුව කියලා කියන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගොඩක් වෙලා කථා කරන්නේ නැහැ. හැබැයි, මම මේ කාරණය කියන්න ඕනෑ.

අද ඉන්දියාවේ වාගේ අපේ රටේ සමහර තැන්වල නිලධාරිවාදය හිස ඔසවමින් තිබෙනවා. සමහර නිලධාරින් ඉන්නවා තමන්ට හිමි රාජකාරිය නිවැරදිව කරන. ආරක්ෂක ලේකම්තුමා වාගේ අමාත්‍යාංශ ලේකම්වරු බවට පත් වුණු සමහර හමුදා නිලධාරින් ඉන්නවා. ඒ වාගේම, වනජීවී රැකවරණය, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් පාලිත ප්‍රනාන්දු මහත්මයා වාගේ. ඒ ගොල්ලෝ හමුදාවේ සිටියත්, ඒ අය අමාත්‍යාංශ ලේකම් වුණාම සිවිල් නිලධාරින් හැටියට කටයුතු කරනවා. හැබැයි, සමහර

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

නිලධාරින් කටයුතු කරන්නේ තවම ඉන්නේ හමුදාවේ ඉන්නවා කියලා හිතාගෙනයි. එම නිසා අද විදේශ අමාත්‍යාංශය වාගේ තැන්වල ප්‍රශ්න මතුවෙලා තිබෙනවා. මොකද, එතුමන්ලාගේ military suit එක ගලවලා නැහැ. ඒ වාගේම, හැමදාම දැක්ක රාජ්‍ය අංශයේ නිලධාරින්ම තමයි තවමත් ඉන්නේ.

සමහර නිලධාරින් ඉන්නවා, චන්ද්‍රිකා මැතිනියගේ කාලයේදීත් එතුමා තමයි ආර්ථිකයේ ලොකු බණ්ඩා. රනිල් මහත්තයාගේ කාලයේදීත් නැතිවම බැරි වුණා. ඊළඟට, මහින්ද මහත්තයාගේ කාලයේදීත් හිටියා; හැමදාම හිටියා. එතකොට හැමදාම එක තැන පල්වෙන අදහස් එන්නේ. ඒ නිසා ඒ නිලධාරි මණ්ඩලය හරහා සුපිරි නිලධාරි පෙළැන්තියක් බිහි වුණොත්, ඉන්දියාව වාගේ නිලධාරි වාදයකට හිස ඔසවන්න පුළුවන්. එතකොට ඒක පාලනය කරන්න බැරි වෙන බවත් මතක් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජීවත්වන අපි සිංහල-බෞද්ධයෝ, අපි දෙමළ අය, අපි මුස්ලිම් අය, අපි හින්දු අය, අපි පොහොට්ටුකාරයෝ, අපි දුරකථනකාරයෝ, අපි සීනුකාරයෝ කියන එක පැත්තකට දාලා, අපි ශ්‍රී ලාංකිකයෝ කියලා හිතන්නේ කවදා ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක ඇති කාලවකවානු දෙකයි තිබෙන්නේ අපි එහෙම හිතපු. අපි 1996දී Cricket World Cup එක ගත්තාම අපි ඔක්කෝම ශ්‍රී ලාංකිකයෝ. එදා, මුත්තයියා මුරලිදරන් දෙමළ මනුස්සයෙක් නොවෙයි; චමින්ද වාස් කතෝලිකයෙක් නොවෙයි; සනත් ජයසූරිය දකුණේ වීරයෙක් නොවෙයි; අසංක ගුරුසිංහ නාලන්දා විද්‍යාලයේ නොවෙයි; අර්ජුන රණතුංග නායකයා. මේ සියලුදෙනාම අපේ කියලා තමයි හිතුවේ. ඒ අවස්ථාව මුළු රටම එකතු වෙච්ච අවස්ථාවක්. ඊළඟට සුසන්තිකා ජයසිංහ ඔලිම්පික් උළෙලේ දී දුවන කොට ඒ තත්පර 10ට අපි ශ්‍රී ලාංකිකයෝ හැටියට කල්පනා කළා. එතැනින් එහාට ලංකාවේ කවදාවත් අඩුම තරමින් සුනාමි ආපු වෙලාවේදීවත්, කොරෝනා වසංගතය ආපු වෙලාවේදීවත් අපි ශ්‍රී ලාංකිකයෝ හැටියට කටයුතු කරලා නැහැ. අපි කටයුතු කළේ බෙදිලා එකිනෙකා ගහගෙන, මරා ගන්නා තත්ත්වයකට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉතා අමාරු අවස්ථාවක කාටවත් කරදරයක් නොවෙන විධියට දුප්පත් ජනතාවට කිසිම ආකාරයක පීඩාවක් දෙන්නේ නැතිව මෙවර අය වැය ගෙනැල්ලා තිබෙනවා. ගම් මට්ටමෙන් වැඩ කරනකොට පක්ෂ භේදයකින් තොරව සියලු ජනතා නියෝජිතයන්ට තමන්ගේ වැඩ කටයුතු කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. එතැන අවිහිංසාව, ද්වේශය නැතිව 'පළිගැනීම' වෙනුවට 'පිළිගැනීම' කියන සංකල්පය බැසිල් රාජපක්ෂ මහත්තයා හඳුන්වා දීලා තිබෙනවා. ඒ නිසා ඊළඟ අවුරුද්දේවත්, 2022 අවුරුද්දේවත් අපි විවේචනය කරමු. හැබැයි, පාට කණ්ණාඩි ගලවලා. ප්‍රශ්නය දිහා බලමු. හැබැයි, පාට කණ්ණාඩි ගලවලා. අපි පොහොට්ටුකාරයෝ නොවී, දුරකථනකාරයෝ නොවී, ජේවීපීකාරයෝ නොවී, සිංහල-බෞද්ධයන් නොවී, කතෝලිකයෝ නොවී, මුස්ලිම්කාරයෝ නොවී, හින්දුකාරයෝ නොවී ශ්‍රී ලාංකිකයන් හැටියට 2022වත් මේ ප්‍රශ්නයට මුහුණ දුන්නොත් තමයි, ශ්‍රී ලංකාව -අපේ ආදරණීය මාතාව- ගොඩ යන්නේ කියන එක මතක් කරමින්, ඒ සඳහා තමුන්නාන්සේලා සියලු දෙනාම ඒ අධිෂ්ඨානය ඇති කර ගන්න කියලා යෝජනා කරමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එස්.එම්.මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.25]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අය වැය විවාදයේ දී අපි දැක්කා ඉස්සෙල්ලා ඇමතිකම්වල ඉඳලා දැන් ඇමතිකම්වල නැති අය රෙදි ගලවා ගෙන කඩේ යන විධිය. ඒ නිසා මම ඒ ගැන දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. එක උදාහරණයක් විතරක් මම කියන්නම්. පැණි promote කරලා ධම්මික කියන කෙනෙක් ප්‍රවර්ධනය කරගෙන ගිය අය, අපි එන්නත ගෙනෙන්න කියනකොට "පැණි තමයි බොන්න හොඳ. දේශීය දේවල් අගය කරන්නේ නැහැ" කියලා අපට කියපු අය, හරියට නිකම් අපි පැණි promote කළා වාගේ කථා කරන එක ගැන නම් අපට හිනා වෙන්න වෙන්නේ අධෝ මුඛයෙන් කියන එක මට කියන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය සම්පූර්ණයෙන්ම දත්ත විජ්ජාවකිනුයි, වචන හරඹයකිනුයි මේ රට නැවත වතාවක් මුසාවෙන්, මුලාවෙන් මෝහනය කරන්න ගත්ත උත්සාහයක් කියලා මම පැහැදිලිව කියන්න ඕනෑ. දැන් කියනවා, කොරෝනා කියලා. මේ කලාපයේ කොරෝනා තිබෙද්දීම අනෙක් රටවලට දැන් මොකද වෙලා තිබෙන්නේ? උදාහරණයක් කිව්වොත්, බංග්ලාදේශයේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි; මියන්මාරයේ 3.2යි; වියට්නාමයේ 2.9යි; චීනයේ සියයට 2.3යි; බෲනායිවල 1.1යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක සම්පූර්ණයේම දත්ත විජ්ජාවක්. ඒ වාගේම, මුදල් ඇමතිතුමාගේ මේ අය වැයෙන් මේ මොහොතේ තිබෙන ප්‍රශ්න එකකටවත් විසඳුමක් ලබා දීලා නැහැ. මේ මොහොතේ තිබෙන ලොකුම අර්බුදය මොකක්ද? එතුමන්ලා මුදල් අච්චු ගහලා උද්ධමනය වර්ධනය වෙන එක අදාළ නැති වුණාට, ඩොලර් අච්චු ගහන්න බැහැ. ඒ නිසා ඩොලර් හොයන්න ක්‍රම ඉදිරිපත් කරලා නැහැ. මාලදිවයිනේ සංචාරක කර්මාන්තය ගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 70ක් වර්ධනය වුණාට, ඒ සඳහා අපට යම් කාලයක් යනවා කියන එක අපට තේරෙනවා. ඩොලර් එන ප්‍රධාන ආදායම් මාර්ග අතරින් එකක් තමයි සංචාරක කර්මාන්තය. විදෙස් ශ්‍රමිකයන් ලක්ෂ 2ක් විතර ඇවිල්ලා හිටියා. දැන් ආරංචි විධියට 75ක් විතර ආපහු ගිහිල්ලා තිබෙනවා. එතකොට ඒ ආදායම අඩු වෙලා තිබෙනවා. ඒක වැඩි කර ගන්න ක්‍රමයක් නැහැ.

ඒ එක්කම, අපනයනය සහ සෘජු විදේශ ආයෝජනය ගැන කිව යුතුයි. දැන් කළු සල්ලි සුදු කරන පනත් ගෙනැල්ලා ආයෝජකයන්ගේ විශ්වාසය නැති කරලා තිබෙනවා. අපට ආරංචියි හෙට-අනිද්දා වනවිට කළු සල්ලි සුදු කරන්න තවත් ඩොලර් බිලියනයක් ගෙනෙන්න උත්සාහයක් තිබෙනවා කියලා. ඒ නිසා ආයෝජකයෝ එන්නේ නැති නිසා සෘජු විදේශ ආයෝජන නැහැ. අනෙක් පැත්තෙන්, අපනයනය දෙස බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බලන්න. අවුරුද්දකට දළ වශයෙන් කෘෂි අපනයනයෙන් විතරක් ඩොලර් මිලියන 2400ක ආදායමක් අපේ රටට එනවා.

ඔළමොට්ටළ විධියට, උද්ධච්ච විධියට රසායනික පොහොර තහනම් කරලා, එකවර කාබනික පොහොර ගෙනෙන්න ඕනෑ කියලා, අද ඒ තීරණය reverse කරගෙන තිබෙනවා. ඒක වෙනම කථාවක්. ඒ නිෂ්පාදනය අඩු වීම නිසා අපට ඩොලර් මිලියන 2,400ක අපනයන ආදායමක් අහිමි වෙමින් පවතිනවා කියන එක මම පැහැදිලිව කියනවා. අනික් පැත්තෙන්, අපේ මුදල් ඇමතිතුමාගේ අය වැය තුළ ප්‍රකාශ නොවන විශාල අපනයන ආදායමක් එන තැනක් තමයි ඇඟලුම් අපනයනය සහ GSP Plus සහනය. අපේ රටට ලබාදෙන GSP Plus සහනය තහනම් කරන්න මේ මොහොත වනකොට යුරෝපීය පාර්ලිමේන්තුව තුළ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒ වෙන මොකවත් නිසා

නොවෙයි, මේ ගොල්ලන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්නේත් නැහැ, ලෝක බැංකුවට යන්නේත් නැහැ, ඒ වාගේම මේ GSP Plus සහනය අහිමි වීම හමුවේ ඉදගෙන ඒක ලබා ගන්න කිසිම උත්සාහයක් ගන්නේත් නැහැ. මෙතුමන්ලාට ඒ තැන්වලට යන්න බැහැ. මොකක්ද, හේතුව? ප්‍රජාතන්ත්‍රවාදය, මූලික මිනිස් අයිතිවාසිකම්, මානව හිමිකම්වලට ගරු කිරීම, නීතියේ ආධිපත්‍යය, මාධ්‍ය නිදහස කියන දේවල් ස්ථාපිත කරන්නේ නැතිව මෙතුමන්ලාට ඒවාට යන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලාට තුනෙන් දෙකක පාර්ලිමේන්තු බලයක් තිබිලා, ස්ථාවර රජයක් තිබුණාට ගිහිල්ලා ඒක ගන්න බැහැ. ස්ථාවර රාජ්‍යයක් තිබෙන්න ඕනෑ. පුරවැසි නිදහස ස්ථාපිත කර තිබෙන්න ඕනෑ. මිනී මරා, උසාවියෙන් දඬුවම් ලබා, හිරේ දැමූ මිනිසුන් නිදහස් කරලා යුරෝපා පාර්ලිමේන්තුවට යන්න බැහැ. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න බැහැ. මොකක්ද, හේතුව? ඒ තැන්වලට ගිය ගමන් අහනවා, තොපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවාද, මාධ්‍ය නිදහස තිබෙනවාද, සිවිල් පුරවැසි නිදහස තිබෙනවාද යනුවෙන්. ඒවාට උත්තර දෙන්න බැරි නිසා මේ ගොල්ලන් යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනික් ප්‍රධාන ප්‍රශ්නය තමයි, මේ වෙලාවේ තිබෙන පෝලිම් යුගය නිමා කරන විධිය ගැන, ජීවන වියදම ඉහළ ගිහින් තිබෙන විධිය ගැන මුදල් ඇමතිතුමාගේ අය වැය තුළ කිසිම උත්තරයක් නැහැ. ගෑස් පෝලිම නැති කරන්නේ කොහොමද? සිමෙන්ති පෝලිම නැති කරන්නේ කොහොමද? කිරි පිටි පෝලිම නැති කරලා පොඩි දරුවෙකුට කිරි ටිකක් ලබා දෙන්නේ කොහොමද? ඒ වාගේම සහල් පෝලිම නැති කරන්නේ කොහොමද? පොහොර ලබා දෙන්නේ කොයි විධියටද? ඒ වාගේම දැන් දළ වශයෙන් පස්දෙනෙක් සිටින පවුලකට මාසයකට ජීවන වියදම රුපියල් 8,000කින් පමණ වැඩිවෙලා තිබෙනවා. බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ භාෂාවෙන් ම කියනවා නම්, අද අපේ රටේ ආර්ථිකය කුල්ල කුජීත වෙලා තිබෙන වෙලාවේ ඒකට විසඳුම් ලබා දෙන්නේ කොහොමද කියලා සඳහන් කරන්නේ නැහැ. හැබැයි, එකක් තිබෙනවා. පොහොට්ටුවේ ප්‍රාදේශීයව ගම් මට්ටමින් සිටින අයට ගරානාවක් දමන්න වසමකට රුපියල් ලක්ෂ 30 ගණනේ දෙන්න සැලැස්මක් හදලා තිබෙනවා. අපි අහනවා, සම්බන්ධීකරණ කමිටුවල සිටින නියෝජ්‍ය සභාපතිවරයෙකුට, මහජන නියෝජිතයෙක් නොවන කෙනෙකුට කොහොමද මිලියන 100ක් ප්‍රතිපාදන වෙන් කරන්නේ කියලා? එතකොට ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන 3ක් ලබාදෙන එක කවර නිර්ණායකයක් යටතේද තෝරන්නේ? කවුද, තෝරන්නේ? කාටද, වග කියන්නේ? ඒ අයට ලබා දෙන්න නම් මුදල් තිබෙනවා. කිරිවලට සහන දෙන්න, සීනිවලට සහන දෙන්න. ගෑස්වලට, සිමෙන්තිවලට සහන දෙන්න මුදල් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! දිවා ආහාර විවේකයෙන් පසු ඔබතුමාට තව විනාඩි 10ක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. S.M. Marikkar, you can continue with your speech. You have ten more minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දිවා ආහාර විවේකයට කලින් කියමින් සිටියේ දත්ත මුදල් ඇමතිතුමා විජ්ජාවෙන් හා වචන හරඹයෙන් අය වැය ඉදිරිපත් කරලා මේ මොහොතේ රට තුළ තිබෙන ප්‍රශ්නවලට කිසිදු විසඳුමක් ලබාදීලා නැහැ කියන කාරණය ගැනයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා රජයේ සේවකයන් විශ්‍රාම යන වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරන්න කථා කරනවා. අනික් අතට කියනවා, "එහෙම කළා කියලා අපි තරුණ අයට අවස්ථාව නොදී ඉන්නේ නැහැ" කියලා. ඊළඟ දවසේ ඇවිත් කියනවා, ඔවුන්ට සියයට 70ක් තැපැල් ඡන්ද ලබාදුන් රාජ්‍ය සේවය රටටම බරක් කියලා. එහෙම නම් අවුරුදු 65ක් දක්වා සේවා කාලය දීර්ඝ කිරීම තුළ, තරුණ අයට රැකියා අවස්ථා ලබා දෙන්නේ කොහොමද? අපි දැක්කා, පසු ගිය දවස්වල චිත්‍ර ඇඳපු මල්ලිලා ඔක්කොම පිට රටවලට යන්න පාස්පෝර්ට් ගන්න, වීසා ගන්න පෝලිමේ ඉන්න ආකාරය. ඉන්න හිතෙන රටක් වෙනුවට යන්න හිතෙන රටක් තමයි මේ ජනාධිපතිතුමාගේ අවුරුදු දෙකක කාලය තුළ හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව එක කාරණයක් ගැන අපි කථා කරනවා. අද මේ ආණ්ඩුවට මේ ආර්ථිකය නිසියාකාරව කළමනාකරණය කරන්න බැරිවීම නිසාම තමයි මේ ඩොලර් අර්බුදය ඇවිල්ලා තිබෙන්නේ. ඒකට කිසිදු විසඳුමක් ලබා නොදුන්නා වාගේම, කොවිඩ්-19 පිටින් දමා හැම එකෙන්ම බේරෙන්න හදනවා. මම අහන්න කැමැතියි, දැන් කෘෂි කර්මාන්තයේ, වී වගාවේ, තේ වගාවේ ඇති වී තිබෙන අර්බුදයට කොවිඩ් වසංගතය බලපා තිබෙනවාද කියලා. පොහොර ගෙනෙන්න ඩොලර් මිලියන 400ක් නොමැතිකම නිසා කාබනික වගාව පටන්ගත්තා. මම දන්නේ නැහැ, අපට ආරංචි විධියට එක පුද්ගලයෙකුගේ වුවමනාවට ජනාධිපතිතුමාව නැඹුරු කර ගෙන තමයි මේ කාරණය වෙලා තිබෙන්නේ. අපට පෙනෙනවා, ආණ්ඩු පක්ෂය ඇතුළෙන්ම මේ සම්බන්ධව දැන් විවේචන ඉදිරිපත් වන ආකාරය. අපට සැකයක් තිබෙනවා, මේකත් දේශපාලන උපක්‍රමයක් ද කියලා. මේ විවේචනය විපක්ෂය පැත්තෙන් නොව, ආණ්ඩුව ඇතුළෙන්ම ගත්තා නම් හොඳයි.

මේ මොහොත වනකොට ආණ්ඩුව නිකුත් කළ පොහොර පිළිබඳ ගැසට් එකත් reverse කර අවසන්. දැන් මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමායි, ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමායි - දෙදෙනාම- ගහ ගන්නවා.

දැන් එක්කෙනෙක් කියනවා "මම නොවෙයි, නැනෝවලට සම්බන්ධ අරයා" කියලා. ඔහු කියනවා "මම නොවෙයි, අරයා සම්බන්ධයි" කියලා. හැබැයි, deal එක කරපු එක්කෙනා එයාගේ වචනවලින්ම කිව්වා, "මම deal කළේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා එක්ක" කියලා. අපට තේරෙන්නේ නැහැ, මෙහි වැරැදිකාරයා කවුද කියලා. නමුත් මේ රටේ මහජනතාවගේ බදු මුදල් කෝටි 800ක් පාඩු වීමේ යථාර්ථය ආණ්ඩුවටම පිළිගන්න සිදුවීම පිළිබඳව අපට යම්කිසි විධියක සැහැල්ලුවක් තිබෙනවා. මහා දේශප්‍රේමීන් විධියට, ජාතික ආරක්ෂාව තහවුරු කරන්න ආ කට්ටිය මේ අර්බුදය තිබියදීම කිසිදු අවසරයක් නැතුව චීන අසූචි නැව කළුතර මුහුදේ නැංගුරම් ලාගෙන ඉන්නවා. ඒක අපේ මුහුදු

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

සීමාව ආක්‍රමණය කරලා ඉවරයි. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, අපි ඔබතුමාට කිව්වා ඕනෑවට වැඩිය කඩේ ගියාම අන්තිමට රාජපක්ෂලා කලිසම ගලවලා ඔළුවේ දාලා තමයි යවන්නේ කියලා. මර්වින් සිල්වාටත් ඒක වුණා. සජින් ද වාස් ගුණවර්ධනටත් ඒක වුණා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, ඔබතුමා මාසයකට විතර කලින් මාධ්‍ය හමුවලට ඇවිල්ලා ගහපු කයිවාරු ටික ආයෙත් පොඩ්ඩක් මතක් කරලා බලන්න. ආණ්ඩුව ඩොලර් මිලියන 6.7ක් ඔය අසූචි නැවට ගෙව්වොත්, ඔබතුමාට ඡන්දය ඉල්ලන්න නම් හම්බ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පොහොර ප්‍රශ්නය නිසා අද වගාවේ නිෂ්පාදනය අඩුවීම එසේ මෙසේ කොට සලකන්න බැහැ. හේතුව, මහ කන්නයෙන් තමයි අපේ කෘෂි නිෂ්පාදනයෙන් සියයට 65ක්ම එන්නේ. ඊයේ ගැසට් එක reverse කළා කියා හෙට පොහොර එන්නේ නැහැ. දැනටමත් ප්‍රමාද වැඩියි. අද එළවලු මිල දෙතුන් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, අපි නම් අහන්නේ නැහැ, "සැප ද?" කියලා. මොකද, හේතුව ජනතාවට මේ විධියට දුක් වෙන්න සිදුවීම පිළිබඳව අපට තිබෙන්නේ කනගාටුවක්. මේ ආණ්ඩුව, මුදල් ඇමතිතුමා මේවාට විසඳුමක් දීලා නැහැ. තුන්වේල කාපු මිනිසුන්ට ජීවන වියදම වැඩිවීම නිසා අද දෙවේලක් කන්න වෙලා තිබෙනවා. දෙවේල කාපු මිනිසුන්ට එක වේලක් ලෙවකන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොළ හතේ මුදල් ඇමති කෙනෙක් ආවාම, මේ ඩොලර් ප්‍රශ්නයට, බඩු මිල ප්‍රශ්නයට, පෝලිම් ප්‍රශ්නයට, ජීවන වියදම් ප්‍රශ්නයට අස්වැසිල්ලක් දෙයි කියා අපි බලාපොරොත්තු වුණා. ඒක ලැබෙන්නේ නැතුව, පොහොට්ටුවේ ගමේ ඉන්න -ග්‍රාමීය- නායකයන්ට, ග්‍රාම නිලධාරී වසම්වලට දෙන ලක්ෂ තිහ හරහා පොඩි කුට්ටියක් ගහ ගැනීම සඳහා වූ පාර කැපීම නම් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොනවත්ම කරන්න බැරි වෙලා තිබියදී දැන් අන්තිමට කියන්නේ මොකක්ද? මා දැක්කා ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කියනවා, "සියලු දෙනාට ඇහුම්කන් දෙන නායකයෙක් ඉන්නේ; සරල නායකයෙක් ඉන්නේ" කියලා. සරල නායකයෙක් නම්, ඇහුම්කන් දෙන නායකයෙක් නම් මුළු රටම, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සියලු දෙනා උද්ඝෝෂණ කරද්දී, පොහොර ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්නේ නැතුව, මෙච්චර දරදඬු විධියට ඊයේ වෙනතුරු ඒ කාරණය අල්ලා ගෙන හිටියේ ඇයි ද කියන එක අපි අහන්න කැමැතියි. මර්දනය තමයි දැන් ඉතුරු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එක කාරණයක් පැහැදිලිව කියන්න ඕනෑ. ඒ තමයි මේ රටේ විකල්ප නායකයා, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ සටනට නායකත්වය දෙන්න සූදානම් වෙලා ඉන්නවා කියන කාරණය. මට සතුටුයි, අපි වාගේ සාමාන්‍ය මන්ත්‍රීවරු ගිහිල්ලා එතුමාට යෝජනාවක් කළාම එතුමා ඒවා පිළිගන්නවා. පසුගිය 16 වෙනිදා තිබුණු රැළිය පිළිබඳ යෝජනාව ඉස් ඉස්සෙල්ලාම මම ගිහිල්ලා එතුමාට කිව්වා, "ජනාධිපතිට අවුරුදු දෙක පිරෙන දවසේ රටේ මේ මේ ප්‍රශ්න තිබෙනවා, මෙවැනි වැඩක් කරමු" කියලා. එතුමා සියලු දෙනා එකතු කරගෙන ඒ වැඩසටහන සාර්ථකව කරන්න උත්සාහ ගත්තා. ආණ්ඩුව මොකක්ද කළේ? ඒක මර්දනය කරන්න උත්සාහ කළා. උසාවියට ගිහිල්ලා ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ගයක් ගන්න බැලුවා, බැරි වුණා. ඊට පස්සේ පොලිස්පති ලවා චක්‍රලේඛ ගස්සවා ඒක නතර කරන්න පුළුවන්ද බැලුවා. හැබැයි, ඔබතුමන්ලා අපට කළේ උදව්වක්. පොලිස්පති ලවා චක්‍රලේඛයක් ගස්සවා සියලු බස් ටික, මිනිස්සු එන එක, ගොවියෝ එන එක නතර කරන්න උත්සාහ ගත්තා. සමහර police areasවල මහ පාරේ ඇණ ගහලා බස් නවත්වලා තමයි ඒ මර්දනය කරන්න උත්සාහ කළේ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියමින්, නීතියේ ආධිපත්‍යය ගැන මහ ලොකුවට කථා කළාට මේ විධියට පොලිස් රාජ්‍යයක් බවට පත් කරලා තමයි එතුමන්ලා කටයුතු කළේ.

ගරු සරත් වීරසේකර ඇමතිතුමා හිතාගෙන ඉන්නේ එතුමා මේ රටේ අයිතිකාරයා කියලායි. එහෙම කටයුතු කරන්න හම්බ වෙන්නේ නැහැ. කඩේ ගියාට ඔහොම කටයුතු කරන්න යන්න එපා. නමුත් ඒ මර්දනය මැද වුණත් අපි ආණ්ඩුවට එකක් කියන්න කැමැතියි. ඔබතුමන්ලා කිව්වා නේ විපක්ෂය දුර්වලයි, දුර්වලයි කියලා. දැන් පෙනෙනවා නේ, විකල්පය කවුද කියලා. අපි ආණ්ඩුවේ පක්ෂවලටත්, විපක්ෂයේ පක්ෂවලටත් 16 වෙනිදා පෙන්නුවා, විකල්පය කවුද, කොහොමද කියන එක. මහා ධාරානිපාත වර්ෂාව සලකන්නේ නැතුව, ජනතාව රටේ නන් දෙසින් ඇවිල්ලා තමන්ගේ ප්‍රශ්නවල තිබෙන පීඩනයේ තරම මොකක්ද කියන එක ආණ්ඩුවට පෙන්නුවා. පෙබරවාරි මාසයේ 9 වැනිදාට මේ රටේ පළාත් පාලන ආයතනවල නිල කාලය ඉවර වෙනවා. ඒ නිසා පුළුවන් නම් ජනවරම test කරලා බලමු කියලා අපි අභියෝග කරනවා. මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කයිවාරු ගහන්නේ නැතුව අපි ජන වරම test කරලා බලමු.

අපි 2018දී ඡන්ද තිබ්බා නේ. ඒ වාගේ දැනුත් තියලා බලමු. අපි පැහැදිලිවම දන්නවා, මේ ගොල්ලන් ඡන්ද තියන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසාම තමයි මේ ආර්ථික අර්බුදයෙන් අපේ රටට ගොඩ එන්න බැරි. මේ විධියට මර්දනකාරී පිළිවෙත් රට තුළ අනුගමනය කරද්දී මේ ආණ්ඩුවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න බැහැ; ලෝක බැංකුවට යන්න බැහැ; ආසියානු සංවර්ධන බැංකුවට යන්න බැහැ. ගියාම අහනවා, "කෝ, ඔයගොල්ලන්ගේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය; කෝ, මාධ්‍ය නිදහස; කෝ, නීතියේ ආධිපත්‍ය; කෝ, මූලික මිනිස් අයිතිවාසිකම්" කියලා. ඒවා ලබා දෙන්නේ නැතිව අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු අනෙක් තැන්වලට යන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ගෙයක් හදන්න බැංකුවකින් ණයක් අරගෙන තිබියදී හදිසියේ ආර්ථික ප්‍රශ්න ඇවිත් අපට ණය වාරිකය ගෙවා ගන්න බැරි වුණොත් බැංකුවට ගිහිල්ලා කථා කළාම, බැංකුව ඒ ණය අපට ගෙවන්න පුළුවන් විධියට reschedule කරලා දෙනවා. මෙතැනදී අපි කළ යුත්තේ මොකක්ද? ගිය අවුරුද්දට විතරක් අපේ රටේ ට්‍රිලියන 2.3ක් ණය අරන් තිබෙනවා. මේ අවුරුද්දේ කීයක් ණය අරගෙන ද දන්නේ නැහැ. ගත්ත ණයවලට ලබන අවුරුද්දේ විතරක් ඩොලර් බිලියන 4.5ක ණය වාරික ගෙවන්න තිබෙනවා. මේවා ගෙවන්න ක්‍රමයක් නැහැ. අවසානයේදී සැම්බියාවට, ලෙබනනයට වෙච්ච විධියට අපේ රටත් collapse වෙන්නයි මේ යන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඇත්ත වශයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා නම් ඉන්නේ මේ රටේ. අපි ඒක දන්නවා. අපි ඒකට ගරු කරනවා. ඉතිරි නායකයෝ ටික නම් ඇමෙරිකාවට යාවි. හැබැයි, දුක් විඳින්න වෙන්නේ මේ රටේ දරු පරම්පරාවටයි. තමුන්නාන්සේලාට තව කාලයක් තිබෙනවා නේ. ඒ නිසා දරදඬු නොවී, උද්ධච්ච නොවී,

නම්‍යශීලී ප්‍රතිපත්තියක ඉඳලා මේ රටට කෙළවෙන්න යන එකෙන්, මේ රට විනාශ වෙන්න යන එකෙන්, මේ රට පුපුරන්න යන එකෙන් බේරා ගැනීම සඳහා වූ වගකීම ගන්න. ඒ වාගේම ආණ්ඩුවේ ඉන්න ඕනෑම ජගතෙකුට අපි නැවත අභියෝග කරනවා, පුළුවන් නම් ඡන්දය තියන්න කියලා. දැන් නියමිත ඡන්ද ටික තියන්න. තියලා බලමු ජන වරම කාටද තිබෙන්නේ කියලා. එතකොට මොළ 7ක් තිබෙන කෙනාටයි, සරල නායකයාටයි මොකක්ද වෙන්නේ කියන එක තේරුම් ගන්න පුළුවන්. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Chamal Rajapaksa. You have 14 minutes.

[අ.භා. 1.10]

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ ගෙවුණු කාලය තුළ දෙපක්ෂයේම කථාවලට සවන් දුන්නා. අද උදේ විපක්ෂ නායකතුමාගේ කථාවටත් සවන් දුන්නා. අපේ හිතවත් මරික්කාර් මන්ත්‍රීතුමාත් තමන්ගේ නායකතුමා ගැන බොහෝ සිහින තියාගෙන ඉන්න බව එතුමාගේ කථාවෙන් පෙනී ගියා. හැබැයි, ඉතින් අපි දේශපාලනයේදී යමෙකු ගැන විශ්වාස කරනකොට එයාගේ ක්‍රියාවලිය ගැන, එතුමා මොනවාද කර තිබෙන්නේ කියන එක ගැනත් සලකා බලන්න ඕනෑ. විපක්ෂ නායකතුමා අපිත් එක්ක හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවුරුදු 30ක් විතර හිටියා. එතුමා 2001 වසරේ සිට 2004 වසර දක්වා කාලය තුළත් ඇමතිවරයෙක් වෙලා හිටියා. නැවතත්, 2015 වසරේ සිට 2019 වසර දක්වාත් ඇමතිවරයෙක් වෙලා හිටියා. එතුමා මොනවාද හම්බන්තොටට කරලා තිබෙන්නේ? හම්බන්තොට හදපු වරාය 99 අවුරුද්දකට මෙතුමන්ලා විදේශ රටකට බදු දුන්නා. අපට ලේසියෙන්ම එතැනට ව්‍යාපාර ගේන්න තිබුණා. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තිබුණා. එතැනට අහස්යානා ගෙනැල්ලා, අපේ නිෂ්පාදන අපනයනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න ඕනෑ තරම් ඉඩකඩ තිබුණා. 2015 වෙනකොට අපි වී නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වෙලායි හිටියේ. යහ පාලන ආණ්ඩුවේ අය අතිරික්ත වී ටික සියල්ලම ගෙන ගිහිල්ලා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගොඩ ගැහුවා. ඒකෙන් සිදු වෙච්ච අලාභය බලන්න. මේ නිසා ව්‍යාපාර ගෙනාවේ නැහැ. මේ වාගේ තවත් බොහෝ දේවල් තිබෙනවා කියන්න. ඒක නිසා තමයි පසුගිය මැතිවරණවලදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාසයේ ජනතාව එතුමාට ඡන්දය නොදුන්නේ. ඒකෙන්ම පේනවා, සුරංගනා කථා ඉදිරිපත් කළාට වැඩක් කරන්න පුළුවන් ද, බැරි ද කියන එක.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බලය එක වරක් ජනතා විමුක්ති පෙරමුණට දුන්නා. එක වරයි දුන්නේ. ඉන් පස්සේ ජනතාව ඒ අය ප්‍රතික්ෂේප කළා. ඒ සභාපතිවරයා වංචාවලට සම්බන්ධයි කියලා චෝදනා කරලා එතැනින් ඉවත් කළා. ඒ නිසා අපි කථා කළාට විතරක් මදි, රට ගැන හිතලා, රට ගොඩ නඟන්න සියලුදෙනා එක්වෙලා කටයුතු කළ යුතු යුගයක් තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ.

මම මේ වෙලාවේ ඉන්දියාවේ හිටපු ජනාධිපති, ආචාර්ය අබ්දුල් කලාම් මහතා විසින් හයිද්‍රාබාද්වලදී කරපු දේශනයකින් යම් කොටස් කීපයක් කියවන්න කැමැතියි. මොකද, මේක අපට ඉතාම වැදගත් වන නිසා. ඉන්දියාව ගැනයි එතුමා මේ කියා තිබෙන්නේ. නමුත් මේක ලංකාවට ඉතාම අදාළයි. එතුමා මෙහෙම කියනවා.

"ඉන්දියාවේ මාධ්‍යය මෙතරම් සෘණාත්මක ඇයි? අපේ ශක්තිය අපේ සාර්ථකත්වය ගැන සඳහන් කිරීමට අප කුළැටි වන්නේ මොකද? අපි ප්‍රබල ජාතියක් වෙමු. අපේ සාර්ථකත්වය පෙන්වන අපූරු නිදර්ශන එමට ය. එහෙත් අප ඒවා ගැන සඳහන් කරන්නේවත් නැත."

ලංකාවේත් වෙන්නේ ඒකමයි. එතුමා තව දුරටත් මෙසේ කියනවා. "කිරි නිෂ්පාදනයේ අප පළමුවැන්නා ය."

වර්ෂ 1945 දී අමුල් ව්‍යාපාරය ආරම්භ කළ ඉන්දියාව අද කිරිවලින් ස්වයංපෝෂිතයි. අපේ රජයත් කිරි නිෂ්පාදනය කිරීම සඳහා කිරි ගම්මාන හැදුවා; ගොවීන්ට උදවු කළා. නමුත් ඇමතිවරු සහ ආණ්ඩු මාරු වෙන කොට ප්‍රතිපත්තියත් මාරු වෙනවා. ඉතින් අපට කවදාවත් කිරිවලින් ස්වයංපෝෂිත වෙන්න බැහැ. එදා අප රට භාර දෙනකොට 1978 වර්ෂයේදී කිරි අවශ්‍යතාවෙන් සියයට 70ක් විතර දේශීයවයි නිෂ්පාදනය කළේ. අපට කිරිවලින් ස්වයංපෝෂිත වෙන්න තිබුණා. නමුත් විවිධ ප්‍රතිපත්ති නිසා අද පිට රටින් කිරි පිටි ගෙනෙන්න සිදු වෙලා තිබෙනවා. අපට මේවා ගැන බලන්න වෙනවා; සිතන්න වෙනවා.

ඊළඟට, අබ්දුල් කලාම් මැතිතුමා මෙසේත් කියනවා.

"ලෝකයේ දෙවන විශාල ම වී නිෂ්පාදකයා අප ය."

2015 වර්ෂයේදී අප රට භාර දෙනකොට වී අතිරික්තයක් තිබිච්ච බව තමුන්නාන්සේලා දන්නවා. ඒක නේ ගිහිල්ලා මත්තල ගුවන් තොටුපොළේ වී ගොඩ ගැහුවේ. දැන් එතැන වී ටිකත් නැහැ. ඒ ගුවන් තොටුපොළට සිදු වෙච්ච අලාභය අතිවිශාලයි; පාඩුව අතිවිශාලයි. ඉතින්, කොහොමද රැකියා උත්පාදනය වන්නේ, කොහොමද රටේ ආර්ථිකය ගොඩ නැඟෙන්නේ?

එතුමා තවදුරටත් කියනවා, "ආචාර්ය සුදර්ශන දිහා බලන්න. ඔහු ගෝත්‍රික ගමක් ස්වයං තිරසාර, ස්වයං මෙහෙයවන ඒකකයක් බවට පරිවර්තනය කර තිබේ. ලක්ෂ ගණන් මෙවැනි සාර්ථකත්වයන් ඇතත් මාධ්‍යය වශී වී ඇත්තේ අසාර්ථක ව්‍යාපෘති, ආපදා වැනි විෂම ප්‍රවෘත්තිවලට ය." කියලා

ඉතින් අපේ රටේ වෙන්නේත් මේකම තමයි. අපේ රටේ බොහොම සාර්ථක ව්‍යවසායකයෝ ඉන්නවා. අපි ඒ අයට අත හිත දෙනවා මදි. එහෙම නැත්නම්, අපි ඒ අය විවේචනය කරනවා.

වී නිෂ්පාදනය ගැන කියන කොට මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් තිබෙනවා නේ, පොහොර ප්‍රශ්නයක්. අපට තිබෙනවා ස්වභාව ධර්මයෙන් දුන් එප්පාවල පොස්පේට් නිධිය. කිසිම ආණ්ඩුවක් ඒ පිළිබඳව අවධානය යොමු කරලා නැහැ. පසුගිය දවස්වල කෘෂිකර්ම ඇමතිවරයා හැටියට සිටි විට මම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකින් ඉල්ලීමක් කළා. අපට ඒ පොස්පේට් නිධිය ආශ්‍රයෙන් නිෂ්පාදන කරන්න පුළුවන්. නමුත් අපි පිටරටින් TSP - Triple Superphosphate - ගෙන්වනවා. අපට පහසුවෙන් Single Superphosphate නිෂ්පාදනය කරන්න පුළුවන්. නමුත් අපි එය කරන්නේ නැහැ. කෘෂිකර්ම ඇමතිවරයා හැටියට මම ඒ ඉල්ලීම ඉදිරිපත් කළා. කර්මාන්ත ඇමතිතුමා කියනවා, ඒක එතුමාගේ කියලා. එතුමාත් ගත්තා. නමුත්, එතුමා එය කළේත් නැහැ.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

වර්තමානයේදීත් ඒක ඉෂ්ට වෙලා නැහැ. එප්පාවල පොස්පේට් නිධියෙන් Single Superphosphate නිෂ්පාදනය කරන්න පුළුවන්. අපේ රටට අවශ්‍ය වන්නේ මෙට්‍රික්ටොන් ලක්ෂ දෙකක් පමණයි. ඉතිරි ටික අපනයනය කරන්න අපට පුළුවන්. එමගින් විදේශ විනිමය හොයන්න පුළුවන්; ඩොලර් හොයන්න පුළුවන්. නමුත් මේවා කෙරෙන්නේ නැහැ. ඒක තමයි මා අපේ රජයෙනුත් ඉල්ලා සිටින්නේ, මේවා ගැන අවධානය යොමු කරන්න කියලා. එතකොට මේ ඩොලර් ප්‍රශ්නයත් පුළුවන් තරම් අඩු කරගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම රැකියා උත්පාදනය කරන්නත් පුළුවන් වෙනවා.

අබ්දුල් කලාම් මැතිතුමා පුවත් පත් ගැන තමයි මෙම ලිපියේ වැඩිපුර කියා තිබෙන්නේ. එතුමා ඊශ්‍රායලයේ ඉන්න කොට, දවසක් ඊශ්‍රායල පුවත් පතක් කියවමින් සිටියා ලු. ඊට පෙර දින "හමාස්" පහරදීම්වලින් විශාල සංඛ්‍යාවක් මිය ගොස් තිබුණා ලු. එතුමා ඒ ගැන කියන්නේ කොහොමද?

"නමුත් ඒ පුවත් පතේ මුල් පිටුවේ ප්‍රධාන ප්‍රවෘත්තිය වූයේ, යුදෙව් මහත්මයකු අවුරුදු පහක් තුළ ඔහුගේ කාන්තාරය පලතුරු උයනක් හා ධාන්‍යාගාරයක් බවට පරිවර්තනය කළ අන්දමයි. බෝම්බ ප්‍රහාරයත්, ජීවිත හානි ආදී ප්‍රවෘත්ති ඇතුළු පිටුවලට රිංගවා තිබුණි." එහෙමයි කියන්නේ.

අපේ රට කාන්තාරයක් නොවෙයි. අපට පුළුවන් හැම වත්තක්ම උද්‍යානයක් කරන්න, ධාන්‍යාගාරයක් කරන්න. නමුත්, අපි ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යන්නේ නැහැ. එක රජයක් ඒක කරනවා. ඊළඟ රජය ඒක කරගෙන යන්නේ නැහැ. ඒ නිසා තමයි අපට අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

ඊළඟට, එතුමා ඉන්දියාවේ තත්ත්වය ගැනත් කියනවා.

"ඉන්දියාවේ අප කියවන්නේ මරණ, ලෙඩ දුක්, ත්‍රස්තවාදී ක්‍රියා, අපරාධ ආදිය ගැනයි. ඇයි, අප මෙතරම් සෘණාත්මක?"

ලංකාවේත් එහෙමයි. මේ වාගේ ප්‍රවෘත්ති පුවත් පත්වලින් හෙළි කරන කොට අපේ අයත් අධෛර්යවත් වෙනවා. රට ගොඩ නඟන්න දායක වීමේ විශාල වගකීමක් අපේ මාධ්‍යයටත් තිබෙනවා.

ඊළඟට, එතුමා මොකක්ද අහන්නේ?

"ජාතියක් වශයෙන් විදේශීය දේට අප කැදර ඇයි? අපට අවශ්‍ය පිටරට නිෂ්පාදන, අපට ඕනෑ කරන්නේ විදේශීය රූපවාහිනී, විදේශීය කමිස ආදියයි. අපට අවශ්‍ය විදේශීය තාක්ෂණයයි. ආනයන කරන දේවලට අපි කැදර මොක ද? ආත්ම විශ්වාසයත් සමඟ ආත්ම ගරුත්වයක් එන බව ඔබ දන්නේ නැද්ද?"

අපි එක කාලයක "සිය රට දේ - සිරි සැප දේ" කියලා කෑ ගැහුවා නේ. ඒ වාගේම අපි විදේශීය රටවලින් ආනයනය කරන දේවල් තහනම් කරන්න කියලා උද්ඝෝෂණ කළා; විවිධ පෙළපාළි ගියා. නමුත් අද කියන්නේ හැම දෙයක්ම පිට රටින් ගෙනෙන්න කියලා. අද පෙළපාළි යන්නේත් ඒකට නේ. මම කියන්නේ නැහැ, ප්‍රශ්නයට විසඳුම කාබනික පොහොර පමණයි කියලා. නමුත් අපට පුළුවන් කාබනික පොහොර සෑම ගෙදරකම, සෑම ගමකම නිෂ්පාදනය කරගන්න. එතකොට අපට රැකියා උත්පාදනය කරන්න පුළුවන්. ඒ වාගේම අලුත් ආදායම් මාර්ග සොයා දෙන්න පුළුවන්. එය එක පාරටම කිරීමේදී යම් අපහසුතාවක් ඇති වුණා. නමුත් එය ක්‍රමානුකූලව කරන්න තිබුණා. අද ඊයේ නොවෙයි, චන්ද්‍රිකා මැතිනියගේ කාලයේත් ඒ සඳහා විශාල වැඩ පිළිවෙළක් කෙරුණා මට මතකයි. ඒ වාගේම පර්යේෂණාගාර - labs - සවි කළ බස් 12ක් අම්පාර වාගේ ප්‍රදේශවලට ගියා. පස පරීක්ෂා කරන එක කළා. ලලිත් ඇතුලත්මුදලි මහත්මයා මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනාවා මට මතකයි, පිදුරු පුච්චන එකට දඩ ගහන්න කියලා. අවශ්‍යතාව අනුව එහෙම කෙරෙන්න ඕනෑ. ඒ වාගේ දේවල් කිරීම තුළ අපට පුළුවන් වෙනවා අපේ විදේශ විනිමය ඉතිරි කරගන්න; රැකියා උත්පාදනය කරන්න; අපේ අමු ද්‍රව්‍යවලට වටිනාකමක් ලබා දීමෙන් හැම කෙනාගේම ආදායම වැඩි කරන්න. කාබනික පොහොර නිෂ්පාදනය කරන කොට ග්ලිරිසීඩියා අවශ්‍ය වෙනවා. හැම වැටකම ග්ලිරිසීඩියා වැව්වොත්, ඒවා විකුණන්න පුළුවන් වුණොත් ඒ අයට ආදායමක් ලැබෙනවා. ගොමවලිනුත් ආදායමක් ලබන්න පුළුවන්. කරන්න පුළුවන් ඒ වාගේ දේවල් තිබෙනවා.

අබ්දුල් කලාම් මැතිතුමා මේ කියන්නේ ඉන්දියාව ගැන. නමුත් අපේ රටේත් ඒකම සිදු වෙනවා. එතුමා කියනවා, "අපේ රජය අකාර්යක්ෂම යයි ඔබ පවසයි. අපේ නීතිය යල් පැනපු එකක් බව ඔබ කියයි. නගර සභාව කැළි කසල ශුද්ධ කරන්නේ නැතැ'යි ඔබ කියයි. දුරකථන අක්‍රිය බවත්, දුම්රිය සේවාව විහිළුවක් බවත් ඔබ කියයි. ගුවන් සේවාව ලෝකයේ නරක ම එක බවත්, ලියුමක් කවදාවත් ලැබිය යුත්තාට නොලැබෙන බවත් ඔබ කියයි. රට බල්ලන්ට ගොස් ඇති බවත් එය අගාධයේ බවත් ඔබ කියන්නේ ය. ඔබ මෙසේ කියාගෙන, කියාගෙන යාවි. ඒත් ඒ සඳහා ඔබ කරන්නේ මොකක්ද?" යනුවෙන්.

කවුරුවත් ඒ ගැන කියන්නේ නැහැ; කළ යුත්ත කරන්නේත් නැහැ. විවේචනය ලේසියි. වැඩ කරන්න ගියාම අමාරුයි. නමුත් සත්භාවයෙන් වැඩ කරනවා නම්, අපි සියලුදෙනා මේ රට ගොඩ නඟන්න එකතු විය යුතුයි. අප හැම කෙනාටම අදහස් තිබෙනවා; මත තිබෙනවා. අපේ පක්ෂය ගොඩ නැඟිලා තිබෙන්නේ පක්ෂ ගොඩාක් එකතු වෙලා. ඒ අය අතර එක එක මත තිබෙනවා. අපි ඒ සියලුදෙනාට ඇහුම් කන් දෙන්න ඕනෑ; විපක්ෂයට ඇහුම් කන් දෙන්න ඕනෑ; රටේ අනෙකුත් විද්වතුන්ට ඇහුම් කන් දෙන්න ඕනෑ. එසේ ඇහුම් කන් දීලා, අපි ඔක්කෝම එකතු වෙලා රටේ අවශ්‍යතාව අනුව හොඳ ප්‍රතිපත්ති හදලා කටයුතු කළොත් අපේ රට දියුණු කරන්න පුළුවන්.

ඉන්දියාව 1999 වසරේදී අබ්දුල් කලාම් මැතිතුමාගේම ප්‍රධානත්වයෙන් විද්වතුන් විශාල පිරිසක් එකතු වෙලා අවුරුදු 20ක සැලැස්මක් හැදුවා. ඒ රටේ අගමැතිවරු මාරු වුණා; ආණ්ඩු මාරු වුණා. නමුත් 2020 වන කල්ම ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුණා. ඒකයි සාර්ථකත්වය. ඒ නිසා දැන් ඉන්න -වර්තමාන- අගමැතිතුමා අවුරුදු 30කට සැලැස්මක් හදලා තිබෙනවා. ඉතින් ඇයි අපට බැරි? මෙහිදී අපට වට පිටාවේ රටවලින් ආදර්ශ ගන්න පුළුවන්.

අපි වෙනත් රටකට ගියොත් ඒ රටේ තිබෙන නීති රීතිවලට ගරු කරනවා. අබ්දුල් කලාම් මැතිතුමා ඒ ගැනත් මෙහෙම කියනවා.

"...සිංගප්පූරුවේ දී ඔබ සිගරැට් කොට පාරේ විසි කරන්නේවත්, කඩ සාප්පුවල දී කෑම කන්නේවත් නැහැ."

නමුත් අපේ රටේ ඊට වඩා වෙනස්.

ඒ වාගේම එතුමා කියනවා, "හවස 5 - 8 කාලය තුළ ඕර්චාඩ් පාරේ රිය පැදවීමට ඩොලර් 5ක් ඔබ ගෙවනවා. ඔබ සාප්පුවක හෝ භෝජනාගාරයක රස්තියාදු වෙලා රථගාලට පැමිණි විට ඔබේ සමාජ අනන්‍යතාව නොතකා දඩය ගෙවිය යුතු ය." කියලා.

අපේ රටේ එහෙම නැහැ නේ. සමහර වෙලාවට අපි බලය පාවිච්චි කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඒවා කිව්වේ අපට ඒ වාගේ අයගේ දේශනවලින් ඉගෙන ගත හැකි පාඩම් හුඟක් තිබෙන නිසායි.

අපි මේ ගත කරන්නේ, ඉතා අපහසු යුගයක්; අපහසු කාල පරිච්ඡේදයක්. කොවිඩ් උවදුරත් සමඟ අපට ලැබෙන්න තිබ්බ ආදායම අඩු වෙලා, රටේ ආර්ථික තත්ත්වය පහත වැටී තිබෙනවා. ඒ නිසා මේ රට ගොඩනඟන්න අපි ඔක්කෝම එකතු වෙලා කටයුතු කරමු කියලා මම ඉතා නිහතමානීව ඔබ සැමගෙන් ඉල්ලනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී රටේ ජනතාව කුපිත නොකර, අපේ රට ගොඩනඟන්න, ජනතාවගේ ජීවිත සමෘද්ධිමත් කරන්න කටයුතු කිරීමට එකතු වෙන්න කියලා මම සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Harin Fernando. You have 15 minutes.

[අ.භා. 1.24]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නා කාලයේ සිට සාමාන්‍යයෙන් අපි අහලා තිබෙන්නේ, අය වැයක් ඉදිරිපත් කරනකොට ඒකෙන් තමන්ට ලැබෙන සහන මොනවාද කියලා ගමේ මිනිස්සු රේඩියෝ එක ළඟට වෙලා අහගෙන ඉන්නවා කියලා. ඇත්ත වශයෙන්ම අය වැයක් ඉදිරිපත් කරනකොට මිනිස්සු බලාපොරොත්තු වුණේ ඒකයි. හැබැයි, මේ අය වැය ලේඛනය කියවා බලනකොට මොනවාද අපිට ලැබිලා තිබෙන සහන? මම දැක්කා, සමහර කට්ටිය කියනවා "මෙහි මහා ලොකු දැක්මක් තිබෙනවා. මේක බිලී පිත්තක් දිපු අය වැයක්" කියලා. මට නම් කියන්න තිබෙන්නේ, මේක 'සර්ගේ' අවුරුදු දෙකේ පාලනය තුළ රටට වෙච්ච හානිය ඔප්පු කරන ලියවිල්ල කියන එකයි.

මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා, මේ රටේ මිනිස්සු කිරිබත් කෑවා; ජය සැමරුවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වනකොට මහා විශාල බලාපොරොත්තු රාශියක් ජනතාවට තිබුණා. දැන් මේ හැම කථාවකදීම කියන්නේ, "මේක ලෝකයටම බලපාපු ප්‍රශ්නයක්. ලංකාවටත් මේ ප්‍රශ්නය ඇති වුණා. ඒකයි මේ ආර්ථික අර්බුදය. ඒකයි මේ ප්‍රශ්නය" කියලා. මට කියන්න, හරියට පාලනය කරන්නේ නැති ලිබියාව, ලෙබනනය වාගේ රටක් හෝ දෙකක් හැරෙන්නට කොරෝනා වසංගතය තිබුණු මොන රටේද පෝලිම් තිබුණේ? ගෑස්වලට පෝලිම්, කිරි පිටිවලට පෝලිම් මොන රටේද තිබුණේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කැමැතියි 'සර්ගේ' මේ අවුරුදු දෙකේ කාලය තුළ වෙච්ච දේවල් කීපයක් ගැන කථා කරන්න. එදා බලයට ආපු ගමන්ම වුණේ, පොලීසියේ හිටපු නිලධාරියෙක් රටෙන් පැනලා යාම. කවුද? නිශාන්ත ද සිල්වා. නිශාන්ත ද සිල්වා ඉස්සෙල්ලාම රටෙන් පැන්නා. මොකද? ඔහු භය වුණා. මේ එන්නේ ඒකාධිපතියෙක්, පොලීසියේ නිලධාරියෙකුට වුණත් ලංකාවේ ඉන්න බැහැ, පැනලා යන්න ඕනෑ කියලා හිතුවා. ඊට පස්සේ මොකක්ද වුණේ? ඔහුට පැනලා යන්න උදවු කළා කියලා ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ ගැහැනු කෙනෙකුව වෑන් එකෙන් උස්සන් ගියා. ඔන්න පටන් ගත්තා ගේම. ශානි අබේසේකරව හිරේ දැම්මා. ඊට පස්සේ, රිසාඩ් බදියුදීන්ව දැම්මා; පාඨලී චම්පිකව දැම්මා; රාජිත සේනාරත්නව ගෙනිච්චා. දේශපාලන වශයෙන් එක එක්කෙනාව බිලී බාන්න පටන් ගත්තා.

මා මිත්‍ර ඩිලාන් පෙරේරා මැතිතුමා, එතුමාගේ කථාව අවසානයේ කියපු දේට මම හරි ආසයි. එතුමා කිව්වා, "ජාතික සමගියක් නැතුව මේ ලෝකයේ දියුණු වෙන්න බැහැ" කියලා. එම ප්‍රකාශයට මම සියයට දාහක් එකඟයි. නමුත්, අල්ලාහ් දෙවියෝ තමයි මහ මොළකාරයා කියපු කෙනාව "එක රටක් - එක නීතියක්" සඳහා වූ කාර්ය සාධක බලකායේ සභාපති කළ රටක ජාතික සමගිය ඇති වෙන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මතක තබා ගන්න. මානව හිමිකම් කවුන්සලයේදී ලංකාව ගැන කථා කරලා, ලංකාවේ හිරේ දැමීම් ගැනත් කථා කළාට පස්සේ තමයි, ශානි අබේසේකරව එළියට දැම්මේ. මතක තබා ගන්න. මම ශානි අබේසේකර ගැන කථා කරද්දි, මගේ මිත්‍ර ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා කිව්වා මට මතකයි, මේ ඔක්කෝම මට දෙන්නේ ශානි අබේසේකර කියලා. පුළුවන් නම්, ඕනෑ තැනකින් හොයලා බලන්න. මගේ ජීවිතේට මම ඒ මනුස්සයාව දැකලාත් නැහැ; කථා කරලාත් නැහැ; කොහේදීවත් හම්බ වෙලාත් නැහැ. නමුත්, මම මේ කථා කරන්නේ ඇත්ත.

ඔබතුමන්ලා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරද්දී, ඔක්කෝම එක එක බයිලා කිව්වා. හැබැයි, අන්තිමට ඔක්කෝම ඒකට අත ඉස්සුවා. ඩිව් ගුණසේකර මැතිතුමා දැන් කියනවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත නොකරන්න තිබුණාය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිනාවට කාරණාව මේකයි. System change එකකට බලයට ආපු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අන්තිමට ඩඩ්ලිට යට වුණා. ඩඩ්ලිට පුළුවන් වුණා, මේ රටේ හාල් මිල තීරණය කරන්න. හමුදාව දමලා වෙළෙන්දන් අල්ලනවාය කියපු රටේ, ඉතිහාසයේ පළමුවැනි වතාවට හාල් මෝල් හිමියන් එකතු වෙලා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා, හාල් මිල තීරණය කළා. ලජ්ජයි. ඇත්තටම කියනවා නම්, ලජ්ජයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොහොර සම්බන්ධයෙන් ගැසට් එකක් ගහලා කර ගත්ත දේ බලන්න. අද නුවරඑළියේ එළවලු නැහැ. එළවලු එකතු කරන තොග පොළවල් වැහුවා. ලංකාවේ මේ පොහොර ප්‍රශ්නයත් එක්ක මේ යන විධියට මාර්තු මාසය නොවෙයි ජනවාරි -ජනේරුව- වන විට මිනිසුන්ට කන්න නැති වෙනවා, මේ පොහොර ප්‍රශ්නයත් එක්ක කරපු විකාරය නිසා. මම පිළිගන්නවා, ජනාධිපතිතුමා මේ කරන්න හදන්නේ හොඳ දෙයක්. නමුත් ඒක කරන්න තිබුණේ stagesවලට. එක පාරටම රසායනික පොහොර ගෙන්වීම නවත්වලා මේක කරන්න බැහැ. හොඳ දේ වුණත් කරන්න ඕනෑ ක්‍රමයක් තිබෙනවා. අද අන්තිමට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1977දී විධායක ජනාධිපති ක්‍රමය ඇති කරනකොට එන්.එම්. පෙරේරා මහත්මයා කිව්වා, විධායක ජනාධිපති ධුරයට පත්වන පුද්ගලයා පිස්සෙක් වුණොත්, - මා කියන වචනය ගැන සමා වෙන්න. - මානසික දුබලතාවක් තිබෙන කෙනෙක් වුණොත් ඒ රටට මොකක්ද වෙන්නේ කියලා.

Sir, I would like to quote Nelson Mandela.

"Our world is not divided by race, color, gender, or religion. Our world is divided into wise people and fools. And fools divide themselves by race, color, gender, or religion."

Sir, I would like to **table*** that quotation by Nelson Mandela.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකෙන් මම කියන්න යන්නේ මොකක්ද? රටේ නායකයා හරි තීන්දු ගත්තේ නැත්නම්, ඒකෙන් රටට ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඔබතුමාට මම පුංචි කථාවක් කියන්නම්. සමාන්‍යයෙන් පිස්සු හැදුණු මනුස්සයෙක් පිස්සු හැදුණාම කරන දේවල් තිබෙනවා. ඉස්සර වෙලාම ඔහු ගහන්නේ පවුලට. ළඟම ඉන්න මිනිහාට තමයි ගහන්නේ. තමන්ට ඡන්දය දීපු ගොවියාට කළේ මොකක්ද? තමන්ට ඡන්දය දීපු ගුරුවරයාට මොකක්ද කළේ? අද "ලංකාදීප" පුවත් පතේ තිබෙනවා, රජයේ සේවකයෙක් Facebook එකේ යම් කිසි දෙයක් පළ කළොත්, ඒ පුද්ගලයාට විරුද්ධව දඬුවම් කරනවාය කියලා. මාර රටක්, අම්මපා! රජයේ සේවකයෙකුට බැහැ, කට අරින්න. ඔහුගේ කට වැහුවා. තමන්ට වැඩ කරපු මිනිසුන්ට මේ කියන්නේ. තැපැල් ඡන්ද ප්‍රතිඵල එද්දී දිලිත් ජයවීර හිටියේ, කොහොමද? ඇයි ඒ? එතුමන්ලාට රජයේ සේවකයෝ ඡන්දය දුන්නා. නමුත් අද ඒ අයට සලකන විදිය බලන්න. ඒ වාගේම සාමාන්‍යයෙන් පිස්සු හැදුණාම මිනිස්සු තනියෙන් හිනා වෙනවා. එහෙම චරිත අද ලංකාවේ අපි දැකලා තිබෙනවා. සාමාන්‍යයෙන් පිස්සු හැදුණාම, කලබල වෙන්න එපා, panic වෙන්න එපා කිව්වාට panic වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණ විධියට කියනවා නම් සදාම් හුසේන්, ගඩාෆි කියන්නේ ඒකාධිපතියෝ. හැබැයි, ඔවුන් කෙළින්ම හැප්පුණේ ලෝකයේ බලවත්ම ඇමෙරිකාවත් එක්ක. හැබැයි, අපේ සර් කාත් එක්කද හැප්පෙන්නේ? ගුරුවරු එක්ක, ගොවියෝ එක්ක, රජයේ සේවකයෝ එක්ක, තමන්ටම ඡන්දය දීපු මිනිස්සු එක්ක. මේ ආණ්ඩුව "නැහැ, බැහැ" කියනවා හැරුණු විට මේ පොතේ එක වචනයක් කියා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මම කැමැතියි, තව පුංචි කථාවක් කියන්න. ගාමිණී වියන්ගොඩ මැතිතුමා මේ පොතේ ලස්සන පරිවර්තනයක් කරලා තිබෙනවා. "හැම මිනිහෙක්ම මැරෙන්නේ තනියෙන්" කියන එක තමයි මේ පොතේ නම. ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් පාලනය කරන්න මිනිසුන්ට බැරි වුණා. ලෝකයම දැනගෙන හිටියා, හිට්ලර් පිස්සෙක්; ඒකාධිපති පිස්සෙක් කියලා. හැබැයි ඒ රටේ මිනිස්සු භය වුණා, ඒ මනුස්සයාට "පිස්සා" කියලා කියන්න. පසුව වඩු කර්මාන්තය කරන පවුලක කාර්මිකයෙක් තමන්ගේ wife එක්ක එකතු වෙලා, මොහු පිස්සෙක් කියලා මිනිසුන්ට තේරුම් කරන්න - ඒත්තු ගන්වන්න- ගියා. කවුරුවත් පිළිගත්තේ නැහැ. ඒ දෙන්නා මොකක්ද කළේ? පාරවල් දිගේ තැන් තැන්වල පුංචි තුණ්ඩු වාගේ ඒවා දැම්මා.

ඒ එක තුණ්ඩුවක සඳහන් වෙලා තිබුණා, "අම්මේ, මේ පිස්සු නායකයා ඔබේ පුතාත් මරයි. අම්මේ, ඔබේ ගෙදර මළ ගෙයක් වෙන්නේ හෙට, අනිද්දාටයි" කියලා. ඊට පස්සේ මිනිස්සු පිළිගත්තා, මේ පිස්සු හැදුණු හිට්ලර් එළවන්න ඕනෑය කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හතරවන කාර්මික විප්ලවය යටතට එන Information Communication Technology ගැන මේ අය වැය ලේඛනයේ නැහැ. ඒ අනුව, Digitalization, Oracle Database, Artificial Intelligence ගැන කථා කරපු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක මේ අය වැය ඇතුළේ නැහැ. එම නිසා බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මංගල අය වැය ලේඛනයේ ලොකු අඩුවක් තිබෙනවා. ලෝකය යන්නේ වෙනත් ක්‍රමයකට. වෙන මොකුත් ඕනෑ නැහැ, මා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලීමක් කරනවා, මුලින්ම මේ එක එක අමාත්‍යාංශවලින් මුද්‍රණය කරන පොත් ටික නවත්වන්න කියලා. මේ පොත් කීදෙනෙක් අරගෙන යනවාද? මේ පොතකට කොපමණ මුදලක් වැය වනවාද? මේ පොත් වෙනුවට CD එකක් දුන්නා නම් හොඳයි. That is digitalization. Whoever who wants to - we have a laptop on our table - can read it on that. Does anybody open this laptop inside the Chamber? If Parliament does not care about digitalization and if the Government, the Finance Ministry do not care about digitalization, how do we move forward?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ වැඩිපුර tax ගෙහුවාම companies ඒ tax ගෙවන්න ඕනෑ. ඒ companies tax ගෙවනකොට අමතර වියදම් කපා හරින්න ඕනෑ. අමතර වියදම් කපා හරිනකොට අනවශ්‍යයි කියා හිතන සේවකයන් අස් කරන්න ඕනෑ. අද මොකක්ද වෙන්නේ? මේ අය වැය ලේඛනය මිනිසුන් අස් කරපු අය වැයක්. රස්සා නිර්මාණය කිරීමක් මේ අය වැයේ කොතැනද තිබෙන්නේ? මා දන්නවා, මගේ කථාවෙන් පස්සේ ඇඟිලි ගණන් කර-කර ඉඳියි, "අපේ කාලයේ මොකක්ද වුණේ? ෆොක්ස්වැගන් ආවාද? අරක ආවාද? මේක ආවාද?" කියා. ඒ විධියට හැම දාම කියන බයිලාව කියයි. එහෙම කියන්න එපා. රට වැටී තිබෙන මේ අවස්ථාවේදී ජාතික වශයෙන් කණ්ඩායම් හැටියට එකතු වෙන්න ඕනෑ. සර් හිතන 5දෙනකු තියාගෙන මේ කරන වැඩේ නවත්වන්න. සර් හිතනවා නම්, සර්ට හොඳම දක්ෂයන් 5දෙනා විතරයි ඕනෑ, මේ පාර්ලිමේන්තුව ඕනෑ නැහැයි කියලා, එහෙම නම් වැඩක් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනාගතය ගැන අපට ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. අඩුම ගණනේ මේ අය වැය තුළ ප්‍රතිපත්තියක්වත් නැහැ. අපේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න මේ ආණ්ඩුවට කිසිම වුවමනාවක් නැහැ. ගණිතය විෂයයට 'S' සාමාර්ථයක් ලැබිලා A/Level විභාගය pass වුණත් රස්සාවක් ලැබෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ගෙවල්වලට applications කීයක් එනවා ඇද්ද? දවසකට තරුණයන් කීදෙනෙක් හම්බවෙනවා ඇද්ද? හැබැයි, ඒ සමහර තරුණයන්ට ගණිතය විෂයයට තිබෙන්නේ 'S' සාමාර්ථයක්. නමුත්, A/L විභාගයේ විෂයයන්වලට 'A' සාමාර්ථයක් සහ 'B' සාමාර්ථ දෙකක් තිබෙන්න පුළුවන්. නමුත්, ඔවුන්ට දෙන්න පුළුවන් රස්සාව මොකක්ද? කම්කරු. ඇයි? ගණිතය විෂයයට 'S' සාමාර්ථයක් තිබෙන නිසා. මොන හොල්මන් අධ්‍යාපන ක්‍රමයකද අපි ඉන්නේ? ලෝකයෙන් ඉදිරියට යන අධ්‍යාපන ක්‍රමයක් අපට නැහැ. අඩුම ගණනේ අපි හිතපු Oracle Database ජනාධිපතිතුමාටවත් එහෙම මොළයක් පැදිලා නැති එක ගැන අපි කනගාටු වෙනවා.

පිස්සු හැදුණාම තමයි බලය පෙන්වන්න හදන්නේ. "මට මරන්න පුළුවන්. බෙල්ලෙන් අල්ලාගෙන යන්න පුළුවන්. බල්ලකු වාගේ බෙල්ලෙන් ඇදගෙන යන්න පුළුවන්" කියලා කියන්නේ, මානසික තත්ත්වය නිවැරදි තැනක නැති මිනිස්සු විතරයි. රජයේ වගකීම කියන්නේ ඔබතුමන්ලාගේත් වගකීමයි.

අපේම මන්ත්‍රී කෙනෙක් යම් කාරණයක් කිව්වා, එහෙම කිව්වේ මොන හේතුවක් නිසාද කියා මා දන්නේ නැහැ. මා එතුමාත් එක්ක කථා කළා. මම ඒක කියනකොටම එතුමා මේ සභාවට එනවා. එතුමා කිව්වා, මා රෝහලට ගියේ බොරුවටයි කියලා. මා මේ ආවරණය පපුවට දමාගෙන ඉන්නේ operation එකක් කරපු නිසායි. හැබයි, බදුල්ලේදී මට මේ සිද්ධිය වුණා නම්, මා එතැනම මැරෙනවා. මොකක්ද හේතුව? බදුල්ල රෝහලේ අඩුම ගණනේ cath lab එකක් නැහැ. ලංකාවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය මොකක්ද? *[බාධා කිරීම්]* ඔව්, පොල් ගෑවා.

ඔබතුමන්ලා නොදන්නා නිසා මා කියන්නම්. මා 2015 වර්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් පත්වූ පසු බදුල්ලට රුපියල් බිලියන 4.5ක- *[බාධා කිරීම්]* කරුණාකර පොඩ්ඩක් සංවර වෙන්න. අසනීප මිනිහෙක් කථා කරද්දි සංවර වෙන්න. *[බාධා කිරීම්]* ලජ්ජයි, ලජ්ජයි. මම කිව්වා, මේ ආණ්ඩුවට පිස්සු කියලා. මේ කථාවලින් ඒක පෙන්නුම් කරනවා. මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මගේ ඉල්ලීම තිබෙන්නේ දේශපාලන වශයෙන් ප්‍රතිපත්තියක් අවශ්‍යයි කියන එකයි.

අපේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය මොකක්ද? ලංකාවේ තිබෙන හැම රෝහලකටම cath lab එකක් දෙනවා කියන ප්‍රතිපත්තිය අවශ්‍යයි. මම කියන්නේ ලංකාවේ ඉන්න හැම මිනිහෙකුටම insurance එකක් දෙන්න අවශ්‍ය බවයි. මේ අය වැය විවාදය තුළ අපි කළාද, නැද්ද කිය කියා රණ්ඩු කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ. අලුතෙන් එන අය වැයක්, අලුතෙන් එන ආණ්ඩුවක් ෆේල් නොවී ඉන්න ඕනෑ නම් අලුත් වැඩ පිළිවෙළක් පෙන්වන්න. එවැනි වැඩ පිළිවෙළක් නැත්නම් අපි පරාදයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මෙතැනින් එහාට කථා කරන්න අවශ්‍ය නැහැ. මම පැහැදිලිව කිව්වා, සර්ට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Kumara Welgama?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අපේ ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කියපු කාරණයට මම පොඩි උත්තරයක් දෙන්න ඕනෑ. එතුමා කිව්වා, එතුමා ඉස්පිරිතාලේ හිටියා කියා මම කිව්වා කියලා. ඒක මම කිව්වා. ඇත්ත. හැබැයි, නමක් කිව්වේ නැහැ. එතුමා තොප්පිය දාගත්තාට මට කරන්න දෙයක් නැහැ. හැබැයි, එතුමාත් මට ඊයේ return එකක් දුන්නා. අර කළු මහත හාමුදුරුවන් ලවා කිව්වා, "අන්න, වෙල්ගම පාර්ලිමේන්තුවේදී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියා කථා කරනවා." කියලා. ඒවා කිව්වාට මේ වෙල්ගම බය වෙන්නේ නැහැ. CID දහයකට ගියත්, මම ගිහින් ඒවාට උත්තර දෙනවා. ඒ නිසා ඔබතුමා කරපු දේ හරි. ඔබතුමා මට ගහන්න එකක් කිව්වා නේ. ඒකට මම උත්තර දෙන්නම්. බය වෙන්න එපා. මේ වෙල්ගම හැංගෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Kanchana Wijesekara, please. You have 14 minutes.

[අ.භා. 1.39]

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දවසේ හරින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමාගේ කථාවෙන් පසු අය වැය විවාදයට එකතු වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ සමාජයේ මතයක් තිබෙනවා, පොකට් එකට විදින මිනිහා තමයි අනෙක් මිනිහා දිහාට ඇඟිල්ල දිගු කරලා "පික්පොකට්කාරයා" යැයි කියන්නේ කියලා. ඒ වාගේම තමයි, මානසික රෝගවලින් පෙළෙන මානසික ලෙඩ්ඩු, තමන්ට තිබෙන මානසික ආතතිය, තමන්ට තිබෙන මානසික පීඩනය -මම දන්නේ නැහැ, පීඩනය කොහොමද ආවේ කියලා.- පිට කර ගන්න අනෙක් මිනිසුන්ටත් ඇඟිල්ල දිගු කරනවා. එතුමා මගේ කථාවත් අහලා ගියොත් හොඳයි. එතුමාගේ කථාවේදී කිව්වා, ගෝලීය වසංගත තත්ත්වයක් තිබුණාට ලෝකයේ වෙන රටවල ගෑස් පෝලිම් තිබුණේ නැහැ, කිරිපිටි පෝලිම් තිබුණේ නැහැ, තෙල් පෝලිම් තිබුණේ නැහැ කියලා. එතුමා එහෙම කියනකොට අපට එතුමාගෙන් මේ කරුණත් අහන්න සිද්ධ වෙනවා. 2015 සිට 2019 වෙනකම් එතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ -වසංගතයක් නොතිබුණු කාලයේ- එතුමා ඩිජිටල් ඇමති. ඒ කාලයේදී තමුන්නාන්සේලාට තෙල් බෙදා ගන්න බැරි වුණා. තෙල් පෝලිම කොහේද තිබුණේ? ගෑස් පෝලිම කොහේද තිබුණේ? ඒ කාලයේ ලෝකයේ කොහේවත් අර්බුදයක් තිබුණේ නැහැ. වසංගතයක් තිබුණේ නැහැ. හැබැයි, එදාත් මේ රටේ මිනිසුන් ගෑස් පෝලිම්වල, තෙල් පෝලිම්වල හිටියා. තමුන්නාන්සේට ඒවා අමතක ඇති. දැන් කථා කරනවා, මේ අය වැය පොතේ ඩිජිටල් නැහැ කියලා. පසුගිය අවුරුදු පහක කාලයක් ලංකාවේ ඩිජිටල් ඇමති කෙනෙක් හිටියා. මම හිතුවා, ඒ කාලයේ ලංකාවම ඩිජිටල් කරලා ඇති කියලා. එක වතාවක balloon එකකුත් උඩ යැව්වා. ඒ කාලයේ කැඟහුවා, online අධ්‍යාපනය දෙන්න විධියක් නැහැ කියලා. මම හිතුවා, එදා ආණ්ඩුවේ හිටපු මහ ලොකු ඇමති කෙනෙක් නිසා ළමයින්ට online අධ්‍යාපනය කරන්න ඩිජිටල් තාක්ෂණ පහසුකම් දීලා ඇති කියලා. දැන් කථා කරනවා, බදුල්ල මහ රෝහලේ පහසුකම් නැහැ කියලා. රෙදි ඇඳගෙනද මේ කථා කරන්නේ? ඌව පළාත් සභාවේ හිටපු මහ ඇමති. *[බාධා කිරීම්]* ඊට පස්සේ බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරපු හිටපු කැබිනට් ඇමති. අර චමින්ද මන්ත්‍රීතුමන්ලාට වැඩ කරන්න ඉඩක් දුන්නේ නැහැ. එදා මොකක්ද කළේ? එදා ඉඳගෙන බදුල්ල දිස්ත්‍රික්කයේ කිසිම දෙයක්- *[බාධා කිරීම්]*

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මගේ මිත්‍රයෙක්. දන්නේ නැත්නම් පොඩ්ඩක් අහන්න. බිලියන 4.5ක- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, that is not a point of Order. Thank you.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙන මොනවත් උදාහරණ ඕනෑ නැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Sir, I am on a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
He is misleading the House. In Badulla, there is a hospital that we made. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, that is not a point of Order. Thank you.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙන මොනවත් ඕනෑ නැහැ. පසුගිය අවුරුදු පහේ ඔය තරම් බදුල්ලට වැඩ කළා නම්, මොන බම්බුවටද මෙතුමා ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ආවේ? බදුල්ලෙන් පැනලා ආවේ මොකටද? කොන්ද පණ තිබුණේ නැහැ, ඡන්දයකට ඉදිරිපත් වෙන්න. බදුල්ල දිස්ත්‍රික්කයෙන් පැනලා ආවා. අන්න, මානසික ලෙඩ්ඩු.

රන්ජන් රාමනායක වාගේම තමයි. රන්ජන් රාමනායකත් රත්නපුරෙන්ද කොහෙන්ද ඡන්දය ඉල්ලුවා. ඊට පස්සේ ආවා ගම්පහට. දැන් හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා රන්ජන් රාමනායකගේ ඡන්ද ටික ගන්න ඊළඟ මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලන්න බලනවා. පහුගිය අවුරුදු පහේ එච්චර වැඩ කළ මිනිහෙක් නම්, ඇයි ජාතික ලැයිස්තුවෙන් ආවේ? මේ පාර්ලිමේන්තුවේ ඇමතිකම් කරපු කිසිම කෙනෙක් ජාතික ලැයිස්තුවෙන් ආවේ නැහැ. කොන්ද කෙළින් තියාගෙන ඡන්දයට මුහුණ දුන්නා; පැරදුණත් මුහුණ දුන්නා. ඡන්දයට මුහුණ දීපු නැති එකම පුද්ගලයා තමයි විපක්ෂයේ හරින් ප්‍රනාන්දු කියන එක අපි මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් එතුමන්ලා කථා කරන්නේ හරියට නිකම් මහා ලොකු ආර්ථිකයක් එක්ක අපට රට භාර දීලා ගියා වාගේනේ. අශෝක අබේසිංහ මන්ත්‍රීතුමා අපේ ආදායම ගැන වියදම ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමන්ලා කෑ ගහලා කියනවා අපේ ආණ්ඩුවෙන් ගන්න තීන්දු reverse කරනවා කියලා. රටම reverse කළේ කවුද? රටම reverse කළේ වෙන කවුරුවත් නොවෙයි යහ පාලන ආණ්ඩුවේ හිටපු තමුන්නාන්සේලා. *[බාධා කිරීම්]* හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා දැන් පැනලා යනවා, කථාවට ඇහුම්කන් දෙන්න විධියක් නැති නිසා. *[බාධා කිරීම්]* ඇයි භයද? උත්තර දෙනවාට කැමැති නැද්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම 1994 ඉඳන් එතුමන්ලා reverse කරපු දේවල් ටික කියන්නම්. එදා, 1994 ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 686යි. මහින්ද රාජපක්ෂ මහත්මයා එදා මේ රටේ පාලන බලය ගන්න වෙලාවේ, 2004දී ඩොලර් 1,062ට තිබුණු ඒක පුද්ගල ආදායම එකම වර්ෂයකවත් reverse ගියේ නැහැ. අවුරුදු නවයකට පසුව තුන් ගුණයකින් වැඩි කරලා, මේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 3,853ට උස්සලා දුන්නා. හැබැයි, 2015 එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ මොකක්ද වුණේ? ඔබතුමන්ලා පාලනය කළේ අවුරුදු හතරහමාරයි. අවුරුදු හතරහමාරෙන් අවුරුදු තුනක්ම ඒක පුද්ගල ආදායම reverse ගියා. ඒ විතරක් නොවෙයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ 2005 ආර්ථික වර්ධන වේගය සියයට 6.2යි, 2006දී සියයට 7.7යි, 2010 වෙනකොට සියයට 8යි. 2014 රට භාරදෙන කොට සියයට 7.4යි. ඔබතුමන්ලාගේ අවුරුදු පහේ හැම අවුරුද්දේම ඒක reverse, මහත්තයෝ. යහ පාලන ආණ්ඩුව තමයි reverse එකට ගියේ. 2015දී සියයට 5යි, 2016දී සියයට 4.5යි, 2017දී සියයට 3.6යි, 2018දී සියයට 3.3යි, 2019දී සියයට 2.3යි. අපට යටින් හිටියේ ඇෆ්ගනිස්තානය විතරයි.

තමුන්නාන්සේලා දැන් ආර්ථිකය කළමනාකරණය කිරීම ගැන කථා කරනවා. මම කැමැතියි මේ සභාවේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සහ ආර්ථිකය ගැන කථා කළ ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා හිටියා නම්. හිටපු අමාත්‍ය ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා නම් ඉන්නවා. අපි දැන ගන්නට කැමැතියි ඔබතුමන්ලා ඒක පුද්ගල ආදායමයි, ආර්ථික වර්ධන වේගයයි reverse කළේ කොහොමද කියලා. ලංකා ඉතිහාසයේ කවදාකවත් වුණේ නැති විධියට reverse එකේ ගියේ කොහොමද, ඒ මහ මොළේ කාගේද කියලා තමුන්නාන්සේලාගෙන් අපි අහන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. ඒ දවස්වල තමුන්නාන්සේලා කථා කළා රට ණය බරක හිර කළා කියලා. අද ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාටත්, මහින්ද රාජපක්ෂ අගමැතිතුමාටත්, මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් අභියෝගාත්මකම අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලා කළ හානිය නිසායි. තමුන්නාන්සේලාට මතක ඇති, ආණ්ඩුව අරගෙන පළමුවෙනි පැය 24 ඇතුළතම මහ බැංකුවට තමුන්නාන්සේලාගේ හිතවතෙක් අධිපතිවරයා විධියට පත් කරගෙන මහ බැංකුව කොල්ල කාලා, එක රැයෙන් පොලී අනුපාතිකය සියයට 3කින් වැඩි කළා. ඒ විධියට සියයට 3කින් පොලී අනුපාතිකය වැඩි වීමෙන් අපේ ණය බර තව තවත් වැඩි වුණා. තමුන්නාන්සේලාගේ අවුරුදු පහේ මොකක්ද කළේ? පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් පාවිච්චි කළා footnote ගහන්නට. එදා කෝප් එක නියෝජනය කළ මන්ත්‍රීවරුන් අයින් කරලා සුජීව සේනසිංහලා දා ගත්තා, තවත් මන්ත්‍රීවරුන්ව දා ගත්තා; තවත් මන්ත්‍රීවරුන් ඉල්ලා අස් කර ගත්තා. ඒ හැම මන්ත්‍රීවරයෙකුටම කියලා footnotes ගහ ගත්තා. මේ සභාවේ ඉන්න තරුණ පසු පෙළ මන්ත්‍රීවරුන් දන්නවා කොහොමද මුදල් ටික බෙදිලා ගියේ කියලා. ඒ දවස්වල අපිත් එක්ක කථා කළා. මෙන්ඩිස් සමාගමේ අරක්කු ලයිසන් ගත්තු අය කවුද කියලා අපි දන්නවා. ඒ දවස්වල රෙද්දයි, බැනියමයි ඇඳගෙන පාර්ලිමේන්තු ආපු අය එක පාරටම ටයි කෝට් ගහගෙන

මේ පාර්ලිමේන්තුවට ආවා. ඒ මුදල් කොහොමද සංසරණය වුණේ කියලා අපි දන්නවා. තමුන්නාන්සේලා ඒ දවසේ ඒ කටයුත්ත වෙනුවෙන් නායකත්වය දීලා මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් විනාශයට පත් කරලා දැම්මා.

2019 නොවැම්බර් මාසයේ 19වෙනි දා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාර ගන්නකොට තිබුණු අභියෝගවලට නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි මේ රටේ පහුගිය අවුරුදු දෙකේ මුහුණ දෙන්න සිද්ධ වුණේ. අද විපක්ෂ නායකතුමා යෝජනා කරනවා, සංචාරක කර්මාන්තය හරහා තමයි මේ රටට මුදල් ගේන්න ඕනෑ, ආයෝජන ගේන්න ඕනෑ, විදේශ ආයෝජන ගේන්න ඕනෑ කියලා. අපි සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් ප්‍රවේශයක් ගත්තාම එතුමන්ලා මොකක්ද කිවවේ? ලංකාව පරීක්ෂණාගාරයක් කරන්න එපා කිව්වා. රුසියාවෙන්, යුක්රේනයෙන් සංචාරකයෝ ගෙනැල්ලා සංචාරක කර්මාන්තය ආරම්භ කරන්න හදනකොට ඒකටත් පහර පිට පහර ගැහුවා. ආයෝජකයෝ ගෙනාවාම, - නිව් ෆෝට්‍රස් සමාගම සමඟ කළ ගනුදෙනුව වෙන්න පුළුවන්, නැඟෙනහිර පර්යන්තයේ ආයෝජන වෙන්න පුළුවන්, බටහිර පර්යන්තයේ ආයෝජන වෙන්න පුළුවන්- ඒ ආයෝජකයන්ටත් පන්න පන්න ගහන්න පටන් ගත්තා. තමුන්නාන්සේලා වරාය නගරය ගැන මොකක්ද කිව්වේ? වරාය නගරය පිළිබඳව ජනතාව තුළ වැරදි මතයක් හැදුවා. මේ පාර්ලිමේන්තුවේ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත සම්මත වෙනකොට ඒක චීන කොලනියක් බවට පත් වෙනවා කියලා කිව්වා. අද වරාය නගරය චීන කොලනියක් බවට පත් වෙලා තිබෙනවාද?

තමුන්නාන්සේලා මොකක්ද කළේ? මේ රටේ තියෙන ආදායම් මාර්ග නැති කළා. අපේ රටට හොඳම ආදායම් මාර්ග බවට පත් වෙලා තිබුණු ගුවන් තොටුපොළවලින්, වරායවලින් ලැබෙන්න තිබුණු ආදායම තමුන්නාන්සේලා අවහිර කළා. තමුන්නාන්සේලාට මතක ඇති, එදා හම්බන්තොට වරාය අවුරුදු 99කට නොවෙයි, අවුරුදු 99 ඒවා දෙකකට, 198කට බදු දුන්නා. තමුන්නාන්සේලා මේ රටේ ආදායම් උත්පාදනය කරන ආර්ථික මර්මස්ථාන එදා වෙන්දේසි කරන්න පටන් ගත්තා. එදා මත්තල ගුවන් තොටුපොළට තමුන්නාන්සේලා මොකක්ද කළේ? මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් කළා. 2015දී තමුන්නාන්සේලාට රට භාර දෙනකොට මේ රටේ වී අතිරික්තයක් තිබුණා. ඒ නිසා තමුන්නාන්සේලා මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් කළා. ඒ විතරක් නොවෙයි, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට -මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනවල බලන්න- කෘෂි කර්මාන්තය reverse ගිය අවුරුදු දෙකක් බවට පත් කළේත්, ඍණ අගයක් බවට පත් කළේත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ 2016-2017 අවුරුදු දෙකේ කියලා කියන්න ඕනෑ. එහෙම වුණේ, වසංගත තත්ත්ව තිබිලා නොවෙයි; නියඟ තිබිලා නොවෙයි; ගංවතුර තත්ත්ව තිබිලා නොවෙයි. ඒකට හේතුව තමුන්නාන්සේලාගේ ආර්ථිකය කළමනාකරණය කිරීමේ නොහැකියාව. තමුන්නාන්සේලා දැන් කියනවා, මැතිවරණයක් තියලා බලන්න කියලා. මැතිවරණයක් තියලා බලන්න කියන අය මැතිවරණවලට ඉදිරිපත් වෙන්නේත් නැහැ. තමුන්නාන්සේලාට, අපට මතකයි, තමුන්නාන්සේලා අවුරුදු 2 1/2ක් පළාත් පාලන මැතිවරණ කල් දමපු විදිය. පළාත් සභා මැතිවරණය තියන්න බැරි තරම් ඈතකට කල් දමලා තියෙනවා. ඒවාට තමුන්නාන්සේලා විසඳුම් දෙන්නේ නැහැ.

අද කෘෂි කර්මාන්තය ගැන තමුන්නාන්සේලා කථා කරනවා. එදා තමුන්නාන්සේලා ගොවියා ගැන හිතුවේ නැහැ. පොහොර සහනාධාරය දෙනකොට පොහොර සහනාධාරය කප්පාදු කරලා එදාත් තමුන්නාන්සේලා මොකක්ද කළේ? ගොවියාට ලැබෙන්න තිබුණු සහනාධාර දුන්නේ නැහැ. අපට යම්කිසි තීරණයක් ගන්න තියෙනවා නම්, ඒ තීරණය ගන්නේ රටේ ජනතාව වෙනුවෙන් නම්, ඒ තීරණය ආපස්සට හැරවිය යුතු වුණත්, ඒ සඳහා මේ රජය කිසි වෙලාවක පසුබට වෙන්නේ නැහැ කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. ජනාධිපතිතුමා අවශ්‍ය තීන්දු-තීරණ අවශ්‍ය වෙලාවට ගනීවි.

මේ අය වැය තුළින් හැම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරන ආකාරයට මුදල් වෙන් කර තිබෙනවා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා පසුගිය දවසේ කිව්වා, රාජපක්ෂවරුන්ට තමයි මේ අය වැයෙන් සියයට 70ක් මුදල් වෙන් කරලා තියෙන්නේ කියලා. මේ අය වැය ලේඛනය කොහොමද කියලා මමත් අරගෙන බැලුවා. අද මහින්ද රාජපක්ෂ අගමැතිතුමා, බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඇතුළු ඒ සියලුදෙනාගේ අමාත්‍යාංශවලට මේ අය වැය තුළ වෙන් කරලා තියෙන්නේ සියයට 29යි. සියයට 70කට වැඩි කොටසක් තියෙන්නේ, අනෙකුත් විෂය භාර ඇමතිවරු යටතේ තියෙන කාර්යභාරය වෙනුවෙන්. ඒ තියෙන මුදල තුළ තියෙන්නේත් අපේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රතිපාදන බවත් අප මතක් කරන්න ඕනෑ. අද විපක්ෂය කොච්චර කුහක වෙලා තියෙනවාද කියලා කියනවා නම්, අද විපක්ෂයට කියන්න දේවල් නැති වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා එතුමාගේ නිල නිවස පාවිච්චි කරන්නේ නැතුව එතුමාගේ පෞද්ගලික නිවසේ ඉඳලා රාජකාරි කටයුතුවලට යන එකත් අද කුහකත්වයෙන් දකිනවා. විපක්ෂයක් හැටියට හැම දේකටම විරුද්ධ අදහස් ප්‍රකාශ කරන තැනට තමුන්නාන්සේලා අද පත් වෙලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් ඇමතිවරයාටත් අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, අද මේ රටට අවශ්‍ය, රටේ ආදයම් මාර්ග ශක්තිමත් කරන, රටේ ජීවනෝපාය සංවර්ධනය කරන නිෂ්පාදන ක්‍රියාවලිය නැවත වතාවක් ශක්තිමත් කරන වැඩසහනක් සඳහා විශාල මුදලක් වෙන් කිරීම සම්බන්ධයෙන්. තමුන්නාන්සේලා අහනවා නේ, "ඉන්ධන ලීටර් 5ක් ද ඇමතිවරුන්ගෙන්, මන්ත්‍රීවරුන්ගෙන් අඩු කරලා තියෙන්නේ. ඇයි මේ විමධ්‍යගත අරමුදල් වැඩි කරලා තියෙන්නේ?" කියලා. ඉන්ධන ලීටර් 5 නොවෙයි, ලීටර් 50ක් අඩු කරන්න තමුන්නාන්සේලා කැමති නම් හෝ ඔක්කෝම ගන්න කියලා ඉල්ලීමක් කරන්න. විපක්ෂයේ මන්ත්‍රීවරු ඒක කරන්න. එහෙම හොඳයි. අපේ ඉන්ධන දීමනාව සම්පූර්ණයෙන්ම අයින් කර ගන්න කියලා තමුන්නාන්සේලා කියනවා නම් කියන්න. තමුන්නාන්සේලා කොහොමත් වැඩක් කරන්නේත් නැහැ නේ. ඒ නිසා සම්පූර්ණ ඉන්ධන දීමනාව අපි අයින් කර ගන්නම්. තමුන්නාන්සේලා ඒ ඉල්ලීම කරන්න. පසුගිය දවස්වල තමුන්නාන්සේලා ඇහුවා, මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් රුපියල් මිලියන 5කින් වැඩි කරලා තියෙන්නේ මොකටද කියලා. විමධ්‍යගත අරමුදල් හැටියට වැඩිපුර රුපියල් මිලියන 5ක් තමුන්නාන්සේලාට අවශ්‍ය නැත්නම් තමුන්නාන්සේලා ඇවිල්ලා කියන්න, "අපට විමධ්‍යගත අරමුදල් වැඩක් නැහැ. ඒකත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට දෙන්න" කියලා. එතකොට ඒකත් අරගෙන ගමේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න අපට පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වන විට අපි විශ්වාස කරනවා, මේ ඉදිරිපත් කර තිබෙන අය වැය තුළින් මේ රටේ ඊළඟ නිෂ්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් අඩිතාලමක් යොදලා තියෙන බව. ගමේ සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 50,000කට වැඩි මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. එහිදී ප්‍රමුඛතාව දීලා තියෙන්නේ මොකටද? ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා. කොවිඩ්-19 එන්නත් ටික ලංකාවට ගේනකොට තමුන්නාන්සේලා රට වටේම ගිහිල්ලා කිව්වා, "ඒ එන්නත ගන්න මේ ආණ්ඩුවට සල්ලි නැහැ" කියලා. අද එන්නත්කරණයෙන් ලෝකයේ පළමුවැනි රටවල් 30 ඇතුළේ

[ගරු කංචන විජේසේකර මහතා]

ලංකාව ඉන්නවා. එන්නත් කළ යුතු ජනතාවගෙන් සියයට 90කට වඩා පළමුවැනි එන්නත ලබාගෙන තිබෙනවා. එන්නත් කළ යුතු ජනතාවගෙන් සියයට 80කට වැඩි පිරිසකට එන්නත් දෙකම ලබා දීලා තිබෙනවා.

අද රටේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කර තිබෙනවා. හැබැයි, මම දන්නවා, තමුන්නාන්සේලා උද්ඝෝෂණවලට මුවා වෙමින් නැවත වතාවක් මේ උත්සාහ කරන්නේ රට වසා, රට අක්‍රිය කරලා, රටේ නිෂ්පාදන ක්‍රියාවලියත් අක්‍රිය කරලා ආර්ථිකමය වශයෙන් නැවත වතාවක් රට අසීරු යුගයක් කරා ගෙන යෑම සඳහා බව. අද තමුන්නාන්සේලා සංවිධානාත්මකව ඒ කටයුත්ත කරගෙන යනවා.

අද වනවිට කොවිඩ් මර්දනය සඳහා වූ එන්නත්කරණය අපි සාර්ථකව කරලා තිබෙනවා. එපමණක් නොවෙයි, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අද මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, නිවාස ව්‍යාපෘතිය වැනි විශාල ව්‍යාපෘති රාශියක් මේ රට තුළ ක්‍රියාත්මක කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමා අවුරුදු පහක් නිවාස ඇමති හැටියට හිටියා නේ. අපට කියන්න කෝ, ඒ කාලයේ ආධාර දීලා ගෙවල් කීයද හැදුවේ කියලා. ණය දීලා ගෙවල් 5,000ක් විතර හදා තිබුණා. හැබැයි, අපේ ආණ්ඩුව කාලයේ අවුරුදු දෙකක් ගත වෙන්න ඉස්සෙල්ලා ආධාර මත ගෙවල් 28,000ක් සාදා ජනතාවට දායාද කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේත් කටයුතු රාශියක් සිදු කර තිබෙනවා. මම දැක්කා, සමහරු කියා තිබෙනවා, "වතුර වළවල් නේ කපා තිබෙන්නේ" කියලා. අද වනවිට ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමාගේ නායකත්වය යටතේ වැව් 1,500ක් සංරක්ෂණය කිරීමේ වැඩ කටයුතු සිද්ධ වෙනවා.

මේ විධියට සංවර්ධන කටයුතු ඉදිරියට කරගෙන යනකොට තමුන්නාන්සේලා තුළ සැකයක් ඇති වෙන බව මම දන්නවා. මොකද, පසුගිය මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට තනි ආසනයක් නේ, හිමි වුණේ. ඊළඟ වතාවේ ඒක තමුන්නාන්සේලාගේ සමගි ජනබලවේගයට වෙයිද කියන සැකය තමුන්නාන්සේලාට තිබෙනවා. අද විපක්ෂයේ නායකයෝ ගණනාවක් ඉන්නවා. එක පැත්තකින් ඒකත් හොඳයි. සජිත් ප්‍රේමදාස මැතිතුමා දිනන්න ඕනෑ කියා කට්ටියක් කියනවා. චම්පික මැතිතුමාට තව ටිකක් ඉන්නවා. මම අද උදේත් දැක්කා, සරත් ෆොන්සේකා මැතිතුමා හැම කෙනාටම තට්ටුවකුත් දමා ගෙන එනවා; වෙනදාට වැඩිය ළං වෙනවා. වෙල්ගම මැතිතුමාත් ඒ පැත්තේ ඉන්නවා. එහා පැත්තේ අනුර කුමාර දිසානායක මැතිතුමාත් ඉන්නවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගාවට හේත්තු වෙලා, එළියේ ඒ ගැන පෙන්වන්නේ නැති කණ්ඩායමකුත් ඉන්නවා. තමුන්නාන්සේලාට ඒක හොඳයි. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවට එනකොට ඔබතුමන්ලාගේ කණ්ඩායමේ හිටපු මන්ත්‍රීවරුන් 51 දෙනාවත් අද තමුන්නාන්සේලා ළඟ නැහැ. ඒ කණ්ඩායමත් බෙදී ඉන්නේ; අද වෙන් වෙලා ඉන්නේ. අද විපක්ෂය නියෝජනය කරන ටීඑන්ඒ එකේ මන්ත්‍රීවරුන් කියනවා, රටට හමුදාව බරක් කියලා. අපි අහන්න කැමැතියි, ටීඑන්ඒ එකේ චාල්ස් මන්ත්‍රීතුමා, "රටට හමුදාව බරක්" යනුවෙන් කළ ප්‍රකාශය එක්සත් ජාතික පක්ෂය, සමගි ජනබල වේගය ඇතුළු විපක්ෂයේ පොදු මතයද කියන එක. මොකද, කවුරුවත් නැඟිටලා ඒකට විරුද්ධව අදහස් ප්‍රකාශ කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටක් හැටියට අපිට අභියෝග ගණනාවක් තිබෙනවා. හැබැයි, ඒ අභියෝගවලට මුහුණ දෙන්න අපට කොන්දක් තිබෙනවා. අපි අභියෝගවලින් පැන යන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිවරයාත්, ඒ වාගේම අපේ කැබිනට් මණ්ඩලයත්, අපේ පාර්ලිමේන්තු කණ්ඩායමත් ඒ අභියෝග ජය ගන්න සම්පූර්ණයෙන්ම සහයෝගය ලබා දෙනවා. මෙතුමන්ලා කියනවා, ප්‍රාදේශීය සභා මැතිවරණයක් පවත්වන්න, ජනාධිපතිවරණය පවත්වන්න කියලා. අපි ඉස්සෙල්ලාම පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වමු. අපි ඒකට සූදානම්. අවුරුදු දෙකහමාරක් ගියාට පසුව මේ පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන්. ඒ නිසා ඉදිරියේදී තමුන්නාන්සේලා, අපි පාර්ලිමේන්තු මැතිවරණයකට යමු. පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වුවාට පසුව පාර්ලිමේන්තුවේ ජන බලය අරගෙන නැවත වතාවක් රට පාලනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්නේ කාටද කියන එක තීන්දු කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය තුළින් සියලු ක්ෂේත්‍ර ආවරණය කර තිබෙනවා. ධීවර රාජ්‍ය ඇමතිවරයා හැටියට මම ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ධීවර කර්මාන්තය නැවත නගා සිටුවන්න එතුමා විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. සුනාමියට පසුව අපි බැරෑරුම් අභියෝග දෙකකට මුහුණ දුන්නා. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව නිසා සිදු වුණු ආපදාව එකක්. අනෙක් එක, වසංගත තත්ත්වය. නමුත් මේ අභියෝග දෙකෙන්ම ගොඩ ඇවිල්ලා ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ධීවර ක්ෂේත්‍රයෙන් ඉහළම අපනයන ආදායම ලබා ගත් වර්ෂය බවට 2021 වර්ෂය පත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම ජලජීවී වගා ජීවනෝපාය වැඩසටහන් තුළින් ඉදිරියට යෑමට එම ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්නත් මේ අය වැය තුළින් කටයුතු කර තිබෙනවා.

සහන දෙන්න පුළුවන් නම් අපිත් කැමැතියි. රුපියල් 5,000 දෙන වේලාවේ තමුන්නාන්සේලා කිව්වා, පුළුවන් නම් රුපියල් 15,000ක් දෙන්න කියලා. තමුන්නාන්සේලා ලොකු ආර්ථිකයක් නේ, අපිට දීලා ගියේ. අද සංචිත ගැන කථා කරනවා. එදා මහින්ද රාජපක්ෂ යුගයේ ඩොලර් බිලියන අටක් ලෙස තිබුණු සංචිත ටික වැඩි කරගන්න තමුන්නාන්සේලා කටයුතු කළේ නැහැ. එදා රුපියල් බිලියන 13,000ක් ලෙස තිබුණු ණය ප්‍රමාණය රුපියල් බිලියන 17,000ක් දක්වා -තවත් බිලියන හතරකින් පමණ- වැඩි කරපු එක තමයි තමුන්නාන්සේලා කළේ.

අවසාන වශයෙන්, මේ අය වැය තුළින් මේ රටේ ජනතාවට සහන සැලසීම සඳහා ලබා දුන් ප්‍රවේශයට ගරු මුදල් ඇමතිතුමාටත්, ආණ්ඩුවටත් ස්තුතිවන්ත වෙමින්, ඔබ සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Hesha Withanage. You have 10 minutes.

[අ.භා. 1.56]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ මිත්‍රයාගේ කථාවෙන් පසුව අදහස් දක්වන්න ලැබීම ගැනත් මං සතුටු වෙනවා. මොකද, යහ පාලන ආණ්ඩුව පරාජයට පත් කරලා, ඒ ආණ්ඩුව ගෙදර යවලා මේ ආණ්ඩුව පත් කරන්න මහා මෙහෙයක් සිදු කළ පසුපෙළ මන්ත්‍රීවරයෙක් තමයි කලින් කථා කළ අපේ රාජ්‍ය ඇමතිතුමා. ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමන්ලා ප්‍රමුඛ

මේ කඳවුර තමයි එදා යහ පාලනයේ තිබුණු දුර්වලකම් ටික රට හමුවේ තබා ඒ ආණ්ඩු පෙරළියේ මූලිකත්වය ගත්තේ. හැබැයි, මොකක්ද වුණේ? ඒ හයිය දීපු ගරු විමල් වීරවංශ ඇමතිතුමාට අද මොකද වෙලා තිබෙන්නේ? ඒ හයිය දීපු උදය ගම්මන්පිල මැතිතුමාට මොකද වෙලා තිබෙන්නේ? ඒ හයිය දීපු දැන් කථා කළ අපේ රාජ්‍ය ඇමතිතුමාට මොකද වුණේ?

පසුගිය මැතිවරණය වෙලාවේ ඡන්දය ඉල්ලන්න ගමකට යන්න දුන්නේ නැහැ. මොරවකදී ගහලා පැන්නුවා. ඒ නිසා විපක්ෂය හදන්න නොවෙයි මහත්තයෝ; රට හදන්නවත්, ආණ්ඩුවේ හොරකම් නතර කරන්නවත් නොවෙයි, ලබන වතාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙන්න අවශ්‍ය වට පිටාව හදා ගන්න. රාජපක්ෂ මහත්වරු කනට ගල් අල්ලන එක නවත්වන්න බැහැ. පසුගිය වතාවේ දැම්මේ නිපුණ රණවක මන්ත්‍රීතුමා විතරයි. ලබන වතාව වනකොට ලැස්තුවක් දාලා, ඩලස් අලහප්පෙරුමලා, කංචන විජේසේකරලා ගෙදර යවන වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාය කියන කාරණය මතක තියාගෙන කඩේ යන්න කියලා මම ඔබතුමන්ලාට මතක් කරනවා.

විමල් වීරවංශ මැතිතුමන්ලාට අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉන්නවෙලා තිබෙන්නේ ඇයි? එදා එතුමන්ලා මේ රටේ හාල්, සීනි, පරිප්පුවල සිදු වන වෙනස ගැන කියලා මහා ආර්ථික පරිවර්තනයක් කළා. හැබැයි, අද එතුමන්ලා ඉන්නේ කොහොමද? අපි සතුටු වනවා, කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරන්න පුළුවන් ඩලස් අලහප්පෙරුම වාගේ දකුණේ මිනිස්සු මේ ගරු සභාවේ සිටීම පිළිබඳව. අද එතුමා කොන්ද කෙළින් තියාගෙන හිටියත්, වියපත් වෙච්ච මන්ත්‍රීවරයාගේ -පිළියන්දල පැත්තේ ගාමිණී ලොකුගේ මහත්තයාගේ- කරට බර ටික පටවලා, මේ රටේ ලංකා විදුලිබල මණ්ඩලය විකුණන්න හදනවා. හැබැයි, ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා කොන්ද කෙළින් තියාගෙන කියනවා, "නැහැ. මට මේ කුණු ගොඩට කර ගහන්න බැහැ. මට මේ පාපයට කර ගහන්න බැහැ. මේක වෙනස් කරන්න" කියලා. ඇමති ධුරය වෙනස් කරලා සතියෙන් අනේ! පව්, ගාමිණී ලොකුගේ ඇමතිතුමා ඒ පවට කර ගහනවා.

අද උදය ගම්මන්පිල ඇමතිතුමාට කොන්දක් තිබෙනවා. උදය ගම්මන්පිල ඇමතිතුමා කියනවා, "ආණ්ඩුවේ කුණු ගොඩවල්වලට කර ගහන්න මට බැහැ. මම ඇත්ත කියනවා" කියලා. හැබැයි, අපි ඊයේ දැක්කා, අපේ රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා, උදය ගම්මන්පිල ඇමතිතුමාගේ කථාව වෙනස් කරලා, කථා කරනවා. ඒක නිසා අපට පෙනෙනවා මේ ආණ්ඩුවේ රාජපක්ෂ මහත්වරු වෙනුවෙන් වන්දනාවේ යන පිරිසක් සහ ජනතාව එක්ක ජනතාව ඉදිරියේ හිට ගන්න පිරිසක් ඉන්න බව. ඒ නිසා ඔය කථාවල තේරුම මොකක්ද කියා රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාගෙන් දැනගන්න පුළුවන්. අපේ කළුතර දිස්ත්‍රික්කයේ නායකතුමා -රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා- දන්නවා ඇති, ඊයේ කළුතර ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදුලි කණුවක ගැට ගහලා තිබුණු බව. අද පුවත් පත්වල පොල් ගෙඩි අකුරුවලින් පළ වෙලා තිබෙනවා, "පානදුර ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමෙක් ඊයේ හවස විදුලි කණුවක ගැට ගහලා" කියලා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පානදුර ප්‍රාදේශීය සභාවේ එම මන්ත්‍රීවරයා කළුතර උතුර පොලීසියට අරගෙන ගිහිල්ලා තිබෙනවා. මට පෙනෙන විධියට තවම මිනිස්සු ගැට ගහගෙන එනවා. ඒ නිසා දැන් කෑ ගහන්න එපා. මේ පාර්ලිමේන්තුවේ දමන සද්දය, පාර්ලිමේන්තුවේ කෑ ගහන හයිය, එළියට ගිහිල්ලා කරන්න බැහැ. මොකද, මිනිස්සු දැන් ගස්වල ගැට ගහන්න පටන්ගෙන තිබෙනවා. කළුතරින් පටන් ගත්ත එක හෙට-අනිද්දා වනකොට මාතරට යන්න මහ කාලයක් ගත වෙන්නේ නැහැ කියන කාරණය විශේෂයෙන් මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ අය වැය ගැන අපි මොනවාවත් කථා කරන්න, කෑ ගහන්න, විග්‍රහ කරන්න ඕනෑ නැහැ. මේ අය වැය පිළිබඳව ජනතාවට හොඳට තේරෙනවා. මේ අය වැයෙන් ජනතාවගේ ප්‍රශ්නවලට කොච්චර උත්තර දුන්නාද කියන කාරණය රටේ ජනතාව දන්නවා. මෙතුමන්ලා කොවිඩ්-19 වසංගතය තිබෙන වෙලාවේ ඉදිරිපත් කළ අය වැයේ සුන්දර වචන ටිකක් තිබුණා අපි දැක්කා. හැබැයි, ඒ වචන ටිකවත් මෙවර අය වැයේ නැහැ. අද මේ අය වැය ගැන කියන්න කිසිම දෙයක් නැහැ. දේශපාලන ව්‍යාපෘති ටිකක් මේ අය වැය තුළින් ගෙනැල්ලා තිබෙනවා. අපි මේ කාරණය කෙරෙහිත් අවධානය යොමු කරනවා. මෙහෙම වෙන්න එපා, මෙහෙම නොවේවා! කියා අපි ප්‍රාර්ථනා කරනවා. නමුත් මේ කාරණා ගැන අවධානයෙන් ඉන්න කියා මම මේ රටේ ජනතාවට මතක් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඊළඟ මැතිවරණය වෙනුවෙන් ජනතාව කඩේ යවන්න හිතාගෙනද, සිල් රෙදි දුන්නා වාගේ පච්කාර දේශපාලන ව්‍යාපෘතියකටද මේ මුදල් වෙන් කර තිබෙන්නේ? මෙවර අය වැයෙන් ඇමතිවරුන්ට මුදල් වෙන් කර නැහැ. අමාත්‍යාංශවලට මුදල් වෙන් කර නැහැ. ඍජුවම අපට පෙනෙනවා, ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන 3ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙන බව. මෙය ඊළඟ මැතිවරණයේ දේශපාලන ගුණ්ඩුවකට පාවිච්චි කරන්න ගනීවිද? සැබැවින්ම මේ අය වැය පොළොවේ යථාර්ථයක් වේවිද? ඒ වාගේම පළාත් පාලන කොට්ඨාසයකට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 4ක් වෙන් කර තිබෙනවා.

මේ සියලු දෙනා ජයග්‍රහණය කරපු අය කියලා අපේ රොෂාන් රණසිංහ රාජ්‍ය ඇමතිතුමා කියනවා මම දැක්කා. අපි දන්නවා නේ, එතුමන්ලාට තිබෙන පරාර්ථකාමීත්වය පිළිබඳව. අපි දන්නවානේ, තමන් දිනවපු කොටස්වලට එතුමන්ලා යම් යම් දේවල් දුන්නු හැටි. කොරෝනා වසංගතය පැවති වෙලාවේ බඩු මල්ල දෙනකොට සමගි ජන බලවේගයට හිතවත් නම් ඒ අහිංසක මිනිහාට බඩු මල්ල දීපු නැති මේ ආණ්ඩුවේ මහත්වරු අපේ මන්ත්‍රීවරුන්ට මේ රුපියල් මිලියන 4 දෙයිද, වැඩ කරන්න? ඒවා හීන. ඒවාට අපි රැවටෙන්නේ නැහැ. මේ Budget එක පාස් කර ගන්න තුරු එහෙම කියයි. අපේ රොෂාන් රණසිංහ රාජ්‍ය ඇමතිතුමා හොඳ මනුස්සයා. මේ කටයුතු කරන්න රාජ්‍ය ඇමතිතුමාගේ හිතේ ඇති. නමුත් එය බිමේ ඉෂ්ට වෙන්නේ නැති බව අපිට විශ්වාසයි.

බෞද්ධ විහාර නඩත්තු කිරීමට රුපියල් මිලියන 500ක්, වෘත්තීයවේදීන්ගේ සංගම් වෙනුවෙන් රුපියල් මිලියන 100ක්, කාන්තා ව්‍යවසායකයන් සඳහා කුඩා සුපිරි වෙළෙඳ සැල් ජාලයක් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ස්ථාපිත කිරීමට රුපියල් මිලියන 15,000ක්, පෝෂණ මල්ල ලබා දෙන්න රුපියල් මිලියන 1,000ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. මේවා හොඳ ව්‍යාපෘති. හැබැයි, මේ ව්‍යාපෘති එකක්වත් රටේ සාමාන්‍ය ජනතාවට අවංකව බෙදන්න පුළුවන්, විනිවිදභාවයෙන් ජනතාව අතරට යන්න පුළුවන් වැඩසටහන් වෙයිද කියන සැකය අපි තුළ තිබෙනවා. මේ ඔක්කොම මොළ හතේ ඇමතිතුමාගේ දේශපාලන ව්‍යාපෘති විතරයි. එතුමාට මොළ හතට වඩා ඇති. හැබැයි, දේශපාලන ගේම් ගහලා මැතිවරණය ජයග්‍රහණය කරන්න බැහැ. ඒ වාගේ සරල විධියට රටක ආර්ථිකය මෙහෙයවන්න බැහැ. රටක ආර්ථිකය ප්‍රසාරණය වෙන්න ඕනෑ ආකාරය ගැන ඔළුවේ නැතිව දේශපාලන කුපාඩිකම්වලින් ඡන්ද දින්නාට රටක ආර්ථිකය නඟා සිටුවන්න බැහැ කියන කාරණය මේ අය වැය ප්‍රකාශය තුළින් පැහැදිලි වෙනවා.

[ගරු හේෂා විතානගේ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද උදෑසන පර්ලිමේන්තුවට එනකොට මටත් ලොකු වේදනාවක් දැනුණා. ඒ ගැන මගේ මේ කථාව වෙලාවේ කියනවා. මොකද, ගරු කථානායකතුමා කැමැති වුණේ නැහැ, මේක කියනවාට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මැතිවරණයෙන් ආණ්ඩු පක්ෂය විශාල ජයග්‍රහණයක් ලැබුවා. ඒ ජයග්‍රහණයේ ගඟ පිටාර ගලනකොට පොල් කෝම්බත් ගඟට වැටුණා. කොනේ- edge එකේ- එල්ලිලා ආපු පොල් කෝම්බ ඊළඟ සැරේ පාර්ලිමේන්තු එන්න මතු වෙන්න තමන්ගේ අම්මා විකුණන, තමන්ගේ තාත්තා, නංගිලා, සහෝදරයන් විකුණන පහත් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මම ඉල්ලීමක් කරනවා. මේ උත්තරීතර ආයතනයේ කාන්තාව ගැන, මේ උත්තරීතර ආයතනයේ මන්ත්‍රීවරු ගැන, මේ උත්තරීතර ආයතනයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ගැන කවදාවත් අපි අගෞරව වන විධියට කථා කරන්නේ නැහැ. අපි කවදාවත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට අගෞරව වන ආකාරයෙන් වචනයක් කියන්නේ නැහැ. මොකද, එතුමාට අපේ ගෞරවයක් තිබෙනවා. එතුමා මේ පාර්ලිමේන්තුවේ අවුරුදු ගණනක් හිටපු නායකයෙක්. චමල් රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ අවුරුදු ගණනක් හිටපු නායකයෙක්. විපක්ෂ නායකතුමා කියන්නේ මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ නායකයා. හැබැයි, මේ ඊයේ පෙරේදා පාර්ලිමේන්තුවට ආපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-එහෙමයි මම කියන්නේ- නිකම් උඩ පැනලා නැටුවාට, මේ චරිත වට්ටන්න බැහැ. හෙට, අනිද්දා වෙනකොට ඒ විධියට අගෞරව කරමින් කථා කරන මහත්වරුන්ගේ කටවල් වැහෙන්න අපි කරුණු කියනවා. මේ අවස්ථාවේ අපි ඒ අයට මතක් කරනවා, තමන්ගේ අම්මා පාවා දෙන්න එපා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුව කියන්නේ වටිනා උත්තරීතර ආයතනයක්. ඒ නිසා මේ උත්තරීතර ආයතනය එවැනි දේ සඳහා භාවිත කරන්න එපා කියන කාරණාව මේ උත්තරීතර ආයතනයට ගෞරව කරන මන්ත්‍රීවරයකු විධියට ඔබතුමා ඒ අයට මතක් කර දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැයේ තිබෙන මූලික කාරණා ටික ජනතාවට වෙනස් විධියකට දෙන්නයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කළේ. ඒවා විකෘති කරලායි ඔවුන් කථා කළේ. මෙවර අය වැයෙන් රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගැන්වීම අවුරුදු 65 දක්වා දීර්ඝ කරන්න යෝජනා කළා. අවුරුදු 65න් විශ්‍රාම යෑම ඉතා හොඳ, මේ රටට වැදගත් වන යෝජනාවක් විධියට එතුමන්ලා පෙන්නුවා. මම කාරණා දෙකක් අහනවා. අවුරුදු 65න් විශ්‍රාම යන එක අපි හොඳයි කියමු කෝ. ඒ නිසා මේ රටේ පළපුරුදු රාජ්‍ය සේවකයන් ටිකක් තව අවුරුදු 5ක් සේවයේ ඉන්නවා. හැබැයි, ඒ නිසා තරුණයාට අවස්ථාව ලැබෙන්නේ නැහැ. තරුණ උදවිය රැකියා ඉල්ලාගෙන පෝලිමට එනවා. එතැනදී ඔබතුමන්ලා එක කණ්ඩායමක් ගැන විතරයි හිතුවේ. මේ රටේ කම්කරුවන් ඉන්නවා. ඒ කම්කරුවන්ගේ වියපත්භාවයත් එක්ක අවුරුදු 65 වනතුරු වැඩ කරන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු 28න් මෙපිට පරිපාලන විභාගය සමත් වෙන පිරිසක් මේ රටේ ඉන්නවා. රාජ්‍ය සේවකයා විශ්‍රාම ගැන්වීම තව අවුරුදු 5කින් ඉස්සරහට යනකොට, රාජ්‍ය සේවයේ පරිපාලන නිලධාරින් තවත් අවුරුදු 5ක් සේවයේ ඉන්නකොට පහළ ඉන්න පිරිසට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මෙන්න මේ විධියට සැලසුමක් නැතිව, ගැටලුවලට උත්තර හොයන්නේ නැතිව, ආණ්ඩුවේ තිබෙන මූල්‍ය අර්බුදයට කොහෙන් හරි උත්තර හොයන විධියට මේ අය වැය හදා ගෙන ඇවිල්ලා නිකම්ම නිකම් ලියවිල්ලක් විධියට කියවලා බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ගියා. අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඔහේ කෑ ගහනවා. එයින් කිසිම එලක් නැහැ කියන කාරණාව අපි පැහැදිලිව කියනවා.

අපි විශේෂයෙන්ම කියනවා, පානදුරේ මන්ත්‍රීතුමා ගස් බැන්දා වාගේ අනේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගස් බඳින තැනට පත් වෙන්න එපා කියලා. මේ අය වැයේ අරමුණ විය යුත්තේ, ඊළඟ ඡන්දය දිනා ගන්න පුළුවන් වටපිටාවක් හදා ගැනීම නොවෙයි. කොරෝනා වසංගතය නිසා මේ රටේ අහිංසක ජනතාවට එදා වේල කන්න බැරි වෙලා තිබෙනවා. අද ගොවියා පාරට වෙලා කෑ ගහනවා. ඒ නිකම් පොහොර ඉල්ලලා නොවෙයි, නොමිලේ පොහොර ඉල්ලලා නොවෙයි, සහනාධාර පොහොර ඉල්ලලා නොවෙයි, කීයකට හරි ඔවුන්ට පොහොර ගෙනැල්ලා දෙන්න කියලා. අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. අර කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා, දේශපාලනඥයෙක් නොවෙයි. එතුමාට කෘෂි විද්‍යාඥයකු විධියට බලාගෙන ඉන්න බැහැ, මේ ගන්නා දේශපාලන තීන්දු දෙස. එතුමා ඊයේ වීරයෙක් වාගේ මේ රටට කිව්වා, කුහකයෝ මොනවා කිව්වා වුණත්, 'මේවා ගේන්න ඕනෑ, මේක ක්‍රියාත්මක වෙන්න ඕනෑ' කියලා. අපිත් කියන්නේ ඒකයි. මේ රටේ අහිංසක ගොවියා පාරේ තියන්නේ නැතිව මේ රටේ සාම්ප්‍රදායිකව ඒ කරගෙන ආපු ගොවිතැනට හයියක් දෙන්න පුළුවන් වැඩසටහන හදන්නවත් අඩුම ගණනේ මේ අය වැය පාවිච්චි කරන්න කියන ඉල්ලීම ආණ්ඩුවෙන් කරමින් මාගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. (Prof.) Ranjith Bandara. You have 17 minutes.

[අ.භා. 2.06]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය දෙවනවර කියවීමේ විවාදයේ අවසාන දවසේ එයට සහභාගි වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා පෞද්ගලිකව සතුටු වෙනවා.

මූලික කාරණා තුනක් පිළිබඳව මාගේ අදහස් ඉදිරිපත් කරන්න සූදානම්. පළමුවෙනි කාරණය තමයි, මේ සමස්ත අය වැය විවාදයේදී, විශේෂයෙන් අපි අපේක්ෂා කළ ආකාරයටම විපක්ෂයෙන් අය වැය පිළිබඳව ගැඹුරු හැදෑරීමක් හෝ අවම වශයෙන් එහි අඩංගු තීරණාත්මක කරුණු පිළිබඳව තර්කානුකූලව කරුණු ඉදිරිපත් වීමක් සිද්ධ නොවීම. මෙය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමාගේ කථාව ඒ සඳහා හොඳ උදාහරණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයෙන් මෙම විවාදයට ඉදිරිපත් වූ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ පිරිසකගේ අදහස් පිළිබඳව සියුම් හැදෑරීමක් කරන්න මට අවස්ථාව ලැබුණා. විශේෂයෙන් අපේ හිටපු අගමැතිතුමා, ගරු විපක්ෂ නායකතුමා, ඒ වාගේම අපි සාකච්ඡා කරන විෂය ක්ෂේත්‍රය පිළිබඳව පරිචයක්

තිබෙනවාය කියන ගරු මන්ත්‍රීතුමන්ලා තිදෙනෙක් මේ සභාවට ඉදිරිපත් කළ කාරණා පිළිබඳව අපි විශේෂයෙන් කරුණු සලකා බැලුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා පුරුදු පරිදි ඉතා ගැඹුරු, ශාස්ත්‍රීය සාකච්ඡාවක්, ලේසියෙන් තේරුම් ගන්න පුළුවන් වචන තිබියදී අමාරු වචන දාලා ඉදිරිපත් කළා. ඔබතුමා දකින්න ඇති, අද උදෑසනත් එතුමා සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ මූලධර්ම පාඩමක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමා හොඳින් කියවන කෙනෙකු වීම පිළිබඳව අපට සතුටුයි. නමුත්, අවාසනාවකට එතුමා වාගේ තීරණාත්මක දේශපාලන නායකයෙක් මෙවැනි සභාවකට ඉදිරිපත් කළ යුතු කාරණා පිළිබඳව ඊට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ කියා අපි විශ්වාස කරනවා. එතුමා ඉදිරිපත් කළ අදහස් සියල්ල සම්පිණ්ඩනය කළහොත්, අ.පො.ස.(උසස් පෙළ) ආර්ථික විද්‍යාව කරන දරුවන්ට තමන්ගේ විෂය නිර්දේශයේ තිබෙන සමහර කාරණා පිළිබඳව අලුත් අවබෝධයක් ලබා ගන්නට නම් ඉඩ කඩ ලැබෙනවා. එම නිසා අපි එතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා, "එන්න, ඊළඟ අය වැයේදී අපි අය වැයට අදාළ කාරණා පිළිබඳව කරුණු ඉදිරිපත් කරමු" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු අග්‍රාමාත්‍යතුමා මේ ගරු සභාවට දීර්ඝ දේශනයක් ඉදිරිපත් කළා. අපි ඉතාම සාවධානව ඒ කථාව අහගෙන සිටියා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Hesha Withanage to the Chair?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)

(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)

(The Hon. (Prof.) Ranjith Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හිටපු අගමැතිතුමා ඉදිරිපත් කරපු කාරණා විභාග කරලා බැලුවා. එතුමා කිසියම් ආකාරයක කරුණු ගළපා ගැනීමට නොහැකියාවකින් පෙළුණාදැයි මට අවබෝධයක් නැහැ. නමුත්, එක කාරණයක් එතුමා පුන පුනා සඳහන් කළා. ඒ තමයි, ඇයි අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් පතාගෙන නොයන්නේ කියන කාරණය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කරන ගනු දෙනු පිළිබඳව රජයක් විධියට අපට යම් කිසි ස්ථාවරයක් තිබෙනවා. එම නිසා, "ඔබතුමා අපට දෙන උපදෙස් හතර වාරයක් මේ රටේ අගමැතිවරයා විධියට කටයුතු කරපු ඔබතුමාට පාවිච්චි කරන්න තිබුණානේ" කියන කාරණය අපි එතුමාට මතක් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැරණි කියමනක් තිබෙනවා, "ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට" කියලා. එතුමන්ලාට කවදාවත් එවැනි සම්මතයක පිහිටා සිටින්නට බැරි වුණාය කියන එක මේ රටේ ජනතාව දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මගේ මිත්‍රයා, ගරු කබීර් හෂීම් මැතිතුමා ගැන කිව්වොත්, එතුමා මට කලකට ඉස්සෙල්ලා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය හැදෑරුවේ. එතුමා අදහස් ගොන්නක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. හැබැයි, අවාසනාවකට එතුමා විසින්ම ගොඩනඟා ගත් උපකල්පන මතයි එතුමාගේ අදහස් ඉදිරිපත් වුණේ. එතුමා එක්තරා අවස්ථාවක කියනවා, "විශාල පිරිසකට රැකියා අහිමි වුණා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ සේවකයන් සහ විශ්‍රාමිකයන් මිලියන 2.1කට නොවරදවාම මේ අර්බුදය අවස්ථාවේ වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවපු ආණ්ඩුවක්, අපේ ආණ්ඩුව.

එතුමා තව තැනක කියනවා, මේ අය වැය සාකච්ඡාව තුළ ගරු මුදල් ඇමතිතුමා ආර්ථික ගැටලු සහ අභියෝග පිළිබඳ කරුණු ඉදිරිපත් කළේ නැහැ කියලා. මම එතුමාට කියන්න කැමැතියි, ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාවේ 13 සහ 19 පිටුවල ඉතා හොඳින් මේ කාරණා පිළිබඳ කරුණු ඉදිරිපත් කරලා තිබෙනවාය කියන එක. මෙයින් එක දෙයක් මට පැහැදිලියි. ඒ තමයි, අපේ ගරු කබීර් හෂීම් මැතිතුමා මේ අය වැය කථාව කියවලා වත් නැහැ කියන එක. විවාදයට කිසිදු සූදානමකින් තොරව ඇවිල්ලා එතුමාගේ හිතේ තිබෙන දේවල් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ නිසා එතුමාගේ මිත්‍රයකු විධියට මම එතුමාට ආරාධනා කරන්න කැමැතියි, මේ අය වැය වාර්තාව කියවන්න කියලා. මා එතුමාට කියනවා, කරුණාකර මේ ගරු සභාව නොමඟ යවන්න එපා කියලා. මා එහෙම කියන්න හේතුව මෙයයි. එතුමා තවත් තැනක කියනවා, අවිධිමත් අංශ වෙත අය වැයෙහි අවධානය යොමු කර නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ පළමුවෙනි වතාවටයි, ඉතා කුඩා -ක්ෂුද්‍ර-, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සිදු වෙච්ච පාඩුව මඟ හරවන්න සෘජුවම රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙන්නේ. පාසල් වෑන් රථ, ත්‍රිරෝද රථ, පෞද්ගලික බස් රථ සහ හඳුනාගත් විවිධ ක්ෂේත්‍රවලට අවම වශයෙන් රුපියල් බිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා මම ගරු කබීර් හෂීම් මැතිතුමාට නැවත වාරයක් ආරාධනා කරන්න කැමැතියි, මේ අය වැය වාර්තාව කියවන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවට අවස්ථා කිහිපයක දී එතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කළා. එතුමන්ලා දෙදෙනා මේ විෂයය පිළිබඳ ප්‍රාමාණිකයන් වන නිසා අඩුම ගණනේ කිසියම් ආකාරයක විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීමක් මේ ගරු සභාවට කරයි කියලා මේ ගරු සභාව අපේක්ෂා කරන්න ඇතැයි මා විශ්වාස කරනවා. අවාසනාවකට එවැන්නක් සිද්ධ වුණේ නැහැ. ඒ වෙනුවට හර්ෂ ද සිල්වා මැතිතුමා එතුමාගේ කථාවේ එක්තරා තැනකදී කියනවා, "ගරු කථානායකතුමනි, විජයවර්ධන මැතිතුමා ඊයේ රෑ කරපු සාකච්ඡාවක් WhatsApp මඟින් කවුරු හරි මට එවලා තිබෙනවා" කියලා. එතකොට කවුරු හරි එවපු WhatsApp පණිවිඩයක තිබෙන එකකින් තමයි එතුමාගේ අය වැය විවාදය ආරම්භ කරන්නේ.

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

අවාසනාවකට, රාජපක්ෂවරුන්ට බැණ වැදීම හැර එතුමන්ලා දෙදෙනාම මේ විවාදයට අලුතින් යමක් එකතු කළා කියා මා විශ්වාස කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි හිතුවා එතුමන්ලා දෙදෙනා අඩුම ගණනේ කිසියම් ආකාරයක සාධනීය විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි කියලා. අපේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අපි එහෙම දෙයක් අපේක්ෂා කරන්නේ නැහැ. හරින් ප්‍රනාන්දු මැතිතුමාගෙන් අපි මොකක්ද බලාපොරොත්තු වන්නේ? අපට එතුමාගෙන් එහෙම දෙයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, අපි හිතුවා මේ දැන උගත් මන්ත්‍රීවරු ඉදිරියට ඒවි, ඇවිල්ලා යමක් සාධනීය ලෙස ඉදිරිපත් කරයි කියලා. මේ ලෝකයම තිබෙන්නේ තීරණාත්මක අවස්ථාවක. ජාතියේ දිශානතිය වෙනස් කරන්න පුළුවන්කම තිබුණා. බලය ලබා ගැනීමට හෝ බලයට ඒමට තිබෙන අවකාශය පෙනෙන තෙක් මානයකවත් නැති වන විධියට මේ අය වැය හරහා ඇහුරුණා කියන බිය තමයි එතුමන්ලාට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කැමැතියි මගේ දෙවැනි කාරණය පිළිබඳව ඔබතුමා දැනුවත් කරන්න. ඉතිහාසයේ පළමුවෙනි වතාවට තමයි, ප්‍රතිපත්ති සම්පිණ්ඩනයක් කියන එක අය වැය සාකච්ඡාව තුළින් ඉදිරිපත් කෙරුණේ. ඔබතුමා මේක පරිශීලනය කරන්න ඇති. ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කළ අය වැය කථාවේ පිටු අංක 23 සිට පිටු අංක 40 දක්වා තමුන්නාන්සේලා කිසි ලෙසකින් වත් අවධානයට යොමු නොකළ කාරණා ගණනාවක් සඳහන් වෙනවා. අය වැය යෝජනා ලබා ගැනීම පිළිබඳව වාගේම කොයි ආකාරයටද මේ අය වැය යෝජනා ක්‍රියාවට නඟන්නේ, ඒ සඳහා වන යාන්ත්‍රණය කවරාකාර ද යනාදි සියලු කාරණා මේ තුළ අඩංගු වුණා. අපි හිතුවා, තමුන්නාන්සේලා මේ පොත් අච්චු ගහන එකට විරුද්ධ වුණාට, අඩු ගණනේ කියන එකවත් අහගෙන ඉඳීවි කියලා. මා හිතනවා, අප එවැන්නක් අපේක්ෂා නොකළ යුතුයි කියලා.

මම කැමැතියි, ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ සාධනීය යෝජනා කිහිපයක් පිළිබඳව තමුන්නාන්සේලා දැනුවත් කරන්න. ඒ අතරින් පළමුවෙනි යෝජනාව තමයි රාජ්‍ය ආයතනවලට වියදම් කිරීමට මුළු වර්ෂය සඳහා දෙනු ලැබූ විවෘත බලය කාර්තුවෙන් කාර්තුවට නිකුත් කිරීමට තීරණය කිරීම. මොකක්ද මේකෙන් අදහස් කළේ? මමත් මීට ඉස්සර වෙලා රජයේ ආයතනවල වැඩ කරලා තිබෙනවා. හුඟක් වෙලාවට අවුරුද්දේ අගට ඩෙස්, පුටු තමයි ගන්නේ. අය වැය යෝජනා සක්‍රිය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වන යාන්ත්‍රණය ස්ථාවර කරන්නයි අපි මේ හරහා උත්සාහ කරන්නේ.

ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමා කියනවා, රාජ්‍ය ව්‍යාපාර සඳහා දෙනු ලබන පුනරාවර්තන වියදම් වෙනුවට ප්‍රාග්ධන ආධාර ලබා දෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රාජ්‍ය ව්‍යවසායයන් 300ක් පමණ තිබෙනවා. ඒ සඳහා ආණ්ඩුව රුපියල් බිලියන 700ක් විතර ආයෝජනය කරලා තිබෙනවා. ආණ්ඩුව හැම අවුරුද්දකම රුපියල් බිලියන 75ක් වියදම් කරනවා, ඒවා නඩත්තු කරන්න. ඒවා මේ රටේ මහ ජනයාගේ මුදල්. ඒ වාගේම අපේ රාජ්‍ය ව්‍යවසායයන් සියල්ලේ ව්‍යාපාර නැඹුරුව සහ මූල්‍ය විනය පිළිබඳ සුවිශේෂ යෝජනා කිහිපයක් ද මෙහි ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවධානය යොමු නොවුණු ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව ඉතිහාසයේ පළමුවැනි වතාවට මෙමඟින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ දැනගැනීම සඳහා මම මේ ගැනත් කියන්නම්. ඔබතුමා බොහොම කනගාටුවෙන් රාජ්‍ය සේවය ගැන කථා කළා. ඔබතුමා දන්නේ නැති වුණාට රජයේ සේවයේ ඉන්නවා, ලක්ෂ 15.1 ක්. මිලියන 1.5ට පොඩ්ඩක් වැඩියි. විශ්‍රාම වැටුප් ගන්න අය ඉන්නවා ලක්ෂ හයහමාරක්. එතකොට මිලියන 2.1කට රජය වැටුප් හෝ විශ්‍රාම වැටුප් ගෙවනවා.

ඒ කියන්නේ අපේ රටේ දහයෙන් එකක් සෘජුවම රජයෙන් වැටුප් හෝ විශ්‍රාම වැටුප් ලබන අය. මාණ්ඩලික සේවයේ 55,000ක් ඉන්නවා. ගුරුවරුන් විධියට සේවය කරන 235,000ක් ඉන්නවා. සංවර්ධන නිලධාරීන් 125,000ක් ඉන්නවා. තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා මම මේවා කියන්නේ. මේ සා විශාල රාජ්‍ය අංශයකින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? අපි බලාපොරොත්තු වෙන්නේ මේ රාජ්‍ය අංශය තවදුරටත් පුළුල් කරන එක නොවෙයි, මෙහි කාර්යක්ෂමතාව ඉහළ නංවන එක. කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන යෝජනා තුනක් මේ අය වැය සාකච්ඡාවේ දී ඉදිරිපත් වෙලා තිබෙනවා. මේවා පිළිබඳව කථා කරන්න.

එකක් තමයි ඒකාබද්ධ ප්‍රතිඵල පාදක ඇගයුම් කළමනාකරණ ක්‍රමයක් - Integrated Results-based Management System එකක් - අපි හඳුන්වා දෙන්න කල්පනා කරනවා. අපි වැටුප් කොමිසමට යෝජනා කරනවා, නව වැටුප් ව්‍යුහයක් ඇති කරන්න. පාරට බැහැලා වැඩි වැටුප් ඉල්ලනවා වෙනුවට, රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා අවම කිරීම සඳහා වන දිගු කාලීන ඉතාම තීරණාත්මක වැඩපිළිවෙළක් අපි යෝජනා කරලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ ආර්ථික අර්බුදය හමුවේ අපේ රටේ දිශානතිය හරවන්නට ඕනෑ කොහේටද කියන එක අපි කල්පනා කළා. තමුන්නාන්සේලාට මේ පිළිබඳව එතරම් අවබෝධයක් නැති වුණත්, ඒ පිළිබඳව අවධානය යොමු කරවන්න මම කැමැතියි. එක්සත් ජාතීන්ගේ ආහාර සංවිධානය කියනවා, පසුගිය කාලසීමාව තුළ කොතරම් ප්‍රමාණයකින් ආහාර මිල ඉහළ ගියා ද කියලා. ඒ නිසා මේකට තිබෙන දිගු කාලීන විසඳුම තමයි නිෂ්පාදන ආර්ථිකයක් වෙත අපේ රට මෙහෙයවන එක. ඒ නිසා තමයි නිෂ්පාදන ආර්ථිකයක් ස්ථාපිත කිරීම සඳහා අය වැය යෝජනාවල විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙන්නේ කියන කාරණයත් මතක් කරමින්, මට කාලය වෙන් කිරීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩී.වී. චානක රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු ඩී.වී. චානක මහතා (ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.வி. சானக - விமானச் சேவைகள் மற்றும் ஏற்றுமதி வலயங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.V. Chanaka - State Minister of Aviation and Export Zones Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ගරු බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යතුමාට මා සුබ පතනවා. විශේෂයෙන්ම ලෝක ආර්ථිකය ඉතාම අසීරු තත්ත්වයක තිබෙන අවස්ථාවක, ඒ වාගේම පසුගිය අවුරුදු 20ක, 30ක කාලය ගත්තාම ලෝකයේම වැඩිම ආර්ථික අර්බුදය තිබෙන මේ මොහොතේ රටේ අනාගතය ගැන හිතලා රටට මෙවැනි අය වැයක් ගෙන ඒම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි මේ අය වැය පිළිබඳ සාකච්ඡාවට යන්න කලින් අද අපට තිබෙන අභියෝග මොනවාද, රටට තිබෙන අභියෝග මොනවාද කියලා බලන්න ඕනෑ. විශේෂයෙන්ම රටට dollar earnings, එහෙම නැත්නම් ඩොලර් එන ප්‍රධාන ක්‍රමවේද කීපය බලමු. ලංකාව ගත්තාම, අපනයනයට වැඩිය ආනයනය වැඩියෙන් කෙරෙන රටක්. අපනයනය ඩොලර් බිලියන 10ක් විතර වෙනකොට ආනයනය ඩොලර් බිලියන 20ක් විතර වෙනවා. හැම වෙලාවේම ආනයනය සහ අපනයනය අතර විශාල පරතරයක් තිබෙන රටක්. හැබැයි, හැම අවස්ථාවකම ලංකාවට ඩොලර් ටික හොයා ගත්තේ සංචාරක ව්‍යාපාරයෙන්, එහෙම නැත්නම් ගුවන් සහ වරාය හරහා නැව් ගමන්වලින් තමයි ඒ මුදල් ටික සොයා ගත්තේ. ඩොලර් බිලියන 4.5ක් සංචාරක කර්මාන්තයෙන් සොයා ගන්නකොට, අනෙක් පැත්තෙන් transportationවලින් තමයි අපි ඩොලර් බිලියනයක් විතර සොයා ගත්තේ. හැබැයි, අපට පසුගිය අවුරුදු දෙකේ මේ සියල්ලම නැති වෙලා ගියා. මේ අවුරුදු දෙකේ විතරක් වෙනදා ලැබුණු ඩොලර් බිලියන 10ක් විතර අපට ඒ පැත්තෙන් අහිමි වෙලා ගියා. ඒ එක්කම, ලෝකයේ ආහාර මිල ගත්තාම, ලෝකයේම ආහාර මිල සියයට 40කින් වැඩිවෙලා තිබෙනවා. අද විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, ලෝකයේ පෝලිම් තිබුණු රටවල් පෙන්වන්න කියලා.

වැඩි ඈතකට යන්න ඕනෑ නැහැ, ඔබතුමන්ලා යුරෝපයට ගිහිල්ලා බලන්න කොරෝනා වසංගතය වෙලාවේ ඒ රටවලට මොකද වුණේ කියලා. එහේ තිබෙන supermarketsවල, එහේ තිබෙන filling stationsවල -මේ සියලු ස්ථානවල- පෝලිම් තිබුණා. Supermarketsවල බඩු ඉවර වෙලා ගන්න නැතිව තිබුණු තැන් ලෝකයේ සෑම රටකම ඕනෑ තරම් තිබුණා. අද ඕස්ට්‍රේලියාවේ බලන්න, එංගලන්තයේ බලන්න, ඇමෙරිකාවේ බලන්න. අද ලෝකයේ සෑම රටක්ම මේ අර්බුදයට මුහුණ දෙනවා. හැබැයි, අද මේ විපක්ෂය පෙන්වන්න හදන්නේ මේක ලංකාවේ විතරක් තිබෙන අර්බුදයක් කියලායි. නැහැ, මේ අර්බුදය ලෝකයේම තිබෙනවා. ලෝකයේ සෑම රටකම වාගේ සියයට 40කින් බඩු මිල වැඩිවෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක ඉඳගෙන තමයි අද අපට මේ අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ.

අද ලෝකයේ තෙල් මිල ගත්තාම 2019ට සාපේක්ෂව දෙගුණයකින් වැඩිවෙලා තිබෙනවා. ගෑස් මිල ගත්තාම සියයට 30කින්, සියයට 40කින් වැඩි වෙලා තිබෙනවා. මෙවැනි අවස්ථාවක තමයි අපට මේ අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ. ඔබතුමන්ලා එදා ගෙනාපු මිල සූත්‍රය අද තිබුණා නම්, රුපියල් 30කින් විතර තෙල් මිල වැඩි වෙලා තියෙයි. හැබැයි, අපි ඒවා නැතිව ඉතාම අසීරු තත්ත්වයක සිටියදී වුණත් අද මේ රටේ වැඩ ටික කරගෙන යනවා.

අය වැය යෝජනා ගැන කථා කරනකොට, අද විශේෂ දේවල් ගැන කථා කරනවා. හැබැයි අපි පළමුවෙන්ම කල්පනා කරන්න ඕනෑ, අපි ජනතාවගේ මූලික අවශ්‍යතා දෙනවා ද කියලා. මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ලංකාවේ ජනතාවගේ නිවාසවලින් සියයට 99.8කට විදුලිය ලබා දුන්නේ. 2005ට කලින් අපේ රටේ ගොඩක් ගම්වලට විදුලිය තිබුණේ නැහැ. ඊළඟ අර්බුදය තමයි වතුර. යහ පාලන ආණ්ඩුව අවුරුදු 5ක් තිබුණා. ඒ කාලය තුළ ජනතාවට වතුර ටික දෙන්න ඕනෑ කියලා හිතුවා ද? ඒ මූලික අවශ්‍යතාව සපුරා දෙන්න ඕනෑ කියලා හිතුවා ද? හැබැයි, මේ ආණ්ඩුව 2024 වෙනකොට අපේ රටේ ජනගහනයෙන් සියයට 90කට වතුර ලබා දෙන වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා. අද මේ අය වැයෙනුත් ඒ සඳහා රුපියල් මිලියන 48,963ක් වෙන් කරලා තිබෙනවා.

ඒ එක්කම, පාරවල් ටික හදන්න පටන් ගෙන තිබෙනවා. සමහර ප්‍රදේශවල පුංචි ළමයි වැල් පාලම්වලින් ඇවිල්ලා තමයි පාසලට යන්නේ. සමහර විට වැවකින්, එහෙම නැත්නම් ගඟකින් ගොඩවෙන්න හැකියාවක් තිබුණේ නැහැ. හැබැයි, අද ඒ පාලම් ටික අපි හදාගෙන යනවා. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමන්ලා එකතු වෙලා මාර්ග කිලෝමීටර් ලක්ෂයේ වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක කරගෙන යනවා. ග්‍රාමීය පාරවල් ටික හදා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, මූලික අවශ්‍යතාවක් වෙච්ච නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා. පසුගිය ආණ්ඩුවට කියන්න තිබුණේ විශේෂයෙන්ම එක දෙයක් ගැන විතරයි. යහ පාලනයේ අවුරුදු පහ තුළම සජිත් ප්‍රේමදාස මහත්මයා ගෙවල් 7,000ක් හැදුවා කියලා විතරයි කියන්න තිබුණේ. හැබැයි, ඒ ගෙවල් 7,000 හැදුවේ කොහොමද? ඒ ගෙවල් 7,000ම හැදුවේ ලක්ෂ හතර ගාණේ ණය දීලායි. ලක්ෂ හතර ගාණේ ණය දීලා ජනතාව ණයකාරයෝ කළා. එහෙම නැත්නම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති භූමිවල, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති භූමිවල තමයි ගෙවල් හැදුවේ. නැත්නම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති භූමිවල තමයි ඒ ගෙවල් ටික හැදුවේ. අන්තිමට අලිමංකඩවල තමයි ගෙවල් හැදුවේ. මොකද වුණේ? ජනතාවට ලක්ෂ හතරත් නැහැ; ඔප්පුවත් නැහැ; ණයක් ගන්නත් බැහැ; ඉස්කෝලේට ළමයා දා ගන්නත් බැහැ; අන්තිමට ගෙදරත් නැහැ. හැබැයි, සජිත් ප්‍රේමදාසට පත්තරවල advertisements ටික තිබුණා. TVවල advertisements ටික තිබුණා. හම්බන්තොට ගමක් හැදුවා නම්, යාපනයේ ගිහිල්ලා පෝස්ටර් ගැහුවා. හැබැයි, ඒ ගෙවල් 7,000 වාගේ නොවෙයි, මේ ආණ්ඩුව ගෙවල් 28,000ක් හදලා තිබෙනවා. මේ ගෙවල් 28,000ම හැදුවේ ණය දීලා නොවෙයි. මේ ගෙවල් 28,000ම හැදුවේ රුපියල් ලක්ෂ 6 ගාණේ ආධාර දීලා. අපි මේ අවුරුදු දෙකට විතරක් ගෙවල් 28,000ක් හදලා ඉවරයි. හැබැයි, කොහේ හරි ඒ ගැන පෝස්ටරයක් තිබෙනවා දැක්කාද? කොහේ හරි පෝස්ටරයක් දැක්කාද? කටවුට් නැහැ; පෝස්ටර් නැහැ; ජනතාවගේ බදු මුදලින් ලක්ෂ තුන, හතර දීලා එලක ගහන්නේ නැහැ. ඒක තමයි මේ ආණ්ඩුව කරපු වෙනස.

අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, "මේ ආණ්ඩුව ආවාට පස්සේ වෙන දා තිබුණු ප්‍රශ්න නොවෙයි තිබෙන්නේ, ගුරුවරුන්ට එළව එළවා ගහනවා" කියලා. අපි කොතැනදීද ගුරුවරුන්ට ගැහුවේ? පෙන්වන්න ගුරුවරුන්ට ගහපු තැනක්? හැබැයි, යහ පාලන ආණ්ඩුව තිබියදී උද්ඝෝෂණවලට එළව එළවා ගැහුවා. එදා රණවිරුවන්ට ගහලා, කිහිලිකරු ටිකත් බිම දාලා, රෝද පුටු පෙරළලා ඒ අය බිම දිගේ ඇදගෙන ගියා. එහෙමයි ගැහුවේ. මේ ආණ්ඩුව කොතැන දීද ඒ විදියට ක්‍රියා කළේ කියලා, කියන්න බලන්න. මේ ආණ්ඩුව කාටවත් ගැහුවේ නැහැ. හැබැයි, ඒ වෙනුවට අවුරුදු 24ක් තිස්සේ තිබුණු වැටුප් විෂමතාවක් මේ අය වැයෙන් විසඳා දෙනවා. අවුරුදු 24ක් තිබුණු වැටුප් විෂමතාව!

යහ පාලන ආණ්ඩුව ගුරුවරු දිහා බැලුවාද? බැලුවේ නැහැ. එදා ජනතා විමුක්ති පෙරමුණ එකතු වෙලා, එක්සත් ජාතික පක්ෂය එකතු වෙලා හදපු ආණ්ඩුව ගුරුවරු දිහා බැලුවාද, ඒ අය ගැන කථා කළාද? මේ කිසි දෙයක් වුණේ නැහැ. අද මේ ආණ්ඩුව ඒ ප්‍රශ්න ටික විසඳාගෙන යනවා.

අපි "වාරි සෞභාග්‍යා" වැඩසටහන හරහා වැව් ටික හදාගෙන යනවා. විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය දියුණු කරන්න චමල් රාජපක්ෂ ඇමතිතුමන්ලා එකතු වෙලා මේ වෙද්දි විතරක් වැව් 1,500ක් ප්‍රතිසංස්කරණය කරලා ඉවරයි. ඒ වාගේම ලබන අවුරුද්ද වන විට වැව් 2,000ක් හදන්න අවශ්‍ය ප්‍රතිපාදන ටිකත් වෙන් කරලා තිබෙනවා.

විපක්ෂයේ අය වැඩිපුරම කථා කරපු දෙයක් තමයි, -මූලාසනයේ ඉන්න අපේ හේෂා විතානගේ මන්ත්‍රීතුමාත් එහෙම කථා කරනවා දැක්කා- ගමට සල්ලි යන එක. ඒක ප්‍රශ්නයක්ද?

[ගරු ඩී.වී. චානක මහතා]

සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ ඔබතුමන්ලා ගෙවල් දෙන්න තෝරපු හැටි මතකද? ඒ කාලයේ ගෙවල් දෙන්න සුදුසු අය තේරුවේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමා. ශාඛා සමිතිය තමයි ණය දෙන්න පුද්ගලයන් තේරුවේ. හැබැයි, මේ අය වැයේ එහෙම තිබෙනවා නම් පෙන්වන්න කෝ. කොට්ඨාසයකට යන රුපියල් මිලියන හතර කොහොමද යන්නේ, වසමකට යන රුපියල් මිලියන තුන කොහොමද යන්නේ? මේ ව්‍යාපෘති තෝරන්නේ මන්ත්‍රීවරු නොවෙයි. ඒ සඳහා ග්‍රාමීය කමිටුවක් තිබෙනවා. මේ කමිටුවේ ආර්ථික සංවර්ධන නිලධාරි ඉන්නවා, ග්‍රාම නිලධාරි ඉන්නවා, සමෘද්ධි නිලධාරි ඉන්නවා. මේ සියලුදෙනාගෙන් සැදුණු කමිටුවකින් තමයි මේ සියල්ල යෝජනා කරන්නේ. අද ඔබතුමන්ලා කියන්නේ ගමේ මන්ත්‍රීට තමයි රුපියල් මිලියන තුනක මුදල දෙන්නේ කියලා. නැහැ, ඒ මුදල දෙන්නේ ගමේ ජනතාවට. මන්ත්‍රීතුමන්ලාගේ අතේ තියාගෙන මේ මුදල වියදම් කරන්න බැහැ. මේ මුදල් යන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් එක්ක එකතු වෙලා තමයි මේ ප්‍රතිපාදන ටික වියදම් කරන්නේ. ගමට - ගමේ ජනතාවට- මුදල් යන එකට ඔබතුමන්ලා විරුද්ධයි. අපි ඒක දන්නවා. හැබැයි, මෙවර බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්තිය තමයි, ගමේ ජනතාවට මුදල් දෙන එක. ගමේ ජනතාවට මුදල් යනවා වාගේම පළමුවැනි වතාවට ජීවනෝපාය වෙනුවෙන් මේ මුදල් සියයට සියයක්ම වුණත් වැය කරන්න පුළුවන්.

කොරෝනා වසංගතයත් එක්ක පසුගිය වර්ෂවල එදිනෙදා ජීවනෝපාය කරපු අයට ආදායම් අහිමි වුණා. තමන් කරපු කම්කරු වැඩ -කුලී වැඩ- නැති වෙලා ගියා. එහෙම නැත්නම් අලුත් ව්‍යවසායකයකුට බිහි වෙන්න අසීරුතාවක් තිබුණා. ඒක මහ හරවන අය වැයක් තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. අවම වශයෙන් තවත් රැකියා ලක්ෂයකට වඩා බිහි වෙනවා, මේ මුදලින් විතරක්. එක පැත්තකින් ගම් මට්ටමින් සංවර්ධනය වැඩි වෙනකොට අනෙක් පැත්තෙන් අපනයන කර්මාන්තය දියුණු කරන්න විශාල වැඩ පිළිවෙළක් මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම කෘෂි අපනයනය, ධීවර කර්මාන්තය ඇතුළු මේ සියලු අපනයනවලට වෙනම අපනයන කලාප 14ක් හදලා ඒවාට අවශ්‍ය ප්‍රතිපාදන -රුපියල් බිලියන 5කට ආසන්න මුදලක්- ලබා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේ විශාල වැඩ පිළිවෙළකට තමයි අපේ ආණ්ඩුව ගමන් කරන්නේ. හැබැයි, අද අපට මේ සියලු දේ කරන්න සිද්ධ වුණේ එදා යහ පාලන ආණ්ඩුව අපට ලබා දුන් දේවල් එක්කයි. යහ පාලන ආණ්ඩුව මොකක්ද අපට ලබා දුන්නේ? අද ඔබතුමන්ලා rankings ගැන කථා කරනවා. යහ පාලන ආණ්ඩුව කාලයේ rankings තිබුණේ කොහොමද කියලා මම ඔබතුමන්ලාට මතක් කරලා දෙන්නම්. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේ -2014දී- නීතියේ ආධිපත්‍යයෙන් අපි අංක එකට හිටියේ, දකුණු ආසියාවෙන්ම. 2018 වෙනකොට ඒක තුන්වෙනි ස්ථානයට ගියා. අපි ලෝකයෙන් 48 වන ස්ථානයේ හිටියේ. ඔබතුමන්ලාගේ කාලයේ ඒක 68 වන ස්ථානයට ගියා. ආර්ථික නිදහසින් අපි දකුණු ආසියාවේ අංක එකට හිටියේ. ඔබතුමන්ලා ඒක අංක දෙකට අරගෙන ගියා; මුළු ලෝකයෙන්ම 90ට හිටපු තැන 115ට අරගෙන ගියා.

ව්‍යාපාර කිරීමේ පහසුතාවෙන් අංක එකට හිටපු අපි, ඔබතුමන්ලා අංක හතරට අරගෙන ගියා. ලෝකයේ 99ට හිටපු අපි ඔබතුමන්ලා 111ට අරගෙන ගියා. ජාත්‍යන්තර තරඟකාරිත්වයෙන් දකුණු ආසියාවෙන් අපි දෙවන ස්ථානයේ හිටියේ. මේක තුන්වන ස්ථානයට ගෙනිහිල්ලා ලෝකයේ 85වන ස්ථානයට අරගෙන ගියා. මේක තමයි, හොඳම එක. දූෂණ ප්‍රත්‍යක්ෂය. ඒකේ දෙවන ස්ථානයේ හිටපු අපි තුන්වන ස්ථානයට අරගෙන ගිහිල්ලා ලෝකයෙන්ම 89වන තැනට අරගෙන ගියා. මහ බැංකුව කඩලා, හොරකම් කරලා, ජාතික ආරක්ෂාව විනාශ කරලා, මේ රට විනාශ කරලා දැම්මා. අද හරින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා කිව්වා, අතීතය ගැන කථා කරන්න එපා, අතීතය ගැන කථා කරන්න අවශ්‍යතාවක් නැහැ, මෙතැන අලුත් මන්ත්‍රීවරු ඇවිල්ලා ඉන්නවා කියලා.

මෙතැන ඉන්නේ අලුත් මන්ත්‍රීවරු නොවෙයි. මේ ආර්ථිකය විනාශ කරපු, වැඩ කරන්න බැරි, බැලුන් යවලා ඒවා බිමට වැටිච්ච, free Wi-Fi දෙනවා කියලා ජනතාවගේ බදු දෙගුණ කරපු, මේ සභාවේ මාධ්‍ය ගැලරියේ ඉන්න මාධ්‍යවේදීන්ට නොමිලේ iPads දෙනවා කියලා ඒ වාරික දෙගුණ කරලා ගත්තු අය තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. එතකොට අපට අතීතය ගැන කථා කරන්න වෙනවා. නමුත්, අපි රටේ ජනතාවට වැඩ කරන අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. අද අනිවාර්යයෙන්ම මේ විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත වෙලා, කොරෝනා තත්ත්වය තියෙද්දිත් රටේ අනාගතය ඉදිරියට යන අය වැයක් බවට මේ අය වැය පත් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.37]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැයේ දෙවන වර කියැවීමේ විවාදයේ හත්වැනි දවසේ එයට සම්බන්ධ වීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව සතුටු වෙනවා වාගේම, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම ගැනත් සතුටු වෙනවා. අපේ ඩී.වී. චානක රාජ්‍ය ඇමතිතුමා මේ රටේ වියත් ආණ්ඩුව පිළිබඳව, ඒ වියත් ආණ්ඩුවේ හැසිරීම පිළිබඳව, ඉදිරි අනාගතය පිළිබඳව සුබදායි ලෙස කරුණු කියන්න යම් උත්සාහයක යෙදුණා. මට මතකයි, මීට කලින් කථා කරපු අපේ වියත් මහින් ආ බෝනස් මන්ත්‍රීතුමාගේ කථාව. පසුගිය කාලයේ අගමැතිතුමා නම් අර චිත්‍ර ඇඳපු දරුවෝ හෙව්වා. තව ටික දවසකින් ඔබතුමන්ලාත් හොයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ වියතුන්ට තිබුණු ගෞරවය කෙලෙසපු වියත් කණ්ඩායමක් අද පාර්ලිමේන්තුවේ ඉන්නවාය කියන එක මම නිර්භයව කියනවා. වියතුන් -උගතුන්, බුද්ධිමතුන්- කියන්නේ මේ රටේ පුංචි මිනිසුන්ට මහා විශ්වාසයක් තිබුණු පිරිසක්. එහෙම නේද රෝහිත ඇමතිතුමා? ඔබතුමන්ලාට, අපට සමහර විට හොරු කියලා කියයි. හොරා කාපු අයට හොරු කියලා කියයි. මම නම් හොරා කාලා නැහැ. එහෙම නේද? බිමේ ඉඳලා -පොඩි තැනේ ඉඳලා- ඉහළට ඇවිල්ලා දැන් ඉන්නේ කොහොමද කියලා මාධ්‍යවලින් කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "එදා දිව්වේ එහෙමයි. ඒවා කැඩුවේ මෙහෙමයි" කියනවා. එහෙම නොවෙයි, වියතුන්ට කිව්වේ. "වියත් මග" නියෝජනය කරමින් පැමිණි මන්ත්‍රීවරුනි, එහෙම නොවෙයි ඔබතුමන්ලාට කිව්වේ. ඔබතුමන්ලා හොරුන්ගෙන් ගලවාගෙන මේ රට හදයි කිව්වා. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ගියාම මේ රට සුර පුරයක් වේවි කියන දැඩි විශ්වාසය තියාගෙන තමයි ගරු චානක රාජ්‍ය ඇමතිතුමනි, මේ වියතුන් එව්වේ. ලජ්ජයි. කොන්ද තිබෙන වියතුන් ටිකක් අයින් වුණා. වී අලෙවි මණ්ඩලයේ සභාපතිතුමා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා වැනි අය අයින් වුණා. ඒ ඇයි? හොරු එක්ක යන්න බැරි නිසා. ඒ වාගේ

වියතුන් බොහෝ ප්‍රමාණයක් අද ඉන්නවා, තමුන්නාන්සේලා මොනවා කිව්වත්, ඡන්දයක් තියලා බලන්න; ගෙදර යවන්නම්. ඔබතුමන්ලා කියනවා නේ ඔබතුමන්ලා 2019දී මහා වික්‍රමයක් කළා කියලා. එහෙම නම් මහත්තයෝ අවුරුද්දක් දීර්ඝ කරන්නේ නැතුව ප්‍රාදේශීය සභා විසුරුවලා බලන්න කෝ, ඔබතුමන්ලා හොඳයි කියලා ජනතාව කියයිද කියලා. ඔබතුමන්ලා දිනන්නේ නැහැ. එතුමන්ලාට දිනන්න බැහැ, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි. එතුමන්ලා අද මොනවාද කියන්නේ? රටට දෙන බලාපොරොත්තු මොනවාද?

රටට කෙසේ වෙතත් තමුන්නාන්සේලාගේ පසුපෙළට තමුන්නාන්සේලාගේ මුදල් ඇමති දීලා තිබෙන ගේම් එක පිළිබඳව හිතන්න කෝ. දැන් අවුරුදු දහයක් යන්න ඕනෑ, පාර්ලිමේන්තුවේ විශ්‍රාම වැටුප ලැබෙන්න. හරි, කමක් නැහැ. ඒක හොඳයි කියමු කෝ. බැසිල් රාජපක්ෂ මහත්තයා අවුරුදු 5ක් හිටියා නේ. තව අවුරුදු 5ක් හිටියොත් එතුමාට විශ්‍රාම වැටුප හම්බ වෙනවා. පසු පෙළට සුම්මා. බලන්න කෝ එකට ඉඳලා ගහන ගේම්. තප්පුලැවා, "තොක්, තොක්, තොක්" කියලා. ඇමෙරිකානු පුරවැසිභාවය තිබෙන මුදල් ඇමතිතුමාට මේ අවුරුදු දහය හිටියාම විශ්‍රාම වැටුපක් හම්බ වෙනවා. පසුපෙළේ අයට නැහැ. කොහොමද ටිකිරි මොළේ? [බාධා කිරීමක්] අපටත් ඕනෑ නැහැ. අපි කියන්නේ ඔබතුමන්ලාට දීපු ගේම් එක ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ කියලායි. එතුමන්ලා රටට ගහන ගේම් එක රටේ ජනතාවට තේරුම් ගන්න බැරි වුණු නිසා තමයි නැවත බලයට ගෙනාවේ. නැවත ඒ ගේම් ගහන්න සමගි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කඳවුර ඉඩ තියන්නේ නැහැ. මතක තියා ගන්න. ඔබතුමන්ලාට ගහපු ගේම් එක අපට ගහන්න ඉඩ දෙන්න බැහැ.

රාජපක්ෂ කඳවුරට ඕනෑ, මේ රටේ අහිංසක මිනිහාගේ අවශ්‍යතාව ගැන හිතන්න නොවෙයි. මම ආර්ථික විද්‍යාව හැදෑරුවා. හැබැයි, මට ඉහළට යන්න බැරි වුණා. මම ව්‍යාපාර කළමනාකරණ බාහිර උපාධිය හැදෑරුවා. අපේ රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමාගෙන් මම මේ කාරණය අහනවා. ණය ගැනීම් හැර ආණ්ඩුවේ මුළු ලැබීම් ප්‍රමාණය රුපියල් බිලියන 2,261යි. ඔබතුමන්ලාගේ ණය වාරික හා පොලිය ඇතුළුව මුළු වියදම රුපියල් බිලියන 5,245යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන හැම පම්පෝරියක්ම කරන්න නම්, ණය ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා.

ඔබතුමන්ලා අතේ සල්ලි නැහැ. මේ ආණ්ඩුවේ සල්ලි නැතුව, බිලියන 3,200ක ණයක් පිළිබඳව අපේක්ෂාවෙන් තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා පෙන්වන සුරපුර හදන්න වෙන්නේ, ඔබතුමන්ලාට ණය දුන්නොත්; ණය ගත්තොත්. එහෙම නැත්නම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මහත්තයා හොරකම් කරපුවා ගෙනත් දෙයිද? අර මොකක්ද box එකක තිබුණු සල්ලි ඥාතීන්ගෙන් අරගෙන ඇවිල්ලා අපට දෙයිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා ඊයේ-පෙරේදා කියනවා, රෝයිගේ ද කාගේද කියන ගිණුමකට - HNB account එකට - කෝටි 1,600 ගණනක් වැටිලා කියලා. මේ කාගේ සල්ලිද? Accountsවලට මෙහෙම සල්ලි වැටෙන්නේ කොහෙන්ද? වියත් මගේ මන්ත්‍රීවරු නැගිටලා කොන්ද කෙළින් තියාගෙන ඒ පිළිබඳව කථා කරයි කියන විශ්වාසයෙන් තමයි මේ ආණ්ඩුව හැදුවේ. ඒවා කෙරෙන්නේ නැහැ. මිනිස්සු ඔබතුමන්ලාගෙන් ඉල්ලුවේ, ඉන්න රටක් මහත්තයෝ. ඉන්න රටක්! කන්න නැතත් කමක් නැහැ කිව්වා. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, කන්න නැතත් ඉන්න රටක් ඉල්ලුවේ. දැන් ඉන්නත් නැහැ, කන්නත් නැහැ. මිනිස්සු යන්න යනවා මහත්තයෝ පෝළිමේ පිට රට. ඇයි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කොහේද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කොහේද? ඔබතුමාට තේරෙන්නේ නැහැ. ඔබතුමා පව්. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා ඉවර කළා, නන්නත්තාර කළා, විනාශ කළා. පව්. ඔබතුමන්ලා කොහොමද ගෝඨාභය මහත්තයා, බැසිල් මහත්තයා පිම්බුවේ. ඇවිල්ලා දුන්නානේ, වැඩේ! ඔන්න, ගේනවා බඩු. දැන් රසායනික පොහොර ගෙනාවාම ඉවරයි නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගේන්න දෙන්නේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා ඔහොම කිව්වාට, දැන් reverse ජනාධිපතිවරයෙක් ඉන්නේ. අපේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා නේ, මොකක්ද කැරකෙන්නේ කියලා. ඒ නිසා දැන් මණ්ඩලය හොඳටම කවල් වෙලා තිබෙන්නේ. මේ අය වැය, උගස් අය වැයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල ඉන්නවා, අතේ සතේ නැති අය. හැබැයි, පාටි දානවා. ඒ සියලු දේවල් කරනවා. තමන්ගේ අම්මා-අප්පාගෙන් උරුම වෙච්ච දේපළ උගසට තියලා, ඒ අය ජීවිතයේ සොඳියේ ඉන්නවා. හැබැයි, අන්තිමට යන්නේ මහ පාරට. ඇයි? දේපළ විකුණලා සින්න වුණාට පස්සේ, යන්න වෙන්නේ මහ පාරට.

මේ ආණ්ඩුවේ ඉඳගෙන බැසිල් රාජපක්ෂ මහත්තයා විකුණුවාට කමක් නැහැ, එයාගේ ඉඩම්. මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, විකුණන්නේ එතුමාගේ ඉඩම් නොවෙයි නේ. මේ රටේ අනාගත පරම්පරාවට තිබෙන, අනාගත පරපුරට උරුම ඉඩම් ටික විකුණලා ආලා උන්නැහේ යයි ඇමෙරිකාවට. මේ තිබෙන්නේ, ණය ගන්න හදපු සැලසුම්. ඒ වාගේම මේ රටේ තිබෙන සම්පත් ටික විකුණන්න හදපු සැලසුම්. මම දන්නවා, පාර්ලිමේන්තුව නම් ඉතුරු වෙයි. ඇයි, එතුමාට එන්න එපායැ. පාර්ලිමේන්තුවේ හය දෙනෙක්ද කොහේද ඉන්නවානේ රාජපක්ෂවරු. ඒ නිසා පාර්ලිමේන්තුව නම් ඉතුරු වෙයි. ඒක මම ටක්කෙටම කියන්නම්. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, අරලියගහ මන්දිරයත් අනිවාර්යයෙන් ඉතුරු වනවා. ඇයි? මහින්ද මහත්තයා ඉන්න එපායැ නාමල් මහත්තයාත් එක්ක. ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය හැර අනෙක් ඒවා සියල්ල අවිනිශ්චිතයි. කාට හරි කියන්න පුළුවන්ද, අනෙක් ඒවා ඉතුරු වෙයි කියලා. බැහැනේ මහත්තයෝ. රෑ 12ට අත්සන් කරලා යුගදනවි බලාගාරය දුන්නා වාගේ දුන්නොත් කාට කියන්නද? අයියා කිව්වා කියලා දුන්නොත්, කාට කියන්නද? මොකද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයාට ලැබී තිබෙන මුක්තියත් එක්ක අද මොන බයිලා ගැහුවත් වැඩක් නැහැ. එයාලට ඉහළින් මොන වීරයෝ හිටියත්, එයාලට කරන්න ඕනෑ දේ මේ මන්ත්‍රීවරු ටික අත උස්සලා අනුමත කරලා ඉවරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ හිරිකිත, කාලකණ්ණි පාලනයෙන් මිදිලා, හොඳ යුගයක් නිර්මාණය කරන්න තමයි අපි, අපේ වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ.

[ගරු චමින්ද විජේසිරි මහතා]

දැන් කියනවා, "උනුත් එකයි- මුනුත් එකයි" කියලා. "උන්" නම් එකයි. ආයේ, උන් ගැන කියලා වැඩක් නැහැ. කියන්න ඕනෑත් නැහැ. කිව්වොත්, ගමට යන්න දෙයි වැඩේ නියමෙටම. අන්න දැන් ගස් බැඳලා, මන්ත්‍රීවරයෙක්. ඒ ගස් බැඳලා තිබෙන්නේ, ගමේ යන්න බැරි නිසා. උනුත් එකයි - මුනුත් එකයි. දැන්, උන් පිළිබඳව අපට ගැටලුවක් නැහැ. ඇයි ඒ? උන්ගේ ගොඩේ ඉන්න අපට අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා තමයි සමගි ජන බලවේගයේ පාක්ෂිකයෝ අලියා ලකුණ තිබේද්දී ටෙලිෆෝනයට කතිරේ ගහලා, මහ බැංකු හොරු ගෙදර යවලා, සජිත් ප්‍රේමදාස මහත්තයාත් එක්ක පිරිසිදු කණ්ඩායමක් රට කරවන තැනට රට ගෙන යන්න ඕනෑ කියලා එවලා තිබෙන්නේ. ඒ නිසා, උන්ගේ ගොඩෙත් මුන්ගේ ගොඩෙත් අපි නැහැ. හැබැයි, උනුයි- මුනුයි, තොපිත් එකයි කියන කාරණය අපට කියන්න වනවා. මොකද, "උනුයි - මුනුයි" කියන අය ආණ්ඩු හදනවා. ඒ ආණ්ඩුවල ඉන්නවා; ලගිනවා. ගන්න තිබෙන ඔක්කෝම ටික අරගෙන එළියට ගිහින් බණිනවා, "මුන් හොරකම් කරනවා" කියලා. පුදුම වැඩක්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න, 2005දී ආණ්ඩුවක් හැදුවා. ඒ ආණ්ඩුවට මුක්කු ගැහුවා. ඒ ආණ්ඩුව හදනකොට, " එයා තමයි හොඳම, රට කරවන්න, රට ගෙනයන්න පුළුවන්" කිව්වා. ටිකක් දුර යනවා. "මේ රට කනවා. මේ රට විනාශ කරනවා. කොමිස් ගහනවා" කියනවා; එළියට පනිනවා. හැබැයි, ගන්න ඕනෑ ඔක්කෝම ගන්නවා. යහ පාලනයටත් ඒ වාගේම මුක්කු ගැහුවා. ඒ නිසා උනුත් එකයි, මුනුත් එකයි, තොපිත් එකයි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ රටේ දැවෙන අර්බුද ගණනාවක් තිබෙනවා. ඒවාට විසඳුම් ඉල්ලන වෙලාවට මොනවාද ඔබතුමන්ලා කියන්නේ? රටේ ජනතාව තුන්වෙල කන්න බත් ටික ඉල්ලනකොට, ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයාට සියයට 10 කොමිස් එක ගන්න පාර හදන්න සල්ලි දීලා හරි යන්නේ නැහැ. ඒකයි අපි කියන්නේ. මේ වෙලාවේ මිනිස්සු පාරවල් හදන්න, නිවාස හදන්න කියන්නේ නැහැ, ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුනි. තමන්ගේ දරුවන් කුස ගින්නට අඬන වෙලාවේ බත් ටිකක් හෝ පාන් කෑල්ලක් බඩට දාන්නේ කොහොමද කියලායි ඔවුන් හිතන්නේ. ඒ පිළිබඳ වැඩි අවධානය යොමු කළා නම්, විපක්ෂයක් හැටියට අපට තිබුණා, "ඔබතුමන්ලා හොඳයි" කියන්න. ඒකයි අපි කියන්නේ.

ගම්වල ඉන්න මිනිස්සු හැටියට, ගම්වල ජීවත් වන මන්ත්‍රීවරු හැටියට අද ගම ඉල්ලන්නේ මොකක්ද කියලා අපි දන්නවා. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ කොහේද තිබෙන්නේ? කවුද මන්ත්‍රීවරයෙක් කිව්වා, බිලී පිත්තක් දීලා තිබෙනවාය කියලා. ඔව්, බිලී පිත්තක් දීලා තිබෙනවා; ඊට හොරෙන් මාළු ටික අල්ලාගෙන. මම ගිහිල්ලා මොකක්ද අල්ලන්නේ? හොරා කන්න ඕනෑ ටික ඔක්කොම හොරා කාලා දමලා, මාළු ටික කලින් අල්ලාගෙන කාලා, මාළු ටික අල්ලන් කාපන් කියලා බිලී පිත්තක් දීලා හරි යන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ නිසා මෙන්න මේ කියන කාරණය පිළිබඳව තේරුම් ගන්න ඕනෑ. ආණ්ඩුව කිව්වේ එකක්, කරන්නේ එකක්, යන්නේ වෙන ගමනක්. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ඊළඟට තිබෙන හැම මැතිවරණයකදීම ඔබට විරුද්ධව තිබෙන සියලු බලවේග එක තැනකට එකතු කරලා, වියතුන්, බුද්ධිමතුන්, මහා සංඝ රත්නය ඇතුළු සියලුදෙනාගේම විශ්වාසවාසය මත, මේ රටේ අනාගත සිතුම් පැතුම් ඉටු කරන යුගය සමගි ජන බලවේග ආණ්ඩුවක් තුළින් නිර්මාණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි විසිඅටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.47]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාදයේදී ප්‍රථම වතාවට අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. විපක්ෂයේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, එතුමා මෙතැන ඇවිල්ලා කියන්නේ ශානි අබේසේකර මහත්මයා විසින් කරන ලද ප්‍රකාශ කියලා මා ප්‍රකාශ කළාය කියලා. මම අදටත් ඒක කියනවා. මම අදත් කියනවා, එතුමා පාස්කු ප්‍රහාරය පිළිබඳව කිසිම අවබෝධයක් නැතුවයි ඉන්නේ. මොකද, ඒ කාලේ හොඳට සතුටෙන් ජීවිතය විඳපු කට්ටිය. පාස්කු ප්‍රහාරය එල්ල වෙනවා කියලා තොරතුරු ටික ලැබෙද්දී ඒ තොරතුරු දීපු මිනිස්සුන්ව ප්‍රහාරය එල්ල කරන්න පාවිච්චි කළා. බැන්නා. අවලාද නැගුවා. කිසිම අවස්ථාවක ඒකට පියවර ගත්තේ නැහැ. ඊට පසුව පාස්කු ප්‍රහාරය ඉවර වෙලා ඒ විමර්ශන කටයුතු සිදු වෙද්දී, අත් අඩංගුවට ගැනීම් සිදු වෙද්දී, නීතිමය කටයුතු සිදු වෙද්දී අද එක එක තැන්වල එක එක කථා කියනවා. එක වෙලාවක එතුමා කිව්වා, එතුමාගේ තාත්තා කිව්ව නිසා ඒ ගැන දැනගෙන හිටියාය කියලා. ඊට පසුව කිව්වා, අක්කා කිව්වා, එතකොට තමයි ඒ ගැන දන්නේ කියලා. දැන් කියනවා, කාදිනල්තුමා කියපු දෙයක් තමයි මම මේ කියන්නේ කියලා. මේ එක එක බොරු එක එක වෙලාවට පටල පටලා ඉන්නවා. අද පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව කඳුළු සලන එතුමන්ලා මොන වාගේ දේශපාලන චරිතද කියලා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තොරතුරු තිබෙනවා, පාර්ලිමේන්තුවේ website එකේ. මා හිතවත් හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා දැන් මෙතැන ඇවිල්ලා කතෝලිකයෙක් හැටියට පෙනී ඉන්නවා. හැබැයි, එතුමාගේ ආගම හැටියට එතුමා තොරතුරු ලබා දීලා තිබෙන්නේ, බෞද්ධ ආගම. මම අහන්නේ, මෙහෙම කෙනෙක්ද මේ සාධාරණය වෙනුවෙන් කටයුතු කරන්නේ කියලා. එක තැනක කතෝලිකයකු හැටියට පෙනී ඉන්නවා. තව තැනක බෞද්ධයකු හැටියට පෙනී ඉන්නවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Sir, I rise to a point of Order.
මම බෞද්ධයෙක් කියලා කියන්නේ නැහැ. කුරුසය බෙල්ලේ තිබෙනවා. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
කියන්නේ නැතුව ඉඳගන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, www.parliament.lk එකට ගිහිල්ලා බලන්න. ගරු මන්ත්‍රීතුමනි, මේ ඔබතුමා දීපු තොරතුරු තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ කිසිම නිලධාරියෙක් ඒ අයට හිතෙන තොරතුරු ඇතුළත් කරන්නේ නැහැ. ඔබතුමා බදුල්ලේ ඉන්න කාලයේ කෝවිලට යද්දී හින්දු භක්තිකයකු හැටියට යනවා. පන්සලට බෞද්ධයකු විධියට යනවා. තව තැනකට කතෝලිකයෙක් විධියට යනවා. තමන්ගේ ආගම මොකක්ද කියලා රටට කියන්න බැරි මන්ත්‍රීවරයෙක්. තමුන්නාන්සේ අනෙක් පැත්ත හැරිලා බලන්න, පිස්සු තමුන්නාන්සේටද, නැත්නම් තමුන්නාන්සේ ඇඟිල්ල දික් කරන අයටද කියලා. දෙබිඩි පිළිවෙත් තිබෙන්නේ. මේ එක් කෙනෙකුටවත් හරියට ප්‍රතිපත්තියක් නැහැ. අඩුම ගණනේ පාර්ලිමේන්තුවට තෝරතුරු දෙද්දී නිවැරදි තොරතුරු ටික දෙන්න බැරි මන්ත්‍රීවරු නේ ඉන්නේ. තමන්ගේ නිවැරදි තොරතුරු ටික දෙන්න බැරි මන්ත්‍රීවරු ඉන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා දිගින් දිගටම ආගම්වලට ගහනවා. *[බාධා කිරීම්]* හැබැයි, තිරුපති කෝවිලට මහින්ද රාජපක්ෂ ෂර්ට් නැතුව ගියේ. *[බාධා කිරීම්]* ෂර්ට් නැතුව ගියේ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන්නේ නැතුව කථා කරන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ඔබතුමා සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයෙක්. හැබැයි, ඔබතුමා මූලාසනයට පැමිණියාට පස්සේ ස්වාධීන මන්ත්‍රීවරයෙක්. ඒ නිසා සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයකුට අනවශ්‍ය කථා කියන්න මගේ කාලය දෙන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නම නොකියා කථා කරන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මා මේ අසත්‍ය කාරණයක්ද කියන්නේ? මා මේ කියන කාරණය අසත්‍ය නම්, එතුමාට ගිහින් බලන්න කියන්න. එතුමාත් අපේ නම් කිව්වා නේ. හැබැයි, අපි ඒවාට උත්තර බඳින්න ගියේ නැහැ. ඇයි? පිස්සන්ට උත්තර බැඳලා වැඩක් නැති නිසා; අනුන්ට මඩ ගහන මිනිසුන්ට උත්තර බැඳලා වැඩක් නැති නිසා. මෙවැනි අය තමයි, ඊළඟට ආණ්ඩුව ගන්නවා කිය-කියා මේ සභාවේ කයිවාරු ගහන්නේ.

අද කුමාර වෙල්ගම හිටපු ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. එතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී දෙයක් කිව්වා. ඊට පස්සේ තව කෙනෙක් ලවා තව කෙනෙක් දෙයක් කියෙව්වා. අද මේ සභාවේ දණ ගහගෙන කථා කරන විධිය අපි දැක්කා නේ. ඒ කියන්නේ පෞරුෂයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා සමාව ගත්තා. ඒ වුණාට කයිවාරුව නම් කොහොමද? එතුමා නිතරම කියන කථාව මොකක්ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

වැල්ල, වැල්ල.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

රැල්ලට හය නම් වැල්ලට එන්නේ නැහැ කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන වැල්ලද? මේ හය මනුස්සයෙක් නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා තත්ත්වය තුළ අඩුවෙන්ම අවධානය යොමු වුණු, තමන්ගේ ජීවනෝපාය අහිමි වුණු සියලු පාර්ශ්ව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා, ඔවුන්ගේ ජීවනෝපාය නැවත ශක්තිමත් කරන්න මේ අය වැය ලේඛනය තුළින් කටයුතු කරලා තිබෙනවා.

අපි රුපියල් බිලියන 85ක් දිස්ත්‍රික් ලේකම්වරුන්ට සෘජුව වෙන් කරලා තිබෙනවා. දිස්ත්‍රික් ලේකම්වරුන්ට සෘජුව මුදල් වෙන් කරද්දී, ඒ ඒ දිස්ත්‍රික්කවලට අයත් ග්‍රාම නිලධාරි වසම් පදනම් කරගෙන තමයි දීලා තිබෙන්නේ. ඒ නිසා කිසිම කෙනෙකුට අසාධාරණයක් නොවෙන්න රේඛීය අමාත්‍යාංශවලින් සිදුවන සංවර්ධනයට සහ ශුභ සාධනයට අමතරව දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා සෘජුවම දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව ජනතාව වෙනුවෙන් ඉටු කරන්න අවශ්‍ය කාරණා අපි දන්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමන්ලා අපේ ආණ්ඩුවට ඇඟිල්ල දික් කළා; චෝදනා කළා. ආණ්ඩුව අරක කරද්දී ඒක හොඳ නැහැයි කිව්වා. මේක කරද්දී ඒක හොඳ නැහැයි කිව්වා. හැබැයි, ඊළඟට කරන්නේ මොකක්ද කියලා විපක්ෂයට අවබෝධයක් නැහැ. දිගින් දිගට පටන් කථාව ගත්තේ විදේශ විනිමය ප්‍රශ්නයත් එක්කයි.

අපේ රටට විදේශ විනිමය ලැබෙන ක්‍රම කිහිපයක් තිබෙනවා. අපනයනය ඉන් ප්‍රධානයි. කොවිඩ් - 19 තත්ත්වය තුළ වුණත් අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද අවසාන වනකොට අපේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 12 දක්වා වර්ධනය කර ගන්න. අපි අපනයනයට කිසිම බාධාවක් ඇති කළේ නැහැ. අපනයනයට අවශ්‍ය සියලු සහයෝගය ලබා දුන්නා. අපි ආනයනය සීමා කළා. ආනයනය සීමා කළත් අපනයන යෙදවුම් සඳහා කිසිදු සීමාවක් දැම්මේ නැහැ.

ඊළඟට, විදේශගත සේවකයන්ගෙන් මේ අවුරුද්දේ ලැබෙන ප්‍රේෂණ ප්‍රමාණය රුපියල් බිලියන 6ක් පමණ වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. කොරෝනා තත්ත්වය තුළ ඒ ඒ රටවල ඇති වුණු ප්‍රශ්න නිසාත් අපට බලපෑමක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, සෘජු විදේශ ආයෝජන සහ පිටරටවලින් ගන්නා ණය සහ ආධාර ගැනත් කියන්න ඕනෑ. මේ ක්‍රමවේදවලට අමතරව විදේශ විනිමය ලබා ගන්න පුළුවන් ක්‍රමවේදය මොකක්ද කියලා අද ආර්ථික විද්‍යාව පිළිබඳව මහා පන්තියක් කරපු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉදිරිපත් කරයි කියලා මා හිතුවා. මෙහි සඳහන් එක කාරණයකටවත් එතුමා උත්තර දුන්නේ නැහැ.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා සංචාරක ව්‍යාපාරය ගැන කථා කළා. අපේ රටට සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 4.5ක ආදායමක් ලැබී තිබෙනවා. හැබැයි, මේ පවතින තත්ත්වය තුළ අද අපට බලාපොරොත්තු වෙන්න පුළුවන් වෙන්නේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක පමණ ආදායමක්. අද විදේශ විනිමය ලැබෙන ප්‍රධාන මාර්ග අවහිරවෙලා තිබෙනවා. ඒ නිසා අපි නැවතත් විපක්ෂයෙන් අහනවා, ආර්ථිකය ඉදිරියට ගෙන යන්න මේ තිබෙන ක්‍රමවේදවලට අමතරව විරුද්ධ පක්ෂය යෝජනා කරන්නේ මොනවාද කියලා. මා එහෙම ඇහුවේ මොකද කියලා මා කියන්නම්. 2019 ජනාධිපතිවරණය අවසන් වුණාට පස්සේ, 2020 අවුරුද්දේ අපි පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ගෙනාවා.

ඔබතුමන්ලා නිතරම කියනවා නේ, හොඳ ආර්ථික ප්‍රතිපත්තියක් ගේන්න අපි උදවු කරන්නම් කියලා. කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ අයට සහන සලසන්න අය වැයක් ගේන්න, අපි උදවු කරන්නම් කියනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනාවා, රුපියල් බිලියන 367ක. 2020 මුල් කාර්තුවේ රුපියල් බිලියන 367ක පරිපූරක ඇස්තමේන්තුවක් අපි පාර්ලිමේන්තුවට ගෙනාවා. අපි ඒක ගෙනාවේ වෙන කිසිම දෙයක් නිසා නොවෙයි. 2015-2019 කාලයේ යහ පාලනය විසින් නොපියවූ බිල්පත් ටික පියවන්නයි. එතුමන්ලා "ගම්පෙරළිය" කියලා මුළු ගමම කණපිට ගහපු ව්‍යාපෘතිවලට ගෙවන්නයි. ඒ ගෙවීම් කරන්න ක්‍රමවේදයක් තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතාව වෙනුවෙන් යෝජනා ගේන්න කියන අය, එදා එතුමන්ලාගේ ආණ්ඩුව විසින් මුදල් නොගෙවා කළ සංවර්ධන කටයුතුවලට ගෙවීම් කරන්න අපි අනුමැතිය ඉල්ලුවාම, අනුමැතිය දෙන්නේ නැතිව කටයුතු කළා. ඒ වෙලාවේ එතුමන්ලා බැලුවේ ආණ්ඩුව පෙරළන්න පුළුවන්ද කියලායි. හැබැයි, අවසානයේ යහ පාලන ආණ්ඩුව නොපියවූ බිල්පත් වෙනුවෙන් රුපියල් බිලියන 423ක් අපේ ආණ්ඩුව ගෙවලා තමයි අපේ ආණ්ඩුවේ වැඩ කටයුතු පටන් ගත්තේ. එදා අය වැය පරතරය සියයට 6.6ක් කියලා පෙන්නුවාට, සත්‍ය වශයෙන් මේ කියපු වියදම් එක්ක සියයට 9.6ක අය වැය පරතරයක් එක්ක තමයි අපි එදා ආණ්ඩුව භාර ගත්තේ කියන එකත් මතක් කරන්න ඕනෑ. ඉන් පසුව කොවිඩ්-19 වසංගතය ආවා. එයින් අනෙක් රටවලට වාගේම අපේ රටටත් බලපෑම් තිබුණා. විරුද්ධ පක්ෂය උත්සාහ කළා, කොවිඩ්වලින් ආණ්ඩුව පෙරළන්න පුළුවන්ද කියලා බලන්න. රටේ මිනිසුන්ගේ ජීවිත අහිමි වුණත් කමක් නැහැ, කොවිඩ්වලින් ආණ්ඩුව පෙරළන්න පුළුවන් වෙයිද කියලා බැලුවා. හැබැයි, අතිගරු ජනාධිපතිතුමා කොවිඩ් එන්නත් ටික ගෙනාවා. එක එන්නතක්, දෙකක් නොවෙයි. ලෝකයේ නිෂ්පාදනය කරන හැම එන්නත් වර්ගයක්ම ගෙනවා. ඒ එන්නත්වලින් කොටසක් අපට ආධාර වශයෙන් ලැබුණා. අනෙක් ටිකට අපි මුදල් ගෙවලා ලබා ගත්තා. අපි මේ රටේ සියයට 62කට වඩා ජනතාවට එන්නත් දෙකම ලබා දීලා මේ රට සුරක්ෂිත කළා. ඒ මරණ සංඛ්‍යාව අඩුවීම අද විපක්ෂයට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ආසාදිතයන් සංඛ්‍යාව අඩුවීම අද විපක්ෂයට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ එකම පරමාර්ථය ඉදිරි මාස කිහිපය තුළ නැවත මේ රට වසා දමන තත්ත්වයට ආසාදිතයන් වැඩි කිරීමයි. රට වසා දමන තත්ත්වයට ආසාදිතයන් වැඩි කිරීමයි. මරණ සංඛ්‍යාව වැඩි වුණාම ඒකෙන් සතුටු වෙලා පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශ කරන්නයි මේ විපක්ෂය කටයුතු කරන්නේ කියලා අපට දැඩි විශ්වාසයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට චෝදනා කරන විපක්ෂය අපට කිසිම වෙලාවක සුන්දර ආර්ථිකයක් දුන්නේ නැහැ. කඩා වැටිච්ච, හිස් වෙච්ච මහ භාණ්ඩාගාරය එක්ක තමයි අපට ආර්ථිකය භාර දුන්නේ. හැබැයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2015 මැතිවරණය පරාද වෙලා යද්දී, අපි ශක්තිමත් ආර්ථිකයක් තමයි යහ පාලනයට භාර දුන්නේ. යහ පාලනයට භාර දීපු ආර්ථිකය එතුමන්ලාගේ නොහැකියාව හින්දා, එතුමන්ලා කිසිසේත් රටේ ජනතාව ගැන හිතුවේ නැති හින්දා, එතුමන්ලාට රිසි සේ විනෝද වෙන්න ඕනෑ හින්දා, ක්‍රමානුකූලව තීන්දු නොගත්ත හින්දා කඩා වැටුණා. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ලැබුණු ආර්ථිකයේ වර්ධන වේගය සියයට 2.3යි. අපි භාර දීපු ආර්ථිකයේ තිබුණේ සියයට 7ක ආර්ථික වර්ධන වේගයක්. අපි ඉතාම දුර්වල ආර්ථිකයක් තමයි භාර ගත්තේ. 2020 අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ, දෙවැනි කාර්තුවේ ඍජුවම කොරෝනා වසංගතයෙන් බලපෑම් ඇති වුණා. 2020 පළමුවැනි කාර්තු දෙකේ ආර්ථිකයේ වර්ධන වේගය ක්‍රමානුකූලව අඩු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාරාන්තික වසංගත තත්ත්වය තුළ එය කළමනාකරණය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාත්, රජයත් ගත් පියවර නිසා 2020 අවුරුද්දේ තුන්වැනි කාර්තුව වෙද්දී සියයට 1.3ක ආර්ථික වර්ධනයක් ලබා ගත්තා. අපි 2020 දෙවැනි කාර්තුව වෙද්දී නැවතත් සියයට 1.3ක වර්ධනයක් ලබා ගන්නවා. අපි 2021 පළමුවැනි කාර්තුව වෙද්දී සියයට 4.3ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්නවා. ඒ නිසා අපි වැඩ පිළිවෙළක් තිබෙන ආණ්ඩුවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුව භාර ගනිද්දි අපේ රටේ ඇමෙරිකානු ඩොලර් බිලියන 25ක ආර්ථිකයක් තිබුණා.

මේ ඩොලර් බිලියන 25ක ආර්ථිකය ඩොලර් බිලියන 81 දක්වා ප්‍රසාරණය කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාට පුළුවන් වුණා. ඒ දුර දැකලා කටයුතු කළ නිසායි. 2005 අපේ රටේ per capita income එක ඇමෙරිකානු ඩොලර් 1,242ක් විධියට තිබුණේ. 2015 වෙද්දී ඒක පුද්ගල ආදායම ඩොලර් 3,841 දක්වා වැඩි කළා. ඔබතුමන්ලාම නියෝජනය කළ ආණ්ඩුව 2015 ඉඳලා 2019 වෙද්දී ඒක පුද්ගල ආදායම ඩොලර් 3,852 දක්වා වැඩි කළා. කීයද වැඩිවීම? ඇමෙරිකානු ඩොලර් 11යි. ඔන්න, අපට මහ ලොකු ආර්ථිකයක් භාර දුන්නා කියන කණ්ඩායමේ වැඩ!

අපේ රටත් උද්ධමනයට ලක් වෙලා තිබෙනවා. හැබැයි මුළු ලෝකයේම අත්‍යවශ්‍ය භාණ්ඩ මිල සියයට 40කින් ඉහළ ගිහින් තිබෙනවා. ලෝකයේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල සියයට 40කින් ඉහළ ගිහින් තිබෙන අවස්ථාවක, අපට පුළුවන් වෙලා තිබෙනවා සියයට 5ත්, 6ත් අතර උද්ධමන වේගයක් තුළ මේ ආර්ථිකය කළමනාකරණය කර ගන්න. අපි අමාරුවෙන් ආර්ථිකය මෙහෙයවාගෙන යද්දී කකුලෙන් අදින්න විපක්ෂය සූදානමින් ඉන්නවා.

දැන් විපක්ෂය දිගටම කිව්වා, ආයෝජන අරගෙන එන්න අපේ රජයට බැහැ කියලා. අපේ රජයට බැහැ කියන අය කරපු විධිය මම කියන්නම්කෝ. 2009 අවුරුද්ද මේ රටේ තීරණාත්මක අවුරුද්ද වුණ, යුද්ධය අවසාන කළ අවුරුද්ද වුණා. ඒ අවුරුද්දේත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට ඇමෙරිකානු ඩොලර් මිලියන 516ක ඍජු විදේශ ආයෝජන ආවා. 2014 අවුරුද්ද වෙද්දී අපි ඒ ආයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 1,635 දක්වා වැඩි කර ගත්තා. හැබැයි, ආයෝජනවලට මිත්‍රශීලී යැයි කියන යහ පාලන ආණ්ඩුව මොකක්ද කළේ? ඒ ආණ්ඩුවට බැරි වුණා එදා 2014දී අපේ ආණ්ඩුව ගෙනාව ආයෝජන ප්‍රමාණයවත් ගේන්න. ඔවුන් 2019 වෙද්දී ගෙනාවේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,189යි. එතැනින්ම තේරුම් ගන්න ආයෝජන වෙනුවෙන් මිත්‍රශීලී පරිසරයක් හදන්න පුළුවන් ආණ්ඩුව අපේ ආණ්ඩුවයි කියන කාරණාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015-2019 කාලයේ ආයෝජන ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 7,000ක් ආවා

කියලා සඳහන් වනවා. හැබැයි, ඔබතුමන්ලා දන්නවාද ඒ ආයෝජන ගෙනාවේ කොහොමද කියලා? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා හම්බන්තොට වරාය හදලා මේ රට ආසියාවේ නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත් කරද්දී, ඔබතුමන්ලා හම්බන්තොට වරාය ඩොලර් මිලියන 1,120ක මුදලකට අවුරුදු 99 ඒවා දෙකකට බදු දීලා, ඒක ආයෝජනයක් හැටියට සැලකුවා. කාගේද මේ ආර්ථික විද්‍යා න්‍යාය? ලංකාවට තිබෙන වත්කමක් බදු දීලා, ඒ බදු දීම ආයෝජනයක් ලෙස සලකනවා. ඔබතුමන්ලාගේ කාලයේ ආයෝජන ගැන කථා කළාට, ඒ අවුරුදු පහක කාලය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 2,038ක් අරගෙන එන්නේත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ අත්සන් කළ ගිවිසුම්, ඒ එකඟතා තුළින්. ඒ නිසා විපක්ෂය මේ අය වැය විවාදය පුරාම මේ පාර්ලිමේන්තුව පාවිච්චි කළේ දිගින් දිගටම රාජපක්ෂවරුන්ට මඩ ගහන්න විතරයි කියලා අපට පෙනෙනවා. මම ඒකනේ කිව්වේ විදේශ විනිමය ප්‍රශ්නයක් පිළිබඳව විරුද්ධ පක්ෂය කථා කරනවා නම්, එතුමන්ලාගේ විසඳුම කියන්න කියලා. ප්‍රධාන වශයෙන් විදේශ විනිමය ගෙනෙන මාර්ග මම කිව්වා. ඒ මාර්ගවලින් පරිබාහිර විපක්ෂය යෝජනා කරන මාර්ගය මොකක්ද? නමුත්, විපක්ෂයට ඒ සම්බන්ධ කිසිම අදහසක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ නායකයා මුළු රටක් නොමඟ යැව්වා. ඒක ඒ අය හැම දාම වාගේ පුරුද්දට කරන දේ. ජනතා විමුක්ති පෙරමුණට සහජ දක්ෂතාවක් තිබෙනවා මේ රට නොමඟ යවන්න පුළුවන් විධියේ. රාජපක්ෂවරු සමස්ත අය වැයෙන් සියයට 64ක් වෙන් කරගෙන කියලා ජනතා විමුක්ති පෙරමුණයි, සමගි ජන බලවේගයයි කිව්වා. හැබැයි, අපි ඒ කියන ඕනෑම මන්ත්‍රීවරයෙකුට ආරාධනා කරනවා, අපිත් එක්ක ඒ සම්බන්ධ විවාදයකට එන්න කියලා. සැබැවින්ම ඒ කියන අමාත්‍යාංශ කිහිපයට මුළු අය වැය ලේඛනයෙන් වෙන් වෙලා තිබෙන්නේ සියයට 29.08යි කියලා අපි පෙන්වන්නම්.

විපක්ෂය ආරක්ෂක අමාත්‍යාංශය ගැන කථා කරනවා; ආරක්ෂක අමාත්‍යාංශයට මුදල් වෙන් කිරීම වැඩි කළා කියනවා. විශේෂයෙන් දෙමළ ජාතික සන්ධානයේ මතය සජිත් ප්‍රේමදාස පාර්ශ්වයත් අරගෙන ගියා. හැබැයි අපි කියන්න ඕනෑ, මේ රටේ අපොස (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙන ගත්ත තරුණ තරුණියන් ලක්ෂයකට රැකියා ලබා දෙන්න අවශ්‍ය මුදල් ප්‍රමාණයත් අන්තර්ගත වෙලා තියෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තුළ බව. එම නිසා ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හුදෙක් යුධ කටයුතුවලට ලඝු කරන්න එපා. මේ රටේ ත්‍රිවිධ හමුදාව පවත්වාගෙන යන්න ඒ වියදම් ටික අවශ්‍යයි. රුපියල් බිලියන 270කට ආසන්න ප්‍රමාණයක් වෙන් වෙන්නේ අපේ රටේ ත්‍රිවිධ හමුදාවට වැටුප් හා වේතන ගෙවලා, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික දීලා, ඒ කටයුතු ටික පවත්වාගෙන යන්නයි. එල්ටීටීඊ එකට හිතවත් කණ්ඩායම් ත්‍රිවිධ හමුදාවට විරුද්ධ වුණාට අපට පුදුමයි, සමඟි ජන බලවේගයත් ඒකත් එක්ක අත්වැල් බැඳගෙන ත්‍රිවිධ හමුදාවට විරුද්ධ වීම ගැන. හැබැයි, එක අතකින් සාධාරණයි. ඒ ඔක්කොම එකම මතයේ නේ ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා ඉතා වගකීමෙන් කියන්න ඕනෑ තව කාරණාවක් තියෙනවා. එනම්, මේ අය වැය ලේඛනය පුරාවටම අධ්‍යාපන විෂයය පිළිබඳව කථා කළා; සෞඛ්‍ය විෂයය පිළිබඳව කථා කළා. අපි ඉතා වගකීමෙන් කියනවා, මේ අය වැය ලේඛනය තුළ සියලු අමාත්‍යාංශවලට සහ පළාත් සභාවලට වෙන් කරපු මුදල එක්ක බැලුවාම, අපේ රටේ අධ්‍යාපනයට සියයට 13.8ක මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තියෙන බව. සියයට 13.8ක මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනයට වෙන් වෙලා තිබෙනවා. සියයට 11ක් සෞඛ්‍යයට වෙන් වෙලා තියෙනවා. සියයට 8ක් කෘෂි කර්මාන්තයට වෙන් වෙලා තිබෙනවා. ඒ නිසා එක්කෝ කරුණු නොදැන විපක්ෂය චෝදනා කරනවා. එහෙම නැත්නම් කරුණු දැනගෙන රටේ ජනතාවට කරුණු නොදන්නවා සේ සලකා කරුණු ඉදිරිපත් කරනවා.

අපේ රටේ ආනයන ආර්ථිකයෙන් අපි මිදෙන්න ඕනෑ. ආනයන මත යැපීමෙන් අපි මිදෙන්න ඕනෑ. ඒකට හේතු කාරණා ගණනාවක් තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි මේ මෑත කාලයේ ආනයනික භාණ්ඩවල මිල ඉහළ යෑම. ඒකට එක හේතුවක් තමයි, කොවිඩ් -19 වසංගත තත්ත්වය තුළ ඒවා නිෂ්පාදනය කරන රටවල මිල ඉහළ යෑම වාගේම, නාවික සහ ගුවන් ප්‍රවාහනයට අධික මිලක් ගෙවන්න සිදු වීම. ඒ තුළ කිරිපිටි ආනයනයේදී අධික මිලක් දරන්න සිද්ධ වුණා. ඒකයි දේශීය කිරි කර්මාන්තය, දියර කිරි කර්මාන්තය, පශු සම්පත් අංශය ශක්තිමත් කරන්න මේ අය වැය තුළ මූලිකත්වය අරගෙන තියෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිරිපිටි මිල බැලුවොත්, 2020දී කිරිපිටි මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 3,210ක්. මේ අවුරුද්ද වෙද්දී කිරිපිටි මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 3,920ක් වෙලා තිබෙනවා. ඒ අනුව ලෝක වෙළෙඳපොළේ ආනයනික කිරිපිටි මිල සියයට 22කින් වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට, ගෑස් මිල ගත්තොත්, ජාත්‍යන්තර වෙළෙඳපොළේ ගෑස් මිල සියයට 93.3කින් වැඩි වෙලා තියෙනවා. බොරතෙල් මිල ගත්තොත්, ලෝක වෙළෙඳපොළේ බොරතෙල් මිල සියයට 74.5කින් වැඩි වෙලා තියෙනවා. ඒ හින්දා අපි ආනයන මත යැපෙන්න යැපෙන්න ලෝක වෙළෙඳ පොළේ මිල ගණන්වලට අපේ ආර්ථිකය වෙනස් කර ගන්න අපට සිද්ධ වෙනවා. ඒ හින්දා අපි නිෂ්පාදනයට වැඩි ඉඩක් දීලා තිබෙනවා. මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල් ආනයනය කිරීම අපි සීමා කර තිබෙනවා. සමහර භාණ්ඩ ආනයනය කිරීම නවත්වා තිබෙනවා. අපේ රටේ කර්මාන්තවලට විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

කොවිඩ් -19 වසංගතය තුළ අපට ඇති වෙච්ච මූලික බලපෑම ගැන බැලුවොත්, විශේෂයෙන්ම සෞඛ්‍ය අංශය සහ අනෙකුත් අංශ කොවිඩ් -19 වසංගතය මර්දනය කිරීම සඳහා දරපු වියදමට අමතරව -ඒ කියන්නේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු දරපු වියදමට අමතරව- රුපියල් බිලියන 117.5ක වියදමක් 2020 වර්ෂයේ රජය දරලා තිබෙනවා. ඒ වාගේම, 2021 අවුරුද්දේ මේ වන විට කොවිඩ් -19 මර්දනය සඳහා රුපියල් බිලියන 210ක් රජය අමතරව වියදම් කරලා තිබෙනවා. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිශතයක් හැටියට කොච්චරද කියලා දිගින් දිගටම විවිධ මන්ත්‍රීවරු කියන්න පටන් අරගෙන තිබෙන බව මම දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දත්ත අනුව, කොවිඩ් මර්දනයට අමතරව දරන වියදම ලෙස දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.3ක් ලංකාව දරා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ එම ප්‍රමාණය සියයට 1යි; කැනඩාවේ සියයට 2.8යි; ඉතාලියේ සියයට 1.2යි; ජපානයේ සියයට 2.1යි. අපේ අසල්වාසී ඉන්දියාවේ එම ප්‍රමාණය සියයට 0.5යි. පාකිස්තානයේ සියයට 0.4යි; බංග්ලාදේශයේ සියයට 0.9යි. ඒ හින්දා අපි ඉතාම ගෞරවයෙන් විරුද්ධ පක්ෂයෙන් ඉල්ලනවා, මේ ගරු සභා ගර්භය තුළ අසත්‍ය කියන්න එපා කියලා. එය කොවිඩ් මර්දනයට සෞඛ්‍ය අංශයේ පටන්, ආරක්ෂක අංශය, රාජ්‍ය සේවකයන්, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ පුරවැසියන් ඇතුළු මේ රටේ සමස්ත ජනතාවටම කරන මහා අගෞරවයක් කියන එක මම ඉතාම වගකීමෙන් කියන්න ඕනෑ.

රටක් හැටියට අපට අරමුණක් තිබෙනවා. අපේ අරමුණ තමයි මේ අය වැය පරතරය සියයට 8.8ට අඩු කිරීම. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අපේ ණය බර අද සියයට 100 ඉක්මවා ගිහින් තිබෙනවා. එදා අපේ රජය මේ රට භාරගෙන කටයුතු කරද්දී, රාජ්‍ය ණය ප්‍රමාණයේ ප්‍රතිශතය සියයට 88 දක්වා අඩු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපට එය කිරීමේ හැකියාව තිබෙනවා. අපට අරමුණක් තිබෙනවා. අපට ඒක

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

කරගෙන යන්න පුළුවන් ක්‍රමවේදය සහ දක්ෂතාව තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට අය වැය ලේඛනය ඉදිරිපත් කරලා, ඒ පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ, විපක්ෂය එය සමස්තයක් හැටියට ගෙන මඩ ගැසීමට පාවිච්චි කරනවා වෙනුවට, ආණ්ඩුවට, රජයට, ඒ වාගේම ජනතාවට යෝජනාවලියක් දුන්නා නම් ඊට වඩා හොඳයි කියන එක තමයි අපේ අදහස.

අපට මේ රට නැවත ගොඩ නඟන්න පුළුවන්. මේ විපක්ෂය, කොරෝනා ප්‍රවර්ධනය කරන විපක්ෂයක්; කොවිඩ් මරණ සංඛ්‍යාව වැඩි වුණාම සතුටු වන විපක්ෂක්; අසත්‍ය අවලාද නඟන විපක්ෂයක්. අද සිටින මේ දුෂ්ට විපක්ෂය, මේ කණ්ඩායම සිටියදීම තමයි අපි එදා යුද්ධය අවසාන කළේ. ඒ විධියටම අපි කොරෝනා තුළින් බැට කන මේ ආර්ථිකයත් ගොඩ නඟනවාය කියන එක මා ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර තිහක පමණ කාලයක් ලබා දෙන්න. ඔබතුමා නියෝජනය කරන විරුද්ධ පක්ෂයෙන් අපට විශේෂයෙන්ම චෝදනා එල්ල කළේ, ගම ගොඩ නඟන්න ගමේ නියෝජිතයන්ට මුදල් වෙන් කිරීම ගැනයි. ඔබතුමා දන්නවාද, පළාත් පාලන ආයතනවල පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් ඉන්නේ 3,297 දෙනකු බව? හැබැයි, මේ රටේ පළාත් පාලන ආයතනවල විරුද්ධ පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු 1,431 දෙනෙක් ඉන්නවා. ඉතිහාසයේ පළමුවන වතාවට තමයි ගමේ මනුස්සයාගේ අවශ්‍යතා ගමේ නියෝජිතයන් විසින් හඳුනා ගෙන ගමේ ජනතාවට අවශ්‍ය විධියට කටයුතු කරන්න ග්‍රාමීය සංවර්ධනය සඳහා මෙසේ මුදල් වෙන් කර තිබෙන්නේ. ඒ හින්දා ඔබතුමන්ලා කුහක වෙන්න එපා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිත් පළමුවැනි අවුරුද්දේ, දෙවැනි අවුරුද්දේ අපට විමධ්‍යගත මුදල් නොදුන්නාට, අපි ඔබතුමන්ලාගේ විමධ්‍යගත මුදල් රුපියල් මිලියන 15 දක්වා වැඩි කර තිබෙනවා. ජනතාවට සහන ලබා දීලා, ජනතාවට දෙපයින් හිටගන්න පුළුවන් ආර්ථිකයක් නැවත ගොඩ නඟද්දී, දේශපාලන වශයෙන් ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා භේද කරන්න අපි සූදානම් නැහැ. ඒ නිසා ඒ පාඩමත් ඉතිහාසයට එකතු වන අලුත් පරිච්ඡේදයක් කියන කාරණාවත් ප්‍රකාශ කරමින්, මේ අය වැය ලේඛනයට සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.15]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජාතික ආරක්ෂාව විනාශ කරපු, රට විනාශ කරපු ආණ්ඩුවක් පරාජය කිරීම සඳහා මේ රටේ ජනතාව පෙළ ගැසුණේ මීට වසර දෙකකට පෙර. එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා ලෙස පත් කරන්න පෙළ ගැසුණු අපේ රටේ ලක්ෂ 69ක් වන ජනතාවට ආචාර කරන ගමන්, අපි ඔවුන්ට එක දෙයක් කියන්න කැමැතියි. ඒ තමයි, මහින්ද-ගෝඨාභය සුසංයෝගයෙන් සැදි මේ ආණ්ඩුව, ඔබ එදා අප කෙරෙහි තැබූ විශ්වාසය කඩ කරන්නේ නැහැ කියන එක. අපි ඒ පණිවුඩය මේ අවස්ථාවේ මුලින්ම දෙන්න ඕනෑ.

පසුගිය වසර දෙක තුළ අපට කටයුතු කරන්න සිදු වුණේ ගෝලීය කොවිඩ් වසංගතය සමඟයි. ඒ නිසා අපේ රටේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම ආර්ථිකය කඩා වැටිලා, මුළු ලෝකයේම ජනතාව පීඩාවට පත් වුණා. නමුත් ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය අබමල් රේණුවකින් හෝ පලුදු නොකරන බවට ආණ්ඩුව සහතික වන බව මා කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ විවාද කරන්නේ අපේ ආණ්ඩුවේ දෙවන අය වැය ලේඛනය පිළිබඳවයි. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, මුදල් ඇමතිතුමා ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මංගල අය වැය මෙයයි.

ලෝක ආර්ථික තත්ත්වය අනුව කිසිදු රටකට මේ වෙලාවේ ජනතාවට විශේෂ සහන ලබා දෙන්න බැහැ. ලෝකයේ බලවත් රටවල් පවා සහන හැකිතාක් කපා හරිමින් ආර්ථිකය පවත්වාගෙන යන්න කටයුතු කරන වෙලාවක්, මෙය. ලෝක බැංකුව සිය අලුත්ම වාර්තාවලින් පෙන්වා දෙන ආකාරයට ලබන වසර තුළදීත් අපට මේ ලෝක අර්බුදයට මුහුණ පාන්න සිදු වෙනවා. භාණ්ඩ මිල වේගයෙන් ඉහළ යෑම නවත්වන්න හැකි වන්නේ නැහැ. අද රටේ භාණ්ඩවල මිල වැඩියි. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේකට පැලැස්තර දැමීමෙන් එලක් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. භාණ්ඩ මිල අඩු කරන්න නම් භාණ්ඩ සුලබ වෙන්න ඕනෑ. මේක සරල ආර්ථික රීතියක්. ඒ නිසා මුදල් ඇමතිතුමා මෙවර අය වැයෙන් නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම සඳහා මූලික අවධානය යොමු කර තිබෙනවා. මේ අය වැය මා දකින්නේ පවතින කොවිඩ් වසංගතය තුළ බිඳ වැටී ඇති ආර්ථිකය ගොඩ ගැනීම සඳහා පදනම සැකසූ අය වැයක් ලෙසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් වසංගතය නිසා බිඳ වැටුණු ලෝක ආර්ථිකය ගොඩ ගැනීම සඳහා ලෝකයේ බොහෝ රටවල අවධානය යොමු වී ඇත්තේ සංචාරක ව්‍යාපාරයටයි. වසංගතයෙන් දැඩි බලපෑමට ලක් වූ ප්‍රධාන ක්ෂේත්‍රය වන්නේ ද සංචාරක ව්‍යාපාරයයි. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයට අනුව කොවිඩ් වසංගතය නිසා ලෝකයේ අපනයන ආදායමෙන් ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 1.3ක හා සෘජු සංචාරක දළ දේශීය නිෂ්පාදිතයෙන් ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 2කට වැඩි පාඩුවක් ලෝක ආර්ථිකයට සිදුව තිබෙනවා. එමඟින් ලෝකයේ රැකියා මිලියන 100කට අධික සංඛ්‍යාවක් අවදානමකට ලක්ව තිබෙන බවයි ඔවුන් පවසන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සංචාරක ක්ෂේත්‍රයට සෘජු හා වක්‍ර ලෙස සම්බන්ධ මිලියන තුනක වාගේ ජනතාවක් අද විශාල අභියෝගයකට මුහුණ දෙනවා.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයත් කොවිඩ් වසංගතය නිසා සම්පූර්ණයෙන් කඩා වැටී තිබෙනවා. සංචාරක ව්‍යාපාරය කියන්නේ, සියයට සියයක්ම පෞද්ගලික අංශය මඟින් මෙහෙයවන කර්මාන්තයක්. රජය සිදු කරන්නේ එය නියාමනය කිරීම පමණයි. ලක්ෂ 30කට ආසන්න පිරිසක් මේ රටේ සංචාරක ව්‍යාපාරයෙන් යැපෙනවා. කොවිඩ් වසංගතය නිසා ඔවුන්ගේ ජීවනෝපාය අහිමි වුණා. කොටි ත්‍රස්තවාදීන්ගේ යුද්ධය හේතුවෙන් වාර්ෂිකව ලක්ෂ 4කට, 5කට පමණ සීමා වී තිබූ සංචාරකයන්ගේ පැමිණීම යුද්ධයෙන් පසු ලක්ෂ 23 දක්වා වැඩි වුණා. වැඩිම සංචාරක පිරිසක් ලංකාවට පැමිණි 2018 වසරේදී සංචාරක ක්ෂේත්‍රයෙන් ලැබූ ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට කිට්ටුයි. ඒ සම්පූර්ණ ආදායම කොවිඩ් නිසා අපට අහිමි වුණා. 2018 වර්ෂයේදී සංචාරක ක්ෂේත්‍රය වාර්තාගත ආදායමක් ලබා ගත්තේ 2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් පසුව එවකට ආර්ථික සංවර්ධන ඇමතිවරයා ලෙස වර්තමාන මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මැතිතුමා ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ

නිසා බව සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් නිරන්තරයෙන් පවසනවා. සංචාරක ක්ෂේත්‍රයේ ස්වර්ණමය යුගය ලෙස හඳුන්වන්නේත් ඒ කාලයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් නිසා පීඩාවට පත් වෙච්ච, සංචාරක ක්ෂේත්‍රයේ නිරතවූවන් රැක ගැනීමට රජයක් ලෙස අපි විවිධ පියවර ගත්තා. මහ බැංකුවේ වාර්තා අනුව සංචාරක ව්‍යාපාරයේ නිරත වූවන් රුපියල් ට්‍රිලියන 365ක ණය ලබාගෙන තිබෙනවා. ඒ ණය ගෙවීම සඳහා අපි සහන කාලයක් ලබා දුන්නා. ලීසිං ලබා ගත් අයට ඒවා ගෙවීම සඳහාත් සහන කාලයක් ලබා දුන්නා. මහ බැංකුව විසින් මූල්‍ය ආයතනවලින් එලෙස ලබා ගත් සංචාරක ක්ෂේත්‍රයේ ණය හා ලීසිං පහසුකම් ගෙවීම සඳහා ලබා දී තිබෙන සහනය ලබන වසරේ මාර්තු මාසය දක්වා දීර්ඝ කර තිබෙනවා. සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක සේවා සපයන්නන් සඳහා විදුලිය හා ජල බිල්පත් ගෙවීමට ලබා දී ඇති සහන කාලය පසුගිය මාසයෙන් අවසන් වුණත්, එය දීර්ඝ කරන ලෙස අදාළ අමාත්‍යාංශවලින් අපි ඉල්ලීම් කර තිබෙනවා. සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක මාර්ගෝපදේශකයන් 2,050 දෙනෙකු සඳහා රුපියල් 20,000 බැගින් දීමනාවක් ගෙව්වා. ඒ සඳහා වැය කෙරුණු මුදල රුපියල් මිලියන 41ක්. ලියාපදිංචි සංචාරක රියැදුරන් වෙනුවෙනුත් රුපියල් 15,000 බැඟින් මුදලක් ගෙව්වා. ඒ අනුව රියැදුරන් 2,156 දෙනෙකුට රුපියල් මිලියන 32.34ක් ගෙවා තිබෙනවා. පළාත් සංචාරක මාර්ගෝපදේශකයන් 511 දෙනෙකුටත් රුපියල් 15,000 බැගින් අපි ගෙව්වා. ඒ මුදල් අපි ගෙව්වේ සංචාරක සංවර්ධන අධිකාරියේ අරමුදල්වලින්. මේ ගෙවීම සිදු කළේ රජය විසින් අවස්ථා දෙකකදී ගෙවනු ලැබූ රුපියල් 5,000ක දීමනාවට අමතරවයි. සංචාරක සේවා සපයන ආයතන සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචියේදී ද ඒ සඳහා අය කරනු ලබන ගාස්තුව අපි ඉවත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොන සහන ලබා දුන්නත් සංචාරක ව්‍යාපාරය නඟා සිටුවන්න නම් මේ රටට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ. සංචාරක ක්ෂේත්‍රයට පැලැස්තර දාලා, සංචාරක ව්‍යාපාරය ගොඩ ගන්න අපට බැහැ. අපි ඒ සඳහා 2009 වර්ෂයේ අත්දැකීම් උපයෝගි කරගන්න ඕනෑ. යුද්ධය අවසන් වුණාට පසු, ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ තමයි සංචාරක ක්ෂේත්‍ර නඟාසිටවූයේ. මේ තිබෙන අභියෝගය ජයග්‍රහණය කරන්න මේ වෙනකොට අවශ්‍ය පසුබිම අපි නිර්මාණය කරගෙන යනවා.

සංචාරක ක්ෂේත්‍රයට විතරක් නොවෙයි, මුළු රටේම ජනගහනයෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයකට මේ වෙනකොට පූර්ණ එන්නත ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. එන්නත ලබා දීමේ දී සංචාරක ක්ෂේත්‍රයේ අයට ප්‍රමුඛතාව දෙන්න කියලා ජනාධිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා. මේ රට සංචාරකයන්ට හිතවාදී රටක් බවට පත් කරන්න නම්, අද මේ රටට එන අයගේ සෞඛ්‍ය සම්පන්නභාවය වෙනුවෙන් ක්‍රමවේද අනුගමනය කරන්න වෙනවා. පසුගිය මාස දෙකක කාල සීමාව තුළ සංචාරකයන් ක්‍රමානුකූලව ලංකාවට එන බව අපි දැක්කා. ඔවුන් එහෙම එන්නේ කොවිඩ් වසංගතය වෙනුවෙන් මේ රට ගෙන ඇති පියවර පිළිබඳව ඔවුන්ට තිබෙන අවබෝධය නිසා.

පසුගිය දවස්වල විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ සංචාරක ක්ෂේත්‍රය ගැන කථා කළා. මේ රටට එන්නේ හිඟන සංචාරකයෝ කියලා සමහර අය ප්‍රකාශ කළා. වෙන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පෞද්ගලික ව්‍යවසායකයන් විසින් සංචාරක ක්ෂේත්‍රය ගොඩනැඟුවා මිසක්, ඒ සඳහා මේ රටේ ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් හැදුණේ නැහැ. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, ආර්ථික සංවර්ධන ඇමතිවරයා වශයෙන් සිටියදී global tourism promotion එකක්, රට ගැන destination promotion එකක් කළා. මේ රට පිළිබඳව ලෝකයේම ප්‍රවර්ධන වැඩ සටහන් කරන්න අපි මේ වෙනකොට වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. කොවිඩ් වසංගතයත් එක්ක අද මේ රට කඩාගෙන වැටිලා තිබෙනවා. අපි මේ රට භාර ගන්නකොට මහ බැංකුවේ මුදල් හොරකම් කරපු මිනිස්සු අද කථා කරන දේවල් ගැන අපි පුදුම වෙනවා. මහ බැංකුවේ මුදල් හොරකම් කරපු මිනිස්සු අද මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ බෝධිසත්වයෝ වාගෙයි.

හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, - එතුමාගේ නම කියලා කථා කරන්න සිද්ධ වෙච්ච එක ගැන මම කනගාටු වෙනවා. එතුමා එදා කිව්වා, "ගෝඨාභය සර් ෆේල්" කියලා. අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ යුද්ධය අවසන් කරන්න නායකත්වය දුන් නායකයා තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. හැටනව ලක්ෂයක් ජනතාව එතුමා කෙරෙහි විශ්වාසයෙන් තමයි එතුමාට ඡන්දය දුන්නේ. හැබැයි හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ගැන අහන්න ඕනෑ, මේ රටේ ජනතාවගෙන් නොවෙයි. ඊයේ - පෙරේදාත් සමාජ මාධ්‍ය හරහා වීඩියෝ පටයක් යනවා මම දැක්කා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියනවා. එහෙම නම් තමන් ගැන තමන් එක්ක ඉන්න ගැහැණු කියන කථා අහගෙන එතුමා නිහඬ වෙන්න ඕනෑ. රාජ්‍ය නායකයන්ට කථා කරන හැටි ඉගෙන ගන්න ඕනෑ. බොරුවට ටී.වී ඉස්සරහට ඇවිල්ලා කථා කරනවා; රටේ නායකයන්ට නිග්‍රහ කරනවා.

පසුගිය දවස්වල විපක්ෂය මහ ලොකුවට කථා කළා, සංචාරක ක්ෂේත්‍රයේ අයට උදව් කරන්න ඕනෑ කියලා. නමුත්, කොවිඩ් වසංගතය වැඩි කරන්න රැළි තියනවා; රැස්වීම් තියනවා. අන්න, මනෝ ගනේෂන් මන්ත්‍රීතුමා එහි පළමුවෙනි ආසාදිතයා වෙලා. එතුමාගෙන් හැදුණු පොකුරු විශාල ප්‍රමාණයක් එනවා. ඒ වාගේ කටයුතු තමයි කොවිඩ්-19 ආසාදිතයන් ප්‍රමාණය වැඩි වෙන්න හේතු වෙලා තිබන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් පසුගිය යහපාලන ආණ්ඩුව කාලයේ මේ රට විනාශ කරලා, රටේ ආර්ථිකය නැති කරලා, රටේ ජාතික ආරක්ෂාව බිඳ වට්ටලා, කරන්න පුළුවන් තුප්පහි වැඩ ඔක්කෝම කරලා මේ ආණ්ඩුවේ රාජ්‍ය නායකයන්ට අද පහර ගහනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අද ගහන්නේ ඇයි? පරණ කථාවක් තිබෙනවා නේ, "අඹ තියෙන ගහට තමයි පොලු ගහන්නේ" කියලා. එතුමාගේ ප්‍රතිරූපය වට්ටන්න බොහෝ උත්සාහ කරනවා. "ෆේල්" කියනවා. එහෙම කියපු අය තමයි අද ෆේල් වෙලා තිබෙන්නේත්; පිස්සන් වාගේ හැසිරෙන්නේත්.

අපි වගකීමෙන් කියනවා, මෙය ඉතාම අමාරු අවස්ථාවක් බව. රටේ ඩොලර් ටික නැහැ; අත්‍යවශ්‍ය භාණ්ඩ ටික ගෙන්වන්න විධියක් නැහැ; ගත්ත ණයවලට ගෙවීම් කරන්න තිබෙනවා. මහ බැංකු හොරකම හරහා පිටරටවලට ගෙවන්න තිබුණු සල්ලි ටික ඇද්දා. ඒවා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු ඡන්දවලට පාවිච්චි කළේ. ඒවා දුන්නාය කියලා කියනවා. අද හොරු ගැන කථා කරනවා. ඒ අයට සම්බන්ධ වෙලා හිටපු ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන පක්ෂ අද මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ බෝධිසත්වයෝ වාගෙයි.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය ජයග්‍රහණය කළා වාගේම කොවිඩ් වසංගතයත් පාලනය කරලා මේ රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න අපි රජයක් හැටියට ඉදිරියේ දී කටයුතු කරනවාය කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක කොවිඩ් වසංගතයත්, ඒ වාගේම ලෝක ආර්ථිකය කඩා වැටීමත් කියන ඒ සියලු අභියෝග හමුවේ මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාට මුලින්ම අපේ ගෞරවනීය ස්තුතිය පුද කරන්නට ඕනෑ.

2019 නොවැම්බර් මාසයේ 16වැනි දා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති වශයෙන් පත්වෙලා මේ වෙනකොට මාස 24ක්, එහෙම නැත්නම් අවුරුදු 2ක කාලයක් වෙනවා. මේ මාස 24න් මාස 20ක්ම කොවිඩ් වසංගතයට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. එම කොවිඩ් වසංගතයත් එක්ක, රටේ සියලු දේවලින් බැහැරවෙලා මේ රටේ මිනිස්සු ජීවත් කරවීමේ වගකීම භාර ගන්න අපට සිද්ධ වුණා. ඒ සඳහා ප්‍රමුඛස්ථානය දුන් නිසා අද වන විට කොවිඩ් පාලනය කරගෙන ඉදිරියට යන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වසංගතයත් එක්ක රට වහන්න සිද්ධ වුණා. ගුවන් තොටුපොළ වහපු නිසා සංචාරක ව්‍යාපාරය නැතිවෙලා, රාජ්‍ය ආදායම අඩු වුණා. ඒ සියලු දේ හමුවේ තමයි මේ මන්ත්‍රීවරුන් වෙනුවෙන්, මේ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, ගුරු වැටුප් වෙනුවෙන්, සංවර්ධනය වෙනුවෙන් -ඒ සියලු දේ වෙනුවෙන්- මෙම අය වැයෙන් මුදල් වෙන් කළේ කියන එක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ගරු මුදල් ඇමතිතුමා මෙම අය වැය පිළිබඳව අද එතුමාගේ පිළිතුරු කථාව කරන්න කලින්, අද විපක්ෂයේ මන්ත්‍රීවරුන් මතු කළ ප්‍රශ්න කිහිපයකට කෘෂිකර්ම අමාත්‍යාංශය භාර ඇමතිවරයා හැටියට මම උත්තර දෙන්න ඕනෑ.

අද උදේ විපක්ෂ නායකතුමා කිව්වා, "කෘෂිකර්ම ඇමති එකක් කියනවා; රාජ්‍ය ඇමති එකක් කියනවා; අමාත්‍යාංශයේ ලේකම් තව එකක් කියනවා" කියලා. අපි කවුරුවත් එකක්, දෙකක්, තුනක් කියන්නේ නැහැ කියන කාරණය මම මුලින්ම කියන්න ඕනෑ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අමාත්‍යවරයාත්, රාජ්‍ය අමාත්‍යවරයාත්, ලේකම්තුමාත් සියලුදෙනාම අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තියත් එක්ක එකට හිටගන්නවා. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ සමගි ජන බලවේගය පක්ෂය ඇතුළේ වාගේ එක මතයක් තියාගන්න බැරි ප්‍රශ්නයක් අපේ පක්ෂය ඇතුළේ නැහැ. ඒ නිසා මුලින්ම එතුමාට එතුමාගේ පක්ෂය ඇතුළේ එක මතයක් තියාගන්න කියන්න. අතිගරු ජනාධිපතිතුමා මේ රටේ පරිසර හිතකාමී කෘෂි කර්මාන්තයක් ඇති කිරීම සඳහා කටයුතු කරගෙන යන අවස්ථාවේ, කෘෂිකර්ම ඇමතිවරයා හැටියට මාත්, රාජ්‍ය ඇමතිවරයාත්, ලේකම්වරයාත් එක මතයක සිටිමින් කටයුතු කරනවාය කියන එක සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට නැනෝ නයිට්‍රජන් පොහොර ආනයනය කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබුණා. එහි ගනු දෙනුවක් ගැන කථා කරලා තිබුණා. මුලින්ම කියන්නට ඕනෑ, චීනයෙන් ආනයනය කළ නයිට්‍රජන් පොහොරවල ප්‍රමිතිය පිළිබඳව ගැටලුවක් පැන නැඟීමත් සමගම අපි චීනයෙන් නයිට්‍රජන් පොහොර ආනයනය කිරීම අත්හිටවපු බව. ඒ සමගම අපි මහ කන්නයට මුහුණ දුන් නිසා, වගාව සඳහා අවශ්‍ය නයිට්‍රජන් වර්ගයේ පොහොර වර්ගයක් ආනයනය කරන්න අපට සිද්ධ වුණා. ඒ සඳහා ඉන්දියාවෙන් ආනයනය කළ හැකි පොහොර වර්ග කිහිපයක් පිළිබඳව විස්තර පොහොර ලේකම් කාර්යාලයට ලැබී තිබුණා. ඒවායින් හොඳම පොහොර වර්ගය හැටියට නැනෝ නයිට්‍රජන් පොහොර වර්ගය හඳුනා ගැනීම නිසායි එම පොහොර වර්ගය ගෙන ඒම සඳහා කටයුතු කරන්න යෙදුණේ. එම පොහොර වර්ගය ගෙන්වීම සඳහා, අපි රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අවශ්‍ය ටෙන්ඩර් කැඳවලා, ඇගැයීම් කමිටුවලට ලක් කරලා, ඒ මිල ගණන් කැඳවලා -ඒ සියලු කටයුතු කරලා- කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ඒවා ආනයනය කරන්න කටයුතු කිරීමේදී, ආනයනය කිරීමට නියමිත නයිට්‍රජන් පොහොරවල මිල අධිකයි කියලා අපට දැනගන්න ලැබුණා. අපට ඒක දැනගන්න ලැබුණේත් බැංකුවෙන් ලද ලිපියක් අනුවයි. ඒ අනුව, මම ඒ පිළිබඳව ජනාධිපතිතුමාත් සමඟ කථා කරලා, ජනාධිපති ලේකම් කාර්යාලයේ වෙනම රැස්වීමක් කැඳවලා, ජනාධිපති ලේකම්තුමාත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, අපේ රාජ්‍ය අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාත්, පොහොර ලේකම් කාර්යාලයේ ලේකම්තුමා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා යන ඒ සියලුදෙනා එක මේසයේ ඉඳගෙන අදාළ ආනයනකරුවා ගෙන්වලා අපි කිව්වා, "ඔබගේ මිල ඉතාම ඉහළයි, එම නිසා ඒ මිලට අපට ගන්න බැහැ, මිල අඩු නොවුණොත් අපි ඒවා වෙනම ආනයනය කරන්න කටයුතු කරනවා" කියලා. ඒ අනුව, ඇමෙරිකන් ඩොලර් 2.5කින් ඔහුගේ මිල අඩු කෙරෙව්වා. ඒ විධියට ඩොලර් 2.5කින් මිල අඩු කළ නිසා, යූඑස් ඩොලර් මිලියන 5.2ක් අපට එම ගනු දෙනුවෙන් ඉතුරු කර ගන්න පුළුවන් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ඒ ආනයනකරුවාට ගෙවන මුදලින් රුපියල් බිලියන 1.7ක් ඉතිරි කර ගන්න අපට පුළුවන් වුණා.

අපි ඔහු සමඟ කර තිබෙන ගනුදෙනුව ඒකයි. ඒ තමයි, ඔහුගේ මිල අඩු කරන්න කටයුතු කිරීම. තමුන්නාන්සේලාට නැනෝ නයිට්‍රජන් පිළිබඳ කුමන හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ පිළිබඳව ඇමතිවරයාට හෝ රාජ්‍ය ඇමතිවරයාට ඇඟිල්ල දික් කරලා වැඩක් නැහැ. ඒවා ගෙන්වීමට රාජ්‍ය අමාත්‍යාංශය ටෙන්ඩර් පටිපාටියක් කැඳවා තිබෙනවා. ඒ සඳහා වෙනම ටෙන්ඩර් කමිටුවක් තිබෙනවා. ඔබතුමන්ලාට ඕනෑ නම්, ඒ අය COPE එකට කැඳවන්න පුළුවන්. කැඳවා ප්‍රශ්න කරන්න පුළුවන්. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේත් ඕනෑම දෙයක් කරන්න පුළුවන්. මගේ අමාත්‍යාංශය යටතේ යම් දූෂණයක් සිදු වෙලා තිබෙනවා නම්, තමුන්නාන්සේලා කියන්න. ඕනෑම ප්‍රසිද්ධ විවාදයකට මමත්, මගේ රාජ්‍ය ඇමතිතුමාත් එන්නම්. ඔබතුමන්ලා ඕනෑම තොරතුරක් අරගෙන එන්න. අපි ඒ ගැන කථා කරන්න ලෑස්තියි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ දූෂණයට ඉඩක් නැහැ. මම මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා මුලින්ම කළේ රසායනික පොහොර ආනයනය කිරීමේ වැරැද්ද කරපු අය ගෙදර යැවීමයි. වී අලෙවි මණ්ඩලයේ හොරකම් කරපු අය අපි ගෙදර යැව්වා. අපි

එතැනින් තමයි පටන් ගත්තේ. ඒකට තමයි අපට ජනවරම දුන්නේ. ඒ නිසා මේ ඕනෑම පොහොර වර්ගයක් ආනයනය කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලාට යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් කියන්න. ඒවාට උත්තර දෙන්න අපි ලෑස්තියි.

අපි චීන පොහොර ආනයනය කළා. දැන් අපේ මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා, ඒකට සල්ලි ගෙවන්න යනවා කියලා. අපි කිව්වේ LC regulations අනුව අපි ඒ මුදල ගෙවන්න බැඳී සිටින බවයි. හැබැයි, අපි උසාවියට ගිහිල්ලා ඒක නවත්ත ගත්තා. ඒ නවත්තා ගත්තේ අපට අවශ්‍ය ප්‍රමිතිය නැති නිසා. ඒ ගැන අපි පැහැදිලිව කියන්න ඕනෑ. අපි කිව්වා, "ඒ පොහොර රට තුළට ගන්නේ නැහැ" කියලා. ඒ නිසා අපි ඒ සමාගමට කියා තිබෙනවා, ආපහු ගිහිල්ලා නීත්‍යානුකූල බලපත්‍රයක් අරගෙන නැවත රැගෙන එන්න කියලා. ඒ නිසා ඔබතුමන්ලාට කියන්න ඕනෑ, ඔබතුමන්ලා එල්ල කරපු චෝදනා ගැන මගේ කථාවේදී මම පැහැදිලි කරන බව.

මෙවර අය වැය ඉදිරිපත් කිරීමේදී මුදල් ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමුවුණේ යැපුම් ආනයන ආර්ථිකයෙන් මිදී නිෂ්පාදන ආර්ථිකයක් කරා යෑමටයි. එතුමා බලාපොරොත්තු වෙනවා, ආනයනය කරන අල ටික, ලූනු ටික, මිරිස් ටික, කිරි පිටි ටික මේ රටේම නිෂ්පාදනය කරන්න. ඒක තමයි රජයේ බලාපොරොත්තුව. ඒ අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට අපේ රටට අවශ්‍ය අල, ලූනු, මිරිස් ටික නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. 2024 වසර වන විට මේ සියල්ල මේ රට තුළ නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරලා ඉවරයි. ආහාර ආනයනය කිරීම සඳහා අපි විශාල වශයෙන් මුදල් පිට රටට යවනවා. ඒ නිසා අපේ බලාපොරොත්තුව ආහාර නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්නයි. ගරු මුදල් ඇමතිතුමා ඒ සඳහා අපට ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ නිසා වැඩිම වියදමක් දරන අල, ලූනු, මිරිස් සියල්ල මේ රට තුළ වගා කරන්න පමණක් නොවෙයි, අපි ආනයනය කරන බීජ ටිකත් මේ රටේ නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ එතුමා අපට භාර දීලා තිබෙනවා. ඒ අනුව, ඒ සියල්ල කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා.

ප්‍රාදේශීය සංවර්ධනයටත් එතුමා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේක විපක්ෂයේ මන්ත්‍රීවරු විහිළුවකට ගන්නවා. දැන් මම අහන්නේ මේකයි. වැවක් හදන්නේ නැතිව අපි කෘෂි කර්මාන්තය කරන්නේ කොහොමද? අපේ පැත්තේ ගම්වල පාරවල් ඉතා දුෂ්කරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන ආසනයේත් කුඩා තේ වතු හිමියෝ ඉන්නවා. ඒ කුඩා තේ වතුවලට යන්න පාරක් තිබුණේ නැහැ. දළු ටික කඩලා ඔළුවේ තියාගෙන පාරට ගේන්න ඕනෑ. ඒ දළුවලට නිසි මිලකුත් නැහැ. ගමේ පාර හදලා, පාරට කොන්ක්‍රීට් දැම්මාම, දළු ලොරිය කුඩා තේ වතු හිමියාගේ ගේ ළඟට යනවා. එතකොට දළුවලට හොඳ මිලක් ලැබෙනවා. ඒ නිසා ප්‍රාදේශීය සංවර්ධනය අවශ්‍යයි. පාරවල් හැදෙන්න ඕනෑ; වතුර දෙන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව අනුව සියලුදෙනාට 2025 වසර වන විට පානීය ජලය දෙන්න, කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග කාපට් කරන්න යනාදී මේ සියලු ව්‍යාපෘතිවලින් ප්‍රාදේශීය මට්ටමේ විශාල සංවර්ධනයක් වෙනවා. මේවා පිළිබඳව විපක්ෂයට විවේචනය කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ විවේචනයට ලක් වෙච්ච අනික් කාරණාත් අපි දැක්කා. තමුන්නාන්සේලා බඩු මිල ගැන කථා කළා. අද වන විට එළවලු මිල ඉතා අධික ලෙස වැඩි වෙලා තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඇයි, එළවලු මිල වැඩි වෙලා තිබෙන්නේ? අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ, සාමාන්‍යයෙන් අවුරුද්දක නොවැම්බර්, දෙසැම්බර් මාස කියන්නේ එළවලු මිල වැඩි වෙන කාලයක් බව. නොවැම්බර්, දෙසැම්බර් මාසවල විතරක් නොවෙයි, පසුගිය මාස තුනේදීම අධික වර්ෂාපතනයකට අපි මුහුණ දුන් බව ඔබතුමන්ලාත් දන්නවා. අද මම නුවරඑළිය දිසාපතිතුමාගෙන් වර්ෂාපතනය සම්බන්ධයෙන් වාර්තාවක් ගත්තා. මේ දවස් 22න් දවස් 20ක් වැහැලා දවස් 2යි පායලා තිබෙන්නේ. ඒ නිසා මේ නොවැම්බර්, දෙසැම්බර් මාසවලදී සාමාන්‍යයෙන් එළවලු මිල ඉහළ යනවාට අමතරව මේ ධාරානිපාත වර්ෂාව නිසාත් එළවලු ගොවීන්ට විශාල හානියක් සිද්ධ වුණා. පුත්තලමේ වගා බිම් සම්පූර්ණයෙන් යට වුණා. මේ සියල්ල එක්ක එළවලු මිල වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි අල, ලූනු, මිරිස් යනාදී මේ සියල්ල ආනයනය කරනකොට විශාල බද්දක් ගහනවා. අද freight charges වැඩි වෙලා. ඒ නිසා මේක ලංකාවේ පමණක් සිදු වන දෙයක් නොවෙයි. ඔබතුමන්ලා BBC News බැලුවොත් පෙනෙනවා, මුළු ලෝකයේම -හැම රටකම- දශක ගණනාවකට පස්සේ වැඩිම භාණ්ඩ මිල මේ කාලයේ තිබෙන බව. ඒ පිළිබඳව වාර්තාවල සඳහන් වෙනවා. ඒක අපේ රටට පමණක් සීමා වෙච්ච දෙයක් නොවෙයි.

ඊළඟට ඔබතුමන්ලා කථා කරනවා, මේ ආණ්ඩුව බොහෝ ආයතන පෞද්ගලීකරණය කරනවා කියලා.

තමුන්නාන්සේලා වාගේ අපි පෞද්ගලීකරණයට ගිහිල්ලා නැහැ. රටකට මහා පරිමාණ ව්‍යාපෘතිවලට විදේශ ආයෝජන අවශ්‍යයි. ඒවා නැතිව අපට ඉදිරියට යන්න බැහැ. ඔබතුමන්ලාගේ කාලයේ හම්බන්තොට වරාය විකුණපු හැටි අපි දැක්කා. අර්ජුන රණතුංග ඇමතිවරයා දන්නේත් නැහැ, හම්බන්තොට වරාය විකුණන එක ගැන. එදා හිටපු අගමැතිවරයාට ඕනෑ විධියට කැබිනට් මණ්ඩලය පත් කරගෙන හම්බන්තොට වරාය වික්කා. එය හදන්න ගිය ඩොලර් බිලියන 1.3 ගෙව්වේ නැහැ. අක්කර 100ක් නිකම් දුන්නා. රුපියල් බිලියන ගණනාවක වංචාවක් වුණා. මීට අදාළව හොංකොං බැංකුවක් සමඟ මුදල් ගනුදෙනු වුණා. හම්බන්තොට වරාය විකුණනකොට මේ රටට වුණු අපරාධය ගැන එදා කැබිනට් මණ්ඩලයේදී කවුරුත් කථා කළේ නැහැ. ශ්‍රීලන්කන් ගුවන් සමාගමට ගුවන් යානා මිලදී ගැනීම හා සම්බන්ධ ගිවිසුම් අවලංගු කරලා සිදු වූ මහා වංචා පිළිබඳව තමුන්නාන්සේලාට මතක ඇති. ඒවා තමුන්නාන්සේලා කළ කටයුතු. ආණ්ඩුවක් හැටියට අපි රටේ මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා නම්, අපට විදේශ ආයෝජන නැතිව බැහැ. හැබැයි, අපි ඒක රටට හිතකර විධියට කරනවා. තමුන්නාන්සේලා වාගේ අමුවට විකුණන්නේ නැතිව, ඇමතිවරයා bypass කරලා යන්නේ නැතිව, තුට්ටු දෙකට -කුණුකොල්ලෙට- විකුණන්නේ නැතිව ඉතාම සාධාරණ ලෙස ඒ කටයුතු සිදු කර තිබෙනවා කියලා තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ.

ඔබතුමන්ලා පරිසර හිතකාමී කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කළා. අද අපේ මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා ලු, මහින්දානන්ද මහත්තයාගේ මොකක්ද ගැලවිලා කියලා. මගේ කිසිම දෙයක් ගැලවෙන්නේ නැහැ, ගලවන්නත් බැහැ, මරික්කාර් මහත්තයෝ. *[බාධා කිරීමක්]* ඔබතුමා හිතනවා ඇති, ගලවා අවසන් කියලා. ඔබතුමන්ලා හරි කැමැති ඇති, ගලවන්නත්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HESHA WITHA*NAGE left the Chair, and* THE HON. SANJEEVA EDIRIMANNA *took the Chair.*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බැඳුම්කර වංචාවෙන් සල්ලි ගන්නකොට, ඒ cheques මාරු කරනකොට, ඒවායෙන් ගනුදෙනු කරනකොට තමයි කාගෙ කාගේත් රෙදි ගැලවුණේ.

අපේ රජය තීන්දුවක් ගත්තා, පරිසර හිතකාමී කෘෂි කර්මාන්තයට යන්න. කෘෂිකර්ම ඇමතිවරයා හැටියට මම ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. මමයි, විෂය භාර ඇමතිවරයා. එහි අභියෝග තිබෙනවා. එහි අමාරුකම් තිබෙනවා. නමුත්, අමාත්‍යවරයා හැටියට මම ඒ අභියෝගය භාර ගත්තා. ඒ ගමන යන අතරතුර යම් යම් අඩුපාඩුකම් වුණා නම්, අපි ඒවා වෙනස් කරන්න කටයුතු කළා. වැවිලි ඇමතිතුමා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ගැටලු ගැන කිව්වාම ජනාධිපතිතුමා ඒ තීන්දුව වෙනස් කළා. ඒකෙන් අදහස් කරන්නේ රෙදි ගලවනවා කියන එක නොවෙයි. ඔබතුමන්ලා කැමැති ඇති, මේ තීරණයේම ඉඳලා තේ කර්මාන්තය කඩා වැටෙනවා නම්. රජය යම් යම් අවස්ථාවලදී අවශ්‍ය සංශෝධන කරනවා. අපට ඒවාට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ඔබතුමන්ලා පාස්කු ප්‍රහාරය ගැන හැම දාම විවේචනය කරනවා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මේ සභාවේ සිටිනවා. ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟව කථා කළොත්, පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ 2019 අප්‍රේල් මාසයේ. එතකොට තිබුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. මාස ගණනක් තිස්සේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය අපට මතකයි. පාර්ලිමේන්තුව ඇතුළේ ජෝගි නැටුවා. වෙනම කමිටු පවත්වා සියලු දේ කළා. හැබැයි, ඔබතුමන්ලා මතක තබාගන්න, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙලා තමයි පාස්කු ප්‍රහාරය වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කළේ, අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගත්තේ කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු රිසාඩ් බදියුදීන් ඇමතිවරයා ඇතුළු ඔබතුමන්ලාගේ ආණ්ඩුව වෙනුවෙන් කටයුතු කළ මිනිස්සු ගණනාවක් අපි අත්අඩංගුවට ගත්තා. අද වනකොට ඒ ගැන විශේෂ අධිකරණයේ නඩු දමා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණා නම්, අද වනකොට පාස්කු ප්‍රහාරයට සම්බන්ධ කිසිම වූදිතයෙක් නැහැ; කිසි කෙනෙක් නැහැ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණු නිසා තමයි පාස්කු ප්‍රහාරය වෙනුවෙන් කිතුනු බැතිමතුන්ට සාධාරණයක් වුණේ කියන එක මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. අද බැලුවාම, මේ පාස්කු ප්‍රහාරයත් කරලා තිබෙන්නේ අපි ලු. පාස්කු ප්‍රහාරය සැලසුම් කරලා තිබෙන්නේ අපි ලු, ඒකෙන් බලයට පත්වෙලා තිබෙන්නේ අපි ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාලන සමයේද ඒක වුණේ? එතුමන්ලා කථා කරන්නේ හරියට පාස්කු ප්‍රහාරයෙන් අපි බලයට පැමිණියා වාගේයි. මතක තියාගන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ආරක්ෂක අමාත්‍යාංශය කොහොමද කටයුතු කළේ කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේ ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ කොහොමද? පාස්කු ප්‍රහාර සිද්ධියේදී තමුන්නාන්සේලාගේ බුද්ධි අංශ කටයුතු කරපු ආකාරය, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කටයුතු කරපු ආකාරය අපට මතකයි. ඒ නිසා ඔබතුමන්ලා හොඳට මතක තියාගන්න. මාස 8ක කාලයක් තුළ තමුන්නාන්සේලා පාස්කු ප්‍රහාරය පිළිබඳ කරුණු මෙහෙය වූ ආකාරය අපට මතකයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව ස්ථාවර නියෝග 86 යටතේ මේ කාරණය මා අහනවා. ගරු ඇමතිතුමනි, ජනාධිපතිතුමා අද උදේ 10.00ට සාකච්ඡාවක් පවත්වා තිබෙනවා, මේ පොහොර සම්බන්ධව. පොහොර ගේන්න තමයි ඒකෙන් යෝජනා වෙලා තිබෙන්නේ. දැන් handphone එකට news alert එකකුත් ආවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා නේ ලේකම්තුමාත්, ඇමතිතුමාත් එක මතයේ ඉන්නවා කියලා. නමුත්, අද ජනාධිපතිතුමා තීන්දු කරලා තිබෙනවා නැවත පොහොර ගේනවා කියලා. ඒ පිළිබඳව ඔබතුමාට තොරතුරක් කියන්න පුළුවන්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, වී වගාව සඳහා රසායනික පොහොර ආනයනය කරන්න අද උදේ 10.00ට තිබූ රැස්වීමේදී කිසිදු තීන්දුවක් ගත්තේ නැහැ. එතැනදී මේ අධික වර්ෂාව නිසා දැඩි හානියට ලක් වූ එළවලු වගාව වෙනුවෙන් විශේෂිත පොහොර වර්ගයක් ආනයනය කිරීම පිළිබඳව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ට අවසරය දුන්නා. ඒ හැරෙන්න - *[බාධා කිරීමක්]* ඔව්. කිසිවක් ගේන්න කටයුතු කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියාගෙන ආවේ පාස්කු ප්‍රහාර සිද්ධිය ගැන පමණක් නොවෙයි. විපක්ෂයේ තමුන්නාන්සේලා කථා කරලා ආණ්ඩුවේ එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරලා දූෂණ අක්‍රමිකතා ගැන කියනවා. ඔබතුමන්ලාට මතක ඇති, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ කරපු දේවල්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලාගේ ඇමතිවරු කරපු දේවල්. තමුන්නාසේලාට මතක ඇති, වී අලෙවි මණ්ඩලයේ වී ටික විකුණලා කරපු දේවල්. තමුන්නාන්සේලාට මතක ඇති, අභිංසක විදේශ ශ්‍රමිකයන්ගේ රක්ෂණයෙන් කරපු දේවල්. තමුන්නාන්සේලාට මතක ඇති, වාහන එකලස් කරලා කරපු දේවල්. තමුන්නාන්සේලාට මතක ඇති, බැඳුම්කර සිද්ධියේදී කරපු දේවල්. ඒ විතරක් නොවෙයි, මහපොළ අරමුදල වැනි ආයතන ගණනාවක් ගැන අපට කියන්න පුළුවන්. මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගැන කියන්න පුළුවන්. වෙන මොකුත් ඕනෑ නැහැ, විජේසිරි මන්ත්‍රීතුමා, ලජ්ජයි කියන්න. ඇමතිවරයාගේ දුව දලු කිලෝ එකෙන් රුපියල් 20ක් ගත්තා. දලු කිලෝ එකෙන් රුපියල් 20ක් ගත්ත ආණ්ඩුවක්. තමුන්නාන්සේලා ඒ තත්ත්වයට පත් වුණා. ඒ තරමට වැවිලි කර්මාන්ත ඇමතිවරයා පත් වුණා. දලු ටික වික්කේ එහෙම. ටෙන්ඩර් කළේ නැහැ. එදා ඔබතුමන්ලා රුපියල් 65ට

විකුණපු එක -*[බාධා කිරීමක්]* බැලුවාට වැඩක් නැහැ, කථා කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, ඔබතුමාට ඕනෑ නම් මම කියන්නම්. හන්තානේ අක්කර සීයක් නෝනාට ලියා ගත්තා; අයිතියක් නැහැ. දැන් LRC එකෙන් ඒ ඔක්කෝම අහුවෙලා තිබෙනවා. ඒ ඉඩමේ හිමිකාරියක් හැටියට ශාමින් කිරිඇල්ල අහුවෙලා නැහැ. හැබැයි, අනුර දිසානායක මන්ත්‍රීතුමනි, නෝනාට අක්කර 100ක් ලියාගෙන තිබෙනවා. තව ටික දවසකින් ඒ සියලු තොරතුරු ලබා දෙන්න අපි කටයුතු කරනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට කියන්න ඕනෑ, කිසිදු අයිතියක් නැහැ බිරිඳට ඒ ඉඩම ලබා ගන්න, LRC එකෙන්. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, මම වගකීමෙන් ඔබතුමාට කියනවා. LRC එකෙන් ලියුමක් දෙනවා, ඇය මේ ඉඩමට හිමිකාරියක් නොවෙයි කියලා. ඒ හිමිකාරියක් නොවෙයි කියන ඉඩමට- විෂය භාර ඇමතිවරයා හැටියට ඉන්නකොට තමන්ගේ බිරිඳට අක්කර 100ක් ලියලා දෙනවා. මේ තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කටයුතු කරපු ආකාරය. ඒ විතරක් නොවෙයි, කබීර් හෂීම් ඇමතිතුමා කලින් හිටපු වැවිලි කර්මාන්ත ඇමති, තමන්ගේ බෑනාට හන්තානේ බංගලාව නිකම් දෙනවා. තමන්ගේ බෑනාට හන්තානේ බංගලාව නිකම් දෙනවා. ඒවා මතක තියා ගන්න. අද හෝටල් හදාගෙන මහා පරිමාණයෙන් කටයුතු කරනවා. හන්තානේ බංගලාව බෑනාට නිකම් ලියලා දෙනවා. නෝනාට අක්කර 100ක් නිකම් ලියලා දෙනවා. ඒ තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කටයුතු කරපු ආකාරය.

අද තමුන්නාන්සේලා කථා කරනවා මේ ආණ්ඩුට තිබෙන චෝදනා පිළිබඳව. ඔබතුමන්ලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට විරුද්ධව විවිධ විධියට කථා කරනවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ශත පහක වංචාවක් කළා කියලා, වැලි ඇටයක වංචාවක් කළා කියලා පුළුවන් නම් තමුන්නාන්සේලා ඔප්පු කරන්න. මම එදාත්, අදත්, හැමදාම කියනවා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා දූෂණ වංචාවකට සම්බන්ධයි කිව්වොත්, එතුමා වෙනුවෙන් මහින්දානන්ද අලුත්ගමගේ දේශපාලනයෙන් අයින් වෙනවා කියලා. එතුමාට ඡන්දය දුන්නේ, ජන වරම දුන්නේ ඒකට නොවෙයි. ඒ නිසා මේ ආණ්ඩුව එතැන නැහැ. තමුන්නාන්සේලා උත්සාහ කරනවා, විවිධ චෝදනා එල්ල කරන්න; තමුන්නාන්සේලා උත්සාහ කරනවා විවිධ දේවල් දාන්න. නමුත් ඔබතුමන්ලාට පුළුවන් මේ ආණ්ඩුව ඇතුළේ සිදුවන ඕනෑම කටයුත්තක් ගැන ඕනෑම අමාත්‍යාංශයක් කෝප් කමිටුවට කැඳවන්න. ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැවති කාලයේ අපට එහෙම කැඳවන්න බැහැ. හැබැයි, ඔබතුමන්ලා අපේ ඕනෑම අමාත්‍යාංශයක් කෝප් කමිටුවට කැඳවන්න. ඒ වාගේම ඔබතුමන්ලා ඕනෑම අමාත්‍යාංශයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කැඳවන්න. ඔබතුමන්ලා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ඕනෑම තොරතුරක් ගන්න. එහෙම තොරතුරු අරගෙන, හොයලා බලලා ඇමතිවරයෙක්, රාජ්‍ය ඇමතිවරයෙක් එහෙම නැත්නම් ආණ්ඩුව මැදිහත් වෙලා යම් වරදක් කරලා තිබෙනවා කියලා තමුන්නාන්සේලාට ඔප්පු කරන්න පුළුවන් නම් තමුන්නාන්සේලා ඒ කටයුත්ත කරන්න.

තමුන්නාන්සේලා වර්තමානයේ පොහොර ගැන කථා කරනවා. පොහොරවල ප්‍රමිතිය ගැන කථා කරනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ පොහොර ගෙනාපු හැටි අපි දැක්කා. 2015-2020 කාලයේ කොහොමද පොහොර ගෙනාවේ? ඇමතිගේ කාමරයේදී lab reports වෙනස් කළේ. බිලියන 7ක හොර පොහොර එළියට දැම්මා; lab reports වෙනස් කළා. මහින්දානන්ද අලුත්ගමගේටත් තිබුණා, චීනයෙන් ආ පොහොරවල lab reports වෙනස් කරන්න. මටත් තිබුණා, lab reports වෙනස් කරලා නැව රට ඇතුළට ගන්න. හැබැයි, අපි ඒක කරන්න දුන්නේ නැහැ. අපි ප්‍රමිතියෙන් තොර පොහොර ගේන්න ඉඩ දුන්නේ නැහැ.

විගණකාධිපතිවරයා කියනවා, තමුන්නාන්සේලා හැම අවුරුද්දකම lab reports වෙනස් කරලා ප්‍රමිතියෙන් යුක්ත නැති පොහොර ගොවියාට බෙදුවා කියලා. හැබැයි අපි එහෙම කරලා නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට අපට අද අභියෝගයක් තිබෙනවා. ජනාධිපතිතුමා අපට භාරදීලා තිබෙනවා, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ඇති කරන්න. ඔබතුමන්ලා කියනවා, රටේ ආහාර හිඟයක් ඇති වෙයි කියලා. ඔබතුමන්ලා භූතයෙක් මවන්න හදනවා, රටේ ආහාර හිඟයක් ඇති වෙයි කියලා. අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ රටේ ආහාර හිඟයක් ඇති වෙන්නේ නැති බව. පසුගිය යල කන්නයේ අපි හෙක්ටෙයාර ලක්ෂ පහක් වගා කළා. මේ මහ කන්නයේ අපි වගා කරනවා, හෙක්ටයාර ලක්ෂ අටක්. අද ගොවියා හෙක්ටෙයාර ලක්ෂ හයහමාරක් වගා කරලා ඉවරයි.

අනෙක් හෙක්ටෙයාර් ලක්ෂ එකහමාරත් තව මාසයක් යනකොට වගා කරලා ඉවරයි. 2021දී අපි යල සහ මහ කන්නයේදී හෙක්ටෙයාර් ලක්ෂ 13ක් වගා කරනවා. හෙක්ටෙයාර් ලක්ෂ 13ක් වී වගා කරනවා කියන්නේ මතක තියා ගන්න, වී මෙට්‍රික්ටොන් මිලියන 5.3ක් අපි නිෂ්පාදනය කරනවා කියන එකයි. ඒක හාල්වලට පරිවර්තනය කළාම හාල් මෙට්‍රික්ටොන් මිලියන 3.4යි. අපේ රටේ මාසික අවශ්‍යතාව කිලෝග්‍රෑම් 195,000යි. ඒ කියන්නේ, ලබන අවුරුද්දටම අපට අවශ්‍ය වෙන්නේ සහල් මෙට්‍රික්ටොන් මිලියන 2.3යි. නමුත්, අපට හාල් මෙට්‍රික්ටොන් මිලියන 3.4ක් තිබෙනවා. අපි මේ මහ කන්නයේ තවම ගොයම් හදනවා විතරයි. මේ මහ කන්නයේ හෙක්ටෙයාර් ලක්ෂ 8ක් අපි වගා කරලා තිබෙනවා. හෙක්ටෙයාරයකින් වී මෙට්‍රික්ටොන් 4.5ක් ගත්තා කියමු. කාබනික කියලා කියන නිසා හෙක්ටයාරයකින් වී මෙට්‍රික්ටොන් 4යි ලැබෙන්නේ කියලා හියමු. ඒත්, මෙට්‍රික්ටොන් මිලියන 3කට ටිකක් වැඩි ප්‍රමාණයක් අපි වී නිෂ්පාදනය කරනවා. ඒ අනුව, හාල් මෙට්‍රික්ටොන් මිලියන 2ක් පමණ අපට ලැබෙනවා. මේ යල කන්නයේ හාල් අපට පෙබරවාරි වෙනකම් තිබෙනවා. අපි පෙබරවාරියේ ගොයම් කපනවා කියන්නේ හාල් මෙට්‍රික්ටොන් ලක්ෂ 2ක් විතර ලැබෙනවා කියන එකයි. ඒ කියන්නේ 2022 ඉදිරි මාස 10ටම අපට හාල් තිබෙනවා. ඒ නිසා අපේ රටට හාල් හිඟයක් ඇති වෙන්නේ නැහැ. ඔබතුමන්ලා අනියත බියක් ඇති කරන්න හදනවා, මිනිස්සුන්ට කන්න නැතිවෙයි කියලා. දැන් ගිහිල්ලා බලන්න. පොහොර නැහැ කියලා ඔබතුමන්ලා ගොවියෝ පාරට දැම්මා. වගා කරන්න ගොවීන්ට ගොවි බිමට යන්න එපා කිව්වා. අද ගොවියා ගොවි බිමට ගිහිල්ලා හෙක්ටෙයාර් 650,000ක් වගා කරලා තිබෙනවා. ඉදිරි මාසයේදී අපි හෙක්ටෙයාර් ලක්ෂ 8ම වගා කරන්න කටයුතු කරනවා. ඒ නිසා ආහාර හිඟයක් ඇති වෙයි කියලා ඔබතුමන්ලා අනියත බියක් හැදුවාට, කිසිදු ආහාර හිඟයක් ඇති වෙන්නේ නැහැ කියන එක මේ අවස්ථාවේදී මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කිව්වා, අපේ රටේ ආහාර හිඟයක් ඇති වෙන්නේ නැහැ කියලා. මේ වන විට අපේ රටේ කන බොන

[ගරු මනුෂ නානායක්කාර මහතා]

දේවල්වල මිල අහස උසට නැඟලා තිබෙන්නේ. මේ ඇතිවෙලා තිබෙන තත්ත්වයත් එක්ක වගා කරපු ගොවියෝ වගා නොකර ඉන්නකොට ලබන මාර්තු මාසය වෙනකොට අපේ රටේ අනිවාර්යයෙන්ම ආහාර හිඟයක් ඇති වෙනවා. එතුමා ලංකාවට හාල් ඇටයක්වත් ගේන්නේ නැහැ කියලා පොරොන්දු වෙච්ච ඇමතිතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ නම කියපු නිසායි මම මේ කථා කරන්නේ. එහෙම නැතිව ඔබතුමාට බාධා කරනවා නොවෙයි. මගේ කථාව ඔබතුමා අහගෙන හිටියා නම් තේරෙයි, මේ රටේ ආහාර හිඟයක් ඇති නොවන බව. ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන සහිතව මම මේ ගරු සභාවට කිව්වා. ඒ නිසා ඒ වගකීම මම බාර ගන්නවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, ආයෙත් ඔබතුමාගේ නම කිව්වා කියලා නැඟිටින්න එපා. ඔබතුමා කිව්වා, "මේ රටට හාල් ඇටයක් මම ගේන්න දෙන්නේ නැහැ. මම සහතික වෙනවා. මම ඇමතිකමෙන් ඉල්ලා අස් වෙනවා." කියලා. එහෙම කිව්වත්ත් මේ රටට හාල් ගෙනාවා. එහෙම නම් ඉතින් තවත් මේවා ගැන කථා කරන්න එපා. මේ ඇතිවෙලා තිබෙන තත්ත්වයත් එක්ක මාර්තු වෙනකොට රටේ නියත වශයෙන්ම ආහාර හිඟයක් ඇති වෙනවා. ඒකට මුහුණ දෙන්න සූදානම් වෙන්න. එහෙම නැත්නම් ඇයි අද මිනිස්සු පෝලිම් ගැහිලා ඉන්නේ? එහෙම නම් ඇයි කිරි පිටිවලට පෝලිම්, ඇයි ගෑස්වලට පෝලිම්, ඇයි හැම එකකටම පෝලිම් හැදිලා තිබෙන්නේ? මේකට උත්තර දෙන්න. මේක තමයි යථාර්ථය; මේක තමයි අපට තේරෙන දේ.

අය වැය ගැන කථා කරනකොට පාස්කු ප්‍රහාරය ගැන කථා කළා. අපි පාස්කු ප්‍රහාරය ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉදිරිපත් කරපු කරුණුවලට තවම උත්තර නැහැ. කවුද "සොනික්" කියන්නේ ඇහුවාම තවම උත්තර නැහැ. හැබැයි, ඒවාට බයේ අපි ඉස්පිරිතාලේ ගිහිල්ලාවත්, හැංගිලාවත් නැහැ. ඒවාවලට අපි සෘජුව මුහුණ දීලා තිබෙනවා. හැබැයි, ඇත්ත වහන්න, කටවල් වහන්න, හිරේ දාන්න හදනකොට ඒවායින් බේරෙන්න ඕනෑ කරන දේවල් අපි කරනවා. හැබැයි, අපි බොරුවට හිරේ දාන්නයි උත්සාහ කරන්නේ. එදා 2015 යහ පාලන ආණ්ඩුව ආවාම හොරු අල්ලන්න උත්සාහ කළා. එතකොට, නොයෙක් නොයෙක් විධියට පළිගැනීම් කරනවා කියලා චෝදනා කළා. අපේ මන්ත්‍රීතුමෙකුත් කිව්වා, පළිගන්න හදනවා කියලා. හැබැයි, තමන්ගේ අම්මාගේ, තාත්තාගේ සොහොන හදන්න ආණ්ඩුවේ සල්ලි හොරකම් කළා නම් ඒක හොරකමක් නොවෙයිද? මට එහෙම ලැයිස්තුවක් කියාගෙන යන්න පුළුවන්. අන්න ඒවා අල්ලන්න තමයි වැඩ කටයුතු කළේ. හැබැයි, එදා ඩීල් ආණ්ඩුවක් තිබුණේ. මේ අය මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක ඩීල් දාලා ඒවා යට ගහ ගත්තා. හැබැයි, යහ පාලන ආණ්ඩුව වාගේ නොවෙයි, සමඟි ජන බලවේගයේ ආණ්ඩුවක් ආවාම ඔය ඩීල් නැහැ; හැම හොරකමකටම නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා කියන එකත් අපි මේ වෙලාවේ සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාවක් තිබෙනවා නේ, වංසෙ කබල් ගානවා කියලා. තමන්ගේ අග හිඟකම් වසා ගන්න උත්සාහ කරන, ගරා වැටිච්ච වලව්වක කථාවකට තමයි, වංසෙ කබල් ගානවා කියන්නේ. අන්න ඒ වාගේ අය වැය කථාවක් තමයි අපේ මුදල් ඇමතිතුමා මේ GR ආණ්ඩුවේ අය වැය ලේඛනය හැටියට පැය දෙකහමාරක් විතර බොහොම අමාරුවෙන් ඉදිරිපත් කළේ. මොකක්ද "GR ආණ්ඩුව" කියන්නේ? "GR ආණ්ඩුව" කියන්නේ, "Gazette Reverse ආණ්ඩුවේ" අය වැය කියන එකයි. "Gazette Reverse ආණ්ඩුවේ" අය වැය තමයි බොහොම අමාරුවෙන් ඉදිරිපත් කළේ. අපි ඒකයි කියන්නේ, මේක "Gazette Reverse ආණ්ඩුව" කියලා; මේක "GR ආණ්ඩුව" නොවෙයි.

අග හිඟකම් වසා ගන්න බැසිල්-කබ්රාල් දූර්වල ආර්ථික කළමණාකරණය ලංකාව බංකොලොත් රාජ්‍යක් බවට පත් කරමින් තිබෙනවා. ඉතිහාසයේ ඉදිරිපත් කළ අවිනිශ්චිතම අය වැය මෙයයි. අමාත්‍යාංශවලට පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්න එපා කියනවා. මෙතෙක් කල් වාර්ෂිකව මුදල් අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කළත්, ඒක කාර්තුමය වශයෙන් තමයි දැන් වෙන් කරන්නේ. "එදා වේල වුවර්" අය වැයක් තමයි මේ වෙලාවේ කරගෙන යන්නේ කියන එක මම පැහැදිලිව සඳහන් කරනවා.

බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කලින්ම කිව්වා, "මරණ තුනක් ඇති මිනිසෙක් පැණි කැය" කියලා. දැන් මරණ තුනක් නොවෙයි, මරණ හයක්, හතක් එක්ක තමයි පැණි කන්නේ කියලා අපි කියනවා. ඉතුරු ටිකත් මරණ තමයි. නිෂ්පාදනය අඩු වෙලා, ආනයනය සීමා කරලා, පොහොර, ඖෂධ, ඉන්ධන ගෙන්වා ගන්න සීමා පනවලා රට බංකොලොත් තත්ත්වයට පත් කරගෙන යනවා. මේවා මුදල් ඇමතිවරයා බලහත්කාරයෙන් කරේ එල්ලා ගත්ත කාරණා කියලා අපි පැහැදිලිවම සඳහන් කරනවා. මේ ආර්ථික අර්බුදයට විසඳුමක්, මේ ආර්ථිකය හිරවෙලා තිබෙන තැනින් ගලවාගන්න විසඳුමක් මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා නැහැ කියලා ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයකු වන ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මැතිතුමා අද "Daily FT" පුවත් පතේ පළ කරපු වාර්තාව මේ වෙලාවේ මම **සභාගත*** කරනවා.

මේක කියෙව්වාම කරුණු ගොඩක් අවබෝධ කරගන්න පුළුවන්.

1977න් පස්සේ ලංකාවේ දළ ආර්ථික සංචිත ප්‍රමාණය වාගේම ශුද්ධ ආර්ථික සංචිත ප්‍රමාණය ප්‍රථම වතාවට සෘණ අගයක් ගන්නා තැනට පත් වෙලා තිබෙනවා. 1977ට ඉස්සෙල්ලා තමයි මේ වාගේ තත්ත්වයක් උදා වුණේ. මේක අගෝස්තු මාසය වන විට ඩොලර් මිලියන සෘණ 400ක් වුණා. ඊට පස්සේ ඒක සැප්තැම්බර් වන විට ඩොලර් මිලියන සෘණ 790ක් වුණා. දැන් වෙනකොට අපේ රටේ සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන 1,200 දක්වා සෘණ අගයකට ගන්න බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට පුළුවන් වුණා. මහ බැංකු වාර්තාවේ ඇතුළත් සටහනක් මේ වෙලාවේ මම **සභාගත*** කරනවා.

මහ බැංකුවේ සංචිත සෘණ අගයක් ගන්න පටන් ගත්තා. එතකොට විදේශ වත්කම් හදාගන්නේ නැතිව ඩොලරය පාලනය කරලා, බොහොම අමාරුවෙන් තියාගෙන ඉන්න එකත් එක්ක මේ ගොල්ලන් උත්සාහ කරනවා, දෙසැම්බර් මාසයේ වනතුරු මේක හිරකරගෙන ඉඳලා එතැනින් පස්සේ අත හරින්න. ඒ වනතුරු - දෙසැම්බර් වනතුරු- අපේ ශ්‍රේෂ පත්‍රය හොඳයි කියන්න තමයි කබ්රාල් මහත්මයලා, මුදල් ඇමතිතුමන්ලා උත්සාහ කරන්නේ. අද වනකොට රටට එන ඩොලර් ප්‍රමාණය එන්නේ නැහැ. අපේ විදේශගත ශ්‍රමිකයන්ගෙන් එන විදේශ ප්‍රේෂණ ටික අඩු වෙලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එහෙම අඩු වෙන්න ප්‍රධාන හේතුව තමයි, ඩොලර් එක හිරකරගෙන ඉඳීම. ඩොලර් එක හිරකරගෙන ඉන්නකොට උණ්ඩියල් ක්‍රමයට තමයි සල්ලි එවන්නේ. ඒ නිසා තමයි එන්න තිබෙන නිල ඩොලර් ප්‍රමාණයවත් රටට එන්නේ නැත්තේ. මේක තේරුම් ගන්න විධියක් නැහැ. හැබැයි, සූක්ෂ්ම, smart economics කරලා තමයි මේක සුද්ධ කරන්න හදන්නේ. හෙජින් ගනුදෙනුව කළා වාගේ, ග්‍රීක් බැඳුම්කර කළා වාගේ අමුතු ගේම් ගහලා 2012 දෙසැම්බර් 31වන දා රත්තරන් තොගය විකුණලා පළමුවෙනි දා නැවතත් සල්ලිවලට අරගෙන, මහ බැංකුව 2012 අවුරුද්දට ලාභ පෙන්වලා, 2013 ඉඳලා පාඩු ලැබුවා වාගේ වැඩ තමයි මේ සූදානම් කරලා තිබෙන්නේ කියලාත් මේ වෙලාවේ මම මතක් කරනවා.

ආනයන සීමා කිරීම හරහා මේ වන විට රටට ගන්න පුළුවන් විශාල ආදායම් ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රට තුළ ඇති භාණ්ඩ හිඟය නිසා කුට ව්‍යාපාරික ප්‍රජාවක් බිහි වෙලා ඉන්නවා; අතරමැදි ප්‍රජාවක් බිහි වෙලා ඉන්නවා. මේ සියල්ල එක්ක මේ රට නැවත වතාවක් 1970-77 යුගයට එළඹිලා තිබෙනවාය කියන එකත් මම මේ වෙලාවේ සඳහන් කරනවා.

දැන් මම මේ වෙලාවේ සඳහන් කරනවා, අලුත්ම gazette reverse එක ගැන. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, "එහෙම එකක් නැහැ" කියලා. "රසායනික පොහොර හෝ කෘෂි රසායන රජයේ සහනාධාර ලෙස කිසිවිටෙකත් ලබා නොදේය" කියලා ජනාධිපතිතුමා මීට පැය භාගයකට ඉස්සෙල්ලා ජනාධිපති කාර්යාලයේදී කිව්වා. ඔබතුමන්ලා බලයට ආවේ කොහොමද? රුපියල් 350ට පොහොර දෙන්නම් කියලා අයියා කිව්වාම, "නැහැ, 350ට නොවෙයි නිකම්ම පොහොර දෙන්නම්" කියලා ඡන්දය අරගෙන ඇවිල්ලා දැන් කියනවා, කිසිම සහනාධාරයක් දෙන්නේ නැහැ කියලා. ඒ gazette එක reverse. රසායනික පොහොර, කෘමිනාශක, දිලීර නාශක, වල්නාශක හැම එකක්ම ගෙන්වන්න අද අවසරය දීලා ඉවරයි. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා අද මෙතැන -පාර්ලිමේන්තුවේ- ඉන්නවා. අරගේ ජනාධිපති ලේකම් කාර්යාලය ඒ තීන්දුව අරගෙන ඉවරයි. අපි කියනවා, මේ ආණ්ඩුව කාලයෙන් කාලයට නාඩගම් නටනවා කියලා. *[බාධා කිරීමක්]* ඡන්ද කාලයට ගෙනාවා නයි නාඩගම, කොරෝනා එනකොට ගෙනාවා පැණි නාඩගම, දැන් ගෙනාවා කාබනික නාඩගම. නටපු නැටුමකුත් නැහැ, බෙරේ පලුවකුත් නැහැ.

දැන් KCl ගෙනෙනවා කියනවා. අසූචි නැව් ගෙනාවා, නැනෝ පොහොර ගෙනාවා. මේ හැම එකම ගෙනැල්ලා අද වෙනකොට මේවායෙන් කවුරු කවුරුත් හම්බ කර ගන්නවා. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට කෙළින් කියාගන්න බැරි වුණාට පොහොර ගෙන්වන ඇමතිවරයා මොකක්ද කළේ කියලා අපි දන්නවා. දැන් කියනවා, මේ ගෙන්වන්නේ "ශාක පෝෂක" කියලා. අපි කියනවා, ශාක පෝෂක නොවෙයි, මේ දවස් ටිකේ "ඝාටක පෝෂක" තමයි සිද්ධ වුණේ කියලා. *[බාධා කිරීමක්]* ඝාටක පෝෂක වුණේ. ඝාටකය තමයි හම්බ කර ගත්තේ කියලා අපි මේ වෙලාවේ සඳහන් කරනවා. මේ ළඟදී අනුරාධපුරයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන තැන්වලට ගිහිල්ලා ඒ තැන්වලින් - *[බාධා කිරීමක්]*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට ඒ කාරණය ගැන කියපු නිසා මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රසායනික පොහොර ආනයනය කිරීම සඳහා කිසිම නිවේදනයක් නිකුත් කරලා නැහැ; කිසිම ගැසට් එකක් නිකුත් කරලා නැහැ කියලා මම ඔබතුමාට කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
රසායනික පොහොර ගෙන්වන්නේ නැහැ කියලා ගහපු ගැසට් එක reverse කරලා නැද්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔබතුමා වගකීමෙන් කියනවාද රසායනික පොහොර ලංකාවට ගෙනෙන්නේ නැහැ කියලා? ශාක පෝෂක?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කිව්වා වී සඳහා කිසිදු රසායනික පොහොරක් ගෙනෙන්නේ නැහැ. ඔබතුමා මගේ කථාව අහගෙන හිටියේ නැහැ. වැස්ස නිසා පලිබෝධ නාශක ප්‍රමාණයක් පමණක් ගෙනෙන්න අවසර දුන්නා කියලා මම කිව්වා. ඒක තමයි කිව්වේ.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
දැන් යූරියා ගන්න වෙලා තිබෙන්නේත් රුපියල් 6,000ට; රුපියල් 10,000ට. ඒක තමයි ඇති වෙන තත්ත්වය. ඔබතුමා එහෙම කියනවා නම් ශාක පෝෂක හෝ, වෙන නමකින් හෝ මේ රටට රසායනික පොහොර ගෙනාවොත් ඔබතුමා ඉල්ලා අස්වෙන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. චීන නැවකට ඩොලර් මිලියන හයක් දෙන්න තිබෙනවා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ කිව්වා, එහෙම දෙන්න අවශ්‍ය නැහැ කියලා. කමක් නැහැ. හැබැයි, රට වටේ ගිහිල්ලා නැවත චීන අසූචි ටික ලංකාවට ගන්න තැනට කොන්ද පණ නැතිකමට තමුන්නාන්සේලා පත් වෙලා තිබෙනවා නම්, අපේ රට පත් කරලා තිබෙනවා නම් අපි ඉතාම කනගාටු වෙන බව මම මේ වෙලාවේ කියනවා. අද වන විට පොහොර හොණ්ඩරය රුපියල් 6,000ට, 10,000ට ගන්න සිද්ධ වෙන කොට, එය රටේ බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙනවා. එතකොට අර පාදෙණියලා කියපු රෝග හැදෙන්නේ නැද්ද දන්නේ නැහැ. ශාක පෝෂකවලින් ආයු අපේක්ෂාව අඩුවීම් සිද්ධ වෙන්නේ නැද්ද කියලා අපි ප්‍රශ්න කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසුන් ගන්න. ස්තුතියි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඊට අමතරව - *[බාධා කිරීම්]* මගේ කථාව අවසන් කරන්න දෙන්න. *[ඝෝෂා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා. *[ඝෝෂා කිරීම්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේදී -

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ෆයිල් එක ඉනේ ගහගෙන ආවා කියලා ඔහොම කරන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම මෙතැන තිබෙන schedule එක අනුගමනය කරන්නේ. *[බාධා කිරීම්]* කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* කරුණාකරලා වාඩි වෙන්න. *[ඝෝෂා කිරීම්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඉතාම සාර්ථක අය වැයක් ඉදිරිපත් කිරීම ගැන බැසිල් රාජපක්ෂ අපේ මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. *[ඝෝෂා කිරීම්]* මේ අය වැය ඉදිරිපත් කරන්නේ බොහොම අමාරු වෙලාවක. *[ඝෝෂා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරුන් කරුණාකරලා වාඩි වෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි කවුරුත් දන්නවා කොවිඩ් වසංගතය හරහා ඉතා අර්බුද තත්ත්වයක්, මුළු ලෝකයේම ආර්ථිකයට ප්‍රශ්න ඇති වෙලා තිබෙද්දී - *[ඝෝෂා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව නිශ්ශබ්ද කරන්න කෝ. *[ඝෝෂා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක, ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ස්ථාවර නියෝග අනුව කථිකයෙක් කථා කරගෙන යන කොට කාලය පිළිබඳව කලින් දැනුවත් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම දෙවතාවක් දැනුම් දුන්නා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සාධාරණ කාලයක් දෙන්නේ නැතුව ඔබතුමා කරන්නේ ආණ්ඩුවේ කොන්ත්‍රාත් එකක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිරිඇල්ල මන්ත්‍රීතුමාගෙන් ඕනෑ නම්- *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *[බාධා කිරීම්]* Point of Order - *[බාධා කිරීම්]* ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, කරුණාකරලා අසුන් ගන්න. *[බාධා කිරීම්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාට කථාව අවසන් කරන්න වෙලාව ඕනෑ නම් ඒක සාධාරණයි. කිරිඇල්ල මන්ත්‍රීතුමාට නැඟිටලා එතුමන්ලාගේ පැත්තෙන් වෙලාව දෙන්න කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා එකඟද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේක කෝලම් මඩුවක් කර ගන්නවා නේ. මන්ත්‍රීතුමා වෙලාව ඉල්ලා ගන්න. ඔබතුමන්ලාගේ පැත්තෙන් ඉල්ලා ගන්න. You must ask for time from the Chief Opposition Whip.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මෙතුමා බැසිල් ඇමතිතුමාගේ ෆයිල් එක උස්සාගෙන-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ, නැහැ. ඒවා කථා කරන්නේ නැතුව ඔබතුමා වේලාව ඉල්ලා ගන්න. *[සෝෂා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. *[සෝෂා කිරීම්]* කරුණාකරලා වාඩි වෙන්න. *[සෝෂා කිරීම්]* කරුණාකරලා වාඩි වෙන්න. *[සෝෂා කිරීම්]* ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා නිශ්ශබ්ද කරවන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. *[සෝෂා කිරීම්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් කථිකයෙක් කථා කරන කොට විනාඩි දෙකක් ඉල්ලුවාම දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම එතුමාට ඒක කිව්වා. *[සෝෂා කිරීම්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩ්ඩක් ඉන්න. මට කථාව අවසන් කරන්න ඉඩ දෙන්න. අපේ මාතලේ දිස්ත්‍රික් මන්ත්‍රීතුමියට වාචිකව පහර දෙන කොට මූලාසනයේ හිටපු මන්ත්‍රීවරයා ඒ අපහාස කරන්න විනාඩි පහක් වැඩිපුර දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක මූලාසනයෙන් නොවෙයි දුන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාට කථාව අවසන් කරන්න විනාඩියක කාලයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ එකඟතාව මත එතුමාට විනාඩියක් දෙන්නම්. [සෝෂා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

ඔබතුමන්ලාට මේ කථා අහගෙන ඉන්න අමාරුයි. මේ කථා අහගෙන ඉන්න අමාරු වනකොට, ෆයිල් මිටිය උස්සාගෙන එන්න ගේට්ටුව ගාවට යන උදවිය, මේ කථාව නවත්වන්න කටයුතු කරනවා. ෆයිල් මිටිය උස්සාගෙන උඩට අරගෙන එන අය- *[බාධා කිරීම්]* මුදල් ඇමතිතුමාගේ ෆයිල් උඩට උස්සාගෙන එන අය, මේ කථාව නතර කරන්න හදනවා.

මම කියනවා, මේ ආර්ථිකය දැන් තිබෙන්නේ හරියට පිළිකා ලෙඩෙක් වාගේ කියලා. මේ රටේ ආර්ථිකය හරියට පිළිකා ලෙඩෙක් වාගේයි. පිළිකා දරුවා ගෙදර තියාගෙන, ඒ දරුවාට දෙනවා අත්බෙහෙත්; දෙනවා සෙල්ලම් බඩු. ඒ ටිකත් ණයට අරගෙන දීලා, ඒකෙන් නිකම් සන්තෝෂ කර කර තියාගෙන ඉන්නවා. හැබැයි, ඉස්පිරිතාලෙට ගෙනි යන්නේ නැහැ. ගන්න ඕනෑ තැනින් ලෙඩේට බෙහෙත් ගන්නේ නැහැ. ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. එහෙම ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැතුව ලෙඩා මැරෙන්න දෙන විධියට මේ රට කඩාගෙන වැටෙන්න දෙන තැනට යන අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ; දූෂිත අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ දූෂිත අය වැය ගැන, සාටක පෝෂක අය වැයේ දූෂිත බව කියන නිසා තමයි තමුන්නාන්සේ මගේ කථාව නතර කරන්න උත්සාහ කරන්නේ කියමින්, මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා.

[අ.භා. 4.02]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැයේ දෙවන වර කියවන විවාදය අවසන් වන වෙලාවේ කථා කරන්න ලැබීම ගැන මම සතුටු වනවා.

විශේෂයෙන්ම මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමාට, ලක්ෂ්මන් කිරිඇල්ල අපේ විපක්ෂයේ සංවිධායකතුමා විනාඩියක වටිනාකමක් දීමෙන් පෙනෙන්නේ, එතුමාගේ කථාව වැඩක් නැහැ කියන කාරණයයි. මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කාලය තව තියෙද්දී, ඔබතුමාට විනාඩියක් ඉල්ලා දෙන්න වුණේ මටයි. ඔබතුමා ගැන කිරිඇල්ල මැතිතුමා හොඳට දන්නවා.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

ඔබතුමා කොහොමද මෙහෙන් file උස්සාගෙන එහාට පැන්නේ, එහෙන් file උස්සාගෙන මෙහෙට පනින්නේ කොහොමද කියලා එතුමා හොඳට දන්නවා. ඒවා මම කියන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් අර්බුදය නිසා මුළු ලෝකයම ආර්ථික වශයෙන් කඩා වැටී, විවිධ ප්‍රශ්න, ගැටලු රාශියකට මුහුණ දෙමින් අර්බුදයට ලක් වෙලා ඉන්න වෙලාවකදී ඉතා සාර්ථක අය වැයක් ඉදිරිපත් කිරීම ගැන, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මම ස්තුතිවන්ත වනවා.

මේ අය වැයෙන් ග්‍රාමීය ජනතාවට බිලියන ගණන් මුදල් වෙන් කර දීලා තිබෙනවා. ගෘහ ආර්ථිකය නංවාලීම සඳහා රුපියල් බිලියන 31ක් - Rs. 31 billion - වෙන් කරලා තිබෙනවා. ගැබිනි මව්වරුන් සඳහා ලබා දුන් පෝෂණ මල්ල, තව වර්ෂ දෙකක් දක්වා දීර්ඝ කරලා තිබෙනවා. දිළිඳු ජනතාවට සහන මල්ලක් ලබා දීලා තිබෙනවා. පසුගිය අවුරුදු දෙකේම ඔබතුමන්ලා හැම වෙලාවේම ඇහුවේ, "කෝ සහන මල්ල" කියලා. මෙන්න, සහන මල්ල දෙන්න අවශ්‍ය වෙලාවේ රුපියල් බිලියන 15ක් මුදල් ඇමතිතුමා වෙන් කර දීලා තිබෙනවා. ඒ ගැන විපක්ෂය එක වචනයක්වත් කථා කළේ නැහැ. ගිය අවුරුදු දෙකේම කළේ, මඩ ගහන එක.

කොවිඩ් අර්බුදය නිසා ආදායම් අහිමි වුණ ත්‍රි රෝද රථ රියැදුරන්, එහෙම නැත්නම් ත්‍රි රෝද රථ අයිතිකාර මහත්වරුන්, පෞද්ගලික බස් රථ හිමියන් ඇතුළු බොහෝ දෙනෙකුට සහන සැලසීම සඳහා ආර්ථික වශයෙන් අමාරු වෙලාවකදී වුණත් එතුමා විශාල මුදලක් වෙන් කර දීලා තිබෙනවා. එතුමා හරියට හොයලා තිබෙනවා, මේ ආර්ථික කඩා වැටීම බලපා තිබෙන්නේ කාටද කියලා. ගරු ජනාධිපතිතුමා "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් පොරොන්දු වුණා, "සියලු උපාධිධාරින්ට මම රැකියා ලබා දෙනවා" කියලා. කොවිඩ් අර්බුදය නිසා මේ රටේ ආර්ථිකය අමාරු තත්ත්වක තිබෙන වෙලාවක වුණත් එතුමා කිව්වා වාගේම, අපේ ගම්වල ඉන්න අහිංසක අම්මලා තාත්තලාගේ ඉගෙන ගත්ත දරුවන් 57,000කට උපාධිධාරි පත්වීම් දුන්නා. ඒ විතරක් නොවෙයි. මේ අය වැයෙන් රුපියල් බිලියන 7.6ක් -ලක්ෂ 76,000ක්- වෙන් කර දීලා තිබෙනවා, ඒ අහිංසක දරුවන් රැකියාවේ ස්ථිර කරලා, ලැබිය යුතු දීමනා ලබා දීමට.

ඊළඟට ජනාධිපතිතුමා පොරොන්දු වුණා, දිළිඳු පවුල්වල ලක්ෂයකට රක්ෂා දෙනවා කියලා. පළමු අවුරුද්දේ එතුමා 37,000කට රක්ෂා දුන්නා. අමාරු කාලයකදී වුණත් ආර්ථික වශයෙන් අමාරුවේ වැටිච්ච මිනිස්සු අමතක කරන්නේ නැතුව, කථාවට සීමා කරන්නේ නැතුව, මේ අය වැයෙන් විශාල මුදලක් ගම්වල ඉන්න අහිංසක මිනිසුන් වෙනුවෙන් මුදල් ඇමතිතුමා ඇතුළු අපේ රජය මුදල් වෙන් කර දී තිබෙන බව මා මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු දෙකේදී අපි මොනවාද දැක්කේ? අපට හම්බ වුණේ ඉතාම අමාරු තත්ත්වයක තිබුණු රටක්. 2015දී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා භාර දුන් රට නොවෙයි, 2019දී අපට හම්බ වුණේ. 2005දී සියයට 6.2ක තිබුණු ආර්ථික වර්ධන වේගය 2006දී සියයට 7.7යි; 2007දී සියයට 6.8යි; 2008දී සියයට 6යි; 2009දී සියයට 3.5යි. ඒ වෙලාව ලෝක ආර්ථික අර්බුදයක් තිබුණු වෙලාවක්. ඊළඟට, 2010දී සියයට 8යි; 2011දී සියයට 8.2යි; 2012දී සියයට 6.3යි; 2013දී සියයට 7.2යි; 2014දී අපි රට භාර දෙද්දී සියයට 7.4යි. ඒ වෙලාවේ අපේ ආර්ථික වර්ධන වේගය දෙවැනි වුණේ චීනයට පමණයි. ඊට පසුව මේ ගොල්ලන් කිව්වා, අලුත් රටක් හදනවා කියලා. "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" හදනවා කිව්වා. *[බාධා කිරීම්]*

ඊළඟට, දින සියයේ වැඩ පිළිවෙළ ගැන කිව්වා. ඒ දින සියයේ වැඩ පිළිවෙළ අපට හොඳට මතකයි. මහ බැංකුව හොරා කාලා, මේ රටේ හදවත වාගේ තිබුණු මහ බැංකුවේ මුදල්වලින් තමයි තමුන්නාන්සේලා පාර්ලිමේන්තු මැතිවරණය කළේ. මේ ඉන්න හුඟක් අය ලක්ෂ පණහ, ලක්ෂ සියය, ලක්ෂ එකසිය පණහ-ලක්ෂ දෙසීය ගත්තා. එහෙම තමයි දවස් සියයෙන් අලුත් රටක් හදනවා කිව්ව අය කටයුතු කළේ.

ඊළඟට, මේ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති වෙනස් වුණ හැටි බලන්න. 2015 ජූලි 23වැනි දා "මාස හැටකින් අලුත් රටක් සෑදීමේ පංචවිධ ක්‍රියාවලිය" ගැන කිව්වා. 2015 නොවැම්බර් 5වන දා ආපසු ඒක වෙනස් කළා. රට හදන ආර්ථික වැඩ පිළිවෙළ, 2016 ජනවාරි මාසයේ ආපසු වෙනස් කළා. මෙගාපොලිස් සංවර්ධන වැඩසටහන ගැන කිව්වා. ඊට පස්සේ 2016 ඔක්තෝබර් 27වැනි දා කිව්වා, "රජයේ ආර්ථික සැලසුම් ප්‍රකාශනය" ගෙනාවා කියලා. 2017 ජනවාරි 7වැනි දා "තිරසර යුගයක් සඳහා වන රජයේ නව ආර්ථික සැලැස්ම" ගැන කිව්වා. ඒක 2017 අගෝස්තු 22වැනි දා ආපසු වෙනස් කළා. ඒකට "තුන් අවුරුදු සංවර්ධන නව ආර්ථික සැලැස්ම" කිව්වා. ඒක සැප්තැම්බර් මාසයේ ආපසු වෙනස් කළා. "2025 - පොහොසත් රටක්" කියලා අට අවුරුදු සැලැස්ම ගැන කිව්වා. ඊට පස 2018දී කිව්වා, නියම ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ පටන් ගන්නේ දැනුයි කියලා. මේ වාගේ විටින් විට ප්‍රතිපත්ති වෙනස් කරපු ආණ්ඩුවක් තිබුණේ. අන්තිමට මොකක්ද සිද්ධ වුණේ? 2014දී සියයට 7.4ට තිබුණු ආර්ථික වර්ධන වේගය 2015දී සියයට 5ට බැස්සුවා; 2016දී සියයට 4.5ට බැස්සුවා; 2017දී සියයට 3.6ට බැස්සුවා; 2018දී සියයට 3.3ට බැස්සුවා; 2019දී සියයට 2.3ට බැස්සුවා. දැන් ඒ හිටපු මුදල් ඇමතිතුමාත් නැහැ. රාජ්‍ය ඇමති කෙනෙක් නම් හිටියා. මොන තරම් භය වුණාද කියනවා නම් ඡන්දෙ ඉල්ලන්නේ නැතුව ජාතික ලැයිස්තුවෙන් ආපු මුදල් රාජ්‍ය ඇමති කෙනෙක් තමයි හිටියේ. තමුන්නාන්සේලා දැන් අහනවා, මොනවාද මේ අවුරුදු දෙකේ කෙරුවේ කියලා. ආර්ථික වර්ධන වේගය වට්ටලා, දූෂණයෙන් පිරුණු රටක්, හොරකම ඉහ වහා ගිය රටක් ඇති කළා. හැම අමාත්‍යාංශයෙන්ම බැලුවේ කොහොමද හොරකම් කරන්නේ කියලායි. මහ බැංකුවට නායකයෝ බැහැලා හොරා කාලා, තමන්ගේ ගෝල බාල මන්ත්‍රීවරු දාලා ඒකට footnotes ලියලා, ඒ කරපු හොරකම යටපත් කරන්න කටයුතු කරපු අය තමයි මෙතැන ඉන්නේ. ඒ හුඟක් අය පැරදුණා. ඒක තමයි ඉතිහාසය. ඒවා මේ රටේ ජනතාවට අමතක වෙලා නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කිව්වා, රාජ්‍ය පාලනය මට දෙන්න, මම ජනාධිපති හැටියට ජයග්‍රහණය කරවන්න, මම කාටවත් මඩ ගහන්නේ නැහැ, මම වැඩ කරන ජනාධිපතිවරයෙක් කියලා. මේ රටේ කිසිම ආණ්ඩුවක් අපොස (සාමාන්‍ය පෙළ) විභාග පාස් නොවුණු අයට රස්සා දුන්නේ නැහැ. අමාරු වෙලාවක, කොවිඩ් අර්බුදය තිබෙද්දී කොවිඩ්වලට අවශ්‍ය බෙහෙත් හේත්, vaccines ගෙනෙන්න අවශ්‍ය සල්ලි -මේ හැම දෙයක්ම හොයා ගන්න තිබෙන වෙලාවක - එතුමා දුන් පොරොන්දු අමතක කරන්නේ නැතුව මේ රටේ අහිංසක ජනතාවට -37,000කට- රස්සා දුන්නා. තමුන්නාන්සේලා මොනවාද කළේ? මහ බැංකු දත්ත අනුව තමුන්නාන්සේලා 2015 වෙද්දී පළමුවැනි මාස අටේදී මේ රටේ ජනතාවගේ අහිංසක දරුවන්ගේ රක්ෂා තුන්ලක්ෂ හතළිස්දහසක් නැති කළා. එහෙම තමයි තමුන්නාන්සේලා කටයුතු කළේ. තමුන්නාන්සේලා දැන් ඉන්නේ, කථා කරන්නේ හරියට නිකම් ඒ සියලු දේවල් අමතක වෙලා වාගෙයි; නිදි පෙත්තක් ගහලා නිදාගෙන ඉඳලා, නින්දෙන් ඇහැරිලා වාගෙයි.

දැන් කියනවා, රට භාරගන්න සූදානම්, රට ගොඩ නඟන්න අප සූදානම් කියලා. රට ගොඩ නඟපු හැටි මේ රටේ ජනතාවට අමතක වෙලා නැහැ. තමුන්නාන්සේලා මේ රට විනාශ කළා. ජාතික ආරක්ෂාව විනාශ කළා. හැම දෙයක්ම විනාශ කළා විතරක්

නොවෙයි, තමුන්නාන්සේලා දේශපාලන පළිගැනීම් කරන්න හැදුවා. ඒක තමයි කුමාර වෙල්ගම අපේ මන්ත්‍රීතුමා එදා කිව්වේ. එතුමා ඒකට මුහුණ දුන්නා. අපි ඒවාට මුහුණ දුන්නා. මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා මොකක්ද කියන්නේ?

ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා දේශපාලන පළිගැනීම් කරන්නේ නැතිව මනුස්සකමින් මේ රට පාලනය කරද්දී මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා කියනවා, එතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේ ආපසු පළිගන්න කටයුතු කරනවා කියලා. එහෙම කියන එක හොඳයි. ඒවා තවතවත් කියන්න. තමුන්නාන්සේලා පළිගන්න ගිය නිසා තමයි අන්තිමට තුනෙන් දෙකේ බලයක් අපට ලැබුණේ. මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාට තිබෙන්නේ පළිගැනීමේ චේතනාවයි; රට හැදීමේ චේතනාව නොවෙයි. ඒක තමයි ඇත්ත. විපක්ෂය දැන් අපට මඩ ගහනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SANJEEVA EDIRIMANNA *left the Chair, and* THE SPEAKER *took the Chair.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, එතුමන්ලා දැන් කියන්නේ, අපේ අය කොමිස්වලින් බඩ වඩාගන්නවා කියලා. අපි 2015 වර්ෂයට ඉස්සරත් එවැනි කථා ඇහුවා. එදා අපි පාරවල් හදනවා කිව්වාම එතුමන්ලා කිව්වේ, පාරවල් රත්තරන්වලින් හදන්න පුළුවන් ඇස්තමේන්තු සකස් කරනවා කියලායි. පාරවල් හදන ඒවායෙන් ගසා කාපු හැටි මා අමුතුවෙන් මතක් කරන්න දෙයක් නැහැ. බිලියන 66ට මං තීරු 6ක් සහිතව හදන්න තිබුණු අධිවේගී මාර්ගය මං තීරු 4කට අඩු කරලා, බිලියන 66ටම ලබා දුන්නේ තමුන්නාන්සේලා ඇවිත් මාස තුනෙන්. එහෙම තමයි ඒ කාලයේ තමුන්නාන්සේලා හොරකම් කළේ. අපි ඒ කාරණා මතක් කර දෙනවා.

දැන් කියනවා, මේ අය වැයෙන් රාජපක්ෂ පවුලට සියයට 64ක් දීලා තිබෙනවා කියලා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා තමයි එහෙම කිව්වේ. මේ වාගේ කාරණයක් අරගෙන මා එතුමාගේ නම කියන්න කැමැති නැහැ. අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ සියයට 29 යි. මා හිතන හැටියට එතුමාට වැරැදිලා වෙන්න ඇති. සියයට 29යි වෙන් කරලා තිබෙන්නේ. ඒ සියයට 29නුත් සියයට 15ක් වෙන් කරලා තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට. ඒ වාගේම, අධ්‍යාපනය වෙනුවෙන් සියයට 8ක් වෙන් කරලා තිබෙනවා. සෞඛ්‍යය වෙනුවෙන් සියයට 7.31ක් වෙන් කරලා තිබෙනවා. ඒ අමාත්‍යාංශ දෙකට විතරක් සියයට 16යි. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාටයි, ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාටයි "රාජපක්ෂ" නම නැහැ නේ. එහෙම නම්, මඩ ගැහීමේත් සීමාවක් තියාගන්න. තමුන්නාන්සේලා එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දිනවන්න කැප වෙච්ච අය. මඩ ගහන කොට සීමාවක් තියාගන්න. තමුන්නාන්සේලාට අවුරුදු 5ක ආණ්ඩුවක් තිබුණා නේ. මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා සොහොනක් ගැන කථා කළා. ඔය සොහොන් ගැන කියලා අපේ අය හිරේ දමන්න තමුන්නාන්සේලා කටයුතු කරපු ආකාරය මේ රටේ ජනතාවට අමතක වෙන්නේ නැහැ. ඒ කාලයේ වැසිකිළි වළවල් පවා හාරපු අය තමයි තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා එදා කළේ වැඩ කළ එක නොවෙයි; රටේ ආර්ථිකය හදන එක නොවෙයි; තරුණ තරුණියන්ට රස්සා දෙන එක නොවෙයි. තමුන්නාන්සේලා කළේ පළිගන්න එක. පළිගැනීමේ චේතනාවයි තමුන්නාන්සේලාට තිබුණේ. එදා වැඩ බැරි මිනිසුන් ටිකක් එකතු වෙලා පළිගැනීම කළා. මේ රටේ ආර්ථිකය බින්දුවට වට්ටපු මිනිසුන් හැටියට තමුන්නාන්සේලා ඉතිහාසගත වෙනවා.

මේ ආණ්ඩුව ඉක්මනින් පෙරළන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතනවා නම්, අපේ පැත්තේ එක් කෙනකු හෝ දෙදෙනකු කරන ප්‍රකාශවල එල්ලිලා මැතිවරණයකින් දිනන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතනවා නම් තමුන්නාන්සේලාට වැරැදිලා. කොවිඩ් - 19 වසංගතය තිබුණේ නැත්නම් අපි පළාත් සභා මැතිවරණය තියලා ඉවරයි. එහෙම වුණා නම්, තමුන්නාන්සේලා අන්ත පරාජයක් ලබනවා. අපි කියනවා, මැතිවරණ තියන්න පුළුවන් සුදුසුම, ඉක්මන් ම දවසේ අපි මැතිවරණය තියනවා කියලා. එදාට තමුන්නාන්සේලාට මේ රටේ ජනතාවගෙන් දඬුවම් ලැබෙයි.

අද තිබෙන්නේ, ආණ්ඩුවට විරුද්ධව ගෙන යන උද්ඝෝෂණයක් නොවෙයි. අද තිබෙන්නේ, විපක්ෂ නායකතුමා රැකගන්න කරන උද්ඝෝෂණ. විපක්ෂ නායකතුමාගේ කකුලෙන් අදින්න එක පැත්තකින් පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා සැලසුම් සකස් කරනවා. ඒ වාගේම තවත් අය සැලසුම් සකස් කරනවා.

සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා, වැම්පියන් කෙනෙක් ඕනෑ කියලා. ඒ වැම්පියන් තමයි අපි ගෙනැවිත් තිබෙන්නේ. ඒ තමයි, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා,"Mr. Clean". එතුමා දූෂණයෙන් තොරව අද මේ රට පාලනය කරගෙන යනවා. තමුන්නාන්සේලා දැන් කියනවා, "දූෂණය, දූෂණය, හොරකම හොරකම!" කියලා. පොහොරවලින් හොරකම් කළා කියනවා. එහෙම නැත්නම් තවත් දෙයකින් හොරකම් කළා කියනවා. තමුන්නාන්සේලා ගිහින් ඒ ගැන පැමිණිලි කරන්න. අපේ කාලයේ අපි පැමිණිලි කළා, ඒ අවශ්‍ය ලිපි ලේඛන ඔක්කොම සහිතව. ඒ හැම කෙනකුම අද බේරිලා ඉන්නේ, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ කිසිවකට බලපෑම් කරන්නේ නැති නිසායි. එතුමා බලන්නේ මේ රට හදන්නයි; මේ රට ගොඩ නඟන්නයි; පළිගන්න නොවෙයි. හුඟක් අය හදනවා එතුමා අවුස්සාගන්න.

අද ප්‍රජාතන්ත්‍රවාදය නැති ලු. අද ප්‍රජාතන්ත්‍රවාදය මොන තරම් තිබෙනවාද කියනවා නම්, එතුමාට "පිස්සා" කියලා කියන්න පුළුවන් ප්‍රජාතන්ත්‍රවාදයක් එතුමා අද මේ රටේ ඇති කරලා තිබෙනවාය කියන එක මා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. "පිස්සෝ", "පිස්සෝ" කියලා කිව්වාට අපි ඒවාට කලබල වෙන්නේ නැහැ.

සමහරුන්ට එතුමාගේ නම ගැනත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. හුඟක් අයට එතුමාගේ නම නන්දසේන කියලා සොයාගන්න පුළුවන් වුණේ, අවුරුදු එකහමාරක් ගියාට පස්සේ. එතුමාගේ නමත් ප්‍රශ්නයක්. ජනාධිපති ධුරයේ දිවුරුම් දුන් එතුමා මුලින්ම පාර්ලිමේන්තුව අමතන්න බොහොම සරල ලෙස පාර්ලිමේන්තුවට එද්දී එතුමාගේ වැරැද්දක් හැටියට කිව්වේ සුදු ඉර කැපුවා කියන එකයි. පසුව දා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා මහා ලොකුවට කිව්වා, "ජනාධිපතිතුමා සුදු ඉර කපාගෙන" ආවා කියලා.

ගරු කථානායකතුමනි, එතුමා එතුමාගේ ගෙදර ඉඳලා රාජකාරි කිරීමත් සමහර මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක්. පසුගිය කාලයේ සමහර අය කියනවා අපි දැක්කා, "අපි රට පාලනය

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

කරන්නේ ගමේ ඉඳලා" කියලා. අපට ඒවා මතකයි. සමහරු කිව්වා, "අපි නිල නිවාසවලට යන්නේ නැහැ" කියලා. සජිත් ප්‍රේමදාස මහත්මයා පසුගිය ජනාධිපතිවරණය කාලයේ කිව්වා, "නිල වාහන ගන්නේ නැහැ" කියලා. මම එතුමා ගැන සතුටු වෙනවා. අද එතුමා විපක්ෂ නායකවරයාගේ නිල වාහන ඔක්කොම පාවිච්චි කරනවා. අපි ඒවාට විරුද්ධ වෙන්නේ නැහැ. විපක්ෂ නායක හැටියට රට පුරා යන්න, තෙමී තෙමී කුඹුරුවල ගිහින් ඉන්න එතුමාට අවශ්‍ය පෙට්‍රල් ටික ඇතුළු ඔක්කොම ආණ්ඩුව දෙනවා. ඒකෙන් ලීටර් 5යි අපි අඩු කරන්නේ. අපි ඒ බවත් මතක් කරනවා.

ජනාධිපතිතුමා සරල වීමත් ප්‍රශ්නයක්. එතුමා තේජවන්තකමින් ගිහින් දිවුරුම් දුන්නේ නැත්නම්, කථා කළේ නැත්නම්, ආචාර වෙඩි මුර පවත්වන්න දුන්නේ නැත්නම්, නිකම් ෂර්ට් එකක් ඇඳගෙන ආවා නම් ඒකත් සමහර අයට ප්‍රශ්නයක්. "නිසි ගෞරවයක් තිබුණේ නැහැ" කියනවා.

අපි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නිවස පිහිටි තැන ඉඳලා තිබෙන මංමාවත් ඔක්කොම හදලා තිබෙනවා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, එතුමා ගෙදර ඉඳලා එන එක ලොකු ප්‍රශ්නයක් කියලා ජනතාව කියන බව. හැබැයි, එතුමා නිල නිවසට ගියා නම්, ඔබතුමා කියනවා, ලයිට් බිලත් මෙච්චරයි, ගෙවලුත් හදලා කියලා. සරල ජනාධිපති කෙනෙකු ආවාම අගය කරන්න. ඔබතුමන්ලා ප්‍රතිපත්තිගරුක අය නම් ඒවා අගය කරන්න. ඒ අගය කිරීම ඉතාම හොඳ දෙයක් ලෙසයි අප දකින්නේ.

ඊළඟට කියනවා, "සාගතයක් එනවා" කියලා. එහෙම සාගතයක් ඇති වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේ රටේ කිසිම මනුස්සයෙකු බඩගින්නේ තියන්න ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය හෝ අප හෝ බලාපොරොත්තු වන්නේ නැහැ කියලා අපි බොහොම ආදරයෙන්, ගෞරවයෙන් කියනවා.

ඒ වාගේම, ඔබතුමන්ලා ලොකු ලොකු ප්‍රචාර යවනවා. ඔබතුමන්ලාගේ ආනන්ද පාලිත මහත්මයා ප්‍රචාරයක් යැව්වා, "පෙට්‍රල් නැහැ" කියලා. ආනන්ද පාලිත කියන්නේ කවුද? එදා මම ජාතික සේවක සංගමය භාරව සිටියේ. එතුමා එදා අපේ පක්ෂයේ හිටපු වෘත්තීය සමිති නායකයා. තිස්ස අත්තනායක මැතිතුමාත්, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් හොඳින් දන්නවා, ආනන්ද පාලිත මහත්මයා. එතුමා ජෝන් අමරතුංග මහත්මයාගේ ගෝලයා. දැන් එතුමා තමයි 'සජබ' වෘත්තීය සමිති සංවිධායක. මොනවාද එතුමා කියන්නේ? උදය ගම්මන්පිල ඇමතිතුමා ඇවිත් නිවැරැදි ප්‍රකාශය කළාම, එතුමා කියනවා, ඔන්න දැන් පෙට්‍රල් නැති වෙනවා කියලා. මොනවාද එතුමා කරන්නේ? ඒ අහිංසක මිනිස්සු -තමුන්නාන්සේලාට ඡන්දය දුන්නු, අපට ඡන්දය දුන්නු අහිංසක මිනිස්සු- අවුස්සලා අරගෙන ගිහින් පෝලිම් ගස්වනවා. දැන් ජනතාව කලබල වෙලා, පෙට්‍රල් නැති වෙයි කියලා. සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් ඡන්දය දුන්, අපටත් ඡන්දය දුන් ජනතාව කලබල කරවා පෝලිම් ගස්වනවා. මොන තරම් කැත ද? දැන් පෙට්‍රල් නැති වුණාද? දැන් පෙට්‍රල් පෝලිම් තිබෙනවාද? නිකරුණේ මිනිස්සු අවුස්සනවා. ඊළඟට කියනවා, "ඔන්න ගෑස් නැහැ, ඉක්මනට ගිහින් ගන්න" කියලා. එහෙම කියලා මිනිස්සු පෝලිම් ගස්වනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් අවුරුදු පහක් තිබුණා නේ. අන්තිමේදී එදා මිනිසුන්ට ගෝල්ෆේස් එකට වෙලා ඉන්න සිද්ධ වුණා නේ, නැව එනකල්. ඒ කාලයේ කොවිඩ්-19 වසංගතය තිබුණාද? එදා මොකක්ද තිබිච්ච අර්බුදය?

උගත් බුද්ධිමත් ජනතාව දන්නවා, අද තිබෙන මේ කොවිඩ් වසංගතය විශාල අර්බුදයක් බව. ඒ අර්බුදය මේ රටේ ආර්ථිකයට මරු පහරක්. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒ අර්බුදය තිබුණත් අපේ අතිගරු ජනාධිපතිතුමා, අපේ ගරු අගමැතිතුමා, අපේ රජය ඉතාම හොඳින් සැලසුම් කරලා ඉතාම හොඳින් ක්‍රියාත්මක වුණා.

අපි vaccine ගෙනාවා. අපේ විපක්ෂ නායකතුමා ඒ වෙලාවේ කිව්වා, plaquenil ගෙනෙන්න කියලා. එහෙම නේද? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කිව්වා, මේකට එකම විසඳුම vaccine කියලා. අපි ඒ vaccine ගෙනාවා. Vaccine ගෙනාවාම මොනවාද කිව්වේ? Vaccine ගෙනාවාම කිව්වා, මේ vaccine පාවිච්චි කරන්න එපා, මේවා හොඳ vaccine නොවෙයි, මේ vaccine පාවිච්චි කළොත් මිනිස්සු මැරෙනවා, අතුරු ආබාධ එනවා කියලා. නොයෙකුත් කතන්දර කිව්වා. ජනතාව තුළ vaccine ගැන විශ්වාසය ඇති කරනවාට වැඩිය ජනතාව තුළ අවිශ්වාසය ඇති කළා. ලෝකයේ ප්‍රබල රටවල් තිබියදී, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතාම උපක්‍රමශීලීව කටයුතු කරලා ජනතාවට vaccine ලබා දුන් ලෝකයේ පළමුවැනි රටවල් 10 අතරට අපේ රට ගෙනාවා. සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වා, "මේ රටේ අන්තිම පුද්ගලයාත් vaccine ලබා ගත්තාට පස්සේ තමයි මම vaccine ලබා ගන්නේ" කියලා. හැබැයි, කොවිඩ්වලට ගොදුරු වුණු නිසා එතුමාටත් vaccine ලබා ගන්නට සිද්ධ වුණා. අපි එතුමාට දුන්නේ හොඳම vaccine එක; Pfizer vaccine එක. ඇයි? අපට සජිත් ප්‍රේමදාස මහත්මයා රැක ගන්නට ඕනෑ. අපි එතුමාට වැඩිය ගහන්න යන්නේ නැහැ. හේතුව, එතුමාට ඇතුළෙන්ම ගහන නිසා.

ගරු කථානායකතුමනි, දුෂ්කර අවස්ථාවක මෙවන් අය වැයක් ඉදිරිපත් කිරීමට හැකි වීම ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම සාර්ථක අය වැයක් ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට ආණ්ඩු පක්ෂයේ සියලුදෙනා වෙනුවෙන් මා නැවත වාරයක් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ නායකත්වය අපි කවදාවත් අමතක කරන්නේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට මොන තරම් පහර දුන්නත්, එතුමා නිවැරදි නායකත්වයක් ලබා දීලා තිබෙනවා. එතුමා, දූෂණයෙන් තොරව ඉතාම හොඳින් රාජ්‍ය පාලනය කරමින්, සංවේදී නායකයකු විධියට සියලුදෙනාගේම ප්‍රශ්නවලට කන්දීලා කටයුතු කරන නායකයෙක්. මේ රටේ පස්වෙනි විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, අපේ පරිණත නායකයා අද මේ ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා. එම නිසා අපේ ආණ්ඩුව තමුන්නාන්සේලා හිතන විධියට ලේසියෙන් වට්ටන්නට හම්බ වෙන්නේ නැහැයි කියන එක අපි පැහැදිලිවම කියනවා. අපි මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරන බව මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා.

[අ.භා. 4.22]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)
ගරු කථානායකතුමනි, ඔබතුමා දකුණෙන් ආපු දේශපාලන නායකයෙක්. ඔබතුමා දන්නවා, අපි හොඳ ඉතිහාසයක් උරුම කර

ගත්ත රටක ජාතියක් බව. ඔබතුමාත්, මමත් අපේ ඉතිහාසය ගැන අහලා තිබෙන සංකල්පයක් තිබෙනවා, "ගමයි පන්සලයි - වැවයි දාගැබයි" කියලා. ඒකත් එක්ක තමයි අපේ සංස්කෘතිය බැඳිලා තිබුණේ. අපේ ඉතිහාසයේ කියනවා, ලෝවාමහාපාය, මිරිසවැටිය, රුවන්මැලි මහාසෑය හැදුවේ දුටුගැමුණු රජතුමා කියලා. රට යුද්ධයකින් බේරාගෙන, එය සිහි කිරීම වෙනුවෙන් තමයි එදා දුටුගැමුණු රජතුමා රුවන්මැලි මහාසෑය හැදුවේ. ඒ වාගේම මහසෙන් රජතුමා ජේතවනාරාමය හැදුවා, අභයගිරිය වළගම්බා රජතුමා හැදුවා, දේවානම්පියතිස්ස රජතුමා ථූපාරාමය හැදුවා.

ගරු කථානායකතුමනි, මම මේ ඉතිහාසය ගැන කිව්වේ, වැරදිලාවත් එදා රජ දවසේ මේ සමගි ජන බලවේගය තිබුණා නම්, ඒ රජවරු සිටි කාලයේ සමගි ජන බලවේගය තිබුණා නම්, අද ථූපාරාමය නැහැ; අභයගිරිය නැහැ; රුවන්මැලි මහාසෑය නැහැ. මොකද හේතුව? එහෙම නම් ඒවා හදනකොටත් කියයි, ඕක හදන්න එපා, මොකටද රුවන්මැලි මහාසෑයක්, මොකටද අභයගිරියක් කියලා. මේ ගරු පාර්ලිමේන්තුවේ ඒ පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරියක් සඳහිරු සෑය සම්බන්ධයෙන් කළ ප්‍රකාශයෙන් දැන් ඒක ඔප්පු වෙලා තිබෙනවා. රටකට ඉතිහාසයක්, ප්‍රෞඪත්වයක් උරුම කරලා දිය යුතුයි. ගරු කථානායකතුමනි, වෙලාවට දෙවියෝ බලලා එදා එතුමන්ලා ඉපදිලා හිටියේ නැහැ. එහෙම වුණා නම් අද අපට අනුරාධපුරයට ගිහිල්ලා වඳින්න වෙන්නේ ගස්වලට විතරයි. එහෙනම් තිබෙන්නේ ගස් විතරයි, වෙන මෙලෝ දෙයක් නැහැ. එහෙනම් ඒ විධියට තමයි ඉතිහාසය නිර්මාණය වෙන්න තිබුණේ.

මට ඉස්සෙල්ලා ගාලු පුරවරයේ කොලු පොඩ්ඩෙක් කථා කරනවා ඇහුණා. මම කාගේවත් නම කියන්නේ නැහැ. ගාල්ල පැත්තේ ඉන්නවා නේ කොල්ලෝ. කොල්ලෙක් කථා කරනවා ඇහුනා. එයා කියනවා ඇහුනා, ඩීල් දේශපාලනයක් ගැන.

එයා කියනවා ඩීල් දේශපාලනයට කැමැති නැහැ කියලා. බොහොම හොඳ, පිරිසිදු, ශුද්ධවන්ත, සුදුවතින් සැරසුණු ඒ කොලු පොඩ්ඩා කියනවා, ඩීල් දේශපාලනය ගැන. ගරු කථානායකතුමනි, ඒ කොලු පොඩ්ඩා ඒ පැත්තට යන්නත් සල්ලි ගත්තා. ඊට පස්සේ ආපහු මේ පැත්තට එන්නත් සල්ලි ගත්ත කොල්ලෙක්. *[බාධා කිරීම්]* අරගෙන ගිය බෑග් එකත් මම කියන්නම්. *[බාධා කිරීම්]* ඒ කොලු පොඩ්ඩා, ගාල්ල පැත්තේ. ඒ කොල්ලා ගාල්ලේ ඔක්කොම දන්නවා; රටම දන්නවා. ඒ තරම් පිරිසිදුකමක්. බලන්න කෝ පිරිසිදුකම. ගරු කථානායකතුමනි, ඔබතුමාත්, මමත් ගත්තාම අපට පවුලක් තිබෙනවා. පවුල් ජීවිතයක් ගත කරනකොට සමහර වෙලාවට, සමහර කෙනෙකුට තමන්ගේ බිරිඳ ගැළපෙන්නේ නැත්නම් ඇයගෙන් වෙන් වෙන්න අයිතියක් තිබෙනවා. කමක් නැහැ, ඒකට රටේ නීතියක් තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. එතකොට රටේ නීතිය අනුව කෙනෙකුට වෙන් වෙන්න පුළුවන්. හැබැයි මනුස්සකම කියලාත් එකක් තියෙනවා නේ. මේ, ආර්ථිකය ගැන කථා කරනවා. හදපු දරුවාට කන්න දීලා ඉන්න එපැයි. මට සමාවෙන්න, ගරු කථානායකතුමනි. දෙවි හාමුදුරුවනේ! එතුමන්ලාගේ නවගුණ වැල අතේ. එහෙමයි කථාව. "කථාව දෝලාවෙන්, ගමන පයින්". මේ වාගේ තුට්ටු දෙකේ දේශපාලනය කරන උන්නැහේලා ගැන තව කියන්න දේවල් තියෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, 2015 බලයට පත් වුණු යහපාලන ආණ්ඩුව පිළිබඳව මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. එම ආණ්ඩුවේ මුදල් ඇමතිවරු දෙනෙනෙක් හිටියා. ගරු කථානායකතුමනි, ඒ මුදල් ඇමතිවරුන් දෙදෙනාගෙන් එක මුදල් ඇමතිවරයෙක් අද ජීවතුන් අතර නැහැ. ඒ තමයි, මංගල සමරවීර මැතිතුමා. එතුමා වෙනුවෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු කථානායකතුමනි, එතුමා ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ. ඒ, එක හිටපු මුදල් ඇමතිවරයෙක්. හිටපු අනෙක් මුදල් ඇමතිවරයා තමයි, රවි කරුණානායක මැතිතුමා. 2015 ඉඳලා ඉදිරිපත් කරපු අය වැය ලේඛන පහම ඉදිරිපත් කළේ ඒ මුදල් ඇමතිවරුන් දෙදෙනා. ගරු කථානායකතුමනි, මංගල සමරවීර හිටපු ඇමතිවරයා අද ජීවතුන් අතර නැති වුණත්, පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් නොවී එතුමා ඉල්ලා අස්වුණා. ඒ අනුව, එතුමාට පාර්ලිමේන්තු වරම අහිමි වෙනවා. රවි කරුණානායක හිටපු මන්ත්‍රීතුමා ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනවා. කොච්චර හොඳ අය වැය ලේඛන ටිකක්ද එතුමන්ලා ඉදිරිපත් කරලා තියෙන්නේ? හරි වැදගත් නේද? ඒ අය වැය ඉදිරිපත් කරපු දෙදෙනාම- මම මැරිච්ච කෙනෙකුට අපහාස කරන්නේ නැහැ- පාර්ලිමේන්තුවෙන් සමු අරගෙන තියෙනවා. එහෙනම් හොඳට කරලා තියෙනවා. එතුමන්ලා හොඳට කරපු නිසා තමයි, දැන් විපක්ෂයෙන් අපට 'කරන හැටි' කියලා දෙන්නේ. කරන හැටි අපට හොඳට කියලා දෙනවා.

ගරු කථානායකතුමනි, මේ අපේ මුදල් ඇමතිතුමාගේ මංගල අය වැය. 2022 අවුරුද්ද වෙනුවෙන් එතුමා මේ 76වැනි අය වැය ඉදිරිපත් කළා. මේක සාම්ප්‍රදායික ලියවිල්ලක් නොවෙයි. සාම්ප්‍රදායික ලියවිල්ලකින් ඔබ්බට ගිය අය වැයක් තමයි, බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළේ. ඒ වාගේම මේ අය වැය කොවිඩ්-19 වසංගතය නිසා බිඳ වැටුණු ආර්ථිකය නැවත ගොඩ ගන්න අභියෝග රාශියක් මැද ඉදිරිපත් කරපු අය වැයක්.

ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු ඔක්කොම සිටිද්දී අපේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා කරපු කථාව ඔබතුමාටත් මතක ඇති. අද උදේ එතුමා හොඳ කථාවක් කළා. අපි ඒ කථාවට ඇහුම්කන් දුන්නා. ඒ කථාවේ දී ඔබතුමා කියපු සමහර වචන හරි බර වැඩියි, විපක්ෂනායකතුමනි. ඔබතුමා ගොඩක් බුද්ධිමත් කෙනෙක්. පොඩ්ඩක් වෙලා ගිහිල්ලා තමයි අපට ඒ වචනෙට උත්තරය හොයා ගන්න පුළුවන් වෙන්නේ. ඒ තරම් බරයි. හැබැයි ඔබතුමාගේ කථාවේදී මම දැකපු දෙයක් තියෙනවා. "දවල් මිගෙල් රැ දනියෙල්" කථාවක් තමයි ඔබතුමා කළේ. මොක්කද ඒ කරපු කථාව? ඔබතුමා කියනවා, විදේශීය ආයෝජන ගැන. ජාත්‍යන්තරයේ අනෙකුත් රටවල් විදේශීය ආයෝජන ළඟා කර ගෙන තියෙන්නේ කොහොමද කියලා ඔබතුමා කියනවා. ඒක හොඳයි. ඊට පස්සේ ඔබතුමා අපේ රටට ලැබුණු විදේශ ආයෝජන ගැන කියනවා. අපේ රටට ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් ලැබුණා කියලා කියනවා. ඒක වැරදි තොරතුරක්. වරායේ දකුණු පර්යන්තයටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් ලැබිලා තියෙනවා; බටහිර පර්යන්තයටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් ලැබිලා තියෙනවා. ඒක විතරක් මා නිවැරදි කරනවා. ඔබතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. ආයෝජන ගෙනෙන්න ඕනෑ. ආයෝජන රටට අවශ්‍යයි. ඒ තුළින් තමයි විදේශ විනිමය ශක්තිමත් වෙන්නේ. ඒ තුළින් තමයි රට දියුණු වෙන්නේ. ඒ සියල්ලම හරි. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදී කියනවා, විදේශ ආයෝජන ගෙනෙන්න කියලා. විදේශ ආයෝජන එනකොට ඔබතුමා ජනතාවත් අරගෙන ලිප්ටන් වට රවුමට යනවා.

මේක මරු කථාවක් නේ, ගරු කථානායකතුමනි. විදේශ ආයෝජන එන්න ඕනෑ. ඒ එනකොට එතුමාගේ පූර්ණ ආශීර්වාදය ඇතුව ඒ එන විදේශ ආයෝජකයන් අනෙක් පැත්තට හරවා යවන්නත් ඕනෑ. එහෙම වෙන්නේ කොහොමද ගරු කථානායකතුමනි? එහෙම වෙන්න බැහැ. එහෙම නම් ඍජුව කියන්න ඕනෑ, විදේශ ආයෝජන එන්න ඕනෑ කියලා.

ඔබතුමන්ලාට ඉතිහාසය මතක ඇති. අපි විදේශ ආයෝජන ගේනවා. ඒක තමයි අපේ අවශ්‍යතාව. රටක් හැටියට විදේශ

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ආයෝජන එන්න ඕනෑ. විපක්ෂ නායකතුමාත් ඒක කිව්වා. ඔබතුමන්ලා දන්නවා, මහින්ද රාජපක්ෂ පස්වන විධායක ජනාධිපතිතුමාගේ කාලයේ තමයි අපට වරාය නගරය -Port City - හම්බ වුණේ කියලා. ගරු කථානායකතුමනි, වරාය නගරය ගොඩ කරන්න -පුරවන්න- විතරක් US Dollars 1.4 billion ලැබුණා. නමුත්, යහ පාලන ආණ්ඩුව ආපු ගමන් කළේ මොකක්ද? ඒ ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය නායකයා -වර්තමාන විපක්ෂ නායකතුමා- මොකක්ද කළේ? ආපු ගමන් ඒ වැඩ කටයුතු නැවැත්තුවා. ඒ වැඩ බිම මුඩු බිමක් කළා. නමුත් අපට පුළුවන් වුණා, නැවත ඒක වැඩ බිමක් බවට පත් කරන්න. ඒ කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන ගියා නම් මොකද වෙන්නේ? නමුත් එහෙම කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒකයි සිද්ධ වුණේ, ගරු කථානායකතුමනි.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඔබතුමා නිවාස ඇමතිවරයා විධියට කටයුතු කළා. ඔබතුමා අද මේ සභාවේ කළ කථාවත් එක්ක, ඔබතුමා නිවාස ඇමති වශයෙන් සිටි කාලයේ හදපු නිවාස ලැයිස්තුවක් මම ගත්තා. ගරු කථානායකතුමනි, එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ හදලා තිබුණු ගම්වල නම් ටික මම කියන්නම්. එක ගමක නමක් තමයි, සහසරගම. ඊළඟට, සොඳුරුගම, සඳසිසිලගම, සඳකිරණගම යනාදි වශයෙන් ඒ ගම්වල නම් තිබෙනවා. මේ ඔක්කෝම "ස" යන්නෙන් පටන් ගන්නේ. හැබැයි, ගෙවල් කීයද තිබෙන්නේ? එක ගමක ගෙවල් 16යි. ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමනි, සඳසිසිල ගමේ තිබෙන්නේ ගෙවල් 10යි. මේවා ලිඛිතව තිබෙනවා. මම මේවා මඩ ගහන්න කියන ඒවා නොවෙයි, ගරු කථානායකතුමනි. සඳසිසිල ගමේ තිබෙන්නේ ගෙවල් 10යි. ඊළඟට, සරණිගම. ඒකේ ගෙවල් 17යි. සරණි! සරණි! සරණිගම ගෙවල් 17යි තිබෙන්නේ. ඊළඟට, සඳරැස්ගම. දෙයියාමුදුරුවනේ! "ස" යන්නෙන්මයි පටන් ගන්නේ. මොකක් හරි බැඳීමක් තිබෙනවා, හොඳයි. විපක්ෂ නායකතුමනි, හොඳ වෙලාවට ඔබතුමා පැරදුණේ. ඔබතුමා පැරදුණේ නැත්නම් මොකද වෙන්නේ? මට මතකයි, ජනාධිපතිවරණයේදී ඔබතුමා ජනාධිපති අපේක්ෂකයා හැටියට වේදිකාවට ගොඩවෙච්ච වෙලාවක තරුණයෙක් ඇවිල්ලා වීඩියෝ එකක් පෙන්නුවා, phone එකෙන්. ඔබතුමා රැස්වීමක කථා කරනකොට ඒක වුණේ. ඔබතුමාගේ ගෝල බාලයෝ ටික මොකද කළේ? අර කොල්ලාට බිම දමාගෙන ගැහුවා. එදා ඒ කොල්ලාට බිම දමාගෙන ගැහුවා. හැබැයි, එදා ඔබතුමා දින්නා නම් එතැන ගමක් හදනවා, "සජිත්ගේ අය බිම දාගෙන නෙලුවා ගම" කියලා. අනිවාර්යයෙන්ම හදනවා. ඇයි, "ස" යන්නෙන් නේ, දෙන්නේ වැඩේ. එහෙමනම්, අනිවාර්යයෙන්ම දෙනවා වැඩේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලෝක පූජිතයි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ලෝක පූජිතයි. එහෙමනම්, ලෝක පූජිත වැඩක් කරනවා. මම මේක කිව්වේ ඇයි? බලන්න, ඔබතුමන්ලා ඒ වෙනුවෙන් දරපු ප්‍රචාරක වියදම් ටික. ගෙවල් 10ක් හදලා එතැන හදපු එලකයට වියදම් කළ මුදලින් තව ගෙවල් දහයක් හදන්න පුළුවන්, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි. අපි බලයට ඇවිල්ලා නිහඬව, මේ කොවිඩ් තත්ත්වය තුළ, මේ ආර්ථික අර්බුද අස්සේ තමුන්නාන්සේලාගෙන් බැණුම් අහගෙන, තමුන්නාන්සේලා දමන තොප්පි ටිකත් ඔක්කෝම ඔළුවට දමාගෙන මොකක්ද කරලා තිබෙන්නේ? ගරු අග්‍රාමාත්‍යතුමා යටතේ තමයි නිවාස අමාත්‍යාංශය තිබෙන්නේ. එතුමා නිවාස ඇමතිවරයා හැටියට අපේ ගරු ඉන්දික අනුරුද්ධ රාජ්‍ය ඇමතිවරයාත් එක්ක ඒ කටයුතු කරනවා. ගරු කථානායකතුමනි, මුළු රටේම ග්‍රාම නිලධාරි වසම් 14,021ක් තිබෙනවා. මේ 14,021ට එක ගමකට ගෙවල් 5 බැගින් ගෙවල් 70,105ක් හදලා දෙනවා. ගරු කථානායකතුමනි, මේ වෙනකොට ගෙවල් 21,000ක වැඩ අවසන් කරලා තිබෙනවා. නමුත්, ඒ වෙනුවෙන් එක පෝස්ටරයක් ගහලා නැහැ; ගෝඨාභය රාජපක්ෂ ජනපතිතුමාගේ මුහුණ නැහැ; මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ මුහුණ නැහැ; විෂය භාර ඇමතිතුමාගේ මුහුණ නැහැ; තොරණ නැහැ; සමරු ගල් නැහැ; "ස" යන්නේ අමාරුව නැහැ. එහෙම අමාරු නැතුව අපි රටක් හැටියට මේ අභියෝගය භාරගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඒ එක්කම එතුමා ඇඟලුම් කර්මාන්තය ගැනත් කථා කළා මම අහගෙන සිටියා. බොහොම හොඳයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ පියා ඇඟලුම් කර්මාන්තයට යමක් කළා. අපි එය පිළිගන්නවා. කවුරු වුණත් හොඳ දෙයක් කළොත්, ඒක හොඳයි කියලා අපි කියනවා. හැබැයි, ඔබතුමා ඒ ගැන කියලා, දැන් හොඳ සූරයෙක් ඕනෑ කිව්වා. මට පෙනෙන විධියට ඔබතුමා දැන් හොඳ සූරයෙක් ගැන කියන්නේ, තාත්තා වාගේම සූරයෙක් ගැන වෙන්න ඇති. බලාගෙනයි, තාත්තා වාගේම සූරයෙක් වෙනවා කියන පණිවුඩය දෙන්න යන්න එපා. 88-89 කාලය අනුර කුමාර දිසානායක මගේ මිත්‍ර මන්ත්‍රීතුමාට මතක තිබෙනවා. ඒ මතකය අපට අවදි කරවන්න වෙනවා. මොකද, ඒ වාගේ සූරයෝ ආවොත් බය වෙනවා නේ. සමහර වෙලාවට අපි අමතක වෙච්ච දේවල් මතක් කරන්නත් ඕනෑ

AMW මෝටර්සයිකල් ටයර් එකක් දෙන්නෙකුට දැම්මා. ඒ කියන්නේ දෙන්නෙකුට එකයි. අඩු ගණනේ ටයර් දෙකක් දමන්න තිබුණානේ. නැහැ, එක ටයර් එකයි දෙන්නෙකුට දැම්මේ. එහෙම ඉතිහාසයක් තිබුණා. එහෙම ඉතිහාසයක් තිබුණු නිසා එතුමන්ලා දැන් අපෙන් අහනවා, අපට උද්ඝෝෂණ කරන්න අයිතියක් නැද්ද ප්‍රජාතන්ත්‍රවාදය නැද්ද කියලා. එතුමන්ලා බලාපොරොත්තු වුණා, මිනිස්සු පොදි පිටින් එනකොට වෙන දා වාගේ කවුරු හෝ ගහයි කියලා. නැහැ, එහෙම වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, යහ පාලන ආණ්ඩුවේ ඔබතුමා ඇතුළු සියලුදෙනාගේ හෘදය සාක්ෂියෙන් මම කාරණයක් අහනවා. මේ රටේ ආබාධිත රණවිරුවන් ජනාධිපති ලේකම් කාර්යාලය ළඟට ආවා. ජනාධිපති ලේකම් කාර්යාලය ළඟට ආපු ආබාධිත රණවිරුවන්ට දෙකේ දෙකේ පොලුවලින් ගැහුවා. ගරු කථානායකතුමනි, ඔවුන්ට එළව-එළවා ගැහුවා. එහෙම ගහනකොට එක රණවිරුවෙකුගේ කෘත්‍රිම පාදයක් ගැලවුණා. අපේ පාර්ලිමේන්තු කණ්ඩායම නියෝජනය කරන ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමන්ලා-අපි එදා ඒ රණවිරුවා ළඟට ගියා. එක රණවිරුවෙකුගේ අත් දෙකම නැහැ. ගරු කථානායකතුමනි, අත් දෙකම නැති ඒ රණවිරුවා අවුරුදු හතක විතර දරු පැටියා එක්ක තමයි එතැනට ඇවිල්ලා හිටියේ. කඳුළු ගෑස් ගහලා, ඒ රණ විරුවාගේ ඇස්වලින් කඳුළු එනවා. නමුත්, ඒ රණ විරුවාට ඇස් දෙක පිහදා ගන්න බැහැ. මොකද, ඔහුගේ අත් දෙකම නැහැනේ. පොඩි එකා බෝතලයෙන් වතුර ටිකක් අරගෙන ලේන්සුව තෙමලා, තාත්තාගේ ඇස්වල තිබෙන කඳුළු පිහ දමනවා. එහෙම ඉතිහාසයක් අපට තිබෙනවා. තමුන්නාන්සේලා පපුවට තට්ටු කරලා අහන්න, ඒකද අපට කියලාත් කරවා ගන්න ඕනෑ කියලා? අපට ඒ වාගේ දේවල් කරන්න තරම් ඇඟේ අමාරුවක් නැහැ.

ගරු කථානායකතුමනි, එතුමන්ලා හම්බන්තොට ගුවන් තොටුපොළ විකුණනවාට විරුද්ධව අපි පෙළපාළි ගියා. මොකක්ද කළේ? අපේ නාමල් රාජපක්ෂ වර්තමාන ඇමතිවරයාට, ඩී.වී.

වානක රාජ්‍ය ඇමතිවරයාට, ප්‍රසන්න රණවීර රාජ්‍ය ඇමතිවරයාට මාස තුනයි දින හතක් හිර ගෙවල්වල ඉන්න සිදු වුණා. මොකක්ද දීපු ප්‍රජාතන්ත්‍රවාදය. දැන් අපි ප්‍රජාතන්ත්‍රවාදය දීලා, ඒක දැන් වැඩිපුරත් පාවිච්චි කරනවා.

ඒ වාගේම විපක්ෂ නායකතුමා ඇහුවා, සංචාරක ව්‍යාපාරය ගැන. අපේ ප්‍රසන්න රණතුංග ඇමතිතුමා ඒකට උත්තර දුන්නා. සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් පළමුවෙන්ම කරන්න තිබෙන දේ අපි කරලා තිබෙනවා. ඒ මොකක්ද? අපේ රටේ ජනතාවට එන්නත ලබා දීම. එන්නත ලබා දීම තුළින් තමයි කොවිඩ් වසංගතය මර්දනය වෙන්නේ. අද ලෝකයේ ස්ථාන පහක් තෝරා ගන්නවා, සංචාරකයන්ට ඉතා හොඳ ස්ථාන බවට. ඉන් පස්වැනි තැන ලංකාවට ලැබිලා තිබෙන්නේ අපි එන්නත ලබා දීලා, රටේ කොවිඩ් තත්ත්වය පාලනය කිරීම නිසා බව එතුමාට මම මතක් කරන්න ඕනෑ. හැබැයි, එහෙම කටයුතු කරලා තිබියදී නැවත කොවිඩ් තත්ත්වය වැඩි කරන්න පුළුවන්ද කියලා එතුමන්ලා බලනවා, ගරු කථානායකතුමනි.

ඩිජිටල් විෂයය සම්බන්ධයෙන් හිටපු ඇමතිවරයාත් කථාවක් කළා. එතුමා කළු පාට සාටකයක් බෙල්ලේ දමාගෙන තමයි කථා කළේ. සාමාන්‍යයෙන් සාටකවල පාට තිබෙනවානේ. අපේ මහින්ද රාජපක්ෂ අගමැතිතුමා -ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ ඉඳලා- කුරහන් පාට සාටකය දමාගෙන ඉන්නවා. කළු පාට සාටකයක් දමා ගන්නේ මොළය මඤ්ඤං වෙච්ච කෙනෙක්. ගමේ භාෂාවෙන් මම මේ කියන්නේ. මොළය මඤ්ඤං වුණාම තමයි කළු පාට සාටකයක් දමා ගන්නේ. කළු පාට සාටකය දමාගෙන දැන් බලනවා, පාස්කු ප්‍රහාරය අපි කරපු වැඩක් වාගේ පෙන්වන්න. පාස්කු ප්‍රහාරය වනකොට අපිද ආණ්ඩුවේ හිටියේ? අපිද, බුද්ධි අංශය භාරව හිටියේ? අපිද, ආරක්ෂාව සැලසුවේ? එදා අපේ ආරක්ෂාවත් අපට සලසා ගන්න බැරුවයි හිටියේ. අපට දීලා තිබුණු පොලිස් නිලධාරීන් දෙදෙනාත් එතුමන්ලා අයින් කරලා තිබුණා.

ගරු කථානායකතුමනි, තාත්තා කිච්ච හින්දා එතුමා එදා පල්ලියට ගියේ නැහැ. ඊට පස්සේ මොකක්ද වුණේ? අන්තිමට එතුමාට රහස් පොලීසියෙන් එන්න කිව්වා. ගරු කථානායකතුමනි, කාටවත් අසනීප වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරන්නේ නැහැ. [බාධා කිරීමක්] හැබැයි, වෙලා තිබෙන්නේ මොකක්ද කියලා බලන්නකෝ. බය වෙච්ච තරමට heart attack එකක් හැදෙනවාද? ඒ කියන්නේ, මෙහෙමත් භය වනවාද? මේ වාගේ කාඩ්බෝඩ් වීරයෝ තමයි අද ඉන්නේ. 2015-2019 කාලයේ අපි හිටියේ පැදුර කිහිල්ලේ ගහගෙනයි, ගරු කථානායකතුමනි. කොහේ යන්නද? හිර ගෙදර යන්න. ඇයි ඒ? අපි උදේට ගෙනියනවා; හවසට ගෙනියනවා. හැබැයි, අපි බය වුණේ නැහැ; අපි හැංගුණේ නැහැ. අපි කෙළින් ඒ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. එහෙම කෙළින් කථා කරන්න, කෙළින් ප්‍රශ්නවලට මුහුණ දෙන්න වගකීමක් ඇති කර ගන්න කියලා මම එතුමන්ලාට කියනවා, ගරු කථානායකතුමනි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි, ගරු කථානායකතුමනි. මට මතකයි, මේ ආණ්ඩුව භාර ගන්න ඉස්සෙල්ලා, එදා කරපු එක දෙයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

යහ පාලන ආණ්ඩුව ගන්න රටේ ගෙන ගිය එකම සටන් පාඨය තමයි, අධ්‍යාපනයට සියයට හයක් ලබා දෙන්න කියන සටන් පාඨය. අධ්‍යාපනයට සියයට හයක් අනිවාර්යයෙන් ලබා දෙන්න කියලා තමයි මහාචාර්යවරු, ආචාර්යවරු පාර දිගේ ගියේ, ගරු කථානායකතුමනි. එහෙම පාර දිගේ ගිහිල්ලා, එදා යහ පාලන ආණ්ඩුව හදාගෙන, යහ පාලන ආණ්ඩුවෙන් අධ්‍යාපනය වෙනුවෙන් සියයට හයක් ලැබුණා නම් ගරු කථානායකතුමනි,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, චමින්ද විජේසිරි ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, වෙලාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මේ කාලය අඩු කරන්නේ අපෙන්ද? එතුමාට නියමිත කාලය දැන් අවසන් වෙලා. එතුමා මුදල් ඇමතිතුමාට නියමිත කාලයෙන් ගත්තාට කමක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාගෙන්වත් කාලය අඩු කරන්නේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ කාලය අපෙන් අඩු කරන්න එපා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාගෙන්වත් කාලය අඩු කරන්නේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ කාලය මුදල් ඇමතිතුමාගෙන් කාලයෙන් අඩු කරන්න. අපෙන් කාලය අඩු කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කරන ඔය වැඩෙන් මුළු සභාවේම කාලය අඩු වෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
තව 'දොන් පෝල්' කෙනෙක්. එහෙම දොන් පෝල් ලා ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, සියයට 6 එදා දුන්නා නම්, ජෝශප් ස්ටාලින්ලා, මහින්ද ජයසිංහලා අද පාරට එන්න ඕනෑ නැහැ.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

නමුත්, කොවිඩ් අර්බුදයක් තිබෙන වෙලාවකත් ජනාධිපතිතුමාගේ ආශිර්වාදය මැද, අගමැතිතුමාගේ උපදෙස් මත අපේ මුදල් ඇමතිතුමා අධ්‍යාපනය සඳහා සියයට 7.5ක් වෙන් කරලා, ඒ තිබුණු ගුරු වැටුප් විෂමතාව ඉවත් කිරීම ගැන අපි සතුටු වෙනවා. ගරු මුදල් ඇමතිතුමනි, අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒවා තමයි අපේ අභියෝග. අපි මේ අභියෝග ජයගන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් නියමිතව තිබෙනවා.

[අ.භා. 4.40]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාගේ කථාවෙන් අද අපට තේරුණා, එතුමාට ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ සජිත් ප්‍රේමදාස මැතිතුමා හදපු ගෙවල්වල නම් පිළිබඳව බව. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කථාවේ ඉංග්‍රීසි වචනවල තිබෙන ගැඹුර -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තේරෙන්නේ නැහැ නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සජිත් ප්‍රේමදාස මැතිතුමා, හොරකම් කළා කියන්න බැහැ; දූෂණය කළා කියන්න බැහැ; තමන්ගේ පවුල් සමාගම් පෝෂණය කළා කියන්න බැහැ. එම නිසා ඕවා තමයි කියන්න තිබෙන්නේ. ඒ ගැන අපි සතුටු වෙනවා. අපි හොයලා බැලුවා, "ස" යන්නෙන් පටන් ගත්ත ගම් විතරක් නොවෙයි, "ර" යන්නෙන් පටන් ගත්ත ගම් කිහිපයකුත් සජිත් ප්‍රේමදාස මැතිතුමා කලුතර පැත්තේ හදලා තිබෙනවා. ඒ ගම මොකක්ද දන්නවාද? "රත්තරන් ගම" කියලා තමයි කියන්නේ. ඒ වාගේ ගොඩක් ගම් හදලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා මේ ආණ්ඩුව කොහේද යන්නේ කියලා. කෘෂි කර්මාන්තය කඩා වැටී තිබෙන මොහොතක ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් අපට තිබෙනවා. ඒ පිළිබඳව අපට පැහැදිලිව කියන්න. එහෙත් ජනාධිපතිතුමා ඒ ගැන ප්‍රකාශයක් කරනවා.මෙහෙත් කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රකාශයක් කරනවා; අමාත්‍යාංශ ලේකම් තව ප්‍රකාශයක් කරනවා; ඊට අමතරව රාජ්‍ය ඇමතිතුමා තවත් ප්‍රකාශයක් කරනවා; නැනෝ නයිට්‍රජන් පොහොර ගෙන්වපු මොහාන් පෙරේරා කියන හාදයෙක් තවත් ප්‍රකාශයක් කරනවා. අපි අහන්නේ ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය කවුද ක්‍රියාත්මක කරන්නේ? ඒ සම්බන්ධයෙන් අද බරපතළ තත්ත්වයක් පැන නැඟී තිබෙනවා.

අද අපේ රටට ගෙනාපු අසූචි -කක්කා- නැවට රුපියල් බිලියන 1.4ක් ගෙවන්න වෙලා. ඒක බාගන්නවාද නැද්ද කියන එක අපි දන්නේ නැහැ. ඒක බැවා හෝ නොබැවා ඔබතුමන්ලා 'කක්කා' නැවකට ඩොලර් මිලියන 6.7ක් එහෙම නැත්නම් රුපියල් බිලියන 1.4කට ආසන්න ප්‍රමාණයක් ගෙවන්න අවශ්‍ය කටයුතු කරලා.

ඊට අමතරව නැනෝ නයිට්‍රජන් පොහොර පිළිබඳව දැන් මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා බෝලය පාස් කරනවා. ශශීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමා බෝලය පාස් කරනවා. ඒ ගැන මොහාන් පෙරේරා මහත්තයා තවත් කථාවක් කියනවා. එතුමා කියන්නේ ඔබතුමා එක්ක තමයි ඒ කටයුතු කළේ කියලා. ඒ ගැන අපි දන්නේ නැහැ. හැබැයි, අමාත්‍යාංශවල තිබෙන වගකීම බලපුවාම, ගැසට් කරපුවා බලපුවාම පොහොර සම්බන්ධව තිබෙන ජාතික පොහොර ලේකම් කාර්යාලය, සීමාසහිත ලංකා පොහොර සමාගම, කොමර්ෂල් පොහොර සමාගම යන ආයතන තිබෙන්නේ ශශීන්ද්‍ර රාජපක්ෂ මහත්තයාට. ඇමතිතුමාට මේ ආයතන නැහැ. එහෙමනම් ගරු කථානායකතුමනි, කවුද මේ පොහොර ගෙන්වීමට සම්බන්ධ වුණේ? නැනෝ නයිට්‍රජන් පොහොර නිසා අද ගොවියාත් අමාරුවේ වැටිලා තිබෙනවා. අද නැනෝ පොහොර ටික සෝදා ගෙන යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ පොහොර අර්බුදය හැදුවේ වෙන කවුරුවත් නොවෙයි මේ රාජපක්ෂ ආණ්ඩුව. මේ පොහොර හොරකමට සම්බන්ධ පුද්ගලයන් කවුද කියන එක අද අපෙට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එක්කෝ කෘෂිකර්ම ඇමතිතුමාද, එහෙම නැතිනම් රාජ්‍ය ඇමතිතුමාද. එහෙමත් නැතිනම් ඔබතුමන්ලා දෙදෙනාම නොවන ඊට වඩා ප්‍රබල හස්තයක් විසින් ඒක කරනවා වෙන්නත් පුළුවන්. මේ පොහොර ප්‍රශ්නය නිර්මාණය කළේ කවුද කියන කාරණයේදී අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි දන්නවා මේක හිතලුවක් කියලා. ජනාධිපතිතුමා දැකපු හීනයක් සැබෑ කරන්න ගිහිල්ලා අද මහ කන්නයම ඉවරයි. ඔබතුමන්ලා දැන් මේ තීරණය reverse කරන්න හදනකොට අද ගොවීන්ගෙන් භාගෙට භාගයක් මහ කන්නයේ කුඹුරට බැහැලා නැහැ. මඩ වැඩවලට බැහැලා නැහැ.

ගරු කථානායකතුමනි, පාරිභෝගිකයාට අද අධික මිලට එළවලු ගන්න වෙලා තිබෙනවා. අද උදේ මම නාරාහේන්පිට ප්‍රදේශයට ගිහිල්ලා එළවලු කිහිපයක් මිලදී ගත්තා. මම ගත්තා බෝංචි ග්‍රෑම් 250ක් ගත්තා. ඒක බෙදලා බලපුවාම මේ බෝංචි කරල් දෙකට රුපියල් 6.50ක් වෙලා තිබෙනවා. කැරට් ග්‍රෑම් 250 ප්‍රමාණයක් ගත්තාම, මේ අලයක් රුපියල් 24ක් වෙලා තිබෙනවා. මේ රුපියල් 24ක කැරට් අලයක් තිබෙන්නේ; සෙල්ලම් ගණනක් නොවෙයි. මේ මාළු මිරිස් කරල රුපියල් 17ක් වෙලා තිබෙනවා. මේ වම්බටු කරල රුපියල් 22ක් වෙලා තිබෙනවා. මේ විධියට එළවලු මිල වැඩි වෙලා තිබෙන්නේ වැස්ස හින්දා විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම නුවරඑළියේ පින්නත් එක්ක දිලීර නාශක නැති වෙනකොට ඒ වගාව විනාශ වෙනවා. පොහොර නැති වෙනකොට අස්වැන්න අඩු වෙනවා. මේ ප්‍රශ්නත් එක්ක තමයි අද පාරිභෝගිකයාට රුපියල් 1,000ක්වත් නැතිව තනි වේලක් කන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද කන්න නොවෙයි ලෙව කන්න තමයි වෙලා තිබෙන්නේ. මේ තත්ත්වය නිර්මාණය කළේ වෙන කවුරුවත් නොවෙයි, ඔබතුමන්ලායි. එම නිසා මේකට වග කියන්න ඕනෑත් ඔබතුමන්ලාමයි.

ඒ වාගේම මේ ආණ්ඩුව ආයෝජන ගැන කථා කරනවා. ආයෝජන කලාප සඳහා මේ අය වැයෙන් රුපියල් මිලියන 5,000යි වෙන් කරලා තිබෙන්නේ. හැබැයි, ආයෝජන කලාප බර තොගයක් ගැන කියලා තිබෙනවා. කාබනික පොහොර නිෂ්පාදනය, ඖෂධ නිෂ්පාදනය, රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය, රබර් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන කෘෂි කාර්මික සැලසුම්, පශු සම්පත් විධියට බර තොගයක් ගැන කියලා තිබෙනවා. රුපියල් මිලියන 5,000න් මොනවාද කරන්න පුළුවන්, ගරු මුදල් ඇමතිතුමනි? මම නියෝජනය කරන බිංගිරිය ආසනයේ අපනයන සැකසුම් කලාපයට සතයක්වත් වෙන් කරලා නැහැ. ඒ සඳහා දැනට

රුපියල් මිලියන 1,100ක් වියදම් කරලා තිබෙනවා. ඒ ඉතුරු වැඩ ටික කරන්න සල්ලි නැහැ. එම නිසා මේ තිබෙන ලේඛනයත් එක්ක රුපියල් මිලියන 5,000ක් කියන්නේ මහ ගණනක් කියලා ඔබතුමා හිතාගෙන ඉන්නවා නම්, ඒක හිතලුවක්, බොරුවක්. රුපියල් මිලියන 5,000න් කරන්න පුළුවන් කෙංගෙඩියක් නැහැ. එම නිසා ඔබතුමන්ලා අද තරුණයා අසහනයට පත් කරන, රැකියා විරහිතභාවය වැඩි කරන තත්ත්වයක් තමයි උදා කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒකත් එක්ක හෙට දවසේ බරපතළ තරුණ අසහනයක් ඇති නොවුණොත් ඒක පුදුමයක් නොවෙයි. එම නිසා රැකියා උත්පාදනය සඳහා කිසිම වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා මේ අය වැයෙන් නිර්මාණය කරලා නැහැ. රැකියා කප්පාදුවක් කරගා තිබෙනවා. රාජ්‍ය සේවයේ රැකියාවකට තරුණයන්ට තිබෙන අවස්ථාව ඔබතුමන්ලා අවුරුදු 5කට block කරලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලා රැකියා උත්පාදනයට අවශ්‍ය කටයුතු කරලා නැහැ. හැබැයි, කථාවට කියන්නේ බිලී පිත්තක් දෙනවා, බිලී පිත්තක් දෙනවා, බිලී පිත්තක් දෙනවා කියලා. මොන බිලී පිතිද? අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි බිලී පිති දුන්නේ. එතුමා නිවාස ව්‍යාපෘතියක් කරනකොට, කර්මාන්තයක් කරනකොට ඒ නිවාස හිමි පුද්ගලයාට උපකරණ කට්ටලයක් දුන්නා. මහන මැෂිමක්, පෙදරේරු කට්ටලයක් දුන්නා. තමන්ගේ වත්ත වගා කරගන්න කරන්න උදව් කළා. අන්න ඒකට තමයි බිලී පිත්තක් දෙනවා කියන්නේ. එම නිසා ඔබතුමන්ලාට ඒ විධියේ වැඩ පිළිවෙළක් නැහැයි කියන එක අපට බොහොම පැහැදිලිව කියන්න පුළුවන්.

දැන් ඔබතුමන්ලා හොරකම් ගැන කියන්නේ මොනවාද? ඔබතුමන්ලා හොරකම් ගැන කියනවා. හැබැයි, අද ඔබතුමන්ලා මේ අය වැය ලේඛනය හරහා රුපියල් මිලියන 10ක turnover එකට සියයට 2.5ක tax එකක් දැම්මා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, සියයට 2.5ක් කිව්වාට, ඒකට සියයට 5ක tax එකක් වදිනවා. මොකද, වැට් එකට වැඩි ප්‍රමාණයක් එකතු වෙනවා. ඒ නිසා turnover එකට tax එකක් ගනිද්දී ඒක දෙපැත්තට යනකොට සියයට 5කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. ව්‍යාපාරිකයෙකුට මාසයකට රුපියල් මිලියන 10ක් කියන්නේ මහ ගණනක් නොවෙයි. එතකොට, මේ විධියට රුපියල් බිලියන 1,140ක් උපයාගන්න උත්සාහ කරනවා. ඔබතුමන්ලා සජාත් මවුපුඩ්ට මිලියන 35ක් උපයාගන්න -හොරකම් කරන්න- ඉඩ දීලා, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ගෙන් සූරාගෙන කනවා. ඒක තමයි ඇත්ත. ඔබතුමන්ලා ව්‍යාපාරිකයන්ට සුදු ලූනුවලින් හොරකම් කරන්න දීලා, ඇන්ටිජන්වලින් හොරකම් කරන්න දීලා, PCRවලින් හොරකම් කරන්න දීලා, සාමාන්‍ය ව්‍යාපාරිකයන්ගෙන් සියයට 2.5ක ටැක්ස් එකක් ගන්නවා කියලා පෙන්වලා සියයට 5ක ටැක්ස් එකක් ගන්නවා. ඒක සාධාරණද? ඒක සාධාරණද කියලා අපි අහනවා. අද ව්‍යාපාර වැටිලා තිබෙන්නේ. අපේ ප්‍රදේශයේ බිත්තර කර්මාන්තය වැටිලා තිබෙන්නේ. මොකද හේතුව? අද ඒ සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය නැහැ; බඩ ඉරිඟු නැහැ. බෙහෙත් ඇතුළු අනෙකුත් අවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වාගන්න විධියක් නැහැ. එම නිසා පැහැදිලිවම අද මේ රටේ කර්මාන්තකරණයට ඔබතුමා ශක්තියක් දෙනවා වෙනුවට, කර්මාන්ත කඩා වැටෙන, ව්‍යාපාරිකයා වට්ටන ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කරමින් ඉන්නේ.

ඒ වාගේම ඔබතුමන්ලා දේශීය කර්මාන්ත ගැන කථා කරනවා. අපේ රටේ භූමියේ පිහිටීමත් එක්ක කර්මාන්තවලටත් වඩා අපේ සේවා ආර්ථිකය තමයි ගොඩක් වටින්නේ. ඒ සේවා ආර්ථිකයට ශක්තියක් දෙන වැඩ පිළිවෙළක් තිබෙනවාද? අපේ ආණ්ඩුව කාලයේ අපි හැදුවා National Sports Strategy එක. ඒ ගැන ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා දන්නවා. ඒවා ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඒවා සඳහා කිසිම වැඩ පිළිවෙළක් නැහැ. Wellness tourism, boatbuilding, IT industry එක දියුණු කරන්න අපි වැඩ පිළිවෙළක් ගෙන ගියා. ගරු කථානායකතුමනි, මේ අය වැයෙන් ඒ එකකටවත් ශක්තියක් දීලා නැහැ. එම නිසා අපට පැහැදිලිව පෙනෙනවා, මේ අය වැය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ හිතලුවක් විතරයි කියලා.

බැසිල් රාජපක්ෂ මහත්මයා එනකොට තමුන්නාන්සේලා කිව්වා, මොළ 7කින් මාර වැඩ ගොඩක් කරයි කියලා. බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමනි, මම නම් කියන්නේ ඔබතුමට මොළ 7ක් නොවෙයි ඊට වඩා තිබෙනවා කියලා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ මොළ 151ක් ගිල්ල කෙනෙක්. මොළ 151ක් ගිලලා තමයි, ඔබතුමාගේ ද්විත්ව පුරවැසිභාවය අහෝසි නොකර මේ පාර්ලිමේන්තුවට එන්න රටක ව්‍යවස්ථාවක් වෙනස් කර ගත්තේ. එම නිසා ඔබතුමා මොළ 7ක කෙනෙක් නොවෙයි, මොළ 151ක් තිබෙන කෙනකු විධියට තමයි මම ඔබතුමා හඳුන්වන්නේ. මොළ 151ක් ගිලපු නිසා, ඒ 151ක් වන මොළ නැති හාදයෝ තමයි ඔය පිටුපස හිටගෙන ඉන්නේ කියන එකත් මම කියනවා. මොළයක් නැති අය දැන් අඬනවා. ගරු කථානායකතුමනි, එම නිසා පැහැදිලිවම අපට නම් තිබෙන්නේ ලජ්ජාවක්. ඒ වාගේම කනගාටුවක්, දුකක්.

මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් කියනවා, හැටනව ලක්ෂයේ කථාව කියන්න එපා කියලා. මොකද, ලක්ෂ 69ක් වන ඒ මිනිස්සු ඡන්දය දුන්නේ විශාල විශ්වාසයකින්. අපට මතකයි අපේ ප්‍රදේශවල අපි දන්නා තරුණයෝ කිව්වා, "හොඳට මතක තියාගන්න, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ආවාම තම පවුලේ කාටවත් නටන්න දෙන්නේ නැහැ, බැසිල්ලාට නටන්න හම්බවෙන්නේ නැහැ, නාමල්ලාට, චිච්ලාට, චූටිලාට නටන්න හම්බවෙන්නේ නැහැ. එතුමා දක්ෂ නායකයෙක් වෙනවා" කියලා.

ඇත්තටම ජනාධිපතිවරණය දිනුවාට පස්සේ අපටත් මේක හිතුණා. ගරු කථානායකතුමනි, අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද ගමකට යන්න පුළුවන්ද? ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ 151දෙනෙක් තියාගෙන ඔබතුමන්ලාට වණ්ඩි වෙන්න පුළුවන්. ඔබතුමන්ලාට අද ගමකට ගිහිල්ලා රැස්වීමක් තියන්න පුළුවන්ද? ඔබතුමන්ලාට පුළුවන් නම් රැස්වීමක් තියන්න. ගමට ගිහිල්ලා කථා කරන්න බලන්න. ඔබතුමන්ලා එළවනවා. ඔබතුමන්ලාට ගමට යන්න බැහැ. ඔබතුමන්ලා ඡන්ද සිතියම අකුළලා, පළාත් සභා සිතියම අකුළලා, ප්‍රාදේශීය සභා සිතියම කරකවලා. අද මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක්ම කිව්වා, "අපි පළාත් සභා මැතිවරණ පවත්වන්නේ නැහැ. ප්‍රාදේශීය සභා මැතිවරණ පවත්වන්නේ නැහැ. අපි තවත් අවුරුදු එකහමාරකින් මහ මැතිවරණයටම යනවා" කියලා. ඒ මොකද එහෙම කියන්නේ? ඔබතුමන්ලාට වෙන විකල්පයක් නැහැ. ඔබතුමන්ලාට මැතිවරණ සිතියම අකුළනවා හැර වෙනත් විකල්පයක් නැහැ. අපි අභියෝග කරනවා, ඔබතුමන්ලාට පුළුවන් නම් 2022දී ඕනෑම මැතිවරණයක් තියලා පෙන්වන්න කියලා. *[බාධා කිරීම්]* අපි -සමඟි ජනබලවේගය- දිනන හැටි, කරන හැටි පෙන්වන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා, ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මට මගේ කථාව අවසන් කරන්නම්.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගරු කථානායකතුමනි, මේක තමයි ඇත්ත. පළාත් සභා මැතිවරණය පවත්වනවා නම් පාර්ලිමේන්තුවේ අපේ හත් දෙනෙක් සූදානමින් ඉන්නවා පාර්ලිමේන්තුවෙන් අයින් වෙලා පළාත් සභා මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් කැප වෙන්න. ගරු කථානායකතුමනි, අද ආර්ථිකය කඩා වැටීමට හේතුව වෙන මොකුත් නොවෙයි, අසාර්ථක ව්‍යාපෘති ගණනාවක් කරපු නිසායි. ඒ වාගේම වැරදි තීන්දු ගත්ත නිසායි. ඔබතුමන්ලා එදා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගම එමිරේට්ස් එකෙන් ගළවලා ගත්තාට පස්සේ රුපියල් බිලියන 309,558ක් පාඩු වෙලා තිබෙනවා. මේ කාගේ සල්ලිද? ප්ලේන් එකක් දැකලා නැති අපේ අහිංසක මිනිසුන්ගේ සල්ලි. මේ ගරු සභාවේ ඉන්න හැමෝම ප්ලේන් එකක ගිහිල්ලා ඇති. නමුත් ප්ලේන් එකක් දැකලා නැති අහිංසක මිනිහාගේ කරමතටත් රුපියල් 14,070ක බදු බරක් පටවලා තිබෙනවා. අද ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ වෙන මොකුත් නොවෙයි, ඔබතුමන්ලා කරපු අසාර්ථක ව්‍යාපෘති නිසායි; ගත්ත වැරදි තීන්දු නිසායි. ඒ නිසා තමයි මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මම අවසන් කරනවා. මට තව තත්පර කීපයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. *[බාධා කිරීම්]*

ගරු මුදල් ඇමතිතුමා. ගරු මන්ත්‍රීතුමන්ලා, නිශ්ශබ්ද වෙන්න.

[අ.භා. 4.52]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (මුදල් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - நிதி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Finance)
ගරු කථානායකතුමනි, අය වැය විවාදය අවසන් කරමින් මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. මුලින්ම ඉතා පුළුල් පරාසයක් ආවරණ කරමින් විවිධ අංශ ගැන පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් වාගේම විවිධ ක්ෂේත්‍රවල නියැළී සිටින අය පශ්චාත් අය වැය සාකච්ඡාවල දී මතු කරපු කරුණු සැලකිල්ලට ගෙන, ඉදිරි කාලයේ විශේෂයෙන් මුදල් නීති පනත, ආදායම් බදු පනත සහ චක්‍රලේඛ උපදෙස් සකස් කිරීමට බලාපොරොත්තු වන බව මම සඳහන් කරන්න කැමතියි.

විශේෂයෙන්ම මේ අය වැය ලේඛන විවාදය තුළ ඉදිරිපත් කරපු කාරණා මෙසේයි පදනම් වුණේ. මගේ අය වැය ලේඛනයේ කොටස් කිහිපයක් තිබුණා. මුලින්ම මම පෙන්වලා දුන්නා රටක් හැටියට, ජනතාව හැටියට අප සතුව තිබෙන ශක්තිය. ඒ වාගේම අපට තිබෙන අභියෝග ගැන මම පැහැදිලි කළා. ඒ අභියෝග තමයි විපක්ෂයෙනුත් ඉදිරිපත් කළේ.

මගේ අය වැය ලේඛනයේ වියදම් හා ආදායම් යෝජනාවලට අමතරව යම් යම් ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කළා. ඒ ප්‍රතිපත්ති යෝජනාවල ඇතුළත් වූ කරුණු ඉදිරි කාලයේ දී තවදුරටත් සාකච්ඡා කරලා ක්‍රියාත්මක කළ යුතු නිසායි අපි ඒවා ප්‍රතිපත්ති හැටියට යෝජනා කළේ. ඒවා ගැන පක්ෂ විපක්ෂ සියලුදෙනාගෙන්ම ඉදිරිපත් වෙච්ච යෝජනා ඉදිරි කාලයේ දී අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ ඇමති මණ්ඩලයත්, රජයත් සලකා බලා අවසානයේ තීන්දු ගනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා පිළිබඳව මාගේ 5.4.9 කියන යෝජනාවේ සඳහන් වන විධියට, රාජ්‍ය සේවයේ තිබෙන වැටුප් විෂමතා ගැලපීම සඳහා, එම වැටුප් විෂමතා ඉවත් කර නව වැටුප් ව්‍යුහයක් ඇති කිරීමට කටයුතු කරන බවට මා යෝජනා කළා. විවිධ අවස්ථාවලදී අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා සහ විෂය භාර ඇමතිවරු ඉදිරිපත් කළ යෝජනා ඉදිරි කාලයේදී අපි ජාතික වැටුප් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඒ කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් මම මෙහිදී සඳහන් කරන්න ඕනෑ, මේ වනකොටත් අතිගරු ජනාධිපතිතුමා සෞඛ්‍ය සේවයේ වැටුප් විෂමතා පිළිබඳව පැහැදිලි කිරීමක් කරලා තිබෙන බව. ඒ ගැන සලකා එම වැටුප් සංශෝධන ඇතුළත් කරන බව මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ඒ වාගේම අපි දැනට මුහුණ දී තිබෙන අභියෝග අතර ඇති අපේ විදේශ විනිමය ගැටලුවට අපි ඉදිරිපත් කළ විසඳුම්වලට අමතරව විපක්ෂයෙනුත් අලුත් යෝජනාවක් ඉදිරිපත් වුණේ නැති වුණත්, ඒවා පිළිබඳව තවදුරටත් අවධාරණය කළ බව.

විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය, අපනයනය, විදේශ රැකියා හා ආයෝජන පිළිබඳව සඳහන් කළා. ඒවා ශක්තිමත් කිරීම සඳහා දැනට බාධාවක් වෙලා තිබෙන අනවශ්‍ය නීති සරල කිරීමටත්, ඒ සඳහා දිය හැකි දිරිගැන්වීම් ඉදිරි කාලයේදී ලබා දීමට අපි කටයුතු කරන බවත් කියා සිටිනවා. මේ අංශ හතර දිරිගැන්වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විශේෂ කාර්ය බලකායක් පත්කරනු ඇතැයි කියා අපි බලාපොරොත්තු වනවා.

මෑතකදී ඇති වුණු වර්ෂාපතනය සමඟ එළවලු, පලතුරු වගාවලට සිදු වී ඇති හානිකර තත්ත්වය නිසා වෙළෙඳ පොළේ සැපයුම අඩාළ වී තිබෙන අතර, එම ද්‍රව්‍යවල මිල ඉහළ ගොස් තිබෙනවා. එම නිසා උද්ධමන වේගය වැඩිවනු ඇතැයි අපි අපේක්ෂා කරනවා. එබැවින් වර්ෂාව නිමවීමත් සමඟ වහාම ක්‍රියාත්මක වන පරිදි වගා සංග්‍රාමයක් දියත් කරලා ඉදිරි මාස දෙක තුන තුළ එළවලු, පලතුරු, බිත්තර, කුකුළු මස්, මාළු, කරවල ආදිය වෙළෙඳ පොළේ සුලබ කිරීමට ප්‍රමුඛත්වය දෙනු ඇතැයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරනවා, මේ වියදම් යෝජනා ගෙන ඒමේදී අපි අධ්‍යාපනයත්, සෞඛ්‍ය ක්ෂේත්‍රයත් කෙරෙහි අවධානය යොමු කළා වාගේම කොවිඩ් උවදුර නිසා අසාධාරණයට හෝ බලපෑමට ලක් වූ පිරිස් ගැනත් සඳහන් කළ බව. නමුත්, යම් කොටසක් සඳහන් කරන්න බැරි වුණා නම්, ඒ සෑම අංශයකටම මේ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වුවන් ඒ සියලුදෙනාටම -සංචාරක ක්ෂේත්‍රයේ හෝ වෙන ඕනෑම ක්ෂේත්‍රයක සිටින සියලුදෙනාටම- සහන සැලසීමට අපි මැළි වන්නේ නැහැ කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ඒ වාගේම අපේ ජනතාවගේ ප්‍රධාන යටිතල පහසුකම් දියුණු කිරීම -විශේෂයෙන්ම සෑමට විදුලිය දීම- තවත් පුළුල් කර පානීය ජලය, මහා මාර්ග සහ නිවාස කියන අංශවලට මේ වර්ෂයේ අප අවධානය යොමු කරන බව විශේෂයෙන් සඳහන් කරනවා. ඒ තුළින් අපේ ගමේ සිටින ජනතාවට වැඩි සේවයක් කරන්න

බලාපොරොත්තු වෙනවා. මේ රටේ වැඩි ජනතාවක් ගම්වල තමයි ඉන්නේ. ඒ සියලුදෙනාටම අවශ්‍ය ශක්තිය ලබා දෙන බව මෙහිදී සඳහන් කරනවා. කොළඹ සීත කාමරවල ඉඳගෙන තීන්දු ගන්නේ නැතිව මේ කටයුත්ත අපි ගමට භාර දීලා තිබෙන බව සඳහන් කරනවා.

උතුරු-නැඟෙනහිර ප්‍රදේශ නියෝජනය කරන මහජන මන්ත්‍රීවරු සඳහන් කළා, උතුරු-නැඟෙනහිරට විශේෂ යෝජනාවක් මේ අය වැයෙන් සඳහන් කරලා නැහැ කියලා. අපි හිතන්නේ මුළු ශ්‍රී ලංකාවම එක රටක් හැටියටයි කියන එක අපි පැහැදිලිව කියනවා. අපි මේ අය වැයෙන් ග්‍රාම නිලධාරි වසම් 14,021ටත්, පළාත් පාලන කොට්ඨාස 4,917ටත් -උතුරු නැඟෙනහිර ඇතුළු සියල්ලටම- එකම විධියට මුදල් වෙන් කළ බව සඳහන් කරනවා. ඒකට ජාති, කුල, ආගම්, ප්‍රදේශ හෝ පක්ෂ භේදයක් සැලකුවේ නැහැ කියන එක මේ අවස්ථාවේදී මම සඳහන් කරනවා. මගේ ගමේ මැදමුලන, අංක 399 වසමටත් මිලියන තුනයි දුන්නේ. අනික් හැම කෙනෙකුම ඉපදිච්ච සෑම ග්‍රාම නිලධාරි වසමකටමත් එක විධියටයි දීලා තිබෙන්නේ කියන එක අපි සඳහන් කරනවා.

නමුත් අපි දන්නවා, සමහර පසුගාමී ප්‍රදේශ තිබුණු බව. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ පසුගාමී ප්‍රදේශ - lagging regions - හැටියට සලකපු උතුර සහ නැඟෙනහිරට "නැඟෙනහිර නවෝදය" ,"උතුරු වසන්තය" වැනි විශේෂිත ව්‍යාපාර හරහා සංවර්ධන වැඩපිළිවෙළක් දියත් කරපු නිසා තමයි අද ඒ ප්‍රදේශ රටේ අනික් ප්‍රදේශ තත්ත්වයට ගේන්න පුළුවන් වුණේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ පවා නැඟෙනහිර පාලම් පාරු 17ක් තිබුණා, අම්පාරෙන් පටන් ගත්තාම පුල්මුඩේ දක්වා. ඒ පාලම් පාරු 17 වෙනුවට හොඳ වර්ගයේ හොඳ පාලම් ඉදි කිරීමට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ පුළුවන් වුණා. ඒ වාගේම ඔබ දන්නවා, යාල්දේවී දුම්රිය උතුරට ගියේ නැති බව. උතුරට - යාපනයට- නැවත යාල්දේවී දුම්රිය ගෙනිච්චේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ කියන එකත් අපි කියන්න ඕනෑ. එදා වවුනියාවෙන් එහාට විදුලි බලය තිබුණේ නැහැ. චම්පික රණවක මන්ත්‍රීතුමාට මතක ඇති, එතුමා විදුලිබල ඇමතිවරයා හැටියට transmission line එක වුන්නාගම් දක්වා ගෙනියලා වුන්නාගම් ඇතුළු උතුරට තුන්සිය හැටපස් දවසේ පැය විසිහතරම විදුලි බලය දුන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ බව. ඒ නිසා අපි, අපට ඡන්ද ලැබුණාද නැද්ද කියන එක නොවෙයි, අපිත් එක්ක ඉන්නවාද නැද්ද කියන එක නොවෙයි බලන්නේ. අපි සියලු දෙනාටම එක වාගේ සලකන බව ආදරයෙන් මතක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදට නියමිත කටයුතු අවසාන වනතුරු කාලය ලබා දෙන්න සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගරු කථානායකතුමනි, මම තව විනාඩියක් ගන්නවා.

අපි බැඳුම්කර වංචාවේ මුදල් රාජ සන්තක කළා. එවැනි තව කාරණා තිබෙනවා නම්, -මෙතැනදී සඳහන් වුණා- ඒවා නීත්‍යානුකූලව ඔප්පු වුණොත් ඒවාත් පවරා ගන්න මම පසුබට වෙන්නේ නැහැ. ඒ සියලු කරුණු පාර්ලිමේන්තුවට ගෙනෙනවා. එහිදී අපට ඡන්දය දෙන්න. විපක්ෂයේ ඔබලාත් ඒවාට අත උස්සන්න. එහෙම කරලා අපි සියලුදෙනා එකතු වෙලා මේ රට ගොඩනහමු කියා ඉල්ලමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විසර්ජන පනත් කෙටුම්පත - 2022, දෙවන වර කියවීම, සභාව එකඟ ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි විරුද්ධයි. බෙදීමක් ඉල්ලනවා.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின்-*
*At the conclusion of the division bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර තමන්ගේ ආසනවල ඉඳගන්න.

දැන් ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්දය ප්‍රකාශ කරන්න.

***(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරු සියලුදෙනා ඩිජිටල් පුවරුවේ තමන්ගේ නම ඉදිරියේ ඡන්දය නිවැරැදිව ලකුණු වෙලා තිබෙනවාද කියලා බලන්න.

ඡන්දය නිවැරැදිව පාවිච්චි කිරීමට නොහැකි වූ, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සිටිනවා නම් කරුණාකර නැඟිටින්න.

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය දීමට නොහැකි වූ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවා නම්, කරුණාකර නැඟිටින්න.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය පාවිච්චි කරන්නේ කොයි ආකාරයටද?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජවරෝදියම් සම්පන්දන් මන්ත්‍රීතුමා.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
இல்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් මන්ත්‍රීවරුන් සිටිනවාද?

ඡන්දය දීමට ලබා දී තිබූ කාලය අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 153: විරුද්ධව 57: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 153: எதிராக 57: விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 153: Noes 57: Abstain 0.*

| | |
|---|---|
| G 001. Maithreepala Sirisena | Yes |
| G 002. G.L. Peiris | Yes |
| G 003. Nimal Siripala de Silva | Yes |
| G 004. Chamal Rajapaksa | Yes |
| G 005. Johnston Fernando | Yes |
| G 006. Dinesh Gunawardana | Yes |
| G 007. Mahinda Rajapaksa | Yes |
| G 009. Basil Rajapaksa | Yes |
| G 010. Pavithradevi Wanniarachchi | Yes |
| G 011. Douglas Devananda | Yes |
| G 013. Bandula Gunawardana | Yes |
| G 014. Janaka Bandara Tennakoon | Yes |
| G 015. C.B. Ratnayake | Yes |
| G 016. Keheliya Rambukwella | Yes |
| G 017. Dullas Alahapperuma | Yes |
| G 018. Wimal Weerawansa | Yes |
| G 019. Mahinda Amaraweera | Yes |
| G 020. Vasudeva Nanayakkara | Yes |
| G 021. Ranjith Siyambalapitiya | Yes |
| G 022. S.M. Chandrasena | Yes |
| G 023. Mahindananda Aluthgamage | Yes |
| G 024. Udaya Gammanpila | Yes |
| G 025. Ramesh Pathirana | Yes |
| G 026. Prasanna Ranatunga | Yes |
| G 027. Namal Rajapaksa | Yes |
| G 028. Rohitha Abeygunawardana | Yes |
| G 029. Ali Sabry | Yes |
| G 030. Sarath Weerasekara | Yes |
| G 031. Susil Premajayanth | Yes |
| G 032. Piyankara Jayaratne | Yes |
| G 033. Duminda Dissanayake | Yes |
| G 034. Dayasiri Jayasekara | Yes |
| G 035. Lasantha Alagiyawanna | Yes |
| G 036. Sudarshini Fernandopulle | Yes |
| G 037. Arundika Fernando | Yes |
| G 038. Nimal Lanza | Yes |
| G 039. Wimalaweera Dissanayaka | Yes |
| G 040. Jayantha Samaraweera | Yes |
| G 041. Angajan Ramamathan | Yes |
| G 042. Dilum Amunugama | Yes |
| G 043. Mohan Priyadarshana | Yes |
| G 044. Vijitha Berugoda | Yes |
| G 045. Roshan Ranasinghe | Yes |
| G 046. Lohan Ratwatte | Yes |
| G 047. Janaka Wakkumbura | Yes |
| G 049. Shehan Semasinghe | Yes |
| G 050. Kanaka Herath | Yes |
| G 051. Sanath Nishantha | Yes |
| G 052. Tharaka Balasuriya | Yes |
| G 053. Kanchana Wijesekara | Yes |
| G 054. Indika Anuruddha | Yes |
| G 055. Siripala Gamalath | Yes |
| G 056. Anuradha Jayaratne | Yes |
| G 057. S. Viyalanderan | Yes |
| G 058. Thenuka Vidanagamage | Yes |
| G 059. D.V. Chanaka | Yes |
| G 060. Sisira Jayakody | Yes |
| G 061. Piyal Nishantha De Silva | Yes |
| G 062. Prasanna Ranaweera | Yes |
| G 063. D.B. Herath | Yes |
| G 064. Nalaka Godahewa | Yes |
| G 065. Channa Jayasumana | Yes |
| G 066. Jeewan Thondaman | Yes |
| G 067. Shasheendra Rajapaksa | Yes |
| G 068. Seetha Arambepola | Yes |
| G 069. Mahinda Samarasinghe | Yes |
| G 070. S.B. Dissanayake | Yes |
| G 071. W.D.J. Senewiratne | Yes |
| G 072. Anura Priyadharshana Yapa | Yes |
| G 073. A.L.M.Athaullah | Yes |
| G 074. Tissa Vitharana | Yes |
| G 075. Dilan Perera | Yes |
| G 076. Jagath Pushpakumara | Yes |
| G 077. Jayarathna Herath | Yes |
| G 079. Chandima Weerakkody | Yes |
| G 080. Rohana Dissanayaka | Yes |
| G 081. Premalal Jayasekera | Yes |
| G 082. Shantha Bandara | Yes |
| G 083. Sarathie Dusmantha | Yes |
| G 084. K. Kadder Masthan | Yes |
| G 085. Asoka Priyantha | Yes |
| G 086. Jayantha Ketagoda | Yes |
| G 087. Mohamed Musammil | Yes |
| G 089. A. Aravindh Kumar | Yes |
| G 090. Amarakeerthi Athukorala | Yes |

| | |
|---|---|
| G 091. Kapila Athukorala | Yes |
| G 092. Sampath Athukorala | Yes |
| G 093. Thisakutti Arachchi | Yes |
| G 094. U.K. Sumith Udukumbura | Yes |
| G 095. Pradeep Undugoda | Yes |
| G 096. Sanjeewa Edirimanna | Yes |
| G 097. Akila Ellawala | Yes |
| G 098. Lalith Ellawala | Yes |
| G 099. Udayana Chaminda Kiringoda | Yes |
| G 100. Jagath Kumara | Yes |
| G 101. Geetha Kumarasinghe | Yes |
| G 102. K.P.S. Kumarasiri | Yes |
| G 103. Karunadasa Kodithuwakku | Yes |
| G 104. Nalaka Bandara Kottegoda | Yes |
| G 105. Upul Galappaththi | Yes |
| G 106. Udayakantha Gunathilaka | Yes |
| G 107. Kokila Gunawardene | Yes |
| G 108. S. Chadrakanthan | Yes |
| G 109. Milan Jayathilake | Yes |
| G 110. Kulasinghsm Thileepan | Yes |
| G 111. Pramitha Bandara Tennakoon | Yes |
| G 112. Shan Vijayalal de Silva | Yes |
| G 113. Chamara Sampath Dasanayake | Yes |
| G 114. Sudarshana Denipitiya | Yes |
| G 115. Isuru Dodangoda | Yes |
| G 116. Sagara Kariyawasam | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 002. Rajitha Senaratne | No |
| O 003. Imthiaz Bakeer Markar | No |
| O 004. Tissa Attanayake | No |
| O 005. Rauff Hakeem | No |
| O 006. Gayantha Karunatileka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 009. Kumara Welgama | No |
| O 010. Patali Champika Ranawaka | No |
| O 011. Palany Thigambaram | No |
| O 013. Ranil Wickramasinghe | No |
| O 015. A. Adaikkalanthan | No |
| O 016. Anura Dissanayake | No |
| O 017. G.G. Ponnambalam | No |
| O 018. A.A.S.M. Raheem | Yes |
| O 020. Athureliye Rathana Thero | Yes |
| O 021. Kabir Hashim | No |
| O 022. Thalatha Atukorala | No |
| O 023. Abdul Haleem | No |
| O 024. Harin Fernando | No |
| O 026. Harsha De Silva | No |
| O 028. R.M. Ranjith Madduma Bandara | No |
| O 029. Dilip Wedaarachchi | No |
| O 030. Niroshan Perera | No |
| O 031. Eran Wickramarathne | No |
| O 032. J.C. Alawathuwala | No |
| O 034. Dharmalingam Sithadthan | No |
| O 035. Vijitha Herath | No |
| O 036. Harini Amarasuriya | No |
| O 037. Selwarasa Gajenthiran | No |
| O 038. S. Noharathalingam | No |
| O 039. S. Shritharan | No |
| O 041. Vadivel Suresh | No |
| O 042. Ashok Abeysinghe | No |
| O 043. Ajith Mannapperuma | No |
| O 044. Buddhika Pathirana | No |
| O 045. Manusha Nanayakkara | No |
| O 046. Nalin Bandara Jayamaha | No |
| O 047. Hector Appuhamy | No |
| O 048. Thushara Indunil Amarasena | No |
| O 049. Velu Kumar | No |
| O 050. Kavinda Heshan Jayawardana | No |
| O 051. Mayantha Dissanayake | No |
| O 052. Sujith Sanjaya Perera | No |
| O 053. S.M. Marikkar | No |
| O 054. Imran Maharoof | No |
| O 055. Mujibur Rahuman | No |
| O 056. Harshana Rajakaruna | No |
| O 058. I. Charles Nirmalanathan | No |
| O 060. Thavaraja Kalai Arasan | No |
| O 061. Rohini Kumari Wijerathne | No |
| O 062. Chaminda Wijesiri | No |
| O 063. Hesha Withanage | No |
| O 064. Waruna Liyanage | No |
| O 065. M. Udayakumar | No |
| O 066. W.H.M. Dharmasena | No |
| O 067. Kins Nelson | No |
| O 068. Rohana Bandara | No |
| O 075. Faizal Cassim | Yes |
| O 076. H.M.M. Harees | Yes |
| O 078. Ishak Rahuman | Yes |
| O 079. Naseer Ahamed | Yes |
| O 080. Muszhaaraff Muthunabeen | Yes |
| O 081. Premanath C. Dolawaththa | Yes |
| O 082. H.Nandasena | Yes |
| O 083. Gayashan Nawananda | Yes |
| O 084. Asanka Nawaratne | Yes |
| O 085. Anupa Pasqual | Yes |
| O 086. Nimal Piyatissa | Yes |
| O 087. Muditha Prishanthi | Yes |
| O 088. Uddika Premaratne | Yes |
| O 089. Nalin Fernando | Yes |
| O 090. Sudath Manjula | Yes |
| O 091. Chinthaka Mayadunna | Yes |
| O 092. Wasantha Yapa Bandara | Yes |
| O 093. Nipuna Ranawaka | Yes |
| O 094. B.Y.G. Rathnasekara | Yes |
| O 095. Kumarasiri Ratnayaka | Yes |
| O 096. Ajith Rajapaksa | Yes |
| O 097. Gunathilaka Rajapaksa | Yes |
| O 098. Thilak Rajapaksa | Yes |
| O 099. Upul Mahendra Rajapaksa | Yes |
| O 100. M. Rameshwaran | Yes |
| O 101. Gamini Waleboda | Yes |
| O 102. Rajika Wickramasinghe | Yes |
| O 103. Sahan Pradeep Withana | Yes |
| O 104. Madura Withanage | Yes |
| O 105. D. Weerasinghe | Yes |
| O 106. Weerasumana Weerasinghe | Yes |
| O 108. Gevindu Cumaratunga | Yes |
| O 109. Yadamini Gunawardena | Yes |
| O 110. Manjula Dissanayake | Yes |
| O 111. Ranjith Bandara | Yes |
| O 112. Surendra Raghavan | Yes |
| O 113. Jayantha Weerasinghe | Yes |
| O 114. Charitha Herath | Yes |
| O 115. Marjan Faleel | Yes |
| O 116. Diana Gamage | Yes |

*Electronic Voting Result:*

**Participants:**

| | |
|---|---|
| Present | 210 |

**Votes:**

| | |
|---|---|
| Yes | 153 |
| No | 57 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

විද්‍යුත් ඡන්ද ක්‍රමයට අනුව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 153යි; විරුද්ධව 57යි. නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව විරුද්ධව ලබාදුන් මුළු ඡන්ද සංඛ්‍යාව 60යි.

ඒ අනුව විසර්ජන පනත් කෙටුම්පත, 2022 දෙවැනි වර කියවීම සම්මතයි.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம்முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන්, "විසර්ජන පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභාව කවදාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
2021 නොවැම්බර් 23වන අඟහරුවාදා.

***පනත් කෙටුම්පත, අංක 57 දරන ස්ථාවර නියෝගය යටතේ, 2021 නොවැම්බර් 23 වන අඟහරුවාදා පවත්වන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී.***

*சட்டமூலம், நிலைக்கட்டளை இல. 57இன்படி, 2021 நவம்பர் 23, செவ்வாய்க்கிழமை நடைபெறவிருக்கும் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.*

*Bill committed to a Committee of the whole Parliament under Standing Order No. 57 for Tuesday, 23rd November, 2021.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.20ට, 2021 නොවැම්බර් 20වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 23වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.20 மணிக்கு பாராளுமன்றம், அதனது 2021 நவம்பர் 20ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 23, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.20 p.m. until 9.30 a.m. on Tuesday, 23rd November, 2021 pursuant to the Resolution of Parliament of 20th November, 2021.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.